අභීතත්ව වර්ගය

සප්තමතරඞ්ගියකථාසූචි

පිට	වස්තුව	
1001	1	වෛද්‍යවාග්‍යීජීවකයන් ඇසූ ප්‍රශ්නයෙක්
1012	2	මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ගුණකථාවක්
1016	3	බෙලට්ඨසීස මහා ස්ථවිරයන් වහන්සේ
1021	4	අනුරුද්ධ මහා ස්ථවිරයන් වහන්සේ
1029	5	මහාකාත්‍යායන මහා ස්ථවිරයන් වහන්සේ
1042	6	ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ
1082	7	සන්හැවිරිදි මහාරහතුන් වහන්සේ
1086	8	ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ ප්‍රශ්නයකට පිළිතුරු දුන් හැටි
1094	9	මගුලේ ගොස් එන අතරමගදී මහණවීම
1112	10	වෙසඟනක්

වෛද්‍යාචාර්‍යජීවකයන් ඇසූ ප්‍රශ්නයෙක්.

7 - 1

දෙවිදත් තෙරතුමෝ එක් කලෙක අජාසත් රජුගේ සහාය ලැබ බුදුරජුන් මරන්නට හිජුකුළු පව්වට නැග, බුදුරජුන් මුදුනට **ගලක්** පෙරළුහ. ගල පහත හෙන විට අනික් ගල් කුළු දෙකක් ඉදිරියට නෙරා එය නවතා ලී ය. ගලින් ගල වැදීමෙන් නැගි ගල් පතුරෙක් විසි වී ගොස් බුදුරජුන් පය හැපින. ගල හැපීමෙන් තැළුනු එතැන ලේ එකතු වීමෙන් බලවත් වේදනාවක් උපන. එකල්හි භික්ෂූන් වහන්සේලා උන්වහන්සේ මද්දකුච්ඡියට වැඩමවා ගෙණ ගියහ. එ තැනින් ජීවකයාගේ අඹවනයට වඩිනු කැමැති වූ උන්වහන්සේ 'මා ජීවකයාගේ අඹවනයට ගෙණ යන්නැ' යි කිහ. භික්ෂූන් වහන්සේලා උන්වහන්සේ ඔසොවා ගෙණ එහි ගියහ. **ජීවක** තෙමේ බුදුරජුන් වෙත පැමිණ තුවාලය පරීක්ෂා කොට බලා එහි කාරම් බෙහෙත් බැඳ 'සවාමීන් වහන්ස! මම දුන් ලෙඛකු බලන්නට නුවරට යන්නෙමි, මා පෙරළා එනතුරු මේ බැන්ද බේත නොලිහා නිබෙන්නට හරිනු මැනැවැ' යි වැඳ, අවසර ගෙණ නුවර ලෙඩා බලන්නට ගියේ ය. එහි දී ඔහුට රෝ විය. ලෙඩාට කළු යුතු පිළියම් කොට, නුවර දෙර වසන්නට කලින් නුවරින් බැහැර වන්නට සිතා එ තැනින් ආයේ ද, කල් තබා දෙර වසා තුබූ බැවින් නුවරින් බැහැර වන්නට නොහැකි විය. එහි ලඟාවත් ම දෙර වසා තුබුනේ ය.

එයින් අමාරුවට වැටුනු ජීවක තෙමේ 'අස්යෝ! මා කලේ ලොකු වරදෙකි, සාමාන්‍ය මිනිසකු සිරුරෙහි තුවාලයක සේ බුදුරජුන්ගේ පාදයෙහි බෙහෙත් බැඳ ආමි, දුන් එය ලිහා හැරිය යුතු වේලාව ය, එසේ නොකලොත් මුළු සිරුරෙහි දුවිල්ල පැතිර යයි, එය ලොකු ම වරදෙකි, මාගේ උගත් කමින් ඇති පලය කුමක් දැ, යි සිතන්නට වන. එ වේලෙහි බුදුරජානන් වහන්සේ අනඳ තෙරුන් කැඳවා 'ආනන්ද ය! ජීවකයාට නුවරින් බැහැර වන්නට නොහැකි ව නුවර තුළ ම සිට තුවාලයෙහි බැඳි බේත ලිහා දමන්නට දුන් වේලාය, යි සිතයි, එහෙයින් මේ බේත ලිහා අස් කරන්නැ' යි වදාළ සේක. අනඳ තෙරුන් වහන්සේ එසේ කළහ. තුවාලයෙන් බේත අස් කළ හැටියේ ම ගසකින් මැලියමක් ගැලවී වැටෙන්නා සේ ලේ කැටි ව තුබූ මුළු වණය ගැලවී වැටුනේ ය. ජීවකයෝ

පාත් වත් ම වහා පැමිණ 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! බුදුරජානන් වහන්සේගේ සිරුරෙහි දූවිල්ලක් හට ගතු දූ' යි ඇසූහ. එවිට උන්වහන්සේ 'ජීවක ය! කුමක් අසහු ද, මම සියලු දූවිලි තැවිලි බෝ මැඩ දී ම හැරපීමි, බෝ මැඩ දී ම තථාගතයන්ගේ හැම දාහයෝ නිවී ගියහ' යි අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:

ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි,
සබ්බගන්ථප්පහීණස්ස පරිලාහො නවිජ්ජතී ති.

ගොස් නිම වූ සසර මග ඇති ශොක රහිත වූ සියලු තන්හි වෙසෙසින් (නො ඇලී එයින්) මිදුනු, සියලු ග්‍රන්ථයන් ප්‍රහීණ කළහුට සිත් දූවිල්ලෙක් නැත්තේ ය.

ගතද්ධිනො = ගිය මග ඇති. ගොස් අවසන් කළ මග ඇති.

යම් තරම් මග යා යුතු නම්, යා යුතු ඒ සියලු මග ගොස් අවසන් කළ, ඉදිරියෙහි යා යුතු මගක් නැති රහතුන් වහන්සේ **ගතද්ධි,** නම් වෙත්. **'කන්තාරඩානවට්ටඩානා'ති මෙ අඩානා නාම'** යනු අටුවා හෙයින් ලොකවාසී සත්ත්වයන් විසින් යා යුතු මාගී දෙකක් ඇති බව පෙනේ. ඒ නම් කතරමග සසර මග යන දෙමග ය.

කතරමග වනාහි **චොරකන්තාර-වාලකන්තාර-නිරුදක-කන්තාර - අමනුස්සකන්තාර - අප්පබ්භක්ඛකන්තාර** යි පස් වැදෑරුම් ය. හොරුන් බහුල ව වසන හොරුන් අරක් ගත් මාගීය **චොරකන්තාර** නම්. සිංහ වග කොටි වළස් ආදී වණ්ඩ සත්ත්වයන් ගණ සැරේට වසන ඔවුන් අරක් ගත් මාගීය **වාලකන්තාර** නම්. යම් මගක නාන බොන දිය නැත් ද ඒ මාගීය **නිරුදකකන්තාර** නම්. යක් රකුස් ඈ නො මිනිසුන් අරක් ගත් මාගීය **අමනුස්සකන්තාර** නම්. යම් මගක කඳ මුල් පලතුරු ඈ කෑ යුතු දේ නැත් ද ඒ මාගීය **අප්පබ්භක්ඛකන්තාර** නම්. මේ කී එක් මගෙක් වත් මෙහි අභිමත නො වේ. සසරමගය මෙහි අභිමත. ඒ නම් සන්තති වශයෙන් නො කැඩී යන එකකට එකක් තුඩු දී පවත්නා ස්කන්ධ ධාතු ආයතනයන් පිළිබඳ පටිපාටිය යි. **'දීඝො බාලානං සංසාරො,** යන්නට කළ පරිකථාව බලනු.

කතරමගට පිළිපන්නේ, තමන් බලාපොරොත්තු තැනට යම් තාක් නො පැමිණියේ ද, ඒතාක් **අඛිකා,** නම් වේ. බලා-පොරොත්තු තැනට පැමිණියේ **ගතඛි,** නම්. සසර, ජාතියෙන්

ජාතියෙහි ඉපිද යන හැම කෙනෙක් ම එසේ ඉපිද යන තුරුම අඛ්ධික නම් වෙති. සසර මග අවසන් නොකළ බැවිනි. ඒ සෝවන් මග ආදියට පැමිණි සප්තවිධ ආර්‍යයෝ ද මූළුමනින් සසර ගමන අවසන් නොකළ බැවින් අඛ්ධිකයෝ ය. සසර ගමන මූළුමනින් අවසන් කොට සිටි රහතුන් වහන්සේය ගතඞ්. මෙහි අදහස් කරණ ලද්දේ ද උන්වහන්සේ ම ය. ගතද්ධිනොං, යනු, ඛීණාසවස්ස, යනු අපෙක්‍ෂා කොට සම්බන්ධ්‍ය ගෙණ සිටියි.

විසොකස්ස= ශොක නැත්තා වූ. පහවූ ශොක ඇති.

විසර්‍ය වතුස්සත්‍යකථාවෙහි එන්නේ ය. ශොකයාගේ ප්‍රහාණය අනාගැමි මඟින් වේ. අනාගාමීමාර්‍ගයෙන් වෘත්තමූලක ශොකය ප්‍රහීණ කළ බැවින් රහතුන් වහන්සේ පහ වූ ශොක ඇති සේක. නිශ්ශොකී සේක.

විප්පමුත්තස්ස = විශෙෂයෙන් මිදුනු.

රහතුන් වහන්සේ ස්කන්ඞ ධාතු ආයතනාදී වූ හැම එකකින් ම මිදුනු බැවින් මොකකුත් නොගෙණ කොතැනකත් නොඇලී ඉතා හොඳින් මිදුනු සේක. කොතැනකත් නොගැටෙන සේක. **'සොඉමං පඨවිං විජෙස්සති'** යන්නෙහි පරිකථාව බලනු.

සබ්බධි = සියලු තන්හි.

ස්කන්ඞ ධාතු ආයතනාදී වූ සියලු තන්හි යි සේ ය.
සබ්බගන්ථප්පහීණස්ස – සියලු ග්‍රන්ථයන් පහ කළ රහතුන් වහන්සේට.

රහතුන් වහන්සේ ය මෙයින් ගණු ලබන්නෝ. මේ පදයත් ගෙන් කිය වෙන තේරුම රහතුන් වහන්සේ කෙරෙහි ම යෙදෙන බැවිනි.

ප්‍රහීණ කළ යුතු කාය ග්‍රන්ථිහු සතර දෙනෙකි. අභිධ්‍යා-ව්‍යාපාද- ශීලව්‍රතපරාමර්‍ශී- ඉදංසත්‍යාභිනිවෙශ යි. **'චතස්සොරෙ ගන්ථා අභිජ්ඣා කායගන්ථො, ව්‍යාපාදෙ කායගන්ථො' සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසෙ කායගන්ථො'** යනු දෙශනා ය.

අභිධ්‍යාකායග්‍රන්ථය සවිස්තර විසින් වදාරන බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක: **'තත්‍ථ කතමෙ අභිජ්ඣාකායගන්ථා? යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පලිගෙධො සංගො පඞ්කො එජා මායා**

ජනිකා සංජනනී සිබ්බනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී දුතියා පණ්ඩි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු ආසා ආසිංසනා ආසිංසිතත්තං රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා සාධුකම්‍යතා අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහායනා සම්පත්ථනා කාම තණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාර බලිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො අභිජ්ඣා ලොභො අකුසලමුලං අයං වුච්චති අභිජ්ඣාකායගන්ථො' යි.

යම් සිතිවිල්ලෙකින් අනුන් අයත් වස්තුව, සම්පත්තිය මට වේවා යි අභිමුඛ කොට සිතා ද ඒ සිතිවිල්ල අභිජ්ඣා නම්. 'අභිජ්ඣායතී ති = අභිජ්ඣා' යි යන මෙයින් ඒ පෙනේ. එහි අර්ථය තවත් පැහැදිලි කරන්නට 'පරභණ්ඩාභිමුඛී ගුත්වා තන්නිත්තතාය පවත්තතී'ති අත්ථො' යනු කීහ. පරභාණ්ඩ යනට අභිමුඛ ව එයට නතු ව පවත්නා බැවින් ඒ සිතිවිල්ල අභිජ්ඣා නම් ය, යනු එහි අර්ථයි. මෙහිලා කොටින් කිය යුත්තේ 'මෙය මට ලැබුනේ නම් යහපතැ යි අනුන් අයත් වස්තුවට තුඩු දී එයට නැමී ලොභ වසයෙන් සිතීම පැතීම අභිඩ්‍යාය යන බව ය. 'පරභණ්ඩාභිජ්ඣායනලක්ඛණා' යි කියූ බැවින් අභිඩ්‍යාව අනුන් අයත් වස්තුව අභිමුඛ කොට සිතීම ලක්ෂණ කොට සිටී ය යි කිව යුතු ය.

මේ වනාහි සිත මුළුමනින් කෙලසන ධර්මයකැ යි ආගම ධර්මයෙහි එයි. තමන් සතු වස්තුවෙහි පැතීම් වශයෙන් පැවැති දුර්ලලොභය ඡන්දකාමය කොටත්, පැතූ වස්තුවෙහි ඇලීම් වස-යෙන් පැවැති එයට වඩා බලවත් ලොභය රාගකාමය කොටත් දක්වා එ දෙකට ම වඩා බලගතු ලොභය අභිඩ්‍යා යි ද දක්වූහ. තවද අන්සතු වස්තුවෙහි පැවැති ඡන්දරාගය විසමලොභ ය යි ද කියත්. තමන් සතු වස්තුවෙහි වේවා, අනුන් සතු වස්තුවෙහි වේවා, යුතු තැන සිටි ඡන්දරාගය අභිඩ්‍යා යි ද

අයුතු තැන සිටි ඡන්දරාගය විසමලෝභ යි ද දක්වන ලද්දේ ය. යුතු තැන හෝ වේවා, අයුතු තැන හෝ වේවා, **'රාගො විසමං දොසො විසමං මොහො විසමං'** යි වදාළ බැවින් කියන් ලෝභයෙක් අවිසම වූයේ නැත ඉදිරියට එළවා සිතීම් අඵියෙන් අභිඛ්‍යා ය. විසම අඵියෙන් විසම ය. මෙහි අකුරු වශයෙන් වෙනස් වුව ද අර්ථ වශයෙන් වෙනසක් නැත. ඒ මේ අභිඛ්‍යාවිෂමලෝභය සිතෙහි ම ඉපිද සිත දූෂිත කරයි. සිතට පිරිසිදු වන්නට සිතට බැබලෙන්නට ඉඩ නො දෙයි. එ හෙයිනි විතෙනාපකෙලෙසෝ යි කීයේ.

අභිඛ්‍යාව හෙතු කොට අන් සතු වසතුව තමා නතු කර ගත් කල්හි ම **කම්මපථය** වේ. නැත, **කම්මමත්තයෙක්** වේ. මෙය අල්ප සාවද්‍යත් මහාසාවද්‍යත් වේ. අන් සතු නො අඟිනා දෙයක් තමා නතු කොට ගැන්ම ගුණ හීන වූවකු අයත් දෙයක් තමා නතු කොට ගැන්ම අල්පසාවද්‍ය වේ. වටින දෙයක් ගැණුම, ගුණාඩ්‍ය කයකු අයත් දෙයක් ගැණුම මහාසාවද්‍ය වේ. පරායත්තවසතුවක් වීම තමාට එය නතු කරගැන්ම, යි අභිජ්ඣාවෙහි අඩංග දෙකෙකි.

අභිඛ්‍යාව රැඳීම් වසයෙන් පවත්නා කල **රාග** නම්. ඒ ම බලවත් ව පවත්නා කල **සාරාග** නම්. සත්ත්වයන් පස්කම් සැපතෙහි ලා පමුණුවන කල **අනුනය** නම්. කැමැති වීම් වසයෙන් පවත්නා කල **අනුරොධ** නම්. එක් අරමුණෙක එක් වරක් ඇලෙන කල සත්ත්වයන් ඒ ඒ භවයෙහි අලවන කල **නන්දි** නම්. නැවැත නැවැත උපදින කල **නන්දිරාග** නම්. අරමුණු කැමැති වීම් වසයෙන් පවත්නා කල **ඉච්ඡා** නම්. සත්ත්වයන්ගේ මූර්ඡාවට කරුණුවන කල **මුච්ඡා** නම්. ගිල අවසනට පමුණුවා ගැණීම් වශයෙන් පවත්නා කල **අජ්ඣොසාන** නම්. සත්ත්වයන් ගිජු බවට පමුණුවන කල **ගෙධ** නම්. ඒ ඒ අරමුණෙහි සත්ත්වයන් අලවන කල, එසේ ම නම්. ඒ ඒ අරමුණෙහි ලැගෙන කල **සඞ්ග** නම්. කිදා බස්වන කල **පසඞ්ග** නම්. සසරට අදින කල **එජා** නම්. ඒ ඒ භවයෙහි උපතට සත්ත්වයන් ඇද යන්නී මෝය. වංචා කිරීම් වසයෙන් පවත්නා කල **මායා** නම්. සත්ත්වයා සසර උපදවන කල **සනිඨා** නම්. සත්ත්වයා සසර දුක හා යොදන කල **සඤ්ඤානි** නම්. සත්ත්වයා වුනිපටිසන්ධි වසයෙන් සසර හා එක් කොට මසන ගලපන කල **සිඛණී** නම්. සසරින් බැහැර යන්නට නො දීමෙන් දැලක් වැනි ව පවත්නා කල **ජාලිනී** නම්. ඉක්මන් ගමන් ඇති සැඩ පහරක් සේ පවත්නා කල **සරිතා** නම්. රූප,

ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධර්ම, කුල, ගණ යන මේ තන්හි ඇලීම් පැතිරීම් වසයෙන් පවත්නා කල **විසතණ්හා** නම්. විපත් ලංකර දෙන අරුතින් **සුතන** නම්. රූපාදීන් කෙරෙහි පැතිර යන අරුතින් **විසටා** නම්. ඒ ඒ වස්තූන් ලබා ගැණුමෙහි සත්ත්වයන් උත්සාහවත් කරණ අරුතින් **ආයුහනී** නම්. කළකිරෙන්ට නොදී සහායකු සේ පවතින අරුතින් **දුතියා** නම්. සසර කළකිරෙන්නට නොදී ගිය ගිය තැන ප්‍රිය සහායකු සේ සත්ත්වයන් සසරෙහිලා අලවන්නී මෝය. පැතිම් අරුතින් **පණිධි** නම්. රැහැණින් ගෙල බැඳි ගොනුන් සේ **කාමැති** කාමැති තැනට සත්ත්වයන් පමුණුවන අරුතින් **භවනෙතති** නම්. ඒ ඒ අරමුණු භජනය කරණ අරුතින් **වන** නම්. ඒ ඒ අරමුණෙහි සත්ත්වයන් බලවත්තර ව අලවන අරුතින් **වනථ** නම්. එකතුවීම් අරුතින් **සන්තව** නම්. සෙනේ කිරීම් අරුතින් **සිනෙහ** නම්. ආලය කිරීම් වසයෙන් බලාපොරොත්තු වන අරුතින් **අපෙක්ඛා** නම්. වෙන වෙන අරමුණෙහි බැඳීම් අරුතින් හෝ නැ අරුතින් හෝ **පටිබන්ධු** නම්. අරමුණ බුදින අරුතින් **ආසා** නම්. පැතීම් අරුතින් **ආසිංසනා** නම්. පැතුබව **ආසිංසිතත්ත** නම්. රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ලාභ ධන පුත්‍ර ජීවිත යන මේ තැන්හි වූ ආසා **රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා** නම්. මෙහි පද නවය ආසා පවත්නා තැන් ඉසින් වදරන ලද්දේ ය. එහි රූපාසාදි පස පංචකාම වසයෙන්, පැවිද්දන්ට විශෙෂ බැවින් සවැන්න පරිකඛාරලොභ වසයෙන්, සෙසු තුන ගිහින් පිළිබඳ අකාප්පි කරවස්තුවශයෙන් වදරන ලදැ යි ද දත යුතු ය.

ගිහියන්ට ධන පුත්‍ර ජීවිත යන මෙ තුනට වඩා ප්‍රියතර වසතුවෙක් නැත. 'මෙය මාගේ, තෙල මාගේ' යි හෝ මෙය මට අසුවලා විසින් දෙන ලද ය, මෙය අසුවලා විසින් දෙන ලදු යි හෝ සත්ත්වයන් ලවා කියවන අරුතින් **ජප්පා** නම්. **පජප්පා අභිජප්පා** යනු එහි ම උපසර්ග විසින් වැඩුනේ ය. කියවන අයුරින් පවත්නා අරුතින් **ජප්පනා** නම්. කියූවහුගේ භාවය **ජප්පිතත්ත** නම්. පස්කම්හි පුන පුනා ලොල් වන අරුතින් **ලොලුප** නම්. ලොල්වූවහුගේ භාවය **ලොලුප්ප** නම්. ලොල් වන ආකාරය **ලොලුප්පායනා** නම්. **ලොලුප්පායිතත්ත** යනු ලොලුපප යන අරුත්හි ම ය. ලාභ ලත් තැන නගුට සලන බල්ලකු සේ සත්ත්වයන්ගේ සැලීමට කරුණුය යන අරුතින් **සුඣඣසදිසතා** නම්. මන වඩන පස් කම් සැප කැමැති වන අරුතින් **සාධුකම්‍යතා** නම්. අම්මා, මහම්මා ආදි අයුක්ත-ස්ථානයන්හි ඇලෙන අරුතින් **අධම්මරාග** නම්. යුක්තස්ථාන

යෙහි ද බලවත් ව උපදනා අරුතින් **විසමලොභ** නම්. අරමුණු කැමැතිවීම් වසයෙන් පවත්නා අරුතින් **නිකනති** නම්. කැමැතිවීම් අයුරෙන් පවත්නා අරුතින් **නිකාමනා** නම්. පැතීම් අරුතින් **පත්ථනා** නම්. පැමිණෙනු කැමැති අරුතෙන් **පිහායනා** නම්. මනා කොට පැතීම් විසින් **සම්පත්ථනා** නම්. පස්කම් කොටස්හි පවත්නා කල **කාමතණ්හා** නම්. රූපාරූපභවයෙහි පවත්නා කල **භවතණ්හා** නම්. උච්ඡේදයෙහි පවත්නා කල **විභවතණ්හා** නම්. එකලා රූපභවයෙහි පවත්නා කල **රූපතණ්හා** නම්. අරූපභවයෙහි පවත්නා කල **අරූපතණ්හා** නම්. නිරොධ යෙහි පවත්නා කල **නිරොධතණ්හා** නම්. රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන්හි පවත්නා කල **රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා** නම්. සත්ත්වයන් සසර කිඳා බස්වන කල **ඔඝ** නම්. සසර යොදන කල **යොග** නම්. චුතිපටිසන්ධි වසයෙන් ගැටලන කල **ගන්ථ** නම්. දැඩි ව ගන්නා කල **උපාදාන** නම්. කුසල් අදහස් අවුරන කල **ආවරණ** නම්. සසර වෙළන කල **නීවරණ** නම්. කුසල් දහම් වසන කල **ජදන** නම්. සසර බඳින කල **බන්ධන** නම්. සිත කිලිටි කරණ කල **උපක්කිලෙස** නම්. සිතක් පාසා එක්වන් නිදන කල **අනුසය** නම්. කුසල් වසයෙන් උපදින සිතට එසේ උපදින්නට නො දී සිටින කල **පරියුඨාන** නම්. වෙළීම් අරුතින් වැලක් සේ සිටින කල **ලතා** නම්. නත් වැදුරුම් දේ කැමැති වන කල **වෙච්ඡ** නම්. සසරදුකට මුල් බැවින් **දුක්ඛමූල** නම්. සසරදුකට කරුණු බැවින් **දුක්ඛනිදාන** නම්. සසරදුක මෙයින් හටගන්නා බැවින් **දුක්ඛප්පභව** නම්. බැඳීම් අරුතින් පාසයක් වැනි බැවින් **පාස** නම්. මාරයාගේ පාස බැවින් **මාරපාස** නම්. බිලියක් වැනි බැවින් **බලීස** නම්. මාරයාගේ බිලිය **මාරබලිස** නම්. මාරයාගේ විසය බැවින් **මාරවිසය** නම්. තෘෂ්ණාවෙන් වැඩුනු සත්ත්වයෝ මාරවිසය නො ඉක්මවති. තෘෂ්ණාව ගලා යෑම් අරුතින් නදියක් වැනි බැවින් **තණ්හානදී** නම්. තෘෂ්ණාව දැලක් වැනි බැවින් **තණ්හාජාල** නම්. දැඩිව බැඳීම් අරුතින් බලුදමක් වැනි බැවින් **තණ්හාගද්දුල** නම්. පුරනු නො හැකි බැවින් **තණ්හාසමුද්ද** නම්. අරමුණෙහි ගිජු ව පවත්නා බැවින් **ලොභ** නම්.

'තත්ථ කතමො ව්‍යාපාදො කායගත්ථො? අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති' අනත්ථං මෙ චරතීති – පෙ – අනත්ථං මෙ චරිස්සතීති – පෙ – පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි – පෙ – චරිස්සතීති – පෙ – අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි – පෙ – චරිස්සතීති – පෙ – අට්ඨානෙ වා පන ආඝාතො

ජායති, යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසං කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති ව්‍යාපාදෙ කායගන්ථො' යනු ව්‍යාපාද කායග්‍රන්ථය වදාළ සැටියි.

යම් සිතිවිල්ලකින් සිත්සතන් කුණුවී යේ ද නැසී යේ ද සිත කුණු කළ, සිත නැසූ ඒ සිතිවිල්ල **ව්‍යාපාදය**, යි කියති. එලොව මෙලොව දෙක්හි ම අවැඩ සිදුකරණ පව් සිතිවිල්ලෙකි මේ. **'ව්‍යාපජ්ජති තෙන චිත්තං පූතිභාවං උපගච්ඡති බ්‍යාපාදයති විනාසයති වා විනයාචාරරූපසම්පත්තිහිතසුඛාදිනී ති ව්‍යාපාදෙ'** යනු එහි නිරුක්තියි. සත්ත්වයන් පිළිබඳ පියවිඟතිය මුළුමනින් වෙනස් කොට ඔවුන් වියරුගතියට පමුණු වන්නේ මේ ය. සිත පිළිබඳ නොසතුට ලකුණු කොට ගත් මෙය අල්පසාවද්‍ය, මහාසාවද්‍ය වශයෙන් දෙපරිදි වේ. එහි විස්තර පරුෂවචනයට කී ලෙසින් දත යුතු ය. අන් සතකු වීම, ඔහු නසන්නට සිතීම යනු එහි අඩංගු. අනුන් කෙරෙහි ක්‍රොධය උපන් පමණකින් ම කම්පථය නොවන්නේ ය. 'මූ නැසේවා වැනසේවා' යි සිතූ කල්හි ම ය ඒ වන්නේ. විස්තර පෙර කියූ සේ දත යුතු ය.

ව්‍යාපාදය සිත නසමින් උපදනේ **ආඝාත** නම්. එය ම එයට වඩා බලවත් ව නැඟී ආමේ **පටිඝාත** නම්. නැසීම පියවිඟතිය කොට සිටියේ **පටිඝ** නම්. ප්‍රතිවිරුඬ ව සිටියේ **පටිවිරොධ** නම්. කිපීම සවභාවය කොට සිටියේ **කොප** නම්. ඒ ම උපසර්ගවියෙන් වැඩුනේ **පකොප-සම්පකොප** නම්. සිත දූෂණය කරණුයේ **දොස** නම්. ඒ ම උපසර්ගවියෙන් වැඩුනේ **පදොස සම්පදොස** නම්. සිත පෙරළනුයේ **ව්‍යාපත්ති** නම්. සිත අතිශයින් දූෂණය කරණුයේ **මනොපදොස** නම්. කිපෙනුයේ **කොධ** නම්. කිපෙන අයුරෙන් සිටියේ **කුජ්ඣනා** නම්. ක්‍රොධභාවය **කුජ්ඣිතත්ත** නම්. දූෂණාකාරයෙන් සිටියේ **දුස්සනා** නම්. දූෂිතභාවය **දුස්සිතත්ත** නම්. පියවිඟතිය හැරීම් වසයෙන් පවත්නේ **ව්‍යාපජ්ජනා** නම්. පියවි ගතිය හැරීම **ව්‍යාපජ්ජිතත්ත** නම්. විරුඬ වනුයේ **විරොධ** නම්. සැඩ පුගුලකු පිළිබඳ සවභාවය වූයේ **චණ්ඩික්ක** නම්. මේ සතුවිල්ල නිසා නැගුනු වචනය නින්දිත අසමපුණි. වූවක් බැවින් ඒ **අසුරොප** නම්. සතුටට ප්‍රතිපක්ෂ බැවින් සිටියේ **අනත්තමනතා** නම්.

'තත්ථ කතමො සීලබ්බතපරාමාසො කායගන්ථො? ඉතො බහිඩා සමණබ්‍රාහ්මණානං සීලෙන සුද්ධි වතෙන සුඩි සීලබ්බතෙන සුඩි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො අයං වුච්චති සීලබ්බතපරාමාසො' යනු ශීලවුතපරාමර්ශ කායග්‍රන්ථය වදාළ සැටියි.

සිලයෙන් පිරිසිදු වනු හැකි ය, ව්‍රතයෙන් පිරිසිදු වනු හැකි ය, ශීලව්‍රතයෙන් පිරිසිදු වනු හැකිය යි මෙසස්නෙන් පිටත්හි වූ තීර්ත්‍යායතනයන්හි කරණ ලද ශීලව්‍රතසමාදාන ශීලව්‍රතපරාමර්ශ නම්. 'සීලෙන සුජ්ඣිතුං සක්කා වතෙන සුජ්ඣිතුං සක්කා සීලබ්බතෙහි සුජ්ඣිතුං සක්කාති ගහිත සමාදානං සීලබ්බතපරාමාසො නාම, යනු ඒ ඉගැන්වීම ය. ශීලයෙන් ව්‍රතයෙන් ශීලව්‍රතයෙන් පිරිසිදුබව ලැබේනු යි උපදින දෘෂ්ටිය සිලබ්බතපරාමාසැයි කොටින් කිය හැකි ය. එසේ කිය හැක්කේ 'සීලෙන වතෙන සුඩීති පරතො ආමාසො සීලබ්බතපරාමාසො' යි ආගමෙහි ආ බැවිනි. 'යමක් නො කරමි' යි වළකී ද ඒ වැළකීම සීලය යි. 'තත්ථ යං න කරොමිති ඔරමති තං සීලං.' ය නු ඒ කීමය. විෂ කෑම, දුක් හැසුරුම් ආදිය ව්‍රත නම්. 'විසභොජනනිච්ඡාචරණාදිකං වතං' යනු කියේ ඒය. හැසිරීම් පමණින් වැළකීම් පමණින් දෙරවැසීම් පමණින් නොසික්මවීම් පමණින් සංසාරසුඩිය විමුක්තිය බලාපොරොත්තු වෙමින් බැහැර සිල්ගන්නෝ වෙති. 'සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලසුඩිකා තෙ සීලමත්තෙන සංයමමත්තෙන සංචරමත්තෙන අවිතික්කමමත්තෙන සුඩිං විසුඩිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති' යනු ඒ වදාළ සැටියි.

මේ සංසාරසුඩිය, සංසාරවිමුක්තිය පතමින් ව්‍රතසමාදන් වන්නෝ 'සන්තෙකෙ සමණබ්‍රාහ්මණා වතසුඩිකා තෙ හත්ථවතිකා වා හොන්ති, අස්සවතිකා වා හොන්ති, ගොවතිකා වා හොන්ති. කුක්කුරවතිකා වා හොන්ති, කාකවතිකා වා හොන්ති, වාසුදෙවවතිකා වා හොන්ති, බලදෙවවතිකා වා හොන්ති, පුණ්ණභද්දවතිකා වා හොන්ති, මණ්භද්දවතිකා වා හොන්ති, අග්ගිවතිකා වා හොන්ති, නාගවතිකා වා හොන්ති, සුපණ්ණවතිකා වා හොන්ති, යක්ඛවතිකා වා හොන්ති, දිසාවතිකා වා හොන්ති, ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා වතසුඩිකා'' යන මෙයින් දක්වන ලදහ.

හත්ථිවත – අස්සවත – **ගොවත** – කුක්කුරවත – **කාකවත** වාසුදෙවවත – බලදෙවවත – පුණ්ණභද්දවත – මණිභද්දවත – අග්ගිවත – නාගවත – සුපණ්ණවත – යක්ඛවත – අසුරවත – **ගන්ධබ්බවත** – මහාරාජවත – චන්දවත – සුරියවත – ඉන්දවත බ්‍රහ්මවත – දෙවවත – **දිසාවත** යන මේ වත පැවතුම් බැහැරියන් විසින් සංසාරසුඛය පිණිස රැකිය යුතු කොට උපදවා ගන්නා ලද ය. 'අද සිට මම ඇතුන් කරන්නා සේ කරමි' යි සිතා ඇතුන් යන සිටින හිඳින නිදන සැටි මල මූ පහකරණ සැටි හොඬ ඔසවන සැටි යන මේ ඇ සියල්ල බලා ඒ සැටියෙන් පිළිපැදීම හත්ථිවත නමැ යි ද, මෙසේ පිළිපැදීමෙන් සුඛය පතන්නේ හත්ථිවතික නමැ යි ද කිහ. සෙස්ස මෙසේ ගන්න. අවසනැ පෙනෙන **දිසාවත** නම් පූර්වපශ්චිමාදි දිශාවනට වැඳුම් පිදුම් කිරීම ය.

මොවුන් මෙසේ ගතු ද මේ වතසමාදානය හිත පිණිස නොපවතින්නේ ය. සාධකසූත්‍රයෙක් මේ – **'ඉධ පුණ්ණ එකච්චෝ කුක්කුරවතං භාවෙති, පරිපුණ්ණං අඛණ්ඩාකිණ්ණං කුක්කුර සීලං – කුක්කුරචිත්තං – කුක්කුරාකප්පං භාවෙති, පරිපුණ්ණං අඛණ්ඩාකිණ්ණං. සෝ කුක්කුරවතං – කුක්කුරසීලං – කුක්කුර චිත්තං – කුක්කුරාකප්පං භාවෙත්වා පරිපුණ්ණං අඛණ්ඩා කිණ්ණං කායස්ස භෙදා පරම්මරණා කුක්කුරානං සහව්‍යතං උපපජ්ජති'** යනු.

ඒ මේ සීලබ්බතපරාමාසය වෙනස් වූ දුක්මනු යි **දිට්ඨි** නම්. දෙසැට මිසදිටුවට ඇතුළත් නු යි **දිට්ඨිගත** නම්. ඉක්මවා යැම නොපහසු නු යි **දිට්ඨිගහණ** නම්. සැක හා බිය සහිත නු යි **දිට්ඨි කන්තාර** නම්. නියම දුක්මට විලෝම නු යි **දිට්ඨිවිසූකායික** නම්. **කලෙක** ශාස්වතය හා **කලෙක** උච්ඡේදය හා ගෙණ දෘෂ්ටියෙන් සැලේ නු යි **දිට්ඨිවිප්ඵන්දිත** නම්. දිට්ඨිගතිකයා එක තැන පිහිටා ගැණුමෙහි අපොහොසත් ය. ඔහු සමහර කලෙක ශාස්වතයට සමහර කලෙක උච්ඡේදයට බසි යි. මේ කියේ ය. සසර යොදනු යි **දිට්ඨිසංයොජන** නම්. අරමුණු දැඩිව ගණී නු යි **ගාහ** නම්. බලවත් පැවැත්මෙන් පිහිටානු යි **පතිට්ඨාහ** නම්. නිත්‍යාදිවශයෙන් පිවිසේ නු යි **අභිනිවෙස** නම් දහම් සැටි ඉක්මවා නිත්‍යාදිවශයෙන් බැහැරින් ආමශීනය කෙරේනු යි **පරාමාස** නම්. අනර්ථඵලවා නු යි අපායට මග නු යි **කුම්මග්ග** නම්. වැරදිමග නු යි **මිච්ඡාපථ** නම්. අනර්ථයනට නීඝී නු යි **තිත්ථායතන** නම්. වැරදිලෙසින් ගණිනු යි **විපරි යෙසග්ගාහ** නම්.

'තත්ථ කතමො ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො? සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති වා අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො තං ජීවං, තං සරීරං, අඤ්ඤං ජීවං, අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති වා' යා එවරූපා දිට්ඨි දිඨිගතං දිඨිගහණං දිඨිකන්තාරො දිඨිවිසූකායිකං දිඨිවිප්ඵන්දිතං දිට්ඨි සඤ්ඤොජනං ගාහො පතිඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මගෙහා මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙස ගාහො, අයං වුච්චති ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො' යි ඉදංසත්‍යාභිනිවෙශකාය ග්‍රන්ථය දැක්විනි.

'මේ ම සත්‍යය, අන්‍ය වූයේ අසත්‍යය' යි දැඩි ගැණුම **ඉදං සත්‍යාභිනිවෙශ,** නම්. ආත්මභාවය (පස්කඳ) නිත්‍යය යන මේ ම සත්‍යය, අන්‍ය වූයේ අසත්‍යය, ආත්මභාවය නිත්‍ය නො වේ, යන මේ ම සත්‍යය වේ, අන්‍ය වූයේ සත්‍යය නො වේ, ආත්මභාවය කෙළවර සහිතය යන මේ ම සත්‍යය වේ, අන්‍ය වූයේ සත්‍යය නො වේ, ආත්මභාවය කෙළවර නැත්තේ ය යන මේ ම සත්‍යය වේ, අන්‍ය වූයේ අසත්‍යය වේ, ප්‍රාණය බිඳෙනසුලු සිරුර පිළිබඳය යි ගැණීමෙන් සිරුර බිඳෙන කල්හි ප්‍රාණයත් බිඳී යන්නේය යි සිතා ඒ ආත්මභාවය ඒ ශරීරය යි යන මේ ම සත්‍යය වේ, අන්‍ය වූයේ අසත්‍යය, (යමෙක් ආත්ම භාවය වේ නම් ඒ ම ශරීරය වේ. යමෙක් ශරීරය වේ නම් ඒ ම ආත්මභාවය වේ යි කී සේ ය.) ආත්මභාවය අනෙකෙක්. ශරීරය අනෙකෙක්. යන මේ සත්‍යය, අන්‍ය වූයේ සත්‍යය නො වේ, සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේ යනු ම සත්‍යය, අන්‍ය වූයේ අසත්‍යය, සත්ත්ව තෙමේ මරණින් මතු නො වන්නේ යනු ම සත්‍යය, අන්‍ය වූයේ අසත්‍ය ය, සත්ත්ව තෙමේ මරණින් මතු වන්නේත් වේ, මරණින් මතු නො වන්නේත් වේ, යනු ම සත්‍යය වේ, අන්‍ය වූයේ සත්‍යය නො වේ, සත්ත්ව තෙමේ මරණින් මතු නොම වන්නේ ය. සත්ත්ව තෙමේ මරණින් මතු නො වන්නේ නො වේ, යනු ම සත්‍යය වේ, අන්‍ය වූයේ සත්‍යය නො වේ, යි මෙසේ බෙදුනු දෘෂ්ටියය **ඉදං සත්‍යාභිනිවෙශ.** සෙස්ස පෙර කීසේ ය.

ඉතා සැකෙවින් කියූ මේ සතරය කායග්‍රන්ථ. **'යස්ස සංවිජ්ජති තං චුතිපටිසන්ධිවසෙන වට්ටස්මිං ගන්ථෙන්ති ඝටෙන්ති'** යනු

ග්‍රන්ථ පැහැදිලි කළ සැටි ය. නාමකය හා රූපකය හෝ' වර්තමානකය හා අනාගතකය හෝ, නො බිඳෙන සේ එකට ගැටලත් නු යි බඳිත්නු යි කායග්‍රන්ථ නම්. යමක්හුගේ සන්තානයෙහි මොවුහු වෙත් නම්, ඔවුහු ඒ සත්ත්වයා චුතිපටිපත්තිවසයෙන් භවයෙහි ලා ගෙණ යන්නෝ ය.

මොවුනතරෙහි අභිද්‍ධ්‍යාකායග්‍රන්ථය අටවැදැරුම් ලොභ සහගිය සිත්හි ද ව්‍යාපාදකායග්‍රන්ථය දෙවදැරුම් දෙම්නස් සහගිය සිත්හි ද ශීලව්‍රතපරාමර්ශ - ඉදංසත්‍යාභිනිවෙශකායග්‍රන්ථ දෙක සිවු වැදැරුම් මිසදිටු සහගිය සිත්හි ද උපදි යි.

අභිද්‍ධ්‍යාකායග්‍රන්ථය අභීතමාර්ගයෙන්, ව්‍යාපාදය අනාගාමීමාර්ගයෙන්, ශීලව්‍රතපරාමර්ශ - ඉදංසත්‍යාභිනිවෙශයෝ ස්‍රොතාපත්තිමාර්ගයෙන් නැසී යති.

පරිලාභො = දැවිල්ලෙක්.

දැවිල්ල දෙවැදැරුම් ය, කය පිළිබඳය, සිත පිළිබඳය යි. මෙහි අදහස් කරණ ලද්දේ සිතපිළිබඳ දැවිල්ල ය. ශීතොෂ්ණාදිවශයෙන් උපදින කය පිළිබඳ දැවිල්ල රහතුන් වහන්සේ ද නොනිවූ සේක. එහෙයින් කායිකදාහය උන්වහන්සේට ද ඇත. සිත පිළිබඳ දැවිල්ලැ යි වදාළේ සිතෙහි උපදින කෙලෙස් දැවිල්ල ය. ඒ වනාහි රහතුන් වහන්සේ විසින් සොපාදිශෙෂනිර්වාණයෙන් නිවන ලදය.

න විජ්ජති = නැත්තේ ය.

බුදුරජානන් වහන්සේ ධර්මරාජන් බැවින් හා දෙශනාවිධියෙහි දක්ෂ බැවින් කායිකචෛතසිකපරිදාහවශයෙන් දෙශනාව පෙරළමින්, ජීවක; යම්හෙයකින් රහතුන් වහන්සේ සියලු කෙලෙස් දැවිලි සොපාදිශෙෂනිර්වාණයෙන් නිවූ සේක් ද, එහෙයින් පරමාර්ථ වශයෙන් නම් රහතුනට කිසිත් පරිදාහයෙක් නැතැ, යි වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

ජීවකයාගේ ප්‍රශනවසතුව නිමියේ ය.

මහාකාශ්‍යප සථවිරයන් වහන්සේගේ ගුණ කථාවක්

7 - 2

එක් කලෙක තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ රජගහා නුවර වස් වැස පවරා, අඩ මසක් ගෙවා, දනවි සැරිසරන්නට සිතා එබව භික්ෂූන්ට දැන් වූහ. මේ වනාහි භික්ෂූන් සමග චාරිකාවෙහි වඩිනු කැමැති බුදුවරුන්ගේ සිරිතෙකි. එසේ අඩ මසකගේ ඇවෑමෙන් චාරිකාවෙහි වඩිනබව දන්වන සේක්, චාරිකාවෙහි යන භික්ෂූන්ගේ ගමන් පහසුව පිණිස පාත්‍ර පිසිම් සිවුරු රැදීම් ආදි වූ කටයුතු සපයා ගණු පිණිස ය. භික්ෂූන් වහන්සේලා චාරිකාව පිණිස පෑ පිසිම් සිවුරු පඬුපෙවීම් ආදිය කරණ කල්හි මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ ද තමන් වහන්සේගේ සිවුරු සෝදා ගත්හ. ඒ දුටු භික්ෂූන් වහන්සේලා 'මේ මොන පුදුමයෙක් ද, ඔන්න වහන්සේ කුමක් හෙයින් මෙසේ සිවුරු සෝදන් ද, මෙ නුවර ඇතුළත පිටත දෙක්හි අටලොස් කෙළක් මිනිස්සු වාසය කරති, ඔවුනතුරෙහි යම් කෙනෙක් නොං නැයෝ නම්, ඔවුහු ඔන්වහන්සේගේ උපස්ථායකයෝ ය, උපස්ථායක නොං වන්නෝ නැයෝ ය, ඔවුහු හැම කෙනෙක් ම ඔන්වහන්සේට උවටැන් කරති, මේ හැම එකක් හැර දමා ඒ ගැණ නොං සලකා ඔන්වහන්සේ කොහි වඩින සේක් ද, ඉදින් මේ කිසිත් නොං සලකා වඩින සේක් නම්, නොං පමා කඳුරැලියෙන් ඔබ්බට නොං වඩින සේකැ' යි කිහ. බුදුරජාණන් වහන්සේ යම් කඳුරැලියකට පැමිණ නැවැත් විය යුතු භික්ෂූන් 'තෙපි මෙයින් ඔබ්බට නොං යවු, පමා නොං වවු' යි නවතාලන සේක් ද, එ තැන නොං පමා කඳු රැලිය, යි කියනු ලැබේ.

චාරිකාවෙහි වඩනට කල් තබා බුදුරජාණන් වහන්සේ 'මෙනුවර අටලොස් කෙළක් මිනිස්සු වෙසෙති, ඔවුනට කටයුතු බොහෝ ය, මහුල් අවමඟුල්හි භික්ෂූන් ද බලාපොරොත්තු වෙති, එහෙයින් විහාරය සිස් කොට තබා යෑම නොං සුදුසු ය, කවරකු නවතා යම් ද, මෙනුවර හැම කෙනෙක් ම වාගේ කාශ්‍යප තැනගේ නැයෝ ය, දායකයෝ' යි සිතා මහසුප් තෙරුන්ට කතා කොට 'කාශ්‍යප! විහාරය සිස් කොට යෑම නොං සුදුසු ය, නුවර වැසි මිනිස්සු මහුලටත් අවමඟුලටත් භික්ෂූන් බලාපොරොත්තු වෙති, ඒ නිසා තමුසේ තම පිරිසත් සමග වෙහෙර නවතිහු' යි වදාළ සේක. උන්වහන්සේ ද කිසිත් නොං බැණ 'එසේය සවාමිනි! යි කියා සිය පිරිසත් සමග නැවතුනාහ. 'ඇවැත්නි! අප විසින් කියන ලද්ද තොප විසින් දැන් දක්නා ලද්දේ නොං වේ ද, කුමක් හෙයින් මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ

සිවුරු සෝදත් ද, මෙතෙමේ බුදුරජුන් සමග නො යන්නේ ය, සී අප විසින් කියන ලද්ද එසේ ම වී ය' යි එහි සිටි අනික් භික්ෂූන් වහන්සේලා පරිහව මුඛයෙන් කතා කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ මේ කතාව අසා නැවතී සිට 'මහණෙනි! තෙපි කුමක් කියහු දැ' යි ඇසූහ. 'සවාමීනි! මහසුප් තෙරුන් වහන්සේ ගැණ කතා කරමු' යි තම තමන් කතා කළ සැටියෙන් ම සියල්ල දැන් වූහ. එවිට බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! තෙපි කාශ්‍යපයන් කුලයන්හි හා සිවුපසයෙහි ඇලුනකුය යි නො කියවු, ඒ තැන මාගේ වචනය පිළිගෙණ නැවතුනේ ය, ඒ තැනගේ පෙර පැතීම වූගේ ද සිවුපසයෙහි නො ලැගී සඳ බදු ව කුලයන් කරා එළඹෙන්නට සමර්ථ යෙක් ව උපදිනු සඳහා ය, ඒ එසේ වී ය, උන්නැගේ කුලයෙහි වත් සිවුපසයෙහිවත් නො ඇලෙති, මම වන්‍දොපමප්‍රතිපදාවත් ආර්‍යවංශ ප්‍රතිපදාවත් දෙශනා කෙළෙම්, කාශ්‍යපයන් මුල් කොට ගෙණ ය' යි වදාළ සේක. 'මහසුප් තෙරුන් වහන්සේ කවද, එසේ පැතුවෝ දැ?' යි භික්ෂූන් විවාළ විට 'මහණෙනි! මෙයට කප් සියදහසකට ඔබ්බෙහි පියුමතුරා නම් බුදුකෙනෙක් ලොව උපන්හ, ඒ බුදුන් දවස මේ තැන ඒ පැතීම කෙළේ' යි තෙරුන් පිළිබඳ සියලු පෙර සිරිත වදාරා 'මහණෙනි! මාගේ පුත්‍ර වූ කාශ්‍යපයන්ගේ සිවුපසය, කුලය, විහාරය, පන්සලය පිරිවෙණය යන කිසි තැනෙක ඇලීමෙක් ගැලීමෙක් නැත, කුඩා විලකට බැස එහි එහා මෙහා හැසිර නැගී යන රජහංසකු සේ මහා කාශ්‍යප තැනත් කිසි තැනක කිසි දෙයක නො ඇලුනෙකැ' යි අනුසන්ධි ගළපා දහම් දෙසන සේක් මේ ගාථාව වදාළ සේක:-

උය්‍යුඤ්ජන්ති සතීමන්තා න නිකේතෙ රමන්ති තෙ,
හංසාව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ' ති.

සමෘතිමත් ක්ෂීණාස්‍රවයන් වහන්සේලා ධ්‍යාන විදර්‍ශනාදියෙහි යෙදෙති. උන්වහන්සේලා ආලයෙහි නො ඇලෙති. විල හැර යන හංසයන් මෙන් උන්වහන්සේලා ආලයක් ආලයක් (හැම ආලයන්) හැර දමත්.

උය්‍යුඤ්ජන්ති සතීමන්තා - සමෘතිමත්හු යෙදෙත්.

මෙහි සමෘතිමත්හු නම්, රහතුන් වහන්සේලා ය. උන් වහන්සේලා තමන් ප්‍රතිවෙධ කළ ධ්‍යාන විදර්‍ශනාදියෙහි **ආවජ්ජන-සමාපජ්ජන-අධිට්ඨාන-වුට්ඨාන-පච්චවෙක්ඛණ** යන පංචවශිතාවන්ගේ වසයෙන් යෙදී ගැටී වසති. **සතීමන්තො**, යන්නට කළ පරිකර්‍මය බලනු. තමන් ප්‍රතිවෙධ කළ ගුණය සිහි කිරීම **ආවජ්ජන** නම්. ඒ ගුණයට සමවැදීම **සමාපජ්ජන** නම්. මෙතෙක් මේ ගුණයට පැමිණ ඉඳිමි' යි ඉටුම **අධිට්ඨාන**

නම්. එයින් නැගී සිටීම වුඨාන නම්. නැවැත නැවැත නුවණින් සලකා බැලීම **පච්චවෙක්ඛණ** නම්.

න නිකෙතෙ රමන්ති තෙ = ඔවුහු ආලයෙහි නො ඇලෙති.

ස්මෘතිමත් ව ධ්‍යාන විදර්ශනාදියෙහි යෙදී ගැටී වසන රහතුන් වහන්සේ **නිකෙත** නම් වූ පංචකාමගුණාලයයෙහි හෝ ගිහිගෙයි ආලය නො කරති.

මෙහි **නිකෙත**, නම්, පංචකාමය හෝ ගිහිගෙය ය. නිකෙතැ යි වාසස්ථානයට නමෙකි. රූපාදිපංචකාමය තෙමේ සිතට වාසස්ථාන බැවින් නිකෙතැයි හඳුන්වනු ලැබේ.

හංසා ඉව පල්ලලං හිත්වා ඔකං ඔකං ජහන්ති තෙ = ඔවුහු විල හැර යන හංසයන් මෙන් සියලු ආලයන් හැර දමත්.

හංසාදීපක්ෂීහු, ගොදුරු ඇති පියුම්විලකට බැස ගොදුරු ගෙණ ඒ ඒ අත බලා යන කල්හි 'මේ මාගේ දිය, මේ මාගේ පියුම, මේ මාගේ උපුල, මේ මාගේ තණ, මේ මාගේ මඩැ' යි එහි වූ කිසිවෙක නො ඇලී බලාපොරොත්තු රහිත ව විල හැර නැගී යති. එමෙන් රහතුන් වහන්සේලා කොතැනක විසුවෝ ද, ඒ හැම තැන කුලෙහි ගෙණෙහි සිවුපසයෙහි නො ඇලී ම වෙසෙති. නො ඇලී ම ඉඳිති. එයින් අන් තැන් බලා යන්නෝ ද, මේ මාගේ වෙහෙර, මේ මාගේ පිරිවෙණ, මේ මාගේ දායක කුලය, මේ මාගේ ශිෂ්‍යගණය ඈ විසින් කිසි තැනක ආලය නො කොට ම යති.

ප්‍රියජනක පක්ෂිවිශෙෂයෙක් **හංස**, නමින් කිය වේ.

ශ්වෙතහංස-රාජහංස=කාලහංස-මලිනහංස යි එහි භෙද කිහිපයෙකි. සුදු පියාපත් ඇති හංසයෝ ය, ශ්වෙත හංස නම්. රතු පා හා තුඩු ඇත්තෝ රාජහංස නම්. කාලහංසයෝ කලු පා තුඩු ඇත්තෝ ය. කිලිටි පා තුඩු ඇති හංසයෝ මලිනහංස නම්. මෙහිලා පලව කාරණ්ඩව බක බලාකාදීහුත් ගන්නා ලද්දේ වරද නැත.

පල්ලල, නම් වැසිකාලයෙහි දිය අධික වන ග්‍රීෂ්මකාලයෙහි දිය සිඳී යන විල ය. එකල එහි දණක් පමණ දිය වෙයි. **ඔකංඔකතො**, යන්නට කළ පරිකථාව බලනු.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

මහාකාශ්‍යපවස්තුව නිමියේ ය.

බෙලට්ඨසීස සථවිරයන් වහන්සේ.

7 - 3

බෙලට්ඨසීස තෙරනුවෝ ඇතුල් ගම්හි කඩපලන පිඬු සිහෘ ගොස් ලත් බත් වළඳ, නැවැත අන් කඩපලකට පිඬු සිහෘ ගියහ. එවර උන්වහන්සේට රළු බතක් ලැබින. දින පතෘ පිඬු සිහෘ යෑම දුකකැ, සි එය වසෘ බැද තබෘ කිහිප දවසක් ධ්‍යාන කොට ධ්‍යානසුවයෙන් දවස් යවෘ වළඳනු කැමැති කල්හි බැඳ තැබූ ඒ බත ගෙණ වළඳති. 'බෙලට්ඨසීස සථවිරයන් පෙරදෑ වසෘ බැඳ තැබූ බත ගෙණ පසුදෑ වළඳති' යි භික්ෂූන් වහන්සේ ලෘ ගොස් බුදුරජාණන් වහන්සේට දැන් වූහ. උන් වහන්සේ මේ කරුණෙහිලෘ පිළිගෙණ තැන් පත් කොට තබෘ දවස් ගෙවෘ වැළඳීම අත්හරිනු පිණිස ශික්ෂාපද පැනවූ සේක. ශික්ෂාපද පැනවීමට කලින් තමන්ගේ අපපිච්ඡතාගුණය නිසෘ බෙලට්ඨසීස සථවිරයන් වහන්සේගේ මේ වැළඳීම වරදක් නොවන බව වදරා අනුසන්ධි ගළපෘ **මේ ධම්දෙශනාව** කළ සේක:-

යෙසං සන්නිවෙසෘ නත්ථි යෙ පරිඤ්ඤාතහෙතවා,
සුඤ්ඤතෝ අනිමිත්තෙනා ච විමොක්ඛා යෙස ගොචරෝ,
ආකාසෙව සකුනානං ගති තෙසං දුරන්නයා' ති.

යම්බදු රහතුන්ට (කම් හෝ චීවරාදිප්‍රත්‍යය) රැස් කිරීමෙක් නැත්තේ ද, යම් කෙනෙක් තුමූ පිරිසිඳ දන්නා ලද අහර ඇත්තාහු ද, යම්බදු රහතුන්ට **සුඤ්ඤත** නම් වූ ද අනිමිත්ත නම් වූ ද (අපණිහිත නම් වූ ද) **නිර්‍වාණය** අරමුණ වේ ද, ඒ රහතුන්ගේ උත්පත්තිය අහසෙහි පක්ෂීන් ගිය මග මෙන් නොදත හැකිය.

යෙසං සන්නිවෙසෘ නත්ථි = යම් කෙනකුන්ට රැස් කිරීමෙක් නැත්තේ (ද)

යෙසං, යනු අනියාමික වචන ය. එයින් රහතුන් වහන්සේ කැණෙති. එහෙත් අසවල් ආයුෂ්මතුන් වහන්සේ ය යි නියමයෙක් නැත. **සන්නිවෙස**, නම් රැස් කිරීම ය. කම්සන්නිවෙස, ප්‍රත්‍යය සන්නිවෙස, යි ඒ දෙපරිදි ය. කුශලාකුශලකම් රැස්කිරීම කම් සන්නිවෙස නම්. චීවරාදී වූ සිවුපසය රැස් කිරීම ප්‍රත්‍යයසන්නිවෙස නම්. රහතුන් වහන්සේ පිළිබඳ මේ දෙක ම නැත. උන් වහන්සේ කරණ පින්කම්හි ප්‍රතිසන්ධිය දීමෙහි ශක්තියක් නැත්තී ය. දන් ඇ පින්කම් කරණ කල්හි රහතුන්ට පහළ

වන සිත්, කුසල් සිත් නොවේ. ඒ අවස්ථාවෙහි ඔවුනට උපදනේ ක්‍රියා සිත් ය. පින්කම්වලදී කුසල් සිත් පහළ වන්නේ පෘථග්ජන සත්ත්වයන්ට ය. අවිද්‍යාතෘෂ්ණාදිකෙලෙශයන් ප්‍රහීණ කොට සිටි බැවින් රහතුන්, කොතෙක් පින්කම් කළත්, ඒ පිළිබඳව උපදින සිත්වල ප්‍රතිසන්ධිය දීමෙහි ශක්තියක් නොලැබේ. අකුශලකර්ම රැස් නොකරති, යනු කුමට ය.

යෙ පරිඤ්ඤතණ්හාභෝජනා = යම් තෙනෙක් පිරිසිඳ දන්නා ලද අහර ඇත්තාහු (ද)

යෙ, යන්නෙන් කියන ලද්දේ රහතුන් වහන්සේ ම ය. පරිඤ්ඤ තුනෙකි. ඒ තුන ම මෙහි ලැබේ ආහාර සතරෙකි. එයින් මෙහි ලැබෙන්නේ කබලීකාරාහාරය පමණෙකි. ඒ මේ කබලීකාරාහාරය ත්‍රිවිධපරිඤ්ඤවෙන් පිරිසිඳ දුන සිටි උත්තමයෝ **පරිඤ්ඤතණ්හාභෝජනා,** නම් වෙත්. **ඤාතපරිඤ්ඤා – තීරණ-පරිඤ්ඤා – පහාණපරිඤ්ඤා** යනු, ඒ පරිඤ්ඤ තුනය.

'තත්‍ථ කතමා ඤාතපරිඤ්ඤා? සබ්බධම්මං ජානාති ඉමෙ අජ්ඣත්තිකා ඉමෙ බාහිරා ඉදමස්ස ලක්ඛණං ඉමානි රස-පච්චුපට්ඨානපදට්ඨානානීති අයං ඤාතපරිඤ්ඤා' 'මොවුහු ඇතුලත්හි වූවෝ ය, මොවුහු පිටත්හි වූවෝ ය, මේ මොහුගේ ලක්ෂණය, මේ කෘත්‍යය, මේ ඵලඔසිටි කරුණය, මේ ලංව සිටි කරුණය,යි සියලු ධර්මයන් පිරිසිඳ දනී ද, ඒ **ඤාතපරිඤ්ඤා ය.** ඉන්ද්‍රියබද්ධඤාතඥානය, අනින්ද්‍රියබද්ධඤාතඥානය යන දෙකට අයුත්තන සියලු ධර්මයන් ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානවශයෙන් ලැබෙන හැටියෙන් දැනීම ය ඤාතපරිඤ්ඤා.

'තත්‍ථ කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතා දිට්ඨමානවසෙන සබ්බධම්මං තීරෙති අනිච්චතො දුක්ඛතො අනත්තතොති ආදිනා අයං තීරණපරිඤ්ඤා' ආධ්‍යාත්මික බාහිර සර්වධර්මයන් ලැබෙන ලෙසින් ලක්ෂණරසප්‍රත්‍යුපස්ථාන පද-ස්ථානවශයෙන් දුන එකී ධර්ම අනිත්‍ය, දුඃඛ, අනාත්ම, රෝග, ගණ්ඩ, සල්ල, අඝ, ආබාධ, පර, පලෝක, ඊති, උපද්‍රව, භය, උපසර්ග, චල, පභඞ්ගු, අද්ධුව, ආදීනව, විපරිණාමධර්ම, අසාරක, අඝමූල, වධක, විභව, සාසව, සඞ්ඛත, මාරාමිස, ජාතිධර්ම, ජරාධර්ම, ව්‍යාධිධර්ම, මරණධර්ම, සෝකධර්ම, පරිදෙවධර්ම, උපායාසධර්ම, සඞ්කිලෙස, අසරණීභූත යනාදී ආකාරයකින් තීරණය කෙරේ ද, ඒ **තීරණපරිඤ්ඤා ය.**

'තත්‍ථ කතමා තීරණපරිඤ්ඤා? එවං තීරයිත්වා අගග-මගෙගන සබ්බධම්මෙසු ඡන්දරාගං පජහතීති අයං පහාණ-පරිඤ්ඤා' තීරණපරිඤ්ඤාවෙන් තීරණය කොට අග්‍රමාර්ගයෙන් සියලු ධර්මයන් කෙරෙහි පැවැති ඡන්දරාගය හෙවත් දැඩි ආශාව දුරුලීම **පහාණපරිඤ්ඤාය.**

බුදිනු ලබන දෙය භොජන නම්. **'භුඤ්ජීයතීති=භොජනං'** යනු අර්ථ සමර්ථනය යි. ආහාර යනු ද මෙයට නමෙකි. **'ආහරතීති=ආහාරො'** යනු නිරුක්තියි. තම ඵලය ඵළවන බැවින් එසේ කියනු ලැබේ. කබලීකාරය, ඵස්සය, මනො-සඤ්චෙතනාය, විඤ්ඤාණය යන මේ සතර ම ආහාරයෝ ය. එසේ කියනු ලබන්නේ කබලීකාරය ඔජාෂ්ටමකරූපය ඵළවන බැවිනි. ඵස්සය ත්‍රිවිධවෙදනාවන් ඵළවන බැවිනි. මනො-සඤ්චෙතනාව තුන් භවයෙහි ප්‍රතිසන්ධිය ඵළවන බැවිනි. විඤ්ඤාණය ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූපය ඵළවන බැවිනි.

මේ සිවු ආහාරය අතුරෙහි මෙහි ලා කබලීකාරාහාරය ගැණේ. පිඩු පිඩු කොට කනු ලබන ඔජා සහිත වූ බත් මාලු ව්‍යඤ්ජනාදිය ය කබලීකාරාහාර නම්. ඔජා යන්නට රසධාතු යි නමෙකි. බුදිය යුතු බත් පිය යුතු පැන් කෑ යුතු පල මුල් කැවුම් හා ලෙවිය යුතු මී හකුරු ආදිය මෙහි ලා දත යුතු ය. මෙ කී ආහාර පානයන්ගේ දැහැමි නො දැහැමි බව ඇ දැනුම මෙහි ඤාතපරිඤ්ඤා නම.

ගමන, පරියෙසන, පරිභොග, ආසය, නිධාන, අපරිපක්ක, පරිපක්ක, ඵල, නිස්සන්ද, සම්මක්ඛන, යන මොවුන්ගේ වසයෙන් ආහාරයෙහි ප්‍රතිකකූලසංඥාව වඩා ආහාරයෙහි ඒ මගින් ලත් දැනුම මෙහි තීරණපරිඤ්ඤා නම.

මෙසේ තීරණය කොට කබලීකාරාහාරයෙහි දැඩි ආසාව දුරු කරණ නුවණ මෙහි පහාණපරිඤ්ඤා නම. ඒ මේ කබලීකාරාහාරය මෙ කියූ ත්‍රිවිධපරිඥාවන්ගෙන් දැන සිටියෝ පරිඤ්ඤාතභොජන නම් වෙති.

සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යෙසං ගොචරො = සුඤ්ඤතවිමොක්ඛ, අනිමිත්තවිමොක්ඛ, අප්පණිහිතවිමොක්ඛ යම් කෙනකුන්ට අරමුණු වේ ද.

මෙහි සුඤ්ඤත-අනිමිත්ත විමොක්ඛ දෙදෙනාගේ ගැණීමෙන් අප්පණිහිතවිමොක්ඛය ද ගන්නා ලද්දේ ය. මේ නම් නිවනය. රාග චෙෂ මොහයන් නැති බැවින් උත්ගෙන් මිදුන බැවින්

නිවන සුඤ්ඤතවිමොක්ඛ නම්. රාගාදිනිමිති නැති බැවින් ඔවුන් කෙරෙන් මිදුන බැවින් නිවන අනිමිත්තවිමොක්ඛ නම්. රාගාදි ප්‍රාර්ථනා නැති බැවින් උන්ගෙන් මිදුන බැවින් නිවන අප්පණිහිත-විමොක්ඛ නම්. **'නිබ්බානං හි රාගදොසමොහානං අභාවෙන සුඤ්ඤතො, තෙහි විමුත්තත්ති සුඤ්ඤතො විමොක්ඛො, තථා රාගාදිනිමිත්තාභාවෙන අනිමිත්තං, තෙහි ච විමුත්තත්ති අනිමිත්තො විමොක්ඛා, රාගාදිපණ්ඩිනං පන අභාවෙන අප්පණිහිතං, තෙහි ච විමුත්තත්ති අප්පණිහිතො විමොක්ඛොති වුච්චති'** යනු අටුවා ය. සියලු ප්‍රතිපක්ෂධර්මයන්ගෙන් මිදී සිටි බැවින් නිවන **විමොක්ඛ,** නමැයි දත යුතු ය. අග්‍රමාර්ගඵල එහි ම ඇතුළත් ය. **'සබ්බසො පටිපක්ඛෙහි විමුච්චතීති = විමොක්ඛො'** යනු දන්නේය.

'ගාවො චරන්ති එත්ථාති = ගොචරො' ගෙරිහු මෙහි හැසිරෙත් නු යි ගොචර නම්. ගොනුන් කෑම සොයා කමින් හැසිරෙන තැන ගොචරැ යි කී සේ ය. **'ගුත්තං සාසෙසට්ඨානං'** යන මෙයින් ඒ පැහැදිලි ය. එවැනි බැවින් මෙ ද ගොචරැ යි කියන ලදී. ත්‍රිවිධවිමොක්ෂ නාමයෙන් කියවෙන නිවන ඵලසමා-පත්තිවසයෙන් අරමුණු කොට ගෙණ වසන රහතුන් වහන්සේලාට ගොදුරු වන්නේ ය. උන්වහන්සේලාගේ සිත නිවන් අරමුණෙහි හැසිරෙන්නේ ය යි කී සේ ය මේ. ඵලසමාපත්තිසමාපජ්ජන, දිඨධම්මසුඛවිහාර යනු ද, මේ සඳහා යෙදේ.

ආකාසෙඉව සකුන්තානං=අහසෙහි පක්ෂීන්ගේ ගමන්මග මෙන්.

අහසින් යන එන පක්ෂීන්ගේ පා සටහන් දකින්නට නො මැති බැවින් ගිය මග නො දත හැකි ය. නො පෙන් විය හැකි ය. ලෞකිකවස්තූන්ගේ පැහැදිලි පෙනුමට බැබලීමට කරුණු වන තැන හෝ, ඉරි, ඇඳ දක්වනු බැරි තැන **ආකාස'** යන්නෙන් කිය වේ. **'භූසං කාසන්තෙ දිප්පන්තෙ පදත්ථා එතෙනාති = ආකාසො'** යනු අරුත් වියකන ය. **"න කස්සති න විලෙඛීයතීති වා = ආකාසො"** යනුත් මෙහි යෙදේ.

පක්ෂීහු උඩ පියා හඹා නැග යෑමෙහි සමර්ථ බැවින් **සකුන්ත** නම්. **'සක්කොන්ති උඩං ගන්තුන්ති = සකුන්තා'** යනු එහි අරුත් එලිකිරීම ය.

ගති තෙසං දුරන්තයා = ඔවුන්ගේ ගමන් නො දතැකි ය.

අහසින් යන එන පක්ෂීන්ගේ පා සටහන් නො දත හැක්කා සේ යම් කෙනකුන්ට යට කියූ දෙවැදෑරුම් සන්නිවය නැත්තේ ද, ත්‍රිවිධපරිඥාවෙන් පිරිසිඳ දත් භොජනය ඇත්තේ ද, ත්‍රිවිධ

විමොක්ෂය ගොදුරු වූයේ ද, ඔවුහු ත්‍රිවිධභව – චතුර්විධයොනි - පංචවිධගති – සප්තවිධවිඥානස්ථිති – නවවිධසත්ත්වාවාස යන මේ පස් තැන් අතුරෙහි මෙ තැනින් අතැනට අතැනින් මෙතැනට උත්පත්ති වශයෙන් ගියහ යි, ඔවුන් ගිය තැන, උපන් තැන නො පැනෙන බැවින් ඔවුන්ගේ ගමන නො ද පෙන්වියැකි ය.

ගති ශබ්දය, ගතිගති – නිබ්බත්තගති – විභවගති – අජ්ඣාසය ගති – නිබ්බත්තිගති – ඤාණගති – භවභෙද – නිඝා – බුඩි – වාසඝාන විසමභාව යන මෙ තැන්හි එන්නේ ය. **'කං ගතිං පච්ඡා ගච්ඡාමි'** යනු ගතිගතියෙහි වේ. **'ඉමෙසං බො අහං භික්ඛුනං සීලවන්තානං නෙව ජානාමි ගතිං වා අගතිං වා,** යනු නිබ්බත්තගතියෙහි ආයේ ය. විභවගතියෙහි ආයේ **'විභවො ගතිධම්මානං නිබ්බානං අරහතො ගති'** යනාදි තන්හි ය. **'එවං බො තෙ අහං බ්‍රහෙම ගතිං ච ජානාමි චුතිං ච ජානාමි'** යනාදි තන්හි ආයේ අජ්ඣාසය ගතියෙහි ය. **'මෙ ගතියො භවන්ති අනඤ්ඤා,** යනාදියෙහි නිබ්බත්තිගතියෙහි වැටුනේය. **'සුඤරං නිබ්බානං ගතො'** යනාදියෙහි ඤාණ ගතියෙහි ය. **'පංචෙව බො පනිමා සාරිපුත්ත! ගතියො'** යනු භවභෙදයෙහි ය. **'යෙහි සමන්නාගතස්ස මහා පුරිසස්ස මෙ ගතියො භවන්ති,** යනු ආයේ නිඝානයෙහි ය. **'ගති මිගානං පවනං'** යනු වාසස්ථානයෙහි ය. **'ගතිගතං'** යනු විසමභාවයෙහි වේ. මෙහි හුනුයේ නිබ්බත්ත ගතියෙහි ය. ක්ෂීණාස්‍රවයන් වහන්සේලාගේ උත්පත්තිගති යි අරුත් දුන්නේ එහෙයිනි.

ධර්මදෙශනාව ගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා දියට පැමිණියාහු ය.

බෙලට්ඨසීසස්ථවිරවස්තුව නිමියේ ය.

අනුරුඬසථවිරයන් වහන්සේගේ සිවුර

7-4

තැන තැන ඉරි ගොස් දිරුම්කඩට පත් සිවුරක් පොරොවා ගත් අනුරුඬ මහාසථවිරයන් වහන්සේ, දවසෙක සිවුරක් කර ගණු පිණිස රෙදි කැබලි එකතු කරමින් කුණුගොඩක් පාසා හැසුරුනු සේක. මේ වේලෙහි මේ අත්බවෙන් පෙර තුන්වන අත්බවේ දී උන්වහන්සේට භාර්‍යා වූ සත්‍රිය, **ජාලිනී,** යන නමින් තව්තිසා දෙව්ලොව ඉපද සිටියා ය. ඕ තොමෝ, සිවුරකට රෙදි කැබලි සොයමින් කුණුගොඩක් ගෑතේ මෙසේ ඇවිදින උන් වහන්සේ දැක තෙළෙස් රියනක් පමණ දික් වූ සතර රියනක් පමණ පළල් වූ දිව්‍යවස්ත්‍ර දෙකක් අතට ගෙණ 'මම මේ රෙදිකඩ දෙක මෙලෙසින් ම දෙන්නෙම් නම්, උන් වහන්සේ නො පිළිගණු ඇතැ' යි සිතා, රෙදිකැබලි සොයා, ඇවිදින තෙරුන්ගේ ඉදිරියෙහි වූ කසළගොඩෙක රෙදිකොත් පෙණෙන ලෙසට කසළ අස්සේ සඟවා තැබූ ය. උන්වහන්සේ ඒ කුණු-ගොඩ අසලින් වඩින සේක්, කුණුගොඩ තුබූ රෙදි කොත් දැක එයට ලං ව කසළ ගොඩින් ඒ ගෙණ බලා 'ඒකාන්තයෙන් මෙය උසස් පංසුකූලයෙකැ' යි සලකා වෙහෙරට වැඩි සේක. තෙරුන් වහන්සේ එයින් සිවුරක් කරන්නට පටන් ගත් දවසෙහි බුදුරජාණන් වහන්සේ පන් සියයක් දෙනා වහන්සේත් පිරිවරා ගෙණ සිවුර මැසීමට වෙහෙරට වැඩම කොට හුන් සේක.

අසූ මහාශ්‍රාවකයන් වහන්සේලාද ඒ පිණිස ම එහි වැඩියහ. මහසුප් තෙරනුවෝ මූල ද, සැරියුත් තෙරනුවෝ මැද ද, අනඳ තෙරනුවෝ කෙළවර ද වැඩ හුන්හ. සෙසු භික්ෂූන් වහන්සේලා නූල් අඹරා දුන්හ. බුදුරජාණන් වහන්සේ ඉදිකටුවල නූල් දමා දුන් සේක. මහා මුගලන් තෙරනුවෝ සිවුර මැසීමට උවමනා අනික් හැම දෙයක් සපයා දුන්හ. මේ අතර ඒ දෙවිදු තොමෝ ගමතුළට වැද 'බුදුරජාණන් වහන්සේ විහාරයෙහි වැඩ හිඳ අසූ මහා ශ්‍රාවකයන් හා ඉන් අන්‍ය ශ්‍රාවකයනුත් පිරිවරා ගෙණ අනුරුඬ භාග්‍යවතුරුවන්ගේ සිවුර මහන්නාහ, උන්වහන්සේලාට දන් පිළියෙල විය යුතු ය, එහෙයින් කැඳ බත් මාලු පිණි සියල්ලක් උයා පිහා ගෙණ විහාරයට ගෙණ යවු' යි නියම කළා ය. මහමුගලන් තෙරනු-වෝ ද දන් වළඳන වේලෙහි ලොකු දඬ ඉරුවක් ගෙණැවිත් භික්ෂූන්ට දුන්හ. උන්වහන්සේලා පන්සියයක් පමණ දෙන

ඒ වළඳ අවසන් කිරීමෙහි අපොහොසත් වූහ. සක්දෙව්රජ තෙමේ සිවුර මහන බිම පිරිබඩ කෙළේ ය. එ තැන ලතුදියෙන් රඳන ලද්දක් වැනි විය. භික්ෂූන් වළඳ ඉතිරි වූ කැඳ අවුළුපත් බත් මහත් රාශියක් විය. ඒ දුටු භික්ෂූන් වහන්සේලා 'මෙතෙක් දෙනාහට මෙතරම් කැඳබත් කුමට ය, ප්‍රමාණයක් සලකා, ගෙණ ආ යුතු ය' යි නෑයන්ට දායකයන්ට කිය යුතු නො වේ ද, අනුරුඬ ස්ථවිරයන් වහන්සේ තම නෑයන්ගේ හා දායකයන්ගේ ලොකුකම පෙන්වන්නට මෙසේ කළෝ වනැ' යි හඬ නගා කතා කරන්නට වූහ. එවිට බුදුරජානන් වහන්සේ, 'මහණෙනි! කිම; තමුසේලා මේ කැඳබත් ආදිය අනුරුඬ තැන විසින් ගෙන්වන ලදැ යි සිතහු දැ' යි අසා වදාළ සේක. 'එසේය, ස්වාමීනි! යි කී කල්හි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! එසේ නො සිතවු! එසේ නො කියවු! අනුරුඬ තෙමේ එසේ කියන්නෙක් නො වේ, ඒ නම එසේ නො කියයි, නො කරයි, රහත්හු සිවුපසය ගැණ කතා නො කරති, මේ පිණ්ඩපාතය ලැබුනේ දෙවියන්ගේ නියමයටැ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො'
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො,
ආකාසෙව සකුන්තානං පදන්තස්ස දුරන්තයන්ති.

යමකුගේ ආස්‍රවයෝ ගෙවී ගියෝ ද, ආහාරයේත් නො ඇලුනේ වේ ද, යමක්හට සුඤ්ඤත-අනිමිත්ත-අප්පණිහිත නිවන අරමුණු වේ ද, ඔහුගේ පියවර නො දතැකි ය.

යස්ස ආසවා පරික්ඛීණා = යමක්හුගේ ආස්‍රවයෝ ගෙවී ගියෝ ද.

ආස්‍රවයෝ සිවු දෙනෙකි. **'චත්තාරො ආසවා'** යි ඒ වදාළ සේක. ඔවුහු කවුරුද යත්:- කාමාසව-භවාසව-දිඨාසව-අවිජ්ජාසව යන මොවුහු ය. **'කතමෙ තෙ? කාමාසවො භවාසවො දිඨාසවො අවිජ්ජාසවො''** යනු පාළිය ය.

එහි ඇස්-කන්-නාස් ආදී සදොරට හමු වන මන වඩන සිත් වඩන රූපාදි අරමුණු නිසා සිතෙහි උපදින ඇල්ම **කාමාසව** නම් වේ. මේ ඒ දේශනාව:- **'තත්ථ කතමො කාමාසවො? යො කාමෙසු කාමච්ඡන්දො, කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං අයං වුච්චති කාමාසවො'** යනු. රූප ශබ්දාදි පඤ්චවිධ කාම ගුණයන්හි කැමැත්තෙක්, පැතීම් රැඳීම් වසයෙන් කාමරාගයෙක්, කැමැතිවීම් සතුටුවීම් වසයෙන් කාම

නන්දියක්, කැමැතිවීම් පිණෑයෑම් වසයෙන් කාමතෘෂ්ණාවක්, කැමැතිවීම් සෙනහකිරීම් වසයෙන් කාමස්නෙහයෙක්, කැමැතිවීම් දැවීම් වසයෙන් කාමපරිළාහයෙක්, කැමැතිවීම් මූසපත්වීම් වසයෙන් කාමමූර්ච්ඡාවක්, කැමැතිවීම් එහි බැස ගැණීම් වසයෙන් කාමජ්ඣෝසානයෙක් වේ ද, ඒය කාමාසව, යනු ඒ පාළියේ ඉතා කෙටි තේරුම ය. ඉතා කොටින් කිය යුත්තේ, රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන කාමවස්තූන් කෙරෙහි ඇලීම් ගැලීම් බැඳීම් විසින් පැවති කෙලෙශකාමය කාමාසවැ යි කාමවස්තූන් කෙරෙහි පවත්නා ආශාව කාමාසවැ යි.

රූපාරූපභවයන්හි පැවැති ඡන්දරාගය හා ධ්‍යානසුඛය පිළිබඳ ඉතා සියුම් තෘෂ්ණාව සේ ගැණෙන ධ්‍යානනිකන්තිය ද, ශාස්වත දෘෂ්ටිය හා එක් ව හට ගත් රාගය ද භවවශයෙන් පැතීම භවාසව, නම් **'රූපාරූපභවෙසු ඡන්දරාගෝ නිකන්තිනන්දි සස්සතදිට්ඨිසහජාතෝ රාගෝ භවවසෙන පත්ථනා භවාසවෝ නාම'** යි එය අටුවාව පැහැදිලි කෙළේ ය. මෙන්න එහි දෙසනා පාළිය:- **'තත්ථ කතමෝ භවාසවෝ? යෝ භවෙසු භවච්ඡන්දෝ භවරාගෝ භවනන්දි භවතණ්හා භවසිනෙහෝ භවපරිළාහෝ භවමුච්ඡා භවජ්ඣෝසානං අයං වුච්චති භවාසවෝ'** යනු. රූපාරූපභවයන්හි පැතීම් වසයෙන් යම් ඡන්දයෙක්, යම් රාගයෙක්, යම් සතුටෙක්, යම් තෘෂ්ණාවක්, යම් ස්නෙහයෙක්, යම් දැවීමෙක්, යම් මූසපත් වීමෙක්, යම් බැස ගැණීමෙක් වේ ද, එය භවාසව නම් වේ යනු එහි යන්තම් සිංහල තේරුම ය.

රූපාදිය, නිත්‍ය-ශුභ-සුඛ-ආත්මාදීන්ගේ වසයෙන් දැක්ම, **දිට්ඨාසව** නම්. දෙසැට මිසදිටු දිට්ඨාසවැ යි කොටින් දන්නේ ය. මේ එහි දෙසනා පාළිය:- **'තත්ථ කතමෝ දිට්ඨාසවෝ? සස්සතෝ ලෝකෝති වා, අසස්සතෝ ලෝකෝති වා, අන්තවා ලෝකෝති වා, අනන්තවා ලෝකෝති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතෝ පරම්මරණාති වා, න හොති තථාගතෝ පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතෝ පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතෝ පරම්මරණාති වා, යා එවරූපා දිට්ඨි -පෙ- විපරියෙසග්ගාහෝ අයං වුච්චති දිට්ඨාසවෝ'** යනු. ඉදං සත්‍යාභිනිවෙශයට කිය සේ දන්න.

දුඃඛාදී වූ අට තැන්හි නො දැන්ම අවිජ්ජාසව නම්. **'අට්ඨසු ඨානෙසු අඤ්ඤාණං අවිජ්ජාසවෝ නාම'** යන්නෙන් ඒ පැහැදිලිය. සිවු සස්දම් වසාලන අනාදිමත්සවභාවාදී වූ ඇති සැටිය

වසාලන නො පෙනෙන මොහයය අවිජ්ජාසව. මේ එහි දෙසනා පාළිය:- **'තත්‍ථ කතමෝ අවිජ්ජාසවෝ? දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අදස්සනං අනභිසමයෝ අනනුබොධෝ අසම්බොධෝ අප්පටිවෙධෝ අස ගාහනා අපරියොගාහනා අසම්පක්ඛණා අපච්චවෙක්ඛණා අපච්චවෙක්ඛණාමම්මං දුම්මජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහෝ පමොහෝ සම්මොහෝ අවිජ්ජා අවිජ්ජාගතා අවිජ්ජායොගෝ අවිජ්ජානුසයෝ අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහෝ අකුසලමූලං අයං වුච්චති අවිජ්ජාසවෝ'** යනු.

දුංඛාදී වූ අට තැන්හි යම් නො දැක්මෙක්, අභිමුඛ ව අවබොධ නො කිරීමෙක්, අනුරූප වසයෙන් අවබොධ නො කිරීමෙක්, අනිත්‍යාදීන් හා යොදා අවබොධ නො කිරීමෙක්, විද්‍යමානතත්ත්වය අවබොධ නො කිරීමෙක්, චතුසච්චාවබෝධයක් අවබොධ නො කිරීමෙක්, රූපාදී වූ එක දහමකුත් අනිත්‍යාදි සාමාන්‍ය හෙයින් සංග්‍රහ නො කිරීමෙක්, එහි නුවණින් බැස නො ගැන්මෙක්, සමලෙසින් නො බැලීමෙක්, ධර්මසවභාවය නො සැලකීමෙක්, එක් කර්මයකුත් නො දැක්මෙක්, සිතෙහි අපිරිසිදු බවෙක්, බාල බවෙක්, මුළාබවෙක්, බලවත්තර මූඪභාවයෙක් හෝ පසින් මුළාවෙක්, අවිද්‍යාවක්, ඔඝයෙක්, යොගයෙක්, අනුසයෙක්, සිත මැඩීමෙක්, අවිදූකණයමෙක්, අකුසල මූලයෙක් වේ ද, ඒය අවිජ්ජාසව, යනු එහි පදරෑත් පමණින් අවිජ්ජාසවය කියා පැම ය.

'චක්ඛු ආදිනෝ සඤ්ඤාති පවත්තනතීති = ආසවා' ඇස්-කන්-නාස්-දිවි-සිරුර-සිත යන සඳෙරින් වැගිරෙන් නු ඔ ආසව නම්. ඇස්-කන්-ආදි සඳෙරෙහි කුසලාදීන්ගේ ද පැවැත්ම ඇතත්, කාමාසාවාදීහු ම වණයකින් ගලන දියර මෙන් අසුවිභාවයෙන් ම වැගිරෙති මොවුහු. එ හෙයින් කාමාදීහු ම ආසව නම් වෙත්. මෙහි ආසව ශබ්දය වැගිරෙන අසුචියෙහි හෝ නැඟී සිටියි.

'ධම්මතෝ යාව භොත්‍රූහු ඔකාසතෝ යාව භවග්ගා සවන්ති ගච්ඡන්ති ආරම්මණකරණවසෙන පවත්තන්තීති = ආසවා' ධර්මවශයෙන් භොත්‍රූභූවිත්තක්ෂණය දක්වාත්, අවකාශවශයෙන් භවාග්‍රය දක්වාත් වැගිරෙන් නුයි ද, යෙත් නුයි ද, අරමුණු කිරීම්

වසයෙන් පවතියි නුයි ද ආසව නම්. ධ්‍යානචිත්තවීථියින්හි අජිණ්ණචිත්තයට මූලින් කාමාවචරගොත්‍රය මැඩ, රූපාවචර-අරූපාවචර ගොත්‍රයන් උපදවමින් පහළ වන චිත්තක්ෂණයත්, සෝතාපත්තිමගඵවීථියෙහි පෘථග්ජන ගොත්‍රය නසා ආර්‍යගොත්‍රය උපදවමින් පහළ වන චිත්තක්ෂණයත් ගොත්‍රභූ, නම් වේ. නෙව-සඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්මලොකය භවඟය නමි.

මෙහි වූ **ආ,** කාරය අවදි අරුත් ඇත්තේ ය. මර්‍යාදා අභිවිධි විසින් අවදිඅරුත දෙ පරිදි වේ. මර්‍යාදා නම් ක්‍රියාව පිටත් කොට පැවැති සීමා ය. **'ආ පාටලීපුත්තා චුද්ධා දෙවෝ'** යනු නිදසුන් ය. අභිවිධි නම්, ක්‍රියාව පැතිරී සිටි සීමාය. **'ආ භවඟා භගවතෝ යසෝ පවත්තති'** යනු නිදසුන් ය. මෙහි ගත්තා ලද්දේ අභිවිධ්‍යර්‍ථ ය. එ හෙයින් මොවුහු මේ ධර්‍මයන් හා ඒ අවකාශයත් ඇතුළත් කොට අරමුණු කිරීම් වසයෙන් පවතිත්.

'චිරපරිවාසියඤ්ඤෙන මදිරාදයෝ ආසවා වියාති=ආසවා' බොහෝ කලක් පැසවා පල් කොට ගත්තා බැවින් මදිරාදීහු ආසව, නම් වෙති. එවැනි හෙයින් මොවුහු ද ආසව, නම්. ලෝ වැස්සන් විසින් බොහෝ කල් පැසවා පල් කොට ගත්තා මදිරාදීහු ආසවැ, යි කියනු ලැබෙත් නම්, මේ කාමාදීහු ම එසේ කිය යුතු වෙති. කිමැය එසේ කිය යුතු? **'පුරිමා භික්ඛවෙ! කොටි න පඤ්ඤායති අවිජ්ජාය ඉතෝ පුබ්බ අවිජ්ජා නාහොසි'** යනු බුදුවදන් බැවිනි.

'ආගතං වා සංසාරදුක්ඛං සවන්ති පසවන්තීති=ආසවා' සසරදුක් දිග් ගස ගසා ප්‍රසවය කෙරෙත් නුයි ආසව, නම්. ආස්‍රවයන්ගෙන් තොර ව සසර කිසි දුකෙක් දිග් ගැසී නොයන්නේ ය. නොද පවත්නේ ය. සසර දිග් කරන්නෝ අස්‍රවයෝ ය.

කාමාසවය තෙමේ, උපදිනුයේ ඇස් - කන් - නාස් ආදී වූ සදෙරෙහි ඉදිරියට ආ ආ ඉවූ අරමුණු, රස විසින් ගෙණ රස විඳ ගැණුම් වසයෙන් පිළිගන්නහුට ය. විඳින්නහුට ය. සතුටු වන්නහුට ය.

භවාසවය තෙමේ, එබදු වූ ම ඉවූ අරමුණු' ඉදිරියෙහි අන් සුගති බවයන්හි ද ලබන්නෙමි, යි භවය ප්‍රාර්‍ථනා කොට රස විඳින්නහුට උපදනේ ය.

දිට්ඨාසවය තෙමේ, සත්ත්ව කියා හෝ, සත්ත්වයාගේ ය කියා හෝ නන්නහුට ය උපදනේ.

මූළමනින් සංයොජන ධර්‍ම නසා නොසිටියහුට අවිජ්ජාසවය උපදනේ ය. අවිද්‍යාවගේ මූලසිදීම නැසීම වනුයේ අර්හත්ඵලයෙනි.

තව ද චිත්තොත්පාද විසින් කාමාසවය තෙමේ අට වැදෑරුම් ලෝභසහගත සිත්හි උපදියි. මිත්‍යාදෘෂ්ටියෙන් තොර වූ සිව් වැදෑරුම් වූ ලෝභසහගත වූ සිත්හි භවාසවය උපදියි. දිට්ඨිගත සම්පයුත්තසිත්හි දිට්ඨාසවය උපදියි. සියලු අකුසලසිත්හි උපදනේ ය අවිජ්ජාසවය තෙමේ.

මොවුහු හැම, අර්‍හත්වයින් එක් වැදෑරුම් ය. **'දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය'** යන ඈ ලෙසින් විනයයෙහි දෙ පරිවර්‍තය, **'තයෝ මේ ආවුසෝ ආසවා කාමාසවෝ භවාසවෝ අවිජ්ජාසවෝ'** යි සූත්‍රපිටකයෙහි සළායතනයෙහි තෙ පරිදි ව, **'අත්ථි භික්ඛවෙ ආසවා නිරයගමනියා අත්ථි ආසවා තිරච්ඡානයොනිගමනියා අත්ථි ආසවා පෙත්තිවිසය ගමනියා අත්ථි ආසවා මනුස්සලොකගමනියා අත්ථි ආසවා දෙවලොකගමනියා'** යි නිබෙබධිකපරියායෙහි පස් පරිදි ව, **'අත්ථි භික්ඛවෙ ආසවා සංවරා පහාතබ්බා අත්ථි ආසවා පටිසෙවනා පහාතබ්බා අත්ථි ආසවා අධිවාසනා පහාතබ්බා අත්ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා අත්ථි ආසවා විනොදනා පහාතබ්බා'** යි ඡක්කනිපාතයෙහි ආහුණෙය්‍යසූත්‍රයෙහි සපරිදි ව ආහ මොවුහු. තව ද, සබ්බාසවපරියායසූත්‍රයෙහි **'දස්සනා පහාතබ්බා'** යන මේ හා සත්පරිදි කොට දක්වන ලදහ. මෙහි කාමාසවාදිභෙදයෙන් සිව් පරිදි වෙති. ආස්‍රවයන්ගේ අසම්මොහය පිණිස මේ එකවිධාදිභෙදය මෙහි දැක්වුනැ යි දත යුතු ය.

ආස්‍රවයන්ගේ ප්‍රහාණය, කෙලෙසපරිපාටිය – මාර්ගපරිපාටිය යි දෙපරිදි ය. කෙලෙස් පිළිවෙළින් කෙරෙණ පරිපාටිය, කෙලෙස පරිපාටිය ය. මග පිළිවෙළින් කෙරෙණ පරිපාටිය, මාර්ගපරිපාටිය ය. කෙලෙස්පිළිවෙළින් ගත් කල කාමාසවය අනාගාමීමාර්ගයෙන් පැහෙන්නේ ය. භවාසවය අර්හත්වමාර්ගයෙන් පැහෙන්නේ ය. දිට්ඨාසවය සොතාපත්තිමාර්ගයෙන් පැහෙන්නේ ය. අවිජ්ජාසවය අර්හත්වමාර්ගයෙන් පැහෙන්නේ ය.

මග පිළිවෙළින් ගත් කල සොතාපත්තිමාර්ගයෙන් දිට්ඨාසවය පැහේ. අනාගාමීමාර්ගයෙන් කාමාසවය පැහේ. අර්හත්වමාර්ගයෙන් භවාසව අවිජ්ජාසවයෝ පැහෙත්. මේ මොවුන් පැහෙන, නැසෙන සැටිය. විස්තර බණපොතින් දත යුතු ය.

ආහාරෙ ච අනිස්සිතො = ආහාරයෙහි ද නොඇලුනේ.

ලොකය තෙමේ, කබලීකාරාහාරයෙහි තණ්හා-දිට්ඨිවසයෙන් ඇලේ. එහෙයින් තණ්හානිස්සය-දිට්ඨිනිස්සය යි නිස්සය දෙකෙකි. තණ්හාව ම තණ්හානිස්සය නම්. දිට්ඨිය ම දිට්ඨිනිස්සය නම්. **'ඉමේ නිස්සයා, තණ්හානිස්සයෝ ච දිට්ඨිනිස්සයෝ ච කතමෙ තණ්හා නිස්සයෝ? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං ඔධිකතං පරියන්තකතං පරිගණ්හිතං මමායිතං ඉදං මම, එතං මම, එත්තකං මම, එත්තාවතා මම, මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියෝ රට්ඨං ච ජනපදෙ ච කොසෙ ච කොට්ඨාගාරං ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති යාවතා අට්ඨසතං තණ්හාවිචරිතං අයං තණ්හානිස්සයෝ'** යි මෙසේ දුක් වූ තණ්හානිස්සය විසිනුත්,

'කතමෙ දිට්ඨිනිස්සයෝ? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරෝ දිට්ඨි විසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහෝ පතිට්ඨාහෝ අභිනිවෙසෝ, පරාමාසෝ කුම්මග්ගෝ මිච්ඡාපථෝ මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහෝ විපරීතග්ගාහෝ විපල්ලාසග්ගාහෝ මිච්ඡාග්ගාහෝ අයථාවකම්හි යථාවකන්ති-ග්ගාහෝ යාවතා වාසට්ඨිදිට්ඨිගතානි අයං දිට්ඨිනිස්සයෝ' යි මෙසේ දුක් වූ දිට්ඨිනිස්සය විසිනුත්, සත්ත්ව තෙමේ ආහාරයෙහි බැඳෙයි. ගිජු වෙයි. කැදරකම් දක්වයි.

තණ්හා විසින් මුළුලොව ගුණ පැහිම, මමය, මාගේය යි හැඟුම තණ්හානිස්සය නම්. දෙසැට මිසදිටු දිට්ඨිනිස්සය නම්.

රහතුන් වහන්සේ වනාහි තණ්හා දිට්ඨිවසයෙන් ආහාරයෙහි නො ඇලෙන සේක. චතුමහාභූතකායයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස ආහාර වළඳන සේක. හුදෙක් භවකන්තාරය තරණය පිණිස වළඳන සේක. ලෝවැඩ පිණිස වළඳන සේක. උන්වහන්සේලාගේ සිවුපසය සෙවුම, වණ ඇත්තකු වණයට පිළියම් කරන්නා සේ ය.

සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො= යමක්හට සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිත විමොක්ඛය අරමුණු වේ ද[1]

ආකාසෙ ඉව සකුන්තානං පදං තස්ස දුරන්තයං = අහසෙහි පක්ෂීන්ගේ පිය මෙන්, ඒ රහතුන් වහන්සේගේ පිය නො දත හැකි ය.

යම් සේ අහසෙහි යන පක්ෂීන්ගේ පියවරක් නො දැක්ක හැකි ද, 'මෙතැන් පයින් ඇක්ම ගියේ ය, මෙතැන ලයින් පැහැර ගියේ ය, මෙතැන හිසින් පැහැර ගියේ ය, මෙතැන පියා පතින් පැහැර ගියේ ය' යන ඈ ලෙසින් තැන් දක්නට නො හැකි ද එමෙන් මෙබඳු රහතුන් වහන්සේගේ පිය ද, උත්පත්තිවශයෙන් ගිය තැන ද, 'නරක පියෙන් ගියහ, තිරිසන් පියෙන් ගියහ' යන ඈ ලෙසින් ගිය තැන් දක්නට නොහැකි ය. නො පෙන් විය හැකි ය.

ආස්‍රවධර්මයන් මුළුමනින් නැසූ පිඬු පිඬු කොට ගන්නා අහරෙහි කිසි ලෙසකිනුත් නො ඇලුනු ශූන්‍යත - අනිමිත්ත - අප්‍රණිහිත වශයෙන් කියන ලද නිවන පලසමවත් සිතට නගා ගෙණ වසන රහතුන් වහන්සේගේ උත්පත්තිය අහසෙහි පක්ෂීන්ගේ පිය නො දත හැකි සේ නො පෙන් විය හැකි සේ නො දත හැකි ය, යනු අදහස ය.

ස්ථාන-රක්ෂා-නිර්ථාණ-හෙතු-ශබ්ද-වස්තු-කොට්ඨාස-පාද-පාද ලාඤ්ඡන යන අරුත්හි එන පද, ශබ්දය මෙහි හුනුයේ පාද ලාඤ්ඡනයෙහි ය. පාදයෙහි ම හුනුයේ යි ගත වරද නැත.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

අනුරුද්ධස්ථවිරවස්තුව නිමියේය.

---

1. 1. 14. "ධම්මස්ස" } යනු බලනු
3. 7. 3. "සුඤ්ඤතො" }

මහාකාත්‍යායන සථවිරයන් වහන්සේ

7 - 5

සඞ්ඛිත්තෙන වූ සම්බුදු රජාණන් වහන්සේ එක් අවසථාවෙක මහාපවාරණ දිනයෙහි මිගාරමාතෘප්‍රාසාදයෙහි යට මාලයෙහි මහාශ්‍රාවකගණයා පිරිවරා වැඩ හුන් සේක. ඒ කාලයෙහි මහාකාත්‍යායන සථවිරයන් වහන්සේ අවන්ති නගරයෙහි වැඩ විසූහ. උන්වහන්සේ දහම් දෙසන දවස්හි මිනිස්සු ඉතා දුර සිට ද අවුත් බණ අසති. එහෙයින් සෙසු තෙරවරු මහාකාත්‍යායන සථවිරයන් වහන්සේට අසුනක් තබා ම වැඩ හිඳින සේක. දිනෙක සක්දෙව් තෙමේ දෙ දෙවිලොව දෙවියන් පිරිවරා අවුත් දිවඟද මලින් බුදුරජුන් පුදා සිටියේ මහාකාත්‍යායන තෙරුන් නො දැක 'කුමක් නිසා මාගේ පින්වතුන් වහන්සේ මෙහි නො වෙත් ද, වඩින සේක් ද, වඩින සේක් නම් යහපතැ' යි සිතී ය. එසේ සිතත් ම උන්වහන්සේ එහි වැඩ තම අසුන්හි වැඩ හිඳ නමන් හිඳිනු දැක් වූහ. සක්දෙව් තෙමේ තෙරුන් දැක ඉදිරියට ගොස්, තෙරුන්ගේ ගොප් ඇට බදා ගෙණ, 'අනේ! මාගේ පින්වතුන් වහන්සේ වැඩි සේක, මම ඔබතුමන් වහන්සේ මෙහි වඩිති යි බලාපොරොත්තු වීමි' යි හඳින් මලින් පුදා පසෙකට වී සිටියේ ය. එවිට සෙසු භික්ෂූන් වහන්සේලා 'සක්දෙව් රජ, වැඩ කරන්නේ දෙන්නේ පුදන්නේ මූණ බලා ය, යහළුකමට ය, මේ මහාඝනිකදු සේ බබලන මහාශ්‍රාවකයන්ට මෙබඳු ගරු සැලකිලි නො කොට මහාකාත්‍යායන තෙරුන් දැක වහා ගොස් ගොප් ඇට ගෙණ අනේ! යහපත! පින්වතුන් වහන්සේ වැඩිය එක, මම පින්වතුන් වහන්සේ වඩින තුරු මග බලා සිටියෙමි, යි ඉදිරියට ගොස් දෙ අතින් පා මිරිකා පුදා වැඳ සිටියේ ය, සක් දෙවිරජුගේ මේ ක්‍රියාව කොතරම් අසුතු දැ' යි කියන්නට වූහ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ මේ කතාව අසා 'මහණෙනි! තමුසේලාගේ අදහසත් කතාවත් වැරදි සහිත ය, මහාකාත්‍යායන තැන වැනි හික්ම වූ ඉඳුරන් ඇති වැසූ ඇස් කන් නාස් ඇ දෙරටු ඇති මහණහු දෙවියන්ට, යකුන්ට, රකුසන්ට, මිනිසුන්ට, යන හැම කෙනකුන්ට ප්‍රිය වෙති' යි වදාරා අනුසන්ධි හළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

යඤ්ඤින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා,
පහීණමානස්ස අනාසවස්ස
දෙවාපි තස්ස පිහයන්ති තාදිනොති.

රියැදුරු විසින් හික්ම වූ අසුන් සේ යමකුගේ ඉන්ද්‍රියයෝ දැමූනු බවට ගියෝ ද, ප්‍රහීණ වූ මානය ඇති ආස්‍රව රහිත වූ තාදී වූ උන්වහන්සේ ගේ (දැක්ම) දෙවියෝ ද පතන්නාහ.

යස්සඉන්ද්‍රියානි සමථංගතානි = යමක්හුගේ ඉන්ද්‍රියයෝ හික්මීමට ගියාහු (ද)

යස්ස' යනු රහතුන් වහන්සේ සඳහා ය. ඉන්ද්‍රිය නම් ඇස්-කන් - නාස් ආදි තැන්ය.[1] **සමථං ගතානි,** යන මෙයින් ඒ ඉන්ද්‍රියයන්ගේ සන්සිඳීම, හික්මීම කිය වේ. රූප-ශබදාදී අරමුණු වල, ඉෂ්ටානිෂ්ටභාවයෙන් සිතෙහි පහළ වන රාගවෙෂාදීනට ඉපදීමට ඉඩ නො ලැබෙන පරිදි චක්ෂුරාදිඉන්ද්‍රියයන්ගේ සංවරය **ඉන්ද්‍රියසමථ'** නම්. හික්ම වූ ඉඳුරන් ඇති රහතුන් වහන්සේ ඉෂ්ට වූත් අනිෂ්ට වූත් කිසි අරමුණෙක රාගය වත් වෙෂය වත් නො උපදවන සේක. හැම තැන එක හැටියෙන් පවත්නා සේක. නො හික්මුනු ඉඳුරන් ඇත්තහුටමය ඉටු අනිටු අරමුණු වල රාග වෙෂ පහළ වනුයේ.

අස්සා යථා සාරථිනා සුදන්තා = රියැදුරු විසින් මනා කොට දැමූ අසුන් සේ.

මැනැවින් දැමූ හික්ම වූ අශ්වයෝ ම වැඩෙහි යෙදීමට සුදුසු වෙති. එහෙයින් රියැදුරන් විසින් වැඩෙහි යොදන්නට කලින් අශ්වයෝ තළා පෙළා නිසි සේ හික්මවනු ලබති. එය කළයුත්තේ දක්ෂ රථාචාර්‍යයන් විසින් ය. නො හික්මුනු අසකු රියෙහි යෙදුයේ නම්, එයින් වනුයේ මරණය හෝ එතරම් දුකෙක. එමෙන් නො හික්මුනු ඉඳුරන් ඇත්තේ, නො හික්මුනු ඉඳුරන් නිසා එයට වැඩිතරම් වූ බලගතු දුක්වලට පැමිණෙන්නේ ය. ඒ දුකට පත්වීම එක් අත්බවෙක පමණක් වන්නේ නො වේ. සසර උපදින හැම අත්බවෙක ඒ වන්නේ ය. ඉඳුරන් හික්මවන තුරු ම වන්නේ ය. එහෙයින් මේ වග දත් නුවණැත්තෝ සිය ඉඳුරන්, තමන් පිළිබඳ ඇස්-කන්-නාස් ආදිය, ධර්‍මය ලෙසින් හික්මවති. දමනය කරති. එසේ ධර්‍මය ලෙසින් හොඳට හික්මුනු ඉඳුරන් ඇත්තෝ ම ය, දෙව් මිනිස් බඹ යක් රකුස් ආදී හැම කෙනෙකුන්ගේ ම වැඳුම් පිදුම් පැහැදුම් වලට පාත්‍ර වන්නෝ. ඔවුන්ගේ සිත් ගන්නෝ.

පහිණමානස්ස = පැහූ මන් ඇති[2]

---

1. 1. 6. ඉන්ද්‍රියෙසු අසංවුතං, යන්න බලනු
2. 1. 7. අතික්කසාවො, ,, ,,

අනාසවස්ස = ආස්‍රව රහිත වූ[1]

දෙවාඅපි = දෙවියෝ ද[2]

මෙහි **අපි'** ශබ්දය විසින් බ්‍රහ්ම මනුෂ්‍ය යක්ෂ රාක්ෂසාදී අන්‍ය සත්ත්වයෝ ද සංග්‍රහ කරණු ලැබෙති. එහෙයින් **දෙවියන්ට පමණක් නොව හැම සත්ත්වයනට** ම ප්‍රියභ රහතුන් වහන්සේ.

තස්ස = ඒ රහතුන් වහන්සේගේ.

පහීණමානස්ස, අනාසවස්ස' යන දෙපදය හා පහත පෙණෙන **තාදිනෝ'** යනුත් මෙයට විශෙෂණ ව සිටියේ ය. එහෙයින් ඒ පද සියල්ල එකතු වූ විට, 'පැහැ මත් ඇති ආස්‍රව රහිත වූ තාදී වූ රහතුන් වහන්සේගේ' යන අර්ථය මතුව එන්නේ ය. එහිලා දුක්ම' යන්න අනින් හෙළා අරුත් ගත යුතු ය.

පිහයනහි = පතත්. කැමති වෙත්. බලාපොරොත්තු වෙත්.

තාදිනෝ = තාදී වූ එක හැටි වූ. නො වෙනස් වූ.

තාදිගුණය කියා පාන බණපොත පැණ විසඳුම් විසින් එය මෙසේ කියා පාන්නේ ය.

'පංචහි ඛන්ධෝරෙහි තාදි' පස් අයුරකින් තාදී සේක රහතුන් වහන්සේ.

'කථං ඉට්ඨානිඤ්ච තාදි?' ඉටු අනිටු ලැබුම්වල කෙසේ තාදී—සේක් ද, රහතුන් වහන්සේ?

'ලාභෙපි තාදි' ඉටු ලැබුම්හි, සිත් ගන්නා ලැබුම්හි, ඇස් කන් නාස් ආ ඇද ගන්නා ලැබුම්හි, සිවුපසය ලැබුම්හි තාදී සේක. එක හැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'අලාභෙපි තාදි' ඉටු ලැබුම් නො ලැබුමෙහි, සිත් ගන්නා ලැබුම් නො ලැබුමෙහි, ඇස් කන් නාස් ආ ඇද ගන්නා ලැබුම් නො ලැබුමෙහි, සිවුපසය නො ලැබුමෙහි තාදී සේක. එක හැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'යසෙපි තාදි' හිතමිතුරු නෑ සියන් ලැබුමෙහි, හිත මිතුරු නෑසියන් පිරිවරා ගැණුමෙහි තාදී සේක. එක සැටි සේක. නො වෙනස් සේක රහතුන්වහන්සේ.

---

1. 7. 4. "යස්සාසවා" යන්න බලනු
2. 1. 13. "සුගතානි" ,, ,,

'අයශසෙපි තාදී' හිතමිතුරු නෑ සියන් විපතෙහි, හිත මිතුරු නෑ සියන් වැටුමෙහි තාදී සේක. එක සැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'පසංසායපි තාදී' හිතමිතුරු නෑ සියන් ගුණ වැණුමෙහි, හිතමිතුරු නෑ සියන් ගුණ කියුමෙහි, තමන් ගුණ වැණුමෙහි, කියුමෙහි තාදී සේක. එක සැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'නින්දායපි තාදී' හිතමිතුරු නෑසියන් හා තමන් ගැරහුමෙහි, බැණුමෙහි තාදී සේක. එක හැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'සුඛෙපි තාදී' කය පිළිබඳ සැපයෙහි, කය පිළිබඳ සැනසුමෙහි, කය පිළිබඳ මහන්බයෙහි, තාදී සේක. එක සැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'දුක්ඛෙපි තාදී' කය පිළිබඳ දුකෙහි, කය පිළිබඳ ගැටුමෙහි, කය පිළිබඳ පිරිහුමෙහි තාදී සේක. එක හැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

මෙසේ මාගේ බුදුරජාණන් වහන්සේ මේ ලාභාලාභාදියෙහි තාදී වන බැවින් එක හැටි වන බැවින් නො වෙනස් වන බැවින් නො කැපෙන බැවින් නො සැලෙන බැවින් නො වෙවුලන බැවින් කෙනෙක් එක් බාහුවක් එක් අතක් සිවු දැහදින් ආලෙප කරත් ද, කෙනෙක් එක් බාහුවක් එක් අතක් වැයෙන් සැස තුනී කෙරෙත් ද, සිවු දැහඳ අලෙවි දුන්නහු කෙරෙහි ස්නෙහයත්, වැයෙන් සැස තුනී කළහු කෙරෙහි කොපයත් නො උපදවන්නෝ ය. ස්නෙහ යත් නො උපදනේ ය. කොපයත් නො උපදනේ ය. ඒ දෙතැන් හි ම උන්වහන්සේ ස්නෙහයත් දුරු කළෝ ය. කොපයත් දුරු කළෝ ය. ස්නෙහවශයෙන් අනුග්‍රහයත් ප්‍රතිඝවශයෙන් නිග්‍රහයත් ඉක්මවා සිටියෝ ය. හැම සංස්කාරයන් කෙරෙහි ම රහතුන් වහන්සේ සමව සිටින සේක. නො වෙනස් සේක. නො සැලෙන සේක. ඒ මේ දෙඅනාව:- **'එකෙවෙව බාහං ගණ්හන්ත ලිම්පෙය්‍යුං, එකෙවෙව බාහා වාසියා තච්ඡෙය්‍යුං අමුකස්මිං නාම රාජා අමුකස්මිං නාම පවිසං, අනුනයපටිඝවිප්පයුත්තෙන චිත්තේන විහරති මහාපඨවිසමේන චිත්තේන විහරති මහාසාගරසමේන චිත්තේන විහරති එවං ඉමානිපෙ තාදී'** යනු.

'කථං චතානාවිති තාදි?' කෙසේ කෙලෙස් බැහැර කළ සේක් තාදී සේක් ද, රහතුන් වහන්සේ?

'භගවතා රාගො චත්තො වන්තො මුත්තො පහීණො පටිනිස්සඨො, දොසො මොහො කොධො උපනාහො මක්ඛො පලාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බෙ අකුසලාභි සඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීණා පටිනිස්සඨා, එවං චත්තා විති භගවා තාදී' රාග-දොස-මොහ-ක්‍රොධ-උපනාහ-මක්ඛ-පලාස-ඉස්සා-මච්ඡරිය-මායා-සාඨෙය්‍ය - ථම්භ-සාරම්භ-මාන - අති මාන-මද-පමාද-සියලු කෙලෙස්-සියලු දුසිරිත්-සියලු දැවිලි-සියලු තැවිලි-සියලු අකුසල සංස්කාර, භාග්‍යවතුන් වහන්සේ විසින් හරන ලදහ. වමාරන ලදහ. ප්‍රහීණ කරණ ලදහ. දුරු කරණ ලදහ. මෙසේ කෙලෙස් බැහැර කළ සේක් තාදී සේක. එක සැටි සේක. නො වෙනස් සේක රහතුන් වහන්සේ.

'කථං තිණ්ණාවිති තාදී?' කෙසේ සසර ඉක්මවා සිටි සේක් තාදී සේක් ද රහතුන් වහන්සේ?

'භගවා කාමොඝං තිණ්ණො' භාග්‍යවතුන් වහන්සේ පංචකාම ගුණිකරාගය මුළුමනින් තරණය කළ සේක.

'භගවා භවොඝං තිණ්ණො' භාග්‍යවතුන් වහන්සේ රූපාරූප භවයන්හි ඡන්දරාගය හා ධ්‍යානනිකාන්තිය තරණය කළ සේක.

'භගවා දිඨොඝං තිණ්ණො' භාග්‍යවතුන් වහන්සේ ශාස්වත දෘෂ්ටි ආදිය හා එක්ව ගිය භවප්‍රාර්ථනාව තරණය කළ සේක.

'භගවා අවිජ්ජොඝං තිණ්ණො' භාග්‍යවතුන් වහන්සේ සිවු සස් දහම්හි නො දැන්මය යි කියූ අවිජ්ජොඝය තරණය කළසේක.

'භගවා සබ්බං සංසාරපථං තිණ්ණො උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො විතිවත්තො' භාග්‍යවතුන් වහන්සේ සියලු සසරමග ප්‍රථමමාර්ග වශයෙන් තරණය කළ සේක. චිතීයමාර්ග වශයෙන් උත්තරණය කළ සේක. තෘතීය මාර්ග වශයෙන් අතික්‍රමණය කළ සේක. චතුර්ථමාර්ග වශයෙන් සමතික්‍රමණය කළසේක. ඵල වශයෙන් ව්‍යතික්‍රමණය කළසේක.

'සො වුත්ථවාසො' ඒ භාග්‍යවතුන් වහන්සේ දශවිධ ආර්‍ය්‍ය වාසයෙහි විසූ වස් ඇති සේක.

'විණ්ණචරණො' ඒ භාග්‍යවතුන් වහන්සේ සීලය හා අෂ්ටවිධ සමාපත්තියෙහි පුරුදු කළ වස් ඇති සේක.

'ගතෙඛං' ඒ භාග්‍යවතුන් වහන්සේ සසරමග ඉක්ම වූ සේක.

'ගතදිසෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ සිහිනෙනුදු නොහිය විරූ නිවන් දෙසට වැහිය සේක.

'ගතෙකෝටි' ඒ භාග්‍යවතුන් වහන්සේ අනුපාදිශෙෂනිර්‍වාණ කොටියට ගොස් සිටි සේක.

'පාලිතබ්‍රහ්මචරියෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ රැකි බඹසර ඇති සේක.

'උත්තමදිට්ඨිපත්තෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ උත්තම සම්‍යක්දෘෂ්ටියට පැමිණි සේක.

'භාවිතමෙගෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ වැඩූ මග ඇති සේක.

'පහීණකිලෙසෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ පැහැ කෙලෙස් ඇති සේක.

'පවිඛ්ධකුපෙපා' ඒ භාග්‍යවතුන් වහන්සේ නොසැලෙන රහත් පලඟ පිළිවිද දුන සිටි සේක.

'සවජ්ඣතනිරොඛෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ සංඝකාර නිරෝධය වූ නිවන ප්‍රත්‍යක්ෂ කොට සිටි සේක.

'දුක්ඛං තස්ස පරිඤ්ඤාතං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් තෙවැදෑරුම් දුක මොනවට ඉක්මවා පිරිසිඳ දන්නා ලද්දේ ය.

'සමුදයෝ පහීණෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දුකහි සමුදය ප්‍රහීණ කරණ ලද්දේ ය.

'මෙගෝ භාවිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දුක් හෙවීමේ මග වඩන ලද්දේ ය.

'නිරොඛෝ සවජ්ඣතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් නිරෝධසඞ්ඛ්‍යාතනිර්‍වාණය සාක්ෂාත් කරණ ලද්දේ ය.

'අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සවභාවලක්ෂණාවබෝධ වශයෙන් මැනැවින් දතයුතු දෙය අධික වූ ප්‍රඥාවෙන් දන්නා ලද්දේ ය.

'පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සාමාන්‍ය ලක්ෂණාවබෝධ වශයෙන් කෘත්‍යසමාපන්න වශයෙන් ඉතිරි නොකොට දත යුත්ත හාත්පසින් දන්නා ලද්දේ ය.

'පහාතබ්බං පහීණං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සමුදය පාක්ෂික වූ කෙලෙස්, පහාණපරිඤ්ඤාවෙන් දැන ප්‍රහීණ කරණ ලද්දේ ය.

'භාවෙතබ්බං භාවිතං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වැඩිය යුතු මග වඩන ලද්දේ ය

'සච්ඡිකාතබ්බං සච්ඡිකතං' ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සාක්ෂාත් කළ යුතු දහම් සාක්ෂාත් කරණ ලද්දේ ය.

'සො උක්ඛිත්තපලිඝො' ඒ භාග්‍යවතුන් වහන්සේ හරන ලද අවිදුකණයම ඇති සේක.

'සඞ්කිණ්ණපරිඛො' ඒ භාග්‍යවතුන් වහන්සේ සුණු විසුණු කළ කර්මාභිසංස්කාර නැමැති පරිඛා ඇති සේක.

'අබ්බූළ්හෙසිකො' ඒ භාග්‍යවතුන් වහන්සේ උදුරා දැමූ සසරට මුල් වූ තෘෂ්ණා නැමැති එසිකාස්තම්භ ඇති සේක.

'නිරග්ගලො' ඒ භාග්‍යවතුන් වහන්සේ බිඳ හළ කාමභවයෙහි උපතට කරුණු වූ ඔරම්භාගීය සංයොජන නැමැති අගුල්කණු ඇති සේක.

'අරියො' ඒ භාග්‍යවතුන් වහන්සේ පහ වූ කෙලෙස් ඇති බැවින් පිරිසිදු සේක.

'පන්නඛජෙ' ඒ භාග්‍යවතුන් වහන්සේ බහා තැබූ ඛන්ධ කිලෙස අභිසඞ්ඛාරභාර හා කාමගුණභාර ඇති සේක. බහා තැබූ මානභාර ද ඇති සේක.

'විසඤ්ඤුත්තො' ඒ භාග්‍යවතුන් වහන්සේ චතුර්විධයොගයෙන් හා සියලු කෙලෙසුන්ගෙන් වෙන් ව සිටි සේක.

'පඤ්චඞ්ගවිප්පහීණො' ඒ භාග්‍යවතුන් වහන්සේ පහ කළ කාමච්ඡන්දාදීපඤ්චඞ්ග ඇති සේක.

'ඡළඞ්ගසමන්නාගතො' ඒ භාග්‍යවතුන් වහන්සේ සදොරට හමු වන රූපාදි අරමුණු කෙරෙහි නගින ප්‍රතිඝානුනය දුරු කොට උපෙක්ෂා වශයෙන් ස්මෘතිමත් ව සම්ප්‍රජාන ව විසීම් විසින් ෂඩඞ්ග පුරා සිටි බැවින් ඡළඞ්ගසමන්නාගත සේක.

'එකාරක්ඛො' ඒ භාග්‍යවතුන් වහන්සේ සිහි රැකුම් විසින් එක් උතුම් රැකුමක් ඇති සේක.

'චතුරපස්සෙනො' ඒ භාග්‍යවතුන්වහන්සේ ප්‍රඥාවෙන්, පටිසෙවන පරිවර්ජන – විනොදන – පජහන යන මොවුන්ගේ වසයෙන් ඔබිනොබ නො පෙරළෙන චතුර්විධාපාශ්‍රය ඇති සේක.

'පනුත්තපච්චෙකසච්චො' ඒ භාග්‍යවතුන් වහන්සේ බැහැර කරණ ලද 'මේ ම සැබ ව, මේ ම සැබව' යි ගත් ප්‍රත්‍යෙක-සඞ්ඛ්‍යාතදෘෂ්ටිසත්‍යය ඇති සේක.

'සමවයසඨෙසනො' ඒ භාග්‍යවතුන් වහන්සේ මොනවට හැර දැමූ සියලු සොයා බැලුම් ඇති සේක.

'අනාවිලසඞ්කප්පො' ඒ භාග්‍යවතුන් වහන්සේ නො කැළඹුනු සම්‍යක් කල්පනා ඇති සේක.

'පස්සද්ධකායසඞ්ඛාරො' ඒ භාග්‍යවතුන් වහන්සේ සන්සිඳ වූ කායසංස්කාර ඇති සේක.

'සුවිමුත්තචිත්තො' ඒ භාග්‍යවතුන් වහන්සේ මොනවට මිදුනු සිත් ඇති සේක.

'සුවිමුත්තපඤ්ඤො' ඒ භාග්‍යවතුන් වහන්සේ මොහඳුරෙන් මොනවට මිදුනු නුවණැති සේක.

'කෙවලි' ඒ භාග්‍යවතුන් වහන්සේ ශීලසමාද්‍ධ්‍යාදි මහත් ගුණ-යෙන් පිරිපුන් සේක.

'වුසිතවා' ඒ භාග්‍යවතුන් වහන්සේ වැසූ බඹසර ඇති සේක් ආර්‍යමාර්ගයෙහි හා දශවිධ ආර්‍යවාසයෙහි විසීම් ඇති සේක.

'උත්තමපුරිසො' ඒ භාග්‍යවතුන් වහන්සේ ක්ෂය කළ කෙලෙස් ඇති බැවින් ආජන්‍යපුරුෂ සේක.

'පරමපුරිසො' ඒ භාග්‍යවතුන් වහන්සේ අත්බව්හි දොස් දැන විදසුනට පිවිසීම් වසයෙන් පරමපුරුෂ සේක.

'පරමප්පත්තිපත්තො' ඒ භාග්‍යවතුන් වහන්සේ අමෘතප්‍රති-ලාභයට පැමිණි බැවින් පරමප්පත්තිපත්ත සේක.

'සො නෙවාවිනාති න අපවිනාති අපවිනිත්වා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ කුසල් අකුසල් ප්‍රහීණ කොට සිටි බැවින්, ඔවුන්ගේ විපාකයන් නො ද රැස් කරණ සේක. ඵලයෙහි පිහිටි බැවින්, නො ද නසන සේක. ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයෙහි සිටි බැවින් කෙලෙස් නසා සිටි සේක.

'සෝ නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ හැරිය යුත්තක් නැති බැවින් කෙලෙස් නො ද දුරු කරණ සේක. තෘෂ්ණාමානදෘෂ්ටි වියින් ගත යුත්තක් නො වන බැවින් නො ද ගන්නා සේක. ඒ හැම එකක් දුරු කොට සිටි සේක.

'සෝ නෙව සංසිබ්බති න විසිනෙති විසිනෙත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණා වියින් කිසිත් නො ද අවුණන සේක. මාන වියින් උසස් කොට නො ද දක්වන සේක. තෘෂ්ණාවෙන් ආවුණනය නො කොට සිටි සේක.

'සෝ නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් ගිනි නො ද නිවන සේක. කෙලෙස් ගිනි නො ද දල්වන සේක. කෙලෙස් ගිනි මුළුමනින් නිවා සිටි සේක.

'අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ හික්මිය යුත්තක් නැති බැවින් අශෛක්ෂ්‍ය වූ ශීලස්කන්ධයෙන් යුක්ත බැවින් සිටි සේක.

'අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ අශෛක්ෂ්‍ය වූ සමාධිස්කන්ධයෙන් යුක්ත බැවින් සිටි සේක.

'අසෙඛෙන පඤ්ඤක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ අශෛක්ෂ්‍ය වූ ප්‍රඥාස්කන්ධයෙන් යුක්ත බැවින් සිටි සේක.

'අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ අශෛක්ෂ්‍ය වූ විමුක්තිස්කන්ධයෙන් යුක්ත බැවින් සිටි සේක.

'අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ අශෛක්ෂ්‍ය වූ විමුක්තිඥාන දර්ශනස්කන්ධයෙන් යුක්ත බැවින් සිටි සේක.

'සච්චං සම්පටිපාදයිත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ චතුරාර්‍යසත්‍යය සවබෝධ වශයෙන් සිය සතන්හි සපයා පිළිවිදු සිටි සේක.

'එජං සමතික්කමිත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව මුළුමනින් ඉක්මවා සිටි සේක.

'කිලෙසග්ගිං පටිපාදයිත්වා ඨිතෝ' ඒ භාග්‍යවතුන් වහන්සේ රාගාදි කෙලෙස් ගිනි නසා සිටි සේක.

'අපරිගමනතාය ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ නැවැත සසර නො ද ඉපැදෙන බැවින් සිටි සේක.

'නයං සමාදාය ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ නයක්‍රම ගෙණ සිටි සේක.

'මුත්තපටිසෙවනතාය ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් මිදී රූපාදි අරමුණු විසින්, නොහොත් සියලු කෙලෙසුන්ගෙන් මිදුනු පලසමවත් විඳිම් වසයෙන් සිටි සේක.

'මෙත්තාය පාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ උප-කෙලශයන්ගෙන් මිදුනු පිරිසිදුබව්හි සිටි මෛත්‍රියෙන් යුක්ත ව සිටි සේක.

'කරුණාය පාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ උපකෙලශයන්ගෙන් මිදුනු පිරිසිදුබව්හි සිටි කරුණාවෙන් යුක්ත ව සිටි සේක.

'මුදිතාය පාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ උප-කෙලශයන්ගෙන් මිදුනු පිරිසිදුබව්හි සිටි මුදිතාවෙන් යුක්ත ව සිටි සේක.

'උපෙක්ඛාය පාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ උප-කෙලශයන්ගෙන් මිදුනු පිරිසිදුබව්හි සිටි උපෙක්ෂාවෙන් යුක්ත ව සිටි සේක.

'අච්චන්තපාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ කෙළවර ඉක්මවා සිටි පිරිසිදු බැවින්, පිරිසිදුබව්හි කෙළවරට පැමිණ සිටි සේක.

'අතම්මයතාය පාරිසුඛියා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණා-දෘෂ්ටි-මානයන්ගේ අභාවයෙන්, පිරිසිදුබව්හි සිටි, තෘෂ්ණා දෘෂ්ටිමාන විරහිත භාවයෙන් යුක්ත ව සිටි සේක.

'විමුත්තත්තා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙ-සුන්ගෙන් මිදුනු බැවින් සිටි සේක.

'සන්තුස්සිතත්තා ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ යථාලාභ-යථාබල-යථාසාරුප්ප සන්තොස විසින් සතුටුබව්හි සිටි සේක.

'ඛන්ධපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ පරිඥාවන් කරණ කොට එක-චතු-පංචක්ඛන්ධයන්ගේ අවසාන යෙහි සිටි සේක.

'ධාතුපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධපරිඥාවන් කරණ කොට අෂ්ටාරශ ධාතුන්ගේ කෙළවර සිටි සේක.

'ආයතනපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ පරිඥාවන් කරණ කොට චාදශායතනයන්ගේ කෙළවර සිටි සේක.

'ගතිපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධපරිඥාවන් කරණ කොට නිරයාදිපංචවිධගතීන්ගේ කෙළවර සිටි සේක.

'උප්පත්තිපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ-පරිඥාවන් කරණ කොට සුගති දුග්ගතීන්හි කෙළවර සිටි සේක.

'පටිසන්ධිපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ-පරිඥාවන් කරණ කොට කාම-රූප-අරූපප්‍රතිසන්ධීන්හි කෙළවර සිටි සේක.

'භවපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධපරිඥාවන් කරණ කොට එකවොකාරාදි භවයන්ගේ කෙළවර සිටි සේක.

'සංසාරපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ-පරිඥාවන් කරණ කොට සකන්ධධාතු ආයතනයන්ගේ නො සිඳ පැවැත්මෙහි කෙළවර සිටි සේක.

'වට්ටපරියන්තෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ-පරිඥාවන් කරණ කොට කර්ම-ක්ලෙශ-විපාක වෘත්තයන්ගේ කෙළවර සිටි සේක.

'අන්තිමෙ භවෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධපරිඥාවන් කරණ කොට අවසාන උත්පත්තිභවයෙහි සිටි සේක.

'අන්තිමෙ සමුස්සයෙ ඨිතො' ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ පරිඥාවන් කරණ කොට අවසන් සිරුරෙහි සිටි සේක.

'අන්තිමදෙහධරො භගවා' ඒ භාග්‍යවතුන් වහන්සේ අවසන් සිරුර දරන බැවින් අන්තිමදෙහධර සේක.

"තස්සායං පච්ඡිමකො චරිමොයං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො"

ඒ රහතුන් වහන්සේගේ මේ ආත්මභාවය අවසාන ආත්මභාවය වේ. උන්වහන්සේ පිළිබඳ ජාතිමරණ සංසාර සඞ්ඛ්‍යාත පුනභීවයෙක් නැත්තේ ය.

'එවං භගවා තිණ්ණාවීති තාදී' මෙසේ භාග්‍යවතුන් වහන්සේ සසර තරණය කළෝ තාදී සේක.

'කථං භගවා මුත්තාවීති තාදී' භාග්‍යවතුන් වහන්සේ රාගාදියෙන් මිදීම් ඇත්තෝ කෙසේ තාදී සේක් ද?

'භගවතො චිත්තං රාගා දොසා මොහා කොධා උපනාහා මක්ඛා පලාසා ඉස්සාය මච්ඡරියා මායාය සාඨෙය්‍යා ථම්භා සාරම්භා මානා අතිමානා මදා පමාදා සබ්බකිලෙසෙහි සබ්බ දුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිලාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි මුත්තං. විමුත්තං. සුවිමුත්තං' භාග්‍යවතුන් වහන්සේගේ සිත රාගයෙන් දොසයෙන් මොහයෙන් ක්‍රොධයෙන් බඩාඝාතයෙන් මක්ඛයෙන් පලාසයෙන් ඊෂ්‍යාවෙන් මාත්සර්‍යයෙන් මායාවෙන් සාඨෙය්‍යයෙන් ථම්භයෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන්ගෙන් සියලු දුසිරිතයෙන් සියලු දරථයෙන් සියලු පරිදාහයෙන් සියලු සන්තාපයෙන් සියලු අකුශලසංස්කාරයෙන් මිදුනේ ය. වෙසෙසින් මිදුනේ ය. මොනවට වෙසෙසින් මිදුනේ ය.

'එවං භගවා මුත්තාවීති තාදී' මෙසේ භාග්‍යවතුන් වහන්සේ රාගාදියෙන් මිදුනෝ තාදී සේක.

'කථං භගවා තන්නිද්දෙසා තාදී?' භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ ශීලශ්‍රද්ධාදියෙන් නිදෙස නිදෙසා කිය යුතු බැවින් ඒ හා සදෘශ වූවෝ කෙසේ තාදී සේක් ද?

'භගවා සීලෙ සති සීලවාති තන්නිද්දෙසා තාදී' භාග්‍යවතුන් වහන්සේ සිල් ඇති කල්හි සිල්වත් යි ඒ ශීලයෙන් නිදෙසුම් ලබන සේක් තාදී සේක.

'සඩාය සති සඩොති තන්නිද්දෙසා තාදී' භාග්‍යවතුන් වහන්සේ ශ්‍රද්ධාව ඇති කල්හි ශ්‍රද්ධාවත් යි ඒ ශ්‍රද්ධායෙන් ප්‍රකාශය ලබන සේක් තාදී සේක.

'විරියෙ සති විරියවාති තන්නිද්දෙසා තාදී' භාග්‍යවතුන් වහන්සේ වීර්‍යය ඇති කල්හි වීර්‍යවත් යි ඒ වීර්‍යයෙන් ව්‍යවහාරය ලබන සේක් තාදී සේක.

'සතියා සති සතිමාති තන්නිද්දෙසා තාදී' සිහිය ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ සමෘතිමත් යි ඒ සමෘතියෙන් ලොකයා ඉදිරියේ පෙනී සිටින සේක් තාදී සේක.

'සමාධිස්මිං සති සමාහිතොති තන්නිද්දෙසා තාදී' සමාධිය ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ සමාහිත යි ඒ සමාධියෙන් ප්‍රකාශයට පැමිණි සේක් තාදී සේක.

'පඤ්ඤාය සති පඤ්ඤවාති තන්නිද්දෙසා තාදී' ප්‍රඥාව ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥාවත් යි ඒ ප්‍රඥාවෙන් ලොකයා අතර පෙනී සිටින සේක් තාදී සේක.

'විජ්ජාය සති තෙවිජ්ජොති තන්නිද්දෙසා තාදී' විද්‍යාව ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිද්‍ය යි ඒ විද්‍යාවෙන් ලොකයා මැද පෙනී සිටින සේක් තාදී සේක.

'අභිඤ්ඤාය සති ජළභිඤ්ඤොති තන්නිද්දෙසා තාදී' අභිඥාවන් ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ ෂඩභිඥ යි ඒ අභිඥාවන් කරණ කොට ලොකයෙහි ඉස්මතු ව පෙනෙන සේක් තාදී සේක.

'දසබලෙ සති දසබලොති තන්නිද්දෙසා තාදී' දසබලය ඇති කල්හි භාග්‍යවතුන් වහන්සේ දසබල යි ඒ දසබලය කරණ කොට ලොව අබිබවා සිටින සේක් තාදී සේක.

'එවං ගගවා තන්නිද්දෙසා තාදී' මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ ඒ ගුණ කරණ කොට විද්‍යමාන ගුණ කරණ කොට දෙවියන් සහිත ලොකයෙහි පෙනී සිටින සේක් තාදී සේක.

'අසුන් හික්මවීමේ ශාස්ත්‍රය දත් රියැදුරකු විසින් මනා සේ දැමූ හික්ම වූ අසුන් සේ, යම් කිසි රහතුන් වහන්සේ කෙනකුගේ ඇස් - කන් - නාස් ආදි ඉඳුරෝ සන්සිඳීමට ගියෝ ද, හොඳට හික්මුනෝ ද, පැහූ මන් ඇති දුරු කළ ආස්‍රවයන් ඇති තාදී ගුණයුත් උන්වහන්සේ දෙවියන් සහිත මුළු ලොවට ප්‍රිය වෙති' යනු අදහස ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

මාහාකාත්‍යායනස්ථවිරසතුව නිමියේය

ශාරීපුත්‍ර මහාසථවිරයන් වහන්සේගේ සිංහනාදය

7 – 6

එක් දවසෙක සැරියුත් මහතෙරනුවෝ, වස් වැස අවසන් කොට ගම් නියම්ගම් දනවු සැරිසරා වඩිනු කැමැත්තෝ බුදුරජුන් වැඳ අවසර ගෙණ සිය පිරිවරත් කැටුව නික්ම ගියහ. තවත් නොයෙක්දෙනා වහන්සේද උන්වහන්සේ පසුපස ගියෝ ය. ඔවුන් දුටු තෙරනුවෝ, නම් ගොත් දන්නවුන්, නම් ගොත් කියා අඬගා ඔවුන්ගේ ගමන් වළකාලූහ. ඔවුන් අතර සිටි වඩා ප්‍රසිඛ නොවූ එක් මහණෙක්, 'නම් ගොත් කියා අඬගා මාත් නවතා–ලන්නෝ නම් යහපත් ය, එසේ මාත් දුන් දුන් නවතාලනු ඇතැ' යි සිත සිතා පස්සේ ගියේ ය. එහෙත් සැරියුත් තෙරුන් වහන්සේ උන් ගැණ සඳහන් නොකොට ඉදිරිය බලා වැඩි සේක. එවේලෙහි මේ මහණ, තෙරුන් කෙරෙහි වරදවා සිතා නොසතුටක් උපදවා ගත්තේ ය. මේ අතර දවසෙක සැරියුත් තෙරුන් පොරවා තුබූ සිවුරෙහි කොණක් ඒ මහණහුගේ සිරුරෙහි ගැටුනේ ය. එයින් තෙරුන් කෙරෙහි ඔහු තුළ හට ගෙණ තුබූ නොසතුට වඩාත් දැඩි විය. ඒ මහණ, සැරියුත් තෙරුන් විහාරසීමාව මදක් ඉක්මවා ඉදිරියට යත් ම, බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! සැරියුත් තෙරුන්නාන්සේ බුදුරජානන් වහන්සේගේ අග්‍රශ්‍රාවක සි උදම්ව එයින් හැඬි දැඩි ව කණ කැඩි යන්නට තරම් සේ මට පහර දී මා කමා නොකරවා ම ඇවිදින්නට ගියහ' යි දන්වා සිටියේ ය. එකෙණෙහි බුදුරජානන් වහන්සේ සැරියුත් තෙරුන් ආපසු ගෙන් වූහ. මෞද්ගල්‍යායන–ආනන්දසථවිරයන් වහන්සේලා 'බුදුරජානන් වහන්සේ අප වැනි මහල් සොහොයුරු සැරියුත් තෙරුන් මේ මහණහුට පහර නොදුන්බව නොදැන තෙරුන් කැඳවූවෝ නොවෙති, ගෙන් වූවෝ සිංහනාද දෙවනු කැමැත්තෙනැ' යි සිතා භික්ෂූන් හුත් කාමර වෙතට ගොස් දොරකවුළු හැර, 'එන්න! ඉක්මනට එන්න, සැරියුත් තෙරනුවෝ අද බුදුරජුන් ඉදිරියෙහි සිංහනාද කරන්නාහ' යි භික්ෂූන් රැස් කළහ. ශාරීපුත්‍ර සථවිරයන් වහන්සේ බුදුරජුන් වෙත ගියහ. ගොස් වැඳ එකත්පසෙක හුන්හ. බුදුරජානන් වහන්සේ 'ශාරීපුත්‍ර! තමුසේ මේ නමට කණ කැඩෙන්නට පහර දුන්නහු දැ?' යි අසා වදාළ කල්හි ඒ ගැණ කිසිත් නොකියා 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! යමක්හට සිරුරෙහි, සිරුර පිළිබඳ සිහිය (කායගතාසතිය) නොඳ එළඹ සිටියා නම්, ඔහු සෙසු සබ්රම්සරුන් ඇඟින් ඇඟ හපා පහරා කමා

නො කරවා ම තැන තැන යනු ඇත, මම එසේ නො වෙමි, මේ මහපොළොව තමන් මතුයෙහි හෙලන පිරිසිදු දේත් අපිරිසිදු දේත් එක සේ උසුලන්නී ය, පිරිසිදු දේ හෙලන්නහු කෙරෙහි ස්නෙහයත් අපිරිසිදු දේ හෙලන්නහු කෙරෙහි කොපයත් නො ද දක් වන්නී ය, හැම එකකු කෙරෙහි ම එක හැටිය, මමත් හැම එකකු කෙරෙහි එක හැටි වෙමි, මාගේ සිත ක්‍රොධාගනිය නිවීමෙහි දියක් වැන්න, කෙලෙස් කුණු දුවීමෙහි ගින්නක් වැන්න, කෙලෙස් රොඩු දුර ගසා හැරීමෙහි සුළඟක් වැන්න, නිහතමාන යෙහි පාපිස්නක් වැන්න, නො උඩඟුබවෙහි සැඩොල් කොලු වැන්න, උඩඟු නො වීමෙහි අං වැටුනු ජරමාලු ගොන් වැන්න, නසි කුණුවලින් මෙත් සිය සිරුරෙත් හට ගත් පිළිකුල ඇත්තේ වෙමි, සිය සිරුර අසුචි පිරූ කළබෙට්ටක් සේ පරිහරණය කරමි'යි කිහ. සැරියුත් තෙරුන් මෙසේ උපමා ගෙණ හැර පාමින්, තමන් පිළිබඳ තතු පහදන කල්හි, මහපොළොව දිය කෙළවර කොට නව වරක් දෙදරා සැලි ගියා ය. රජෝහරණ – චණ්ඩාලකුමාරක – මෙදකථාලිකා උපමාවත් මෙසේ කියා පාන කල්හි, එහි රැස්ව හුන් පෘථග්ජන භික්ෂූන් වහන්සේලා අඩන්නට වූහ. ඇස්වලින් නැගි දා කදුලු නවතා ගන්නට ඔවුහු අපොහොසත් වූහ. රහතුන් වහන්සේලාට ධම්සංවෙගය උපත. දෙස් නැගූ මහණහුගේ සිරුර ගිනි ඇවිළ ගත්තේ ය. එකෙණෙහි ඔහු බුදුරජුන් පාමුල බිම වැටී තමන් කළ දෙස් නැගුම මුළුමනින් බොරුබව කියා කමාව ඉල්ලා සිටියේ ය. එවිට බුදුරජානන් වහන්සේ 'ශාරීපුත්‍ර! මේ නිත්දික මිනිහාගේ හිස සත් කඩකට පැළෙන්නට කලින් මූට කමාව දෙන්නැ'යි වදාළ විට, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ උකුටික යෙන් හිඳ දෙහොත් මුදුන් දී 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම ඒ මහණහුට කමාව දෙමි, එහිලා පසුබට වීමෙක් කිසිසේත් නැත, මම සැරියුත්, මම බුදුපුත්, මම දෙටුපුත්, මම දම්සෙනෙව්, මා අතින් වරදෙක් මේ ආයුෂ්මතුන් වහන්සේට වී නම්, එයට මේ ආයුෂ්මතුන් වහන්සේ මට කමත්වා'යි කියා සිටියහ. රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා 'අස්යෝ; බලන්න! තෙරුන්ගේ මහත් ගුණයෙක හැටි, නිමීල ගුණයෙක හැටි, තමන්ට බොරුවට දෙස් නගා ගැරහූ මේ මහණහු කෙරෙහි අඹැටක් පමණත් කොපයක් නො කොට දෙසක් නො කියා තෙමේම උකුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ කමා කරන්නැ, යි කියති'යි කතා කරන්නට වූහ. එ වේලෙහි බුදුරජානන් වහන්සේ භික්ෂූන් හුන් තැනට ගොස් 'තුම්හේලා කියන්නහු කිමැ'යි අසා 'මහණෙනි! ශාරීපුත්‍රයන් වැන්නවුනට කොපයක් දෙසයක් උපදවන්නට නො හැකි ය, ශාරීපුත්‍රයන් වැන්නෝ තමන් මරන්නට ආවුන් කෙරෙහි වත්

කොපයක් නො කරති, ඔවුහු එබන්දෙහි අපොහොසත් ය, මහණෙනි! මාපුත් සැරියුත් තැනගේ සිත මහපොළොව වැන්න, මහපොළොවටත් වඩා ස්ථිර ය, මහපොළොව සැලුන ද සැරියුත් තැනගේ සිත මොනලෙසකිනුත් නො සැලෙන්නේ ය, ඒ ඉන්ද්‍ර කීලයක් වැන්න, පහන් දිය ඇති විලක් වැන්නැ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදී සුබ්බතො, රහදොව අපෙතකද්දමො සංසාරා න භවන්ති තාදිනොති.

යමෙක් තෙමේ පොළොව හා සම වූයේ ඉන්ද්‍රකීලයක් බඳු වූයේ නො සැලෙන ගති ඇත්තේ මනා ව්‍රත ඇත්තේ කිසිවකුට නො කිපේ ද, පහ වූ මඩ ඇති විලක් සේ පහන් වේ ද, නො වෙනස් ගුණ ඇති රහතුන් වහන්සේට සසර සැරිසරුම් නො වේ.

පඨවිසමො=පොළොව හා සම වූයේ.

'පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය' යනාදි තැන්හි සේ සසම්භාර පෘථිවියෙහි මේ ආයේ ය. සත්‍යයන් පිළිබඳ පටන් ගැණුමක්, සත්‍යයන්ගේ මුලක් නැත්තා සේ මහාපොළොවෙහි ද පටන් ගැණුමෙක්, නැත්තේ ය. මුලක් නැත්තේ ය. එ හෙයින් සාසනයෙන් බැහැර සිටියෝ මිනිසුන් මුළා කරන්නට තමන් ගත් ලබ්ධිය තහවුරු කරන්නට, පොළොව මහෙශ්වරාදි දෙවියන් විසින් මවන ලදැ, යි කියති. එහි සත්‍යයෙක් නැත්තේ ය. පිළිගත යුත්තෙක් නැත්තේ ය. මිසදිටු ගත්තෝ ම එසේ කියති. හෙතු ඵලධර්මනියාමය නො දත් බැවින් එසේ කියන්නෝ ය. මහා පෘථිවියෙහි හටගැන්ම - නැසුම ස්වභාව සිඬ ය. පෘථිවිය කරන් නෙක් මවන්නෙක් නැත්තේ ය.

නැසෙන්නා වූ ලෝකය ගින්නෙන් හෝ නැසෙන්නේ ය. ජලයෙන් හෝ නැසෙන්නේ ය. සුළඟින් හෝ නැසෙන්නේ ය. මේ කොයි එකකින් වුව ද ලොකය නැසී ගිය කල්හි පොළොවෙන් යට සිටි අහසත්, පොළොවෙන් උඩ සිටි අහසත් එක්ව එක් අහසෙක් වන්නේ ය. ඒ මේ අහස්කුහරය මහඳුරෙන් අඳුරු වන්නේ ය. එකල මුළු ලොව කිසිවෙක් නැත්තේ ය. ලෝකය තෙමේ අසඞ්ඛ්‍යයක් කල් මෙසේ සිටින්නේ ය, එක් මිදුලෙක් ව.

මේ කියූ කල් ගෙවී ගිය තැන, නැවැත අහසෙහි වළාකුල් නැග වැසි වස්නේ ය. නවම්-මැදින් දෙමස අතර අටදිනෙහි මෙන් පළමු කොට වැටෙන්නේ හිම ය. ඉන්පසු ඉතා සියුම් ව වැසි වසී. ඒ වැසි පිළිවෙළින් නෙළුම්දඬු-මොහොල්-තල්කඳ පමණට වැස කෙළ ලක්ෂයක් සක්වළ තුළ දැවී ගිය නැසී ගිය සුණු වී ගිය

තැන් ජලයෙන් පුරා උතුරවා හරින්නේ ය. මෙසේ වට මේ දිය කඳ, යටින්, උඩින් නැගි සුළඟින් ටිකින් ටික ඝන බවට පැමිණේ. එය නෙළුම් කොළයෙහි රැඳී සිටි දිය බිඳක් සේ වට ව ඝන වේ. හොඳට ම ඝන වූ විට 'පෘථිවි'යි කියනු ලැබේ. මෙසේ ජලයෙහි වූ පරමාණු කැටි වීමෙන් දිය මතු පිට හට ගන්නා ස්ථබ්ධ අවස්ථාවට, පෘථිවි අවස්ථාවට එන්නට ගත වූ කාලය මෙ පමණැ, යි මොන ලෙසකිනුත් නො කියැකි ය. අනන්තාපරිමිතකාලයෙක් ඒ සඳහා ගෙවී යන්නේ ය.

මිනිසුන්ගේ වයස දස අවුරුද්දෙන් පටන් ගෙණ ක්‍රමයෙන් නැගී අසඞ්ඛ්‍යයට පැමිණේ. නැවැත අසඞ්ඛ්‍යයේ සිට ක්‍රමයෙන් පිරිහී ගොස් දස අවුරුද්දට වැටේ. මෙසේ මිනිසුන් පිළිබඳ වයස දස අවුරුද්දේ සිට අසඞ්ඛ්‍යයටත් අසඞ්ඛ්‍යයේ සිට දස අවුරුද්ද ටත් නැගීමට හා බැසීමට ගත වූ කාලය තරම් කාලයෙක් ජලීය පරමාණු කැටි වී පොළොව හට ගැන්මට ගත වේ, යි භූගභීවිද්‍යාඥ යන් විසින් සලකනු ලැබේ. ක්‍රමයෙන් පොළොව මෙසේ එක් යොදුන් තුන් ගවු පමණ වැඩේ.

මෙහි, අතින් හෙලා ගත යුතු වූ **යො'** යන ප්‍රථමා විභක්ත්‍යන්ත පදයක් බලා **පඨවිසමො'** යනු සිටියේ ය.

නො විරුජ්ඣති – විරුඬ නො වේ. නො කිපේ.

නො' යනු, නිපාත ය. **'සුභාසිතං යෙව භාසෙය්‍ය නො ච දුබ්භාසිතං'** යන මෙහි ඒ යෙදුනේ නිෂෙධයෙහි ය. **'අභිජානාසි නො ත්වං මහාරාජ! ඉමං පඤ්හං අඤ්ඤෙ සමණබ්‍රාහමණෙ පුච්ඡිතා'** යන මෙහි ප්‍රශ්නයෙහි ආයේ ය. **'න නො සමං අත්ථි තථාගතෙන'** යන මෙහි අවධාරණයෙහි වැටුනේ ය. නො' යන්න අත්ථොඩාර වශයෙන් අම්හ ශබ්දයට ආදෙශ රූපයක් ව පැමිණ පච්චත්ත – උපයොග – සම්පදාන – සාමි වචනයන්හි පවති. එකල්හි නිපාත නො වේ. සර්වනාමයක් සේ ගැණේ. **'ගාමං නො ගච්ඡ්‍යයාම'** යනු පච්චත්තවචන යි. පච්චත්ත නම් ප්‍රථමා විභක්ති යි. උපයොග නම් විතීයා විභක්ති යි. **'මා නො අජ්ජ විකාලිංසු'** යනු එයට නිදසුන් ය. **'සංවිභජෙය්‍ය නො රජ්ජෙන'** යනු සම්ප්‍රදානයෙහි වැටුනේ ය. **'සත්ථා නො භගවා අනුප්පත්තො'** යනු සාමිවචනයෙහි ආයේ ය. සාමි නම් සම්බන්ධය යි. මෙය ශුද්ධනාම පදයක් සේ ද භාෂායෙහි එයි. **'නො තරිතො නදීපාරං පත්තො'** යනු නිදසුනි.

ඉන්දඛීලූපමො – ඉන්දඛීලයක් බඳු වූයේ.

නුවර දෙර සතුරන්ගෙන් රකින්නට එළි පත්තෙන් ඇතුළත රියන් අටක් හෝ දසයක් ගැඹුරට පොළොව සාරා හිඳු වන හර දුවයෙන් කළ කණුව ඉන්දබීල' යි ගැණේ. **'නගරමාරවිනිවාරණත්ථං උම්මාරබ්භන්තරෙ අඨ වා දස වා හත්ථෙ පඨවිං ඛණිත්වා ආකොටිතස්ස සාරදාරුමයස්සෙතං අධිවචනං'** යනු අටුවා ය.

මේ සඳහා ගල් ගඩොලින් කළ කණු ද මෙ නමින් හඳුන්වති. නුවර දෙර රැකුමට, නුවර දෙර සවිකිරීමට මෙය දෙරඋළුවස්සෙහි දෙපස සිටුවා උළුවහු කණු, ඒ හා සම්බන්ධ කරණු ලැබේ. මෙහි යම් පමණක් පොළොවෙන් මතු පිට සිටියේ ද, එ පමණක් ම වන්නේ ය පොළොව යටත්. සමහර ඉන්දබීලයෝ පොළොවෙන් මතු පිට සොළොස් රියන් විසි රියන් පමණිනුත් සිටුවනු ලබති. පොළොව මතු පිට ඇති පමණ ම පොළොව යට ද ලන බැවින් සිටු දිගින් හමන කිසිත් සැඩපවනකින් ඒ නො සැලෙන්නේ ය. තිර ව සිටින්නේ ය.

විනයට පැමිණ ඉන්දබීලයක් පිහිටු වීමට ඇදුරන් නියම කළ තැන, ඉන්දබීලයක් නො පිහිටු වන ලද ද, ඉන්දබීල යි ගැණේ. යම් නුවරෙක දෙරකොටුවෙහි දෙරබා ආදී යමක් නැත්තේ ද, එහි ප්‍රාකාරයාගේ මඩ්‍යය, ඉන්දබීලය යි සලකත්. මෙහි ගන්නා ලද්දේ දෙර උළුවහු කණු, ශක්තිමත් කරණු පිණිස උළුවහු දෙපස සිටුවන කණු ය. මෙහිලා පාළියෙන් කළ නිරුක්ති මෙසේ ය:- **'බිලති ජනානං ගමනං පටිඝාතෙතීති= බීලො, ඉන්දස්ස බීලො=ඉන්දබීලො, ඉන්දො එව පදං බිපති එත්ථාති= ඉන්දබීලො'** මෙහි ඉන්ද්‍රයාගේ කණුව' යනු කීමෙහි තේරුමක් නැති බැවින් ඉන්ද ශබ්දයෙන් ගත යුතු සේ පෙනෙනුයේ ප්‍රධාන යන අරුත ය. එය තුල්‍යාධිකරණත්වයෙන් බීල ශබ්දය හා ඝටිත වූ කල ප්‍රධාන කණුව' යන අරුත ලැබේ. ඉන්ද ශබ්දය ප්‍රධාන යන අරුතෙහි ද වැටේ. උස් බැවින් ඉන්ද්‍රයාගේ කීලය වැනි නු යි ගත් කල ද වරදක් නො කියැකිය.

ඉන්ද්‍ර පා තබන කණුව ඉන්දබීලය' යනු දෙවැන්නෙහි කෙටි තේරුම ය. පා තැබීම, අරක් ගැණීමැ, යි ගත යුතු සේ පෙනේ. උළුවහු දෙපස සිටු වන මේ කණු දෙකෙහි දෙවියන් අරක් ගන්නා ලදු, යි පැරණියන්ගේ සැලකීම' පිළිගැණීම, මේ නිරුක්තියට පදනම වූ සේ පෙනේ. පිරිත් මඬුවෙහි බඳින ඉන්දබීලය ද දෙවියන් සඳහා ම බඳින්නක් සේ ය අප දන්නේ. මේ කරුණු අනුව සලකන විට සතුරු ගමන් වළකනුයේ බීල' නමැ යි කළ අර්ථසමර්ථනය වරදය යි නො කියැකි ය. නුවරදෙර පිහිටි උළුවහු කණු ඉන්දබීල පිහිටුවා ශක්තිමත් කරණු, සතුරන් වළකනු පිණිස ය.

සංස්කෘතයෙහි ඉන්ද්‍රකීල ශබදයෙක් ඇත්තේ ය. එහි මන්දිර පර්වත – ඉන්ද්‍රධ්වජ යන තෙයරුතෙක් කොෂග්‍රන්ථයන්හි දක්නා ලැබේ. පාළියෙහි ඉන්ද්‍රකීල' ශබදයෙක් ඇත්තේ ය. එය වැටෙනුයේ එසිකාස්තම්භයෙහි ය. එසිකා නම් එළිපත ය. ස්තම්භ නම් කණු ය. උළුවහු සවිකරණු පිණිස සිටු වන කණු ය.

උළුවහු කණු ශක්තිමත් කරන්නට එදා මෙසේ පොළොව සාරා දෙපස කණු සිටු වන ලද නමුත් අද ඒ පිණිස උළුවහු කණු දෙකෙහි පිටිපස අළු දෙක තුනක් සවි කොට නැවැත ඒ අළු බිත්තියට සවි කරණු ලැබේ. මේ යට කියන කරුණු ද මෙහිලා සැලකිය යුතු ය. පුරාණජම්බුවීපයෙහි ඉන්ද්‍රපූජාව අති ශ්‍රෙෂ්ඨ ස්ථානයක් ගත්තේ ය. ඉන්ද්‍රපූජාවෙන් වැස්ස ද එයින් ධනධාන්‍යපශුසම්පත්තිය ද ආරෝග්‍ය හා බුඩිය ද දීර්ඝායුෂ ද යුඩයන්හි ජය ද ලැබෙතැ යි වෛදිකයෝ සැලකූහ. මෑත දී ඉන්ද්‍ර, වෛදිකදෙවගණයෙහි විතීයස්ථානයට පත් වූ නමුත් පෙර පටන් පැවැත එන ඉන්ද්‍රපූජාව දඹදිව්වැස්සන්ට අමතක නො වී ය. එහෙයින් ඔවුහු අවුරුදු පතා ඉන්ද්‍රපූජාව සඳහා මහොස්තව කළහ. ඒ උත්සවයන්හි ප්‍රධානස්ථානය ගත්තේ ඉන්ද්‍රයා උදෙසා ධ්වජයක් තැබීම ය. ඒ ධ්වජය ඉන්ද්‍රධ්වජ, ශක්‍රධ්වජ යන නම්වලින් ප්‍රසිඬ ව ගියේ ය. ඒ ධ්වජය බැඳි කණුව ද පුරාතනයෙහි දී ක්‍රමවත් ව සිටු වන ලද්දේ ය. ඉන්ද්‍රකීල යන නම වූයේ ඒ කණුවටය යි ද සිතිය හැකි ය. මුල් අවදියේ ඒ සඳහා ගැණුනේ ඊට නියමිත රුක් වර්ගවලින් එකෙකි. පසු පසු අවුරුදු පතා ඒ පිණිස ගන්නට සම්මත කොට තුබූ රුක් සොයා ගැණීමෙහි අපහසුව නිසා දෝ ඉන්ද්‍රකීලය චිරස්ථායී වන ලෙස ගල් හා ගඩොල් යොදා සාදන ලද්දේ ය.

කල් යත් යත් ඉන්ද්‍රමහොත්සවය හා ඉන්ද්‍රධ්වජයත් දඹදිව් වැස්සන්ට අමතක ව ගිය බැවින් ධ්වජය බැඳි කණුවට නම් වූ 'ඉන්ද්‍රකීල' යන්න ධ්වජයට ද ව්‍යවහාර කරන්නට වූහ. බුද්ධ-කාලයෙහි ඉන්ද්‍රකීල' ශබදයේ මුල් අදහස බෙහෙවින් වෙනස්ව තුබුනු බව **පාවිත්තියපාළියෙහි** පෙනෙන **'ඉන්දකිලො නාම සයනීඝරස්ස උම්මාරො'** ඉන්දකීලය නම් නිදනගෙයි එළිපතය යන මෙයින් පෙනේ. මෙය පිහිටු වන ලද්දේ නගරයෙහි ප්‍රකට ස්ථානයක ය. පුරාණ අනුරාධපුරයෙහි ඇතුළත හා පිටත ද ඉන්ද්‍රකීල දෙකක් තුබු බව **විනය අටුවාවෙන්** පැහැදිලි වේ.

කීල, බිල ශබද කොෂග්‍රන්ථයන්හි එකකට එකක් වෙනස් අරුත් ඇති ශබද දෙකක් සේ දක්වන ලද ද, කරුණු සලකන-

විට මේ දෙක සමානාර්ථවත්ය යි ගත හැකිය. කීල' ශබ්දය ම බිල' යි වෙනස් විය. සංස්කෘතයෙහි ඇතැම් අල්පප්‍රාණාක්ෂරවත් ශබ්ද ප්‍රාකෘතයෙහි මහාප්‍රාණාක්ෂරවද්භාවයට පෙරළුනු බව පෙනේ. කීල' ශබ්දය ගිරිසිළුව, උල, කණුව, ලෙඟය, වැලමිට යන අරුත්හි එන අතර, බිල' ශබ්දය උල යන අරුතෙහි ඒය යි කොෂකාරයෝ කීහ.

තාදී = සථිර ගුණ ඇත්තේ. නො සැලෙන නො වෙනස් වන ගුණ ඇත්තේ. [1]

සුබ්බතො = මනා වත ඇත්තේ.

මෙහි **සුබ්බත'** යන්නෙන් කියනුවෝ තිව්‍රාණාවබෝධයට අනුලෝම වූ විදර්‍ශනාභාවනාසඞ්ඛ්‍යාතප්‍රතිපත්තියෙහි හැසිරෙන් - නෝ ය. එ පිළිවෙත ඇත්තෝ ය. දුහඟ සමාදන් ව රකින්නෝ ය. දුහඟ තෙළෙසෙකි. යට කියන ලදී:[2] එහෙයින් එහි නො කියන ලද්ද පමණක් මෙහි කිය වේ.

පංසුකූලික + අඞ්ග යන දෙ සද එක් ව **පංසුකූලිකඞ්ග** යි සිටියේ ය. **පංසුකූලික** නම්, සොසානිකාදි තෙවිසි සිවුරු අතුරෙහි යම්කිසි එකක් දුරීම සවභාවය කොට ඇත්තේ ය. **අඞ්ග** නම් කාරණය. සමාදානවෙතනා ය. යම් සමාදන් වීමක් හෙතු කොට පංසුකූලික' යි කියනු ලැබේ ද, එයට කරුණු වූ වෙතනාය අඞ්ග.

මේ ඒ තෙවිසි සිවුරු. සොසානික -පාපණික - රථියවොල - සඞ්කාරවොල - සොත්‍රිය - නහානවොල - තිත්‍රියවොල - ගත-පච්චාගත - අගහිදඞ්ග - ගොඛායිත - උපච්ඡායිත - උත්තරඛායිත - අනතවච්ඡන්න - දසාවච්ඡන්න - ඛජාහට - ථූපචීවර - සමණචීවර - ආණිසෙකික - ඉද්ධිමය - පවික-වාතාහට - දෙවදත්තිය - සාමුද්දිය යි.

එහි **සොසානික** නම්, කිසිවකු විසින් සොහොනෙහි හැර දැමූ රෙද්දෙන් කළ සිවුර.

පාපණික නම්, කඩපලෙහි හැර දැමූ රෙද්දෙන් කළ සිවුර.

රථියවොල නම්, පින් කැමැත්තන් විසින් ගන්නෙක් ගණිවා යි ජනෙල් කවුළුවෙන් වීථියට දැමූ රෙද්දෙන් කළ සිවුර.

සඞ්කාරවොල නම්, ආඟාව හැර නො වටනා කම නිසා කසළ ගොඩෙහි දැමූ රෙද්දෙන් කළ සිවුර.

සොත්‍රිය නම්, වැදූ ගැණියගේ ගැබ්මල පිසදමා බැහැර ලූ රෙද්දෙන් කළ සිවුර.

---

1. 7. 5. "තාදිනෝ" යනු බලනු.
2, 1, 14 'අනුඛම්මචාරී' ,, ,,

නහානවොළ නම්, යකැදුරන් විසින් යක්ෂාවෙශවූවනට හන්දවා මැතුරු දියෙන් ඔවුන් හිස පටන් නාවා කාලකණ්ණිවස්ත්‍රය යි බැහැර ලූ රෙද්දෙන් කළ සිවුර.

තිත්ථියවොළ නම්, දිය නාන තොටුපලෙහි හැරදමා ගිය රෙද්දෙන් කළ සිවුර.

ගතපච්චාගත නම්, සොහොනට ගොස් පෙරළා ගෙට ආ මිනිසුන් විසින් ඉස් සෝදා නා කිලිටිය යි බැහැර කළ රෙද්දෙන් කළ සිවුර.

අග්ගිදඩ්ඪ නම්, ගින්නෙන් එක් දෙසක් දැවී ගිය කල ඒ අශුභ-යෙකැ යි හැරදැමූ රෙද්දෙන් කළ සිවුර.

ගොබායිත නම්, ගෙරින් මීමුන් විසින් එක්දෙසක් කෑ කල පරිභොගයට නො සුදුසුය යි හැරදැමූ රෙද්දෙන් කළ සිවුර.

උපවිබායිත නම්, වේයන් විසින් එක් දෙසක් කෑ කල පරිභොගයට නො සුදුසුය යි හැරදැමූ රෙද්දෙන් කළ සිවුර.

උන්දුරබායිත නම්, මියන් කෑ රෙද්දෙන් කළ සිවුර.

අන්තවජිනන නම්, කෙළවරක් සිදීගිය පසු හැරදැමූ රෙද්දෙන් කළ සිවුර.

දසාවජිනන නම්, දාවලු කැඩීගිය රෙද්දෙන් කළ සිවුර.

ධජාහට නම්, නැවු නගිනා වේලෙහි වෙළඳුන් විසින් ඉවුරෙහි යමෙක එල්ලා තබා ගිය රෙදිකඩින් හෝ යුදබිම ගැට ගසා ගිය රෙද්දෙන් කළ සිවුර.

ථූපවීවර නම්, තුඹස් සිසාරා බලිතොවිල් කිරීමට ගැට ගැසූ රෙද්දෙන් කළ සිවුර.

සමණවීවර නම්, මහණුන් දුන් රෙද්දෙන් කළ සිවුර. මහණුන් අයත් මේ වස්ත්‍රය හැම අතකින් දැහැමි එකක් විය යුතුය.

ආභිසෙකික නම්, රජුන්ගේ අභිෂෙකමණ්ඩපයෙහි හැරදමා ගිය රෙද්දෙන් කළ සිවුර.

ඉඩිමය නම්, කළ පින් ඇති භික්ෂූන් රහත්බව ලැබීමෙහි දී සෘඩියෙන් ඇඟ දැවටෙන සිවුර. එහිභික්ෂුභාවයෙන් පැවිදි වන්නහුට ලැබෙන සිවුර.

134 – 135

පථික නම්, මිනිසුන් අතරමග දමාගිය රෙද්දෙන් කළ සිවුර.

වාතාහට නම්, සුළඟින් ගෙණ ගොස් දුර ලූ, කිසිවකු අයත් නො වූ රෙද්දෙන් කළ සිවුර.

දෙවදත්තිය නම්, දෙවියන් පිදූ රෙද්දෙන් කළ සිවුර.

සාමුද්දිය නම්, මුහුදුරැළයෙන් ගොඩ දැමූ රෙද්දෙන් කළ සිවුර.

මේ, මෙහි කොටින් කියූ වස්ත්‍ර තෙවිස්ස. වීථි–සොහොන් –කසළගොඩ යනාදී තැනෙක පස් මතුයෙහි වැටී සිටින කල එහි ඉවුර සේ ඉස්මතු ව පෙනෙන්නේ නු යි හෝ පස් මෙන් පිළිකුල් බවට යන්නේ නු යි හෝ පංසුකූල නම් වේ. මේ තෙවිස් සක් වස්ත්‍ර අතුරෙහි යම්කිසි එකකින් කළ සිවුරක් දැරීම ද පංසුකූල ශබ්දයෙන් කිය වේ. මෙන්න පොත:– **'රථිකසුසාන සඞ්කාරකූටාදිනං යත්ථ කත්ථ වි පංසූනං උපරි ඨිතත්තා අබහුගහතට්ඨෙන තෙසු පංසුසු කූලම්වාති=පංසුකූලං, අථ වා පංසු විය කුච්ඡිතභාවං උලතීති = පංසුකූලං'** යනු.

යම් වස්ත්‍රයක් සඞ්ඝයාට දෙමු යි සඟසතු කොට දේ ද, වස්ත්‍ර සිඟා ගියවුන් විසින් හෝ ලද්දේ ද, ඒ වස්ත්‍ර පංසුකූලගණයට නො වැටේ. සඞ්ඝයාට හෝ ගණයාට හෝ දෙන්නවුන් විසින් වස් අගින් පමුණුවා දෙන වස්ත්‍රය ද, සෙනසුන් කර වූ දායකයන් විසින් ඒ සෙනසුන වසන භික්ෂූන් උදෙසා දෙන වස්ත්‍රය ද, යන දෙක ද පංසුකූල නො වේ. භික්ෂුදත්තියචීවරයෙහි ද දායකයා විසින් යම් සිවුරක් භික්ෂූන්ගේ පාමුල තබන ලද ද, ඒ සිවුර ඒ මහණහු විසින් පංසුකූලිකභික්ෂූහුගේ අත තබන ලද නමුත් දායකයකු විසින් පාමුල තබා දුන් බැවින් එය පිරිසිදු වූයේ එක් පසෙකින් ය. භික්ෂූහුගේ පාමුල තබා දුන් වස්ත්‍රය, ඒ භික්ෂූහු විසින් පංසුකූලිකභික්ෂූහුගේ පාමුල තබා දෙන ලද්දේ නම්, එය දෙපසින් ම පිරිසිදු වූයේ වේ. එය ලැබූ කාලයෙහි ද, දුන් කාලයෙහි ද පාමුල තැබූ බැවිනි. යම් සිවුරක් ලත් කල්හි ද, දුන් කල්හි ද අත්හි ම තබා දෙන ලද්දේ නම්, එය අනුක්කඪචීවර නම් වේ.

මේ වස්ත්‍ර අතුරෙහි එක්තරා එකක් දිරාගිය තැන් කපා හැර සෝදා සිවුරු කොට, එය කප් බින්දු තබා ඉටා සියලු පූජිකෘත්‍යය නිමවා ගහපතිචීවරය මුදාහැර දැරිය යුතු ය. **'ගහපති දානචීවරං පටික්ඛිපාමි, පංසුකූලිකඞ්ගං සමාදියාමි'** යි. මේ වාක්‍ය දෙකෙන් එකෙකින් හෝ දෙකින් මෙය සමාදන් විය හැක්කේ ය.

පංසුකූලිකයෝ උක්කඪ – මජ්ඣිම – මුදුක යි තිදෙනෙකි. එහි සොහොනෙහි ම හැරදැමූ කඩරෙදි සොයාගෙණ සිවුරු කොට

දරන්නේ උක්කඨ නම්. 'පැවිද්දෝ ගණිත්වා' යි තැබූ වස්ත්‍රයක් ගෙණ සිවුරක් කොට දරන්නේ මජ්ඣිම නම්. පාමුල තබා දෙන ලද්දක් ගෙණ දරන්නේ මුදුක නම්. මොවුනතුරෙහි යම් කිසි ධුතඞ්ගධරයකු සිය කැමැත්තෙන් තමා පිණිස ම ගිහින් විසින් දෙන ලද වස්ත්‍රයක් ඉවසූ ඇසිල්ලෙහි ධුතඞ්ගය බිඳෙන්නේ ය.

'පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා' යනු වදාළෝ මෙහි අනුසස් දක්වන්නට ය. 'පැවිද්ද පංසුකූලචීවරධාරණය නිසා වන්නී ය' යනු එහි සිංහල තේරුම ය.

නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො=උපසම්පදාමාලකයෙහිසඞ්ඝයා වහන්සේ මැද **'පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො'** යි ආචාර්‍යෝපාද්ධ්‍යාය-යන් විසින් කියන ලද්දෙහි 'එසේය, ස්වාමීනි!, යි තමන් පිළින කළ නිඃශ්‍රයට සුදුසු පිළිවෙත් ඇතිබව.

පඨමෙ අරියවංසෙ පතිඨානං = ලැබූ පසයෙන් ලැබූ සැටියෙන් සෑහීමට පත්වීමැ යි කියූ ප්‍රථම ආර්‍ය්‍යවංශයෙහි පිහිටීම.

ආරක්ඛදුක්ඛාභාවො = එහිලා වස්ත්‍ර විසින් ආලය නො කට යුතු බැවින් සිවුරු රැක්මෙහි ගැහැටක් නැති බව.

අපරායත්තවුත්තිතා = අනුන් අයත් පැවතුම් නැති බව.

චොරභයෙන අභයතා = සොරබියෙන් බිය නොවන බව.

පරිභොගතණ්හාය අභාවො = මුළුමනින් රළු බැවින් පරිභොග-යෙහි තෘෂ්ණා නැති බව.

සමණසාරුප්පපරික්ඛාරතා = මහණුන්ට සුදුසු පිරිකර බව.

අප්පඝානි චෙව සුලභානි ච තානි අනවජ්ජානීති භගවතා සංවණ්ණිතප්පච්චයතා = වටිනාකමෙහි අඩු බව, එහෙයින් සුලබය නිවරදු, යි භාග්‍යවතුන් විසින් වණ්ණිනා කළ ප්‍රත්‍යයයක් බව.
පාසාදිකතා = දුටුවන් පහදින බව.

අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති = අප්පිච්ඡභාවාදීන්ගේ පල නිපද වන බව.

සම්මා පටිපත්ති අනුබ්‍රූහණං = ඉදිරියෙහි උපදින මනාපිළිවෙත් වඩනා බව.

පච්ඡිමාය ජනතාය දිඨානුගතිආපාදනං = පශ්චිම ජනසමූහය තමාගේ ඒ දෘෂ්ටිය අනුව යන බව යන මේ එහි අනුසස් ය.

'මාරසෙනවිසාතාය පංසුකූලධරෝ යති'
සන්නාඩකවචෝ යුද්ධභූමියෝ විය සොභති.

පහාය කාසිකාදීනි වරවත්ථානි ධාරිතං,
යං ලොකගරුනා කෝ තං පංසුකූලං න ධාරයෙ.

තස්මා හි අත්තනෝ ඉච්ඡං පටිඤ්ඤං සමනුස්සරං,
යෝගාචාරානුකූලමනි පංසුකූලෙ රතෝ සියා,

මරු හා මරසෙන් නැසීමෙහි පංසුකූලචීවරය දරන මහණ තෙමේ යුද්ධභූමි සන්නාහ බැඳි රජකු සේ හොබනේ ය.

තුන්ලෝ ගුරු බුදුරජුන් විසින් උතුම් කසීසළු ආ හැරදමා යම් පංසුකූල සිවුරක් දරන ලද ද, ඒ පංසුකූල්සිවුර කවරෙක් නම් නො ද දරන්නේ ද.

එහෙයින් සසුන්වන් මහණ තෙමේ උපසම්පදාමාලකයෙහි තමන් දුන් ප්‍රතිඥව සිහි කරමින් යොගාවචරයන්ට අනුලෝම් වූ පංසුකූලචීවරධාරණයෙහි ඇලෙන්නේ ය.

'නිච්චරධාරණං තිච්චරං, තං සීලො = තෙච්චරිකො, තස්ස අඞ්ගං = තෙච්චරිකඞ්ගං' සහල සිවුර තනිපට සිවුර අදනා සිවුර දුරිම තිච්චර' නම්. එය සවභාවය වූයේ මෝහට නු යි තෙච්චරිකා' නම්. ඒ තෙච්චරිකයාගේ අඞ්ගය තෙච්චරිකඞ්ග' නම්.

යම් සමාදානවෙතනාවක් කරණ කොට මහණ තෙමේ තෙච්චරිකා නම් වේ ද, ඒ සමාදානවෙතනාව මොහුගේ තෙච්චරිකභාවයට කරුණු වන බැවින් තෙච්චරිකඞ්ග නම් වේ.

තෙච්චරිකඞ්ගය සමාදන් වන මහණහු විසින් **'චතුත්ථක චීවරං පටික්ඛිපාමි, තෙච්චරිකඞ්ගං සමාදියාමි'** යන මේ වැකි දෙකින් එක්තරා එකකින් ඒ සමාදන් විය යුතු ය. වැකි දෙකින් ම සමාදන් වන ලද්දේ ද වරද නො වේ. සමාදන් වූ තෙච්චරිකඞ්ගය ඇති මහණ තෙමේ සිවුරු පිළියක් ලැබ තමන්ට අපහසු බැවින් හෝ, සිවුරු කරන්නට කෙනකු නො ලැබුනු බැවින් හෝ, ඉදිකටු නූල් ආදිය අසම්පූර්ණ බැවින් හෝ, යම් තාක් සිවුරු නො කොට තබා ද, එයින් දොෂයෙක් නො වේ. ධුතඞ්ගභෙදයෙක් නොවන්නේ ය, ඒ තැබීමෙන්. සිවුරු කොට නිමවා රැඳූ කල්හි පරිභොග නො කොට තබන්නට නම් නො වටනේ ය. යම් ලෙසකින් පැරණි සිවුර මුදුහැර 'මේ සිවුර නැවැත පරිභොග කරන්නෙමි' යි බහා තබන්නේ නම්, ඔහු ධුතාඞ්ගභෙවෙරයෙක් වන්නේ ය. එහෙත් ධුතඞ්ගය නො බිඳෙන්නේ ය.

තෙචීවරිකයෝ උක්කඨ – මජ්ඣිම – මුදුක යි තිදෙනෙකි. එහි යම් තෙචීවරිකයෙක් සිවුරු රඳන කල පළමු කොට අඳනය හෝ තනිපට සිවුර පඬු ගන්වා ඒ රැඳූ සිවුර හැඳ නැවැත අනික් සිවුරත් රඳා එය පොරවා ගෙණ සඟළ සිවුර රඳන්නේ ද, ඔහු උක්කඨ නම්. සඟළ සිවුර අඳනය සේ අඳින්නට නො වටනේ ය. ග්‍රාමාන්තසෙනා සනයෙහි වසන්නහු විසින් කළ යුතු සේ ය මේ කියේ. වෙනෙහි වසන්නහු විසින් කළ යුත්තේ තනිපට සිවුර හා සඟළ සිවුර එකවිට සෝදා පඬු ගැන්වීම ය. ඒ සිවුර පඬු ගන්වා රැහණෙහි ලා තෙත සිඳෙන තුරු එයට ලං ව නුදුරු තැනෙක සිටිය යුතු ය. එසේ සිටිය යුත්තේ සිවුරු තෙත සිඳෙන්නට පෙර යම් කිසිවකු එහි එනු දුටු කල ඒ සිවුරු වහා ගෙණ තම සිරුර මත්තෙහි ලා ගැණීමට, සිවුර ගෙණ ඇඟපත වසා ගැණීමට පහසු වනු පිණිස ය. යම් තෙචීවරිකයෙක් සිවුර රඳන්ගන්වන සාලාවෙහි තුබූ පඬු ගැන් වූ අඳනා පොරෝණා සිවුරු ගෙණ ඇඳ පොරොවා තම සිවුරු පඬු ගන් වන්නේ ද, ඔහු මජ්ඣිම නම්. යම් තෙචීවරිකයෙක් රඳන් ගන් වන වේලෙහි යහළු මහණුන්ගේ සිවුරු ඉල්ලා ඇඳ හෝ පොරොවා ගෙණ රඳන් ගන් වන්නේ ද, ඔහු මුදුක නම්. ඔහුට වනාහි තමා අයත් වූ හෝ නො වූ අඳනා පොරෝණා පිණිස නො ඉටු සෙනසුන්හි පසතුරුණු වශයෙන් ඉටු සිවුරු ඇඳීම පෙරවීම නො සුදුසු නො වේ. ඒ ඇඳීම හෝ පෙරවීම සුදුසු වන්නේ සිවුරු පඬු ගන් වන වේලෙහි ය. සෙසු තැන ගෙණ යෑම් ආදියෙන් පරිභොගය නො සුදුසු ය. යහළු මහණුන්ගේ සිවුරු වුවද පරිභොග කළ යුත්තේ අතරතුරෙහි කරුණක් ඇතිවිටකම ය. මේ තෙචීවරිකභික්ෂුහට තුන් සිවුරෙන් වැඩි, සිවුවන සිවුරක් වශයෙන් අංශකඩය හැර අන් සිවුරෙක් නො ද වටනේ ය. ඒ අංශකඩය ද පළලින් වියතක් හා දිගින් තෙරියනක් ද විය යුතු ය. තුන් සිවුරෙන් වැඩි, සිවුවන සිවුරක් තමා පිණිස ඉවසූ කල මේ තිදෙනාගේ ම ධූතඞ්ගය බිඳී යන්නේ ය.

තෙචීවරිකො භික්ඛු සත්තුඨො හොති කායපරිහාරිකෙන චීවරෙන = තුන් සිවුරු දරන මහණ තෙමේ කයින් වැළඳ ගත් තුන් සිවුරෙන් ම සතුටු වේ.

තෙනස්ස පක්ඛිනො විය සමාදායෙව ගමනං = එහෙයින් පක්ෂියකු පියා හඹා යන කල්හි තම පියාපත් සිරුරෙහි ම ලා ගෙණ යන්නා සේ මේ මහණ ද තුන් සිවුරු ගෙණ ම යන්නේ ය.

අප්පසමාරම්භතා = මඳ කටයුතු ඇති බව.

අතිරෙකචීවරලොලුප්පහානං = තුන් සිවුරෙන් වැඩි සිරුරෙහි ලොල් බව දුරු කිරීම.

කප්පියෙපි මත්තකාරිතා = කැප වස්තුවෙහි පවා අපිස් ගුණ සපයනු පිණිස පමණ දැන පරිභොග කිරීම.

සලෙලබවුත්තිතා = කෙලෙස් තුනී කිරීමෙහි පැවතුම් ඇති බව.

අප්පිච්ඡතාදීනං ඵලනිප්ඵත්ති=අප්පිච්ඡභාවාදීන්ගේ ඵලනිෂ්පත්තිය යන මේ එහි අනුසස් ය.

'අතිරෙකචන්ඵතණ්හං පහාය සන්නිධිවිවජ්ජිතො ධීරො,
සන්තොසසුඛරසඤ්ඤූ තිචීවරධරො භවති යොගී

තස්මා සපත්තචරණො පක්ඛීව සචීවරොව යොගීවරො,
සුඛමනුවිචරිතුකාමො චීවරනියමෙ රතිං කයිරා.'

තුන් සිවුරෙන් වැඩි සිවුරෙහි තෘෂ්ණාව දුරු කොට වස්ත්‍ර සන්නිධියෙන් තොර වූ ධෛර්‍යවත් වූ සන්තොෂසුඛයෙහි රස දන්නා වූ යොගීවර මහණ තෙමේ තුන් සිවුරු දරන්නේ වේ.

එහෙයින් පියාපත් පමණකින් හැසිරෙන පක්ෂියකු සේ තුන් සිවුරු සහිත ව ම යොගී මහණ තෙමේ සැප සේ හැසිරෙනු කැමැත්තේ තුන් සිවුරෙහි ඇලුම් කරන්නේ ය.

'භික්ඛාසඞ්ඛාතානං පන ආමිසපිණ්ඩානං පාතො = පිණ්ඩ පාතො, පරෙහි දින්නානං පිණ්ඩානං පත්තෙ නිපතනන්ති වුත්තං හොති, තං පිණ්ඩපාතං උඤ්ඡති තං තං කුලං උපසඞ්කමන්තො ගවෙසතීති = පිණ්ඩපාතිකො, පිණ්ඩාය වා පතිතුං වතමෙතස්සාති = පිණ්ඩපාතී, පිණ්ඩපාතී එව පිණ්ඩ-පාතිකො, පිණ්ඩපාතිකස්ස අඞ්ගං = පිණ්ඩපාතිකඞ්ගං' භික්ෂා සඞ්ඛ්‍යාතආමිසපිණ්ඩයන්ගේ හීම පිණ්ඩපාත නම්. අන්හු විසින් දුන් බත් පිඬු, පාත්‍රයෙහි බැහීම පිණ්ඩපාත යි කියන ලද්දේ ය අන්හු විසින් දෙන ලදු ව පාත්‍රයෙහි හෙන ඒ අහර පිඬු, යමෙක් අවුලා ගණී ද, ඒ ඒ ගෙට යමින් අහර පිඬු සොයා ද, ඔහු පිණ්ඩ-පාතික නම්. පිඬු සොයා යෑම ව්‍රතයක් කොට ගත් මහණ ද පිණ්ඩපාතී නම්. ඔහු ම පිණ්ඩපාතිකත් වේ. ඒ පිණ්ඩපාතිකයාගේ අඞ්ගය පිණ්ඩපාතිකඞ්ග නම් යම් සමාදානචෙතනාවක් කරණ කොට මහණ තෙමේ පිණ්ඩපාතික නම් වේ ද, ඒ සාමදාන චෙතනා ව ම ඔහුගේ පිණ්ඩපාතිකත්වයට කරණු වන බැවින් පිණ්ඩපාතිකඞ්ග නම් වේ.

පිණ්ඩපාතිකඞ්ගය සමාදන් වන මහණහු විසින් **'අතිරෙක-ලාභං පටික්ඛිපාමි, පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි'** යි මේ

එකෙකින් හෝ දෙකින් ම හෝ සමාදන් විය යුතුය. පිණ්ඩපාතිකඞ්ගධර මහණහු විසින් සඞ්ඝභත්ත – උද්දෙසභත්ත– නිමන්තන – සලාකභත්ත – පක්ඛික – උපොසථික – පාටිපදික ආගන්තුකභත්ත – ගමිකභත්ත – ගිලානභත්ත – ගිලානුපට්ඨාකභත්ත විහාරභත්ත – ධුරභත්ත – වාරභත්ත යන මේ බත් තුදුස නො ඉවසිය යුතු ය. හළ යුතුය.

සඞ්ඝභත්ත නම්, සඟ සතු කොට සියලු සඟුන් උදෙසා දෙන බත.

උද්දෙසභත්ත නම්, මහණුන් කිහිප නමක් උදෙසා දෙන බත.

නිමන්තන නම්, සඟනට හෝ මහණුන් කිහිප නමකට ආරාධනා කොට දෙන බත.

සලාකභත්ත නම්, කුසපත් හෙලා නියම කොට දෙන බත.

පක්ඛික නම්, මසක් පිළිබඳ දෙ පක්ෂයෙන් එක් පක්ෂයෙක එක් දිනෙක දෙන බත.

උපොසථික නම්, පොහොය පොහොයෙහි, පොහොයක් පාසා දෙන බත.

පාටිපදික නම්, පැළවිය දිනයෙහි දෙන බත.

ආගන්තුකභත්ත නම්, ඇවිත් යන්නවුනට දෙන බත.

ගමිකභත්ත නම්, ගමන් යන්නවුනට දෙන බත.

ගිලානභත්ත නම්, ගිලනුන්ට දෙන බත.

ගිලානුපට්ඨාකභත්ත නම්, ගිලනුනට උවටැන් කරන්නවුනට දෙන බත.

විහාරභත්ත නම්, තමන් කර වූ සඟ සතු වෙහෙර වසන්නන් උදෙසා දෙන බත.

වාරභත්ත නම්, ගම් වැස්සන් විසින් වාරයෙන් වාරය දෙන බත.

යම් ලෙසකින් දායකයන් විසින් 'සඟසතු බත් පිළිගණු මැනැවැ' යි ආ ලෙසින් නො කියා 'අපගේ ගෙයි සඞ්ඝ තෙමේ භික්ෂාව ගත්තේ ය, ඔබ වහන්සේ ද අවුත් භික්ෂාව පිළිගණිවු' යි දෙන බත භික්ෂා නාමයෙන් කී බැවින් පිළිගන්නට වටනේ ය. සඞ්ඝයා කෙරෙන් ලත් බෙහෙත් බඩු ආදියෙන් යුත් යාමකාලික-සත්තාහකාලික-යාවජීවිකසලාක ද දායකයන් අවුත් විහාරයෙහි දී ම පිස දුන් බත ද පිළිගත හැක්කේ ය මොහුට.

පිණ්ඩපාතිකඞ්ගධරයෝ උක්කඨ මජ්ඣිම-මුදුක යි තිදෙනෙකි. එහි උක්කට්ඨ තෙමේ පෙර පසින් හෝ පසු පසින් හෝ ගෙණෙන ලද භික්ෂාව පිළිගන්නේ ය. ඉදිරියට හමු වූ දෙරටුවෙහි සිට පාත්‍රය ගන්නවුනට ද පාත්‍රය දෙන්නේ ය. මොහුට පාත්‍රය බොජුන්හලට ගෙණ ගොස් නැවැත ගෙණවුත් දෙන භික්ෂාව ද පිළිගත වරද නැත. 'ස්වාමීනි! අද පිඬු පිණිස නො වැඩිය යුතු ය, වෙහෙරට ම භික්ෂාව ගෙණ එම්හ' යි දායකයන් කියූ වචනය ඉවසා එ දවස විහාරයෙහි ඉඳ භික්ෂාව නො පිළිගන්නේ ය, මෙ තෙමේ. මජ්ඣිම තෙමේ දායකයන් විසින් කළ එබඳු ආරාධනා-වක් ඉවසා එ දවස පමණක් ම විහාරයෙහි ඉඳ භික්ෂාව පිළිගන්නේය. සෙට දවසටත් එසේ පිළිගණුව, යි කළ ආරාධනා නො ද ඉවසන්නේ ය. මුදුක තෙමේ දායකයන් විසින් සෙට දවස පිණිස කළ ආරාධනාත් ඉන් පසුදාට කළ ආරාධනාත් ඉවසන්නේ ය. එ දවසට පමණක් ආරාධනා ඉවසන මජ්ඣිමයා ද, සෙට අනිද්දා දෙ දවසට ම ආරාධනා ඉවසන මුදුකයා ද යන දෙදෙන ම අනුන් අයත් නො වූ පැවැත්මෙන් ලැබිය යුතු සැපය නො ලබන්නෝ ය. උක්කඨ තෙමේ ම ඒ සෙරිවිහාරසුඛය ලබා. එක් ගමෙක එක් දවසෙක ආර්‍යවංශ සූත්‍ර දෙශනාවක් වූ ය. එ දවස මේ උක්කඨ තෙමේ මජ්ඣිම-මුදුක දෙදෙනාට 'ඇවැත්නි! බණ අසන්නට යමු' යි කී ය. ඒ දෙදෙන අතුරෙන් මජ්ඣිම තෙමේ 'ස්වාමීනි! එක් මිනිසකු විසින් අද වෙහෙර නවතින්නට මට ආරාධනා කොට තිබේ, එහෙයින් යනු නො හැකි' යි කීයේ ය. මුදුක තෙමේ ද 'ස්වාමීනි! සෙට දවස පිණිස මට ද ආරාධනාවක් තිබේ' යි කී ය. මෙසේ මේ දෙදෙන දහම් රස විඳුමෙන් පිරිහී ගියහ. උක්කඨ තෙමේ උදෑසන ම පිඬු සිඟා ගොස් අහරකිස නිමවා බණ අසන්-නට ගොස් දහම් රස වින්දේ ය. යට කියූ බත් තුදුස, අතිරෙක ලාභ අතුරෙහි යම් කිසි ලාභයක් ඉවසූ ඇසිල්ලෙහි ම ධුතඞ්ග බිඳෙන්නේ ය.

'පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා' යි වදාළ බැවින්

නිස්සයානුරූපපටිපත්තිසබ්භාවො = නිඃශ්‍රයට සුදුසු පිළිවෙත් ඇති බව.

දුතියෙ අරියවංසෙ පතිඨානං = දෙවන පිණ්ඩපාතාර්‍යවංශයෙහි පිහිටීම.

අපරායත්තවුත්තීතා = අනුන් අයත් නො වූ පැවතුම් ඇති බව.

අප්පානි චෙව සුලභානි ච අනවජ්ජානීති භගවතා සංවණ්ණිත පච්චයතා = සුලු ය, සුලබ ය, නිවරද ය, යි බුදු රජුන් විසින් වණිනා කළ ප්‍රත්‍යය ඇති බව.

කොසජ්ජනිම්මථනතා = කුසිතබව මැඩීම.

පරිසුඛාජීවතා -- පිරිසිදු දිවි පැවතුම් ඇති බව.

සෙඛියපටිපත්තිපූරණං = සෙඛිය පිළිවෙත් පිරීම.

අපරපොසිතා = පමණ දුන පිළිගැන්මෙන් හා අනුන් හා හැනී නොවසන බැවින් පරපොෂණයක් නැති බව.

පරානුග්ගහකිරියා = ගෙයක් පාසා ගොස් මද මද පිළිගන්නා බැවින් අනුනට අනුග්‍රහ කරණ බව.

මානප්පහානං = අත්තිමජීවිකාවෙහි පිහිටි බැවින් මානයාගේ පැහිම.

රසතණ්හානිවාරණං = මිශ්‍රාහාරයෙන් දිවි ගෙවන බැවින් රස තෘෂ්ණාව දුරු කිරීම.

ගණභොජනපරම්පරභොජනවාරිතතඞ්ගකම්මපදෙහි-

අනාපත්තිතා = ගණභොජනපරම්පරභොජනවාරිතතඞ්ගකම්-පදයන්ගෙන් ඇවැත් නොවන බව.

අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතා = අප්පිච්ඡභාවාදීන්ට අනුලොම් පැවතුම් ඇති බව.

සම්මා පටිපත්තිබ්‍රූහණං = මනා පිළිවෙත් වැඩීම.

පච්ඡිමජනතානුකම්පනං = පශ්චිමජනසමූහයට අනුකම්පා කිරීම යන මේ එහි අනුසස් ය.

'පිණ්ඩියාලොපසන්තුට්ඨෝ අපරායත්තජීවිකෝ,
පහීනාහාරලොලුප්පෝ හොති චාතුද්දිසෝ යති.

විනොදයති කොසජ්ජං ආජීවස්ස විසුජ්ඣති,
තස්මා හි නාතිමඤ්ඤේය්‍ය භික්ඛාචරියං සුමේධසෝ.

පිණ්ඩපාතිකස්ස භික්ඛුනෝ අත්තාහරස්ස අනඤ්ඤපොසිනෝ,
දේවා පිහයන්ති තාදිනෝ නෝ වේ ලාභසිලොකනිස්සිතෝ.'

පිඬුසිඟීමෙන් ලත් අහරින් සතුටු වූ අනුන් අයත් නොවූ දිවි පැතුම් ඇති අහරෙහි පහ කළ ලොල් බව ඇති මහණ තෙමේ සියලු තැන නොපැකිලෙන බැවින් සිවු දිගට ම සුදුසු වන්නේ ය.

කුසිත බව දුරු කරයි. මොහුගේ දිවි පැවැත්ම පිරිසිදු වේ. එහෙයින් නුවණැත්තේ බික්සිඟීම නොඉක්ම වන්නේ ය.

මෙබඳු ගුණ ඇති තමා ම පොෂණය කරණ එහෙයින් ම අනුන් පොෂණය නොකරණ තාදීභාවයෙන් යුත් පිණ්ඩපාතිකනිඝ්‍යහට ලාභයසස් ඇසුරු නොකෙළේ නම්, දෙවියෝ ද කැමැති වෙත් ශීලාදීගුණයෙහි බුහුමන් කෙරෙති.

'දූනං වුච්චති අවඛණ්ඩනං, අපෙතං දූනතෝ = අපදූනං, අවඛණ්ඩනානති අපෙථා, සහ අපදූනෙන = සපදූනං, අවඛණ්ඩ විරහිතං අනුසරනති වුත්තං හොති, සපදූනං චරති ඉදමස්ස සීලනති = සපදූනචාරී, සපදූනචාරී එව = සපදූනචාරිකෝ, තස්ස අඞ්ගං = සපදූනචාරිකඞ්ගං' දූනය අවඛණ්ඩනැ යි කියනු ලැබේ. විවේජදය යි. කඩ කිරීම ය. ඒ (විවේජද) කඩ කිරීමැ යි කියන දූනයෙන් පහ වූයේ අපදූන' නම්. අවිවේජද ය, නොකඩ කිරීම ය, යන අරුති. නොකඩ කිරීම සමග පවත්නේ සපදූන' නම්. කඩ කඩ කිරීමෙන් තොර අතරින් අතර හැර නොපැවැති ගෙපිළිවෙළ ය. ගෙපිළිවෙළින් හැසිරේනු යි මේ ගෙපිළිවළින් හැසිරීම මොහුගේ සවභාවය නු යි සපදූනචාරී' නම්. ඒ සපදූනචාරී තෙමේ ම සපදූනචාරික නම් ද වේ. සපදූනචාරී හුගේ අඞ්ගය සපදූනචාරිකඞ්ග නම්. යම් සමාදූනවෙතනාවක් කරණ කොට මහණ තෙමේ සපදූනචාරික වේ ද, ඒ සමාදූන වෙතනාව ම ඔහුගේ සපදූනචාරිකභාවයට කරුණු වන බැවින් සපදූනචාරිකඞ්ගැ, යි දත යුතු ය.

සපදූනචාරිකඞ්ගය සමාදන් වන මහණහු විසින් **'ලොලුප්ප චාරං පටික්ඛිපාමි, සපදූනචාරිකඞ්ගං සමාදියාමි'** යි මේ එකෙකින් හෝ දෙකෙන් ම හෝ ඒ සමාදන් විය යුතු ය. සපදූනචාරිකඞ්ගය සමාදන් වූවහු විසින් ගම්දෙර සිට උවදුරු ගැණ සලකා යම් කිසි විථියෙක හෝ ගමෙක උවදුරු වේ නම්, ඒ හැර අන් තැනෙක සිඟා යා යුතු ය. ගම්දෙරෙක හෝ විථියෙකහෝ ගමෙක හෝ පිළිවෙළින් තුන් දවසකුත් සිඟා කිසිවක් නොලැබුනේ නම්, එබඳු තැන ගම නොවේ ය, යි ග්‍රාමසංඥව හැර දමා යා යුතු ය. එහෙත් යම් තැනෙකින් ටිකක් වත් ලැබේ නම්, එබඳු තැන හැර නොයා යුතු ය. මේ මහණ උදෑසන ම පිඬු සිඟීමට ගම් වැදිය යුතු ය. එසේ පිඬු සිඟා ගිය කල්හි නොවැද්ද යුතු තැන් සලකා

එ තැන් හැර අන් තැනකට යා හැකි වන්නේ ය. විහාරයෙහි දන් දෙන්නන් විසින් හෝ අතර මග එන්නන් විසින් හෝ මොහුගේ පාත්‍රය ගෙණ පිණ්ඩපාතය දෙනු ලැබේ නම්, ඒ පිළිගැණීම වරද නො වේ. මග බැස යන මේ මහණහු විසින් පිඬු සිඟා යන වේලෙහි ඉදිරියට හමු වූ ගම නොයික්මවා පිඬු සිඟිය යුතු ම ය. එ ගමෙහි දී පිණ්ඩපාතය නො ලැබුනේ නම්, එකල ගම් පිළිවෙළින් යැපෙන පමණ සිඟිය යුතු ය.

සපදානචාරිකඞ්ගධරයෝ උක්කඨ – මජ්ඣිම – මුදුක යි තිදෙ-නෙකි. එහි යම් සපදානචාරිකයෙක් ඉදිරි පසින් හෝ පසු පසින් ගෙණෙන ලද ආහාර ද, බොජුන්හලට ගෙණවුත් දෙන ආහාර ද නො පිළිගෙණ ඉදිරියට හමු වූ දොරකඩ දී පාත්‍රය දෙන්නේ ද, ඔහු ය උක්කඨ. මොහු, භික්ෂාව ගෙණෙන්නෝ දූ, යි බලමින් බොහෝ වේලා නො ඉඳියි. යමෙක් වනාහි ඉදිරි පසින් හෝ පසු පසින් ගෙණෙන ලද ආහාර හා බොජුන්හලට ගෙණෙන ලද ආහාර පිළිගන්නේ ද, ඉදිරියට හමු වූ දොරකඩ දී පාත්‍රය දේ ද භික්ෂාව ගෙණෙන්නෝ දූ, යි බලා නො ඉඳී ද, ඒ ය මජ්ඣිම. මෙතෙමේ උක්කඨපිණ්ඩපාතිකයාහට අනුලොම් ව සිටින්නේ ය. මුදුක තෙමේ, එ දවස් ම භික්ෂාව ගෙණෙන්නෝ දෝ යි බලා හිඳියි. ගෙ පිළිවෙළ හැර පිඬු සිඟීමේ දී මේ තිදෙනාගේ ම ධුතඞ්ග බිඳෙන්නේ ය.

කුලෙසු නිච්චනවකතා = සපදානචාරික භික්ෂු කිසි කුලයක් කරා නිතර නො එළඹෙන බැවින් කුලයෙහි අළුත් බව.

චණ්ඩපමතා = කිසි කුලයෙක නො ඇලෙන බැවින් හා සොම්ගුණ ඇති බැවින් සඳ බඳු බව.

කුලමච්ඡරප්පහානං = අන්හු තම දායකකුලය කරා නො එළ-ඹෙත්වා, යි කුල මසුරුබව දුරු වීම.

සමානුකම්පිතා = සියල්ලන් කෙරෙහි සම අනුකම්පා ඇති බව.

කුලූපකාදීනවාභාවො = කුලසඞ්ග්‍රහකිරීම, කුලය හා එක්වීම යනාදී දොස් නැති බව.

අභවානානභිනන්දනා = කැඳවීම් ඇරයුම් ඉවසීමෙන් සතුටු නො වන බව.

අභිහාරෙන අනත්ථකතා = අහර එළවා දීමෙන් ප්‍රයොජන නැති බව.

අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතා=අපිස් සතොස් ඇ ගුණයනට අනුලොම් පැවතුම් ඇති බව යන මේ එහි අනුසස් ය.

'වන්දූපමො නිච්චනවො කුලෙසු අමච්ඡරී සබ්බසමානුකම්පො,
කුලූපකාදීනවවිප්පමුත්තො හොතීධ භික්ඛු සපදානචාරී.

ලොලුප්පචාරං ච පහාය තස්මා ඔක්ඛිත්තචක්ඛු යුගමත්තදස්සී,
ආකඞ්ඛමානො භුවි සෙරිචාරිං චරෙය්‍ය ධීරො සපදානචාරං.'

මේ සස්නෙහි සපදානචාරිකභික්ෂු තෙමේ කුලයට සඳ වැනි ය. නිති අළුත් ය. මසුරු බව නැත්තේ ය. සියලු දෙනා කෙරෙහි සම අනුකම්පා ඇත්තේ ය. කුලයට එළඹීමෙන් වන වරදින් වෙන් ව සිටියේ ය.

එහෙයින් ලොල් බැවින් ගෙ පිළිවෙළ ඉක්ම සිඟීම හැර යට හෙලූ ඇස් ඇත්තේ වියදඬු පමණ දුර බලනුයේ පොළොවෙහි සෛවරීවිහාරය කැමැත්තේ ධෘතිමත් වූයේ ගෙ පිළිවෙළින් පිඬු සිඟීමෙහි ව්‍රතය පුරන්නේ ය.

'එකාසනෙ භොජනං = එකාසනං, තං සීලමස්සාති = එකාසනිකො, තස්ස අඞ්ගං = එකාසනිකඞ්ගං' ඒ ඒ ඉරියවු වලින් නො වෙනස් වූ එක් ම අසුනෙහි හිඳ වැළඳීම, එකාසන' නම්. ඒ එකාසනභොජනය ස්වභාව කොට ගත්තේ එකාසනික' නම් වේ. ඒ එකාසනිකයාගේ එකාසනික වීමෙහි කාරණය එකාසනිකඞ්ග යි ගැණේ. යම් සමාදානචෙතනාවක් කරණ කොට මහණ තෙමේ එකාසනික වේ ද, ඒ සමාදානචෙතනාව ම ඔහුගේ එකාසනිකභාවයට කරුණු වන බැවින් එකාසනිකඞ්ග නම්.

එකාසනිකඞ්ගය සමාදන් වන මහණහුට **'නානාසනභොජනං පටික්ඛිපාමි, එකාසනිකඞ්ගං සමාදියාමි,** යි මේ දෙකෙන් එකෙකින් හෝ දෙකෙන් සමාදන් විය හැකි ය. එකාසනිකඞ්ගය සමාදන් වූවහු විසින් ආසනශාලාවෙහි හිඳින්නහු ථෙරාසනයෙහි නො ඉඳ 'මේ අසුන මට පැමිණෙන්නේ ය' යි සලකා සුදුසු අසුනෙක හිඳිය යුතු ය. එසේ හුන් කල්හි අතර තුර එයින් නැඟී සිටින්නට සිදු නො වේ. එහෙත් වළඳ අවසන් වන්නට පෙර ආචාර්‍යයන් වහන්සේ හෝ උපාද්‍ධ්‍යායයන් වහන්සේ හෝ එහි පැමිණියෝ නම් අසුනෙන් නැගිට වත් කළ යුතු ය. මෙහි ලා ත්‍රිපිටක චූලාභය මහා ස්ථවිරයන් වහන්සේ, එකාසනිකඞ්ගධරභික්ෂු වළඳන වේලෙහි ආචාර්‍යෙපාද්‍ධ්‍යායයන් වහන්සේ එහි ආවාහුනම්, ධුතඞ්ග භෙදයට බියෙන් වළඳ අවසන් වනතුරු නො නැඟී සිටිය යුතු ය යි ද,

වළඳමින් හුන් අසුනෙන් නැගිට ගොස් නැවැත වැළඳුයේ නම්, ධුතඞ්ග බිඳෙන බැවින් නැගිට ගොස් අවුත් නැවැත නො වැළඳිය යුතු ය,යි ද කීහ. අඩාල කළ බොජුන් ඇති මේ මහණ වළඳමින් හුන් අසුනෙත් නැගිට වතාවත් කෙරේ නම්, නැවැත නො වැළඳිය යුතු ය යනු, මෙහි පිළිපදින ආකාරය යි.

එකාසනිකඞ්ගධරයෝ උක්කට්ඨ - මජ්ඣිම - මුදුක යි තිදෙ-නෙහි. එහි යමෙක් මඳ වූ හෝ බොහෝ වූ යම් කිසි බතෙක අත බැහුයේ,ඉන් පිටත් බතක් නො ගත්තේ ද, ඔහු උක්කට්ඨ නම් යම් ලෙසකින් මිනිස්සු තෙරුන් කිසිවක් නො වළඳන ලදැ, යි නිතෙල් ආදිය ඵලවත් නම්, මේ තෙමේ ඒ පිළිගත්තේ බෙහෙත් පිණිස ම ය. බත් පිණිස නම් නො ද පිළිගත්තේ ය. යමෙක් වළඳන අතර ම පාත්‍රයෙහි බත් නො නිමෙන්නට පෙරාතුව ම පුන පුනා පිළිගන්වන ලද බත් පිළිගත්තේ ද, ඔහු මජ්ඣිම නම්. මොහු භොජනපරියන්තිකැ යි හඳුන්වනු ලැබේ. බොජුන් කෙළවර කොට ඇත්තේ ය යනු අදහස ය ඒ ආසනයෙන් නො නැගී සිට ලැබෙන තාක් බත් පිළිගත්තේ මුදුක නම්. මොහු උදකපරියන්තික නම් වේ. වැළඳූ පාත්‍රය සේදීමට දිය ගන්නා තුරු වළඳන්නේ ය, යනු අදහසි. යම් තාක් හුන් ආසනයෙන් නො නැගේ ද, ඒ තාක් වළඳන හෙයින් මේ තෙමේ ආසනපරියන්තික යි ද කියනු ලැබේ. මේ තිදෙන නත් අසුන්හි හිඳ යාවකාලිකභොජනයක් වැළඳූ කෙණෙහි ම ධුතඞ්ගයෙන් පිරිහෙත්.

අප්පාබාධතා = ආබාධ රහිත බව.

අප්පාතඞ්කතා = සිරුරු දුක් නැති බව.

ලහුඨානං = සැහැල්ලු පැවැත්ම.

බලං = කාය ශක්තිය.

ඵාසුවිහාරෝ = පහසු විහරණය.

අනතිරිත්තපච්චයා අනාපත්ති = නො කැප බොජුන් වැළඳීම හෙතු කොට පැමිණිය යුතු ඇවැතින් ඇවැත් නො වීම.

රසතණ්හාවිනොදනං - රසතෘෂ්ණාව දුරු කිරීම.

අපච්චත්තාදිනංඅනුලොමවුත්තිතා = අපච්චත්තාදීන්ට අනු-ලොම් පැවැත්ම යන මේ එහි අනුසස් ය.

'එකාසනභොජනෙ රතං න යති භොජනපච්චයා රුජා,
විසහනති රසෙ අලොලුපෝ පරිහාපෙති න කම්මමත්තනෝ.

ඉති එාසුවිහාරකාරණො සුවිසලෙලබරතූපසෙවිතෙ,
ජනයෙථ විසුද්ධමානසො රතිමෙකාසනභොජනෙ රතා,

බත් නිසා හට ගත්නා රොගයෝ එක් අසුතේ හිඳ වැළඳීමෙහි ඇලුනු මහණහු නො මඬිති. නො පෙළති. රසයෙහි ලොල් නො වූ ඒ මහණ තෙමේ තමාගේ ශමථවිදර්ශනාකර්මය නො පිරිහෙලයි.

මෙසේ පිරිසිදු සිත් ඇති මහණ තෙමේ සැප විහරණයට කරුණු වූ පවිත්‍ර වූ සලෙලබගුණයෙහි ඇලුනවුත් විසින් සෙවුනා ලද එකාසනභොජනයෙහි ඇලීම උපද වන්නේ ය.

'දුතියභාජනස්ස පටික්ඛිතත්තා කෙවලං එකස්මිංයෙව පත්තෙ පිණ්ඩො පත්තපිණ්ඩො, ඉදානි පත්තපිණ්ඩගහනෙ පත්තපිණ්ඩසඤ්ඤං කත්වා පත්තපිණ්ඩො සීලමස්සාති = පත්ත පිණ්ඩිකො, තස්ස අඞ්ගං = පත්තපිණ්ඩිකඞ්ගං' දෙවන බඳුනක් පිළිකෙව් කොට හුදෙක් එක් ම බඳුනෙක පිඬු ගැණීම පත්තපිණ්ඩ නම්. ඒ බඳුනෙහි පිඬු ගැණීමෙහි පත්තපිණ්ඩසංඥාව කොට එක් ම බඳුනෙක පිඬු ගැණීම ස්වභාවය කොට ගත්තේ පත්තපිණ්ඩික නම් වේ. යම් සමාදානවෙතනාවක් කරණ කොට මහණ තෙමේ පත්තපිණ්ඩික වේ ද, ඔහුගේ පත්තපිණ්ඩිකභාවයට ඒ සමාදාන වෙතනාව ම කරුණු වන බැවින් පත්තපිණ්ඩිකඞ්ග.

පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වන මහණහුට, **'දුතියභාජනං පටික්ඛිපාමි, පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි'** යි මේ එකෙකින් හෝ දෙකෙන් ඒ සමාදන් විය හැකි ය. පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වූවහු විසින් කැඳ වළඳන කල්හි බඳුනෙහි තබා අවුළු ලද්දේ නම්, කැඳ නො වළඳ පළමු කොට අවුළු වැළඳිය යුතු ය. නැත, කැඳ හෝ පාත්‍රයෙන් පිළිගෙණ පළමු ව වැළඳිය යුතුය. මෙසේ කියන ලද්දේ අවුළු, කැඳෙහි බහාලූයේ නම්, කුණු මස් ආදී ව්‍යඤ්ජන කැඳෙහි බහාලීමෙන් කැඳ පිළිකුල් වේ. පිළිකුල් වූ කැඳ අවුළු වැළඳීමෙන් වමනය වන්නේ ය. එහෙයින් එබඳු පිළිකුල් උපද වන මීශ්‍රාහාර වැළඳීම වළකනු සඳහා ය. මී සකුරු ආදී නො පිළිකුල් යමක් ලැබුනු විට ඒ හැම, පාත්‍රයෙහි ම බැහිය යුතු ය. දෙවන බඳුනක් පිළිකෙව් කළ බැවින් අන් කොළපත් ආදිය ගැණීම ද නො සුදුසු ය. මේ මෙහි පිළිපදින සැටි ය.

පත්තපිණ්ඩිකඞ්ගධරයෝ උක්කඨ-මජ්ඣිම-මුදුක යි තිදෙ-නෙකි. එහි උක්කඨ තෙමේ උක් ගස් වළඳන කාලයෙහි එහි භපය හැර දමනු මිසක්, අන් අහරක් වළඳන විට ඒ අහරෙහි වූ කැලි කසළ වත් බැහැර නො කරන්නේ ය. උක්කඨයාහට තමන්

වළඳන බතෙහි ඇති කුණු රොඩු වත් බැහැර කරන්නට නො වටනේ ය. බත් කැටි මත්ස්‍ය මාංස කැටුම් ඈ අතින් කඩා කැබිලි කොට වැළඳීමට ද උක්කඨයාහට අවසර නැත්තේ ය. මජ්ඣිමයා-හට එක් අතකින් කඩා කන්නට පිළිවන. එහෙයින් ඔහුට හත්ථ-යොගී' යන නමෙක් ද වේ. මුදුකයාහට පාත්‍රයෙහි ලන හැම දෙයක් ම අතින් හෝ දතින් කඩා වළඳන්නට හැක්කේ ය. එහෙයින් මොහුට පත්තයොගී' යන නමෙක් ද වේ. දෙවන බඳුනක් ඉවසූ ඇසිල්ලෙහි තිදෙනාගේ ම ධුතඞ්ග බිඳෙන්නේ ය.

නානාරසතණ්හාවිනොදනං = නන් රස වැළඳීමෙහි බලාපො-රොත්තුව දුරු කිරීම.

අත්‍රිච්ඡතාය පහානං = නන් බඳුන්හි වූ නොයෙක් රස වෙසෙස්හි උපදින ආසාව දුරු කිරීම.

ආහාරෙ පයොජනමත්තදස්සිතා = ආහාරයෙහි ප්‍රයොජන පම-ණක් ම දැකීම.

ථාලකාදිපරිහරණබෙදාභාවො = තලු තැටි ආදිය පරිහරණයෙහි විඩා නැති බව.

අවික්ඛිත්තභොජිතා = නො විසුරුනු බොජුන් ඇති බව.

අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතා = අප්පිච්ඡභාවාදීන්ට අනු-ලොම් පැවතුම් ඇති බව යන මේ එහි අනුසස් ය.

'නානා භාජනවික්ඛෙපං හිත්වා ඔක්ඛිත්තලොචනො'
ඛණන්තො විය මූලානි රසතණ්හාය සුබ්බතො.

සරූපං විය සන්තුට්ඨිං ධාරයන්තො සුමානසො,
පරිභුඤ්ජෙය්‍ය ආහාරං කො අඤ්ඤෙ පත්තපිණ්ඩිකො.'

නන් බඳුන්හි පැවැති චිත්තවික්ෂෙපය හැර පාත්‍රසංඥාවෙන් යට හෙලූ ඇස් ඇති ව රසතෘෂ්ණාවෙහි මුල් උදුරන්නකු සේ මහාව්‍රත ඇත්තා වූ මූර්තිමත් සන්තොෂය දරන්නකු සේ මනා සිත් ඇත්තා වූ පත්තපිණ්ඩිකයා හැර අන්කවරෙක් ආහාර වළඳන්නට සමර්ථ වන්නේ ද.

'බලූති පටිසෙඩ්ඪෙ නිපාතො, පවාරිතෙන සතා පච්ඡා-ලඛං භත්තං පච්ඡාභත්තං නාම, තස්ස පච්ඡාභත්තස්ස භොජනං = පච්ඡාභත්තභොජනං, තස්මිං පච්ඡාභත්තභොජනෙ පච්ඡාභත්තසඤ්ඤං කත්වා පච්ඡාභත්තසීලමස්සාති = පච්ඡා-භත්තිකො, න පච්ඡාභත්තිකො = බලුපච්ඡාභත්තිකො, සමාදාන

වසෙන පටිකඛිත්තාතිරිත්තභොජනස්සෙතං අධිවචනං, තස්ස අඞ්ගං = ඛලුපච්ඡාභත්තිකඞ්ගං' ඛලු, යනු ප්‍රතිෂෙධාර්ථයෙහි නිපාතයෙකි. ආහාර පැවරූවහු විසින් පසු ව ලත් බත **පච්ඡාභත්ත'** නම් පසු ව ලත් බත වැළඳීම **පච්ඡාභත්තභොජන'** නම් වේ. ඒ පච්ඡාභත්තභොජනයෙහි පච්ඡාභත්තසඤ්ඤාව උපදවා පසු ව ලත් බත වැළඳීම ස්වභාවය කොට ගත්තේ පච්ඡාභත්තික නම්. ඒ මේ පසු ව ලත් බත් බුදීම නො කරණ සුලු වූයේ, ඛලු පච්ඡාභත්තික යි කියනු ලැබේ. සමාදාන වසයෙන් වැළකූ අතිරිත්ත භොජනය ඇත්තහුට **ඛලුපච්ඡාභත්තික'** යනු නමෙකි. ඛලු යන්නෙන් පක්ෂියෙක් ද කිය වේ. ඌ කටින් ගත් ගෙඩිය බිම වැටුනු කල අනිකක් නො කත්තේ ය. මේ ව්‍රතධරයා ද එබඳු යි අටුවාවෙහි කියන ලද්දේ ය. යම් සමාදානචෙතනාවක් කරණ කොට මහණ තෙමේ ඛලුපච්ඡාභත්තික වේ ද, ඒ සමාදාන චෙතනාව ම, මොහුගේ ඛලුපච්ඡාභත්තිකභාවයට කරුණු වන බැවින් **ඛලුපච්ඡාභත්තිකඞ්ග'** නම් වේ.

ඛලුපච්ඡාභත්තිකඞ්ගය සමාදන් වන මහණහුට **'අතිරිත්තං භොජනං පටිකඛිපාමි, ඛලුපච්ඡාභත්තිකඞ්ගං සමාදියාමි'** යි මේ දෙකින් එකකින් හෝ දෙකෙන් සමාදන් විය හැකි ය. මෙය සමාදන් වූවහු විසින් පැවරූ බත කැප කරවා ගෙණ නැවැත නො වැළඳිය යුතු ය.

ප්‍රභෙද විසින් මොහු ද උක්කඨ – මජ්ඣිම – මුදුක යි තෙ වැදැරුම් ය. තමන් වළඳන පළමු වන බත් පිඩෙහි පවාරණයක් නො වන බැවින් ඒ පළමු වන බත් පිඩ වළඳන්නේ ය. එහි, උත්කෘෂ්ටව්‍රතධර තෙමේ ඒ වළඳන වේලෙහි අත් පසට ගෙණ ආ අත් බොජුනක් පිළිකෙව් කිරීමෙන් පවාරණය වන බැවින් ඒ පළමු වන බත් පිඩ වැළඳීමෙන් පසු, දෙවන බත් පිඩ නො වළඳන්නේ ය. මධ්‍යම තෙමේ යම් බතක් පවාරණය කෙළේ ද, එම බත කැප කරවා වළඳයි. අන් බතක් නො වළඳන්නේ ය. මුදුක තෙමේ ආසනයෙන් නැඟී සිටින තුරු ම වළඳන්නේ ය. පවාරණය කළ බතක් කැප කරවා වැළඳූ කෙණෙහි ම මේ තිදෙනාගේ ම ධුතඞ්ග බිඳෙන්නේ ය.

අනතිරිත්තභොජනාපත්තියා දූරීභාවො = කැප නො කළ බත් වැළඳීමෙන් වන ඇවැතින් දුරු වීම.

ඔදරිකත්තාභවො = එක් පිඩෙකිනුත් යැපෙන බැවින් කුස පිරීමක් නැති බව.

නිරාමිසසන්නිධිතා = කැප කරවා වළඳිමි, යි තැන්පත් කොට තබන ආමිස නැති බව.

පුනපරියෙසනාය අභාවො = නැවැත ආහාර සෙවුමක් නැති බව.

අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතා = අප්පිච්ඡභාවාදීන්ට අනුලොම් වූ පැවතුම් ඇති බව. යන මේ එහි අනුසස් ය.

'පරියෙසනාය ඛෙදං න යාති න කරොති සන්නිධිං ධීරො,
ඔදරිකත්තං පජහති ඛලුපච්ඡාභත්තිකො යොගී.

තස්මා සුගතප්පසත්ථං සන්තොසගුණදිවුඩ්සංජනනං,
දොසෙ විධුනිතුකාමො භජෙය්‍ය යොගී ධුතඞ්ගමිදං'

ධෛර්‍යවත් ඛලුපච්ඡාභත්තික තෙමේ පවරා නැවැත නො වළඳන බැවින් අහර සෙවීමෙන් පීඩාවට නො පැමිණෙයි. කැප කරවා වළඳිමි, යි අහර තැන්පත් කොට නො තබයි. බඩපුරා කන බව දුරු කරයි.

එහෙයින් රාගාදීදොස නසනු කැමති යොගී තෙමේ බුදු රජුන් විසින් පස්සනා ලද දෙයින් සතුටුවීම් ආදී වූ ගුණ වඩන්නා වූ මේ ඛලුපච්ඡාභත්තිකඞ්ගය සෙවනය කරන්නේ ය.

'අරඤ්ඤෙ නිවාසො සීලමස්සාති = ආරඤ්ඤිකො, තස්ස අඞ්ගං = ආරඤ්ඤිකඞ්ගං' වනයෙහි විසුම, ස්වභාවය කොට ගත්තේ ආරඤ්ඤික නම්. වනයෙහි විසුමට කරුණු වූ සමාදාන චෙතනාව ආරඤ්ඤිකඞ්ග නම් වේ.

ආරඤ්ඤිකඞ්ගය සමාදන් වන මහණහු විසින් **'ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි, ආරඤ්ඤිකඞ්ගං සමාදියාමි'** යන මේ එකෙන් හෝ දෙකෙන් හෝ සමාදන් විය යුතු ය. මෙය සමාදන් වූවහු විසින් ගාමන්තසෙනාසනය හැර වනසෙනසුනෙහි අරුණු නැංවිය යුතු ය. උපචාර සහිත වූ මුළුගම ම ගාමන්තසෙනාසන නම්. එක් ගෙයක් ඇත්තේ, බොහෝ ගෙවල් ඇත්තේ, වැට පවුරු ආදියෙන් වට කරණ ලද්දේ, වැට පවුරු ආදියෙන් වට නො කරණ ලද්දේ, මිනිසුන්ගේ වාසය ඇත්තේ, නැවැත එම්හ යි හැර දමා ගිය බැවින් මිනිසුන්ගේ වාසය නැත්තේ, යටත් පිරිසයින් සිවුමසකට වැඩිකලක් යම් කිසි ගැල් සාත්තුනායකයකු විසින් වසන ලද්දේ ගමැ යි ගණු ලැබේ. යම් ගමක් එලිපත් දෙකකින් යුක්ත වේ නම්, ඒ එලිපත් දෙකෙන් ඇතුළු එලිපත සිට මැදියම් බලැති පිරිමියකු විසින් ගැසූ ගල වැටුනු තැන, ගාමූපචාරැ යි ගණිත්. මෙහිලා විනයධරයෝ ගන්නෝ තුරුණු වියෙහි පිහිටි පිරිමියකු තමන්ගේ හයිබල පෙන්වා අත දිගු කොට

ගැසූ ගල වැටුනු තැනින් ඇතුළත ය. සූත්‍රානතිකයෝ කවුඩන් පන්නා හැරීමට ගල් ගසන ලෙසට ගැසූ ගල වැටුනු තැනින් ඇතුළත ගාමූපචාර යි ගණිත්.

වැට පවුරු ආ යමකින් වට නො කළ ගමෙහි සියල්ලට කෙළවර වූ ගෙයි දෙරකඩ සිටි ගැහණියක බදුනකින් විසි කළ වතුර වැටුනු තැන, ඝරූපචාර නම්. ඒ ඝරූපචාරයෙහි සිට විසි කළ ගල වැටුනු තැන, ගාම නම්. එතැන් සිට විසි කළ දෙවන ගල වැටුනු තැන ගාමූපචාර නම් ගමත් ගාමූපචාරයත් හැර, සෙසු සියලු තැන 'අරණ්‍ය' යි අදත්තාදානපාරාජිකා විභාගයෙහි කියන ලද්දෙ ය. අභිධම්යෙහි කියන ලද්දේ නුවර ඉඳුබිලයි පමණ් පිටත සියලු තැන අරණ්‍යය බව ය. මේ ඛුතඛගයෙහි ලා ගත යුත්තේ සූත්‍රපිටකයේ කියූ ලෙසට ය. එහෙයින් ගම් කෙළවර සිට දුනු පන්සියයක් දුර වූ සථානය පශ්චිම අරණ්‍ය සෙනාසනය යි ගත යුතු ය. මෙ ද ඊ ණගා තැබූ නව පියක් පමණින් යුත් ආචාර්‍යවරුන්නෙන්, වැට පවුරු ඇතිත ගමෙහි දෙර ඵලිපත පටන් ද, වට නො කළ ගමෙහි පළමු ගැසූ ගල වැටුනු තැන පටන් ද, වෙහෙර පවුර දක්වා දුනු පන්සියය මැන ගත යුතු ය. ඉදින් වෙහෙර වට නො කරණ ලද්දේ නම්, එහි ආදියෙහි ම තුබූ නොනැස්නක් හෝ බන්හලක් හෝ නිතර රැස් වන තැනක් හෝ බොධිය හෝ සෑය හෝ සෙනසුනට දුරින් පිහිටා සිටියේ නම්, එතැන් සිට ඒ දූරසථානය සීමා කොට මැන ගත යුතු ය. මේ විනයයෙහි කියූ සැටි ය. මැදුම්සහිඅටුවාවෙහි කියන ලද්දේ ද වෙහෙරෙහි ද ගමෙහි මෙත් උපචාරය එළවා, ඒ විහාරොපචාරග්‍රාමොපචාර දෙක නියම කළ ගල් දෙක වැටුනු දෙ තැනැ අතරතුර මතින්නට ය. ඒ දෙක අතර ද දුනු පන්සියයක් තිබිය යුතුය යි ද කියන ලදී.

වන සෙනසුන අසල ගමෙක් වී ද එ ගම් වැසි මිනිසුන් කරණ බස්බිණුම් වෙහෙර වැස්සන්ට ඇසේ ද, එහෙත් වනසෙනසුන හා ගම කඳු ගඩගාදියෙන් වෙන් කරණ ලද්දේ කෙලින්, විහාරයට නො යා හැකි වේ ද, විහාරයට යන ඒ පියවි මග නැවූ ආදි යමකින් යා යුතු වේ ද, ඒ මාර්‍ගයෙන් දුනු පන්සියය මැන, විහාරය සීමාවෙන් වෙන් කට යුතු ය.

යම් මහණෙක් අසල පිහිටි ගමෙහි ආරණ්‍යාඔග සමපාදනය කොට දුනු පන්සියයක් සපයන්නට සිතා ඒ ඒ තැන්හි වූ කුඩා මං අහුරා ද, ඔහු ඛුතඛගචොර නම් වේ. ආරණ්‍යකනිඤ්ඤහුගේ ලෙඛින් පෙළෙන ආචාර්‍යෙව්‍යාපාධ්‍යායයන්ට වනසෙනසුන හිත

නො වේ නම්, ආරණ්‍යකභික්ෂුහු විසින් ඔවුහු ග්‍රාමාන්තසෙනාසනයට ගෙණ ගොස් උපස්ථාන කළ යුතු වෙති. එහිලා ආරණ්‍යකයා විසින් කළ යුත්තේ අරුණ නගින්නට පෙරාතුව ග්‍රාමාන්තය හැර ආරණ්‍යකාඞ්ගයට කී ලක්ෂණයුක්තවනයට ගොස් එහි දී අරුණ නැගීම ය. ලෙඩින් පෙළෙන්නන්ගේ රොගය අරුණ නගින වේලෙහි ම බලවත් ව නැගී ගියේ නම්, ව්‍රතධරයා විසින් එහිදීත් කළ යුක්තේ ධූතාඞ්ගපාරිශුද්ධිය පිණිස රොගියා අතහැර නො ගොස් ඔහුට උපස්ථාන කිරීම ය.

ප්‍රභෙද විසින් මොවුහු උක්කඨ-මජ්ඣිම-මුදුක යි තිදෙනෙකි එහි උත්කෘෂ්ට තෙමේ කොතරම් අපහසුකම් තුබුණ ද, සියලු කල්හි අඞ්ගලක්ෂණයුක්තඅරණ්‍යයෙහි ම අරුණු නගත්තේ ය. මධ්‍යම තෙමේ වැසිසාරමස්හි ග්‍රාමාන්ත සේනාසනයෙහි විසීම ලබයි. මෘදුක තෙමේ හිමසාරමස්හි ද ග්‍රාමාන්තසෙනාසනයෙහි වසන්නේ ය. මේ තිදෙන තමතමන්ට නියමිත වූ කාලය තුළ වනයෙන් අවුත් ග්‍රාමාන්තසෙනාසනයෙහි හිඳ බණ අසන්නෝ දැන දැන අරුණ නගත් ද, එහෙත් ඔවුන්ගේ ධූතඞ්ගය නො බිඳෙන්නේ ය. බණ අසා අවසන් කොට වනයට යන අතරමග දී අරුණ නැගුනේ ද, ධූතඞ්ගයාගේ බිඳීමෙක් නො වේ. එහෙත් බණ දෙසා අවසන් කොට ධර්මදෙශකයා ධර්මාසනයෙන් බැස ගිය පසු මොහොතක් සැතපී හිඳ යන්නෙමු, යි සිතා නිදන කල්හි අරුණ නැගුනේ ද තමන්ගේ කැමැත්තෙන් ග්‍රාමාන්තසෙනාසනයෙහි දී අරුණ නංවත් ද, යන දෙ තැන්හි ම ධූතඞ්ගය බිඳේ.

ආරඤ්ඤකො භික්ඛු අරඤ්ඤසඤ්ඤං මනසිකරොන්තො භබ්බො අලඩං වා සමාධිං පටිලද්ධුං, ලඩං වා රක්ඛිතුං=ආරණ්‍යකාඞ්ගධර භික්ෂු තෙමේ අරණ්‍යසංඥාව මෙනෙහි කරන්නේ නො ලත් සමාධිය බලන්නට ලැබූ සමාධිය රකින්නට සුදුසු වේ.

සත්ථාපිස්ස අත්තමනො හොති = ශාස්තෘන් වහන්සේ ද මොහුට තුටු වෙති. මෙන්න බුදුරජුන් ඒ වදාළ සැටි:- **'තෙනාහං නාගිතස්ස භික්ඛුනො අත්තමනො හොමි අරඤ්ඤවිහාරෙන්'** යනු. 'මම ඒ වනවාසය හෙතු කොට නාගිතභික්ෂුහට සතුටු වෙමි' යනු එහි සිංහල ය.

පන්තසෙනාසනවාසිනො චස්ස අසප්පායරූපාදයො විත්තං න වික්ඛිපන්ති = වනසෙනසුන්හි වසන මේ මහණහුගේ සිත නො සැප වූ රූපාදී අරමුණු වික්ෂේපයට නො පමුණුවති.

විගතසන්තාසො හොති = පහ වූ තැතිගැණීම් ඇත්තේ වේ.

ජීවිතනික්කන්තිං ජහාති = ජීවිතාශාව දුරු කරයි.

විවෙකසුඛරසං අස්සාදෙති = විවෙකසුඛරසය වළඳයි.

පංසුකූලාදිභාවො චස්ස පතිරූපො හොති = මේ මහණහුට පංසුකූලිකාදී සෙසු ධූතඞ්ගපූරණය ද සුදුසු වේ යනු, එහි අනුසස් ය.

'පවිවිත්තො අසංසඨො පන්තසෙනාසනෙ රතො,
ආරාධයන්තො නාථස්ස වනවාසෙන මානසං.

එකො අරඤ්ඤෙ නිවසං යං සුඛං ලභතෙ යති,
රසං තස්ස න විඤ්ඤන්ති අපි දෙවා සඉන්දකා.

පංසුකූලං ච එසොව කවචං විය ධාරයං,
අරඤ්ඤසඞ්ගාමගතො අවසෙසධූතායුධො.

සමත්ථො න චිරස්සෙව ඡෙතුං මාරං සවාහිනිං,
තස්මා අරඤ්ඤවාසම්හි රතිං කයිරාථ පණ්ඩිතො.'

කායවිවෙකයෙන් විවෙකී වූ, කිසිවකු හා හැනීමක් නැති, වන-සෙනසුන්හි ඇලුනා වූ වනයෙහි විසීමෙන් බුදුරජුන්ගේ සිත සතුටු කරන්නා වූ-

එකලා වූ යති තෙමේ වනයෙහි වසන්නේ යම් සැපයක් ලබා ද ඒ සුඛරසය ශක්‍රදෙවෙන්ද්‍රයා සහිත වූ දෙවියෝත් නො ලබති.

මෙතෙමේ පංසුකූලචීවරය කවචයක් මෙන් දරන්නේ අවශිෂ්ට ධූතාඞ්ගධර්ම නැමැති ආයුධ ඇත්තේ වනයෙහි කෙලෙස් යුදට ගියේ-

නො බෝ කලකින් ම සෙනාසහිත වූ මරු දිනන්නට සමර්ථ වේ. එහෙයින් නුවණැත්තේ වනවාසයෙහි ඇලුම් කරන්නේ ය.

'රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං, තං සීලමස්සාති = රුක්ඛමූලිකො, රුක්ඛමූලිකස්ස අඞ්ගං = රුක්ඛමූලිකඞ්ගං' රුක්මූල විසීම රුක්ඛමූල නම්. ඒ රුක්මූල විසීම ස්වභාවය කොට ගත්තේ රුක්ඛමූලික නම්. රුක්ඛමූලික වීමට හෙතු වූ සමාදාන චෙතනාව රුක්ඛමූලිකඞ්ග නම්.

රුක්ඛමූලිකඞ්ගය සමාදන් වන මහණහුට **'ජනනං පටික්ඛිපාමි රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි'** යන මේ වචන දෙකින් එකකින් සමාදන්වීම ප්‍රමාණවත් වේ. මේ සමාදන් වුවහු විසින් රාජ්‍ය සීමාවෙහි සිටි රුක, දෙවියන් වෙසෙති යි මිනිසුන් පුද දෙන රුක, ලහටු ගන්නා රුක, පල ගන්නා රුක, වවුලන් ලගින රුක, සිදුරු ඇති රුක, වෙහෙර මැද සිටි රුක, යන මේ රුක් හැර වෙහෙර කෙළවර සිටි රුකෙක් ගත යුතු ය.

ප්‍රභෙද විසින් මොවුහු උක්කට්ඨ-මජ්ඣිම-මුදුක යි තිදෙනෙකි. එහි උත්කෘෂ්ටයාහට තමන් කැමැති රුකක් ගෙණ පිළිදැගුම් කරන්නට ඉඩ නැත්තේ ය. ඔහු විසින් එකෙණෙහි ම පැමිණි රුක්මුල ඇති වියලී වැටුනු පරඬල් ආදිය පයින් ඇත් මෑත් කොට එහි විසිය යුතු ය. මෙහි ලා මධ්‍යමයාහට එහි පැමිණියවුන් ලවා රුක්මුල පිළිදැගුම් කර වන්නට ඉඩ ඇත්තේ ය. මෘදුකයාහට තමන් කැමැති සේ ආරාමිකසාමණෙරාදීන් ගෙණ ගොස් උන් ලවා සැස පිරිසිදු කරවා වැලි විසුරුවා සම කරවා පවුරු පිරිකෙව් කරවා දොරකුත් යොදා වසන්නට හැකි ය. පැමිණි මිනිසුන් එහි පුද පෙරහර කරතොත් එහි නො රැඳී ධුතඞ්ගධරභාවය නො හඟවා පිළිසන් තැනකට ගොස් හිඳිය යුතු ය. බුඩොපස්ථාන-ආචාර්‍යොපස්ථාන-ධර්මදෙශනා-ධර්මශ්‍රවණා දිය පිණිස මුත් අන් කරුණක් නිසා මේ තිදෙන අන් සෙවණැති ගෘහාදියෙක විසූ කෙණෙහි ම ධුතඞ්ග බිඳෙන්නේ ය. මෙහි ලා අඞ්ගුත්තරභාණකයෝ බණ අසන්නට සෙවෙණතුළට වන් ධුතඞ්ගධරයා බණ අවසන් වූ පසු මෙහි මඳක් වසමි, යි සිතා සිටි කල්හි අරුණ නැගී ගියේ නම්, ධුතඞ්ග බිඳී යේ යි කියත්.

රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජාති වචනතො නිස්ස යානුරූපපටිපත්ති සබ්භාවො = තාගේ පැවිද්ද රුක්මූලසෙනසුන නිසා පවත්නේ ය, යි වදාළ බැවින් නිසට සුදුසු පිළිවෙත් ඇතිබව.

අප්පානි චෙව සුලභානි ච තානි ච අනවජ්ජානීති භගවතා සංවණ්ණිතපච්චයතා = මදය, සුලබය, නිවරදය යි බුදුරජුන් විසින් වැණූ සිවුපසය ඇතිබව.

අභිණ්හං තරුපණ්ණවිකාරදස්සනෙන අනිච්චසඤ්ඤා සමුට්ඨාපනතා-නිතර රුක් කොළ වෙනස්වීම දැක්මෙන් අනිත්‍ය සංඥාව උපදවන බව.

සෙනාසනමච්ඡෙර කම්මාරාමතානං අභාවො = ආවාසයෙහි මසුරු බව හා නවකම්හි ඇලුම් නැති බව යන මේ එහි අනුසස් ය.

'වණ්ණිතො බුඩසෙට්ඨෙන නිස්සයොති ච භාසිතො,
නිවාසො පවිවිත්තස්ස රුක්ඛමූලසමො කුතො.

ආවාසමච්ඡෙරහරෙ දෙවතාපරිපාලිතෙ,
පවිවිත්තො වසන්තො හි රුක්ඛමූලම්හි සුබ්බතො.

අභිරත්තීති නීලානි පණ්ඩුනි පතිතානි ච,
පස්සන්තො තරුපණ්ණානි නිච්චසඤ්ඤං පනූදති.

තස්මා හි බුඩ්දායජ්ජං භාවනාභිරතාලයං,
විවිත්තං නාතිමඤ්ඤෙය්‍ය රුක්ඛමූලං විචක්ඛණො.'

බුදුරජුන් විසින් යම් රුක්මුල්සෙනසුනෙක් නිඃශ්‍රයට සුදුසු, යි වැණුයේ ද, එහෙයින් විවෙකය කැමැත්තහුට රුක්මුල සමාන වූ සෙනසුනෙක් කොයින් වේ ද.

ආවාස මසුරුකම දුරු කරන්නා වූ දෙවියන් විසින් රක්නාලද විවෙකයෙන් යුත් රුක්මුල්සෙනසුනෙහි වසන මනා ව්‍රත ඇති මහණ තෙමේ.

ගස්වලින් වැටුනු ඉතා රතු වූ ද මදනිල් වූ ද පඬුවන් වූ ද කොළ දකිමින් සංස්කාරධර්මයන් පිළිබඳ ව පවත්නා නිත්‍යසංඥාව දුරු කරන්නේ ය.

එහෙයින් විචක්ෂණශ්‍රමණ තෙමේ බුදුරජුන්ගේ දායාදය වූ භාවනාවෙහි ඇලුනවුන්ට ගෙයක් බඳු වූ විවෙකයෙන් යුත් රුක් මුල් සෙනසුන නො ඉක්ම වන්නේ ය.

'අබ්භොකාසෙ නිවාසො = අබ්භොකාසො, අබ්භොකාසො සීලමස්සාති = අබ්භොකාසිකො, තස්ස අඩ්ගං = අබ්භොකාසිකඩ්ගං' එලිමහන් තැන විසීම ස්වභාවය කොට ගත්තේ අබ්භොකාසික නම්. එලිමහන් තැන විසීමට කරුණු වූ සමාදාන චෙතනාව **අබ්භොකාසිකඩ්ග** නම්.

අබ්භොකාසිකඩ්ගය සමාදන් වන මහණහු විසින් **'ජනතඤ්ච රුක්ඛමූලඤ්ච පටික්ඛිපාමි, අබ්භොකාසිකඩ්ගං සමාදියාමි'** යන මෙදෙකින් එක්තරා එකකින් ඒ සමාදන් විය යුතු ය. මෙ තැන්හි වනාහි වෘක්ෂමූලය මුත් වෘක්ෂමූලිකාඩ්ගය ප්‍රතික්ෂෙප නො කරමි යි, කී බැවින් වෘක්ෂමූලිකාඩ්ගය ද නො බිඳෙන්නේ ය. අබ්භොකාසිකඩ්ගය සමාදන් වූවහුට බණ අසනු පිණිස බණ දෙසනු පිණිස, පොහෝ පවුරුණු කරණු පිණිස, උපොසථා ගාරාදියට ඇතුල් විය හැකි ය. එහෙත් ඒ බණ ඇසීම් ආදිය අවසන් වූ පසු අබ්භොකාසයට ම යා යුතු ය. උපොසථා ගාරාදියට ඇතුල් වූ පසු වැසි වසින්නට පටන් ගත්තේ නම්, බැහැර නො ගොස් සිට වැසි නැවතුනු කල්හි නික්ම යා යුතු ය. බොජුන්හලට ගිනිහලට පිවිස වත් පිළිවෙත් කරන්නට බොජුන්හලෙහි ස්ථවිරභික්ෂූන් බතින් විචාරන්නට අනුනට වණපොත් කරවන්නට, තමන් වණපොත් කරවා ගන්නට සෙවණින් යුත් ගෙවලට පිවිසිය හැකි ය. ගෙයින් පිටත අතැන මෙතැන දැමූ සඟසතු ඇඳපුටු ආදිය ඇතුළෙහි තබන්නට ගෙට ඇතුල්වීමෙහි ද වරද නැත. මහල්ලන්ගේ හා යහළු මහණුන්ගේ

පා සිවුරු ආදී පිරිකර ගෙණ මග යන කල්හි වැසි වැස්සේ නම්, ඒ නොතෙමෙනු පිණිස, මාවත පිහිටි ශාලාවකට ඇතුල්වීමට ද ඉඩ ඇත්තේ ය. එහෙත් කිසිත් පිරිකරක් නොගෙණ ශාලාවෙහි සිටිමි, යි සිතා වෙහසෙන් යෑම නොසුදුසු ය. සවහාව හමනින් ගොස් වැසි නවතින තුරු ශාලාවෙහි නැවතී සිට යනු හැකි ය. මේ මෙහි පිළිපදින සැටි යි.

ප්‍රභෙද විසින් උක්කණ්ඨ-මජ්ඣිම-මුදුක යි මොවුහු තිදෙනෙකි. එහි උත්තකෘෂ්ටයාහට ගසක් වත් කන්දක් වත් ගෙයක් වත් ඇසුරු කොට සිටිය නොහැකි ය. ඔහු එලිමහනෙහි ම සිවුරුවලින් කිළියක් කොට විසිය යුතු ය. මධ්‍යමයාහට ගසක් කන්දක් ගෙයක් ඇසුරු කොට ඇතුළට නොවැද ඉරමුදුන් වේලෙහි ගස් කඳුවල සෙවණැල්ල වැටෙන පමණ තැනට ද, ගෙයි පරාල කොන්වල දිය වැටෙන පමණ තැනට ද ඇතුල් නොවී විසිය හැකි ය. මෘදුකයාහට වැසිදිය ඇතිවිට මතුපිට සෙවෙණි නොකළ ගල්ලෙනට කොළ අතු තුනී කොට සෙවෙණි කළ කොළමඩුවට ඉවිරෙදි කුඩාරමට කුඹුරු රකින්නන් විසින් හැර දමූ එහි පිහිටි පැලට ඇතුල්වීමට අවසර ඇත්තේ ය. විසිම පිණිස සෙවණකට, රුක්මූලකට, පිවිසි කල්හි මේ තිදෙනාගේ ම ධුතඞග බිඳෙන්නේ ය. දැන දැන එහි හුන්නහු අරුණ නැගූ කල්හි ධුතඞග බිඳෙන්නේ, යි අඞ්ගුත්තරභාණකයෝ කියත්.

ආවාසපළිබෝධුපච්ඡේදෑ = ආවාසපලිබෝධ සිඳලන බව.

ථීනමිද්ධපනූදනං = ථිනමිද්ධ දෙදෙනා දුරු කිරීම.

මඝකා විය අසඞ්ගචාරිනෝ අනිකේතා විහරන්ති භික්ඛවෝති= ගේ නැති මහණෝ මෘගයන් සේ ඇල්මක් නැති ව හැසිරෙන්නාහු වෙසෙත් ය යන ලොකයාගේ පැසසීමට සුදුසු බව.

නිස්සඞගතා = ආවාස පිළිගැන්මක් නැති බැවින් එහි ඇලුම් රහිත බව.

චාතුද්දිසතා = සතර දිගට සුදුසු බව.

අපච්චත්තාදීනං අනුලොමවුත්තිතා = අපිස්බව් ආදීන්ට අනුලොම් පැවැතුම් ඇතිබව යන මේ එහි අනුසස් ය.

> 'අනගාරියභාවස්ස අනුරූපෙ අදුල්ලභෙ,
> තාරාමණීචිතානමහි චන්දදීපපභාසිතෙ.
>
> අබ්භොකාසෙ වසං භික්ඛු මිගභූතෙන චෙතසා,
> ථිනමිද්ධං විනොදෙත්වා භාවනාරාමතං සිතො.

පවිවෙකරසස්සාදං න චිරස්සෙව වින්දති.,
යස්මා තස්මා හි සප්පඤ්ඤෝ අබ්හොකාසෙ රතො සියා.'

පැවිද්දට සුදුසු වූ සියලු තැන දී ම ලැබිය හැකි බැවින් දුර්ලභ නො වූ තාරකා නැමැති මැණික්බුබුලුවලින් සැරසුනු අහස් නැමැති වියන් ඇති චන්ද්‍රාලොක නැමැති පහන් එලියෙන් හෙබියා වූ –

එලිමහන් තැන, කිසි තැනෙක ඇලුම් නැති බැවින් මුවන්ට බඳු සිතින් යුක්ත ව වසන්නා වූ මහණ තෙමේ ඊනමිඩය දුරු කොට භාවනාවන්හි ඇලීම් ඇසුරු කෙළේ ය.

යම් හෙයකින් විවෙකරසාස්වාදය නො බෝ කලකින් ම විඳ ගණී ද, එහෙයින් නුවණැත්තේ එලිමහන් තැන ඇලුනේ වන්නේ ය.

සොසානිකඞ්ගය ද **'න සුසානං පටික්කිපාමි, සොසානිකඞ්ගං සමාදියාමි'** යන මෙයින් එක්තරා එකකින් සමාදන් විය යුතු ය. සොසානිකඞ්ගය සමාදන් වූවහු විසින් මිනිස්සු ගමක් පිහිටුවා 'මෙතැන සොහොනැ' යි සම්මත කොට ගණිත් ද, එහි නො විසිය යුතු ය. යම් තැනෙක මළසිරුරු නො දවන ලද්දේ නම් එ තැන සොහොනැ යි නො ගැණේ. මළසිරුරු දැවූ තැන සිට නැවැත අවුරුදු දෙළසක් තරම් කල්, එහි මළසිරුරු නො දවා හරින ලද නමුත් එ තැන සොහොනැ යි ගණිත්. එහි වසන්නහු විසින් සක්මන් මඩු ආදිය කරවා ඇඳපුටු පනවා පැන් හා පරිභොග ජලය එළවා බණ කියන්නෙකු ව නො විසිය යුතු ය. මේ ධුතඞ්ගය ඉතාබර ය. ඒ නිසා අතරමග දී උපන් උවදුරු නසනු පිණිස සඞ්ඝ-ස්ථවිරයන්ට හෝ රාජ්‍යනිලධරයකුට හෝ දන්වා සිහිනුවණින් යෙදී විසිය යුතු ය. සක්මන් කරණ විට ඇස්කෙළවරින් සොහොන දෙස බල බලා සක්මන් කළ යුතු ය. සොහොනට යන විටත් මහ මගින් නො ගොස් කුඩාමගකින් යා යුතු ය. තමන් යන සොහොනෙහි ඇති තුඹස් ගල් මුල් රුක් ආදී අරමුණු දවාලෙහි ගොස්, තිබෙන තැන් හොඳට දැන ගත යුතු ය. එසේ දැන ගත් කල්හි ඒ අරමුණු රාත්‍රියෙහි භයට කරුණු නො වේ. සොහොනෙහි අමනුෂ්‍යයන් කෑ ගසන විටද ඔවුන්ට කිසිවකින් නො ගැසිය යුතුය. එක් දවසකුත් සොහොනට නො ගොස් නො සිටිය යුතුය. මැදුම්යම සොහොනෙහි ගෙවා පැසුළුයම හැරී ඒම වරද නැතැයි අඞ්ගුත්තරභාණකයන්ගේ පිළිගැණීම ය. සොහොනට යන්නහු විසින් අමනුෂ්‍යයන්ට ප්‍රිය වූ තලපිටි තලමුරුවට උඳුබත් මස් කිරි තෙල් සකුරු ආදී කන බොන දේ නො කෑ යුතුය. සොහොන් දුමින් සිරුර දුගඳ ව අපිරිසිදු ව ඇති බැවින් කුලගෙට නො වැදිය යුතුය. මේ මෙහි පිළිපදින සැටියි.

ප්‍රභෙද විසින් මොවුහු උක්කට්ඨ - මජ්ඣිම - මුදුක යි තිදෙනෙකි. එහි යමෙක් යම් තැනෙක නිතර මිනී දැවීම් මිනීකුණු ඇද බැඳීම් හැඩීම් පවත්නේ නම්, ඒ තැන වසන්නේ උක්කට්ඨ තෙමේ ය. උක්කට්ඨයා විසින් එබඳු තැනෙක ම විසිය යුතු ය. මේ කියූ මිනීකුණු දැවීම් ආදී තුනෙන් යටත් පිරිසෙයින් එකකුත් ඇති තැන වසන්නේ මධ්‍යම තෙමේ ය. කියූ ලෙසින් සොහොනය යි සම්මත කළ, සොහොන් ලකුණු පමණක් ඇති තැන වසන්නේ මෘදුක තෙමේ ය. සොහොන් ලකුණුවලින් තොර වූ තැන විසීමෙන් මේ තිදෙනාගේ ම ධුතඞ්ග බිඳෙන්නේ ය. අඞ්ගුත්තරභාණකයෝ කියන්නෝ දහවල් නමුත් සොහොනට නො ගිය දවසෙහි ධුතඞ්ග බිඳෙන බව ය.

මරණසතිපටිලාභෝ = මරණානුස්මෘතිය ලැබීම.

අප්පමාදවිහාරිතා = මරණසතිය ලැබීමෙන් මහණදම්හි නොපමා බව.

අසුභනිමිත්තාධිගමෝ = මළසිරුරු දැකීමෙන් අසුභනිමිති ලැබීම.

කාමරාගවිනෝදනං = අශුභලක්ෂණ වැටහීමෙන් කාමරාගය දුරුවීම.

අභිණ්හං කායසභාවදස්සනං = නිරුතුරු සිරුරෙහි පිළිකුල්බව හා දුගඳ බව සැලකීමෙන් ශරීරස්වභාවය දැක්ම.

සංවෙගබහුලතා = කායස්වභාව දැක්මෙන් හා මරණසතිය ලැබීමෙන් සංවේගබහුලබව.

ආරොග්‍යමදදිප්පහාණං = ආරෝග්‍යමද - යෞවනමද - ජීවිතමද දුරුවීම.

භයභෙරවසහනතා = කුදු මහත් බිය හා බිය එළවන අරමුණු ඉවසන බව.

අමනුස්සානං ගරුභාවනියතා = අමනුෂ්‍යයන්ගේ ගෞරවයට තැන්බව.

අපිච්ඡතාදීනං අනුලොමවුත්තිතා = අපිස්බව් ආදීන්ට අනුලෝම් වූ පැවැතුම් ඇතිබව යන මේ එහි අනුසස්ය.

'සොසානිකඤ්ගි මරණානුසතිප්පභාවා
නිද්දාගතම්පි න ඵුසන්ති පමාදදොසා
සම්පස්සතො ච කුණපානි බහූනි තස්ස
කාමානුරාගවසගම්පි න හොති චිත්තං.

සංවෙගමෙති විපුලං න මදං උපෙති
සම්මා අථො ඝටති නිබ්බුතිමෙසමානො,
සොසානිකඞ්ගමිති නෙකගුණාවහන්තා
නිබ්බාණනින්නහදයෙන නිසෙවිතබ්බන්ති'

මරණසතිභාවනානුභාවයෙන් සිහිනෙනුත් ප්‍රමාදදොෂයෝ සොසානිකඞ්ගධරභික්ෂු සපර්ශ නො කෙරෙත්. බොහෝ කුණපයන් දන්නා වූ ඔහුගේ සිත ද කාමරාගයට වසඟ නො වන්නේ ය.

මහත් වූ සංවෙගයට පැමිණේ. ආරොග්‍යමදාදී මදයට ද නො පැමිණේ. එසේ නො පැමිණ නිර්වාණධර්මය සොයමින් ව්‍යායාම කෙරේ. මෙසේ නොයෙක් ගුණ එළවන බැවින් සොසානිකඞ්ගය නිවන් කෙරෙහි නැමුනු සිතැති යොගාවචරයා විසින් සෙවිය යුතු ය.

යථාසන්ථතිකඞ්ගය ද **'සෙනාසනලොලුප්පං පටික්ඛපාමි, යථාසන්ථතිකඞ්ගං සමාදියාමි,** යන මේ දෙකෙන් හෝ එකෙකින් හෝ සමාදන් විය යුතු ය. මෙය සමාදන් වූ මහණහු විසින් යම් සෙනසුනක් මේ ඔබට වන්නේ යැ යි සෙනසුනගන්වන්නහු විසින් භාර කරණු ලැබේ ද, ඒ සෙනසුනෙන් ම සතුටු විය යුතු ය. මේක හොඳය, මේක නරකය, යි කියමින් අනෙකෙක් සෙනසුනෙන් නො නැගිට විය යුතු ය. මේ මෙහි පිළිපදින සැටි යි.

ප්‍රභෙද විසින් මොවුහු උක්කඨ - මජ්ඣිම - මුදුක යි තිදෙනෙකි එහි උත්කෘෂ්ඨ තෙමේ තමන්ට ලැබුනු පැවැරුනු සෙනසුන දුර පිහිටි වෙහෙරෙක්හි ද, අසල සිටි වෙහෙරෙක්හි ද, අමනුෂ්‍ය සර්පාදීන් නිසා උවදුරු සහිත ද, උෂ්ණ ද, සීත දැ යි නො විචාරන්නේ ය. මද්ධ්‍යාමයාහට ඒ ගැණ විචාරනු හැකි ය. එහෙත් එහි ගොස් ඒ බලනු නො හැකිය. මෘදුකයාහට එහි ගොස් බලා ඒ සෙනසුන සිත් නො ගන්නේ නම්, අනිකක් ගත හැකි ය. මේ තිදෙනා අතුරෙහි කාහට වුවත් සෙනසුන් පිළිබඳ ලොල්බව උපන් ඇසිල්ලෙහි ධූතඞ්ග බිඳෙන්නේ ය.

යං ලඩං තෙන තුට්ඨබ්බං වුත්තොවාදකරණං = යමක් ලදේදේ නම් එයින් සතුටු විය යුතු ය යි බුදුරජුන් විසින් වදාළ අවවාදය පිළිපදින බව.

සබ්‍රහ්මචාරීනං හිතෙසිතා – නැගිට විය යුතු බාල භික්ෂූන් පවා නො නැගිටු වන බැවින් සබ්‍රම්සරුන්ට හිත පසස්නා බව.

හීනප්පණ්ණිතවිකප්පපරිච්චාගො = හීනප්‍රණීතභෙදය නො සලකා හැරීම. තාදී ගුණයට අනුකූල වීම.

අනුරොධ විරොධප්පහාණං = රාග වෙෂ දුරු කිරීම.

අත්‍රිච්ඡතාය චාරපිදහනං = අත්‍රිච්ඡතා නම් ආශාවට වැද්ද නො දීම.

අප්පිච්ඡතාදීනං අනුලොමවුත්තිතා = අපිස්බව් ආදීන්ට අනුලොම් පැවතුම් ඇති බව යන මේ එහි අනුසස් ය.

> 'යං ලඞ්ඛං තෙන සන්තුඨො යථාසන්ථතිකො යති,
> නිබ්බිකප්පො සුඛං සෙති තිණසන්ථරකෙසුපි.
>
> න සො රජ්ජති සෙඨම්හි හීනං ලඞ්ඛා න කුප්පති,
> සබ්‍රහ්මචාරීනවකෙ හිතෙන අනුකම්පති.
>
> තස්මා අරියසතාවිණ්ණං මුනිපුඞ්ගවවණ්ණිතං,
> අනුයුඤ්ජථ මෙධාවී යථාසන්ථතරාමතන්ති.'

යම් සෙනසුනක් ලද්දේ නම්, එයින් සතුටු වූ යථාසන්ථතිකඞ්ගධරයති තෙමේ, යහපත් ය, අයහපත් ය, යන විතර්ක රහිත ව තණකොළ ඇතිරියෙහි ද සුවසේ හෝනේ ය.

මේ මහණ තෙමේ යහපත් සෙනසුනෙහි ද නො ඇලේ. අයහපත් සෙනසුන් ලද ද නො කිපේ. බාලභික්ෂූන් පවා සෙනසුනෙන් නො නැගිටු වන බැවින් සම්රම්සරුන්ට හිත වැඩ එළවන්නේ ය.

නුවණැති මහණ තෙමේ එහෙයින් නොයෙක් සිය ගණන් ආර්‍යයන් විසින් පුරුදු කරණ ලද බුදුරජුන් විසින් වැණූ යථාසන්ථතිකඞ්ගයෙහි යෙදෙන්නේ ය.

නෙසජ්ජිකඞ්ගය ද **'සෙය්‍යං පටික්ඛිපාමි, නෙසජ්ජිකඞ්ගං සමාදියාමි'** යන මෙ දෙකින් එකකින් වත් සමාදන් විය යුතු ය. නෙසජ්ජිකඞ්ගධරයා විසින් රැයෙහි තුන් යමින් එක් යමක් නැගිට සක්මන් කටයුතු ය. ඉදීම-සිටීම-සක්මන-නිදීම, යන ඉරියවු සතරින් නිදීම ම මොහුට නො සුදුසු ය. මේ මෙහි පිළිපදින සැටිය.

ප්‍රභෙද විසින් උක්කඨ-මජ්ඣිම-මුදුක යි මොවුහු තිදෙනෙකි. එහි උක්තෘෂ්ටයාහට හේත්තුවන ලෑලිකඩ, සිවුරු අකවටුව, එල්ලී සිටින ලෑලිකඩ යන මේ පරිභොගය ද නො වටනේ ය. මඛ්‍යමයාහට මෙ තුනෙන් එකක් පරිභොග කළ හැකි ය. මෘදුකයාහට හේත්තුවන ලෑලිකඩ, සිවුරුඅකවටුව, එල්ලී සිටින ලෑලිකඩ, කොට්ටය, පඤ්චඞ්ගය, සත්තඞ්ගය යන පස පරිභොග කිරීම නො සුදුසු නො වේ. එහි පඤ්චඞ්ග නම්, පිටාටුව පා සතර යන මේ පස් අඟින් යුත් දඬුමැසි පුටුව ය. සත්තඞ්ග නම් පිටාටුව දෙ පස හේත්තුපුවරුකඩ හා පා සතර යන සත් අඟින් යුත් දඬුමැසි පුටුව ය. ඒ සත්තඞ්ග නම් දඬුමැසි පුටුව පීළාභය සථවිරයන් වහන්සේ පරිභොග කළහ. උන්වහන්සේ එහි හිඳ නෙසජ්ජිකඞ්ගය පුරා කල් නො යවා ම අනාගාමීඵලයට පැමිණ පිරිනිවන් පෑ සේක. සයනයට වැටුනු විට මේ තිදෙනාගේ ම ධුතඞ්ග බිඳෙන්නේ ය.

'සෙය්‍යසුඛං පස්සසුඛං මිඩසුඛං අනුයුත්තො විහරතීති වුත්තස්ස චෙතසො විනිබන්ධස්ස උපච්ඡෙදනං, නිදීමෙන් ලැබෙන සුවය, ඇලයෙන් ඇලයට පෙරැළි පෙරැළී නිදීමෙන් ලැබෙන සුවය, පසිඳුරන් හැකිළීමෙන් ලැබෙන නිදිසුවය, යන මෙහි යෙදී වසන්නේ ය, යි කියන ලද චිත්තවිනිබන්ධය සිඳ හැරීම.

සබ්බකම්මඨානානුයොගසප්පායතා = සියලු කමටහන්හි යෙදී මෙහි සැප බව.

පාසාදිකඉරියාපථතා = පැහැදීම එළවන ඉරියවු ඇති බව.

විරියාරම්භානුකූලතා = වීර්‍යාරම්භයට අනුකූල බව.

සම්මාපටිපත්තියා අනුබ්‍රෑහණං = යහපත් පිළිවෙත් වඩනා බව යන මේ එහි අනුසස් ය.

'ආභුජිත්වාන පල්ලඞ්කං පණිධාය උජුං තනුං,
නිසීදන්තො විකම්පෙති මාරස්ස හදයං යති.

සෙය්‍යසුඛං මිඩසුඛං හිත්වා ආරඞ්වීරියො,
නිසජ්ජාභිරතො හික්ඛු සොභයන්තො තපොවනං.

නිරාමිසං පීතිසුඛං යස්මා සමධිගච්ඡති,
තස්මා සමනුයුඤ්ජෙය්‍ය ධීරො නෙසජ්ජිකං වතං.,

පළක් බැඳ සිරුර කෙලින් තබා හිඳින්නා වූ මහණ තෙමේ මාරයාගේ හෘදය කම්පිත කෙරේ.

නිදීමෙහි ඇලුනු මහණ තෙමේ සයනසුඛ, නිද්‍රාසුඛයන් හැර වැඩූ වීර්‍යය ඇති ව තපොවනය හොබවමින්-

යම් හෙයකින් පස්කම් සැපයෙන් වෙන් වූ ප්‍රීතිසැපයට පැමිණේ ද, එහෙයින් නුවණැති මහණ තෙමේ නෛෂ්ක්‍රම්‍යකඬගයෙහි මනා කොට යෙදෙන්නේ ය.

සියලු ම ධුතාඬග ශෛක්ෂ්‍ය - පෘථග්ජන - ක්ෂීණාස්‍රවයන්ගේ වසයෙන් කුසල් ද අව්‍යාකෘත ද වේ. අකුශලධුතාඬගයෙක් නැත්තේ ය. මේ ශාසනයෙහි ලාමක අදහස් ඇති තෘෂ්ණාවෙන් මැඩුනු ඇතැම් මහණෙක් ආරණ්‍යක වේ, යි වදුල බැවින් ඒ පාපභික්ෂූන්ගේ අකුශල චෙතනාවෙන් ද ධුතඬග සෙවනය වන බැවින් අකුශලධුතාඬගයෙක් ද ඇතැ, යි යමෙක් කියන්නේ නම්, ඔහුට කිය යුත්තේ අරණ්‍යගත වූ ඒ පාපභික්ෂුහට වනයෙහි විසීම මුත් ආරණ්‍යකධුතාඬගයක් නැති බව ය.

මොවුහු ඒ ඒ අඬගසමාදානයෙන් කම්පාකරණ ලද කෙලෙස් ඇති බැවින් ධුත යි නම් ලැබූ මහණහුගේ අඬගනු යි හෝ, කෙලෙස් කම්පා කළ අරුතෙන් ධුත යි කියන ප්‍රඥ්ඥව මෝ හට අඬග වූයේ නු යි හෝ ධුතඬග නම් වෙති. තම තමන්ට විරුඬ වූ ධර්‍ම නසන අරුතෙන් ධුත නම් වූ ද ප්‍රතිපත්තියට කාරණ බැවින් අඬග නම් වූ ද ධර්‍මයෝ ධුතඬග නම් වෙති යි ද කියත් අකුශලයෙන් කෙලෙස් කම්පිත නො වන බැවින් පව්වු මහණහුගේ චෙතනාදීහු ධුත නම් නො වෙති.

මෙහිලා - **ධුත** - **ධුතවාද** - **ධුතධම්ම** - **ධුතඬග** - **ධුතඬග කවරක් හට ඝිත** ද යන කරුණු ද දත යුතු ය. එහි **ධුත** නම්, නැසූ කෙලෙස් ඇති පුද්ගල තෙමේ හෝ කෙලෙස් නසන ධර්‍ම යි. ධුත වාද යන්නේහි ලා **ධුත - න ධුතවාද, න ධුත - ධුතවාද, නෙව ධුත - න ධුතවාද, ධුත - ධුතවාද** යි මේ කියන සිවු දෙන දත යුතු ය. එහි යමෙක් ධුතඬග කරණ කොට තමන්ගේ සන්තානයෙහි බොහෝ කලක සිට නොයෙක් ලෙසින් පැවැත ආ කෙලෙස් නසා, අන්හු ධුතඬගයෙන් අවවාද අනුශාසනා නො කෙරේ ද, හේය ධුත-න ධුතවාද වූයේ. **බඞ්කුලසථවිරයන්** වහන්සේ වැනි ය හේ. යමෙක් තමන් පිළිබඳ කෙලෙස් නො නසා අනුනට ධුතඬගයෙන් අවවාද අනුශාසනා කෙරේ නම්, හේය **න** ධුත-ධුතවාද වූයේ. **උපනන්දසථවිරයන්** වහන්සේ වැනි ය හේ. යමෙක් තමන් කෙලෙස් නො නැසූ බැවින් අනුනටත් කෙලෙස් නසන්නට ධුතඬගයෙන් අවවාද අනුශාසනා නො කෙරේ ද, හේය නෙව ධුත - න ධුතවාද වූයේ. **ලාළුදායිසථවිරයන්** වහන්සේ වැනි ය හේ. යමෙක් තමන් පිළිබඳ කෙලෙස් නසා අනුනටත් ඒ පිණිස ධුතඬගයෙන් අවවාද අනුශාසනා කෙරේ ද, හේ ය ධුත - ධුතවාද වූයේ. **ශාරීපුත්‍රසථවිරයන්** වහන්සේ වැනි ය හේ.

ධුතධර්ම නම්, අපිස්බව - ලද දෙයින් සතුටුවීම - කෙලෙස් ලියන බව - ගණයා කෙරෙහි ඇලීමෙන් සිත වෙන්කිරීම - නුවණ යන මේ පස ය. මේ පස ධුතඞ්ගචෙතනාවට පරිවාරක වූයේ ය. එහෙයිනි ධුතධර්ම නම්. එහි අපිස්බව හා ලද දෙයින් සතුටුවීම අලොභයෙහි ද, කෙලෙස් ලියනබව, ගණයා කෙරෙහි ඇලීමෙන් සිත වෙන්කිරීම යන දෙක අලොභයෙහි හා අමොහයෙහි ද වැටේ. අලොභය කරණ කොට ඒ ඒ ධුතඞ්ගයෙන් බැහැර කළ යුතු ගෘහපතිදානචීවරාදිවස්තූන්හි ඇලීම ද, අමොහය කරණ කොට ඒ වස්තූන්හි දොස් වසාලන මොහය ද කම්පිත වේ. තව ද අලොභයෙන් බුදුරජුන් විසින් නො ඇලී පරිභොග කටයුතු ය යි අනුදැන වදාළ සැප පහසුකම් ඇති ඇඳ ඇතිරි ආදිය හෝ චීවරාදිප්‍රත්‍යය හෝ ප්‍රතිසෙවනයෙන් පවත්නා කාමසැපයෙහි නො යෙදෙන්නේ ය. අමොහයෙන් අතිසල්ලේඛප්‍රතිපත්තිමුඛ-යෙන් පවත්නා ආත්මක්ලමථුයෙහි යෙදීම කම්පිත වේ. එහෙයිනි මේ ධර්ම පස, ධුතධර්ම යි කියන ලද්දේ. ධුතඞ්ග යට කියන ලද ය.

රාගචරිතයාහට හා මොහචරිතයාට ධුතඞ්ග සත්ප්‍රාය වේ. ධුතඞ්ග සෙවනය දුක් වූ පිළිවෙතෙකි. කෙලෙස් ලියන ඉරියවු ද වේ. සැප පහස් ඇති දේ ඇසුරු කොට පවත්නා රාගය, දුක් වූ පිළිවෙතෙහි පිහිට නො ලබන බැවින් දුක් වූ පිළිවෙතින් ඒ සන්සිඳී යන්නේ ය. අප්‍රමත්තයාහට සල්ලේඛය නිසා මොහය පැහී යන්නේ ය. ආරණ්‍යකාඞ්ග - වෘක්ෂමූලිකාඞ්ග දෙක සෙවනය කිරීම වෙෂචරිතයාහට ද හිත වන්නේ ය. අරණ්‍ය - වෘක්ෂ මූලයන්හි නො ගැටී වසන්නහු ගේ වෙෂය සන්සිඳෙන්නේ ය.

මේ ධුතාඞ්ගයෝ ශීර්ෂාඞ්ග තුනෙක, අමිශ්‍රාඞ්ග පසෙකැ යි සැකෙවින් අට දෙනෙක් වෙති. එහි සපදානචාරිකඞ්ග - එකාස-නිකඞ්ග - අබ්භොකාසිකඞ්ග යන තිදෙන ශීර්ෂාඞ්ග නම් වෙත්. සපදානචාරිකඞ්ගය රක්නේ පිණ්ඩපාතිකඞ්ගය ද රක්නේ ය. එකාසනිකඞ්ගය රකින්නහුට පත්තපිණ්ඩිකඞ්ගය හා ඛලුපච්ඡා-භත්තිකඞ්ගය ද මැනැවින් රැකිය හැක්කේ ය. අබ්භොකාසිකඞ්ගය රකින්නහුට රුක්ඛමූලිකඞ්ග - යථාසන්තිකඞ්ගයන්හි රැකිය යුත්තෙක් නැත්තේ ය. මෙසේ මේ අඞ්ගයෝ තිදෙන උත්තමාර්ථ-යෙන් ශීර්ෂාඞ්ග නම් වූහ. ආරඤ්ඤිකඞ්ග-පංසුකූලිකඞ්ග-තෙචීවරි-කඞ්ග-නෙසජ්ජිකඞ්ග-සොසානිකඞ්ගයනපසඅමිශ්‍රාඞ්ග නම් වේ.

මේ ධුතාඞ්ග දෙකක්, චීවරප්‍රතිසංයුක්ත ය. පසක්, පිණ්ඩපාත ප්‍රතිසංයුක්ත ය. පසක්, සෙනාසනප්‍රතිසංයුක්ත ය. එකක්, වීර්‍ය්‍ය ප්‍රතිසංයුක්ත යි සතරකට බෙදිය හැකි ය. ප්‍රත්‍යය ඇසුරු කළ ධුතඞ්ග දොළොසෙක, වීර්‍ය්‍යය ඇසුරු කළ එකෙකැ, යි නිඃශ්‍රය වශයෙන් දෙකට බෙදේ.

ධුතඬග සෙවනය කරණ යමක්හට කමටහන් වැඩේ නම් ඔහු විසින් ධුතඬග සෙවනය කළ සුතු ය. යමක්හුගේ කමටහන් පිරිහේ නම්, ඔහුට ධුතඬග සෙවනය නොසුදුසු ය. ධුතඬග සෙවනය කරණ විට යමක්හුගේ කමටහන් වැඩේ නම්, අනාගත ජනයා කෙරෙහි අනුකම්පා පෙරදුරි ව ඔහු විසින් ඒ සෙවිය සුතු ය. ධුතඬග සෙවුනේත් නොසෙවුනේත් යමක්හුගේ කමටහන් වැඩේ නම්, ඔහු විසින් කළ යුත්තේ ඉදිරිය බලා ධුතඬග සෙවනය කිරීම ය.

විසාඛ විසින් භික්ෂූන්ට තෙළෙසෙකි. භික්ෂුණීන්ට අටෙකි. සාමණේරයනට දෙළොසෙකි. සික්ඛමානා-සාමණේරීන්ට සතෙකි. උපාසක - උපාසිකාවනට දෙකෙකැ, යි මේසේ දෙසාළිසකට බෙදේ.

එලිමහන් තැන්හි ආරණ්‍යකාඬගයෙන් යුත් සොහොනෙක් වේ නම්, එහි දී ශක්තිමත් භික්ෂූන්ට එක් වර ම සියලු ධුතඬග සමාදන් ව රැකිය හැකි ය. ආරඤ්ඤිකඬග - බලූපච්ඡාභත්තිකඬග දෙක භික්ෂුණීන්ට නීතියෙන් ම තහනම් කරණ ලද්දේ ය. අබ්භොකාසිකඬග - රුක්ඛමූලිකඬග - සොසානිකඬග යන තුන දුරීම සෙවනය කිරීම ඉතා අපහසු ය. කරදර සහිත ය. ධුතඬගයකින් බලාපොරොත්තු වන ඵලය මෙහෙණකට මෙයින් නොලැබිය හැකි ය. එහෙයින් පසක් හැර අටක් ඇලාට (මෙහෙණන්ට) රැකිය හැක්කේ ය. තෙචීවරිකඬගය සාමණේරයන්ට නොරැකිය හැකි ය. සික්ඛමානා - සාමණේරීන් විසින් රැකිය හැක්කේ සතෙකි. එකාසනිකඬගය හා පත්තපිණ්ඩිකඬගය, උපාසක - උපාසිකාවන්ට සුදුසු වේ.

ධුතගුණ රකින්නහුගේ හැසිරීම පිරිසිදු ය. පැහැදීමට කරුණු ය. ඔහු පිළිබඳ පූජාභාගප්‍රතිපදාව සම්පූර්ණ වන්නී ය. කායික - වාචසිකසමාචාරයෝ රැකෙති. වැඩෙති. මනඃසමාචාරය කානතිමත් ය. වීර්‍යය දැඩි වන්නේ ය. භය සන්සිඳෙන්නේ ය. සත්කායදෘෂ්ටිය ඇද හැලෙන්නී ය. ක්‍රෝධයට තැන් නැති වේ. මෛත්‍රිය වැඩේ. ආහාරය දන්නා ලද්දේ ය. සියල්ලන් විසින් ගෞරව කරණු ලබන්නේ ය. භෝජනයෙහි පමණ දන්නේ ය ඔහු. නිදී මැරීමෙහි යෙදුනේ ය. අනගාරික වේ. කාමැති තැන විසීමෙහි සමර්ථ වේ. පවට පිළිකුල් කරන්නේ ය. පවට බිය වන්නේ ය විවෙකයෙහි ඇලුනේය. අප්‍රමත්ත වේ.

ශ්‍රද්ධා ඇත්තේ, ලජ්ජා ඇත්තේ, ඛෙය්‍ය ඇත්තේ, කුහක නොවූයේ, ශාසනයට හිත වූයේ, කෑදර නොවූයේ, ශික්ෂා කැමැත්තේ. කිපිසිත් නැත්තේ, මෛත්‍රී විහරණ ඇත්තේ ධුතඬග රැකීමට සුදුස්සේ ය.

'පඨවිසමං මහාරාජ, ධුතගුණං විසුඩිකාමානං පතිට්ඨාන ට්ඨෙන, ආපොසමං මහාරාජ, ධුතගුණං විසුඩිකාමානං සබ්බ කිලෙසමලධොවනට්ඨෙන, තෙජොසමං මහාරාජ, ධුතගුණං විසුඩිකාමානං සබ්බකිලෙසවනජ්ඣාපනට්ඨෙන, වායොසමං මහාරාජ, ධුතගුණං විසුඩිකාමානං සබ්බකිලෙසමලරජො-පවාහනට්ඨෙන' යනු වදාළෝ **නාගසෙන**මහාස්ථවිරයන් වහන්-සේ ය. ධුතගුණ, නිවන් කැමැත්තවුනට පිහිටා සිටීමට කරුණු වන බැවින් පෘථිවිය සමාන ය. කෙලෙස් මල සෝදා හරින බැවින් ජලය වැනි ය. කෙලෙස්වනය දවන බැවින් මහගිනිකඳක් වැනි ය කෙලෙස් මල, සිත් තුළින් බැහැර කරණ බැවින් චණ්ඩමාරුතයක් වැනි ය, යනු එහි කෙටි තේරුම ය.

මහාමුහුද, නන් වැදූරුම් රත්නයන් ගේ හට ගැන්මට ස්ථාන වන්නා සේ ධුතඞ්ගයෝ නන් වැදූරුම් වූ සෝවන් ආදි උත්තම ගුණරත්නයනට උත්පත්තිස්ථාන වන බැවින් අපරිමිතගුණ ඇත්තාහ.

යමෙක් 'මම ධුතඞ්ග රකිමි' යි කියා නැති ගුණ පහළ කරන්නේ ලාමක අදහසින් යුක්ත ව සිවුපසය නො පිළිගන්නකු සේ දායකයනට හඟවා වංචනික ව සිවුපසය උපද වන්නේ කුහක කමින් යුක්ත වූයේ රුදුරු බඩ රැකුම නිසා ශාසනයෙහි රැඳී ලාභ කීර්ති ප්‍රශංසාවනට ගිජු වූයේ ධුතඞ්ග රක්ෂා කරන්නේ වේ ද, හේ ධුතාඞ්ගරක්ෂකයෙක් නො වේ. බුඩශ්‍රාවකයෙක් නො වේ. නියම මහණෙක් නො වේ. හේ සියලු ගුණ නසන්නේ ය. ලොකය අපා-යයට ඇද ලන්නේ ය. අපායයට මං සලසා ගන්නේ ය. මරණින් මතු අපායයෙහි හෙන්නේ ය. අවීචිමහානරකයෙහි අවුරුදු කෙළ ගණනක් උඩුකුරු යටිකරු වෙමින් නිරා ගින්නෙන් දැවී දැවී පැසෙන්නේ ය. එයින් චුත ව ප්‍රෙතලොකයෙහි උපදින්නේ රළු පරළු සිරුරු ඇති ව, හිස මතුයෙහි පිහිටි ඉදිකටුතුඩ පමණ කට ඇති ව, බිහිසුණු රූසටහන් ඇතිව, කැඩුනු බිඳුනු කන් සිදුරු ඇතිව පණුවන් ඇතුළට කා වැදී ගිය සිරුරු ඇති ව ඇතුළත ගිනි ගෙණ දිලිසෙන සිරුරු ඇති ව, ප්‍රෙතදුකින් හඬන වැලපෙන නිජ්ඣා-මතණ්ඩිකාදී ප්‍රෙතලොකයන්හි මහාශ්‍රමණප්‍රෙත ව උපදින්නේ ය. ඉපිද පොළොවසිසාරාහඬ හඬා ඇවිදින්නේ ය, **'යො ඛො මහා රාජ! පුගගලො පාපිච්ඡො ඉච්ඡාපක්තො කුහකො ලුද්දො ඔදරිකො ලාභකාමො යසකාමො කිත්තිකාමො අසුත්තො අප්පත්තො අනනුච්ඡවිකො අනාරහො අප්පතිරූපො ධුතඞ්ගං සමාදියති, සො දිගුණං දණ්ඩමාපජ්ජති සබ්බගුණඝාතමා-පජ්ජති. දිඨධම්මිකං ගිලනං ඛීලනං ගරහනං උප්පණ්ඩනං**

ඛිපනං අසම්හොගං නිස්සාරණං නිච්ඡුභනං පවාහනං පබ්බාජනං පටිලභති, සම්පරායෙපි සතයොජනිකෙ අවීචිමහානිරයෙ උණ්හකඞ්ගත්තසන්තත්තඅච්චිජාලාමාලකෙ අනෙක වස්සකොටිසතසහස්සානි උඩමඩො තිරියං ඵෙනුද්දෙහකං සම්පරිවත්තකං පච්චති, තතො මුඤ්චිත්වා කිසඵරුසකාලඞ්ග පච්චඞ්ගො සුචිමුඛප්පමාණසුසිරුත්තමඞ්ගො ජාතො පිපාසිතො විසමභිරූපවණ්ණො භග්ගකණ්ණසොතො උම්මිලිත නිමිලිතනයනො අරුගත්තපක්කගත්තො පුළවාකිණ්ණසබ්බ කායො වාතමුඛෙ ජලමානො විය අග්ගික්ඛන්ධො අන්තො ජලමානො අතාණො අසරණො අරුණ්ණරුණ්ණකාරුඤ්ඤ රවං පරිදෙවමානො නිජ්ඣාමතණ්හිකො සමණමහාපෙතො හුත්වා ආහිණ්ඩමානො අට්ටස්සරං කරොති' යනු පාළි යි. මෙසේ හෙයින් ධූතාඞ්ගරක්ෂණය නිවන් පිණිස විය යුතුය.

රහදො ඉව අපෙතකද්දමො = පහ වූ මඩ ඇති විලක් සේ

මඩ නැති පහන් සිහිල් දිය පිරුණු ගැඹුරු වූ විලක් සේ කෙලෙස් මඩ නැති බැවින් රහතුන් වහන්සේ හැමතින් පිරිසිදු වෙති.

සංසාරා න භවන්ති තාදිනො = ස්ථිරගුණ ඇත්තහුට සංසාරයෝ නො වෙති.

ස්ථිරගුණ ඇත්තෝ නම්, රහතුන් වහන්සේ ය. කිසි කලෙක කිසි දෙයක් නිසා උන්වහන්සේගේ සිතේ පැවැත්ම වෙනස් නො වන්නේ ය. සුගති-දුග්ගතිභවයන්හි චුතිපටිසන්ධි වසයෙන් හැසිරීම සංසාර නම්[1].

තමන් මතු පිට පිරිසිදු සුවඳ මල් ආදිය දැමූ ව ද, අපිරිසිදු මලමූ ඇ දැමූ ව ද මහපොළොව කිසිවකු කෙරෙහි නො ඇලෙයි. නො කිපෙයි. ඉන්ද්‍රකීලය ද තමන් මතු පිට මලමූ ඇ කළ ද සුවඳ මලින් පිදූ ව ද කිසිවකු කෙරෙහි නො ඇලෙයි. නො කිපෙයි. එමෙන් රහතුන් වහන්සේ ද තමාට සිවුපසය පිදූව යි කියා හෝ, නො පිදුව යි කියා හෝ කිසිවකු කෙරෙහි නො ඇලෙති. නො කිපෙති. රහතුන් වහන්සේ අනුරොධ-විරොධ නැත්තාහ යි වදාළෝ එහෙයිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි නව දහසක් භික්ෂූහු සිවු පිළිසැඹියාවන් ලබා රහත් වූහ.

ශාරීපුත්‍රස්ථවිරවස්තුව නිමියේ ය.

---

1. 5. 1. "සංසාරො" යනු බලනු.

සත් හැවිරිදි මහරහතුන් වහන්සේ.

7-7

කොසඹැනුවර එක් කුලගෙයක නුවණැති භාග්‍යවත් එක් කුලපුත්‍රයෙක් වී ය. බුදුසසුනෙහි පැහැදී සිටි ඔහු, ගිහිගෙය හැර පැවිදි ව උපසම්පදාව ද ලබා **තිස්ස**ස්ථවිර යි ප්‍රසිද්ධියට පැමිණියේ ය. ඒ නුවර වැසි එක් දැයකයකු විසින් ආරාධනා කරණු ලැබූ උන්වහන්සේ එහි වස් වැස පවාරණය කළහ. එවිට ඒ දැයක තෙමේ තුන් සිවුරු හා ගිතෙල් උක්හකුරු ආදි බෙහෙත් බඩු ගෙණැවිත් උන්වහන්සේගේ පාමුල තැබී ය.
ස්ථවිර තෙමේ- මොනවාද මේ?

දැයක- තුන් සිවුරු හා ගිතෙල් උක් හකුරු ඇ බෙහෙත් බඩු.
ස්ථවිර- මොකට ද ඒ?

දැයක- ඇයි, ඔබවහන්සේ මාගේ ආරාධනාවෙන් මෙහි වස් වැසුවෝ! නො වහු ද?

ස්ථවිර- ඉතින්, මොකට ද -මේවා?

දැයක- මාගේ විහාරයෙහි මාගේ ආරාධනාවෙන් වස් වැස පවාරණය කොට සිටි සවාමීන් වහන්සේලාට මා මෙසේ පිරිකර පුදනු මාගේ සිරිත ය. ඒ සිරිත අනුව මම මේවා ඔබ වහන්සේට පුදන්නට ගෙණ ආවෙමි. එහෙයින් මේවා මට අනුකම්පා පිණිස පිළිගෙණ වදරන්න.

ස්ථවිර- හොඳ යි, එය වරද නැත. මට මෙයින් වැඩෙක් නැත.

දැයක- ඇයි ද සවාමීනි! එසේ කියන්නහු?

ස්ථවිර- මේවා රකින්නට මා ලඟ කුඩා නමක් නැත. සිටිය ද මට ඕවායින් වැඩෙක් නැත.

දැයක- හොඳයි, සවාමීනි! පිළිගන්න, මාගේ පුතා ඔබ වහන්සේ ලඟ පැවිදි කරවමි.

ස්ථවිර- එසේ නම් ඕවා පැත්තක තබන්න.

එවිට දැයක තෙමේ සත් හැවිරිදි තම පුතු කැඳවාගෙණ අවුත් පැවිදි කරන්නට තෙරුන්නාන්සේට භාර කෙළේය. උන්වහන්සේ ලමයා භාර ගෙණ භික්ම්වා කෙස් බුහා තවපසඳුවකකම්මට්ඨානය කියවා පැවිදි කළහ. කෙස් කපා අවසන් වත් ම ලදරු තෙමේ

සිවු පිළිසැඹියාවනුත් ලබා රහත් වූයේ ය. ඉක්බිති සථවිරයන් වහන්සේ එහි අඛමසක් ගෙවා 'බුදුරජුන් දකිමි' සි හෙරණුන් ලවා බඩු පොට්ටනියකුත් ගන්වා ගෙණ මග බැස යන්නෝ අතර මග තුබූ වෙහෙරකට ගියහ. හෙරණ තෙමේ එහිදී ද 'තමන් ආගනතුකැ' සි සලකා නොසිට තම ගුරුවරයාට හිඳින්නට සෙනසුනක් පිළියෙල කෙළේ ය එය පිළියෙල කරත් ම රෑ බෝ වූ බැවින් තමාට සෙනසුනක් පිළියෙල කර ගත නොහැකි විය. එහෙත් හෙරණ තෙමේ සවස, වත් සපයන්නට ගුරුන් වෙත ගියේ ය. එවිට උන්වහන්සේ 'ඔය උන්නැහේ! තමුසේට නිදන්නට තැනක් පිළියෙල කර ගත්තෙහි දැ' යි ඇසූ විට 'එයට ඉඩ ලැබුනේ නැතැ' සි ඔහු කී ය. 'එසේ නම් දැන් තැනක් පිළියෙල කිරීම අපහසු ය, කරදර සහිත ය, මා ඉන්නා කාමරයේ ම තමුසේට නිදා ගන්නට හැකි ය, එන්නැ' යි සථවිරයන් වහන්සේ සාමණේරයනුත් කැටුව නිදන්නට කාමරයට ගියහ. සථවිරයන් වහන්සේ නිදන්නට ඇඳ වැතිර ගත්හ. පුහුදුන් බැවින් ඇඳ වැතිර ගත් සැටියේ ම පිරිත් කියූ ව ද නොකියූ ව ද නිදි ගත්හ.

ඉක්බිති හෙරණ තෙමේ 'ගුරු හාමුදුරුවන් හා එක කාමරයෙහි ඉන්නා තුන්වන දවස අද ය, යම් ලෙසකින් හාමුදුරුවන් වාගේ මාත් වැතිර නිදා ගත්තොත් මාගේ ගුරු හාමුදුරුවෝ සහසෙය්‍යාපත්තියට පැමිණෙන්නාහ' යි සිතා ගුරුවරයාගේ ඇඳ ලහ ම අහරමිණිය ගොතා එලිවන තුරු ම පැදුරු කබලක් එලා-ගෙණ වාඩි වී හුන්නේ ය. සථවිරයන් වහන්සේ උදැසන නිත්දෙන් නැගිට 'හෙරණුන් කාමරයෙන් බැහැර කරමි' යි පසෙක තුබූ වටාපත ගෙණ වටාපත් අහින් හෙරණුන් හුන් පැදුරට ගසා 'ඔය! උන්නැහේ! කුඩානම; තමුසේ දැන් දෙරට බසිවු' යි කීහ. වටාපත් අග හෙරණුන්ගේ ඇසෙහි වැදුනේ ය. ඇස හිල් විය. ලේ ගලන්-නට වන. හෙරණ තෙමේ එසේ තිබිය දීත් ගුරුන්ගේ බසට 'සවාමිනි! කුමක් කියන්නහු දැ' යි අසා නැවැතත් 'දෙරට යවු' යි කී කල්හි ඇස තුවාල වූ බව නොකියා ම එක් අතකින් ඇස වසා ගෙණ දෙරට බැස්සේ ය.

උදැසන ගුරුන්ට වත් සපයන වේලෙහි ද ඇසෙහි ලේ පිස දමා ගෙණ අද හෙරණුන් සේ නිකම් නොසිට එක් අතකින් ඇස වසා ගෙණ එක් අතකින් මුසුන් කෙටියක් ගෙණ වැසිකිළියත් මුව දෝනා තැනත් හැමද පිස දමා මුවදෝනා දිය තබා පිරිවෙණත් හැමන්දේ ය. ගුරුවරයාට දෑහැවි දෙන වේලේ එක් අතකින් ඇස වසා ගෙණ බිම බලා එක් අතකින් ම දෑහැවි දුන්නේ ය. මේ කිසිත් නොදැන සිටි සථවිරයන් වහන්සේ 'හෙරණ; නොහික්මූනෙකැ, ගුරුන්ට එක් අතකින් දෑහැවි දීම සුදුසු දැ' යි ඇසූහ.

'හාමුදුරුවන් වහන්ස! ගුරුනට එක් අතකින් කිසිවක් නො දිය යුතු බව මම දනිමි, ගුරුනට යමක් කමක් එසේ දීම වතක් නො වේ, එසේ දෙන ලද්දේ අනික් අත නො සිස් බැවිනැ' යි හෙරණ තෙමේ කී ය. ස්ථවිරයන් වහන්සේ හෙරණුන් එසේ කී කල්හි 'මොක ද උන්නැහේ!' යි ඇසූහ. එවිට ඔහු සියලු තොරතුරු දැන් වී ය. ඒ අසා මහත් සංවෙගයට පැමිණි ස්ථවිරයන් වහන්සේ 'අයියෝ! මා කළේ ලොකු වරදෙක, සත්පුරුෂය! මට කමන්න, මම මෙය නො දැන සිටියෙමි, මට පිහිට වන්නැ' යි දෙහොත් මුදුනේ තබා සත් හැවිරිදි හෙරණුන්ගේ පාමුල්හි හිඳ ගත්හ. එවිට හෙරණ තෙමේ 'ස්වාමීනි! ගුරුදෙවයන් වහන්ස! කමා කරවා ගැන්මට, මට සිදු වූ හදිසිය කීයෙම් නො වෙමි, හාමුදුරු-වන් වහන්සේගේ සිත රැක්මට මෙය කීමි, මේ ගැණ හාමුදුරුවන් වහන්සේට වරදක් කියන්නට බැරි ය, මෙය දැන කළේ නො වේ, මෙ දවස මා කළ පවෙක් ද නැත, මෙය මට සිදු වූයේ පෙර සසර දී කළ පවක් නිසා ය, එහෙයින් මේ නිසා පසුතැවිලි නො වනු මැනැවි, මෙය මතක් නො කෙළේ ද, හාමුදුරුවන් වහන්සේ මේ නිසා විපිළිසරක් ඇති කර ගණිත් ය යන අදහසින් ය, අමුත්තක් නො සිතූ ව මැනැවැ' යි දන්වා සිටියේ ය.

එහෙත් ස්ථවිරයන් වහන්සේ ඇස්වැසිලි නො ලැබ සංවෙග-යෙන් හෙරණුන් අත තුබූ බඩුපොට්ටනියත් ගෙණ බුදුරජුන් වෙත ගියහ. බුදුරජානන් වහන්සේ ද ඔවුන්ගේ ඊම බලා-පොරොත්තුවෙන් පෙර මඟ බලා වැඩ හුන් සේක. ඔවුහු බුදු රජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්හ. එවිට බුදු රජානන් වහන්සේ 'තමුසේලාගේ සැපසනීප කෙසේ දැ' යි ඇසූහ. 'ස්වාමීනි! සුව පහසු වරද නැත, කිය යුතු අමුත්තෙක් ද නැත, මේ කුඩා නම නම්, බොහොම කදිම ය, මේ නම තරම් ගුණවත් කෙනකු මා මෙයට කලින් දැක නැතැ' යි තෙරුන් කී කල්හි 'මොක ද මේ නමගේ ඇති ගුණ ය?' යි උන්වහන්සේ නැවැත ඇසූහ. එවිට ස්ථවිරයන් වහන්සේ මුල සිට සියලු තොරතුරු කියා, 'ස්වාමීනි! මම මේ නමට, මා අතින් වූ වරදට කමන්නැ යි කීමි, එවිට මේ නම, හාමුදුරුවන් වහන්සේ අත වරදෙක් නැත, මා අතත් වරදෙක් නැත, කමා වන්නට දෙයක් නො කෙරුණි, මෙය සසර දෙෂයෙක, විපිළිසර නො වනු මැනැවැ' යි මා අස්-වැසූයේ ය, දැනුත් අස්වසන්නේ ය, මා කෙරෙහි නො සතුටක් අගෞරවයක් මේ දක්වාත් නො දැක් වී ය' මට දෙෂාරොපණයක් නො කෙළේ ය, මේ නමගේ හොඳකම මෙතරම් ය, යි මොන ලෙසකිනුත් නො කියැකිය' යි කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ 'මහණෙනි! රහත්හු මොන ලෙසකිනුත් කිසිවකු කෙරෙහි නො කිපෙති, දෙස් නො කියති. රහත් නෙමේ සන්හුන් සිත් ඇත්තේ ය, සන්හුන් ඉඳුරන් ඇත්තේ ය' යි වදාරා මේ ධම්මදෙශනාව කළ සේක:-

සන්තං තස්ස මනං හොති සන්තවාචා ච කම්ම ච,
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනොති.

මැනැවින් දුන වෙසෙසින් මිදුනු සන්හුන් නො සැලෙන ගුණ ඇති රහත්හුගේ සිත සන්සිදුනේ ය. වචනය ද සන්සුන් ය. කම්ය ද ශාන්ත ය.

සන්තං තස්ස මනං හොති = ඔහුගේ සිත සන්සිදුනේ වේ.

මෙහි ඔහුගේ, යි කියේ රහතුන් වහන්සේ පිළිබඳ ය. සිත සන්හුන් වන්නේ අභිද්ධ්‍යාදී ත්‍රිවිධමනොදුශ්චරිතයන්ගේ අභාවය හෙතු කොට ය. සිතේ සන්සිදුම බලාපොරොත්තු වන්නහු විසින් ඒ අභිද්ධ්‍යාදිපාපධර්ම නැසිය යුතු ය.

සන්තවාචා ච කම්ම ච = වචනය ද ශාන්ත ය. කම්ය ද ශාන්ත ය.

වචනය සන්හුන් වන්නේ මුසාවාදාදී වූ ත්‍රිවිධවාග්දුශ්චරිතයන්ගේ අභාවය හෙතු කොට ය. බොරු කියන, කේලාම් කියන, පරුස්බස් කියන, නන් දෙඩන මිනිසුන්ගේ වචනය නො සන්හුන් ය. මේ කියූ බස් නො කියන්නහුගේ වචනය සන්සිදුනේ ය.

කම්ය සන්හුන් වන්නේ ත්‍රිවිධකායදුශ්චරිතයෙන් වැලකී සිටීමෙනි. සතුන් මරණ, හොරකම් කරණ, පරදාරකම් කරණ මිනිසුන්ගේ කය නො සන්හුන් ය. මේ පවිකම් නො කරන්නහුගේ කම්ය ම සන්සිදුනේ ය. **'අභිජ්ඣාදීනං අභාවෙන මනං සන්තං එව හොති. උපසන්තං. නිබ්බුතං. තථා මුසාවාදාදීනං අභාවෙන වාචා ච පාණාතිපාතාදීනං අභාවෙන කායකම්මං ච සන්තං එව හොති'** යනු අට්ඨා ය.

මෙහි චකාරයෝ නිපාතයෝ ය. ඔවුහු සමුච්චය - ව්‍යතිරේක-විකල්ප-අවධාරණ-වාක්‍යාරම්භ-අනුකඞ්ඪන-පදපූරණ යන මෙහි දක්නා ලැබෙති. **'මිත්තඤ්ච සච්චඤ්ච සන්තඤ්ච පුත්තදාරඤ්ච බන්ධවඤ්ච** යනාදී තැන සමුච්චයෙහි ය. **'යෝ ච බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණං ගතෝ,** යනාදී තැන ව්‍යතිරේකයෙහි ය. **'ආරොහිස්සති ච'** යනාදී තැන විකල්පයෙහි ය. **'ඝතෙ ච'** යනාදී තැන අවධාරණයෙහි ය. **'පඨමඣානන්ති නාමෙසෝ'** යනාදී තැන වාක්‍යාරම්භයෙහි ය. **'පුඤ්ඤඤ්ච'** යනාදී තැන අනුකඞ්ඪනයෙහි ය. **'යථා ච**

වණ්ඩ බුඩස්ස පාදපඞ්කරුහම්පි ච' යනාදී තැන පදපුරණ-යෙහි ය. මෙහි ආයේ ද සමුච්චයෙහි ය. **සමුච්චය** නම්, රැස් කිරීම ය. සවභාවයෙන් වෙන් ව සිටියවුන් උනුන් බලාපොරොත්තු වීම යි. **'සමුච්චයො නාම රාසීකරණ, සභාවභිත්තානං අඤ්ඤ මඤ්ඤසාපෙක්ඛාකරණං'** යනු විවෘති යි. නිපාත වූ චකාරයෙහි අර්ථභෙද තවත් ඇත්තේ ය. භාෂාවෙහි නාමයක් සේ ද චකාරය ගැණේ. චන්ද-චොර-නිම්මල-අන්ධිකාර යන අරුත් පවස යි, ඒ චකරය තෙමේ.

සම්මා අඤ්ඤ විමුත්තස්ස = මැනැවින් දැන, වෙසෙසින් මිදුනු

උපසන්තස්ස = සන්සුන් වූ

රාග දෙවෂ මොහාදි කිසිත් කිලුටෙක් සිතෙහි නැත්තේ **උපසන්ත** නම්. **'රාගස්ස සංතත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාපිතත්තා නිබ්බුතත්තා විහතත්තා පටිප්පස්සඩත්තා උපසන්තො. දොසස්ස - මොහස්ස - කොධස්ස - උපනාහස්ස - මක්ඛස්ස - පලාසස්ස - ඉස්සාය - මච්ඡරියස්ස - මයාය - සාඨෙ - ය්‍යස්ස - ථම්භස්ස - සාරම්භස්ස - මානස්ස - අතිමානස්ස - මදස්ස - පමාදස්ස - සබ්බකිලෙසානං සබ්බදුච්චරිතානං සබ්බදරථානං සබ්බපරිළාහානං සබ්බසන්තාපානං සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා - පෙ - පටිප්පස්සද්ධත්තා උපසන්තො,** යන දෙශනා පාලියෙන් ඒ පැහැදිලි ය. යට කියන ලද්දේ ය.

තාදිනො = එක හැටි වූ, නො වෙනස් වූ[1]

රහතුන් වහන්සේ පිළිබඳ රහත් වන්නට පෙර පැවැති අභිද්‍ධ්‍යා - ව්‍යාපාද - මිත්‍ථ්‍යාදෘෂ්ටි යන ත්‍රිවිධමනොදුශ්චරිතය ද මුසාවාදාදී වූ චතුර්විධවාග්දුශ්චරිතය ද ප්‍රාණඝාතාදිත්‍රිවිධකායදුශ්ච-රිතය ද රහත්වන තැනේ දී මුළුමනින් ප්‍රහීණ වූ හෙයින් උන්-වහන්සේගේ කය - වචන - සිත යන තිදොර ම සන්සුන් වූයේ ය. එහෙයින් පවිත්‍රය. දීප්තිමත් ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි කොසඹැනුවර වැසි තිස්ස ස්ථවිරයන් වහන්සේ සිටු පිළිසැඹියාවන් ලබා රහත් වූහ. සෙසු මිනිසුනට ද ධර්මදෙශනාව සාර්ථක වූ ය.

කොසම්බියවාසීතිෂ්‍යස්ථවිරවස්තුව නිමියේය.

---

1. 7 - 5 "තාදිනො" යනු බලනු.

ශාරීපුත්‍රමහාසථවිරයන් වහන්සේ ප්‍රශ්නයකට පිළිතුරු දුන් සැටි.

7 – 8

දිනෙක තිස් නමක් පමණ වෙනෙහි වසන භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත පැමිණ වැඳ, එකත් පසෙක හුන්හ. තමන් වහන්සේ වෙත පැමිණි ඒ හැම භික්ෂුහට ම රහත්වීමේ වාසනාව ඇතිබව දුටු බුදුරජාණන් වහන්සේ සැරියුත් තෙරුන් අමතා 'සැරියුත්! වැඩ, පුන පුනා වැඩ ශ්‍රඬෙන්ද්‍රියය නිවනට ඇතුලත් ව පවතී, නිවන කෙළවර කොට සිටියේ ය, මා කියන මේ කතාව තමුසේ පිළිගන්නහු දැ' යි අසා වදාළ සේක. එවිට ශාරීපුත්‍ර සථවිරයන් වහන්සේ 'සවාමිනි! භාග්‍යවතුන් වහන්ස! ශ්‍රඬෙන්ද්‍රියය නිවනට ඇතුලත් ය, එය නිවන කෙළවර කොට සිටියේ ය, යනු මම පිළිගණිමි, මා එසේ පිළිගන්නේ බුදුරජාණන් වහන්සේගේ කතාව අදහා ගැණීමෙන් නොවේ, මම අනුන් කීවක් නොපිළිගණිමි, තමන්ට නොවැටහෙන තමන්ගේ නුවණට ගොදුරු නොවන යමක් අනුන් කියූ පළියට පිළිගැණීම නොසුදුසු ය, යනු මාගේ වැටනීම ය, සවාමිනි! භාග්‍යවතුන් වහන්ස! යම් කෙනෙක් ඒ කාරණය එකාන්ත විසින් නොදන්නෝ නම්, නොදක්නෝ නම්, ප්‍රත්‍යක්ෂ විසින් නොදන්නෝ නම්, නුවණින් ස්පර්ශ නොකොළෝ නම්, එබදු අය මේ කරුණෙහි ලා අනුන් කීවක් අසා ශ්‍රඬෙන්ද්‍රියය නිවනට ඇතුලත් ය, නිවන කෙළවර කොට සිටියේ ය, යනු අදහා ගන්නෝ ය, මම අනුන් කී තරමින් යමක් පිළිගන්නෙක් නොවෙමි' යි පිළිතුරු දුන්හ.

මේ ප්‍රශනව්‍යාකරණය අසා හුන් භික්ෂූන් වහන්සේලා 'ශාරීපුත්‍ර සථවිර තෙමේ තමන්ගේ මිසදිටු ගැණුම තාම නොම හැර සිටියේ ය, අද දක්වාත් සම්මා සම්බුදු රජුන්ගේ වචන නොඅදහා'යි. කතාවක් ඉපද වූහ. බුදුරජාණන් වහන්සේ මේ කතාව අසා 'මහණෙනි! ඇයි ඔහොම කියහු? මහණෙනි! මම, පඤ්චේන්ද්‍රියයන් නොවඩා ශමථ – විදර්‍ශනාවන්හි නොයෙදී මගපල ලබන්නට සමතෙක් ඇත්තේ ය, යනු තමුසේ අදහන්නහු දැ,යි සැරියුත් තැනගෙන් ඇසීම්, එයට ඒ තැන කියේ, එසේ මගපල ලබන්නෙක් ඇතැ හි නොඅදහන බව ය, නොපිළිගන්නා බව ය, ඒ මිසක් දුන් දෙයක, කළ දෙයක, විපාකයත් බුඬාදීන්ගේ ගුණත් නොඅදහන්නෝ නොවෙති, මේ තැන තමන් දැන ගත් උපදවා ගත් ධ්‍යානවිදර්‍ශනා මාර්ගඵල ධර්‍මයන්හි අනුන්ගේ කීම් පිළිගෙණ ඇදකීම් කරන්නෙක් නොවේ, එහෙයින් ඒ තැන උපවාදරහිත ය' යි වදාරා අනුසඬි ගළපා මේ ධර්‍මදෙශනාව කළ සේක:–

අස්සඩො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදෙ ච යො නරො,
හතාවකාසො වන්තාසො සවෙ උත්තමපොරිසොති.

ඇදහීම් නැත්තා වූ නිවන දන්නා වූ සන්ධි සිඳ හැර සිටි නැසූ අවකාශ ඇති වැමෑරූ ආශා ඇති යම් පුද්ගලයෙක් වේ ද හේ එකාන්තයෙන් උත්තමපුරුෂයෙකි.

අස්සඩො = ඇදහීම් නැත්තා වූ.

තමන් විසින් ම දැන ගත් ධ්‍යාන – විදර්ශනා – මාර්ග – ඵල – නිර්වාණ යන ලෞකික – ලොකොත්තරගුණධර්මයන් අනුන්ගේ බසින් අනුන් කීවාට අනුන්ගේ කීමෙන් ඉල්ලීමෙන් නො අදහන බැවින්, බුදුරජුන් විනා අන්‍යශාස්තෘවරයකු කෙරෙහි ඇදහීමක් නැති බැවින් රහතුන් වහන්සේ ශ්‍රඩා නැත්තාහ, යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. රහතුන් වහන්සේ තමන් විසින් ප්‍රත්‍යක්ෂ විසින් දත් ධර්මය, ශ්‍රමණ – බ්‍රාහ්මණ – දිව්‍ය – මාර – බ්‍රහ්ම යන කිසිවක්හුගේ කීමක් උඩ, කිසිවක්හුගේ කීමක් නිසා දැන ගත්තෝ නො වෙති. ඒ තමන් දත් ධර්මය අනුන්ගේ කීමක් ඇදහීමෙන්, දන්නා ලද්දකුත් නො වේ.

'සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං න කස්ස චි සද්දහති, අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා දෙවස්ස වා මාරස්ස වා බ්‍රහ්මුනො වා' යනු දෙශනා කළෝ එ බැවිනි.

වසවත් මරුන් ඈ විසින් බුදුවෙස් ගෙණ අවුත් අහස්හි සිට 'ආත්මයෙක් ඇත, එය නිත්‍ය ය, එකාන්ත ය, ශුභ ය, සුඛ ය, ස්ථිරය'යි කියූ ව ද, එය නො ද පිළිගන්නෝය. නො ද අදහන්නෝ ය. එසේ ම උසස් දිව්‍යබ්‍රහ්මාදිසම්පත් පෙන්වා 'අන්‍ය ශාස්තෘවරයකු අදහා ගණිවු'යි කියූ ව ද, නො ද අදහන්නෝ ය. රහතුන් වහන්සේ තබා දිඝීසම්පන්න යි කියන සොතාපන්න තෙමේත් සංස්කාරයක් නිත්‍ය, යි කා කී වත් නො අදහන්නේ ය. අන්‍ය ශාස්තෘවරයකු අදහව, යි කී ව ද නො අදහන්නේ ය.

'අඨානමෙතං භික්ඛවෙ, අනවකාසො යං දිඝීසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය නෙතං ඨානං විජ්ජති,, අඨානමෙතං භික්ඛවෙ! අනවකාසො යං දිඝීසම්පන්නො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය නෙතං ඨානං විජ්ජති' යනු අඨානපාළි යි.

කෙසපුත්ත නියම්ගම් වැසි ක්ෂත්‍රියයෝ බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! විටින් විට අප නියම්ගමට එන නොයෙක් අන්දමේ අදහස් ඇති මහණ බමුණෝ තමතමන් ගත් ලබ්ධීන් හුවා දැක්වීම පිණිස අන්‍යයන් ගත් ලබ්ධීන් පහත් කොට

අනෙයය්‍යාණික කොට දක්වති, මේ නිසාම ඒ හැම ලබ්ධියක් කෙරෙහි ම අප සිත්තුළ කවුරුන් කියන ලද්ද සත්‍ය ද, කවුරුන් කියන ලද්ද පිළිගත යුතු ද, යි මහත් විමතියක් හට ගෙණ තිබේ. ඒ පිළිබඳව අප සිත්තුළ මහත් විචිකිච්ඡාවක් පවතී' යි කීහ.

එවිට බුදුරජාණන් වහන්සේ 'කාලාමයෙනි! තමුසේලාගේ ඒ විමතිය වරද නැත, තමුසේලාගේ සිත්තුළ නැගී ඇති සැකය, සැක කළ යුතු තැනෙක ම නැගී තිබේ, ඒ නිසා එය වරදය, යි නො කියැකිය, කාලාමයෙනි! තමුසේලා කිසිවක්හුගේ කතාවක්, දහමක් ආරංචියෙන්, පරම්පරාකථාවෙන්, මේ මෙසේ,යි අනුන් කියන හෙයින්, අපගේ පිටකපාළිය හා සම වේ, යි සිතීමෙන් නො පිළිගත යුතු ය, තර්කානුකූල ය, න්‍යායානුකූලය, මේ කාරණය යහපත් ය, අප ගත් ලබ්ධිය හා සමය, යි සැලකීමෙන් නො පිළිගත යුතු ය, මේ මහණ සුදුස්සෙක, එහෙයින් මොහුගේ කතාව පිළිගත යුතු ය, යි සුදුසු බව සැලකීමෙන් නො පිළිගත යුතු ය, මේ මාගේ ගුරුවරයා ය, එහෙයින් ගුරුවරයා කියන කතාව පිළිගත යුතු ය,යි ගුරුකම සැලකීමෙන් නො පිළිගත යුතු ය' යම් දහමක් ලබ්ධියක් තමුසේලාගේ බුද්ධියට අනුරූප වේ නම්, නුවණින් සලකා බලා විමසා ම පිළිගත යුතු ය, පරබුද්ධියට යටත් නො වී සවබුද්ධියෙන් විමසා බුද්ධියට ගොදුරු වූ කල්හි ම පිළිගත යුතු ය' යි වදාළ සේක.

'එථ තුම්හෙ කාලාමා! මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නය-හෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණෝ නො ගරුනි, යදා තුම්හෙ කාලාමා, අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා සමත්තා සමා-දිනනා අහිතාය දුක්ඛාය සංවත්තනන්හි, අථ තුම්හෙ කාලාමා, පජහෙය්‍යාථ -පෙ- ඉමෙ ධම්මා කුසලා ඉමෙ ධම්මා අනවජ්ජා ඉමෙ ධම්මා විඤ්ඤුපසත්ථා ඉමෙ ධම්මා සමත්තා සමාදිනනා හිතාය සුඛාය සංවත්තනන්හි ති, අථ තුම්හෙ කාලාමා, උප-සම්පජ්ජ විහරෙය්‍යාථ' යනු දෙශනා ය.

නිදහස් ලෙසින් තම තම නුවණින් හැම එකක් ම නිරණය කොට ගැණීමට අවකාශ ඇත්තේ බුදුරජුන් දෙවි කොට ගත්ත-හුට ම පමණක් බව මෙයින් පැහැදිලි ය. අන් එකා ද ධර්මයකින් එක ද ලබ්ධියකින් මෙබදු නිදහසෙක් ලොකයට ලැබී නැත. එයට හෙතුව බුදුදහමින් අන්‍ය වූ හැම ධර්මයක් හැම ලබ්ධියක් සිර වූ පදනමක් උඩ නො වෙනස් වන තත්ත්වයක් උඩ රඳා නො

පැවැත්ම ය. ඒ ඒ දහම් ඒ ඒ ලබ්ධින් උරගා බැලීමට විවෙචනය කිරීමට බුදුදහමින් දුන් නිදහස වැනි නිදහසෙක් ඒ ඒ ධර්මෝත්පාදක ශාස්තෘන් විසින් දෙන ලද්දේ නම්, ඔවුන්ගේ ධර්ම ඔවුන්ගේ ලබ්ධිහු ප්‍රතිඝ්‍යාරහිත වන්නෝ ය. බිඳ වැටෙන්නෝ ය.

සාමාන්‍යපදාර්ථවිෂයයෙහි මෙසේ නම්, ධ්‍යාන - විදර්ශනා - මාර්ග - ඵල - නිර්වාණ යන ලෞකිකලොකොත්තරධර්මවිෂයයෙහි අනුන් කියුවක් ඇදහීමෙන්, පිහිටක් නො වනබව කිය යුතු නො වේ.

තම තමන් විසින් ම සිය සිතින් ඇදහිය යුතු ය. තම තමන් විසින් ම ප්‍රත්‍යක්ෂ කර ගත යුතුය. අනුන් බසින් නො ඇදහිය යුතු ය. එසේ නො ද අදහන බැවින් රහතුන් වහන්සේ අශ්‍රද්ධාවත් ය. **'අත්තනා පටිවිඩගුණං පරෙසං කථාය න සද්දහතීති අස්සඩො'** යනු අටුවා ය.

අකතඤ්ඤූ = නිවන දන්නා වූ.

අකත, යි නිවනට නමෙකි. හෙතුප්‍රත්‍යයධර්මයන් විසින් දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් නො කළ බැවින් ඒ අකත, යි හඳුන්වනු ලැබේ. **'පච්චයෙහි න කතන්ති = අකතං'** යනු නිරුක්ති යි. **'අත්ථි භික්ඛවෙ, අජාතං අභූතං අකතං'** යනාදි තන්හි දක්නා ලැබේ.

නිවන වනාහි කුශලාකුශලකර්මාදිහෙතුධර්මයකින් නිපන්නෙක් නො වේ. එසේ ම දිව්‍යබ්‍රහ්මාදි කෙනකුන් විසින් නිපදවන ලද්දේ ද නො වේ. සෘතුශක්තියකින් 'උපදින්නේත් නො වේ. එහෙයින් කර්මජ නො වේ. හෙතුජ නො වේ, සෘතුජ නො වේ. අතීත නො වේ. අනාගත නො වේ. වර්තමාන නො වේ. ඇසින් දත හැක්කේ නො වේ. කණින් දත හැක්කේ නො වේ. නාසයෙන් දත හැක්කේ නො වේ. දිවෙන් දත හැක්කේ නො වේ. සිරුරෙන් දත හැක්කේ නො වේ. මෙසේ අකත හෙයින් ආර්‍යශ්‍රාවකයා විසින් සිතින් දත යුත්තේ ය. එහෙයින් උන් වහන්සේ මේ නිවන මගපල සිත්වලට අරමුණු කිරීම් වශයෙන් ප්‍රත්‍යක්ෂ කොට දත් බැවින් **අකතඤ්ඤූ'** යි කියත්.

නිර්වාණධර්මය, ආර්‍ය පුද්ගලයන් විසින් චතුර්විධමාර්ගඥානයන් කරණ කොට ගෙණ ප්‍රත්‍යක්ෂ විසින් ද, කල්‍යාණපෘථග්ජනයන් දෙශනා මාර්ගය කරණ කොට ගෙණ අනුමාන විසින් ද දතයුතු ය. එයින් මෙහි අදහස් කරණ ලද්දේ නම් ප්‍රත්‍යක්ෂ විසින් නිවන දත් ආර්‍යයන් වහන්සේ ය. ඔවුනතුරෙහි ද ප්‍රධාන විසින් රහතුන් වහන්සේ ය.

සොතාපත්තිමග්ගවිත්තවීථියෙහි මූල සිට පිළිවෙළින් **භවඬඹ-භවඬඹවලන** – භවඬඹුපච්ඡේද යන චිත්තක්ෂණයන්ට, **කම්ම-කම්ම-නිමිත්ත** – ගතිනිමිත්ත යන තුනෙන් එකෙක් අරමුණු වේ. එතැන් සිට ඒ චිත්තවීථියෙහි ලැබෙන **මනොද්වාරාවජ්ජන – පරිකම්ම – උපචාර – අනුලෝම** යන චිත්තක්ෂණයන්ට, අරමුණු වන්නේ සංස්කාරධර්ම යි. එතැන් සිට එහි **ගොත්‍රභූ – මග්ග – ඵලචිත්ත**-යන්ට නිවන අරමුණු වන්නේ ය.

සකදාගාමිමග්ගවිත්තවීථියෙහි **පරිකම්ම-උපචාර-අනුලෝම** චිත්තයන්ට, සංඝකාර හා **වෝදන-මග්ග-ඵලචිත්තයන්ට** නිවන අරමුණු වන්නේ ය. සොතාපත්ති මග්ගවිත්තවීථියෙහි ගොත්‍රභූ නමින් ආ සිත මෙහි වෝදන නමින් ආයේ ය. සොවත්වීමෙන් පසු පෘථග්ජනගොත්‍රය සිඳ හැරිය බැවින්, එය මෙහි වෝදන නම් විය. වෝදන නම් පිරිසිදු යන අරුති.

අනාගාමී – අරහත්තමග්ගවිත්තවීථින්හි ද සංඝකාර-නිවීරණ-යන්ගේ ආරම්මණභාවය මෙසේ දත යුතු යි. මේ චිත්තවීථින්හි අවසානයෙහි ලැබෙන භවාඬ්ගචිත්තයන්ට අරමුණු වන්නේ ඛීණාශ්‍රව ය.

චිත්තක්ෂණ දසසතකින් යුත් මේ චිත්තවීථියෙහි ප්‍රථමචිත්ත ක්ෂණය භවාඬ්ග නමින් කිය වේ. එතැන් සිට පිළිවෙළින් චිත්තක්ෂණ අටක්, භවඬඹවලන – භවඬඹුපච්ඡේද – **මනොද්වාරාවජ්ජන – පරිකම්ම උපචාර – අනුලෝම – ගොත්‍රභූ – මග්ග** යි හැඳින් වේ. එතැන් සිට චිත්තක්ෂණ දෙකක්, ඵලචිත්තක්ෂණ නමින් ගන්නා අතර ඉතිරි චිත්තක්ෂණ සය, භවාඬ්ග වශයෙන් ගණිත්. සොතාපත්තිමග්ගචිත්ත වීථියෙහි ලැබුනු ගොත්‍රභූ චිත්තක්ෂණය, සකදාගාමිමග්ග – අනාගාමි-මග්ග – අරහත්තමග්ග-විත්තවීථිතුනේ දී වෝදන නමින් හඳුන්වත්.

සොතාපත්තිමග්ගවිත්තවීථි-**සකදාගාමිමග්ගවිත්තවීථි-අනාගාමි** මග්ගවිත්තවීථි – අරහත්තමග්ගවිත්තවීථි යන මේ වීථිසිත් සතර එක් එක් වර ම මුත් දෙවරක් නොඋපදනේ ය. මේ වීථිසිත් උපන් විට ඒ ඒ මඟින් නැසිය යුතු කෙලෙස් එක්වරින් ම නැසී යන බැවිනි. හෙනපහරින් කඩා වැටෙන ගස් අතු සේ යමක්හුගේ සිත්හි මේ චිත්තවීථියක් උපන් ඇසිල්ලෙහි ඒ සිතේ අතිදීර්ඝ-කාලයෙක සිට පැවත ආ සියලු කෙලෙස් බිඳ වැටෙන්නේ ය. එතැන් සිට මේ ආර්‍යයන්ට පහළ වන්නේ පලසිත් ය. පලසිත් උපන්නේ ද නිවන අරමුණු කොට ය. ආර්‍යයන් වහන්සේ නිවන මඟපලසිත්වලට අරමුණු කිරීම් වසින් ප්‍රත්‍යක්ෂ කොට දන්නා-සේකැ, යි වදලෝ එබැවිනි.

සන්ධිච්ඡේදෙ ච = සන්ධි සින්දු වූ ද.

සන්ධි නම්, ගැළපීම ය. මෙහි වෘත්තසන්ධි, සංසකාරසන්ධි යි සන්ධි දෙකෙකි. කර්මවෘත්තය වෘත්තසන්ධි යි ද, ක්ලෙශවෘත්තය සංසකාර-සන්ධි යි දැ යි ගැණේ. අතීතභවය හා වර්තමානභවයත්, වර්තමාන භවය හා අනාගතභවයත් ගැළපීම මෙහි සන්ධි යි කියනු ලැබේ. ගැළපීම වන්නේ කර්ම-ක්ලෙශයන්ගේ වසයෙනි. එහෙයින් රහතුන් වහන්සේ කර්මවෘත්තසඞ්ඛ්‍යාතවෘත්තසන්ධියත් ක්ලෙශ වෘත්තසඞ්ඛ්‍යාතසංසකාරසන්ධියත් සිඳ දමා සිටි බැවින් සන්ධිච්ඡේද නම් වෙති. විස්තර යට කියන ලද්දේ ය.

යො නරො = යම් පුද්ගලයෙක් තෙමේ.

නර ශබදයට පුරුෂ - සත්ත්ව - මනුෂ්‍ය යන අරුත් දිය හැකි ය. **'බුඬො අයං එදිසකො නරුත්තමො'** යන මෙතැන නරශබදය සිටියේ මනුෂ්‍යවාචකව ය. **'නරා ච අථ නරියො'** මෙහි සිටියේ පුරුෂවාචකනරශබදය ය. සත්ත්වවාචකනරශබදය යෙදී සිටියේ **'යො නරො අනුගිජ්ඣති'** යන මෙතැන ය. මෙහි ද සත්ත්වවාචක ව සිටියේ ය, යි ගැණීම වරද නැත. ඒ ඒ තැනට සුදුසු සේ අරුත් ගත යුතු ය.

ප්‍රථමප්‍රකෘතිකසත්ත්ව තෙමේ පසු කල උසස් තැන සිටී නු යි ඒ ම පුරුෂ නම් වේ. උසස් තැනට පැමිණීම් අරුතින් ද නර නම්. ස්වකීයකර්මයෙන් පමුණුවනු ලබන හෙයිනුත්, සුගති-දුග්ගති දෙකට පැමිණෙන බැවිනුත් නර නමැ, යි කියන ලදී.

'නෙතීති=නරො, යථා පඨමපකතිභූතො සත්තො ඉතරාය පකතියා සෙඨඨෙන පුරි උච්චඨානෙ සෙති පවත්තතීති=පුරිසො, එවං නයනඨෙන නරොති, වුච්චති, නරීයති සකෙන කම්මෙන නරිය්‍යතීති=නරො, සුගති දුග්ගතිං නයතීති=නරො' යනු අර්ථසමර්ථනය යි.

හතාවකාසො = නැසූ අවකාශ ඇති.

'කුසලාකුසලකම්මබීජස්ස ඛීණත්තා නිබ්බත්තනොකාසො හතො අස්සාති = හතාවකාසො' කුශලාකුශලකර්මබීජය ක්ෂය කල බැවින්, නැසූ උපදනා තැන් ඇත්තේ මෝහට නු යි **හතාවකාස** නම්. මත්තෙහි කිසිත් තැනෙක නො උපදින්නේ ය යන අරුත් ය. මෙහි අවකාශ යි කීයේ, සත්ත්වයන් උපදින ස්ථාන වන භව - යොනි - ගති ආදිය යි. විස්තර කී සෙයින් දන්න. උත්පත්තිය ගෙණ දෙන කර්මශක්තිය කර්මක්ෂයකරඥාන යෙන් සුන් කල හෙයින් රහතුන් වහන්සේ සක්ඛ්‍යපරිනිර්වාණ යෙන් පසු කිසිත් තැනෙක නො උපදින සේක.

වන්තාසො = වැමෑරූ ආශා ඇති.

'චතූහි මගෙගහි කත්තබ්බකිච්චස්ස කතත්තා ආසා ඉමිනා වන්තාති = වන්තාසො, සිවු මගින් කළ යුතු කටයුතු කළ බැවින් මොහු විසින් ආශාව වමාරන ලදූ, යි **වන්තාස** නම්. සිවු මගින් කළ යුතු කටයුතු නම් පිළිවෙළින් ඒ ඒ මගින් නැසිය යුතු කෙලෙස් නැසීම ය. සිවු මගින් නැසිය යුතු කෙලෙස් නසත් ම කාමතෘෂ්ණාදීන්ගේ වසයෙන් අෂ්ටොත්තරශතප්‍රභෙද වූ තෘෂ්ණාව ද නැසෙන්නී ය. එහෙයින් පහව ගිය තෘෂ්ණාව ඇත්තේ වන්තාස, යි කියනු ලැබේ. තෘෂ්ණාව ආශා, යි හඳුන් වන ලද්දී අරමුණු යටපත් කිරීමෙන් අරමුණු කරා ගොස් අරමුණු වළඳන බැවින් ය.

'ආරම්මණානං අසනතො = ආසා, අජ්ඣොත්ථරණතො ච අනුගත්ත්වා පරිභුඤ්ජනතො වාති අත්ථො' යනු ඒ කීහ.

සො වෙ උත්තමපොරිසො = හෙතෙමේ එකාන්තයෙන් උත්තම පුරුෂ වේ.

'සො × වෙ' යනු සවෙ, යි ගැළපී සිටියේ ය. අනුන්ගේ කතාවෙන් කිසිත් නො අදහන අත්දුටු නිවන ඇති සසර ගැළපීම් සිඳ දැමූ නැසූ උපදින තැන් ඇති හෙවත් මත්තෙහි නො උපදින වැමෑරූ ආශා ඇති මහත් ගුණැති පුද්ගල තෙමේය. මෙසේ ලැබූ ලොවුතුරු දහම් ඇති බැවින් සියල්ලන් අතුරෙහි උත්තමපුරුෂ නම් වෙත් රහතුන් වහන්සේ.

වෙ යනු, නිපාත යි. **'න වෙ අනත්ථකුසලෙන අත්ථචරියා සුඛාවහා නවාහං පණ්ණං භුඤ්ජාමි'** යන තැන ඒ වැටුනේ එකාංසාර්ත්‍ථ-යෙහි ය. **'සවෙ එතෙන යානෙන නිබ්බාණස්සෙව සන්තිකෙ'** යනාදී තැන පදපූරණයෙහි වේ. **'දදන්ති වෙ යථා සඛං යත්ථ පසාදනං ජනො'** යනාදී තැන වචස්සග්ගයෙහි වැටුනේ ය. මෙහි ආයේ එකාංසාර්ත්‍ථයෙහි ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි තිසක් පමණ වනවැසි භික්ෂූන් වහන්සේලා සිවු පිළිසැඹියාවන් ලබා රහත් වූහ. සෙසු මහජනයාහට ද ධර්මදෙශනාව වැඩ සහිත වූ ය.

ශාරීපුත්‍රප්‍රශතවිසර්ජනවස්තුව නිමියේ ය.

මගුලේ ගොස් එන අතරමගදී මහණවීම.

7 – 9

ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේට මවු පිය දෙපසින් අයත් වූ ධනය අසූහත් කෝටියකි. උන්වහන්සේ පැවිදිවීමේ දී ඒ සියලු ධනය හැරදමා පැවිදි වූහ. චාලා-උපචාලා-සීසූපචාලා යි සහෝදරියෝ තිදෙනෙක් හා චඤ – උපසෙන රෙවත යි සහෝදරයෝ තිදෙනෙක් ද වූහ. උන්වහන්සේ රෙවත කුමාරයා හැර අන් පස්දෙනා ම පැවිදි කර ගත්හ. ගෙදර නැවතුනේ එක් ම රෙවත කුමාරයා පමණෙකි. මෑනියෝ සැලී ගියහ. ඕතොමෝ 'මා පුත් උපතිස්ස පැවිදි විය, ඒ මදිවාට සහොදරියන් තිදෙනාත් සහොදරයන් දෙදෙනකුත් පැවිදි කරගත්තේ ය, යම් ලෙසකින් අනිකාත් පැවිදි කර ගත්තේ නම්, අපට වන්නේ මහත් වරදෙකි, මේ මහත් ධනය නැසෙන්නේ ය, කුලවංශය සිඳෙන්නේ ය, උන්හිටිතැන් නැතුව යන්නේ ය, එහෙයින් අද හෙට ම මූට මගුලක් පිළියෙල කොට දිය යුතු ය' යි සිතූ ය.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද කල් තබා ම භික්ෂූන් අමතා 'ඇවැත්නි! රෙවත කුමරු පැවිදිවීමෙහි කැමැත්තෙන් මෙහි ආවොත් ආසැටියේ ම උන් පැවිදි කරන්න, මාගේ අම්මා තාත්තා දෙදෙන ම මිසදිටුවෝ ය, ඒ නිසා මූන් පැවිදි කරන්නට ඔවුන්ගෙන් අසනු වුවමනා නැත, රෙවතගේ මවුත් මම ය, පියාත් මම ය, ඔහුගේ ජීවිතයට වගකියන්නේ මම ය, එහෙයින් ඔවුන් විචාරී මෙහි වැඩෙක් නැත, මම ඒ බලා ගන්නෙමි, රෙවත ආ සැටියේ කල් නො ගෙවා ම පැවිදි කරවු' යි නියොග කළහ.

යම්තම් සත් හැව්රිදි වයසට පැමිණි රෙවත කුමරුට කසාදයක් බැඳ දෙන්නට උත්සාහවත් වූ මවු තොමෝ ඒ ගැණ සොයා බලා තමකුලයට කැපෙන කුලයකින් දූරියක නියම කොට ගෙණ සුබදවසකුත් බලා කුමරුත් සරසා ගෙණ නෑ මිතුරනුත් සමග දූරියගේ නිවසට ගියා ය. එහි දී දෙපස නෑහිතමිතුරෝ කුලසිරිත් අනු ව රෙවත කුමරුත් ඒ දූරියත් අඹුසැමියන් වශයෙන් බැඳ, දිය බඳුනක් ගෙන්වා ඔවුන් ඉදිරියෙහි තබා 'මේ රන්බඳුනෙහි දිය යම් සේ නො වෙන් ව පවත්නේ ද, එමෙන් ම නුඹලා දෙදෙන නො වෙන් ව නො බිඳී දිවි තිබෙන තුරු මතු ඇති වන දූ දරුවනට ආදර්ශ දෙමින් ගුණවත් ව විසිය යුතු ය' යි ඒ කුමර කුමරියන්ගේ දකුණත්

එකට තබා අත පැන් වත් කොට මහුල් කළහ. ඒ වේලෙහි දූරියගේ නෑයෝ 'දූ නුඹගේ මිත්තනිය දුටුදම් ඇත්තී ය, ඇසේ නුඹත් බොහෝ කල් ජීවත් වවු' යි මඟුලාශීර්වාද කළහ.

එවිට රෙවත තෙමේ මිත්තනිය දුටු ධර්මය කුමක් දෑ, යි සිතා 'මිත්තනියෝ කොහිදැ' යි ඇසී ය. 'කිම පුත! නොදන්නහු ද, අර, දත් වැටී ඇති පැසුනු හිසකෙසින් යුත් ඇඟ රැලි නැගුනු තලකැලලින් හැවසුනු සිරුරු ඇති ගොනැස්සක් සේ කුදුගැසුනු මැහැල්ලි ය, ඇය ගේ වයස අවුරුදු එක් සිය විස්සෙකි' යි ඔවුහු කීහ. එවිට ඔහු 'මාබිරියත් එසේ වන්නී දෑ, යි ඇසී ය. 'ඔව්, අතරකා දී නො මැරී සිටියොත් එසේ වන්නීය' යි කිහ. 'අයියෝ මේ සිරුරත් ජරාවෙන් දැදුරු වී මෙ බඳු වෙනස් කමකට පැමිණියේ නම්, මෙය මට නො වන්නට හෙතුවක් නැත, මෙය මාගේ සොහොයුරු වූ උපතිස්ස සථවිරයන් වහන්සේ දන්නා සේකැ' යි සිතූ රෙවත තෙමේ 'අදම මම මෙයින් පැන යමි' යි සිතිවුහන් කර ගත්තේ ය.

මහුලෙන් පසු සියගෙට එනු පිණිස ඔවුහු රෙවත කුමරු හා ඔහු බිරිඳත් ශ්‍රේෂ්ඨාවකට නංවා ගෙණ මග බැස ආහ. මදක් දුර ගිය කල්හි රෙවත තෙමේ 'සිරුරු කිස කරන්නට වුවමනා ය' යි කියා ශ්‍රේෂ්ඨාව බිම තබ්බවා ඉන් බැස වනරොදකට ඇතුළු ව එහි ටික වේලාවක් හිඳ පෙරළා ආයේ ය. ටිකදුරක් ගොස් තවත් වරක් එසේ කෙළේ ය. තෙවන වරකුත් එසේ කෙළේ ය. එවිට නෑයෝ 'රෙවතට අසනීපයකැ'යි සිතා වැඩියෙන් රැකවල නො කළහ. රෙවත තෙමේ නැවැතත් මදක් දුර ගොස් පළමු හැටියට ම කියා ශ්‍රේෂ්ඨාවෙන් බැස 'නුඹලා ශ්‍රේෂ්ඨාව ගෙණ ඉදිරියෙන් යවු, අපි හිමින් හිමින් එන්නෙමු' යි වනරොදතුළට ගියේ ය. නෑහිතමිතුරෝ 'කුමරු පස්සෙන් එනු ඇතැ' යි සිතා ශ්‍රේෂ්ඨාව ගෙණ ගියහ.

එවර රෙවත තෙමේ වනරොදට ගිය ගමනේ ම පැන ගියේ වනයෙහි එක් පෙදෙසක හුන් තිසක් පමණ භික්ෂූන් දැක ඔවුන් වෙත ගොස් වැඳ 'සවාමීනි! මා පැවිදි කරණු මැනැවැ යි ඉල්ලා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා ද හොඳට ඇඳ පැලඳ සිටි ඔහු දැක 'ලමයා, ඔයා රජකුමරෙක් ද, නැත, අමාත්‍යපුත්‍රයෙක් ද, එසේත් නො වේ නම්, මුදලි මූහන්දිරම් කෙනකුගේ පුතෙක් ද, යනු අපි නො දනුම්හ, එහෙයින් ඔය ලමයා අපි කෙසේ පැවිදි කරමු දැ' යි ඇසූහ. 'සවාමීනි! ඇයි, ඔබ වහන්සේලා මා නො හඳුනන්නහු ද, මම අනෙකෙක් නො වෙමි, මම උපතිස්ස සවාමීන් වහන්සේගේ මලනු වෙමි' යි කී කල්හි 'කවු ද ඔය

කියන උපතිස්ස ස්වාමි' යි ඇසූහ. 'ඇයි නො දන්න හු ද, ඔබ වහන්සේලා නිතර යමකු සඳහා ශාරීපුත්‍ර, ශරීපුත්‍ර, යි කියන්නහු ද, ඒ ස්වාමීන් වහන්සේ මාගේ සහෝදරයා' යි කීවිට, 'හැබෑ ද ඔය ලමයා සැරියුත් තෙරුන් වහන්සේගේ සොහොයුරෙක් දූ' යි කීහ. 'ඔව්, ස්වාමීනි!' යි රෙවත කීයේ ය. 'එහෙ නම් මෙහි එන්න, ඔය ලමයා ආවොත් පැවිදි කරන්නැ,යි උන්වහන්සේ අපට නියම කොට තිබේ, මෙහි එන්නැ' යි ලමයා ලඟට ගෙණ ඇඳුම් අබරණ ගලවා පසෙක තබා පැවිදි කොට, පැවිදි කළබව සැරියුත් මහ තෙරුන් වහන්සේට දන්වා යැවූහ.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් වෙත ගොස් 'ස්වාමීනි! වනවැසි උන්නාන්සේලා රෙවත කුමරු පැවිදි කළ බව මට දන්වා එවා තිබේ, එහෙයින් මම එහි ගොස් තොරතුරු දැන එමි' යි එහි යෑමට අවසර ඉල්ලූහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ 'පොඩ්ඩක් ඉන්නැ' යි ගමනට අවසර නො දුන්හ. කිහිප දවසක් ගත කොට නැවැතත් අවසර ඉල්ලූහ. එවර ද අවසර නො දී 'ශාරීපුත්‍ර! තවත් ටිකක් ඉන්න, මමත් එමි 'යි ඒ ගමනත් වැළකූ සේක. ඒ අතර කුඩා හෙරණ තෙමේ 'මා මෙහි තව දුරට නැවතී සිටියොත් නෑයෝ මා ලුහු බැඳ අවුත් කැඳවා ගෙණ යන්නෝ ය' යි සිතා රහත්බව දක්වා කමටහන් උගෙණ පා සිවුරු ගෙණ එ තැනින් තිස් යොදුනක් ඈත්හි වූ කිහිරිවනයට ගොස් වස් වසා ඒ වස් තුන් මස තුළ දී ම සිවු පිළිසැඹියාවන් ලබා රහත් වූයේ ය.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වස් පවරා බුදුරජුන් කරා ගොස් නැවැතත් මලනුවන් දක්නට යන්නට අවසර ඉල්ලූහ. 'හොඳයි, ශාරීපුත්‍ර! යමු, මමත් එමි' යි බුදුරජානන් වහන්සේ තවත් පන්සියයක් භික්ෂූන් කැටුව නික්මුනු සේක. ඒ පිරිසෙහි වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ දෙ මංහන්දියෙක සිට 'ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! රෙවත හෙරණුන් වසන තැනට මේ දෙ මගින් කොයි මගකින් නමුත් යා හැකි ය, එහෙත් මේ මග සැට යොදුනක් පමණ දිග ඇත්තේ ය, ඇදය, මග දිගට දෙපස ගම් පිහිටා ඇති බැවින් මිනිසුන්ගෙන් ගහනය, අනික් මග තිස් යොදුන් පමණ දිග ය, නො ඇද ය, ඉද්ද ගැසුවා සේ කෙලින් පිහිටා තිබේ, එහෙත් අමනුෂ්‍යඋපද්‍රව බොහෝ ය, එහෙයින් අප යා යුත්තේ කි නම් මගකින් දූ' යි බුදුරජුන් විචාළාහු ය. බුදුරජානන් වහන්සේ 'සීවලී තැන ආයේ දූ' යි අසා 'එසේය' කී කල්හි 'එසේ නම් අපි කෙලින් පිහිටි පාරෙන් යමු' යි වදාළ සේක. 'මම් තමුසේලාට මේ ගමනේ දී කැඳ බත් ආදිය පිළියෙල කර

දෙන්නෙමි, එහෙයින් කෙලින් පෑරෙන් යමු' යි නොවදුරා 'මෙතැන උතුන්ගේ පුණ්‍යවිපාක දෙන තැනැ, යි සිතා උන්වහන්සේ 'සිවලි ආයේ නම්, කෙලින් පෑරෙන් යමු' යි වදාළ සේක.

බුදුරජානන් වහන්සේ මෙසේ වදාරා කෙලින් මගට බට කල්හි දෙවියෝ 'සිවලිතෙරුන්ට සත්කාර කරන්නට' යි යොදුනක් පාසා විහාර කර වූහ. දවසකට යොදුනකට වඩා ඉදිරිය බලා වඩින්නට ඉඩ නොතබා එක් එක් රෑ ඒ කරවූ විහාරයන්හි වාසය කරවා භික්ෂූන් උදැසන නැගී සිටි කල්හි තමන් අයත් කෑද කැවිලි ආදිය ගෙණ අවුත් 'සිවලි තෙරුන් වහන්සේ කොහි දැ' යි සොයා ඇවිදිති. උන්වහන්සේ සොයා ඒවා උන්වහන්සේට පිළිගන්වති. සිවලි තෙරනුවෝ ඒ කෑද කැවිලි බුඩ ප්‍රමුඛසඞ්ඝයා වහන්සේට වළඳවත්. බුදුරජානන් වහන්සේ සිය පිරිස සමග ඒ තිස් යොදුන් දිග ගමනේ දී සිවලි තෙරුන්ගේ පින් වළඳමින් ඉදිරිය බලා වැඩි සේක. රෙවත තෙරනුවෝ ද බුදුරජුන් වඩිනබව දැන බුදුරජුන් ප්‍රධාන භික්ෂූන් වහන්සේට රෑ දවල පහසුවෙන් වැඩ හිඳිනට වුවමනා හැම එකක් පිළියෙල කළහ. බුදුරජානන් වහන්සේ භික්ෂූන් සමග රෙවත තෙරුන් හුන් තැනට වැඩ එහි මසක් පමණ කල් නැවතී සිටි සේක.

එහි වසන කල්හි ද උන්වහන්සේ සිවලි තෙරුන්ගේ පින් තෙදින් උපන් දෙය ම වැළඳූ සේක. බුදුරජුන් කිහිරිවනයට ඇතුල් වන වේලෙහි බුදුරජුන් සමග ගිය භික්ෂුපිරිසෙහි සිටි මහලු භික්ෂූන් වහන්සේලා දෙනමක් නොයෙක් කටයුතුවල යෙදී සිටි කායක්ෂම ඒ හෙරණහු දැන 'මේ මහණ මෙතෙක් අළුත් අළුත් වැඩ කරණ ගමනේ මහණකම් කරන්නට කෙසේ නම් සමර්ථ වේ ද, බුදුරජානන් වහන්සේත් මේ හෙරණ සැරියුත් තෙරුන්ගේ මලනුවන් බැවින් මේ නොපනත් කම් ඉවසමින් ඒවා බලමින් පිඬු සිඟා වළඳමින් මෙබඳු අළුත් වැඩ කරන්නකුගේ ලඟට ආ සේකැ'යි පහත් කොට සිතූහ.

බුදුරජානන් වහන්සේ පසුදා උදැසන ලොව බලන සේක් ඒ භික්ෂූන් දැක ඔවුන්ගේ සිතුවිලි දැන ගත්හ. එහි මසක් පමණ නැවැතී සිට පෙරළා වඩින ගමනේ දී උන්වහන්සේ ඒ මහලු දෙනමට තමන්ගේ තෙල්කුලාව, පෙරහන, වහන් අමතක වන සේ ඉටා එතැනින් නික්මුනු සේක්, විහාරසීමාවෙන් පිටතට පැමිණ ඒ ඉටීම හළ සේක. මහලු වහන්සේලා දෙනම 'මට තෙල්බටය

අමතක විය, මට බඹරාව අමතක වී ය, මට සෙරෙප්පු අමතක වී ය' යි එහි නැවැතී, තුබූ තැන් සොයමින් ඒ කිඹිරිවනයෙහි කිඹිරිකටු මඬිමින් බොහෝ වේලාවක් තැන තැන සොයා බැලුහ. ඒ අතර එහි එක් කිඹිරිගසෙක එල්ලා තුබූ ඒ බඹු දුක රැගෙණ ගියහ.

බුදුරජාණන් වහන්සේ ඒ පන් සියයක් භික්ෂූන් වහන්සේත් ගෙණ එතැනින් පිටත් ව අතරමග සිවලී තෙරුන්ගේ පින්තෙදින් ලත් දේ ම වළඳමින් මසක් පමණ ගෙවා සැවැත් නුවර ජේතවනාරාමයට වැඩි සේක. පසුදා උදැසන මේ මහලු දෙනම අනික් දෙනාත් සමග උදැසනින් නැගිට මුණකට සෝදා විශාඛාවන්ගේ ගෙට කැඳ වළඳන්නට ගියහ. එහි දී හැම දෙනා වහන්සේ කැඳ කැවිලි වළඳා අවසන් කොට එහි මදක් රැඳී හුන්හ. ඒ වේලෙහි විශාඛා තොමෝ 'ස්වාමීනි! ඔබ වහන්සේලාත් බුදුරජුන් සමග රෙවත තෙරුන් බලන්නට ගියහු දැ' යි ඇසූ ය. 'ඔව්, උපාසිකාව! ගියෙමු' යි ඔවුන් කී කල්හි 'කොහොම දැ, ස්වාමීනි! එතැන සිත් කලු දැ' යි ඇසූ ය. එවිට මහලු දෙදෙනා වහන්සේ 'නැත, එ තැන ප්‍රේතයන් ඉන්නා තැනක්, කිඹිරිගස් පිරී තිබේ, ඒ හැම ගසක් ම කටු සහිත ය, එ තැන මොන සිත්කලුබවෙක් දැ' යි කීහ. ඔවුහු එ තැනින් පිටත් ව ගියහ.

ඒ වේලේ ම කුඩා භික්ෂූන් වහන්සේලා දෙනමක් කැඳ වළඳන්නට එහි පැමිණියහ. උපාසිකා තොමෝ ඔවුන්ට ද කැඳ කැවිලි පිළිගැන්නූ ය. අවසන්හි උපාසිකා තොමෝ ඔවුන්ගෙන් ද රෙවත තෙරුන් හුන් තැන සිත්කලු දැ' යි ඇසූ ය. ඒ දෙනම 'උපාසිකාව! එහි සිත්කලුකම වචනයෙන් කියනු බැරි තරම් ය, තෙරුන් වසන තැන, අප අසා තිබෙන සැටියට සුධර්මාදිව්‍යසභාව තරමට සිත්කලු ය, සෘද්ධියෙන් කළ තැනක් වැනි ය' යි කී කල්හි 'මේ දෙදෙනා වහන්සේ එක් ලෙසකින් කියත්, මෙයට කලින් මෙහි වැඩි දෙදෙනා වහන්සේ අන්ලෙසකින් කීහ, මේ කාරණය බුදුරජුන් වෙතින් අසා දත යුතු ය' යි උපාසිකා තොමෝ සිතට ගත්තා ය. භික්ෂූන් වහන්සේලාත් කැටුව නොබෝ වේලාවකින් බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක. උපාසිකා තොමෝ බුඩ ප්‍රමුඛසඞ්ඝයා වහන්සේ සකසා වළඳවා, අවසන්හි බුදුරජුන් වෙත පැමිණ වැඳ 'ස්වාමීනි! බුදුරජාණන් වහන්සේ සමග, රෙවත තෙරුන් වැඩ හිඳින තැනට ගිය සමහර දෙනා වහන්සේ 'එතැන කිඹිරිකටු කැලයෙක් ය, ප්‍රේතයන් ඉන්නා තැනෙක් ය' යි කියත් සමහර කෙනෙක් දෙව්විමනක් බඳුය' යි කියත්, කොහොම දැ ස්වාමීනි! එ තැනැ' යි ඇසූ ය. 'උපාසිකාවෙනි! ගමෙක වුවත්

කැලයෙක වුවත් යම් තැනෙක රහත්හු වෙසෙත් නම්, ඒ තැන සිත්කලුම' යි වදාරා උත්වහන්සේ අනුසඤ්ඤි ගළපා මේ ධම්ම දෙශනාව කළ සේක:-

ගාමෙ වා යදි වාරඤ්ඤෙ නිනෙන වා යදි වා ථලෙ,
යත්ථාරහන්තො විහරන්ති තංභූමි රාමණෙය්‍යකන්ති[1]

ගමෙක හෝ වනයෙක හෝ වල තැනෙක හෝ ගොඩ තැනෙක හෝ යන, යම් තැනෙක රහත්හු වෙසෙත් නම්, ඒ බිම සිත් කලු ය.

ගාමෙ වා = ගමෙක හෝ.

'ගාමො නාම එකකුටිකො' පි ගාමො, ඒකුටිකො' පි ගාමො, තිකුටිකො' පි ගාමො, චතුක්කුටිකො' පි ගාමො, සමනුස්සා' පි ගාමො, අමනුස්සා' පි ගාමො, පරික්ඛිත්තො' පි ගාමො, අපරික්ඛිත්තො' පි ගාමො, සොණිසාදිනිවිට්ඨො' පි ගාමො, යො' පි සඤ්ඤා, අතිරෙකචාතුමාසනිවිට්ඨො සො' පි වුච්චති ගාමො' ගල් ගඩොලින් බැඳි තාප්පයකින් හෝ කටු අතුවැටකින් වට කළා වූ හෝ වට නොකළා වූ මිනිසුන්ගේ විසීමට තැන් වූ හෝ නොවූ එක් පැල්පතක් ඇති බිම්පෙදෙසත් ගම ය. පැල්පත් දෙකක් ඇති බිම්පෙදෙසත් ගම ය. පැල්පත් තුනක් ඇති බිම් පෙදෙසත් ගම ය. පැල්පත් සතරක් ඇති බිම්පෙදෙසත් ගම ය. ඊට නොපිහිටුවා ගොතුන් දෙදෙන තිදෙන බැගින් කැටි කැටි ව, එක් එක් ව ලැගි තැනක් සේ ගෙවල් දෙක තුන බැගින් පිහිටි, දෙක තුන බැගින් ගෙවල් පිහිටුවන ලද බිම්පෙදෙසත් ගම ය. යටත් පිරිසයින් සිවු මසකට වැඩිතරම් කලක් වෙළඳ සමූහයක් නවාතැන් ගෙණ සිටි තැනත් ගම ය.

'ගාමෙ නාම යො කොචි එකකුටිකො වා අනෙකකුටිකො වා සපරික්ඛිත්තො වා අපරික්ඛිත්තො වා සමනුස්සා වා අමනුස්සා වා අතිරෙකචාතුමාසනිවිට්ඨො යො කොචි සඤ්ඤා' පි යන මෙයින් මූලින් කියන ලද්ද වඩාත් තහවුරු වේ. මෙහිලා ගෙවල් සමූහයක් ඇති බිම්පෙදෙස ගමැ යි අමුතුවෙන් කිය යුතු නොවේ.

'ගාමූපචාරො නාම පරික්ඛිත්තස්ස ගාමස්ස සචෙ අනුරාධපුරසෙස්සව දෙව ඉන්දඛීලා හොන්ති, අඛණ්ඩනාභිමෙ ඉන්දඛීලෙ සිතස්ස ථාමමජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො' පවුරු වැට කටු ආදියකින් වට කළ ගමෙක අනුරාධපුරයෙහි මෙන් ඉන්දඛීල

1. "තංභූමිං රාමණෙය්‍යකං: සමන්තර පොතෙක

දෙකක් වේ නම්, ඇතුල් ඉන්දඛීලයෙහි සිට ශක්තියෙන් මධ්‍යම ප්‍රමාණ වූ පුරුෂයකු විසින් වීසි කළ ගල වැටුනු තැන ගාමූපචාරැයි ගණිත්. බාහිරඉන්දඛීලය අභිධර්මනයින් අරණ්‍යසඞ්ඛ්‍යාවට යන්නේ ය. තරුණයෙක් තමශක්තිය පෙන්වීම පිණිස වීසි කළ ගල, වැටුනු තැනින් ඇතුළත ගාමූපචාරැ යි විනයධරයෝ කියත්. සෞත්‍රාන්තිකයෝ කියනුවෝ කවුඩන් පන්නා හැරීමට ගැසූ ගල, වැටුනු තැනින් ඇතුළත, ගාමූපචාරය කොට ය.

'අපරික්ඛිත්තගාමෙ යං සබ්බපච්චන්තිමස්ස සරස්ස චාරෙ ඨිතො මාතුගාමො භාජනෙන උදකං ඡඩ්ඩෙති, තස්ස පතන ඨානං සරූපචාරො, තතො වුත්තනයෙනෙව එකො ලෙඩ්ඩු-පාතො ගාමො, දුතියො ගාමූපචාරො' පවුරු වැටකටුවලින් වට නො කළ ගමෙහි කෙළවර පිහිටි ගෙයි දොරකඩ සිට මාගමක විසින් බඳුනකින් ගෙණ වීසි කළ දිය වැටුනු තැන සිට ඇතුළත සරූපචාරැයි ද, එතැන සිට වීසි කළ ගල වැටුනු තැනින් මෙපිට ගාම යි ද, නැවැත එතැන සිට වීසි කළ ගල වැටුනු තැනින් මෙපිට ගාමූපචාරැ යි ද කියත්. මෙහිලා මෙ ද දන්න:- **'නිම්බකොසස්ස උදකපතනඨානඛාතරං සරං නාම'** වහළ කෙළවරින් දිය වැටෙන තැනින් ඇතුළත සර නම්. ගෙයි සතර පැත්තෙහි ම වහල්පලේ කෙළවරින් වතුර වැටෙන තැනින් ඇතුල් කොටස සර යි ගැණේ.

'යං පන චාරෙ ඨිතො මාතුගාමො භාජනධොවන උදකං ඡඩ්ඩෙති, තස්ස පතනඨානඤ්ච, මාතුගාමෙනෙව අත්තො ගෙහෙ ඨිතෙන පකතියා බහි ඨිතස්ස සුප්පස්ස වා සම්මුඤ්ජ-නියා වා පතනඨානඤ්ච, සරස්සෙව පුරතො චිසු කණ්ණෙසු සම්බන්ධිත්වා මජ්ඣෙ රුක්ඛසූචිචාරං ඨපෙත්වා ගොරූපානං පවෙසනනිවාරණත්ථං කතපරික්ඛෙපො ච අයං සබ්බො'පි සරූප චාරො නාම' ගෙයි දොරකඩ සිටි මාගමක විසින් වීසි කළ බඳුන් දෙවූ දිය වැටුනු තැන ද, මාගමක විසින් ඇතුල් ගෙයි සිට උත්සාහවත් නො ව පියවි ගතියෙන් පිටතට වීසි කළ කුල්ල හෝ ඉදල වැටුනු තැන ද, ගෙයි ඉදිරිපිට සිට දෙපසින් ගෙණ කොන් දෙක එකතු කොට මැද දොරකඩ තබා ගොන් සරක් ආදීන්ගේ ඇතුළට වැදීම වළක්වනු පිණිස බඳින ලද වැට ද, සරූපචාර නම්. ගෙයි දොරකඩටත් දොරකඩ සිට වීසි කළ දිය වැටුනු තැනටත් අතර පෙදෙස ද, ගෙයි ඇතුළටත් ගෙයි ඇතුළේ සිට ගෑණියක උත්සාහරහිත ව පියවි ගතියෙන් වීසි කළ කුල්ල හෝ ඉදල වැටුනු තැනටත් අතර පෙදෙස ද, ගේ ඉදිරියෙහි මිදුලට

ගෙරි සරකුන්ට වැද්ද නොදෙනු සඳහා බඳින ලද තාප්පයෙන් හෝ වැටෙන් ඇතුල් පෙදෙස ද, සරූපවාරය සේ ගත යුතු ය යි කීහ. මේ කියූ ක්‍රමතුනෙන් කොයි ක්‍රමයකින් වුව ද සරූපවාරය පිරිසිදුනු හැකි ය.

'තස්මිං සරූපවාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩු පාතඛ්භන්තරං ගාමෝ නාම' හෙවල් සමූහයක් ඇති ගමෙක නම් එ ගමෙහි කෙළවර තුබූ ගේ පිළිබඳ උපවාරයෙහි සිටි මධ්‍යම වයසක පුරුෂයකු විසින් අධිකශක්තියෙන් වීසි කළ ගල වැටුනු තැනින් මේ පිට ගාම නම් වේ. ගල පළමු වැටුනු තැන මුත් එතැනින් පෙරළී ගොස් නැවතුනු තැන නොගැණේ.

'තතෝ අඤ්ඤස්ස ලෙඩ්ඩුපාතස්ස අබ්භන්තරං ගාමූපචාරෝ නාම' පළමු ලෙඩ්ඩුපාතයෙන් ගමැයි පිරිසිද ගත් තැන් සිට එබඳු පුරුෂයකු විසින් එලෙසින් ම නැවැත දමා ගැසූ ගල වැටුනු තැනින් මොඛ ගාමූපවාර නමැ යි කිය යුතු ය. ඒ ගල පෙරළී ගොස් නැවතුනු තැන නොගැණේ. මෙන්න ඒ කී සැටි:- **'පතිතෝ පන ලුඨිතෝ යත්ථ ඨච්ඡති, තං න ගණෙතබ්බං'** යනු.

පාළිය ලෙසින් **පරික්ඛිත්තගාම - අපරික්ඛිත්තගාම** යි ගම දෙවැදෑරුම් ය පරික්ඛිත්තගාම නම්, පවුරු වැටකටු ආදී යමකින් වටකරණ ලද ය. එසේ වට නොකළ ගම අපරික්ඛිත්ත නම් වට කළ ගමෙහි වට කිරීමෙන් ඇතුළත ය ගම. අනුරාධපුරය සේ ය. වට කළ ගමෙහි ඉඳහිල්ලයෙහි සිටි මධ්‍යමවයසක පුරුෂයකු විසින් වීසි කළ ගල වැටුනු තැන ගාමූපවාරය යි. **'ගාමූපචාරෝ නාම පරික්ඛිත්තස්ස ගාමස්ස ඉන්දඛීලෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතෝ'** යනු පාළියෙහි ආයේ ය එය.

වට නොකළ ගමෙහි කෙළවර පිහිටි ගෙයි උපවාරයෙහි සිට, මධ්‍යම වසකයකු විසින් ගැසූ ගල වැටුනු තැනින් මෙ පිටය ගම. **'අපරික්ඛිත්තස්ස ගාමස්ස සරූපවාරෙ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතෝ'** යනු එහි ලා පාළිය යි. ග්‍රාම පරිවෙජ්දය දත් විට ග්‍රාමෝපචාරලක්ඛණය පළමු කියූ ලෙසින් දත හැකි බැවින් නැවැත **'තතෝ ඨිතස්ස මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩු පාතෝ'** යි පාළියෙහි නොකියවුනේ ය. එහෙයින් ග්‍රාමෝපචාරය කියූ සේ දන්න.

යමෙක් වනාහි ගෘහොපචාරයෙහි සිටියහුගේ ගල වැටුනු තැන ම (ලෙඩ්ඩුපාතය ම) ග්‍රාමෝපචාර යි කියා නම්, එවිට ගෘහොපචාරය, ග්‍රාම යි ගත යුතු වේ. ගෘහ-ගෘහොපචාර-ග්‍රාම-ග්‍රාමෝපචාර යන මේ විභාගය, එ කල්හි අවුල් වන්නේ ය. අසඞ්කර වශ

යෙන් ග්‍රාම-ග්‍රාමෝපචාර දෙක, පාළියත් අට්ඨකථාවත් සංසන්දනය කොට යට කියූ ලෙසින් දතයුතු ය. යම් ගමක් පෙර මහත් ව තිබී පසු කාලයෙහි ගෙවල් විනාශ වී යෑමෙන් කුඩා බවට ගියේ නම්, එකල එහි ගෘහෝපචාරයෙහි සිට, ලෙඩ්ඩුපාතයෙන් ම ග්‍රාම-ග්‍රාමෝපචාර දෙක පිරිසිඳ දත යුතු ය.

වා යනු, නිපාත ය. **'පාටලිපුත්තස්ස බෝ ආනන්ද, තයෝ අන්තරායා භවිස්සන්ති අග්ගිතෝ වා උදකතෝ වා මිථු-භෙදතෝ වා'** යන මෙහි ආයේ සමුච්චයෙහි ය. **'මධුවා මඤ්ඤති බාලෝ යාව පාපං න පච්චති'** මෙහි ආයේ උපමා-යෙහි ය. **'කෝ වා තවං කස්ස වා පුත්තෝ'** මෙහි සන්දේහ යෙහි ය. **'ඉමස්ස වචනං සච්චං වා යදි වා මුසා'** මෙහි පද පූරණයෙහි වේ. **'අමාපෙතෝ සමිං සමානං වා'** යන මෙහි ව්‍යවස්ථිත විභාෂා ය. **'වා වස්සාගෙන නිපාතෝ'** යන මෙහි නිශ්චයෙහි ය. **'වගහනානං වා වගෙන'** මෙහි විකල්ප යි. මෙහි වූගේ සමුච්චයෙහි ය. සමුච්චය-විකල්පාර්ථයන්හි හෙන, වා' යන නිපාතය පදාවසානයෙහි ද සමානාධිකරණපද දෙකක මධ්‍ය යෙහි ද වැටේ. පදාදියෙහි නො වැටේ.

අරඤ්ඤං වා = වනයෙක හෝ.

'ඨපෙත්වා ගාමං ච ගාමූපචාරං ච සබ්බමෙතං අරඤ්ඤං' යනු විනයපාළියෙහි අරණ්‍යය දැක් වූ සැටි යි. ගාමූපචාරයත් හැර ඉන් බැහැර හැම තැන අරණ්‍යය යනු එහි තේරුම ය.

'නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං' ඉන්ද-ඛීලයෙන් පිටත හැම තැන අරණ්‍යය යනු අභිධර්මකථා ය.

'ආරඤ්ඤකං පන සෙනාසනං පඤ්ච ධනුසතිකං පච්ඡිමං' පවුරු ආදියෙන් වට කළ ගමෙහි ඉන්දඛීලයෙහි පටන් ද, වට නො කළ ගමෙහි ප්‍රථමලෙඩ්ඩුපාතයෙහි පටන් ද, සතර රියන් බාගයක් පමණ දික් වූ දුන්නෙන් දුනු පන් සියයක් ඉක්ම ගිය තැන අරණ්‍යය යනු සෞත්‍රාන්තිකකථා ය.

විනයයෙහි කී අරණ්‍යලක්ෂණ නිරවශේෂවශයෙන් අවහා-රථාන ගැන්මෙහි ග්‍රාම-අරණ්‍ය දෙක අවුල් නො කොට ගැන්ම සඳහා කියන ලද්දේ ය.

අභිධර්මයෙහි කී අරණ්‍යලක්ෂණ, අප්‍රධාන වශයෙන් ග්‍රාමෝප චාරයත් ග්‍රාමසඞ්ඛ්‍යාවට ම යන බැවින්, ප්‍රධාන වශයෙන් ගම නො වන පෙදෙස ම අරණ්‍ය ය යි දක්වන්නට කියන ලද්දේ ය.

සූත්‍රාන්තයෙහි කී අරණ්‍යලක්ෂණය ආරණ්‍යකභික්ෂූන් සඳහා ම කියන ලද්දේ ය. සූත්‍රයෙහි කී අරණ්‍යය මෙහි ද ගත යුත්තේ ය. විනය-අභිධර්මී දෙක්හි කී ලෙසින් අරණ්‍යය ගැණුම ද වරද ය යි නො කියැකි ය.

නිනෙන වා = වලතැනෙක හෝ.

දියෙන් සෑරුනු තැන්, වනසිවුපාවුන් සෑරූ තැන් නිම්න ස්ථාන යි ගණිත්. ස්වභාවයෙන් පිහිටි ප්‍රපාතස්ථාන ද මෙහි ම ඇතුළත් ය.

ථලෙ වා = ගොඩ තැනෙක හෝ.

පොළොවෙහි වඩා උස් ව සිටි තැන් ස්ථලස්ථාන හැටියට ගණන් ගැණේ. දියෙන් යට නො වන තැන්, යට නො වන පෙදෙස් ය ඒ. **'ථලෙති නිරුදකපදෙසෝ'** යනු බැලිය යුතු ය.

ථල ශබ්දයෙන්, පැවිද්ද හා නිවන ද කියවේ. ලොකය තෙමේ දියෙන් යට නො වන තැන් ම ථල යි කියයි එමෙන් කෙලෙස්වතුරෙන් යට නො වන බැවින් පැවිද්ද හා නිවන ථල'යි කියනු ලැබේ. **'තිණණා පාරඝතා ථලෙ තිඨති බ්‍රාහ්මණෝ'** යනු එයට නිදසුන්. මෙහි ගැණෙන්නේ ලොකයා විසින් හඳුන් වන ගොඩබිම ය. **'තිඨතයි ථපෙතීති = ථලං'** යනු නිරුක්ති යි.

යඤ්ඤ අරහන්තෙනා විහරන්තීති = යම් තැනෙක රහත්හු වෙසෙත් ද.

අභිද්ථලයෙහි සිටි ආර්‍යයෝ ය රහත්හු. උත්වහන්සේලා කෙබඳු ගුණවත්හු ද යනු ඉතා කොටින් කියූ ගාථාවකි පහත දැක්වෙන්නී.

'ආරකත්තා හතත්තා ච කිලෙසාරීන සෝ මුනි,
හතසංසාරචක්කාරෝ පච්චයාදීන චාරහෝ,
න රහෝ කරොති පාපානි අරහන්තෙන වුච්චති' යනු.

'කිලෙසාරීනං ආරකත්තා = අරහං' කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් රහත් ය යනු එහි තේරුම යි. **මේ රහත්** යන සිංහලනාමය, සමහර තැනෙක ප්‍රඥප්තිවාචක ව ද, සමහර තැනෙක ගුණවාචක ව ද, එන්නේ ය. ගුණවාචක තැන, බුදුවරයකු, ප්‍රඥප්ති වාචක තැන සෙසු රහතුන් ද ගණිත්. බුදු - පසේබුදු - මහ රහතුන්ට මේ නාමය යෙදේ.

කෙලෙසුන් කෙරෙන් දුරුවීම වන්නේ, මාර්ගඥනයෙන් කෙලෙස් නැසීමෙන් ය. අවකාශ වශයෙන් ඒ නො වන්නේ ය. කුණුමස් බැද තැබූ යමෙක, කුණුමස් ඉවත් කළ පසුත් දුගඳ

පවත්නා සේ, නැසූ කෙලෙස් ඇත්තහුගේ චිත්තසන්තානයෙහි පැවැති නො නැසූ කෙලෙස් ඇත්තහුගේ කායවාක් ප්‍රයොග වැනි කායවාක් ප්‍රයොගයට හෙතු වූ නැසී ගිය කෙලෙසුන්ගෙන් ඉතිරි වූ ක්ලෙශපරිභාවිතාකාරය, කෙලෙස් පුරුද්ද ක්ලෙශවාසනා යි කියනු ලැබේ. මේ නිසා ඇතැම් රහතුන් වහන්සේගේ කායවාක් ප්‍රයොගයෝ අතැම් මිනිසුන්ගේ සිත් නො ගණිති. පිලිඤ්චවච්ඡ රහතුන් වහන්සේ මිනිසුන්ට වසලැ යි ඇමැතුවෝ මේ ක්ලෙශ-වාසනාව නිසා ය. බුදුරජානන් වහන්සේ ආර්‍යමාර්ගඥානයෙන් මේ වාසනාදෝෂය සහිත වූ ම සියලු කෙලෙස් නසා දැමූහ. වාසනා සහිත ව කෙලෙස් නසන්නෝ බුදුවරයෝ ම ය. එය බුදුවරයන්ට මුත් සෙසු රහතුනට නැත්තේ ය. ආර්‍යශ්‍රාවකයන්ගේ සිත්හි තරම් මේ කෙලෙස් පුරුද්ද පසේබුදුවරයන්ගේ සිත්හි ප්‍රකට ව නැත්තේ ය. එහෙයින් ප්‍රධාන විසින් බුදුරජානන් වහන්සේ ම රහතුන් වහන්සේ වෙති. එහි ලා මෙ ද දන්නේ ය:-

'සො තතො ආරකා නාම යස්ස යෙනාසමඞ්ගිතා,
අසමඞ්ගී ච දොසෙහි නාථො තෙනාරහං මතො' යනු.

යමෙක් යමක් හා නො යෙදේ ද, එයින් හේ දුරු වූයේ නම. බුදුරජානන් වහන්සේ ඒ කිසිත් ක්ලෙශයක් හා නො යෙදුනෝ ය. එහෙයින් උන්වහන්සේ රහතුන් වහන්සේ ය.

'කිලෙසාරීනං හතත්තා = අරහං' බුදුරජානන් වහන්සේ අර්‍ගමාර්ගඥානය කරණ කොට කෙලෙස් සතුරන් නැසූ බැවින් රහත් ය. මෙලොව පරලොව දෙක්හි ම සියලු අවැඩ, සියලු නපුරු, කර වන්නෝ ක්ලෙශයෝ ය. එහෙයින් කෙලෙස්, සතුරන් වැනි ය. බුදුරජානන් වහන්සේ රාගාදිකෙලෙස් සතුරන්, මාර්ගඥාන් නැමැති ශස්ත්‍රයෙන් මුල් සහිත ව නැසූ සේක. එහෙයින් උන් වහන්සේ රහතුන් වහන්සේ ය. එහි ලා මෙ ද දන්නේ ය:-

'යස්මා රාගාදිසඞ්ඛාතා සබ්බෙපි අරයො හතා;
පඤ්ඤාසත්ථෙන නාථෙන තස්මාපි අරහං මතො' යනු.

බුදුරජුන් විසින් යම් හෙයකින් සියලු රාගචෙෂාදී වූ සතුරෝ මාර්ගඥාන නැමැති ආවුධයෙන් නසන ලද්දෝ ද, එහෙයින් උන් වහන්සේ රහතුන් වහන්සේ ය.

'හතසංසාරචක්කාරො = අරහං' නසන ලද සංසාරචක්‍ර-යාගේ, අර ඇත්තේ රහත් නම්. භවයෙන් භවය හෙතුඵල වශයෙන් නො සිඳ පවත්නා රූප - වෙදනා - සංඥා - සංස්කාර-විඥාන යන පංචස්කන්ධයන්ගේ පටිපාටිය, චක්ඛුධාතු - රූපධාතු-

චක්ඛු විඤ්ඤාණධාතු ආදීන්ගේ පටිපාටිය, චක්ඛායතන – රූපායතනාදීන්ගේ පටිපාටිය, සංසාරය කියන ලදී. යට කියූ විස්තරය බැලිය යුතුය. එම, සත්ත්වයන් නොයෙක් ගති-යොනි ආදියෙහි නන්වෙසින් භ්‍රමණය කරවන බැවින් චක්‍ර නම් වේ.

අවිද්‍යා-භවතෘෂ්ණා නැමැති බොස්ගෙඩි ඇති, පුණ්‍යාභිසංඛාරාදිය නැමැති දැව් ඇති, ජරා-මරණ නැමැති නිම්වළලු ඇති ආස්‍රව සමුදය නැමැති අලවංගුවෙන් විද, ත්‍රිභව නැමැති රියෙහි යෙදූ අනාදිමත් කාලයක සිට පැවැත එන සංසාරචක්‍රය, බුදුරජාණන් වහන්සේ මාගීඥාන නැමැති පොරවෙන් නසාලූ සේක.

තව ද, මේ සංසාරචක්‍රයෙහි අවිද්‍යාව මූල බැවින් එහි නාභිය වේ. ජරා – මරණ කෙළවර බැවින් නිම්වළලු වේ. නාභිය වූ අවිද්‍යාව හා ද නිම්වළලු වූ ජරා – මරණ හා ද ගැළපී සිටි බැවින් මධ්‍යයෙහි වූ සංඛාර – විඤ්ඤාන – නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වේදනා-තෘෂ්ණා – උපාදාන – භව – ජාති යන මේ දසය දැව් වේ. එහි ලා මෙ ද දන්නේ ය:–

> 'අරා සංසාරචක්කස්ස භත්තා ඛීණාසිනා යතෝ,
> ලොකනාථෙන තෙනෙස අරහන්ති පවුච්චති' යනු.

බුදුරජුන් විසින් නුවණ නැමැති කඩුවෙන් සංසාරචක්‍රයාගේ අර සඞ්ඛ්‍යානසංස්කාරයෝ නසන ලද්දාහු ද, එහෙයින් උන් වහන්සේ රහතුන් වහන්සේ ය.

'පච්චයාදීනං අරහොා අරහං' සිවුපසයට සුදුසු වූයේ රහත් නම්.

කර්මඵල අදහා පරිත්‍යාගයෙහි යෙදෙන්නන්ගේ ඒ පරිත්‍යාගයන්ට විපත් සිදු කරණ සියලු කෙලෙස් මූළුමනින් නසා සිටි බැවින් හා පරිත්‍යාගයන් සමෘද්ධියට පත් කරණ ශීලසමාධ්‍යාදි ගුණයෙන් මූළුමනින් වැඩී සිටි බැවින් හා එබඳු පරිත්‍යාගයන්ට සුදුස්සන් අතුරෙහි ප්‍රධාන ව සිටි බැවින් බුදුරජාණන් වහන්සේ ශ්‍රද්ධාවන් ලොකයාගේ සිවුපසයට හා සෙසු පුදවෙසෙසුන්ට ද සුදුසු ව සිටි සේක. එහෙයින් ම ය බුදුරජුන් ලොව දිනූ පසු ඉන් පෙර, පිදිවිලි ලත් සෙස්සෝ ඒ ලත් පිදිවිලිවලින් ඔබ්බනෝ. බුඬ ප්‍රමුඛආර්‍යසීමහාසඞ්ඝයා වහන්සේ ම පූජාසත්කාරයනට සෙසු හැම කෙනකුට ම වඩා සුදුසු බැවින් සහම්පති මහාබ්‍රහ්මයා විසින් මහමෙර තරම් රුවන් දමකින් පුදන ලද්දාහ. සෙසු ශක්‍ර-බ්‍රහ්මාදීහු ද නොයෙක් පූජාසත්කාරයන්ගෙන් උන්වහන්සේ පිදූහ.

කොසල බිම්බිසාර, ධර්මාශොකාදිරජහු නොයෙක් ලෙසින් උත්වහන්සේ පිදූහ. එහෙයින් උත්වහන්සේ රහතුන් වහන්සේ ය. එහි ලා මෙ ද දන්නේ ය:-

'පූජා විසෙසං සහපච්චයෙහි
යස්මා අයං අරහති ලොකනාථෝ,
අත්‍ථානුරූපං අරහනති ලොකෙ
තස්මා ජිනෝ අරහති නාමමෙතං' යනු.

බුදුරජානන් වහන්සේ චීවරාදී වූ සිවුපසය සමග සියලු පූජා විශෙෂයන්ට යම් හෙයකින් සුදුසු වන සේක් ද, එහෙයින් උන් වහන්සේ ලොකයෙහි අර්හත් වූ ම රහතුන් වහන්සේ ය.

'න රහො කරොති පාපානි තෙන අරහං' රහසින් වත් පව් නො කරණ බැවින් රහත් නම්. බුදුරජානන් වහන්සේ ලොභ-ද්වෙෂ -මොහාදිසකලපාපහෙතූන් මූළුමනින් නැසූ සේක. කීර්තිකාම-යෙන් මැඩුනු බොහෝ දෙන, අපකීර්තියට බියෙන් රහසින් පව් කරති. එ පරිද්දෙන් බුදුරජානන් වහන්සේ රහසත් පව් නො කරණ බැවින් රහතුන් වහන්සේ ය. එහි ලා මෙ ද දන්නේ ය:-

'යස්මා නත්‍ථි රහො නාම පාපකමෙසු තාදිනො,
රහාභාවෙන තෙනෙස අරහං ඉති විස්සුතො' යනු.

පව්කම්හි බුදුරජානන් වහන්සේගේ රහසෙක් නැත. එසේ පව් කිරීමෙහි රහසක් නැති බැවින් උන්වහන්සේ රහතුන් වහන්සේ ය.

තව ද උන්වහන්සේ නුවණැත්තන්ගෙත් ඇත්ව සිටි බැවින් නුවණැත්තන්ට සමීප බැවින් පාපධර්මයන් පහ කළ බැවින් නුවණැත්තන් විසින් පිදිය යුතු බැවින් සසරගමන් නැති බැවින් දෙව්බඹුන් ඇ විසින් පැසසිය යුතු බැවින් රහතුන් වහන්සේ ය.

'ආරකා මන්දබුද්ධිනං ආරකා ච විජානතං,
රහානං සුපගීණත්තා විදූනමරහෙය්‍යතො,
භවෙසු ච රහාභාවා පාසංසා අරහං ජිනෝ'

යනු ඒ අර්හත්ත්වය පිළිබඳ පාළිය ය.

ලාමක අදහස් ඇති යම් මිනිස් කෙනෙක් මනා කොට නො පිළිපදින් නම්, බුදුරජානන් වහන්සේ ඔවුන් කෙරෙහි ඉතා ඈත්හි සිටියාහ. එහෙයින් රහතුන් වහන්සේ ය. එහි ලා මෙසේ දන්නේ ය:-

'සම්මා න පටිපජ්ජන්ති යෙ නිහීනාසයා නරා,
ආරකා තෙහි භගවා දූරෙ තෙනාරහං මතෝ' යනු.

අතිශයප්‍රණීතඅද්‍ධ්‍යාසයෙන් යුත් යම් කෙනෙක් මනා කොට පිළිපදිත් ද, බුදුරජානන් වහන්සේ ඔවුන්ට ඉතාලං ව සිටි සේක. එහෙයින් උන්වහන්සේ රහතුන් වහන්සේ ය. එහි ලා මෙසේ දන්නේය:-

'යෙ සම්මා පටිපජ්ජන්ති සුප්පණිතාධිමුත්තකා,
ආරකා තෙහි ආසන්නෙ තෙනාපි අරහං ජිනො' යනු.

සත්පුරුෂයන් විසින් හැරිය යුතු බැවින් අකුශලයෝ රහ නම් වෙත්. ඔවුන් මුළුමනින් ප්‍රහීණ කළ බැවින් බුදුරජානන් වහන්සේ රහතුන් වහන්සේ ය. එහෙයින් කීහ:-

'පාපධම්මා රහා නාම සාධූහි රහිතබ්බතො,
තෙසං සුට්ඨු පහීණත්තා භගවා අරහං මතො' යනු.

ප්‍රත්‍යක්ෂ කළ සඩමීය ඇති, පරිශුද්ධ ගොචර ඇති යම් ආර්‍ය්‍ය කෙනෙක් වෙත් ද, ඒ ආර්‍ය්‍යයන් විසින් අත් නො හරින ලද බුදු රජානන් වහන්සේ රහතුන් වහන්සේ ය. කීහ එහෙයින් මෙසේ:-

'යෙ සච්ඡිකතසඩම්මා අරියා සුද්ධගොචරා,
න තෙහි රහිතො හොති නාථො තෙනාරහං මනො, යනු.

යම් උත්තමයකුට රහසෙක් හෝ චුතිපටිසන්ධි වසයෙන් සසර ගමනෙක් හෝ නැත්තේ ද, පැහූ මරණ ඇති උන්වහන්සේ රහතුන් වහන්සේ ය. මේ එය කියූ සැටි:-

'රහො වා ගමනං යස්ස සංසාරෙ නත්ථි සබ්බසො,
පහීණජාතිමරණො අරහං සුගතො මාතො' යනු.

දෙවියන් සහිත ලොකයෙහි යමකු හා ගුණයෙන් සමානයෙක් නැත්තේ ද, එහෙයින් පැසසිය යුතු බැවින් බුදුරජානන් වහන්සේ රහතුන් වහන්සේ ය. මෙය එහිලා දතයුතුයි:-

'ගුණෙහි සදිසො නත්ථි යස්මා ලොකෙ සදෙවකෙ,
තස්මා පාසංසියත්තාපි අරහං දිපදුත්තමො' යනු.

තංභූමි රාමණෙය්‍යකා = ඒ බිම සිත්කලු ය.

'භවන්ත්‍යස්මින් භූතානීති = භූමි' යනු නිරුක්ති යි. 'භූ' ධාතුවෙන් **මික්'** ප්‍රත්‍යය ව සිඩ ය. ඉකාරන්ත ය. සත්‍රිලිඞ්ගික ය. විකල්පයෙන් **ඩීප්'** ප්‍රත්‍යය ව ඊකාරන්ත ව ද, එයි. **තංභූමි'** යනු සම්‍යතපදයෙකි. තශබ්දය අනික් ශබ්දයක් හා සමාස වූ කල්හි මධ්‍යයෙහි නිග්ගහීතයෙක් ආගම වේ. මෙම කීහ:-

'තසද්දස්ස සමාසම්හි සද්ධිං පරපදෙහි වෙ,
නිග්ගහීතාගමො පුබ්බපදෙ චිත්තන්තු පච්ඡිමෙ' යි.

'භූතයෝ මෙහි වෙත් නු' යි භූමි නම්. සිත් ඇලීමට සුදුසු වූයේ **රාමණෙය්‍යක'** නම්. භූමිශබදය බලා රාමණෙය්‍යකා යි විය.

කෙලෙස් නැසූ උතුමන්ගේ පා පහස ලත් සිත් පිත් නැති වස්තූහු ද ලොකයෙහි මහත් බවට පිදිය යුතු බවට ගියහ. එහෙයින් ඒ වස්තූහු සදෙවකලොකයා විසින් පුදනු ලබති. එහෙයින් රහතුන් වහන්සේලා වාසය කළ ගම් පෙදෙස් වන පෙදෙස් ඈ හැම තැනක් ම සිත්කලු ය. මන වඩා, යි වදාළ සේක. ඒ තැන් පිදීම දෙව් මිනිසුන්ට හිත පිණිස සැප පිණිස වන්නේ ය. රහතුන් වහන්සේලා, ගම්පෙදෙස් මිනිසුන්ගේ එකතුවීම් හැසිරීම් ආදිය තදින් පවත්නා තැන් බැවින්, එ තැන්හි කායවිවෙකය නො ලබති. කෙලෙසුන් හා එක්වීමක් නැති බැවින් චිත්තවිවෙකය නම් ලබත්. දිව්‍යරූප වැනි රූප, දිව්‍යශබද වැනි ශබද, දිව්‍යගන්ධ වැනි ගන්ධ, දිව්‍යරස වැනි රස, දිව්‍යස්පර්ශ වැනි ස්පර්ශ උන්වහන්සේලා මැඩීමෙහි උන්වහන්සේලාගේ සිත් සොලවාලීමෙහි අපොහොසත් ය. නො සමත් ය. එහෙයින් උන්වහන්සේලා ගමෙහි වේවා, වෙනෙහි වේවා, අන් තැනෙක වේවා, කොතැනෙක විසුවෝ ද එතැන නම් එකාන්තයෙන් සින්කලු ය. ලොවට හිත ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහ.

ඉන් පසු දවසෙක භික්ෂූන් වහන්සේලා 'ඇවැත්නි! සීවලී ස්ථවිරයෝ සත් අවුරුදු සත් මස් සත් දවසක් මවු කුස දුක් වින්දෝ ය. නිරයෙහි ඉපිද බොහෝ කලක් නිරය දුක් වින්දෝ ය. මෙකල මහත් සත්කාර ලබති' යි කතා කරන්නට වූහ. ඒ අතර එහි වැඩම කළ බුදුරජානන් වහන්සේ මේ කතාව අසා සීවලී තෙරුන් පෙර කළකම් මෙසේ දක්වා වදාළ සේක:-

'මහණෙනි! විපස්සි බුදුරජුන්ගේ ලොව ඉපදීම මෙයට කප් එක් අනුවකට පෙර සිදු විය, උන්වහන්සේ එ දවස ලොවට හිත සැප පිණිස දනවු සැරිසරා ගොස් පෙරළා තම පිය රජු අයත් නුවරට වැඩියාහ, එදා රජ තෙමේ උන්වහන්සේලාට දන් පිළියෙල කොට නුවරවැස්සන්ටත් එයට එක්වන්නට දන්වා යැවී ය, දැන් වූ ලෙසින් ඔවුහු එයට උදව් කළහ, පසු දා ඔවුහු හැම කෙනෙක් එක් ව කතා කොට රජු දුන් දානයට වඩා හැම අතින් ම උසස් ලෙසින් දන් පිළියෙළ කොට බුදුරජුන්ට පවරා, රජුට ද දන්වා යැවූහ, රජ තෙමේ එහි ගොස් දන් බලා, මම හෙට මෙයට වඩා සරුසාර ලෙසින් දන් දෙමි' යි සිතා පසුදාට බුදුරජුන්ට ආරාධනා කෙළේ ය, උන්වහන්සේ භික්ෂුසඞ්ඝයා ත් සමග එහි වැඩ දන්

වැළඳූහ, එහෙත් රජ තෙමේත් දන් දීමෙන් නුවර වැස්සත් පැරදවීමට අපොහොසත් විය, එසේ ම නුවර වැස්සෝත් රජු පැරදවීමට අපොහොසත් වූහ, රජු හා නුවර වැස්සෝ මෙසේ උනුන් තරඬයට බැස දන් දුන්හ. නුවර වැස්සෝ සවන වර 'දැනයට මෙ නම් දෙය නැතැ' යි කිසිවකුටත් නො කියැකි ලෙසින් දන් පිළියෙල කොට නැවැත නැවැතත් අඩු මොනවා දැ යි එකෙනෙක පරීක්ෂා කොට බැලූහ, මෙසේ එකිනෙක පරීක්ෂා කොට බලන්නෝ, අළුත් මීවද නො දුක, 'පැසවා ගත් මී කොතරම් වත් තිබේ, නැත්තේ අළුත් මීවදැ' යි මිනිසුන් සතර දෙනකු, එකාට කහවණු දහස බැගින් කහවණු සාරදහසක් දී මීවද ගන්නා පිණිස නුවර සතර පැත්තේ දෙරටු සතරෙහි නැවැත් වූහ, ඒ වේලෙහි පිටිසර මිනිසෙක් ගම්මුලාදැනි තැන හමුවන්නට එන්නේ අතර මගදී මීවද වෙළඳකුගෙන් අත්ත පිටින් ම මීවදයක් මිල දී ගෙණ එහි නුවර මැස්සත් හා පිලවුන් බැහැර කොට, 'ගම්මුලාදැනියාට දෙන්නෙමි' යි ගෙණ නුවරට ඇතුල් විය, මී සොය සොයා එහි සිටි මිනිහෙක් ඒ දුක, 'ඔය! ඔය විකුණන මියක් දැ' යි ඔහු ගෙන් ඇසී ය, ඔහු එක්වර ම 'නැතැ' යි කීයේ ය, 'මුදල් ටිකක් ගෙණ මීවදය මට දෙන්නැ' යි නැවැතත් ඔහු ඉල්ලී ය, එවිට ඒ පුරුෂ තෙමේ, 'මේ මීවදය පතාගයකුත් නො වටී, එහෙත් මොහු මේ මීවදයට කහවණුවක් දෙන බව කියයි, සල්ලිකාරයකු වගේ ය මොහු පෙනෙන්නේ, ඒ නිසා තව ටිකක් ගණන වැඩි කළ යුතු ය'යි සිතා ඒ ගණනට දිය නො හැකිය, යි කී ය,

එවිට 'එහෙ නම් මෙන්න, කහවණු දෙකක්' යි ඔහු කීයේ ය. මීවදය අයිති තැනැත්තේ එයට දැ කැමැත්තේ නො වී ය' ක්‍රමයෙන් මීවදය කහවණු දහසට නැංගේ ය, මීවදය ඉල්ලා සිටි තැනැත්තේ තම අත තුබූ කහවණු දහස ම ඔහු වෙතට දික් කෙළේ ය, එවිට අනික් තැනැත්තේ, 'ඔය! තමුසේට පිස්සු ද, මුදල්වලට කරන්නට වැඩක් නැති නිසා ද මෙසේ කරන්නහු, මේ මීවදය පතාගයකුත් නො වටී, එහෙත් තමුසේ දහසකට එය ඉල්ලන්නහුය' යි කීයේ ය, 'ඔව්! තමුසේ කියන එක ඇත්ත යි, මමත් එය දනිමි, මෙයින් ලොකු වැඩක් නැත, ලොකු ගණනක් නො වටී, ඒ වුනත් මට මේ වේලේ මෙයින් වැඩක් තිබෙන නිසා නො වටින ගණන් වත් දීලා ගන්නව සිතුයෙමි' යි ඉල්ලුම්කරු කී විට, 'මෙයින් ඇති වැඩේ කුමක් දැ' යි නැවැත ඇසී ය, 'අටසැට දහසක් භික්ෂූන් වහන්සේ පිරිවරා ගත් විපස්සී බුදුරජාණන් වහන්සේට හෙට දානයක් පිළිගැන්වීමට කටයුතු සූදානම් කොට තිබේ, කෑ යුතු පියයුතු හැම දෙයක් ම එහි ඇත්තේ ය, නැත්තේ අළුත් මීවද

පමණෙකැ' යි ඔහු කියා, 'හා! එහෙම ද, දැනයකට ද, එහෙනම් මට මෙයට මුදල් වුවමනා නැත, මුදලට නො දෙමි, මටත් දැනයේ පින් ලැබේ නම්, මම නො මිලයේ දෙන්නෙමි' යි මේවදය අසිතිකරු කී ය,

මේවදය ඉල්ලුම්කරු මේ වග අනික් නුවර වැස්සන්ට දන්වා සිටියේ ය, ඔවුහු මොහුගේ ශ්‍රද්ධාව මහත් බව දැන, 'හා! හොඳ යි, අපි එයට කැමැත්තෙමු, පින් දෙන්නෙමු, පින් අනුමෝදන් වෙව' යි කීහ, හේ මේවදය ඔවුන්ට දුන්නේ ය, ඔවුහු එය දැනශාලාවට ගෙණ ගියහ, දැනය සඳහා බුද්ධප්‍රමුඛ මහා-සඞ්ඝයා වහන්සේ වැඩි සේක, දැයකයෝ උත්වහන්සේලා වඩා-හිඳුවා පැන් පිළිගන්වා කැඳ කැවිලි වැළඳෙව්වාහු ය, නැවැත ලොකු රන්තැටියක් ගෙණවුත් මේවදය එහි ලා මිරිකූහ, මේවදය ගෙණා තැනැත්තේ පඬුරු පිණිස, දිසැලියක් ද ගෙණා යේ ය, හෙතෙමේ ම ඒ දී රන්තැටියේ ම වත් කොට මී පැණින් සමග හනා බුද්ධප්‍රමුඛ සඞ්ඝයා වහන්සේට මූල සිට පිළිගැන්වී ය, ඒ මී හා දී උත්වහන්-සේලා තමන්ට සැහෙන පමණින් වැළඳූහ, එහෙත් තව ඉතිරි විය, මේ මිපැණි ටික මෙතෙක් බොහෝ දෙනාට කෙසේ සැ හීදැ, හි නො සිතිය යුතු ය, බුදුරජාණන් වහන්සේගේ අනුභාවයෙන් ම එය හැම දෙනකුට ම සැහී ගියේ ය. බුඩවිෂය නො සිතිය යුතු ය, නො සිතිය හැකි ය, යි වදාළ කරුණු සතරෙක් ඇත්තේ ය, ඒ කරුණු ගැණ යමෙක් සිතන්නේ නම් ඔහු උමතු බවට පැමිණෙන්නේ ය,

මේවද දුන් ඒ පුරුෂ තෙමේ ඒ සුලු පින්කමින් මරණින් පසු දෙව්ලොව ඉපද, මෙතෙක් සැරිසරා එන්නේ දෙව්ලොවින්, චුත ව එක් කලෙක බරණැස් නුවර රජගෙදරක උපන්නේ ය, පිය රජුගේ ඇවැමේන් රජබවට පත් ඔහු රටක් වට කොට 'රට දෙවු, නැත, යුඬ කරමු' යි රටවැසියන්ට දන්වා යැවී ය, රට වැස්සෝ 'රටත් නො දෙමු, යුඬත් නො කරමු' යි දන්වා යවා සතර වාසල අගුලු ලා ගත්හ, ඔවුහු රහස් දොරින් නික්ම දර පැන් ආදිය නුවරට ඇතුල් කර ගණිති, එ මගින් සියලු කටයුතු කෙරෙති, රජ තෙමේ සතර මහදොර රක්නේ, සත් අවුරුදු සත් මසක් නුවර අවුරා ගෙණ සිටියේ ය, එවිට මවු තොමෝ 'මා පුත් කුමක් කරන්නේ දැ' යි අසා එපවත් දැන, 'මපුතුට කිසිවක් නො දැනේ, ඔහුට කිසිත් තේරුමක් නැත, යවු! එ නුවර ඇති කුඩා දොරටුත් වසා අවුරන්නට කියවු' යි දන්වා යැවූ ය, ඔහු ද මැනියන් කියූ ලෙසට කුඩා දොරටුත් අහුරවා සිටියේ ය, නුවර වැස්සන්ට බැහැරට එන්නට මං නැති වූ බැවින්

සත්වන දා තමන්ගේ රජු මරා ඔහුට රජය දුන්හ, ඔහු මේ කර්මය කොට මරණින් මතු අවීචිමහානිරයෙහි ඉපිද පොළොව යොදුනක් වැඩෙන තුරු ම එහි පැසී ඉන් චුත ව මිනිස් ලොව උපන්නේ ය, කුඩා දෙරටු සතර අවුරන්නට උපදෙස් දුන් පුරාණ මවගේ ම කුසයෙහි පිළිසිඳ ගත්තේ ය, සත් අවුරුදු සත් මසක් මවු කුස හුන් මෙතෙමේ සත් දවසක් ම යොනිමුඛයෙහි වැටී සරස් ව හොත්තේ ය, මහණෙනි! සීවලි, පෙර කළ ඒ අකුශල කර්මයෙන් මෙතෙක් නිරයෙහි පැසී ඉන් චුත ව මිනිස් ලොව උපදින තැනේදී එදා ඒ කුඩා දෙරටු වැසීමට උපදෙස් දුන් සත්‍රිය කුස ඉපද මෙතෙක් කල් ඒ මවුකුස විසී ය, අළුත් මීව ද දුන් පිණෙන් මෙතැන දී මහත් ලාභයෙන් අගතැන් ගත්තේ ය'යි.

නැවැත දිනෙක භික්ෂූන් වහන්සේලා එක් ව, 'අයියෝ! පුදුම ය, හෙරණුන්ගේ ලාභය ද පුදුම ය, පිණ ද පුදුම ය, එකලාවූවහු විසින් පන්සියයක් භික්ෂූන්ට කුළු ගෙවල් පන්සියයක් කරවන ලද්දේය, යි කතා කරමින් සිටිය දී එහි වැඩි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! මාගේ පුතුට පිණකුත් නැත, පවකුත් නැත, පින් පව් දෙක ම ම පුතු බැහැර කෙළේය' යි. බ්‍රාහ්මණවර්ගයෙහි එන මේ ගාථාව වදාළ සේක:-

'යොධ පුඤ්ඤං ච පාපං ච උභො සඞ්ගං උපච්චගා,
අසොකං විරජං සුඛං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං' යි

බදිරවනියරෙවතස්ථවිරවස්තුව නිමියේ ය.

වෙසඟනක්.

7 – 10

අප බුදුරජුන් දවස පිඬු සිඟා වැළඳීමෙන් දිවි ගලවන එක් මහණෙක් බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ පැරණි උයනකට වැදී මහණදම් කරන්නේ ය. එදවස ම එතුවර විසූ වෙසඟනක් එක් පුරුෂයකුට 'මම අසවල් තැනට එන්නෙමි, ඔබ එතැනට ආ යුතු ය, යි සලකුණු කියා යියා ය. එහෙත් ඒ පුරුෂයා ඇ කියූ තැනට නො ගියේ ය. වෙසඟන ඔහු එතු බලා සිට නො පැමිණි බැවින් නො ඉවසිල්ලෙන් අතන මෙතන ඇවිදින්නී භික්ෂූන් වහන්සේ කමටහන් වඩමින් හුන් උයනට වැදුනී, එහි අහරමිණිය ගොතා හුන් ඒ භික්ෂු දුටුවා ය. දැකත් එහි ද කවරකු හෝ සොයමින් තැන තැන අවිදින්නී, එක්වන්නට අන් පිරිමියකු, නො ලැබ 'මේ ඉන්නේ පිරිමියෙක, මූවත් රවටා ගෙණ අමාරුව පිරිමසා ගණිමි' යි සිතා උන්වහන්සේට මූණ හරවා ඇඳ සිටි රෙද්ද කිහිපවරක් ම ලිහලිහා අඳින්නටත් කෙස්ස කඩ කඩා බඳින්නටත් තවත් නොයෙක් ඉඟිබිඟි කරන්නටත් සිනාසෙන්නටත් පටන්ගත්තා ය. යොගී භික්ෂූන් වහන්සේ ඒ දැක තැති ගත්හ. බලවත් සංවෙගයට පැමිණියහ. මුළු සිරුර එය පැතිර ගියේ ය. ප්‍රේතියකගේ විකාරයකැ, යි උන්වහන්සේට සිත් විය.

ඒ අතර බුදුරජානන් වහන්සේ තමන් වහන්සේ වෙතින් කමටහන් ගෙණ ගිය ඒ භික්ෂුහුගේ තොරතුරු බලා වදාළ සේක. එවිට වෙසඟනක ඇ කරණ නො හොබිනා ක්‍රියාත් දැක භික්ෂුහට එහිලා සංවෙග උපන්බව ද දැක ගදකිළියෙහි ම වැඩහිඳ ඔහුට 'මහණ! සල්ලාලයන් නො ඇලෙන තැන ම, පහ කළ රාගය ඇත්තන් ඇලෙන තැන වන්නේ ය' යි වදාරා ආලොකය පතුරුවා මේ ධර්මදේශනාව ද කළ සේක:–

රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී මනෝ,
විතරාගා රමිස්සන්ති න තෙ කාමගවෙසිනෝ හි.

වන පෙදෙස සිත් කලුය. කාමිජන තෙමේ යම් තැනෙක නො ඇලේ නම්, රහතුත් වහන්සේලා එ තැන ඇලෙන්නාහ. උන්වහන්සේලා කාමය සොයන්නෝ නො වෙති.

රමණීයානි අරඤ්ඤානි = වනයෝ සිත්කලු වෙති.

මනා කොට මල් පිපි සිටි ගස් වැල්වලින් ගහන වූ පහන් දියෙන් හා පියුම් උපුල් හෙල්මැලි කුමුදුමල් ආදියෙන් පිරුණු

කැසුබ් ආදීන්ගෙන් ගැවසී ගත් විල්වලින් ශොභමාන වූ වනයෝ ම වැඩියක් සිත්කලු වෙති. සිත් ඇලෙන්නේ එබඳු තැන්හි ය. මෙහි ප්‍රධාන විසින් අභිමත එබඳු වනයෝ ය. **'අරියතෙ ගම්‍යතෙති = අරඤ්ඤං'** ප්‍රයොජන ඇත්තන් විසින් එළඹෙනු ලැබේ නු යි අරඤ්ඤ නම්.

යත්ථ න රමතී ජනො = කාමීජන තෙමේ යම් තැනෙක නො ඇලේ ද.

මෙහි **ජන** නම්, වස්තුකාම ක්ලෙශකාමයන් සොයන බලන එහි ගැලෙන සාමාන්‍යයා ය. **'කුසලා කුසලං ජනෙතීති = ජනො,** කුසල් අකුසල් උපදවන්නේ ජන නම්. වස්තුකාම ක්ලෙශ කාමයන් සපයමින් එහි බැඳී සිටින තැනැත්තේ මහත්ත්වයෙන් හීන වූයේ කිසිත් වෙසෙසුමක් නො කොට ජනැ යි දක්වන ලද්දේ ය. කාම වස්තුන්හි ගිජුව ඒ ම රැස් කරන්නේ, පුල්පියුම් ආදියෙන් ගැවසීගත් වන පෙදෙස්හි නො ඇලෙයි. පුල් පියුම් වෙනෙහි නො ඇලෙන නීලමැස්සන් සේ.

වීතරාගා රමිස්සන්ති = රහතුන් වහන්සේලා ඇලෙන්නාහ.

කාමරාග - රූපරාග - අරූපරාගයන් මුලසුන් කොට සිටියෝ වීතරාගීහු ය. රහතුන් වහන්සේ ය.

එකොළොස් අයුරකින් බෙදුනු කාමලොකයෙහි ඉන්ද්‍රියා නින්ද්‍රියබඩවස්තුන් කෙරෙහි ඇල්ම, ගිජුකම, **කාමරාග** නම්. මෙහි ඒ ඇලුම දැඩි කල්හි රාග යි ද, දුර්වල කල්හි ඡන්ද යි ද කියත්

'කතමෙ ධම්මා කාමාවචරා? හෙඨතො අවීචිනිරයං පරියන්තං කත්වා උපරිතො පරනිම්මිතවසවත්තී දෙවෙ අන්තො කරිත්වා යං එතස්මිං අන්තරෙ ඵත්ථාවචරා ඵත්ථ පරියාපන්නා ඛන්ධ ධාතුආයතනා, ඉමෙ ධම්මා කාමාවචරා' අවීචියේ පටන් පරනිර්මිතවශවර්තී දෙවියන් තෙක් මේ අතර අවකාශයෙහි දැඩි ව හැසිරෙන සකන්ධ ධාතු ආයතනයෝ කාමාවචර නම් වෙති.

කාමාවචරසකන්ධාදීන් කෙරෙහි පවත්නා කාමවස්තුන්—— කෙරෙහි වූ ඒ මේ ඇල්ම, ගිජුකම සංසකාරසකන්ධයෙහි ඇතුළත් වේ. මනොවිඥානයෙන් දත යුතු ය. මොහුගේ ඉපැත්මට ප්‍රධාන විසින් හෙතු වන්නේ, ශුභනිමිත්ත හා අයොනිසොමනසිකාර යන මෙදෙක ය. ශුභනිමිත්ත නම් රාගයාගේ ඉපැත්මට කරුණු වූ ඉටු අරමුණ ය. නො මගින් කරණ කල්පනාව අයොනිසොමනසිකාරයි.

රූපරාග නම්, රූපභවයෙහි පවත්නා ඡන්දරාග ය යි. බලවත් ඇල්ම ය.

'කතමෙ ධම්මා රූපාවචරා? හෙට්ඨතො බ්‍රහ්මලොකං පරියන්තං කත්වා උපරිතො අකනිට්ඨෙ දෙවෙ අන්තොනා කරිත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධාතුආයතනා ඉමෙ ධම්මා රූපාවචරා, බ්‍රහ්මපාරිෂද්‍යබ්‍රහ්මලොකය පටන් අකනිට්ඨ බඹලොව තෙක් මේ අතර පවත්නා සකඛන්ධාතුආයතනයෝ රූපාවචරයෝ ය. මේ කී රූපාවචරයන්හි පවත්නා ඇල්ම යි්දුකම රූපරාග යි ගැණේ.

ප්‍රථමධ්‍යානභූමියක් වූ බ්‍රහ්මපාරිෂද්‍යයෙහි ආයුකාලය, අසඞ්ඛ්‍ය කල්පයෙන් තුනෙන් පංගුවක් වේ. එහි වූවෝ මහාබ්‍රහ්මයන් ගේ පරිවාරකයන් බැවින් **බ්‍රහ්මපාරිසජ්ජ** යි කියනු ලැබෙත්. බ්‍රහ්ම පුරොහිතයෙහි ආයුකාලය, උපාඞ්ගකල්පයෙකි. ඔවුහු මහාබ්‍රහ්මයන්ගේ පුරොහිතයන් බැවින් **බ්‍රහ්මපුරොහිත** නම්. අසඞ්ඛ්‍ය කල්පයෙක්, මහාබ්‍රහ්මයන්ගේ ආයුකාලය යි. සහස්සබ්‍රහ්ම – දිසහස්සබ්‍රහ්ම ඇ විසින් පැහැයෙන් හා ආයුකාලයෙන් හා සැපයින් හා අන් දෙතල වැසියනට වඩා මහත් බැවින් **මහාබ්‍රහ්ම** නම්. සහස්සබ්‍රහ්ම යි කියන්නේ සක්වළ දහසකට අධිපති වූ බ්‍රහ්ම තෙමේ ය. සක්වළ දෙදහසකට අධිපති වූගේ දිසහස්ස නම්. බ්‍රහ්මපාරිසජ්ජයෝ හීනයහ. බ්‍රහ්මපුරෝහිතයෝ මධ්‍යමයහ. මහාබ්‍රහ්මයෝ ශ්‍රෙෂ්ඨයහ. මේ බඹතල තුන ප්‍රථම ධ්‍යානභූමි යි. මෙ තුන සමතලයෙහි පිහිටියේ ය.

මද ආලොකය ඇත්තේ **පරිත්තාභ** නම්. ආයුකාලය මහාකල්ප දෙකෙකි. සීමා කොට නොදැක්ක හැකි තරමට ආලොකය ඇත්තේ **අප්පමාණාභ** නම්. ආයුකාලය, මහාකල්ප සතරෙකි. වලාගැබකින් විදුලි කලඹක් නික්ම යන්නා සේ ඔබ නොබ විසිර යන ආලොකය ඇත්තේ **ආභස්සර** නම්. ආයු, මහාකල්ප අටෙකි. ශ්‍රෙෂ්ඨයෝ ආභස්සරයෝ ය. පරිත්තාභ – අප්පමාණාභයෝ ඔවුන්ගේ පරිවාරකයෝත් පුරොහිතයෝත් වෙති. මෙ තුන තෘතීයධ්‍යාන භූමි යි. සමතලයෙහි පිහිටියේ ය.

එකට හැනී සිටි ආලොකය ඇත්තේ **පරිත්තසුභ** නම්. ආයු, කප් සොළොසෙකි. පමණ නොකොටැකි ආලොකය ඇත්තේ **අප්පමාණසුභ** නම්. මහාකප් දෙතිසෙක් ඔවුන්ගේ ආයුකාලය යි. ආලොකයෙන් හැම අතකින් ආකීර්ණවූගේ **සුභකිණ්හ** නම්. සූසැට කපෙක්, ඔවුන්ගේ ආයුකාලය යි. ශ්‍රෙෂ්ඨයෝ සුභකිණ්හයෝ ය. පරිත්තසුභ - අප්පමාණසුභයෝ හීන මධ්‍යම වෙති. මෙතුන තෘතීයධ්‍යාන භූමි යි. සමතලයෙහි පිහිටියේ ය.

මහත්ඵල ඇත්තේ **වෙහප්ඵල** නම්. ධ්‍යානබලයෙන් ලැබූ මහත්ඵල ඇත්තේ ය. වෙහප්ඵල – අසඤ්ඤසත්ත දෙ තලවැස්සන්ගේ ජීවනකාලය, පන්සිය කපෙකි. වෙදනා–සංඥා–සංඝකාර–විඥාන (නාමසකන්ධ) නැත්තේ **අසඤ්ඤසත්ත** නම්. ඇත්තේ රූප–සකන්ධය පමණෙකි. මෙ දෙක සමතලයෙහි පිහිටියේ ය.

සුඛාවාසබඹතල පසෙකි. විස්තර යට කියන ලද්දේ ය. අවිහයෙහි ජීවනකාලය, කප් දහසෙකි. අතප්පයෙහි දෙදහසෙකි. සුදස්සයෙහි සාර දහසෙකි. සුදස්සියෙහි අට දහසෙකි. අකනිඨයෙහි සොළොස් දහසෙකි. මේ හැම චතුර්ථධ්‍යානභූමි යි.

මේ සොළොස් බඹතලයෙහි ආයුකාලයත් සම්පත්තියත් බලවත් බැවින් එයට අයත් සකන්ධාදීන් කෙරෙහි ඇති ඇල්ම බලවත් ය. එම රූපරාග නම්. මෙය ඉපැදෙනුයේ එහි ආයුසම්පත්ත්‍යාදිය මහත් බැවින් නිත්‍ය, ශුභ, සුඛ ඈ විසින් ගැණීමෙනි.

අරූපාරාග නම්, අරූපභවයෙහි පවත්නා ඡන්දරාගය යි

'කතමෙ ධම්මා අරූපාවචරා? හෙඨතො ආකාසානඤ්චායතනූපගෙ දෙවෙ පරියන්තං කත්වා උපරිතො නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගෙ දෙවෙ අන්තො කරිත්වා එත්ථාවචරා එත්ථ පරියාපන්නා ඛන්ධධාතු ආයතනා ඉමෙ ධම්මා අරූපාවචරා' ආකාසානඤ්චායතනය පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් ඇති බඹලොව සතරෙහි හැසිරෙන සකන්ධධාතුආයතනයෝ අරූපාවචරයෝ ය. මෙ කී අරූපාවචරයන්හි පවත්නා ඇල්ම, ගිජුකම අරූපරාගය යි ගැණේ. විස්තර යට කියන ලද්දේ ය. ආකාසානඤ්චායතනූපගදෙවියන්ට ආයු, කප් විසි දහසෙක්. විඤ්ඤාණඤ්චායතනූපගදෙවියන්ට කප් සතලිස් දහසෙක්. ආකිඤ්චඤ්ඤායතනූපග දෙවියන්ට කප් සැට දහසෙක්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගදෙවියන්ට කප් අසූ සාර දහසෙක් ආයු. මේ මොවුන් පිළිබඳ ථූල–සණ්හ–සණ්හතර–සණ්හතමභාවය පිළිවෙළින් වන්නේ ය.

කාමරාගයාගේ පැහීම අනාගාමීමාර්ගඥානයෙන්, රූපරාග–අරූපරාගයන්ගේ පැහීම අර්හත්මාර්ගඥානයෙන් වේ. එ ද කෙලෙස් පිළිවෙළින් හා මගපිළිවෙළිනි. කෙලෙස්පිළිවෙළින් වන කල්හි කාමරාගයාගේ පැහීම අනාගාමීමාර්ගයෙන් ද, රූපරාග – අරූපරාගයන්ගේ පැහීම අර්හත්මාර්ගයෙන් ද වේ. මගපිළිවෙළින් වන කල්හි කාමරාගයාගේ තුනීබව සකෘදාගාමීමාර්ගයෙන් වන කල්හි, නිරවශෙෂ ප්‍රහාණය අනාගාමීමාර්ගයෙන් ද වේ. රූපරාග – අරූප–

රාගයන්ගේ ප්‍රහාණය වනුයේ අනීනමාගීයෙනි. මෙසේ තුනී වන්නට පැහීමට පෙර ද තදඞ්ග - විෂකමහණ විසිනුදු මොවුන්ගේ එක්තරා පැහීමෙක් වේ. තදඞ්ගාදීන්ගේ ප්‍රහාණයෙන් කිසි කෙනෙක් විතරාගී නො වෙති. මෙහි දුක්වූනෝ මාගීයෙන් නැසූ කාමරාගාදිය ඇති රහතුන් වහන්සේ ය. සාමාන්‍යජනයා නො ඇලෙන වන-පෙදෙස්හි ඇලෙන්නෝ මුත්වහන්සේලා ය.

න තෙ කාමගවෙසිනො = උන්වහන්සේලා කම්සැප නො සොයන්නෝ ය.

කාමගවෙෂකයෝ රැදෙවේලේ කාමවස්තූන් සොය සොයා ඇවිදින්නෝ **කාමවස්තූන්හි** ඇලී ගැලී සිටින්නෝ මෙබඳු සිත්කලු වනපෙදෙස්හි ඇලීමෙහි අපොහොසත් වෙති. එයට හෙතු ඔවුන් රැදෙවේලේ **කෙලෙසුන්** විසින් හා ප්‍රකට අප්‍රකට තවත් නොයෙක් උවදුරින් පෙළෙන මැඩෙන මිරිකෙන බැවිනි.[1]

'අබලා නං බලියන්ති මද්දන්‍යෙව නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නාමිවොදකං'

දුර්ලකෙලෙශයෝ පවා කම්සැප සොයා යන්නහු පෙළති. මඬිති. ප්‍රකට අප්‍රකට උවදුරු ද කම්සැප සොයන්නා මඬිත්. ඒ හෙතුවෙන් දුක ඔහු ලුහු බැඳ එන්නේ ය. බිදුනු නැවට දිය උනන්නා සේ ය.

වනගුම්හු කොතෙක් සිත්කලු වුවත් ලොකීයජන තෙමේ එහි නො ඇලේ. රැදෙවේලේ කාමයෙන් පෙළෙන්නක බැවිනි. රහතුන් වහන්සේලා එබඳු වනපෙදෙස්හි ඇලෙති. කාමයන් මූලුමනින් දුරු කළ බැවිනි. මේ කියේ දෙශනාගාථාවේ ඉතා කෙටි අදහස ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ස්ථවිරයන් වහන්සේ සිවු පිළිසැඹියාවත් ලබා රහත් බවට පැමිණ අහසින් අවුත් සතුති කරමින් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ සිටියාහ.

අන්‍යතරස්ත්‍රියගේ කථාවස්තුව නිමියේය

සකලජනධර්මාර්ථසඞ්ග්‍රහනිපුණ පණ්ඩිත අම්බලම්ගොඩ ධම්ම-කුසල නායක ස්ථවිරයන් කළ **'සඩ්ඛීසාගර'** නම් වූ ධර්මපද වර්ණනාවෙහි අර්හත්ත්වවර්ගාත්මක සප්තමතරඞ්ගය නිමියේ ය.

1, 2, 4. "කාමරතිසන්ථවං" යනු බලනු.

සහස්‍රවග්ගය

අෂ්ටමහරඬගියකථාසූචි

පිට	වසතුව	
1121	1	මිනීමරුවෙක්
1128	2	දරුවිරිය සථවිරයන් වහන්සේ
1134	3	කුණ්ඩලකෙසි සථවිරාවෝ
1144	4	බමුණකු ඇසූ ප්‍රශනයෙක්
1150	5	ශාරීපුත්‍ර මහා සථවිරයන් වහන්සේගේ මාමා
1153	6	ශාරීපුත්‍ර මහා සථවිරයන් වහන්සේගේ බෑනා
1156	7	ශාරීපුත්‍ර මහා සථවිරයන් වහන්සේගේ යහළුවෙක්
1161	8	ආයු වැඩෙන හැටි
1167	9	සඞ්කිචව සථවිරයන් වහන්සේ
1182	10	ඛාණුකොණ්ඩඤ්ඤ සථවිරයන් වහන්සේ
1184	11	බෙල්ල කපා ගැණීමට තැත් කළ භික්ෂූ
1189	12	පටාචාරාවට සිදු වූ විපත්
1197	13	කිසාගොතමියගේ පුණ්‍යබලය
1202	14	බොහෝ දූ පුතුන් ලැබූ මෙහෙණ

මිනී මරුවෙක්.

8 - 1.

මාගේ සවාමිදරු වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ එක් අවදියෙක වෙළුවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක. එකල්හි එහි නුවර විසූ හොරු හාරසිය අනූ නව දෙනෙක් ගම් නියම්ගම් පැහැර ගණිමින් හොර කමින් ජීවත් වෙති. පිහුවන් ඇස් ඇති, තඹවන් දැලිරුවුල් ඇති එක් මිනිහෙක් ඒ හොරුන් වෙත ගොස්, 'මමත් තමුසේලා හා එක් ව තමුසේලාගේ කණ්ඩායමට බැඳී දිවි ගෙවන්නට කැමැත්තෙමි, තමුසේලා ඒ ගැන සතුටු ද' යි ඇසී ය. එවිට ඔවුහු, ඒ මිනිහා සොරදෙවු ලඟට ගෙන ගොස්, 'මේ මිනිහාත් අප ලඟ නැවැතී අප හා එක් ව අප කරණ වැඩ කරමින් ජීවත් වන්නට ඇවිත් සිටී' යි දැන් වූහ. සොරදෙවු තෙමේ ඔහු දෙස බලා, 'මූ හැබෑ යකෙක්, අම්මාගේ තනය කඩා කැමටත් තාත්තාගේ බෙල්ල කඩා ලේ බීමටත් හපනෙක්, මූ ඉතා දරුණු' යි සිතා 'මූට අප හා එකතු වීමෙන් වැඩෙක් නැතැ' යි කීයේ ය. එහෙත් ඒ මිනිහා එතැනින් නො ගොස් එතැන ම නැවැතී සොරදෙවුගේ මෙහෙකරුවකු සතුටු කර ගත්තේ ය. මූ කෙරෙහි සතුටු වූ සොරදෙවුමෙහෙකරු තෙමේ තඹදැලිරුවුල් ඇති මිනිහාත් කැටු ව සොරදෙවුගේ ලඟට ගොස්, 'මහත්මයානෙනි! මේ මිනිහා වැඩට හොඳ ය, කම්මැලියෙක් නො වේ, අපට හිතවත් ය, ඒ නිසා මූ නතර කර ගෙණ සැලකිල්ලක් කරණු මැනැවැ' යි කියා සොරදෙවු සතුටු කොට ඔහුට හාර කෙළේ ය.

හොරුන්ගේ ගම් පැහැරීමෙන් වෙහෙසට පත් ගම්වැස්සෝ රජයේ ආරක්ෂකනිලධරයන් හා කැටු ව ගොස් මේ හොරුන් අල්ලා මාවිවූ ලා උසාවියට ගෙණ ආහ. නඩු විභාග කළ විනිශ්චය කාරයෝ, උන්, වරද කරුවන් කොට හිස ගසා දමා මරන්නට තීන්දු කළහ. එහෙත් උන් හිස සිඳ මරන්නට කෙනෙක් එහි නො වූහ. එවිට නිලධරයෙක් සොරදෙවු වෙතට ලං ව, 'තට මුන් හිස සිඳ මරන්නට හැකි නම්, රජයෙන් නිදහස, තට ලබා දීමට අපි පොරොන්දු වෙමු' යි දැන් වී ය. සොරදෙවු තෙමේ එයට සතුටු නො වී ය. ඉන් පසු නිලධරයෝ එක් එක් හොරා වෙත ගොස් රහසේ කණට කොදුරා මේ වග කියූහ. එහෙත් හොරුන් අතර වූ එකෙකුත් මෙයට සතුටු නො වී ය. නැවැත තඹදැලියාට ද මෙය රහසේ කීහ. ඔහු එය පිළිගෙණ රජයේ නියමය පරිදි ඒ සියල්ලන් මරා රජයෙන් ලත් නිදහස ඇති ව ඒ පිණිස තැගි ද ලබා ගත්තේ ය.

ආරක්ෂකභටයෝ, නුවර දකුණු දෙසෙහි ද මෙලෙසින් ම ගම් පැහැරු හොරු කණ්ඩායමක් අල්ලා නඩු අසා වරදකරුවන් කොට ඔවුන් ද මු ලවා ම මරවා කැබි දුන්හ. ඉක්බිති රාජ පුරුෂයෝ මූ කළ දස්කම් බලා 'රජයෙහි චොරඝාතකතනතුර මූට දිය යුතු ය' යි නිරණය කොට ඒ තනතුර හා තනතුරට අයත් කන්න මාන්න ද දුන්හ. ඉන් පසු ඔහු පැසුළු උතුරු දෙ දිසාවෙන් අල්ලා ගෙණ ආ හොරුන් ද බරගණනක් පළමු ලෙසින් මරා දැමී ය. ගම් පහරමින් රටවැසියන් පෙළූ හොරුන් දහස් ගණන් මරා දැමූ ඔහු වරින් වර දවසට එකකු දෙන්නකු බැගින් ගෙණෙන හොරුන් ද මරමින් අවුරුදු පනස් වසක් ම ඒ තනතුර උසුලා සිටියේ ය. කල් යත් ම මහලු බවට පත් වූයේ තරුණකාලයෙහි මෙන් එක පහරින් ම එකකු මැරීමෙහි අපොහොසත් විය. මිනිසුන් මැරීමෙහි දී එකාට දෙතුන් වර පහර දීමෙන් මිනිසුන් වෙහෙසට පත් කරන්නේ ය.

නුවර වැස්සෝ 'දැන් මෙතෙමේ මේ තනතුරෙහි වැඩ කිරීමෙහි අපොහොසත් ය, මොහුගේ ශරීරයෙහි දුර්ලකම තදින් පෙනේ, මිනිසකු මැරීමට දෙතුන් වර පහර දීමෙන් මිනිසුන් වෙහෙසට පත් කරයි, එහෙයින් මේ තනතුරට අන් එකකු පත් කරන්නැ' යි කියා සිටියහ. එයින් ඔහු ඒ තනතුරින් පහ කළහ. හොරුන් මරණකාලයෙහි මොහුට අළුත් රෙදිකඩක් ඉණ ලන්නට, කිරි පැණි විකක් කන්නට, කැඳ විකක් බොන්නට, විනොද ගමනක් යන්නට, නැයන් හා සතුටු වන්නට, ඉඩකඩක් නො ලැබින. එහෙයින් ඔහු තනතුරින් අස් වූ දවසෙහි ම 'කිරිකැඳ විකක් උයන්නැ' යි ගෙදර අයට නියම කෙළේ ය. ගෙදර අය ඔහුගේ නියමය ලෙසට කිරිකැඳ පිසූහ. ඔහු කඩපිලට ගොස් අළුත් රෙදිකඩක් ගෙණ ඇඳ, මල්පොකුරක් අතට ගෙණ, සුවඳ දිය ඇඟ ඉස ගෙණ අවුත්, ගෙට වැදී හුන්නේ ය. එවිට ගෙයි වැස්සෝ කැඳ, බදුනෙක වත් කොට ගෙණැවිත්, ඔහු ඉදිරියෙහි තබා, අතකට සේදීමට දිය ද ගෙණැවිත් තැබූහ.

ඒ වේලෙහි ශාරීපුත්‍ර මහාසථවිරයන් වහන්සේ සමාධියෙන් නැගී 'අද මා කොතැනක යා යුතු දැ' යි තමන් වහන්සේ පිඬු සිඟා යන මගතොට බලා වදාළ සේක. මෙසේ බලා තඹදුළි ගෙදර පිසූ කැඳ දැක, 'ඒ පුරුෂ තෙමේ එයින් මට සඬ්‍රහයක් කරන්නේ දැ' යි බැලූහ. එවිට උන්වහන්සේට 'මා දැක මෙ තෙමේ මට සඬ්‍රහ කරන්නේ ය, එයින් ඔහු මහත් සැපතක් ලබන්නේ ය'යි පෙනී ගියේ ය. එකල්හි උන්වහන්සේ සිවුර ගැටවටු කොට පොරොවා පාත්‍රය ගෙණ තඹදුළිගෙය බලා වැඩි සේක. ගෙයි

වැස්සන්ට නොා පෙනෙන සේ ගෙය ඉදිරියෙහි වැඩ සිටි සේක. තඹදූලි තෙමේ තෙරුන් දැක පහන් සිත් ඇති ව, 'මම බොහෝ කලක් ම චොරඝාතකකර්මය කෙළෙමි, මිනිසුන් බරගණනක් මැරීමි, අද මෙහි ගිතෙල් බහා පිසූ කැඳක් තිබේ, සැරියුත් හාමුදුරුවෝත් පිඬු සිඟා ඇවිත් සිටිති, අද වත් උන්වහන්සේට කැඳ ටිකක් පිළිගන්වමි' යි තමන් ඉදිරියෙහි තුබූ කැඳබඳුන පැත්තක තබ්බවා තෙරුන් වෙත ගොස් වැඳ, ගෙට වැඩමවා ගෙණ වඩා හිඳුවා, පාත්‍රයට කැඳ හා ගිතෙල් පිළිගන්වා පවන් සලමින් සිටියේ ය. එහෙත් මෙයට කලින් කවදා වත් මෙබඳු කැඳක් බොන්නට නොා ලැබුනු මොහුට කැඳ බීමෙහි ඕනෑකම ඒ වේලෙහිද තදින් තුබුනේ ය. ස්ථවිරයන් වහන්සේ ඔහුගේ ඒ ඕනෑකම දැන, 'උපාසක උන්නැහේ! තමුසේත් ගොස් කැඳ ටිකක් බීලා එවු' යි කීහ. එවිට ඔහු තමන් අත තුබූ තල්වැට අනෙකකුට දී ගොස්, කැඳ බීවේ ය. ස්ථවිරයන් වහන්සේත් 'උපාසක තැනට ම පවන් සලව' යි පවත් සලන්නා ද එ තැනින් පිටත් කළහ. ඔහු ගොස් තඹ දූලියාට පවන් සැලී ය. තඹදූලි බඩ පුරා කැඳ බී අවුත් නැවැතත් වටාපත ගෙණ තෙරුන්ට පවන් සලන්නට පටන් ගත්තේ ය. ස්ථවිරයන් වහන්සේ ද කැඳ වළඳ අවසන් කළහ. එවිට ඔහු ස්ථවිරයන් වහන්සේගේ පාත්‍රය ගත්තේ ය. ස්ථවිරයන් වහන්සේ අනුමෙවෙනි බණ වදාළ සේක. එහෙත් ඔහුට තම සිත, එයට නතු කරන්නට නොා හැකි වි ය.

ස්ථවිරයන් වහන්සේ, 'උපාසක! මා කියන බණ සිතට නොා ගන්නහු කුමක් නිසා දූ' යි ඇසූ විට, 'අනේ! ස්වාමීනි! මා බොහෝ කලක් ම කරණ ලද්දේ රෞද්‍ර කර්මයෙකි, මිනිසුන් බොහෝ ගණනක් මැරීමි, ඒවා සිහිවන විට බිය උපදී, පසුතැවිල්ල බලවත් ය, ඒ නිසා බණ සිතට ගන්නට නොා හැක්කෙමි' යි කීයේ ය. එවිට ස්ථවිරයන් වහන්සේ 'උපායයක් කරමි' යි සිතා 'මොක ද ඒවා උපාසක තැනට ඕනෑ නිසා කරණ ලද්දේ ද, නැත, අනුන් කී නිසා කරණ ලද දූ' යි ඇසූ විට, 'ස්වාමීනි! ඒවා කරණ ලද්දේ මාගේ ඕනෑකමට නොා වේ, රාජ නියොගය නිසා මම ඒවා කෙළෙමි' යි කී ය. එකල ස්ථවිරයන් වහන්සේ 'උපාසක! එය තමුසේට අකුශලයෙක් වේ දූ' යි ඇසූහ. මෝඩ උපාසක තෙමේ තෙරුන් වහන්සේගේ මේ විචාරීමෙන් 'තමන්ට පවෙක් නැතැ' යි සිතා 'ස්වාමීනි! එසේ නම් බණ වදාරනු මැනැවැ' යි කීයේ ය. ස්ථවිරයන් වහන්සේ බණ වදාළ සේක. එයින් උපාසකයාගේ සිත එකඟ වි ය. බණ අසන්නේ ම සොතාපත්තිමග්ගඤාණයට පෙරටු ව ලැබෙන අනුලෝමඤාණය

ලබා ගත්තේ ය. එයට පසුත් බණ වදාරා ස්ථවිරයන් වහන්සේ විහාරයට වැඩි සේක. උපාසක තෙමේ තෙරුන් පස්සේ ගොස් පෙරළා එන්නේ ගවදෙනක වෙස් ගත් යකින්නක විසින් ඇණ මරණ ලද්දේ තුසී පුරයෙහි උපන්නේ ය.

එයින් දවස් කිහිපයකට පසු ධර්මශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'චොරඝාතකයා පණස් පස් අවුරුද්දක් මිනී මරා එයින් අස් වූ දා ම සැරියුත් හාමුදුරුවන්ට පිණ්ඩපාතය දී, පිණ්ඩපාතය දුන් දා ම කලුරිය කෙළේ ය, එහෙයින් මොහු කොයිබ උපන්නේ දැ' යි කතා කළහ. බුදුරජානන් වහන්සේ ධර්මශාලාවට වැඩ භික්ෂූන් විචාරා කතා කළ කරුණ අසා, 'මහණෙනි! තම්බ-දාඨිකයා තුසීපුර උපනැ' යි වදාළ සේක. එවිට භික්ෂූහු 'ස්වාමීනි! අවසර, කුමක් වදාරන සේක්? මෙතෙක් කල්, අවුරුදු පනස් පහක් ම මිනිසුන් මරමින් ජීවත් වූ මේ මිනිහා දෙව්ලොව උපන්නේ දැ' යි නැවැත ඇසූහ. 'ඔව්! මැරෙණ වේලෙහි ඔහුට බලගතු කලණ මිතුරෙක් මුණ ගැසුනේ ය, සැරියුත්, ඔහු සැරියුත් තැනගේ බණ අසා අනුලොමඥානය ලබා මැරී ගොස් තුසිත දෙව්ලොව උපනැ' යි වදාරා,

'සුභාසිතං සුණිත්වාන නගරෙ චොරඝාතකො,
අනුලොමඛන්තිං ලඩාන මොදතී තිදිවං ගතො'

යන මේ ගාථාව වදාළ සේක. චොරඝාතක තෙමේ බුදුදහම අසා අනුලොමක්ෂාන්තිය ලබා දෙව්ලොවට ගියේ සතුටු වේ, යනු එහි තේරුම ය.

බුදුරජානන් වහන්සේ මෙසේ වදාළ කල්හි භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! අනුමෙවෙනි බණ එතරම් ලොකු එකක් නො වේ, ඔහු කළ පව් එයට වඩා ඉතා ම බලගතු ය, ලොකු ය, එබඳු බලගතු පවක් කළ මෙතෙමේ එබඳු විශෙෂයක් කෙසේ ඉපද වූයේ දැ' යි ඇසූහ. 'මහණෙනි! තමුසේලා කුමක් කියන්නහු? මා දෙසා ඇති බණෙහි ලොකු ය, කුඩා ය, ටික ය, හුඟය, යි වෙනසක් නො කරවු, ප්‍රමාණයක් නො දක්වවු, එක් වචනයක් නමුත් මහත් අර්ථයෙන් යුක්ත නම්, එ ම ශ්‍රේෂ්ඨ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා,
එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මතීති.

අරුත් රහිත පදයෙන් යුත් වචන දහසක් නමුත් (උතුම් නො වේ.) යම් වචනයක් ඇසීමෙන් සන්සිඳීමෙක් වේ ද, අර්ථ වත් (ඒ) එක් පදය උතුම් වේ.

සහස්සමපි චෙ වාචා = වචන දහසක් නමුත් (උතුම් නො වේ.)

සහස්සං යනු, පරිච්ඡේදවචන යි. **'දස දසකං = සතං, දස සතං = සහස්සං'** දස, දසකයක් සියයෙකි. සියය දසයක් දහසෙකි.

අපි යනු, නිපාත යි. එයින් කියනුයේ දහසින් අඩු වුවත් දහසින් වැඩි වුවත් වැඩෙක් නැත යනු යි.

'අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති තණ්හක්ඛය රතො හොති සම්මාසම්බුද්ධසාවකො' යන මෙහි අපි ශබ්දය සම්භාවනාවෙහි වැටේ. **'අම්හාකම්පි පණ්ඩිතකා'** යන මෙහි ගර්හාවෙහි එයි. **'අයම්පි ධම්මො අනියතො'** යන මෙහි අපෙක්ෂා වෙහි ය. **'ඉතිපි අරහං'** යන මෙහි සමුච්චයෙහි ය. **'අපි භන්තෙ භික්ඛං ලභෙථ'** යන මෙහි ප්‍රශ්නයෙහි ය. **'අපිධානං'** යන මෙහි සංවරණයෙහි ය. මෙහි සමුච්චයෙහි ආයේ ය. එහෙයින් දහසින් අඩුගණන් ද, දහසින් වැඩිගණන් ද ගැණේ.

චෙ යනු, නිපාත යි. **'මංචෙ ත්වං නිබණං වනෙ'** යන මෙහි සිටි චෙ යන්න, යදි යන නිපාතයාගේ අර්ථය කියයි. **'නිඞ්ත ච්චරස්මිං පන භික්ඛූනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිච්චරෙන විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං'** යන මෙහි සංශයෙහි වැටේ. මෙහි යදි යන නිපාතයාගේ අර්ථය කිය යි. **'වුච්චතෙති = වාචා'** කියනු ලබන්න **වාචා** නම්.

අනත්ථපදසංහිතා = අරුත් නැති පදයෙන් යුත්. වැඩක් නැති.

වාචා යන්නට විශෙෂණ යි. **'අනත්ථපදසංහිතා ආකාස-වණ්ණනා පබ්බතවණ්ණනා වනවණ්ණනාදීනි පකාසකෙහි අනීය්‍යානදීපකෙහි අනත්ථකෙහි පදෙහි සංහිතා'** යනු අටුවා ය. ආකාශ – පර්වත – වන – ග්‍රාම – නගර – ජනපද – සාගර – චන්ද්‍රොදය – සුර්‍යොදය – උද්‍යන – සලිලක්‍රීඩා – මධුපාන – සම්භොගාදී වූ අර්ථශූන්‍ය, විමුක්තියට හිත නො වූ අරුත් පවසන, එලොව මෙලොව දෙකට වැඩ නැති පදයන්ගෙන් යුක්ත වචනයෝ. **'අනත්ථසංහිතා' ති රාජකථාදි තිරච්ඡානකථා නිස්සිතා'** රාජ කථාදි තිරශ්චීන කථාවන් ඇසුරු කළ වචන; **අනත්ථපදසංහිත** නම්. රාජ-චොර-මහාමත්ත-සෙනා – භය-යුඬ-අත්ත-පාන-වත්ථ -සයන-මාලා-ගන්ධ-ඤාති-යාන-ගාම-නිගම-නගර-ජනපද-ඉත්ථි සූර-විසිඛා – කුම්භඨාන – පුබ්බපෙත – නානත්ත – ලොක-සමුද්ද-ඉතිභවාභව කථා දෙතිස මෙලොව පරලොව හිතයට සරස් වන බැවින් අකුල් වන බැවින් **අනත්ථපදසංහිත** නම් වේ.

මහාසම්මත - මඛාතු-ඔම්මාසොකාදි රජවරු මෙසේ මෙසේ ආනුභාව ඇත්තාහ, යනාදින් රජුන් ගැණ කරණ කතා ය රාජ කථා. සොරුන් පිළිබඳ කතා ය චොරකථා. සෙස්ස ද මෙසේ ය. අසුවල් රජ තෙමේ මනා රූ ඇත්තේ ය, දුකුම්කලු ය, ඈ ලෙසින් කෙරෙණ ගෙහසිතකථාව ම තිරච්ඡානකථා නම් වේ. කම්සථාන භාවනාවෙහි සිට, අසුවල් රජ තෙමේ මහානුභාව ඇත්තේ ද, විනාශයට ගියේ ය, යි ඈ ලෙසින් කෙරෙණ කතාව තිරච්ඡානකථා නොවේ. **'අනත්ථසංහිතාති න ඉධ ලොකත්ථං වා පරලොකත්ථං වා නිස්සිතා'** මෙලොව දියුණුව හා පරලොව දියුණුව ඇසුරු නොකළ වචන, අනත්ථපදසංහිත, යි මෙයින් කියන ලද ය. ආකාශවණ්ණාදිය හා රාජකථාදිය ඇසුරු කළ වචන මෙලොව පරලොව දෙක්හි දියුණු ව නසා ලන්නේ ය.

එකං අත්ථපදං සෙය්‍යථා = අර්ථවත් එක්පදය උතුම් වේ. වැඩ ඇති එක්පදය උතුම් ය.

අර්ථයෙන් යුකතපදය, අර්ථවත් පදය අත්ථපද නම්. අර්ථයට තැන් වූ අර්ථනිශ්‍රිත වූ පද අර්ථපද නමැ යි. ගත වරද නැත.

'අත්ථසාධකං නිබ්බානපටිසංයුත්තං, ඛන්ධධාතුආයතන-ඉන්ද්‍රියබලබොජ්ඣඞ්ගසතිපට්ඨානපරිදීපකං' යන මෙයින් නිවන හා හැනී සිටි සකඤ - ධාතු - ආයතන - ඉන්‍රිය-බල - බොඛ්‍යඞ්ග - සතිපඨානයන් පිළිබඳ අරුත් පවසන පද, අර්ථපද නම් වේ යයි පැවසේ. මෙහි අර්ථ යි ගැණෙන්නේ මේ කියූ අර්ථසමූහය යි. ශබ්දයන්ගේ නැගීම වන්නේ අරුත් ඇසුරු කරගෙණ ය. ශබ්ද ඇසුරු කර ගෙණ අරුත් පවසනුයේ පද නම්. **'අත්ථජෝතකා වණ්ණා පදං'** යනු ශාබ්දිකවචන යි. ශබ්දයන්ගේ පැවැත්මට සථාන වූ අර්ථයෝ නන් වැදැරුම් වෙති. එහෙත් මෙහි ලා ගැණෙන්නෝ සත්ත්වසන්තානයෙහි පහළවන රාග - ද්වේෂ - මොහාදී වූ කෙලශධර්මයන් සන්සිදුවා සත්ත්වයන් නොමැරෙණ බවට පත් කරණ සදුකාලිකසුඛයට පමුණු වන අර්ථයෝ ය. ඔවුහු නම්, නිවන හා හැනී සිටි සකඤාදී අර්ථයෝ ය. රාගාදි කෙලශයන්ගේ සන්සිදීම සකඤාදීන්ගේ අරුත් දැනීමෙත් ම මුත් අන් ලෙසකින් නොවන බැවින් මේ කියූ අර්ථවත්පදය ම ශ්‍රේෂ්ඨ ය. උතුම ය. එය වදාළෝ **සෙය්‍යථා**, යනු යෙදීමෙනි.

සත්ත්වයන්ගේ සිත්හි පහළ වන හැම කෙලශයක්හුගේ සන්සිඳීමට සකඤාදී වූ අර්ථවත් පදය ම කරුණු බැවින්, ධර්මධරදෙශක තෙමේ සවකීයධර්මකථාව ආකාශවණ්ණාදිවණ්ණා වන්ගෙත් හා රාජකථාදිතිරශ්චීනකථාවන්ගෙන් නොදෙ සර-

සන්නේ ය. ආකාශවර්ණනාදිය නො කියන්නේ ය. රාජකථාදිය නො කරන්නේ ය. සක්‍රාඛ්‍යකථා කියන්නේ ය. ධාතුකථාව කරන්නේ ය. ආයතන බෙදා කියන්නේ ය. දහම් දැනීමෙන් තොර වූ වාචාල වූ නූගත් දෙශකයා ම අසන්නන්ගේ සිත්හි රාගාදි කෙලෙස් උපද වන්නේ ය. රාගාදි කෙලෙස් පහළ වන සැටියෙන්, බණ යි යමක් කියන්නේ ය. අසන්නන්ට සිනහ උපද වන්නේ ය. නන් දෙඩ වන්නේ ය. මෙබඳු අව්‍යක්තදෙශක තෙමේ දෙවියන් සහිත ලොකය අපායයට ඇද ලන්නේ ය. සසර දුක දිග් ගස්සන්නේ ය. තෙමේත් අපායයෙහි හෙන්නේ ය.

යං සුත්වා උපසම්මති = යම් වචනයක් අසා සන්සිඳේ ද.

යං යන, මෙයින් මතු ව එන්නේ පූර්වෝක්ත අර්ථපදය යි. 'යම් වචනයක් අසා සන්සිඳේ ද, එබඳු අර්ථවත් එක්පදය ද උතුම් වේ' යි **'එකං අත්ථපදං සෙය්‍යො'** යනු හා සම්බන්ධ කොට අරුත් ගත යුතු ය.

සන්සිඳේ යනු සඳහා **සම්මති'** යනු ප්‍රමාණවත් වූයේ ද, **උප'** යන්නකින් එය දැඩි කරණ ලද්දේ ක්ලෙශයන්ගේ සන්සිඳීම නැවැත නො උපදින ලෙසින් ම සන්සින්දේ ය, යනු දැක්වීමට ය. තථාගතධර්මශ්‍රවණයෙන් එසේ වන්නේ ය යනු දැක්වීමට අමුතු කතා දැක්විය යුතු නො වේ. නිවන් දුටු අපරිමිතසත්ත්වගණය ම එයට සාධක ය.

උප යනු, උපසර්ගයෙකි. එය **'උපනගරං'** යන තැන සමීපයෙහි ය. **'බුද්ධුපට්ඨාකො'** යන තැන පූජායෙහි ය. **'උපමානං'** යන තැන සමානභාවයෙහි ය. **'පරං උපවදති'** යන තැන දොස් කීමෙහි ය. **'සගගං ලොකං උපපජ්ජති'** යන තැන උත්පත්තියෙහි ය. **'උපසම්මති'** යන තැන භෘශාර්ථයෙහි ය. **'නිසිනනං වා උපනිසීදෙය්‍ය'** යන තැන එළැඹීමෙහි ය. **'උපබාරියං දොණො'** යන තැන වැඩිබවෙහි ය. **'උපකාරො'** යන තැන පෙරකම්හි ය. **'සොචෙය්‍යපච්චුපට්ඨානං'** යන තැන වැටහෙන ආකාරයෙහි ය. **'උපසම්පනෙනා'** යන තැන උපරිභාවයෙහි ය. **'උපවාසො'** යන තැන අහර නො ගැන්මෙහි ය. **'උපධා, උපසගෙගා'** යන තැන සංඥයෙහි ය. **'උපපත්තිතො ඉක්ඛති'** යන තැන යුක්තියෙහි ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්පලාදියට පැමිණියාහු ය.

තම්බදාඨිකචොරසාතකවස්තුව නිමියේ ය.

දාරුචීරියසථවිරයන් වහන්සේ

8 – 2

එක් කලෙක මිනිසුන් කණ්ඩායමක් මුහුදින් එතෙර වන්නට නැවු නැගී යියේය. උන් යිය නැව මුහුදු මැද දී බිඳී ගොස් එහි ගිලුනී ය. නැවෙහි හුන්නෝ මස් කැසුබ් ආදීන්ට බත් වූහ. උන් අතරෙහි හුන් එක් මිනිහෙක් ලැලි කඩෙක එල්ලී පිනා ගොස් සුපාරක පටුනට ගොඩ බැස්සේ ය. ඔහුට හැදීමට පෙරළීමට කිසිත් රෙදිකඩෙක් ඔහු අත නො වී ය. එහෙයින් ඔහු කිසිවක් කර ගත නො හැකි ව වේලුනු දරකෝටු ගොඩක් එකතු කොට වැල්වලින් වෙළා බැඳ හැඳ පොරොවා ගෙණ දෙවාලයකට ගොස් වලන් කබලක් අතට ගෙණ පටුත්ගමට වැදුනේ ය. ගම්වැසි මිනිස්සු ඔහු දැක, කැඳබත් දී එක් රහත් නමෙකැ' යි සිතා සැලකිලි කළහ. මිනිසුන් රෙදි ගෙණැවිත් දුන් විට ද 'මම මේ රෙදි පිළිගෙණ හැන්දේ නම් පෙරෙව්වේ නම් දුන් ලබන මේ ලාභසත්කාරයන් ගෙන් පිරිහෙන්නෙමි' යි සිතා ඒ කිසිත් නො පිළිගෙණ දරවැහරි ම හැඳ පොරොවා හැසුරුනේය. බොහෝ දෙනකුන් 'රහතුන් වහන්සේ, රහතුන් වහන්සේ' යි කියන්නට පටන්ගත් විට 'ලොකයෙහි යම් රහත් කෙනෙක් වෙත් ද, රහත්මගට පිළිපන්නෝ හෝ වෙත් ද, මමත් ඔවුන් අතර එක්තරා එකෙකැ' යි ඔහුට අදහස් වී ය.

ඔහු මෙසේ සිතා දවස් යවන කල්හි ඔහුගේ පෙර අත්බවෙක සහලේ නැ වූ එක්තරා දෙවියෙක් 'මේ තෙමේ පෙර මා හා එක් ව ඉණිමගක් බැඳ, කන්දක් මුදුනට නැගී මහණදම් කෙළේ ය, දැන් රහත්මි යි සිතා හැසිරෙයි, එයින් විනාශයට පැමිණෙන්නේ ය, එහෙයින් මූ සංවේගයට පත් කළ යුතු ය' යි සිතී ය.

පෙර කසුප් බුදුරජුන්ගේ සාසනය පිරිහී යත්, සාමණේරාදීන් ගේ නො පනත්කම් දුටු සත් නමක් භික්ෂූන් වහන්සේලා සංවේගයට පැමිණ 'සාසනය අතුරු දහන් වන්නට පෙර පිහිටක් කර ගණිමු' යි සිතා වනගත වූහ. එහි වනයෙහි තැන තැන ඇවිදින උන්වහන්සේලා කන්දක් දැක 'ජීවිතාලය ඇත්තන් නැවැතිය යුතු ය, අන්‍යයන් මේ කදුමුදුනට නැගිය යුතු ය' යි ඉණිමගක් බැඳ කදු මුදුනට නැග ඉණිමග බිම හෙලා, මහණදම් කරන්නට පටන් ගත්හ. ඔවුන් අතුරෙහි සඬ්ඝ සථවිර තෙමේ එක් රැයක් ගතවත් ම රහත් වී ය. උන්වහන්සේ අනවතප්තාවිලෙහි මුණකට සෝදා උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය ගෙණවුත් 'ඇවැත්නි! දැහැටි

වළඳ මුව සෝදා මේ පිණ්ඩපාතය වළඳවු' යි අනික් සදෙනාට දුන් වූහ. උත්වහන්සේලා 'සවාමීනි! ඔබ වහන්සේ කුමක් කියහු? යමෙක් පළමුව රහත් වේ නම්, ඔහු විසින් ගෙණෙන පිණ්ඩපාතය වැළඳිය යුතු ය' යි අප විසින් නියම කර ගන්නා ලද ද, අපිත් ඔබ වහන්සේ මෙන් විශෙෂගුණයක් උපදවා ගෙණ තුමූ ම පිණ්ඩපාතය ගෙණවුත් වළඳන්නෙමු' යි කියා සඬ්ඝ ස්ථවිරයන් එළ වූ පිණ්ඩපාතය නො පිළිගත්හ.

ඊට පසු දා දෙවන තෙරුන් වහන්සේ අනාගාමී වූහ. උත්වහන්සේත් පළමු තෙරුන් සේ පිණ්ඩපාතය ගෙණවුත් වළඳන්නට කී කල්හි 'ඇවැත්නි! මහතෙරුන් දුන් පිණ්ඩපාතය නො පිළිගත් අප, ඔබ වහන්සේ ගෙණා පිණ්ඩපාතය පිළිගැණීම යුතු ද, එය කළ හැකි වැඩෙක් දැ' යි සෙසු තෙරවරු ඇසූහ. එවිට පිණ්ඩපාතය ගෙණා දෙවන තෙරුන් 'ඔව්, තමුන්නාන්සේලාගේ කීම හරි යි, මාගේ පිණ්ඩපාතය පිළිගැණීම වර දැ' යි කී විට 'අපිත් ඔබ වහන්සේලා දෙනම මෙන් යම් කිසි විශෙෂ ගුණයකට පැමිණ තමන්ගේ ශක්තියෙන් යමක් ලබා ගෙණ වළඳන්නට ලැබුනොත් වළඳන්නෙමු' යි ඒ පිණ්ඩපාතය ද ඔවුහු නො පිළිගත්හ. ඒ අතර සඬ්ඝ ස්ථවිරයන් වහන්සේ පිරිනිවි සේක. අනාගාමී ව සිටි ස්ථවිරයන් වහන්සේ ද පිරිනිවන් පා බ්‍රහ්මලොකයෙහි උපන්හ. සෙසු පස් දෙනා වහන්සේ විශෙෂගුණයක් උපදවා ගැණීමෙහි අපොහොසත් වූවෝ, ඒ කදුමුදුනෙහි ම සා පිපාසා දෙකින් හා අවිවෙන් වියලී, සත්වනදා කලුරිය කොට දෙව්ලොව උපන්හ. මේ බුඩොතුපාදයෙහි ඒ පස් දෙන දෙව්ලොවින් චුත ව මිනිස්ලොව ඒ ඒ කුලගෙවල උපන්හ. උන් එකෙක් **පුණ්ණකුසාති** නම් රජ වි ය. එකෙක් **කුමාරකාශ්‍යප** වූයේ ය. එකෙක්, **දුරුවීරිය** නම් වි ය. එකෙක්, **දබ්බමල්ලපුත්ත** ය. එකෙක්, **සන්තියපරිබ්බාජක** ය. උන් අතුරෙහි බ්‍රහ්මලොකයෙහි උපන්නේ ය, මෙහි පුරාණ සහලේ නැ වූ දෙවියෙකැ, යි කියන ලද්දේ.

මේ දෙවි තෙමේ දුරුවීරිය කරා පැමිණ 'ඕය්! බාහිය! තමුසේ රහත් නො වහු, ඒ තබා රහත්මගට වත් නො පැමිණියහු ඒ පිණිස ප්‍රතිපදාවකුත් තට නැත, ශීලයකුත් නැතැ' යි කී ය. බාහිය තෙමේ අහසෙහි සිටි බ්‍රහ්මයා බලා සංවෙගයට පැමිණ 'අයියෝ; මම රහත්මි, යි සිතුයෙම් ද, එය මා කළ බලගතු වරදෙක, මෙතෙමේ, ඔබ රහත් නො වහු, රහත්මගට නො පිළිපන්හු යි කියයි, එහෙයින් ලොකයෙහි රහත් වූ අනෙකෙක් ඇත්තේ දැ' යි සිතා

'දෙව්ලොව රහත්හු හෝ රහත්මගට පිළිපන්නෝ වෙත් දැ?' යි ඇසී ය. එවිට දෙවි තෙමේ 'බාහිය! උතුරු දනව්වෙහි සාවත්ථී නම් නුවරෙක් ඇත, එහි දෙව්රම්වෙහෙර, තිලෝගුරු සම්බුදුරජාණන් වහන්සේ වැඩ වසන සේක, බාහිය! දනුව, උන්වහන්සේ රහත් සේක, රහත්වීමට අන්හට මග කියන සේක, උපදෙස් දෙන සේක, පිළිවෙත වදුරන සේක, එහි යව' යි කී ය. බාහිය තෙමේ දෙවියන් කියූ කතාව අදහා සංවේගයට පැමිණ ඒ වේලෙහි ම සුප්පාරක පටුනෙන් පිටත් ව එක් රැයකින් ම සැවැත් නුවරට ගියේ ය. එසේ ගියේ දෙවියන්ගේ හා බුදුරජුන්ගේ ආනුභාවයෙන්ම ය.

ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස නුවරට වැඩම කොට සිටියහ. බාහිය තෙමේ උදය දන් වළඳ කාමරතුළින් එළියට බැස අලසකම දුරලන්නට සක්මන් කරණ භික්ෂූන් දැක 'බුදුරජාණන් වහන්සේ කොහි දැ?' යි ඇසී ය. භික්ෂූන් වහන්සේලා 'උන්වහන්සේ පිඬු සිහා වැඩි සේක, තමුසේ කොහි සිට ආවහු දැ' යි ඇසූ විට 'සවාමීනි! මම සුප්පාරකපටුනෙහි සිට ආමි' යි කී ය. එවිට භික්ෂූන් වහන්සේලා 'සුප්පාරකයෙන් පිටත් වූවහු කවදා දැ' යි ඇසූහ. 'ඊයේ සවසැ' යි පිළිතුරු දින. ඕ! බොහෝ දුර සිට ආවහු, දෙපය සෝදා ගෙණ ඔහෙන් වාඩි වී තෙල් ටිකක් ගා ගෙණ පොඩ්ඩක් විඩා සන්සිඳුවා ගන්න, බුදුහාමුදුරුවන් වැඩියාම දකිනු හැකි ය' යි කී විට, බාහිය තෙමේ 'අනේ! සවාමීනි! එසේ කරණු බැරිය, බුදුරජුන්ගේ හෝ මාගේ ජීවිතයට අනතුරෙක් කොයි මොහොතක වේ දැ' යි නො දනිමි, මම කොතැනකත් නොහිඳ එක්රැයකින් ම විසි යොදුන් මග හෙවා ආමි, ඒ නිසා බුදුරජුන් දැක ම විඩා හරිමි' යි සැවැත් නුවරතුළට වැද අලාමක වූ බුබ්‍රිසෙන් පිඬු සිහා වඩින බුදුරජුන් දැක, 'අහෝ! බොහෝ කලකින් ගෞතම බුදුරජාණන් වහන්සේ මා විසින් දක්නා ලදහ' යි දුටු තැන සිට නැමී නැමී අවුත් ඇතුල් වීථියෙහි දී ම පසඟ පිහිටුවා වැඳ බුදුරජුන්ගේ පාදයෙහි ගොප්මස දැඩි ව අල්වා ගෙණ 'භාග්‍යවතුන් වහන්ස! මට බණපිටක් වදුරනු මැනැව, සුගතයන් වහන්සේ මට බණක් වදුරන සේක්වා, එය මට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස පවත්නේ ය' යි කියා සිටියේ ය.

හා! හා! බාහිය! මේ කඩපල මැද, මම පිඬු සිහා, මෙහි ආයෙමි, දැන් බණ කීමට සුදුසු නැත, මෙ තැනත් එයට නො සුදුසු ය' යි බුදුරජාණන් වහන්සේ වදාළ විට, බාහිය තෙමේ 'සවාමීනි! සසර සැරිසරන්නහු විසින් පෙර, බත් නො ලද්දේ නො වේ, කොතරම් වත් බත් ලද්දේ ය, බුදුහාමුදුරුවන්ගේ හෝ මාගේ ජීවිතය කොයි වේලේ බිඳී යන්නේ දැ යි මට

කියනු නොහැකි ය, ඒ නිසා මෙතැන දී ම බණ විකක් වදාරනු මැනැවැ' යි දෙවනුත් ඉල්ලී ය. බුදුරජාණන් වහන්සේ ඒ දෙවන වර ඉල්ලීමත් නොපිළිගත්හ. 'මා දුටු තැන් සිට මොහුගේ ඔරුර සතුටින් පිරී පවති, ප්‍රීතිවෙගය බලවත් ය, දැන් බණ ඇසුවත් එය ප්‍රතිවෙධ කිරීමෙහි මෙතෙමේ සමර්ථ නොවේ, එහෙයින් මෙතෙමේ මැදහත් බවෙන් යුකත වේවා, එක් රැයකින් ම එක් සිය විසි යොදුන් දිග් මඟ ගෙවා ආ බැවින් මොහුගේ වෙහෙස ද බලගතු ය, එයත් සන්සිඳී යේවා' යි අදහස් කළ බුදුරජාණන් වහන්සේ ඔහුගේ ඉල්ලීම දෙවරක් ම ප්‍රතික්ෂෙප කොට තෙවනවර ඇවිටිල්ල බලවත් බැවින් එ තැන ම සිට 'එසේ නම්, බාහිය! දුටුදුයෙහි දැකුම් පමණක් වන්නේ ය' යි තා හික්මිය යුතු ය' යි දහම් දෙසූහ. බාහිය, බණ අසා සිටියේ ම සියලු ආස්‍රවධර්මයන් නැසීමෙන් සිවු පිළිසැඹියාවන් ලබා රහත් වූයේ ය. ඒ ඇසිල්ලෙහි ම ඔහු බුදුරජුන් වෙතින් මහණකම ඉල්ලී ය. එවිට බුදුරජාණන් වහන්සේ 'බාහිය! සිවුරු පිරිකර තිබේ දැ, යි ඇසූහ. ඔහු 'නැතැ' යි කී විට 'එසේ නම් පා සිවුරු සොයා ගෙණ එව' යි වදාළ සේක.

බාහිය තෙමේ වනාහි පෙර සසර විසි දහසක් අවුරුදු මහණකම් කෙළේ ද, තමන් ලත් සිවුපසය තමන් විසින් ම වැළඳිය යුතු ය' යි සිතා අන් එක් ම භික්ෂු නමකටත් තමන් ලත් සිවුරක් පාත්‍රයක් කිසි දවසකත් නොදුන්නේය, ඇටත් පිරිසයින් ඉදුල්කඩ පිණිස ලේන්සු කැල්ලකුදු නොදුන්නේ ය. බුලත්විඩක් පවා නොදුන්නේය. මේ නිසා මොහුට පින්බලයෙන් පා සිවුරු නොලැබෙන බව දුටු බුදුරජාණන් වහන්සේ 'එහිහිභික්ෂුප්‍රව්‍රජ්‍යාව, නොදුන් සේක.

එකල්හි බාහිය තෙමේ පා සිවුරු සොයා ගියේ ය. අතර මග දී දෙනකගේ වේසයෙන් ආ යකින්නක විසින් ඇණ මරණ ලද්දේ ය. ඒ අතර බුදුරජාණන් වහන්සේ ද පිඬු සිඟා ගෙණ විහාරයට වැඩ දන් වළඳ, නැවැත භික්ෂූන් වහන්සේලාත් කැටුව විහාරයෙත් බැහැරට වැඩි සේක. එහි දී බාහියගේ මළසිරුර කුණුගොඩෙක තිබෙනු දුන 'මහණෙනි! මේ බාහියගේ මළකඳ යි බුදුරජාණන් වහන්සේ ගෙදරකින් ඇදක් ගෙන්වා 'මේ මළකඳ මෙනි තබා ගෙණ ගොස් දවා සැයක් කරවු' යි වදාළ සේක. භික්ෂූන් වහන්සේලා එසේ කළහ. පෙරළා විහාරයට පැමිණි භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් මළසිරුර දැවූබව දන්වා 'බාහිය කොහි උපන්නේ දැ' යි ඇසූහ.

එ කල්හි බුදුරජාණන් වහන්සේ බාහිය පිරිනිවන් පෑබව වදාරා, 'කිසූ සැටියේ වහා ම යමක් අවබෝධකරගැණීමෙහි වාසනාගුණය ඇති, යමක් කිසූ ලෙසින් වටහා ගන්නා වූ මාගේ ශ්‍රාවකයන් අතුරෙහි මේ බාහිය තැන පළමුවන තැනැත්තාය' යි අග්‍රස්ථානාන්තරනාමලෙඛනයට බාහියගේ නාමය ඇතුලත් කළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා 'සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවතුන් වහන්සේ බාහිය රහත් වී ය' යි වදාරන සේක, සවාමීනි! හේ රහත් වූයේ කවදා දූ' යි ඇසූහ. 'ඇයි! මහණෙනි! නො දන්නහු ද, මාගෙන් බණ ඇසූ දැම බාහිය රහත් වී ය' යි උන්වහන්සේ වදාළ සේක. 'සවාමීනි! භාග්‍යවතුන් වහන්සේ බාහියට බණ දේශනා කළ බවක් අපි නො දනුම්හ, බණ වදාළෝ කවදා දූ' යි භික්ෂූන් ඇසූ කල්හි 'මහණෙනි! පසුගිය දා තුවර ඇතුල් පිපියෙහි පිඬු සිඟා හිය දවසේ' යි වදාළ සේක. 'එසේ නම් සවාමීනි! පාරේ සිට වදාළ බණ එතරම් දිග බණක් නො විය හැකි ය, එ පමණ නො දික් බණකින් බාහිය ඔතරම් උසස් විශෙෂ ගුණයක් කෙසේ ලැබී දූ' යි නැවැතත් භික්ෂූන් වහන්සේලා ඇසූහ. එවිට උන්වහන්සේ 'මොකද මහණෙනි! එසේ කියහු? මාගේ බණ ටික ය, හුඟ ය, දිග ය, කොටය, යි සිතහු ද? තමුසේලා එසේ නො සිතහු, මාගේ බණ ටික වුවත් වැඩ සහිත ය, හිතකර ය, හුඟ වුවත් වැඩ සහිත ය, හිතකර ය, එහෙයින් ටික ය, හුඟය යි, බණේ වෙනසෙක් නැත, දෙලොවින් ම අනාථීකර වූ දෙලොවට ම වැඩක් නැති රාජකථාදි ප්‍රබන්ධකථා නවකථා කෙටිකථා සිය දහස් ගණනකටත් වඩා, අර්ථවත් එක් ගාථාපදය, ශ්‍රෙෂ්ඨය, උත්තමය' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක:-

සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති නි.

අරුත් රහිත පදයෙන් යුත් ගාථා දහසක් නමුත් (උතුම් නොවේ.) යම් ගාථාපදයක් ඇසීමෙන් සන්සිඳීමෙක් වේ ද (ඒ) එක් ගථාපදය ශ්‍රෙෂ්ඨ වේ.

සහස්සංඅපි චෙ ගාථා = ගාථා දහසක් නමුත් (උතුම් නොවේ.

ගාථා නම්, ඡන්දසින් බැඳි වාක්‍ය ය. අක්ෂරනියමය ඡන්දස් නම්. එය මාත්‍රාඡන්දස් - වර්ණඡන්දස් යි දෙපරිදි ය. වෛදික ලෞකික යි ද දෙකට බෙදත්. සමහරු ගණ - මාත්‍රා - අක්ෂරඡන්දස් විසින් ද තෙපරිදි කොට බෙදති. මෙසේ විවිධමත ලෙසින් බෙදුනු අක්ෂර නියමසඞ්ඛ්‍යාතගායත්‍රීආදිඡන්දස, ගාථාවන්ට නිදුනය

(මූලකාරණය) වේ. **'ජන්දෙ නිදානං ගාථානං'** යන බුඩවචන යෙන් එය පැහැදිලි ය. අකුරු, පද උපදවයි. පද, ගාථා උපදවයි. ගාථාවෝ අරුත් පවසත්. **'අක්ඛරං හි පදං ජනෙති, පදං ගාථං ජනෙති, ගාථා අත්ථං පකාසෙති'** යනු දන්න. කවිතෙමේ ගාථාවන්ගේ ආශය වේ. මෙහි කවිතෙමේ ගාථා පවත්වන බැවින් ප්‍රතිෂ්ඨා වේ. **'කවි ගාථානමාසයො'** යනු ආප්තයි.

ගාථා බොහෝ සෙයින් පාදසතරකින් යුක්ත වේ. එයට අඩු වැඩි පාදයන්ගෙන් බැඳුනු ගාථා ද නැත්තේ නො වේ. පාද නම් ගාථාවක සතරින් කොටසකි. සෑම තැන්හි සමචතුර්ථභාගය ම පාදයකැ, යි නො ගත හැකි යි. සමහර ගාථාවන්ගේ පාද, මාත්‍රා විසින්, අකුරු විසින් වෙනස් ය. මාත්‍රාදිවශයෙන් පාදයන්ගේ වෙනස්බව වුව ද, පාද සතරින් හෝ එයට අඩු වැඩි පාදයන් ගෙන් බැඳුනී ගාථා, යි කියනලදී. එහෙත් **'චතුශ්චරණනිබද්ධා ගාථා'** යි සාමාන්‍යයෙන් දක්වන ලද්දේ ය.

'පාදෙ චාදශ විෂමෙ මාත්‍රාශ්චාෂ්ටාදශ චිතීයෙ හි
පංචදශ චෙත් තුරියෙ කථිතා ගාථා තථෛවාර්‍යා'

විෂම (ප්‍රථම-තෘතීය) පාදයෙහි මාත්‍රා දොළොසක් ද, චිතීයපාද යෙහි මාත්‍රා අටළොසක් ද, චතුර්ථපාදයෙහි මාත්‍රා පසළොසක් ද යොදා කළ බැඳුම ගාථා යි මින් කියන ලදී. චිතීය-චතුර්ථපාදයෝ සමපාදයෝ ය. මොවුහු මෙසේ කියූවෝ ද ත්‍රිපිටකයෙහි ඡන්දසින් බැඳුනු හැම බැඳුම් ම විශෙෂයක් නො තබා ගාථා යි හඳුන්වන ලද්දේ ය. ගත යුත්තේ ඒ ය.

අනත්ථපදසංහිතා = අරුත් රහිත පදයෙන් යුත්.

එකං ගාථාපදං සෙය්‍යො = එක් ගාථාපදය නමුත් ශ්‍රෙෂ්ඨ වේ.

යං සුත්වා උපසම්මති = යම් ගාථාපදයක් අසා සන්සිඳේ ද[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

දැරුවීරියස්ථවිරවස්තුව නිමියේ ය.

---

1. 7. 1. "යං සුත්වා උපසම්මති" යනු බලනු.

කුණ්ඩලකෙසි සථවිරාවෝ

8 – 3.

රජගහනුවර සොළොසැවිරිදි වයස් වූ සිටුදුවක් වූ ය. ඕ තොමෝ රූසපුවෙන් දූතුම්කලු ය. දුටු දුටුවන් නෙත් සිත් පැහැර ගත්තා ය. තරුණවයසෙහි සිටින ස්ත්‍රිහු තරුණමදයෙන් මත් ව නිතර පුරුෂයන් පතන්නාහු ය. ඔවුන් කෙරෙහි ලොල් ව වසන්නාහු ය. ඔවුන් හා කොයිවේලේ එක්වෙමු දැ, යි සිතන්නාහු ය. තරුණයන් දුටු තැන ඇඟමැලි කඩන්නාහ. ඉහි මරන්නාහ. අදුනන නොඅදුනනබව නොසිතා, සිනා සෙන්නාහ. ගැහැණුන්ගේ හැටි, මෙසේ බව දන්නා සිටුදුවගේ මවුපියන් තම දුව සත් මහල් ගෙයි උඩ මාලෙහි නිදන කාමර යෙහි රැකවල් සහිත කොට වාසය කර වූහ. කටයුතු සඳහා දැසියක පවරා දුන්හ. මේ කල්හි රාජභටයෝ මිනීමැරුම් සොරකම් ආ කල සාහසිකපුරුෂයකු පිටිතල හයා බැඳ, සතර මාහන්දි, තුන් මංහන්දි, දෙ මංහන්දි ගෑනේ ඇවිද්දවමින් මරන්නට ගෙණ ගියහ. උඩ මහලෙහි හුන් සිටු දූ මිනිසුන්ගේ කෑ කෝ ගැසීම් අසා, 'මේ කිමැ, සි උඩමහලෙහි සිට බලන්නී, බැඳ ගෙණ යන ඒ සාහසිකයා දූක, ඌ කෙරෙහි ඇලුනී ඌ පතා, කෑමත් නොකා ඇඳ වැතිර යටිකුරු ව නිදන්නට වූ ය.

එහි පැමිණි ඇගේ මවු තොමෝ 'දුව! මොක ද නිදන්නී? අපහසුවෙක් ද? කියන්නැ' යි කිවු ය. 'අම්මේ! මට කිසි යුතු අපහසුවෙක් නැත, දැන් රාජභටයන් විසින් සොරෙකැ, යි කියා පිටිතල හයා බැඳ ගෙණ ගිය මිනිහා අම්මා දුටුවා ද, මම ඔහු දෙස බැලීමි, එ කෙණෙහි මාගේ සිත ඔහු කෙරෙහි ඇදී ගියේ ය, බැඳී ගියේ ය, ඒ පුරුෂයා ගන්නැ, යි මා සිත මට කියයි, ඒ මිනිහා නොලැබේ නම්, මා මැරෙණු එකාන්න ය, මම මෙහි ම මැරෙමි' යි ඕ තොමෝ නොසහවා කිවු ය. 'හා! ඒ මොන බොළඳ කාන්තාවක් ද, ඔයට වඩා තරුණ, හැඩ වැඩ ඇති හොඳ මිනිස්සු කොතරම් සිටින් ද, ඔය අදහස කොතරම් නරක ද, ඔය අදහස අත් හරින්න, අපි උඹට අපේ ජාතියට කුලයට පරපුරට ධනයට රූපයට වයසට සුදුසු ගැලපෙන පිරිමියකු සොයා දෙන්නෙමු, ඉක්මන් වන්නට එපා, අපට කැපෙන මිනිහකු සොයා ගත හැකි ය, ටිකක් ඉවසන්නැ' යි මවු තොමෝ කිවු ය. 'අම්මා මොනවා කියනවා ද, මට වෙන මිනිහකු වුවමනා නැත, මට වුවමනා ඒ ගෙණ ගිය මිනිහා ම ය, අම්මාලා මට ඒ මිනිහා ලබා නොදෙන්නෝ නම්, වෙන මිනිහකු ලබා දෙන්නට

වෙහෙසෙන්නට එපා, ඒ දිග හරියන්නේ නැත, මා ගැණ ඉදිරි යට බලාපොරොත්තු වහු නම්, මේ මිනිහා ම ලබා දෙන්න, එසේ නොකොට මා ගැණ බලාපොරොත්තු වන්නට එපා, මම දිවි නසා ගන්නවා, වරදින්නේ නැතැ' යි ඇ තදින් කියා සිටියා ය.

මවු තොමෝ දුව සනසන්නට පැය ගණනක් කරුණු කියා බැරි තැන මේ වග, පියාට ද දැන්වූ ය. පියා ද දුවට මේ ගැණ නොයෙක් ලෙසින් කීයේ; දුව එයින් වලකා ලන්නට එය වෙනස් කරන්නට අපොහොසත් වී ය. අන්තිමේ දී මවු පිය දෙදෙන, සොරා බැඳ ගෙණ ගිය රාජභටයන් වෙතට රහසින් මුදල් දී මෙහෙකරුවන් යැවූහ. රාජභටයෝ ඔහු රහසින් නිදහස් කොට, සිටානන් වෙත යවා, ඒ වෙතුවට අනික් දුප්පත් මිනිසකු මරවා, සොරා මැරුහ, යි රජයට දන්වා සිටියාහ. සිටු තෙමේ ඔහුට කවා පොවා හොඳට සනපා කිහිපදිනකට පසු දුව පාවා දුන්නේ ය.

සිටු දූ තොමෝ එතැන් සිට සිය සැමියාගේ සිත් සතුටු කරන්නට සිතා, නිතර නිතර නන්වැදෑරුම් ඇඳුම් කැඩුම් සුවඳ විලවුන් ආදියෙන් හා රන් අබරණවලින් ඇඟ සරසන්නී ය. තොමෝ ම කෑම් බීම් පිළියෙල කරන්නී ය. කවන්නීය. පොවන්නී ය. නාවන්නී ය. සඟන්නී ය. පැයට සතර පස් වරක් ඇඳුම් වෙනස් කරමින්, සඟන් ගා මූණ සෝදමින්, සුවඳ විලවුන් ගල්වමින් පියොරසුණු දමමින්, තොල් නිය සායම් ගා රතු කරමින්, ඇඟ සැරසීම පිරිමින් තමන් වෙත ඇද ගන්නට මායම් කරණ කාමයෙන් නොතිත් වූ පුරුෂලොල වූ වල්ගැණුන් ගේ සිරිතෙකි.

සිටුදුවගෙන් මෙසේ නිතර සැලකුම් ලබන ඒ සාහසික පුරුෂ තෙමේ සියඹුව ඇඳ ගත් ඇඳුම් කැඩුම්වල වටිනාකම දැක 'මෑ මරා මේ ඇඳුම් කැඩුම් අබරණ ගෙණ විකොට, මුදල් ටිකක් අතට ගෙණ ආප්ප පිට්ටු ඇ යමක් කා, කවදා සතුටු වන්නෙම් දෝ' යි සිතා, එයට උපායයක් සලකා ගෙණ, කිසිත් නොකා, ඇඳ වැතිර නිදි ගත්තේ ය.

භාර්‍යාව:- අය්යෝ! මොක ද මේ අවේලාවේ නිදන්නහු? අපහසුවෙක් ද? හිසරදය ද? බඩරුදුවක් ද? කියන්න ඉක්මනට.

පුරුෂ තෙමේ:- නෑ, සොඳුර! අපහසුවෙක්.

භාර්‍යාව:- එහෙනම්, අම්මා තාත්තා සිත් රිදෙනන්ට යමක් කීවෝ ද? කළෝ ද?

පුරුෂ තෙමේ:- නෑ නෑ එහෙම එකක් නෑ.

භාර්‍යාව:- එහෙ නම් නිදන්නහු? ඇත්ත කියන්න! මා හැර කාට කියන්නට ද බලාපොරොත්තුව?

පුරුෂ තෙමේ:- සොඳුර! මම, දෙවියන්ට භාරයක් ඔප්පුකිරීමට බැඳී සිටිමි. ඒ සඳහා මා විසින් කළ යුත්තී බිලිපූජාවක්. මාගේ දිවි ඉතිරි වූයේ, දෙවියන්ගේ අනුකම්පාව නිසා ය. සොඳුර; මාගේ බිරිය වශයෙන් ලැබීම ද දෙවියන් නිසා ම වී ය. දෙවියන්ට බැන්ද පඹුර නිසා ම නොවේ නම්, ඔයා මට කවදාවත් ලැබේ ය, යි මම නොසිතමි. මේ භාරය ඔප්පු කරන්නේ කෙසේ ද, යි මම නිතර සිතමින් තැවෙමින් ඉඳිමි.

භාර්‍යාව:- හා! එය ද කාරණ ය, එය ලොකු වැඩෙක් ද? කියන්න එයට වුවමනා දේ, මම සියල්ල පිළියෙල කරම්, මාගේ පණ වුවත් දෙනවා කියන්න.

පුරුෂ තෙමේ:- වතුර නොදමා පිසූ කිරිබත් ටිකක්, විලඳ පස්මල් ටිකක්, කපුරු, සාම්බ්‍රානි, තෙල් පහන් වැටි පිහිදිය, පලතුරු, විලක්කු, බුලත්.

භාර්‍යාව:- හා! හොඳයි, අද ම මම මේවා පිළියෙල කරණවා.

මෙසේ කියා ඕ තොමෝ ඒ සියල්ල පිළියෙල කොට නිමියා වෙතට ගොස්, 'සියල්ල පිළියෙල කළා, යන්නට සූදානම් වන්නෑ, යි කිවු ය. 'සොඳුර! එසේ නම් යමු, අන් කිසිවකු ගෙණ යෑම හොඳ නැත, යා යුත්තෝ අපි දෙදෙනම ය, නෑයකු වත් ගෙණ යා යුතු නැත, හොඳට පිරිසිදුව හොඳට ඇඳ පැලඳ යා යුතු ය, සතුටින් සැපසේ යා යුතු ය' යි සොරා කී කල්හි ඕ තොමෝ ඔහු කී ලෙසට සියල්ල සපයා ගෙණ හොඳට ඇඳ පැලඳ, කිරිබත් විලඳ ආදී පූජෝපකරණයන් ගන්වා ගෙණ, සොරුන් මෙහෙකරුවනුත් සමග රියකට නැඟී කඳුපාමුල දක්වා ගියා ය. කඳුපාමුලට ගොස් ඒ සියලු දෙන ම රියෙන් බැස්සාහ.

ඉක්බිති ඒ සොර පුරුෂ තෙමේ 'සොඳුර! මෙතැනින් ඔබ්බට මුන් සමග යා යුතු නොවේ, රියත් සමග මුන් හැම නවතා පූජා බඩු පමණක් ගෙණ යා යුතු ය, මේ පිදේනිය ගන්නැ' යි බිරියට

කී ය. ඕ තොමෝ ද උෆ කී ලෙසට පිදේනි උස්සා ගත්තා ය. හොරාත් ඇය සමග කඳුමුදුනට නැංගේ ය. මිනිස්සු කඳුමුදුනට නගින්නෝ එක් පැත්තකින් ය. එක් පැත්තක් මුදුනේ සිට පාමුල දක්වා ම බිඳ වැටී ගොස් ය. මිනිස්සු සොරුන් ගෙණ කඳුමුදුනට නැගී බිඳ වැටී ගිය පැත්තෙන් සොරුන් හෙලත්. හෙලනු ලබන හොරු කැලි කැලි වලට කැඩී බිම වැටෙත්. එහෙයින් මේ කන්ද **චොරපපාත** යි ප්‍රසිඛ ය.

සිටු දූ තොමෝ කඳුමුදුනෙහි සිට 'සවාමිනි! පිදේනිය පුදත්නැ' යි කිවු ය. උෆ එයට කිසිත් නො කීයේ ය. නැවැතත් ඕ 'හිමියෙනි! පිදේනිය පුදන්නැ, යි කිවු ය. එවිට සොරා 'පිදේනි පිදීමෙන් මට වැඩෙක් නැත, තා මෙහි ගෙණ ආයේ පිදේනි දෙන්නට නො වෙමි, තා මරා දමන්නටැ, යි කී ය. ඈ තැති ගත්ති 'ඇයි හිමියෙනි! එසේ කියහු, මම ඔබ වහන්සේ හේ ය, මේ ඇදුම් කැඩුම් අබරණත් ඔබ වහන්සේගේ ය, ඔබවහන්සේ මාගේ ය, ඇයි මා මරන්නහු?, යි ඇසූ ය. 'තා ඇඟ ලා ඇති ඇදුම් කැඩුම් අබරණ ගන්නටැ, යි කී විට, ඇයි! හිමියෙනි! මේ ආභරණ ගන්නට මම මැරිය යුතු වෙම් ද, මාත් ආභරණත් ඔබ වහන්සේගේ බව නැවැත නැවැතත් කිය යුතු ද, ඒ එසේ ය, මෙන්න ආභරණ'යි ඈ කිවු ය. එහෙත් සොරා ඇය මැරීමට සැරසුනේ ය. ඒ දුටු සිටුදුව 'සවාමිනි! මා මැරීමෙන් ඔබවහන්සේට ඇති පලය කිම? මේ සියලු ආභරණ ගෙණ මාගේ පණ රැක දෙන්න, මෙ තැන් සිට මා මව මෙන් සලකා ගන්න, එසේ නො කැමැති නම්, දැසියක කොට ගන්න, හිමියෙනි! රනින් කළ මේ සියලු අහුපලඳනාත් වෙරළුමිණියෙන් කළ ආභරණත්, ඇඟලා ඇති කසිසළු ඈ වසත්‍රත් ගෙණ කැමැත්තක් කරන්න, මට දිවි පමණක් දෙන්නැ'යි කිවු ය.

හොරා 'තා නො මරා ඇදුම් කැඩුම් ගත්තෙම් නම්, තෝ එබව තාගේ මවුපියන්ට කියහි ය, එහෙයින් තා මරමි, මෝඩ ගැණි! බොරුවට නො හඬව, නො වැලපෙව, ආභරණ එක්තැන් කොට පොදි බඳුව, තා නො මරා හරින්නට නො හැකි ය' යි කීයේ ය. 'අග්‍යෝ! මෙය ඉතා බැරුරුම් ය, සුලු නො වේ, තුවණ ලැබී ඇත්තේ නිකමට නො වේ, ඒ ඒ දේ සොයා බලා පරීක්‍ෂා කොට කිරීමට ය, මමත් මේ වේලෙහි මුට කළ යුත්ත දනිමි' යි, 'හිමියෙනි! පොඩ්ඩක් ඉඩ දෙන්න, ඔබ වහන්සේ සොරකු කොට බැඳ ගෙණ යද්දී මාගේ බලවත් ඉල්ලිම පිට මාගේ මවුපියෝ රාජභටයන් වෙත බරගණනක් මුදල් යවා ඔබ නිදහස් කොට ගෙණ මට හිමියා කොට දුන්හ, එදා සිට මෙතෙක් මම

ඔබ වහන්සේගේ මෙහෙ කරන්නියක් වෙමි, මේ කාලය තුළ මා අතින් යම් යම් ප්‍රමාද දෙෂ ඔබට සිදු වන්නට ඇත, මේ මැරෙණ වේලේ ඔබ වහන්සේ කමා කර ගන්නට මට ඉඩ දුන මැනැවැ' යි සිටුදූ ඉල්ලා සිටියා ය. 'හා! හොඳ යි! එයට ඉඩ දිය හැකියි, කමා කර ගණුව' යි හොරා කඳුමුදුනෙහි කෙළවරට වී සිටියේ ය.

එවිට සිටුදූව ඔහු තෙවරක් පැදකුණු කොට සතර තැනෙක සිට වැඳ, 'හිමියනි! අනේ! මේ ඔබගේ අවසන් දැකුම ය, අද සිට ඔබටත් මාගේ දැකීමෙක් නොලැබේ, මටත් ඔබගේ දැකීමෙක් නැතැ' යි කිය කියා ඉදිරියෙන් ඇඟ එල්ලී සිඹිමින් අඹමින් පසුපසින් ඇඟ එල්ලී සිඹිමින් අඹමින් කඳුමුදුන සිටි සොරා එකවරට උස්සා කන්දෙන් පහතට දැමූ ය. උඟ කන්දෙහි ඒ ඒ තැන ගැටෙමින් හැපෙමින් බිම හෙන්නේ, කඩ කඩ වී බිම වැටුනේ ය. කඳුමුදුනෙහි අරක් ගත් දෙවි තෙමේ උන්ගේ ඒ ක්‍රියාදැක සාධුකාර දෙන්නේ-

'හැම කරුණෙහිම ඒ - පුරිස් නොවෙ පඬි ලෙව්හි,
ඉතිරිය ද පඬි වේ - ඒ ඒ තැනෙහි විසකුත්'

යන මෙය හඬ නගා කීයේ ය.

සිටු දූ තොමෝ සොරු කඳුමුදුනෙන් බිමට දමා 'මා දැන් ගෙදර ගියොත් හිමියා කොහි ද? කෙළෙහි කිමැ? යි නොයෙක් දෙන නොයෙක් දේ අසති, ඇත්ත කියූ විට මට ගරහති, ඇණුම් බැණුම් කරති, මා මරා මාගේ ඇදුම් කැඩුම් අබරණ ගන්නට සූදනම් වූ බව දැන උඟ මරා දැම්මි' යි කියූ ව ද නොඅදහති, ඒ නිසා ගෙදර නොයමි' යි තීරණය කොට ගෙණ, ඒ කඳුමුදුනෙහි ම ඇදුම් කැඩුම් ගලවා දමා, වනයට වැද, තැන තැන ඇවිදින්නී, පරිව්‍රාජකයන් විසූ පන්සලකට ගොස් උන් වැද, 'ස්වාමිනි! මා පැවිදි කරණු මැනැවැ' යි ඉල්ලා සිටියා ය. එවිට ඔවුහු ඇය පැවිදි කළහ. එසේ පැවිදි ව ටික දවසක් ගෙවා 'ස්වාමිනි! ඔබ වහන්සේලාගේ පැවිද්දෙහි ඉතා උසස් තැන කොතැන ද? උසස් පලය කුමක් දැ?' යි විවාළා ය. 'පිණැත්තිය! දසකසිණ පිරියම් කොට ධ්‍යාන උපදවා ගැණීම, අප සතු වාදදහසක් ඉගෙණීම් යන මේ ය, අපගේ පැවිද්දෙහි උසස් ඵල ය' යි පිරිවැජියෝ කිහ. 'ස්වාමිනි! ධ්‍යාන උපදවාලීම මට අසිරු ය, මම එහි අපොහොසත් වෙමි, එබැවින් ඔබ වහන්සේලා සතු වාදදහස පමණක් හන් උනෙමි'' යි ඕ කිවු ය.

පිරිවැජියෝ ඇයට වාදදහස උගන්වා, 'යව; තෝ දැන් අපගේ වාදයෙහි දක්ෂ යි, මේ මුළු දඹදිව සෑම තැන ගොස්, තා හා වාදයෙහි සමතෙක් සිටී ද, යි සොයා බලව, යම් කිසි තිහියෙක් වාදයෙහි දක්ෂ වූයේ නම්, කරට කර ගැලපී සිටියේ නම්, ඔහුට අඹු වෙව, එහි පැවිද්දෙක් දක්ෂ වූයේ නම්, ඔහු වෙත පැවිදි වෙව' යි, ජම්බු අත්තක් ඇය අතට දී පිටත් කොට යැවූහ. ඕ එතැන් සිට **ජම්බුපරිව්‍රාජිකා** යි ප්‍රසිද්ධ වූ ය. තැන තැන ගොස් උනුන් විවාරන්නට වූ ය. මෙසේ කිහිප දවසක් ගෙවී ගියේ ද, ඇය අසන ප්‍රශ්නයන්ට පිළිතුරු දීමෙහි පොහොසතෙක් ඇයට හමු නො වී ය. ජම්බුපරිව්‍රාජිකාව එනු අසා බොහෝ දෙන පැන ගියහ. ඇය පිඹු සොයා යන විට වැලි ගොඩක් ගසා ජම්බු අත්ත එහි සිටුවා 'මා සමඟ වාදයට කැමැත්තෙක් වේ නම්, ඔහු මේ ජම්බු අත්ත උගුලා දමාවා'යි දන්වා යන්නී ය. වාද කරණු තබා එයට ලං විය හැක්කෙක් නව ම එහි නොවී ය. එක් ජම්බු අත්තක් මැලවී ගිය විට තව එකක් ගන්නී ය. මෙසේ දවස් යවන ඕ තොමෝ සැවැත් නුවරට ගොස් ගම්දෙර වැලිගොඩක් ගසා, කොළ අත්ත එහි සිටුවා, මා හා වාද කරණු කැමැත්තෙක් මේ අත්ත උගුලා දමාවා' යි දන්වා පිඹු සිහා ගියා ය. ගම් දරුවෝ එය වට කොට ගත්හ.

ශාරිපුත්‍ර මහා සථවිරයන් වහන්සේ බත්කිස අවසන් කොට, බැහැර වඩින සේක්, වැලිගොඩ වටේ සිටි ලමයින් දැක 'මේ කිමැ' යි උන් අතින් ඇසූහ. ගම්දරුවෝ උන්වහන්සේට තොරතුරු කීහ. 'ලමයිනි! ඔය කොළ අත්ත උගුලා පැන්තක තබන්නැ' යි උන්වහන්සේ වදාළ විට 'අනේ! අපට බැහැ' යි කීහ. "ඇයි! එසේ කියහු? බිය ද? බිය වන්නට එපා, ඔය ලමයින්ට විරුඬ ව කෑවත් ආවොත් මම බලා ගන්නම්, කොළ අත්ත වැලිගොඩින් අස් කරන්නැ' යි උන්වහන්සේ කීහ. එවර ලමයි කොළ අත්ත උගුලා දැමූහ. එ තැනින් දූවිලි නැගින. පරිව්‍රාජිකා තොමෝ අවුත් බැණ දෙඩා තරවටු කොට 'ඔය දරුවෝ මේ කොළ අත්ත උගුලා දැමුවෝ මොක ද? ඔය දරුවන්ට මා හා වාද කළ හැකි ද? කවු ද කීයේ කොළ අත්ත අස් කරන්ටැ?' යි ඇසූ ය. 'මේ හාමුදුරුවන් අපට කීවා, කොළ අත්ත උගුලා දමන්නට, ඒ නිසා අපි එය අස් කෙළෙමු' යි ලමයි කීහ.

එකල්හි ඕ තොමෝ සැරියුත් තෙරුන්ට ලං ව 'හැබෑ ද, ස්වාමිනි! මේ කොළ අත්ත අස් කරන්නට ඔබ වහන්සේ මේ දරුවන්ට කී හු? එසේ නම් දැන් මා හා වාද කළ යුතු ය, වඩින්න

ඒ පිණිස මෙ තැනටැ' යි කිවු ය. 'ඔව්! මම එය අස් කරවීමි, එසේ කර වූයේ වැද කරණු සඳහා ම ය, වැද කරමු' යි සථවිරයන් වහන්සේ කීහ. පරිව්‍රාජිකා තොමෝ 'හොඳ යි සවාමිනි'! යි වැද කරන්නට සවස් වේලේ තෙරුන් වසන තැනට ගියා ය. නුවර ඇලලුනේ ය. 'පඬිවරු වැද කරති' යි නුවර වැස්සෝ පරිව්‍රාජිකාව හා ම තෙරුන් වෙත ගොස් වැඳ හුන්හ. පරිව්‍රාජිකාව ද හොඳට වැඩි වී 'සවාමීනි! මම ඔබ වහන්සේගෙන් ප්‍රශ්නයක් අසමි' යි කිවු ය. 'ඔව්! හරි, අන්න! සහෝදරිය'! යි ප්‍රශ්න අසන්නට සථවිරයන් වහන්සේ අවසර දුන්හ. ඕ තොමෝ ඔවුන් සතු හැම වැදයක් ම දක්වා ප්‍රශ්න ඇසූ ය. සථවිරයන් වහන්සේ ඒ හැම වැදයක් ම කරුණු දක්වමින් බණඩනය කළහ. නැවැත 'තට තවත් ඇසිය යුතු ප්‍රශ්න තිබේ දැ' යි ඇසූ විට 'නැතැ' යි කිවු ය

ඉක්බිති සථවිරයන් වහන්සේ 'තෝ මාගෙන් ප්‍රශ්න බොහෝ ගණනක් ඇසීහි, එහෙයින් මා විසිනුත් තාගෙන් එක් ප්‍රශ්නයෙක්' වත් ඇසිය යුතු ය, තා එයට පිළිතුරු දිය යුතු ය, යි කී විට 'සවාමීනි! අසනු මැනැවැ' යි කිවු ය. එකල්හි උන්වහන්සේ 'එක නම් කිමැ?' යි ඇසූහ. ඕ තොමෝ එයට පිළිතුරු දෙන්නට අපොහොසත් වූවා, 'සවාමීනි! මේ කිනම් මන්ත්‍රයෙක් දැ?' යි ඇසූ ය. 'මේ බුඩමන්ත්‍රයෙකැ, යි කීහ. 'මටත් මෙය උගන්වනු මැනැවැ' යි කිවු ය. 'උගන්වන්නට නම් අප සේ විය යුතු ය' යි සථවිරයන් කී කල්හි 'සවාමීනි! මා පැවිදි කරගන්නැ' යි කියා සිටියා ය. සථවිරයන් වහන්සේ ඇය මෙහෙණ වරට යවා පැවිදි කර වූහ. ඉන්පසු ලත් උපසම්පදාව ඇති ඕ තොමෝ කුණඩලකෙසී සථවිරා, යි ප්‍රසිඩ වූ ය. වැඩි දවස් නො යවා ම පිළිසැඹියාවන් ලබා රහත් වූ ය.

ටික දවසකට පසු ඛමීශාලාවට, රැස් වූ භික්ෂූන් වහන්සේලා 'කුණඩලකෙසී සථවිරා තොමෝ වැඩි බණක් දහමක් නො අසා ම පැවිද්දෙහි ඵල ලැබූ ය, සොරකු හා යුඩයක් කොට දිනා අවුත් සසුන්ගත වූ ය' යි කතා කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක්, ඒ කතාව අසා 'මහණෙනි! මා දෙගනා කොට ඇති බණ, ටිකය, හුඟ ය, දිගය, කොට ය, යි නො මැනිය යුතු ය, නො කිය යුතු ය, මා දෙසූ හැම බණ පදයෙක ම නිවන් රසය කැවී ඇත්තේ ය, එහෙයින් එහි අඩු වැඩිබවෙක් උස් පහත් බවෙක් නැත, වැඩක් නැති අනර්ථප්‍රතිසංයුක්තපද සිය දහස් ගණනකට වඩා ඉතා කුඩා වූ ද, අර්ථවත්පදය ශ්‍රෙෂ්ඨ ය, උතුම් ය, එසේ ම දිනීමෙක් වන්නේ ද, තමන් තුළ ඉතා දිගුකලක සිටි පලා

පදියත් වූ කෙලෙස් සොරුන් පරදවා ජය ගත්තහුට ය, අන් බැහැර සොරුන් පරදවා ජය ගෙණ සිටියහුට, ජයෙක් දිනීමෙක් නො වන්නේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක:-

යො ච ගාථාසතං භාසෙ අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්යො යං සුත්වා උපසම්මති.
යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ,
එකංච ජෙය්‍යමත්තානං සවෙ සඞ්ගාමජුත්තමෝ' ති.

ඉදින් යමෙක් අර්‍ථරහිතපදයෙන් යුත් ගාථා සියයක් කියන්නේ නමුත්, (ඒ උතුම් නො වේ) යමක් අසා සන්සිඳේ ද (එසේ වූ) එක් ගාථාපදය උතුම් වේ.

යමෙක් දහසින් ගිණූ මිනිසුන් දහසක් (එක්ම) යුඩ භූමියක දී දිනන්නේ වේ ද, එහෙත් හෙතෙමේ දිනුයේ නම් නො වේ. යමෙක් වනාහි එකකු වූ ම තමන් දිනන්නේ වේ ද, හෙතෙමේ එකානතයෙන් යුඩ දිනුවන්ට උතුම් වේ.

යො ච ගාථාසතං භාසෙ = ඉදින් යමෙක් ගාථාසියයක් කියන්නේ නමුත් (උතුම් නො වේ)

අනත්ථපදසංහිතා = අර්‍ථ රහිතපදයෙන් යුත්.

එකං ගාථාපදං සෙය්යො = එක්ගාථාපදය උතුම් වේ.

යං සුත්වා උපසම්මති = යමක් අසා සන්සිඳේ ද.[1]

යමෙක් ආකාශවණ්ණනාදිඅර්‍ථරහිතපදවලින් යුත් සිය දහස් ගණන් ගාථාවන් කියන්නේ නමුත්, එයින් වැඩෙක් නො වන්නේ ය. එහෙයින් ඒ ගාථා කීම උතුම් නො වේ. යම් කිසිවක් අසා, අසන්නේ, ඇතුළත සිටි සියලු කෙලසුන් සන්සිඳවාලීමෙන් සන්සිඳේ ද, එයට ඉවහල් වූ යම් එක් ම ධම්පදයෙක් වේ නම්, ඒ ම ය ශ්‍රෙෂ්ඨ. ඒ ම ය උතුම්.

'පිරිවැජියෙනි! අලොභය-මෛත්‍රිය-මනා සිහිය-එකඟබව යන මේ ධම්පද අතුරෙහි එක් ම ධම්පදයෙක් වුව ද ඉතා උතුම් ය, මින් එකෙකින් වුවත් නිවන් සිදු කර ගත හැකි ය' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. රාගාදී වූ කෙලෙසුන් මැඩීමට බලය මේ හැම ධම්පදයෙක ඇති බැවින්, මින් එක් පදයෙක් වුවත් ඒ පිණිස ප්‍රමාණවත් ය, යනු වදාළ සේ ය. සකඞ්කඨාදිය ඇසුරු කළ ධම්පදයෝ නිවන් ලබා දෙත් ය, යි කියනු කුමට ය.

1. 7. 1 'යං සුත්වා උපසම්මති" යනු බලනු.

යො සහස්සං සහස්සෙන = යමෙක් දහසින් ගිණු දහසක්. දහස් වරක් ගිණු දහස. දශලක්ෂයක්.

සහස්ස ශබදය, මෙහි යෙදුනේ අනෙකසඞ්ඛ්‍යාවක් ලෙස ය. **'සහස්සරංසි, සතතෙජො,** යනාදි තන්හි සේ ය. නොයෙක් දහස් ගණන්, නොයෙක් සිය ගණන් යන අරුත, ඒ දෙතැන යෙදුනු **සහස්ස-සත** ශබදදෙක කියාලයි. නියමයෙන් ම දහසෙක සියයෙක යන අරුත් නො කියයි. **මිස්සක - ගුණිත - සම්බන්ධ - සංකෙත - අනෙක,** යි සඞ්ඛ්‍යාශබද පස්, කොටසක් කොට ද බෙදා තිබේ. ශබදලක්ෂණග්‍රන්ථයන්ගෙන් ඒ දත හැකි ය.

සහස්ස ශබදය, ශාබ්දිකයෝ දසශබද සියයක්, ද්වන්ද සමාස කොට එකශෙෂ කිරීමෙන් පසු ඉතිරි වූ දසශබදයට බහුත්වය ද සලකා, සහස්ස' යි ආදෙශ කොට නිපදවති. නැවැත, සහස්ස' යන ප්‍රකෘතියෙන් ප්‍රත්‍යය කොට අං' ආදෙශයෙන් සහස්සං' යි කොට භාෂාවෙහි යොදති. **'සතං දසගුණං = සහස්සං'** සියය, දසයෙන් ගිණුයේ සහස්ස නම් වේ, යනු එහි තේරුම ය. මෙය ද මුලින් කියූවට විරුඬ නො වේ. අන් ලෙසකින් කියූ ව ද මෙ ද ඒ ම ය. සහස්ස ශබදය නියතනපුංසක ය. එකවචන ඇත්තේ ය. එය විශෙෂ්‍ය පදයක් බලා තමන් අයත් ලිඞ්ග - වචන - වෙනස් නො කරයි. මේ ගාථාවෙහි එන සහස්ස ශබදය සිටියේ, එහි ම වූ මානුසෙ' යන්නට විශෙෂණ ව ය. එය පුලලිඞ්ගික ය. බහුවචන ඇත්තේ ය. එහෙත් එය බලා සහස්ස ශබදය තමන් අයත් ඒ එකවචනභාවය හා නපුංසකත්වය නො හැරියේ ය.

සඩගාමෙ මානුසෙ ජිනෙ = මිනිසුන් දිනන්නේ ද, දහසින් ගුණ කළ දහසක් මිනිසුන් දිනන්නේ ද. දශලක්ෂයක් මිනිසුන් දිනන්නේ ද.

සඩගාම නම්, යුඩය යි. ප්‍රතිවිරුද්ධ වූ දෙපක්ෂයක් අතර කෙරෙණ ඇණුම්-කෙටුම්-පැහැරුම් ආදිය යුඩය යි. ඇණුම්-කෙටුම් ආදිය කෙරෙණ තැනත් මෙයින් කිය වේ. සම්පහාර-සමර-රණ-ආජි-ආහව-යුඩ-ආයොධන-සංයුග යනාදි නාම ද මෙයට පර්‍යාය වේ. **'මනුනො අපච්චං මානුසො'** = යනු මානුසෙ' යන්නෙහි අර්ථ විවරණය යි.[1]

එකං එව ජෙය්‍යං අත්තානං = එකකු ම වූ තමන් දිනන්නේ වේ ද.

---

1 1 13 'සීයේ‍යා නන්දති සුගගතිං ගතො' යනු බලනු.

යමෙක් එකලා වූ තමන් දිනන්නේ නම්, හෙතෙමේ රැතැන් දිවාතැන් ඇ හැම තැන්හි සිහි ඇති ව සිය සිරිතට ගැළපෙන කමට හනක් ගෙණ තමා තුළ සිටින දහසටත් වැඩි රාගාදිකෙලෙස් සතුරන් මැඩ දිනන්නේ ය. කෙලෙස් සතුරන් පරද වන්නේ ය.

සෝ වෙ සඞ්ගාමජුත්තමෝ = හෙතෙමේ එකාන්තයෙන් යුද දිනුවන්ට උතුම් වේ.

යුද දිනුයේ **සඞ්ගාමජිත්'** නම්. ඔවුනතුරෙහි ප්‍රධාන වූයේ 'සඞ්ගාමජුත්තම' ය.

යමෙක් දහලක්ෂයක් පමණ වූත් සතුරන් හා යුද වැද, තමන් හයිබල ඇති බැවින් උන් හැම පරදවා තෙමේ ජය ගණී ද, එහෙත් ඒ උතුම් ජයෙක් නො වේ. යමෙක් කමටහන් වඩා කෙලෙස් සතුරන් නසා ජය ගණී ද, ඒ ජය ය උතුම්. මෙතෙමේ ම සටන් බිම ජය ගත්තවුනට වඩා හැම අතින් ශ්‍රෙෂ්ඨ ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

කුණ්ඩලකෙසී ස්ථවිරාවස්තුව නිමියේ ය.

බමුණකු ඇසූ ප්‍රශ්නයෙක්

8 – 4

නමින් අප්‍රකට එක්තරා බමුණෙක් 'බුදුරජ තෙමේ අර්ථය ම පමණක් දනී ද, නැත, අනර්ථයත් දනී දැ' යි සිතා, එය විචාරන්නට දිනක් බුදුරජුන් වෙතට ගියේ ය. ගොස් පසෙකට වී හිඳ 'ස්වාමීනි! ඔබ වහන්සේ අර්ථය ම දන්නහු ය, අනර්ථය නොදන්නහුය, යනු මාගේ කල්පනා ය, ඒ ගැණ ඔබ වහන්සේ කුමක් කියහු? යි ඇසී ය. 'බමුණ! මම අර්ථයත් දනිමි, එසේ ම අනර්ථයත් දනිමි' යි වදාළ කල්හි 'එහෙනම්, ස්වාමීනි! මට අනර්ථයක් පහදා දෙන්නැ,' යි ඉල්ලා සිටියේ ය. 'බමුණ! **ඉරළදාවනතුරු නිදීම-අලසබව – චණ්ඩිකම – කටයුතුදිග්ගැසීම – තනි ව තැන තැන ඇවිදීම – අන් අඹුවන් ගැණුම** යන මේ ජඩකම් කරන්නාහට අනර්ථයෙක් ම වන්නේ ය, අවැඩෙක් ම වන්නේ ය, හෙතෙමේ එලොව මෙලොව දෙක්හි ම කාලකණ්ණියෙක් වන්නේ ය' යි වදාළ විට, බමුණු මහත් සන්තොෂයට පැමිණ සාධුකාර දී 'ගණාචාර්‍යයන් වහන්ස! ගණශ්‍රේෂ්ඨයන් වහන්ස! බොහො ම සතුති යි, ඔබ වහන්සේ අර්ථානර්ථ දෙක ම දන්නහු' යි කී ය. 'බමුණ! ඔව්, මාතරම් හොඳ නො හොඳ දන්නෙක් යුතු අයුතු දන්නෙක්, වැඩ අවැඩ දන්නෙක් මෙලොව නැතැ' යි වදාරා නැවැත බමුණාගේ අදහස් විමසා බලා 'බමුණ! තමුසේ දිවි ගෙවන්නට කිනම් වැඩක් කරහු දැ' යි බුදුරජානන් වහන්සේ ඇසූහ. බමුණු තෙමේ 'ගෞතමය! මා ඔබ වහන්සේට බොරු කියන්නේ නැත, රක්ෂාවට මම සූදු කෙළිමි' යි කී ය. බුදුරජානන් වහන්සේ 'කොහොම ද එයින් වාසි දැ? යි ඇසූ විට 'පින්වතුන් වහන්ස! වාසි අවාසි දෙක ම තිබේ, සමහර දවසෙක වාසි, සමහර දවසෙක අවාසි' යි කී ය. එවිට උන්වහන්සේ 'බමුණ! අන්හු පරදවා ලබන වාසිය ලොකු වාසියක් නො වේ, එය ඉතා කුඩා ය, එය මහත් වාසියක් හැටියට නො පිළිගත හැකි ය, යමෙක් කෙලෙසුන් පරදවා දිනා නම්, ඒ දිනීම ලොකු දිනීමෙකි, ලොකු වාසියෙකි, ඒ දිනීම, නැවැත නො දිනුමක් කරන්නට යකකුට වත් බැරි ය, ඊට සමතෙක් කො තැනකත් නැතැ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:–

අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා,
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො.

නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහබ්‍රහමුනා
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනොති.

ආත්මය දිනන ලද්දේ එකාන්තයෙන් උතුම් වේ. යම් ඒ අන්‍ය වූ ප්‍රජාවක් (දිනන ලද්දී උතුම් නොවේ) ආත්මදමනය කළ, සතත යෙන් සංයත වූ හැසිරීම් පැවතුම් ඇති, එබඳු පුරුෂයාගේ කෙලෙස් දිනීම, දෙවියෙක්, නොදිනන ලද්දක් නොකරන්නේ ය. ගන්ධර්‍වයෙක් ද නොද කරන්නේ ය. බ්‍රහ්මයෙක් ද නොද කරන්නේ ය. වශවර්‍තී මාර තෙමේ ද නොද කරන්නේය.

අත්තනා හවෙ ජිතං සෙය්‍යො = ආත්මය දිනන ලද්දේ එකාන්ත යෙන් උතුම් වේ.

අත්තනා යනු, කෙලෙස් සහ ගිය සිත ය. ලෝභාදිකෙලශයන් ගෙන් යුත් සිත, අත්තා' යන මෙයින් කිය වේ.

හවෙ යනු, නිපාත ශි. එකංසාර්‍ථ ශි. පදපූරණයෙහි ද එයි. එයට **'හවෙ තෙ භාගිනෙය්‍ය සමණබ්‍රාහ්මණා'** යනු නිදසුන් ය.

දිනීම, **ජිත** නම්. යමෙක් තම සන්තානගත සියලු කෙලෙස් පරදවා ජය ගෙණ සිටී නම්, ඔහු විසින් ආත්මය දිනන ලද ය. ඒ එකාන්තබව හවෙ' යන්නෙන් වදුරත්. කෙලෙසුන් දිනීමට මාගී භාවනා කළ යුතු ය. වැඩී ගිය මාගීඥනයන්ගෙන් ඒ ඒ කෙලෙසුන්ගේ මුල් සිඳීම වන්නේ ය. එවිට ආත්මය දිනන ලද්දේ වේ.

යා ච අයං ඉතරා පජා = යම් මේ අන්‍ය වූ ප්‍රජාවක්.

යම් මේ සත්ත්වසමූහයෙක් දූකෙළීමෙන්, වසතු ව පැහැර ගැණීමෙන්, යුද්ධකිරීමෙන්, බලයෙන් දිනන ලද්දේ ද, යටපත් කරණ ලද්දේ ද ඒ දිනීම, යටපත් කිරීම උතුම් නොවේ.

අත්තදන්තස්‍ස = ආත්මදමනය කළා වූ.

ආත්මදමනය, සි වදුලෝ කමටහන් වඩා සිතෙහි වූ කෙලෙසුන් නැසීම ය.

පොසස්‍ස = පුරුෂයාගේ.

පොස යනු, මිනිසාට නමෙකි. **'කම්මචිත්තඋතුආහාරෙහි පොසීයතීති = පොසො'** කර්‍මය – චිත්තය – ඍතුය – ආහාරය යන සතරින් පොෂණය වන්නේ රැකෙන්නේ දිවිපවත් වන්නේ පොස නම් වේ, යනු එහි ඉතා කෙටි අදහස ය. **'උපකරණෙන සයං පොසීයතීති = පොසො'** යනුන් ඒ සඳහා ම කළ අරුත් පැවසීමෙකි. එහි උපකරණ, සි කීයේ කර්‍මචිත්තඍතු ආහාර ම ය.

නිච්චං සඤ්ඤතචාරිණෝ = සතතයෙන් සංයත වූ පැවතුම් ඇති.

කයින් කෙරෙන පව් හා වචනයෙන් කෙරෙණ පව් හැර සිටියේ, **සඤ්ඤතචාරී** නම්. කය වචන දෙකෙන් මුළුමනින් හික්මුනේය සඤ්ඤතචාරී.

න එව දෙවෝ = දෙවියෙක් නොම කරන්නේ ය.

සම්මුතිදෙව - උපපත්තිදෙව - විසුඬිදෙව, යි දෙවියෝ තුන් පරිදි ය. මහාසම්මත රජුගේ **කාලයෙහි** සිට ලොකයා විසින් දෙව, යි සම්මත රාජ-රාජකුමාරාදීහු ය සම්මුතිදෙව. වෘක්ෂපථිත ගෘහවනාදිභූමිනිශ්‍රිතදෙවියෝත් දෙවිලොව උපත් දෙවියෝත් උපපත්තිදෙවියෝ ය. ඕඩ්ඩාපදෙසික - මනොපදෙසික - සීත - වලාහක - උණ්හවලාහක - චන්ද - සූරියාදීහු ද මොවුන් කෙරෙහි ම ඇතුලත් ය. රහතුන් වහන්සේ විසුඬි දෙවියෝ ය. පොතෙහි ඒ මෙසේ කියන ලදී:-

'සම්මුතිදෙවා නාම රාජානෝ දෙවියෝ කුමාරා, උපපත්තිදෙවා නාම භුම්මදෙවෙ උපාදාය තදුත්තරිදෙවා, විසුද්ධිදෙවා නාම බුඩපච්චෙකබුඩඛීණාසවා' යි.

'පඤ්කම්සැපයෙන් කෙළින්, ප්‍රතිපාඣිකයන් දිනන්නට කැමැති වෙත්, ලොවට යුතු අයුතුකම් පහදා දෙත්, උතුම් වූ සිරුරුපැහැයෙන් බබලත්, සතුති කරණු ලබත්, ශොභාවිශෙෂය නිසා දකින්නට අසන්නට කැමැති වක්‍ර ලබත්, පවිසොත ගමනින් කැමැති තැනට යෙත්, සිය සමත්බව කරණ කොට ඒ ඒ කට යුතු කිරීමෙහි පොහොසත් වෙත්, යන මේ තේරුම් උඩ උපපත්තිදෙවියෝ, දෙවියෝ වෙති' යි පොතපතෙහි කියත්. මෙන්න එහි ආ සැටි:-

'දිබ්බන්ති කීළන්ති පංචහි කාමගුණෙහි, පවිපකෙඩ වා විපෙතුං ඉච්ඡන්ති, වොභරන්ති ච ලොකස්ස සුභාසුභන්ති, ජොතන්ති පරමාය සරීරජුතියා, ඵොඵියන්ති තඩභාවජ්ජිතෙහි, කාමියන්ති දට්ඨුං සොතුං ච සොභාවිසෙසසමොගෙන, ගච්ඡන්ති ච යථිච්ඡිතඨානං පවිසොතගමණෙන සකෙකාන්ති ච අනුභාවසම්පත්තියා තං තං කිච්චං නිප්ඵාදෙතුන්ති-දෙවා' යනු.

'උත්තම වූ ධ්‍යානක්‍රීඩාවෙන් කෙළින්, ප්‍රතිපාඣිකකෙලාශයන් දිනන්නට කැමැති වෙත්, ඉතා සියුම් නුවණට ගොදුරු වූ අරුත් පහදා දෙත්, සියලු කෙලෙස්මලින් බැහැර වූ ඉතා පිරිසිදු වූ නුවණින් බබලත්, අතිශය නිමල වූ ගුණයොගයෙන් සතුති කරණු

ලබත්, නිරුත්තර වූ පුණ්‍යක්ෂේත්‍රභාවයෙන් දකින්නට අසන්නට පුදන්නට කැමැති වනු ලබත්, පෙරළා නො එන ගමනින් අමා මහනිවනට යෙත්, උනුන්ගේ සිත් හසර දැන ඒ ඒ සත්ත්වයන් හිතයෙහි යොදන්නට පොහොසත් වෙත්, නිවතෙහි පිහිටුවන්නට පොහොසත් වෙත්, යන යුතුකම් උඩ රහතුන් වහන්සේ විසුඩිදෙවියෝ ය' යි කියත්. මෙන්න මෙහි ඇදුරු වදන්:-

'දිබ්බනති කීළනති පරමාය ඣානකීළාය, විජෙතුං ඉච්ඡනති පටිපක්ඛෙ, පරමසුඛුමඤ්ඤාණවිසයං අත්ථං ච වොහරනති ජොතනති සබ්බකිලෙසදොසකලුසාපක්කම්ම පරමවිසුඛාය ඤාණගතියා, ඨොමීයනති ච විඤ්ඤාතසභාවෙහි, පරමනිම්මල ගුණවිසෙසයොගතො, කාමීයනති ච අනුත්තරපුඤ්ඤක්ඛෙත්තතාය දඬ්ඪුං සොතුං පුච්ඡිතුං ච, ගච්ඡනති ච අමතමහානිබ්බාණං අපච්ඡාගමනීයාය ගතියා, සක්කොනති ච චිත්තාචාරං ඤත්වා තෙ තෙ සත්තෙ හිතෙ නියොජෙතුං අමතමහානිබ්බාණ සුඛෙ ච පතිට්ඨාපෙතුනති = දෙවා' යනු.

දෙව ශබදය තෙමේ **'දෙවාතිදෙවං නරධම්මසාරථිං'** යනාදී තැන විසුඩිදෙවියන් කෙරෙහි, **'අයං හි දෙවකුමාරො'** යනාදි තැන සම්මුතිදෙවියන් කෙරෙහි, **'පංචහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති දෙවො මඤ්ඤෙ'** යනාදී තැන උප්පත්තිදෙවියන් කෙරෙහි, **'අහං දෙව සකලජම්බුදීපෙ අඤ්ඤස්ස රඤ්ඤො සන්තිකෙ කිංචි භයං න පස්සාමි'** යනාදී තැන ඊශ්වරපුද්ගලයන් කෙරෙහි, **'දෙවො ච ඨොකඨොකං පූසායති'** යනාදි තැන මෙඝයෙහි, **'විඛෙ විගතවලාහකෙ දෙවෙ'** යනාදි තැන අහසෙහි ආයේ ය. මෙහි උප්පත්ති දෙවියන් කියයි දෙව ශබදය තෙමේ.

න ගන්ධබ්බො - ගන්ධර්වයෙක් නො (කරන්නේය)

සිවු මහරජයේ වැසි ගයන නටන වයන දෙව්පිරිස, **ගන්ධබ්බ** නම්. **'ගොම්හි සගෙග ධුනනති කම්පනති ගායනනටනාදිව සෙන = ගන්ධබ්බා'** යනු විවෘතියි. **'ගන්ධං සඞ්ගීතවාද්‍යාදිජනිත ප්‍රමොදං අර්ථති ප්‍රාප්ණොතීති = ගන්ධර්වඃ,** යනු ද බැලිය යුතු ය. 'සඞ්ගීතවාද්‍යාදියෙන් හටගත් සතුටට පැමිණේ' නුයි ගන්ධර්ව නම්, ඔවුහු නම්, ස්වර්ගීයගායකයෝ ය. දෙවයොනිවිශෙෂයෙකි. හා හා - හූහූ - චිත්‍රරථ - හංස - විශ්වාවසු - ගොමායු-තුම්බුරු - නන්දි යනාදී නම්වලින් ඔවුහු දක්නා ලදහ. මෙන්න මේ කියූ සැටි:-

'හාහා හූහූශ්චිත්‍රරථො හංසො විශ්වාවසුස්තථා,
ගොමායුස්තුම්බරු නින්දිරෙවමාද්‍යාශ්ව තෙ ස්මාතාඃ' යි.

වග්ගිපුරාණයෙහි මොවුහු කොටස් එකොළොසක් කොට බෙදා දක්වන ලදහ. මෙන්න ඒ කොටස් එකොළොස:- **අභ්‍රාජ - අඛ්‍යාරිවමහාභි - සූයස්වර්ච - භාභු - හසන - සුහසන - භාස්ඛෙව - මුඛිඤාණ - මහාමන - විශ්වාවසු - ඤාශානු** යි. මේ ගඤ්ඡීයෝ **මනස්ගණඞ්ඛි - දෙවගණඞ්ඛි** යි දෙ කොටසකට ද බෙදෙත්. පින් බලෙන් මේ කල්පයෙහි මනුෂ්‍ය වූයේ ගඤ්ඡීත්වයට පැමිණියේ ද, හේ **මනස්ගණඞ්ඛි** නම්. පෙර කල්පයෙහි කළ පිණෙන් **මේ කල්ප**යෙහි මුල ම උපන්නේ ගඤ්ඡීත්වයට පැමිණියේ ද, හේ **දෙවගණඞ්ඛි** නම්.

න මාරො සහ බ්‍රහ්මුනා - බ්‍රහ්මයා සමග මරු තෙමේ ද නො (කරන්නේය)

මෙහි **මාර** නම්, වසවත් මරු තෙමේ ය. හේ පරනිර්මිත වශවර්ති දිව්‍යලොකයෙහි එක් පෙදෙසෙක වසන්නේ ය එහෙත් එහි රජ නො වේ. **හෙතෙමේ**, එහි තමන් වසන පෙදෙසෙහි ඊශ්වර ව වෙසෙයි. දුම්රික රාජපුත්‍රයකුගේ විලාසය ඇත්තේ ය.

බඹලොව උපන්නෝ **බ්‍රහ්ම** නම්. මහත් සිරුරු ඇති බැවින් බ්‍රහ්ම. **'මහනනසරීරත්තාය = බ්‍රහ්මා'** වැඩීමට යේ නු යි බ්‍රහ්ම. **'බ්‍රහති වුඩිං ගච්ඡතීති = බ්‍රහ්මා'** මතු මතු වැඩෙනු යි බ්‍රහ්ම **'උපරූපරි බ්‍රූහතීති. බ්‍රහ්මා'** ඒ ඒ ගුණවිශෙෂ කරණ කොට වැඩුනේ නු යි බ්‍රහ්ම. **'තෙහි තෙහි ගුණවිසෙසෙහි බ්‍රූහිතො ති බ්‍රහ්මා'** යනු බඹලොව උපන්නහු කෙරෙහි බ්‍රහ්ම යනු නැගීමට ඇති යුතුකම් ය. බ්‍රහ්මපාරිසජ්ජය පටන් අකනිට්ඨය තෙක් ඇති රූපාවචරභූමියට ඇතුළත් වූ ද **ආකාසානඤ්චායතනය** පටන් **නෙවසඤ්ඤානාසඤ්ඤායතනය** තෙක් ඇති අරූපාවචරභූමියට ඇතුළත් වූ ද සත්ත්වකාය තෙමේ ය **මේ**.

බ්‍රහ්ම ශබ්දය තෙමේ, **'සනඤ්ඤා බ්‍රහ්මා, විසහඤ්ඤා බ්‍රහ්මා,** යනාදී තැන මහාබ්‍රහ්මයා කෙරෙහි, **'බ්‍රහ්මාති භික්ඛවෙ, තථාගතස්සෙතං අධිවචනං'** යනාදී තැන බුදුරජුන් කෙරෙහි, **'බ්‍රහ්මචක්කං පවත්තෙතීති ලොකෙ අප්පතිවත්තියං'** යනා දී තැන ශ්‍රෙෂ්ඨාර්ථයෙහි, **'තමොනුදෙ බ්‍රහ්මා සමණානවක්ඛු -පෙ- සච්ච ව්‍යෙතා බ්‍රහ්ම උපාසිතො මෙ'** යනාදී තැන බමුණා කෙරෙහි **'බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ'** යනාදි තැන මවුපියන් කෙරෙහි නැගී සිටියේ ය.

සම්මුතිබ්‍රහ්ම - උපපත්තිබ්‍රහ්ම - විසුද්ධිබ්‍රහ්ම යි බ්‍රහ්මයෝ ද තෙප රිදී වෙති. **'සම්මුතනං සාලිඤෙදුරං'** යි කියැවුනෝ සම්මුති

බ්‍රහ්මයෝ ය. **'අපාරුතා තෙසං අමතස්ස චාරා'** යි කියැවුනෝ උපපත්තිබ්‍රහ්මයෝ ය. **'පරමත්ථබ්‍රහ්මතාය -පෙ- පාරමිප්පත්තිතො'** යි කියැවුනෝ විසුඬිබ්‍රහ්මයෝ ය.

ජිතං අපජිතං කයිරා = දිනන ලද්ද (දිනීම) නො දිනන ලද්දක් (නො දිනීමක්) (නොකරන්නේ ය.

කයිරා යන මේ ය, ගාථාවෙහි තුබූ නකාර හා බැඳුනේ. **ජිතං,** යන මෙයින් කියැවෙනුයේ, කෙලෙස් සතුරන් පරදවා දිනීම ය. ජයගැණීම ය. ඒය අන් කිසිවකු විසින් නො දිනුමක් නො කළ හැක්කේ.

තථාරූපස්ස ජනතුනො = එබඳු පුරුෂයාගේ.

ආත්මදමනය කළ සතතයෙන් සංයත වූ පැවතුම් ඇති පුරුෂ තෙමේ මෙයින් දැක්වුනේ ය.

ජනතු නම්, සත්ත්ව තෙමේ ය. සසර පුන පුනා උපදින බැවින් එසේ කියනු ලැබේ. **'ජායතීති = ජනතු'** යනු ඒ කියයි.

'දූ කෙළීම, ධනපැහැරගැණීම, යුදකිරීම, බලය මැඩීම යන මේ කුමකින් නමුත් යමකු විසින් අනෙකෙක් දිනන ලද්දේ ද, ඒ දිනීම උතුම් නො වේ' යි මෙසේ වදාළෝ, ඒ දිනුම අස්ථිර බැවිනි. දිගට නො පවතින්නක් බැවිනි. දිනූයේ, නැවැත අන්හු විසින් පරදවනු ලබන්නේ ද එහෙයිනි.

'යමකු විසින් කෙලෙස් සතුරන් නසා ආත්මය දිනන ලද්දේ නම්, ඒ දිනීම උතුම් වේ' යි වදාළෝ, ආත්මය දිනූ පුරුෂ තෙමේ දෙවියකු විසින් ගන්ධර්‍යයකු විසින් මාරයකු විසින් බ්‍රහ්මයකු විසින් යන කිසිවකු විසිනුත් කවර කලෙකත් කො තැනකදීත් නො පරදවනු ලබන්නේ ද, නො පැරදවිය හැක්කේ ද එහෙයිනි. තමන් නැසූ කෙලෙස් නැවැත උපදවන්නට මේ ලොකයෙහි කිසිවකුට නො හැකි ය. ශක්‍ර බ්‍රහ්මාදි කිසි කෙනෙක් එහිලා සමර්ථ නො වෙත්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

අනර්ථපාවර්ජකබ්‍රාහ්මණ වස්තුව නිමියේ ය.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ මාමා.

8 – 5

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දිනෙක තම මාමා වෙතට වැඩි සේක. මාමා උත්වහන්සේ දැක, සතුටු ව අසුන් පනවා පිළිගත්තේ ය. නැවැත දැහැත් පිළිගන්වා කතාවට වැටුනේ ය.

ස්ථවිර තෙමේ:– මාමා 'කොහොම ද, දන් පින් කරහු?

බ්‍රාහ්මණ තෙමේ:– ඔව් පින්දහම් කරණවා.

ස්ථවිර:– මොකක් ද කරණ පින්කම?

බ්‍රාහ්මණ:– මසක් පාසා දහසක් පමණ වියදම් කොට දන් දෙනවා.

ස්ථවිර:– කාට ද දන් දෙන්නහු?

බ්‍රාහ්මණ:– නිගට්‍ඨයන්ට.

ස්ථවිර:– දන් දෙන විට කරණ ප්‍රාර්ථනාව?

බ්‍රාහ්මණ:– බඹලොව උපදින්නට පතනවා.

ස්ථවිර:– දන් දීම බඹලොවට මග ද?

බ්‍රාහ්මණ:– ඔව්! බඹලොවට මග.

ස්ථවිර:– කවුද මාමාට කියේ?

බ්‍රහ්මණ:– මාගේ ගුරුදෙවයෝ.

ස්ථවිර:– මාමේ! බඹලොවට යන මග මාමාත් නො දනී' මාමාගේ ඔය ගුරුදෙවයෝත් නො දනිත්.

බ්‍රාහ්මණ:– කවුරු ද බෑනෝ! එහෙ නම් දන්නෝ?

ස්ථවිර:– මාගේ ගුරුදෙවයෝ.

බ්‍රාහ්මණ:– කවුද බෑනාගේ ගුරුදෙව?

ස්ථවිර:– තිලෝගුරු බුදුරජානන් වහන්සේ. එන්න යන්නට

මාමේ! මම මාමාට බඹලොවට යන මග කියවා දෙන්නම්.

මෙසේ කියා ස්ථවිරයන් වහන්සේ බමුණාත් කැටුව බුදුරජුන් වෙත ගොස් වැඳ 'ස්වාමීනි! මේ මාගේ මාමා, මෙ තෙමේ මෙසේ කියා' යි සියලු තොරතුරු දන්වා, 'මොහුට බඹලොවට යන මග පහදා දෙනු මැනැවැ' යි කීහ.

බුදුරජානන් වහන්සේ 'එසේ ද, බමුණ?' යි අසා, 'එසේ ය' යි කී කල්හි 'බමුණ! අවුරුදු සියයක්, දහස දහස බැගින් වියදම් කොට, මෙසේ දුන් දනට, මොවුනට දෙන දනට, වඩා මොහොතක් පහන් සිතින් මාගේ ශ්‍රාවකයකු දැකීම, මාගේ ශ්‍රාවකයක්හට බත් සැන්දක් දීම මහත් එලැ' යි වදාරා අනුසන්ධ ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:—

මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතත්තී.

මසක් පාසා දහස බැගින් වියදම් කොට, අවුරුදු සියයක් මුළුල්ලෙහි, යමෙක් ලෞකිකමහාජනයාහට දන් දුන්නේ වේ ද, වැඩූසිත් ඇති එක් ආර්‍යපුද්ගලයකු ඇසිල්ලකුදු පුදන්නේ වේ ද, අවුරුදු සියයක් මුළුල්ලෙහි දුන් යම් දානයෙක් වේ නම්, (ඒ දානයට වඩා) ඒ ආර්‍යයාහට කළ පූජාව ම උතුම් වේ.

මාසෙ මාසෙ සහස්සෙන = මසක් මසක් පසා දහසක් වියදම් කිරීමෙන්[1]

යො යජෙථ සතං සමං = යමෙක් අවුරුදු සියයක් මුළුල්ලෙහි දන් දෙන්නේ ද.

සමං යන මෙහි ප්‍රකෘති ය සමා' යනු යි. සමා' යනු නිත්‍යබහු වචනාන්ත ය. සත්‍රීලිඞ්ගික ය, යි වාමනාදීන් කියතත්, **'සමාං සමාං විඥායතෙ'** යන යෙදුම් බලා එකත්වයෙහි ද වේ ය, යි ස්වාමී යොගෙශ්වරයෝ කියත්. අවුරුද්දට නමෙකි. සංවච්ඡර-වච්ඡර-හායන-සරද-වස්ස යනාදිය එයට පර්‍යා ය.

එකං එව භාවිතත්තානං = වැඩූ සිත් ඇති එක් ම ආර්‍යයකු.

ශීල-සමාධි-ප්‍රඥාගුණයන්ගෙන් වැඩුනු ආර්‍යයන් වහන්සේ **භාවිතත්ත** නම්. මේ කියූ ගුණධර්මයන් වැඩීම් හෙතුවෙන් කය-වචන-සිත යන තුන් තැන, සියලු වක්ගති, ඇදගති පහ ව ගොස් ඒ තෙ තැන ඍජු වන්නේ ය. පිරිසිදු වන්නේ ය. එසේ පිරිසිදු වූ කායාදිචාරත්‍රය ඇත්තෝ භාවිතත්තයෝ ය. ඔවුන් කෙරෙහි ම දුන් දෙය මහත්ඵල වන්නේ ය. මෙහි ලා සොතාපන්නයාගේ පටන් ක්ෂීණාස්‍රවයන් වහන්සේ තෙක් සිටි ආර්‍යගණය ගැණේ.

---

1 5 11 'මාසෙ මාසෙ කුසගෙගන' 8 4 'යො සහස්සං සහස්සෙන' යනු බලනු

එක ශබදය සඞ්ඛ්‍යා-අතුල්‍ය-අන්‍ය-අසහායාර්ථයන්හි වැටේ. සඞ්ඛ්‍යාර්ථවාචිකල එකවචන වේ. අන් තෙ තැන එකවචන-බහු වචන ගන්නේ වේ. මිශ්‍රාර්ථයෙහි ද එක ශබදය ආයේ,යි සමහරු කියත්. මිශ්‍රාර්ථවාචිකල සර්වනාම නො වේ ය, යි ද පිළිගණිත්. **'එකො ච ඛො භික්ඛවෙ, ඛණො ච සමයො ච බ්‍රහ්මචරිය වාසාය'** යනාදී තැන සඞ්ඛ්‍යායෙහි ද, **'චෙතසො එකොදි භාවං'** යනාදී තැන අතුල්‍යාර්ථයෙයි ද, **'එකො වූපකට්ඨො'** යනාදී තැන අසහායාර්ථයෙහි ද, **'සස්සතො අත්තා ච ලොකො ච ඉදමෙම සච්චං මොසමඤ්ඤන්ති ඉච්චෙකෙ අභිවදන්ති'** යනාදී තැන අන්‍යාර්ථයෙහි ද ආයේ ය. මෙහි සඞ්ඛ්‍යාවාචක ය.

මුහුත්තං අපි පූජයෙ = මොහොතකුත් පුදන්නේ ද.[1]

සා එව පූජනා සෙය්‍යො = ඒ පූජාව ම ශ්‍රෙෂ්ඨ වේ.

පූජා නම්, මෙලොව පරලොව අදහා ගෙණ පූජාබුද්ධියෙන් දියයුත්තන්ට යමක් දීම ය. විස්තර මතු එන්නේ ය.

යං චෙ වස්සසතං හුතං = ඉදින් අවුරුදු සියයක් මුළුල්ලෙහි දුන් දනෙක් වේ ද (එයට වඩා)

හුත නම්, දානය ය. වෙදදියෙහි ගින්නෙහි ලූ ගිතෙල හුත, යි කියන ලදී. වහ්නිදෙවතාවන් සඳහා කෙරෙණ පිදිවිල්ලක් සේ ය ඒ ගැණෙන්නේ. **'අගෙනෞ ප්‍රක්ෂිප්තං ඝෘතාදි හුතම්'** යනු විවෘති යි.

'යො ච සීලාදිගුණවසෙන වඩ්ඪිතත්තානං හෙට්ඨිම කොටියා සොතාපන්නං, උපරිමකොටියා ඛීණාසවං සරමාර සම්පත්තං කටච්ඡුභික්ඛාදානවසෙන වා යාපනමත්තඅාහාර-දානවසෙන වා ථූලසාටකදානමත්තෙන වා පූජෙය්‍ය, යං ඉතරෙන වස්සසතං හුතං, තතො සායෙව පූජනා සෙය්‍යො' යමෙක් ශීලාදිගුණධර්මයන්ගේ වසයෙන් වැඩුනු සිතැත්තවුන් අතුරෙහි යටත් පිරිසයින් ගෙදෙරට පැමිණි සොතාපන්නයකු, උඩත් පිරිසයින් ක්ෂීණාස්‍රවයකු බත්හැන්දක් පමණ දීමෙන්, යැපෙන පමණට අහරටිකක් දීමෙන්, දළරෙදිකඩක් දීමෙන් පුදන්නේ නම්, ඒ පිදීම අනෙකකු විසින් අවුරුදු සියයක් මුළුල්-ලෙහි නො සුදුසු තැන දුන් ප්‍රණීතදානයට වඩා, කළ පූජාවට වඩා ශ්‍රෙෂ්ඨ වන්නේ ය. උතුම් වන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බ්‍රාහ්මණ තෙමේ සෝවන් පලයට පැමිණියේ ය. අනික් බොහෝ දෙන ද සෝවන් වූහ.

ශාරීපුත්‍රස්ථවිරමාතුලබ්‍රාහ්මණවස්තුව නිමියේය.

---

1. 5. 6 'මුහුත්තමපි චෙ විඤ්ඤූ' යනු බලනු

ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ බැනා.

8 - 6

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එක් දිනෙක, තම බැනනු ලැබූ බමුණකු වෙත ගියහ. හෙතෙමේ උන්වහන්සේ සතුටින් පිළිගෙණ වඩා හිඳුවා ආගන්තුකසත්කාර කොට පසෙකට වී හිඳ ගත්තේ ය.

ස්ථවිර තෙමේ – කොහොම ද සැපසනීප?

බ්‍රාහ්මණ තෙමේ – වරදක් නැත. ඔහෙ ඉන්නවා.

ස්ථවිර – පින් දහම්?

බ්‍රාහ්මණ – ඔව්! ඒවාත් හැකිපමණටත් වඩා කරණවා.

ස්ථවිර – මොනව ද කරණ පින්කම්?

බ්‍රාහ්මණ – ස්වාමීනි! මසක් පාසා සුවුපාවකු මරා ගිනිදෙවියන් පුදනවා.

ස්ථවිර – එහෙම ද, එයින් කුමක් බලාපොරොත්තු වන්නෙහි?

බ්‍රාහ්මණ – හා! ස්වාමීනි! මෙය මහපින්කමෙක්, ඔබලොවට යන මග, ඒනිසා එසේ කරණවා.

ස්ථවිර – සතුන් මැරීම ඔබලොවට යන මගැ, යි කීවෝ කවුරු ද?

බ්‍රාහ්මණ – ගුරුන්නාන්සේ.

ස්ථවිර – බොරු නො කරව, ඔබලොවට යන මග ඌ දන්නේ ද? තෝ දන්නෙහි ද? ඌත් නො දනී. තෝත් නො දනිහි, මා සමග යන්නට එව, එය කියවා දෙන්නට, එය දන්නෝ තිලෝගුරු වූ බුදුරජානන් වහන්සේ ම ය. උන්වහන්සේ හැර එය දන්නෝ නැත.

මෙසේ කියා බැනාත් ගෙණ බුදුරජුන් වෙත ගිය ස්ථවිරයන් වහන්සේ 'ස්වාමීනි! මේ මාගේ බැනා, මෙහුට ඔබලොවට යන මග වදුරනු මැනැවැ, යි දුන්වූහ. බුදුරජානන් වහන්සේ 'හැබෑ ද, දරුව' යි අසා වදාළ සේක. 'එසේ ය, ස්වාමීනි!, යි හෙතෙමේ කී ය. 'දරුව! මෙසේ සිතට ගන්න, අවුරුදු සියයක් ගිනිදෙවියන් පුදන්නහුට, ඒ ගිනිදෙවිපිදුමට වඩා මාගේ ශ්‍රාවකයක්හට ක්ෂණමාත්‍රයක් කරණ පූජාව මහත් ඵලකර ය. ගිනිදෙවිපිදුම, මාගේ දහම් දත් කුඩානමකට ක්ෂණමාත්‍රයක් කරණ පූජාව හා සම නොවන් නීය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:—

යො චෙ වස්සසතං ජනතු අග්ගිං පරිචරෙ වනෙ,
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ,
සා යෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතනති.

ඉදින් යම් මිනිසෙක් වෙනෙහි (වැස) අවුරුදු සියයක් මුළුල්ලෙහි ගිනි පුදන්නේ ද, යම් මිනිසෙක් වැඩූ සිත් ඇති එක් ම ආර්‍යයකු මොහොතක් නමුත් පුදන්නේ ද, අවුරුදු සියයක් මුළුල්ලෙහි කළ ඒ ගිනිපිදීමෙක් වේ ද, එයට වඩා ඒ ප්‍රත්‍යයපූජාව ම ශ්‍රෙෂ්ඨ වේ,

යො චෙ වස්සසතං ජනතු = ඉදින් යම් මිනිසෙක් අවුරුදු සියයක් මුළුල්ලෙහි

අග්ගිං පරිචරෙ වනෙ = වෙනෙහි වැස ගිනිදෙවියන් පුදන්නේ ද.

මිත්‍ථ්‍යාලබ්ධිකයෝ වනගත ව කිරිබත්, ගිතෙල්, මී, සකුරු ආදිය ගින්නෙහි බහමින්, අබ, සුන්සාල්, ගීතණ ආදි යාගද්‍රව්‍ය ගින්නෙහි ඉසිමින් සංසාරයෙන් මිදෙනු පිණිසැ, යි ගිනි දල්වත්. මේ වනාහි අන් තොටුවන් අතර බහුල ව පවත්නා පූජාවිධියකි. ඔවුන් මෙය කරන්නේ සංසාරශුද්ධිය සලකා ගෙණ ය. ඇතැම් පුරාතනයෝ ගින්න, හාස්කම් ඇති, මිනිසුන්ට ශුභාශුභසිද්ධ කරණ එක්තරා දෙවියෙකැ, යි ගත්හ.

පරිචරෙ යනු, ක්‍රියාපද යි. එහි මූලය **චර** යනු යි. **චර** යන ධාතු ව පිළිබඳ පූජාර්ථය අප්‍රකට ය. සැඟ වී සිටියේ ය. එය මතු කළේ **පරි** යන උපසර්ගය යි. උපසර්ග, ධාතුන්හි ඇත්තා වූ ම අරුත් මතු කර දෙන බව ආචාර්‍යවරයෝ කියත්. **'ධාතුස්මිං සන්ත-මෙවත්ථං උපසග්ගා පකාසකා'** යනු ආචාර්‍යවචන යි.

වන නම්, කැලය යි **'වනතති තං භජනති මයූරකොකිලා දයො සත්තාති = වනං'** මොනර-කොවුල්-කීර-මයිනාදි පක්ෂීන්ට ස්ථාන වූයේ වන නම්. **'බහුවෘක්ෂයුක්තස්ථානං = වනම්'** යනු කොෂවචන යි. බොහෝ ගස් කොළන්වලින් ගැවසී ගත් තැන වනැ, යි එයින් කිය වේ. සත්‍රී-නපුංසක දෙක ම භජනය කරයි.

එකං එව භාවිතත්තානං = වැඩූ සිත් ඇති එක් ම ආර්‍යයකු.[1]

මුහුත්තං අපි පූජයෙ = මොහොතකුත් පුදන්නේ ද[2]

සා එව පූජනා සෙය්‍යො = ඒ පූජාව ම ශ්‍රෙෂ්ඨ වේ.[3]

---

1. 8 5 'එකං ච භාවිතත්තානං' යනු බලනු.
2. 5. 6 8 5 "මුහුත්තමපි චෙ විඤ්ඤු, මුහුත්තමපි පූජයෙ" යනු බලනු.
3. 8. 5. "සායෙව පූජනා සෙය්‍යො" යනු බලනු.

යං වෙ වස්සසතං හුතං = ඉදින් අවුරුදු සියයක් මුළුල්ලෙහි දුන් දනෙක් වේ ද[1]. (එයට වඩා)

මෙහි **හුතැ**, යි කියන ලද්දේ ගිනිපිදීම ය. එය මෙලොව පරලොව දෙකට ම වැඩෙක් නැත.

යමකු විසින් වනගත ව සියක් අවුරුදු කල් වෙදෙක්තපරිදි කළ ගිනිපිදීමට වඩා මොහොතක් කල් සිවුපසයට අයත් යමකින් ගුණයන්ගෙන් වැඩුනු කෙනකු පිදීම ම ඉතා ශ්‍රෙෂ්ඨ ය, යි, මෙයින් වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බමුණු තෙමේ සෝවන් වි ය. අතික් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියාහ.

ශාරිපුත්‍රස්ථවිර භාගිනෙය්‍යවස්තුව නිමියේය.

---

4. 8. 5. "යං වෙ වස්සසතං හුතං" යනු බලනු.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ යහළුවෙක්.

8 – 7

දිනක් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ තම යහළුවකු හමු වන්නට ඔහු ඉන්නා තැනට වැඩියහ. හෙතෙමේ තෙරුන් දැක, ඉදිරියට ගොස්, සතුටින් පිළිගෙණ, වඩා හිඳුවා සත්කාර කෙළේ ය. ස්ථවිරයන් වහන්සේ ඔහු හා පිළිසඳර කතාවට බැස, 'කුමක් කරන්නෙහි දැ' යි ඇසූහ. 'ස්වාමීනි! මම යිඪ නම් දානය දෙමි' යි කී ය. එවිට ස්ථවිරයන් වහන්සේ බමුණාත් කැටුව බුදුරජුන් වෙත ගොස්, 'ස්වාමීනි! මේ බමුණු මාගේ යහළුවෙක, මොහු බඹ-ලොව උපදින්නට සිතා යිඪ නම් දානයක් පවත්ව යි, බඹලොව උපදින්නට ලොකු ආසාවක් මොහුට තිබේ, එහෙයින් මොහුට එහි උපදින්නට මග වදාරනු මැනැවැ' යි දන්වා සිටියහ. එවිට බුදු රජානන් වහන්සේ, 'බ්‍රාහ්මණ! බඹලොව උපදින්නට සිතා තා විසින් අවුරුද්දක් මුළුල්ලෙහි ලොකීයමහාජනයාට දන් දී තිබේ, ඒ තාගේ දානය, පහන් සිතින් මාගේ ශ්‍රාවකයකු වඳින්නකුගේ සිතෙහි උපදින කුශලවෙතනාව සතරට බෙදූ කල ඉන් ලැබෙන එක් කොටස පමණත් නො අගනේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:–

යං කිඤ්චි යිඪං ව හුතංව ලොකෙ
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො,
සබ්බම්පි තං න චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යොති.

මේ සත්ත්වලොකයෙහි පින් කැමැත්තෙක් යම්කිසි කුඩා දනක් හෝ අමුතු මහදනක් හෝ අවුරුද්දක් මුළුල්ලෙහි දුන්නේ නමුත්, ඒ හැම දනක් ම (ආර්‍යයකු වඳින්නකුට උපදින කුශලවෙතනාව පිළිබඳ) සතරෙන් එක් කොටසටත් නො පැමිණේ. ඍජු බවට පැමිණියවුන් කෙරෙහි කෙරෙණ වන්දනාව ම (එයට වඩා හැම අතකින්) ශ්‍රෙෂ්ඨ වේ.

යං කිඤ්චි යිඪං ව හුතං ව ලොකෙ = සත්ත්වලොකයෙහි යම් කිසි කුඩා දනක් හෝ අමුතු මහදනක් හෝ.

'යං කිඤ්චි යිඪං ව' යනු වදාළෝ ලොකීයමහාජනයා අත ඇති හැම දනක් ම නො හැර ගැණීමට ය. **'අනවසෙසපරියා දානවචනමෙතං'** යනු අටුවා ය. **යිඪ නම්**, බොහෝ සෙයින් මඩගල අවස්ථාවන්හි මිනිසුන් විසින් දෙන දන් ය. **'යිඪතති**

යෙහුයෙන මඞ්ගලකිරියදිවසෙසු දිනතදානං' යනු අටුවා ය. ගෙපල්තැනීම – බිම්කෙටීම – මුල්ගල්තැබීම – උළුවහුතැබීම – ගෙ වැදීම – වැඩිවිය පැමිණීම – ආවාහ – විවාහ – දරු ඉපැදුම – නම් තැබීම – සිළු තැබීම – රෙදිඇඟලෑම – එලියට වැඩීම – පුනනූල් දැමීම – කන්විදීම – හිස තෙමීම – බත්කැවීම – හිසපිරීම යනාදි මේ ක්‍රියා ලොකීයමහාජනයා විසින් මඞ්ගල යි සම්මත කොට ඇත්තේ ය. ලොකීයයන් විසින් මඞ්ගල යි සම්මත කොට ගත් තවත් නොයෙක් ක්‍රියාවෝ වෙති. ඒ ඒ ජාතීන් විසින් සවජාති-කත්වය අනුව මඞ්ගල යි සම්මත කොට ගත් මඞ්ගල ක්‍රියාවෝ, ඒ ඒ ජාතීන්ගේ වසයෙන් වෙනස් වූවෝ ද වෙති.

සිට්ඨං යනු, සමහර තැනෙක මහාදානයෙහි ද වැටේ. **'සිඨනති මහායාගො, සබ්බසාධාරණං මහායාගනති අත්ථො'** යනු ආචාර්‍යවචන යි.

මෙහි **හුත** නම්, සකස් කොට දුන් පාහුන නම් දානය යි. කර්ම-කර්මඵල අදහා දුන් දානයත් මෙ නමින් කිය වේ. **'හුතනති අභිසඞ්ඛරිත්වා කතං පාහුනදානං චෙව කම්මං ච ඵලං ච සද්ද-හිත්වා කතදානං ච'** යනු අටුවා ය. මෙහි පාහුනදානැ, යි කීයේ දිශාවිදිශාවන්හි සිට පැමිණි ප්‍රියමනාප වූ නෑ මිතුරන් සඳහා මහත් සත්කාරයෙන් යුක්ත කොට පිළයෙල කළ ආගන්තුක දානය යි. **'පාහුනං වුච්චති දිසාවිදිසතො ආගතානං පිය මනාපානං ඤාතිමිත්තානං අත්ථාය සක්කාරෙන පටියත්ත ආගන්තුකදානං'** යනු අටුවා ය.

පුරාණව්‍යාඛ්‍යාවෙහි 'කර්මඵල අදහා සකස් කොට සරහා දෙන ලද අමුතු මහදනක්' යි හුතං' යන්න සිංහලට නැගුනේ ය. එහෙත් අටුවාව පාහුනකසඞ්ඛ්‍යාත ආගන්තුකදානය, කර්මඵල අදහා දෙන දානය, යි දාන දෙකක් කොට කියයි. ච යනු, වා යන්න හ්‍රස්ව වූ තැන ය.

ලොක නම්, සත්ත්වලොකය යි. අවිශෙෂයෙන් එසේ කියූ ව ද දාන සීල භාවනාදී පින්කම් කරණ සත්ත්වලොකය ම මින් ගැණේ.

සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො = පින් කැමැත්තෙක් අවුරුද්දක් මුළුල්ලෙහි (දන්) දුන්නේ (නමුත්)

එක් අවුරුද්දක් මුළුල්ලෙහි පින් කැමැත්තෙක් මුළු සක්වළ දන්හල් පිහිටුවා ලොකීයමහාජනයාහට කඩ නො කොට අතර නො තබා දන් දුන්නේ නමුත්. මෙන්න පාලිය මෙහි:- **'එකං සංවච්ඡරං නිරන්තරං එව වුත්තප්පකාරං දානං සකලචක්ක-වාළෙපි ලොකීයමහාජනස්ස දදෙය්‍ය'** යනු.

යම් කාලපරිච්ඡේදයක් ෂට්සෘතුන්ගෙන් පිරිසිදේ නම්, ඒ කාලය, සංවච්ඡර, යි කියනු ලැබේ. 'සංවසන්ති එත්ථාති = සංවච්ඡරො, සංවසන්ති සෘතවොත්‍රෙති = සංවත්සරඃ' යනු නිරුක්ති යි.

සබ්බං අපි තං න චතුභාගං එති = ඒ සියලු දානය ම සතරෙන් කොටසටත් නො එයි.

සෘජුබවට ගිය සොතාපන්නාදී ආර්‍යයන් කෙරෙහි පහන් සිතින් වන්දනා කරන්නහුගේ සිතෙහි හට ගන්නා කුශල චෙතනාව කොටස් සතරකට බෙදූ කල්හි එහි එක් කොටසක් හා දසම කළ නො හැකි ය. එක් අවුරුද්දක් මුළුල්ලෙහි පින් කැමැත්තකු විසින් මුළු සක්වළ දන්හල් පිහිටුවා ලොකීයමහාජනයාහට කඩ නො කොට අතර නො තබා දෙන දන.

අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො = සෘජුවූවන් කෙරෙහි (කරණ) වන්දනාව ම ශ්‍රෙෂ්ඨ වේ.

යටත් පිරිසෙයින් සොතාපන්නයකු කෙරෙහි ද උඩත් පිරිසයින් ක්ෂීණාස්‍රවයකු කෙරෙහි ද, පහන් සිතින් සිරුර නමා නමස්කාර කරන්නහුට එක් විටෙක උදිපන කුශලචෙතනාව පිළිබඳ ඵලය, සතරට බෙදා ලැබෙන එක් කොටස ම, ලෞකික මහාජනයාහට දෙන හැම දානයට ම වඩා ඉතා මහත් ය. ශ්‍රෙෂ්ඨ ය. ආර්‍යයකු වැඳීමෙහි දී ඒ වඳින්නහුගේ සිත්හි හට ගන්නා කුශලචෙතනාවෙහි සතරෙන් පංගුවකටත් ලං නො විය හැකි ය, ලෞකිකයනට දන් දීමේ දී දෙන්නහුගේ සිතෙහි හට ගන්නා දාන චෙතනාවට. ආර්‍යයන් කෙරෙහි වූ නමස්කාර චෙතනාමාත්‍රය ම ඉතා මහත් ය. එහෙයිනි සෘජුවූවන් කෙරෙහි කරණ වන්දනාව ම ශ්‍රෙෂ්ඨ ය' යි වදාළෝ.

අභිවාදනා නම්, වැඳිය යුත්තෙක් යම් දිසාවෙක වෙසේ නම්, ඒ දිසාවට මූණ ලා සතර ඉරියව්වෙන් ම කරණ නමස්කාර ය යි.

'ගරුට්ඨානීයං දිස්වා අභිවාදනකරණං අභිවාදනං නාම, යස්මිං වා දිසාභාගෙ සො වසති ඉරියාපථෙ කප්පෙන්තො තතො අභිමුඛොව වන්දිත්වා ගච්ඡති වන්දිත්වා තිට්ඨති වන්දිත්වා නිසීදති වන්දිත්වා නිපජ්ජති ඉදං අභිවාදනං නාම, යනු ටීකා ය.

කායික-චාවසික-මානසික යි නමස්කාරය තෙපරිදිය. නැවැත ඒ එකෙක් එකෙක් ම උත්තම-මධ්‍යම-අධම වශයෙන් තුන් තුන් පරිදි වේ.

එහි අත්පා දිගු කොට දඬුකඔක් සේ බිම වැතිර දෙ දණින් බිම ගොස් හිස බිම තබා කරණ නමසකාරය, උත්තමකායික නමසකාරය වේ. දෙ දණ හා හිස බිම තබා කරණ නමසකාරය කායිකමඛ්‍යමනමසකාරය වේ. දෙහොත් මුදුන් දී දණ හා හිස බිම තබා කරණ නමසකාරය, කායිකඅඛමනමසකාරය ය.

තමන් විසින් භකතියෙන් යුකත ව රචනා කළ ගද්‍යයකින් හෝ පද්‍යයකින් කරණ නමසකාරය, උත්තමවාචසිකය වේ. තුණුරුවන් ගුණ ඇසුරු කොට ගෙතුනු ගාථාදි යමකින් කරණ නමසකාරය, මඛ්‍යමවාචසිකය වේ. සියඛසින් ගුණ කියා කරණ නමසකාරය, අඛමවාචසිකය වේ.

මානසිකනමසකාරය, සිතෙහි පහළ වන ශ්‍රඛාදිගුණයන්ගේ මහත්තමභාවය නිසා උත්තමමානසිකය වන්නේ ය. ඒ ම මහත්තර භාවයෙන් මඛ්‍යම වන්නේ ය. මහත් භාවයෙන් අඛම වන්නේ ය. දෙපතුල් සම ව බිම පිහිටුවා දෙ අත්ල සම ව නළල මැද තබා වැඳියයුත්තහුට මුණ දී නැමී සිට වැඳීම, දෙ පතුල් සම ව බිම තබා දෙ දණමඬල සම ව ඔසොවා වැලමිටි දෙක එමත තබා දෙඅතුල් සම ව එකතු කොට කරපුටය නළලෙහි තබා වැඳී ම, දෙ දණමඬුලු දෙ වැලමිටි හිස යන පස් අඟ බිම පිහිටුවා වැඳීම, දෙ අත්ලෙන්, වඳිනු ලබන්නහුගේ පා පිරිමදිමින් වැඳීම, දරදණඩක් සේ බිම වැටී වැඳීම යන මේ ද මේ නමසකාර විෂයෙහි ලා උගත යුතු ය.

එක් දවසෙක බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ විසූහ. එ දවස උන්වහන්සේ අලුයම ලොව බලා වදුල සේක් එ නුවර ම සැඩොල් ගෙයක හුන් ආයු ගෙවීගිය සැඩොල් ජර මැහැල්ලක දුටු සේක. ඇය අද හෙට ම මැරී ගොස් නිරයෙහි උපදින බව ද දුටහ. කරුණාසාගර වූ බුදුරජානන් වහන්සේ ඇය ලවා පින්කමක් කරවා, ඇය දෙව්ලොවට යවන්නෙමි, යි සිතා භික්ෂූන් වහන්සේලාන් පිරිවරා ගෙණ නුවර පිඬු සිඟා වැඩි සේක.

එ වේලෙහි සැඩොල් මැහැල්ල හැරමිටිවාරුවෙන් නුවරින් පිටතට යන්නී, බුදුරජුන් දැක මුණ ලා සිටියා ය. බුදුරජානන් වහන්සේ ද ඇයගේ ගමන් වළකන්නට සේ ඉදිරියෙහි වැඩ සිටියහ. එවිට මෞදගල්‍යායන සථවිරයන් වහන්සේ බුදුරජුන්ගේ අදහස දුන බුදුරජුන්ට වදින්නට.

'සැඩොලිය! බුදුරජුන් = පා වැඳ ගණුව සතුටින්,
තට මහකුළුණු සිත් = දක්වා සිටීති එතුමෝ.
හැම තැන එකහැටි = රහතුන් කෙරෙහි සියසිත,
පහදා වහා බැඳදිලි = වඳුව තගෙ දිවි ටිකෙකි' යි

සැඩොලිය මෙහෙයූහ. ඇය ද ඒ අසා සංවෙග ඇත්තී බුදු රජුන් කෙරෙහි සිත පහදා පසඟ පිහිටුවා වැඳ, එකඟ වූ සිත් ඇති ව නැවැතත් දෙහොත් මුදුනෙහි තබා වඳිමින් සිටියා ය. බුදු රජානන් වහන්සේ 'මේ, මැට දෙව්ලොව ඉපදීමට පමණැ' යි නුවරට වැඩි සේක. ඉන් ටික වේලාවකට පසු බියෙන් තැති ගත් තරුණ දෙනක විසින් පහර දෙනු ලැබූ ඕතොමෝ මරණයට පැමිණයා, දෙව්ලොව උපන්නී දහසක් දෙවඟනන් පිරිවර, කොට ඇත්තී වූ ය.

වන්දනාමයකුශලකර්මය, අපායොත්පත්තිකරඅකුශලකර්මය යට පත් කොට සැඩොලිය දෙව්ලොව උපදවා ඇයට මහත් සැපතක් සිදුකර දුන්බව මෙයින් පෙනේ.

කායවඞ්කාදී වූ හැම වක්කමක් ම නැති කොට සිටි බැවින් කායාදිචාරත්‍රයයෙහි කිසිත් ඇදපලුද්දක් නැති මුළුමනින් පිරිසිදු ආර්‍යයන් වහන්සේ, **උජ්ජුගත** නම් වෙති.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ බ්‍රාහ්මණ තෙමේ සෝවන් වී ය. අනික් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියාහ.

ශාරීපුත්‍රස්ථවිරසහායකබ්‍රාහ්මණවස්තුව නිමියේ ය.

ආයු වැඩෙන සැටි.

8 - 8.

දඹදිව දිසලමබ්ක නම් බමුණු ගමෙක් වූයේ ය. එහි වැඩිදෙන බමුණෝ ය. උන් අතුරෙහි බාහිර පැවිද්දෙන් පැවිදි ව සිටි බමුණෝ දෙදෙනෙක් අටසාළිස් වසක් තපස්කම් කළහ. උන් දෙන්නාගෙන් එකෙක් 'පැවිද්ද නිසා සිය මවුපියපරපුර නැසි යන්නේය' යි සිවුරු හැර දැමී ය. කිරිදෙනුන් සියයක් හා මසුරන් සියයකුත් දායාද ලැබ පවුල් වී ය. ටික කලකට පසු පුතෙක් ද ලැබුනේ ය.

මේ කාලයෙහි බමුණාගේ මිත්‍ර වූ තාපස තෙමේ පිටරටකට ගොස් සිටියේ, පෙරළා දිසලමබ්ක ගමට පැමිණියේ ය. බමුණු එබව දැන අඹුව හා පුතාන් ගෙණ තවුසා වෙත ගොස් පුතු වඩන්නට අඹු අතට දී, තෙමේ පළමු කොට තවුසාට වැන්දේය. නැවැත අඹු, පුතු සැමියා අතට දී, තොමෝත් තවුසාට වැන්දා ය. එවිට තාපස තෙමේ 'තෙපි බොහෝ ආයු ඇත්තෝ වහුවා' යි ආශීර්වාද කෙළේ ය.

ඉක්බිති අඹුසැමි දෙදෙන පුතු ලවා ද වැන්ද වූහ. තාපස තෙමේ ඒ වේලෙහි ආශීර්වාද නො කොට නිහඬ වී ය. බමුණා හට මෙය තේරුම් ගත නො හැකි වී ය. එහෙයින් ඔහු 'ස්වාමීනි! අප වඳින වේලෙහි අපට ඔබ වහන්සේ ආයු බොහෝ වේවා, යි ආශීර්වාද දුන්නහු ය, මේ කුඩා දරු ලවා වන්දවන වේලේ එසේ නො කළහු ය, එසේ නො කළහු කුමක් නිසා දැ?, යි ඇසී ය. එවිට තාපස තෙමේ 'මොහුට ඉතා ලඟ අනතුරෙක් ඇත්තේ ය' යි කී ය. 'ස්වාමීනි! මේ පොඩි එකා කෙතෙක් දවස් ජීවත් වේ දැ?' යි ඇසූ විට 'සත් දවසෙකැ' යි කී ය. 'එය වළකන්නට බැරි අනතුරෙක් දැ?' යි ඇසූ විට 'මම ඒ නො දනිමි, ඒ ගැණ යමක් කියන්නට මම අපොහොසත්මි' යි තවුස් තෙමේ කී ය. බමුණු තෙමේ ඒවර 'ස්වාමීනි! ඒ ගැණ කියන්නට දන්නෝ කවුරු දැ?' යි ඇසී ය. 'අන්න! ශ්‍රමණගෞතම තෙමේ ඒ ශාස්ත්‍රය හොඳට දනී යි, ඔහු වෙතට ගොස් මේ ගැණ පිළියමක් ඔහුගෙන් අසා දැන ගන්නැ' යි කී විට 'ස්වාමීනි! මම ඔහු වෙත යෑමට බිය ඇත්තේ වෙමි'යි කී ය. 'හා බිය විය යුතු නො වේ, ගෞතමයන් වහන්සේ සත්ත්වයන් කෙරෙහි මහත් කරුණා ඇති සේක,

සත්ත්වයන්ට එලොව මෙලොව දෙක්හි වැඩ දක්වන සේක, ලමයාට ආදරය ඇත්තෙහි නම්, පමා නොකොට ගෞතමයන් වෙත යන්නැ' යි තවුස් තෙමේ කී ය.

බමුණු තෙමේ බුදුරජුන් වෙත ගොස් බුදුරජුන් වැන්දේ ය. එයට පසු බැමිණි තොමෝ බුදුරජුන් වැන්දා ය. දෙදෙනාට ම උන්වහන්සේ දීක්ෂායුෂ පැතූහ. එවිට පුතු ලවාත් වැන්දවූහ. ඒ වේලෙහි උන්වහන්සේ කිසිත් නොබැණ නිහඬ වූහ. බමුණු තෙමේ, පුතුට දීක්ෂායුෂ නොපැතීමේ හෙතුව බුදුරජුන් අසින් විචාළේ ය. එහිදී උන් වහන්සේ පුතුට අනතුරක් කල් නොයා දී ම සිදුවන බව වදාළ සේක.

බමුණු, බුදුරජුන්ගේ සර්ව්ඥතාඥානය නොඅදහන්නේ, තමන්ගේ මන්ත්‍රය සර්ව්ඥතාඥානය හා සසඳා බැලී ය. එහෙත් ඔහුට පුතුට වන ඒ අනතුර වලකාලීමෙහි උපායයෙක් නොපෙනිනා. එහෙයින් ඔහු 'ස්වාමීනි! ඔය අනතුර වලකාලීමට හැකි උපායයෙක් තිබේ දැ?' යි ඇසී ය. 'ඇතැ' යි උන්වහන්සේ වදාළ විට 'ඒ කිමැ?' යි බමුණු ඇසී ය. 'තම ගෙදෙර පිරිබඳ ගන්වා පිරිත් මණ්ඩපයක් කොට එහි ඇතුළත අටක් හෝ සොළොසක් අසුන් පනවා ඒ අසුන්හි මාගේ ශ්‍රාවකයන් වඩා හිඳුවා මා දෙසූ පිරිත ඒ නමලා ලවා දෙශනා කරවා ගත්කල්හි ඔය අනතුර මගහැරී යන්නේය' යි වදාළ සේක.

එකල්හි බමුණු තෙමේ 'ගෞතමයන් වහන්ස! මණ්ඩපතැනීම් ආදී වූ සියලු කටයුතු මට කළ හැකි ය, පිරිත් දෙශනාවට ඔබ වහන්සේගේ ශ්‍රාවකයන් ලබා ගැණීම කෙසේ කළ යුතු දූ' යි ඇසී ය. 'හොඳ යි, ගෙදෙර කළ යුතු වැඩ කොට නිමවා මට දැන් වූ කල්හි මම පිරිතට උන්නාන්සේලා එවත්නෙමි' යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. බමුණු තෙමේ 'මැනැවැ' යි පිළිගෙණ ගෙදෙර ගොස් එහි සියලු කට යුතු කොට නිමවා විහාරයට ගොස් ගෙදර කට යුතු අවසන්බව බුදුරජානන් වහන්සේට දැන්වී ය. උන්වහන්සේ පිරිතට භික්ෂූන් යැවූහ. භික්ෂූහු එහි ගොස් මණ්ඩපයෙහි අසුන් ගත්හ. බමුණු තෙමේ පුතු ද පිළපිට හිඳ්වී ය. භික්ෂූන් වහන්සේලා රැදුවල් සතක් නොකඩ කොට පිරිත් දෙසූහ. සත්වනදා සවස බුදුරජානන් වහන්සේ ද එහි වැඩි සේක. උන්වහන්සේ එහි වැඩි කල්හි සක්වළ වැසි දෙවියෝ ද එහි රැස් වූහ.

අවරුද්ධ නම් එක්තරා යක්ෂයෙක් වෙසවුණු යක්ෂරජුට දෙලොස් අවුරුද්දක් මෙහෙ කොට එයින් මිදී, මේ ලදරු බිලි කොට ගැණීමට, වෙසවුණු යක්ෂරජුගෙන් වර ලබා සිටියේ ය. අවරුද්ධ යකු මේ දරු බිලි කොට ගන්නා දිනය බලා, බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක. උන්වහන්සේ එහි වැඩි කල්හි මහෙශාක්‍ය දෙවියෝ ද එහි රැස් වූහ. එහි සිටි අලෙපශාක්‍ය දෙවියෝ මහෙශාක්‍යයන් එන් එන් ම පසු බැස ගොස් එ තැනින් දෙලොස් යොදුනක් ඇතට වන්හ. බුදුරජාණන් වහන්සේ ද මූළුරුය ම එහි පිරින් දෙසූහ. එයින් දරු ගැණීමට නියම ව තුබූ අත් දවස මෙසේ ඉකුත් ව ගිය බැවින් යකුට දරුවා බිලි ගැණීමට නො හැකි විය. අටවනදාට එලි වූ සැටියේ ඒ බමුණු අඹුසැමි දෙදෙන පුතු වඩා ගෙණවුත් බුදුරජුන්ගේ පා වැන්ද වූහ. උන්වහන්සේ 'දිගාසිරි ලැබේවා' යි වදාළ සේක. ඉක්බිති බමුණු තෙමේ 'ගෞතමයන් වහන්ස! මේ දරු කොතෙක් කල් ජීවත් වේ ද' යි ඇසී ය. අවුරුදු එක් සිය විස්සක් ජීවත් වන්නේ ය' යි උන්වහන්සේ වදාළ සේක ඔහුට **ආයුවඩිනා** යි නම් කළහ. අනතුරින් නිදහස් ව වැඩි විය පැමිණි ආයුවඩින තෙමේ බොහෝ දෙනා සමග තැන තැන හැසිරෙන්නට වී ය.

මෙ දවස, භික්‍ෂූන් වහන්සේලා ධර්මසභාවට රැස් වූ දිනෙක 'සත්වයා ගේ මරණයට කැප ව සිටි ආයුවඩින තෙමේ, දැන් ඒ හැම අනතුරකින් ම නිදහස් ව අවුරුදු එක් සිය විස්සකට ආයු ඇති ව දැන් උතුන් පිරිවරා ගෙණ යසට තැන තැන හැසිරේ; එහෙයින් ලොකවාසී සත්වයන්ගේ ආයු වැඩීමේ ක්‍රමයක් ඇති විය යුතු ය' යි එහි කතා කරමින් හුන්හ. බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට 'මහණෙනි! සත්වයන්ට වඩා ගත හැක්කේ ආයු පමණෙක් ම නො වේ, ගුණවතුන් වඳින පුදන හැම කෙනෙක් ම කරුණු සතරකින් වැඩෙති, උවදුරුවලින් මිදෙති, ආයු ඇතිතාක් ම යහතින් ජීවත් වෙති' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

අභිවාදනසීලිස්ස නිච්චං වඩ්ඪාපචායිනෝ,
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණෝ සුඛං බලන්ති.

සිල්වතුන් වඳින සුලු, නිතර, ගුණයෙන් වැඩිහිටියන් පුදන්නා හුගේ ආයු - වණ් - සැප - බල යන මේ සිවු ගුණයෝ වැඩෙත්.

අභිවාදනසීලිස්ස = වඳින සුලු. සිල්වතුන් වඳින්නා වූ.

නිච්චං වද්ධාපචායිනො = නිතර, ගුණයෙන් වැඩී සිටියවුන් පුදන්නහුගේ.

ජාතිවෘඩ – ගොත්‍රවෘඩ – වයොවෘඩ – ගුණවෘඩ යි ලොකයෙහි වැඩිහිටියෝ සිවු දෙනෙකි. එහි ලොකය හට ගත් තැන් පටන් හෝ ජාතිය හට ගත් තැන් පටන් යම් මනුෂ්‍යජාතියක් නො සිඳ එන්නී නම් එබඳු ජාතියෙක උපන්නේ **ජාතිවෘද්ධ** නම්. බොහෝ කලක සිට අතරමග නො කැඩී නො සිඳී එන පර-පුරෙක උපන්නේ **ගොත්‍රවෘද්ධ** නම්. වයසින් අසූවස් අනුවස් ඉක්මවා සිටියේ **වයොවෘද්ධ** නම්. ශීලාදිගුණයෙන් වැඩී සිටියේ **ගුණවෘද්ධ** නම්.

ලොකයෙහි ඒ ඒ ජාතීන් විසින් යම් මනුෂ්‍යජාතියක් තොමෝ ආදිමභාවයෙන් හා ආර්‍යභාවයෙන් පිළිගණු ලබන්නී නම්, ඒ ජාතිය එසේ පිළිගන්නන් විසින් පිදිය යුතු ය යනු ලොක සම්මතය. ඒ සම්මතය අනු ව ජාතිවෘඩත්වය පිදිය යුතු කොට ගණිති.

ඒ ඒ පාරම්පරිකයන් විසින් සිය පරපුරෙහි ආදිමයෝ, වංශස්ථාපකයෝ පිදිය යුත්තෝ ද, එහෙයින් ගොත්‍රවෘඩත්වය පිදිය යුතු කොට ගණිති.

බාලවයස්කයන් විසින් වෘඩවයස්කයෝ පිදිය යුතු ය. එහෙයින් වයොවෘඩත්වය පිදිය යුතු ය යි සම්මතය.

ශීලාදිගුණයන්ගෙන් මේරීමට ගියෝ, ලොකයෙහි බාල – මහලු – උගත් – නූගත් හැම කෙනකුන් විසින් ම ගුණය සලකා පිදිය යුතු ය. ගුණවෘඩත්වය අන් සියලු වෘද්ධත්ව, අභිභවනය කොට සිටියේ ය. ඒ ඉදිරියෙහි ජාතිවෘඩත්වාදිය ඉතාපහත් ය. ගුණවෘඩත්වය ම නැගී සිටියේ ය.

උපාලි ස්ථවිරයන් වහන්සේ කුලයෙන් කරණවෑම් වූවෝ ද ගුණහෙතුවෙන් මහෙශාක්‍යයන් යට කොට සිටියහ. මහෙ-ශාක්‍යයන්ගෙන් වැඳුම් පිදුම් ලැබූහ. ඔවුන් තම පාමුල නතු කළහ.

සටිකාර තෙමේ කුලයෙන් කුඹල්කරුවෙක් වූයේ ද, තමන් පිළිබඳ මහත් ගුණයෙන් උසස් කුලවතුන් අභිභවනය කෙළේ ය. තම පා මුල්හි ඔවුන් නතු කෙළේ ය. දෙවිමිනිසුන්ගෙන් වැඳුම් පිදුම් ලැබූයේ ය. කරුණු මෙසේ බැවින් ප්‍රධාන විසින් මෙහිලා පිදිය යුතු ය යි අදහස් කරණ ලද්දේ ගුණවෘඩත්වය යි කිය යුතුය. ජාතිවෘද්ධත්වාදිය ද ඒ ඒ කරුණු අනු ව යෑමෙන්

පිදිය යුතුය. එහෙත් මේ ශාසනයෙහි ජාතිභෙදයෙක්, කුල-භෙදයෙක් ඇතැ, යි නොගත යුතුය. ශාසනයෙහි එබඳු භෙදයෙක් නැත්තේය. ලොකසම්මතය අනුව පිදිය යුත්තේ පිදිය යුතුය යනු, ශාසනධර්මය යි.

එදම පැවිදි වූ භෙරණහු පටන් සියලු ශාසනිකයෝ ගිහියාට වඩා ගුණයෙන් වැඩිහිටියෝය. පැවිද්දාට, පැවිද්දෙන් හෝ උපසම්පතාවෙන් වැඩි සිටියෝ පැවිද්දන් අතර වැඩිහිටියෝය. ගිහිගෙයි වසන්නහුට, ගෙයි වසන වැඩිහිටියෝ, ඒ ඒ කුලවල වැඩිහිටියෝ, මවුපියෝ, වැඩි මහල් සහෝදර සහෝදරියෝ, වැඩිහිටියෝය.

මහාකාත්‍යායන ස්ථවිරයන් වහන්සේ මධුරා නගරයෙහි වැඩ වාසය කරණ දවසෙක **කණ්ඩරායන** බ්‍රාහ්මණ තෙමේ උන්වහන්සේ හමු වන්නට ගොස් 'ඔබ වහන්සේලා මහලු වයසෙහි සිටින්නන්ට වැඳීමක්, පිදීමක්, දුක නැගී සිටීමක්, ඉදිරියට ගොස් පිළිගැණීමක්, අසුන් දීමක් යන ඇ ලෙසින් කිසිත් සැලකිල්ලක් නොකරන්නහු, යි මා අසා තිබේ, ඒ එසේ බව මට අද හොඳට වැටහී ගියේය, කාත්‍යායන ස්ථවිරයන් වහන්සේලා අතර එබඳු යහපත් සිත් ගන්නා සිරිත් විරිත් කිසිවක් ඇතිබව නොපෙනේ, එය නොසුදුසු ය, පිළිකුල් කට යුතු ය' යි කීයේය.

එවිට ස්ථවිරයන් වහන්සේ 'බ්‍රාහ්මණ! වෘඛභූමි ය - දහර භූමි ය, යි භූමිහු දෙදෙනෙක් අපගේ බුදුරජානන් වහන්සේ විසින් වදුරන ලද්දාහු ය, එහි යමෙක්, උත්පත්තියෙන් අසූ - අනූ - සියක් වස් ඇත්තේ කාමසෙවනය කෙරේ ද, කාමදුහයෙන් රැ දුවල දුවී දුවී සිටී ද, කාමවස්තූන් සොයා යේ ද, ඔහු මහල්ලෙක් නොවේ ම ය, වයසින් මහලු වුවත් කට යුතු අතින් ඔහු මහලු නොවේ, කටයුතු අතින් බාලයෙක් ම ය, යමෙක් විසි තිස් වස් ඇත්තේ ප්‍රථම වයසින් යුක්ත වූයේ තරුණකමින් ඔද වැඩී වූයේ කාම සෙවනය නොකෙරේ ද, කාමගින්නෙන් හෝ නොදුවේ ද, කාමවස්තූන් සොයා නොයේ ද, ඔහු වයසින් තරුණ වූයේ ද, මහල්ලෙක් ම ය, පණ්ඩිතයෙක් ම ය' යි බමුණාට වෘඛභූමියත් දහරභූමියත් කියා පෑහ. **කණ්ඩරායන** තෙමේ 'එසේ ය! සවාමීනි! කාරණය ඇත්තෑ' යි කියා හුන් තැනින් නැගිට පොරොවා තුබූ උතුරු සළුකඩ එකස් කොට එ දවස ම පැවිදි ව සිටි භෙරණහු පටන් හැම දෙනා වහන්සේගේ පා සිඹ සිඹ වඳිමින්, 'ඔබ වහන්සේලා ය

ලොකයෙහි වෘඛයෝ, වෘඛභූමියෙහි සිටියහු ඔබ වහන්සේලා, අපි වනාහි වයසින් මහලු වුවත් බාලයෝ වෙමු, බාලභූමියෙහි සිටින්නෝ වෙමු' යි සතුති කොට යිසේ ය.

ලොකයෙහි පිදිය යුතු වූයේ, වැඳිය යුතු වූයේ, එළැඹිය යුතු වූයේ ගුණයෙන් වැඩී යියඛව ම ය යනු මෙයින් ද පැහැදිලි වේ.

ගුණයෙන් වැඩී යියවුන් කෙරෙහි කළයුතු වූ පූජාවිශෙෂයෝ නම්, සතකාර-ගරුකාර-වන්දනා-මානනාදීහු ය.

චතනාරො ඛම්මා වඩ්ඪනති = සතර ගුණයෝ වැඩෙත්.

මෙහි වූ **ඛම්ම** ශබ්දය ගුණවාචක ව සිටියේ ය.[1] එහෙයින් ධම්මා යන්නට ගුණයෝ යි අරුත් කියති.

ආයු වණ්ණා සුඛං බලං = ආයුෂ ය-වර්ණ ය-සැප ය-බලය.

'එති පවත්තතීති = ආයු' ජීවිතෙන්ද්‍රියයාගේ පැවැත්ම **ආයු** නම්. ඡවිගතවර්ණධාතුව **වණ්ණ** නම්. සිත-කය දෙක සැපවත් කිරීමේ ශකතිය **සුඛ** නම්. කායශකතිය හා ඥනශකතිය **බල** නම්. එ දෙක ම මෙහි ලා ගැණේ. **'බලනති ජීවනති ජීවිතං ඛපෙපනතීති** = බලං, කායබලය යි. **'බලනති සම්මා ජීවනං ජීවනති එතෙනාති** = බලං' ඥනබලය යි.

ආයු යම්තාක් වැඩේ ද, ඒ තාක් ඉතිරි ගුණයෝ ද වැඩෙත්. පනස් වසකට ආයු ඇති කුශලකමීයක් කළ තැනැත්තහුට පස් විසි වයසේ දී අනතුරෙක් වන්නේ නම්, එය ගුණවතුන් වැඳීම පිදීම නිසා නො ම වන්නේ ය. අනතුර දුර ගසා යන්නේ ය. හෙතෙමේ ආයු ඇති තාක් ම ජීවත් වන්නේ ය. ඔහුගේ ශරීර ශොභාදි ගුණයෝ ද ආයුෂය හා ම වැඩෙන්නෝ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ආයුවර්ධන කුමාර තෙමේ පන්සියයක් උපාසකයනුත් සමග සෝවන් විය. අන් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියහ.

දිසායුකුමාරවත්ථුව නිමියේ ය.

---

1. 1. 1. 'මනොපුබ්බඞ්ගමා ධම්මා' යනු බලනු.

සංකිච්ච සථවිරයන් වහන්සේ.

8 – 9

අප බුදුරජුන් දවස සැවැත්නුවර වැසි කුලපුත්‍රයෝ තිස් දෙනෙක් බණ අසා පැහැදී පැවිදි වූහ. ඒ තිස් දෙන උපසම්පදාවට පැමිණ පස් වසක් ගෙවා බුදුරජුන් වෙත ගොස්, 'අප විසින් පිරිය යුතු ධුර කෙතෙක් දැ' යි අසා දැන, තමන් මහලු බැවින් ග්‍රන්ථධුරය පුරන්නට නොහැකිය, යි තීරණයට බැස, විදර්‍ශනා ධුරයෙහි සිත් අලවා කමටහන් කියවා ගත්හ. ඉන් පසු ඔවුහු බුදුරජුන් වෙතින් එක් ම කාලයකට ගොස් කමටහන් වඩන්නට අවසර ඉල්ලූහ. බුදුරජාණන් වහන්සේ 'තමුසේලා යන කාලය කිනම් දැ' යි ඇසූ කල්හි, 'අසුවල් කාල ය' යි කීහ. ඔවුනට එහි දී භික්‍ෂූන්ගෙන් නිසා බිය හට ගන්නා බව දුටු බුදුරජාණන් වහන්සේ, සංකිච්චයන්, ඔවුන් හා ගිය කල්හි ඒ බිය සන්සිඳෙන බව හා මහණකම මුදුන් පැමිණෙන බව ද දත් සේක.

සඞ්කිච්ච හෙරණ තෙමේ ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේගේ ගෝලනමෙකි. උතුපත්තියෙන් සත් ඇවිරිදි ය. මවු තොමෝ සැවැත් නුවර පොහොසත් ගෙදරක ප්‍රභූපවුලක උපන්නියක. සඞ්කිච්ච දරුවන් කුස ඉන්ද දී ම හදිසියේ හට ගත් ලෙඩකින් ඕ තොමෝ මළා ය. මළ සිරුර ගින්නෙන් දවද්දී එහි දරුගැබ පිඹිටි කොටස ඉතිරි ව දැවුනේ ය. ඒ දුටු මිනිස්සු නොදැවී ඉතිරි වූ කොටස ගින්නෙන් බැහැරට ගෙණ එහි දෙතුන් තැනකට හුල් වලින් ඇන්නාහ. එක් හුල් පහරක් කුස තුළ හුන් කුඩා දරුගේ ඇස තොණෙක වැදුනේ ය. මිනිස්සු නැවැත නැවැතත් එයට හුල් වලින් ඇණ බැලුවෝ ද, කිසිවක් නොදුක එය ගිනි අඟුරෙහි ම ලා වසා දමා ගෙවලට ගියහ. ගැබ්මස දැවුනේ ය. රන්පිළිමයක් වැනි වූ දරු තෙමේ අඟුරු උඩ, පියුමක් මත හුන්නකු සේ හුන්නේ ය.

පශ්චිමභවිකසත්ත්‍ව තෙමේ මහමෙරින් මිරිකුනේ ද, එයට යට වූයේ ද රහත් නොවී නොමියෙන්නේ ය.

පසුදා නැගෝ, සෑය නිවන්නට එහි ගියෝ අඟුරු උඩ හුන් දරු දුක පුදුමයට පැමිණ, මෙතෙක් දරගොඩක් දැවෙද්දීත් මුළු සිරුර ඉතිරි නොව දැවෙද්දීත් මේ දරු නොදැවුනේ කුමක් නිසා ද, මෙයින් ඉදිරියෙහි වන්නේ කිමැ?, යි සිතමින් කියමින් දරු ගෙණ ගොස් දරු පිළිබඳ තොරතුරු නිමිති දන්නන් අතින් අසා බැලූහ. ඔවුහු ලකුණු බලා, 'මේ දරු ගෙදර සිටියේ නම්, හත්

මුතු පරපුරෙක නෑයෝ හිඟා කන්නෝ ය, පැවිදි වූයේ නම්, පන් සියයක් පමණ මහණුන් පිරිවරා තැන තැන ඇවිදින්නේ ය, යි කීහ. දරුගේ ඇසෙහි කොණක් හුල් පහරට කැඩී ගොස් තුබූ බැවින් සඩකිච්ච යි ඔහුට නම් කළහ. ඔහු පසු කාලයෙහි ප්‍රසිඩියට ගියේ ද, එ නමින් ම ය. ගෙයි අය, 'වන්නෙක් වේවා, හොඳ යි, සුදුසු විය පැමිණේවා, එවිට අපගේ තෙරුන් වෙත පැවිදි කළ හැකි' යි හොඳින් රැක බලා ගත්හ. 'තා මවු කුස වසද්දී තාගේ මවු කළුරිය කළා, මළ සිරුර දවද්දී කුස තුළ හුන් තෝ නො දුවුනෙහි' යි නුවර වැසි කුඩා දරුවන් කියනු අසා සංවෙගයට පැමිණි ලදරු තෙමේ 'මම මහත් බියකින් මිදී සිටිමි, එහෙයින් ගිහිකම් කිරීම මට නො සුදුසු ය, මට ගිහිකමෙන් වැඩෙක් නො වේ ය' යි නෑයන් වෙත කියා සිටියේ ය. ඔවුහු ද 'තම අදහස පිරුණේ ය' යි දරු ගෙණ ගොස් සැරියුත් තෙරුන්ට පැවිදි කරණු පිණිස පාවා දුන්හ. ස්ථවිරයන් වහන්සේ තවපඤ්චකකර්මස්ථානය කියවා එ දරු පැවිදි කළහ. පැවිද්දට කෙස් කපද්දී ම හෙතෙමේ සිවු පිළිසැඹියාවන් ලබා රහත් වී ය. මේ සඩකිච්ච හෙරණුන් පිළිබඳ කෙටිකතා ය.

වනයට යන්නට අවසර ඉල්ලා සිටි මහණුන්ගේ බිය සන්සිඳී මහණකම මුදුන් පැමිණෙන බව දුටු බුදුරජානන් වහන්සේ 'තමුසේලා වනයට යන්නහු නම්, වැඩිමහල් සහෝදර වූ ශාරීපුත්‍ර තැන හමු ව ඒගැණ කතා කර ගණිවු' යි වදාළ සේක. භික්ෂූන් වහන්සේලා 'යහපතැ' යි පිළිගෙණ තෙරුන් වෙත ගිය කල්හි උන්වහන්සේ 'ආයුෂ්මත්නි! ඔබ වහන්සේලා මෙහි ආවහු කිමැ' යි ඇසූහ. 'ස්වාමීනි! අප බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ වනයට යන්නට සූදානම් වීමු, එවිට උන්වහන්සේ හාමුදුරුවන් වහන්සේ හමුව දැක කතා කොට යවු' යි නියම කළ බැවින් ඔබ වහන්සේ දැක, වැඳ පුදා යන්නට ආවෙමු' යි භික්ෂූන් වහන්සේලා දැන් වූහ.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ, 'මා පිය බුදුරජානන් වහන්සේ මේ භික්ෂූන් නිකමට මෙහි නො එවන සේක, මොකක් නමුත් කරුණක් දැක මොවුන් මෙහි එවූහ' යි සිතන්නෝ කරුණ දැක, ඔබ වහන්සේලාට හෙරණෙක් සිටී දැ?' යි ඇසූහ. භික්ෂූහු 'නැතැ' යි පිළිතුරු දුන්හ. 'එසේ නම්, මේ සඩකිච්චයන් කැඳවා ගෙණ යවු' යි කී විට 'ආයුෂ්මත්නි! අපට හෙරණකුගෙන් වැඩෙක් නැත, එය අපට කරදරයෙක් වන්නේ ය, වෙනෙහි වසන අපට කුඩා නමක් වුවමනා නැතැ' යි කීහ. 'ඇවැත්නි! එසේ නො සිතවු, නො කියවු, මේ හෙරණ ගෙන් ඔබ වහන්සේලාට කිසිත්

කරදරයෙක් නොවන්නේ ය, මේ නම අන් හෙරණුන් සේ නොවේ. සමහර විට ඔබ වහන්සේලාගෙන් ඒ කුඩානමට කරදර විය හැකි ය, බුදුරජානන් වහන්සේත් ඔබ වහන්සේලා නිකමට මෙහි නොවූහ, තමුන්නාන්සේලා මෙහි අවුත් පෙරලා යන ගමනේ මා විසින් තමුන්නාන්සේලා සමඟ හෙරණකු පිටත් කරණු ඇතැ'යි සිතා මෙහි එවූහ, ඒ නිසා මේ කුඩා නම කැටුව ඇවූ'යි සථවිරයන් වහන්සේ කීහ.

එකල්හි ඔවුහු 'යහපතැ'යි පිළිගෙණ හෙරණුන් ද ගෙණ තෙරුන් හමු ව වෙහෙරින් නික්ම පිළිවෙළින් යන්නෝ, එක්සිය විසි යොදුනකින් ඇත්හි වූ ගෙවල් දහසක් පමණ ඇති ගමකට ඇතුල් වූහ. එ ගම්වැස්සෝ, ඒ භික්ෂූන් දැක පහන් සිත් ඇති ව මනා කොට වළඳවා, ඔබ වහන්සේලා කොහි වඩින්නහු දැ?' යි අසා 'පහසු තැනක් බලා යන්නෙමු' යි කී කල්හි පාමුල්හි වැටී, 'ස්වාමීනි! ස්වාමීන් වහන්සේලා මේ වස් තෙමස මෙහි වැඩ වසන්නෝ නම්, අපි තිසරණයෙහි පිහිටා පන්සිල් සමාදන් ව ගෙණ, පොහෝ දිනයන්හි පෙහෙ ව පින් දහම් කරන්නෙමු' යි නවතින්නට ආරාධනා කළහ. උන්වහන්සේලා ඒ ආරාධනාව ඉවසූහ. ගම්වැස්සෝ ආරාධනාව ඉවසූබව දැන, රෑ වසන තැන් දුවල වසන තැන්, සක්මන් කරණ තැන්, පන්සල් කුටි සියල්ල පිළියෙල කොට වඩා හිඳුවා ඉතා ඕනෑ කමින් උපස්ථාන කළහ.

ඒ සථවිරයන් වහන්සේලා වස් වසන දවසෙහි එක් තැනෙක රැස් ව 'ඇවැත්නි! අපි ජීවමාන බුදුරජුන්ගෙන් කමටහන් ගෙණ ආවෝ වෙමු, පිළිවෙත් පිරීමෙන් ම බුදුරජුන් සතුටු කරණු මිසක් උගත් කමින් වන්පොහොසත් කමින් උන්වහන්සේ සතුටු කරණු බැරි ය, නිරයෙහි දෙර නිතර ඇරී පවත්නේ ය, එහෙයින් උදය පිබු සිඟා යන වේලාවත් සවස තෙරුන්ට උපස්ථාන කරණ වේලාවත් හැර අන් කිසි වේලාවක දෙ දෙනකු එක් තැන් නොවිය යුතු ය, යමක්හට අපහසුවෙක් වී නම්, ගෙඩිය ගැසූ කල එහි ගොස් ඔහුට උවටැන් කළ යුතු ය, අද සිට මේ වනයෙහි ඒ ඒ තැන එකී ව සිට දිවා රෑ දෙක්හි ම නොවම කමටහන්හි යෙදෙමු' යි නියම කර ගත්හ.

ඔවුන් මෙසේ ව්‍යවස්ථා කර ගෙණ වසන කල්හි ඒ අසල දුප්පත් මිනිසෙක් දුවකගේ ගෙදර නැවැති ඇයගෙන් උවටැන් ලබමින් හුන්නේ ය. හෙතෙමේ ඒ දුවගේ ගෙයි කන්නට නැති වූ දවසෙක අනික් දුවක නිසා ජීවත් වෙම්' යි ඒ දුවගේ ගෙට යන්නට පිටත් ව මගට බැස්සේ ය. ඒ භික්ෂූන් වහන්සේලා

ගමෙහි පිඬු සිඟා ගෙණ තමන් වසන තැන් බලා එන්නාහු, අතර මග දී ගඟකින් සනානය කොට කල්වේලා පැමිණි යෙන් එහි ම ඉවුරෙහි වැලි මත හිඳ දන් වැළඳූහ. ඒ දුප්පත් මිනිසා ද එහි පැමිණ පසෙකට වී සිටියේ ය. භික්ෂූන්, ඔහුගෙන් 'කොහි යෙහි දැ' යි ඇසූ කල්හි හෙතෙමේ සියලු තොරතුරු කී ය. භික්ෂූන් වහන්සේලා ඒ තොරතුරු අසා ඔහු කෙරෙහි දයානුකම්පා ඇත්තාහු, 'උපාසක! තමුසේගේ බඩගින්න බලවත් බව පෙනේ, කොළයක් ගෙණ එන්නැ' යි කොළයක් ගෙන්වා තමන් වළඳන හැටියට ම හැම දෙනා වහන්සේ එක් එක් බත් පිඬ බැගින් ඔහුට දුන්හ.

දන් වළඳන වේලෙහි එ තැනට පැමිණියක්හට බත් දෙන භික්ෂූනම් විසින් තමන් වළඳන සැටියෙන් ම බත් පිඬක් හෝ එයට වැඩියක් හෝ දෙනු ලබන්නේ ය. ඔහු බත් කා තෙරුන් වැඳ, 'සවාමීනි! ඔබ වහන්සේලාට මේ ලෙසට දන් දෙන්නට කළ ආරාධනා තිබේ දැ' යි ඇසී ය. 'ඔව්, ආරාධනා තිබේ, දවස් පතා ම මිනිස්සු මේ ලෙසට දන් දෙත්' යි භික්ෂූන් කී විට, 'අපට කොතරම් මහන්සි දුරුවත් මෙතරම් රසමසට කෑමක් ලැබෙන්නේ නැත, ඒ නිසා වෙන තැනක නොගොස් මේ උන්නාන්සේලා ළඟ ම නැවතී ජීවිකාව කරමි' යි සිතා, සවාමීනි! මමත් ඔබ වහන්සේලා වෙත ම නැවැතී වත් පිළිවෙත් කර ගෙණ මෙහි ම නවතින්නට කැමැත්තෙමි' යි කී ය. භික්ෂූහු එයට කැමැත්ත දුන්හ. උපාසක තෙමේ භික්ෂූන් සමග භික්ෂුනිවාසයට ගොස් වත් පිළිවෙත් කරමින් භික්ෂූන්ගේ සිත් ගෙණ වසන්නේ දෙමසකින් පසු දුව දකින්නට යන්නට සිතා, 'සවාමීන් වහන්සේලාගෙන් ඇසුවොත් යන්නට ඉඩ නොලැබෙන්නේ ය, එහෙයින් නොදන්වා ම යමි' යි සිතා ඒලෙසට නොදන්වා ම ගියේ ය. මේ කාලය තුළ ඔහු අතින් වූ ලොකු ම වරද භික්ෂූන්ට නොදන්වා ගිය මේ ගමන ය.

ඔහු, දුව බලන්නට ගියේ මහාවනයක් අසලින් වැටී තුබූ මගකිනි. ඒ වනයෙහි මංපහරන සොරු, නිතර හැසිරෙති. සොරු දෙවියන් පුදමින් එහි වෙසෙති. ඔවුහු 'මේ වනයට යමෙක් පළමු කොට ඇතුල් වූයේ නම්, ඌ මරා උගේ මසින් හා ලෙයින් ඔබ වහන්සේට පිදේනි දෙන්නෙමු' යි දෙවියන්ට පඹුරු ගැට ගසා සිටියහ. එහෙත්, මේ වන තුරුත් එය ඉටු කිරීමට ඔවුන්ට ඉඩ නොලැබුනේ ය. උපාසක, ඒ වනයට ඇතුල් වූයේ සොරුන්ගේ දෙවතාරාධනාවෙන් සත්වන දිනයේ ය. එහෙයින් සොරදෙටු සත්වන දිනයේ කෙසේ නමුත් භාරය ඔප්පු කළ යුතුය යි සිතා

ගසකට නැගී මිනිසුන් එනු බලමින් ගස උඩ හුන්නේ ය. මඟ එන උපාසකයා දුටු සොරදෙවු තෙමේ අවට සැඟ වී සිටි සොරුන්ට ඉඟි කෙළේ ය. ඔවුහු වන මැදට පැමිණි උපාසකයා ඉදිරියට කඩා පැන අල්ලා, යනු බැරි ලෙසින් තද කොට බැඳ දැමූහ.

අනතුරු ව වියලි දඬුකඩ දෙකක් එකට ගටා ගිනි දල්වා වියලි දර කැබැලි ගොඩ ගසා ගින්න මහත් කොට එහි යකඩහුල් බහා ඒවා මුවහත් කළහ. ඒ දුටු උපාසක තෙමේ 'යකඩහුල් මුවහත් කරන්නහු කුමට ද' යි ඔවුන්ගෙන් ඇසී ය. 'නා මරා නාගේ මසින් හා ලෙයින් මේ වනයෙහි අරක් ගෙණ සිටින දෙවියන්ට පිදේනි දෙන්නටය' යි උන් කී කල්හි මරණ බියෙන් බියපත් උපාසක තෙමේ, 'නිඝූන් කළ උපකාර ගැණ නො සලකා තම දිවි රැක ගන්නට 'පින්වත්නි! මම නිඟන්-නෙක්මි, උතුන් කා ඉතිරි කොට කසළගොඩට දමන බත් විතක් කා ජීවත් වන්නෙක්මි මම, එබඳු කාලකණ්ණියකුගේ මසින් ලෙයින් දෙවියන්ට පිදේනි දීම දෙවියන්ගේ සතුට පිණිස, ඔබ තුමන්ලාගේ වැඩීම පිණිස නො වන්නේ ය, මාගේ මස් ලේ අපිරිසිදු ය, එයින් දෙවියන් පිදීම යුතු නැත, මම එකක් කියමි, රජකුලවලින් නික්ම පැවිදි වූ තිස් එක් නමක් නිඝූහු, අන්න, අතන වාසය කරත්, ඔවුහු පිරිසිදු පුරුෂයෝ ය, ඔවුන්ගේ මස් ලේ පිරිසිදු ය, ඒ නිසා ඒ නිඝූන් මරා උන්ගේ මසින් හා ලෙයින් ඔය පිදේන්න පිළියෙල කිරීම ය සුදුසු, එසේ කළා ම දෙවියන්ගේ සිත් සතුටු වන්නේ ය, ඔබ තුමන්ලාගේ දියුණුව ද එයින් ම ලැබෙන්නේ ය' යි කී ය. **'අහෝ! දුජ්ජීන ලොක ය. අහෝ කළ ගුණ නො සලකන ලොක ය. අහෝ; අසත්පුරුෂලොක ය.**

සොරු ද මොහුගේ කීම පිළිගත්හ. 'මූ කාලකණ්ණියකු බව හැඩහුරු කමින් ම, පෙනේ, මූගේ මස් ලේ පිදේන්නට නො සුදුසු ය, හොඳ වංශවත් මිනිසුන්හුගේ මස් ලෙයින් පිදේනිය පිළියෙල කළ හැකි නම් වඩා හොඳ ය' යි පිළිගත් හොරු, 'වර යන්නට, උන් ඉන්නා තැන පෙන්වාලව, යි උන් ගෙණ ඌගෙන් පාර අසමින් භික්ෂූන් වසන තැනට ගියහ. හොරු එහි යන වේලේ භික්ෂූහු එහි නො වූහ. එවිට ඔවුන් 'කෝ බොල! උන්නාන්හේලා?' යි උපාසකයාගෙන් ඇසූහ. 'ඔවුහු තම තමන් අයත් කාමරවල භාවනා කරමින් සිටිති, අර පෙනෙන ගෙඩිය ගැසූ විට සියලු දෙන එක් තැන් වෙති, ඔවුන්ගේ ව්‍යවස්ථාව එසේ ය' යි ඌ කී විට සොරදෙවු තෙමේ

ගෙඩිය ගැසුයේ ය. භික්ෂූහු ගෙඩිහඬ අසා 'වෙනදා නොා ගසන වේලාවෙක ගෙඩිය ගසන ලද්දේ ය, කාට නමුත් කරදරයෙකැ යි සිතා තම තමන් හුන් කාමරවලින් වහා එලියට බැස, වෙහෙර මැදට ගොස්, එහි තුබූ ගල්ලෑලි උඩ වාඩි ගත්හ.

ප්‍රධාන ස්ථවිරයන් වහන්සේ හොරුන් දෙස බලා 'ගෙඩිය ගැසුවෝ කවුරු දැ?' යි ඇසූහ. 'ස්වාමීනි! මම' යි සොරදෙවු තෙමේ කී ය. 'කුමක් නිසා ගෙඩිය ගැසුයෙහි දැ' යි ඇසූ විට මේ වනයෙහි අරක් ගත් දෙවියන්ට අප දුන් පොරොන්දුවක් තිබේ, එය ඉටු කිරීමට මෙයින් මහණකු ගෙණ යන්නට වුවමනා බැවිනැ' යි කී ය. එවිට ස්ථවිරයන් වහන්සේ භික්ෂූන්ට කතා කොට, 'ඇවැත්නි! සහෝදරයන් පිළිබඳ කටයුත්තක දී පළමුවෙන් එහි ලා ඉදිරිපත් විය යුත්තේ වැඩිමාල් සහෝදරයා ය, වැඩිමලා ම එහි බර කරට ගත යුතු ය, එහි ලා වග කිය යුතු ය, එහෙයින් මම මොවුන් සමඟ යමි, කිසිවක්හටත් අනතුරෙක් නොා වේවා, තමුන්නාන්සේලා පැමිණි කටයුත්තෙහි අප්‍රමත්ත ව මහණ කම මුදුන් පමුණුවා ගණිවු' යි කී ය.

අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ නැගී සිට, 'ස්වාමීනි! එසේ නොා වදරනු මැනැවි, වැඩිමාල් සොහොයුරාගේ කටයුතු අයිති බාල සොහොයුරාට ය, ඒ නිසා ඔය ගමන අයිති මට ය, මම යමි' යි කීහ. මේ ලෙසින් ඒ පිරිසෙහි වූ හැම දෙනා වහන්සේ ම 'මම යමි, මම යමි' යි නැගී සිටියාහ. ඒ භික්ෂූන් වහන්සේලා එක් මවකගේ එක් පියකුගේ දරුවෝ නොා වූහ. ඥාතිරාගීහු ද නොා වූහ. එහෙත් හැම දෙන ම සෙසු පිරිස සඳහා දිවි දෙන්නට කැමැති වූහ. ඔවුන් අතරෙහි, 'තමුන්නාන්සේ යා යුතු' යි කියන්නට එකෙකුත් සමර්ථ නොා වී ය.

සංකිච්ච හෙරණ තෙමේ මේ භික්ෂූන්ගේ කතා අසා, 'ස්වාමීනි! ඔබ වහන්සේලා කිසිවකුත් මේ ගමන යා යුතු නොා වේ, යා යුත්තේ මම ය, එහෙයින් මම ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් දිවි දෙමි, මම යමි' යි නැගී සිටියේ ය. එවිට භික්ෂූන් වහන්සේලා 'හා! මේ ගමන එසේ යෑමට ඉඩ නොා දිය හැකි ය, යන්නමෝ නම්, අපි කවුරුත් යමු, එකලා වූ කට යන්නට ඉඩ දෙනු බැරිය' යි කීහ. 'ඇයි ස්වාමීනි! එසේ කියහු?' යි හෙරණුන් ඇසූ විට, 'ඔබ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්ගේ ගෝලනමෙකි, සාමාන්‍ය ස්ථවිර කෙනකුගේ ගෝලයෙක් නොා වහු, නොප ගොස් මෙයට බිලි වුවොත් මාගේ කුඩා නම ගෙණ ගොස් හොරුන්ට පාවා දුන්නහු' යි ස්ථවිරයන් වහන්සේ

අපට දෙස් කියන්නෝ ය, ඒ දෙෂය මග හැර හැණීම ඉතා ම අපහසු ය, ඒ නිසා අප විසින් විශෙෂයෙන් ඔබ රැකිය යුත්තහු ය, මේ ගමනට ඉඩ දෙනු නො හැකි ය' යි භික්ෂූන් වහන්සේලා කීහ. 'සවාමීනි! ඔබ වහන්සේලා කුමක් කියහු ද, බුදුරජානන් වහන්සේ ඔබ වහන්සේලා මාගේ ගුරු හාමුදුරුවන් වෙත එව්වෝත්, මාගේ ගුරු හාමුදුරුවෝ මා ඔබ වහන්සේලා කැටුව එව්වෝත් මේ කරදරය දුන වදුරා ය, ඒ නිසා මේ කරදරය මා පිටට ගත යුතු ය, මා විසින් ම ය එය බේරා දුම්ය යුත්තේ, ඒ නිසා මට යන්නට අවසර දෙනු මැනැවි, මම යමි, මා අත යම් වරදෙක් තිබේ නම්, ඒ හැමට කමා කරන්නැ' යි කමා කරවා ගෙණ හෙරණ තෙමේ යන්නට පිටත් වී ය.

ඒ වේලෙහි භික්ෂූන් වහන්සේ තුළ මහත් සංවෙගයෙක් උපන. කදුලු කඩා වැටෙන්නට වන. පපු ගැහෙන්නට වන. පා සැලෙන්නට වන. මහතෙරුන් වහන්සේ 'උපාසකයෙනි තොප ගිනි දල් වන විට හුල් මුවහත් කරණ විට කොළ අතුරන විට ඒවා දැකීමෙන් මේ ලදරු බිය විය හැකි ය, ඒ නිසා ලදරුවාට නො පෙනෙන්නට ඒ කටයුතු කර ගණිවු' යි හොරුන්ට කීහ. හොරු හෙරණුන් ගෙණ ගොස්, හෙරණුන් පසෙක හිඳුවා මහතෙරුන් කී ලෙසට ඒ කට යුතු අවසන් කළහ. ඉන් පසු සොරදෙටු කඩුව කොපුවෙන් ඇද ගෙණ හෙරණුන් ඉදිරියට ආයේ ය. සොරු කියූ තැන හිඳ ගත්තා වූ හෙරණ තෙමේ ධ්‍යානයට සම වැදුම් හිඳ ගත්තේ ය. සොරදෙටු කඩුව, අර අත මේ අත පෙරළ පෙරළා අවුත් හෙරණුන්ගේ කරට කඩු පහරක් දුන්නේ ය. එ කෙණෙහි කඩුව නැමී, දෙ මුවහත, එකෙක එක හැපී හැකිළී සිටියේ ය. හොර තෙමේ 'මේ කඩු පහර හොඳට නො වැදුනේ ය' යි සිතා කඩුව ඇද දිග හැර, ඇද කුද හැර, නැවැතත් පහරක් ගැසී ය. එවර එය තල් පතක් සේ කඩුමිට දක්වා හැකිළී ගියේ ය. එ වේලෙහි මේ හෙරණුන් මහමෙරිත්තුන් යට කොට මරන්නට සමතෙක් මේ ලොව නො වූයේ ය. මහමෙරට යට වුවත් ඒ වේලෙහි සාමණේර තෙමේ නො මියෙන්නේ ය. එසේ නම් කඩු පහරින් කෙසේ මියෙන්නේ ද.

මේ දුක පුදුමයට පැමිණි සොර තෙමේ 'මාගේ මේ කඩුව ඉස්සර නම් ගල්කණුවක් කිහිරිකණුවක් වුවත් කපා හෙලීමෙහි සමත් ය, දැන් එක්වරක් නැමී ගියේ ය, එක්වරක් තල්කොළ-යක් හැකිලෙන්නා සේ හැකිළී ගියේ ය, මේ කඩුවට සිත් පිත් නැත ද හෙරණුන්ගේ ගුණ දන්නා සේ ය, මට සිත් පිත්

තුබුන ද මම ඒ නොදනිමි' යි කඩුව බිම දමා හෙරණුන්ගේ පාමුල වැටී යටි කුරු ව, 'සවාමීනි! අපි ධනය සොයන්නට මේ වනයට පැමිණියෙමු, ඒ අප දුරදී වුවත් දුටු කල එක් ව සිටි දහස් ගණන් මිනිස්සු ද තැති ගණිති, වෙවුලති, දෙතුන් විටක් කතා කරන්නට අපොහොසත් වෙති, ඔබ වහන්සේට බිත්දුවක් තරමටවත් තැති ගැණීමෙක් වෙවුලීමෙක් නැත, කෝවමුවෙහි සිටි සවණීයක් සේ ද, පිපිසිය කිණිහිරි මලක් සේ ද, ඔබ වහන්සේගේ මුණ දිලිසෙන්නේ ය, එයට හෙතු කිමැ'යි.

'තැති ගැන්මෙක් ඔබට-නැත, නැත බියෙක් වත් කිසි,
සිරුරේ පැහැය දිලිසේ-මෙබඳු බිය ඇති කල්හිත්.

එබැවින හිමියනේ! - මෙහි ලා නො අඩනෙහි කිම,
කරුණු පහදා දෙනු මැන - ඉතිරී නො කොට මැනැවින්'

යි මෙසේ විචාළේ ය.

එකෙණෙහි ධ්‍යානයෙන් නැගී සිටි හෙරණ තෙමේ ඔහුට 'සොරදෙටුව! රහතුන් වහන්සේට සිය අත්බව හිස තුබූ බරක් වැනි ය, එය නැසී වැනසී බිඳී යන කල්හි උන්වහන්සේ සතුටු වෙති, එයට බිය නො වෙති' යි වදාරා,

'හැරියහුට අත්බව - දුක් නැත සිතේ ගණදෙටු!,
සුන් කළ බැඳුම් ඇති - ඉසි සියලු බිය ගෙව්වේ

රහතුන් ඇලුම් හා - දුක් දහම් ඇති සැටි දත්,
මරණය බියට නො කරුණු - බර බහා තැබුමක් සේ'

යි ධර්මදේශනා කෙළේ ය.

සොරදෙටු තෙමේ සෙසු හොරුන් දෙස බලා, 'තොපගේ අදහස් කෙසේ ද, මේ මහණහුට කුමක් කරන්නට තොපි සිතහු දැ?' යි ඇසී ය. ඔවුහු එක්විට ම 'ඔබ වහන්සේ?' යි ඇසූහ. 'මම මෙයට කලින් කිසි ම දිනෙක මෙබඳු පුදුමයක් නො දුටිමි, මට සිතෙන්නේ හිඟිගෙය හැර දමන්නට ය, මේ සවාමීන් වහන්සේ ලඟ පැවිදි වන්නට ය, මම එසේ කරමි' යි හොරදෙටු කී විට සෙසු සොරුන් අපිත් පැවිදි වෙමු' යි කීහ. මෙසේ කතා කොට ගෙණ, සොරු සියලු දෙන හෙරණුන් වැඳ මහණකම ඉල්ලූහ. හෙරණ තෙමේ ඔවුන් අත තුබූ කඩුවලින් ම කෙස්රැවුලු හා දමා රෙදිකඩමාලු ම දුවලු සිඳ දමා, තඹ පැහැති මැටි, දිය කොට පොවා ඒ රෙදිකඩ අන්දවා

දැසසිල් ගත්වා ඔවුනුත් ගෙණ මග බැස යත්තේ, 'මම තෙරුන් වහන තැනට නොගොස් පිට පාරේ ම හිඳෙම් නම්, උන් වහන්සේලාට අස්වැසිල්ලෙක් නැත, මහණදම් නිසි සේ කරණු නොහැකි ය, සොරුන් මා ගෙණ ගිය දවසේ පටන් නොඅඬා සිටින එක නමකුත් නැත, කදුලු නොවගුරන්නෙක් නැත, හෙරණ තෙමේ මරණ ලදද, නොමරණ ලදදැ' යි යන සිතිවිල්ලෙන් කල් යවන උන්වහන්සේලාගේ සිත කමටහනට නොනගින්නේ ය, ඒ නිසා එහි ගොස් උන්වහන්සේලා හමු වී කතා කොට යම්' යි සිතා වනයෙහි දී පැවිදි කර ගත් නවකයන් පිරිවරා ගෙණ එහි ගියේ ය.

හෙරණුත් දැකීමෙන් අස්වැසුනු ඒ සථවිරයන් වහන්සේලා, 'කොහොම ද, සඬකිව්ව! දිවි ලද දැ?' යි ඇසූහ. හෙරණ තෙමේ 'එසේ ය, සවාමීනි! මොවුහු මා මරන්නට මහන්සි ගත්තෝ ද, නොහැකි ව මාගේ ගුණයෙහි පැහැද බණ අසා පැවිදි වූහ, මම ඔබ වහන්සේලා දැක යන්නට මෙහි ආයෙමි, පමා නොවී මහණ දම් කරණු මැනැවි, මම බුදුරජුන් වෙත යමි' යි ඒ භික්ෂූන් වැඳ අවසර ගෙණ නවකයන් ද කැටුව පළමු කොට උපාධ්‍යායයන් වෙත ගියේ ය. උන්වහන්සේ 'කොහොම ද, සංකිච්ච! ගෝලපිරිසක් ලැබූයෙහි?' යි ඇසූ විට, 'එසේ ය සවාමීනි! ලැබූයෙමි' යි සියලු තොරතුරු දන්වා සිටියේ ය. ඉක්බිති සංකිච්ච හෙරණ තෙමේ බුදුරජුන් වෙත ගියේ ය. උන්වහන්සේ ද තොරතුරු අසා, 'එසේ ද සංකිච්ච!' යි අසා 'එසේ ය' යි කී කල්හි 'මහණෙනි! තොපි සොරකම් කරමින් දුශ්ශීල කම් කරමින් මෙතෙක් දවස් ගෙවූ වහු ය, එසේ පව්කම් කරමින් අවුරුදු සියයක් ජීවත් වීමට වඩා දැන් මෙසේ ශීලයෙහි පිහිටා මණා පැවැතුම් ඇති ව එක් දවසක් ජීවත්වීම ම අතිශයශ්‍රේෂ්ඨ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

යො ච වස්සසතං ජීවෙ දුස්සීලෝ අසමාහිතෝ,
එකාහං ජීවිතං සෙය්‍යෝ සීලවන්තස්ස ඣායිනෝ ති.

දුසැසීල වූ, එක දැහැමි අරමුණෙක නොපිහිටි සිත් ඇති යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද, (ඔහුගේ ඒ ජීවත්වීමට වඩා) සිල්වත් ව ධ්‍යානකරන්නහුගේ එක් දවසක් ජීවත්වීම උතුම්වේ

යො ච වස්සසතං ජීවෙ = යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද.

දුස්සීලෝ = සිල් නැත්තා වූ.

සිල් නැත්තේ **දුස්සීල** නම්. එහි **'දුස්සීලො ති නිස්සීලො, සීලවිරහිතොති අත්ථො'** යනු අටුවා ය.

ශ්‍රමණදුශ්ශීල - ගෘහස්ථදුශ්ශීල යි දුශ්ශීල තෙමේ දෙවැදෑරුම් ය.

ශ්‍රමණජීවිතය දෙවියන් සහිත ලොකයට වැඩ වන පරිදි සකස් කරන්නට බුදුරජුන් පැන වූ ශික්ෂාපදසමූහය, ආපත්තිස්කන්ධ වශයෙන් සතෙකි. **පාරාජිකා - සඞ්ඝාදිසෙස - ථුල්ලච්චය - පාචිත්තිය - පාටිදෙසනීය - දුක්කට - දුබ්භාසිත**, යි. එහි පාරාජිකා-සඞ්ඝාදිසෙස ආපත්තිස්කන්ධයෝ, ආදිබ්‍රහ්මචරියකසීලයෙහි ද, සෙසු ආපත්තිස්කන්ධයෝ' ආභිසමාචාරිකසීලයෙහි ද ඇතුළත් වෙති. එහි **'යානි වා පන සික්ඛාපදානි බුද්දානුබුද්දකානීති වුත්තානි, ඉදං ආභිසමාචාරිකං, සෙසං ආදිබ්‍රහ්මචරියකං'** යනු ආචාර්‍යවචනයි.

යම් උපසම්පත්තයකු විසින් ආදිබ්‍රහ්මචරියකසීලයෙහි ගැණෙන පාරාජිකා-සඞ්ඝාදිසෙස ආපත්තිස්කන්ධ දෙකට ඇතුළත් ශික්ෂා පදයෙක් මඩින ලද්දේ නම්, හෙතෙමේ ශ්‍රමණදුශ්ශීල නම් වේ. එහි ලා මෙ ද දත යුතු ය. පාරාජිකාපත්තිස්කන්ධයට අයත් ආපත්තීන් ඡේද්‍යගාමිනී බැවින්, පාරාජිකාපත්තියකට පැමිණියේ ම එකාන්ත දුශ්ශීල වන්නේ ය. හෙතෙමේ එයින් ශාසනයෙන් සහ මුලින් ගිලිහී ගියේ ය. ඔහුට පිළියම් නො කොට හැකි ය.

සඞ්ඝාදිසෙසාපත්තීන් උත්ථානගාමිනී බැවින්, සඞ්ඝාදිසෙසා-පත්තියකට පැමිණි මහණ තෙමේ දුශ්ශීල වූයේ ද' ඔහුට ඒ දුශ්ශීල භාවයෙන් නැගී සිටිනු හැකි ය. ඔහු නැවැත සිල්වත් කරන්නට පිළියම් ඇත්තේ ය. එහෙයින් ඔහු සතෙකිච්ඡ ය. අභව්‍ය ම නො වේ. පිළියම් ලබනතුරු දුශ්ශීල වේ.

ආභිසමාචාරිකසීලයෙහි ලා ගැණෙන අන්‍යාපත්තිස්කන්ධපසට අයත් ශික්ෂාපදයක් දැන දැන ව්‍යතික්‍රමණය කෙළේ ද, දුශ්ශීල වේ. මෙතෙමේ දුශ්ශීල වූයේ ආචාරවිපත්තියෙනි. මෙකී ආපත්තිස්කන්ධ පස දෙශනාගාමිනී බැවින්, විධි වූ පරිදි උපසපන් මහණකු පාමුල එය ආරොචනය කිරීමෙන් නැවැත දෙශනාමාත්‍රයෙන් සිල් වත් විය හැකි ය. පිරිසිදු වනතුරු මෙතෙමේත් දුශ්ශීල ය' යි කියන ලද්දේ ය.

මෙහි පාරාජිකා - සඞ්ඝාදිසෙසාපත්තීහු ශීලවිපත්තියෙහි ද, ථුල්ලච්චය - පාචිත්තිය - පාටිදෙසනීය - දුක්කට - දුබ්භාසිතාපත්තීහු ආචාරවිපත්තියෙහි ද ඇතුළත් වෙති. මෙකී ආපත්තීන් පිළිබඳ කෙටිකතාවක් ඉදිරියෙහි එන්නී ය.

සාමණෙරදුස්සීල තෙමේ ද, ශ්‍රමණදුශ්ශීලයන්ගේ ගණයෙහි වැටේ. හෙරණසීලය ද ආභිසමාචාරික-ආදිබ්‍රහ්මචරියක වසයෙන් දෙ පරිදි ය. පන් සත්තෑවක් සෙඛියාවත් ද, ආගන්තුක වත් ආදි තුදුස් කඳුවත් ද, සුක්කවිසඝි ආදි ලොකවද්‍ය සම පනසක් ශික්ෂා ද ආභිසමාචාරිකසීලයෙහි ඇතුළත් ය.

දසසිල් – දසසික-දසපරිජී – දසනාසනා – දසදඬුවම් යන සමපනස් හෙදගත දසසීලය, ආදිබ්‍රහ්මචරියකසීලයෙහි ඇතුළත්ය. මෙකී දසසීලය, ආදිබ්‍රහ්මචරියකසීලය, යි කී සේ ය.

පණිවායෙන් දුරුවීම – අයිනාදනින් දුරුවීම-අබ්‍රම්සරින් දුරුවීම – මුසවායෙන් දුරුවීම-රහමෙරින් දුරුවීම-විකල්බොජුනෙන් දුරුවීම-නටනු ගණු වයනු විසුළු දැක්මෙන් දුරුවීම-මල්ගඳවිලවුන් ඇ දැරීමෙන් දුරුවීම – උසසුන් මහසුනෙන් දුරුවීම – රන්රිදී මසු කහවණු පිළිගැන්මෙන් දුරුවීම යන මෙ දස හෙරණහු පිළිබඳ දසසීලය යි. මෙය ම භික්මිය යුතු බැවින් දසසික ද වේ.

දැන දැන සතක්හු දිවිගැලවුම-දැන දැන දනා අයත් දැ සොර සිතින් ගැණුම-දැන දැන තිරිසන් ගිය මාගමක් හා ද මෙවුන් දම් සෙවුම-දැන දැන සිනාමුසු බසිනිදු මුසවාකීම-දැන දැන පිණිබිඳක් සා ද, රාටිකක් පීම-බුදුරුවන්හි අයුණුකීම-දමුරුවන්හි අයුණුකීම –සඟුරුවන්හි අයුණුකීම – පුවතක් මෙහෙණක හා ද මෙවුන් දම් සෙවුම – අනියතමිස දිටුගැණුම යන මෙදස, හෙරණහු පිළිබඳ පරිජී වේ. මේ එකක් ම හෙරණහුගේ දුසිල්බවට පමණ ය. මේ දසය ම දසනාසනා නම් ද වේ. මෙහි පසෙක් ලිඞ්ගනාසනා ය. පසෙක් සඵිනාශනා ය. දසපරිජීයෙහි මුල්පස ලිඞ්ගනාසනා ය. සෙසු පස සඵිනාශනා ය.

සංවාසනාසනා-ලිඞ්ගනාසනා-දණ්ඩකම්මනාසනා යි නාසනා තුනෙකි. එහි ධර්මාමිෂසම්භොගයන් තහනම් කොට උතේක්ෂ-පණිය කර්මයෙන් බැහැර කිරීම **සංවාසනාසනා** නම්. සිවුරු හරවා ඉවත් කිරීම **ලිඞ්ගනාසනා** නම්. රත්නත්‍රය ඇසුරු කිරීමෙන් බැහැර කිරීම **දණ්ඩකම්මනාසනා** නම්. හෙරණසිකෙහි **සබ්බනාසනා** යි කීවා මේ දණ්ඩකම්මනාසනා ය.

යම් හෙරණෙක් ප්‍රාණඝාතාදීන් අතුරෙහි එකකුදු කෙරේ නම් හෙතෙමේ ලිඞ්ගනාසනයෙන් නැසිය යුතු ය. සිවුරු හරවා ඉවත් කළ යුතු ය. කුරුකුහුඹුවකු පවා මැරූ මකුණුබිජුවක් පවා නැසූ

හෙරණ තෙමේ සිවුරු හරවා බැහැර කළ යුතු ය. ඒ නැසුණු කෙණෙහි ම සරණගමණය - උපාධ්‍යායග්‍රහණය - සෙනාසන ග්‍රහණය යන මොවුහු ද නැසී යත්. සඞ්ඝලාභයෙන් පිරිහෙයි. ශ්‍රමණලිඞ්ග මාත්‍රය ම ඉතිරි වේ. ගුණය මුළුමනින් නැති වී යයි. මෙසේ පාරාජිකාවට පැමිණි හෙරණ තෙමේ ගැවසී ගත් වරද ඇත්තේ මතු සංවරයෙහි නො පිහිටා ද, නැවැත පැවිදි නොකොට බැහැර කළ යුතු ය.

හෙරණහු පිළිබඳ විකාලභොජනශික්ෂාපදය පටන් ජාතරූපරජතප්‍රතිග්‍රහණශික්ෂාපදය තෙක් ඇති අනික් ශික්ෂාපද පස බිඳී ගිය කල්හි සිවුරු නො හරවා වැලිදඬුවම් ආදිය දිය යුතු ය. ශික්ෂාපද ගැන්වුව ද නො ගැන්වුව ද වරදෙක් නො වේ. එහෙත් ආයතිසංවරයෙහි පිහිටුවනු පිණිස වැලිදඬුවම් දී සිකපද ද දිය යුතු ය.

විකාලභොජනාදීන් අතුරෙහි එකක් කළ හෙරණහුට ද, සෑමලු බෝමලු ආදියට ගණන් විසින් වැලි දිය ඇදීමට නියම කොට ඒ ඇද දුම්මු කල්හි, ආයතිසංවරය පිණිස සිල් දිය යුතු ය' සි කීසේ ය.

ගුරුන් නො විවාරා හම්වැදීම, මුදල් ගණුදෙනු කිරීම, නොකැප පිරිකර සෙවුම, මාගමුන් හා මිතුරුබව, ලදරුවන් හා මිතුරුබව, වෙළඳුම්කිරීම, වෙදකම්කිරීම, නැකැත්කීම, යන්ත්‍රබැඳීම මන්ත්‍රකිරීම, අගොවරස්ථානයන්හි හැසිරීම, වත් පිළිවෙත් නොකිරීම යන මේ ආදිය ද වැලි දඬුවම් දී ආයතිසංවරය පිණිස සිල් දිය යුතු වරදු යි බණ පොත කියාලන්නේ ය.

පැවිද්දන් ලබන ලාභයෙන් පිරිහෙලීම, පැවිද්දන්ට අනර්ථ පිණිස ප්‍රයොගකිරීම, පැවිද්දන් ආවාසයෙන් නෙරපීමට ප්‍රයෝගකිරීම, පැවිද්දන්ට ආක්‍රොශපරිභවකිරීම, පැවිද්දන් පැවිද්දන් කෙරෙහි භෙදකිරීම යන මේ පස, හෙරණහු වසන සෙනසුන් හා සඞ්ඝාවාස, භොජනශාලාදියෙන් නෙරපා දැමීමට හෙතු වන වරද ය. මෙකී වරද කළ හෙරණුන් පන්නා හැරීම, ආවාර්‍යෝපාධ්‍යායයන් විසින් කළ යුතු ය. මෙහි මූලින් දැක් වූ ආභිසමාචාරිකආදිබ්‍රහ්මචරියකසීලයන්ගෙන් හිලිහුනු හෙරණ තෙමේ ශ්‍රමණදුශ්ශීල නම් වේ.

ගිහියා පිළිබඳ සීලයෙන් සිල්වත් නො වූයේ ගෘහස්ථදුශ්ශීල නම් වේ. **'උපාසකඋපාසිකානං නිච්චසීලවසෙන පඤ්චසික්ඛාපදානි, සති වා උස්සාහෙ දස, උපොසථඞ්ගවසෙන අට්ඨාති ඉදං ගහට්ඨසීලං'** උපාසක-උපාසිකාවන් පිළිබඳ නිත්‍යශීල වශයෙන්

පඤ්චසීලය ද, උත්සාහය ඇති කල්හි දසසීලය ද, උපොසථඞ්ග වසයෙන් අටසීලය යන මෙ තුන ගෘහස්ථශීල යි කියන ලද්දේ ය. පංචසීලයත් දසසීලයත් නිත්‍යශීල වේ. උත්සාහය ඇති සම්බාධ (කරදර) නැති ගිහියන්ට නිතොර හැම වේලේ ම රැකිය හැකි බැවින් ඒ නිත්‍යශීල වේ. කොතෙක් ගැහැට තුබුන ද, ගිහියා විසින් පන්සිල් නො කඩ කොට නිතොර ව රැකිය යුතු ම ය

ගිහිසීලය, බ්‍රහ්මචරියකපංචසීලය යන ඈ ලෙසින් විස්තාරයට ගියේ ද, මෙහි මෙසේ සිල් තුනක් කොට දක්වන ලද්දේ සියල්ලනට පොදු වසයෙනි. සියල්ලනට සාධාරණ සේ ය.

මෙහි ඉතා කොටින් දැක් වූ දුශ්ශීලභාවය සිකපදසමාදන් ව නො ගැන්මෙන් හා සමාදන් වූ සිකපද බිඳීමෙන් හා වන්නේ ය යි ද, මෙ දෙකින් පළමුවැන්න දෙවැන්න තරම් සාවද්‍ය නො වේ ය, යි ද කීහ.

සීලය ලෞකික-ලොකොත්තර විසින් බෙදෙන කල්හි දුශ්ශීල භාවය වන්නේ ලෞකිකශීලය පිළිබඳ ය. ලොකොත්තරශීලයෙන් සිල්වත් වූවහුගේ දුශ්ශීලභාවයෙක් මොනලෙසකිනුත් නො වේ. දුශ්ශීල වනුයේ ලෞකිකශීලයෙනි. එය නිතර කැඩී බිඳී සිඳී යෑමට පහසු බැවිනි. ලොකොත්තරශීලයෙහි එසේ බිඳී යෑමෙක් සිඳී යෑමෙක් නැත. එයින් සිල්වත් වූයේ සිල්වත් වූයේ ම ය. එහෙයින් මෙහි ප්‍රධාන විසින් දුස්සීල යි වදාළෝ මාගීයට පූර්ව භාගයෙහි කොට රැකිය යුතු වූ ලෞකිකශීලයෙන් තොර වූවහු ය.

අසමාහිතො = එක අරමුණෙක නො පිහිටියා වූ. එකඟ නො වූ.

උපචාර-අර්පණා විසින් දෙවැදෑරුම් වූ සමාධීන්ගෙන් සමාහිත නො වූයේ, එක අරමුණෙක නො පිහිටි සිත් ඇත්තේ, උපචාර-අර්පණා සමාධීන්ගෙන් ඔබා ගත යුතු කෙලෙස් ඔබා නො ගත්තේ **අසමාහිත** නම්.

උපචාරසමාධි නම්, කාමරාග – ව්‍යාපාද – ඊනමිද්ධ – උඩච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන පංචනීවරණයන් යටපත් වීමෙන් කාමාවචර සිතෙහි ඇතිවන එකඟබව ය. සිතේ නො විසිරී පැවැත්ම ය. උපචාරසමාධිය ලැබීමේ දී පංචනීවරණයන් දුර ගසා යෑමෙන් යට පත් වීමෙන් සිත සමාහිත වන්නේ ය. මේ එකඟබව අර්පණා ලඟ හැසිරෙන බැවින්, උපචාරසමාධි; යි හඳුන් වනු ලැබේ

අප්පිණාසමාධිය ලෞකික – ලොකොත්තරභෙදයෙන් දෙපරිදි ය. එහි ලෞකිකඅප්පිණාසමාධි නම්, විතක්කාදිධ්‍යානාඞ්ග පහළ වීමෙන් රූපාවචරභාවයට හෝ අරූපාවරභාවයට පැමිණි සිතෙහි ඇති වන ඉතා බලගතු එකඟබව ය. **ලොකොත්තරඅප්පිණාසමාධි** නම්, නිවන් අරමුණු කොට උපදින මාගී – ඵල සිත්හි ඇතිවන එකඟ බව ය. අප්පිණාසමාධිය ලැබීමෙහි දී විතක්කාදිධ්‍යානාඞ්ගයන් පහළ වීමෙන් සිත සමාහිත වන්නේ ය. උපචාරසමාධියෙහි දී ධ්‍යානාඞ්ගයෝ ස්ථිර ව නො පවතිත්. අප්පිණාසමාධියෙහි දී අඞ්ගයෝ ස්ථිර ව පවතිත්. මෙකී සමාධින්ගෙන් සිත එකඟ නො කළේ **අසමාහිතෝ**' යි කියන ලද්දේ ය.

එකාහං ජීවිතං සෙය්‍යෝ = එක් දවසක් ජීවත්වීම උතුම් ය.

සීලවතොස්ස = සිල්වත් වූ.[1]

ඣායිනෝ = ධ්‍යාන කරන්නහුගේ.

ආලම්බනොපනිඣ්‍යාන – ලක්ඛණොපනිඣ්‍යාන යන ධ්‍යානයන් ගෙන් ධ්‍යාන කරන්නේ ඣායී නම්. **"තත්ථ අට්ඨ සමාපත්තියො පඨවිකසිණාදිආරම්මණං උපනිජ්ඣායන්තීති = ආරම්මණූපනිජ්ඣානන්ති සිද්ධිං ගතා"** යනු ආචාර්‍යවචන යි. අෂ්ටසමාපත්තීහු පඨවිකසිණාදි වූ අටතිස් අරමුණු මෙනෙහි කරණ බැවින් **'ආරම්මණූපනිජ්ඣාන'** නම් වෙති. අටතිස් අරමුණු අතුරෙහි එකඟ සිත තබා ඒ මෙනෙහි කිරීමෙන් එහි සිත බැඳීමෙන් ලැබිය යුතු අෂ්ටසමාපත්තීහු, ආරම්මණූපනිජ්ඣාන නමැ, යි කියන ලදහ.

විදර්‍ශනා-මාගී-ඵල **'ලක්ඛණූපනිජ්ඣාන'** නම්. **"විපස්සනා මග්ගඵලානි පන ලක්ඛණූපනිජ්ඣානං නාම"** යනු ආචාර්‍ය වචන යි. අනිත්‍යාදිලක්ෂණ, මෙනෙහි කරණ බැවින් විදර්‍ශනාව ද, විදර්‍ශනාවෙන් කළ කෘත්‍යය මාගීයෙන් අභිවෘද්ධියට පැමිණෙන බැවින් මාගීය ද, නිරෝධසත්‍යයාගේ අවිපරීතලක්ෂණය මෙනෙහි කරණ බැවින් ඵලය ද, ලක්ෂණොපනිඣ්‍යාන නම් වේ. මෙහි පූර්‍ව භාගයෙහි ආලම්බනොපනිඣ්‍යානය ද, ලොකොත්තරමාගීක්ෂණයෙහි ලක්ෂණොපනිඣ්‍යානය ද අභිමත ය. මේ දෙකින් දුක්වුනේ ශමථවිදර්‍ශනා දෙක ය. එහෙයින් එ දෙකෙහි යෙදුනේ **'ඣායී'** වේ.[2]

ධර්‍මදේශනාවගේ අවසානයෙහි ඒ පන් සියයක් දෙනා වහන්සේ පිළිසැඹියාවන් ලබා රහත් වූහ. ධර්‍මදේශනාව පැමිණි සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

---

1. 4. 10. 'සීලවතං' යන්න බලනු.
2. 2. 1. 'ඣායිනෝ' යන්න බලනු.

ඉන් මෑත භාගයෙහි සංකිච්ච සාමණෙර තෙමේ උපසම්පදා ව ලබා දස වස් ගෙවා හෙරණකු පැවිදි කර ගත්තේ ය. ඒ හෙරණ තෙමේ සංකිච්ච තෙරුන්ගේ බෑනා ය. නාමය අතිමුත්තක ය. විසි වයස් ඇති ඔහුට, 'තමුසේ උපසම්පදාවෙහි පිහිටු වන්නට ඕනෑ ය, ඒ නිසා නෑයන් හමු වන්නට ගොස් වයස අසා දැන එව' යි උන්වහන්සේ හෙරණුන් පිටත් කළාහු ය. අතර මග සිටි සොරු හෙරණුන් අල්ලා මරන්නට සූදානම් වූහ. එවිට හෙරණ තෙමේ දහම් දෙසා ඔවුන් පැහැදුනවුන් කෙළේ ය. සොරු ද 'අප මෙහි ඉන්නා බව කිසිවකුටත් නො දන්වනු මැනැවැ' යි සාමණෙරයන් මුදා හැරියාහ.

ඉදිරියෙහි එන තම මවු පියන් දැකත් හෙරණ තෙමේ සත්‍ය යත් පොරොන්දුවත් රකිනු පිණිස හොරු මග රැක ඉන්නා බව ඔවුන්ට නො දැන් වී ය. හොරු උන් අල්ලා වෙහෙස කළහ. එවිට මවුපියෝ 'ඔබ වහන්සේ සොරුන් හා එකතු ව, මග හොරු ඉන්නා බව අපට නො දන්වා, ඔවුන්ගේ පක්ෂය ගෙණ උන් ලවා අප වෙහෙස කර වූ වහු' යි හඬන්නට වූහ. සොරු ඒ දැක, 'මේ උන්නාන්සේ අප මෙහි ඉන්නා බව මවුපියන්ටත් නො කීහ' යි පැහැද මහණකම ඉල්ලා සිටියාහ.

හෙරණ තෙමේ සංකිච්ච තෙරුන් මෙන් උන් පැවිදි කොට උපාඩ්‍යායයන් වෙත කැඳවා ගෙණ ගියේ ය. අනතුරු ව සංකිච්ච තෙරුන් විසින් බුදු රජුන් වෙත යැවූ හෙරණ තෙමේ එහි ගොස් ඒ තොරතුරු සියල්ල බුදුරජුන්ට දැන් වී ය. උන් වහන්සේ 'එසේ ද, මහණැ'යි අසා 'ස්වාමීනි! එසේ ය'යි හෙරණුන් කී කල්හි පළමු සේ අනුසන්ධි ගළපා ධර්මදෙශනා කරණ සේක්, මේ ගාථාව වදාළ සේක. මේ අතිමුත්තක-සාමණෙරකථාවත් කී සැටි ම ය යි දත යුතු ය.

සංකිච්චසාමණෙරවස්තුව නිමියේය.

බාණුකොණ්ඩඤ්ඤ සථවිරයන් වහන්සේ.

8 - 10

බාණුකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ බුදුරජුන්ගෙන් කමටහන් ගෙණ වනයට ගියහ. එහිදී උන්වහන්සේ කමටහන්හි යෙදී රහත් වූහ. ඒ බව බුදුරජුන්ට දන්වන්නට මග බැස එද්දී හට ගත් කලාන්තභාවයක් නිසා පාරෙන් මඳක් ඈත් ව ගලක් උඩ වාඩි වී ධ්‍යානයට සමවැදුනාහ. ගමක් පැහැර ගත් සොරු තම තමන්ට ගෙණ යා හැකි නොයෙක් බඩු, පොදි බැඳ හිස තබා ගෙණ එන්නෝ, වෙහෙසට පැමිණියාහු, විඩා හරින්නට සිතා තෙරුන් හුන් ගල ලඟට ගොස්, ධ්‍යානයට සමවැදී නිශ්චල ව සිටි තෙරුන් කණුවකැ යි කල්පනාවට ගෙණ එහි හිඳ ගත්හ. එක් සොරෙක් තම හිස තුබූ බඩු පොදිය, තෙරුන් හිස මත තැබී ය. තවෙකෙක් ඒ මත්තෙහි තව පොදියක් තැබී ය. මෙලෙසින් ඒ හැම දෙන තම තමන් ගෙණා බඩුපොදි එහි එක එක මතුයෙහි තබා තෙරුන් වටේට නිදි ගත්හ.

පසුදා උදෑසන ඔවුහු නින්දෙන් නැගිට, තම තමන් තැබූ බඩුපොදි ගන්නෝ, තෙරුන් දැක, අමනුෂ්‍යයෙකැ යි සිතා දුවන්නට පටන් ගත්හ. එවිට ස්ථවිරයන් වහන්සේ, 'උපාසකයෙනි! ඇයි, බිය නො වවු, මම පැවිද්දෙක්මි, තොපට මාගෙන් බියෙක් නැත, විපතක් නැත, සිටිවු' යි කීහ. මේ කතාව ඇසූ සොරු තෙරුන් පාමුල වැටී, 'ස්වාමීනි! අපට කමන්න, අපි කණුවෙකැ යි සිතා මෙසේ කෙළෙමු, අපට කමන්නැ' යි තෙරුන් කමා කරවා ගත්හ. දෙටුසොරු 'මම හාමුදුරුවන් ලඟ මහණ වෙමි' යි කී කල්හි අනික් සොරු ද, අපිත් මහණ වන්නෙමු'යි එක් සිත් ව මහණකම ඉල්ලූහ. උන්වහන්සේ ඒ සියලු දෙනා පැවිදි කළහ. එතැන් පටන් තෙරුන්නාන්සේ **'බාණුකොණ්ඩඤ්ඤ'** යි ප්‍රසිද්ධ වූහ.

ස්ථවිරයන් වහන්සේ ඒ නවකයන් ගෙණ බුදුරජුන් වෙත ගියහ. බුදුරජානන් වහන්සේ, 'කොණ්ඩඤ්ඤ! තමුසේට ගෝලයන් ගොඩක්, කොයින් ද මොවුහු?' යි ඇසූහ. කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ඔවුන් පිළිබඳ සියලු තොරතුරු දන්වා ලූහ. බුදුරජානන් වහන්සේ 'මහණෙනි! එසේ දැ' යි ඇසූ කල්හි, 'ස්වාමීනි! මේ අන්දමේ පුදුමයක් නම්, මෙයට කලින් අප කවදාවත් දැක නැත, ඒ නිසා ම අපි මහණ වීමු'යි කීහ. 'මහණෙනි! මේ අන්දමේ මෝඩ වැඩ කරමින් පව් රැස් කර

කර අවුරුදු සියයක් ජීවත් ව ඉන්නවාට වඩා දැන් නුවණින් යුක්ත ව සිහි කල්පනා ඇති ව නිවැරදි ව එක දවසකුදු ජීවත් වන්නා වූ තොපගේ ඒ එක් දවසේ ජීවත් වීම අතිශයශ්‍රේෂ්ඨ ය'යි වදාරා අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක:-

යො ච වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො,
එකාහං ජීවිතං සෙය්‍යා පඤ්ඤවනනස්ස ඣායිනොති.

නුවණ නැත්තා වූ, දුහැමි වූ එක් අරමුණෙක නො පිහිටි සිත් ඇති යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද (ඊට වඩා) නුවණැති ව ධ්‍යාන කරන්නහුගේ එක් දවසේ ජීවත් වීම ඉතා උතුම් වේ.

යො ච වස්සසතං ජීවෙ = යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද

දුප්පඤ්ඤො = නුවණ නැත්තා වූ. මෝඩ වූ.

ශමථ-විදර්ශනා-මාර්ග-ඵල යන ලෞකික-ලෝකොත්තරප්‍රඥා-වෙන් තොර වූයේ **දුප්පඤ්ඤ** නම්.

අසමාහිතො = එකඟ නො වූ සිත් ඇති. විසුරුනු සිත් ඇති.[1]

එකාහං ජීවිතං සෙය්‍යා = එක් දවසක් ජීවත් වීම උතුම් වේ.[2]

පඤ්ඤවනනස්ස = ප්‍රඥවත් වූ. නුවණැති.

ඣායිනො = ධ්‍යාන කරන්නා වූ.[3]

නුවණ නැති ව එක් තැනෙක නො පිහිටා ගෙන සියක් අවුරුද්දක් ජීවත් වීමට වඩා නුවණැති ව එක් තැනෙක පිහිටා ගෙන එක් දවසක් ජීවත් වීම ඵලදායක ය. උතුම් ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු පිළිසැඹියාවත් ලබා රහත් වූහ. ධම්දෙශනාව පැමිණි සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

ඛාණුඝකොණ්ඩඤ්ඤසථවිරවත්ථුව නිට්ඨිතං.

---

1. 8. 9 'අසමාහිතො' යනු බලනු
2. 8. 9 'එකාහං ජීවිතං සෙය්‍යා' යනු බලනු.
3. 2. 1 'ඣායිනො' යනු බලනු.

බෙල්ල කපාගැණීමට තැත් කළ භික්ෂු.

8 – 11

සැවැත් නුවර වැසි එක් කුලපුත්‍රයෙක් බුදුරජුන්ගෙන් බණ අසා පැවිදි ව උපසම්පදාව ද ලැබී ය. පසු ව කළකිරී 'මා වැනියක් හට ගිහිකම නො සුදුසු ය, මහණකම උඩ සිට මැරී යෑම හැම අතකින් ම උතුම් ය'යි මැරෙන්නට උපාය සොයමින් දවස් ගෙවී ය. දිනෙක වෙහෙර වැසි භික්ෂූන් වහන්සේලා ගිනිහල් ගෙයි උන් නයකු දැක ඌ අල්ලා කළයෙක ලා කට බැඳ එය ගෙණ වෙහෙරින් බැහැරට ගියහ. කළකිරී හුන් මහණ තෙමේත් දන් වළඳ එන්නේ, ඒ භික්ෂූන් දැක, 'ඇවැත්නි! මේ කිමැ' යි විචාරා 'නයෙකැ' යි කී කල්හි 'මූ ගෙණ යන්නහු කොහි දැ'යි ඇසී ය. 'මූගෙන් කරන්නට වැඩෙක් නැත, බැහැර ලන්නට ගෙණ යමු'යි භික්ෂූන් කී විට ඒ මහණ තෙමේ, 'නයා ලවා දෂ්ට කරවා ගෙණ මැරෙමි' යි සිතා, 'නයා මට දෙන්න, මම ඌ බැහැරලමි' යි නයා ඉල්ලා ගෙණ ගොස් කවුරුත් නැති තැනෙක හිඳ නයා ලවා දෂ්ට කරවා ගන්නට මහන්සි දැරී ය. එහෙත් නයා එහි උත්සාහවත් නො වී ය. එකල ඔහු කළයෙහි අත ලා නයා අල්ලා ඌ ඒ අතට මේ අතට කෙළේ ය. එහෙත් නයා දෂ්ට නො කෙළේ ය. ඒ වර නයා අල්ලා කට හරවා කටෙහි ඇඟිලිතුඩක් බැහී ය. එසේ කළ ද නයා දෂ්ට නො කෙළේ ය. මහණ තෙමේ 'මොකෙක් ද මූ, මූ නයෙක් නො වේ, මූ ගැරඬියෙක්'යි වීසි කොට වෙහෙරට ගියේ ය.

භික්ෂූන් වහන්සේලා 'කොහොම ද, නයා බැහැර ලෑවෙහි දැ'යි ඇසූහ. 'ඔව්! බැහැර ලෑවෙමි, මූ නයෙක් නො වේ, ගැරඬියෙකැ'යි මහණුන් කී කල්හි 'මොනවා, ඌ නයෙක්, ගැරඬියෙක් නො වේ, අල්ලා කළයෙහි දමන වේලේ පෙණය පුප්පා පිම්බේ ය, අල්ලා ගන්නා ලද්දේ ද ඉතා අමාරුවෙනි, තමුන්නාන්සේ ඌ ගැරඬියෙකැ යි කියන්නහු මොනවා දැක දැ'යි ඇසූහ. 'ආයුෂ්මත්නි! ඌ ලවා මම දෂ්ට කරවා ගැණීමට බොහෝ වේලාවක් නොයෙක් ලෙසින් මහන්සි දැරීමි, අන්තිමේ දී මාගේ ඇඟිල්ල ඌගේ කට තුළට බැහීමි, එහෙත් ඌ මට දෂ්ට නො කෙළේ ය, මා ඌ ගැරඬියෙකැ'යි කියනු, ලබන්නේ මේ නිසා ය' යි ඒ මහණ කීයේ ය. එවිට භික්ෂූන් වහන්සේලා නිහඬ වූහ.

දිනෙක අම්බැට්ටයෙක් දැලිපිහියා දෙකක් ගෙණ විහාරයට ගොස් එකක් පසෙක තබා එකක් ගෙණ භික්ෂූන්ගේ හිසරුවුල් බාන්නට පටන් ගත්තේ ය. මේ අතර කළකිරී සිටි මහණ තෙමේ බිම තුබූ පිහිය ගෙණ, 'මේ තරයෙන් බෙල්ල කපා ගෙණ මැරෙමි'යි ගසකට නැග්ත්තු වී පිහිය බෙල්ලට තබා උපසම්පදා වූ දා පටන් තමන් රැකි සීලය ගැණ සිහි කෙළේ ය. එවිට ඔහුට 'තමන් රැකි සීලය නිම්ලචන්ද්‍රමණ්ඩලයක් සේ අතිශය නිර්මල ය හි ද, ජාතිරඹගමාණික්‍යයක් සේ ද ප්‍රභාසවරය' යි ද වැටහුනේ ය. මෙසේ තම සීලයෙහි නිර්මලතාව දුටු ඔහුගේ සිරුර ප්‍රීතියෙන් පිණා ගියේ ය. එවිට ඔහු ඒ ප්‍රීතිය යටපත් කොට විදර්ශනා වඩා පිළිසැඹියාවන් ලබා රහත්බවට පැමිණ පිහියත් ගෙණ විහාරයට පිවිසියේ ය. එවිට භික්ෂූන් වහන්සේලා 'තමුන්නාන්සේ මෙතෙක් වේලා කොහි ගියහු දැ' යි ඇසුවිට, 'මම මේ කරයෙන් බෙල්ල කපා ගෙණ නහින්නට සිතා වෙහෙරින් බැහැර ගියෙමි' යි හෙතෙමේ කී ය.

ඉක්බිති භික්ෂූන් වහන්සේලා, 'නො මළහු මක්නිසා දැ' යි ඇසූ විට 'නහින්නට සිතා කරය ගෙණ ගිය නමුත්, දැන් මම අනිත්‍යමාගීඥනකරයෙන් සියලු කෙලෙස් කපා හැරී සිටිමි, මම දැන් එබඳු ආවුධයක් අතට ගැණීමෙහි පවා නො සුදුස්සෙක් ව සිටිමි' යි කීයේ ය. එකල 'මෙතෙමේ බොරු දෙසා' යි සිතා භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් එබව දැන් වූහ. උන් වහන්සේ 'මහණෙනි! රහත්හු නම් සියතින් තම ජීවිතය නො නසන්නාහ' යි වදාළ කල්හි, ඔවුහු, 'සවාමීනි! බුදුරජාණන් වහන්සේ 'මේ මහණ රහතෙකැ' යි වදාරන සේක් ද, මොහුට රහත් වීමට වාසනා ගුණයෙක් තුබුනේ නම්, කුමක් නිසා මෙතෙමේ උකටලි වී ද, මොහුට රහත් වීමට ඇති වාසනාව කුමක් ද, නයා මොහුට දෂ්ට නො කෙළේ කුමක් නිසා දැ' යි අසා සිටියහ. 'මහණෙනි! ඒ නයා, මෙයින් තෙවන අත්බවෙහි මොහුගේ දැසයෙක් වී ය, එහෙයින් ඒ නයා මොහු එදා සවාමියා යි සිතා දෂ්ට නො කෙළේ ය' යි වදාළ සේක. මහණ තෙමේ එතැන් සිට සළිදැස යි ප්‍රසිද්ධ වී ය.

'කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි එක්තරා කුල පුත්‍රයෙක් උන්වහන්සේ වෙතින් බණ අසා උපන් සංවේගයෙන් පැවිදි වී ය, පැවිද්දෙන් වැඩි දවස් නො යවා ම උපසම්පන්න ද වී ය, ඉන් පසු ඔහු තුළ බලගතු නො ඇල්මෙක් හටගත්තේ ය, එවිට ඔහු එ බව තම යහළු මහණුන්හට කී ය, හෙතෙමේ මේ මහණහුට ගිහිබවෙහි දෙස් දක්වා කරුණු කියා පෑ ය, ඒ ඇසූ

උකටලී මහණ නැවැතත් සසුනෙහි ඇල්ම උපදවා ගත්තේ ය, සසුනෙහි ආලය හැර සිටි දවසෙහි පසෙක දමා තිබීමෙන් දූවිලි කා දිරුම් කඩට ගොස් තුබූ සිවුරු පිරිකර ඔහු කුඩා ගල්කෙමියක් ලඟට ගොස් එහි ලා සෝදා පිරිසිදු කරන්නට පටන් ගත්තේ ය, යහළු මහණ ද ඔහු ලඟ ම සිටියේ ය, එකල මේ මහණ තෙමේ, 'පින්වත! සිවුරු හැර දමා යන්නට සිතා සිටි මම බලාපොරොත්තු වූයේ එසේ යන විට මේ පිරිකර ඔබතුමන්ට දිලා යන්නට ය' යි යහළුවාට දැන් වී ය. එ තැන් සිට යහළු මහණ තෙමේ, මේ පිරිකර ටික තමන් ගන්නට සිතා 'ආයුෂ්මතුනි! මේ පැවිද්දෙන් ඇති වැඩෙක් නම්, දැන් මට නො පෙනේ, මේ ජීවිතය ලොකු කරදර එකක්, පාකබලක් ගෙණ ගෙයක් ගානේ හිහමනේ යන්නට ඕනෑ, දින පතා ම එය නො කොලොත් කා බී අවසාන යි, උනුන්ගෙන් කොතරම් ඇණුම් බැණුම් ඇසිය යුතු දැ' යි සිතා බලන්න, අපි ගිහිගෙයි සිටින්නමෝ නම්, අපට මොකවත් හරි හම්බ කර ගෙණ අඹුදරුවනුත් සමග එක් ව කා බී ප්‍රීතියෙන් කල් දවස ගෙවිය හැකි ය, එවිට කිසිවකුගෙන් ඇණුමෙක් බැණුමෙක් නැතැ' යි පැවිද්ද ලොකු කරදරයක් කොට කියා පෑයේ ය, ගිහිකමෙහි අනුසස් කියේ ය, එවිට අනික් මහණ තෙමේ ඔහුගේ මේ කතාව අසා කළකිරී, 'මෙයා හරි මිනිහෙක්, මම සසුනෙහි කලකිරී සිටිමි' යි කී කල්හි මට ගිහිකමේ දෙස් කියා සසුනෙහි අනුසස් කියේ ය, දැන් ගිහිකමේ අනුසස් කියා සසුනෙහි දෙස් කියන්නේ ය, ඒ මොන පුදුමයෙක් ද, මොකද මේ' යි සිතන්නේ, තමන් අයත් සිවුරු පිරිකරට ඇති ආශාවෙන් මෙසේ කියන බව දැන, තම සිත හික්මවා ගත්තේ ය, මොහු මෙසේ කසුප් බුදුරජුන්ගේ කාලයෙහි මහණකු සසුනෙහි උකටලී කළ බැවින් දැන් මොහුට උකටලී බව හට ගත්තේ ය, එදා අවුරුදු විසි දහසක් කළ ඒ මහණකම මොහුට දැන් රහත් වීමට හෙතු වී ය' යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

නැවැත භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! මේ මහණ, කර කැන්ත බෙල්ල තබා ගෙණ සිටියේ ම රහත් වී ය, එමතරම් ඉක්මනට රහත් විය හැකි දැ' යි ඇසූහ. 'ඔව්, මහණෙනි! රහත් විය හැකි යි, වියදීවත් පිණැති භික්ෂුහට පය ඔසවා බිම තබත් ම පය බිම වදින්නට පෙරාතුව ම අර්හත්මාර්ගඥානය ලැබිය හැකි ය, කම්මැලියකුට ඒ ලබ නුබැරි ය, එහෙයින් කම්මැලිකමින් අවුරුදු සියයක් ජීවත් වීමට වඩා වියදී කරන්නකු මොහොතක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ වන්නේ ය, වියදී කරන්නාගේ ජීවත්වීම ම දෙවියන් සහිත ලොකයට හිතකර ය, වැඩ දායක ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

යො ච වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො,
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හනති.

කුසීත වූ වීර්‍යරහිත වූ යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ නමුත් (එයට වඩා) දැඩි කොට වීර්‍ය කරන්නහුගේ එක් දවසේ ජීවිතය උතුම් ය.

යො ච වස්සසතං ජීවෙ = යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ නමුත්.

කුසීතො = අලස වූ.

කුසීත නම්, කාමවිතක්කාදියෙන් මැඩී කල් දවය ගෙවන්නේ ය.

'කුසීතොති කාමවිතක්කාදීහි තීහි විතක්කෙහි විතිනාම-නකපුගගලො' යනු අටුවා ය.[1]

හීනවීරියො = වීර්‍යරහිත වූ. වීර්‍ය නැත්තා වූ.[2]

එකාහං ජීවිතං සෙය්‍යො = එක් දවසක් ජීවත් වීම උතුම් වේ.[3]

විරියං ආරභතො දළ්හං = දැඩි කොට වීර්‍යය කරන්නහුගේ.

ආලම්බනොපනිඩ්‍යාන – ලක්ෂණොපනිඩ්‍යාන යන දෙවැදැරුම් ධ්‍යානයන් ඉපද වීමට සමර්ථ වූ වීර්‍යය කරන්නහු, මෙයින් ගණිත්.

දළ්හං යනු, ක්‍රියා විශෙෂණ යි. නාමවිශෙෂණ – ක්‍රියා විශෙෂණ, යි විශෙෂණ දෙකෙකි. කාරකපදයකට විශෙෂණ වූයේ නාම විශෙෂණ නම්. ක්‍රියාපදයකට විශෙෂණ වූයේ ක්‍රියා විශෙෂණ නම්. ක්‍රියාවිශෙෂණය, බහිඩ-අබහිඩ වශයෙන් දෙ වැදැරුම් ය. සියලු ආලපනය ක්‍රියාවෙන් පිටත්හි බැවින් ක්‍රියාව හා අසම්බන්ධ බැවින් බහිඩක්‍රියාවිශෙෂණ නම්. 'මුදුං, දළ්හං' යනාදි ක්‍රියාවිශෙෂණ ක්‍රියාවෙන් පිටත්හි නො වන බැවින් අබහිඩක්‍රියාවිශෙෂණ නම්. එ ද ප්‍රථමාවිභක්ත්‍යන්තඅබහිඩක්‍රියා විශෙෂණය, විතීයාවිභක්ත්‍යන්ත අබහිඩක්‍රියාවිශෙෂණ, ය යි දෙ පරිදි ය. ක්‍රියාව අකර්මකධාතුවකින් සිද්ධ නම්, ක්‍රියාවිශෙෂණය ප්‍රථමාවිභක්තිය ගණී. 'සුඛං සයති' යනු එයට නිදසුන් ය.

---

1. 1. 6. 'කුසීතං' යනු බලනු
2. 1. 6. 'හිනවීරියං' යනු බලනු.
3. 8. 9. 'එකාහං ජීවිතං සෙය්‍යො' යනු බලනු.

සයති' යන්න සි-සයෙ, යන අකම්ක ධාතුවෙන් සිද්ධ හෙයින් සුඛං' යන ක්‍රියාවිශෙෂණය ප්‍රථමාවිභක්තිය ගත්තේ ය. ආරභතො, යන්න රභ රාභස්සෙ' යන සකම්කධාතුවෙන් සිඩ හෙයින් දළහං' යන ක්‍රියාවිශෙෂණය චිතීයාවිභක්තිය ගත්තේ ය. සද්දසා-රත්ථජාලිනියෙහි එය මෙසේ කීහ:-

'අඛහිඩා දුධා හොති පඨමාදුතියන්තතො,
සකම්මකාය දුතියා අකම්මා පඨමා මතා' යි.

මෙහි ලා ආචාර්‍යමතභෙද ඇත්තේ ය. ශබ්දශාස්ත්‍රීය ග්‍රන්ථ-යන්ගෙන් ඒ දත යුතු ය.

ක්‍රියාවිශෙෂණය, නපුංසකලිඞ්ගිකඑකවචනාන්තැ යි ද ශබ්ද ශාස්ත්‍රයෙහි ලා එය ධාතුවිශෙෂණැ යි ද, ශාසනයෙහි භාවන-පුංස කැ, යි ද කියත්. නිරුක්තිසඞ්ග්‍රහය ඒ මෙසේ කිය යි:-

'ක්‍රියාවිසෙසනං යාව තං සබ්බං හි නපුංසකෙ,
සියා ච එකවචනං යථා භික්ඛු සුඛං ඨිතො.

ක්‍රියාවිසෙසනං සත්ථෙ වුත්තං ධාතුවිසෙසනං,
භාවනපුංසකන්ත්‍ය ච සාසනෙ සමුදීරිතං.'

ක්‍රියාවිශෙෂණ, නපුංසකඑකවචන වූයේ භූ - කර ධාතුන්ගේ අත්ථ සියලු ධාතුන්හි වීද්‍යමාන බැවිනි. 'භූ කරා සබ්බධාත්වත්ථෙසු එව සන්ති' යනු ආප්ත යි.

කම්මැලි ව සියක් අවුරුද්දක් ජීවත් වීමට වඩා වීර්‍යය දැඩි ව කරමින් එක් දවසක් ජීවත් වීම ම උතුම් ය යනු කෙටි අදහස ය ගාථාවේ ඇත්තේ.

සර්‍යදාසස්ථවිරවස්තුව නිමියේ ය.

---

1. 8. 9. 'එකාහං ජීවිතං සෙය්‍යො' යනු බලනු.

පටාචාරාවට සිදු වූ විපත.

8 - 12.

එදා සැවැත් නුවර සතළිස් කෝටියක් ධනය ඇති එක්තරා මහාසිටුකුලයෙක දුවක් වූ ය. ඕ පටාචාරා තොමෝ ය. හැඩහුරු කමින් හා රූසපුවෙන් දකින්නන්ගේ සිත් ඇද ගත්තා ය. දහසය හැවිරිදි වයසට ලඟාවත් ම දුරාචාරයන්ගෙන් වළකනු පිණිස, නොා හැදුනු තරුණයන්ගෙන් රැක ගන්නට මාල්සතකින් යුත් සිවුමැදුරෙහි මතුමාලෙහි ඇ වාසයකර වූහ. එහෙත් ඕ තොමෝ සියගෙයි මෙහෙකරු වූ කොලු ගැටයකු හා පෙම්බැඳ රහසිගත ව ඌ හා ම ලිඛිතසම්බන්ධයෙන් කල් දවස ගෙවූ ය.

මවුපියෝ මේ රහස් හැසුරු ම ගැණ කිසිත් නොා දත්හ. එහෙයින් ඔවුහු, ඇය තම කුලයට හා වසතුවට සරිලන කුලයෙක සිටු තරුණයකුට අඹු කොට දෙන්නට, නැකැත් බලා දවස් නියම කර ගත්හ. මගුල් දවස ඔන්න මෙන්න කියා තිබිය දී පටාචාරා තොමෝ තම සොරයහළුවා ලඟට ගෙන්වා, 'සොඳුර! මා අසුවල් සිටුතරුණයාට අඹු කොට දෙන්නට මවුපියන් නියම කර ගෙණ තිබේ, මා, මවුපියන් නියම කර ගෙණ ඇති ලෙසට ඔහුට අඹු කොට දුන්නොත්, ඔයාට එහි එන්නට වත් ඉඩ නොා ලැබේ, ඒ නිසා මා ගැණ බලාපොරොත්තුවක් තිබේ නම්, අද ම රෑ කැමැති තැනකට ගෙණ යන්නැ' යි කිවූ ය.

එවිට කොලුගැටයා 'හා! මම හෙට පාන්දරින් ම එලිය වැටෙන්නට පෙර අවුත් නුවරගේට්ටුව ලඟ සිටින්නම්, ඔයා කාටත් නොා දැනෙන්නට පාන්දරින් නැගිට එන්නැ' යි කී ය. කොලුගැටයා කතා කර ගත් ලෙසට පසු දා උදැසන එතැනට පැමිණියේ ය. පටාචාරා ද කොයින් දේ සොයා ගත් තැන තැන ඉරීගිය කිලිටි රෙදිමාලු කඩක් ඇඳ, කෙස්ස ලිහා අවුල් කොට බැඳ, ඇඟ දූලි හා ගෙණ, කළයකුත් අතට ගෙණ දැසින් සමඟ ලිදට යන්නියක සේ ගෙන් නික්ම කොලුගැටයා කියූ තැනට ගියා ය. ඌ ඇය ගෙණ ඉතා ඈත පළාතකට ගොස් අප්‍රසිඬ ගමෙක නවාතැන් ගත්තේ ය.

එහි දෙදෙන එක් ව වෙල් කොටමින් සිසාමින් දරපලා විකුණමින් ඉතා දුකසේ දිවි ගෙවූහ. පටාචාරා සියතින් දිය ඇද, වී කොටා, කෑම බීම පිළියෙල කරමින් භිමියා සතප්පන්නී, කල් නොා යවා ම පෙර කළ අකුශලයෙක විපාක විඳින්නට පටන් ගත්තා ය. කල් යත් කුසෑ දරු ගැබෙක් ද හට ගත්තේ ය.

එයින් ඕ වඩාත් දුකට පත් වූ ය. දරු ගැබ ද ක්‍රමයෙන් මුතුරා හිඳේ ය. දරු, බිහිවන්නට ලං වූ විට පටාචාරා තොමෝ, 'අපට මෙහි උපකාර කරන්නෙක් නැත, කොතරම් වරදක් කළත් මවුපියෝ දූ පුතුන් කෙරෙහි ආදරය ඇත්තෝ ය, මොළොක් සිත් ඇත්තෝ ය, ඒ නිසා, මා මාගේ මවුපියන් වෙතට ඇරලන්න, එහි දී ගැබ්බරින් සැහැල්ලු වෙමි' යි කිවු ය. එවිට ඒ පුරුෂ තෙමේ 'සොඳුරි! කුමක් කියහි ද, මා එහි ගියොත් ඔයාගේ මවුපියන් මා දෙපලු කරණු ඇත, මා අල්ලා හැම වධබන්ධනයක් ම කරණු එකාන්ත ය, එහෙයින් මට එහි යනු නොහැකි' යි ගමන වැළකුයේ ය.

පටාචාරාව තවත් කිහිපවරක් මවුපියන් වෙත යන්නට කීව ද, ඔහු එය වැළකුයේ ය. දිනක් තම හිමියා දරපලා පිණිස වනයට ගිය කල්හි, 'අපේ එක්කෙනා මා නොදුක, කොයි ගියා දූ යි ඇසුවොත්, මා, මවුපියන් වෙත ගිය බව කියන්නා' යි අසල ගෙවල වැස්සන්ට කියා දෙර අටවා බැඳ තබා, එතැනින් නික්ම ගියා ය වනයෙන් දරපලා ගෙණ පෙරළා ආ සවාමිපුරුෂ තෙමේ ඇය නොදුක අටවා තුබූ දෙර හැර බලා, අසල්වැස්සන් විචාරා දුන, ඇය ලුහුබැඳ දිවි ය. දුව ගොස් ඇය නවතා, 'ගෙදර නොයව' යි නොයෙක් ලෙසින් කියා සිටියේ ය ඒ අතර ම විලි පහරන්නට වි ය. ඕ ගසක් යටට ඇදී හඬමින් මොර දෙමින් බිම පෙරළි පෙරළී පස් කටින් ගණිමින් දරුවකු වැදූ ය. ගෙට යෑමේ බලාපොරොත්තු ව අතර මග දී සිදු වූ බැවින් දෙ දෙන මා දරුන් ගෙණ පෙර විසූ තැනට ම පැමිණියහ.

එයින් ටික දවසක්, ගිය තැන තව දරුගැබෙක් හට ගත්තේ ය. ඒ වරද වදන්නට ගෙදර යන්නට අවසර ඉල්ලා නොලැබුනු බැවින් සවාමිපුරුෂයා ගෙයි නැති වේලාවක් බලා දරුන් වඩා ගෙණ මග බැස ගෙදර බලා ගියා ය සවාමිපුරුෂයාත් පළමු සේ ලුහුබැඳ ගොස් ගමන වළකා ලන්නට කරුණු කී ය. මේ අතර ඔවුන් මග සිටිය දී මහවැස්සෙක් වයින්නට වන. මුළු අහස විදුලි එලියෙන් ඇවිළ ගත්තා සේ විය. විදුලි කෙටුමෙන් මුළු පොළොව දෙදරන්නට වන. ඒ වේලෙහි බඩරුදු හටගෙණ විලි පහරන්නට වි ය. එවිට ඕතොමෝ 'හිමියා! හිමියා! බඩ රිදෙයි, ඉවසනු නොහැකි ය, නොතෙමෙන තැනක් සොයා කියන්නා' යි මොර දුන්නී ය.

ස්වාමිපුත්‍ර තෙමේ ඔබිනොබ බලා අත තුබූ පොරොවෙන් තුඹසක් මත තුබූ වනරොදක් කපා පිළියෙල කරන්නේ, තුඹසෙහි හුන් නයකු විසින් දෂ්ට කරණ ලද්දේ, මුළු සිරුර විෂ පැතිරී එ තැන ම මැරී වැටුනේ ය. පටාචාරා ව මහදුක් විඳිමින් හිමියා එනු බලා සිටින්නී, තවත් පුතකු වැදූ ය. දරු දෙදෙන, වැසි සුළං ඉවසනු නො හැකි ව මහහඬින් හඬන්නට වූහ. ඒ වර ඇය දරු දෙදෙනා බඩතුරෙහි තුරුල් කොට දෙ දණත් දෙ වැලමිටත් බිම ඔබා රාත්‍රිය ගෙවූ ය. ඇයගේ සිරුර සුදු මැලි විය. පාන් වූ සැටියේ ම උපන් ලේවන් වූ මස්වැදැල්ලක් සේ සිටි ඒ පුතු උකුලට ගෙණ අනිකාගේ ඇඟිල්ල අල්ලා ගෙණ, හිමියා සොයන්නට හිමියා ගිය අතට ගියා ය. එසේ යන්නී, තුඹස මත මැරී වැටී තුබූ හිමියාගේ ලේ පැහැති තද සිරුර දැක, 'අය්යෝ! මා නිසා මාගේ හිමියා මග මළේ ය' යි හඬමින් දරු දෙදෙනාත් ගෙණ මග බැස ගියා ය.

එදා මුළු රැය වැස්සා වූ වැසි දියෙන් අචිරවතී ගඟ තන පමණට පිරී ඉතිරී තුබුනේ ය. මඟ බැස යන ඇය ඉදිරියෙහි තුබූ ඒ ගඟ දැක ඉන් එතෙර වන්නට අපොහොසත් වූවා, වැඩිමහල් පුතු මෙ ගොඩ සිටුවා බාලපුතුත් ගෙණ ගඟෙන් එ ගොඩ වී ඒ දරු එහි කොළඅතු කඩා දමා, ඒ මත නිදි කරවා, වැඩිමහල් පුතු ගෙණෙන්නට නැවැතත් ගඟට බැස්සා ය. බාලපුතු කෙරෙහි වූ නො ඉවසිල්ලෙන් වරින් වර පිටිපස බල බලා යන්නී, ගඟ මැද දී අහස යන උකුස්සෙක් ගංඉවුරෙහි කොළඅතු මත නිදා හුන් ලේ කැටි දරු දැක, මස්වැදැල්ලෙකැ, යි සිතා, එ තැනට පාත් විය. ඕ තොමෝ ඒ දැක, දැත ඔසොවා, 'සූ සූ' යි තෙවරක් මහහඬින් කෑ ගැසූ ය. අහස ඉතා දුර සිට උකුසු තෙමේ ඒ නො සලකා බිමට බැස, ලදරුවා ඩැහැ ගෙණ අහසට නැංගේ ය. මෙගොඩ සිටි වැඩිමාල් පුතු ද මවු ගඟ මැද සිට, දෙ අත ඔසොවා, මහ හඬින් කෑ ගසන බව දැක, තමන්ට කතා කරන්නී ය, යි සිතා දුවැවිත් ගඟට බැස්සේ ය. කිසිත් හසරක් නො දත් ඒ කුඩා දරු ජල-වෙගයට හසුව දියෙහි ගැලී ගියේ ය.

එ කල ඕ තොමෝ 'අනේ! මාගේ එක් පුතෙක් උකුස්සකු විසින් ගෙණ යන ලද්දේ ය, එකෙක් දියෙහි ගැලී ගියේ ය, මාගේ හිමියා අතර මග මළේය, අනේ දෙයියනේ! මේ විපත කාට කියම් ද, මම තනි වීමි, කොයි යෙම් ද, කුමක් කරම් ද, අනේ! මට දෙය්යන්ගේ පිහිට ය, මට පිහිට වන්නට වෙනෙකෙක් නැත, දෙය්යනේ! මා රැක ගන්න, මා බලා ගන්න, මට පිහිට වන්න, කෝ හෙවනක්, කෝ කෑමෙක්, කෝ

ඇඳුමෙක්, කෝ ඉණකඩෙක්, මොකද මේ මට වුනේ, මොක ද මේ විපත, මොකක් ද මේ විපාක ය, මොකක් ද පාප ය, මොකක් ද කරුමය' යි කියමින් හඬමින් මග යන්නී, සැවැත්නුවරින් එන මිනිසකු දැක ඔහුට ලං ව, 'කොහි සිට එවූ දැ' යි ඇසූ ය. 'අම්මේ! මම සැවැත්නුවර සිට එමි' යි ඔහු කී ය. 'සැවැත්නුවර මා දන්නා හඳුනන පවුලක් අසුවල් කඩපලට නො දුරෙහි ඇත, ඒ පවුල ගැණ තමුසේ දන්නහු දැ' යි ඇසූ විට, 'ඔව්, මම ඒ පවුල හොඳට හඳුනමි, ඒ ගැණ කිසිවක් ඇසිය යුතු නො වේ, අතිකක් ගැණ දැන ගන්නට වුවමනා නම්, ඒ අසව' යි මගියා කීයේ ය. 'මට වුවමනා ඒ ගෙදර ගැණ ම දැන ගැණීම ය, අනෙකකින් මට වැඩෙක් නැත, කරුණා කර එහි තොරතුරු කියන්නැ' යි ඕ තොමෝ මගියාට බල කළා ය.

එවිට ඒ මගී පුරුෂ තෙමේ 'අම්මා බල කර කර අසන නිසා කියනු මිසක්, ඒ ගැණ යමක් කියන්නට මා කැමැති නැත, ඊයේ මුළු රැය ම වැසිවටබව අම්මා දන්නවා, නො වේ දැ' යි ඇසී ය. 'ඔව්, දනිමි, ඊයේ වැසි වැස්සේ මට ය, අනෙකෙකුට නො වේ, මා හඳුනන ඒ සිටුගෙදර තොරතුරු කියන්නැ' යි ඕ තොමෝ නැවතත් කිවු ය. එවිට ඔහු 'ඊයේ වැහි වහිද්දී සිටානන්ගේ ගෙය සහමුලින් බිඳ වැටුනේ ය, ගෙයි තුබූ සියලු දේ විනාශ වී ගියේ ය, මොකවත් ඉතිරි වූයේ නැත, සිටු, සිටුඅඹු, සිටුපුත් යන තිදෙන ම ගෙට යටවී මළහ, අද ඒ මළ සිරුරු තුන එක් ම සැයෙක ලා දවන්නාහ. අර පෙනෙන්නේ ඒ සැයෙන් නගින දුම ය, යි කියත් ම ඇය ඇඳ සිටි රෙදිමාල්ල ඉණෙන් ගිලිහී වැටුනේ ය. ඕ තොමෝ ඒ නො දැන නිර්ඝාත්‍ර ව සීසන් නැති ව

'දෙපුත් කලුරිය කළෝ – මළේ මග මාගේ හිමි,
තිදෙන මවුපිය සොහොයුරු – දැවෙත් දැන් එක සැයේ.
දෙපුත් කලුරිය කළෝ – මළේ මග මාගේ හිමි,
තිදෙන මවුපිය සොහොයුරු – දැවෙත් දැන් එක සැයේ'

යි මෙසේ කියමින් හඬමින් වැලපෙමින් තැන තැන ඇවිදින්නී ය. මිනිසුන් ඇය දැක පිස්සියකැ යි කියා කුණුකසළ හිස දමන්නට පස්වැලි ඇඟ ලන්නට ගල්මුල්වලින් පහර දෙන්න්ට පටන් ගත්හ.

දිනෙක බුදුරජානන් වහන්සේ පිරිස් මැද ධර්මාසනාරූඪ වී දහම් දෙසන සේක්, ඉදිරියෙහි එන ඇය දුටු සේක. එසේ ම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පිරූ පැරුම් ඇත්තියකැ, යි ද උන්-වහන්සේට පෙනී ගියේ ය.

පියුමතුරා බුදුරජානන් වහන්සේ තමන් වහන්සේගේ ශාසනයෙහි එක් සථවිරාවක්, දෙයතින් ඔසොවා නදුන් වනයෙහි තබන්නහු සේ එතදග්‍රසථානයෙහි තැබූ සේක. එදා ඒ දුටු මෝ තොමෝ, කවදා නමුත් මමත් ඔබ වහන්සේ වැනි බුදු කෙනකුන් වෙත දී විනයධරසථවිරාවන් අතුරෙහි අගතැන් පත් වන්නෙමි' යි පැතූහ. එවිට බුදුරජානන් වහන්සේ ඉදිරියෙහි වන දැ බලන නුවණ මෙහෙයා බලා මෑගේ මේ පැතීම, මුදුන් පැමිණෙන බව දැක ඒ පිරිස් මැද දී ම, මෝ තොමෝ මතු එන කාලයෙහි ගෞතම බුදුරජුන්ගේ ශාසනයෙහි පටාචාරා යන නම් ලබා විනයධර සථවිරාවන් අතර මුල්තැනට පත්වන්නී ය' යි වදාළ සේක.

පියුමතුරා බුදුරජුන් ඉදිරියෙහි එදා මෑ කළ මේ පැතුම දුටු අපගේ සවාමි දරු වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ, මෑට පිහිට වන්නට මා හැර අනෙකෙක් මෙලොව කොතැනෙකත් නැත, එහෙයින් මා ම, මෑට පිහිට විය යුතු ය' යි විහාරයට එන ලෙස ඉටු සේක. ධම්ශාලාවෙහි බණ අසමින් හුන් පිරිස ඇය දැක, 'මේ අර තැන තැන ඇවිදින පිස්සි, මෑට මෙහි ඇතුල් වන්නට ඉඩ නොදිය යුතු ය' යි නැගි සිටි කල්හි, බුදුරජානන් වහන්සේ, 'මෙහි එන්නට ඉඩ හරින්න, මෑගේ මෙහි ඊම නොවළකාලිය යුතු ය, මෙහි එන්නට ඉඩ හැරිය යුතු ය' යි වදාරා ලඟට ආ කල්හි, 'සහෝදරිය! සිහිය ලබව' යි වදාළ සේක.

එ කෙණෙහි ම ඕතොමෝ සිහිය ලැබූ ය. ඒ වේලෙහි ඉණ ඇද තුබූ රෙදිකඩ කඩා වැටී ඇති බව, දැක විලිබිය ඇත්තී, එ තැන ම බිම දණ ගැසුවා ය. එවිට එහි සිටි පුරුෂයෙක් තමන් එකස් කොට තුබූ උතුරුසළුව ඈ ඉදිරියට විසි කෙළේ ය. එය ඉණ දවටා ගත් පටාචාරා තොමෝ බුදුරජුන් ඉදිරියට ගොස් රන්වන් සිරිපා මත හිස තබා වඳිමින්, 'සවාමිනි! මට පිහිට වන්න, පිහිට වන්න, මට පිහිට වන්නට ඔබ වහන්සේ හැර වෙනෙකෙක් නැත, එහෙයින් මට පිහිට වන්න, මා හැර දමන්න එපා, මාගේ එක පුතකු උකුස්සෙක් ගෙණ ගියේය, එකෙක් ගඟේ වැටී මළේ ය, මාගේ ස්වාමියා අතර මග දී මළේ ය, අම්මා, තාත්තා, අග්‍රයා යන තිදෙන ගෙය කඩා වැටී ගෙට යට වී මළහ, ඒ තිදෙන එක් ම දරසැගේ දුවුනාහ, සවාමිනි! මා බේරා ගන්න, මා පිට මං නොකරන්නැ' යි කියා සිටියා ය.

බුදුරජාණන් වහන්සේ ඇගේ මේ බැගෑපත් කතා ව අසා, 'පටාචාරාව! අමුත්තක් නොසිත ව, තෝ පැමිණියෙහි, තට පිහිට වන්නට පොහොසතා වෙත ය, ඒ නිසා බිය නොවව, සැනසෙව, තට මම පිහිට වෙමි, තා කියූ සියල්ල මම පිළිගණිමි, තීගේ එක් පුතෙක් උකුස්සකු විසින් ගෙණ යන ලද ය, එකෙක් ගගේ වැටී මැරුණේ ය, හිමියා අතර මග දී මලේ ය, අම්මා, තාත්තා, අය්යා යන තිදෙන ගෙට යට වී මලහ, මෙය හොඳින් සිතට ගණුව, දැන් තාගේ ඇස් වලින් කඳුලු කඩා වැටේ, එහි ප්‍රමාණයෙක් ද නැත, හොඳට සිහියට ගන්න, මේ ලෙසින් සසර ඉපිද මැරි මැරී එන තාගේ ඇස් වලින් දූපුත් ආදීන් නිසා කඩා හැලුනු කඳුලු සිවු සයුරෙහි දියකඳට වඩා ඉතා විශාල ය' යි වදාරා,

'සිවු සයුරෙහි ඇති-දියකඳ ඉතා විකම ය,
දුකින් පැහැසුනු මිනිසැස්-දෙකින් ගිලිහුනු ලසොවින්.

කඳුලු ම ඉතා බෝ-සයුරෙහි දියට වැඩියෙන්,
යාළුව! මෙසේ ඇතිකල – කුමකට ඔබ පමා වහු?'

යි මෙ ද වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ **අනමතග්ගසමියායසුත්තය** මෙසේ වදාරන කල්හි ඇයගේ ශොකය තුනී වී ගියේ ය. ඒ බව දන් උන්වහන්සේ, 'පටාචාරා! අසත්න! පරලොව යන කිසිවක් හටත් කිසි අතකින් පිහිට වන්නට ඔහුගේ දූ පුත්තු මවුපියෝ නැ මිතුරෝ සමර්ථ නොවෙති, දිවි ඇති ව සිටියෝ ද, ඔවුහු තමාට අයත් නොවෙති, ඒ නිසා නුවණැත්තහු මිසින් ශීල-සමාදානයෙහි පිහිටා සිල් පිරිසිදු කොට වහා ම නිවනට යන මග පිරිසිදු කර ගත යුතු ය' යි දක් වන්නට,

'න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා,
අන්තකෙනාභිපන්නස්ස නත්ථි ඤාතීසු තාණතා.

එතමත්ථවසං ඤත්වා පණ්ඩිතෝ සීලසංවුතෝ,
නිබ්බානගමනං මග්ගං ඛිපමෙව විසොධයේ'

යනු වදාළ සේක.

මේ දෙශනාව අවසානයෙහි පටාචාරාව පොළොව වැලි පමණ කෙලෙස් දවා හැර සෝවන් වූ ය. එහි සිටි අන් බොහෝ දෙන ද සෝවන් පලාදියට පැමිණියහ. එ කෙණෙහි පටාචාරා තොමෝ බුදුරජුන් ගෙන් පැවිද්ද ඉල්ලූ ය. උන්වහන්සේ ඇය මෙහෙණවරට යවා පැවිදි කර වූහ. උපසපන් වූ ඕතොමෝ පටිතාචාර ඇති බැවින් **පටාචාරා** යි ප්‍රසිඛ වූ ය.

දිනෙක, ඕ කළයට දිය ගෙණ පා සෝදන්නී, ඒ දිය, පොළොවෙහි ටික තැනක් ගලා ගොස් නැවැතුනු බව දැක, දෙවන වරත් දිය ගෙණ පා සේදුවා ය. ඒ දිය, පළමු දිය ගලා ගොස් නැවැතුනු තැන ඉක්මවා දුර ගොස්, පොළොවට කා වැදුනේ ය. තෙවන වර පා සේදූ ජලය දෙවන වරටත් වඩා දුර ගොස්, පොළොව ගිලුනේ ය. මේ දුටු ඕ තොමෝ එය ම අරමුණු කොට තුන් වයස පිරිසිඳ, 'පළමුවර පා සේදූ දිය වැඩිදුරක් ගලා නො ගියා සේ මේ ලොකවාසී සත්ත්වයෝ ප්‍රථම වයසෙහි ද මියෙන්නාහ, දෙවන වර පා සේදූ දිය, එයට වඩා දුර ගලා ගියා සේ, මධ්‍යමවයසෙහි ද මියෙන්නාහ, තෙවන වර දිය, දෙවන දිය තැන් ඉක්මවා දුර ගියා සේ පශ්චිමවයසෙහි ද මියෙන්නාහ' යි සිතට නැගූ ය.

ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ ගඳකිළියෙහි වැඩ හුන් සේක්, ආලොකයක් ඇති කොට ඇය ඉදිරියෙහි සිට වදාරන්නාක්හු සේ 'ඔව්! පටාචාරා! පටාචාරාවගේ කල්පනාව හරි, මේ ලොකයෙහි සත්ත්වයකු මැරෙණකාලය නියම කොට නො කියැකි ය, පංචස්කන්ධය දෙවියකු විසින් බ්‍රහ්මයකු විසින් ඊශ්වරයකු විසින් වෙන අන් කිසිවකු විසින් මැවූවෙක් නො වේ, එහෙයින් පංචස්කන්ධයේ ඉපැන්ම හා නැසුම ගැණ නියමයක් නො කළැකි ය, තාගේ කල්පනාව ඉතා ම හරි, සුදුසු යි කල්පනාව, මෙසේ පංචස්කන්ධයෙහි ඉපදීම හා විනාශවීම ගැණ නො සිතා නො සලකා අවුරුදු සියයක් ජීවත්වීමට වඩා, පංචස්කන්ධයෙහි හටගැන්ම හා විනාශය දකිමින්, එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ ය' යි අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයන්ති.

යමෙක් (පංචස්කන්ධයෙහි) උත්පත්තිය හා විනාශය නො දක්නේ අවුරුදු සියයක් ජීවත් වන්නේ ද, (ඒ ජීවත්වීමට වඩා) උත්පත්තිය හා විනාශය දක්නහුගේ එක් දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ වේ.

යො ච වස්සසතං ජීවෙ = යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද.

අපස්සං උදයව්‍යයං = උත්පත්තිය හා විනාශය නො දක්නේ. නො දකිමින්.

මෙහි 'උදයව්‍යයඤාණදර්‍ශනයෙන් තොර වූ' යනු අරුත් ය. 'අපස්සං' යන්න යො' යන්නට විශෙෂණ කොට 'නො දක්නා වූ යමෙක්' යි අරුත් ගත ද වරද නැත්තේ ය.

එහි, උත්පත්තිස්වභාව ය – උත්පාද ය – අභිනවාකාර ය **උදය** නම්. විපරීතස්වභාව ය – බිඳීයෑම **ව්‍යය** නම් **නිබ්බත්ති ලක්ඛණං ජාති උප්පාදෙ අභිනවාකාරො උදයො නාම, විපරිණාමලක්ඛණං ඛයො භඞ්ගො වයො නාම'** යනු අටුවා ය. කොටින් කියතොත් උදය නම්, පංචස්කන්ධයෙහි හටගැන්මැ'යි ද ව්‍යය නම්, පංචස්කන්ධයෙහි 'බිඳීයෑමැ' යි ද කිය හැකි ය.

උදයසඞ්ඛ්‍යාතපංචස්කන්ධයෙහි හටගැන්ම පස්විසි අයුරකින් හා ව්‍යයසඞ්ඛ්‍යාතපංචස්කන්ධයෙහි බිඳීයෑම පස්විසි අයුරකින් දත යුතු ය. රූපස්කන්ධය, අවිද්‍යා – තෘෂ්ණා – කර්ම – ආහාර යන හෙතුන් නිසා හට ගන්නේ ය, යි සිවු අයුරකින් දැක්ම හා, රූපස්කන්ධයෙහි නිබ්බත්තිලක්ෂණය දැකීම හා යන, පස්වැදැරුම් දැකීම, රූපස්කන්ධයෙහි උදය දැකීම වේ. ඉතිරි, වෙදනා-සංඥා-සංස්කාර-විඥාන යන සකන්ධ සතර ද, පෙර කී පස් අයුරින් බැලීම, ඒ ඒ සකන්ධයන්හි උදය දැකීම වේ.

අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ආහාර යන මොවුන්ගේ නිරොධය හා විපරිණාමලක්ෂණයත් එක් එක් සකන්ධයෙක්හි ලා දැකීම විනාශය දැකීම වේ.

මෙසේ එක් සකන්ධයෙක්හි උදය, පස් අයුරකින් හා ව්‍යය, පස් අයුරකින් දැ යි දස අයුරකින් උදයව්‍යයදර්ශනය වන්නේ පංචස්කන්ධයෙහි සමපනස් අයුරු වන්නේ ය.

එකාහං ජීවිතං සෙය්‍යො = එක් දවසක් ජීවත්වීම උතුම් වේ.

පස්සතො උදයව්‍යයං = උදයව්‍යය දක්නහුගේ. උදයව්‍යයදර්ශන ඥානයෙන් ඥානවත් වූවහුගේ.

පංචස්කන්ධයෙහි ඉපදීම හා විනාශය නො දක්නහුගේ අවුරුදු සියයක් ජීවත්වීමට වඩා උදයව්‍යයදර්ශනඥානයෙන් යුක්තවූවහුගේ එක් දවසක් ජීවත්වීම උතුම් වේ.

'යතො යතො සම්මසති ඛන්ධානං උදව්‍යයං,
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං'

යමෙක් යම් කලෙක රූප-වෙදනා-සංඥා – සස්කාර – විඥාන යන පංචස්කන්ධයෙහි උදයය හා ව්‍යය ය සලකා ද, නුවණින් දකී ද, එකල්හි ඔහු යම් බලගතු සතුටක් ලබා ද, එය ඔහුට අමෘතය වේ. නිවනට පමුණු වන මාර්ගය වේ.

මේ ධර්මදෙශනාවගේ අවසානයෙහි පටාචාරා තොමෝ පිළිසැඹියාවන් ලබා රහත් වූ ය.

පටාචාරාස්ථවිරාවස්තුව නිමියේ ය.

කිසාගොතමියගේ පුණ්‍යබලය.

8 - 13

එදා සැවැත්නුවර සිටුගෙයක රුස් කොට තුබූ සතළිස් කෙළක් ධනය නිකමට අහුරා වී ගියේ ය. සිටු තෙමේ ඒ දුක මහත් ශොකයෙන් කිසිවකුත් නොකා, ඇඳට නැඟී නිදා ගත්තේ ය. මේ බව ඇසූ ඔහුගේ යහළුවෙක් වහා එහි ගොස්, ඇඳට ලං වී 'යහළුව! මේ ගැණ කණගාටු නොවන්න, ඔකත් මහකප්පක් ද, මම එයට උපායයක් කියන්නම්, ඒ කරන්නැ' යි කී ය. සිටු 'ඒ කිමැ' යි ඇසූ කල්හි, 'තමුසේ කඩපිලෙහි පැදුරක් එලා, ඒ අහුරා ගෙණවුත් එහි ගොඩ ගසා තබා, අහුරා විකුණන්නකුසේ එතැන ඉන්න, එහි ආ යම් කෙනෙක් 'රටේ අත් මිනිස්සු විකුණන්නෝ රෙදි තෙල් මී උක් හකුරු දුරු මිරිස් ලුණු ලුනු පොල් දෙල් කොස් ආදිය හා පිළිඝෙල කළ කැම් බීම ය, තමුසේ අහුරා විකුණන්නහු ය' යි කියත් ද, එවිට ඔවුන්ට තමන් අත තිබෙන දේ හැර අන් කුමක් විකුණම් ද' යි කියන්න, යමෙක් පැමිණ, වෙන මිනිස්සු රෙදි තෙල් මී ආදිය විකුණති, තමුසේ රන්රිදී විකුණන්නහු' යි කියා ද, එවිට රන් රිදී කොහි ද' යි ඔහුගෙන් අසන්න, මේ තිබෙන්නේ රන් රිදී නො වේ ද' යි කී කල්හි, 'එය ගෙණෙන්නැ' යි ඔහු ලවා ම ගෙන්වා ගෙණ, අනින් ගන්න, මෙසේ දෙන ලද්දා තාගේ අතේ දී රන්රිදී වූයේ නම්, ඒ දුන් තැනැත්තිය තරුණියක් නම්, ඇය තමුසේගේ පුතුට අඹු කොට දී, සතළිස් කෙළක් පමණ වූ මේ ධනයත් ඇයට පාවා දෙන්න, ඇය දුන් දෙයකින් ඔබත් ප්‍රයොජන ගන්න, නැත, දුන් තැනැත්තා තරුණයෙක් නම්, තමුසේගේ දුව ඔහුට අඹු කොට දෙන්න, මේ මුදලුත් ඔහුට පාවා දී, ඔහු දෙන දෙයකින් ඔබත් දිවි ගෙවන්නැ' යි යහළු මිනිසා කීයේ ය.

සිටු තෙමේ 'යහපතැ' යි තම කඩපිළට ඒ අහුරා ගෙන්වා ඇළුවා කී ලෙසට ගොඩ ගසා තබා, තමාත් අහුරා විකුණන්නකු සේ එ තැන වාඩි වී හුන්නේ ය. යම් කෙනකු එහි පැමිණ, 'රටේ මිනිස්සු රෙදි තෙල් ආදිය විකුණති, තමුසේ අහුරා විකුණන්නහු ය, මොකද මේ' යි ඇසූ විට, 'මා ලඟ තිබෙන දෙය නො විකුණා වෙන කුමක් විකුණම් ද' යි සිටු තෙමේ අසන්නේ ය. මේ වේලෙහි කෙට්ටු සිරුරක් ඇති බැවින් **කිසාගොතමී** යි ප්‍රසිද්ධ වූ එක් දුප්පත් තරුණියක් කඩපිළට ගියා, අහුරාගොඩ ලඟ හුන් සිටානන් දැක, 'පියේ! මොකද මේ, වෙන අය රෙදි තෙල් ආදිය විකුණත්, ඔබ විකුණන්නහු රන්රිදී ය, මොකද මේ' යි ඇසූ ය.

කෝ, දුව! රන්රිදී?' යි සිටු විචාළේ ය. 'පියානෙනි! ඔබ රන්රිදී, ලඟ තබා ගෙණ, රන්රිදී කොයි දූ, යි මගෙන් අසන්නහු ය, මේ මහාපුදුමයෙකැ' යි ඕතොමෝ කිවූ ය. 'දුව! එසේ නම් රන්රිදී ගෙණෙන්නැ' යි සිටානන් කී කල්හි ඈ අත පුරා රන්රිදී ගෙණවුත් සිටානන්ගේ අත තැබූ ය. ඒ තැබූ සියල්ල ම රන්රිදී වි ය. සිටු තෙමේ 'තීගේ ගෙදර කොහි දූ' යි ඇසී ය. 'අසවල් තැනැ' යි ඕ පිළිතුරු දුන්නී ය. ඇයගේ ඒ පිළිතුරෙන් ම සිටු තෙමේ ඇය දීග නො ගිය බව දැන, ධනය තැන්පත් කොට තබා, ඇයගේ ගෙට ගොස් තම පුතුට ඇය අඹු කොට දෙන්නට, දෙමවුපියන් හා කතා කොට නියම කර ගත්තේ, නියම දිනයෙහි ඇය තම පුතුට අඹු කොට දී සතළිස් කෙළක් ධනයත් ඇයට භාර කෙළේ ය.

ඉන් ටික දවසකට පසු, ඇයගේ කුසෙහි දරුගැබෙක් හට ගත්තේ ය. දස මසක් ගෙවා ඕ තොමෝ පුතකු වැදූ ය. යන්තමට පය ඔසොවන්නට හැකිවත් ම දරු තෙමේ කලුරිය කළේ ය. ගෞතමිය, මින් පෙර කවදාත් මළ එකකු නො දුටු බැවින් මළකුණ දවන්නට ගෙණ යන්නවුන් වළකා, 'මාගේ පුතුට බෙහෙතක් අසා දැන කරමි' යි මළසිරුර අකැයෙහි රුවා ගෙණ 'මාගේ පුතුට බෙහෙතක් කරන්නට දන්නෝ වෙත් දූ' යි අසමින් ගෙයක් ගානේ ඇවිදින්නට වූ ය. එවිට මිනිස්සු 'දුව! මළපුතුට බෙහෙත් අසමින් ඇවිදින්නී පිස්සු දූ' යි ඇසූහ. එහෙත් 'මළපුතුට බෙහෙත් කරන්නට වෙදකු සොයා ගණිමි' යි ඕ රට ගම පුරා ඇවිද්දා ය. එකල උගත් මිනිසෙක් ඇය දැක 'මේ මළදරු මැයගේ කුලුඳුළේ පුතු විය යුතු ය, මෙයට පෙර මෑ මළවුන් නො දුටුවා ද විය හැකි ය, ඒ නිසා මෑට මා පිහිට විය යුතු ය' යි 'දුව! මම නම් බෙහෙත් නො දනිමි, වෙදෙක් නො වෙමි, එහෙත් වෙදකු ගැණ මම දනිමි, වුවමනා නම් කිය හැකි' යි කීයේ ය.

එවිට ගෞතමී තොමෝ, 'කවුද ඒ, කො තැන ද ඉන්නේ?' යි ඇසූ ය. 'දුව! බුදුරජානන් වහන්සේ ඒ වෙදා, උන්වහන්සේ වෙත ගොස් බෙහෙත් අසා ගන්නැ' යි ඒ උගත් පුරුෂ තෙමේ කී ය. 'හොඳ යි, පින් සිදු වේවා, මම එහි ගොස් බෙහෙතක් අසා ගණිමි' යි බුදුරජුන් වෙත ගොස් වැඳ පසෙකට වී, 'ස්වාමීනි! බුදුරජානන් වහන්සේ මාගේ පුතුට බෙහෙතක් කියන්නට දන්නා සේක් දූ?' යි ඇසූවිට, උන්වහන්සේ, 'ඔව් දනිමි, යි වදාළ සේක. 'එයට වුවමනා කුමක් දූ' යි ඕ ඇසූය. 'යමකුගේ ගෙයි මෙයට පෙර කවදාත් පුතෙක් නො මළේ ද, දුවක් නො මළා ද, එබඳු දූපුතුන් නො මළ ගෙයකින් ඇඟිලිතුඩු දෙකට ගත හැකි පමණ අබටිකක් සොයා ගෙණෙව' යි වදාළ සේක.

හොඳ යි! සවාමිනි! මම සොයා ගෙණ එමි' යි බුදුරජුන් වැඳ පුතුත් ගෙණ එතැනින් නික්ම ගමට ගොස් ගෙයක දොරකඩ සිට මාගේ පුතුට බෙහෙතක් පිණිස අබවීකක් ගන්නට නිබේ දැ' යි ඇසූ ය. ගෙදර අය 'නිබේ ය' යි අබ ගෙණවුත් දෙන විට, 'මේ ගෙයි මෙයට පෙර දූ පුත් ආදි කෙනෙක් මලෝ දැ' යි ඇසූ ය, 'දුව! කුමක් කියහි? ජීවත් වන්නෝ ටික දෙනෙක් ම ය, මළාහු ම බොහෝ ය' යි ගෙයි වැස්සෝ කිහ. 'හා! එහෙම ද, එසේ නම් මේ අබ වුවමනා නැත, මෙන්න! අර ගෙණ තබන්න, මේ අබ බෙහෙතට නො සුදුසු ය' යි පෙරළා දුන්නි ය.

ඈ මේ ලෙසින් මුල සිට ගෙයක් ගානේ යමින් අබ සොයමින් මුළු ගමෙහි ම ඇවිද්දු ය. නො මළ ගෙයක් සොයා ගත නො හැකි ව අබ නො ගෙණ සවස 'අනේ' මේ මොන පුදුමයෙක් ද, සිතූයේ මාගේ පුතු පමණක් ම මළේ ය කියා ය, ගමේ හැම ගෙයක ම ජීවත් වන්නන්ට වඩා මළ අය ම ඉතා බොහෝ ය' යි ඕතීමෙන් පුත්‍රස්නේහයෙන් මොළොක් ව තුබූ ඇයගේ සිත තදබද ව ගියේ ය. එකල ඕ තොමෝ පුතු කැලයෙහි දමා බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක සිටියා ය. බුදුරජුනන් වහන්සේ 'අබ ගෙණාවාදැ' යි ඇයගෙන් ඇසූහ. 'සවාමිනි! නො ගෙණාවෙමි, මුළු ගම ඇවිද සොයා බැලීමි, එහි ජීවත් ව සිටින්නන්ට වඩා මළ අය ම ඉතා බොහෝ ය' යි ඕ තොමෝ කිවුය. 'නී මෙතෙක් මාගේ පුතු ම මළේ ය යි සිතූයෙහි ය, ඒ වැරදි ය, මරණය සියලු දෙනාට සාධාරණ ය, මාර තෙමේ මිනිසුන්ගේ අදහස් සම්පූර්ණ වන්නට පෙරාතුව ම ඔවුන් මහත් සැඩපහරක් මෙන් ඇද ගෙණ යන්නේ ම බොහෝ සෙයින් අපාය නැමැති සමුද්‍රයෙහි හෙලන්නේය' යි වදාරා,

'තං පුත්තපසුසම්මත්තං බ්‍යාසත්තමනසං නරං,
සුත්තං ගාමං මහොඝෝව මච්චු ආදාය ගච්ඡති.'

යන මේ ගාථාව වදාළ සේක. පුත් ගොන් මිලුන් ආදීන් නිසා මත් වූ රත් රිදී ආදියෙහි හා රූපාදිපංචකාමයෙහි ඇලුනු සිත් ඇති මිනිසා නිදිහත් ගම්වැසි මිනිසුන් මුහුදට ඇද ගෙණ යන මහත් සැඩපහරක් සේ මාර තෙමේ ඇද ගෙණ යන්නේ ය.

මේ දෙශනාවසානයෙහි ගෞතමී තොමෝ සෝවත් වූවා ය. අන් බොහෝ දෙන ද එහිදී තමතම නැණ පමණින් සෝවත් ඵලාඥදිට පැමිණියහ. සෝවත් ඵලයට පැමිණි ගෞතමී තොමෝ

බුදුරජුන්ගෙන් මහණකම ඉල්ලූ ය. බුදුරජානන් වහන්සේ ඇය මෙහෙණවරට යවා පැවිදි කරවූ සේක. ලැබූ උපසම්පදාද ඇති ඕ තොමෝ 'කෘශාගෞතමීස්ථවිරා' යි ප්‍රසිද්ධ වූ ය.

වත් කිරීමෙහි වාරය පැමිණ තුබූ බැවින් දිනෙක පොහොය ගෙයි පහන් දල්වමින් සිටි ගෞතමී ස්ථවිරා තොමෝ පහන් දැල්ල ඉපිද ඉපිද බිඳි බිඳී යනු දැක 'සියලු සත්ත්වයෝ ම මෙ පරිද්දෙන් ඉපිද ඉපිද මැරි මැරී යන්නෝ ය, නිවනට පැමිණියෝ ම එසේ නො වන්නාහ, එබන්දන්ගේ මෙබඳු විප්‍රකාරයෙක් නො පෙනේ ය' යි අරමුණු ගත්තා ය. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩ හුන් සේක් ම ආලොකයක් පතුරුවා ඇය ඉදිරියෙහි වැඩ හිඳ කියන්නහු සේ 'ඔව් ගෞතමි! ඒ එසේ ය, තිගේ කල්පනාව නිවරද ය, මේ සියලු සත්ත්වයෝ පහන් දැල්ල සේ ඉපිද බිඳී යති, නිවනට පැමිණියේ ම එසේ නො ඉපැදෙති, නො බිඳෙති, ස්ථිරවූවෝ ඔවුහු ම ය, නො වෙනස් වන්නෝ ය, සන්සිඳී ගියෝ ය, එබැවින් නිවන් නො දැක අවුරුදු සියයක් ජීවත් වීමට වඩා නිවන් දැක ක්ෂණමාත්‍රයක් ජීවත් වීම ම ශ්‍රෙෂ්ඨ වේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක :—

යො ච වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං,
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදනති.

අමාමහනිවන නො දක්නා වූ යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ නමුත් (එයට වඩා) අමාමහනිවන දක්නහුගේ එක් දවසක් ජීවත්වීම ශ්‍රෙෂ්ඨ වේ.

යො ච වස්සසතං ජීවෙ = යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ නමුත්.

අපස්සං අමතං පදං = අමාමහ නිවන නො දක්නාවූ. අමාමහ නිවන නො දක්නේ.

නිවන දැක්ක යුත්තේ මගපල නුවණින් ය. මගපල නුවණට ම නිවන ප්‍රත්‍යක්ෂ වන්නේ ය. නිවන මරණින් මිදීමට කරුණු වන බැවින් පංචස්කන්ධදුඃඛය සහමුලින් නැති කිරීමෙන් ලැබිය යුතු බැවින් අමෘතපද නම්. 'මරණ නැති කොටස' යන අරුතෙක් ද මින් කිය වේ. සොතාපත්තිමග්ගඤ්ඤාණය පටන් අරහත්තඵලඤ්ඤාණය තෙක් ඇති මග්ගඵලඤ්ඤාණයන්ගෙන් නිවන දැක්ක හැකි ය. එහෙත් ඒ එක් තරමින් නො දැක්ක හැකි ය. පිළිවෙළින් උපරිම උපරිම ඥානයන්ගෙන් කෙරෙණ නිර්වාණ

දර්‍ශනය වඩ වඩා පැහැදිලි ය. වඩ වඩා පෙනෙන්නේ ය. ක්‍රම ක්‍රමයෙන් මාර්ගඥනයන්ගෙන් ඒ ඒ කෙලෙස් තට්ටුවෙන් තට්ටු ව නැසී යන බැවිනි එසේ වන්නේ.[1]

එකාහං ජීවිතං සෙය්‍යෝ = එක් දවසක් ජීවත්වීම උතුම් වේ.

පස්සතෝ අමතං පදං = අමාමහනිවන දක්නහුගේ. මාර්ගඥන-යන්ගෙන් නිවන දක්නහුගේ.

නිවන මගපලනුවණින් නො දක්නහුගේ අවුරුදු සියයක් ජීවත් වීමට වඩා මගපලනුවණින් නිවන දක්නහුගේ එක් දවසක් ජීවත්වීම උතුම් ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි කිසාගොතමී තොමෝ හුන් හැටියෙන් ම පිළිසැඹියාවන් ලබා රහත් වූ ය.

කිසාගොතමීවත්ථුව නිමියේ ය.

---

1. 2. 1. 'අමතපදං' යනු බලනු

බොහෝ දූ පුතුන් ලැබූ මෙහෙණ.

8. 14

එදා සැවැත්නුවර ගෙයක පුත්තු සත් දෙනෙක් හා දූවරු සත් දෙනෙක් හා යන දූපුත්තු දස සතර දෙනෙක් වාසය කළහ මේ පවුලේ සිටි මේ සියල්ලෝ ම පවුල් රැකීමට සුදුසු වයසට පැමිණ සිටියෝ, කරකාර බැඳ ගෙණ ඩහදිය මහන්සියෙන් දිවි රකිමින් සුව සේ විසූහ. දූ පුතුන් මෙසේ ගිහිගෙට ඇතුල් ව ටික දවසක් ගිය තැනේ දී, එහි පිය තෙමේ කලුරිය කෙළේ ය. ඔහුගේ බිරිඳ තම හිමියා නැසී ගියේ ද, තමන් අයත් වතුපිටි ගේදොර මිලමුදල් ආදී බුදලයට අයත් කිසිවක් දූපුතුන්ට නො දී තොමෝ ම බුදලය රැක බලා ගත්තා ය. එහෙත් ඇයගේ දූපුත්තු මෙය නො ඉවසූහ. එහෙයින් දිනෙක, ඒ හැමදෙන එක් ව මෑනියන් වෙතට ගොස් 'අම්මා! අපගේ තාත්තා මැරී ගොස් අදට ටික කලක් ගත වි ය, අම්මා ද දැන් මහලු ය, අම්මාට බුදලයේ කටයුතු කිරීම දැන් පහසු නැත, අම්මාට එයින් ඇති ප්‍රයොජනය කුමක්ද, අම්මාට දැන් වුවමනා කරන්නේ, හොඳට කා බී හැඳ පැලඳ පින් දහම් කිරීම ය, අම්මාට වුවමනා හැම දෙයක් ම අපට කළ හැකි ය, අම්මාගේ උපස්ථානය අපි හොඳට කරන්නෙමු, අපි එයට බැඳී සිටින්නෙමු' යි කීහ. ඕ තොමෝ ඔවුන්ගේ ඒ කතාව අසා නිහඬ වූ ය. දූපුත්තු නැවැත නැවැතත් එක් ව ගොස් මෙසේ කීහ.

දවසෙක, මේ මහලු මවු තොමෝ දූපුතුන් ගෙන්වා 'දරුවෙනි! තෙපි මාගේ කටයුතු නො නසා අඩු පාඩු නො කොට බුදලයට අයත් ඉඩකඩම් වතුපිටි ආදිය රැක බලා ගණිමින්, වැඩපල කරන්නහු නම්, මට බුදලයෙන් වැඩෙක් නැත, තොපට එය හොඳින් රැක බලා ගත හැකි නම්, අද හෙට ම මට එය තොපට භාරදිය හැකි ය' යි කිවු ය. ඔවුහු 'අපට එය ඉතා පහසුවෙන් රැක බලා ගත හැකි' යි කීහ. දිනක් මවු තොමෝ සියලු දූපුතුන් ගෙන්වා මුළු බුදලය ජීවිතබුත්තිය ද නො තබා ඔවුන් අතර බෙදා දුන්නු ය.

ඉන් දවස් කීහිපයකට පසු, ඕ තොමෝ වැඩිමහල් පුතුගේ ගෙට ගියා ය. වැඩිමහල් පුතුගේ බිරිය, එන්නා වූ නැන්දම්මා දැක, 'නැන්දම්මා එනවා අපේ, අනේ, වාසනාවන්, නැන්දම්මා මෙහි එන්නී' වැඩිමහල් පුතු යි සලකා, වැඩිමහල් පුතුට අත පුරා බඩ පුරා දෙකොටසක් දුන් සේ සිතා ගෙණ ය' යි ඒ මහලු මවට ඇසෙන සේ හඬ නඟා කිවු ය. අනික් පුතුන්ගේ ගෙවලට ගිය

යියදුත් ඒ ලේළිලා ද මෙසේ ම කිහ. දුවරුත් කීවාහු එසේ ය. ආලා ද 'මෑ අප වැදූ මවැ' යි නො සැලකූහ. **ජඩලොකය, අධමලොක ය, දුජ්ජටලොක ය, දුම්තලොක ය, අකතඤ්ඤ ලොක ය,**

මෙසේ හැම දූපුතුන්ගේ අවමානයට පැමිණි ඒ මහලු මවු තොමෝ 'මුන් ලඟ ඉඳීමෙන් වැඩෙක් නො වේ, තොතරම් සිටිය ද වන්නේ මෙසේ ය; මග නහින්නට සිදු වන්නේ ය, ඒ නිසා මෙහෙණවරට ගොස් මහණ වී දිවි ගලවමි' යි මෙහෙණවරට ගොස් පැවිදි වූ ය. උපසම්පදාවට ද පැමිණියා **'බහුපුත්තිකා-ත්ථේරී'** යි ප්‍රසිඛ වූ ය.

ඉක්බිති බහුපුත්තිකාත්ථේරී තොමෝ 'මා මහලු වයසට ගොස් පැවිදි වූ බැවින් නිකරුණේ කල්ගෙවීම නො සුදුසු ය, වැඩි බණ දහමක් ඉගෙණීමටත් කාලයෙක් නැත, එහෙත් මහණකමෙහි නො පමා විය යුතු ය' යි මෙහෙණන් පිළිබඳ වන් පිළිවෙත් කරන්නී මුළු රෑය ම භාවනා කරමි' යි යට පහයට බැස, එහි කණුවක් අතින් අල්ලා ඒ වටේ ඇවිදිමින් භාවනා කරන්නී ය. රෑ එළි බැස ඇවිදින විට ද 'ගස්වල හැපේය' යි සිතා ගස් අල්ලා ගස් වටේ යමින් භාවනා කරයි. 'බුදුරජුන් වදාළ පිළිවෙත ම කරමි' යි ධෘය ගැණ සිතා මතා එය ම සිහියට ගෙණ තදනුකුල ව මහණදම් කරයි.

මේ වේලෙහි ගදකිළියෙහි වැඩහුන් බුදුරජානන් වහන්සේ ආලොකයක් පතුරුවා ඉදිරියෙහි වැඩ හුන්නහු සේ 'බහුපුත්තිකාව! මා දෙසූ දහම් ගුණ, නො සිතා නො බලා නො දැක නො පිළිපැද අවුරුදු සියයක් ජීවත්වීමට වඩා ඒ දහම් ගැණ, සිතා බලා දැන මොහොතක් ජීවත්වීම උතුම් ය' යි වදාරා අනුසඤ්ඤි ගලපා මේ ධම්දෙශනාව කළ සේක:-

යො ච වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං,
එකාහං ජීවිතං සෙය්යො පස්සතො ධම්මමුත්තමන්ති.

උත්තමධම්ය නො දක්නා වූ යම් පුදගලයෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද, (ඔහුගේ ඒ ජීවත්වීමට වඩා) උත්තමධම්ය දන්නා වූ පුද්ගලයාගේ එක් දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ වේ.

යො ච වස්සසතං ජීවෙ=යමෙක් අවුරුදු සියයක් ජීවත් වන්නේ ද

අපස්සං ධම්මං උත්තමං=උත්තමධම්ය නො දක්නා වූ. උතුම් දහම් නො දක්නේ.

නවලොකොත්තර ධර්මය මෙහි උත්තමධර්ම නම්. සිවු මගත් සිවු පලයත් නිවනත් ය ඒ.

සතරමග – සතර පල – නිවන, උපාදානස්කන්ධසඞ්ඛ්‍යාත ලොකයෙන් එතෙර බැවින් ලොකය හා නොගැටී සිටි බැවින් ලොකොත්තරධර්ම නම්. ස්කන්ධයෝ ලොකයට අයත් ය. ලොකයට අයත් ස්කන්ධයන්ගෙන් කිසිත් නැති බැවින් නිවනම ප්‍රධාන විසින් ලොකොත්තර වේ. සතර මග, සතර පල වසයෙන් ගැණෙන්නේ වෙදනා – සංඥා – සංස්කාර – විඥාන යන ස්කන්ධ සතර ට බෙදුනු චිත්ත චෛතසික ධර්ම යි. සංස්කාරස්වභාවයෙන් සහමුලින් ම තොර වූ නිවන අරමුණු කොට උපදින මාර්ගචිත්තය, සියලු කෙලෙස් නසා උපාදානස්කන්ධ, ලොකයෙන් එතෙර වන බැවින් ලොකොත්තර නම් වේ. පලසිත, උපාදානස්කන්ධසඞ්ඛ්‍යාත ලොකයෙන් එතෙර වූ බැවින් ලොකොත්තර නම් වේ. මාර්ගචිත්ත-වීථියෙහි යෙදෙන ස්පර්ශාදිය ද සම්ප්‍රයුක්තධර්මසහිත වූ ඵලචිත්තය ද චතුස්සත්‍යයෙහි ඇතුළත් නො වෙති. මාර්ගාඞ්ග අට හැරය.

එකාහං ජීවිතං සෙය්‍යො = එක් දවසක් ජීවත්වීම උතුම් වේ.

පස්සතො ධම්මං උත්තමං = උත්තමධර්මය දක්නහුගේ. මාර්ගඥානයෙන් නවලොකොත්තරධර්මය දැන සිටියහුගේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බහුපුත්‍රිකා ස්ථවිරා තොමෝ පිළිසැඹියාවන් ලබා රහත් වූ ය.

බහුපුත්‍රිකා ස්ථවිරාවස්තුව නිමියේ ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසලනායකස්ථවිරයන් කළ සඞ්ඝීසාගර නම් වූ ධර්මපදවර්ණනාවෙහි සහස්‍රවර්ගාත්මකඅෂ්ටමතරඞ්ගය මෙතෙකින් නිමියේ ය.

පාපවගීය

නවනමතරඩගීය කථා සූචි

පිට	වසතුව	
1209	1	චූලෙකසාටකබ්‍රාහමණයා
1215	2	සෙය්‍යසක සඨවිරයන්ගේ අනභිරතය.
1217	3	පොරි දුන් ගැහැණියක්
1220	4	අනාථපිණ්ඩික සිටාණන්ගේ උදුර අදහස.
1226	5	පිරිකර තැන තැන දැමූ මහණෙක්
1228	6	බළල් පා ඇති සිටුවරයා
1232	7	ධනවත් වෙළෙන්දෙක්
1237	8	කුකකුටමිත්‍රයා
1244	9	කොක නම් බලුවැද්ද
1249	10	මැණික්කරු කළ අපරාධය
1253	11	කම්මිපාකය පසුපස යන සැටි
1263	12	සුප්‍රබුද්ධශාක්‍යයා

චූලෙකසාටක බ්‍රාහ්මණයා

9 - 1.

විපස්සී බුදුරජුන් දවස, **මහාඒකසාටක** නමින් ප්‍රසිද්ධ වූ බමුණෙක් වී ය. ඔහු අප බුදුරජුන් දවස, **චූළෙකසාටක** නම්. එක් සළුවක් තුබූ බැවින්, එනම් වූයේ ය. බැමිණියට තුබුනේ ද එක් සළුවක් ම ය. මෙසේ දෙ දෙනාට ම අඳින්නට තුබුනේ එක් එක් රෙදිකඩ වුව ද, පොරොවන්නට තුබුනේ එක් ම රෙදි කඩෙකි. මේ දෙ දෙන, ගෙන් පිටත යන කල්හි මාරුවෙන් මාරුවට මේ පොරෝණය ඇඟලා යන්නෝ ය.

දිනෙක, අසල වෙහෙරෙහි බණ අසන්නට කල් දැන් වූ කල්හි බ්‍රාහ්මණ තෙමේ 'සොඳුර! බණ අසන්නට පන්සල් යෑමට කල් දන් වන ලද්දේ නොවේ ද, කොහොම ද, ඔයා, දැන් යනවා ද? නැත් නම් රෑ යනවා ද? අප දෙන්නාට තිබෙන්නේ එක් ම පොරෝණය බැවින්, එක් විට දෙන්නාට ම යනු බැරි ය, එහෙයින් කියන්නක් කියව' යි කී ය. බැමිණි, 'ස්වාමිය! රෑ යෑම මට අපහසු ය, මම දවල් යමි' යි සළුව ගෙණ පොරොවා වෙහෙරට ගියා ය. බමුණා, දවල් දවස ගෙයි ගත කොට, රෑ හොස් බුදු රජුන් ඉදිරියෙහි හිඳ, බණ අසත් ම ඔහු සිරුර පැතිර ගෙණ පස්වණක් ප්‍රීතිය උපන.

ඒ වේලෙහි ඔහු බුදුරජුන් පුදනු කැමැත්තේ ද, 'මම මේ සළුව බුදුරජුන්ට පූජා කෙළෙම් නම්, මටත් සොඳුරටත් පොරොවන්නට රෙදිකඩෙක් නැති ව යන්නේ ය' යි ද සිත් වී ය. මෙසේ ඒ වේලෙහි ඔහුට මසුරු සිත් දහසක් උපන්නේ ද, ඒ සිත් මැඩ සළුව පිදීමට නැවැතත් සිත් උපන. ඒ වරත් මසුරු සිත් උපන. එරින් වර මෙසේ සැදුහැ සිත් හා මසුරු සිත් ඉපද නැසී යත් ම පළමු යම ඉක්ම ගියේ ය. මැදියමෙහි ද සළුව පුදන්නට නොහැකි වී ය. පැසුළුයම පැමිණියේ ය.

ඒ වේලෙහි බමුණා, 'මා පිළිබඳ සැදුහැ සිතත් මසුරු සිතත් එක සේ බලගතු ව නැගෙත්, නැගෙත්, යාම දෙකක් ම ඉක්ම ගියේ ය, මේ මසුරු සිත මෙසේ වැඩී ගියේ නම්, මට සතර අපායයෙන් ඔලුව උස්සනු බැරි ය, එහෙයින් සළුව පිදිය යුතුම ය' යි මසුරු සිත මැඩ සැදුහ සිත පෙරටු කොට සළුව ගෙණ බුදුරජුන් පා මුල්හි තබා 'දිනන ලද්දේ ය, දිනන ලද්දේ ය' යි තෙ විටක් ම මහහඬින් කෑ ගැසුයේ ය.

බණපිරිසෙහි හුන් කොසොල්රජ ඒ අසා, මූ කුමක් දිනී ද, යි දනිවු' යි රාජපුරුෂයන්ට නියම කෙළේ ය. රාජපුරුෂයන් ඔහු වෙත ගොස් ඇසූ කල්හි බමුණු එයකි ය. ඔවුහු ඒවග රජුට දුන් වූහ. රජ තෙමේ පැහැද 'මූ කලේ අමාරු වැඩෙකැ' යි ඒ වේලෙහි ම සළු දෙකක් ගෙන්වා ඔහුට දුන්නේ ය. බමුණු ඒ සළුදෙකත් බුදුරජුන්ට ම පිදී ය. රජ තෙමේ, එ ද දුක, නැවැතත් දෙක, සතර, අට, සොළොස බැගින් කිහිපවරක් සළු ගෙන්වා ඔහුට දුන්නේ ය. ඒ හැම වර ම බමුණු, ඒ සළු බුදුරජුන්ට ම පිදී ය. නැවැතත් රජ තෙමේ රෙදි ජෝඩු දෙ තිසක් ගෙන්වා දුන්නේ ය. 'බමුණු තමන් පිණිස එකකුත් නො ගෙණ ලැබෙන හැම එකක් දෙන්නේ ය' යි පැතිර යන කතාවෙන් නිදහස් වනු පිණිස ඒ දුන් රෙදිජෝඩු දෙ තිසෙන් ජෝඩු දෙකක් තමන්ටත් අඹුවටත් තබා ගෙණ අනික් හැම බුදුරජුන්ට පිදී ය. බමුණා, තමන් ලත් සළු, සියක් වරක් පිදුව ද, රජ තෙමේ ඔහුට තව තවත් දෙනු කැමැති ව සිටියේ ය.

පෙර දවස, මහාඑකසාටකබ්‍රාහ්මණ තෙමේ, සිවු සැටක් වස්ත්‍ර යුග අතරින් යුග දෙකක් ම ගත්තේ ය. දැන් මේ බමුණා, තමන් ලත් වස්ත්‍රයුග දෙ තිසෙන් යුග දෙකක් ගත්තේ ය. රජ තෙමේ රාජපුරුෂයන් අමතා 'කොලෙනි! බමුණා කලේ අමාරු වැඩෙකි, එහෙයින් මූ රජගෙට ගෙණ යවු' යි අණ කෙළේ ය. ඔවුහු එසේ කළහ. එවිට රජ තෙමේ ඔහුට එහි දී ලක්ෂය ලක්ෂය වටිනා පලස් දෙකක් දුන්නේ ය. 'අනේ, මේ වටිනා පලස් මාගේ මේ කුණු සිරුරෙහි දවටා ලන්නට නොසුදුසු ය, මේ සුදුසු බුදුසසුනට ම ය' යි බමුණු තෙමේ, එක් පලසක් ගඳකිළියතුළ බුදුරජුන් සැතපෙන යහන මුතුයෙහි වියනක් කොට බැඳ අනෙක තම ගෙයි භික්ෂූන් නිතර දන් වළඳන හැන වියනක් කොට බැන්දේ ය.

එ දින සවස් වරුවෙහි බුදුරජුන් වෙත ගිය රජ තෙමේ ගඳකිළියෙහි බැඳ තුබූ වියන දුක, වියනට බැඳ නිබෙන්නේ තමන් බමුණාට දුන් පලසකැ, යි දැන 'සවාමීනි! මේ පූජාව කා විසින් කරණ ලද දැ' යි ඇසි ය. 'එකසාටක විසිනැ' යි බුදුරජුන් වදාළ කල්හි 'බමුණු ද පැහැදී සිටියේ, මා පැහැදි තැනට ම ය' යි වඩාත් පහන් ව ඇතුන් සිවු දෙනක, අසුන් සිවු දෙනක, කහවණු සාර දහසෙක, ගැණුන් සිවු දෙනක, දැසින් සිවු දෙනක, පිරිමින් සිවු දෙනක, ගම්වර සතරකැ' යි මෙසේ ප්‍රයෝජන ඇති හැම දෙයකින් සතර සතර බැගින් බමුණාට දෙවී ය.

මේ වේලෙහි ධර්මශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා 'ආයුෂය මේ ලැබීම, පුදුම ය මේ ලැබීම, චූලෙකසාටකයාගේ කර්මය, ඒ මොහොතෙහි ම විපාක දුන්නේ ය, දැන් කළ කර්මය දැන් විපාක දුන්නේ ය, කුශල කර්මයේ හැටි ඉතා පුදුම ය' යි කතා කරන්නට වූහ. එ කෙණෙහි එහි වැඩි බුදුරජාණන් වහන්සේ එහි කළ කතාව අසා 'මහණෙනි! දෙන්නට අදහස උපන් පළමු යම ම නො පසු බට ව දුන්නේ නම්, මේ බමුණු ලබන්නේ සියලු දෙයින් සොළොස සොළොස ය, මැදියම වත් දුන්නේ නම්, සියලු දෙයින් අට අට ලබන්නේ ය, සතර සතර ලැබුවේ හොඳට ම පාන් වූවායින් පසු දුන් බැවිනි, පින් කිරීමට අදහස උපන් සැටියේ ම ඒ උපන් අදහස නො පිරිහෙළා ඒ ඇසිල්ලෙහි ම කළ යුතු ය, දෙම් දේ, නො දෙම් දේ, කරම් දේ, නො කරම් දේ, යි යිත සිතා පසුබට වෙමින් කරණ පිණ සමපත් දෙන විටත් අඩුව ම දෙන්නේ ය, කල් යව යවා දෙන්නේ ය, එහෙයින් පින් කළ යුත්තේ පින් කිරීමට අදහස උපන් ඇසිල්ලේ ම ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

අභිත්වරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ,
දන්ධං හි කරතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො ති.

සුචරිතධර්මවිෂයයෙහි යුහුසුළු වන්නේ ය. පව්කම්හි සිත වළකා ලන්නේ ය. පින්කම් ලැසි ව කරන්නහුගේ සිත පව්කම්හි ඇලේ.

අභිත්වරෙථ කල්‍යාණෙ-සුචරිතධර්මවිෂයයෙහි යුහුසුළු වන්නේ ය.

මෙහි **කල්‍යාණ'** යන මෙයින් කියේ දැන-ශීල-භාවනා යන කුශලකර්ම තුන ය. මේ හැම කුශලකර්මයක් ම නො පසුබට ව වහ වහා කළ යුතු බව **අභිත්වරෙථ'** යන ක්‍රියා පදයෙන් වදාළ සේක. කුශලකර්ම වහා කළ යුතු, කුමක් නිසා ද, යනු ගාථාවේ දෙවන අඩින් පැහැදිලි වේ.

මේ ක්‍රියාපදය බොහෝ ධම්මපද පිටපත්හි **අභිත්වරෙථ'** යි ආයේ ය. එය සමහර කෙනෙක් **අභිත්තරෙථ'** යි ලියති. කියති. සිංහලපුරාණ සන්නයෙහි මෙයට අරුත් දී තිබෙන සැටියෙන් ද පෙනෙනුගේ අභිත්වරෙථ' යනු වඩා සුදුසු සේ ය. **අභි** පූර්ව **ත්වර** ධාතුව වහා ගමන් අරුත් හි වැටේ. සංස්කෘතයෙහි ද, **ත්වර්** ධාතුව ශීඝ්‍රගමනාර්ථයෙහි ආයේ ය. **'අභිත්වරෙථා හි තුරිත තුරිතං සිඝ සිඝං කරෙය්‍යා හි'** යන අටුවාවෙන් ද ඒ බව පැහැදිලි ය. සුචරිත ධර්මවිෂයයෙහි යුහුසුළුවීම නම්, කුශලධර්ම වහා කිරීම ය. **අභි** යන උපසර්ගය ඒ වහා කිරීම, වඩාත් තියුණු කරයි. විමසා ගත යුතුය සුදුසු පදයක්.

අභි' යනු, අභිමුඛභාව, විශිෂ්ට, ඌර්ධ්වක්‍රියා, සමානභාව, වෘඩි අධිකභාව, කුල, ලක්ෂණ, ඉත්ථම්භූත, ඒපසා, වන්දන යනාදී අරුත්හි එයි. **අභිකක්කමති, අභිධම්මො, අභිරූහති අභිරූපො, අභිජාතො, අභිවස්සති, අභිජාතො' රුක්ඛමභි විජ්ජොතතෙ විජ්ජු, සාධු දෙවදත්තො මාතරභි, රුක්ඛමභිවිජ්ජොතතෙ චන්දො, අභිවාදෙති,** යනාදිය එයට නිදසුන් ය. මෙහි වූයේ අධිකභාවයෙහි ය. මේ බලනු:– **'ගිහිනා වා සලාකභත්තදානාදි යං කිඤ්චිදෙව කුසලං කරිස්සාමීති චිත්තෙ උප්පන්නෙ යථා අඤ්ඤෙ ඔකාසං න ලභන්ති, එවං අහං පුරෙ අහං පුරෙති තුරිතතුරිතමෙව කාතබ්බං. පබ්බජිතෙන වා උපජ්ඣායවත්තාදීනි කරොන්තෙන අඤ්ඤස්ස ඔකාසං අදත්වා අහං පුරෙ අහං පුරෙ ති තුරිතතුරිතමෙව කාතබ්බං'** යනු අටුවා ය. ගිහියකු විසින් සලාකබත් දීම් ආදී වූ යම් කිසි කුශලකර්මයක් කරන්නෙමි, යි සිත් උපන් ඇසිල්ලෙහි ම අනෙකෙක්හට ඉඩ නො තබා ම 'මම පළමු කරන්නෙමි' මම පළමු කරන්නෙමි, යි ඉදිරිපත්ව වහා ඒ කළ යුතු ය. පැවිද්දහු විසින් උපාද්ධ්‍යායවත් ආචාර්‍යවත් ආගන්තුකවත් ගිලන්වත් ආදී යමක් කරන්නහු අනෙකක්හට කිරීමට ඉඩ නො තබා ම 'මම පළමු කරන්නෙමි, මම පළමු කරන්නෙමි, යි වහා වහා කළ යුත්තේ ය, යි මෙයින් පැහැදිලි කළහ.

පාපා චිත්තං නිවාරයෙ = පව්කමින් සිත වළකා ලන්නේ ය.

පව්කමින් කියා හෝ අකුශලචිත්තොත්පාදයෙන් කියා හෝ අරුත් ගත හැකිය. **'පාපා චිත්තන්ති කායදුච්චරිතාදිතො වා පන පාපකම්මතො වා අකුසලචිත්තුප්පාදතො වා,** යනු අටුවා බැවිනි. අකුසල් සිතිවිලි, අකුසලචිත්තුප්පාද නම්.

නිවාරයෙ, යනු ක්‍රියා පද යි. එහි වූ **නි'** යනු උපසර්ග යි. එයින් වැඩුනු **වාරයෙ'** යනු සිත අකුශලකර්මයෙන්, නොහොත් අකුශලචිත්තොත්පාදයෙන් මුළුමනින් වැළැකිය යුතු බව කිය යි. අකුසල් ටිකකුත් සිතෙහි නො තැබිය යුතු ය. අකුසල් සිතිවිලි නො ඉපද විය යුතු ය යනු, කී සේ ය. මේ උපසර්ගය, නිරවශෙෂ, අභාව ව්‍යපන, අතිශය, මොක්ෂ, සමූහ, ගෘහ, ආදෙශ, උපමා, හීන, ප්‍රසාද, නිර්ගත, අත්‍යය, දර්ශන, අවසාන, නිෂ්ක්‍රාන්ත, අධොභාග, අවධාරණ, සමීප, බන්ධන, දක්ෂ, අන්තර්භාග, උපරති, ප්‍රාදුර්භාව, වියොග, නිෂෙධ, නීහරණ, ආවරණදී අර්ථයන්හි හෙයි. **නිවරසෙසං, නිම්මක්ඛිකං, නික්කන්තො, නිග්ගෙසාසො, නිබ්බානං, නිචයො, නිකෙතනං, නිද්දානං**

නිදස්සනං, නිහිනසෙවී, නිය්‍යාසො, නිගගතො, නික්කසාවො, නිද්දිසති, නිඞ්තං, නිබ්බානං, නිධනිත්වා, නිච්ජයො, නිස්සයො, නිබ්බන්ධො, නිපුණො, නිසාමෙති, නිරාසො, නිම්මිතං, නිරාලයො, නිවාරෙති, නිහරතො, නිවරණං යනු පිළිවෙළින් නිදසුන් ය. මෙහි ආයේ නිෂෙධයෙහි ය.

දන්ධං හි කරතො පුඤ්ඤං = පසුබට ව පින් කරන්නහුගේ.

යමෙක් 'දෙම් ද, නො දෙම් ද, කෙරෙම් ද, නො කෙරෙම් ද, පල ලැබේ ද, නො ලැබේ ද, යි ගෝරුමඩ ඇති මගෙක යන්නකු සේ පින් කිරීමෙහි පසුබට වේ ද, හෙතෙමේ පින්කම් ලැසිව කරන්නේ ය. ඔහුට එකසාටක බමුණාට සේ බලවත් ව නැගෙන මසුරු මල නිසා කරන්නා වූ ද පින්කමෙන් නියම පල නො ලැබේ. මසුරුකම මිනිසා උසස්බවෙන් පහත හෙලන, මිනිසාගේ සතුරෙකි. මසුරුකම නැමැති මිනිස් සිත් තුළ නගින මේ සතුරා, මිනිසාට නපුර කරණුයේ මෙලොවින් පමණක් නො වේ. එ ලොව මෙ ලොව දෙකින් ම නපුරක් ම කරන්නේය. එහෙයින් මේ මසුරුකම අන් හැම සතුරකුට වඩා නපුරු ය. අහිතකර ය. දන් පින් ආදී යම් පින් කමක් කරන්නට සිතුයේ ද, එයට ඉඩ නො දෙන්නේ මේ මසුරුකම ය. මසුරුකම වඩාත් බලගතු වනුයේ බණදහම් නො දත්, දූ පුතුන් ගැණ සිත සිතා ඉන්නා මෝඩ මිනිසාට ය. ඔහුට තමා ගැණ සිතනු බැරි ය. පරලොව ගැණ සිතනු බැරි ය. ලැසි ව තතන තතනා පින්කම් කරණු ඒ නිසා ය.

දන්ධං, යනු, ක්‍රියාවිශෙෂණ යි. ලැසිබව පසුබට බව එයින් කිය වේ. **හි**, යනු, නිපාත ය. පදපූරණයෙහි වේ. **'වුත්තං හි භගවතා එවං බුඩං සරන්තානං'** යනාදි තන්හි හෙතුවෙහි ය. **'ජීනවචනයුත්තං හි'** යනාදී තන්හි අවධාරණයෙහි ය. **'වුත්තං හි'** යනාදී තන්හි දළ්හීකරණයෙහි ය. **හිඤ්ඤු'** යනාදී තන්හි අබ්භූතකර්මයෙහි ය. **හින්තාලං'** යනාදී තන්හි විශෙෂයෙහි ය. **හෙලා හිදාලං'** යනාදි තන්හි දුඃඛයෙහි ය. **'හි පංචවගගානං අනුක්කමො ඨානානුක්කමෙන වෙදිතබ්බො. පඨමං කණ්ඨ ඨානං පතිඨිතං. තතො තාලුමුඛදන්තොට්ඨඨානානි'** යනාදී තන්හි සත්‍යයෙහි ය. **'හි සත්ථං අධීයතෙ විදූ'** යනාදී තන්හි තර්කශාස්ත්‍රයෙහි ය.

'පුනාතීති = පුඤ්ඤං' පින් කරන්නහු හෝ ඔහු පිළිබඳ සන්තානය (යම් සන්තානයෙක තෙමේ උපන්නේ නම්, ඒ සන්තානය) පවිත්‍ර කෙරේ, නු යි දාන ශීල භාවනා යන වෙතනා

ත්‍රිකය පුඤ්ඤ නම් වේ. දානාදිවෙතනාවෝ, ලොභාදිඅකුශල-යන් මැඩ, සිත පවිත්‍ර කරණ බැවින්, පුණ්‍ය නම් වෙති යි කී සේ ය. රාග, දෙස, මොහ, කොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා' මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාද යනාදී කෙලෙස් හෙතු කොට, සත්ත්වසන්තානය නිතර අපවිත්‍ර වන්නේ ය. කෙලෙස් නිසා අපවිත්‍ර වන චිත්ත සන්තානය, දානාදිවෙතනාවෙන් තදඞ්ගාදිවසයෙන් ඔවුන් ඔබා මැඩ, පිවිතුරු කෙරෙත්. එහෙයිනි ඒ වෙතනා පුණ්‍ය නම්.

'ජුජ්ජභාවං ජනෙතීති = පුඤ්ඤං' දානාදිවෙතනාවෝ දානාදී වෙතනාවන්ගෙන් යුක්ත වූවන්ගේ පූජ්‍යත්වය ඇති කෙරෙත්. ඔවුන් පිළිබඳ කොට පූජ්‍යත්වය උපදවත්. **'පූජිතං වා නෙතී=ති පුඤ්ඤං'** දානාදිවෙතනාවෝ පින්කම් කරන්නහු පුදන ලද්දකු කොට පිදිය යුත්තකු කොට සමාජයට පමුණු වත්.

පාපස්මිං රමතී මනො = සිත පාපයෙහි ඇලේ.

කුසල්කම් කරණ මොහොතෙහි ම සිත කුසල්හි ඇලෙයි. ඉන් ඉක්බිති පවට නැමී ගණී යි. කුසල්දහම් වහ වහා කළ යුතු ය යි වදාළෝ එහෙයිනි. ඉමක් නො දැක් විය හැකි කාලයක් පවට බොහෝ සෙයින් නැමී සිටි සිත, ඉන් මුදා කුශලකර්ම කෙරෙහි නතු කිරීම පහසු නො වේ. එහෙයින් අකුශලකර්මයන්ට ඉඩ නො තබනු පිණිස කුශලධර්ම වහා කළ යුතු ය, යි වදාළ සේක.

දෙශනාවසානයෙහි බොහෝ භික්ෂූන් වහන්සේලා සෝවන් පලාදියට පැමිණියාහු ය.

වූලෙකසාටකබ්‍රාහමණවස්තුව නිමියේය.

සෙය්‍යසකස්ථවිරයන්ගේ අනභිරතිය.

9 - 2

සෙය්‍යසක ස්ථවිර තෙමේ, ලාලුදායී තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකි. ලාලුදායී ස්ථවිර, ශ්‍රාන්තමෘගයකු වැනි ය. පිරිහීමට කරුණු වූ නිදීම් බිණීම් ආදී ක්‍රියාවන්හි නිතර යෙදී සිටියේ ය. දිනෙක සෙය්‍යසක, තමන්ට උපන් බ්‍රහ්මචර්‍යවාසයෙහි නො ඇලීම තම ආචාර්‍ය වූ ලාලුදායී තෙරුන්ට දන්වා සිටි විට ලාලුදායී ස්ථවිර, සෙය්‍යසකයන් විනයයෙහි එන ප්‍රථමසඞ්ඝාදි-ශෙෂයට කරුණු වූ ශුක්‍රමොචනයෙහි යෙදවී ය. එතැන් සිට, සෙය්‍යසක තෙමේ තමන්ට නො ඇල්මක් උපන් හැම විටක, අතින් උපක්‍රම කොට ශුක්‍ල මුදවා හරි යි. බුදුරජානන් වහන්සේ සෙය්‍යසකයන්ගේ මේ ශුක්‍ල මුදාහැරීම අසා ඔහු ගෙන්වා 'සෙය්‍යසක! තෝ අතින් උපක්‍රම කොට ශුක්‍ල මුදා හරින්නෙහි සැබෑ දැ?' යි අසා වදාළ සේක. 'ස්වාමීනි! එසේ ය'යි හේ කී ය. 'කුමක් නිසා මෙබඳු පහත් වැඩක්, නින්දා කළ යුතු වැඩක් කෙළෙහි ද? කෙළෙහි ඉතා පහත් නො කියැකි නො සුදුසු පිළිකුල් වැඩෙකි, විළිබිය නැසී යන වැඩ, වනවර-යන්ගේ වැඩ' යි නොයෙක් ලෙසින් ගරහා ශික්ෂාපදයක් ද පනවා 'මෙබඳු අශික්ෂිතක්‍රියාවෝ මෙ ලොව පරලොව දෙක්හි ම දුක් පිණිස වන්නාහ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්ම දෙශනාව කළ සේක:-

පාපං චෙ පුරිසො කයිරා න නං කයිරා පුනපපුනං,
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයොති

පුරුෂයෙක් පාපයක් කෙළේ නමුත්, එය නැවැත නැවැත නො කරන්නේ ය. එහි ආලය නො කරන්නේ ය. පව් රැස් කිරීම දුක් ය.

නො දැනීමෙන්, ගිනිඅඟුරු මැඩගත් එකෙක්, එහි ම පය තබා නො සිඳ, වහා එයින් පය ඇද ගන්නා සේ, පුරුෂ තෙමේ ප්‍රමාදදොෂයකින් හෝ අසත්පුරුෂයන් හා එක් ව විසීමකින් හෝ යම් කිසි පාපකර්මයක් කළේ නමුත්, එ කෙණෙහි ම නුවණින් මෙනෙහි කොට 'මෙ වැනි ලාමකක්‍රියා මාගේ ජාති ගොත්‍ර වයස් ආදියට නො සුදුසු ය' යි සලකා, පව්කම් නො කරන්නේ ය. පව්රැස් කිරීම එ ලොව මෙ ලොව දෙක්හි ම කායික-චෛතසික දුඃඛයාගේ දිග් ගැසීමට කරුණු වන්නේ ද එහෙයිනි.

"ත තං කයිරා" යනු බොහෝ පොත්හි

පාපං වෙ පුරිසො කයිරා – පුරුෂ තෙමේ පවක් කෙළේ නමුත්

නුවණැති මිනිස්සු තම සිත, යමකින් ඇත් කොට රැක ගණිත් ද, ඒ ඇත් කර ගැණීමට ඉම වූ කර්ම්ය, **පාප** නම් වේ. මේ ඇදුරුවදන්:- **'පාතති රක්ඛතති සුජනා අත්තානං අස්මාති පාපං'** යනු.

න නං කයිරා පුනපපුනං = එය නැවැත නැවැත නො කරන්නේය.

න තමහි ඡන්දං කයිරාථ = එහි ආලය නො කරන්නේ ය.

පාපය, අපායයට මග වන බැවින්, මෙ ලොව දීත් නපුරක් ම කරණ බැවින් නුවණැත්තේ එහි ඇලුම් නො කරන්නේ ය. කරණු කැමැත්ත **ඡන්ද** නම්.

දුක්ඛො පාපස්ස උච්චයො = පව් රැස් කිරීම දුක් ය.

සසර, ජාතියෙන් ජාතියට ඉපිද මැරී යන සත්ත්වයා යම් දුකක් විඳින්නේ නම්, ඒ දුකට හෙතුව පව්රැස් කිරීම ය. රැස් කරගත් පව සත්ත්වයාට දුක් දෙන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

සෙය්‍යසකස්ථවිරස්තුව නිමියේය.

පොරි දුන් ගැහැණියක්

9 - 3

රජගහනුවර පිපඵලිගුහාවෙහි වැඩ වසන ආයුෂ්මත් මහා කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේ එක් අවස්ථාවෙක ධ්‍යානයට සමවැද සත්වන දිනයෙහි ඉන් නැගී සිටි සේක. එදා පිඬු සිහා යන්නට තැනක් දිවැසින් බැලූ උන්වහන්සේ ඒ වේලෙහි හැල් කෙතක් රැක ඇල්වී කරල් කඩා ගෙණ අවුත් විලද බඳින ගැහැණියක දැක, නැවැත 'මෝ මට යමක් දෙන්නට පොහොසත් දැ' යි බැලූහ. පොහොසත් බව හා මහත් සැපත් ලබන බව දුටු ස්ථවිරයන් වහන්සේ සිවුරු ගැටවටු ගත්වා පාත්‍ර ය ගෙණ ඇල් කුඹුර සමීපයට ගොස් පසෙක වැඩ සිටියහ. ඕ තොමෝ උන්වහන්සේ දැක පහත් සිත් ඇත්තී මහත් සතුටට පැමිණ 'ස්වාමීනි! වැඩ සිටිනු මැනැවැ' යි විලද ගෙණ උන්වහන්සේ වෙත ගොස් විලද පුදා පසඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි! මමත් ඔබ වහන්සේ දුටු ධර්මයට හිමි තැනැත්තියක් වන්නෙම්වා' යි පැතූ ය. උන්වහන්සේ 'එසේ වේවා' යි අනුමෝදනා කළ සේක. ඕ ද තෙරුන් වැඳ තමන් කළ ඒ පින්කම් ගැණ සිතමින් එහි හුන්නු ය.

ඒ කෙත, අසලමඟ, එක් පසෙක මහත් බිලයක් විය. එහි දරුණු විස ඇති සර්පයෙක් විසි ය. ඌ, තමන් කළ පින්කම ගැණ සිතමින් එමඟ ගිය ඒ ගැහැණියට දෂ්ට කෙළේ ය. විෂ පැතිර ගැණීමෙන් මූසපත් වූ ඕ තොමෝ එහි බිම ඇද වැටුනී, පහත් සිතින් කලුරිය කොට තව්තිසා දෙව්ලොව රන් විමනෙක උපන. අත්බව තුන් ගවු පමණ ය. සර්ව්‍යලඞ්කාරයෙන් අලඞ්කෘත මේ දෙව්දූ, දෙලොස් යොදුන් පමණ දිගැති හැකිළූ කල තුඹ මලක් පමණ වන දිව්‍යඵළුවක් හැඳ, එබදු ම එකක් පොරොවා දෙවඟනන් දහසක් පිරිවර කොට ගෙණ තමන් පෙර කළ කම් කියා පාන්නට සේ රන් විලදින් පිරුණු රන් තැටිවලින් හොබින විමන් දෙරකඩ සිට, තම සම්පත් බලා 'මේ සැපත ලද්දී මා හිමි වූ මහසුප් තෙරුන්ට පිදූ විලද දැනයේ විපාක වශයෙනැ' යි දැන, 'මෙබදු කුඩා කමකින් මෙවැනි මහත් සැපතක් ලැබූ මා පමාවීම නොසුදුසු ය, මා මුන්වහන්සේ පිළිබඳ වත් පිළිවෙත් කොට මේ සැපත ස්ථිර කරම්' යි උදෑසන ම රන් ඉදලක් හා කූඩයක් ගෙණ අවුත් තෙරුන් වසන පිරිවෙණ හැමද, කුණු කසළ බැහැර දමා පැන් හා නානදිය එළවා තැබූ ය.

තෙරුන් වහන්සේ මේ හැමදුම් පැන් එළවා තැබුම් හෙරණකු විසින් කරණ ලදැ, යි සිතූහ. දෙවඟන දෙවන දා

එසේ කළා ය. තෙරුන් වහන්සේ එදත් ඒ හැටියෙන් ම සැලකූ හ. තෙවන දා හමදින වේලේ යතුරු සිදුරෙන් ඇතුළු ගෙට වැටුනු ශරීරාලොකය දැක, දෙර හැර 'මිදුල හමදින්නේ කවරෙක් දැ' යි ඇසූහ. එවිට ඕ තොමෝ 'ස්වාමීනි! මම, ඔබ වහන්සේගේ උපස්ථායිකා වූ ලාජදෙව දුහිතෘ' යි කිවූ ය. 'මට මෙයට පෙර එ නම් ඇති උපාසිකාවක් උපස්ථාන කළා දැ' යි උන්වහන්සේ අසා වදාළ කල්හි 'ඇයි ස්වාමිනී! එසේ අසනු, මම පෙර ඇල්ලී කුඹුරක් රක්නී, පිඹුසිඟා වැඩි ඔබ වහන්සේට විලඳ ටිකක් පුදා පහත් යිනින් ආපසු යන්නී, නයකු විසින් ඩසිනු ලැබ කලුරිය කොට තව්තිසා දෙව්ලොව උපන්නෙමි, මා විසින් මෙසේ ඔබ වහන්සේ නිසා මහත් සැපතක් ලද්දී ය. දැනුත් ඔබ වහන්සේගේ වතාවත් කොට මා ලැබූ ඒ සැපත තර කර ගන්නට සිතා මෙහි ආවෙමි' යි ඕ තොමෝ කිවූ ය. 'ඊයේ පෙරේදත් මෙහි අතුපතු ගැවා, පැන් එළවා තැබුවා නී දැ' යි ඇසූ විට 'ස්වාමිනී! එසේ ය' යි කිවා ය.

ඉක්බිති මහසුප් තෙරනුවෝ 'දැන් ඉතින් වත් පිළිවෙත් කළා ඇති, මින් පසු මෙහි නො ආ යුතු ය, කල වත් පිළිවෙත් තිට සැහේ, දැන් මෙ තැන හැර යව' යි කී හ. 'අනේ ස්වාමීනි! එසේ නො වදාරනු මැනැවි, කුමක් නිසා එසේ වදාරහු, ඔබ වහන්සේ නිසා ලත් මේ සැපත තහවුරු කර ගන්නට මට ඉඩ දෙනු මැනැවි, මා නො නසනු මැනැවි, මට ඉඩ දෙනු මැනැවැ' යි දෙවිදූ පුනපුනා කියත්, මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ වෙත දෙවිදුවක පැමිණ මිදුල් හැමද, පැන් එළවා තබා, උපස්ථාන කළා, යි ධර්මකථිකයන් ලවා නො කියව, මෙබඳු කීම්වලට මා ලක් නො කරව, මෙවක් පටන් වත් කරණු තබා මෙහි පැමිණීම ද නො කළ යුතු ය' යි ස්ථවිරයන් වහන්සේ කී හ. එවිට ද ඕ තොමෝ 'ස්වාමිනි! මා නො නසනු මැනැවැ' යි ඇවිටිලි කළා ය. ඉක්බිති ස්ථවිරයන් වහන්සේ 'මා කියන්න නො අසා' යි සිතා නී තීගේ පමණ නො දනිහි' යි අසුර ගැසූහ. එවිට දෙව්දූ තොමෝ අහසට නැග දෙහොත් මුදුනෙහි තබා 'ස්වාමිනි! මා ලද සැපත තව තවත් දියුණු කර ගන්නට ඉඩ දෙනු මැනැවැ' යි අහස සිට හඬන්නට වූ ය.

දෙව්රම්වෙහෙර ගඳකිළියෙහි වැඩ හුන් බුදුරජානන් වහන්සේ ඇගේ හැඬීම අසා, ආලොකය පතුරුවා ඇය ඉදිරියෙහි හිඳ වදාරන්නහු සේ 'දෙව්දුව! මාගේ පුත් මහසුප් තැන තිට අභිඤ්ඤා නො වේ, ඒ තැන ඒ තැනගේ ආරක්ෂාව සලසා ගත යුතු ය, උන්නැහේ කොතරම් භික්ෂූනෝ ද, ලොකාපවාදයෙන්

මිදිය නොහැක්කෝ ය, ඉදිරියෙහි ඇති වන ලොකාපවාදය නිසා තිට ඒ තැන යන්නෑ, යි කියයි, ඒ තැනගේ සංවරය ඒ තැනට ම අයත් ය, පින් කිරීමෙන් මේ මේ සත්ත්වපාක ලැබෙන්නේ ය, යි සිතා පින් දහම් කිරීම පින් කරන්නන් අයත් ය, එහෙයින් ඒ තැන කියන්නට කන් දෙව, පින් කිරීම එලෝ මෙලෝ දෙක්හි ම සැප පිණිස ම වන්නේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක:—

පුඤ්ඤඤ්චෙ පුරිසෝ කයිරා කයිරාථේනං පුනප්පුනං,
තම්හි ඡන්දං කයිරාථ සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝති.

පුරුෂයෙක් තෙමේ පින්කම් කළේ නමුදු, එය නැවැත නැවැත ද කරන්නේ ය. එහි ආලය කරන්නේ ය. පින් රැස් කිරීම සැපය.

සත්ත්වසන්තානය, ඉතා දිගුකලක් ම කෙලෙසුන්ට යටත් වූයේ ය. යටත් ව එන්නේ ය. ඒ කාලය, මෙතරම් ය, යි නොහිණිය හැකි ය. එහි ඉමෙක් නැත. ඒ හෙතුවෙන් සත්ත්වසන්තානය හැම විටක ම පස්කම්හි ඇලී බැඳී සිටී යි. පවට බෙහෙවින් නතුව පවතී. එය වළකාලීමට පිළියම් නොකළේ නම්, හැම කල්හි ම එසේ පවතී. එහෙයින් සිතේ පහළ වන පවිසිතිවිලිවල ප්‍රමාණයෙක් නැත. බුදුරජානන් වහන්සේ සිතතුළ පවිසිතිවිලිවලට ඉපදෙන්නට ඉඩ නොදෙනු සඳහා, නිතර නිතර ම පින් කළ යුතු ය,යි වදාළ සේක. යම් සිතෙක කුසල්සිතිවිලි නිතර පහළ වන්නේ නම්, එහි අකුසල් සිතිවිලිවලට ඉඩ නොලැබෙන්නේ ය.

පුඤ්ඤඤ්චෙ පුරිසෝ කයිරා = පුරුෂයෙක් තෙමේ ඉදින් පින් කළේ නම්.[1]

කයිරාථේනං පුනප්පුනං = එය නැවැත නැවැත ද කරන්නේ ය.

තම්හි ඡන්දං කයිරාථ = එහි ආලය කරන්නේ ය.

සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ = පින් රැස්කිරීම සැප වේ.

මෙසේ වදාලෝ පිණම මෙලෝ පරලෝ දෙක්හි සැප එළවන බැවිනි.

ධම්දෙශනාවගේ අවසානයෙහි දෙවිදු තොමෝ සතළිස් පස් යොදුනකින් ඇත සිටියා ම සෝවත් පලයට පැමිණියා ය.

ලාජදෙවදුහිතෘවස්තුව නිමියේය.

1, 9, 1 "දණ්ඩාභි කරතෝ පුඤ්ඤං" යනු බලනු.

අනාථපිණ්ඩිකසිටානන්ගේ උදුරඅදහස

9-4

අනාථපිණ්ඩික සිටු තෙමේ ජේතවනමහාවිහාරය සඳහා සූපනස් කෙළක් ධනය වියදම් කෙළේ ය. බුදුරජානන් වහන්සේ එහි වැඩ හිඳින කල්හි සිටු තෙමේ දවසට තුන් විටක් උන්වහන්සේට උපස්ථානය පිණිස එහි යයි. යන්නේ ද, හිස් අතින් නොවේ. සාමණේරයෝත් නවක භික්ෂූන් වහන්සේලාත් විහාරයට එන සිටානන්ගේ ඉදිරියට ගොස් 'අපට කුමක් ගෙණ ආ වෙහි දැ' යි විමැරත්. එහෙයින් සිටු තෙමේ කිසි දිනෙකත් හිස් අතින් විහාරයට නොයයි. උදැසන යතොත්, කැඳ අවුළපත් ගෙන්වා ගෙණ යයි. උදැසන කෑමෙන් පසු යතොත්, හිතෙල් උක්හකුරු වෙඩරු ආදි බෙහෙත් වගී ද, සවස්වරුවේ යතොත් මල් සුවඳ විලවුන් වස්ත්‍ර ආදිය ද ගෙණ යන්නේ ය. සිටු තෙමේ මෙසේ නිතර දින පතා දන්දී සිල් සමාදන් ව ගෙණ වෙසෙයි. මෙසේ පැවැති දන් දීම් ආදිය නිසා සිටු අත තුබූ මහාධනසඤ්ඤය අවසන් ව ගියේ ය. සිටු තෙමේ දිළිඳු වි ය. වෙළඳුන් විසින් සිටුගෙන් නයට ගෙණ තුබූ මුදල අටලොස් කෙළක් වි ය. එ ද ඔහුට නොලැබුනේ ය. වෙළෙන්දෝ නයට ගත් ඒ මුදල ආපසු නොදුන්හ. කුලසතු වූ එ පමණ ම ධනය ගංඉවුරෙක නිදන් කොට තුබුනේ වතුරට ඉවුර සේදී යෑමෙන් විනාශයට පත් වි ය. මේ නිසා සිටු තෙමේ මිල මුදල් අතින් පිරිහී ගියේ ය. දිළිඳු වි ය. එහෙත් ඔහු තමන් දෙන දන්, නොකඩ කොට ම දෙන්නේ ය. එහි පසු පසුබැස්මක් නොවි ය. දෙන්නේ ද, එදා මෙන් රසවත් ලෙසින් පිළියෙල කොට නොවේ. මෙදා ඔහු එසේ කිරීමෙහි අපොහොසත් වි ය.

දිනෙක බුදුරජානන් වහන්සේ සිටු මෙසේ ඇමතූහ.

බුදුරජානන් වහන්සේ:- 'මහසිටු! දුනුත් දන් දෙනු ලැබේ ද?'

සිටු තෙමේ:- එහෙයි, ස්වාමීනි! දෙනු ලැබේ.

බුදුරජ:- හොඳට?

සිටු:- අමාරුයි, ස්වාමීනි! එසේ කරණු.

බුදුරජ:- එහෙසැම්?

සිටු:- දුන් දෙන්නේ යම්තමකට, කඩසාලේ බත්, කාඩිහොදි, අමාරුකම නිසා එසේ දෙමි.

බුදුරජ:- ගැහැවිය; එහෙත් දැන් කටුකලෙසට රළුලෙසට දන් දෙමි, යි නොසිතව, ගැහැවිය! තුන් සිත පහදා බුඩාදිආර්‍ය්‍යයනට රළු දෙයක් දෙන ලද ද, එය රළු නොවේ, කටුක නොවේ. නීරස නොවේ. දෙන ලද්දේ ආර්‍ය්‍යපුද්ගලයන්ට බැවින්, එහි කටුකබවෙක් රළුබවෙක් නීරසබවෙක් නොවේ මම පෙර වේලාම බමුණු ව උපන් කාලයේ, දඹදිව වැසි සියලු දෙනා කැඳවා මහදන් දුනිමි, එහෙත් එක දවසකුත් තිසරණයෙහි පිහිටි එකක්හට කිසිවක් දී ඇත නුහුනෙමි, ඒ තරමට එදා ලොකය දන් දීමට තරම් අයගෙන් තොර ව පැවැත්තේ ය, ඒ නිසා ඔබ දැන් දෙන මේ දානය කටුකය, රළුය, යි නොසිතව.

සිටානන්ගේ ගෙයි දොරකොටුවෙහි එක් දෙවිදුවක් අරක් ගෙණ සිටියා ය. ඕ තොමෝ බුදුරජුන් හා උත්වහන්සේගේ ශ්‍රාවකයනුත් සිටානන්ගේ ගෙට ඇතුල් වන විට උත්වහන්සේලාගේ ආනුභාවයෙන් එහි සිටිනු නොහැකි ව දෙදරා ගසි. 'යම්ලෙසකින් මොවුහු මේ ගෙට නොඑන් නම්' ඒ ලෙසට යමක් කියා මුන් හා සිටු බිදුවා ලන්නෙමි'යි සිතා ඒ දෙවි දූ තොමෝ සිටානන්ගේ පොහොසත්කම නිසා, යමක් කියා ගත නොහී නිහඬ ව හුන්නී, 'දැන් සිටු දුප්පත් බැවින් මුන්ගේ මෙහි ඊම වළක් වන්නට යමක් කියමි'යි සිටු නිදන කාමරයට ඇතුල් ව සිටානන්ට පෙනෙන සේ අහස සිටියා ය.

සිටු තෙමේ:- මේ කවුද?

දෙවිදූ:- මහසිට! මම ඔබගේ සිවුවන දොරටුවේ අරක් ගෙණ ඉන්නා දෙවිදූ,

සිටු:- කුමක් නිසා මෙහි ආ වෙහි?

දෙවිදූ:- ඔබට අවවාදයක් දෙන්නට,

සිටු:- හා හොඳයි, මොකක් ද අවවාදය?

දෙවිදූ:- මහසිට! ඉදිරිය නොබලා ම ඔබ විසින් ශ්‍රමණ ගෞතමයන් උදෙසා මහත් මුදල් කඳක් වියදම් කරණ ලද්දේ ය, එහෙයින් ඔබ දැන් දුප්පත් ය, දැනුත් දිගින් දිගට ම එසේ කරණ බව පෙනේ, මෙසේ දිගින් දිගට ම මෙය කර ගෙණ ගියොත් වැඩි දවස් නොගොස් ම තමුන්නාන්සේට භිඟමනට බසින්නට සිදු වනු ඒකාන්ත ය, ශ්‍රමණ ගෞතමයා ඔබට කුමක් කරන්නෙහි? ශ්‍රමණ

ගෞතමයාටත් ඔහුගේ සව්වන්ටත් බත් බුලත් පිණිස වියදම් කරණ ඔය මුදල්කද යම්කිසි කර්මාන්තයක් පිණිස යොදන්න, එවිට දැන් වැටී සිටින ඔය අමාරුකම්වලින් මිදෙනු ඇති ය,

සිටු:- මට නී දෙන අවවාදය ඕක ද?

දෙව්දූ:- මහසිටු! එසේ ය,

සිටු:- මෙ තැනින් යව, තා වැනි දහසකටත් මා දෙන දන් වළකනු නොහැකි ය, නීගේ අවවාද මට නොරුස්නේ ය, නීගේ කිම්වලින් මට වැඩෙක් නොවේ, නීගේ මෙහි විසීම මට හිත පිණිස නොවේ, එහෙයින් වහා ම මෙතැනින් බැහැර යව.

සෝවත්මගට පැමිණ සිටි සිටානන්ගේ බස් අසා, එහි රැඳී ගත නුහුනු දෙව්දූ තොමෝ දරුවනුත් ගෙණ ඉන් නික්ම ගියා ය. ගියා ද, වසන්නට තැන් නොලැබ දුකට පත් ඕ තොමෝ 'සිටු කමා කරවා එහි ම වසමි' යි තුවර අරක් ගත් දිව්‍යපුත්‍රයකු කරා ගොස්, තමන් කළ අපරාධය කියා 'සැමිනි! මා ගෙණ සිටු ලඟට ගොස් මා කෙරෙහි සිටු කමා කරවා, මා හුන් තැන ම වසන්නට ඉඩ ලබා දෙනු මැනැවැ' යි දන්වා සිටියා ය. එවිට දෙව්පුත් තෙමේ 'නී කියන ලද්ද අසුතු ය' යි කියා සිටු වෙත යෑමට නොහැකි ය, යි කී ය. ඉන්, පසු බට නොවූ ඕ තොමෝ සිවු වරම් රජුන් වෙත ගියා ය. ඔවුහු ද එයට කන් නොදුන් හ. එවිට සක්දෙව් රජු කරා ගියා ය. ගොස් 'දෙවයන් වහන්ස! මට ඉන්නට තැනක් නැත, දවස් කිහිපයක් ම මේ දරුවන් ද අත එල්ලා ගෙණ පිහිටක් නොලැබ ඇවිදීමි; ඔබ වහන්සේ මා කෙරෙහි කරුණා කරණු මැනැවි, මට ඉන්නට තැනක් ලබා දෙනු මැනැවැ' යි ඉල්ලා සිටියා ය.

ඉක්බිති සක්දෙවිරජ තෙමේ 'නිට මම උපායයක් කියමි, එයට අනුව කටයුතු කරව' යි කීයේ ය. 'දෙවයන් වහන්ස! එසේ ය, වදාරනු මැනැවි, එසේ කරමි' යි ඕ තොමෝ කිවු ය. සක්දෙව් තෙමේ 'යව, නී ගොස් පළමු කොට සිටානන්ගේ මුදල්ලේකම් තැනගේ වෙශය ගණුව. සිටානන් අතින් ලියවිලිපිට මුදල් නයට ගත් වෙලෙන්දෝ බොහෝය, ඒ මුදල අටලොස් කෙලෙකි, නීගේ ආනුභාවයෙන් ඒ මුදල් ගෙන්වා නිස්ව තිබෙන ගබඩා පුරවාලව, නිදන් කොට තිබූ, දිය පහරින් මුදුබත් වූ මුදලත් අටලොස් කෙලෙකි, එය ද ගෙණැවිත් එහි ම තැන්පත් කරව, අසුවල් තැනත් එ පමණ ම මුදල් තිබේ, එයට හිමිකම් කියන්නෙක් නැත, එහෙයින් ඒ මුදලත් ගෙණැවිත් සිටුගේ නිස් ගබඩාව පුරවාලව, නී කළ වරදට දඬුවම් වශයෙන්, මේ සියලු මුදල් ගෙණැවිත් තබා, සිටු කමාකර ගණුව' යි කීයේ ය.

දෙව්දූ සක්දෙව්දුන් කීලෙසට ඒ සියලු ධනය ගෙණැවිත් ගෙයි ගබඩාවන්හි පුරවා එහි ම අහස බබල බබලා සිටියා ය. ඒ දුටු සිටානන් 'මේ කවරෙක් දෑ' යි ඇසූ විට, 'මහසිටු! මම ඔබගේ සිවුවන දෙරටුවේ අරක් ගෙණ සිටි නුවණමද දෙව්දූ වෙමි, නුවණමදකමින් මා විසින් ඔබ ඉදිරියේ දී කියන ලද්දට මට කමා වන්න, සක්දෙව්දුන්ගේ නියමයෙන් මම සිවුපනස් කෙළක් ධනය ගෙණැවිත් ඔබගේ හිස් ගබඩා පිරවීමි, එසේ කරණ ලද්දේ, මා කී වැරදිකතාවට දඬුවම් පිණිස ය, මෙ තැනින් ගිය දා සිට, ඉන්නට තැනක් නො ලැබීමෙන් වෙහෙසට පත්වා සිටිමි, ඒ නිසා මට කමා වන්නැ' යි දෙව්දූ කිවූ ය.

ඉක්බිති සිටු තෙමේ 'මේ දෙව්දූ තමන් කළ වරදට දඬුවම් විඳිබව කියා තමන් කළ වරද ද පිළිගණී යි, ඒ නිසා බුදුරජුන් වෙත කැඳවා ගෙණ යා යුතු ය' යි ඇය බුදුරජුන් වෙත කැඳවා ගෙණ ගොස් 'ති කළ සියල්ල බුදුරජානන් වහන්සේට සැලකරව' යි කීයේ ය. එවිට දෙව්දූ තොමෝ බුදුරජුන් පාමුල හිස තබා 'සවාමීන් වහන්ස! නුවණමද වූ මම ඔබ වහන්සේගේ ගුණ නො දූන වැරදි කතාවක් කෙළෙමි, එයට මට කමාවනු මැනැවැ' යි පළමු කොට බුදුරජුන් කමා කරවා දෙවැනි ව සිටානන් කමා කරවා ගත්හි ය.

එවිට බුදුරජානන් වහන්සේ කුසල් අකුසල් දෙක්හි ඉෂ්ටානිෂ්ට විපාකයන් දක්වීමට සිටානන්ටත් දෙව්දූවටත් බණ වදාරන සේක් 'ගැහැවිය! මේ ලොකයෙහි පාපිඡ තෙමේ තමන් කළ පාපකර්මය, අනිෂ්ටවිපාක දෙනතුරු, පෙර කළ කුශල-කර්මයන්ගේ වසයෙන් ඉෂ්ටවිපාක විඳින්නේ ය, යම් විටෙක පාපකර්මය, විපාක දෙන්නට පටන් ගත්තේ නම්, පාපකාරී පුද්ගල තෙමේ එවක් පටන් අනිෂ්ට විපාකයක් ම විඳින්නේ ය, එසේ ම පින් කරන්නේ ද කළ, කුශලකර්මය ඉෂ්ටවිපාක දෙන තුරු, පෙර කළ අකුශල කර්මයන්ගේ වශයෙන් දුඃඛවිපාකයක් ම විඳින්නේ ය, ලබන්නේ ය, යම් විටෙක ඔහු කළ කුශලකර්මය, විපාක දීමට ඉඩ ලැබ විපාක දෙන්නට පටන් ගත්තේ නම්, එවක් පටන් යහපතක් ම දක්නේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක:-

පාපොපි පස්සති භද්‍රං යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ පාපෝ පාපානි පස්සති.

භද්‍රොපි පස්සති පාපං යාව භද්‍රං න පච්චති,
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රෝ භද්‍රානි පස්සතීති.

යම් තාක් පව නො පැසේ ද, (ඒ තාක්) පාපයා ද යහපත දකියි. යම් කලෙක පව පැසේ ද, එකල පාපයා පව්පල දකී යි.

යම් තාක් පිණ නො පැසේ ද, (ඒතාක්) පින් කළ තැනැත්තේ ද අයහපත දකි යි. යම් කලෙක පිණ පැසේ ද, එ කල පින් කළ තැනැත්තේ යහපත දකි යි.

පාපො අපි පස්සති භද්‍රං = පාපයා ද යහපත දකි යි

පව් ඇත්තේ, පවින් යුක්ත වූයේ **පාප** නම්. **'කාය-දුච්චරිතාදිනා පාපකම්මෙන යුත්තපුග්ගලො'** යනු, **පාපො** යන්නට කළ අටුවා ය.

පවින් යුත් තැනැත්තේ ද, පව් කම් කරන්නේ ද, පෙර, සසර කරණ ලද පින්බලෙන් උපන් සැපය වළඳන්නේ යහපත දකි යි. සසර, ජාතියෙන් ජාතියට ඉපද මැරී යන සත්ත්වයාගේ සසර සැරිසැරීම, කවදා පටන් ගැණුනේ ද යනු, නො දත හැකි ය. එහි කොණක් නැති බැවිනි. ඉමක් නැති කලක පටන් ඒ ඒ අත්බව්හි ඉපද එන සත්ත්ව තෙමේ එසේ එන්නේ ද, නිකම් නො වේ. සිස් අතින් නො වේ. කය වචන සිත යොදා මෙහෙයා නානාවිධකර්ම රැස් කරමින් ය එන්නේ. ඒ කර්මගණයෙහි කුශලකර්මත් ඇත. අකුශලකර්මත් ඇත. විපාක නො දුන් ඒ කර්ම, කම් කළහු ලුහුබැඳ එයි. පසු පස එයි. එහෙයින් අනුගාමික වේ. කළ අත්බවේ දී විපාක දුන් කර්මයනට වඩා බලගතු කර්ම අනාගතභවයන්හි දී විපාක දීමට ඉතිරි වී ඇත්තේ ය. දැන් මේ අත්බවේදී පව්කම් කරන්නේ ද, යටගිය බවයන්හි කළ කුශල-කර්මයන්ගේ වශයෙන් යහපත දකි යි.

යාව පාපං න පච්චති = යම් තාක් පව නො පැසේ ද. විපාක නොදේ ද.

පාපයා, පෙර කළ පින් බෙලෙන් මෙ ලොව දී සැප විඳින්නේ ඔහු විසින් මෙ ලොව දී කළ පව්කම, මෙ ලොව දී හෝ පරලොව දී විපාක දෙන තුරු පමණෙකි. රා අරක්කු, පෙරණ විකුණන සතුන්, මස් පිණිස විකුණන මරණ, ගණිකා මඩම්, තබන තබවන මිනිස්සු අද සමාජයෙහි ධනවත් ව නන් වැදැරුම් පස්කම් සැප විඳිති. එහෙත් ඔවුහු මෙලොව මෙසේ පව්කම් කරණ බැවින් පාපයෝ ය. මොවුන් මේ විඳුනා පස්කම් සැපය පවත්නේ මොවුන් දැන් කරණ මේ පව් කම් විපාක දෙන තුරු පමණෙකි.

පච්චති යනු, ක්‍රියාපදයි. කුශලකර්මයන්ගේ විපාකය එයින් කියත්. පලදීම කියත්.

යදා ච පච්චති පාපං = යම් කලෙක පාපය විපාක දේද.

පාපයා විසින් කළ පව්කම, යම්කලෙක දිඨධම්මවෙදනීය වසයෙන් මෙලොව දී හෝ, උපපජ්ජ-අපරාපරිය වෙදනීය වසයෙන් පරලොව හෝ විපාක දේ ද. (ඒ වනතුරුය)

අථ පාපෝ පාපානි පස්සති = එකල්හි පාපයා පව්පල දකී යි.

පව් කළ තැනැත්තේ මෙ ලොව නොයෙක් වධබැදුම්වලට ද, පරලොව අපායදුඃඛයට ද වැටෙන්නේ ය. හසු වන්නේ ය. ඒකාන්තය.

පව් කරණ මිනිසා තමන් කළ පාපකර්මය, විපාක දෙන තුරු මෙ ලොව සැප විඳින්නේ, පෙර අත්බවිහි කළ කුශල-කර්මයන්ගේ ශක්තියෙනි. යම් කලෙක දිඨධම්මවෙදනීය වසයෙන් මෙ ලොව ම හෝ උපපජ්ජවෙදනීය අපරාපරියවෙදනීය වසයෙන් පරලොව හෝ තමන් කළ අකුශලකර්මය පැසෙන විට දුක් විඳින්නේ ය.

භද්දං අපි පස්සති පාපං=පින් කළ තැනැත්තේ ද අයහපත දකියි.

කායසුචරිතාදි කල්‍යාණකර්ම ඇත්තේ, කල්‍යාණකර්මයෙන් යුක්ත වූයේ භද්‍ර නම්. **'කායසුචරිතාදිභෙදභද්දකම්මයුත්තතා භද්දං'** යනු එයට කළ අටුවා ය.

යාව භද්දං න පච්චති = යම් තාක් පින්කම් නො පැසේ ද.

පින් කළ තැනැත්තේ' පෙර කළ අකුසල්කම් බෙලෙන් මෙ ලොව දුක් විඳිනුයේ, මෙ ලොව දී කළ පින්කම් මෙ ලොව දී හෝ පරලොව දී විපාක දෙන තුරු පමණි.

යදා ච පච්චති භද්දං = යම් කලෙක පින්කම පැසේ ද.

පින් කළහුට කුශලකර්මය, දිඨධම්මවෙදනීය වසයෙන් මෙ ලොව ම හෝ උපපජ්ජවෙදනීය-අපරාපරියවෙදනීය වසයෙන් පරලොව හෝ විපාක දෙන තුරු, පෙර කළ අකුසල්කම්වල දුකඛ විපාකය විඳින්නට සිදු වන්නේ ය.

අථ භද්දෝ භද්දානි පස්සති = එකල්හි පින් කළ තැනැත්තේ යහපත දකියි.

පින් කළේ මෙ ලොව ලාභසත්කාරාදිසුඛය ද පර ලොව දිව්‍යසම්පත්ත්‍යාදිසුඛය ද විඳින්නේ, යහපත දක්නේ ය.

පින් කරන්නේ, තමන් මෙ ලොව කළ කුසල් පල දෙන තුරු පෙර කළ අකුසල්බලෙන් දුකට වැටෙන්නේ ය. යම් විටක තමන් කළ කුශලකර්මය, මෙ ලොව දී හෝ පරලොව දී විපාක දෙන්නේ ද, එවිට කායිකචෛතසිකසුඛයට භාජන වන්නේ ය,

ධම්දෙශනාවගේ අවසානයෙහි දෙවිවූ තොමෝ සෝවන් පල-යෙහි පිහිටියා ය. දෙශනාව පැමිණ සිටියවුනට වැඩ සහිත වූ ය.

අනාථපිණ්ඩිකශ්‍රෙෂ්ඨිවස්තුව නිමිණේය.

පිරිකර තැන තැන දැමූ මහණෙක්

9 – 5

අප බුදුරජුන් දවස, එක් මහණෙක්, ඇඳ-පුටු-ගුදිරි-කොට්ට-මෙට්ට-ඇතිරිලි ආදී වූ පිරිකර, ප්‍රයොජන ගෙණ ඒ ඒ තැන හැර දම යි. ඒ සියල්ල අව්වෙන් වැස්සෙන් වේයන්-ගෙන් මීයන්ගෙන් නැසී ය යි. ඒ දුටු භික්ෂූන් වහන්සේලා 'ඇවැත! මෙසේ කරන්නෙහි ඇයි? මේ පිරිකර තැන් තැන්වල මෙසේ හැර දැමීමෙන් නැසී යන්නේ නො වේ ද? යම් කිසි-වකින් ප්‍රයොජන ගත්තෙහි නම්, පසු ව එය නො නැසෙන සේ තැන්පත් කළයුතු නො වේ දැ?' යි කීහ.

එ කල්හි ඒ මහණ 'ඇවැත්නි! එය එතරම් ලොකු එකෙක් ද, මා කළ එය එතරම් ලොකු එකෙකැ, යි මට නො පෙනේ, ඒවාට හිත් පිත් නැතැ' යි කියමින් දිනපතා ම එසේ ම කර යි. සෙසු මහණෝ, ඔහුගේ ඒ ක්‍රියාව බුදුරජානන් වහන්සේට දන්වා ලූහ. උන්වහන්සේ ඒ අකීකරු මහණ ගෙන්වා 'මහණ තෝ ඇඳ-පුටු-කොට්ට-මෙට්ට ප්‍රයොජනට ගෙණ නැවැත ඒවා නැසී යන ලෙසින් තැන තැන හැර දමන්නෙහි සැබෑ දැ?' යි අසා වදාළ සේක. 'ස්වාමීනි! එසේ ය, මා විසින් කරණ ලද්ද ලොකු එකෙක් නො වේ, එය ඉතා සුලු ය, මම ඒ නිසා එසේ කෙළෙමි, ස්වාමීනි! කිම, ඇඳ පුටු ආදියට සිත් පිත් නැ නො වේ ද, ඒ සිත් පිත් නැති ඇඳ පුටු අතැන මෙතැන දැම්මාට සිදුවන පව කුමක් දැ?' යි ඒ මහණ කීයේ ය.

එවිට බුදුරජානන් වහන්සේ 'මහණ! මහණුන් විසින් නම්, තා කරණ සේ කළ යුතු නො වේ, පව කුඩා ය, මහත් ය, යි නො සැලකිය යුතු ය, පවෙහි කුඩා මහත්බව සැලකීම වරද ය, වැසි වස්නා වේලෙහි උඩුකුරු කොට එලිමහනෙහි තැබූ කළය එක්විට එක් බින්දුවකින් නො පිරෙයි, නැවැත නැවැත වස්නා කල්හි ගණන් නැති දිය බින්දු වැටීමෙන් පිරෙන්නේ ය, එලෙසින් පව්කරණ මිනිස් තෙමේ කුඩා කුඩා පව් කරන්නේ පිළිවෙළින් එක් තැන් වීමෙන් මහත් පව් රැසක් කරන්නේ වේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:–

මාවමඤ්ඤෙථ[1] පාපස්ස න මන්තං ආගමිස්සති,
උදබින්දුනිපාතෙන උදකුම්භො පි පූරති,
පූරති බාලො පාපස්ස ථොකථොකම්පි ආචිනන්ති.

1. 'මාප්පමඤ්ඤෙථ' යනු බොහෝ පොත්හි

ඒ සුළු පව මා කරා නො එන්නේ, යි පවට අවමන් නො කරන්නේය. නොහොත් පව සුලුය, යි නො සිතන්නේ ය. එක් එක් දිය බින්දුව වැටීමෙන් කළගෙඩිය පිරෙන්නා සේ මද මද ව වුවත් පව් රැස් කරණ අඥ තෙමේ පවෙන් පිරී ය යි.

මා අවමඤ්ඤථ පාපස්ස = පවට අවමන් නො කරන්නේ ය. නොහොත් පව සුලුය, යි නො සිතන්නේ ය.

න මං තං ආගමිස්සති = ඒ පව මා කරා නො එන්නේ ය.

පාප, යි වදුලෝ සතුන් මැරීම් ආදි පව්කම් ය. 'මා විසින් කරණ ලද්දේ ඉතා සුලු පව්කමෙක් ය, මා අතින් කැරුණු ඒ පව්කම ඉතා කුඩා ය, එය මට කවද්ද විපාක දෙන්නේ ද, එය මට විපාක දීමට අපොහොසත්'යි පවට අවමන් නො කට යුතු ය. පව සුලු, යි නො සිතිය යුතු ය, යි වදුළ සේ ය මේ.

උදබින්දුනිපාතෙන උදකුම්භොපි පූරති – එක් එක් දියබින්දුව වැටීමෙන් කළය ද පිරෙයි.

පූරති බාලෝ පාපස්ස = අඥ තෙමේ පවෙන් පිරෙයි.

ථොකථොකංපි ආචිනං = මද මද ව වුවත් පව් රැස් කරණ

වැසි වස්නා වේලේ උඩුකුරු කොට තැබූ හළ මුව ඇති කළ වලන් ආදී කුඹල්බදුනක් එක් එක් දිය බිඳ වැටීමෙන් ක්‍රමයෙන් පිරි යන්නා සේ නුවණැති මිනිස් තෙමේ ටික ටික වූවත් පව් රැස් කරන්නේ, පවෙන් පිරී ගණී යි. එහෙයින් සුලු පව වුවත් නො කට යුතු ය, යි වදුළ සේක.

උදකුම්භ නම්, දිය ගන්නා කළය යි. දිය ගන්නා හැලි වලන් ඇ අන් කුලල්බදුන් ද මෙහි ඇතුළත් ය. **උදකකුම්භ'** යි තුබූ තැන්හි **උදක'** ශබ්දයට **උද'** ආදෙශ වීමෙන් **උදකුම්භ'** වී ය. ඇතැම් කෙනෙක් **උද'** යනු ආදෙශයකැ, යි නො ගෙණ **උද'** ශබ්ද යි ගණිත්.

දියෙන් පුරණු ලබන්නේ **කුම්භ** නම්. **'කෙන පලෙන උම්භියති පූරියතීති = කුම්භෝ'** යනු නිරුක්ති යි.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියෝ ය. බුදුරජානන් වහන්සේ ද එළිම්හන්හි යහනක් පනවා වැඩ හිඳ 'ඇද පුටු ආදිය තැන් පත් නො කෙළේ, වරදට පැමිණේ ය, යි ශික්ෂාපදයක් පැනවූ සේක.

අසංයතඛත්තුවත්ථුව නිට්ඨිතං.

බළල් පා ඇති සිටුවරයා

9 - 6

එක් කලෙක සැවැත් නුවර වැස්සෝ, එකතු ව බුඩප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට දන් දෙති. දිනෙක, එහි එක් දානකට වැඩියා වූ බුදුරජාණන් වහන්සේ 'උපාසකයෙනි! මෙ ලොව දන් දෙන ඇතැම් කෙනෙක්, දන් දෙන්නෝ, එහි අන්හු සමාදන් නො කරවති, එසින් ඔවුනට ලැබෙන්නේ උපනුපන් තැන්වල දී භොගසමපත්තිය පමණෙකි, පරිවාරසමපත්තිය නො ලැබේ, දන් දෙන ඇතැම් කෙනෙක්, තුමූත් දන් දෙති, අන්හුත් එහි සමාදන් කරවති, ඒ හෙතුවෙන් ඔවුහු උපනුපන් තැන භොග සමපත්තිය හා පරිවාරසමපත්තිය ලබති' යි අනුමොදනා කළ සේක.

ඒ වේලෙහි, එහි සිටි එක් නුවණැති මිනිසෙක්, බුදුරජුන් වදුළ මේ බණ අසා 'මම මේ උභයසමපත්තිය ම ලබනු පිණිස එයට හෙතු වන පින්කමක් කරන්නෙමි' යි සිතා බුදුරජුන් නැගිට වඩින වේලේ උන්වහන්සේගේ පසු පස ගොස් 'සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! හෙට මාගේ දානය පිළිගණු මැනැවැ' යි ආරාධනා කොට සිටියේ ය. 'කෙතෙක් භික්ෂූන් ඒ පිණිස ආ යුතු දැ' යි බුදුරජුන් අසා වදුළ විට 'සවාමීනි! සියලු දෙනා වහන්සේය' යි ඔහු කී ය. උන්වහන්සේ එය ඉවසා වදුළ සේක.

ඉක්බිති ඒ මිනිස් තෙමේ, ගමට ගොස්, ගෙයක් කඩපිලක් පැල්පතක් ගානේ යමින් අම්මේ! පියේ! අක්කේ! නංගී! අය්යේ! මල්ලී! යන ආ ලෙසින් උනුනුන්ට සුදුසු සේ අමතමින් මම හෙට දානට බුදුරජාණන් වහන්සේට ආරාධනා කෙළෙමි, එහෙයින් ඒ පිණිස හැකි පමණින් සහලින් කැවිලියෙන් කිරි-යෙන් පැණියෙන් මුදලින් ආධාර කරන්න, ලැබෙන හැම දෙයක් එක් තැන උයා පිහා දන් පිළියෙල කරන්නෙමි' යි කීයේ ය.

එක් ධනවත් මුදලාලි මහතෙක් තම සාප්පුවට සම්මාදම් ඉල්ලා ගොඩ නැගුනු ඒ මිනිසා දැක 'මේ මෝඩ මිනිහා තමන්ට දන් දිය හැකි තරමට උන්නාන්සේලා පමුණුවා නො ගෙණ මුළු ගමරට පුරා සම්මාදම් කරමින් ඇවිදී ය' යි කිපී, 'ඔය! තමුසේගේ අතේ ඇති ඔය බදුන මෙහි ගෙණෙව' යි ගෙන්වා ගෙණ, සහල් මුං මැ ඇඟිලි තුඩුවලින් ගෙණ හැම එකකින්

ටික ටික දුන්නේ ය. එතැන් සිට මේ මුදලාලි **බලල් කකුලැති මුදලාලි**, යි ප්‍රසිඬ වී ය. මේ මුදලාලි, ගිතෙල් හා පැණි දුන්නේ, කොණක ඉදිකටුතුඬක් ලන තරම් වූ ඉතා කුඩා සිදුරක් ඇති කොළ පියැල්ලෑවක් තෙල්බදුනෙහි හා පැණිබදුනෙහි බහා ඒ සිදුරෙන් උනා එන බින්දුවක් දෙකක් පමණෙකි.

උපාසක තෙමේ, අන්‍හු විසින් දුන් සියලු දෑනොපකරණ එක් පැසකටත්, මුදලාලි දුන් සහල් මුං මැ ගිතෙල් පැණි අන් පැසකටත්, ගත්තේ ය. මුදලාලි, ඒ දෑක 'කුමක් නිසා මේ මිනිහා මා දුන් උපකරණ අන් පැසකට ගණ්ඩි දැ' යි සිතා යන්නා වූ ඒ උපාසකයා පසු පස, 'මොහු කරන්නේ කුමක් දැ' යි සොයා බලා මට කියව' යි මෙහෙකරුවකු පිටත් කෙළේ ය. උපාසකයා ඒ ගෙණ ගොස් දෑනය පිණිස කැඳ බත් මාලු පිණි, උයන බදුන්වල මුදලාලි දුන් සහල් මුං මැ ඇට එක දෙක බැගින් හා ගිතෙල් පැණි බින්දු එක දෙක බැගින් හා බහා 'මුදලාලිට වැඩෙක් වේවා' යි කීයේ ය.

මුදලාලි යැවූ මෙහෙකරුවා පෙරලා ගොස් එබව මුදලාලිට දුන් වී ය. මුදලාලි ඒ අසා 'ඔතැනට රැස්වන මහපිරිස් මැද මට නිගාවන ලෙසක් කළොත්, මාගේ නම ඇද කීවොත් බිහා එතැන ම ඇණ මරන්නෙමි' යි සිතා කිරිවිවියක් ඉණ ගත්වා ගොස් දෑනශාලාවෙහි පසෙකට වී හුන්නේ ය.

උපාසක තෙමේ එහි වැඩි බුඬප්‍රමුඛමහාභික්ෂුසඞ්ඝයා වහන්සේ වළඳවා අවසන් කොට බුදුරජුන් අමතා 'සවාමීනි! මම හැම දෙනකුගෙන් ම දෑනොපකරණ ලබා ගෙණ හැම දෙනකුගේ ම උපකාරයෙන් මේ දෑනය පිළියෙළ කෙළෙමි, හැම දෙන ම තම තමන්ගේ වත් පොහොසත් කම් ලෙසින් සහල් ආදී වූ දෑනොපකරණ බොහෝ කොටත් සුවල්ප කොටත් දුන්හ, ඒ හැම දෙනාට ම එයින් මහත් වැඩෙක් වේවා, මෙහි අනුසස් හැම දෙනාට ම ලැබේවා' යි කියා සිටියේ ය.

උපාසකයා කළ මේ පුණ්‍යානුමොදනාව ඇසූ මුදලාලි 'අසුවලා ඇඟිලිතුඩු තුනට අල්ලා සහල් මුං මැ දුන්නේ ය, යි මා වෙත් කොට ගෙණ මාගේ නම ඇද කීවොත් මූ මරන්නෙමි, යි සිතා මම මෙහි ආමි, එහෙත් මොහු එසේ වෙනසක් නොකොට නැළි ගණනින් දුන්නන්ටත් ඇඟිලිතුඩුවලින් ගෙණ දුන්නන්ටත් සම සේ විපාක ලැබෙන ලෙසට පින් දුන්නේ ය, නැළිගණනින් දුන්නා, යි කියාත් ඇඟිලිතුඩුවලින් ගෙණ

දුන්නැ, යි කියාත් කිසිත් වෙනසෙක් නැත, ඒ නිසා මෙබඳු හොඳ අදහස් ඇති මූ කෙරෙහි මා සිතූ සැටි ඉතා අයුතු ය, යම් ලෙසකින් මූ කමා කරවා නො ගත්තෙම් නම්, මාගේ හිස පිට හෙණ වැටෙනු එකාන්තය' යි සිතා උපාසකයා වෙත ගොස් 'උපාසක! ඔබ මට කමන්නැ' යි කීයේ ය.

මේ කිසිත් නො දත් උපාසකයා උඩ බිම බලා 'මේ කිමැ' යි ඇසූ විට ඔහු සියලු තොරතුරු කියා සිටියේ ය. ඒ අසල වැඩ හුන් බුදුරජානන් වහන්සේ එය දැක, 'මේ කිමැ' යි දන් හල වතාවත් කළ අයගෙන් ඇසූහ. ඔවුහු එපුවත් බුදුරජානන් වහන්සේට සැළකළහ. උන්වහන්සේ 'එසේ ද සිටැ' යි අසා වදාළ කල්හි ඔහු එසේ' යි දැන් වී ය. බුදුරජානන් වහන්සේ 'උපාසකයෙනි! පිණ ටිකැ, යි නො සිතිය යුතු ය, අවමන් නො-කට යුතු ය, මා වැනි බුදුරජුන්ට, නැත, බුඩප්‍රමුඛසඞ්ඝයාට දන් දී එය ටිකැ, යි කිසිලෙසකිනුත් සැලකිය යුතු නො වේ, නුවණැති මිනිස්සු පින් කරන්නෝ, වසුන් හැරි බඳුනක් ටික ටික දියෙන් පිරී යන්නා සේ, පිළිවෙළින් පින් කරන්නෝ ය, පිළිවෙළින් පිණෙන් පිරී යන්නෝ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

මාවමඤ්ඤෙථ[1] පුඤ්ඤස්ස නමන්තං ආගමිස්සති,
උදබින්දුනිපාතෙන උදකුම්භොපි පූරති,
පූරති ධීරො පුඤ්ඤස්ස ථොකථොකම්පි ආචිනන්ති.

ඒ සුලු පිණ, මා කර නො එන්නේ ය, යි පිණට අවමන් නො කරන්නේ ය. නොහොත් පිණ ස්වල්පය, යි නො සිතන්නේ ය. දියබිඳු වැටීමෙන් කළගෙඩිය (යම්සේ) පිරේ ද, (එසේ) මඳ මඳ ව පින් රැස් කරණ ප්‍රාඥ තෙමේ පිණෙන් පිරෙන්නේ ය.

මා අවමඤ්ඤෙථ පුඤ්ඤස්ස = පිණට අවමන් නො කරන්නේ ය. නොහොත් පිණ සුලුය, යි නො සිතන්නේ ය.

න මං තං ආගමිස්සති = එ පිණ මා කරා නො එන්නේ ය.

ප්‍රඥවත් මනුෂ්‍යයෝ පිණක් කොට 'මා විසින් සුලු පිණක් කරණ ලද්දේ ය, එය විපාක දීම්වසයෙන් මා කරා නො එන්නේ ය, මෙසේ ස්වල්පමාත්‍ර වූ කුශලකර්මය කො තැන්හි දී මා දක්නේ ද, මම හෝ එය කො තැන්හි දී දකින්නෙම් ද, එය කවදා විපාක දෙන්නේ දැ' යි පිණට අවමන් නො කරන්-නෝ ය. නො සිතන්නෝ ය.

---

1 "මාපපමඤ්ඤෙථ" යනු බොහෝ පොත්හි

උදබින්දුනිපාතෙන උදකුම්මෙහා අපි පූරති = (එක් එක්) දිය බිඳ වැටීමෙන් කළය ද පිරෙයි.

පූරති ධීරෝ පුඤ්ඤස්ස = ප්‍රාඥ තෙමේ පිණෙන් පිරෙන්නේ ය.

ථොකථොකං අපි ආචිනං = මද මද ව පින් රැස් කරණ.

මෙහි වූ **ආචිනං** යනු, උඩ සිටි **ධීරෝ** යනු බලා සිටියේ ය.

වැසි වස්නා වේලෙහි වසුන් හැර උඩුකුරු කොට එලි මහනෙහි තැබූ හැලි වලන් අඟ කුලල් බඳුනක් නිරතුරු ව එක් එක් දිය බිඳ වැටීමෙන් ක්‍රමයෙන් පිරෙන්නා සේ ප්‍රාඥ පුරුෂ තෙමේ ටික ටික වුවත් පින්රැස් කරන්නේ පිණෙන් පිරෙන්නේ ය. එහෙයින් ටික ටික වුවත් පින් රැස් කළ යුතු ය' සි වදාළ සේක.

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ මුදලාලි සෝවත් ඵලයට පැමිණියේය. ධම්දෙශනාව පැමිණ සිටි පිරිසටත් වැඩ සහිත වූය.

චිලාලපාදකශ්‍රේෂ්ඨිවස්තුව නිමියේය.

ධනවත් වෙළෙන්දෙක්

9 - 7

අප බුදුරජුන් දවස සැවැත් නුවර ධනවත් වෙළෙන්දෙක් විසි ය. ඔහු දුගැමි ය. ඉවසන සුලු ය. භික්ෂූන් කෙරෙහි භකතිමත් ය. දෙනු කැමැත්තේ ය. වෙළඳුම් පිණිස තැන තැන යන්නේ ය. දිනෙක, මේ වෙළඳ තෙමේ, බරකරත්ත බර ගණනක් විකිණිය යුතු නොයෙක් බඩුවලින් පුරවා, ගොනුන් බැඳ, සූදානම් කොට, පන්සලට ගොස්, 'මම අසුවල් පළාතට වෙළඳුම් පිණිස යන්නට අදහස් කොට සිටිමි, ඒ පළාතේ යනු කැමැති සවාමීන් වහන්සේලාට මා සමග යනු හැකි ය, කැමැති නම් මම පිළියෙල කරන්නෙමි, සවාමීන් වහන්සේලාට එයින් කිසිත් කරදරයෙක් නො වන්නේ ය, මා හා එඬින්නට කැමැති නම්, සූදානම් වනු මැනැවැ' යි දන්වා සිටියේ ය. ඒ අසා බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා ද ඔහු සමග යන්නට සූදානම් වූහ. වෙළඳ තෙමේ භික්ෂූන් හා මගට බැස්සේ ය

එ දවස, එහි ඔබ්නොබ හැසුරුනු සොරු, මෙබව දුන ඔහු අල්ලා ගන්නට සිතා මග දෙපස වනයෙහි සැඟවී සිටියහ. වෙළඳ තෙමේ භික්ෂූන් සමග වනයට ඇතුල් වන දෙරටුවෙහි එක් ගමෙක නවාතැන් ගත්තේ ය. කරත්ත ලිහා හැර, ගොනුන්ට තණ පැන් දෙමින්, දෙතුන් දිනක් එහි නැවතී සිටියේ ය. භික්ෂූන් වහන්සේලාට දිනපතා ආහාරපාන පිළියෙල කොට දෙන්නේ ය. කල් බලමින් වනයෙහි සැඟවී සිටි සොරු, කල් හෙවී යන කල්හි 'යව, වෙළෙන්දු කවදු එන්නේ දු, යි දුන එව' යි එක් මිනිසකු එහි පිටත් කොට යැවූහ. ඔහු එහි ගොස්, 'වෙළෙන්දු ඉදිරි බලා යන්නේ කවදු දු' යි එගම විසූ යහළු ගම්වැසි මිනිසකු අතින් විමසුවේ ය. 'තව දෙතුන් දිනකින් ඉදිරි බලා යනු ඇතැ' යි ඔහු කී ය.

එසේ කියා ඔහු 'කුමක් නිසා මෙසේ අසවු දු' යි ඔහුගෙන් ඇසී ය. 'අපි වෙළෙන්දු අල්ලා, බඩු පැහැර ගන්නට, මග රැඳී සිටුමු' යි සොරා කී විට 'එසේ නම් වහා යව, අද හෙට ම වාගේ වෙළෙන්දු මෙ තැනින් නික්ම යනු ඇතැ' යි කියා සොරු පිටත් කොට යවා 'මට සොරුන් හා එකතුවීම හොඳ දු; වෙළෙන්දු හා එකතුවීම හොඳ දු' යි සිතා බැලී ය. එහි දී ඔහුට සොරුන් හා එකතුවීමෙන් වැඩක් නො වන බව පෙනී ගියේ ය. එහෙයින් ඔහු වෙළෙන්දු ලඟට ගොස් 'තමුසේ මෙතැනින් පිටත් ව යන්නහු කවදු දු' යි වෙළෙන්දුගෙන් ඇසී ය. 'අද

හෙට ම පිටත් ව යන්නෙමි' යි ඔහු කී විට 'එසේ නො යව, මාගේ කීම අසන්න, තමුසේ අල්ලා, ඉණ ඉහ කඩා ගන්නට බලාපොරොත්තු වන හොරුරුළක් මේ වනයෙහි සැඟවී සිටින බව මම දනිමි, ඒ නිසා තව කිහිපදිනක් මෙහි ම නැවතී සිටින්නැ' යි කී ය.

අනෙකා 'තමුසේ කෙසේ දන්නහු ද, යි ඇසී ය. 'මම හොඳට දනිමි, මාගේ යහළුවෙක් ඒ හොරු රුළේ සිටි යි' ඔහු හා කතා කළ මට මෙය ඔහුගෙන් දැනගන්නට ලැබුනේ ය' යි කී ය. 'හා, හොඳයි, බොහො ම සතුති යි, මම ඉදිරියට නො යමි, පෙරළා ගම් බලා යමි' යි වෙළෙන්දා කීයේ ය.

'දෙ තුන් දිනකින් වෙළෙන්දා එනු ඇතැ' යි මග බලා හුන් සොරු, කල් යන කල්හි නැවැතත් ඒ මිනිහා ම 'යව, වෙළෙන්දා එන දිනය නියම වසයෙන් දැන එව' යි පිටත් කොට යැවූහ. ඔහු පෙර සේ තම යහළුවා වෙතට ගොස් වෙළෙන්දාගේ ගමනේ තොරතුරු දැන, සොරුන් වෙත ගොස්, 'වෙළෙන්දා ඉදිරියට නො ගොස් පෙරළා ගම් බලා යන බව සොරුන්ට දැන් වී ය

සොරු වහවහා ඒ වනයෙන් නික්ම ගොස් වෙළෙන්දා ගම් බලා යන මග සැඟවී සිට ගත්හ. තම සොරමිතුරාගෙන් ම සොරුන් මෙසේ සිට ගත්බව දැන ගත් ඒ ගම්වැසි තෙමේ ඒ වගත් වෙළෙන්දාට රහසින් කී ය. එවිට ඔහු 'මා මෙහි රැඳී සිටියත් මට අමුතු ගැහැටෙක් නැත, ගමට ගියත් මෙයට වඩා පහසුවෙක් ද නැත, එහෙයින් තැන තැන නො ගොය් මෙහි ම රැඳෙමි' යි සිතා භික්ෂූන් වෙත ගොස් 'ස්වාමීනි! මාගේ ඉණඉහ කඩා ගැණීමට බලාපොරොත්තුවෙන් අප එනු බලා ඉදිරියෙහි සිටි හොරු රුළක් දැන් අප ගමට යන බව දැන එමග රැඳී සිටින බව මට දැනගන්නට ලැබී තිබේ, ඒ නිසා මම මෙ තැනින් කො තැනත් නො ගොස් කිහිප දවසක් මෙහි ම නතර වන්නට සිතා ගතිමි, ස්වාමීන් වහන්සේලාත් මෙහි නවතිනු කැමැත්තෝ නම්, එසේ කරණු මැනැවි, තමන්ගේ කැමැත්තක් කළාට වරද නැත, නවතින්නෝ නම්, මම දන්පහන් පිළියෙල කරන්නෙමි' යි කියා සිටියේ ය.

භික්ෂූන් වහන්සේලා 'අපට මෙහි නැවැතී සිටීමෙන් වැඩෙක් නැත, මහත්මයා ටික දිනක් මෙහි නැවැතී සිට සොරබිය පහව ගිය කල්හි පෙරළා එන්න, අපි යන්නෙමු' යි කියා සැවැත් නුවරට ගොස් බුදුරජුන් ඉදිරියට පැමිණ වැඳ සිටියාහ. බුදුරජානන් වහන්සේ 'කිම, මහණෙනි! තමුසේලා උපාසක තැන හා එක් ව

නො ගියහු දැ?' යි ඇසූහ. 'ස්වාමීනි! ටික දුරක් ගියෙමු, වඩා ඇත නො ගියෙමු, ඔහු අල්ලා ගන්නට සොරු දෙ මගෙක ම රැස් කකා සිටියහ, එහෙයින් ඔහු ඉන් ඔබ්බට නො ගොස් එහි ම නැවතුනේ ය, එහි නැවැතී සිටීමෙන් අපට වැඩක් නො වන නිසා අපි හැරී ආවෙමු' යි භික්ෂූන් වහන්සේලා කී හ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ 'ධනවත් වෙළෙඳ තෙමේ, ජීවත්වනු කැමැත්තකු අති දරුණු විෂ දුරු කරන්නා සේ සොරුන් රැඳී සිටි මග අත් හැරියේ ය, සසර බිය දක්නා සුලු මහණහු විසින් ද මේ තුන් බවය, සොරුන් නැගී සිටි මග වැනිය, යි සලකා පව් දුරු කළ යුතුය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

වාණිජොව භයං මග්ගං අප්පසත්ථො මහඛනො,
විසං ජීවිතුකාමොව පාපානි පරිවජ්ජයෙති.

තමන් කැටුව යන වෙළඳුන් නැති මහදන වෙළඳකු, ප්‍රතිභය සහිත වූ මග හැර යන්නා සේ, ජීවත්වනු කැමැත්තකු දරුණු විෂය හැර දමන්නා සේ පව්කම් දුරු කරන්නේ ය.

වාණිජො ඉව = වෙළඳකු සේ.

සල්පිල් තබා හෝ රෙදිපොදි ඇ පොදි, කර හිස තබා හෝ කත්බර අතින් කරින් රැගෙණ හෝ යනාදී නොයෙක් ලෙසින් බඩු විකොට මුදල් උපයන්නේ **වාණිජ** නම්.

ඉව, යනු, නිපාත ය. සමානාර්ථ වාචක වේ. මේ සඳහා වගේ, වැනි, මෙන්, සේ, එව් යනාදී නිපාත සිංහලයෙහි යෙදේ.

භයං මග්ගං = බිය සහිත වූ මග.

භය නම්, චිත්තොත්‍රාසය යි. සතුරන්ගේ රෞද්‍රභාවාදියෙන් හට ගත් චිත්තවිකලත්වය භය නැමැ, යි සාහිත්‍යදර්පණයෙහි කියන ලදී. **මග්ගං**' යන්නට විශෙෂණව සිටියේ ය. '**චොරෙහි පරියුට්ඨිතත්තා සප්පටිභයත්ති අත්ථො**' යනු අටුවා ය.

මග්ග යනු, ප්‍රතිපදා - ප්‍රකෘතිමාර්ග - උපාය - කථාප්‍රබන්ධ යන මෙ තැන්හි එයි. ජාතිජරාදුක්ඛයන්ගෙන් පරිපීඩිතසත්ත්වයන් විසින්, නිවනට පැමිණෙනු පිණිස එකාන්තසෙන් සෙවිය යුතු ප්‍රතිපදාව, මග්ග නමින් කිය වේ. විශෙෂයෙන් කිය යුත්තේ, අවිද්‍යාවෙන් සම්මුඪවූවන් විසින්, ගවේෂණය කළ යුතු බැවින්, සෙවිය යුතු බැවින්, ආර්‍ය්‍යප්‍රතිපදාව මාර්ග, යි සසුනෙහි හඳුන් වන

ඛව ය. **'මං සිවං ගච්ඡති එතෙනාති = මඟෙහා: නිබ්බානං, මඟෙහති, නිබ්බානඤ්ඤෙකි වා මඟයියතීති-මඟෙහා, කිලෙස මාරෙනෙනා ගච්ඡතීති = මඟෙහා'** යනු නිරුක්ති යි.

මග යන්නන්, පාපහරින් තෘණරහිත කරණු ලැබේ, නුයි පථිකයන් විසින් සොයනු ලැබේ, නුයි මඟ නැමැ, යි කියනු ලබන්නේ ප්‍රකෘතිමාගීය යි. **'පථිකෙකි මජ්ජතෙ නිතතිණං කරී යතෙති=මඟෙහා, පථිකෙකි මඟගීයතෙති වා = මඟෙහා'** යනු නිරුක්ති යි.

ඉතදූ නිපදවනු කැමැත්තන් විසින්, ඒ පිණිස යොදන උපායය, **මඟ**, යි ද කියනු ලැබේ. **'තං තං කිච්චං හිතං වා නිප්ඵාදෙතුකාමෙකි මඟ්ගීයති ගවෙසීයතීති = මඟෙහා'** යනු නිරුක්ති යි. ඒ නම් උපාය ය. **'තං තං උප්පත්තිං මඟගති ගවෙසති ජනෙති නිප්ඵාදෙතීති = මඟෙහා'** යනු ටීකා ය.

'මහාවිහාරවාසිනං වාචනාමඟගනිසසිතං' යන තන්හි යෙදී සිටි මඟ ශබ්දය කියන්නේ කථාප්‍රබන්ධය යි. එද මග මෙන් දිග් බැවින් එසේ හඳුන්වනු ලැබේ.

මෙහි වූ මඟශබ්දය, ප්‍රකෘතිමාගීය කිය යි. සවභාවයෙන් පිහිටි මඟය ඒ. **'මාගීයතෙ සංස්ක්‍රියතෙ පාදෙන මඟ්‍යතෙ ගමනාගාන්විජ්‍යතෙ ඉති = මාගීඃ'** යනු නිරුක්තිවචන යි.

අප්පසත්ථා = වෙළඳ සමූහයක් නැති.

වාණිජා යනු, වෙසෙස යි. **සත්ථ** නම්, වෙළෙඳ සමූහය යි. වෙළඳුමට බඩු ගෙණ අන් අන් පෙදෙස් කරා ගියා වූ හෝ යන්නා වූ ජනසමූහ තෙමේ ය සත්ථ. **'භණ්ඩමූලං ගහෙත්වා වාණිජාය පදෙසනතරං ගතො ජනසමූහො සත්ථොති වුච්චති'** යනු කීයේ, ඒ අරුත් පවසන්නට ය. මේ සත්ථය, **ජඞ්ඝසත්ථ-සකටසත්ථ**, යි දෙපරිදි ය. විකිණිය යුතු බඩු විකිණීම පිණිස අතින් කරින් හිසින් කදින් ගෙණ, පා ගමනින් හැසිරෙන්නේ, ජඞ්ඝසත්ථ ය. බඩු, ගැල් ආදියෙහි ලා ඒ ඒ තැන ගොස් වෙළඳුම් කරන්නේ සකටසත්ථ ය. ඒ මේ සකටසත්ථය අද නොයෙක් ලෙසින් වැඩි ඇත්තේ ය. ගොඩ-දිය අහස් තෙමගින් ම මේ වෙණද සමූහය තෙමේ වෙණදුම් පිණිස ඒ ඒ යාන විශෙෂ-යන්ගේ උපකාරයෙන් දෙශාන්තර කරා යන්නේ ය.

මෙසේ මෙහි සැකෙවින් කියූ එක ද වෙළඳ සමූහයෙකුදු නැත්තේ **අප්පසත්ථ** නම්. මෙහි **අප්ප** ශබ්ද අභාවය කිය යි.

මහද්ධනො = මහත් ධන ඇති. බොහෝ ධනධාන්‍යදිවස්තුව ඇති.

විසං ජිවිතුකාමො ඉව = විෂ නසා දුරු කොට ජීවත්වනු කැමැත්තකු සේ

ප්‍රාණහරණය කරන්නා වූ ද්‍රව්‍යජාතීහු විෂ, යි කියත්. **'විෂං ප්‍රාණහරං ප්‍රොක්තං'** යි කියූයේ එහෙයිනි. කාකොලක-කාලකූට හලාහල - සෞරාෂ්ට්‍රික - ශෞලකිකෙය - බ්‍රහ්මපුත්‍ර - ප්‍රදීපන-දරද වත්සනාභ, යි ප්‍රධානවිෂජාතීහු නවයෙකි. ඇතැම් තැනක මේ ප්‍රධානවිෂජාතීහු මෙයට වෙනස් ලෙසින් ද දැක් වෙත්. උප විෂජාතීහු පසෙකි. අක්ෂීර - සනුභික්ෂීර - කාලිහාරිකා-කරවීර ධුස්තුර යි. මේ විෂය, ස්ථාවර - ජඞ්ගම, යි දෙ කොටසකට බෙදේ. ස්ථාවරවිෂ, ස්ථාන දශයක් ඇසුරු කර යි. ජඞ්ගමවිෂ, ස්ථාන සොළොසක් ඇසුරු කෙරේ. විස්තර පොතපතින් දත හැකි ය. ජීවත්වනු කැමැත්තේ විෂ දුරු කරන්නේ ය, යනු එකාන්තය.

පාපානි පරිවජ්ජයෙ = පව් දුරු කරන්නේ ය.

භය සහිත මාගීය හැර දමා, තමා හා එක් වූ වෙළඳමුළක් ද නැති ව යන මහදන වෙළඳකු සේ ද, දරුණු විෂ නො කා දුරු කොට ජීවත්වනු කැමැත්තකු සේ ද, තමාට සුව කැමැති නුවණැති මිනිස් තෙමේ ස්වල්පමාත්‍රවූත් පාපයක් නො කරන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු පිළිසැඹියාවන් ලබා රහත් වූ හ. ධර්මදෙශනාව පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

මහාධනවණ්ගවස්තුව නිමියේය.

කුක්කුට මිත්‍රයා

9 – 8

රජගහා නුවර සිටු කුලයෙක සිටුදුවක් තොමෝ, සත්මාල් ගෙයි උඩුමාලයෙහි කාමරයෙක ලා මවුපියන් විසින් රකිනු ලැබුවා ය. එහි ඇගේ වැඩට කෙල්ලක් ද වූ ය. දිනක් සවස් වේලේ සිටුදූ තොමෝ ජනෙල් කවුළුවෙන් පිටත කඩ දෙපස බලා සිටියා ය. ඒ වේලේ එක් වැදිගැටයෙක් මුවන් මරා මස් කොට කරත්තයක ලා, එහි ඒරිය කඳ උඩ හිඳ, මස් විකුණන්නට නුවරට ගියේ ය. මුවන් මරා මස් විකොට දිවි ගෙවන, මේ වැදිගැටයා දුටු ඒ සිටුදුවගේ සිත මූකෙරෙහි තදින් ඇලී ගියේ ය. මේ වැදිගැටයාගේ නම කුක්කුටමිත්‍ර ය.

එ කෙණෙහි සිටුදූ තොමෝ තමන් ලඟ සිටි කෙල්ලට තුටු පඬුරක් දී සතුටු කොට 'යව, අර යන පුරුෂයා මස් විකොට පෙරළා එන වේලාව දැන එව' යි ඈ පිටත් කොට යැවූ ය. ඕ තොමෝ, ඔහු වෙත ගොස් 'තමුසේ කොයි වේලේ නැවැත මෙ තැනින් යන්නහු දැ' යි ඇසූ ය. 'අද දවස ම මස් විකුණන්නට සිදු වී තිබේ, ඒ නිසා අද පෙරළා යෑමට ඉඩ ලැබේ දැ, යි නො කියැකි ය, හෙට උදැසනින් ම අසුවල් පාරෙන් යෑමටය අදහසැ'යි වැදිතරුණයා කී විට ඈ ඒ කතාව අසා අවුත් සිටුදුවට දැන්නු ය.

සිටුදුව එය අසා උමතු බවට පැමිණි එකියක සේ, ඇඳුම් කැඩුම් ආදිය පොදි බැඳ තබා ඉතා අලුයම නින්දෙන් නැගිට කිලිටි රෙදිකඩක් හැඳ, කළගෙඩියක් ඉණ තබා, අන් කෙල්ලන් හා එක් ව දියතොටට යන්නියක සේ, ගෙන් නික්ම ගොස්, වැදිතරුණයා කියූ මග, ඔහු එනු බලා සිටියා ය.

ඒ වේලෙහි වැද්දා ද කරත්තයත් ගෙණ එමඟ ආයේ ය. සිටුදූ කිසිත් නො බැණ, ඉණ තුබූ කළගෙඩිය හැරදමා, ඔහු පසු පස ගියා ය. වැද්දා පසු පස එන ඇය දැක 'නවතුව, මා පස්සේ නො එව, යන තැනක යව' යි ඈ නවතාලන්නට උත්සාහ කළ ද ඈ ඔහු පස්සේ ම ගියා ය. ඔහු නැවැතත් 'නැගනිය! මම තී නො හඳුනමි, කවරකුගේ දුවක් දැ' යි නො දනිමි, බැහැර යව' යි කී කල්හි 'පාරේ යන මට නවතින්නැ, යි තමුසේ කියන්නහු කුමක් හෙයින් ද, මහමග කාටත් අයත් ය, යන තැනක තමුසේ යන්න, මා යන්නේ මාගේ කැමැත්ත ලෙස ය, මාගේ ගමන

වළකාලීම ඔබට අයත් වැඩෙක් නොවේ, ඔබ යන තැනක ඔබ යන්න, මා යන තැනක මම යමි' යි ඕ තොමෝ කිවු ය. වැද්දෑ නැවැත නැවැතත් 'මා පස්සේ නොඑව' යි කීයේ ය.

එවර, ඕ තොමෝ 'තම තමන් වෙත එන සැපතට, පයින් ගසා පන්නා හැරීම යුතු නැත, එසේ කරන්නෝ මෝඩයෝ ය, තමන් අතට පත් සැපත නොපිළිගන්නෝ කොහි වෙත් ද, යන තැනක යව' යි කියමින් ම වැද්දාගේ කරත්තයට නැග ගත්තා ය. වැද්දෑ ඇය ගෙණ තමන් වසන තැනට ගියේ ය.

ඇගේ මවුපියෝ, ඇය සැම තැන සොයා බැලූහ. ඇය සොයා ගත නුහුනු ඔවුහු ඇය මළාය, යි සිතා කිහිප දවසක් ගෙවා මතකබත් දත් දුන්හ. වැද්දෑ හා එක් ව ගිය සිටුදූ තොමෝ ඌ හා එක් ව විසිමෙන් පිළිවෙළින් පුතුන් සත් දෙනකු වැදූ ය. ඔවුහු වැඩිවිය පැමිණියෝ දීග ගියහ.

මේ අතර දිනෙක, බුදුරජානන් වහන්සේ අලුයම ලොව බලා වදාළ සේක. ඒ වේලෙහි උන්වහන්සේට දුපුතුන් සහිත වූ කුකකුටමිත්‍රයා පෙනී ගියේ ය. 'කුමක් නිසා මොවුහු මාගේ නුවණැසට හසුවුනෝ දැ' යි බලා වදාළ බුදුරජානන් වහන්සේ මොවුන් කෙරෙහි වූ සෝවන් විමෙහි වාසනාගුණය දුටු සේක. ඒ වේලෙහි ම උන්වහන්සේ පාසිවුරු දරා, වැද්දෑ මළපුඩු අටවා තුබූ තැනට වැඩි සේක. එ දවස ඒ මළපුඩුවල එක ද සතෙකුත් නොබැඳුනේ ය. බුදුරජානන් වහන්සේ එහි තමන් වහන්සේගේ සිරිපා සටහන් ඔබ්බා, එ තැනින් මදක් ඈත්හි වූ කැලෑරොදක සෙවණෙහි වැඩ සිටියා හ.

කුක්කුටමිත්‍ර ඉතා අලුයම දුනු ඊ ගෙණ මළපුඩු අටවා තුබූ තැනට ගොස්, පිළිවෙළින් මළපුඩු බලා යන්නේ, එක ද මලයෙක සතකු නොබැඳුනු බව දැක වඩාත් විපරම් කරණුගේ, ඒ අසල තුබූ පා සටහන් දැක 'කවරෙක් නමුත් මල බැඳි සතුන් මුදා හැරියේ වනා' යි කෝපයෙන් ඉල්පී ඔබිනොබ සොයා යන්නේ, වනරොදසෙවණෙහි හුන් බුදුරජුන් දුටුයේ ය. දැක 'මල බැඳුනු සතුන් මුදා හැරියේ මූය, මූ විද මැරිය යුතු ය' යි සිතා දුනුනී ඇද ගත්තේ ය. බුදුරජානන් වහන්සේ දුනුනී ගන්නා තුරු බලා හිඳ විදින්නට නොහැකිවන සේ ඉරිමක් කළ සේක. ඔහු ඊය විදීමටත්, ඊය බාන්නටත් නොහැකි ව කටින් කෙළ වගුරුවමින් කලානතව සිටියේ ය.

මේ අතර ඔහුගේ පුත්‍රයෝ ගෙට පැමිණියෝ, පියා නොදැක 'පියා මෙතෙක් නාගේ ය, එන්නට කල් යවයි, කල් යවනු යම් කිසි උවදුරක් නිසා විය යුතු ය, යි මැනියන් විචාළාහු ය. ඕ ද 'පුතුනි! මෙතෙක් නාගේ කරදරයක් නිසා විය යුතු ය, ගොස් බලවු' යි ඔවුන් පිටත් කළා ය. පියා සොයා ගිය ඔවුහු දුන්න ඇද ගන්නටත් ඊය විදින්නටත් නොහැකි ව නොසෙල් වී සිටි පියා දැක 'අපගේ පියාට සතුරෙක් මුණ ගැසුනේ වනැ' යි වහා ම දුනුහී ඇද ගත්හ. ඔවුහු ද බුඬානුභාවයෙන් කුමකුත් කරගත නොහී පියා සිටි සේ, කටින් කෙළ වගුරුවමින් සිට ගත්හ. වැදිගැණිය තම නිමියාත් පුතුනුත් එනු කල් යන බව දුන ලේළියන් සත් දෙනාත් ගෙණ, ඔවුන් සොයා ගියා, දුනු නගා ගෙණ කටින් කෙළ පෙරමින් හුන් ඔවුන් දැක, මොවුහු දුනු ඇද ගෙණ සිටින්නෝ කවුරුන් ඉලක්ක කොට දැ' යි වට පිට බැලූ ය.

එ කෙණෙහි ඕ, බුදුරජුන් එහි වැඩ සිටිනු දැක දෙයත හිස බැඳ, 'මා පියා නොනසවු, මා පියා නොනසවු' යි මහහඬින් කෑගැසූ ය. කුකකුටමිත්‍ර, කලාණත ව සිටියේ ද, එහඬ අසා තරමක් සිහි ලැබ 'අග්ගයෝ, වැඩ වැරදුනේ ය, මූ මාගේ මාමණ්ඩිල, මා කළේ වරදැ' යි සිතී ය. ඔහු පුත්තු ද, 'මූ අපගේ මූත්තනු ල, අප කළේ ද බලගතු වරදෙකැ' යි සිතූහ. අනතුරු ව කුකකුටමිත්‍ර, කොපවෙගය සන්සිඳුවා ගෙණ මෙත්සිත් උපදවා ගත්තේ ය.

පුත්‍රයෝ ද 'මූ අපගේ මූත්තනු' යි සිතා මොළොක් බවට පැමිණියහ. එවිට වැදිමවු වූ සිටුදු තොමෝ දුනුහී බැහැර දමා, මා පියා කමා කරවා ගණිවු' යි ඔවුනට කිවූ ය. බුදුරජාණන් වහන්සේ, උන් මොළොක් සිත් උපදවා ගත් බව දුන, දුනු හෙළන්නට අවසර දුන්හ. ඔවුහු බුදුරජුන් වැඳ 'සවාමිනි! අපට කමන්නැ' යි කියා කමා කරවා ගෙණ, පසෙකට වී හුන්හ.

ඒ වේලෙහි බුදුරජාණන් වහන්සේ ඔවුනට දුනකථාදී වූ අනුපිළිවෙළකතාව දෙසූහ. ඒ දෙසුම් අවසන්හි පුතුන් සත්-දෙනාත් ලේළිත් සත් දෙනාත් සමග කුකකුටමිත්‍ර තෙමේ සෝවන් පලයෙහි පිහිටා ගත්තේ ය. බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා හැසිර පස්වරුයෙහි වෙහෙරට වැඩි සේක. ආනන්ද සථවිරයන් වහන්සේ 'සවාමිනි! මෙතෙක් කොතැනක වැඩි සේක් දැ' යි උන් වහන්සේ විචාළාහුය. 'ආනන්ද! මම කුකකුටමිත්‍රයන් වෙතට ගියෙමි' යි වදාළ කල්හි 'සවාමිනි! භාග්‍යවතුන් වහන්සේ ඔහු සතුන් නොමරන්නකු කළ සේක් දැ' යි ඇහූහ. 'ඔව් ආනන්ද!

කුක්කුටමිත්‍ර, මගෙන් බණ අසා දූ පුතුනුත් සමග නො සැලෙන සැදැහයෙහි පිහිටා තුනුරුවන්හි සැක නැත්තේ සතුන් නො මරන්නෙක් වී ය' යි වදාළ සේක.

එවිට භික්ෂූන් වහන්සේලා 'ස්වාමීනි! ඔහුට අඹුවක් සිටී දැ'යි ඇසූහ. 'ඔව්, ඔහුට අඹුවක් සිටියි' ඕ කුලදුවක් වූවා, සෝවන් පලයෙහි ද, පිහිටා සිටින්නී ය' යි වදාළ කල්හි භික්ෂූන් වහන්සේලා 'කුක්කුටමිත්‍රගේ අඹු කුඩා අවදියේ ම සෝවන් පලයට පැමිණ දීග ගියා, පුතුන් සත් දෙනකු ලැබූ ය, ඕ, මෙතෙක් දවස් ම තම හිමියාට සතුන් මරන්නට දුනු ඊ අඩවිය මළපුඩු දැල් ආදිය සපයා දුන්නී ය, ඔහු ඈ එළ වූ ඒ මරුදැල් ආදිය ගෙණ ගොස්, මුවන් හූරන් ඈ සතුන් මැරී ය, කිම, සෝවන් වූවෝ සතුන් මරත් දැ' යි කතාවක් ඉපද වූහ.

ඒ වේලෙහි එහි වැඩි බුදුරජානන් වහන්සේ 'මහණෙනි! සෝවන් වූවෝ සතුන් නො මරති, ඕ, හිමියාට කීකරු වන පිණිස එසේ කළා ය, මා දුන් මේ උපකරණ ගෙණ ගොස් සතුන් මරාවා, යි සිතෙක් ඇයට කිසිවිටක නො උපන්නේ ය, අල්ලෙහි වණයක් නැති කල්හි විෂ අතට ගත්තහුට, අතට ගත් ඒ විෂයෙන් විපතක් නො වන්නේ ය, අතෙහි වණමුඛයක් නැති බැවින් අතට ගත් විෂ ඇඟ පැතිර නො යන්නේ ය, එ පරිද්දෙන් පව් අදහස් නැති බැවින් පව් නො කරන්නහුට දුනුහී ගෙණැවිත් දුන් තරමින් පවක් නො වන්නේ ය, විෂ කෑමෙහි අදහසක් නැති ව අතට ගන්නා විෂයෙන් විපතක් නො වන්නා සේ, පව් අදහස් නැති ව දුනුහී ගෙණවුත් දුන් පමණින් පවක් වන්නේ නො වේ ය' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො ති.

අල්ලෙහි වණයෙක් නො වන්නේ නම්, අල්ලෙන් විෂ ගන්නේ ය. විෂ, අල්ලෙහි වණයක් නැත්තහු අනුව නො යයි. (එසේ) පව් නො කරන්නහුට පවක් නැත.

පාණිම්හි චෙ වණො නඅස්ස=අල්ලෙහි වණයෙක් නො වන්නේ නම්.

පාණි යනු, අතට නමෙකි. එය වෙසෙසක් නො සලකාය. විශෙෂ විසින් **පාණි** යනු, රූඪ වූයේ අල්ලෙහි ය. මෙහි ද එයින්

අල්ල කිය වේ. **'පණති වොහරති එතෙනා ති = පාණි'** යනු එහි අරුත් වැකිය ය. ගණුදෙනුවෙහි ඉවහල් වූ අවයවය, **පාණි** නම්.

'සරීරං වණයති විචුණ්ණෙති ජිඤ්ඤවජිඤ්ඤං කරොතීති= වණො' සිරුර සුණු කරන්නේ, කුදුමහත් සිදුරු කරන්නේ **වණ.** එය, ශාරීරික-ආගන්තුක විසින් දෙපරිදිය. ශාරීරිකව්‍රණයෝ වා පිත් සෙම් ලේ කෝපයෙන් හට ගණිත්. මේ එකක්හුගේ කෝපය වුවත් වණ හට ගැණීමට පමණ ය. එහෙයින් මොවුන්ගේ සන්නිපාතයෙන් වණ හට ගැණුම කිය යුතු නැත. ආයුධ ඇ පහර ලැබීමෙන් කණුකටු ඇණීමෙන් ගල්මුල් හැපීමෙන් හට-ගන්නා වණ ආගන්තුක ය. විස්තර වෙදපොත් ඇසුරෙන් දත හැක්කේ ය. මෙහි ලා දෙවැදුරුම් වණයෝ ම ගැණෙත්.

හරෙය්‍ය පාණිනා විසං = අල්ලෙන් විෂ අර ගන්නේ ය.

'සොණ්තපථගතං විසති දෙහමිති = විසං' සිරුර කා වැදී යන්නේ විස. එහි ස්ථාවර – ජඞ්ගම – කෘත්‍රිම – යොගජ – වෘශ්චික, යි ප්‍රධානභෙද පසෙකි. අවාන්තරභෙද රාශියෙක් වේ.[1]

නඅබ්බණං විසං අත්ථෙති'=විෂ, වණ නැත්තහු අනුව නො යයි.

'න අබ්බණං විසං අත්ථෙති' = යනු පද බෙදුම ය. යමකුගේ අල්ලෙහි වණයෙක් නො වේ නම්, ඔහු විෂයක් අතට ගත්තේ ද ඒ විෂය ඔහුගේ සිරුරෙහි පැතිර නො යයි. විෂය ඇඟ කා වැදී නො යයි. **අබ්බණ,** යි කියේ වණපිළියල් නැත්තේ ය.

නත්ථි පාපං අකුබ්බතො=පව් නො කරන්නහුට පව් නැත්තේ ය.

අල්ලෙහි වණයක් නැති කෙනකු අතට ගත් විෂ, ඔහු සිරුර තුළට කා වැදී නො යන්නා සේ, පව්කම් නො කරන්නකු පව්කම් කරන්නකු අතට, දුනුහී හුල් දුල් ආදී සතුන් මැරීමට ගන්නා උපකරණ දෙන ලද්දේ ද, ඒ දුන්නහු පව්කම් නො කරණ බැවින් ඔහුගේ සිත්තුළ අකුසලවෙතනාවන්ගේ පහළවීමෙක් නැත්තේ ය. එහෙයින් ඕහට පවෙක් නො වන්නේ ය. පාපවෙතනා නැත්තහුට පවෙක් නැත.

මේ ධර්මදෙශනාවෙන් පසු දවසෙක, භික්ෂූන් වහන්සේලා 'දූපුතුන් සහිත වූ කුකකුටමිත්‍රට සෝවන් වීමෙහි හෙතුව කිම, කුමක් නිසා, ඔහුට ඒ ලැබුනේ ද, කුමක් නිසා ඔහු වැදිකුලයෙහි උපන්නේ ද'යි කතාවක් ඉපිද වූහ. එ කල්හි බුදුරජානන් වහන්සේ ඔවුන් පිළිබඳ මේ යටගියාව මෙසේ වදාළ සේක:-

---

1 9 7 'විසං ජීවිතුතාමොව' යනු බලනු.

'මහණෙනි! යටගිය දවස කසුප් බුදුරජුන්ගේ කාලයෙහි උන්වහන්සේ පිරිනිවී ගිය කල ශ්‍රීදෙහය සෑයෙහි නගා දවා ධාතූන් ගෙණ භක්තිමත් මනුෂ්‍යයෝ ධාතුචෛත්‍යයක් කර වන්නට කටයුතු පිළියෙල කළහ, ඔවුහු ඒ චෛත්‍යය හිරියල් අඹරා කුඩු කොට තලතෙල් ලා හනා ගඩොල් සේ කැටි කොට පුළුස්සා එහි ස්වර්ණාලෙපය දී සෑය ඇතුළ ඒ ගඩොලින් බැඳ පිටත වටය එකලා ඝනරනින් බැන්දහ, එහි එක ගඩොල ලක්ෂයක් අගනේ වී ය, මෙසේ ඔවුහු ධාතුනිධානය තෙක් ම සෑයෙහි කළ යුතු සියලු කටයුතු කරවා රැස් වී ධාතුනිධාන පුණ්‍යකර්මය සඳහා මහත් ධනයක් වියදම් කළයුතු බැවින්, පින්කම කවරකුගේ ප්‍රධානත්ව-යෙන් කළ යුතු දැ' යි සාකච්ඡා කළහ, මේ සාකච්ඡාවේ දී එක් ගම්=වැස්සෙක් 'මා මේ පින්කමේ මූලිකයා විය යුතු ය'යි සිතා පින්කම වෙනුවෙන් කෙළක් මසුරන් පරිත්‍යාග කෙළේ ය, එහි සිටි නුවර වැස්සෝ ඒ පරිත්‍යාගය දැක, මෙ නුවර වසන අපේ ධනපතියා උපන්දා සිට නො කා, නො බී, නො දී, මිලමුදලට ම වහල් ව, දුප්පතුන් තළා පෙළා නඩුහබ කියමින් මුදල් ම රැස් කරයි, ඔහුට වුවමනා මුදල් තරකිරීම ය, මෙබඳු මහපින්කමෙක මූලිකයා වන්නට මොහුට සිත් නො උපදියි, අර පිටිසර මිනිසා, කෙළක් මසුරන් දී මේ පින්කමේ ප්‍රධානයා වී ය' යි පරිභවමුඛයෙන් කතා කළහ,

නාගරිකධනපති තෙමේ මිනිසුන් කළ මේ කතාව අසා, 'මම මෙහි නායක වෙමි'යි දෙ කෙළක් දුන්නේ ය, එකල අනෙකා තුන් කෙළක් දුන්නේ ය, එය දැක නාගරිකයා සිවු කෙළක් දුන්නේ ය, මෙසේ මොහු තරඟයට සේ ක්‍රමයෙන් වඩා අට කෙළක් දුන්නේය, පිටිසර මිනිසාගේ වත්කම නව කෙළක් ම වී ය, එහෙයින් ඔහු කල්පනාවට බැස්සේ ය, නුවර වැස්සාගේ වත්කම පමණ නො කොට හැකි වී ය, නිධන් ගතධනය සතළිස් කෝටියකි, ඔහු නිතර ගණු-දෙනුවෙහි යොදා තුබූ ධනයෙහි පමණ නැත්තේ ය, මේ බව දැන සිටි පිටිසර මිනිසා 'මම මේ ලෙසට නව කෙළක් දෙන්නෙමි, දස කෙළක් දෙන්නෙමි, යි වඩා ගියෙම් නම්, මේ තරඟයෙන් මට ජයගණු බැරි ය, මොහු හා මට මොනලෙසිනුත් තරඟ කරණු බැරිය, මාගේ දුප්පත්කම මෙයින් එලිදරවු වන්නේ ය, එය මට මදිකමෙකි, අනුනට නො හැඟෙන සේ එය කළ යුතු ය' යි සිතා 'මම අඹුදරුන් හා මෙතෙක් ධනය දෙන්නෙම්, ධාතුචෛත්‍යය උදෙසා ම දෙන්නෙමි, දැන් ධනය දීමෙන් වැඩෙක් නැත, එහෙයින් මම අඹුදරුන් ගෙණ ධාතුචෛත්‍යය සතු වෙමි' යි දැසෑය සතු වී ය.

එවිට නුවර වැස්සෝ මුදල් කා අතත් තිබේ, එහෙයින් මේ පිණිස මුදල් ලබා ගත හැකි ය, ඒ අපහසු නොවේ, මේ මිනිහා කලේ එබන්දෙක් නොවේ, ඔහු තමන් ඇතුළු මුළු පවුල ම ධාතු-චෛත්‍යය සතු කෙලේ ය, එය හැම දෙනකුට ම කල හැකි නොවේ, එහෙයින් මේ පිටිසර මිනිහා ම මේ මහාපින්කමෙහි ප්‍රධානයා කල යුතුය, මුදල් තුබූ පලියට කෙනකු ප්‍රධාන කිරීම සුදුසු නොවේ, මුදලට වහල්වීම මිනිස්කම නොවේ, එබැවින් අපි මේ ආතම පරිත්‍යාගය කල පිටිසර මිනිහා ම මෙහි ප්‍රධාන කරමු' යි නියම කොට, ඔහු එහි ප්‍රධාන කලහ,

එ තැන් සිට ඔහු මුළු පවුලත් සමඟ සෑයට දුස වී ය, මුළු පවුල, දෙ මාල්ලන් හා සොලොස් දෙනෙකි, නුවර වැස්සෝ එයින් නො පසුබට ව මුදල් එකතු කොට ඒ සොලොස් දෙනා බරට මුදල් සෑයට පුදා ඔවුන් හැම දෙනා දුසභාවයෙන් මුදලූහ, එහෙත් ඔවුහු හැමදෙන දිවි ඇති තෙක් සෑය පිළිදගුම් කරවා සිට මිය පරලොව ගියෝ, දෙව්ලොව උපන්හ. එ තැන් සිට බුබ්නන්තරයක් දෙව්ලොව ම හැසුරුනු ඔවුනතුරෙන් නායකයාගේ බිරිය අප බුදුරජුන් දවස දෙව්ලොවින් අවුත් රජගහ සිටුගේ දුවක් ව උපන, ලදරු වියේ ම ඕ සොවන් වූ ය, ඇයගේ නිමිත්තා නොයෙක් ජාතීන්හි ඉපිද අවුත්, අප බුදුන් දවස වැදිකුලයෙහි උපන, උන් පෙර එක් ව විසීම නිසා, වැදිගැටයා දුටුදු ම ඒ පුඒසෙනහය තෙමේ සිටුදු යටත් කොට ගත්තේ ය, වැදිකුලයට ගියා ද, ඒ පුඒසෙනහය නිසාම ය, පුත්තු දෙව්ලොවින් අවුත් ඇයගේ කුස පිළිසඳ ගත්හ. පුතුන්ගේ භාය්‍යාවෝ ද, ඒ ඒ තැන උපන්නෝ වැනි විය පැමිණ වැදිගෙට ම ආහ, මෙසේ ඒ සියල්ලෝ කසුප් බුදුරජුන් දවස සෑය පිළිදගුම් කළ පිණෙන් සෝවන් පලයට පැමිණියාහු ය' යි.

කුක්කුටමිත්‍රව්‍යාධවස්තුව නිමියේය

කොක නම් බලුවැද්ද

9 - 9

එක් දිනෙක, පෙරවරුයෙහි කොක නම් බලුවැද්ද දුන්නක් ද ඉගණ, බල්ලන් පිරිවරා වනයට යන්නේ, අතර මඟදී ඉදිරියෙහි එන මහණ කෙනකු දැක, උන්වහන්සේ කෙරෙහි කිපී 'මා විසින් කාලකණ්ණියෙක් දක්නා ලද ය, අද නම්, කිසිත් ලැබෙනු නැතැ'යි සිතමින් ගියේ ය. අද ද, භික්ෂූන් වහන්සේ නමක් ඉදිරියට හමු වූ කල්හි, මෙසේ සිතන කියන නොසතුටු වන මෝඩයෝ ඇත්තාහ. ආගම දැනීමෙන් තොර වූ බැවින්, ඔවුහු එසේ සිතති. කියති. නොසතුටු වෙති. මෙලොව පරලොව දෙකින් පිරිහෙති ඔවුහු. වැද්දාගේ ඉදිරියට ආ ඒ භික්ෂූන් වහන්සේ ද, ගම පිඬු සිඟා හැසිර, බත් කිස නිම කොට, පෙරළා විහාරයට වැඩියාහ.

වැද්දා, වනයෙහි ඇවිද කිසිත් නොලැබ ගේ බලා එන්නේ, එවරත් ඒ මහණහු දැක, 'අද මට කිසිත් නොලැබුනේ, මේ කාලකණ්ණියා නිසා ය, දැන් නැවැතත් මූ මුණ ගැසින, දැන් මූ නිකම් හැරිය යුතු නොවේ, බල්ලන් ලවා කවාලන්නෙමි' යි සිතා බල්ලන් උසි ගන්වා භික්ෂූන් වහන්සේ වෙත යැවී ය. උන්වහන්සේ 'උපාසක! මෙසේ නොකරණු' යි කී විට 'අද ඉදිරියට තා හමු වූ බැවින්, මට කිසිත් නොලැබුනේ ය, තවත් වරක් මා හමු වන්නට ඉදිරියට ආවෙහි ය, කිසි කමාවක් නට නැති, බල්ලන් ලවා තා කවාලන්නෙමි' යි බල්ලන් උසි ගැන්වූයේ ය.

භික්ෂූන් වහන්සේ වහා, ගසක බඹයක් පමණ ඉහළට නැඟ ගත්හ. බල්ලන් ගස වට කොට සිටියාහ. වැද්දා ගස ලඟට ගොස් 'තෝ ගසට නැග්ගෙහි නමුත්, නට අද යන්නට ඉඩ නොදෙමි, නට නිදහසෙක් නැතැ' යි කියමින් ඊ තුඹින් යටිපතුලට ඇන්නේ ය. එ කල්හි භික්ෂූන් වහන්සේ මහත් බැගෑපත් හඬින් 'උපාසක! නට පාපයෙකි, මෙසේ නොකරණු' යි කියත් කියත් ම වැද්දා, එයට කන් නොදී කිහිපවරක් ම උන්වහන්සේට ඊයෙන් ඇන්නේ ය.

භික්ෂූන් වහන්සේ, එක් පයකට විදින කල්හි, ඒ පය ඔසොවා ගෙණ, අනික් පය පහත හෙළයි. ඒ පයට විදින විට පළමුවර ඔසොවා ගත් පය පහත හෙළයි. මෙසේ කරමින් නොවිදින්නැ'යි ඉල්ලා සිටියහ. වැද්දා ඒ කිසිත් නොසලකා යටිපතුල් දෙකට ම ඇන්නේ ය. භික්ෂූන් වහන්සේගේ මුළු සිරුර ගිනිපන්දම්වලින් ගිනි තැබුවා සේ දැහෙයෙන් මැඩ ගත්තේ ය. උන්වහන්සේ

වෙදනාව බලවත් වූ බැවින් සිහිය නිසිලෙස පිහිටුවාලීමෙහි අපොහොසත් වූ හ. ඇඟ තුබූ සිවුර ගිලිනී වැටුන ද, ඒ නොදන්හ. සිවුර වැද්දාගේ සිරුර වසා හිස මත වැටුනේ ය. ගස වට කොට සිටි බල්ලෝ භික්ෂූන් වහන්සේ වැටුනාහ, යි සිතා, සිවුරතුලට වැදී වැද්දාගේ ඇඟමස් කඩා කා ඇට පමණක් ම ඉතිරි කොට, සිවුර තුළින් එලියට අවුත් බලා හුන්හ. භික්ෂූන් වහන්සේ ගස තුබූ වියලි අත්තක් කඩා බල්ලන් හුන් තැනට දැම්මාහ. එයින් උඩ බැලූ බල්ලෝ, ගස උඩ හුන් තෙරුන් දැක, 'අප විසින් කා දමන ලද්දේ අපගේ සවාමියා, යි හැඳින වනඝ තුලට වන්හ.

වැද්දාගේ මරණින් කම්පිත වූ භික්ෂූන් වහන්සේ 'මාගේ සිවුර ඇඟමත වැටීම නිසා වැද්ද මළේ ය, වුනේ වරද ය, මාගේ ශීලයට වරදෙක් වී ද, ශීලය පිරිසිදු දැ, යි සිතමින් වහා ගසින් බැස, බුදුරජුන් වෙත ගොස්, මුල සිට සියල්ල කියා, 'සවාමීනි! භාග්‍යවතුන් වහන්ස! මා නිසා වැද්ද මැරුම් කෑයේ ය, කිම, සවාමීනි! එයින් මාගේ ශීලභෙදයෙක් වී ද, මම දුශ්ශීල වෙම් ද, මට මහණකම් තිබේ දැ?' යි ඇසූහ.

බුදුරජාණන් වහන්සේ, 'මහණ! විපිළිසර නොවෙව, නුඹට සිල් තිබේ, ශීලවිපත්තියක් නැත, මහණකම පිරිසිදු ය, වැද්ද වරදක් දෙසක් නැත්තහුට වරද කොට මේ විපතට වැටුනේ ය, ඔය වැද්ද වරද නැති අයට වරද කෙළේ, අද පමණක් නොවේ, පෙරත් වරද නැත්තන්ට වරද කොට, විපතට වැටුනේ ය' යි වදාරා, 'මහණෙනි! යටගිය දවස වෙදෙක්, වෙදකම් පිණිස වෙදකම් සොයා සොයා ගම පුරා හැසුරුනේ ය, සැපිපාසා දෙකින් පෙළුනු ඔහු ගමින් නික්ම ගම්දෙරකඩ සෙල්ලම් කරමින් සිටි ඉතා කුඩා කොල්ලන් දැක, 'මුන් නයකු ලවා දෂ්ට කරවා, මුන්ට පිළියම් කොට, යම්කිසිවක් ලබා ගන්නෙමි' යි සිතා, ගස් සිදුරක හිස එලියට දමා නිදා හුන් නයකු ඒ කොල්ලන්ට පෙන්වා, 'ලමයිනි! බලන්න, මේ කුරුළු පැටවා කොතරම් කදිම ද, ඌ අල්ලා ගන්නැ' යි ඔවුන් පෙළඹ වී ය, එක් ලමයෙක් නයා බෙල්ලෙන් තදින් අල්ලා ගෙණ, එලියට ඇද, නයකු බව දුන,වෙදාගේ ඇඟට දුම්මේ ය, එකෙණෙහි නයා, වෙදාගේ ඇඟ ඒතී දෂ්ට කරණ ලදුව ඒ තැන ම මැරී වැටුනේය මෙ පරිද්දෙන් මේ වැද්ද පෙරත් වරද නැත්තන්ට වරද කොට විපතට පැමිණියේ ය' යි යටගියාවත් දක්වා නැවැත අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක:-

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පචෙව්ති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො ති.

යමෙක් ප්‍රදූෂිත නො වූ, පිරිසිදු වූ, කෙලෙස් රහිත වූ, පුරුෂ-යක්හට වෙෂ කෙරේ නම්, ඒ පව උඩුසුළඟට දැමූ සියුම් රජස තමා කරා ම එන්නා සේ, ඒ අඥානයා කරා ම පෙරළා එන්නේ ය.

යො = යමෙක්,

අනියාමිත වචනය **යො** යනු. අසුවලාය, යි නියම නො කරණ ලද්දේ ම මෙයින් ගැණේ. මෙහි එන **තං** යනු, අපෙක්ෂාවෙන් සිටියේ ය.

අප්පදුට්ඨස්ස = ප්‍රදූෂිත නො වූ. අපරාධ නැති. අනුනට වරද නො කරණ.

යමෙක් තමාට වත් අනුනට වත්, මහත් කරුණක් නිසා වත්, සුලු කරුණක් නිසා වත්, නො කිපේ නම්, වරදක් නො කෙරේ නම්, තමන් කෙරෙහි වත්, අනුන් කෙරෙහි වත් දූෂිත වූ සිත් ඇත්තේ නො වේ නම්, හේය **අප්පදුට්ඨ.** මේ අටුවාව බලන්න, **'අප්පදුඨස්සාති අත්තනො වා සබ්බසත්තානං වා අදුඨස්ස'** යනු.

නරස්ස = නර නම් වූ. නරු යි හඳුන්වන.[1]

සුද්ධස්ස = පිරිසිදු වූ. නිරපරාධ වූ.

සුඛ නම්, පිරිසිදු තැනැත්තේ ය. වරද නැත්තේ ය. **'සුද්ධස්සාති නිරපරාධස්සෙව'** යනු අටුවා.

පොසස්ස = පුරුෂයකුට. නර නම් වූ සත්ත්වයකුට.

නරස්ස – පොසස්ස යන දෙ පදය, එක් කොට අරුත් ගන්නේ ය. දෙ පදය ම එකාර්ථවත් ය. සත්ත්වවාචක වූ නර ශබ්දය යොදා තදර්ථයෙහි ම පොසශබ්දය යෙදුනේ සත්ත්වාර්ථය අන් අයුරකින් දක්වනු සඳහා ය. **'නරස්සාති සත්තස්ස, පොසස්සාති ඉදම්පි අපරාකාරෙන සත්තාධිවචනමෙතන්ති'** යනු අටුවා ය. ධර්මාර්ථාවබොධකයන්ගේ වසයෙන් මෙසේ

1, 7. 8. 'නරො' යන්නට කළ පරිකථාව බයනු

යෙදුනේ ය, යි ද කිය හැකි ය. එක් ම සත්ත්වයාගේ අවස්ථා දෙකක් මේ දෙපරිද්දෙන් දැක්වෙන බැවින්, යම් අවස්ථාවක් යමකුට පෙනේ නම්, ඒ දක්නා අවස්ථාව ගෙණ සත්ත්ව නම් මේ, යි අවබොධ කළහැකි ය.

අනඞ්ගණස්ස = කෙලෙස් රහිත වූ. පව් නැත්තා වූ.

රාගාදී කෙලෙස් යමකු කෙරෙහි නැත්තේ නම්, හේය **අනඞ්ගණ.**

රාග-ද්වේෂ-මෝහයෝ අඞ්ගණ නම්. **'රාගෝ අඞ්ගණං දෝසෝ අඞ්ගණං මෝහෝ අඞ්ගණං'** යන දේශනා එහි සාධක ය. කුමක් හෙයින් මෙතුන අඞ්ගණ, යි හඳුන් වත් ද? මෙන්න එයට පිළිතුරු:- **'පාපකානං හෝ එතං ආවුසෝ අකුසලානං ඉච්ඡාවචරානං අධිවචනං යදිදං අඞ්ගණන්ති'** යනු. රාගද්වේෂාදිය කැමැති ලෙස හැසිරෙන, කැමැති ලෙස පවත්නා අකුශලයන් බැවින් එසේ හඳුන්වති.

අඞ්ගණ ශබ්දය, භූමිභාග - කිලෙස - මල යන අරුත්හි එයි. **'භූමිභාගෙ කිලෙසෙ ච මලෙවාඞ්ගණමුච්චතෙ'** යනු කොෂයි. **'චෙතියඞ්ගණං බොධියඞ්ගණං'** යනාදී තැන්හි භූමිප්‍රදෙශයෙහි වැටේ. **'රාගෝ අඞ්ගණං'** යනාදී තැන්හි කෙලෙස් කිය වේ. **'තෙසෙව රජස්ස වා අඞ්ගණස්ස වා පහාණාය වායමති'** යනාදී තැන්හි මලයෙහි ය. **'අඤ්ජති තඤ්ච සිතං වා අතිසුඤ්ඣතාය අභිබ්‍යඤ්ජතීති = අඞ්ගණං'** යන පාඨයෙන් භූමිප්‍රදෙශය කිය වේ. එහි සිටියහු මැනැවින් ප්‍රකට කරන්නේ, නු යි අඞ්ගණ නම්. භූබණ්ඩය යි. **'අඞ්ගණති එතෙන තං සමඞ්ගීපුග්ගලා නිහීනභාවං ගච්ඡන්තීති = අඞ්ගණං'** රාගාදීන් හා යෙදී සිටින සත්ත්වයෝ ලාමකබවට යෙත්, නු යි අඞ්ගණ නම්. රාගාදිකෙලෙශ-ත්‍රිකයයි. **'අඤ්ජති මඤ්ඤතීති = අඞ්ගණං'** ඇඟ වැකෙන්නේ අඞ්ගණ නම්. රජස් දූවිලි ආදිය යි. මෙහිලා රාගාදිකෙලෙශයෝ ම වදුරන ලද ය. රාගාදීකෙලෙස් නැත්තේ, අනඞ්ගණ නම් වේ. **'අනඞ්ගණස්සාති නික්කිලෙසස්ස'** යනු අට්ඨවාය.

තං එව බාලං පවෙවති පාපං = පව ඒ අඥයා කරා ම පෙරළා එන්නේ ය.

යමෙක් නිරපරාධි වූ පිරිසිදු වූ කෙලෙස් නැති යමක්හට අතින්, පයින්, දණ්ඩෙන්, සැතින්, ගලින්, මුලින්, වචනයෙන්, සිතින් පහරදීම් ආ විසින් අපරාධයක් කෙරේ නම්, ඔහු කළ ඒ පව ඔහු කරා ම එන්නේ ය, යනු භාවයි.

උඩුසුළඟෙහි සිටියහුට පහර දෙනු කැමැත්තෙන් දැමූ සියුම් රජස, ඒ පහර දුන්නහු කරා ම එන්නා සේ, ඔහු හිස පිට ම වැටෙන්නා සේ, නිරපරාධී වූ එකක්හට අත් පා ආදියෙන් පහර දෙමින් යමෙක් අපරාධ කෙරේ ද, ඒ පාපය, මෙ ලොව ම හෝ පරලොව නරකාදියෙහි පැසෙන්නේ, විපාක දුක් වසයෙන් ඒ අඥයා කරා ම පෙරළා එන්නේ ය.

මෙහි රජස්, යි කීයේ දූවිල්ල ය. සත්‍රීපුෂ්ප ප්‍රකෘතිජ ගුණයන්හි ද රජස් ශබදය යෙදේ. එහෙත්, ඒ දෙයරුත මෙහි නො යෙදේ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ පහර කෑ මහණ තෙමේ රහත් වි ය. පැමිණ සිටි පිරිසට ද දෙශනාව වැඩ සහිත වූවා ය.

කොකසුනබලුදදකවසතුව නිමියේ ය.

මැණික්කරු කළ අපරාධය

9-10

අප බුදුරජුන් දවස, සැවැත් නුවර මැණික් කපන්නෙක් වාසය කෙළේ ය. මහණෙක් ඔහුට කුළුපග ව සිටියේ, දෙලොස් අවුරුද්දක් එහි ම දන් ගත්තේ ය. මැණික්කරු හා ඔහු අඹුව හා දෙදෙන මහත් සෘනාහයෙන් ඒ මහණහුට මවුපිය තනතුරෙහි සිට උවටැන් කළහ. දවසක් මැණික්කරු තෙමේ තෙරුන් ඉදිරියෙහි මස් කපමින් හුන්නේ ය. ඒ වේලෙහි කොසොල්රජ තෙමේ 'සණ ගා පිරිසිදු කොට විද එවාලව'යි වටිනා මැණික් ගලක් ඔහු වෙත එවීය.

මැණික්කරු, ලේ සහිත අතින් ම එය පිළිගෙණ එ තැන ම තුබූ පැහැක් මත තබා, අත සෝදා ගන්නට ගෙට ඇතුල් විය. එ කෙණෙහි ඒ ගෙදර වැඩූ කොස්වාලිහිණියෙක් ලේ ගඳ දැනීමෙන් මස් කැබැල්ලකැ, යි සිතා, පියාඹා අවුත් තෙරුන් බලා සිටියදී ම මැණික ගිල ගත්තේ ය අත සෝදා පෙරළා එහි පැමිණි මැණික්කරු, මැණික නො දැක, මැණික ගත්තා ලද්දේ කා විසින් දැ, යි අඹුව හා දූපුතුන් අතින් විචාරා 'අපි නො ගත්තම්හ' යි ඔවුන් කී විට 'මැණික ගත්තා ලද්දේ තෙරුන් විසිනැ' යි සිතා මේ රහස අඹුව හා කතා කෙළේ ය. 'හිමියනි! එසේ කියනු යුතු නැත, අපි මෙතෙක් උත්වහන්සේගේ කිසිත් වරදක් නො දුටුම්හ, උත්වහන්සේ ගත්හ, යි කීම හොඳ නැත, ඒ වරදය, තව සොයා බැලිය යුතු ය, උත්වහන්සේ මෙය ගත්හ, යි මට නම් නො සිතේ' යි ඇ කී විට, ඔහු තෙරුන්ට ලං ව 'සවාමීනි! අර පැස උඩ තිබුනු මැණික ඔබ වහන්සේ ගත්තු දැ' යි ඇසී ය.

උත්වහන්සේ, 'නො ගත්තෙමි' යි කීවිට 'ඔබ හැර අනෙකෙක් දුන් මෙහි නො ආයේ ය, ඔබ හැර අනෙකෙක් මෙහි නැත්තේ ය, මැණික ගත්තහු ඔබ ම ය, ගත්තහු නම්, මා කරදරයෙහි නො ලා, ඔබත් කරදර නො විඳ, මැණික දෙන්නැ' යි මැණික්කරු කී ය.

සථවිරයන් වහන්සේ නිහඬ වූ හ. එවිට ඔහු අඹුට කතා කොට 'සොඳුර! මැණික ගත්තෝ තෙරුන් වහන්සේ ම ය, මේ වේලෙහි අනෙකෙක් මෙහි නො ආයේ ය, සොරකමින් ගත්තක්, නැවැත දෙන්නෝ කවුරු ද, මැණික ගත්තෝ මේ උත්නාන්සේ ම ය, එහි සැකයෙක් නැත, ගහලා බැණලා වත් මැණික ගත යුතු ම ය' යි වැරෙන් කියා සිටියේ ය.

ඕ තොමෝ 'හිමියි! ඔයා මේ කියනු කිම, හාමුදුරුවන් ඔය මැණික තබා, ඔයට වැඩිතරම් වූවක් වුව ද ගන්නේ නැත, ඒ එකාගත ය, මා නොසසන්න, ඔබත් නොනැසෙන්න, ඔය ගැණ හාමුදුරුවන් විචාරනුවට වඩා, මඟ බැස යෑම හොඳ ය, හාමුදුරුවන් තෙරෙහි එබදු දෙෂාරොපණයක් කිරීම බලගතු වරදකැ' යි කිවු ය. මැණික්කරු, අඹුව කී කිසිත් නොගෙණ, 'අප සියල්ලන් දුසකම් කළත් එය, මැණික තරම් නොඅගතේ ය' යි කියා රැහණක් ගෙණ තෙරුන් වෙලා දඹුකඩින් අල්ලා පෙළී ය. තෙරුන්ගේ හිසින් හා නාස්වලින් ලේ ගලන්නට වන. ඇස් ගැල වී පිටත නික්මෙන්නා සේ වී ය.

සථවිර තෙමේ, වේදනාව ඉවසා ගත නොහී, බිම ඇද වැටුනේ ය. ඒ වේලෙහි කොස්වාලිහිණියා ලේ ගඳින් පියාඹා අවුත් ලේ බී ය. මැණික්කරු, කොපවෙහෙසෙන් ලිහිණියාට පයින් හසා හෙළී ය. උඟ එ තැන ම මැරී වැටුනේ ය. ලේ ගලමින් බලවත් වෙදනාවෙන් බිම වැටී හුත් සථවිර තෙමේ 'උපාසක! මාගේ වෙළුම බුරුල් කොට ලිහිණියා මළේ දැ' යි බලන්නැ' යි කී ය. එවිට ඔහු තෝ ද මැරෙව' යි ගුගුලේ ය. 'මැණික ගිල්ලේ මේ සතා ය, මූ දැන් මළ නිසා එය කියමි' යි තෙරුන් කී විට මැණික්කරු ලිහිණියාගේ බඩ පලා බලන්නේ මැණික දැක, වෙවුලන්නේ, සංවෙගයට පැමිණ, තෙරුන් පාමුල වැටී 'සවාමීනි! මට කමන්න, සවාමීනි! මට කමන්න, මේ ගැණ කිසිත් නොදැන, මම මේ අපරාධය කෙළෙමි' යි කියා සිටියේ ය.

එ කල්හි තෙරුන් වහන්සේ, උපාසක! මේ තාගේ දෙෂයෙක් නොවේ, මා අත දෙෂයෙක් ද නොවේ, මෙය සසර දෙෂයෙක් වේ, මම තට කමන්නෙමි' යි කිහ. මැණික්කරු 'සවාමීනි! ඔබ වහන්සේ කමන්නහු නම්, පෙර සේ මාගේ ගෙයි භික්ෂාව හඳුමැනැවැ' යි ඉල්ලී ය.

එ කල්හි, සථවිරයන් වහන්සේ 'උපාසක! අමුත්තක් නොසිතව, මම මෙ තැන් පටන් අනුන්ගේ ගෙයක වහල් පලයක් යටට නොයන්නෙමි, මේ කරදර ගැහැට හැමෙකක් වන්නේ, අනුන්ගේ ගෙවලට වදින්නහුට ය, මෝඩමිනිස්සු මහණ උන්නාන්සේ ඔවුන්ගේ දුස්සන් කොට සිතති, මහණ උන්නාන්සේ ජීවත් වන්නෝ කන්නෝ බොන්නෝ අදින්නෝ පොරවන්නෝ අප නිසාය, යි සිතා සුලු වරදෙහි පවා ගහන්නට බණින්නට තලන්නට සැරසෙති, ඇතැම් මහණහු මහණකම කිමැ, යි නොසිතා, නොදැන, ඔහින්ගේ ගෙට වදිති, උන්ගේ මගුල් අවමගුල්

නැටුම් බලිතොවිල් ආදියෙහි කටයුතු සපයති, අනාවාරයෙහි යෙදෙති, උන්ගෙන් යමක් ලැබුමට කුටොපක්‍රම කරති, නොමහින් උන්ට පසසති, උන් උසස් කොට දක්වති, විෂමාචාර ඇති මහණුන් නිසා යිහියා මහණුන් කෙරෙහි කළකිරෙයි, මේ හෙතුවෙන් ප්‍රියශීලී භික්ෂූහු, යිහින්ගේ ඇණුම් බැණුම්වලට ලක් වෙති, මේ කරුණු නිසා අතපය හයිබල තිබෙනතුරු ගෙයක් ගානේ පිඬු සිහා ඇවිද ජීවත් වන්නෙමි' යි කියා දුහඟදර ව

'මහණට හැම කුලෙන් – ලැබේ ටික ටික ඒ බත,
පිඬු සිහා යන්නෙමි – ඇත්තේ මෙ මට දඟබල'

යන මේ ගය කිහ.

මේ කරුණෙහිලා හට ගත් සංවෙගය ඇති සථවිරයන් වහන්සේ, කල් නොයවා ම පිරිනිවන් පෑහ. මැරී වැටුනු කොස්වාලිභිණියා ද මැණික්කරුගේ අඹුවකුස පිළිසිඳ ගත්තේ ය. මැණික්කරු මැරී ගොස් නිරයෙහි උපන. මැණික්කරුගේ අඹුව තෙරුන් කෙරෙහි පහන් සිත් ඇති ව සිටි බැවින්, කලුරිය කොට දෙව්ලොව උපනි. අනතුරු ව භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙතින් උන් උපත් තැන් ඇසූහ. උන්වහන්සේ 'මහණෙනි! මේ ලොකයෙහි ඇතැම්හු මවුගැබ ම උපදිත්, පව් කළ ඇතැම්හු නිරයෙහි, පින් කළහු දෙව්ලොව උපදිත්, ආස්‍රවරහිතයෝ පිරිනිවී යෙති' යි වදාරා අනුසඤ්ඡගළපා මේ ධම්දෙශනාව කළ සේක:-

ගබ්භමෙකෙපපජ්ජන්ති නිරයං පාපකම්මිනො,
සග්ගං සුකතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා.

සමහර සත්ව කෙනෙක් මවුකුස උපදිත්. පව් කළෝ නිරයෙහි උපදිත්. පින් කළෝ සුගතියට යෙත්. ආස්‍රවරහිතයෝ පිරිනිවෙත්.

ගබ්භංඑකෙකඋපපජ්ජන්ති = සමහර කෙනෙක් මවුගැබ උපදිත්.

ගබ්භං එකෙ උපපජ්ජන්ති = යනු පද සිඳීම යි. **ගබ්භ** ශබ්දය, කුක්ෂියෙහි, කුක්ෂිගත පුත්‍රයා කෙරෙහි, ඔවරකයෙහි හෙන්නේ ය. **'යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මාණවො'** යන තැන මාතෘකුක්ෂියෙහි, **'ගබ්භො ච දෙව පතිට්ඨිතො ගබ්භො ච පතිතො ජාතා'** යන තැන කුක්ෂිගත පුත්‍රයා කෙරෙහි, **'ගබ්භං පවිසථා'** යන තැන ඔවරකයෙහි හුන්නේ ය. ගෙයක් තුල ඇති කාමරය ඔවරක, යි කියනු ලැබේ. මේහි ආයේ මවුගැබ කියනු සඳහා ය.

මැරී යන සත්ත්‍වයන් අතුරෙහි සමහර සත්ත්‍ව කෙනෙක් මවුගැබ උපදනාහ, යි කී සේ ය.

නිරයං පාපකම්මිනො = පව්කම් ඇත්තෝ නිරයෙහි උපදනාහ. **සග්ගං සුකතිනො යන්ති** = පින් ඇත්තෝ ස්වර්ගයට යෙත්.

සුකතී නම් පින් කෙළේ ය. සුකතී යනු සුගති' යි කියූයේ කියන්නේ, ලියූයේ, ලියන්නේ කකාරය ගකාර බවට නිතර පෙරළෙන බැවිනි. මෙය නිපැදුනේ **'කර කරණෙ'** යන ධාතුවෙනි. එහෙයින් පළමු කොට සුකතී යි සිඬ වි ය. පසුව කකාරයට ගකාර ව ග්‍රස්ව ව සුගති යි ආයේ ය. මූලාස්ථාව සුකතී' යනු ම ය. සුගති' යි ගෙණ 'මනාගති ඇත්තේ සුගති වේ, යි අරුත් ගැණීම එතරම් සාර්ථක නො වේ. විමසා ගන්න.

රූපාදී වූ පස්කම් ගුණයෙන් මොනවට උස්ව සිටි තැන, **සග්ග** නම්. **'රූපාදීහි පංචකාමගුණෙහි සුට්ඨු අග්ගොති = සග්ගො'** යනු දන්නේ ය.

පරිනිබ්බන්ති අනාසවා = ආස්‍රවරහිතයෝ පිරිනිවෙත්.

රහතුන් වහන්සේ ය ආස්‍රවරහිතයෝ. උන්වහන්සේලා මගපල නුවණින් සියලු ආස්‍රවයන් නසා සිටියෝ ය. රහතුන් වහන්සේලා උත්පත්ති වශයෙන් කො තැනකත් නො උපදිති.

පරිනිබ්බන්ති, යන මේ ක්‍රියාපදයෙන් දක්වා වදාළෝ නිරුපධි ශෙෂපරිනිර්වාණයෙන් රහතුන් වහන්සේලා පිරිනිවෙනබව ය. එකල සකත්‍යයන්ගේ ඉතිරිවීමෙක් ද නැත. විස්තර කී සේ දන්නේය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පාමිණියාහු ය.

මණ්ඩිකාරකුලොපගතිෂ්‍යස්ථවිරවස්තුව නිමියේ ය.

කම්විපාකය පසුපස යන සැටි

9 - 11

සාදම්රු වූ බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන දවසෙක, උත්වහන්සේ දක්නට, මහත් ගණනක් භික්ෂූන් වහන්සේලා මග බැස දෙව්රම බලා ආහ. අතර මගදී, උත්වහන්සේලා උදැසන ගමක පිඬු සිඟා හැසුරුනාහ. එහම් වැස්සෝ උත්වහන්සේලා දුක, වැඩමවා ගෙණවුත්, අසුන් පනවා වඩා හිඳුවා කෑද අවුළුපත් පිළිගන්වා, පිඬු සිඟා යන වේලාව ලං වනතුරු බණ අසමින් හුන්හ. මේ වේලෙහි ගෙදරක එක් ගැහැණියක් බත් උයා බා තබා, මාලුව්‍යඤ්ජන පිස, ඒවා තෙම්පරාදු කරමින් හුන්නී ය. එ තෙණෙහි ඇතිලි යට ගිනි ඇවිළ ගත්තේ ය. ඉන් නැගි ගින්න පියස්ස ද ඇවිළ ගත්තේ ය. ගින්න බුරබුරා ඉහළ නැංගේ ය. ඒ හා තණහුලක් ද පවනින් අහස නැග ගියේ, අහස පියාඹා ගිය කපුටකු ඇඟ දැවටී ගත්තේ ය. කපුටු එයින් දැවී එ තැන ම ඇද වැටුනේ ය. එහි වැඩහුන් භික්ෂූන් වහන්සේල ඒ දුක, 'අග්‍යෝ! මේ බලවු, කාක්කාට වූ විපත, පවක හැටි, පොළොව ඇවිළ තුබූ ගින්නෙන්, අහස ඉතා දුර පියාඹා ගිය කපුටු දැවුනු සැටි, මෙය පවක්, අපි යමු බුදුරජුන් වෙත මෙය විචාරන්නටැ' යි එ තැනින් නැගී ගියහ.

දිනෙක, තවත් බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා බුදුරජුන් දක්නට නැව් නැග ආහ. ඒ නැව මූද මැද දී ගල් ගැසුනා සේ, නිසල ව සිට ගත. නාවිකයෝ කලබල වූහ. සොයා බැලූහ. නැව නිසලව සිට ගැණීමෙහි හෙතු වූ කිසිවක් නො දුටහ. ඒ අතර එකෙක් 'මෙහි අප අතර කාලකණ්ණි යකු විය යුතුය, නො වේ නම්, මෙසේ නො විය හැකි ය, නැව මොන අතකට වත් පදවනු බැරි ය, කාලකණ්ණියකු සිටිය යුතුම ය' යි කී ය. නාවිකයෝ එක් ව කාලකණ්ණියා සොයා බලන්නට යුහුසුළු වූහ. ඒ පිණිස හැම එකකු අතට සිවිටු දුන්හ. එ වේලෙහි කාලකණ්ණි සිවිටුව ප්‍රධානනාවික යාගේ බිරිය අතට ගියේ ය. තෙවන වරකුත් එසේ කළහ. ඒ වරත් එසේ ම විය. මේ ගැණිය තරුණ ය. දුකුම් කලුය. දුටුවන් සිත් ගන්නී ය.

ඒ වේලෙහි සෙසු නාවිකයෝ, 'මහත්මයානෙනි! මේ ගැණ දුන් අපි කුමක් කරමු ද' යි ප්‍රධානනාවිකයාගේ මූණ බැලූහ. එවිට ඔහු 'මට එකියක නිසා මේ මහාජනයා විපතෙහි හෙළනු බැරි ය, ඒ නිසා තමුසේලාට ඕනෑ එකක් කළාට මගෙන් වරදෙක් නැතැ'' යි කී ය. එ තෙණෙහි නාවිකයෝ, ඇය ඔසොවා ගත්හ. ඕ මරණ භයින් බියපත් ව මරහඬ නගන්නට

වූ ය. එහඬ ඇසූ නාවික තෙමේ 'ඔය ඇදුම් ආයින්තම් මූදට දමනු නොසුදුසු ය, ඒවා ගෙණ රෙදිමාල්ලක් අන්දවා මූද දමවු, කිසිවක් ඇඟ නැති ව මූද දැමූ කල්හි චරින් වැර මැ මතු වන්නී ය, එය මට ඉවසනු බැරි ය, මට මෑ නොපෙනෙන ලෙසට, මූද දැමූ සැටියේ යට කිඳ බසින ලෙසට, වැලිකළයක් බෙල්ලෙහි එල්ලා මූද දමවු' යි නියම කෙළේ ය. ඔවුහු එසේ කළහ. ඕ එ තැන දී ම මස් කැසුබ් ආදීනට බත් වූ ය. මේ පුවත ඇසූ භික්ෂූන් වහන්සේලා ද 'මේ ගැහැණිය කළ අකුශලකර්මය කිමැ' යි බුදුරජුන් විචාරමු" යි නැවෙන් බැස යන්නන් හා එක්ව ගියහ.

අනික් සත් නමක් භික්ෂූන් වහන්සේලා බුදුරජුන් දක්නට වඩින්නෝ, අතර මගදී ම රෑ වූ බැවින්, එක් වෙහෙරකට ගොස් නිදා ගන්නට තැනක් ඉල්ලූහ. ඒ විහාරයෙහි ගල්ලෙනක් වී ය. ගල් ලෙනතුළ ආසන සතක් පිළියෙල කොට ආරාමිකයෝ ඔවුනට ඒ ලෙන භාර කළහ. ඔවුහු එහි නිදි ගත්හ. මහරෑ කුළුගෙයක් පමණ වූ මහගලක් පෙරළී අවුත්, ලෙන්දෙර වසා සිටියේ ය. පාන් වූ කල්හි එහි පැමිණි නෙවාසික භික්ෂූහු, ඒ දැක, වටපිට සිටි මිනිසුන් බොහෝ ගණනක් ගෙන්වා ගෙණ, ලෙන්දෙර වසා සිටි ගල ඉවත් කරන්නට වෙර දුරුහ. එහෙත් ගල තුබූ තැනින් අඟලකුත් එහා මෙහා කරන්නට ඔවුහු අපොහොසත් වූහ. ලෙන තුළ සිටි භික්ෂූන් වහන්සේලා ද ගල පෙරළන්නට මහන්සි ගත්හ. ඔවුනට ද ඒ කරණු නොහැකි වී ය. සත් දවසක් ම මෙසේ ගෙවී ගියේ ය. ආගන්තුකභික්ෂූහු ද, බඬ සයින් පෙළෙමින් සත් දවසක් එහි මහත් දුක් විඳිමින් දිවි ගෙවූහ. සත්වන දින ඒ ගල, තෙමේ ම ලෙන්දෙරින් ඉවත් වී ය. එහි සිටි භික්ෂූන් වහන්සේලා පණ අදිමින් එලි බැස්සහ. උක්වහන්සේලාගේ පණ යන්තම් කට රැඳී තුබුනේ ය. ඒ භික්ෂූන් වහන්සේලා ද 'අප ගේ මේ පව කිමැ' යි බුදුරජුන් වෙතින් අසා දැන ගණිමු' යි කියා එ තැනින් නික්මුනාහ. ඔවුහු එ තැනින් නික් ම ටික දුරක් මග යන්නෝ, අනික් දෙපිරිස හා එක් වූහ. තුන් පිරිස ම බුදුරජුන් වෙත ගොස් වැද පසෙක හිඳ, තමතමන් දුටු කරුණු, තම තමන් ඉදිරියෙහි සිදු වූ දේ, පිළිවෙළින් දන්වා, මෙසේ වන්නට මොවුන් කළේ කුමක් දැ' යි ඇසූහ.

ඉක්බිති බුදුරජානන් වහන්සේ 'මහණෙනි! යටගිය දවස, බරණැස් නුවර ගොවියෙක් විසී ය. ඔහු තම වැඩට ගොනකු හික්ම වන්නේ, හික්මවා ගත නොහැකි වී ය, ඌ ටික දුරක් ගොස් බිම වැතිර ගණියි, තලා පෙලා නැගිටුවනු ලබන්නේ ද

නැවැතත් ටික දුරක් ගොස් බිම ලඟියි, ගොවියාට තමන් කැමැති සේ ඌ හසුරුවා ගත හැක්කේ ය, එ තැන දී මොහු කොපයෙන් මැඩුනේ, ගොනා පිදුරුවලින් වෙළා පිදුරු මිටියක් සේ කොට ගිනි දුල් වී ය, ගොනා මුළුමනින් ද හළු වී ගියේ ය, අද මේ කපුටු එදා ඒ ගොවිය, එදා ඒ කළ පාපකර්මයෙහි විපාකය අද මේ කපුටු වින්දේ ය, මහණෙනි! මේ ම, එහි දරුණු විපාක නොවේ, මූ මේ දරුණු පවින් දිගුකලක් මුළුල්ලෙහි නිරයෙහි පැසී, නොයෙක් කටුක දුක් වින්දේ ය, මෙසේ විද ඉතිරි වූ සවලපකර්මයාගේ විපාක වශයෙන් සිවුවරක් ම කපුටු ව මේ ලෙසින් අහසෙහිදී ම දුවී මළේ ය, මහණෙනි! මේ පස්වන වරය,

මහණෙනි! යටගිය දවස, බරණැස් නුවර ගැහැවියෙක් වී ය, ඔහුගේ අඹුව දුකුම්කලු ය, ඕ ගේදොර දිය ඇදුම් විකෙටුම් බත් පිසුම් ආ හැම කටයුත්තක් ම සියතින් කරමින් සැමියාගේ සිත් ගෙණ විසූ ය, එහි ගෙදර වැඩු බල්ලෙක් වී ය. ඌ දින පතාම ගේ දොර වැඩපල කරණ ඒ ගැහැණිය දෙසට මූණ ලා බිම ලැග හිඳියි, කුඹුරට බත් ගෙණ යන විට, දරපලා පිණිස කැලයට යන විට ආ හා එක් ව යයි, පෙරලා එන විටත් එසේ ම එයි, ඒ දුටු ගම්වැසි තරුණයෝ 'බලුවැදි ගෙන් නික්මුනේ ය, අද මසුන් සමඟ හොඳ හැටි කෑ හැකි ය' යි කවටකම් කරත්, ඕ එයින් ලජ්ජාවට පැමිණ, ගල් කැට ලී කැබලි ආදියෙන් ගසා බල්ලා පලවා හරියි, ඌ එයින් ටිකක් නැවැතී සිට නැවැතත් ඇය ලුහුබැඳ යයි, මහණෙනි! මේ බලු අනෙකෙක් නොවේ, මෙයට තෙවන අත්බවෙහි මේ සත්‍රියගේ හිමි ය, එදා හටගත් සේනහය සිඳ හරින්නට නොහැකි ව මෙසේ ජාතියෙන් ජාතියට ලුහුබැඳ යයි, මහණෙනි! මේ සසර ඇවිදින ගැහැණු පිරිමි අතර අඹු සැමියන් සේ කල් නොයැවූ එක ද ගැහැණියක් නැත, එක ද පිරිමියෙක් නැත, එක් ම ගැහැණිය, ඇති තාක් පුරුෂයන්ට අඹු වූ ය, එසේ ම එක් ම පුරුෂයා, ඇති තාක් ස්ත්‍රීන්ට සවාමිපුත්‍ර වී ය, මත්තෙහි ද එසේ ය, එහෙයින් අග මුලක් නැති මේ සසරෙහි හැම ස්ත්‍රී පුරුෂයෝ ම අඹුසැමියන් සේ කල් යැවූහ, ඉදිරියෙහි ද කල් දවස් යවන්නාහ, වඩා නොදුරෙහි වූ අත්බවිහි නැයන් කෙරෙහි සෙනහය බලවත් ව පවතී, එ හෙයින් මෙයට තෙවන අත්බවේ දී තමාගේ අඹු ව සිටි ඇය කෙරෙහි බල්ලාගේ සේනහය අධික වී ය, බල්ලා ඒ සෙනහය හැර දැමීමෙහි අපොහොසත් වී ය, දිනෙක, ඕ තම හිමියාට කෑද අවුළුපත් ගෙණ කුඹුරට යන්නී, බල්ලා කෙරෙහි නැගි කොපයෙන් රැහැණකුත් ඉණ සහවා ගෙණ ගියා ය, බලු ඇය පස්සෙහි ගියේ ය, අනතුරුව ඕ හිමියාට

කැඳ අවුළුපත් දී හිස් කළයක් ගෙණ ලිදක් ලඟට ගොස් කළය වැල්ලෙන් පුරවා බල්ලාට අඩ ගැ ය, බලු ඉතා ආදරයෙන් වලිගය සොලවමින් ඈ වෙතට ගියේ ය, එ කෙණෙහි රැහණ කොණකින්, බල්ලාගේ බෙල්ල තද කොට බැඳ, අනික් කොණේ කළය බැඳ, කළය ලිඳ තුළට බැවා ය, බලු කළයත් සමඟ ඇදී ගොස් ලිඳට වැටී මළේ ය, මෝ, ඒ පාපකර්මයාගේ විපාක වශයෙන් දිගුකලක් අපායයෙහි පැසී, විපාකාවශේෂවශයෙන් අත්බව් සියයෙක ම වැලිකළ බෙල්ලෙහි බැඳ, දියෙහි දමන ලද්දී, කලුරිය කළා ය, මහණෙනි! මේ ඇය විසින් ඒ විපාකය විඳි සියක්වන අත්බව ය,

මහණෙනි! තමුසේලා විසින් ද මේ විඳින ලද්දේ පෙර, කළ පවෙක විපාකයෙකි, මම එ ද තමුසේලාට කියමි, යටගිය දවස, බරණැස ම වාසභූමි කොට සිටි ගොපලු දරුවෝ සත් දෙනෙක් වූහ, ඔවුහු ගෙරිසරක් ගෙණ තණ කවමින් සතියෙන් සතිය කැලෑ පෙදෙසට යති, දවසෙක ගෙරිසරක් තණ කවා ගෙණ එන්නෝ, අතර මගදී මහතලගොයකු දුක උණ පස්සෙහි ලුහුබැඳ දිවූහ, තලගොයා පලා ගොස් තුඹසක් තුළට වන, ගොයා වැදුනු තුඹසෙහි, සත් තැනෙක සිදුරු තිබෙනු දැක 'දැන් මොකකුත් කරණු බැරි ය, කරදර වීමෙන් වැඩෙක් නො වේ හෙට අවුත් මූ අල්ලා ගණිමු' යි සත් දෙන ම එක් සිත් ව එකෙකා එක් එක් කොළකැටිය බැගින් ගෙණවුත්, ඒ සිදුරු හත වසා යියහ, පසුදා එය ඔවුනට අමතක වී ය, එහෙයින් ඔවුහු වෙනතක ගොස්, එහි සතියක් හරක් තණ කවමින් ගත කළහ, සතිය ගෙවා, එ මහින් ම එන ඔවුහු තුඹස දැක, සිහිපත් වී 'තලගොයාට වූයේ කිමැ, යි බලමු' යි තුඹස වෙත ගොස් තම තමන් සිදුරුවල ගැසූ කොළකැටි ඉවත් කළහ, ඇට සම් පමණක් ඉතිරි ව සිටි ගොයා ද, වෙව්ලමින් ගැහි ගැනී තුඹසින් එලියට ආයේ ය, ඔවුහු ගොයා දැක, හටගත් කරුණා ඇති ව 'මූ මැරීම නො සුදුසු ය, වැඩෙක් ද නැත, තිබෙන්නේ ඇට හා හම ය, මස් ටිකකුත් නැත සත් දවසක් ම කෑම නැති කමින් මූ වැරී ගොස් ය, බඩ ගා යනුත් බැරි ය, මූ මරා කුමට පව් ගණිමු ද' යි කතා කොට යන්නට අත්හැර දුමූහ, මෙසේ ඔවුහු, ගොයා නො මැරූ නිසා නිරයෙන් නිදහස් වූහ. එහෙත් පාපකර්මය ලුහුබැඳ ආයේ ය, සති දෙකක් එකතු ව, තුදුස් අත්බවක සත් දවස, සත් දවස, කෑමට කිසිවක් නො ලැබූහ, බීමට පැනක් නො ලැබූහ, මහණෙනි! මා දුන් කී ඒ කර්මය කලෝ තමුසේලා ය, එදා තමුසේලා ගොපලු කොල්ලෝ ය, අද මාගේ සසුන්හි පැවිදි ව සිටියෝ ද, එදා කළ ඒ කර්මයෙහි දරුණු විපාකය තමුසේලාට මෙසේ විඳින්නට සිදු වී ය' යි ඔවුන් ඇසූ ප්‍රශ්න මෙසේ පහදා දුන් සේක.

එ වේලෙහි එහි සිටි මහණෙක් දණ බිම ඔබා හිඳ, 'ස්වාමීනි කිම, පව් කොට අහස ඉගිලුනත්, මුද වැටුනත්, කඳු ගුහාවන්ට! වැදුනත්, කළ පව්කමින් නිදහසෙක් නෑ නො වේ ද' යි බුදුරජුන් විචාළේ ය. 'මහණ, එසේ ය, නිදහසෙක් නො ලැබේ, අහස් ආදී කො තැනක සිටියත් පවින් ගැලවීමෙක් නැත, කළ පව් කමින් නිදහස් වීමට මෙ ලොව කො තැනකත් නැත, කො තැන සිටියත් පව්කමට ඉඩ ඇත්තේ ය, පාපකර්මයෙන් නිදහසෙක් නැතැ' යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක:-

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මාති.

යම් තැනෙක සිටි සත්ත්ව තෙමේ පව්කමින් මිදෙන්නේ නම්, එබඳු බිම් පෙදෙසෙක් (මෙලොව කො තැනකත්) නැත. අහසෙහි ද නැත. මුහුද මැද ද නැත. කඳුවිවරයන්ට වැද ද නො මිදෙන්නේ ය.

න අන්තලික්ඛෙ = අහසෙහි නැත.

අහසට නමෙකි **අන්තලික්ඛ** යනු. යමක් කරණ කොට ලොකය වස්තුනානාත්වය දකී ද, ඒ ය අන්තලික්ඛ. **'තෙසං තෙසං වත්ථූනං අන්තරං නානත්තං ඉක්ඛතෙ ලොකො එතෙනාති = 'අන්තලික්ඛං'** යනු වාක්‍යයි. සංස්කෘතයෙහි **'අන්තරික්ෂ-අන්තරීක්ෂ'** යි ශබ්ද දෙකක් දක්නා ලැබේ. යමක්හුගේ මැද තාරකාවෝ වෙත් නම්' තාරකාවන්ගේ ඒ ආධාරස්ථානය, අන්තරික්ෂ-අන්තරීක්ෂ නමින් හඳුන්වනු ලැබේ. **'අන්තර් මධ්‍යෙ සෘක්ෂාණි නක්ෂත්‍රාණි යස්‍ය තත් = අන්ත-රීක්ෂම්'** යනු වාක්‍යයි. භූලොක ස්වර්ලොක දෙක මැද දක්නා ලබන්න ආකාශය යි. **'ද්‍යාවා පෘථිව්‍යො මධ්‍යෙ ඊක්ෂ්‍යමාණං ව්‍යොම'** යනු දන්නේ ය. පක්ෂීන්ගේ හා වලාකූටයන්ගේ සංචරණස්ථානය යි.

න සමුද්දමජ්ඣෙ = මුහුද මැද නැත.

ජලසමූහස්ථානය, **සමුද්ද** නම්. සඳ උදාවීමෙහි දී ඒ ජලස්කන්ධය තදින් සීත වන බැවින් එසේ කියනු ලැබේ. **'සම්මා ක්ලීදනති චන්ද්‍රෙදයෙ අස්මා ආපානීති = සමුද්දො'** යනු ඒ දක්වන්නට කීහ. ජලය පමණට ලුණු මෙහි වේ, නු යි ද සමුද්ද, යි කියත්. **'සමං උදකෙන ලොණං එත්ථාති වා = සමුද්දො'**

මිලිඳු රජු විසින් අසනු ලැබූ නාගසෙන ස්ථවිරයන් වහන්සේ විසින් 'මහරජ! ජලසමූහස්ථානයෙක යම් පමණ දිය

වේ නම්, එ පමණ ම එහි ලුණු වන්නේ ද, යම් පමණ ලුණු වේ නම්, එ පමණම එහි දිය වන්නේ ද, ඒ මේ ජලසමූහය, සමුද්‍ද නම් වේය, යි වදාළ වචනය මෙය සාර්ථක කරන්නේ ය.

'අඪති අච්ඡරියබ්භුතධම්මෙහි සමන්නාගතත්තා සමුද්දති අත්තසන්නිස්සිතානං මච්ඡමකරාදීනං පීතිසොමනස්සං පසවති ජනෙතීති = සමුද්දො' අරුම පුදුම කරුණු අටකින් යුක්ත බැවින්, තමන් ඇසුරු කරණ මත්ස්‍යමකරාදිසත්ත්වයනට තුටු පහටු බව උපද වන්නේ සමුද්‍ද නම්, යනු එහි අරුති.

මුහුද, වටින් වක්‍රවාට පර්වතය පැහැර සිටියේ ය. වෙරල පටන් අඟුල, දැඟුල, වියත, දෙ වියත, රියන, දෙ රියන, යට, දෙ යට, ඉස්බ, දෙ ඉස්බ, ගව්ව, දෙ ගව්ව, යොදුන, දෙ යොදුන, දස යොදුන, සිය යොදුන, දහස් යොදුන යන ඇ ලෙසින් ගැඹුරු ව ගොස් මහමෙර සමීපයෙහි සුවාසු දහසක් යොදුන් ගැඹුරුති ව සිටියේ ය. **'මහාසමුද්දො භික්ඛවෙ, අනුපුබ්බ-නිනෙනා අනුපුබ්බපොණො අනුපුබ්බපබ්භාරො'** යන බුඩ වචනය එයට සාධක වේ.

මෙහි පත්ලෙහි සිට යොදුන් සතළිස් දහසක් පමණට නැගී සිටි ජලය, යොදුන් දෙ සිය, තුන් සිය, පන් සිය, දස දහස පමණ දිගැති තිමි-තිමිඞ්ගල-තිමිරපිඞ්ගල-ආනන්ද-තිමින්ද-අන්ඩාරොහ- මහාතිමි යනාදී වූ මහමසුන් නිසා සැලෙන්නේ ය. මුද හරි මැද සාර දහසක් යොදුන් පමණ උස් වූ දිය කඳ නො සැලී සිටියේ ය. ඉන් මතු කොටසෙහි යොදුන් සතළිස් දහසක් පමණ වූ දියකඳ රළගැටීමෙන් සැලෙන්නේ ය.

මහාසමුද්‍රයෙහි ම ඒ ඒ තැන, ඛුරමාලීසමුද්‍ද - අග්ගිමාලීසමුද්‍ද දධිමාලීසමුද්‍ද කුසමාලීසමුද්‍ද - නළමාලීසමුද්‍ද - පවාළනාළීසමුද්‍ද යි නම් සයක් යොදා හඳුන්වනු ලැබේ.

මුහුදෙහි, යම් තැනෙක, දිය, විදුරුවැල්ලෙන් ආලොකවත් වී ද, මිනිස් පමණ ඛුරනාසා ඇති මත්ස්‍යයෝ, ඔප් නැගූ කර සමූහයක් සේ දිය ඉපිල ගිලෙත් ද, ඒ සමුද්‍රඛණ්ඩය, **ඛුරමාලී** නම්. පත්ලෙහි වූ රත්වැල්ලෙන් විහිද ගිය රන්රැස් නිසා ජලතලාව මැදි දවල් හිරු සේ බබලා ද, ඒ සමුද්‍රඛණ්ඩය, **අග්ගිමාලී** නම්. යම් මුහුදු පෙදෙසෙක දිය දධිපටලයක් සේ වේ ද, ඒ **දධිමාලී** නම්. යම් තැනෙක දිය, ඉඳුනිල්මිණිවැල්ලෙන් විසිර ගිය නිල්පැහැයෙන් යුක්ත ද, නිල්කුසතණ සේ බබලා ද, ඒ **කුසමාලී** නම්. යම් තැනෙක දිය චංශරාගමාණික්‍යයන්ගේ බහුලභාවය නිසා තරුණ හුණවනයක් සේ පෙනේ ද, ඒ **නළමාලී** නම්. යම් තැනෙක දිය රිවිමඬලක් සේ රත්පැහැ වේ ද, ඒ **පවාළනාළී** නම්.

මහාසමුද්‍රය, ක්ෂීරසමුද්‍ර - නීලසමුද්‍ර - ප්‍රවාලසමුද්‍ර - සඛණ්ඩසමුද්‍ර යි කොටස් සතරකට බෙදත් ව්‍යවහාර කෙරෙත්. මහාමෙරු පර්වතයෙහි පෙර දිග සුදු පැහැයෙන් යුක්ත බැවින්, ඒ කොටස **ක්ෂීරසමුද්‍රය,** යි ගණිත්. ඒ ලෙසින් දකුණු දිග කොටස **නීලසමුද්‍ර,** යි ද, පැසුළු දිග කොටස, **ප්‍රවාලසමුද්‍ර,** යි ද, උතුරු දිග කොටස, **සඛණ්ඩසමුද්‍ර,** යි ද ගණිත්.

මහමෙරට හා යුගන්ධරයට අතර ප්‍රවාසූ දහසක් යොදුන් පුළුලැති මුහුදු කොටස, **සීදන්තසමුද්‍ර,** යි කියත්. එහි දිය ඉතා සියුම් ය මොනර පිලක් බැහැගේ ද, ඒ එහි ගැලෙන්නේ ය. එහෙයිනි සීදන්ත නම්. මෙසේ කූලපර්වතයන්ගේ අතර ගෙණ සීදන්තසමුද්‍ර, සතෙකැ, යි ආචාර්‍යවරයෝ කියත්.

මෙකල ශාන්තිකරසමුද්‍ර - අත්ලන්තික සමුද්‍ර - දක්ෂිණසමුද්‍ර - ඉන්දියසමුද්‍ර - උත්තරසමුද්‍ර, යි සමුද්‍රය පසකට බෙදත්.

මොවුනතුරෙහි ශාන්තිකරසමුද්‍රය, අන්‍ය සමුද්‍රයනට වඩා විශාල වේ. එහි දිය, දියපාර, රැල ආදිය අඩු බැවින් නිසල ව පවතී. අත්ලන්තිකසමුද්‍රය, ඉතා කුඩා ය. එහෙත් බියකරු ය. ඉන්දියසමුද්‍රය, කන්‍යාකුමාරියෙන් දකුණෙහි වූයේ ය. දක්ෂිණ සමුද්‍රයෙහි දිය, ශෛත්‍යයෙන් කැටි වූයේ, ගල් සේ පවතී. උත්තර සමුද්‍රයෙහි දිය ඉතා සීතල ය. ඒ වටා පිහිටි දිවයින්හි මිනිසුන්ට වසනු නොහැකි ය.

මහාසමුද්‍රයෙහි මහාමෙරුපර්වතයට සමීපයෙහි දිය, වැඩි මතු වන්නේ ය. වැඩුනු ඒ දිය, හාත්පසින් උඩ නැගී ගොස් බිහිසුණු හඬ නගමින් නැවැත්ත මුහුදට ඇද හැලෙන්නේ ය. ඒ දියකඳ වැටුනු තැන දිය දෙ කඩ ව ගොස් යොදුන් ගණන් දිග පළලැති ගැඹුරු වලෙක් සැදී සිටී යි. එතැන, **වඩබාමුව,** යි කියත්. දියකඳ උඩට නැගී නැවැත්ත වැටීමේ දී එහි උපදින ශබ්දය **වඩාමුව හඬ,** යි ගණු ලැබේ.

වෙළඹික සවරූපයෙන් මුහුදුපත්ලෙහි හැසිරෙන ප්‍රලය වහ්නිය, වඩබාමුවැ, යි වෛදිකයෝ කියත්.

මුහුදුපත්ලෙහි වූ ගිනිකඳ පිපිරී යෑමෙන් හටගන්නා විවරයන්ට ඇද ගන්නා දියපාර, වඩබාමුවැ, යි ඇතැම් සාමුද්‍රික ශාස්ත්‍රඥයෝ කියත්.

ලොකය, හටගැණීමේ දී සඳහිරු පහළ වීමෙන් පසු සිනෙරු - චක්කවාළ - හිමවන්තාදිපර්වතයෝත්, මහාසමුද්‍රාදීහුත් පහළ වෙති. එහි දී පොළොවෙහි උස්ව සිටි තැන් පර්වත, යි ද වලතැන් සමුද්‍ර, යි ද, සම වූ තැන් මහාද්වීප, යි ද, ඔත්හ. පර්වතාදී මේ වස්තූන්ගේ හටගැණීම සාහාවික ය. මේ වස්තූහු, බ්‍රහ්ම විෂ්ණුමහේශ්වරකර්තෘක නොවෙත්

මූහුදුදිය, කලෙක පිරිහෙන්නේ ය. කලෙක වැඩෙන්නේ ය. මේ දෙකට කරුණු වනුයේ, චන්ද්‍රයාගේ පිරිහීම හා වැඩීම ය. චන්ද්‍රයාගේ පිරිහීම කාෂ්ණපක්ෂයෙහි වන්නේ ය. වැඩීම ශුක්ල පක්ෂයෙහි වන්නේ ය. චන්ද්‍රයාගේ මේ ක්ෂය වෘඩිය අනුව සමුද්‍ර ජලයාගේ ක්ෂයවෘඩිය වේ. සමුද්‍රජලය පිළිබඳ මේ ක්ෂය-වෘඩිය ලෝකයා විසින් වඩදිය, බාදිය, යී හඳුන්වනු ලැබේ.

නූතනයෝ, වඩදියට හා බාදියට කාරණය, චන්ද්‍ර සූර්‍යයන් ගේ ආකර්ෂණබලය, යි කියත්. චන්ද්‍ර සූර්‍යයන් කෙරෙහි වූ ඒ ඒ වස්තූන් ඇද ගැණීමේ බලය හෙතු කොට අමාවක-පසළොස්වක යන දෙ දිනයෙහි වන්නා වූ වඩදිය, බාදිය දෙක මහවඩදිය මහබාදිය, යි ද, අමාවක්හි චන්ද්‍ර-සූර්‍ය්‍ය-පාථිවී යන මේ ග්‍රහයන් සම කෝණාකාර ව පිහිටන බැවින්, චන්ද්‍ර - සූර්‍ය්‍යයන් කරා ඇදී යන ජලප්‍රමාණය, අමාවක - පසළොස්වක දෙ දිනයෙහි ඇදී යන ජලය සේ, මහත් නො වන බැවින්, සුලුවඩදිය-සුලුබාදිය යි ද කියත්. අමාවක් දිනයෙහි සූර්‍ය්‍යයා පොළොවට ඉතා ඇත්හි පිහිටයි. චන්ද්‍රයා ලංව පිහිට යි. ඔවුන්ගේ ආකර්ෂණ-බලය හෙතු කොට, පොළොවෙහි ඇති ජලය - වාතය - පස් යන මේ ආදිය ඇදී යයි. පොළොව පෙරළෙන වස්තුවක් වුව ද එක් පසකට දිය ඇ ඇදී ගිය කල්හි පොළොවෙහි සමබර නැති වීමෙන් එය පරිවර්තනය නො වන්නේ ය. එහෙයින් එ පමණ ම දිය කොටසක් විරුඬපාශ්වයට තල්ලු වී යයි. ඒ ඇදී ගිය කොටස මහවඩදිය නමින් හඳුන්වත්. පසළොස්-වක්හි ද මෙසේ ය.

න පබ්බතානං විවරං පවිසන්ති = පර්‍වතවිවරයට වැද (මිදුමක්) නැත. කඳුගුහාවලට වැද.

'පබ්බතොති සෛලෝ, සෛලෝ හි සන්ති සබ්බාතෙහි පබ්බහි සඞ්ගහිතත්තා පබ්බතොති වුච්චති' පර්‍වත නම් ශෛලය යි, එය සන්ති නම් වූ පුරුක්වලින් බැඳී සිටි බැවින් පබ්බත, යි කියනු ලැබේ. **'පබ්බා අස්ස අත්ථීති වා = පබ්බතෝ'** සන්ධිපුරුක් මොහුට ඇත්තේ, නු යි හෝ පබ්බත නම්. **'සන්ති-සබ්බාතෙහි පබ්බහි විතතනා පබ්බතෝ'** සන්ති නම් පුරුක් වලින් වැඹුනු බැවින් පබ්බත නම්. **'පර්‍වති පූරයතීති = පර්‍වතඃ, පර්‍වාණි භාගාඃ සනාත්‍යනේනේති = පර්‍වතඃ** යනු පරකීය වාක්‍යයි.

ශිලාපර්‍වත පාංශුපර්‍වත, යි පර්‍වතයෝ දෙපරිදි වෙත්. මහමෙර, ලොකයෙහි විශාලතම පර්‍වතය, යි කියත්. එය මූදමැද ත්‍රිකූට නම් පර්‍වත තුනක් මතු පිට පිහිටියේ ය. එක්ලක්ෂ අට සැට දහසක් උස ය. සටහන් විසින් බෙරයක් සේ ය. අට පැහැයකින් බබලයි.

යොදුන් සුවාසූ දහසක් මුදුදියෙහි ගැලී සිටී යි. දියෙන් මතු පිට ද එ පමණ ම වේ. අයමින් සුවාසූ දහසක් යොදුන. චිතරින් සුවාසූ දහසක් යොදුන.

මහමෙර වටා සුවාසූ දහසක් යොදුන් උස ඇති යුගන්ධර-පර්වතය පිහිටියේ ය. එහි දෙසාළිස් දහසක් යොදුන් දියෙහි ගැලී ගියේ ය. දියෙන් මතු පිටා සිටියේ ද එ පමණ ය. එය වටා පිහිටියේ ඊශධර පර්වතය යි. එය යොදුන් දෙ සාළිස් දහසක් උස ය. දිය යට එක්විසි දහසෙකි. දිය මතු පිට ද එ පමණ ය. ඒ වටා කරවික පර්වතය පිහිටියේ ය. එහි පමණ යොදුන් එක් විසි දහසෙකි. අඩක් දියෙහි ගැලී සිටියේ ය. දිය මතුපිට ද එ පමණ ය. කරවිකපර්වතය වටා සුදර්ශනපර්වතය වේ. එය දස දහස් පන් සියයක් යොදුන් උස ය. අඩක් දිය යට ය. අඩක් දිය මතු පිට ය. සුදර්ශනපර්වතය වටා යොදුන් පන් දහස් දෙ සිය පනසක් උස් වූ නෙමිඤ්ධරපර්වතය වේ. අඩක් දිය යට ය. අඩක් මතු පිට ය. නෙමිඤ්ධරපර්වතය වටා විනතක පර්වතය වේ. එය යොදුන් දෙ දහස් ස සිය පස් විස්සක් උස් වේ. අඩ, අඩ දිය යට හා මතුපිට ය. විනතකපර්වතය වටා අස්වකණ්ණපර්වතය වේ. යොදුන් එක් දහස් තුන් සිය දෙලොසක් උස් වේ. අඩ, අඩ දිය යට හා මතුපිට ය

චක්‍රවාටයන්ගේ ගණනක් නො දැක්විය හැකි ය. ඔවුහු අනන්තයහ. එහි එසේ ම චක්‍රවාටපර්වතයෝ ද වෙති. සක්වළක් පාසා චක්‍රවාට පර්වතයෙක් වේ. චක්‍රවාටයෙක් චක්‍රවාටපර්වතයකින් වටකරණ ලද්දේ වේ. **'ලෝකධාතු නෙමිමණ්ඩලසදිසෙන චක්කවාළපබ්බතෙන සමන්නතෙතා පරික්ඛිත්තත්තතා චක්කවාළනති වුච්චති'** යනු ආචාර්‍යවචනයි. මහාසමුද්‍රය වටා ඒ ඒ තැන මහාද්වීප සතරෙක් වේ. ජම්බුද්වීප-අපරගොයාන-උත්තර කුරු-පූර්‍වවිදෙහ යි. මෙයින් මහත්තම වන්නේ ජම්බුද්වීපය යි. එහි දිග පළල යොදුන් දස දහසෙකි. එහි හිමාලය පර්වතය පිහිටියේ ය. එය තුන් දහසක් යොදුන් පැතිර සිටියේ ය. හිමයට සථාන බැවින්, හිමාලය නම් වී. යොදුන් පන් සියයක් පමණ උස ය. සුවාසූ දහසක් රන්රිදී මැණික් පර්වතවලින් හොබනේ ය. එහි වූ අනවතප්තාව්ල වටා සුදර්ශනකූට-චිත්‍රකූට කාලකූට – ගන්ධමාදනකූට – කෛලාසකූට, යි පර්වත පසෙක් පිහිටියේ ය. සුදර්ශනකූටය, උසින් යොදුන් දෙ සියයෙකි. අනික් පර්වත සතර ද උසින් එ පමණ ම වේ. පළලින් පනස් යොදුනෙකි. දිගින් දෙ සිය යොදුනි. ඡද්දන්තව්ල වටා චුල්ලකාල-මහාකාල උදකපාර්ශ්ව – වන්‍රපාර්ශ්ව – සූර්‍යපාර්ශ්ව – මණිපාර්ශ්ව – සඛණී පාර්ශ්ව, යි පර්වත සතෙක් ඇත්තේ ය. ඔවුනතුරෙහි සඛණී

පාර්ශ්ව පර්වතය, සත් යොත්නක් උස් වේ. මණිපාර්ශ්වපර්වතය ස යොත්නක් උස ය. සූර්‍යපාර්ශ්ව පර්වතය, පස් යොත්නකි. චන්ද්‍රපාර්ශ්ව පර්වතය, සිවු යොත්නකි, උදකපාර්ශ්වපර්වතය, තුන් යොත්නකි. මහාකාල පර්වතය, දෙ යොත්නකි, චුල්ලකාලපර්වතය එක් යොත්නකි.

ලොකයෙහි වූ පර්වත අතුරෙහි හිමාලය-හෙමකූට-නිෂධ-නීල-ශ්වෙත-භෘඞ්ගවත්-මෙරු - මාල්‍යවත් - ගන්ධමාදන-මහෙන්ද්‍ර මලය සහ්‍ය - ශුක්තිමත් - ඍක්ෂවත් - වින්ධ්‍ය - පාරිපාත්‍ර-කෛලාසමන්දර-ලොකාලොක - මහත් යන පර්වත ශ්‍රේෂ්ඨපර්වත, යි පුරාණයෝ කියත්.

ලොකයෙහි මෙයින් අන්‍යවූත් පර්වත විය යුතු ය. එසේ ම උස්මිටිකම්වලින් ද වෙනස් විය යුතු ය. ඒ හැම පර්වත කෙනෙක් ම ගාථාවෙහි එන **'පබ්බතානං'** යන පදයට ඇතුළත් කළ හැකි ය.

විවරශබ්දය, ඡිද්‍ර - දූෂණ - අපරාධ යනාදී අරුත්හි එයි. මෙහි ඡිද්‍රය කිය වේ. ඡිද්‍ර නම් සිදුරු ය.

න විජ්ජති සො ජගතිප්පදෙසො = එබඳු බිම්පෙදෙසෙක් නැත.

"ගච්ඡන්ති යස්සං සා ජගති" යම් තැනෙක යෙත් නම් ඒ **ජගති** නම්. භූමිය හා ගෙමිදුල කිය වේ. **'මහියං ජගති වුත්තා මන්දිරාලින්දවත්ථුනි'** යනු කොෂ යි. මෙහි ආයේ භූමියෙහි ය. එහෙයින් වාක්‍යයෙහි **යස්සං'** යි කීහ. **පදෙස** නම්, කොටස ය. බිම්පෙදෙසැ, යි කීයේ එහෙයිනි. පදෙස යනු, කොයි දෙයක වුවත් කොටසක් ගැණීමේ දී යෙදිය හැකි ය. **'පදිස්සතීති = පදෙසො,** යනු නිරුක්ති යි.

මහාපටඇඟිල්ල හා ඩබරැඟිල්ල විදහා ගත් කල එ දෙක අතර, පදෙස, යි ද කියනු ලැබේ. **'තජ්ජනීයයුත්තෙ අංගුඪෙ තතෙ පදෙසො'** යනු කොෂයි.

යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා = යම් තැනෙක සිටි සත්ත්ව තෙමේ පව්කමින් මිදෙන්නේ නම්.

ඉදින් යමෙක් 'මේ උපායයෙන් තමන් කළ පව්කමින් මිදෙන්නෙමි' යි අහස සිටියේ ද, අසූසාර දහසක් ගැඹුරැති මුහුද මැද සිටියේ ද, පර්වතවිවරයෙක සැඟවී ගත්තේ ද, පව්කමින් නො මිදෙන්නේ ය. පූර්වපශ්චිමාදී වූ කිසිත් බිම්පෙදෙසක පව්කමින් මිදිය හැකි කෙසගක් පමණ වූත් අවකාශයෙක් නැත්තේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු සෝවන් පලාදියට පැමිණියෝ ය. ධර්මදෙශනාව මහාජනයාට වැඩ සහිත වූ ය.

භික්ෂූන් තෙනමකගේ කථාවසතුව නිමියේය.

සුප්‍රබුඬශාක්‍යයා

9 – 12

සුප්‍රබුඬශාක්‍ය තෙමේ 'මේ තෙමේ මාගේ දුව හැරදමා ගියේ ය' යි ද, 'මපුතු පැවිදි කොට සතුරුකම් කෙළේ ය' යි ද බුදුරජුන් කෙරෙහි වෛර බැඳ ගත්තේ ය. දිනෙක මොහු 'ආරාධනා ලත් තැනින් බත් කන්නට නොදෙමි' යි බුදුරජුන් වඩින මග අවුරා ඇතුල් වීථියෙහි මත්පැන් බී සිට ගතු. ඒ වේලෙහි බුදුරජානන් වහන්සේ භික්ෂූන් විසින් පිරිවරන ලදුව එ තැනට වැඩි සේක. අවට සිටියෝ එබව ඔහුට දැන්වූහ. සුප්‍රබුඬ තෙමේ 'ඉවත ගව, යි ඔහුට කියවු, ඔයා අප තරම් මහලු නොවේ, යන්නට මග ඉඩ නොදෙන්නෙමි' යි මග අවුරා සිටියේ ය. 'එසේ නොකරව' යි මිනිසුන් කියනු ලැබූ ඔහු කිසිත් නොඅදහා එසේ ම සිට ගත්තේ ය. බුදුරජානන් වහන්සේ වඩනට මග නොලැබ එහි ම නැවැතුනු සේක. එ කල්හි ඔහු, 'තෝ ගොස් ඔහු කියන්නක් දැන එව' යි චරපුරුෂයකු, බුදුරජුන් වෙත පිටත් කොට යැවී ය. බුදුරජානන් වහන්සේ එහි නතර වෙත් ම සිනා පහළ කළ සේක. ආනන්ද සථවිරයන් වහන්සේ එ දැක 'සිනා පහළ කිරීමෙහි හෙතු කිමැ' යි බුදුරජුන් විවාළහු ය. 'ආනන්ද! සුප්‍රබුඬයා දක්නහු ද? මා වැනි බුදු කෙනකුන්ට යෑමට මග ඉඩ නොදී ඔහු විසින් කළ කම්ය සුළු එකෙක් නොවේ, එය ඉතා මහත් ය, බැරෑරුම් ය, අදින් සත්වනදා ඔහුගේ ගෙයි පාතමාලයෙහි පඬිපෙළ මූල පැළී යන්නේ ය ඒ පැළුනු තැනින් මොහු පොළොව හිලී නිරයට වදින්නේ ය' යි උන්වහන්සේ වදාළ සේක. තොරතුරු දැන ගැණීම පිණිස යොදවා සිටි චරපුරුෂයා, මේ කතාව අසා ඔහු වෙත ගොස් තම කණ වැටුනු එය ඔහුට කී ය. සුප්‍රබුඬ තෙමේ, 'මාගේ බැනනුවන්ගේ කතාවෙහි වරදෙක් නැත, ඔහු යමක් කියා නම්, එය ඒ සැටියෙන් ම වන්නේ ය, එසේ වුවත් කමක් නැත, වන්නෙක් වේවා, ඔහු බොරු කියන්නකු කොට නිග්‍රහ කරන්–නෙමි, ඔහු, මා මෙයින් සත්වනදා පොළොව ගැලී යන්නේ ය' යි නියමයෙන් නොකියා, මාගේ ගෙයි යටිමාලයේ පඬිපෙළ මූල දී පොළොව වදින්නේ ය, යි බිම් නියමයක් කරයි, අද සිට මම එ තැනට නොයමි, එ තැනදී පොළොව නොවැද, ඔහුට බොරු වෙන් නිග්‍රහ කරන්නෙමි' යි තරයේ සිතට ගෙණ, තමන් ප්‍රයෝජන ගන්නා සියලු බඩුමුට්ටු, මුදුන් මාලයට ගෙන්වා ගෙණ, පඬිපෙළ අස් කරවා, දෙර වසා එක් එක් දෙරටුවෙහි මලුවපුරුෂයන් දෙදෙනා බැගින් සිටුවා 'යම්ලෙසකින් මා යටිමාලට බසිනු පිණිස පැමිණිය හොත්, මා එයින් වලක්වාලවු' යි නියම කොට සත්වන දා උඩුමාලෙහි සිරියහන් ගබඩාවට වැදී හුන්නේ ය.

බුදුරජානන් වහන්සේ එය අසා, "සුප්‍රබුඬයා හුදෙක් මාලිගාවේ මතුමාලේ තබා අහසට නැග අහස සිටිය ද, නැවූ නැගී මූදු ගිය ද කඳු විවරයකට වැදුන ද, බුදුවරුන්ගේ කතා දෙ පරිදි නො වේ යමක් කීහු නම්, ඒ එසේ ම වන්නේ ය, මා කියූ තැනේ දී ම ඔහු පොළොව ගැලෙන්නේ ය' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක:-

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස,
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චුති.

මාර තෙමේ, යම් තැනෙක සිටි සත්ත්වයා නො මැඩලන්නේ ද, එබඳු බිම්පෙදෙසෙක් නැත. අහසෙහි ද එබඳු තැනෙක් නැත. මුහුදමැදත් එබඳු තැනෙක් නැත. පර්වතවිවරයට වැද ද, එබඳු තැනෙක් නැත.

න අන්තලික්ඛෙ = අහසෙහි නැත.

න සමුද්දමජ්ඣෙ = මුහුද මැද ද නැත.

න පබ්බතානං විවරං පවිස්ස = කඳු විවරයට වැද ද නැත.

න විජ්ජති සො ජගතිප්පදෙසො = එබඳු වූ බිම්පෙදෙසෙක් නැත.

යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු = මරු යම් තැනක සිටියහු නො මැඩලන්නේ ද.

සත්වනදා බුදුරජුන් පිඬු සිඟා වෙහෙරට වැඩිය කල්හි යට මාලෙහි සිටි මගුල් අසු, උදම්ව පහර දෙන්නට වන. සුප්‍රබුඬ, උඩුමාලෙහි හුන්නේ ම 'මේ කිමැ' යි අසා "මගුල් අසු මත් ව ගියේ ය' යි කී කල්හි, තමන් දැක ම අසු සන්සිඳෙන බැවින් ඌ උඩුමාලෙට නගා ගන්නට නැගිට දොරකඩට පැමිණියේ ය. එ කෙණෙහි ම සියලු දොර ඇරී ගියේ ය. එහි සිටි මල්ලවයෝ ඔහු බෙල්ලෙන් අල්වා පහතට ඇද දැමූහ. මෙලෙසින් සත් මාලෙහි ම දොර ඇරුනේ ය. හැම දොරකඩ සිටි මල්ලවයෝ ඔහු බෙල්ලෙන් අල්වා මාලින් මාලට ඇද දැමූහ. ඔහු යටිමාලෙහි පඬි පෙළ මුල වැටුනු සැටියේ ම මහපොළොව පැළී විවර වූවා ය. ඔහු එහි ගැලී ගොස් අවීචිමහානරකයෙහි සිට ගත්තේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියෝ ය.

සුප්‍රබුඬශාක්‍යවසතුව නිමි

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල නායක ස්ථවිරයන්** කළ **සද්ධර්මසාගර** නම් වූ **ධර්මපදවර්ණනාවෙහි** පාපවර්ගාත්මකනවමතරඞ්ගය මෙතෙකින් නිමියේ ය.

දණ්ඩවග්ගය

දශමතරඛගීය කථාසූචි

1265 - 1 සවග මහණුන් කළ හිංසාවක්
1268 - 2 සවග මහණුන්ගේ කොලාහලයක්
1270 - 3 ගෑරඩියකු මැරූ කුඩා දරුවෝ
1273 - 4 කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ
1280 - 5 කම්සැප පතා සිල්ගත් උපාසිකාවෝ
1284 - 6 ගඳකිළිය දුටු මිනිසා
1288 - 7 මහමුගලන් මහතෙරුන්ගේ පිරිනිවීම
1297 - 8 බොහෝ පිරිකර ඇති මහණෙක්
1306 - 9 සන්තති මහා මාත්‍යයෝ
1313 - 10 හිහන්නකු පැවිදි කිරීම
1369 - 11 සුඛ සාමණේරයෝ

සවග මහණුන් කළ හිංසාවක්

10- 1

එද අප බුදුරජුන් දවස සතළොස් වග නමින් හඳුන්වනු ලැබූ මහණෝ, දවසෙක තමන්ට සැතපෙන්නට සෙනසුන් පිළියෙල කරන්නට වූහ. ඒ වේලෙහි සවග මහණෝ "අපි ඔය ඇත්තනට වඩා වැඩිමහලු වමහ, ඔය පිළියෙල කළ සෙනසුන් අපට ලැබිය යුතු ය" යි අරගල කළහ. එකල සතළොස් වග මහණෝ "ඔය ඇත්තන් වැඩිමහලු බව සැබෑ ය, එයින් අපට ඇති කාරිය කිම, මේ සෙනසුන් හැමට පළමු අප විසින් පිළියෙල කර ගන්නා ලද්දේ ය, ඒ නිසා මොන ලෙසකිනුත් මේ සෙනසුන් කාටත් නොදෙමු" යි දරදඬු වූහ. එයින් කිපුනු සවග මහණෝ සතළොස් වග මහණුන්ට අතින් පයින් දණ්ඩෙන් පහර දුන්හ. බුදුරජානන් වහන්සේ මේ අරගලය අසා "යම් මහණෙක් අන් මහණකුහට පහර දේ නම් ඔහු වරදෙහි බැඳෙන්නේ ය" යි "**යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං**" යි මේ ප්‍රහාරදන ශික්ෂා පදය පණවා, "මහණෙනි! මහණහු විසින් මම, යම් සේ නම් අන්හුත් එසේ ම දණ්ඩනයට බිය ඇත්තෝ වෙති, මරණයට තැති ගණිති" යි සලකා අන්‍යයාට පහර නොදිය යුතු ය, අන්හු නො නැසිය යුතු ය"යි අනුසන්සි ගළපා මේ ධම්දෙසනාව කළ සේක.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙති.

සියලු දෙන දණ්ඩනයෙන් තැති ගණිත්. සියලු දෙන මරණයට බිය ඇත්තෝ වෙත්. තමා උපමා කොට (අනෙකකු) නොමරන්නේය නොමරවන්නේ ය.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස = සියලු දෙන දණ්ඩනයෙන් තැති ගණිත්.

මෙහි සබ්බ ශබ්දය සාවශෙෂාර්ථයෙහි හෙන්නේ ය. "සියලු දෙන දණ්ඩනයෙන් තැති ගණිති, මරණයෙන් බියපත් වෙති" යි වෙනසක් නොකොට වදළ නමුදු, සබ්බ ශබ්දය සාවශෙෂාර්ථ බැවින් කෙශරසිංහ, අජානෙයහස්ති අශ්ව වෘෂභ, ක්ෂිණාස්‍රව යන මොවුන් හැර "අන්‍යයෝ ම තැති ගණිත්, බියපත් වෙති" යි දතයුතු ය. මෙහි කියූ කෙශරසිංහාදීහු දණ්ඩනයෙන් මරණයෙන් තැති නොගණිත්. බියපත් නොවෙත්. ඒ බව සාවශෙෂාර්ථ සබ්බ ශබ්දය යොදලීමෙන් දක්වා වදළ සේක බුදුරජානන් වහන්සේ.

161-162

''ඉමිස්සා ච දෙසනාය ව්‍යඤ්ජනං නිරවසෙසං. අත්ථො පන සාවසෙසො. යථා හි රඤ්ඤා සබ්බෙ සන්නිපතන්තූති භෙරියා වාරාපිතායපි රාජමහාමත්තෙ ඨපෙත්වා සෙසා සන්නිපතන්ති එවමෙව ''සබ්බෙ තසන්ති'' ති වුත්තෙ පි හත්ථාජානෙය්‍යො අස්සාජානෙය්‍යො ඉසභාජානෙය්‍යො ඛීණාසවොති ඉමෙ වත්තාරො ඨපෙත්වා අවසෙසාව තසන්තීති වෙදිතබ්බා'' යනු අටුවා ය. රජු විසින් ''සියලු දෙන රැස් වෙත්වා'' යි අණ කළ විට රජ මහ ඇමැතියන් හැර, අනික් දෙන රැස් වෙති. එමෙන් ''සියලු දෙන තැති ගණිත්'' යි කී විට තැති ගන්නෝ හස්ත්‍යාජානෙය්‍යාදීන් හැර අන්‍යයෝය හස්ත්‍යාජානෙ-ය්‍යාදිවූ සිවු දෙන තැති නො ගණිත්. සාවශෙෂවාචකැ යි කියනුයේ යමක් කියන කල්හි කොටසක් හැර කීම ය.

සබ්බ ශබ්දය කිසිවක් ඉතිරි නො කොට ද කියන්නේ ය. ''සබ්බං රූපං සබ්බා වෙදනා සබ්බසක්කායපරියාපන්නෙසු ධම්මෙසු'' යනු නිදසුන් ය.

''සබ්බං රූපං'' යනාදි පාලියෙහි ආ සබ්බශබ්දයෙන් රූප වේදනාදීහු ඉතිරි නො කොට ගැණෙති. එය සප්පදෙස – නිප්පදෙස විසයභාවයෙන් දෙ පරිදි ය. සබ්බසබ්බ – පදෙසසබ්බ – ආයතනසබ්බ – සක්කායසබ්බ යන චතුර්විධවිෂයයන්හි දක්නා ලබන ප්‍රයොග ඇති බැවින් එසේ වන්නේ ය.

''සබ්බෙ ධම්මා සබ්බාකාරෙණ බුඩස්ස භගවතො ඤාණ මුඛෙ ආපාථමාගච්ඡන්ති'' යනාදි තැන්හි සබ්බසබ්බයෙහි ආයේය.

''සබ්බෙසං වො සාරිපුත්ත! සුභාසිතං පරියායෙන'' යනාදි තැන්හි පදෙසසබ්බයෙහි ආයේ ය.

''සබ්බං වො භික්ඛවෙ! දෙසිස්සාමි චක්ඛුඤ්ඤෙව රූපං ච -පෙ-මනඤ්චෙව ධම්මෙ ච'' යනාදි තැන්හි ආයතනසබ්බයෙහි ආයේ ය.

''සබ්බධම්මමූලපරියායං වො භික්ඛවෙ! දෙසිස්සාමි'' යනාදි තැන්හි සක්කායසබ්බයෙහි ආයේ ය.

තමන් කියන පදරුත්, කිසිවකුත් ඉතිරි නො කොට කීම, ගැණීම නිප්පදෙස නම්. හැම පදර්ථ කෙනෙක් හැම අයුරකින් ම මදකුත් නො හැර බුදුරජුන්ගේ නුවණට ගොදුරු වෙති යනු එහි අදහසය. අන් තුන් තැන්හි වූ සබ්බ ශබ්දය සප්පදෙස විසයක වේ.

දණ්ඩස්ස යනු පංචම්‍යර්ථයෙහි ෂෂ්ඨී ය. දණ්ඩනයෙන් යි අරුත් කියනුයේ එහෙයිනි. ජාත්‍යාදීන් ගැටීම් වශයෙන් පවත්නා වාග්දණ්ඩ, අත් පා දඬු මුගුරු ආදියෙන් පහර දීම් වශයෙන් පවත්නා කායදණ්ඩ, සියය, දහසය යනාදී වශයෙන් තැබීමෙන් කරන්නා වූ ධනදණ්ඩ, යන මෙය මෙලොව පවත්නා දණ්ඩන.

ඇණුම්, බැණුම්, තැළුම්, පැහැර ගැණුම්, මැරුම් යනාදිය හා එයට සාධන වූ මුඛ, හස්ත, පාද, දණ්ඩ, මුද්ගර, ශස්ත්‍ර යනාදියත් දණ්ඩ ශබ්දයෙහි ඇතුළත් ය. **"දණ්ඩනං=දණ්ඩෝ, දණ්ඩන්ති පහරන්ති එතෙනාති= දණ්ඩෝ"** යනු අර්ථසමර්ථන ය යි. මේ දණ්ඩය තෙ පරිදි ය. **වධ**-අනුග්ගහණ – පරික්ලෙස යි.

"වධොනුග්ගහණං චෙව පරික්ලෙසො තථෙව ච,
ඉති දණ්ඩවිධිඤ්ඤූහි දණ්ඩාපි තිවිධො මතො"

යනු ටීකා ය.

දැමීම ද දණ්ඩ' යි කියත්. **"දමන්ත්‍යනෙනාති = දණ්ඩෝ"** යනු.

සාමාදි උපායයන් අතුරෙහි එන සිවුවන උපායය ද දණ්ඩ' යි හඳුන්වනු ලැබෙ. පද්මනාලයටත් දණ්ඩ යි නමෙකි. කාය වාඩ්මනොදුශ්චරිත තුණ ද දණ්ඩ යි ආයේ ය. **"කායදණ්ඩෝති කායදුච්චරිතං වචීදණ්ඩාදිසුපි එසොව නයො"** යනු අටුවාහි. මෙහි ආයේ වධබන්ධනාදි දණ්ඩනැ යි දත යුතු ය.

සබ්බෙ භායන්ති මච්චුනො = සියලු දෙන මරණයට බිය වෙත්.

රහතුන් වහන්සේ පැහැ සත්කායදෘෂ්ටිය ඇති බැවින් නාම රූපධර්මයන්ගේ බිඳීම හැර අන් මියන සතකු නො දක්නාහු මරණයට බිය නො වන්නෝ වෙති. කෙශරසිංහාදීහු සත්කාය දෘෂ්ටිය බලවත් බැවින් තමන්ට ප්‍රතිපක්ෂ සත්ත්වයකු නොදක්නෝ අහඞ්කාරපරවශ ව මරණයෙහි බිය ඇත්තෝ නො වෙති. **"ඉමෙ සු භි බීණාසවො සක්කායදිට්ඨියා පහීණත්තා මරණකසත්තං න පස්සන්තො න භායති. ඉතරෙ තයො සක්කායදිට්ඨියා බලවත්තා අත්තනො පටිපක්ඛභූතං සත්තං අපස්සන්තා න භායන්ති"** යනු අටුවා ය.

මච්චුනො යනු පංචම්‍යර්ථයෙහි ෂෂ්ඨී ය. මරණයෙනැ යි කියනුයේ එහෙයිනි. මච්චු යනු මරණයට නමෙකි. **"මච්චු මරණං"** යනු සාධකය.

අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ = තමා උපමා කොට නො මරන්නේ ය. නොමරවන්නේ ය.

තමා උපමා කොට අන් සතකු නො නසන්නේ ය, නො නස්වන්නේ ය, යනු වදළෝ, "මම යම්සේ දඩුවමට මරණයට බියපත් වෙමි නම්, අන්‍යයා ද දඩුවමට මරණයට එසේ බිය පත් වන්නේය" යනු සිතන්නහුට "අන් පා දඩු මුගුරු සැත් ආදි යමකින් අන්හට හිංසා නො කට යුතු ය, අනුන් ලවාන් හිංසා නො කර විය යුතු ය" යනු සිතට නැග එන බව දක්වනු සඳහා ය. "අන්‍යයා ද තමා මෙනැ"යි සිතන්නහුට අනුන් තළා පෙළා ගසා කැමෙහි නපුරු අදහස් පහළ නො වන්නේ ය.

ධම්දේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

ඡඩ්වර්ගීයභික්ෂුවස්තුව නිමි.

සවගමහණුන්ගේ කෝලාහලයක්

10 – 2.

සවග මහණෙනි ප්‍රහාරදන ශික්ෂාපදයට කරුණු වූ යම් කිසි කරුණක් ඉදිරිපත් කොට සතළොස් වග මහණුන්ට පහර දුන්නාහු ද, ඒ කරුණ ම ඉදිරිපත් කොට සතළොස් වග මහණුන්ට ම පහර දෙනු පිණිස දඬු මුගුරු ගෙණ ඉදිරියට ආහ. මෙහි ලා බුදුරජානන් වහන්සේ උන්ගේ කෑ කෝ ගැසීම අසා "මහණෙනි! අද සිට මහණුන් විසින් යමක් කළ විට තුමූ වරදෙහි බැඳෙත් නම් එබඳු ක්‍රියා නො කටයුතු ය" යි වදළ සේක. නැවත

"යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තිය."

යන, මේ තලසත්තික ශික්ෂාපදය ද මෙහි ලා පැණවූ සේක. "යම් මහණෙක් අන් මහණකුහට කිපියේ නො සතුටු සිත් ඇත්තේ (පහර දෙන්නට) අත් පා දඬු මුගුරු ඔසවා නම් පවිති ඇවැත් වේ" යනු එහි අදහසය.

මෙසේ මේ ශික්ෂාපදය පණවා "මහණෙනි! මහණුන් විසින් මා මෙන් අන්හු ද දණ්ඩනයට තැති ගණිත්, මාගේ ජීවිතය මට යම් සේ ප්‍රිය වේ නම් උන්ගේ ජීවිතය උන්ටත් එසේ ම ප්‍රිය යි දැන අන්හු නො නැසිය යුත්තාහ. නො නැස්විය යුත්තාහ, යි වදාරා අනුසන්ධි ගළපා මේ ධර්මදේශනාව කළ සේක.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙති.

සියලුදෙන දණ්ඩනයෙන් තැති ගණිත්. හැමදෙනට ජීවිතය ප්‍රියය. තමා උපමා කොට (කිසිවකු) නො මරන්නේ ය, නො ද මරවන්නේ ය.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස = සියලු දෙන දණ්ඩනයෙන් තැති ගණිත්.[1]

සබ්බෙසං ජීවිතං පියං = හැමදෙනහට ජීවිතය ප්‍රිය ය.

මෙහි ද සබ්බ ශබ්දය සාවශෙෂ බැවින් රහතුන් වහන්සේ හැර අන් හැමට ජීවිතය ප්‍රිය වේ. ජීවිතය, නාමජීවිතය – රූපජීවිතය යි දෙ පරිදි ය. එය යට කියූ සේ දන්නේ ය. රහතුන් වහන්සේ

"නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පතිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා" යි

උදන් අනමින් ජීවිතයෙහි හා මරණයෙහි මැදහත් වෙති.

1, 10, 1, 'සබ්බෙ තසන්ති දණ්ඩස්ස' බලනු.

"මම යම්සේ දණ්ඩනයට බිය ඇත්තේ වෙමි ද එසේ ම සියලු දෙන දණ්ඩනයට බිය ඇත්තෝ වෙති, මාගේ ජීවිතය මට යම්සේ ප්‍රිය වේ ද, එසේ ම සියලු දෙනාගේ ජීවිත ඔවුනට ප්‍රිය වේ" යි තමන් හා අන්හු සමත්වයෙහි ලා සලකා අනුනට පහර නොදිය යුතු ය අනුන් ලවා අනුනට පහර නොදෙවිය යුතු ය" යි මෙයින් වදළ සේක.

ෂඩ්වර්ගීයභික්ෂුවස්තුව නිමි.

ගැරඩියකු මැරූ කුඩා දරුවෝ

10 – 3

දිනෙක බුදුරජානන් වහන්සේ සැවැත් නුවර පිඩු සිහා වැඩි සේක. උන්වහන්සේ ඒ වඩිනා ගමනේ දී අතර මග කොලු රැලක් ගැරඩියකු දඬුකඩකින් ගසා මරණු දැක "දරුවෙනි! නුඹලා කුමක් කරන්නහු ද?" යි ඇසූහ. "ස්වාමීනි! අපි ගැරඩියකු මරමු" යි කී කල්හි "කුමකට මරහු ද?" යි ඇසූහ. "ස්වාමීනි! මූ අපට දෂ්ට කෙරේ ය" යි කී කල්හි "ලමයිනි! නුඹලා තමන්ට සැප පතා මේ සතා මැරීමෙන් උපනුපන් තැනේ දී දුකට ම වැටෙන්නහු ය, සැප ලබන්නෝ නො වන්නහු ය, තමන්ට සැප කැමැත්තන් විසින් අනුන් නසනු යුතු නැතැ" යි වදරා අනුසන්ධි ගළපා මේ ධර්මදෙශනාව කළ සේක.

සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං.
සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති,
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛන්ති.

තමාට සුව කැමැති වූ යමෙක් තෙමේ (එසේ ම) සුවකැමැති වූ සත්ත්වයන් දණ්ඩනයෙන් පෙළා ද, හෙතෙමේ පරලොව සැප නො ලබයි.

තමාට සුව කැමැති වූ යමෙක් තෙමේ (එසේ ම) සුව කැමැති වූ සත්ත්වයන් දණ්ඩනයෙන් නො පෙළා ද, හෙතෙමේ පරලොව සැප ලබයි.

සුඛකාමානි භූතානි = සුව කැමැති වූ සත්ත්වයන්.

කායික - චෛතසික සුඛය, මෙහි සුඛ යි වදරණ ලද්දේ ය.

භූත ශබ්දය "**භූතස්මිං පාචිත්තයං**" යන මෙහි විද්‍යමානභාවයෙහි ද, "**භූතමිදන්ති භික්ඛවෙ! සමනුපස්සථ**" යන මෙහි පංචස්කන්ධයෙහි ද, "**චත්තාරො ඛො භික්ඛු මහාභූතානං හෙතු**" යන මෙහි පඨවිධාත්වාදිමහාභූතයන් කෙරෙහි ද, "**යො ච කාලසසො භූතො සභූත පචිනිං පචී**" යන මෙහි රහතුන් කෙරෙහි ද, "**සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමස්සයං**" යන මෙහි සත්ත්වයන් කෙරෙහි ද, "**භූතගාමපාතව්‍යතාය පාචිත්තියං**" යන මෙහි තරුලතාදියෙහි ද, "**භූතං භූතතො සංජානාති**" යන මෙහි සිවුමහරජය පිළිබඳ යට සත්ත්වගණයෙහි ද, "**යානීධ භූතානි සමාගතානී**" යන මෙහි අමනුෂ්‍යයන් කෙරෙහි ද, "**ජාතං භූතං සඞ්ඛතං**" යන මෙහි උත්පත්තියෙහි ද ආයේ ය. මෙහි අවිශෙෂ ව සියලු සතුන් කෙරෙහි යෙදෙයි. "**කම්මකිලෙසෙන භවතීති, බන්ධපාතුභාවෙන භවතීති වා = භූතො**" යනු වාක්‍යයි.

යො දණ්ඩෙන විහිංසති = යමෙක් දණ්ඩනයෙන් පෙළා ද.

යො යනු අනියාමිත වචනයි. අසවලා යි නියම ඉනා කළ බැවිනි. **'දණ්ඩෙන'** යනු දෙසනාමාත්‍ර ය. එහෙයින් පහර දීමට සාධන වන්නා වූ හැම එකක් ම මින් ගත හැකි ය. දඹුකඩ, කැව කැබිලිති, මුගුරු, ආයුධ, අත්පා ආදීය ය ඒ. **යමෙක්** සැප කැමැති වූ සත්ත්වයන්ට කුලමල කියා ගැටීමෙන්, අනින් පයින් තැළීමෙන්, දඹු මුගුරුවලින් කෙටීමෙන් සිය දහස් ගණන් ධනය ඇප කොට නැබබවීමෙන් දුකට පමුණුවන්නේ ද, යි මෙසේත් කියැකි ය.

අත්තනො සුඛමෙසානො=තමාට සැප සොයන්නා වූ, සැප කැමැත්තා වූ.

සුඛ යි සිඩ කිරීමෙහි "සු පුබ්බ ඛනු අවදාරණෙ, සු පුබ්බ ඛාද. ඞක්ඛණෙ, **සුඛ සුඛනෙ**" යන ධාතුත්‍රයයෙන් එකක් ගණිත්. යම් චෙතනා-මාත්‍රයක් කය සිත දෙක ඔද වැඩි කෙරේ ද, කය සිත දෙක්හි ඔදවැඩි බවට කරුණු වූ ඒ චෙතනාමාත්‍රය සුඛ යි ගණු ලැබේ.

එසානො යනු "**එසන්තො ගවෙසන්තො පත්ථෙන්තො**' යි අටුවා කළහ. එහෙයින් සොයන්නේ, පතන්නේ, කැමැතිවන්නේ **'එසන'** නම්.

පෙච්ච සො න ලභතෙ සුඛං = හෙතෙමේ පරලොව සැප නො ලබයි.

තමාට සැප සොයන්නේ සැප නො සොයන්නා වූ අන්හු තළා පෙළා හිංසා කෙරේ නම්, ඔහු **පරලොව** දී මිනිසුන් පිළිබඳ සැපයක් පමණකුදු නො ලබන්නේ ය. දෙවිසැප - නිවන්සැප නො ලැබීමෙහි කා කථා ද, එකාන්තයෙන් අන්හට කළ දණ්ඩනයෙන් ඔහු ලබන්නේ කටුක දුකක් ම ය.

පෙච්ච යනු භවාන්තරාර්ථවාචක අව්‍යයෙකි. පරලොවැයි කියේ එහෙයිනි.

සුඛකාමානි භූතානි = සුව කැමැති වූ සත්ත්වයන්.

යො දණ්ඩෙන න හිංසති = යමෙක් දණ්ඩනයෙන් නො පෙළා ද.

අත්තනො සුඛමෙසානො = තමාට සැප සොයන්නා වූ. සැප පතන්නා වූ.

පෙච්ච සො ලභතෙ සුඛං = හෙතෙමේ පරලොව සැප ලබයි.

යමෙක් ක්ෂාන්ති මෛත්‍රී ආදී ගුණයෙන් යුක්ත ව "**මම** යම්සේ සැප කැමැත්තෙමි ද, දුකින් පිළිකුල් ඇත්තේ වෙමි ද ලෝ වැසි අන් සියලු දෙනාත් එසේ ය" යි සිතා සම්ප්‍රාප්තවිරති ආදියෙහි සිටියේ කියන

ලද කිසිත් දණ්ඩනයකින් කිසිවෙකුත් නො පෙළා ද, නො තළා ද, හෙතෙමේ මනුෂ්‍ය වූයේ මිනිස් සැපත් දෙවි වූයේ දෙවසැපත් එ දෙකම ඉක්ම වූයේ නිවන් සැපත් ලබන්නේ ය. එබඳු එකකුට ඒ සැපය අවශ්‍යයෙන් ලැබෙන බැවින් එය චත්මන් සැපයක් සේ වේ යි දක්වන්නට ලහතෙ යි වර්තමානකාලික ක්‍රියාපදය යෙදුනේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ බොහෝ ගණනක් කොල්ලෝ සෝවාන් වූහ.

බහුකුමාරකවස්තුව නිමි.

කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ

10 – 4

කුණ්ඩධාන තෙරුන් පැවිදි වූ දා සිට උන්වහන්සේ හා එක් ව උන්-හිඳින්ස්ස යන යන තැන ගැහැණියක් ද යයි. එහෙත් කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ තමන් හා එක් ව හැසිරෙණ තමන් යන යන තැන යන ඒ ගැහැණිය කවදුවත් නො දකිති. එහෙත් සෙසු හැම දෙනට ඒ පෙණේ. ගමෙහි පිඬු සිඟා යන තෙරුන්ට ගම් වැස්සෝ බත් හැන්දක් පුදා "ස්වාමීනි! මේ පිදූ බත් හැන්ද ඔබ වහන්සේට ය, මේ බත් හැන්ද ඔබ වහන්සේ ගේ යෙහෙළියටැ" යි තවත් බත් හැන්දක් පාත්‍රයට බෙදත්.

කසුප් බුදුරජුන් දවස උන්වහන්සේගේ ශාසනයෙහි පැවිදිව සිටි භික්ෂූන් වහන්සේලා දෙනමක් ඉතා යහළු ව එක මවුකුස උපන්නවුන් සේ එක් ව වසු හ. දිගා වළඳන බුදුවරුන්ගේ ශාසනයෙහි පැවිදිවරු අවුරුද්දකට වරක් හෝ සමසකට වරක් පොහොය කරන්නට එක් තැන් වෙති. මේ දෙදෙනා වහන්සේ ද පොහොය කරන්නට හුන් තැනින් නික්ම ගියහ. මේ වේලෙහි තවතිසා වැසි දෙවියෙක් එසේ නික්ම යන ඒ තෙරුන් දැක "මේ තෙරහු ඉතා එකමුතු ය, දෙදෙනකු වුව ද එකකු සේ ය පෙණෙන්නෝ, එහෙයින් මුන් දෙන්නා බිඳු වන්නට පිළිවන් දැ" යි සිතී ය. තමන් නුවණ නැති බැවින් ඒ සිතුවිල්ල නො හැර ඒ පිණිස කල් බලමින් සිටියේ ය. ඒ වේලෙහි එයින් එක් නමක්, අනික් නමට කියා සිරුරුකිස කරන්නට ගස් අතරකට වැදුනේ ය. ඒ අතර ඒ දෙවි තෙමේ ගැණුවෙසක් ගෙණ, තෙරුන් සිරුරුකිස කොට පෙරළා එන කල්හි එක් අතකින් හිස කේ අවුල් හැර හැර, එක් අතකින් ඉණ ඇද තිබූ රෙදිකඩ දුවිලි ගසා හරිමින් පිළියෙල කොට කොට තෙරුන් පසු පස ම 'ආවා ය. එහෙත් උන්වහන්සේ මෙය නො දුටහ. සිරුරුකිස සඳහා කැලයට ගිය තෙරුන් එනු බලා සිටි අනික් ස්ථවිරයන් වහන්සේට හිසකෙහෙ බඳිමින් රෙදිකඩ ඉණ දවටමින් වෙහෙස දක්වමින් තෙරුන් පස්සෙහි එන ඇය පෙණිනා. දෙවි දූ තෙරුන් කමන් දුටුබව දැන අතුරුදන් ව ගියා ය. සිරුරුකිස සඳහා ගිය ඒ තෙරුන් තමන් වෙත ආ කල්හි "ඇවැත! තට සිල් නැත්තේ ය, තාගේ සිල් බිඳුනේ ය" යි ඒ ස්ථවිරයන් වහන්සේ කීහ. "මට එබඳු විපතක්, මාගේ, සිල් බිඳුමක් නො වී ය" යි උන්වහන්සේ කී කල්හි, "ඇයි එසේ කියහු මේ දැන් තරුණ ගැහැණියක, හිසකෙහෙ බඳිමින් ඉණ රෙදිකඩ දවටමින් ඇඟපත පිස දමමින් තට ලංව තා පස්සෙහි එනු මම දුටු වෙමි, මා මෙ කියන්නේ අනෙකකු විසින් කියන ලද්දක් නො වේ. ඒත්, ඔබ වහන්සේ මට එබන්දක් නො වීය" යි කියන්නහු ය, ඔය කියන කතාව මම කෙසේ අදහම් දැ" යි ඇසූහ. එවිට ඒ ස්ථවිරයන් වහන්සේ හිසට හෙණ වැටුනකු සේ "ඇවැත! මා නො නසව, මට කරන්නට ඔයට වඩා අන් විපතක් නැත, මට එබඳු විපතක් සිදු වී නැතැ" යි කීහ. එ වේලෙහි අනික් තෙරුන් වහන්සේ "මාගේ ඇසින් ම දක්නා ලද්දක් ඔබ නැතැයි කියන්නහු ය, මම

ඔය කියන කතාව කෙසේ අදහම් ද, ඔබ ඒ ගැහැණිය හා මෙවුන්දම් සෙවනය නො කළහු යි මට කොයි ලෙසකිනුත් නො පිළිගත හැකි ය, අනාචාරයෙහි හැසිර එන ගැහැණියක ලෙසින් මය ඇ ඔබ පස්සෙහි ආවා, තා, ඇය හා ජඩකම්හී හැසිරීම ගැන කිසිත් සැකයෙක් නැතැ'' යි කියා දර කෝටුවක් බිඳ හැරියා සේ යහළුකම බිඳ දමා නික්ම ගොස් පොහොය ගෙයි දිත් ''මම මොහු හා පොහොය නො කරමි'' යි හිඳ ගත්හ. විලට ගොස් ආ ස්ථවිරයන් වහන්සේ ''ස්වාමීනි! මාගේ සිලයෙහි අඩුවක් පමණ වූත් කැලලෙක් නැතැ'' යි කී කල්හි මිතුරුකම් හැර ගිය ස්ථවිරයන් වහන්සේ ''ඔය ස්ථවිරයන් කියන කතාව පිළිගත යුතු නො වේ, කාරණය මම මගේ ඇසින් ම දුටු බෙමි, මා කියන්නේ අනුන් කියූවක් නො වේ. ඇසින් ම දුටුවකැ'' යි කීහ. මේ අතර දෙවි තෙමේ ඒ තෙරුන් හා පොහොය කරන්නට නො කැමැති ව හුන් තෙරුන් දැක 'මා විසින් කරණ ලද්දේ ඉතා බලගතු වරදකැ'' යි සිතා අහස සිට ''ස්වාමීනි! මේ තෙරුන් ගේ සිලයෙහි දෙසෙක් නැත, මුන්වහන්සේගේ සිල් බිඳීමෙක් නැත, ස්වල්පමාත්‍ර වූත් වරදෙක් මුන්වහන්සේට එහිලා නො නැගිය හැකි ය, සිල් පිවිතුරු ය, මුන්වහන්සේ විමසනු සඳහා එසේ කෙළෙමි මම ය, එහෙයින් මුන්වහන්සේ හා පොහොය කරනු මැනවැ'' යි කීයේ ය. කියත් ම ඒ අදහා ගත් ස්ථවිරයන් වහන්සේ පොහොය කළහ. එහෙත් පෙර සේ අනික් තෙරුන් කෙරෙහි මෙත් සිත් ඇත්තෝ නො වූහ. ඒ දෙවියා විසින් කළ පූර්වකර්මය මෙ පමණි.

ආයු කෙළවර කලුරිය කළ ස්ථවිරයන් වහන්සේලා දෙව්ලොව උපන්හ. දෙවි තෙමේ ආයු කෙළවර චුත ව ගොස් අවීචිමහා නරකයෙහි ඉපිද බුඩාන්තරයක් මුළුල්ලෙහි එහි පැසි අප බුදු රජුන් දවස සැවැත් නුවර ඉපිද තරුණවයසට පැමිණියේ බුදු සසුන්හි මහලු පැවිදිකම් ලැබුයේ ය. පාපය කුඩා යි නො සිතිය යුතු ය කවටකම් පිණිස ද පව් නො කළ යුතු ය. පව් කුඩා වුව ත් දරුණු විපාක දෙන්නේ ය. කවටකම් පිණිස කළ ද විපාක දෙන්නේය.

මෙසේ ඔහු පැවිදි වූ ද සිට ම මේ ගැණුරුව ඔහු පස්සේ යන එන බව මහජනයාට පෙණුනේ ය. කුණ්ඩධාන යි නම් කළේ ද එහෙයිනි. ගැණියක පස්සෙහි ඇති ව යන එන කුණ්ඩධානයන් දුටු අනික් දෙනා වහන්සේ අනාථපිණ්ඩික සිටු අමතා ''මහසිට! මේ දුසිල්හු ඔබ තුමන්ගේ වෙහෙරින් බැහැර කරන්න, මේ දුසිල්හු නිසා අනික් දෙනා වහන්සේටත් මග බැස යනු බැරි ය, විඳින්නට සිදු වී ඇත්තේ බලවත් අවනම්බුවෙක, ඒ නිසා අද හෙට ම ඔය දුසිල්හු වෙහෙරින් ඇද දමන්නැ'' යි දන්වා සිටියහ. එවිට සිටු තෙමේ ''ස්වාමීනි! බුදුරජාණන් වහන්සේ වෙහෙර නැත්තාහු ද'' යි ඇසි ය. ''සිට! ඇතැ'' යි ඔවුහු කීහ. ''එසේ නම් ස්වාමීනි! බුදු රජාණන් වහන්සේ ඒ දැන ගන්නා සේකැ'' යි කී කල්හි භික්ෂූහු විශාඛා උපාසිකාවට දැන් වූහ. ඕත් ඔවුනට එසේ ම කිවු ය. එවර ඒ භික්ෂූහු කොසොල් රජු වෙත ගොස් ''මහරජ! කුණ්ඩධානයා ගැහැණියක ගෙණ හැසිරේමින් සියලු මහණුන්ට නින්ද ඇති කරමින් කල් ගෙවයි,

දැන් අපට පාරේ බැස යන්නට බැරි තැනට වැඩ සැලසී තිබේ, එහෙයින් ඒ දුසිල් මහණුනු තමුන්නාන්සේගේ රථින් පන්නා හරිණු මැනවැ'' යි වැරින් කියා සිටියහ. රජතෙමේ ''ස්වාමිනි! බුදුරජානන් වහන්සේ මේ දවස්වල කොහි වැඩ වසත් දැ'' යි ඇසි ය. ''මහරජ! වෙහෙර වැඩ වසති'' යි කී විට ''වැඩ වසනා සෙනසුන කුමක් දැ'' යි ඇසි ය. ඔවුහු සෙනසුන කීහ. ''එසේ නම් තමුන්නාන්සේලා වඩින්න, මම ඒ ගැන බලා ගනිමි'' යි කියා රජ තෙමේ සවස් වේලේ වෙහෙරට ගොස් කුණ්ඩධාන තෙරුන් වසනා කාමරය මිනිසුන් ලවා වට කරවා තෙරුන් වෙත ගියේ ය. රජු ද කුණ්ඩධාන තෙරුන් පිටිපස සිටි ඒ ගැණුරුව දුටුයේ ය. උන්වහන්සේ රජුගේ පැමිණීම දැන වෙහෙර උඩුමාලට නැග වැඩ හුන්හ. රජ තෙමේ තෙරුන් නො වැන්දේ ය. ගැණුරුවත් නො ද දක්කේ ය. දෙරමුල්ල, ඇඳයට බැලුයේ ය. එහෙත් නො ද දක්කේ ය. නොදැක ''ස්වාමිනි! මා මෙහි එද්දී මෙහි ගැණියක ඉඳිනු දුටුවෙමි, ඈ දැන් පෙණෙන්නට නැත, කොහි ද ඈ දැන්, කියන්න, පිටත් කළහු කොතැනට ද. කො තැනින් දැ'' යි කියන්නට අසන්නට වූයේ ය. ''මහරජ! ගැහැණියක් මෙහි නැත, ගැහැණියක ඉඳිනු මම නො දිටිමි'' යි තෙරුන් කී කල්හි ''කියන්නහු බොරු, දැන් ඔබ වහන්සේගේ පිටිපස ගැහැණියක ඉඳිනු මම දුරදී ම දුටුවෙමි, එය වළහාලන්නට ඔබට බැරි ය, ඇත්ත කියවු'' යි රජ තෙමේ කී ය. ස්ථවිරයන් වහන්සේ ''මහරජ! ගැහැණියක් මෙහි නැතැ'' යි කී විට රජ තෙමේ ''මේ කිමැ'' යි සිතා ස්වාමිනි! ඔබ වහන්සේ පොඩ්ඩක් වේලා මෙහි ම සිටිනු මැනවැ'' යි කීයේ ය. ස්ථවිරයන් වහන්සේ රජු කී ලෙසට උඩමාලෙන් පාත මාලට බැස ආලින්දයෙහි සිට ගත්හ. එ වේලෙහි ද ඒ ගැහැණිය තෙරුන් පිටිපස සිට ගත. රජ ඇය දැක උඩ මාලට නැංගේ ය. ඔහු පැමිණි බව දත් ස්ථවිරයන් වහන්සේ එහි ම වැඩ හුන් හ. එ වේලෙහි රජ, සියලු තැන බලන්නේ ද ඇය නො දැක ''ස්වාමිනි! දැන් ගැහැණියක් මෙහි සිටියා, ඈ කොහි ද, නො සඟවා කියන්නැ'' යි කී විට ද තෙරුන් වහන්සේ ''මම නො දිටිමි'' යි කීහ. ''ස්වාමිනි! කුමක් කියහු ද, මම දැන් ඇය ඔබවහන්සේගේ පිටිපස සිටිනු දුටුවෙමි'' යි රජ තෙමේ කීය. ''ඔව්, මහරජ! හැම දෙන ම මාගේ පිටිපස ගැහැණියක් ගමන් කෙරේය යි කියත්, එහෙත් මම කිසිදෙනත් මා පිටිපස ගැහැණියක ගමන් ගෙණ ඇති බවක් නො දිටිමි'' යි කීහ. එවිට ''මෙහි යම් කිසිවක් විය යුතු ය'' යි සැලකූ රජ තෙමේ ''ස්වාමිනි! මෙ තැනින් නැගී සිටින්නැ'' යි තෙරුන්ට කියා තෙරුන් බැස ආලින්දයෙහි සිට ගත් කල්හි ගැහැණිය තෙරුන් පිටිපස සිටිනු දැක උඩුමාලට නැග බලනුයේ, නො දැක එවර්ත් තෙරුන් විවාළේ ය. උන්වහන්සේ ''නො දකිමි'' යි කී කල්හි ''මේ ගැහැණු වෙසක් ගත්තෙකැ'' යි නීරණයට බැස ගත් රජ තෙමේ තෙරුන්ට ලංව ''ස්වාමිනි! මේ අන්දමේ කිලිටක් නුඹ වහන්සේගේ පස්සෙහි නිතර ගමන් කරණු දකින්නෝ නුඹ වහන්සේට බත් සැන්දක් පමණකුත් දෙන්නට කැමැති නො වෙති, එබඳු දේ දැක දැක කවර කෙනෙක් කන්නට බොන්නට දෙත් ද, එහෙයින් දනය පිණිස මගේ මාලිගාවට වඩින්න, මම දන් දෙන්නම්, මම ඔබ වහන්සේට සිවු පසය සපයන්නම්'' යි පවරා මාලිගාවට ගියේ ය.

එකල්හි මේ දත් අනික් බොහෝ භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! බලවු, රජු කළ පහු වැඩේ, මේ දුසිල් මහණහු වෙහෙරින් ඇද දමන්නට ගොස් ඔහු කළේමේ මහණවු සිවු පසින් පවරා යෑම ය, වෙහෙරින් නෙරපූ සැටි කදිමය" යි ඒ ඒ තැන කැටි කැටි වූ අවඥාමුඛයෙන් කතා කරන්නට වූහ. තෙරුන් කරාත් ගොස් "දුශ්ශීලය! දැන් තෝ රාජකුලූපග වූයෙහිය" යි කියමින් ඇණුම් බැණුම් කළහ. එහිට ඒ ස්ථවිරයන් වහන්සේ "දුශ්ශීලයෝ නම් තෙපි ය, තලගොයි වහු තෙපි ය, ගැහැණියක ගෙණ හැසිරෙන්නහු තෙපි ය" යි කියන්නට වන්හ. ඒ භික්ෂූන් වහන්සේලා එවේලෙහි බුදුරජුන් කරා ගොස් "ස්වාමීනි! කුණ්ඩධානයා, දුශ්ශිලයෝ තෙපි ය, කියා අපට ගරහයි, අප, තලගොයින් වැනි ය යි කියයි, ගැහැණු ගෙණ හැසිරෙන්නහු තෙපි ය යි කියා" යි දැන් වූහ. එවිට බුදුරජාණන් වහන්සේ කුණ්ඩධානයන් කැඳවා "මහණ! තමුසේ මෙසේ කී වහු සැබෑද" යි ඇසූහ. "ස්වාමීනි! සැබෑ ය, මම එසේ කීමි" යි කුණ්ඩධාන තෙමේ නො පැකිළ කී ය. "ඇයි තමුසේ එසේ කීවහු?" යි අසා වදළ විට "මා සමග කතා කළ බැවිනැ" යි කීය. "මහණෙනි! සැබෑ ද, තමුසෙලා මේ නම සමග කතා කළහු?" යි බුදුරජානන් වහන්සේ ඇසූහ. "ස්වාමීනි! ඔය උන්නාන්සේ ගැහැණියක සහවා ගෙණ හැසිරෙති, ගැහැණියක් නිතර ඔය උන්නාන්සේගේ පසුපස යයි, ඔය උන්නාන්සේගේ ඒ නෙයියාඩම දුටු අපි මහාජනයා අපට නින්ද කරණ්හිසා එසේකතා කළෙමු" යි ඔවුහු කීහ. අනතුරු ව බුදුරජානන් වහන්සේ කුණ්ඩධාන තෙරුන් අමතා "මේ නම් ලා තමුසේ සමග කතා කළෝ තමුසේගේ පස්සෙහි ගැහැණියක හැසිරෙණු දැක ය, ඒ සැබෑ ය, තමුසේ ගැහැණියක නො දැක ම මේ නම ලා සමග කුමක් නිසා කතා කළහු ද? තා විසින් පෙර දෙයක ඉපද වූ පව් අදහසක් නිසා තමුසේට මේ සිදු විය, දැනුත් කුමක් නිසා පව් අදහස් උපදවහුද" යි අසා වදළ විට රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා "ස්වාමීනි! මොහු පෙර කළ කම් කිමැ" යි ඇසූහ. බුදුරජානන් වහන්සේ ඔවුනට මොහුගේ ඒ පූර්වකර්මය වදරා, "මහණ! තමුසේ මේ විප්‍රකාරයට පැමිණියහු ඒ කළ පාපකර්මය නිසා ය, දැනුත් එබඳු වූ පව් අදහස් ඉපදවීම නොසුදුසුය, එහෙයින් මින් පසු මේ නමලා සමග ඔය අන්දමේ රුදුරු කතා සිත් නො ඉන්නා කතා කිසිවක් නො කළ යුතු ය, කට කැඩී ගිය කස්ලෝ තලියක් සේ නිහඬ විය යුතු ය, රළු පරුෂ බස් නො බිණිය යුතු ය, යමකුට එබඳු බසක් කීයේ නම් ඔහුද පෙරළා එසේ කියන්නේ ය, එවිට තමුසේත් එසේ කියන්නහු ය, දෙපක්ෂයෙහි වූවෝ මේසේ බහින් බස් වී මහත් විපතට වැටෙන්නෝ ය, එහෙයින් කාටත් රිදෙන ඇණෙන බස් නො කිය යුතු ය, කවුරුන් මොනවා කීවත් යමෙක් එයට ඉනා ගැටේ නම්, නො කිපේ නම්, නො බණී නම් ඔහු නිවන් නො පැමිණියේ ද පැමිණියකු වැනි ය" යි වදරා අනුසන්ධි ගළපා මේ ධම්දෙශනාව කළ සේක.

මා වොච එරුසං කඤ්චි වුත්තා පටිවදෙයුං තං,
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙයුං තං.

සචෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා,
එස පත්තොසි නිබ්බානං සාරම්භො තෙ න විජ්ජති.

කිසිවකුට රළු බස් නො කියව. (තා විසින් රළුබස්) කියනලද්දෝ තට පෙරළා රළුබස් කියන්නෝ ය. යම්හෙයකින් එකටෙක කියා ගැන්ම දුක් වේද (එහෙයින්) ප්‍රතිදණ්ඩයෝ තා පහසන්නාහ.

මුවවිට සිඳ දැමූ ලෝ තලියක් සේ තමා නිශ්චල කෙරෙහි නම් ඒ තෝ නිවණට පැමිණියේ වෙහි ය. තට එකටෙක කියුම් ඉකරුම් නැත්තේ ය.

මා වො ව එරුසං කඤ්චි – කිසිවකුට රළුබස් නො කියව.

'මා×අවොව' යනු පද සිදීමය. අසන්නහුගේ මම් සිඳ හරින්නා වූ කර්කශවචන **එරුස** නම්. **''මම්මච්ඡෙදකං කක්ඛළ වචනං එරුසං නාම''** යනු අටුවා ය. **''මම්මඝට්ටනවසෙන පවත්තිතං වචනං එරුසං''** යනු ද දන්නේ ය.

යමෙක් යමකුගේ යම් වචනයක් අසා ගැටේ ද, කිපේ ද, සැඩ වේ ද, යුතු අයුතුකම් සිහිපත් කිරීමෙහි අපොහොසත් වේ ද, හොඳ නො හොඳ නො පෙණේ ද, තැන් නො තැන් නො දනේ ද, මේ ආදීනට කරුණු වූ බස එරුස නමැ යි දත යුතු ය. එබඳු රළුබස් කිසිවිටෙක කිසිවකුටත් තමන් වෙත ඉන්නා ඉතා පහත් මෙහෙකරුවකුට වත් නො කිය යුතුය.

වුත්තා පටිවදෙය්‍යුං = තා විසින් එරුෂ වචන කියන ලද අන්‍යයෝ තටත් පෙරළා එරුෂවචන කියන්නෝ ය.

යම් ලෙසකින් යමෙක් යමකුට "තෝ දුශ්ශීල ය, තෝ පව්ටෙක, තෝ තලගොයකු වැනි ය, තෝ ඔටුවෙක, බල්ලෙක, රොඩියෙක" යන ආ ලෙසකින් සිත ගැටෙන කිපෙන රළුබසක් කියේ නම් ඒ කියන ලද අන්‍යායන්, ඒ කියුම් හාර ගත් තැනැත්තේත් දම් නො දම් නො දක්නේ නම් ඒකාන්තයෙන් ඔහු ද මුලින් රළුබස් කිවහුට වඩාලාත් රළුබස් කියන්නේ ය. වඩාලාත් බණින්නේ ය එහෙයිනි මේ වදළෝ, **නන්දිවිශාලසුජාත** ජාතකාදිය බැලිය යුතු ය.

දුක්ඛා හි සාරම්භකථා = යම් හෙයකින් එකටෙක කියා ගැන්ම දුක් වේ ද.

''කත්තරි කරණෙ සාරම්භෙ'' කරණු ලද්දට වැඩියක් කිරීම, කියන ලද්දට වැඩියක් කීම **සාරම්භ** නම්. මෙය කුසල් අකුසල් විසින් ලැබෙන්නේ ය. එහෙයින් දෙ පරිදි ය. එහි වනාහි ගිහියකුහට, එක් සලාක බතක් දෙන්නා වූ යම් කිසිවකු දක, තමා විසින් සලාකබත් දෙකක් හෝ තුණක් දිය යුතු ය යි අදහස් වේ ද, සිතෙහි එබඳු අදහසක් පහළ වේ ද, පැවිද්දකුහට, එකකු එක් සඟියක් උගත් කල්හි තමන් සඟි දෙකක් උගත යුතු ය යි අදහස් වේ ද සිතෙහි එබඳු අදහසක් පහළ වේ ද එය කුසල් විසින් ගත යුතු ය.

ගිහියකුහට, අනුන් කරණ ඇඟ සැරසුම් ඇ බලා ඊට දෙ ගුණයක් දෙ ගුණයක් කරමි යි සිතෙහි අදහස් පහළ වේ ද පැවිද්දකුහට, අනෙකෙක් යම් පමණ යම් පමණ ප්‍රගුණ කෙරේ ද කියා ද එයට දෙ ගුණයක් දෙ ගුණ-යක් ප්‍රගුණ කරමි, කියමි යි මානවශයෙන් සිතෙහි අදහස් පහළ වේ ද, එය අකුසල් විසින් ගතයුතුය.

''සවෙ පන කො චි කිං චි වදති න ඉදං එවං කත්තබ්බන්ති තෙන සාරඩචිත්තො භාකුටිකමුඛො කො මෙ ත්වන්ති පසය්හති අයමස්ස සාරම්භො'' ''තා විසින් මෙය නො කළ යුතු ය'' යනාදීන් යමකු යමක් කිවිට එයින් අසහනසිත් ඇති ව මූණ භකුළා ගෙණ ''මට කියෙහි තෝ කවරෙක් වෙහි ද'' යි කීවහුට බලාත්කාරකම් කෙරේ ද, කීවහු ප්‍රතිකථා-වෙන් මැඩලා ද මේ ප්‍රතිකථාවට එලෙසින් උපන්නේ සාරම්භ නමැ යි කීහ. මේ වනාතී චිත්තොපක්ලෙශයකි. මෙයින් සිත කිලිටි වේ.

සාරම්භකථා නම් එකටෙක කීම ය. මෙහි එකටෙක කිරීම යම් සේ නම්, එකටෙක කීමත් එසේ ම පව් ය. **''එසා කරණුත්තරා යුගග්ගාහ-කථා නාම දුක්ඛා''** යනු අටුවා ය.

පටිදණ්ඩා ඵුසෙය්‍යු තං = ප්‍රතිදණ්ඩයෝ තා ස්පර්ශ කරන්නාහ.

ගැසූවහුට ගසන පහර ප්‍රතිදණ්ඩ නම්. එය පළමු ගැසූ පහරට සම වුව ද නො සම වුව ද ප්‍රතිදණ්ඩ යි කියනු ලැබේ.

''තා අනුනට පොලු මුගුරු කිරිච්චි ඇ යමකින් පහර දෙනු ලබා නම් තාගේ ඒ පහර කෑ තැනැත්තේ තටත් එසේ ම පහර දෙන්නේය'' යනු මෙයින් පැහැදිලි කෙරේ. මුලින් කළ දණ්ඩනය දණ්ඩ නම්. එයට පිළිතුරු විසින් කළ දණ්ඩනය ප්‍රතිදණ්ඩ නම්. කායදණ්ඩාදීහු ම ය මෙයින් ගැණෙන්නෝ.

සවෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා – කට කඩා දැමූ කස්ලෝ තලියක් සේ තමා නිශ්චල කෙරෙහි නම්.

කට කඩා හැර තලිය පමණක් ඉතිරි කළ කස්ලෝතලිය අතින් පයින් දණ්ඩෙන් යන යමකින් ගසන ලද්දේ නමුත් හඬ නො නගා ද, එමෙන් යමෙක් අනුන්ගේ කායදණ්ඩාදි යමකින් කිසිවිටෙකත් නො සැලේ නම් නො ගැටේ නම් (මතු සම්බන්ධය) කට නැති තලිය කෙසේ ගසාලුව ද හඬ නො නගන්නා සේ, යමෙක් කවුරුන් විසින් කුමක් කියන ලද්දේ නමුත් නො බෙණේ නම් නො ගැටේ නම් ඒ යහපත් ය යනු කී සේ ය.

'අත්තානං' යන්නට සිතැ යි අරුත් කිව ද වර ද නැත. රන්-රිදී-තඹ-යකඩ-ඊයම් යනු පස් ලෝ ය. මේ පස ම කංස ශබ්දයෙන් ගැණේ. කංස නම් වූ රන්-රිදී ආදී යමකින් පාන පාත්‍රාදි යමක් කැරුණේ ද එ ද කංස යි හඳුන් වත්. මේ එබඳු තැනෙකි.

එස පත්තොඩි නිබ්බාණං = ඒ තෝ නිවණට පැමිණියේ වෙහි.

මේ පිළිවෙත පුරන්නා වූ ඒ තෝ, දැන් නිවණට නො පැමිණි යෙහි ද, මතු නිවන් ලබන හෙයින් නිවණට පැමිණියෙක් නම් වන්නෙහි ය.

සාරම්භො තෙ න විජ්ජති = තට එකටෙක කිරීමෙක් නැත්තේ ය.

මෙයේ ඇති කල්හි තට "මම දුශ්ශීල නම් තෝත් දුශ්ශීල වෙහි ය" යනාදීන් එකටෙක කියා කර ගැණීම **ලක්ෂණ** කොට ඇති යුගග්‍රාහයෙක් නො වන්නේ ය.

"කරණුත්තරියකරණෙ සාරම්භො" සාරම්භය එකටෙක කිරීම ලකුණු කොට ඇත්තේ ය යනු දන්නේ ය.

ධම්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ. කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ ද බුදුරජුන් දුන් අවවාදයෙහි පිහිටා රහත්බවට පැමිණියාහු ය. වැඩි කල් නො යවා අහසට නැඟ පළමු ලහය ද ගත්හ.

කුණ්ඩධානස්ථවිරවත්ථුව නිමි.

කම්සැප පතා සිල්ගත් උපාසිකාවෝ

10–5

සැවැත්නුවර වැසි බොහෝ ගණනක් ස්ත්‍රීහු මහාපොහොය දිනයෙහි පෙහෙවස් සමාදන් ව වෙහෙරට ගියහ. එහි දී විශාඛාවෝ ඒ උපාසිකාවන් අතර හුන් වැඩි මැහැලි උපාසිකාවන් වෙතට ගොස් "මැනියෙනි! කුමක් පතා තෙපි පෙහෙවස් ගත්තහු ද?" යි ඇසූහ. එවිට ඒ මැහැලි උපාසිකාවෝ "දිවසැප ලැබීමේ බලාපොරොත්තුවෙන් පෙහෙ වූමහ" යි කීහ. අනතුරු ව විශාඛා තොමෝ මැදියම් වයසෙහි සිටි උපාසිකාවන් වෙත ගොස් එසේ ම ඇසූ ය. "සපත්නිවාසයෙන් මිදෙන්නට පෙහෙ වූමහ" යි ඇලා කීහ. නැවත තරුණවයසෙහි සිටි උපාසිකාවන් වෙත ගොස් එසේ ඇසූ විට "කුලදුලේ පුතුන් ලබන්නට පෙහෙ වූමහ" යි ඇලා පිළිතුරු දුන්හ. ඒ වර විශාඛා තොමෝ ලදරු උවැසියන් අතින් ද එය ම ඇසූ ය. "අපි පෙහෙවස් වසන්නමෝ වැඩි දියට නො ගොස් බාල කාලයේ දී ම දිග කන්නවැ" යි ඔවුහු කීහ. එවිට විශාඛා තොමෝ උන් හැම දෙන කැඳවා ගෙණ බුදුරජුන් ඉදිරියට ගොස් මේ සියලු පුවත් උන්වහන්සේට දන්වා සිටියා ය. බුදුරජානන් වහන්සේ ඒ අසා "විශාඛාවෙ! සත්ත්වයන්ගේ ජාති ආදීහු, කෙවිටී දඩු ගත් එඩෙරුන් වැන්නාහ, ජාතිය, සත්ත්වයන් ජරාව කරා පමුණුවයි, ජරාව, ව්‍යාධිය කරා පමුණුවයි, ව්‍යාධිය මරණය කරා පමුණුවා, පොරවෙන් කපන්නා සේ ජීවිතය සිඳලයි, තතු මෙසේ වුවත් මේ සත්ත්වනිකායයෙහි නිවන් පතන්නෝ නැත, ඇත්තාහු සසර ම පතන්නෝ ය" යි වදරා අනුසන්ධි ගලපා මේ ධර්මදේශනාව කළ සේක.

> යථා දණ්ඩෙන ගොපාලෝ ගාවෝ පාජෙති[1] ගොචරං,
> එවං ජරා ච මච්චු ච ආයුංපාජෙන්ති පාණිනන්ති.

ගොපලු තෙමේ දණ්ඩෙන් (තළතළා) ගෙරිසරක් තණ බිමට පමුණුවන්නා සේ ජරාවත් මරණයත් සත්ත්වයන්ගේ ආයුෂය ක්ෂයට පමුණුවත්.

යථා දණ්ඩෙන ගොපාලෝ ගාවෝ පාජෙති ගොචරං = එඩෙරා කෙවිටෙන් තළතළා ගෙරින් තණබිමට පමුණු වන්නා සේ.

ගොපාලෝ යනු හරක් එඩෙරාට නමෙකි. ගෙරිරැක්මෙහි දක්ෂ වූ එඩෙරකු කෙරෙහි පිහිටිය යුතු අංග එකොළසෙක් ආගම ධර්මයෙහි දක්වෙන්නේ ය. ඒ අංග එකොළසින් යුත් එඩෙරතෙම ම ගොගණපරිහරණයටත් ගොසමූහයාගේ දියුණුව සිදු කිරීමටත් සුදුසු ය. එසේ යුක්ත නො වූයේ නාමමාත්‍රයෙන් ගොපල් ය. මේ ය ඒ අඞ්ග එකොළොස.

---

1. 'පවෙති' යි සමහර පොත්හි.

ගොනුන්ගේ ස්වරූප දන්නකු වීම, ගොනුන්ගේ සිරුරෙහි කළ ලකුණු දන්නකු වීම, නිල මැස්සන් තැබූ ඉහඳ ඉවත් කරන්නකු වීම, බෙහෙත් දී වණ බඳින්නකු වීම, සුදුසු කාලයෙහි ගොවුදෙහි දුම් දෙන්නකු වීම, සම විසම ගං තොටුපල දන්නකු වීම, ගොනුන් පැන් පානය කළ නො කළ බව දන්නකු වීම, මග සම විසමකම් දන්නකු වීම, ගොවරයෙහි දක්ෂයකු වීම, ඉතිරි කොට දෙවන්නකු වීම, ප්‍රධාන ගවයන්ට වැඩි සැලකිලි කරන්නකු වීම, මෙ කී අඬිගයන්ගෙන් යුත් ගොපලු තෙමේ ම ගවපටටි දියුණු කොට පස් ගෝරස වැළඳීමෙහි සමර්ථ වන්නේ ය.

ගාවො යනු ගො යන්නෙන් විහක්ති ලෙණ නිපන්නේ ය. **ගො** යනු "**ගොසු දුය්හමානාසු ගතො**" යන මෙහි පශුවාචක ය. "**ගොමතිං ගොතමං නමෙ**" යන මෙහි පෘථිවිවාචක ය. "**ගොත්තවසෙන ගොතමං**" යන මෙහි වාවායෙහි ය. "**ගන්ධබ්බො**" යන මෙහි ස්වර්ගයෙහි ය. "**උණ්හගූ සිතගූ**" යන මෙහි රශ්මි වාචක ව සිටියේ ය. උණ්හගූ නම් සූය්‍යයා ය. සිතගූ නම් චන්ද්‍රයා ය. "**උණ්හා ගාවො රංසයො එතස්සාති = උණ්හගූ, සීතා සීතලා ගාවො රංසයො එතස්සාති = සිතගූ**" යනු අර්ථසමර්ථනය යි. "**ගදං**" යන මෙහි වප්‍රවාචක වේ. "**ගො විය වජිරො විය පරෙසං දුක්ඛං දදතීති = ගදං**" යනු වාක්‍යයි. "**ගො සිතචන්දනං**" යන මෙහි ජලාවාචක වේ. "**ගො විය උදකං විය සීතං චන්දනන්ති = ගොසිතචන්දනං**" යනු වාක්‍ය ය යි. "**ගොචරෝ**" යනු චක්ඛුරාදි ඉන්ද්‍රියවාචක ය. වාක්‍යය "**ගාවො ඉන්ද්‍රියානි චරන්ති එත්ථාති = ගොචරෝ**" යනු යි. "**ගණ්ඨිපදං**" යන තැන්හි ඝණවාචක ය. "**ගො ඝාණං තිට්ඨති එත්ථාති = ගණ්ඨි, ගණ්ඨි ච තං පදං චාති = ගණ්ඨිපදං**" යනු දන්න. "**ගීතං ගායනං**" යනාදියෙහි ගායනා කරන්නහු කෙරෙහි වැටේ. "**ගොහි ගීතරෙහි ඊයතෙ උච්චාරියතෙති ගීතං**" යනු වාක්‍යය යි. මේ ආදී විසින් නානාර්ථවාචක වූ ගො ශබ්දය මෙහිලා සිටියේ පශුවාචක ව ය.

ගවයන් තණ පිණිස හැසිරෙණ බිම්පෙදෙස් මෙහි ගෝචර නම් වේ. භික්ෂූන් පිඬු සිහා හැසිරෙණ ගම් ද ගෝචර යි කියනු ලැබේ. "**ගොචරොති භික්ඛාචාරගාමො**" යනු ටීකා ය. පිණ්ඩපාතාදිය පිණිස එළඹෙන්නට සුදුසු තැන ය ගෝචර නම්. "**ගොචරොති ච පිණ්ඩපාතාදිනං අත්ථාය උපසඞ්කමිතුං යුත්තට්ඨානං**" යනු පොතෙහි ඒ ආ සැටියි.

තව ද ආගම පිළිබඳ පොතපතෙහි උපනිස්සයගොචර-ආරක්ඛගොචර-උපනිබන්ධගොචර යි ගෝචර තුණක් ආයේ ය. එහි කල්‍යාණමිත්‍ර තෙමේ උපනිස්සයගොචර නම්. අප්පිච්ඡකථා ආදී දශකථාවස්තූන්ට ස්ථාන බැවිනි. ඉන්ද්‍රියසංවරය ආරක්ඛ ගොචර නම්. සතර සතිපට්ඨානය උපනිබන්ධගෝචර නම්. එසේ කියනුයේ සතර සතිපට්ඨානය සිත බැඳ තැබීමට සිත හැසිරවීමට තැන් වන බැවිනි. මේ එකකුදු මෙහි නො ගැණේ. ගැණෙන්නේ ගවයන් තණ කා හැසිරෙණ තැන ය.

එවං ජරා ච මච්චූ ච = එසේ ජරාවත් මරණයත්.

ආයුං පාජෙන්ති පාණිනං = සත්ත්වයන්ගේ ආයුෂය (විනාශයට) පමුණුවන්නාහ.

දක්ෂ වූ ගොපලු, කුඹුරු වතුපිටිවලට වදින්නා වූ ගෙරිසරක්, කෙවිටෙන් පහරමින්, ඉන් වළකා, තණ දිය ඇති බිම්පෙදෙස් කරා ගෙණ යන්නා සේ ජරාමරණ යන මොවුහු සත්ත්වයන්ගේ ජීවිතය සිඳ ලන්නෝ ය.

මෙහි **ජරාමරණ**, එඩෙරා සේ, **ජීවිතය**, ගොනුන් සේ, **මරණය තණබිම** සේ දත යුතු ය. ඉතිය, සත්ත්වයන්ගේ ජීවිතය ජරාව වෙතට පමුණුවයි. ජරාව, ව්‍යාධිය වෙතට, ව්‍යාධිය මරණය. වෙතට පමුණුවයි. මරණයෙන් ඒ භවයෙහි ජීවිතෙන්ද්‍රියයාගේ පැවැත්ම අවසන් වන්නේ ය. ජරාමරණ ඉදිරියෙහි විස්තර වන්නේ ය.

ආයු නම් ජීවිතකාල ය යි. "**එති ගච්ඡතීති** = ආයු" යනු නිරුක්ති යි. ඇතැම් සත්ත්වයන් පිළිබඳ ආයුකාලය සීමිත වුව ද මනුෂ්‍යාතිරශ්චීනාදී ඇතැම් සත්ත්වයන් පිළිබඳ ආයුෂයාගේ සීමා නියමයෙක් ඒකාන්ත විසින් නො දැක්විය හැකි ය.

ලොකයෙහි මනුෂ්‍යයන්ගේ ආදිම මහාපුරුෂයෝ දෙවත්වය පවා ඉක්මවා සිටියෝ අසඞ්ඛ්‍යායුස්ක වූහ. මොවුන්ගේ ඒ ඉතා දීර්ඝ වූ ආයුකාලය ගෙවා ලූවෝ ද ජරාමරණයෝ ය. දීර්ඝායුස්ක වූ ඒ මිනිසුන් අතර කල් යැමෙන් විවිධ දුර්ගුණ පහළ විය. ඒ හෙතුවෙන් මිනිසුන්ගේ දිගු කලක් ජීවත්වීමේ ශක්තිය ක්‍රමයෙන් පිරිහෙන්නට වන. එය, "**ඉමෙසු සබ්බෙසු වෙපුල්ලං ගතෙසු තෙසං සත්තානං ආයුපි පරිහායි, වණ්ණොපි පරිහායි**" යනාදි දෙශනා ප්‍රදෙශයන්ගෙන් පැහැදිලි වේ. මෙසේ පැවැත ආ මිනිසුන්ගේ ආයුකාලය, බුදුරජානන් වහන්සේ දවස සියක් වසට ඉතා ටිකක් අඩු වැඩි බවට පැමිණියේ ය. "**අප්පමිදං භික්ඛවෙ! මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං, යො භික්ඛවෙ! චිරං ජීවති සො වස්සසතං අප්පං වා භීයොා**" යනාදි දෙශනාවෙන් ඒ බව කියන්නා හ.

අද මනුෂ්‍යයාගේ ජීවිතකාලය සියක් වසිනුදු ප්‍රමාණවත් කරන්නට නො හැකි ය. පමණ කට හැක්කේ සැට වසකට හෝ සැත්තෑ වසකට ය. එහි හෙතු පෙර කී සේ මිනිසුන් අතර අසද්ගුණ බහුල වශයෙන් පහළ වීම ය. අසද්ගුණ පහළවීම ආයු පිරිහීමට කරුණු වන්නා සේ ආරොහපරිණාහසම්පත්ත්‍යාදිය පිරිහීමට ද හෙතු වේ.

ඒ ඒ කාලයන්ගේ වශයෙන් අඩු වැඩි වන සත්ත්වයන්ගේ ඒ ඒ අත්බව පිළිබඳ ජීවිතකාලය, ජීවිතෙන්ද්‍රියය, ජරාමරණ විසින් ම විනාශයට පමුණු වනු ලැබේ. එය වළකනු බැරි ය. ලොකයට ඇතුළත් බැවිනි.

පාණ නම් ජීවිතෙන්ද්‍රිය ය. ඒ මේ ජීවිතෙන්ද්‍රියය යමෙකුට වේ නම් ඔහු **පාණි** යි ගණු ලැබේ. පරමාර්ථ විසින් ප්‍රාණියෙක් නැත. ව්‍යවහාර-යෙහි නම් ලැබේ. **''පාණොති ජීවිතින්ද්‍රියං වොහාර මත්තතො සත්තො''** යනු අටුවා ය. **''පාණොති ජීවිතින්ද්‍රියපටිබඬා බන්ධසන්තති, තං වා උපාදය පඤ්ඤත්තො සත්තො''** යන මෙයිනුදු එය තහවුරු කෙරෙන්. ජීවිතෙන්ද්‍රියප්‍රතිබඬ වූ ස්කන්ධ සන්තතිය ප්‍රාණි යි කියනු ලබන්නී ය. සත්ත්වව්‍යවහාරයට එය ඇසුරු කොට නැඟුනෙකි.

ධම්දේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන්ඵලාදියට පැමිණියෝ ය.

විශාඛාදි උපාසිකාවන්ගේ පෙෂවස්කම් පිළිබඳ වස්තුව නිමි.

ගඳකිළිය දැවූ මිනිසා

10 - 6

එක් දවසක් මහාමුගලන් තෙරණුවෝ, ලක්ෂණ මහාතෙරණුවන් හා එක් ව ගිජුකුළු පව්වෙන් බිමට බස්නා සේක්, අජගර නම් ප්‍රේතයකු දුටු සේක. උෆ උස මහතින් යොදුන් පස් විස්සක් පමණ වූ සිරුර ඇත්තේ ය. උගේ හිස් මුදුනෙන් නැග යන ගිනි දැල් සිරුර හාත්පස විහිද සිටියේ ය. සිරුර වටින් නැගෙනා ගිනි දැල් හිස් මුදුන කරා යන්නේ ය. දෙපසින් නැගෙන ගිනිදැල් සිරුර මැද දී එක් වන්නේ ය. මෙසේ මේ බිහිසුණු දැකුම් දුටු මහාතෙරණුන්ට එතැන දී ම සිනා පහළ විය. ලක්ෂණ තෙරණුන් ඒ දැක "සිනාසිමහි හේතු කවරේ ද?" යි මුගලන් තෙරණුන් අතින් විචාළ විට "ඇවැත! මගේ සිනාසීමෙහි හේතු කීමට මේ කාලය නොවේ, බුදුරජුන් ඉදිරියෙහි දී එය විචාරන්නැ" යි කියා රජගහ නුවර පිඩුසිහා ගියහ. පිඩුසිහා ගෙණ බුදුරජුන් වෙත පැමිණි මුගලන් තෙරුන් අතින් ලක්ෂණ තෙරණුවෝ සිනාසීමෙහි හේතුව විචාළහ. එවිට උන්වහන්සේ "ආයුෂ්මතුනි! මම එහිදී ප්‍රේතයකු දිටිමි, ඔහුගේ අත්බව පස් විසියොදුන් පමණ ය, මේතරම් බිහිසුණු අත්බවක් මා මීට කලින් දැක නැත, එහෙයින් මට සිනා පහළ වී ය" ය යි කීහ. බුදුරජානන් වහන්සේ ඒ අසා "මහණෙනි! මගේ ශ්‍රාවකයන් චක්ෂුෂ්මත් ව වෙසෙති" යි යනාදීන් වදරා, "මහණෙනි! මමත් ඔය කියන ප්‍රේතයා බෝ මැඩ දිටිමි, මෙයට කලින් ඒබව මම කිසිවෙකුටත් නොකීමි, නොකියේ යම් කෙනකු මාගේ කතාව නොපිළිගත හොත් එය ඔවුනට අවැඩ පිණිස වන බැවිනි, මමත් දැන් මුගලන් තැන සාක්ෂ්‍ය කොට එය කියමි" යි වදළ සේක. එහි රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා "ඔහු කළ පූර්වකර්මය වදරණු මැනවැ" යි දන්වා සිටි කල්හි බුදුරජානන් වහන්සේ එය මෙසේ ගෙණහැර පෑ සේක.

"මහණෙනි! කසුප් බුදුරජුන් දවස සිටුවරයෙක් විය, ඔහුගේ නම සුමඬ්ගල ය, බුදුරජුන් උදෙසා ඔහු විහාරයක් කර වී ය, එම බිම්පෙදෙස දිග පළලින් රියන් දෙහස් අටසියයක් පමණ ය, ගෙපල් ඇද එ බිම රන් ගෘඩාල් අතුරවා විහාරය කරවීමට මහත් ධනයක් ඔහු වියදම් කෙළේ ය, විහාරපූජාමහෝත්සවය ද මහත් ධන වියදමින් මැනවින් සිදු කෙළේ ය, දිනක මේ සිටු තෙමේ උදෑසනම බුදුරජුන් දක්නට විහාරයට ගියේ ය, යන ගමනේ නුවර දෙර අම්බලමක ඕස සිට පොරවා ගත් කසාවතක් ඇති ව මඬ තැවරුණු පා ඇති ව නිදහුන්නකු දැක, 'මූ රෑ, තැන තැන ඇවිද මඩත් ඇඟ තවරා ගෙණ නිදන්නකු විය යුතු ය" යි හඬ නගා කී ය, එය ඇසූ ඔහු ඔලුව උස්සා බලා සිටු දැක "වේවා, කරන එක මම දනිමි" යි සිටුහු කෙරෙහි වෛර බැඳ ගත්තේ ය, නැවත, ඔහු කෝපයෙන් දිලිහී දිලිහී සිටුගේ පැසුනු කරල් බර ව තිබූ කුඹුර සත් වරක් ගිනි දී විනාශ කෙළේ ය, සත් වරක් ගාලෙහි සිටි ගොනුන්ගේ කකුල් කපා හැරියේ ය, ගෙය සත් වරක් දවා හළු කෙළේ ය, මෙයිනුත් කෝපය සන්සිඳවා ගත නුහුනු ඔහු

සිටු ගෙදර මෙහෙකරුවකු හා යහළු ව 'තගේ සිටු වඩා ප්‍රිය කරන්නේ කුමකට ද'' යි ඇසී ය, බුදුරජුන් වසනා ගඳකිළියට වඩා ප්‍රිය එකක් සිටුට නැතැ' යි කී කල්හි බුදුරජුන් පිඬු සිහා වඩිනු බලා හිඳ වෙහෙරට ගොස් එහි පැන් බඳුන් බිඳ දමා බුදු රජුන් වසන ගඳකිළියට ගිනි තබා පැන ගියේ ය, 'ගඳකිළිය දවෙන්නේ ය' යි දත් සිටු තෙමේ වහා එහි දුව ගියේ, ද හලු වූ ගඳකිළිය දැක දෙමිනස් නොං කොට තදින් අත්පුඩි ගැසී ය, එහි රැස් ව සිටි මිනිස්සු 'සිට! මෙතෙක් මහත් ධනයක් වියදම් කොට තැනූ ගඳකිළිය දවී යන කල්හිත් ඔබ අත්පුඩි ගසන්නහු කුමක් නිසා ද?'' යි ඇසූහ, සිටු තෙමේ 'පින්වත්නි! මා මේ ධනය නිදන් කරණ ලද්දේ යම්තම් තැනක නොං වේ, සොර සතුරන් විසින් අනතුරු නොං කළැකි ගින්නෙන් වතුරෙන් උවදුරු නොවන තැනක ය, මම මගේ ධනය තැන්පත් කෙළෙමි. මා තැන්පත් කළ ඒ ධනය කිසිවකුට පැහැර ගත නොං හැකි ය, ගින්නෙන් නොං දැවිය හැකි ය, වතුරෙන් උල්පවාලිය නොං හැකි ය, පළමු වියදම් කළ පමණ ම වියදම් කොට වෙහෙරක් කරන්නට නැවතත් මට ඉඩ ලැබුනේ ය'යි මහත් සතුටින් අත්පුඩි ගැසිමි' යි කීයේ ය. ඔහු එසේ කියා පළමු වියදම් කළ ගණන ම වියදම් කොට එහි වෙහෙරක් කරවා විසි දහසක් මහණුන් පිරිවර කොට සිටි බුදුරජානන් වහන්සේට දන් දී එය පූජා කෙළේ ය.

ගඳකිළිය දවූ පුරුෂ තෙමේ 'මූ නොං මරා පසු බට කරන්නට නොං හැකි ය. අන් මොකක් කළත් මූ පසු බස්සන්නට නොං පිළිවන. වේවා, මූ මරා ලන්නෙමි' යි බඩතුරෙහි සිරියක් රුවා ගෙණ සත් දවසක් ම ඉඩ කඩ බලමින් සෝදිසියෙන් වෙහෙර තුළ ම හැසුරුණේ ය. එහෙත් ඔහුට ඒ පිණිස ඉඩක් නොං ලැබිනි. සිටු තෙමේ සත් දවසක් දන් දුන්නේ ය. සත්වනද බුදු රජුන් වැඳ 'ස්වාමීනි! මගේ කුඹුරු එක් මිනිසකු විසින් සත් වරක් ම දවා හලු කරණ ලද්දේය, ගාලෙහි සිටි ගොනුන්ගේ කකුල් කපා හරිණ ලද්දේ ය, ගොඩ නැඟූ ගෙවල් ගිනිබත් කරණ ලද්දේ ය, ගඳකිළියත් දවා හැරියේ ඔහු ය, ඒ නිසා ස්වාමීනි! මම මේ පින්කමෙහි පළමු වන පින් කොටස ඔහුට පමුණුවන්නෙමි, ඔහු එයින් සුවපත් වේවා' යි මහහඬින් කියා පින් පැමිණ වූයේ ය. මේ ඇසූ ඒ පුරුෂ තෙමේ 'මා කළේ ලොකු අපරාධයෙක්, මෙ තරම් විපත් කළ මා කෙරෙහි මොහුගේ සිත් තුළ කිපුමෙක් නොං සතුටෙක් නැත, මෙහි දීත් පළමුවෙන් මට පින් පැමිණ වී ය, මම මූට නපුරක් ම කෙළෙමි, එහෙයින් මේ මිනිහා කමා කරවා නොගත්තෙම නම්, මා පිට හෙණ වැටෙනු ඇතැ' යි සිතා සිටු වෙතට ගොස් පාමුල වැටී, 'පින්වත! මට කමන්නැ' යි කියා සිටියේ ය. සිටු 'කාරණය කිමැ' යි ඇසූ විට 'පින්වත! මම තමුන්නාන්සේට ලොකු නපුරක් කෙළෙමි, එයට කමන්නැ' යි කී ය. 'හා තෝ ද මාගේ කුඹුරු ගිනි තැබූ වෙහි? ගොනුන් පා කැපූ වෙහි? ගේ ගිනි බත් කෙළෙහි? ගඳකිළිය හලු කෙළෙහි? යි සිටු ඇසූ කල්හි 'එසේය' යි ඔහු කී ය. 'මෙයට කලින් කවදවත් මා විසින් තෝ නොං දක්නා ලද්දෙහි ය. එසේ කල්හි මා හා ඔ තරම් නොං සතුටෙක් අමනාප-

යෙක් වූයේ, වන්නේ මොක ද, දැක නැති කල? නො හඳුනනා කල මට ඔතරම් ලෙසින් නපුරක් කරන්නට, විරුඩ ව නැඟ එන්නට කරුණු කිමැ?' යි සිටු තෙමේ ඇසි ය. ''තමුන්නාන්සේ දිනෙක මා නිදනා තැනට අවුත් කළ කතාව ඔබට මතක ද? අන්න, ඒ, එද කළ කතාව නිසා මා සිත්තුළ කෝපයෙක් හට ගැණුනේ ය, මේ සියල්ලට හේතුව එය' යි කී විට සිටාණන්හට එය මතක් වී ය. 'ඔව්, මට මතකය, මා එබදු කතාවක් කීවා, ඒ ගැණ මට කමන්නැ' යි සිටු තෙමේ ඔහු කමා කර ගෙණ 'මිතුර නැගී සිටින්න, මම තට කමන්නෙමි, නැගිට යන්නැ' යි කීයේ ය. එකල්හි ඒ පුරුෂ තෙමේ 'පින්වත! තමුන්නාන්සේ මට කමන්නහු නම්, මාත් ඔබේ අඹුදරුවනුත් ඔබ ගෙයි මෙහෙකරුවන් ලෙසට නවතා ගන්නැ' යි ඉල්ලා සිටියේ ය. සිටු තෙමේ 'මිතුර, මා සිතෙහි නො සතුටෙක් අමුත්තෙක් නැත, මේ සැබෑය, මා එද කීයූ ඒ වචන දෙක තුණට කිපි නො සතුටු ව මෙ තරම් මහත් නපුරක් කෙළෙහි ය, ගෙයි නවතා ගෙණ මා යමක් කියන ලද්දේ නම්, එය මෙයට වඩා බිහිසුණු විය හැකි ය, ගෙයි වසන්නන් සමග මොකුත් කතා කළ හැකි නො වේ. මාගේ ගෙයි මට කර ගත නො හැකි ලොකු වැඩෙක් ද නැත, මම තට කමා කරමි, ගෙයි නවතා ගැණීම නම් කළ හැකි නො වේ. ඒ නිසා සතුටු හැටියක් කර ගන්නැ' යි කීයේ ය. ඔහු එතැනින් බැහැර ගියේ, ඉතා දුකසේ කල් ගෙවී ය. කල් යෑමෙන් මැරී ගිය ඔහු ඒ කළ කම්මයෙන් අවීචියෙහි උපන. එහි ඉතා දිගු කලක් නිමිහිම නැති දුක් වින්දේ ය. විපාකාවශෙෂ විසින් දැන් මේ ගිජුකුළුපවවෙහි ප්‍රේත යෙක් ව සිටි ය'' යි මෙසේ ඔහුගේ ඉකුත් පුවත වදළ බුදුරජානන් වහන්සේ ''මහණෙනි! අඥනයෝ පවකම් කරන්නෝ විපාක දැන නො කරති. පසුව තමන් කළ පවකම්වලින් දවෙන්නෝ, තුමූ ම ලැව්ගිනි වැනි වෙති'' යි වදරා අනුසන්ධි ගළපා මේ ධම් දෙශනාව කළ සේක.

අථ පාපානි කම්මානි කරං බාලෝ න බුජ්ඣති,
සෙහි කම්මෙහි දුම්මෙධෝ අග්ගි දඩ්ඪොව තප්පති.

අඳ තෙමේ ක්‍රොධ වශයෙන් පමණක් පවකම් කරන්නේ නො වේ. පවකම් කරණ අඳ තෙමේ මේ පවකමට මෙබදු විපාකයෙක් ඇතැ යි ද නො දනී යි. අඳ තෙමේ තමන් කළ පව කම්හි ගින්නෙන් දවන ලද්දකු සේ තැවෙන්නේ ය.

අථ = එ පමණක් නො වේ.

අඳ තෙමේ පවකම් කරන්නේ ක්‍රොධ වශයෙන් පමණක් නො වේ යි කී සේ ය මේ.

පාපානි කම්මානි = පවකම්.

කරං බාලෝ න බුජ්ඣති = කරන්නා වූ අඳ තෙමේ නො දනියි.

පරපණ නැසුම් ඇ පව්කම් කරණ ගුණ නුවණින් තොර මිනිස් තෙමේ "මා විසින් කළ මේ පව්කමට මෙසේ වූ අනිෂ්ට විපාකයෙක් ඇතැ" යි නො දන්නේ ය. පව්කම් කරන්නේ "පව්කම් කරමි" යි නො දන්නේ නො වේ. "න බුජ්ඣති" යනු වදළෝ කළා වූ ද කරන්නා වූ ද කර්මයට ලැබෙන විපාකය නො දන්නේ ය යනු දක්වනු සඳහා ය. "පාපං කරොන්තො ච පාපං කරොමීති අබුජ්ඣනකො නාම නත්ථි, ඉමස්ස කම්මස්ස එවරූපො නාම විපාකොති අජානන්තො න බුජ්ඣතීති වුත්තං" යනු අටුවා ය.

සෙහි කම්මෙහි දුම්මෙධො = නුවණ නැත්තේ සිය කමින්. තමන් කළ පව්කමින්.

සෙහි යනු තමන් අයත්, තමන් පිළිබඳ යන අරුත් ඇත්තේය. 'ස ශබ්දයෙන් කරණාර්ථයෙහි තෘතීයා වූ තැනි. ස ශබ්දය, සහ – සමාන– පසත්ථ – සන්ත යන අරුත්හි ත, ම, ශබ්ද කාර්‍යයෙහි, නාමවිභක්තියෙහි' ධාතුප්‍රත්‍යයෙහි ව්‍යඤ්ජනයෙහි, ස්වකීයවස්තුවෙහි, තමන් කෙරෙහි, නෑයන් කෙරෙහි, ක්ෂෙත්‍ර, රාක්ෂසයන් කෙරෙහි හෙන්නේය. "සවික්කා සවිචාරා, සනිදස්සනා" යනාදී තැන්හි සහාර්ථයෙහි, "හරිස්සවණ්ණො පඨවිප්පභාසො" යනාදී තැන්හි සමානාර්ථයෙහි, "සෙය්‍යො සෙට්ඨො" යනාදී තැන්හි ප්‍රශස්තාර්ථයෙහි, "සබ්හි සඞ්ම්මො, සප්පුරිසො" යනාදී තැන්හි සන්තාර්ථයෙහි, "සො පුරිසො, සා ඉත්ථි" යනාදී තැන්හි තශබ්ද–කාර්‍යයෙහි, "අසු රාජා අසු ඉත්ථි" යනාදී තැන්හි මශබ්දකාර්‍යයෙහි, සි, යො, අං, යො, නා, හි, ස,නං" යනාදී තැන්හි නාමවිභක්තියෙහි, තිජගුප කිතමානෙහි ඛජසා වා" යන තැන්හි ධාතුප්‍රත්‍යයයෙහි, "ය, ර, ල, ව, ස, හ, ළ, අං" යන තැන්හි ව්‍යඤ්ජනයෙහි, "සානි කම්මානි සපුත්තො" යනාදී තැන්හි තමන් සතු වස්තුවෙහි, "සධනං සපරිසං" යනාදී තැන්හි තමන් කෙරෙහි, සන්දිට්ඨො සම්භත්තො" යනාදී තැන්හි නෑයන් කෙරෙහි, "සස්සං සාලි" යනාදී තැන්හි ක්ෂේත්‍රයෙහි, "සපත්තො" යනාදී තැන්හි රාක්ෂසයන් කෙරෙහි වැටුනේ ය. මෙහි ආයේ තමන් අයත් වස්තු ක්‍රියාදියෙහි ය.

අග්ගි දඩ්ඪොව තප්පති" = ගින්නෙන් දවන ලද්දකු සේ තැවේ.

අඥ තෙමේ තමන් කළ පාපකර්මයන්ගෙන් නිරයෙහි ඉපිද ගින්නෙන් දන ලද්දකු සේ කායික – චෛතසිකසන්තාපයෙන් තැවෙන්නේ ය.

අඥ තෙමේ ක්‍රොධයෙන් පව්කම් කරන්නේ මතු නො වේ. පව් කරන්නා වූ හෙතෙමේ මේ කර්මයට මෙබඳු දුඃඛවිපාකයෙක් ඇතැයි ද නො දනියි. තමන් කළ පව්කමින් අපායෙහි ඉපිද ගිනි ගෙණ දැවෙන්නෙකු සේ සිත කය දෙක්හි වූ බලවත් සන්තාපයෙන් නිති තැවෙන්නේ ය, යනු මෙහි අදහස ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

අජගරප්‍රෙතවස්තුව නිමි.

මහමුගලන් මහතෙරුන්ගේ පිරිනිවීම

10 – 7

එක් දවසෙක, අන්තොටුවෝ එක් තැන් ව "ඇවැත්නි! කුමක් නිසා ශ්‍රමණ ගෞතමයන්හට මහත් සේ ලාභසත්කාර උපදින්නේ දැ" යි උනුන් සාකච්ඡා කරන්නට වූහ. එහි දී ඔවුහු "ශ්‍රමණ ගෞතමයාහට මොද්ගල්‍යායන නම් ශ්‍රාවකයෙක් ඇත්තේ ය, ශ්‍රමණ ගෞතමයා ඔය තරම් මහත් ලාභසත්කාර ලබනුයේ ඒ ශ්‍රාවකයා නිසා ය. ඔහු දෙව්ලොවට ගොස් දෙව්බව ලබන්නට උනුන් කළ කම් අසා දැන අවුත්, මෙබඳු පින්කම් කොට උසස් සම්පත් ලැබුවන් දෙව්ලොව සැප විඳිනි යි ද, නිරයයට ගොස් නිරි සතුන් කළ කම් අසා දැන අවුත්, මෙබඳු පව්කම් කොට කටුක නපුරු දුක් විඳින තිරිසනුන් නිරයයෙහි වෙසෙති යි ද මිනිසුන්ට කියාල යි. මිනිස්සු ඒ අදහා ගෙණ ඔවුනට මහත් සේ ලාභසත්කාර එළවති. එහෙයින් ඔය කියන මොද්ගල්‍යායනයා ජීවිතයෙන් තොර කෙළෙමු නම්, අපටත් ලාභසත්කාර මහත් සේ ලැබිය හැකි ය" යි කතා කොට ගත්හ. එහි ඔවුහු උත්සාහවත් වූහ. යම් කිසිවක් කොට මුගලන් තෙරුන් මරන්නට නියම කර ගත්හ. ඒ පිණිස කහවනු දහසක් එකතු කොට ගහලයන් ගෙන් වූහ. "අසවල් කලුගල් ලෙනෙහි මුගලන් තෙර වෙසෙයි. එහි ගොස් ඌ මරා එවු" යි ගහලයන්ට මුදල් දුන්හ. ඔවුහු ධනලොභයෙන් ඒ පිළිගෙණ, "තෙරුන් මරන්නෙමු" යි උන් වහන්සේ වැඩහුන් ලෙන වට කළහ. තෙරණුවෝ ගහලයන් ලෙන වට කළ බව දැන යතුරු සිදුරෙන් ඉන් නික්ම ගත්හ. ගහලයෝ එද එහි තෙරුන් නො දැක පසු දිනකත් එහි ගොස් ලෙන වට කොට සිටියහ. එදත් උන්වහන්සේ වහල මුදුන බිඳ අහසට නැඟී ගත්හ. මෙසේ තෙරණුවෝ දෙමසක් පමණ කල් ගහලයන්ගෙන් රැකුනාහ. තෙවන මස පැමිණියේ ය. ඒ තෙවන මසෙහි උන්වහන්සේ පෙර තමන් කළ අකුශලකර්මයකින් මෙසේ වන බව දැන "කළ කමට සැහවෙනු තමන්ට තබා බුදුරජුනටත් නො හැකි ය" යි කොතැනෙකත් නො ගොස් ලෙන තුල ම රැඳී සිටියහ. ගහලයෝ එද ලෙනට ඇතුල් ව තෙරුන් අල්ලා යමගුරුවලින් තළා උන්වහන්සේගේ සිරුරෙහි ඇට සුන්සහල් පමණට පොඩි කළහ. එ වේලෙහි ඔවුහු "තෙරුන් මළහ" යි සිතා සිරුර වනලැහැබක දමා ගියහ. තෙරුන් වහන්සේ "බුදු රජුන් දකම පිරිනිවී යන්නෙමි" යි සිය සිරුර ධ්‍යාන නමැති වෙළුමෙන් වෙළා තර කොට අහසින් බුදුරජුන් වෙත ගොස් වැඳ "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! පිරිනිවන් පාමි" යි දන්වා සිටියහ.

බුදුරජාණන් වහන්සේ-මුගලන්! පිරිනිවන් පාන්නහු?

මුගලන්තෙර- භාග්‍යවතුන් වහන්ස! "එසේය."

බුදුරජ තමුසේ පිරිනිවෙන්නහු කොතැන?,

මුගලන්- ස්වාමිනි! කලුගල් ලෙන පිහිටි පෙදෙසෙ,
බුදුරජ- මුගලන්! එසේ නම් මට බණටිකක් කියන්න. මෙතැන් සිට තමුසේ වැන්නකු මට දකින්නට ලැබෙන්නේ නැත. එහෙයින් බණටිකක් කියන්න.

මුගලන්- ස්වාමිනි! හොඳමයි, බණටිකක් කියමියි තෙරුන් වහන්සේ එ වෙලෙහි අහස නැග, පිරිනිවන් පෑනා දවසේ සැරියුත් තෙරුන් සේ නානාවිධ සෘද්ධිප්‍රාතිහාර්‍යය දක්වා බණත් කියා බුදුරජුන් වැඳ කලුගල් ලෙන තුබූ වනරොදට ගොස් එහිදී පිරිනිවන් පෑ සේක. "සොරු තෙරුන් මැරුහ" යි එදවස දඹදිව සැම තැන පතළ ව ගියේ ය. අජාසත් රජ තෙමේ උන්සොයන්නට වරපුරුෂයන් යෙදී ය.

දවසක් මේ සොරු රා තැබෑරුමක, රා බොන වේලේ එකෙක් එකකුගේ රා කෝප්පයට ගසා එය බීම හෙළි ය. ඔහු අනිකාට බැණ වැදී "ජඩ පුරුෂය! තෝ කුමක් හෙයින් මාගේ රා පොලොත්ත බීම හෙලූ යෙහි ද?" යි ඇසි ය. "තා කියනු කිම, මුගලන් තෙරුන්ට පළමු කොට පහර දුන්නෙහි තෝ නො වෙහි ද?" යි කී විට "පළමු කොට මා ගැසූ බව තෝ කෙසේ දනිහි ද, එසේ කියන්නෙහි කෙසේ ද?" යි ඔහු විවාළේ ය. මෙසේ ඔවුහු බහින් බස් කියමින් කොලාහල කළහ. ඔවුන්ගේ ඒ කතාව අසා සිටි වරපුරුෂයෝ උන් අල්ලා රජු ඉදිරියට පැමිණ වූහ. "මුගලන් මහතෙරුන්නාන්සේ මරණ ලද්දෝ තොප විසින් ද?" යි ඇසූ විට ඔවු හැම දෙන කිසිත් නො බැණ නිහඬ වූහ. නැවත නැවතත් ඇසූ කල්හි "දේවයන් වහන්ස! එසේ ය" යි කීහ. "මුගලන් තෙරුන් මරන්නට කීවෝ කවුරුදෑ?" යි ඇසූ විට "නග්න ශ්‍රමණයන් කීහ" කී කිහ. එ වෙලෙහි රජ තෙමේ උන් ගෙන්වා වළක් කප්පවා පහර දුන් සොරුන් හා සමග එහි ලවා පිදුරුවලින් මුළුමනින් වස්වා ගිනි ලැවූයේ ය. නැවත වැ ගෙන්වා එයින් සස්වා කැබලි කර වී ය.

එද දම්සබාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා "මහමුගලන් තෙරුන් තමන්ට නුසුදුසු මරණයකට පැමිණියහ" යි කතා කරන්නට වූහ. එවෙලෙහි එහි වැඩියා වූ බුදුරජානන් වහන්සේ ඒ අසා "මහණෙනි! තමුසෙලාගේ කතාවත් පිළිගැණීමත් වරද නැත, ඒ තැන පැමිණියේ ඒ තැනට මේ අත්බවේ හැටියට සුදුසු මරණයකට නො වේ. එහෙත් ඒ තැන පැමිණි මරණය, පෙර කළ අකුශලකර්‍මයකට ගැළපෙන මරණයෙකි. මෙන්න ඒ කර්‍මය, "යටගිය දවස බරණැස් නුවර එක් කුලපුත්‍රයෙක් වී කෙටීම දර ගෙණීම බත් පිසීම ආදිය කරමින් මවුපියන් රැක බලා ගත්තේ ය. දවසෙක ඔහුගේ මවුපියන් "පුත! නුඹට මේ වැඩ සියල්ලක් තනි ව කරන්නට නො හැකි ය. ඔය ලෙසට ගෙදරත් වනයේත් කළයුතු කටයුතු තනි ව කිරීම නුඹට විඩාවෙකි, කරදරයෙකි. ඒ නිසා ගෙයි කටයුතු සොයා බැලීමට, සෑහෙන තැනකින් නුඹට ලමිස්සියක ගෙණෙන්නෙමු" යි කිහ. එවිට මේ කුලපුත් තෙමේ "මවුපියෙනි! ලමිස්සියකගෙන් මට වැඩෙක්

නැත, ඕවා පටලවා ගත් කල කොහොම කරදර ද, මට අම්මා තාත්තා බර නැත, මම ඔබ දෙපොල ජීවත් ව ඉන්නා තුරු උවටැන් කරමි. එහෙයින් මට ගෑණියකගෙන් වැඩෙක් නැතැ'' යි එයට අසතුටු බව දන්වී ය. මවුපියන් ඔහුගේ අසතුට ගැණ නොසලකා ''ගෑණියක ගෙණ එන්නට ඕනැ'' යි තරයේ කියා තරුණියක ගෙණවුත් පුතුට පාවා දුන්හ. ඕ ටික දවසක් ඔවුනට උවටැන් කොට පසු ව උන් දකිනුත් නොකැමැත්තී තම හිමියා ගෙට ආ කල ''ඔහේගේ මවුපියන් හා එක් තැන වසන්නට නොපිළිවනැ'' යි මහහඬින් කියා සිටියා ය. එහෙත් ඔහු එය ගණනකට නොගත්තේ ය. ඔහු බැහැර ගිය වේලේ නියඳ කෙදි කැලි හා කැඳ පෙණත් ගෙයි ඒ ඒ තැන විසුරුවා හැරියා ය. හිමියා ගෙට අවුත් 'මේ කිමැ' යි ඇසූ කල්හි, 'මේ ඔහේගේ ඇස් නැති මවුපියන්ගේ වැඩ ය, මුළු ගෙය ම සෙම් සොටු දමා අපවිත්‍ර කරමින් එහා මෙහා ඇවිදිති, මට මුන් සමග එක තැන වසන්නට නොහැකි ය' යි කිවු ය, මෙසේ ඈ දවස ගානේ කියත් ම පිරුපැරුම් ඇති මේ පුරුෂ තෙමේ ද මවුපියන් කෙරෙහි බිඳී ගොස් 'වේවා, මම හොඳ වැඩක් කරන්නෙමි, කරණ වැඩේ මම දනිමි' යි මවුපියන් කවා පොවා අවසන් කොට 'අසවල් තැන ඉන්නා අපගේ නැයන් අප දකිනු කැමැත්තෙන් එහි එන්නැ යි දන්වා එවා තිබේ. එහෙයින් දැන් එහි යා යුතු ය' යි ඔවුන් කරත්තයක නංවා ගෙණ ගොස් කැලෑවක් මැද දී ගොනුගේ නාස්ලනුව පියා අතට දුන්නේ ය. ''පියේ! ගොනුන් යන විට පා හඬ නඟින්නේ ය, මේ ටික තැන සොරු වෙසෙක්, මම කරත්තයෙන් බසින්, නෙමි' යි කියා කරත්තයෙන් බැස, සෙමින් යමින් උඟුර යටින් මොර ගා සොරුන් ආ සැටියක් දක්වී ය. මවුපිය දෙදෙන එ හඬ අසා 'සොරු ආහ'' යි සිතා ''පුතේ! අපි මහලු වම්හ, නුඹ දිවි රැක ගණින්, අප ගැණ නොවෙහෙසෙන්නැ' යි කීහ. හෙතෙම මවුපියන් එසේ අඬ අඬා කියත් ම සොරුන් ආ හැටි දක්වමින් උන් කොටා මරා මළකුණු කැලයට ඇද දමා පෙරළා ගෙට ගියේ ය. මේ මුගලන් පෙර කළ කමැ'' යි වදළ සේක. නැවතත් ''මහණෙනි! මුගලන් මේ පාපකර්මය කොට නොයෙක් අවුරුදු ලක්ෂගණනක් නරකයෙහි ඉපිද පැසී විපාකාවශේෂ විසින් අත්බව සියයක ම මේ පරිද්දෙන් කෙටුම්කා ඇට නහර කුඩු කුඩු ව ගියෙක් ව මරණයට පැමිණියේ ය. මේ ලෙසින් සලකන විට පෙණෙනුයේ මුගලන් තමන් කළ කර්මයට අනුරූප වූ ම මරණයක් ලැබූ බව ය. මේ තීර්ථකයෝත් සොරුන් හා එක් ව නිරපරාධී වූ මා පුතු කෙරෙහි අපරාධයක් කළහ. ඔවුන් ද ඒ අපරාධයට සුදුසු විධයට පැමිණියෝ ය. අපරාධ නැත්තවුන් කෙරෙහි අපරාධ කරන්නේ කරුණු දසයකින් විපතට පත් වන්නේ ය'' යි වදරා අනුසන්ධි ගලපා මේ ධර්මදේශනාව කළ සේක.

යෝ දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති,

වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං,
ගරුකං වාපි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ,

රාජතෝ වා උපස්සග්ගං අඛහක්ඛානං ව දරුණං.
පරික්ඛයං ව ඤාතීනං භොගානංව පභඞ්ගුරං.

අථවස්ස අගාරානි අග්ගී ඩහති පාවකෝ,
කායස්ස භෙදා දුප්පඤ්ඤෝ නිරයං සොපපජ්ජති කි.

යමෙක් දණ්ඩනයට නොනිසි වූ අද්‍රෝහ වූ රහතුන් කෙරෙහි දණ්ඩනයෙන් අපරාධ කෙරේ ද, හෙතෙමේ දශවිධ දුඃඛකාරණයන් අතුරෙහි එක්තරා එකකට වහා ම පැමිණේ.

පරුෂ වූ වෙදනාවකට හෝ ධනහානියකට හෝ සිරුර බිඳීමට හෝ බලවත් රොගයකට හෝ චිත්තක්ෂෙපයට හෝ පැමිණෙන්නේ ය.

රජුන් කෙරෙන් වන උවදුරකට හෝ දරුණු වූ ගැරහීමකට හෝ නැයන්ගේ විනාශයට හෝ භොගයන්ගේ විනාශයට හෝ පැමිණෙන්නේ ය.

නොහොත් පාවක නම් ගින්න ඔහුගේ ගෙවල් දවයි. ඒ අඥපුද්ගල තෙමේ කය බිඳීමෙන් නිරයයෙහි උපදී.

යෝ දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති=යමෙක් දඩුවමට නුසුදුසු වූ ද්වේෂ නොකරණ රහතුන් කෙරෙහි දණ්ඩනයෙන් නපුරක් කෙරේ ද.

නුවණැති යමෙක් කායදණ්ඩ ධනදණ්ඩ වාග්දණ්ඩ යන කිසිත් දණ්ඩනයකට නුසුදුසු වූ තමහට වත් අනුනට වත් නපුරක් නොකරන්නා වූ එහෙයින් ම සියලු සතුන් කෙරෙහි මෛත්‍රීපර වූ උතුමකුහට කාය දණ්ඩාදී යම්කිසි දඩුවමක් කෙරේ ද, නපුරක් කෙරේ ද, (මතුසම්බන්ධයි)

දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති = (ඔහු) දශවිධ දුඃඛහෙතූන් අතුරෙහි එක්තරා හෙතුවකට වහා ම පැමිණේ.

පෙරඩෙහි වූ ය ශබ්දය, ත ශබ්දය අපෙක්ෂා කරණ හෙයින් 'ඔහු' යි අතින් හෙළන ලද්දේ ය. එය 'නිගච්ඡති' යන ක්‍රියා පදය කරන්නහු වශයෙන් සිටියේ ය.

කායදණ්ඩාදිය නැති, කාහටත් කිසි තැනෑ දීත් නපුරක් අහිතයක් නොකරණ උතුමකු කෙරෙහි, දඩුවම් කරණ තැනැත්තේ මතු කියනු ලබන දස වැදෑරුම් කරුණු අතුරෙහි එක්තරා එකකට වහා ම පැමිණේ යනු අදහසි.

වෙදනා ඵරුසං = රළු වූ වෙදනාවකට (හෝ)

මෙහි ලා ගැණෙන වෙදනාව දුඃඛවෙදනාව බව ඵරුසං යන විශෙෂණයෙන් කියනු ලබන්නේ ය. දශවිධ දුඃඛකාරණයන් අතුරෙහි මේ පළමුවැන්න ය. "සීසරොගාදිභෙදං ඵරුසං වෙදනං" යනු අටුවා ය. එහෙයින් අත් පා ආදිය බිඳීමෙන් හෝ කන් නාස් ඇ පිළිබඳ රොගයකින් හෝ උපන් ශාරීරිකදුඃඛ වෙදනාව ම මෙහිලා අභිමත ය,

කර්මවිපාකජවේදනාවෝ බුදුරජානන් වහන්සේ ද නොහැර පවතිත්. "යටගිය දවස එක් කුලගෙයක උපන් මහාබොධිසත්වයන් වහන්සේ ලදරු වියෙහි මහමගෙක සෙල්ලම් කරමින් සිටියහ. ඒ වේලෙහි පිඬු සිහා යන පසේබුදුවරයකු දැක මේ නිසමුඩු කළ මහණ කොහි යේ ද" යි ගල් කැටක් ගෙණ උන්වහන්සේට එල්ල කොට දමා ගැසූහ, එය උන්වහන්සේගේ පාපිට වැදීමෙන් ලේ ගලන්නට වන. එද බොධිසත්ත්වයෝ ඒ පාපකර්මයෙන් අවුරුදු දහස් ගණනක් නිරයෙහි ඉපිද දුක් විඳ මේ දවස බුදුබවට පැමිණියෝ ද පිලොතික කර්මවශයෙන් තමන් වහන්සේගේ උඩ පතුලෙහි ගල් පතුරක් වැදීමෙන් හටගත් බලවත් වේදනාවක් වින්දෝ ය." මෙසේ වදළ සේක එය.

"පුරෙහං දරකො හුත්වා කීළමානෙ මහාපථෙ,
පච්චෙකබුද්ධං දිස්වාන මග්ගෙ සකලිකා ඛිපිං.
තෙන කම්මවිපාකෙන බුඩභූතස්ස මෙ සතො,
පවිඩෙහි සිලං තත්ථ දෙවදත්තො විසට්ටවාකි"

ඤාතිං = හානියට හෝ.

ගේ දොර ඉඩ කඩම් වතුපිටි මිලමුදල් නැතිවීම්, අන්සතුවීම් ආදී වූ අර්ථසම්පත්තීන් හා දරුමල්ලු නෑ මිතුරු මවුපිය ආදීන්ගේ විනාශයට ද තමන් කළ, තමන් කරණ අකුශලකර්ම හෙතුවනබව සැලකිය යුතු ය.

සරිරස්ස ච භෙදනං = සිරුර බිඳීමට හෝ.

අත් පා කැඩුම් බිඳුම් ඔලු පැළුම් ඇස් කන් නාස් ඇඟ ඉඳුරන්ගේ පිරිහුම් ආදී වූ සිරුරෙහි බිඳුමට ද කළ කම්, කරණ කම් හෙතු වන්නේ ය.

ගරුකං වාපි ආබාධං = නැවත බලවත් ලෙඩට හෝ.

කාශ ශ්වාස අතීසාර ශොථ උදර කුෂ්ට ගණ්ඩ කිලාස අපස්මාර විසූචිකා මහාමාරි චසූරි ප්‍රමෙහ පිළිකා මාංසවෘඩ්ඩ්‍යාදුරු උපදංශ ආදී රෝගයෝ සත්ත්වජීවිතය නසන බිහිසුණු රෝගයෝ ය. මනුෂ්‍යයන් අතර පවත්නා කාණ කුණි ඛණ්ජ පීඨසප්පි ආදී භාවයෝ ද බිහිසුණු ය. මෙකී රොගයනට කළ කම්, කරණ කම් බෙහෙවින් හෙතු වන්නේ ය. කාණ කුණි ආදී භාවයනටත් කර්මය හෙතු වේ.

සිත කළඹන්නේ ආබාධ නම්. "ආබාධති චිත්තං විලොළෙති ති = ආබාධො" පාලිඅර්ථකථාචාර්‍යවරයෝ "අප්පාබාධං අප්පාතඞ්කං" යනු විවරණය කරමින් විසභාගවේදනාව ආබාධ යි. ඒ වනාහි සිරුරෙහි එක් දෙසෙක හට ගෙණ මුළුසිරුර යපටකින් බැන්ද සේ පැකිර ගණියි.

යාප්‍යරොගය ආතඞ්ක නම්. අනෙක ආබාධ නම්. කුඩා රොග ආතඞ්ක නම්. බලවත් රොගය ආබාධ නම්. සිරුරතුළ හට ගන්නේ ආබාධ යි ද, සිරුර පිට හට ගන්නේ ආතඞ්ක යි ද කෙනෙක් කියත්, "අපේ

බොධිසත්ත්වයෝ ඉතා ඇත කාලයෙහි ගැහැවි කුලයෙක උපන්හ, ඔහු එද ශක්තිමත් මිටි පුරුෂයෙක් විය, එකල්හි ම එහි ,මල්ලව පොර ඇල්ලීමෙහි දක්ෂයෙක් ද විසි ය. ඔහු දිනක් බෝසතුන් වසනා නුවරට පැමිණ මිනිසුන් හා පොර අල්ලා ජය ගෙණ පෙරළා යන්නට මගට බැස්සේ ය, මේ දත් බොධිසත්ත්ව තෙමේ ඔහු ගෙන්වා "අපිත් පොරයක් අල්ලා බලමු" යි කීයේ ය. ඔහු ද සිනාසී පොරයට වන්නේ ය. මහාසත් තෙමේ ඔහු අතින් ගෙණ ඔසවා බිම හෙලන්නේ කොදු ඇටය බිඳ බිම හෙළී ය. එ වේලෙහි නුවරවැස්සෝ මහාසතුන් වස්ත්‍රාභරණාදියෙන් පිදූහ. නැවත මහසත් මල්ලවපොරකරු නැඟිටුවා කොදු ඇටය සෘජු කොට බැඳ 'මෙතැන් පටන් මෙබඳු දේ නො කරව' යි කියා පිටත් කර යැවී ය. මේ පාපකර්මයෙන් මහසත් තෙමේ උපනුපත් තැන දුක් වින්දේය. අවසන් අත් බවේ දී බුදු වූයේ ද පිටෙහි නිති පවත්නා රිදුමකින් පෙළුනේ ය. ඒ රිදුම් උපන් විට බුදුරජානන් වහන්සේ සැරියුත් – මුගලන් තෙරුන් කැඳවා 'මට බණ කියවු' යි වදරා තමන් වහන්සේ සුගත් සිවුර පණවා ගෙණ සයනය කරණ සේක." මෙය මෙසේ වදළ සේක.

"නිබ්බුඩෙ වත්තමානම්හි මල්ලපුත්තං නිසෙධයිං,
තෙන කම්මවිපාකෙන පිට්ඨිදුක්ඛං අහූ මමානි"

චිත්තක්ඛෙපං ච පාපුණෙ = ඔල්මාදයට හෝ පැමිණෙන්නේ ය.

මිනිස් තෙමේ යකුන් වැහීමෙන් හෝ පිත කිපීමෙන් හෝ ඔල්මාදයට පැමිණෙන්නේ ය. මේ දෙඝනාවෙන් ඔල්මාදය අකුශල කර්ම විපාක විසිනුත් වන බව පැහැදිලි ය. කර්ම විපාක විසින් වන ඔල්මාදය බෙහෙත් පිළියමින් නො සන්සිඳෙන්නේ ය. ඒ කළ අකුශලකර්මය ගෙවී යෑම ම මෙය සන්සිඳීමෙහි හෙතු ය. එහෙයින් මෙබන්දෙහි පිළියමින් කර්ම නැත්තේ ය.

රාජතො වා උපස්සග්ගං = රජුන් කෙරෙන් වන උවදුරට හෝ.

සෙනාපති, භාණ්ඩාගාරික, විනිශ්චයකාර, ලෙඛකාධිකාර, ධන ශ්‍රෙෂ්ඨී ආදි ස්ථානාන්තර පහ කිරීමෙන් හා චතුපිටි ගේදෙර ඉඩ කඩම් මිලමුදල් පැහැර ගැනීමෙන් මිනිසුනට රජුන්ගෙන් වන උවදුරු ඇත්තේ ය. මෙ කී උවදුරුවලට අකුශලකර්ම ද හෙතු වන්නේ ය.

ඉතා තෙද ඇති බැවින් විශෙෂයෙන් බබලන්නේ සමාජයෙහි කැපී පෙණෙනුයේ **රාජ** නම්. "**අතිතෙජවන්තතාය විසෙසෙන රාජතෙ දිප්පතෙති = රාජා**" යනු ඒ කී සේ ය. දන – ප්‍රියවචන – අර්ථචර්‍යා – සමානාත්මතා යන සිවුසඟරාවතින් ජනයන් තමන් කෙරෙහි රඳා වන්නේ ද **රාජ** නම් වේ. මෙ ඒ කියූ සැටි. "**දනං ච පියවචන ච අත්ථචරියා ච සමානත්තතා චාති චතුහි සඞ්ගහ වත්ථූහි අත්තනි ජනං රඤ්ජෙතීති පි = රාජා**" යනු.

සතුටු උපදවන අරුතින් චන්ද්‍ර, යි තවන අරුතින් සූයා්, යි කියන්නා සේ රැදවීම අරුතින් රාජ යනු අන්වර්ථ නාමයෙකැ යි කීහ. මෙන්න එය.

''යථා ප්‍රහ්ලාදනාච්චන්ද්‍රඃ ප්‍රතාපාත්තපනෝ යථා.
තථෛව සොභූදන්වර්ථෝ රාජා ප්‍රකෘතිරඤ්ජනාත්''

වොටුනු පලන් රජ තෙමේ ම රාජ යි කියනු ලැබේ. අන්‍ය වූයේ ක්ෂත්‍රිය ජාති ඇත්තේ රාජන්‍ය – ක්ෂත්‍රිය යන නම්වලින් හැඳින් වේ. මේ ඒ කීම.

''මුඩාභිසිත්තෝ රාජාති කථිතෝ ඉතරෝ පන,
රාජඤ්ඤෝ ඛත්තියෝ චාති වුත්තෝ ඛත්තියජාතිකෝ''

උපස්සග්ග නම් උවදුරු ය. ''**උපස්සග්ගොති උපසට්ඨාකාරෝ තත්ථ තත්ථ ලග්ගනාකාරෝ**'' යනු අටුවා ය. යමකු විසින් ගෘහ වාස්තු ආදී යමක් ගිනි තැබීම් ආදියකින් විනාශ කළ කල්හි එහි යමක් නො නැසී ඉතිරි වී නම් ඒ ඉතිරි දෙයෙහි එල්බ ගෙණ ලැග ගෙණැ නැසුනු දේ ගැණ ශොක කිරීම උපසට්ඨාකාර යි කීහ. උපස්සග්ග යන්නට කළ අටුවාව මෙසේ වුවත් ලොකයා විසින් උවදුරු යි ගණු ලබන්නෝ ද උපස්සග්ග නම් වෙති.

අඛිභක්ඛානං ව දරුණං = දරුණු වූ අබිබවා කීමට හෝ. දෙෂාරොපපණයට හෝ.

''තෝ මෙතැන උමං බින්දෙහි, මේ රාජාපරාධය කෙළෙහි'' යනාදීන් තමා නො කළ නො දුටු නො ඇසූ නො සිතූ විරූ දේ තමන් පිට එන්නේ ය. බලවත් වූ දෙෂාරොපණයට පැමිණෙන්නේ ය. ඇතැම් විට ඇතැම් මනුෂ්‍යයෝ තමන් නො කළ නො දුටු නො ඇසූ නො සිතූ දේ ගැන ගැරහුම් ලබන්නෝ වධබන්ධන ලබන්නෝ වෙති. එයට පෙර කළ අකුශලකම් ද හෙතු විය හැකි බවට පහත දැක්වෙන්නී නිදසුන් කතා ය. ''අප මහසත් තෙමේ පෙර එක් අත්බවෙක පහත් කුලයෙක උපන්නේ ය, නමින් මුනාලි නම් ය. ධුර්තයෙක් ව දුදනන් හා එක්ව දිනෙක සුරාහි නම් පසේ බුදුරදුන්ට 'දුශ්ශීලයා, නින්දිතයා, පවිටු ගති ඇත්තා' යි බැණ වැදුණේ ය. ඔහු ඒ පවින් අවුරුදු බොහෝ ගණනක් නිරයෙහි ඉපිද පැසී මේ අන්තිම අත්බවෙහි බුදු වූයේ ලාභයෙන් අගතැන් පත් වී ය. එය නො ඉවසූ තීර්ථකයෝ 'ශ්‍රමණ ගෞතමයාට අපකීර්තියක් උපද වන්නෙමු' යි සිතා ඒ පිණිස සුන්දරී නම් පරිව්‍රාජිකාව යෙදූහ. ඕ තොමෝ එතැන් පටන් සැම දවස හිමිදිරියෙහි බුදුරජුන් වසන වෙහෙර අසලින් යන්නී, යම් කෙනකු 'කොහි සිට එන්නී ද?' යි ඇසූ කල්හි 'ශ්‍රමණ ගෞතමයන් හා එක ගෙයි නිදි හිඳ එන්නිමියි' යි කියා ඉක්මන් ගමනින් යන්නී ය. මේ කතාව රට පුරා පැතිර ගියා ය. තීර්ථකයෝ 'බලන්න, පින්වත්නි! ශ්‍රමණ ගෞතමයාගේ ජඩකම්, අනුන් දෙන දේ කමින් බොමින් වැදුම පිදුම

ලබමින් ශ්‍රමණ ගෞතමයා කරණ වැඩ, ගැණුන් හා එකට නිදයි. ඇලාට කැමපිම දෙයි. ඇදුම් කැඩුම් සපය' යි කියමින් බුදුරජුන්ට නින්ද කරන්නට වූහ.'' මාගේ ස්වාමීදරු වූ බුදුරජානන් වහන්සේ තිලෝගුරු වූ සේක් ද පෙර කළ අකුශලවාක්කම්ශක්තියෙන් බිහිසුණු වූ මේ දෙඟාරොපණයට ලක් වූ සේක. සෙස්සන් ගැණ කියනු කිම. කියන ලද්දේම ය.

''මුනාළිනාමහං ධුත්තෝ පුබ්බෙ අඤ්ඤය ජාතියා,
පච්චෙකබුද්ධං සුරභිං අබ්භාචික්ඛිං අදූසකං.

තෙන කම්මවිපාකෙන නිරයෙ සංසරිං අහං,
බහූනි වස්සසහස්සානි දුක්ඛං වෙදෙසි වෙදනං.

තෙන කම්මාවසෙසෙන ඉධ පච්ඡිමකෙ භවෙ,
අබ්භක්ඛානං මයා ලඬං සුන්දරිකාය කාරණාති''

පරික්ඛයං ව ඤාතීනං = නැයන් ගේ ක්ෂයට හෝ. නැයන් ගේ විනාශයට හෝ.

''**අත්තනෝ අවස්සයෝ භවිතුං සමත්ථානං ඤාතීනං පරික්ඛයං වා**'' යනු අටුවා ය. ''තමන්ට පිහිට වන්නට නිසි පොහොසත් නැයන්ගේ විනාශයට'' යනු අරුත් ය. මිනිසකුගේ එලොව මෙලොව දියුණුවෙහි මහත් කොටසක් නැයන් සතු ය. එබඳු දුක සැප දෙකෙහි ම එක සේ සැලෙන තුටු වන නැයන්ගේ විනාශය මිනිසුන්ගේ දියුණුවට මහත් බාධාවෙකි. එහෙයින් නැයන්ගේ විනාශය මිනිසුන්ගේ පිරිහීමෙකි. මේ විනාශයටත් පෙරකළකම් හෙතුවන බව මෙයින් වදරණ ලද්දේ ය.

භොගානං ව පභංගුරං = භොගයන්ගේ විනාශයට හෝ.

රන් අහුරුවීම, මුතු කපු ඇට වීම, කහවණු කැටකැබලිති වීම, සහල් උඳු මුං මෑ ආදී ධාන්‍ය කුණුවීම, දෙපා සිවුපා ඇති සතුන් කන්නු කොරු වීම, යනාදී උපභොග පරිභොග වස්තූන්ගේ විනාශයට හෝ.

භොග නම් ධනධාන්‍යවස්ත්‍රාභරණාදී වූ උපභොගසමූහය හා දසි දස ගව මහිෂාදී පරිභොගවස්තු සමූහය යි.

පභංගුර නම් විනාශය යි. කුණුවීමයි. මිනිසුන් පිළිබඳ මෙ කී වස්තූහු කෙතෙක් රක්ෂිත ගොපිත වුව ද පෙර කළ අකුසල්කම් බෙලෙන් නැසී යන්නෝ ය. ලොකයෙහි විසූ ඇතැම් මහාධනෙශ්වරයෝ තමන් නො දන්නා ලදු ව ම අහෙතුක ව මෙන් නිර්ධන වූහ. එහෙත් ඔවුන්ගේ නිර්ධනත්වය අහෙතුක නො වේ. සහෙතුක ම ය. හෙතු ව නම් එක් ලෙඟකින් පෙර කළ කම් ය. දනුදු ඇතැම් ධනවත්හු බලා සිටිය දී නිර්ධන වන්නෝ ද මේ හෙතුවෙන් ය. මනුෂ්‍යයන්ගේ නිර්ධනත්වයට තවත් හෙතු නැත්තේ

නො වේ. මේ හැර අන් හැම හෙතුවක් ම නුවණින් වළකා ගත හැකි ය. කර්ම හෙතුවත් එක් ලෙසකින් වළකා ගැණීමට ඉඩ ඇත්තේ ය. පවකම් යට පත් කිරීමට සැහෙන පමණින් කුසල්කම් කිරීම පවකම්හෙතුන් මැඩ පැවැත්වීමේ ක්‍රමය වේ.

අථවස්ස අගාරානි = නොහොත් ඔහුගේ ගෙවල්.

ගෙට **අගාර** යි නමෙකි. ගෙවල් ගොඩ නැගීම සඳහා ගණු ලබන කණු-යටලී-බාල්ක-පරාල ආදි දැවදඩු අර යි කියනු ලැබේ. ඔවුන් ගන්නේ හෙවත් එයින් කැරෙන්නේ 'අගාර' නම්. **"න ගච්ඡතීති = අගා ථම්භාදයො, තෙ රාති ගණ්හාතීති = අගාරං"** යනු එහි අරුත් පැවසීම ය. මෙහි විශෙෂ බොහෝ ය. පෙර කියන ලද්දේ ය.

අග්ගි ඩහති පාවකො = පාවක නම් ගින්න දවයි.

පාපි පුද්ගලයාගේ ගෙවල් ගින්නෙන් දැවෙති යි කියූ සේ ය. අනෙකකින් නො දැවුනෝ ද අවුරුද්දට දෙතුන් වර හෙණ වැදීමෙන් දැවෙන්නෝ ය. එසේත් නො දැවුනෝ ද ස්වභාවධර්ම විසින් නැඟුණු ගින්නෙන් දැවෙති.

අග්ගි නම් වක් ව පැතිරී යන්නේ ය. ඒ මේ ගින්න හුනු තැන ඇති හැම දෙයක් දවා පවිත්‍ර කරණ බැවින් **පාවක** යි කියනු ලැබේ. **"පුණාතීති= පාවකො** යනු අරුත් ය.

"එකසංවච්ඡරෙ වත්තිබත්තුං, අඤ්ඤස්මිං අවිජ්ජමානෙපි අසනි අග්ගි වා පතිත්වා ඩහති. අත්තනොව ධම්මතාය උට්ඨිතො පාවකො වා ඩහතියෙව" යනු අටුවා ය.

කායස්ස භෙදා = සිරුර බිඳීමෙන් මරණයෙන් පසු.

දුප්පඤ්ඤො = අඥපුද්ගල තෙමේ. **කිසි** හසරක් නො දන්නේ.

නිරයං සොපපජ්ජති = හෙතෙමේ නිරයයෙහි උපදී.

ඒ අඥපුද්ගල තෙමේ, නපුරක් අවැඩක් නො කළ තැනැත්තහුට නපුරක් අවැඩක් කරන්නේ මරණින් මතු නරකයෙහි උපදින්නේ ය. මේ කියූ විපත් දසයෙන් එකකටවත් මෙලොව දී අසු වන්නේ ය. මරණින් මතු නිරයයෙහි උපදින්නේ ය. නිරයෙහි ඉපැත් ම නො ද වරදින්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියෝ ය.

මහාමොද්ගල්‍යායනස්ථවිරවස්තුව නිමි.

බොහෝ පිරිකර ඇති මහණෙක්

10-8

සැවැත් නුවර වැසි කෙළෙඹියෙක්, සිය බිරිඳ මළ පසු පැවිදි වූයේ ය. පැවිදි වන්නේ තමන්ට විසිමට පිරිවෙණක්, වැඩ ගන්නට ගිනිහල් ගෙයක්, බඩු තබන්නට ගබඩාවක් කරවාලා ගිතෙල් මී හකුරු තෙල් ආදියෙන් ගබඩාව පුරවා තබා ම පැවිදි වූයේ ය. මෙහෙකරුවන් කැඳවා තමා කැමැති ලෙසින් බත් මාලු ඉදි කරවා ගෙණ අනුභව කරන්නේ ය. ඒ අතර සපයා ගත් සිවුරු පිරිකර මහත් රාශියක් ඔහු අයත් ව තුබුනේ ය. රෑ පොරෝණා තුන් සිවුර දවල නොා පොරවයි. දවල පොරෝණා තුන් සිවුර රෑ නොා පොරවයි. රෑ දවල වෙන වෙන සිවුරු දරයි. පන්සල් වත්ත කෙළවර තැනූ ගෙයක වෙසෙයි. ඔහු එක් දිනක් සිවුරු ඇඳ ඇතිරිලි ආදිය අව්වේ ලා වේලන වේලේ සෙනාසන චාරිකාවෙහි යන භික්ෂූන් වහන්සේලා දැක "ආයුෂ්මතුනි! මේ හුහක් සිවුරු ඇඳ ඇතිරිලි තා අයත් ද?"යි ඇසූහ. "මාගේ ය"යි කී විට "ඇවැත! බුදු රජුන් විසින් මහණහුට අනුදන්නා ලද්දේ තුන් සිවුරෙක් ම ය, එයට වැඩි යමක් උන්වහන්සේ විසින් නොා අනුදන්නා ලද්දේ ය. බුදු සසුන්හි පැවිදි ව මෙසේ බොහෝ පිරිකර ඇත්තේ වෙහි"යි කියා ඔවුහු මේ මහණ බුදුරජුන් ඉදිරියට ගෙණ ගියහ. ගෙණ ගොස් "ස්වාමීනි! මේ මහණහුට පිරිකර ගොඩක් තිබේ"යි දැන් වූහ. එවිට බුදුරජානන් වහන්සේ "මහණ! මේ නම් ලා කියන කාරණය සැබෑ ද?යි ඇසූහ. "ස්වාමීනි! සැබෑ"යි කී විට "මහණ! තමුසේ මා අප්පිච්ඡතා ගුණය ගැණ බණ කියද්දීත් කුමක් හෙයින් මෙසේ සිවුරු පිරිකර ගොඩක් රැස් කොට ගෙණ වසහු ද?"යි අසා වදළ සේක. මෙයින් කිපුනු ඒ මහණ, පොරෝණා සිවුර ගලවා විසි කොට, පිරිස මැද අඳනය පමණකින් සිටියේ ය. බුදුරජානන් වහන්සේ "මහණ! විළිබිය සොයන් නහු පෙර දිය රකුසු කල්හීත් විළිබිය සොයමින් දෙළොස් අවුරුද්දක් විසුවෝ නොා වහු ද? කුමක් හෙයින් දැන් මෙසේ උතුම් බුදු සසුන්හි පැවිදි ව සිට පොරෝණය ගලවා දමා භය ලජ්ජා නැති ව සිටිහු ද?"යි ඇසූහ. ඔහු බුදුරජුන්ගේ බස් අසා භයලජ්ජා උපදවා බැහැර ලූ සිවුර ගෙණ පොරොවා බුදුරජුන් වැඳ පසකට වී හුන්නේ ය. ඒ අතර එහි රැස් ව හුන් භික්ෂූන් වහන්සේලා "ඒ කතා පුවත දැන ගණු කැමැත්තෙමු"යි බුදුරජුන්ට සැළකළහ. උන් වහන්සේ එය මෙසේ වදළ සේක.

"මහණෙනි! යටගිය දවස මහසත් තෙමේ බරණැස් රජුගේ අග මෙහෙසිය කුස උපන්නේ ය. නමින් **මහිංසාසක** නම් වූයේ ය. බාල සහෝදර තෙමේ චන්ද්‍ර නම් වී ය. උන්ගේ මවු, මිය ගිය කල්හි රජ තෙමේ අන් බිසොවක අග මෙහෙසි බවෙහි තැබී ය. ඕ ද පුතකු වැදූ. සූයඃ යි ඔහුට නම් කළහ. රජ තෙමේ ඒ කුමරු දැක පිණා ගොස්

'සොඳුර! ඔබගේ පුතුට වරයක් දෙනු කැමැත්තෙමි'යි මෙහෙසියට දන්වා සිටියේ ය. 'ප්‍රිය ස්වාමිය! එසේ වේවා, වුවමනා විට මම එය ගන්නෙයි' යි කියා පුතු වැඩිවිය පැමිණි කල්හි දවසක් රජු වෙත ගොස් 'දේවයන් වහන්ස! ඔබ වහන්සේ මා පුතු උපන් ද මට වරයක් ගන්නැ' යි කීවහු ය. එය මට දැන් වුවමනා ය. එහෙයින් මා පුතුට රජය දුන මැනවැ' යි ඕ තොමෝ කිවු ය. රජ තෙමේ 'මාගේ පුත්‍රයෝ දෙදෙන ගිනි කඳන් සේ බබලති. සූර්‍ය්‍ය කුමරුට රජය දෙනු නො හැකි ය' යි කීය. එයින් නොපසු බට වූ මෙහෙසිය නැවත නැවතත් රජය ම ඉල්ලූ ය. රජ සැලුනේ ය. තදින් වෙවුලුනේ ය, 'මාගේ දෙ පුතුන්ට මෑ විපත් කරන්නී ය' යි සිතා රජ තෙමේ දෙ පුතුන් ගෙන්වා 'මා පිය පුතුනි! ඉවසන්න, මා අතින් වැඩ වැරදී ගියේ ය. මට වූයේ මහා නපුරෙකි, නුඹලාට කියනුත් නො හැකි ය, නො කියාත් බැරි ය. මම සූර්‍ය්‍ය කුමරු උපන් ද ඔහුට වරයක් දුනිමි. ඒ ය මා අතින් වූ වරද, ඉවසන්න, මා පෙම්බර පුතුනේ! මට එයට කමන්න, දැන් සූර්‍ය්‍ය කුමරුගේ මවු, ඔබ ගේ කුඩම්මා, සූර්‍ය්‍ය කුමරුට රජය දෙන්නැ' යි මට කියයි. ඔහුට රජය දෙන්නට මාගේ කැමැත්තෙක් නැත. මා රජය නුදුන් විට ඒ මවු නුඹලාට මොන විදියේ විපතක් කරන්නීදැ' යි කියන්නට බැරි ය. සමහර විට නුඹලාට වස විස දෙන්නට ද බැරි කමෙක් නැත. ඒ නිසා මෙතැනින් බැහැරක යන්න. වනයට ගොස් එහි පැල්පතක් තනා ගෙණ වසන්න. මා මළ පසු අවුත් රජය ගෙණ දැහැමි ව රජය කරන්නැ' යි කීයේ ය. ඔවුහු පහයෙන් බැස, පියා වැඳ වනයට යන්නට රජමැදුරෙන් නික්මුනාහ. මිදුලෙහි සෙල්ලම් කරමින් හුන් සූර්‍ය්‍ය කුමරු ද ඔවුන් දැක ඔවුන් හා යන්නට නික්මුනේ ය. මහ සත් තෙමේ සිය සොහොයුරන් හා වනයට ඇතුල් ව මාර්ගයෙන් මඳක් ඈත් ව පිහිටි ගසක් මුල වාඩි වී 'මල්ලී! බොහෝ වෙහෙස ඇත්තේ ය. ඒ නිසා දිය කඩිත්තක් සොයා ගොස් හොඳට නාලා පැන් බී අපටත් කොළයකට පැන් ටිකක් ගෙණ එන්නැ' යි සූර්‍ය්‍යකුමරුට කීයේ ය. සූර්‍ය්‍ය කුමරු පැන් සොයා විලක් වෙත ගියේ ය. ඒ විල වෙසවුණු වරම් රජුගේ අණින් දිය රකුසකු විසින් අරක් ගන්නා ලද්දේ ය. වෙසවුණු රජ, ඒ විල පාවා දෙන දිනයෙහි 'දේවධර්ම නො දන්නවුන් මේ විලට බටුවොත් ඒ හැම දෙනා කා දමව, දෙවධර්මය දන්නන් හැර අන් හැම දෙනෙක් ම තා අයත් ය. ඔවුනට තම කැමැත්තක් කළ හැකි ය' යි කීයේ ය. එ තැන් පටන් ඒ දියරකුසා විලට බටුවන් අතින් දෙවධර්මය විචාරා නො දනිමි' යි කියන්නන් කා දමන්නේ ය. සූර්‍ය්‍යකුමරු ද කිසිත් නො දැන විලට බැස්සේ ය. දිය රකුසා ඔහු අල්වා 'දෙවධර්මය දන්නෙහිදැ?'යි විචාළේ ය. එවිට ඔහු 'දෙවධර්මය නම් සඳහිරු'යි කී ය. දියරකුස් 'තෝ දෙවධර්මය නො දනිහි' යි අල්ලා දියෙහි ගිල්වා සිය විමන තුළ බැහී ය. මහසත් තෙමේ ඔහු පමාවනු දැක චන්ද්‍රකුමරු එහි යැවී ය. 'දෙව ධර්මය කිමැ'යි විචාළ කල්හි 'දෙවධර්මය නම් සිවු දිගැ'යි ඔහු කීය. දියරකුස් ඔහුත් ගෙණ විමන තුළ බැහී ය. ඔහු එනුත් පමාවනු දුටු මහසත් 'අනතුරක් විය යුතු ය'යි තෙමේ එහි ගොස් දෙදෙන ම විලට බට පා සටහන් දැක 'මේ විල

දියරකුසකු විසින් අරක්ගන්නා ලද්දේ වනැ'යි දැන කඩුව සරසා දුන්න ගෙණ නිසල ව සිටියේ ය. දිය රකුස්, දියට නො බැස සිටී මහසතුන් දැක, වෙනෙහි වැඩ කරණ මිනිසකුගේ වෙසින් අවුත් 'පින්වත! තමුසේ මග විඩාපත් වූ වහු, කුමක් හෙයින් විලට බැස නාලා පැන් බී නෙළුඹුදැලි කා මල් පැලඳ 'නො ගන්නහු දැ?'යි ඇසි ය. මහසත් 'මූ රකුස්'යි දැන තා විසින් මාගේ සොහොයුරු දෙදෙන ගන්නා ලද්දෝ දැ?' සී විචාළේ ය. 'ඔව්, ගන්නා ලද්දෝ මා විසිනැ'යි ඌ කී විට 'එයට කරුණු කියව'යි කී ය. 'මා විසින් මේ විල වෙසවුණු රජුගෙන් ලද්දේ ය. එහෙයින් මේ විලට බස්නා හැම කෙනෙක් ම මා අයත් ය, එය මට වරම් රජු විසින් දෙන ලද වරෙකැ'යි රකුස් තෙමේ කී ය. 'කිම, සියල්ලෝ ම තා අයත්ද? යි මහසත් ඇසී ය, 'ඔව්, සියලු දෙන ම මා අයත් ය, දෙවධර්මය දන්නන් හැර අන් හැම දෙනෙක් ම මා අයත් ය, ඔවුන් මට යටත් විය යුතු ය දෙවධර්මය දන්නෝ ම මා අතින් නිදහස් ව යෙති'යි කී ය. මහසතුන් 'දෙව ධර්මයෙන් තට වැඩක් ඇත්තේ ද?'යි ඇසූ කල්හි ඇතැ'යි කී ය' වේවා, මම දෙවධර්මය දනිමි, වුවමනා නම් කිය හැකි' යි කී කල්හි කියන්නැ' යි ඔහු කී ය. 'මේ වේසයෙන් සිට කියනු නො හැකිය. මාගේ ඇඟපත කිලිටි ය, කිලිටි ගතින් සිට බණ දහම් කීම නො හොබනේ ය' යි කී විට රකුස්, බෝසතුන් පැන් පොවා මලින් සරසා පිළියෙල කළ මණ්ඩපයක පලක් නංවා වඩා හිඳුවා තෙමේ බෝසතුන්ගේ පා මුල්හි වැටී හුන්නේ ය. එකල්හි බෝසත් තෙමේ 'සිහි එළවා අසව' කියා

"විළිබිය දෙකින් යුත් – කුසල් දහමින් සුපිහිටි
සපුරිස් දෙව් දහමය යි – කිය වේ ලොවේ ගුණවත්"

යන මේ ගය කියා පෑ ය,

රකුස් මේ දහම් අසා පැහැද 'පණ්ඩිතය! මම තා කෙරෙහි පැහැදුනෙමි, එහෙයින් වඩා දැහැමි වූ සොහොයුරු තට දෙන්නෙමි, යි කී කල්හි මහසත් 'මාගේ බාලමලනුවන් ගෙණ එව' යි කී ය. රකුස් එවිටි 'පණ්ඩිතය! තමුසේ දෙවධර්මය දන්නහු පමනක් ය, එහි පවත්නා සැටියක් නො පෙණේ ය' යි කී ය. මහසතුන් 'කරුණු කිමැ' යි විචාළ විට 'යම් හෙයකින් තමුසේ වැඩිමහල්ලා තබා බාලයා ගෙන් වන්නහු වැඩිමහල්ලන් පිදීම නො කරහු' යි කියා සිටියේ ය. 'රකුස්! එසේ නො කියව, මම දෙවධර්මයත් දනිමි, එහි පවත්නා සැටිත් දනිමි, පවත්නේ ද වෙමි, අපි සියල්ලෝ මේ බාලයා නිසා ම වනගත වුම්හ. අපගේ පියා අතින් මේ දරුගේ මවු තොමෝ මොහු පිණිස රජය ඉල්ලූ ය. පියා ඒ නො දී අප රකින්නට වනයට යන්නැ' යි අපට නියම කෙළේ ය, එතැන දී ඒ ලදරු එහි නො රැඳී අප හා එක් ව ආයේ ය. වනයේ දී ඔහු රකුසෙක් ගත්තේය යි කීම කිසිවෙක් නො අදහන්නේ ය. ඒ නිසා මම නින්දවට බියෙන් බාලයා ම ගෙණ එව යි කීමි' යි කී කල්හි රකුස් මහසතුන් කෙරෙහි වඩාත් පැහැදී 'තමුන්නාන්සේ දෙවධර්මය දන්නහුය'යි ස්තුති කොට දෙ බැයන් ගෙණවුත්

දුන්නේය. මහාසත්ත්ව තෙමේ රකුස් බවෙහි දෙස් පහද දී උෆ පන්සිල්හි පිහිටුවා රකුස් විසින් කළ රුකවල් ඇතිව එ වනෙහි වැස පිය රජු මළ කල්හි රකුස් ද ගෙණ බරණැසට ගොස් රජය ගෙණ චන්ද්‍ර කුමරුට යුවරජකම හා සූය්‍ය කුමරුට සෙනෙවි තැන් ද දී රකුස් හට සිත්කලු තැනෙක දෙවොළක් කරවා පුදසත්කාර ලැබෙන සැටි ද සලසාලූයේ'' ය.

බුදුරජානන් වහන්සේ මෙසේ ඒ බහුභණ්ඩික භික්ෂුව පිළිබඳ ඉකුත් කතාව ගෙණහැර දක්වා ''මහණෙනි! එද දිය රකුසා මේ බහුභණ්ඩික භික්ෂු තෙමේ ය, සූර්යකුමරු ආනන්ද තෙමේ ය, චන්ද්‍රකුමරු ශාරිපුත්‍ර තැන ය, මහිංසාසක මම'' යි ජාතකය ගැලපූ සේක. නැවත ''මහණෙනි! මේ තෙමේ පෙර දෙවධර්මය සොයමින් හිරිඔතප්වලින් යුතු ව දවසැර දුන් මේ සිවු පිරිස මැද මෙලෙසින් සිට මා ඉදිරියෙහී ආශා නැත්තේ වෙමි යි කියමින් අසුත්තක් කෙළේ ය, සිවුර ගලවා බැහැර කළ පමණින් ශ්‍රමණයෙක් වන්නේ නො වේ'' යි වදරා අනුසන්ධි ගළපා මේ ධර්ම දෙශනාව කළ සේක.

> න නග්ගචරියා න ජටා න පඞ්කා
> නානාසකා ථණ්ඩිලසායිකා වා,
> රජෝ ව ජල්ලං උක්කුටිකප්පධානං
> සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛන්ති

නිර්ස්ත්‍ර ව භිද කරණ තපස්හු, එතෙර නො වූ සැක ඇති සත්ත්වයා පිරිසිදු නො කෙරෙත්. දළමඩුලු දැරීම් ද පිරිසිදු නො කෙරෙත්. ඇඟ මඩ ගා කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්. අහර නො වළඳා කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්. බිම හෙව කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්. ඇඟ රජස් දූලි පතුරු නගිනා තාක් නො නා භිද කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්. උක්කුටිකයෙන් භිද කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්.

න නග්ගචරියා = නග්න ව භිද කරණ තපස් කම් පිරිසිදු නො කෙරෙත්.

මිනිස් ලොව නිවන් සොයන්නන්ගෙන් කවදත් නො සිස් වූයේ ය. ලොකයා තුළ නිවණ පිළිබඳ හැඟීම උදා වූ ද පටන්එය ලබනු පිණිස උනුන් විසින් නා නා ප්‍රතිපදවෝ ඇසුරු කරණ ලද්දහු ය. එහෙත් ඒ පිණිස සෙවුනු ඇසුරු කෙරෙණු හැම ප්‍රතිපද කෙනෙක් ම ඒ පිණිස හිත නො වූහ. එයට මාර්ගය නො වූහ. ලොකය විසින් නිවන් පිණිස ඇසුරු කෙරුණු ඒ ප්‍රතිපද අතුරෙහි නග්නත්වය ද එකෙක් විය. නග්නත්වය යි කියේ රෙදි නො හැඳ රෙදි ඇඟ නො ලා හෙලුවෙන් විසීම ය. ඒ මේ නග්නත්වය වනාහී, වස්ත්‍රාභරණාදිය දැරීම තෘෂ්ණාවර්ධනයට, රාගොත්පත්තියට කරුණු ය, තෘෂ්ණාව, රාගය නිවණට බාධක ය, යනාදීන් ගෙණ වස්ත්‍රාභරණාදිය ඇඟ දැරීම, විලිවසා ගැනීම නිවන් පිණිස නො වන්නේ ය යි ගත් ලොකය විසින් ඇති කරණ ලද්දේ ය. එය මේ සසුන්හි නග්ගචරියා, නග්ගපටිපද, නිජ්ඣාම පටිපද යනාදී නම් වලින් පළට ව ඇත.

නග්නත්වය උසස් පිළිවෙතකැ යි ගත්තෝ නග්නශ්‍රමණයා නිර්ආඝාරාධක යි ගණිත්. එහෙයින් ඔහු එබඳු දැකුම් ඇති මිනිසුන්ගේ ගෞරවයට පාත්‍ර ව සිටියි.

මොහු ද්විකවිඝ-කවිඝශෙව-මුක්තකවිඝ-එකවාසස්-අවාසස් යි **පස්** වැදෑරුම් කොට පරයන් විසින් දක්වනු ලැබේ. මේ ඒ දැක් වූ සැටි.

''විකවිඝඃ කවිඝශෙවශ්ච මුක්තකවිඝස්තථෛව ච,
එකවාසා අවාසාශ්ච නග්නඃ පංචවිධඃ ස්මෘතඃ'' යනු.

''**න ජතෙ ලජ්ජතෙ ඉති = නග්නඃ, නග්න එව = නග්නකඃ**'' යනු නෙරුක්තිකවචනයි. ලජ්ජා විය යුතු තැන් නො වැසීමෙන් ලජ්ජිත නො වන්නේ **නග්න** නම්. ලජ්ජා නැත්තේ' යි යූ සේ ය. යම් කෙනකුගේ කුලයෙහි වෙදය නැත්තේ ද ශාස්ත්‍රය නැත්තේ ද මනා පැවතුම් නැත්තේ ද ඔවුහු නග්නැ යි පොදුවේ කියන ලදහ. උන්ගේ ආහාරය ද වෙසෙසින් ගර්හිත ය. මේ ඒ දැක්වූ සැටි.

''යෙෂා කුලෙ න වෙදෙස්ති න ශාස්ත්‍රං නෙව ච වුතම්,
තෙ නග්නාඃ කීර්තිතාඃ සද්භිස්තෙෂාමන්නං විගර්හිතම්''

මේ **කිම්** පුරාණග්‍රන්ථයන්හි ආයේ ය.

න නග්ගචරියා, යන තැන්හි ඇති **න** කාරය නිපාතයෙකි. එය මේ ගාථාවෙහි එන '**සොධෙන්ති**' යන ක්‍රියා පදය හා එක් ව සිටියේ ය. අරුත් ගන්නා තැන **න** කාරය හා **සොධෙන්ති** යන ක්‍රියා පදය එක් කොට අරුත් ගත යුතු ය. මෙ ගාථාවෙහි එන හැම **න** කාරයෙක් සිටියේ ඒ ආඛ්‍යාතය බලා ය.

න ජටා = දළමඩුලු දැරීම් ද පිරිසිදු නො කෙරෙත්.

දළමඩුලු දැරීමෙන් සංසාරශුද්ධියක් නො ලැබේ යි යූ සේ ය. **ජටා**, යි තෘෂ්ණාවට ද නමෙකි. ඒ මෙහි නො යෙදේ. ''අනන්තො ජටා'' යනාදි තැන්හි ඒ ආයේ ය. හුණ බට ආදීන්ගේ ආකුලතාවය ද, අවුල් බව ද, ජටා යි කියත්. ''වෙණුජටා නළජටා'' යනාදී තැන ඒ දක්නා ලැබේ. ඒ ජටාවත් මෙහි නො ගැණේ. බාහිරක තවුසන් විසින් හැඩපලු ගොතා බඳින කෙස්වැටිය, කොණ්ඩය මෙහි **ජටා** යි ගැණේ. ''**ජටත් කෙශඃ පරස්පරං ලග්නාඃ ජටති පරස්පරං සංලග්නා භවන්තීති = ජටා**'' යනු කොෂයි.

දුම්මල මී ඉටි රුක්මැලියම් ආදී ලහටු ගල්වා කෙස් එකට කැටි කොට බැඳුම නිවන් පිණිස පවත්නේය යි සැලකූ බැහැරි තවුසෝ **ප්‍රතිපත්තියක්** සේ මේ කෙරෙති. ඒ මේ ජටා දැරීම, කෙස් එකට ගැට ගැසීම නිවන් **පිණිස** නො වන්නේ ය යි බුදුරජානන් වහන්සේ මෙයින් වදළ සේක.

නපංකා = ඇඟ මඩ ගා කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙති.

මූණ නො සෝද දත්මල-ඇස්මල-කන්මල-සෙම්සොටු දරීම, මීමුන් හූරන් සේ ඇඟ මඩ ගා ගැණුම යනාදි ක්‍රියා නිවන් පිණිස වේ ය යි සලකා එසේ පිළිපැදුම් මෙහි **පඩිකාය** න්නෙන් ගැනේ. **පඩිකා** යනු **මඩ**ට නමෙකි. මෙහි අතත්ස්වභාවයෙහි තත්ස්වභාවාරොපණයෙන් මඩ ගා ගැණුම් ගණිත්. මේමඩ ගා ගැණුම් නිවන් පිණිස මග නො වන්නේ ය.

නානාසකා = අහර නො වළඳා කරණ තපස්හු ද පිරිසිදු නො කෙරෙත්.

ඇතැම් බැහැරි මහණෝ සංසාරශුඩිය පිණිස දවසක් හැර දවසක්, දෙ දවසක් හැර දවසක්, අඩමසකට වරක්, දවසකට වරක්, දෙ දවසකට වරක්, එක් බත් පිඩක්, දෙ පිඩක්, යන ඇලෙසින් බත් අනුභව කෙරෙති.

තවිද ඇතැම් බැහැරි මහණෝ ආහාර ප්‍රතික්ෂෙපයෙන් සංසාර ශුඩිය වේය යි ඉගණ ඩෙබරින්, ඩෙබරසුණෙන්, ඩෙබර පැනින්, ඩෙබර අහරින් දිවි පැවැත්ම කළහ. එසේ ම මුං ඇට කීපයකින්, තල ඇට කීපයකින්, සහල් ඇට කීපයකින්, ඒ පිටී ටිකෙකින්, සහල් තැම්බූ දියෙන් සහල් ආදියෙන් කළ නන් අහරින් දිවි ගෙණ ගියහ. මෙසේ කරණ තපස් නිවණට හිත නො වේ.

බත් කන්නේ **'අසක'** නම්. බත් නො කන්නේ **'අනසක'** නම්. වැළකීම් අරුත් කියන න කාරය හා එක්ව දීර්ඝ ව **නානාසක** වී ය. මෙහි ලා ගැණෙන්නේ බත් නො කන්නන් නො ව බත් නො කෑම ය. බත් නො කා කරණ තපස් ය.

ථණ්ඩිලසායිකා වා = බිම වැද හෙව් කරණ තපස් ද පිරිසිදු නො කෙරෙත්.

නිවන් සොයා යන බැහැරි මහණෝ එළුවන් සේ, ගොනුන් සේ, ඇතුන් සේ, අසුන් සේ, බල්ලන් සේ බිම වැකිර හිඳ කති. බොති. නිදති. යති, හිඳිති. මෙ කී කිරිසන් ගිය සතුන්ගේ යම් කිසි ස්වභාවයෙක්, යම් කිසි ආකල්පයෙක් වේ නම් ඒ සියල්ලෙහි මොවුහු පිළිපදිති. ගැටෙති. බැඳෙති. නිවන් පතාය එසේ කරණු. එහෙත් ඒ නිවන් පිණිස උපායය නො වන්නේය.

ථණ්ඩිල, යි පොළොවට නමෙකි. පොළොව මතු පිට නිදන්නෝ **ථණ්ඩිලසායික** නම් වෙත්. එහෙත් මෙහි ගැණෙන්නේ පොළොව මතු පිට හෙව කරණ තපස් ය.

රජො ච ජල්ලං = සිරුරු රැස් වූ රජස් දැලි ඇති තපස් ද.

උක්කුටිකප්පධානං = උක්කුටික ව හිඳ ඇවිද කරණ තපස්.

ඇතැම් බැහැරි තවුස් කෙනෙක් ඇඟ සෝදූ රජස්දූලි පහ කොට හැරීම, නිවණට කරුණු නො වන්නේය යි තපස් කිරීමට පටන් ගත් දින සිට ස්නානය නො කෙරෙති. ඇඟපත මූණකට නො සෝදති. සිරුරෙහි කුණු පතුරු නහා ගණිති.

උක්කුටිකයෙන් හෙවත් බිම ඇණ තබා ඉඳිති. එලෙසින් ම ඔබ-නොබ හැසිරෙති. එහෙත් මේ රජස්දූලි දූරීම හා උක්කුටිකයෙන් හිඳ කරණ තපසත්, නිවන් පිණිස නො වවන්නේ ය. 'න සොධෙන්ති' යනු හා සම්බන්ධ ය.

තවද නිවන් සොයන ඇතැම් බැහැරි තවුසෝ "සැරිසැරීමෙන් ශුද්ධිය වේ, බොහෝ කොට ඉපැදීමෙන් ශුඛිය වේ, බොහෝ කොට විසීමෙන් ශුඛිය වේ, යාගයෙන් ශුඛිය වේ, ගිනි දෙවියන් පිදීමෙන් ශුඛිය වේ" යි යන ඇලෙසින් කියමින් ගණිමින් මිත්‍යා තපස් කළහ. ඒ එක තපසකුත් නිවන් පිණිස නො පවතී. හුදෙක් ඒ හැම තපසක් ම ආත්මක්ලමථ-වෙක් වන්නේ ය.

නිවණ සෙවීමෙහි උත්සාහවත් වූ අප මහසත්හු හැම යස ඉසුරු හැර අනොමා ගංතෙර පැවිදි ව ගම් නියම්ගම්හි හැසිර ආලාරකාලාම-උද්දකරාම පුත්‍ර තවුස් කරා ගොස් උන් වෙත දී උන්ගේ ධර්මමාර්ගය මුළුමනින් උගත්හ. උන්වහන්සේට එයින් අත් වූ ඵලය නම් ධ්‍යානමාත්‍රයක් ලබා ගැනීම ය. ඒ ලැබූ ධ්‍යාන මාත්‍රය නිවණ නොවේ' යි උන් හැර මගට බැස ගියහ. ඒ අතර උරුවෙලාවට පැමිණි මහසත්හු එහි තෙරඤ්ජරා ගඟබඩ වන ලැහැබකට වැදී මෙත්බැවුමෙහි නිරත වූහ. එහි දී සිතෙහි බිය උපදවන සුලු නත් අරමුණු උන්වහන්සේ ඉදිරියෙහි පහළ වී ය. එහෙත් ඒ කිසිත් මහසතුන්ට බියට හෙතු නො වී ය.

මෙ දවස උන්වහන්සේ තුළ තපස, රළුපිළිවෙත, පාපයට පිළිකුල, පරමවිවේකය යන මේ සතරෙහි දැඩි උනන්දුවක් පැවැත්තේ ය. එහෙයින් උන්වහන්සේ තවුසන් අතර මහ තවුස් වූහ. රළු පිළිවෙත් ඇත්තන් අතර ප්‍රධානයා වූහ. පාපයට පිළිකුල් කරන්නන් අතර පරමජෙගුච්ඡී වූහ. විවේකින් අතර පරමවිවේකී වූහ.

ලොකයෙහි එවක නිවන් පිණිස උග්‍ර තපස් කළ තවුසන් අතර ප්‍රධාන වූ මහසත්හු පරමතපස්වී ව නිවන් පතා නග්නත්වය ඇසුරු කළහ. මල් මූ කිරීමෙහි ලොකාචාරයෙන් තොර වූහ. බත් වළඳා අවසානයෙහි අත ලෙවූහ. මල පහරා අතින් පිස දැමූහ. "එනු මැන වහන්ස! සිටිනු මැන වහන්ස!" යි කියා දුන් දෙය නො ද පිළිගත්හ. එළ වූ දෙය, උදෙසා කළ දෙය, නිමැතූ දෙය, වලඳින් නගා දුන් දෙය, සැළියෙන් නගා දුන් දෙය, පැසෙන් නගා දුන් දෙය, එළිපත අතර කොට දුන් දෙය, දඹුකඩ අතර කොට දුන් දෙය, මෝල්ගස අතර කොට දුන් දෙය, බත් කන දෙදෙනෙකුන් අතරෙහි එකකු නැඟිට දුන් දෙය, ගැබිනියක දුන්

දෙය, කිරි පොවන්නියක දුන් දෙය, යමාදන් කරවා දුන් දෙය, බල්ලන් සිටි තැන දුන් දෙය, මැස්සන් කැටි කැටිව හැසිරෙණ තැන දුන් දෙය නො ද පිළිගත්හ. දියමස්, ගොඩමස්, නො ද කැහ. සුරා, මෙරය, කාඩි නො ද පූහ. එක් ගෙයක සිහා එක් බත් පිඩකින් දෙකක සිහා දෙපිඩෙකින් සතක සිහා සත් පිඩකින් දිවී යැවූහ. දවසට වරක්, දෙ දවසට වරක්, සත් දවසට වරක්, අඩමසට වරක් බත් අනුභව කළහ. අමුපලා, බොඩහමු, හුරුහැල්, සමකැබලි, මැලියම්, සෙවෙල්, රුක්ලාටු, කුඩු, දම්කොඩ, තලඇමුරුවට, ලා තණ, වනමුල්, ගෙඩි, වැටුනු ගෙඩි වළඳමින් දිවි රැක ගත්හ. හණවැහැරි, මුසුවැහරි, මීනීරෙදි, පොළොව දමූ රෙදි, රුක්පොතු, අදුන්දිවිසම්, කුසතණ වැහරි, නියඳවැහැරි, පෝරුවැහැරි ඉස කේ කම්බිලි, අස්ලොම් කම්බිලි, බකමූණු පියාපතින් කළ වැහැරි දැරූහ. හිසකේ දැළිරැවුළු උගුලා දැමූහ. යහන් බැහැර කොට උඩුකුරු ව සිටියහ. යකඩකුරු ඇ මතුයෙහි සක්මන් කළහ. ඒ මත්තෙහි නිදි ගත්හ. "පව් සෝදහරිමි" යි දවසට තෙ වරක් දියට බටහ.

සිරුරෙහි අවුරුදු ගණන් නැඟි රජස් දූලි විය. බොහෝ කලක් පොතු එක් වූ කිඹිරිකණුවක් සේ සිරුර, හටගත් පොතු ඇත්තක් වී ය.

මහසත්හු සිහි ඇති ව ම ඉදිරියට ගියහ. සිහි ඇති ව ම පෙරළා ආහ. විසම තැන්හි සිටි කුඩා සතුන් පවා නො නසමි' යි දියබිඳු කෙරෙහි ද දයාව දැක් වූහ.

වනයෙහි වසන මහසත්හු ගොපල්ලකු, තණ ගෙණ යන්නකු, දර ගෙණ යන්නකු, වෙනෙහි වැඩ කරන්නකු දුටුවෝ නම්, ඔවුනට නො පෙණෙනු පිණිස වනයෙන් වනයට, ලැහැබින් ලැහබට, වළ තැනින් වළ තැනට, ගොඩින් ගොඩට විටින් විට ගමන් ගත්හ. ගොනුන් ගොපලුන් නැති ගාල්වලට වැද දෙ දණ දෙ වැලමිට බිම හැන ගමන් කොට කිරි වස්සන්ගේ ගොම කුස පුරා අනුභව කළහ. බිහිසුණු සොහොන්වලට වැද මිනී ඇට කොටට විසින් හිස පය තබා නිදි ගත්හ.

නිවන් සොයා ගොස් මෙසේ උග්‍රතපස් කළ මහසතුන්ගේ සිරුර තදින් වැරි ගියේ ය. මස්ලේ වියලී ගියේය. මලමග ගිලී ගියේ ය. නිසිදනමාංසය මැදින් ගැඹුරු ව ගියේ ය. කොදු ඇටය උඩ යටට නැමී ගියේ ය. ඉලඇට දිරා ගිය සාලාවක ගොනැස් සේ උඩු යටි ව නැමී වැටුනේ ය. දෙ ඇස් ගැඹුරු ලිඳක දියයට පෙණෙන තරු සේ යටට ගිලී ගියේ ය. හිසේ සම අමු වෙන් කැපූඅවු සුලං වැදීමෙන් වේලී ගිය කිත්තලබු ගෙඩියක සිවිය සේ අවු සුලං වැදීමෙන් වියලී ගියේ ය. උදරසම පිට කටුවෙහි ඇලී සිටියේ ය. සිරුරෙහි මුල් කුණු වූ ලොම් අතගැ කල්හි ගැලවී අතට ආයේ ය. උන් වහන්සේ මලමූ පහ කරන්නට හුන් කල්හි එතැන ම ඇද වැටුනා හ.

මහසත්හු සංසාරවිමුක්තිය පිණිස මෙසේ හොර වූ තපස් කළහ. එයින් එහෙත් කිසිත් පිරිමැසිල්ලක් නො වූ බව **"කායපි බෝ අහං සාරිපුත්ත! ඉරියාය කාය දුක්කරකාරිකාය න අජ්ඣගමං උත්තරි මනුස්සධම්මා**

අලමරියඤාණදස්සනවිසෙසං'' යි මෙයින් දක්වා, ලොකයෙහි කිසිවකුට ආහාරයෙන්, යාගයෙන්, ගිනි පිදීමෙන්, අවෙලකාදිව්‍රතසමාදනයෙන්, දළ මඩුලු බැඳීමෙන්, බිම නිදීමෙන්, රජස් දූලි ඇඟ නැගීමෙන් යන ඇලෙසකින් සිත කය තැවීමෙන්, සිත කයට දුක් දීමෙන්, සසරින් නිදහසෙක් නො ලැබේ' යි වදළ සේක.

මච්චං අවිතිණ්ණකඩ්ඛං = එතෙර නො වූ සැක ඇති මිනිසා. නො නැසූ සැක ඇති සත්ත්වයා.

සත්ත්වපර්‍යායය නාම අතුරෙහි '**මච්ච**' යනු මූලපද යි අර්ථ කථාවන්හි දක්වන ලද්දේ ය. මැරීම, ස්වභාව කොට ඇත්තේ ය යනු එහි තේරුම ය. '**මරිතබ්බසභාවතාය = මච්චො**'' යනු විවෘති යි. සත්ත-නර-මානව-පොස-පුග්ගල-ජීව-ජාගු-ජන්තු-ඉන්දගු-භින්දගු-මනුජයනාදියෝහි පර්‍යායය නාම වෙති.

පූර්‍වාන්තාදිඅෂ්ටවස්තුකසංශයෙන් එතෙර නො වූ, හෙවත් මග නැණින් නො නැසූ සැක ඇති සත්ත්වයන්ට නග්නවර්‍යාදියෙහි පිළිපැදීමෙන් වැඩෙක් නැත්තේ ය. පාරිශුද්ධියක් නො ද ලැබෙන්නේ ය. නග්න වර්‍යාදීහු ඔහු පිරිසිදු නො කෙරෙති.

> ''යා කාචි කඩ්ඛා ඉධ වා හුරං වා
> සකවෙදියා වා පරවෙදියා වා,
> ඛ්‍ායිනො තා පජහන්ති සබ්බා
> ආතාපිනො බ්‍රහ්මචරියං චරන්තා''

ධ්‍යානකරණ විදසුන් වඩා ප්‍රදහනවර්‍යායෙහි යෙදීමෙන් කෙලෙස් තවන මගබඹසර හැසිරීමෙන් ශ්‍රද්ධානුසාරී ඇ විසින් භෙද වූ සොතාපන්නපුද්ගල තෙමේ ස්වපරසන්තානයන්හි වූ සියලු සැක මාර්ගක්ෂණයෙහි දී සිඳ හරියි. සෝවාන් මග නැණින් සියලු සැකයන් ගෙන් එතෙර වේ. මෙ සේ එතෙර නො වූයේ ''**අවිතිණ්ණකඩ්ඛ**'' නම්.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවාන්ඵලාදියට පැමිණියහ.

බහුභණ්ඩිකස්ථවිරවස්තුව නිමි.

සන්තති මහාමාත්‍යයෝ

10 – 9

කොසොල් රජුට සන්තති යි මහඇමැතියෙක් විය. රජුට අයත් රටෙහි එක් පළාතක් රජුට විරුද්ධව නැගී සිටි කල්හි මේ ඇමැති තෙමේ ඒ පළාත සෙමෙහි තබන්නට එහි ගියේ ය. ගොස් එහි නැගී සිටි කැරැල්ල සන්සිඳවා අවුත් රජුට ඒ බව සැළ කෙළේ ය. සතුටු වූ රජ තෙමේ ඇමැති යාට සත් දවසක් රජකම කරන්නට කියා පවරා දී නැවීම්, ගී කීමෙහි දක්ෂ වූ නළුහනක ද දුන්නේ ය. ඒ සත් දවස ම සුරා බී මත් වූ ඇමැති තෙමේ සත්වන දා මැනවින් හැඳ පැළඳ සැරසී ඇතකු පිට නැගී දිය නාන්නට යනුයේ, වාහල්කඩ අසල දී පිඬු සිඟා වඩනා බුදු රජුන් දැක, ඇතු පිට හිඳ හිස නමා වැඳ නික්ම ගියේ ය. එහි දී බුදුරජුන් සිනා පහළ කරණු දැක ආනන්ද ස්ථවිර තෙමේ "ස්වාමීනි! කුමක් නිසා සිනා පහළ කළ සේක් ද?" යි ඇසී ය. "ආනන්ද! අර යන්නහු දුටු වහු ද, ඒ සන්තති ඇමැතියා ය. ඔහු අද මා ඉදිරියට එන්නේ ය. එන්නේ ද ඇති තරම් අබරණ ඇඳ පැළඳ ගෙණ ය. මා ඉදිරියෙහි දී සිවුපද ගයක් අසා ඒ අවසන්හී රහත් වන්නේ ය. රහත් ව සත් තලක් අහසට නැඟ පිරිනිවෙන්නේ ය" යි උන්වහන්සේ වදළ සේක. එහි හුන් හැම දෙනාට බුදුරජුන්ගේ මේ කතාව ඇසින. මිස දිටු ගත්තෝ "පින්වත්නි! ශ්‍රමණ ගෞතමයාගේ කතාවක හැටි බලන්න. කටට ආවක් ම ඔහු කියයි. උඟුර තෙක් සුරා බී මත් ව සිසන් නැතු ව සිටුනා සන්තති ඇමැති හොඳට ඇඳ පැළඳ සැරසී ඔහු වෙත අවුත් බණ අසා පිරිනිවන් පාන්නේය'යි කියයි. ශ්‍රමණ ගෞතමයා ඔය අන්දමේ කතා කීමට ගජ සමතෙක් ය. ඔහු මේ වර නම් බොරු දෙසා බාන්නෙකු කළ යුතු ය"යි කතා කළහ. සමිදිටු ගත්තෝ "පුදුමය බුඩානුභාවය, අද බුදු රජුන්ගේ හැටිත් සන්තති ඇමැතියාගේ සැටිත් දක්ක හැකිය" යි හඬ නැඟුහ. ඇමැති මුළු දවල් දවස නාන තොටෙහි දිය කෙළ දියෙන් ගොඩ නැඟී උයන් ගොස් සුරාපානය කරන්නට සිතා එහි වූ සුරා ශාලාවෙහි හිඳ ගත්තේ ය. ඒ වේලෙහි නළුහන ද ඔහු ඉදිරියෙහි බැස නැටීමට හා සින්දු කීමට පටන් ගතු. ඕ සතියක්ම බඩ පුරා කෑම නො ගත්තා ය. කෑවා යන්තමක් ය. බඩ පුරා කා නටනු නො හැකි බැවින් ඕ එසේ වීකක් ම කෑවා ය. සතියක් ම සෑහෙන පමණට නො කා නො බී නටන කල්හි මහන්සිය බලවත් ව ගියෙන් ඇයගේ කුසතුළ බඩවැල් කපා හරින්නා සේ රුදු ඇති කරමින් නැඟුනු ශස්ත්‍රවාතය පපුමස සිඳ හෙළී ය. එකෙණෙහි ම ඕ මළා ය. ඇමැති ඒ දැක බලවත් ශොකයෙන් මැඩී ගියේ ය. සතියක් පැවැති වෙරිමත උණු කබලෙහි ඉසි දිය බිඳක් සේ එ වේලෙහි ම සිඳී ගියේ ය. ශොකය තව තවත් නැඟුනේ ය. ඇමැති "මාගේ මේ ශොකය සන්සිඳවන්නට බුදුරජුන් හැර අනෙකකුට නො හැකි ය. බුදුරජුන් හැර අනෙකෙක් මාගේ ශොකය සන්සිඳ වන්නට සමත් නො වේ" යි සිය පිරි

සත් ගෙණ සවස් වේලෙහි බුදුරජුන් වෙත ගියේ ය. ගොස් "ස්වාමිනි! මාගේ නළඟන මළා. එයින් මා තුළ හට ගෙණ ඇති ශොකය බලගතු ය. ඒ ශොකය සන්සිඳ වන්නට ඔබ වහන්සේට හැර අනෙකෙකුට නො හැකි ය. එහෙයින් මම මෙහි ආමි, මට පිහිටවනු මැනවැ" යි සැළ කෙළේය. බුදුරජානන් වහන්සේ "බොහෝ ම කදිම ය ඔබ ගේ මෙහි ඊම, ශොක සන්සිඳුවා ලීමෙහි පොහොසතුන් ලහට ම ඔබ ආවහු ය, එහෙයින් මේ ඊම වැඩ දයක ය, මේ නළඟන මෙසේ ඔබ ඉදිරියෙහි මළ වාර ගණන ගිණිය නො හැකි ය, ඇය මැරුණු හැම වර ම ඔබ හැඬුවහු ය, එසේ ඔබ හඬන වේලෙහි ඔබ දෙ ඇසින් වැගුරුණු කඳුලු සිවු සඳුරෙහි දියටත් වැඩි ය" යි වදරා

"තට පෙර බවෙහි කළ - යම් කමක් වේ නම් එය
වියලව අනාබව්හි - රා ඇ කිසිත් දහමෙක්,
නො ම වන්නේ ද මතු - බවෙහි රූ ඇ දහමුත්,
නො ගණිහි නම් - (එකලා) සන්සුන් ව හැසිරෙන්නෙහී"

යනුත් වදළ සේක. මේ දෙසුම් අවසන්හි සත්තති මහ ඇමති තෙමේ රහත් වූයේ තම ආයුසංස්කාරය බැලී ය. බලා එය කල් නො පවත්නා බව දැන 'ස්වාමීනි! මට පිරිනිවන් පාන්නට අවසර දුන මැනවැ"යි අයැද සිටියේය. බුදුරජානන් වහන්සේ ඔහු කළ කම් දන්නා සේක් ද "ඔබ පෙර කළ කම් මට කියවු, කියන්නහු ද සත්තලක් අහසට නැග අහස සිට කියවු" යි වදළ සේක. උන්වහන්සේ මොහු කළ කම් දන්නා සේක් ද මෙසේ වදළෝ, එහි තමන් වහන්සේ අසත්‍යවාදියෙකැ යි කියා නිගන්නට රැස් ව හුන් මිස දිටු ගත්තවුන් පසු බස්සන්නට, බුඬානුභාවය හා සන්තති මහාමාත්‍යානුභාවය දකින්නට පැමිණ සිටි සමදිටු ගත්තවුන් පින් කිරීමෙහි උත්සාහවත් කරන්නට ය.

සන්තති මහාමාත්‍යතෙමේ "යහපතැ" යි බුදුරජුන් වැඳ එක් තලක් අහස නැග බැස නැවතත් බුදුරජුන් වැඳ පිළිවෙළින් සත් තලක් අහස නැග එහි පළක් බැඳ හිඳ "ස්වාමීනි! මම මේ කපට එකානූවන කපෙහි විපස්සි බුදුරජුන් දවස බන්ධුමති නුවර කුලගෙයක උපන්නෙමි, එහි දී වැඩිවිය පැමිණි මම අනුනට ගැහැටක් පෙළීමක් නො වන, තමන්ටත් පින් වැඩෙන, කටයුතු මොනවා දැ යි සොයා බැලීමි. බණ ඇසීම සඳහා එන්නන්ට කල් දැන්වීම එබඳු වැඩකැ යි මට සිත් විය, එතැන් සිට මම එය කෙළෙමි, මහජනයා එහි සමාදන් කර වීමි, පින් කෙළෙමි, පොහෝදා පෙහෙවස් විසීමි, දන් දීමි, බණ ඇසීමි, බුදුරුවන් ඇ තුන් රුවනට වැඩි තරම් රුවනෙක් ලොව නැතැ යි මිනිසුන් ලවා තුණුරුවනට සත්කාර කර වීමි, එය හඬ නගා කියමින් තැන තැන ගියෙමි, මා මෙසේ කියා ඇවිදින විට මාගේ කතාව ඇසූ බුදුරජුන්ගේ පිය වූ බන්ධුමන්තු රජ තෙමේ මා ගෙන්වා 'තෝ කුමක් කෙරෙහි දැ?' යි ඇසී ය. එ වේලෙහී මම 'දෙවයන් වහන්ස! තුණුරුවනෙහි ඇති ඉණ මා දන්නා තරමින් කියමින් මහජනයා පින්කමෙහි

යොදවමින් දවසරින්නෙමි'යි කීම්. එවිට රජ තෙමේ 'ඇවිදින්නෙහි කෙසේ ද?' යි ඇසි ය. ''පයින් ඇවිදිමි' යි මම කීම්. එ වේලෙහි රජ තෙමේ 'පයින් ඇවිදීම අපහසු ය'. එය ඔබ කරණ වැඩෙට තරම් ද නො වේ. එහෙයින් මේ මල්වඩම කර ලා අර පෙණෙන අසු පිට නැගී ඇවිදින්නැ'යි කියා මුතු මාලයක් වැනි මල්වඩමක් හා අයකු නියම කොට දුන්නේ ය. එතැන් සිට මම රජු කී ලෙසට ඇවිද්දෙමි, රජ තෙමේ එසේ ඇවිදිනා මා, ටික කලක් බලා සිට නැවත ගෙන්වා සුදු අසුන් සිවු දෙනකු යෙදූ රියක් මට දුන්නේ ය. තෙවන වරකුත් මා ගෙන්වා පළඳින්නට අබරණත් තවත් නොයෙක් හොඟයනුත් දෙවාලා ඇතකුත් දෙවී ය. මෙසේ නොයෙක් වර රජුගෙන් සම්පත් ලැබූ මම ඒ කාලයේ ආයු පමණින් අසූසාර දහසක් අවුරුදු බණ අසන්නට එන්නැ යි කාලඝොෂා කරමින් ඇතු පිට නැගී ඇවිද්දෙමි. ඒ කාලයේ මා මෙසේ කරණ අතර මා සිරුරෙන් සඳුන් සුවඳ හැමී ය මුවෙන් උපුල් මල් සුවඳ හැමී ය, ස්වාමිනි! මා මේ පෙර කළ කර්මය'' යි' කියා අභය හිඳ ම තෙජොධාතු කසිණයට සම වැද පිරිනිවන් පෑයේ ය. සිරුරෙන් ගිනි දැල් නිකුත් ව ඔස් ලේ නහර දවී ගියේ ය. දෑ සමන් මල් මොට්ටු රැසක් සේ ඒ පමණින් ධාතු ඉතිරි විය. බුදුරජානන් වහන්සේ එහි යට බිම සුදු රෙද්දක් අතුරවා ලූහ. ධාතූහු එහි වැටී සිට ගත්හ. එහි රැස් ව සිටී මහ දෙනේ ධාතු වැද පිදී ය. බුදුරජානන් වහන්සේ ධාතු, පාත්‍රයෙක ලා ගෙන ගොස් සිවුමංහන්දියක දගැබක් කරවූ සේක.

මෙදවස දම්සබාවෙහි භික්ෂූහු ''සන්තකි මහාමාත්‍යතෙමේ දම්දෙසුම් අවසන්හි රහත් ව හැඳ සිටී ඇඳුම් කැඩුම් සහිතව ම අහසෙහි දී පිරිනිවි යේ ය. එහෙයින් මොහු ශ්‍රමණ යි හැඳින් විය හැකි ද, හැඳින් විය යුතු ද, බ්‍රාහ්මණ යි හැඳින් විය හැකි ද, හැඳින් විය යුතු ද, කිම මොහු ශ්‍රමණයෙක්, බ්‍රාහ්මණයෙක් වේ ද'' යි කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ එහි වැඩි යේක් ඒ කතාව අසා ''මහණෙනි' මා පුත් ශ්‍රමණ යි කිය යුතු ම ය යි වදරා මෙධර්මදෙශනාව කළ සේක.

> අලඞ්කතො වෙපි සමං චරෙය්‍ය
> සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරි,
> සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
> සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛූති.

සැරසුනේ නමුත් සම ව හැසිරෙන්නේ ද ශාන්ත ද දමුනේ ද නියම කරණ ලද්දේ ද බඹසර ඇත්තේ ද සියලු සතුන් කෙරෙහි දණ්ඩනය බහා තබා සිටියේ ද බ්‍රාහ්මණ නම් හෙතෙමේ ය. ශ්‍රමණ නම් හෙතෙමේ ය. භික්ෂු නම් හෙතෙමේ ය.

අලඞ්කතො අපි = සැරසුනේ ද.

ශරීරාලඞ්කරණය යමකින් කරණු ලැබූ වේ ද ඒ අලඞ්කාර නම්. මුක්තාහාරාදිය ය. අන් වස්ත්‍රාභරණාදිය ද මෙහි ඇතුළත් ය. මුක්තාහාරාදි අලඞ්කාරයෙන් සැරසුනේ, සරසන ලද්දේ **අලඞ්කත** නම් වේ.

වෙ = ඉදින් යම්ලෙසකින්.

සම• චරෙය්‍ය = සම ව හැසිරෙන්නේ ද.

කය – වචන – සිත යන වාරත්‍රයයෙන් කෙරෙන පව්කම් හැර කාය සුචරිතාදියෙහි යෙදී ඉරියවු පැවැත්වීම සමචරණ යි ගැණේ. කායසුචරිතාදිය, කායාදීදෙරටු සම කරණ බැවින් සම යි ද, කායදුශ්චරිතාදිය, කායාදි දෙරටු විසම කරණ බැවින් විසම යි ද කියනු ලැබේ. මෙයින් ගැණෙනුයේ පව්කම්වලින් දුරු ව කායසමාධි සංයමයෙහි යෙදී වසන්නේ ය.

සන්තො = ශාන්ත ද, ඇලෙන කිපෙන මුළාවන ගති නැත්තේ ද.

යමෙක් අරමුණෙහි ඇලේ නම්, අරමුණෙහි හැපේ නම්, අරමුණෙහි මුළා වේ නම් ඔහු ශාන්ත නො වේ. නො සන්සිදුනේ ය. එසේ නො ද බැඳෙන්නේ, නො ද කිපෙන්නේ, නො ද මුළා වන්නේ ශාන්ත නම් වේ. **'රාගාදිවූපසමෙන සන්තො, නිබ්බුතලෙ සොති සන්තො''** යනු අටුවා ය.

දන්තො = දමුනේ ද.

දන්තභූමියට පැමිණියේ දන්ත නම්. දන්තභූමි නම් රහත් පලය යි. ඇස් – කන් – නාස් ඇ ඉඳුරන්ගේ එකාන්තදමනය රහත්පලයට පැමිණිමෙන් ම වන බැවින් එසේ කියන ලද්දේ ය. ඇස් – කන් – නාස් ඇ රූප ශබ්දදීන් හා ගැටීමෙන් පහළ වන ජවනචිත්තාවස්ථාවෙහි යොනිසොමනසිකාරය ඇත්තේ ද 'දන්ත' නමි. ඡඩඞ්ගොපෙක්ෂා වශයෙන් ඉඳුරන් කෙරෙහි වූ උත්තමදමනයෙන් යුක්ත වූයේ 'දන්ත' නමි. **''ඡළඞ්ගුපෙක්ඛා වසෙන ඉන්ද්‍රියෙසු උත්තමදමනෙන දන්තො''** යනු ඒ කි සැටියි. මෙ ද ඒය. **''ඉධ ඛීණාසවො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො උපෙක්ඛකො විහරති සතො ච සම්පජානො''** යනු මේ ඇ ලෙසින් කිය වෙන රහතුන්ගේ ඇස් – කන් – නාස් ඇ සදෙර ම ඉෂ්ට වූ හෝ අනිෂ්ට වූ රූ ඇ අරමුණක් හමු වූ කල්හි සිතෙහි පිරිසිදු වූ මුල් පැවැත්ම අත් නො හරිණ ලෙසින් පැවැති මැදහත්බව විදීම ලකුණු කොට සිටි උපෙක්ෂාව 'ඡඩඞ්ගොපෙක්ෂා' නමි. රහතුන් වහන්සේ ඉටු අරමුණින් සතුටු වන්නේ ද අනිටු අරමුණින් නො සතුටු වන්නේ-නො වෙකි. හැම අරමුණෙහි ම සිහි ඇතිව යහපත් නුවණ ඇති ව මැදහත් ව වෙසෙති.

'දන්තො' යනු කොටින් පහදන්නෝ **''දන්තොති නිබ්බි සෙවනො නිප්පරිඵන්දෙ''** යනු කිහ. නිබ්බිසෙවන වූයේ හෙවත් ඉඳුරන් දැමීමෙන් යුක්ත වූයේ, කිසි ලෙසකින් නො ද සැලෙන්නේ ය. දන්ත නම් හේ ය. කිසි ලෙසකින් නො ද සැලෙන්නේ යි කියේ ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද රූ ඇ කිසි අරමුණක් විසය කොට සතුටු නො සතුටු බවට නො පැමිණෙන්නේ

රූ ඇ අරමුණකින් කම්පිත නො වන්නේ ය, නො සැලෙන්නේ ය යනුයි මේ ම අන් ලෙසකින් විස්තර පහදන්නෝ "**කිලෙසවිප්පන්දරහිතචිත්ත තාය දන්තො**" යනු කීහ. යමෙකුගේ සිත රාගාදිකෙලෙසුන්ගෙන් නො සැලේ ද කෙලෙස් සැලුම්වලින් තොර වූයේ ද ස්ථිර ව පිහිටියේ ද හේ දන්තය යනු එහි තේරුම ය.

"**දන්තොති නිබ්බිසෙවනො, දන්තහත්ථිඅස්සාදිසදිසො. චක්ඛුතොපි දන්තො -පෙ- මනතොපි දන්තොති දන්තො. සබ්බවාරවිසෙවනා හිත්වා අරියෙන දමථෙන දන්තභූමිං පත්තොති දන්තො. උත්තමෙන දමෙන අග්ග මග්ගදමථෙන දන්තොති දන්තො. චතුමග්ගසඞ්ඛාතාය දන්තාය දන්තොති දන්තො. සිවීබිතසික්ඛොති දන්තො. සුපරිසුඛකායසමාහාරතාය චෙව හත්ථපාදකුක්කුච්චාභාවතො දවාදිඅභාවතො කායෙන දන්තොති දන්තො**" යනු දන්ත යන්නහුගේ අර්ථකථාවෝ ය. මෙ කී අර්ථකථාවන්ගෙන් පූර්ව භාගයෙහි ඉඳුරන් දැමීමෙන් වන දැමීමත්, අපරභාගයෙහි ආර්‍යමාර්ගභාවනා වෙන් වන දැමීමත් කියවේ.

නියතො = නියම කරණ ලද්දේ.

චතුර්විධමාර්ග **නියම**යෙන් නියම කරණ ලද්දේය යි කියූ සේ යි. සොතාපන්න - සකදාගාමී - අනාගාමී ආර්‍යපුද්ගලයන් ගැණ එක බීජි - කොලංකොල - සත්තක්ඛත්තුපරමතාදිනියමය, මාර්ගනියමය යි කියන ලද ය. මාර්ගනියමයෙන් නියත වූවහුගේ භවොත්පත්තිය ද නියත ය.

බුදුරජානන් වහන්සේ දෙවරම් මහවෙහෙර වැඩ වසනදිනෙක අනේ පිඬු සිටු තෙමේ එහි ගොස් බුදුරජුන් වැඳ පසෙක හුන්නේ ය. බුදුරජානන් වහන්සේ සිටු අමතා "ගැහැවිය! යම් දවසෙක ආර්‍ය ශ්‍රාවකයා පිළිබඳ භය වෛර චෙතනාවෝ සන්සුන් වූවාහු ද සිවු වැදෑරුම් වූ සොතාපත්ති අඞ්ග-යන්ගෙන් යුක්ත වූයේ ද ප්‍රතීත්‍ය සමුත්පාදඥානය හෝ ප්‍රතිත්‍යසමුත්පාදය ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය යමකු විසින් විදසුන් නුවණින් මොනවට අව බොධ කරණ ලද්දේ වේ ද "ඔහු කැමැත්තේ නම් ඔහුට, මම [ක්ෂය කළ නිරය තිරච්ඡාන යොනිය පෙත්තිවිසය ඇත්තේ වෙමි, පහ කළ අපායොත් පත්ති ඇත්තේ වෙමි, සොතාපන්න වෙමි, අනුනට යටත් වූ පැවැතුම් නැත්තේ වෙමි, ප්‍රථමමාර්ග සඞ්ඛ්‍යාතසම්මත්තනියමයෙන් නියම කරණ ලද්දේ වෙමි, මත්තෙහි වූ මාර්ගත්‍රයසඞ්ඛ්‍යාතසම්බොධිය උතුම් වූ මාර්ගය කොට සිටියේ එකාන්තයෙන් සම්බොධිය අවබොධ කරන්නේ වෙමි" යි කිය හැකි ය.

ගැහවිය! සතුන්මැරීම, සොරකම්කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, රහමෙරබීම යන අකුසල් කිරීමෙන් මෙලොව පරලොව දෙක්හි ඒ කරන්නහුට සිදුවන පස් වැදෑරුම් භය වෛර චෙතනාවෝ, දුක් දෙමනස්, සතුන් මැරීම් ආදියෙන් වැළකී සිටින්නහුට නො වන්නාහ. ඔහු පිළිබඳ මේ පස් වැදෑරුම් භය වෛරයන් සන්සිඳෙන සැටි ය.

ගැහවිය! ආර්‍යශ්‍රාවක තෙමේ බුදුන් කෙරෙහි නො නැසුනු නො-සැලුනු පැහැදීම, දහම් කෙරෙහි නො නැසුනු නො සැලුනු පැහැදීම, සඟුන් කෙරෙහි නො නැසුනු නො සැලුනු පැහැදීම, ආර්‍යයන් කෙරෙහි වූ ප්‍රිය ශීලීභාවය යන චතුර්විධ සොතාපත්ති අඞ්ගයන්ගෙන් යුක්ත වේ. මේ ආර්‍යශ්‍රාවකයා පිළිබඳ සොතාපත්ති අඞ්ග සතර ය. ප්‍රතීත්‍යසමුත්පාදය හා ආර්‍යඅෂ්ටාංගික මාර්ගය දැනීම ආර්‍ය වූ න්‍යාය දර්ශනය වේ.

ගැහවිය! මෙසේ ඇති කල්හි ආර්‍යශ්‍රාවක තෙමේ මාර්ග නියමයෙන් නියමිත වේ'' යි වදළ සේක.

මාර්ගනියමයෙන් නියමිත වූ ආර්‍යශ්‍රාවක තෙමේ දිවි ගැලවීගිය ද කිසිත් සංස්කාරයක් නිත්‍ය විසින් සුඛ විසින් ආත්ම විසින් නො පිළිගණියි. කුරුකුහුඹියකුගේ පවා දිවි නො ගලවයි. ''සක්විති රජය දෙන්නෙමු'' යි කීව ද සතකු නො මරයි. තථාගත ශරීරයෙහි ලේ නො සොලවයි.

''සහාවස්සදස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති,
සක්කායදිට්ඨි විචිකිච්ඡිතං ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තෝ
ඡ චාභිඨානානි අභබ්බෝ කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං''

යන මෙයිනුදු පළ වන්නේ ආර්‍යශ්‍රාවකයාගේ නියතභාවය යි. සොතාපන්න පුද්ගල තෙමේ සෝවාන්විම සමග ම සක්කායදිට්ඨිවිචිකිච්ඡාසීලබ්බත-පරාමාස යන ක්ලෙශවෘත්තය දුරු කිරීමෙන් නිරය – තිරච්ඡානයොනිය – පෙත්තිවිසය – අසුරකාය යන විපාකවෘත්තයෙන් මිදුනේ විපාකවෘත්තයට මුල් වූ කර්මවෘත්තයෙහි ඇතුළත් ඕදරික කර්ම වන මාතෘඝාතනාදි ආනන්තර්යකර්මයන් අන්‍ය භවයකදීවත් නො කරන්නේ ය යනුයි.

බ්‍රහ්මචාරි = බඹසර ඇත්තේ. ශ්‍රේෂ්ඨචර්‍යා ඇත්තේ.

ශාසනබ්‍රහ්මචර්‍ය මාර්ගබ්‍රහ්මචර්‍ය යි බ්‍රහ්මචර්‍ය දෙ පරිදි ය. විස්තර මතු එන්නේ ය.

සබ්බෙසු භූතෙසු = සියලු සතුන් කෙරෙහි.

සබ්බ ශබ්දය අනවශෙස පරියාදන බැවින් එක ද සතකුත් නො හැරය. ''සබ්බෙ තසන්ති දණ්ඩස්ස'' යන්නට කළ පරිකර්‍මය බලනු.

නිධාය දණ්ඩං = දණ්ඩනය බහා තබා. දඬුවම් හැර.

සො බ්‍රාහ්මණො = හෙතෙමේ බ්‍රාහ්මණ වේ. බ්‍රාහ්මණ වූයේ හෙතෙමේ ය. විස්තර ඉදිරියෙහි එන්නේ ය. මෙහි බ්‍රාහ්මණ නාමයෙන් ගැණෙන්නෝ රහතුන් වහන්සේ ය.

සෝ සමණෝ = හෙතෙමේ ශ්‍රමණ වේ. ශ්‍රමණත් හෙතෙමේ ය.

යමෙකුගේ කායකර්මාදිය සන්සිඳි ගියේ නම් හෙතෙමේ ය. විස්තර මතු එන්නේ ය.

සෝ භික්ඛු = හෙතෙමේ භික්ෂු ය. භික්ෂු නමුත් හෙතෙමේ ය.

සසර බිය විසින් දක්නේ භික්ෂු නම් වේ. විස්තර මතු එන්නේ ය.

යමෙක් ඇඳුම් ආයිත්තමින් සැරසුනේ ද කායවිසමාදියෙන් තොර ව හැසිරෙන්නේ නම්, ශාන්ත නම්, දමුනේ නම්, මාර්ග නියමයෙන් නියමිත නම් බඹසරින් යුක්ත නම්, කිසි සතකුටත් දඩුවම් නොකෙරේ නම්, ඔහු සිතින් බැහැර කළ පව් ඇති බැවින් බ්‍රාහ්මණ නම් වේ. සන්සිඳුවාලූ පව් ඇති බැවින් ශ්‍රමණ නම් වේ. කෙලෙසුන් බිඳ හැරපූ බැවින් භික්ෂු නම් වේ. **''සෝ එවරූපෝ බාහිතපාපත්තා බ්‍රාහ්මණොති පි සමිතපාපත්තා සමණොති පි හින්න කිලෙසත්තා භික්ඛූතීපි වත්තබ්බොයෙව''** යනු අටුවා ය. මෙයින් ගැණෙන්නෝ රහතුන් වහන්සේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සොවාන් ඵලාදියට පැමිණියහ.

සන්තතිමහාමාත්‍යවස්තුව නිමි.

———

හිඟන්නකු පැවිදිකිරීම

10 - 10

ආනන්ද මහාස්ථවිරයන් වහන්සේ, දවසෙක දිරා ගිය කිලිටි රෙදි කඩක් හැඳ, කබල් තැටියක් අතට ගෙණ, හිඟා කා ඇවිදින කුඩා කොලුවකු දුටහ. දැක "තට මේ හිඟමනට වඩා මහණවීම නරක ද?" යි ඇසූහ. "ස්වාමීනි! මා මහණ කරන්නෝ කවුරු ද?" යි ඌ ඇසූ විට, අනඳතෙරණුවෝ "තෝ කැමැත්තෙහි නම්, මම තා පැවිදි කරන්නෙමි" යි කීහ. "ස්වාමීනි! පැවිදි වන්නට මම කැමැත්තෙමි" යි කොලු කී ය. ස්ථවිරයන් වහන්සේ කොලුත් රැගෙණ බුදුරජුන් වෙත ගොස් සියතින් ම ඇහ උළා ඌ නාවා කමටහන් කියවා පැවිදි කළහ. ඌ ඇඳ තුබූ දිරු රෙදිකඩ ගෙණ දිග හැර බලා පෙරහනකටවත් ගන්නට සැහෙන තැනක් එහි නැති බව දැක, කබල් තැටියත් සමග එය ගහක් උඩ තැබූහ. කොලු පැවිදි ව ලැබූ උපසපන්බව් ඇත්තේ, බුදුරජුන් නිසා ලැබෙන ලාභ සත්කාර වළඳන්නට විය. වටිනා සිවුරු හැඳ පෙරවී ය. ටික දවසක් යත් ම මස් ලේ වැඩීමෙන් තරබාරු සිරුරු ඇත්තේ විය. ඒ හාම සසුනෙහි කළකිරුණේ ය. සසුනෙහි ඇල්ම නැති ව ගියේ ය. "සැදැහැවතුන් විසින් සැදැහැයෙන් දෙන සිවුරු හැඳ පොරවා ඇවිදීමෙන් ඇති කාරිය කිම, සිවුරු හැර මම මට අයිති වැරහැලිකඩ අඳිමි" යි වැරහැල්ල තිබූ ගස ලඟට ගියේ ය. ගොස් ඒ බලා "අලජ්ජිය! මෙබඳු වටිනා සිවුරු හැර දමා මේ දිරු කිලිටි රෙදිකඩ ඇඟ ඔතා ගෙණ කබල් තැටිය අතට ගෙණ සිහන්නට යන්නෙහි දැ" යි තෙමේ තමාට අවවාද කෙළේ ය. මෙසේ තමන් තමන්ට අවවාද කරත් ම සසුනෙහි කළකිරීම පහව ගියේ ය. සිත සන්සිඳුනේ ය. ඔහු රෙදිකඩත් තැටියත් එහි ම තබා නැවතත් විහාරයට ගියේ ය. ටික දවසක් ගිය තැන නැවතත් කළකිරුණේ ය. ගස ලඟට ගියේ ය. රෙදිකඩ ගත්තේ ය. පෙර සේ ම එ වරත් තෙමේ තමාට අවවාද කෙළේ ය. කළකිරුම් නැති විය. පෙරළා විහාරයට ආයේ ය. නැවතත් කළ කිරුණේ ය. ගස ලඟට ගියේ ය. රෙදිකඩ ගත්තේ ය. තෙමේ තමන්ට අවවාද කෙළේ ය. කළකිරීම පහව ගියේ ය. විහාරයට ආයේ ය. මෙසේ කිහිප වරක් එහා මෙහා යන ඒ මහණ දුටු අනික් භික්ෂූන් වහන්සේලා "කොහි යෙහි ද?" යි ඔහුගෙන් ඇසූහ. "ගුරුන් වෙත යමි" යි ඔහු කී ය. මෙලෙසින් ඔහු තමන්ගේ ඒ රෙදිකඩ ම අරමුණු කොට සිත වැඩී ය. එයින් නො ඇල්ම දුරු ව ගොස් ටික දිනකින් ම ඔහු රහත් බවට පත් විය.

දවසක් භික්ෂූන් වහන්සේලා "ඇවැත! ඔබ දැන් ටික දිනක සිට ගුරුන් වෙත යන බවෙක් නො පෙණේ, ඇයි නො යහු" යි ඇසූහ. "ඇවැත්නි! ගියෙම් වැඩ ඇති දවස්හි, දැන් එහි යෑමෙන් වැඩෙක් නැත, ගුරුවරයාගෙන් වැඩ ඇති දවස්හි එහි ගියෙමි, දැන් සියල්ල සම්පූර්ණ ය, වැඩ නැති බැවින් දැන් නො යමි" යි ඒ මහණහු කී කල්හි භික්ෂූන් වහන්සේලා බුදුරජුන්

වෙත ගොස් "ස්වාමිනි! පිලොතිකස්ථවිරතෙමේ, තෙමේ රහත් යි කියා" යි බුදුරජුන්ට දන්වා සිටියහ. එවිට උන්වහන්සේ "මහණෙනි! පිලොතිකයන් කියේ කිමැ?" යි ඇසූහ. ඔවුහු පිලෝතිකයන් කී සියල්ල දැන් වූහ. බුදුරජානන් වහන්සේ "ඔව්, මහණෙනි! ඒ තැන කීවා සැබෑ ය, ඒ තැන, තම ගුරුන් හා එකතු ව සිටියේ, ගුරුන් වෙත ගියේ, ඒ තැනට වැඩ ඇති දවසේ ය, දැන් ඒ තැනගේ ඒ වැඩ සම්පූර්ණ ය, ඒ නිසා ගුරුන් හා පැවැති එක්වීම දැන් අත් හැර සිටියි, තෙමේ ම සසුනෙහි නො ඇලීම දුරු කොට සසුනෙහි ඇලුම් උපදවා රහත් බවට පැමිණියේ ය" යි වදරා මේ ධර්ම-දේශනාව කළ සේක.

හිරිනිසෙධො පුරිසො කො චි ලොකස්මිං විජ්ජති,
යො නින්දං අපබොධති අස්සො භද්‍රො කසාමිව.

අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ,
සඩ්ඩාය සීලෙන ච විරියෙන ච,
සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච,
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා,
පහස්සථ දුක්ඛමිදං අනප්පකන්ති.

කසපහරින් වැළකෙන උතුම් අසකු සේ යමෙක් නින්දව හෙවත් අකුශල විතර්කය සිය සිතින් පහ කෙරේ ද, නොහොත් අකුශල විතර්කයෙහි දෙස් දනී ද, ලජ්ජායෙන් අකුශලවිතර්කයන් දුරු කරණ පුරුෂයෙක් තෙමේ ලෙවිහි කිසිවෙක් ම ඇත්තේ ය.

සම්ථියෙන් පහළ උතුම් අසකු සේ කෙලෙස් තවන වෙර ඇත්තහු වූ, සසර කළකිරුම් ඇත්තහු වූ, ශ්‍රද්ධාවෙන් ද ශීලයෙන් ද වීර්‍යයෙන් ද සමාධියෙන් ද ධම්මවිනිශ්චයයෙන් ද යුක්ත ව සම්පූර්ණ වූ විද්‍යාචරණ ඇත්තහු, සිහි ඇත්තහු, ඉතා බොහෝ වූමේ සසර දුක දුරු කරවූ.

හිරිනිසෙධො = ලජ්ජායෙන් අකුශල විතර්කයන් දුරු කරණ.

"මා වැනි පිළිවෙල නො සිඳ ආ, පවිත්‍ර වූ ජාතිගොත්‍ර ඇති, නුවණින් හා වයසින් වැඩී සිටි, බොහෝ ඇසූ පිරූ තැන් ඇති, සැදැහැවත් තලතුනා එකකුට කාමාදිඅකුශලවිතර්කයන්ට යටත් වීම තරම් දූ යි සිතා පාපයෙහි ලජ්ජා ඇති ව කාමාදි අකුශලවිතර්කයන් දුරු කරන්නා වූ"

පුරිසො = පුරුෂයෙක්.

"පූරෙති නිස්සයස්සාභිලාසන්ති = පුරිසො, පුරිඋච්චෙ යානෙ සෙති පවත්තතීති = පුරිසො" යනු අරුත් පැවසීම ය. තුම අදහස් පුරන්නේ, අදහස් කළ දෙය නොනසා කරන්නේ, උසස් තැන පවත්නේ, සිටියේ පුරුෂ නම්.

කො චි ලොකස්මිං විජ්ජති = කිසිවෙක් ම ලොව ඇත්තේ ය.

සත්ත්වලොකයෙහි ය. ලොකය, සත්ත්වලොකය-අවකාශ ලොකය-සංස්කාරලොකය යි තෙ පරිදි ය. එහි, ඉන්ද්‍රියබඬ ස්කන්ධයන්ගේ සමූහ සන්තානය සත්ත්වලොක නම්. **"ඉන්ද්‍රියබඬානං ඛන්ධානං සමූහො සන්තානො ච සත්තලොකො"** යනු ටීකා වචන ය. මේ වනාහි බ්‍රහ්ම-දිව්‍ය-මනුෂ්‍ය-තිරශ්චීන ප්‍රෙත-අසුර-නෙරයිකාදි ආත්මභාව විසින් විවිධ භෙද ඇත්තේ, කෙළවරක් නැත්තේ ය. එහෙයිනි **"සත්ත්වවිෂය අචින්ත්‍ය"** යි වදළෝ. සිතන්නෝ විසාතයට පැමිණෙන්නෝ ය. නො සිතිය හැකි ඒ මේ සත්ත්වගණයෙහි පින්පවිපල පැළේ නු යි ලොක නම් වී. **"ලොකීයන්ති එත්ථ පුඤ්ඤපාපඵලානීති = ලොකො"** යනු ඒ පැහැදිලි කිරීම ය. **ලොකීයති එත්ථ පුඤ්ඤපාපං තබ්බිපාකො වාති = ලොකො, ලොකීයති එත්ථ කුසලාකුසලං තබ්බිපාකො වාති ලොකො"** යනු එහිලා කළ තවත් විවෘතීහු ය. **"සස්සතො ලොකො අසස්සතො ලොකො"** යනාදී තැන්හි මේ යෙදී සිටියේ ය. ගාථායෙහි ආයේ ද මේ ලොකය යි.

"අනින්ද්‍රියබඬානං රූපාදීනං සමූහො සන්තානො ච ඔකාස ලොකො" ඉන්ද්‍රියබඬ නොවූ ඉන්ද්‍රියයන් හා නොබැඳුනු රූපාදීන්ගේ සමූහසන්තානය අවකාශලොක නම්: මේ ද, පෘථිවී-පර්වත-ගංගා-සමුද්‍රය-වෘක්ෂ-ලතා-වහ්නි-වායු-චක්‍රවාටාදීන්ගේ වශයෙන් විවිධ භෙදයට ගියේ කෙළවරක් නැත්තේ ය. **ලොකීයති විවිත්තාකාරතො දිස්සතීති = ලොකො ලොකීයන්ති එත්ථ තසා වා ථාවරා වාති = ලොකො"** යනු එහි අරුත් උදුරා දැක්වීම ය. විසිතුරු ලෙසින් දක්නා ලැබෙ, මෙහි නො පැහැ භය තෘෂ්ණා ඇත්තෝ, පැහැ භයතෘෂ්ණා ඇත්තෝ දකිනු ලැබෙත් නු යි ලොක නම්. **"යාවතා චන්දිමසුරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා කාව සහස්සධා ලොකො එත්ථ තෙ වත්තති වසො"** යනාදී තැන්හි මේ යෙදී සිටියේ ය.

"උභයෙ පි ඛන්ධා සඞ්ඛාරලොකො" ඉන්ද්‍රියයන්ගෙන් බැඳී සිටියා වූත්, ඉන්ද්‍රියයන් හා නොබැඳුනා වූත් ස්කන්ධසමූහය සංස්කාර ලොක නමැ යි කීහු. මෙයින් අර්ථ විසින් දුක්ඛ-සමුදය යන ආර්‍යසත්‍ය දෙක ගැණේ. **"ලුජ්ජති පලුජ්ජතීති = ලොකො, ලුජ්ජනට්ඨෙන = ලොකො"** යනු එහිලා ගත යුතු ය. නෑසෙන වැනසෙන අරුතින් ලොක නම්. **"එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා"** යනාදී තැන ඒ දක්නා ලැබෙ.

මෙසේ ලොකය, සත්ත්ව-අවකාශ-සංස්කාර ලොක යි විභාග විසින්, ස්වරූප විසින් කියන ලද්දේ ද, ස්කන්ධලොකාදීන්ගේ වශයෙන් ස්කන්ධ ලොක-ආයතනලොක-විපත්තිභවලොක-විපත්තිසම්භවලොක-සම්පත්ති භවලොක සම්පත්ති සම්භවලොක-එකවිධ ලොක - විවිධලොක-ත්‍රිවිධ-ලොක-චතුර්විධ ලොක පංචවිධ ලොක-ෂඩ්විධලොක-සප්තවිධලොක - අෂ්ටවිධලොක යනාදීන් නොයෙක් භෙදයට ගියේ ය. ඒ හැම පංචොපා-

දනස්කන්ධයන් කෙරෙහිම ඇතුල් ව ගත්තේ ය. යමෙක් එකකින් ම නැසේ නම් වැනසේ නම්ඒ මය ලොක. ලොක ශබ්දය උපාදනස්කන්ධ-යන් කෙරෙහි ම රුඪය. විස්තාරකථා අනික් පොතින් දත හැකි ය.

යො නින්දං අපබොධති = යමෙක් නින්දව පහ කෙරේ ද.

සිතෙහි හටගන්නා කාම-ව්‍යාපාද-විහිංසා යන විතර්ක මෙහි නින්ද යි ගන්නා ලද ය. නොපමාව සිට මහණදම් කරන්නේ තම සිත්හි උපන් නින්දව හෙවත් කාමාදිඅකුශලවිතර්ක සිය සිතින් පහ කෙරේ ද, නොහොත් අකුසලවිතර්කයන්හි දෙස් දනී ද. 'පුරිසො' යන්න හා සම්බන්ධව සිටියේ ය. "අපබොධති" යන ක්‍රියාපදය සමහර පොතෙක "අප්ප-බොධති" යි[1] ලියා ඇත්තේ ය. එහෙත් එය විය යුත්තේ "අපබොධති" යනු සේ ය මට පෙණෙන්නේ. **"අප්පමත්තො සමණධම්මං කරොන්තො අත්තනො උප්පන්නං නින්දං අපහරන්තො බුජ්ඣතීති අපබොධති, යථා හද්‍රො අස්සො අත්තනි පතමානං කසං අපහරති අත්තනි පතිතුං න දෙති යො එවං නින්දං අපබොධති"** යන අර්ථකථා පාඨය නිසා.

අප යන වර්ජනාර්ථවාචී වූ අව්‍යය හා **බුධ×ඤාණ** යන ධාතුවෙන් නිපන්නේ ය මෙම ක්‍රියා රූප ය. එහෙයින් අර්ථකථාචාර්‍යයෝ **"අපහරන්තො බුජ්ඣතී"** යි මෙහි අරුත් කීහ.

අස්සො භද්‍රො කසාමිව = කසපහරින් වැළකෙන උතුම් අසකු සේ.

"මමත් කසපහර ලැබිය යුත්තෙම් ද" යි තමන් ඇඟ කසපහර ගසා ලිය නොදෙන්නා වූ, මොනවට හික්මුනු උතුම් අසකු සේය.

හික්මුනු උතුම් අසු, තමන් කෙරෙහි එන කසපහර යම් සේ වළකා ද, තමන් වෙර කසපහර වැටෙන්නට යම්සේ ඉඩ නොදේ ද, එසේ යමෙක් පවෙහි ලජ්ජාවෙන් කාමාදිඅකුශල විතර්කයන් සිය සිතින් පහ කෙරේ ද එබදු පුරුෂයෙක් මේ සත්ත්වලොකයෙහි කිසිවෙක් ම ඇත්තේ ය. එබදු පුරුෂයෙක් ලැබීම ලොකයෙහි කලාතුරකින් ම වන්නේ ය. ඇත්තේ කිසිවෙක් ම ය.

අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො = සැමටියෙන් පහළ උතුම් අසකු සේ.

හික්මුණු උතුම් අසු, යම් කිසි පමාවකින් කසපහරකට යටත් වී නම්, මමත් කසපහරට යටත් වීමි" යි එතැන් පටන් සිට හැම විටෙක ම කස පහර වළකන්නට වැයම් කරන්නේ ය. එසේ වැයම් කරණ උතුම් අසකු සේ ය යනු අරුත් ය.

ආතාපිනො භවාථ = කෙලෙස් තවන වෙර ඇත්තහු වවු.

1. සමහර පොතෙක 'අප්පබොධෙති' යි ආයේය.

'තත්ථ කතමං ආතප්පං? යෝ චෙතසිකෝ විරියාරම්භෝ -පෙ- සම්මා-වායාමෝ, ඉදං වුච්චති ආතප්පං'' යනු වදළ බැවින් සිතේ යම් වෙරක් වැයමක් වේ නම් එය **ආතප්ප** නමැ යි කිය යුතු ය.

''**ආතාපෙති කිලෙසේතීති = ආතාපෝ, ආ සමන්තතෝ තාපෙතීති = ආතාපෝ, තිසු භවෙසු කිලෙසෙ ආතපතීති = ආතාපෝ, කිලෙසඝන්තා-පත්ථෙන ආතාපෝ, කිලෙසානං ආතාපනට්ඨෙන ආතාපෝ**'' සිතෙහි වූ වීර්‍ය්‍ය ය. සම්‍යක් ව්‍යායාමය, කෙලෙස් තවා නූ යි භවත්‍රය පිළිබඳ හැම කෙලෙසුන් හැම ලෙසකින් තවන්නේ නූ යි ආතාප නම්. ආතාප යි සම්‍යක් ප්‍රධනවීර්‍ය්‍යයට නමෙකි. දැඩි ව දැවිය යුතු බැවින් **'ප්‍රධන'** නම්. මේ ම නැවත නැවත යෙදිය යුතු බැවින් අනුයොගය යි ද කියනු ලැබේ. ඇතැම් තැනෙක කායික – චෛතසිකවීර්‍ය්‍ය දෙක්හි ම ''ආතප්ප – ආතාප' ශබ්ද දෙක අවිශෙෂ ව යෙදී ඇත්තේ ය. ඒ මේ කෙලෙස් දවන තවන සම්‍යක්-ප්‍රධනවීර්‍ය්‍යය ඇත්තේ ආතාපී නම් වේ. එහි බහුත්වය **'ආතාපිනෝ** යනු යි. සම්‍යක් ප්‍රධනවීර්‍ය්‍යවන්හු ආතාපිහු වෙති. ''**ඉමිනා ආතාපෙන උපෙතෝ හොති සමුපෙතෝ උපාගතෝ සමුපාගතෝ උපපන්නෝ සම-පන්නෝ සමන්නාගතොතෙන වුච්චති ආතාපී**'' යනු දෙශනා ය. ''**කායික චෙතසිකසඞ්ඛාතෙන විරියාතාපෙන ආතා පවන්තෝ**'' යනු අට්ඨා ය.

සංවෙගිනෝ = සසර කළකිරුම් ඇත්තහු වටු.

භවාථ් යන ක්‍රියාරූපය මෙහි ඇද දැක් විය යුතු ය. ''**සභොත්තප්පං ඤාණං සංවෙගෝ නාම**'' භය සහිත වූ ඤණය **සංවෙග** නම්. ඉපදීම – මහලුවීම – රොගාතුරවීම – මැරීම – අතීතවෘත්ත – අනාගතවෘත්ත – වත්-මන් අහර සෙවුම යන මුන් පිළිබඳ දුක යන අෂ්ටවිධ සංවෙගවස්තූන් නිසා උපදවන බිය සහිත නුවණ සංවෙග යි දත යුතු ය. ලොකය ඉපැදුම් මහලු වීම් ඇ දුක් වලින් නිතර ඇවිළ ගත්තේ ය. කෙලෙසුන්ගෙන් ඇවිසුනේ ය. නො මග පිළිපන්නේ ය. ලොකය ස්ථිර නො වේ. රැකුම් රහිත ය. නැ ෘසන සුලුය ය. හැම කල් පවත්නේ නො වේ. හැර යා යුතු ය. සැඟීමට පත් නො වන්නේ ය. තෘෂ්ණාවට දස ය. යන මේ ඇ ද සංවෙග යට කරුණු ය.

මෙසේ උපදනා සංවෙගයෙන් භව ආදියෙහි කිසි රැකුමක් කිසි සැහ වුමක් කිසි පිළිසරණක් නො දක්නේ, එහි නො ලැඟුනු සිතැත්තේ, නිවණට නැමී සිටියේ, නිවණට බර වූයේ සමථ විදර්‍ශනාවන්හි යෙදුනේ, සංස්කාර ගත වූ සියල්ලෙහි කළකිරුණේ, නො ද ඇලුනේ **සවෙගී** නම් වේ. බහුත්වය **'සවෙගිනෝ'** යනු ය. ''**සංවෙගෝ අස්ස අත්ථීති = සංවෙගී**'' යනු දන්නේ ය.

සද්ධාය = ශ්‍රද්ධාවෙන් ද ඇදහීමෙන් ද විස්වස් කැබීමෙන් ද.

ලෞකික - ලොකොත්තර විසින් ශ්‍රද්ධාව දෙ පරිදි ය. එහි මග පල සිත්වල යෙදී සිටියා ලොකොත්තර ශ්‍රද්ධා ය. ඕ නිවන් අරමුණෙහි සිත පහදන්නී ය. ලොකය පිළිබඳ කුසල්සිත්හි යෙදුනා ලෞකික ශ්‍රද්ධා ය. ඕ තුණුරුවන් ගුණ ඇති සිත පහදන්නී ය. මෙහි මෙඳෙක ම ගැණේ.

සීලෙන ච = සීලයෙන් ද.

පාතිමොක්ඛ - ඉන්ද්‍රිය - ආජීව - පච්චයසන්නිස්සිත යි සීලය සිවු වැරදෑමී ය. එහි සික්ඛාපදසීලය පාතිමොක්ඛ නම්. මේ වනාහි සිල - සති - ඤාණ - ඛන්ති - විරිය යි සංවර විනය පසින් සංගෘහීත ය. ආපත්ස්කන්ධ විසින් පාරාජිකා - සංඝාදිසෙස-ථුල්ලච්චය - පාචිත්තිය - පාටිදෙසනීය දුක්කට - දුබ්භාසිත යි ආපත්ති ස්කන්ධ සතින් පරිමිත ය. ශික්ෂාපද විසින් දෙසිය සත් විස්සකින් නියමිත ය. මෙසේ මේ සීලය දෙසිය සත් විස්සක් සිකපදයෙන් නියමිත වුව ද ශික්ෂා විසින් කෙළවරෙක් නැත්තේය.

මේ සීලය, නැවත ආභිසමාචාරික - ආදිබ්‍රහ්මචරියක යි දෙ වැදෑරුම් ය. "අභිසමාචාරොති උත්තමසමාචාරො, අභිසමාචාරො එව අභිසමාචාරිකං, අභිසමාචාරං වා ආරබ්භපඤ්ඤත්තං, ආභිසමාචාරිකං, ආජීවට්ඨමකතො අවසෙසසීලස්සෙතං අධිවචනං, යානි වා සික්ඛාපදානි බුද්ධානුබුද්ධකානීති වුත්තානි ඉදං ආභිසමාචාරිකං සීලං, ඛන්ධකවත්තපරියාපන්නං වා ආභිසමාචාරිකං" යනු ආභිසමාචාරිකසීලය තේරූ සැටිය. කය වචන දෙක්හි උතුම් හැසිරීම, කය වචන දෙක්හි ජනප්‍රිය භාවය අභිසමාචාර නම්. ඒ ම ආභිසමාචාරික නමුදු වේ. නොහොත් අභිසමාචාර යි කියන සෝවාන් ඇ මගපල සඳහා පණවා වදළ ශික්ෂාපදසමූහය ආභිසමාචාරික නම් වේ. ආජීවට්ඨමක සීලයෙන් අන්‍ය වූ සීලය මෙයින් කිය වේ. නොහොත් කුඩා, ඉතා කුඩා පවිති, දුක්කට, දුබ්භාසිත යන ශික්ෂාපද, ව්‍යතික්‍රමණ නො කොට රැකීම ආභිසමාචාරිකසීලය යි ගණු ලැබේ. නොහොත් සුදු වග - මහවග දෙක්හි ආ කදුවත් පිරීම ආභිසමාචාරිකසීලය යි දන්නේ ය.

"මග්ගබ්‍රහ්මචරියස්ස ආදිභාවහුතන්ති ආදිබ්‍රහ්මචරියකං, ආජීවට්ඨමකසීලස්ස එතං අධිවචනං, තං හි ආදිභාවහුතං පුබ්බභාගෙයෙව පරිසොධෙතබ්බතො. තෙනෙවාහ "පුබ්බෙ ව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො පරිසුද්ධො හොතීති" මඟඔසඟ යි කියන ආර්‍යමාර්ගයට පැමිණෙනු සඳහා ආදියෙහි පිරිය යුතු බැවින් ආදිභාවහුත වූ සීලය ආදිබ්‍රහ්මචරියක නම් වේ. ඒ නම් සතුන් මැරීම - හොරකම් කිරීම-කාමයෙහි වරදවා හැසිරීම-බොරුකීම-කේලාම් කීම-පරුසඛස්බිණිම-නන්දෙඩීම - වැරදි දිවි පෙවෙත යන මෙයින් වැළකීම සඳහා සමාදන් ව ගන්නා ආජීවට්ඨමකසීලය යි. මේ සීලය මාඟියට පෙරටුව ම පිරිය යුතු බැවින්, පාරාජිකා - සඞ්ඝාදිසෙස යන මහාශික්ෂාපද ව්‍යතික්‍රමණය නො කොට රැකීම, හෙවත් භික්ෂු - භික්ෂුණී උභය-

විභඩ්ගයෙහි ඇතුළත් ශික්ෂාපද රැකීම ආදිබ්‍රහ්මචරියක නම් වේ, පාරාජිකාවිරති හා සඩ්සාදිසෙසවිරති මාඝීබ්‍රහ්මචරියාවට ආදි වූ බැවින් ආදි බ්‍රහ්මචරියකසීලැ යි දන්නේ ය.

මෙසේ ව්‍යවස්ථා කරණ ලද ශික්ෂාපදශීලය, ''පාතිමොක්ඛ සංවර''යි නම් කරණු ලැබේ. එසේ නම් කැරෙන්නේ කරුණු ඇති බැවිනි. මේ ඒ කරුණු ඉතාම කොටින්.

''යො නං පාති රක්ඛති තං මොක්ඛෙති ආපායිකාදීහි දුක්ඛෙහීති පාතිමොක්ඛං'' යම් සිලයෙක් තෙමේ තමන් රක්නහු අපායයන් පිළිබඳ දුක්වලට වැටෙන්නට නො දී ඒ දුක් වලින් රැක ගණී ද, එයින් මුදා ද එහෙයින් **පාතිමොක්ඛ** නම් ඒ.

''කිලෙසානං බලවභාවතො පාපකිරියාය සුකරභාවතො පුඤ්ඤකිරියාය ච දුක්කරභාවතො ච බහුක්ඛත්තුං අපායෙසු පතනසීලොති = පාති, පුථුජ්ජනො; තං පාතිනං සංසාර දුක්ඛතො මොක්ඛෙතීති = පාතිමොක්ඛං'' කෙලෙසුන්ගේ බලවත් බව හෙතු කොට, පව්කිරීමේ පහසුකමින් හා පින් කිරීමෙහි නොපහසුකමින් නොයෙක් වර අපායයෙහි හෙන සුලු වූයේ පාති ය. ඒ නම් පුහුදුන් සත්ත්වතෙමේ ය. මෙසේ අපායයෙහි හෙන ඒ පෘථග්ජන සත්ත්වයා සසරදුකින් මුදා නු යි **පාතිමොක්ඛ** නම් ඒ.

''අනිච්චතාය වා භවාදිසු කම්මවෙගක්ඛිත්තො සටියන්තං විය අනවට්ඨානෙන පරිඛමණතො ගමනසීලොති = පාති, මරණවසෙන වා තම්හි තම්හි සත්තනිකායෙ අත්තභාවස්ස පතන සීලොති වා = පාති, සත්ත සන්තානො, චිත්තමෙව වා, තං පාතිනං සංසාරදුක්ඛතො මොක්ඛෙතීති = පාතිමොක්ඛං'' අනිත්‍යභාවය හෙතු කොට හෝ කාළභවාදියෙහි කර්ම වෙගයෙන් බහාලන ලදු ව ලිඳෙන් පැන් නගනා ආඩියකු සේ සැලෙමින් කරකැවෙමින් හෙන සුලු වූයේ පාති ය. මරණ වශයෙන් හෝ, ඒ ඒ සත්ත්ව නිකායයෙහි අත්බව හෙලන සුලු වූයේ පාති ය. ඒ නම් සත්ත්ව සන්තානය ය. සිත ය. මෙසේ හෙන සුලු වූ සත්ත්වසන්තානය, සිත සසරදුකින් මුදා නු යි **පාතිමොක්ඛ** නම් ඒ.

''අථ වා අවිජ්ජාදිනා හෙතුනා සංසාරෙ පතති ගච්ඡති පවත්තතීති = පාති, තස්ස පාතිනො සත්තස්ස තණ්හාදී සංකිලෙසත්තයතො මොක්ඛො එතෙනාති = පාතිමොක්ඛං'' අවිද්‍යාදී වූ හේතුවෙන් සසරෙහි හෙන්නේ පාති ය. අවිද්‍යාදිහෙතුවෙන් සසරෙහි හෙන ඒ සත්ත්වයා තෘෂ්ණාදිසංක්ලෙශත්‍රයයෙන් මුදලීම **පාතිමොක්ඛ** නම්.

''අථ වා පාතෙති විනිපාතෙති දුක්ඛෙහීති = පාති, චිත්තං. තස්ස පාතිනො මොක්ඛො එතෙනාති = පාතිමොක්ඛං'' දුක් හෙතු කොට වැටෙන්නේ පාති ය. සිතයි. මෙයින් දුකෙහි වැටෙන්නහුගේ මිදීම වේ නු යි **පාතිමොක්ඛ** නම්.

"පතිති වා එතෙන අපායදුක්ඛෙ සංසාරදුක්ඛෙ වාති = පාති, තණ්හා දිසංකිලෙසො; තතො පාතිතො මොක්ඛොති = පාතිමොක්ඛං" මේ කරණකොට අපායදුකෙහි හෝ සසරදුකෙහි වැටෙන්නේ පාති ය. ක්ලෙශ ධර්මයි. ඒ තෘෂ්ණාදි සංක්ලෙශයන්ගෙන් මිදීම පාතිමොක්ඛ නම්.

"අථ වා පතති එත්ථාති පාතිනි = ඡ අජ්ඣත්තිකබාහිරායතනානි. තතො ඡ අජ්ඣත්තිකබාහිරායතනසඞ්ඛාතතො පාතිතො මොක්ඛොති = පාතිමොක්ඛං" මෙහි හේතු යි පාතිනිය. ෂඩ්විධ ආදධ්‍යාත්මිකබාහිරායතන යි. ඒ ෂඩ්විධආධ්‍යාත්මික බාහිරායතන සඞ්ඛ්‍යාත වූ පාතිහු කෙරෙන් මිදීම පාතිමොක්ඛ නම්.

"අථ වා පාතො විනිපාතො අස්ස අත්ථීති = පාති, සංසාරො; තතො මොක්ඛොති = පාතිමොක්ඛං" මෝ හට හිම ඇත්තේ නු යි පාති නම්. සංසාරය යි. ඒ සසරින් මිදීම පාතිමොක්ඛ නම්.

"අථ වා සබ්බලොකාධිපතිභාවතො ධම්මිස්සරො භගවා පාතිහි වුච්චති, මුච්චති එතෙනාති = මොක්ඛො, පාතිනො මොක්ඛො තෙන පඤ්ඤත්තොති = පතිමොක්ඛො, පතිමොක්ඛං එව = පාතිමොක්ඛං" සර්ව ලොකාධිපතිභාවයෙන් භාග්‍යවතුන් වහන්සේ පති යි කියනු ලැබෙත්. එයින් මිදේනු යි මොක්ඛ නම්. පති වූ බුදු රදුන්ගේ මොක්ෂය උන්වහන්සේ විසින් ම පණවන ලද යි පතිමොක්ඛ වේ. ඒ පතිමොක්ඛය ම පාතිමොක්ඛ නම්.

"සබ්බගුණභූතානං වා මූලභාවතො උත්තමට්ඨෙන පති ච සො යථා වුත්තත්ථෙන මොක්ඛො චාති = පතිමොක්ඛො, පතිමොක්ඛො එව = පාතිමොක්ඛං" සියලු ගුණයන්ට මුල් බැවින් උතුම් අරුතින් පති වූයේ ද හේ ම ය කියූ අරුත් විසින් ම මොක්ඛ වූයේ ද හේම නු යි පතිමොක්ඛ වේ. ඒ පතිමොක්ඛයම පාතිමොක්ඛ නම්.

මේ ශික්ෂාපදශීලය, තදඞ්ග විසින් සමාධි ප්‍රඥ සහිත වූයේ විෂ්කම්භන විසින් හා සමුච්ඡේද විසින් අතිශයින් මුදනු යි පාතිමොක්ඛ නම්.

ඒ ඒ ව්‍යතික්‍රමණදෙෂයන්ගෙන් වෙන් වෙන් ව මිදීම පතිමොක්ඛ ය යි. ඒ ම පාතිමොක්ඛ නම්.

නිවණට 'මොක්ඛ' යි නමෙකි. ඒ මොක්ඛයට පිළිබිඹු වූයේ පති මොක්ඛ ය යි. සුදුසු පරිදි කෙලෙස් නිවන බැවින් සීලසංවරය නිවණෙහි උදය දක්වන්නේ ය. නිවණෙහි පිළිබිඹු ය. හිරුගේ උදවීම දක්වනු අරුණා ලොකය සේ ය. ඒ මේ නිවණට පිළිබිඹු වූ පතිමොක්ඛය ම, සීලසංවර ය ම පාතිමොක්ඛ නම් වේ.

මොක්ෂය පිණිස පවත්නේ හෝ මොක්ෂයට අභිමුඛ වූයේ පතිමොක්ඛ ය යි. ඒ ම පාතිමොක්ඛ නම්.

මෙතෙක් කොටින් දක්වුනේ ශික්ෂාපදශීලය පාතිමොක්ඛ යි දක්වීමට පොතපතෙහි ආ යුතුකම් ය.

සංවර නම් ශික්ෂාපදව්‍යතික්‍රමණය නො වන සේ කායවාග්ද්වාරයන් රැක ගැණුම ය. කොටින් කිය හැක්කේ ශික්ෂාපද නොබිඳ රැක ගැණුම සංවර නම් බව ය. එ ද පාතිමොක්ඛ ම ය.

'සංවරති පදහති එතෙනාති = සංවරෝ'' යනු අරුත් හෙලි පෙහෙලි ය යි. මෙය සත් වැදැරුම් ආපත්තිස්කන්ධයන්ගේ අව්‍යතික්‍රමණය ලක්ෂණ කොට ඇත්තේ ය. ''සත්තන්නං ආපත්තික්ඛන්ධානං අවීතික්කම ලක්ඛණෝ සංවරෝ'' යනු අටුවා ය.

ආලොක අතුරෙහි සූර්‍යාලොකය ම මහත් ආලොකය වේ. පර්වත අතුරෙහි මහාමේරු පර්වතය ම මහත් පර්වතය වේ. ලෞකික ශීලසංවර අතුරෙහි ප්‍රාතිමොක්ෂසංවරය ම මහත් සංවරය වේ. අධික සංවරය වේ. උත්තමසංවරය වේ. බුඩොත්පාදයක ම ලැබිය යුත්තේ ය. බුදු රජුන් විසින් ම පැණවිය යුත්තේ ය. ශික්ෂාපද පැණවීම බුදුරජුන්ට විනා ශ්‍රාවකයන්ට විෂය නො වේ.

ඒ මේ ප්‍රාතිමොක්ෂසංවරශීලයට උපකාරකධර්ම වූයේ ආචාර ගොචර දෙක ය.

එහි ආචාර නම්, කයින් ශික්ෂාපද මැඩ ඉක්මවා නො යෑම ය. හෙවත් ත්‍රිවිධකායසුචරිතය ය. වචනයෙන් ශික්ෂාපද මැඩ ඉක්මවා නො යෑම ය. හෙවත් චතුර්විධ වාක් සුචරිතය ය. කයින් හා වචනයෙන් ශික්ෂාපද නො මැඩීම, නො ඉක්මවීම සප්තවිධකායවාක්සුචරිතය ය. කොටින් කිය හැක්කේ සියලු සීලසංවරය ම ආචාර නම් බව ය. එකල මානසිකාචාරය ද ගැණේ.

යම්කිසි පැවිද්දෙක් සිවුපසය ලබන්නට සිතා, හුණදඬු, කොළ, මල්, ගෙඩි, නහනසුණු (සබන්) දැහැටි නො දේ ද, තමන් පහත් තැන තබා, දයකයාගේ සන්තොෂය බලාපොරොත්තු වෙමින් වාටු බස් බිණීම, (වාටු කම්‍යතා) මුං ඇට ව්‍යඤ්ජනය සේ බොරු හැබෑ දෙකින් මුසු වූ ඇත්ත ටිකක් ඇති බොරුවෙන් ම ගහන වූ බස් බිණීම, (මුග්ගසුප්‍යතා) ගිහියන්ගේ සිත් ගැණීම පිණිස ඔවුන්ගේ කුඩා දරුවන් වඩා ලහට ගෙණ කිරිමවුන් දරුවන් නල වන්නා සේ නැලවීම, (පාරිභටිකතා) ගිහියන්ගේ ලියුම් පණිවිඩ ගෙණ යෑම ඊම, (ජඞ්ඝ පෙසනිකා) යන මෙයින් හෝ වෙදකම් කිරීම, නැකැත් කීම, වස්කවි සෙත්කවි කීම, බලිතොවිල් කිරීම, තෙල් නුල් මැතිරීම යනාදී වූ බුදුරජුන් විසින් ගැරහුනු වෙනත් අනික් වැරදි දිවි පෙවෙතින් හෝ දිවි අතා යවා ද, එසේ ජීවත් නො වීම ද ආචාර යි කියනු ලැබේ.

යම්කිසි පැවිද්දෙක් වැඩිමහලු තෙරුන් කෙරෙහි ගෞරවය හා යටත් පැවතුම් ඇති ව, වැඩිමහලු මහණුන් සිවුරෙන් හෝ සිරුරෙන් නො ගටා විලිබිය ඇති ව වෙසේ ද, වැඩිමහලු මහණුන් ඉදිරියෙහි නො සිටී ද, හිස වසා පොරවා නො ඉඳී ද, විහාර සීමාව තුළ දෙවුර වසා නො ඉඳී ද, අසුන්හි හිඳ වැඩිමහලු තෙරුන් හා කථා නො කෙරේ ද, වැඩිමහල්ලන් ඉදිරියෙහි පා වහන් නො දරා ද, ගම් වදනා කල මහල්ලන් පසුබා තෙමේ ඉදිරියෙහි නො යේ ද, ගැහැණුන් වසනා කාමර තුළට නො වදී ද, කුඩා ලමුන්ගේ ඇඟපත අත නො ගා ද, මනා කොට හැඳ පොරවා ද, දුටුවන් පහදනා යෑම ඊමෙන් හා වට පිට බැලීමෙන් සැදුනේ ද, යට හෙලා ලූ ඇස් ඇති ව සන්සුන් ඉඳුරන් ඇති ව යෑම් ඊම් කෙරේ ද, පමණ දැන වළඳා ද, නින්දෙහි නො ඇලුනේ ද, භාවනාවෙහි යෙදුනේ ද, සිහි නුවණින් යුක්ත වේ ද, ලද දෙයින් සතුටු වේ ද, වෙර වඩා ද, ආභිසමාචාරික වත් පිළිවෙත් පිරීමෙහි යෙදී වෙසේ ද ඔහුගේ මේ සදාචාර ප්‍රවෘත්තිය යහපත් පැවැත්ම ආචාර' යි කියනු ලැබේ.

යම්කිසි පැවිද්දෙක්, වැඩිමහලු මහණුන් විචාරා ම බණකීම්, පැණ විසඳුම්, පාමොක් උදෙසුම් කෙරේ ද, ගෞරවයෙන් නැඟී සිට කතා කෙරේද, ගෙවලට ගොස් ගැහැණියකට, කෙල්ලකට ''කිබෙන්නේ මොනවා ද, කෑද කිබේ ද, බත් කිබේ ද, කැවුම් කිබේ ද, කන්නට බොන්නට මොකුත් කිබේ දැ'' යි යන ආ ලෙසින් නො සරුප් බස් නො බෙණේ ද, ඔහුගේ මේ සදාචාර ඉණය ආචාර යි කියනු ලැබේ.

ගොචර නම්, මහණදම්ට අනතුරු කරණ තැන් නො සෙවුම නොබැහුම ය. සසුන් වත් යම්කිසි පැවිද්දෙක් වෙසහනන් වසනා තැනට, වැන්දඹු ගැහැණුන් වසනා තැනට, සැමියන් බැහැර ගිය ගැහැණුන් වසනා තැනට, වැඩිවිය පැමිණ දීග නො ගොස් ගෙයි වැඩෙනා තරුණ ගැහැණුන් වසනා තැනට, නො සන්සුන් කෙලෙස් ඇති රාගය ඇසුරු කළ බස් බණන නපුංසකයන් වසනා තැනට, මෙහෙණන් වසනා තැනට, නො යේ ද, බෙබද්දන් හැසිරෙණ මත්පැන් හලට නො යේ ද, රජුන් හා රජ ඇමතියන් හා තීර්ථකයන් හා තීර්ථශ්‍රාවකයන් හා එක් ව නො වෙසේ ද, තුණුරුවන්හි ඇදහිලි නැති, කම්පල නො අදහන, බික්සඟ ඇ සිවු පිරිසට ගරහන, ඒ පිරිස් බිය ගන්වන, අවැඩ කරණා, සැදෑ නැති කුල සෙවනය නො කෙරේ ද, මේ, මහණුන් පිළිබඳ නුසුදුසු තැන් නො සෙවූ ම, ඇසුරු නො කිරීම ගොචර යි කියනු ලැබේ.

ගොචරය, උපනිස්සයගොචර-ආරක්ඛගොචර-උපනිබන්ධගොචර යි තුන් වැදෑරුම් ය.

එහි උපනිස්සයගොචර නම්, අප්පිච්ඡකථා ආදි දසවිධ කථාවනට පිහිට වූ සීලාදිගුණ යුත් කල්‍යාණමිත්‍රයා ය. යම් කලණමිතුරකු ඇසුරු කිරීමෙන් පෙර නො ඇසූ විරූ දහම් අසා ද, පෙර ඇසූ විරූ දහම් නැවත

නැවත පිළිවිසීමෙන් පිරිසිදු කෙරේ ද, සෑක තැන නිසැක කර ගණී ද, සිය දිටු ඇද හැර ගණී ද, කම්පල අදහා ද, තුණුරුවන්හි පහන් වේ ද, රූ අරූ දහම් තතු දැන සම්දිටු ඇද හරී ද, නම් රූ දහම් හට ගැණීමෙහි හෙතු හා එයින් හට ගත් දහම් මැනැවින් දැන ඉකුත් කල්හි හා මතු එන් කල්හි හා දැන් පවත්නා කල්හි හා යන තුන් කල්හි සැක දුරු කර ගණී ද, උදය-ව්‍යය ඥානාදීන්ගේ වශයෙන් විදසුන් වඩා ආර්‍යභූමියට පැමිණ ස්ථිරශ්‍රද්ධාවෙන් තුණුරුවන්හි සිත පහදවා ගණී ද, ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥ යන පංච විධ ධර්මයන්ගෙන් තෙමේ වැඩේ ද, යන මේ හැමට කරුණු වූ ඇදුරු, මෙහි කලණමිතුරු නම් වේ. උපනිස්සයගොචර ද මේ ය.

ආරක්ඛගොචර නම්, ඉඳුරන් සංවර කර ගැණුම ය. ශාසනික භික්ෂු තෙමේ ගමට හෝ වීථියට වන් කල්හි යට හෙලාලූ ඇස් ඇති ව වියදඬු පමණ බලමින් ඇස්, කන්, නාස් ඇ සයිඳුරන් මොනවට රැක ගණිමින් යේ ද, ඇත්, අස්, රිය, පාබල සෙනහ, ගැහැණු, පිරිමි යන මොවුන් දෙස නො බලා, වට පිට නො බලා යේ ද, මහණහු පිළිබඳ මෙබදු වූ ඔබ් නොබ බැලීම් ආදී වූ අසංවරයට ඉඩ නො තබන ස්මෘතිය ම ආරක්ඛ ගොචර නම් වේ යි දත යුතු ය.

උපනිබන්ධගොචර නම්, යොග කරණ මහණහුගේ භාවනා චිත්තය අතන මෙතන යා නො දී බැඳ තැබීමට කරුණු වන අරමුණ ය. එනම් සිවු සිවටන් ය. **''කො ච භික්ඛවෙ! භික්ඛුනො සතතා පෙත්තිකො විසයො, යදිදං චත්තාරො සතිපට්ඨානා''** යනු දෙශනා ය. ''මහණෙනි! මහණහුට සිය පිය සතු ගොදුර කුමක් ද?' මේ සිවු සිවටන් ය'' යනු එහි සිංහලය යි.

පරමාණු පමණ වූ වරදෙහි බිය දැකීම, ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් නො ගිලිහී සිටීමට කරුණු වේ. පරමාණු පමණ වූ වරද නම්, නො දැන සිහි නැති ව සෙඛියාසික්ඛාපද මැඩ ඉක්මවා සිටීම හා අකුසල් සිත් ඉපදවීම ඇ ය. බිය දැකීම නම්, පරමාණු පමණ වූ වරද එක් ලක්ෂ අටසැට දහසක් යොදුන් උසැති මහමෙරපව්ව වැනි කොට දැකීම ය. ගැණීම ය. තැත, දුර්භාෂිතමාත්‍ර වූ වරද පාරාජිකාපත්තියක් වැනි කොට ගැණීම ය. මෙසේ ස්වල්පමාත්‍රවූ වරද මහත්කොට සිතා එයින් බියට පත්වන බව, පරමාණු පමණ වූ වරදෙහි බිය දැකීම ය. දුර්භාෂිතමාත්‍රය පාරාජිකාපත්තියක් වැනි කොට සිතන්නේ ම ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් නො ගිලිහී සිටීයි.

යම් හෙයකින් ප්‍රාතිමොක්ෂසංවරශීලයෙන් මහණ තෙමේ මේ සසුන්හි පිහිටා ගණී ද, එහෙයින් එය පතිට්ඨා නම්. **''සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤො, පතිට්ඨා මහාරාජ! සබ්බෙසං කුසලානං ධම්මානං, සීලෙ පතිට්ඨිතස්ස බො මහාරාජ! සබ්බෙ කුසලා ධම්මා න පරිහායන්ති''** යනාදී දෙශනාප්‍රදෙශයන්ගෙන් මැනවින් ඔප්පු වේ.

ඒ මේ ශීලය, පූර්වොත්පත්තිඅර්ථයෙන් ආදි නම් වේ. කියන ලද ම ය, ඒ. ''තස්මාතීහත්වං බත්තිය! ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු, කො වා දි කුසලානං ධම්මානං? සීලං ච සුවිසුද්ධං දිට්ඨි ච උජුකා'' යි.

නුවරක් ඉදි කරණ වඩුවා පළමු කොට නුවර පිණිස සුදුසු තැනක් සොයයි. සොයා එතැන පිරිසිදු කෙරෙයි, පසුව එහි දෙ මං හන්දි, තුන් මංහන්දි, සිවු මංහන්දි පිහිටුවයි. එමෙන් යොගාවචර තෙමේ මුලින් ම සිල් පිරිසිදු කරයි. ඉන් පසු පිළිවෙළින් සමාධි, විදර්ශනා මාර්ග, ඵල, නිර්වාණයන් ප්‍රත්‍යක්ෂ කරයි.

රදවා රෙදි සායම් කිරීමේ දී පළමු කොට කෘරම් දියක් යොදා රෙදි සෝදා පිරිසිදු කරයි. නැවත රෙදිවල තමන් කැමැති සායමක් ගන්වයි. සිතියම් ඇඳීමෙහි සමත් සිත්තරා රූපයක් බිත්තියෙහි ඇඳීමට පළමු, එහි කළ යුතු පිරියම් කරයි. එ මෙන් ශාසනාවචර කුලපුත්‍ර තෙමේ පළමු ව සිල් පිරිසිදු කරයි. පසුව සමථවිදර්ශනාදිධර්ම අත්පත් කරයි. එ හෙයින් ප්‍රාතිමොක්ෂසංවරශීලය, ආදි යි කියනු ලැබේ.

දෙපා කැඩුනු නෙනෙකුට ගමන් බිමන් කිරීමෙහි කැමැත්තෙක් නො වන්නේ ය. ගමන් බිමන් කිරීමෙහි කැමැත්තක් උපදිනු දෙපා ඇත්තකුට ම ය. එමෙන් යමකුගේ ශීලය කැඩී බිඳී ගියේ ද, සම්පූර්ණ නො වූයේ ද, ඔහුට නිවන් යනු පිණිස ඤාණගමනෙක් නො වන්නේ ය. එහෙයින් මේ ම වරණයි කියනු ලැබේ.

සංයම විසින් සඤ්ඤම නම්. සංවර විසින් සංවර නම්. සික පද මැඩ ඉක්මවීම් වශයෙන් සිල්වත්හට සැලෙන්නට, කැපෙන්නට නො දේ නු යි සඤ්ඤම නම්. සිකපද මැඩ ඉක්මවා සිටී මේ ප්‍රවේශද්වාරය වසා නු යි සංවර නම්.

සත්ත්වයන් විසින් ගණු ලබන ආහාරය කටින් ඇතුල් ව කුදුමහත් සිරුරු අවයව පැකිර ගන්නා සේ යොගාවචරයාගේ චාතුර්භූමිකකුශලය සිල් නැමැති මුවින් ඇතුල් ව උභයාර්ථසංසිද්ධිය සම්පාදනය කරණ බැවින් මුඛ යි කියනු ලැබේ.

චාතුර්භූමිකකුශලයන්ගේ පිළිලැබීම පිණිස පෙරටු ව ගමන් කරණ බැවින් පමුඛ යි කියනු ලැබේ. ශ්‍රේෂ්ඨ ය, ප්‍රධාන ය යන අරුත් ය.

මේ ශීලය, විනයයෙහි දක්වෙන පරිදි ඡත්තිචතුර්ථකර්මවාක්‍ය සඞ්ඛ්‍යාතප්‍රඥප්තිබලයෙන් ම ඉතිරි නො කොට පිහිටන්නේ ය. එසේ පිහිටි සිල් ඇත්තේ ම පාතිමොක්ඛසංවරසංවුත යි ගැණේ.

ප්‍රාතිමොක්ෂසංවරශීලය, ශ්‍රද්ධාවෙන් සම්පාදනය කළ යුතු ය. ශ්‍රද්ධාව ම එයට සාධනය වේ. එහෙයින් බුදුරජුන් පැණ වූ සිකපද අඩු වැඩි නො කොට ශ්‍රද්ධාවෙන් ම ජීවිතයෙහි ද ආඥාව දුරර මැනවින් රක්ක යුතු ය.

බලනු මැනවි. මහාවත්තනි නම් වනපෙදෙසෙහි සොරුන් විසින් තලවැලින් බැඳ දමා ගිය එක් ස්ථවිර නමක් වැල නොකඩා සත් දිනක් එහි ම වැටී හෙව විඳසුන් වඩා අනාගාමී ව කලුරිය කොට බඹලොව උපන් තේ ය.

මෙම සිරිලක්දිව එක්තරා මහවනපෙදෙසක එක් භික්ෂූන්වහන්සේ නමක් භාවනාවෙහි යෙදී හුන්හ. ඒ අතර එහි යනෙන සොරු උන්වහන්සේ දැක අල්ලා රසකිඳ වැලින් බැඳ දමා ගියහ. එ වේලෙහි එහි ම හට ගත් ලැව්ගින්නෙන් වනය දැවෙන්නට විය. එහෙත් උන්වහන්සේ කිඳි වැල බිඳේය යන බියෙන් නො නැගිට එහි ම වැකිර භාවනා කරන්නෝ ගින්නට අසුවී දැවී මිය ගිය හ. ඒ දම රහත් පලයට පැමිණියහ. මෙසේ රහත් වූ කෙණෙහි ම පිරිනිවන් පාන්නෝ **ජීවිතසමසීසි** යි කියනු ලැබෙත්. එහෙයින් උන්වහන්සේ ද ජීවිතසමසීසි නම් වූහ. එද ඒ වන මගින් වඩනා දීඝභාණක අභය මහා තෙරණුවෝ එය දැක සිරුර ආදහනය කොට ධාතු ගෙණ සැයක් කර වූහ. එ හෙයින් අනික් සැදහවත් කුලපුත් තෙමේ ද එසේ කරන්නේ ය.

''පාතිමොක්ඛං විසොධෙන්තෝ අප්පෙව ජීවිතං ජහේ,
පඤ්ඤත්තං ලොකනාථෙන න භින්දේ සීලසංවරං''

පාමොක් රකිනුයේ දිවි ගැලවී ගිය ද මනා යි සිතා බුදුරජුන් විසින් පණවා වදළ සිකපද නො බිඳින්නේ ය.

''**පහාරාද! යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං, තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති**'' යි තම ශ්‍රාවකයන් ගැණ තමන් වහන්සේගේ පිළිගැණීම මෙසේ දක්වා වදළ බුදු රජානන් වහන්සේගේ සසුන්හි මහලු පැවිදි ලත් ශ්‍රාවකයන් විසින් ජීවිතපරිහරණයෙහි කාලික වූ සුලු පහසුකම් සලකා දුර්භාෂිතමාත්‍ර වූ ශික්ෂාවක් ද නො ඉක්ම විය යුතු ය. සිල්වත් මහණහුට ඉතා කුඩා ශික්ෂාවකුත් ඉක්මවා සිටින්නට අවසර නැත්තේ ය. ''පහාරාදය! මහාසමුද්‍රය වෙරළ ඉක්මවා නො යන්නා සේ මාගේ ශ්‍රාවකයෝ මා විසින් පැණ වූ පිකපදයක් ජීවිතය නිසාවත් ඉක්මවා නො යන්නාහ'' යනු ඒ පාලිපෙදෙයෙහි කෙටි තේරුම ය.

එහෙත් ඇතැම් මහණෝ සසුන් දහම් ලිහිල් කොට ගෙණ සිවුපසය තර කොට ගෙණ ''කම්සැප විඳුනා ගිහින් සේ ශාසනික භික්ෂූන් වහන්සේ ද කාලයට ගැළපෙන සේ, දෙශයට ගැළපෙන සේ, සමාජයට ගැළපෙන සේ හැඩ ගැසිය යුතු ය, පෙළ ගැසිය යුතු ය, ගමන් කළ යුතු ය'' යි කියති. 'ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද මකා දැමිය යුතු ය'' යි කියති. ''අනුන්ගෙන් කෙරෙණ දිවි පැවැත්ම උසස් අදහස් නැති කරන්නේ ය'' යි කියති. ''පිඩු සිහා වැළඳීම ආත්මගෞරවය නසන්නකැ'' යි කියති, **ආකඩ්ඛමානෝ සඞ්ඝෝ මමවචනෙන බුද්ධානුබුද්ධකානි සික්ඛාපදානි සමූහන්තූ**'' යන දෙශ-

නාවට පටහැනි අරුත් පළ කොට දහම් නො දහම් කරති. නො දහම් දහම් කරති. විනය අවිනය කරති. අවිනය විනය කරති. "මාගේ අවැමෙන් සඩ්ඝ තෙමේ කැමැත්තේ නම් ක්ෂුද්‍රානුක්ෂුද්‍රශික්ෂාපද සමූහනය කෙරේවා" යි බුදුරජානන් වහන්සේ වදළෝ, සඩ්ඝයා පිළිබඳ ප්‍රඥප්තිය තර කරණු සඳහා මුත්, ශික්ෂාපද මකා දැමීමට ඉඩ තබනු පිණිස නො වේ. මේ අනුශාසනය ශික්ෂාපද මකා දැමීමට කළ අනුශාසනාවක් වේ නම් "**සඤ්චිච්ච බුද්දනුබුද්දකානි සික්ඛාපදානි පරිමද්දති, ආපත්ති නිගූහති, අගතිගමනං ච ගච්ඡති, රිදිසො චුච්චති අලජ්ජිකි**" යනු නො එන්නේ ය. "දැන දැන කුදු මහත් සුලු සුලු ඇවැත් මැඩීම, පැමිණි ඇවැතින් නො නැගී ඇවැත් වසා ගෙණ සිටීම, ඡන්දදියෙන් අගතියට යෑම යන මෙයින් යුක්ත වූයේ, අලජ්ජි යි කියනු ලැබේ" යනු එහි සිංහලය. පූර්වොක්ත දෙශනා වෙහී අරුත්, මේලොව සාමාන්‍යජීවිතයෙහි ලා වරදවා ගන් වන අලජ්ජීහු කුදු මහත් සිකපද මඩිමින් සසුන නසන්නෝ ය.

ලොකය, මිථ්‍යාග්‍රහණය අනුව ගියේ නම්, ආභිසමාචාරිකසීලය සසුනෙන් ගිලි හෙන්නේ ය. ආභිසමාචාරිකසීලය ගිලි හී ගිය කල්හි, ආදිබ්‍රහ්ම චරියකසීලය අතුරුදහන් වූ කල්හි එයින් සසුන ද නැසෙන්නේ ය. "**සො වත භික්ඛවෙ! භික්ඛු ආභිසමාචාරිකං ධම්මං අපරිපූරෙත්වා ආදි බ්‍රහ්මචරියකං ධම්මං පරිපූරෙස්සතීති නෙතං ඨානං විජ්ජති**" යනු දෙශනා ය. ආභිසමාචාරිකසීලය නො පුරන්නේ, ආදි බ්‍රහ්මචරියකසීලය පුරන්නේ ය යනු කිසිලෙසකින් නො විය හැක්කේ ය යනු මෙයින් පැහැදිලි ය. ආභිසමාචාරිකසීලය පුරන්නේ ම ආදිබ්‍රහ්මචරියකසීලය පුරන්නේ ය යනු ආගමිකනිෂ්ඨා ය. එහෙයින් බුදුරජුන් වදළ කිසිත් සිකපදයක් කාලානුකූල ව වේව යි දෙශානුකූල ව වේව යි සමාජානුකූල ව වේව යි අන් කිසිවක් පිණිස වේව යි කිසිවකුටත් වෙනස් කිරීමට වත් අන් අතකට පෙරළීමට වත් මකා දැමීමට වත් අවසරයෙක් නැත්තේ ය.

"**ලජ්ජී රක්ඛිස්සන්ති, ලජ්ජී රක්ඛිස්සන්ති**" යි වදළ වචනයන්ගෙනුදු ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපදයන්ගේ අසමූහනය ම නො මුකා හැරීම ම අභිමත වේ. ආභිසමාචාරිකසීලයට අයත් ශික්ෂාපදයන්ගේ රැකීමෙන් ම භික්ෂූන් වහන්සේ ලජ්ජී වන බැවින් එකී ශික්ෂාපදයන්ගේ පැවැත්ම ශාසනාන්තර්ධානය තෙක් එසේ විය යුතු ම ය. ආභිසමාචාරිකසීලයපිරිමෙන් ලජ්ජී භාවයට පැමිණි භික්ෂූන් වහන්සේ ම සසුන් රකින්නෝ ය යි වදළ බැවින් සසුන්හි නො නැස ම, කල් පැවැත්ම ලජ්ජී භික්ෂූන් වහන්සේ නිසා ම මුත් කාලයට දෙශයට සමාජයට අනුකූල වන්නන් වෙනස් වන්නන් නිසා නො වන්නේ ය. එහෙයින් සදසත් ලොකය කාලයට දෙශයට සමාජයට යටත් ව ආත්මපොෂණය පිණිස සිකපද මැඩීමෙන් අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තිවල යෙදුනවුන්ගේ මිථ්‍යාග්‍රහණයට අසු නො විය යුතු ය. මිලින්ද ප්‍රශ්නයෙහි ශික්ෂාසමූහනප්‍රශ්නය බලනු.

ප්‍රාතිමොක්ෂසංවරශීලය දෙශනාශුඩි යි කියනු ලැබේ. ඇවැත් දෙසි-මෙන් පිරිසිදු වන බැවිනි. පාචිත්තියාදී ඇවැත් දෙසීම පමණින් ද, සඞ්ඝා දිසෙස ඇවැත් සහමැද දෙසා පරිවාස-මානත්ත-අබ්භාන කර්මයන් කර ගැණීමෙන් ද වරදට පත් වූ වහුට පිරිසිදු විය හැකි ය. පාරාජිකාපත්තින්ට පෑමිණියහුට කිසි ලෙසකිනුත් පිරිසිදු නො විය හැකි ය.

ඉන්ද්‍රියසංවරසීල නම්, ලොභාදී වූ කෙලෙස් නූපදනා ලෙසට සවැ-දැරුම් ඉඳුරන් රැක ගැණුම ය. ඇස්, කන්, නාස් ඇ දෙරටු සයින් එකෙක හමු වන රූප, ශබ්ද, ගන්ධාදී අරමුණෙක එල්ඛ පිළිවෙළින් ජවන් සිත් පහළ වන අවස්ථාවෙහි ඇස්, කන්, නාස් ඇ දෙරටුවල ඉපදිය හැකි ජවන් සහිත වූ කෙලෙසුන් කෙරෙන් සිත මුදු ගැණීමට කරුණු වූ සිහියෙන් සිදු කරණ සීලය, ඉන්ද්‍රිය සංවරසීලය යි දත යුතු ය.

සතිසාධක වූ ඒ මේ සංවරය චක්ෂුරාදිඉන්ද්‍රියයන්ගේ මාර්ගයෙන් රූපාදිඅරමුණු නිමිත්කොට සිතෙහි කෙලෙස් ඉපදීම වළකන්නේ ඉන්ද්‍රිය සංවරසීල නම් වි ය. මෙ කී සංවරය ජවනාවස්ථාවෙහි උපදින්නේ ද චක්ඛුන්ද්‍රියසංවරය, සොතින්ද්‍රියසංවරය යන ඇ ලෙසින් ඉන්ද්‍රියයන්ගේ වශයෙන් ව්‍යවහාර කරණු ලැබේ.

චක්ෂුරාදිඉන්ද්‍රියයන්ගේ අසංවරය හෙතු කොට ඒ ඒ පුද්ගලයන් කරා රාග ලෙඝ මොහාදිලාමකඅකුශල ධර්මයෝ ලුහු බැඳ එන්නාහ. ඔවුන්ගේ ඒ ලුහු බැඳීම වළකන්නේ ඉන්ද්‍රියසංවරසීලය යි.

නිමිත්තග්ගාහය හා අනුබ්‍යඤ්ජනග්ගාහය ඉන්ද්‍රියසංවරයට අහිත ය. පටහැනි ය. එයින් ඉන්ද්‍රියසංවරයෙක් නොවන්නේ ය. ඉන්ද්‍රියසංවර-යෙක් ඇත්තේ නම් එ ද නැසෙන්නේ ය.

නිමිත්තග්ගාහ නම්, පියවුරු ඇ ගැණු නිමිති, දැළි රැවුලු ඇ පිරිමි නිමිති කෙලෙස් ඉපදීමට හෙතුවන අත් නිමිති හෝ ඇසින්, කණින් නැහැ යෙන්, දිවෙන්, සිරුරෙන් සිතින් ඇද ගැණීම ය.

අනුබ්‍යඤ්ජනග්ගාහ නම්, ක්ලේශධර්මයන් ප්‍රකටභාවයට පමුණුවන අත්, පා, සිනා, කියුම්, බැලුම් ඇ පිළිගැන්ම ය.

නිමිත්තග්ගාහය හා අනුබ්‍යඤ්ජනග්ගාහය ඉන්ද්‍රියසංවරයට කරුණු නො වන බැවින්, සසරබිය දක්නා නුවණැත්තෝ එ දෙක ම නො ගන්නෝ ය. හුඳක් දුටු දෙය දුටු පමණින්, ඇසූ දෙය ඇසූ සැටියෙන් ගන්නෝ ය. සලකන්නෝ ය. ශුභ විසින් නො ගන්නෝ ය. අශුභ විසින් ම ගන්නෝ ය.

එ ද මිහින්තලා මහවෙහෙර විසූ මහාතිස්ස මහා ස්ථවිරයන් වහන්සේ දවසෙක අනුරාධපුරයට පිඬු සිහා ගියහ. අනුරාධපුරයෙහි සිට එක් ගැහැ-ණියක් තම භිමියා සමග කොලහල කොට "මළ ඉලව දිග කැමට වඩා

එකලා ව හිඳිම යහපතැ'' යි සලකා ඇද පැලඳ ගෙණ මගට බැස මිහින් තලය බලා යන්නී ය, ඈ මග දී මහාකිස්ස තෙරුන්ට මුණ ගැසුණා ය. සන්සුන් ඉඳුරන් ඇති ව පාරේ වඩිනා උන්වහන්සේ දුටු ඈගේ සිත්හි කාමාශාවක් උපන. ඕ එයින් තෙරුන් පොළඹවන්නට සිතා දත් පෙන්වා මහ හඬින් සිනාසුනා ය. මුල් කමටහන මෙනෙහි කරමින් මග වඩිනා තෙරුන් වහන්සේ, ඒ කිමැ යි බලනුවෝ, ඇගේ දත් ඇට දැක ස්වකීය අස්ථිකකර්මස්ථානය සිතට නැඟී ඊමෙන් විඳසුන් වඩා රහත් වූහ. මේ බව මෙසේ කීහ.

''තස්සා දන්තට්ඨිකං දිස්වා පුබ්බසඤ්ඤං අනුස්සරි,
තත්ථෙව සො ඨිතො ථෙරො අරහත්තමපාපුණි'' යි.

ඇගේ හිමියා ඇය සොයා යන්නේ මග දී තෙරුන් දැක ''ස්වාමීනි! මෙහි ගැහැණියක් ගියා ද'' යි ඇසි ය. එවිට තෙරුන් වහන්සේ

''නාභිජානාමි ඉත්ථී වා පුරිසො වා ඉතො ගතො,
අපි ච අට්ඨිසඞ්ඝාටො ගච්ඡතෙ ස මහාපථෙ'' යි

එයට පිළිතුරු දුන්හ. ''මෙ තැනින් ගැහැණියක් ගියා ද, පිරිමියෙක් ගියේ ද යි මම නො දනිමි, එහෙත් මේ මහමගැ ඇට ගොඩක් නම් ගියේ ය, යනු එහි සිංහල ය.

ඉන්ද්‍රියසංවරසීලය සිහියෙන් සම්පාදනය කළ යුතු ය. එහි සාධනය සිහිය යි. ඉන්ද්‍රියයන් සිහියෙන් රැක ගත් විට අභිධ්‍යාදි පාපධර්මයෝ උන් කරා නො එන්නෝ ය.

''වරං භික්ඛවෙ! තත්තාය අයොසලාකාය ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය චක්ඛුන්ද්‍රියං සම්පලිමට්ඨං නත්වෙව චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු අනුව්‍යඤ්ජනසො නිමිත්තග්ගාහො'' ''මහණෙනි! ගින්නෙන් දිලෙන ගිනි දැල් සහිත යකඩ හුලකින් ඇස මදින ලද්දේ උතුම් ය, ඇස මැදීම හොඳ ය, ඇසින් දැක්ක යුතු වූ රූපයන්හි කුඩා ලකුණු ගැණීම් විසින් වත් නිමිති ගැන්ම උතුම් නො වේ, හිතකර නො වේ'' යි වදළ ආදිත්ත පරියාය සූත්‍රදෙශනාව සිහියට ගෙණ රූපාදී අරමුණුවල ඇස් කන් නාස් ඇ දෙරටුවල පැවැති සිත් අභිධ්‍යාවාදීන් විසින් ලුහු බැඳ යා හැකි නිමිති ගැණුම නො මුළා වූ සිහියෙන් වළකාලමින් මේ ඉන්ද්‍රියසංවරසීලය මොන වට රැක ගත යුතු ය. ඉන්ද්‍රියසංවරසීලය යම් ලෙසකින් නොරැකිනි නම්, ප්‍රාතිමොක්ෂසංවරසීලයත් වැට නැති ගොයමක් සේ නො රැකෙන්නේ ය. කල් නො පවත්නේ ය. දෙර හළ ගම්, සොරුන් විසින් පැහැර ගණු ලබන්නා සේ, කෙලෙස් සොරුන් විසින් පැහැර ගණු ලබන්නේ ය. මනා කොට සෙවෙණි නො කළ ගෙය වැසි දියෙන් තෙමී යන්නා සේ රාගයෙන් තෙමෙන්නේ ය. මේ බලන්න මේ විදළ සැටි.

"රූපෙසු සද්දෙසු අථෝ රසෙසු
ගන්ධෙසු එස්සෙසු ච රක්ඛ ඉන්ද්‍රියං,
එතෙහි ද්වාරා විවටා අරක්ඛිතා
හනන්ති ගාමං ච පරස්සහාරිනෝ"

"යථාගාරං දුච්ඡන්නං වුට්ඨි සමති විජ්ඣති,
එවං අභාවිතං චිත්තං රාගෝ සමති විජ්ඣති" යනු.

ඉන්ද්‍රියසංවරසීලය රැක ගත් විට වැට කටු බැඳ රැක ගත් ගොයම සේ ප්‍රාතිමොක්ෂසංවරසීලය රැකුණේ වේ. කල් පවත්නේ වේ මනා ව දෙරගුල් ලූ ගම, සොරුන් විසින් නො පහරණු ලබන්නා සේ ම ප්‍රාතිමොක්ෂසංවරසීලය කෙලෙස් සොරුන් විසින් පැහැර ගණු නො ලැබේ. හොඳට සෙවෙණි කළ ගෙය වැස්සට නො තෙමෙන්නා සේ සිත රාගයෙන් නො තෙමෙන්නේය ය යනුත් දත යුතු ය.

සිත වහා පෙරළෙන සුලු ය. ඒ පෙරළීම ද රාගාදීන්ගේ වශයෙන් නොයෙක් අවස්ථාවනට පෙරළෙන්නේ ය. කලෙක රාගයෙන් මැඩෙන්නේ ය. කලෙක මොහයෙන් මැඩෙන්නේ ය, කලෙක මානයෙන් මැඩෙන්නේ ය. මෙසේ, සිත නොයෙක් කෙලෙසුන්ගේ වශයෙන් වහා පෙළෙන්නේ ය. යම් විටෙක සිත රාගයෙන් පෙරළුනේ ද, හෙවත් සිතෙහි රාගය උපන්නේ ද, එවිට අශුභය මෙනෙහි කිරීමෙන් ඒ රාගය දුරු කොට ඉන්ද්‍රිය සංවරය රැක ගත යුතු ය. මෙසේ ම සිතෙහි පහළ වන අන් කෙලෙස් ද ඔවුන් මැඩීමට දුරුකිරීමට පොහොසත් වූ ධර්ම මෙනෙහි කිරීමෙන් දුරු කොට ඉන්ද්‍රියසංවරය රැක ගත යුතු ය. ඒ වග ආගමය කියන්නේ මෙසේ ය.

වඩ්ඪීස ස්ථවිරයන් වහන්සේ මහණ වූ අළුත ම ආනන්ද මහාස්ථවිරයන් වහන්සේ හා පිඬු සිහා යන්නෝ අතරමග දී ගැහැණියක දැක උපන් රාගය ඇත්තෝ.

"කාම රාගෙන ඩය්හාමි චිත්තං මෙ පරිඩය්හති.
සාධු නිබ්බාපනං බ්‍රූහි අනුකම්පාය ගොතම"

යි කීහ. "මම කාමරාගයෙන් දැවෙමි, මාගේ සිත කාමරාගයෙන් දැවේ. ගෞතමය! එය නිවන සැටියක් කරුණා කොට කියනු මැනවි" යනු අරුත් ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ,

"සඤ්ඤය විපරියෙසා චිත්තං තෙ පරිඩය්හති,
නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං,
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං,
සඞ්ඛාරෙ පරතො පස්ස දුක්ඛතො නො ච අත්තතො,
නිබ්බාපෙහි මහාරාගං මා ඩය්හන්ථෝ පුනප්පුනං"

යනු කීහ. ''විපරීත කල්පනාව නිසා තාගේ සිත රාගයෙන් දූවේ, රාගය ඉපදීමට හේතු වූ ශුභාලම්බනයන් සිතට නොා ගණුව, සියලු සංස්කාරයන් පර වශයෙන් දුක් වශයෙන් බලව, ආත්ම වශයෙන් නොා බලව, එසේ කොට තා සිත නැගී ඇති මහාරාගය නිවාලව, එයින් නැවත නැවත නොා දූවෙව'' යනු අරුත්ය. මේ බණට නැමී ගත් වඩ්ගීස ස්ථවිරයෝ රාගය සිතින් දුරු කොට ම පිඬු සිහා ගියහ.

මේ ලක්දිව එදා කරඬුලෙන නම් විහාරයෙක් විය. එහි විපස්සි ආදී බුදුරජුන් සත් නමකගේ ගිහිගය හැර යෑමේ කතා පුවත විසිතුරු ලෙසට සිතියම් කොට තුබුනේ ය. දවසෙක එම වෙහෙර බලන්නට බොහෝ භික්ෂූහු එහි පැමිණියහ. ඔවුහු එහි ඇඳ තුබූ සිතියම් දැක ''ස්වාමීනි! වෙහෙර ඇඳ ඇති සිතුයම් සිත් ගන්නේ ය'' යි එහි වැඩහුන් චිත්ගුත්ත ස්ථවිරයන් වහන්සේට දැන් වූහ. ''ඇවැත්නි! එසේ ද, මම හැට අවුරුද්දක් පෙර සිට මෙම ලෙනෙහි වෙසෙමි. එහෙත් මෙහි සිතියම් ඇති බවක් මම දැන නොා සිටියෙමි, අද ඇස් ඇති ඔබ වහන්සේලා නිසා ඒ දැන ගතිමි'' යි උන්වහන්සේ කීහ. චිත්තගුත්ත ස්ථවිරයන් වහන්සේ කිසි විටෙකත් ඇස ඇර උඩ නොා බැලූහ. එහි ලෙන් දෙරකඩ තුබූ නාගස, බීම වැටී තිබෙනා මල් රේණු දක පිපියේ වනැ යි සිතනු විනා කිසි දවසෙකත් නාගස උඩ නොා බැලූහ. මාගම විසූ රජ තෙමේ උන්වහන්සේගේ ගුණ අසා පැහැද වැඳ ගණු කැමැත්තේ තෙ වරක් පණිවිඩ යැවීය. එහෙත් උන්වහන්සේ නොා ද වැඩි සේක. එවිට රජ තෙමේ ''තෙරුන් වඩිනා තුරු රට වැසි දරුවන්ට කිරි බොන්නට ඉඩ නොා තබමි'' යි කිරිමවුවරුන්ගේ පියයුරු රෙදි පටින් බඳවා මුද්රා තැබූ වී ය. එ අසා තෙරුන් වහන්සේ මාගමට වැඩියහ. රජ තෙමේ තෙරුන් ඇතොවුරට වැඩම කරවා දෙහොත් මුදුන් දී වැඳ ''අද ඉඩ පහසුකම් මද ය, හෙට සිල් සමාදන් වන්නෙමි'' යි තෙරුන්ගේ පාත්රය ගෙණ ටික තැනක් ගොස් බිසවුන් හා එක් ව වැඳ නැවතුනේ ය. රජු වඳිනා කලත් බිසවුන් වඳිනා කලත් තෙරුන් වහන්සේ ''සුඛී හොතු මහරාජා'' යි කියත්. ඒ දුටු භික්ෂූන් වහන්සේලා ''ස්වාමීනි! ඔබ වහන්සේ රජු වඳිනා කලත් බිසවුන් වඳිනා කලත් කුමක් නිසා ''සුඛී හොතු මහා රාජා'' යි කියන්නහු දැ?'' යි ඇසූහ. එ බසට උන්වහන්සේ ''ඇවැත්නි! රජු වඳිනා බවකුත් බිසවුන් වඳිනා බවකුත් මම නොා දනිමි, එහෙයින් එසේ කියමි'' යි කීහ.

රජ තෙමේ ''තෙරුන්ට එහි විසිම නොපහසු ය''යි කරඬුලෙනට ආ පසු වැඩම කර වී ය. එහි වැඩි දා ම උන්වහන්සේ රූ සක්මන් කරණුවෝ නාරුක අරක් ගත් දෙවියා විසින් දැල් වූ විලක්කු එලියෙන් කමටහන් පිරිසිදු ව වැටඹී ගියෙන්, ඉතා සතුටු ව භාවනා කරන්නෝ මැදියම ගෙවී යෑම හා ම මුළු වනය මහඟ නාවමින් රහත් වූහ.

එක් කලෙක මහාමිත්ත තෙරුන්ගේ මවු තොමෝ විසගඩු රොගයෙන් ආතුර වූ ය. ඇයගේ දූ දා මෙහෙණෑස්නෙහි මෙහෙණක් ව වුසූ ය. මවු තොමෝ දූව හෙන්වා ''ආර්යාව! යන්න මා රොගාතුර ව වසනා බව,

ඔබගේ සොහොයුරු භික්ෂූන්ට දන්වා එයට පිළියමක් අසා දැන එව'' යි කියා සිටියා ය. ඒ ගොස් එ පුවත තෙරුන්ට කිවූ ය, උන්වහන්සේ ''නැගනිය, මා දන්නා පිළියමක් නැත, එහෙත් මම කළ යුතු පිළියමක් කියමි, මා මහණ වූ ද සිට කිසි දිනෙක නරක සිතින් ඉදුරන් බිඳ විසහාග රූපයක් දෙස බලා නැත, මේ මා කීයේ ඇත්ත ය, එය අදහා ගෙණ ගොස්, තී මේ සත්‍ය වචනයෙන් මාගේ මැණියන්ට වහා සුවයක් ලැබෙවා' යි මැණියන්ගේ සිරුර අත ගාන්නැ'' යි කීහ. ඒ ගොස් එසේ කළා. එකෙණෙහි ම සිරුර හට ගෙණ තුබූ විසඟවූ පෙණ පිඬු සේ වියලී ගියේ ය. ඔවු නැඟී සිට ''බුදුරජානන් වහන්සේ අද වැඩ සිටි සේක් නම් ඒකාන්තයෙන් මා පුත් හිස පිරිමදින සේකැ'' යි ප්‍රීතියෙන් කියන්නට වූ ය. ඉන්ද්‍රිය-සංවරසීලයෙන් සිල්වත් වූයේ **ඉන්ද්‍රියසංවරසංවුත** යි ගැණේ.

ආජීවපාරිසුඛිසීල නම්, මිත්‍ථ්‍යාජීවයෙන් වැළකීම ය. පිරිසිදු වූ දැහැමි ව කෙරෙණ ජීවිකාව නිසා ඇති වන සීලය යි. බුදුරජුන් විසින් පණවා වදළ පාරාජිකා - සඞ්ඝාදිසෙස - ථුල්ලච්චය - පාචිත්තිය - පාටි-දෙසනීය - දුක්කට යනාදී වූ සිකපද ඉක්මවීම වශයෙන් ද ප්‍රාණඝාතාදී වූ සප්තවිධඅකුශලකර්මපථයෙහි හා කුහනා ලපනා-නෙමිත්තිකතා - නිප්පෙ-සිකතා-ලාභෙනලාභං නිජිගිංසනතා යන පාපධර්මයන්හි යෙදීම වශයෙන් ද පවත්නා මිත්‍ථ්‍යා ජීවයෙන් වැළක්ම මෙයින් අදහස් කරණු ලැබේ.

එහි එන පාරාජිකාව මෙසේ දක් වූ සේක, බුදුරජානන් වහන්සේ. ''**ආජීවහෙතු ආජීව කාරණා පාපිච්ඡෝ ඉච්ඡාපකතෝ අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති ආපත්ති පාරාජි කස්ස**'' පාපිච්ඡ වූ පාපිච්ඡ, වෙන් මැඩුනු යම්කිසි උපසපන් මහණෙක්, මෙසේ ඇති කල්හි සිවුපස-යෙන් වෙහෙසට නො පත් ව ජීවත් වෙමි'' යි තමන් කෙරෙහි නැති ධ්‍යාන මාර්ගඵලාදි උසස් ගුණධර්ම ඇතැයි කියා නම්, ඒ මහණ පරිජි ඇවැතට පැමිණෙන්නේ ය.

එහි එන සඞ්ඝාදිසෙසය මෙසේ ය. ''**ආජීවහෙතු ආජීවකාරණා සංචරිත්තං සමාපජ්ජති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස**'' උපසපන් මහණෙක් ආජීව හෙතුවෙන් ආවාහ හෝ විවාහ වනු කැමැති ගෑණු පිරිමි දෙදෙනෙකු පිළිබඳ එකෙණෙහි වන සඞ්ගමය පිණිස ඔවුනොවුන්ගේ පණිවිඩ කියා නම්, ඒ මහණ සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණෙන්නේ ය.

එහි එන ථුල්ලච්චය මෙසේ ය. ''**ආජීවහෙතු ආජීවකාරණා යෝ තෙ විහාරෙ වසති සෝ භික්ඛු අරහති භණිති පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස**'' උපසපන් මහණෙක් ආජීවය නිසා, අදහස් දන්නකුහට නුඹගේ විහාරයෙහි වසන මහණ රහත්'' යි තමා උදෙසා අනියමයෙන් කියා නම්, ඒ මහණ ථුල්ලච්චයාපත්තියට පැමිණෙන්නේ ය.

එහි එන පාචිත්තිය මෙසේ ය. ''**අජීවහෙතු ආජීවකාරණා භික්ඛුනි පණීතභොජනානි අගිලානෝ අත්තනෝ අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති**

අපත්ති පාවිත්තියස්ස'' උපසපන් මහණෙක් දිවි පැවැත්මෙහි අදහසින් නොගිලන් වූයේ ම පිණි කිරි ගිතෙල් මත්ස්‍යමාංසාදි භොජන නොනැ නොපැවරුවන්ගෙන් තමන් පිණිස ඉල්ලා ගෙණ වළඳා නම්, ඒ මහණ පාවිත්තියාපත්තියට පැමිණෙන්නේ ය.

එහි එන පාටිදෙසනීයය මෙසේ ය. ''**ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුණී පණීතභොජනානි අගිලානා අත්තනොඅත්ථාය විඤ්ඤත්වාභුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස**'' යම් උපසපන් මෙහෙණක් නොගිලන් වූවා ජීවිකාව හෙතු කොට පිණි බොජුන් තමන් පිණිස ඉල්ලා ගෙණ වළඳා නම්, ඒ මෙහෙණ පාටිදෙසනීයාපත්තියට පැමිණෙන්නී ය.

එහි එන දුක්කටය මෙසේ ය. ''**ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුණී සූපං වා ඔදනං වා අගිලානා අත්තනො අත්ථාය විඤ්ඤපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස**'' උපසපන් මෙහෙණක් නොගිලන් වූවා ජීවිකාව හෙතු කොට තමන් උදෙසා මසක් හෝ බතක් ඉල්ලා ගෙණ වළඳා නම්, ඒ මෙහෙණ දුක්කටාපත්තියට පැමිණෙන්නී ය.

මේ ආජීවය නිසා පැණ වූ සිකපද සය ය. මේ සිකපද නොඉක්මවා නොමැඩ මෙකී ආපත්තීන්ට නොපැමිණ කරණ දිවි පැවැත්වීමෙන් ඇති වන්නේ ආජීවපාරිසුඩ්සීලය යි. මේ සිකපද මැඩීමෙන් මහණුන්ගේ හා මෙහෙණන්ගේ ආජීවය අපිරිසිදු වේ. කිලිටි වේ.

කුහනා නම්, ලාභසත්කාර කීර්තිප්‍රශංසාවෙහි ගිජු ව කෑදර ව පව්වය-පටියෙධන, සාමන්තජප්පන, ඉරියාපථසන්නිස්සිත යන මෙයින් හෝ මේ එකකින් අන්‍යයා පුදුමයට පත් කරවීම ය.

එහි දයකයකු මහණකු වෙත පැමිණ සිවුරු ඇ සිවුපසයට අයත් යමකින් පැවරූ කල්හි, ඒ මහණ සිවුපසයෙහි ගිජු ව සිටිය ද ඒවග නොහඟවා, ''මට වටිනා සිවුරු කෑම් බීම් යාන වාහන ගෙවල් දෙරවල් බෙහෙත් පිරිකරවලින් වැඩෙක් නැතැ'' යි ඒ හැම පිළිකෙව් කෙරෙයි. ඒ ප්‍රතික්ෂෙපයෙන් සතුටු වූ දයකයා විසින් ''අපේ ස්වාමීන් වහන්සේ පිරිකර ලබා ගැණීමෙහි ආශා නැත්තාහ, සිල්වත් ය, ගුණවත් ය, මෙවැනි සිල්වත් ගුණවත් නමක් කවද ලැබිය හැකි ද, කෙසේ නමුත් බත් හැන්දක් පමණකුත් වළඳවා ගත යුතු ය''යි වටිනා සිවුරු ඇ පිළියෙළ කොට ගෙණ වුත් ''ස්වාමීනි! මෙය පිළිගත මැනවැ'' යි පැ රැත්ත කරණු ලබන්නේ බණ දෙසා දයකයාට ම හිත පිණිස පිළිගන්නා සැටි හඟවා එළවනු ලබන හැම පසයක් ම හැම දෙයක් ම පිළිගණියි. එතැන් සිට කරත්ත බරට පිදුව ද සැඟීමට පත් නොවෙයි. කරත්ත බරට පිදුව ද පිළිගණියි. මෙසේ සිවුරු ඇ පිරිකර කරත්ත බරට තමන් වෙත ඇදී එන සේ, ගෙණවුත් පුදන සේ, දයකයන් මහාජනයා විස්මය පත් කිරීම **පව්වයපටිසෙධන** නම්.

ලාභසත්කාරයෙහි ගිජු වූ මහණ, තමන් කෙරෙහි නොවූ උසස් ගුණ ඇති සේ දක්වන කතාවෙන් මහජනයා පුදුමයට පත් කරයි. ඒ මහණ ලාභසත්කාරයෙහි කැතකමින් මැඩුනේ, ගරු බුහුමන් ලබනු කැමැත්තේ ''මෙසේ ඇති කල්හි මහාජනයා මට ගරු බුහුමන් කරන්නේ ය'' යි සිතා ''මෙබඳු සිවුරු ඇ දරන්නේ, කුඩ වහන් ඇ දරන්නේ උසස් මහණෙක, යමකුට මෙබඳු උසස් ගුරුවරු වෙත් නම්, ඒ මහණ උසස් ය, යමකුට මෙබඳු මැති ඇමැතිවරු වෙත් නම්, ඒ මහණ උසස් ය, යමකුට මෙබඳු

ධනවත් දයකයෝ රාජකීයයෝ රාජ්‍යනිලධරයෝ මිත්‍රයෝ වෙත් නම්, ඒ මහණ සැලකිය යුත්තෙක, පිදිය යුත්තෙක, ඇසුරු කළ යුත්තෙක, යමෙක් මෙබඳු මහ වෙහෙරක වෙසේ නම්, ඒ මහණය පිදිය යුතු මහණ, මේ මහණ තෙමේ මෙබඳු ශාන්තවිහාරසමාපත්තීන් ලැබ සිටින්නේ ය'' යි යනාදීන් හැඟෙන පරිදි ඊට සරිලන ගැඹුරු වූ ශූන්‍යතාප්‍රතිසංයුක්තලෝකොත්තර කථා කියා ද, මෙසේ ධ්‍යානාදියට සමීප කොට කියන කතාවෙන් අසන්නන් පුදුමයට පත් කිරීම සාමන්තජප්පන නම්.

ලාභසත්කාරයෙහි ගිජු ව මිනිසුන්ගෙන් ගරුබුහුමන් ලබන රිසියෙන් මහණ යෑම් ඊම් ඇ ඉරියව්වෙන් මහාජනයා පුදුමයට පත කරයි. මේ මහණ පාපිච්ඡ ඇත්තේ කැතකමින් මැඩුනේ ''මෙසේ කළ කල්හි මහාජනයා මට බුහුමන් කෙරේ'' යි සලකා යයි. නිදයි. හිඳියි. සිටියි. තමන් මහාගුණවතෙකැ යි දුටුවන්ට වැටහෙන ලෙසින් හැම ඉරියවු පවත්වයි. සමාපත්තියට සම වැදුනකු සේ හිඳියි. මෙසේ ඉරියවු පැවැත්වීමෙන් පුදුමයට පත් කිරීමය, ඉරියාපථසන්නිස්සිත.

ලාභසත්කාරයෙහි ගිජු වූ මහණහුගේ දන්හු පිළිබඳ ආලපනාදිය ලපනා නම්. එහි ආලපනා – ලපනා - සල්ලපනා - උල්ලපනා-සමුල්ලපනා – උන්නහනා – සමුන්නහනා – උක්කාචනා - සමුක්කාචනා – අනුප්පියභාණිතා – චාටුකම්‍යතා – මුග්ගසුප්‍යතා – පාරිභට්ටතා යන මේ ක්‍රියා සමූහය ඇතුලත් ය.

එහි, විහාරයට පැමිණි මිනිසුන් අමතා, ''ආ, කුමට ආවහු, කිම ආරාධනාවක් සඳහා ආවහු? හා, වේවා, එසේ නම යන්න, මම මහණුන් ගෙණ පසු ව එන්නෙමි'' යි මෙසේ දයකයාට පළමු ව කතාව පටන් ගැණීම ආලපනා නම්. තවද ''මම මෙරට ඉන්නා පණ්ඩිතොපාධිධරයා වෙමි, සැලකිය යුත්තා මම වෙමි, මට වඩා උසස් කෙනක් ගත් අනෙකෙක් මේ පළාතේ නැත, අදත් මුලසුනක් ගැණීමට යන්නට සිදු වී තිබේ. රජ මා කෙරෙහි පහන් ය. අසවල් මන්ත්‍රීතුමා මට හිතවත් ය, මේ ලියුම. අසවල් මුදලිතුමා මාගේ දයකයෙක්, ඇමතිතුමාත් දයකයෙක්'' යි මෙසේ නොයෙක් කරුණු කියා තමන් උසස් කෙනකු සේ දැක්වීම ය ආලපනා.

''රජුගෙන්, ඇමැතිගෙන් පිදිවිලි ලබන ස්වාමීන් වහන්සේ කවු ද? – ස්වාමීන් වහන්සේ යි කියනු ලබන්නෝ කවුරුදැ?'' යි යන ඇ ලෙසින් යමකු ඇසූ විට ''ඒ වෙන කෙනෙක් නොවෙති මා මියක්'' යි යන ඇ ලෙසින් පිළිතුරු දීමය ලපනා.

දයකයා සමග නිතර කතාබස් කිරීමෙන් දයකයා කළකිරේ ය යන බිය ඇති ව ඔහුට ද ඉඩ තබ තබා කතා කිරීම සල්ලපනා නම්.

''මේ තමා මහාධනවතා, මහානායකයා. මහාදනපතියා, ගමේ ප්‍රධානයා, රට කර වන්නා'' යන ඇ ලෙසින් දයකයා උසස් කොට කතා කිරීම උල්ලපනා නම්.

"මහත්මයාගේ, රාළහාමිගේ, මුදලිතුමාගේ සත්වන පරපුර දක්වා හැම කෙනෙක් ම ගමේ, රටේ, සමාජයේ උසස් අය වූහ. මහතුන්ට වඩා, රාළහාමිලාට වඩා, මුදලිතුමාලාට වඩා කුලවත් ධනවත් ඉණවත් උදවිය මේ පළාතේ නො සිටියහ, අදත් නැත" යන ඈ ලෙසින් දයකයා හැම අතකින් ම උසස් තැන තබා කතා කිරීමය සමුල්ලපනා.

"උපාසකය! ඉස්සර නම් මේ දවස්වල තමුසේලා අලුත් බත් දන් දුන්නහු ය, දැන් කලකින් එබන්දෙක් නොවී ය, ඒ මන් ද?" යි විචාරා "ස්වාමීනි! දැනුත් දෙන්නෙමි, ප්‍රමාදවීම ඉඩ පහසුකම් මද නිසා ය, ඉඩ පහසුකම් ලැබුනු සැටියේ දෙන්නෙමි" යි දයකයා කියන තුරු වචනයෙන් වෙළාලෑමය උන්නහනා. තවද උක්ගස් ගෙණෙන්නකු, දැක, "උපාසකය! මේ උක්ගස් කොයි වත්තේ ද? ස්වාමීනි! මේවා අපගේ ම කොරටුවේ, රස ද උක්ගස්? ස්වාමීනි! මේවා වෙන ද සේ රසවත් ද යි නො කා කියනු බැරි ය, පසුගිය වාරවල දී නම් රසවත් ව තුබුනේ ය. උපාසකය! ඔබගේ කීම ඇත්ත ය, එහෙත් මහණුන්ට උක්ගස් දෙන්නැ යි අපට කියන්නට නො වටනේ ය" යන ඈ ලෙසින් දයකයාට ගැලවී යන්නට ඉඩ නො දී දයකයා වෙළා බැඳ කරණ කතාවය උන්නහනා ය.

හැම පසින් ම හැම ලෙසින් ම දයකයා අවුලේ ලා කතා කිරීම, නැවත නැවත කතාවෙන් වෙළා බැඳුම සමුන්නහනා නම්.

"මේ ගෙයි වැස්සෝ මා ගැණ දනිත්, මෙහි යම් දියයුතු දෙයක් වේ නම්, එය මට ම දෙති" යන ඈ ලෙසින් ඔවුන් උසස් කොට දැක්වීම උක්කාවනා නම්. "මහණහු දෙදෙනෙක් ගම් වැද එහි වූ අම්බලමක ටිකකට හිඳ ගත්හ, ඒ වේලෙහි එක් ගැණු ලමයෙක් එහි ආයේ ය; ඈ ලඟට ආ විට එක් මහණෙක් අනික් මහණහුගෙන් "වහන්ස! මෝ කාගේ දුවක් ද" යි ඇසී ය, නො දන්නහු ද? මෝ අපගේ තෙලන්දරිකා උපාසිකා මැණියන්ගේ දූ, මෑගේ මවු තොමෝ මා එහි ගිය විට ගිතෙල් දෙන්නී ය, දෙන විට කළයෙන් ම දෙයි, මේ දූත් එසේ ය" යන තෙලන්දරිකකථාව මෙහි ලා නිදසුන් කළ හැකි ය.

හැම ලෙසකින් හැම අතකින් තමන්ගේ දයක ගෙවල් උසස් තැන තබා දැක්වීම සමුක්කාවනා නම්.

සත්‍යයට ගැළපෙන බව ධර්මයට ගැළපෙන බව නො සලකා නො බලා නැවත නැවත පියතෙපුල් බිණුම අනුප්පියභාණිතා නම්.

තමන් පහත් කොට දයකයා උසස් කොට තබන පැවතුම් ඇති බව, තමා දයකයාට වඩා පහත් කොට ගැණීම වාටුකම්‍යතා නම්.

මුං ඇට තැම්බූ කල්හි එහි කොටසක් පැසී ද, කොටසක් නො පැසී ද තිබෙන්නා සේ යමකුගේ කතාව සත්‍ය අසත්‍ය දෙකින් මිශ්‍ර ව තිබේ නම්,

එබදු බොරු සැබෑ දෙකින් මුසු වූ බස් ඇත්තේ මුග්ගසුප්ප නම් වේ. ඔහුගේ ස්වභාවය, නැත, බොරු බොහෝ කොටත් සැබෑ ස්වල්ප කොටත් කතා කිරීම මුග්ගසුප්පතා නම්.

කිරිදරුවන් වඩනා කිරිමවක සේ දයකයන්ගේ දරුපැටවුන් ඇකයෙන්, කරින් වඩා ගැණුම, උන් නැලවීම පාරිභට්ටතා නම්.

ලාභසත්කාරයෙහි කැදර වූ පාපිච්ඡා ඇති මහණහුගේ අන්හු පිළිබඳ නිමිත්ත - නිමිත්තකම්ම - ඔභාස - ඔභාසකම්ම - සාමන්තජප්පා - පරිකථා යන මෙය නෙමිත්තිකතා නම්.

එහි කැමි බීම් ඇ දෙනු සඳහා මෙරමාහට සිත් උපදවන කායවාක්-කම් නිමිත්ත නම්. අන්හු ඉදිරියෙහි බඩ සයින් ඉන්නා බව හඟවා ඔත් ලබන්නට අතින් බඩ අතගැමිය කායකර්ම. ''වළඳන්නට නැති කමින් සිරුර කෙටටු වී ය'' යන ඇ කීම ය වාක්කර්ම.

කැමක් ගෙණ යන්නන් දැක, ''කිම, කැමක් ලැබූ වහු ද?'' යි ඇ ලෙසින් නිමිත්තිකිරිම නිමිත්තකම්ම නම්.

''මේ දවස්හි මහණුන්ට කැමිබීම් නැත්තේ ය, කැමිබීම් භිග ය'' යන ඇ ලෙසින් සිවු පසය පිළිබඳ කතාවෙන් තමන්ගේ අදහස හැඟවීම ඔභාස නම්.

වස්සන් රකින්නන් දැක, ''කිම මොවුහු කිරිදෙනුන්ගේ වස්සෝ ද? මෝරුදෙනුන්ගේ වස්සෝ ද?'' යි විචාරා ''ස්වාමීනි! කිරිදෙනුන්ගේ වස්සෝ ය'' යි කී කල්හි ''හා, මොවුහු කිරිදෙන්නුන්ගේ වස්සෝ නොවෙති, කිරිදෙනුන්ගේ වස්සෝ නම්, භික්ෂූන් වහන්සේලාද කිරි ලබන්නහු ය, භික්ෂූන් වහන්සේලාත් කිරි ලැබිය යුතුය'' යි ඇ ලෙසින් කුඩාදරුවන් ලවා ඔවුන්ගේ මවු පියන් හඟවා කිරි ලබා ගැණීම් ඇ පිණිස කරණ කතා ඔභාසකම්ම නම්.

තමන් කැමැති වූ වස්තුවට ලං කොට කතා කිරීම සාමන්තජප්පා නම්, මේ මෙයට නිදසුන් කතාවක්, ''එක් මහණෙක් වළඳනු රිස්සෙන් වේලාව බලා නිතර සිවු පසයදෙන උවැසියකගේ ගෙට ගොස් පුටුවක් ඇද එහි හුන්නේ ය, උවැසිය ඒ මහණහු දැක කිසිවක් නොදෙන අටියෙන් ''අද ගෙයි සහල් නැතැ'' යි සහල් ගෙණෙන්නට යන්නියක සේ හඟවා අසල ගෙයකට ගියා ය. ඒ අතර මහණ තෙමේ ගෙයතුළට වැදී වට පිට බලනුයේ, දෙරමුල්ලේ තුබූ උක්ගස, හැළියෙක තුබූ හකුරු, පැහැක තුබූ ලුනු මාලු, හැළියෙක තුබූ හාල්, කුඩා බදුනෙක තුබූ ගිතෙල් දැක අවුත් කිසිවක් නොදන්නකු සේ හුන් තැන ම හුන්නේ ය. උවැසිය ටික වේලාවක් ගෙවා අවුත් ''අනේ, අද අපගේ ස්වාමීන් වහන්සේට දානය නොලැබෙන සැටිය අද මට පෙණෙන්නේ, ඒ ගිය තැනත් සහල් ඇටයකුත් නැත, ඒ ගෙයි උදවියත්

අද බඩ ගින්නෙන් සිටිති'' යි කියමින් ගෙට ඇතුල් වූ ය. එවිට මහණ ද ''උවැසිය! හරි මමත අද දන් නො ලැබෙන බව මගදී ම ඉඳිරියට හමු වූ නිමිත්තවලින් දැන සිටියෙමි'' යි කී ය. ''ස්වාමීනි! ඔබ වහන්සේ මග දී දුටු ඒ නිමිති මොනවා ද?'' යි ඇසූ කල්හි ''අම්මේ මා පන්සලෙන් දෙරට බැස එද්දී මට නයෙක් මුණ ගැසුනේ ය. ඌ අර දෙර මුල්ලේ තිබෙන උක්ගස වැන්නේ ය, ඌ එතැනින් පන්නා හැරීමට මා ගැසූ ගල්කැට සැළියේ තිබෙන හකුරුකැට වාගේ ය, උගේ පෙණ ගොබය පැසේ තිබෙන ලුනුමාලු පෙති වාගේ ය, දත් සැළියේ තිබෙන සහල් ඇට වාගේ ය, මා ගැසූ ගල් පහර නිසා උගේ කටින් වැඟුරුණු කෙළ කුඩා බදුනෙහි පුරවා ඇති ගිතෙල් වාගේ ය'' යි කීයේ ය. එවිට උවැසිය ''මේ මහණ රවටනු නො හැකි ය'' යි උක්ගස් කපා වළඳන්නට දී පසුව බත් උයා ගිතෙල් හකුරු මාලු සමග වළඳන්නට දුන්නී ය.''

කැමැති දෙය ලැබෙන තෙක් පෙරළ පෙරළා කී දෙය නැවත කීම පරිකථා නම්.

ලාභසත්කාරකීර්තිප්‍රශංසායෙහි ගිජු වූ පාපිච්ඡා ඇති මහණහු ගේ මෙරමා පිළිබඳ අක්කොසනා – චීමහනා – ගරහනා – උක්ඛෙපනා- සමුක්ඛෙපනා - ඛිපනා - සංඛිපනා - පාපනා – සම්පාපනා අවණ්ණහාරිතා – පරපිටියීමංසිකතා යන මෙයින් අන්හු පිළිබඳ ගුණය පිසදමා සුණු කොට ලාභ උපදවා ගැනීම නිප්පෙසිකතා නම්.

එහි දශවිධ ආක්‍රොශවස්තූන්ගෙන් ආක්‍රොශ කිරීමය අක්කොසනා.

අන්හු තළා පෙළා පරිභව කිරීමය චීමහනා.

''සැදහැ නැත්තේ ය, නො පහන් තැනැත්තේ ය'' යන ආ ලෙසින් නැගීම ය ගරහනා.

''මෙබඳු බස් මෙහි නො කියව, මුව පියා ගණුව'' යන ආ ලෙසින් ඔසවා දැමීම ය උක්ඛෙපනා. හාත්පසින් කරුණු සඟිත කොට, හෙතු සඟිත කොට ඔසවා දැමීම නොහොත් නො දෙන්නහුට ''අහෝ, පින්වත් තෙමේ දනපති ය'' යන ආ ලෙසින් කථා කිරීම ද උක්ඛෙපනා.

''මහාදනපති ය, මහාදයක ය'' යන ආ ලෙසින් උසස් තැන තබා කතා කිරීම ය සමුක්ඛෙපනා.

''බිජුවට කන මොහුගේ ජීවිතයෙන් ප්‍රයෝජන කවරේ ද'' යි යන ආ ලෙසින් කවටකම් කිරීම, පිරිහෙලා කතා කිරීමය ඛිපනා.

''කුමක් හෙයින් මොහුට නො දෙන්නා යි කියත් ද, මොහු නිසරු භිඟන්නන්ට නැත යන වචනය දෙන්නේ ය'' යන ආ ලෙසින් කතා කිරීමය සංඛිපනා.

නො දෙන බව නො හොත් අන්හු පිළිබඳ නුගුණ සැම තැන පැමිණ-වීමය පාපනා.

කොතෙකුත් ඉතිරි නො කොට හාත්පසින් නුගුණ පැමිණ වීමය සම්පාපනා.

"මෙසේ මේ තෙමේ දෙස් කීමට බියෙන් වත් දෙන්නේ ය" යි සිතා ගෙන් ගෙට, ගමින් ගමට, දනවිවෙන් දනවිවට නුගුණ ගෙණ යෑමය අවණ්ණහාරිතා.

ඉදිරියෙහි ගුණ කියා නො ඉදිරියෙහි නුගුණ කීම පරපිටයීමංසිකතා. ඉදිරියෙහි බැලීම පමණකුත් නො කොට පිටි පැවිට පිටමස් කෑමක් වැනි නු යි මෙය පරිපිටයීමංසිකතා නම් වී ය.

අක්කොසනාදී මේ හැම එකක් ම හුණ පතුරෙන් ඇහ සූරා පිස දමන්නා සේ අනුන්නේ ගුණ සූරා දමන්නේ ය. සුගන්ධ ද්‍රව්‍ය අඹරා සුණු කොට සුවඳ විඳ ගන්නා සේ අනුන් පිළිබඳ ගුණ සුණු කොට ලාභ ප්‍රයෝ-ජන උපදවන්නේ ය.

ලාභසත්කාරකිර්තිප්‍රශංසායෙහි ගිජු වූ පාපිච්ඡා ඇති මහණහු ගේ ගෙයින් ලත් ආමිසය ඒ ගෙට ගෙණ යෑම ඒ ගෙයින් ලත් ආමිසය මේ ගෙට ගෙණ ඒම, මෙයින් ලත් දෙය අන් තැනකට ගෙණ යෑම යන ඈ ලෙසින් ආමිසය සෙවීම ලාභෙන ලාභං නිජිගිංසනතා ය.

"**යථා වා පන හොන්තෝ සමණබ්‍රාහ්මණා සඩ්ඩාදෙය්‍යානි හොජනානි ගුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්-පෙන්ති, සෙය්‍යථීදං, අඞ්ගං නිමිත්තං**" යන ඈ ලෙසින් වදළ ජීවිකාවෘත්තිය පිණිස මහණ බමුණන් විසින් සෙවූනා ලබන අඞ්ගවිද්‍යාදිපාපධර්ම ද මෙහි ලා ගැණේ.

මෙසේ ආජීවය හෙතු කොට පණවා වදළ ස වැදැරුම් සික පද ඉක්මවා යෑමෙන්, කුහනාලපනාදිපාපධර්මයන්ගේ වශයෙන් කෙරෙණ මිථ්‍යාජීවයෙන් වෙන් වීම ආජීවපාරිසුද්ධිශීලය යි දත යුතු ය.

ආජීව නම්, සිවුපසය සෙවීමෙහි ධාර්මිකඋත්සාහය යි. ඒ මේ ධාර්-මික උත්සාහය ඇසුරුකොට ජීවිතයාත්‍රාව වන බැවින් ආජීව යි කියනු ලැබේ. පිරිසිදුබව ය, පාරිසුද්ධි. ආජීවයාගේ පිරිසිදු බව ආජීව පාරිසුද්ධි නම්. "**එකං ආගම්ම ආජීවන්තීති = ආජීවො, කො සො? පච්චයපරියෙසනවා-යාමො, පාරිසුද්ධිති = පරිසුද්ධතා, ආජීවස්ස = පාරිසුද්ධි = ආජීවපාරිසුද්ධි**" යනු දන්නේ ය.

ආජීවපාරිසුද්ධිසීලය වීර්‍යයෙන් සම්පාදනය කළ යුතු ය. වීර්‍යය එයට සාධනය වේ. යමක්හුගේ වීර්‍යය විධිමත් ලෙසින් පවත්නේ නම්, ඔහුට

මිත්‍යාජීවය දුරුකළ හැකි ය. එහෙයින් අයුතු ලෙසින්, නොදැහැම් ලෙසින් සිවුපසය සෙවුම දුරු කළ යුතු ය. දැහැමින් සිවුපසය සෙවුමෙන් ආජීව-පාරිසුඛ්සිලය රැක ගත යුතු ය. දැහැමින්, යුතු ලෙසින් උපදවා ගත් සිවුපසය වැළඳිය යුතු ය. නොදැහැමින්, අයුතු ලෙසින් උපදවා ගත් පසය විෂ මිශ්‍ර භොජනයක් සේ දුරු කළ යුතු ය.

ධුතඞ්ගධර නොවූ මහණහුට සුදුසු වන්නේ සඩ්සයාගෙන්, ගණයා-ගෙන් දම්දෙසුමෙහි පහන් ගිහින්ගෙන් ලැබුනු සිවුපසය ය. එහෙත් ඉතා ම සුදුසු වන්නේ පිඬු සිඟීමෙහි උපන් පසය ය. ධුතඞ්ගධරයාහට, පිඬු සිඟා යෑමෙන් උපන් පසය හා ධුතගුණයෙහි පහන් ගිහින්ගෙන් ධුතගුණයට අනුලොම් ව උපන් පසය සුදුසු ය.

ධුතඞ්ගධර වුව ද, නොවුවද ආජීවපාරිසුඛ්ය කැමැති මහණහුට චීවර-පිණ්ඩපාත දෙක්හි නිමිත්ත-ඔභාස-පරිකථා-විඤ්ඤත්ති යන මේ සතර නොසුදුසු ය. සෙනසුන් විසයෙහි නිමිත්ත-ඔභාස-පරිකථා යන තිදෙන ධුතඞ්ගධර නොවූ මහණහුට වරද නොවෙති. එහෙත් විඤ්ඤත්තිය නොවටී.

එහි සෙනසුනක් කරණු සඳහා ගෙපල් පිරිසිදු කරණ මහණකු දැක, ගිහින් විසින් "ස්වාමීනි! කුමක් කරහු, මෙය කරණු ලබන්නේ කා විසින් ද?" යි විචාළ කල්හි "එබදු කිසිවෙක් නැත" යි පිළිතුරු දීමත්, මෙබඳු අන් වචනත් නිමිත්ත නම් වේ.

මහණෙක් ගිහින් දැක "තමුසෙලා කොහි වසන්නහු ද?" යි අසා "අපි ප්‍රාසාදයන්හි වසමු" යි ඔවුන් කී කල්හි "ඇයි, පින්වන්නි! මහණුන්ට ප්‍රාසාද නොසුදුසු ද?" යි විචාරා නම් ඒ හා මෙබඳු අන් වචන ද ඔභාස නම් වේ.

මහණුන්ට සෙනසුන සම්බාධ යි කීම් හා එබඳු අන් කීම් ද පරිකථා නම් වේ.

නිමිත්ත – ඔභාස – පරිකථා යන මෙයින් උපන් සෙනසුන මහණුනට නොකැප නොවේ. චීවර – පිණ්ඩපාත කැප නොවේ – චීවර – පිණ්ඩ පාත – සෙනාසන යන ප්‍රත්‍යය විඤ්ඤත්තියෙන් උපන්නේ නොකැප වේ. නොනැ නොපැවරුවන්ගෙන් ඉල්ලීම විඤ්ඤත්ති නම්. බෙහෙ-තෙහි නිමිත්ත-ඔභාස-පරිකථා-විඤ්ඤත්ති යන සතර ම වටනේ ය. එහෙත් එසේ උපන් බෙහෙත රොගය ඝන්සිඳුනු කල්හි වැළඳීම නොසුදුසු ය.

මෙහිලා විනයධරයෝ, ඒ වැළඳීමට අවසර දුන් බැවින් සුදුසු යි ද, සූත්‍රාන්තිකයෝ, ඒ වැළඳීමෙන් ඇවැත් නොවූවත් ආජීවය කොපාවන බැවින් නොසුදුසු ය යි ද කියත්.

යමෙක්, බුදුරජානන් වහන්සේ විසින් යමක් අනුදන්නා ලද්දේ නමුත් සැරියුත් මහතෙරණුවන් සේ ජීවිත විනාශයක් එළඹ සිටිය ද, ඔහා-සාදියෙන් උපන් ඒ පසය නො ද වළඳන්නේ ද, ලද දෙයක් ම වළඳන්නේ ද මහතෙමේ "පරමසල්ලෙඛවුත්ති" යි කියන ලද්දේ ය.

ආජීවපාරිසුඛිසීලය පරියෙට්ඨිසුඛි යි ගණිත්. එක් විසි අනෙසනයෙන් දුරු ව දැහැමින් සිවුපසය උපදවන්නාහුගේ ආජීවය, සෙවීමෙන් පිරිසිදු වන්නේ ය. එහෙයිනි එසේ ගන්නේ. සෙවීමෙන් පිරිසිදුබව පරියෙට්ඨිසුඛි නම්.

පච්චයසන්නිස්සිතසීල නම්, ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුපසය ගැණීම ය. ප්‍රත්‍යවෙක්ෂාවෙන් පිරිසිදු කොට සිවුපසය ප්‍රයෝජන ගැණීම විසින් පැවැති නිරවද්‍යචෙතනාමාත්‍රය මෙහි **පච්චයසන්නිස්සිතසීල** නම්. මේ වනාහී නුවණින් හොඳට සලකා බලා ප්‍රත්‍යයපරිභෝග කිරීම ලකුණු කොට සිටියේ ය.

පච්චය නම්, සිවුරු - ආහාර - සෙනසුන් - බෙහෙත් - පිරිකර යන මේ ය. එය ඇසුරු කෙළේ **පච්චයසන්නිස්සිත** ය. "**යෙ පටිච්ච නිස්සාය පරිභුඤ්ජමානා පාණිනො යන්ති ගච්ඡන්ති පවත්තන්ති තෙ පච්චයා**" යනු අරුත් පැහැදිලි කිරීම ය.

එහි පච්චයසන්නිස්සිතසීලයෙන් සිල්වත් වන්නහුගේ චීවර පරිභොගය, ශීතොෂ්ණපිඩා හා කණමැසි හා මදුරු සුලං අවු සප් යන මොවුන්ගෙන් වන පිඩා නසනු පිණිස, විළිබිය නසන තැන් මුවා කිරීම පිණිස විය යුතු ය. ඔහු චීවරපරිභොගයෙහි දී "**පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි යාව දෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං**" යි ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. නුවණින් සලකන්නේ ය.

පිණ්ඩපාතපරිභොගය කෙළිසෙල්ලම් පිණිස, මද වැඩුම් පිණිස, සැරසීම් පිණිස, අලඞ්කාරය පිණිස නො විය යුතු ය. විය යුත්තේ මේ සිරුර යම්තමකට පවත්වා ගැණුමට ය. යම්තම් යැපීමට ය. බඹගිනි නිවා ගැණුමට ය. සසුන් බඹසරට හා මඟ බඹසරට රුකුල් දෙනු පිණිස ය. තව ද "මේ පිණ්ඩපාතය වැළඳීමෙන් පැරණි බඩගිනි වෙදනාත් නසමි, අලුත් වෙදනාත් නො උපදවමි" යි සලකා ගෙණ ද විය යුතු ය. එ සේ ම "මෙයින් මාගේ ජීවිතයාත්‍රාව ද, නිරවද්‍යභාවය ද, ඵාසුවිහරණය ද වන්නේය" යි සලකා ගෙණ ද විය යුතු ය. ඔහු පිණ්ඩපාතපරිභොගයෙහිදී" **පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි නෙව දවාය න මදය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණං ච වෙදනං පටිහංඛාමි නවං ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරෝ ච**" යි ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. නුවණින් සලකන්නේ ය.

සෙනාසනපරිභොගය, ශීතොෂ්ණපීඩා නසනු පිණිස, මැසි මදුරු අවු සුළං නයි පොළොං ඇ උවදුරු නසනු පිණිස, සෘතු පීඩා නසනු පිණිස, සිත එකඟ කර ගැණීමෙන් වන සුවය පිණිස විය යුතු ය. ඔහු සෙනාසනපරිභොගයෙහි දී "පටිසංඛා යොනිසෝ සෙනාසනං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං" යි ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. නුවණින් සලකන්නේ ය.

ග්ලානප්‍රත්‍යයපරිභොගය, හුදෙක් ව්‍යාබාධයන්ගෙන් උපන් වේදනා නසනු පිණිස, යම් පමණකින් ඒ සියලු දුක් නැසී යේ ද එ පමණක් පිණිස විය යුතු ය. ඔහු ග්ලානප්‍රත්‍යයපරිභොගයෙහි දී "පටිසංඛා යොනිසෝ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි. යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය" යි ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. නුවණින් සලකන්නේ ය.

පච්චයසන්නිස්සිතසීලය නුවණින් සම්පාදනය කළ යුතු වේ. නුවණ එයට සාධනය යි. සිවුපසයෙහි ආදීනවය හා ආනිසංසය සැලකීමේ සමත්බව ඇත්තේ නුවණට ය. එහෙයින් සිවුපසයෙහි ආශාව හැරපියා දැහැමින් සෙමින් උපන් සිවුපසය කියූ ලෙසින් නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට වළඳමින් පච්චයසන්නිස්සිතසීලය සම්පාදනය කළ යුතු ය.

ප්‍රත්‍යවෙක්ෂා දෙ පරිදි ය. ප්‍රත්‍යය ප්‍රතිලාභකාලය විසින් හා පරිභොග කාලය විසින් හා සිවුපසය ලත් කල්හි ධාතු විසින් හෝ පිළිකුල් විසින් ප්‍රත්‍යවෙක්ෂා කොට තැබූ සිවුරු ආදිය, එයින් මතු ඒ ඒ ප්‍රත්‍යයානුකූල ව ප්‍රත්‍යවෙක්ෂා කොට වළඳන්නහුගේ පරිභොගය නිවර ද වේ. ලත් වේලෙහි ප්‍රත්‍යවෙක්ෂා නො කළ ද, පරිභොගකාලයෙහි ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුගේ පරිභොගය ද නිවරද ය.

පරිභොගය, ථෙය්‍යාපරිභොග – ඉණපරිභොග – දායජ්ජපරිභොග – සාමිපරිභොග යි සිවු වැදෑරුම් ය.

එහි සොරා කෑම ථෙය්‍යාපරිභොග නම්. දුශ්ශීලයා සහ මැද හිඳ වළඳන්නේ ද, ඔවුන්ගේ ඒ වැළඳීම ථෙය්‍යාපරිභොග යයි. ණය කෑම ඉණපරිභොග නම්. සිල්වත් වූවකු ප්‍රත්‍යවෙක්ෂා නො කොට වැළඳීම ඉණපරිභොගය යි. එහෙයින් සිවුරු අදනා පොරෝණා හැම වේලෙහි ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය. දන් වළඳන වේලේ බත් පිඩක් පාසා ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය. එසේ නො හැක්කහු විසින් පෙරවරු, පස්වරු, පෙරයම, මැදියම, පසුයම ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය. එසේ ප්‍රත්‍යවෙක්ෂා නො කොට සිටියදී ම අරුණ නැගි ගියේ නම්, පරිභොගය ඉණපරිභොගය වේ. සෙනසුන් පරිභොග කරණ හැම විට ම ප්‍රත්‍යවෙක්ෂාව කළ යුත්තී ය. ඛෙහෙත් පිළිගැණීමේ දී හා පරිභොග කිරීමේ දී ද ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය.

පිළිගන්නා වේලේ ප්‍රත්‍යවෙක්ෂා කළ ද පරිභොග කරණ වේලේ ප්‍රත්‍යවෙක්ෂා නො කෙළේ නම්, ඔහුට එය ඇවැත් කරන්නේ වේ. පිළිගැනීමේ දී ප්‍රත්‍යවෙක්ෂා නො කළ ද, වැළඳීමේ දී ප්‍රත්‍යවෙක්ෂා කිරීම ඇවැත් නො කරන්නේ ය. මවු පියන් සතු දෙය කෑම දයජ්ජපරිභොග නම්. මවු පිය පරපුරෙන් එන ජඩගම-ස්ථාවරවස්තු සමූහය දයජ්ජ නම්. මෙහි ඒ නො වේ. මෙහි ලා ගැණෙනුයේ බුදුරජුන් සතු බුදුරජුන් උදෙසා ලැබෙන සිවුපසය යි. බුදුරජුන් සතු ඒ මේ දයජ්ජ ප්‍රධාන-අප්‍රධාන විසින් දෙ පරිදි ය. ඒ දෙවැදෑරුම් දයජ්ජය ම ''අනුජානාමි භික්ඛවෙ! ගහපතිචීවරං'' යනාදී ලෙසින් අනුදත් බැවින් බුදුරජුන් සතුම ය. සප්තවිධ ශෛක්ෂ්‍යයන්ගේ සිවුපසය වැළඳීම දයජ්ජපරිභොග යි ගැණේ. සප්ත ශෛක්ෂ්‍යයෝ ම ය බුදුරජුන්ගේ පුත්‍රයෝ. ඔවුහු බුදුපියානන් අයත් සිවුපසයට දයාදයෝ (උරුමක්කාරයෝ) ව ඒ වළඳන්නෝ ය. සප්තශෛක්ෂ්‍යයන් වළඳනු ලබන්නේ බුදුරජුන් අයත් සිවු පසයෙක් ද, ගිහින් අයත් සිවු පසයෙක් ද යි මෙහි ප්‍රශ්නයක් නැගිය හැකි ය. සිවුපසය ගිහින් විසින් පිළියෙල කරණ ලද ද භික්ෂූන් වහන්සේට ඒ ලැබෙනුයේ බුදුරජුන් අනුදත් බැවින් ම ය. ගිහින් විසින් පුදන සිවුපසය බුදුරජුන් සතුම ය. භික්ෂූහු වළඳන්නේ බුදුරජුන් සතු වූ ම සිවුපසය' යි ඒ ප්‍රශ්නයෙහි ලා දිය යුතු පිළිතුර ය. මෙයට ධම්මදයාදසූත්‍රය සාධක විසින් දක්විය හැකි ය.

මෙසේ සිවු පසය බුදුරජුන් අයත් වුව ද බුදුරජුන් නිසා ම ලැබුන ද ඇතැම් නිර්ලජ්ජී භික්ෂූහු තමන්ගේ කුලය, ධනය, යසස, පාණ්ඩිත්‍යය, ශීලය, වාසනාව නිසා ලැබෙන්නේ ය යි කියමින් උඟුර තෙක් කා බී අපායයට මග පිළියෙල කරති.

රහතුන් වහන්සේගේ සිවුපසය වැළඳීම සාමිපරිභොග නම්. තෘෂ්ණාවට දාසවන ස්වභාවය ඉක්මවා සිටියෝ රහතුන් වහන්සේ ය. එ බැවින් උන්වහන්සේ සිවුපසයෙහි හිමියෝ වෙති.

මෙහි දක් වූ සිවු වැදෑරුම් වූ පරිභොගයන් අතුරෙන් සාමි පරිභොගය හා දයජ්ජපරිභොගය කාටත් වටනේ ය. ඉණපරිභොගය කිසිවකුටත් නො වටනේ ය. ථෙය්‍යපරිභොගයෙහි කවර කතා ද,

සිල්වතුන් ප්‍රත්‍යවෙක්ෂා කොට නුවණින් සලකා කරණ යම් මේ පරිභොගයෙක් වේ ද, එය ඉණපරිභොගයට ප්‍රතිපක්ෂ බැවින් ආණණ්‍ය-පරිභොග නම් වේ. මෙබඳු සිල්වතුන් ශෛක්ෂ්‍යසඞ්ඛ්‍යායෙහි ඇතුළත් වන බැවින් දයජ්ජපරිභොගය හෝ වේ. සිල්වත් තෙමේ ශික්ෂායෙන් යුක්ත බැවින් ශෛක්ෂ්‍ය යි කියනු ලැබේ. මේ පරිභොගයන් අතුරෙහි සාමිපරිභොගය ම ප්‍රධාන ය. එ බැවින් සාමිපරිභොගය පතන්නා වූ මහණහු විසින් යට කියූ ප්‍රත්‍යවෙක්ෂා විධියෙන් පස් විකා වළඳමින් පච්චයසන්නිස්සිත සීලය සැපයිය යුතු ය. එසේ කරණුයේ කෘත්‍යකාරී වන්නේ ය. වදළෝ ම ය.

''පිණ්ඩං වීහාරං සයනාසනං ච
ආපං ච සංඝාටිරජූපවාහනං,
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඩ්ඩාය සෙවෙ වරපඤ්ඤසාවකො,

තස්මා හි පිණ්ඩසයනාසනෙ ච
ආපෙ ච සඩ්ඝාටිරජූපවාහනෙ,
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු,

කාලෙන ලඛා පරතො අනුග්ගහා
බජ්ජෙසු හොජ්ජෙසු ච සායනෙසු,
මත්තං ස ජඤ්ඤු සතතං උපට්ඨිතො
වනස්ස ආලෙපනරූහණෙ යථා''

උතුම් නුවණැති බුදු සවු මහණ තෙමේ ''පටිසංඛා යොනිසො චීවරං පටිසේවති'' යන ඇ දහම් අසා දැන පිඬු - වෙහෙර - සෙනසුන් - සිවුරු හා රජස් සෝද හරිණ දිය පස්වකා වළඳන්නේ ය.

එහෙයින් ඒ මහණ තෙමේ පිඬු-සෙනසුන්-සිවුරු-රජස් සෝද හරිණ දිය යන මේ සිවු පසයෙහි පියුම් පතෙහි වැටුනු දිය බිඳු සේ නො ඇලෙන්නේ ය.

සුදුසු කාලයෙහි අනුන්ගෙන් අනුග්‍රහ වශයෙන් ලත් කෑ යුතු, බීදිය යුතු, රස විඳිය යුතු වස්තූන්හි නිති එළැඹ සිටී සිහි ඇති ඒ මහණ තෙමේ වණයට බෙහෙත් හෙලීමෙහි පමණ දන්නා සේ පමණ දන්නේ ය. පමණ දැන වළඳන්නේ ය.

''කන්තාරෙ පුත්තමංසං ව අක්ඛබස්සබභිඤ්ජනං යථා,
එවං ආහරි ආහාරං යාපනත්ථාය මුච්ඡිතො''

කාන්තාරයෙහි දී පුත් මස් සේ, අකුරෙහි තෙල් ලෑම සේ, තෘෂ්ණාවෙන් මුසපත් නො වූයේ, යැපෙන පමණින් අහර ගන්නේ ය.

භාගිනෙයාසඩ්ඝරක්ඛිත හෙරණ තෙමේ—

''උපජ්ඣායො මං භුඤ්ජමානං සාලිකුරං සුනිබ්බුතං,
මා හෙවං ත්වං සාමණෙර! ජීවිහං ඣාපෙසි'සඤ්ඤතො,

උපජ්ඣායස්ස වචො සුත්වා සංවෙගමලභිං තද,
එකාසනෙ නිසීදත්වා අරහත්තං අපාපුණිං,

සොහං පරිපුණ්ණසඩ්කප්පො චන්දෙ පණ්ණරසි යථා,
සබ්බාසවපරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො''

දවසෙක මාගේ උපාද්ධ්‍යායන් වහන්සේ, ඉතා නිවුනු ඇල්සාලේ බත් වළ දන මට කතා කොට, "උන්නැහේ! අසංයත ව, නො හික්මුනෙක් ව බත් වළඳා දිව පුළුස්සා නො ගණුව' යි කී ය.

එද මම උන්වහන්සේගේ වචනය අසා සංවෙගයට පැමිණියෙමි. සංවෙගය කො තරම් දැ යි කියතොත් මම ඒ ආසනයෙහි ම හිඳ රහත් වීමි.

මම පසළොස් වක් පොහොය ද සඳ සේ පිරිපුන් මනදෙළ ඇත්තේ වීමි. මාගේ සියලු ආසුවයෝ ගෙවී ගියහ. දැන් මට නැවත භවයෙහි ඉපැත්මෙක් නැත්තේ ය.

භාගිනෙය්‍යසඞ්ඝරක්ඛිත හෙරණ තෙමේ මැනවින් පස්විකා වළඳා මේ ප්‍රත්‍යයසන්නිඃශ්‍රිතශීලය සම්පූර්ණ කෙළේ ය.

ප්‍රත්‍යසන්නිඃශ්‍රිතශීලය 'පච්චවෙක්ඛනසුඩි' යි කියනු ලැබේ. "පටිසංඛා යොනිසො" යනාදින් දක්වුනු ප්‍රත්‍යවෙක්ෂාවිධියෙන් පිරිසිදු වන බැවිනි. ගාථාවෙහි ආ 'සීලෙන' යන පදයෙන් කියවුනේ මේ සිවුවැදෑරුම් සීලය යි.

විරියෙන ච = වීර්‍යයෙන් ද,[1]

සමාධිනා = සමාධියෙන් ද.

සමාධි නම්, කුසල් සිතේ එකඟ බවය. නිදෙස් අරමුණෙක මනා සේ පිහිටි කුසල් සිතය. "තත්ථ කතමො සමාධි? යා චිත්තස්ස ඨිති සණ්ඨිති පෙ- සම්මාසමාධි, අයං වුච්චති සමාධි" යන විභඞ්ගපාලිය ඒ පැහැදිලි-කරයි.

"සහජාතානි සම්මා ආධියති පතිට්ඨපෙතීති = සමාධි" යම් චිත්තශක්ති-යක් තොමෝ තමන් හා එක් ව උපන් අනික් චෛතසික ධර්ම, නන් අර මුණෙහි විසිර යා නො දී ඒ ගත් අරමුණෙහි ම මනා කොට තබා ද, ඒ ය සමාධි.

"එකාලම්බනෙ සුට්ඨු ආධානං = සමාධි" සිත හා චෛතසිකධර්ම විසිර යා නො දී එක් අරමුණෙක තැබීම ය සමාධි.

"එකාරම්මණෙ චිත්තං සමං ආධියති තෙන චිත්තන්ති = සමාධි" යම් ධර්මශක්තියකින් සිත එක් අරමුණෙක සම ව තබා ද, ඒය සමාධි.

"ආරම්මණෙ චිත්තං සම්මා ආධියති ඨපෙතීති = සමාධි" අරමුණෙහි සිත මනා කොට තබා ද, ඒ ය සමාධි.

ඒ මේ අත යා නො දී අරමුණු විසින් සෙලවිය නො දී සිත එක ම නිදෙස් අරමුණෙක පැවැත්වීම නැවැත්වීම, සමාධි නම්. හුලං නැති තැන පහන් සිළ නිසල ව සිටින්නා සේ සිත අරමුණෙහි නිසල ව සිටීම ය ඒ.

---

1. I, 6. 'ආරඩවීරියං' යන්නට කළ පරිකථාව බලනු

නහන සුණු, පමණට ලැබූ දිය නිසා ඒ මේ අත නො ගොස් එකට බැඳී සිටින්නා සේ, මේ චිත්තශක්තිය නිසා, චිත්තචෛතසිකධර්ම එක ම අරමුණෙක නිසල ව සිටින්නේ ය. එහි ම ලැගී සිටින්නේ ය. විසිර පවත්නා චිත්තචෛතසිකධර්ම, මේ නිසා එකට කැටි වන්නේ ය. චිත්ත චෛතසිකධර්ම එක අරමුණෙක එකතු කොට කැටි කොට තබන්නේ සමාධිය ය. එකග්ගතා චෛතසිකය යි.

''පරිග්ගහට්ඨයේන = සමාධි'' එකග්ගතාචෛතසිකය ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් විසින් වට කොට ගන්නා ලද බැමින් සමාධි නම්.

''පරිවාරට්ඨයේන = සමාධි'' ශ්‍රද්ධාදිඉන්ද්‍රියයෝ උනුන්ට පිරිවර විසින් සිටියෝ ද එබැවින් සමාධි නම්.

''පරිපූරට්ඨයේන = සමාධි'' ශ්‍රද්ධාදිඉන්ද්‍රියයෝ වැඩීමෙන් පිරිපුන් බවට ගියෝ ද, එබැවින් සමාධි නම්.

'එකග්ගට්ඨයේන = සමාධි'' එක් අරමුණක් බලාපොරොත්තුවෙන් පවත්නා බැවින් සමාධි නම්.

'අවික්ඛෙපට්ඨයේන = සමාධි'' නන් අරමුණුවල නො විසිරීම බලාපොරොත්තුවෙන් සිටුනා බැවින් සමාධි නම්.

'අවිසාරට්ඨයේන = සමාධි'' දිය ලූ නහනසුණු සේ නො විසිර පවත්නා බැවින් සමාධි නම්.

''අනාවිලට්ඨයේන = සමාධි'' කෙලෙස් කිලිටි නැති බැවින්, නො කැළඹුනු බැවින් සමාධි නම්.

''අනිඤ්ජනට්ඨයේන = සමාධි'' නො සැලෙන බැවින් සමාධි නම්.

''විමුත්තට්ඨයේන = සමාධි'' විෂ්කම්භන විසින් හෝ සමුච්ඡේද විසින් කෙලෙසුන්ගෙන් මිදුනු බැවින් හා අරමුණෙහි නො මිදුනු බැවින් හා සමාධි නම්.

''එකත්තපථධ්‍යානවසෙන චිත්තස්ස ඨිතත්තා = සමාධි'' එක් අරමුණෙක දැඩි ව පිහිටීමෙන් අරමුණෙහි සිත නො සැලී පවත්නා බැවින් සමාධි නම්.

''සමං එසතීති = සමාධි'' සමං යි කීවා අර්පණාව ය. විරුද්ධ ධර්මයන් නසන බැවින් අර්පණාවට සමා යි නමෙකි. විරුද්ධධර්මයන් නැති බැවිනුත් අර්පණාව සමා යි හඳුන් වනු ලැබේ. ඒ මේ අර්පණාව අදහස් පරිදි සොයා ද, එබැවින් සමාධි නම්.

''විසමං නෙසතීති = සමාධි'' ධ්‍යානයනට, විරුද්ධ ව සිටි ඒ ඒ විසම ධර්මයන් නො සොයා ද, එබැවින් සමාධි නම්.

''සමං එසිතත්තා = සමාධි'' අර්පණාව සෙවූ බැවින් සමාධි නම්. අර්පණාව සිද්ධ බැවිනි.

"විසමං නෙසිතත්තා = සමාධි" ධ්‍යානයනට විරුඬ ව සිටි ධර්මයන් නො සෙවූ බැවින් සමාධි නම්.

"සමං ආදියතීති = සමාධි" අර්පණාව ගණී නු යි සමාධි නම්.

"විසමං නාදියතීති = සමාධි" ධ්‍යානයනට විරුඬ ව සිටි ධර්මයන් නො ගණී නු යි සමාධි නම්.

"සමං අදිතත්තා = සමාධි" අර්පණාව ගත් බැවින් සමාධි නම්.

"විසමං අනාදිත්තතා = සමාධි" ධ්‍යානයනට විරුඬ ව සිටි ධර්මයන් නො ගත් බැවින් සමාධි නම්.

"සමං පටිපජ්ජතීති=සමාධි" අර්පණාව ලබන්නට පිළිපදිනු යි සමාධි නම්.

"විසමං න පටිපජ්ජතීති = සමාධි" විරුඬ ධර්මයන් ලබන්නට නො පිළිපදිනු යි සමාධි නම්.

"සමං පටිපන්නත්තා = සමාධි" අර්පණාව පිළිපන් බැවින් සමාධි නම්.

"විසමං න පටිපන්නත්තා=සමාධි" විරුඬධර්මයන්ට නො පිළිපන් බැවින් සමාධි නම්.

"සමං ඣායතීති = සමාධි" සම ව දවා නු යි හෝ, සම වූ ආකාරයෙන් දවා නු යි සමාධි නම්. ශාන්ත වූ අර්පණාවට අනුකූලභාවයෙන් සිටි බැවින් සම වූ ආකාරයෙන් පවතී යන අරුත් ය.

"විසමං ඣාපෙතීති = සමාධි" සමාධියට විරුඬ වූ ධර්මයන් දුරු කිරීමෙන් දවා හරිණු යි සමාධි නම්.

"සමං ඣාපිතත්තා = සමාධි" සම වූ ආකාරයෙන් දවූ බැවින් සමාධි නම්.

"විසමං ඣාපිත්තා = සමාධි" සමාධියට විරුඬ වූ ධර්මයන් දවූ බැවින් සමාධි නම්.

මෙසේ පස්විසි අයුරකින් කියූ සමාධ්‍යර්ථ එක් තැන් කොට දක්වනුවෝ සමාධානට්ඨෙන = සමාධි" යි කීහ. සමාධානාර්ථයෙන් සමාධි යනු එහි අරුත් ය. "සම්මා අවික්ඛෙපනවසෙන ආධානං සමාධානං" නො විසිර මනා කොට පැවැත්මය සමාධාන. යම් ධර්මයක්හුගේ අනුභාවයෙන් චිත්තචෛතසිකධර්මයෝ එක් අරමුණෙක සන්සිඳී නො විසිර අතැන මෙතැන නො ගොස් සිටිත් ද, ඒ සමාධානැ යි දත යුතු ය.

සමාධිය ප්‍රමුඛලක්ෂණ ද අවික්ෂෙපලක්ෂණ ද අවිසාරලක්ෂණ ද ඇත්තේ වේ. "පාමොක්ඛලක්ඛණො අවික්ඛෙපලක්ඛණො වා අවිසාරලක්ඛණො වා සමාධි" යනු දන්නේ ය.

සියලු කුශලධර්මයෝ සමාධිය ප්‍රමුඛ කොට සිටියෝ ය. සමාධියට මිටි ව සිටියෝ ය. සමාධියට අනුව ගියෝ ය. සමාධියට නැමී සිටියෝ ය. උඩුමාලයෙහි කූටාගාරයාගේ සියලු ගොනැස් කූටයට මිටි ව

කූටයට නැමී එහි ම ගැලී සිටී බැවින් සියලු ගොනැස්වලට කූටය ම ප්‍රමුඛ වන්නා සේ ය. යුදට වන් බළ සෙනග රජු ම ප්‍රධාන කොට සිටියේ ය. මේ සමාධිහුගේ ප්‍රමුඛ ලක්ෂණය යි.

චිත්තචෛතසිකධර්ම ගෙණ ගොස් ඒ ඒ අරමුණුවල නො බහා ලීම සමාධිහුගේ අවික්ෂෙපලක්ෂණය යි. සිතෙහි මේ ඇති කල්හි සිතත් සිතිවිලිත් අන් අරමුණු කරා නො යත්.

නහනසුණට දිය ලූ කල්හි නො විසිර පවත්නා සේ චිත්තචෛතසිකධර්ම ඒ ඒ අරමුණුවල නො විසිර පැවැත් ම විසිර යා නො දීම සමාධිහුගේ අවිසාරලක්ෂණය යි.

සමාධිය, සහජාතධර්මයන් අරමුණෙහි ලා කැටි කිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. චිත්තචෛතසිකධර්මයන්ගේ වැටුම බැහුම නැසීම හෝ කෘත්‍යය කොට ඇත්තේ ය. "සහජාතානං ආරම්මණෙ සම්පිණ්ඩනරසො චික්ඛෙපවිද්ධංසනරසො වා" යනු එහි ලා දන්නේ ය. සමාධිය චිත්තචෛතසිකධර්ම සන්සිඳවීම පල කොට ඇත්තේ හෝ නුවණ පල කොට ඇත්තේ හෝ උඩඟුකමින් චිත්තචෛතසිකධර්මයන්ගේ නො සැලෙන බව පල කොට ඇත්තේ හෝ ය. මේ ඒ කියූ සැටි. "උපසමපට්ච්චුපට්ඨානො ඤාණපච්චු පට්ඨානො වා අවිකම්පනපච්චුපට්ඨානො වා" යි. "සමාහිතො යථාභූතං පජානාති පස්සතීති" යි වදළ බැවින් ඒ ඉතාපැහැදිලි ය. එකඟ වූ සිතැත්තේ නියම තතු දනී යනු එහි සිංහල ය.

සමාධිය සැපය ආසන්නකාරණය කොට සිටියේ ය. "සමාධි සුඛ පදට්ඨානො" යි කීයේ එහෙයිනි. මෙහි ලා නිරාමිෂසුඛය ම ගන්නේ ය. "සුඛිනො චිත්තං සමාධියතීති" වදළ බැවින් විශෙෂ විසින් සමාධියට ආසන්නකාරණය වනුයේ සැපය ම ය. සිත එකඟ කළ හැක්කේ සුඛිත පුද්ගලයාහට බැවිනි.

සමාධිය අවික්ඛෙපලක්ෂණයෙන් එක් වැදෑරුම්. උපචාර අප්පණා විසින්, ලෞකික - ලොකුත්තර විසින්, සප්පීතික - නිප්පීතික විසින්, සුඛ සහගත – උපෙක්ඛාසහගත විසින් දෙවැදෑරුම්. හීන - මජ්ඣිම - පණීත විසින්, සවිතක්කසවිචාර – අවිතක්කවිචාරමත්ත – අවිතක්කඅවිචාර විසින්, පීතිසහගත – සුඛසහගත – උපෙක්ඛාසහගත විසින්, පරිත්ත – මහග්ගත – අප්පමාණ විසින් තෙවැදෑරුම්. දුක්ඛාපටිපදදන්ධාභිඤ්ඤ - දුක්ඛාපටිපදඛිප්පාභිඤ්ඤ-සුඛාපටිපදදන්ධාභිඤ්ඤ සුඛාපටිපදඛිප්පාභිඤ්ඤ විසින් පරිත්ත පරිත්තාරම්මණ – පරිත්තඅප්පමාණ රම්මණ - අප්පමාණපරිත්තාරම්මණ– අප්පමාණඅප්පමාණාරම්මණ විසින්, පඨමජ්ඣාන – දුතියජ්ඣාන – තතියජ්ඣාන - චතුත්ථජ්ඣාන විසින්, හානභාගීය - ඨිතිභාගීය විසෙසභාගීය– නිබ්බෙධභාගීය විසින්, කාමාවචර – රූපාවචර – අරූපාවචර – අපරියාපන්න විසින්, ඡන්ද - විරිය – චිත්ත – විමංසා විසින් සිවුවැදෑරුම්. ධ්‍යාන පිළිබඳ පංචකනයයෙහි ලැබෙන ධ්‍යානපංචකයාගේ වශයෙන් පස්වැදෑරුම්.

එකග්ගතාවෙතසිකය, උඩහු බවෙන් තොර වූයේ අවික්ඛෙප ලක්ඛණ සමාධි නම්. "චිත්තස්සෙකග්ගතා අවික්ඛෙපෝ සමාධි."

බුඩානුස්සති ආදී වූ කමටහන් සඳෙන හා මරණානුස්සති - උපසමානුස්සති- ආහාරෙ පටික්කූලසඤ්ඤ - චතුධාතුවවත්ථාන යන සිවුකමටහන් වැඩීම නිසා කාමරාග - ව්‍යාපාද - ථීනමිඩ - උඩච්ච කුක්කුච්ච - අවිජ්ජා යන පංචනිවරණයන්ගේ යටපත් වීමෙන් කාමාවචරචිත්තයෙහි හට ගන්නා එකඟකම අර්පණා සමාධියට පෙරටුව අර්පණාසමාධිය ලඟ හැසිරෙන බැවින් උපචාරසමාධි නම්.

ප්‍රථමධ්‍යානචිත්තවීථියෙහි ලැබෙන පරිකර්මචිත්තය, ප්‍රථමධ්‍යාන චිත්තයට අනන්තරප්‍රත්‍යය වසින් ප්‍රත්‍යය වන්නේ ය යි වදළ බැවින් එහි පරිකර්මචිත්තයට අනතුරුව උපදනා ප්‍රථමධ්‍යානචිත්තය හා එක්ව පවත්නා එකඟකම අප්පණාසමාධි නම්. විතර්කාදිධ්‍යානාඞ්ග පහළ වීමෙන් රූපාවචරභාවයට හෝ අරූපාවචරභාවයට ගිය සිතෙහි බලවත් එකඟකම ය ඒ. සිත හා සිනිවිලින් අරමුණට නඟන්නී අප්පණාය. ඒ නම් විතර්කය යි. රූපාවචරසිත්වල හා අරූපාවචර සිත්වල හට ගැණෙන විතර්කය ඉතා බලවත් ව චිත්තචෙතසික, අරමුණට නගන බැවින් චිත්තචෙතසික යන් අරමුණෙහි දැඩිව ඔප්පු කරණ බැවින් අප්පණා යි කියනු ලැබේ.

ප්‍රථමධ්‍යානය උපදවනු කැමැති යොගාවචරයා චරිතානුකූල වූ කමට හතක් ගෙණ ඒ වඩනා කාලයෙහි ධ්‍යානය ලැබීමේ දී ඔහුට, මනොවාර යාගේ ඉදිරියට පැමිණි අරමුණක් එල්බ ගෙණ ජවන් පසකින් යුත් චිත්ත වීථියක් පහළ වේ. අරමුණ මනොද්වාරයට හමු වූ කල්හි භවඞ්ගචලනයත් භවඞ්ගුපච්ඡේදයත් වන්නේ ය. ඉන් පසු මනොවාරාවජ්ජනය උපදින්නේ ය ඒ මනොවාරාවජ්ජනයට අනතුරු ව ජවන් සිත් පහළ වේ. එහි පළමුවන ජවනය පරිකර්ම නම්. දෙවන ජවනය උපචාර නම්. තෙවන ජවනය අනුලොම නම්. සතරවන ජවනය ගොත්‍රභූ නම්. පස්වන ජවනය ධ්‍යාන නම්. මේ ජවන් පසෙහි උපචාර නමින් ගත් දෙවන ජවනයෙහි යෙදී සිටී එකඟකම (එකග්ගතාචෙතසිකය) උපචාර සමාධි නම් වේ. ඉතා ලඟත් ඉතා දුරත් නො වැ සමීපයෙහි හැසිරෙමින් කල් නො යවා අර්පණාව ගෙණ දෙන බැවින් උපචාර යි කියනු ලැබේ. සතරවන ගොත්‍රභූජවනය නිරුඬවත් ම පස්වැනි ව උපදනා ධ්‍යානචිත්තය හා එක් ව සිටී එකඟකම (එකග්ගතාචෙතසිකය) අප්පණා සමාධි නම්. ධ්‍යානය ලඟ හැසිරෙණ බැවින් උපචාර. කෙලෙස් යටපත් වන බැවින් අප්පණා.

කාම-රූප-අරූප භූමීන්හි සත්ත්වයන් විසින් උපදවනු ලබන කුශල චිත්තවීථීන්හි යෙදී සිටී එකඟබව ලෞකියසමාධි නම්.

කාම රූප-අරූප භූමීන්හි සත්ත්වයන් විසින් ධ්‍යානලාභී ව එම පාදක කොට හෝ සම්මර්ශනය කොට උපදවන ආර්‍යමාර්ගයන්හි වූ එකඟ බව ලෝකුත්තරසමාධි නම්.

චතුෂ්කනය විසින් ධ්‍යානය සතරකට බෙදුනු කල්හි එහි පළමුවන දෙවන ධ්‍යානවිත්තවීථීන්හි ද, පංචකනය විසින් ධ්‍යානය පසකට බෙදුනු කල්හි එහි පළමුවන දෙවන තෙවන ධ්‍යානවිත්තවීථීන්හි ද යෙදෙන එකඟ බව ප්‍රීති චෛතසිකය හා යෙදුනු බැවින් සප්පීතිකසමාධි නම්.

චතුෂ්කනය විසින් ධ්‍යානය සතරකට බෙදුනු කල්හි එහි තෙවන සතර වන ධ්‍යානවිත්තවීථීන්හි ද, පංචකනය විසින් බෙදුනු කල්හි එහි සතරවන පස්වන ධ්‍යානවිත්තවීථීන්හි ද යෙදෙන එකඟබව ප්‍රීතිචෛතසිකය හා නො යෙදෙන බැවින් නිප්පීතිකසමාධි නම්.

මේ මෙසේ වුව ද සප්පීතික - නිප්පීතිකසමාධීන්ගේ උපචාරය නානාවජ්ජනවීථියෙහි දී සප්පීතික ද නිප්පීතික ද වන්නේ ය. එකාවජ්ජනවීථියෙහි ජවන් සත පිළිබඳ වෙදනාචෛතසිකය නො පෙරළෙන බැවින් ප්‍රථම - ද්විතීයධ්‍යානයන්ගේ උපචාරසමාධිය සප්පීතික ම වේ. තෘතීය-චතුර්ථ-පංචමධ්‍යානයන්ගේ උපචාර සමාධිය නිප්පීතික ම වේ. "සබ්බෙසම්පි ඣානානං නානාවජ්ජන වීථියං උපචාරසමාධි සියා සප්පීතිකෝ, සියා නිප්පීතිකෝ, එකාවජ්ජනවීථිම්පන ආදිතෝ දුකනිකජ්ඣානානං උපචාරසමාධි සප්පීතිකෝව, ඉතරෙසං නිප්පීතිකෝව, විසභාගවෙදනස්ස චිත්තස්ස ආසවනප්පවෙයත්තාභාවතෝ, එකවීථියං වෙදනාපරිවත්තානාභාවතෝ" යනු ටීකා ය.

ධ්‍යානය සතරට බෙදන කල්හි එහි ප්‍රථම-ද්විතීය-තෘතීය ධ්‍යානවීථීන්හි ද, පසට බෙදන කල්හි එහි ප්‍රථම-ද්විතීය-තෘතීය-චතුර්ථධ්‍යාන වීථීන්හි ද යෙදෙන එකඟබව සුඛවේදනාසහගත බැවින් සුඛසහගතසමාධි නම්.

ධ්‍යානය සතරට බෙදන කල්හි චතුර්ථධ්‍යානවිත්තවීථියෙහි ද, පසට බෙදන කල්හි පංචමධ්‍යානවිත්තවීථියෙහි ද යෙදෙන එකඟ බව උපෙක්ෂා වේදනාසහගත බැවින් උපෙක්ඛාසහගතසමාධි නම්. එහි ම උපචාර සමාධිය යට කී ලෙසින් සුඛවේදනාසහගත ද උපෙක්ෂා වේදනාසහගත ද වේ. "එත්ථාපි චුත්තනයෙනෙව අත්ථෝ වෙදිතබ්බෝ" යි කීයේ එහෙයිනි.

පිළිලැබූ පමණින් සිටියේ ඝීනසමාධි නම්. පළමු කොට ලැබූ භාවූරා කියා ලැබූ සමාධිය අනාසෙවිත අබහුලීකෘත බැවින් හැම අතින් දුර්-වල ය. එබැවින් ඝීන යි කියනු ලැබේ. තව ද සමාධිය උපදවන්නට, වඩන්නට, මහන්සි ගන්නා කලෙහි දී ඡන්ද - චිත්ත - විරිය - වීමංසා යන මොවුහු ලාමක ව පැවැත්තෝ ද, එයින් ද සමාධි ඝීන වේ. එසේ ම මහත් පින් පල කැමැති ව පැවැත්තෝ ද ඝීන වේ. භවයම්පත්තිය පිණිස පැවැත්මෙන් හා ව්‍රත්තාඛ්‍යාසයාගේ වශයෙන් හෝ පැවැත්මෙන් ද ඝීන වේ.

වැඩියක් නො වැඩුනු වැඩි කලක් නො වැඩූ, නො සෙවුනු සමාධිය, වැඩියක් ප්‍රගුණභාවයට නො පැමිණි බැවින් මජ්ඣිමසමාධි නම්. භීනප්-පණීතසමාධින්ගේ මැද සිටී බැවින් මජ්ඣිම යි කියනු ලැබේ. සමාධිය පිණිස වැයම් කරණ වේලෙහි ඡන්ද - චිත්ත – විරිය – වීමංසා යන මොවුහු මධ්‍යම වූවාහු නම් සමාධිය ද, මජ්ඣිම වේ. ලෞකිකඅභිඥාවන් සපයනු පිණිස පැවැත්මෙන්, හුදෙක් අලොභාඛ්‍යාසයාගේ වශයෙන් පැවැත්මෙන්, විවේකාඛ්‍යාසයාගේ වශයෙන් පැවැත්මෙන් මජ්ඣිම වේ.

මනා කොට පුහුණු කළ වසඟබවට පැමුණුනු සමාධිය පණීත සමාධි නම්. සමාධිය පිණිස වැයම් කරණ වේලෙහි ඡන්ද-චිත්ත-විරිය වීමංසා යන මොවුහු ප්‍රණීත වූවාහු නම්, සමාධිය ප්‍රණීත වේ. විවේකය කැමැත්-තෙන් ආයත්තභාවයෙහි සිටීයහු විසින් වඩන ලද්දේ ද, පරහිතය පිණිස වඩන ලද්දේ ද, නිර්වාණාඛ්‍යාසයාගේ වශයෙන් පැවැත්තේ ද ප්‍රණීත වේ.

උපචාරසමාධිය හා ප්‍රථමඛ්‍යානසමාධිය විතර්ක – විචාරයන් හා යෙදී සිටුනා බැවින් සවිතක්කසවිචාරසමාධි නම්. ධ්‍යානය පසට බෙදීමෙහි දී ලැබෙන විතීයඛ්‍යානසමාධිය විතර්කය නැත්තේ විචාරය ඇත්තේ අවිතක්කවිචාරමත්තසමාධි නම්. යම් යොගාවචරයෙක් විතර්කයෙහි පමණක් ම දෙස් දක විචාරයෙහි දෙස් නො දක්නේ, හුදෙක් විතර්කප්‍රහා-ණය පමණක් කැමැත්තේ ප්‍රථමඛ්‍යානය ඉක්මවා යේ ද, ඔහු ලත් ඒ සමා ධිය අවිතක්කවිචාරමත්තසමාධි නම් වේ.

ධ්‍යානය සතරට බෙද ගත් කල්හී එය විතීය–තෘතීය–චතුර්ථධ්‍යානයන් හි ද පසට බෙද ගත් කල්හි එහි තෘතීය-චතුර්ථ-පඤ්චමධ්‍යානයන්හි ද යෙදුනු එකඟබව විතක්කවිචාරරහිත බැවින් අවිතක්කඅවිචාරසමා නම්.

චතුෂ්කනයෙහි ලා ප්‍රථම-විතීයඛ්‍යාන දෙක්හි ද, පංචකනයෙහි ලා ප්‍රථම-විතීය තෘතීයඛ්‍යාන තුණෙහි ද යෙදුනු එකඟ බව පීතිසහගතසමාධි නම්.

චතුෂ්ක-පංචකනයෙහි ලා තෘතීය-චතුර්ථධ්‍යාන දෙක්හි යෙදුනු එකඟ බව සුඛවේදනාව හා යෙදුනු බැවින් සුඛසහගතසමාධි නම්.

චතුෂ්ක-පංචකනය දෙක්හි කෙළවර ලැබෙන සතරවන පස්වන ධ්‍යාන යන් හා යෙදුනු එකඟබව උපෙක්ඛාවේදනාවෙන් යෙදුනු බැවින් උපෙක්ඛා සහගතසමාධි නම්. මේ දෙකැන්හි ම උපචාරසමාධිය ප්‍රීති-සුඛ දෙකින් ම සහ යුක්ත වේ. උපෙක්ඛාසහගත හෝ වේ.

උපචාරඛ්‍යානයෙන් යුත් සිතෙහි ලැබෙන එකඟබව කාමාවචර බැවින් පරිත්තසමාධි නම්. ප්‍රතිපක්ෂධර්මයන්ගෙන් කැඩුනු බැඳින් ද අනුභාවය මද බැවින් ද පරිත්ත යි කියනු ලැබේ.

රූපාවචර-අරූපාවචරකුශලචිත්තයන් හා එක් වූ එකග්ගතාව කෙලෙස් යට පත් කරණ බැවින්, මහත් ඵල බැවින් දීර්ඝසන්තාන බැවින් මහත් වූ හෝ උද්ධර වූ ඡන්දාදීන් කරණ කොට පිළිපන් බැවින් මහග්ගතසමාධි නම්.

ආර්‍යමාර්ගවිත්තවීථීන්හි යෙදෙන එකග්ගතාව අරමුණු කිරීම වශයෙනුදු ප්‍රමාණකරධර්මයක් මෙයට නැති බැවිනුදු අප්පමාණසමාධි නම්.

ධ්‍යාන වඩන්නහු විසින් පඨකසිණාදී වූ අරමුණක් ගෙණ කරන්නා වූ පළමුවන ධ්‍යානභාවනාවෙහි පටන් ඒ ඒ ධ්‍යානය පිළිබඳ උපචාරවිත්තය දක්වා පැවැති සමාධිභාවනාව පටිපද නම් වේ. උපචාරය පටන් අර්පනාව දක්වා පැවැති ප්‍රඥාව අභිඤ්ඤා නම් වේ. නීවරණාදිවිරොධධර්මයන්ගේ පැවැත්ම බහුල බැවින් ඒ මේ ප්‍රතිපදාව ඇතැම් යොගාවචරයන්ට දුක් වන්නී ය. සේවනය පහසු නො වේ. අභිඤ්ඤාව ද එකකුට ලැසි ය. මද ය. වහා නො පවතී. යමෙක් නො සැප වූ ආවාසාදිය සේවනය කෙරේ ද, ඔහුට ප්‍රතිපදාව දුක් වන්නී ය. අභිඤ්ඤාව ලැසිව පවතී. වහා නො පවතී. තව ද කුඩා මහත් පළිබොධයන් සිදු හැරීම් ආදී වූ පූර්වකෘත්‍යයන් නො සපයා භාවනාවෙහි යෙදුනහුට ප්‍රතිපදාව දුක් වන්නී ය. දශවිධ අර්පණා කෞශල්‍යයන් නො සපයන්නාහට අභිඤ්ඤාව වහා නො වන්නී ය. තවද තෘෂ්ණාවෙන් මැඩුනහුට ප්‍රතිපදාව දුක් වන්නී ය. අවිද්‍යාවෙන් මැඩුනහුට අභිඤ්ඤාව වහා සිදු නො වන්නී ය. යමෙක් පෙර බවයෙක සමථභාවනා නො කෙළේ ද, ඔහුට ප්‍රතිපදාව දුක් වන්නී ය. යමෙක් විදර්ශනාභාවනා නො කෙළේ ද ඔහුට අභිඤ්ඤාව වහා සිදු නො වන්නී ය. දැඩි වූ කාමච්ඡන්දාදී වූ කෙලෙස් ඇති මෘදු වූ ශ්‍රද්ධාදීන්ද්‍රියයන් ඇත්තහුට ප්‍රතිපදාව දුක ය. අභිඤ්ඤාව වහා නො වන්නී ය. එහෙයින් යමෙක් දුඃඛප්‍රතිපත්තියෙන් ද, ලස් වූ අභිඤ්ඤාවෙන් ද සමාධියට පැමිණෙන්නේ ද, ඔහුගේ ඒ සමාධිය දුක්ඛාපටිපදදන්ධාභිඤ්ඤ නම්.

ප්‍රතිපදාව දුක් වන සැටි පෙ කියේ ය. සැප වූ ආවාසාදිය සේවනය කිරීමෙන් ද අභිඤ්ඤාව තියුණු වන්නී ය. දශවිධඅර්පණා කෞශල්‍යයන් සම්පාදනය කරන්නහුට ද අභිඤ්ඤාව විශද වන්නී ය. අවිද්‍යාවෙන් නො මැඩුනහුගේ ද අභිඤ්ඤාව ප්‍රකට වන්නී ය. යමෙක් පෙර බවයෙක විදර්ශනා භාවනා කෙළේ නම්, ඔහුට අභිඤ්ඤාව තියුණු වන්නී ය. තියුණු වූ ශ්‍රද්ධාදීන්ද්‍රියයන් ඇත්තහුගේ ද අභිඤ්ඤාව ආලෝකවත් ය. එහෙයින් යමෙක් දුඃඛප්‍රතිපත්තියෙන් ද වහා සැපයෙන අභිඤ්ඤාවෙන් ද සමාධියට පැමිණෙන්නේ ද, ඒ සමාධිය දුක්ඛාපටිපදඛිප්පාභිඤ්ඤ නම්.

නීවරණාදිවිරුඬධර්මයන්ගේ නො වීමෙන් ප්‍රතිපදාව සැපවන්නී ය. සේවනය පහසු වේ. සැප වූ ආවාසාදිය සේවනයෙන් ද ප්‍රතිපදාව පහසු වන්නී ය. සැප වන්නී ය. කුඩා පළිබොධ සිදු දැමීම ආදී වූ පූර්වකෘත්‍යය සපයන්නාහට ද ප්‍රතිපදාව සැප වන්නී ය. තෘෂ්ණාවෙන් නො මැඩුනහුටත් ප්‍රතිපදාව සැප වන්නී ය. යමෙක් පෙර බවයෙක සමථභාවනා කෙළේ නම්, ඔහුට ද ප්‍රතිපදාව සැප වේ. මද වූ කෙලෙස් ඇති මොළොක් වූ ශ්‍රද්ධාදීන්ද්‍රියයන් ඇත්තහුට ද ප්‍රතිපදාව සැප වන්නී ය. මෙසේ සුඛප්‍රතිපත්තියෙන් ද ලස් වූ අභිඤ්ඤාවෙන් ද යමෙක් සමාධියට පැමිණෙන්නේ ද, ඔහුගේ ඒ සමාධිය සුඛාපටිපදදන්ධාභිඤ්ඤ නම්.

සුඛප්‍රතිපත්තියන් ද වහා ලැබෙන අභිඥාවන්ගෙන් ද යුත් සමාධිය සුඛාපටිපදඛිප්පාභිඤ්ඤ නම්.

යම් සමාධියක් වශීභාවයට නො පමුණු වන ලද්දේ, මතු ධ්‍යානයන්ට උපකාර වන්නට නො පොහොසත් වේ ද, අල්පානුභාව ඇති බැවින් ඒ සමාධිය පරිත්තපරිත්තාරම්මණ නම්.

යම් සමාධියක් එකඟුලක් දෙයඟුලක් පමණ ද නො වැඩුනු කිසුණු අරමුණෙහි පැවැත්තේ ද, ඒ සමාධිය පරිත්තඅප්පමාණාරම්මණ නම්.

යම් සමාධියක් ප්‍රගුණ ද, මනා කොට වඩනා ලද්දේ ද, මතු ධ්‍යානය නට උපකාර වීමෙහි සමර්ථ වේ ද, ඒ සමාධිය අප්පමාණපරිත්තාරම්මණ නම්.

යම් සමාධියක් එකඟුලක් දෙයඟුලක් පමණත් වැඩුනු කිසුණු අරමුණෙහි පැවැත්තත් ද, ඒ සමාධිය අප්පමාණඅප්පමාණාරම්මණ නම්.

මෙහි පළමුවන සිවුවන සමාධීන්ට කියන ලද ලක්ෂණ මිශ්‍ර වීමෙන් දෙවන තෙවන සමාධීන්ගේ ව්‍යාමිශ්‍රකතය දත්තේ ය.

යටපත් කළ කාමච්ඡන්දාදීන් ඇති විතක්ක-විචාර-ප්‍රීති-සුඛ-සමාධි යන මොවුන්ගේ වශයෙන් අඞ්ග පසකින් යුත් ප්‍රථමධ්‍යානය පඨමජ්ඣාන සමාධි නම්.

සන්සිඳී ගිය විතක්ක-විචාර ඇති අඞ්ග තුනකින් යුත් විතීයධ්‍යානය දුතියජ්ඣානසමාධි නම්.

ප්‍රීතිය ඉක්මවා සිටී හෙවත් ප්‍රීතියෙන් ද තොර වූ පිළිකුල් කළ ප්‍රීතිය ඇති අඞ්ග දෙකකින් යුත් තෘතීයධ්‍යානය තතියජ්ඣාන සමාධි නම්.

ප්‍රහීණ වූ සුඛවේදනා ඇති උපෙක්ෂාවෙදනාසමාධිනුගේ වශයෙන් දෙයඟක් ඇති චතුර්ථධ්‍යානය චතුත්ථජ්ඣානසමාධි නම්.

ප්‍රථමද්ධ්‍යානලාභීයොගාවචරයාහට කාමාස්වාදහේතුවෙන් වස්තුකාම ක්ලේශකාමාලම්බන ඇති සංඥාමනස්කාරයෝ, ජවනාවර්ජනයෝ වෙත් නම්. ඔහුගේ ධ්‍යානප්‍රඥාව භානභාගිනී නම් වූවා. ඒ මේ භානභාගිනී ප්‍රඥාව හා යෙදුනු සමාධිය භානභාගිය නම්. ඒ ඒ ධ්‍යානයට විරුද්ධ වූ නීවරණ විතක්ක-විචාරාදීන්ගේ පැවැත්මේ හෙතුවෙන් මොහුගේ භාන භාගීය භාවය වන්නේ ය. පිරිහීම යෙවුනේ හෝ පිරිහීම මොහුට ඇත්තේ හෝ භානභාගීය නම්. කිලෙස සමුදාචාර-අසප්පායකිරියා අනනුයොග යන කරුණු තුන නියා පිරිහෙන්නේ ය. එහිදු කම්මාරාමතා-භස්සාරාමතා-නිද්දාරාමතා-සඞ්ගණිකාරාමතා යන මෙහි එක්වන් යෙදීමෙන් ක්ලෙශසමුදාචාරය හෙතුකොට වහා පිරිහෙයි. අසප්පායක්‍රියාවෙන් පිරිහෙන්නේ ලැසි ව පිරිහෙයි. ගිලන්බව-සිවුපසයෙහි විකලබව යනාදී වූ පළිබොධයන්

හෙතු කොට නිතර ධ්‍යානයට නො පැමිණෙන්නේ ය. නිතර නො යෙදී මෙන් පිරිහෙන්නේ ද, ලැසි ව පිරිහෙයි. මෙහිලා කියන ලද්දේ පිරිහීමේ බලවත් කාරණ ය යි. ක්ලෙශසමුදාවාරයය ඒ. ක්ලෙශසමුදාවාරය ප්‍රථම-ඩ්‍යානයාගේ පිරිහීමේ බලවත් කාරණය වේ. අනික් චිතීයඩ්‍යානාදියෙන් පිරිහෙන්නේ යට යට ධ්‍යානයන් පැතීමෙනි.

ප්‍රථමද්ධ්‍යානලාභියොගාවචර තෙමේ ඒ ධ්‍යානයට සුදුසු වූ සිහිය පිහිටුවාලයි නම්, ඒ ධ්‍යානප්‍රඥාව ස්ථිතිභාගිනීප්‍රඥා නම් වා. ඒ මේ ස්ථිති භාගිනීප්‍රඥාව හා යෙදුනු සමාධිය ඨිතිභාගීය නම්. මොහුගේ ස්ථිතිභාගීය භාවය එයට සුදුසු වූ සිහිය පිහිටීමෙන් වන්නේ ය. බලාපොරොත්තුව නො හැරීමෙන් පැවැත්ම සෙවුනේ නු යි ඨිතිභාගීය නම්.

විතර්කරහිත වූ චිතීයඩ්‍යානය කෙසේ උපද වන්නෙම් දෝ යි අවිතක්කාරම්මණ වූ සංඥාමනස්කාරයෝ, ජවනාවර්ජනයෝ වෙත් නම්, ඒ ධ්‍යානප්‍රඥාව මතු ධ්‍යාන ලැබීමට ආසන්නකාරණ වන බැවින් විශෙෂ භාගිනීප්‍රඥා නම් වා. ඒ මේ විශෙෂභාගිනීප්‍රඥාව හා යෙදුනු සමාධිය විසෙසභාගීය නම්. මෙහි විශෙෂභාගීයභාවය වන්නේ ධ්‍යානයෙන් මත්තෙහි මගපල ලැබීම් වශයෙනි.

ප්‍රථමඩ්‍යානලාභියොගාවචරයාගේ සත්‍යප්‍රතිවෙධය සහගියා වූ සංඥා-මනස්කාරයෝ බලවත් විදර්ශනාව හා යුක්ත වූවාහු නම්, ඒ ධ්‍යානප්‍රඥාව නිර්වෙධභාගිනිප්‍රඥා නම් වා. ඒ මේ නිර්වෙධභාගිනීප්‍රඥාව හා යෙදුනු සමාධිය නිබ්බෙධභාගීය නම්. මෙහි නිබ්බෙධභාගීය භාවය වන්නේ විදර්-ශනාලම්බන වූ සංඥාමනස්කාරයන්ගේ සමුදාවාර වශයෙනි.

ධ්‍යානචිත්තවීථියෙහි උපචාර නමින් ලකුණු වන ධ්‍යානචිත්තය හා යෙදී සිටි එකඟබව කාමාවචරසමාධි නම්.

රූපාවචරඩ්‍යානචිත්තය හා යෙදී සිටි එකඟබව රූපාවචරසමාධි නම්.

අරූපාවචරඩ්‍යානයෙහි වූ එකඟබව අරූපාවචරසමාධි නම්.

ලොකොත්තරද්ධ්‍යානචිත්තයෙහි යෙදුන එකඟබව අපරියාපන්න-සමාධි නම්. මේ සමාධිය ලොකයට ඇතුළත් නො වන බැවින් මෙ නමින් හඳුන් වනු ලැබේ. කාමාවචර-රූපාවචර-අරූපාවචර සමාධි, ත්‍රෛභූම කවුත්තයෙහි ඇතුළත් වන බැවින් පරියාපන්න නමින් හඳුන්වත්.

කත්තුකම්‍යතාකුසලච්ඡන්දය අධිපති කොට ලැබූ එකඟබව ඡන්දසමාධි නම්.

වීර්‍යය අධිපති කොට ලැබූ එකඟබව විරියසමාධි නම්. යම් මහණෙක් වීර්‍ය අධිපති කොට, ධුර කොට, දෙටු කොට යම් සමාධියක්, සිතෙහි එකඟබවක් ලබා ද ඒ ය විරියසමාධි.

සිත අධිපති කොට ලැබූ එකඟබව චිත්තසමාධි නම්. මහණ තෙමේ සිත අධිපති කොට, පෙරටු කොට, දෙටු කොට යම් සමාධියක්, සිතෙහි එකඟබවක් ලබා ද ඒ ය චිත්තසමාධි.

ප්‍රඥාව අධිපති කොට ලැබූ එකඟබව විමංසාසමාධි නම්. යම් සමාධියක්, සිතෙහි එකඟබවක් ප්‍රඥාව අධිපති කොට, පෙරටු කොට, දෙටු කොට ලබා ද ඒ ය විමංසාසමාධි.

ධ්‍යානය පසක් කොට බෙදීමෙහි දී චතුක්කනය විසින් දක් වූ ප්‍රභෙදයෙහි යම් චිතීයඩ්‍යානයෙක් වී ද, ඒ ධ්‍යානය විතර්කමාත්‍රයක් ඉක්ම වීමෙන් චිතීයඩ්‍යාන නම් වේ. විතර්කවිචාර දෙදෙනා ගේ ඉක්මීමෙන් තෘතීයඩ්‍යාන නම් වේ. මෙසේ එය දෙකක් කොට වෙන් කිරීමෙන් ධ්‍යානය පහට බෙදා ගත යුතු ය. මෙසේ බෙදුනු ඒ ධ්‍යාන පසට අඞ්ග වූ විතර්කාදී වූ පස සමාධි පසෙක් වේ. පංචජ්ඣානඞ්ග වශයෙන් සමාධියගේ පංචවිධ භාවය දන්නේ ය. මෙහි ලා විතර කැමැත්තහුට පටිසම්භිදමග්ගපාළිය බැලිය හැකි ය.

සමාධිසංකිලෙසය = කුසල් සිතෙහි එකඟබව කෙලෙසීම සමාධිසංකිලෙස නම්. වැඩියක් පුරුදු නො කළා වූත් නො වැඩූත් ප්‍රථම ඩ්‍යානාදියෙන් නැගී සිටි කම්සැප විෂය කොට ඇති සංඥාමනස්කාරයන්ගේ, ජවනාවර්ජනයන්ගේ පැවැත්මය ඒ. ඒ හෙතුවෙන් ධ්‍යානය පිරිහේ. ධ්‍යානය කිලිටි වේ.

සමාධිවොදනය = කුසල් සිතෙහි වූ එකඟබවෙහි පිරිසිදුවීම සමාධිවොදන නම්. ප්‍රථමද්ධ්‍යානාදියෙන් නැගී සිට චිතීයද්ධ්‍යානාදීන් කෙසේ උපද වන්නෙම් දැ යි යන යොගාවචරයා පිළිබඳ ස ඥාමනස්කාරයන්ගේ, ජවනාවර්ජයන්ගේ පැවැත්ම ය ඒ. ඉදිරියෙහි විශෙෂාධිගමයට හෙතු වූ ධර්ම යි. කෙලෙසීම නම් හානභාගීයධර්ම යි. පිරිසිදුවීම නම් විශෙෂභාගීයධර්ම යි.

සමාධිභාවනාව = ලොකිය - ලොකුත්තර විසින් බෙදුනු සමාධියෙහි වැඩීම සමාධිභාවනා නම්. එහි සුපරිශුද්ධශීලයෙහි පිහිටියහු විසින් පළිබොධයන් සිඳ කමටහන් දෙන කළණමිතුරු ඇදුරකු වෙත ගොස් සම සතළිස් කමටහන් අතුරෙහි තම සිරිතට සුදුසු වූ එක්තරා කමටහනක් ගෙණ සමාධිය වැඩීමට නො සුදුසු වූ තැන් හැර පසඟින් යුත් වෙහෙරෙක වසමින් දික් වූ හිසකේ ඇ කුඩා පළිබොධයන් ද සිඳ දමා භාවනාක්‍රමය නො පිරිහෙලා වැඩිය යුතු ය. මේ මෙහි ඉතා කෙටි කතා ය. විතරකතා විශුඩිමාර්ගයෙන් උගත හැකි ය

ආර්‍යමාර්ගසම්ප්‍රයුක්ත වූ සමාධිය ලොකුත්තර නම්. ඒ වඩනා සැටි ප්‍රඥාභාවනාවෙහි ඇතුළත් කරණ ලද්දේ ප්‍රඥාව වැඩූ කල්හි වඩනා ලද්දේ ම වේ. එහෙයින් ඒ ආර්‍යමාර්ගසමාධිය මෙසේ වැඩිය යුතු ය යි වෙන් කොට දක්මෙක් මෙහි නො වන්නේ ය.

සමාධිආනිසංසය = ක්‍රමානුකූල ව වැඩුනු සමාධියෙහි අනුසස් පසෙක් වේ. රහත් කෙනෙක් යම් සමාපත්තියකට සමවැද එකඟ වූ සිතින් "සැපයේ දවස් යවම්හ" යි යම් සමාධියක් වඩද් ද, රහතුන් වහන්සේගේ ඒ අර්පණා සමාධිය මෙලොව සැපවිහරණය අනුසස් කොට සිටියේ ය. බුදුරජානන් වහන්සේ ද එය මෙසේ වදළ සේක. "න ඛො පනෙතෙ චුන්ද! අරියස්ස විනයෙ සල්ලෙඛා වුච්චන්ති දිට්ඨධම්මසුඛවිහාරා පනෙතෙ අරියස්ස විනයෙ වුච්චන්ති" යි. චුන්ද! මේ බාහිර භාවනාවෙන් උපදවන ලද ධ්‍යානධර්මයෝ සිත එකඟකිරීම් මාත්‍රයක් කරන්නාහු මුත් ආර්‍ය්‍යධර්මය ලෙස, ආර්‍ය්‍යශාසනයෙහි කෙලෙස් නසන්නන් ලෙස නො පිළිගැණෙති, යනු එහි කෙටි අදහස ය. මේ ශාසනයෙහි අවිහිංසාදීහු ද ලොකොත්තර ධර්මයන්ට පාදක වන බැවින් කෙලෙස් නසන ප්‍රතිපද යි කියනු ලැබෙත්. එහෙත් මෙහි සිතෙහි එකඟබව පමණක් කරණ ධ්‍යානධර්ම, සල්ලෙඛප්‍රතිපද යි නො කියැ වේ.

සමාපත්තියෙන් නැගී සිට "සන්හුන් සිතින් විදර්ශනා කරම්හ" යි සිත මෙහෙයන්නවුන්ගේ ධ්‍යානය විදර්ශනාවට ආසන්නකාරණ බැවින් අර්පණාසමාධියත් තෘෂ්ණාසංක්ලෙශාදියෙන් කිලිටි වූ බැවින් ඉතා ගැහැට ඇති සසරෙහි අර්ථප්‍රතිලාභයට යොග්‍ය වූ එයට රුකුල් දෙන්නා වූ උපචාර සමාධියත් විදසුන් වැඩීම අනුසස් කොට සිටියේ ය. එහෙයින් වදළ සේක මෙය. "සමාධිං භික්ඛවෙ! භාවෙථ, සමාහිතො භික්ඛවෙ! භික්ඛු යථාභූතං පජානාති" යි.

යම් කෙනෙක් අට සමවත් උපදවා අභිඥාපාදකද්ධ්‍යානයට සම වැද, සමවතින් නැගිට 'එකොපි හුත්වා බහුධා හොති" යන ඇ ලෙසින් කියූ ක්‍රම ඇති අභිඥවන් පතමින් අට සමවත් උපදවද්ද, ඔවුන්ට අභිඥාලාභයට සුදුසු වූ පූර්වහෙතුව ඇති කල්හි ඒ සමවත්, අභිඥාවට ආසන්නකාරණ බැවින් අර්පණාසමාධිය ප වැ භිඥ අනුසස් කොට සිටියේ ය. "සො යස්ස යස්ස අභිඤ්ඤා සච්ඡිකරණි යස්සධම්මස්ස චිත්තං අභිනින්නාමෙති අභිඤ්ඤා සච්ඡි කිරියාය. තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සතිසති ආයතනෙ" යනු එහි ලා වදළ සේක.

යම් කෙනෙක් නො පිරිහුනු ධ්‍යාන ඇත්තෝ බ්‍රහ්මලොකයෙහි උපදිම්හ යි බ්‍රහ්මලොකයෙහි ඉපැත්ම පතමින් හෝ නො පතමින් ධ්‍යාන භාවනා කෙරෙත් ද, ඔවුන්ට බ්‍රහ්මලොකයෙහි ඉපැදීම එළවන බැවින් ඒ මේ අර්පණාසමාධිය භවවිශෙෂය එළවීම අනුසස් කොට සිටියේ ය. "පඨමං ඣානං පරිත්තං භාවෙත්වා කත්ථ උප්පජ්ජති? බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සහව්‍යතං උප්පජ්ජන්ති" යනු වදළෝ එහෙයිනි. උපචාර සමාධිය ද කාමාවචර සුගතිභවවිශෙෂය එළවන්නේ ය.

යම් කිසි ආර්‍ය්‍ය කෙනෙක් අෂ්ටසමාපත්ති උපදවා නිරොධ සමාපත්තියට සමවැද සත් දවසක් සිතින් තොර ව හිඳ මෙලොවෙහි දී ම චිත්ත-

නිරොධසඞ්ඛ්‍යාතනිබ්බානයට පමිණ සැපසේ වාසය කරමහ යි සමාධි භාවනා කරත් ද, ඔවුන්ගේ අර්පණාසමාධිය නිරොධසමාපත්තිය අනුසස් කොට සිටියේ ය. ''සොළසහි ඤාණචරියාහි නවහි සමාධිචරියාහි වසී භාවතෝ පඤ්ඤානිරොධසමාපක්කියා ඤාණං'' යනු දෙශනා ය.

එදවස ආලාරකාලාම තවුස්හට පුක්කුස නම් මල්ලරාජපුත්‍ර තෙමේ ශ්‍රාවක වීය. ඔහු දිනක් කුසිනාරා නුවරින් පාවානුවරට යනු පිණිස මගට බැස්සේ ය. ඒ වේලෙහි බුදුරජානන් වහන්සේ ඒ මහ අසල ගසක්මුල වැඩහුන් සේක. පුක්කුස තෙමේ උන්වහන්සේ දැක වෙත ගොස් වැඳ ''ස්වාමීනි! පැවිද්දන්ගේ ශාන්තවිහරණය මහත් පුදුම එකෙක, අරුම එකෙක, ස්වාමීනි! දවසක් දවල ආලාරකාලාම තෙමේ මග බැස යන්නේ මඟින් ටිකක් ඇත් ව ගසක් මුල හිඳ ගත්තේ ය, ඒ වේලෙහි ගැල් බොහෝ ගණනක් ඒ ලඟින් ඔහු පසු කොට ගියේ ය, ගැල් පස්සෙහි ආ එක් මිනිසෙක් ආලාරකාලාමයා දැක ලඟට ගොස් ''ස්වාමිනි! දැන් මෙතැනින් ගිය ගැල් ඔබවහන්සේ දුටු වනු ද?' යි ඇසි ය, ආලාර, නො දිටිමි, යි කී ය, 'ගැල් හඬ ඇසුනේ ද?' යි ඇසූවිට එයට ද ඔහු 'නැතැ' යි කී ය, ඔහු එවිට 'නිදි ගත්තහු ද?' යි ඇසි ය, එයට ද 'නැතැ' යි කී ය, ස්වාමීනි! සිහි කල්පනා ඇති ව සිටියහු ද?' යි ඇසි ය. 'ඔව්, සිහිකල්පනා ඇති ව සිටියෙමි' යි ආලාර කී ය. එවිට ඒ මඟියා ස්වාමිනි! මහපුදුමයෙක මහ අරුමයෙක, නො නිදත් සිහිකල්පනා ඇති වත් විසූ ඔබවහන්සේ මෙ තැනින් ගිය ගැල් නො දක්කහු ය, ගැල් යන හඬත් නො ඇසූ වහු ය, එහෙත් ඔබවහන්සේ ගේ සිවුර දූවිල්ලෙන් ගැවසී ගෙණ තිබේ ය' යි කීයේ ය, 'ඔව්, උපාසක! ඒ එසේ ය, සිවුරෙහි සැමතැන දූවිලි' යි ආලාර කී විට මඟියාහට 'මහපුදුමයෙක, මහඅරුමයෙක, පැවිද්දන්ගේ මේ ශාන්ත විහරණය, නො නිද සිහි කල්පනා ඇති ව සිටිය ද මෙ තැනින් ගිය ඒ ගැල් නො දක්නා ලද්දේ ය, ගැල් යන හඬ වත් නො අසනා ලද්දේ ය' යි අද්භූතයෙක් උපත. ආලාරයා කෙරෙහි පහන් වූ ඔහු, ඔහුට පසසා එතැනින් නික්ම ගියේ ය'' යි කීයේ ය.

එකල්හි බුදුරජානන් වහන්සේ ''පුක්කුස! පිළිතුරු කියව, එකෙක් නො නිද සිහි ඇති ව ම සිට ලඟ යන ගැල් නො දක්නේ ය, ගැල් යන හඬ නො අසන්නේ ය, එකෙක් නො නිද සිහි ඇති ව ම සිට මහත් හේ විදුලි ගසමින් ගොරව ගොරවා වස්නා කල්හි පවත්නා හෙණහඬ, මෙසර්ජනා නො දක්නේ ය, නො අසන්නේ ය. පුක්කුස! ඒ කිමැ යි සිතින් නෙහි ද? එ දෙකින් කවර එකෙක් දුෂ්කර වන්නේ ද? වනු අපහසු ද?'' යි වදළ සේක. ''ස්වාමීනි! යමෙක් නො නිද සිහිකල්පනා ඇති ව ම සිට විදුලි කොටන ගොරවන හඬ නො අසා නම් එය ම අපහසු ය'' යි පුක්කුස කී විට බුදුරජානන් වහන්සේ ''පුක්කුස! පසු ගියදා මා ආතුමා නුවර කම්මෙක ඉදි කළ පැල්පතෙක වසද්දී, දවසක් විදුලි කොටමින් ගොරව ගොරවා මහත් සේ වසින්නට වන, එද ඒ අසල කුඹුරෙක සි සාමින් සිටි

සොහොයුරු ගොවියෝ දෙදෙනෙක් හා ගොන්නු සතරදෙනෙක් හෙණ වැදී මිය ගියහ. ඒ වේලෙහි ආතුමාවෙහි සිටි තෑක් මිනිස්සු එතැනට රැස් වූහ, මම ද පැල්පතෙන් දෙරට බැස මිදුලෙහි එහා මෙහා ඇවිදිමින් සිටියෙමි, එකල්හි මිනිහෙක් මා වෙත පැමිණ වැඳ පසෙක සිටියේ ය, මම ඔහුගෙන් මෙතෙක් දෙනා පැමිණියෝ කුමකට දැ?' යි ඇසීමි, ''ස්වාමීනි! දැන් පිපිරූ හෙණය වැදී ගොවියෝ දෙදෙනෙක්, ගොන්නු සතර දෙනෙක් අතැන මැරී වැටී සිටිත්, මහාජනයා රැස්ව සිටිනු ඒ බලනු සඳහා ය'' යි කියා නැවතත් ඒ මිනිසා 'ස්වාමීනි! ඔබවහන්සේ ඒ වේලෙහි කොතැනක වැඩ සිටියහු දැ?' යි ඇසී ය. මා ඔහුට 'මම මෙහි හුන්නෙමි, කොතැනකත් නොගියෙමි' යි කී විට 'ඇයි, ස්වාමීනි! හෙණ හඬ නොඇසූ වහු දැ? ගොරව ගොරවා වසිනු නොදුටු වහු දැ?' යි ඔහු පුදුමයෙන් ඇසූහ. එවිට මට වැස්සක් ගැණ හෙණ අඬක් ගැණ දනුමක් නොවී ය' යි මම කීමි, 'ස්වාමීනි! එසේ නම් බුදුරජානන් වහන්සේ නිදි ගත් සේක් දැ?' යි ඇසී ය. 'මම නැතැ' යි කීමි. එසේ නම් සිහිකල්පනා නැති ව සිටියෝ දැ?' යි ඇසී ය. මම එයට ද 'නැතැ' යි කීමි. ස්වාමීනි! බුදුරජානන් වහන්සේට නොනිදා සිහි කල්පනා ඇති ව සිටත් මේ මහවැස්ස නොපෙණුනේ ය. මහණ පිපුරුම නොඇසුනේ ය. ඒ පුදුමැ' යි ඔහු කී විට 'ඔව්, උපාසක! ඒ එසේ ය. මා වසිනු නොදක්නේ ය. හෙණ ගසනු මට නොඇසුනේ ය' යි මම කීමි. එකල්හි ඒ මිනිසාට 'පැවිද්දෝ මෙසේ මහත් ශාන්ත විහරණයෙන් කල් යවති. එය මහත් පුදුමැ' යි සිත් විය. ඔහු මා කෙරෙහි පැහැද වැඳ පැකුණු කොට පිටත් ව ගියේ ය'' යි වදළ සේක. මෙසේ සමාධිය දිට්ඨධම්මසුඛවිහාරාදී වූ අනුසස් පසක් ඇත්තේ වේ.

කරුණු මෙසේ බැවින් නුවණැති යොගාවචර තෙමේ නොයෙක් අනුසස් ඇති රාගාදී වූ කෙලෙස්මල සෝද හරින්නා වූ සමාධිභාවනා වෙහි නොපමා වන්නේ ය. ඒ මෙසේ කිහ.

''තස්මා නෙකානිසංසමිහි කිලෙසමලධොවනෙ,
සමාධිභාවනායොගෙ නප්පමජ්ජෙය්‍ය පණ්ඩිතො''

ගාථාවෙහි ආ **'සමාධිනා'** යන්නෙන් අෂ්ටසමාපත්තිය ගැණේ

ධම්මවිනිච්ඡයෙනා ච = ධම්මවිනිශ්චයෙන් ද විදර්ශනා ප්‍රඥාවෙන් ද.

විදර්ශනාප්‍රඥාව ධම්මවිනිශ්චය නම්. ''මේ කට යුතු ය. මේ නොකට යුතු ය, මේ සදෙස් ය. යුතුකම් මේ ය, මේ යුතුකම නොවේ'' යන ආලෙසින් කරුණු නොකරුණු දැනීම ලකුණු කොට ඇති බැවින් විදර්ශනා ප්‍රඥාව ධම්ම විනිච්ඡය නාමයෙන් හැඳින් වේ.

සම්පන්නවිජ්ජාචරණා = සම්පූර්ණ වූ විද්‍යාචරණ ඇති ව.

විජ්ජා නම් නුවණ ය. ''වින්දති ජානාතීති = විජ්ජා, විදිතං කරොතීති = විජ්ජා, වින්දියං වින්දතීති = විජ්ජා, (යථාවතො උපලබභතීති අත්ථො) අත්තනො වා පටිපක්ඛස්ස විජ්ඣනට්ඨෙන = විජ්ජා, (තමොක්ඛන්ධාදිකස්ස විදලනට්ඨෙනාති අත්ථො) තතො එව අත්තනො විසයස්ස විදිතකරණට්ඨෙනාච් = විජ්ජා'' යනු නිරුක්ති යි.

මෙසේ පොදුවේ විජ්ජා නම් නුවණැ යි කීයේ ද මෙහි මෙයින් ත්‍රිවිද්‍යා හා අෂ්ටවිද්‍යා ගැණෙති. මෙ කී විද්‍යාවෝ තම තමන් විසින් නැසිය යුතු වූ කෙලෙස් නසමින් තම තමන් විසින් දත යුතු වූ, ප්‍රකට කළ යුතු වූ අනිත්‍යාදුක්ඛ – අනාත්මධර්මයන් දැන ගන්නෝ ය. ප්‍රකට කරන්නෝ ය. නිවන් රස තතු පරිදි විඳ ගන්නෝ ය. තමන්ට පටහැනි ව සිටී අවිද්‍යාන්ධකාරය පළා ලන්නෝ ය.

''පුබ්බෙ නිවාසානුස්සති ඤාණං = විජ්ජා'' පෙර විසූ ස්කන්ධපරම්පරාව සිහිපත් කිරීමෙහි පැවැති නුවණ විද්‍යා නම්. අනතුරු ව ඉක්ම ගිය භවය පටන් ඒ ඒ භවයෙහි විසූ අනුභව කළ ස්කන්ධපරම්පරාව යම් සිහියකින් සිහි පත් කෙරේ ද, ඒ සිහිය පුබ්බෙ නිවාසානුස්සති නම්. ඒ සිහිය හා හැනි සිටි එක් ව යෙදුනා වූ නුවණ පුබ්බ නිවාසානුස්සති ඤාණ නම්. එය උපදනේ පෙර විසූ කඳපිළිවෙළ වසා සිටී අවිද්‍යාන්ධකාරය නසා පූර්වේනිවාසය සිහිපත් කරවමිනි. එහෙයින් ඒ විද්‍යා යි කියනු ලැබේ.

පෙර විසූ කඳ පිළිවෙළ සිහි පත් කිරීම ස්කන්ධපටිපාටියෙන් හෝ චුති පටිසන්ධි වශයෙන් හෝ වන්නේ ය. මෙසේ වනු ශ්‍රාවකයන් ගේ වශයෙනි. බුදුරජුන්ගේ වශයෙන් නො වේ. බුදුරජුනට ස්කන්ධ පටිපාටි කෘත්‍යයෙක් නැත්තේ ය. චුතිප්‍රතිසන්ධිවශයෙන් එක් අත් බවකින් අන් අත් බවකට යෑමෙක් ද නැත. උන්වහන්සේලා නොයෙක් කප් කෙළඟණන් අතුරෙහි යට හෝ උඩ යම් යම් තැනක් සිහි පත් කරණු කැමැත්තෝ ද ඒ ඒ තැන් උන්වහන්සේලාට හස්තාමලකයක් සේ ප්‍රකට වන්නේ ය. පැහැදිලි වන්නේ ය, අතරතුර කිසින් ජාතියක, භවයෙක උන්වහන්සේලාගේ නුවණ නො ගැටෙන්නේ ය. නො පැකිළෙන්නේ ය. තමන් කැමැති තැන ම නුවණින් අල්ලා ගන්නෝය උන්වහන්සේලා.

තීර්ථක – ප්‍රකෘතිශ්‍රාවක – මහාශ්‍රාවක – අග්‍රශ්‍රාවක – ප්‍රත්‍යෙක බුඩ සර්වඥබුඩ යි පූර්වෙනිවාසය සිහි පත් කරන්නෝ සදෙනෙකි.

මෙහි තීර්ථක නම්, කර්මවාදී ක්‍රියාවාදීහු ය. ඔවුනට සතළිස් කපෙක් ම වැටහෙන්නේ ය. නුවණ දුර්වල බැවිනි. ප්‍රකෘතිශ්‍රාවකයනට **කප් එක්** දහස් එක් සියයක් වැටහේ. අසූ මහාශ්‍රාවකයනට කල්පලක්ෂයක් වැටහේ. අග්‍රශ්‍රාවකයනට එකාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් වැටහේ. ප්‍රත්‍යෙක බුඩයනට දෙයාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් වේ. සර්වඥබුඩයනට පරිච්ඡේදයෙක් නැත්තේ ය. (විතර කැමැත්තන්ට විශුද්ධිමාර්ගය විතර කියන්නේ ය.)

මෙහි ලා තීර්ථකයන්ගේ දර්ශනය කණමැදිරි ඵලියක් සේ ය. ප්‍රකෘති-ශ්‍රාවකයන්ගේ දර්ශනය තෙල් පාන් ඵලියක් සේ ය. මහා ශ්‍රාවකයන්ගේ දර්ශනය පන්දම් ඵලියක් සේ ය. අග්‍රශ්‍රාවකයන්ගේ දර්ශනය පාන්තරු ඵලියක් සේ ය. ප්‍රත්‍යේකබුඩයන්ගේ දර්ශනය හඳපාන් ඵලියක් සේ ය. සර්වඥබුද්ධයන්ගේ දර්ශනය දහස් රසින් තෙබී මැදි දවල් පායා සිටි සරක් තිරු මඬලක් සේ ය.

තීර්ථකයන් පිළිබඳ පුබ්බෙනිවාසානුස්සතිය අන්ධයන්ගේ සැර යටි කොණ අල්ලා ගෙණ යෑමක් සේ ය. එසේ කියේ අන්ධයනට සැරයටි කොණ අත හැරියනු බැරි සේ තීර්ථකයන් ස්කන්ධපටිපාටිය හැරදමා අභිමත තැනක් සිහිපත් කිරීමෙහි අපොහොසත් බැවිනි. ප්‍රකෘතිශ්‍රාවකයන් පිළිබඳ වූවා, කුඩා ගහක් එතෙර කරන්නට ඒ මත්තෙහි ලූ ඔඟයක යෑමක් සේ ය. මහාශ්‍රාවකයන් පිළිබඳ වූවා සතර පස් දෙනෙකුට යාහැකි සේ කළ පුවරුහෙයක යන ගමනක් සේ ය. අග්‍රශ්‍රාවකයන් පිළිබඳ වූවා ගැල්රිය යැ හැකි සේ කළ හෙයකින් යෑමක් සේ ය. ප්‍රත්‍යේකබුඩයන් පිළිබඳ වූවා බොහෝ මිනිසුන්ගේ පාගමනට සුදුසු සේ කළ මහමගෙක යෑමක් සේ ය. සර්වඥබුඩයන් පිළිබඳ වූවා බොහෝ ගැල්රිය ඇතට යැ හැකි සේ කළ මහාසකටමාර්ගයෙක යෑමක් සේ ය.

පුබ්බෙනිවාසය සිහියට නගන්නා වූ බුදුරජානන් වහන්සේ ප්‍රතිසන්ධිය මුල් කොට චුතිය කෙළවර කොට ඇති එක් ස්කන්ධ පරම්පරාවක, ස්කන්ධපරම්පරා දෙකක, තුණක යන ඇ ලෙසින් අත් බව ලක්ෂගණන් ද, නස්නා හටගන්නා නොයෙක් කල්පයන් ද නස්නා අසවල් කල්පයෙහි අසවල් අත්බවෙහි මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත්‍ර ඇත්තෙම් වීම් යි යන ඇ ලෙසින් තත් වැදැරුම් වූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහි පත් කරණ සේකැ යි දන යුතු ය.

"සත්තානං චුතූපපාතෙ ඤාණං = විජ්ජා" යන්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය දැන ගන්නා නුවණ විද්‍යා නම්. සත්ත්වයන් ඒ ඒ භවඅයන් ගිලිහී යෑම හා ඒ ඒ භවයෙහි ඉපදීම චුතූපපාත නම්. ඒ මෙ චුති - උත්-පත්ති දෙක පිළිබඳ පැවැති දහම් දැන ගන්නා නුවණ චුතූපපාතඤාණ නම්. ඒ උපදනේ චුතිපටිසන්ධි දෙක වසා සිටි මොහඳුර නසා එදෙක ප්‍රකට කරමිනි එහෙයින් ඒ විද්‍යා යි කියනු ලැබෙ. ඇතැම් තැන මේ දිබ්බ-චක්ඛුඤාණ යි ආයේ ය.

බුදුරජානන් වහන්සේ සත්ත්වයන්ගේ චුතිඋත්පත්ති දන්නා සේක් දෙවියන්ගේ ප්‍රසාදචක්ෂුස හා සම වූ මිනිස් ඇස ඉක්මවා සිටි පිරිසිදු ඇසින් මැරෙන - උපදින - උස් - පහත් - පැහැකි - නො පැහැනි - දුප්පත් - පොහොසත් - කළ කම් අනුවගිය සතුන් - "මේ සත්ත්වයෝ කයින් - කටින් - සිතින් දුසිරිත් කළෝ, ආර්‍යයනට ගැරහූවෝ, මිසදිටු ගත්තෝ

මරණින් මතු නිරයයෙහි උපන්නෝ ය. මේ සත්ත්වයෝ කයින්-කටින්-සිතින් යුසිරිත් කළෝ, ආර්‍යයනට නො ගැරහූවෝ, සම්දිටු ගත්තෝ මරණින් මතු ස්වර්ගයෙහි උපන්නෝ ය'' යන ආ ලෙසින් දන්නා සේක.

''ආසවානං ඛයෙ ඤාණං = විජ්ජා'' ආස්‍රවයන් ක්ෂය කිරීමෙහි සහ චුලින් ගෙවාලීමෙහි නුවණ විද්‍යා නම්. කාම - භව - දිටියි - අවිජ්ජා ය ආස්‍රව. මොවුන් නැසීම වැනසීම (අර්හන්මාර්ගය) **ආසවක්ඛය** නම්. ඇතැම් තැන ආස්‍රවයන්ගේ ප්‍රහාණය, අත්‍යන්තක්ෂය, ක්ෂය වූ ආකාරය, නැති බව, බය යන්නෙන් ගැණේ. ආස්‍රවයන් ක්ෂය වූ කල්හි සියලු ක්ලේශ ක්ෂය වූවාහු ම වෙති. එහෙයින් අර්හන්මාර්ගය ආස්‍රවක්ෂය යි කියනු ලැබේ ඒ මේ අර්හත්මාර්ගචිත්තයෙහි යෙදෙන ප්‍රඥාවෙතසිකය **ආසවක්ඛයඤාණ** නම්. ඒ උපදනේ සිවු සස්දහම් වසා සිටි මොහදුර නසා එ දහම් පැහැදිලි කරමිනි. එහෙයින් ඒ විද්‍යා යි කියනු ලැබේ.

බුදුරජානන් වහන්සේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රවරහිත වූ චේතොවිමුක්තිය හා ප්‍රඥාවිමුක්තිය මේ අත්ඛවේදී තමන්වහන්සේ මි ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වසන සේක. (මෙහි විස්තර විභඞ්ග - පටිසම්භිදා - විසුද්ධිමග්ග ආදියෙහි ආයේ ය.)

විපස්සනාඤාණ - මනොමයිද්ධිඤාණ - ඉද්ධිවිධඤාණ - දිබ්බසොතඤාණ - පරචිත්තවිජානනඤාණ - පුබ්බෙනිවාසානුස්සතිඤාණ - දිබ්බචක්ඛුඤාණ - ආසවක්ඛයකරඤාණ යන මේ අට ය. අට්ඨවිද්‍යා.

''විපස්සනාඤාණමනොමයිද්ධි
ඉද්ධිප්පභෙදපි ච දිබ්බසොතං
පරස්ස චෙතො පරියායඤාණං
පුබ්බෙනිවාසානුගතං ච ඤාණං
දිබ්බං ච චක්ඛාසවඛඞ්ගයො ච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා''

ඒ ඔවුන්ගේ එකත්‍ර සඞ්ග්‍රහගාථා ය.

එහි විදස්සනාඤාණය, නැවත උදයබ්බයඤාණ - භඞ්ගඤාණ - භය ඤාණ - ආදීනවඤාණ - නිබ්බිදඤාණ - මුඤ්චිතුකම්‍යතාඤාණ - පටිසඞ්ඛානඤාණ - සඞ්ඛාරුපෙක්ඛාඤාණ - අනුලොමඤාණ යි නව වැදෑරුම් ලැබී.

''පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං'' යන්නාහි විසින් හෝ ඛණ විසින් පහළ වූ නාමරූප ධර්මයන්ගේ පෙරළීම, වෙනස්වීම අනුව බැලීමේ දී උපදින්නා වූ තරුණ විදර්ශනාප්‍රඥාව උදයබ්බයානුපස්සනාඤාණ නම්. පංචස්කන්ධය පිළිබඳ ඉපදීම හා නැසීම දන්නා නුවණය ඒ.

පරම්පරා විසින් හෙවත් සමානවස්තුක ඍතු-ආහාර ආදියන් ගෙන් පහළ වූ රූපපරම්පරා විසින් හෝ, උත්පාද – ස්ථිති – භඩග යන ඛණ විසින් රූපාදිධර්මයන්ගේ ඉපැත්ම උදය නම්. එසේ පහළ වූ රූපාදිධර්ම යන්ගේ නැසි යෑම වය නම්. ඒ මේ උදය – වය අනුව බැලීම උදයබ්බයානුපස්සනා ය.

උදයබ්බයානුපස්සනාඤාණය පිණිස කමටහන් වඩන්නේ සෑකෙවින් හා විස්තර විසින් වඩන්නේ ය.

පිරිසිදු වූ විදර්ශනාඥනය ඇති යොගාවචර තෙමේ සම්මසන ඤාණයන්ගේ කෙළවරට ගොස්, නැවත නාමරූපධර්ම පිළිබඳ උත්පත්ති ලක්ෂණය උදයයි ද, විපරිනාමලක්ෂණය වය යි ද බලන්නේ ය. ''මේ නාමරූපධර්මයන්ගේ උත්පත්තියෙන් පෙර කිසි තැනෙක රැස්ව සිටීමෙක් නැත්තේ ය. උපදින්නා වූ නාමරූපධර්මයන්ගේ එක් ව තුබූ තැනෙකින් ඒමෙක් ද නැත්තේ ය. නිරුඩ වන්නන්ගේ දිශානුදිශාවකට යෑමෙක් ද නැත්තේ ය. එසේම නිරුඩ වන්නන් රාශි වශයෙන් සිටීමෙක් ද නැත්තේ ය. වීණාව වයන කල්හි එයින් උපන් ශබ්දය ඉපදීමට පෙර කිසි තැනෙක රැස් ව සිට නො උපන්නේ ය. නිරුඩ වන කල්හි දිශානුදිශාවකට ගොස් කිසි තැනෙක රැස් නො වන්නේ ය. එමෙන් සියලු රූපාරූප ධර්මයෝ පෙර කිසි තැනෙක නො වූවෝ ම පහළ වෙති. නිරුඩ වන්නේ කිසි තැනෙක නො යෙති'' යි මෙසේ නාම-රූපධර්මයන්ගේ ඉපදීම හා බිඳීම සැකෙවින් බලන්නේ ය.

විස්තර විසින් වඩන්නේ ''පෙර භවයෙහි වූ අවිද්‍යාහෙතුවෙන්, පෙර භවයෙහි වූ තෘෂ්ණාහෙතුවෙන්, අවිද්‍යා තෘෂ්ණාඋපනිඃශ්‍රය සහිත කර්ම හෙතුවෙන්, කැඳබත් ඇ ආහාර හෙතුවෙන් රූපස්කන්ධය පහළ වන්නේ ය'' යි වදළ අවිද්‍යා - තෘෂ්ණා - කර්ම - ආහාර යන සිවු වැදෑරුම් ප්‍රත්‍යය-ධර්ම හා රූපස්කන්ධයාගේ උත්පත්තිලක්ෂණය වූ අභිනවාකාරය යන පස නුවණින් බලන්නේ ය.

රූපස්කන්ධයෙහි ඉපදීම දැක, නැවත ඒ ඉපදීමෙහි හෙතු වූ අවිද්‍යා – තෘෂ්ණා - කර්ම – ආහාර යන ප්‍රත්‍යධර්මයන් රහත් මග නුවණින් නැවත නො උපදනා ලෙසට නිරුඩ කිරීම නිසා, රූපස්කන්ධයාගේ නැවත පහළ වීමෙක් නො වන්නේ ය. රූපස්කන්ධය නිරුඩ වන්නේ ය' යි මෙසේ අනාගතරූපස්කන්ධයාගේ පහළ වීමෙහි හෙතු වූ අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ආහාර යන සිවු වැදෑරුම් වූ ප්‍රත්‍යයයන්ගේ නිරොධය අනුව බැලීම හා රූපස්කන්ධයාගේ විපරිණාමය අනුව බැලීම යන පස නුවණින් බලන්නේ ය.

මෙසේ මෙහි ඉතා කොටින් දක් වූ රූපස්කන්ධයෙහි උදය හෙතු සතර හා උත්පත්තිලක්ෂණය ද එසේ ම රූපස්කන්ධයෙහි ව්‍යය හෙතු සතර හා ව්‍යයලක්ෂණය ද නුවණින් බැලීම උදයබ්බයානුපස්සනා ඤාණ යි දන්න.

එසේ ම අවිද්‍යා – තෘෂ්ණා – කර්ම-ස්පර්ශ යන හෙතූන් නිසා වේදනා ස්කන්ධයාගේ හට ගැනීම වන්නේ ය' යි බැලීම හා උදය ලක්ෂණ බැලීම, අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ස්පර්ශ යන හෙතූන්ගේ නිරුද්ධියෙන් වේදනා-ස්කන්ධය නිරුඬ වන්නේ ය' යි බැලීම හා විපරිණාමලක්ෂණය බැලීම උදයබ්බයානුපස්සනාඤාණ යි දන්න.

'ඵුට්ඨෝ වෙදෙති, ඵුට්ඨෝ සඤ්ජානාති ඵුට්ඨෝ චෙතෙති" යි වේදනා-සංඥා-සංස්කාර ස්කන්ධ තුණ, ස්පර්ශය පැවැත්මෙහි ලා හෙතු බැවින් රූපයාගේ හට ගැන්මට සිවුවන හෙතු ව වූ කබලිඞ්කාරාහාරයාගේ ස්ථානයෙහි එස්සාහාරය ලා සංඥා-සංස්කාර ස්කන්ධයන්ගේ පහළ වීමෙහි අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-ස්පර්ශප්‍රත්‍යයයන් හා ඔවුන්ගේ උදයලක්ෂණය බැලීම, අවිද්‍යා-තෘෂ්ණා-කර්මස්පර්ශයන්ගේ නිරුද්ධියෙන් සංඥා සංස්කාර-ස්කන්ධයන්ගේ නිරොධය වන්නේය' යි බැලීම හා විපරිණාමලක්ෂණය බැලීම උදයබ්බයානු පස්සනාඤාණ යි දන්න.

විඤ්ඤාණස්කන්ධයෙහි අවිද්‍යා-තෘෂ්ණා-කර්ම-නාමරූප යන මොවුන් ගේ සමුදය හා නිරෝධය උදයලක්ෂණය හා විපරිණාමලක්ෂණය දැකීම උදයබ්බයානුපස්සනාඤාණ යි දන්න.

මෙසේ පංචස්කන්ධයෙහි විස්තර විසින් සම පණසක් ආකාර වූ ලක්ෂණදර්ශනයෙන් උදයබ්බයානුපස්සනාඤාණය සිඩ වන්නේ ය යි දත යුතු ය.

මෙයින් ඥානවත් වූවාහට චතුරාර්යසත්‍යය – ප්‍රතීත්‍යසමුත්පාදය – එකත්වාදිවතුර්විධනය – අනාත්මාදිලක්ෂණ යන ධර්ම ප්‍රකට වන්නේ ය. මේ තෙමේ ම ආරබ්ධවිදර්ශක යි ද කියනු ලැබේ.

"ආරම්මණපටිසඩ්ඛා භඩ්ගානුපස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං" ඉපදීම නැසීම යන දෙ තැන්හි මොනවට වැඩී ගිය නුවණ ඇත්තහුට, රූපාදී අරමුණු බයවය විසින් දැන, ඒ දැනීමෙන් උපන් නුවණින් රූපාදීන් ගේ භඩ්ගය, විනාශය පැහැදිලි ව පෙණෙන්නේ ය. ඒය භඩ්ගානුපස්සනා-ඤාණ නම්. ඉපදීම නැසීම යන දෙකෙන් නැසීම ම දක්නා නුවණ ය.

ඉපදීම හා නැසීම දැඩි ව ගෙණ විදසුන් වඩන්නාහට ඉපදීම ඉක්මවා ගොස් නැසුම වැටහෙන්නේ ය. මෙසේ රූපාදීන්ගේ නැසීම වැට හී ගිය කල්හි වර්තමානභවය පිළිබඳ රූප – වේදනා – සංඥා – සංස්කාර - විඤ්ඤාණ යන මෙහි එකෙකෙහි නැසී යෑම සිතින් බලා, රූප වේදනාදිය පිළිබඳ නැසී යෑම බැලු ඒ සිත්වල ද නැසී යෑම බලමින් "අතීතභවයන්හි වූ සංස්කාර යෝ ද බිඳෙති, අනාගත සංස්කාරයෝ ද බිඳෙති" යි මෙසේ දුටු නො දුටු සියලු සංස්කාරයන් එක් කොට නැසී යෑම ම අරමුණු කරමින් උපදනා නුවණය භඩ්ගානුපස්සනාඤාණ.

වැසි වස්නා කල්හි ගංඉවුරෙහි සිටි මිනිසා වැසි දිය වැටීමෙන් ඉහදිය මතු පිට නැඟී බිඳී යන දිය බුබුලු දක්නා සේ, මේ යොගී තෙමේ ද සියලු සංස්කාරයන්ගේ බිඳී යැම දක්නේ ය. බිඳී යැම අනිත්‍යතාවයෙහි අවසාන කෙළවර ය. එහෙයින් භඞ්ගානුදර්ශක යොගී තෙමේ සියලු සංස්කාරයන් අනිත්‍ය විසින් බලයි. නිත්‍ය විසින් නො බලයි. අනිත්‍යවස්තූන් දුක් බැවින්, දුඃඛවස්තූන් අනාත්ම බැවින්, සංස්කාරධර්ම දුක් විසින් බලයි. සැප විසින් නො බලයි. අනාත්ම විසින් බලයි ආත්ම විසින් නො බලයි. යම් වස්තුවක් අනිත්‍ය-දුඃඛ-අනාත්ම ලක්ෂණයන් ගෙන් යුක්ත වූයේ ද, ඒ පිළිගත යුතු, සතුටු විය යුතු වස්තුවේ ක් නො වේ. යමක් පිළිගත යුතුත් සතුටු විය යුතුත් නො වේ ද එහි නො ඇලිය යුතු ය යි සලකයි. මෙසේ භඞ්ගානුපස්සනානුසාරයෙන් අනිත්‍ය – දුඃඛ – අනාත්ම විසින් දක්නා ලද සංස්කාරයන්හි කලකිරෙන්නේ ය. සතුටු නො වන්නේ ය. නො ඇලෙන්නේ ය. සතුටු නො වන්නේ නො ඇලෙන්නේ පළමු කොට නුවණින් සංස්කාරයන්හි ඇලීම් නැති කරන්නේ ය. සියලු සංස්කාරයන්ගේ නිරෝධය දකින්නේ ය. ඊට ගැන්ම නො දක්නේ ය. මෙසේ සංස්කාරයන් බිඳෙනසුළු දක්නා භව දෘෂ්ටිප්‍රහාණ දී වූ අනුසස් අටක් පිරිවර කොට ගත් නුවණ, භඞ්ගානුස්සනාඤාණ යි කොටින් දන්නේ ය.

භයතුපට්ඨානඤාණ නම්, සංස්කාරධර්මයන් භය විසින් වටහා ගන්නා නුවණ ය. සංස්කාරයන්ගේ බයවය අරමුණු කොට ඇති භඞ්ගානුදර්ශනඥානය නිතර සෙවනය කරන්නා වූ යොගාවචරයා හට භව - ගති – යොනි ස්ථිති – සත්ත්වාවාසයන්ගේ වශයෙන් භෙදයට ගිය සංස්කාරයෝ, සුව සේ ජීවත් වනු කැමැති බියසුලු පුරුෂයෙකුට සිංහව්‍යාඝ්‍රාදිවණ්ඩසත්ත්වයන් හා සොහොන් බිම් - රණබිම් – ගිනි අඟුරුවල් බිය විසින් වැටහෙන්නා සේ බිය ඇති ව වැටහෙති. "අතීතසංස්කාරයෝ නිරුද්ධ වූහ. වර්තමානසංස්කාරයෝ නිරුද්ධ වෙති. අනාගතසංස්කාරයෝ ද මෙ ලෙසින් ම නිරුද්ධ වන්නාහ" යි දක්නා යොගාවචරයාහට මෙ කරුණෙහි ලා ඉපැදෙනුයේ භයතුපට්ඨානඤාණය යි.

උපාසිකාවකට පුත්තු තිදෙනෙක් වූහ. තිදෙන ම රාජාපරාධකාරයෝ ය. එහෙයින් රජු ඔවුන්ගේ හිස් ගසා දමන්නට නියම කෙළේ ය. උපාසිකාව ද පුතුන් සමග හිස සිඳින තැනට ගියා ය. අලුගෝසුවෝ වැඩි මහල්ලාගේ හිස සිඳ දෙවැන්නාගේ හිස සිඳින්නට වන්හ. ඕ, වැඩිමහල්ලාගේ හිස සිඳ දමූ බවත් දෙවැන්නාගේ හිස සිඳින බවත් දැක බාල පුතු කෙරෙහි වූ බලාපොරොත්තුව අත්හැර දැමූ ය. මෙ ද එසේ ය, යොගාවචරයාගේ අතීතසංස්කාර පිළිබඳ නිරොධය දැක්ම, උපාසිකාවගේ වැඩි මහල් පුතුගේ කපා හළ හිස දැක්ම වැනි ය. වර්තමානසංස්කාරයන් පිළිබඳ නිරොධය දැක්ම, දෙවැන්නාගේ සිඳිනු ලබන හිස දැක්ම වැනි ය. අනාගත සංස්කාරන් නිරුද්ධ වන්නාහ යි අනාගතසංස්කාරයන් පිළිබඳ නිරොධය දැක්ම, බාල පුතු කෙරෙහි වූ බලාපොරොත්තුව අත්හැර දැමීම

වැනි ය. මේ ලෙසින් භවත්‍රයයෙහි සියලු සංස්කාරයන්ගේ ම නිරෝධය දක්නා යොගාවචරයාහට එය තීරණය කිරීමෙහි පොහොසත් ව උපදනා ඤාණය භයතුපට්ඨානඤාණ යි දන්නේ ය.

භයතුපට්ඨානඤාණය, බිය වේ ය යි නො දතයුතුය. ඒ වනාහි "අතීතසංස්කාරයෝ නිරුඬයහ. වර්තමානසංස්කාරයෝ නිරුඬ වෙති. අනාගතසංස්කාරයෝ නිරුඬ වන්නාහ' යි තීරණ මාත්‍රයක් ම කරයි." අහුරුවල් දුටු තැනැත්තේ එයට නොබියව "යම් කෙනෙක් මෙහි වැටුනෝ නම් ඒ සියල්ලෝ මහත් දුක් අනුභව කරන්නෝය" යි තීරණය කරයි. තෙමේ එයින් බිය ඇත්තේ නො වේ. එමෙන් මේ නුවණ ද පළමු කී සේ තීරණමාත්‍රයක් ම කරයි. බිය ඇත්තේ නො වන්නේ ය. හුදෙක් මෙයට සියලු භව යොනි ගති ස්ථිති සත්ත්වාසයන්හි වූ සංස්කාරයෝ බිය වසින් වැටහෙන්නෝ ය. භයතුපට්ඨානැ යි කීයේ එහෙයිනි.

ආදීනවානුපස්සනාඤාණ නම්, සංස්කාරයන්ගේ දෙස් දක්නා නුවණ ය. භයතුපට්ඨානඤාණය සෙවනය කළ යොගාවචරයාහට කිසිම භවයෙක අයානියක ගතියක ස්ථිතියක සත්ත්වාවාසයෙක රැකෙන්නට තැනක්, සැඟවෙන්නට තැනක් පිහිටක් නො පෙණෙන්නේ ය. එ හෙයින් ම කිසින් සංස්කාරයෙක පැතීමක් නො වන්නේ ය. පරාමර්ශයෙක් හෝ නැත්තේ ය. භවත්‍රය ගිනිගත් අහුරුවල් සේ, සතරමහාභූත, දරුණු විෂ ඇති සර්පයන් සේ, පංචස්කන්ධය එස වූ කඩු ඇති අලුගෝසුවන් සේ, ආධ්‍යාත්මිකායතන හිස් ගම් සේ, බාහිරායතන ගම් පහාණ ොරුන් සේ, සප්තවිඤ්ඤාණස්ථිතීන් හා නවසත්ත්වාවාස ගිනි ගෙණ දැවෙන්නන් සේ, සියලු සංස්කාර ගඩු, ලෙඩ, හුල්, දුක් විපත්, පිඩා සේ, ආස්වාද රහිත වූවාහු නීරස වූවාහු මහත් ආදී නව රාසියක් සේ, වැටහෙන්නෝ ය. සුව සේ ජීවත් වනු කැමැත්තකුට සිත් ගන්නා සේ පිහිටා සිටී, එහෙත් සැඩ සතුන්ගෙන් ගැවසී ගත් මහා වනයක් සේ දිවියන් ලැගුම් ගත් ගුහා සේ දියරකුසන් අරක් ගත් දිය සේ, එස වූ කඩු ඇති සතුරන් සේ, විස සහිත බොජුන් සේ වැටහෙති. එබඳු වනගහනයකට පැමිණීමෙන් හට ගත් බිය ඇති හට ගත් ලොමු දැහැ-ගැනීම් ඇති ඒ පුරුෂ තෙමේ එහි හැම අතකින් ම දෙස් දක්නේ ය. එ පරිද්දෙන් මේ යොගි තෙමේ ද භඩිගානුපස්සනා වශයෙන් සංස්කාර න් භව වශයෙන් වැටහුනු කල්හි හැම අතකින් ම පංචස්කන්ධයෙහි දෙස් ම දක්නේ ය.

මෙසේ පෙර කම් බෙලෙන් මෙහි ඉපැත්ම, උපන්නහුගේ පැවැත්ම, සංස්කාරනිමිත්ත, මත්තෙහි ඉපැත්මට හේතු වූ කම්, මත්තෙහි ඉපැ ම, යන (උප්පත්ති පවත්ති-නිමිත්ත ආයූහනා පටිසන්ධි)මේ පස වස්තු කොට ඇති නුවණ ආදීනවානුපස්සනාඤාණ යි දන්නේ ය.

නිබ්බිදානුපස්සනාඤාණ නම්, දක්නා ලද දෙස් ඇති සංස්කාරයන් කෙරෙහි කලකිරීම් වශයෙන් උපදනා නුවණ ය. ආදීනවානුපස්සනාඤාණ

යෙන් ඳුනවත් යොගී තෙමේ භව යොනි ගති ආදියෙහි වූ සංස්කාරයන් පිළිබඳ දෙස් දක්නේ, විවිධ හෙද ඇති සංස්කාරයන් කෙරෙහි කලකිරෙයි, නො ද ඇලෙයි. චිත්‍රකූට පර්වත ප්‍රාන්තයෙහි ඇලි වසන ස්වණ්ණහංසයෙක් අපිරිසිදු වූ සැඩොල් ගම් දෙර වෙරවළෙක යම් සේ නො ඇලේ ද, එසේ මේ යොගී තෙමේ ද මැනවින් දක්නා ලද දෙස් ඇති හෙද සහිත වූ කිසින් සංස්කාරයෙක නො ඇලෙන්නේ ය. භාවනාරතියෙන් යුක්ත බැවින් සත් වැදැරුම් අනුපස්සනාවන්හි ම ඇලෙයි. නිර්වාණපදයෙහි ම ඇලෙයි. එයට නැමුනු සිත් ඇත්තේ වේ.

භයතුපට්ඨාන-ආදීනවානුපස්සනා-නිබ්බිදානුපස්සනා යි අකුරු විසින් මේ වෙනස් වුව ද, අර්ථ විසින් එකෙක්ම ය. නො වෙනස් ය. සියලු සංස්කාරයන් බිය විසින් දක්නේ භයතුපට්ඨාන නම්. ඒ සංස්කාරයන් කෙරෙහි ම දෙස් දක්නේ ආදීනවානුපස්සනා නම්. උන් කෙරෙහි ම කලකිරෙන්නේ නිබ්බිදානුපස්සනා නම් "යා ච භයතුපට්ඨානෙ පඤ්ඤා, යා ච ආදීනවෙ ඤාණං, යා ච නිබ්බිදා ඉමෙ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමෙව නානං" යනු ආජනයි.

මුඤ්චිතුකම්‍යතාඤාණ නම්, සංස්කාරයන් කෙරෙන් මිදීම වශයෙන් උපදනා නුවණ ය. මෙයින් ඳුනවත් වූ සංස්කාරයන් කෙරෙහි කලකිරෙණ, සංස්කාරයන් කෙරෙහි නො ඇලෙන යොගීහුගේ සිත, එක ද සංස්කාරයක් කෙරෙහි නො ඇලෙන්නේ ය. නො ද බැඳෙන්නේ ය. සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැත්තේ බැහැර යනු කැමැත්තේ ම වේ. දැලෙහි බැඳුනු මත්ස්‍යයෙක්, සර්ප මුඛයට අසු වූ මැඩියෙක්, කුඩුවෙක බැඳුනු වනකුකුළෙක්, මත්‍ර පුටුවෙක අසු වූ මුවෙක්, අහිකුණ්ඩිකයකු අතපත් නයෙක්, මහ මඩෙහි එරුණු ඇතෙක්, ගුරුළුමුවපත් නයෙක්, රාහු මුව පත් සඳ, සතුරන් විසින් වට කොට ගත් පුරුෂයෙක්, ඒ ඒ තැනින් මිදෙනු කැමැත්තේ යම් සේ ද, එ පරිද්දෙන් මේ යොගීයාගේ සිත් සියලු භව යොනි ගති ආදියෙන් මිදෙනු කැමැත්තේ වේ. සියලු සංස්කාරයන්ගෙන් මෙසේ මිදෙනු කැමැති යොගියාහට උපදනේ මුඤ්චිතුකම්‍යතාඤාණ යි දන්නේ ය.

පටිසඩ්ඛානුපස්සනාඤාණ නම්, සංස්කාරයන්ගෙන් මිදීම පිණිස ඔවුන් පුන පුනා අනිත්‍ය - දුඃඛ - අනාත්ම විසින් සලකන නුවණ ය. මෙහි ලා යොගි තෙමේ ඒ සංස්කාරයන් පටිසඩ්ඛානුපස්සනාඤාණයෙන් ලිලකුණට නගා පරිග්‍රහ කරන්නේ ය. "සංස්කාරයෝ කල් නො පවත්නාහ. ඉපැදුම - නැසුම දෙකින් පිටිසිදිනා ලද්දාහ. ව්‍යාධි - ජරාමරණාදියෙන් පලුදු වන්නාහ" යන ආකරුණුවලින් අනිත්‍යයහ යි දකියි. "නිතර පෙළෙන්නෝ ය. දුක් ඇත්තාහ, දුකට වත්ථූහු ය" යන ආකරුණුවලින් දුඃඛයහයි දකියි. "අමනාපයහ, දුගඳ වන්නාහ, පිළිකුල්යහ" යන ආකරුණුවලින් අශුභයහ යි දකියි. "අනුන් අයත් ය. සිස් ය. වශයෙන් නො

පවත්නාහ'' යන ආ කරුණුවලින් අනාත්මයහ යි දකියි. මෙසේ බලන්නහු විසින් සංස්කාරයෝ තිලකුණට නගා පරීක්ෂා කරණ ලදද්හු වෙති. මිදීමට උපායය සපයනු පිණිස මෙසේ කරන්නේ ය.

මිනිසෙක් මසුන් අල්ලන්නට කුමින දියෙහි අටවා තැබී ය. කල් ගෙවා කුමිනට අත බහා දිය යට දී සර්පයකු ගෙදින් අල්ලා ගෙණ ''මත්ස්‍යයෙක් ගත්තා ලදැ'' යි සතුටු ව දියෙන් ඔසවා බලන්නේ සෝවැනි තුණ දක ''සර්පයෙකැ'' යි දැන බියට පැමිණ දෙස් දක කලකිරී උගෙන් මිදෙනු කැමැත්තේ නඟුටෙන් අල්ලා අත වෙළුම් හැර දෙතුන් විටක් හිස වටා කරකවා දුර්වල කොට ඉවත දමා ඉවුරට නැඟ ''සර්පයෙකුගෙන් බේරුණෙමි'' යි ආ මග බලමින් සිටියේ ය. යොගාවචරයා ද ත්මභාවය ලබා සතුටු වූ කාලය එහි මිනිසා මත්ස්‍යයෙකැ යි සර්පයකු අල්ලා ගෙණ සතුටු වූ කාලය වැනි ය. එකට හැනී සිටි නාමරූපධම්ම වෙන් කොට එහි තිලකුණු දක්ම කුමින් කටින් එලියට ඇද ගත් සර්පයාගේ සෝවැනි තුණ දක්ම වැනි ය. මිනිසා සර්පයා දක බියට පත් වූ කාලය වැනි වූයේ යෝගී හුගේ භයතුපට්ඨානඤාණ ය යි. ආදීනවානුපස්සනාඤාණය දෙස් දක්ම වැනි ය. නිබ්බිදානුපස්සනාඤාණය සර්පයා අල්ලා ගැණීමෙහි කලකිරීම වැනි ය. මුඤ්චිතුකම්‍යතාව සාපයාගෙන් මිදෙනු කැමැත්ත වැනි ය. පටිසඞ්ඛානුපස්සනාඤාණයෙන් සංස්කාරයන් කෙරෙහි තිලකුණු නැඟීම සර්පයාගෙන් මිදීමට උපායය යෙදීමක් වැනි ය. ඒ මිනිසා සර්පයා හිස වටා කරකවා දුර්වල කොට මැඩීමෙහි අපොහොසත් බවට පමුණුවා මුළු මනින් මිදෙන්නේ යම් සේ ද, එ මෙන් මේ යොගි තෙමේ ද තිලකුණු නැඟීමෙන් සංස්කාරයන් නිත්‍ය ශුභ සුඛාදීන්ගේ වශයෙන් වැටහෙන්නට සිහියට නගින්නට අපොහොසත් බවට පමුණුවා මැනවින් මිදී සිටින්නේ ය. මේ පරිණකින් ම යොගීහට පටිසඞ්ඛානුපස්සනාඤාණය උපන්නේ ය යි දන්නේ ය.

සඞ්ඛාරුපෙක්ඛාඤාණ නම්, දෙස් දක කලකිරී අත් හළ සංස්කාරයන් කෙරෙහි නැවත සිත් නො අලවා මැදහත් ලෙසින් උපදනා නුවණ ය. ''සංස්කාරයෝ ශූන්‍යයහ'' යි පරිග්‍රහණය කොට නැවත මෙය මම ය, මාගේ ය' යි ගත යුත්තක් නැති බැවින් ශූන්‍යයයි ගත් යොගී තෙමේ නැවත සිවු අයුරකින් ස අයුරකින් අට අයුරකින් දස අයුරකින් සොළොස් අයුරකින් දෙසාළිස් අයුරකින් සංස්කාරයන්ගේ හිස් බව දක තිලකුණු නගා සංස්කාරයන් පරීක්ෂා කරන්නේ බියත්, ඇලීමත් හැර සංස්කාරයන් කෙරෙහි මැදහත් වන්නේ ය. මම ය, මාගේ ය, යි නො ගන්නේ ය.

එක් පුරුෂයකුට මන වඩන ගැහැණියක් වූ ය. ඔහු ඇය හැර මොහොතකුත් තනි ව වසන්නට අපොහොසත් වී ය. ඔහු තදින් ඇයට ආලය කෙළේ ය. දවසෙක ඇය අන් පුරුෂයෙකු හා සිනා සෙමින් කතා කරණු දක කොපයට පැමිණ බලවත් සිත් තැවුලක් වින්දේ ය. ඇ නැවත නැවතත් එසේ කළා. පසු ව ඒ පුරුෂ තෙමේ ඇය ගෙයින් පන්නා

හැරියේ ඇයට ආලය නො කෙළේ ය. 'මාගේ අඹු' යි නො ගත්තේ ය. ඉන් පසු ඇය අන් පුරුෂයන් හා කතා කරණු, එකතු ව හිඳිනු සිටිනු සිනා සෙනු දුට ද ඒ පුරුෂයාහට කොපයෙක් සිත් තැවුලෙක් නො වී ය. මේ යොගාවචර තෙමේ ද එසේ සංස්කාරයන් කෙරෙහි දක්නා ලද දෙස් ඇති බැවින් මැදහත් වන්නේ ය. සංස්කාරධර්මතත්ත්වය දක්නා ඔහු කිසිත් භවයෙක යොනියක ගතියක විඥානස්ථිතියක සත්ත්වාවාසයෙක නො ඇ-ලෙයි. හැකිළෙයි. පෙරළෙයි. නො පිහිටයි මැදහත් බවෙහි හෝ පිළිකුල් බවෙහි පමණක් ම පිහිටන්නේ ය පියුම් පතෙහි වැටුනු දියබිඳු එහි නො ඇලෙන්නා සේ ගින්නට ඇල්ලූ කුකුළුපියාපත හැකිළෙන්නා සේ මේ යොගීහුගේ සිත භවත්‍රයයෙහි කො තැනකත් නො ද ඇලෙයි. නො පිහිටයි. එසේ කල්හි සඞ්ඛාරුපෙක්ඛාඤාණය උපන්නේ වේ. මෙසේ උපන් සඞ්ඛාරුපෙක්ඛාඤාණය යම් ලෙසකින් ශාන්තිපදය වූ නිර්වාණය ශාන්ත වශයෙන් දකී ද, එකල සංස්කාරයන්ගේ පැවැත්ම හැර, නිවණට ම පැන සිටියි. නිවණ ශාන්ත වශයෙන් නො දකී නම්, පුනපුනා සංස්කාරයන් අරමුණු කොට ම පවත්නේ ය.

මුඤ්චිතුකම්‍යතා – පටිසඞ්ඛානුපස්සනා – සඞ්ඛාරුපෙක්ඛා යි අකුරු විසින් මේ වෙනස වුව ද, අර්ථ විසින් එකෙක් ම ය. නො වෙනස් ය. "යා ච මුඤ්චිතුකම්‍යතා යා ච පටිසඞ්ඛානුපස්සනා යා ච සඞ්ඛාරුපෙක්ඛා, ඉමෙ ධම්මා එකත්ථා ව්‍යඤ්ජනමෙව නානං" යනු ආප්තයි. නිබ්බිදානුපස්ස නාඤාණයෙන් කලකිරී සිටි යොගීහු ගේ උත්පාදදීන් හරිණු කැමති බව මුඤ්චිතුකම්‍යතා ය. මිදීමට උපායය සපයනු පිණිස අනතුරු ව කරණ සංස්කාරපරීක්ෂණය පටිසඞ්ඛානුපස්සනා ය. මිදී අවසන්හි මැදහත් බව සඞ්ඛාරුපෙක්ඛා ය.

අනුලොමඤාණ නම්, උදයබ්බයාදී වූ අට වැදෑරුම් විදසුන් නුවණට හා සත්තිස් බෝ පැකි දහමුන්ට අනුලොම් ව ලොකොත්තර මාර්ගක්ෂණ-යෙහි පහළ වන චිත්තවීථියෙහි වූ මනොද්වාරාවර්ජනයට අනතුරු ව උපදනා කාමාවචරඥානසම්ප්‍රයුක්තවිදර්ශනාචිත්තයන් හා යෙදී සිටි නුවණ ය.

දැහැමි රජෙක් විනිශ්චයාසනාරූඪවූයේ විනිශ්චය කාරක මහාමාත්‍ය-යන් අට දෙනකු විසින් කරණ ලද විනිශ්චය අසා අගතියට නො ගොස් මැදහත් ව 'එසේ වේවා' යි අනුමෝදන් ව ඔවුන් කළ විනිශ්චයටත් පෞරාණිකරාජධර්මයටත් අනුකූල වන්නේ යම්සේ ද, එසේ මේ නුවණ ද මුලින් උපන් උදයබ්බයාදිඤාණයන්ට ද, මතු උපදනා සත්තිස් බෝ පැකි දහමුන්ට ද, අනුකූල වන්නේ ය. එහි අනුලොමඤාණය දැහැමි රජු සේ ය. අට වැදෑරුම් විදසුන් නුවණ අට මහ ඇමතියන් සේ ය. බෝ පැකි දම් පැරණි රජදහම සේ ය. රජ තෙමේ 'එසේ වේවා' යි යම් සේ ඔවුන්ගේ විනිශ්චයට හා රාජ ධර්මයට අනුකූල වේ ද, එ මෙන් අනිත්‍යාදිවශයෙන්

සංස්කාරයන් අරභයා උපදනේ, අෂ්ටවිධවිදර්ශනාඥානයන්ට හා කොටි-පාක්ෂිකධර්මයන්ට අනුලොම් වන්නේ ය. එ හෙයින් මෙය සච්චානු ලොමිකඤාණ යි කියනු ලැබේ.

අනුලොමඥානය ලොකොත්තරචිත්තවීථියෙහි ආවර්ජනචිත්තයට පසු ගොත්‍රභූචිත්තයට පසු ව උපදනා සිත්හි, මාර්ගය හා ගැටෙමින් උපදනේ **ව්‍යුත්ථානගාමිනීවිදර්ශනා** නම් වේ. **"අතම්මයකං භික්ඛවෙ! අතම්මයකං ආගම්මි, යායං උපෙක්ඛා එකත්තා එකත්තසිතා තං පජහථ තං සමතික්කමථ"** යනුවෙන් සළායතනවිභඞ්ගයෙහි මෙය **අතම්මයතා** යි ද, **"නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති"** යනුවෙන් **නිබ්බිදා** යි ද, **"පුබ්බෙ ඛො සුසිම! ධම්මට්ඨිතිඤාණං පච්ඡා නිබ්බානෙ ඤාණං"** යනුවෙන් සුසීම සූත්‍රයෙහි **ධම්මට්ඨිති ඤාණ** යි ද, **"සඞ්ඛාරානං ඛො පොට්ඨපාද! පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං"** යනුවෙන් **සඞ්ඛාරුග්ග** යි ද, දසුත්තරසූත්‍රයෙහි **පාරිසුද්ධිපධානීයඞ්ග** යි ද, ප්‍රතිසංවිත්මාර්ගයෙහි **මුඤ්චිතුකම්‍යතා - පටිසඞ්ඛානුපස්සනා සඞ්ඛාරුපෙක්ඛා** යි ද, **ප්‍රස්ථානප්‍රකරණයෙහි අනුලොම-ගොත්‍රභූ** - වොදන යි ද, රථවිනීතසූත්‍රයෙහි **පටිපදා ඤාණදස්සනවිසුද්ධි** යි ද, විදර්ශනාවගේ කුළු-ගැන්ම මෙහි ම කෙරෙණ බැවින් **සික්ඛාප්පත්තවිදස්සනා** යි ද ආයේ ය. මෙසේ අෂ්ටවිද්‍යායෙහි ආදිම විසින් ගැණෙන විදර්ශනාඥානය, උදයබ්බය-ඤාණාදීන්ගේ වශයෙන් නව වැදෑරුම් යි දත යුතු ය.

මනොමයඉද්ධිඤාණ නම්, කොපුවෙකින් කඩුවක් ඇද ගන්නා සේ, කරඬුවෙකින් නයකු ඇද ගන්නා සේ, මේ සිරුරෙන් සියලු අභපඤ්ඤ ඇති හැඩහුරුකම් ආදියෙන් නො වෙනස් වූ මනොමයකයක් මවා ගැනීමෙහි පොහොසත් වූ නුවණ ය. **"ඉධ භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං"** යි ආයේ මේ නුවණ ය.

ඉද්ධිවිධඤාණ නම්, ප්‍රකටබව, අප්‍රකටබව, පොළොව කිමිද යෑම, දිය මතුපිට සක්මන් කිරීම, අහස පලක් බැඳ හිඳීම, සඳහිරු අත ගෑම යන ආ නන් වැදෑරුම් ක්‍රියා **දක්වීමෙහි** පොහොසත් නුවණ ය. **දිබ්බසොතඤාණ** නම්, දෙවියන්ගේ හා මිනිසුන්ගේ දුර වූත් ළඟ වූත් ශබ්ද ඇසීමෙහි පොහොසත් නුවණ ය.

පරචිත්තවිජානනඤාණ නම්, රාගසහිත සිත රාග සහිත යිද රාගරහිත සිත රාගරහිත යි දැ යි සොළොස් අයුරකින් අනුන්ගේ සිත පිරිසිඳ දන ගන්නා නුවණ ය. මෙය සමන්තපාසාදිකාවේ දිබ්බචක්ඛු වසයෙනි.

පුබ්බෙනිවාසානුස්සතිඤාණ - දිබ්බචක්ඛුඤාණ - ආසවක්ඛයකරඤාණ යන මේ තුන ත්‍රිවිද්‍යාකරාවෙහි ලා කියන ලද්දේ ය. විද්‍යාඥානය තුනට බෙදීමෙහි ලා ගැණෙන්නේ මේ තුන ය. අටක් කොට බෙදීමෙහි දී මේ තුන හා මනොමයඉද්ධිඤාණාදි පසත් ගැණෙති.

වරණ නම්, පාතිමොක්ඛසංවර – ඉන්ද්‍රියසංවර – මත්තඤ්ඤුතා – ජාගරියානුයොග – සද්ධා – හිරි – ඔත්තප්ප – බහුස්සුතතා – පරක්කම–සති මති – ආකාසානඤ්චායතන – විඤ්ඤාණඤ්චායතන – ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන මේ පසළොස් දහම් ය. මේ එහි සංග්‍රහ ය.

"සීලං වරං ඉන්ද්‍රියසංවරෝ ච
මත්තාඤ්ඤතා ජාගරියානුයොගෝ
සද්ධාහිරොත්තප්පබහුස්සුතත්තං
පරක්කමෝ චෙව සතීමති ච
චත්තාරි ඣානානි ච තානිමානි
තිපඤ්චධම්මා වරණානි ජඤ්ඤු"

මේ දහම් පසළොස ආයාර්‍යශ්‍රාවකයනට නිවන් යැමට උපකාර බැවින් වරණ යි කියනු ලැබේ. "වරන්ති තෙන අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති වරණං" යනු අත්ථසම්වර්ථනය යි.

පතිස්සතා = සිහි ඇති ව, නිති එළඹ සිටි සිහි ඇති ව.

කමටහන් වඩන්නට සම්පූර්ණ කරන්නට පොහොසත් සිහිය පතිස්සති නම්. "කම්මට්ඨානං එතිං ගමෙතුං සමත්ථා සති පතිස්සති" යනු අට්ඨවා ය එයින් යුක්තයෝ පතිස්සතා ය.

පහස්සථ = දුරු කරවු, හැරපියවු.

ඉදං දුක්ඛං = මේ සසර දුක

අනප්පකං = අතල්ප වූ, ඉතා බොහෝ වූ. ටික නො වූ.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

පිලොතිකතිෂ්‍යස්ථවිරවස්තුව නිමි.

සුඛසාමණේරයෝ

10 – 11

බරණැස් සිටුහට ගන්ධකුමාර නම් පුත්‍රයෙක් විය. සිටු මළ පසු බරණැස් රජ, ගන්ධකුමාර ගෙන්වා ඔහුට ඒ සිටු තනතුරු දුන්නේ ය. එතැන් සිට ඔහු ගන්ධසෙට්ඨි යි ප්‍රසිද්ධ විය. දිනෙක අයකැමි තෙමේ ඔහු මුදල්නාණ්ඩාගාරය වෙත කැඳවා ගෙණ ගොස් "සිටු! මේ මුදල් ඔබ තුමන්ගේ පියා සතු ය. මෙතෙක් මුදල් එහි තිබේ. මෙතෙක් මුදල් මුතුන් මිමුතුන් අයත් ය. එයට කැමැත්තක් කරණු මැනවැ" යි කියා සිටියේ ය. සිටු තෙමේ සියලු මිල මුදල් බලා "ඇයි, මොකද, ඒ අය මේ මුදල් රන් රිදී මුතු මැණික් නො ගෙණ ගියෝ?" යි ඇසි ය. "පින්වත! පරලොව යන්නෝ, පරලොව යන විට මිල මුදල් අඹුදරු ඇ කිසිවක් ගෙන නො යෙති, කොතරම් වෙහෙස විඳ හරිහමාබ කළෝ ද, සියල්ල හැර දමා ම මැරී යෙති, මේ ලොව හැම කෙනෙකු ම පරලොව යන විට, ගෙණ යන්නේ තමන් කළ පින් පව් දෙක පමණෙකි, අන් කිසිවක් ගෙණ යන්නෝ නො වෙති" යි අයකැමි කී කල්හි "ඔවුහු මෝඩකමට මේ මහත් ධනය මෙහි හැරදමා ගියෝ ද. මම මේ සියල්ල ගෙණ යන්නෙමි, කා බී සැප විඳින්නෙමි. කා බී අවසන් කොට ගිය කල්හි ගෙණ ගියේ වන්නෙමි" යි සිතා සිටු තෙමේ ලක්ෂයක් වියදම් කොට පළිහුගලින් නාන කොටුවක්, ලක්ෂයක් වියදම් කොට පළිහුයෙන් නාන ගල්ලැල්ලක්, මෙසේ ලක්ෂය බැගින් වියදම් කොට පුටුවක්, බත් කෑමට පිහානක්, කෑම ගන්නා තැන මණ්ඩපයක් බත් කන පිහාන තැබීමට දරණුවක්, බත් කන සැටි පෙණෙන ලෙසින් සිමැදුරු කවුළුවක් කරවූයේ ය. දවල බතට දහසක් රෑ බතට දහසක් වියදම් කෙළේ ය. පුර පසළොස්වක අවපසළොස්වක දෙකට කෑම පිළියෙල කරන්නට මේ වඩන්නට ලක්ෂයක් දෙවයි. පසළොස්වක දෙක්හි, බත් කන විට දහසක් වියදම් කොට නුවර ද සරසවා "ගන්ධකසිටානන් බත් කන සැටි බලත්වා" යි නුවර අණබෙර යවයි. මහාජන තෙමේ එය බලන්නට එතැනට රැස් වෙයි. සිටු තෙමේ එ දින වෙසෙසින් නාන කොටුවට බැස පුටුවේ හිඳ සුවඳ දියකල සොළොසකින් නා අවුත් සිමැදුරුකවුළුව හැර දමා මණ්ඩපය තුළ පණවා ඇති පුටුවෙහි හිඳියි. එකල මේ වඩන්නෝ දරණුව මේසය මත තබා ඒ මත්තෙහි පිහාන තබා එයට බත් බෙදති. ගන්ධකසිටු, මහත් උත්සවයෙන් එය කා බී සතුටු වෙයි.

එ දවස එක් පිටිසර වැසි මිනිසෙක් කෑමට වුවමනා දරු මිරිස් අබ කහ ලුණු ලූණු ඇ තුනපහ ගෙණ යන්නට දර කරත්ත කිහිපයක් ගෙණ නුවරට ඇතුල් ව යහළුවකුගේ ගෙයි නවාතැන් ගත්තේ ය. එද පසළොස්වක ය. "ගන්ධකසිටු කන හැටි බලත්වා" යි එදත් නුවර අණබෙර යැවී ය. ඒ ඇසූ ගේ අයිති මිනිස් තෙමේ තම යහළුවාට කතා කොට "ඕය! සමූසේ මෙයට කලින් කිසි දිනෙක ගන්ධක සිටානන් කන බොන සැටි

දැක තිබෙද?'' යි ඇසී ය. ඔහු 'නැතැ' ය කී ය. ''එසේ නම් එනව යන්නට, මේ දැන් අණ බෙර ගැසූයේ, එය බලන්නට මහාජනයාට රැස්වනු සඳහා ය. එය බැලිය යුත්තෙකැ'' යි යහළුවාත් කැඳවා ගෙණ ගෙයි වැස්ස පුරිස් තෙමේ සිටු මැදුර බලා ගියේ ය. මහාජන තෙමේ ද රැස්ව සිටියේ ය. පිටිසරයා බත් සුවඳ ඉව අල්ලා එහි ආශා ඇත්තේ යහළුවාට කතා කොට ''මිතුර! මට අරින් බත් ටිකක් කට ගාන්නට ඇති නම් හොඳැ'' යි කී ය. ''ඒ ඔන බලාපොරොත්තු නො වන්න. එය කොයි ලෙසිනුත් කළ හැක්කක් නො වේ'' යි කී විට, පිටිසරයා ''කට ගාන්නට ම ඕනෑ'' යි නැවත නැවතත් කියා සිටියේ ය. එ කල්හි අනෙකා පිරිස් කෙළවර සිට ''සිට! මම ඔබට වදිමි'' යි තෙවරක් මහත් හඬින් කියා සිටියේ ය. සිටු ,,තෝ කවරෙක් වෙහි?'' යි ඇසී ය. ''මම නාගරිකයෙක්මි'' යි හේ කී ය. ''තෝ කියන්නෙහි කිමැ?'' යි ඇසී ය. ''මේ සිටින්නේ පිටිසරයෙක්, හේ නුඹ වහන්සේ බත් වළඳනු දැක ඔබ වහන්සේ වළඳනා බතට ලෝබකම් කරයි. බත් ටිකක් කට ගාන්නට නො ලැබුනොත් දිවි යන්නේය කී කියයි. එහෙයින් මු කෙරෙහි කරුණා උපදවා මුට බත් කටක් දෙනු මැනවැ'' යි දන්වා සිටියේ ය. ''එසේ නො කට හැකි ය'' යි සිටු කී ය. එවිට නාගරික පුරුෂ තෙමේ ''යහළුව! සිටානන් කී වචනය ඇසුනේ ද?'' යි ඇසී ය. ''ඔව්, ඇසුනේ ය. එහෙත් බත් කටක් නො ලැබුනොත් ජීවත් නො වෙමි'' යි කීය. එ වර ද ඔහු සිටානන් අමතා ''සිටුතුමනි! බත් කටක් නො ලැබුනොත් මූ මැරෙන බව ම කියයි. එහෙයින් වටිනාකම් නො සලකා දිවි දෙන බව සිතා මුට බත් කටක් දුන මැනැව'' යි ඉල්ලී ය. ''ඕය! බත් පිඬෙක වටිනාකම සියයක් හෝ දෙසියයක් පමණ විය හැකි ය. එය මහ කජ්ජෙක් නො වේ. මුට දෙනු බලා සිට අන්හුන් ඉල්ලා සිටියොත් ඔවුනටත් දිය යුතු ය. එසේ වී නම් මම කන්නෙම් කුමක් ද? හොඳින් කල්පනා කොට බලන්න. ඒ එසේ නො වේ ද'' යි සිටු කී විට ''සිද්දිය නම් එසේ විය හැකි ය. කෙසේ නමුත් මුට බත් කටක් දුන්නොත් දිවි දුන්නා සේ ය'' යි කී ය. ''දෙන්නට නම් මොනා ලෙසකින් හුත් නො පිළිවන, නො ලැබුනොත් දිවි හරිමි යි කියා නම්, මාගේ ගෙයි තුන් අවුරුද්දක් කුලී වැඩ කරන්නට ඌට කියව, නොමිලයේ බත් දෙන්නම් නො හැකිය. එ විට මට මුට බත්තලියක් දෙන්නට පිළිවනැ' සිටු තෙමේ කීයේ ය. පිටිසරයා එය අසා ''හෑ යහපත, මම එසේ කරමි'' යි අසූ දරුවන් හැර දමා බත්තලියක් පිණිස කුලී වැඩ කරන්නට සිටු ගෙට ගියේ ය. ඔහු එතැන් සිට වැඩ කරන්නේ සියලු වැඩ සකස්ව ම කෙළේ ය. එයින් ඔහු බත් බැලයා යි ප්‍රසිද්ධ විය. කුලී වැඩට බැස තුන් අවුරුද්දක් පිරුණු දිනයෙහි ගෙයි බත් බෙදන්නා, සිටු වෙත ගොස් ''ස්වාමීනි! බත්බැලයා තුන් අවුරුද්දේ කෙළවරට පැමිණ සිටියි. තුන් අවුරුද්දක් ඉතා නොඳින් ඔහු වැඩ කර තිබේ. ඒ ඉතා අමාරු කාරියෙකි. මේ තුන් අවුරුද්ද තුළ ඔහු විසින් එක වැඩකුත් නො වරදවා අත පසු නො කොට ඉතා සැලකිල්ලෙන් කරණ ලද්දේ ය'' යි දන් වී ය. සිටු තෙමේ ඔහු කෙරෙහි පහන් විය. එයින් තමන් ඒ දවල බතට දෙදහසක් ද, බත්බැලයාගේ බතට දහ-

යක් ද දෙවා "අද බත්බැලයාට හැම සැලකිල්ලක් කළ යුතුය. විත්තාමණිය හැර අන් හැම දෙන උෂ්ණ හා එක් ව කටයුතු කළ යුතු ය" යි අණ කොට තවත් නොයෙක් සම්පත් ඔහුට පවරා දුන්නේ ය. එතැන් සිට බත්බැලයා ද සිටානන්ගේ ගඳ දියෙන් නාන්නේ ය. නානපුටුවෙහි හිඳින්නේ ය. ඒ රෙදි ම අඳින්නේ ය. සිටානන් හිඳිනා පුටුවෙහි හිඳින්නේ ය. ඉක්බිති සිටු තෙමේ එක් දිනෙක "බත්බැලයා කන බොන හැටි දකින්නට කැමැත්ත සිටු ගෙට එත්වා" යි නුවර බෙර හැසිර වී ය. 'මිනිස්සු රස්ව මැසි පිට මැසි බැඳ එහි නැගී බත්බැලයා කන සැටි බලා හුන්හ. නළුවෝ ද පැමිණ ඔහු පිරිවරා ගත්හ. මේ වඩන්නෝ බත්බැලයා ඉදිරියෙහි බත් පිඟානක් ගෙණැවිත් තැබූහ. ඔහු බත් කන්නට අත කට සෝදන් ම පසේ බුදුවරයෙක් සමාපත්තියෙන් නැගී සිට "අද කොං තැනක පිඬු සිඟා යන්නෙම් ද" යි විමසා බලා, බත්බැලයා දැක "මොහු අවුරුදු තුණක් තිස්සේ කළ කුලී වැඩට අද බත්පිඟානක් ලැබී තිබෙ. බත්පිඟානට මූ ගත් වෙහෙස, විඳි දුක් සුලු නො වේ. එහි ඉමක් නැත. එහෙත් මොහුට ශ්‍රද්ධාව තිබේ ද යනු විමසිය යුතු ය" යි විමසන්නේ ශ්‍රද්ධාව ඇති බව දුටුයේ ය. දැක නැවත "ශ්‍රද්ධාව තිබුනා ද, සමහර කෙනෙක් අනුනට යමක් දීමෙහි අපොහොසත් වෙති. දීමෙහිදී මැලි වෙති. එහෙයින් මොහු ඒ අතින් කෙබඳුදෙක් වේ ද යනුත් විමසිය යුතු ය" යි දෙවනු ද විමසූයේ, දීමෙහි පොහොසතකු බව හා තමන් වහන්සේට සඬ්ගුහ කිරීමෙන් මහත් සම්පත් ලබන බව දැක පා සිවුරු ගෙණ අහස නැගී ගොස් ඔහු ඉදිරියෙහි පෙණී සිටියේ ය. බත්බැල තෙමේ පසේ බුදුරජුන් දැක "මම පෙර දන් නුදුන් බැවින් එක් බත්පිඟානක් උදෙසා අවුරුදු තුනක් තිස්සේ පරවැඩ කෙළෙමි, මේ ලැබූ බත්පතින් වැඩිම ගණනේ මට එක රැ දවලක් රැකෙන්නට හැකි ය. එ හෙයින් මම මේ බත්පත මේ ස්වාමීන් වහන්සේට පූජා කෙළෙමි නම්, මට එයින් කප් කෙළගණනක් රැකෙන්නට පිළිවන්නැ" යි සිතා අවුරුදු තුණක් පුරා බැලමෙහෙ කොට ලත් බත්පතින් බත් උළුකුදු කටේ නො තබා එහි ආශාව දුරු කොට බත්පතත් ඔසොවා ගෙණ පසේ බුදු රජුන් වෙත ගොස් බත්පත අනෙකකු අතට දී පසඟ පිහිටුවා වැඳ පිහාන වම් අතින් ගෙණ දකුණතින් එහි තිබූ බත්, පසේ බුදුරජුන්ගේ පාත්‍රයට පූජා කෙළේ ය. උන්වහන්සේ බතින් කොටසක් පාත්‍රයට බෙදූ කල්හි, අකුත් පාත්‍රය වැසූහ. එකල්හි ඔහු "ස්වාමීනි! මේ එක ම බත් කොටස දෙකට බෙදන්නට නො හැකි ය. මට මෙලොවින් සඬ්ගුහ පුවමනා නැත. පරලොවින් ම සඬ්ගුහ කරණු මැනවැ" යි බත් ටිකකුත් ඉතිරි නො කොට සියල්ල ම පිළිගැන්වී ය. කෙතේ පිණිස ටිකකුත් ඉතිරි නො කොට දෙන දනය මහත් ඵල ඇත්තේ ය. බත්බැල, එසේ කරන්නේ සියල්ල පිළිගන්වා වැඳ "ස්වාමීනි! එක් බත්පිඟානක් උදෙසා තුන් අවුරුද්දක් පුරා අනුන් යටතේ බැලමෙහෙ කළ මා විසින් විඳින ලද්දේ ටික දුකක් නො වේ. මහත් දුකක් ම විඳින ලද්දේ ය දන් ඉතින් ස්වාමීනි! උපනුපත් තැන මට සැපයක් ම වේවා, ස්වාමීන් වහන්සේ දත් ධර්මයට ඔබත් හිමියෙක් වන්නෙම් වා" යි කියා සිටියේ ය. පසේ බුදුරජානන් වහන්සේ-

"ඉස්නාලද පැතූ – හැම දේ සම්පී වේවා,
පණුරැසි සදෙවි සියලු – සකප්හූ සපිරෙත්වා
ඉස්නා ලද පැතූ – හැම වහා ඉපී වේවා,
මිණිදෝරසෙව් සියලු – සකප්හූ සපිරෙත්වා,

යි අනුමෙවෙනි කොට "මේ මහජන තෙමේ මා ගන්ධමාදනයට යන තුරු ම බලා සිටීවා" යි ඉටා ගන්ධමාදනයට වැඩි සේක. මහාජන තෙමේ වඩනා උන්වහන්සේ බලමින් එහි සිටීසේ ය. බුදුරජානන් වහන්සේ ඒ පිණ්ඩපාතය පන් සියයක් පසේ බුදුනට බෙදා දුන්හ. සියලු දෙනා වහන්සේ තමන්ට යැපෙන පමණ ම ගත්හ. ස්වල්ප වූ පිණ්ඩපාතය, මෙසේ සෑහීමට ගියේ කුමක් නිසාද යි සිතිය යුතු නො වේ. ඒ එසේ වූයේ පසේ බුදුරජුන්ගේ බලයෙනි. ගෙණ ගිය ඒ පිණ්ඩපාතය පසේ බුදුරජුනට බෙදනු දුටු මහාජන තෙමේ දහස් ගණනින් සාධුනාද පැවැත් වී ය. එ නද හෙණ සිය ගණන් කඩා වැටෙන සේ වී ය.

ගන්ධක සිටු තෙමේ "බත්බැල මා විසින් දුන් සම්පත් ඉසිලීමට නො සුදුසු ය, එහි අපෝසත් ය, ඒ නිසා මිනිස්සු ඔහුට කවටකම් කරමින් කැකොස්සන් ගසති" යි සිතා ඒ දැන ගන්නට මෙහෙකරු මිනිසුන් එහි යැවී ය. ඔවුහු එහි ගොස් අවුත් "සිට! කවටකමෙක් නො වේ, සම්පත් ලබන්නෝ මෙසේ වෙති" යි ඒ සියලු තොරතුරු ඔහුට දන්වූහ. සිටු තෙමේ ඒ අසා සතුටින් ඉකිර පැකිර ගිය සිරුරු ඇති ව "මහාපුදුමයෙක්, ඔහු විසින් කරණ ලද්ද, එය ලෙහෙසි වැඩෙක් නො වේ, මම මෙතෙක් කල් මෙතරම් සම්පත් ඇති ව සිටියෙම් ද, අන්හට කිසිවෙක් දෙන්නට අපොහොසත් වීමි" යි සංවේගයට පැමිණ බත්බැල ගෙන්වා "තා විසින් මෙබන්දක් කරණ ලද්දේ සැබෑ ද?" යි ඇසි ය. හේ 'එසේ ය" යි කී ය. "එසේ නම් මේ දහස ගෙණ මටත් තා කළ පිණෙහි පින් දෙව" යි ඉල්ලී ය. බත්බැල එසේ කෙළේ ය. සිටු තෙමේ තමන් සතු සියලු සම්පත් දෙකට බෙදා කොටසක් ඔහුට දුන්නේ ය.

වත්ථුසම්පද, පවිවයසම්පද, චෙතනාසම්පද, ඉණාතිරෙකසම්පද යන මොවුනතුරෙහි, වත්ථුසම්පද නම්, නිරොධසමාපත්තියෙන් නැගී සිටි රහතුන් වහන්සේ හෝ අනාගාමී ආර්‍යයන් වහන්සේ ය. පවිවයසම්පද නම්, දැහැමින් උපන් සිවුරු, පිඬු, සෙනසුන්, බෙහෙත් පිරිකර ය. චෙතනාසම්පද නම්: දනයෙහි ලා මුල, මැද, කෙළවර යන තුන් කල්හි පැවැති චෙතනාව සොමනස්සසහගතඤාණසම්පයුත්තඅසඞ්ඛාරිකභාවයෙන් යෙදී පැවැත්ම ය. ඉණාතිරෙකසම්පද නම්, දනය පිළිගන්නහු නිරොධසමාපත්තියෙන් නැගී සිටීම ය. බත්බැලගේ දනයෙහි මේ කියූ සිවු වැදෑරුම් වූ සම්පදවෝ සම්පූර්ණ ව සිටියහ. දනය පිළිගත්තෝ පසේ බුදුරජානන් වහන්සේ ය. සිවු පසය බැලමෙහෙ කොට දැහැමින් උපන්නේ ය. බත් බැලට දනය පිළිබඳ පැවැත්තී සොමනස්සසහගතඤාණසම්පයුත්ත අසඞ්ඛාරික චෙතනා ය, ප්‍රතිග්‍රාහක වූ පසේ බුදුරජානන් වහන්සේ එකෙණෙහි සමාපත්තියෙන් නැගී

සිටි සේක. මෙ කී සම්පත්තීන්ගේ අනුභාවයෙන් දායකයෝ මෙ ලොවදී ම මහත් සැපතට පැමිණෙති. එහෙයිනි මෙතෙමේ සිටු වෙතින් මහත් සම්පත් ලැබූයේ.

ඉන් ටික දවසකට පසු බරණැස් රජ, මෙය දැන බත්බැල ගෙන්වා දහසක් දී පින් ලබා තුටු සිත් ඇත්තේ මහත් භොගයනුත් දී සිටු තනතුරුත් දුන්නේ ය. එතැන් සිට ඔහු බත්බැල සිටු යි ප්‍රසිද්ධ විය.

බත්බැල සිටු ගන්ධක සිටු සමග යහළුව එක් තැන්ව කමින් බොමින් නිදමින් දිවිතෙක් සිට මැරී ගොස් දෙව්ලොව උපන්නේ ය. එහි එක් බුඩාන්තරයක් දිව සැපත් වළඳා අප බුදුරජුන් දවස සැවැත් නුවර සැරියුත් මහතෙරුන්ගේ උපස්ථායක කුලයෙක පිළිසිඳ ගත්තේ ය. ඔහුගේ මවු තොමෝ ලැබූ ගැබ්පෙරහර ඇත්තී කිහිප දිනකට පසු ' පන්සියයක් භික්ෂූන් සමග සැරියුත් තෙරුන්ට නන් රසින් යුත් අහරක් පිළිගන්වා කහවත් දරා රන් තැටියක් ගෙණ අසුන් කෙළවර හිඳ භික්ෂූන් වළඳා ඉතිරි කළ ඉඳුල් බත් ටිකක් කන්නට ලැබෙන්නෙම් නම් මහත් ලාභයෙකැ'' යි හට ගත් දෙළදුක් ඇත්තී වූ ය. පසු දිනෙක ඕ එසේ කොට එ දෙළදුක් සන් සිඳුවා ගත්තා ය. පසු පසුත් ඕ එසේ කළා ය. කල් යත් ම ඇයට පුතෙක් උපන. පුතුට නම් තබන දිනයෙහි සැරියුත් මහතෙරුන් වැඩමවා ''හිමියෙනි! මා පුතුට ශික්ෂාපද දෙනු මැනවැ'' යි ඉල්ලූ ය. එවිට සැරියුත් මහතෙරණුවෝ ''මොහුගේ නම කිමැ'' යි ඇසූහ. ''හිමියෙනි! මේ දරු පිළිසිඳ ගත් ද සිට මේ ගෙයි කිසිවකුටත් කිසි දුකෙක්, අසනිපයෙක් නො වී ය. එ හෙයින් අපි මොහුට 'සුබ' යි නම් කෙළෙමු'' යි කීවා ය. උන්වහන්සේ ද එ නම ගෙණ ලදරුට ශික්ෂාපද දුන්හ. මවු තොමෝ එතැන් සිට ''මම මාගේ පුතුගේ අදහස් නො බිඳිමි'' යි කන් විදිනා මඟුල් ඇ හැම මඟුලෙක ම දන් දුන්නී ය. ලදරු සත් අවුරුද්දට පැමිණෙත් ම ''මැනියෙනි! මම හාමුදුරුවන් ලඟ මහණ වන්නට කැමැත්තෙමි'' යි කියා සිටියේ ය. ඕ තොමෝ ද ''පුත! යහපත, මම ඔබගේ කිසි ම අදහසකට විරුඬ නො වෙමි, කිසි ම අදහසකට අවහිර නො කරමි, කැමැති නම් එසේ වන්නැ'' යි තෙරුන් ගෙට වැඩම කරවා ''හිමියෙනි! මේ දරු ඔබ වහන්සේ වෙත මහණ වන්නට කැමැති යි කිය යි, එහෙයින් මොහු අද සවස විහාරයට ගෙණ එන්නෙමි'' යි කියා තෙරුන් විහාරයට යවා නෑයන් කැඳවා ''මාගේ පුතුට ගිහියකු වශයෙන් කළ යුතු හැම සැලකිල්ලක් අද ම කරමි'' යි නොයෙක් ඇඳුම් කැඩුම් ආයිත්තම් ඇඟ කර පළඳවා මහත් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්ත කොට විහාරයට කැඳවා ගෙණ ගොස් තෙරුන්ට භාර කළා ය. තෙරණුවෝ ''දරුව! මහණකම් කෙරුම පහසු නැත, එය තදින් දුක් විඳිය යුතු වැඩෙකි, දුක් නැති කිරිමට කළ යුත්තේ මහණකම වුව ද, එය රැකීම, එයට අනුව වැඩ කිරීම ඉතා අසිරු ය, එහෙයින් ඔය ලමයාට ඒ මහණකම කළ හැකි ද?'' යි ඇසූහ. ''මහණ වන්නට කැමැත්තෙමි, හාමුදුරුවන් වහන්සේ කියන්නේ යම් හැටියක් නම ඒ හැටියට මට කළ හැකි ය'' යි එ දරු කීයේ ය. තෙරුන් වහන්සේ

කමටහන් කියවා ඔහු පැවිදි කළහ. මවු පියෝ එතී ම නවාතැන් ගෙණ, එක් දවසක් බුදුරජුන් ප්‍රධාන සඞ්ඝයා වහන්සේට, තන් රසමසින් යුත් බොජුන් පිළිගන්වා සත් දවස ගෙවා, ගෙවලට ගියහ. අටවන ද මහ තෙරණුවෝ වෙහෙර වැසි භික්ෂූන්, ගම් බලා වැඩි කල්හි කුඩා නම ලවා, පා සිවුරු ගන්වා පිඬු පිණිස ගමට වැඩියහ. හෙරණ තෙමේ අතරමග තුබූ ඇල දෙළ ආදිය දැක, පණ්ඩිත තෙරණුන් සේ මහ තෙරුන්ගෙන් ප්‍රශ්න ඇසී ය. උන්වහන්සේ ඒ හැම ප්‍රශ්නයකට ම පිළිතුරු දුන්හ. එවිට හෙරණ තෙමේ "භාග්‍යවතුරුවන් වහන්සේ තමන් වහන්සේගේ පා සිවුරු ගන්නා සේක් නම්, මම මෙහි නවතිමි" යි කී ය. එකල්හි කිසිත් නොබැණ පා සිවුරු ගෙන්වා ගත්හ. ඉක්බිති හෙරණ තෙමේ "හිමියෙනි! මට කැම ගෙනෙන්නේ නම්, නන් රසින් යුත් බොජුනක් ම ගෙන ආ යුතු ය" යි ඉල්ලීය. "තමුසේ කියන ඔය රසවත් බොජුන් මම කොතැනින් ලබම් ද?" යි ඇසූ විට "හිමියෙනි! භාග්‍යවතුරුවන් වහන්සේගේ පිණෙන් නො ලැබෙන්නේ නම්, මාගේ පිණෙන් ඒ ලැබෙන්නේය" යි කී ය. ස්ථවිරයන් වහන්සේ දෙර යතුරු ලා, යතුර හෙරණුන් අතට දී, ගමට පිඬු සිඟා වැඩි සේක. හෙරණ, ඒ අතර විහාරයට අවුත්, තෙරුන් වසනා කාමරයෙහි දෙර හැර, ගෙට ඇතුල් ව, දෙරගුලු ලා, සිය සිරුර ගැණ නුවණින් කරුණු සිතමින් හුන්නේ ය. ඔහුගේ ගුණ තෙදින් සක්දෙව් රජුගේ පඬු ඇඹුල් අසුන තදින් රත් වී ගියේ ය. සක්දෙව් "ඒ කිමැ' යි බලනුයේ හෙරණහු දැක "මහණදම් කරණ ඒ හෙරණන් වෙතට මා දැන් යා යුතු ය'යි සිවුවරම් මහරජහු ගෙන්වා "තෙපි ගොස් වෙහෙර අවට සිටි ගස් වැල්හි හිඳ, හඬන අරගල කරණ පක්ෂීන් පලවා රැකවල් කරවු" යි නියොග කෙළේ ය. ඔවුහු එසේ කොට රැකවල් ගත්හ. සඳ හිරු දෙදෙන "තම විමන් ගෙණ සිටිවු" යි කළ නියොගය මැනවින් ඉටු කළහ. තෙමේත් අඟුල්කණුව අරක් ගෙණ සිටියේ ය. වෙහෙර හැම තැන නිහඬ වී ය. හෙරණ තෙමේ එකහ සිතින් විඳුන් වඩා අනගැම්බවට පැමිණියේ ය.

මහාස්ථවිරයන් වහන්සේ "හෙරණුන් නන්රසින් යුත් බොජුනක් ගෙණෙන්නැ යි කියන ලද්දේ ය, එය කවරකුගේ ගෙයින් ලැබිය හැකි දැ" යි සොයනුවෝ සැදැහැති ගෙයක් දැක ඒ බලා වැඩි සේක. ඒ ගෙයි උදවිය ඉතා සතුටු ව "හිමියෙනි! ඔබ වහන්සේ මෙසේ කළහු අපගේ පිණ කැ" යි උන්වහන්සේ වඩා හිඳුවා, කැඳ අවුලුපත් පිළිගන්වා, දන් වළඳන තුරු බණ වදරණු මැනවැ" යි ආරාධනා කළහ. උන්වහන්සේ ඔවුනට සිහි කටයුතු වූත් සින් ඇලවිය යුතු වූත් බණක් දෙසූහ. අනතුරු ව ඔවුහු උන්වහන්සේට නන්රැසැති බොජුන් පිළිගැන් වූහ. උන්වහන්සේ එය හෙරණුන් පිණිස ගෙන යන්නට සූදනම් වනු දැක "ස්වාමීනි! ඔය ටික භාග්‍යවතුරුවන් වහන්සේ වළඳනු මැනවි, මෙහි තවත් බොජුන් තිබේ, ගෙණ යන්නට එයින් පිළියෙල කරන්නෙමු" යි කීහ. උන්වහන්සේ එය වැළඳූහ. ඉන් පසු ගෙයි උදවිය නැවත පාත්‍රය ගෙණ ඒ පුරා බොජුන් පිළිගැන්නූහ. උන්වහන්සේ එය රැගෙන "හෙරණ බඩ ගින්නේ ය" යි කඩිනම් කොට වෙහෙරට වැඩි ඉස්ක.

එ දවස උදැසන බුදුරජානන් වහන්සේ වළඳා අවසන් කොට වෙහෙළ ගදකිළියෙහි වැඩ හිඳ "අද සුබ හෙරණ ගුරුන් අතට පාත්‍රය දී මහණදම් කරමි යි වෙහෙර රැඳුනේ ය, එ හෙයින් ඒ නමගේ අදහස මුදුන් පැමිණියේ ද' යි බැලිය යුතු ය" යි විමසුහ. එ වේලෙහි උන්වහන්සේට සුබ හෙරණුන් අනගැමි වූ බව පෙණී ගියෙන්, වඩාත් විමසන සේක් "අද ම මෙතෙමේ රහත් වන්නටත් නො පොහොසත් ය, ශාරිපුත්‍රත් හෙරණ බඩ ඕන්නේ ය යි කඩිනම් කොට අහර ගෙණ එන්නේ ය, යම් ලෙසකින් අහරණ රහත් වන්නට කලින් අහර ගෙණ ආයේ නම්, එය මොහුට අනතුරෙක් වන්නේ ය, එ හෙයින් මා එහි ගොස් දෙරකඩ රැකවල් ගත යුතු ය" යි ගදකිළියෙන් නික්ම අවුත් දෙරකඩ අරක් ගෙණ සිටි සේක. එ වේලෙහි ම ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අහර ගෙණ එනැනට ආහ. යට කියා ඇති පිළිවිසුම් විසඳූ හෙරණ තෙමේ එ කෙණෙහි ම රහත් වි ය. බුදුරජානන් වහන්සේ සැරියුත් තෙරුන්ට කතා කොට "කුඩා නමට අහර දෙව" යි වදළ සේක. "උන්වහන්සේ කාමරය වෙතට ගොස් දෙරට තට්ටු කළහ. හෙරණ දෙර හැර එලියට බැස තෙරුන්ට වත් දක්වී ය. "දන් වළඳව" යි තෙරුන් වදළ කල්හී, තෙරුන්ට බතින් වැඩක් නැති බව දත් හෙරණ නිවන් ගැණ සිත සිතා ප්‍රත්‍යවෙක්ෂා කරමින් දන් වළඳා පාත්‍රය සෝදූ තැබී ය. එ වේලෙහි සිවු වරම් රජහු, රැකවල් හැර ගිය හ. සඳ හිරු, සිය විමන් හළහ. සක්දෙව් තෙමේත්, රැකවල් හැර සිටියේ ය. ඉරත්. අහස මැද ඉක්මවා ගියේ පෙණිනා. භික්ෂූන් වහන්සේලා ඒ අතර "දන් සවස් කාලය වේ, හෙරණ වළඳා අවසන් කළේ දැන් ය, කිම අද උදය කාලය අධික වේ ද? සවස් කාලය මද වේ ද" යි කතා කරන්නට වූහ. එකල්හී එහි වැඩි බුදුරජානන් වහන්සේ ඒ කතාව අසා "ඔව්! මහණෙනි! පින්වතුන් මහණදම් පුරණ විට එසේ වන්නේ ය, අද සිවුවරම් රජහු, සක්දෙව් රජ, සැමතැන අරක් ගෙණ සිටියහ, සඳහිරු, සිය විමන් හී ම හුන්හ, මමත් දෙරකඩ අරක් ගෙණ සිටියෙමි, සුබ හෙරණ ඇල දෙළින් දිය ගන්නා දියාලුවන්, දැවදඬු සසින්නා වූ දඬුවඩුවන්, හී ඇද හරින් නාවූ හී වඩුවන්, රියසක් කරණ රියවඩුවන් දැක, ආත්මදමනය කොට රහත් වී ය" යි මේ ධම්දෙශනාව කළ සේක,

උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං,
දරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතාති.

දියාලුවෝ දිය ගෙණ යති. හී වඩුවෝ හී දඬු නමති. වඩුවෝ දැව නමති, සුවවයෝ තමන් දමති.

උදකං හි නයන්ති නෙත්තිකා = දියාලුවෝ තමන් කැමැති තැනට දිය ගෙන යති.

උසුකාරා නමයන්ති තෙජනං = හීවඩුවෝ හීදඬු නමති.

දරුං නමයන්ති තච්ඡකා = වඩුවෝ දැව නමති.

අත්තානං දමයන්ති සුබ්බතා = සුවවයෝ තමන් දමනය කරති[1]

සුවසේ අවවාද කට හැකි, අනුශාසනා කට හැකි සුවසේ කිය හැකි, කියන්නට පහසු වූ කියන හැම හිතයක් මුදුනෙන් පිළිගන්නා වූ මවුපිය ගුරුවර ඇ වැඩිහිටි අයගේ බස් පිළිගන්නා වූ අය වෙති සුබ්බතයෝ. "සුබෙන ඔවදිතබ්බා අනුසාසිතබ්බාති සුබ්බතා" යනු දන්නේ ය. "සුවද" යන්නෙහි 'ද' කාරයට 'ත' කාර ව වකාරය දෙකක් කොට එයට 'බ' කාර ව 'සුබ්බත' යනු නිපන්නේ ය.

තව ද යම් කෙනෙක්, දැඩි වූ පරුෂ වූ කර්කශ වූ වචනයෙන් කියන කල ද, එය ඉවසත් ද, නො කිපෙත් ද, මනා කොට නුවණින් කල්පනා කොට අවවාදනුශාසනා දැඩි ව ගණිත් ද, "ඔවදථ භන්තෙ! අනුසාසථ, තුම්හෙසු අනොවදන්තෙසු කො අඤ්ඤො ඔවදිස්සති" යනාදී ලෙසින් වැඩි යක් වැඩියක් ම අවවාදනුශාසනා ප්‍රාර්ථනා කෙරෙත් ද ඔවුහු ය සුබ්බතයෝ.

"යො පන ඔවදියමානො සාධු භන්තෙ! සුඨු වුත්තං අත්තනො වජ්ජං අත්තනො දුද්දස්සං හොති, පුනපි මං එවරූපං දිස්වා වදෙය්‍යාථ අනුකම්පං උපාදය, චිරස්සං මෙ තුම්හාකං සන්තිකා ඔවාදෙ ලඩොති වදති, යථානුසිට්ඨං ච පටිපජ්ජති, සො විසෙධිගමස්ස අවිදූරො හොති, තස්මා එව පරස්ස වචනං සම්පටිච්ඡිත්වා කරොන්තා සුවචොති" යන මෙයිනුදු සුවව යා කවරෙක්ද යනු පැහැදිලි වන්නේ ය. වැඩිහිටියන් විසින් අවවාද කරණු ලබන යමෙක් "වහන්ස! කියන ලද්දේ යහපතෙක, තමාගේ වරද තමාට නො දත හැකි ය, නැවතත් මා පිළිබඳ වරදක් දුටුකල මට අනුකම්පා පිණිස කියනු මැනව, ඔබ වෙතින් අනුශාසනාවක් ලද්දී බොහෝ කලකින් ය" යි අවවාදනුශාසනා ලෙසින් පිළිපදී ද, ඔහු විශෙෂාධිගමයෙන් ඈත් වූවෙක් නො වේ. එහෙයින් මෙසේ අනුන් බස් පිළිගෙණ කරන්නේ සුව වයා ය, යනු එහි අදහස ය.

අප්පිච්ඡතා, අනත්තුක්කංසනතා, අක්කොධනතාදිය සුවවබව කරණ දහම් ය. ඔවුහු සොළොසෙකි. මජ්ඣිමනිකායයෙහි අනුමාන සූත්‍රයෙහි එන්නේ ය. එහෙයින් මේ දහම්වලින් යුක්තයෝ ම සුවවයෝ ය. කීකරු හු ය. කියන්න ඉවසන්නෝ ය. අවවාදයෙහි නො ද කිපෙන්නෝ ය. අවවාදය බලාපොරොත්තු වන්නෝ ය.

"සුවවො පන දුවිධො හොති එකච්චො පස සිතබ්බො එකච්චො න"

පැසසිය යුත්තේ ය, නො පැසසිය යුත්තේ ය යි සුවව තෙමේ දෙවැදැරූ ය. එහි යමෙක් බතට බුලතට සිවුරට රෙදි කඩට ඇඳට පුටුවට ගිලන්පසට

1. 6, 5, "උදකංහි නයන්ති නෙත්තිකා" යනු බලනු.

සැලකිල්ලට යන ඇ සිවුපසයට කීකරු වන්නේ නම්, ඔහු නො ද පැසසිය යුත්තේ ය. ගණන් නොගත යුත්තේ ය. ඔහු සුවව වුව ද සුවවැ යි නො ගැණේ. යමෙක් දහමට ගරු කරමින් දහමට පූදමින් සුවවබවට පැමිණේ ද, ඔහු ම පැසසිය යුත්තේ ය. සුවව වූයේ ය. "නාහං තං භික්ඛවෙ! භික්ඛු සුවවොති, වදමි යො වීවර-පෙ- හෙසජ්ජපරික්ඛාරහෙතු සුවවො හොති, සොවවස්සතං ආපජ්ජති. තං කිස්ස හෙතු තං හි සො භික්ඛවෙ! භික්ඛු -පෙ- පරික්ඛාරං" යනු දෙශනා ය.

රාධ බමුණු තෙමේ සැරියුත් මහතෙරුන්ගේ ශිෂ්‍යයකු ලෙස මේ සසුනෙහි පැවිදි විය. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඔහු කැටු ව වනයට වැඩියෝ එහිදී "මේ හළ යුතු ය, මේ කළ යුතු ය, මෙසේ පිළිපැදිය යුතු ය" යන ඇ ලෙසින් නිතර අවවාද කරණ සේක. රාධ තෙමේ ද ගුරුන්ගේ අවවාදයට නැමී අවවාද පරිදි පිළිපැදීමෙන් වැඩි දවස් නො යා දී ම රහත් විය. ඉන් පසු සැරියුන් මහතෙරණුවෝ ශිෂ්‍යයා ද කැටු ව බුදුරජුන් වෙත පැමිණියෝ "සැරියුන! ශිෂ්‍යනම කීකරු ද, සුවව ද?" යි අසා වදළ කල්හි "ස්වාමිනි! එසේ ය, ඒ නම කීකරු ය, දෙසක්, වරුක් පෙන්වා අවවාද කළාට නො කිපෙයි, අමනාප නො වෙයි, කවදත් නො කිපුනේ ය, අමනාප නො වූයේ ය" යි කීහ. බුදුරජානන් වහන්සේ ඔහු ඉදිරියට තබා භික්ෂූන්ට අවවාද කරණ සේක් "මහණෙනි! රාධයා මෙන් කීකරු විය යුතු ය" යි වදරණ සේක.

යමෙක් තමන්ගේ සුවවබව හෙතු කොට අවවාදකයාගේ වචන කෙරේ නම්, අවවාදය අනුව පිළිපදී නම්, ඔහු සැප විඳියි. **කිපල්ලත්ථ ජාතක, කිසපුප්ඵ ජාතක** බැලිය යුතු ය.

මෙ ම සිරිලක එද සිරිසවත්ථු නම් යක්ෂ නගරයෙක් විය. මුහුදු ඔම තෙක යෙදී හුන් වෙළඳුන් සමූහයක් තමන් නැඟී ගත් නැව් කැඩී ගියෙන් එනුවර යාබද ව තුබූ මුදු වෙරලට ගොඩ බටහ. යකින්නෝ ඔවුන් දක පොළොඹවා නුවර තුළට ගෙණ ගොස් අත් පා බැඳ සිර ගෙයක ලා ඇවිරුහ. පසු දවස්හි ඔවුන් තම හිමියන් කොට ගෙණ කලක් සිර ගෙයි අවුරා ගෙණ සිටි මිනිසුන් මරා කෑහ. එකල්හි දෙටු වෙළඳ තෙමේ මෑලා යකින් නන් බව දැන එ බව තම පිරිසට කියා එතැනින් සැහවී යන්නට කථා කෙළේ ය. සමහර කෙනෙක් එයට සතුටු නො වූහ. එවිට ඔහු තම බස් පිළිගත් වෙළඳුන් හා එක්ව සැහවී ගියේ ය.

එ දවස මහයක් තෙමේ හිමවත වස්සවලාහන අස්රජෙක් ව ඉපද සිටී ඒ ය. අහසින් යන්නේ ය. සෘද්ධිමත් ය. හිමවතින් මෙහි දවුත් සය ජාත භැල් අනුභව කොට යන්නේ ය. යන්නේ ද "ජනපදයට යන්නෝ වෙත් නම්, මා හා එන්වා" යි මිනිස් බසින් කියා, එ බස් පිළිගත්තන්, තම පිට නංවා ගෙණ යන්නේ ය. ඇතැම් කෙනෙක් වාලධිය ගෙණ යති. එද ද මහයක් තෙමේ අහස යන්නේ මේ දැන සිරිසවත්ථු නුවරින් සැහවී යෑමට

බලාපොරොත්තු ඇති ව සිටි වෙළඳුන් ගෙණ ඔවුන්ගේ ගම් රටට පමුණුවා ලී ය. කෙනෙක් සැහවී නො ගොස් එහි ම රැඳී ගත්හ. එයට කිහිප දිනකට පසුත් එසේ ම කැඩී බිඳී ගිය නැව කිහිපයක මිනිස්සු එහි ගොඩ බටහ. යකින්නෝ පෙර සේ ඒ මිනිසුන් තම භීමයන් කොට ගෙණ එහි සිටි වෙළඳුන් මරා මස් කෑහ. දෙටු වෙළඳාගේ වදන් පිළිගෙණ සැහවී ගත් වෙළඳුන්ගේ දිවි රැකුනේ ය.

මෙයේ ආචාර්‍යෝපාධ්‍යායයන්ගේ ගුරුවරුන්ගේ වැඩිමහල්ලන්ගේ අවවාදයට වචනයට නො නැමෙන්නෝ වදන් නො පිළි ගන්නෝ එලෝ මෙලෝ දෙකින් ම විනාශයට යන්නෝ ය. අවවාදය කරන්නෝ සැපයට යන්නෝ ය.

එහෙයින් වදළ සේක බුදුරජහු:-

"බුදුන් දෙසූ ඔවදන් - යම් කෙනෙක් නොකරත් නම්,
රකුසියන් ගත් වෙණදුන් - වැනි ව ඔවුහු නැසෙති.

බුදුන් දෙසූ ඔවදන් - යම් කෙනෙක් කරති නම්,
වලාදෙවි ගත් වෙණදුන් - වැනි ව තෙර යෙත් ඔවුහු"

යි. ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් කළ සද්ධර්මසාගරය** නම් වූ **ධර්මපදවර්ණනාවෙහි දණ්ඩවර්ගාත් මකදශක තරඩගය නිමි.**

ජරාවගීය

එකාදශතරඞ්ගියකථාසූචි

වස්තුව

1 රා ධී මත්ව නැටූ ගැණු
2 සිරිමාවත්ගේ මළ සිරුර
3 උත්තරා මෙහෙණ
4 මීනී ඇටවල ඇලුණු මහණෝ
5 රූපනන්ද
6 මල්ලිකාදෙවිය ගෙතූ ඩොරුව
7 ලාලුදායි තෙරුන්ගේ බණ
8 බුදුරජානන් වහන්සේගේ උදන් ඇතුමෙක්
9 ධනවතකු හිඟන්නකු වීම

රාබී මත්ව නැටූ ගැණු

11 – 1

සැවැත් නුවර වැසි පන්සියයක් පමණ කුලපුත්‍රයෝ, "මෙසේ කලෙක්ත් මැලා අප්‍රමාද විහරණ ඇත්තාහු වෙති" සියඹුවන් විශාඛාමහාඋපාසිකාවට භාර දුන්හ. එතැන් සිට ඇලා උයනට, වෙහෙරට යන්නෝ නම්, විශාඛා උපාසිකාවන් හා එක් ව යෙති. දවසක් එහි "සුරා උත්සවයෙක් වන්නේ ය" යි දැන්වීම් පළකළ කල්හි ඇලා සිය සැමියනට සුරා පිළියෙල කළහ. ඔවුහු ද සත් දවසක් සුරා උත්සවයෙහි කෙළිසෙල්ලම් කොට අටවනද ගොවි කම් වෙණදම් ඇ කර්මාන්ත පිණිස ගෙවලින් නික්ම ගියහ. ඒ ගැණු "අපට අප හිමියන්ගෙන් සුරා ටිකක් වත් බොන්නට නො ලැබුනේ ය. ගෙයි ද සුරා ඉතිරි ව තිබෙ. හිමියනට නො දනෙන ලෙසින් ඉන් ටිකක් බොන්නෙමු" යි සිතා විශාඛාවන් වෙත ගොස් "ආර්‍යාවෙනි! කුලකින් උයන් යන්නට නො ලැබුනේ ය. උයන් යනු කැමැත්තෙමු" යි කීහ. විශාඛාවෝ ද "හොඳයි, එසේ නම් කළ යුතු වැඩ අවසන් කොට යවු" යි කීහ. ඇලා වැඩ වැඩ අවසන් කොට විශාඛාවන් සමග උයන් ගොස් විශාඛාවන්ට නො දනෙන සේ සුරා ගෙන්වා බී මත් ව තැන තැන හැසිරෙන්නට වූහ. ඒ දත් විශාඛාවෝ "මැලා කළෝ ලොකු වරදක්, තීර්ථකයෝ දැන් ශ්‍රමණගෞතමයාගේ ශ්‍රාවිකා වූ විශාඛාවෝ රා බී මත් ව හැසිරෙති යි සිතා, මට ගරහන්නාහ" යි 'කෙල්ලනි! තොප කළ වැඩේ හොඳ නැත, මටත් මෙයින් ගැරහුම් ලැබෙන්නේ ය. තොපගේ හිමියෝත් තොපට කිපෙත්, දැන් තෙපි කුමක් කරන්නාහු ද" යි ඇසූහ. ඇලා එවිට "ආර්‍යාවෙනි! කළ වරදට දැන් කුමක් කරමු ද, අපි අපේ හිමියනට ලෙඩ වූ ලෙසක් පෙන්වමු" යි කීහ. මම තොපට සුරා බොන්නට නො කීමි, ඉලඳ වන්නට නො කීමි, තොපි ඒතාපගේ වැඩවලින් ප්‍රකට වනු" යි විශාඛාවන් කී කල්හි ඇලා සිය ගෙවලට ගොස් හිස වහා පොරවා ගෙණ ලෙඩ වූ සැටි දක්වමින් වැතිර හොත්හ. එකල ඇලාගේ ස්වාමිපුරුෂයෝ ගෙවලට අවුත් "කොහි ද අපේ අම්මණ්ඩි, කොහි ද අපේ උපාසකම්මා" යි අසා "ලෙඩින් පෙළෙන්නී ය" යි ගෙයි සිටි දු පුතුන් කී කල්හි "එකතින් මැලා ඉතිරි ව තුබූ සුරා බොන්නට ඇතැ" යි ලං ව පරීක්ෂා කොට සුරා බී බව දැන තළා පෙළා අරගල කළහ.

මෙයින් පසු එක් දවසෙක සුරා බොන්නට සිතූ මේ ගැණු විශාඛාවන්ට උයන් යන්නට අඩ ගැහ. "පෙරත් තෙපි මට ගැරහුම් ලැබෙන පරිදි ක්‍රියා කළාහු ය. තෙපි යවු, මට යන්නට ඉඩ නැතැ" යි විශාඛාවෝ කීහ. "ආර්‍යාවෙනි! මින් පසු අපි මේ බදු වැඩ නොකරන්නෙමු. අප කළ ඒ නො පණත් කමට කමන්න, අපි දැන් බුද්ධපූජාවක් කරණු කැමැත්තම්හ, ඒ නිසා අප වෙහෙරට කැඳවා ගෙණ යනු මැනවැ" යි ඇලා කීහ. "එසේ නම් පූජාභාණ්ඩ පිළියෙල කොට මට කියවු" යි කී කල්හි පැස් පුරා වට්ටි පුරා කරඩු පුරා සුවඳ මල් ගෙණ, රා බඳුනුත් එල්ලා ගෙණ දිග පළලැති රෙදි පොරවා ගෙණ විශාඛාවන් වෙත ගොස් "පූජාභාණ්ඩ පිළි-

යෙල කොට ගතිමු'' යි ඇට දන්වා ඇය්ක් කැටුව ගොය් වෙහෙරට ඇතුල් ව පෘසකට වී රා බී හිස් රා බඳුන් බැහැර දමා ධර්‍මශාලාවට ගොඩ නැඟී බුදුරජුන් ඉදිරියෙහි වාඩි ගත්හ. එවිට විශාඛාවෝ ''ස්වාමිනි! මැලෑට බණ ටිකක් වදරණු මැනවැ'' යි ආරාධනා කළහ. ඒ වේලෙහි මේ ගැණු රා බී මත් ව මදවෙගයෙන් සින්දු කියන්නට නටන්නට අදහස් කළහ.

එක් මාරකායික දෙවියෙක් ''උන් හැමගේ සිරුරෙහි ආවිෂ්ට ව ශ්‍රමණ ගෞතමයාගේ ඉදිරියෙහි නොසරුප් නොසැබි වියරු දක්වන්නෙමි'' යි උන් ඇඟ ආවිෂ්ට වී ය. උන් අතුරෙහි සමහර ගැණු බුදුරජුන් ඉදිරියෙහි අප්පුඩි ගසා සිනා යෙන්නට වූහ. සමහර ගැණු නටන්නට පටන් ගත්හ. බුදුරජානන් වහන්සේ ''මේ කිමැ'' යි බලා වදරණ සේක් කරුණු දැන ''මාරපාක්ෂිකයනට ඉඩ නොදෙමි. මා විසින් පැරැමී පුරණ ලද්දේ, මාරපාක්ෂිකයනට ඉඩ දෙනු පිණිස නොවේ'' යි යක්ෂානුභාවය නිසා විළිබිය නැති ව වියරු වැටී සිටියවුනට බිය උපදවනු පිණිස බැමලොමින් රශ්මිකදම්බයක් විහිදු වූ සේක. එකෙණෙහි ලෝ පුරා මහාගනදුරෙක් පැතිර ගියේ ය. ඇණු මරණභයින් තැති ගත්හ. බියට පැමිණියහ. ඒ බියෙන් උඟුර තෙක් බී තුබූ රා වහා දිරා ගියේය. බුදුරජානන් වහන්සේ, වැඩ හුන් පලඟෙහි අතුරුදහන් වූ සේක් මහමෙර මතුයෙහි වැඩ සිට ඌර්ණලොමධාතුවෙන් බුදුරැස් පතුරුවා හැරි සේක. ඒ ඇසිල්ලෙහි සඳ දහසක් නැඟී සිටි කලක් සේ අන්ධකාරය නැසි ගියේ ය. ඉක්බිති ඒ ගැණුන් අමතා ''මා වෙතට එන්නා වූ තෙපි මෙසේ පමාව එන්නට නොසුදුස්සහු ය. තොපගේ ප්‍රමාදය බලා මාරකායික දෙවියෙක් තොප කෙරෙහි ආවිෂ්ටව මා වෙත දී නොකළ යුතු දේ තොප ලවා කර වී ය. සිනා නොවිය යුතු තැන සිනාසුනෝ ය. නොනැටිය යුතු නැන නැටුවහු ය. එහෙයින් මාරකායිකයනට ඉඩ නොලැබෙන සේ තොප විසින් රාගාදී වූ ගිනි මුළමනින් නිවා දැමීමට උත්සාහ කළ යුතුය'' යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

කෝ නු හාසෝ කිමානන්දෙ නිච්චං පජ්ජලිතෙ සති,
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථා කි

නිතොර ගිනි ඇවිල දැවෙද්දී, කවර සිනහවෙක් ද, කිනම් සතුටෙක් ද, අඳුරෙන් වැසුනහු පහණක් කිම නොසොයහු.

කෝ නු හාසෝ = කවර සිනහවෙක් ද?

කෝ යනු කිං යන්න මුල් කොට ඇත්තේ ය. එය සලිඞ්ගික වේ. ''කිංසූධ චිත්තං පුරිසස්ස සෙට්ඨං, කිං සීලං, කෝ සමාධි'' යන තැන්හි. සේ ය.

නු යනු නිපාතයි. ප්‍රශ්න, සංශය යන අරුත්හි එයි. ''කස්මා නු කුම්භෙ දහරා න මීයරෙ, අරහං නු ඛො ස්මි, නො නු ඛොස්මි'' යනාදි තැන්හි සේ ය. මෙහි ප්‍රශ්නයෙහි ආයේ ය.

සන්තොසය හාස නම් "හාසොතීති = හාසෝ, හසති යෙන = සෝ හාසෝ, හසනං = හාසෝ යනු අරුත් කීම ය. තුටු පහටු අයුරය හාස.

කිං ආනන්දෙ — කි නම් සතුටෙක් ද?

කිං ශබ්දය "කිං සෙවමානෝ ලභතීධ පණ්ඩිතං, කිං රාජාදයෝ ලොකං පාලෙන්ති, යං කිං වි රූපං අතීතානාගතපච්චුප්පන්නං, කිං තෙ වක්කලි, ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, කිං නු කාහාමි දෙවතෙ" යන මෙ තැන්හි පිළිවෙළින් ප්‍රශ්න, ගර්හා, අනියම, නිරර්ථක, වචන ප්‍රතිග්‍රහණ යන අරුත්හි එන්නේ ය. තවත් ස්වරූප, වස්තු, ක්‍රියා, කාරක, කෘත්‍ය යන අරුත්හි ද මයදේ. මෙහි ද ප්‍රශ්නයෙහි ය.

දැඩි සතුට ආනන්ද නම්. "ආහුසෝ නන්දයති ති = ආනන්දෙ" යනු විවෘතියි. "ආ හුසා තුට්ඨි ආනන්දෙති වුච්චති" යනු ටීකා ය.

නිච්චං = නිතොර. අතර නො තබා. නො කඩවා.

අතර නො තබා නො කඩවා පැවැත්ම 'නිච්චං' යන්නෙන් කිය වේ. "තොරතෝන්චියක් නැතුව" යනු සාමාන්‍ය ව්‍යවහාරයයි.

පජ්ජලිතෙ සති = ගිනි ඇවිල දන කල්හි. ගිනි ගෙණ තදින් ඇවිල ගත් කල්හි.

මේ සත්ලොව රාගාදි එකොළොස් ගින්නකින් රැ දවල හැම මොහොතක්හි අතර නො තබා තදින් ඇවිල ගෙණ දවෙන්නේ ය. රාග, දෙස, මොහ, ව්‍යාධි, ජරා මරණ, සොක, පරිදෙව, කායික-දුක්ඛ-චෙතසිකදුක්ඛ, උපායාස යන මේ ය ඒ ගිනි එකොළොස. මේ ඔවුන්ගේ සංග්‍රහ ය.

"රාගො ච දෙසො ච මොහො ච ව්‍යාධි
ජරා ච මරණඤ්ච සොකමෙව
පරිදෙවදුක්ඛම්පි ච දෙමනස්සං
පායාසඑකාදසමිච්ඡිමාහු

රාගාදීහු ඇතුළත්හි සිට සත්ත්වයා පිළිබඳ හැම ගුණයක් දවන්නෝ ය. සත්ත්වයා පුථස්ජන්නෝ ය. එහෙයින් මොවුහු ගිනි වෙති. සත්ත්ව-ශරීරගතසප්තධාතූන් ම වියලන්නෝ ය මොවුහු. සත්ත්ව ශරීරය ශුෂ්ක කරන්නෝත් මොහු ය.

අන්ධකාරෙන ඔනද්ධා = අඳුරෙන් වැසුන තෙපි අඳුරෙන් වළඳනා ලදහු.

මෙහි අන්ධකාර නම්, අවිද්‍යා ය. ප්‍රකෘති අන්ධකාරය පියවි ඇසින් දැකීම බැලීම නසන්නේ ය. පියවි ඇස වැඩට නැත්තක් කරන්නේ ය. චක්ඛුවිඤ්ඤාණයාගේ ඉපැත්ම වළකන්නේ ය. අවිද්‍යාව ද එබදු ය. නුවණැස නසන්නේ ය. සත්‍යය වසා ලන්නී ය. සත්ත්වයා නො මඟ යවන්නී ය. එහෙයින් අන්ධකාර යි වදළ සේක.

ප්‍රකෘතිඅන්ධකාරයෙන් හැසි ගැවසී ගත් සත්ත්වලෝකය ක්‍රියා විරහිත වන්නා සේ අවිද්‍යාන්ධකාරයෙන් වැළඳුනු සත්ත්වලෝකයත් ක්‍රියාවිරහිත වන්නේ ය.

පදීපං න ගවෙස්සථ = පහන් කිම නො සොයහු දැ?

මෙහි පදීප නම්, මගපල නුවණ ය. සූර්‍යාලෝකාදී වූ යමකිසි ආලෝකයක්හුගේ ලැබීමෙන් ප්‍රකෘති අන්ධකාරය නැසී යන්නා සේ මග පල නුවණ ලැබීමෙන් අවිද්‍යාන්ධකාරය නැසී යන්නේ ය. බුදුරජානන් වහන්සේ "අවිද්‍යා නැමැති ගනදුරෙන් වැළඳ ගත්, අවිද්‍යාන්ධකාරයෙන් වැසි ගිය තෙපි එය දුරලීම පිණිස, එයින් ගොඩ එනු පිණිස කුමක් හෙයින් නැණ පහන නො දල් වවු ද? කිම නො සොයවු දැ" යි මෙයින් වදළ සේක. අවිද්‍යාන්ධකාරයෙන් අඳුරුව ගිය සත්වලෝකයෙහි නැණ පහන දැල්විය යුතු ය යනු එහි අදහස ය.

මුළු සත්ලොව රැ දවල හැම මොහොතෙක අතර නො තබා එක ඇටියෙන් රාගාදී වූ ගිනි වලින් ඇවිල දවෙන්නේ ය. එසේ දවෙන මේ සත්ත්වයාහට මොන සිනහවෙක් ද, මොන සතුටෙක් ද, සිනහ වන්නට සතුටු වන්නට කරුණු නැත්තේ ය. අවිද්‍යා අඳුරෙන් තදින් මුළා ව සිටින්නා සත්ත්වයා විසින් ඒ අවිද්‍යා අඳුර නසන්නට වෙර වැඩිය යුතු ය. නුවණ දියුණු කර ගත යුතු ය.

ධර්මදේශනාවගේ කෙළවර ඒ ගැණු සෝවාන් පලයෙහි පිහිටියාහු ය. බුදුරජානන් වහන්සේ උන් නො සැලෙන සැදහයෙහි පිහිටි බව දැන, මහ-මෙර මුදුනෙන් බැස බුඩාසනයෙහි වැඩ හුන් කල්හි විශාඛාවෝ "ස්වාමීනි! සුරා බීම කෑම බීමෙක, විළිබිය නසන්නෙක, නින්දවට කරුණෙක, මේ ලොව දියුණුව නසන්නෙක, පරලොව අපායයට හෙලන්නෙක, ස්වර්ගය අවුරන්නෙක, 'ස්වාමීනි! මේ ගැණු ඔබ වහන්සේ ඉදිරියෙහි ඉරියවු පම-ණෙහි වත් පිහිටා ගන්නට නො හැකි ව අප්පුසි ගසන්නට සිතාසෙන්නට ශී කියන්නට නටන්නට උඩ පනින්නට පටන් ගත්තෝ සුරා බී මත්ව සිටී බැව්නි, කිරිසනකුටත් මේ බීම නො වටනේ ය. මේ බීම නිසා මිනිසා මූල-මනින් කිරිසනකු කරන්නේ ය" යි කීහ. "ඔව්, විශාඛා සුරා බීම ඉතා පහත් බීමක්, රා අරක්කු බීම නිසා විපතට පත් මිනිසුන්ගේ ගණන නො කියහැකිය, මේ නිසා මිනිස්සු මෙ ලොව ම ධනහානියට, මහාග හානියට, යසස්හානියට, ප්‍රඥා හානියට පැමිණෙන්නෝ ය. මරණින් පසු සිවු අපාය-යෙහි උපදින්නාහ" යි බුදුරජුන් වදළ කල්හී, නැවත විශාඛාවෝ 'ස්වාමීනි! මේ රා අරක්කු ලොව පහළ වුයේ කවදද" යි ඇසූහ. බුදුරජාණන් වහන්සේ ඒ දක්වන්නට විස්තර විසින් කුම්භජාතකය වදළ සේක. එය කැලිය යුතුයි.

විශාඛාසහායිකාවස්තුව නිමි.

සිරිමාවන්ගේ මළ සිරුර

12 - 2

වේසා ගැණියක් වූ සිරිමා රජගහ නුවර වීසූ දුටුවන් මන නුවන් ඇද ගන්නා රූ සපුටෙන් යුත් කාන්තාව වූවා ය. ඕ තොමෝ එක් අවදියෙක උක්තරා උපාසිකාවට වරදක් කොට, ඇය හා කලහයක් ඇතිකර ගත්තා ය. උක්තරා තොමෝ සුමන සිටුපුත්තුගේ භිරිය ය. පුණ්ණක සිටානන්ගේ දූ ය. පසු දවසෙක සිරිමා තොමෝ උත්තරාව කමා කරවා ගන්නට සිතා, උක්තරාවගේ ගෙයි බුදුරජුන් දන් වළඳනා දිනෙක එහි ගියා ය. වළඳා අවසන් කොට හුන් බුදුරජානන් වහන්සේ කමා කරවා ගත් ඕ තොමෝ එ වෙලෙහි අනුමොදනා පිණිස –

"අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ.
ජිනෙ කදරියං දනෙන සච්චෙන අලිකවාදිනං"

යි මේ දහම් අසා සෝවාන් වූවා ය. මේ කෙටිකතා ය. විස්තර කථාව අක්‍රෝධවර්ගයෙහි අනුමොදනා ගාථා වණ්ණනාවෙහි එන්නී ය.

සොතාපන්න සිරිමාවෝ බුදුරජුන් ආරාධනා කොට පසු ද මහදන් පවත්වා, සඞ්ඝයා වහන්සේ උදෙසා නිතර දෙන්නට ලහබත් අටක් පිළියෙළ කළහ. මුල සිට වැඩිමහල් පිළිවෙළින් අටනමක් භික්ෂූන් වහන්සේලා නිතර එහි වඩිත්. උන්වහන්සේලාට කිරි ගිතෙල් ආදිය පාත්‍ර පුරා දෙත්. එකකු ලත් කිරි ගිතෙල් තුන් හතර නමකට සෑහෙන්නේ ය. දින පතා කහවණු සොළොසක් වියදම් කොට දන් පිළියෙළ කෙරෙත්.

දවසෙක එක් භික්ෂු නමක් ඇගේ ගෙයි තමන්ට ලැබුනු ලහබත වළඳා තුන් යොත්තකින් ඇත්හි පිඟිටි එක් ආවාසයකට ගියේ ය. එහි සවස මහ අතරුන්ට උවැටන් කොට වත් පිරිත් කියන වේලේ භික්ෂූහු "ඇවත! අද දවල් දානය ගත්තහු කොතැනින් ද?" යි ඇසූහ. "සිරිමාවගේ ගෙයි දී වැළඳූ යෙමි" යි ඒ මහණ කී ය. ආවාසික භික්ෂූහු "ඇවැත! කොහොම ද, සිරිමාව එය හොඳින් සැලකිල්ලෙන් කරන්නී ද? වළඳන්නට රිසි උපදනා ලෙසට දන් දෙන්නී ද" යි ඇසූහ. "ස්ථවිරවරුනි! කුමක් අසනු ද? ගාගසින් බලනු මැනවි, සිරිමාවගේ දානයෙහි මහත් කම් එට කියන්නට තරා හැකි ය, ඈ තරම් හොඳට දන් දෙන ගැණියක් රජගහ නුවර කොතැනකත් නැත, එහි කිසි දෙයක් අඩු නැත, හැම දෙයක් ම ඇත්තේ ය, කෑම බීම ඉතා රසවත් ය, මහණුන් කෙරෙහි දක්වන සැලකිලි උසස් ය, දීමෙහි මැලිකමෙක් ඇට නැත, දෙන්නට උපන් ගැණි සිරිමා ය, වළඳා අවසන් වූ කල්හි ඉතිරි වන කෑම බීමෙහි පමණ කියනු නො හැකි ය, ඒ තරමට කෑම බීම එහි ඉකිරි වේ, අහංකාර කමක් ඇ තුළ නැත, ඕ ම දන් පිළිගන්වා බත් මාලු බෙදමින් පැන් පිළිගන්වමින් අත කට සෝදන්නට පඩිසැකම් ඉදිරියෙහි තබමින් ඉඳුල් හැර දමමින් සියලු කුදු මහත් වතාවත්

කරන්නී ය, ඇගේ ශ්‍රද්ධාව පුදුම ය, මෙ ලෙසින් ලෝඛකම් හැර දන් දෙන ගෑණු පිරිමි දකින්නට නැත. ඇගේ දානයටත් වඩා ඊට පින්නේ ඇගේ දැකීම ය, ඕ එතරම් නෙත් සිත් ඇද ගන්නා හැඩහුරුකමින් යුත් ගැණියකැ''යි ඒ මහණ සිරිමාගේ ගුණ කී ය.

එ වේලෙහි එහි සිටි එක් මහණෙක්, සිරිමාගේ ගුණ කථාව අසා, ඇය කෙරෙහි ඇලී, ''ගොස් බලන්නට ඕනෑ'' යි තම වස් ගණන ඒ මහණහුට දන්වා, නැවත ''හෙට සිරිමාගේ ගෙට දානය පිණිස යන්නට කුසපත් ලබා ඇති මහණහුගේ වස් ගණන කෙතෙක් ද'' යි ඇසි ය. ''ඇවැත! ඔබ වහන්සේ එහි යන්නහු නම්, ඔබ වහන්සේට සඬ්ඝස්ථවිර ව හෙට එහි ගොස් දන් පිළිගත හැකි ය'' යි ඒ මහණ කී කල්හි එයින් යතුටු වූ ඒ මහණ තෙමේ එ වේලෙහි ම පා සිවුරු ගෙණ ඉතා අලුයම අරුණ නැගෙත් ම දන් දෙන කැනට ගොස් සඬ්ඝස්ථවිර ව සිට දන් පිළිගත්තේ ය.

පෙර දිනයෙහි එහි දන් වැළඳූ මහණ එ තැනින් බැහැර ගිය ඇසිල්ලෙහි ම සිරිමා රොගාතුර වූ ය. තදින් ගිලන් වූ ඕ ඇඟ ලා තුබූ ඇඳුම් ආයිත්තම් ගලවා දමා නින්දට ගියා ය. එදත් දන් පිළිගන්නට භික්ෂූහු එහි පැමිණියහ. එහි මෙහෙ කරණ කෙල්ලෝ භික්ෂූන් දන් පිළිගන්නට ඇවිත් සිටුනා බව සිරිමාට දැන් වූහ. ඕ නොමෝ ''මම ගිලන්මි. කිසිත් කරන්නට මට නො පිළිවන, දුරියෙනි! තෙපි හාමුදුරුවරු වඩා හිඳුවාලා පාත්‍ර ගෙණ පළමුකොට අවුලුපත් පිළිගන්වා නැවත දන් වළඳවාලවු, වළඳනා වේලෙහි මා අඳහස් ලෙසින් පා පුරවා බත් මාලුපිණි පිළිගන්වාලවු'' යි නියොග කළා ය. මෙහෙ කරණ කෙල්ලෝ ''යහපතැ' යි භික්ෂූන් ගෙට වැඩම කරවා වඩා හිඳුවාලා පළමු කොට අවුල්පත් පිළිගන්වා ඉන් පසු දන් පිළියෙල කොට පිළිගැන් වූහ. සිරිමා කී ලෙසින් දන් වළඳනා වේලෙහි බත් මාලු පිණියෙන් පාත්‍ර පුරවා, සිරිමාවට ඒ බව දන්වා සිටියහ. ඕ නොමෝ ඒ දකිනු කැමැති ව ''දුරියෙනි, මම හාමුදුරුවරු දකිනු රිසියෙමි, මා අල්ලා ගෙණ එ තැනට ගෙණ යවු'' යි කිවු ය. මෙසේ මෙහෙ කරණ කෙල්ලන් විසින් අතින් ගෙණ භික්ෂූන් ඉදිරියට පමුණු වන ලද සිරිමා නොමෝ වෙවුල වෙවුලා භික්ෂූන් වැන්ද ය. අවුරුදු කෙළ ගණනක් රැස් ව සිටි කෙලෙස් ඇති ඒ මහණ තෙමේ ඇය දක මුළා වූයේ ලත් බතත් කා ගත නො හී, පාත්‍රයත් රැගෙණ වෙහෙරට ගොස් එය වසා තබා පොරොවා තුබූ සිවුරෙහි කොණක් බීම එලා නිදන්නට වන. එක් යහළු මහණෙක් එහි පැමිණ තොයෙක් ලෙසින් පෙරැත්ත කළ ද කිසිවක් වළඳවා ගත නො හැකි විය. එ දවස ම සිරිමා කලුරිය කළා ය. රජ තෙමේ සිරිමා කලුරිය කළ බව බුදු රජුන්ට දන්වා යැවී ය. බුදුරජානන් වහන්සේ එය අසා, ''සිරිමාවගේ මළ සිරුර ආදහන තො කොට අමුයොහොනට ගෙණ ගොස් බලු කවුඩු කැනහිල් ඇනට ලං වන්නට බැරි සේ තබ්බවා රැකවල් ලව'' යි රජුට දන්වා යැවූ සේක. රජ එසේ කරවී ය. පිළිවෙළින් තෙ දිනක් ඉක්ම ගියේ ය. සිවුවන ද මළසිරුර ඉදිමින. වනදෙරින් පණුවෝ වැගිරෙන්නට වූහ. මුළු සිරුර ඇල් සාල් බත් සැළියක් සේ විය. ඉක්බිති රජ තෙමේ

බුදුරජානන් වහන්සේගේ අදහස් දැන "කුඩා ළමයින් හා ගෙවල් රකවල සිටියවුන් හැර අන් හැම කෙනෙක් සිරිමාව දකින්නට එත්වා. නො ආවුන්ට කහවණු අට බැගින් දඩ ය" යි මුළු නුවර අණබෙර යැවී ය. "සඬඹයා වහන්සේත් කැටුව බුදුරජානන් වහන්සේත් සිරිමාව දකින්නට පොහොත් බිමට වැඩම කරණ සේක්වා" යි ආරාධනා යැවී ය. බුදුරජානන් වහන්සේ "සිරිමාව දකින්නට යමු" යි සඬඹයාට දන් වූහ. ක්ලෙශ වශී ව සිටි මහණ, සිවු දිනක් ම නො කා නො බී කිසිවකුත් කියන්නක් නො පිළිගෙණ බත් නැති ව සිටියේ ය. පාත්‍රයෙහි තුබූ බත් කුණු විය. පාත්‍රයෙහි මළ බැඳුනේ ය. ඔහුගේ යහළු මහණෝ ඔහු වෙත ගොස් "ඇවැත්! බුදුරජානන් වහන්සේ සිරිමාව දකින්නට වඩිනා සේකැ" යි කිහ. සිවු දිනක් නො කා නො බී නිදි ගත් ඒ මහණ, 'සිරිමා' යි කී සැටියේ වහා නැඟිට "කුමක් කියහු?" යි ඇසි ය. "බුදුරජානන් වහන්සේ සිරිමාව බලන්නට වඩිනා සේක, ඔබත් එහි යන්නහු දැ?" යි ඇසූහ. "ඔව්, මමත් යමි" යි බත් විසි කොට පාත්‍රය සෝදා එවිකයෙහි බහා මහණුන් හා එක් ව එහි ගියේ ය බුදුරජානන් වහන්සේ මහණගණයාගෙන් පිරිවරණලදු ව පසෙකට වී වැඩ සිරි සේක. මෙහෙණෝ, රාජපුරුෂයෝ උපාසක උපාසිකාවෝ එක එක තැන රැස් ව සිට ගත්හ.

බුදුරජානන් වහන්සේ =	මහරජ, මෝ කවු ද?
මහරජ තෙමේ =	ස්වාමීනි! ජීවකයාගේ නැගනි වූ සිරිමා.
බුදුරජ =	මෑ ද ඒ සිරිමාව?
මහරජ =	ස්වාමීනි! එසේ ය, මෝ සිරිමා ය.
බුදුරජ =	මහරජ! එසේ නම් කහවණු දහසක් දී කැමැති කෙනෙකුට දැන් මේ සිරිමාව ගෙණ යන්නැ යි මුළු නුවර අණබෙර යවන්න.
මහරජ =	හොඳයි, ස්වාමීනි; යවන්නෙමි.

රජ තෙමේ මෙසේ කියා නුවර බෙර යැවී ය. එහෙත් එකෙකුත් ඒ පිණිස නො ආයේ ය. ඉක්බිති රජ තෙමේ 'සිරිමාව ගන්නට එකෙත් මෙහි නැහැ" යි බුදුරජානන් වහන්සේට දන්වා සිටියේ ය. "මහරජ! එසේ නම් ගණන අඩු කර ගන්නැ' යි කියා දන්වාලව" යි වදළ විට "පන් සියයක් දී සිරිමාව ගන්නැ" යි අණබෙර යැවී ය. ඒ වරත් එකෙකුත් ඉදිරිපත් නො වී ය. එකල්හී දෙසියපණසට, දෙසියට, සියයට, පණසට, පස්විස්සට, විස්සට, දහයට, පසට, එකකට, පැදයකට, මදටයකට, කුටිටුවකට සිරිමාව ගන්නැ යි විළිවෙළින් දෙළොස් වරක් අණබෙර යැවී ය. එකෙකුත් ඒ ගන්නට නො ආයේ ය. එවිට "නො මිලයේ හැරගෙණ යන්නැ යි" දැන් වී ය. එහෙත් නිකමටවත් හා, හූ, කියන්නෙක් එහි නො වී ය. රජ තෙමේ ඒ බව බුදුරජානන් වහන්සේට දන්වා සිටියේ ය.

උන්වහන්සේ "මහණෙනි! වැඩක හැටි බලවු, එදා මේ නුවර හැම දෙනකුගේ සීත් ගෙණ සිටී මේ ගැණිය, අද නො මිලයේත් ගෙණ යන්නට කවුරුත් නැත, එදා ගත්තේ දවසට කහවණු දහයක් දීලා ය, දැන් නිකමට දුන්නත් ගන්නෙක් නැත, එදා මහාජනයා මුළා කළ මැයගේ රූපය අද ඇස් හැර බැලීමටත් නො හැකි තැනට වැටුනේ ය, මහණෙනි! බලවු, හැඩට යසට තිබුනු සිරුරට සිදුවී ඇති සැටි, හිස පටන් දෙපතුල තෙක් මේ එක ම පණුවැදුල්ලෙක, වණමුවින් වැගිරෙන ලේ සැරවෙහි නිමාවක් නැත, පණුවන්ගේ සීමාවක් නැත, මහණෙනි! මේ සිරුර මුළුමනින් කුණු ගොඩෙක, කුණුවළෙක, පණුවැදුල්ලෙකැ" යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං,
ආතුරං බහුසඩ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිතිති

යම් සිරුරෙක් තිර පැවැත්මෙක් නැත්තේ ද. වණ සමූහයක් වූ (තුන්සියයක් ඇටින්) නගා සිටුවන ලද ගිලන් වූ බොහෝ දෙනා විසින් ඉහය යි සලකන ලද විසිතුරු කළ මේ සිරුර බලව.

පස්ස = බලව.

මසැස හැර බලව යනු අදහස නො වේ. නුවණැසින් නය ලෙසින් බලව යනු අදහස ය.

චිත්තකතං = විසිතුරු කළ, සැරසූ.

ලෝකය තෙමේ මදමත් ව මේ සිරුර කොමු පිළි, දුහුල් පිළි, පට පිළි ඇනන් වැදැරුම් වූ වටිනා පිළියෙන් හා රන් රිදී මුතු මැණික් ආදියෙන් කළ ශීර්ෂාභරණ, ග්‍රීවාභරණාදී වූ නානාවිධ ආභරණයෙන් මොනවට සරසන්නේ ය. විසිතුරු කරන්නේ ය. සුවඳ දිය, සුවඳ සබන් පියොර ආදියෙන් සුවඳවත් කරන්නේ ය, නොයෙක් වෙශ විලාස දක්වා හිස පිරන්නේ ය. සුවඳ තෙල් ගල් වන්නේ ය. රැවුලු කපන්නේ ය. කුඩුම්බි තබන්නේ ය. තොල් නිය පාට ගන් වන්නේ ය.

බිම්බං = සිරුර.

බිම්බ යි සත්ත්වශරීරයට නමෙකි. "බිම්බං වුච්චති සරීරං" යනු කොෂ යි. කුණු කසළ, වමනය කරණ බැවින් එසේ කියන ලද්දේ ය. රැ දුවල් දෙකහි ඇස්, කන් නාස් ඇ වණමුඛයන්ගෙන් වමනය කරන්නේ කුණු කසළ ම වේ. "වමු × උග්ගිරණෙ" යනු ධාතුයි.

අරුකායං = වණසමූහයක් වූ.

මුව, දෙඇස, දෙනාස්සිදුරු, දෙකන් සිදුරු, මලමග, මූමග යන මේ නව තැන මහාවණමුඛ නම්. මේ හැම තැනකින් දිවා රැ දෙක්හී ගලන්නේ

වැඟහන්නේ පිට වන්නේ කුණු ය. දුගඳ ය. පිවිතුරු නො වූ දැ ය. සිය ශිරුරෙහි රැස් ව සිට මේ නව මඟින් නිකුත් වන අශුචි ය. තෙමේ ම අතින් පයින් කෝටුවෙන් පහසනු තබා දුර සිට දක්නට ද අකැමැත්තේ ය. ඒ බැහැ පැත්තෙහි ඉන්නට යන්නට අකැමැත්තේ ය. මෙසේ හැමලෙසින් පිළිකුල් වූ කැහි, කෙල, සොටු, කබ, කම්මල, මල මූ නිතර නිකුත් වන මේ ශිදුරු නවය දුගඳ වහනය වන බැවින්, කුණු වැගිරෙණ බැවින් වණමුව නම් වේ.

අරු යි වණයට නමෙකි. සිරුරෙහි වූ කුණුකසළ උඩට නගනා බැවින් වණමුව 'අරු' යි කියනු ලැබේ. ඔවුන්ගේ සමූහය අරුකාය නම්.

සම්ඵස්සිතං = (තුන්සියයක් ඇටින්) නගා සිටුවන ලද.

දෙසිය් දත් ඇට හැර, සූසැටක් අත් ඇට, සූ සැටක් පා ඇට, සූ සැටක් මස් ඇසුරු කළ මොළොක් ඇට, දෙකක් විළුම් ඇට, දෙකක් ගොප් ඇට, දෙකක් දහ ඇට, දෙකක් දණ ඇට, දෙකක් කලවා ඇට, දෙකක් කටි ඇට, අටළොසක් පිටිකටු ඇට, සූ විස්සක් ඉල ඇට, තුදුසක් උර ඇට, එකක් ලය ඇට, දෙකක් අකු ඇට, දෙකක් කොටු ඇට, දෙකක් බාහු ඇට, දෙකක් අක්බාහු ඇට, සතක් ගෙල ඇට, දෙකක් හනු ඇට, එකක් නාස් ඇට, දෙකක් ඇස් ඇට, දෙකක් කන් ඇට, එකක් නළල් ඇට, එකක් මුදුන් ඇට, නවයක් හිස් කබල් ඇට යන තුන්සියයක් පමණ ඇටවලින් ගළපා, නහරින් වේළා, මසින් ලෙහෙයෙන් වඩා නගා සිටුවන ලද්දේ ය මේ සිරුර. මේ කියන ලද්දේ ආගමධර්මයෙහි ආ සැටි ය.

වෛද්‍යශාස්ත්‍රීයග්‍රන්ථයන්හි ද මිනිස් සිරුරෙක ඇත්තේ ඇට තුන් සිය යෙකැ යි කියන ලද්දේ ය. "ත්‍රීණ්‍යස්ථිශතානි භවන්ති මනුෂ්‍යශරීරේ" යනු ආප්තයි. වෛදිකයෝ "ඇට තුන් සියසැටෙ කැ" යි කියත්. ශල්‍ය තන්ත්‍රයෙහි කියන ලද්දේ ද තුන් සියයෙකි. එහි, ශාඛාවන්හි එක් සිය විස් ඉසක, උකුළුදෙපස, පිට, උදර, ලය යන තැන්හි එක්සිය සතළොසක, ගෙලෙන් උඩ පෙදෙස තෙ සැටෙකැ යි ඇට තුන් සියය මෙසේ වෙන් කරත්.

දත් ඇට හා මේ සියලු ඇට කපාල, රුචක, තරුණ, වලය, නලක යි කොටස් පහකට බෙදත්. දණ, ඇල, කොපුල්, තල්ල, හක්ක, හිස යන මෙ තැන්හි වූ ඇට කපාල නම්. දත් ඇට රුචක නම්. නැහැය, කණ, ඉගිල, ඇස, කොඡය යන මෙ තැන්හි වූ ඇට තරුණ නම්. අල්ල, පල්ල, පිට, බඩ, ලය යන මෙ තැන්හි වූ ඇට වලය නම්. සෙසු ඇට නලක නම්.

ආතුරං = ගිලන් වූ.

සිරුර දිවා රෑ දෙක්හි කැවීම, පෙවීම, නැහැවීම, ඉළීම, ඉරියවු පෙරළීම් ආ යන මෙයින් නිතර පිළිදගුම් කළ යුතු බැවින්, පරිහරණය කළ යුතු බැවින් ගිලන් ය. සිරුර ජරාවෙන් ව්‍යාධියෙන් ගිලන් ය. කෙලෙසුන්ගෙන් ගිලන් ය. එහෙයින් සිරුර ආතුර යි වදළ සේක.

අනුසඩ්කප්පං = බොහෝ දෙනා විසින් යහපත් යි කල්පනා කරණ ලද.

නො නැසූ කෙලෙස් ඇති අඥයන් විසින් අශුභ වූ ශරීරය ශුභය යි සම්මත ය. එහෙයින් ඔවුහු එහි මුසපත් වෙති. එයින් ඔවුහු පව්කම් කරන්නෝ ය.

යස්ස නත්ථි ධුවං යීකි = යම් සිරුරෙක නිති පැවැත්මේක් නැත්තේ ද.

එකතින් නස්නා සුලු ය. එකතින් විසිරෙණ සුලුය යි මේ වදළ සැටියි. සිරුරෙහි එකාන්ත ස්ථිර පැවැත්මෙක් නැත්තේ ය. ශරීරය යි කියන නාම රූපධර්ම දෙ කොටස දිවා රෑ දෙක්හි හැම මොහොතෙක ඉපිද ඉපිද මැරි මැරී යන්නේ ය. සිරුරෙහි තිර පැවැත්මෙක් නැතැ යි වදළෝ එහෙයිනි. එහෙත් සන්තති වශයෙන් දීගට පවත්නා බවක් පෙණෙන හෙයින් නුවණැත්තේ සිරුර ස්ථිරය, ශුභය, සුඛය යන ආ ලෙසින් වරුවා ගන්නේ ය. එයට ආලය කරන්නේ ය. එහි හැපෙන්නේ ය.

"වස්ත්‍රාභරණාදියෙන් සැරසූ, වණසමූහයක් වූ ඇටවලින් නැඟුනු, ගිලන් වූ බොහෝ දෙනා විසින් යහපතැ යි පිළිගත්, තිර පැවැත්මක් නැති මේ සිරුර බලව" යි වදළෝ සිහි එලවා බලන්නට ය. නුවණින් බලන්නට ය. කරුණු සිතට ගෙන බලන්නට ය. නිවණට හිත ලෙස බලන්නට ය. ආගමට අනු ව විද්‍යාවක්‍රවර්තිපදයෝ මෙහි ලා මෙසේ කීහ: "මේ ශරීරය නම් මුත්තෙකින් මැණිකෙකින් මරාවකින් පබළුයෙකින් රණෙකින් රිදියෙකින් නිමියේ නො වෙයි. ඇටින් සමින් නහරින් ඉසින් ලෙහෙයින් මසමින් පිතින් වමනින් අසුචියෙන් හිඟකෙහෙයෙන් ලොමින් නියෙන් දතින් වකුගඩුවෙන් හදවතින් අක්මායෙන් බඩදිවින් දලබුයෙන් අතුණෙන් අතුණුබහනින් නො පැසුනු අහරින් පුයායෙන් ඩැහයෙන් කෙලින් කඳුළෙන් සොටුයෙන් සඳමිදුලෙන් හිස් මුදින් නිමියේ ය, බැලූ බැලූ සේ අසාර ය, සිතූ සිතූ සේ පිළිකුල ය, නුවණ නැති නැති වූ සේ යහපත් ව වැටහෙන්නේ ය, බුදු ඇසිනුදු බලා සාරයක් දක්නට නැතියාව හැම ලෙසින් ම අසාර ව සිටියේ ය, පෙණ පිඬක් සේ, දිය බුබුලක් සේ, විදුලියක් සේ, ඉන්ද්‍රජාලයක් සේ, සිහිනෙන් දුටු රුවක් සේ අස්ථිර ය, අයාපන, නොසඛා ය, දුර්ගන්ධයට ආකර ය, අශුචියට පාත්‍ර ය, මුත්‍රයට භාජන ය, ගඩක් වැන්න, පොළක් වැන්න, රොගයක් වැන්න, ඇවිදිනා අසුචිපිඩක් වැන්න, මෙමේ ම තමහට විෂ ය, තෙමේ ම තමහට ගිනි ය, ඇතුළෙහි අසුචි පුරා පිටතැ සිතියම් කළ කළයක් වැන්න, එක් දවසක් නො නැ ව එක් දවසක් නොඉඳු ව එක් දවසක් දත් නො මැද් ද පැයක් බුලත් නො කැ ව මෙමේ ම තමහට අසුචි වළක් සේ වැටහෙයි, කන්හි කණුදු ලෙසින් සිටි අසුචි ය, ඇස්හි මඩ ලෙසින් සිටි අසුචි ය, නාසායෙහි සොටු ලෙසින් සිටි අසුචි ය, ස්වභාවයෙන් අධොමාර්ගයෙන් වැහෙන්නා වූ අසුචිය යන මෙතෙක් අසුචියෙන් අතුරක් නැත්තේ ය, රොගයට ආකර ය, ශොකයට ආකර ය, භයට ආකර ය, උපද්‍රවයට ආකර ය, අද නස්සි, හෙට නස්සි යි හිමක් නැත්තේ ය, ආදී මවුකුස් මහතරකයෙහි වැස විඳුනා දුකට කාරණ ව සිටියේ ය,

සොර වූ ජරායුකට පිහිට ව සිටියේ ය. මරහු මුවෙහි විදුනා මරණයුකට පිහිට ව සිටියේ ය. තමාගේ පිළිකුල් තමාට ම ඉවසා ගත නො හැකි දුර්ගන්ධ ඇත්තේ ය. මළ එක දවසකුදු ගෙයි ලැග්ග, ලැඟි ගෙය අසූ සොහොනක් සේ කරණ පිළිකුලට නිදන ව සිටියේ ය. නො ගත හැක්ක, නො දිය හැක්ක, නො සිතිය හැක්ක, එසේ වූ කුණු ශරීරය හා ඒ ශරීරය නිසා පවත්නා සිත මුත් අනික් ආත්මයෙක් නැත. මේ චිත්තයත් මේ ශරීරයත් ඇති ව නැති වන හෙයින් අනිත්‍ය ය. නොයෙක් දුකට පිහිට හෙයින් දුක ය, තමා කැමැති සේ නො පවත්නා හෙයින් අනාත්ම ය'' යි.

මෙය බලා වඩා නිවන් පසක් කරණු කැමැත්තහු විසින් සිරුරෙහි හැම කොටසක් සිතින් වෙන් කොට හැම කොටසක් වණ්ණ, සණ්ඨාන, දිසා, ඔකාස, පරිච්ඡේද යන පස් අයුරින් ඉගෙණ ව්‍යවස්ථා කොට නැවත වණ්ණ, සණ්ඨාන, ගන්ධ, ආසය, ඔකාස විසින් පස් පරිද්දෙකින් පිළිකුල් බව සිහි කළ යුතු ය.

එහි පළමු කොට තචපංචකාදීන්ගේ වශයෙන් පිරිසිඳ අනුලෝම ප්‍රතිලෝම විසින් වචනයෙන් හැදැරිය යුතු ය. සිතිනුදු හැදැරිය යුතු ය. වචනයෙන් හැදෑරීම සිතින් කරණ හැදෑරීමට ප්‍රත්‍යය වන්නේය. මනසාසජ්ඣායනය ලක්ෂණප්‍රතිවේධයට කරුණු වන්නේ ය. කෙසාදීන් පිළිබඳ පැහැය මේ ය යි නිශ්චය කර ගැණීම ඔවුන් පිළිබඳ සටහන් නිශ්චය කර ගැණීම, සිරුරෙහි නාභියෙන් උඩ, උපරිමදිසා ය. යට පෙදෙස හෙට්ඨිමදිසා ය. එහෙයින් මේ කොටස මේ දිසායෙහි ය යි යනාදීන් දිසා නිශ්චය කර ගැණීම. මේ කොටස මේ අවකාශයෙහි පිහිටියේ ය, යනාදීන් අවකාශ නිශ්චය කර ගැණීම, මේ කොටස උඩින් යටින් සරසින් අසවල් කොටසින් පිරිසිඳිනා ලද ය. කේසයෝ ලෝමයෝ නොවෙති, ලෝමයෝ කෙසයෝ නොවෙති යනාදීන් සභාගවිසභාගයන් පිරිසිඳ ගැණීම යන පස් අයුරෙන් මේ උග්ගහ යුතු ය. මේ උගැන්ම 'උග්ගහ කොසල්ල' යි කියත්. අනතුරු ව දස අයුරකින් වඩ වඩාත් මේ මෙනෙහි කළ යුතු ය. දස අයුරකින් කෙරෙණ මේ මනසිකාරය 'මනසිකාරකොසල්ල' යි කියත්.

මෙසේ උග්ගහකොසල්ල, මනසිකාරකොසල්ල දෙකෙන් දක්ෂ වූවහු විසින් පැහැයෙන් සටහනින් ගඳින් හටගත් තැනින් අවකාශ විසින් කෙස් ආදී පිළිකුල් ය යි නිශ්චය කර ගත යුතු ය. මෙසේ පිළිකුල් විසින් මෙනෙහි කරන්නහුට මුළු සිරුර කොවස් කොටස් වශයෙන් ප්‍රකට වන්නේ ය. සියලු කොටස් පැහැදිලි ව පෙණෙන්නට වූ කල්හි මිනිස් කිරියන් ආ සත්ත්වාකාරය හා ස්ත්‍රීපුරුෂාදි ස්වභාවාකාරය හැර කොට්ඨාස රාසි වශයෙන් නුවණට ඒ වැටහෙන්නේ ය. අනුපුබ්බමුඤ්චනාදීන්ගේ වශයෙන් පිළිකුල් බව නැවත නැවත මෙනෙහි කිරීමෙන් පිළිවෙළින් අර්පණාව පහළ වන්නී ය. එහි කෙසාදීන් වණ්ණසණ්ඨානාදීන්ගේ වශයෙන් වැටහීම උග්ගහනිමිත්ත නම්. හැම ලෙසකින් පිළිකුල් බව වැටහීම පටිභාග නිමිත්ත

නම්. එය සෙවනය කිරීමෙන් වැඩීමෙන් ප්‍රථමධ්‍යානයාගේ වශයෙන් අර්පණාව වන්නී ය. නැවත මෙ තෙමේ කෙසාදීන්ගේ වණ්ණභෙදය ඇසුරු කොට ධ්‍යාන ලබන්නේ ෂඩ් අභිඥවන් ප්‍රතිවෙධ කරන්නේ ය. විස්තර විශුද්ධිමාර්ගයෙහි එන්නේ ය.

සිරුර මෙසේ බැලීම නිවණට හිත ය. වරදවා ගුහ වශයෙන් බැලීම නිවණට හිත නොවේ. වරදවා බැලීම නිවන් මග අවුරන්නේ ය. කෙලෙස් උපද වන්නේ ය.

"අඩ්ගපච්චඩ්ගකොට්ඨාස කලාපාකාරතො පන.
සංගතො රූපපුඤ්ජොව වුත්තො බිම්බොති එකතො"

අත් පා කෙස් ලොම් ඇ කොටස් කලාප වශයෙන් එකට බැඳී සිටි රූප සමූහය ම සිරුර යි කියන ලද්දේ ය.

"නානා සන්ධිපරිච්ඡින්නඅඩ්ගපච්චඩ්ගරූපිනො
හොති නාමං සරිරන්ති ඉත්ථී වා පුරිසොති වා"

නොයෙක් සන්ධින්ගෙන් පිරිසිඳිනා ලද අභපසහ සමූහයට ශරීර යි නම් වේ. ස්ත්‍රී-පුරුෂ යන නම් ද වේ.

"ජාතො ජිණ්ණො මතො ව්‍යාධි සත්තොයමිති සම්මුති,
ජායමානාදිභාවෙන රූපකායො පවත්තති"

"මේ සත්ත්ව තෙමේ උපන්නේ ය. මහලු වූයේ ය. මළේ ය. රෝගී ය" යි සම්මුතියක් මුත් පරමාර්ථ විසින් සත්ත්වයෙක් නැත්තේ ය. උප දින දිරණ ස්වභාවයෙන් රූපසමූහය පවත්නේ ය.

"කායො න පස්සති සුණාති ච නෙව කිඤ්චි
ජානාති කිඤ්චිමපි නෙව සයං කරොති,
යුත්තො පවත්තති මනෙන තථා තථායං
සුත්තෙන යන්තමිව දරුමයං පයුත්තං"

ශරීරය තෙමේ රූප නො දකියි. ශබ්ද නො අසයි. කිසිවකුත් නො දකියි. තෙමේ කටයුතු ද නො කරයි. හුවලින් යුත් දරුමය යන්ත්‍රයක් සේ සිතින් යුක්ත වූයේ ඒ ඒ දෙය කරයි.

"නානත්තතො හි මනසො අනිලස්ස භෙදෙ
භෙදනිලස්ස ගමනාදික්‍රියාවිභාගො
කායස්ස සිජ්ඣති ක්‍රියා ච තථා තථායං
දෙසන්තරම්හි ඉතරිතරරූපසිද්ධි"

චිත්තජවායොධාතුහුගේ භෙදය, සිතේ වෙනස් බව හෙතු කොට වන්නේ ය. එායොධාතුහුගේ වෙනස්වීම නිසා යෑම් ඊම් ඉඳීම් සිටීම ආදී වූ ක්‍රියා සිදු වේ. එ ද ඒ ඒ අයුරෙන් ඒ ඒ දෙශයෙහි අනික් අනික් ක්‍රියාවන්ගේ සිද්ධිය පිණිස වේ.

"නානත්තතෝ මානසභූරවානං
නානාභිධානානි භවන්ති එවං,
අත්ථානුරූපක්‍රියසද්දහෙතු
තත්ථාවිනිබ්භොගමති රමන්තෙ"

චිත්ත, පඨවිධාතු, ශබ්ද යන මොවුන්ගේ නානාභාවය හෙතු කොට නොයෙක් නාමයෝ වෙත්. මෙසේ අර්ථානුකූල වූ ක්‍රියා ශබ්ද දෙදෙනා හෙතු කොට සිරුරෙහි වෙන් කිරීම නො කැමැත්තෝ ස්ත්‍රී-පුරුෂග්‍රහණයෙන් සිරුරෙහි ඇලෙත්.

"කත්වා විනිබ්භොගමිදං සරීරං
නිස්සත්තමෙතන්ති පහාය සඤ්ඤං,
මොහන්ධකාරාතුරජීවලොකෙ
තුච්ඡං විතක්කෙතිහ ධම්මමත්තෙ"

මේ ශරීරය ධාතු ආයතනාදීන්ගේ වශයෙන් වෙන් කොට "ශරීරය සත්ත්ව රහිත ය" යන කල්පනාව හැර මොහන්ධකාරයෙන් ආතුර වූ සත්ත්වලොකය තෙමේ ධම්මාත්‍ර වූ මේ ශරීරයෙහි හිස් වූ මිථ්‍යාකල්පනාවෙන් විතර්කනය කරයි.

"අලද්ධා සබ්භි සංවාසං සරීරෙ ධාතුමත්තකෙ
යථාභූතමජානන්තෝ කරොන්තා පටිසං රතිං"

සත්පුරුෂයන් හා ආශ්‍රයයෙන් වෙන් ව ධාතුමාත්‍ර වූ ශරීරයෙහි තත්ත්වාකාරය නො දත හැකි ය. ඒ නො දන්නෝ ප්‍රතිසයත් ඇල්මත් කරති.

"භූතපුඤ්ජොව භූතානං වසෙනෙවං පවත්තති,
නත්ථි කොචි පවත්තෙන්තො පවත්තාපනකො තරො."

සතර මහාභූතයන්ගේ වශයෙන් සතර මහාභූතපුඤ්ජය ම යෑම් ඊම් ආදිය වූ ගෙණ පවතී. යෑම් ඊම් ආදි කරන්නා වූත් කරවන්නා වූත් කිසි. නිමයක් මෙහි නැත්තේ ය.

"නහෙත්ථ දෙවො න බ්‍රහ්මා නත්ථිත්ථී පුරිසොකි වා,
ධාතුමත්තාසුභානිච්චා දුක්ඛධම්මා පවත්තරෙ"

179-180

මෙහි දෙවියෙක් නැත. බ්‍රහ්මයෙක් නැත. පුරුෂයෙක් නැත. ධාතු මාත්‍ර වූ අශුභ වූ අනිත්‍ය වූ දුඃඛධර්මයෝ ම පවතිත්.

"නායං මිත්තො න ඤාතී ච න ච කස්සචි සන්තකො,
නිජ්ජිවාසුචි මත්තොව කෙවලං කම්මසම්භවො"

මේ ශරීරය යහළුවෙක් නො වේ. නෑයෙක් නො වේ. කිසිවකුට අයත් ද නො වේ. හුදෙක් කර්මයෙන් හටගත් ජීවරහිත වූ අසුචි මාත්‍රයෙක් ම ය.

පස්ස යන ක්‍රියාපදයෙන් දක්වා වදාළෝ මේ සිරුර කලාප-ආදීනව-අශුභාදීන්ගේ වශයෙන් බැලීම ය. බැලිය යුතු බව ය. ධර්මාභිසමයට හෙතු වන්නේ එය බැවිනි. "යස්ස ධුවභාවො වා ඨිතභාවො වා නත්ථි එකන්තෙන භෙදනවිකිරණවිද්ධංසන ධම්ම මෙවෙතං, ඉදං පස්සථ" යන විවරණය එය කියාලයි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි අසූසාර දහසක් දෙනාට ධර්මාභිසමය වූයේ ය. ඒ මහණ ද සෝවාන් විය.

සිරිමාවස්තුව නිමි.

උත්තරා මෙහෙණ

11 -3

උත්තරා නම් වූ මෙහෙණ, උපතින් එක් සිය විසි අවුරුදු වයස් ඇත්තී ය. එහෙත් ඕ තොමෝ තමන් මැහැල්ලකැ යි වක ගසා නො ඉඳ ගමට වැද පිඩු සිඟා හැසිරෙන්නී ය. දවසෙක මග දී මහණකු දැක බතින් විචාරා සිඟා ගත් බත් උන්වහන්සේට පිදූ ය. එයින් ඕ තොමෝ නිරාහාර වූ ය. දෙවන තෙවන දවස්හි ද එසේ කළා ය. සිවුවනදත් ඕ පිඩු සිඟා ගියා ය. එදා එක් පටු මංකඩක දී බුදුරජානන් වහන්සේ ඇයට හමු වූහ. ඇ බුදුරජුන් දැක පාරෙන් ඉවත් වන්නී තමන් පොරොවා තුබූ සිවුරෙහි කොණක් පෑගී කෙලින් සිට ගත නො හැකිව බිම ඇද වැටුනී ය. එකල්හි බුදු රජානන් වහන්සේ ඇය වෙතට ගොස් "මෙහෙණ! තොපගේ අත්බව හොඳට ම දිරා ගොස් තිබේ. එය කල් නො ගොස් අද හෙට ම බිඳ වැටෙන්නේ ය, යි වදරා මේ ධම්දෙශනාව කළ සේක.

> පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභඞ්ගුරං,
> භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතන්ති.

මේ රූපය ජරායෙන් තදින් දිරා ගියේ රොගයනට කැදැල්ලක් බඳු ව සිටියේ ය. වහා බිඳෙන සුලු ය. කුණු වූ මේ සිරුර වහා බිඳෙන්නේ ය. යම් හෙයකින් ජීවිතය, මරණය කෙළවර කොට ඇත්තේ ද එහෙයිනි.

පරිජිණ්ණං ඉදං රූපං = මේ රූපය තදින් දිරා ගියේ ය.

හැමතකින් මුළුමනින් යමක් දිරා ගියේ නම්, ඒ පරිජිණ්ණ යි කියනු ලැබේ. මේ මෙහෙණගේ සිරුර තදින් දිරා ගොස් තුබූ බැවින් මෙසේ වදළ සේක.

මෙහි රූප නම් ශරීරය යි. "යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං" යනු රූපස්කන්ධයෙහි ආයේ ය. "රූපූපත්තියා මග්ගං භාවෙති" යනු රූපභවයෙහි ආයේ ය. "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිඩා රූපානි පස්සති" යනු කසිණනිමිත්තයෙහි ආයේ ය. "චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" යනු වර්ණයෙහි ආයේ ය. රූපප්පමාණො රූපප්ප සන්තො" යනු සණ්ඨානයෙහි ආයේ ය. "ආකාසො පරිවාරිතො රූපන්ත්වෙ සඞ්ඛං ගච්ඡති" යනු ශරීරයෙහි ආයේ ය.

ස්වකීය ස්වභාවය පවසනුයේ හෝ වෙනස් බවට විකාරයට විනාශයට පැමිණෙනුයේ රූප නම්. "රූපෙති පකාසෙති අත්තනො සභාවන්ති = රූපං, රූප්පති විකාරමාපජ්ජතීති වා රූපං යනු දන්නේ ය.[1]

රොගනිඩ්ඩං[2] = රොගයන්ට කැදැල්ලක් ය.

---

1. 4. 1 'කො ඉමං පඨවිං විජෙස්සති' යනු බලනු. 2. 'රොගනිඩ්ඨං' පොත්හි.

"රුජතීති = රොගො, රුජති භඤ්ජති අඩග පවවඩ්ගානීති = රොගො." අග පසග බිඳින්නේ හෝ පෙළන්නේ රොග නමී මුළු සිරුර නත් වැදැරුම් රොගයන්ට වාසස්ථාන බැවින් 'රොග නිඩඩ' යි කියන ලද්දේ ය. "අක්බිරොගාදිනං අනෙකසං රොගානං නිඩඩං කුලාවකන්ති රොගනිඩඩං."

පහඩ්ගුරං = වහා බිඳෙන්නේ ය.

හිටලා තරුණ වුව ද ජරසිගාල යි හඳුන් වනු ලැබෙ. තරුණ වූ කිදිවැල පූතිලතා යි කියත්. එමෙත් ඒ දවස උපන් සිරුර රන්වන් වූයේ ද නිති වැගිරෙණ අරුතින් කුණු බැවින් 'පහඩ්ගුර' යි කියනු ලැබේ. "සරසතො උපක්කමනතා ච පහඩගුපගමන සීලතාය පහඩගුරං" යනු අටුවා ය.

භිජ්ජති පූතිසන්දෙහො = කුණු වගුරුවන සිරුර බිඳෙන්නේ ය.

රන්වන් වුව ද, අතර නො තබා නව දෙරින් කෙල සොටු ඇ කුණු වගුරණ බැවින් සිරුර'පූතිසන්දෙහ' යි කියත්. මේ ද තෙල් පිරුණු භිල් වූ සැළක් සේ මේ සිරුරෙන් මල මූ ඇ අසූචි වැගිරෙන්නේ ය. "අසූචි සන්දතෙ නිච්චං යථා මෙදකථාලිකා" යනු ආප්තයි. "භිජ්ජති" යන ක්‍රියා පදය කල් නො යවා ම බිඳෙන බව කියයි.

මරණන්ත‍ං හි ජීවිත‍ං = ජීවිතය මරණය කෙළවර කොට සිටියේ යම් හෙයකින් ද එහෙයිනි.

සියලු සත්ත්වයන්ගේ ජීවිතය මරණයෙන් කෙළවර වන්නේ ය. එක් අත් බවක් පිළිබඳ ජීවිතයය මරණයෙන් කෙළවර වනුයේ. නැවත එකා තැනක හෝ ඒ පිහිටන්නේ ය. එ තැනින් ද ඒ මරණයෙන් කෙළවර වන්නේ ය. සසර මුළුමනින් කෙළවර වන තුරු මෙයේ ජාතියෙන් ජාතියට මැරි මැරි ඉපද ඉපද යන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි මෙහෙණ තොමෝ සෝවාන් වූ ය. ධර්මදෙශනාව මහජනයාටත් වැඩ සහිත වූය.

උත්තරාස්ථවිරාවස්තුව නිමි.

මිනී ඇටවල ඇලුනු මහණෙනි

11 - 4

එක් කාලෙක බොහෝ ගණනක් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් ගෙණ භාවනාවට වනයට වැඩියහ. එහි දී ඔවුහු භාවනා වඩා ධ්‍යාන උපදවා ගත්හ. එයින් ඔවුන් පිළිබඳ කෙලෙස් යටපත් ව ගියේ ය. එකල්හි ඔවුහු ''අපගේ මහණකම මුදුන් පැමිණියේ වනැ' යි සිතා තමන් ලත් ගුණය බුදු රජුන්ට දන්වන්නට ජේතවනයට ගියහ. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් දෙරකඩට ආ ඇසිල්ලෙහි අනඳ තෙරුන් අමතා ''ආනන්ද! මේ නමලාට මෙහි පැමිණ මා දැකීමෙන් වැඩෙක් සිදු නො වේ. එහෙයින් පළමු කොට අපි සොහොනට ගොස් නැවත මා දකින්නට එන්නට කියව'' යි වදළ සේක. තෙරුන් වහන්සේ බුදු රජුන්ගේ ඒ ප්‍රකාශය ඔවුනට දන් වූහ. ඔවුහු කිසිත් නො බැණ ඉතා පතුටින් සොහොනට ගියහ. ''බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ වදරන්නට යම්කිසි කරුණෙක් දක්නා ලද්දේ වනැ'' යි සිතූ හ. සොහොන් ගිය ඒ භික්ෂූහු සොහොනෙක තැන තැන දමා තුබූ දවස් ගණන් ඉක්මුනු දුගඳ හමන්නා වූ මිනිකුණු දුටහ. එයින් ඔවුන් සිත්හි ප්‍රතිඝය උපන්නේ ය. ඒ අතර එ දවස ම එහි දමූ මිනියක් දැකීමෙන් එහි ආලය උපන. එයින් ම තමන් කෙලෙස් සහිත බව දැන ගත්හ. මේ වේලෙහි බුදුරජාණන් වහන්සේ ඉඳකිළියෙහි වැඩ හුන් සේක් ම ආලොකයක් යවා ඔවුන් ඉදිරියෙහි සිට බණ වදරන්නකු සේ ''මහණෙනි! මෙබදු ඇට ගොඩවල් දැක එහි ඇලීම තොපට තරම් නො වේ'' යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

යානිමානි අපත්ථානි අලාපූනෙව සාරදෙ,
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රතිඝි

ශරත් කාලයෙහි ඒ ඒ තැන දමූ ලබුකබල් වැනි වූ කොබෝවන් පැහැති යම් යම් මිණි ඇට වේ ද, ඒ මිනී ඇට දැකීමෙන් කි නම් ඇල්මක් වේ ද,

යානි ඉමානි = යම් මේ.

අපත්ථානි = ඒ ඒ තැන දමූ.

අලාපූනි ඉව = ලබුකබල් වැනි වූ.

සාරදෙ = ශරත් කාලයෙහි.

ඉල්මස කාලපක්ෂයෙහි පටන් පිළිවෙලින් සාර මසෙක් සාර මසෙක් හෙමන්ත – ගිම්හ – වස්ස යි තුන් ඍතු කෙනෙක් වෙති. ඒ එක් ක්‍රමයෙකි. නැවත එ තැන් පටන් ම ගෙණ පිළිවෙළින් දෙ මස දෙ මස හෙමන්ත – සිසිර – වසන්ත – ගිම්හ – වස්ස – සරද යි ඡඩ් ඍතු කෙනෙක් වෙති. එහි ඉල්-උදුවප් දෙමස. හෙමන්ත උතු නම්. දුරුතු-නවන් දෙමස,

සිසිරඋතු නම්. මැදින්-බක් දෙමස, වසන්ත උතු නම්. වෙසක්-පොසොන් දෙමස, ගිම්හඋතු නම්. ඇසළ-නිකිණි දෙමස, වස්සඋතු නම්. බිනර-වප් දෙමස, සරදඋතු නම්.

බිනර-වප් දෙමසෙහි මුළුමනින් ඖෂධවර්ගයන්ගේ පැසීම වන්නේ ය'' යි ශාස්ත්‍රයෙහි කී බැවින් මේ දෙමස් කාලය සරද නමින් හඳුන් වත්. ''සරති පීළයති අස්මිං ඉති = සරදෙ, ශීර්‍යන්තෙස්‍යාං පාකෙනෞෂධයඃ ඉති = ශරත්'' යනු අත්ථ නිශ්චය වේ. මේ දෙ මස් කාලය මෙහි සාරද නම්.

කාපොතකානි අට්ඨිනි = කොබෝවන් පැහැති මිනී ඇට.

පරවියන්ගේ පැහැය වැනි පැහැය ඇත්තේ 'කාපොතක' නම්. එ නම් සුදුපාට ය. මිනී ඇට සුදු ය. එහෙයින් එයට විශෙෂණ කොට 'කාපොත-කානි' යෙදුනේ ය.

ගින්නෙන් පැසුනු, වාතයෙන් වියලුනු මේදය, ඇටැ යි ගැණේ. මේදය මසින් හට ගත්තේ ය.

''මෙදෙ යත් ස්වාග්නිනා පක්වං වායුනා චාති ශොෂිතම්,
තදස්ථිසංඥං ලභතෙ සසාරඃ සර්වවිග්‍රහෙ''

ඇතුළත්හි වූ හරය හෙතු කොට ගස්කොළන්වල පැවැත්ම වන්නේ ය. එමෙන් දෙහධාරණය වන්නේ අස්ථිසාරය හෙතු කොට ය.

''අභ්‍යන්තරගතෛඃ සාරෛර්යථා තිෂ්ඨන්ති භූරුහාඃ,
අස්ථිසාරෛස්තථා දෙහා ධ්‍රියන්තෙ දෙහිනො ධ්‍රැවම්''

ශරීරවත්හුගේ සිවි - මස් - නැසී බොහෝ කල් ගිය ද ඇට විනාශ නො වී පවතී. ඇට සත්ත්වයන්ගේ හරය වේ.

''තස්මාච්චිර විනෂ්ටෙෂු ත්වඩ්මාංසෙෂු ශරීරිණාම්,
අස්ථිනි න විනශ්‍යන්ති සාරාණ්‍යෙතානි දෙහිනාම්''

තානි දිස්වාන කා රති = ඒ මිනී ඇට දක්මෙන් මොන ඇල්මෙක් වේ ද.

ශරත් කාලයෙහි ඒ ඒ තැන දමූ අවුසුළඟින් වියලී ගිය ලබු කබල් වැනි වූ කොබෝවන් වූ මේ මිනී ඇට බලා ස්වල්ප වූත් කාම රතියක් ඉපදවීම තොපට නො සුදුසු ය. එසේ එහි ඇලීම, බැඳීම තොපට විනාශය පිණිස වන්නේ ය. එහෙයින් ඒ මිනී ඇටවල ඇලීම තොපට සුදුසු ද? ''රමන්ති තාය රමණං වා = රති'' ඇලීම 'රති' නම්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂුහු සිටි ලෙසින් ම රහත් ව බුදුරජුන්ට තුති පුද දෙමින් ඉදිරියට විත් වැඳ සිටියහ.

අධිමානකභික්ෂුවස්තුව නිමි.

———

රූපනන්ද

11 – 5

එක් දවසක් රූපනන්දවෝ "මාගේ වැඩි මහලු සොහොයුරු තෙමේ, සියලු රජසිරි හැර පැවිදි ව බුදුබව ලබා ලොකයෙහි අග්‍ර පුද්ගල විය, ඔහු පුත් රාහුලයෝත් පැවිදි වූහ. මා හිමිපුත් තෙමේ ද කිසිත් නො බලා පැවිදි විය. මැණියන්දෑත් පැවිදි වූහ. මෙතෙක් නෑයන් පැවිදි ව සිටිය දී මම මෙහි ඉඳ කුම් කෙරෙම් ද, මමත් පැවිදි වන්නෙමි" යි සිතා මෙහෙණ අසපුවකට ගොස් පැවිදි වූහ. පැවිදි වූවෝ ද ස්නෙහයෙන් මුත් ඇදහිලි ඇති ව නො වූහ. ඕ එ දවස එහි විසූ රූසපුවෙන් යුත් එක ම කාන්තාව වූවා, රූපනන්ද යි ප්‍රසිද්ධ වූ ය. ඕ තොමෝ "බුදුරජානන් වහන්සේ රූපය නිත්‍ය නො වේය. දුකින් ගැවසුනේ ය. ආත්මයෙන් තොර ව සිටියේ ය. වෙදනා – සංඥා – සංස්කාර – විඥානයෝ අනිත්‍යයහ, දුඃඛයහ, ආත්මරහිතයහ යි කියන සේක. 'මෙ බඳු දැකුම්කලු දුටුවන් නෙත් සිත් පහද වන මාගේ සිරුරෙහි දෙස් කියති" යි බුදුරජුන් ඉදිරියට යන්නට අකැමැති වූවා ය.

සැවැත් නුවර වැස්සෝ ඉතා උදෑසන සුදු පැහැති රෙදි උරමා කොට පොරවා පෙහෙව දන් දෙති. සවස් කාලයෙහි වට්ටි පැස් පුරවා සුවඳ මල් රැගෙණ දෙවරම් වෙහෙරට ගොස් බුදු රජුන් වැඳ මල් පුද බණමඩුවට ගොස් බණ අසති. ඔවුහු පෙරළා ගෙවලට යන්නෝ බුදු රජුන්ගේ මහත් කම ගැණ කියමින් යෙති. සිවු කොටසකට බෙදෙන මේ ලොකීයජනයා අතර යම් කෙනකුට බුදු රජුන් දැක ප්‍රසාදයෙක් නූපදනේ නම් එබන්දෝ ම ඉතා ටික දෙනෙක් වෙති. පහදින්නෝ ම බොහෝ වෙති. රූපය දැක පහදින්නෝ ද බුදුරජුන්ගේ ලක්ෂණානුව්‍යඤ්ජනප්‍රතිමණ්ඩිත වූ ස්වර්ණ වර්ණශරීරය දැක පහදිත්. ශබ්දයට පහදින්නෝ ද කෙළ ගණන් අත්බව නිසා පැවැති බුදුරජුන්ගේ ගුණසොෂයත්, අෂ්ටාඞ්ගසමන්වාගත ධර්මදෙශනා–සොෂයත් අසා පහදිත්. කටුක පිළිවෙතට පහදින්නෝ ද සිවුරු ආදියෙහි රළුබව නිසා බුදුරජුන්ට ම පහදිත්. ගුණයට පහදින්නෝ ද "බුදුරජුන් පිළිබඳ ශීලය මෙ බඳු ය. සමාධිය මෙ බඳු ය. ප්‍රඥාව මෙ බඳු ය. භාග්‍යවත් තෙමේ ශීලාදිගුණයන්ගෙන් අසම ය. අප්‍රතිපුද්ගල ය" යි බුදුරජුන්ට ම පහදිත්. මෙසේ බුදුගුණ කියන්නා වූ ඔවුන්ගේ මුව එහි ලා අසමත් වේ.

රූපනන්ද ද, මෙහෙණන් හා උවැසියන් හා මුව නො පොහොනා ලෙසින් කියන බුදුගුණකතාව අසා, "මොවුහු හැම දෙන ම මා සොහොයුරුගේ ගුණය ම උසස්ලෙසින් කියා පාති. වේවා, මම ද දවසෙක එහි යන්නෙමි. එක් දවසක් ම මාගේ රූපයෙහි දෙස් කියනු ඇත. එයට කම් නැත. දවසක් කියන දෙස එ තරම් ලොකු විය නො හැක. වේවා, යන්නෙමි, මෙහෙ-

ණක හා එක් ව යන්නෙමි. ගොස් මට බුදුරජුන් පෙණෙන ලෙසට, බුදු රජුන්ට මා නොපෙණෙන ලෙසට හිඳ බණ අසන්නෙමි'' යි සිතා ''මමත් අද බණ අසන්නට යමි'' යි මෙහෙණන්ට දන් වූ ය. එ කල්හි මෙහෙණෝ ''පුදුමයෙක්, බොහෝ කලකින් රූපනන්දවටත් බුදුරජුන් දක්නට සිත් වී තිබෙ. මේ බදු සිතෙක් උපනේ කුමක් නිසා ද, බුදුරජානන් වහන්සේ මූ නිසා කෙබඳු බණක් වදරණ සේක් ද'' යි සිතූහ. රූපනන්ද, මෙහෙණන් හා බණ අසන්නට විහාරයට ගියා ය. ඒ වේලෙහි රූපනන්ද එතු දුටු බුදු රජානන් වහන්සේ ''මා, මැට කෙබඳු බණක් දෙසිය යුතු ද, මූ සිත් ගන්නේ කෙබඳු බණෙක් ද, මෝ රූපගරුක ය. රූලකුණින් මත් ව සිටී යි, ආත්මස්නෙහය බලවත් ය. කටුවෙන් කටුව උදුරන්නා සේ රූප යෙන් ම මූ පිළිබඳ රූපමද ය, සිඳ හැරිය යුතු ය. මැට සුදුසු රූපමදය බිඳ වැටෙන බණෙකැ'' යි සිතා ඇ විහාරයට ඇතුල්වත් ම සොළොසැවිරිදි තරමී ඇති රූ ලකුණෙන් සිත් ගන්නා ගැණු රූපයක් මවා පෑ සේක. ඒ මවා පෑ ගැණු රූපය රතු පැහැති සළුවක් ඇඳ, මුතු මැණික් ඇ වටිනා අබර– ණින් සැරසී. තල් අත්තක් අතට ගෙණ බුදුරජුන්ට පවන් සලමින් බුදුරජුන් ඉදිරියෙහි සිටියා ය. ඒ ස්ත්‍රී රූපය බුදුරජුන්ට හා රූපනන්දවට මුත් අන් කිසි වකුට නො පෙණෙන්නේ ය. රූපනන්ද තොමෝ මෙහෙණන් සමඟ විහාරයට ඇතුල් වී, උන්ගේ පිටි පස සිට, පසඟ පිහිටුවා වැඳ, එහිම හිඳ. මාපට ඇඟිල්ල පටන් බුදුරජුන් බලන්නී. හැම ලකුණෙන් විසිතුරු වූ දීප්ති– මත් වූ ව්‍යාමප්‍රභායෙන් වට වූ බුදුරජුන්ගේ සිරුර බලා නැවත පුන්සඳසිරි පරයා බබලන මුහුණ දෙස බැලූ ය. ඒ වේලෙහි බුදුරජුන් ඉදිරියෙහි වූ ස්ත්‍රීරූපය දැක ''තමන් ස්වඤ්ඤාජහංසියක ඉදිරියෙහි සිටී කැවිඩියක සේ'' යි සිතූ ය. ඒ දැක රූපනන්දවගේ දෙ ඇස බමන්නට විය. ''කෙස් කළඹ නළල දත් ඇට මුණ දෙතොල නැහැය කොතරම් සිත් ගන්නා සුලු ද'' යි සිතන්නා වූ රූපනන්දව ඒ සිරුරෙහි ස්නෙහ කළා ය. ඉක්බිති බුදුරජා නන් වහන්සේ රූපනන්දවගේ සිත එහි ඇදී ගියබව දැන බණ වදරණ සේක් නිර්මිත රූපය, ඒ සොළොසැවිරිදි බව ඉක්මවා විසිහැවිරිදි බවට පත් වූවක් කොට දක්වූ සේක. ''මේ රූපය දැන් පළමු තුබූ පරිදි නො වේ'' යි රූපනන්ද ඒ ඇසිල්ලෙහි ම එයට කළ ස්නෙහය මඳක් හැරපූ ය. බුදුරජා නන් වහන්සේ ද පිළිවෙළින් ඒ වේලෙහි ම ඒ රූපය වරක් වැද තැනැත්– තියක කොට, මැදියම් වයසෙහි සිටී තැනැත්තියක කොට, දිරුම් කඩට ගිය මැහැල්ලක කොට දක්වූහ. රූපනන්ද ඒ රූපය පිළිවෙළින් වෙනස් ව ගොස් මැහැල්ලක බවට පැමිණි වේලෙහි වැටුනු දත් ඇති ඉදුනු කෙස් ඇති මැදින් නැමී සිටී ගොණැස්සක් සේ වක ගැසුනු සැරයටියක් අතින් ගත් හැමතකින් වෙවුලන ඒ ස්ත්‍රිය දැක එහි කළ ස්නේහය මුළුමනින් හැරපූ ය. නැවත බුදුරජානන් වහන්සේ එය ලෙඩෙන් වැඩුනක් කොට දක්වූහ. ඒ වේ ලෙහි ඒ නිර්මිතරූපය අත තුබූ සැරයටිය හා තල්අත්ත බිම හෙළා මිලමූ වඟුරමින් මහහඬ නගමින් බිම වැටී මල මූ දෙක්හි ගැලී දඟලන්නට විය.

රූපනන්ද, මේ දැක වඩාත් කලකිරුණි ය. අනතුරු ව බුදුරජානන් වහන්සේ ඒ ස්ත්‍රිය මළ එකියක කොට දැක් වූහ. මළා වූ කෙණෙහි ම ඕ ඉදිමී ගියා ය. වණමුවවලින් සැරව ගලන්නට විය. පණුවෝ වැගිරෙන්නට වූහ. බලු කපුටෝ එ තැන රැස් ව මළමිනිය කඩා කන්නට වූහ. මේ දුටු රූපනන්ද "අහෝ මේ ගැණිය මෙ තැනදී ම මහලු ව ගියා ආතුර වූවා මළා ය. මට වන්නේ ද ඔය ටික ය. මා කරා ද ජරාව්‍යාධිමරණයෝ පැමිණෙන්නාහ" යි අත්බව අනිත්‍ය විසින් දුටුවා ය. අනිත්‍ය විසින් දක්නා ලද්දේ දුඃඛ විසින් හා අනාත්ම විසින් දක්නා ලද්දේ ම වෙයි. ඇයට භවප්‍රපාතය ගිනි ඇවිල ගත්තක් සේ ද, ගෙල ලැඹුනු මිනී කුණක් සේ ද වැටහිණ. සිත කමටහනට නතු විය. ඉක්බිති බුදුරජානන් වහන්සේ රූපනන්දව සිය අත්බව අනිත්‍ය විසින් දුටුබව දැන "මත්තෙහි මෝ තොමෝ තමන්ට පිහිටක් කර ගැන්මෙහි පොහොසත් දැ" යි බලා වදරණ සේක්, ඇය එහි පොහොසත් නො වන බවත් පිටතින් ඒ පිණිස පිහිටක් ලැබිය යුතු බවත් දැන ඇයට ඕක විසින්-

"නන්ද මෝඩ මිනිසුන් ඉතා ඕනෑ කමින් බලාපොරොත්තු වන පතන කියන, ජරාවෙන් දුදුරු වී යන කිසි සේත් පිරිසිදු නො වන කුණු වූ උඩ යට දෙකින් අසුචි උතුරණ වගුරණ මේ සිරුර බලව.

මේ නො මළ සිරුර යම් සේ නම් අර මළ සිරුරත් එසේ ය. අර සිරුර සේ ය. මේ සිරුර. ඒ නිසා මේ සිරුර ධාතු වශයෙන් හා ශූන්‍ය වශයෙන් බලව, සසරට මින්මතු නො වැදෙව, භවයෙහි ඇලය දුරු කොට කෙලෙස් සන්සිඳුවා හැසිරෙව" යි වදළ සේක.

නාන්දවෝ දෙශනාවට අනුව නුවණ මෙහෙයවා ඒ වේලෙහි සෝවාන් වූහ. බුදුරජානන් වහන්සේ මතු මාර්ගඵල උදෙසා විදසුන් පේ කිරීමට ශූන්‍යතා කර්මස්ථානය වදරණුවෝ, "නන්ද! මේ සිරුරෙහි හරයෙක් නම් නැත, ඇතැයි කිසි විටෙකත් නො සිතව, අඛැටක් තරමටත් මෙහි හරයෙක් නැත. මේ වනාහි ඇට තුන් සීයයක් නඟා කළ ඇටතුවරෙකැ" යි වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

අට්ඨීනං නගරං කතං මංසලෝහිතලෙපනං,
යත්ථ ජරා ච මච්චු ච මානෝ මක්ඛෝ ච ඔහිතෝකි.

යම් තැනෙක ජරාව ද මරණය ද මානය ද මකු බව ද යන මේ කෙලෙස් තැන්පත් කරණ ලද ද එබඳු වූ ඔස් හා ලෙයින් ගල්වන ලද නුවරෙක් ඇටින් කරණ ලද්දේ ය.

හැල්-මුං-උලු-අමු-මෙනේරි ආදී වූ පූර්වාන්න අපරාන්න ධාන්‍ය තැන් පත් කරණු පිණිස ලී සිටුවා වැලින් බැඳ මැටි ගසා කළ වී කොටුවක්

යම් සේ නම් එ පරිද්දෙන් මේ සිරුරත් තුන් සියයක් ඇටින් කැරුණේ ය. නහරවැලින් වෙළුනේ ය. මස් ලේ ගැල්වුනේ ය. ජරා මරණ මාන මක්ඛ යන මොවුනට තැන් ය. මොවුන් තැන්පත් කරන්නට කළ කොටු-ගුලෙක් ය. කායික චෛතසිකාබාධයෝ ද මෙහි පටවන ලදහ.

අට්ඨීනං නගරං කතං = ඇටවලින් නුවරක් කරණ ලදී.

ප්‍රාසාදදිගාහ විශෙෂයෝ යම් තැනෙක වෙත් නම් එතැන 'නගර' නමි. "**නගා පාසාදයෝ අස්ස සන්තීති = නගරං**" යනු එහි අරුත් බිණිම ය. "**න X සරං**, යි විච්ඡෙද කොට න කාරය සම්පූණාර්ථවාචකය යි කියා අර්ථ කථාවෝ "**නගරං**" යනු "**ධන ධඤ්ඤාදිඋපභොගපරිභොගවත්ථූහි නං පරිපුණ්ණං සරං එත්ථාති=නගරං**" යි. අරුත් පළ කළහ. ධනධාන්‍යාදී උපභොග පරිභොග වස්තූන්ගෙන් පිරී ඉතිරී ගිය ගෙවලින් සැදුනු තැන නගර නම් වේ යනු එහි සිංහල ය. ස කාරයට ග කාරය විය.

නගරශබ්දයෙහි අරුත් මෙසේ පළ කළ ද මෙහි එන නගර ශබ්දය නැසී සිටියේ ආත්මභාව යි කියන සිරුරෙහි ය. ධනධාන්‍යාදී වස්තූන්ගෙන් පිරුණු තොයෙක් තරාතිරමේ ගෙවල් දොරවල් ඇති තැන නගරයි කියන්නා සේ ජරා මරණ මාන මක්ඛාදියෙන් පිරුණු තැනත් නගරයක් වැනි බැවින් එසේ හැඳින්වීම යුක්තියුක්ත ය. ඒ නම් ආත්මභාවය යි. සිරුර යි.

මංසලොහිතලෙපනං = මස් ලේ ගල්වන ලද.

මිනිස් සිරුර මස් වැදලි නවසියයකින් යුක්ත ය. නවසියයක් මස් වැදලි මිනිස් සිරුරෙක ඇත්තේ ය. සියලු මස් පිඬු රතු පැහැයෙන් යුක්ත වෙත්. එරබදු මල් බඳු ය.

මංස නම්, කැටි වූ ශොණිත ය යි, හෙවත් සත වූ ලේ ය.

"ශොණිතං ස්වාග්නිනා පක්වං වායුනා ච සනීකෘතම්.
තදෙව මාංසං ජානීයාත්තස්‍ය භෙදනපි ච්‍රැවේ"

යන මෙයින් කියේ ඒ ය.

රස ධාතුව ශොණිතස්ථානගත වූයේ ශොණිත යි කියනු ලැබේ. ශොණිතස්ථානගත ව කැටි වූ රසධාතුව ම මාංස යි ගණු ලැබේ. "**ශොණිතමිති ශොණිතස්ථානගතත්වාදස එව ශොණිතසංඥං ලභතෙ**" යනු ආප්ත වචනයි.

මස් පිඬු සිරුරෙහි නහර බැලනහර ඇට පුරුක් හන්දි වෙළා ගෙණ සිටිත්. මස් පිඬුවලින් වෙළන ලද්දෝ ම බලවත් වෙත්. මේ ඒ කිම.

"සිරාස්නායවස්ථිපර්වාණි සන්ධයශ්ච ශරීරිණාම්.
පෙශීභිඃ සංවෘතාන්‍යත්‍ර බලවන්ති භවන්ත්‍යතඃ"

ලොහිත නම්, අක්මාව කරා ගිය රඤ්ජකපිත්තයෙන් රතු පැහැයටත් පැයීමටත් පමුණුවන ලද රස ධාතුව ය. මේ එහි ආඡ්තය.

"යදු රසො යකෘද්යාති තත්‍ර රඤ්ජකපිත්තතඃ.
රාගං පාකං ච සම්ප්‍රාප්‍ය ස භවෙදුක්තසංඥකඃ"

ඒ විනාහි සන්නිවිතලොහිත-සංසරණලොහිත ය දෙ පරිදි යි. එහි සන්නිවිතලොහිතය, තදින් කකාරා ගත් සන බවු ලතු දිය වැනි ය. සංසරණලොහිතය, පිරිසිදු ලතුදිය වැනි ය. සන්නිවිතලොහිතය පවත්නේ සිරුරෙහි උඩ පෙදෙසෙහි ය. සංසරණලොහිතය මුළු සිරුර පැතිර සිටියේ ය. කෙස් ලොම් නිය දත් යන මස් රහිත තැන් හා තද වියළි සමත් හැරය ඒ පැතිර සිටියේ. නහරදැල් අනුසාරයෙන් එය සියලු සිරුර පැතිර යයි.

එක් පාත්‍රයක් පුරණ පමණ වූ සන්නිවිතලොහිතය යකෘන්මාංසයාගේ යට පෙදෙස පුරා හදය වකුගඩු පපුමස් තෙමමින් සිටියි.

යත්ථ = යම් තැනෙක. යම් සිරුරක.

ජරා ච = ජරාවත්. දිරීමත්. ඉදුරන් පැසීමත්.

ජරා නම්, දිරීම ය. ලොකව්‍යවහාර විසින් මහලුවීම ය. නාකි වීම ය. මෙය ඉන්ද්‍රියබඩසන්තාන – අනින්ද්‍රියබඩසන්තාන දෙකට සාධාරණ ව පවතී. මෙහිලා ගැණෙන්නේ ඉන්ද්‍රියබද්ධසන්තානයාගේ සත්ත්වශරීරයෙහි දිරා යෑම ය. මහලු වීම ය. "බන්ධානං පරිපාකො" යි කී බැවින් ඉකා කොටින් රූපවෙදනාදිස්කන්ධයන්ගේ මෙරීම ජරා යි දන්නේ ය.

බුදුරජානන් වහන්සේ "**යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා බණ්ඩිච්චං පාලිච්චං වලිත්තතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති භික්ඛවෙ ජරා**" යි මදක් විස්තර විසින් වදළ සේක. ඒ ඒ සත්ත්ව සමූහයෙහි ඒ ඒ සත්ත්වයන් පිළිබඳ දිරා යෑම, දිරීම, දත් වැටීම, කෙස් ඉදීම, ඇඟ රැලි වැටීම, ආයු ගෙවීම, ඉඳුරන් මෙරීම, ජරාය, යනු එහි කෙටි අරුත් ය.

"ලොව හැම සත්ත්වයෙක් ම ජරාවට යටත් ය. ජරාවෙන් මැඩුණේ ය. මිරිකුනේ ය" යනු දැක්වීමට ය. "**තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ**" යනු වදළෝ. "**ජරා**" යනු වදළෝ ස්වරූප දක්වනු සඳහා ය. "**ජීරණතා**" යනු ආකාර දැක්වීමට ය. "**බණ්ඩිච්චං පාලිච්චං වලිත්තවතා**" යනු කෘත්‍යය දැක්වීමට ය. කල් යත් යත් ම දත් වැටේ. කෙස් ලොම් පැසේ. ඇඟ රැලි වැටේ. මේ දත් වැටීම් ආදිය කරන්නී ජරාව ය. ජරාහෙතුවෙන් දත් වැටීම් ආදිය සිදු වෙත්. දිය සුළඟ ගිනි ගිය මඟ, සිඳි බිඳි දුවී ගිය තෘණවෘක්ෂාදියෙන් ප්‍රකට ව පෙණෙන්නා සේ කඩ

දත් ආදියෙන් ජරාව ගිය මග පැහැදිලි ව පෙනේ. දත් වැටීම් ආදිය ජරා යි. වෙසෙසක් නො තබා කියූව ද ඔවුහු ජරාව නොවෙති. ජරාව ඇසින් බලා දත නො හැකි ය. ඇසින් දත හැක්කේ ජරාව ගිය මඟගහි ලකුණු ය. දත් වැටීම් ආදිය ජරාවේ ඵලය යි. "ආයුතෙනා සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ" යනු ජරාව පිළිබඳ ප්‍රකෘතිය දක්වනු සඳහා ය. මෙයින් කල් යෑමෙන් ඉතා පැහැදිලි වන ආයු ගෙවීම, ඉඳුරන් මිහි කිරීම විසින් ජරා පිළිබඳ ප්‍රකෘතිය දැක් වේ. ජරාවට පැමිණියහුගේ ආයු පිරිහෙන බැවින් ජරා තොමෝ ඵලොපචාර විසින් ආයු පිරිහීමැ යි වදළ සේක. තුරුණු වියෙහි වෙසෙසින් පහන් වූ සියුම් වූ තමහට විෂය වූ අරමුණු සුවසේ ගැණීමට සමත් වූ, ඇස් කන් නාස් ආදී ඉඳුරෝ ජරාවට පැමිණීමෙන් මෙරීමට ගියෝ කැළඹුනාහු, නො පහන් වූවාහු, මහත් වූත් තමහට විෂය වූත් අරමුණු ගන්නට අසමර්ථ වෙති. එහෙයින් ඵලොපචාර විසින් ඉඳුරන් ගේ මෙරීමැ යි වදළ සේක.

ප්‍රකටජරා-ප්‍රතිවිඡන්නජරා යි ජරාව දෙ වැදෑරුම් ය. දත්වැටීම්, මකස් ලොම් පැසීම්, ඇහැරැලි වැටීම් ආදී ඇසට පෙණෙන බැවින් රූපධර්මයන්හි වූ ඒ ජරා තොමෝ ප්‍රකට ජරා නම්. අරූප ධර්මයන්හි වූ ජරා තොමෝ එබඳු විකාරයක්හුගේ දක්මට කරුණු නො වන බැවින් ප්‍රතිවිඡන්නජරා නම්.

සවීචිජරා - අවීචිජරා යි නැවතත් ජරාව දෙ පරිදි ය. අතරතුර වෙසෙසක් නො දත හැකි නිරතුරු පවත්නා ජරා තොමෝ සවීචි ජරා නම්. අතරතුර පහළ වන පැහැ වෙසෙස් ආදී සුවසේ දත හැකි වූවා අවීචිජරා නම්.

මරණ ය = මරණය ද

මරණ නම්, දිවි සිඳියැම ය. කලුරිය කිරීම ය. නැසී යැම ය. මේ එය තරමක් විස්තර කළ සැටි. "එකභවපරියාපන්නස්ස ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදෙ මරණං" යනු. එක භවයකට ඇතුළත් එක භවයකින් පිරිසිඳිනා ලද ජීවිතෙන්ද්‍රියයාගේ සිඳී යැම මරණය යනු එහි තේරුම ය. මෙ ද ඉන්ද්‍රියානින්ද්‍රියසමස්තවස්තූන් ම පිළිබඳ වේ. මෙහිලා ගැණෙනුයේ ඉන්ද්‍රියසමබන්ධවස්තූන් කෙරෙහි වූ මරණය යි. කොටින් සම්වුති විසින් සත්ත්වයන්ගේ දිවි ගැලවී යැම මරණැ යි දත යුතු ය.

බුදුරජානන් වහන්සේ "තම්හා තම්හා සත්තනිකායා චුති ච චනතා භෙදෙ අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධානං භෙදෙ කළෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චති භික්ඛවෙ! මරණං" යි මැක් විස්තර විසින් වදළ සේක. ඒ ඒ සත්ත්වසමූහයෙන් ඒ ඒ භවයෙන් ගිහිමි, ගිලිහෙන බව, බිඳීම අතුරුදහන් වීම, මව්වූ මරණය, කලුරිය කිරීම, ස්කන්ධයන්ගේ බිඳීම, සිරුර බහා කැබීම මරණය යනු එහි කෙටී අරුත ය.

චුති නම්, ගිලිහීම ය. චවනතා නම්, ගිලිහෙනබව ය. භෙද නම්, ස්කන්ධයන්ගේ බිඳීම ය. අන්තරධාන නම්, බිඳී ගිය සටයෙහි නො පැවැත් ම යේ ඡින්න වූ ස්කන්ධයන්ගේ නො පැවැත්ම ය. මච්චු මරණ නම්, මැරී යෑම ය. මෙයින් සමුච්චිඡෙදමරණය වළකාලයි. කාලකිරියා නම්, මරුගේ ක්‍රියා ය. මෙයින් සම්මුතිමරණය දක් වේ. ඛන්ධානං භෙදෙ යන මෙයින්, පරමාර්ථ විසින් මරණය දක්වන ලද්දේ ය. පරමාර්ථ වසින්, සත්ත්වයෙක් නැත. පුද්ගලයෙක් නැත. ස්ත්‍රියක් නැත. පුරුෂයෙක් නැත. බ්‍රහ්මයෙක් නැත. යක්ෂයෙක් නැත. මාරයෙක් නැත. ඇත්තෝ ස්කන්ධයෝම ය. එහෙයින් ස්කන්ධයෝ තුමූ ම බිඳෙති. නැසෙති. මැරෙති. සත්ත්වයෙක් නම් නො ද මැරෙයි. ස්කන්ධයන් බිඳෙන නැසෙන මැරෙණ විට, සත්ත්වයා මැරේ යි කියා ද බිඳුනු විට මළේ යි කියා ද ව්‍යවහාරයෙහි පවතී. එක් ස්කන්ධයක් ඇති භවයාගේ වශයෙන් 'කලෙඛරස්ස නික්ඛෙපො' යනු වදළ සේක.

යම් විටෙක ආයුෂය, කර්මයෙන් හටගත් උණුසුම, විඤ්ඤාණය යන මොවුහු සිරුරෙන් පහ වන්නෝ ද එකල සිරුර වැඩකට නැති දරදණ්ඩක් සේ හෝනේ ය.

පස්කඳ මුළුමනින් ලැබෙන භවයන්හි සත්ත්වයන් පිළිබඳ චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යි ඉන්ද්‍රිය පසෙක් ලැබේ. ඒ ඉන්ද්‍රියයෝ නානාවිෂය ඇත්තෝ නානාගොචර ඇත්තෝ වෙති. චක්ඛුරින්ද්‍රියය ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ද ශ්‍රොත්‍රෙන්ද්‍රියය චක්ඛුරින්ද්‍රියයාගේ ද යි එකෙක් එකක්හුගේ ගොචරවිෂය නො විඳියි. රූපාරම්මණය ගොදුරුවනුයේ චක්ඛුරින්ද්‍රියට ය. ශබ්දලම්බනය ශ්‍රොත්‍රෙන්ද්‍රියයට ගොදුරු වන්නේ ය. නැත, රූපාරම්මණය ශ්‍රොත්‍රෙන්ද්‍රියයට වත් ශබ්දලම්බනය චක්ඛුරින්ද්‍රියයට වත් ගොදුරු නො වෙත්. එහෙයිනි කීයේ, "ඉන්ද්‍රියයෝ නානාවිෂය ඇත්තෝ ය. නානාගෝචර ඇත්තෝ ය" යි. සෙසු තැන්හි ද මෙසේ ය. ජවන් සිත මොවුනට පිළිසරණ ය.

මෙකී ඉන්ද්‍රියයෝ පවත්නෝ ආයුෂය නිසා ය. ආයුෂ නම් ජීවිතේන්ද්‍රිය ය. ආයුෂය පවත්නේ උණුසුම නිසා ය. උණුසුම නම් කර්මජතේජස ය. උණුසුම පවත්නේ ආයුෂය නිසා ය. දැල්වෙන පහනෙහි ගිනිසිළුව නිසා ආලෝකයත් ආලෝකය නිසා ගිනිසිළුවත් පවත්නා සේ ය. ගිනිසිළුව උපදනී ආලෝකය ගෙණ ම උපදී. ගිනිසිළුව ඒ තමා ඉපද වූ ආලෝකයෙන් ම නොමෝත් සියුම් ව මහත් ව දික් ව කෙටි ව ප්‍රකට වන්නී ය. ගිනිසිළුව පැවැත්මෙන් ඉපද වූ ආලෝකයෙන් ඒ ගිනිසිළුව පැවැත්ම පිළිබඳ වූ ම ප්‍රකට භාවය මෙන් කර්මජතේජස නිසා උපන් කර්මජමහාභූතයන්ගෙන් හටගත් ජීවිතෙන්ද්‍රියය විසින් කර්මජතේජස්භූතයන්ගේ පාලනය වේ. ජීවිතෙන්ද්‍රියය කර්මජතේජස්භූතයන්ගේ පැවැත්ම පාලනය කරයි. මෙසේ ජීවිතෙන්ද්‍රියය කර්මජතේජස නිසා සිටියි. කර්මජතේජස ජීවිතෙන්ද්‍රියය නිසා සිටියි.

ඛණික – සම්මුඛි – සමුච්ඡේද විසින් මරණය තෙ වැදැරුම් ය. එහි උපන්ද පටන් මැරෙණ තුරු හැම මොහොතක ම රූපාරූප ධර්මයන්ගේ බිඳුම නැසුම ඛණිකමරණ නම්, "තිස්ස මළේ ය. ඵුස්ස මළේ ය' යනා ඇ ලෙසින් පැවැත්මි සම්මුතිමරණ නම්. මෙහි ලා තිස්සයෙක් ඵුස්සයෙක් නො ලැබෙන්නේ ය. ලැබෙන්නෝ නාම රූප ධර්මයෝ ය. තිස්ස, ඵුස්ස යනාදි ව්‍යවහාරය ලොකයා විසින් සම්මත කර ගන්නා ලද්දෙකි. "තිස්ස මළේ ය, ඵුස්ස මළේ ය" යනාදිය සම්මුතිමරණ යි කීයේ එහෙයිනි. රහතුන් වහන්සේගේ මතු භවයෙක උත්පත්තිනිවාරණය සමුච්ඡේද මරණ නම්.

නැවත මරණය ආයුක්ඛය – පුඤ්ඤක්ඛය – උභයක්ඛය – උපච්ඡෙදක යි සිවු වැදැරුම් ය. එහි උත්පත්තිය ගෙණ දුන් කර්මවෙගය බලවත් ව තිබිය දී ද ඒ ඒ ගතිවලට නියමිත වූ ආයුකාලය ගෙවී යෑමෙන් වන මරණය ආයුක්ඛය නම්. ඒ ඒ ගතිවලට නියමිත වූ ආයුකාලය ඉකිරි ව තිබිය දී පිළිසිඳ දුන් කර්මයාගේ විපාකශක්තිය ගෙවී යෑමෙන් වන මරණය පුඤ්ඤක්ඛය නම්. ආයුකාලය හා කර්මශක්තිය එකවිට ගෙවී යෑමෙන් වන මරණය උභයක්ඛය නම්. ආයුෂය හා කර්මශක්තිය ඉකිරි ව තිබියදී ද මෙලොව දී අවි පහර ලැබීම් ආදී යම්කිසි උපක්‍රමයකින් හෝ මෙලොව ම ඉණවතුන් කෙරෙහි කළ යම්කිසි අපරාධයකින් හෝ පිළිසිඳ දුන් කර්මශක්තිය සිදී යෑමෙන් වන මරණය උපච්ඡෙදක නම්. මේ මරණය නිරිසතුනට උතුරුකුරු දිවයිනට ඇතැම් දෙවකාවුනට සිදු නො වේ.

මානො ච = මානය ද[1]

මක්ඛො ච = ගුණමැකීමද.

අනුන්ගේ ගුණ වසා දැමීම මක්ඛ නම්. **"පරෙහි වා කතාපාමහන්තානම්පි කාරානං ඛෙපනතො ධංසනතො මක්ඛොති වුච්චති"** අන්හු කළ මහත් උපකාරය නසන බැවින් මක්ඛ යි කියනු ලැබේ. ඒ නම් අනුන්ගේ ගුණ මැකීමේ, ගුණ වැසීමේ ආකාරයෙන් පැවැති දෙමනස් යහගිය චිත්තොත්පාදය යි.

අනුකම්පක වූ යමකු විසින් නොයෙක් වෙහෙස දරා හද උයස් තැන තැබූ යම්කිසි ගිහියෙක් පසු දවස "තා විසින් මට කුමක් කරණ ලද දැ" යි මහු කළ ඒ සියලු උපකාර නසාලයි ද නො සලකා හරි ද, ආචාර්‍යෝපාද්ධ්‍යායයන් විසින් සිවුපසින් හා උද්දෙසපරිපුච්ඡාදියෙන් අනුග්‍රහ කොට ධර්මශාස්ත්‍රාදියෙහි බල ගන්වන ලද යම්කිසි පැවිද්දෙක් පසු දවස රට

1. යමකවර්ගයෙහි "අනික්කසාවො" යන්නට කළ පරිකථා බලනු.

වැසියාගෙන් ලැබූ සත්කාර ඇත්තේ, ගුරුන් කෙරෙහි ආදර නැති ව හැසිරෙත්නේ "මේ තෙමේ හද වඩනා ලද්දේ මා විසිනැ" යි කී කල්හී කළ උපකාර අමතක කොට ගුරුන් කළ උපකාර නසාලයි ද, ගිහියාගේ හා පැවිද්දාගේ මේ කළගුණ නැසීමට කරුණු වූ පූර්වොක්තවිත්තොත්පාදය අර්ථ වශයින් ඔක්ක යි දතයුතු ය. එහි පරගුණ මැකීම ලක්ෂණ යි. පරගුණ නැසීම කෘත්‍යය යි. පරගුණ වසා දැමීම ප්‍රත්‍යුපස්ථානය යි. "සො පරගුණමක්ඛනලක්ඛණො, තෙසං විනාසනරසො, තදවජානනපච්චුපට්ඨානො" යි ඒ කීහ.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ස්ථවිරා තොමෝ රහත් වූවා ය. මහජනයාට ධර්මදෙශනාව සාර්ථක වූවා ය.

රූපනන්දස්ථවිරාවය්තුව නිමි.

මල්ලිකා දෙවිය ගෙතූ බොරුව

11 –6

ඒක් දවසක් මල්ලිකා තොමෝ නාන කොටුවට ගොස් මුණ කට සෝදා පා සෝදන්නට නැඹුරු වූවා ය. ඒ වේලෙහි ඇය හා නාන කොටුවට වැදුනු රජගෙයි ම ඇති දඩි වූ බල්ලෙක් බිසවුන් කෙරෙහි ඇලුම් කරන්නේ බිසවුන් නැමී සිට පා සෝදනු දැක පිටි පසින් අවුත් ඇයගේ පිටට අත් ගසා වල් කමෙහි යෙදෙන්නට පටන් ගත. මල්ලිකා ද බලු ඇත් නොකොට නිසොල්මනේ ඒ පහස සතුටින් ඉවසා සිටියා ය. කොසොල් රජ ඒ වේලෙහි රජ ගෙයි උඩුමාලේ කවුළුදොර ලඟ සිටියේ, මල්ලිකාවගේ හා බලුගේ ඒ අසද්‌යොගය දැක, බිසවුන් රජගෙට ආ වේලෙහි, වෙත කැඳවා "බැල්ල! බැහැර යව, තෝ බැල්ලක, බල්ලකු හා එකතු වන්නී බැල්ලියක, එහෙයින් තෝ බැල්ලක. තෝ මිනිස් ගැහැණියක් නොවෙහි, බල්ලකු ගත්තෙහි, බල්ලකු හා සිටියෙහි කිමැ?" යි ඉගුලේ ය. මල්ලිකා තොමෝ කළ වරද වසා ගන්නට සිතා "දේවයන් වහන්ස! මොක ද ඔතරම් ගෙරවිල්ලෙක්? මොක ද මා කළ වර ද? කියනු මැනැවැ" යි බියසුලු බව සහවා කිවු ය. එවිට රජ තෙමේ "ඇයි මගෙන් අසනු බලු හා කළකම්?, බලු හා කළ කම් දන්නොහි තෝ, බලු හා බලුකම් කොට එය වසා ලන්නට සැරසෙහි දැන්, බැල්ල, බැහැර යව" යි නැවතත් ඉගුලේ ය. "දෙවයන් වහන්ස! ඉවසනු මැනවි, මම ඔය කියන අන්දමේ බලුකමක් නොකෙළෙමි, එතරම් අමාරුවක් මට නැත, මම මිනිස් දුවක්මි, බැල්ලක් නොවෙමි මම" යි මල්ලිකාව කී කල්හි රජ තෙමේ "මැ මා ඇසින් දුටු කාරණය වසාලයි, තෝ බොරු කියහි, ඔය කියන කතාව මම නොපිළිගණිමි" යි කී ය. එවිට මල්ලිකාව "දෙවයන් වහන්ස! මට කමත්ත, උදහස් නොවන්න, ඔබ වහන්සේ කියන කතාවත් ඇත්ත විය හැකි ය, මම එය පිළිගණිමි. අපේ ඔය නාන කොටුවට එකතු ගිය විට කවුළුවෙන් බලන්න කුට ඔහු පෙණෙන්නේ දෙදෙනකු සේ ය, මාගේ මේ කතාවේ ඇත්ත දැන ගැණීමට වුවමනා නම් ඔබතුමන් නාන කොටුවට යෑ යුතු ය, ඔබතුමන් එහි ගිය විට මම කවුළුවෙන් බලන්නම්" යි කිවු ය. රජ තෙමේ, පියවි ගතියෙන් ම මෝඩගති ඇත්තකු බැවින් මල්ලිකාවගේ මේ කතාව අදහා නාන කොටුවට වැද සිටියේ ය. මල්ලිකා තොමෝ ද කවුළුව ලඟ සිට බලා රජු පෙරළා ආ කල්හි "මහරජ! මට තරවටු කරහු, මට නින්ද කරහු, මොක ද ඒ කළහු?, රජ ව සිට බොහෝ ගණනක් බිසෝවරු හිඳ දී මේ ලෙසට එඑදෙනක හා වල්කම් කරණු ඔබට සුදුසු ද?" යි ඇසූ ය. රජ "මම එබන්දක් නොකෙළෙමි" යි කී කල්හි "කුමක් කියහු? මා දුටු දෙය වෙනස් කරන්නට ඔබට හැකි ද? නිදහසට කියන ඔය කතාව මට පිළිගණු නොහැකි ය" යි මල්ලිකා කියා සිටියා ය. රජ තෙමේ "මේ

කියන කතාව ඇත්ත විය හැකි ය. නාන කොටුවට පිවිස සිටියේ බලන්නන්ට දෙදෙනෙක් ව පෙණෙන්නේ ය යනු ඇත්ත ය'' යි පිළිගෙණ මල්ලිකා කෙරෙහි වූ සැකය අත් හළේ ය.

ඉක්බිති මල්ලිකා තොමෝ ''මේ රජ මෝඩයකු බැවින් මට රවටා ගත හැකි වී ය. එහෙත් මා කළේ පව් වැඩෙකි. පහත් වැඩෙකි. එය කාට වත් කියන්නට බැරි ය. මම බොරුවෙන් රජුට නිග්‍රහ කෙළෙමි. බොරු කියා රජු රැවටීමී. එහෙත් බුදුරජානන් වහන්සේ මෙය දන්නා සේක. අග්‍ර-ශ්‍රාවක දෙ දෙනා වහන්සේ දන්නා සේක. අසූ මහාශ්‍රාවකයන් වහන්සේ දන්නා සේක. මා කළේ බරපතල වරදකැ'' යි නිතර සිතන්නට වූ ය.

රජුගේ අසදෘශමහාදනයෙහි එක දවස කළ පරිත්‍යාගය තුදුස් කෙළක් අගනේ විය. බුදුරජුන් හිස දරූ සේසත වැඩහුන් පලඟ පාත්‍රය තැබූ පාත්‍රාධාරය සිරිපා තැබූ පා පුටුව යන මේ සතර මෙ පමණ අගනේ ය යි මිල නොකළැකි ය. මේ මහා දනයෙහි මල්ලිකාව ද කටයුතු කළා ය. එහෙත් ඕ තොමෝ මරණාසන්නකාලයෙහි මේ එකකුත් සිහි නොකොට කළ පව් කම ම සිහියට ගෙණ මැරී ගොස් අවීචිමහානරකයෙහි උපන්නී ය. ඕ තොමෝ රජුට ප්‍රිය වූවා ය. එහෙයින් රජ තෙමේ බලවත් ශෝකයෙන් මිරිකුනේ ආදහනය කොට මල්ලිකාව උපන් තැන විචාරමි යි සිතා බුදු රජුන් වෙත ගියේ ය. බුදුරජානන් වහන්සේ එකෙණෙහි ඔහු එහි පැමිණි කරුණ ඔහුට අමතක වන සේ ඉටා වදළ සේක. රජු බුදුරජුන් ඉදිරියෙහි සිත් ඇලවිය යුතු වෙන බණ කතාවක් අසා පෙරළා මාලිගාවට ගිය කල්හි, නැවත අසා බලන්නට ගිය කරුණ සිහියට නැගී ආයේ ය. ''මම මල්ලිකාව උපන් තැන අසන්නට සිතා බුදුරජුන් වෙත ගියෙමි. එහෙත් එය මට අමතක වී ය, අද නැවත එහි යනු නොහැකි ය'' යි සිතා රජ තෙමේ පසුදු බුදුරජුන් වෙත ගියේ ය. බුදුරජානන් වහන්සේ එදු ද එය ඔහුට අමතක වන සේ ඉටූ සේක. උන්වහන්සේ මේ ලෙසින් සත් දවසක් ම එය ඔහුට අමතක වන සේ ඉටූහ. මල්ලිකා ද සත් දවසක් නිරයයෙහි පැසී අටවනදු නිරයයෙන් ගැලවී තුසිත භවනයෙහි උපන්නී ය.

බුදුරජානන් වහන්සේ කුමක් නිසා මෙසේ ඉටා වදළ සේක් ද යත්, මල්ලිකා නොමෝ, රජුට ඉතා ප්‍රිය ය. මන වැඩූ ය. එහෙයින් ඇය නිරයයෙහි උපන්බව දැන ගතු නම් රජ තෙමේ ''මෙබඳු ශ්‍රද්ධාවත් දන් පින් බොහෝ කොට කළ මල්ලිකාන් නිරයයෙහි උපන්නී නම්, දන් දීමෙන් වැඩෙක් නැතැ' යි මිසදිටු ගෙණ පන්සියයක් භික්ෂූන් උදෙසා නිතර ගෙයි දෙන දන් නවතා නිරයයෙහි උපදින්නේ ය'' යි දැන රජු කෙරෙහි කුළුණු සිතින් එසේ ඉටූ සේක. මේ සත් දවස ඉක්ම ගිය තැන අටවන දු පිබූ සිහා වඩනා සේක් රජ ගෙට වැඩි සේක. ''බුදුරජානන් වහන්සේ වැඩි සේකැ'' යි ඇසූ රජ තෙමේ මාලිගාවෙන් දෙරට බැස පාත්‍රය ගෙණ උඩුමාලට නැගෙන්නට වන. බුදුරජානන් වහන්සේ රියහලෙහි වැඩ හිඳින්-

නට කැමැත්ත දක් වූහ. රජ තෙමේ උන්වහන්සේගේ කැමැත්ත පරිදි එහි වඩා හිඳුවා කැඳ අවුලුපත් වළඳවා වැද පසෙක හිඳ "ස්වාමීනි! මල්ලිකාව උපන් තැන දැන ගන්නට සිතා සත් දවසක් ම විහාරයට ගියෙමි. සත් දවසෙහි ම එය අමතක ව ආවෙමි. ස්වාමීනි! අපේ මල්ලිකාව උපන්නී කොහි ද?" යි ඇසි ය. "මහරජ, ඇ තුසිත භවනයෙහි උපන්නී ය" යි වදළ විට "ස්වාමීනි! ඕ තොමෝ තුසිත භවනයෙහි නුපන්නී නම් මහපුදුමයෙක්, ඇ එහි නුපන්නී නම් අන් කවරෙක් එහි උපදී ද, ඇ හැඬෑ ගෑණියක්, ඇය වැනි ගෑණු කොහි සිටින් ද, හිඳිනා සිටිනා හැම තැනදී ම ඕ බුදුරජුන් සිහි කරයි. බුදුරජුන් පුදන්නෙමි. බුදුරජුන්ට සක්කාර කරන්නෙමි' යි දන් පිළියෙල කිරීම මුත් ගෙදෙර වැඩෙක් ඇය අතින් කෙරෙන්නේ නැත. ඇය මළ ද සිට ස්වාමීනි! ඔට ඇති ශොකය ඉවසා ගත නො හැකි ය. මාගේ මේ සිරුර සිරුරෙක් නො වේ. ශොකය එ තරම් බළවත්" යි කීයේ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ "මහරජ! ශොක විය යුතු නො වේ. උපන් හැම කෙනකුට ම මරණය නියමයෙන් වන්නේ ය. කිසි ලෙසකිනුත් එය වැළකිය හැකි නොවේ" යි කියා "මහරජ! මේ රිය කා අයත් ද?" යි අසා වදළ සේක. එවිට රජ තෙමේ "එය මාගේ මුත්තනුවන්ගේ ය" යි කී ය. නැවත අනිකක් පෙන්වා "මෙය කාගේ ද?" යි ඇසූහ. එවිට එය "අප පියා සතුය" යි කී විට අනිකක් පෙන්වා "මෙය කාගේ ද" යි විමසූ සේක. "එය මා සතු ය" යි රජ තෙමේ කී ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ "මහරජ! ඔබගේ මුත්තනුවන්ගේ රිය ඔබගේ පියාගේ රියට වඩා වෙනස් ව ගියේ ය. පියාගේ රියට වඩා මුත්තනුවන්ගේ රිය දිරුමකඩට ගොස් තිබේ. එ දෙක මොන සැටියෙනුත් සම නොවේ. ඔබගේ පියා සතු රිය ඔබගේ රියට වඩා වෙනස් ය. එ දෙක ද සමතැන් නො ගන්නේ ය. මහරජ! සිහි එළවා බැලිය යුතු ය. මේ දඹුකඩවලටත් ජරාව පැමිණෙන සැටි, ජරාවෙන් දුරු නො වූවෙක් ලොකයෙහි කොහැනකත් නැත. එසේ නම් මිනිස් සිරුරට ජරාව පැමිණෙනු කිය යුතු ද, මහරජ! ජරාව නො එන්නී සත්පුරුෂයන්ගේ ධර්මයට පමණෙකි. නො දිරන්නා වූ මහලු නො වන්නා වූ සත්ත්ව කෙනෙක් නැත. එය සිහියට ගන්නැ" යි ධර්මදේශනාව කළ සේක.

සීරන්ති වෙ රාජරථා සුචිත්තා අථො සරීරම්පි ජරං උපෙති,
සතඤ්ච ධම්මෝ න ජරං උපෙති සන්තෝ හවෙ සබ්භි පවෙදයන්තීති.

මොනවට විසිතුරු කළ රජුන්ගේ රිය ද, ඒකාන්තයෙන් ජරාවට පැමිණේ. නැවත සිරුරක් ජරාවට පැමිණේ. සත්පුරුෂයන්ගේ ධර්මය වනාහි ජරාවට නො පැමිණේ. සත්පුරුෂයෝ සත්පුරුෂයන් හා මෙසේ ප්‍රකාශ කෙරෙත්.

සීරන්ති වෙ රාජරථා සුචිත්තා = මොනවට විසිතුරු කළ රජුන්ගේ රථයෝ ඒකාන්තයෙන් දිරත්.

රාජරථ නම්, රජුන්ගේ මඞ්ගලරථයෝ ය. ඔවුහු මුතු මැණික් ඇ සත් රුවනින් හා සෙසු රථාලඞ්කාරයෙන් මොනවට සරසන ලද්දෝ 'සුවිත්ත' වෙති. කො තරම් හොඳින් සරසන ලද්දෝ නමුත් රජුන්ගේ මංගලරථයෝ ද දිරුම්කඩට යන්නාහ යි මෙයින් වදාළ සේක.

අථො සරිරම්පි ජරං උපෙති = නැවත සිරුර ද ජරාවට පැමිණේ.

මිනිසකු මවුකුස පිළිසිඳ ගැණීමට මවුපියන්ගේ සඞ්ගමය, මවුගේ මල්වර කාලය, පිළිසිඳ ගැණීමට සුදුසු සත්ත්වයකු එළඹ සිටීම යන කරුණු තුණ එකවට ලැබිය යුතු ය. "තිණ්ණං ඛො පන භික්ඛවෙ! සන්තිපාතා ගබ්භස්සාවක්කන්ති හොති. යතො ඛො භික්ඛවෙ! මාතාපිතරො ච සන්නිපාතිතා මාතා ච උතුනී හොති ගන්ධබ්ඛො ච පච්චුපට්ඨිතො හොති එවං ඛො භික්ඛවෙ! තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති" යනු දෙශනා ය.

මෙහි කී මවුපියන්ගේ සඞ්ගමය මෙවුන්දම් සෙවුමෙන් ම වනු යේ නො වේ. අත් පා ගැණීම් ආදියෙන් ද ඒ වන්නේ ය. එයිනුදු ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ සිතෙහි රාගචෙතනාවක් හට ගත්තී නම් එ ද පිළිසිඳ දීමෙහි හෙතු විය හැකි ය. පිළිසිඳ දෙන්නට ඒ ප්‍රමාණ වත් ය. සාමපණ්ඩිතයන්ගේ හා මණ්ඩව්‍ය කුමරුන්ගේ පිළිසඳ ගැණුම වූයේ හුදෙක් නැබ පිරි මැදීමෙන් හට ගත් රාගචෙතනාව නිසා ය. ඔසප් වූ මෙහෙණක දැක උදයි තෙරුන්ට රාගසිතෙක් පහළ විය. එයින් ඒ තෙරුන්ගේ ශුක්ලධාතුව වැගිරෙන්නට වන. එයින් ඇඳ තුබූ අඳනය කිලිටි විය. එකල්හි උදයි ස්ථවිර තෙමෙ ඒ අඳනය සෝදන්නට ඒ මෙහෙණට ම දුන්නේ ය. ඕ තොමෝ ඒ අඳනය සෝදන්නී එහි ලග්න ව තුබූ ශුක්ලය රාගචිත්තයෙන් තම අඞ්ගජාතයෙහි හා මුඛයෙහි බහා ගත්තා ය. එයින් කුමාරකාශ්‍යප තෙරුන්ගේ පිළිසිඳ ගැණීම විය. ශුක්ල හා මිශ්‍ර ව තුබූ මූත්‍ර පානය කළ මුවදෙනගේ කුස සෘෂිශෘඞ්ගතාපසයාගේ පිළිසිඳ ගැණීම විය. මෙයින් පෙණෙනුයේ පුරුෂසංසර්ගයෙක් නො ලැබුන ද අන් යම්කිසි හෙතුවකින් මවගේ සිතෙහි රාගචෙතනාවක් පහළ වූ කල සත්ත්වයෙක් එළඹ සිටියේ නම්, මවත් මල්වර ව සිටියා නම්, පිළිසිඳ ගැණුම සිදු වන බව ය.

මවුකුස පිළිසිඳ ගන්නා කල්හි ශුක්‍රශ්‍රොණිත දෙක ඇසුරු කොට පූර්ව කර්මශක්තියෙන් ප්‍රතිසන්ධිචිත්තයාගේ පහළවීම සමග කායදශකය වස්තුදශකය පුම්භාවදශකය හෝ ස්ත්‍රීභාවදශකය යන රූපකලාප තුණ ද පහළ වෙති. නපුංසකයකු වූ කල්හි භාවදශක දෙක පහළ නො වේ. මේදිය කලල රූපය යි කියනු ලබන්නේ. මෙහි පමණ ඒ ඒ ඇදුරන් විසින් වෙනස් ලෙසින් දක්වන ලද්දේ ය. එකෙක්, එය මැස්සක එක්වරක් බොන දිය උඟුරක් පමණෙකැ යි කියයි. එකෙක්, එය හිමාලයවනයෙහි වසනා හුණු

පුපුලු නම් සතකුගේ උදරරෝමයක් පහත් තෙලෙහි බහා නගා ගෙණ සත් විටක් ගසා දැමූ කල්හි එහි අග රැඳෙන තෙල්බිඳ පමණැ යි කියයි. එකෙක්, එය ඉදිකටු මූණත තලතෙලෙහි බහා නගා ගෙණ යටි කුරු කළ කල්හි ඉන් වැගිරෙණ තෙල්බිඳ පමණැ යි කියයි. එකෙක්, එය එළලොමක් පිරිසිදු ගිතෙලක බහා නගා ගෙණ යටිහුරු කළ කල්හි ඉන් වැගිරෙන තෙල් බිඳ පමණැ යි කිය යි.

පිළිසඳ දෙන සිත සමග පහළ වන කායදශකාදිරූපකලාප තිදෙන පෙර කළ කුශලාකුශලකර්මය නිසා ම ප්‍රතිසන්ධිකාලයෙහි එම සිත සමග පෙර පසු නො වී එකක්ෂණික ව පහළ වෙති. මේ කලාපයන් අතර පරිච්ඡේද-කාශධාතුව ද ඇත්තේ ය. ඒ ඔවුන් එකකු එකකු හා මිශ්‍ර නොවනු පිණිස ය. මේ කලාප තුණ ආපෝ ධාතුවෙන් බැඳී වටකුරු ව සිටියි. කලලරූපය වටකුරු වන්නේ මේ නිසා ය. කලාපයන්ගේ අතර ආකාශධාතුව ඇති නමුත් ආපෝ ධාතුවෙන් බැඳී මේ කලාප තුණ වටකුරුව ම පවතී. මෙහි වූ වායෝ ධාතුව නිසා ඇතුළෙන් පිටතටත් පිටතින් ඇතුළටත් යෑ නොහැකි ව වෙන් වෙන් ව විසිර නො ගොස් සිටිත්. පක්ෂිසර්පාදීන්ගේ බිත්තර වටකුරු ව සිටියෝ කලලරූපය ම ඒ ඇති සැටියෙන් ම වැඩෙන බැවිනි. ඒ මේ කලලරූපය ක්‍රමයෙන් මහත් වෙමින් සතියක් කල් කලල-රූප වශයෙන් ම පවත්නේ ය.

ඉන් පසු කර්ම-චිත්ත ඍතු-ආහාර යන මොවුන් නිසා ද මව විසින් අනුභව කළ ආහාරයාගේ රසයෙන් හට ගන්නා වූ මෘදු ලෞහිතය මවගේ රසනහර අනුව ගොස් ගර්භාශයෙහි වූ කලල රූපයෙහි වැදීම නිසා ද ආහාරජරූප කලාපයන් දෙවන සතියෙහි බොහෝ සෙයින් හට ගැනීමෙන් ඒ කලලරූපය මස් සේදූ දියක් වැනි අර්බුදවස්ථාවට පැමිණේ. ඉන් පසු තෙවන සතියෙහි කළු ඊයම් දියක් බඳු වූ පෙශී අවස්ථාවට ද සිවුවන සතියෙහි කිකිළිබිත්තුවක් බඳු වූ හැඩහුරුකම් ඇති වටකුරු වූ ඝනාවස්ථාවට ද පැමිණේ. පස්වන සතියෙහි ඒ ඝන වූ අවස්ථාවෙන් දෙ අත් දෙපා හිස යන අවයවයන්ගේ පහළ වීමට පස් පොළක් හට ගනී. පස්වන සතිය පටන් එකොළොස්වන සතිය දක්වා මෙදැතුරෙහි අතුල් පතුල් ඇඟිලි-ඇස්-කණ් නාස්-මුව-වස්ඉඟ-මූමඟ-නියපොතු හිසකේ-ලොම්-සියුම්-ඇට නහර ආදිවූ අවුකුසයෙහි දී පහළ විය යුතු වූ සියල්ල හට ගන්නේ ය. ගැබහෝනා ලදරුවාගේ උදරය හට ගැණුනු කාලයෙහි ඔහුගේ පෙකෙණියෙහි වූ පෙකෙණිවැල මවගේ ආමාසයෙහි යට පෙදෙසෙහි බැඳී සිටිනා බැවින් මව අනුභව කරණ ආහාර පානයන්ගේ රසයෙන් හට ගත් මෘදුලෝහිතය පෙකෙණිවැල අනුව ගොස් ලදරුවාගේ උදරයට ඇතුල් වන්නේ ය. එයින් ආහාරජ රූපකලාපයෝ පහළ වෙත්. එයින් ලදරු ක්‍රමයෙන් අභපසඟින් මහත් වන්නේ ය. මෙසේ හට ගැණුනේ ශරීර යි කියනු ලැබේ. මෙය ඒ ඒ සත්ත්වනිකායයන්ගේ වශයෙන් උස් මහත් ඇ විවිධ අවස්ථාවන්ට

පැමිණේ. ඇතැම් සත්ත්වශරීරයෙක් ඇසින් නො දත හැකි ය. එ තරම් කුඩා ය. ඇතැම් සත්ත්වශරීරයෙක් යොදුන් සිය ගණන් උස් මහත් වේ යනු ආගමාගත ය. තව ද මේ පිළිබඳ කරුණු සුශ්‍රුතසංහිතා භාගවත පුරාණ දෙවඳකාමධෙනු යනාදී පෙරකියග්‍රන්ථයන්හි ද සවිස්තර ව දක්වා ඇත්තේ ය. එ තැන්හි දුක්වුනු මේ කරුණු මෙහි දුක්වූ කරුණු හා සමහර කැනෙක දී සටනාවට නො ගියේ ය. එහෙත් එ තැන්හි එන කරුණු දැන සිටීම ද මෙහි ලා ප්‍රයෝජනවත් වේ. මෙහි නො දුක්වුනේ පොත දිග් ගැසෙන බැවිනි.

සතං ච ධම්මෝ න ජරං උපෙති = සත්පුරුෂයන්ගේ ධර්මය දිරුම් කඩට නො යෙයි.

සත්පුරුෂයෝ නම් බුඩාදීමහොත්තමයෝ ය. නවලෝකොත්තර ශ්‍රීසඩර්මය ධර්ම නම්, ඒ ය බුඩාදීමහොත්තමයන්ගේ ධර්මය. මේ ධර්මය කිසි කලෙකත් කිසි කැනෙකත් කිසි අතකිනුත් ජරාවට නො යන්නේ ය. ඒ ධර්ෂයෙකි වෙනස් බවෙක් නම් නො වන්නේ ය.

සන්තෝ හවේ සබ්භි පවෙදයන්ති = සත්පුරුෂයෝ සත්පුරුෂයන් හා එකාන්තයෙන් මෙසේ පවසත්.

සත්පුරුෂයෝ සත්පුරුෂයන් හා ම කතා කරති. අසත්පුරුෂයන් හා කතා නො කෙරෙති. අසත්පුරුෂයන් ස්කන්ධධාතුආයතනාදීන්ගේ තතු නො දන්නා බැවිනි, සත්පුරුෂයන් අසත්පුරුෂයන් හා කතා නොකරණු. ස්කන්ධාදිය ගැණ කරුණු නො දත් ජරාමරණ ගැණ නො සලකන අඥයන් හා කතා කිරීමෙන් එ ලොවට හා මෙලොවට හා වැඩක් නැත්තේ ය.

බණ අසා සිටි ඔබාහෝ දෙන සෝවාන්පලාදියට පැමිණියෝ ය.

මල්ලිකාවස්තුව නිමි.

ලාලුදායි තෙරුන්ගේ බණ.

11 –7

ලාලුදායි තෙරණුවෝ මඟුල් ගෙට ගොස් ''තිරෝ කුඩ්ඩෙසු තිට්ඨන්ති'' යි අව මඟුල් ගෙයි කියන බණ කියති. අවමඟුලට ගොස් ''දානං ව ධම්මචරියා ච'' යි මඞ්ගලසූත්‍රගාථාවක් හෝ ''යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා'' යි රතනසූත්‍රගාථාවක් කියති. මෙසේ ඒ ඒ තැනට ගොස් ''අනෙකක් කියමි'' යි අනෙකක් කියන්නෝ ද ''අනෙකක් කියමි'' යි නො දනිත්. එ කල්හි භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් ''ස්වාමීනි! ලාලුදායි තෙරණුවෝ උඩ බිම නො දැන බණ කියති. මඟුලට ගොස් අවමඟුල් බණ කියති. අවමඟුලට ගොස් මඟුල් බණ කියති. තැන නො තැන ගැණ ඔහුට දැනුමෙක් නැත. තැනේ හැටි බලා බණ කියන්නට ලාලුදායි තෙරණුවෝ නො දනිති'' යි බුදුරජානන් වහන්සේට දන් වූහ. ''මහණෙනි! ලාලුදායි පෙරත් ඔබදු ය. තැනට ගැලපෙන ලෙසට යමක් කියන්නට නො දන්නේ ය. තැනට නො ගැළපෙන බණ කියන්නේ දැන් පමණක් නො වේ. ඉස්සර ද අනෙකක් කිය යුතු තැන අනෙකක් ම කීයේ'' යි බුදුරජානන් වහන්සේ වදළ විට භික්ෂූහු ඒ කවද ද?'' යි ඇසූහ.

''යටගිය දවස බරණැස් නුවර අග්ගිදත්ත – සොමදත්ත යි බමුණෝ දෙ දෙනෙක් වූහ. සොමදත්ත, අග්ගිදත්තගේ පුත්‍ර ය. ඔහු රජගෙයි සේවා කම් කෙළේ ය. පියාට ප්‍රිය ය. පියාගේ මන වැඩුයේ ය. අග්ගිදත්ත ගොවිකමින් ජීවත් වූයේ ය. ගොවිතැන් වැඩ සඳහා ඔහුට ගොන්නු දෙ දෙනෙක් සිටියහ. අතරක ඉන් එකෙක් මළේ ය; එයින් ඔහුගේ ගොවිතැන නැවතුනේ ය. පුත් සොමදත්ත ඒ අතර දවසෙක ගෙට ආයේ ය. එකල්හි ඔහු 'සොමදත්ත! මා වෙත සිටි ගොන් දෙන්නාගෙන් එකකු මළ බව තෝ නො දනිහි ද? ඉන් එකෙක් මළේ ය. එදා සිට මට කිසි වැඩෙක් නැත. කුඹුරුවැඩ නවතාලන්නට සිදු වී තිබේ. එහෙයින් අප මහරජතුමන්ගෙන් වත් ගොනකු ඉල්ලා දෙන්නැ' යි කී ය. සොමදත්ත 'රජුගෙන් ගොනකු ඉල්ලීම මට තරම් නො වේ. ඒ මට මදිකමෙකි. මා පහත් එකකු බව ඉන් පැහැදිලි වන්නේ ය. රජතුමා මා පහත් එකකු කොට සිතන්නේ ය' යි සිතා 'පියේ! ඒ ඉල්ලීම මා කරණ එක නො සුදුසු ය. මම එතැන සෙවකයෙක්මී. තාත්තා රජතුමන් වෙත ගොස් වැඳ ගොනකු ඉල්ලා සිටින්නැ' යි කී ය. 'එහෙනම් පුතේ මා රජු වෙතට කැඳවා ගෙණ යන්නැ' යි අග්ගිදත්ත කී විට සොමදත්ත තෙමේ 'අපේ තාත්තා මෝඩ ය. එන්න, යන්න, යන වචනය පමණකුත් හරිහැටි කියන්ට නො දනියි. අනෙකක් කිය යුතු තැන අනෙකක් ම කියයි. තැනට නිසි සේ කතා කරන්නට නො දනියි. එහෙයින් රජු වෙත යන්නට පෙරාතුව රජු ඉදිරියෙහි කතා කරණ සැටි උගන්වා පුරුදු කරවා ගෙණ යා යුතුය' යි සිතා අග්ගිදත්තයන් බීරණත්ථම්භක නම් සොහොන් බිමට කැඳවා ගෙණ ගොස් තණ කොළ එකතු කොට තණමිටි කීපයක් බැඳ ඒවා එක එක

ඇසට හේත්තු කොට ඉන් පසු ඔහු ඒ ඒ තැනට ගෙණ ගොස් මේ රජ-තුමා ය. මේ යුවරජ ය. මේ අගමැති ය. මේ සෙනෙවිය යි යන ආ-කලසින් නම් කොට පියාට පෙන්වා රජගෙට ගිය කල්හි මේ ලෙසින් ඉදිරියට යා යුතු ය. මේ ලෙසින් පස්සට යා යුතු ය. රජු ඉදිරියේ මෙසේ සිටිය යුතු ය. රජුට මෙසේ කිය යුතු ය. යුවරජුට මෙසේ කිය යුතු ය. රජු වෙත ගිය ඇසිල්ලෙහි ම දෙයත් එකතු කොට මහරජතුමනි! ඔබ වහන්සේට ජය වේවායි කිය යුතුය'' යි පළමු කොට උගන්වා පි ය. නැවත-

'මහරජුනි! ගොවිකම් – කෙළෙමි මම යම් ගොන්ගෙන්,
මළේ උන්ගෙන් එක් ගොන් – දෙනු මැන දෙවන ගොනකු'

යන ගය බැඳ දුන්නේ ය. අග්ගිදත්තට මේ ගය කටට හුරු කර ගන්නට අවුරුද්දක් ගත වි ය, අවුරුද්දක් ගෙවා කට පාඩම් කොට ගෙණ ඒ බව සුතුට දන් වී ය. එ කල්හි ඔහු පුත් සොමදත්ත හිස් අතින් රජු ඉදිරියට යෑම නො සුදුසු ය. ගුරුවරයකු රජකු ඇමැතියකු වෙදකු වැඩිහිටියකු වැඳගතකු හමුවීමට යන කල්හි හිස් අතින් යෑම මනුෂ්‍යාධර්මයෙක්නො වේ. එහෙයින් රජගෙට ගෙණ යෑමට පඩුරක් පිළියෙල කර ගෙණ එහි යන්න. මම මදක් කලින් ගොස් රජු ඉදිරිභයහි පෙණී සිටින්නෙමි' යි කීයේ ය. අග්ගිදත්ත 'ඒ යහපතැ' යි ගිවිස පඩුරකුත් ගෙන සොමදත්ත රජු ඉදිරියෙහි පෙණී සිටී ඇසිල්ලෙහි රජු වෙත එළඹියේ ය. රජ තෙමේ ද ඔහු සතුටින් පිළිගෙණ 'වාඩි ගන්නැ' යි කියා 'මෙහි ආවෙහි කුමක් නිසා ද? වුවමනා කුමක් ද?'' යි ඇසී ය. එවිට ඔහු-

'මහරජුනි! ගොවිකම් – කෙළෙමි මම යම් ගොන්ගෙන්,
මළේ උන්ගෙන් එක් ගොන් – ගණු දෙවන ගොන් කැත්රද!'

යන මේ ගය කී ය. 'තෝ කුමක් කියහි' යි රජු ඇසූ විට ඔහු නැවතත් එය ම කියේ ය. ඉක්බිති රජ තෙමේ ඔහු එය වරදු කී බව සිතට ගෙණ, සිනහ පහළ කොට 'සොමදත්ත! නුඹලාගේ ගෙදර බොහෝ ගොන්නු සිටිති' යි කී ය. ''දෙවයන් වහන්ස! ඒ ගොන්නු ඔබ වහන්සේ විසින් ම දෙන ලද්දෝ වෙති' යි සොමදත්ත කී විට ඔහු කෙරෙහි පැහැද බමුණාහට ගොනුන් සොළොස් දෙනකුන් හා රෙදි පිළි අබරණ බොහෝ කොට දී උන් විසූ ගම ද පමුණු ගම් කොට දෙවා පිටත් කොට යැවී ය'' යි මේ පුවත වදළ බුදුරජානන් වහන්සේ නැවත ''එ දවස රජ වූයේ ආනන්ද තෙමේ ය. අග්ගිදත්ත බමුණු වූයේ ලාලුදායි ය. සොමදත්ත වූයේ මමැ'' යි ජාතකය ගළපා ''ලාලුදායි පෙරත් ඔබදු ය. එදත් තමන්ගේ මෝඩකම් නිසා කිය යුත්ත හැර අනෙකක් ම කී ය. කිසිත් ධර්මශාස්ත්‍රයක් නුගත් මෝඩයා ගොනකු සමාන ය'' යි මේ දෙශනාව කළ සේක.

අප්පස්සුතායං පුරිසෝ බලිවද්දෙ ව ජීරති,
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති

ඇසූ විරූ ධර්මශාස්ත්‍රය නැති මේ පුරුෂ තෙමේ ගොනකු සේ දිරයි. ඔහුගේ මස් වැඩේ. නුවණ නො වැඩේ.

අප්පස්සුතායං පුරිසෝ = උගත් කම් නැති පුරුෂ තෙමේ.

'අප්පස්සුතෝ අයං' යනු පදවිජෙදයි. මූලපණ්ණාසකාදී වූ එක් පණ්ණාසකයක් හෝ දෙවගක් එක් වගක් හෝ යටත් පිරිසයින් එක් සූත්‍රයක් හෝ පුහුණු නො කළ නො ද උගත් තැනැත්තේ, කමටහන් උගෙණ එහි නොයෙදුනේත් අප්පස්සුත නම්. **'අප්පස්සුතොකි අත්තනො පරෙසං ච හිතාවහෙන සුතෙන විරහිතොති අත්ථො'** තමන්ටත් අනුන්ටත් හිත වැඩ එළවන්නා වූ ධර්මශාස්ත්‍රාදිය ඉගෙණීමෙන් තොර වූයේ **අප්පස්සුත** යි කොටින් කිය යුතු ය.

බලිවද්දො ව ජීරති = ගොනකු සේ දිරයි. මෝරා යයි.

බල වඩන්නෝ **බලිවද්ද** නම්. ගොනා ය. කිසිත් හසරක් නො දත්තේ, කුසල් අකුසල් නො දත්තේ, යුතු අයුතු නො දත්තේ, වග **කිමෙින්** තොර වූයේ හුදෙක් බල වඩන්නේ ය. එහෙයින් ඔහු ගොනකු වැනිය යි **කීයේ** මෙහි වූ **'ඉව'** යන **නිපාත**යෙනි.

මංසානි තස්ස වඩ්ඪන්ති = ඔහුගේ මස් වැඩේ.

මස් **පමණක්** නො ව ඔහු පිළිබඳ ඇට සම් නහර ඇටමිදුලු **ආදී** වූ හැම එකක් ම වැඩේ.

පඤ්ඤා තස්ස න වඩ්ඪති = නුවණ නො වැඩේ.

මවට පියාට අන් නැයකුට වැඩක් නැති, නිකම් කා බී වැඩෙන ගොනකු මෙන් නූගත් මිනිහා කමින් **බොමින් අදිමින් පලඳිමින් නිදමින්** මවට පියාට අන් නැයකුට වැඩක් නැති ව වැඩෙන්නේ ය. **උපාධ්‍යාය-වත්තක්** ආචාර්‍යවත්තක් ආගන්තුකවත්තක් **ගිලන්වත්තක්** නො කරන්නේ ය. භාවනාවක නො යෙදෙන්නේ ය. **නිරර්ථක** ව **ම** වැඩෙන්නේ ය. මෝරන්නේ ය. කිසිවකටත් නො නිසි බැවින් හැර දමූ පෘථුල් ගොන් මාල්ලකු වනයෙහි ඇවිද කා බී මසින් ලෙයින් තරව යන්නා සේ මේ නූගත් මිනිහා ද ආචාර්‍යෝපාධ්‍යායන් විසින් හරණ ලදු ව **සඩ්ඪයාට උපන්** සිව්පසය කා බී වමන විරෙචන ආදියෙන් කය වඩා මසින් ලෙයින් තර

වන්නේ ය. මසින් වැඩෙන්නේ මහත් සිරුරු ඇත්තේ වන්නේ ය. එහෙත් ඔහුගේ තුවණ නම් යන්තමකිනුත් නො වැඩේ. වනයෙහි ගස් වැල් ඇ වැඩෙන්නා සේ ඇස්-කන්-නාස් ඇ සදෙර නිසා පවත්නා තණ්හා මානාදී වූ කෙලෙස් ම තර වේ. මිහත් වේ. මස් තර වන පමණටත් වැඩියෙන් කෙලෙස් තර වේ.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියෝ ය.

ලාලුදායිස්ථවිර වස්තුව නිමි.

බුදුරජානන් වහන්සේගේ උදන් ඇනුමෙක්

11-8

බුදු වන්නට පිරිය යුතු වූ සියලු දහම් මුළුමනින් සම්පූර්ණ කොට ඒ පිණිස බෝරුක් මුල වැඩ හුන් බුදුරජානන් වහන්සේ එදා ඉර බැස යන්නට පෙරාතු ව මරසෙනග පලවා හැරි සේක. පෙරයම, පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ වසා සිටි අවිදදුර පා කොට හැරි සේක. මැදියම දිව්‍යස පිරිසිදු කළ සේක. අලුයම සියලු සතුන් කෙරෙහි කරුණායෙන් යෙදී ප්‍රත්‍යයාකාරයෙහි නුවණ බහා එය අනුලොම-ප්‍රතිලොම විසින් සලකන සේක්. අරුණ නැගෙත් ම සම්‍යක් සම්බොධිය අවබොධ කළ සේක. ඉන් ඉන් පසු නොයෙක් දහස් ගණන් බුදුවරුන් විසින් අත් නො හැර පැවැත් වූ ප්‍රීතිවාක්‍යය පහළ කරණු පිණිස මේ ගාථාවන් වදළ සේක:-

අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තෝ දුක්ඛා ජාති පුනප්පුනං.

ගහකාරක! දිට්ඨොසි පුනගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා.

නැවත නැවත උත්පත්තිය (යම්හෙයකින්) දුක් ද (එහෙයින්) ගෙය කරන්නා වූ වඩුවා සොයන මම නොයෙක් ජාති යි කියූ සසරෙහි බොධිඥනය නො ලබන්නෙම් සැරිසරා ඇවිද්දෙමි.

ගෘහකාරකය! (මවිසින් තෝ) දක්නා ලද්දෙහි ය. නැවත (මට) ගෙයක් නො කරන්නෙහි. තාගේ සියලු පරාළයෝ බිඳ දමන ලදහ. කැණිමඩල විසුරුවන ලදී. (මාගේ) සිත නිවණට පැමිණියේ ය. අර්හත්ඵලයට පැමිණියෙමි.

අනෙකජාතිසංසාරං = නොයෙක් ජාති යි කියූ සසරෙහි.

සසර වනාහී ජාති මෙතෙකින් සැදුනේ ය යි ජාති විසින් මොන ලෙසකිනුත් ගිණිය නො හැකි ය. ජාති විසින් පිරිසිදිය නො හැකි ය. එහෙයින් සසර "අනෙකජාතිසංසාරං" යි වදළ සේක.

සන්ධාවිස්සං = ඇවිද්දෙමි. ජාතියෙන් ජාතියට ගියෙමි.

මේ වනාහි අතීතකාලයෙහි අනාගත වචනයි. "අතීතෙපි භවිස්සන්ති තඩ්කාලවචනිච්ඡයං" යනු අනුශාසනා ය.

අනිබ්බිසං = නුවණ නො ලබන්නෙමි.

සිවුසස් දහම් දක්නා සිවු මග නුවණ මෙයින් කැමැති වන ලද්දේ ය. ඒ නුවණ නො ලබන්නෙම් නො ද විඳින්නෙම්. මේ එහි අටුවාව. **"අනිබ්බිසං ඤාණං අවින්දන්තෝ අලභන්තෝයෙව"** යනු.

ගහකාරකං ගවෙසන්තෝ = ගෙය කරන්නහු සොයන්නා වූ (මම)

මම මේ අත්බව යි කියන ගෙය කරන්නා වූ තෘෂ්ණා නැමැති වඩුවා සොයන්නෙම්. "**සන්ධාවිස්සං**" යනු හා සම්බන්ධ ය. මෙහි ගහකාරක නම් තෘෂ්ණා ය. අත්බව නැමැති ගෙය ගොඩ නගන බැවිනි. ලොකයා පිළිගත් ගෙයක් ගොඩ නැඟීමෙහි දී ඒ පිණිස ගල්-වැලි-හුණු-මැටි-දැවදඩු ආදී වූ ද්‍රව්‍යරාශියක් යෙදිය යුතු ය. එමෙන් ම අත්බව යි කියන ගෙය ගොඩ නැඟීමේ දී රූප-වේදනා-සංඥා-සංස්කාර-විඥාන යි ද්‍රව්‍යාදව්‍යධර්ම-රාශියක් ඒ පිණිස යෙදෙන්නී ය. සසර උපත දෙන කුශලාකුශලකර්ම, තෘෂ්ණාව මුල් කොට හට ගත්තේ ය. අවිද්‍යා-උපාදානාදීන්ගෙන් ද මේ පිණිස උපකාර ඇතත් පංචස්කන්ධය ඉපදවීමෙහි ප්‍රධාන වන්නී තෘෂ්ණා ය. ද්‍රව්‍ය අද්‍රව්‍යධර්මයන්ගෙන් ගොඩ නැඟුනු ඒ මේ ආත්මභාවය ගල් වැලි ආදී ද්‍රව්‍යයන්ගෙන් ගොඩනැඟුණු ගෙයක් වැනි බෙයින් ආත්මභාවය හැඳින්වීමට ආගමධර්මයෙහි ගහ-ගෙය යන නාම යොදන ලද්දේ ය. ගල් වැලි ඇ එක්තැන් කොට ගෙය කරන්නේ වඩුවා ය. රූපාරූප ධර්ම එක් තැන් කොට ආත්මභාවසංඛ්‍යාත ගෘහය කරන්නී තෘෂ්ණා ය. එහෙයින් තෘෂ්ණාව වඩුවා වැනි ය. තෘෂ්ණාව හා වඩුවා හා දෙ දෙන ම ගහකාර-කශයෝ ය. මෙහිලා ගහකාරක යි කියූවා තෘෂ්ණා ය.

ආත්මභාවසඞ්ඛ්‍යාතගෘහය කරන්නා වූ තෘෂ්ණා නැමැති වඩුවා සොයන්නා වූ මම ඔහු දැකීමට ලබා ගත යුතු වූ බොධිඥානය ලබා ගණු පිණිස දීඝඞ්කරපාදමූලයෙහි දී කරණ ලද පැතුම් ඇති ව දන් ඇ දස පැරුම් දම් මුල් කොට ඇති බුදුකුරුදම් ඇස්-ඉස්-මස්-ලේ-අඹුදරු ඇ හැම සැපත් පුදු ලොව අනෙකකුට නො යෙදිය හැකි මහත් වීර්‍යයක් යොදු සපයමින් ජාතීන් විසින් නිමා කළ නො හැකි මේ සසර ඉපැදෙමින් මැරෙමින් ඔබිමොබ ඇවිද්දෙමි.

දුක්ඛා ජාති පුනප්පුනං = නැවත නැවත ඉපදීම දුක් ය.

මම එසේ මුල් පැනීමේ සිට හැම ජාතියක ම ලැබූ හැම සැපතක් ම හැර දමා නොයෙක් කටුක දුක්වලට මුහුණ දෙමින් ගෘහකාරකයා සොය-මින් ඇවිද්දෙමි, පුන පුනා ඉපදීම හා මරණය දුක් බැවිනි. ජරාය ව්‍යාධිය මරණය යන මොවුන් හා මිශ්‍රව සිටී බැවින් නැවත ඉපදීම දුක් ය, තෘෂ්ණාව මාර්ගඥතයෙන් දක්නා තුරු ම උත්පත්තිය නො නවතින්නී ය. එහෙයින් ඒ තෘෂ්ණාව සොයමින් ඇවිද්දෙමි. "**ඉදං ගහකාරකං ගවෙ-සන්තස්ස පුනප්පුනජාතනං වට්ටං දුක්ඛං. යස්මා ජරාව්‍යාධිමරණම්ස්සත්තා ජාති නාමෙසා පුනප්පුනං උපගන්තුං දුක්ඛා. න ච සා තස්මිං අදිට්ඨේ නිවත්තති. තස්මා තං ගවෙසන්තෝ සන්ධාවිස්සං**" යනු අටුවා ය.

ගහකාරක = ගෘහකාරකය.

දිවථොසි = දක්නා ලද්දෙහි ය (තෝ.)

සර්වඥතාඥනය ලබන්නා වූ මා විසින් තෝ දක්නා ලද්දෙහි ය. සියල්ල දත් නුවණ ය සර්වඥතාඥන නම්.

''**සබ්බං අඤ්ඤාසීති = සබ්බඤ්ඤු, සබ්බඤ්ඤුස්ස භාවෝ=සබ්බඤ්ඤුතා, සා එව ඤාණං සබ්බඤ්ඤුතාඤාණන්ති වත්තබ්බෙ සබ්බඤ්ඤුත ඤාණන්ති වුත්තං**'' යනු විවරණ යි. සියලු දහම් දත්තෝ සබ්බඤ්ඤු නම්. ඒ මේ සබ්බඤ්ඤු ශබ්දයගේ පැවැත්මට නැඟීමට යම් තත්ත්වයෙක් කරුණු වී නම්, ඒ සබ්බඤ්ඤුතා නම්. සියල්ල දත්තෙකු යි දනුමට කීමට ඔහු පිළිබඳ යම් භාවයෙක් කරුණු නම්, ඒ ය සබ්බඤ්ඤුතා යි කියේ. ඒ නම් අනෙකෙක් නො ව සියල්ල දනීම ය. එය සබ්බඤ්ඤුතාඤාණ යි කිය යුතු වුව ද, එහි සිලුටුබව සලකා සබ්බඤ්ඤුතඤාණ යි ගත්තා ලදී.

''සබ්බං අඤ්ඤාසි'' යන විවරණයෙහි එන **සබ්බ** ශබ්දය ලොකය පිළිබඳ හැම දෙයක් ම ගත යුතු බව කිය යි. ලොකයට අයත් හැම දෙයක් ම සඞ්ඛත ය. ලොකය පිළිබඳ නො වූ පදාර්ථ, **අසඞ්ඛත** ය. ඒ ද මේ සබ්බ ශබ්දයෙහි හෙන්නේ ය. **සඞ්ඛත** නම්, හෙතූන්ගෙන් හට ගත් පදාර්ථයෝ ය. ඒ නම්, ස්කන්ධපංචක ය යි. අසඞ්ඛත නම්, හෙතූන්-ගෙන් නො හට ගත් පදාර්ථයෝ ය. ඒ නම් නිවණ ය. මේ සඞ්ඛත-අසඞ්ඛත දෙක සඞ්ඛාර-විකාර-ලක්ඛණ-නිබ්බාණ-පඤ්ඤත්ති යි පසකට බෙදෙන්නේ ය. ''**සඞ්ඛතාසඞ්ඛතාදිභෙද සබ්බධම්මා හි සඞ්ඛාරෝ විකාරෝ ලක්ඛණං නිබ්බාණං පඤ්ඤත්තීති පඤ්ච ඤෙය්‍යපථා හොන්ති**'' යනු අටුවා ය.

කුශලාකුශලාදිහෙතුධර්ම හා එයින් හට ගන්නා ඵලධර්ම හා **සංස්කාර** නම්. රූපලහුතා රූපමුදුතා රූපකම්මඤ්ඤතා කායවිඤ්ඤත්ති වචී විඤ්ඤත්ති **විකාර** නම්. උපචය සන්තති ජරතා අනිච්චතා **ලක්ඛණ** නම්. ලොකය හා මිශ්‍ර නො වූ ලොකයෙහි ඇතුළත් නො වූ ප්‍රත්‍යාධර්මබලයෙන් නො උපදින්නා වූ අසංස්කෘත ධාතුව **නිර්වාණ** නම්. යථොක්තධර්මයන් මේ මේ යි හඳුන්වන්නට පැණවුනු සංඥ **ප්‍රඥප්ති** නම්.

එහි සංස්කාර-විකාර-ලක්ඛණ යන මෙ තුණ සඞ්ඛත ය. ප්‍රත්‍යයයන් නිසා හට ගත්තේ ය. නිර්වාණ ප්‍රඥප්තී දෙක අසඞ්ඛත ය. ප්‍රත්‍යබලයකින් නො හට ගත්තේ ය.

මෙයින් පිටත් දෙයක්, මෙහි නො ඇතුළත් දෙයක් නැත්තේ ය. මේ පසෙහි සියල්ල ඇතුළත් ය. දත යුත්තේ ද මෙ පමණ ය. මෙහි ඇතුළත් නො වූ දත යුත්තෙක් කොහි කැනකත් නැත. දත යුතු හැම මෙහි ඇතුළත් ය. එහෙයින් මේ පස සකලඥෙය මණ්ඩලැ යි කියනු ලැබේ. සවිනෝමඩලැ ශී සිංහල පොතපතෙහි ආයේ ය මේ.

මෙසේ කොටින් කියූ සඩ්ඛත වූ (ප්‍රත්‍යයයන් විසින් උපදවන) පංච-ස්කන්ධය පිළිබඳ අනිත්‍යාදිස්වභාව හා අසඩ්ඛත වූ, (ප්‍රත්‍යයයන් නිසා නො උපන්) නිවණ පිළිබඳ සුඤ්ඤතාදිආකාර ඉතිරි නො කොට දනීම සර්වඥතාඥන නැම යි දන්නේ ය.

''කතමං තථාගතස්ස සබ්බඤ්ඤුතඤාණං?'' යන චොදනාවෙහි පරි-හාරය, සබ්බං සඩ්ඛතමසඩ්ඛතං අනවසෙසං ජානාතීති = සබ්බඤ්ඤුත-ඤාණං'' යනු යි. සියලු සඩ්ඛත අසඩ්ඛතධර්මයන් ඉතිරි නො කොට දන්නා නුවණ සර්වඥතාඥන නමැ යි එයින් කියන ලදී.

නොයෙක් විෂයයන්හි පැවතීම් විසින් සර්වඥතාඥනයාගේ භෙදය ඉමහත් ය. ''අතීතං සබ්බං ජානාතීති = සබ්බඤ්ඤුතඤාණං - පෙ - පච්චුප්පන්නං සබ්බං ජානාතීති - සබ්බඤ්ඤුතඤාණං. තත්ථ ආවරණං නත්ථීති = අනාවරණඤාණං'' යනු පටිසම්භිදාපාළියෙහි ආයේ ය. මෙහි අතීතං අනාගතං පච්චුප්පන්නං යන පදත්‍රයයෙන් කියනුයේ අතීතානා-ගතප්‍රත්‍යුත්පන්න වූ චක්ඛුරාදිවස්තු රූප හා රූපාදිවිෂයරූප, එසේ කාල-භෙදයෙන් සර්වඥතාඥනයට විෂය වන බව ය.

''එක්වූ වෙව රූපා ව එවං තං සබ්බං ජානාති ති = සබ්බඤ්ඤුතඤාණං පෙ - මනෝ වෙව ධම්මා ව එවං තං සබ්බං ජානාතීති = සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථීති = අනාවරණඤාණං'' යනු ද ආයේ ඔවුන් ස්වරූප විසින් දක්වනු සඳහා ය. චක්ඛු-සොත-ඝාණ-ජිව්හා කාය-මන යන වස්තුරූප හා රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම යන විෂයරූප ඔවුන්ගේ ස්වභාව විසින් දනීම සර්වඥතාඥනැ යි කියන ලදී.

''යාවතා අනිච්චට්ඨං දුක්ඛට්ඨංඅනත්තට්ඨං තං සබ්බං ජානාතීති = සබ්බඤ්ඤුතඤාණං'' රූපවෙදනාදිස්කන්ධපංචකය පිළිබඳ අනිත්‍ය - දුඃඛ-අනාත්ම-තත්ත්වයන්, උන් පිළිබඳ අනිත්‍යාදිආකාරයන් දනීම සර්වඥතා ඥනැ යි කියන ලදී. විස්තර ග්‍රන්ථාන්තරයෙන් දන්නේ ය.

සර්වඥතාඥනය ආවර්ජනාප්‍රතිබඛ බැවින් මොහුට ආවරණයෙක් නැත්තේ අනාවරණඤාණ නම් වේ. සර්වඥතාඥනය හා සමගතික බැවින් ඒ හා ම අනාවරණඤාණය දක්වන ලද්දේ ය. ධර්ම විසින් තත්ත්ව විසින් මේ දෙකෙහි විශෙෂයෙක් නැත්තේ ය. සර්වඥතාඥනය කිසි ධර්මයකින් කිසි පුද්ගලයකු විසින් ආවරණ කරන්නට අවුරන්නට නො හැකි බැවින් අනාවරණඤාණැ යි කියනු ලැබේ. ඇතැම් කෙනෙක් සර්වඥතාඥානය සර්වාලම්බනික බැවින් මනොවිඤ්ඤාණය වැනි ය යි ද, ඒ මේ සකලධර්ම-විෂයයෙහි අප්‍රතිහත හෙයින් කිසිවෙක නො ද හැපෙන බැවින් අනාවර-ණැයි ද කියත්.

"යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යඅතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනෝ තෙ ධම්මා" යනු බුදුවදනින් සර්වඥතාඥානයාගේ මහත්ත්වය හා ඥෙය්‍යධර්මයන්ගේ මහත්ත්වය පැහැදිලි වන්නේ ය. දත යුතු දහම් යම් පමණ වේ නම්, ඥානය ද ඒ පමණ වේ. ඥානය යම් පමණ වේ නම්, දත යුතු දහම් ද ඒ පමණ වේ. ඥානය, දත යුතු දහම් කෙළවර කොට සිටියේ ය. දත යුතු දහම්, ඥානය කෙළවර කොට සිටියේ ය. දත යුතු දහම් ඉක්මවා ඥානය නො පවත්නේ ය. ඥානය ඉක්මවා ගිය ඥෙය්‍යපථයෙක් නැත්තේ ය. ඥෙය්‍ය-ඥාන දෙක උනුන් කෙළවර කොට පවත්නේ ය.

මැනැවින් පියවෙන උඩු යටි දෙ පියන, යට පියන උඩ පියනත් උඩ පියන යටපියනත් ඉක්මවා නො ගොස් උනුන් කෙළවර කොට පවත්නා සේ ඥෙය්‍ය-ඥාන දෙක උනුන් කෙළවර කොට සිටියේ ය.

මෙයින් දැක් වෙනුයේ ද කාමරූපාරූපලොකයන්හි ලැබෙන තාක් සඞ්ඛත ධර්ම හා ලොකයෙන් බැහැර ලැබිය හැකි අසඞ්ඛතධර්ම හා එකතුක් නො හැර බුදුනුවණට විෂය වන බව ය. දත යුතු දේ ඇත්තේ බුදුනුවණ පමණට ය. බුදුනුවණ දත යුතු දේ පමණට ඇත්තේ ය. එකිනෙකට වැඩි බවෙක් මෙහි නැත්තේ ය. මේ නුවණ 'සමන්තචක්ඛු' යි ද හඳුන්වනු ලැබේ. "සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤාණං" යනු දෙසනා ය. කාමාවචර බැවින් ලෞකිකය. මාර්ගඵල හා නො යෙදෙන්නේ ලොකොත්තර නො වේ.

පුන ගෙහං න කාහසි = නැවත (මට) ගෙයක් නො කරන්නෙහි.

පංචස්කන්ධය උපද වන තෘෂ්ණාව-මූලොච්ඡින්න කළ බැවින් නැවත මට සසර ඉපැත්මෙක් නො වන්නේ ය. සසර ඉපැත්මට කරුණු වන කුශලාකුශලකර්මයන්ගේ හට ගැනීමෙක් නො වන්නේ ය. පංචස්කන්ධයෙක් නැවත පහළ නො වන්නේ ය.

සබ්බා තෙ ඵාසුකා භග්ගා = තාගේ සියලු පරාළයෝ බිඳින ලදහ. සියලු ගෘහෝපකරණ බිඳ දමන ලදී.

ඵාසුකා නම්, රාගද්වෙෂමොහාදී වූ ඇති තාක් සියලු කෙලෙස් ය. ඔවුහු ආත්මභාවසඞ්ඛ්‍යාත ගෘහයෙහි පරාළ වෙති.

ගහකූටං විසංඛිතං = කැණිමඩල විසුරු වන ලදී.

මෙහි ගහකූටැ, යි කීවා අවිද්‍යා ය. අවිද්‍යාව, ආත්මභාවයට ගෙය කට කැණිමඩල වැනි ය. එහි පල සතරෙහි වූ පරාළඟ් කැණිමඩල හා සඞ්ඛන්ධ ව පවත්නේ ය. එමෙන් ආත්මභාවය සඞ්ඛන්ධි වූ රාගාදි-

ක්ලෙශධර්මයෝ අවිද්‍යාව හා සම්බන්ධ ව සිටියෝ ය, ඔවුහු අවිද්‍යා-හෙතුවෙන් ම උපදිත්. **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"** යනු දෙශනා ය. අවිද්‍යා නම්, දුඃඛාදීන්ගේ නො දැනීම ය. ඒ මේ අවිද්‍යා නම් වූ කැණිමඩල මෑ විසින් රහත්මගනුවණ නමැති පොරවින් පළා විසිරුවාපියන ලද්දේ ය.

විසඞ්ඛාරගතං චිත්තං = (මාගේ) සිත නිවණට පැමිණියේ ය, අරමුණු කිරීම වශයෙන් නිවණට පිවිසියේ ය.

"ඉදනි මම චිත්තං විසඞ්ඛාරං නිබ්බානං ආරම්මණකරණ වසෙන ගතං අනුපවිට්ඨං" යනු අටුවා ය. දැන් මාගේ සිත අසඞ්ඛතනිබ්බාණයට අරමුණු කිරීම වශයෙන් පැමිණියේ ය යන අරුති. නිවණ මට අවබොධ විය, නිවණ මාගේ හිතට වැටහුනි, යනු වදළ සැටියි.

තණ්හානං ඛයමජ්ඣගා = තෘෂ්ණාක්ෂයට පැමිණියෙමි. අර්හත්ඵලයට පැමිණියෙමි.

යමකට පැමිණ යමක් ඇසුරු කොට තෘෂ්ණාව මුළුමනින් ක්ෂය වූ නම්, නැවත නො හට ගන්නා පරිදි ගෙවී ගියා නම්, හේ තෘෂ්ණාක්ෂය නම්. අර්හත්ඵලය යන මෙයින් නිවණ ද කිය වේ. තෘෂ්ණාවගේ අත්‍යන්ත-නිරොධය මෙයින් වන බැවින් එසේ කියන ලද්ද් ය. අර්හත්මාර්ගයට පැමිණීම හා ම තෘෂ්ණාව නිරවශයෙන් නිරුඬ වන්නී ය.

උදනගාථාවස්තුව නිමි.

ධනවතකු හිඟන්නකු වීම

11 – 9

බරණැස් නුවර අසූ කෙළක් වස්තුව ඇති සිටුගෙයක් විය. ඒ ගෙට සිටියේ එක ම පුතෙකි. මේ මහත් ධනයට හිමියා වූයේ ද ඔහු ය. එහෙත් ඔහු කිසිත් ශිල්පශාස්ත්‍රයක් නො ද උගත්තේ ය. තුබූ ධනයෙහි මහත්කම බලා දෙ මවුපියෝ ඔහුට කිසිවක් නො ද ඉගැන්නූහ. එහෙයින් ඔහු එහි එනුවර වැසි අනික් ධනවත් තරුණයන් හා එක් ව නැටුම් ගැයුම් ගිකියුම් උගත්තේ ය. මවුපියන්ගේ කැමැත්ත වූයේ ද, තම පුතුට නැටුම් ඉගැන්වීමට ය. එහෙයින් ඔවුහු ද එයට අනුබල දුන්හ. බරණැස් නුවර ශිල්පශාස්ත්‍රයනට උත්පත්තිස්ථානය වූයේ, ධනවතුනට ද උත්පත්තිස්ථාන විය. මේ දවස එහි සැලකිය යුතු තවත් සිටුගෙයක් වී ය. එ ද පොහොසත් ය. මෙ තරම් ම ධනවත් ය. මේ ගෙයි ධනය අයත් වූයේ, එක් දරියකට ය. ඇයගේ මවුපියෝ ද ධනමදයෙන් මත් ව ඒ දරියටත් කිසිත් ශිල්පශාස්ත්‍රයක් නො ද ඉගැන්වූ හ. එහෙයින් ඕ තොමෝ ද නැටුම් ගී කියුම් උගත්තා ය. මේ සිටු කුමරු හා සිටු කුමරිය හා දෙ දෙන කරකාර බැඳුමේ නිසි වියට පැමිණියෝ, දෙ පස නෑයන්ගේ කැමැත්ත ලෙස ගෘහබන්ධනයට ඇතුළත් වූහ. ටික කලක් ගිය තැන මවුපියෝ කලුරිය කළහ. එයින් දෙ පැත්තක තිබූ ධනය එක් තැන් වී ය. පමණ විසින් ඒ ධනය දෙ අසූකෙළක් වූයේ ය.

සිටුපුත් තෙමේ දවසට තෙ විටක් රාජසේවාව පිණිස රජගෙට යයි. එ නුවරවැසි බෙබද්දෝ මේ සිටුපුත් බෙබද්දකු කොට තම බඩ පුරවා ගන්නට සිතූහ. ඔහු බැදි මස් හා ලුනු, ඇඳ සිටි රෙදිවලුවල ගැට ගසා, මූලපලාමුල් රැගෙණ සිටුපුත් එනු මග බලා සිටියහ. එ වෙලෙහි සිටුපුත් ගෙට එන්නට මග බැස එන්නේ ය. බෙබද්දෝ එන්නහු දැක රා, කට පුරා බී, ලුනු කටේ දමා මූලපලාමුලුත් කටින් ගෙණ ඉදිරියට පැමිණ, 'ආයය්‍ය! ඔබතුමෝ බොහෝ කලක් ජීවත් වනුවා, අපි ඔබතුමන්ට පින්, වැඩෙන්නට කන්නට බොන්නට ඇත්තෝ වන්නෙමු" යි මහහඬින් කියා සිටියහ. සිටුපුත් ඒ අසා පසුපස එන මෙහෙකරු අතින් "මොවුන් බොන්නේ මොනවාදැ?" යි ඇසී ය. "සුරාය" යි හෙතෙමේ කී ය. "මොනව ද ඒ, හොඳ දෙයක් ද"? යි සිටු පුත් ඇසූ විට "ඔව්! ආයය්‍ය! බොන්නට හොඳ දෙයක් මෙයට වඩා නැත, බොන්නන් විසින් බිය යුත්තේ සුරා ය, මේ බී විට ඕනෑම දෙයක් ඇඟට නො දැනෙන සේ කළ හැකි ය. ඇතේ වෙර වැඩේ, බඩගිනි නගින්නේ ය" යි මෙහෙකරු කී ය. එකල්හි සිටුපුත් තෙමේ ද! රා ගෙන්වා බොන්නට පටන් ගතු. බෙබද්දෝ සිටු පුත් රා බොන්නට පටන් ගත් බව දැන ඔහු පිරිවරා ගත්හ. කල් යත් බෙබද්දන්ගේ ගණන නැඟී ගියේ ය. රවේ සිටි බෙබද්දෝ සිටුපුත් වට කොට ගත්හ. ඔහු දිනපතා දෙසිය තුන්සිය යවා රා ගෙන්වා බී ය. උන් හිටි තැන මුදල් ගොඩ ගසා තබා, සිය දහස් ගණනින් වියදම් කෙළේ ය. කමිකට නැති වැඩට ධනය යෙදී ය. බෙබද්දන්ට සූදුකාරයන්ට වයන්නන්ට

ගයන්නන්ට නටන්නන්ට ඉමක් කොනක් නො තබා ධනය දුන්නේ ය. මෙසේ දෙත්, මෙසේ කරත්, වැඩි දවස් නො යා දී ම තමන්ට අයත් ව තුබූ අසූ කෝටියම වියදම් වී ගියේ ය. මුදල් තුබූ තැන කපුරු පිලිස්සූ තැන මස් විය. ඉක්බිති ඔහු බිරිඳ ලඟ තුබූ මුදල් ගෙන්වා ගත්තේ ය. එ ද ඒ ලෙසට ම වියදම් කෙළේ ය. එයින් ඔහුට කන්නට අඳින්නට මං නැති ව ගියේ ය. එකල්හි තමන්ට හා බිරිඳට මවුපිය උරුමයෙන් ලැබී තිබූ වතුපිටි ඉඩකඩම කුඹුරු ඇඳ පුටු මේස අල්මාරි පිහන් කෝප්ප හැළි වළං පැදුරු කොට්ට පාපිසි ඈ හැම දෙයක් විකුණා කෑයේ ය. අවසානයෙහි හුන් ගෙය ද විකිණි ගියේ ය. අඹුව හා මාගට බැස්සේ ය. ගෙවල පිළිකණු ගානේ නවාතැන් ගණිමින් කොළපත් තැටි ගෙණ හිඟමින් දිවි ගෙවී ය. නොයෙක් දෙන කා බැහැර ලන ඉදුල් යොයා කමින් කල් යැවී ය. විළි වසන්නට රෙදි කඩක් නො වී ය.

දවසෙක මේ දෙදෙන හිඟමින් පන්සලට ආහ. එහි විසූ කුඩා වහන්දෑ ඔවුන්ට වළඳා ඉතිරිව තිබූ ඉදුල් බත් දුන්හ. බුදුරජානන් වහන්සේ ඒ දැක සිනහ පහළ කළහ. එවිට ආනන්ද ස්ථවිරයන් වහන්සේ "ස්වාමීනි! කුමක් නිසා සිනා පහළ කළ සේක් ද?" යි උන් වහන්සේගෙන් ඇසූහ. "ආනන්ද! බලන්න, මේ තුවර කෝටි දෙකක් මුදල් ඇතිව සිට ඒ සියල්ල කා බී අවසන් කොට ගේ දොරට ඇඳුමට කැඹුමට පවා අහිමි ව මේ දෙ දෙන හිඟා කන සැටි, මේ මිනිහා මේ මහත් ධනය කා බී අවසන් නො කොට යම් කිසි කර්මාන්තයෙක යෙදී නම්, මොහුට මේ නුවර සිටු නායකයා වන්නට ඉඩ තුබුනේ ය. නැත, මේ සියල්ල හැර දමා තරුණ අවදියේ ම පැවිදි වී නම් රහත් වන්නට ඉඩ තුබුනේ ය. මැදියම් වියේ දී මේ මුදල් කර්මාන්තයෙක යෙදී නම් දෙවන සිටු වන්නට පිළිවන්කම තුබුනේ ය. එසේ නො කොට ඒ හැම හැර දමා පැවිදි වී නම් මොහු අනගැමි වන්නේ ය. මහලු වියේ දී එසේ කළේ නම් තෙවන සිටු වරයා හෝ පැවිදි වී නම් අඩු ගණනින් සකෘදගාමී හෝ වන්නට හැකියාව තුබුනේ ය. අඹු ද සෝවාන් වන්නී ය. දැන් මොහු ගිහි සැපතිනුත් පිරිහුනේ ය. පැවිදි සැපතිනුත් පිරිහුනේ ය. මෙසේ අන්තිමට පිරිහී ගොස් දිය සිඳී ගිය විලෙක පියාපත් වගුළ කොස්වා ළිහිණියක සේ වූයේ ය" යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

අවරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ.
අවරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං,
සෙන්ති චාපාතිඛිත්තාව පුරාණානි අනුත්ථුනන්ති.

බඹසර නො වැස යොවුන් වියෙහි ධනය නො ලැබ මසුන් නැති විලෙක (මඩ මතු වයෙහි හිඳ තැවෙන) කොස්වා ළිහිණියක සේ තැවෙත්.

බඹසර නො වැස තුරුණු වියෙහි ධනය නො ලැබ දුන්නෙන් විදුනා ලද ඊතල සේ පෙර කළ දේට සුසුම් ලමින් හොවිත්.

අවරිත්වා බ්‍රහ්මචරියං = බඹසර නො වැස. බ්‍රහ්මචරියවාසය නො කොට.

මහණකමට සුදුසු තරුණවයසෙහි දී පැවිදි ව ගෙණ මහණකම් නො කොට, යනු අදහස ය. මේ සසුන්හි මහණකමට අයත් ග්‍රන්ථධුර-විදර්-ශනාධුර පිළිබඳ හැම ක්‍රියාවකට ම බාල මහලු දෙ වයසට වඩා සුදුසු තරුණ වයසබව මෙයින් පැහැදිලි වේ.

බ්‍රහ්මචරිය නම්, ශ්‍රේෂ්ඨචර්‍යා ය. උසස් හැසිරීම ය. පැවැත්ම ය. නැත, බ්‍රහ්ම වූ බුද්ධාදිමහොත්තමයන්ගේ හැසිරීම ය.

දන-වෙය්‍යාවච්ච-සික්ඛාපද-බ්‍රහ්මවිහාර-ධම්මදෙසනා - මෙථුනවිරති-සදරසන්තොස - උපොසථ - අරියමග්ග - සාසන - අජ්ඣාසය-විරිය-යන අරුත්හි හෙන්නේ යි. 'බ්‍රහ්මචරිය' ශබ්දය.

''තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං තස්ස සුචිණ්ණස්ස අයං විපාකෝ ඉද්ධි ඵුති බලවිරියූපපත්ති ඉදං ච මෙ විර මහාවිමානං'' මෙහි යෙදී සිටී බ්‍රහ්මචරියශබ්දය දනය කියා ලන්නේ ය.

''තෙන පාණිකාමදදෙ තෙන පාණි මධුස්සවෝ,
තෙන මෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති,

මෙහි වෙයාවච්චයෙහි වැටේ. ''ඉදං බො තං භික්ඛවෙ! තිත්තිරි යං නාම බ්‍රහ්මචරියං අහොසි'' මෙහි ආයේ සික්ඛාපදයෙහි ය. ''තං බො පන පංචසිඛ! බ්‍රහ්මචරියං නෙව නිබ්බිදය න විරාගාය යාව දෙව බ්‍රහ්මලොකූපපත්තියා'' යන මෙහි බ්‍රහ්මවිහාරයන් කෙරෙහි වැටේ. ''එකස්මිං බ්‍රහ්මචරියස්මිං සහස්සං මච්චුභායිනෝ'' මෙහි ධම්මදෙසනාවෙහි ආයේ ය. ''පරෙ අබ්‍රහ්මචාරි භවිස්සන්ති මයමෙත්ථ බ්‍රහ්මචාරි භවිස්සාම'' මෙහි ආයේ මෙථුනවිරතියෙහි ය. ''මයං ච භරියා නාතික්කමාම අමිහෙ ච භරියා නාතික්කමන්ති අඤ්ඤත්‍ර තාහි බ්‍රහ්මචරියං චරාම, තස්මා හි අම්හාකං සියරෙ'' මෙහි සදරසන්තොසයෙහි ආයේ ය. ''නීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියෙ උපපජ්ජති මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣන්ති'' මෙහි උපොසථයෙහි ආයේ ය. ''ඉදං බො පන පංචසිඛ බ්‍රහ්මචරියං එකන්තනිබ්බිදය විරාගාය-පෙ-අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො'' මෙහි අරියමග්ගයෙහි ආයේ ය. ''තයිදං බ්‍රහ්මචරියං ඉඛං චෙව ඵීතං ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාවදෙව මනුස්සෙහි සුප්පකාසිතං'' මෙහි සාසනයෙහි ආයේ ය. ''අපි අතරමානානං එලාසාව සම්පජ්ජති විපක්ක-බ්‍රහ්මචරියොස්මිං එවං ජානාහි ගාමණි'' මෙහි අජ්ඣාසයෙහි ආයේ ය. ''අභිජානාමි බො පනාහං සාරිපුත්ත, චතුරඞ්ගසමන්නාගතං බ්‍රහ්මචරියං චරිත්වා තපස්සි සුදං හොමි පරමතපස්සි'' මෙහි වීර්‍යයෙහි ආයේ ය.

මෙහිලා ගැණෙනුයේ එකාසන-එකසෙය්‍යා-මෙථුනවිරති ආදී වූ ශාසන බ්‍රහ්මචර්‍යය නො වේ. ලොකොත්තරශීලසමාධිප්‍රඥා නම් වූ මාර්ගබ්‍රහ්ම-චර්‍යයත් නො වේ.

ඉතාඋතුම් බැවින් නිවණ බ්‍රහ්ම නම්. ශීල සමාධි ප්‍රඥා යන ශික්ෂා තුණ පවත්නේ නිවන් පිණිස ය. එහෙයින් බ්‍රහ්ම නම් වූ නිර්වාණය පිණිස හැසිරිය යුතු වූ හික්මිය යුතු වූ ඒ ශික්ෂා තුණ බ්‍රහ්මචර්‍ය්‍ය නම්. ශාසන-බ්‍රහ්මචර්‍ය්‍ය යනුත් ඒ ම ය යි කිව ද අර්ථ විරුද්ධ නො වේ. බ්‍රහ්මචරියා ශබ්දයෙන් සාසන-මග්ගබ්‍රහ්මචරිය දෙක ම ගැණෙන බැවින් හා එ දෙකම නිවන් පිණිස පවත්නා බැවින් හා.

ලෞකික වූ ශීලසමාධිප්‍රඥාවෝ සාසනබ්‍රහ්මචරිය නම්. ලොකොත්-තරමාර්ගසම්ප්‍රයුක්ත වූ ශීලසමාධිප්‍රඥාවෝ මග්ගබ්‍රහ්මචරිය නම්. පරියත්ති පටිපත්තිසාසනයෝ සාසනබ්‍රහ්මචරිය නම්. පටිවෙධ සාසනය මග්ගබ්‍රහ්ම චරිය නම්.

මෙය මෙසේ දෙපරිද්දෙකින් විභාගයට ගිය ද මෙථුනවිරති-සමණධම්ම -සාසන-මග්ග යි සිවු පරිද්දෙකින් ද විභාගයට යන්නේ ය. "බ්‍රහ්මචරියං නාම මෙථුනවිරති සමණධම්ම සාසන මග්ගානං ඉදං අධිවචනං" යනු අටුවා ය. එහෙයින් ප්‍රකෘතිශීල මාත්‍රයෙන් වුව ද සිල්වත් ගිහියාගේ මෙවුන්දමින් වැළැක්ම බ්‍රහ්මචරිය යි කිය හැකි ය.

අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය
අඞ්ගාරකාසුං ජලිතංව විඤ්ඤූ,
අසම්භුනන්තෝ පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං නාතික්කමෙය්‍ය,

යන මේ ගාථාධර්මය එහි සාධක වේ. "නුවණැති ගිහියා දිලිසෙන අඟුරු වළක් සේ සිතා මෛථුනසෙවනය (ස්ත්‍රීසෙවනය) දුරුකරන්නේ ය. ඉදින් එසේ නො හැක්කේ නම්, පරස්ත්‍රීසෙවනයෙන් වත් වළකින්නේ ය" යනු එහි අදහස ය.

මෛථුන යතෙකි. ඒ සතින් හා අසධර්මසෙවනයෙන් වැළැක්ම මෛථුනවිරති නම්. ඒ මේ මෛථුනවිරතිය ස්ත්‍රීසෙවනයෙන් වැළැක්ම බ්‍රහ්මචරිය නම්. කාමාස්වාදයෙන් ස්ත්‍රීශරීරස්පර්ශය විඳීම, ස්ත්‍රීන් හා සිනාසීම, ඇසින් ඇස බැලීම, ස්ත්‍රීන්ගේ කතා ගීකීම් ආදී වූ ශබ්ද ශ්‍රවණය, ස්ත්‍රීන් හා පෙර කළ කෙළි සෙල්ලම් සිහිකිරීම, පස්කම් සැප විඳුනා ගැහැ-ටියකු දැක එහි ඇලීම, දිව්‍යනිකායයක් පතා බඹසර හැසිරීම යන මේ ය ඒ සතය. බ්‍රහ්මචරිය කැමැත්තහු විසින් මේ සතින් හා ස්ත්‍රීසම්භොගයෙන් මුළු-මනින්ම වැළකිය යුතු ය.

අප බුදුරජුන් දවස රජගහ නුවර කපිල නම බමුණෙක් වී ය. ඔහුට පිප්ඵලී නම පුතෙක් සිටියේ ය. ඔහුගේ වයස අවුරුදු විස්සෙකි. පිණුත්-තේ ය. මවුපියෝ කසාදයක් බැඳ දෙන්නට සිතා දකුම්කලු තරුණියක ඇසායන්නට බමුණන් අට දෙනකු ඒ ඒ පළාත්වලට යැවූහ. බමුණෝ

තැගිබෝග ගෙණ සාගලනුවරට ගියහ. එතුවර කොසියවංශය ඇති බමුණකුහට සොළොස් වයසැති සිත් ගත් රූසපුවෙන් යුත් දුවක් වූ ය. නමින් භද්‍රකාපිලානී නම් වූවා ය. පිණැත්තී ය. බමුණෝ එහි ගොස් සියලු වගතුග කියා කොසිය බමුණු ගිවිස්වා ගත්හ. "දරියක් ලදැ" යි කපිල බමුණාහට ලියුමක් ද යැවූහ. පිප්ඵලි බමුණුකුමාර තෙමේ මෙය දත්තේ ය. දැන ලියුමක් ලියා භද්‍රකාපිලනියට යැවී ය. මේ ඒ ලියුම.

රජගහනුවර කපිල බමුණු නිවසේ දී ය.

කරුණාවෙන් ලියමි.

පින්වත් භද්‍රා!

මාගේ මවුපියෝ ඔබ මට බිරිය කොට ගෙණ දෙන්නට කටයුතු පිළියෙල කරත්. ඔබගේ මවුපියන් ද එයට සතුට දී ඇති බව මට දැන ගන්නට ලැබිනා. එහෙත් මම එයට නො කැමැත්තේ වෙමි. මම ගිහිකම් කරන්නට බලාපොරොත්තු නො වෙමි. එහෙයින් භද්‍රා තමන්ගේ කුලයට වස්තුවට හැඩ රූවට වයසට ගැළපෙන ස්වාමි පුත්‍රයකු හා දිගු යන්න. තමන්ට කැපෙන භිමියකු සොයා ගන්න. මම තව ටික දිනකින් මේ සියල්ල හැරදමා මහණවන්නෙමි. මා හා අමතාපයක් ඇති කර නො ගන්න. සැපවත් වේ වා!

මෙයට, කාරුණික

පිප්ඵලි.

පිප්ඵලි, ලියා යැවූ මේ ලියුම ලැබෙන්නට කලින් භද්‍රාද්‍ද ලියුමක් ලියා පිප්ඵලිට යැවූ ය. මේ ඒ ලියුම.

සාගල නුවර කොසිය බමුණු ගෙදර දී ය.

දිගාසිරි ලැබේවා.

පින්වත!

ඔබගේ මවුපියන් මා ගැණ සොයන්නට මෙහි එවූ බමුණෝ මාගේ මවුපියන් හා කතා කොට තැගිබෝගත් දී මා ඔබගේ බිරිය කරන්නට නියම කරගෙණ ගියහ. එහෙත් මම මේ දිවියෙහි දී කිසිවකුගේ බිරිය වන්නට නො කැමැත්තී වෙමි. දිග කැමට මාගේ බලාපොරොත්තුවක් නැත. මා ගැණ ඔබගේ බලාපොරොත්තුවක් වේ නම් එය හැරදමනු මැනවි.

මෙයට, මෙත්සිතැති

භද්‍රා.

ලියුම් ගෙණ ගියෝ අතරමග දී මුණ ගැසී කතා කොට ලියුම් කඩා බැලූහ. ලියුම් දෙක ඔවුන්ගේ සිත් නො ගත්තේ ය. එහෙයින් ඔවුහු ඒ ලියුම් දෙක ඉරා දමා වෙන ලියුම් දෙකක් ලියා ඒ දෙපලට යැවූහ. මේ ඒ ලියුම් දෙක.

රජගහනුවර කපිල බමුණු නිවසේ දී ය.

සෙත් වේවා.
ප්‍රිය භද්‍රා!

ඔබ මාගේ ධර්මපත්නිය වන්නට යැම අප පෙර කළ පිණෙක විපාකයකැ යි මාගේ පිළිගැණීම ය. ඒ එසේ වීම අප දෙපලගේ ඉදිරි ජීවිත සඵල වීමට හෙතු වනු ඇත. මම ඔබ බිරිය කර ගන්නට කැමැත්තෙමි. ඒ එසේ වේවා.

මෙයට, කාරුණික
පිප්ඵලී.

සාගල නුවර කොසිය බමුණු ගෙදර දී ය.

දිගාසිරි ලැබේවා,
මා ප්‍රිය හිමියෙනි!

ඔබගේ හා මාගේ හා අඹුසැමියන් වශයෙන් එක්වීම ඉතා උසස් කොට සැලකිය හැකි ය. අපගේ මවුපියෝ මා ඔබගේ බිරිඳ වනු දක්මට කැමැත්තෙන් සිටිති. ඔබගේ මවුපියන්ගේ කැමැත්තත් එසේ ය යි සිතමි. මම ද ඔබ හා එක් ව ජීවත් වීමට කැමැත්තෙමි.

මෙයට, විනීත
භද්‍රා.

දෙපස නැයෝ මඟුල් කටයුතු පිළියෙල කළහ. මේ දෙපල කෙරෙහි මෙ පිණිස නැයන්ගේ ඇවිවිල්ල හා ඉක්මන්කම ඉලවත් විය. එහෙයින් කල් නො යාදී ම කසාද බැඳුම සිදු විය. එහෙත් ඒ දෙ දෙන අඹුසැමියන් වශයෙන් ජීවත් නො වූහ. එක දවසකුත් ඒ දෙදෙන එක් ව ගොස් නිදි නො ගත්හ. වෙන් වෙන් ව ගොස් නිදති. එක ඇඳෙහි නිදත්, දෙ දෙන අතර මල්දම් රැසක් තබා නිදන පෙදෙස් වෙන් කොට ගණිත්. නො නිද ම මුළු රෑය ගෙවති. කිසිවිටෙක සිනාසීම් පමණකුත් නැත. ඔවුහු අනික් පහත් මිනිසුන් සේ ලොකාමිසයෙහි නො ගැලී ඒ හා නො හැනී ගිහිගෙයි වසන්නෝ ම වූහ. ටික දිනක් ගිය අතර දෙපස ම මවුපියෝ මැරි ගියහ. ඔවුන් මළ පසු මේ දෙ දෙන සමාන අදහස් ඇති ව "මුළු තුන් ලොව ගිනි ගෙණ දැවෙන තණපැලක් වැනි ය. මෙහි කිසිත් සැනසීමෙක් නැත, මෙයින් සසරගමන දිග් ගැසෙන්නේ ය. අපි මහණ වෙමු" යි නියම කොට ගෙණ කඩපිළෙන් කසාවන් රෙදිත් මැටිපා දෙකකුත් ගෙන්වා ගෙණ කෙස් බා හැර "ලෝකයෙහි යම රහත් කෙනෙක් වෙත් නම්, අපේ මේ පැවිද්ද ඒ උතුමන් නිසා ය" යි පැවිදිවෙස් ගෙණ මැටි පා, කර ලග්ගවා ඛමුණු ගෙයින් නික්ම ගියහ. පිප්ඵලී පැවිද්ද ඉදිරියෙහි යයි. යන්නහුට දෙ පා හත්දියක් මුණ ගැසිනි. ඔහු එ තැන නැවතී සිට "භද්‍රා අප දෙ දෙනා මෙසේ එක් ව ගමන් කිරීම ලොකාපවාදයට කරුණු වේ. රට වැස්සෝ අප

කෙරෙහි නුපුරු අදහස් උපදවති, එයින් ඔවුනට පව් පිරෙන්නේ ය. එහෙ-යින් ඔබ මේ දෙ මඟින් එක් මගෙක යන්න මම එක් මගෙක යන්නෙමි'' යි කී ය. ''ආයුෂ්‍යයන් වහන්ස! ඒ එසේ ය, පැවිද්දන්ට මාගම මලයෙකි. අප එක් ව ගමන් කරණ විට දකින්නෝ අපට දෙස් කියති'' යි කියා භද්‍රා තොමෝ ''අපි වෙන් වෙමු'' යි තෙ වරක් පැදකුණු කොට වැඳ, පිට නො පා පස්සෙන් පස්සට ගොස් සතර විටක් හිස බිම තබා වැඳ දෙහොත් මුදුන් දී සිට ''කල්පලක්ෂයක් පමණ කල් පැවැති අපගේ මිත්‍රසන්ථවය මෙයින් හමාර වන්නේ ය. ඔබ වහන්සේ දකුණු පස මඟින් වඩිනු මැනවි. මම වම්පස මඟින් යමි'' යි මගට බැස්සා ය. එකෙණෙහි පොළොව දෙදරා ගියා ය. හඬ නගන්නට වන. අහස හෙණ හඬ නැංගේ ය. සක්වළගල හඬ නැගුයේ ය. මේ වේලෙහි මාගේ ස්වාමිදරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩ හුන් සේක් පොළෝ හඬ අසා ආවර්ජනා කරණ සේක් මොවුන් දැක පා සිවුරු ගෙණ එකලා ව ම තුන් ගවු මග ගෙවා ඉදිරියට ගොස් රජගහනුවරට හා නාලන්දවට හා අතර පිහිටි බහුපුත්‍රික නම් නුගගස මුල වැඩහුන් සේක. එ මග එන පිප්ඵලී තෙමේ එහි වැඩ හුන් බුදුරජුන් දැක එළඹ වැඳ උන් වහන්සේගෙන් ලැබූ අවවාද ඇත්තේ උපසපන් වී අටවන දිනයෙහි රහත් විය. භද්‍රා තොමෝ මෙහෙණවරකට ගියා එහි දී රහත් වූවා ය. මොවුහු දෙදෙන රහත් වූවෝ මෙථුනවිරති නම් වූ බ්‍රහ්මචයර්‍යයෙහි අනුභාවයෙනි. මෙය මෙසේ අනුභාවය ඇති කල්හි, මෙයට වඩා හැම ලෙසකින් උත්තරිතර වූ මහණදම් පිරීම් ආදී වූ බඹසර හැසුරුමෙහි ලා කුමන කතා ද,

ශ්‍රමණධර්මය, මෛථුනධර්මසමායොගයෙන් ඉතා ඈත් ව මාගමුන් නො දැක ම රැකිය යුතු තරම් උසස් ගුණයෙකි. එයට අයත් හැම හැසිරි-මෙක් ම මහණකමැ යි ගැණේ. මහණකම බ්‍රහ්මචරිය යි කීයේ, එය සදෙවකලොකයාගේ පරමාභිවාදනයට පරමපූජාවට කරුණු වන උසස් හැසිරීමක් බැවිනි.

ශීලසමාධිප්‍රඥ යන ශික්ෂාත්‍රයයෙන් සංගෘහිත වූ සියලු බුදුසසුන ම සාසනබ්‍රහ්මචරිය නම් වේ. ''සකලසාසනබ්‍රහ්මචරියං නාම අධි සීලසික්-ඛාදිසික්ඛාත්තයසංගහං අනවසෙසං සත්ථුසාසනභූතං සෙට්ඨචරියං'' යනු ආගමකථා ය.

''කතමං ච භික්ඛවෙ! බ්‍රහ්මචරියං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙස්‍යථිදං, සම්මාදිට්ඨි-පෙ-සම්මාසමාධි යන මෙයින් ආර්ය-මාර්ගය මග්ගබ්‍රහ්මචරිය යි වදළ සේක බුදුරජහු.

අන් හැම බ්‍රහ්මචරියකට වඩා මෙය ප්‍රණීත ය. උතුම් ය, එසේ කියනු චතුර්විධ මාර්ගඵලයන් අවසන් කොට සිටී බැවිනි. මණ්ඩපෙය්‍ය කථාවෙහි මෙය බ්‍රහ්මරිචයමණ්ඩ යි ආයේ ය. ''බ්‍රහ්මචරිය මණ්ඩොතී

මග්ගබ්‍රහ්මචරියමෙව මණ්ඩෝ'' යනු අටුවා ය. පිරිසුන් බැවින් මලරහිත බැවින් වෙසෙසින් පහන් බැවින් මග්ගබ්‍රහ්මචරිය ම, බ්‍රහ්මචරියමණ්ඩ යි ද; පිය යුතු බැවින් සෙවිය යුතු බැවින් හැසිරිය යුතු බැවින් මණ්ඩපෙය්‍ය යි ද කියනු ලැබේ. යමක් බිමෙන් විසංඥව ගියෝ සිය රෙදිකඩටත් අස්වාමික වේ නම්, පහත් වූව ද එය නො පිය යුතු ය. බ්‍රහ්මචරිය ය එසේ නො වේ: එය පහන් බැවින් මණ්ඩ නම්. හිතසුව එළවන බැවින් පෙය්‍ය නම්: එහෙයින් පිය යුතු ය. හැසිරිය යුතු ය. හිතසැප එළ වන්නේ ය.

අලඞ්ඛා යොබ්බනෙ ධනං = යොවුන් වියෙහි ධනය නො ලැබ.

තරුණවයස ධන සැපයීමට ඉතා සුදුසු කාලය බව මෙයින් පැහැදිලි ය. එහෙයින් ඒ පිණිස මුල සිට ශිල්පශාස්ත්‍රාදිය උගත යුතු ය. මව්පියන් විසින් දු පුතුන්ගේ මතු දිවිය වැඩ වන ලෙසට ශිල්පශාස්ත්‍රාදිය උගන්වා ලිය යුතු ය. සදශ්‍රය ලබා දිය යුතු ය. ශිල්ප ශාස්ත්‍රාදිය උගැන්මෙන් තොර ව වැඩුනු දුපුතුනට ධනය රැස්කොට දී ම ඔවුන්ගේ විපතට හෙතු වන්නේ ය. එය දයාදයෙක් නො වේ. දයාදය නම්, ශිල්පශාස්ත්‍රාදියෙහි උගැන්මක් ලබාදීම ය. උගැන්මෙන් හා සදශ්‍රයෙන් වැඩුනු ඔවුහු දෙලොව ජීවිතය ම සඵල කර ගන්නෝ ය. මේ යුතුකම නො සලකන්නා වූ මව්පියෝ වරද කරුවෝ ය. දු පුතුන් යොවුන් වියට පැමිණෙත් ම ඔවුහු ධන සැපයීමෙහි, සැපයූ ධනය නිසි තැන යෙදියෙහි රැකීමෙහි සමතුන් කළ යුතු ය. යොවුන් විය ම ධන සැපයීමට සුදුසු වේ. යොබ්බන නම්, තරුණ වයස ය. ''යුවස්ස භාවෙ = යොබ්බනං''

ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ = මසුන් නැති විලෙක (මඩ මතුයෙහි හිඳ නැවෙන) කොස්වාළිහිණියන් සේ නැවෙත්.

මහණකමට සුදුසු වූ තරුණවයසෙහි පැවිදි ව බ්‍රහ්මචරියවාසය නො කොට, නුපන් භොගයන් උපද වන්නට උපන් භොගයන් රැක ගන්නට අපහොසත් තරුණකාලයෙහි ධනලාභයට හෙතු වූ ගොවිකම් ආදිය නො කොට පමා බැවින් කල් යවන අඳුජනයෝ දිය සිඳී ගිය බැවින් මසුන් නැති විලෙක මඩ මතුයෙහි හිඳ නැවෙන පියාපත් ගැලවී වැටුනු කොස්වාළිහිණියන් සේ නැවෙත්.

අපරිත්වා බ්‍රහ්මචරියං = බඹසර නො වැස.

අලඞ්ඛා යොබ්බනෙ ධනං = යොවුන් වියෙහි ධනය නො ලැබ

සෙන්ති චාපාතිඛිත්තාව පුරාණානි අනුත්ථුනං = දුන්නෙන් විදිනා ලද ඊතල සේ පෙර කළ දෙයට සුසුම් ලමින් හොවිත්.

තරුණ වයසෙහි බඹසර නො වැස ධනය නො ලැබ පමා බැවින් කල් යවන මුග්ධජනයෝ දුන්නෙන් විදිනා ලද, වෙගය ඇති තාක් ගොස්, වෙගය සිදී ගිය කල්හි වෙනෙහි වැටුණු ඊතල ඇර ගන්නට කෙනකු නැති කල එහි ම තිබී නස්නා සේ තුන් වයස ම ඉක්මවා සිටියෝ "පෙර මෙසේ කෑම්හ, මෙසේ පුම්හ, මෙසේ ඇන්දෙමු මෙසේ පැලන්දෙමු" යන ඇ ලෙසින් පෙර කළ කෑම් පීම් නැටුම් ගැයුම් ආදියට සුසුම් ලමින් ශොක කරමින් හොවිත්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

මහාධනශ්‍රෙෂ්ඨිවස්තුව නිමි.

සකලජනධර්මාර්ථසඞ්ග්‍රහාභිලාෂී සණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිරයන් කළ සඩර්මසාගරය නම් වූ ධර්මපද වර්ණනාවෙහි ජරාවර්ගාත්මක එකාදශ තරඞ්ගය මෙතෙකින් නිමියේ ය.

ආතමවගීය

ද්වාදශතරඞ්ගීයකථාසූචි

වස්තුව

1 බොධිරාජකුමාරයන්ට දුපුතුන් නො ලැබීමේ හේතුව
2 උපනන්ද තෙරුන් සිවුපසය සැපයූ සැටි.
3 පධානික තෙරුන්ගේ බණ
4 කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ
5 මහාකාලයාට වූ විපත
6 දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ
7 දෙවදත්ත ස්ථවිරයන් කළ ප්‍රකාශයෙක්
8 කාල ස්ථවිරයන් වහන්සේ
9 චූලකාල උපාසක කැන
10 අත්තදත්ත ස්ථවිරයන් වහන්සේ

බොධිරාජ කුමාරයන්ට දූ පුතුන් නො ලැබීමේ හෙතුව

12 - 1

බොධිරාජ කුමාරයා කර වූ ප්‍රාසාදය කොකනද නමින් පතළේ ය. එය එද මිහි පිට තිබූ අන් හැම ප්‍රාසාදයන් අබිබවා සිටියේ ය. බලන්නවුන්ට එය පෙණෙනුයේ අහස ඉඟිල්ලෙන්නක් සේ ය. එද වඩුකර්මාන්තයෙහි අතිශයදක්ෂ වූ වඩුවා ලවා එය කර වී ය. බොධි රාජ කුමාර තෙමේ වඩුවා ගෙන්වා, "තමුසේ මෙයට කලින් මේ බදු පහයක් කර තිබෙ ද, නැත, තා කළි පළමු පහය මේ ද?" යි ඇසි ය, "දෙවයන් වහන්ස! එසේ ය, මා කළ පළමු පහය මේ ය" යි ඔහු කී ය. එවිට කුමාර තෙමේ "මින් පසු මොහු අනෙකකු උදෙසා මෙබදු පහයක් කළේ නම්, මාගේ මේ පහයෙහි වටිනා කම පහත වැටෙන්නේ ය. එහෙයින් අද හෙට ම මොහු මරා දැමිය යුතු ය. නැත, අන් පා හෝ කපා දැමිය යුතු ය. ඇස් හෝ උදුරා දැමිය යුතු ය. එවිට මොහුට අන් පහයක් කරන්නට නො පිළිවනැ" යි සිතා තම යහළු වූ සඤ්ජීකා පුත්‍රයාහට ඒ බව කී ය. ඔහු එයින් තැති ගෙණ "මේ රටේ ඉන්නා දක්ෂ වඩුවා මේ තෙමේ ය. කුමාරයා මොහු මරවනු ඒකාන්ත බව පෙණේ, මොහු මැරිම රටට බලවත් පාඩුවෙකි. මා දැන දැන මොහු මරන්නට ඉඩ තැබීම නො සුදුසු ය. මොහු මරණයෙන් ගැළවිය යුතු ය" යි සිතා වඩුවා වෙත ගියේ ය. ගොස් "පහයේ වැඩ අවසානද" යි ඇසි ය. "අවසානය" යි වඩුවා කී ය. එවිට සඤ්ජික තෙමේ "තමුසේ මරවන්නට කුමාරයාගේ අදහසක් තිබෙ. එයින් ගැලවී ගන්නා සැටියක් සිතා ගන්නැ" යි දන් වී ය. වඩු තෙමේ "මෙය මට දන්වීමෙන් මහත්මයා කළේ ලොකු උපකාරයෙක්, වේවා, මේ ගැණ කරණ සැටි මම දනිමි" යි නිහඬ විය.

එක් දවසක් කුමාර තෙමේ වඩුවා වෙත ගොස් "පහයෙහි වැඩ අවසාන ද" යි ඇසි ය. එවිට "දෙවයන් වහන්ස! වැඩ අවසන් නැත. කළ හරියට වඩා කරන්නට ඉතිරි හරිය බොහෝ ය" යි කී ය. "ඉතිරි වැඩ මොනවාද?" යි ඇසූ විට "දෙවයන් වහන්ස, සොයා බලා කියන්නම, තව ලී කොටන් කිහිපයක් වුවමනා ය. ඒවා ගෙන්වා දෙන්නැ" යි වඩුවා දන්වා සිටියේ ය. "වුවමනා ලී කොටන් මොනවා ද?" යි කුමරු ඇසූවිට "වඩා වටිනා හර ඇකි ලී දැන් වුවමනා නැත. දැනට වුවමනා කරන්නේ අරටු නැති සැහැල්ලු ලී" යි කී විට ඔහු ඒවා ගෙන්වා දුන්නේ ය. ඉක්බිති වඩුවා "දෙවයන් වහන්ස! මින් පසු ඔබ වහන්සේ මෙහි නො ආ යුතු ය. කරන්නට ඉතිරි ව ඇත්තේ ඉතා සියුම් කැටයම් ය. ඒවා කතා කර කර කළ හැකි නො වේ. කා වත් බලා සිටිය දී ඒ කරණු අපහසු ය, හිත එක් තැන් කොට ගෙණ ඒ කළ යුතු ය. එන්නට ඉඩ දිය යුත්තේ කැමි ටික ගෙණ

එන අපේ පවුලට පමණ ය. එහෙයින් වැඩ අවසන් කොට මා දන්වන තුරු වැඩපලට යාපත් නො වනු මැනවැ'' යි කී ය. කුමරු ද එය පිළි ගත්තේ ය.

ඉක්බිති වඩු තෙමේ මඩුවෙහි ම කාමරයකට වැද ලී ශුද්ධ කොට කපා කොටා අඹු දරුවන් ද ඇතුළත හිඳුවා ගෙණ යෑ හැකි තරමේ අහස්යානයක් සාදා නිම කොට කැම ගෙණ ආ අඹුට ''ගෙයි ඇති විකිණිය හැකි සියලු බඩු මුට්ටු විකුණා දමා, රන් රිදී මුතු මැණික් තිබෙන හරියකුත් ගෙණ එව'' යි කීයේ ය. රජකුමරුද වඩුවා ගෙයින් එලියට නො බස්නා බැවින් ගෙය වට කොට රැකවල් තැබුයේ ය. වඩුවා යන්ත්‍රයේ සියලු වැඩ අවසන් කොට දූ පුතුන් සමග අඹු ගෙන්වා ගෙණ උදය කා බී අඹුදරුවන් අහස් යානයට නංවා ජනෙල් කවුළුවකින් එලියට බැස අහසට නැග ගියේ ය.

''දෙවයන් වහන්ස, අන්න, අන්න, වඩුරාළ පැන යා'' යි බොහෝ දෙන කෑ කෝ ගසමින් උඩ බලා සිටිය දී ම වඩු තෙමේ අහසින් ගොස් හිමාලයවනයෙහි බැස, නුවරක් ඉදි කොට එහි රජ විය. හේ කාෂ්ටවාහන නම් වූයේ ය. බොධිරාජ කුමාර තෙමේ ගෙ වැදීමේ මඩ්ගලය සඳහා බුදු රජුන් ආරාධනා කොට, පහය සිවුදෑ ගඳින් පිරිබඩ කොට, පළමු එලිපත සිට රෙදි පාවාඩ ඇතිර වූයේ ය. කුමරුට පුත්තු නැත. එහෙයින් ඔහු ''මට පුතෙක් හෝ දුවක් ලැබේ නම්, බුදුරජානන් වහන්සේ මේ පාවාඩ උඩින් වඩිනා සේකැ'' යි සිතමින් හුන්නේ ය. කුමරු බුදුරජානන් වහන්සේ ගෙට වැඩි කල්හි දණ බිම ඔබා වැඳ පාත්‍රය ගෙණ ''ස්වාමීන් වහන්සේ ගෙට වඩිනා සේක්වා'' යි ආරාධනා කෙළේ ය. එහෙත් උන් වහන්සේ ගෙට නො වැඩි සේක. නැවතත් ආරාධනා කෙළේ ය. එ වේ-ලෙහි උන්වහන්සේ අනඳ තෙරුන් දෙස බැලූහ. අනඳ තෙරණුවෝ බුදු රජුන් තමන් දෙස බැලූ බැල්මෙන් පාවාඩ උඩින් නො වඩිනා බව දැන ''පාවාඩ හකුළා දමන්න, බුදුරජානන් වහන්සේ පාවාඩ උඩින් නො වඩිනා සේක, උන්වහන්සේ පශ්චිම ජනතාව ගැණ බලන සේක. එහෙයින් පාවාඩ හකුළා දමන්නැ'' යි කීහ. රජකුමරු ද පාවාඩ හකුළුවා බුදුරජුන් ගෙට වැඩම කරවා වඩා හිඳුවා කැඳ අවුලුපතින් සතප්පා පසෙකට වී හිඳ වඳිමින් ''මම බුදුරජානන් වහන්සේගේ දායකයෙක් වෙමි. තෙ වරක් ම සරණ ගිය උපාසකයෙක්මි. එක් වරක් සරණ ගියෙම් මව්කුසේ දී ය. දෙවණ වර සරණ ගියෙම් ගැටවරකාලයේ ය. තෙවන වර සරණ ගියෙම් නුවණැති කාලයේ ය. එසේ වූ මා විසින් ඇතිර වූ පාවාඩ උඩින් බුදුරජානන් වහන්සේ නො වැඩි සේක. කුමක් නිසා බුදුරජානන් වහන්සේ එසේ කළ සේක් දැ'' යි ඇසී ය. එකල්හි උන්වහන්සේ ''කුමාරය! ඔබ කුමක් සිතා පාවාඩ ඇතිර වූ වහු දැ?'' යි ඇසූහ. ''ස්වාමීනි! මම පාවාඩ ඇතිර වූ යෙම් මට පුතෙක් හෝ දුවක් ලැබේ නම් බුදුරජානන් වහන්සේ පාවාඩ උඩින් වඩිනු ඇතැයි සිතා යි'' කී විට ''කුමාරය! මම ඒ නිසා ම පාවාඩ නො පා ගන්නට අදහස් කෙළෙමි'' යි උන් වහන්සේ වදළ සේක. ''ස්වාමීනි!

කිම, මම පුතකු හෝ දුවක නො ලබම් ද? මට ඒ පිණිස වාසනාවක් නො වේ ද යි?'' ඇසී ය. ''ඔව්, ඔබට ඒ පිණිස වාසනාවක් නැත, පුතෙක් හෝ දුවක් නො ලැබේ යි වදාළ විට ''කුමක් නිසා එසේ නො ලැබේ ද?'' යි ඇසී ය. ඔබ එක් ජාතියක දී අඹුව හා එක් ව මහාඅපරාධයක් කළහු ය. ඒ අපරාධය නිසා'' යි වදාළ කල්හි ''ස්වාමිනි! එය වදරණු මැනවැ'' යි ආරාධනා කෙළේ ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ ''කුමාරය! පෙර එක් ජාතියක සිය ගණනක් මිනිස්සු ලොකු නැවකින් මුදු ගියහ. නැව මුද මැද දී බිඳී ගියාය. එකල්හි ඔබ දෙ මහල්ලෝ පුවරුකඩක එල්ලී ගොඩබිමකට පැමිණියහු ය. නැවෙහි සිටි අන් හැම දෙන දියෙහි ගැලී නටහ. දෙ මහල්ලන් ගොඩ බට බිම, කුරුල්ලන්ගේ වාසභූමියක් වූ ය. එහි කුරුල්ලෝ අතුරු සිදුරු නැති ව හුන්හ. ඒ වේලෙහි ඔබ දෙපොල බඩසයින් පෙළුනෝ කන්නට දෙයක් නො ලැබ කුරුලු බිත්තර ගෙණවුත් ගිනිඅඟුරුවල ලා තම්බා කෑහ. කුරුලුපැටවුන් අල්ලා තම්බා කෑහ. ලොකු කුඩා කුරුල්ලන් තම්බා කෑහ. එක් අවස්ථාවකවත් ඔබ දෙපොලට සංවේගයෙක් භයෙක් නො උපනැ'' යි පෙර කළ ඒ අපරාධය ප්‍රකාශ කොට, ''කුමාරය! ඔබ එද බිරින්ද හා සමඟ සිහි නුවණින් ක්‍රියා කළහු නම්, තුන් වයසින් එක් වයසක දී ඔබට පුතකු හෝ දුවක ලැබෙන්නට ඉඩ තුබුනේ ය. ඔබ දෙපොල අතුරෙන් එකෙක් වත් එසේ වී නම් ඔහු නිසා වත් පුතකු හෝ දුවක ලැබීමට හැකියාවක් නො වන්නේ නො වේ. කුමාරය! තමාට තමා ප්‍රියයෙක් වේ නම්, තමාට තමා හිත වැඩ පතා නම් ඔවුන් විසින් තුන් [වයසේ දී ම තෙමේ රැකිය යුතු ය. එසේ නො හැකි වී නම්, තුන් වයසින් එක් වයසක දී නමුත් තෙමේ රැකිය යුතුම ය'' යි මේ ධර්මදෙශනාව කළ සේක.

අත්තානඤ්චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං,
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතොති.

ඉදින් තමා (තමාට) ප්‍රිය යි දන්නේ නම්, ඒ තමා සුරක්ෂිත කොට රකින්නේ ය. නුවණැති පුරුෂ තෙමේ තුන්වයසින් එක් වයසකදී තමන් රකින්නේ ය.

අත්තානං චෙ පියං ජඤ්ඤා = ඉදින් තමා ප්‍රිය යි දන්නේ නම්.

අත්තා යි පංචස්කන්ධයට නමෙකි. හේ ස්ථිරපදර්ථයෙක් නො වේ. නො නැසෙනසුලු පදර්ථයෙක් නො වේ. ලැබිය හැකි පදර්ථයෙක් නො වේ. එහෙයින් ''රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා'' යි වදාළ සේක.

අත්තා යනු ස්ථිර නම්, නො නැසෙන සුලු නම්, ලැබිය හැකි නම්, ''රූපං ච හිදං භික්ඛවෙ! අත්තා අභවිස්ස නයිදං රූපං ආබාධාය සංවත්තෙ ය්‍ය'' යනු නො වදරණ සේක. ''මහණෙනි! මේ රූපය ආත්ම වී නම්,

තමා යි ගත යුතු පදාර්ථයෙක් ඇත්තේ වී නම්, මේ රූපය ආඛ්‍යාත පිණිස නො පවත්නේ ය'' යනු අරුත් ය. සෙසු ස්කන්ධයන් ගැණ කිය යුත්තේ ද මෙසේ ය.

රූපාදිස්කන්ධයන් කෙරෙහි ''උපන් ස්කන්ධයෝ, සිටීමට පැවැත්මට නො පැමිණෙත්වා, සිටීමට පැමිණියෝ නො බිඳෙත් වා, හට ගැණීමෙන් නැසී යෑමෙන් නො පෙළෙත්වා'' යනාදීන් දෙව් බඹ මිනිස් ඇ කිසිවකුගේ වශීභාවයෙක් නැත්තේ ය. රූපාදි ස්කන්ධයෝ, දෙව් බඹ මිනිස් ඇ කිසිවකුගේ ඊශ්වරත්වය පිළිගන්නෝ නො වෙති. අධිපතිභාවයට යටත් වූවෝ නො වෙති. ස්කන්ධයන් කෙරෙහි කරන්නා ය, විඳින්නා ය, අධිෂ්ඨායකයා ය යනාදීවූ මොවුන්ගේ පැවැත්මෙක් නැත්තේ ය. එහෙයින් රූපාදිස්කන්ධයන් කෙරෙහි වූ ආත්ම ව්‍යවහාරය ඇති සැටි ගෙණ පැණවුනෙක් නො වේ. පංචස්කන්ධයෙහි භවයෙන් භවයට අතර නො තබා යන සුවදුක් අනුභව කිරීමෙහි අධිපති කම් කරණ ආත්මයෙක් තමා යි ගැණෙන්නෙක් ඇතැ යි ගෙණ පැණවුනෙක් නො වේ. සාමාන්‍ය ලොකව්‍යවහාරය අනුව හෙස් ලොකයාගේ අවබොධයට පහසු වනු පිණිස පැණවුනෙක් වේ. එහෙයින් පංචස්කන්ධයෙහි භවයක් පාසා දිගින් දිගට අත්වැල් බැඳ යන ආත්මයෙක්, තමා යන්නෙක් ස්ථිර පදාර්ථයෙක් ඇතැ යි නො ගත්තෝ ය.

මෙහි චක්ෂුරාදීන්ද්‍රියධර්මයන් හා රූපාදිආලම්බනයන්ගේ ගැටීම හැපීම් හෙතුවෙන් උපදනා චිත්තරාශියක් හා, ඒ හා එකට ඉපිද නස්නා දෙපණස් චෛතසිකධර්මසමූහයක් ද කම්මජප්පච්චය – ආරම්මණූපනිස්සයප්පච්චය – සහජාතප්පච්චය යනාදී වූ ප්‍රත්‍යධර්මයන්ගේ අනුභාවයෙන් බලයෙන් ඉපිද නස්නෝ වෙති. ක්ෂණයක් පාසා ඉපද නැසී යන සුලු චිත්තචෛතසික ධර්ම හැර, අන් කිසි ස්ථිර ආත්මයෙක් තමා යන්නෙක් මෙහි නැත. ඇත්තේ හෙතුඵලපරම්පරා සම්බන්ධයෙකි. මෙ තැන ඉතා සියුම් ය. තේරුම් ගැණීම පහසු නො වේ. එහෙයින් ලොකය නානා තරාතිරමේ ආත්මවාද ඉපද වූයේ ය. දිගින් දිගට පවත්නා ආත්මයෙක් ඇතැ යි ගත්තේ ය.

අතීත ජාතියෙහි කරණ ලද කුශලාකුශලාදි කර්මයන්ගේ බලයෙන් පහළ වූ ස්කන්ධායතන ධාතූහු එහිදී ම නිරුද්ධ වී යන්නාහ. ඒ අතීත-කර්මයන්ගේ හෙතුවෙන් ම මේ අත්බවේ දී අන්‍ය වූ ම ස්කන්ධායතන ධාතූහු පහළ වෙත්. අතීත භවයෙන් මේ භවයට ආවා වූ එක ම ධර්මයෙක් නැත්තේ ය. මේ අත්බවේ දී කර්මයන්ගේ හෙතුවෙන් උපන් ස්කන්ධාදීහු මෙහි ම නිරුද්ධ වෙති. පුනර්භවයෙහි අන්‍ය වූ ම ස්කන්ධාදීහු හට ගන්නාහු ය. මේ වර්තමාන භවයෙන් පුනර්භවයට එක් ධර්මයකුත් නො යන්නේ ය.

ගුරුවරයා සිය මුවින් කරණ හැදෑරීම අතැවැසියාගේ මුවතුළට නො ද වදියි. එහෙත් ඒ හෙතුවෙන් අතැවැසියාගේ මුවෙහි හැදෑරීම නො පවත්නේ ද නො වේ. දූතයා විසින් පානය කරණ ලද මැතුරු දිය රෝගියාගේ කුස තුළට නො ද පිවිසෙයි. එහෙත් ඒ හෙතුවෙන් රෝගියාගේ රෝගය නො සන්සිඳෙන්නේ ද නො වේ. මුහුණෙහි කරණ රැවුලු කැපීම් ඇ ලීලා විලාස සැරසිලි මුණ බලන කන්නාඩි අදීයෙහි පැමිණෙන වැටෙන මුව පිළිබිඹුවෙහි නො වදී යි. නොවැටෙයි. එහෙත් ඒ හෙතුවෙන් ඒ මුව පිළිබිඹුවෙහි රැවුලු කැපීම් ඇ ලීලා විලාස සැරසිලි නො පෙණෙනුයේ ද නො වේ. එක් පහන් වැටියෙක දැල්වෙන පහන් සිළක් අන් පහන් වැටියකට නො ය යි. එහෙත් ඒ හෙතුවෙන් එහි පහන් සිළක් නො දැල්වෙන්නේ ද නො වේ.

ඒ පරිද්දෙන් මේ අතීතභවයෙන් මේ භවයට, මේ භවයෙන් පුනර්භවයට, කිසි ස්කන්ධයෙක් නො යන්නේ ය. අතීතභවයෙහි ස්කන්ධායතනධාතූන්ගේ හෙතුවෙන් මෙහි ද, මෙහි වූ ස්කන්ධායතනධාතූන්ගේ හෙතුවෙන් පුනර්භවයෙහි ද ස්කන්ධායතනධාතූහු නො උපදිත්. මේ මෙහි පාලිය. "යෙ අතීතෙ කම්මප්පච්චයා නිබ්බත්තා බන්ධා, තෙ තත්ථෙව නිරුද්ධා, අතීතකම්මප්පච්චයා පන ඉමස්මිං භවෙ අඤ්ඤෙ බන්ධා නිබ්බත්තා, අතීතභවතො ඉමං භවං ආගතො එකධම්මොපි නත්ථි. ඉමස්මිං භවෙ කම්මප්පච්චයෙන නිබ්බත්තා බන්ධා නිරුජ්ඣිස්සන්ති පුනබ්භවෙ අඤ්ඤෙ නිබ්බත්තිස්සන්ති. ඉමම්හා භවා පුනබ්භවං එකධම්මොපි න ගමිස්සති. එසි ව බො යථා ආචරියමුඛතො සජ්ඣායො අන්තෙවාසිකස්ස මුඛං පවිසති, න ච තප්පඩිවයා තස්ස මුඛෙ සජ්ඣායො න වත්තති. න දූතෙන මන්තොදකං පිතං රොගිනො උදරං පවිසති. න ච තස්ස තප්පච්චයා රොගො න වූපසම්මති, න මුඛෙ මණ්ඩනවිධානං ආදස තලාදීසු මුඛනිමිත්තං ගච්ඡති. න ච තත්ථ තප්පච්චයා මණ්ඩනවිධානං න පඤ්ඤායති. න එතිස්සා වට්ටියා දීපසිඛා අඤ්ඤං වට්ටිං සඞ්කමති, න ච තප්පච්චයා දීපසිඛා න නිබ්බත්තති., එවමෙව න අතීතභවතො ඉමං භවං, ඉතො වා පුනබ්භවං කොචි ධම්මො සඞ්කමති. න ච අඤ්ඤ භවෙ බන්ධායතනධාතුප්පච්චයා ඉධ, ඉධ වා බන්ධායතනධාතුප්පච්චයා පුනබ්භවෙ බන්ධායතනධාතුයො න නිබ්බත්තන්ති" යනු.

අතීතහෙතූන් හා වර්තමානඵලධර්මයන්ගේ ද වර්තමානහෙතූන් හා අනාගතඵලධර්මයන්ගේ ද සම්බන්ධය දිගින් දිගට හෙතුඵල වශයෙන් පැවැත්ම නුවණැමදයන්ට පෙණෙනුයේ දිගින් දිගට භවයෙන් භවයට යන ස්ථිර වූ අවිනශ්වර වූ ආත්මයක් සේය. එහෙයින් ඔවුහු "ස්ථිර ආත්මයෙක් නො වේ නම්, බුදුවන්නකු ඇති විය නො හැකි ය. පව් කොට අපායයෙහි උපදින්නකු නො විය හැකි ය. පින් කොට සුගතියෙහි උපදින්නකු නො විය හැකි ය. එහෙයින් ආත්මයෙක් ඇත්තේ ය" යනා දිවූ මිථ්‍යාවාද උපදවා ලොකය අපායයෙහි හෙලති.

''"භවයෙන් භවයට යන ආත්මයෙක් පුද්ගලයෙක් වේ ද?" යි ඇසූවන්ට බුදුරජානන්, වහන්සේ වදලෝ කර්මශක්තිය මුත් ආත්මයක් නැති බව ය. ඒ කර්මශක්තිය ද නිත්‍ය නො වේ. එ ද වෙනස් වන සුලු ය. එහෙයින් එ ද ආත්මයෙක් නො වේ. අතීතහේතූන්ගේ හා වර්තමාන ඵලයන්ගේ වර්තමානහෙතූන්ගේ හා අනාගතඵලයන්ගේ පරම්පරාසම්බන්ධය කොතරම් දුරට හැනී පවතී ද යනු. "න ච සො න ච අඤ්ඤො" යනාදි දෙශනාවන්ගෙන් පැහැදිලි වේ. වර්තමාන සත්ත්වයා අතීත සත්ත්වයා නො වන බැවින් හා අනාගතසත්ත්වයා අතීත සත්ත්වයා නො වන බැවින් හා අනාගතසත්ත්වයා වර්තමානහෙතූන්ගේ ඵලය බැවින් හා "න ච සො න ච අඤ්ඤො" යනු වදළ සේක. ඒ මුත් එක් සත්ත්වයකු දිගට යන බව නො වදළ සේක. වර්තමාන සත්ත්වයා අතීතසත්ත්වයා නො වන බව ද කර්මයෙන් හටගත් ඵලය කෙරෙහි (සත්ත්වයා කෙරෙහි) ඒ ක වෙගය නිසාම නොයෙක් උස්මිටිකම් පෙරපුරුද්ද ඇතිවන බව ද වදළ සේක. ඒ මුත් ස්ථිර ආත්මයෙක් ඇතැයි ගෙණ ආත්මදෙශනාව නො කළ සේක.

"කම්මා විපාකා වත්තන්ති විපාකො කම්මසම්භවො,
තස්මා පුනබ්භවො හොති එවං ලොකො පවත්තති"

කර්මය නිසා විපාකයෝ පවතිත්. විපාකය කර්මයෙන් හට ගත්තේ ය. එහෙයින් නැවත භවය වේ. ලොකයෙහි පැවැත්ම මෙසේ ය. දිගට යන ආත්මයෙක් නැත්තේ ය.

"කම්මස්ස කාරකො නත්ථි විපාකස්ස ච වෙදකො
සුද්ධධම්මා පවත්තන්ති එවෙතං සම්මදස්සනං"

කර්මය කරන්නෙක් නැත. එසේ ම විපාකය විඳින්නෙක් නැත. ශුඛ වූ ප්‍රත්‍යයප්‍රත්‍යුත්පන්නධර්මයෝ ම පවත්නාහ. මේ වනාහි තත්ත්ව දර්ශනය යි. ස්ථිර වූ ආත්මයෙක් ඇතැ යි ගැණු ම මිත්‍යාග්‍රහණයෙක් වේ.

කරුණු මෙසේ බැවින් බුදුරජානන් වහන්සේ ආත්මයක් ගෙණ කිසි දෙශනාවක් නො කළ සේක.

බුඩදෙශනා තොමෝ සම්මුතිදෙශනා-පරමාර්ථදෙශනා යි දෙ වැදෑරුම් ය. එහි ලොකව්‍යවහාරය නො ඉක්මවා ලෝවැස්සා විසින් ඒ ඒ පදාර්ථවිෂයයෙහි පණවා ගත් ව්‍යවහාරය බැහැර නො කොට කරණ දෙශනාව සම්මුතිදෙශනා නම්. රූපාදිස්කන්ධයන් කෙරෙහි සත්ත්ව පුද්ගල ස්ත්‍රීපුරුෂ ආත්මාදිව්‍යවහාරයෝ ලොකයා විසින් පණවා ගන්නා ලද්දෝ ය. ලෝවැස්සාට පහසුවෙන් වැටහෙනු පිණිස බුදුවරයෝ ඒ ව්‍යවහාරයන් ගෙණ ධර්මදෙශනා කරති.

සම්මුතිය නිතර වෙනස් වන සුලු ය. පෙරළෙන සුලු ය. පඨවී ආදී වූ ශුද්ධාෂ්ටකරූපයකින් කැරුණු එකකට ලෝකයා විසින් ස්වණ් යි පැණවුමෙක් කැරුණේ ය. ස්වණ් යනු පැණවුමෙකි. එයින් කරණ ඔටුන්න රන් ඔටුන්න යි ද, එය බිඳ හැර නැවත එයින් ම නිපද වන කඩුව, රන් කඩුව යි ද, එය බිඳ නැවත එයින් ම තනන කරඬුව රන් කරඬුව යි ද යි මෙසේ එක ම ද්‍රව්‍යය නත් වැදැරුම් සම්මුතීන්ට පෙරළින. එය බිඳ එයින් අන් කුමක් කරණ ලද්දේ ද, ඒ හැම ලොකසම්මුතිය අනුව වෙනස් වේ.

නො පෙරළෙන නො වෙනස් වන ඇති තතු ගෙණ කරණ දෙශනාව පරමාර්ථදෙශනා නම්. සත්ත්ව පුද්ගල ස්ත්‍රී පුරුෂ ආත්මාදිව්‍යවහාර හැර දමා මේ ව්‍යවහාරයන්ගෙන් හඳුන් වන ස්කන්ධධාතු ආයතනාදී වූ තත්ත්වාර්ථ දක්වන කතා ය. පරමාර්ථදෙශනා. බුදුරජුනට විෂය වනුයේ ද මේ ස්කන්ධධාතු ආයතනාදි අර්ථ ය ම ය. එයිනුදු ස්කන්ධාදී වූ අර්ථය පරමාර්ථ නම් වේ. බුදුවරයෝ දහම් තතු ඉගැන්වීම සඳහා පරමාර්ථදෙශනාව යොදා ගනිත්.

තව ද සම්මුතිය හැර ඇතැම් කෙනකුන්ට පරමාර්ථය ඉගැන්වීම අපහසු ය. එහෙයින් ලොකසම්මුතිය නො හැර දහම් දෙසූ සේක.

"පඤ්ඤත්තිං අනතික්කම්ම පරමත්ථෝ පකාසිතෝ,
යමඤ්ඤං නාතිධාවෙය්‍ය තස්මා අඤ්ඤෙපි පණ්ඩිතෝ,
පරමත්ථං පකාසෙන්තෝ සමඤ්ඤං නාතිධාවයේ"

යි අටුවාව කී ය. කරුණු අටක් නිසා මෙසේ දෙශනා කරත්. හිරි ඔතප් දක්වීම, කර්ම තමන් අයත්බව දක්වීම, පුද්ගලයන් පිළිබඳ ඒ ඒ ක්‍රියා දක්වීම, ආනන්තය්‍යකම් දක්වීම, බ්‍රහ්මවිහරණ දක්වීම, පූර්වෙනිවාසය දක්වීම, දක්ෂිණාවිශුද්ධිය දක්වීම, ලොකසම්මුතිය නො හැරීම යන මේ ය ඒ කරුණු අට.

පරමාර්ථ නම්, වෙනස් වනුයේ නො වේ. වෙනස් කරණු ද නො හැකි ය. ස්වණ් යන සම්මුතියෙහි පරමාර්ථයෙක් තිබේ. ඒ නම්, පෘථිවි-ආපස්-තේජස්-වායු-වණ්-ගන්ධ-රස-ඔජස් යන ශුද්ධාෂ්ටකරූපය යි. මෙය හැම ද්‍රව්‍යයෙකම ඇත්තේ ය. ඒ ඒ ද්‍රව්‍ය කෙරෙහි ලොකයා විසින් පැණ වෙන සම්මුතිය වරින් වර වෙනස් වන්නේ ය. ශුද්ධාෂ්ටකරූපය වෙනස් නො වේ.

සත්ත්වපුද්ගලස්ත්‍රීපුරුෂආත්මාදිවිවිධප්‍රඥප්තීන්ට තැන්වනුයේ චිත්ත චෛතසිකධර්ම හා හැනුනු ඒ මෙ ශුද්ධාෂ්ටකරූපය ම වේ.

ඒ මුත් පරමාර්ථ විසින් රනෙක් රිදියෙක් ලොහයෙක් තඹයෙක් මැටියක් කැටයෙක් දඬුවෙක් සත්ත්වයෙක් පුද්ගලයෙක් ස්ත්‍රියක් පුරුෂයෙක් දෙවියෙක් බ්‍රහ්මයෙක් ආත්මයෙක් විදින්නෙක් කරන්නෙක් නැත්-

තේ ය. ලොකයාගේ ස්වණ්ණ රජතාදී වූ විවිධප්‍රඥප්තීන්ට යටත් වූ මේ ශුඩාෂ්ටකරූපය උස් පහත් ව පෙණෙන්නේ ය ස්වර්ණය රජතයට වඩා උසස් ය රජතය ස්වණ්ණයට වඩා පහත් ය. මිනිසා තිරිසනාට වඩා උසස් ය. තිරිසනා මිනිසාට වඩා පහත් ය. බ්‍රහ්මයා දෙවියාට වඩා උසස් ය. දෙවියා බ්‍රහ්මයාට වඩා පහත් ය. එහෙයින් මෙහි පෙණෙන වෙනස් බව නාමධාතූන් හා එක් වූ ශුඩාෂ්ටකරූපය පිළිබඳ උස් පහත් බවය. මේ හැම තැන ශුඩාෂ්ටක රූපයාගේ නම් වෙනසෙක් නැත්තේ ය.

දහම් තතු මෙසේ බැවින් බුදුරජානන් වහන්සේ සත්ත්වපුද්ගලාදීන් කෙරෙහි පරමාර්ථ විසින් ආත්මව්‍යවහාරයක් නො කළ සේක. කළ සේක් ලොකව්‍යවහාරය නො ඉක්මවීම ය. උන්වහන්සේ පරමාර්ථ විසින් ආත්ම නම්, පංචස්කන්ධය යි වදළ සේක ආත්ම යනු සත්ත්වපුද්ගලාදීන් කෙරෙහි ලොකයා උපදවා ගත් ව්‍යවහාරය වූ බැවින් ඔවුන්ගේ සුබාව බොධය සලකා ම සත්ත්වශරීරයෙහි ආත්ම ව්‍යවහාරය කළ සේක. සත්ත්වයා පිළිබඳ හයවක් පාසා දිගින් දිගට යන ස්ථිර ආත්මයෙක් ඇතැ යි නො ද පිළිගත් සේක.

"අත්තා හි කිරදුද්දමො" යනාදී තැන්හි සිතෙහි, "අත්තනො ආසනෙයෙව අත්තානං දස්සෙසි" යනාදී තැන්හි කයෙහි එන අත්ත ශබ්දය මෙහි ආයේ සිතෙහි ය. අත්ත (ආත්මන්) ශබ්දය යත්න-ධෘති-බුධි-ස්වභාව-බ්‍රහ්ම-දෙහ යන අරුත්හි ඒය යි අමර කොෂයෙහි ද, මනස් යන අරුත්හි ඒ ය යි මෙදිනිකොෂයෙහි ද, පුත්‍ර අරුත්හි ඒ ය යි ශබ්දරත්නාවලියෙහි ද, ජීව-අර්කහුතාශන යන අරුත්හි ඒ ය යි හෙමචන්ද්‍රකොෂයෙහි ද කියන ලද්දේ ය.

රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං = එය හොඳින් රකින්නේ ය. රැකිය යුතුය.

නං යනු "අත්තානං" යනු සඳහා යෙදුනේ ය. එහෙයින් 'නං' යන්නෙන් කියවෙනුයේ ආත්මය යි. සිත යි. ආත්මය තමාට ප්‍රිය වේ ය යි යමෙක් සලකන්නේ නම්, දන්නේ නම්, ඔහු ඒ තමන් ආත්මය යි ගන්නා ලද්ද, මැනවින් ඉතා හොඳින් රකින්නේ ය. නො ද එසේ නම්, ආත්මය ප්‍රිය යි ගැණීමෙන් සැලකීමෙන් වැඩෙක් නො වන්නේ ය.

තිණ්ණං අඤ්ඤතරං යාමං = යාම තුනින් එක්තරා යාමයෙක.

බුදුරජානන් වහන්සේ තමන් ධර්මේශ්වර බැවින්, ධර්මදෙශනායෙහි දක්ෂ බැවින් තුන් වයසින් එක්තරා වයසක් මෙහි යාම යි දක්වූ සේක.

මිනිස් වයස ප්‍රථම-මධ්‍යම-පශ්චිම යි තුන් කොටසක් කොට බෙදුනේ ය. ඉන් එක් කොටසෙක් යාම යි දක්වීන. දවසෙහි සයෙන් කොටසෙක් හෝ අටෙන් කොටසෙක් යාම යි කියනු ලැබේ. පහාර යි මෙයට තවත් නමෙකි. "පහාරො යාමසඤ්ඤිතො" යනු කොෂයි. මනුෂ්‍යයකු මනුෂ්‍යයන් අතර සම්පූර්ණයෙන් ජීවත් විය යුතු කාලය ඒ ඒ කාලයන්හි

මිනිසුන් අතර පහළ වන සුවරිත දුශ්චරිත අනුව එක්සිය විස්සෙක, එක්සිය දසයෙන්, අනූවෙක, අසූවෙක, සැත්තෑවෙක, සැටෙක, යන ආ ලෙසින් සාමාන්‍ය විසින් සම්මත ව ඇත්තේ ය. ඒ සම්මතය අනුව අද ජීවත් වන මිනිසකුගේ ජීවත්වීමේ කාලය බොහෝ සෙයින් සැට අවුරුද්දෙකින් හෝ සැත්තෑ අවුරුද්දෙකින් සීමිත කළ හැකි ය. ආදිකල්පිකමනුෂ්‍යයන්ගේ ආයු කාලය අසිදීර්ඝ වූයේ ය. ඇතැම් කෙනෙක් කල්ප ගණනක් ජීවත් වූහ. ඒ දවස ඔවුන් අතර දුර්ගුණයෝ නො වූහ. ඔවුන් දීර්ඝායුෂ්කයන් වීමේ හේතුව ඒ ය.

සැට අවුරුද්දෙකින් සීමිත මනුෂ්‍යායුෂයෙහි මුල් විසි අවුරුද්ද ප්‍රථම වයස කොට, මැද විසි අවුරුද්ද මධ්‍යමවයස කොට, පැසුළු විසි අවුරුද්ද පශ්චිමවයස කොට ගැණෙන්නේ ය. ප්‍රථමවයසෙහි ඇතුළත් මුල් විසි අවුරුද්ද ප්‍රථමයාමය වේ. මද්ධ්‍යමවයසෙහි ඇතුළත් මැද විසි අවුරුද්ද මධ්‍යමයාමය වේ. පශ්චිමවයසෙහි ඇතුළත් පැසුළු විසි අවුරුද්ද පශ්චිම යාමය වේ. මේ කියූ තුන් යාමයෙහි ම ආත්මය තමාට ප්‍රිය යි සලකන්නහු විසින් ඒ රැක ගත යුතු ය. යමකුට යම් ලෙසකින් දෙ යාමයෙක්හි ම ආත්මය රැක ගැණීමට අවස්ථා නො වූ නම් එක් යාමයෙක්හි වත් ඔහු විසින් ආත්මය රැක ගත යුතු ය. තුන් යාමයෙන් එක් යාමයෙක දී වත් ආත්මය රැක ගත යුතු ය යනු, එක් යාමයක් ම ආත්මාරක්ෂාවට වෙන් කරණු සඳහා වදරණ ලද්දේ නො වේ. තුන් යම ම හෙවත් තුන් වයස ම එයට සුදුසු වේ. මෙසේ වදළෝ මුල් මැදියම් දෙකෙහි අන් කටයුතු නිසා ආත්මා-රක්ෂාවක් කර ගැණීමෙහි ඉඩ පහසුකම නො වූයේ නම්, පැසුළු යමහි ඒ කරගත යුතු ම ය යනු ගන්වනු සඳහා ය.

පටිජග්ගෙය්‍ය පණ්ඩිතෝ = නුවණැත්තේ රකින්නේ ය.

කුමක් රකින්නේ ද යත්, ආත්මය රකින්නේ ය. ගිහියෙක් "තමා රක්නෙමි" යි පහයෙක උඩු මහල්තලයෙහි හොඳට වැසූ දෙර කවුළු ඇති කාමරයකට වැද සම්පූර්ණ ආරක්ෂා ඇති ව වසන්නේ ද, පැවිද්දෙක් මනා ලෙස වැසූ දෙර කවුළු ඇති ලෙනක වසන්නේ ද තමා නො රකීම ය. දෙර අගුල් ලා රැකවල් ඇති ව සිටිය ද ගිහියාත් නො රැකෙන්නේ ය. පැවිද්දත් නො රැකෙන්නේ ය. ශක්ති වූ පරිදි දන් සිල් ඇ සින්කම කරණ ගිහියාත්, වත්පිළිවෙත් කරණ ධර්ම දහම ඉගෙන කමටහන් වඩන දවස නො හැර වත් පිරිත් දෙසන පැවිද්දත් තමා රක්නේ නම්.

තුන් වයසෙහි ම තමන් නො රැකියහැකි වුවත්, නුවණැති පුරුෂ තෙමේ මෙලෙසින් දන් සිල් ඇ සින්දම කරමින් තමා රක්නේම ය. මුල් වයසෙහි කෙළි සෙල්ලම්වල යෙදී වසන ගිහියකුට කුසල් කරන්නට ඉඩ පහසු නො වූයේ නම්, ඔහු විසින් මැද වයසෙහි දී නොපමාව කුසල් දහම් කර ගත යුතු ය. අඹුදරුවන් රැකීම ආ කටයුතු බොහෝ බැවින්, මැද වයසෙහිදී ද ඒ නො හැකි වූයේ නම්, පැසුළු වයස්හි දී වත් සින් දහම් කර

ගත යුතු ය. පැසුළු වයසේ දී වත් පින් දහම් කළේ නම්, හේ තමා රැක්කේ නම් වේ. එසේ ද නො කරන්නහුට ආත්මය නම් ප්‍රිය නො වේ. ඔහු ස්වකීය ආත්මය අපාය එක ම මාඟීය කොට ඇත්තක් කරන්නේ ය.

පැවිද්ද මුල් වයසෙහි බණ දහම් උගන්නේ, උගත් බණ දහම් දරන්නේ, අනුනට උගන් වන්නේ, වත් පිළිවෙත් නො පුරණුයේ, භාවනාවෙහි පමා වනුයේ නම්, ඔහු මැදවයසෙහි දී මහණදම් කළ යුතු ය. මුල් වයසෙහි උගත් පර්‍යාප්තියෙහි අර්ථකථා විනිශ්චය, කාරණාකාරණ විචාරීම් ආදියෙන් මැද වයසෙහි දී ද පමාව සිටියේ නම්, පැසුළු වයසෙහි දී මහණදම් කළ යුතු ය. පැසුළු වයසෙහි දී වත් මෙසේ කළේ නම්, හේ තමන් රැකියේ නම් වේ. මෙසේ තුන් වයසින් එක වයසකත් මහණදම් නො කරන්නාහට, තෙමේ තමාට ප්‍රිය නො වේ. ඔහු පසු තැවුල්ලෙන් තමන් නවන්නේ ය.

ධර්මකීර්තිපාදයන් මේ කියූ සැටි. "ඉදින් ගිහිකෙනෙක් තමන් රකුම් හ යි සිතා මාලිගාවල යටිමාල් හැර මතුමාල්වලට නැගීලා ඉනුත් ගබඩාවලට වැද ආත්මාරක්ෂාව ඇති ව වෙසෙත් නමුත්, පෘථිවි වරු හිත්ති හා දෙරලි දෙරබා ඇති ගල්ලෙනක වෙසෙත් නමුත් සිකින් සත්හුන්කමක් නැත්තෝ වූ නම් උං තමන් රක්නා නම් නො වෙති. ගිහිවුවත් පව නො යෙදී බල වූ ලෙස දන් පින් කෙරෙත් නම්, පැවිදි වුවත් ධුරද්වයයින් එක්තරා ධුරයෙක හා වත පිළිවෙත යෙදී වෙසෙත් නම්, උං තමන් රක්නා නම් වෙති. තුන් වයස පුරා කට නො හෙතත් නුවණැත්තෝ එක් වයසෙක වුවත් තමන් රකිති. ඉදින් ගිහිහු පළමු වයසෙහි කෙළිනළුවෙහි ලොල් බැවින් පින් කට නුහුණු වූ නමුත්, මධ්‍යම වයස වුවත්, පින් කළෝ නම් යහපත. ඉදින් මධ්‍යම වයස දී අමුදරුවන් රකිනා නිසා පින් කට නුහුණු වූ මකළවර වයස දී වුවත් පින් කළ මනා ය. තුන් වයසින් එක් වයසෙක වුවත් පමා වූ නම් උන්ගේ ආත්මය උන්ට සතුරු වත් මුත් ප්‍රිය වූවා නම් නො වෙයි. මහණ වූවාහු පළමු වයස මාඟීාධිගම ඵලාධිගම නිසා භාවනාවට පමා වූ නම් මධම වයස වුව නොපමාව මහණදම් කළෝ නම් යහපත. ඉදින් පළමු වයස උගත් පෙළ අර්ථත් විනිශ්චයත් කාරණාකාරණත් විචාරීමෙන් මධ්‍යම වයස ගියත් කෙළවර වයස වුවත් තමන්ට පිහිටක් සිතූ නම් යහපත. වයස් තුණ වුවත් දෙකෙක වුවත් එකෙක වුවත් නො පමා වීම කෙළවර වයසට සමභ වී නම් තමන් රක්කා නම් ම වෙති. එසේ කොට ගත නො හෙන්නවුන්ට අන්කැව ප්‍රිය නො වෙයි. තමන්ට සතුරෝ නම් තුමූ ම ය" යි.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොධිරාජකුමාර තෙමේ සෝවාන් වී ය. ධර්මදේශනාව පැමිණ සිටි පිරිසටත් වැඩ සහිත වූ ය.

උපනන්දතෙරුන් සිවුපසය සැපයූ සැටි

12 - 2

උපනන්ද ස්ථවිරයන් වහන්සේ දහම් දෙසීමෙහි සමර්ථයෙකි. දහම් දෙසීමෙහි සමත් භික්ෂූන් අතර උන්වහන්සේට ද තැනක් ලැබී තිබුනේ ය. අභිවිජතාවෙන් බර ව සිටි උන්වහන්සේ අප්පිච්ඡතාවය ගැන නිතර බණ කියති. ඒ බණ ඇසූ ඇතැම් භික්ෂූන් වහන්සේලා තම තමන් වෙත තුබූ තුන් සිවුරු ඇ පිරිකර පුද ධුතාඞ්ග සමාදන් වූහ. භික්ෂූන් හැර දමූ සියලු පිරිකර ඔහු ම ගත්තේ ය.

එක් වස් කාලයෙක උපනන්ද තෙරණුවෝ දනවු බලා ගියහ. එහි එක් විහාරයෙක විසූ තරුණවියෙහි සිටි හෙරණෝ ඔහු කියන විසිතුරු කතා ඇසීමෙහි ආශා ඇති ව "ස්වාමීනි! මේ වර මෙහි වස් එළඹ වැඩ හිඳුනු මැනැවැ" යි ආරාධනා කළහ. එවිට උපනන්ද ස්ථවිර තෙමේ වස් එළඹෙනු හැකි ය, හොඳයි, මෙහි වස් වැසි පිරිකර කෙතරම් ලැබෙ ද?" යි ඇසී ය. "එක එක සළුව ලැබෙ ය" යි හෙරණුන් කී කල්හි එහි වහන් ගහල තබා අන් වෙහෙරකට ගොස් එහි මහණුන් අතින් "මෙහි වස් කෙළවර වස් එළඹී මහණුන්ට කුමක් ලැබේ ද?" යි අසා "එක තමට සළු ඔදකක් ලැබෙ ය" යි කී විට එහි හැරමිටිය තබා අන් වෙහෙරකට ගියේ ය. ඒ වෙහෙර වැස්සන් "සළු තුණක් ලැබෙ ය" යි කී කල්හි එහි දිය පෙරා ගන්නා කුඩා මුට්ටියක් තබා තවත් වෙහෙරකට ගියේ ය. "එහි ලැබෙන්නේ කුමක් ද?" යි අසා රෙදි කැබලි සතරක් ලැබෙ ය" යි කී විට "හා හොඳයි, මම මෙහි වස් එළඹෙන්නෙමි" යි කියා වස් එළඹෙන දිනයෙහි එහි වස් එළඹ ගිහි පැවිද්දන්ට බණ කියමින් කල් ගෙවී ය. බණකතාවෙහි පැහැදුනු ගිහි පැවිද්දෝ ඔහුට රෙදි කැබලි හා සිවුරු බොහෝ පිදූහ.

උපනන්ද ස්ථවිර තෙමේ වස් පවරා "මාගේ වහන්සහල ඔය විහාරයේ ය. හැරමිටිය ඔය විහාරයේ ය. වතුර පෙරා ගන්නා මුට්ටි පොඩිය ඔය විහාරයේ ය. ඒ නිසා ඔය විහාරයෙන් වස් වැසි පිරිකර මටත් ලැබිය යුතුය" යි හැම තැනට ලියා යැවී ය. ලියුම් යවා පිරිකර ගෙන්වා ගෙණ බරකරත්-කයක පටවා ඒ සමග ඵ තැනින් නික්මුනේ ය මග අසල පිහිටි වෙහෙරක තරුණ මහණහු දෙදෙනෙක් එහි ලැබුනු රෙදි කැබලි දෙකක් හා පලසක් බෙදා ගන්නට හෝ හැකි ව මග අසලට පැමිණ කොලාහල කරන්නෝ පිරිකර කරත්තය පස්සෙහි එන තෙරුන් දැක "හාමුදුරුවන් වහන්ස! මහ කලබලයක්, කරුණා කොට අපට මෙය බෙදා දෙනු මැනවැ" යි උප-නන්ද තෙරුන්ට කීහ. "හා හොඳයි, එසේ වේවා, නමුත්නාන්සේලා මා කියන එක අසන්නහු නම්, ඔය කියන කාරණය බෙරා දිය හැකිය" යි ස්ථවිර තෙමේ කී ය. "එහෙයි, ස්වාමීනි! අපි හාමුදුරුවන් වහන්සේ කියන්නක් කරමු" යි ඒ දෙනම කීහ. එකල්හි උපනන්ද ස්ථවිර තෙමේ

සළු දෙකත් පලසත් අතට ගෙණ යට දෙක ඒ මහණුන් දෙ පලට දී "මේ පලස දැරීමට ඔය දෙනම ම සුදුසු නො වෙකි. මෙය බණ කියන කෙනා-කුට සුදුසු පලසෙකි. හැම තැන බණ කියන්නෙමේ මම ය. මෙය සුදුසු මටැ" යි බර ගණනක් වටිනාකම් ඇති ඒ පලසත් ගෙණ එතැනින් වහා නික්ම ගියේ ය.

ඉක්බිති ඒ භික්ෂූහු විපිළිසර ව බුදුරජුන් වෙත ගොස් "උපනන්ද ස්ථවිරයන් වහන්සේ අපට ලැබී තිබූ පලසක් අපගේ කැමැත්තක් නැති වි ගෙණ ගියහ" යි පැමිණිලි කළහ. බුදුරජානන් වහන්සේ "මහණෙනි! ඔය කෙරුම අරුමයක් නො වේ. උපනන්ද. පෙරත් ඔය නමලාට අයක් පිරිකර හැහැර ගෙණ තිබෙ. ඔය නමලා විපිළිසරට පත්කළේ දැන් පමණක් නො වේ. පෙරත් ඔය නමලාට ඔබදු දේ කරණ ලද්දේ ය" යි වදරා ඒ පුවත ගෙණ හැර දක්වූ සේක.

"පෙර එක් අත්බවෙක තමුසෙලා දෙන ම දියකාවෝ දෙදෙනෙක් වී වහු ය. එකෙක් ඉවුරු අසබඩ ම හැසිරෙයි, එකෙක් ගැඹුරු දියෙහි හැසිරෙයි. දවසක් ඔවුනට රේමස්සෙක් ලැබුනේ ය. එ වේලෙහි "ඔලුව තට ය. නගුට මට ය" යි කියා ගන්නා ඔවුන් දෙදෙනා අතර තරමක කලහයෙක් හට ගත්තේ ය. උපනන්ද එ දවස හිවලෙක් ව ඉපිද සිටියේ ය. මේ හිවලා ඒ වේලෙහි මෙ තැනින් ගියේ ය. දියකාවෝ මේ හිවලා දැක, "මාමේ! මේ මාලුවා අපට බෙද දෙන්නැ" යි හිවලාට කිහ. හිවලා, කුම කියහු තෙපි? රජුගේ නියමය පරිදි මෙතෙක් වේලා මම නඩු ගණනක් ඇසීමි. එන තැන හිදීම නියා පා රිවදන්නට වුවයන් මදක් ඇවිද විඩා සංසිඳුවා ගැනීමට මම මෙහි ආයෙමි. තොපගේ ඔය නඩු අසන්නට මට දැන් පිළිවන්කමෙක් නැතැ" යි කීය. එ කල්හි දියකාවෝ "මාමේ! එසේ නො වදරණු මැනවි. කොතරම් අපහසුකමක් තුබුනා ද, මේ මාලුවා බෙදු දී යා යුතු ම" යි ඇවිටිලි කළහ. "හා හොඳයි, වේවා, මේ ගැණ මාගේ කීම උඹලා පිළිගන්නට ඕනෑ. එසේ පිළිගණිහු නම්, මුට මෙය බෙදු දිය හැකි ය" යි හිලවා කී විට, "මාමේ! මෙහි දී මාමා කරණ තීරණයකට අපි එකඟ වන්නෙමු මාමා කියන හැටියක් පිළිගන්නෙමු" යි කිහ. හිවලා "හා හොඳා" යි කියා රේමසු ගෙණ ඔලුව කඩා එක පසෙකත් නගුට කඩා එක පසෙකත් තබා "බැණෙව්! ඔලුව ඉවුර අසබඩ වැඩ කරණ බැණාට, නගුට ගැඹුරු දියෙහි වැඩ කරණ බැනාට මැද හරිය නඩුව ඇසූ මට" යි මැද හරිය ගෙණ එතැනින් නික්ම ගියේ ය. රැවටුනු දියකාවෝ දෙ දෙන හිවලා යන මග බලා සුසුම් හෙලමින් එහි සිටියහ" යි.

බුදුරජානන් වහන්සේ මේ ඉකුත් වත්ත දක්වා "පෙරත් උපනන්ද තමුසේලා රැවටී ය" යි වදරා උපනන්ද තෙරුන්ට ගරහා යේත් "මහණ! අනුනට අවවාද කරන්නහු පළමු කොට අවවාදයෙහි පිහිටිය යුතු ය. තමා එයට සුදුසු තැන සිටිය යුතු ය. අනුනට අවවාද කරන්නහු අවවාද

කරන්නට කලින් අවවාදයෙහි පිහිටිය යුතු ය'' යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ,
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍යා පණ්ඩිතොත්.

පළමු කොට තමා ම සුදුසු ගුණයෙක්හි පිහිටුවන්නේ ය. ඉන් පසු අනුනට අවවාද කරන්නේ ය. මෙසේ කරන්නා වූ නුවණැත්තේ නො කෙලෙසෙන්නේ ය.

අත්තානං එව පඨමං **පතිරූපෙ නිවෙසයෙ** = පළමු කොට තමා ම සුදුසු **ගුණයෙක්හි** පිහිටුවන්නේ ය.

'අත්තානං' යනු තමන් දක්වනු සඳහා යෙදුනේ ය. ''එව යනු යෙදුනේ එහි නියමය පිණිස ය. ඒකාන්තයෙන් විය යුතු බව දක්වනු පිණිස ය. පඨමං යනු යෙදුනේ අවස්ථාව දක්වනු පිණිස ය. 'පතිරූපෙ' යනු යෙදුනේ පිහිටු විය යුතු තැන කො තැන ද යි දක්වනු පිණිස ය. 'නිවෙසයෙ' යනු යෙදුනේ පිහිටු වීම දක්වනු පිණිස ය. දැන් ''අත්තානං, එවං පඨමං, නිවෙසයෙ'' යනු පැහැදිලි ය.

අප්පිච්ඡතාදිගුණ හා අරියවංසපටිපද හා මෙහි යෙදෙන්නට සුදුසු වූ ගුණයෝ ය. එහෙයින් අනුනට අවවාද කරනු කැමැත්තේ පළමු කොට අප්පිච්ඡතාදිගුණයන්හි හෝ අරියවංසපටිපදවන්හි පිහිටා ගන්නේ ය. තමා එහි පිහිටු විය යුතු ය.

''යො අප්පිච්ඡතාදිගුණෙහි වා අරියවංසපටිපදාදීහි වා පරං අනුසාසිතුකාමො සො අත්තානං එව පඨමකරං කත්වා ගුණෙ පකිට්ඨාපෙය්‍ය'' යනු අටුවා ය. එහෙයින් 'පතිරූපෙ' යනු මෙ කී ගුණ කියනු ව යෙදුනේ යි දත් යුතු ය.

අප්පිච්ඡතාදිගු යට කියූ සේ දත යුත්තාහ. අරියවංසපටිපද නම්, චීවරසන්තොස-පිණ්ඩපාතසන්තොස - සෙනාසනසන්තොස - භාවනාරාමතා යි මේ සේ සිවු වැදෑරුම් ය. ''එත්තරෙ මෙ භික්ඛවෙ! අරිය වංසා'' යි වදළෝ එහෙයිනි.

එහි දළ සියුම් රළු මොළොක් තර දිරූ සිවුරුවලින් යම සිවුරක් ලද කල්හි එයින් සතුටු වීම, සැහීවට පත්වීම, එහි ගුණකියාපැම නො සුදුසු අන්වෙෂණයකින් සිවුරු නො යෙවීම, සිවුරු නො ලැබීමෙන් නො කැවීම, ලැබුන ද තෘෂ්ණාවෙන් එහි නො බැඳීම, අන්වෙෂණාදියෙහි වරද දැකීම, ශීතඋෂ්ණාදිය නැසීම පිණිස යි දනිමින් පරිභොග කිරීම, ලද සිවුරෙහි යතුටුවීමෙන් තමා උසස් කොට නො දැක්වීම, අනුනට නො හැරහීම. චීවරසන්තොසාදියෙහි ගුණකීමට දක්ෂවීම, අලස නොවීම, සිහි නුවණින් යෙදීම යන මේ ප්‍රථමආයවංශප්‍රකිපදය.

රෙදිකැබලිවලින් මහමැඩලි ඇ කොට කරණු ලබන්නේ චීවර ය යි. එය කරණ පිළිවශයෙන් බොම-කප්පාසික-කොසෙය්‍ය-කම්බල-සාණ භඩ්ග යි ස වැදෑරුම් ය. දුකූල-පත්තුන්නපට්ට-සොමාරපට්ට-චීනපට්ට-සෘඩිමය-දෙවදත්තිය යන මේ සවැදෑරුම් සිවුරු ද යට කී ස වැදෑරුම් සිවුරෙහි අනුලොම් වන බැවින් මහණුන් ගේ පරිභොගයට සුදුසු ය. කුස-චීර - වාකචීර - ඵලකචීර - කෙසකම්බල-පොත්ථක-චම්ම-උලූකපක්ඛ-රුක්ඛදුස්ස - ලතාදුස්ස - එරකදුස්ස - කදලිදුස්ස - වෙළුදුස්ස යන මේ ආදීන්ගේ වශයෙන් එන රෙදි පට්ටා වැහරි ලොම් නූලින් කළ සිවුරු මහණුන්ට නො කැප ය. නො සුදුසු ය.

ලද පිණ්ඩපාතයෙන් සතුටුවීම, එහි ගුණකීම, පිඩුසෙවීමට නො සුදුසු අන්වෙෂණයනට නො පැමිණීම, පිඩු නො ලැබීමෙන් නො තැවීම, ලද ද තෘෂ්ණාවශයෙන් එහි ගැටීම, දෙස් දැකීම, බ්‍රහ්මචරියයට අනුග්‍රහ පිණිස යි දැන පරිභොග කිරීම, එයින් තමා උසස් කොට නො දැක්වීම, අනුනට අවමන් නො කිරීම, පිණ්ඩපාතසන්තොසයෙහි ගුණකීමට දක්ෂවීම, අලස නො වීම, එහි සිහිනුවණින් යෙදීම ද්විතියආර්‍ය්‍යවංශප්‍රතිපද ය.

එහි පිණ්ඩපාත නම්, ඔදන-කුම්මාස-සත්තු-මච්ඡ-මංස-බීර-දධි-සප්පි-නවනීත-තෙල-මධු-ඵාණිත-යාගු-බාදනීය-සායනීය-ලෙහනීය යන මේ ය.

සඩ්සභත්ත-උද්දෙසභත්ත-නිමන්තණ-සලාකභත්ත - ගිලානභත්ත-ගිලානුපට්ඨාකභත්ත-ධුරභත්ත-කුටිභත්ත-වාරකභත්ත විහාරභත්ත යන මේ බත් මහණුන් පිළිබඳ පිණ්ඩපාතක්ෂෙත්‍ර ය යි.

ලද සෙනසුනෙන්, සතුටුවීම, එහි ගුණකීම, සෙනාසන හෙතුවෙන් නො සුදුසු අන්වෙෂණාදියට නො පැමිණීම, නො ලද සෙනසුනට නො තැවීම, ලද ද තෘෂ්ණා විසින් එහි මුසපත් නොවීම, දෙස් දැකීම, ශීතොෂ්ණාදිය නැසීම පිණිස යි සලකා පරිභොග කිරීම එයින් තමා උසස් කොට නො දැක්වීම, අනුනට නො ගැරහීම, සෙනාසනසන්තොසයෙහි ගුණකීමට පොහොසත් වීම, අලස නො වීම, සිහි නුවණින් එහි යෙදීම තෘතීයආර්‍ය්‍ය-වංශප්‍රතිපද ය.

සෙනාසන නම්, මංච-පීඨ-භිසි-බිම්බොහන-විහාර-අඩ්ඪ-යොග-පාසාද-හම්මිය-ගුහා-ලෙන-අට්ට මාල-වෙළුගුම්බ රුක්ඛමූල යන මේ ය

සංඝ-ගණ-ඤාති-චිත්ත-සකසන්තකධන-පංසුකූල යන මෙය සෙනාසනක්ෂෙත්‍ර ය යි. සෙනාසනසන්තොසය පිණ්ඩපාතයෙහි කී පරිදි දන්නේ ය. ග්ලානප්‍රත්‍ය ය පිණ්ඩපාතයෙහි ම ඇතුළත් වේ.

භාවනාරාමතා නම්, භාවනාවෙහි ඇලීම ය සතිපට්ඨාන - සම්‍යක්ප්‍රධාන-සෘඩිපාද-ඉන්ද්‍රිය-බල-බොජ්ඣඩ්ග - අනුපස්සනා-මහාවිදස්සනා-බොධිපක්ඛියධම්ම-අට්ඨතිසාරම්මණ යන මේ ආදීන්හි ඇලීමය. භාවනා

රතිය විදීමය. පස් වැදෑරුම් ප්‍රහාණයන්හි ඇලීම හෝ කාමච්ඡන්දාදික්ලේශයන් දුරු කරමින් භාවනාරතිය විඳීම, එයින් තමා උසස් කොට නොදක්වීම, අනුනට නොගැරහීම, එහි දක්ෂවීම, අනලස්වීම, සිහිනුවණින් යෙදීම චතුර්ථආයර්‍යවංශප්‍රතිපද ය.

චතුර්විධආයර්‍යවංශයන් අතුරෙහි ප්‍රථම-විතිය-තෘතීය-ආයර්‍ය වංශයන්ගෙන් තෙළෙස් ධුතගුණයන්ගේ හා චතුර්විධප්‍රත්‍යය සන්තොෂයාගේ විශයෙන් මුළු විනයපිටකය කියන ලද්දේ ය. සිවු වන ආයර්‍යවංශයෙන් අතික් පිටක දෙක දක්විනි.

බුදු, පසේබුදු, මහරහත්හු ආයර්‍යයෝ ය. මේ දහම් සතර උන්වහන්සේලාගේ ප්‍රවෙණිහු ය. එහෙයින් ආයර්‍යවංශ නම් වෙති. ක්ෂත්‍රිය-බ්‍රාහ්මණාදිකුල වංශය යම් ලෙසකින් වෙත් නම්, මේ ආයර්‍ය වංශයත් ආයර්‍යයන්ගේ ප්‍රවෙණි නම් වේ. සම්‍යෙහි වූ වංශ අතුරෙහි මේ වංශය ම ශ්‍රේෂ්ඨ වේ. උත්තරිතර වේ. මූලගන්ධාදීන් අතුරෙහි කලුඅගිල් ගඳ ම ශ්‍රේෂ්ඨ වන්නා සේ ය.

අථ අඤ්ඤං අනුසාසෙය්‍ය = ඉන් පසු අනුනට අවවාද කරන්නේ ය.

තමන් පළමු කොට අප්පිච්ඡතාදිගුණයන්හි පිහිටා, මෙහි සැකෙවින් කියූ ආයර්‍යවංශප්‍රතිපදාවෙහි පිහිටා අනුනට එයින් අවවාද කරන්නේ ය. තෙමේ ආදර්ශවත් පුරුෂයෙක් ව අවවාද කරන්නේ ය.

න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ = නුවණැත්තේ නොකෙලෙසෙන්නේය. නොකිලිටි වන්නේ ය.

තෙමේ, පළමු කොට ගුණදහමෙහි නොපිහිටා අනුන්ට අවවාද කරන්නේ නම්, අනුන්ගෙන් ගැරහුම් ලබන්නේ ය. ගැරහුම් ලබා කෙලෙසෙන්නේ ය. තෙමේ පළමු කොට ගුණදහමෙහි පිහිටා අවවාද කරන්නේ නම්, අනුන්ගෙන් පැසසුම් ලබන්නේ නොකෙලෙසෙන්නේ ය.

යම් කෙනෙක් අනුන්ට අවවාද කෙරෙත් නම්, ඔවුන් පළමු කොට එබඳු ගුණයෙහි පිහිටා ගත යුතු ය. තමන් ගුණයෙහි පිහිටා සිට අනුනට ද එලෙසින් අවවාද කළ යුතු ය. යම් කෙනෙක් තමූ එබඳු ගුණයෙක නොපිහිටා අනුනට අවවාද කෙරෙත් නම්, ඒ අවවාද පිළිගන්නෝ නැත. තමූ ම නින්ද පරිභව ලබන්නෝ ය. යම් කෙනෙක් පළමු කොට ගුණයෙහි පිහිටා අනුනට අවවාද කරන්නෝ නම්, ඔවුහු පැසසුමට බඳුන් වෙති.

ධම්දෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු දෙන ම සෝවාන් පලයෙහි පිහිටියාහු ය. ධම්දෙශනාව මහජනයාට වැඩ සහිත වූ ය.

උපනන්දස්ථවිරවස්තුව නිමි.

පධානික තෙරුන්ගේ බණ

12 - 3

පධානික ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් වෙතින් කමටහන් උගෙණ තවත් මහණුන් පන් සියයක් කැටුව වනයට ගියහ. වනයට ගොස් එහි වස් එළඹියහ. වස් එළැඹි දිනයෙහි සෙසු වහන්දැට "තමුන්නාන්සේලා මෙහි ආවහු, ජීවමාන බුදුරජුන් වෙතින් කමටහන් උගෙණ ය. එහෙයින් නො පමා ව මහණදම් කරවු" යි කියා තෙමේ ගොස් නිදන්නේ ය. සෙසු මහණෝ මුල් යම සක්මන් කොට මැදුම් යම වෙහෙරට වැද ගණිත්. පධානික ස්ථවිර තෙමේ නිදු නැගිට ඒ මහණුන් වෙත ගොස් "කිම, ඔබ උන්නාන්සේලා කැලයට ආවෝ, නිද ගැණුමට ද, වහා නැගිට ගොස් මහණදම් කරවු" යි තෙමේ ගොස් එසේ ම නැවැතත් නිදයි. අන් මහණෝ මැදුම් යමෙහි ද එලි බැස සක්මන් කොට පාන් වන්නට ලං වත් ම වෙහෙරට වැද හිඳිත්. පධානික තෙමේ නැවතත් නින්දෙන් නැගිට මහණුන් වෙත ගොස් ඒ මහණුන් වෙහෙරින් එලියට ඇද දමා අවුත් නැවතත් නිදයි. පධානික ස්ථවිරයන් නිතර මෙසේ කරණ බැවින් ඒ සෙසු මහණෝ හැදෑරීමක් කමටහන් වැඩීමක් කර ගන්නට නො හැකි ව කලකිරීමට පත් වූහ. සිත් අන් අතට පෙරළිත. එකල්හි ඒ භික්ෂූන් වහන්සේලා "අපේ ස්වාමීන් වහන්සේ ඉතා ඕනෑකමින් මහණකම ගැණ උත්සාහයක් දක්වති, උන්වහන්සේ එය කෙසේ කරත් ද යි අපත් පරීක්ෂා කොට බැලිය යුතු ය" යි පරීක්ෂා කරන්නෝ, ඔහු මහණකම කැණ හැටි දැක 'ඕ, වැඩේ වැරදුනි, අපේ ස්වාමීන් වහන්සේ බොරුවට හඬ නගන්නෙකැ" යි කියන්නට වූහ. ඒ භික්ෂූන් වහන්සේලා නිදි වැරීමෙන් තදින් වෙහෙසට පත් වී කිසි විශෙෂගුණයක් උපද වන්නට නො හැකි ව වස් අවසන් කොට පවරා බුදුරජුන් වෙත ගොස් පිළිසඳර කතාවට වැටුනාහ. බුදුරජාණන් වහන්සේ "කොහොම ද, තමුසේලා මහණදම් පිරූ වහු ද?" යි අසූහ. එ වෙලෙහි ඒ භික්ෂූහු එහි දී සිදු වූ හැටි දන්වා සිටියහ. "මහණෙනි! ඔය උන්නාන්සේ තමුසේලාට පෙරත් ඔය හැටියට ම අන්තරාය කළහ" යි වදළ කල්හි "ස්වාමීනි! ඒ වදරණු මැනවැ" ඔවුහු ආරාධනා කළහ. එකල්හි බුදුරජාණන් වහන්සේ

"දැහැමි මවුපිය වෙත - නො වැඩී ගුරුකුලයෙහි නිසි
නො වැසි මේ කුකුළු - කල් නො කල් නොම දන්නේ"

යි අකාලරාව් කුක්කුටජාතකය වදළ සේක. නැවත උන්වහන්සේ "මහණෙනි! මේ පධානිකයා එද ඒ කුකුළා ය. මේ පන් සියයක් දෙන එද ඒ තරුණයෝ ය. දිසාපාමොක් ඇදුරු මමැ" යි ජාතකය විස්තර කොට වදරා "මහණෙනි! අනුනට බණ කියන්නහු, හොඳට හැදුනකු

ාකු විය යුතු ය. දුමුනකු භික්මුනාකු විය යුතු ය. බණදහම් දන්නකු විය යුතු ය. මෙසේ අවවාද කරන්නේ හොඳට දුමුනෙක් ව පරහු දමින්නෙක් ාදන්නෙක් වන්නේ ය'' යි මේ ධම්දෙශනාව කළ සේක.

අත්තානං වෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති,
සුදන්තෝ වත දමෙථ අත්තා හි කිර දුද්දමොති.

පරහට යම් ලෙසකින් අනුශාසනා කෙරේ නම්, තමාත් ඒ අනුශාසනා ලෙසින් කරන්නේ නම්, එකාන්තයෙන් තෙමේ මනා ව දුමුනේ පරහු දමන්නේ ය. ආත්මශ දමන්නට දුෂ්කරය.

අත්තානං ෙව තථා කයිරා යථා අඤ්ඤං අනුසාසති=යම් ලෙසකින් පරහට අනුශාසනා කෙරේ නම්, තමාත් එසේ ම කරන්නේ ය.

''සත්තු නො මැරිය යුතු ය. හොරකම් නො කළ යුතු ය. පරඹුවෝ නො සෙවිය යුතු ය. පාපුරුෂයෝ නො ගත යුතු ය. බොරු නො කිය යුතු ය. මත් පැන් නො පිය යුතු ය. මහණදම් කළ යුතු ය. සිල් පිරිසිදු කර ගත යුතු ය. පොහොය කළ යුතු ය. ඇවැත් නො වැදිය යුතු ය. ඇවැත් දෙසිය යුතු ය. පිරි වෙස් පිරිය යුතු ය. මානත හැසිරිය යුතු ය. අබ්භාන කළ යුතු ය. වත් පිළිවෙත් පිරිය යුතු ය. ගම් නො වැදිය යුතු ය. වැඩි මහල්ලෝ පිදිය යුතු ය. තෙරුවන් වැඳිය යුතු ය. කැමි පිම් හිඳිනා ගෙවල තබා නො ගත යුතු ය. නො සුදුසු වේලෙහි කෑම්පිම නා ඇල්ලිය යුතු ය. නො නිදිය යුතු ය. නිදි වැරිය යුතු ය. භාවනා කළ යුතු ය. නීවරණයන්ගෙන් සිත පිරිසිදු කර ගත යුතු ය. කෝලාහල නා කළ යුතු ය. අකැපදෙය හළ යුතු ය'' යනා ඈ ලෙසින් පරහට යම් ලෙසකින් අනුශාසනා කරන්නේ නම්, බණ කියන්නේ නම්, තමාත් මේ කියූ ලෙසින් වර?න්, නො කළ යුත්තෙන්, පවින්, අකුශලයෙන් අස්විය යුතු ය. යමෙක් පවිකම් ශකරේ නම්, වරදෙහි බැඳේ නම්, අකැපයෙහි ශයදේ නම්, ඔහු සද්ධිවිහාරික-අන්තෙවාසික-දයකාදි කිසිවකු වරදින්. නො කළ යුත්තේ පවින් අකුශලයෙන් මුදු ලන්නට අපොහොසත් වේ. ඔවුනට හිනුවැඩ සැලසීමෙහි අසමර්ථ වේ. බොහෝ දෙන පරහට අනුශාසනා කරන්නෝ ය. බණ කියන්නෝ ය. එහෙත් ඒ අනුශාසකයෝ බණ කියන්නෝ වැඩි දෙන පව් කම් කරන්නෝ ය 'වරදෙහි යෙදී සිටින්නෝ ය. අවැඩ කරන්නෝ ය. මෙසේ පවිකම් කරමින් වරද කරමින්, අවැඩ කරමින් පරහු වරදින් මුදු ලන්නට අනුශාසනා කරන්නෝ, බණ කියන්නෝ ශිහි පැවිදි දෙපසෙහි ම බහුල ව දක්නා ලැබෙත්.

සුදන්තෝ වත දමෙථ = තෙමේ මොනවට දුමුනේ පරහු දමන්නේ ය.

යමෙක් යම් ධර්මයකින් ශාස්ත්‍රයකින් ඉණයකින් මොනවට දුමුනේ ද, වැඩුනේ ද, ඔහු ඒ තමන් දුමුනු වැඩුණු ධර්මයෙන් ශාස්ත්‍රයෙන් ඉණයෙන් පරහු ද දමන්නේ ය. වඩන්නේ ය. තෙමේ නො දුමුනේ නො වැඩුනේ

දරුණු දමන්නේ ය. වඩන්නේ ය. යනු නොඇදහිය හැකි ය. අදහන්නට කරුණු නැත්තේ ය. නොදමුනෙක් අන්හු දමන්නේ ය. නොඋගතෙක් අන්හු උගත් කරන්නේ ය. අශික්ෂිතයෙක් අනුන් ශික්ෂිත කරන්නේ ය. යනු නොපිළිගැනෙන්නේ ය.

"ජාතිමාත්‍රයෙන් මහාපුරුෂභාවයට පත් වූවෝ ද, ඉණුනුවණින් නොදමුනෝ නොවැඩුනෝ අන්හු දමන්නට වඩන්නට අපොහොසත් වෙති" යනු එකාන්තය. "එතෙර වුනෙම් අන්හු එතෙර කරන්නෙමි, මිදුනෙම් අන්හු මුදන්නෙමි. දමුනෙම් අන්හු දමන්නෙමි" යන මහාපුරුෂවචනයෝ සාධක වෙති.

අත්තාහි කිර දුද්දමෝ = ආත්මදමනය දුෂ්කර ය. ආත්මය දමනය කිරීම පහසු නොවේ.

මෙහි අත්තා යනු සිත ය. චිත්තදමනයට ආදියෙහි ශීලයෙන් මධ්‍යයෙහි සමාධියෙන් අවසානයෙහි ප්‍රඥාවෙන් හික්මිය යුතු ය. මුළුමනින් චිත්තදමනය වනුයේ, සිවු වැදැරුම් මගපල නුවණින් අක් මුල් නොකියැකි කලක පටන් සිතෙහි තැන්පත් ව එන රාග වෙෂ මොහා දී වූ බලතර කෙලෙසුන් ඉකිරි නොකොට සිඳ හැරීමෙන් ය. සිත දමුනේ නම්, එවිට ය. ඉන් මෙ පිට චිත්තදමනය ධර්මශාස්ත්‍ර ඉගෙණීමෙන් ආචාර්‍යෝපාධ්‍යාය මාතෘ පිතෘ ආදීන්ගේ අවවාදයෙන් කල්‍යාණමිත්‍රයන්ගේ ආශ්‍රයෙන් ඔවුන්ගේ සෙවනයෙන් දහැමි වට පිටාව හා ගැටීමෙන් වන්නේ ය. නැත, ඔතින් බුලතින් ඇදුමෙන් කැඩුමෙන් කුලයෙන් ධනයෙන් නොවන්නේය. කරුණු මෙසේ බැවින් ලොකයෙහි වූ දුෂ්කර ක්‍රියාව නම්, සිත දමනය කිරීමැ යි බුදුරජානන් වහන්සේ වදළ සේක.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ පන් සියයක් දෙනා වහන්සේ රහත් ඵලට පැමිණියාහු ය.

ප්‍රධානිකතිෂ්‍යස්ථවිරවස්තුව නිමි.

කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ

12 - 4

බුදුසසුනෙහි නම් පතළ මහතෙරුන් අතර කුමාරකාශ්‍යප මහාස්ථවිරයන් වහන්සේ ද කෙනෙක් වූහ. උන්වහන්සේගේ මැණියෝ රජගහනුවර එක්තරා සිටුවරයෙකුගේ දුවක් වූහ. ඕ තොමෝ සිය නුවණ මෝරා ගිය කැන් පටන් මහණ වීමෙහි කැමැත්ත දක්වා ඒ පිණිස මවුපියන්ගෙන් අවසර ඉල්ලා සිටියා ය. එහෙත් ඇයට මවුපියන්ගෙන් ඒ පිණිස අවසර නො ලැබුනේ ය. නිතර නිතර පැවිද්දට අවසර ඉල්ලමින් කල් ගෙවූ ඇයගේ වයස මෝරා ගියේ ය. දිග යැමට සුදුසු වයසට පත් ඕ තොමෝ මවුපියන්ගේ ඇවිටිල්ලෙන් දිග ගියා, පතිදෙවතාවූවක් ව පතිකුල යෙහි වාසය කළා ය. ටික කලකට පසු ඇය කුස දරු ගැබෙක් පිහිටියේ ය. ඒ බව නො දත් ඕ තොමෝ හිමියා සතුටු කොට පැවිදි වන්නට අවසර ඉල්ලූ ය. එවිට ඔහු ඇයට හැම සත්කාරයක් ම හැම සම්මානයක් ම කොට මෙහෙණවරකට කැඳවා ගෙණ ගොස් නො දනීමෙන් දෙවදත්ත ස්ථවිරයන්ගේ පක්ෂයෙහි වූ මෙහෙණන් වෙත පැවිදි කරවී ය.

එයින් ටික දවසක් ගිය තැන එහි මෙහෙණෝ ඇය ගැබනියක බව දැන "මේ කිමැ?" යි ඇසුහ. "ආර්‍යාවෙනි! මොන ලෙසකින් මේ සිදු වී දැ යි කියන්නට මම නො දනිමි. පැවිදි වූවාට පසු මේ බන්දකට හෙතු වූ ක්‍රියාවක මම නො යෙදුනෙමි. එහෙයින් මාගේ ශීලයට විපතක් නොවූ ය. මාගේ සිල් නම් පිරිසිදු ය. ඒ එකාන්තය" යි ඕ තොමෝ කිවු ය. එකල්හි මෙහෙණෝ ඇය දෙවදත්ත තෙරුන් වෙතට ගෙණ ගියහ. "ස්වාමීනි! මේ මෙහෙණ සැදහැයෙන් පැවිදි වූ තැනැත්තියක, එහෙත් මැයගේ කුස දරුවකු පිළිසිඳ ගත් අයුරෙක් පෙණේ, මේ කොයි කලෙක සිදු වූවෙක් දැ යි අපට දැනුම් නැත. එහෙයින් දැන් මේ ගැණ කුමක් කරමුදැ?" යි මෙහෙණෝ කීහ. දෙවදත්ත ස්ථවිර තෙමේ "මැය නිසා මාගේ මෙහෙණන්ට නින්දවක් ලැබෙන්නට ඉඩ දිය නො හැකි ය" යි සිතා "මැයගේ සිවුරු ගලවා පිටත්කර හරිවු" යි නියම කෙළේ ය. එකල්හි ඕ තොමෝ "ආර්‍යාවෙනි! මා නො නසවු, මම පැවිදි වූවා, මේ දෙවදත්ත තෙරුන් බලා නො වෙමි. මාගේ පැවිද්ද දෙවදත්ත තෙරුන් පිළිබඳ නො වේ. එහෙයින් කරුණා පෙරදැරිව මා බුදුරජුන් වෙත ගෙණ යනු මැනවැ" යි කියා සිටියා ය. මෙහෙණෝ ඇය දෙවිරමට ගෙණ ගොස් බුදුරජුන්ට දැන් වූහ. බුදුරජානන් වහන්සේ ඇයගේ දරුගැබ ගිහිකල පිහිටි බව දක්නා සේක් ද, රටවැසි මහා ජනයා අතර හටගන්නා වූ වැරදි කතාවන්ට ඉඩ නො තබනු පිණිස, පසේනදි කොසොල් රජතුමන් අනේපිඬු මහසිටුතුමාත් සුලු අනේපිඬු සිටුතුමාත් විසාඛාමහඋවැසියත් තවත් රටේ පතළ නම් ඇති කිහිපදෙනෙකුත් ගෙන්වා උපාලි මහතෙරුන් කැඳවා "තමුසේ ගොස් මේ දරිය සිවු පිරිස මැදට පමුණුවා මේ දරු ගැබ කවද

පිණිටි එකෙක් දැ යි මෙයා බලා දන් වන්නැ'' යි අණකළ සේක. උන්-වහන්සේ විසාඛා උවැසිය රජුන් ඉදිරිපිටට පමුණුවා මේ විනිශ්චය ඇයට භාර කළහ. විශාඛාවෝ කිරයක් අද්දවා ඇය කිරය තුළට ගෙණ ඇයගේ අත් පා පෙදකණි උදර ඇ හැම තැනක් බලා මාස දින ගැණ දරුගැබ පිණිටිසේ ගිණිකල්හි ය'' යි උපාලි තෙරුන්ට දැන් වූහ. එවිට උන්වහන්සේ ඇය පිරිසිදු තැනැත්තියක බව සිවු පිරිස මැද ප්‍රකාශ කළහ. ඒ මෙහෙණ එයින් දවසකට පසු පියුමතුරා බුදුරජුන් වෙත පැතූ පැතුම් ඇති මහපිණැති පුතකු වැදූ ය.

දවසක් රජ තෙමේ මෙහෙණවර ලඟින් යනුයේ කුඩා දරුවකු හඬනු අසා ''කිමැ'' යි රාජසේවකයන් අතින් විමැළේ ය. ඔවුන් ''දේවයන් වහන්ස! මෙහෙණකට පුතෙක් ලැබී ඇත්තේ ය. මේ ඒ දරුගේ හැඩිමැ''යි කී කල්හි ඒ දරු රජගෙට ගෙන්වා කිරිමවුන්ට භාර කොට ඇති දැඩි කර වී ය. නම් තබන ද 'කාශ්‍යප' යි නම් කෙළේ ය. රජකුමරකු වඩනා පරිද්දෙන් වැඩුනු බැවින් පසු කාලයෙහි කුමාර කාශ්‍යප යි හේ ප්‍රසිද්ධ විය. මේ කුමරු සෙල්ලම් පිටියෙහි සෙල්ලම් කරන්නේ එහි රැස් වන අනික් දරුවන්ට සෙල්ලම් පිණිස අතින් පයින් පහර දෙයි. එවිට අන් දරුවෝ ''මේ අම්මා නැති පියා නැති එකෙක් අපට පහර දේ ය'' යි කැමොර ගසති. කුමරකසුප්, රජුවෙත ගොස් ''දේවයන් වහන්ස! කොල්ලෝ මට අම්මා නැති එකෙක, පියා නැති එකෙකැ යි නිගා කරති. මාගේ අම්මා කවු ද? පියා කවු ද? කියන්නැ'' යි කී ය. රජ තෙමේ කිරිමවුන් පෙන්නා ''මේ ඔබගේ මැනිවරු'' යි කී ය. ''එකකුට මැනිවරු හුගක් නො විය හැකි ය. එකකුට එක මැනියක විය යුතු ය. කෝ මාගේ අම්මා'' යි කුමාර තෙමේ නැවතත් ඇසි ය. එවිට රජ තෙමේ මේ දරු රවටනු නො හැකිය'' යි සිතා ''පුත! ඔබගේ අම්මා මෙහෙණක් ය. මම ඔබ මෙහි ගෙණ අවුත් වැඩිමි'' යි දැක් වී ය. එ පමණින් උපන් සංවේග ඇති ඒ දරු ''පියානන් වහන්ස! මා පැවිදි කරවන්නැ'' යි කී කල්හි ''යහපතැ'' යි කියා මහත් සත්කාරයෙන් යුක්ත ඔහු බුදුරජුන් වෙත ගෙණ ගොස් පැවිදි කර වී ය. ඔහු ලැබූ උපසම්පද ව ඇත්තේ, කුමාරකාශ්‍යප යි හැම තැන පකළේ ය. නැවත උන්වහන්සේ බුදුරජුන් වෙතින් කමටහන් කියවා ගෙණ වන වැද උත්සාහ කරණුවෝ, විශෙෂගුණයක් ඉපදවීමෙහි අපෙ-හොසත් ව නැවතත් කමටහන් පැහැදිලි ලෙසින් කියවා ගණිමි යි බුදුරජුන් වෙත ගොස් කමටහන් කියවා ගෙණ අන්ධවනයෙහි නවාතැන් ගත්හ.

එ දවස කසුප් බුදුරජුන්ගේ සසුන්හි එක් ව මහණදම් කොට අනාගාමි-ඵලයට පැමිණ බ්‍රහ්මලොකයෙහි ඉපද සිටි එක් මහණෙක් බඹලොවින් බැස ඔහු වෙත ගොස් ප්‍රශ්න පසළොසක් විළියෙල කොට දී ''මේ ප්‍රශ්න-යන්ට පිළිතුරු දිය හැක්කෝ බුදුරජානන් වහන්සේ ය. එහෙයින් උන් වහන්සේ වෙත ගොස් මේ ප්‍රශ්නයන්ගේ පිළිතුරු අසා දන උගණුව'' යි

කුමරකසුජ තෙරුන් බුදුරජුන් වෙතට පිටත් කෙළේ ය. ස්ථවිර තෙමේ තමන් ඇසූ ප්‍රශ්න බුදුරජුන් විසඳා අවසන් වත් ම රහත්පලයට පැමිණියේ ය. තෙරුන් මැනියන්ගෙන් වෙන් වූ ද සිට දෙළොස් අවුරුද්දක් ම ඇයගේ නෙත්වලින් කඳුළු කඩා වැටුනේ ය. දවසෙක ඕ තොමෝ කඳුලෙන් තෙත් වූ මුණු ඇති ව පිඬු සිහා යන්නී, එක් වීථියක දී තෙරුන් දැක "පුතේ! පුතේ! මදක් නවතින්නැ" යි කිය කියා තෙරුන් අල්ලා ගන්නට දුවන්නී, බිම ඇද වැටුනා ය. තන පුඩුවලින් කිරි වැගිරෙත් ඒ තැනින් නැගිට තෙමුණු සිරුරු ඇත්කි දුව ගොස් තෙරුන් අල්ලා ගත්තා ය.

ඉක්බිති ස්ථවිරයන් වහන්සේ "යම් ලෙසකින් දැන් මැගෙන් මිහිරි බසෙක් ලැබුනේ නම්, ස්නෙහය ඉවසා ගත නොහී මෝ තොමෝ මේ තැන ම මැරෙන්නී ය. දැන් මැයට මිහිරි බසින් කතා කිරීම සුදුසු නො වේ. තද ගකියම පෙන්විය යුතු ය" යි සිතා "මෙහි හැසිරෙහි කුමක් නිසා ද? තව ම ස්නෙහය අත් හරින්නට නොහැකි වූ ද? කුමක් නිසා ය ඔ තරම් ඇඩුම් දෙඩුම්? පැවිදි ව සිටත් උනුන් කෙරෙහි ආලය කිරීම සුදුසු ද?" යි හඬ නගා කිහ. "අයියෝ! අපේ ස්වාමීන් වහන්සේගේ කථා ව රළු ය, තද ය" යි සිතා "පුත! කුමක් කියහු ද?" යි ඇසූ ය. ස්ථවිරයන් වහන්සේ ඒ වරත් එසේ ම කිහ. එවිට ස්ථවිරා තොමෝ "මා මොහු නිසා දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි වැගිර වූ කඳුළු අපමණ ය. ඇස් දෙකින් නැග එන කඳුලු දරා ගන්නට අදත් නොහැකිය. මොහු මට තද ගති පෙන්වයි. පපුවේ මොළොක් බවෙක් නැත. මට දැන් මොහුගෙන් ඇති කාරිය කුමක් ද" යි පුතා කෙරෙහි තිබූ ආලය හැර දැම්මා, එ දවස ම රහත් වූ ය.

මේ අතර භික්ෂූන් වහන්සේලා ධර්මශාලාවට රැස් වූහ. "අයියෝ, දෙවිදත්, කුමාරකාශ්‍යප ස්ථවිරයන් හා ඒ ස්ථවිරයන්ගේ මැනියන් නසා දැම්ම කොතරම් සැහැසි ද, නපුරු ද, බුදුරජානන් වහන්සේ පිහිට නො වූ සේක් නම්, ඒ දෙ දෙනාගේ ජීවිත අවසන් වී යනු ඒකාන්ත ය. ආශ්චර්ය අතක් පිදුවු ඳයක් කවුරු දනිත් ද, බුදුරජානන් වහන්සේගේ අනුකම්පාව කොතරම් මහත් ද, කොතරම් පුදුම ද, බුදුවරයෝ ලොවට අනුකම්පා කරන්නෝ ය" යි කතා කරන්නට වූහ. මේ වේලෙහි බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක. එහි දී භික්ෂූන් කළ කතාව අසා "මහණෙනි! ඔය දෙපලට ඔම පෙරත් පිහිට වීම්, දැන් පමණක් පිහිට වූයේ නොවේ" යි.

"නුගමුව සෙවුම යුතු - සාමුව සෙවුම යුතු නැත,
නුගමුව වෙත මැරුමකුම - නො තුම් සාමුව වෙත දිවි"

යි නිග්‍රෝධමිගජාතකය වදළ සේක. නැවත උන්වහන්සේ "මහණෙනි! මේ දෙවදත්ත තෙමේ එදා සාධමෘගයා ය. දෙවදත්තගේ මේ දැන් ඉන්නා පිරිස එදා සාධමෘගයාගේ මුවරැල ය. මරණයට බිලි ව සිටි මුවදෙන මේ

මෙහෙණ ය. මුවපැටවා කුමාරකාශ්‍යප ය. ගැබිනි වූ මුවදෙනට දිවි දුන් නිග්‍රෝධ මුවා මමැ'' යි ජාතකය ගළපා, පුත් කෙරෙහි වූ ආලය හැර මෙහෙණ තමාට පිහිටක් කර ගත් බව වදරණ සේක්. ''මහණෙනි! මේ ලොකයෙහි කිසිවකුටත් තමන් කරණ සග පවග දෙන පින්කමකින් අනෙකකුට පිහිටක් කරණු නො හැකි ය. තෙමේ තමාට පිහිට ය. අනෙකෙක් අනෙකකුට ස්වර්ගාපවර්ගසම්පත් දීමෙන් පිහිට වීමට පොහොසත් නො වේ. තමා ම තමාට පිහිට විය යුතු ය. තමා ම ස්වර්ගමාර්ගයත් මොක්ෂමාර්ගයත් සිදු කර ගත යුතු ය. අනෙකෙක් අනෙකකුට මේ අකින් කුමක් කරන්නේ ද'' යි මේ ධර්මදෙශනාව කළ සේක.

අත්තා හි අත්තනෝ නාථෝ කෝ හි නාථෝ පරෝ සියා,
අත්තනාහි සුදන්තෙන නාථං ලභති දුල්ලභන්ති.

තෙමේ ම තමාට පිහිට ය. අන් කවරෙක් නම්, පිහිට වේ ද මනා කොට දමුනු තමන් විසින් ම, ලබන්නට දුෂ්කර වූ පිහිට ලබයි.

අත්තාහි අත්තනෝ නාථෝ = තෙමේ ම තමාට පිහිට ය. තමාට පිහිට වන්නේ තෙමේ ය.

''තමාගේ හිසට තමාගේ අත ය'' යන පිරුළට පදනම් වූවා ද මේ දෙශනා ය. තමාට පිහිට වන්නාවූ තමා ම බව 'හි' යන්නෙන් තහවුරු කළ හ. එහෙයින් නියම පිහිට මිනිසුන් දෙවියන් බඹුන් යකුන් රකුස් මරුන් ඇ මොවුන්ගෙන් පැතීමෙන් යැදීමෙන් කිසි ලෙසකින් කිසි කලෙකත් සිදු නො වන්නේ ය. සඵල නො වන්නේ ය. ඒ පැතීම් යැදීම් මිථ්‍යාවක් වේ. ලෞකිකජීවිතය හැඩගසා ගැනීමෙහි ලා මද වහළෙක් දෙවියන්ගෙන් නො ලැබෙන්නේ නො වේ. ''තමහට තෙමේ පිහිටැ'' යි වදළ වචනයෙන් එය බැහැර කරණු ලද්දේ ද නො වේ. ලෞකිකජීවිතයට දෙවියන්ගේ අනුකම්පාව ලැබිය යුත්තී ය'' යි බුදුරජානන් වහන්සේ ද වදළ සේක. ලෞකික ජීවිතය සඳහා දෙවියනට පින්බලි දීම වරද නො වේ. එයට දෙවියන්ගේ පිහිට ලැබේ.

නාථ නම්, හිත වැඩ පතන්නේ ය. කමාට හිත වැඩ පතන්නා තමා ම බැවින් ''**අත්තා හි අත්තනෝ නාථෝ**'' යනු වදළාහු ය.

''**නාථතීති-නාථෝ**'' යනු නිරුක්ති යි 'නාථ' ශබ්දයාගේ සිද්ධියට මුල් වූ 'නාථ' ධාතුව **යාචන-උපතාපන-ඉස්සරිය-ආසිංසන** යන අර්ථ සතරෙක ඒ, යි ශබ්දලක්ෂණකාරයෝ කියත්. ඒ අනුව නාථ ශබ්දය ''**නාථති සත්තානං හිතං යාචති, කිලෙසෙ වා උපතාපෙති, සග්ගෙසු වා ඉස්සරියං කරොති, කෙසං වා හිතං ආසිංසතීති = නාථෝ**'' යි විවරණය කරත්. මෙහි යාචනාර්ථයෙන් නාථ යි ගන්නේ නම්, හිහන්නා නාථ යි ගත යුතු වේ. එ කල්හි ස්වයම්ප්‍රභූත්වයෙන් දිවි යවන්නේ, අනාථ නම් වේ. ඒ

ඵසේ නො ගත යුතු ය. නාථ ශබ්දය යාවනාදිඅර්ථයන්හි පවත්නේ ලොක සඞ්කෙත වසින් උත්තමපුරුෂයන් කෙරෙහි නැඟී සිටියේ ය. භාග්‍ය වත් බුදුරජානන් වහන්සේ උත්තම පුරුෂයන් අතරෙහි අත්‍යුත්තම වෙත්. උන්වහන්සේ හැම සතුන් කෙරෙහි උස් මිටි කම් නො බලා සමානුකම්පික ව හිත වැඩ පතන සේක. එහෙයින් නාථ ශබ්දයෙහි එන යාවනාර්ථය දැන් සාර්ථක වී සිටියේ ය. හිහන්නකු කෙරෙහි නාථ යනු නො නඟින්නේ ය. ''දස ඉමෙ භික්ඛවෙ! **නාථ කරණධම්මා**'' යි අඞ්ගුත්තරනිකාය යෙහි දසමනිපාතයෙහි එන නාථ කරණධර්ම දශය ද මෙහි ලා දත යුතු ය. සිල්වත් බව - බොහෝ ඇසූ පිරූ තැන් ඇතිබව - කලණමිතුරුබව - කීකරු බව - සබ්‍රහ්මචාරීන්ගේ කුදු මහත් කටයුතුවල දක්ෂභාවය - ධර්ම කාමීභාවය--පටන් ගත් වීර්‍ය ඇති බව-යථාලාභසන්තොසය-සිහි ඇති බව -නුවණැති බව යන මෙ දශය නාථකරණධර්ම නම්. විස්තර එයින් දන්නේ ය. මොවුහු තමතමන් විසින් නිපද විය යුතු වූ විශෙෂාධිගමයෙහි ප්‍රධාන ව සිටුනා අර්ථයෙන් නාථකරණ නම් වෙත්.

කොචි නාථො පරො සියා = අන් කවරෙක් නම් පිහිට වේ ද.

තම තමන්ගෙන් අන්‍ය වූ කිසිවකුට ලෞකික-ලොකොත්තර වශයෙන් පවත්නා භව-විභවසම්පත්තීන් සද දීමට පොහොසත් වූ කිසිවෙක් මේ ලොකයෙහි නැත්තේ ය. කිසිවකු විසින් කිසිවකුට ඒ සද දිය නො හැකි ය. ඒ පිණිස ධම්මොපදෙශ නම් දිය හැකි ය.

අත්තනා එව සුදන්තෙන = හොඳට දමුනු තමා විසින් ම.

කය-වචන-සිත යන මෙතැන්හි වූ හැම සැඩ පරොස් ගතියක් ම ඒ ඒ ධර්මයන්ගෙන් නසා සිටියහු විසින් ම, චක්ෂුරාදි ඉන්ද්‍රියයන් දමනය කිරීම වශයෙන් ආත්මදමනය කොට සිටියහු විසින් ම.

නාථං ලභති දුල්ලභං = ලබන්නට දුෂ්කර වූ පිහිට ලබයි.

යමෙක් පිළිවෙත් සරු ව කුසල් දහම් කළේ නම්, ඔහු ලබන්නට නො හැකි වූ ලබන්නට දුෂ්කර වූ පිහිට ලබන්නේ ය යන අරුත් ය. මෙහි ලබන්නට අපහසු ලබන්නට නො හැකි වූ පිහිට නම්, රහත්බව ය. ඒ මේ රහත්බව නමැති පිහිටෙන් යමෙක් පිහිට සහිත වූයේ, සනාථ වූයේ නම්, නැවත කිසි කලෙකත් අනාථ නො වන්නේ ය. පිළිවෙතින් තමා දමා සිටියේ ම මෙයින් සනාථ වන්නේ ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

කුමාරකාශ්‍යපස්ථවිරවස්තුව නිමි.

මහාකාලයාට වූ විපත

12 - 5

මහාකාල උපාසක තෙමේ නුවණැත්තේ සැදැහැ ඇත්තේ ය. ඔහු මාසයකට අට දිනක් පෙහෙවස් සමාදන් ව වෙහෙර ම නැවතී බණ අසයි. එ දවස එක් රෑයක සොරු ගෙයක් බිඳ එහි වූ බඩු මුට්ටු පැහැර ගෙණ ගියහ. ලොහොං බඳුන් එකට හැපීමෙන් හට ගත් හඬින් නැගී සිටි ගෙවැස්සන් විසින් ලුහු බඳිනා ලද සොරු, පැහැර ගත් බඩු ඒ ඒ තැන දමා පලා ගියහ. ගෙවැස්සෝ ද ඔවුන් නො හැර පසුපස දිවූහ. එහෙත් ඔවුහු හොරු අල්ලා ගැනීමෙහි අසමත් වූහ. හොරුන්ගෙන් එකෙක් වෙහෙර මඟින් ගොස්, රෑ බණ අසා අවසන් කොට අලුයම එ තැනින් නැගිට ගොස් විල් ඉවුරෙක හිඳ මුණකට සේදූ මහාකාල උපාසකයාගේ ඉදිරියෙහි සොරා ගත් බඩු මිටියක් හෙලා පැන ගියේ ය. සොරුන් පසුපස ආ මිනිස්සු ඒ බඩු මිටිය දැක, මහාකාල උපාසකයා අල්ලා ''තෝ ඊයේ රෑ අපගේ ගේ බිඳ බඩු පැහැර ගෙණ අවුත්, දැන් මෙහි උපාසකයකු සේ හැසිරෙති'' යි උපාසකයාට තදින් පහර දුන්හ. උපාසක තෙමේ එතැන ම මළේ ය. උදැසන පැන් ගෙණෙන්නට පොකුණට ගිය සාමණේරයෝ මහාකාලයාගේ මලකඳ දැක කම්පිත ව, ''අයියෝ'' වෙහෙර බණ අසා නිදුහුන් උපාසකයා මැරී වැටී සිටී, මේ මරණය අසුතු මරණයෙකැ'' යි බුදුරජානන් වහන්සේටු දැන් වූහ. එවිට උන් වහන්සේ ''මේ අවස්ථාවේ හැටියට මේ මරණය අයුතු ය. පෙර කළ කම් ගැණ සිතන්, ඔහු ලැබූ මේ මරණය ඒ කම්යෙක විපාක බැවින් අයුතු ය යි නො කියැකි ය'' යි වදළ විට භික්ෂූන් වහන්සේලා ''ඒ කළ කම් වදරණු මැනවැ'' යි ඇයැද සිටියහ. බුදුරජානන් වහන්සේ,

''මහණෙනි! යටගිය දවස බරණැස් රජුට අයත් පිටිසර ගමක් අසල මහත් වනයෙක් විය. ඒ වනය ඇසුරු කොට සොරු ගම් පහරන්නට වූහ. එවිට බරණැස් රජ තෙමේ වනයට වදනා තැන වනදෙරකඩ රාජභටයකු නැවැත් වූයේ ය. ඔහු කුලියට රෑ දවල මිනිසුන් එ තෙර මෙ තෙර කරයි. මේ අතර එක් මිනිසෙක් හැඩ රුව ඇති තම් ධිරියත් කුඩා රියෙක නංවා ගෙණ, එ තැනට පැමිණියේ ය. එහි රැකවල සිටී රාජභට තෙමේ ඇය දැක ඇය කෙරෙහි ආලය කෙළේ ය. ධිරියක් රියෙක නංවා ගෙණ එහි පැමිණි මිනිසා ඔහුට කතා කොට ''රාළහාමි! අප මේ වනයෙන් එ තෙර කරවනු මැනවැ'' යි කී කල්හි ''දැන් ඔය තමුසේ කියන එක මේ රෑ මට කරන්නට නො හැකි ය. හෙට පාන් වූ සැටියේ ම තමුසේලා කරදරයක් නො වන ලෙස එ තෙරට පමුණුවන්නෙමි'' යි කී ය. එයින් සතුටට නොපත් මඟියා 'ඇයි, රාළහාමි! එසේ කියහි. යම්තම් රෑ වූ සැටියේ? මිනිසුන් එ තෙර කරවන්නට තව කල් තිබෙනවා නො වේ ද? තව රෑ ඛෝ වී, නැක, කරුණා කරන්න රාළහාමි! අපට, අප ඉක්මනට යා යුතු ය. අපි

කරත්තයකුත් ගෙණ ආවමෝ, ඉක්මනට ඇා යුතු ම නිසා ය. යමු රාළහාමි!' යි කියේ ය. එවිට පොලිස් හට තෙමේ 'ඇයි, ඔය තරම් හදිසියෙක්? දැන් මේ රෑ යන්නහු කුමක් කරන්නට? අපගේ ගෙයින් දෙදෙනාට ම කෑම ටිකක් ඔත හැකි ය. රෑ එහි නවතින්නටත් පිළිවන, අපට අපහසුවෙක් නැතැ' යි කී ය. එහෙත් මගියා ඒ කිසිවකටත් කන් නො දුන්නේ ය. යන්නටම උත්සාහ කෙළේ ය. පොලිස්හටයා ඒ අතර ම සිය මෙහෙකරුවන් ලවා මගියා ආ කරත්තය ගොනුන් මුදා පසෙක තබ්බවා, මගියා නවතින්නට නො හැකිබව කියද්දී ම ඔහුට දෙරකොටුවෙහි ඉන්නට සලසා දී රෑ කෑම ද පිළියෙල කරවී ය.

පොලිස්හටයා අත මැණිකෙක් තුබුනේ ය. ඔහු එය මගියාගේ රියෙහි නො පෙණෙන තැනෙක සඟවා තබා රෑ පහන් වූ කල්හි, රෑ සොරු ආ සැටියෙක් හැඟවී ය. මෙහෙකරුවෝ කලබල වූහ. ඔවුහු ගෙයි තුබූ මැණික යොයා බැලූහ. මැණික තුබූ තැන නො වී ය. එයින් වඩාත් කලබල වූ මෙහෙකරුවෝ මැණික සොයන්නෝ 'රාළහාමි! මැණික නැත, අන් හැම එකක් තිබේ. නැත්තේ මැණික පමණැ' යි කීහ. පොලිස් හටයා වහා ගම්දෙර රැකවල් තබා ගම තුළ සිට එන්නන්ගේ අතමිට ඉණ ඉහ පරීක්ෂා කරවූ' යි නියම කළේ ය. මගියා ඉතා අලුයම නැගිට රියෙහි ගොනුන් බැඳගෙණ එ තැනින් නික්මිනි, ඒ වේලෙහි රැකවලෙහි සිටි මිනිස්සු ඔහු නවතා පළමු කොට අතමිට ඉණ ඉහ සොයා බලා නැවත රිය ද පරීක්ෂා කොට බැලූහ. මැණික රියෙහි සඟවා තුබුනේ ය. ඔවුහු මැණික දක "තෝ මැණික සොරා ගෙණ යෙහි" යි පහර දී අල්ලා මුලාදැනියාට භාර කළහ. මුලාදැනියා ද රේ මූට නවාකැන් හා ඔක් බුලත් දුන්නාට වූ කළ උපකාරය නරක ද, ඔය ජඩයා තළා පෙළා මරා දමවූ' යි නියම කෙළේ ය" යි එය මෙසේ ප්‍රකාශ කළ සේක. මහා කාලයා කළ පූර්වකර්මය මෙසේ වදළා වූ බුදුරජානන් වහන්සේ "මහණෙනි! ඔහු ද මැරී ගොස් අවීචි යෙහි උපන, එහි පැසී ඉතිරි වූ පාපයෙන් ජාති සියයකදී ම පහර කා මරණයට පත් විය. මේ පරිද්දෙන් මේ ලොකයෙහි හැම සත්ත්වයෙක් ම තමන් කළ පාපකර්මය නිසා සිවු අපායයෙහි ඉපිද විනාශයට පැමිණේ ය" යි මේ ධර්ම දේශනාව කළ සේක.

අත්තනා හි කතං පාපං අත්තජං අත්තසම්භවං,
අභිමන්ථති දුම්මෙධං වජිරං වස්මමයං මණින්ති.

තමා විසින් ම කළ කමා කෙරෙන් ම උපන් තමා කෙරෙන් ම හට ගත් පාපකර්මය තෙමේ පාෂාණමය වූ මැණික (කා දමන) විදුර මෙන් අඥානයා තදින් මැඩලයි. මිරිකාලයි.

අත්තනා හි කතං පාපං අත්තජං අත්තසම්භවං = තමා ම කළ තමා කෙරෙන් ම උපන් තමා කෙරෙන් ම හට ගත් පාපකර්මය තෙමේ.

''කතං අත්තපං අත්තසම්භවං' යන පද තුණ 'පාපං' යන්න වෙසෙසා සිටියේ ය. 'අත්තනාව' යනු 'අත්තනා හි' විය යුතු ය.

සතුන් මැරීම්, හොරකම් කිරීම්, ඈ ලාමකක්‍රියා කිරීමෙහි දී ඒ කරන්නහුට ඒ වේලෙහි උපදනා චිත්තවීථියෙහි යෙදෙන අකුශල චෙතනාව පාප නම්. ඒ මේ අකුශලචෙතනාව සතුන් මැරීම් ඈ කරන්නහුගේ ම සිත්හි වූවක් බැවින් එය තමා විසින් කරණ ලද්දෙක, තමා කෙරෙහි උපන්නෙක, තමා කෙරෙහි හට ගත්තෙකැ යි වදළ සේක.

අභිමන්ථති දුම්මෙධං වජිරං ඉව අස්මමයං මණිං = පාෂාණමය වූ මැණික (කාදමන) විදුර මෙන් අඥානයා තදින් මඩියි. පෙළයි.

ගලෙන් හටගත් විදුර, තමන් හට ගත් තැන ම හට ගත් මැණික ලොකු කුඩා සිදුරු ඇත්තක් කොට කඩ කඩ කොට පරිභොගයට නො සුදුසු වූවක් කරන්නේ ය. විදුර, මැණික්ගල පරිභොගයට නො සුදුසු වූවක් කරන්නා සේ තමා කෙරෙහි උපන් තමා කෙරෙහි හට ගත් තමා විසින් ම කරණ ලද ප්‍රාණඝාතාදි අකුශලකර්මය තෙමේ, පාපකාරී වූ අඥානයා සිවු අපායයෙහි හෙලා තදින් මඩින්තේ ය. දුක් දෙන්නේ ය. කපන්නේ ය. කොටන්නේ ය. දෙ පලු කරන්නේ ය. කඩකඩ කරන්නේ ය.

වජිර, නම් නවරත්නමාණික්‍ය අතුරෙහි එක්තරා මැණිකෙක. මාණික්‍ය විශෙෂයෝ බොහෝ ය. එහෙත් නවරත්නමාණික්‍ය ම ප්‍රධාන වේ. ඒ ඒ ආචාර්‍යවරයෝ නවරත්නමාණික්‍ය වෙනස් වෙනස් ලෙසින් දක්වත්.

මුක්තාඵල - හීරක - වෛදූර්‍ය - පද්මරාග - පුෂ්පරාග - ගොමෙද - නීලමාණික්‍ය - ගාරුත්මත - ප්‍රවාල යි එකකුගේ නවරත්න ගිණීම ය.

''මුක්තාඵලං හීරකඤ්ච වෛදූර්‍යං පද්මරාගකම්
පුෂ්පරාගං ච ගොමෙදං නීලං ගාරුත්මතන්තථා,
පද්මරාගං මරකතං නීලඤ්චෙති යථාක්‍රමම්'' යනු ඒ ය.

එකෙක්, මුක්තා - මාණික්‍ය - වෛදූර්‍ය - ගොමෙද-වජ්‍ර-විද්‍රැම-පද්මරාග-මරකත-නීලමාණික්‍ය යන මොවුන් නව රත්න කොට ගණියි.

''මුක්තාමාණික්‍ය වෛදූර්‍යගොමෙදන් වජ්‍රවිද්‍රැමෞ,
පද්මරාගං මරකතං නීලඤ්චෙති යථාක්‍රමම්'' යනු ඒ ය.

එකෙක් නවරත්න අතුරෙහි පසක් මහාරත්නැ යි ද සතරක් උප රත්නැ යි ද කියයි. වජ්‍ර-මෞක්තික-මාණික්‍ය-නීල-මරකත යන පස මහාරත්නයෝය. ගොමෙද-පද්මරාග-වෛදූර්‍ය-ප්‍රවාල යන සතර උපරත්නයෝ ය.

"වජ්‍රඤ්ච මෞක්තිකඤ්චෛව මාණික්‍යං නීලමේව ච
තථා මරකතං ඥෙයං මහාරත්නානි පංචධා
ගොමෙදඃ පද්මරාගඤ්ච වෛදූර්‍යඤ්ච ප්‍රවාලකම්,
චත්වාරි උපරත්නානි නවරත්නමිදං ස්මෘතම්" යනු ඒ ය.

මෙහි විස්තරය ඉතා දිග ය. එය යුක්තිකල්පතරුවෙන් දන්නේ ය.

"වජතෙව න පටිහඤ්ඤතෙ යස්ස ගමනං කෙනචීති = වජිරං" යනු අරුත් පැවසීම ය. හැම වස්තුවක් කපා හරින්නේ වජිර ය යි. වජ්‍රයේ ගමන කිසිවකු විසින් වළකාලිය නො හැකි ය.

"පෘථිව්‍යාං යානි රත්නානි යෙ චාන්‍යෙ ලොහධාතවඃ,
සර්වාණි විලිඛෙද්වජ්‍රං තච්ච තෙරූන විලිඛ්‍යතෙ"

යන මෙයිනුදු කියන්නේ ඒ ය. වජ්‍රය පොළොවෙහි ඇති අන් හැම රත්න හා ලොහධාතු කපා හරින්නේ ය. වජ්‍රය ඒ කිසිවකිනුත් නො කැපිය හැක්කේ ය.

හිමාලය - වෙණුවිල - සෞවීරජනපදය - සුරාෂ්ට්‍රදෙශය - කාලිඞ්ගය - කොසල ජනපදය - මාතඞ්ගජනපදය - බිහාරය යනඅට තැන වජ්‍ර හට ගන්නා ස්ථාන වෙකි.

හිමාලයයෙහි හට ගන්නෝ මදක් තඹවන්වෙකි. වෙණුවිලෙහි හට ගන්නෝ චන්ද්‍රකාන්තිය වැනි පැහැ ඇත්තෝ වෙකි. සෞවීරයෙහි හට ගන්නෝ සුදු නෙළුම්මල් පැහැ ඇත්තෝ ය. සුරාට්දෙශයෙහි හට ගන්නෝ තඹවන් වෙකි. කළිඟු රට හට ගන්නෝ රන්වන් වෙකි. කොසොල් රට හට ගන්නෝ කසාවන් වෙකි. මාතඞ්ග දෙශයෙහි හට ගන්නෝ මදක් කසාවන් වෙකි. බිහාරයෙහි හට ගන්නෝ සම්වන් වෙකි.

කෘතයුග - කලියුග දෙකෙහි කොසොල් රටෙහි ද, ත්‍රෙතායුගයෙහි හිමාලය - මතඞ්ගපර්වතයන්හි ද, ද්වාපරයුගයෙහි බිහාරයෙහි හා සුරාෂ්ට්‍ර - යෙහි ද, කලියුගයෙහි වෙණුවිල හා සෞවීරයෙහි ද වජ්‍ර හට ගණිත්.

වජ්‍රයෙහි පෘථිවි - ආපස් - තෙජස් - වායු - ආකාශ යන පංචමහාභූත ගුණ ඇත්තේ ද, තේජෝගුණය අධික වන්නේ ය. සිංහලයෝ දියමන්තිය යි කියත්. වජ්‍ර පැලඳීමෙන් ආයුරාරොග්‍යාදී වූ සම්පත් ලැබෙ ය යි පරශාස්ත්‍රිකයෝ කියත්. විස්තර පිණිස ගරුඩ මත්ස්‍යපුරාණ, භාවප්‍රකාශ, යුක්තිකල්පතරු ආදී ග්‍රන්ථ බැලිය යුතු ය.

ගලින් හට ගත් ද්‍රව්‍ය 'අස්මමය' යි කියනු ලැබේ. මණි ශබ්දයට විශෙෂණ ව සිටි බැවින් මෙයින් ගලින් හට නත් මැණික් ගැණේ. මැණික් ගල අස්මමය යි මෙහි ලා දන්නේ ය.

මාහැඟිබවට, වටිනාකමින් උසස්බවට, සිත් ඇලවිය යුතුබවට, හැම කල්හි හැම තැනෙක ම නො ලැබිය හැකි බවට, උසස් මිනිසුන් විසින් පරිභොග කළ යුතුබවට ගිය ගල්, මැණික් යි කියනු ලැබෙ. "මනති මහග්ඝභාවං ගච්ඡති = මණි" යනු අරුත් මතුකිරීම ය. තව ද යම් ගල් වෙසෙසක් නිසා රන් රිදීයෙන් කළ අබරණ පිදිය යුතුබවට ගියේ ද, ලෝ වැස්සා විසින් පුදනු ලැබෙ ද රන් රිදී ආදීන් පිදිය යුතු බවට පත් කරණ ලද්ද මැණික් යි කියත්. "මියති අතිමානීයති ආභරණං එතෙනාති වා = මණි" යනු ඒ කීම ය.

වජ්‍ර ද මැණික් වෙසෙසෙකි. එය මෙහි වෙන්කොට දැක් වූයේ අන්‍ය මාණික්‍යයනට වඩා මෙහි ලා දැක් විය හැකි විශෙෂාර්ථයක් එහි ඇති බැවිනි. තමන් කළ අකුශලකර්මය තමා ම විනාශයට හෙලන්නේ ය. එමෙන් ගලින් ම හට ගත් වජ්‍රය. ගලින් ම හට ගත් වටිනා මැණික්, සිදුරු සිදුරු කොට කඩා හෙලන්නේ ය. ආත්ම සම්භවපාපයෙහි ද අත්මසම්භවවජ්‍රයෙහි ද ඇති මෙ සමානත්වය දැක්වීමෙන් උපමෙයාර්ථපක්ෂය මැනවින් අවබොධ වන්නේ ය. වෙන් කොට දැක්වුනේ මේ නිසා ය.

ගලින් මැවුනු විදුරු "මේ අපගේ ජාතියෙ ගල්" යි නො සිතා මැණික් ගල් සිදුරු කොට කඩ කඩ කොට හරින්නා සේ තමන් කළ පාපය "මුන් නිසා වේ ද යි අප ඇති වූයේ" යි නො සිතා නුවණ නැති මිනිසුන් සිවු අපාය නැමති යත ලා මිරිකා ලන්නේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි පැමිණ සිටි භික්ෂූහු සෝවාන් පලාදියට පැමිණියාහු ය.

මහාකාලවස්තුව නිමි.

දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ

12-6

"දෙවදත්ත තෙමේ පරමදුශ්ශීලයෙක, පව්කාරයෙක, පව් කිරීමෙන් වැඩුනු තෘෂ්ණාවෙන් අජාසත් රජ පහදවා ගත්තේ ය. ඒ මඟින් ඔහුට නොයෙක් ලාභසත්කාර ලැබින, පියා මැරීමට අජාසත් මෙහෙය වී ය. ඔහු හා එක් ව බුදුරජුන් මැරීමට නොයෙක් උපක්‍රම යෙදී ය" යි දවසෙක භික්ෂූන් වහන්සේලා ධර්මශාලාවට රැස් වී කතා කරමින් හුන්හ. ඒ අතර බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක. "තමුසේලා කතා කරන්නහු කුමක් ගැණ ද?" යි අසා "තමුසේලා කුමක් කියහු, දෙවදත්ත ඔබදු වැඩ කරන්නේ දැන් පමණක් ද? පෙරත් ඔහු මා මරන්නට නොයෙක් ලෙසින් උපක්‍රම යෙදී ය" යි වදරා කුරුඩගම්ගජාතකය දෙසූ සේක. නැවත උන් වහන්සේ "මහණෙනි! දුසිල්කම් නිසා උපන් තෘෂ්ණා තොමෝ ඒ දුසිල්. මාළුවාවැල ගසක් වෙළා ගන්නා සේ හැම ලෙසකින් වෙළා ගෙණ සිටු අපායයෙහි හෙලා ය" යි දක් වන්නට මේ ධර්මදෙශනාව කළ සේක.

යස්ස අච්චන්තදුස්සීල්‍යං මාළුවා සාලමිවොත්ථතං,
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡති දිසොති.

යමකු පිළිබඳ එකාන්තදුශ්ශීලභාවය ගසක් වෙළා ගත් මාළුවා වැල සේ දුසිල් පුහුලා වැළඳ සිටියේ වේ ද, ඒ දුසිල් පුහුල් තෙමේ, සතුරෙක් තම සතුරාට යම් සේ අවැඩ කරණු කැමැති වේ ද, එසේ තමාට අවැඩ කරන්නේ ය.

යස්ස අච්චන්තදුස්සීල්‍යං = යමකුගේ ඒකාන්තදුශ්ශීලභාව ය.

උපන් දා සිට දස අකුසල් කරමින් කල් යවන ගිහියාත්, උපැසපන් වූ දා සිට ගරු ඇවැතුන්ට පැමිණි මහණුත් අත්‍යන්තදුශ්ශීලයෝ ය, මෙහි ලා දෙ තුන් අත් බවෙක දුශ්ශීල වූයේ ම දුශ්ශීල යි ගණු ලැබේ. එසේ ආත්මභාව කිහිපයක පටන් දුශ්ශීල වූවහුගේ දුශ්ශීලභාවය අත්‍යන්තදුශ්ශීලභාව ය යි කියන ලද්දේ ය. දුශ්ශීල භාව නම්, දුශ්ශීලයාගේ ඇස්-කන්-නාස් ඇ සදෙර නිසා උපන් දුසිල්කම් ය.

සතුන් මැරීම, හොරකම් කිරීම, අනුන් අයත් ගැහැණුන් හා එක්වීම, බොරු කීම, කේලාම් කීම, පරුෂවාක්‍ය බිණුම, වැඩකට නැති බස් බිණුම, නපුරු ලෝභකම, වනස් සිතිවිලි, මිසදිටුව යන අකුසල්, කර්මපථවලට පැමිණීමෙන් ගිහියා දුශ්ශීල වේ.

සතුන් මැරීමෙහි ලා උපදින චෙතනාව ප්‍රාණඝාත අකුසලකර්ම නම්. ඒ චෙතනා ශක්තියෙන් සාහත්ථිකාදී වූ කවර ප්‍රයොගයක් හෝ කොට සතකු මැරූ කල්හි එය කර්මපථභාවයට යන්නේ ය. සතුන් මැරීම් ඇ අකුසල් කර්මපථභාවයට යන්නේ ද මේ ලෙසිනි.

පැවිද්දාගේ දුසිල්බවට කරුණු වන්නෝ ගරුකාපත්තිහු ය. **සුක්කවිසට්ඨි-කායසංගණ්ඨ-දුට්ඨුල්ලවාචා - අත්තකාමපාරිචරියා - සඤ්ච-රිත්ත-කුටිකාරක-මහල්ලක-දුට්ඨදෙස-දුතියදුට්ඨදෙස - සඞ්ඝභෙද - දුතිය-සඞ්ඝභෙද - දුබ්බච - කුලදූසන** යන මේ ය ගරුකාපත්ති. ගණන් විසින් තෙළෙසෙකි. සඞ්ග්‍රහය මෙසේ ය.

"විසට්ඨි කායසංසග්ගං දුට්ඨුල්ලං අත්තකාමං ච,
සඤ්චරිත්තං කුටිවෙව විහාරෝ ච අමූලකං,
දුබ්බචං කුලදූසඤ්ච සඞ්ඝාදිසෙසා තෙරස"

සුක්කවිසට්ඨි - ශුක්ල මූදනු කැමැති සිත් ඇති යම් මහණෙක් ස්වකීය අඞ්ගජාතය සිය සිරුර පිළිබඳ අවයවයෙක හෝ ඉන් බැහැර අන් යමක හෝ ගටා සුකුරු මුදු හැරියේ නම්, ඒ මහණහුගේ එසේ සුකුරු මුදු හැරීම ය සුක්කවිසට්ඨි. සිහිනෙන් සුකුරු මිදීම ඇවැත් නො වේ. කෙස්-ලොම්-නිය-දත්-මල-මූ-කෙල-සොටු-වියලි සම් යන මෙ තැන් හැර සිරුර පැතිර සිටී සුකුරු, කුඩා මැස්සකු බොන පමණකුත් ගිලිහී යෑම්, මේ ඇවැතට පමණ ය.

කායසංසග්ග-මිණිස් ගැණියක යන අදහසින් තම් සිරුරෙන් මිනිස් ගැණිය-කගේ සිරුර ගටා, ඉන් ලැබෙන පහස කැමැත්තෙන්, ඇයගේ අත් පා ඇඟ කුදු මහත් සිරුරු අවයව අතගෑමය කායසංසග්ග. කායසංසර්ගරාගයෙන් යටත් පිරිසෙයින් ගෑහැණියක ලොමියක් පමණකුත්, තමන්ගේ සිරුරු ලොමකින් පහසන්නේ නම්, මේ ආපත්තිය සිදු වේ. තව ද සෙවුමෙහි අදහස් ඇති ව ගැහැණියකගෙන් ලත් පහස ඕනෑකමින් ඉවසීම ද මේ ඇවැතට පමණ ය.

දුට්ඨුල්ලවාචා - නො සැබි කතාවන්හි යෙදීමෙන් එහි රස විඳීමට ගැණියක යන කල්පනාවෙන්, ගැණියකගේ මලමාර්ග-මූත්‍රමාර්ග දෙකට ස්තුති කිරීම් නින්ද කිරීම් විසින්, "එව මෙවුන්දම් සෙවුවට, දෙව මට මෙවුන්දම් සෙවුම" යන ආදී ලෙසින්, මෙවුන්දම් සෙවුම් ආදී ඉල්ලීම් විසින්, යටත් පිරිසෙයින් අකින් ආකාර දැක්වීම් පමණකින්, සැබි-නො සැබි බස් තෝරා ගැණීමෙහි සමත් ගැණියකට නො සැබි බස් බිණුම ය දුට්ඨුල්ලවාචා.

අත්තකාමපාරිචරියා - යම් ගැණියක කෙරෙහි, තමාට මෙවුන්දමින් උවැටත් කිරීමෙහි, අනුභස් කියා පෑමය අත්තකාමපාරිචරියා. මහණහු කියන ඒ අනුභස් කතාව ඒ ගැණියට වැටහීම පමණින් මේ ඇවැත සිදු වේ.

සංචරිත්ත - අඹු සැමියන් වීමෙහි කැමැති ගැණුන්ගේ හා පිරිමින්ගේ පණිවිඩ පිළිගැණීම, විමසීම, නැවත ගෙණ ඒම ආදී විසින් පිරිමියාගේ අදහස් ගැණියටත්, ගැණියගේ අදහස් පිරිමියාටත් ගෙණ ගොස්, ගෙණ අවුත් කියා පෑම ය සංචරිත්ත. මිත්‍රාමාත්‍ය වශයෙන් එකෙණෙහි හැසිරෙණු කැමැති ගැණියකට පිරිමියාගේ පණිවිඩ කීම ද මේ ඇවැතට පමණ ය.

කුටිකාර - තමන් ඉල්ලා ගත්, පොරෝ උදලු ආදියෙන්, තමන් උදෙසා කිළියක් කරවීමෙහි දී, එය විනයයෙහි කී ලෙසින් ප්‍රමාණවත් කොට කර විය යුතු ය. භික්ෂූන් ලවා කුටීවත් දෙශනා කර විය යුතු ය. ප්‍රමාණවත් නො කොට කුටීවත් නො දෙසවා, තමන් ඉල්ලා ගත් උපකරණයන්ගෙන් තමන් උදෙසා කිළි කිරීම ය කුටිකාර.

මහල්ලකවිහාර – කිළිය කරවා දෙන්නකු ඇති කල්හි, තමන් උදෙසා මහා විහාරයක් කරවීමෙහි දී විහාරවාස්තුව දෙශනා කරවිය යුතු ය. එසේ දෙශනා කරවා උවදුරු රහිත උපචාරසහිත විහාරවාස්තුවෙහි කිළිය කර විය යුතු ය. එසේ නො කොට උවදුරු සහිත උපචාර රහිත විහාරභූමියෙහි මහා විහාරයක් කරවීම ය මහල්ලකවිහාර.

දුට්ඨදෙෂ-කිසියා වූ මහණෙක්, මුල්රහිත වූ පරිජිඇවැතකින්, පිරිසිදු වූ හෝ අපිරිසිදු වූ අන් මහණකුහට, සසුනෙන් බැහැර කරණු කැමැති සිතින් පාරාජිකාවට පැමිණියහු ය යි චොදනා කෙරේ ද, ඒ මහණ, තෙමෙත් ඒ දෙෂය පිළිගණී ද ආපත්තාධිකරණයක් මුල්රහිත ද එකල්හි ඔහුට වන්නේ ය දුට්ඨදෙස.

දුතියදුට්ඨදෙෂ – ජාතිගොත්‍රාදිඅශලෙශයන් අතුරෙහි එක්තරා ලෙශයක් ඉදිරිපත් කොට මහණකු සසුනෙන් බැහැර කරණු කැමැති සිතින්, අන්තිම වස්තුවකින් චොදනා කරණ කල්හි වන්නේ ය දුතියදුට්ඨදෙස.

සඞ්ඝභෙද – සඞ්ඝභෙදයෙහි උත්සාහවත් වී ඒ පිණිස භෙද කර වස්තූන් දැඩි ව ගෙණ ක්‍රියා කරන්නා වූ මහණහුට, අන් මහණුන් විසින් එහි වරද කිය යුතු ය. එහෙත් ඒ මහණ, එහි දැඩි ව සිටී නම්, තෙ වරක් ම ඔහුට ඒ හැර දමන්නට මැනවින් කරුණු කිය යුතු ය. අවවාද කළ යුතු ය. සමනුභාෂණයාගේ තෙ වන වර අවසානයෙහිත් ඒ මහණ එසේ ම සිටී කල වන්නේ ය සඞ්ඝභෙද.

දුතියසඞ්ඝභෙද – සඞ්ඝභෙදයට උත්සාහ කරන්නා වූ මහණහුට අනුව පවත්නා වූ අන් මහණෝ වෙත් නම්, ඔවුන්ට සඞ්ඝභෙදයෙහි වරද කියා අවවාද කළ යුතු ය. අවවාදක්ෂම නො වෙත් නම්, තෙ වරක් ම මොනවට කරුණු කිය යුතු ය. තෙවන වර අවසානයෙහිත් සඞ්ඝභෙදකභික්ෂුවට ම ඔවුන් අනුව පවත්නා කල වන්නේ ය දුතියසඞ්ඝභෙද.

දුබ්බව - කිකරු නො වූ යම් මහණෙක් ප්‍රාතිමොක්ෂයට අයත් ශික්ෂාපද විෂයයෙහි (ශික්ෂාපදයකින්) තමා නො කිය යුත්තක් කෙරේ නම්, ඔහුට තෙ වරක් ම අවවාද කළ යුත්තේ ය. තෙවන වර අවසානයෙහි ද එසේ ම සිටී කල වන්නේ ය දුබ්බව.

කුලදූසක – කුලයන්ගේ ශ්‍රද්ධාව නසන්නා වූ පහත් පැවතුම් ඇති යම් මහණෙක් වේ නම්, ඔහු එයින් මුදලනු පිණිස තෙවරක් ම අවවාද කළ කළ යුතු ය. අවවාදයෙහි තෙවන වර අවසන්වත් ම ඔහු එසේ සිටියේ නම්, වන්නේ ය කුලදූසක.

මෙයින් එක්තරා ඇවැතකට පැමිණි මහණහු විසින් මෙයින් පිරිසිදු වීමට මුල-මැද-අග යන තුන් තන්හි ම සඩ්ඝයා වහන්සේ (සඩ්ඝයාවහන්සේගේ පිහිට) ලැබිය යුතු ය. මෙහි පිරිසිදු බව පිණිස පිළිවෙළින් පරිවාස-මානත්ත-අබ්භාන යන කම් තුන සඩ්ඝයා ලවා කරවා ගත යුතු ය. එහෙයින් මේ තෙළෙස සඩ්ඝාදිසෙසාපත්ති යි කියනු ලැබේ. සඩ්ඝයා ලවා මේ කම් කරවා ගෙණ මෙයින් නැඟී සිටිය යුතු බැවින් මේ ආපත්තිගණය වුට්ඨානගාමිනී යි කියනු ලැබේ. මෙයින් එක්තරා එකකට පැමිණීම බලවත් වරදක් සේ ගැණෙන බැවින් ගරුකාපත්ති යි කියනු ලැබේ. විස්තර විනයයෙන් දන්නේ ය. ගිහි පැවිදි දෙපස පිළිබඳ දුසිල්බව පිළිවෙළින් අත් බව් දෙකෙක තුනෙක පටන් ආයේ අත්‍යන්තදුශ්ශීලබවැ යි ගැණේ.

මාළුවාසාලම්වොත්ථතං = ගසක් (වැලඳ සිටී) මාළුවා වැලක් සේ (ඔහු) වැලඳ සිටියේ වේ ද.

'අව්වන්තදුස්ශීල්‍යං' යන්නට විශෙෂණ වේ. එහෙයින් වැලඳ සිටී අත්‍යන්තදුශ්ශීලභාවැ යි කියූව ද වරද නැත. **'ඔත්ථටං'** යන්න **'ඔකතං'** යි බොහෝ පොත්හි ආයේ ය. විමසා ගන්න.

සාල යනු, සල්රුකෙහි වඩා ප්‍රසිද්ධ ය. එහෙයින් ව්‍යාඛ්‍යානයෝ **'සාලං'** යනු සල්රුකැ යි ගත්හ. සාල ශබ්දය විශෙෂයක් නො තබා හැම වෘක්ෂයෙක ම හෙන්නේ ය. මාළුවාවැලෙන් වැසුනු මාළුවාවැල වැලඳ ගත් ගස, වැසි දවසෙහි මාළුවාවැලෙහි බොකුපත් දියෙන් පිරී බර වීමෙන් බිඳ වැටෙන්නේ ය. මෙහි සාල, යනු සල්රුකැ යි අරුත් දීම යුක්තියුක්ත නො වේ. **''සෙය්‍යථාපි භික්ඛවෙ! ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ මහන්තං සාලවනං. තං වස්ස එරණ්ඩෙහි සඤ්ඡන්නං අන්තරෙන යමකසාලානං''** යන මෙහි සල්රුක්හි ආයේ ය. **''අථ ඛො තං භික්ඛවෙ! මාළුවාබීජං අඤ්ඤතරස්මිං සාලමූලෙ නිපතෙය්‍ය''** යන මෙහි වෘක්ෂයෙහි ආයේ ය. **''තවෙව දෙව! විජිතෙ තවෙවුය්‍යාන භූමියා උජුවංසා මහාසාලා නිලොභාසා මනොරමා''** යන මෙහි වන දෙවුරුකෙහි ආයේ ය. **''සාලරුක්ඛෙ ජෙවයි රුක්ඛෙ යස්මිං කිස්මිං චි පාදපෙ''** යන මෙයින් සාල ශබ්දය හෙන තැන් වඩාත් පැහැදිලි ය.

'ඔත්ථතෘ' යන මෙහි **'අව+ථත'** යනු පදවිභේද යි. **'අව'** යන උප සර්ගයමෙහි සිටියේ පැකිර ගැනීම අරුතෙහි ය. එහෙයින් මුළු මනින් පැකිර ගැන්ම, වසා ගැන්ම, වැළඳ ගැන්ම මෙයින් කිය වේ. දුසිල්කම්හි හා මාළුවාවැලෙහි සාධර්මය කියා පාන්නේ මෙහි වූ **'ඉව'** යන යන නිපාතයෙනි. දුසිල්බව දුසිල්හු නසන්නා සේ මාළුවාවැල තමන් විසින් වැලඳුනු රුක නසා ය යනු එයින් පැහැදිලි වේ.

කරොති සො තථත්තානං යථා නං ඉච්ඡති දිසො = සතුරෙක් ඒ තම සතුරාට අවැඩක් කරණු කැමැත්තේ යම් සේ ද, එසේ ඒ දුසිල් තෙමේ තමාහට අවැඩ කරන්නේ ය.

තමන්ගේ දුසිල්බව මෙසේ තමන් නසන බැවින් තෙමේ තමාහට සතුරකු වැනි ය. සතුරා තම සතුරාට අවැඩ කරන්නා සේ දුශ්ශීලපුද්ගල තෙමේ තමාට අවැඩ කරන්නේ ය යි වදළෝ එහෙයිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහු ය.

දෙවදත්තස්ථවිරවස්තුව නිමි.

දෙවදත්තස්ථවිරයන් කළ ප්‍රකාශයෙක්

12 - 7

ආනන්ද ස්ථවිරයන් වහන්සේ දවසෙක පිඬු සිහා නුවරට වැඩි සේක. දෙවිදත්, උන්වහන්සේ දැක, තමන් සඩ්ඝයා බිඳ හරිණබව දන් වී ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ පිඬු සිහා පෙරළා අවුත් බුදු රජුන් වෙත ගොස් වැඳ "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මම මේ පෙරවරුයෙහි රජගහ නුවරට පිඬු සිහා ගියෙමි. එහි දී දෙවිදත්, මා වෙත අවුත් "ඇවැත්! ආනන්ද ස්ථවිරතුමනි! පොඩ්ඩක් නවතින්න මම අද පටන් බුදුන්ගෙන් වෙන් ව සඩ්ඝයා හැර දමා පොහොය කරන්නෙමි සඩ්ඝ කර්ම කරන්නෙමි. එබව දනගන්නැ යි කී ය. ස්වාමීනි! දෙවිදත් අද සඩ්ඝයා බිඳින්නේ ය. වෙන් ව පොහොය හා සඩ්ඝකර්ම කරන්නේ ය" යි දන්වා සිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ:-

"සුදනට මනාකම් – සුවසේ කරණු හැක්කේ,
යහකම් පවිටු දනහට – නො කළැකිය (මේ ලෙව්හි)
පවිටහුට පවකම් – සුවසේ කරණු හැක්කේ,
සුදනහු විසින් පවකම් – නො කළැකිය (කිසිලෙසකින්)"

යි උදන් අනා "ආනන්ද! තමාට අවැඩ කර ගැනීම අපහසු නැත. අපහසු හිතවැඩක් කර ගැනීමැ යි" වදරා මේ ධර්මදෙශනාව කළ සේක.

සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච,
යං වෙ හිතං ච සාධූ ච තං වෙ පරමදුක්කරන්නි

අයහපත් දෙය ද තමහට අහිත දෙය ද සුවසේ කට හැකි ය. යමක් හිත ද යහපත් ද එය ඒකාන්තයෙන් දුෂ්කර ය.

සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච = අයහපත් දෙය තමාට අහිත දෙය කිරීම පහසු ය.

යම් කර්මයෙක් වරද සහිත නම්, මෙ ලොව දී ම තැළුම් පෙළුම් බැදුම් මැරුම් ආ කමකටොලුවලට පමුණුවා නම්, එ බදු අසත්කර්ම අසාධූ නම් වේ. යම් කර්මයෙක් කරණ ලද්දේ සිවු අපායයට පමුණුවා නම්, ඒ කර්ම අහිත වේ. මේ අසාධූ-අහිතකර්ම, පහත් තැනට දිය ගෙණ යෑම පහසුවෙන් ලෙහෙසියෙන් කළ හැක්කා සේ සුවසේ කට හැකි ය. සතුන් මැරීම් ආ පවකම් මෙ ලොව අයසටත් පරලොව දුකටත් හෙතු ය. එහෙයින් ඒ පවකම් අසාධූ ය. අහිත ය. ලෙහෙසියෙන් කළ හැකි ය.

වැඩීමට යන්නේ හිත නම්. "**හිතොති වුඩ්ඪං ගච්ඡතීති = හිතං**" යනු අරුත් පැවසීම ය. **හිත තො** වන්නේ **අහිත** නම්.

යං වෙ හිතං ච සාධුං ච තං වෙ පරමදුක්කරං = යමක් හිත ද යාපත් ද එය එකාන්තයෙන් කිරීම ඉතා අපහසු ය.

ඒ ලොව මෙ ලොව දෙක්හි සත්නට හිත වන්නේත් යාපත් වන්නේත් පින්කම් ය. සත්ත්ව තෙමේ පින් නිසා ම කීර්තිමත් ද ආයුෂ්මත් ද දිප්තිමත් ද සුවපත් ද බලවත් ද ප්‍රඥවත් ද රූපවත් ද ධනවත් ද කුලවත් ද වන්නේ ය. ලෞකික වශයෙන් ලැබිය හැකි හැම සැපතකින් ම සුඛිත මුදිත වන්නේ ය. පරලොව දෙව් සැපතින් ප්‍රීත වන්නේ ය. අවසන්හි පින් කරණ කොට කෙලෙස් නසා පරම සැප වූ නිවන් සැපතින් සැපවත් වන්නේ ය. පිණින් නො ලැබිය හැක්කෙක් නැත්තේ ය. හැම සැපතක් ම දෙන්නේ පිණ ය. එහෙයින් එබඳු හිත පින්කම් යහපත් පින්කම් කරණු පහසු නැත. පිණ හැම එකකට ම වඩා හිත බැවින් යාපත් බැවින් එය පරම දුෂ්කර යි වදළ සේක. යථිගං බලා යන ගඟක් උඩුගං බලා යන්නට හැරවීම, නතු කිරීම පහසු නො වේ. ඒ කළ හැක්කෙක් නො වේ. සඟ පවග සැප දෙන පින්කම් කිරීම එයට වඩා අපහසු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියහ.

සඞ්ඝභෙදපරිසක්කනවත්ථුව නිමි.

කාල ස්ථවිරයන් වහන්සේ

12 - 8

මෙ තෙමේ, අප බුදුරජුන් දවස සැවැත් නුවර ඇසුරු කොට විසි ය. එහි එක් උපාසිකාවක් මවක සේ මොහුට උපස්ථාන කරයි. එහි මෑගේ ගේ අවට පිහිටි ගෙවල විසූ මිනිසුන් බුදුරජුන් වෙතින් බණ අසා අවුත් "බුදුවරු පුදුම ගුණ ඇත්තෝ ය. උන්වහන්සේලාගේ දම් දෙසුම් ඉතා රසවත් ය" යි කියනු ඇසූ ඒ ස්ත්‍රිය දිනෙක කාල තෙරුන් වෙත ගොස් "ස්වාමීන් වහන්ස! මම බණ අසන්නට බුදුරජුන් වෙත යන්නෙමි" යි කිවූ ය. කාල තෙමේ "බණ අසන්නට එහි යා යුතු ද" යි ඇය එයින් වැළකී ය. එහෙත් ඕතොමෝ බණ අසන්නට යා යුතු ම බව නැවත නැවතත් දන් වූ ය. කාල තෙරුන් ඒ හැම වරෙක ම ඕ තොමෝ වළකනු ලැබුවා ය. තෙරුන් විසින් එසේ වළක්වන ලද්දී, උපාසිකාව බුදුරජුන් වෙතින් බණ ඇසූ නම්, තමන් ඉකුරෙහි කළකිරෙණු ඇතැ යි අදහස් කොට ය.

උපාසිකා තොමෝ දවසක් අලුයම්න් නැගිට කා බී පෙහෙවස් ගෙණ දු අමතා "අපේ හාමුදුරුවන් නොදින් වළඳවන්නැ" යි නියම කොට වෙහෙරට ගියා ය. ඕ ද තෙරුන් ගෙට වැඩි වේලේ මැනියන් කී ලෙසට තෙරුන් වැළඳෙව්වා ය. ස්ථවිර තෙමේ වළඳා අවසන් කොට "උපාසිකාව කොහි ගියා ද" යි ඇසී ය. "පෙහෙවස් ගෙණ වෙහෙරට ගියා" යි දන් වූ කල්හී තෙරුන් බඩ, ගිනි හට ගත්තේ ය. ඇහ ගැහෙන්නට වන. "වැරදුනා, කෑ බත් පමණ ය. මෑ මා කෙරෙහි කළ කිරෙණු ඒකාන්ත ය" යි සිතූ ස්ථවිර තෙමේ වෙගයෙන් වෙහෙරට ගොස් උපාසිකාව බුදුරජුන් වෙත හිඳ බණ අසනු දැක බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! ඔය උපාසිකාව මෝඩ ය. සියුම් ගැඹුරු බණ මැයට වැඩෙක් නැත. දන් සිල් ගැණ බණ ටිකක් දෙසනා කිරීම මැට පමණ ය" යි කියා සිටියේ ය. එකල්හී බුදුරජානන් වහන්සේ "තමුසේ ය මෝඩ, කැත අදහසක් නිසා මෙසේ කියහු, තා කියනා ලෙසට මම බණ කියම් ද? එසේ සිතූ වහු ද? තමුසේ, තමුසේගේ විනාශයට මග පාදගණු මට පෙණේ ය" යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං
පටික්කොසති දුම්මෙධෝ දිට්ඨිං නිස්සාය පාපිකං,
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලතීති.

යම් අඥයෙක්, පහත් අදහස් නිසා දැහැමින් දිවි යවන පව් නසා සිටි බුඩ්ධාදීආර්‍යයන් වහන්සේලාගේ ධර්මානුශාසනාව වළකා ලන්නේ ද (එය) උණගසේ පල ගැන්ම සේ තමාගේ විනාශය පිණිස පල ගන්නේ ය.

යො දුම්මේධො = යම් අඥයෙක්. මෝඩයෙක්.[1]

පාපිකං දිට්ඨිං නිස්සාය = ලාමකදෘෂ්ටිය නිසා. පහත් අදහස් උපදවා

මෙහි **පාපිකදෘෂ්ටිය** නම්, තමාට ලාභසත්කාර පිරිහේය යන බියෙන් උපදවා ගත් කැත අදහස ය.

අරහතං අරියානං ධම්මජීවිනං = නික්ලෙශී වූ දහැමින් දිවි ගලවන බුඩාදී ආර්‍යයන්ගේ.[2]

සාසනං පටික්කොසති = අනුශාසනාව වළකා ද.

සාසන නම්, බුදුරජුන්ගේ අනුශාසනාය. බුදුරජුන් පිළිබඳ ස්කන්ධ ධාතු ආයතනාදි කථා ය. ඒ මේ බුඩ වචනය අනුශාසනාර්ථයෙන් සාසන නමි. "අනුසාසනට්ඨෙන **සාසනන්ති** වුච්චති" යනු ආචාර්‍යවචනයි. "යො ත්වං ආනන්ද! මයා ධම්මෝ ච විනයෝ ච දෙසිතෝ **පඤ්ඤත්තෝ** සෝ වෝ මමච්චයෙන **සත්ථා** යන මේ බුදු වදනිනුදු එය පැහැදිලි වේ. "ආනන්දය! තොපට මා විසින් යම් ධර්මයෙක් යම් විනයයෙක් දෙසන ලද ද පණවන ලද ද ඒ ධර්මවිනය මාගේ ඇවැමෙන් තොපට ශාසන වන්නේ ය" යනු එහි කෙටි තේරුම් ය.

"මේ ගරු ඇවැත, මේ ලඝු ඇවැත" යනාදීන් වෙන් වෙන් කොට බෙද විනයපිටක ය අනුශාසනා කරන්නේ ය. "මේ සතිපට්ඨාන, මේ සතර සම්‍යක් ප්‍රධාන" යනාදීන් සත්තිස් බෝ පැකි දම් විනෙයජනයන්ගේ අදහස් පරිදි විභාග කොට සූත්‍රපිටකය අනුශාසනා කරන්නේ ය. "මේ පංචස්කන්ධ ය. මේ ද්වාදශායතනය" යනාදීන් ස්කන්ධධාතුආයතනාදිය ඇති තාක් විභාග කොට අභිධර්ම පිටකය අනුශාසනා කරන්නේ ය. "අභිසම්බොධියේ පටන් පිරිනිවීම තෙක් පිටක වශයෙන් නිකාය වශයෙන් අඩග වශයෙන් ස්කන්ධ වශයෙන් දෙශනා කළ අසූසාරදහසක් ධර්මස්කන්ධයෝ තොපට අනුශාසනා කෙරෙති" යි වදළ වචනයෙනුදු ත්‍රිපිටක බුඩවචනය සාසනය බව ව්‍යක්ත ය. සාසනය, පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ, අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා ඇ විසින් ද බෙදී යන්නේ ය.

එලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය එල්ලති = උණගසේ පල හටගැන්ම මෙන් තමාගේ විනාශය පිණිස පල ගන්නේ ය.

අඥනයාගේ බුඩානුශාසනය වළකාලීම, ලාමක අදහස යන මේ දෙක, උණගසෙහි පල ගැන්ම උණගසෙහි විනාශය පිණිස වන්නා සේ අඥනයාගේ විනාශය පිණිස වන්නේ ය. පල ගැන්මෙන් පසු උණගස

1. **2**, 6 'දුම්මේධිනොජනා' යනු බලනු.
2. 2, **1**, 'අරියානං ගොචරෙ රතා' යනු බලනු.

වැනසී යන්නා සේ බුඩානුශාසනා වළකාලීමෙන් හා ලාමක අදහස් ඉපිද වීමෙන් අඥයා නැසෙන්නේ ය. කෙහෙල් කැන කෙහෙල් ගස නසයි. උණපලය උණගස නසයි. බටපලය බටගස නසයි. දරුගැබ අස්වෙළඹ නසයි. එමෙන් සත්කාරය තෙමේ ලාමක පුරුෂයා නසයි. මේ එය කියූ සැටි.

"එලං වෙ කදලිං හන්ති එලං වෙළුං එලං නළං,
සක්කාරෝ කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා" යි

ධර්මදෙශනාවගේ අවසානයෙහි උවැසිය සෝවාන් වූ ය. ධර්ම දෙශනාව පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූවා ය.

චූලකාල උපාසක තැන

12 - 9

මහාකාල උපාසකයා සේ චූලකාල උපාසක ද බණ අසන්නට රාත්‍රියෙහි විහාරයට යන්නේ ය. එසේ රෑ වෙහෙරට ගොස් බණ අසන මේ උපාසක තෙමේ බණ අවසානයෙහි ඉතා උදැසනින් වෙහෙරෙන් නික්ම පෙරළා ගෙය බලා යයි. මේ මොහුගේ සිරිති. මොහු දිනක් බණ අසා උදැසනින් සැවැත් නුවර බලා වෙහෙරින් පිටත් ව ගියේ ය. එ දවස එහි ගෙවල් කිහිපයක් බිඳ බඩු පැහැර ගත් සොරු ගෙහිමියන් විසින් පසුපස ලුහුබඳනා ලද්දෝ පැහැර ගත් බඩු සැවැත් නුවර බලා යන උපාසකයා ඉදිරියෙහි හෙළා පැන ගියහ.

හොරුන් පස්සේ එළ වූ මිනිස්සු චූලකාල උපාසකයා දැක "මේ හොරා, පෙණේ ද මූ, රෑ හැකි තරම් ගෙවල් බිඳ හොරකම් කොට මේ එළි වන ජාමෙහි උපාසකකම් කරන්නකු සේ හැසිරෙයි. මූට තළමු" යි අල්ලා ගෙණ තැළූහ. එ තැනින් දිය ගෙණෙන්නට යන ගැණු, උපාසකයාට තළනු දැක ඔවුනට කරුණු කියා, යන්තමකින් බේරා හැර ගොස් එ බව භික්ෂූන් වහන්සේලාට දැන් වූහ. උන්වහන්සේලා බුදුරජානන් වහන්සේට එය සැළකළහ. බුදුරජානන් වහන්සේ එය අසා "මහණෙනි! චූලකාල උපාසක තමන් එ බදු වැරදි වැඩක් නො කළ නිසා ඒ ගැණුන්ගේ වහළින් යන්තමකින් නො මැරී ගැලවුනේ ය. ලොකවාසී බොහෝ සත්ත්වයෝ පව්කම් කොට සතර අපායෙහි ඉපිද දුක් විඳිති. මෙලොව දී කිලිටි වෙති. අපවාදයට මුණ දෙති. ගුටිබැට කන්නෝ වෙති. පින් කළෝ මරණින් පසු සුගතියෙහි උපදිති. නිවන් ලබති. එයින් ම නිවී යති" යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

අත්තනාව කතං පාපං අත්තනා සඞ්කිලිස්සති,
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති,
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤෝ අඤ්ඤං විසොධයෙති.

තමන් විසින් ම පව් කරණ ලද නම්, (එයින්) තෙමේ ම කෙලෙසෙන්නේ ය. තමන් විසින් පව් නො කරණ ලද නම්, තෙමේ ම පිරිසිදු වන්නේ ය. පිරිසිදු බව හා අපිරිසිදු බව තම තමා පිළිබඳ වේ. අනෙකෙක් අනෙකකු පිරිසිදු නො කරන්නේ ය.

අත්තනා එව කතං පාපං = තමන් විසින් ම පව් කරණ ලද නම්.
අත්තනා සඞ්කිලිස්සති = තෙමේ ම කෙලෙසෙන්නේ ය.

යම් කෙනෙක් සතුන් මැරීම්, සොරකම් කිරීම්, පරදරපරපුරුෂ සෙවුම්, බොරු ඇ බිණුම්, රහමෙරපිම් ඇ පව්කම් කළෝ නම්, කරත් නම්, ඔවුහු, හැම, සිවු අපායයෙහි ඉපිද ඉමක් කොණක් නැති දුක් විඳිමින් කෙලෙසෙන්නෝ ය. මේ ඇ පව්කම් කරණ කල්හි ද මේ අත්බවහි ද කෙලෙසෙති.

අත්තනා අකතං පාපං = තමන් විසින් පව් නො කරණ ලද නම්.

අත්තනා එව විසුජ්ඣති = තෙමේ ම පිරිසිදු වන්නේ ය.

යම් කෙනෙක් පවින් දුරු ව,පින් කළෝ නම්, කරත් නම් ඔවුහු ස්වර්ග සම්පත්තියටත් නිර්වාණසම්පත්තියටත් පැමිණ තුමූ ම පිරිසිදු වෙති. පින් කරණ කල්හි ද පිරිසිදු වෙති.

සුද්ධි අසුද්ධි පච්චත්තං = පිරිසිදුබව, අපිරිසිදුබව තම තමා අයත් ය.

සුද්ධි නම්, කුසල් ය. අසුද්ධි නම්, අකුසල් ය. ඒ ඒ සත්ත්වයන් විසින් කරණ ලද, කරණු ලබන කුසල් අකුසල් හැම එකෙක් ම කළවුන්ටත් කරන්නවුන්ටත් අයත් ය යි මෙයින් වදළ සේක.

"**අත්තානං පති = පච්චත්තං**" යනු විවෘති යි. තමන් කරණ කුසල් අකුසල් දෙකින් හිමියා තමන් ම බව 'පති' යන්න පැහැදිලි කරයි. "සුද්ධි අසුද්ධි අත්තානං පති (සියා)" කුසල් අකුසල් තමන් පිළිබඳ වන්නේ ය යනු අරුත් ය. "කාරකසත්තානං අත්තනියෙව විපච්චති" යනු අටුවා ය.

න අඤ්ඤෝ අඤ්ඤං විසොධයෙ = අනෙකෙක් අනෙකකු පිරිසිදු නො කරන්නේ ය.

එකකු කළ පවින් අනෙකෙක් අපායට නො යයි. එකකු කළ පිණින් අනෙකෙක් දෙව්ලොව ද නො යයි. සසර දුක් විඳිතත්, සසර දුකින් මිදෙතත්, එයට උපකාර ව සිටින්නේ තම තමන් කළ පවිපින් දෙක ය. තම තමන් කළ පින් පව් දෙකට විපාක තම තමන් ම විඳිය යුතු ය. අනෙකෙක් අනෙකකු පිරිසිදු කිරීමෙහි වත් අපිරිසිදු කිරීමෙහි වත් සමත් නො වේ. ඒ නො වන්නේ ය. තමන් කළ කම්හි විපාක තමන් කරා ම එන්නේ ය. තමන් කළ කම් අන්හු කරාත්, අන්හු කළ කම් තමන් කරාත්, පල විසින් කවදවත් නො එන්නේ ම ය. "අනෙකෙක් අනෙකකු පිරිසිදු නො කරන්නේ ය" යි වදළෝ එහෙයිනි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි චූලකාල සෝවාන් වී ය. දෙශනාව පැමිණ සිටි පිරිසට ද වැඩ සහිත වූ ය.

චූලකාලඋපාසකවස්තුව නිමි.

අත්තදත්ථ ස්ථවිරයන් වහන්සේ

12 - 10

මහණෙනි! මෙයින් සාරමසක් ගිය තැන මම පිරිනිවෙන්නෙමි'' යි දිනක් බුදුරජානන් වහන්සේ භික්ෂූන් අමතා වදළ සේක. එ වේලෙහි සත් සියයක් පමණ වූ පෘථග්ජන භික්ෂූන් වහන්සේ මහත් සංවේගයට පැමිණියෝ, බුදුරජුන් හැර නො ගොස් ''මේ ගැණ කුමක් කරමු ද'' යි උනුන් කතා කරමින් දවස් ගෙවූහ. අත්තදත්ථ ස්ථවිරයන් වහන්සේ ද ඒ අතර වූහ. උන්වහන්සේ ''මාගේ අමාමැනියන් වහන්සේ සිවු මසක් ගිය තැන පිරිනිවන් පාන්නෝ ය. අයියෝ! මම මෙතෙක්, පහ වූ රාග ඇත්තේ නො වෙමි. වන්නී විපතකි. එහෙයින් මම බුදුරජුන් ජීවත් ව ඉන්දදී ම, රහත් වන්නට උත්සාහ කරමි'' යි භික්ෂූන් ඉන්නා සිටුනා තැනට නො ගොස් බවුන් වැඩීමෙහි යෙදී ගත්හ. එකල සෙසු භික්ෂූන් වහන්සේලා ''ආයුෂ්මත්නි! ඔබ වහන්සේ දන් ටිකදක සිට අප ඉන්නා සිටුනා තැනට නො එන්නහු, කිසි කතාබහක් නැත්තහු කුමක් නිසා ද?'' යි ඇසූහ. එ වේලෙහි ද උන් වහන්සේ කිසිත් නො බිණූහ. එවිට භික්ෂූන් වහන්සේලා ඒ තෙරුන් බුදු රජුන් ඉදිරියට ගෙණ ගොස් ''ස්වාමීනි! මේ ස්ථවිරයෝ වෙනද මෙන් අප හා කතා නො කරති. අප ඉන්නා තැනට නො එති. එසේ කරහු කුමක් නිසා ද? යි ඇසුව ද කිසිත් නො කියති. මේ තෙරුන්ගේ වෙනස කුමක් නිසා වූවක් ද යි අපි නො දනිමු'' යි බුදුරජුන්ට දන් වූහ. බුදු රජුන් ''මහණ තමුසේ එසේ කරහු, කුමක් හෙයින් ද?'' යි ඇසූ කල්හි ''ස්වාමීනි! මාගේ අමාමැනියන් වහන්සේ මෙ තැන් සිට සිවු මසක් ගිය තැනේ දී පිරිනිවන් පානා සේක. එ බැවින් මා අමා මැනියන් ජීවත් ව ඉන්දදී ම රහත් වන්නට වෙර දරමි'' යි ස්ථවිරයන් වහන්සේ කීහ. බුදු රජානන් වහන්සේ ''තමුසේගේ අදහස වැදගති. කළ යුතු එසේ ය'' යි සාධුකාර දී ''මහණෙනි! තමුසේලා මා කෙරෙහි ස්නේහ කරහු නම්, ඒ හැම කෙනකුන් මේ අත්තදත්ත තැන සේ විය යුතු ය. පහන් දල්වමින් සුවඳ දුම් දෙමින් මල් පුදමින් ආහාරපාන තබමින් මා පුදන්නෝ, මා පුදන්නෝ නො වෙති. යම් කෙනෙක් ධර්මානුධර්මප්‍රතිපත්තියෙන් මා පුදත් නම්, ඒ අය ය මා පුදන්නෝ, ඒ නිසා තමුසේලා කවුරුත් මේ අත්තදත්ත තැන මෙන් පිළිවෙත් පිරිය යුතු ය'' යි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

අත්තදත්ථං පරත්ථෙන බහුනාපි න හාපයෙ
අත්ථදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතෝ සියාති

බොහෝ වූත් පරාර්ථය නිසා (පරාර්ථය බොහෝ ය යි සලකා) ආත්මාර්ථය නො පිරිහළන්නේ ය. ආත්මාර්ථය වෙසෙසා දන ආත්මාර්ථයෙහි නියැලියෙක් වන්නේ ය.

බහුනා අප පරත්ථෙන = බොහෝ වූ ද පරාර්ථයන් නිසා.

අත්තදත්ථං න භාපයෙ = ආත්මාර්ථය, තමන් පිළිබඳ කටයුතු නො පිරිහෙළන්නේ ය.

පරාර්ථය බොහෝ ය යි තමන්ගේ කටයුතු නො පිරිහෙළිය යුතු ය. ඉහි තෙමේ වනාහි තුටටුවක් තරම් වූ තමන්ගේ ලාභය දහසක් තරම් වූ අන්හු පිළිබඳ ලාභය නිසා නො පිරිහෙළන්නේ ය. නො ද අත්හරින්නේ ය. ස්වල්ප මාත්‍රවූ තමන්ගේ ලාභය ම උසස් මකාට ගන්නේ ය. ආත්මාර්ථය සලකා ම කෑ යුතු දැන් විඳිය යුතු දැන් සපයන්නේ ය. පරමාර්ථය සලකා නො ද සපයන්නේ ය.

මේ මෙහි වදරණ ලද්දේ කමටහන් මුඛයෙනි. එ බැවින් ආත්මාර්ථ නම්, අර්හත්ඵලය යි. එය ලබන්නට වෑයම් කරණ මහණහු විසින් ද "මම අත්වැඩ කරන්නෙමි වෙමි දැ" යි භික්ෂුසඩ්ඝයා උදෙසා උපන් චෛත්‍යප්‍රතිසංස්කරණාදිය හා ආචාර්‍ය්‍ය වත් උපාධ්‍යාය වත් ආගන්තුක වත් ආදිය ද නො හළ යුතු ය. මාර්ගඵලප්‍රතිවේධයෙහි පොහොසත් වනුයේ අභිසමාචාරික වත් පුරණ මහණ තෙමේ ම ය. එ හෙයින් අභිසමාචාරය පිණිස පණවා වදළ කුදු මහත් ශික්ෂාපදයන්ගෙන් කිය වෙන ආචාර්‍යෝපාද්ධ්‍යායා දී වූ වත් පිරීමත් ආත්මාර්ථය ම වන්නේ ය. යම් මහණෙක් තදින් වඩා ගත් විදර්ශනා ඇති ව "අද අද ම රහත් පලය පසක් කරන්නෙමි" යි ප්‍රතිවේධය පතමින් වෙසේ ද, අද හෙට ම අධිගමය වන්නේ ය" යි සිතන ඒ මහණහු විසින් ආචාර්‍යෝපාද්ධ්‍යාදී වූ වත් පිරිහෙළා වුව ද තමන්ගේ කට යුතු ය යි කියූ නාමරූපධර්ම අනිත්‍ය දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයට නඟා මෙනෙහි කිරීම නම් වූ විදර්ශනා භාවනාව ඉදිරියෙහි වහ වහා වැඩිය යුතු ය.

අත්තදත්ථං අභිඤ්ඤාය = ආත්මාර්ථය මැනවින් දැන. වෙසෙසා දැන මෙය මාගේ වැඩැ යි සලකා.

සදත්ථපසුතෝ සියා = ස්වාරථයෙහි යෙදුනෙක් වන්නේ ය.

අර්හත් ඵලාධිගමය තමාගේ වැඩැයි සලකා ඒ පිණිස වූ එයට හිත වූ විදර්ශනාභාවනාවෙහි යෙදුනෙක් වන්නේ ය. යෙදිය යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ ස්ථවිර තෙමේ රහත් වූයේ ය. එහි පැමිණ සිටි භික්ෂූන් වහන්සේලාට ද ධර්මදෙශනාව වැඩ සහිත වූ ය.

අත්තදත්තස්ථවිරවස්තුව නිමි.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල** ස්ථවිරයන් කළ **සඩ්ඩසාගර** නම් වූ ධම්පදවර්ණනාවෙහි **ආත්මවර්ගාත්මක** ද්වාදශතරඞ්ගය නිමියේ ය.

කෘතඥතා

මේ වනාහි සද්ධර්මසාගර නම් වූ ධර්මපදවර්ණනායෙහි තෙළෙස් වැනි තුදුස් වැනි තරඞ්ග දෙකින් ප්‍රමාණවත් කරණ ලද හත්වන කොටසයි. මෙහි සවැනි කොටස පළවී අවුරුදු සතරකට වැඩි කලක් ගත වුව ද මෙතෙක් මේ කොටස මුද්‍රණයට නොපැමිණියේ කාලයෙහි ඇති විසමත්වයත් මෙහි මුද්‍රණයෙහි වියදම් දැරූ කීර්තිමත් **ඩී. ඩී. ඇස්. විරසූරිය** මහතුන්ගේ බලාපොරොත්තු රහිත අභාවයත් නිසා ය. මෙහි මුද්‍රණය පමාවනු දුටු **රංජිත කීර්තිගමගේ** මහතා කොළඹ අනුල මුද්‍රණාලයාධිකාරී **ඩබ්ලිව්. ඩී. ජේ. රත්නායක** මහතාගේ ද අනුබලය ලැබ මෙය මුද්‍රණය කරවීම, මට හා සද්ධර්මසාගරයෙහි නිමාම් දකිනු කැමැති පාඨකයනට ද මහත් අනුබලයෙක් වෙයි.

සද්ධර්මසාගරය මුල සිට හත්වන කොටසේ අවසානය තෙක් කියවා බලා පොතේ තතු දැන සිටින පූජ්‍යාවරදෙශීය භාෂාවන්හි විචක්ෂණ, සමය සමයාන්තරයන්හි බුද්ධිමත්, රාජකීය අද්‍යාපන මණ්ඩලයේ නියෝජ්‍ය අද්‍යාපනාධ්‍යක්ෂක සිවිල් නිලධර **ආචාර්ය ආනන්ද ගුරුගේ** මහතුන් විසින් ලියැවුනු **"මාගේ අදහස"** යන හිසින් මෙහි යොදා ඇති ලිපියෙන් මේ සියවසෙහි ලියනලද සිංහල බණපොත් අතුරෙහි සද්ධර්මසාගරය කොතැනක සිටී ද, යනු පාඨකයනට ඉතා පහසුයෙන් වටහා ගත හැකි ය. පොත කියවා බලන්නට පෙරාතුව ම බලා, පාඨකයනට පොතේ තතු ගැණ අවබෝධයක් ලැබිය හැකි එම ලිපිය මෙයට එක් කළ ආචාර්ය ආනන්ද ගුරුගේ මහතා, මාගේ කෘතඥතාවට ලක් ව සිටුනේ ය.

අවසාන වශයෙන් පොත පිටපත් කරදීමෙන් හා ශෝද්‍ධ්‍යපත්‍ර කියවීමෙන් උපකාරක වූ මෙම පිරිවෙණෙහි උපප්‍රධානාචාර්ය වූ **පණ්ඩිත බෙරලපනාතර පඤ්ඤාසෙඛර** ස්ථවිර තැනට හා පාරිවෙණික ශිෂ්‍ය වේරගල රතනසාර - වරදිවෙල ධම්මාරාම ගොඩහේනේ ධම්මික - කලුවඩුමුල්ලේ කල්‍යාණ - ආර් ජී. අමරවංස - ඇස්. එච්. දයාසේන යන මොවුනට ද මාගේ කෘතඥතාව හිමිය. එසේම අනුල මුද්‍රණාලයේ කාර්‍යමණ්ඩලයද මෙහිලා මා විසින් පැසසිය යුතුය.

මෙයට

අම්බලම්ගොඩ ධම්මකුසල ස්ථවිර

2507/1963 9. 15

අම්බලම්ගොඩ - ශාස්ත්‍රාදය විශ්වවිද්‍යාලය පිරිවෙණ.

මාගේ අදහස

ධම්මපදය වූ කලී සකල ලොකවාසී බෞද්ධාබෞද්ධ විද්වජ්ජනතා ව විසින් බුදුසමයෙහි සාරාංශය ලෙස සාදරයෙන් පිළිගෙන පරිශීලය කැරෙන මනහර පද්‍යග්‍රන්ථයෙකි. හුදු සරල පද්‍ය 421 කින් සමන්විත වුව ද බුද්ධධර්මයෙහි සියලු ගැඹුරු සියුම් දර්ශන එහි සැකෙවින් අන්තර්ගත වේ. මේ කරුණ නිසා ධම්මපදය උගැනීමෙහි දී ඒ ඒ පද්‍යයන්හි අර්ථය පමණක් නොව, ඒවායෙහි සැකෙවින් දැක්වෙන ධර්මකොට්ඨාශ පිළිබඳ සම්පූර්ණ විස්තර ද මනා අවබෝධය සඳහා අත්‍යවශ්‍ය ය. ධම්මපදයට විවිධ භාෂාවලින් විවරණ, ව්‍යාඛ්‍යා, අනුවාද රාශියක් බිහිවී ඇත්තේ මේ හෙතුවෙනි.

ලඞ්කාබෞද්ධසාහිත්‍යයෙහි ධම්මපදය වටා ලියැවුණු පොත් බොහෝ ය. ධම්මපදට්ඨකථාව ලියැවුනේ ලඞ්කාවේදී ය. ඊට මුල් වූ පැරණි හෙළටුවාව ද මෙහි ම පැවැත්තේ ය. දැනට විද්‍යමාන පැරණි සිංහලගද්‍ය කෘතිය වන ධම්පියාඅටුවා ගැටපදය ද ධම්මපදය වටහා ගැනීම සුකරවනුවස් ලියැවුනෙකි. සිංහලගද්‍යසාහිත්‍යයෙහි මුදුන්මල්කඩක් සේ ගිණිය යුතු වූ සද්ධර්මරත්නාවලිය ද ධම්මපදට්ඨකථාවෙහි අනුවාදයෙකි.

අම්බලම්ගොඩ ශාසනෝදය විශ්වවිද්‍යාලය පරිවෙණාධිපති **රාජකීයපණ්ඩිත ගරු අම්බලම්ගොඩ ධම්මකුසල** හිමිපාණන් අතින් ලියැවී ගෙන යනු ලබන සද්ධර්මරත්නාවලිය ප්‍රමාණයෙන් මෙන් ම පරිපූර්ණත්වයෙන් ද මෙතෙක් ලියැවුණු සෑම කෘතියක් ම අබිබවා සිටුනේ ය. එසිවන සියවසෙහි සිංහලයෙන් ලියැවුණු උසස් ම බණපොත මෙයැ යි අවිවාදයෙන් පිළිගතහැකිය. ධම්මකුසල හිමිපාණන්ගේ මේ විශාල කෘතියෙහි තෙළෙස් වැනි තුදුස් වැනි තරඹ දෙක ය දැන් පළවන්නේ. පෙර පළවූ කොටස් මෙන් මෙය ද ගැඹුරු වූ ධර්මවිවරණයෙන් හා සමයානන්තර පිළිබඳ තුලනාත්මක විවෙචනයෙන් යුක්ත ය. බුදුදහම මෙන් ම භාරතීය දර්ශනවාද පිළිබඳ ව විශදතර පටුන්වයක් ලබා ඇති මේ හිමිපාණෝ ව්‍යක්ත ලෙස සියමත ඉදිරිපත් කෙරෙති. පරමත විවෙචනය කරති. මෙ වැනි පොතක් සිංහල පාඨකයන් අතට ලක් වන්නේ ඉතාමත් කලාතුරකිනි. මාගේ මේ ප්‍රකාශයෙහි සත්‍යය සොයා බැලීමට කැමැත්තෝ අගනිදත්ත පුරෝහිතයාට දෙසූ ගාථාවනට ලියැවුණු පරිකථා බලත්වා. (පිටු 1718 සිට) මේ ගාථාවලිය බුදු

දහමේ සම්පිණ්ඩනයකි. ඊට ධම්මකුසල හිමිපාණන් අතින් ලියැවුණු පරිකථාව බුදුදහමෙහි අගය වටහා ගැනීමටත් බුද්ධ-දර්ශනයෙහි ශ්‍රේෂ්ඨත්වය දැන ගැනීමටත් එකාන්තයෙන් ම ඉවහල් වෙයි.

"සද්ධර්මසාගරය" වූ කලී උසස් පාණ්ඩිත්‍යයත් මනාධර්මාව-බෝධයත් සානුකම්පික ශාස්ත්‍රාන්නතිකාමිත්වයත් විවෙචනාත්මක බුද්ධිප්‍රභාවත් එකලෙස විදහාපාන කෘතියකි. මින් වන ධර්ම-ශාස්ත්‍රීය සේවය සුළුපටු නො වේ. මේ උතුම් කටයුත්තෙහි නිරතව සිටින ගරු ධම්මකුසල හිමිපාණන් වහන්සේට සිංහල බෞද්ධජනතාවගේ ගෞරවසම්ප්‍රයුක්ත කෘතඥතාව නිතැතින් ලැබිය යුතු ය.

ආනන්දගුරුගේ

1963 අගෝස්තු 23 වැනිදා,
අනුර,
නුගගහවත්ත, කොළඹ 5.

සද්ධම්සාගර නම් වූ ධම්පද වණ්නාව පිළිබඳ ගිහිපැවිදි වියත් පඬිවරු මෙසේ පවසති

"ධම්මපදයේ එන ධම්කාරණයන් විස්තර කරලීමට ලියා ඇති මේ ධම්ප්‍රකරණය විශාලවූවක් මෙන් ම ධම්කථික භික්ෂූන්ට ද කරුණු විස්තර වශයෙන් සලකා ගැනීමට ඉවහල් වන උතුම් ධම්කෝෂයක් වේ."

අතිගරු රාජකීය පණ්ඩිත කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"සද්ධම්සාගරය යථාර්ථයෙන් ම සද්ධම්සාගරයකි. මෙහි අසුවල් දෙය අඩුයයි කිසිවකුට කිව නොහැකි ය. එබැවින් ධම්මපදයට මෙතෙක් ලියා ඇති විස්තර ව්‍යාඛ්‍යාවන් අතර සද්ධම්සාගරය මුදුන්මල්කඩක් වැනි යැයි කිව හැකි ය. එසේ ම විසිවැනි සියවසේ ලියා ඇති සවිඟඟසම්පූර්ණ ධම්ග්‍රන්ථය සද්ධම්සාගරයයි මම ප්‍රකාශ කරමි."

අතිගරු මහොපාධ්‍යාය හිස්සැල්ලේ ශ්‍රී ඤාණොදය ශ්‍රී ලංකා රාමඤ්ඤනිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"සද්ධම්සාගරය කළ පණ්ඩිතාචාර්‍ය ධම්මකුසල මහානායක ස්ථවිරයන් වහන්සේ ඡන්දොලංකාර තර්කව්‍යාකරණාදී ශාස්ත්‍රාන්තර යන්හිදු ත්‍රිපිටක පාලියෙහිදු බැස සිටි බුද්ධිප්‍රභා ඇති ප්‍රසිද්ධ පඬිවරයාණ කෙණෙකි. උන්වහන්සේ ගේ ශක්තිය ගෙන බලත් ම මේ ග්‍රන්ථය ඔබට ඉතා සුළු වැඩෙකි. ඔබට සුළු වැඩක් වුව ද මැත කාලයෙහි මේසා විශාල ධර්මප්‍රබන්ධනයක් කළ අන් අයෙකු ගැන අපි නොදනුම් හ."

අතිගරු රාජකීය පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"ධම්පද වර්ණනාවෙහි දී අර්ථකථාචාර්‍ය වරයකු ගේ හා ටීකාචාර්‍යවරයකු ගේ තත්ත්වය ඒතද් ග්‍රන්ථ ප්‍රතිපාදකයාණන් කෙරෙහි එකවට පිහිටන්නේ වෙයි. ධම්ඥානය දියුණු කර ගැණුමට කැමැති නවීනයනට හා ධම්ඥානය දියුණු කරගත් ප්‍රවීණයනටත් එකසේ ඵලදායක වන මේ ග්‍රන්ථය සාහිත්‍ය රසයෙන් ද සමලංකෘත වෙයි."

අතිගරු ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය රාජකීය පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්ද ශ්‍රී ලංකා රාමඤ්ඤනිකායේ මහානායක මාහිමියන් වහන්සේ

"දම්පියා අටුවාවෙහි එන නිදාන කථා වත්මන් වහරින් කියවීමට රුචිකර වූ සරල බසින් විස්තර කොට තිබීම මෙහි දක්නා විශේෂ ලක්ෂණයකි. ග්‍රන්ථ කර්තෘන් වහන්සේ ගේ ශෛලීය සරල ය. භාෂාව දෛනික ය. කථා ව්‍යවහාරෝපගත ය. එහෙයින් පාඨකයාට අශ්වාද ජනක ය. නෙතට හෝ සිතට වෙහෙසක් නො දන්වා තව තවත් දුරට කියවීමට රුචිය උපද වන්නේ ය. එපමණකුදු නොවේ. මේ ශත වර්ෂයෙහි මෙතරම් විශාල ග්‍රන්ථයකුත් අන් කිසිම කෙනෙකු ගේ අතින් ලියැ වී නැති බව ඉදුරා කිය හැකි ය."

අතිගරු රාජකීය පණ්ඩිත මහොපාධ්‍යාය කහඳාමෝදර වන්ද්‍රකීර්ති ශ්‍රී පියරතන මහානායක මාහිමියන් වහන්සේ

"සද්ධම්සාගර නම් වූ ධම්පද වණ්නාව බෞද්ධ කථා සාහිත්‍යයත්, මාර්ගයත්, දර්ශනයත් යන තුනම හකුලා දැක්වෙන ස්වාධීන නිර්මාණ යක් වැන්න. පිටු තුන්දහසක් පමණ ඇති මේ රචනාව බෞද්ධ කථා සාහිත්‍යය, මාර්ගය හා දර්ශනය ද හකුලා දැක්වෙන කොෂග්‍රන්ථයක් වශයෙන් අමාවතුර, බුත්සරණ, සද්ධම්රත්නාවලිය යන පැරණි ග්‍රන්ථයන් ඉක්මවන්නකි."

මහාගන්කරු මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමා

"වත්මන් බසින් හා සරල රීතියකින් මෙබඳු කෘතියක් නිමැවීම සද්ධම් සාගරයට බැස ගැනීමට අලුත් තොටක් සැපයීමක් බඳු බවත්, මෙබඳු කෘතියක අගය ප්‍රත්‍යක්ෂ වනුයේ තව අවුරුදු හත්අටසියයකින් බැවින් මෙය කර්තෘන් වහන්සේ ගේ දූරදර්ශී භාවයෙහි ප්‍රතිඵලයක් බවත් මට වැටහිණි."

මහාචාර්ය ඩී. ඒ. හෙට්ටිආරච්චි මැතිතුමා

ලොකවගීය

ත්‍රයොදශතරඩගීයකථාසුචි

පිට	වස්තුව	
1497	1	තරුණ භික්ෂූන් වහන්සේ.
1501	2	පිඩුසිහීම.
1505	3	විදර්ශක භික්ෂූන් වහන්සේ.
1508	4	අඥයා කිඳුබසිනා තැන.
1511	5	සම්මුඤ්ජනී ස්ථවිරයන් වහන්සේ.
1514	6	අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ.
1521	7	පෙහෙරකෙල්ලගේ මරණය.
1529	8	අහසෙහි ගිය භික්ෂූන් වහන්සේ.
1554	9	තරුණියක බොරුකියා නිරයට ගිය සැටි.
1561	10	අසදිසදානය.
1641	11	අනේපිඩු සිටුපුත් නිවනට නතු වූ සැටි.

තරුණ භික්ෂූන් වහන්සේ

13 — 1

එක්තරා සථවිරයන් වහන්සේ නමක් දවසක් තරුණ මහණකු සමග අලුයම විශාඛාවන්ගේ ගෙට ගියහ. එහි, මහණුන් උදෙසා දිනපතා කෑද දනෙක් පැවැත්තේ ය. එහිදී සථවිර තෙමේ කෑද වළඳා තමන් හා කැටුව ගිය නමටත් කෑද වළඳවාලා, ඔහු එහි ම රඳවා තෙමේ අන් ගෙයකට ගියේ ය. එහි සිටි විශාඛාවගේ මිනිබිරිය තමන් වෙත එන මහණුන්ට මුත්තනිය සේ ම කළයුතු වතාවත් කරන්නී ය ඕ තොමෝ එදා ද ඒ තරුණ මහණහුට පිළිගන්වන්නට පැන් පෙරන්නී දිය බඳුනෙහි වැටුනු තම මූණේ සෙවනැල්ල දැක සිනාසුනා ය. එහි හුන් ඒ මහණ ද ලදුරියගේ මූණ බලා සිනාසුනේ ය. ලදුරිය, සිනාසෙන මහණහු දැක "මේ හිස බූගා තව්ටයා මා දැක සිනාසෙන්නේ ය"යි කිවූ ය. එවිට මහණ "ඇයි, නී මට සිනාසෙහි? නීත් තව්වියක, නීගේ අම්මාත් තව්වියක, අප්පා තව්වයෙක, මට සිනාසෙහි කුමක් නිසා ද? අම්මාට අප්පාට සිනාසෙව" යි බැණ වැදුනේ ය. ලදුරිය අඬමින් විශාඛාවන් ලඟට දුව ගියා ය. ඒ වේලෙහි විශාඛා තොමෝ සැඛයා වහන්සේ උදෙසා දන් පිළිගෙල කරවන්නී කුස්සියෙහි හුන්නී හඬමින් දුව ආ මිනිබිරිය දැක "කුමක් නිසා හඬහි ද" යි ඇසූ ය. ඕ තොමෝ එහි වූ කතාව මුළුමනින් විශාඛාවට කිවූ ය. එවිට විශාඛා තොමෝ ඒ මහණ වෙත ගොස් "සවාමීනි! මේ කුඩා ලමයා කළ කතාවට තරහ නොවනු මැනැවි, හිස් බූ ගා කපා කොටා මැසූ කසට දිය පොවා සකස් කළ සිවුරු හැඳ පෙරව ගෙණ පාකබලක් අතට ගෙණ ගෙයක් පාල්පතක් ගානේ හිඟමින්-ඇවිදුනා ඔබවහන්සේට ඔතරම් තරහ උපදිනු මොක ද? මේ කුඩා ලමයා සෙල්ලමට කී කතාව ගණන් ගත්තහු ඇයි? ඔය තරම් කුඩා එකකුත් ඉවසනු බැරි නම් මෙතරම් උසස් මහණකමක් කරණු කෙසේ වේ ද? මේ ලමයා ඔබවහන්සේට අගෞරවයක් කරණ රිසියෙන් ඒ කියේ නොවේ" යි කිවා ය. එකල්හි මහණ "ඇත්ත, උවැසියෙනි! උවැසියට පෙණෙන්නේ මාගේ හිස බූ ගැම, කපා කොටා මැසූ සිවුරු, මාගේ හිඟමන, උවැසිය! ඇට වටී ද මට එසේ කියනු? මාගේ හිස බූ ගැම ඇට රැඳුවක් ද? උවැසිය කියන්නී ඇ කළ ඒ කතාවෙහි වරදක් නැති බව නොවේ දැ?" යි කීය.

විශාඛාතොමෝ නිහඬ වූ ය. ඕතොමෝ ඒ දෙදෙනා ම සනසාලීමෙහි අපොහොසත් වූවා ය.

ඒ වේලෙහි විශාඛාවන්ගේ ගෙයින් කැඳ වළඳ දන් වැළඳීමට අන් ගෙයකට ගිය මහතෙරුන්නාන්සේ පෙරළා එහි ආහ. එහි දී මේ සියලු කතා පුවත දැන "මහණ! ඒ කතාව ඔය ලෙසින් බරට ගත යුතු කතාවක් ද? තරහ විය යුතු කතාවක් ද? බොරු ද හිස බූ ගා කපා කොට මැසූ සිවුරු හැද පෙරව පා කබලක් අතට ගෙණ ගෙයක් ගානේ හිඟා කනු? එසේ කරන්නහුට මෙය ලොකු බැණීමෙක් ද? අහක යව" යි ඒ බාල නමට තරවටු කළහ එවිට කුඩා නම "පෙණේ ද අපගේ මහතෙරුන්ගේ හැටි, මට ම තරවටු කරති, අර කෙල්ලට කිසිත් තරවටුවක් නො කරති" යි සිතා "ස්වාමීනි! කෙල්ලගේ බැණීම බැණීමෙක් නො වේ, ඔබ වහන්සේගේ පිළිගැණීම මාගේ කතාව ම බැණීම ය යනු" යි කී ය. එවේලෙහි බුදුරජානන් වහන්සේ එහි වැඩි සේක. උන්වහන්සේ ඒ කුඩා නමට සෝවන් වීමට තුබූ වාසනා ගුණය දැක **"විශාඛාව! කෙස් බූ ගැම් ඇ පමණින් මාගේ ශ්‍රාවකයන්ට කෙස් බූ ගැවෝ ය, සිවුරු කඩමාලු අඳින්නෝ ය, හිඟන්නෝ ය"** යන ඇ ලෙසින් බණින්නට වටී දැ" යි අසා වදාළ සේක. එකෙණෙහි ම කුඩා නම නැගී සිට දෙහොත් මුදුන් දී සකසා වැඳ "ස්වාමීනි! මේ කාරණය බුදුරජානන් වහන්සේට මැනැවින් වැටහී ඇත්තේ ය, අපගේ උපාද්ධ්‍යායයන් වහන්සේටත් මහා උපාසිකාවටත් මෙය වැටහී නැතැ" යි කී ය. එකල්හි බුදු-රජානන් වහන්සේ "කුඩා නම, මා ඔහුට අනුකූලබව පිළිගෙණ ඇතැ" යි දැන **"කාම ගුණ නිසා සිනාසීම හොඳ නැත, එය ඉතා පහත් ක්‍රියාවක, පහත් දැය සෙවුම නො සුදුසු ය, පමාව කල් යැවීම සසර දිග් ගැසීමට කරුණු වන බැවින් ඒ නො වටනේ ය"** යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

ගිනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ,
මිච්ඡාදිඨිං න සෙවෙය්‍ය න සියා ලොකවද්ධනොති.

පහත් දහම් නො සෙවුනේ ය. ප්‍රමාදය හා එක්ව නො වසන්නේ ය. මිසදිටු නො සෙවුනේ ය. ලොව වඩන්නෙක් නො වන්නේ ය.

ගිනං ධම්මං න සෙවෙය්‍ය = පහත් දහම් සෙවනය නො කරන්නේ ය.

පස් කම් ගුණය මෙහි හීනධර්මැ යි වදාළ සේක. මිනිසුන් විසින් තබා ඔටු, ගොන්, බලු, කැණහිල් ඈ තිරිසන් සතුන් විසිනුදු ඒ නො සෙවිය යුතු ය. ඒ, ඒ තරමට හීන ය. ලාමක ය. පහත් ය. වැදගතකුට, උගතකුට කොයිලෙසිනුත් ඒ තරම් නො වන්නේ ය. පස්කම් සෙවුමෙන් සිවු අපායයෙහි හෙන්නේ ය. උපදින්නේ ය. එහෙයින් හීන ය. ලාමක ය.

"න පණ්ඩිතතාය හිනො, හිනජච්චතාය හිනො, න උක්කඨකම්මන්තතාය හිනො, හිනාචාරතාය හිනො" උතුම් නො වන බැවින්, උත්තමාර්ථයක් නො ලැබිය හැකි බැවින්, උත්තමයන්ට නො සුදුසු බැවින් හීන ය. ලාමකස්වභාව ඇති බැවින්, ලාමක ජාති ඇති බැවින්, ලාමක සත්ත්වයන් විසින් සෙවිය යුතු බැවින් හීන ය. චණ්ඩාල පුක්කුසාදී වූ පහත් ජාති ඇත්තෝ, පහත් කුල ඇත්තෝ ක්ෂත්‍රියා දී වූ උසස් කුල ඇත්තන් හා එක්ව විසීම නො ලබති. චක්‍රවර්ති ආදී වූ පෘථග්ජනයෝ සොතාපන්නාදී වූ ආර්‍යයන් හා එක්ව විසීම නො ලබත්. මොවුන් හැම කෙනකුන් කාම සෙවකයන් බැවිනි. කාම සෙවනය පහත් ස්වභාව ඇත්තවුන්ගේ ක්‍රියාවක් බැවින් හීන ය. පහත් ජාති ඇත්තන් සම්කරුකම්, රියකරුකම්, පෙහෙරකම්, පුප්සැඩකම් යනාදී වූ ලාමකකර්මාන්තයන්හි යෙදී ජීවිකාව කරන්නා සේ කාමයෙන් අන්ධ වූ අඥ වූ පෘථග්ජනයෝ ප්‍රාණඝාතාදී වූ මිත්‍යාකර්මාන්තයන්හි යෙදී ජීවිකාව කරත්. මෙසේ හීන කර්මාන්ත ඇති බැවින් හීන ය. හීන වූ බ්‍රහ්මචර්‍ය මාත්‍රයකුත් නො රැක පෘථග්ජනයෝ බුඩාදී උත්තමයන් විසින් ගැරහූ කාමමිත්‍යාචාරාදිය කරත්. මෙසේ හීනාචාර ඇති බැවින් හීන ය. වැදිමිනිසුන්ගේ ධර්මයක් බැවින්, නාගරිකයන් බැහැර ලූ බැවින්, සාමාන්‍යයන්ගේ ධර්මයක් බැවින්, ශිෂ්ටයන් විසින් නො සෙවුනු බැවින්, අනර්ථයෙන් යුක්ත බැවින්, අර්ථයෙන් බැහැර බැවින් හීන ය. මේ සැකෙවිනි හීනලක්ෂණ ධර්මයෙහි කී ලෙසින් වඩාලාත් දත යුතු ය.

මෙසේ බැවින් පංචකාමය නො සෙවිය යුතු ය. දුරුකළ යුතු ය. එය බෞද්ධයනට දෙයයුරකින් කළ හැක්කේ ය. ඒ නම් වික්ඛම්භන - සමුච්ඡේද යන දෙයයුරෙනි. **"ඉති කාරණේහි කාමා න සෙවිතබ්බා පරිවජ්ජෙතබ්බා වික්ඛම්භනතො වා සමුච්ඡේදතො වා"** යි ඒ කීහ. **"අට්ඨිකඞ්ඛඵූපමෙ කාමෙ අප්පස්සාදට්ඨෙන මංසපෙසූපමෙ කාමෙ අනුදහනඨෙන පස්සන්තො න සෙවති පරිවජ්ජෙති"** යනු සාධක සූත්‍රයි.

කාමයන් අවස්ථානුරූපව යටපත් කිරීමෙන් ඔබා ගැණීමෙන් නො සෙවිය හැකි ය. දුරුකළ හැකි ය. **"සොතාපත්තිමග්ගං -පෙ- සකදාගාමිමග්ගං -පෙ- අනාගාමිමග්ගං -පෙ- අරහත්ත මග්ගං භාවෙන්තො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිරවසෙසං සමුච්ඡෙදතො කාමෙ න සෙවති පරිවජ්ජෙති"** යනු සමුච්ඡෙදයෙහි ලා දන්නේ ය. ස්‍රොතාපත්ති ආදී වූ සතර මාර්ගයන් වැඩීමෙන් මුළුමනින් කාමයන් සෙවනය නො කොට සිටිය හැකි ය.[1]

පමාදෙන න සංවසෙ = ප්‍රමාදයෙන් යුක්තව නො වසන්නේ ය. ප්‍රමාදය හා එක්ව නො විසිය යුතු ය.

කුසල් දහම් විසයයෙහි සිහියෙන් තොරවීම ප්‍රමාදය යි කියන ලද්දේය.[2]

මිච්ඡාදිඨිං න සෙවෙය්‍ය = මිසදිටු සෙවනය නො කරන්නේ ය. මිසදිටු නො සෙවිය යුතු ය.

මිසදිටු යි කියන ලද්දේ ශාස්වත – උච්ඡෙද විසින් දෙවැදෑරුම් වූ අනර්ථකර අයථාදර්ශන ය යි. ඒ දෙසැටෙකි.[3]

න සියා ලොකවද්ධනො = ලොව වඩන්නකු නො වියයුතු ය.

යමෙක් ලොකය ශාස්වතැ යි හෝ උච්ඡෙදැ යි හෝ ගෙණ සිහි නුවණින් තොරව පංචකාමය සෙවනය කරන්නේ නම්, ඔහු සසර චුති-පටිසන්ධි වශයෙන් දිගට ඉපිද ඉපිද යන්නේ ලොව වඩන්නේ ය. මෙහි ලොකැ යි ගත්තේ පංචස්කන්ධය යි. මිසදිටු ගෙණ ප්‍රමත්ත ව කාමසෙවනය කරන්නහුට දිග් වූ සසර ගමන වළකාලිය නො හැකි ය. එහෙයින් සසර දිගට ඉපිද ඉපිද නො යන්නට නම්, ලොකය නො වඩන්නට නම්, පංචස්කන්ධය හැරදමන්නට නම් මිසදිටු නො ගෙණ අප්‍රමත්ත ව කාමසෙවනයෙන් බැහැර විය යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ තරුණ භික්ෂුනම සෝවන් විය. පැමිණ සිටි පිරිසට ද දෙශනාව වැඩ සහිත වූ ය.

අන්‍යතරදහරභික්ෂුවස්තුව නිමි.

---

1. 2. "මා කාමරතිසත්ථවං," යනු බලනු.
2. 2. "පමාදෙ" යනු බලනු.
3. 1. "අනිකකසාවො" යනු බලනු.

පිඬු සිඟීම

13 – 2

සොම්දරු වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුදුබවට පැමිණ හා පුරා කියා දවසක කිඹුල්වතට වැඩි සේක. ඒ පළමු ගමනේ දී උන්වහන්සේගේ නෑයෝ එක්ව පෙර ගමන් කළහ. එහි නිග්‍රොධාරාමයට වැඩි බුදුරජාණන් වහන්සේ නෑයන්ගේ මන් බිඳිනු පිණිස අහස රුවන් සක්මනක් මවා සක්මන් කරමින් ධර්මදේශනා කළ සේක. එබණ අසා පහන් වූ නෑයෝ සුදොවුන් මහරජුන් පෙරටු කොට මානය හැර දමා උන්වහන්සේ වැඳ සිටියාහ. ඒ ඤාතිසමාගමයෙහි පොකුරු වැසි වට. රැස්ව සිටි මිනිස්සු එය ඉදිරියට ගෙණ තැන තැන කතා කරන්නට වූහ. බුදුරජාණන් වහන්සේ "මහණෙනි! මේ පොකුරු වැසි වැටීම පුදුමයෙක් නො වේ, පොකුරු වැසි වැටුනේ අද විතරක් නො වේ, පෙර මා වෙසතුරු රජව උපන් අවදියේත් මෙලෙස ම පොකුරු වැසි වැටුනේ ය"යි වෙසතුරුදා වදාළ සේක. එදා එහි බණ ඇසූ හැම නෑ කෙනෙක් ම පසුදා දානය පිණිස උන්වහන්සේට ආරාධනා නො කොට ගෙවලට ගියහ ශුද්ධෝදන මහරජ තෙමේත් "මා පුතු මා වෙත නො අවුත් කොහි යන්නේ දැ"යි සිතා දානය පිණිස ආරාධනා නො කොට ම ගොස් විසිදහසක් පමණ භික්ෂූන් වහන්සේලාට සැහෙන පමණින් කෑද අවුලුපත් පිළියෙල කරවා හිඳිනට අසුන් ද පැණවී ය.

පසුදා පිඬු සිහා වඩනා බුදුරජනන් වහන්සේ "පෙර බුදුවරු කොතැනකත් නො ගොස් නෑ ගෙට ම පිඬු සිහා ගියෝ ද, නැත, කිසිත් වෙනසක් නො කොට උස් පහත් කම් නො සලකා ගෙපිළිවෙළින් වැඩියෝ දැ"යි බලා වදාරණ සේක් ගෙ පිළිවෙළින් වැඩිය බව දැන කිඹුල්වතට ඇතුල්ව ඉදිරියට හමු වූ පළමු ගෙය පටන් පිඬු සිහා වැඩි සේක. එවේලෙහි පහය උඩුමාලෙහි හුන් රාහුලමාතාවෝ බුදුරජුන් පිඬු සිහා වඩිනා බව දැක ළඳ බව සුදොවුන් මහරජුට දන්වා ලූහ. රජ තෙමේ ත්‍රස්ත ව හුන් තැනින් නැගිට හිණ තුබූ වස්ත්‍රය මග දිගට උන උනා අදිමින් වහා ගොස් බුදුරජුන් වැඳ "පුත! ඇයි මෙහෙම කරහු? කුමක් නිසා මා නසහු? නරකද කළහු? පුත බබ වහන්සේ මේ සිහා කෑමෙන් කළහු, මට මදිකමක්, රන්දෙලාවලින් මෙනුවර පුරා ගමන් බිමන් කළ බබ වහන්සේට කෙළිදෙළෙන් කල් යැවූ බබ වහන්සේට මෙසේ

කරණු වටී ද? කුමක් හෙයින් මට ලජ්ජා උපදවහු? ඔබ වහන්සේට අහර සපයනු මට නො කළැකි දැ?''යි කඳුලු වගුරවමින් අසා සිටියේය. ''මහරජ! දනු, මම ඔබ කිසිදාකත් ලජ්ජාවට පත් නො කරමි, පිඬුසිඟීම අපගේ පරපුරේ සිරිත ය, එහෙයින් මාගේ මේ පිඬුසිඟීම ගැණ කාටත් කිසිත් කියන්නට ඉඩ නැත, මෙය ඔබට කණස්සලු වීමට කරුණෙක් නො වේ, ලජ්ජා ඇත්තකු වන්නට කරුණෙක් නො වේ, නැසුනෙමි යි සිතන්නට කරුණෙක් නො වේ, එහෙයින් මාගේ මේ පිඬුසිඟීමට සතුටු වන්නැ''යි බුදුරජානන් වහන්සේ වදාළවිට, රජ තෙමේ නැවැතත් ''පුත! ඇයි එහෙ ම කියහු? සිඟීමෙන් දිවි යවන පරපුරෙක් ද මාගේ පරපුර? යි ඇසී ය. ''මහරජ! මම දනිමි ඔබගේ පරපුර සිඟීමෙන් දිවි ගලවන පරපුරක් නො වන බව, පිඬුසිඟීම මාගේ පරපුරේ සිරිත, මාගේ වංශය ජිනවංශය යි, ඔබගේ වංශය ගෞතමවංශය යි, ගෞතමගොත්‍රිකයන් පිඬු සිඟා නො යන බව මම දනිමි, මාගේ වංශයේ ඇත්තෝ කවදාත් පිඬු සිඟා ගියෝ ය, පිඬුසිඟීමෙන් ම ජීවත් වූවෝ ය, ජීවත් වන්නෝ ය. ජිනවංශිකයන්ගේ ජීවිතයෙහි ඔද වැඩි බව, ආලෝක ය පිඬු සිඟා වැළඳීම නිසා ම වන්නේ ය''යි වදාළ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව කළ සේක.

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.
ධම්මං චරෙ සුචරිතං න නං දුච්චරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

පිඬු සිඟීමෙහි නො පමා වන්නේ ය. පිඬු සිඟා යාම සකස් කොට කරන්නේ ය. පිඬු සිඟා හැසිරෙණ සුලු මහණ තෙමේ මේ ලොව්හි හා පරලෙව්හි සුවසේ හොවියි.

පිඬු සිඟීම මනාකොට කරන්නේ ය. එය නො මනා කොට නො පුරන්නේ ය. පිඬු සිඟා හැසිරෙණ සුලු මහණ තෙමේ මේ ලෙව්හි හා පරලෙව්හි සුවසේ හොවියි.

උත්තිඨෙ නප්පමජ්ජෙය්‍ය = පිඬු සිඟීමෙහි නො පමා වන්නේ ය

පිණ්ඩචාරික වත නො පිරිහෙළා ගෙපිළිවෙළ නො ඉක්මවා දොර දොර සිට සිඟා ලැබිය යුතු අහරෙහි නො පමා වන්නේ ය.

යම් මහණෙක් පිණ්ඩවාරිකවත පිරිහෙළා පිණ්ඩි පිණ්ඩි බොජුන් සොයමින් හැසිරේ නම් ඒ මහණ පිඩු සිඟීමෙහි පමා වූවෙක් වේ. ගෙපිළිවෙළින් පිඩු සිඟා යන මහණ නො පමා වූවෙක් වේ.

පිඩු සිඟා නො ගොස් කෑම් බීම් ලඟට ලැබෙනතුරු වෙහෙර රැඳී එගැණ පතමින් සිටීම මහණකමට නො ගැළ පෙන්නේ ය. එහෙයින් ඒ ඒ කුලයන්හි උස් පහත්කම් නො සලකා ගෙන් ගෙට පිළිවෙළින් ගොස් අහරෙහි නො පමා විය යුතු ය.

පිඩු සිඟීමෙහි යෙදී වසන මහණ තෙමේ බුදුරජුන් වැණූ සිවු පසය ලබන්නේ, කම්මැලිකම දුරලන්නේ, පිරිසිදු දිවි ඇත්තෙක් වන්නේ, අනුනට යටත් නො වන්නේ, අනුනට අනුග්‍රහ කරන්නේ, මානය නසන්නේ, රසතෘෂ්ණාව වළකන්නේ, අප්පිච්ඡතාදි ගුණයනට අනුලොම් වන්නේ, පිළිවෙත් පුරන්නේ වේ

ධම්මං සුචරිතං චරෙ = පිඩු සිඟීම සකස් කොට කරන්නේ ය.

එක්විසි වැදැරුම් අනෙසනයන්ගෙන් දුරුව පිඩු සිඟීමැ යි කියූ සුචරිතධර්මයෙහි හැසිරිය යුතු ය. එක්විසි අනෙසනය දුශ්ශීලඅලජ්ජීන්ගේ ජීවනොපායය වේ. බුදුරජුන් විසින් ඒ නිඝු කරණ ලද්දේ ය. මෙහි **'ධම්ම'** යනුත් පිඩු සිඟීම කියන්නට යෙදුනේ ය.

ධම්මචාරී = පිඩු සිඟා යන මහණ තෙමේ.

ධම්මචාරී නම් පිඩු සිඟා යෑම ස්වභාව කොට ගත් මහණ තෙමේ ය. ධර්මය ලෙසින් විනය ලෙසින් පිඩු සිඟා යන මහණ ය.

අස්මිං ලොකෙ පරම්හි ච = මෙලොව හා පරලොව.

සුඛං සෙති = සුවසේ හොවියි. නිදයි.

මේ මහණ මෙලොව හා පරලොව සැපසේ නිදන්නේ ය. මේ මහණ **"අන්තමිදං භික්ඛවෙ ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං"** යන සුගතොවාදය සිහියට ගෙණ, තමසිත නැසුනු මන් ඇත්තක් කොට ගෙපිළිවෙළින්, භික්මවා ගත් ඇස් කන් නාස් ඈ ඇතිව කුකුස් නැතිව පිඩු සිඟා යන්නේ ලැබූ අහරින් තුටු වන්නේ ය. ලැබූ අහරට වඩා රසැති අහරක් නො පතන්නේ ය. මෙසේ වූයේ ම දෙලොව සුවසේ හෝනේ ය. මේ මෙය කී සැටි.

"නීවමනං කරිත්වාන සපදානං කුලාකුලං,
පිණ්ඩිකාය චරේ භික්ඛු ගුත්තද්වාරෝ සුසංවුතෝ,
ලුබ්ධෙනපි ච සන්තුස්සෙ නාඤ්ඤං පත්ථෙ රසං බහුං"යි.

මේ මහණහු එක්විසි අනෙසන මුළුමනින් හැරිය යුතු ය. ආජීවහෙතුවෙන් බුද්ධපතිකුට්ඨ වූ කිසිත් නො කළ යුතු ය. ගෙදර දොරෙහි උස් පහත්කම් නො සැලකිය යුතු ය. කුල ගොත්‍ර නො තැකිය යුතුය. ශ්‍රමණප්‍රතිපත්තිය ම සැලකිය යුතු ය. ආර්‍යවංශ ප්‍රතිපදාවෙහි පිහිටා ගත යුතු ය. මෙ තෙමේය **ධම්මචාරී** මෙ තෙමේ ශාසනය කරන්නේ ය. බුද්ධාදී ආර්‍ය්‍ය-යන්ගේ ප්‍රවේණිය රක්නේ ය. සදෙවකලොකයාගේ වන්දන මානනාදියට තැන් වන්නේ ය. ලොකයට නය නැත්තේ ය. අනුන් යටතෙහි නො වන්නේ ය. හැම තන්හි විශාරද වන්නේ ය.

මෙතෙමේ, මෙලොව හැම ඉරියව්වෙහි, පරලොව හැම ඉරි-යව්වෙහි අකම්පිත වේ. භය රහිත වේ. එහෙයින් දෙලොවෙහි ම සුවසේ වසන්නේ ය.

ධම්මං චරෙ සුචරිතං = පිඬු සිඟීම වරද නැති ලෙසින් කරන්නේ ය.

පිඬු සිඟීම වරද නැති ලෙසින් කිරීම නම් රසයෙහි නො බැඳී ගෙදර දොර උස් පහත්කම් නො සලකා මනා පැවැත්මෙන් යුතුව මත් බිඳ හැර ගෙපිළිවෙළින් පිඬු සිඟා යෑම ය.

න නං දුච්චරිතං චරෙ = එය නො මනා කොට නො කරන්නේ ය.

වෙසඟනන් වසන තැන්, මළ සැමියන් ඇති තැන්, බැහැර ගිය සැමියන් ඇති තැන් ආ නො සුදුසු තන්හි හැසිර පිඬු සිඟන්නේ නපුරු කොට සිඟන්නේ ය. නපුරු කොට පුරන්නේ ය. මේ කියූ නො සුදුසු තැන් හැර යුතු තන්හි සිඟන්නේ මනාකොට සිඟන්නේ ය. මනාකොට පුරන්නේ ය.

ධම්මචාරී = පිඬු සිඟන මහණ තෙමේ.
අස්මිං ලොකෙ පරම්හි ච = මේ ලොව හා පරලොව
සුඛං සෙති = සුවසේ හොවියි. නිදයි. වසයි.

ධර්මදේශනාවගේ අවසානයෙහි ශුද්ධොදන මහ රජතෙමේ සෝවාන් වූයේ ය. පැමිණ සිටියවුනට ද ධර්මදේශනාව සාර්ථක වූ ය.

ශුද්ධොදනවස්තුව නිමි.

විදර්ශකභික්ෂූන් වහන්සේ

13 — 3

පන්සියයක් පමණ විදර්ශකභික්ෂූන් වහන්සේ බුදුරජුන් වෙතින් කමටහන් ගෙණ වනයට ගියහ. එහිදී ඔවුහු රහත් වන්නට සිතා මහත් ඕනෑකමින් කමටහන් වැඩූහ. එහෙත් විශෙෂාධිගමයක් ලැබීමෙහි අපොහොසත් වූ ඔවුහු නැවැතත් විශෙෂ කොට කමටහන් කියවා ගන්නට බුදුරජුන් වෙත එන්නෝ අතර මග දී මිරිඟුවක් දැක එහි සිත් හසුරුවමින් ජෙතවනය බලා ආහ. ඔවුන් දෙව්රමට ඇතුල් වූ වේලෙහි තද වැස්සෙක් වසින්නට වන. දෙරපිළ ඒ ඒ තැන සිටගත් ඒ මහණෝ වැසි දියෙහි නැගී බිඳී යන දිය බුබුලු දැක **"අපගේ සිරුරද ඉපිද නැසෙන බැවින්, මේ නැගී බිඳී යන දිය බුබුලු වැනි"** යි සිතන්නට වූහ. බුදුරජානන් වහන්සේ ගඳකිළියෙහි වැඩහුන් සේක් ඒ මහණුන් බලා උන් හා කතා කරමින් ආලොකයක් පතුරුවා මේ ධර්මදෙශනාව කළ සේක.

යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති ති.

දිය බුබුලක් යම් සේ බලා ද, මිරිඟුවක් යම්සේ බලාද මරරජ තෙමේ එසේ ලොකය බලන්නහු නො දක්නේ ය.

බුබ්බුලකං යථා පස්සෙ = දිය බුබුල යම්සේ බලා ද.

මරීචිකං යථා පස්සෙ = මිරිඟුවක් යම්සේ බලා ද.

මච්චුරාජා එවං ලොකං අවෙක්ඛන්තං න පස්සති = මරරජ තෙමේ එසේ ආත්මභාවය දක්නහු නො දකී.

ආත්මභාවසඞ්ඛ්‍යාතලොකය, පරමාර්ථ විසින් සක්ඛ්‍යධාතු ආයතනැයි ගත යුතු ය. එය ඉපිද ඒ හා ම නස්නේ ය. දියෙහි හට ගන්නා දිය බුබුල හට ගැණීම හාම නැසෙන්නා සේ ය ඒ නස්නේ. එහෙයින් එය සිස් ය. හරයෙක් නැත. තමාගේ යි ගන්නට කිසිත් නැත. දෙව් බඹ මිනිස් තිරිසන් ඈ නන් අයුරෙන් පෙණේ. ඈත පෙණෙන මිරිඟුව ගෘහ සංස්ථානාදි වශයෙන් පෙණෙන්නා සේ ය ඒ පෙණෙනුයේ. ලං ලංවත්

මිරිහුවෙනි ගන්නට කිසිත් නැත්තා සේ මෙහි දෙව් බඹ මිනිස් නිරිසන් අෑ විසින් ගන්නට කිසිත් නැත්තේ ය. එහෙයින් සිස් ය. නිසරු ය, සි විදර්‍ශනාඥානයෙන් දක්නේ මරරජු විසින් නො දක්නා ලැබේ.

ආත්මභාවය දියබුබුලක් මිරිහුවක් වැනි කොට බලන්නා හට ආත්මභාවය කෙරෙහි අනිත්‍ය – දුඃඛ – අනාත්ම දර්‍ශනයෝ පහළ වෙත්. **"යථා උදකබුබ්බුලකං අසාරං නිස්සාරං සාරාපගතං, යථා මරීචි අසාරා නිස්සාරා සාරාපගතා, එවමෙව රූපං අසාරං නිස්සාරං සාරාපගතං, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිද්දෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා"** යනු ඝාඨකසූත්‍ර යි.

"සිරුර දසාර ය නිස්සාර ය සාරයෙන් තොර ය" සි බලන්න හුට සිරුරෙහි උපදවා ගත් නිත්‍ය සුඛ ආත්මදර්‍ශනයෝ පහව යෙත්. **"අනිච්චතො පස්සතෙනා නිච්චසඤ්ඤං පජහති. දුක්ඛතො පස්සතෙනා සුඛසඤ්ඤං පජහති. අනත්තතො පස්සතෙනා අත්තසඤ්ඤං පජහති"** යනු ඒ කීහ.

දිය මතුපිට නැගී බිඳී යන ගොලාකාර වූ දිය බිඳ **බුබ්බුලක** යි කියනු ලැබේ. පවනින් සැලෙන හිරුරැස් **මරීචි** නම්. එය දුටු සිවුපාවෝ එය **ජල** යැයි සලකා දුවගොස් විනාශයට පත් වෙත්.

එවං ලොකං අවෙක්ඛන්තං = මෙසේ ලොකය බලන්නහු.

පංචස්කන්ධය මෙහි ලොක නම්. එසේ නම් කලේ පංචස් කන්ධය නැසෙන වැනසෙන බැවිනි. පංචස්කන්ධය අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන නිලකුණට නගා බලන්නේ **අවෙක්ඛන** නම්. පංචස්කන්ධයෙහි වූ අනිත්‍යාදිලක්ෂණ තතුසේ දැක්ක හැක්කේ විදර්‍ශනාඥානයට ය. එහෙයින් විදර්‍ශනාඥානයෙන් පංචස්කන්ධය බලන්නේ මෙහි අදහස් කරණ ලද්දේ ය.

දියබුබුල හා මිරිහුව ඉපිද නස්නා බැවින් සිස් ය, අසාරය සි දක්නා සේ යොගිජන තෙමේ පංචස්කන්ධය ඉපිද නස්නා බැවින් සිස් ය, අසාර ය යි දකියි. මේ දෑකුම් දෙක මේ අතින් සමාන බව **එවං** යන්නෙන් පැහැදිලි කළහ.

මච්චුරාජා න පස්සති = මරරජ තෙමේ නො දකියි.

විදර්ශනාඥානයෙන් ඥානවත් යොගී තෙමේ පංචස්කන්ධයෙහි දෙස් දැක එය හරින්නේ ය. එයින් මරණයෙන් මිදෙන්නේ ය. නිවන් පසක් කරන්නේ ය. නිවණ මරණයට තැන් නො වේ. **අමත, අච්චුත** යන නම් නිවණ කියන්නට යෙදුනේ ද එහෙයිනි. මෙහි මරණය ම **මච්චුරාජ** යි කියන ලද ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂුහු උන්හිටිතැනදී ම රහත් වූහ.

විදර්ශකභික්ෂුවස්තුව නිමි.

අභයා කිඳු බස්නා තැන.

13 - 4

බිම්සර රජුගේ රාජ්‍යයෙහි එක් පිටිසර පෙදෙසෙක් රජුට විරුඬව නැගී සිටියේ ය. එහි විසූ හැම කෙනෙක් තැන තැන කැරලි ගැසූහ. රජ තෙමේ එය සන්සිඳවනු පිණිස සිය පුත් අභය කුමරු එහි පිටත් කොට යැවී ය. රජුගේ නියම්යෙන් ගිය කුමාර තෙමේ නැග තුබූ ඒ සියලු කලිකලහ සන්සිඳුවා රට සෙමෙහි තබා පෙරළා ආයේ ය. එකල්හි රජ තෙමේ සියපුතු කෙරෙහි තුටු වූයේ, නටන්නට ගී කියන්නට දක්ෂ වූ නිළියක ගෙන්වා ඇය පාවා දී සත් දවසක් රජකමත් ඔහුට පවරා දුන්නේ ය. කුමරු ඒ සත් දවස මාලිගා තුළට වී රජසිරි වළඳා අටවනදා ඒ නිළිය හා ගඟට ගොස් දිය නාලා අවසනා මල් උයනට ගියේ, එහිදී නිළියගේ නැටුම් බලමින් මදක්ලක් එහි රැඳී සිටියේ ය. ඒ වේලෙහි තදින් බබවාල් ගැස්සීමෙන් නැගුනු වාතාබාධයෙකින් නිළිය මැරී වැටුනා ය. කුමරු සැලුනේ ය. ශොකයෙන් තද බද විය. එසින් ඔහු මාලිගාවට නො ගොස් බුදුරජානන් වහන්සේ වෙත ගියේ ය. ගොස් වැඳ "ස්වාමීනි! මට වූයේ ලොකු විපතෙක්, පිය රජු මට භාර කොට සිටි නළඟන දැන් මල් උයනේදී කලුරිය කළා, එසින් මාසිත නැගී ඇති ශොකය ඉතා මහති, එය නිවාලනු මැනැවැ"යි ඇයද සිටියේ ය. එවේලෙහි බුදුරජානන් වහන්සේ "අභය! ඔබ පෙර අත්බැවිනි මේ නිළිය මේ හැටියට මළතැන් වලදී අඩා වගුරුවන ලද කඳුලුවල ඉමෙක් නැතැ"යි කුමරු සැනසූ සේක. එසින් කුමරුගේ ශොකය තුනී වී ගියේ ය. ඒ බව දත් බුදුරජානන් වහන්සේ නැවැතත් "අභය! මෙහෙම තැන ශොක කළ යුතු නො වේ නුවණ නැති අය ම ය ශොක කරන්නෝ, ඒ නිසා අභය ශොක නැත්තකු විය යුතු ය, මෙතැන නුවණ නැති අය ගිලා බස්නා තැනෙකැ"යි දක්වමින් මේ ධම්දෙශනාව කළ සේක.

එථ පසසථිමං ලොකං චිත්තං රාජරථූපමං,
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගෝ විජානතනති.

එවු! යම් ආත්මභාවයෙක නුවණ නැත්තෝ ගැලෙත් ද, තතු දන්නවුන්ට ඇල්මෙක් නැත්තේ ද, විසිතුරු වූ රජුන්ගේ රියක් වැනි වූ මේ ආත්මභාවය බලවු

එථ = එවු.

යත්ථ බලා විසීදන්ති = යම් ආත්මභාවයෙක නුවණ නැත්තෝ ගැලෙත් ද.

නත්ථි සඞ්ඛෝ විජානතං = තතු දන්නවුනට ඇල්මෙක් නැත්තේ ද.

විත්තං = විසිතුරු වූ.

රාජරථූපමං = රජුන්ගේ රියක් වැනි වූ.

ඉමං ලොකං පස්සථ = මේ ආත්මභාවය බල වූ.

මෙහි **ලොක** නම් ආත්මභාවය යි. පංචස්කන්ධය යි ඉතා පැහැදිලි අරුතෙන් කිය යුත්තේ සත්ත්වයන් විසින් දරණ සිරුර ලොකැයි පිළිගෙණ ඇති බව ය. එය විසිතුරු ය. රජුන් ගමන් ගන්නා රියක් වැනි ය. එහෙත් එහි විසිතුරු බව, රදරියක් වැනි බව ප්‍රකෘතිසිද්ධ නො වේ මෙහි ඇත්තේ උනුන් අතින් කෙරෙණ කාලික වූත් ස්ථානික වූත් විසිතුරු-බව ය. රදරියක් වැනි බව ය. එද සිරුරෙහි පිටත පිළිබඳ ය රන් රිදී පට පිළී ආදියෙන් කෙරෙණ විසිතුරුබව සිරුරෙහි පිටත මුත් ඇතුළත නො වේ.

රාජරථයෝත් නත් වැදැරුම් වටිනා වස්ත්‍රයන්ගෙන් සරසනු ලබත්. එසේ ය මේ සිරුරත් ලොකයා විසින් නොයෙක් වටිනා විචිත්‍රවස්ත්‍රයන්ගෙන් සරසනු ලබන්නේ. රාජරථය ඇතුළතින් හා පිටතින් සරසනු ලබන්නේ ද සිරුරෙහි පිටත මුත් ඇතුළත විසිතුරු කරණු නො හැක්කේ ය. එහෙයින් රියෙක සැරසීම නුවණට හුරු ය. සිරුර සැරසීම නුවණට හුරු නො වේ.

සිරුර, මුග්ධයන් ගැලෙන, මුග්ධයන් විසින් සතපනු ලබන, මුග්ධයන්ට ම ප්‍රිය වූ ස්ථානයෙකි. එය **"යත්ථ බාලා විසීදන්ති"** යනුවෙන් වදාළ සේක. එය පරමසත්‍යයක් බව අද වඩාලාත් පෙණෙන්නේ ය. පෙර කළ පිණෙන් ධනවත් වූ මුග්ධයෝ ධනයෙන් කළයුතු දේ පසෙක තබා සිරුර සතපන්නට පමණ ඉක්මවා ගේ දොර නංවත් යාන වාහන ලංකර ගණිත් සතුන් මරා කත්. මත් පැන් බොත්. පරඹුවන් පරපුරුෂයන් ගණිත්. කළ හැකි හැම දුසිරිතක් ම මේ සඳහා කරත්. මේ මුග්ධයෝ සතුන් මරා කෑම මත්පැන්-බීම ගණිකාමඩම් තැබීම සූදු කෙළීම යන ඈ සදාචාරයි ගණිත්. මේ දුසිරිත් රට පුරා පැතිර වීමට සමාජශාලා නමින් දුශ්චරිතාගාර පිහිටුවත් නැටුම් හල් ගොඩ නගත්. තරුණියන් නිර්වස්ත්‍ර කොට මහාජනයා මැද වෙදිකා මත නංවා රූප

සුන්දරියන් කොට ඔවුන්ගේ වැළිබිය නසා ලත්. ධනවත් මූග්ධ-යෝම ය සෙසු දෙනා දුශ්චරිතයෙහි අපායයෙහි ගලන්නෝ. මොවුහු යමෙකින් කමෙකින් පිහිට වන්නෝ ද මුත් සේම දුසිරිත් කරණ මුන්ගේ දුසිරිතයනට රුකුල් දෙන මූග්ධයන්ට ම ය.

මහජනයා උසස් කොට සලකන තනතුරු උපාධි වත් පොහොසත් කම් ආදී කිසිවක් ආත්මදමනය පිණිස ප්‍රඥා ලාභය පිණිස නො පවත්නේ ය. එහෙයින් ඒ තනතුරු උපාධි වත් පොහොසත් කම් වඩාලාත් බිහිසුණු ය. හික්මීමක් නැති උගතා බිහිසුණු ය. ආත්මදමනයට තුඩු නො දුන් උගත් කම හැම විපතකටම මූල් වන්නේ ය. එබඳු උගත්කම් ඇත්තෝ නො ගැලිය යුතු නො සැරසිය යුතු සිරුරෙහි වඩාත් ගැලෙන්නෝ ය.

කුමාරකාශ්‍යපමහාස්ථවිරයන් වහන්සේගේ මෑනියෝ ගිහි ගෙයි උන් කාලයෙහි එක් උත්සව දිනයෙක සිය සැමියා "සිරුර සරසා ගත්නැ" යි කියන ලද්දේ "හිමිය! මේ සිරුර ඇඳුම් ආයිත්තම් ලා සැරසීමෙන් කිනම් පලයෙක් ලැබේ ද කිනම් වැඩෙක් වේ ද, මේ සිරුර සැරසීම අසුචි පිරූ කළයෙක පිටත සිහියම් කිරීම වැනි නො වේදැ" යි අසා සිරුර සැරසීම ප්‍රතික්ෂේප කළහ. මේ බඳු ගැහැණු අදත් ලොව වෙසෙත් ද. ඉණ හිස විකොට වත් ඇඳුම් කැඩුම් සපයා සිරුර සැරසීම ම බලාපොරොත්තු වන ගැණු ම ය අද ලොව ඇත්තාහු. ගැහැණු නට වසඟ වූ මූග්ධපුරුෂයෝ ද උන් කියන හැම දෙයක් ම කරත්. නො උගත් ගැණු සැරසීම්වලින් මොන ලෙසකිනුත් සෑහීමට නො පැමිණෙත්.

සඬ්ඝ නම් රාග, දෙස, මෝහ, මාන දිට්ඨි, කිලෙස, දුච්චරිත යන මේය. කාමරාග භවරාග පටිඝ මාන දිට්ඨි විචිකිච්ඡා අවිජ්ජා යන මේ ද සඬ්ඝ යි ගණිත්. පංචස්කන්ධය සජීවතන්ත්‍රයෙන් ගෙණ එහි ඇලීම තෘෂ්ණා දෘෂ්ටි ආදීන්ගේ වශයෙන් කෙරෙන්නේ ය. පංචස්කන්ධයෙහි ඇලීමට කරුණු වන බැවින් මොවුහු සඬ්ඝ නම් වෙති. **"සජ්ජන්ති එතෙනාති ඝ සඬ්ඝා. ලග්ගනට්ඨෙන වා සඬ්ඝා"** යනු දන්න. සිරුරෙහි තතු දන්නවුනට මේ කිසිත් සඬ්ඝයෙන් නැත්තේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි රාජකුමාර තෙමේ සෝවන් වූයේ ය. පැමිණ සිටි පිරිසට ද දේශනාව වැඩ සහිත වූ ය.

අභයරාජකුමාරවත්ථු නිමි.

සම්මුඤ්ජනී සථවිරයන් වහන්සේ

13 — 5

සම්මුඤ්ජනී සථවිරයන් වහන්සේ උදය-සවසැයි නොසලකා හැම වේලෙහි ම මලුපෙත් මං හමදිත්. උදය පටන් සවස් වනතුරු හැම වේලෙහි ම ඒ ඒ තැන හමදින්නා වූ මුත් වහන්සේ එක් දවසක් ඉදලත් ගෙණ රෙවත තෙරුන් වෙත ගොස් "මේ සතා මහකම්මැලියෙක්, සැදහැති මිනිසුන් සැදහැයෙන් දෙන බත් කා අවුත් දවල ගෙට වැද හිඳ රුවත් ම නින්දට බසියි, නරක ද ඉදලක් ගෙණ මේ මිදුල් අතු ගැම" යි කිහ. එවිට රෙවත තෙරණුවෝ "මොහු අවවාද කළ යුතුය" යි සිතා "ඇවැත! මෙහි එව" යි අමතා "දිය නා එන්නැ" යි කිහ. ඔහු දිය නා ආ කල්හි වෙතට ගෙණ වාඩි ගන්වා "ඇවැත! ඔය විදියේ හැමදීමක් මම නොදනිමි, වත් පිළිවෙත් කරමි යි දවස මුළුල්ලේ හැමදී ම වැඩෙක් නොවේ, එයින් ම දවස ගෙවී ගිය කල අන් වැඩකට කාලයෙක් නොලැබෙන්නේ ය, උදැසනින් නැගිට හමදින තැනක් හැමද අවසන් කොට පිඬු සිඟා ගොස් අවුත් වළඳ රෑ වසන තැනෙක හිඳ සිහි එළවා දෙතිස් කුණු කොටස් ගැණ සලකා ආත්මභාවයෙහි තබා සිතට ගෙණ සවස නැගී සිට නැවැතත් හමදනා තැන් හැමදිය යුතු ය, නිතර හැමදීම කමටහන් වැඩීමට බාධක බැවින් එසේ නොකට යුතු ය" යි ද අවවාද කළහ. සම්මුඤ්ජනී සථවිර තෙමේ තෙරුන්ගේ අවවාදය පිළිගෙණ ඒ ලෙසට මහණ දම් කරණුයේ ටැඹී දවස් නොයවා ම රහත් බවට පැමිණියේ ය. ඒ දවස් කිහිපය තුළ වෙහෙර මිදුල්හි කුණු කසළ ගොඩ ගැසී තියේ ය. එවිට අන් භික්ෂූහු "ඇවැත! මිදුල් කුණු කසළින් පිරී ඇත්තේ ය, දැන් ටික දවසක සිට නොහමදහු කුමක් නිසා දැ" යි ඇසූහ. "සවාමීනි! නිකරුණේ දවස් ගෙවූ කාලයෙහි නිතර හැමදීමි, දැන් එසේ නොකළ හැකි ය, හැමදීමට ඇති කාලය ඉතා ටික ය, දැන් එදට මහණදම් කරමි" යි සම්මුඤ්ජනී තෙරුන් කී විට "මෙ තෙමේ රහත් බව හඟවා" යි සිතා බුදු රජුන් වෙත ගොස් එය දන්වා සිටියහ. උන්වහන්සේ "මහණෙනි! ඔව්! මාගේ පුත් පෙර නිකම් සිටි දවස නිතර මිදුල් හැමන්දේ ය, දැන් ඒ නම මාගීඵලසුඛයෙන් කල් යවන්නේ ය, එහෙයින් ඒ නමට මිදුල් හැමදීමට එතරම් කාලයෙක් නොවේ ය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

යෝ ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සෝ නපමජ්ජති,
සෝ ඉමං ලෝකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමාති.

යමෙක් පෙර පමාබවට පැමිණ ද පසුව හෙතෙමේ නොපමා වේ ද, හෙතෙමේ වලාපටලයෙන් මිදුනු සඳසේ මෙලොව බබලව සි.

යෝ පුබ්බෙ පමජ්ජිත්වා ච = යමෙක් පෙර පමාබවට පැමිණ ද.

පච්ඡා සෝ නපමජ්ජති = පසුව හෙතෙමේ පමා නොවේ.

අබ්භා මුත්තෝ චන්දිමා ඉව = වලාපටලයෙන් මිදුනු සඳසේ.

සෝ ඉමංලෝකං පභාසෙති = හෙතෙමේ මෙලොව බබලවසි.

වත් පිළිවෙත් කිරීම නිසා හෝ බණ දහම් ඉගෙණීම නිසා හෝ යමෙක් මුල් කාලයෙහි යොනිසොමනසිකාරයෙහි යෙදී වසන්නට නොහැකි වූයේ ද හෙතෙමේ පෙර පමා වූවකු ලෙස ගණිනු ලැබේ. එහෙත් හෙතෙමේ ම පසුව මගපල සුවයෙන් දවස් යවන්නේ නම් නොපමාවූවකු ලෙස සලකනු ලැබේ. ඒ ඒ පදාර්ථයන්හි ඇති නතු මෙනෙහි කිරීම යොනිසොමනසිකාරය සි ගත හැක්කේ ද මෙහි ලා මගපල ලැබීමට කරුණු වූ සංඝකාර තත්ත්වය ඇති සැටියෙන් සැලකීම සිතට නගා ගැණීම යොනිසොමනසිකාරය සි ගැණේ. ඒ උසස් වූ යොනිසොමනසිකාරය සි. මගපල ලැබීම සඳහා සංඝකාරධර්මතත්ත්වය මෙනෙහි කරන්නහුට ඇතිකාක් වත් පිළිවෙත් කිරීම හා බණ දහම් ඉගෙණීමත් පමායෙකැ සි කියන ලදී.

මගපලසුවයෙන් දවස් යවන ඒ ශ්‍රෙෂ්ඨපුද්ගල තෙමේ, වලාකඩින් මිදුනු චන්ද්‍ර තෙමේ අවකාශය යම් සේ බබලවා ද, එසේ මේ ආත්මභාවසඞ්ඛ්‍යාතලොකය ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථානපදස්ථානාදීන්ගේ වශයෙන් සප්තවිශුද්ධික්‍රමයෙන් අවබොධ කර ගැණීම ය "ආත්මභාවසඞ්ඛ්‍යාතලොකය බබලවා" සි වදාලෝ.

අබ්භ නම් වලාපටලය සි. චන්ද්‍රයා පිළිබඳ උපක්ලෙශ සතරෙකි. අබ්භ, මහිකා, ධූමරාජි රාහු සි. ඒ මෙසේ වදාළ සේක. **"අබ්භා භික්ඛවෙ, චන්දිමසුරියානං උපක්කිලෙසා, මහිකා භික්ඛවෙ, චන්දිමසුරියානං උපක්කිලෙසා, ධූමරාජෝ භික්ඛවෙ, චන්දිමසුරියානං උපක්කිලෙසෝ, රාහු භික්ඛවෙ,**

චන්දිමසුරියානං උපක්කිලෙසො" යි. අබ්හ නම්, වලාපටලයි. මහිකා නම්, පිණිය. ධූමරාජ නම්, දුම්රුස ය. රාහු නම්, එනම් අසුරිඳු ය. චන්ද්‍රයා පිළිබඳ උපක්ලෙශ පසකැ යි ගන්නා තැන ධූලිසමූහය ද එක් උපක්ලෙශයෙක් වේ.

දිය දරණ බැවින්, සතුන් රකින බැවින්, නොයෙක් සිය ගණන් පටල ඇති බැවින් අබ්හ නම්.

"ආපං භරතීති = අවති සත්තෙ රක්ඛතීති = අබ්හති අනෙකසතපටලො හුත්වා ගච්ඡතීති = අබ්හ" යනු අර්ථ සමර්ථනය යි. දුම්, ගිනි, දිය සුළඟ යන සිවුදෙනාගේ එක්-වීමෙන් වලාකුල් හට ගණිය යි භූවිද්‍යාඥයෝ කියත්. සඳදෙව් විමන මෝ හට ඇත්තේ නු යි **චන්දිමන්තු** නම්. සඳදෙව් පුත් ය. නැත, සඳ දෙව්පුත් මෙහි ඇත්තේ නුයි චන්දිමන්තු නම්. සඳ දෙව් පුත් හා සඳවිමන වෙන් කොට නො දැක්විය හැකි වස්තූන් බැවින් මෙතැන්හි අභිමතපදාර්ථයක් ගැණීමට ඉඩ ඇත්තේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙනෙක් සෝවන් පලාදියට පැමිණියාහු ය.

සමමුඤ්ජනීස්ථවිරවස්තුව නිමි.

අඩගුලිමාල ස්ථවිරයන් වහන්සේ

13—6

කොසොල් රජුට අයත් එක් ගමෙක **ගර්ග** නම් බමුණෙක් විය. කොසොල් රජුගේ පුරොහිත වූයේ ද ඒ බමුණු ය. **මන්තානී** නම් බැමිණියක් ඔහුට බිරිය වූ ය. ගර්ග නිසා මෑ පුතකු වැදූ ය. ඔහු උපන් වේලේ කොසොල් රට හැම ගමෙක නුවරෙක තුබූ සියලු ආයුධ දිලිහී ගියේ ය. රජුගේ මගුල් කඩුව ද දිලිහිත. බමුණු තෙමේ සිය දරු උපන් නැකත බැලී ය. සොර නැකතින් උපන් බව දැක එය කාටත් නො දන්වා නිහඬ වී ය. පසුදා ඔහු රජගෙට ගොස් රජුගෙන් "රෑ දවස ගත වූයේ කෙසේ දැ" යි ඇසී ය. "ගුරුතුමනි! ඊයේ රෑ මා හිස් දොර තුබූ මගුල් කඩුව ගිනිගත්තක් සේ වුනා, එතැන් සිට නිදි නැතිව මට මා බිසොවට රජයට මොන නපුරෙක් වේ දැ යි සිතමින් රෑ දවස ගත කළා" යි රජ තෙමේ කීයේ ය. එවිට බමුණු "මහරජ! ඒ අනෙකෙක් නො වේ, ඊයේ රෑ මා ගෙයි උපන් ලදරුගේ අනුභාවයෙන් මගුල් කඩුව පමණක් නොව හැම ගමෙක හැම නුවරෙක තුබූ ආයුධ දිලිහී ගියේ වනැ" යි කියා සිටියේ ය. ඉක්බිති රජ තෙමේ එයින් වන වැඩ අවැඩ විචාළේ ය. බමුණු "ඌ සොරෙක් වන්නේ ය" යි කියා නැවැත රජුගේ සිත් ගන්නා අටියෙන් "ඌ අද හෙට ම මරා වළ දමමි" යි කී ය. රජ තෙමේ "ඌ එකලා සොරෙක් වන්නේ ද, නැත, සොරමුළක් ගෙණ ගම් පහරණ සොරදෙටුවෙක් වන්නේදැ" යි ඇසී ය. බමුණු "ඌ එකලා සොරෙක් වන්නේ ය" යි කී කල්හි රජ තෙමේ "එසේ නම් ඌ රකුව" යි කී ය.

බ්‍රාහ්මණ තෙමේ යහපතැ යි පෙරළා ගෙට අවුත් පුතුට **'අහිංසක'** යි නම් තබා පිළිදැගුම් කෙළේ ය. අහිංසක සොළොස් අවුරුදු වයසට පැමිණි කල්හි ශිල්ප උගන්නට තක්සලා නුවර දිසාපාමොක් මහඇදුරු වෙත යැවී ය. ඔහු එහි මැනැවින් ශිල්ප උගන්නේ ගුරුසිත් ගත්තේ ය. ගුරු වචනය නො ඉක්මවා සිටියේ ය. ඉතා කීකරු ය. කී දෙය වහා කෙළේ ය. හැම කෙනෙකුගේ මන වැඩුයේ ය. එහෙයින් එහි සිටි ආචාර්‍යවරයෝ ඔහු කෙරෙහි සෙනහ ඇත්තෝ වූහ. මෙසේ දවස ගෙවුනේ ය. මේ අතර ඔහු හා එකට උගන්නා අන් සිසුදරුවෝ ඊෂ්‍යා ඇත්තෝ "මූ ආ දවසේ සිට අපගේ ගුරුවරුනට මූ මිසක් අපි නො පෙණෙන්නමෝ ය, එහෙයින් කුමක් හෝ කොට මූ කෙරෙහි ගුරුන් බිඳුවාපියමු" යි කුමන්ත්‍රණය

කළහ. එහිදී "මූ නො මැලි හෙයින් මැලි එකෙකැ යි නො කිය හැක්ක, කුලීන හෙයින් අකුලීනැයි නො කිය හැක්ක, නුවණැති හෙයින් නුවණ නැතැයි නො කිය හැක්ක, එහෙයින් මේ කිසිවක් කියා ගුරුන් බිඳුවාපියන්නට නො හැක්ක, එහෙත් මූ ගුරු බිරිය හා අනාචාරයෙහි හැසිරේ යි කී කල්හි ගුරු මූ හා බිඳෙන්නේ ය" යි කතා කොට මේ වග ගුර්වරයාට කියන්නට ඒ සිසුදරුවෝ තුන් කොටසකට බෙදී සිට ගත්හ. ඉන් එක් කොටසෙක සිසුදරුවෝ දිසාපාමොක් ඇදුරන් වෙත ගොස් "ආචාර්‍යයන් වහන්ස! ඔබ වහන්සේට දැන්විය යුත්තෙක් ඇත, එයට අවසර දී වදුළ මැනැවැ" යි කීහ. "කියවු" යි ඔහු කී ය. එවිට ඔවුහු ලොකු රහසක් කියන්නා සේ බිය දක්වමින් ගුරුන් වෙත ලංව "ආචාර්‍යතුමනි! අභිංසක ගුරු බිරිය හා අනාචාරයෙහි හැසිරේ" යි කීහ. එ බසින් උදහස් වූ දිසාපාමොක් "මා දරු එසේ නො කෙරේ" යි ඔවුන් පන්නා හැරියේ ය. නැවැත අන් දිනෙක දෙවන කොටසට අයත් වූවෝ ගොස් "ගුරුතුමනි! දැන්විය යුතු රහසෙක් තිබේ, එයට අවසර" යි කියා, අභිංසක ගුරුමෑනියන් හා ඇඟ ඇලි කම් ඇත්තේ නොහොබනේ ය" යි කීහ. දිසාපාමොක් ඔවුන් ද පන්නා හැරියේ ය. ඉන් පසු දවසෙක, තුන්වන කොටසට බෙදී සිටි සිසුදරුවෝ ගොස් "ගුරුතුමනි! අවසර! ඔබවහන්සේට නො දන්වා නො සිටිය හැකි බලගතු රහසෙක් අප ඇසට හමු වී ඇත, එය ඉතා නින්දිත එකෙකි, රට වැසියාහට එහිලා දුකුමෙක් වී නම් අපට ජීවත් වීමෙන් වැඩෙක් නැත, අප උගන්නා ශිල්පයෙන් වැඩෙක් නැත. එහෙයින් එය දන්වන්නට අපට අවසර දුන මැනැවැ" යි කීහ. දිසාපාමොක් "කියවු" යි කී කල්හි ඔවුහු ද "ගුරුතුමනි! අභිංසකගේ හා ගුරුබිරියගේ හැසිරීම ඉතා නපුරු ය, අඹු සැමි දෙදෙනකුන්ගේ හැසිරීම සේ ය, උන් දෙන්නාගේ හැසිරීමැ" යි කීහ. දිසාපාමොක් උන් කෙරෙහි ද උදහස්ව "මෙතැනින් යවු" යි කී කල්හි "ගුරුදෙවය! අප කෙරෙහි උදහස් නො වනු මැනැව, ටික දවසක් ගිය නැත අප කී බසෙහි සැබෑබොරු දත හැකි වන්නේ ය" යි කියා ඔවුහු එතැනින් නික්ම ගියහ.

දිසාපාමොක් මුන්ගේ බසින් සැකයට වැටී එගැණ පරීක්ෂා කරණුයේ දවසෙක අභිංසක, ගුරු මෑනියන් හා පිය තෙපුල් කතා කරණු අසා "සිසු දරුවන් කීයේ සැබෑවැ" යි අදහා ගෙණ කාමයෙන් අඬවූයේ, අභිංසක මරා දමන්නට සිතී ය. නැවැත ද "ඉදින් මම මූ මැරුයෙමි නම්, මා වෙත ශිල්ප

උගන්නට එන්නෝ අඩු වෙත්, එවිට මට ලැබෙන ලාභ සත්කාර ද අඩු වන්නේ ය, එහෙයින් යම්කිසි උපායයක් යොදා මූ මැරුව මනාය" යි සලකා අනෙකකු ලවා, මරවන අටියෙන් "පුත! අහිංසක! මෙහි එව' තාගේ ශිල්ප ඉගැන්ම අවසන් වන්නට ලංව තිබේ, එය සම්පූර්ණ වන්නට උපචාර වුවමනා ය, එහෙයින් ශිල්පයට උපචාර පිණිස දහසක් මිනිසුන් මරා එව" යි අණ කෙළේ ය. "ගුරු දෙවය! මම අන්නට හිංසා නො කරණ කුලයෙහි උපන්මි, එහෙයින් මම කෙසේ මිනිසුන් මරම් ද" යි ඇඟ මැලි කැඩී ය. එකල දිසාපාමොක් "පුත! අහිංසක! ඒ කළ යුතු ය, මේ වේලෙහි කුල සිරිත් ගැණ සිතීම චරද ය, ශිල්පයට උපචාර නො කරන්නේ ශිල්ප නො ලබන්නේ ය" යි කීයේ ය. එවිට, අහිංසක ඉන් පසු කිසිත් නො බැණ දුනු නී සපයා ගෙණ වන වැද වන මැදින් යන එන්නන් මරා ලන්නට පටන් ගතු. මරා දමන්නවුන්ගේ ඇඳුම් කැඩුම් අබරණ ආ කිසිවක් තෙමේ නො ගණියි. මැරුවන්ගේ ගණන පමණක් ගණියි කල් යත්, මැරූ මිනිසුන්ගේ ගණන අමතක ව යියේ එහෙයින් ඔහු එතැන් සිට එක මිනිසකුගෙන් එකැඟිල්ල බැගින් කපා ඒ ඒ තැන තැබී ය. එද නැසෙන බව දැක නැවැත කපා ගත්නා වූ ඇඟිලි වැලක අවුණ, ගෙල දැරී ය. එහෙයින් **අඞ්ගුලිමාල** යි ප්‍රසිද්ධ විය.

අඞ්ගුලිමාල තෙමේ රාත්‍රියෙහි ගම් වැද ගෙවල දොර බිඳ ගෙට වැද හොත්තා වූ මිනිසුන් මරා ඇඟිලි කපා ගෙණ යන්නට පටන් ගත්තේ ය. ගම් වැස්සෝ බියෙන් වෙව්ලා හියහ. බියෙන් ගැහෙන්නට වූහ. කරන්නට කිසිවක් නො දන් ඔවුහු, ගෙවල හැර දරු බිළිදුන් හා වටිනා ඇඳුම් කැඩුම් හා රන් රිදී අබරණ ද මිල මුදල් ද ගෙණ නියම් ගම් තුළට වන්හ. නියම්ගම්වැස්සෝ එසේ ම කොට නුවර වටා කඳවුරු බැඳ සිට ගත්හ. ඒ අතර දවසෙක ගම් නියම්ගම් නුවර වැසි මිනිස්සු රජගෙය මිදුලෙහි රැස්ව සිට "දෙවයන් වහන්ස! ඔබවහන්සේගේ රජයෙහි අඟුල්මල් නම් සොරෙක් දුටු දුටුවන් මරා ඇඟිලි කපා ගෙණ යයි, දර පලා සඳහා වනයට යන්නෝ දැන් නැත, හැම ගම් අගම් කෙළේ ය, නියම්ගම් අනියම්ගම් කෙළේ ය, දනවු නො දනවු කෙළේ ය, හැම දෙනෙක් ම බියෙන් තැති ගෙණ සිටිත්, මෙසේ රට වැසියා පෙළන තවන මේ බිය වහාම දුරු කරණ සේක්වා" යි මහහඬින් මුරගාන්නට වූහ. එවිට කොසොල් රජ තෙමේ අඟුල්මල් මරා දමන්නට රාජපුරුෂයන්ට නියම කෙළේ ය. එවේලෙහි

කොසොල් රජු වෙත සිටි අඟුල්මල් සොරුගේ පිය වූ පෙරෙවි බමුණු තෙමේ ඒ නියමය අසා ගෙට ගොස් සිය බිරිය අමතා "සොඳුර! රජු විසින් මරන්නට නියම කරණ ලද අඟුල්මල් අනෙකෙක් නො වේ, දිසාපාමොක් වෙත ශිල්ප උගන්නට යැවූ අපගේ පුතු ය, දැන් මෙයට කළ යුත්තේ කුමක් දැ"යි කී ය. "හිමියෙනි! ඔබ ගොස් මපුතු කැඳවා ගෙණ එවු"යි ඕතොමෝ කියා සිටියා ය. එබසට ඔහු "සොඳුර! ලොකයෙහි විශ්වාස නො කොට හැකි සිටු දෙනාගෙන් එකෙකි සොරු, ම පුත් ද දැන් සොරෙකි, එහෙයින් මට යෑ නො හැක්කැ"යි කී ය. එවිට බැමිණි "මට කුමක් වුවත් කම් නැතැ"යි පුතු රැක ගන්නට සිතා ගෙයින් නික්ම ගොස් වන වැද "පුත! අහිංසක! ඇයි, මට මෙසේ දුක් දෙන්නෙහි? මෙහි එන්න! මෙසේ මිනිසුන් මරණු ඔබගේ කුලයට නමට ගැළපේ ද? පුත! අහිංසක! ශිල්ප උගත්තෙහි මිනිසුන් මරණු පිණිස ද? රාජ-පුරුෂයන් ඔබ මරා දමන්නට දුනු හී ගෙණ රැක සිටිනු ඔබට දැනුම් නැත, මට දුක් දෙනු ඔබට තරම් නො වේ, දසමසක් ඔබ කුසෙහිලා දැරීමි, ඒ කාලයෙහි මා විඳි දුක් දන්නෙම් මම මැ යි, වැදූ දා පටන් ශිල්ප උගන්නට යන තුරු ඔබ වඩන්නට මා ගත් වෙහෙස නො දනිහි ද? මෙහි එන්නැ"යි මෙසේ කියමින් හඬන්මින් වනයෙහි ඇවිදින්නට වූවා ය.

එදවස උදෑසන බුදුරජානන් වහන්සේ මහකුළුණු සමවතට සම වැද ලොව බලා වදාරණ සේක් අඟුල්මල් සොරු දුටු සේක දැක "මම මූ කරා ගියෙම් නම් මූ මාගෙන් බණ අසා රහත් ව අමාමහනිවන දකින්නේ ය, නො ගියෙම් නම් මවු මරා මැරී ගොස් නිරයෙහි ඉපිද අතුරු කපක් දුක් විඳින්නේ ය, එහෙයින් මා මූ කරා යා යුතු ය"යි සැවැත් නුවර පිඩු සිඟා වළඳා වෙහෙරට වැඩ ඔහු කෙරෙහි කරුණාවෙන් මග බැස වඩනා සේක. එසේ වඩින්නා වූ බුදුරජුන් දුටු නොයෙක් දෙන. බුදුරජුන් නො හැඳින, "මහණ! තෙල මග නො යා, එමග සොරෙක් ඇත්තේ ය, ඌ ඉතා දරුණු ය, ලේ වැකුණු සිරුරු ඇත්තේ ය, කඩමාලු හැඳියේ ය, දුනු හී දරා සතුන් කෙරෙහි ටිකකුත් කුළුණු නැත්තේ ය, බිහිසුණු ය, ගම් නො ගම් කෙළේ ය, නියම්ගම් නැසූයේ ය, දනවු නො දනවු කෙළේ ය, දුටු දුටු මිනිසුන් මරා එකාගෙන් එකැඟිල්ල බැගින් කපා ගෙණ ඒ ඇඟිලි වැලක අවුණ මාලාවක් කොට දරන්නේ ය, මහණ! තෙල මග යන්නෝ විසි තිස් දෙනා

බැගින් කාණ්ඩ ගැසීමෙන් යුතුව ම යෙත්, එහෙත් ඔවුහු යන්නෝ පණ බියේ ම යෙත්"යි ඉදිරියට පැමිණ කියා සිටියාහ. එහෙත් උන් වහන්සේ උන් කියන බස් නොඇසෙන සේ එම මග ම වැඩ අඟුල්මල් සිටි වන පෙදෙසට ම වැඩි සේක.

එදවස අඟුල්මල්හුගේ අඞ්ගුලිමාලාවෙහි එකැගිල්ලෙකින් දහස පිරෙන්නේ ය. එහෙයින් ඔහු එදවස පළමු කොට දුටු කෙනකු මරා ඇඟිලි දහස පුරවා ගෙණ ගුරුන් දැක ශිල්පයට උපචාර දක්වා ඉස් සෝදා නා සුදු පිළි හැඳ නෑ දෑ නිතවතුන් වෙත යන්නට සිතා වනයට වදනා මඟින් මදක් ඉවත් ව තවරෙක් ඒ දැසි බලා සිටියේ ය. ඒ වේලෙහි එමග වඩනා බුදුරජුන් දැක, පුදුමයට පැමිණ "මේ මග දස දෙන විසි දෙන තිස් දෙන සතළිස් දෙන පණස් දෙන බැගින් කණ්ඩායම් ගැසී ආවෝ ද මාගෙන් මැරුම් කෑහ, එහෙත් මේ මහණ, මා ගැණ නොදන්නා සේ එයි, මූ මැරුව මැනැවැ" යි සිතා දුනු ගී ගෙණ බුදු රජුන් ලුහු බැඳ ගියේ ය. එ වේලෙහි උන්වහන්සේ "හැකි තරම් වේගයෙන් ලුහු බැඳ දිවනා අඟුල්මල් ප්‍රකෘති ගමනින් යන මට ලංවන්නට අසමර්ථ වේවා"යි ඉටුහ. ඒ ඉරීම්බලයෙන් අඟුල්මල් දිවනා තැන් හා බුදු රජුන් වඩනා තැන් නොලං වූ සේ පෙණෙන්නට වන. එහෙත් ඔහු දැන් දැන් මහණහු ගණිම්, මෙ තැනදී ඔසු කෙරෙම්"යි දෙලොස් ගව්වක් තැන් ලුහු බැඳ ගියේ ය. බුදු රජානන් වහන්සේ ඉදිරියෙහි වළක් හෝ ගොඩක් දක්වන සේක. සොරු වළින් නැග ගොසින් බැස යන්නේ කට කෙළ සිදී ඔහදියෙන් තෙත් වූ සිරුරු ඇත්තේ වෙහෙසට පත් විය. ඉක්බිති ඔහු "අනේ' කිම, මම පෙර දුවන ඇතුන් දුවන අසුන් දුවන රිය දුවන මුවන් දුව ගොස් අල්ලා ගතිමි, එහෙත් අද හැකි-තරම් වේගයෙන් දුවනා මට පියවිගමනින් යන මේ මහණහු අල්වා ගත නොහැකිය"යි සිතා බුදුරජුන්ට "සිට මහණ,යි කියේ ය. බුදුරජානන් වහන්සේ "මම සිටියෙමි, තෝ ද සිටුව"යි වදාළ විට "මහණ! තෝ නොසිට යන ගමන් සිටියා වූ මට තෝ සිටුව'යි කියහි, මේ කියනු යුකති දැ" යි ඇසී ය එකල්හි බුදුරජානන් වහන්සේ "මම සෑමදා ක්ෂාන්තිමෛත්‍රී ආදී ගුණයන්හි පිහිටා ගත් බැවින් සිටියෙමි නම් වෙමි, තෝ එසේ නොවෙහි, මෙතෙක් දහස් ගණනින් සතුන් මරන්නා වූ තෝ එබදු කිසි ගුණයෙක නොපිහිටි බැවින් නොපිහිටියේ වෙහි, ඉරියවු විසින් සිටියෙහි ද, තා කළ අකුසල් විසින් සිවු අපායයෙහි උපදනා බැවින් නොසිටියෙහි" යි

වදාළ සේක. එකල්හි අඟුල්මල් "මෙ වැනි අභීත නාදයෙක් අනෙකකු විසින් කළ නො හැක්කේ ය, මේ නාදය සුදෙවුන් පිත් මහමහණහුගේ විය යුතු ය, සියුම් නුවණැති ඔහු මා දැක මට වැඩ පිණිස මෙහි ආයේ වන, මා කෙරෙහි උපන් කරුණාව නිසා මෙහි ආයේ වනැ" යි තම අත තුබූ දුනු හී වළකඩෙක බහා ගොස් බුදු රජුන්ගේ පාමුල්හි වැතිර වැඳ "තිලෝගුරු හිමියනේ! මා පැවිදි කර ගන්නැ" යි ඇය ද සිටියේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ ඔහු පැවිදි කොට ඔහු හා ජෙතවනාරාමයට වැඩි සේක. එයින් ටික දවසක් ගිය තැන අඞ්ගුලිමාල ස්ථවිර තෙමේ රහත් බවට පැමිණ රහතුන් අතුරෙහි එක්තරා එකෙක් විය. දිනෙක අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ විවේකයට පැමිණ එකඟ සිතින් යුක්තව අභීත්ඵල සුඛය විඳිනුවෝ

"පෙර පමාවූවෙක් පසුව නො පමා වේ නම්,
හේ, වලාමුත් සඳසේ මේ ලොව බබලවාලයි"

යනුවෙන් තම ප්‍රීතිය ප්‍රකාශ කළහ. මේ ප්‍රීතිප්‍රකාශයෙන් පසු උන්වහන්සේ පිරිණිවී ගියහ.

එකල්හි සෙසු භික්ෂූන් වහන්සේලා එක්ව "ආයුෂ්මත්නි! අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ කොතැන උපන්නෝ දැ"යි ධර්මසභාවෙහි කතාවක් ඉපද වූහ. බුදුරජානන් වහන්සේ ඒ අසා "මහණෙනි! මාගේ පුත් පිරිනිවියේ ය" යි වදාළ විට "ස්වාමීනි! මෙතෙක් දෙනාත් මරා පිරිනිවියේ දැ" යි නැවැත ඇසූ හ. "අඞ්ගුලිමාල මෙතෙක් කල් කල්‍යාණමිත්‍රයකු නො ලැබ පව් කෙළේ ය, පසුව ඔහු කල්‍යාණ මිත්‍රයකු ලැබ අප්‍රමත්ත විය, පින් දහම් කෙළේ ය, එයින් ඔහු මුලින් කළ සියලු පව් වැසී ගියේ ය" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථියති,
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමාති.

යමකු කළ පව්කම්, පින් කමින් වැසී යේ ද, ඔහු වලාපටලයෙන් මිදුනු සඳසේ මෙ ලොව බබලවාලයි.

යස්ස පාපං කතං කම්මං = යමකු විසින් කළ පව්කම.

කුසලෙන පිථියති = කුසලින් වැසී යේ ද.

මවු මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදුරජුන් සිරුරෙහි ලේ සෙලවීම, සමානසංවාසකසඞ්ඝයා භෙද කිරීම, යන ආනන්තර්‍යකර්ම නො කළ රහත්වීමේ වාසනා ගුණය ඇති යමකු විසින් පාපමිත්‍රයන් හා එකතුවීමෙන් ප්‍රාණඝාතාදි-අකුශලකර්ම කොතෙක් කරණලද නමුත් ඒ සියල්ල කල්‍යාණ මිත්‍රසංසර්ගය නිසා පසුව කළ පින්බලයෙන් පිළිවෙත් පුරා රහත්වීම්හෙතුවෙන් වැසී යන්නේ ය. අර්හන්මාර්ගකුශලය සියලු පව් සිඳ හරින්නේ ය. ඔහු පිළිබඳ සියලු අකුසලයෝ විපාක නො දෙන තැනට යන්නෝ ය. රහතුන් වහන්සේට මතු ඉපැත්මක් නැති බැවින් උන්වහන්සේ පෙර කළ කිසිත් අකුසලයෙක් ප්‍රතිසන්ධි විපාකයක් නම් නො දෙන්නේ ය. අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ රහත් වූවෝ එහෙයිනි. උන් වහන්සේ පෙර පව්වූ මිතුරන් හා එක්ව නොයෙක් පව්කම් කළෝ ද ආනන්තර්‍යකර්මයක් නම් කිසිදාකත් නො කළෝ ය. එහෙයින් පසුව බුදුරජානන් වහන්සේගේ ආශ්‍රයෙන් පිළිවෙත් පුරා රහත් වූවාහු තමාගේ පෙර වූ සියලු අකුසල් නසාලූහ. අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ පිළිබඳ වූ හැම අකුසලයෙක් ම අවිපාකභාවයට පැමිණියේ උන්වහසේගේ අර්හන්මාර්ගකුශලබලයෙනි. එය අකුශලච්ඡේදක විය. එහෙයින් මෙය උපච්ඡේදක නම් වේ. අජාසත් රජුන් පිළිබඳ වූ සෝවන්වීමේ වාසනා ගුණය පිතෘඝාතකඅකුශලකර්මය විසින් නසන ලද්දේ ය. මේ අකුශලයෙන් කුශලය වැසී ගිය තැනෙකි. මෙ ද උපච්ඡේදක නම් වේ. මෙයට ප්‍රවෘත්තිවිපාක විසින් උන්වහන්සේ බලු කපුටු ආදීන්ට ගැසූ ගල්මුල්පහරවලට ලක් වූහ.

සො අඛ්‍යා මුත්තො චන්දිමා ඉව ඉමං ලොකං පභාසෙති = ඔහු වලාවකින් මිදුනු සඳසේ මේ ලොව බබලවාලයි.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙනෙක් සෝවන් පලාදියට පැමිණියෝ ය.

අඞ්ගුලිමාලස්ථවිරවස්තුව නිමි.

---

1. 13. 5 "සො ඉමං ලොකං පභාසෙති" යන්නට කළ පරිකථා බලනු.

පෙහෙරකෙල්ලගේ මරණය.

13 — 7

බුදුරජානන් වහන්සේ **අලවි** නුවරට වැඩි ගමනෙක එහි වැඩසෝ උන්වහන්සේට ආරාධනා කොට දන් පිළිගැන්නූහ. උන්වහන්සේ වළඳ අවසානයෙහි "ජීවිත ය අස්ථිර ය, මරණය එකාන්ත ය, මම මැරෙන්නෙමි, මාගේ ජීවිතය මරණය කෙළවර කොට සිටියේ ය, ජීවිතය අනියත ය, මරණය නියත ය, මේ සැටියෙන් මරණය ගැන නිතර සිහිකළ යුතු ය, යම්කෙනකුන් මරණසතිය මෙසේ නො වඩන ලද නම්, ඔවුහු පසු කල්හි නයකු දැක බියට පත් පුරුෂයකු සේ සන්තාපයට පැමිණෙන්නාහ. මරහඬ නගමින් කලුරිය කරන්නාහ, යම්කෙනකුන් මරණසතිය වඩන ලද නම්, ඔවුහු දුරදීම නයකු දැක කෝටුවෙන් ගෙණ වීසි කොට සිටි පුරුෂයකු සේ තැති නො ගන්නෝ ය, බියපත් නො වන්නෝ ය, ඒ නිසා හැම කෙනකුන් මරණසතිය වැඩිය යුතු ය" සි ධර්මදේශනා කළ සේක. එහෙත් ඒ දෙශනාව ඇසූ හැම දෙනෙක් පෙර සේ ගෙදර දොරේ කටයුතු වලම යෙදී හුන්හ. ඒ දෙශනාව අනුව යෙදෙන බවෙක් නො වී ය. එහි එක් සොළොස්වැරිදි පෙහෙර කෙල්ලක් "බුදුරජානන් වහන්සේගේ දෙශනාව කොතරම් අගී ද, උන් වහන්සේ වදාළෝ අපට වැඩ වත්නක් ය, අවැඩට වැටෙන්නක් කවදාවත් නො වදාරණ සේක, එහෙයින් මා මරණසතිය වැඩිය යුතුය" සි දිවා රෑ දෙක්හි ම මරණසතිය වැඩූ ය. බුදුරජානන් වහන්සේ ද දෙව්රම බලා පෙරළා වැඩි සේක. ඒ තරුණිය ද මරණසතිය වඩමින් තුන් අවුරුද්දක් ම කල් ගෙවූ ය.

මේ කාලයෙහි දවසෙක බුදුරජානන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදාරණ සේක් මැය දැක "මැයට කුමක් වන්නේද" සි විමසා බැලූහ. එහිදී "ඇය බණ අසා සෝවත් වන බවත්, ඇය නිසා එහිදී කරණ ධර්මදේශනාව මහාජනයාට වැඩ සහිත වන බවත් දැක භික්ෂුගණයාත් ගෙණ ජේතවනයෙන් නික්ම **අඟනාලව** විහාරයට වැඩි සේක. අලවි නුවර වැස්සෝ එදින බුදුරජුන් දකිනු රිසියෙන් එහි ගියහ. ගොස් දුනමානාදියෙන් උන්වහන්සේට සඬ්ගහ කළහ. පෙහෙර තරුණිය ද බුදුරජුන් වැඩි බව අසා තුටුසිත් ඇති ව "මා මෙයින් තෙවසකට උඩ දී රන්වන් වූ බුදුරජානන් වහන්සේ දක්නා ලදහ, දැන් උන්වහන්සේගේ සවණීවණී වූ ශ්‍රීදෙහය දකිත්නට මිහිරි වූ උතුම් දහම් අසන්නට ලබන්නෙමි" යි

සිතූ ය. එදා පෙහෙරහලට යන ඇයගේ පියා, "දුව! අනුන්ගේ රෙද්දක් වියන්නට ගනිමි, එහි තව වියතක් පමණ වියන්නට ඉතිරිව ඇත, අද ඒ ටික වියා අවසන් කළ යුතු ය, ඒ නිසා පිළිවියන සරස්දඬුවෙහි නූල් ඕතා ගෙණ වහා එව" යි කියා ගියේ ය. එකල්හි ඕ තොමෝ "මම බණ අසන්නට යන්නට සිතා ගෙණ සිටියෙමි, තාත්තා පිළිවියන සරස්දඬුව පිළියෙල කොට ගෙණ එන්නැයි කියයි, දැන් මෙයට කුමක් කෙරෙම් ද, බණ අසන්නට යම් ද, නැත, සරස්දඬුව ගෙණ යම් ද, සරස් දඬුව ගෙණ නොයියොත්, තාත්තා මට තළන්නේ ය, හොඳයි, තසරය වඩා ගෙණ ගොස් දී පස්සේ බණ අසන්නට යමි" යි සිතා මිටි පුටුවෙක හිඳ තසරයෙහි නූල් ඒතුවා ය. අලව් වැස්සෝ බුදු රජුන් වළඳවාලා අවසන් කොට පාත්‍රය ගෙණ අනුමෙවෙනිබණ අසන්නට සූදානම් ව සිටියහ. එකල්හි බුදුරජාණන් වහන්සේ "මම මේ තෙක් දුර නිස් යොදුන් මඟ ගෙවා යම් කුල දැරියක නිසා ආයෙම් නම්, ඇට මෙහි එන්නට තවම ඉඩ නැත්තේ ය, එහෙයින් ඇ මෙහි ආ විටෙක අනුමෙ-වෙනි බණ වදාරන්නෙමි" යි කිසිත් නොබැණ වැඩ හුන් සේක. බුදුරජාණන් වහන්සේ කිසිත් නොබැණ වැඩහුන් සේක් ද, එ ගැණ කිසිත් කියන්නට ශක්තියක් දෙවියන් සහිත ලොක යෙහි කිසිවකුටත් නැත්තේ ය. පෙහෙරදැරිය තසරයෙහි නූල් වඩා අවසන් කොට එය පැසෙක ලා ගෙණ පෙහෙර හලට යන්නී බුදු රජුන් වැඩ හිඳුනා තැනින් බුදුරජුන් දෙස බල බලා ගියා ය. උන්වහන්සේ ද කර ඔසොවා ඇ දෙස බැලූහ. ඕ තොමෝ බුදුරජුන් බැලූ බැල්මෙන් "තමන් දෙස බලා ය" යි දැන "පුදුමයි, මෙතරම් මහත් පිරිසක් මැද වැඩ හිඳ මා දෙස බැලීම, එකනින් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වෙතට මා පැමිණෙනු බලාපොරොත්තු වන සේකැ" යි තසරය බහා තුබූ පැස පසෙක තබා බුදුරජුන් වෙත ගියා ය. "මෝ තොමෝ මා වෙත නොපැමිණ ගියොත් අනියතගති ඇතිව පුහුදුන්ව කලුරිය කරන්නී ය, මා වෙත පැමිණ මාගෙන් බණ අසා ගියොත් සෝවන්ව නියතගති ඇතිව කලුරිය කොට තුසිතදෙව්මන්හි උපදිනීය" යි දැන බුදුරජාණන් වහන්සේ ඇ දෙස බැලූ සේක. එදා ඇ මැරෙණු එකාන්න ය. ඇයට එදා මරණය පැමිණෙනු වළකාලනු නොහැකි ය.

පෙහෙරදැරිය බුදුරජුන් බැලූ බැල්මෙන් ම බුදුරජුන් වෙත ඇදී ගියා සවණක් රැස් අතරට වැද එසින් සැරහී දෙහොත් මුදුනේ තබා වැඳ පසෙකට වී හුන්නී ය. ඒ සා මහත් පිරිසක් මැද එතෙක් වේලා කිසිත් නොබැණ වැඩ හුන් බුදුරජාණන් වහන්සේ ඇය වැඳ සිටි කල්හි මෙසේ අසා වදාළ සේක.

බුදුරජානන් වහන්සේ = ලමයා කොහි සිට ආයෙහි ද?

දූරිය = ස්වාමීනි! මම කොහි සිට ආයෙම් දැයි නො දනිමි.

බුදු = හා හොඳයි, දැන් මේ කොතැනක යෙහි?

දූරිය = එය ද නො දනිමි ස්වාමීනි!

බුදු = නො දනිහි?

දූරිය = දනිමි, ස්වාමීනි!

බුදු = දනිහි?

දූරිය = නො දනිමි, ස්වාමීනි!

එහි මෙය අසා සිටි මිනිස්සු කෝපයෙන් ඉල්පී ගියෝ "බලා පියවු, ඇරැගේ හැටි, මේ පෙහෙරකෙල්ල බුදුරජුන් ඉදිරියෙහි කටට ආ ආවක් කියා, මොක ද, මැගේ මේ ඔළමොළ කම්, කොහි සිට ආයෙහි ද යි ඇසූ කල්හි කියන්නට තුබුනේ පෙහෙරගෙදර සිට ආ බව නේ ද කොතැනක යෙහි ද? යි ඇසූ වේලේ කිය යුතුව තුබුනේ රෙදි වියන තැනට යන බව නේ ද, එසේ නො කියා මෑ කටට ආ ආ බස්ම කීවා ය" යි කෑකෝ ගසන්නට වූහ.

බුදුරජානන් වහන්සේ මහජනයා නිශ්ශබ්ද කොට නැවැත "ලමයා, 'කොහි සිට ආයෙහි ද' යි මා ඇසූ විට, 'නො දනිමි' යි කීයෙහි කුමක් නිසා ද?" යි ඇසූහ. "ස්වාමීනි! තිලෝගුරු හිමියෙනි! ම පියානෙනි! පියානන් වහන්සේ මා පෙහෙරගෙදර සිට ආ බව දන්නා සේක් ය, එසේ දැන 'කොහි සිට ආයෙහි ද' යි විචාළ සේක්, 'කොතැනින් චුත ව මෙහි උපන්නී ද' යි මා ලවා කියවනු සඳහාය, යි මට සිතුනේ ය, මම කොතැනින් චුත ව අවුත් මෙහි උපන්මි, යි මා නො දන්නා බැවින් 'නො-දනිමි' යි කීයෙමි" යි ඕ තොමෝ කිවූ ය. "බොහොම හරි ලමයා, මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් සැටි, මාගේ ප්‍රශ්නයට ලමයාගේ පිළිතුර නියම පිළිතුරු" යි බුදුරජානන් වහන්සේ සාධුකාර දුන්හ.

නැවැත "ආ' ලමයා! 'කොතැනක යෙහි' යි මා ඇසූ ප්‍රශ්නයට 'නො දනිමි' යි කීයෙහි කුමක් නිසාද?" යි ඇසූ කල්හි "ම පියානන් වහන්ස! පියානන් වහන්සේ මා තසරය පැසෙක බහා ගෙණ පෙහෙරහලට යන බව දැන දැන මෙසේ අසා

වදාළ සේක් මෙතැන මැරී ගොස් කොතැනක උපදින්නිහි දැ' යි මා ලවා කියවා ගන්නට ය, උත්පත්තිවශයෙන් මෙතැනින් කො තැනකට යනු දැ' යි මා නො දන්නා බැවින් නො දනිමි' යි කීයෙමි'' යි පෙහෙරිය කිවු ය. බුදුරජානන් වහන්සේ එවරද ඇයට පෙරසේ වදාරා සාධුකාර දුන්හ. නැවැත, ''ආ' ලමයා මා තෙවන වර නො දනිහි දැ' යි ඇසූ වචනයට 'දනිමි' යි කීයෙහි කුමක් සලකා දැ?'' යි බුදුරජානන් වහන්සේ ඇසූහ. ''මපියානන් වහන්ස! මා මැරෙණ බව දන්නා බැවින් දනිමි' යි කීයෙමි'' යි ඇය කිවු ය. එවරද බුදුරජානන් වහන්සේ සාධු කාර දුන්හ.

නැවැත ''ආ ලමයා! මා සිවුවන වරට ඇසූ දනිහි දැ'යි යන්නට නො දනිමි'යි කීයෙහි, ඒ කුමක් නිසා දැ''යි අසා වදාළ කල්හි ''මපියානන් වහන්ස! මා මැරෙණ බව මුත්, කොයි දවසෙක, කොයි වේලෙක, කොයි පැයෙක මැරෙන්-නෙම් දැ'යි නො දන්නා බැවින් නො දනිමි'යි කීමි''යි පෙහෙර දැරිය කීවා ය. එවරද බුදුරජානන් වහන්සේ ඇයට සාධුකාර දී රැස්ව සිටි පිරිස අමතා ''තෙපි මෙතෙක් දෙනා අනුනට දොඩන්නට ගරහන්නට දන්නා පමණ මුත්, මේ දැරිය කීවා ගැණ කිසිත් නො දන්නහු ය, යමකුට යමක් තේරුම් ගැණීමට නුවණැස නැත්තේ නම්, මසැස තුබුනේ ද ඔහු දැස් නැති අන්ධයෙක් ම ය, යමකුට පැණැස තිබේ නම් ඔහු ම ය ඇස් ඇත්තේ''යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති,
සකුන්තො ජාලමුත්තොව අප්පොස්සග්ගාය ගච්ඡතීති.

මේ ලොකීයමහාජන තෙමේ අන්ධ ය. මුන් අතුරෙහි ටික දෙනෙක් ම වෙසෙසා දකිත්. දැලින් මිදුනු වටුවකු සේ ටික දෙනෙක් ම දෙව් ලොවට යත්.

අයං ලොකො අන්ධභූතො = මේ ලෝවැසිතෙමේ දැස් නැත්තේය.

මසැස තුබුනේ ද, පැණැස නැත්තේ නම් හේ අන්ධයෙකි. ලොකීයමහාජන තෙමේ එසේ ය. සත්ත්වලොකය **''සස්සතො ලොකො අන්තවා ලොකො''**යි ගත්තේ එහෙයිනි. නුවණැස නැත්තේ නම්, මසැසින් වැඩෙක් නො වන්නේ ය. 'සත්ත්ව ලොකය ශාස්වත ය, කෙළවර ඇත්තේය'යි ගත්තේ මසැස ඇති මේ ලොකයයි. ආර්‍යයන් වහන්සේ මේ මහාජන

පක්ෂයෙහි නො වෙත්. මේ කීම උන්වහන්සේ පිළිබඳ නො වේ. උන්වහන්සේ පැණැස් ඇත්තෝය. අන්ධකථාව පෘථග්ජනලොකය පිළිබඳ ය. මේ දන්නේය.

"යථා හි නාම ජච්චන්ධො නරො අපරිණායකො,
එකදා යාති මග්ගෙන කුම්මග්ගෙනාපි එකදා"

උපතින්ම දැස් නැත්තේ, එහා මෙහා ගෙණ යන්නකු නැති කල්හි සමහර වේලක නියම මගිනුත් සමහර වේලක නො මගිනුත් යන්නේ ය.

"සංසාරෙ සංසරං බාලො තථා අපරිණායකො,
කරොති එකදා පුඤ්ඤං අපුඤ්ඤම්පි ච එකදා"

එසේ නුවණැස් නැති අඥජන තෙමේ අර්හන්මාර්ගයට පමුණු වන්නකු නැති විට සසර එහා මෙහා ඇවිදිනුයේ, සමහර කලෙක පින් කරන්නේ ය. සමහර කලෙක පව් කරන්නේ ය.

"භුත්වාතිඝොරම්පි සුදීඝරත්තං
අනන්තදුක්ඛං භවචාරකෙසු,
න තත්ථ උක්කණ්ඨති බාලසත්තො
ලඬා සඛී තෙනහි තණ්හවිජ්ජා"

අඥ තෙමේ සසර නැමැති සිරගෙයි ඉතා දිගුකලක් ඉතා දරුණු වූ කෙළවරක් නැති දුක් විඳ ද එහි නො කළකිරෙන්නේ ය. මෝඩයාට සසර කළකිරීමෙක් නැත. තෘෂ්ණා අවිද්‍යාවනට යටව සිටුනා බැවිනි.

"යෙනානුභූතං අමිතං ච යත්ථ
පතිට්ඨිතං දුක්ඛමනාදි කාලෙ
තමෙව පත්ථෙති පුනප්පුනම්පි
අඤ්ඤාණජාලස්ස යමානුභාවො"

කොණක් මිම්මක් නැති කාලයෙහි සිට කොණක් මිම්මක් නැති දරුණු දුක් විත්දේ ද, නැවැත නැවැතත් එයම පතන්නේ ය. බලාපොරොත්තු වන්නේ ය. මේ වනාහි අන්ධ භාවයේ අනුභාවය යි.

අන්ධ යනු මෙහි නැගී සිටියේ අඥයා උඩ ය. ලොක ව්‍යවහාරයෙහි ආයේ දැස් නැත්තා කෙරෙහි ය. **"සුඤ්ඤො අන්ධො දවයෙනථ"** යනු කොෂාගතය.

පියවිඇසට වඩා මිනිසාට පැණැසම ශ්‍රෙෂ්ඨ වේ. මිනිසා විසින් ලැබිය යුත්තේ ඒමය. හොඳ – නො හොඳ – මග – නො මග – යුතු – අයුතු – නිත්‍ය – අනිත්‍ය – ශුභ – අශුභ – සුඛ – දුක්ඛ – ස්ථිර – අස්ථිර – කළයුතු – නො කළයුතු – වරද – නිවරද – කුසල් – අකුසල් ඈ විසින් මෙලොව හිතයෙහි හා පරලොව හිතයෙහි හා වැටෙන නො වැටෙන හැම දෙයක් පෙන්නුම් කරන්නහු පැණැස බැවිනි. පියවිඇසින් තොර වූයේ මෙලොව කටයුත්තෙහි ම නො නගින්නේ ය. නො යෙදෙන්නේ ය. පැණැසින් තොර වූයේ එලොව මෙලොව දෙක්හි ම නො නගින්නේ ය. නො යෙදෙන්නේ ය. එහෙයින් දෙයතින්ම නො නගින්නහු අන්ධ යි හැඳින්වීම යුක්තිතර ය. අන්ධවූයේ **අන්ධභූත** නම්. 'භූත' යන්නෙහි විශෙෂාර්ථයෙක් නැත.

ලොක යනු මෙහි සත්ත්වලොකයෙහි වැටේ. ඉන්ද්‍රිය-බඩරූපාරූපධර්මසමූහය සත්ත්වලොක නම්. රූපශබ්දාදියෙහි ඇලෙන ගැලෙන මුසපත් වන බැවින් සත්ත්වලොකයි කියනු ලැබේ. එහි සත්ත්වගණයෙහි කුසල් අකුසල් හා කුසල් අකුසල් විපාක හා දක්නා ලැබේ නුයි ලොක නම්. **"ලොකී යති එත්ථ කුසලාකුසලං තබ්බිපාකො වා ති = ලොකො"** යනු හා **"ලොකීයන්ති එත්ථ පුඤ්ඤපාපඵලානි දුජ්ජනට්ඨෙනෙව වා = ලොකො"** යනු හා නිරුක්ති. මෙසේ බැවින් ඉන්ද්‍රියබද්ධ රූපධර්ම අරූපධර්ම රූපාරූප ධර්මයන්ගේ සන්තාන වශයෙන් පවත්නාවුන්ගේ සමූහය සත්ත්වලොක නමැ' යි ගතයුතු ය. කාමභව, රූපභව, අරූපභව, එකවොකාර භව, චතුවොකාරභව, පංචවොකාරභව, සඤ්ඤීභව, අසඤ්ඤී භව, නෙවසඤ්ඤීනාසඤ්ඤීභව යන නවවැදැරුම් භවයන්හි වූ සත්ත්වගණයය සත්ත්වලොක.

එත්ථ තනුකො විපස්සති = මෙහි ස්වල්ප වූ සත්ත්වයෙක් වෙසෙසා දකියි.

නව වැදැරුම් සත්ත්වාවාසයන්හි වූ සත්ත්වගණය මෙතෙක් මහත ය. මෙතෙක් විශාල ය. ගණනින් මෙපමණ ය. යනාදීන් කොණක් කෙළවරක් කිසිලෙසකින් පිරිසිඳුනු නො හැකි ය. සත්ත්වවිෂය අවින්ත්‍යයි වදාළෝ එබැවිනි. **"මහා ඛො පනායං ලොකසන්නිවාසො"** යනු සාධකය.

ඒ මේ ලොකසන්නිවාසයෙහි ටික දෙනෙක්ම පංචස්කන්ධය දකිත්. පංචස්කන්ධයෙහි වෙසෙසා දැක්ම නම් අනිත්‍යාදිවශයෙන් එහි තතු දැක්මය. කාම, රූප, අරූප භූමීන් පිළිබඳ නාම

රූප ධර්මයන්ගේ දිරීම, බිඳීම, පෙරළීම, ඔවුන්ගේ ම නිති පෙළීම, වෙහෙසීම, ඔවුන්ගේ ම නො පවත්නා බව දැක්ම ය. මෙසේ පංචස්කන්ධය අනිත්‍යානුපස්සනාවන්ගේ වශයෙන් බලන්නෝ මේ මිනිසුන් අතර ඉතා ටික දෙනෙක් ම වෙත්. ඒත් එදා ය. අද නම් නැත්තාහු මැයි කියයුතු සේ පෙණෙත්.

ජාලමුත්තෙනා සකුණෙනා ඉව = දැලින් මිදුනු වටුවකු සේ. දැලට හසු නො වී පැන ගිය වටුවකු මෙන්.

දක්ෂ වූ ළිහිණිවැද්දකු විසින් දැල් දමා දැලට හසු කොට ගන්නා වටුවන් අතර කිසිවෙක් ම දැලින් මිදී පලා යන්නේ ය. **සකුණන** ශබ්දය අවිශේෂයෙන් පක්ෂිවාචක ය. එහෙත් ඇතැම් කොෂ්ඨකාරකයෝ **සොණ්ඨකකුක්කුට** පක්ෂියා 'සකුණන'යි කියත්. භාෂාවෙහි අවිශේෂයෙන් පක්ෂීන් කෙරෙහි වැටුනු තැන් කොතෙකුත් දක්නා ලැබේ. එහෙයින් 'සකුණන' ශබ්දයෙන් වටුවා ද කිය හැකි ය. අටුවාවේ ආවේ ද එහෙයින් ය. **"සකෙකාති උදඛං ගණනුනති = සකුණෙනා"** යනා නිරුක්තිය විසින් ගත්කල සකුණන ශබ්දය පක්ෂීන් කෙරෙහි යෙදීම වරදෙක් නො වේ. **ජාලමුත්තන** නම්, දැලෙන් මිදුනේ ය. වෙඝයෙන් පලා යන මෘගාදීන් හසු කොට ගන්නේ ජාල නම්. **"යේ සීඝගතෙ ඛාවනෙන මිගාදයෝ ලාති ගණ්හාති ති - ජාලං"** යනු නිරුක්තිය යි.

අප්පෝ සගගාය ගච්ඡති = සවලප වූ සත්ත්වයෙක් සුගතියට යයි.

මාරජාලයෙහි බැඳුනු මාරයාගේ පස්කම් ගුණ නැමැති දැලින් වැසුනු දැලට අසු වූ සත්ත්වයන් අතර බොහෝ දෙනෙක් ම අපාය යට යෙත්. ඉතා ටික දෙනෙක් ම සුගතියට යෙත්. නිවන් ලබන්නෝ ඊටත් වඩා ටික දෙනෙක් වෙත්. මෙහිලා මිනිස් ලොවින් චුත ව නැවැත මිනිස්ලොව ම උපදින්නෝ ටික දෙනෙක් වෙත්. එහෙත් මිනිස්ලොවින් චුත ව නිරයෙහි උපදින්නෝ, තිරිසන්යොනියෙහි උපදින්නෝ, ප්‍රෙතලොකයෙහි උපදින්නෝ ඉතා බොහෝ වෙත්. එසේ ම මිනිස්ලොවින් චුත ව දෙව්ලොව උපදින්නෝ ටික දෙනෙක් වෙත්. එහෙත් මිනිස් ලොවින් චුත ව නිරයෙහි, තිරිසන් යොනියෙහි, ප්‍රෙතලොකයෙහි උපදින්නෝ ඉතා බොහෝ වෙත්. එසේ ම දෙව්ලොවින් චුත ව නැවැත දෙව්ලොව උපදින්නෝ ටික දෙනෙක් වෙත්. එහෙත් දෙව්ලොවින් චුත ව නිරයෙහි, තිරිසන්යොනියෙහි, ප්‍රෙතලොකයෙහි උපදින්නෝ ඉතා බොහෝ වෙත්. එසේ ම දෙව්ලොවින් චුත ව මිනිස්ලොව උපදින්නෝ ටික දෙනෙක් වෙත්. එහෙත්

දෙව්ලොවින් ගිලිහී නිරයෙහි, තිරිසන්යොනියෙහි, ප්‍රෙතලොකයෙහි උපදින්නෝ ඉතා බොහෝ වෙත්, සි යනාදීන් වදාළ දෙශනාව සිත්හි දැරිය යුතු ය. අඞ්ගුත්තරනිකායයෙහි එකකනිපාතයෙහි සිවුවන වගෙහි මේ එන්නේ ය. විස්තර විසින් එයින් දන්නේ ය.

ධම්මදෙශනාවගේ අවසානයෙහි පෙහෙරිය සෝවත් වූ ය. දෙශනාව මහාජනයාටත් වැඩ සහිත වූවා ය. යලි ඕතොමෝ පැසත් ගෙණ පියාවෙත ගියා ය. එවේලෙහි ඔහු හිඳගෙණ ම නින්දට වැටී සිටියේ ය. පෙහෙරිය ද එගෑණ නොසලකා පැස එළවන ගමනේ පැස්වෙම කෙළවර හැපී හඬ නගා වැටුනී ය. නින්දෙන් පිබිදුනු පෙහෙර තෙමේ ගත් නිමිත්තෙන් ම පළමු ලෙසින් දුරදිග නොබලා සරස්දඩුව ඇද්දේ ය. වෙම් කෙළවර ගොස් තරුණියගේ උරෙහි ඇණුනේ ය. එයින් ඕ එතැන ම මැරී වැටුනා ය. පෙහෙර තෙමේ ලේ පෙරා මැරී වැටුනු ඇය දැක-හඬමින් වැලපෙමින් "මාගේ මේ ශොකය සන්සිඳවන්නට ඉන්නෝ බුදුරජාණන්-වහන්සේ පමණැ"සි බුදුරජුන් වෙත ගොස් "ස්වාමීනි! මා දුව මළා, ශොකය නම් නොඉවසිය හැකි ය"සි හඬ හඬා කියා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහු අස්වසා "මේ අක් මුල් නැති සසර තා දූලාගේ මරණ ගැණ ම වැගිර වූ කඳුළු සිවු සයුරෙහි දියකඳට වැඩිය"සි අනමතග්ගකථාව වදාළ සේක. ඔහු එයින් තුනී වූ ශොක ඇති ව බුදුරජුන් වෙතින් ලැබූ මහණ උපසපන් බැව් ඇත්තේ නොබෝ දිනකින් රහත් මගට පැමිණියේ ය.

පෙසකාරදුහිතාවත්‍ථුව නිමි.

අහසෙහි ගිය භික්ෂූන් වහන්සේලා

13 — 8

නිස්නමක් පමණ දිසා වැසි භික්ෂූන් වහන්සේලා දිනෙක බුදුරජුන් වෙත ගියහ. එවේලෙහි ආනන්ද සථවිරයන් වහන්සේ වත් සපයන්නට ගියෙන් එහි හුන් ආගන්තුක භික්ෂූන් දැක "බුදුරජුන් මේ භික්ෂූන් හා පිළිසඳරකතා අවසන් කළ කල්හි වත් සපයන්නෙමි"යි දෙර කොටුවෙහි සිට ගත්හ. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් හා පිළිසඳර කොට කෙළවර ඔවුනට සිත් අලවන්නට සුදුසු සිහි කරන්නට සුදුසු ධම්කථාවක් දෙසූ සේක. ඔවුහු එය අසා එ තැනදී ම රහත් ව අහසට නැග ගියහ. ආනන්ද සථවිරයන් වහන්සේ "ඔවුන් බොහෝ කල් ගෙවති"යි සිතා බුදු රජුන් වෙත ගොස් "ස්වාමීනි! නිස් නමක් පමණ භික්ෂූහු මෙහි ආවෝ නො වෙත් ද, ඔවුහු කොහි දැ?"යි ඇසූහ. "ආනන්ද! ඔවුන් ගියහ"යි බුදුරජුන් වදාළ කල්හි "ස්වාමීනි! කිනම් මගෙකින් ගියාහු දැ?"යි නැවැත ඇසූහ. "ආනන්ද! ඔවුහු ගියෝ අහසිනැ"යි වදාළ සේක. "ස්වාමීනි! ඒ භික්ෂූහු රහත්හු දැ?"යි ඇසූ විට "ඔව්! ආනන්ද! ඒ නමලා හැම දෙනම දැන් මගෙන් බණ අසා රහත් වූහ"යි වදාළ සේක. මේ වේලෙහි ම එපෙදෙසැ අහසෙහි බොහෝ ගණනක් හංසයන් පියාඹා යනු දුටු බුදුරජාණන් වහන්සේ "ආනන්ද! යමකු විසින් චතුර්විධ ඍද්ධිපාදයෝ මොනවට වඩනා ලද්දේ නම් පුරුදු කරණ ලද්දේ නම් ඔවුනට හංසයන්ට මෙන් අහසින් යත හැකි ය"යි වදාරා මේ ධම් දෙශනාව කළ සේක.

හංසාදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා,
නීයන්ති ධීරා ලොකම්හා ජෙත්වා මාරං සවාහිණිං.

හංසයෝ අහසෙහි යෙති. (ඍද්ධිමත්හු) ඍද්ධියෙන් අහසෙහි යෙති. නුවණැත්තෝ සෙන් සහිත වූ මරු දිනා ලොකයෙන් නික්ම යෙත්.

හංසාදිච්චපථෙ යන්ති = හංසයෝ අහසෙහි යෙත්.

කම්ම්පාකජඍද්ධිය හංසයන්ගේ අහස්ගමනට කරුණු ය. පක්ෂීහු අහසැ යන්නෝ කම්ම්පාකජඍද්ධිය නිසාය.

හංස නම්: පක්ෂිවිශෙෂයෙකි. ශ්වෙතගරුත් – චක්‍රාඛ – මානසෞක – කලකණ්ඨ – සිතවජ්ද – සිතපක්ෂ – සරඃකාක – පුරුදංශක – ධවලපක්ෂ – මානසාලය යනාදී නම්වලින් ද

මොවුහු හඳුන්වනු ලැබෙත්. මොවුනතර රාජහංස – කිලිටි පාතුඩු ඇති හංස – කළු පාතුඩු ඇති හංස විසින් භෙද දක්නා ලැබේ. එහි රාජහංසයෝ ශ්‍රෙෂ්ඨ වෙත්.

ආදිච්චපථ නම්, අහස ය. **ආදිච්ච** යි සූර්‍යයාහට නමෙකි. සූර්‍යයාගේ මාර්ගය නුසි අහස **ආදිච්චපථ** නම් වේ. ආදිච්ච යන්නෙහි විස්තර කථාව බ්‍රාහ්මණවර්ගයෙහි **"දිවා තපති ආදිච්චෝ"** යනාදිදෙශනාපාඨය යටතේ එන්නී ය.

ඉද්ධියා ආකාසෙ යන්ති = ඍද්ධියෙන් අහසැ යෙත්.

යම් කෙනකු විසින් ඡන්දිද්ධිපාද-විරියිද්ධිපාද-චිත්තිද්ධිපාද-වීමංසිද්ධිපාදයෝ වඩනා ලද්දේ නම් ඔවුහු ඒ ඍද්ධිපාදබලයෙන් අහසෙහි යෙත්.

"ඉජ්ඣනං = ඉද්ධි" කැමැත්ත සිදු කොට ගැණීම **ඍද්ධි** නම්. යමක්හුගේ වැඩීම ඉතිර පැතිර ගිය ඵලලාභය 'ඍද්ධි'යි මේ අනුව කිය හැකි ය.

"ඉජ්ඣන්ති අභිප්පෙතඵලං පසවන්ති එතායාති = ඉද්ධි" යම් ශක්තියෙකින් තම තමන් බලාපොරොත්තු වන ඵලය සැපයේ නම් ඒ ශක්තිය ඍද්ධි නමැයි මේ විග්‍රහය අනුව කියයුතු ය. යුක්තියට අනුකූල වූ ව්‍යාපාරය උපායසම්පත්තිය ඍද්ධි යි කී සේ ය. එහිලා **"උපායසම්පදායෙතං අධිවචනං"** යනු දන්නේ ය.

"අයං බෝ චිත්තෝ ගහපති සීලවා කල්‍යාණධම්මෝ සචෙ පණිදහිස්සති අනාගතමද්ධානං රාජා අස්ස චක්කවත්තීති තස්ස බෝ අයං ඉජ්ඣිස්සති හි සීලවතෝ චෙතොපණිධි විසුද්ධත්තා" = සිල්වත්බව හා කලණදහම් ඇතිබවැයි කියූ උපායසම්පත්තිය ඍද්ධි යි මෙයින් පැහැදිලි වේ. "මේ චිත්තගහපති තෙමේ සිල්වත් ය, කලණදහම් ඇතියේ ය, ඉදින් මෙතෙමේ මම අනාගත යෙහි සක්විතිරජ වෙම්වා යි පතන්නේ නම් ඔහුගේ පැතීම පිරිසිදු බැවින් සමෘද්ධ වන්නී ය" යනු අරුත් ය. චිත්තගහපති බලාපොරොත්තු වන සක්විතිරජබව සමෘද්ධ කර දෙන උපාය සම්පත්තිය වූ සිල්වත්බව හා කලණ දහම් ඇතිබව ඍද්ධි යි මෙයින් කියන ලද්දේ ය.

"ඉජ්ඣන්ති සත්තා එතායාති = ඉද්ධි, ඉද්ධා වුද්ධා උක්කංසගතාති වුත්තං හොති" සත්ත්වයෝ යම් ශක්තියක් කරණ කොට සමෘද්ධියට උත්කර්ෂයට උසස්බවට යෙත් නම් එයට හෙතුවන ශක්තිය ඒ ගුණබලය ඍද්ධි යි කීයේ ය. මේ

විකල්පයෙහි කරණසාධන නිර්වචනය ම යෙදෙන්නේ ය. මෙයින් පෙණෙනුයේ ඒ ඒ දෙය තමන්ගේ අභිමතය ලෙස සිදුකට හැකි ශක්තිය ඍද්ධිය වන බවය.

ආගමධර්මයෙහි ඒ ඍද්ධිය දශවිධයෙහි කියන ලදි. **අධිට්ඨාන-විකුබ්බන - මනොමය - ඤාණවිප්ඵාර - සමාධිවිප්ඵාර - අරියා-කම්මවිපාකජ - පුඤ්ඤ - විජ්ජාමය - සම්මාපයොග** වශයින්.

මිනිසුන් පිළිබඳ ලෞකික - ලොකොත්තර වූ යම් කිසි අර්ථ ලාභයෙක් අර්ථසිද්ධියෙක් වේ නම් ඒ හැම මෙහි ම ඇතුළත් ය.

එහි **''කතමා අධිට්ඨානා ඉද්ධි? ඉධ භික්ඛු අනෙකවිධිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති''** යනාදි ලෙසින් පටිසම්භිදයෙහි ආවා **අධිට්ඨානඉද්ධිය** යි. ඉටීමෙන් හෙවත් තදින් පිහිටා සිටි සිතින් නිපන් ඍද්ධිය අධිට්ඨාන ඉද්ධි නම්.

''අධිට්ඨානවසෙන නිප්පන්නත්තා අධිට්ඨානා ඉද්ධි, බහුභාවා-දිකස්ස අධිට්ඨහනං අධිට්ඨානං එතිස්සා අත්ථීති = අධිට්ඨානා'' යනු ටීකා විවරණය යි.

සූත්‍රයෙහි එන **ඉධ** යන්නෙන් ගැණෙනුයේ බුදුසසුන ය. **''ඉධාති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ තෙන වුච්චති ඉධාති''** යනු ඒ පැහැදිලි කළ අයුරු ය.

භික්ඛු යන්නෙන් ගැණෙනුයේ ශාසනික භික්ෂු තෙමේ ය. ඍද්ධිවිධකරණයට සුදුසු මහණෙක් බුදුසසුනෙන් පිටත් තැනක නො ලැබෙන්නේ ය. අනෙක් සසුනෙක ඍද්ධිවිධ කරණයට සුදුස්සෙක් නො ලැබෙන්නේ ය. **''සබ්බපඤ්ඤාර ඉද්ධිවිධඤාණස්ස අභාවං දීපෙති''** යනු අටුවා ය.

බුදුසසුනෙහි ලැබෙන ඒ මහණ තෙමේ ද සාමාන්‍ය මහණෙක් නො වේ. හේ පුහුදුන් වූයේ නමුත් මුළුමනින් කෙලෙස් නො නැසුයේ නමුත් ශීලාදිප්‍රතිපත්තියෙන් නො අඩුව පිරී සිටියේ ද සෝවන් වූයේ ද සෙදගැමි වූයේ ද අන ගැමි වූයේ ද රහත්පල-යට පැමිණියේ ද මෙහිලා පොහොසත් වේ. **''භික්ඛුනි පුථුජ්ජන කල්‍යාණකො වා හොති භික්ඛු, සෙඛ්බා වා අරහා වා අකුප්පධම්මා''** යනු දන්නේ ය.

සෘද්ධීන් පිළිබඳ භූමි-පාද-පද-මූල ධර්මයන්ගෙන් යුක්ත වූ එහිලා නියමිත වූ තුදුස් අයුරෙන් හෝ පසළොස් අයුරෙන් සිත දැමූ ඡන්දා දී වූ එක එක අධිපති ධර්මයන්ට සමවැදීම් වසයෙන් හා ආවර්ජනාදිවශීභාවයන්ගේ වශයෙන් ද මොළොක් කළ කර්ම යට සුදුසු කළ සිත් ඇති පූර්වයොග සම්පත්තියෙන් ද යුත් මහණ තෙමේ ම සෘද්ධිවිධකරණයෙහි පොහොසත් වේ.

මේ මහණහු විසින් නන් වැදැරුම් වූ සෘද්ධි කොට්ඨාශයන්ට පැමිණෙන්නට පෙර ප්‍රකෘතියෙන් එකකුව සිට සෘද්ධීන් පිළිබඳ භූමි - පාද - පද - මූලධර්මයන් එකකුත් නො පිරිහෙලා සම්පාදනය කටයුතු ය. එයින් පසු අභිඥාපාදක චතුර්ථද්‍යානයට සමවැද ඉන් නැගිට සිය දෙනකු වනු කැමැත්තහු නම් "සියයෙක් වෙමි, සියයෙක් වෙමි"යි පිරියම් කටයුතු ය. එහි මැනැවින් පේවිය යුතු ය. නැවැතත් අභිඥාපාදක චතුර්ථද්‍යානයට සමවැද ඉන් නැගී සිට නැවැතත් පෙර කියූ සේ සිය දෙනකු වනු කැමැත්තහු නම් "සියයෙක් වෙමි" යි ද දහස් දෙනකු වනු කැමැත්තහු නම් "දහසෙක් වෙමි" යි ද ඉටිය යුතු ය. ඒ මේ ඉටීම සමග ඒ යොගී මහණ තෙමේ සියයෙක් දහසෙක් වන්නේ ය. යම් ලෙසකින් තමන්ගේ ඒ ඉටීම ඵල සහිත නො වී නම් නැවැත නැවැතත් පළමු පරිදි සෘද්ධිය ලැබෙන තාක් ම පිරියම් කොට ඉටිය යුතු ය. එහි දී පළමු කොට බොහෝ දෙනෙක් වෙමි යි ආවර්ජනා කොට නුවණින් ඉටිය යුතු ය. ඒ මේ ආවර්ජනය කාමාවචර චිත්තයෙන් කෙරෙන්නේ ය. එය පරිකර්මය පිළිබඳ වේ. මේ යොගී මහණහු විසින් අනතුරු ව ඒ පරිකර්මකාමාවචර චිත්ත -යන්ගේ අවසානයෙහි ද චතුර්ථද්‍යානයට සමවැද ඉන් නැගිට නැවැතත් "බොහෝ දෙනෙක් වෙමි" යි ආවර්ජිතා කළ යුතු ය. ඉන් පසු පහළ වන පරිකර්ම - උපචාර - අනුලොම - ගොත්‍රභූ යන පූර්වභාගචිත්තයන්ට අනතුරු ව උපදනා නිෂ්පාදනා විසින් අධිට්ඨානචිත්තයැ යි නම් කෙරෙණ නුවණින් ඉටිය යුතු ය. ඒ අධිට්ඨානඤ්ඤාණය සමග ම ඉටූ පරිදි සියයෙක් හෝ දහසෙක් හෝ දසදහසෙක් හෝ වේ. මේ අධිට්ඨානචිත්තය කාමාවචර නො වේ. රූපාවචර ය. චතුර්ථද්‍යානය පිළිබඳ ය.

එකොපි හුත්වා බහුධා හොති = එකෙක් ව ම බොහෝ දෙනකු පරිද්දෙන් වේ, යන මේ පෙළහරට චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේගේ සෘද්ධිප්‍රතිලාභය දැක්විය හැකි ය.

චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ බුදු රජුන් ජීවකයන්ගේ දානය පිණිස වැඩම කළ කල්හි එක් ම අභිඥාචිත්තයෙන් තමන් වැනි ක්‍රියාත්මක භික්ෂු රූප දහසක් මවාගෙණ වෙහෙර

වැඩ හුන්හ. උන්වහන්සේ විසින් මැවුනු ඒ සියලු භික්ෂූහු හැමතින් චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ වැනි වූහ. නිර්මිත භික්ෂූන්ගේ ඉදීම් සිටීම් යෑම් ඊම් නිදීම් නැගිටීම් බිණීම් ඈ හැම පැවතුම් ද උන්වහන්සේගේ පැවතුම් වැනි ම විය. සෘද්ධිමත් තෙමේ යමක් කරයි නම්, නිර්මිත භික්ෂූහු ද එය එසේ ම කරත්. එසේ වන්නේ මෙසේ මෙසේ විය යුතුය යි නියම නො කොට මැවීම කළ බැවිනි.

සෘද්ධිමත් තෙමේ යම් ලෙසකට යමකු මවනු කැමැත්තේ නම් ඒ ලෙසින් මවන්නේ ය. පැහැ ඇත්තන් කොට දිග් හිස කෙස් ඇත්තන් කොට හිස අඩක් මුඩු කළවුන් කොට මුළුමනින් හිස මුඩු කළවුන් කොට බණ දෙසන්නන් කොට බණ අසන්නන් කොට බණ උගන්නන් කොට යන ඇලෙසින් නන් වෙස් ගන්වා තමාට කැමැති සේ මවන්නේ ය. ඔහු විසින් මෙයට උපාය වූ චතුර්ථද්ධ්‍යානයට සමවැද ඉන් නැගිට "මෙතෙක් දෙන මෙසේ වෙත්වා, මෙතෙක් දෙන මෙසේ වෙත්වා, මෙතෙක් දෙන ප්‍රථම වයසෙහි වෙත්වා, මෙතෙක් දෙන මද්ධ්‍යම වයසෙහි වෙත්වා, මෙතෙක් දෙන පශ්චිම වයසෙහි වෙත්වා" යන ඇලෙසින් පිරියම් කොට ආවජ්ජනා කිරීමෙන් නැවැතත් ධ්‍යානයට සමවැද ඉන් නැගිට අභිඥාවිත්තයෙන් ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම තමාගේ කැමැත්ත ලෙසින් මැවෙන්නේ ය.

බහුධා පි හුත්වා එකොපි හොති = බොහෝ දෙනකුන් පරිද්දෙන් වී නැවැත එකෙක් ම වෙයි යන මේ පෙළහරට ද සාධක විසින් චුල්ලපන්ථක ස්ථවිර කථාවස්තුව දත යුතු ය. සෘද්ධිමත් භික්ෂූහු විසින් මේ පෙළහරෙහි බොහෝ දෙනෙක්ව නැවැත "එකෙක්ව ම සක්මන් කරමි, හදාරමි, ප්‍රශ්න අසමි, ප්‍රශ්න විසඳමි" යි මේ ඇලෙසින් සිතා පාදකද්ධ්‍යානයට සමවැද ඉන් නැගිට "එකෙක් වෙමි" යි ආවජ්ජනා කොට නැවැත ධ්‍යාන යට සමවැද ඉන් නැගී සිට "එකෙක් වෙමි"යි ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම එසේ වන්නේ ය. එකෙක් වන්නේ ය. මෙසේ නො කරන්නේ පිරිසිඳ ගත් කාලයාගේ වසයෙන් තෙමේ ම එකෙක් වේ.

ආවිභාවං කරොති = ආවිභාව නම්, ප්‍රකටභාවය යි. කිසිවකින් මුවහ නො වූ බව යි. එලි පෙහෙලිබව යි. එහෙයින් එලි පෙහෙලි බව කෙරෙයි යනු එහි අරුත් ය.

මෙ පෙළහර කරණු කැමැත්තේ අඬකාරය ආලොකයට පෙරළයි. මුවහ කරණ ලද්ද එලිපෙහෙලි කරයි. ඇස්හමු නොවූවහු ඇස් හමු කෙරෙයි. මෙතෙමේ යම් කිසිවකින් වැසුනා වූ හෝ ඉතා දුර සිටියා වූ හෝ කිසිවකු විසින් තෙමේ හෝ පරා හෝ යම් සේ දක්නා ලැබේ ද එ පරිද්දෙන් තමන් හෝ අන්හු හෝ ප්‍රකට කරණු කැමැත්තේ පාදකධ්‍යානයෙන් නැගිට "මේ අඬකාරස්ථානය ආලොකවත් වේවා" යි හෝ "මේ ඇස් හමු නොවූ තැන ඇස් හමු වේවා" යි හෝ "මේ වැසුනු තැන ප්‍රකට වේවා" යි හෝ පිරියම් කොට ආවජ්ජනයෙන් පසු පෙර කියූ සේ ම නැවැත ධ්‍යානයට සමවැද එසින් නැගිට එසේ ඉටන්නේ ය. ඒ ඉටීම හා ම ඉවූ පරිදි ම වන්නේ ය. අන්හු දුර සිටියහු ද දකින්. තෙමේ දකිනු කැමැත්තේ නම් දකියි.

මෙම සිරි ලක්දිව තළහුරුවෙහෙර වැසි **ධම්මදින්න** මහ තෙරණුවෝ තිස්ස මහ වෙහෙර සෑ මලුවෙහි වැඩහිඳ **අපණ්ණක** සූත්‍ර දෙශනාව කරණ සේක් අත තුබූ තල්වැට යටිහුරු කළහ. එකෙණෙහි අවීචි මහානිරය තෙක් එක් මිදුලක් සේ මුළුලොව පළට විය. නැවැත තල්වැට උඩුහුරු කළහ. එකෙණෙහි බඹ ලොව තෙක් එක් මිදුලෙක් සේ පෙණී ගියේ ය. මෙසේ උන් වහන්සේ නිරයත් දෙව්ලොවත් පෙන්වා කුශලාකුශලකර්ම විපාකය දක්වමින් දහම් දෙසූහ. එහිදී බොහෝ දෙනෙක් ඒ ඒ මගපල පසක් කළහ. ආචීණ්ණවාරිත්‍රානුභාවයෙහිලා මෙය සාධක විසින් දත යුතු ය.

තිරොභාවං කරොති = කිසිවකින් මුවහ වූ බව යි. අප්‍රකට භාව යයි. එලිපෙහෙලි නො වූ බවයි. එහෙයින් නො එලි පෙහෙලි බව කෙරෙයි යනු එහි අරුත්ය.

තිරොභාව නම් වූ පෙළහර කරණු කැමැත්තහු විසින් අඬකාරය මැකීම පිණිස නීලකසිණයට සමවැද ආලොකය අඬකාරයටපෙරළිය යුතු ය. නො වැසුනු දෑය වැසුනක් කළ යුතු ය. ඇසට හමු වූ දෑය නො හමු දෑයක් කළ යුතු ය. මේ යොගී තෙමේ නො මුවහ වූයේ හෝ නො වැසුනේ හෝ ලඟ සිටියේ හෝ නො දක්නා ලැබේ ද එපරිද්දෙන් තමන් හෝ අන්හු හෝ මුවහ කරනු කැමැත්තේ පාදකධ්‍යානයෙන් නැගිට "මේ ආලොකස්ථානය අඬකාරස්ථානයෙක් වේවා" යි හෝ "මේ නො වැසුනු තැන වැසේවා" යි හෝ "මේ ඇස් හමු වූයේ නො හමු වේවා" යි හෝ පිරියම් කොට ආවජ්නා කිරීමෙන් පළමු කියූ සේ ඉටන්නේ ය. මේ ඉටීම හා ම ඉවූ පරිදි වන්නේ ය. තෙමේත් නො දකිනු කැමැත්තේ නම් නො දකිනු ලැබේ.

බුදුරජාණන් වහන්සේ තමන් වෙත පැමිණි **යසකුලපුත්** ඔහුගේ පියාට නො පෙණෙන පරිදි මුවහ කළ සේක. එක් සිය විසි යොදුන් මග ගෙවා **මහාඝපඨින** රජු ඉදිරියට වැඩම කොට ඔහු අනාගාමිඵලයෙහි හා ඇමැතියන් සොතාපත්ති ඵලයෙහි ද පිහිටුවා ඔහු පසු පස ආ දහසක් සත්‍රීන්ගෙන් පිරිවැරුණු **අනොජා** දෙවියට පිරිස් සහිත වූ රජු නො පෙණෙන සේ මුවහ කළ සේක. **මිහිඳු** මහරහතුන් වහන්සේ ලක්දිවට වැඩම කළ දවසෙහි **පිය තිස්** රජුට තමන් හා එක්ව ආවුන් නො පෙණෙන සේ මුවහ කළ සේක. මේ හැම පෙළහර තිරොභාවප්‍රාතිහාර්‍යයෝ ය.

මුඑමනින් ප්‍රකට වූ ප්‍රාතිහාර්‍යය **ආවිභාව** නම්. අප්‍රකට වූ ප්‍රාතිහාර්‍යය **තිරොභාව** නම්. ප්‍රකට ප්‍රාතිහාර්‍යයෙහි ඍද්ධිය හා ඍද්ධිමත් පුද්ගලයා පෙණෙන්නේ ය. යමාමහපෙළහරින් ඒ දත හැකි ය. අප්‍රකටප්‍රාතිහාර්‍යයෙහි ඍද්ධිය පමණක් ම පෙණේ. ඍද්ධිමත් තෙමේ නො පෙණේ. මහක – බ්‍රහ්මනි–මන්තනික සූත්‍රයන්ගෙන් ඒ පැහැදිලි වන්නේ ය.

"තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ" බිත්තියෙන් පවුරෙන් පව්වෙන් පිටත තිරොකුඩ්ඩ – තිරොපාකාර – තිරොපබ්බත නම්. බිත්තියෙන් පවුරෙන් පව්වෙන් පිටත නො ලැගෙමින් නො ගැටෙමින් නො හැපෙමින් අහසෙහි මෙන් ගමන් කෙරෙයි යනු එහි අරුත් ය. ඍද්ධි රහිත වූ මනුෂ්‍යයෝ කිසිවෙකින් නො ඇවිරුණු මුවහ නො වූ තැන්හි කිසිවක නො ගැටී නො හැපී සුවසේ යෙති. ඍද්ධිමත් පුද්ගල තෙමේ ද එසේ භිත්තිප්‍රාකාර පර්වත යන කිසිවක නො ගැටෙමින් අහසෙහි යන්නා සේ යෙයි.

යොගී තෙමේ ආකාසකසිණයට සමවැද ඉන් නැගිට බිත්තියක් හෝ පවුරක් හෝ පව්වක් හෝ ආවර්ජනා කොට යම් බිත්තියෙක යම් පවුරෙක යම් පව්වෙක ඇතුල් පැත්තේ සිට පිට පැත්තට යනු කැමැත්තේ නම්, ඒ බිත්ති ආදිය ආවර්ජනා කොට කරණලද පිරියම් ඇති ඒ යොගීහු විසින් "ආකාශය වේවා"යි ඉටිය යුතු ය. ඒ ඉරීම හා ම ආකාශය වන්නේ ය. යට බස්නා කැමැත්තහුට හෝ උඩ නගිනා කැමැත්තහුට හෝ හේ කුහරයෙක් වේ. විනිවිද සරසට යනු කැමැත්තහුට සිදුරෙක් වේ. යොගී තෙමේ ඒ සිදුරෙහි නො ලැගෙමින් නො ගැටෙමින් අහසෙහි යන්නා සේ තමන් කැමැති සේ යන්නේ ය.

"පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ" පොළොවෙන් හෝ දියෙන් හෝ උඩට නැඟීම **උම්මුජ්ජ** නම්. පොළොවෙහි හෝ දියෙහි හෝ කිඳ බැසීම **නිම්මුජ්ජ** නම්. යොගී තෙමේ දියෙහි මෙන් පොළොවෙහි ද නැඟීම ගැලීම කෙරෙයි යනු අරුත් ය.

මෙසේ කරණු කැමැති යොගීහු විසින් ආපොකසිණයට සමවැද ඉන් නැගිට "මෙතෙක් තැන පොළොව දියකදෙක් වේවා"යි පිරිසිඳ පිරියම් කොට ආවජ්ජනා කිරීමෙන් පසු පෙර කියූ සේ ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම තමා පිරිසිඳ ගත් තැන පොළොව දියබවට යන්නේ ය. යොගී තෙමේ එහි මතු වන්නේ ය. කිදෙන්නේ ය. මතුවීම හා කිඳුබැසීම කරන්නේ ය. ඍද්ධිරහිත වූ මනුෂ්‍යයෝ යම් සේ ස්වභාවයෙන් දියෙහි නැඟීම කිදීම කෙරෙත් ද, එමෙන් ඍද්ධිඇත්තේ පොළොවෙහි නැඟීම කිදීම කරන්නේ ය. මෙතෙමේ මෙසේ නැඟීම කිදීම පමණක් කරන්නේ නො වේ. නැම බීම මුවසේදීම බඩුසේදීම සිවුරු සේදීම යනාදී වූ තමන් කැමැති හැම ක්‍රියාවක් ම කරන්නේ ය. පොළොවෙහි දිය පමණක් ම මවන්නේ ද නො වේ. ගිතෙල් තල තෙල් මීපැණි ඇ දිය බහුල වූ ද්‍රව්‍යයන් අතුරෙහි තමන් කැමැති දෑයක් මොහුට මැවිය හැකි ය. එහිලා "ඒ ඒ දෑය මේ පමණ මේ පමණ වේවා"යි පරිකම්‍ය කටයුතු ය. ආවජ්ජනා කටයුතු ය. නැවැත ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම ඉටුලෙසින් ඒ ඒ දෑය නිපැදෙන්නේ ය. නගා ගත් ගිතෙල බඳුනෙහි බහන්නහුට ගිතෙල් ම වේ. තෙල්-මීපැණි, තෙල්-මීපැණි ම වේ. දිය දිය ම වේ. යොගී තෙමේ දියෙහි තෙමෙනු කැමැත්තේ නම් තෙමෙයි. නො තෙමෙනු කැමැත්තේ නම් නො තෙමෙයි ඒ පොළොව දිය වනුයේ යොගීහට ම ය. අන්හට පොළොව ම ය මනුෂ්‍යයෝ එහි පයින් යෙත්. යානයෙන් යෙත්. වාහනයෙන් යෙත්. ගොවිතැන් කෙරෙත්. යම් ලෙසකින් යොගී තෙමේ ඔවුනටත් "පොළොව දිය කදෙක් වේවා"යි ඉටී නම් එසේ වන්නේ ය. පිරිසිඳ ගත් කාලය ගෙවී ගිය තැන පොළොව, පොළොව ම ය.

"උදකෙපි අභිජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං" ජලයෙහි ද යට නො බැස යටට කිඳු නො ගොස් පොළොවෙහි මෙන් යෙයි යනු අරුත් ය. යම් දියකදක් ඇක්මුණු කල්හි යටට කිඳු බසී නම්, ඒ දියකද **භිජ්ජමානෑ**යි කියනු ලැබේ. එසේ නො ද බිඳෙනුයේ **අභිජ්ජමාන** නම්.

දියෙහි පොළොවෙහි මෙන් යනු කැමැති කල්හි යොගීහු විසින් පඨවිකසිණයට සමවැද ඉන් නැගිට "මෙතෙක් තැන දියකඳ, පොළොව වේවා"යි පිරිසිඳ පිරියම් කොට ආවජිනා ද කොට පෙර කියූ සේ ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම පිරිසිඳ ගත් තැන දියකඳ පොළොව වන්නේ ය. යොගී තෙමේ එහි යන්නේ ය. සෘද්ධිරහිත වූ මනුෂ්‍යයෝ යම් සේ ස්වභාවයෙන් නො බිඳෙන පොළොවෙහි යෙත් ද, එපරිද්දෙන් මේ යොගී තෙමේත් නො බිඳෙන දියෙහි පොළොවෙහි මෙන් යෙයි. එ පමණෙක් ද නො වේ. එහි හේ යම් ඉරියව්වක් කරණු කැමැත්තේ නම් එය කරන්නේ ය. ඔහුට එය කරණු හැකි ය. දියකඳ පොළොව කිරීම පමණක් ම කරණුයේ ද නො වේ. රන් රිදී මුතු මැණික් කඳු හෙල් රුක් ආදීන් අතුරෙහි යම් යම් දැයක් කරණු කැමැත්තේ නම් ඒ ඒ දැය යට කියූ සේ පරිකර්මාදිය කොට ඉටන්නේ ය. ඒ ඉටීම හා ම ඉටුලෙසින් ඒ ඒ දැය නිපැදෙන්නේ ය. ඒ දියකඳ පොළොව වනු ඔහුට ම ය. අන්හට දිය කඳ ම වේ. මස් කැසුබු දියකා ආදී වූ සත්ත්වයෝ කැමැති සේ හැසිරෙත්. අනෙක් දෙන උදෙසා ද දියකඳ පොළොව කරණු කැමැත්තේ නම් ඔහුට එය කළ හැකි ය.

"ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛිසකුණො,"
පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි යනු අරුත් ය

පක්ෂියකු මෙන් අහසෙහි යනු කැමැති යොගීහු විසින් පළමු කොට පඨවිකසිණයට සමවැද ඉන් නැගිට හිඳගෙණ යනු කැමැත්තහු නම්, පලඟක් පමණ තැන වෙන් කොට පරිකර්මාදිය කිරීමෙන් කියූ පරිදි ඉටිය යුතු ය. නිදාගෙණ යනු කැමැත්තහු නම්, ඇඳක් පමණ තැන ද පයින් යනු කැමැත්තහු නම් මගක් පමණ තැන් දැයි ඒ ඒ ක්‍රියාවනට සුදුසු පමණ තැන් වෙන් කොට ගෙණ පරිකර්මාදිය කටයුතු ය. "පොළොව වේවා"යි ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම එසේ වන්නේ ය. සෘද්ධිරහිත වූ මනුෂ්‍යයෝ යම් සේ පොළොවෙහි යෙත් ද සිටිත් ද හිඳිත් ද හොවිත් ද, එපරිද්දෙන් මේ යොගී තෙමේ ද අහසෙහි සක්මන් කරයි. සිටියි. හිඳියි. හොවියි.

අහසෙහි යනු කැමැත්තහු විසින් දිව ඇස ද උපදවා ගත යුතු ය. යායුතු මගෙහි නොයෙක් ගස් වැල් කඳු හෙල් ආදීහු වෙත්. නා ගුරුළු ආදීහු නො ඉවසීමෙන් ගස් ගල්ආදිය මවා පාන්නෝ ය. එබඳු උවදුරු දක්නා පිණිස මේ යොගීහට දිව

ඇස උපදවා ගැණුම අවශ්‍යයෙන් ම වියයුතු ය. තව ද එලි මහත් තැන්හි බැසීම පිණිස දිව්‍යඤ්චක්ෂුරභිඥානය උපදවා ගත යුතු ය.

"ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා ආමසති පරාමසති පරිමජ්ජති" මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති මේ සඳහිරු අතින් මෙසේ අතගාලයි, හාත්පසින් පහසයි, පිරිමදියි, යනු මෙහි අරුත් ය.

අභිඥාපාදකද්ධ්‍යානයාගේ වශයෙන් මේ සෘද්ධිය නිපැදෙන්නී ය. මෙහි කසිණසමාපත්තිනියමයෙක් නැත්තේ ය සිත තම යටතට ගත් යොගී තෙමේ සඳහිරු ගැණ ආවජිනා කොට අභිඥාඥානයෙන් "මේ සඳහිරු දෙදෙන අත්පසෙහි වෙත්වා" යි ඉටයි. ඒ ඉටීම හා ම ඔවුහු අත්පසෙහි වෙත්. එකල යොගී තෙමේ හුන්නේ හෝ වැදහොත්තේ හෝ සඳ හිරු අතින් ගණියි. පිරිමදියි. සෘද්ධිරහිත වූ මනුෂ්‍යයෝ ස්වභාවයෙන් අත්පසෙහි වූ යම්කිසි වස්තුවක් අතින් ගණිත් ද පිරිමදිත් ද, එමෙන් මේ යොගී තෙමේ ද අත්පසෙහි වූ සඳ හිරු අතින් ගණියි. පිරිමදියි. සඳහිරු වෙත පැමිණ අල්ලන්නට පහසන්නට පිරිමදින්නට කැමැත්තේ නම් එසේ කරයි. එහි ම හිඳ හෙව අල්ලන්නට පහසන්නට පිරිමදින්නට කැමැත්තේ නම් "අත්පසෙහි වෙත්වා"යි ඉටිය යුතු ය. ඒ ඉටීම් බලයෙන් නටුවෙන් ගැලවී වැටුනු තල්ගෙඩියක් සේ සඳහිරු ඒ යොගියා වෙත පැමිණ අත්පසෙහි සිටිත්. එකල හේ සඳහිරු අල්ලයි. අත දිගු කොට හෝ අල්ලයි. අත දිගු කරණ කල්හි උපාදින්නකහස්තය නිසා අනුපාදින්නක හස්තය දිගු වන්නේ ය. තෘෂ්ණදෘෂ්ටින් විසින් 'මාගේය'යි ලංකොට ගත් ප්‍රකෘතිහස්තය උපාදින්නක නම්.

මෙසේ මේ යොගී තෙමේ සඳහිරු පහසන්නේ මතු නො වේ. කැමැත්තේ නම් පාපුටුවක් කොට පා තබයි. හිඳිනා පුටුවක් කොට හිඳියි. ඇඳක් කොට නිදයි. හේත්තු ලෑල්ලක් කොට හේත්තු වෙයි. එකකු මෙසේ කරණ කල්හි අනෙකකුට ද මෙසේ කළ හැකි ය. නොයෙක් සිය දහස් ගණන් භික්ෂූන් මෙසේ කරණ කල්හි ඔවුන් අතුරෙහි එක් එක් භික්ෂුහට ද එපරිද්දෙන් ම කළ හැකි ය. ඔවුන් හැමගේ සෘද්ධිය සමෘද්ධ වන්නී ය. සඳහිරුන්ගේ ගමනාගමනයෙහි ආලොක කරණයෙහි වෙනසෙක් ද නැත. එ ද පෙරසේ ම වේ. එහි අඩු වැඩි බවෙක් නැත්තේ ය. තලිදහසෙක දිය පුරවා පෙලට තබා බලන කල්හි

ඒ තලිදහසෙහි ම සඳමඬල දක්නා ලැබේ. සඳමඬලෙහි චෙතස් ඛවෙක් නො දක්නා ලැබේ. ප්‍රකෘතිස්වරූපයෙන් සිටියේ ය. මේ පෙළහර ද එබඳු ය.

"යාව බ්‍රහ්මලෝකා කායෙන වසං වත්තෙති" කයින් බඹ ලොව තෙක් තම වශය පවත්වයි යන අරුත් ය. බඹලොව තම වශයෙහි පවත්වාසි කියූ සේ ය.

යොගී තෙමේ බඹලොවට යනු කැමැත්තේ "දූරසථවසතුහු සමීපසථ වෙත්වා"යි ද "සමීපසථවසතුහු දූරසථ වෙත්වා" යි ද "බොහෝ වූ වසතුහු සවලප වෙත්වා"යි ද "සවලපවසතුහු බොහෝ වෙත්වා"යි ද ඉටා නම්, ඒ ඉටීම සමෘද්ධ වන්නේ ය. දිවැසින් දිවකණින් බ්‍රහ්මරූපය බ්‍රහ්මශබ්දය දකියි. අසයි. චේතොපරියඤ්ඤණයෙන් සිත දැන ගණියි.

දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යනු කැමැත්තේ නම් ශරීරයාගේ වශයෙන් සිත පෙරළන්නේ ය. ශරීරයාගේ වශයෙන් සිත ඉටන්නේ ය. මෙසේ ශරීර විසින් සිත පෙරළා ඉටා සුඛසංඥව හා ලහුසංඥව උපදවා දෘශ්‍යමාන ශරීරයෙන් බඹලොව යන්නේ ය. අදෘශ්‍යමාන ශරීරයෙන් යනු කැමැත්තේ නම් චිත්තයාගේ වශයෙන් ශරීරය පෙරළා ඉටා සුඛසංඥලහු සංඥවන්ට පැමිණ නො පෙණෙන සිරුරෙන් බඹලොව යන්නේ ය.

මේ යොගී තෙමේ බඹහු ඉඳිරියෙහි මනොමයඅඞ්ගප්‍රත්‍යඞ්ගයෙන් පිරිපුන් නො පිරිහුනු ඉඳුරන් ඇති රූවක් මවන්නේ ය. එසේ මවාපා තෙමේ සක්මන් කරන්නේ වේ ද එකල්හි මවාපා රූපය ද සක්මන් කරන්නේ ය. තෙමේ සිටී නම් හිඳී නම් ගොවී නම් දුවා නම් දිලියේ නම් බණ කියා නම් ප්‍රශ්න අසා නම් ප්‍රශ්න විසඳ නම් ඒ මැවුනු රූපය ද ඒ හැම ක්‍රියාවක් එසේ ම කරන්නේ ය. යොගී තෙමේ බඹහු හා එක්ව සිටී නම් කතා බස් කෙරේ නම් සාකච්ඡා කෙරේ නම් මැවුනු රූපයන් එ හැම එසේ ම කරන්නේ ය.

දූරසථවසතුන් ලං කිරීමෙහි ලා පාදකධ්‍යානයෙන් නැගිට "දුර පිහිටි දෙව්ලොව හෝ බඹලොව ලං වේවා" යි පිරියම් හා ආවජ්ජනා කොට නැවැත එයට සමවැද අභිඥඥනයෙන් ලං වේවා යි ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම සමීපසථ වන්නේ ය. සෙස්ස ද මෙසේ දත යුතුයි.

බුදුරජානන් වහන්සේ යමාමහ පෙළහර කොට දෙව්ලොව වඩනා සේක් යුගඛර පර්වතය හා මහාමේරුපර්වතය ඍද්ධිබල යෙන් ලං කොට පොළොවෙන් **එක්** පියවරක් නගා යුගඳුරු පවුමතුයෙහි තබා දෙවන පියවර මහමෙර මුදුනෙහි තබාලූ සේක.

මුගලන් මහතෙරණුවෝ සැවැත්නුවරින් නික්මුනු දෙලොස් යොදුන් තැන පැහිර සිටි මහපිරිස් බලා නිස් යොදුන් පමණ වූ සකස් නුවරට යන දිග මග හකුළුවා එකෙණෙහි ම ඒ පිරිස එනුවරට පමුණුවා ලූහ.

මෙම සිරිලක්දිව **චූලසමුද්‍ර** මහතෙරණුවෝ දුර්භික්ෂ කාලයෙක එක් උදැසනක තමන් වෙත පැමිණි සත් සියයක් පමණ වූ මහණ පිරිසක් දැක ලක්දිවෙන් පිඬු සපයා ගැනීම අපහසුය සි සලකා එකෙණෙහි ම ඒ මුළු පිරිස ගෙණ මහපොළොව හකුළුවා දඹදිව පැළලුප් නුවරට වැඩියහ.

නිස්සඟුත්තන මහතෙරණුවෝ සවස් වේලෙහි මූණකට සෝදා සිවුරු පොරොවා ගෙණ "මහබෝ වඳින්නට ඕනෑ" සි සිතූහ. ඒ සිතූ කෙණෙහි ම පොළොව හැකිළ ගොස් දුර තුබූ මහබෝ මැඩ ලංව සිටියේ ය.

සම්මා සම්බුදු රජානන් වහන්සේ තමන් වහන්සේගේ හා අඬගුලිමාලයන්ගේ හා දුර නො වූ අතර දුර කළ සේක.

මහසුප් මහතෙරණුවෝ බොහෝ වූ දැය ටික දැයක් කළ සේක. **මහමුගලන්** මහතෙරණුවෝ ටික දැය බොහෝ වූ දැයක් කළ සේක. **මහාඅනුල** මහතෙරණුවෝ වියලී ඔත් වළඳනා නිසූන් දැක අසල තුබූ ගහෙහි දිය ගිතෙල් කළ සේක.

මෙසේ දුරසථවසතුන් සමීපසථ කෙළේ ද, සමීපසථවසතුන් දුරසථ කෙළේ ද, බොහෝ වූ දැය ටික දැයක් කොළේ ද, ටික දැය බොහෝ වූ දැයක් කෙළේ ද, මෙහි සිටියේ දිවැසින් රූප දකී ද, දිවකණින් ශබ්ද අසා ද, වෙතොපරියඤ්ඤණයෙන් සිත දැන ගණී ද, මෙහි සිටියේ බඹහු හා එක්ව සීවී ද, කතා කෙරේ ද සාකච්ඡා කෙරේ ද, පැණෙන්නා වූ හෝ නො ද පැණෙන්නා වූ හෝ සිරුරෙන් බඹ ලොවට යේ ද යන කරුණෙන් ද බඹලොව තම වශයෙහි පවත් වන්නේ නො වේ. "යම් හෙයකින් හෙතෙමේ ඒ බඹහු ඉඳුරියෙහි රූපයක් මවාලයි" ද යන ඈ ලෙසින් කියූ ඍද්ධිවිධියට පැමිණේ ද එපමණෙකින් කයින් බඹලොව වශයෙහි පවත් වන්නේ නම් වේ. මෙහි ලා කියූ සෙසු සියල්ල ඍද්ධිය පිළිබඳ පූර්වභාගය දැක්වීම සඳහා කියන ලද ය.

"පකතිවණ්ණවිජහනවිකාරවසෙන පවත්තත්තා විකුබ්බ-නා ඉඩි නාම" තමාගේ ප්‍රකෘතිවෙශය හැර අන්‍ය විකෘතිවෙශ යක් ගැණීම් වශයෙන් පවත්නා සෘද්ධිය විකුබ්බන ඉද්ධි නම්. **"විවිධරූපනිම්මානසඞ්ඛාතං කුබ්බනං එතිස්සා අත්ථීති = විකුබ්බ නා"** යනු එහි ලා ටීකාගත ය. විවිධරූප මවා පෑමය යි කියන විවිධක්‍රියා කිරීම මෝහට ඇත්තේ නු යි, විකුබ්බනා, යනු එහි අරුත් ය. එය පටිසම්භිදායෙහි **"කතමා විකුබ්බනා ඉද්ධි? සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙති"** යි ඈ විසින් ආය.

මේ කපින් උඩ එකුන් තිස්වන කපෙහි ලෝ පහළ වූ **සිඛී** සම්බුදු රජානන් වහන්සේට **අභිභූ** නම් මහාශ්‍රාවකයෙක් වූයේ ය. බුදුරජානන් වහන්සේ ඒ ශ්‍රාවකයාත් ගෙණ එක් දවසෙක බඹලොවට වැඩි සේක. එහි මහාබ්‍රහ්ම තෙමේ උන්-වහන්සේලා පිළිගෙණ අසුන් පණවා වඩා හිඳ වී ය. එවේලෙහි බුදුරජුන්ගේ නියමයෙන් අභිභූ මහාස්ථවිරයන් වහන්සේ දෙසූ ධර්මදෙශනාව ගැණ නො ද සතුටු වූ බඹහු "බුදුරජානන් වහන්සේ විසින් අපි දක්නා ලද්දමෝ ඉතා දිගු කලකිනි, එසේ ම අපිදු බුදුරජානන් වහන්සේ දුටුමෝ කලකිනි, උන් වහන්සේගෙන් බණ අසන්නට අපි බලාපොරොත්තු වීමු. එහෙත් මේ මහණ බණ දෙසා" යි සිතූහ. බුදුරජානන් වහන්සේ බඹුන්ගේ මේ නො සතුට දැන "අභිභූ! තමුසේගේ බණට මේ බඹහු නො සතුටුව සිටිත්, එහෙයින් ඔවුන් වෙවුලුම් කන සේ දෙදරා යන ලෙසින් බණ කියව" යි වදාළ විට අභිභූ මහා ස්ථවිරයන් වහන්සේ නීලකසිණයට සමවැද එයින් නැගිට අභිඥාඥානයෙන් සක්වළ දහසෙක සියලු තැන්හි අන්ධකාරය පැතිර වූහ. "මේ අන්ධකාරය කිමැ" යි බැලුවනට එකෙණෙහි ම ආලොකකසිණයට සමවැද එයින් නැගිට ආලොකයක් පතුරුවා හැරියහ. එවේලෙහි "ආලොකය කිමැ" යි බැලුවනට තමන් දක්වා ලූහ. එකල්හි සක්වළ දහසෙක දෙවිමිනිස්සු දෙහොත් මුදුන් ගන්වා තෙරුන් වැඳ සිටියහ. උන්වහන්සේ එහිදී "මා කියන බණ මහාජන තෙමේ අසාවා" යි **"ආරභථ නික්ඛමථ"** යනාදි ගාථා ඉදිරියෙහි තබා ධර්මදෙශනා කළ සේක.

නැවැත උන්වහන්සේ තමන්ගේ ප්‍රකෘතිරූපය හැරදමා වරින්වර ලදරුවෙසක් නාගවෙසක් ගුරුළුවෙසක් ගණිත්. අසුර රුවක් සක්රුවක් දෙව්රුවක් බඹරුවක් සීරුවක් වග

රූවක් ඇත්රූවක් අස්රූවක් ගණින්. හෙලක් වෙලක් කන්දක් මුහුදක් ඈ හාස්කම් මවා දක්වත්. මේ මෙසේ කරණු විකුර්ණර්ධිය යි. විකුර්ණර්ධියේ හාස් කම්න් මෙසේ කරත්.

විකුර්ණර්ධියට පැමිණෙනු කැමැති යොගීහු විසින් පඨවිකසිණාදීන් අතුරෙහි යම් කිසි අරමුණක් ගෙණ අභිඥාපාදක ධ්‍යානය උපදවා එයින් නැගිට ලදරූවෙස් ගැණුම් අතුරෙහි යම් වෙසක් ගණු කැමැත්තහු නම්, පාදක ධ්‍යානයෙන් නැගිට තමන් පිළිබඳ ලදරූවෙසය ආවර්ජනා කොට පිරියම් අවසන්හි නැවැත එයට සමවැද එයින් නැගිට "මෙබඳු දරූවෙක් වේම්" යි ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම දරූවෙක් වන්නේ ය. ඇත් අස් ඈ රූ මැවීමෙහිදී "ඇතෙක් වේම්" යි නො ඉටා "ඇතෙක් වේවා" යි ඉටිය යුතුය. අස් රූ ඈ මැවීමෙහි ද මෙම පිළිවෙළ ය.

"සරීරඛනනතරෙ අඤ්ඤසෙසව මනොමයසස සරීරසස නිපජනනිවසෙන පවතතනතා මනොමයා ඉදධි නාම" තමන් ගේ සිරුර තුළ සිනිත් නිපත් අන් සිරුරක් මවා පෑම් විසින් පවත්නා ඍද්ධිය මනොමයඉදධි නම්.

"කතමා මනොමයා ඉදධි? ඉධ භිකඛු ඉමසමා කායා අඤ්ඤං කායං අභිනිමමිනාති රූපං මනොමයං සබබඞග පචචඞගං අහීනින්ද්‍රියං සෙය්‍යථාපි පුරිසො මුඤ්ජසමහා ඊසිකං පවාහෙය්‍ය" යන ඇලෙයින් ඕ පටිසම්භිදායෙහි ආවා ය.

පුරුෂයෙක් මුදුතණගසකින් ගොබයක් යම්සේ ඇද ගණී ද, එසේ මේ ශාසනයෙහි යොගී භික්ෂු තෙමේ මේ කයින් මනොමය වූ සියලු අඟපසඟින් යුත් නො පිරිහුනු ඉඳුරන් ඇති අන් කයක් මවා යනු අරුත් ය.

මනොමය ඍද්ධියක් කරණු කැමැත්තහු විසින් පාදකධ්‍යාන යෙන් නැගී සිට පළමු කොට සියකය ගැණ ආවර්ජනා කිරීමෙන් යට කියූ සේ "සිදුරෙක් වේවා" යි ඉටිය යුතු ය. ඒ ඉටීම හා ම සිදුරෙක් වන්නේ ය. නැවැත ඒ සිදුර තුළ අන් කයක් ගැණ ආවර්ජනා කිරීමෙන් පිරියම් කොට යට කියූ සේ ම ඒ සිදුර තුළ "අන් කයෙක් වේවා" යි ඉටිය යුතු ය. එකල යොගී තෙමේ මුදුතණ ගසින් ඇද ගන්නා ගොබක් සේ කොපුවෙන් ඇද ගන්නා කඩුවක් සේ හැවයෙන් එලියට ගන්නා නයකු සේ ඒ අන්කය ඇද ගන්නේ ය.

මුදු තණ ගසින් ගොබය ඇද ගත් පුරුෂයාහට "මේ මුදු තණගස ය, මේ එහි ගොබ ය, තණගස අනෙකක, ගොබය අනෙකෙක, තණගස ගොබය නො වේ, ගොබය තණ ගස නො වේ, එහෙත් මේ ගොබය තණගසින් ඇද ගන්නා ලදැ" යි අදහසක් වන්නා සේ මේ යොගීහට ද "මේ සියකය ය, මේ අන්කය ය, සියකය අන්කය නො වේ, අන්කය සියකය නො වේ, සියකය අනෙකෙක, අන්කය අනෙකෙක, එහෙත් සියකයෙන් මේ අන්කය ඇද ගන්නා ලදැ" යි අදහස් වන්නේ ය. එලියට ඇද ගත් තණගොබය යම් සේ තණ ගස වැනි වේ ද එමෙන් මනොමයරූපයත් යොගියා වැනි ම වේ.

සියවෙස් හැර ඒ හා කිසිසේත් සමාන නො වන ලදරු වෙස් නාවෙස් ඇ අන් වෙසක් ගැණීම විකුර්ණර්ද්ධිය යි. මනොමයසෘද්ධිය කරණු කැමැත්තේ පාදකද්ධ්‍යානයෙන් නැගිට ශරීරය ආවර්ජනා කොට "එය සිදුරු වේවා" යි ඉටන්නේ ය. එකල්හි ශරීරය සිදුරු වන්නේ ය. ඒ සිදුරතුළ "තමන් වැනි අන් සිරුරෙක් වේවා" යි ඉටීම හා ම සිය සිරුරතුළ තමන් වැනි අන් සිරුරෙක් මැවෙන්නේ ය. මැවුනු ඒ සිරුර තමන් වැනි ය. මේ වනාහි විකුර්ණර්ද්ධි – මනොමයර්ද්ධි දෙක්හි වෙනස ය.

ගමනාර්ථයෙන් සියලු සත්ත්වයන් කෙරෙහි සාධාරණ විසින් පැවැති ගො ශබ්දය තැල්ල – මොල්ලි ඇ අවයවයන්ගෙන් යුත් ගොපිණ්ඩයෙහි ම රුසී ව පවත්නා සේ අභිඥාවිත්තයෙන් උපදවන්නා වූ සියලු රූපයන්ට සාධාරණ වූ මනොමයඉද්ධි යනු අභිඥාවිත්තයෙන් හටගන්නා වූ ආත්මභාවය කෙරෙහි ම රුසී ව පවත්නේ යි දතයුතු ය. සෘද්ධියට පැමිණියහු හැම අතකින් සමාන වූ මේ මැවීමෙහි සිතින් නිපන්බව ම ප්‍රධාන බැවින් මනොමයඉද්ධි යි කියනු ලැබේ. මනොමය ව්‍යවහාරය මේ සෘද්ධියෙහි ම අතිශයයොග වන්නේ ය. අධිෂ්ඨාන – විකුර්ණර්ද්ධින් කෙරෙහි ඒ ව්‍යවහාරය අතිශයවත් නො වන්නේ ය.

"ඤාණප්පවත්තිතො පුබ්බෙ වා පච්ඡා වා තඞ්ඛණෙ වා ඤාණානුභාවනිබ්බත්තො විසෙසො ඤාණවිප්ඵාරා ඉද්ධි නාම" පශ්චිම භවිකසත්ත්වයාහට රහත්මග නුවණ ඉපැත්මට පෙර විදසුන් වඩනා කල්හි හෝ ඊට පෙර පිළිසිඳ ගැණීමත් රහත්වීමත් අතර කාලයෙහි හෝ රහත්වීමෙන් පසු සක්‍රාපරිනිර්වාණය තෙක් ඇති මේ කාලයෙහි හෝ රහත්මග නුවණ ලබන්නා වූ

මොහොතෙහි හෝ රහත්මග නුවණ නිසා නිපත් පැහිය යුතු කෙලෙසුන්ගේ පැහීම නම් වූ වැඩිය යුතු ධර්මයන්ගේ වැඩීම නම් වූ විශෙෂත්වය **සඞ්ඛාරුපෙක්ඛාඤාණ** නම්.

එය පටිසම්භිදායෙහි මෙසේ ආවා ය. **"කතමා සඞ්ඛාරුපෙක්ඛා ඤාණේ? අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය පහානාය සුඤ්ඤතානුපස්සනාය අත්තානුපස්සනාය නිබ්බිදානුපස්සනාය විරාගානුපස්සනාය නිරොධානුපස්සනාය පටිනිස්සග්ගානුපස්සනාය ඛයේ ඤාණං වයේ ඤාණං විපරිණාමේ ඤාණං ලක්ඛණපටිවෙධෙ ඤාණං පච්චවෙක්ඛණේ ඤාණං ගොත්රභූ ඤාණං ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යා ඉමෙ ධම්මා පහාතබ්බා ඉමෙ ධම්මා භාවෙතබ්බා ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා ඉමෙ ධම්මා සමෙච්ච ලද්ධබ්බා ඉමෙ ධම්මා පත්තබ්බා ඉමෙ ධම්මා සමෙච්ච පත්තබ්බා ඉමෙ ධම්මා සච්ඡිකතා ඉමෙ ධම්මා සමෙච්ච සච්ඡිකතා ඉමෙ ධම්මා පටිලද්ධා ඉමෙ ධම්මා සමෙච්ච පටිලද්ධා ඉමෙ ධම්මා පත්තා ඉමෙ ධම්මා සමෙච්ච පත්තා ඉමෙ ධම්මා සච්ඡිකතා ඉමෙ ධම්මා සමෙච්ච සච්ඡිකතා

"සමාධිකෝ පුබ්බේ වා පච්ඡා වා තඞ්ඛණේ වා සම්ථානුභාවනිබ්බත්තෝ විසෙසෝ සමාධිවිප්ඵාරා ඉද්ධි නාම" සමාධියෙන් පෙරවූ ව හෝ එයින් පසු ව හෝ සමාපත්ති කාලයෙහි හෝ සමාධියෙන් හටගත් ගුණවිශෙෂය සමාධිවිප්ඵාරා ඉද්ධි නම්.

එය පටිසම්භිදායෙහි "කතමා සමාධිවිප්ඵාරා ඉද්ධි? පඨමේන ඣානෙන නීවරණානං පහානඤ්ච ඉඤ්ජිතඤ්ච = සමාධිවිප්ඵාරා ඉද්ධි" යි. මෙසේ ආවා ය. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ප්‍රහාණාඞ්ගය සමෘද්ධ වන්නේ නු යි සමාධිවිප්ඵාරා ඉද්ධි නම් යනු එහි අරුත් ය.

"පඨමජ්ඣානාදිසමාධිතෝ පුබ්බේ උපචාරක්ඛණෙ පච්චා සමාපත්තියා විණාමපච්චයෙන තඞ්ඛණෙ සමාපත්තික්ඛණෙ තස්මිං තස්මිං ඣානෙ සමාධිතෝජෙන නිබ්බත්තෙතා නීවරණවිතක්කමහනවිතක්කාදිසමතික්කමතඤ්ඤෙවදක්ඛිතිරොධසඞ්ඛාතස්ස අඞ්ගස්ස හානා "තෝ විසෙසෝ" යනු පිකා ය. ප්‍රථමධ්‍යානාදී වූ සමාධියෙන් පූර්ව වූ වඩා බලගතු නො වූ උපචාරසමාධි කාලයෙහි හෝ ඒ ඒ ධ්‍යානයන් පස්වැදෑරුම් වශීභාවයන්ගෙන් පුහුණු කිරීමට පසුව හෝ සමාපත්තිකාලයෙහි හෝ ප්‍රථමධ්‍යානාදී වූ ඒ ඒ ධ්‍යානයෙහි සමාධිතෙජයින් හටගත් නීවරණ ඔබා ගැණීම විතර්කවිචාරාදී වූ ධ්‍යානාඞ්ග ක්‍රමයෙන් ඉක්මවාලීම නිරොධසමාපත්තිඤ්ඤණයෙහි උපදුරු ඉවසීම යනාදී වූ ගුණවිශෙෂය සමාධිවිප්ඵාරර්ද්ධිය යි මෙයින් කියන ලද්දේ ය.

ප්‍රථමධ්‍යානයෙන් පෙර පසු ව හෝ එකොණෙහි හෝ නීවරණද, ද්විතීයධ්‍යානයෙන් විතර්කවිචාරද, තෘතීයධ්‍යානයෙන් ප්‍රීතිය ද, චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛ ද, ආකාසානඤ්චායතනයෙන් රූප-ප්‍රතිඝ-නානාත්තසංඥ ද, විඤ්ඤාණඤ්චායතනයෙන් ආකාසානඤ්චායතනසංඥ ද, ආකිඤ්චඤ්ඤායතනයෙන් විඤ්ඤාණඤ්චායතනසංඥ ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් ආකිඤ්චඤ්ඤායතනසංඥ ද දුරුව යෑමෙන් පහව්මෙන් ප්‍රහාණාඞ්ගය සිදු වන්නේ ය. සමාධිවිප්ඵාරර්ද්ධිය යි කීයේ ද මේ ප්‍රහාණාඞ්ග සිද්ධිය යි දත් යුතු ය.

සැරියුත් මහතෙරණුවෝ මුගලන් මහතෙරණුන් හා ඛණෙ-ඛණදරා වනුපෙනසුහෙහි පසළොස්වක් පොහොය දිනෙක එලිමහන්හි සිදහළ හිසකේ ඇතිව වැඩ හුන් හ. එවේලෙහි අහසෙහි යන එක්තරා යකෙක් අන් යකකු විසින් වළකනු ලබන්නේ ද

උන්වහන්සේගේ හිසට තද පහරක් ගැසී ය. එ හඬ අහසගෙර-විල්ලක් සේ මහත් ව පැතිර ගියේ ය. මහතෙරණුවෝ පහර දෙත් ම සමාධිගත වූහ. එයින් උන්වහන්සේට කිසි ද අපහසුවෙක් නො වී ය.

නිරොධසමාපත්තියට සමවැද හුන් **සඤ්ජීව** මහතෙරණුන් කලුරිය කළැ සි සිතා ගෙරිහරක් බලමින් හැසුරුණු ගොපලු කොල්ලෝ තණ දර ගොමවැරටි එකතු කොට සිරුර මතුයෙහි සිරුර වසා ගොඩ ගසා ගිනි තැබූහ. එයින් උන්වහන්සේගේ සිවුරෙහි නූල් පටක් පමණකුත් නො දවුනේ ය.

සිරිමා නම් වෙසඟන **උත්තරා** උපාසිකාවගේ හිසෙහි කකිය මින් තුබූ තෙල් ඇතිලිය වත් කළ වේලෙහි උපාසිකා තොමෝ මෙත් වැඩීමෙන් උපදවනු ලැබූ උපචාරසමාධියට සමවැදුනා ය. ඒ හුණුතෙල් සියල්ල නෙළුම්කොළයෙක වැටුනු දියත්තක් සේ පෙරැළී ගියේ ය. මෙ හැම සමාධිවිපඵාරඉද්ධිහු ය.

"පංසුකූලාදිසු අපංසුකූලවිකාරාදිකා සත්ත අරියාඉද්ධි නාම" පිළිකුල් ඇ විසින් ගත යුතු වස්තූන්හි නො පිළිකුල් ඇ විසින් හැඟීම් ඇති ව විසීම් ආදිය අරියා ඉද්ධි නම්.

පටිසම්භිදායෙහි ඕ මෙසේ අවා ය. **"කතමා අරියා ඉද්ධි? ඉධ භික්ඛු සචෙ ආකඞ්ඛති පංසුකූලෙ අප්පංසුකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පංසුකූලසඤ්ඤී තත්ථ විහරති"** යනු ඇ ලෙසින්. මේ ශාසනයෙහි මහණ තෙමේ "පිළිකුල් අරමුණෙහි නො පිළිකුලැ සි යන සත් ඇති ව වසන්නෙමි" සි ඉදින් කැමැත්තේ නම් පිළිකුල් අරමුණෙහි නො පිළිකුලැසි සත් ඇති යේ වෙසෙයි, යනු එහි අරුත්.

අනිෂ්ටවස්තූන් සිත් නො ගන්නා වස්තූන් ප්‍රතිකූලය සි ගණිත්. තව ද මෙම ඍද්ධිය **"චෙතොවසිප්පත්තානං අරියානංයෙව සම්භවතෝ"** සි කී බැවින් චෙතොවශීප්‍රාප්ත වූ ආර්‍යයන්ගේ ම වශයෙන් සිද්ධ වන්නී ය.

මේ ඍද්ධියෙන් යුක්ත වූ ක්ෂීණාශ්‍රවභික්ෂු තෙමේ මන නො ගන්නා වූ සත්ත්වාලම්බනයෙහි මෙත් සිත් පතුරුවමින් හෝ අසුභමලමූත්‍රාදී වූ අරමුණෙහි ධාතුවශයෙන් මෙනෙහි කරමින් හෝ වසන්නේ ය. සත්ත්වාලම්බනයෙහි ධාතුවශයෙන් බැලීම නො වටනේ නො වේ. මේ තෙමේ මන වඩන්නා වූ නෑ මිතුරු

ඈ අරමුණෙහි අශුභමනසකාරය පැතිරවීමෙන් හෝ අනිත්‍ය විසින් සිත්හි කරමින් හෝ වසන්නේ ය. ඉටු අනිටු පිළිකුල් නො පිළිකුල් සියලු අරමුණෙහි මෙත්සිත් පතුරුවමින් හෝ ධාතුස්වභාවය මෙනෙහි කරමින් හෝ වසන්නේ ය. ඇසින් රූප දැක කණින් ශබ්ද අසා නැහැයෙන් ගඳ සුවඳ අසා දිවෙන් රස විඳ කයින් පහස ඉවසා සිතින් අරමුණු දැන ගෘහනිශ්‍රිත වූ සොම්නසින් සතුටු ද නො වී දොම්නසට ද නො පැමිණ පිළිකුල් නො පිළිකුල් සියලු අරමුණුවල පිරිසුදු වූ පියවිබව නො හරණා වූ ඇස් කන් නාස් ඈ සදොර පවත්නා හෙයින් ෂඩඞ්ගොපෙක්ෂා යි කියනු ලබන තත්‍රමද්‍ධ්‍යස්ථොපෙක්ෂායෙන් යුක්ත වන්නේ පිළිකුල් නො පිළිකුල් අරමුණුවල පිළිකුල්බව හා නො පිළිකුල්බව හැර සිහි නුවණින් යෙදී වසන්නේ ය.

"පක්ඛිආදීනං පන වෙහාසගමනාදිකා කම්මවිපාකජා ඉද්ධි නාම" පක්ෂි ආදීන්ගේ අහස් ගමන් ආදිය කම්මවිපාකජ ඉද්ධි නම්.

පටිසම්භිදායෙහි ආවා මෙසේ ය. **"කතමා කම්මවිපාකජා ඉද්ධි? සබ්බෙසං පක්ඛීනං සබ්බෙසං දෙවානං එකච්චානං මනුස්සානං එකච්චානං විනිපාතිකානං අයං කම්මවිපාකජා ඉද්ධි"** යි. සියලු පක්ෂීන්ගේ සියලු දෙවියන්ගේ ඇතැම් මිනිසුන්ගේ ඇතැම් විනිපාතිකයන්ගේ අහස් ගමන් ආදිය කම්මවිපාකජඉද්ධිය යනු එහි අරුත්.

පක්ෂීහු අභිඥාප්‍රාප්තද්‍ධ්‍යානයක් හෝ බලප්‍රාප්තවිදර්ශනාවක් හෝ නො මැති ව අහසින් යන්නෝ ය. දෙවියෝ ධ්‍යානයක් විදර්ශනාවක් නො මැති ව තමන් ලත් ආත්මභාවවිශෙෂයෙන් අහසෙහි යත්. කල්පයෙහි මුල විසූ ඇතැම් මනුෂ්‍යයෝ **පියඞ්කර මාතා උත්තරමාතා සුස්සමිත්තා ධම්මගුත්තා පුනබ්බසුමාතා** යනාදී වූ කුසල් කම් බෙලෙන් ඉපිද අකුසල් කම්හි විපාක විසින් සැපයෙන් ඇද වැටුනු ඇතැම් විනිපාතිකයෝ ඇතැම් ප්‍රෙතයෝ ධ්‍යාන විදර්ශනා කිසිත් නැති ව කර්මවිපාක විසින් අහසෙහි යෙත්. මේ හැම දෙන උපන්දා සිට අහසෙහි යන්නෝ ය.

"චක්කවත්තිආදීනං වෙහාසගමනාදිකා පන පුඤ්ඤවතො ඉද්ධි" සක්විති ඈ මහසතුන්ගේ අහස් ගමන් ආදිය පුඤ්ඤිද්ධි නම්. **"කතමා පුඤ්ඤවතො ඉද්ධි? රාජා චක්කවත්තී වෙහාසං ගච්ඡති සද්ධිං චතුරඞ්ගිතියා සෙනාය අන්තමසො අස්සබන්ධගොබන්ධපුරිසෙ උපාදාය"** යි පටිසම්භිදායෙහි ආවා පුඤ්ඤවතො

ඉදඬිය යි. සක්විති රජතෙමේ සිවුරඟසෙන් සමග යටත් පිරිසෙයින් අස්ගොවු ගොපලු මෙහෙකරු ආදීන් පටන් සියලු රජපිරිස් ගෙණ අහසින් යෙත් යනු එහි අරුත්.

මෙහිලා උනුන් විසින් කරණ ලද පින් මෝරා යෑමෙන් සමෘද්ධ වන්නා වූ බලවිශෙෂය පුණ්‍යර්ද්ධිය යි කොටින් දත යුතු ය. සක්විති රජ තෙමේ සිවුරඟ සෙන් හා ඇත්ගොවු අස්ගොවු ගොපලු ලෝකුරු රන්කරු සොම්මරු ආ මෙහෙකරු වන් ද ගෙණ අහසට නැඟ අහසින් ගොස් මහමෙර පැදකුණු කොට සියලු සක්වළ ඇවිද දවල් බතට රජගෙට ම පෙරළා එන්නේ ය. සක්විති රජු පිළිබඳ මේ බලමහිමය පෙර කළ කුශල කම්බලයෙන් නිපන්නේ ය. **ජෝතිය** සිටුහට මහපොළොව පළා රුවන් පහයෙක් පැන නැඟින. කප්රුක් සුසැටෙක් පහළ විය. **ජටිලක** සිටුහට අසුරියනක් උස රන් කන්දෙක් පහළ වූයේ ය. **මොඝක** සිටු තෙමේ සත් වරක් මරණින් මිදුනේ ය. **මෙණ්ඩක** ඉස් සෝදා නා උඩ බැලූ කල්හි අහසින් වැටෙන සුවඳරත්හැලින් ඔහුගේ දෙළොස් දහස් පන්සියයක් පමණ වී කොටු අතුරු සිදුරු නැති ව පිරී යයි. ඔහු බිරිය වූ **චන්දපදුමාවන්** පිසූ හාල් නැළියෙහි බත් සියලු දඹදිව් වැස්සන්ට බෙදා දෙන ලද ද අවසන් නො වේ. ඔහු පුත් **ධනඤ්ජය** කහ වණ්ණ දහසක් මල්ලෙහි ලා ඇති නාක් දඹදිව් වැසියනට බෙදා දුන්නේ ද ඒ නො නිමියේ ය. ඔහු ලේලි වූ **සුමනාවන්** වී ලාභයක් දඹදිව් වැස්සන්ට බෙදූ ද ඒ ලාභයෙහි එක් ඇටයෙකුදු අඩු නො වී ය. මෙහෙකරු **පුණ්ණක** එක් නඟුලක් ගෙණ සාන කල්හි වම්පස සතෙක, දකුණුපස සතෙකැ යි එකවිට ම හීවිටි මං තුදුසෙක් වන්නේ ය. මේ පුණ්‍යර්ද්ධිය යි.

"විජ්ජාධරාදීනං වෙහාසගමනාදිකා පන විජ්ජාමයා ඉද්ධි" විද්‍යාධරාදීන්ගේ අහස් ගමන් ආදිය විජ්ජාමය ඉද්ධි නම්. අථර්ණ-විද්‍යාවෙන් නිපන්නී විද්‍යාමයර්ද්ධිය යි ටීකාව කියයි. **"අථබ්බණ විජ්ජාගතිනිබ්බත්තා විජ්ජාමයා"** යනු ඒ ටීකා ය.

"කතමා විජ්ජාමයා ඉද්ධි? විජ්ජාධරා විජ්ජං පරිජප්පිත්වා වෙහාසං ගච්ඡන්ති ආකාසෙ අන්තලික්ඛෙ හත්ථිම්පි දස්සෙන්ති. අස්සම්පි දස්සෙන්ති. රථම්පි දස්සෙන්ති. පත්තිම්පි දස්සෙන්ති. විවිධම්පි සෙනාබ්‍යූහං දස්සෙන්ති. අයං විජ්ජාමයා ඉද්ධි" විද්‍යාධරයෝ මන්ත්‍රවිද්‍යාව පිරිවහා මතුරා අහසෙහි යෙත් අහසෙහි ඇත් අස් ජිය පාබල සෙන් දක්වත්. නත් වැදුරුම් සෙන් කඳවුරු දක්වත්. මෙය විද්‍යාමයර්ද්ධිය යනු එහි අරුත්.

විද්‍යාධරයෝ මන්ත්‍රයන්ට උපචාර දක්වා ගන්ධාරවිද්‍යාදී වූ මන්ත්‍ර විද්‍යාවන් මතුරා ජප කොට මන්ත්‍රානුභාවයෙන් අහසෙහි යන්නෝ ය. අහසෙහි හස්තිරූප අශ්වරූපාදී වූ නානාවිධරූප දක්වන්නෝ ය. සෙනා කඳවුරු දක්වන්නෝ ය. මන්ත්‍රෞෂධාදීන්ගේ බලයෙන් තවත් නොයෙක් විස්මයකර වූ ක්‍රියා කරන්නෝ ය.

"තෙන තෙන සම්මාපයොගෙන තස්ස තස්ස කම්මස්ස ඉජ්ඣනං තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි" නීතියට එකඟ වූ නීතියට අවිරුද්ධ වූ සම්‍යක්ප්‍රයොගයෙන් අභිමතාර්ථසමෘද්ධියෙහි පොහොසත් වූ යුක්තිපූර්වකක්‍රියාවෙන් ඒ ඒ කටයුතු සඵලවීම සම්මාපයොගපච්චයඉද්ධි නම්.

"කථං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි? නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. අබ්‍යපාදෙන බ්‍යාපාදස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. එවං තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනඪෙන ඉද්ධි" යි ඒ පටිසම්භිදායෙහි ආ ය. නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ පැහීම අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ පැහීම අර්හන්මාර්ගයෙන් සකලක්ලෙශයන්ගේ පැහීම න්‍යායානුගත ක්‍රියාවෙන් සමෘද්ධ වේ නුයි යන අරුත් විසින් ඒ ඒ ක්‍රියායෙහි සම්‍යක් ප්‍රයොගයෙන් වන අර්ථසංසිද්ධිය සම්මාපයොගපච්චය ඉද්ධි නම් වේ ය යනු එහි අරුත්.

ප්‍රථමද්ධ්‍යානයෙන් කාමච්ඡන්දය දුරුවී යන්නා සේ ඉතිරි ධ්‍යානයන්ගෙන් ව්‍යාපාදාදීහු දුරුව යන්නාහු ය. අර්හන්මාර්ගයෙන් සියලු කෙලෙස් කැඩී බිඳී වැටෙන්නේ ය. ශකටරවනා චක්‍රරවනාදිය කිරීමෙන් හෝ ගණිතගන්ධර්වාදි ශිල්පකර්මාන්ත ඉගෙණීමෙන් හෝ සැත්කම් ඇ වෙදකමක් ඉගෙණීමෙන් හෝ ත්‍රිවෙදය ත්‍රිපිටකය ඉගෙණීමෙන් හෝ සීසෑම් වෙණඳුම් ඇ යම් කිසි ක්‍රියාවකින් හෝ වන්නා වූ ඵලසිද්ධිය මේ සම්‍යක් ප්‍රයොගප්‍රත්‍යයර්ද්ධියෙහි ඇතුළත් ය.

ඉතා සැකෙවින් කියූ මේ සෘද්ධීන් අතුරෙහි මෙහිලා අධිට්ඨානා ඉද්ධි – පුඤ්ඤවතො ඉද්ධි – විජ්ජාමයාඉද්ධි යි ආ සෘද්ධි තුණ ප්‍රධාන විසින් ගණු ලැබේ. **"ආකාසෙ යන්ති ඉද්ධියා"** යන මෙහි

"ඉද්ධියා" යන පදයෙන් ගැණෙන්නේ මේ තෙවැදෑරුම් සෘද්ධිය යි. හංසයන්ගේ අහස්ගමන කර්මවිපාකජබැවින් **"හංසාදිච්චපථෙ යන්ති"** යන මෙහි නැගී සිටියා කර්මවිපාකජසෘද්ධිය යි.

ඉද්ධිපාද නම් ඡන්ද – විරිය – චිත්ත – වීමංසා යන මෙ සතර ය. සෘද්ධිප්‍රතිලාභයට කරුණු බැවින් ඉද්ධිපාද නම් වී. පාද නම් උපාය යි. සෘද්ධිලැබීමෙහි උපායය ඉද්ධිපාදැ යි ගතයුතු ය. ඡන්ද – විරිය – චිත්ත – වීමංසා යන මේ එකින් එකින් ම සත්ත්ව-යන්ගේ වැඩීම උතකර්ෂයට යෑම සිදු වන්නේ ද එහෙයින් මේ එක එක වෙන් වෙන් ව ඡන්දිද්ධිපාද-විරියිද්ධිපාද යන ඈ ලෙසින් ධර්මයෙහි ප්‍රසිද්ධියට ගියේ ය.

විවෙකජභූමි – පීතිසුඛභූමි – උපෙක්ඛාසුඛභූමි – අදුක්ඛම සුඛ භූමි යි සෘද්ධීන් පිළිබඳ භූමි සතරෙක් වේ. එහි විවෙකජභූමි නම් ප්‍රථමද්ධ්‍යානය යි. පීතිසුඛභූමි නම් ද්විතීයද්ධ්‍යානය යි. උපෙක්ඛා සුඛභූමි නම් තෘතීයද්ධ්‍යානය යි. අදුක්ඛමසුඛභූමි නම් චතුර්ථද්ධ්‍යා-නය යි. වෙසෙසක් නො දක්වා සෘද්ධීන් පිළිබඳ භූමිසතරෙකැ යි කියන ලද්දේ ද මෙ කියූ භූමීහු අධිට්ඨාන – විකුබ්බන මනොමය සෘද්ධීන් පිළිබඳ වෙත්ද සෙස්සන් පිළිබඳ නො වෙත්ද එහෙයිනි.

මේ භූමීන් අතුරෙහි චතුර්ථද්ධ්‍යානය ම සෘද්ධීන්ට භූමි වේ. එසේ වනුයේ චතුර්ථද්ධ්‍යානයෙහි පිහිටා සෘද්ධීන් ඉපදවිය යුතු බැවිනි. අන්‍ය වූ ප්‍රථමද්ධ්‍යානාදීහු තිදෙන සෘද්ධීන්ට සම්භාරභූමීහු වෙත්. යොගී තෙමේ සෘද්ධියට පැමිණෙනුයේ තෘතීයද්ධ්‍යානයෙහි සුඛඵරණයෙන් ද ප්‍රථම-ද්විතීයද්ධ්‍යානයන්හි ප්‍රීතිසුඛඵරණයෙන් ද ධ්‍යානසුඛය හා එක් ව උපන් සුඛසංඥාවට හා ධ්‍යානසම්ප්‍රයුක්ත ලහුසංඥාවට පැමිණීමෙන් තමන් පිළිබඳ නාමකාය රූපකාය දෙක්හි ලහු මෘදු කර්මණ්‍යයන් ලැබීමෙනි. ප්‍රථම – ද්විතීය – තෘතී-යද්ධ්‍යාන සම්භාරභූමි යි කීයේ එහෙයිනි. උපකරණභූමි යි කීසේ ය.

යොගී තෙමේ මෙ කියූ ධ්‍යාන තුණෙහි අතිශයභාවයට ගිය ලහුභාවය හා එක් ව යෙදුනු ධ්‍යානසුඛය දිගට පවත් වනුයේ ලහුභාවය හා එක් ව සිටි සුඛසංඥාවට ඇතුළත් වූවකු සේ වන්නේ ය. ඒ මේ ලහුභාවය හෙවත් ඔහු පිළිබඳ නාමකාය රූපකාය දෙක්හි සැහැල්ලුබව සෘද්ධියෙන් තොරව ද යොගියා අහසට නංවන පමණට පොහොසත් ලෙසින් පවත්නේ ය. ප්‍රථමාදී වූ ධ්‍යාන තුණට සමවැදීමෙන් සැපබවටත් සැහැල්ලු-බවටත් ගිය නාමකාය රූපකාය ඇති ඒ යොගියා තම සිත දමනය කළ කල්හි චතුර්ථද්ධ්‍යානය, සෘද්ධිප්‍රතිලාභය සුව සේ ලබන්නට කරුණු වන්නේ ය.

ඡන්ද – විරිය – චිත්ත – වීමංසා – ඡන්දසමාධි–විරියසමාධි–චිත්ත සමාධි – විමංසාසමාධි යි යෑදියන් පිළිබඳ පද අටෙක් වේ. යම් යොගාවචරයෙක් ඡන්දය ඇසුරු කොට සමාධිය ලබා ද සමාධි ලාභයට ආශ්‍රය කර ගත් ඒ ඡන්දය සමාධි නම් නො වේ. ඒ සමාධිය ද ඡන්ද නම් නො වේ. ඡන්දය අනෙකෙක. සමාධිය අනෙකෙක. මෙයින් කියන ලද්දේ ඡන්දය එක් පදයක් බව හා සමාධිය එක් පදයක් බව ය. සෙසු තුණෙහි ක්‍රමය ද මෙසේ ය. ඡන්ද – විරිය – චිත්ත – වීමංසා යන සතර, පද සතරක් කොට ද ඒ සතර හා යෙදුනු සිතේ එකඟබවැ යි කියූ සමාධි සතර, සතර පදයක් කොට ද ගතයුතු ය, **"තත්‍ථ ඡන්ද විරිය චිත්ත වීමංසා චත්තාරි පදානි, තංසම්පයුත්තා චත්තාරෝ සමාධි චත්තාරි පදානීති එවං අට්ඨ පදානි"** යනු අටුවා ය. මොවුන් කරණ කොට සෘද්ධියට පැමිණෙන බැවින් මොවුන් සෘද්ධිප්‍රතිලාභය පිණිස පවත්නා බැවින් මේ පද අට, පද නම් වී ය.

ධ්‍යානචිත්තයාගේ නො සැලීම සිදු කරණ ධර්ම, මූලපදය යි කියන ලදි. ඒ සොළොසෙකි. අලස බැවින් නො නැමුනු විය්‍යී යෙන් තද බද වූ බැවින් නො සැඟවුනු සිත අලසබව නිමිති කොට නො සැලීම, උඩඟු බැවින් උඩඟු නො වූ සන්හුන් සිත උඩඟුබව නිමිති කොට නො සැලීම, රාග විසින් අරමුණෙහි ඇලීමෙන් නො නැමුනු සිත රාගය නිමිති කොට නො සැලීම, ක්‍රොධවශයෙන් දූෂිත නො වූ සිත ව්‍යාපාදය නිමිති කොට නො සැලීම, මිසදිටු ඇසුරු නො කළ සිත මිසදිටුවෙන් නො සැලීම, ඡන්දරාග විසින් දුරසථ වූත් සමීපසථ වූත් අරමුණු හා නො හැනුනු සිත ඡන්ද-රාගයෙන් නො සැලීම, විෂකම්භන විමුක්ති විසින් කාමරාගයෙන් මිදුනු සිත නොහොත් පංචවිධවිමුක්ති විසින් ඒ ඒ ප්‍රතිපක්ෂ-ධර්මයන්ගෙන් මිදුනු සිත කාමරාගයෙන් නො සැලීම, විෂකම්භන වීසින් කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත කෙලෙසුන්ගෙන් නො සැලීම, සඩලා වූ ද කෙලෙසුන්ගෙන් නො සැලුනු සිත පැහැනු ඒ ඒ කෙලෙසුන්ගෙන් නො සැලීම, එකඟ බැවින් ඉතා සන්හුන් සිත නන් අරමුණෙහි වූ කෙලෙසුන්ගෙන් නො සැලීම, ශ්‍රද්ධායෙන් අරක් ගත් සිත අශ්‍රද්ධායෙන් නො සැලීම, විය්‍යීයෙන් අරක් ගත් සිත ආලස්‍යයෙන් නො සැලීම, සමෘතියෙන් අරක් ගත් සිත ප්‍රමාද-යෙන් නො සැලීම, සමාධියෙන් අරක් ගත් සිත ඖද්ධත්‍යයෙන් නො සැලීම, ප්‍රඥයෙන් අරක් ගත් සිත අවිද්‍යයෙන් නො සැලීම, ප්‍රඥ විශදතයෙන් ආලොකවත් වූ සිත අවිද්‍යාන්ධකාරයෙන් නො සැලීම යන මේ ය ඒ සොළොස.

මෙහි මෙසේ ඉතා සැකෙවින් කියූ භූමි-පාද-පද-මූලධර්ම සම්පූර්ණ කොට සිටි යොගී තෙමේ ම සෘද්ධිකරණයෙහි සෘද්ධි-ප්‍රතිලාභයෙහි සමර්ථ වන්නේ ය යි දතයුතු ය. මෙහි විස්තරකථාව පටිසම්භිදාමග්ග-විසුද්ධිමග්ගයෙහි ආවා ය.

නියන්ති ධීරා ලෝකම්හා ජේට්ඨා **මාරං සවාහිණිං**=නුවණැත්-තෝ සෙන් සහිත වූ මරු දිනා ලොකයෙන් නික්ම යෙත්.

මෙහි ලොකයෙනැ යි වදාළේ සංසාරවට්ටයෙනි. නිවනට යන්නන් සංසාරවට්ටය මුළුමනින් හැරයා යුතු ය. එය මාගීඥාන ලාභයෙන් කළයුතු වේ. එහෙයින් සසරින් නික්ම යන ධීරයෝ මාගීඥානවත්හු ය. සකාඛ්‍යධීරාදීන්ගේ වශයෙන් ඔවුන්ගේ භෙදය ඉමහත් ය. "**සුසන්ති ධීරා නිබ්බානං**" යන්නට කළ පරිකථාව බලනු.

නිවනට යන්නහු විසින් සෙන් සහිත වූ මරු ද පැරද විය-යුතු ය. මාරකථාව යට කියන ලදී[1] [2]. කාම – අරති – බුභුක්ඛා – තණ්හා – ථිනමිද්ධ – උත්තාසා – විචිකිච්ඡා – මක්ඛ – ථම්භ – ලාභ – සිලොකසක්කාර – යසස – අත්තුක්කංසන – පරවම්භන යන මේය මරසෙන්.

"කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති,
තතියා බුභුක්ඛා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.
පංචමී ථිනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො ච අට්ඨමො.
ලාභො සිලොකො සක්කාරො මිච්ඡා ලද්ධා ච යො යසො,
යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.
එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිපපහාරිනී,
න නං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛං"

පළමු කොට කුලඝකාමයෝ ගිහියන් වසනුකාමයෙහි මූසයන් කෙරෙත්. ඔවුන් එසේ මූසයන් කොට මැඩලා පැවිදිවූවනට වෙනෙහි ඉතා දුර සෙනසුන්හි හෝ අන්‍ය වූ අධිකුශලධර්මයන්හි හෝ උකටලී බව උපදවත්. "**පබ්බජිතෙන ඛො ආවුසො අභි-රති දුක්කරා**" යි කීයේ ඒ ය. ඉන් පසු ඔවුහු අනුන් අයත් දිවි පෙවෙන් ඇති බැවින් සා පිපාසායෙන් පෙළෙත්. එයින් පෙළෙන්නට වත් කල්හි තෘෂ්ණාව නන් දැය සෙවීමෙහි ලා

1, 1, 6. 'තං වෙ පසහති මාරො'
2, 3, 6. යොඛෙථ මාරං පුඤ්ඤුපධෙන } පරිකථා බලනු.

ඔවුන් සිත විඩාවට පත් කරයි. විඩාවට පත් වූ කල්හි සිත කය දෙක්හි මැලිකම නැගී එයි. විශෙෂගුණයක් නො ලබා වෙනෙහි දුර සෙනසුන්හි වසන කල්හි බියසුලු බව හට ගණියි. හැම අතකින් තැති ගෙණ කලක් විවෙකරස නො විඳ වසන ඔහුට මේ නියම මග දැ යි බුදුදහම්හි සැක උපදී. කෙලෙස කින් හෝ එය දුරු කොට වසන කල්හි ස්වල්පමාත්‍ර වූ ගුණ විශෙෂයක් ලැබීම කරණ කොට ඔවුන්ගේ සිතෙහි මානය මකුබව තදබව යන මේ අසත් ගුණයෝ පහළ වෙත්. එ ද යටපත් කොට වසන කල්හි එයට වැඩිතරම් වූ විශෙෂාධිගමයක් නිසා ලාභකීර්තිසතකාරයෝ උපදනාහ. ඒ ලාභාදියෙන් මුසපත් වූවෝ ධර්මප්‍රතිරූපක වූ ධර්මයට විරුද්ධ වූ කරුණු ගෙණ පාමින් මිථ්‍යායශස් ලබා එහි ගැලී ජාත්‍යාදියෙන් තමන් උසස් කොටත් පරා පහත් කොටත් දක්වත්.

මේ දසවැදැරුම් මරසෙන් මහණ බමුණන් මෙසේ නසන්-නේය. පෙළෙන්නේ ය. කාය ජීවිතයන්හි ආශාරහිත වූ ධෛර්‍ය්‍ය වත් පුරුෂයෝ ම මරසෙන් දිනීමෙහි මරසෙන් පැරදවීමෙහි සමර්ථ වෙත්. ඔවුහු ම මගපල ලබා සසරින් එතෙර වෙත්

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා-දියට පැමිණියාහු ය.

ත්‍රිංශත්භික්ෂුවස්තුව නිමි.

තරුණියක බොරුකියා නිරයට ගියසැටි.

13—9

බුදුරජාණන් වහන්සේ බුදුබව ලබා වැඩිකල් නො යාදී ම උන්වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙමේ ගුණයෙන් හා ගණනින් ඉමහත් ව ගියේ ය. නිවන් අවබොධ කළ දෙවිමිනිසුන්ගේ ගණන නො දත හැකි විය. බුද්ධගුණය අස්සක් මුල්ලක් නො හැර ලොව පැතිරිණ. එහෙයින් ලාභසත්කාරයෝ හැම දවසෙහි හැම පැයෙහි හැම මොහොතෙහි උන්වහන්සේ වෙත ගලා ආහ. එයින් ඉර උදෑමෙහි දී කණමැදිරියන් සේ තීර්ථකයෝ නැසුනු ලාභසත්කාර ඇත්තෝ වූහ. පාරක් තොටක් මංහන්දියක් කඩපිළක් නො හැර ඔවුහු සැමතැන ඇවිද "කිම, ශ්‍රමණ ගෞතම පමණක් ම ද බුදු? ඇයි, අපි බුදු නො වමෝ? අපිත් බුදුහු වෙමු, කිම, ඔහුට දුන්දෙය පමණක පින්? මහත්පල? නැත, අපට දුන් දෙය ද පින්, අපට දුන් දෙය ද මහත්පල, අපටත් දෙවු, උන්සේ අපිත් නිවන් දැක්වීමෙහි පොහොසතුම්හ අපටත් උන්ට සේ සත්කාර කරවු" යි කියා පෑහ. එහෙත් ඔවුනට ලැබුනු ලාභසත්කාරයෙක් නො ද වී ය. වඩාලාභී ඔවුහු ලාභසත්කාරයෙන් පිරිහුනෝ ය. එකල තැන තැන විසිර සිටි තීර්ථකයෝ එක්රැස් වූහ. සාකච්ඡා කළහ. "ශ්‍රමණ ගෞතමගේ වරදක් මහාජනයා අතරට දී ඔහු ලාභසත්කාරයෙන් පිරිහෙලිය යුතු ය" යි ඔවුහු තීරණය කළහ.

එදවස සැවැත් නුවර ප්‍රසිද්ධ ගෘහණියක් වූය. ඕ රූ සපුවෙන් හැඩහුරුකමින් දෙවඟනන් පැරද වූ. දුටු දුටු දනන්ගේ මනහුවන් පැහර ගත්තු. අහර දහර පා මිනිසුන් තම වශයට ගැණිමෙහි ඉමහත් දස්කම් ඇත්තී ය. නමින් ඕ **චිඤ්චිමාණවිකා** ය. පිරිවැජ්ජන් සරණ ගිය පිරිවැජි තරුණියක. තීර්ථකයන්ගේ සභාවෙහි සිටි එක් ක්‍රූර මන්ත්‍රියෙක් ඇය නම් කොට "චිඤ්චි-මාණවිකාව යොදා, ශ්‍රමණ ගෞතමට අපවාද උපදවා ඔහු ලාභසත්කාරයෙන් පිරිහෙලිය යුතු ය" යි කියා සිවියේ ය. හැම කෙනෙක් "ඒ මානැවැ" යි පිළිගත්හ.

මින් පසු දවසෙක ඕතොමෝ පිරිවැජිඅරමට ගියා තීර්ථකයන් වැඳ සිටියා ය. එහෙත් තීර්ථකයෝ ඇය හා නො බිණූහ. සතුටින් නො ද පිළිගත්හ. එකෙකුත් පියමනාපබවක් නො ද දැක්වී ය. එකල ඕතොමෝ, "ඇයි, හිමියෙනි! මා හා කතා නො කරහු? කිම, මා අත වරද? මෙන්න, වඳිමි හිමියෙනි!

මා අත, මා නො දන්නා වරද කොතෙකුත් ඇතිවිය හැකි ය, කුමක් නිසා මා හා කතා නො කරහු ? කියනු මැනැවි, මෙන්න, වඳිමි'' යි තෙවරක් වැඳ සිටියා ය. ''කෙල්ල! තී කොහි සිටියෙහි? ශ්‍රමණ ගෞතම ගැණ නො දනිහි? ඔහු අප පිරිහෙලනු නො දකිහි? ඇස් නැත්තී වෙහි? අප ගැණ මිනිසුන් කළ කිරවයි ඔහු, තිට ඒ ගැණ කිසිත් දැනුමක් නැත්තාසේ ය පෙණෙන්නේ, තී කුම් අසහි? කුම් කෙරෙහි, තී?'' යි තීර්ත්‍රිකයෝ ගිඟුම් දුන්හ. විඤ්ඤිමාණවිකා ''කමන්න, හිමියෙනි! මෙන්න වැන්දා, මට ඒ ගැණ කුමක් කියහු? මම ඔබ කියන හැම එකක් කරමි, එහිලා මම පසු නො බලමි, කමන්න, හිමියෙනි! මෙන්න වැන්දා, කියනු මැනැවැ''යි කී කල්හි ''බුහුන! අප ගැණ බලාපොරොත්තු වෙහි නම්, ශ්‍රමණ ගෞතමට වරදක් පමුණුවා එය රටෙහි සැම තැන පතළ කොට ඔහුට ගැහැට කරන්න, ඔහු ලබන ලාභසත්කාර නො ලැබෙන තැනට කටයුතු සලසන්න, බහු ලබන පුද පඬුරු වළකාලන්න, මග බැස නො යන තැනට වැඩ යොදන් නැ'' යි කීහ. විඤ්ඤිමාණවිකා තොමෝ ''හොඳ' යි හිමියෙනි! ඕක මහ කාරියෙක් ද, මම ඒ හැම එකක් බලාගන්නම්, ශ්‍රමණ ගෞතමට පාඩමක් උගත්වන්නම්'' යි කියා තීර්ත්‍රිකයන් වැඳ නික්ම ගියා ය. ගැණුමායමෙහි කෙළවරට ම ගොස් සිටි මෝ තොමෝ එතැන් සිට නුවරවැස්සන් රැ බණ අසා දෙව්රමින් නික්මෙන වේලේ ඉඳුගොව්වකු සේ රතු පැහැති රෙදි කඩක් හිස පටන් පොරොවා සුවඳ මල් ගෙණ දෙව්රම දෙසට යයි. යමෙක් ''මේ වේලේ කොහි යෙහි දැ'' යි ඇසී නම්, ''මා යන තැන් තට කුමටැ'' යි බැණ වැදී ගොස් දෙව්රම සමීපයෙහි වූ තීර්ත්‍රිකයන්ගේ පන්සලක නිදන්නී ය. නුවරවැසි උපාසකවරු ඉතා අලුයම යම්තම් පාන්වත් ම නින්දෙන් නැගිට මූණ කට සෝදා මල් පහන් සුවඳ දුම් ගෙණ ගෙවලින් නික්ම බුදුරජුන් පුදනට දෙව්රම බලා යෙත්. ඒ වේලෙහි මෝතොමෝ දෙව් රම ඇතුළත නිදා ගත් සැටි පෙන්වමින් යුහු සුලු ව නුවරට වදියි. ඒ වේලෙහි ''ඊයේ රැ නිදි ගත්තෙහි කොහි දැ'' යි ඇසී නම්, ''මා නිදි ගැණුම් තට කුමට ය? ඇයි එසේ අසහි? මා කොතැන ලැග්ගත් තට ඇති කාරිය කිම? එහි තට ඇති අමාරුව කිමැ'' යි පරුස බසින් බැණ වදියි. මෙසේ එක් මස් පසළොස් දවසක් ගෙවී ගියදා සිට ''තී මේ වේලෙහි කොහි සිට එහි දැ'' යි ඇසී නම්, ''මම ඊයේ රැ ශ්‍රමණ ගෞතමයන් හා ගඳකිළියෙහි නිදා හිඳ එමි'' යි කියන්නට වූ ය. මේ ඇසූ නූගත් සාමාන්‍ය මහාජන තෙමේ මේ කතාවෙහි සැක ඉපද වී ය.

මෙසේ කියමින් සිවු මසක් ගෙවූ මේ ගෑණිය, නැවැත බඩ ඉදිරි යට නෙරා සිටුනා සේ, රෙදි කැබලි බඩ තබා බැඳ ගැබ් ගත්ති යක සේ පෙත්වමින් බඩ වසා රතු පැහැති රෙදි කඩක් පොරවා ගෙණ, "ශ්‍රමණ ගෞතමයන් නිසා ගැබිනී වූවා" යි පළමු කොට මෝඩ ගෑණු පිරිමින් ලවා ගැන් වූ ය. නැවැත අටමසක් නව මසක් පමණ ගිය තැන බඩ වඩාත් ඉදිරියට නෙරා සිටුනා සේ, දරකෝටු ගෙණ කුඩාවට කපා මිටියක් කොට රෙදිකඩෙ කින් ඕතා එය බඩ බැඳ අනෙක් රෙදිකඩක් පොරොවා අතුල් පතුල් ගෙරි ඇටින් කළා උදුම්මා වෙහෙසට පත්වූවා සේ තතන තතනා සෙමින් සෙමින් අතන මෙතන හැසිරෙන්නී දවසෙක බුදුරජුන් බණඅස්නෙහි වැඩහිඳ බණ වදාරණ කල්හි එහි ගොස් බුදුරජුන් ඉදිරියෙහි සිටගත්තා ය. සිට, "මහාශ්‍රමණය! මේ බලන්න මාබඩ, ඔබ මට කළ හරිය, බණ දෙසන්නට සමත් සේ ම මේ වැඩටත් ඔබ සමත්වෙති, යනු මට කළ මේ කාරි යෙන් ම මහාජනයා තේරුම් ගෙණ ඇත. මෙබඳු වැඩවල දොස් මහාජනයාට කියතත් ඔබ මේ වැඩවලින් වෙන්වී නැත, ගෑණු අතරමං කිරීම ඔබට වරද නැත, ඔබට හොඳ ය, ඔබ නිසා මම ගැබිනී වීමි, මේ දරු ගැබ ඔබගේ ය, මේ දරු ගැබට මාස ගණන පිරී තිබේ, අද හෙට ම ඔබගේ දරු එළි දකිනු ඇත, එහෙත් තවම එයට සුදුසු තැනකුත් පිළියෙල කොට නැත, තෙලට මිරිසට මොකුත් නැත, තෙමේ ඒවා සපයා ගැණී මෙහි අපොහොසත් නම්, ඔය ඉන්නා ඔබගේ මහාදායක වූ කොසොල් රජුට, අනේපිඬු සිටුහට, විශාඛාවට තමන් අතින් වූ මේ කාරණය කියා යවා වැදුම් ගෙට වුවමනා තෙල් මිරිස් ඉඟුරු සුදුලූණු ආදිය ගෙන්වා ගැණීම නරක ද, නො කළ හැකි ද, ඔය බණ කියන කටින් ඒ ටිකත් කීමේ වරදක් තිබේ ද, මේ කෙල්-ලට කරණ දෙයක් වහාම කරන්න, වදන්නී කොතැන දැ යි කියන්න, දන්නෝ මෙ පමණක් ද, අපේ පැරැත්තක් නැතිව ඒ කළ සේ, අපේ පැරැත්තක් නැතිව මේ වැදුම්ගෙයි වැඩ ටිකත් කරන්න, ගැබ් ගත්විට කරණ සැටි නො දනිත් දැ" යි අසුවි පිඩක් ගෙණ සඳමඩලට ගසන්නා සේ මහපිරිස් මැද කියමින් බැණ වදින්නට වූ ය.

මාගේ ස්වාමිදරු වූ සම්බුදුරජාතන් වහන්සේ බණදෙසුම් නවතා සිහනදදෙන සිංහරාජයකු සේ "පරිව්‍රාජිකාව! තා කියන කතාවේ සැබෑ බොරු තීත් මමත් දනිමු, අන්හු නො දනිත්" යි වදාළ සේක. "ඇත්ත, මහණ! කීයේ සැබෑ ය, මේ කාරණය ඔබත් මාත් දන්නා බව මේ කවුරුත් දනිත්, එය කිය යුතු

නො වේ ය'' යි මෑ කියත් ම සක්දෙව් රජුගේ සලස්න උණු වී ගියේ ය. සක්දෙව්රජ ''කුමක් නිසා මා සලස්න උණු වී දැ'' යි බලනුයේ චිඤ්චිමාණවිකා බොරුවෙන් බුදුරජුන්ට බැණ වදිනා බව දැන ''මේ කාරණය මහාජනයා ඉදිරියෙහි ම පිරිසිදු කළ යුතු ය'' යි අන් දෙව් පුතුන් සිවු දෙනකුන් හා එහි පැමිණියේ ය. දෙව් පුත් සිවුදෙන මී වෙස් ගෙණ ඇය බඩ බැඳ තුබූ කෝටු කැබලි මිටිය කපා දැමූහ. කෝටු කැබලි මිටිය ඇයගේ උඩ පතුල මත වැටුනේ ය. අග් පතුල් කැඩී ගියේ ය. පොරොවා තුබූ රෙදිකඩ සුළඟින් ගසා ගියේ ය. ඒ දුටු මිනිස්සු ''කාලකන්නි කෙල්ල! තී නිරපරාධ වූ කැලල් රහිත වූ මහාපුරුෂ වූ බුදුරජානන් වහන්සේට කුමක් නිසා මෙසේ බණිහි දැ'' යි හිස කෙළ ගසා අතින් පයින් ගලින් කැටින් දඬුවෙන් මුගුරෙන් තළා පෙළා දෙව්රමින් පිටතට ඇද දැමූහ. ඈ බුදුරජුන් නො පෙණෙන-මානයේ ගිය කල්හි පොළොව දෙකඩට පැළී අවීචිමහානරකයෙන් නැගී ආ ගිනිදැලින් දැයාද විසින් ලත් කම්බිලියක් පොරෙවා ගත්තියක සේ වෙළී දැවටී අවීචිමහානරකයෙහි ඉපිද ගත්තු. මේ නිසා තීර්ත්තකයෝ ද ලබා සිටි සත්කාරමාත්‍රයෙනුදු පතුලට ම ගිලිහී ගියහ. බුදුරජානන් වහන්සේ පිළිබඳ සත්කාරයෝ මහත් වූහ.

පසු දා ධර්මශාලාවෙහි රැස් වූ භික්ෂූන් අතර ''චිඤ්චිමාණවිකා මෙතරම් මහත් ගුණ ඇති අග්‍රදක්ෂිණාර්හ වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේට බැණ වැද මේසා මහත් විපතට පත් වූවා''යි කතාවක් උපන. ඒ වේලෙහි එහි වැඩි බුදුරජානන් වහන්සේ භික්ෂූන් විචාරා ''මහණෙනි! චිඤ්චිමාණවිකා මට බැණ වැද විපතට පත්වූවා අද පමණක් නො වූවා පෙරත් මට බොරු කියා බැණීමෙන් විපතට පත් වූවා''යි වදාරා

බූ විසුරු පරාදෙස් – (සියැසින්) නො දැක (අන්බස්)
(ගෙණ) මෙරමා කෙරෙහි – කුදුමාවරද හැමතින්
තෙමේ (අන්බස් හැර) – පසක් නො ම කොට (නිසිලෙස)
(දඩ කිසිවකුහටත්) – නො පණවා යනු (දහමය.)''

යන මේ ලෙසින් මහාපදුමජාතකය ද සවිස්තර ව වදාළ සේක.

''එකල්හි මෝ චිඤ්චිමාණවිකා මහාපදුම කුමාර වූ බොධි-සත්ත්වයන්ගේ මව මළ පසු එම රජුගේ අගබිසෝ බවට පැමිණ මහසතුන් අනාචාරයට පොළඹවා ගන්නට නොයෙක් ගෑණු මායම් කොටත් නො හැකි වූවා තමන් ලෙඩ වූ සැටියක් පෙන්වා 'ඔබගේ පුතු මහාපදුම මා නො සතුටුව සිටියදී ම කෑකොස්සන්

ගසත්දී ම මා ඇද ගෙණගොස් මා දුෂණය කෙළේය'යි රජුට කියා සිටියා ය. රජ තෙමේ කිපියේ ය. කෝපවේගය උසුලා ගත නුහුනු රජ, මහසතුන් සොරුන් හෙලනා ගලින් පහතට හෙලවා ලීය. ඒ ගල්කන්දෙහි අරක් ගෙණ සිටි දෙවියෙක් බිම හෙන්නට නොතබා මහසතුන් වඩා ගෙණ නාරජකුගේ පෙණ ගොඩයෙහි හින්ද වී ය. නාරජු ද මහසතුන් නා විමනට ගෙණ ගොස් එහි කොටසෙක අධිපති කොට (රජකමෙහි) තැබී ය. මහාසත්ව තෙමේ එහි අවුරුද්දක් පමණ වැස ඉන් නික්ම හිමවනට ගොස් පැවිදි ව ධ්‍යානාභිඥවන් උපදවා ගත්තේ ය. ඒ කාලයෙහි වනයෙහි දඩයම් කරණ එක් මිනිසෙක් මේ තවුසා දැක රජුට දන්වී ය. රජ තෙමේ තවුස් වෙත ගොස් ආ ගිය තොරතුරු කතා බස් කොට සතුටු ව බෝසතුන් රජයෙන් පවරා සිටියේ ය. තවුස් තෙමේ එය නොද පිළිගෙණ "දශරාජධර්මයන් නොඉක්මවා අගතියට නොබැඳී දහමින් රජය කරව"යි අවවාද කෙළේ ය. එවේලෙහි රජ හුන් තැනින් නැගිට කඳුලු පෙර පෙරා හඬමින් නුවරට පිවිසෙනුයේ අතරමගදී ඇමැතියන් අතින් "මම කුමක් නිසා මේ හැටි යහපත් ගති ගුණ ඇති මනා පැවතුමෙන් යුත් කෙනකුගෙන් වෙන් වීම් ද"යි ඇසි ය. "මහරජ! අගමෙහෙයිය නිසා"යි ඔවුහු පිළිතුරු දුන්හ. එයින් කොපවේගයෙන් වේගවත් වූ රජතෙමේ ඇකකුල් දෙකින් ගන්වා හොරුන් හෙලනා ගලින් පහතට හෙලවා නුවරට වැද දහමින් රජය කෙළේ ය" යි බුදුරජානන් වහන්සේ මේ අතීත පුවත මෙසේ වදාරා "එදවස මහාපද්ම කුමාර වූයේ මහාසත්ව තෙමේ ය, චිඤ්චිමාණවිකා එදවස ඒ රජුගේ දෙවන අගබිසෝ ය"යි පහදා දී "මහණෙනි! සත්‍යවචනය හැර දමා බොරු වෙහි පිහිටා පරලොව ගැණ නොතකන ගිහි පැවිද්දන්ට නොකළැකි පවකමෙක් නැතැ"යි මේ ධර්මදේශනාව කළ සේක.

එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනෝ,
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියන්ති"

එක ම ධර්මයක් ඉක්මවාලූ බොරු කියන සුළු වූ හළ පරලෝ ඇති සත්ත්වයා විසින් නොකොට හැකි වූ පාපයෙක් නැත්තේ ය.

එකං ධම්මං අතීතස්ස = එක් ධර්මයක් ඉක්මවා සිටියා වූ.

මෙහි **"එකං ධම්මං"** යනු ආයේ වාක් සත්‍යය සඳහා ය. සත්‍යවචනය වාක් සත්‍ය නම්. **"සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය"** යනාදී තන්හි සේ ය.

"අතීතස්සාති යා සා අට්ඨ අනරියවොහාරෙ වජ්ජෙත්වා අට්ඨසු අරියවොහාරෙසු පතිට්ඨාය සච්චං හණෙන අලිකතති අරියෙහි ඨපිතා මරියාදා, තං අතිකකමිත්වා ඨිතස්ස" අට වැදැරුම් අනාර්‍ය්‍ය ව්‍යවහාරය දුරු කොට අට වැදැරුම් ආර්‍ය්‍ය ව්‍යවහාරයෙහි පිහිටා බොරු නො කියන්නේ ය. ඇත්ත කියන්නේ ය යි ආර්‍ය්‍යයන් විසින් තැබූ සීමාව ඉක්මවා යන අනාර්‍ය්‍ය ව්‍යවහාරයට බැස බොරු කියන්නා වූ. **"ජනතු නො"** යන්නට විශෙෂණ ව සිටියේ ය. එහි අනාර්‍ය්‍ය ව්‍යවහාරය නම්, **"අදිට්ඨං දිට්ඨං මෙ, අසුතං සුතං මෙ, අමුතං මුතං මෙ, අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙ, දිට්ඨං අදිට්ඨං මෙ, සුතං අසුතං මෙ, මුතං අමුතං මෙ, විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙ"** යි ආයේ ය. ඇසින් නො දුටු කණින් නො ඇසූ නැහැයෙන් දිවෙන් සිරුරෙන් නො ගත් නො දත් සිතින් නො ගත් නො දත් අරමුණු මා විසින් දක්නා ලද ය, අසන ලද ය, ගන්නා ලද ය, දන්නා ලද ය යි ද, ඇසින් දුටු කණින් ඇසූ නැහැයෙන් දිවෙන් සිරුරෙන් ගත් සිතින් දත් අරමුණු මා විසින් නො දක්නා ලද ය, නො අසන ලද ය, නො ගන්නා ලද ය, නො දන්නා ලද ය, යි දැන දැන බොරු කීම ය අනාර්‍ය්‍ය ව්‍යවහාරය නම්. දක්නා ලද අරමුණ දක්නා ලදැයි යන ඈ ලෙසින් පැවසීම ආර්‍ය්‍ය ව්‍යවහාර නම්. ඒ පිණිස යෙදෙන වෙතනාව ප්‍රධාන විසින් අනාර්‍ය්‍ය ව්‍යවහාරය වේ.

මුසාවාදිස්ස ජනතුනො = බොරු කියන සුලු සත්ත්වයා විසින්

යමකුගේ වචනයන්හි එක ද වචනයකුත් සත්‍යය නො වූයේ නම්, ඔහු **මුසාවාදී** නම්. අසත්‍ය ය, සත්‍ය ය සේ කීම පෙරටු කොට සිටියහුගේ අර්ථනාශක වාක්ප්‍රයොගය හෝ කාය ප්‍රයොගය **මුසා** නම්. ඔහු විසින් වළහා කියන අදහසින් මෙරමා රවටන කාය වාක්ප්‍රයොගයෙන් උපදවන ලද වෙතනාව **මුසාවාද** නම්. **මුසා** යනු අභූත වූ අතථ්‍ය වූ වස්තුව ය. එය භූත වශයෙන් තථ්‍ය වශයෙන් දැන්වීම හැඟවීම වාද නම්. ලක්ෂණ විසින් අතථ්‍ය වස්තුව, තථ්‍ය විසින් අන්හට දක්වනු කැමැත්තහුගේ එබඳු වූ ම විඥප්තියෙන් උපදවන ලද වෙතනාවයි. මෙරමා වැඩ නසන්නා වූ සිස් වූ බොරු බස් බණන්නේ ය මුසාවාදී.

සත්ත්වතෙමේ ජායනාර්ථයෙන් ජනතු නම්. **"ජනතුනො ති සත්තස්ස, සත්තො හි ජායනට්ඨෙන ජනතුති වුච්චති"** යනු අටුවා ය.

විතිණ්ණපරලොකස්ස = හළ පරලොව ඇති පරලොව ගැණ බලාපොරොත්තු නැති.

සත්‍යය දුර ගසා බොරු කියන එහෙයින් ම හළ පරලොව ඇති තැනැත්තේ දිව්‍ය මනුෂ්‍ය සම්පත්තීන් හා නිර්වාණ සම්පත්ති-ය ද යන කිසිත් සැපතක් නො ලබන්නේ ය. නො දකින්නේ ය. **"මුසාවාදෙ භික්ඛවෙ, ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති"** යනාදි දෙශනා ද බැලිය යුතු ය.

නත්ථි පාපං අකාරියං = නො කොටැකි පවෙක් නැත්තේ ය.

බොරු කියන්නහුට, නො කොටැකි පව් ඇතැයි කීමට ආගම ධර්මයෙන් මද අවසරයෙකුත් නැත්තේ ය. ඇතිතාක් හැම පවෙක්ම ඔහුට කළ හැකි ය. ඔහු කරන්නේ ය. වෙතියජාතක, තක්කාරුජාතක බැලිය යුතු ය.

විඤ්ඤාමාණවිකා වසතුව නිමි.

අසදිස දානය

13 — 10

කිලෝහුරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ පන්සියයක් දෙනා වහන්සේ කැටුව දනවු සැරිසරා පෙරළා දෙව්රමට වැඩි සේක. එදවස කොසොල් රජ තෙමේ විහාරයට ගොස් දානය පිණිස බුදුරජුන්ට ආරාධනා කෙළේ ය. පසුදා, ඔහු දන් පිළියෙල කොට "මා පිළියෙල කළ දානය බලවු"යි නුවර වැස්සන් කැඳවී ය. ඔවුහු රජමැදුරට ගොස් දානවස්තූන් බලා පුදුමයට පැමිණ තුමූත් පසුදා දානයට බුදුරජුන් පවරා දන් පිළියෙල කොට "මහරජානන් වහන්සේ අප පිළියෙල කළ දානය බලන සෙක්වා" යි රජුට දන්වා යැවූහ. රජ තෙමේ එහි ගොස් දන් බලා "මුන්ගේ දානය මාගේ දානයට වඩා හැම ලෙසකින් සරුසාර ය" යි සිතා ඊට පසුදත් තෙමේ දන් පිළියෙල කොට "එවු! මාගේ දන් බලවු" යි එවරත් නුවරුන්ට දන්වා යැවී ය. නුවර වැස්සෝ එවරත් එහි ගොස් දන් බලා ඊට පසුදා එයට වැඩි තරම් ලෙසින් දන් පිළියෙල කළහ. මෙසේ රජු හා නුවර වැස්සෝ දවසින් දවස වඩ වඩා දන් පිළියෙල කළෝ උනුන් පැරදවීමෙහි අසමර්ථ වූහ. රජ තෙමේ නුවරුන්ටත් නුවරවැස්සෝ රජුටත් නො ද පැරදුනාහ.

භවනවර නුවරවැස්සෝ සිය ගුණයෙන් දහස් ගුණයෙන් දන් වඩා මේ දානයෙහි "මේ දෙය නැතැ" යි කියන්නට නො හැකි-වන සේ හැම දෙයක් ම ගෙන්වා තබා දන් පිළියෙල කළහ. රජ තෙමේ එදන් බලා පුදුමයටත් සංවේගයටත් පැමිණ "අයියෝ මේ ලෙසින් දන් පිළියෙල කිරීමට මට පිළිවන් කමෙක් නැ නො වේ ද, මාගේ ජීවිතයෙන් කම් කිමැ" යි ලතැවෙමින් එයට උපාය සිතමින් ඇඳ වැතිර මුණින් තලා බැස හොත්තේ ය. ඒ වේලෙහි මල්ලිකා එහි පැමිණ "කිම, මහරජ! නිදහු? ඔය නින්දෙක්?, මොන කරුමයෙක්? හැබෑ වැඩෙක්, නැගිරින්න, මුණත් ඇතිලී ගොස් කියන්න කාරණය" යි කියා සිටියා ය. "සොඳුර! නො දනිහි?" යි ඇසුවිට "මම කෙසේ දනිම්? නො දනිමි" යි කිවු ය. එවිට රජ තෙමේ දානය ගැණ තොරතුරු ඇයට කී ය. ඕතොමෝ "දෙවයන් වහන්ස! ඕකත් වැඩෙක්? ගිත හිතා ලතැවෙන්නට යමෙක් එහි තිබේ ද? ඒ ගැණ සිත කණස්සලු කර ගතයුතු නො වේ, ඔබ දැක තිබේ ද හිමියෙනි! මෙයට කලින් රජතුමෙක් මොන රටක වත් යටත් රටවැසියන් විසින් පරදවන ලද? ආ! දැකීම තිබේවා, අහලා තිබේ ද හිමියනි!

එහෙ ම එකක්? කණගාටු නොවනු මැනැවි, මම දන් පිළියෙල කරන්නම්, ඔබ වහන්සේ පන්සියයක් දෙනා වහන්සේට වැඩ හිඳීමට සැහෙන පමණට සල්කලණ ලැල්ලෙන් මණ්ඩපයක් ඇතුල් වලියෙහි කරවනු මැනැවි, වටිනා සුදු කුඩ පන්සියයක් සාදවා ඇතුන් පන්සියයක් ගෙන්වා ඒ එක එක කුඩය උන්ගේ සොඬට දී පන්සිය දෙනා වහන්සේගේ හිස මතුයෙහි කොට දරා සිටින ලේසට වැඩ පිළියෙල කරවනු මැනැවි, රතින් ඔරු අටක් හෝ දහයක් කරවා ඒ ඔරු මණ්ඩපය මැද තැබ්බවිය යුතු ය, භික්ෂූන් වහන්සේලා දෙනමක් දෙනමක් අතර හිඳ එකෙකි රාජකන්‍යාවට කොකුම් යොන් පුප් තුවරලා තුරුක් තෙල් කස්තුරි කළු අගිල් ආදි සුගන්ධ ද්‍රව්‍යයන් ඇඹරීමට නියම කළ යුතු ය, දෙනමට දෙනමට පවන් සැලීම පණිස තල්වැට දී රාජකන්‍යාවන් ඒ ඒ තැන සිටවිය යුතු ය. ඇඹරූ සුගන්ධද්‍රව්‍යයන් මණ්ඩපය මැද වූ රන්ඔරුවල බහන්නට තවත් රාජකන්‍යාවන් කොටසකට නියම කළයුතු ය, රන් ඔරුවල වූ සුවඳෙහි නිලුපුල්මල් මිටි බැඳ බහා සුවඳ දිය කලඹ කලඹා එහි ඉසීමට තරුණියන් කොටසක් නියම කළ යුතු ය, නුවර වැස්සන්ට රාජකන්‍යාවෝ නැත, සුදු කුඩ හා ඇත්තු නැත, මේ මා කියූ ලෙසට දන්හල පිළියෙල කළවිට එයින් ම ඔවුහු පැර දී යති, කන්ස්සලු නොවී මේ මා කියූ කටයුතු වහා කරවනු මැනවැ" යි කීවා ය. රජතෙමේ "යහපතැ" යි මල්ලිකාව කී ලෙසට ඒ හැම එකක් කරවී ය. එහෙත් එක් නමකට කුඩය දරා සිටීමට ඇතෙක් නොවී ය. එබව රජ තෙමේ මල්ලිකාවට දැන්වී ය. මල්ලිකාව "මෙහෙමා කියහු, දෙවයන් වහන්ස! ඔබ වහන්සේගේ ඇත්හල්හි ඇත්තු පන්සියයෙක් නැත්තේ දැ" යි ඇසූ කල්හි "සොඳුර! දහස් ගණනක් ඇත්තු ඇත්තාහ, එහෙත් නැත්තේ මෙතැනට සුදුසු ඇතෙකි, ඇත්හල්හි සිටිනා ඇත්තු නපුරු ය, සැඟ ය, ඒ ඇත්තු භික්ෂූන් වහන්සේලා දුටු කල්හි වෙරම්බවාතය ගෙ ඇඹරෙති, වඬාත් වණ්ඩ වෙති, එබඳු, ඇතුන් මෙහි ගෙන්වීම නොසුදුසු ය" යි රජ තෙමේ කියා සිටියේ ය. "ආ, වේවා මහරජ! එක් ඇත් පැටවකු මෙහි ගෙන්වන සේක්වා. උන් සිටුවන තැන මම කියන්නෙම්" යි කී කල්හි රජ තෙමේ ඇත්පැටවකු ගෙන්වා මල්ලිකාවට භාර කෙළේ ය.

රජ තෙමේ මල්ලිකාවගේ නියමය ලෙසට දන්හලෙහි සියලු කටයුතු නිම කරවා දැනයට වඩින්නට බුදුරජාණන් වහන්සේට කල් දැන්වී ය. උන්වහන්සේ පන්සියයක් පමණ වූ මහණ පිරිසත්

ගෙණ එහි වැඩ පිළිවෙළින් අසුන් අරා වැඩ හුන්හ. අනතුරුව ඇත්පෙළ ද උන්වහන්සේලා පසුපස උන්වහන්සේලාගේ හිස මතුයෙහි කුඩ දරමින් සිට ගත්හ. මල්ලිකා තොමෝ සැඩ ඇතුගේ සොඬයට කුඩයක් දී අඞ්ගුලිමාල තෙරුන් පසුපස සිටුවාලූ ය. ඌ වාලධි ය දෙකලවා අතර රුවා දෙකන් යට හෙලා දෙ ඇස් වසා කුඩය සොඬින් ගෙණ නිසලව සිටියේ ය. ඇතුගේ ඒ විලාශය දුටු මහාජන තෙමේ විස්මයට පැමිණ "අයියෝ! මහාපුදුමයෙක්, මේ සැඩ ඇතුගේ සැටි"යි ඇතුදෙස ම ඇස් පිය නො ගසා නිසල ව සිටියේ ය. රජ තෙමේ බුදුරජුන් හා ඒ පන්සිය දෙනා වහන්සේත් මැනැවින් වළඳවා අවසන්හි වැඳ සිට "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! මේ දන්හලෙහි ඇති කැප නො කැප හැම දෙයක් බුදුරජානන් වහන්සේට පුදමි" යි කියා සිටියේ ය.

මෙසේ මේ මහාදානයෙහි එක දවස ම පිදූ දානොපකරණ-යන්හි වටිනාකම තුදුස් කෙළක් විය. බුදුරජුන් උදෙසා තැන වූ **සේසත හිඳිනා පලඟ පාඅඩිය පාපුටුව** යන මේ සතරෙහි වටිනාකම මුදල් ගණනින් මෙ පමණැයි ගණන් නැත්තේ ය. නො ගිණිය හැකි ය. වටිනාකම නො දැක්විය හැකි ය. මෙයට පසු කිසිත් දවසෙක බුදුරජානන් වහන්සේට මෙබඳු දනක් දිය හැකි එක ද පොහොසතෙක් නො වී ය. එහෙයින් මෙ දන **අස දිසදානැ** යි පතළේ ය. හැම බුදුරජුනට ම මෙබඳු මහත් දනෙක් එක් වරක් ම වන්නේ ය. හැම බුදුරජුන් කල්හි ම මේ දන පිළි යෙල කරන්නී ද ගෑණියක් ම ය.

කොසොල් රජුට **කාල-ජුණහ** යි ඇමැතියෝ දෙදෙනෙක් වූහ. උන් දෙන්නා අතුරෙන් කාල තෙමේ ඒ වේලෙහි "අයියෝ! මහාගොන් කමෙක්, රජගෙට වන්නේ මහාවිනාශයෙක්, නො පිරිමැසිය හැකි විපතෙක්, මේ එක දවසේ ම තුදුස් කෙළක් ධනය විනාශ වී යයි, මේ මොන කරුමයෙක්? මේ ගොල්ලෝ මේවා කා බී ගොස් සමහරු ඇද වැටී නිදත්, සමහරු ගම් නියම් ගම් දනවු වැද ඇවිදිත්, සමහරු වල් වැදී විඩාවන් සන්සිදු වත්, සමහරු මතුර මතුරා රුක්මුල්හි හිඳිත්, අනේ! රජගෙදර, ඉවරයි රජගෙදර, කම්මුතු යි රජගෙදර"යි සිත-මින් හුන්නේ ය. ජුණහ තෙමේ "රජුගේ දානය මහපුදුම ය, රජකමක් නැත්තකුට මෙබඳු දනක් දෙන්නට නො හැකි ය, මෙබඳු පුදුම දනක් දියහැක්කේ රජෙක් ම ය, අන් අයට මෙහි පින් පමුණු වන්නෙක් ද නැත, මම ම මෙහි පින් අනු-

මෝදන් වෙමි, රජුට පින් සිදු වේවා, මල්ලිකා දෙවියටත් පින් සිදු වේවා, මේ දෙපල නිසා මෙබඳු මහදනක් දැක සතුටු වන්නට, කළ පින් ඇත්තන්ගේ හැටි දැන ගන්නට ලැබිණ, රජ, බොහෝ කල් ජීවත් වේවා, බිසොවත් බොහෝ කල් ජීවත් වේවා, අනේ! යහපනි, අනේ, යහපනි'' යි පින් අනුමෝදන් වී ය.

නිලෝගුරු බුදුරජාණන් වහන්සේ වළඳා අවසන් කළ කල්හි රජ තෙමේ අනුමෙවෙනි බණ අසන්නට බුදුරජුන්ගේ පාත්‍රධාතු ව ගත්තේ ය. එකල්හි උන්වහන්සේ ''මේ රජු විසින් මහගඟක් ගලන්නා සේ දන් දුන් සැටි ඉතා බලගතු ය, මහදනෝ මේ මහාදානයෙහි සිත් පහදා ගන්නට පොහොසත් වූවෝ ද නො වූවෝ ද'' යි බලා වදාරණ සේක්, ඒ ඇමැත්තන් දෙදෙනාගේ සිත් හසර දැක ''මම රජුගේ මේ දානයට සරිලන සේ බණ කියම් නම් කාලගේ හිස සත්කඩට පුපුරන්නේ ය, ජුණහ සෝවන් වන්නේ ය'' යි දැන කාල කෙරෙහි මහත් දයාවෙන් මෙබඳු මහ දනක් දී සිටි රජුට සිවුපදගයක් ම වදාරා හුනස්නෙන් නැගිට විහාරයට වැඩි සේක. භික්ෂූහු අඟුල්මල් තෙරුන් වෙත ගොස් ''සප්තවිර තුමනි! කොහොම ද කුඩය දරා සිටි ඒ නපුරු ඇතු දැක බියපත් වූවාහු දැ''? යි ඇසූහ. උන්වහන්සේ ''මම බියපත් නො වීමි, උඹ මට බියට කරුණෙක් නො වේ'' යි කිවිට ඔවුහු බුදුරජුන් වෙත ගොස් ''ස්වාමීනි! අඟුල්මල් තෙරණුවෝ තමන් රහත් යි හඟවති'' යි දන් වූහ. ''මහණෙනි! ඒ තැනට බියෙක් නැත, තැති ගැන්මෙක් නැත, ඒ තැන කීයේ සැබෑ ය, ක්ෂීණාශ්‍රව වූ ඍෂභාජානෙයයන් අතුරෙහි ප්‍රධාන ඍෂභාජානෙය වූ මාගේ පුත්‍රනිෂ්ඨූහු කිසිවකටත් බිය නො වෙති'' යි වදාරා බ්‍රාහ්මණ වර්ගයෙහි එන:—

''උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රූමි බ්‍රාහ්මණං''

යන මේ ගය වදාළ සේක.

රජ තෙමේ ද ''මෙබඳු මහත් පිරිසකට නත්ලෙසින් සරසා දන් දුන් මට සෑහෙන පමණින් අනුමෝදනාවක් නො කොට එක ම ගයක් වදාරා නැගිට වැඩි සේක, කිම, මා පිළිගෙල කළ දානය බුදුරජුන්ට නො සුදුසු ද, කැප දය නො පුදා අකැප දය පුදන ලදද, බුදුරජාණන් වහන්සේ මා හා අමනාප වූ සේක් ද, කාට වුවත් දුන් දනට ගැළපෙන ලෙසට දහම් දෙසිය යුතු

නො වේ දැ'' යි සිතා විහාරයට ගොස් බුදුරජුන් වැඳ ''ස්වාමීනි! කිම, මා දියයුතු දැය නො දුන් දැ?''යි ඇසී ය. ''මහරජ! කිම එසේ අසහු? ඔබට නො සෑහෙන බණක් මා දෙසූ ද? මා දෙසූයේ එතැනට ගැළපෙන බණෙක්, ඔබගේ දන යම්තම් දනෙක් නො වේ, දුන්නේ සුදුසු දනෙක් ම ය, අනෙකකුට නො දිය හැකි ය එබඳු දනෙක්, මෙය අසදිසදානැයි කියයුතු ය, මෙබඳු මහත් දනෙක් එක් බුදුකෙනකුට ලැබෙන්නේ එක් වරක් ම ය, මෙ බඳු දනක් දිය හැක්කේ ද එක් වරක් ම ය, කිහිපවරක් මෙබඳු දන් නො දිය හැකි ය, නො ද ලැබිය හැකි ය'' යි බුදුරජුන් වදාළ කල්හි ''එහෙ නම්, ස්වාමීනි! දනට සෑහෙන පරිදි මාගේ පූජාවට පමණ වන සේ මට බණක් නො වදාළ සේක් කිමැ'' යි ඇසී ය.

ඉක්බිති බුදුරජානන් වහන්සේ ''මහරජ! ඒ වේලෙහි එහි වූ පිරිස අපිරිසිදු නිසා ඒ පිරිසෙහි ඔළමොට්ටලයන් කිහිප-දෙනකුන් සිටි බැවින් ඔවුන්ගේ සිත්හසර අපිරිසිදු නිසා එක් ගයක් ම කීම්'' යි වදාළ සේක. ''ස්වාමීනි! දන් පුදන වේලෙහි එහි සිටි පිරිසෙහි ඇති වරද කිමැ'' යි විචාළ කල්හි කාල-ජුණහ දෙදෙනාගේ ඒ වේලෙහි පැවැති සිත් හැසුරුම් වදාරා කාල කෙරෙහි දයාවෙන් දිගට අනුමෙවෙනි බණ නො වදාළබව බුදු රජානන් වහන්සේ වදාළ සේක. රජ තෙමේ පෙරළා ගොස් කාල ගෙන්වා ''තා මෙබඳු නපුරු අදහසෙක් උපදවන ලද්දේ සැබෑ දැ'' යි ඇසී ය. ''සැබෑ ය, දෙවයන් වහන්සැ!'' යි කීවිට ''තාගෙන් අබැටක් පමණකුත් නො ගෙණ මා මාගේ අඹුදරු-වනුත් එක්ව මා සතු දැය දෙන කල්හි තට ඇති අපහසුව කුමක් ද, වෙදනාව කුමක් ද, තට දියයුතු දැය සුදුසු වේලෙහි නො දුන්නෙම් ද, මාගේ දීම් ගැණ තට ඇති කතා කිම, මාගේ දීම් මට සැප පිණිස හෝ වේවා, දුක් පිණිස හෝ වේවා, එයින් තට ඇති කාරිය කිම, මේ රටෙහි නො සිට රටිනුත් බැහැර යව'' යි කාල රටින් පිටුවහල් කොට ජුණහ ගෙන්වා ''මා දන් දෙද්දී තෝ අනේ, යහපතැ' යි සිතුයෙහි සැබෑ දැ?'' යි ඇසී ය. ''දෙවයන් වහන්ස! එසේ ය'' යි කීවිට ''ආ! තා සිතු සැටි කදි මයි, ඒ සිතුවිලි මටත් මාමාටත් හිත පිණිස වනු ඇත, මම මාමාට වඩාලාත් පහන් වීමි, මාමා මාගේ පිරිවර දෙනාත් එක්ව මාදුන් ලෙසට සත් දවසක් ම දන් දෙව''යි සත් දවසකට රජය භාර දී ගොස් බුදුරජුන් වැඳ ''ස්වාමීනි! බලන සේක්වා මේ මෝඩයාගේ සැටි, මූ මා දුන් දනට අමනාපව සිටීය''යි සැලකළේ ය. ''ඔවූ! මහරජ ! තමන් දෙනු තබා අන්හු දෙන

දනට ද මෝඩයෝ සතුටු නො වෙත්, ඔවුහු එයට ඊර්ෂ්‍යා කරත්, අනුන් ලබන සැපත නො ඉවසත්, අනුන්ගේ දියුණුවට සුසුම් හෙලත්, අනුන් කනු දැක අනුන් අඳිනු දැක අනුන් හිඳිනු දැක අනුන් යනු දැක අනුන් උගත්කම් දැක අනුන් තනතුරු දැක ගැටෙත්, හැපෙත්, අනුන් රූසිරි බලා අනුන් ඇඟමස් බලා අනුන් උසමහත බලා අනුන් තෙද බලා අනුන් පිරිවර බලා අනුන් මිල මුදල් බලා අනුන් වතුපිටි බලා රවත් ගොරවත්, මොවුහු මහරජ! මෙලොව ම දීනයෝ වෙත්, පරගැත්තෝ වෙත්, කෙළවර යන එන තැන් නැත්තෝ වෙත්, පුලන්නෝ වෙත්, හිඟන්නෝ වෙත්, මොවුහු මහරජ! පරලොව නිරයෙහි උපදිත්, නිරය ගිනිපෙණෙලි වෙත්, යගුල් ගිලිත්, ලොහොදිය බොත්, කැපෙත්, සිඳෙත්, දෙපලු වෙත්, මැරෙත්, උපදිත්, මහරජ! නුවණැත්තෝ තමනුත් දෙමින් අනුන්ගේ දීමෙහි සතුටු වෙත්, පිණායත්, එහි පින් අනුමෝදන් වෙත්, මොවුහු මහරජ! මෙලොව ම සතුටු වෙත්, අනුනට ප්‍රිය වෙත්, සුදනන් හා එක් වෙත්, මොවුහු මහරජ! පරලොව දෙව්-ලොව උපදිත්, දෙවියන් හා සතුටු වෙත්, සැපතින් පිණා යෙත්'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං,
ධීරොව දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථා,ති

තද මසුරෝ ඒකාන්තයෙන් දෙව්ලොවට නො යත්. මෝඩයෝ දන්දීමට නො පසසත්. නුවණැත්තේ දන්පින් අනුමෝදන් වන්නේ ඒ හේතුවෙන් ම හෙතෙමේ පරලොව සැප ඇත්-තේ වේ.

න වෙ කදරියා දෙවලොකං වජන්ති = තද මසුරෝ ඒකාන්ත යෙන් දෙව්ලොවට නො යත්.

''කිසි සැපතෙක් අන්හට නො වේවා, හැම සැපත් මට ම වේවා'' යන කැත අදහසින් සැපත් සඟවා තබා ධනය රැස් කරණ පරා ඉණඉහ කඩා බිඳ ධනය උපදවන කරුණාමාත්‍රයක් සිත නො ලැගුනු නිත්දිත ධනපති තෙමේ, එලොව මෙලොව නො දත් මෙරමා විපතෙහි තුටුවන පොහොසතා **කදරිය** නම් වේ. **''කුච්ඡිතො අරියො අත්ථපති කදරියො''** යනු බැලිය යුතු ය. නො දෙන බැවින් නොකන බැවින් සඟවන බැවින් මෙරමා

විපතෙහි තුටුවන බැවින් එසින් ධන උපයන බැවින් නිරය තිරිසන්යොනිය ප්‍රෙතයොනිය යන පහත් තැනට දුක් ඇති තැනට යන්නේ ද කදරිය යි කියනු ලැබේ. **"අදයකතනා කුච්ඡිතං ඨානං අරතීති වා කදරියො"** යනු දන්නේ ය.

"කදරියො වුච්චති අනරියො" අනාර්‍ය තෙමේ කදරිය යි හඳුන්වන ලද්දේ තදමසුරුකම නිසාය. මෙහි කදරිය යි කියේ තද මසුරුකම ය. **"කදරියන්ති එදඛමච්ඡරියසඞ්ඛාතං නාමං"** යනු අට්ඨා ය. මේ මසුරුකමින් යුත් තැනැත්තේ තම ගෙට පිඬු සිඟා ආ මහණබමුණකු දුටු වේ ද, හුන් තැනින් නොං නැඟිටියි. ගල්කණු ලීකණු සේ නොං සැලී තද ව සිටියි. යම්තම්සැලකිල්ලකුත් නොං ද දක්වයි.

මසුරුතැනැත්තේ යමක් කමක් අනුනට දෙන්නකු දුටු කල්හි ඒ දෙන්නහු එසින් වළකා ලන්නේ ය. ඒ මෙසේ දෙසන ලද ය.

"කදරියො පාපසඞ්කප්පො — මිච්ඡාදිට්ඨි අනාදරො,
දදමානං නිවාරෙති — යාචමානානභොජනං" යි.

නොං තද වූ මසුරුකම, මොළොක් වූ මසුරුකම, නොං දැඩි වූ මසුරුකම **වෙච්ඡ** නමින් හඳුන් වනු ලැබේ. මෙයින් මැඩුනේ මෙයින් පෙළුනේ තම ගෙට පැමිණි මහණක්හට වත් දෙඅත් එකතු කොට වැඳුමක් පමණකුත් නොං කරයි එහෙත් පත්සල් ගියේ යටත් පහත් ව වැඳ හිඳ "ස්වාමීන්වහන්සේ අපේ ගෙවලට නොං වඩින සේක, අපට කැම්බීම්වලින් අපහසුවෙක් නැත, අප හිඳිනා පළාත් කැම්බීම් බහුල පළාත් ය, එහෙයින් කැම්බීම්වලින් ස්වාමීන් වහන්සේලාට උපස්ථානකිරීම අපහසු නොං වේ" යන ආලෙසින් මිගිරි බසින් කතා කරයි. ඒ ඇසූ මහණහු "මේ උපාසක සැදැහැත්තේ ය, දන්දීමට කැමැත්තේ ය, දීමෙහි පොහොසත්" යි ගෙණ පසුදා එගම පිඬු සිඟා යත්. එසේ පිඬු සිඟා යන මහණුන් දුටු ඒ උපාසක නොං පෙණී යන්නේ ය. සැඟවී ගන්නේ ය. ගෙය හැර අත් කැනක හෝ යන්නේ ය. නැත, ගෙට වැද දොර වසා ගන්නේ ය. වැටකඩුලු බඳින්නේ ය. මහණහු ගෙයි පිළට නැඟ "මහත්මයා ගෙයි ඉන්නේ ද" යි ඇසුවිට ගෙයි වැද හිඳ ම නැත කියැන්නැයි කියන්නේ ය. යම් ලෙසකින් මහණහුට හමු වූයේ ද **එකල** යම්තම්කට වැඳ "ස්වාමිනි! අද කලබල දවසක්, කටයුතු රාශියක් තිබේ, කතා කරන්නටත් ඉඩ පහසු නැත, හාමුදුරුවන්ට දන් වීකක් පිළි-

ගත්වන්න, මම යමි'' යි වහා ගෙන් පිටත්ව යයි. **නො දෙන්**-නකු දෙන්නකු සේ භගවන්නේ මේ නො දෑඹි වූ **මොළොක්**-**කම** නිසා ය.

තදමසුරුකම් ඇත්තහුගේ සිත, යමක් කමක් **ඉල්ලා** සිටි කල්හි ඉල්ලන්නකු දුටු කල්හි නපුරුවිලසින් හැකිළෙන්නේ ය. සිතෙහි වන ඒ නපුරු හැකිළීම **කටුකඤ්චුකතා** යි කියනු ලැබේ. කටුකඤ්චුකතා නම් මසුරුකමින් මැඩුනු තැනැත්තේ **කට ලඟට** පිරුණු බත්සැළියෙන් බත් ගන්නේ බතෙහි යටට හැන්ද **නොබහා** යම්තමකින් සැඳිතුඩ බතෙහි හපා ගන්නේ ය. අන් **යමක්** ගන්නේ ද හැන්ද පුරවා නම් නො ගන්නේ ය. තමා **කන්නේ** කටුක දෙයක් ම කන්නේ ය. ඇඟිලිතුඩින් ගෙණ **කන්නේ** ය. දිවතුඩින් ගෙණ කන්නේ ය. කිසි දවසෙක කට බඩ පුරා නම් නො කන්නේ ය. රසක් මසක් කැවිලියක් පැණියක් නො කන්-නේ ය. කදරිය කියේ මේ තෙමේ ය. මේ මොවුන්ගේ සභාවය යම්තමකින් වදුළ ගාථාවක්:-

"යෙධ මච්ඡරිනෝ ලොකෙ — කදරියා පරිභාසකා,
අඤ්ඤසං දදමානානං — අන්තරායකරා නරා"

යනු. මසුරුකම් ඇති තදමසුරු වූ මහණබමුණන්ට නිගා කරන්-නා වූ මිනිස්සු, දන් දෙන්නා වූ අනුන්ට අන්තරාය කරන්නෝ වෙත්'' යනු එහි සිංහල ය. ලෝකයෙහි මෙබන්දෝ දුර්ලභ නො වෙත්. අද ද වත්පොහොසත්කම් ඇති සමහර මිනිස්සු වත්-පොහොසත්කමේ තරමට තබා එදා වේල සපයා ගෙණ කන බොන මිනිසුන් තරමටත් නො කන්නෝ ය. කාඬි හොඳි හා සුන් සාලේ බත් බුදින්. මොවුහු ඉණට වතක් නො අඳින්. මොවුන් අනුනට බතක් බුලතක් පැණක් වතක් දෙනු නම් කවදත් නැත්තේ ය. මේ මොවුන් මරණින් මතු ලබන පරලොව:-

"නිරයං තිරච්ඡානයොනිං — යමලොකා උපපජ්ජරෙ,
සවෙ එනති මනුස්සතතං — දළිද්දෙ ජායරෙ කුලෙ.
වොළං පිණ්ඩා රතිඛ්ඩසා — යත්ථ කිවෙජන ලබහති,
පරතෝ ආසිංසරෙ බාලා — තම්පි තෙසං න ලබ්භති,
දිට්ඨෙව ධම්මෙ සච්පාකෝ — සම්පරායෙ ච දුග්ගති"

යනු. නිරයෙහි තිරිසන්යොනියෙහි යමලෙව්හි උපදින්. මිනිස්-ලොවට එන්නේ දිළිඳු කුලයෙක උපදින්. එහි කෑම් බීම් ඇදුම්

පැළඳුම් පස්කම්ඇලුම් සෙල්ලම් ආදී කිසිවක් නොලබත්. අනුන් ගෙන් කිසිවක් බලාපොරොත්තු වූවෝ ද එ ද නොලබත්" යනු එහි සිංහල ය.

බාලා හවෙ නපසංසනති දුනං = බාලයෝ (මෝඩයෝ) ඒකාන්තයෙන් දන් දීම නොපසසත්[1]

දන් දීමට මෝඩයෝ සතුටු නොවෙත්. දන් දීමෙහි සතුටු නොවන්නෝ මෝඩයෝ ය.

දුන යනු සිද්ධක්‍රියාවකි. කම්ම – කත්තෘ – කරණ – සම්ප්‍රදාන යන අරුත් සතරෙහි සිද්ධ කටහැකි ය. එහෙත් දෙන්නකු කෙරෙහි හා දීම පිළිගත්නකු කෙරෙහි යෙදුනු දුන ශබ්දයෙක් අපට දක්නට නොලැබුනේ ය. දෙන්නහු කෙරෙහි හා දීම පිළිගත්නහු කෙරෙහි ප්‍රසිද්ධව නැඟී සිටියෝ දායක දූතු පටිග්ගාහකාදි ශබ්දයෝ ය. ශබ්දලක්ඛණ විසින් දෙන්නහු කෙරෙහි හා පිළිගන්නහු කෙරෙහි දුනශබ්දයක් නිපදවිය හැකි සේ පෙණුන ද ශබ්දසිද්ධීය ප්‍රයොගානුකූල වියයුතු බැවින් ව්‍යවහාරය අනුව යායුතු බැවින් එසේ නිපදවීම යෙදෙන්නේ නොවේ. දෙශනාඡීකථාවන්හි දැක්වෙන්නක් ම ප්‍රවචනානුකූලව එසේ නිපදවිය යුතු ය.

"**දීයතීති = දුනං, දුතබ්බං = දුනං**" දෙනු ලබන වසතුව දියයුතු වසතුව දුන නම් යන අරුත්. "**දුනං දෙති අන්නං පානං වත්ථං යානං**" යනාදි තන්හි යෙදී සිටියේ කම්මත්ථියෙහි සිද්ධ දුනශබ්දය යි. එහෙත් ආහාරපානාදී දුනවසතු දුනසඞ්ඛ්‍යාවට යනුයේ ප්‍රධාන විසින් නොවේ. අප්‍රධාන විසින් ය.

මෙහිලා ගැණෙන දුනවසතු සූත්‍රපිටකයෙහි දසපරිදි කොටත් අභිධම්පිටකයෙහි සපරිදි කොටත් විනයපිටකයෙහි සිවුපරිදි කොටත් දක්වන ලද්දේ ය. එහි අන්න – පාන – වත්ථ – යාන – මාලා. – ගන්ධ – විලෙපන – සෙය්‍යා – ආවසථ – පදීපෙය්‍ය යන මේ දසය **සූත්‍රපිටකයෙහි** ආයේ ය. එහි සඞ්ග්‍රහය මේ.

"අන්න පානං වත්ථං යානං — මාලාගන්ධවිලෙපනං
සෙය්‍යාවසථදීපෙය්‍යං — දුනවත්ථු ඉමෙ දස"

යනු. අන්න නම්:– බත්, මාළු, කැවුම්, අග්ගලා, තලප, දියමස්, ගොඩමස්, අල, බතල ආ කඩා විකා කන හැම දේ ය.

T. S. I. "දීඝෝ බාලානංසංසාරෝ" යනු බලනු.

පාන නම්:- අඹ, දඹ, කෙහෙල්, ඇටකෙහෙල්, මීවද, මිදිපල, ඕලු, උගුරැස්ස, කොසඹ, ඩෙබර, මහඩෙබරපල ආ මැඩ පෙරා ගත් පැන් හා හිතෙල්, තලතෙල්, කිරි, කැඳ, රස ආ මත්පැන් ගණයට අසු නොවන හැම දේ ය.

වත්ථ නම්:- කොම්මිපිළී, කපුපිළී, දුහුල්පිළී, තිහිරිපිළී, පත්තුණ්ණ-පිළී, රෝමයෙන් උපදිනාපිළී, හණපිළී ආ දේ ය.

යාන නම්:- කරත්ත, අත්කරත්ත, ඇලා, පල්ලැක්කි, වහන් ආ ය.

මාලා නම්:- ගණ්ඨිම, ගොප්ඵිම, වෙඨිම, වෙසිම, විධූනික මක්ඣාරිකා ආදී වූ ගෙතූ නොගෙතූ මල් ය.

ගන්ධ නම්:- ඇඹරූ නොඇඹරූ සුවඳ ගන්වන උපකරණ ය.

විලෙපන නම්:- රත්සඳුන්, සුදුහඳුන්, කස්තුරි, කර්පූර, සඹුන්, බාම් ආ ය.

සෙය්‍යා නම්:- ඇඳ, පුටු, සෝපා, කව්විවි ආදියෙහි හා පාවාරකොජවාදියෙහි ඇතිරිය යුතු කොච්ච, මෙච්ච, ගුදිරි, බිසි, කුසිම් ආ ය. අසුන් ද මෙහි ම ඇතුළත් ය.

ආවසථ නම්:- මන්දිරප්‍රාසාදාදී වූ කුඩා මහත්ගේ ය. අතුපැල, පිදුරුපැල, තණපැල හා ගේයසි කිසිවකින් පිරිසිද ගත් තැන් ද මෙහි ම ඇතුළත් ය.

පදීපෙය්‍ය නම්:- පහන් දැල්වීමට හිත වූ පහන්, පහන්වැටි, පහන්තෙල්, ඉටිපන්දම්, විලක්කු ආ ය.

අභිධම්පිටකයෙහි කියූ දැනවසතු නම්:- රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, ධම්මා යන මේ ය.

එහි නීලපීතාදිවණ්ණවන්ත වස්තූන්හි වූ සිත් ඇලවිය යුතු වූ නීලපීතාදිවණ්ණායතනය රූප නම්.

මිහිඟුබෙර, පණාබෙර, ගැටබෙර, යක්බෙර, දවුල්, පටහ, උඩැක්කි, රබන්, තම්මැට්ටම්, වස්කුලල්, තුළුනාලම්, නාග-සින්නම් ආදියෙන් නගිනා, සිත් ඇලවිය යුතු වූ ශබ්දායතනය ශබ්ද නම්.

මල්, කොළ, පතුරු, හර, මුල්, ආදී වූ ඒ ඒ වසතූන් පිළිබඳ සිත් ඇලවිය යුතු වූ ගන්ධායතනය ගන්ධ නම්.

මල්, මුල්, කොළ, ගෙඩි, පතුරු බත්මාලු ආදියෙහි වූ සිත් ඇලවිය යුතු වූ රසායතනය රස නම්.

ඇඳ, පුටු, කොට්ට, මෙට්ට, ගුදිරි, බිසි ආදියෙහි වූ සිත් ඇලවිය යුතු වූ ස්පර්ශායතනය ස්ප්‍රෂ්ටව්‍ය නම්.

ඒ ඒ වස්තුන් පිළිබඳ ඔජාශක්තිය, සත්ත්වශරීරය තර කරණ ඕජා නම් වූ ධර්මායතනය ධර්ම නම්.

නීල පීත ලොහිත ඔදාතාදී වූ වර්ණවත් පුෂ්පවස්ත්‍රාදී වූ වස්තුවක් ලැබ ඒ වස්තුව ඇති පරිදි නීලපීතාදීවර්ණ වශයෙන් සලකා තුණුරුවනට පිදීම, මිහිඟුබෙර ආදියෙහි වූ සිත් ඇලවිය යුතු ශබ්දය, ශබ්ද වශයෙන් සලකා තුණුරුවනට පිදීම, අගිල් තුරුවලා ආදී වූ සිත් ඇලවිය යුතු සුගන්ධද්‍රව්‍යයක් හෝ ඉන් පෙරා ගත් දියක් හෝ සුගන්ධ වශයෙන් සලකා තුණුරුවනට පිදීම, මූලරසාදී වූ ප්‍රණීත රසවිශෙෂයක්, රස වශයෙන් සලකා තුණුරුවනට පිදීම, ඇඳ පුටු ආදීන් කෙරෙහි වූ සිත් ඇද ගන්නා පහසක්, පහස වශයෙන් සලකා තුණුරුවනට පිදීම, ඕජස්කවස්තු, ඕජස්ක වශයෙන් සලකා තුණුරුවනට පිදීම යන සවැදැරුම් පිදීම පිළිවෙළින් රූපදාන සද්දදාන ගන්ධදාන රසදාන ඵොට්ඨබ්බදාන ධම්මදාන යි ගණු ලැබේ.

මෙහි ශබ්දදානය අල මුල් ආදියක් උදුරා දෙන්නා සේ නිලුපුල්මිටි අත තබා දෙන්නා සේ දෙනු බැරි ය. ශබ්දදානය කළ යුත්තේ සවස්තුක කොට ය. තව ද තෙරුවනටැයි සලකා තෙරුවන් ඉදිරියෙහි ම තූර්‍යවාදනය කිරීම, බෙර දවුල් නාගසින්නම් ආදිය තැබීම ධර්මකථික භික්ෂූන්ට මිහිරිහඬ ඇති කරණු පිණිස ගිතෙල් උක්සකුරු ඇ පිදීම, ධර්මශ්‍රවණයෙහි ලා කාලඝොෂාකිරීම, හඬ නගා පෙළපොත් කියවීම, මිහිරි හඬින් බණ කීම යන ඇ ද ශබ්දදානයෙහි ඇතුළත් ය.

ධර්මදානැ යි ගැණෙන ඔජාදානය ද සවස්තුක කොට කළ යුතු ය. ජීවිතදානැ යි සලකා ගිතෙල් තලතෙල් මීපැණි උක් හකුරු ඇ පිදීම, ලහබත් පැකිබත් සඟබත් ඇ පිදීම, පානදානැ යි සලකා අඹපැන් ඇ පිදීම, රොගීභික්ෂූන්හට බෙහෙත් සපයාදීම, වෙදුන් කැඳවීම, දැල් කුමින් මළපුඩු කුරුළු කුඩු ඇ නසාලීම, බන්ධනගත සත්ත්වයන් මුදාහැරීම, සතුන් නො මරත්වා යි අණ බෙර හැසිරවීම, සතුන්ගේ දිවිරැකුම යන මේ ඇ ධර්මදානයෙහි ඇතුළත් ය.

අභිධම්පිටකයෙහි කියූ මේ ෂඩ්විධ දූනවසතුහු සූත්‍ර – විනය පිටක දෙක්හි කියූ දූනවසතුන්හි ගැබ්ව පවත්නා බැවින් එක ම ආහාරදූනය කරන්නහුට ආහාරය රූපාදීන්ගේ වශයෙන් සලකා දෙන කල්හි මේ ෂඩ්විධ දූනය ම සිදු වන්නේ ය. විනය පිටකයෙහි දැක් වූ දූනවසතු, චීවර – පිණ්ඩපාත – සෙනාසන – ග්ලානප්‍රත්‍යය විසින් සිවුවැදෑරුම් ය. අරුත් පැහැදිලි ය. දීමට කරුණු බැවින් දූනවසතු නම් වේ.

මෙසේ සූත්‍ර-අභිධම්-විනයපිටක විසින් බෙදුනු දූනවසතු අතුරෙහි සූත්‍රපිටකයෙහි දැක් වූ දූනවසතුපරිත්‍යාගයට වඩා විනය පිටකයෙහි දැක් වූ දූනවසතුපරිත්‍යාගය මහත්ඵලැයි ද එයට වඩා අභිධම්පිටකයෙහි දැක් වූ දූනවසතුපරිත්‍යාගය මහත්ඵලැයි ද සමහර ආචාර්‍යයෝ කියත්. එහෙත් කිනම් දූනවසතුවක් වුවත් ක්ෂේත්‍රාදිත්‍රිවිධසම්පත්තිය ඇති කල්හි මහත්ඵල නො වීමෙහි හේතු නැත්තේ ය. වසතුපරිත්‍යාගය මහත්ඵල වනුයේ ත්‍රිවිධසම්පත්තිය ඇතිකල්හි ම ය.

විසිවැදෑරුම් කොට දැක් වූ මේ වසතූන්ගේ පරිත්‍යාගය ආමිස දූනැ යි කියනු ලැබේ. **"තණ්හාදීහි ආමසිතබ්බතෝ ආමිසනාති වුච්චති"** යනු ආගමකථා ය. තෘෂ්ණාමානදෘෂ්ටීන් කරණ කොට ආමර්‍ශනය කළයුතු බැවින් අතපත ගෑයුතු බැවින් ආමිසැයි කියනු ලැබේ යනු අරුත්. **"එවමෙතං සබ්බම්පි ආමිසදූනං නාම තණ්හාදීහි ආමසිතබ්බතෝ"** යි කී බැවින් මෙ කියූ දූනවසතූන්ගේ පරිත්‍යාගය ආමිසදූන නම් වේ.

නිෂ්පර්‍යායය – පර්‍යායය විසින් මෙය දෙපරිදිසි. චීවර – පිණ්ඩ-පාත – සෙනාසන – ගලානප්‍රත්‍යය යන සිවුපසය නිෂ්පර්‍යායා-මිෂයෙහි හෙන්නේ ය. **චීවරාදයෝ චත්තාරෝ පච්චයා නිප්පරි-යායාමිසමෙව න අඤ්ඤේන පරියායෙන වා කාරණේන වා ලෙසෙන වා ආමිසං"** යනු අර්‍ථකථා ය. සිවුපසය තෘෂ්ණාදීන් විසින් ආමර්‍ශනය කළයුතු බැවින් ම ආමිෂ වනු මුත් අන් ලෙසකින් ආමිෂ වූයේ නො වේ. එහෙයින් නිෂ්පර්‍යායාමිෂැයි කියනු ලැබේ.

පර්‍යායාමිෂය යි ගණිනුයේ භවසම්පත් සිද්ධ කොට දෙන-කුශලකර්‍මයි. මේ ඒ අර්‍ථවිවරණය යි **"දූබ්බකවෙච්ච වදවං පත්තෙනෙනා සම්පත්තිභවං දූච්ඡමානෝ දූනං දෙති - එප-සම්පත්තියෝ නිබ්බත්තෙන්ති එවං කරොනෙනා අනුපුබ්බෙන දෙවමනුස්සසම්පත්තියෝ පට්ලභති දූදං පරියායාමිසං නාම"**

යනු. භවසම්පත් කැමැති ව දන් දෙනුයේ ධ්‍යානසම්පත් උපද-වනුයේ පිළිවෙළින් දිව්‍යමනුෂ්‍යසම්පත් ලබන්නේ ය. ඒ ලැබීමට කරුණු වූ වට්ටගාමීකුසලය පර්‍යායාමිෂය යි දතයුතු ය.

මෙසේ දෙවැදෑරුම් වූ මේ ආමිෂය බුදුරජානන් වහන්සේ අයත් වේ. **"අනුජානාමි භික්ඛවෙ ගහපතිවීවරං"** යි අනුදත් බැවින් ම භික්ෂූන් වහන්සේ සිවුපසය ලබත්. එහෙයින් සිවුපසය බුදුරජානන් වහන්සේ අයත් ය. සම්පත්තිභවය පතා දන් දී සිල් රැක සමාපත්ති උපදවන්නෝ පිළිවෙළින් පර්‍යායාමිෂය වූ දිව්‍යමනුෂ්‍යසම්පත් ලබන්නෝ ය.

"දීය්‍යති එතායාති = දානං = යම් ශක්තියක් කරණ කොට දෙනු ලැබේ ද දීමට සාධන වූ ඒ ශක්තිය දාන නම් වේ. ඒ නම් දානවෙතනා ය. දී මෙහිලා ප්‍රධාන වූවා මෝ ය. ප්‍රධාන විසින් දානය වන්නී ද දානවෙතනා ය. අරුත් විසින් දානයත් මෝ ය. **"සා එව අත්ථතො දානං"** යනු කියේ එහෙයිනි.

"අනුපවජ්ජත්තභවමූලස්ස අනුග්ගහවසෙන වා පූජාවසෙන වා අත්තනො දෙය්‍යධම්මස්ස පරෙසං පරිච්චාගවෙතනා දානං" නො සුන් සසරගමන් ඇත්තහුගේ තමන් අයත් ආහාරපානාදිය අනුග්‍රහ විසින් හෝ පූජා විසින් හෝ අනුනට දීමෙහි පිදීමෙහි පැවැති සිතිවිල්ල දානය යි.

"යාය චෙතනාය අත්තාදිදෙය්‍යධම්මං සංහරිත්වා අනුකම්පාපූජාසු අඤ්ඤතරවසෙන පරෙසං දීය්‍යති තං දානං" යම් සිතිවිල්ලක බලයෙන් ආහාරපානාදී වූ දියයුතු දැයක් එක්තැන් කොට අනුකම්පාපූජාඅතුරෙහි එකෙකින් යුක්ත ව අනුනට දෙනු ලැබේ ද ඒ සිතිවිල්ල දානය යි.

"පරං උද්දිස්ස සුබුද්ධිපුබ්බිකා අත්තාදිදසවත්ථුකා දානපරිච්චාගචෙතනා දානං" දෙන ලද්ද විපාක ඇත්තේ ය, පූජා කරණලද්ද විපාක ඇත්තේ ය, යන ඈ ලෙසින් ආ සම්‍යක්දෘෂ්ටිය පෙරටු කොට ඇති ආහාරපානාදිය පරිත්‍යාග කිරීමේ චෙතනාව දානය යි.

"සානුසයසන්තානවතො පරෙසං පූජානුග්ගහකාමතාය අත්තනො විජ්ජමානවත්ථුපරිච්චජනවසප්පවත්තා චෙතනා දානං නාම" අනුසයසහිත සිත් ඇත්තහුගේ තමන් සතු දැය පිදීමෙහි කැමැත්තෙන් හෝ අනුග්‍රහ කිරීමෙහි කැමැත්තෙන් හෝ අන්හට දීම් පිදීම් විසින් පැවැති සිතිවිල්ල දානය යි.

"අන්නාදිදුනවත්ථූනං චාගෝ යෝ බුද්ධිපුබ්බකෝ,
යෙ තං දුනන්ති දීපෙන්ති බුද්ධා දුනඤ්ඤදුයිනෝ"

බුදුවරයෝ ආහාරපානාදිවස්තූන් පිළිබඳ බුද්ධිපූර්වකපරිත්‍යාගය දුනය යි වදුරත්.

මෙතෙක් මෙහිලා ඇද දැක් වූ දෙශනාර්‍ථකථාවන්ගෙන් දුන නම් දුනවෙතනා යි පැහැදිලි වේ.

දුනය නම් මෙපමණෙක් ම නොවේ. මෙහි වූ අලොභය ද දුන ය යි කියනු ලැබේ. තදඛතිකතත්‍තසම්ප්‍රයුක්ත බැවිනි. **"චෙතනාති ච පධානවසෙන වුත්තං තංඝතිකත්තා, තංසම්පයුත්තෙනා අලොභොපි දුනං නාම'** යනු අටුවා ය. **"සද්ධා නිදිසං කුසලං දුනං"** යනාදි තන්හි ආයේ මේ වෙතනාදුනය යි.

අර්‍ථ විසින් දුනැයි ගැණෙන මේ වෙතනා තොමෝ පූර්‍ව වෙතනා – මධ්‍යවෙතනා – අපරවෙතනා යි තෙ වැදුරුම් ය. මේ ත්‍රිවිධවෙතනා ම දුන නම්. එහෙත් එහිදු කම්පථයට නැඟි මධ්‍යවෙතනාව ම ප්‍රතිසන්ධි – ප්‍රවෘත්තිවිපාක දිම් වශයෙන් අර්‍ථසාධක වන්නී ය. ප්‍රධාන විසින් දුනය වන්නී මේ මධ්‍ය-වෙතනා ය මුඤ්චනවෙතනා යන අන් නම කිනුදු මෝ හඳුන්වනු ලබන්නී ය.

දන් දෙන්නට සිතා දූහැමින් සෙමින් දියයුතු දුය සැපයීම දියයුත්තන් සෙවීම සපයා ගත් දුය ප්‍රතිග්‍රාහකයන් අතට පිරිනැමීම යනාදී වූ ක්‍රියාවන් සිදු කිරීමෙහි දී සිදු කරන්නහුට එක එක ක්‍රියාව පිළිබඳව පහළවන ජවන් සිත් සතකින් යුත් චිත්තවීථින්ගේ ගණන නොකියැකි ය. මේ හැම් ක්‍රියාවක ම පමණ නොදත හැකි, පමණ නොකියැකි චිත්තවීථිහු පහළ වෙත්. ඒ හැම චිත්තවීථියක ජවන් සිත් සතෙක් සතෙක් වන්නේ ය. ඒ හැම ජවනයක ම වෙතනාවක් ද වේ.

සපයා ගත් දියයුතු දුය ප්‍රතිග්‍රාහකයන් අත තැබීමෙහි දී කායවිඥප්තිය ඉපදවීමට කරුණු වූ අර්‍ථසාධකජවනවීථියක් පහළ වන්නී ය. ඒ ජවනවීථියෙහි හෙවත් ජවන් සිත් සතෙහි යෙදුනු වෙතනාචෛතසිකය ප්‍රධාන වශයෙන් දුන්මයකුශල කර්‍මයි ගණිත්.

දීමෙන් පසු "මා විසින් දනක් දෙන ලදැ"යි සිහි කරන්නේ ද සිහි කරන්නහුට ඒ ඒ වේලාවන්හි උපදනා චිත්තවීථීන්ගේ පමණ නොකියැකි ය. ඒ උපදනා චිත්තවීථීන්හි ඇති ජවන් සිත් ද වෙතනා සහිත ම වේ.

දීමට පෙර දීමට පසු යන පූර්වාපර අවස්ථා දෙක්හි පූර්වවෙතනා අපරවෙතනා වශයෙන් ඉමක් කොණක් නැති ව උපදනා කාමාවචරකුසලවිත්තවීථිහු අර්ථසාධකජවනවීථියට දැලයෙහි සිට රුකුල් දෙන්නේ ය. පෙර අපර දෙපසින් රුකුල් ලත් ඒ අර්ථසාධකජවනවීථියගේ ප්‍රථමජවනවිත්තයෙහි වූ වෙතනාව ක්ෂෙත්‍රසම්පත්ත්‍යාදී වූ හැම සම්පත්තියකින් යුක්ත වූ නම් ඔද වැඩි වූ නම් **ධනඤ්ජය-මෙණ්ඩක** සිටු ආදීන්ට සේ මෙලොව දී ම සිටුසම්පත් ආදී වූ ප්‍රවෘත්තිවිපාක දෙන්නී ය. දිට්ඨධම්මවෙදනීයකම්ම යි කියන්නී ද මෝ ය. මේ කර්මය **කාකවළිය-මල්ලිකා** ආදීන්ට සේ සත් දවසක් ඇතුළත පරිපක්කවෙදනීය වශයෙන් හෝ ප්‍රථමවයසෙහි කරණ ලද්දේ ප්‍රථමවයසෙහි ද මද්ධ්‍යමවයසෙහි කරණ ලද්දේ මද්ධ්‍යමවයසෙහි ද පශ්චිමවයසෙහි කරණ ලද්දේ පශ්චිමවයසෙහි ද අපරිපක්කවෙදනීය වශයෙන් මෙලොවදී ම විපාක දෙන්නේ ය.

සුමනමාලාකාර, බිම්සර රජුට ගෙණ ගිය මල් අටනැළිය මගදී හමු වූ බුදුරජුන්ට පුදා, **එකසාටකබ්‍රාහ්මණ,** අඹුව හා තමන්ට ඇඳ පෙර ව කලඑලි බැසීමට තුබූ එක ම රෙදිකඩ බණ අසා බුදුරජුන්ට පුදා, **පුණ්ණික** බතට කුලීවැඩ කරමින් ලත් බත්බුලත් සැරියුත් මහතෙරුන්ට පුදා, **මල්ලිකා,** පැසෙහි ලාගත් කොමුපිඩු තුණ මග වඩිමින් සිටි බුදුරජුන්ට පුදා, **ගොපාලමාතා,** රන්මසු දහසකට මිල නියම කොට ඉල්ලූ තම කෙස් වැටිය එසේ නො විකොට පසුදාක හිස් පයක් අතින් ගෙණ ගෙදොරට පිඬු සිඟා පැමිණි මහාකාත්‍යායන තෙරුන් ප්‍රධාන කොට අට නමක් වූ සඟනට පිදිය යුතු දැයක් නො වූයෙන් ඒ වටිනා කෙස්වැටිය කපා විකුණා රන්මසු අටක් ගෙණ එයින් දන් සපයා පුදා, **සුප්පියා,** කලවේ මස් කපා පිස රෝගී මහණක්හට පුදා, **පුණ්ණ,** කුඩුකැවුමක් හිණ තබා දියට යන්නී එය අතර මගැ හමු වූ බුදුරජුන්ට පුදා දෘෂ්ටධර්මවෙදනීයකර්මයාගේ ඉෂ්ටවිපාකය මොවුහු මහත්සේ ලැබූහ. දෙවිමිනිසුන් අතර මොවුන්ගේ කීර්තිය උස්ව නැංගා ය. ලද සම්පත් ඉමහත් ය.

ඒ ජවනවීථියෙහි ම සත්වන ජවනවෙතනාව දෙවන අත් බවේ දී **අඞ්කුරා** දී වූ දෙවිපුතුන්ට සේ කාමසුගතිභූමියෙහි ප්‍රතිසන්ධිවිපාක හා ප්‍රවෘත්තිවිපාක දෙන්නී ය. උපපජ්ජවෙදනීයකම්ම යි කියන්නී ද මෝ ය.

මද්ධ්‍යයෙහි වූ අනෙක් ජවනවේතනා පස අපරාපරියවෙද-නීයකම්ම වසයෙන් ඉඩකඩ ලත් පරිද්දෙන් ප්‍රතිසන්ධි -ප්‍රවෘත්ති විපාක දෙන්නී ය.

ජවන්සිත්හි යෙදෙන මෙ කියූ වේතනාවන් හා එක්ව යෙදෙන සපශීාදී වූ අන් සිතිවිලි ද තද්ගතික තත්සම්ප්‍රයුක්ත බැවින් දැන-මයකුසලයෙහිලා ම ගණිත්.

මෙ කියූ වේතනාදැනය :-

1 සොමනස්සසහගතඤ්ඤාණසම්පයුත්තඅසඞ්ඛාරිකය.
2 ,, ,, සසඞ්ඛාරිකය.
3 සොමනස්සසහගතඤ්ඤාණවිප්පයුත්තඅසඞ්ඛාරිකය.
4 ,, ,, සසඞ්ඛාරිකය.
5 උපෙක්ඛාසහගතඤ්ඤාණසම්පයුත්තඅසඞ්ඛාරිකය.
6 ,, ,, සසඞ්ඛාරිකය.
7 උපෙක්ඛාසහගතඤ්ඤාණවිප්පයුත්තඅසඞ්ඛාරිකය.
8 ,, ,, සසඞ්ඛාරිකය යි

කාමාවචරකුසලචිත්තයන්ගේ වශයෙන් අටවැදැරුම් ය. ප්‍රතිරූප-දෙශවාසය සදාශ්‍රය ධර්මශ්‍රවණය පූර්වේකෘතපුණ්‍යත්වය යොනිසො මනස්කාරය යන මේ ඈ හෙතුන් නිසා ටික දෙනකුන්හට 'දන් දියයුතු ය' යන අදහස උපදී.

එහි යමෙක් සැදැහ බහුල බැවින් අනුසස් දැනීමෙන් පිළි-ගන්නවුන් හමුවීමෙන් තුටුපහටුව 'දෙනලද්ද විපාක ඇත්තේ ය, යන ඈ ලෙසින් පැවැති සම්‍යක්දෘෂ්ටිය පෙරදැරි කොට නො-ගිලන් බැවින් දන් පින් කිරීමෙහි පුරුද්දෙන් පසු නො බැස අනුන් විසින් නො මෙහෙයනලදු ව දන් දේ ද, එවේලෙහි ඔහුට පහළ වන්නේ මෙහි දැක් වූ පළමු කුසල් සිත ය. මහාදානයත් ඒ ය.

පළමුවැන්නෙහිලා කියූ පරිදි තුටුපහටු ව සම්‍යක්දෘෂ්ටිය පෙරටු කොට අමුක්තත්‍යාගී ව දෙම් දෝ නො දෙම් දෝ යි පසු බැස බැස හෝ මෙරමා විසින් මෙහෙයනලදු ව දන් දේ ද එකල්හි උප-දනේ දෙවන කුසල්සිත ය.

භික්ෂූන් වහන්සේ කෙරෙහි නෑයන් කරණ වත්පිළිවෙත් දැකීමෙන් හටගත් පළපුරුද්ද ඇති කුඩාදරුවෝ භික්ෂු නමක්

දුටු කල්හි සතුටු ව කිසි ද වගක් නොසලකා තමන් අත තුබූ දෑයක් දෙන්නෝ ය. එකල්හි ඔවුනට උපදනේ තෙවන කුසල් සිත ය.

යම් කලෙක ඒ කුඩාදරුවෝ මවුපියාදීන්ගේ නියමයෙන් ඇවිදිල්ලෙන් මෙහෙයුනෝ දෙත් ද එකල්හි සිවුවන කුසල් සිත උපදී.

සොම්නස් වීමට සැහෙන කරුණු නොලැබීමෙන් යම් යම් අවස්ථායෙක දන්දීම් ආදි පින්කම් කෙරෙත් ද ඒ ඒ අවස්ථායෙහි ඒ ඒ ක්‍රියාවනට සුදුසු පරිදි පස්වන සවන සත්වන අටවන සිත් සතර උපෙක්ෂාසහගත ව උපදනේ ය. චිත්තවගීයෙහි කියූ විස්තරය බැලිය යුතු ය.

මේ චේතනාඳුනය දානමයපුණ්‍යක්‍රියා - ශීලමයපුණ්‍යක්‍රියා යි වසතු විසින් දෙපරිදි ය. යම් කලෙක අහරපැන් ආදියයුතු දෑයක් ලැබ 'මා විසින් දත් දියයුතු ය' යි සලකා දේ ද එකල්හි එය දානමයපුණ්‍යක්‍රියා ය. දියයුත්තක් ලැබ 'දන්දීම මාගේ වංශය යි, දන්දීම අප පරපුරෙහි පැරණියන්ගේ සිරිතැයි, වුතයැයි, ආදි ලෙසින් සලකා දේ ද එකල්හි එය ශීලමයපුණ්‍යක්‍රියා ය.

කායකම්-වාක්කම්-මනඃකම් එසින් දානය තෙපරිදි ය. දාන වසතු සියනින් දීම පිදීම කායකම් ය. අන්හට කියා අන්හු ලවා දෙවීම පිදවීම වාක්කම් ය. විද්‍යමාන වූ දානවසතූන් ඇරැඹ දන් දෙමි යි සිතීම මනඃකම් ය.

චිත්තොත්පාද විසින් අටවැදෑරුම් වූ දානමයචෙතනාව ප්‍රතිසන්ධි දීම් වශයෙන් නවවැදෑරුම් ය. ප්‍රවෘත්තිවිපාක දීම් වශයෙන් සොළොස්වැදෑරුම් ය.

අටවැදෑරුම් කාමාවචර කුසල් සිත්හි එන චතුර්විධඥාන සම්ප්‍රයුක්ත කුශලය, උතුකෘෂ්ට-ලාමක විසින් දෙපරිදි ය. එහි උතුකෘෂ්ට පක්ෂයෙහි ගැණෙන කුසල් සිත් සතරෙහි යෙදුනු චේතනා සතර ත්‍රිහේතුකඋතුකෘෂ්ට කුශලචෙතනා නම් වේ. "**යං අත්තනෝ පවත්තිඛණෙ පුථුජ්ජනපච්ඡිමභවිකපුග්ගලෙහි පරිවාරිතං පච්ඡා වා ආසෙවනලාභෙන සමුදාචරණං හොති තං උක්කට්ඨං නාම**" යම් කුසල් සිතෙක් එයට පෙර පසු වූ කුසල් සිත්වලින් පිරිවරා ගත්නා ලද නම්, ආසෙවනය ලැබීමෙන් පුරුදු පුහුණු කරණලද නම් ඒ උතුකෘෂ්ට නම. චේතනාව පිළිබඳ මේ උතුකෘෂ්ටභාවය වනුයේ දන් පින් කමක් කිරීමට අදහස් කොට

දියයුතු දෑය සෙවීම සකස් කිරීම යන හැම ක්‍රියාවක ම පහළ වන්නා වූ සිත් හා දන් පින් කමින් පසු එය සිහි කරණ හැම අවස්ථායෙක ම පහළ වන්නා වූ සිත් හා ඥානසම්ප්‍රයුක්ත වූ කල්හි ම ය.

යම් දානචෙතනාවක් පෙරපසින් හා පසු පසින් කුශල කර්මයන්ගෙන් පිරිවරණු ලැබ දන් දෙන කාලයෙහි ද 'මේ දානය මෙබඳු අනුසස් ඇත්තේ ය' යන කම්මස්සකතාඤාණයෙන් යුක්ත වූවා නම්, ආදි-මධ්‍ය-අවසාන යන තුන් තන්හි ඤාණයෙන් ඔදවැනි වූවා නම් ඕ තොමෝ ත්‍රිහේතුකඋත්තමාශ්වකුශලකර්ම යි කියන ලද්දී ය. තවද යම් ඥානසම්ප්‍රයුක්ත කුශලයෙක් නීවරණයන්ගෙන් හෝ තමන් උසස් කොට දැක්වීමැයි කියන අත්තුක්කංසනයෙන් හෝ නො ද කිලිටි ව පැවැත්තේ නම්, කුසල් කිරීමෙහිලා තෘෂ්ණාමානාදීන්ට යටත් නො ව කරණ ලද නම් එ ද උත්තමාශ්ව ය. **"තිහෙතුකං උක්කට්ඨං කුසලං තිහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තියං සොළසවිපාකානි විපච්චන්ති"** ත්‍රිහේතුක වූත් උත්තමාශ්ව වූත් කුශලකර්මය චතුර්විධ වූ ත්‍රිහේතුක ප්‍රතිසන්ධීන් අතුරෙහි ත්‍රිහේතුක වූ එක් ම ප්‍රතිසන්ධියක් දී පසු ව සහේතුක අටෙක, අහේතුක අටෙකැයි ප්‍රවෘත්තිවිපාක සොළොසක් දෙන්නේ ය.

ත්‍රිහේතුකඋත්තමාශ්වකුශලචෙතනා තොමෝ සම්පාකාම සර්වඥයෙහි මහෙශාක්‍ය වූ මහානුභාව ඇති දෙවිමිනිසුන් කොට උපදවයි. දෙවිමිනිසුන් පිළිබඳ මහෙශාක්‍යභාවයට විශාරදභාවයට මහත් කමට කරුණු වන්නී මෙසේ සකස්වන ත්‍රිහේතුක උත්තමාශ්වකුශලචෙතනාවයි. මෙයින් පිළිසඳ ලැබූ කිසිම දෙවියෙක් මිනිසෙක් කිසි විටෙකත් කිසි තැනකදී කිසිවකුනුත් පසුබට නො වන්නේ ය. නො ද පැකිලෙන්නේ ය. නො ද හැපෙන්නේ ය. හැම තැන ඉදිරියට යන්නේ ය. සියල්ලන් සියල්ලකින් යටපත් කොට සිටින්නේ ය. මැඩගෙණ සිටින්නේ ය. හැම යස ඉසුරකින් ම අන්හු අබිබවා බබලන්නේ ය. අවශෙෂ ලෝකය තෙමේ මොහු ඉදිරියෙහි නැමී සිටින්නේ ය. විධෙය වන්නේ ය.

ත්‍රිහේතුකලාමකකුශලචෙතනා නම්, ඥානසම්ප්‍රයුක්ත වූ කුසල් සිත් සතරෙහි යෙදෙන චතුර්විධචෙතනා ය. **"යං පන අකුසලෙහි පරිවාරිතං පඤ්ඤා වා දුක්කටමෙතං මයාති විප්පටිසාරුප්පාදනෙන පරිහාවිතං ඔමකං නාම"** යම් දාන චෙතනාවක් පෙර පසු දෙපස මූලින් හා අඟින් අකුශල චෙතනාවන් විසින් පිරිවරණ

ලද ද, අධර්මයෙන් ලත් ධනයෙන් පිළියෙල කළ දානවස්තූන් දුශ්ශීලාදීන් කෙරෙහි පිරිනැමීම් ආදී වූ අකුශලක්‍රියාවන්ගෙන් ගහණ වූවා ද ලාමකවේ. තවද ත්‍රිහෙතුක කුශලකර්මයක් කොට පසු ව මම වැඩකට නැති වැඩක් කෙළෙමි'යි විප්‍රතිසාරට පැමිණියේ නම් එයිනුදු දානචේතනාව ලාමක වේ. නීවරණධර්මයන්ගෙන් හෝ අත්තුක්කංසනාදී වූ පාපකල්පනාවන්ගෙන් අපවිත්‍ර වූ කිලිටි වූ චේතනාව ද ලාමක ය.

"තිහෙතුකං ඔමකං දුවිහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තනියං තිහෙතුකරහිතානි විපාකානි විපච්චන්ති" ත්‍රිහෙතුක වූව ද යට කී හේතූන්ගෙන් ලාමකභාවයට ගිය කුශලචේතනාව චතුර්විධ දුර්හෙතුකප්‍රතිසන්ධීන් අතුරෙහි යම්කිසි දුර්හෙතුක ප්‍රතිසන්ධියක් දී පසු ව ප්‍රවෘත්තිකාලයෙහි ඥානසම්ප්‍රයුක්ත වූ විපාක සතර හැර අන් දෙළොස් විපාකයන් දෙන්නී ය.

දුර්හෙතුකප්‍රතිසන්ධි සි කියේ ඥානවිප්‍රයුක්ත වූ විපාක සිත් සතර ය. මේය ත්‍රිහෙතුක වූව ද ලාමක බැවින් ශක්තියෙන් අඩු ය. එහෙයින් ත්‍රිහෙතුකප්‍රතිසන්ධි දීමෙහි අපොහොසත් ය. එහෙත් ඥානසම්ප්‍රයුක්ත බැවින් අහෙතුකප්‍රතිසන්ධි නොදෙයි. ඥානවිප්‍රයුක්ත වූ විපාක සතරත් අහෙතුක වූ විපාක අටත් යන දෙළොස් විපාකයෝ ප්‍රවෘත්තිකාලයෙහි ලැබෙන්නාහ. මෙයින් පිළිසඳ ගන්නේ ද සාමාන්‍යයෙක් නොවන්නේ ය. දෙවියන් අතර වූව ද මිනිසුන් අතර වූව ද උසස් දෙවියෙක් උසස් මිනිසෙක් වන්නේ ය.

ඥානවිප්‍රයුක්ත වූ කුශලය ද උතුකෘෂ්ට-ලාමක වසින් දෙවැදෑරුම් ය. යම් චේතනාවක් උතුකෘෂ්ට-ඥානවිප්‍රයුක්ත දුර්හෙතුක වූ කුසල් සිත් සතරෙහි යෙදුනී ද ඕ දුර්හෙතුක උතුකෘෂ්ට කුශලචේතනා නොමේ ය. දැහැමින් උපයා ගත් දානවස්තුව දීමෙහි අනුසස් සලකා සිල්වතුන් කෙරෙහි දීමෙහි දී පහළවන දන් සිතිවිල්ල ය. ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවිපාකදානය ත්‍රිහෙතුකලාමකකුශලයෙහි කී සේ ය. **"දුවිහෙතුකං උක්කට්ඨං කුසලං දුවිහෙතුකං පටිසන්ධිං දත්වා පවත්තනියං තිහෙතුක රහිතානි දවාදසවිපාකානි විපච්චන්ති"** යනු එහිලා දත්තේ ය.

මේ කුශලචේතනාව ත්‍රිහෙතුකලාමකකුශලචේතනාව හා විපාක දීම් වශයෙන් සමාන බල ඇත්තී ය. මේ දෙකම සපුනාකාම සවගීයෙහි දුර්හෙතුකප්‍රතිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි ඥානවිප්‍රයුක්ත වූ මහාවිපාක සතර ය, අහෙතුකකුශලවිපාක අටය, යන දෙළොස් විපාකයන් උපදවයි.

යම් වෙතනාවක් තොමෝ ලාමකඥානවිප්‍රයුක්ත වූ කුසල්සිත් සතරෙහි යෙදුනී ද දවිහෙතුකලාමකකුශලවෙතනා නම් ඕ ය. ඕ ලාමක වන්නී දීමෙහි අනුසස් නො සැලකීම, අධාමීක වස්තු පරිත්‍යාගය, නො සකස් ව දීම, එසේත් දී 'මම වැඩකට නැත්තක් කෙළෙමි'යි විපිළිසරවීම යන මේ ඈ නිසා ය. තවද මෝ නීවරණ-යන්ගෙන් හෝ අත්තුක්කංසනාදියෙන් කිලිටි වීමෙන් ද ලාමක වේ. දවිහෙතුකලාමකකුශලවෙතනාව අහෙතුක ප්‍රතිසන්ධිය දී ප්‍රවෘත්ති-යෙහි අහෙතුක විපාක ම උපදවයි.

"දවිහෙතුකා ඔමකං පන කුසලං අහෙතුකං එව පටිසන්ධිං දෙති. පවත්තියං අහෙතුක විපාකානෙව විපච්චති" යනු එහිලා දන්නේ ය.

මේ කුශලවෙතනාව මිනිසුන් ජාත්‍යන්ධයන් කොට ජාති බධිරයන් කොට ජාත්‍යඝ්‍රාණිකයන් කොට ජාතිමූගයන් කොට ජාත්‍යුන්මත්තකයන් කොට පණ්ඩකයන් කොට උභතොබ්‍යඤ්ජන-කයන් කොට නපුංසකයන් කොට උපදවයි. **"යං ඔමකං අහෙ-තුකං තං මනුස්සෙසු ජච්චන්ධබධිරනපුංසකඋභතොබ්‍යඤ්ජන-කාදීනං අහෙතුකපටිසන්ධිං දත්වා පච්ඡා අහෙතුක විපාකෙ දෙති"** යනු එහිලා දන්නේ ය.

එහි ජාත්‍යන්ධයෝ නම් චක්ෂුඃප්‍රශාද ය ඉපදවීමෙහි අපො-හොසත් කමීයකින් පිළිසඳ ගත්තෝ ය. උත්පත්තියෙන් ම දැස් නැත්තෝ ය. උත්පත්තියෙන් ම කන් නැත්තෝ නැහැය නැත්තෝ ගොළුවෝ දිශාව්‍යවහාරය නො දතුවෝ පිස්සෝ ජාතිබධිර ජාත්‍ය-ඝ්‍රාණ ජාතිමූග ජාතිඵළ ජාත්‍යුන්මත්තකයෝ ය. කාමදාහයෙන් දැවී වියරු කරන්නෝ පණ්ඩකයෝ ය. ගෑණු පිරිමි ලකුණු දෙකින් ම යුක්තයෝ උභතොබ්‍යඤ්ජනකයෝ ය. එදෙකින් ම තොර වූ වෝ නපුංසකයෝ ය.

චාතුමීහාරාජිකභූමියෙහි විනිපාතික අසුරයන්ගේ ද අහෙතුක සුගති ප්‍රතිසන්ධිය කරන්නී මේ කුශලවෙතනා තොමෝ ය. ඥාති-ප්‍රෙත නම් වූ විනිපාතික අසුරයෝ මනුෂ්‍යභූමියෙහි ම උපදනාහු නමුත් චාතුමීහාරාජිකයෝ ම ය යි ගැණෙති ඔවුහු. චාතුමීහාරාජි-කයෙහි අහෙතුකප්‍රතිසන්ධිකයන් ඇතැයි කියන්නේ ද එහෙයිනි. මොවුහු වෘක්ෂපර්වතාශ්‍රිතවිමානයන්හි වසන බලසම්පන්න වූ යක්ෂ-යන්ගේ මෙහෙකරුවෝ ය. ගස් කොළ වැල් ලෙන් ගුහා සොහොන් ආදියෙහි වසමින් මිනිසුන් හැරලන පිදේනිතටු ඈ කමින් ලදරු-වන් ලෙඩුන් පෙළමින් දුබලයන් බිය ගන්වමින් ඉතා දුකසේ දිවි යවන අමනුෂ්‍යයෝ ය.

"එකාහි චෙතනා එකං එව පටිසන්ධිං දෙති" පූර්ව-මධ්‍ය-අපරචේතනා අතුරෙහි එක් ජවන් වීථියෙක පහළ වන ජවන් සිත් සතෙහි චේතනා සතක් යෙදුනේ ද එක් චේතනාවක් එක් ම ප්‍රතිසන්ධියක් දෙන්නී ය. එක් චේතනාවකට දිය හැක්කේ එක් ම ප්‍රතිසන්ධියෙකි. එක් කර්මයෙකින් ලැබෙන්නේ එක් ම ප්‍රතිසන්ධියක් බව මෙයින් කිය වේ. එක් චේතනාවකට එක් ම ප්‍රතිසන්ධියක් මුත් ප්‍රතිසන්ධි කිහිපයෙක් නො ලැබෙත්. ප්‍රවෘත්තිවිපාක නම් අත් බව් සිය දහස්හි ද ලැබේ. යම්කිසි කුසලයක් හෝ අකුසලයක් කිරීමෙහි දී එහි ආදිභාගයෙහි හා අපරභාගයෙහි පහළ වන නා නා ජවනවීථීන්ගේ වශයෙන් ලැබෙන්නා වූ චේතනාවන්ගේ ගණනට එක එක බැගින් ප්‍රතිසන්ධි ද සිය දහස් අත්බව්හි ප්‍රවෘත්ති-විපාක ද ලැබෙත්. **අපුත්තක** සිවුගේ දන චේතනාවෝ මේ කතාව සථිර කරත්.

දවසෙක අපුත්තක සිවු තෙමේ උදෑසනින් නින්දෙන් නැගිට මුණකට සෝදා අහර ගෙණ රාජකාර්‍යීය පිණිස ගෙන් නික්ම යන්නේ අතරමග දී පිඬු සිඟා වඩනා **තගරසිඛී** පසේ බුදුරජුන් දැක උන්වහන්සේට පිණ්ඩපාතය දෙන්නැ'සි අඹුට කියා ගියේ ය. ඕ ද මහත් ප්‍රීතියෙන් බුදුරජුන් ගෙට වැඩමවා ගෙණ පසඟ පිහිටුවා වැඳ රසමසින් යුත් පිණ්ඩපාතය පිළිගැන්නූ ය. රජකිස කොට පෙරළා ගෙට එන සිවුහට පිණ්ඩපාතය ගෙණ වඩනා පසේබුදුරජ තෙමේ මුණ ගැසුනේ ය. එවිට ඔහු "ස්වාමීනි! අපේ ගෙයින් මොකවත් ලැබුනේ දැ සි ඔලුව උස්සා පාත්‍රය දෙස බැලී ය. බුදු රජ තෙමේ ද "සිට! එසේ ය ලැබුනේ ය" සි පිළිතුරු දුන්නේ ය. ඔහු පාත්‍රය දෙස බලත් ම එහි වූ ආහාරයන්ගේ සුගන්ධය ඔහුගේ නාහයෙහි වැදී ගියේ ය. එයින් සිවුගේ සිත ලෝභයෙන් පෙළින. "අයියෝ! මා කළ මෝඩ වැඩෙක්, මේ වටිනා බත්මාලු ටික වැඩ-කරුවකුට දුන්නෙම් නම්, ඔහුගෙන් කොතරම් වැඩගන්නට තිබුනේ දැ"සි ඔහුට සිත් වී ය. මෙසේ සිවු අඹුලවා දෙවූ මේ පිණ්ඩ-පාතදානයාගේ විපාක වශයෙන් සවගීලෝකයෙහි සත්වරක් මනුෂ්‍යලෝකයෙහි සත්වරක් සි දසසතර වරක් සම්පත්කාමසවගී-යෙහි උත්පත්තිය ලැබී ය. ඒ වදුලෝය මෙසේ=**"යං ඛෝ මහාරාජ! සෙට්ඨිගහපති තගරසිඛිං පච්චෙකසම්බුද්ධං පිණ්ඩපාතෙන පටිපාදෙසි, තස්ස කම්මස්ස විපාකෙන සත්තක්ඛත්තුං සුගතිං සගගං උපපජ්ජි, තස්ස කම්මස්ස විපාකාවසෙසෙන ඉමිස්සාපයව සාවත්ථියා සත්තක්ඛත්තුං සෙට්ඨිත්තං කාරසි"** යනු.

"සත්වරක් දෙව්ලොව උපන්නේ ය, සත්වරක් මිනිස්ලොව සිටුකම් කෙළේ ය" යනු වදාළෝ පූර්ව-පශ්චිම වෙතනාවන්ගේ වශයෙනි. මේ එක් ම පිණ්ඩපාතදානයෙහි වූ එක් ම වෙතනාව ප්‍රතිසන්ධි දෙකක් නො දුන්නී ය. මෙතෙමේ කාම ස්වර්ගයෙහි උපන් තුදුස්වර ම එහි උපන්නේ පූර්ව-පශ්චිම වශයෙන් පහළ වූ චිත්ත-වීථින්හි යෙදුනු පූර්ව-පශ්චිම වෙතනාශක්තියෙනි.

"මේ ශ්‍රමණයාහට පිණ්ඩපාතය දෙව"යි කී මොහුට එක් ම ජවනවීථියෙහි පැවැති වෙතනාවගේ වශයෙන් අර්ථසිද්ධිය වූවා ද, එහි ආදි භාගයෙහි පැවැති ජවනවාරයත් අපරභාගයෙහි පැවැති ජවනවාරයත් යන ජවනවාර දෙක පූර්ව-පශ්චිම වෙතනාවන්ගේ ශක්තියෙන් මොහු මෙසේ උපනැයි වදාළ සේක. එහෙයින් දන් දීමෙහි දී පූර්ව-මද්ධ්‍ය-අපරවෙතනා හැම එකෙක් ම මැනැවින් ලැබිය යුතු ය. එම වෙතනා සොම්නසින් යුක්ත විය යුතු ය. නුවණින් ඔද වැඩිය යුතු ය. නො පසු බැස ස්ථිර ව සිටිය යුතු ය. දීමෙහි නියම ඵල ලබනු කැමැත්තන් මෙකී ත්‍රිවිධවෙතනාවෝ ම ක්‍රමානුකූලව ම පිළියෙල කළයුතු ය. හැඩ ගැස්සි ය යුතු ය. දීම මහත්ඵල වනුයේ එවිට ය. දානවෙතනා ක්‍රමානුකූල ව පිළියෙල නො වූ නම් ඉන් ලැබෙන ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තිවිපාක කාන්තිමත් නො වේ. අපුත්තක සිටු එහි නිදර්ශක වේ.

අපුත්තක තෙමේ සම්පත් ඇතු ව උපන්නේ ද "අයියෝ! මේ බත්මාලු ටික වැඩකරුවකුට දෙන ලද්දේ නම් කොතරම් වැඩෙක්-දැ"යි සිත්හි නැගි මේ විපිළිසරය හෙතු කොට උපන් අත්බවේ දී රසට කෑමට හැඩට ඇදීමට පහසුවට යෑමට සිය සිත නමා ගැණීමෙහි අපොහොසත් වූයේ ය. පස්කම් සැප උසස් ලෙසට වැළඳීමට මොහුගේ සිත නැමී නො සිටියේ ය. කෑයේ කාඩිහොදි හා හනා ගත් නිබුඩුසාලේ බත් ය. ඇන්දේ හනවැහැරියෙන් කළ තුට්ටුවක් පමණකුත් නො වටිනා දළ රෙදිකඩ ය. ඉණ බැන්දේ ලනු පටක් ය. තැන තැන ගියේ දිරූ කරත්තයකින් ය. හිස දැරුයේ තල් අත්තක් ය. පය ලූයේ ගෙවී ගිය දිරූ වහන්-කබල් ය. නිදි ගත්තේ ඉරි ගිය දිරූ පැදුරු කඩක ය. ඒ වදාළෝය මෙසේ:—

"යං ඛො සො මහාරාජ! සෙට්ඨි ගහපති දත්වා පච්ඡා විප්ප-ටිසාරී අහොසි වරමෙතං පිණ්ඩපාතං දාසා වා කම්මකරා වා භුඤ්ජෙය්‍යුන්ති තස්ස කම්මස්ස විපාකෙන නාස්සු උළාරාය භත්තභොගාය චිත්තං නමති, නාස්සු උළාරාය වත්ථභොගාය

චිත්තං නමති. නාස්සු උළාරාය යානභොගාය චිත්තං නමති. නාස්සු උළාරානං පඤ්චන්නං කාමගුණානං භොගාය චිත්තං නමති'' යනු.

හීන වූ ඡන්ද-චිත්ත-වීර්‍ය්‍ය-වීමංසා යන මොවුන් හා යොගයෙන් මොවුන් හා හැනීමෙන් දානවෙතනාව හීන වේ. ලාමක වේ. මද්ධ්‍යම වූ ඡන්දාදීන් හා යොගයෙන් හැනීමෙන් මඞ්‍යම වේ. ප්‍රණීත වූ ඡන්දාදීන්ගේ යෝගයෙන් ප්‍රණීත වේ. මෙසේ දානවෙතනාව හීන-මද්ධ්‍යම-ප්‍රණීත වශයෙන් තෙපරිදි වේ.

දානය, සඞ්ඝික-පුද්ගලික වශයෙන් දෙපරිදි ය. සඞ්ඝයා වහන්සේට දෙනු ලබන දානය සඞ්ඝික යි ද පුද්ගලයක්හට දෙනු ලබන දානය පුද්ගලික යි ද කියනු ලැබේ.

එහි සඞ්ඝ නම් ආර්‍ය්‍යශීලයෙන් ආර්‍ය්‍යසමාධියෙන් සමාන-භාවයට ගියෝ ය. **''සීලදිට්ඨිසාමඤ්ඤතාය සඞ්ඝාතභාවං ආපත්තොති = සඞ්ඝො''** යනු දන්නේ ය. මොවුහු කොතැනෙක සිටියෝ ද සංහත ම වෙති. එකට හැනී සිටියෝ වෙති. බුද්ධශ්‍රාවක ගණයාකෙරෙහි නැගි මේ සඞ්ඝ ශබ්දය උන්වහන්සේ කෙරෙහි කෙවලව නැගී සිටියේ ශීලසමාධ්‍යාදීන්ගේ සමානත්වයෙන් හැනී සිටීම නිසා ය.

අරියසඞ්ඝො යනාදී තන්හි ආයේ සමූහාර්ථය ගෙණ ය. ආර්‍ය්‍ය-යන්ගේ සමූහය යන අරුත් ය. තවද ඒ ඒ මගපලින් කෙලෙස් දැවිලි සමුච්ඡේද-ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයන්ගේ වශයෙන් මොනවට නසා සිටි බැවින් ආර්‍ය්‍යගණය තෙමේ සඞ්ඝ යි කියනු ලැබේ. **''තෙහි තෙහි මග්ගඵලෙහි කිලෙසදරථානං සමුච්ඡේද පටිපස්සද්ධිවසෙන සම්මදෙව සාතිතත්තා=සඞ්ඝො''** යනු දන්නේ ය.

සඞ්ඝතෙමේ දක්ඛිණෙය්‍යසඞ්ඝ-සම්මුතිසඞ්ඝ යි දෙපරිදි ය. එහි සැදැහවතුන් විසින් පරලොව අදහා දෙන දානවස්තුව මහත්ඵල කිරීමෙන් එයට සුදුසු ව සිටියේ දක්ඛිණෙය්‍යසඞ්ඝතෙමේ ය. ආර්‍ය්‍යශ්‍රාවකගණය යි. **''පරලොකං සද්දහිත්වා දාතබ්බං දෙය්‍ය-ධම්මං දක්ඛිණංනාම, මහප්ඵලභාවකරණතො තං දක්ඛිණං අරහතීති = දක්ඛිණෙය්‍යො''** යනු දන්නේ ය. ආර්‍ය්‍යසඞ්ඝ තෙ-මේ ය, සැදැහවත් ලොකයා විසින් කම්පල අදහා දෙන දානවස්තුව පිරිසිදු කිරීමෙන් මහත්ඵල කරණුයේ. එහෙයිනි දක්ඛිණෙය්‍ය නම්. මේ ඒ දැක් වූ සැටි, **''දක්ඛිණාය වා හිතො මහප්ඵලභාව-කරණෙ විසොධනතොති = දක්ඛිණෙය්‍යො''** යනු.

මේ දකුණේයාග්‍රාවකගණය තෙමේ **සොතාපත්තිමග්ගට්ඨ= ඵලට්ඨ, සකදාගාමිමග්ගට්ඨ = ඵලට්ඨ, අනාගාමිමග්ගට්ඨ = ඵලට්ඨ, අරහත්තමග්ගට්ඨ = ඵලට්ඨ සි** අටදෙනකුගෙන් පිරී සිටියේ ය. මේ අට දෙන මේ බුදුසසුනෙහි ම විනා අන් කිසිත් සසුනෙක නොලැබෙත්. ඒ අන් සසුන් මොවුන්ට ක්ෂෙත්‍ර නොවේ. ආර්‍යීභාවය ලැබීමෙහි මාගීය ඇත්තේ මේ සසුන්හි ම ය. බුදුරජානන් වහන්සේගේ මේ ශ්‍රෙෂ්ඨ නාදයෙන් එ බව පැහැදිලි වේ. **"ඉධෙව සමණෝ ඉධ දුතියෝ සමණෝ ඉධ තතියෝ සමණෝ ඉධ චතුත්ථෝ සමණෝ සුඤ්ඤා පරප්පවාදා සමණේහි අඤ්ඤේහි"** යනු ය ඒ නාද ය. යම් සසුනෙක ආර්‍යීෂ්ටාඞ්ගිකමාගීය නොලැබේ නම්, එහි පළමුවන සෝවන් මහණුන් දෙවන සෙදගැම් මහණුන් තෙවන අනගැමි මහණුන් සිවුවන රහත්මහණුන් නැත. අන්‍ය වූ පරප්‍රවාදයෝ (සාසනයෝ) මෙකී ශ්‍රමණයන්ගෙන් සිස් ය යනු එහි අදහස යි. පරප්‍රවාද නම් දෙසැට මිසදිටු ය. එහෙයින් බුදුසසුන්හි වූ ආර්‍යීමාගීයෙහි ගොස් ආර්‍යීත්වයට පැමිණියෝ ම තමන් පිළිගත් දැනවසතුව මහත්ඵල කිරීමෙහි පොහොසත් වෙත්.

"ඉධ භික්ඛවෙ! භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො අයං භික්ඛවෙ පඨමො සමණෝ" සක්කායදිට්ඨි–විචිකිච්ඡා–සීලබ්බතපරාමාස යන තුන් බැඳුම් නැසීමෙන් මාගීස්‍රොතයට පැමිණියේ අපායයෙහි නොහෙන්නේ ධර්‍මනියාමයෙන් නියත වූයේ ඉතිරි තුන් මග පිහිට කොට සිටියේ ප්‍රථම ශ්‍රමණ තෙමේ ය. ඒ නම් සොතාපත්තිමග්ගට්ඨ=ඵලට්ඨයෝ ය.

"ඉධ භික්ඛවෙ! භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති අයං භික්ඛවෙ දුතියෝ සමණෝ" තුන් බැඳුම් නැසියෑමෙන් රාගදොසමොහයන් තුනී වූ බැවින් සකදාගාමී වූයේ එක්වරක් ම මෙලොව ඉපද සසර දුක් කෙළවර කරණුයේ දවිතීයශ්‍රමණ තෙමේ ය. ඒ නම් සකදාගාමිමග්ගට්ඨ-ඵලට්ඨයෝ ය.

"ඉධ භික්ඛවෙ! භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මා තස්මා ලොකා අයං තතියෝ සමණෝ" කාමලොකයෙහි උපතට හෙතු වූ කාම ලොකයෙහි උපත දෙන

සක්කායදිට්ඨි – විචිකිච්ඡා – සීලබ්බතපරාමාස – කාමරාග – ව්‍යාපාද යන පස් බැඳුම් නැසීයෑමෙන් ඔපපාතික වනුයේ එහි ම පිරිනිවන් පානුයේ ඒ උපන් බඹ ලොවින් උපත පිණිස අන් කොතැනෙකත් නො යනුයේ තෘතීයශ්‍රමණ තෙමේ ය. ඒ නම් අනාගාමිඵලයට-ඵලට්ඨයෝ ය.

"අධ භික්ඛවෙ! භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං භික්ඛවෙ චතුත්ථො සමණො" කාම භව දිට්ඨි අවිජ්ජා යන ආශ්‍රවධර්මයන් නැසීමෙන් ආශ්‍රව රහිත වූ සියලු කෙලෙස් බැඳුමෙන් මිදුනු රහත්පල සිත හා රහත්පල නුවණ මේලොවදී ම දැන පසක් කොට එයට පැමිණ වසනුයේ චතුර්ථශ්‍රමණ තෙමේ ය. ඒ නම් අරහත්තඵලයට-ඵලට්ඨයෝ ය.

මේහි මෙසේ ඉතා සැකෙවින් කියූ මේ යුගසතර ඵලස්ථයන් ප්‍රධාන කොට ම ආයේ ය. මේ දෙසුනාව ප්‍රධාන වසින් මිගජල අතුරෙහි ඵලස්ථපුද්ගලයන්ගේ වශයෙන් ආවා ය. මහාපරිනිබ්බාණසූත්‍රයෙහි **"එකූනනවුතො කප්පා යතො සුභද්‍ර"** යනාදී වූ ගාථාවෙහි ආ 'සමණෝ' යනු මාගීඵලස්ථපුද්ගලයන් දෙදෙනා හා ඒ ඒ මග පිණිස පටන් ගත් විදර්ශනා ඇත්තහු සඳහා ය. මේ යුගසතර වෙන වෙන ම බෙදා ගත් විට පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක් වෙත් **"යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො"** යනු දන්නේ ය.

තිලෝගුරු වූ සම්මා සම්බුදුරජානන් වහන්සේ මේ පුද්ගලයන් අට දෙනා ඒ ඒ මාගීඵලප්‍රත්‍යක්ෂකිරීමෙහි දී ඒ පිණිස මාගීය කොට ගත් ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන්ගේ විශෙෂතාය ගෙණ සත් දෙනකු කොට දැක් වූ සේක. **"සන්තිමෙ භික්ඛවෙ! පුග්ගලා ආහුණෙය්‍යා පාහුණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස, කතමෙ සත්ත? උභතොභාගවිමුත්තො පඤ්ඤාවිමුත්තො කායසක්ඛි දිට්ඨිප්පත්තො සද්ධාවිමුත්තො ධම්මානුසාරී සද්ධානුසාරී, ඉමෙ ඛො භික්ඛවෙ! සත්තපුග්ගලා ආහුණෙය්‍යා පාහුණෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස"** යනු ඒ සත් දෙනකු කළ සැටියි.

එහි අරූපසමාපත්තිබලයෙන් රූපකායයෙන් හා මාගීඵල බලයෙන් නාමකායයෙන් යන දෙකොටසින් සසරින් මිදී සිටියේ **උභතොභාගවිමුත්ත** නම්. **"දවීහි භාගෙහි විමුත්තො අරූපසමා-**

පත්තියා රූපකායතො විමුත්තො මග්ගෙන නාම කායතො'' යනු දතයුතු ය. චතුර්විධඅරූපසමාපත්තීන් අතුරෙහි එක එකින් නැගිට සංඝකාරයන් සම්මර්ශනය කොට අර්හත්ත්වයට පැමිණි සිවු දෙනාගේ හා නිරොධසමාපත්තියෙන් නැගිට අර්හත්ත්වයට පැමිණි අනාගාමී පුද්ගලයාගේ වශයෙන් උභතොභාගවිමුත්ත තෙමේ පස් වැදැරුම් වේ. මේ ඒ වදාළ දෙශනාව :- **''කතමො ච භික්ඛවෙ පුග්ගලො උභතො භාගවිමුත්තො? ඉධෙකච්චො පුග්ගලො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵස්සිත්වා විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති අයං වුච්චති පුග්ගලො උභතොභාගවිමුත්තො''** යනු මේ දෙශනාව ආවා අෂ්ටවිමොක්ෂ-ලාභීන්ගේ වශයෙනි.

ප්‍රඥෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතායෙන් සසරින් මිදී සිටියේ ප්‍රඥා විමුක්ත නම්. **''පඤ්ඤාය විමුත්තො පඤ්ඤාවිමුත්තො''** යනු දතයුතු ය. මෙතෙමේ ද ශුද්ධවිදර්ශකක්ෂීණාශ්‍රවයාගේ හා චතුර්විධ-ධ්‍යානයන්ගෙන් නැගිට අර්හත්ත්වයට පැමිණි ක්ෂීණාශ්‍රවයන් සිවු දෙනාගේ වශයෙන් පස්වැදැරුම් වේ. මේ ඒ දෙශනාව:- **''න හෙව ඛො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵස්සිත්වා විහරති පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති අයං වුච්චති පුග්ගලො පඤ්ඤාවිමුත්තො''** යනු. මේ දෙශනාව ආවා අෂ්ට විමොක්ෂය ප්‍රතික්ෂෙප කිරීම් විසිනි. තවද යමෙක් සංඝකාරධර්මයන් අනාත්ම වශයෙන් මෙනෙහි කරණුයේ ප්‍රඥාව බහුල කොට ඇත්නේ ප්‍රඥෙන්ද්‍රිය ප්‍රතිලාභය කෙරේ ද රහත්මග තෙක් ඇති අනෙක් මගපල සයෙහි දිට්ඨප්පත්ත වේ ද, හෙතෙමේ අර්හත්ඵලයෙහි ප්‍රඥාවිමුක්ත වේ. කයින් ධ්‍යානස්පර්ශය කොට අනතුරුව නිවන් පසක් කොට සිටියේ **කායසාක්ෂි** නම්. **''කායෙන ඣානඵස්සං ඵස්සිත්වා පච්ඡා නිරොධං නිබ්බාණං සච්ඡිකත්වා සිතො කාය-සක්ඛි නාම''** යනු දතයුතු ය. මෙතෙමේ පළමු කොට සියකයින් ධ්‍යානස්පර්ශය කෙරෙයි. අනතුරුව නිවන් පසක් කෙරෙයි. සොතාපත්තිඵලය පටන් රහත්මග තෙක් ඇති මගපල සදෙනාගේ වශයෙන් මේතෙමේ සවැදැරුම් ය. මේ ඒ දෙශනාව:- **''ඉධෙ-කච්චො පුග්ගලො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵස්සිත්වා පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති අයං වුච්චති පුග්ගලො කායසක්ඛි''** යනු. ''සංඝකාරයෝ දුක් වෙත්, නිරොධය සැපයැ'' යි නුවණින් දක්නා ලද්දේ පසක් කරණ ලද්දේ **දෘෂ්ට-ප්‍රාප්ත** නම්. **''දුක්ඛා සඞ්ඛාරා සුඛො නිරොධොති ඤාතං හොති දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤායාති දිට්ඨප්පත්තො''**

යනු දතයුතු ය. මෙතෙමේ ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි යෙදුනු නුවණින් පළමු කොට නිවන දුටු බැවින් ඉන්පසු ස්‍රොතාපත්ති-ඵලාදීන්ගේ වශයෙන් නිවනට පැමිණි බැවින් දිට්ඨපත්ත යි කියනු ලැබේ. මෙතෙමේ ද කායසාක්ෂිහු මෙන් සවැදැරුම් ය. මේ ඒ දෙශනාව:- **"ඉධෙකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති යථාභූතං පජානාති-තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා පඤ්ඤාය -පෙ- අයං වුච්චති පුග්ගලො දිට්ඨප්පත්තො"** යනු.

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමාත්‍රතායෙන් සසරින් මිදී සිටියේ **ශ්‍රද්ධා විමුක්ත** නම් **"සද්ධාය විමුත්තො සද්ධාවිමුත්තො"** යනු දතයුතු ය. මෙතෙමේ ද පෙර කියූ සේ සවැදැරුම් වේ. මේ ඒ දෙශනාව :- **"ඉධෙකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති යථාභූතං පජානාති තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා පඤ්ඤාය -පෙ- නො ච ඛො යථා දිට්ඨප්පත්තස්ස අයං වුච්චති පුග්ගලො සද්ධාවිමුත්තො"** යනු. මොහුගේ ක්ලෙශක්ෂය වනුයේ මාර්ගක්ෂණයේදී ය. ස්‍රොතාපත්ති-මාර්ගක්ෂණයෙහි අදහනුයේ චතුර්විධඵලක්ෂණයෙහි මිදී සිටින්-නේ ය. එහෙයින් ශ්‍රද්ධාවිමුක්ත යි කියනු ලැබේ. අන්‍යමාර්ගක්ෂණ යන්හි සමාධීන්ද්‍රියාදීහු බලවත් වූවාහු ද, ස්‍රොතාපත්තිමාර්ගක්ෂ-ණයෙහි ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ බලවත්බව නිසා ම මේ නම් විය. දිට්ඨප්පත්තයාහට පූර්වභාගමාර්ගක්ෂණයෙහි කෙලෙස් සිඳලන නුවණ නො ලැසි ව තියුණු ව වහා එළඹ සිටින්නේ ය. වඩා මුවහත් නො වූ කඩුවකින් කෙසෙල් කඳක් සිඳින කල්හි එහි කඩුපහර වැදුන තැන මට වනුයේ නො වේ. එහි කඩුපහර වහා වදින්නේ ද නො වේ. හඬ ද නැගෙයි. සිඳිනු පිණිස බලවත් උත්සාහයෙක් ද කළයුතු ය. ශ්‍රද්ධාවිමුක්තයාගේ පූර්වභාගභාවනාව ද එබඳු ය. ඉතා මුවහත් වූ කඩුවකින් කෙසෙල් කඳක් සිඳින කල්හි එහි කඩුපහර වැදුන තැන මට වේ. කඩුව එය වහා සිඳ ගෙණ ඇතුළට වදින්නේ ය. හඬ ද නො නැගෙයි. බලවත් උත්සාහයෙක් ද නො වුවමනා ය. ප්‍රඥාවිමුක්තයාගේ පූර්වභාගභාවනා ද එබඳු ය.

ප්‍රඥාව පෙරදැරි කොට ඇති මාර්ගය වඩනුයේ **ධම්මානුසාරී** නම්. **"ධම්මං අනුස්සරතිති=ධම්මානුසාරී"** යනු අර්ථව්‍යක්තිය යි. මෙහි ධර්ම නම් ප්‍රඥාය. ස්‍රොතාපත්තිඵලය පසක් කිරීමෙහි දී

යම් කිසිවකුගේ ප්‍රඥෙන්ද්‍රියය අධිමාත්‍ර වී නම්, ප්‍රඥාපූර්ඞගම වූ ආර්‍යමාර්ගය වඩා නම්, හේ ය ධම්මානුසාරී. මේ ඒ දෙශනාව:- **"යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති පඤ්ඤාවාහි පඤ්ඤාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති අයං වුච්චති පුග්ගලෝ ධම්මානුසාරී"** යනු.

ශ්‍රද්ධින්ද්‍රියය අනුසරණය කරණ්‍යේ නැතහොත් ශ්‍රද්ධින්ද්‍රියයෙන් නිර්වාණය අනුසරණය කරණ්‍යේ **ශ්‍රද්ධානුසාරී** නම්. සෝතාපත්තිඵලය පැසක් කිරීමට පිළිපන්නහුට ශ්‍රද්ධෙන්ද්‍රියය අධික ව නැතී සිටියේ නම්, ශ්‍රද්ධාපූර්ඞගම වූ ආර්‍යමාර්ගය වඩා නම්, හේය ශ්‍රද්ධානුසාරී මේ ඒ දෙශනාව :- **"යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස සද්ධින්ද්‍රියං අධිමත්තං හොති සද්ධාවාහි සද්ධාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති අයං වුච්චති පුග්ගලෝ සද්ධානුසාරී"** යනු.

මොවුන් පිළිබඳ විස්තාරකථාමාර්ගය පටිසම්භිදා - විසුද්ධිමග්ග - අඞ්ගුත්තරනිකායට්ඨකථාදියෙහි එසි. මෙහි ද "අරියානංගොවරෙතා" යන්නට කළ පරිකථා ද බැලිය යුතු ය.

ආර්‍යශීලයෙන් ආර්‍යසමාධියෙන් ආර්‍යප්‍රඥයෙන් අගතැන්පත් වූවෝ මොනවට පිළිපන්නෝ නො ඇද ව පිළිපන්නෝ නිවනට පිළිපන්නෝ සැලකිල්ලට සුදුසු වූවෝ දුර සිට ගෙණැවිත් පිදීමට පරලොව හදහා වැඩීමට දෙහොත් මුදුන් දී වැඩීමට සුදුසු වූවෝ මුන්වහන්සේ ය. පහ වූ රාග-දෙස-මොහ ඇත්තෝ පරම සලෙලඛවූවෝ පරමසනතුෂ්ටවූවෝ පරම පුණ්‍යක්ෂෙත්‍රවූවෝ මුන්වහන්සේය. කෙනෙක් ත්‍රිවිද්‍යාධරයහ. කෙනෙක් ෂඩභිඥාධරයහ. කෙනෙක් ප්‍රතිසංවිතම්ආර්ගිකයහ.

මේ මහාආර්‍යගණයෙහි අග්‍රදක්ෂිණාර්හවූවෝ මාගේ තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේ ය. විස්තර බණපොතින් දතයුතු ය.

එහිනිකඛුඋපසම්පදා-සරණගමනඋපසම්පදා- ඔවාදපටිග්ගහණ උපසම්පදා - පඤ්හබ්‍යාකරණඋපසම්පදා ගරුධම්මපටිග්ගහණඋපසම්පදා - දූතෙනඋපසම්පදා - අට්ඨවාචිකඋපසම්පදා - ඤත්ති චතුත්ථ කම්මඋපසම්පදා යි මේ ශාසනයෙහි උපසම්පදා අටෙක් වේ

එහි පශ්චිමභවික පුද්ගලයාහට **"එහි භික්ඛු! චර බ්‍රහ්මචරිඝං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය"** යි දෙනු ලබන උපසම්පදා **"එහි භික්ඛුඋපසම්පදා** නම්.

"බුද්ධං සරණං ගච්ඡාමි" යන ඇලෙසින් තෙවරක් වාග්භෙද කරවා දෙනුලබන්නි **සරණගමනඋපසම්පදා** නම්.

"තස්මාතිහ කස්සප! එවං සික්ඛිතබ්බං" යන ඇලෙසින් ස්ථවිර-මද්ධ්‍යම-නවකයන් කෙරෙහි විළිබිය ද දම් දෙසුම් අත්‍ථවත් කොට සිත්හි කොට ඇසීම ද කායගතාස්තිමනසිකාරය ද යන තුන් අවවාදයන් පිළිගැන්වීමෙන් දෙනු ලබන්නි **ඔවාදපටිග්ගහන උපසම්පදා** නම්.

දශ අශුභයෙහිලා බුදුරජුන් විසින් අසා වදාළ ප්‍රශ්නයන් විසඳුම් කළ සොපාකසාමණෙරයන්හට අනුදන්නා ලද්දී **පඤ්හබ්‍යාකරණඋපසම්පදා** නම්.

"වස්සසතූපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කත්තබ්බං අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අන්තිකක්කමතීයො" යන ඇලෙසින් වදාළ අට ගරුදහම් පිළිගැන්වීමෙන් මහාපජාපති ගොතමියට අනුදන්නා ලද්දී **අට්ඨගරුධම්මපටිග්ගහනඋපසම්පදා** නම්.

අඩ්ඪකාසි නම් ගණිකාව පිණිස මෙහෙණක දූතකර්මයෙහි යොදා භික්ෂුසඞ්ඝයා වෙත එළැඹ උපසම්පදාවට ආරාධනා කළ කල්හි අනභිමුඛයෙහි ම ඥප්තිකර්මවාක්‍යයන් කියවා උපසපන් කරණ ලෙසින් අනුදන්නා ලද්දී **දූතෙනඋපසම්පදා** නම්.

මෙහෙණ සඟවෙතින් ඥප්තිචතුත්‍ථකර්මයෙන් හා මහණසඟ වෙතින් ඥප්තිචතුත්‍ථකර්මයෙන් හා මෙහෙණන්හට අනුදන්නා ලද්දී **අට්ඨවාචිකඋපසම්පදා** නම්.

ඥප්තිචතුත්‍ථකර්මයෙන් මහණුන්හට අනුදන්නා ලද්දී **ඥප්තිචතුත්‍ථකර්මඋපසම්පදා** නම්.

මෙහි කියූ මේ උපසම්පදා අතුරෙහි එහිභික්ඛුඋපසම්පදා-සරණගමනඋපසම්පදා-ඔවාදපටිග්ගහනඋපසම්පදා පඤ්හබ්‍යාකරණඋපසම්පදා-ගරුධම්මපටිග්ගහනඋපසම්පදා යන මෙ පස බුදුරජුන් දවස ම පැවැත්තේ උන්වහන්සේ දවස ම අභාවයට ද

ගියේ ය. දූතෙන උපසම්පදා-අට්ඨවාචිකඋපසම්පදා යන මෙ දෙක මෙහෙණසස්න පැවැති තාක් ම පැවැත්තේ අභාවයට ගියේය. අද පවත්නී ඥප්තිචතුර්ථකර්මඋපසම්පදා ය.

ඥප්තිචතුර්ථකර්මයෙන් උපසපන්බවට පැමිණි පෘථග්ජන භික්ෂූන්වහන්සේ ශීල-සමාධි-ප්‍රඥයෙන් සංහත වූවෝ එකට හැනී සිටියෝ **සම්මුතිසඞ්ඝ** යි ගැණෙත්. මේ පුහුදුන් මහණුන් කෙරෙහි නැගී සිටි සඞ්ඝ යනු ඔවුන්කෙරෙහි නැගුනේ ප්‍රධානාර්ථ විසින් නො වේ. පුහුදුන් මහණෝ ද පූර්වභාගප්‍රතිපදායෙහි සිටි බැවින් දානයෙහිලා පූර්වචෙතනාව සේ මේ සඞ්ඝ ශබ්දයෙහි ම ඇතුළත් ව සිටිත් අප්‍රධාන විසින්. මේ කියූ සැටි **"පොථුජ්ජනිකසඞ්ඝස්සාපි පුබ්බභාගපටිපදාය ඨිතත්තා පුරිමචෙතනා විය දානෙ, එත්ථෙව සඞ්ගහො දට්ඨබ්බො"** යි.

සම්මුතිසඞ්ඝ තෙමේ දෘෂ්ටිශීලාදියෙන් ආර්‍යයන් වහන්සේ හා සමානභාවයට නො ගියේ ද ඝටනාවට නො ගියේ ද නිවනට නතු වූ පෘථග්ජනදෘෂ්ටිශීලාදියෙන් උන් උන් සමාන බැවින් ඝටනාවට ගිය බැවින් දක්ෂිණාර්ගයන් කෙරෙහි කළයුතු වූ වැඳුම් පිදුම්වලට සුදුසු වූයේ නුයි සඞ්ඝ නම් වේය යි දතයුතු ය. **"සොපි හි කිඤ්චාපි අරියෙන දිට්ඨිසීලසාමඤ්ඤෙන අසංහතො අඝටිතො නීය්‍යානිකපක්ඛියෙන පන පොථුජ්ජනිකෙන සංහතත්තා ඝටිතත්තා දක්ඛිණෙය්‍යපණ්ණපාතාරහො සඞ්ඝොයෙවාති වෙදිතබ්බො"** යනු පාලියි.

සඞ්ඝ යන මෙයින් ප්‍රධාන විසින් ආර්‍යයන් වහන්සේ ම ගැණෙත්. සෝවන් ඇ මගපල පසක් කරණු පිණිස ආර්‍යයන් ගිය මග යන බැවින් සාමාන්‍ය වූ උපසම්පන්නභික්ෂූන් වහන්සේත් අප්‍රධාන විසින් සඞ්ඝ නම් ය. මුන්වහන්සේ බුදුරජුන් පිරිනිවී සියක් අවුරුද්දක් ගිය තැන නානාවිධ හෙතුන් නිසා ව්‍යග්‍ර වූහ. මෙහි මුල්වූවෝ විශාලා මහානුවර මහාවන විහාරයෙහි වුසූ වජ්ජ භික්ෂූන් වහන්සේ ය.

උන්වහන්සේ **"කප්පති සිඞ්ගිලොණකප්පො"** අඟක ලුණු බහාතබා ලුණු නැති යාවකාලික ආහාර හා මුසු කොට වැළඳීම කැප ය.

"කප්පති ගාමන්තරකප්පො" අන් ගමකට යෙමි'යි සිතා භොජනපවාරණය කළ පසු ඉතිරි වූ කැප නො කළ බොජුන් වැළඳීම කැප ය.

"කප්පති දවඞ්ගුලකප්පො" ඉර අවරට ගොස් සෙවණැලි දැඟුලක් පමණ වූ කල්හි විකාලයෙහි ද යාවකාලික ආහාර වැළ-දීම කැප ය.

"කප්පති ආවාසකප්පො" එක් සීමායෙහි නන් අවස්හි පොහෝ පවුරුණු ආදී වූ සඞ්ඝකර්ම කිරීම කැප ය.

"කප්පති අනුමතිකප්පො" ඇතුළු සීමායෙහි සඞ්ඝයාගේ ඡන්දය නො ගෙණ ඡන්දය පසුව ගන්නා අදහසින් වෙන් වෙන් ව සඞ්ඝකර්ම කිරීම කැප ය.

"කප්පති ආවිණ්ණකප්පො" ආචාර්‍ය්‍ය උපාද්‍ධ්‍යායයන්විසින් පුරුදු කළ කැප හෝ නො කැප දැය සුදුසු නො සුදුසු දැය ඔවුන් කළ බැවින් තමනුත් කිරීම කැප ය.

"කප්පති අමථිතකප්පො" භොජන පවාරණය කළ පසු මිදීගෙණ එන බැවින් කිරි ද නො වූ, මුළුමනින් නො මිදුනු බැවින් දී ද නො වූ අයිරිත් කැප නො කළ කිරි වැළඳීම කැප ය.

"කප්පති ජලොගි පාතුං" මද්‍යභාවයට නො ගිය තරුණ සුරාබීම කැප ය.

"කප්පති අදසකං නිසීදනං" අනුදත් ලෙසින් සුගත්වියත් පමණ වූ දාවලු නො තබා කළ හිඳිනා ඇතිරිය පරිහරණය කිරීම කැප ය.

"කප්පති ජාතරූපරජතං" රන් රිදීමසු කහවණු පිළිගැණීම කැප ය, යන මේ දශවස්තූන් උපදවා විනය පැණවීම් වෙනස් කොට සඞ්ඝයා වහන්සේ හෙද කළහ.

එතැන් සිට කලින් කල නොයෙක් හෙතුන් නිසා සඞ්ඝයා වහන්සේ තව තවත් භින්න වූ හ. මේ භින්නත්වය දඹදිව මෙන් ම ලක්දිව ද පැතිර ගියේ ය. එහෙත් පෘථග්ජන භික්ෂූන් වහන්සේ නිවනට නතු ව දෘෂ්ටිශීලාදියෙන් සමාන ව සිටිනාතුරු සම්මුතිසඞ්ඝ නම් වෙත්. සඞ්ඝ යි ගැණීමෙහි දී මොවුන් අත පවත්නා අන්-කිසිදු හෙදයෙක් නො සැලකෙන්නේ ය. විස්තර විනය ග්‍රන්ථ-යන්ගෙන් දතයුතු ය.

සඞ්ඝයා වහන්සේ දක්ෂිණෙය්‍ය – සම්මුති යි දෙපරිද්දෙකින් ව්‍යවස්ථිත වූවාහු ද ඒ නො ගෙණ සඞ්ඝයා වහන්සේ පිළිබඳ කිසිත් හෙදයක් නො සලකා උන්වහන්සේ කෙරෙහි වූ සුප්‍රතිපන්නතා

දී වූ ගුණයන් හදහා දෙනු ලබන දානය, සඞ්ඝිකදානැ යි සම්මත ය. මෙසේ සම්මත වූ සඞ්ඝිකදාන සතෙක් ආගමයෙහි ආයේ ය.

"බුද්ධපමුඛෙ උභතො සඞ්ඝෙ දානං දෙති, අයං පඨමා සඞ්ඝගතා දක්ඛිණා" ප්‍රථමසඞ්ඝිකදානය, පසෙක මහණසඟුන් පසෙක මෙහෙණ සඟුන් ඒ දෙපස මැද බුදුරජුන් වඩා හිඳුවා දෙනු ලබන්නේ ය.

"තථාගතෙ පරිනිබ්බුතෙ උභතො සඞ්ඝෙ දානං දෙති, අයං දුතියා සඞ්ඝගතා දක්ඛිණා" බුදුරජුන් පිරිනිවි කල්හි මහණ – මෙහෙණ සඟුන් දෙපස වඩා හිඳුවා එ මැද බුද්ධාසනයක් පණවා එහි සධාතුකබුද්ධප්‍රතිමාවක් වඩා තබා බුද්ධපූජාදිය කොට දෙනු ලබන්නේ දෙවැන්න ය.

"භික්ඛුසඞ්ඝෙ දානං දෙති, අයං තතියා සඞ්ඝගතා දක්ඛිණා" එකලා මහණසඟනට දෙනු ලබන්නේ තෙවැන්න ය.

"භික්ඛුනිසඞ්ඝෙ දානං දෙති, අයං චතුත්ථී සඞ්ඝගතා දක්ඛිණා" මෙහෙණ සඟන උදෙසා දෙනු ලබන්නේ සිවු වැන්න ය.

"එතහාහා මෙ භික්ඛූ ච භික්ඛුනියො ච සඞ්ඝතො උද්දිසථානි දානං දෙති, අයං පඤ්චමී සඞ්ඝගතා දක්ඛිණා" සඞ්ඝයා වහන්සේ වෙනුවෙන් මට මෙතෙක් මහණ – මෙහෙණන් දෙනු මැනැවැ යි මහණ මෙහෙණ සඟුන් වෙත දෙනු ලබන්නේ පස්වැන්න ය.

"එතහාහා මෙ භික්ඛුසඞ්ඝතො උද්දිසථානි දානං දෙති, අයං ඡට්ඨී සඞ්ඝගතා දක්ඛිණා" උපසපන් මහණුන් සිවු නමකට නොඅඩුව වසන වෙහෙරකට ගොස් "වහන්ස! මට සඞ්ඝයා වහන්සේ වෙනුවෙන් මෙතෙක් භික්ෂූන් දෙනු මැනැවැ" යි පමුණුවා ගත් එක් නමකට හෝ දෙනු ලබන්නේ සවැන්න ය.

"එතහාහා මෙ භික්ඛුනියො සඞ්ඝතො උද්දිසථානි දානං දෙති, අයං සත්තමී සඞ්ඝගතා දක්ඛිණා" "වහන්ස! මට සඞ්ඝයා වහන්සේ වෙනුවෙන් මෙතෙක් මෙහෙණ සඟුන් දෙනු මැනැවැ"යි පමුණුවා ගත් එක් මෙහෙණකට හෝ දෙනු ලබන්නේ සත්වැන්න ය.

මේ සියලු සඞ්ඝිකදානයෝ මහාපොළොව පස් සේ මහාමුහුදු දිය සේ අහස තරු සේ ප්‍රමාණ රහිත වූ ඉෂ්ටවිපාක ඇත්තෝ ය.

"භවිස්සන්ති බො පනානන්ද! අනාගතමද්ධානං ගොත්‍රභූනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා, තෙසු දුස්සීලෙසු සඞ්ඝං උද්දිස්ස දානං දස්සන්ති, තදුපහං ආනන්ද! සඞ්ඝගතං දක්ඛිණං අසඞ්ඛෙය්‍යං අප්පමෙය්‍යන්ති වදාමි" = ආනන්ද මතු එන කාලයෙහි කහකඩක් අත කර බැඳ ගොවිකම් ඇ කරමින් අඹු දරුවන් රක්නා වූ පවිටු ගති ඇති 'අපි මහණුම්හ' යි පිළින කරන්නා වූ ගොත්‍රභූ නම් දුශ්ශීල කෙනෙක් වන්නාහ, එකල්හිදු දන් පින්කම් කරන්නා වූ මිනිස්සු දන් පිළියෙල කොට සඞ්ඝයාහට දෙම්හ, යි ඒ දුසැසීලයන්හට මාගේ සඞ්ඝයා උදෙසා දෙන්නාහ, ආනන්ද! ඒ දානය ද සඞ්ඝයා උදෙසා දුන් බැවින් සඞ්ඝගත දාන ම වේ. එ ද ගිණිය නො හැකි ප්‍රමාණවත් කට නො හැකි ඉෂ්ටවිපාක ඇත්තේ ම වේ ය,, යි වදාළ බැවින් සඞ්ඝයා උදෙසා දෙනු ලබන දානයෙහි මහත්කම කොතරම් දැ යි පැහැදිලි ය. පත්දහසක් හවුරුදු මුළුල්ලෙහි සදෙවක ලොකයාහට සඞ්ඝයා වහන්සේ ම උරම පුණ්‍යක්ෂෙත්‍රය වන්නාහ යනු වදාළෝ සඞ්ඝයා වහන්සේ කෙරෙහි දුසැසීලභාවයක් කිසි කලෙක කිසිලෙසකින් නො වන බැවිනි. දුසැසිල වන්නෝ නම්, දුසැසිල වන්නෝ උපාසකයෝ ය. ඒ ඒ පුද්ගලයෝ ය. පුද්ගලයන් පිළිබඳ දුසැසීලභාවය සඞ්ඝගතදක්ෂිණාවනට විපත්තිකර නො වේ. දුසැසීලයන් කෙරෙහි වුව ද සඞ්ඝයා උදෙසාය, යි යම් දායක් දෙන ලද්දේ නම්, ඒ සඞ්ඝගත ම වේ. අනුසස් අපමණ ය. **"සඞ්ඛෝ හි දුස්සීලෝ නාම නත්ථි, දුස්සීලා පන උපාසකා, තෙසු දුස්සීලෙසු භික්ඛුසඞ්ඝං උද්දිස්ස සඞ්ඝස්ස දෙමාති දානං දස්සන්ති, සඞ්ඝගතා දක්ඛිණා නාම"** යනු සාධක ය.

සඞ්ඝගතදක්ෂිණා පිරිනැමීම පහසු නො වේ. ඒ පහසු සඞ්ඝයා කෙරෙහි ආදරසත්කාර කිරීමෙහි පොහොසත් නුවණැති යනට ය. යමෙක් සඞ්ඝගතදක්ෂිණාවක දෙමි, යි සතුන් වසනා තැනකට ගොස් "වහන්ස! මාගේ දානයට සඞ්ඝයා වහන්සේ වෙනුවෙන් භික්ෂුනමක් හෝ දෙනමක් දෙනු මැනැවැ"යි ඇයැද සිටියේ හෙරණකු ලැබ "මට ලැබුනේ හෙරණෙකැ"යි දොම්නසටත්, සථවිර නමක් ලැබ "මට ලැබුනේ සථවිර නමෙකැ"යි සොම්නසටත් පැමිණේ ද, ඔහුට සඞ්ඝගතදක්ෂිණා නො දිය හැකි ය. ඔහුගේ ඒ දානය සඞ්ඝගතදානයෙක් නො වේ. යමෙක් හෙරණකු ලත් කල්හි දොම්නසට නො පැමිණ සථවිර නමක් ලත් කල්හි සොම්නසට නො පැමිණ සඞ්ඝයා වහන්සේ පිළිබඳ සුප්‍රතිපන්නතාදී වූ ගුණයෙහි ම පැහැදී ගුණ හදහා "මම දෙන්නෙමි සඞ්ඝයා වහන්සේටැ"යි ඒ අවසථායෙහි සඞ්ඝයා වහන්සේ

කෙරෙහි නො වෙනස් ව සත්කාර කිරීමෙහි පොහො සත් වේ ද, හේ ම සඞ්ඝගතදක්ෂිණා පිරිනැමීමෙහි දක්ෂ වේ. ඒ දානය ම සඞ්ඝිකදානය වේ.

සඞ්ඝිකදානයෙහි ලා 'මෙතෙමේ සිල්වත්, මෙතෙමේ සිල් නැත්, මෙතෙමේ හෙරණ, මෙතෙමේ මහලු, ඈ ලෙසින් දානය පිණිස පැමිණි භික්ෂූන් වහන්සේගේ උස්පහත්කම් සලකා සොම් නස් දෙම්නස්වීම නො යෙදෙන්නේ ය. දානය පිණිස පැමිණි භික්ෂූන්ගේ ගුණනුවන අඩුවැඩිකම් සලකා දෙන දානය සඞ්ඝික නො වේ. පුද්ගලවිශෙෂය සැලකීම සඞ්ඝිකදානයට හිතකර නො වේ. සඞ්ඝිකදානයක් දෙනු කැමැත්තේ පුද්ගලවිශෙෂය නො සලකා පැමිණි හැමදෙනා වහන්සේට සැරියුත් – මුගලන් දෙන-මට සේ සත්කාර කොට දන් දෙන්නේ ය. සඞ්ඝයා වෙනු-වෙන් ලත් දුසිල් මහණකුහට ද නො ද විපිළිසර ව නො ද දෙම් නස් ව සඟගුණ සලකා දෙන්නේ නම්, එක් රහත් නමක්හට දුන් දානයට වඩා එය වැඩිතරම් වන්නේ ය.

මේ බලනු මැනවි. "දඹදිව එක්තරා නුවරෙක වෙහෙරක් කර වූ ධනවතෙක් 'සඞ්ඝිකදානයක් දෙමි' යි වෙහෙරට ගොස් සඟමැද සිට 'වහන්ස! දානය පිණිස සඞ්ඝයා වෙනුවෙන් භික්ෂු නමක් දුන මැනැවැ' යි ඇයැද සිටියේ ය, සඞ්ඝයා වහන්සේ ඔහුට භික්ෂු නමක් දුන්හ, ඒ භික්ෂු නම දුසිල් ය, දායකයා ද එය දැන සිටියේ ය, එහෙත් හෙතෙමේ එයින් විපිළිසර නො වී ය, දෙම්නසට නො ද පැමිණියේ ය, භික්ෂු නම ගෙට කැඳවා ගෙණ ගොස් ගේ හැමද පිරිබඩ කොට උඩුවියන් බැඳ පණවා තුබූ අසුනෙහි පා සෝදා තෙල් ගල්වා වඩා හිඳුවා ගඳින් දුමින් මලින් පුදා බුදුරජුන් ඉදිරියෙහි යටත් ව සිට සැලකිලි කරන්නා සේ සඞ්ඝගුණයෙහි පැහැද සඟගුණ සිහි කරමින් ඒ භික්ෂු නමට දන් දුන්නේ ය, දන් වළඳා වෙහෙරට ගිය එ මහණ එදින ම සවස පන්සල පිළිදැගුම් කරන්නට කියා උදැල්ලක් සොයා දාවල දන් වැළඳූ ගෙය බලා ගියේ ය. එ වේලෙහි දන් දුන් දායක පුටුවෙක හුන්නේ ඉන් නැගී නො සිට ලඟ තුබූ උදලු කෙටිය 'මෙන්න, ගණිවු'යි පයින් ඔහු වෙතට වීසි කෙළේ ය, එහි හුන් අනෙක් දෙනා එ දැක 'තමුසේ හැබෑ මිනිහෙක්, අද උදය කාලයෙහි ඔය මහණහුට කළ සත්කාරයනට කළ වැඩේ වටී ද, උදය කළ සත්කාරයන්ගේ තරම නො කියැකි ය, ඒ ඉමහත් ය, මේ කිමැ'යි කීහ. 'මා උදය කළ සත්කාර මොහු සඳහා නො වේ. මොහුට කරණ ලදුයේ නො වේ, මා ඒ හැම කරණ ලද්දේ අෂ්ටාර්‍යපුද්ගල මහාසඞ්ඝයා වහන්සේට ය' යි උපාසක කීයේ ය.

සඞ්ඝිකදානයෙහිලා දෙන්නහු විසින් දන් පිළිගන්නවුන්ගේ සිල්වත් බව ගුණවත්බව උස්පහත්බව පුද්ගල විසින් නො සැලකිය යුතු ය. සඞ්ඝගුණයෙහි ම සිත බැඳිය යුතු ය. එම සිහිකළ යුතු ය. සඞ්ඝයා උදෙසා කහ කඩ අත කර බැඳ අඹුදරුවන් රක්නා සීසෑම් ගෙරිරැකීම් වෙණඳුම් කරණ සැහැසියනට දෙන දැය මහත් ඵල කරණුවෝ සැරියුත්-මුගලන් මහරහතුන් වහන්සේය, යි සිත්හි දැරිය යුතු ය. **"කසාවකණ්ඨසඞ්ඝස්ස දිත්තදක්ඛිණම්පන කො මහප්ඵලකරණෙන සොඛෙති?"** යන ප්‍රශ්නයෙහිලා පිළිතුර වූයේ **"සාරිපුත්ත-මොග්ගල්ලානාදයො මහාසාවකා"** යනු ය.

අද හෙලදිව වැස්සන් අත සඞ්ඝගතදක්ෂිණා පිරිනැමීමෙක් ඇතැයි කියන්නට කරුණු නැත්තේ ය. මෙහිලා දායකප්‍රතිග්‍රාහක දෙපක්ෂය ම කරුණු නො සලකා හැරියා සේ දක්නට ඇත. සඞ්ඝගතදක්ෂිණා පිරිනැමීමෙහිලා දායකයා විසින් ගණන් නියම කොට සඞ්ඝයා වහන්සේට කෙරෙණ ආරාධනය, කෙතෙක් දෙනා වහන්සේ දානය පිණිස වැඩම වියයුතු දැ, යි දායකයා විචාරීම, දානය පිණිස පැමිණි භික්ෂූන්ගේ ගණන බලා දන්පත් බෙදා තැබීම, පැමිණි භික්ෂූන්ගේ ගණන තමන් නියම කළ ගණනට වඩා අඩු ව ගිය කල්හි තැබූ දන්පත් බැහැර කිරීම, වැඩි ව ගිය කල්හි අඩු දන්පත් නැවැත ගෙණවුත් තැබීම, පැමිණි භික්ෂූන් අතර දයකයාගේ සිත් නො ගත් භික්ෂූහු වූවාහු නම්, ඔවුන් දැක දොම්නසට පැමිණීම, සිත් ගත් භික්ෂූන් දැක සොම්නසට පැමිණීම, තමන් ඇයද සිටි භික්ෂූන්ගේ ගණන අඩුව ගිය කල්හි දානවස්තුව විනාශ වී ය යි දොම්නසට පැමිණීම, වැඩි ව ගිය කල්හි ඉඩ පහසුකම් නො දැක දොම්නසට පැමිණීම, තමනට හිතවත් වූ භික්ෂූන්ගේ නම්ගම් ලියූ කුසපත් ඇල වූ පිරිකර සඞ්ඝයා ඉදිරියෙහි තබා සඞ්ඝිකවාක්‍යයෙන් පැවරීම, නැවැත දායකයා විසින් එපිරිකර තමන් කැමති සේ නම්ගම් ලෙසින් වෙන් කොට දීම, මෙලොව ප්‍රසිද්ධිය පිණිස කීර්තිය පිණිස දීම, දානය පිණිස එතැනට පැමිණි ප්‍රතිග්‍රාහකයන්ට පමණක් පැවරෙණ සේ පිළියෙල කර ගත් පාලිවාක්‍යයකින් දානවස්තුව පවරා ගැණීම යන මේ හැම, සඞ්ඝගතදක්ෂිණාවට විරුද්ධ ව සිටියෝ ය. දායක - ප්‍රතිග්‍රාහක දෙපක්ෂය විසින් මෙසේ දැන හෝ නො දැන මෙහිලා යොදන බොහො පිළිවෙත් සඞ්ඝිකදානයට පටහැනි ය. සඞ්ඝිකපරිෂ්කාරවිෂයයෙහි සඞ්ඝසම්මුති නො ලැබ සඞ්ඝිකපරිෂ්කාර තමන් අයත් කර ගැණීම, සඞ්ඝයා වහන්සේට යන්තමක් පෙන්වා දි වැඩියක් තමන් සතු කරගැණීම

යනාදිය ද මෙකල විනය නො දත් ඇතැම් භික්ෂූන් අත පවත්නා වූ අපාමග දක්වන්නා වූ පව් කම් ය. මෙ ද සඞ්ඝිකයෙහි නො ද යෙදෙන්නේ ය.

මෙසේ වැරදි ලෙසින් පිළියෙල වූ දානය සඞ්ඝික දානයක් නො වන අතර මේ දානයෙන් දායක-ප්‍රතිග්‍රාහක දෙපක්ෂයට ම වැඩෙක් නො වන්නේ ය. දායකයාහට මෙයින් තරමක අස්-වැසිල්ලෙක් වූයේ ද, ප්‍රතිග්‍රාහකයාහට උදර පූරණය මුත් අන් ඵලයෙක් නැත්තේ ය. එහෙත් මේ උදරපූරණය පරලොවට හිත නො වේ. අපාය පිණිස වේ.

දානය මෙසේ සඞ්ඝික විසින් සතකට බෙදෙන්නා සේ පුද්ගලික විසින් තුදුසකට බෙදෙන්නේ ය. ඒ මෙසේ ය.

"තථාගතෙ අරහන්තෙ සම්මා සම්බුද්ධෙ දානං දෙති, අයං පඨමා පාටිපුග්ගලිකා දක්ඛිණා" එකලා වූ සම්මා සම්බුදුරජානන් වහන්සේට දේ නම්, එය පළමු වැන්න ය.

"පච්චෙකසම්මාසම්බුද්ධෙ දානං දෙති, අයං දුතියා" පසේ බුදුරජක්හට දේ නම්, එය දෙවැන්න ය.

"තථාගතසාවකෙ අරහන්තෙ දානං දෙති, අයං තතියා" තථාගතශ්‍රාවක වූ රහතුන් වහන්සේ නමක්හට දේ නම්, එය තෙවැන්න ය.

"අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං චතුත්ථී" රහත්පලය පසක් කරණු පිණිස පිළිපන්නහුට දේ නම්, එය සිවුවැන්න ය.

"අනාගාමිස්ස දානං දෙති, අයං පඤ්චමී" අනාගාමී පුද්ගල-යක්හට දේ නම්, එය පස්වැන්න ය.

"අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං ඡට්ඨී" අනාගාමීඵලය පසක් කරණු පිණිස පිළිපන්නහුට දේ නම්, එය සවැන්න ය.

"සකදාගාමිස්ස දානං දෙති, අයං සත්තමී" සකෘදාගාමී පුද්ගලයක්හට දේන ම්, එය සත්වැන්න ය.

"සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නෙ දානං දෙති, අයං අට්ඨමී" සකෘදාගාමීඵලය පසක් කරණු පිණිස පිළිපන්නහුට දේ නම්, එය අටවැන්න ය.

"සොතාපන්නෝ දුනං දෙති, අයං නවමී" සෝවන් වූ වක්හට දේ නම්, එය නවවැන්න ය.

"සොතාපත්තිඵලසච්ඡිකිරියාය පවිපන්නෙන දුනං දෙති, අයං දසමී" සෝවන්ඵලය පසක් කරණු පිණිස පිළිපන්නහුට දේ නම්, එය දසවැන්න ය.

තෙරුවන් සරණ ගියේ ය, පංචසීලයෙහි පිහිටියේ ය, දස සීලයෙහි පිහිටියේ ය, එ දවස පැවිදි වූ හෙරණ තෙමේ ය, උපසපන් මහණ තෙමේ ය, වතින් පිරී සිටි මහණ තෙමේ ය, ආරඛවිදර්ශීක තෙමේ ය, සෝවන් මග පිහිටියේ ය, යන මේ අට දෙන සෝවන්ඵලය පසක් කරණු සඳහා පිළිපන්නෝ ය. කීහ එය මෙසේ: **"තිසරණගතෝ උපාසකෝ තදහු පබ්බජිතෝ සාමණෙරෝ උපසම්පන්නෝ භික්ඛු වත්තසම්පන්නෝ භික්ඛු ආරද්ධවිපස්සකෝ භික්ඛු මග්ගට්ඨෝති ඉමෙ අට්ඨ සොතාපත්තිඵලසච්ඡිකිරියාය පවිපන්නා නාම"** යි.

"බාහිරකෙ කාමෙසු විතරාගෙ දුනං දෙති, අයං එකාදසමී" සසුනෙන් බැහැර වූ පහ වූ කාමරාග ඇති ධ්‍යානලාභී වූ තවුසක්හට දේ නම්, එය එකොළොස්වැන්න ය.

"පුථුජ්ජනසීලවනෙන දුනං දෙති, අයං දවාදසමී" පුහුදුන් සිල්වත් මිනිසක්හට දේ නම්, එය දොළොස්වැන්න ය.

"පුථුජ්ජනදුසසීලෙ දුනං දෙති, අයං තෙරසමී" පුහුදුන් සුසිල් මිනිසක්හට දේ නම්, එය තෙළෙස්වැන්න ය.

"තිරච්ඡානගතෙ දුනං දෙති, අයං චුද්දසමී" බලු කපුටු ආ තිරිසන් ගිය සතක්හට දේ නම්, එය තුදුස් වැන්න ය.

තිරිසනුනට දෙනු ලබන දැය ගුණ විසින් උපකාර විසින් පොෂණය කිරීම් විසින් දෙවුනේ මෙහිලා නොගැණේ. පරලොව හදහා කුස පිරෙණ පමණින් දෙන ලද්දේ ම ගැණේ.

කමත්බිමෙක ඇති පසට වඩා යොදුනක් පමණ තැන ඇති පස, යොදුනක් පමණ තැන ඇති පසට වඩා සියක් යොදුනක් පමණ තැන ඇති පස, දහසක් යොදුන් පමණ ඇති තැන පසට වඩා සුවහස් යොදුන් පමණ තැන ඇති පස අනන්තාපරිමාණ විසින් පිළිවෙළින් මහත් මහත් ව ගියා සේ, තිසරණ පිහිටියහු පටන් ගෙණ බුදුරජුන් දක්වා සිල්වත් ගුණවත්හට දෙන දන්හි විපාකය ඉෂ්ටඵලය පිළිවෙළින් මහත් වන්නේ ය. එකින් එක

වැඩී සිටුනේ ය. සම්මා සම්බුදු රජුන්හට දෙන දන් ම පුද්ගලික දාන අතුරෙහි විපාක විසින් හැමට වඩා මහත්තම වන්නේ ය. සඞ්ඛ්‍යා නො කොට හැක්කේ ය. බුදුරජුන්ට වඩා ශ්‍රෙෂ්ඨ දක්ෂිණාර්හයෙක් ලොව නැත්තේ ද එහෙයිනි. එහෙත් මේ හැම දනට වඩා මහත් ඵලවනුයේ බුදුපාමොක් මහසඟනට දෙන දන් ය. **"නත්ථෙවාහං ආනන්ද! කෙනචි පරියායෙන සඞ්ඝගතාය දක්ඛිණාය පාටිපුග්ගලිකං දානං මහප්ඵලන්ති වදාමි"** යනු එහිලා දතයුතු යි. "ආනන්ද! කොයිලෙසකිනුදු සඞ්ඝගත දානයට වඩා පුද්ගලිකදානය මහත්පල ඇතැයි මම නො කියමි" යනු එහි අරුත්. අන් කවරක්හටත් දෙනු ලබන්නට වඩා සඞ්ඝයාහට දෙනු ලබන්න ම මහත්පලැ යි මෙයින් වදාළ සේක. එහෙයින් දන් දෙන්නන් විසින් ගුණනුවණින් යෙදී නිවන් සඳහා ම දන් දියයුතු ය. නිවන් පතා දෙන දානය ම නිර්වාණ පාක්ෂික වේ. කාන්තිමත් ද වේ. කාමසම්පත් පතා දෙන දානය සාංසාරික වේ. කාන්තිමත් ද නො වේ.

දානය පිළිබඳ සම්පදා සතරෙකි: **වත්ථුසම්පදා – පච්චයසම්පදා – චෙතනාසම්පදා – ගුණාතිරෙකසම්පදා** යි.

"නිරොධසමාපත්තිතො වුට්ඨිතො අරහා වා අනාගාමී වා දක්ඛිණෙය්‍යො වත්ථුසම්පදා නාම" දානයෙහි ලා නිරොධ සමාපත්තියෙන් නැගී සිටි රහතුන් වහන්සේගේ හෝ අනාගාමී ආර්‍යයක්හුගේ සම්මුඛභාවය වත්ථුසම්පදා නම්. දුන් මොහොතෙහි ම ඉෂ්ටඵල දීමෙහි පොහොසත් වූයේ එකෙණෙහි නැගී සිටි නිරොධසමාපත්තිය ඇති රහතුන් වහන්සේට හා අනාගාමී ආර්‍යයන් වහන්සේට දෙනු ලබන දානය යි. එහෙයින් මේ ආර්‍යයෝ දෙදෙන උත්කෘෂ්ට විසින් වත්ථුසම්පදායෙහි ගැණෙත් ස්‍රොතාපන්නාදිආර්‍යයන්ගේ සම්මුඛභාවය ද වත්ථුසම්පදා යි ගැණෙතුදු එය රහතුන්ගේ හා අනාගාමීන්ගේ සම්මුඛභාවය තරම් ඉෂ්ට ඵලදානයෙහි වෙගවත් නො වේ. 'ඛෙත්තසම්පදා'යි හඳුන්වනු ලබන්නී ද මෝ ය.

"පච්චයානං ධම්මෙන සමෙන උප්පත්ති පච්චයසම්පදානාම" හදහා දෙන දානවස්තුන්ගේ දැහැමිබව පච්චයසම්පදා නම්.

"දානතො පුබ්බෙ දානකාලෙ පච්ඡාභාගෙති තීසු කාලෙසු චෙතනාය සොමනස්සසහගතඤ්ඤණසම්පයුත්තභාවො චෙතනාසම්පදා නාම" දානවස්තුන් හා ප්‍රතිග්‍රාහකයන් සපයන සොයන

කාලයෙහි, දානවස්තූන් ප්‍රතිග්‍රාහකයන් අත තබන කාලයෙහි, එයින් පසු කාලයෙහි යන තුන් කල්හි දාන චෙතනාව සොම්නසින් හා නුවණින් බැඳී පැවැත්ම චෙතනාසම්පදා නම්.

"දක්ඛිණෙය්‍යස්ස සමාපත්තිතො වුට්ඨිතභාවො ගුණාතිරෙකසම්පදා නාම" දන් පිළිගැණීමට පැමිණි රහතුන් හා අනාගාමී ආර්‍යයන් නිරොධසමාපත්තියෙන් එකෙණෙහි නැගී සිටිබව ගුණාතිරෙකසම්පදා නම්. මෙ කියූ සම්පදා සතරින් නො අඩු ව පිරී ගත් දානමයකුසලචෙතනාව මේ අත්බව්හි ම විපාක දෙන්නී ය. ඒ එකාන්ත ය.

රජගහනුවර **කාකවලිය** නම් එක් දිළිඳු මිනිසෙක් විසී ය. එක් දවසක් ඔහුගේ අඹු, දෙන්නාට බීමට සෑහෙන පමණින් පිළියෙල කරගත් කොළකැඳක් එදින ම නිරොධසමාපත්තියෙන් නැගී සිටි **මහසුප්** මහරහතුන් වහන්සේට පිදූ ය. උන්වහන්සේ එය ගෙණ ගොස් බුදුරජුන් වෙත එළවූහ. බුදුරජානන් වහන්සේ එයින් තමන්ට සෑහෙන පමණක් ම පිළිගත්හ. ඉතිරි කොටස පන්සිය දෙනකුහට සෑහෙන්නේ විය. කාකවලිය ද එහි පැමිණියේ ය. ඔහුට ද එයින් කැඳ ටිකක් ලැබුනේ ය. මහාස්ථවිරයන් වහන්සේ කාකවලියහට මෙයින් ලැබෙන ඉෂ්ටඵලය කිමැ යි බුදුරජුන් විචාළ කල්හි කාකවලිය මෙයින් සත්වන දා සිටුතනතුරු ලබන්නේය යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. ඒ වදාළ ලෙසට එරටැ රජ තෙමේ කාකවලියහට එරටෙහි සිටුතනතුර දුන්නේ ය. සියඹුව ලත් නිදන් සැළි සතෙහි වූ මහත් ධනය නිසා මෙ තෙමේ එරටැ මහාධනවතා ද වූයේ ය.

කාකවලියගේ සිටුතනතුරු ලැබීමත් ඔහු අඹුගේ නිදන් සැළි ලැබීමත් පූර්වෝක්තසම්පදා සතරින් පිරී ගත් දානමයකුසල චෙතනාව මෙලොව ම කල් නො යා දී මහත් විපාක දෙන බවට නිදසුන් විසින් දතයුතු ය.

දානයෙහි ලා ලැබියයුතු මේ ගුණාතිරෙකසම්පදාව අද මෙ කල නො ලැබිය හැකි ය. එහෙයින් මෙ කල දන් දෙන්නන්හට දාන වස්තූන් ප්‍රතිග්‍රාහකයන් අත තබත් ම ඇස් ඉදිරියෙහි ලැබෙන ඉෂ්ටඵලයෙක් නො ද පෙණෙන්නේ ය. ඉතිරි සම්පදා තුණ අද ද දානයෙහිලා ලැබිය හැකි ය. එහි හෙතු මෙ දවස බුද්ධොත්පාද කාලයක් වීම ය. බුද්ධොත්පාදයෙහි වුව ද එ ද ලැබීමෙහි සමර්ථයෝ නුවණැත්තෝ ය. උසස් වූ ප්‍රතිග්‍රාහකයන් වශයෙන් ගැණෙන

දක්ෂිණාර්ගීසඞ්ඛ්‍යාත වූ ආර්‍ය්‍යයන් බුද්ධොත්පාදකාලයෙහි ම මුත් ඉන් අන් කලෙක නො ලැබෙන බැවින් ආර්‍ය්‍යසඞ්ඝ නම් වූ සර්ව සම්පූර්ණවස්තුසම්පදාව අන් කල්හි නො ලැබේ. පච්චයසම්පදා - චෙතනාසම්පදාවන් නුවණැත්තන්හට අබුද්ධොත්පාදකාලයෙහි වුව ද ලැබිය හැකි ය. පච්චය-චෙතනාසම්පදා කොතරම් පවිත්‍ර වූව ද පවිත්‍ර වූ වස්තුසම්පදායෙන් තොර වූ දානය ආලොකවත් විපාකයක් දායකයා නො පසුබස්වන විපාකයක් නො දෙන්නේ ය.

දඹදිව **අසිතඤ්ජන** නුවර **මහාකංස** නම් රජෙක් වූයේ ය. ඔහුට පුත්තු දස දෙනෙක් වූහ. එකෙක් අඩකුර නම් ය. හෙතෙමේ රජයෙන් තමාට හිමි කොටස අනෙක් සොහොයුරන්ට පවරා දී තෙමේ සාමාන්‍යයකු සේ වෙළඳමට බැස්සේ ය. දවසෙක හෙතෙමේ දෙවියකු වෙතින් දානඵල අසා සොම්නස් ව රට ඒ ඒ තැන දන්හල් කරවා හැම දෙනාහට සැපසේ ජීවත් වන්නට මග යොදා මහවතුරක් සේ දන් දෙන්නට පටන් ගතු. රට තැන තැන තුබූ මොහුගේ දන්හල්වලට දින පතා දරපලා එකතු කරණ මිනිස්සු සැට දහසක් වූහ. දුරුම්රිස් ඈ කුළුබඩු අඹරා කැටි කොට දෙන ලම්ස්සියෝ සොළොස් දහසක් වූහ. එළවලු කපා සෝදා යොදා දෙන තුලතුනා ගෑණු එපමණ ම වූහ. තිස්දහසක් අරක්කැමියෝ කෑම පිළියෙල කළහ. අසූ සත්දහස් දෙසිය දෙසැත්තෑ යාලක් ද තුදුස් අමුණක් ද දෙපෑල් දෙලාස්සක් ද සුවඳ ඇල්හාල්, බත් පිණිස තැම්බූහ. දානය පිණිස පැමිණි හැම දෙනෙකුන්හට ම තම තමන් රිසි හැම දැයක් ම ලැබින. මේ දැය නැතැ යි කියන්නට එහි කිසි දැයක අඩුවෙක් නො වී ය. දින පතා උදය සවස එනුවර "බඩගිනි ඇත්තෝ කවුරු ද, පිපාසා ඇත්තෝ කවුරු ද, රෙදිපිළී නැත්තේ කවරක්හට ද, කරත්ත බැඳීමට ගොනුන්ගෙන් අසුන්ගෙන් ප්‍රයොජන ඇත්තෝ කවුරු ද, කුඩ වහන් සබන් පියොර සුවඳදිය වුවමනා නම් කියන්නැ, යි කියමින් නුවර පුරා ඇවිදීමට බොහෝ දෙනෙක් යොදන ලදහ. මෙසේ පච්චය - චෙතනාසම්පදාවන්ගෙන් කිසිත් අඩුවක් නැති ව බොහෝ අවුරුදු ගණනක් අතර නො තබා දන් දුන් අඩකුර තෙමේ මිය ගොස් තව්තිසා දෙව්ලොව උපන්නේ ය.

අප බුදුරජුන් දවස මැටිකබලක් ගෙණ කඩපලක් ගානේ හිඟමින් දිවි ගැලවූ **ඉඤ්ඤක** නම් යාචක තෙමේ දවසක් කඩ පිළෙක හිඟා යන්නේ තමාට දෙන්නට ගෙණ ආ බත්සැන් ද

එනි සිඟා වැඩිය **අනුරුද්ධ** මහාතෙරුන්ට දෙවී ය. මිය ගොස් ඒ පිණෙන් තව්තිසා දෙව්ලොව උපන් ඉඳුක රූපයෙන් ශබ්දයෙන් ගඤ්ඡයෙන් ස්ප්‍රෂ්ටව්‍යයෙන් ආයුෂයෙන් වණ්ණයෙන් සැපයෙන් බලයෙන් ප්‍රඥයෙන් ආධිපත්‍යයෙන් අඬකුරයා යමකොට සිටියේ ය.

මේ දවස මාගේ නිලෝගුරු සම්මා සම්බුදු රජානන් වහන්සේ අභිධම්දේශනාව පිණිස තව්තිසා දෙව්ලොව පරසතු රුක්මුලනි පැණවුනු පඬුඇඹුල් සලස්න අරා වැඩ හුන් සේක. දසදහසක් සක්වළ වැසි නොයෙක් තරාතිරමේ දෙව්බඹුන් බණ අසන්නට එහි රැස්වූහ. අඬකුර ද එහි ආයේ ය. ඉඳුක ද පැමිණියේ ය. ඉඳුක බුදුරජුන් ඉදිරියෙහි ම වාඩි ගත්තේ ය. අඬකුර බුදුරජුන්ට අටසාළිස් ගව්වෙකින් ඈත්හි සිට ගතු. එකල්හි බුදුරජානන් වහන්සේ අඬකුර අමතා =

"මහාදුනං තයා දින්නං අඬකුර! දීඝමන්තරෙ!
සුවිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකෙ"

යි ඇමතූ සේක. "අඬකුර! තෝ බොහෝ දිගුකලක් දන් දුන්නෙහි, ඉතා ඈත්හි හිඳිහි, මෙහි මා වෙත එව" යනු අරුත්.

බුදුරජුන් විසින් මෙසේ අඬ ගා වදුළ කල්හි අඬකුර "ස්වාමීනි! බොහෝ කලක් දන්හල් කරවා මා විසින් දන් දෙන ලද ද එ දන් දක්ෂිණාර්හයන්ගෙන් සිස් වූ බැවින් මට ලොකු ඵලලාභයෙක් නො වී ය, මේ ඉඳුක බත්සැන්දක් දී තරු මැඩ බබලන පුන්සඳ සේ අප යටපත් කොට බබලයි, කරමැටි බිමෙහි වපුළ බීජයන් ගොවියාගේ සිත් පුරා ඵල නො දෙන්නා සේ දුශ්ශීලයන් කෙරෙහි දුන් මහදන් ද ඉෂ්ටඵල දීමෙන් දෙන්නහු සතුටු නො කරන්නේ ය, සාර වූ කුඹුරෙක්හි වපුළ ඉතා ටික වූ ද බීජයන් නිසි කල්හි වැසිදහර ලබා යෑමෙන් ගොවියා සතුටු කරන්නා සේ ගුණවත් තාදී වූ සිල්වතුන් කෙරෙහි දුන් නො මහත් වූ ද දානය මහත්ඵල දානයෙන් දෙන්නහු සතුටු කරන්නේ ය, ස්වාමීනි! මා කොතරම් උසස් ලෙසින් දන් දෙන ලද නමුත් දානයෙහිලා මහත් ධනයක් යොදන ලද නමුත් මාගේ ඒ දානය දක්ෂිණාර්හයන්ගෙන් සිස් වූ බැවින් මම මෙසේ ඉතා ඈත්හි හැම සැපනින් ඉඳුහට අඩුව ඔහුට යටත් ව ඉඳිමි" යි කියා සිටියේ ය.

අඞ්කුර හවුරුදු බොහෝ ගණනක් දත් දුන්නේ ය. එ ද යන්නමකට නො වී ය. චෙතනාසම්පදයෙන් පවිත්‍ර ව වසනු සම්පදයෙන් මහත් කොට ප්‍රතිග්‍රාහකයන්ගේ මනදෙළ වඩාලා ම දුන්නේ ය. ඉඳුක සිඟා යද්දී තමන්ට ලැබුනු බත්සැන්ද පමණක් මි දුන්නේ ය. අඞ්කුරගේ දුනයෙහි දත් පිණිස එක් දවසෙක නැම්බූ සුවඳඇල් සහල්, විසිපස්කෝටි අනූතුන්ලක්ෂ සතළිස් පත්දහස් සයිය කොටසක් කළ කල්හි ලැබෙන ඉතා කුඩා කොටස පමණටත් ඒ බත්සැන්ද නො අගනේ විය. අඞ්කුරගේ දුනය හැම රසමසින් පිරී තුබුනේ ය. සියතින් ම දෙවුනේ ය. ප්‍රතිග්‍රාහකයන්ට රිසි වූ හැම දෙයක් ම දුන්නේ ය. වෙළඳුම පටන් ගත් දා සිට දුනොපකරණ රැස් කිරීමෙහි දත්. දීමෙහි නො පසුබට උත්සාහයෙක් එහි පැවැත්නේ ය. එහෙයින් එහි යෙදුනු පූජාචේතනා බොහෝ ය.

ඉඳුකගේ දුනයෙහි වටිනාකමෙක් උසස්බවෙක් මිහිරි බවෙක් නො වී ය. සියතින් නො දෙවුනේ ය. රසින් මසින් අවුලුයෙන් කැවිලියෙන් නො පිරුණේ ය. අමුතු උත්සාහයෙක් ද නො වී ය. එහෙයින් එහි නැගුනු පූජාචේතනා ද වික ය. එහෙත් ඉඳුක නෙමේ හැම යසිසුරෙන් අඞ්කුර යට කොට සිටියේ ය. ඉඳුකගේ දුනය, වසනු-චෙතනා-ප්‍රත්‍යයසම්පදයෙන් පිරී සිටි බැවින් ඉඳුක නැති සිටියේ ය. අඞ්කුරගේ දුනය වසනුසම්පදයෙන් පිරිහින. දත් පිළිගත්නෝ සිල්වත් නො වූහ. එහෙයින් අඞ්කුරගේ දුනය ඉෂ්ටඵලදුනයෙහි ශක්තිමත් නො වී ය.

දන්පින්කම් සඳහා යොදන දුනවසතුහු ධාර්මිකවූවෝ දුනය මහත්පල කරත්. ආයුධ වෙළඳුමෙන් සත්ත්ව වෙළඳුමෙන් මද්‍ය වෙළඳුමෙන් විෂවෙළඳුමෙන් සතුන් මැරීමෙන් හොරකම් කිරීමෙන් පරඹුවන් සෙවුමෙන් පරපිරිමි සෙවුමෙන් බොරු කීමෙන් පරාපෙළීමෙන් මං පැහැරීමෙන් ගණිකාවන් තැබීමෙන් උපයන ධනයෙන් සපයන දුනවසතු ධාර්මික නො වේ. දුනය එබඳු දුනවසතු යොදු සිවුරෙන් පිළියෙන් සළුවෙන් ඛනින් රසින් මසින් කිරියෙන් පැණියෙන් කැවිලියෙන් ලෙව්ල්ලෙන් බුලතින් කපුරෙන් සුවඳින් ඇදෙන් පුටුවෙන් පැදුරෙන් කොට්ටයෙන් මෙට්ටයෙන් බිස්සෙන් ඇතිරියෙන් ගිතෙලින් දියෙන් වෙඹුරෙන් හකුරෙන් මීයෙන් සකස් කොට දෙන ලද ද දුන්නහු ඵලදුනයෙන් ආයු ඇත්තකු පැහැ ඇත්තකු සැප ඇත්තකු බල ඇත්තකු නුවණැත්තකු නො කරන්නේ ය.

"ධම්මං චරෙ යොපි සමුඤ්ඤකං චරෙ
දුරං ච පොසං දදමප්පකස්මිං,
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ"

දහසක් භික්ෂූන්ට දුන් දන් ඇති නොහොත් කහවණු දහසක් වියදම් කොට පිළියෙල කළ දන් ඇති ලක්ෂයක් දෙනකුගේ මහාදානයෝ, භික්ෂූන් දසකෙළකට කහවණු දසකෙළකින් දුන් නා වූ ඒ මහාදානයෝ, අතැන මෙතැන හැසිරෙමින් යමක් කමක් දුකසේ සපයා ගෙණ ඉඳුල්කමින් දුකසේ කරණ දිවිවැටුම් ඇති අඹුදරුවන් ද රක්නා පලා පමණ වූත් දියයුතු දෙයක් ඇතිකල්හි නො පසුබට ව දෙන දිළින්දාගේ දානයෙහි සිය-යෙන් කොටසටත් ලං නො වෙත්. නො අගිත්.

"කෙනෙසයඤ්ඤො විපුලො මහග්ගතො
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස"

මහත් වූ ප්‍රත්‍යයයන්ගේ වශයෙන් උදාරබවට ගිය මේ මහා දානය දැහැමින් සෙමින් ලැබ දුන් දානයාගේ වටිනාකමට කුමක් හෙයින් නො ඒ ද, සහස්‍රයාගී වූ ලක්ෂයක් දෙනාගේ දසකෙළකගේ ඒ දානයෝ එබඳු දිළින්දාගේ නො මහත් වූ දානයෙහි සියයෙන් කොටසකට වත් කවරහෙයින් නො අගිත් ද නො වටිත් ද, එයට කරුණු මෙසේ වදාරණ සේක.

"දදන්ති හෙකෙ විසමෙ නිවිට්ඨා
ඡෙත්වා වධිත්වා අථ සොචයිත්වා,
සා දක්ඛිණා අස්සුමුඛා සදණ්ඩා
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
එවම්පි සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ"

ඇතැම් කෙනෙක් දන් දෙන්නෝ විසම වූ කායවාඞ්මනා කර්මයෙහි පිහිටියෝ කය වචන සිත වැරදි මග යොදා පව්මගින් දන සපයා අනුන් තළා පෙළා මරා ශොකීන් කොට දන්දෙත්. ඒ දානයෝ කඳුලු වැකුණු මුණු ඇත්තන් කොට මෙරමා හඬව හඬවා දුන් බැවින් අස්සුමුඛදාන නම් වෙත්. අස්සුමුඛදානය දානවස්තුවෙන් කොතරම් මහත්බවට ගියේ ද, දැහැමින් සෙමෙන්

යමක් ලැබ දුන් දානයාගේ වටිනාකමට කොයි ලෙසකිනුදු නො පැමිණෙන්නේ ය. ඒ මහාදානය මේ දියයුතු දැයින් නො පිරිපුන් දානයට කිසිසේත් සම නො වන්නේ ය. ඒ මහාදානය මෙහි සියයෙන් කොටසක් හා ද නො වටනේ ය. යම්තම් දානය ම මහත් ය. උදාර ය.

දානය දානවස්තූන්ගේ දැහැමිබවෙන් දැහැමි වේ. නො දැහැමි බවෙන් නො දැහැමි වේ. දැහැමි වූයේ මහත්පල ඇත්තේ ය. නො දැහැමි වූයේ පල නැත්තේ ය. දැහැමි වූයේ දෙන්නහු හැමතින් නගා සිටු වන්නේ ය. නො දැහැමි වූයේ දෙන්නහු හැමතින් පහත ලන්නේ ය.

දානය, පූර්ව-මද්‍ය-අපරචේතනා වශයෙන් ලැබෙන චේතනා සම්පදායෙන් පිරිහුනේ ඵලදායක නො වේ. මෙහි යට කියූ චුලෙ-කසාටක බමුණු පුවත පූර්වචේතනා ව කිලිටිව ගිය දානයෙහි විපාකය මෙබඳු යි කියාලන්නේ ය. ඒ බැලිය යුතු ය.

මද්‍යවේතනාව කිලිටි ව ගිය කල්හි ලැබෙන විපාකයෙහි තරම පහත දැක්වෙන පුවතින් පැහැදිලි වන්නේ ය. "උක්දඬු-මිටියක් කරට ගෙණ උක්දඬුකඩක් සපමින් මග යන මිනිසකු දුටු, දරුවකු ද කර තබා ගෙණ උන් පසු පස ගිය අනෙකෙක් දරු උදෙසා ඔහුගෙන් උක්දඬුකඩක් ඉල්ලී ය, එහෙත් හෙතෙමේ දරුගේ හැඬීමත් උක්දඬු ඉල්ලීමත් නො ඇසුනකු සේ පසු නො බලා ම ගියේ ය, නැවැත නැවැතත් උක්දඬු ඉල්ලා කළ ඇවැටිල්ලෙන් මහත් සේ කිපුනු ඒ මිනිසා බැණ වදිමින් පසු නො බලා ම උක්දණ්ඩක් ඇද පස්සට වීසි කෙළේ ය, කලක් සිට මිය ගිය මෙතෙමේ ඇතුළත මෝරා තුබූ දළ ලොභය හෙතු කොට ප්‍රෙතලොකයෙහි උපන. කිලිටි වූ චේතනායෙන් වුව ද උක්දඬුකඩ දුන් පින් බෙලෙන් ඌ සඳහා අට කිරියක් පමණ බිමැ අඳුන් පැහැති මොහොල් පමණ උස් මහත් වූ උක්ගසින් පිරී ගත් උක්වනයෙක් පහළ වූයේ ය. සාපිපාසායෙන් මිරිකී ගිය විටෙක 'උක්දඬුකඩක් කපා ගණිමි" යි ඌ උක්වනයට ගිය කල්හි උක්දඬු, තෙමේ ම පැසී නැමී ඇඹරී අවුත් ඌට පහර දෙන්නේ ය.

උක්දඬුකඩ දුන්නේ ද උක්දඬුකඩ දීමෙහි පැවැති චේතනා-මාත්‍රය ලොභාදිඅකුශලයන්ගෙන් කිලිටි වූ බැවින් හේ ප්‍රෙත ලොකයෙහි උපන. උක්දඬු දී මෙහි විපාක විසින් උක්වනයෙක් පහළ වි ය. එහෙත් එයින් ඌට වැඩක් නො වූයේ ය.

අපරවෙතනාව කිලිටිව ගිය කල්හි ලැබෙන දානඵලය කෙබ-දු ද යනු යට කියූ අපුත්තක සිටුපුවනින් දත හැක්කේ ය. ඒ බැලිය යුතු ය.

'දෙමි, යි සිතක් උපන් කෙණෙහි යමක් අන්හට දීම නො පහසු නො වේ. පහසු ය. නො පහසු වනුයේ යමක් අන්හට දී ඉන් පසු උපන් ලොභාදී වූ යම්කිසි කිලිටෙකින් හෝ අන්හු කී බසෙකින් හෝ මේ දීම මෝඩ කමෙක, මේ දීමෙන් වැඩෙක් නැතැ'යි පසුතැවිලි නො වී සිටීම ය. එය කඩු ගිලීමටත් වඩා අපහසු ය. දීමෙන් පසු සිත පිරිසිදු ව තබා ගැණීම අපහසු ය.

වස්තු-ප්‍රත්‍යය-චෙතනාසම්පත්තීන් නො අඩුව යෙදුනු දාන ය ම දෙන්නහු උපනුපන් තන්හි සනසන්නේ ය. ඔදවැඩි කරන්නේ ය. දායකයා නුවණැත්තකු කරන්නේ දනැත්තකු කරන්නේ කුලැත්තකු කරන්නේ විශාරදයකු කරන්නේ නො පසුබස්නකු කරන්නේ වීරයකු කරන්නේ කන්නකු කරන්නේ අඳින්නකු කරන්නේ පළඳින්නකු කරන්නේ දෙන්නකු කරන්නේ දුටුවන් පහදවන්නකු කරන්නේ උසට නිසි මහත ඇත්තකු කරන්නේ මහතට නිසි උස ඇත්තකු කරන්නේ මස්ලේ ඇත්තකු කරන්නේ දිගා ඇත්තකු කරන්නේ බලැත්තකු කරන්නේ දූ පුතුන් ඇත්තකු කරන්නේ පිරිවර ඇත්තකු කරන්නේ අධිපතියකු කරන්නේ නො පැරදවිය හැක්කකු කරන්නේ මෙ කියූ වස්තු-සම්පත්ත්‍යාදියෙන් පිරී ගත් දානමයකුශලචෙතනා මාත්‍ර ය යි.

පියුමතුරා බුදුරජුන් දවස **සුජාත** නම් තෙරකෙනකුන් වහන්සේ පංශුකූලවීවරයට සුදුසු රෙදිකඩක් සොයා යනු දුටු **හංසවති** නුවරවැසි සැදැහැති මිනිසෙක් ඇද තුබූ රෙදිකඩින් කැබැල්ලක් කඩා උන්වහන්සේට පුදා ගියේ ය. හේ ඒ පිණෙන් තෙනිස් වරක් දෙව්ලොව ඉපිද දෙව්රජය කෙළේ ය. සත්සිය වරක් මිනිස්ලොව සක්විතිකම් කෙළේ ය. කාශි-කොශල-මගධ-කුරු-පඤ්චාල-අඞ්ග-වඞ්ගකාලිඞ්ගාදිදෙශයන්හි ඉපිද පෙදෙසි රජකම් කළ වාර මෙතෙකැ යි නො කියැ කි ය. කසුප් බුදුරජුන් දවස පැවිදි ව මහණදම් පුරා එතැන් පටන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරමින් ඇවිදුනා හෙ-තෙමේ අප බුදුරජුන් දවස කොසඹෑ නුවර බමුණු ගෙයක ඉපිද ඉගෙණ බුදුගුණ අසා මහණ ව උපසපන් වී භාවනා කරන්නේ රහත් වි ය.

මෙහි වූ දැනවසතු හැම එකෙක් නො අගනේ විය. නො වටනේ විය. එහෙත් ධාර්මික ය. ප්‍රත්‍යයසම්පත්තියෙහි මහත්ත්වයත් ධාර්මිකත්වයත් වස්තුසම්පත්තියෙහි ගුණමහත්ත්වයත් චේතනා සම්පත්තියෙහි පවිත්‍රත්වයත් නිසා මේ දුප්පත් මිනිස් තෙමේ ලොව් ලොවුතුරා හැම සැපයින් පිරී ඉතිරී පැතිරී ගියේ ය. සසරදුක නිමා කෙළේ ය.

සඟනමක්හට රෙදිකඩක් දුන් මල්වඩමක් දුන් සුවඳ පිඩක් දුන් උක්පැණිත්තක් දුන් පිඬු සිඟා ගිය මහණක්හට කිරිබතක් දුන් උක්ගස් කඩක් දුන් මිහිරිපලයක් දුන් වැල්නිඹිරියක් දුන් කැකිරිපලයක් දුන් නියඹරුවක් දුන් කොම්බුපලයක් දුන් පලා මිටක් දුන් මූලපලාවක් දුන් කොසඹකොළමිටක් දුන් තලමූරුවටක් දුන් මල්මිටක් දුන් කාබානක් දුන් අස්වටක් දුන් කළලෝ පයක් දුන් දුම්කබලක් දුන් තල් වැටක් දුන් මොනරපිල්මිටියක් දුන් කුඩයක් දුන් වහනක් දුන් ඉඳුල්කඩක් දුන් කැවුමක් දුන් අග්ගලාවික් දුන් ලාලුවක් දුන් වළඳනා මහණක්හට පැනිත්තක් දුන්- ඇඹුල් කැඳක් දුන් දැගැබකට සුවඳපසඟුලක් දුන් පිදුරු වඩමක් දුන් නොයෙක් තරාතිරමේ උවැසියෝ වෙන වෙන දහස් ගණන් දෙවඟනන් පිරිවර කොට ඇතියාහු සක්දෙව්රජුගේ පරිචාරිකාවන් ලෙසින් දෙව්ලොව උපන්හ. වස්තුසම්පත්තාදීන්ගේ පරිපූණ්ණතායෙන් මොවුහු මේ සම්පත් ලැබූහ.

කරුණු මෙසේ බැවින් ඉෂ්ටඵලකාමතායෙන් දන් දෙන්නන් විසින් දන් දීමෙහි දී කුදු මහත් හැම දීමනාවක්, මෙ කියූ සම්පත්තීන්ගෙන් සම්පූණ් කළ යුතු ය. සවල්ප වූ දැනවසතු ඇති දැනය මහත් වනුයේ එවිට ය. මහත් දැනය, මහත්තම වනුයේ එවිට ය.

වත්‍ථුසම්පදා-චෙතනා සම්පදාදෙකින් පරිපූණ් වූ දක්ෂිණා තොමෝ ෂඩඞ්ගසමන්වාගත දක්ෂිණා යි කියනු ලැබේ. **"කථඤ්ච භික්ඛවෙ! ඡළඞ්ගසමන්නාගතා දක්ඛිණා හොති? ඉධ භික්ඛවෙ දායකස්ස තීණඞ්ගානි හොන්ති පටිග්ගාහකානං තීණඞ්ගානි, කතමානි දායකස්ස තීණඞ්ගානි? ඉධ භික්ඛවෙ! දායකො පුබ්බෙ දානා සුමනො හොති, දදං චිත්තං පසාදෙති, දත්වා අත්තමනො හොති, ඉමානි දායකස්ස තීණඞ්ගානි. කතමානි පටිග්ගාහකානං තීණඞ්ගානි? ඉධ භික්ඛවෙ! පටිග්ගාහකා වීතරාගා වා හොන්ති රාගවිනයාය පටිපන්නා වා, වීතදොසා වා හොන්ති දොසවිනයාය පටිපන්නා වා, වීතමොහා වා හොන්ති මොහවිනයාය පටිපන්නා වා, ඉමානි පටිග්ගාහකානං තීණඞ්ගානි"**

මහණෙනි! දක්ෂිණව ෂඩඞ්ගසමන්වාගත වන්නී කෙසේ ද? මහ-ණෙනි! දානයෙහිලා දෙන්නහු පිළිබඳ අඞ්ගතුණෙක් වේ. දායක තෙමේ දීමට පෙර සතුටු සිත් ඇත්තේ වේ. දෙන්නේ සිත පහදා ගණියි. දීම අවසානයෙහි සතුටු සිත් ඇත්තේ වේ. මේ දායකයා පිළිබඳ අඞ්ග තුණය. මහණෙනි! දානයෙහිලා පිළිගන්නෝ පහ වූ රාගය ඇත්තෝ හෝ රාගය දුරුකිරීමට පිළිපන්නෝ වෙත්. පහ වූ දේවෂය ඇත්තෝ හෝ දේවෂය දුරුකිරීමට පිළිපන්නෝ වෙත්. පහ වූ මොහය ඇත්තෝ හෝ මොහය දුරුකිරීමට පිළි-පන්නෝ වෙත්. මේ පිළිගන්නන් පිළිබඳ අඞ්ග තුණ ය. මේ ෂඩඞ්ගය ඡළඞ්ගසූත්‍රයෙහිලා වදාළ සේක.

මහාමුහුදු දිය නැළිගණනින් ලාස්ගණනින් මැන මෙතෙකැයි දක්වන්නට නො හැකි මහාදියකඳක් වන්නා සේ ෂඩඞ්ගසමන්වා-ගත දක්ෂිණාවෙහිලා ලැබෙන කුශලරාශිය මෙතෙකැයි දක්වනු නො හැකි ය. එහිලා පමණ නො කොට හැකි, ගණන් නො කියැකි මහාපුණ්‍යස්කන්ධයෙක් ම ලැබෙන්නේ ය.

"පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා චත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා"

දීමට පෙර සතුටුවීම දෙන කල්හි සතුටුවීම දීලා අවසන්හි සතුටු-වීම යන මෙතුණ දායකයා පිළිබඳ දානසම්පත් ය.

"වීතරාගා වීතදොසා වීතමොහා අනාසවා,
ඛෙත්තං යඤ්ඤස්ස සම්පත්තං සඤ්ඤතා බ්‍රහ්මචාරිනො"

පහ වූ රාග ඇති පහ වූ දේවෂ ඇති පහ වූ මොහ ඇති ආශ්‍රවරහිත වූ සීලසංයමයෙන් සංයත වූ බ්‍රහ්මචාරීහු දානයෙහිලා සුදුසු වූ පිළි-ගත්තා වූ ක්ෂෙත්‍රය වෙත්.

"සයං ආචමයිත්වාන දත්වා සකෙහි පාණිහි,
අත්තතො පරතො චෙසො යඤ්ඤො හොති මහප්ඵලො"

මේ දානය තමන් කෙරෙන් හා ප්‍රතිග්‍රාහකයන් කෙරෙන් මහත් පල ඇත්තේ වේ. එහෙයින් තමන් විසින් ම දක්ෂිණාර්ගීයන්ගේ අත් පා සෝදා සියනින් ම දන් දිය යුත්තේ ය.

"එවං චජිත්වා මෙධාවී සද්ධො මුත්තෙන චෙතසා,
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජති"

නුවණැති සැදැහැති පණ්ඩිත තෙමේ ලාභමාත්සර්‍යාදියෙන් මිදුනු සිතින් යුක්ත ව මෙසේ දන් දී නිදුක් වූ සුව ඇති දෙව්ලොව උපදින්නේ ය.

පුබ්බචේතනා = 'දෙන්නෙමි' යි සිත උපන් තැන් පටන් 'මේ කුඹුරෙන් උපන් සහලින් දන් දෙන්නෙමි'යි කුඹුර ලකුණු කිරීම පටන් ඒ ඒ කටයුතු ගැණ සිතන්නහුට උපදනා චෙතනා ය.

මුඤ්චනචෙතනා = දන් දෙන වේලෙහි දන්පත් අතට ගෙණ ඒ දන්පත් ප්‍රතිග්‍රාහකයන් අත තබන් ම උපදනා චෙතනා ය.

අපරචෙතනා = දෙනලද දන් ගැණ සිහිකරණ හැම වේලෙහි උපදනා චෙතනා ය.

මෙහි 'වීතරාග, යනාදිය වදුළෝ ප්‍රතිග්‍රාහකයන් උතුකෑමට වශයෙන් දක්වනු සඳහා ය. හුදෙක් රහතුන්ට, අනාගැමින්ට, සෙදගැමින්ට සෝවනුන්ට දුන් දන ම ඡඩ්ඩිතසම්භාගත නො වේ. එ දවස පැවිදි වූ හණ්ඩගාහකසාමණේරයාහට දුන්නේ ද ඡඩ්ඩිතසම්භාගත ය. ඔහුගේ පැවිද්ද සෝවන්මග පිණිස ම බැවිනි.

"මහරජ! සිල්වත්හට දෙනලද්ද මහත්පල වේ, දුසිල්හට දෙන ලද්ද මහත්පල නො වේ"යි දක්වනු පිණිස **"සීලවතො බො මහාරාජ! දින්නං මහප්ඵලං නො දුස්සීලස්ස"** යි වදළා වූ ක්‍රමය මෙහිලා නො යෙදේ. එහෙයින් එය නො ගෙණ දායකයාගේ වශයෙන් ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් දායක ප්‍රතිග්‍රාහකයන්ගේ වශයෙන් වන්නා වූ දානයාගේ මහත්ඵලභාවය දතයුතු ය. මෙය වදුළෝ සඞ්ඝගතදක්ඛිණාවන් ගෙණ නො වේ. පුද්ගලිකදාන මෙහිලා ගත්හ. පුද්ගලිකදානවිෂයයෙහිලා සිල්වත්හට දෙන ලද්ද ම දෙනු ලබන්න ම මහත්පල වේ.

"යො සීලවා දුස්සීලෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුපසන්නචිත්තො,
අභිසඤ්ඤහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා දායකතො විසුජ්ඣති"

සිල්වත් යමෙක් පහන් සිත් ඇති ව දහමින් ලත් දායක් මහත් වූ කම්පල හදහා දුශ්ශීලයන් කෙරෙහි දුන්නේ ද ඒ දක්ෂිණාව දෙන්නහු සිල්වත් බැවින් ඔහුගේ වශයෙන් පිරිසිදු වේ. කාරණනිමත් වේ.

විශ්වන්තර මහාරජුගේ දූපුතුන් දීමෙහිලා රජුගේ දානාධ්‍යාසයෙහි හා සිල්වත්බැව්හි මහත්ත්වහෙතුවෙන් පොළොව සැලී ගියා ය. එය ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් වූ අරුමයෙක් නො වේ. එහි ප්‍රතිග්‍රාහක තෙමේ ජූජක නම් බමුණු ය. ඔහු සිල්වතෙක් නො වී ය. මෝ දක්ෂිණාව පිරිසිදු වූවා මහත්පල වූවා දායකයා අතින් ම ය.

"යො දුස්සීලො සීලවන්තෙසු දදාති දානං
අධම්මෙන ලද්ධං අප්පසන්නචිත්තො,
අනභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති"

දුස්සීල වූ යමෙක් නො පහන් සිත් ඇති ව නො දැහැමින් ලත් දැයක් මහත් වූ කම්පල නො අදහමින් සිල්වතුන් කෙරෙහි දේ ද ඒ දක්ෂිණාව පිළිගන්නන් සිල්වත් බැවින් පිළිගන්නන්ගේ වශයෙන් පිරිසිදු වේ. කාන්තිමත් වේ.

කැළණිගංමුවදොර විසූ කෙවුළෙක් **දීඝසොම** මහාතෙරුන්හට තුන් දවසක් පිණ්ඩපාතය දුන්නේ ය. ඒ දුන් පිණ්ඩපාතය මර ඇඳෙහි හොත් ඔහුට අපායයෙන් නිදහස් වීමට හෙතු විය. මේ අපායයෙන් වූ නිදහස ඔහුගේ සිල්වත්බවෙකින් හෝ දානාද්ධ්‍යාසයෙහි මහත් බවෙකින් හෝ සිදුවූවෙක් නො වේ. පිළිගත්තහුගේ සිල්වත්බවෙන් ම වූයේ ය. මෙහි පිළිගත්තෝ දීඝසොම තෙරණුවෝ ය. එහෙයින් මෝ දක්ෂිණාව ප්‍රතිග්‍රාහකයා අතින් ම පිරිසිදුවූ ය.

"යො සීලවා සීලවන්තෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුප්පසන්නචිත්තො,
අභිසද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං විපුලඵලන්ති බ්‍රෑමි"

සිල්වත් යමෙක් ඉතා පහන් සිත් ඇති ව දැහැමින් ලත් දැයක් මහත් වූ කම්පල හදහමින් සිල්වතුන් කෙරෙහි දේ ද ඒ දක්ෂිණාව දෙන්නහුගේ හා පිළිගන්නහුගේ වශයෙන් ම පිරිසිදු වේ. කාන්තිමත් වේ.

අසදිසමහාදානය මේ දෙශනාව සාර්ථක කරයි. එය මහත්පල වූයේ දායක-ප්‍රතිග්‍රාහකදෙපක්ෂය ම දානයක් මහත් පල වීමෙහි ලැබිය යුතු වූ හැම අඞ්ගයකින් ම යුක්ත වූ බැවිනි.

"යො වීතරාගො වීතරාගෙසු දදාති දානං
ධම්මෙන ලද්ධං සුප්පසන්නචිත්තො,
අභිසද්දහං කම්මඵලං උළාරං
තං වෙ දානං ආමිසදානනමග්ගං,

පහ වූ රාග ඇති යමෙක් ඉතා පහන් වූ සිත් ඇති ව දැහැමින් ලත් දැයක් මහත් වූ කම්පල හදහමින් පහ වූ රාග ඇත්තවුන් කෙරෙහි දේ ද ඒ දානය ආමිෂදාන අතුරෙහි අග්‍ර වූ දානය වේ.

මෙහි **වීතරාග** නම්, අනාගාමී ආර්‍යයන් වහන්සේ ය. රහතුන් වහන්සේ **එකාන්ත** වීතරාගයෝ ය. එහෙයින් රහතුන් වහන්සේ කෙරෙහි දෙන ලද්ද ම අග්‍ර වේ. භවාලය භවප්‍රාර්ථනා නැති බැවිනි. රහතුන් වහන්සේ දානඵල අදහන්නෝ ය. උන්වහන්සේ තරම් දානඵල අදහන අන් කෙනෙක් නො වෙත්. රහතුන් වහන්සේ විසින් කළ කර්මය ඡන්දරාගයෙන් තොර බැවින් කුසලයෙක් හෝ අ කුසලයෙක් හෝ නො වන්නේ ය. හුදෙක් ක්‍රියාමාත්‍රයෙක් ම වේ. එහෙයින් උන්වහන්සේට දෙන ලද්ද අග්‍රය යි කියත්.

බුදුරජානන් වහන්සේ විසින් ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේට දෙනලද්ද මහත්පල ද, නැත, ශාරීපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ විසින් බුදුරජුන්ට දෙනලද්ද මහත්පල ද? යනු මෙහි නැගෙන ප්‍රශ්නයෙකි බුදුරජුන් හැර දීමෙහි විපාක දන්නෙක් තුන් ලොව මනැත්තේ ය. එහෙයින් බුදුරජුන් විසින් සැරියුත් තෙරුන්ට දෙන ලද්ද ම මහත්පල වේ යනු එයට පිළිතුර ය.

පෞද්ගලිකදාන මහත්පල වන සැටි දක්වන මෙහි, එම මහත්පල නො වන සැටි ද මෙසේ දත යුතු ය.

"යො දුස්සීලො දුස්සීලෙසු දදාති දානං
අධම්මෙන ලද්ධං අප්පසන්නචිත්තො,
අනභිසද්දහං කම්මඵලං උළාරං
සා දක්ඛිණා නෙවුභතො විසුජ්ඣති"

දුසිල් වූ යමෙක් නො පහන් සිතින් නො දැහැමින් ලත් දැයක් මහත් වූ කම්පල නො අදහමින් දුශ්ශීලයන් කෙරෙහි දේ ද ඒ දක්ෂිණාව දායකප්‍රතිග්‍රාහක දෙපක්ෂය ම දුශ්ශීල බැවින් ඒ දෙපසින් ම පිරිසිදු නො වේ. කාන්තිමත් නො වේ.

දක්ෂිණාවිචිනන-දක්ෂිණාභීවිචිනනැ යි දානයෙහිලා ලැබිය යුතු පරීක්ෂාවෝ දෙදෙනෙකි.

පරීක්ෂා කොට ගැණීම තෝරා ගැණීම **විචිනන** නම්. දිය යුතු දානවස්තුන් තෝරා ලං කොට ගෙණ එයින් දන්දීම දක්ෂිණා විචිනන නම්.

මේ බුදුසසුනෙන් බැහැර වූ පංචනවුතිප්‍රභෙදවත් පාෂාණ්ඩ-දුශ්ශීලයන් දක්ෂිණාවට නො සුදුසු' යි තෝරා බැහැර කොට ශීලාදිගුණසම්පන්න ශාසනික භික්ෂූන් වහන්සේ ම දානයට සුදුසු වෙති' යි තෝරා ගැණීම දක්ෂිණාභීවිචිනන නම්. මේ දක්ෂිණා - දක්ෂිණාභීවිචිනනයෝ දානයෙහිලා බුදුරජානන් වහන්සේ විසින් පසස්නා ලදහ. **"විවෙය්‍ය දානං සුගතප්පසත්ථං"** යනු එහිලා දතයුතු ය.

කාලවශයෙන් දානය පසකට බෙදේ. **"පංචිමානි භික්ඛවෙ! කාලදානානි. කතමානි පංච? ආගන්තුකස්ස දානං දෙති. ගමිකස්ස දානං දෙති. ගිලානස්ස දානං දෙති. දුබ්භික්ඛෙ දානං දෙති. යානි තානි නවසස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති. ඉමානි ඛො භික්ඛවෙ! පංච කාලදානානි"** යනු සූත්‍ර යි.

අවුත් යනුයේ **ආගන්තුක** නම්. එබන්දකුට දීම ආගන්තුක-දාන යි. ආගන්තුක තෙමේ, එහි අමුත්තකු බැවින් පිඬු සිඟා යෑමට ගොදුරුගම් හා මග නො මග නො දනි යි. ගමනින් වූ විඩා ද ඇත්තේ වේ. එහෙයින් ඒ දීම කාලදාන යි. හුන් තැන හැර අන් තැනකට යනුයේ **ගමික** නම්. එබන්දකුට දීම ගමිකදාන යි. හේ අන් තැනකට යනු සඳහා ගමට පිඬු සිඟා ගියේ නම් තමන් බලාපොරොත්තු වන අර්ථයෙන් පිරිහෙන්නේ හෝ බලාපොරොත්තුවන තැනට බලාපොරොත්තුවන වේලෙහි නො පැමිණෙන්නේ හෝ වේ. ගමට පිඬු සිඟා නො ගොස් උදෑසන ම දෙන ලද්දක් වළඳා ගියේ නම්, තමන් කැමැති වූ හැම එකක් නිසි කාලයෙහි කොට ගත හැක්කේ වේ. එහෙයින් ඒ දීම කාලදාන යි.

ලෙඩින් පෙළෙන්නේ **ගිලාන** නම්. ඔහුට දීම ගිලාන දාන යි. පිඬු සිඟා යෑමෙහි අපොහොසත් වූ ගිලන් තෙමේ කෑම් බීම් නො ලැබීමෙන් වඩාලාත් ගිලන් වන්නේ ය. පිඬු සිඟා යෑමෙන් රෝගය උත්සන්න වන්නේ ය. පිඬු සිඟීමෙන් ලැබෙන මිශ්‍ර-කාහාරය හිත ද නො වන්නේ ය. එහෙයින් ඒදීම කාලදාන යි.

කෑම් බීම් විරල ලැබීම අපහසු කාලය **දුබ්භික්ඛ** නම්. එබඳු කාලයෙහි දීම දුර්භික්ෂයෙහි දැන සි. මිනිස්සු මෙබඳු කාලයන්හි කෑම් බීම් හිඟ වේ ය යන බියෙන් ඇති දැය අන්හට දීමෙහි කැමැති නො වෙත්. එහෙයින් භික්ෂූහු ද ආහාරපානයෙන් වෙහෙසට පත් වෙත්. යමෙක් දෙනු කැමැත්තේ ද මහත් වූ ශ්‍රද්ධාවෙන් මසුරුමල මැඩ ම දෙසි. එහෙයින් දුර්භික්ෂකාලයෙහි දීම කාලදැන සි.

ගසකින් වැලකින් කුඹුරකින් හේනකින් වැවිල්ලෙකින් හාපුරා කියා ලත් ධාන්‍යවගී හෝ ඵලවගී පළමු කොට සිල්-වතුන්ට දීම කාලදැන සි. මෙසේ බැවින් මේ පස කාලදැන නම් වේ.

"කාලෙ දදන්ති සප්පඤ්ඤා වද්ඤූනු ජිතමච්ඡරා"

ප්‍රතිග්‍රාහකයන්ගේ වචන දන්නා වූ පහ වූ මසුරුමල ඇති කම්සවකතාඥානයෙන් ඥානවත් වූ ජනයෝ සුදුසු කාලයෙහි දන් දෙත්.

"කාලෙන දින්නා අරියෙසු උජුභූතෙසු තාදිසු,
විප්පසන්නමනා තස්ස විපුලා හොති දක්ඛිණා,"

කායවඞ්කාදියෙන් තොර වූ බැවින් ඍජු වූ තාදිගුණයුක්ත ආර්‍යයන් කෙරෙහි වෙසෙසින් පහන් සිතින් සුදුසු කල්හි දෙන ලද්දේ ද ඒ දුන්නහුගේ දැනවෙතනාව මහත්ඵල දැයක වන්නී ය.

"යෙ තත්ථ අනුමොදන්ති වෙය්‍යාවච්චං කරොන්ති වා,
න තෙන දක්ඛිණා ඌනා තෙපි පුඤ්ඤස්ස භාගිනො"

ඒ දැනයෙහි යම් කෙනෙක් පහන් සිතින් පින් අනුමෝදන් වෙත් ද වත් පිළිවෙත් හෝ කෙරෙත් ද එයින් දක්ෂිණාව අඩු නො වන්නී ය. ඔවුහු ද පිණෙහි කොටස් කාරයෝ වෙත්.

"තස්මා දදෙ අප්පටිවාණචිත්තො යත්ථ දින්නං මහප්ඵලං,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනං"

යම් සිල්වතකු කෙරෙහි දෙනලද්ද මහත්ඵල වේ ද එහෙයින් ලෝභකම් මසුරුකම් මැඩ ඔබා දීමෙහි ඇලුනු සිතැත්තේ දන් දෙන්නේ ය. සත්ත්වයනට පරලොව පිහිට වන්නේ පින් ය.

සත්පුරුෂදාන වශයෙන් දානය පසකට බෙදේ. **"පංචිමානි භික්ඛවෙ! සප්පුරිසදානානි. කතමානි පංච? සක්කච්චං දෙති. චිත්තීකත්වා දෙති. සහත්ථා දෙති. අනපවිද්ධං දෙති. ආගමන දිට්ඨිකො දෙති. ඉමානි ඛො භික්ඛවෙ! පංච සප්පුරිසදානානි"** යනු සූත්‍ර යි.

සකස් කොට දීම, ගෞරව පෙරදැරි ව දීම, සියතින් දීම, නිරතුරු දීම, අනාගතභවයට ප්‍රත්‍යය ය වන්නේ ය යි කම්පල හදහා දීම යන මේය ඒ පස.

සුන් සහල් ඇ පහත් සහල් හැර සුවඳ සහල් ඇ වටිනා සහලින් පිළියෙල කළ බත ප්‍රණීත වූ ඔජස්ක වූ සූපබ්‍යඤ්ජන-යන්ගෙන් යුක්ත කොට, ගේ හැමද උඩුවියන් බැඳ වටිනා අසුන් පණවා සුවඳදුම් දී දක්ෂිණාවට සුදුස්සන් පමුණුවා ගෙණ පා දොවා වඩා හිඳුවා ගෞරව පෙරදැරි ව අනුන් ලවා නො දෙවා අක්මුල් නැති සසර ඇවිදුනා මා අත්පා නැති ව උපන් ජාතීන් පමණ නැත. එහෙයින් සසරින් මිදෙන්නෙමි'යි සියතින් කල් නො හැර නිරතුරු ව කම්පල හදහා දීම සප්පුරිසදානැ'යි වදාළ සේක.

"පංචිමානි භික්ඛවෙ! සප්පුරිසදානානි. කතමානි පංච? සද්ධාය දානං දෙති. සක්කච්චං දානං දෙති. කාලෙන දානං දෙති. අනගගහිතචිත්තො දානං දෙති. අත්තානං ච පරං ච අනුපහච්චදානං දෙති. ඉමානි ඛො භික්ඛවෙ! පංච ස පුරිස-දානානි" යනු සූත්‍ර යි. මෙ ද එහිලා දන්නේ ය.

ශ්‍රද්ධායෙන් දීම, සකස් කොට දීම, සුදුසු කාලයෙහි දීම, ආශායෙන් නො මැඩුනු සිත් ඇති ව දීම, අනුන් හා තමන් නො-පෙළා දීම යන මේය ඒ පස.

කර්මය හා කර්මඵලය හදහා දුන් දන් හේතු කොට උප-නුපන් තන්හි දායක තෙමේ ධනයෙන් සමෘද්ධ වේ. නිධාන ගත වූ මහත්ධන ඇත්තේ වේ. උපභොග පරිභොග සම්පත් ඇත්තේ, මනා රූ ඇත්තේ වේ. දැකුම් කලු වේ. උතුම් වූ රූප-ලක්ෂණයෙන් යුක්ත වේ. **"සද්ධාය භික්ඛවෙ! දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති. අඩ්ඪො ච හොති මහද්ධනො. මහාභොගො. අභිරූපො ච හොති. දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො"** යනු එහිලා දතයුතු ය.

සකස් කොට දුන් දන් හෙතුවෙන් උපනුපන් තන්හි ධන යෙන් සමෘද්ධ වේ. නිධානගත වූ මහත්ධන ඇත්තේ වේ. භොග-සම්පත් ඇත්තේ වේ. අඹු දරු දැසි දස් පණිවිඩකරු කම්කරු ඈ හැම කෙනෙක් කීකරු වෙති. වචනයට කන් දෙති. නැමී සිටිත්. **"සක්කච්චං බො පන භික්ඛවෙ! දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙ පි සුස්සුසන්ති. සොතං ඔදහන්ති. අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති"** යනු එහිලා දත යුතු ය.

සුදුසු කල්හි දුන් දන් හෙතුයෙන් යම් යම් තැනෙක දී ඒ දානයාගේ විපාකය නිපැදේ නම් ඒ හැම තැන දායක තෙමේ ධනයෙන් සමෘද්ධ වේ. නිධානගත වූ මහත්ධන ඇත්තේ වේ. භොගසම්පත් ඇත්තේ වේ. ඔහුට ලැබෙන්නා වූ හැම ධන-යෙක් ම තරුණ කල්හි ලැබෙන්නේ ය. එ ද මහත් වේ. **"කාලෙන බො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති. අඩ්ඪො ච හොති මහද්ධනො මහා-භොගො. කාලගතා චස්ස අත්ථා පචුරා හොන්ති"** යනු එහිලා දතයුතු ය. ආශායෙන් නො මැඩුනු සිතැති ව දුන් දන් හෙතු-යෙන් යම් යම් තැනක දී ඒ දානයෙහි පලය නිපැදේ ද දායක තෙමේ ඒ හැම තැන ධනයෙන් ආඪ්‍ය වේ. මහත්ධන ඇත්තේ මහත් භොගසම්පත් ඇත්තේ වේ. ඔහුගේ සිත පස්කම් සැප විඳුමට නැමී සිටියි. **"අනග්ගහිතචිත්තො බො පන භික්ඛවෙ! දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති. අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. උළාරෙසු ච පංචසු කාමගුණෙසු භොගාය චිත්තං නමති"** යනු එහිලා දතයුතු ය.

තමන් හා අනුන් හා නො පෙළා දුන් දන් හෙතුයෙන් යම් යම් තැනක ඒ දානයාගේ පලය නිපැදේ නම්, ඒ හැම තැන දායක තෙමේ ධනයෙන් ආඪ්‍ය වේ. මහත්ධන ඇත්තේ මහත් භොගසම්පත් ඇත්තේ වේ. ලත් ධනය ගින්නෙන් දියෙන් රජුන් ගෙන් සොරුන්ගෙන් අප්‍රියදායාදයන්ගෙන් විනාශයට නො යේ. **"අත්තානං ච පරං ච අනුපහච්ච බො පන දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති. අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. න චස්ස කුතො චි භොගානං උපසාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා"** යනු එහිලා දතයුතු ය.

දැන් මෙහි කියූ ලෙසට නො දෙන හැම දානයෙක් ම අසත්-පුරුෂදානැ'යි නම් කරණ ලද්දේ ය. මේ එහිලා සාධකසූත්‍රය. **"පංචිමානි භික්ඛවෙ! අසපපුරිස දානානි. කතමානි පංච? අසක්කච්චං දෙති. අවිත්තී කත්වා දෙති. අසහත්ථා දෙති. අප-විද්ධං දෙති. අනාගමනදිට්ඨිකො දෙති. ඉමානි ඛො භික්ඛවෙ! පංච අසපපුරිස දානානි"** යනු අසත්පුරුෂදාන ද පසෙකැ'යි මෙහි දක්වනලද ය.

කුමාරකාශ්‍යප මහාස්ථවිරයන් වහන්සේ **සෙතව්‍ය** නුවර සමීපයෙහි ඇට්ටේරියවනයෙහි වැඩ වසන එක් අවදියෙක, එහි **පායාසි** නම් රදලයෙක් මහත් යසඉසුරෙන් යුක්ත ව වාසය කෙළේ ය. "පරලොව නැත, ඔපපාතිකසත්ත්වයෝ නැත, යනාදීන් මිසදිටු ගෙණ සිටි ඔහු කුමරකසුප් තෙරුන් හා කළ වාදයෙන් පැරද සම්දිටු ගෙණ බුදුරජුන් සරණ ගොස් දුගී මගී යාවකාදීන් හා මහණ බමුණන් උදෙසා දන්වැට තැබී ය. එහෙත් ඔහුගේ දානය නිවුඩුහාලේ බතින් කාඩි හොද්දෙන් පිළියෙල වූයේ ය. කෑ හැකි බතෙක් හොද්දෙක් එහි නො වී ය. දුගීමගියනට දුන් රෙදිපිළී සැම තැන නූල් කැටි කැටි ව ඇඹරී සිටි දාවලු සහිත දළ රෙදිකඩ ය. එහි සංවිධායක වූයේ **උත්තරමාණවක** තෙමේ ය. එහෙත් එහිලා ඔහු පායාසිගේ නියමයන් අකුරට ම පිළිපැද්දේ ය. උත්තරගේ කැමැත්ත ලෙසින් කිසිවක් එහි පිළියෙල නො වී ය. දන් පිණිස වූ හැම කෑමක් බීමක් වතක් පිළියෙල කරණ ලද්දේ පායාසිගේ නියමය ලෙසට ය. මෙයින් කළකිරී සිටි උත්තර දවසෙක "මම දැන් මේ දන්වැට නිසා මොහු හා එක්වීමි' මොහු හා එක් ව කටයුතු කරන්නට සිදු වූයේ මේ දන් වැට ය, මෙ ලොව මෙසේ සිදු වුව ද පරලොව දී නම්, මොහු හා එක් නො වන්නෙමි"යි සිතා එසේ පතයි. මේ ප්‍රාර්ථනාව ගැණ දත් පායාසි උත්තර ගෙන්වී ය.

පායාසි = හැබෑ ද උත්තර! පරලොවදී මා හා එක් නො වන්නට පැතුම් පතන්නෙහි තෝ?

උත්තර = ඔවු! එසේ පතමි.

පායාසි = ඇයි, ඒ එසේ පතහි? අපි පින් කැමැත්තෝ නො වෙමු ද? පරලොව සැප බලාපොරොත්තු වන්නෝ නො වෙමු ද?

උත්තර = ඔවු! ඇත්ත ය. පින්වතුන්ගේ කතාව. ඔබ දෙන දානවස්තූන් දකිනා විට එබඳු පැතුමක් කිරීම අයුතු ය'යි කියනු නො හැකිය. පිරිසිදු නො කළ හාලේ බත්.

කෑඹිහොදි. කොටා අඹරා ගත් ලුනුම්රිස්. ඔබතුමන් කනු තබා අතිනුත් නොා අල්ලන කෑම බීම. මිනිසකුට තබා තිරිසනකුටත් නොා හොබනා කෑම. ඔබගේ නියමය නිසා අපි මහණබමුණන්ටත් මේ පිළිකුල් කෑම දෙන්නෙමු. ඔබගේ නියමය ඉක්මවනු බැරි නිසා දෙනු මිසක් ඉක්මවනු හැකි නම් නොා දෙන්නෙමු. ඔබගේ දන්වැටෙහි තිබෙන්නේ තිරිසන් කෑම. එහි දෙන රෙදිපිළි එයට දෙවෙනි නොා වේ. හැම තැන නූල් කැටි ගැසුනු ගෝනි පඩන්ගු වැනි දළරෙදි. ඒ රෙදි මිනිසකුට නම් ඇන්ද නොා හැකි ය. ඔබතුමා මට ප්‍රිය ය. එහෙයින් අපි ප්‍රියයකු අප්‍රියයක් හා මනවඩන්නකු අමනාපයක් හා කෙසේ එක් කරමු ද. කෙසේ යොදන්නෙමු ද. මේ කරුණු සැලකූ මම මෙලොව දී කෙසේ වුවත් පරලොව දී ඔබ හා එකතු වන්නට නොකැමැත්තෙන් මෙසේ පැනීම්.

පායාසි = එසේ නම්, මා දෙන සැටි නොා හොබනේ නම් තා කැමැති ලෙසකින් දෙනු විනා මා හා පරලොවදී එක් නොා වන්නට පැතීම යුතු නැත. තෝ කැමත්තෙහි නම්, මා කන බොන හැටියට මා අඳින රෙදිපිළිවල හැටියට කන බොන දැන් රෙදිපිළිත් පිළියෙල කොට දෙව. උත්තර තෙමේ පායාසිගේ මේ කීමෙන් පිණා ගියේ දැනවස්තූන් හැම එකක් මැනවින් පිළියෙල කෙළේ ය. එතැන් සිට ඒ දන්වැට ඉතා අගනා කැවිල්ලෙන් පෙවිල්ලෙන් ලෙවිල්ලෙන් වනින් පිළියෙන් පිරී ගියේ ය.

පායාසි තෙමේ නොා සකස් කොට දන් දී සැලකිලි නැති ව දන් දී කලින් කල අතර තබා දන් දී අනුන් ලවා දන් දෙවා මැරී ගොස් චාතුම්හාරාජිකදෙවියන් අතර **සෙරිස්සක** නම් ගිස් විමනෙක උපන්නේ ය. උත්තර මාණවක තෙමේ සකස් කොට දන් දී සැලකිලි ඇති ව දන් දී අතර නොා තබා නිතර දන් දී සියතින් දන් දී මැරී ගොස් තව්තිසා දෙව්ලොව උපන්නේ ය.

මේ කාලයෙහි **ගවම්පති** මහාස්ථවිරයන් වහන්සේ දුවල විවෙකයෙන් හිඳින්නට ඒ සෙරිස්සක විමනට නිතර යත්. පායාසි දෙව්පුත් තෙමේ එහිදී උන්වහන්සේට හමු විය. එකල්හි උන්වහන්සේ "තෝ කවරෙක් වෙහි?" සි ඇසූහ. ඔහු තමන් පිළිබඳ සියලු තොරතුරු උන්වහන්සේට කී ය. "තාගේ දන්හලෙහි

සංවිධායක ව සිටි උත්තර කොහි දැ'' යි ඇසූවිට ''ස්වමීනි! ඔහු සකස් ව සියතින් සැලකිලි ඇති ව නිතර දන් දුන් හෙතුයෙන් මෙයට උඩින් පිහිටා සිටි මහත් සම්පත් ඇති තව්තිසා දෙව්ලොවැ ඉපිද මා විදුනා සැපතට වඩා හැම අතකින් ම සිය දහස් ගුණය-කින් උසස් වූ යසිසුරු විදිසි, මම නො සකස් ව සැලකිලි නැති ව අනුන්ලවා දන් දෙවා මේ හිස් විමනෙහි උපන්මි, බලන්න, ස්වාමීනි! වෙනසක හැටි, එහෙයින් ස්වාමීන් වහන්සේ මිනිස්ලොවට වැඩි-යාම සකස් ව සැලකිලි සහිත ව සියතින් ම දන් දෙන්නැ' යි මිනිසුනට කියනු මැනවැ'' යි දෙව්පුත් තෙමේ කියේ ය. උන්ව-හන්සේ මේ කතාව අසා පෙරළා මිනිස්ලොවට වැඩි සේක් මෙසේ ධර්මදෙශනා කළ සේක.

මේ ඒ ධර්මදෙශනාව:—

සක්කච්චං දානං දෙථ = සකස් කොට දන් දෙවු.

සහත්ථා දානං දෙථ = සියතින් දන් දෙවු.

චිත්තීකතං දානං දෙථ = ගරුසැලකිලි දක්වා දන් දෙවු.

අනපවිද්ධං දානං දෙථ = නො කඩ කොට නිතර දන් දෙවු.

පායාසි රාජඤ්ඤ, අසක්කච්චං දානං දත්වා අසහත්ථා දානං දත්වා අචිත්තීකතං දානං දත්වා අපවිද්ධං දානං දත්වා කායස්ස-හෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපන්නො සුඤ්ඤං සෙරිස්සකං විමානං = පායාසි රදල තෙමේ සකස් නො කොට දන් දී සියතින් දන් නො දී සැලකිලි නො දක්වා දන් දී කඩ කඩ කොට ඉදහිට දන් දී මැරී ගොස් චාතුම්හා-රාජික දෙවියන්ගේ හිස් වූ සෙරිස්සක විමනෙහි ඉපිද සිටි යි.

යො පන තස්ස දානෙ බ්‍යාවටො අහොසි උත්තරො නාම මාණවො, සො සක්කච්චං දානං දත්වා සහත්ථා දානං දත්වා චිත්තී-කතං දානං දත්වා අනපවිද්ධං දානං දත්වා කායස්ස හෙදා පරම්ම-රණා සුගතිං සග්ගං ලොකං උපපන්නො දෙවානං සහව්‍ය-තත්ති = යමෙක් ඔහුගේ දන්හල්හි සංවිධායක වී ද. ඒ උත්තර-මාණවක තෙමේ සකස් කොට දන් දී සියතින් දන් දී සැලකිල් ලෙන් දන් දී නො කඩ කොට දන් දී මරණින් මතු දෙව්ලොව ඉපිද සිටි' යනු.

රෙවතී කතා පුවත ද අසත්පුරුෂදානයෙහි අනිෂ්ටවිපාක කියාලන බැවින් එද බැලිය යුතු ය.

කොසොල් රජුගේ දුවනියක් වූ සුමනා දවසක් බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක සිට මෙසේ බුදුරජුන් හා කතාවට වැටුනා ය.

සුමනා = ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! බුදුරජුන්ගේ සසුනෙහි එක් තරම් සැදෑ ඇති එක්තරම් සිල් ඇති එක් තරම් නුවණැති ශ්‍රාවකයෝ දෙදෙනෙක් වෙත්. එකෙක් දෙන්නේ ය. එකෙක් නො දෙන්නේ ය. දෙදෙන ම මැරී ගොස් දෙව්ලොව උපදින්නාහ. එහි උපත් ඒ දෙදෙනාගේ වෙනස් බවෙක් වේ ද?

බුදුරජ = ඔව්! සුමනා! මහත් වෙනස් බවෙක් ඔවුන් අතර වන්නේ ය. දන් දුන් මහණ, දෙව්ලොව උපන්නේ දන් නො දී දෙව්ලොව උපත් මහණහු ආයුෂයෙන් පැහැයෙන් සැපයෙන් බලයෙන් යසසින් අධිපති කම්න් යටපත් කොට සිටි සි.

සුමනා = ස්වාමීනි! ඒ දෙදෙන දෙව්ලොවින් ගිලිහී මිනිස්ලොව උපන් කලත් ඔවුන් දෙදෙනා අතර වෙනසෙක් වන්නේ ද?

බුදුරජ = ඔව්! සුමනා! එයත් ඇසිය යුත්තෙක් ද? දන් දුන්නේ මිනිස්ලොවේදීත් දන් නො දුන්නහු මිනිසුන් පිළිබඳ ආයුෂයෙන් පැහැයෙන් සැපයෙන් බලයෙන් යසසින් අධිපතිකම්න් යටපත් කොට ගණිසි.

සුමනා = හොඳයි! ස්වාමීනි! මහණ වූ විටත් ඒ වෙනස තිබේ ද ඔවුන්ගේ?

බුදුරජ = සුමනා! එය අමුතුවෙන් කිය යුත්තෙක් ද? වෙනස තිබේ. දන් දුන් තැනැත්තා පැවිදි වූ කල්හි ඔහුට දායකයන්ගෙන් සිවුරු පිරිකර කෑම් බීම් සෙනසුන් ගිලන්පස බොහෝ කොට ලැබේ. මේ සිවුපසය දායකයන්ගේ බලවත් ඇවිටිල්ල නිසා ම ඔහු පිළිගණිසි. ඔහුට දැනයක් පිණිස ආරාධනාවක් නො ලැබෙන්නේ ඉතා කලාතුරෙකිනි. ආරාධනාවක් නැති දවසක් නැති තරම් ය. දිනපතා ම වාගේ ඒ නමට දායකයන්ගේ ආරාධනා ය. මොනවා හෝ වැළඳීම ආරාධනාවක් ලබාලා ය. ඒ නම යම් කිසි සඬ්‍රම්සරුන් හා එක්ව වසා ද ඒ හැම කෙනෙක් ම මහ වඩන්නා වූ

කායවාඞ්මනඃකර්මයන්ගෙන් යුක්ත ව ම ඔහු ඉදිරියෙහි හැසිරෙත්. කතා කෙරෙත්. නිතර ම ඔහුට ප්‍රිය මනාප ලෙසින් වැඩ කරත්. ඔහු ගැණ සිතත්. මන නො වඩන්නා වූ සිත් නො ගන්නා වූ ක්‍රියාවෙක් වේ නම්, ඒ ඉතා කලාතුරෙකින් ය. හැම දෙනෙක් කවදාත් ඒ නමට හොඳහිත ම දක්වත්.

සුමනා = රහත් වූ කල්හි?

බුදුරජ = නැත, සුමනා! රහත්බවෙහි වෙනසෙක්. රහත්බවෙහි වෙනසෙක් ඇතැයි මම නම් නො කියමි.

සුමනා = ස්වාමීනි! මෙසේ බලන කල්හි දෙවියන්ට මිනිසුන්ට පැවිද්දන්ට වහල් පිණ ම බැවින් ඒ කා විසිනුත් පින් කළයුතු නො වේ ද? දන් දියයුතු නො වේ ද?

බුදුරජ = ඔවු! කා විසිනුත් පින් කළයුතු යි, සුමනා! දන් දියයුතු යි. අහස ගමන් ගත් සඳ, අහසෙහි ඇති සියලු තරු තමාගේ ආලෝකයෙන් යටකොට බබලන්නාසේ සිල්වත් සැදැහැවත් පුද්ගල තෙමේ තමාගේ ත්‍යාගගුණය කරණ කොට ලොකයෙහි සියලු මසුරන් ඔබා බබල යි.

විදුලිය ගසන සිය ගණන් වලාපටල ඇති මෙඝය ගොරව ගොරවා වසින්නේ පොළොවෙහි ගොඩතැන් වළතැන් දියෙන් පුරවා හරින්නා සේ සෝවන් වූ බුද්ධශ්‍රාවක තෙමේ ආයුවර්ණාදියෙන් මසුරහු යටපත් කොට ගණී යි. උපභොගපරිභොගසම්පත්ත්‍යාදියෙන් වැඩුනු හෙතෙමේ මරණින් මතු දෙව්ලොව ඉපිද සතුටු වෙයි.

"යථාපි චන්ද්‍රෝ විමලො ගච්ඡං ආකාසධාතුයා,
සබ්බෙ තාරගණෙ ලොකෙ ආභාය අතිරොචති.

තථෙව සීලසම්පන්නො සද්ධො පුරිසපුග්ගලො,
සබ්බෙ මච්ඡරිනො ලොකෙ චාගෙන අතිරොචති.

යථාපි මෙඝො ථනයං විජ්ජුමාලී සතක්කකු,
මච්ඡරිං අධිගණ්හාති පඤ්චට්ඨානෙහි පණ්ඩිතො.

ආයුනා යසසා චෙව වණ්ණෙන ව සුඛෙන ව,
සවෙ භොගපරිබ්බුළ්හො පෙච්ච සග්ගෙ පමොදති"

යනු දෙශනා ය.

සීවලී මහාරහතුන් වහන්සේ මේ සසුන්හි ලාභීන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූවෝ සසර කරණලද දැනමයකුශලඛණ්ඩියත්ගේ අනුභාවයෙනි. රහතුන් වහන්සේලා කොතෙක් වූවෝ ද, සීවලී රහතුන් වහන්සේ ම සිවුපසය ලබන්නවුන් අතුරෙහි ප්‍රධාන වූහ. උන්වහන්සේ එහිලා දෙවෙනි වූවෝ බුදුරජාණන් වහන්සේට පම ණෙකි. එක් දවසට සිය්දහස්ගණන් ආරාධනාවෝ උන්වහන්සේ වෙත ගලා ආහ. මග වඩනා කල්හි කෑම් බීම් බෙහෙත් පිරිකර ගත් දිව්‍යමනුෂ්‍යයෝ මග දෙපස රැස් කකා සිටියාහ. එසේ ම මග දෙපස කෑම් බීම් සිවුරු පිරිකර ආදියෙන් පිරිණු අවත්හල් ඉබ ඉබේ ම විවෘත වේ. සීවලිසූත්‍රවිවරණය බැලිය යුතු ය.

ලොසක මහාරහතුන් වහන්සේ රහත් නමක් වූවෝ ද වළඳන්නට අඳින්නට පොරවන්නට නිසිත් කෑමක් බීමක් සිවුරක් පිරිකරක් නො ලැබීමෙන් වෙහෙසට පත් වූහ. මුන්වහන්සේ යම් ගෙයක යම් ගමෙක යම් රටෙක යම් පිරිසෙක හුන්නෝ ද ඒ ගෙයඒ ගමඒ රටඒ පිරිස හැම යසිසුරෙන් පිරිහීමට වැටුනෝ ය. කන්නට බොන්නට අඳින්නට පලඳින්නට නැති ව යෑමෙන් එ ගෙවල් ඒ ගම් ඒ රටවල් ඒ පිරිස් මහත් දුකට පත් වූහ. මුන්වහන්සේගේ මවුපියෝ ද නිහඬනට ගියහ.

ලොසක ස්ථවිරයන් වහන්සේ කොසොල් රටට අයත් කෙවුල් ගෙවල් දහසක් පමණ ඇති කෙවුල් ගමෙක කෙවුලියක කුස උපන්හ. ඔහු පිළිසිඳ ගත්දැ ම එගම් වැස්සෝ සියකැමින් පිරිනි ගියහ. එදා ඔවුනට එක මසකුත් හසුකර ගත නො හැකි විය. මුළු ගම් ම දුප්පත් විය. ඔහු මවුකුස ඉන්දදී ම එගම සත් වරක් ගින්නෙන් හලු වී ගියේ ය. රාජදණ්ඩනයන්ට අසු විය. මෙසේ නොයෙක් අතින් විපතට වැටුනු ඔවුහු දවසක් එක් තැන් ව "මේ මොන විපතෙක් ද අපට, ටික දවසක සිට ගමට ම හෙණ වැදී තිබේ, කන්නට බොන්නට දෙයක් සපයා ගත නො හැකි ය, දරු සිහිත්තෝ බඩගින්නෙන් වැලපෙති, මේක මහාකාලකණ්ණිකමෙක්, වෙන දා නො වූ විපතක්, හදිසියේ අප හිස පිට කඩා වැටෙන්නට මොකක් හෝ විය යුතු ය, කාලකණ්ණියකු අප අතර සිටිය යුතු ය, එසේ නො වේ නම් සතුරකු කළ කොහිවිනයක් විය යුතු ය, අප මෙය අද අදම සොයා බැලිය යුතු ය, මෙහි දී ඇස් කන් පියා ගෙණ හුන්නොත් හැම එකාම කන්නට නො ලැබ මැරී යනු එකානන්තය" යි එහි වූ ගෙවල් දහස පළමු කොට පන්සියය පන්සියය

බැගින් දෙකොටසට බෙදූහ. බෙදූ ඔවුහු එක් කොටසක් අනෙක් කොටස හා සම්බන්ධකම් හැර ගණු දෙනු නවතා ගම් දෙකක වැස්සන් සේ ජීවත් වන්නට වූහ. මෙසේ දෙකොටසක් වූ පසු ලොසක මැනියන් හුන් කොටස පිරිහෙන්නටත් අන් කොටස වැඩෙන්නටත් වූහ. පිරිහෙනු දුටු කොටසට අයත් වැඩිහිටියෝ තම කොටස නැවැතත් බෙදූ පළමු සේ වෙන් වෙන් ව ජීවත් වන්නට සැලසූහ. මෙසේ ඔවුහු ඒ ගෙවල් කිහිපවරක් බෙදූ බෙදූ ගොස් ලොසක පිළිසිඳ ගත් ගෙය අල්ලා ලොසක මැනියන් එ ගමින් නෙරපා යැවූහ. ඕ තොමෝ ඉන්නට තැනක් නැත්නට බතක් බොන්නට දියක් අදින්නට වතක් යන්නට මගක් නොවූයෙන් දුක සේ දිවි ගලවන්නී කුස පිළිසිඳ ගෙණ සිටි පුතු වැදූ ය. ඔහු පශ්චිමභවිකයෙක් විය. පශ්චිමභවිකයකු මොන ලෙසිනුත් මරන්නට පිළිවන් කමෙක් කාටත් නැත්තේ ය. ඔහුගේ සිතෙහි රහත්වීමෙහි වාසනාබලය දැල්වුනේ ය. මවු තොමෝ කුඩා දරු මාස කිහිපයක් ඉතා දුක සේ හදූ වඩා පයින් හැසිරෙන්නට තරම් වූ කල්හි කොළපතක් දී හිඟමනට යැවූ ය. යමා තොමෝ උන් පෙරළා එන්නට පෙරාතු ව එතැනින් බැහැර ගියා ය. එනැන් පටන් ඒ කුඩා කොලු, හිඟමනෙන් ලැබෙන්නක් ඇත, එය කාලා ගේ පිළිකන්නක හෝ අතුමැස්සක් යට හෝ ගස්සෙවණක හෝ රැ දවස ගෙවා පසු දුන් හිඟමනේ ගොස් මොකවත් සපයා ගෙණ කන්නේ ය. මෙසේ මෙ තෙමේ පංසුපිසාචකයකු සේ දිවි ගලවන්නේ සත් හැවිරිදි කල්හි ඒ ඒ ගෙවල හැළිවලන් පිඟන් කෝප්ප හවිටි මුට්ටි සෝදූ දිය දූමූ තන්හි ඇති බත් උළු ඇඟිද කමින් ගෙවලින් බැහැර ලන කුණු ගොඩවල් අවුස්සා වරහැලි කැබලි සොයා ගෙණ විළි වසා ගන්නේ ජීවත් වන්නේ ය.

දවසෙක සැවැත්නුවර පිඩු සිඟා වඩනා සැරියුත් මහාතෙරණුවෝ ඉඳුල් ඇඟිද කන මේ කොලු දැක මහත් කරුණාවෙන් "දරු! මෙහි එන්නැ" යි අඩ ගා වදාළ සේක. කොලු ද වහා ගොස් මහාතෙරුන් වැඳ වැටුනේ ය. 'තාගේ ගම කොහි ද? මවු පියෝ කොහි ද? ආයෙහි කොහි සිට දැ" යි ඇසූ කල්හි "සාමීනි! මම හිඟන්නෙක්, මට පිහිටෙක් නැත, උදවු කරන්නෙක් නැත, මවු පියෝ මා නිසා දුකට පැමිණ මා හැර ගියහ, මම හිඟමනෙන් ජීවත් වෙමි" යි කී ය. එකල්හි උන්වහන්සේ "මහණ වනු නරක දැ" යි ඇසූහ, "අනේ! සාමීන් වහන්ස! කොතරම් හොඳ ද, මට කොතරම් වැඩෙක් ද, මා වැනි හිඟන්නෙකු පැවිදි කරන්නෝ කවුරු දැ" යි කීයේ ය. "නෑ ලමයා! මම තා මහණ කරමි" යි

පාත්‍රයෙහි අත බහා කෑම ටිකක් ගෙණ ඔහුට දී කනතුරු බලා සිට විහාරයට කැඳවා ගෙණ ගොස් සියතින් ම වතුර ඇද ඇඟ උළා නාවා පැවිදි කළහ. පැවිදි කොට කල් වයස් පිරී සිටි තැන උප-සපන් ද කළහ.

මෙසේ පැවිදි උපසපන් වූ උන්වහන්සේ වැඩි වයසට පැමිණි කල්හි ලොසක ස්ථවිර යි ප්‍රසිද්ධ වූහ. පින් නැත්තෝ ය. අස දිසමහාදානයෙහිදු බඩ පුරා කෑමක් නො ලැබූහ. එහිදී ද ලැබුනේ යම්තම් කට ගෑමට තරම් බත් ටිකෙකි. උන්වහන්සේගේ පාත්‍ර-යෙහි එක් ම කැඳ හැන්දක් වත් කළ විට පාත්‍රය කැඳෙන් කට ලඟට පිරී ගියා සේ අන්හට පෙණෙන්නේ ය. මිනිස්සු දෙන්නට ගෙණ ආ කැඳ ද "හාමුදුරුවන්ගේ පාත්‍රය කට ලඟට පිරී තිබේය" යි අනෙකකුහට දී යන්නාහ. අනෙක් බතක් රසක් මසක් කැවිල්-ලක් ලෙවිල්ලක් පාත්‍රයට බෙදූ කල්හි ද පෙණෙනුයේ ඒ බෙදූ බත් ටික පාත්‍රය පිරී ගියා සේ ය.

ටික දවසක් ගිය තැන ලොසක ස්ථවිරයන් වහන්සේ විදසුන් වඩා රහත් වූහ. එහෙත් සිවුපසය ලැබීමෙහි වාසනාවක් එයිනුදු මතු නො වූ ය. මෙසේ දුකසේ දිවි යවන උන්වහන්සේගේ ආයුෂය පිරිහී ගියේ ය. පිරිනිවන් පානා දවස ලං විය. ලොසක තෙරුන් ගැණ බලා වදාළ සැරියුත් මහතෙරුන්ට ලොසක තෙරුන් පිරිනිවන් පානා බව පෙණින. උන්වහන්සේ "ලොසක අද පිරිනි-වෙන්නේ ය, මා අද ඔහුට බඩ පුරා කෑම ටිකක් දිය යුතුය" යි ලොසක තෙරුන් කැටු ව සැවැත් නුවර පිඬු සිඟා ගියහ. මහා-ජනයාගෙන් අතුරු සිදුරු නැති ව පිරී ගත් සැවැත් නුවර එදා අත දිගු කොට වඳින්නෙක් පුදන්නෙක් දක්නට නො ලැබින. සැරියුත් යන නාමය කණු වැටුනු සැටියේ දෙහොත් මුදුනේ තබා දුව එන මිනිස්සු එදා එහි නො වූ හ" යි කිය යුතු තරමට මිනිස්සු එහි නො පෙණී ගියහ. සැරියුත් තෙරණුවෝ ලොසක තෙරුන් අසුන්හලට යවා තමන් වහන්සේ එකලා ව නැවැතත් සිඟා ගියාහු සිඟා ගත් අහර ලොසකට දෙව' යි අනෙකෙකු අත යැවූහ. ඒ ගෙණ ගිය බත මග දී ගෙණ ගිය එකා ම ගිල දැමීය. ලොසක ස්ථවිර තෙමේ අසුන්හල සිටියේ වඩනා තෙරුන් දැක ඉදිරියට ගොස් වැඳ සිටියේ ය. එකල්හි උන්වහන්සේ "ලොසක! මා එවූ බත් ටික වැළඳූ දැ?" යි ඇසූ විට "නැත ස්වාමීනි! යි" කී ය. සංවෙගයට පැමිණි මහාතෙරණුවෝ කල් බලා වදාළෝ කල් ගිය බව දැන ලොසක තෙරුන් එහිම රඳවා තුමූ රජගෙට වැඩියහ. රජ තෙමේ උන්වහන්සේට පාත්‍රය පුරා චතුමධුර පිළිගැන්වී ය. එවර

උන්වහන්සේ ඒ වතුමඩුර ගෙණ ගොස් "ලොසක! බඩ පුරා මේ වළඳව" යි පාත්‍රය ඔහු ඉදිරියට කොට අල්ලා ගෙණ සිටියහ. ලොසක සථවිර තෙමේ තෙරුන් කෙරෙහි ගෞරවයෙන් ලජ්ජා ඇති ව නො වළඳ, සිටියේ ය. "ලොසක! ලජ්ජිත නො වන්න, හොඳට සෑහෙන පමණට වළඳන්න, මම පාත්‍රය ගෙණ සිටින්-නෙම්, ඔතැන ම හිඳ වළඳන්න, මා මෙය අත් හැරියොත් මෙහි මොකුත් ඉතිරි වන්නේ නැත, මම මෙය අත් නො හැර ගෙණ සිටින්නෙම් ඒ නිසා ය" යි මහාතෙරුන් පාත්‍රය ගෙණ සිටිය දී ම ලොසක සථවිර තෙමේ ඇතිතාක් බඩ පුරා වළඳ, එ දවස ම පිරිනිවියේ ය. බුදුරජානන් වහන්සේ ලොසක තෙරුන්ගේ සිරුර ආදහන කරවා ධාතු ගෙන්වා සෑයක් කර වූහ.

ලොසක සථවිර තෙමේ කසුප් බුදුරජුන් දවස පැවිදි ව සිල්-වත් ව විදසුන් වඩමින් එක්තරා වෙහෙරක නෙවාසික ව සිටියේ ලාභමච්ඡර්යාදියෙන් මසුරු ව රහත් නමකගේ සිවුපසය වළකා ලූයේ ය. තම දායකයකුගේ ගෙයකින් රහත් නමට දෙන්නැ' යි දුන් ගිතෙල් මී හකුරු යොදා පිළියෙල කළ කිරිබතක් ගිනි අහු-රෙහි ලාපුළුස්සා දැමී ය. පසු දවස තමන් කළ ඒ සාහසිකකම්යෙන් හටගත් දෙම්නසින් දැවී මනුෂ්‍යප්‍රෙතයෙක් ව සිට මැරී ගොස් අපායයෙහි උපන. භවුරුදු ලක්ෂගණනක් අපායයෙහි පැසී එයින් මිදී ජාති පන්සියයක් පිළිවෙළින් යකෙක් ව ඉපිද ගත්තේ ය. මේ ජාති පන්සියයෙහි ම බඩ පුරා කෑයේ එක් ම දවසෙක ය. කෑයේ ද ගැඹිමල ගොඩෙකි. එයින් පසු තවත් ජාති පන්සියයක් බලු ව උපන්නේ ය. ඒ කාලය තුළ ද බඩ පුරා කෑයේ එක් ම දවසෙක ය. එදා ද කෑයේ වමනය කළ බත් අසුචි රැසෙකි. මේ සා මහත් දීර්ඝකාලය තුළ අන් කිසි දවසෙක කිසි ලෙසක කෑමෙක් බඩ පුරා කන්නට නො ලැබුනේ ය. එයින් චුත ව ගොස් කසී රට ඉතා දුප්පත් ගෙයක උපන්නේ ය. නමින් මිත්තවින්දක වී ය. මොහුගේ උපතින් ඒ ගෙයි අය වඩවඩාත් දුප්පත් වූහ. එහිදී ද කිසි දවසෙක පෙකනියෙන් උඩට දිය ටිකකුත් නො ලැබුනේ ය. මවු පියෝ බඩගිනි දුක ඉවසනු නො හැකි ව ඔහු ගෙයින් පන්නා දැමූහ. එතැන් සිට මෙතෙමේ තවත් නොයෙක් වධබන්ධන ලබමින් ආයේ අප බුදු රජුන් දවස කොසොල් රට ඉපිද නොයෙක් දුක් ගැහැට විඳිමින් සිට පැවිදි ව විදසුන් වඩා රහත් වූයේ ය.

මෙ තෙමේ පෙර කසුප් බුදුරජුන් දවස පැවිදි ව සිට ද කළ ලාභාන්තරාය හෙතුවෙන් සතර අපායයෙහි හා මිනිස් ලොව ඉපිද නන්වැදෑරුම් කටුක දුක් විඳ්දේ ය. එ දවස ම

කළ ත්‍රිලක්ෂණභාවනා හෙතුවෙන් මෙ දවස පැවිදිකම් ලබා රහත් වූයේ ය. රහත් වූයේ ද පෙර දන් පින් කම් නො කළ බැවින් පිරිනිවන් පානා දවස දක්වා ම එක් දවසකුත් බඩ පුරා කෑමෙක් නො ලැබුනේ ය. සැරියුත් මහාතෙරුන්ගේ සෘද්ධිබලයෙන් පිරිනිවන් පානා දිනයෙහි ලත් චතුමධුරයෙන් කට බඩ පිරී ගියේ ය.

රහත්ගුණය හැර රහතුන් වහන්සේ පිළිබඳ අන් හැම ගුණයෙක ම වෙනස් කම් ඇත්තේ ය. රූපයෙන් ආයුෂයෙන් වණියෙන් සැපයෙන් බලයෙන් නුවණින් උසින් මහතින් ලාභයෙන් පිරිවරින් යසසින් ප්‍රියමනාපභාවයෙන් නීරොගභාවයෙන් රහතුන් වහන්සේ ද වෙනස් වෙත්. එක් කෙනකුන් වහන්සේට අන් කෙනකුන් වහන්සේ අසමාන වෙත්. රහතුන් වහන්සේ කෙරෙහි පෙණෙන මේ නොයෙක් අසමානකම්වලට හෙතු වනුයේ ද උන්වහන්සේ සසර එන දවස කළ දානමයකුශලකර්මයාගේ හීන – මද්ධ්‍යම – උත්කෘෂ්ටභාව ම ය. උස්පහත්කම ය.

දවසක් **සීහ** සෙනාපති තෙමේ බුදුරජුන් වෙත ගොස් වැඳ "ස්වාමීනි! දන් දීමෙන් මෙ ලොවෙහිත් විපාක ලැබෙනබව දැක්විය හැකි දැ?" යි ඇසී ය. "ඔවු! සීහ! දීමෙහි විපාක මෙලොවදීත් ලැබෙන බව පෙන්විය හැකි ය. දීමෙන් මෙ ලොවදීත් මහා විපාක ලැබේ, සීහ! දෙන්නහු බොහෝ දෙනාට ප්‍රියයකු මන වඩන්නකු වීම සත්පුරුෂයන් ඔහුගේ ඇසුරට පැමිණීම සත්කීර්තිය දසත පැතිරීම දෙන්නහු ක්ෂත්‍රිය බ්‍රාහ්මණා දී වූ පිරිසක් මැදට පැමිණිය ද විශාරද ව නිභීය ව නො මකු ව පැමිණීම යන මෙය මෙ ලොව ලැබෙන විපාකයන්ගෙන් විකෙකැ" යි වදාළ බුදුරජානන් වහන්සේ නැවැත "සීහ! මෙ ලොව මෙසේ උසස් තැනට ගිය දායක තෙමේ දානමය කුශලකර්මශක්තියෙන් මරණින් මතු දෙව්ලොව උපදින්නේ ය" යි වදාළ සේක. එවිට සීහ තෙමේ "ස්වාමීනි! බුදුරජුන් වදාළ මේ ඓහිකදානඵලය මම ද දනිමි, දීමෙන් මේ කියූ විපාක මෙහිදී ලැබෙන බව මගෙන් ම මම දැන සිටිමි, මේ දානඵල ඇදහීමට බුද්ධවචනයෙක් වුවමනා නො වේ, ඇස් ඉදිරියෙහි එය පෙණෙන බැවිනි, මම ද දානපති ව දන් දෙමි, එහෙයින් මම බොහෝ දෙනාට ප්‍රියයෙක් මන වඩන්නෙක් වෙමි, සත්පුරුෂයෝ මා සෙවනය කරත්, සීහ තෙමේ සඞ්ඝොපස්ථායකයෙකැ, යි මා පිළිබඳ කල්‍යාණ වූ කීර්ති ශබ්දයෙක් මහාජනයා අතර පැතිර ඇත, කැත්-බමුණු-ගැහැවි-මහණ පිරිසක් කරා යන්නෙම් විශාරද ව ම නො මකු ව ම යමි, එහෙත් දන් දෙන්නේ මරණින් මතු දෙව්ලොව උපදින්නේ ය යනු මට නො පෙණේ,

මම එය බුදුරජාණන් වහන්සේගේ වචනයෙන් හදහම්" යි කීයේ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ "ඔවු! සිහ! ඒ එසේ ය, එහි වෙනසෙක් නැත, දන් දෙන්නේ මරණින් මතු දෙව්ලොව උපදින්නේ ය" යි වදාළ සේක. මෙහිලා මෙ ද දත යුත්තේ ය.

"දදං පියො හොති භජන්ති නං බහුං
කිත්තිං ච පප්පොති යසො ච වඩ්ඪති,
අමඛිකුහුතො පරිසං විගාහති
විසාරදෙ හොති නරො අමච්ඡරී"

දන් දෙන්නේ බොහෝ දෙනාට ප්‍රිය වේ. බොහෝ දෙන ඔහු සෙවනය කරත්. කීර්තියට ද පැමිණේ. යශස ද වැඩේ. නො ද හැකුළුතේ පිරිස් මැදට යෙයි. ඒනා මසුරු වූ මිනිස් තෙමේ විශාරද වේ.

"තසමා හි දානානි දදන්ති පණ්ඩිතා
විනෙයය මවෙජ්ජරමලං සුඛෙසිනො,
තෙ දිඝරත්තං තිදිවෙ පතිට්ඨිතා
දෙවානං සහව්‍යතං ගතා රමන්ති"

එහෙයින් සැප සොයන නුවණැති මනුෂ්‍යයෝ මසුරුමල දුරු කොට දන් දෙත්. ඔවුහු දෙව්ලොව උපන්නෝ දෙවියන් ගේ සහභාවයට ගියෝ බොහෝ කලක් එහි ඇලී වසත්.

"කතාවකාසා කුසලා තතො චුතා
සයංපභා අනුවිචරන්ති නන්දනං,
තෙ තත්‍ථ නන්දන්ති රමන්ති මොදරෙ
සමප්පිතා කාමගුණෙහි පංචහි,
කත්වාන වාක්‍යං අසිතස්ස තාදිනො
රමන්ති සඝෙ සුගතස්ස සාවකා"

කළ දෙව් විමන් ඇති එහෙයින් ම කළ පින් ඇති සත්ත්වයෝ මෙයින් චුතවූවෝ සවකීය ආලොකයෙන් ආලොකවත් ව නන්දන වනයෙහි හැසිරෙත්. පස්කම් සැපතින් සෑහීමට පැමිණි ඔවුහු එහි සතුටු වෙත්. ඇලෙත්. මුදිත වෙත්. තාදී වූ බුදුරජුන්ගේ වදන් පිළිගෙණ පිළිපැදීමෙන් උන්වහන්සේගේ ශ්‍රාවකයෝ දෙව් ලොව ඇලෙත්.

දවසෙක බුදුරජානන් වහන්සේ **කොලිය** දනව්වෙහි **සජ්ජ-නෙල** නම් නියම්ගම්හි පිඬු සිඟා වැඩි සේක. එහි වුසූ **සුප්පවාසා** තොමෝ තම ගෙට පිඬු සිඟා වැඩිය බුදුරජුන් දැක ගෙයි වඩා හිඳුවා වළඳවා දෙහොත් මුදුන් දී පසෙක හුන්නී ය. එ කල්හි බුදුරජානන් වහන්සේ **"භොජනං සුප්පවාසෙ දෙන්ති පටිග්ගාහකානං චත්තාරි ඨානානි දෙති. කතමානි චත්තාරි? ආයුං දෙති. වණ්ණං දෙති. සුඛං දෙති. බලං දෙති. ආයුං දත්වා ආයුස්ස වණ්ණං දත්වා වණ්ණස්ස සුඛං දත්වා සුඛස්ස බලං දත්වා බලස්ස භාගිනී හොති දිබ්බස්ස වා මානුසස්ස වා** = සුප්පවාසා! ආහාර දෙන ආර්‍යශ්‍රාවිකා තොමෝ ප්‍රතිග්‍රාහකයනට ආයුෂ-වර්ණ-සුඛ-බල යන අනුසස් දී තොමෝත් දෙවියන් මිනිසුන් පිළිබඳ වූ ආයුෂ-වර්ණ-සුඛ-බල යන මොවුනට හිමි වන්නී ය" යි වදාරා නැවැත:-

"සුසඞ්ඛතං භොජනං යා දදාති
සුචිං පණ්ණිතං රසසා උපෙතං,
සා දක්ඛිණා උජ්ජුගතෙසු දින්නා
චරණොපපන්නෙසු මහග්ගතෙසු
පුඤ්ඤෙන පුඤ්ඤං සංසන්දමානා
මහප්ඵලා ලොකවිදූනවණ්ණිතා,
එතාදිසං යඤ්ඤමනුස්සරන්තා
යෙ වෙදජාතා විචරන්ති ලොකෙ.
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානං"

යම් ස්ත්‍රියක් තොමෝ රසවත් සුපබ්‍යඤ්ජනයන්ගෙන් යුත් පිරිසුදු වූ මැනැවින් පිළියෙල කළ භොජනයන් නො ඇද වූ විද්‍යා චරණධර්මයන්ගෙන් යුක්ත වූ රහතුන් වහන්සේ කෙරෙහි දේ ද, එසේ දුන් එ දක්ෂිණාව පිණෙන් පිණ ගටන්නී මහත්පල ඇත්තී බුදුරජුන් විසින් පසස්නා ලද්දී ය. මෙ බඳු දන් සිහි කරන්නෝ සතුටු සිත් ඇති ව ලොව හැසිරෙත්. මසුරුමල දුරු කොට අනින්දිත ව දෙව්ලොවට පැමිණෙත් යි කොටින් වදාළ සේක.

දවසෙක බුදුරජානන් වහන්සේ භික්ෂූන් අමතා **"භොජනං භික්ඛවෙ! දදමානො පටිග්ගාහකානං පඤ්ච ඨානානි දෙති. ආයුං දෙති. වණ්ණං දෙති. සුඛං දෙති. බලං දෙති. පටිභාණං දෙති** = මහණෙනි! දන් දෙනුයේ ප්‍රතිග්‍රාහකයනට ආයුෂය දෙයි. වර්ණය දෙයි. සුඛය දෙයි. බලය දෙයි. ප්‍රඥාව දේය" යි වදාළ සේක.

එහි ලා මෙ ද දත යුතු ය.

"ආයුදෙ බලදෙ ධීරො වණ්ණදෙ පටිභාණදෙ
සුඛස්ස දතා මෙධාවී සුඛං සො අධිගච්ඡති.
ආයුං දත්වා බලං වණ්ණං සුඛං ච පටිභාණකං,
දිඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජති" යනු.

ආයුෂ – බල – වණ්ණ – ප්‍රඥ – සුඛ දෙන්නා වූ නුවණැති පුරුෂ තෙමේ සැපයට පැමිණෙන්නේ ය. ආයුෂ – බල – වණ්ණ – සුඛ – ප්‍රඥවන් දී යම් යම් තැනක උපදින්නේ ද ඒ උපන් හැම තැන දීඝායුෂය හා යශස් ඇත්තේ වේ.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු පරිත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා මනුස්ස දෙහගගං උපපජ්ජති" මහණෙනි! තමා දන් දෙන්නෙකැ ,යි මහා ජනයා මැද පෙණී සිටීමේ අදහසින් කළ දානමයකුශලකර්මය තෙමේ කළහු මරණින් මතු මිනිස්ලොව හැම යස ඉසුරෙන් පිරිහී ගිය පහත් කුලයෙක උපදවන්නේ ය.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරිය වත්ථු මත්තසො කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා මනුස්සසොභග්ගං උපපජ්ජති" මහණෙනි! තමාගේ පමණට සරිලන සේ සැදැහැසිතින් කළ දානමයකුශලකර්මය තෙමේ කළහු මරණින් මතු මිනිස්ලොව හැම යස ඉසුරෙන් පිරී ගත් උසස් කුලයෙක උපදවන්නේ ය.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරිය වත්ථු අධිමත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති" මහ-ණෙනි ! ඉතිරී පැතිරී යන සේ වඩාලා කළ දානමයකුශලකර්මය තෙමේ කළහු මරණින් මතු සිවු මහරජයෙහි උපදවන්නේ ය.

"තත්‍ර භික්ඛවෙ! චත්තාරො මහාරාජානො දානමයං පුඤ්ඤ-කිරියවත්ථු අතිරෙකං කරිත්වා චාතුම්මහාරාජිකෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා-වණ්ණෙන-සුඛෙන-යසෙන-ආධිපතෙය්‍යෙන. දිබ්බෙහි රූපෙහි-සද්දෙහි-ගන්ධෙහි-රසෙහි-ඨොට්ඨබ්බෙහි" මහණෙනි! සිවු මහාරජදරුවෝ දානමය කුශලකර්මය අධිකතර ව කොට එහි අනෙක් දෙවියන් දිව්‍යමය වූ

ආයුෂයෙන් - වණ්ණයෙන් - සුඛයෙන් - යශසින් - අධිපතිභාවයෙන් දිව්‍යමය වූ රූපයෙන් - ශබ්දයෙන් - ගන්ධයෙන් - රසයෙන් - ස්ප්‍රෂ්ටව්‍ය යෙන් යන දසකරුණෙන් යටපත් කොට සිටියි.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරිය වත්ථු අධිමත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා යාමානං දෙවානං සහව්‍යතං උපපජ්ජති" මහණෙනි! දානමය කුසලකර්මය බොහෝ ව නිතර නිතර කෙළේ මරණින් මතු යාමදෙව්ලොව උපදින්නේ ය.

"තත්‍ර භික්ඛවෙ! සුයාමෝ දෙවපුත්තෙනා දානමයං පුඤ්ඤ කිරියවත්ථු අතිරෙකං කරිත්වා යාමෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති. දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි" මහණෙනි! සුයාම දෙවපුත්‍ර තෙමේ එහි දානමයකුශලකර්මය වඩා වඩා කොට යාමදෙවියන් දිව්‍යමය වූ ආයුෂයෙන් - දිව්‍ය - මය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් යටපත් කොට සිටියි.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා තුසිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජති" මහණෙනි! මෙහි දානමයකුශලකර්මය අධික කොට කෙළේ මරණින් මතු තුසිත දෙව්ලොව උපදින්නේ ය.

"තත්‍ර භික්ඛවෙ! සන්තුසිතෙ දෙවපුත්තෙනා දානමයං පුඤ්ඤ කිරියවත්ථු අතිරෙකං කරිත්වා තුසිතෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි" මහණෙනි! එහි සන්තුෂිත දෙවපුත්‍ර තෙමේ දානමයකුශලකර්මය වඩ වඩා කොට තුසී දෙවියන් දිව්‍යමය වූ ආයුෂයෙන් - දිව්‍යමය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් යන දස කරුණෙන් යටපත් කොට සිටියි.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරිය වත්ථු අධිමත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා නිම්මාණරතීනං දෙවානං සහව්‍යතං උපපජ්ජති" මහණෙනි! මෙහි දානමයකුශලකර්මය යමකු විසින් අධික ව කරණලද්දේ වේ ද ඒ කළ තැනැත්තේ මරණින් මතු නිම්මාණරතී දෙව්ලොව උපදින්නේ ය.

"තත්‍ර භික්ඛවෙ! සුනිම්මිතෙ දෙවපුත්තෙනා දානමයං පුඤ්ඤ කිරියවත්ථු අතිරෙකං කරිත්වා නිම්මාණරතී දෙවෙ දසහිඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි"

මහණෙනි! එහි සුනිර්මිත දෙවපුත්‍ර තෙමේ දානමයකුශලකර්මය වඩ වඩා කොට නිර්මාණරතී දෙවියන් දිව්‍යමය වූ ආයුෂයෙන්-දිව්‍යමය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් යන දස කරුණෙන් යටපත් කොට සිටියි.

"ඉධ පන භික්ඛවෙ! එකච්චස්ස දානමයං පුඤ්ඤකිරියවත්ථු අධිමත්තං කතං හොති. සො කායස්ස භෙදා පරම්මරණා පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජති" මහණෙනි! මෙහි යමකු විසින් දානමයකුශලකර්මය අධික කොට කරණ ලද්දේ වේ ද ඒ කළ තැනැත්තේ මරණින් මතු පරනිර්මිතවශවර්තී දෙව්ලොව උපදින්නේ ය.

"තත්‍ර භික්ඛවෙ! වසවත්තී දෙවපුත්තෙනා දානමයං පුඤ්ඤකිරියවත්ථු අතිරෙකං කරිත්වා පරනිම්මිතවසවත්තී දෙවෙ දසහි ඨානෙහි අභිගණ්හාති දිබ්බෙන ආයුනා -පෙ- දිබ්බෙහි පොට්ඨබ්බෙහි" මහණෙනි! එහි වශවර්තී දෙවපුත්‍ර තෙමේ දානමයකුශලකර්මය වඩ වඩා කොට පරනිර්මිත දෙවියන් දිව්‍යමය වූ ආයුෂයෙන් - දිව්‍යමය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් යන දස කරුණෙන් යටපත් කොට සිටියි.

"දානං ලොකෙ සක්කසම්පත්තිං දෙති මාරසම්පත්තිං දෙති. බ්‍රහ්මසම්පත්තිං දෙති. චක්කවත්තිසම්පත්තිං දෙති. සාවකපාරමීඤාණං දෙති. පච්චෙකබොධිඤාණං දෙති. අභිසම්බොධිඤාණං දෙති" දානමය කුශලකර්මය ලොකයෙහි ශක්‍රසම්පත්තිය-මාරසම්පත්තිය - බ්‍රහ්මසම්පත්තිය - චක්‍රවර්තිසම්පත්තිය - ශ්‍රාවකපාරමීඥානය - ප්‍රත්‍යේකබෝධිඥානය - අභිසම්බෝධිඥානය දෙන්නේ ය.

"මහණෙනි! පිණට නො බවු, මහණෙනි! පිණැයි සුඛයට නමෙකි, මහණෙනි! මා විසින් බොහෝ කලක් කළ දානාදි කුශලකර්මයන්ගේ බලයෙන් මා විසින් වළඳනා ලද ඉෂ්ටවිපාකය කාන්තවිපාකය ප්‍රියවිපාකය මනවඩනවිපාකය මම ප්‍රත්‍යක්ෂ විසින් දනිමි, මම සත් අවුරුද්දක් මෙත් සිත් වඩා මෙත්තාබ්‍රහ්මවිහාරය උපදවා සංවර්තවිවර්තකල්ප සතක් කාමලොකයට උත්පත්තිවශයෙන් පෙරළා නො ආමි, කප නැසී යෑමෙහිදී ආභස්සරබ්‍රහ්මලොකයෙහි පිළිසිඳ ගනිමි, කප නැගීමෙහි දී ශූන්‍ය වූ බ්‍රහ්මවිමානයෙහි ඉපිද එහි අනෙකකු විසින් නො මැඩිය හැකි වූ මහාබ්‍රහ්ම වීමි, මම සතිස්වරක් සක්දෙවි රජ වීමි, සක්විති රජ වීමි, ඒ ඒ ප්‍රදෙශයන්හි රජකම් කළ අවස්ථාවන්ගේ ගණනෙක් නැත, සක්දෙවි රජ ව උපන් අන්තිම අත්බවෙහිදී මේ මහත් ඉෂ්ටවිපාකය කිනම්

කුශලකර්මයක්හුගේ විපාක විසින් මට ලැබිනි ද, මම දැන් මෙසේ සෘද්ධි ඇත්තෙම් ආනුභාව ඇත්තෙම් උපන්නෙම් කිනම් කර්ම-යක්හුගේ විපාක විසින් දැයි මට සිත් උපන, එහිදී පෙර මා විසින් කළ දාන-ශීල-භාවනා යන කුශලකර්මයන්ගේ විපාක වශයෙන් මේ ලදැයි ද, මම දැන් ඒ කුශලකර්මයන්ගේ විපාක බලයෙන් මහත් සෘද්ධි ඇත්තෙම් අනුභාව ඇත්තෙම් වීමි යි ද ඒ වේලෙහි මට පෙණිනැ'' යි ද බුදුරජානන් වහන්සේ **සුනෙත්ත** කාලයෙහි කළ කුශලකර්මයෙන් තමන් වහන්සේ විසින් වැළඳූ භවයෙන් වැසී ගිය උදාරපුණ්‍යවිපාකය මෙසේ ප්‍රකට කොට මහාජනයා පින්කිරීමෙහිලා උත්සාහවත් කළ සේක. තෙද ගැන්වූ සේක.

දවසෙක **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ බුදුරජුන් ඉදිරි යෙහි,

''ආදිත්තස්මිං අගාරස්මිං යන්තීහරති භාජනං,
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

එවමාදිපිතො ලොකො ජරාය මරණන ච,
නීහරෙථෙව දානෙන දින්නං හොති සුනීහතං

දින්නං සුඛඵලං හොති නාදින්නං හොති තං තථා,
චොරා හරන්ති රාජානො අග්ගි දහති නස්සති.

අථ අන්තෙන ජහති සරීරං සපරිග්ගහං,
එතදඤ්ඤාය මෙධාවී භුඤ්ජෙථ ච දදෙථ ච.

දත්වා ච භුත්වා ච යථානුභාවං,
අනින්දිතො සග්ගමුපෙන්ති ඨානං''

යනු කියා සිටියේ ය.

ගෙයක් ගින්නෙන් ඇවිළ ගත් කල්හි එහි වූ යම්කිසි දැයක් ගින්නට අසුවන්නට පෙරාතු ව බැහැරට ගණී ද ඒ ගත් හැම දැයෙක් පසුකාලයෙහි ඔහුට ප්‍රයොජනය පිණිස වන්නේ ය. බැහැරට නො ගත් දැය එහි ම දැවී යයි.

එපරිද්දෙන් මේ සත්ත්වලොකය තෙමේ රාග-දෙවෂ-මොහ-ජරා-මරණ-ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය උපායාශ යන මෙයින් නිති දෙවේලෙහි දැවෙන්නේ ය. ඇවිළ ගත්තේ ය. එහෙයින් දන් දීමෙන් නිතර ඇවිළ දැවෙන්නා වූ මේ පඤ්චස්කන්ධසඞ්ඛ්‍යාතගෘහ යෙන් පුණ්‍යවෙතනා නැමැති බඩු බැහැරට ගන්නේ ය. ගතයුතුය. බැහැරට ගන්නා ලද්දේ වන්නේ දෙන ලද්දය.

සුවපල ඇත්තේ දෙන ලද්ද ය. නො දුන් දෑය එසේ නො වේ. නො දුන් දෑය, ගෙයි සඟවා තුබූ දෑය හොරු පැහැර ගණිත්. රජුනට අයත් වේ. ගින්න දවාලයි. දියෙන් නැසෙයි.

සිරුර හා නො වැනසී තුබූ ධනරාශිය ද අඹුදරු ආදීන් ද මරණයෙන් හැර දමා පරලොව යන්නේ ය. නුවණැත්තේ මෙබව දැන කන්නේ ය. බොන්නේ ය. අඳින්නේ ය. පළඳින්නේ ය. දෙන්නේ ය. පිණෙහි යොදන්නේ ය. තම වත්පොහොසත් කම් ලෙසින් දීලා කාලා පිණෙහි යොදලා මරණින් මතු දෙව්ලොව යන්නේ ය, යන අරුත්.

දවසෙක අන් **දෙව්යෙක්** බුදුරජුන් වෙත පැමිණ උන්වහන්සේ ඉදිරියෙහි මෙසේ කී ය:-

"මච්ඡේරා ච පමාදා ච එවං දානං න දීයති,
පුඤ්ඤමාකඞ්ඛමානෙන දෙය්‍යං හොති විජානතා" යි.

සපයා ගත් ධනය මුළු ගන්වන සඟවා තබන මසුරත් විසින් මසුරුමල හෙතු කොට, සිහියෙන් තොර ව වසන සිහිනැති ප්‍රමාදයෙන් දවස් යවන්නහු ප්‍රමාදය හෙතු කොට දන් නො දෙනු ලැබේ. පින්පල කැමැත්තා වූ කම්පල දන්නහු විසින් දන් දිය යුතු ම ය යනු අරුත්.

දවසෙක අන් **දෙව්යෙක්** බුදුරජුන් වෙත පැමිණ උන්වහන්සේ ඉදිරියෙහි සිට මෙසේ කී ය:-

"යස්සව භීතො න දදාති මච්ඡරී තදෙවාදදතො භයං,
ජිඝච්ඡා ච පිපාසා ච යස්ස භායති මච්ඡරී.
තමෙව බාලංඵුසති අසම්ං ලොකෙ පරම්හි ච,
තස්මා විනෙය්‍ය මච්ඡේරං දජ්ජා දානං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකසම්ං පතිට්ඨා හොනති පාණිනං" යි.

මසුරුමලින් මැඩුනේ වසනුපරිහානියෙන් කෑම් පිම් ඇදුම් පැළඳුම් සපයාගත නො හැකි වේය යි බියට පත් ව අනුනට කිසි දෑයක් නො දේ ද, ඒ නො දීම ම ඔහුට බියට කරුණු වේ. දන් දෙන කල්හි කෑම් පිම් ඇදුම් පැළඳුම් නො ලැබ යා යි බියෙන් දන් නො දෙන මසුරා ඒ නිසා ම සාපිපාසායෙන් පෙළෙන්නේ ය. හෙතෙමේ යම් සාපිපාසා දුකකට බිය වේ ද ඒ සාපිපාසා දුක මෙලොව පරලොව දෙක්හි ම ඔහු ලුහුබැඳ යයි.

මෙසේ සාපිපාසා දුක, සසර දිගින් දිගට ලුහුබඳනා බැවින් මසුරුමල දුරු කොට මසුරුමල මැඩලුවෙක් ව දන් දෙන්නේ ය. සත්ත්වයනට පරලොව පිහිට වනුයේ පිණ ය. සත්ත්වයන්ගේ ජීවිත සුඛිත මුදිත වනුයේ හොඳට හැඩ ගැසෙනුයේ පින් බලයෙනි, යනු අරුත්.

දවසෙක අන් **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:-

"තෙ මතෙසු න මීයන්ති පන්ථානංව සහබ්බජං,
අප්පස්මිං යෙ පවෙච්ඡන්ති එසධම්මො සනන්තනො.
අප්පස්මෙකෙ පවෙච්ඡන්ති බහුනෙකෙ න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා සහස්සෙන සමං මිතා" යි.

කතරමගට බැස යන්නන් තමන් හා එක් ව යන අනෙක් දෙනා-හටත් තමන් වෙත තුබූ ටික දැය නමුත් බෙදා දෙන්නා සේ යම් කෙනෙක් දියයුතු දැය ඉතා මද ව ඇති කල්හිත් බෙදා දෙන්නෝ ද ඔවුහු නො දෙන්නන් නො දෙන සුලු බැවින් මැරෙණ කල්හි නො ද මැරෙන්නෝ ය. ඉතා ටික දැය නමුත් දීම බුද්ධාදිසත්-පුරුෂයන්ගේ ස්වභාවය යි. මළහුගේත් නො දෙන්නහුගේත් වස්තුවෙහි වෙනසෙක් නැත්තේ ය. මේ දෙදෙනාගේ ම වස්තුව එකසමාන ය.

කෙනෙක් තමන් වෙත ඇති ටික දැයිනුත් දන් දෙන්නෝ ය. කෙනෙක් උපභොග වස්තු බොහෝ ඇත ද දන් නො දෙත්. ටික දැයක් ඇති කල්හිත් ඒ ටික දැයින් කම්පල හදහා දුන් දානයෙහි වටිනාකම ඉමහත් ය යනු අරුත්.

දවසෙක අන් **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:-

"දුද්දදං දදමානානං දුක්කරං කම්මකුබ්බතං,
අසන්තො නානු කුබ්බන්ති සතං ධම්මො දුරන්නයො,
තස්මා සතං ච අසතං ච නානා හොන්ති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායණා" යි

ටික දැයක් ඇතිකල්හි එය දීම අසත්පුරුෂයනට නො කටහැකිය. දීම දුෂ්කරය. සත්පුරුෂයෝ අසත්පුරුෂයනට නො කට හැකි වූ අසත්පුරුෂයනට දුෂ්කර වූ ඒ දානය දෙන්නෝ ය. සත්පුරුෂයෝ දුෂ්කර වූ දානාදිසුචරිතක්‍රියා කෙරෙත්. අසත්පුරුෂයෝ සත්-පුරුෂයන්ගේ ඒ ක්‍රියාවන්ට අනුව නොයෙත්. ඒ එසේම ය. සත්පුරුෂයන් කරණ දානාදිසුචරිතක්‍රියා අසත්පුරුෂයන්ට කළ නො හැකි ය.

එහෙයින් සත්පුරුෂයන්ගේත් අසත්පුරුෂයන්ගේත් සස-රෙහි ඉපැත්ම වෙනස් ය. අසත්පුරුෂයෝ නිරයයෙහි උපදිත්. සත්පුරුෂයෝ ස්වර්ගයෙහි උපදිත්.

දවසෙක අන් **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:-

"දානං ච යුද්ධං ච සමානමාහු
අප්පාපි සත්තා බහුකෙ ජිනන්ති,
අප්පම්පි චෙ සද්දහානො දදාති
තෙනෙව සො හොති සුඛී පරත්ථ" යි.

දීම හා යුද්ධය සමානය යි කියත්. වීර්‍ය්‍යවත් පුරුෂයෝ ටික-දෙනෙක් වූවාහු ද ඔවුහු බොහෝ වූත් බියසුලු වූත් සතුරන් පරදවා ජය ගණිත්. කම්පල හදහා ටික දැයක් නමුත් දෙන්නේ ඒ කරණ කොට පරලෙව්හි ඉෂ්ටවිපාක ලබා සුව ඇත්තේ වන්නේ ය, යනු අරුත්.

ජීවිතයට බිය වන්නහුට යුදකට නො හැකි ය. ධනහානියට බිය වන්නහුට දන් දෙනු නො හැකි ය. "දිවිය ද රැක ගණිමි, යුද ද කරමි" යි කියනුයේ යුද නො කරන්නේ ය. "දිවි ගැලවී යේවා, අත්පා කැඩී බිඳී යේවා, සතුරන් මැඩලන්නෙමි" යි උත්-සාහ ඇත්තේ යුද කරන්නේ ය. "භොගයන් ද රැක ගණිමි, දන් ද දෙමි" යි කියනුයේ දන් නො දෙන්නේ ය. මෙබැවින් දානයත් යුද්ධයත් සමානය යි කීහ.

තවද යුදබිම වීරපුරුෂයෝ ටික දෙනෙක් වූවාහු ද ඔවුහු බොහෝ වූ භීරුකපුරුෂයන් සිය දහස් ගණනින් යම්සේ මැඩ ඔබා ගණිත් ද එසේ ශ්‍රද්ධාදිගුණවත් පුරුෂ තෙමේ ඉතා කුඩා දනක් දෙනුයේ ද බොහෝ මසුරන්, බොහෝ කෙලෙසුන් පර-දවා යටපත් කොට ජය ගන්නේ ය. මසුරුමල මැඩ යටපත් කොට දන් දී බොහෝ උසස් සැප ලබයි. මෙසේ ද දානය හා යුද්ධය සමාන වේ.

දවසෙක අන් **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:-

"යො ධම්මලද්ධස්ස දදාති දානං
උට්ඨානවිරියාධිගතස්ස ජන්තු,
අතිකම්ම සො වෙතරණිං යමස්ස
දිබ්බානි ඨානානි උපෙති මච්චො" යි.

යමෙක් නැති සිවුනා වැරින් දැහැමෙන් සෙමෙන් ඉපැයූ වස්තුවෙන් ආර්‍යාගුණයුක්ත පුද්ගලයන්හට දන් දේ ද, හෙතෙමේ යමයාගේ වෙතරණිය හා අත් එක් තිස් නිරය හැම අතින් ඉක්මවා දෙවිලොවට පැමිණෙයි, යනු අරුත්.

දවසෙක අන් **දෙවියෙක්** බුදුරජුන් වෙත පැමිණ මෙසේ කී ය:-

"විවෙය්‍ය දානං සුගතපපසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ" සි.

දිය යුතු දෑය හා දීමට සුදුස්සන් නෝරා බෙරා දීම හා දෙක බුදුරජුන් විසින් පසස්නාලද ය. මේ ලොකයෙහි යම් **කෙනෙක්** කම්පල හදහා දීමට සුදුසු වෙත් ද ඔවුන් කෙරෙහි දීම මහත් පල ඇත්තේ වේ. මනා සරුකුඹුරෙක වපුළ බීජුවට ශස්‍යඵලය මහත් කොට දෙන්නා සේ මහත්පල දෙන්නේ ය, යනු අරුත්.

දවසක් බුදුරජානන් වහන්සේ තමන් වෙත පැමිණි **අනේ-පිඬු** සිටු අමතා "ගෘහපතිය! යම්කිසි ආර්‍යශ්‍රාවකයෙක් චීවර-පිණ්ඩපාත - සෙනාසන - ගිලානප්‍රත්‍යය යන මෙයින්, මොනවට පිළි පන් සිල්වත් සඞ්ඝයා පුදන් ද ඔවුහු හැම යසඉසුරු දෙන්නා වූ සවඟීය පිණිස පවත්නා වූ යිහියනට සුදුසු වූ පිළිවෙතෙහි පිළිපදින්නෝ වෙත්, එමතු ද ගෘහපතිය! ඔවුනට දවරැදෙක්හි සියලු වේලෙහි පින් රැස් වේ, ඔවුහු මරණින් මතු දෙවිලොව උපදිත්" යි වදාළ සේක ඉම් ඒ දෙශනාව.

"නිගිණ්හාමීවිපටිපදං පටිපජ්ජන්ති පණ්ඩිතා,
සම්මග්ගතෙ සීලවන්තෙ චීවරෙන උපට්ඨිතා
තෙසං දිවා ච රත්තෝ ච සදා පුඤ්ඤං පවඩ්ඪති,
සඟඤ්ච කමනිට්ඨානං කම්මං කත්වාන භද්දකං" යනු.

බුදුරජානන් වහන්සේ "මහණෙනි! මම යම් හැටියෙකින් ආහාර පානාදිවස්තූන් දිමෙහි හා තමන් බෙදා ගත් කොටස නොවැන බෙදාදීමෙහි ඵලය දනිම් ද, ඒ හැටියට මා දන්නා හැටියට සෙසු අයත් දනිත් නම්, ඔවුහු පරහට නොදී තුබූ කිසිවක් නොද කන්නෝ ය, සි මට සිර්‍ර ව කිය හැකි ය, ඔවුන්ගේ සිත කිසි දවසෙක මසුරුමලින් නම් යටපත් නොවන්නේ ය, ඔවුන් දෙන දෑය පිළිගැණීමට ප්‍රතිග්‍රාහකයෝ වූහු නම්, අන්තිම

බත්කට වුව ද, ආ ආවුන්ට දී, යන්තමින් ඉතිරි වූ අන්තිම බත්කට වුව ද ඔවුනට නො දී නම් නො කන්නෝ ය, යම් කෙනෙක් එසේ නො දී කන්නෝ නම්, මහණෙනි! ඒ අය මා මෙන් දාන සංවිභාගඵලය නො දන්නෝ ය, එසේ නො දී කනු එහි ඵලය නො දන්නා බැවිනි, ඔවුන්ගේ සිත් මසුරුකමින් මැඩීගත් බැවිනි එසේ නො දී කන්නෝ" යි වදාළ සේක.

මේ ඒ වදාළ සැටි: **"එවං වෙ සත්තා ජානෙය්‍යුං දානසංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, න අදත්වා භුඤ්ජෙය්‍යුං, න ච තෙසං අස්ස චරිමො ආලොපො, චරිමං කබලං, තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං, සචෙ තෙසං පටිග්ගාහකා අස්සු, යස්මා ච බො භික්ඛවෙ! සත්තා න එවං ජානන්ති දානසංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, තස්මා අදත්වා භුඤ්ජන්ති, මච්ඡෙරමලං ච තෙසං චිත්තං පරියාදාය තිට්ඨති"** යි.

"එවං වෙ සත්තා ජානෙය්‍යුං යථා වුත්තං මහෙසිනා,
විපාකං සංවිභාගස්ස යථා හොති මහප්ඵලං.
විනෙය්‍ය මච්ඡෙරමලං විප්පසන්නෙන චෙතසා,
දජ්ජා කාලෙන අරියෙසු යත්ථ දින්නං මහප්ඵලං.
අන්නං ච දත්වා බහුනො දක්ඛිණෙය්‍යෙසු දක්ඛිණං,
ඉතො චුතා මනුස්සත්තා සග්ගං ගච්ඡන්ති දායකා.
තෙ ච සග්ගගතා තත්ථ මොදන්ති කාමකාමිනො,
විපාකං සංවිභාගස්ස අනුභොන්ති අමච්ඡරා"

මහර්ෂි වූ බුදුරජුන් විසින් වදාළ පරිදි දානසංවිභාගයාගේ මහත් වූ විපාකඵලය අන්‍ය සත්ත්වයෝත් දන්නාහු නම්,

ඉතා ටික වූත් දියයුතු දැයෙක් යම් ආර්‍යක්ෂෙත්‍රයෙක දෙන ලද්දේ මහත්පල ඇත්තේ වේ ද, එහෙයින් ඒ ආර්‍යයනට මසුරුමල පහ කොට වෙසෙසින් පහන් වූ සිතින් සුදුසු කාලයෙහි දන් දෙන්නෝ ය.

කම්පල හදහා දීමට සුදුස්සන් කෙරෙහි දක්ෂිණාව නොහොත් බොහෝ වූ ආහාරපානාදිය දුන් දායකයෝ මේ මිනිස්ලොවින් ච්‍යුත ව ගියෝ දෙව්ලොව උපදිත්.

නො මසුරු වූ ඔවුහු දෙව්ලොව උපන්නාහු එහි මන වඩන කම්සැපතින් යුක්ත ව සතුටු වන්නෝ ය. දානසංවිභාගයාගේ ඉෂ්ටඵලය වළඳන්නෝ ය.

මෙසේ බුදුරජානන් වහන්සේ නොයෙක් ලෙසින් දැනඵල වදාළ සේක. නොයෙක් තරාතිරම් ඇති දෙව් මිනිස්සු ද දැනඵල කියා පැහ. එහිලා බුදුරජානන් වහන්සේ ම ශ්‍රෙෂ්ඨ වෙත්. උන් වහන්සේ තරමට දැනඵල දන්නෝ දැනඵල කියූවෝ දෙවියන් සහිත ලොකයෙහි නො වූහ. අද ද නො වෙත්. මත්තෙහි ද නො වන්නෝ ය. දැනඵල දක්වනු සඳහා උන්වහන්සේ වදාළ ධර්මදේශනාවෝ පිටකත්‍රයයෙහි නොයෙක් තැන බොහෝසෙයින් පැනිර සිටියහ. මෙහි දැක්වුනේ එහිලා බිඳුමාත්‍රයෙකි. හැම ගෙණ පැමෙණි අපි නො පොහොසතුම්හ.

දැනය වනාහි හැම සැපයට නිදැන වේ. හැම සැපතට මූල කාරණ වේ. හැම හොඟයනට පිහිට වේ. හැම විෂමගතයනට රක්ෂාස්ථාන වේ. හැම විපතට පිළිසරණ වේ.

දැනය තරම් ඇසුරුකළ යුත්තෙක් සෙවිය යුත්තෙක් බැවිය යුත්තෙක් එල්බ ගැණුමෙක් රැකවලෙක් යායුතු තැනෙක් උතුම් මගෙක් කොතැනත් නැත්තේ ය.

දැනය වනාහි නිශ්‍රයාඪී විසින් රනින් කළ සිහසුනක් වැන්න. ප්‍රතිඥාඪී විසින් මහාපොළොව වැන්න. ආලම්බනාඪී විසින් රැහණක වැන්න. දුඃඛනිස්තරණාඪී විසින් නැවක වැන්න. ලොභමාත්සර්‍යාදීන් නසා අස්වැසන බැවින් සඞ්ග්‍රාමශූරයකු වැන්න. බියෙන් රක්නා බැවින් මොනවට පිරිකෙවූ කළ නුවරක් වැන්න. මසුරුමල ඈ නො තැවරුණු බැවින් පියුමක් වැන්න. මසුරුමල ඈ දවන බැවින් ගින්නක් වැන්න. මසුරුමලයනට ලංවිය නො හැකි බැවින් සර්පයකු වැන්න. නො තැනි ගන්නා බැවින් සිංහයකු වැන්න. මෙලොව පරලොව දෙක්හි කායබලාදිය දනවන බැවින් හස්තියකු වැන්න. අභිමඞ්ගලැයි සම්මත බැවින් ශ්වේතසෘඟයකු වැන්න. විපතින් මුදා සැපතටත් සසරින් මුදා නිවනටත් පමුණුවන බැවින් ක්ෂේමභූමීන්ට පමුණුවන වලාහක අස්රජහු වැන්න. මේ වනාහි නුවණැති පැරැන්නන් දැනය ගැණ සිතූසේ ය.

"නාහං භික්ඛවෙ! ආදිකෙනෙව අඤ්ඤාරාධනං වදාමි අපි ච බො අනුපුබ්බසික්ඛා අනුපුබ්බපටිපදා අඤ්ඤාරාධනා හොති" මහණෙනි! මම පටන්ගත් තැන ම මූල ම කිසිවකු හටත් නිවන් ලැබේය යි නො කියමි. පිළිවෙළින් හික්මීමෙන් පිළිවෙළින් ක්‍රියා කිරීමෙන් පිළිවෙළින් පිළිවෙත් පිරීමෙන් ඒ ලැබිය හැකිය යි මම කියමි යි බුදුරජානන් වහන්සේ මෙසේ

වදාළ බැවින් දානකථාව ආනුපූර්වකථාවෙහි ප්‍රථම කථාව වේ. එහෙයින් ම දානමයකුශලකර්මය ත්‍රිවිධපුණ්‍යක්‍රියාවස්තුන් අතර ත්‍රිවිධ-චතුර්විධ සඞ්ග්‍රහවස්තුන් අතර දශවිධ පාරමිතාවන් අතර ආදියෙහි සිටියේ ය.

නිවන් ලැබීම ටික කලකින් ටික පින්කමකින් කළ නො හැකි ය. එයට කප් සියදහසක් මුළුල්ලෙහි පින් දහමින් හොඳට මෝරා ගිය නුවණක් වුවමනා ය. කප් සියදහසෙකැ යි කීයේ අඩු ම ගණනින් ය. මේ කියූ කාලය තුළ සත්ත්වයාගේ එක් ම තැනක ඉපැත්මෙක් නො වේ. අත්බවෙන් අත්බවට චුතිපටි-සන්ධිවසයෙන් යා යුතු ය. එසේ යන්නෝ ඇතැම් කලෙක දුගතියෙහි ද, ඇතැම් කලෙක සුගතියෙහි ද උපදනාහ. දුග-තියෙහි උපන්නහුගේ කප් සියදහස තව තවත් දිග් ගැසෙන්-නේ ය. දුගතිය පිණට ස්ථාන නො වේ. එහෙයිනි එසේ දිග් ගැසෙනු. සුගතියෙහි උපන්නන් විසිනුදු කප් සියදහස ගෙවී ගිය තැනේ දී නිවන් ලැබීමට නම් ඒ කාලය මුළුල්ලෙහි අතර නො තබා දානශීලාදී වූ හැම ගුණයෙක් ම හැම පින්කමෙක් ම එයට සරිලන සේ සම්පූර්ණ කළ යුතු ය. සුගතියෙහි ද සමහර තැන් පිණට හිත නො වේ. හිත මනුෂ්‍යත්වය ම ය. මනුෂ්‍යත්වය ද අඞ්ගවිකලත්වයට නො පැමිණියේ ම භොගසම්පත්ත්‍යාදියෙන් නො පිරිහුනේ ම ප්‍රතිරූපදෙශයෙහි වූ යේ ම සදාශ්‍රය ඇතියේ ම නො ගිලන් වූයේ ම හිත වේ. මනුෂ්‍යත්වය මේ සියල්ලෙන් පුරා ලනුයේ ප්‍රධාන විසින් දානමයකුශලකර්මය යි. එහෙයින් හැමට පළමු නිවන් පිණිස කළයුතුත් කරන්නට පහසුත් දානමය කුශලකර්මය බැවින් බුදුරජවරු දානකථාව ම පළමුකොට වදා-රණ සේක. දානමයකුශලකර්මය නිවන් පිණිස පවත්නා බැවින් **බ්‍රහ්මචරිය** යි හඳුන්වන සේක.

සිවුසස්දහම් වසා සිටිනා ක්ලෙශාන්ධකාරය දුර ගසා යනුයේ මාර්ගඥානාලොකයෙනි. ඒ මේ මාර්ගඥානාලොකය පහළ වනුයේ ලොභද්වේෂමොහාදික්ලෙශධර්ම ඒ ඒ තත්ත්වයෙන් ඔබාලීමෙන් ය. දානචේතනාව මේ පිණිස මහත් උපකාරයෙක් වේ. පළමු කොට ලොභාදී වූ ක්ලෙශධර්ම තදඞ්ගප්‍රහාණයෙන් යටපත් කරන්නී දානචේතනා ය. එහෙයින් කෙලෙස්මල බිඳින්නහුට පහසුවෙන් කෙලෙස් බිඳිය හැක්කේ දානචේතනාවගේ බලයෙනි. අන් පිළි-වෙත් සකස් කොට පිරීම මෙතරම් පහසු නො වේ. ආදියෙහිලා මෙය ම පහසු බැවින් දානය ආදි කොට වදාරණ සේක.

යම් කුල කෙනෙක් සරණ සිල්-පන්සිල් නිතිරැකුම, ලහබත්-පැනිබත්-මැසිබත්-වස්වැසිබත් පිදීම, පොකුණක්-ලිඳක්-ආවාස-යක් කොට පිදීම යන මේබදු පින්කම් කෙරෙත් ද, ඒ කුලයන්ගේ ගතිය එකාන්ත ය. සථිර ය. ඒ කුලයෝ සොතාපන්නාකුලයන් වැනි වෙත්. යම් කිසි කුලයෙක ශ්‍රද්ධා-ශීල-ශ්‍රැත-ත්‍යාග-ප්‍රඥ යන ගුණයෝ ඔද වැඩි ව තර ව පවතිත් ද, එහෙත් ප්‍රාර්‍ථනා නැත්තේ ද, ඒ කුලයෙහි ගතිය එකාන්ත නොවේ. යම් කිසි කුලයෙක ප්‍රාර්‍ථනා ඇත්තේ ද ශ්‍රද්ධාශීලාදි ගුණයෝ ඔදවැඩි ව තර ව නොපවතිත් ද, ඒ කුලයෙහි ගතිය ද එකාන්ත නොවේ. ශ්‍රද්ධා ශීලාදි ගුණ හා ප්‍රාර්‍ථනා යම් කිසි කුලයෙක වෙත් නම්, ඒ කුලයෙහි ගතිය එකාන්තය. නියමිත ය.

අහසෙහි ලූ දඹුකඩ, අගින් මැදින් මුලින් යන තුන් තැනින් කොතැනෙකින් බිම හෙන්නේ දැයි නොකියැකි ය. එහි නියමයක් නොකට හැකි ය. එ පරිද්දෙන් සත්ත්වයන්ගේ ඒ ඒ භවයන්හි පිළිසිඳ ගැණීම ද නියත නොවේ. පිළිසිඳ ගැණීමෙහි නියමයෙක් නැත්තේ ය. අසුවල් භවයෙහි ම මෙතෙමේ පිළිසිඳ ගණියයි නොකියැකි ය. එහෙයින් පින්කම් කොට එක් තැනක් නියම කොට ප්‍රාර්‍ථනා නැබිය යුතු ය. "මාගේ මේ දානය නිවන් පිණිස වේවා" යි පතන්නහු විසින් නිවනට නතු කොට තැබූ දාන චෙතනාව බුදුබව පවා ලබාදීමෙහි පොහොසත් ය. භවසම්පත් පතා භවයට නතු කොට තැබූ දානචෙතනාව භවසම්පත් ම දෙන්නී ය. එයින් නිවන් ලබනු අපහසු ය.

"දින්නං ඵලත්ථිනා දානං වණ්ණිජ්ජංව ජිගුච්ඡියං,
සබ්බථා අපරාමට්ඨං විසිට්ඨන්ති විඤ්ඤුනියං"

ඵලයට ගිජුවී දුන් දන් වෙළඳුමක් සේ පිළිකුල් කටයුතු ය. තෘෂ්ණාදෘෂ්ටීන් හා මොන ලෙසකිනුදු මුසු නොවූ දානය හැමතින් ඉතා උසස් ය යි දත යුතු ය.

ශීලාදිගුණයුක්තයක්හට සැන්දක් පමණ බතක් පිදූ පස්රියන් පමණ බිමෙක කළ පන්සලක් පිදූ තැනැත්තේ කප්සිය දහස් ගණනක් දුගතියෙන් රැකෙන්නේ ය. දුගතියෙහි නොහෙන්නේ ය. කෙළවර ඒ කුශලය ඔහුට නිවන් පිණිස ප්‍රත්‍යය වන්නේ ය. එහෙයින් දන් පින් කොට නිවන ම පැතිය යුතුයි.

ධීරෝ ච දානං අනුමොදමානෝ = නුවණැත්තේ දානය අනුමොදන් වන්නේ ය. කළ හැටි ඉතා මැනැවැයි සතුටු වන්නේ ය.[1]

1. 2. 1. "ධීරා" යනු බලනු.

අනුමෝදනා නම්, යමකු කළ කුශලකර්මය දැක හෝ අසා හෝ කළ හැටි යහපතැයි කුශලකර්මය අනුව සතුටුවීම ය. සිතෙහි හැඟී සතුට වචනයෙන් පැවසීම හෝ අනුමෝදනා නම. යම් කිසි කර්මයෙකින් ලැබෙන අර්හත්සම්පත්තිය දැකීමෙන් සිතෙහි හට ගන්නා ප්‍රීතිවෙගය හෝ අනුමෝදනා ය. දුන්නහුට සොම්නස් දනවමින් දීමෙහි අනුසස් පැවසීම හෝ අනුමෝදනා ය. එය, සඞ්ඝ හත්තානුමෝදනා - මඞ්ගලහත්තානුමෝදනා - අවමඞ්ගලහත්තානු මෝදනා යි තෙපරිදි වේ එහි සඞ්ඝගතදක්ඛිණාවක් පිරිනැමූ තැනේ දී ඒ පිරිනැමූවන් සතුටට පත් කෙරෙමින් කෙරෙණ ධර්ම දේශනා සඞ්ඝභත්තානුමෝදනා නම්. එසේ ම දාවාහ් විවාහ ගෙවැ-ළුම් බත්කැවීම් ආදී වූ ලොකයා විසින් මඞ්ගලැ යි සම්මත කොට ගත් ක්‍රියාවන්හි දී දුන් දන් නිසා කෙරෙණ දෙශනා මඞ්ගල හත්තානුමෝදනා නම්. මළවුන් සඳහා දුන් දන් නිසා කෙරෙණ දෙශනා අවමඞ්ගලහත්තානුමෝදනා නම්.

තෙනෙව යසා හොති සුඛී පරත්ථ = ඒ හෙතුවෙන් ම හෙතෙමේ පරලොව සැප ඇත්තේ වේ.

"තෙනෙව යසා දානානුමෝදනාපුඤ්ඤෙන පරලොකෙ දිබ්බසම්පත්තිං අනුභවමානො සුඛී හොති" අනුන් කළ දානමය කුශලකර්මය ගැණ සතුටු වනුයේ ඒ සතුටු වීමෙන් ලත් කුසල යෙන් ම පරලොව දෙවිසැප විඳිමින් කායික - චෛතසික සුඛ යෙන් සුවපත් වන්නේ ය.

යමෙක් අනුන් කළ කුසලයෙහි පින් අනුමෝදන් වූයේ සිත්හි නගිනා ඊර්ෂ්‍යා-ද්වේෂ-මාත්සර්‍ය්‍ය-විහිංසාවන් නසා ශ්‍රද්ධාප්‍රඥාදි-ගුණයන්ගෙන් ආරාධිත වූ සිත් ඇතියේ උපනුපන් තන්හි සතුටු සිත් ඇති ව හැම කල්හි වසන්නේ ය.

එදා එක් තරුණයෙක් දෙවරම් වෙහෙර සඟසතු කොට පූජා කරන්නට පැන් පිරූ පැන් කෙණ්ඩිය අතට ගෙණ සිටි අනාථ-පිණ්ඩික සිටාණන්ගේ ශ්‍රී ශොභාව දැන "මේ දානය මහාදානයක්, ආශ්චර්‍ය්‍යවත් දානයක්, දිය යුතු දානයක්, අනෙකකුට නො දිය හැකි දානයක්" යි ප්‍රියවචන කියමින් පින් අනුමෝදන් වූයේ අබැටක් පමණ මිලයකුත් විසදම් නො කොට ම අනුමෝදන් වූ පින් බෙලෙන් දෙව්ලොව ඉපිද අධික වූ දිව්‍ය සෞඛ්‍යයින්ලාභ-යෙන් පිණා ගියේ ය. එහෙයිනි වදාළේ "පුණ්‍යානුමෝදනාමාත්‍ර-යෙන් පරලොව සුව ඇත්තේ වන්නේ" යි.

"සුඛං අස්ස අත්ථීති = සුඛී" සුව ඇත්තේ **සුඛී** නම්. **පරස්මිං = පරත්ථ,** පරලෙව්හි යන අරුත්හි **පරත්ථ** යනු වේ.

ධර්මදේශනාවගේ අවසානයෙහි **ජූණහ** තෙමේ සෝවන් වූයේ ය. ධර්මදේශනාව පැමිණ සිටි මහාජනයාට වැඩ සහිත වූ ය. **ජූණහ** තෙමේ සෝවන් වූයේ රජු දන් දුන් ලෙසට සත් දවසක් දන් දුන්නේ ය.

අසදෘශමහාදානවස්තුව නිමි.

අනේපිඬු සිටුපුත් නිවනට නතු වූ සැටි.

13—11

අනේපිඬුසිටු සැදැහවත් ය. එහෙත් ඔහු පුත් කාළ තෙමේ සැදැහ නැත්තේ ය. බුදුරජුන් වෙත යනු, ගෙට වැඩිය ද දකිනු, බණ අසනු, සඬයා වෙත ගොස් වතාවත් කරණු ඔහුට නො රිස්තේ ය. "පුතේ! ඔහොම නො කරන්නැ" යි සිටු විසින් කියන ලද්දේ ද හේ එය නොපිළිගණියි. දවසෙක සිටු තෙමේ "මේ දරු මෙබඳු දෘෂ්ටියක් ගෙණ සිටීමෙන් මරණින් මතු අපායයෙහි උපදින්නේ ය, ඒ සිකුරු ය, මා බලා සිටියදී මේ දරු අපාගත වන තැනට කටයුතු කිරීම මට මහත් වේදනාවෙක, ඔදි කමෙක, වේවා, මේ පොළොවෙහි මිලමුදලට අත් අතක ගසන්නට බැරි මිනිසෙක් නැත, නුවණ මද මිනිහා මිලමුදල් ම බලා පොරොත්තු වෙයි, එ බන්දකුට මිලමුදල් ටිකක් දුන් විට ඔහු ලවා ඕනෑම වැඩක් කරවිය හැකි ය, එහෙයින් මිලමුදල් ටිකක් දී මොහුගේ අදහස් වෙනස් කරම්" යි සිතා "පුත! පන්සලට ගොස් සිල් සමාදන් ව බණටිකකුත් අසා එන්න, ඒ ආ සැටියේ පුතාට මම ඕනෑ වැඩක් කරගැණීමට සන්තොෂ වශයෙන් මුදල් ටිකක් දෙන්නෙම්" යි කී ය. ඔහු ද එයට තුටු පහටු ව "කෝ තාත්තේ! මට දෙන මුදල් පෙන්වන්නැ" යි කී විට "මෙන්න' පුත! මුදල්, මේ මුදල් දෙන්නෙම්, වරදින්තේ නැතැ" යි කී ය. මෙසේ සිටු දෙතුන්විටක් ම කී කල්හි සිටුපුත් පෙහෙවස් ගෙණ විහාරයට ගොස් බණ ඇසීමෙන් වැඩෙක් නැතැ' යි වරක් පහසු තැනක නිදා හිඳ උදැසනින් ම නින්දෙන් නැගිට ගෙදර යියේ ය. මහාසිටු තෙමේ "මා පුත් පෙහෙව ආයේ ය, ඉක්මනට කෑද අවුදු ගෙණ එවූ" යි ගෙන්වා දෙවී ය. ඔහු මුදල් අතට නො ගෙණ නම් නො කම්, යි ගෙණවුත් දුන් හැම දෑය ම ප්‍රතික්ෂෙප කෙළේ ය. සිටු තෙමේ පුතුගේ පෙළීම නො ඉවසන්නේ මුදල් පොදියක් ගෙන්වා ඔහුට දෙවූයේ ය. ඔහු එය අතට ගෙණ කෑම ගත්තේ ය. පසුදුත් සිටු තෙමේ "පුත! මේ වර නුඹට පළමු වරට වඩා මුදල් දෙන්නම්, හැබැයි, නුඹ විහාරයට ගොස් බුදුරජුන් වෙතින් එක් බණ පදයක් ඉගෙණ අවුත් එය මටත් කියා දෙන්නට ඕනෑ, මුදල් දෙන්නෙම් එවිට ය" යි කියා ඒවරත් ඔහු විහාරයට පිටත් කොට යැවී ය. ඔහු මුදල් ලැබීමෙහි ආශාවෙන් එවරත් වෙහෙරට ගොස් බුදු රජුන් ඉදිරියෙහි හිඳ එක් ම බණ පදයක් ඉගෙණීමට සැරසුනේ ය. බුදුරජාණන් වහන්සේ ඔහු උගත් බණ පදය අමතක වන ලෙසක් කළ සේක. සිටුපුත් පළමු උගත් බණ පදය

අමතක ව ගිය බැවින්, නැවැත ද බණ පදයක් උගන්නෙමි යි එහි ම සිට බණ ඇසී ය. උගන්නෙමි යි සිතා අසන්නේ මැනැවින් අසන්නේ ය. උගන්නෙමි යි සිතා බණ අසන්නවුන්ට ධර්මය තෙමේ සෝවන් ඇ මග පල දෙන්නේ ය. මේ සිටු පුතු ද උගන්නෙමි යි දැඩි ව ගෙණ බණ අසයි. බුදුරජාණන් වහන්සේ ද ඔහුට අසන අසන බණ පදය නොසැලැකෙන සැටියක් ම කරණ සේක. අන් පදයක් උගන්නෙමි, අන් පදයක් උගන්නෙමි, යි සිතමින් බණ ඇසූ ඔහු ඒ වේලෙහි ම සෝවන්මඟ නුවණ ලැබී ය. පසුදා ඔහු බුදුරජුන් ප්‍රධාන කොට ඇති මහාසඞ්ඝයා වහන්සේ සමඟ නුවර සියගෙට පැමිණියේ ය. අනේපිඬු සිටුහට සිය පුතු දැක "අද වෙනදා වගේ නොවේ මපුතු, අද මපුතුගේ හැඩ හුරුකම් කාගේත් සිත ගණී, කාටත් රුචි උපදවා" යි අදහස් විය. ඒ අතර සිටුපුත්හට ද "මාගේ පියා අද බුදුරජුන් ඉදිරියෙහි මට මුදල් නොදෙනු නම්, මුදල් ලැබීමෙහි ආශාවෙන් මා පෙහෙවුනු බව නොකියා සඟවනු නම්, යෙහෙකැ"යි අදහස් විය. එහෙත් බුදුරජාණන් වහන්සේ මුදල් ලැබීමෙහි ආශාවෙන් ඔහු පෙහෙව ගත්බව දැන සිටි සේක.

මහාසිටු තෙමේ සියගෙට වැඩ ම කළ බුදුරජුන් ප්‍රධාන මහා සඞ්ඝයා වහන්සේට කෑදී පිළිගන්වා නැවැත පුතුට ද කෑදී ගෙන්වා දෙවී ය. ඔහු ද නිහඬ ව කෑදී බී කැවිලි ද වළඳා බතුත් අනුභව කෙළේ ය. නැවැත සිටු තෙමේ බුදුරජුන් දන් වළඳා අවසන් කළ ඉක්බිති මුදල්මල්ල ගෙන්වා පුතු ඉදිරියෙහි තබා "පුත! මම නුඹට සැහෙන මුදලක් දෙන්නෙමි" යි නුඹ පෙහෙවස් ගන්වා විහාරයට යැවීමි, මේ මා කී ඒ මුදල, එය භාර ගෙණ කැමැත්තක් කර ගන්නැ"යි කී ය. හෙතෙමේ ද බුදුරජුන් ඉදිරියෙහි තබා මුදල් දෙන විට ලජ්ජා ඇති ව "මට මුදල්වලින් වැඩෙක් නැතැ"යි කියා සිටියේ ය. "නෑ පුත! ගන්න' මා මෙය දෙන්නේ ඉතා සතුටින්, ගන්න, වරදෙක් නැත, භාර ගෙණ වුවමනා දෙයක් කර ගන්නැ"යි මහාසිටු කියද්දීත් ඔහු මුදල් නොපිළිගත්තේ ය. ඉක්බිති අනේපිඬු මහාසිටු බුදුරජුන් වැඳ "ස්වාමීන් වහන්ස! අද මපුත් වෙනස් වී සිටියි, ඔහුගේ හැඩ හුරුකමත් සිරුරුපැහැයත් වෙනදාට වඩා සිත්කලු ය, මා මන වඩන්නේ ය"යි දැන්වී ය. බුදුරජාණන් වහන්සේ "ඇයි සිට! එසේ කියහු දැ"යි අසා වදාළ කල්හි "ස්වාමීනි! ඔහු මුලින් දවසේ විහාරයට යැවූයෙම් මුදල් ටිකක් දීමේ පොරොන්දුව පිට ය, පසුදා විහාරයේ සිට ආ මොහුට බත් කන්නට කිම්, එහෙත් එදා මොහු මුදල්

අතට නො ගෙණ බත් කන්නට සතුටු නො වී ය, අද නම් පැරැත්ත කර කර දුන්න ද ගන්නට නො කැමැත්තේ ය' යි කීවිට බුදුරජානන් වහන්සේ "ඔවු! මහසිට! නුඹගේ පුතුට අද සක්විති සැපතටත් වඩා දිව්‍යලොක සැපතටත් වඩා හැම ලෙස-කින් සෝවන් පලය උතුම් ය" යි වැටහී ගොස් තිබේ, එහෙයින් මේ ලෞකික වූ හැම දෙයක් ගැණ ඔහුගේ ආශාව බොහෝ දුරට අඩු ව ගොස් තිබේ, මේ මුදලට කැමැති නැත්තේ එහෙයිනැ" යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

පථව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා,
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරන්ති.

මහාපෘථිවියෙහි වූ එක් රජයට වඩා ස්වර්ගයට යනුවට ද වඩා මුළු ලොව අධිපතිභාවයට වඩා සෝවන් පලය උතුම් වේ.

පථව්‍යා එකරජ්ජෙන = පොළොවෙහි එක් රජයටත් වඩා සක්-විතිරජය ලැබීමටත් වඩා.

සක්විතිරජබවට කිසි ලෙසකිනුත් ලංකළ හැකි සම කළ හැකි අන් රජයෙක් මේ මුළු මහාපොළොවෙහි නැත්තේ ය. සක්විති රජකම පොළොවෙහි ඇති එක් රජය' යි වදාළෝ එහෙයිනි. මිනිස් ලොව ඇති අසහායසම්පත්තිය උසස් ම සම්පත්තිය මෙය වේ. මෙයට වැඩිතරම් වූ සම්පත්තියෙක් මිනිස් ලොව නැත.

දෙදහසක් කුඩා දිවයිනෙන් පිරිවැරුණු සිවු මහාදිවයිනෙහි පතළ අණසක ඇති ජනරක්ෂ්‍යකත්වය සක්විති රජකමැ' යි ගැණේ පොළොව ඇති අන් හැම රජකමෙක් මෙයට යටත් ය. මෙය අන් හැම රජකම් අබිබවා සිටියේ ය.

පෙර කළ සියලු කුසලයන්ගේ විපාකය එකවිට වැළඳීමෙහි පොහොසත් වූවෙක් ම එබඳු කාලයෙක ලොකමාන්‍ය වූ අති පවිත්‍ර වූ මවුපියපරපුරක් ගෙණ උපන්නේ මේ ජනරක්ෂ්‍යකත්ව-යට පැමිණෙන්නේ ය.

සක්විති රජකම ලැබීමට සුදුසු පිණැත්තකු ලෝ පහළ වීමට සියක් වසක් තිබිය දී කාමාවචර දෙවියෙක් රන්වන් සළු හැඳ සුවඳ විලවුන් ඇඟ තවරා පළඳනා ඇඟලා මිණි වොටුනු දරා මගුල් වෙස් ගෙණ මේ මගුල් සක්වළ සිවු මහාදිවයින වටා "මෙයින් සියක් අවුරුද්දක් ගිය තැන සක්විති රජකු උපදිනු ඇතැ" යි කියමින් හැසිරෙන්නේ ය. එතැන් සිට සියක් අවු-රුද්දක් ගිය තැන කෘතපුණ්‍ය වූ මේ මහාපුරුෂ තෙමේ උභයකුල

පරිශුද්ධ මාතෘපිතෘන් ගෙණ නානාවිධ ආශ්චර්‍යයන් මැද ලොව පහළ ව කුමාරපරිහාරයෙන් වැඩී මුළු මහත් දඹදිව ද්‍රීපච්චක්‍රවර්තී ව දස රජදම් නො වරදවා සිවු සඟරාවතින් ප්‍රජාපාලනය කරන්නේ, දන් ඈ දසවැදැරුම් සක්විති වත් පුරා රජසිරි විඳින්නේ ය. පුරපසළොස්වක් දිනයෙහි උදෑසන ලක්ෂයක් වියදම් කොට මහාදන් පවත්වා සුවඳදියෙන් ඉස් සෝදා නා සුදුවත් හැඳ පොරවා ගෙණ පෙහෙවස් ඉටා සිරියහන් ගබඩාවට පිවිස පලක් බැඳ හිඳ දානාදිකුශලකර්මයන් සිතමින් සිහිකරමින් හිඳිසි. එකල පූර්වේ-කෘතකුශලබලයෙන් චක්‍රරත්නය – හස්තිරත්නය – අශ්වරත්නය – මාණික්‍යරත්නය-ස්ත්‍රීරත්නය-ගෘහපතිරත්නය-පරිණායකරත්නය යන සප්තවිධ චක්‍රරත්නයන්ගේ ප්‍රතිලාභයෙන් දෙදහසක් කොදෙවු වලින් පිරිවැරුණු සිවු මහාදිවයිනෙහි සක්විති රජවන්නේ ය.

මෙතෙමේ චක්‍රරත්නයෙහි ආනුභාවයෙන් නො දිනූවන්දිනන්නේ ය. හස්ති-අශ්වරත්නයන්ගේ බලයෙන් දිනා ගත් කොදෙවු සහිත වූ සිවු මහාදිවයිනෙහි කැමැති සේ සුව සේ හැසිරෙන්නේ ය. පරිණායකරත්නයෙහි මහිමයෙන් දිනා ගත් විජිතයන් එක්වන් රකින්නේ ය. මෙයින් අන්‍ය වූ රත්නයන්ගේ අනුහසින් උපභොගසුඛ වළඳන්නේ ය.

චක්‍රරත්නයෙන් මොහුට උත්සාහශක්තියොගය පරිණායකරත්නයෙන් මන්ත්‍රශක්තියොගය හස්ති-අශ්ව-ගෘහපති රත්නයන්ගෙන් ප්‍රභුශක්තියොගය පිරිපුන් ව ලැබෙන්නේ ය. ස්ත්‍රී-මාණික්‍ය රත්න දෙකින් මෙකී ත්‍රිවිධ ශක්තියොග ඵලය ම වන්නේ ය. මෙතෙමේ ස්ත්‍රී-මාණික්‍යරත්න කරණ කොට අනන්තාපරිමිත භොග සම්පත්තීන් වළඳන්නේ ය. චක්‍රරත්නය පහළ වීමෙන් පසුලොවැති අන් හැම දෙවස්ථාන කෙනෙක් ම, අභාවයට යන්නෝ ය. ලෝවැසි සියල්ලෝ එයට ම වඳිති. පුදති. ගරු කෙරෙති.

මෙහි මුලින් කියූ ත්‍රිවිධරත්නයෝ, අදොස නම් කුසල මූලයෙන් හටගත් ගණන් නැති කුසලචේතනාබලයෙන් නිපැදුනෝ ය. මාණික්‍ය-ස්ත්‍රී-ගෘහපතිරත්නයෝ, අලොභ නම් කුසලමූලයෙන් හටගත් ගණන් නැති කුසලචේතනාබලයෙන් නිපැදුනෝ ය. පරිණායකරත්නය, අමොහ නම් කුසලමූලයෙන් හටගත් ගණන් නැති කුසලචේතනාබලයෙන් නිපැදුනේ ය. මෙහිලා මේ කීවා ඉතා කෙටිකතා ය. විස්තරකථාව බොජ්ඣඞ්ගසංයුත්ත-රතන සුත්ත යන මෙතැන්වලින් දත යුත්තේ ය.

ලෞකික වූ හැම සැපතින් මුදුන්පෙත්තට නැගි මේ මහෙ-ශාක්‍යමහාපුරුෂයෝ දෙදෙනෙක් එක්සක්වළෙක එක් වට පහළ නො වෙත්. පහළ වන්නේ එකෙක් ම ය. එසේ එකකු පහළවනු, ලොකයා අතර හටගන්නා වූ විවාද නැසීම පිණිස ආශ්වර්‍යය පිණිස චක්‍රරත්නයෙහි මහත්ත්වය රැකෙනු පිණිස ය.

දෙදෙනකු එකවිට උපන් කල්හි "අපගේ රජ මහත් ය, අපගේ රජ මහත් ය" යි මහාජනයා අතර විවාද හටගන්නේ ය. "මේ දිවයිනෙහි සක්විති රජෙක, මේ දිවයිනෙහි සක්විති රජෙ-කැ"යි එක්වට කියත්, සක්විත්තන්ගේ ආශ්වර්‍යයෙක් නැත්-තේ ය. දෙදහසක් කොදෙවු පිරිවර කොට ඇති සිවු මහාදිවයිනෙහි චක්‍රරත්නයාගේ ඓශ්වර්‍යදානයෙහි යම් කිසි බලයෙක් මහානු-භාවයෙක් වේ නම් එ ද පිරිහෙන්නේ ය. මේ හෙතු ය දෙදෙනකු එක්වට පහළ නො වීමෙහි.

බුදුරජකු ලොව පහළ ව ඇති කල්හි සක්විතිරජෙක් හෝ සක්විති රජකු ලොව පහළ ව ඇති කල්හි බුදුරජෙක් හෝ ලොව පහළ නො වේ. සක්විති රජකු ලොව ඇති කලෙක බුදුකෙනෙක් ලොව පහළ වූවෝ නම් සක්විති රජපැවිද්ද හෝ ලබයි. කලුරිය හෝ කරයි. සක්විතිරජුගේ සොහොන් අලු ථූපාරහ වේ. එයට වැඳීමෙන් පිදීමෙන් බුහුමන් කිරීමෙන් දෙවිමිනිස් සැප ලැබිය හැකි ය.

සංයුත්තනිකායට්ඨකථාවෙහි "මෙතෙමේ මහත් පුණ්‍යානුභාව-යෙන් නැගුනේ 'පින්වත් තෙමේ අණසක පවත්වා යන වචනයන් ගෙන් මෙහෙයුනේ අණසක පවත්වා' නු යි චක්කවත්තී නමැ" යි කියන ලදී.

දීඝනිකායට්ඨකථාවෙහි "මෙතෙමේ චක්‍රරත්නය පවත්වා නු' යි හෝ චතුර්විධසම්පත්තිචක්‍රයෙන් යුක්තව පවතී නු යි හෝ අනුනට හිතපිණිස චතුර්විධර්‍යාපථයන්ගේ පැවැත්ම මොහු කෙරෙහි ඇත්තේ නු යි හෝ චක්කවත්තී නැමැ"යි කියන ලදී.

සක්විතිරජ සුප්පතිට්ඨිතපාදතා දී වූ මහාපුරුෂලක්ෂණ දෙති-සකින් හෙබියේ ය. දැහැමි වූයේ ය. පුණ්‍යානුභාවයෙන් රජය ලැබ රජ වූයේ ය. පරහිතකරණයෙන් හෝ දැහැමි වූයේ ය. ආත්මහිතකරණයෙන් හෝ ධර්මරාජන් වූයේ ය. සිවු සයුරකෙළ-වර කොට ඇති මහාපොළොවට ඊශ්වර වූයේ ය. ඇතුළත්හි වූ ක්‍රොධාදී වූ සතුරන් හා බැහැර සියලු රජුන් දිනා සිටියේ ය. දනවුහි නො සැලෙන බවට පැමිණියේ ය. සප්තරත්නයෙන්

පිරිවැරුණේ ය. දිව්‍යපුත්‍රයන්ගේ සිරුරු වැනි සිරුරු ඇති පර සෙනා මැඩලන දහසකට වැඩි පුත්‍රයන්ගෙන් බැබලුනේ ය. **"අයං පි දෙව! කුමාරො දවතතිංසමහාපුරුසලක්ඛණෙහි සමන්නාගතො, යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙවව ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියපත්තො සත්තරතනසම්පන්නො පරොසහස්සං ඛො පන පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා"** යනු එහි පාලි.

දෙතිස් මහාපුරිස්ලකුණෙන් හෙබි මෙතෙමේ ගිහි ව සිටියේ ම සක්විති වන්නේ ය. පැවිදි වූයේ සම්බුදු වන්නේ ය. මේ ඒකාන්ත සිද්ධිය වේ. **"සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො"** යනු පාලියි. **දීඝනිකායයෙහි අම්බට්ඨ – මහාපදාන – චක්කවත්තිසීහනාදසූත්‍ර හා සාරසඞ්ග්‍රහයෙහි චක්කවත්තිවිභාවනාකථා ද** බැලිය යුතුය.

මෙහි කියූ මහත්ත්වයෙන් යුක්ත වූ මහාපුරුෂයක්හුගේ ජනරඤ්ජකත්වය පොළොවෙහි එක්රජය යි වදාළ සේක.

සග්ගස්ස ගමනෙන වා = ස්වර්ගයට යනුවට වඩා සගසැප ලැබීමට වඩා.

චාතුර්මහාරාජිකාදිස්වර්ගලොක සයෙක, බ්‍රහ්මපාරිෂද්‍යාදිරූපාවචරබ්‍රහ්මලොක සොළසෙක, ආකාසානඤ්චායතනාදිඅරූපාවචර බ්‍රහ්මලොක සතරෙකැ' යි ස්වර්ගවිස්සෙකි.[1]

සබ්බලොකාධිපච්චෙන = මුළු ලොව අධිපතිභාවයට වඩා. නාගසුපණ්ණි වෛමානික ප්‍රෙතයන් සහිත මුළු ලොව අධිපතියකු වීමට වඩා.

සොතාපත්තිඵලං වරං = සොතාපත්තිඵලය උතුම් වේ. සොතාපත්තිඵලයට පැමිණීම උතුම් ය.

සොතාපත්ති මග්ගචිත්තය ලැබූ පුද්ගලයාහට එයට අනතුරුව ඒ හා ම උපදනා සිත සොතාපත්තිඵල නම්. මග්ගචිත්තය කුසල් ය. ඵලචිත්තය එහි විපාකය. මග්ගචිත්තයාගේ විපාක වශයෙන් උපදනා චිත්තය සොතාපත්තිඵල නම් වේ.

---

1. 1. 13 "ගියො නන්දති සුග්ගතිං ගතො" යනු බලනු.

කෘත්‍ය වශයෙන් හා ආලම්බන වශයෙන් අසමාන වූ අනුලෝම-ගොත්‍රභූ-මඟඵ-ඵල යන ලෞකික ලොකොත්තර ජවන් සිත් සතක් පරම කොට ඇති එකාවජ්ජනඅභිණ්හාවිත්තවීථියෙහි සතර වන හෝ පස්වන ජවනසථානයට පැමිණියේ සොතාපත්තිමඟඵ චිත්තය සි. සතරවන ජවනය, මඟඵචිත්තය වී නම් ඒ චිත්තවීථියෙහි ම පස්වන සවන සත්වන ජවනයෝ ඵලචිත්ත නම් වෙත්. පස්වන ජවනය මඟඵචිත්තය වී නම්, සවන සත්වන සිත් දෙක ඵලසිත් වේ. සොතාපත්තිඵලැයි කියේ මේ ඵලසිත් ය.

සතරවන ජවනය, මඟඵචිත්තය ලෙසින් ලැබෙන චිත්තවීථියෙහි පළමුවන දෙවන සිත් දෙක අනුලෝම සි ද, තෙවන සිත ගොත්‍රභූ සි ද, පස්වන ජවනය මඟඵචිත්තය ලෙසින් ලැබෙන චිත්තවීථියෙහි පළමුවන ජවනය පරිකම්ම සි ද, දෙවන ජවනය උපචාර සි ද තුන්වන ජවනය අනුලෝම සි ද සතරවන ජවනය ගොත්‍රභූ සි ද ගැණේ. මොවුනට අරමුණු වන්නේ අනිත්‍යාදිලක්ඛණත්‍රයයෙන් යම් ඒ එකෙක් ය. අනිත්‍යාදී වූ යමක් ම අරමුණු කොට පරිකම්ම-උපචාර-අනුලෝම නාමයෙන් උපදිනි මේ නියූ ජවනයෝ. මෙසේ කෘත්‍යවශයෙන් වෙන වෙන නම් ලබන්නෝ ද වෙනසක් නො තබා අනුලෝමයෝ ම වෙත්.

අනුලෝමඤනයන්ගෙන් සත්‍යප්‍රතිච්ඡාදක අවිද්‍යාඛකාරය පහව ගිය කල්හි ගොත්‍රභූචිත්තය නිවන් අරමුණු කොට තුන්වැනි ව හෝ සතරවැනි ව උපදනේ ය. මේ ගොත්‍රභූචිත්තය තමා ආවජ්ජනයෙක් නො වූ යේ ම ආවජ්ජනසථානයෙහි සිට මාඝීය ආවජ්ජනය කරණ බැවින් පටිපදඤණදස්සනවිසුද්ධිය නො වේ. මාඝීය නො වන බැවින් ඤණදස්සනවිසුද්ධියත් නො වේ. මේ දෙයතුර ගණන් ගත යුතු නො වේ. විදර්‍ශනාස්‍රොතයෙහි වැටුනු බැවින් විදර්‍ශනා සි ගත යුතු ය.

සතරවන පස්වන සිත් සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස යන සංයොජන තුණ හා සියලු කෙලෙසුන් පිළිබඳ අපායගාමීඝකතිය, මරණ නසන බැවින් මඟඵචිත්ත සි ගැණේ. මොවුනට අරමුණු වන්නේ නිවණ ය. නිවන අරමුණු කොට මඟඵචිත්තයෝ උපදින්. ඵලචිත්ත නම්, ඒ මඟඵචිත්තයන්ගේ විපාක සි. මෙහි මුලින් කියූ ආර්‍යපුද්ගලවිභාගය බැලි ය යුතු ය.

සක්විති රජකම් කළ ද දෙව්ලොව හෝ බඹලොව ඉපිද දෙව් සැප බඹසැප වින්ද ද මුළු ලොවැ ම රජ වුව ද අපායයෙන් මිදීමෙක් නැත. සෝවන් පලයට පැමිණියේ ම හැර පියනලද 'අපායය

ඇත්තේ වේ. ඔහු සෝවන්මගඵල ලබා කෙලෙසුන්ගේ අපා-යෝත්පාදකශක්තිය නැසූ බැවිනි එසේ වනු. එහෙයින් ඔහුගේ අපායයෙහි ඉපැදීමෙක් නැත. ආර්‍යපුද්ගලයන් අතුරෙහි හැමට දුර්ලභ වූ සත්තක්ඛත්තුපරමසෝතාපත්තියාද භවයෙහි උපදිනුයේ සත්වරක් ම ය. අටවැනි භවයෙහි නම් උපතෙක් ඔහුට ද නොලැබෙන්නේ ය. "සියලු ලෞකික වූ සැපතට වඩා ලොකොත්තර වූ සෝතාපත්තිඵලය උතුම්" යි වදළෝ මේ නිසා ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවන් පලා-දියට පැමිණියාහු ය.

කාලනම් අනාථපිණ්ඩිකපුත්‍රවස්තුව නිමි.

සකලජනධර්මාර්ථසඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල සථවිරයන්** කළ **සද්ධර්මසාගර** නම් වූ ධර්මපදවර්ණනාවෙහි ලොකවග්ගාත්‍මකත්‍රයොදශ තරඞ්ගය නිමියේ ය.

බුද්ධවර්ගය

චතුර්දශතරඞ්ගීයකථාසූචි

පිට	වස්තුව	
1649	1	මාගන්දියගේ එඩි බිද දැමූ සැටි.
1662	2	යමාමහපෙළහර.
1685	3	එරකපත්ත නා රජු.
1697	4	ආනන්දමහාතෙරුන් ඇසූ ප්‍රශ්නයක්.
1712	5	සසුනෙහි නො ඇලුනු මහණෙක්.
1718	6	අශීදත්තපුරොහිතයා.
1869	7	ආනන්ද මහාස්ථවිරයන් වහන්සේගේ ප්‍රශ්නය.
1872	8	බොහෝ භික්ෂූන් එක්ව කළ කථාවක්.
1884	9	රන්සෑයෙක්.

මාගන්දියගේ එඩි බිඳ දැමූ සැටි

14 — 1

මාගන්දිය නම් බමුණෙක් එකල **කුරුරට** විසි ය. ඔහුට එක් ම දුවක් වූ ය. ඕ ද නමින් මාගන්දියා නම් වූවා ය. රූසපුවෙන් හා හැඩහුරුකමින් උසස් තැනට නැගී සිටි ඕ තොමෝ එරට ගෙවල වැසි අන් තරුණ ගැණුන් අබිබැ වූ ය. ගමනින් බිණුමෙන් බැලුමෙන් සිනාවෙන් රූසපුවෙන් හැඩහුරුකමින් දුටුදුටුවන්ගේ මනනුවන් පැහැරගත් මැය ඉල්ලා මාගන්දිය බමුණු වෙත පැමිණි ක්ෂත්‍රිය-බ්‍රාහ්මණ තරුණයන්ගේ ගණන ටික නො වේ. එසේ ම දින පතා ඒ පිණිස ලැබුනු ලියුම්වල හා පණිවිඩකරුවන්ගේ ද ගණන අඩු නැත.

මාගන්දිය බමුණු තෙමේ දූ නිසා උදම් ව සිටියේ වෙත පැමිණි හැම කැත්කුමරුන් හා බමුණුකුමරුන් 'තෙපි එකෙකුත් මාගේ දුවට තරම් නො වහු' යි බනින් බැලනින් සඬ්ගහ කොට පෙරළා යැවී ය.

මාගන්දිය බමුණු, දූ නිසා මෙසේ දැපෙමින් සිටි අවදියේ දවසක මාගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදුරණුවෝ මාගන්දිය බමුණු දුටු සේක. එවිට 'වන්නේ කිමැ' යි විමසනුවෝ මාගන්දිය බමුණා හා ඔහු බිරිය තුන්මගපල ලබනු දුටහ.

මේ බමුණු, ගමින් පිටත පිහිටි දෙවොලකට ගිනිදෙවියන් පුදන්නට නිතර යන්නේ ය. බුදුරජාණන් වහන්සේ දවසක් ඔහු ගිනිදෙවියන් පුදන වේලෙහි උදැසන ම පාසිවුරු ගෙණ එහි වැඩි සේක. බමුණු බුදුරජුන්ගේ රූසිරි බලා "හා! හරි, මේ මාගේ දුවට නිසි මිනිහෙක්, යස පිරිමියා, මම සොයමින් සිටියෙම් මෙ වැනි පිරිමියකු, එය දැන් ඉබේට ම හරි ගියා, දුවගේ පිණ, මෙ වැන්නෙක් මාගේ ජීවිතයෙහි මෙයට කලින් දක්නා ලද්දේ නැත, මොහුට ම දුව දෙමි" යි සිතා බුදුරජුන් වෙතට එළැඹ "මහණ! මට එක් දුවක් සිටි සි, ඇ තරම් රූසපුවෙන් හා අභ-පසඟින් හෙබි කෙල්ලක් මේ රටේ කොතැනකත් නැත. ඇය ඉල්ලුම්කරුවෝ ඇය පතා මා වෙත ආවෝ ඉතා බොහෝ ය, ලැබුනු ලියුම් පණිවිඩ කෙළවරෙක් නැත, ඒ ආවුන් මම පන්නා හැරියෙමි, ඒ එකෙකුත් මාගේ දුවට කිසිවකින් ලං නො වී ය, ඔබ නම් ඇයට ගැළපෙනබව පෙණේ, එහෙයින් මම ඇය ඔබට දෙන්නට කැමැත්තෙමි, මෙය පිණෙකින් සිදු වූවෙකි, මද

වේලාවක් ඔතැන නැවතී සිටින්න, මා ගෙට ගොස් ඇය කැඳවා ගෙණෙනතුරු යි වහා ගෙට ගොස් බැමිණිය අමතා "සොදුර! අපගේ බලාපොරොත්තුව සිදු වි ය, මම මාගේ දුවට සරිලන පිරිමියකු සොයා ගතිමි,' ඔහු මාගේ දුවට සරිලන එක් ම පිරිමි යා ය, ඔහුට දුව දියයුතු ම ය, කල් හරිණු නො සුදුසු ය" යි ඇඳුම් ආයිත්තම් ලා දූ සරසා ගෙණ බැමිණිය ද සමග බුදුරජුන් වැඩ සිටි තැනට ගියේ ය. රටවැස්සෝ ද මෙය අසා දැක පුදුමයට පැමිණ එය බලන්නට එහි ගියහ. බුදුරජාණන් වහන්සේ පළමු සිටි තැන නො සිට එහි පදසලකුණු දක්වා මදක් ඈත් ව අන් තැනක වැඩ සිට ගත්හ. බුදුරජුන්ගේ පාලකුණු වනාහි "මෙය අසවලාට ම පෙණේවා" යි ඉටා තැබූ තැනෙහි ම දක්නා ලැබේ. එසේ ඉටා තැබූ පාසටහන අනෙකකුට දක්නට නො ලැබේ. "කොහි ඔයා කියන ඒ හොඳ පිරිමියා" යි බැමිණිය ඇසූ කල්හි "මේ මෙතැන සිටුව යි මම ඔහුට කිමි" යි බමුණු වට පිට බලනුයේ පාලකුණු දැක "මේ ඔහුගේ පාසටහනැ" යි බැමිණියට පාසටහන් පෙන්වී ය.

දෙහලක්ෂණවිද්‍යාවෙහි දක්ෂ වූ බැමිණි තොමෝ "මේ පාසටහන කාමසෙවනය කරන්නකුගේ නො වේ" යි කිවු ය. "සොදුර! නී දියසැළක කිඹුලකු දක්නකුවැනියෙහි, මහණ! මම තට මාගේ දුව අඹු කොට දෙමි, යි කී කල්හි ද ඔහු කිසිත් නො බැණ එය ඉවසා සිටියේ ය, කට පියාගෙණ මා හා එව" යි කීයේ ය. "තමුසේ කෙසේ කී වද, මේ පාසටහන පහ කළ කෙලෙස් ඇත්තකුගේ ම ය" යි බැමිණිය තමන් උගත් දෙහලක්ෂණවිද්‍යානුසාරයෙන් කරුණු ගෙණ හැර දක්වූ ය මේ ඒ ලකුණු මදක්:

"අසිරා රා ඇති – මිනිස් පා මැද උස් වේ,
අසිරා දෙසින් මැඩුනහු – පියග එබුනේ නො ද සැක.
අසිරා මොහැති දන – පා මුලට ඇදුනේ වේ,
මේ පා කෙලෙස් සෙවණැලි – පා කළ එකකුගේ වැනි"

ඉක්බිති බමුණු තෙමේ "සොදුර! කතා නැති ව නිහඬ ව මෙහි එන්නැ" යි බැමිණිය ද ගෙණ මදක් ඉදිරියට යන්නේ බුදුරජුන් දැක "මේ ඒ තරුණයා මෙහි සිටී" යි බැමිණියට පෙන්වා බුදුරජුන් වෙත ගොස් "මහණ! මේ මාගේ දූ, ඔබට ම කැපෙන බිරිඳ, බාර ගණුව" යි කී ය. බුදුරජාණන් වහන්සේ කිසිත් නො බැණ "බමුණ! මම ඔබට එකක් කියන්නට කැමැත්තෙමි, එය අසහි දැ" යි අසා වදාළ සේක. "ඔවු! අසමි" යි කී කල්හි සිය රද මැදුරෙන් නික්මීමෙහි පටන් සියලු තොරතුරු ගෙණහැර දැක් වූ සේක.

"බොධිසත්ත්ව වූ මම අතට පත් සක්විතිරජසිරි හැර කන්ථක අසු පිට නැගී ඡන්න ද ගෙණ පහයෙන් නික්මීමි, ඒ වේලෙහි මාගේ ගමන් වළකනු පිණිස මරු නුවරදොර අවුරා සිටියේ ය, එසේ සිටි මරු සිද්ධාර්ථ! කොහි යන්නෙහි කොතැනකත් යනු නො යෙදෙ යි, ගමන් හැරදමා ගෙට යව, අදින් සත්වන දා ඔබට සත්රුවන් පහළ වන්නේ ය, යි මට කියේ ය, 'මාරය! මම එය දනිමි, මට එයින් වැඩෙක් නැතැ' යි කීමි, එසේ නම් කුමක් බලාපොරොත්තු වෙහි දැ' යි ඇසූ විට මම බුදුබව බලාපොරොත්තු වෙමි, යි කීමි, එකල්හි මරු හා! හොඳයි වේවා, අද සිට කාම-විතර්කාදීන් අතුරෙන් යම් කිසි විතර්කයක් ගැණ සිත කොමු කෙළෙහි නම්, දැන ගත හැකිය, යි මට තර්ජනය කෙළේ ය, එ මතු ද, එදා සිට මරු මාගේ සිදුරු සොයමින් හැම මොහොතෙහි ම මා පසු පස එළවා ගියේ ය, මම ද බුදුබව පිණිස සාවුරුද්දක් අනෙකකුට කරණු තබා සිතන විටත් ලොමු ඩහ ගන්වන දුෂ්කර ක්‍රියා කොට ආද්‍ධ්‍යාත්මික පුරුෂධෛර්‍යය නිසා බුදුබව ලබා ගතිමි, එයින් පස්වන සතියෙහි විමුක්තිසුඛ වළඳමින් අජපල්නුග රුක්මුල හුන්නෙමි, එදවසැ මරු මම මෙතෙක් අවුරුදු ගණනක් සිදුරු සොයමින් මුන් පස්සේ ලුහු බැඳ ගියෙමි, එහෙත් මුන්ගේ අබැටක් තරම් වූත් කිසි දොසක් නො දුටුවෙමි, සිද්ධාර්ථ මාගේ විෂය ඉක්මවා ගියේ වනැ, යි බලවත් සිත්තැවිලියට පැමිණ මහමගැ බිමැ ඉරි ඇඳ ඇඳ වාඩිවී හුන්නේ ය, එ වේලෙහි ඔහුගේ දූවරු තිදෙන **තණ්හා-අරති-රගා** පියා දක්නට නැත, කොහි ගියේ වනැ යි සොයා බැලූහ, ඇලා මහමග බිම ඉරි අඳිමින් හුන් මරහු දැක 'පියේ! කිම දුක් ඇති ව නො සතුටු මුහුණින් ඔතැන ඉන්නෙහි' යි ඇසූහ, එවිට මරු ඇලාට මා පිළිබඳ සියලු තොරතුරු දැන්වී ය, සිද්ධාර්ථගේ තොරතුරු ඔබඳු නම්, එය මහකජ්ජෙක් ද? ඒ ගැණ නො සිතුව මැනැවි, ඔහු අප දුටු සැටියේ අපගේ වසයට අපගේ යටතට එනු එකාන්ත ය, එහෙයින් කණගාටු නො වන්-නැ' යි මරහනෝ කීහ, එය අසා 'දුවනියෙනි! එය කළ හැක්කේ නො වේ, ඔහු කිසිවකුගේත් යටතට යන්නෙක් නො වේ' යි කී කල්හි නැවැතත් ඇලා 'පියේ! එසේ නො කියනු මැනැවි, අපි ගෑණු, ගෑණියකට ඕනෑම පිරිමියකු වසයට යටතට ගත හැකි ය, අපට නො නැමෙන්නෙක් මිහි පිට සිටී ද, කොටි-වලස්-සී-ඇත් ඇ චණ්ඩසත්ත්වයෝ, නුවණැත්තා වූ මිනිස්සු සඞ්ග්‍රාමශූරයෝ අප වෙත පරමදීනයෝ වෙත්, ඔවුන් සිනාසෙන විට අපිදු සිනාසෙන්නෙමු, හඬනවිට හඬන්නෙමු, වාටුබස් කියන්නෙමු, ප්‍රිය වූ බසින් උන් බැඳ ගන්නෙමු, තැනට ඔබින සේ හැසිරෙන්-නෙමු, එසේ කොට බිලිය ගිලි මසකු සේ උන් කාමපාශයෙන්

බැඳගෙණ එන්නෙමු, කණගාටු නො වනු මැනැවි, ගැණුන් සිතු-වොත් ඕනෑ ම පිරිමියකු තම පාමුල නතු කරගන්නට පිළිවන, කාමයෙන් ඇස් වැසී ගිය තැනැත්තහු පණ ඇති නැති හැම වස්තුවක් ඉදිරියෙහි සාපිපාසයෙන් පෙළෙන හිඟන්නකු වැනි-ය, යි කියා තිබෙනු නො දන්නහු ද, අප ගොස් වරක් දෙවරක් ඇස්කොණකින් බලා කටකොණකින් සිනාසී ඇඳිවත් උන උනා ඇඳ ඇඳ මොළොක් බවක් පෙම්මුහුණක් පෙන් වූ විට ඔයා අපට නැමී එනු අප පස්සේ එළවා එනු කාටත් වළකා ලනු බැරි ය, ඔයා අපගේ යටතට එනු පුදුමයෙක් නො වේ, අපගේ ක්‍රීඩාසකුන්තයකු වනු බලනු මැනැවැ, යි කියා මාවෙත අවුත් 'මහණ! අපි ඔබට අඹු වන්නෙමු, අපි ඔබට හැමදෙයක් කරන්නෙමු'යි කීහ, මම ඔවුන්ගේ ඒ කතාව සිහියට නො ගතිමි, කණට නො ගතිමි, ඔවුන් දෙස ඇස ඇර නො ද බැලීමි, එවිට ඔවුහු පිරිමින්ගේ අදහස් එක හැටි නො වේ, සමහරු කෙල්ලන්ට, සමහරු තරුණියන්ට, සමහරු දෙකඩ හරිවයසේ ගැණුන්ට සමහරු මහලු ගැණුන්ට, ප්‍රෙම කරත්, එහෙයින් අපි ඒ ඒ වෙස් ගෙණ සිද්ධාර්ථියා පොළොඹවා ගන්නෙමු, යි අත්බව් සියය සියය මවාගෙණ කෙල්ලන් ලෙසට නො වැදූ තරුණ ගැණුන් ලෙසට වරක් වැදූ ගැණුන් ලෙසට දෙවරක් වැදූ ගැණුන් ලෙසට තෙවරක් වැදූ ගැණුන් ලෙසට ගෙයි මහලු වූ ගැණුන් ලෙසට දෙකඩ හරි වයසේ ගැණුන් ලෙසට මැහැල්ලන් ලෙසට සවරක් මා ඉදිරියට අවුත් 'මහණ! අපි ඔබගේ අඹුවම්හ''යි කීහ එ වේලෙහි මම යම් ලෙසකින් උපධීන්ගෙන් මිදුනෙම් ද, එලෙසින් කිසිත් නො බැණ සිටියෙමි, මට සතුටෙක් හෝ නො සතුටෙක් නො වී ය, එහෙත් ඔවුහු එතැනින් බැහැර නො ගියහ, එකල්හි මම 'මෙතැනින් යවු, තෙපි කුමක් සිතා මෙසේ නන් දෙඩහු ද, කුමක් නිසා මා පොළොඹවන්නට වෙහෙස දරහු ද, විතරාගීන් ඉදිරියෙහි තබා සරාගීන් ඉදිරියෙහි දු නො කියයුතු නො කියැකි මෙබඳු නො සැබි බස් කීවහු කුමට ය, තථාගත වූ මාගේ සියලු කෙලෙස් පහව ගියේ ය, තොපට මා වසයට යට-තට නො ගත හැකිය, යි කීමි'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො යාති කුඛිංචි ලොකෙ,
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.
යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි කුඛිංචි නෙතවෙ
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථාති,

යම් බුදුකෙනකුන් විසින් දිනූ කෙලෙස්, වැරදිලෙසින් දිනන-ලද්දේ නො වේ ද, ලොකයෙහි අන්කිසි ක්ලෙශධර්මයෙක් ඒ බුදුන් විසින් දිනූ කෙලෙසුන් ලුහු බැද නො යා ද, අපමණ ගොදුරු ඇති රාගාදිහෙතු නැති බුදුන් කවර හෙතුවෙකින් ගෙණ යවූ ද.

ජාලිනී නම් විසත්තිකා නම් තෘෂ්ණව යම් බුදුකෙනකුන් කිසි උපතකට කිසිවකුගේ වසයට ගෙණ යන්නට (සමර්ථ) නො වේ ද, අපමණ ගොදුරු ඇති රාගාදිහෙතු නැති ඒ බුදුන් කවරහෙතුවක් කරණ කොට ගෙණ යවූ ද.

යස්ස ජිතං නාවජීයති = යම් බුදු කෙනෙකුන් විසින් දිනූ කෙලෙස් රැස, නපුරු කොට දිනූයේ නම් නො වේ ද.

බුදුරජුන් විසින් ඒ ඒ මාගීයෙන් නැසූ වැනසූ කෙලෙස් රැස උන්වහන්සේ විසින් දිනූයේ නැවැත නො උපදනා ලෙසට ය. කෙලෙස් ටිකකුත් ඉතිරි නො කොට ය. කෙලෙසුන්ගේ මුල් නො තබා ය දිනුයේ එහෙයින් උන්වහන්සේගේ කෙලෙස් දිනුම කෙලෙස් නැසුම නපුරු දිනුමෙක් වැරදි නැසුමෙක් නො වේ. නින්ද කළයුතු දිනුමෙක් නො වේ. උන්වහන්සේ මුල් නො තබා ම කෙලෙස් දිනූ සේක. එහෙයින් උන්වහන්සේගේ කෙලෙස් දිනුම දිනුමෙක් ම ය. එහෙයින් කීහ අටුවායෙහි: **"යස්ස සම්මා සම්බුද්ධස්ස තෙන තෙන මග්ගෙන ජිතං රාගාදිකිලෙසජාතං පුන අසමුදාචරණතො නාවජීයති. දුජ්ජිතං නාම න හොති"** යි.

පංචස්කන්ධලොකයෙහි රාගාදී වූ කිසිත් ක්ලෙශයෙක් බුදු-රජුන් විසින් නැසූ වැනසූ කෙලෙස්කද ලුහුබැඳ නො යන්නේ ය. බුදුරජුන් විසින් නැසූ වැනසූ දිනූ රාගාදී වූ කෙලෙස් අතුරෙහි එක් ම ක්ලෙශයෙකුදු නැවැත ලුහුබැඳ නො එන්නේය යි කියූ සේ ය. මෙහි ලොකය යි ආයේ පඤ්චස්කන්ධය යි. **"යස්ස ජිතං කිලෙසජාතං රාගාදිසු කොචි එකො කිලෙසොපි ලොකෙ පච්ඡතොවතතී නාම න හොති නානුබන්ධති"** යනු අටුවා ය.

තං බුද්ධං = ඒ බුදුන්.

සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්වාණ-ප්‍රඥප්ති යි කියූ සකල-ඥෙය්‍යධර්මවිෂයයෙහි නො පැකිළ පවත්නා වූ දතයුතු හැම දෙයක නො හැනී පවත්නා වූ සර්වඥතාඥානයට නිමිත්ත වූ අර්හත්මාර්ගයාගේ අධිගමයෙන් පරිභාවිත වූ පුරුදු වූ වැඩුනු සන්තානය ඇසුරු

කොට ගත් නම් ඇති විශෙෂසත්ත්වොත්තම තෙමේ බුද්ධ නම් වේ. **"සබ්බඩම්මෙසු අප්පටිහතනිමිත්තානුත්තරවිමොක්ඛාධිගමපරිභාවිතං ඛන්ධසන්තානමුපාදාය පණ්ණත්තිකො"** යනු අටුවා ය.

සංස්කාර නම්: අටළොසක් වූ නිෂ්පන්නරූපධර්ම හා තෙපණසක් වූ චිත්තවෛතසිකධර්ම යන එක් සැත්තෑ ධර්මයෝ ය. **විකාර** නම්: කායවිඥප්ති-වාග්විඥප්ති ලඝුත්ව-මෘදුත්ව-කර්මණ්‍යත්වයන ධර්ම පස ය. **ලක්ෂණ** නම්: උපචය-සන්තති ජරතා යනධර්ම තුණ ය. **නිර්වාණ** නම්: අසංස්කාරක ධාතු ය. ප්‍රඥප්ති නම්: ඒ ඒ පදාර්ථ-විෂයයෙහි නැගෙන පැණවීම් ය. සකලඥෙයමණ්ඩලය යි කියනුයේ මේ පස ය. මෙය දන්නා නුවණ සර්වඥතාඥානය යි කියනු ලැබේ. මෙයට තැන් වූ සකන්ධසන්තානය ඇසුරු කොට සිටි සත්ත්ව තෙමේ බුද්ධය යි කොටින් දත යුතු ය. **"බුද්ධො සබ්බඤ්ඤුතඤ්ඤුණො"** යනු මෙබැවිනි.

අනුත්තරවිමොක්ඛ නම්: රහත්මග නුවණ ය. කෙලෙසුන්ගෙන් මිදෙනුයේ 'විමොක්ඛ' නම්. එය සිවු අරීමග සඳහා ම කිය හැකි ය රහත්මග ඒ අනෙක් ආර්‍යමාර්ගයන්ට වඩා ඉතා උසස් බැවින් ප්‍රණීත බැවින් ආර්‍යමාර්ගයන්ගේ මුදුන් පෙත්ත බැවින් 'අනුත්තරවිමොක්ඛ' යි ගන්නේ ය. ඒ සමග එයට අනතුරුව ම අනන්තර-සමනන්තරාදිප්‍රත්‍යයය ලැබීමෙන් උපදනේ රහත්පලය යි. ඒ මේ රහත්පලය බුදුවරයන්ට උපදනේ සෙසුදෙනාට මෙන් නො වේ. උන්වහන්සේලාට සර්වඥතාඥානාදී වූ සියලු බුදුගුණත් සමග උපදනේ ය. **"බුද්ධානං හි අරහත්තඵලනිප්ඵජ්ජමානං සබ්බඤ්ඤුතඤ්ඤුණාදීහි සබ්බෙහි බුද්ධගුණෙහි සද්ධිංයෙව නිප්ඵජ්ජති"** යනු ටීකා ය.

රහත්පලය අනුත්තරවිමොක්ෂසඞ්ඛ්‍යාත වූ අර්හත්මාර්ගයට අනතුරුව ම ලැබෙන බැවින් 'විමොක්ඛන්ත' යි හඳුන්වනු ලැබේ. ඒ මේ විමොක්ඛන්තයාගේ ලැබීමෙන් ලැබිය යුතු වූයේ 'විමොක්ඛන්තික' නම් වේ. සර්වඥතාඥානය හා අන්‍ය වූ බුද්ධඥානත් ය ඒ. රහත්පල ලැබීමෙන් ලැබිය යුතු වූ සියලු දහම් ගොදුරු කොට ඇති සර්වඥතාඥානයට අනන්තර-සමනන්තර-උපනිඃශ්‍රයාදි වශයෙන් ස්ථාන වනුයේ අනුත්තරවිමොක්ෂසඞ්ඛ්‍යාත අර්හත්මාර්ගයයි. එයින් සර්වඥතාඥානය සිදු වේ. සර්වඥතාඥානාදී වූ හැම බුදුගුණයෙක් ම කුළු-ගැණෙනුයේ අර්හත්ඵලක්ෂණයෙහි ය. ඒ කීහ මෙසේ: **"විමොක්ඛො අරහත්තමගෙගා. විමොක්ඛස්ස අනෙතා අරහත්තඵලං. තස්මිං විමොක්ඛනෙත භවං විමොක්ඛන්තිකං නාම.**

සබ්බඤ්ඤුතභාවො හි අරහත්තමගෙගන සිජ්ඣති. අරහත්තඵ-ලොදයෙ සිද්ධං හොති. තස්මා සබ්බඤ්ඤුභාවො විමොක්ඛනෙත භවො හොති'' යනු.

මේ පිණිස ඉතා දිගුකලක් බුදුකුරුදහම් පුරා සිටියෙක් ම පැරුම්දම් කුළු ගන්වා සිටියෙක් ම සුදුසු වන්නේ ය. මෙ කියූ බුදුගුණ ලබන්නේ හේ ය. එහෙයින් ම හේ බුද්ධ නම් වේ.

යම් සිවු සස්දහම් දැනුමෙක් සර්ම්ඥතාඥානය ලැබීමට අන් හෙතුන්ට වඩා ඉතා ම ලඝ ඉතා ම හොඳ හෙතුව වේ ද, ඒ මේ සිවුසස් දහම් දැනුම නිසා ලැබුනු නම් ඇති සත්ත්වවිශෙෂය තෙමේ බුද්ධ නම් වේ. ඒ කීහ මෙසේ: **''සබ්බඤ්ඤුතඤ්ඤාණපදට්ඨානං වා සච්චාභි-සමයමුපාදාය පණ්ණත්තිකො සත්තවිසෙසො බුද්ධො''** යි.

චතුස්සත්‍යාවබොධයෙහි තත්ත්ව විසින් බුද්ධ ශබ්දය **චතුසච්ච-බුද්ධ-පච්චෙකබුද්ධ-සම්මාසම්බුද්ධ** යන පුද්ගලයන් තිදෙන කෙ-රෙහි වැටේ.

එහි යමෙක් අනුන්ගෙන් ලත් උපදෙස් ඇති ව බණ ඇසු-මෙන් පරතොඝොෂප්‍රත්‍යයය ලබා, චතුස්සත්‍යාවබොධය කළේ ද හේ **චතුසච්චබුද්ධ** නම්. සත්‍යාභිසමය කළ ශ්‍රාවක වූ රහතුන් වහන්සේ ය. උන්වහන්සේගේ සත්‍යඥානය ආසන්නකාරණ වනුයේ කොටසෙක වූ ශ්‍රාවකපාරම්ඥානයට ම ය.

අසඞ්ඛ්‍යකල්ප දෙකක් හා මහාකල්පලක්ෂයක් පිරූ පැරුම් ඇති ව පරොපදෙශයෙන් හා පරතොඝොෂප්‍රත්‍යයයෙන් තොර ව යෝනිසොමනසිකාරයෙන් තමන්ට පමණක් සීමා වූ චතුස්සත්‍යාව බොධය ඇත්තේ **පච්චෙකබුද්ධ** නම්. තමන් අවබොධ කර ගත් නමුත් එය අන්හු ලවා අවබොධ කරවීමෙහි අපොහොසත් වූ පසේබුදුරජ තෙමේ ය. මෙතෙමේ ආශයානුශය දන්නා නුවණින් තොර බැවින් සත්ත්වයන්ගේ චරිතාධිමුක්ති බලා දහම් දෙසීමෙහි අපොහොසත් ය. ඒ නිසා ම මුන්වහන්සේගේ සත්‍යාභිසමය අසම්පූර්ණ ය. සත්ත්වයන්ට දහම් අවබොධ කර විය නොහැක්කේ ද ඒ නිසා ම ය. උන්වහන්සේගේ සත්‍යාභිසමය ද ආසන්නකාරණ වනුයේ කොටසෙක වූ ප්‍රත්‍යෙකබොධිඥානයටම ය.

චතුරසඞ්ඛ්‍යකල්පලක්ෂයක් හෝ ඉනුත් වැඩිකලක් පැරුම්දම් පුරා අනුන්ගෙන් ලත් කිසිත් උපදෙශයක් නැති ව අනුනටත් අව බොධ කර විය හැකි සේ කිසිම අඩුබවක් නැති ව හැම ලෙසකින්

පරිපූර්ණ කොට දතයුතු සියලු දහම් දැන සිටියේ **සම්මාසම්බුද්ධ** නම්. මාගේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ය. මුන්වහන්සේ පසේබුදුරජහු මෙන් නොව ආශයානුශයඥානයෙන් ඥනවත් ය. එහෙයින් සත්ත්වයන්ගේ චරිතාධිමුක්තික බලා තමන් අවබොධ කර ගත් ධර්මය අනුනටත් අවබොධ කරවීමෙහි පොහොසත් ය. මුන්වහන්සේගේ සත්‍යාභිසමය ආසන්නකාරණ වනුයේ සකල බුද්ධඥනයට ම ය. **"නං බුද්ධමනන්තගොචරං"** යන මෙහි ආවෝ මුන්වහන්සේ ය. මුන්වහන්සේගේ ධර්මාවබොධය පසේබුදුරජුන්ගේ ධර්මාවබොධය සේ එක් කොටසක් පිළිබඳ කොට නොව ඇති තාක් දතයුතු දහම් පිළිබඳ කොට ඇතිබව **සම්මා** යන්නෙන් කියන්නේ ය. ශ්‍රාවකයන්ගේ අවබොධය මෙන් පරොපදෙශයෙකින් නොව තම නුවණින් ම අනුන්ගෙන් ලත් කිසිදු උපදෙශයක් පිහිටක් නැති ව සියලු දහම් දැන ගත් බව **සං** යන්නෙන් කියන්නේ ය. ඒ එසේ ම ය. කිසි ද ශ්‍රාවකයෙක් අනුන්ගෙන් බණ නොඅසා සත්‍යාභිසමය නොකරන්නේ ය.

සර්ඥතාඥානාදි අපරිමිතගුණයන්ට සථාන වූ සකකිසනතානය බුද්ධ නම් වේ යනු ඉතා කෙටි කතා ය. **"සබ්බඤ්ඤුතාදි-අපරිමෙය්‍යගුණගණාධාරෝ බුද්ධසන්තානෝ බුද්ධෝ"** යනු අටුවා.

නිදේශයෙහි ව්‍යඤ්ජනාර්ථ විසින් බුද්ධශබදයෙහි අර්ථවිවරණය මෙසේ ආයේ ය.

"බුජ්ඣිතා සච්චානීති=බුද්ධෝ" චතුරාර්‍යසත්‍යධර්මයන් අවබොධ කළේ බුද්ධ නම් කොටින්.

"බොධෙතා පජායාති=බුද්ධෝ" හෙතුසම්පත් ඇති සත්ත්වයනට තමන් දත් චතුස්සත්‍යධර්මය අවබොධ කරවනුයේ බුද්ධ නම් කොටින්.

"සබ්බඤ්ඤුතාය=බුද්ධෝ" දතයුතු දහම් දැනීමෙහි පොහොසත් නුවණ ඇති බැවින් බුද්ධ නම් කොටින්.

"විසිට්ඨා බුද්ධි අස්ස අත්ථීති=බුද්ධෝ" චතුස්සත්‍යාවබොධයෙහි විශිෂ්ට බුද්ධියක් මොහුට ඇත්තේ බුද්ධ නම් කොටින්.
"සබ්බදස්සාවිතාය=බුද්ධෝ" සියලු දහම් නුවණැසින් දක්නා ලද බැවින් බුද්ධ නම් කොටින්.

අනඤ්ඤනෙය්‍යතාය=බුද්ධෝ" අන්හු විසින් අවබොධ නොකරවන ලද්දේ තමන් විසින් ම අවබොධ කර ගත් බැවින් **බුද්ධ** නම් කොටින්

"විසවිතාය = බුද්ධො" නත් වැදැරුම් ගුණසුවඳ විහිදුවන බැවින් පිපි පියුමක් සේ විකශනාර්ථයෙන් බුද්ධ නම් කොටින්. **"නානා ගුණවිසවනතො පදුමම්ව විකාසනත්ථෙන බුද්ධො"** යනු අටුවා.

"ඛීණාසවසඞ්ඛාතෙන = බුද්ධො" ආශ්‍රවධර්මයන් ක්ෂය කිරීමෙන් නිදි හැර සිටි පුරුෂයකු සේ සියලු කෙලෙස්නිදි නසාලීමෙන් පිබිදියේ බුද්ධ නම් කොටින්. **"චිත්තසංකොචකරධම්මප්පහා නෙන නිද්දාක්ඛයවිබුද්ධො පුරිසො විය සබ්බකිලෙසනිද්දාක්ඛය විබුධත්තා බුද්ධො"** යනු අටුවා.

"නිරුපක්කිලෙසසඞ්ඛාතෙන=බුද්ධො" උපක්ලෙශරහිත බැවින් බුද්ධ නම් කොටින්.

එකන්තවීතරාගොති = බුද්ධො" එකතින් පහ වූ රාග ඇත්තේ බුද්ධ නම් කොටින්.

"එකන්තවීතදොසොති = බුද්ධො" එකතින් පහ වූ දෙවෂ ඇත් තේ බුද්ධ නම් කොටින්.,

"එකන්තවීතමොහොති = බුද්ධො" එකතින් පහ වූ මොහ ඇත් තේ බුද්ධ නම් කොටින්.

"එකන්තතික්කිලොසොති = බුද්ධො" එකතින් පහකළ කෙ-ලෙස් ඇත්තේ බුද්ධ නම් කොටින්.

"එකායනමග්ගං ගතොති = බුද්ධො" නිවනට යන එක් ම මගට පැමිණියේ බුද්ධ නම්. කොටින්.

"එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති = බුද්ධො" පරොපදෙශ රහිත ව තමන් ම සම්‍යක් සම්බොධිය අවබොධ කළේ බුද්ධ නම් කොටින්.

"අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභාති = බුද්ධො" මොහය නැසූ බැවින් බුද්ධිය පිළිලැබූ බැවින් බුද්ධ නම් කොටින්. **"බුද්ධි-බුද්ධං බොධොති පරියායවචනමෙතං"** යනු අටුවා. නීලරක්තගුණ-යොගයෙන් ගුණී වූ වස්ත්‍ර ද නීලවස්ත්‍රය රක්තවස්ත්‍රය යි නීල-රක්තාදිව්‍යවහාරය ලබන්නා සේ බුද්ධගුණයොගයෙන් එකී ගුණීහු ද බුද්ධ නම් වෙත්. **"යථා නීලරත්තාදිගුණයොගා නීලො පටො රත්තො පටොති වුච්චති එවං බුද්ධගුණයොගා බුද්ධො"** යනු අටුවා.

"පාරමිතාපරිභාවිතාය පඤ්ඤාය සඞ්ඛම්පි ඤෙය්‍යං අබුජ්ඣිත්ථ = බුද්ධෝ" පාරමිතාවන්ගෙන් වැඩුනු පුරුදු වූ සුවද කැවුනක් බඳු වූ ප්‍රඥයෙන් දතයුතු සියලු දහම් දන්නේ බුදුන නම් කොටින්.

"සම්මා සම්බුද්ධෝති වත සෝ භගවාති අධිගතගුණවිසෙසෙහි ඛීණාසවෙහි බුජ්ඣිතබ්බොති = බුද්ධෝ" ලැබූ ගුණ විශෙෂ ඇති ක්ෂීණාශ්‍රවයන් විසින් ඒ භාග්‍යවත් තෙමේ එකාන්තයෙන් සම්‍යක් සම්බුද්ධය යි දත යුත්තේ බුදුන නම් කොටින්.

"අපරිමිතඤ්ඤෙය්‍යපරිභාවිතපාරමිතාසමුහතාය පඤ්ඤාය සබ්බෙ සඞ්ඛතාසඞ්ඛතෙ ධම්මෙ අබුජ්ඣි බුජ්ඣතීති බුජ්ඣිස්සතීති=බුද්ධෝ" ප්‍රමාණ රහිත වූ කල්පයන්හි රැස් කළ පාරමිතා බලයෙන් මහත් වූ නුවණින් සියලු සඞ්ඛත-අසඞ්ඛත ධර්මයන් දත්තේ හෝ දනී හෝ දන්නේ හෝ බුදුන නම් කොටින්.

"දෙව වටටමූලානි අනඤ්ඤුද්ධරාපිතෝ හුත්වා බහිසන්තානතෝ සයමෙව මහාසමුද්දතෝ වාලිකුද්ධරණං විය උද්ධරතීති = බුද්ධෝ" අනෙකකු විසින් නො උදුරණලදු ව තෙමේ ම මහමුහුදින් වැලි නගා ගන්නා සේ සන්තානයෙන් දැඩි වෘත්තමූලයන් උදුරා නු සි බුදුන නම් කොටින්.

"දෙව දිට්ඨධම්මිකසම්පරායිකසඞ්ඛාතෙ අත්ථෙ උද්ධරිත්වා ඛාරෙතීති = බුද්ධෝ" දිට්ඨ වූ ඓහික පාරත්‍රිකාර්ථයන් නගා දරා සිටී නු සි බුදුන නම් කොටින්.

"බාලසඞ්ඛාතෙ පුථුජ්ජනෙ වටටදුක්ඛතෝ උද්ධරතීති=බුද්ධෝ" බාලයි කියූ පුහුදුන් සසර දුකින් නගා ගණී නු සි බුදුන නම් කොටින්.

"චතුන්නං අරියසච්චානං අවිපරීතං සයම්භුඤාණෙන බුද්ධත්තා පච්චුද්ධත්තා බුද්ධෝ" චතුර්විධ ආර්‍යසත්‍යයන් පිළිබඳ අවිපරීතාර්ථයන් පරොපදෙශ රහිත ව සවයම්භූඥානයෙන් අවබොධ කළ බැවින් බුදුන නම් කොටින්.

"සබ්බඤ්ඤූපි ඤෙය්‍යඤ්ඤූ සබ්බඤ්ඤුතඤාණෙන සයම්භුඤාණෙන බුද්ධත්තා බුද්ධෝ" දතයුතු සියලු දහම් ඉතිරි නො කොට හැමතින් මුළුමනින් සවයම්භූඥානයෙන් දත් බැවින් බුදුන නම් කොටින්.

සම්මා සම්බුදු රජුන් කෙරෙහි නැගි ඒ මේ බුදු නාමය මව විසින් පියා විසින් සොහොයුරකු විසින් සොහොයුරියක විසින් මිතුරකු විසින් ඇමැතියකු විසින් නෑයකු විසින් සහලේ නෑයකු

විසින් මහණකු විසින් බමුණකු විසින් සක්දෙවිඳු විසින් බඹකු විසින් නො ද කැරුණේ ය. අර්ථයක් නො ගෙණ අර්ථයක් ඇසුරු නො කොට නො ද කැරුණේ ය. ඒ නම් රහත් පලයාගේ කෙළවර සර්ව්ඥතාඥානය සමධිගමය හා සමධිගත විමොක්ඛන්තික නාමයෙක් වේ. මහබෝ මුල්හි පස් මරුන් බිඳ පිළිවෙළින් ගොස් රහත් මග නුවණ ලබා එහි අන්තය වූ රහත්පලය ලැබීම සමග ම පහළ වූ සර්ව්ඥතාඥානය නිමිති කොට පැණවුනේ ය. **"බුද්ධොති නෙතං මාතරා කතං. න පිතරා කතං. න භාතරා කතං. න භගිනියා කතං. න මිත්තාමච්චෙහි කතං. න ඤාතිසාලොහිතෙහි කතං. න සමණබ්‍රාහ්මණෙහි කතං. න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධොති"** යනු නිදේශවචන යි.

එහි සච්ඡිකා පඤ්ඤත්ති නම්, රහත්පලය පසක් කිරීමෙන් හෝ දතයුතු දහම් එකකුත් නො හැර හැම ලෙසින් දත් බැවින් හෝ එය නිමිති කොට අනුරුත් විසින් ලත් නාම යි. **"සච්ඡිකා-පඤ්ඤත්තීති අරහත්තඵලසච්ඡිකිරියාය වා සබ්බධම්මසච්ඡිකිරියාය වා ජාතා පඤ්ඤත්ති"** යනු අටුවා.

අනන්තගොචරං = කෙළවර නො දත හැකි අරමුණු ඇති. සකලඥෙයමණ්ඩලයාගේ වශයෙන් බොහෝ අරමුණු ඇති.

බුද්ධං යනු විසෙසා සිටියේ ය. සර්ව්ඥතාඥානය ඥෙයමණ්ඩලයාගේ වශයෙන් අනන්තාලම්බනිකය යි මෙයින් වදාළ සේක.

අපදං = හෙතුරහිත වූ.

පද නම්, හෙතු ය. රාගාදික්ලෙශයෝ සත්ත්වයන්ට අනුන්ගේ වශයට යෑමට ද සසර ඉපැත්මට ද හෙතු වෙති. රාගාදික්ලෙශ පදැයි කියන ලද්දේ එහෙයිනි. සත්ත්වයන්ට අනුනට යටත් වන්නට සසර පුන පුනා ඉපදීමට කරුණු වනුයේ කෙලෙස් ය. එබඳු කෙලෙස් හෙතු නැත්තේ **අපද** නම්. බුද්ධං යනු වෙසෙසයි.

කෙන පදෙන නෙස්සථ = කිනම් හෙතුවෙකින් ගෙණ යවු ද?

යමක්හට සසර ඉපැත්ම දෙන රාගාදිහෙතුන් අතුරෙහි එක් හෙතුවකුත් ඇත්තේ නම්, ඒ හෙතු ඇති පුද්ගලයා ඒ හෙතු බලයෙන් තොපට තොප කැමැති කොතැනකට වුව ද ගෙණ යා හැකි ය. බුදුරජුන්ට වනාහි සසර උපත දෙන අනුන් යටතට පමුණුවන එක් ම හෙතුවෙකුත් නැත්තේ ය. එහෙයින් හෙතු

නැති බුදුරජුන් කිනම් හෙතුවකින් තෙපි ගෙණ යහු දැ'යි කී සේ ය. **"යස්ස හි රාගපදුට්ඨස්ස එකපදම්පි අත්ථි, තං තුමෙහ තෙන පදෙන නෙස්සථ, බුද්ධස්ස පන එකපදම්පි නත්ථි, තං අපදං බුද්ධං තුමෙහ කෙන පදෙන නෙස්සථ"** යනු අටුවා

යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි කුහිං චි නෙතවෙ = යම් බුදු කෙනකු කිසි භවයකට හෝ කිසිවකුගේ යටතට හෝ පමුණුවන්නට ජාලිනී නම් වූ විසත්තිකා නම් වූ තෘෂ්ණාවක් නැත් ද.

උත්පත්ති විසින් යම් කිසි භවයකට හෝ කෙලෙස් රැහණින් බැඳ කෙලෙස් විසින් කිසිවකුගේ යටතට හෝ හෙතු වූ ජාලිනී-විසත්තිකා යන නම්වලින්නුදු ප්‍රසිද්ධ තෘෂ්ණාව බුදුරජානන් වහන්සේට මදකුත් නැත.

තං බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ = සකල ඥෙයමණ්ඩලයාගේ විශයෙන් බොහෝ අරමුණු ඇති හෙතුරහිත වූ ඒ බුදුරජුන් කවර හෙතුවෙකින් ගෙණ යහු ද.

සවිතේ දත් නුවණට අරමුණු වන ඉමක් ම්මක් නැති නන්වැදෑරුම් වූ අරමුණු ඇතත් සසර පුනා පුනා ඉපැත්මට කරුණු වන රාගාදී වූ හෙතු එකෙකුත් නැති ඒ බුදුන්, තෙපි කිනම් හෙතුවක් බලා කිනම් හෙතුවකින් ගෙණ යහු ද, තොපගේ යටතට ගණිහු ද, තොප කොයි ලෙසින් සිතුව ද, තැත් කළ ද ඒ නම් කළ නො හැක්කේ ම ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙවතාවුන්ට ධර්මාවබොධය වී ය. මරඟනෝ එහි ම නො පෙණී ගියහ, සි මේ දෙශනාව ගෙණ හැර දක්වා "මාගන්දිය! එදා මා ඉදිරියෙහි නොයෙක් කෙළි සෙල්ලම් කළ රාගිකවචන කියූ ඒ මරඟනෝ සෙම් සොටු ආ කිසිත් අපවිත්‍රයෙකින් නො දූවටුනු රන්කදන් වැනි දැකුම් කලු සිරුරු ඇත්තෝ වූහ, එහෙත් උන්ගේ අත් ගැණුමෙක්හි පවා සිතෙක් කැමැත්තෙක් මොනලෙසකිනුත් මට නො උපන්නේ ය, තමුසේගේ දුවගේ මේ සිරුර දෙතිස් කුණපයෙන් පිරුණු කුණු ගොඩෙක, ඇසින් කදුළු කඩ, නාහෝ යෙන් සෙම් සොටු, කටින් කෙළ කැහි, කණින් කන්කදුරු, සිරුරෙන් ඩහදිය මලමූත්‍ර කුණු කොටස් දවරැ දෙක්හි අතර නො තබා වැහෙන්නේ ය, තාගේ දුවගේ සිරුර පිටත පිරියම් කළ ගුථඝටයක් වැන්න, බමුණ! වැඩිකතා කුමට ය, යම් ලෙසකින් මාගේ පයෙහි අසුචි වැකුණු

නම්, මෝ පාපිස්නා දඬුකඬක් සේ සිටියා ද, මම අසුචි පිස-දමන්නට කියා වත් මැගේ සිරුර මාගේ පයින් නො ද පහස්-නෙමි" යි වදාරා.

"තණහා රති රගා - දූක මෙවුන්දම් සෙවුමෙහි,
නො ද විය සඳෙක් මා සිත - එ මට තා දුව කුමට ය?
මලමූ දෙකින් පිරී - නිතර ම දුගඳ වහනා
තා දූ පයින් පමණත් - පහසනු නො ඉස්නේ වෙමි"

යි මෙසේ ද වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි මාගන්දිය අඹු සැමි දෙපොල අනාගාමීඵලයෙහි පිහිටා ගත්හ.

මාරදුහිතෘවඝතුව නිමි.

යමාමහපෙළහර

14 — 2

රජගහ නුවර සිටු තෙමේ, දිය කෙළනා ගඟෙහි, දියමතු පිට හා දිය යට, දැල් බන්දවා දිය කෙළි කෙළියි. එසේ කරණුයේ, පිටතින් එන උවදුරු වළකන්නට හා තමන් නො දැන ඇඟෙන් ගැලවී වැටෙන අබරණ රැකගණුසඳහා ය. දවසෙක සිටු, දිය කෙළනා අතර ඉතා මට සිලිටි වූ දියසෙවෙල් බැඳුනු කළගෙඩියක් තරම් වූ සඳුන් ගැටයක් දියෙහි පාවී අවුත් දිය කෙළනා කැන බැඳ තුබූ දැලෙහි ලැගුනේ ය. සිටු තෙමේ එය ගෙන්වා කුමැයි දැන ගන්නට මෙහෙකරුවකු ලවා වැකෙටියෙකින් සැස්වූයේ ය. එ වේලෙහි එය රත්සඳුන් ගැටයෙකැ'යි දන්නා ලද්දේ ය. සිටු-තෙමේ සම්දිටු හෝ මිසදිටු ගත්තෙක් නො වී ය. මැදහත් විචාර කයෙක් විය. "මේ මාගේ ගෙයි රත්සඳුන් බොහෝ ය, මට මෙයින් වැඩෙක් නැත, මේ රටේ අපි රහතුම්හ, අපි රහතුම්හ, යි කියා ගන්නෝ ද බොහෝ ය, මම රහතුන් නො හඳුනම්, රහත්හු කවුරු දැයි නො දනිම්, එහෙයින් මේ සඳුන් ගැටයෙන් පාත්‍රයක් ලියවා පැසෙක බහා සැටරියන් පමණ දිගැනි හුණලී කීපයක් එක එක දිගට තබා බැඳ, පොළොව කැණ සිටුවා එහි මුදුන පාත්‍රය තබා මේ රටෙහි රහත්හු වෙත් නම්, අහසින් අවුත් මෙය ගණිත්වා' යි ප්‍රසිද්ධ කරන්නෙමි, යමකු අවුත් පාත්‍රය ගත්තොත් මම අඹු දරුවනුත් සමග ඔහු සරණ යමි" යි සිතූ සිටු තෙමේ ලියන වඩුවන් ගෙන්වා ඔවුන් ලවා සඳුන්ගැටයෙන් පාත්‍රයක් ලියවා හුණගස මුදුන එල්වා "රහත්හු වෙත් නම්, අහසින් අවුත් මේ සඳුන් පාත්‍රය ගන්නා සේක්වා" යි දැන්වීම් පළ කොට හැරියේ ය.

එකල්හි පූරණකාශ්‍යපාදිශාස්තෘහු සඳෙන "මේ පය සුදුසු අපට ය, අනෙකෙක් මෙය දැරීමට සුදුසු නො වේ, එහෙයින් අපි වෙහෙසට පත් නො කොට, මේ පය අපට දෙන්නැ" යි කියා යැවූහ. සිටු තෙමේ "මේ පය එසේ දෙනු නො හැකි ය, යමෙක් එය අපට සුදුසුය යි කියා නම්, ඔහු අහසින් අවුත් එය ගත-යුතු ය" යි දන්වා යැවී ය. පස් දවසක් මෙසේ ඉක්ම ගියේ ය. සවනදා **නිර්ග්‍රන්ථඥාත** පුත්‍ර තෙමේ අතැවැස්සන් ගෙන්වා "තමු-සේලා ගොස් මේ පය සුදුසු අපගේ ගුරුතුමාට ය, මේ කුඩා සඳුන්ගැටයක් නිසා උන්වහන්සේ අහසින් ගෙන්වීම නො සුදුසු ය, ටිකදෙයක් නිසා මහත්ගුණයක් පෙන්වීම උන්වහන්සේට තරම් නො වේ, එසේ නො කළ මැනැව, උන්වහන්සේට මෙය දුන මැනවැ' යි කියවු" යි සිසුන් අත දන්වා යැවී ය. ඔවුහු සිටු වෙතට

ගොස් එසේ කීහ. "එසේ දෙනු නො හැකි ය, එය බලාපොරොත්තු වන්නකු අහසින් අවුත් අප බලා සිටිය දී ගතයුතු ය, එයට වඩා අන්ලෙසක් කරණු නො හැකි ය" යි සිටු ඔවුනට කී ය. එකල්හි ඤතපුත්‍ර තෙමේ එය ගණු කැමැති ව, අතැවැස්සන්ට කතා කොට "ඕග්! මම හුණගස ලඟට ගොස් එක් අතක් එක් පයක් ඔසොවා අහසට නගින ලෙසක් කරන්නෙමි, එවිට තමුසේලා සේරම හා! හා, මේ මොන පුදුමයෙක් ද, මේ කිසිත් වැදගැම්මකට නැති දඬු කඩක් නිසා සැඟවී ඇති රහත්ගුණය නොද පෙන්වනු මැනවැ' යි කියා, මාගේ අතපය ඇඟ එල්ඛ ගණිවු" යි ඔවුනට කියා සිටු වෙතට ගොස් "මහසිට! මේ පය සුදුසු අපට ම ය, අප හැර අන්‍යයනට මෙය සුදුසු නො වේ, එහෙයින් එය අපට දුන මැනැව, සුලු දෙයක් නිසා අප අහසට නංවනු නො මැනැව, මේ වැදගැම්මකට නැති දෙයක් නිසා, අපගේ රහත්ගුණය ලොවට පෙන්වනු ද නො මැනැව, එහෙයින් මෙය අපට ම දෙන්නැ" යි තරයේ කියා සිටියේ ය. "තමුන්නාන්සේ කියන කතාව මට පිළිගත නො හැකි ය, මට එයට කැමැති වන්නට ද නො පිළිවන, මටත් අපගේ මේ රටේ රහත්හු සිටින් දැ' යි දැන ගන්නට අදහසෙක් උපන, එහෙයින් ඔබ වහන්සේලා කැමැත්තහු නම්, පාත්‍රයත් ඔබ-වහන්සේලාට සුදුසු නම්, අහසින් ම අවුත් එය ගණු මැනැව, එසින් වරදෙක් වන්නේ නො වේ" යි සිටානත් කී කල්හි, ඤත-පුත්‍ර තෙමේ "හා! වේවා, මදක් ඈත් වවු" යි අතැවැස්සන් ඈත් කොට "අහසට නගිමි" යි එක් අතක් හා එක් පයක් උස්සා සිට ගත්තේ ය. එ වේලෙහි අතැවැස්සෝ දුව ඇවිත් "හිමියනේ! අපට ලොකයා ලවා නින්ද, නො කරවනු මැනැවි, ඔය කරණ වැයම මොන පලයක් සඳහා ද, මළ දඬුමුවා පාකබලකට ඔබ-වහන්සේ තුළ සැඟවී ඇති මහත් වූ රහත්ගුණය පෙන්වීම සුදු-සු ද එයට ඉඩ දෙනු නො හැකි ය"යි අහින් පසින් ඇද බිම හෙලූහ. නාතපුත්, සිටු අමතා "මහසිට! මූලා මට අහස නැගෙන්-නට ඉඩ නො දෙති, මූලා, මා අදනා කල මම කුම් කරම් ද? මූලා කියන්නෙහි ද එක්තරා ඇත්තෙක් තිබේ, පාත්‍රය අපට ම දුන මැනැවැ" යි නැවැතත් ඉල්ලී ය. සිටු ද "මූලා කරන්නේ කපටි කමෙක, තක්කඩිකමෙකැ" යි දැන "වුවමනා නම් අහසින් ගොස් ගණුව" යි එවරත් කියා සිටියේ ය. පූරණකාශ්‍යපාදීවූ ෂඩ්ශා-සනෘහු සදවසක් නොයෙක් ලෙසින් වැයම් කළෝ ද පාත්‍රය ලබා ගැණීමෙහි අපොහොසත් වූහ.

ආයුෂ්මත් **මහාමෞද්ගල්‍යායන** මහාසථවිරයන් වහන්සේ හා ආයුෂ්මත් **පිණ්ඩෝල භාරද්වාජ** මහාසථවිරයන් වහන්සේ රජ ගහ නුවර පිඬු සිඟා යන්නට සිතා ගොස් එක් ගල්තලාවක් උඩ

සිට සිවුරු ගැටවටු කළහ. ඒ අසල සිටි ධූනීයෝ උන්වහන්සේලා දැක "දන්නහු ද? මෙසින් සදවසකට උඩදී රජගහ සිටු සදුන් ගැටයෙකින් පාත්‍රයක් ලියවා රහත්හු වෙන් නම් ගණිත්වා' සි දිගට තබා බැඳි උණගසක් පොළොව කැණ සිටුවා ඒ මත්තෙහි පාත්‍රය තබවා අදට සත් දවසෙක් වී ය, එහෙත් 'මම රාත්මි' සි ඒ ගන්නට අහසට නැගි එකෙකුත් නැත, ලොකයෙහි දැන් රාත්හු නැත්තාහ, මම රාත්මි, මම රාත්මි'සි කියා හැසිරෙන්නෝ රාත්හු නොවෙති" සි හඬ නගා කීහ. මහාමෞද්ගල්‍යායන මහා සථවිරයන් වහන්සේට මේ කතාව ඇසුනේ ය. උන්වහන්සේ, පිණ්ඩෝලභාරද්වාජ තෙරුන් අමතා "ඇවැත්නි! අරුන් කළ කතාව තමුන්නාන්සේටත් ඇසුනේ ද? ඔවුහු, බුදුසසුනෙහි තතු දන්නවුන් සේ කතා කෙරෙති, තමුන්නාන්සේත් මහාඍද්ධි ඇති කෙනෙකි, මහත් අනුභාව ඇති කෙනෙකි, යන්න! අහසින් ගොස් ඒ පාත්‍රය ගෙණ එනු මැනැවැ" සි කීහ.

එකල්හි පිණ්ඩෝල භාරද්වාජ සථවිරයන් වහන්සේ "ඇවැත්නි! මෞද්ගල්‍යායන සථවිරතුමනි! ඇයි මට කියහු? ඔබවහන්සේ මේ සසුනෙහි ඍද්ධිමතුන්ට අග්‍රය යි නම් දරා සිටිත්, එහෙයින් පාත්‍රය ගැණීමෙහි සුදුසු ඔබ වහන්සේ ය, එහෙයින් ලොකය තව ම රහතුන්ගෙන් හිස් නොවන බව හඟවා පත්‍රය ගෙණ එනු මැනැව, ඔබ වහන්සේ ඒ සඳහා නොයතොත් මට යෑ හැකි ය" සි කීහ. "හා! මැනැව, ගොස් පාත්‍රය ගෙණ එනු මැනැවැ" යි මෞද්ගල්‍යායන සථවිරයන් වහන්සේ කී කල්හි පිණ්ඩෝලභාරද්වාජ සථවිරයන් වහන්සේ අභිඥ පාදක චතුර්ධ්‍යානයට සමවැද ඉන් නැගී සිට තුන් ගවු පමණ දිග පළලට පැතිර තුබූ ගල්තලාව ඇඟිලිතුඩින් උපුටා ගත් පුලුන් පොදක් සේ අහසෙහි නගා තබා රජගහ නුවර මතුයෙහි අහසෙහි සත්වරක් අහස සිසාරා සක්මන් කළහ. එ වේලෙහි ඒ ගල්තලාව තුන් ගවු පමණැති නුවර වසා සිටි සියත් පනක් සේ පෙණෙන්නට වන. නුවරවැස්සෝ "ගල්තලාව අප තලා මිරිකා ගෙණ වැටේ" සි බියපත් ව කුලුවච්චි ඇ හිස තබා ඒ ඒ තැන සැඟවී ගත්හ. සත්වන වර සථවිරයන් වහන්සේ ගල්තලාව කඩ කඩ කොට බිඳ මහාජනයාට තමන් වහන්සේ දක්වූහ. මහාජන තෙමේ තෙරුන් දැක, "අනේ! හාමුදුරුවනේ! ඔය ගල බිම නොහෙලා තදින් අල්ලා ගන්න, අප නොනසනු මැනැවැ"සි මරහඬ දුන්නේ ය. එවිට සථවිරයන් වහන්සේ එගල ඇඟිලිතුඩින් බැහරට වීසි කළහ. එය මුලින් තුබූ තැන ම වැටුනේ ය. නැවැත උන්වහන්සේ සිටු ගෙය මත්තෙහි අහසෙහි වැඩ සිටියාහු ය. සිටුතෙමේ තෙරුන් දැක බිම මුණින් තලා වැටී වැඳ "බසින්න, ස්වාමීනි! බසින්නැ" සි බිමට බස්වා ගෙණ වඩා හිඳුවා පාත්‍රය

ගසින් බාවා ගෙන්වා චතුමධුර පුරවා තෙරුන්ට පිළිගැන්වී ය. ස්ථවිරයන් වහන්සේ පාත්‍රය ගෙණ වෙහෙරට වඩින්නට නික්මුනාහ. එ වේලෙහි වලට කුඹුරට ගොස් සිටි මිනිස්සු ඒ පෙළහර නො දුටහ. ඔවුහු පැමිණ "අනේ! හිමියනේ! අපටත් පෙළහර දක්වනු මැනැවැ" යි පසු පස්සේ එළවා ගියහ. උන්වහන්සේ ද උනුන්ට පෙළහර දක්ව දක්වා විහාරයට වැඩියාහ.

බුදුරජානන් වහන්සේ තෙරුන් පස්සේ එළවමින් "අපටත් පෙළහරක්, අපටත් පෙළහරක්, තෙපි පැත්තකට වවු, තෙපි පැත්තකට වවු" යි කෑ කෝ ගසමින් යන මිනිසුන්ගේ අරගලය අසා "ආනන්ද! කුමක් ද මේ අරගලය? කාගේ කෑ කෝ ගැසීමෙක් ද, ආනන්ද! මේ" යි විචාරා "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! පිණ්ඩොල භාරද්වාජ ස්ථවිරයන් රජගහනුවර සිටු අහස තැබූ පාත්‍රය ගෙණ තිබේ, එය දුටු මිනිස්සු ඒ ස්ථවිරයන් පස්සේ යමින් 'අපටත් පෙළහරක්, අපටත් පෙළහරක්, යි කෑ කෝ ගසති, ඒ මේ අරගලය" යි ආනන්ද ස්ථවිරයන් වහන්සේ දන්වා සිටි කල්හි භාරද්වාජ තෙරුන් කැඳවා "හැබෑ ද තමුසේ විසින් සෘද්ධිප්‍රාතිහාර්‍යයෙක් කරණලදැ' යි කියන්නෝ" යි අසා වදාළ සේක. "ස්වාමීනි! එසේය" යි පිළිතුරු දුන් කල්හි "කිම තමුසේ විසින් එසේ කරණ ලද්දේ"යි තෙරුන්ට තරවටු කොට පාත්‍රය ගෙන්වා කඩ කඩ කරවා අඳුන් පිණිස අඹරවා ගන්නැ" යි භික්ෂූන්ට දෙවා සෘද්ධිප්‍රාතිහාර්‍යය නො කරණ ලෙසට ආඥා පැණවූ සේක.

ඉක්බිති තීර්ත්‍රිකයෝ "ශ්‍රමණගෞතම පාත්‍රය කැබලි කැබලි වලට කඩවා බෙදා දී මින් පසු පෙළහර නො කරණ ලෙසට ආඥා පණවා තිබේ, ශ්‍රමණගෞතමගේ ශිෂ්‍යයෝ පණ ගියත් ඒ අණ කඩ නො කෙරෙති, ශ්‍රමණ ගෞතමත් ඒ ලෙසට ම පිළිපදින්නේ ය, මෙයින්, අපට ලැබුනේ මහත් ලාබයෙකි, දැන් ඉතින් අප කැමැති ලෙසකින් පෙළහර කරණු හැකි ය" යි කතා කොට "පසුගිය දා අපගේ ගුණ රැක ගැණීමෙහි අදහසින් දැවකඩක් නිසා පෙළහර නො දැක්වීමු, ශ්‍රමණගෞතමගේ ශ්‍රාවකයෝ පාත්‍රය තරම් සුලුදෙයටත් පෙළහර පාමින් තම ගුණය මහාජනයා ඉදිරියෙහි කියා පෑහ, ශ්‍රමණගෞතම තමාගේ දනුමැතිකම නිසා ඒ පාත්‍රය කැබලිතිවලට කඩවා සෘද්ධිප්‍රාතිහාර්‍යය නො කළ යුතු ය" යි ව්‍යවස්ථා ද පැණවූයේ ල, දැන් ඉතින් අපි ඔවුන් සමග කරට කර දී තරඟයට පෙළහර කරන්නෙමු" යි ගමක් ගොඩක් නුවරක් පාරක් තොටක් ගෙයක් දොරක් පැල්පතක් නො හැර යමින් කියන්නට වූහ.

බිම්සර රජ තෙමේ, මෙය අසා බුදුරජානන් වහන්සේ වෙත ගොස් වැඳ එකත් පසෙක හුන්නේ ය

බුදුරජානන් වහන්සේ = මහරජ! දැන් මෙහි ආවහු කිම?

බිම්සර රජතෙමේ = ස්වාමීනි! ඔබවහන්සේ විසින් මින්පසු පෙළහර නො කරණ ලෙසට ශ්‍රාවකයන්ට අණ කරණ ලද්දේ සැබෑ ද?

බුදුරජ. = ඔවු! මහරජ! මාගේ ශ්‍රාවකයන්ට පෙළහර නො කරණ ලෙසට මම අණ කෙළෙමි.

බිම්සර = ඇයි, ස්වාමීනි! එසේ අණකළහු? පෙළහර නො කරණ ලෙසට අණ කොට තිබිය දී ශ්‍රාවකයන් වහන්සේ කෙසේ පෙළහර කෙරෙත් ද?

බුදුරජ = මහරජ! ඒ එසේ නො වේ. පෙළහර නො කරන්නට අණ කරණ ලද්දේ මාගේ ශ්‍රාවකයෝ ය. මට එහි තහනමෙක් නැත. මට පෙළහරකරණු හැකි ය

බිම්සර = ස්වාමීනි! ඔබවහන්සේ හැර පැණවුනු අණ තිබේ ද?

බුදුරජ = මහරජ! මම එය ඔබගෙන් ම අසමි. මේ ඔබගේ රටෙහි ඔබට අයත් අඹදඹ ආදිය වැවූ උයන් තිබේ ද?

බිම්සර = එහෙම යි, ස්වාමීනි! බොහෝ අඹදඹ වතු තිබේ.

බුදුරජ = ඔබගේ ඒ අඹදඹවතුවලින් අඹදඹ කඩා කන්නවුන්ට ඔබ කරන්නේ කුමක් ද?

බිම්සර = ස්වාමීනි! මම ඔවුන්ට දඬුවම් පමුණුවමි.

බුදුරජ = හොඳයි, මහරජ! වේවා, ඒ අඹදඹවතුවලින් ඔබ අඹ දඹ කඩා කෑවිට ඔබටත් දඬුවම් පමුණුවා ද?

බිම්සර = ස්වාමීනි! මට එහිලා දඬුවමෙක් නැත. මා කන්නේ මට අයත් වතුවල අඹදඹ ය. එහෙයින් මට දඬුවම් පමුණුවන්නෙක් නැත.

බුදුරජ = ඔබගේ අණ පවත්නේ ඔබට අයත් තුන් සියයක් යොදුන් පමණ වූ මේ රටේ ය. මේ ඔබගේ රටෙහි ඇති වතුවල අඹදඹ කන ඔබට දඬුවම් නැත. අනුන් කෑ කල ඔවුන්ට දඬුවම් තිබේ. මහරජ! එමෙන් මාගේ අණ කෙළලක්ෂයක් සක්වළ පුරා පැතිර

ඇත්තේ ය. මා පණවන අණ ද මට මුත් අනෙකකුට ඉක්ම වන්නට නො හැකි ය. මා පිළිබඳ අණකිරීමෙක් නැත. මාගේ අණ අනුන්ට මුත් මට නො වේ. පෙළහර කරන්නට මට ඉඩ තිබේ. ඒ අණත් මට බාධාවක් නැත. ඔබගේ වතුවල අඹදඹ ඔබ කැකල ඔබට දඬුවම් නැත්තා සේ අනුන්ට නො කරන්නට අණකළ දෙය මා කළා යි වරදෙක් නැත.

නිඝීකයෝ මේ කතාව අසා බියපත් ව "අපි නටුම්හ, ඔලුව එසවීමෙක් අපට නො ලැබේ, ශ්‍රමණගෞතම විසින් පෙළහර නො කරණ ලෙසට අණ කරණ ලද්දේ ශ්‍රාවකයෝ ල, ඒ අණ ඔහු කෙරෙහි ක්‍රියාතමක නො වේ ල, එහෙයින් ගෞතම පෙළහර කෙරේ ල, අපි මෙහිලා කුමක් කරමෝ ද" යි එක්තැන් ව කතා කරන්නට වූහ.

බිම්සර රජ තෙමේ මේ අතර දවසෙක බුදු රජුන් වෙත ගොස් "සවාමිනි! ඔබවහන්සේ කවදා තරමට පෙළහර කරන්නට බලාපොරොත්තු වන සේක් ද? කොතැනකදී එය කර වදාරණ සේක් ද?" යි ඇසී ය. "මහරජ! මෙයින් සාරමසක් ගිය තැන එන ඇසළ මස පුරපසළොස්වක් පෝයදා සැවැත්නුවර ඇසුරු කොට පෙළහර කරන්නට බලාපොරොත්තු වන්නෙමි" යි බුදුරජානන් වහන්සේ දන්වාලූ සේක. උන්වහන්සේ යමාමහපෙළහර කිරීමට මෙසේ දුර තැනක් නියම කර ගත්තාහු එතැන නිඝීකමඨනය පිණිස සියලු බුදුවරයන් පෙළහර කරණ තැනවීම හා මහාජනයා හට රැස්වීමට පහසුකම් සලසනු සඳහා ය.

බුදුරජානන් වහන්සේගේ මේ ප්‍රකාශය ඇසූ නිඝීකයෝ "මෙයින් සිවුමසක් ගිය තැන ශ්‍රමණගෞතම තෙමේ පෙළහර කරන්නේ ල' එහෙයින් දැන් සිට ම අපි ඔහු පස්සේ ඔහු නො හැර යමු, මහාජනයා එසේ ඔහු පස්සේ යන අප දැක මේ කිමෑ, යි විවාළොත් 'මහණ ගොයුම්හු හා තරහයට පෙළහර කරමු' යි කිහිපදිනකට පෙර අප කී බව හා ඔහු දැන් එයට බියෙන් පලා යන බව හා ඒ නිසා අප ඔහු පස්සේ මෙසේ එළවා යන බව හා ඔවුනට කියමු" යි කතා කර ගත්හ.

බුදුරජානන් වහන්සේ රජගහ නුවර සිඟා වළඳා මගට බට සේක. නිඝීකයෝ ද උන්වහන්සේ පසුපස ගොස් උන්වහන්සේ වැළඳු කෑන ලගින්. රෑ ගෙවූ තැන හිඳ කෑම ගණිත්. මිනිසුන් මොවුන්ගේ මේ හැසිරීම දැක "මේ කිමෑ" යි විවාළ කල්හි ඔවුහු මුල දී කතා කර ගත් සැටියෙන් කියත්. මහාජන තෙමේ ද "පෙළහර බලමු" යි ඔවුන් ලුහු බැඳ යෙයි. බුදුරජානන් වහන්සේ

දින්මග ගෙවා සැවැත් නුවරට පිවිසි සේක. තීර්ථකයෝ ද උන්-වහන්සේ පස්සෙහි ම ගොස් තම දායකයන් සමාදන් කරවා මසු දහසක් ලබා ගෙණ කිහිරිලිකණුවෙන් මඩුවක් කරවා නිල් මානෙල් මලින් එය සොයවා "අපි ද පෙළහර මෙහිදී ම කරමු" යි හුන්හ. ඒ අතර **පසේනදි කොසොල් රජ තෙමේ** බුදුරජුන් වෙත ගොස් "ස්වාමිනි! තීර්ථකයෝ මඩුවක් කරවා ගෙණ පෙළහර කරමු යි බලා හිඳිත්, මමත් ඔබවහන්සේට මඩුවක් කරවා දීමට කැමැත්තෙමි" යි කී ය "මහරජ! මට මඩුවෙන් වැඩෙක් නැත, මට මේ සඳහා මඩුවක් කරවා දෙන්නෙක් ඇත්තේ ය" යි බුදු රජුන් වදාළ කල්හි "ඇයි ස්වාමිනි! එසේ වදාරණ සේක්, මා හැර අන් කවුරු මඩුවක් කරවා දීමෙහි පොහොසත් වෙත් ද?" යි ඇසී ය. "සක්දෙවිඳු" යි උන්වහන්සේ වදාළ සේක. "ස්වාමිනි! පෙළහර කරණ සේක් කොතැන්හිද" යි නැවැත ඇසූයේ ය. "ගඩඹ රුක්මුල්හි ය" යි දැන් වූහ තීර්ථකයෝ "බුදුහු අඹගසක් මුලදී පෙළහර කරති" යි දැන තමන්ගේ දායකයන්ට දන්වා ගවුසභාරක් ඇතුළත යටත් පිරිසයින් එ දවස හටගත් පැළැටි පවා උදුරවා වනයෙහි දැම්ම වූහ.

බුදුරජානන් වහන්සේ ඇසළමස පුරපසළොස්වක් දවසෙහි නුවරතුළට සිඟා වැඩි සේක. රජුගේ ගණ්ඩනම් උයන්පල් තෙමේ දිම්ගොවිටක් තුළ තුබූ පැසුනු ලොකු අඹගෙඩියක් දැක ඒ කඩා කන්නට පැමිණි කවුඩන් හඹවා කඩාගෙණ රජුට දෙන්නට යන්නේ අතරමගදී බුදුරජුන් දැක "රජ තෙමේ මේ අඹගෙඩිය අනුභව කොට ඕනෑ නම් මට වැඩි ම ගණනේ කහවණු අටක් හෝ සොළොසක් දෙන්නේ ය, ඒ දෙන කහවණු අට හෝ සොළොස මට දවස් කිහිපයකුත් දිවි ගෙවා ලෑමට තරම් නො වේ, මාගේ පිණේ හැටි ඔහොම, මම මෙය බුදුරජුන්ට පිදීම් නම්, එය මට එකාණනයෙන් කිය නො හැකිතරම් කාලයක් හිත සැප පිණිස වන්නේ ය" සි ඒ අඹගෙඩිය බුදුරජුන්ට පිදී ය. එකෙණෙහි උන්වහන්සේ අනඳ තෙරුන්ගේ මූණ බැලූහ. අනඳ තෙරණුවෝ සිවු මහවරම් රජුන් විසින් පිදූ පාත්‍රය ගෙණ බුදුරජුන්ගේ ශ්‍රීහස්තයෙහි තැබූහ. උන්වහන්සේ පාත්‍රයෙන් අඹගෙඩිය පිළිගෙණ එහිදී ම එය වළඳනු කැමැතිබව හැඟ වූ කල්හි අනඳ තෙරණුවෝ සඟල-සිවුර පණවා වැඩ හිඳින්නට සැලසූහ. බුදුරජානන් වහන්සේ එහි වැඩ හුන්හ. අනඳ තෙරුන් පැන් පෙරා ගෙණවුත් අඹගෙඩිය මිරිකා අඹපැන් පිළියෙල කොට පිළිගැන්වූ කල්හි එය වළඳා උයන්පල්ලාට කතා කොට "මේ අඹඇටය මෙහි ම පස් යට කරව" යි දුන් සේක. ඔහු ද එසේ කෙළේ ය. බුදුරජානන් වහන්සේ ඒ

මතුපිට අත සේදූහ. එකෙණෙහි ම අඹකඳ නඟුලිසක් පමණින් උසින් පණස්රියන් පමණැති ව නැගී සිටියේ ය. සිවු දිගට ගිය අතු සතර හා මුදුන් අත්ත පණස්රියන් පණස්රියන් පමණ වී ය. අඹගස ඒ වේලෙහි ම මලින් පලින් සැදී සිටියේ ය. ගසෙහි එක එක තැන ඉදුනු රතුවුනු පැසුනු නො පැසුනු නොයෙක් තරා-තිරමේ අඹවලු විය. පසු පස එන්නා වූ භික්ෂූන් වහන්සේලා අඹ වළඳ ම ඉදිරියට යන්නාහ. රජ තෙමේ මේ පුවත අසා අඹගස කපා නො දමන ලෙසට රැකවල් තැබී ය. ඒ ගස ගණ්ඩ නම් උයන්ගොව්වා විසින් සිටු වන ලද බැවින් **'ගණ්ඩබ්බ-රුක්ඛ'** යි ප්‍රසිද්ධ විය. එහි සිටි නොයෙක් ධූර්තයෝ ගස යට වැටෙන අඹ කා "බොල! දුෂ්ට නිවටුනි! ශ්‍රමණ ගෞතම තෙමේ ගඳඹරුක්මුලේ දී පෙළහර කරන්නේ ය යි අසා එය ඉවසනු නො හැකි ව එයට අවහිර කරන්නට යොදුනක් ඇතුළත තුබූ එදා ම හටගත් අඹපැල පවා තොප විසින් උදුරාපියන ලද්දේය, තොප කළේ කොතරම් පහත් වැඩෙක් ද, මේ, ඒ කියූ අඹගසැ" යි කියමින් අඹමස කා ඇටවලින් තීර්ථකයන්ට පහර දුන්හ.

එ වේලෙහි සක්දෙව් රජ තෙමේ වාතවලාහක දෙව්පුතුන් ගෙන්වා "තීර්ථකයන්ගේ මඩුකූඩාරම් සුළඟින් උපුටා කසළ ගොඩෙහි බහව" යි නියම කෙළේ ය. "හිරුරැස් සැඩබවට පමුණුවා උන් අව්වෙන් තවව" යි හිරුදෙවියන්හට අණ කෙළේ ය. වතාවලාහක දෙව්පුතුනට වාමඬුල්ලක් නංවන්නට ද නියම කෙළේ ය. සක්දෙවිඳුන්ගේ අණ ලැබූ මේ හැම කෙනෙක් අණ ලෙසින් ඒ සියල්ල කළහ. මේ හැම එකෙකින් වෙහෙසට පත් තීර්ථකයෝ තඹපැහැති තුඹස් වැනි වූහ. උන්ගේ සිරුරු දූවිල්ලෙන් වැසී ගියේ, එ වේලෙහි වට වැසිදියෙන් තිත් ගැසුනෝ ය. එයින් ඔවුහු කබරගොන් වැනි වූවෝ, හමු හමු වූ තැනින් හිස් ලූලූ අත දිවූහ.

තීර්ථකයන් මෙසේ හිස් ලූලූ අත දුවන වේලේ **පූරණ-කාශ්‍යප**ගේ දායක වූ ගොවියෙක් "දැන් අපගේ රහතුන් වහන්සේ පෙළහර කරණ වේලා ය, පෙළහර බලන්නට යමි" යි ගොනුන් ලිහා හැර උදැසන ගෙණ ආ කැඳකළබෙට්ට හා රැහැණ ද රැගෙණ එනුයේ පලා යන පූරණකාශ්‍යප දැක "ස්වාමීනි! පොඩ්-ඩක්, මේ දුවන්නහු කොහි ද? මමත් සියලු වැඩ අත් හිටවා එන්නෙම් ඔබවහන්සේලාගේ පෙළහර බැලීමටැ" යි කී ය. "මොන පෙළහරෙක්, ඔය අතේ ඇති කැඳකළයත් රැණත් මට දෙව" යි

ඉල්ලා ගෙණ, ගංඉවුරකට ගොස් කළගෙඩිය රැණින් බැඳ බෙල්ල එල්ලා ගෙණ ගඟට පැන්නේ ය. එ වේලෙහි ම ගඟ දියබුබුලු නගමින් මැරී ගොස් අවීචිමහානරකයෙහි උපන.

සක්දෙව්රජ තෙමේ අහසෙහි රැවන්සක්මනක් මැවී ය. එහි එක් කොණෙක් නැගෙනහිර සක්වළ මුවවිටෙහි හැපී සිටියේ ය. එක් කොණෙක් බස්නාහිර සක්වළ මුවවිටෙහි හැපී සිටියේ ය. බුදුරජානන් වහන්සේ සතිස් යොදුන් පමණ තැන මහාජනයා රැස් ව සිටි කල්හි පස්වරු වේලේ "දැන් පෙළහර කරණ වේලා"යි ගඳකිළියෙන් නික්ම ඉදිරිපිට පිළෙහි වැඩ සිටි සේක. එකල්හි සෘද්ධි ඇති **සරණී** නම් අනාගාමී උපාසිකා තොමෝ බුදුරජුන් වෙත එළඹ "තිලෝගුරු හිමියෙනි! මා වැනි දුවක ඉන්ද දී ඔබ වහන්සේ වෙහෙසෙනු මට නො රිස්නේ ය, මම පෙළහර කරමි" යි කිවු ය. "සරණී! නී පෙළහර කරණ සැටි මට කියව" යි වදාළ කල්හි "ම පියාන! මුළුසක්වළගැබ මහපොළොව දියකඳක් කොට මම දියකාවෙස් ගෙණ දියෙහි ගැලී නැගෙනහිර සක්වළ මුවවිට හිස නගා තමන් දක්වම්, එසේ ම කිමිද ගොස් බස්නාහිර උතුරු දකුණු සක්වළ මුවවිට හිස නගාලම්, වටේ කිමිද මැදින් හිස නගම්, මැදින් ගැලී ගොස් වටින් හිස නගම්, ඒ කවුදැ යි විවාළවිට සරණී නම් අනාගාමී උපාසිකා ය' යි කියම්, ගැහණියකගේ ආනුභාවය මෙතරම් නම්, බුදුරජුන්ගේ ආනුභාවය කවරතරම් දැ' යි තීර්ථකයෝ ඔබ වහන්සේ නො දැක ම පැණ යති" යි කිවු ය. "සරණී! නී එබඳු පෙළහර කරන්නට පොහොසත් බව දනිමි, එහෙත් මෙය තොප පිළිබඳ එකෙක් නො වේ" යි බුදුරජානන් වහන්සේ ඇය වැළකූ සේක. එ වේලෙහි ඕතොමෝ "බුදුරජානන් වහන්සේ මට මෙයට ඉඩ නො දෙති, මට වඩා උසස් ලෙසින් පෙළහර කිරීමෙහි සමතුන් සිටින බැවින් එසේ කරති" යි එකත් පසෙක සිටියා ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ "මොවුන්ගේ ගුණය මෙසේ ප්‍රකට වන්නේය" යි තිස් යොදුන් පමණ තැන පැතිර ගත් පිරිස මැද සිංහනාද කරන්නෝ' යි අන්‍යයන් අතින් ද "තමුසේලා පෙළහර කරන්නහු කෙසේ දැ?" යි අසා වදාළ සේක. ඔවුහු "තිලෝගුරු හිමියනේ! අපි මෙසේ පෙළහර කරමු" යි බුදුරජුන් ඉදිරියෙහි සිට සිංහනාද කළහ.

ඔවුනතුරෙහි **සුදුඅනෝපිඩු** සිටු තෙමේ "මා වැනි අනාගාමී උවසු පූතක්හු ඉන්ද දී බුදුරජුන් වෙහෙසෙනු නො හොබනේ ය"යි බුදුරජුන් වෙත එළඹ "සවාමීනි! මම පෙළහර කරමි, එයට අවසර දී වදාරණු මැනැවැ" යි කී ය. එ වේලෙහි බුදුරජුන් විසින් විවාරණ ලද ඔහු "සවාමීනි! මම දෙලොස් යොදුන් පමණ වූ බඹු

අත්බවක් ගෙණ මේ මහාපිරිස මැද මේඝගජීනාවක් බඳු බ්‍රහ්ම ඝොෂාවක් කරම්, අත්පොළොසන් ද දෙම්, එකල්හි මහාජන තෙමේ මේ කිනම් හඬෙක්දැ' යි විචාරයි, ඒ බඹඅත්බවක් ගත් සුටු අනේපිඬු සිටුහුගේ අප්පුඩි ගැසීමෙකැ, යි කී කල්හි තීර්ථිකයෝ ගැහැවිහුගේ මහත්කම මෙතරම් නම්, බුදුරජුන්ගේ මහත්කම කියනු කිමැ, යි ඔබවහන්සේ නොදැක ම පළාගෙති" යි කියේ ය. "සිට! ඒ එසේ ය, ඔබ එබඳු පෙළහරෙක සමතකුබව මම දනිමි' යි 'කම් නැතැ" යි ඔහු ද වැළකූ සේක.

ඉක්බිති සත් හැවිරිදි වූ පිළිසිඹියා පත් **වීරා** හෙරණිය බුදුරජුන් වෙත එළඹ "මපියේ! මම පෙළහර කරම්" යි කිවු ය. "නී කරණ පෙළහර කෙබඳු ද?" යි ඇසූ ඕතොමෝ "පියේ! මහමෙර, සක්වළගල, හිමාලය යන මෙතුණ ගෙණවුත් මෙහි පිළිවෙළින් තබා මම මෙහෙණවෙස් හැරදමා හස්දෙනක වෙස් ගෙණ එකෙනෙකින් පැන පැන එකෙක වත් නොහැපෙමින් යම්, මහාජන තෙමේ මා දැක 'මෝ කවුරැ දැ, යි විචාරා වීරා හෙරණිය, යි දැන ගන්නේ ය, එවිට තීර්ථිකයෝ 'සත් හැවිරිදි කෙල්ල මෙතරම් මහත් නම්, අනුභාව ඇත්ති නම් මහණ ගොයුම්හුගේ තරම් කාට කිය හැකි දැ, සි ඔබ වහන්සේ නොදැක ම පැන යති"යි කිවා. බුදුරජානන් වහන්සේ "කම් නැතැ" යි ඇය ද වැළකූ සේක.

ඉක්බිති පිළිසිඹියා පත් මහරහත් **චුන්ද** හෙරණ තෙමේ බුදුරජුන් වැඳ, පෙළහර කිරීමට අවසර ඉල්ලී ය. එහි දී "තා කරණ පෙළහර කිමැ?" යි ඇසූ කල්හි "මාගුරුපියේ! මම දඹදිවට ඔවජයක් සේ සිටි මහදඹගස කඳින් ගෙණැ සොලවා මහදඹඉරු ගෙණවුත් මේ පිරිසට කවන්නෙමි, පරසතුමල් ගෙණවුත් පුදා, ඔබතුමන් වහන්සේට නැමී වඳිමි" යි කී ය. බුදුරජානන් වහන්සේ "කම් නැතැ" යි ඔහු ද වැළකූ සේක.

ඉක්බිති මහරහත් **උත්පලවණ්ණා** සථවිරාවෝ බුදුරජුන් වැඳ, "මට දිවිදුන් මපියේ! පෙළහර කිරීමට මට අවසර දෙන සේක්වා' මම පෙළහර කරම්, හිමියනේ! මම ඔබවහන්සේගේ දූලා අතර ඍද්ධියෙන් අගතැන් ගනිම්, මට වඩා ඍද්ධියෙන් උසස් වූ දූ කෙනෙක් ඔබවහන්සේට වෙන නැත, මා තරම් දුවක ඉන්දදී ඔබවහන්සේ වෙහෙසෙනු ඇයි? මම පෙළහර කරම්, මම මේ අවට දෙළොස් යොදුන් පමණ තැන පැහිර සිටි පිරිසට මා පෙණෙන සේ වටින් සතිස් යොදුන් පමණ වූ පිරිස් ඇති සක්වින්තෙක් ව අවුත්, ඔබවහන්සේගේ පා වඳිම්, එවිට මහාජන තෙමේ මා දැක විචාරන්නේ ය, විචාරා මා බව දැන ගන්නේ ය,

තීර්ථකයෝ බුදුරජුන්ගේ ශ්‍රාවිකා වූ ගෑණුත්, පෙළහර කිරීමෙහි මෙතරම් සමත් වෙත් නම්, බුදුහු කොතරම් ද, යි ඔබවහන්සේගේ අසලට වත් නොපැමිණ පලායන්නාහ, එහෙයින් මට අවසර දුන මැනැවැ" යි අයැද සිටියහ. "දනිමි උත්පලවණ්ණී! තොපගේ තරම' එහෙත් මේ පෙළහර මා අතින් ම විය යුත්තෙක, තොපි මෙයට නො ද සුදුස්සහ ය" යි වදාළවිට ඕ ද එකත් පසෙක සිට ගතු.

ඉක්බිති මහාමෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ බුදුරජුන් වැඳ, "සුවාමීනි! මම පෙළහර කරමි, මට නම් අවසර ඕනෑ, මම මහාමෙර, බැදි උඳුඇටක් සේ කමි, ආයෙත් දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන වූ මේ මහාපොළොව පැදුරක් සේ අකුළා ගෙණ ඇඟිලි අතර තබා ගණිමි, ආයෙත් මහාපොළොව කුඹල් සකක් සේ කරකවා අනික් පැත්ත ගසා යටපිට උඩපිට කොට පොළොවෙහි වූ රස ඕජාව රැස් ව සිටිනා හැම දෙනාට කවමි, ආයෙත් මේ දඹදිව මාගේ වමතට ගෙණ දඹදිව් වැසි මිනිසුන් දකුණතින් ගෙණ අන් දිවයිනෙක තබමි, ආයෙත් කිම? මුගලන! 'මම සුවාමීනි! මහාමෙර කුඩම්ට කොට මහාපොළොව ඊමත්තෙහි කුඩරෙද්ද කොට තබා ඒ කුඩය අතට ගත් මහණකු සේ අහස ඇවිදිමි" යි අවසර ඉල්ලූහ. "මුගලන! ඒ හැම එකක් කළ හැකිය' යි මම පිළිගණිමි, තමුසේ ඔය කියූ පෙළහරටත් වඩා, බැරෑරුම් පෙළහර කිරීමෙහි සමත්බව ද මම දනිමි, පෙළහර කිරීමෙහි තමුසේ තරම් සමතකු නැතිබවත් මම දනිමි, එහෙත්, මේ වේලේ පෙළහර කිරීමට, තමුසේටත් ඉඩ දෙනු නො හැකි ය, මේ පෙළහර, මා ම කළ යුතු ව තිබේ" යි වදාළ විට "මේ පෙළහර, අප බලාපෙරොත්තු වන තරමේ සුලු පටු පෙළහරක් නොවන බව පෙණේ, මෙතැනට වුවමනා මේ හැම පෙළහරකට ම වඩා ඉතා බලගතු පෙළහරෙකැ" යි මහාමුගලන් තෙරණුවෝ ද පසෙකට වූහ.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරුන් අමතා "මුගලන! මේ පෙළහර පැවැත්වීම මට ම අයත් වූවෙකි, එය තමුසේලා අයත් නොවේ, මේ මහාපිරිස මැද තමුසේලා කැදවන ලද්දේ, තමුසේලා ලවා සිංහනාද කරවනු පිණිස ය, ඒ මුත් පෙළහර කරවන්නට කළ කැදවීමෙක් නොවේ, මම මේ ලොකයෙහි කවුරුන් හාත් සම නොවෙමි, මා පිට පැමිණි බර ඉසිලීමට මා ම මුත්, අනෙකෙක් සමත් නොවේ, මා උසුලන බර මේ ලොකයෙහි කාටත් උසුලනු නොහැකි ය, මා දැන් උසුලන බර ඉසිලීමට කෙනකු නැතිබව පුදුමයෙකැ' යි නො කියැකි ය,

මේ බුදු වූ අවස්ථාවේ තබා තිරිසන් යොනියෙහි උපන් අවස්ථා-වේ ද මා තනි ව ඉසුලූ බර උසුලන්නට සමත් කෙනෙක් නො වූහ'' යි වදාළ විට මුගලන් තෙරුන් විසින් ''ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! ඔය වදාළ සිද්ධිය, කවදා කොතැනක දී කෙසේ වී දැ'' යි විචාරණ ලද්දාහු,

''යම් යම් තැනෙක ගැල – බර වේ ද යම් තන්හි,
ගැඹුරැති මගෙක් වේ නම් – එ හැම තැන හැමවිටක ම.
යොදතී කළුවහබ් – හේ ගැල්දුරය උසුලයි''

යන ලෙසින් කෘෂ්ණවෘෂභජාතකය වදාළ සේක.

නැවැත ද බුදුරජානන් වහන්සේ එය ම වෙසෙසා දක්වන සේක්:

''සිත්කලු බස් කියයි – කිසිදා නො සිත්කලු බස්,
නො කියයි මනවඩන බස් – කියන්නහුගේ බර වූ.
එ මහබර උදුලේ – ලබා දුන් දන බමුණුට,
එයින් තුටු සිත් ඇත්තේ – වී ය ඔහු බෙහෙවින් එහි''

යි නන්දිවිසාලජාතකය ද විස්තර සහිත ව වදාරා රුවන් සක්මනට බට සේක. එහි පෙර දිග-පැසුළු දිග-උතුරු දිග-දකුණු දිග දෙ-ළොස් යොදුන දෙළොස් යොදුන මහාපිරිස් වූ හ. එක් කොට ගත් කල්හි සූවිසි යොදුන් පමණ වූ ඒ පිරිස් මැද ස්වාමි දරු වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ තෙජොකසිණයට සමවැද එයින් නැගී සිටි සේක්, නැබින් උඩ සිරුරෙන් ගිනිකඳ, ආපො-කසිණයට සමවැද එයින් නැගී සිටි සේක්, නැබින් යට සිරුරෙන් දියකඳ, යට සිරුරෙන් ගිනිකඳ, උඩ සිරුරෙන් දියකඳ, ඉදිරි පස සිරුරෙන් ගිනිකඳ, පිටිපස සිරුරෙන් දියකඳ, පිටිපසින් ගිනිකඳ, ඉදිරිපසින් දියකඳ, දකුණු ඇසින් ගිනිකඳ, වම් ඇසින් දියකඳ, වම් ඇසින් ගිනිකඳ, දකුණු ඇසින් දියකඳ, දකුණු කන් සිදුරෙන් ගිනිකඳ, වම් කන් සිදුරෙන් දියකඳ, වම් කන් සිදුරෙන් ගිනිකඳ, දකුණු කන් සිදුරෙන් දියකඳ, දකුණු නාස් සිදුරෙන් ගිනිකඳ, වම් නාස් සිදුරෙන් දියකඳ, වම් නාස් සිදුරෙන් ගිනි-කඳ, දකුණු නාස් සිදුරෙන් දියකඳ, දකුණු උරයෙන් ගිනිකඳ, වම් උරයෙන් දියකඳ, වම් උරයෙන් ගිනිකඳ, දකුණු උරයෙන් දියකඳ, දකුණු අතින් ගිනිකඳ, වම් අතින් දියකඳ, වම් අතින් ගිනිකඳ, දකුණු අතින් දියකඳ, දකුණැලයෙන් ගිනිකඳ, වමැල-යෙන් දියකඳ, වමැලයෙන් ගිනිකඳ, දකුණැලයෙන් දියකඳ, දකුණු පයින් ගිනිකඳ, වම් පයින් දියකඳ, වම් පයින් ගිනිකඳ,

දකුණු පයින් දියකඳ, අතැඟිලිදසයෙන් හා පයැඟිලිදසයෙන් හා විසි ඇඟිල්ලෙන් ගිනිකඳ දසයක් හා දියකඳ දසයක්, අතැඟිලි අතරින් හා පයැඟිලි අතරින් හා ගිනිකඳ අටක් හා දියකඳ අටක්, එකී එකී ලොම් අගින් ගිනිකඳ, එකී එකී ලොම් අගින් දියකඳ පවත්වමින්, සවණක් රස් විහිදුවමින්, මේ පෙළහරෙහි මවාලූ බුදුරජුන් සිටිනා කල්හි හිඳිනා කල්හි වැද හෝනා කල්හි රුවන් සක්මනැ සක්මන් කරමින් මවාලූ බුදුරජුන් සිටිනා ඉරියවු හැර අනික් තුන් ඉරියව්වෙන් කල් යවන කල්හි වැඩ සිටිමින්, මවාලූ බුදුරජුන් හිඳුනා ඉරියවු හැර අනෙක් තුන් ඉරියව්වෙන් කල් යවන කල්හි වැඩ හිඳිමින්, මවාලූ බුදුරජුන් වැද හෝනා ඉරියවු හැර අනෙක් තුන් ඉරියවුවෙන් කල් යවන කල්හි වැදහෙවමින් ශ්‍රාවකයන් හා අසාධාරණ වූ යමාමහ පෙළහර කළ සේක. මේ වනාහි බුදුරජානන් වහන්සේගේ යමකප්‍රාතිහාර්‍යඥානය යි.

මේ පෙළහර කර වදාළ බුදුරජානන් වහන්සේ එය සක්මන් කරමින් කර වදාළ සේක. ගිනිකඳ, දියකඳ හා කිසිවිටෙකත් මිශ්‍ර නො වූයේ ය. දියකඳ, ගිනිකඳ හා ද මිශ්‍ර නො වූයේ ය. ගිනිකඳ හා දියකඳ හා දෙක ම බඹලොව දක්වා නැග සක්වළ මුව විට වැගිරේ. එ දෙක සිරුරෙන් නික්මෙන සවණක් රැස් ද කළයෙන් ඉසිනු ලබන රන්දියක් සේ ද කරාමයෙන් නිකුත් වන දිය-දහරක් සේ ද එක් සක්වළගැබකින් උඩට නැග බඹලොව හැපී පෙරළා අවුත් සක්වළ මුවවිට ම පැතිර ගණියි. එක් සක්වළ-ගැබෙක් එක් ගොනැස්සක් ඇති බෝගෙයක් සේ එකාලොක වෙයි. මෙසේ පෙළහර කරමිනුදු, බුදුරජානන් වහන්සේ අතර-තුර මහාජනයාට බණ ද වදාරණ සේක. බණ වදාරණ සේක්, මහාජනයා කුසීතයන් නො කොට ඔවුනට අවසර දිදී ම වදාරණ සේක. එකෙණෙහි මහාජන තෙමේ සාධුකාර දෙයි. ඔවුන් සාධුකාර දෙන කල්හි ඒ සා මහත් පිරිසෙහි සිත්හසර බලා එකී එකී දෙනාගේ සිත සොළොස් සොළොස් අයුරකින් දැන ගන්නා සේක. බුදුවරුන්ගේ සිත් ලුහු ව පෙරළෙන්නේ ය. යම් යම් කෙනෙක් යම් යම් ධර්මයෙක යම් යම් පෙළහරෙක පහදින් නම්, උන් උන්ගේ අදහස් ලෙසට බණත් වදාරණ සේක. පෙළ-හරත් කරණ සේක. මෙසේ බණ වදාරත්, මෙසේ පෙළහර කරත් බොහෝ දෙනාට ධර්මාවබොධය විය. බොහෝ දෙන නිවන් දුටහ.

බුදුරජානන් වහන්සේ මේ සමාගමයෙහි තමන් වහන්සේගේ අදහස් ලෙසට ප්‍රශ්න විචාරීමෙහි පොහොසත් වූ අනෙකකු නො දැක බුදුකෙනකුන් මවාලූ සේක. මවා ලූ බුදුරජුන් විචාළ

ප්‍රශ්න තමන් වහන්සේ විසඳන සේක. අපගේ බුදුරජුන් සක්මන් කරණ කල්හි, මවාලූ බුදුරජහු හිඳීම් සිටීම් ආදීන් අතුරෙහි එක්-තරා ඉරියව්වෙකින් කල් යවන සේක. මෙසේ කර වදාරන්නා වූ බුදුරජුන්ගේ පෙළහර ද බලා බණ ද අසා එම සමාගමයෙහි විසිකෙළක් දෙන නිවන් දුටහ. බුදුරජානන් වහන්සේ පෙළහර කරමින් ම "පෙර දවස බුදුවරයෝ මේ පෙළහර කොට කො-තැනෙක වස් එළඹියෝ දැ" යි බලා, "තාවතිංසභවනයෙහි වස් එළඹ මාතෘදිව්‍යපුත්‍රප්‍රමුඛදෙවගණයාට අභිධර්මය දෙසූහ" යි දැක දක්ෂිණශ්‍රීපාදය නගා යුගඳුරු මුදුනෙහි තබා වාමශ්‍රීපාදය නගා මහමෙර මුදුනෙහි තැබූ සේක. රුවන් සක්මන පටන් අට සැට-ලක්ෂයක් යොදුන් පමණ වූ මේ සා මහත් අවකාශය තුන් පිය-වරකින් ගෙවා තව්තිසා දෙව්ලොවට වැඩි සේක. එහි පා අතුරු දෙකෙක් ම විය.

මෙහිලා 'බුදුරජුන් පා දිගු කොට යුගඳුරු මුදුනෙහි පා තැබූ-හ' යි නො ගන්න. උන්වහන්සේ පා නගත් ම, ඒ පර්වතයෝ පාමුලට අවුත් පා පිළිගත්හ. නැවැත බුදුරජුන් ඇක්මුනු කල්හි තුබූ තැන ම සිට ගත්හ. සක්දෙව්රජ තෙමේ බුදුරජුන් දැක බුදුරජානන් වහන්සේ මේ වර පඬු ඇඹුල් සලස්නෙහි වස් එළඹ වැඩ හිඳිනා බව පෙණේ, එසේ නම්, එය බොහෝ දෙවියන්ට මහත් උපකාරයෙක් වන්නේ ය, බුදුරජුන් මෙහි වස් එළඹි කල්හි, අනෙකකුට මෙහි හිඳුනු තබා අත තබන්නට ද ඉඩෙක් නො ලැබෙන්නේ ය, මේ සලස්නත් දිගින් සැට යොත්නෙක, මහතින් පණස් යොත්නෙක, පළලින් පසළොස් යොත්නෙක' එහෙයින් බුදුරජුන් වැඩ හුන් කල්හි ද මෙය හිස් වූවක් සේ වන්නේ ය" යි සිතී ය. බුදුරජානන් වහන්සේ ඔහුගේ අදහස් දැන තමන් වහන්සේගේ සඟළ සිවුර ගල්තලය වැසෙන සේ බහාලූ සේක. සක්දෙව් "සිවුරෙන් ගල්තලය වැසුන ද තමන් වහන්සේ මඳ තැනෙක ම වැඩ හිඳිනු ඇතැ" යි සිතී ය. එ ද දත් බුදුරජානන් වහන්සේ කුඩා පුටුවක් වසා හිඳිනා මහා පංසුකූලිකයකු සේ ඒ සලස්න සිවුරතුළ ම කොට වැඩ හුන් සේක. මහාජන තෙමේ රුවන්සක්මන මතුයෙහි බුදුරජුන් නො දැක සංවෙගයට පැමිණියේ ය. සඳ හිරු බැස ගිය කලක් සේ දසදහසක් සක්වළ එකපැහැර අඳුරු විය. එකල්හි මහා-ජන තෙමේ

"ගියෝ දෝ? සිතුකුළ – නැත, කෙලෙස්කුළ යුගඳුරු,
නො දකිමු අපි නරදෙටු – සම්බුදු අනේ! ලෝ දෙටු"

යනු කියමින් හඬන්නට වන.

තවද එහි සිටි අන් කෙනෙක් "බුදුරජානන් වහන්සේ ප්‍රකෂී වූ කායචිත්තාවිවේකයෙහි ඇලුනු සේක, උන්වහන්සේ මෙබඳු පිරිසෙක මහත් පෙළහරෙක් මා විසින් කරණ ලදැ' යි ලජ්ජාවෙන්, අන් නුවරකට හෝ දනව්වකට හෝ වැඩිසේක් වනැ" යි

"එකලාබවැ ඇලුනු - නුවණැති මුනිඳු මෙලොවට,
පෙරළා නො එති නො දකිමු - ලෝදෙවු බුදුහු නරදෙවු"

යි හඬ හඬා මෙසේ විලාප කියන්නට වූහ. මෙසේ හඬමින් වැල-පෙමින් "සවාමීනි! බුදුරජානන් වහන්සේ කොතැන වැඩිසේක් ද" යි ඔවුහු මුගලන් තෙරුන් වෙත ගොස් ඇසූහ. උන්වහන්සේ බුදුරජුන් වැඩි තැන් දන්නාහු නමුත් අනුන්ගේ ගුණ ප්‍රසිද්ධ වුවමනා ය, යන අදහසින් "අනුරුද්ධ තෙරුන් අතින් විචාරවු" යි කීහ. එකල්හි ඔවුහු "බුදුහු කොහි ද" යි අනුරුද්ධ තෙරුන් විචාළාහු ය. "තව්තිසා දෙව්ලොව වස් වසා පඬු ඇඹුල් සලස්-නෙහි වැඩ හිඳ මාතෘදේව්‍යපුත්‍රයාහට අභිධර්මය දෙශනා කරණු පිණිස වැඩි සේකැ"යි තෙරුන් වදාළ විට, "පෙරළා කවදා වඩින්නාහු ද" යි ඇසූහ. "උපාසකයෙනි! බුදුරජානන් වහන්සේ තුන් මසක්, එහි වස්වසා වැඩ වසන සේක, වස් අවසන් කොට මහාපවාරණදිනයෙහි පෙරළා මෙහි වඩිනු ඇතැ"යි උන්වහන්සේ කීහ. එවිට ඒ මිනිස්සු "බුදුරජුන් නො දැක නම් පෙරළා ගෙවලට නො යමු" යි කඳවුරු බැඳ ගත්හ. ඔවුනට හිස් අහස ම පියස්ස විය. එතෙක් මහාපිරිසෙහි උනුන්ගේ සිරුරු හැපීමෙක් නො ද වී ය. පොළොව විවර ව හිඳේ ය. පොළෝතලය සෑම තැන පිරිසිදු විය. මල මූ වැකුණු පසෙක් එහි නො වී ය. බුදුරජානන් වහන්සේ මහාමුගලන් තෙරුන් අමතා "මුගලන! මේ කාලය මුළුල්ලෙහි සුදු අනේපිඬු සිටු මේ මහාපිරිසට කෑම බීම දෙනු ඇත, එහෙයින් තමුසේ මොවුනට බණ කියන්නැ"යි නියම කළහ. සුදුඅනේපිඬු-සිටු තෙමේ ඒ තුන් මස මුළුල්ලෙහි ඒ හැමදෙනාහට ම යැපෙන පමණට කෑද බත් කැවිලි පෙවෙලි බුලත් දුම්කොළ ගඳමල් හා පළඳනා ද දුන්නේ ය. මහාමුගලන් තෙරණුවෝ දහම් දෙසූහ. පෙළහර බලනු පිණිස පැමිණි මිනිසුන් ඇසූ හැම ප්‍රශ්නයක් ම උන්වහන්සේ විසඳූහ. දසදහස් සක්වල වැසි දෙවියෝ අභිධර්මය දෙසන්නට පඬු ඇඹුල් සලස්නෙහි වැඩ හුන් බුදුරජුන් පිරිවරා ගත්හ. ඒ කීහ මෙසේ:

"තව්තිසා දෙව්ලොව - එ පරසතුරුක් මුල්හි
පඬු ඇඹුල් සලසුනමත - හුන්නෝ බුදුහු ලෝතුම්.

දෙවියෝ දස දහස් – ලෝදහි එක් රැස් වී,
නබ මුදුන විසු සම්බුදු – ලං වී සෙවෙන් පුද දී.
කිසි දෙවියෙක් එහි – සම්බුදුරජුට සිරිමත්,
පැහැයෙන් නො සම වේ ම ය – සම්බුදුරජු ම බබලා,
සවණක් රැසින් එහි වූ – සියලු දෙවියන් මැඬගෙණ" යි

ඉක්බිති මාතෘදිව්‍යපුත්‍ර තෙමේ තුසිතභවනයෙන් අවුත් තමන් වහන්සේගේ ශරීරප්‍රභායෙන් සියලු දෙවියන් මැඬගෙණ එහි වැඩහුන් බුදුරජුන්ගේ දකුණු පසෙහි හුන්නේ ය. ඉන්‍ද්‍රක දිව්‍ය පුත්‍ර අවුත් දකුණු පස්හි ම හිඳ ගත්තේ ය. අඬකුර දිව්‍යපුත්‍ර අවුත් වම් පසෙහි වාඩිලා ගත්තේ ය. එහෙත් ඔහු මහෙශාක්‍ය වූ දෙවියන් එන් එන් පසු බැස ගොස් බුදුරජුනට දෙලොස් යොදුනෙකින් ඈත්හි සිට ගත්තේ ය. බුදුරජාණන් වහන්සේ එ වේලෙහි ඉන්‍ද්‍රක-අඬකුර දෙදෙනා දැක මෙසේ අසා වදාළ සේක.

බුදුරජ = "අඬකුර! තා විසින් – දසදහස් හවුරුදුතුළ,
දෙලොස් යොත්නක් පමණැති – තැනෙහි
ලිප් බදවා බෝ
දෙනලද ද දන් බෝ – මවෙතවුත් මෙලෙසින් දුන්,
දෙලොස් යොත්නක් මාගෙන් – කම් කිම
ඇත හුන්නෙහි?

මේ වදාළ බස මහාපොළොව සිටි මිනිසුනට ද ඇසුනේ ය.

අඬකුර = "හිමියෙනි! තිලෝගුරු-එදා මාදුන් දන් ඒ,
දීමට තැනක් සුදුසු-නො ලබා අතේ සිස් වී
මේ ඉන්දකයකු-දුන් දන් ඉතා මද වේ,
එහෙත් හේ අප මැඬගෙණ-තරු මැදසදෙවි බැබලේ"

අඬකුර මෙසේ කී කල්හි නැවැත බුදුරජාණන් වහන්සේ "ඉන්‍ද්‍රක! තෙපි මාගේ දකුණු පස්හි හුන්නහු කුමක් හෙයින් ඔතැනින් නැගිට නො ගොස් ඉන්නහු දැ?" යි විචාළ සේක. එවිට ඉන්‍ද්‍රක තෙමේ "ස්වාමීනි! ඒ මම මහාසරු කෙතක බිජුවට, ඉතා ටිකක් වපුළ ගොවියකු සේ දක්ෂිණාඝීසම්පත්තිය ලැබීමි" යි දක්ෂිණාඝීයන් දක්වන්නට මෙසේ කීය:

"රළු නිසරු කෙත්හි-වපුලෙ ද බොහෝ බිජුවට,
නො ද මහත්පල වේ එය-ගොවිහු ද සතුටු
නො කෙරේ.

එමෙන් බෝ දන්වත්-දුසිල්හට දුන් මා ඒ,
මහත්පලදෙනු නො ද වේ-දුන්නහු ද තුටු නො කෙරේ
සරුකෙතක වැපුරූ-මඳ බිජුවට ද මැනැවින්,
වැසිදිය ලබා වැඩුමෙන්-ගොවිහු තුටු කරණාසේ
ගුණවත් එකසැටි-සිල්වතුන් වෙත දුන් දන්,
මඳ වුව ද පලදීමෙන්-ඒ පින් මහත් පලැති'' යි.

මෙහිලා ඉන්දක කළ පෙරකම් කිම යත්: ඔහු පිඬු සිඟා වැඩිය අනුරුද්ධ මහාතෙරුන්ට, තමන්ට දෙන්නට ගෙණ ආ බත්සැන්දක් දෙවී ය. ඔහුගේ ඒ දන අවුරුදු දස දහසක්, දෙලොස් යොදුන් තැන ලිප් බඳවා දුන් දනට වඩා ඉතා මහත් විය.

ඉන්දක මෙසේ කී කල්හි බුදුරජානන් වහන්සේ අඞ්කුර අමතා ''අඞ්කුර! දන් දෙන විට පිරික්සා දිය යුතු ය, එවිටය සරු කෙතක වපුළ බිජුවට සේ දන් මහත්පල වනුයේ, තෙපි එසේ නො කළහු ය, එහෙයින් තාගේ දානය මහත්පල ඇත්තේ නො වී'' යයි වදාරා:- නැවත,

''කො තැනෙක්හි දුන් දන්-මහත්පල ඇත්තේදැ යි,
දිය යුතුය දන් විමසා-දෙන්නෝ සගලොවට යෙත්.
පිරික්සා දෙන දන්-මුනිඳුන් පසස්නා ලද,
මෙලොව දන් පිළිගැණුමට-සුදුස්සන් වෙත දුන් දන්,
සරු කෙතක වැපුරූ-බිජුවට පලැති වන සේ
මහත් පල ඇති වනුයේ-පිරික්සා දෙනු එබැවින්''

යි දන් මහත්පල වන පරිදි වදාළ සේක. ඒ පිණිස ම උන්වහන්සේ

''තිණ දෙසින් යුතු කෙත්-රා දෙසින් යුතු මේ සත්,
පහ කළ රා ඇත්තනට-දුන් දෙය මහපලැති ඉන්.
තිණ දෙසින් යුතු කෙත්-දෙස්දෙසින් යුතු මේ සත්,
පහ කළ දෙසැත්තන්හට-දුන් දෙය මහපලැති ඉන්.
තිණ දෙසින් යුතු කෙත්-මෝ දෙසින් යුතු මේ සත්,
පහ කළ මොහැත්තන්හට-දුන් දෙය මහපලැති ඉන්.
තිණ දෙසින් යුතු කෙත්-ඉස දෙසින් යුතු මේ සත්,
පහ කළ ඉසැත්තන්හට-දුන් දෙය මහපලැති ඉන්''

යනු වදාළ සේක. මේ දෙසුම් අවසන්හි ඉන්දක-අඞ්කුර දෙදෙන සෝවන් වූහ. මහාජනයාට ද මේ දෙශනාව වැඩ සහිත වූ ය.

අනතුරු ව බුදුරජානන් වහන්සේ මාතෘදිව්‍යපුත්‍රයන් අබිමුව හිඳුවා **''කුසලා ධම්මා අකුසලා ධම්මා''** යි අභිධර්මදෙශනාව ඇරඹූ සේක. පිඬු සිඟා යන වේලෙහි තමන් වහන්සේ

පෙරළා එනතුරු දහම් දෙසන්නට අන් බුදුරුවක් මවා තබා හිමවතට වැඩ නාලිය දැහැටි වළඳ අනුතත්දහතළාවෙහි මුව සෝදා උතුරුකුරු දිවසිනෙන් පිණ්ඩපාතය ගෙණවුත් මහා-සාලමාලකයෙහි වැඩ හිඳ වළඳන සේක. සැරියුත් මහාතෙර-ණුවෝ එහි ගොස් බුදුරජුන්ට වත් කෙරෙති. බන්කිස නිම කළ බුදුරජානන් වහන්සේ "සැරියුත්! අද මම මෙතෙක් දහම් දෙසීම්, තමුසේ, තමුසේගේ කුඩා නමලාට ඒ දහම් උගන්වන්-නා" යි නියම කළ සේක.

යමාමහපෙළහර දැක සතුටට පත් පන්සියයක් නැණවත් මිනිස්සු සැරියුත් මහාතෙරුන් වෙත පැමිදි වූහ. බුදුරජහු මෙසේ වදාළෝ ඔවුන් සඳහා ය. නැවැත බුදුරජානන් වහන්සේ දෙව්-ලොවට වැඩ මවාලූ බුදුරජුන් වදාළ තැන් පටන් දහම් දෙසති. සැරියුත් මහාතෙරණුවෝ ද එහි ගොස් බුදුරජුන් වදාළ දහම් දැන පෙරළා අවුත් ඒ දහම් ඒ නිකුණුන්ට උගන්වත්. ඒ නිකුණුහු බුදුරජුන් දෙව්ලොව වැඩ වසනා කල්හි ම ප්‍රකරණ සතකින් පරිමිත වූ ඒ ධර්ම දරා ගත්හ. ඒ පන්සිය දෙන කසුප් බුදුරජුන් දවස කිරිවවුල් ව ඉපද එක් ගල්තල්ලක එල්බ සිටියෝ ඒ ගල්ලෙන වසන තෙරුන් දෙනමක් සක්මන් කරමින් විජම්දහම් පිරිවානා හඬ අසා එ හඬෙහි නිමිති ගෙණ එය ඇසූහ. "මොවුහු සකඛ-යෝ ය, මොවුහු ඛානුහු ය" යන ආ ලෙසින් නොරතුරු නොදැන ම පිරිවානා හඬෙහි නිමිති ගත් සැටියේ ම කිරිවවුලුබවෙන් මිදී දෙව්ලොව උපන්හ. එහි බුද්ධාන්තරයක් දිවසැප වැළඳූ ඔවුහු සැවැත්නුවර කුලගෙයක ඉපිද වැඩුනෝ යමාමහපෙළහර දැක පැහැදෙ තෙරුන් වෙත පැමිදි ව සිසල්ලන්ට පළමු ව සඤාප්‍ර-කරණය දරා ගත්හ. බුදුරජානන් වහන්සේ එපිළිවෙළින් නෙමිසක් මුළුල්ලෙහි විජම්දහම් දෙසූ සේක. දෙශනාවසානයෙහි අසූකෙළක් දෙවියෝ නිවන් දුටහ. මාතෘදිව්‍යපුත්‍ර සොවන් ඒ ය. සතිස් යොදුන් තැන පැහිර සිටි මහාපිරිස "දැන් සත්වනදා පවාරණය"යි මහා මුගලන් තෙරුන් වෙත ගොස් "සවාමිනි! බුදුරජුන් දෙව්ලොඹින් බස්නා දිනය දැන ගන්නට වුවමනා ය, අපි උන්වහන්සේ නොදැක ගම්රට බලා නොයමු" යි කී කල්හි මුගලන් තෙරණුවෝ "මේවා, උපාසකයෙනි!"යි එහි ම පොළොව ගැලී "මහාමෙර මුදුනට නගින මා, මහාජන තෙමේ දකීවා" යි ඉටා මැණික් ඇවුණු නිල්පලස් හුයක් සේ පැණෙනුවෝ මහාමෙර මුදුනට නැගි සේක. රැස් ව හුන් මිනිස්සු "එක් යොත්නක් නැංගාහ, දෙ යොත්නක්, හුන් යොත්නක් නැංගාහ" යි කියමින් බලා සිටියහ. තෙරණුවෝ බුදුරජුන්ගේ සිරිපා නිසින් ඔසවන්නා සේ මහාමෙර මුදුනට නැග

වැඳ "සාමීනි! එදා රැස් වූ මහාජනකාය තෙමේ බුදුරජාණන් වහන්සේ දැක ම යමු" යි නතරවී සිටියි, එහෙයින් මිනිස් ලොවට බැස වදාරන්නෝ කවදා දැ" යි ඇසූහ. "මුගලනා! තමුසේගේ වැඩි-මහල්සොහොයුරු සැරියුත් මෙ දවස කොහි වෙසේ දැ"යි බුදු-රජුන් අසා වදාළ කල්හි "සාමීනි! උන්වහන්සේ **සඬකස්ස** නුවර වස් එළඹ වැඩ සිටිති" යි කීහ. "මුගලනා! එසේ නම්, මම තව සත් දිනකින් එන මහාපවාරණ දිනයෙහි සඬකස්ස නුවර දෙරට බසින්නෙමි, මා දකිනු කැමැති හැම කෙනකුත් එහි පැමිණිය යුතු ය, ඔවුනට එහි පැමිණෙන්නැ'යි කියන්න, සැවැත් නුවර සිට සඬකස්ස නුවරට ඇත්තේ තිස් යොත්නෙක, මෙතෙක් තැන් යෑමෙහි දී කිසිවකුටත් බත් පිණිස හාල් ලුනු මිරිස් ඇ කිසිවක් වුවමනා නැත, පෙහෙවස් ගෙණ අසල වෙහෙරකට බණ අසන්නට යන්නන් සේ යන්නට කියවු" යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. උන්වහන්සේ ද "එසේය, සාමීනි!" යි බුදුරජුන් වැඳ පෙරළා ගොස් ඒ මහාපිරිසට එය දැන් වූහ.

බුදුරජාණන් වහන්සේ වස් පවරා සක්දෙවිඳුන් අමතා "මහ රජ! මිනිස්ලොවට යෑමට දැන් කාලය යි, එහෙයින් මම මිනිස් ලොවට යමි" යි දැන් වූ සේක. එකල්හි සක්දෙවි තෙමේ බුදු රජුන්ට මිනිස් ලොවට බැසීමට රනින් මිණියෙන් රිදියෙන් ඉණිමං තුණක් මවා, ඉණිපා සඬකස්ස නුවර දෙරටුවෙහි පිහිටුවා ලී ය. මූදුන් කොන් මහාමෙර මූදුනෙහි තැබ්බ වී ය. එහි දකුණු පස වූ රන්මුවා ඉණිමග දෙවියන්ට බැසීම සඳහා ය. වම් පස වූ රිදීමුවා ඉණිමග බඹුන්ට බැසීම සඳහා ය. මැද තුබූ මිණිමුවා ඉණිමග බුදුරජුන්ට බැසීම සඳහා ය. බුදුරජාණන් වහන්සේ මහාමෙර මූදුනෙහි සිට දෙවොරොහණ පෙළහර කොට උඩ බලා වදාළ සේක. එකෙණෙහි බඹලෝ නවය එක් මිදුලෙක් විය. යට බලා වදාළ සේක. එකෙණෙහි නොයෙක් ලක්ෂ ගණන් චක්‍රවාටයෝ එක් මිදුලක් ඇත්තෝ වූහ. දෙවියෝ මිනිසුන් දුටහ. මිනිස්සු දෙවියන් දුටහ. බුදුරජාණන් වහන්සේ සවණක් රැස් විහිදූහ. එදා සනිස් යොදුන් පමණ වූ ඒ පිරිසෙහි බුදුසිරි බලා පැහැද බුදුබව නො පැතුවෙක් නො වී ය. හැම දෙන ම බුදුබව පැතූහ. රන්ඉණිමගින් දෙවියෝ බටහ. රිදීඉණිමගින් මහබඹු බටහ. බුදුරජාණන් වහන්සේ මිණිඉණෙන් බට සේක. පංචසිඛගන්ධර්ව පුත්‍ර, දකුණු පස සිට බෙලුවපණ්ඩු විණාව වයමින් බුදුරජුන් පුදමින් බටුයේ ය. මාතලී සඬ්ගාහක, වම් පසින් දිවගදමල් ගෙණ වදිමින් පුදමින් බටුයේ ය. මහබඹු, කුඩසේසත් දැරී ය. සුයාම, වල්ලිදුනා සැලී ය. බුදුරජාණන් වහන්සේ මොවුන් හා බැස සකස් නුවර

දෙර පිහිටා ගත් සේක. සැරියුත් මහාතෙරණුවෝ බුදුරජුන් ඉදිරියට පැමිණ බුදුරජුන් වැඳ සිටියහ. සැරියුත් තෙරුන් විසින් මෙයට පෙර මෙබඳු මහත් බුදුසිරියෙන් යුක්ත ව ඔසිනා බුදුරජාණන් වහන්සේ නොදක්නා ලද සේක් ද, එහෙයින් උන්වහන්සේ,

"මෙබන්දෙක් මින් පෙර — මවිසින් නොදක්නා ලද,
යලි නොද අසන ලද — කිසිවකු අනින් කිසිදු.
මිහිරිබස් තෙපලන — සිවුගණැති සම්බුදුරද,
පිළිසඳ විසින් වැඩියෝ — මෙලොවට තුසී පුරයෙන්"

යි තමන් වහන්සේගේ ප්‍රීතිය මෙසේ ප්‍රකාශ කළහ.

නැවැත ද සැරියුත් මහාතෙරණුවෝ "ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස! සියලු දෙව් මිනිස්සු ඔබ වහන්සේට ප්‍රිය කරති, ඔබ වහන්සේ ම පතති" යි ද කිහ. "සැරියුත්! ඒ එසේය, ඒ කියයුතු නොවේ, මෙබඳු මහත් ගුණ ඇති බුදුවරු සියලු දෙව් මිනිසුන්ට ප්‍රිය වෙත්, යනු කිය යුතු නොවේ" යනු වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතන්ති.

යම් නුවණැති කෙනෙක් ධ්‍යානයෙහි ඇලුනාහු ද, නිවනෙහි ඇලුනාහු ද, සිහි ඇත්තා වූ ඒ සම්බුදුවරයන්ට දෙවියෝ ද කැමැති වෙත්.

යෙ ඣානපසුතා ධීරා = යම් නුවණැති කෙනෙක් ධ්‍යානයෙහි ඇලුනාහු ද.

යම් කෙනෙක්, ආලම්බනොපනිධ්‍යාන-ලක්ඛණොපනිධ්‍යාන යන දෙවැරැම් ධ්‍යානයෙහි, ආවජ්ජනාදිවසිතාවන්ගේ වසයෙන් ඇලී සිටියෝ ද ඔවුහු ය **ඣානපසුත**. මෙහිලා බුදුවරයෝ ගැණෙති. I, 2, I.

නෙක්ඛම්මූපසමෙ රතා = නිවනෙහි ඇලුනාහු ද.

මෙසිනුදු ගැණෙන්නෝ බුදුරජාණන් වහන්සේ ය

නෙක්ඛම්ම ශබ්දය, **පඨමජ්ඣාන-පබ්බජ්ජා-විමුත්ති-විපස්සනා-නිබ්බෙධකුසල** යන මෙතැන්හි වැටේ.

I, 2, I. "නෙක්ඛිත්තො, ධීරා" යනු බලනු.

''නෙක්ඛම්මං පඨමජ්ඣානෙ පබ්බජ්ජායං විමුත්තියං,
විපස්සනායං නිස්සෙසකුසලස්මිං ච දිස්සති''

යනු කොෂවචන යි. **''නෙක්ඛම්මාභිරතානං පරමවොදානප්පත්තානං''** යනාදී තන්හි ප්‍රථමද්ධ්‍යානයෙහි, **''නෙක්ඛම්ම සඞ්කප්පො''** යනාදී තන්හි ප්‍රව්‍රජ්‍යාවෙහි, **''නෙක්ඛම්මූපසමෙ රතා''** යනාදී තන්හි විමුක්තියෙහි, **''නෙක්ඛම්මසඤ්ඤා''** යනාදී තන්හි විදර්ශනාවෙහි, **''කාමච්ඡන්දො නෙක්ඛම්මං''** යනාදී තන්හි නිඃශෙෂ කුශලයෙහි වැටුනේ ය. නෙක්ඛම්ම යන මෙයින් අනාගාමී මාර්ගය ද කිය වේ. කාමයන්ගෙන් වෙන් ව සිටි බැවිනි ඒ. **කාමෙහි නික්ඛන්තත්තා නෙක්ඛම්මං අනාගාමිමග්ගො වා''** යනු අටුවා ය.

නෙක්ඛම්ම ශබ්දය සේ ම **උපසම** ශබ්දය ද නිවන කියන්නේ ය. එකාර්ථවත් ඒ දෙ සද ම මෙහි යෙදී සිටියි. එක් අරුතක් සඳහා එක් අරුතක් ඇති පද දෙකක් යෙදී සිටියේ සකලක්ලෙශයන්ගේ අත්‍යන්තව්‍යපපසමය නිවනෙන් ම වන බව දැක්වීමට ය. සියලු කෙලෙස් පහව යෑමෙන් ම සන්සිඳීම වන බව දන්වනු ව හෝ නිවන **'නෙක්ඛම්මූපසම'** යි කියන ලද ය. කෙලෙස් සන් සිඳීමැ යි කියන නිවන හෝ කෙලෙසුන් සන්සිඳුවන නිවන හෝ යි අරුත් ගත ද වරද නැත.

දෙවාපි තෙසං පිහයන්ති = දෙවියෝ ද කැමති වෙත්.

අපි ශබ්දය මනුෂ්‍යාදීන්ගේ ගැණීම සඳහා ය. එහෙයින් කැමැති වන්නෝ දෙවියෝ ම පමණක් නො වෙති. මනුෂ්‍යාදී වූ අන්‍ය සත්ත්වයෝ ද කැමැති වෙත්. **'තෙසං'** යන්න **'සම්බුද්ධානං'** යනු බලා සිටියේ ය.

සම්බුද්ධානං සතීමතං = ස්මෘතිමත් වූ සම්බුදුවරයන්ට.[1, 2, 2].

ආලම්බනොපනිද්ධ්‍යාන-ලක්ෂණොපනිද්ධ්‍යානයන්හි ඇලී සිටි කෙලෙස් සන්සිඳවන නිවනෙහි ඇලුනු සිහි ඇත්තා වූ සම්බුදුවරුන්ට එකී ගුණ කරණ කොට දිව්‍යමනුෂ්‍යාදී වූ හැම කෙනෙක් කැමැති වෙත්. මෙබඳු මහත් ගුණ ඇති බුදුවරුන් දැක ''අහෝ! අපිදු බුදු වන්නමෝ නම් යෙහෙකැ'' යි බුදුබව පතමින් කැමැති වෙත්.

ධර්මදෙශනාවගේ අවසානයෙහි තිස් කෙළක් පමණ දෙනාට නිවන් ලැබින. සැරියුත් මහාතෙරුන්ගේ අතැවැසි පන්සියය දෙනා රහත් වූ හ. යමාමහපෙළහර කොට දෙව්ලොව වස්

1. 2. 2. ''සතිමතො'' යනු බලනු.

එළඹ **සකස්** නුවර දෙරකඩට බැසීම සියලු බුදුවරුන් විසින් අත් නොහළ ක්‍රියාවකි. එහි දකුණු සිරිපා පිහිටි තැන **අචල-චෛත්‍යස්ථාන** නම් වී ය. බුදුරජානන් වහන්සේ එහි වැඩ සිට පුහුදුනට විෂය වූ ප්‍රශ්න විචාළ සේක. ඔවුන් පිළිතුරු දිය හැකි ප්‍රශ්නයන්ට පිළිතුරු දුන්හ. සොතාපන්නහු පිළිබඳ ප්‍රශ්නයන්ට පිළිතුරු දීමෙහි ඔවුහු අපොහොසත් වූහ. එසේ ම සොතා-පන්නයෝ සකෘදාගාමීන්ට විෂය වූ ප්‍රශ්නයන්ට පිළිතුරු දීමෙහි අසමර්ථ වූහ. සැරියුත් තෙරුන් වහන්සේට විෂයවූවෙහි මුගලන් තෙරණුවෝ ද, බුදුරජානන් වහන්සේට විෂය වූවෙහි සැරියුත් තෙරණුවෝ ද, එසේ ම අසමර්ථ වූහ. එහි ලා අසමර්ථ වූ සැරියුත් තෙරුන් වහන්සේ නැගෙනහිර දෙස පටන් කොට සියලු දිගුන් බැලූහ. සියලු තැන එක මිදුලෙක් ඇත්තේ ම වී ය. අට දිසා-වෙහි දෙවියෝ, මිනිස්සු, උඩ සිටි බඹලෝ වැස්සෝ නාගයෝ ගුරුළෝ ඈ හැම කෙනෙක් ඇඳිලි බැඳ "ස්වාමීනි! මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට පොහොසතෙක් මෙහි නැත, ඔතැන්හි ම සොයනු මැනැව" යි කීහ. මේ අතර බුදුරජානන් වහන්සේ "සැරියුත් වෙහෙසෙ යි, ඒ තැන,

"යෙසං සඞ්ඛතධම්මා සෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියා පුට්ඨො පබ්‍රූහි මාරිස"

යන මේ බුද්ධවිෂයක ප්‍රශ්නය අසා සෙඛා සෙඛයන්ගේ ආගමන-ප්‍රතිපදාව මා අතින් විචාරා යි ප්‍රශ්නයෙහි නිසැක ව සක්‍යාදීන් කෙරෙහි කිනම් මුඛයකින් මේ ප්‍රතිපදාව කියන්නෙම්, මම බුදුරජුන්ගේ අදහස් ගන්නට නො හැකි වෙම් දැ' යි මාගේ අද-හසෙහි සැකෙරෙයි, එහෙයින් ඒ තැනට මා ඒ පිණිස නය නො දෙනලද නම්, ඒ තැන ඒ කිමෙහි අපෝසත් ය, ඒ නිසා නය දෙමි" යි නය දෙන සේක් **"හුතමිදන්ති සාරිපුත්ත සමනු-පස්සසි"** යනු වදාළසේක. නැවැත උන්වහන්සේට "සැරියුත් තෙමේ මාගේ අදහස් ගෙණ අදහස් දැන කියනුයේ සක්‍යවශයෙන් කියන්නේ ය"යි ද අදහස් වූයේ ය. තෙරුන්ට නය දීම හා ඒ ප්‍රශ්නය නය සියයකින් නය දහසකින් වැට හී ගියේ ය. සැරියුත් තෙරණුවෝ බුදුරජුන් දුන් නයයෙහි සිට එ පැණ විසඳූහ.

සම්බුදු රජානන් වහන්සේ හැර, සැරියුත් තෙරුන්ගෙන් ප්‍රශ්න අසන්නට සමතෙක් ලොව නැත්තේ ය. එහෙයින් ශාරී-පුත්‍ර ස්ථවිරයන් වහන්සේ බුදුරජුන් ඉදිරියෙහි සිට "ස්වාමිනි! මම මුළු කපක් ම වැසි වට කල්හි මෙතෙක් දියබිඳු මහමුහු-

දෙහි ද මෙතෙක් දියබිඳු පොළොවෙහි ද මෙතෙක් දියබිඳු කඳු මුදුන්හි ද වැටුනැ යි ගණන් කොට ලක් තැබීමට සමර්ථ වෙමි"යි අභීතනාද කළහ. "සැරියුත්! ඒ එසේ ය, තමුසේ එසේ ගණිත්-නට පොහොසත් බව මම දනිමි"යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. සැරියුත් තෙරුන්ගේ නුවණට උපමා කළ හැක්කෙක් නම් නැත්තේ ය. එහෙයින් කීහ:

"ම නුවණට ලක්වී-ගෙවේ ගඟ නම් ගඟවැලි,
ගෙවේ මුහුදෙහි දියකඳ-මිහිතලමැටිකඳ ගෙවේ" යනු.

"සවාමිනි! ලොකනාථයන් වහන්ස! මා එක් ප්‍රශ්නයක් විසඳූ කල්හි ඒ පිණිස වැලි ඇටක් එක්දිය බිඳක් පස් ටිකක් ගණන් වශයෙන් නො තබා ප්‍රශ්න සිය ගණනින් හෝ විසඳන්නේ සමූහ ව සිටි ප්‍රශ්නයන්ට වැලිවලින් එක් වැලි ඇටක් දියකදින් එක් දියබිඳක් පස් කඳින් එක්වැලි ඇටක් තරම් පස් ටිකක් පසෙක තබම් නම්, වහා ම ගඩාදී තන්හි වූ ඒ වැලි පස් ගෙවී යන්නේ ය, එහෙත් මාගේ ප්‍රශ්න විසඳීම නම් නො ගෙවෙන්නේ ය"යි කීහ.

මෙබඳු මහත්ගුණ ඇති මහාතෙරුන් වහන්සේත් බුද්ධ විෂයයෙහිලා ඇසූ ප්‍රශ්නයෙහි අගමුල නො දැක බුදුරජුන් දුන් නයයෙහි ම සිට ප්‍රශ්න විසඳූහ. ඒ අසා භික්ෂූන්ගෙන් යම් ප්‍රශ්න-යක් ඇසූ නම් කිසිවකුටත් එයට පිළිතුරු දෙනු බැරිවී ය. දම්-සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ එකලා ව ම එය විසඳූහ"යි කතාවක් පැන නැඟින. බුදුරජානන් වහන්සේ ඒ අසා "සැරියුත් තෙමේ, මහාජනයාට, විසඳනු බැරි ප්‍රශ්න විසඳුයේ අද ඊයේ නො වේ, පෙරත් විසඳූයේ ය" යි වදාරා ඒ දක්වනු පිණිස:—

"දහසකට වැඩි වූ-නුවණැතියි එහි රැස් වූ,
ඔවුහු හවුරුදුසියයක්-හඬනෝ යමෙක් දමරුත,
දන්නේ නුවණැති-එකලා වූ ම එ පුරිස්
දෙට ද සෙට මෙ ලොවේ-යට කොට ඔවුන් සැම දෙන"

යි මේ ජාතකය වදාළසේක.

යමක ප්‍රාතිහාර්‍යවස්තුව නිමි.

එරකපත්ත නා රජු

14 — 3

එරකපත්ත නාරජ තෙමේ කස්සප සම්බුදු රජුන්ගේ ශාසනයෙහි තරුණ උපසපත් මහණෙක් ව සිටියේ දවසෙක අහුලකුට නැගී ගහෙහි ගියේය. ඒ යද්දී එරැහස් ලැහබක් දැක එහි එක් කොළයක් අතින් ඇල්ලී ය. ඒ වේලෙහි අහුල ද වෙහයෙන් ගමන් ගෙණ තුබුනේ ය. එහෙයින් මේ මහණ අල්ලාගෙණ සිටි එරැ කොළය කැඩී අතට ආයේ ය. තමන් පැමිණි ඇවැත සුලු බැවින් ඔහු එය නොදෙසා විසි දහසක් හවුරුදු වන මැද මහණදම් කෙළේ ද මැරෙන්නට ලං ව සිටි කාලයෙහි, එරැකොළය බෙල්ලෙහි දැවටී ගියා සේ සිතා ඇවැත් දෙසනු කැමැති වූයේ ද අන් මහණකු නොලැබ, "සිල් අපිරිසිදු ය" යි විපිළිසර ව ඕය ගොස් එරැරුක් කඳකින් කළ ඔරුවක් පමණ වූ නාරජෙක් ව උපන්නේ ය. ඔහුගේ නම ද 'එරකපත්ත' නම් වී ය. ඌ උපත් සැටියේ ම අත්බව බලා "මෙතෙක් කලකුත් මහණදම් කොට මැඩියන් ගොදුරු කොට ගන්නා අහෙතුකයොනියෙක උපනැ"යි එහිදී ද විපිළිසරට පත් වී ය. පසු දවසෙක මේ නාරජු ගඟදිය මතු පිට පෙණය මහත් කොට තබා තම දුවක වූ නැයින්නක් ඒ මත්තෙහි හිඳුවා ඇ ලවා ගී කියවා, "බුදුකෙනෙකුත් වහන්සේ ලොව උපන් සේක් නම්, මම මේ උපායයෙන් එය දැන ගන්නෙමි" යි ඔහුට අදහසෙක් වී ය. "යමෙක් මාගේ මේ ගීයට පෙරළා ගීයක් කියා නම්, ඔහුට මහත් සම්පතුත් සමග මේ දුව ද දෙන්නෙමි" යි ද සිතා අඩ මසකට වරක් දුව පෙණය මත්තේ තබන්නේ ය. ඕ ද පෙණ ගොබයෙහි සිට නටමින්:

"කිම අදිපති රජ දැ? – රජ කෙසේ රදිසුරු වෙ දැ?
කෙලෙස ද විරජ වනුයේ? – කියැ වේ බල්හු කෙලෙසින්?"

යි මෙසේ ගයයි. දඹදිව් වැස්සෝ මෙය අසා "නැයින්න අල්ලාගණිමු" යි තම තමන් උගත් ලෙසින් උන් කී ගීයට පෙරළා ගී කියති. එහෙත් ඒ ගී ඇයගේ සිත් නොගත්. අඩමසකට වරක් පෙණ ගොබෙහි සිට මෙසේ ගායනා කරණ ඇයට එක් බුදාණතරයෙක් ඉක්ම ගියේ ය.

මේ දවස අපගේ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. දවසක් උන්වහන්සේ අලුයම ලොව බලා වදාරණ සේක් එරකපත්තයා හා උත්තරමාණවකයා දැක නැවැත ඔවුනට කුමක්

වන්නේ දැ" යි බලා වදාළ සේක. එකල්හි "අද එරකපත්තන තම දුව පෙණගොබ මතුයෙහි හිඳුවා නටවන දවස ය, උත්තර මාණවක මා දෙන ගීය ගන්නේ ම සෝවන් වන්නේ ය, නැවැත ඒ ගීය ගෙණ ඔහු නාරජු වෙත යන්නේ ය, නාරජු එය අසා බුදුන් ලොව උපන් බව දැන මා වෙත එනු ඇත, එහි දී මම ඔහු ලං කොට මහාසමාගමයෙහි ධර්මදේශනාවක් කරන්නෙමි, ඒ අවසන්හි සුවාසූදහසක් දෙන සෝවන් වන්නාහ" යි දුටහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ බරණැසට නො දුරෙහි එක් මහරි ගසක් මූල වැඩහුන් සේක. දඹදිව් වැස්සෝ ද ගී සපයා ගෙණ එහි රැසු වූහ. බුදුරජාණන් වහන්සේ නො දුරෙහි යන උත්තර දැක "උත්තර!" යි ඇමතූහ. හේ ද "කිම ස්වාමීනි!"යි ඇසි ය. "මෙහි එව" යි වදාළ කල්හි වෙත ගොස් වැඳ සිටියහු අතින් "කොහි යෙහි?" යි විචාළ සේක. "එරකපත්තගේ දූ ගී ගයන තැනටැ" යි කී කල්හි "ඒ ගීයට පිළිතුරු ගීයක් තනා ගත්තෙහි?" යි ඇසූහ. "එසේ ය, ස්වාමීනි!" යි කී විට 'එය කියව" යි වදාළ සේක. හේ ද තමන් දන්නා ලෙසින් තැනූ ඒ ගීය බුදුරජුන් ඉදිරියෙහි කියා පෑයේ ය. බුදුරජාණන් වහන්සේ "උත්තර! මේ ගීය ඒ ගීයට පිළිතුරෙක් නො වේ, මම තට පිළිතුරුගීයක් තනා දෙමි, එය ගෙණ යව" යි වදාළ කල්හි "එසේ ය, ස්වාමීනි!" යි කී කල්හි බුදුරජාණන් වහන්සේ "උත්තර! නැසින්න ගී ගයන විට නෝ ද,

"යමෙක් සඳෙරට අදි – පති වේ ද හේ රජ වේ,
ඇලෙනුයේ නම් සඳෙරෙහි – රදිසුරු නම් ද හේ ම ය.
සඳෙරෙහි නො ඇලුනේ – විරජ නම් වේ ඒ මෙහි,
ඇලෙනුයේ අඳබල් සී – කියා වේ ලෝ දනන් මැද"

යන මේ ගීය ගයන්නැ" යි වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ඔහුට මෙය උගන්වා නැවැත "උත්තර! තා මේ ගීය ගැයූ විට මේ ගීයට පිළිතුරු විසින් ඇය ද ගීයක් ගයනු ඇත, ඒ මෙසේ ය:

"කුමකින් ගෙණ යනු – ලැබේ දෝ අඳබල් දන,
නුවණැති දෙනේ කෙලෙසින් – පා කොට හරී දෝ හෝ?.
කෙසේ නම් යෙදුමෙන් – බියරහිත දැ සී එපුරිස්,
මවිසින් ඇසූ මේ පැණ – ඔබ දැන් කියනු මැනැවී"

යනු,

එවිට තෝ ඇය ඉදිරියෙහි,

"කම් ඇ දියපහර – විසින් ගෙණ යැවෙ අඳබල්,
නුවණැති දෙනේ වැරයෙන් – කම් ඇදියපහරඒ.
හැරලා සිටී සැම – බෙවෙහි යෙදුමෙන් වෙන් වූ,
පුරිස් බියරහිතැ යි – කිය වේ මෙලොව මිදුනු"

යන මේ ගීය ද ගයව" යි මෙසේ ගීය උගන්වා ලූ සේක.

උත්තර තෙමේ මේ පිළිතුරු ගීය උගන්නේ ම සෝවන් වූයේ ය. සෝවන් වූ හෙතෙමේ ඒ ගීය උගෙණ ගොස්. "එම්බා! නැයින්න! මා තාගේ ගීයට පිළිතුරු විසින් ගීයක් පිළියෙළ කර–ගෙණ ආමි' එය ගයන්නට මට මදක් ඉඩ දෙන්නැ" යි කියා තද–බද වී සිටි මිනිසුන් අතරින් උරයෙන් උර හපා යන්තමකින් එහි ලං විය. එ වේලෙහි නැයින්න පියාගේ පෙණ ගොබෙහි සිට නට නටා **"කිම අදිපති රජද?"** යන මේ ගීය ගැයූ ය. උත්තර එයට පිළිතුරු විසින් **"යමෙක් සදෙරට අදිපති වේද?"** යන මෙය ගැයී ය. නැවැත නැයිනිය **"කුමකින් ගෙණයනු ලැබේ දෙ?"** යන ගීය ගැයූ. උත්තර **"කම් ඇ දියපහර විසින් ගෙණ යැවෙ අඳබල්"** යනුවෙන් පිළිතුරු දින. නාරජ තෙමේ එය අසා බුදු–රජුන් උපන්බව දැන "මා මේ බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මෙබඳු පදයෙක් නම් නො අසනලද ය, එකතින් බුදුරජානන් වහන්සේ ලොව උපන්හ" යි සතුටු ව නගුටින් දියට ගැසී ය. එයින් මහාරැළ නැගී දෙතෙර ඉවුරු බිඳී ගියේ ය. එතෙර එක්සිය සතළිස් රියනක් තැන්හි හා මෙතෙර එක්සිය සතළිස් රියන් තැන්හි සිටි මිනිස්සු දියෙහි ගැලී ගියහ. නාරජ තෙමේ ඒ සියලු මිනිසුන් පෙණගොබෙහි ලා ඔසවා ගොඩට පැමිණ වී ය. නැවැත උත්තර වෙත ගොස් "හිමියෙනි! බුදුරජහු කොහි දැ?"යි ඇසී ය. "උන්වහන්සේ අර පෙණෙන ගසමුලැ"යි හේ කී ය. "ස්වාමීනි! එනු මැනැවි, එහි යන්නටැ" යි උත්තර සමග එහි ගියේ ය. මහාජන තෙමේ ද ඔවුන් හා ම නික්ම ගතු. නාරජ බුදුරජුන් වෙත ගොස් සවණක් රැස් අතරට වැදී බුදුරජුන් වැඳ අඬ අඬා සිටියේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ "නාරජ! කුමක් නිසා හඬහු දැ?" යි අසා වදාළ සේක. "ස්වාමීනි! මම ඔබවහන්සේ වැනි බුදුවරයකුගේ ශ්‍රාවකයෙක් ව අවුරුදු විසිදහසක් මහණකම් කෙළෙමි, එහෙත් ඒ මහණකම මා සසරින් එතෙර කරන්නට පොහොසත් නො වී ය, ඒ මහණකම ඵල–රහිත වී ය, ඉතාකුඩා එරුක්කොළයක් මා අතින් කැඩී ගියෙන් මම මේ අහෙතුකප්‍රතිසන්ධිය ගෙණ බඩගා ඇවිදුනා තැන

උපන්මි, බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ම මිනිසත්බවක් නොලැබීමි, බණක් නො ද ඇසීමි, ඔබ වහන්සේ වැනි බුදුවරයකු දැක ගත නුහුනෙමි'' යි නාරජු කී විට, නැවැත බුදුරජානන් වහන්සේ ''මහරජ! මිනිසත්බව සුලබ නො වේ, ඒ ලැබීම ඉතා අපහසු ය, මිනිසත්බව ලැබීම බොහෝ කලකින් මහත් පිණෙකින් වන්නේ ය, බණදහමක් ඇසීම ද ඒ තරම් ම අපහසු ය, බුදුවරයකුගේ ලෝ පහළවීම ද එසේ ම කලාතුරකින් වන්නේ ය, මේ තුණ එකවර සිදුවීම තරම් අපහසු සිදුවීමෙක් මේ ලොකයෙහි නැත්තේය'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන ජීවිතං,
කිච්ඡං සද්ධම්මසවණං කිච්ඡො බුද්ධානංඋප්පාදෙති.

මිනිසත්බව ලැබීම දුෂ්කර ය. සත්ත්වයන්ගේ ජීවිතය දුක් ය. බණ දහම් ඇසීම දුර්ලභ ය. බුදුවරුන්ගේ ඉපදීම දුර්ලභ ය.

කිච්ඡො මනුස්සපටිලාභො = මිනිසත්බව ලැබීම අපහසු ය.

සහෙතුක කාමාවචර කුසල් මේ, යි යට කියන ලදී. දව රැ දෙක්හි අතර නො තබා රූපරසාදී වූ පස්කම්රසයෙන් ඇස්, කන්, නාස් ඈ ඉඳුරන් පිණවීම ම බලාපොරොත්තුවෙන් දවස් යවන පව් අදහස්වලින් ගහන වූ පුහුදුනට මැරෙන්නා වූ කාලයෙහි සහෙතුකකාමාවචරකුසලයක් සිතට නගා ගැණුම පහසු නො වේ. එය කෙතරම් අපහසු ද? යත් : කණකැස්බකුට වියසිදුරෙන් අහස දැකීමට ද වඩා අපහසු ය. ''**සෙය්‍යථාපි භික්ඛවෙ! පුරිසො එකච්ඡිග්ගලං යුගං මහාසමුද්දෙ පක්ඛිපෙය්‍ය. තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය, පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය, උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය, දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය, තත්‍රස්ස කාණො කච්ඡපො, සො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන සකිං උම්මුජ්ජෙය්‍ය, තං කිම්මඤ්ඤථ භික්ඛවෙ! අපි නු සො කාණො, කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගිවං පවෙස්සෙය්‍ය, යදි නූන භන්තෙ කදාචි කරහචි දිසස්ස අද්ධුනො අච්චයෙනාති, ඛිප්පතරං ඛො සො භික්ඛවෙ! කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගලෙ යුගෙ ගිවං පවෙසෙය්‍ය, තතො දුල්ලභතරාහං භික්ඛවෙ! මනුස්සත්තං වදාමි. සකිං විනිපාතගතෙන බාලෙන**'' යනු මිනිස්බව දුලබබව වදාළ එක් දෙශනාවකි. මහා මුහුදෙහි බහන ලද, පෙර පැසුළු දකුණු උතුරු දිසාවන්ගෙන් හමන වාතය විසින් ඒ මේ අත ගෙණ යන එක් සිදුරක් ඇති වියදණ්ඩක් වේ ද මුහුදෙහි වසන හවුරුදු සියයකට වරක්

හිස ඔසවා බලන කණකැස්බකු ඒ වියදඬු සිදුරෙහි මොන ලෙසකින් නමුත් ගෙල ඇතුල් කිරීම බොහෝ දිගුකලක් ගොස් කවද හෝ සිදුවිය හැකි වුවත් මිනිසත්බවෙන් ගැලවී අපායයට ගිය අඥමනුෂ්‍යයා නැවැත මිනිස්කමක් ලබනු ඉතා අපහසු ය යනුඑහි කෙටි තේරුම ය.

මහාමුහුදෙහි වසන හවුරුදු සියදහසකට වරක් දියෙන් හිස නගන කණකැස්බකුට සිදුර මැදින් දෙකට කැඩුනු වාත-යෙන් මුහුදෙහි ඒ මේ අත පා වී යන වියදණ්ඩ එක් තැන් ව පෙර තුබූසේ සිටි කල්හි එම වියසිදුරෙන් අහස දැක්ක හැකි වුවත්, පව්කම් කොට අපායයෙහි උපන්නකුට මිනිස්බව ලැබීම නම් හවුරුදු සියදහසකිනුදු නො වන්නේ ය. "**මහන්තෙන හි වායා මෙන මහන්තෙන කුසලෙන ලද්ධබ්බත්තා මනුස්සත්තපටි-ලාභො කිච්ඡො දුල්ලභො**" යනු අටුවා ය.

"අවෙකල්ලමනුස්සත්තං බුද්ධාදිච්චාභිමණ්ඩිතං,
සුදුල්ලභතරං තං හි ඛණො නිබ්බාණසිද්ධියා"

විසෙස විසින් බුද්ධොත්පාදයෙක ඇස් කන් නාස් ඇ ඉඳුරන්ගේ විකලබවක් නැති ගොළු බිහිරිබැව් ඇ නැති මිනිසත්බවක් ලැබීම කියනු බැරි තරම් අපහසු ය. ඒ මිනිසත්බව ම ය, නිවන්ලැබීමට කරුණු වනුයේ.

"හෙතුදුක්කරතො වෙව සාරතො ච මහග්ඝතො,
මහාසාරං ච රතනං මනුස්සත්තං සුදුල්ලභං"

මේ මිනිසත්බව ලැබුම අපහසු වනුයේ එය ලැබීමට කරුණු වන පින්කිරීම අපහසු බැවිනුත් මිනිසත්බව තමා දිව්‍ය බ්‍රහ්මාදී වූ අන් හැම උසස් අත්බවකට ම වඩා, උසස් බැවිනුත් මහඟු බැවිනුත්ය. මහාසාරරත්නයක් සේ එය ලබනු අපහසු ය.

කිච්ඡං මච්චානජීවිතං = සත්ත්වයන්ගේ ජීවිතය දුක් ය.

කිච්ඡ යනු දුකට නමෙකි. යම් ස්වභාවයෙක් තෙමේ සැපැ යි ගැණෙන ස්වභාවය විසුරුවා හරී ද ඒ කිච්ඡ නම්. දුකට නමෙ-කැ යි කීයේ එහෙයිති.

සත්ත්වපර්‍යාය නාම අතුරෙහි මූලපදය **මච්ච** යනුයි. මැරෙණ ස්වභාවය ඇත්තේ 'මච්චු' නම්. ජීවිතෙන්ද්‍රියය දරණ හැම එකකු කෙරෙහි ම විශෙෂයක් නො තබා මෙය නගිතත්, මෙහිලා මිනිසා කෙරෙහි ම ඒ නැගී සිටියේ ය.

ජීවිත නම් පණදැරීම ය. ජීවත්වීම ය. ආයුෂය යි ද කියනු ලැබේ. එය දුක් වනුයේ නිතොර සිසෑම් වෙණදැම් ඇ කොට මහත් ආයාශයෙන් රැකිය යුතු බැවිනුත් එසේ කළ ද ඉතා ටික කලක් ම පවත්නා බැවිනුත් ය.

සත්ත්ව තෙමේ හැම කම්කටොල්ලට මූණ දෙනුයේ ජීවිතය නිසාම ය. සතුන් මරනුයේ සොරකම් කරණුයේ දූහැම් නොදූහැම් වෙණදැම් කරණුයේ අවුවැසි නොබලා වෙහෙස වනුයේ වනදුගී ගිරිදුගී ජලදුගී පළිතදුගී ගෙවා නොරට යනුයේ ජීවිතය නිසා ම ය. දුවන්නේ පනින්නේ ජීවිතය නිසා ම ය.

සත්ත්වයන් පිළිබඳ වූ ඒ මේ ජීවිතය ආශ්වාස ප්‍රශ්වාස දෙකින් බැඳී සිටියේ ඔවුන් සම ව පවත්නා කල්හි ම පවතී. ඒ එසේම ය. යම් ලෙසකින් නැහැයෙන් පිටතට නිකුත් වූ වාතය ඇතුළට නොගත් කල්හි ද ඇතුළත්හි වූ නාසිකාවාතය පිටතට නොනික්මුනු කල්හි ද ජීවිතය නැසී යන්නේ ය.

ඉරියවු සම ව පැවැත්ම ද ජීවිතයාගේ පැවැත්මට කරුණු ය. යම්ලෙසකින් සිවු ඉරියව්වෙන් එකෙකුත් වැඩි ව පැවැත්නේ නම් ජීවිතය නැසී යන්නේ ය.

ශීතොෂ්ණයන්ගේ සම ව පැවැත්ම ද ජීවිතයාගේ පැවැත්මට කරුණු ය. අධිකශීතයෙනුත් අධිකඋෂ්ණයෙනුත් ජීවිතය නැසී යන්නේ ය. ශීතොෂ්ණ දෙකෙනුදු ජීවිතය බැඳී සිටියේ ය.

සතර මහාභූතයන්ගේ සම ව පැවැත්ම ද ජීවිතයාගේ පැවැත්මට කරුණු ය. ශරීරගතපෘථිවිධාතාදීන් කෙරෙහි එකකු අනෙකාකුට වඩා නැගී සිටි කල්හි ජීවිතය නැසී යන්නේ ය. මෙසේ ජීවිතය, සතර මහාභූතයන්ගෙනුදු තම පැවැත්මෙහි රුකුල් ලබා සිටියි.

මේ හැම එකක් සම ව සිටිය ද වැඩි කලක් ජීවිතය පවත්නේ නම් අවුරුදු සියයකට අඩු ව හෝ මදක් වැඩි ව පවත්නේ ය. එහෙත් කිනම් ක්ෂණයෙක කිනම් මොහොතෙක කිනම් පැයෙක ජීවිතය නැසේ දැ යි නොකියැකි ය.

ජීවිතය පවත්නේ ඉතා මදකලෙකි. රියසක පෙරළෙනත් නැවතී තිබෙනත් නිම්වලල්ලෙහි එක් පෙදෙසකින් ම පවත්නා සේ සත්ත්වජීවිතය පරමාර්ථවශයෙන් එක් චිත්තවීථියක් පවත්නා තාක් පවත්නේ ය. චිත්තක්ෂණ සතළොසකින් පමණ වන එක් චිත්තවීථියක් සිදී ගිය කල්හි සත්ත්ව තෙමේ මළේ ය, නිරුද්ධ

වූයේ ය යි කියනු ලැබේ. ඒ එසේම ය. අතීතචිත්තක්ෂණයෙහි ජීවත් වූ සත්ත්වයා වර්තමානචිත්තක්ෂණයට ද වර්තමානචිත්තක්ෂණයෙහි ජීවත් වන සත්ත්වයා වර්තමානචිත්තක්ෂණයට ද නොදැ පැමිණෙන්නේ ය. එක් චිත්තක්ෂණයෙක පැවැති රූපධර්ම අන්‍ය චිත්තක්ෂණයකට නොගොස් නිරුද්ධ වෙමින් පරම්පරා වශයෙන් දිගින් දිගට යන්නේ ය. මෙසේ සත්ත්වජීවිතය මඳකලකින් නැසෙන බැවින් හා පවත්නා චිත්තක්ෂණය මඳබැවින් හා ඉතා ටික කලක් ම පවතී.

කිච්ඡං සද්ධම්මසවණං = ඛණදහම් ඇසීම ලැබිය නොහැකි ය. දුක සේ ලැබිය යුතු ය.

බුදුරජාණන් වහන්සේගේ අදහස් ලෙස දහම් දෙසන්නකු කප් කෙළ සිය දහස් ගණනිනුදු ලබා ගන්නට නොහැකි බැවින් ඛණ දහම් ඇසීම දුර්ලභය යි වදාළ සේක. තත්ත්වපූර්ණ ධර්මදෙශකයා පරමාර්ථ ධර්මය මැනැවින් දන් ලාභ කීර්ති ප්‍රශංසාවෙහි මද වූ ද බලා පොරොත්තු නැති පාල්‍යර්ථකථා ටීකාවනට එකඟව සවල්පමාත්‍රයකුත් ඉන් නොබැහැර ව න්‍යායානුකූල ව උපමා උපමෙය පදාර්ථයන් ගළපා අනුනට ධර්මාර්ථයන් වටහා දීමෙහි සමර්ථයකු විය යුතු ය. විශෙෂ විසින් ධර්මදෙශක නම් අභිධර්මය දත් තැනැත්තේ ය. **"ආභිධම්මිකා භික්ඛූයෙව කිර ධම්මකථිකා නාම. අවසෙසා ධම්මං කථෙන්තාපි න ධම්මකථිකා. කස්මා? තෙ හි ධම්මං කථෙන්තා කම්මන්තරං විපාකන්තරං රූපාරූපපරිච්ඡෙදං ධම්මන්තරං ආලොළෙත්වා කථෙන්ති. ආභිධම්මිකා පන ධම්මන්තරං අනාලොළෙත්වා. තස්මා ආභිධම්මිකො භික්ඛු ධම්මං කථෙතු වා මා වා පුච්ඡිතකාලෙ පන පඤ්හං කථෙන්තී"** යනු ආගම බැවිනි.

අභිධර්මය දත් භික්ෂූහු ධර්මකථිකයෝ වෙති. සෙස්සෝ ඛණ කියන්නෝ ද ධර්මකථිකයෝ නොවෙත්. ඔවුහු ඛණ කියන්නෝ කර්මාන්තර, විපාකාන්තර, රූපාරූප පරිච්ඡෙද ධර්මාන්තර ආලොළනය කොට ධර්මදෙශනා කරත්. අභිධර්මය දත්තෝ ධර්මාන්තරය ආලොළනය නොකොට ධර්මදෙශනා කරත්. අභිධර්මය දත් භික්ෂු තෙමේ ඛණ කියාවා හෝ නොකියාවා හෝ විචාළ කල්හි ප්‍රශ්න විසඳන්නේ ය. පරම්පරාධර්මය නොදත් දෙශක තෙමේ නියම ධර්මදෙශකයෙක් නොවන්නේ ය. **"යාය වා තාය වා අපපමත්තතාය පඤ්ඤාය සමන්නාගතො පන භික්ඛු ධම්මකථං කථෙනෙනා ඉතො වා එතෙනා වා අනොකඞ්කමිත්වා යට්ඨිකොටිං ගහෙත්වා අඤ්ඤා විය එකපදිකා දණ්ඩසෙතු**

ආරූළෙහා විය ගච්ඡති'' මඳ නුවණැති මහණ තෙමේ දහම් දෙසන විට සැරයටි කොණ ගත් අන්ධයකු සේ එක් පියවරක් තැබිය හැකි තරම් වූ එක් පාපුවරුවක් ඇති ඒදණ්ඩට නැග ගත්තකු සේ දහම් තතු නො දැන බියෙන් ඇවිසී අතැනින් මෙතැනින් මොනවා හෝ කරුණු ටිකක් ඇහිඳ ගෙණ උඩ බිම නො දැන දහම් දෙසන්නේ ය. එහෙයින් ධර්මකථිකයා පරමාර්ථය මොනවට උගෙණ ධර්මනෙත්තිය දැන හැම කරුණෙක ම නො පැකිළ දහම් දෙසිය යුතු ය. පරමාර්ථ ඥානය මෙන් ම නෙත්ති යෙහි එන ප්‍රස්ථානඥානය ද ධර්මදෙශකයාහට අවශ්‍යයෙන් තිබිය යුතු ය. ප්‍රස්ථාන නම්, දෙශනාව පැවැත්වීම ය. දෙශනාව ක්‍රමානුකූලව ගෙණ යෑම ය. දෙශනාව පැවැත්වීම දෙශනාව ගෙණ යෑම ආස්වාද-ආදීනව-නිශ්ශරණ-ආස්වාදාදීනව-ආස්වාද-නිඃශරණ - ආදීනවනිඃශරණ - ආස්වාදාදීනවනිඃශරණ - යි සත් වැදැරුම් ය. **''අස්සාදෙ ආදීනවො නිස්සරණං අස්සාදෙ ච ආදීනවො ච අස්සාදෙ ච නිස්සරණං ච ආදීනවො ච නිස්සරණං ච අස්සාදෙ ච ආදීනවො ච නිස්සරණං චාති එතෙ සත්ත පට්ඨානනයා''** යනු එහිලා ආයේ ය.

රූපශබ්දාදිවස්තුකාමයන්ගේ ඇසුරෙන් හටගන්නා වූ ක්ලෙශ කාමයෙන් සිත්හි නගින සොම්නස ආස්වාදය යි. **''අස්සාද-යතී ති = අස්සාදෙ. සුඛං සොමනස්සං ච''** යනු නිරුක්තියි. තවද පංච උපාදාන ස්කන්ධයන් නිසා උපදනා සැප සොම්නස ආස්වාදය යි. **''යං භික්ඛවෙ! පංචුපාදානක්ඛන්ධෙ පටිච්ච උප්ප-ජ්ජති සුඛං සොමනස්සං, අයං පංචසු උපාදානක්ඛන්ධෙසු අස්සාදෙ''** යනු ආගම ය. ඉෂ්ටාලම්බනය ගැණ ද කිය යුත්තේ මෙසේ ය. රූපාලම්බනයෙහි රස විඳ ගැණුමෙන් ඒ අරබයා රාගය උපදනේ ය. ඒ ආස්වාදය යි. තෘෂ්ණාව ද ආස්වාද නම්.

''අස්සාදෙති එතායාති = අස්සාදෙ'' යනු අර්ථසමර්ථන ය යි. තෘෂ්ණාව නිසා සත්ත්වයා සුඛයත් සුඛාලම්බනයත් ආස්වාදය කරණ බැවිනි එසේ කියනු. සිවු වැදැරුම් විපල්ලාසයෝ ද ආස්වාද නම් වෙත්.

ඒ මේ ආස්වාද නම් වූ කාමයන්හි රසවිඳ ගැණීම පමණක් කරුණු කොට මුල් කොට කරණ දෙශනාව ආස්වාද පූර්වක දෙශනා බැවින් එබඳු දෙශනා මාත්‍රයකින් ශ්‍රාවකයන්ට සසරින් ගැලවී යෑමෙහි අදහසෙක් නූපදනේ ය. එහෙයින් මේ පළමුවන ප්‍රස්ථානය හික්ම විය යුතු සත්ත්වයන්ට හිත පිණිස නො වන්-නේ ය.

ත්‍රෛභූමක සංස්කාරයන්හි පවත්නා දෝෂය ආදීනවය යි. **"ආදීනං අතිවිය කපණං වාති පවත්තතීති = ආදීනවො"** කෘපණ මනුෂ්‍යයකු වැනි බැවින් ත්‍රෛභූමකසංස්කාර අනිත්‍යාදි ස්වභාව හෙයින් ආදීනව නම්. පංච උපාදානස්කන්ධයෝ අනිත්‍ය වෙත්. දුක් වෙත්. පෙරළෙන එක් හැටියෙන් නො පවතින ස්වභාවයෙන් යුක්ත වෙත්. පංච උපාදානස්කන්ධයන්හි වූ මේ අනිත්‍යාදිස්වභාවය ආදීනව නම් වේ. **"යං භික්ඛවෙ! පංචුපාදානක්ඛන්ධා අනිච්චා දුක්ඛා විපරිනාම ධම්මා, අයං පංචසු උපාදානක්ඛන්ධෙසු ආදීනවො"** යනු දෙශනා ය.

ඒ මේ ආදීනව නම් වූ සංස්කාරධර්මයන්හි වූ දෝෂය පමණක් ගෙණ කරණ දෙශනාව ආදීනවපූර්වකදෙශනා බැවින් එබඳු දෙශනා මාත්‍රයෙකින් ශ්‍රාවකයන්ට සසරින් නික්ම යෑමෙහි අදහසෙක් නූපදනේ ය එ ද භික්ම විය යුතු සත්ත්වයන්ට හිත පිණිස නො වන්නේ ය.

ආර්‍යමාර්ගය හෝ නිර්වාණය නිඃශරණය යි. **"නිස්සරති එතෙනාති = නිස්සරණං, අරියමග්ගො නිස්සරතීති වා = නිස්සරණං, නිබ්බාණං"** ආර්‍යමාර්ග සඞ්ඛ්‍යාත නිඃශරණය, සතිපට්ඨානා දී වූ සත්තිස් බෝ පැකිදහම් වසයෙන් හා එහි ඇතුළත් කායානුපස්සනාදීන්ගේ වසයෙන් ද විභාගයට ගියේ ය. නිෂ්පර්‍යය වශයෙන් භෙදයක් නැතත් නිර්වාණ සඞ්ඛ්‍යාත නිඃශරණය, සොපාදිසෙස - අනුපාදිසෙස භෙදයෙන් හා ද්වාරආරම්මණ - විඤ්ඤාණ-ඵස්ස-වෙදනා-සඤ්ඤා-චෙතනා-තණ්හා-විතක්ක-විචාර ධාතු-කසිණායතන-අසුභ-ද්වත්තිංසාකාර-ඛන්ධ-ආයතන-අට්ඨාරසධාතු - තිභව-ඣාන - අප්පමඤ්ඤා - ආරුප්ප - ද්වාදසපටිච්ච-සමුප්පාදඞ්ග යනාදී වූ සඞ්ඛතධර්මයන්ගේ නිඃශරණයෙන් විභාගයට යන්නේ ය.

සසරින් නිදහස් වීමට ඉවහල් වූ ආර්‍යමාර්ගපූර්වකදෙශනාව නිඃශරණපූර්වකදෙශනා බැවින් එය සසරින් නික්ම යන්නන්ට හිත පිණිස වන්නේ ය.

ආස්වාද-ආදීනව දෙක පෙරටු කර ගත් දෙශනාව ආස්වාදාදීනවපූර්වක බැවින් එ ද භික්ම විය යුත්තන් භික්මවීමට ප්‍රමාණවත් නො වේ.

කාමයන්ගේ රස විඳ ගැණීම පළමු කොට කියා අනතුරුව එහි දොස් නො කියා මිදීම කියන දෙශනාව ආස්වාද-නිඃශරණ දෙකින් පමණක් මිශ්‍ර වූ බැවින් සත්ත්වයන් භික්ම වන්නට එ ද නො සුදුසු ය. ආදීනව නො දැක්වීම නිඃශරණයට උපාය නො වන බැවිනි.

ආස්වාදය නොකියා ආදීනව-නිඃශරණ දෙක පමණක් වුවත් කීම හික්ම විය යුත්තන් හික්මවීමට ප්‍රමාණ බැවින් ආදීනව-නිඃශරණ පූජික දෙශනාව සාර්ථක වේ.

කාමයන්හි රසවිදුම එහි දෙෂය ඉන් නික්මීම ගෙණ හැර දක්වන්නා වූ දෙශනාව ආස්වාදාදීනවනිඃශරණපූජිකදෙශනා ය. එ ද සත්ත්වයන්ට හිත වේ.

මෙහි කොටින් කියූ මේ පධ්‍යානයන්ගේ වහළින් ධර්මාවබෝධය ලබන්නා වූ පුද්ගලයෝ ප්‍රධාන විසින් තිදෙනෙක් වෙත්. අප්‍රධාන විසින් එකෙක් වේ. උද්ඝටිතඥ – විපචිතඥ – ඥෙය්‍ය යන තිදෙන ප්‍රධාන වෙත්. පදපරම තෙමේ අප්‍රධාන වේ

එහි යමක්හට උදෙසූ ඇසිල්ලෙහි ධර්මාවබෝධය වේ නම් හේ උද්ඝටිතඥ ය. මේ තෙමේ මෙහි තෙවන පධ්‍යානයෙන් සසර ගැට බිඳ හැර, සසරින් නික්ම යෙයි. එහෙයින් මොහුට නිඃශරණදෙශනාව ඒ පිණිස වන්නේ ය. **"කතමෝ ච පුග්ගලෝ උග්ඝටිතඤ්ඤූ? යස්ස පුග්ගලස්ස සහ උදහටවේලාය ධම්මාභි සමයෝ හොති, අයං වුච්චති පුග්ගලෝ උග්ඝටිතඤ්ඤූ"** යනු එහි ආගමකථා ය. අර්ථසම්වර්ණනය මෙසේ දන්නේ ය. **උග්ඝටිතං ඝටිතමත්තං උද්ධිටඨමත්තං ජානාතීති=උග්ඝටිතඤ්ඤූ, උග්ඝටිතං උච්චලිතං ජානාතීති=උග්ඝටිතඤ්ඤූ, උග්ඝටිතෝ චලිතමත්තෙ ආසයෙ ධම්මං ජානාති අවබුජ්ඣතීති = උග්ඝටිතඤ්ඤූ"** යි.

යමක්හට සැකෙවින් කියූ දහම්, විස්තර විසින් බෙදා දක්වන කල්හි ධර්මාවබෝධය වේ නම් හේ විපචිතඥ ය. මේ තෙමේ මෙහි සවන පධ්‍යානයෙන් සසර ගැට බිඳ හැර සසරින් නික්ම යෙයි. එහෙයින් මොහුට ආදීනවනිඃශරණපූජිකදෙශනාව ඒ පිණිස වන්නේ ය. **"කතමෝ ච පුග්ගලෝ විපචිතඤ්ඤූ?, යස්ස පුග්ගලස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථෙ විභජීයමානෙ ධම්මාභිසමයෝ හොති, අයං වුච්චති පුග්ගලෝ විපචිතඤ්ඤූ"** යි එහි ආගමකථා ය. අර්ථසම්වර්ණනය මෙසේ දන්නේ ය. **"විපඤ්චිතං විත්ථාරිතං නිද්දිටඨං ජානාතීති = විපචිතඤ්ඤූ, විපඤ්චිතං වා මන්දං සණිකං ධම්මං ජානාතීති = විපචිතඤ්ඤූ"** යි.

යමක්හට උද්දෙස-පරිපුච්ඡා-යොනිසොමනසිකාර-කල්‍යාණ-මිත්තසෙවන යනාදිය නිසා පිළිවෙළින් ධර්මාවබෝධය වේ නම්, හේ ඥෙය්‍ය ය. මෙ තෙමේ මෙහි සත්වන පධ්‍යානයෙන් සසර

ගැට බිඳ හැර සසරින් නික්ම යෙයි. එහෙයින් මොහුට ආස්වාදීනවනිඃශරණපූර්වකදෙශනාව ඒ පිණිස වන්නේ ය. **"කතමො ච පුග්ගලො නෙය්‍යො? යස්ස පුග්ගලස්ස උද්දෙසතො පරිපුච්ඡතො යොනිසො මනසිකරොතො කල්‍යාණමිත්තෙ සෙවතො භජතො පයිරුපාසතො අනුපුබ්බෙන ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො නෙය්‍යො"** යනු එහි ආගමකථාය. අර්ථසමර්ථනය මෙසේ දන්නේ ය. **"නෙතබ්බො ධම්මස්ස පටිනිද්දෙසෙන අත්ථං පාපෙතබ්බොති = නෙය්‍යො"** යි.

බණදහමට කොතෙක් කන් නතු කළ ද මෙලොව දී ආර්‍ය්‍යමාර්ගීය නො ලබනුයේ පදපරම ය. පදපරමයාගේ වශයෙන් පැවැති සංකිලෙසභාගීය වූ හෝ වාසනාභාගීය වූ හෝ ඒ දෙපසෙහි වූ හෝ දෙශනාවක් හෝ සූත්‍ර එකදෙශයක් හෝ ගාථාවක් හෝ මේ කියූ නයක්‍රමයන්ට උදාහරණ වශයෙන් උපුටා දක්වා ද එකල්හි සත්වැදැරුම් පර්‍යානය ම ගැණුනේ වන්නේ ය. පදපරම, හුදු ආස්වාදපූර්වකදෙශනාවෙන් ද සතුටු වෙයි. ඇතැම් විට ආදීනවපූර්වකදෙශනාවෙන් ද සතුටු වෙයි. ආස්වාද-ආදීනව පූර්වකදෙශනාවෙන් ද සතුටු වෙයි. ආස්වාද-නිඃශරණ පූර්වකදෙශනාව ද පදපරමයාගේ පැහැදීමට කරුණු වෙයි.

මැනැවින් පරමාර්ථධර්මවිභාගය උගෙණ මේ කියූ සත්වැදැරුම් පර්‍යානය ලෙසින් දහම් දෙසනුයේ නියම ධර්මදෙශක තෙමේය. නියම ධර්මදෙශකයකු වීම නො පහසු ය. එහෙයින් බණ දෙසුම ද නො පහසු ය. **"පරෙසං බො පන ආනන්ද! ධම්මදෙසනා න සුකරා"** = යන බුද්ධ වචනයෙන් එය පැහැදිලි වේ.

නගරවර්ණනා රාජවර්ණනා සත්‍ය්‍යාවර්ණනා සත්‍රීවර්ණනා ආදිය කියන යන හැටි ඉඳින හැටි නිදන හැටි කන හැටි බොන හැටි බඳින හැටි ගේ හදන හැටි වතුවවන හැටි මුදල් සපයන හැටි කියන දෙසන දෙශකයා නියම ධර්මදෙශකයෙක් නො වේ. ඔහු සාමාන්‍ය කථිකයෙකි. දෙශකයෙකි. ඔහුගෙන් පරමාර්ථය පිළිබඳ කිසිත් අසා ගත නො හැකි ය. ඔහු ඒ නො දනියි. ඔහු කියනුයේ දෙසනුයේ රටේ තොරතුරු ගමේ තොරතුරු ගෙදර තොරතුරු පවුලේ තොරතුරු ය. එහෙයින් නියම ධර්මදෙශකයකු ලැබීම එදා ද අපහසු ය. අද එදාට ද වඩා අපහසු ය. එහෙයිනි වදාළෝ **"කිච්ඡං සද්ධම්ම සවණං"** යනු.

කිච්ඡො බුද්ධානං උප්පාදො = බුදුවරුන්ගේ ඉපැත්ම දුර්ලභ ය.

බුදුබව පිළිබඳ මුල් පැතුම මනුෂ්‍යජාති ඇති පුරුෂයකු ව රහත්වීමෙහි හෙතු ඇත්තකු ව බුදුවරයකු ඉදිරියෙහි සිට පැවිදි ව පංචාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගෙණ බුදුනට දිවි පුදා බුදුබව ලැබීමෙහි ආශා ඇත්තකු ව සිට කළ යුතු ය. එක් අත්බවකදී ම මේ අටගුණයෙන් යුක්තවූවකු කරණ බුදුබවපැතුම ම සමෘද්ධි වන්නේ ය. මේ අටඟින් යුක්තවූවහු විසිනුදු බුදුබව පැතීම මහත් උත්සාහයෙන් යෙදී කළ යුතු ය. මෙය පහසු නො වේ. කවදා නමුත් කිසිවකු නමුත් මේ අටඟින් යුක්ත ව මුල් පැතුම කළ ද ඉන් පසු බුදුබව පිණිස පිරිය යුතු වූ දසපෙරුම්දම් පිරුම පහසු නො වේ. ධර්ම විසින් ඒ නො පහසු ය. කාල විසින් ඒ නො පහසු ය. ධර්ම විසින් මහත් ය. කාල විසින් දීර්ඝ ය. මෙසේ නියත විවරණ ලැබූ මහාබෝධිසත්ත්වයකු ලැබීම කප් කෙළ සුවහස් ගණනකිනුත් නො සිදු වන බැවින් බුදුවරුන් ලෝ පහළවීම ඉතා දුර්ලභය යි වදාළ සේක. **"මහතොනත පන වායාමෙන අභිනීහාරස්ස සම්පජ්ජනතෝ සම්දඛාභිනීහාරස්ස ච අනෙකෙහිපි කප්පකොටිසහස්සෙහි දුල්ලභුප්පාදතෝ බුද්ධානං උප්පාදෙපි කිච්ඡායෙව, අතිවියදුල්ලභෝ"** යනු අටුවා ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි අසුසාරදහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. නාරජ ද නිරිසන් ව නො සිටියේ එදා ම සෝවන් වන්නේ ය. නාගයෝ පිළිසිඳ ගැණීම සැවදාමීම නිදීම මෙවුන්දම් සෙවීම මැරීම යන පස්වැදෑරුම් කරුණෙහිලා වෙහෙසෙත්. එහෙත් මෙතෙමේ මේ කරුණුවල වෙහෙසට නො පත්ව මාණවකවෙශය ගෙණ හැසුරුනේ ය.

එරකපත්‍රනාගරාජවස්තුව නිමි.

ආනන්ද මහාතෙරුන් ඇසූ ප්‍රශ්නයෙක්

14 — 4

දවසක් ආනන්දස්ථවිරයන් වහන්සේ දවල එකලා ව "අපගේ බුදුරජාණන් වහන්සේ විපස්සී ආදීවූ බුදුරජුන් සත් නමකගේ මවු පියන් ගැණ ආයුෂ ගැණ බෝරුක් ගැණ ශ්‍රාවක රැස්වීම් ගැණ කරුණු වදුලෝ නමුත්, ඒ බුදුරජුන්ගේ පොහොය කිරීම් ගැණ කිසිත් නො වදුළ සේක, ඒ බුදුරජුන්ගේ පොහොය කිරීම අප බුදුරජුන්ගේ පොහොය කිරීමට වඩා වෙනස් ද? නැත, සම දැ" යි සිතා බුදුරජුන් වෙත ගොස් එය ඇසූහ. උන්වහන්සේ "විපස්සී බුදුරජාණන් වහන්සේ සත් අවුරුද්දකට වරක් පොහොය කරණ සේක, එය සත් අවුරුද්දට ම අවවාද වසයෙන් ප්‍රමාණවත් වේ, සිබී බුදුරජහු හා වෙස්සභූ බුදුරජහු සැවුරුද්දකට වරක් පොහොය කරණ සේක, පොහොය කරණද, උන්වහන්සේලා කරණ ඒ අවවාදය සැවුරුද්දට ම ප්‍රමාණවත් ව සිටියේ ය, කකුසඳ කොණාගමන බුදුරජහු අවුරුද්දට එක් දවසක් පොහොය කරණ සේක, එය ඒ අවුරුද්දට ම සැහී සිටියි, කසුප් බුදුරජුන්ගේ පොහොය කිරීම සමසකට එක් වරක් ම වේ, එදා කළ ඒ පොහොය සමසෙහි ම ක්‍රියාතමක වේ, මෙසේ ඒ ඒ බුදුරජුන්ගේ පොහොය කිරීමෙහි කාලය පිළිබඳ වෙනස මුත් පොහොය කිරීමෙහි වෙනසෙක් නැතැ" යි වදාරා මේ ගාථාවන් වදුළ සේක.

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා,
සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං.

ඛන්තීපරමං තපෝ තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා,
න හි පබ්බජිතෝ පරූපඝාති
සමණෝ හොති පරං විහෙඨයන්තෝ.

අනූපවාදෝ අනූපඝාතෝ පාතිමොක්ඛෙ ච සංවරෝ,
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තංච සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගෝ එතං බුද්ධාන සාසනන්ති.

සියලු පව් නො කිරීම කුසල් ඉපදවීම වැඩීම සිය සිත පිරිසිදු කිරීම පව් නො කිරීම යන මෙය බුදුරජුන්ගේ අනුශාසනා ය.

ඉවසීම නැමැති ක්ෂාන්තිය උතුම් තපසෙකි. බුදුරජහු නිවන උතුමැයි කියත්. අනුන් පෙළනුයේ පැවිද්දෙක් නො වේ. අනුන් වෙහෙසන්නේ මහණෙක් නො වේ.

උපවාද නො කිරීම හිංසා නො කිරීම ප්‍රාතිමොක්ෂශීලයෙහි සංවරය අහරෙහි පමණ දැනීම ගමට දුර වන සෙනසුනෙහි ඇලීම අට සමවත්හි නිති යෙදීම යන මේ සියල්ල බුදුරජුන්ගේ අනුශාසනා ය.

සබ්බපාපස්ස අකරණං = සියලු පව් නො කිරීම.

කාය වාක් දෙ දෙර පහළ වන හටගැණෙන පව් නො කොට හැරීම මෙයින් අදහස් කරණ ලද්දේ ය. ඒ නම් ආභිසමාචාරික ආදිබ්‍රහ්මචරියක වශයෙන් දෙපරිදි වූ ප්‍රාතිමොක්ෂසංවර-ඉන්ද්‍රිය සංවර-ආජීවපාරිශුද්ධි-ප්‍රත්‍යය සන්තිශ්‍රිත යන චතුපාරිසුද්ධි සීලය රැකුම ය. සීල සංවරයෙන් සියලු පව් දුරුකිරීම මෙයින් වදාළ සේක. දැක්වුනු තාක් සිල් '**සබ්බපාපස්ස අකරණං**' යන මෙහි ඇතුළත් ය. කාය වාක් දෙ දෙරෙහි පිරිසිදුබව මින් දන්නේ ය. ශීලකථාව කියන ලදී. ඒ බලන්නේ ය.

කුසලස්ස උපසම්පදා = කුසල් ඉපදවීම වැඩීම.

ලෞකික-ලොකොත්තර-ශමථ-විදර්ශනා වශයෙන් පැමිණිය යුතු ලැබිය යුතු කාමාවචරාදී වූ සිවුබිම පිළිබඳ කුසල් ඉපද වීම හා ඉපද වූ කුසල් වැඩීම මින් ගැණේ. ශමථ විදර්ශනාවන් ගෙන් ලැබිය යුත්තේ සමාධිය යි. ඒ සමාධිප්‍රතිලාභය '**කුසලස්ස උපසම්පදා**' නම්. "**උපසම්පදා ති අභිනික්ඛමනතො පට්ඨාය යාව අරහත්තමග්ගා කුසලස්ස උප්පාදක්ඛෙව උප්පාදිතස්ස ච භාවනා**" යනු අටුවා. සමථනම්, අෂ්ටසමාපත්තීන්හි වූ සිතේ එකඟ බවය. එය විදර්ශනා පාදක කොට සිටියේ ය. විදර්ශනා නම්, අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා-අනත්තානුපස්සනා-නිබ්බිදානුපස්සනා-විරාගානුපස්සනා-නිරොධානුපස්සනා-පටිනිස්සග්ගානුපස්සනා යන සත් වැදැරුම් අනුපස්සනා ය.

සචිත්තපරියොදපනං = සිය සිත පරිසිදු කිරීම.

සිත පිරිසිදු කිරීම නම්, පංච නීවරණධර්මයන්ගෙන් සිත නිදහස් කොට ගැණීම ය. පංචනීවරණ නැති කිරීමෙන් සිත පිරිසිදු වේ. ශමථ විදර්ශනා මාර්ගඵලාවබොධයෙන් ලැබෙන ප්‍රඥාවෙන් පංච නීවරණයන්ගේ නැසීම සිදු වේ. ශමථ විදර්ශනාමාර්ග ඵලාවබොධයක් නැති ව නීවරණයන්ගේ නැසීමෙක් නො වන්නේ ය. කෙලෙස් නසා රහත්පලයට පැමිණීම මෙයින් වදාරණ ලද ය. "**සචිත්තපරියොදපනන්ති නීවරණෙහි අත්තනො චිත්තස්ස වොදපනං**" යනු අටුවා.

සීල බලයෙන් කය-වචන දෙකින් සිදු වන පව් නසා හෙවත් මැනැවින් සිල් රැක, ශමථ-විදර්ශනා බලයෙන් චාතුර්භූමික කුශලයන් උපදවා වඩා රහත්පලයට පැමිණ සිත පිරිසිදු කළ යුතු ය, යනු මේ ගාථාවේ ප්‍රථම-ද්විතීය-තෘතීය පාදයන්ගෙන් ලැබෙන අර්ථය යි. ශීල-සමාධි-ප්‍රඥා ශික්ෂාත්‍රය ය මෙයින් කිය වේ.

එකං බුද්ධාන සාසනං = මේය බුදුවරුන්ගේ අනුශාසනා.

ගිහි‍ම් පිය හැකි ජනයන්ට නිවන් මග පෙන්වා ඔවුන් එහි ගමන් කරවනු පිණිස දෙසූ දෙශනාමාර්ගීය වදුළ ධර්මමාර්ගීය අවවාදය අනුශාසනා නම්. ශාසනඃශාසන-සුගතොවාද-සඳ්ධර්ම්-බ්‍රහ්මචර්‍ය්‍ය යන නම් ද මේ සඳහා යෙදේ.

ඛන්තී පරමං තපෝ තිතික්ඛා = ඉවසීම නම් වූ ක්ෂාන්තිය උතුම්-තපයෙකි.

"ඛන්තී නි යා එසා තිතික්ඛා සඞ්ඛාතා ඛන්ති නාම, ඉදං ඉමස්මිං සාසනෙ පරමං උත්තමං තපෝ" තිතික්ඛා යන නමින් කියන යම් මේ ඉවසීමෙක් වේ ද මේ ය මේ ශාසනයෙහි උතුම් තපස, යනු අටුවා.

ඉවසීම නම් වූ ක්ෂාන්තිය, අධිවාසනාක්ෂාන්ති-ධර්මනිධ්‍යානක්ෂාන්ති' යි දෙපරිදි ය. පරාවිසින් කියන කරණ තමාට නුරුස්නා දෙය ඉවසීම අධිවාසනාක්ෂාන්ති නම්. ප්‍රතිපදඥානදර්ශනවිශුද්ධි කාලයෙහි සංස්කාරධර්මයන් පිළිබඳ අනිත්‍යාදිස්වභාවධර්මයන් ඇති සැටියෙන් දැන ගැණීමෙන් සංස්කාරධර්මයන් අරමුණු කොට උපදනා විදර්ශනාඥානය ධර්මනිධ්‍යානක්ෂාන්ති නම් වේ. මෙහි අභිමත අධිවාසනාක්ෂාන්ති ය යි. කොටින් කියතොත් ඉවසීම් යි කිය යුතු යි.

"තඤ්ච කතමා ඛන්ති? ඛමනතා අධිවාසනතා අවණ්ඩිකතං අඤ්ඤරොසපෝ අත්තමනතා" යනු එය පැහැදිලි කළ සැටි යි. මේ හැම පදයකින් අධිවාසනා ක්ෂාන්තිය කිය වේ. අනුන් විසින් කරණ කියන නුරුස්නා දෙයට එකට එක නොකොට පළි නොගෙණ ඒ හැම එකක් තමන් පිටට ගෙණ විසීම ඇණුම් බැණුම් ආදියෙන් අනුන්ගේ ඇස්හි කඳුලු නොඋපදවා නොකිපී විසීම හැම එකක් කෙරෙහි වෙර නැති ව සතුටු සිතින් යුක්ත ව විසීම ඉවසීමය යි ඒ පද සමූහයෙන් වඩ වඩාත් පැහැදිලි කළහ.

"ඛමතීති = ඛන්ති, ඛමනං = ඛන්ති" යනු විවරණ යි. ඉවසානු යි **ඛන්ති** නම්. ඉවසීම **ඛන්ති** නම් වා. පාරමීභාවයට යන්නී ද මෝ ය. ඉවසීම මෙහි ලක්ෂණ ය. හොඳ නොහොඳ

දරා ගැණීම මෙසින් කෙරෙන්නේ ය. අවිරුද්ධභාවය මෙහි වැටහීම ය. ආසන්නය ඇති සැටි දැකීම ය. ඇති සැටි දකින්නාහට ඉවසිය හැකි ය. ඉවසීමෙන් කෙරෙණුයේ හැම හොඳ නො හොඳක්ම තමන් පිට නගා ගැණීම ය. වීර්‍යය නිසා මෙය සිදු වන්නේ ය. වීර්‍යය ඇත්තහුට ඒ ඒ සත්ත්වයන්ගෙන් හා අවු සුළං ආදියෙන් සිදු වන හැම ගැහටක් ඉවසිය හැකි ය. වීර්‍යය ඇත්තහුට ඉවසීම අවශ්‍යයෙන් තිබිය යුතු ය. වීර්‍යවත්හුගේ ඉවසීම ම ප්‍රශස්ත ය. උසස් ය: යම් යම් දුබල කම් නිසා කෙරෙණ ඉවසීම නියම ඉවසීමෙක් නො වේ. එය බැරි කම් නිසා නො සිතා නො බලා කෙරෙන්නේ ය. බලවත්හුගේ ඉවසීමය ඉවසීම.

"යො හවෙ බලවා සන්තො දුබ්බලස්ස තිතික්ඛති'
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලෝ"

යනු දන්නේ ය.

"සොරෙක් වෙහි, මෝඩයෙක් වෙහි, ඔවුවෙක් වෙහි, ගොනෙක් වෙහි, කොටළුවෙක් වෙහි, තිරිසනෙක් වෙහි, නැත කට සුගතියෙක්, තා දුගතිය ම කැමැති විය යුතුය"යනාදීන් දශ අක්‍රොශ වස්තූන්ගෙන් ආක්‍රොශ කරණවිට හා අවු සුළං මැසි මදුරු සප් සෘපවස් ආදියෙන් උපදනා දුක්ඛවෙදනා පැමිණිවිට හා ඉවසනු ද උතුමන්ගේ සුභාව ය යි.

මේ එක් උතුමකු ඉවසූ සැටි:- **ලොමසනාග** මහාතෙරණුවෝ **සැගිරියෙහි පියඟු** ගුහාවෙහි පධානඝරයෙහි වැඩ වසන සේක් නවම් මැදින් දෙමස අතර හිම වැටෙන අට දවසෙහි ලොකන්තරික නරකය සිහි කොට කමටහන් නො හැර එලිමහනෙහි කල් ගෙවූහ. එසේ ම උන්වහන්සේ දැඩි වූ උෂ්ණයද ඉවසූහ. ඝම්කාලයෙහි බතින් පසු කමටහන් මෙනෙහි කරමින් සක්මන් කළහ. එ වේලෙහි උන්වහන්සේගේ කිහිලිවලින් ඔහ ගලන්නට වන. ඒ දුටු අත වැස්සකු "සාමීනි! මෙහි හිදිනු මැනැව, මෙතැන සිහිල්"සි දැන් වූ කල්හි ද අවිචිමහානරකය ගැණ සිහි කොට එහි ම හුන්හ.

මේ තවත් උතුමකු ඉවසූ සැටි:- දවසක් **පධානිය** මහාතෙරණුවෝ **බණ්ඩවෙල** විහාරයෙහි පධානඝරයෙහි ආයුෂ්මංශ ප්‍රතිපදාව අසමින් හුන්හ. එ වේලෙහි ඝොරවිෂ ඇති සර්පයකු විසින් දෂ්ටකරණු ලැබූ උන්වහන්සේ එ බව දැන පහන් සිත් ඇති ව ම බණ ඇසූහ. විෂවෙගය කද ව ගියේය. ඒ අතර උපසම්පදා වූ කැන් පටන් තම සීලය ගැණ සලකා බැලූ උන්වහන්සේට

තමන්ගේ සීලයෙහි කිසිත් කිලිටෙක් නැතැ' යි දැනීමෙන් මහත් ප්‍රීතියෙක් උපන. ඒ හා ම ඇඟදැවෙමින් තුබූ ඒ විෂවෙගය පොළොවට බැස ගියේ ය. එහිදී ම උන්වහසේ රහත් වූහ.

මේ තවත් උතුමෙකු ඉවසූ සැටි:- එක් පිණ්ඩපාතික තෙර කෙනකුන් වහන්සේ **ගවරවාල අඞ්ගන** විහාරයෙහි රැ බණ අසමින් හුන්හ. එ වේලෙහි උන්වහන්සේගේ කෙණ්ඩාමස පොළඟකු විසින් අඬුවකින් ගණු ලබන්නා සේ ඩැහ ගණු ලැබී ය. උන්වහන්සේ බණට අන්තරායයක් නො කොට පොළඟා අල්ලා ඵවිකයෙහි බහා විෂවෙගය ඉවසා බණ ඇසූහ. එලිවන යාමයෙහි විෂබැසීම ස්‍රොතාපත්ති ආදී ත්‍රිවිධ මාර්ගඵලයන්ට පැමිණීම බණ හමාර කිරීම යන මේ තුණ එක විට ම සිදු විය. අනතුරු ව උන්වහන්සේ පොළඟා මුදා හළහ.

මේ තවත් උතුමෙකු ඉවසූ සැටි:- දවසක් ආර්‍ය්‍යවංශප්‍රතිපදාව පිළිබඳ ධර්මදෙශනා කරමින් හුන් **දීඝභාණක අභය** ස්ථවිරයන් වහන්සේට මහාලාභසත්කාර උපන. එහි සිටි අන් තෙර නමක් ඒ දැක ඉවසනු නො හැකි ව ඇණුම් බැණුම් කරන්නට විය. දවසක් මේ දෙදෙනා වහන්සේ එක් ව මගට බැස ගියහ. ඒ යන අතර ගව්වක් දිගට ම අභය තෙරුන්ට මේ අනෙක් ස්ථවිරයන් වහන්සේ ඇණුම් බැණුම් කළහ. එහෙත් අභය තෙරණුවෝ ඒ කිසිවකින් කොපයට නො පැමිණියහ. ඒ සියලු ගැරහුම් ඉවසූහ.

මේ තවත් උතුමෙකු ඉවසූ සැටි:- සිතුල්පවු වෙහෙර වැසි **පධානිය** තෙරුන්ට රැ භාවනාවෙහි යෙදී සිටියදී උදරවාතයෙක් හට ගැණුනේ ය. රැ නිදි වැරීමෙන් නැගුනු වාතකොපය ඉවසනු නො හැකි ව එහාට මෙහාට පෙරළෙමින් හුන් උන්වහන්සේ දුටු අන් තෙර නමක් "ඇවත! පැවිද්දා නම් ඉවසන්නකු විය යුතු ය" යි කී කල්හි පධානිය තෙරණුවෝ සියලු වාත වෙදනාවන් මැඩ නිසල ව හොත්හ. බලවත් ව නැගී සිටි වාතය නැබ පටන් පසුව තෙක් පැතිර ලය පළාගෙණ යන සේ පැවැත්තේ ය. ස්ථවිරයන් වහන්සේ වෙදනා මැඩ විදසුන් වඩා අනගැමිපලයට පැමිණ පිරිනිවියාහ.

මෙහි මෙසේ ඉතා සැකෙවින් කියූ අධිවාසනාක්ෂාන්තිය හෙවත් ඉවසීම කුදු මහත් හැම සැපතක් සිදු කරණ බව මේ කියූ කෙටි කතාවන්ගෙන් පැහැදිලි ය. එහෙයින් ක්ෂාන්තිය මඞ්ගල නම් ද වේ.

"කොධං වධිත්වා න කදාචි සොචති
මක්ඛපහානං ඉසයෝ වණ්ණයන්ති,
සබ්බසං වුත්තං ඵරුසං ඛමෙථ
එතං ඛන්තිං උත්තමමාහු සන්තෝ.

භයානි සෙට්ඨස්ස වචෝ ඛමෙථ
සාරම්භහෙතු පන සාදිසස්ස,
යෝ චිධ හීනස්ස වචෝ ඛමෙථ
එතං ඛන්තිං උත්තමමාහු සන්තෝ"

යනු සරභඞ්ග තාපසයන් සක්දෙව්රජහට කළ එක් ධර්ම දෙශනා වකි. "ක්‍රොධය නැසීම් හෙතුවෙන් කවදුත් ශොක නො කර යි, ඍෂීහු අනුන්ගේ ගුණ මකා දැම්මෙන් තොරවීම, අකෘතඥතා යි කියන මක්ඛය පහකිරීම උසස් සේ වණිනා කෙරෙත්, සියල්ලන් කියූ පරුෂ වචන මිනී මරු වචන ඉවසිය යුතු ය, සත්පුරුෂයෝ පැරණි පඬිවරු මේ ඉවසීම උතුම් යැ යි කියත්,

භය හෙතුවෙන් ශ්‍රෙෂ්ඨයා කියන වදන් ඉවසන්නේ ය, එකට එක කිරීම නිසා සමානයා කියන වදන් ඉවසන්නේ ය. මේ මිනිස් ගණයෙහි යමෙක් ජාතිශ්‍රොත්‍රාදියෙන් තමාට වඩා ලාමකයකු පහත් තැන සිටියකු කියන වචන ඉවසා නම්, මේ ඉවසීම උතුම්, යි සත්පුරුෂයෝ කියත්,, යනු අරුත්.

පෙර එක් කලෙක දෙවියන් හා අසුරයන් අතර යුද්ධයෙක් හට ගැණුනේ ය. එහි දී දෙවියන්ට ජය අත් විය. දෙවියෝ අසුර සෙනාධිපති වූ වෙපචිත්තී අසුරයා බැඳ සක්දෙව්රජ වෙත ගෙණ ගියහ. ඒ වේලෙහි ඔහු සක්දෙව්රජුට "තෝ හොරෙක් වෙහි, මෝඩයෙක් වෙහි" යන ආදී ලෙසින් ආක්‍රොශ කරමින් "ජර සක්‍ක! තෝ හැමදා දිනන්නෙහි, යම් දවසෙක අපටත් දිනීමෙක් වී නම් එදාට තා බැඳ අසුරභවනයෙහි දෙරටුව වෙත් නිදි කරවා තළ වන්නෙමි" යන ආදී කියමින් ගැරහී ය. සක්දෙව්රජ තෙමේ ඒ කිසිත් ගණනකට නො ගත්තේ ය. එවිට මාතලී රියැදුරු "මෙතෙමේ මේ ආණුම් බැණුම්වලට පළි නො ගෙණ සිටිනුයේ අසුරයනට බිය නිසා ද, නැත, දුබලකම් නිසා ද නැත, ඉවසීම නිසා දැයි සිතා සක්දෙව්රජු වෙත ගොස් ඒ ආදී ය. එකල සක්දෙව් තෙමේ "නාහං භයා න දුබ්බල්‍යා ඛමාමි" මම බියෙන් නො ඉවසම්, දුබල කම නිසා නො ඉවසම්' යි කියා මෙසේ ද කී ය.

"සදත්ථපරමා අත්ථා ඛන්ත්‍යා භියෝ න විජ්ජති,
යෝ හවේ බලවා සන්තෝ දුබ්බලස්ස තිතික්ඛති,
තමාහු පරමං ඛන්තිං නිච්චං ඛමති දුබ්බලෝ" යි.

සියලු දේ තමන්ගේ ප්‍රයෝජනය පිණිස පවතී. තමන්ගේ ප්‍රයෝජනය පිණිස පවත්නා ඒ දේ අතුරෙහි ඉවසීම තරම්, ඉවසීමට වඩා උසස් වූ ගුණයෙක් බලයෙක් නැත. යමෙක් බලවත් ව සිට අබලයන් දුබලයන් කියන කරණ හැම එකක් ඉවසා නම් ඒ මය උතුම් ඉවසීම. දුබලයා තමන්ගේ දුබලබව නිසා හැමදා ඉවසන්නේ ය.

බුදුරජානන් වහන්සේ දවසක් භික්ෂූන්ට නො ඉවසා කටයුතු කිරීමෙහි වරද දක්වනු පිණිස භික්ෂූන් ඉවසීමෙහි යොදනු පිණිස වෙදෙහිකාවසතුව දක්වා වදාළ සේක. මේ ඒ වෙදෙහිකාවසතුව:- "යටගිය දවස **සැවැත්** නුවර **වෙදෙහිකා** නම් ගැහැණිසක් වූ ය, ඕ සුරත ය, පහත් පැවැතුම් ඇත්ති ය, නිවුනිය, යි රට පුරා පැතිර ගියා ය, ඒ ගෙයි වුසු **කාළි** නම් දැස්ස 'අපගේ සවාමිදුවගේ මේ උසස් ප්‍රසිද්ධිය විමසා බලම්' යි දවසක් ඉර උදාවී බොහෝ වේලා ගිය පසු නින්දෙන් නැගී සිටියා ය, එ කල්හි වෙදෙහිකා තොමෝ 'කෙල්ල! බොහෝ වේලා නිදි ගත්තෙහි අපහසුව කිමැ?' යි ඇසූ ය, ඕ 'අපහසුවෙක් නැතැ' යි පිළිතුරු දින, එසේ නම් මෙතෙක් ඉර නගිනතුරු නිදි ගත්තෙහි කිමැ' යි දැස්සට තරවටු කළා ය, දැස්ස, සවාමිදුව වඩාලාත් විමසන්නට සිතා පසුදා වඩාත් දවල් කොට නින්දෙන් නැගී සිටියා ය, එදා ගැහැවිනී කිසිත් නො බැණ තදකොපයෙන් දෙරපොල්ල ගෙණ දැස්සගේ හිසට පහර දුන්නී ය, හිසෙන් ලේ ගලන්නට වන, ඕ ලේ ගලා වැටෙන හිසැතිව අසල ගෙවලට ගොස් 'ඔලන්න, අපගේ සවාමිදුවගේ ඉවසීමෙහි හැටි, සුරතභාවය බලන්න, මෙන්න අපගේ සවාමිදුවගේ නිවීම්' යි කියා පෑය, එයින් වෙදෙහිකාව සැඩ ය, රළු ය, දරුණු ය, නො ද ඉවසා' යි රට පුරා මහත් අපකීර්තියක් පැතිර ගියේ ය, වෙදෙහිකා පිළිබඳ ව පැතිර තුබූ කීර්තියට වඩා මේ අපකීර්තිය දෙතුන් ගුණයෙන් නැගී ගියා ය,, යනු.

පුණ්ණ සථවිරයන් වහන්සේ බුදුරජුන් ඉදිරියෙහි "**පුණ්ණා-පරන්ත** දනවුවැස්සෝ මට ආක්‍රොශ කළෝ නම්, පරිභව කළෝ නම් අතින් පයින් දඬුයෙන් මුහුරෙන් පහර දුන්නෝ නම්, කඩුයෙන් පිහියෙන් කිණිස්සෙන් හෙල්ලෙන් තෝමරයෙන් ඇන්නෝ නම්, දිවි තොර කළෝ නම්, ඒ හැම එකෙක මම කිසිත්

කතා නැති ව එකට එක නො කොට සිටිමි'' යි කී කල්හි බුදු-රජානන් වහන්සේ පුණ්ණ තෙරුන්ගේ ඉවසීමට පසසා එහි ගොස් වසන්නට පුණ්ණ තෙරුන්ට අවසර දුන් සේක.

''**පඤ්චිමෙ භික්ඛවෙ! ආනිසංසා ඛන්තියා. කතමෙ පඤ්ච? බහුනො ජනස්ස පියො හොති. මනාපො. න වෙරබහුලො හොති. න වජ්ජබහුලො හොති. අසම්මූළ්හො කාලං කරොති. කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති**'' ඉවසන්නේ දෙව්මිනිස් හැම කෙනෙක්හට ප්‍රිය වේ. හැම කෙනෙ කුන්ගේ මන වඩන්නේ වේ. ක්‍රොධ නැත්තේ වේ. සිහි ඇති ව කලුරිය කරන්නේ ය. මරණින් මතු දෙව්ලොව උපදින්නේ ය. **ඛන්තිවාදී - මහාකපි - මහිස-ධම්මපාල - රාජොවාද-ජදදන්ත-භූරිදත්ත** ජාතකාදිය බැලිය යුතු ය.

පරමං = උතුම්.

''**පරං පච්චනීකං මාරෙතීති, පකට්ඨභාවෙ රමතීති වා, පරති අත්තනො උත්තමභාවං පාලෙති පූරෙතීති වා = පරමං**'' යනු නිරුක්ති. සතුරන් නසා නුයි පරම. උසස් තැන ඇලේ නුයි පරම. තමන්ගේ උතුම්බව රකිනු යි පරම.

තපො = තපස්. කෙලෙස් තැවීම.

තප තපස් = යනු ප්‍රධාන විසින් කුශලශීලයෙහි ද අප්‍රධාන විසින් රුළහී විසින් අකුශල ශීලයෙහි ද වැටේ. ''**තපා දයො එත්ථ ඛුඛ්‍යවසෙන කුසලසීලෙ වත්තන්ති, රුළහිවසෙන අකුසල-සීලෙ**'' යනු ආචාර්‍ය්‍යවචන යි.

ආගමධර්මයෙහි ආයේ කුශලශීලයෙහි ය. කුශලශීල නම් පව් නසන කෙලෙස් මඩින ස්වභාවශක්තිය යි. ඉවසීමෙන් කෙලෙස් මැඩිය හැකි බැවින් ඉවසීම තපසැ යි වදාළ සේක. ''**කිලෙසෙ තාපෙතීති = තපො, තපො නාම පාපතාපනකො ධම්මො, පාපකෙ ධම්මෙ තපති'ති තපො** = යනු එහි නැගී සිටියේ ය.

අකුසල් සිල් ඇතියේ නිරයාදියෙහි වැටී තැවෙන්නේ ය. පැසෙන්නේ ය. අකුසල් විසින්, අකුසල් කෙළේ නිරයාදියෙහිලා තවනු ලබන්නේ ය. බැහැරියන් අත පවත්නා තපස්කම් කුසල් සිල් නො වේ. ''**නිරයාදිසු තාපෙතීති = තපො**'' යනු අකුශල ශීලයෙහි නැගී සිටියේ එහෙයිනි.

තව ද **තප** හෝ **තපස්** යනු ''**ඛන්තිපරමං තපො තිතික්ඛා**'' යි කියූ ඉවසීමෙහි ද ''**තපො කරිස්සාමි පහාය කාමෙ**'' යන මෙහි හා ''**දානං සීලං පරිච්චාගං අජ්ජවං මජ්ජවං තපං**'' යන මෙහි කියූ

පෙහෙවස් කම්හි ද **"සමණඤාණං තපෝ සුඛෝ"** යන මෙහි බුදු වදන් ඉගෙණීමෙහි ද දුහඟ පිරීමෙහි ද පැවිද්දෙහි ද ආශේය. තවද ඉන්ද්‍රියසංවරය හා වීර්‍යය තප යන්නෙන් ගන්නා බව **"තපෝ නාම අභිඣා දෙමනස්සාදිනං තපනතෝ ඉන්ද්‍රියසංවරෝ ච, කොසජ්ජස්ස තපනතෝ විරියං තපෝ නාම,** යන අර්ථ කථා පාඨයන්ගෙන් පැහැදිලිවේ. **"තපෝ ච බ්‍රහ්මචරියඤ්ච"** යනු එහිලා දන්නේ ය. තවද තප ශබ්දය ධර්‍ම ව්‍රත යන අරුත්හි වැවේ ය යි කොෂයෝ කියත්. **"තපෝ ධම්මෙ වතෙ වෙව"** යනු කොෂ යි.

බැහැරියන් අත ද තපස් ඇත්තේ ය. **"යෙ චාපි ලොකෙ අමරා බහූ තපා"** යන සුත්තනිපාත කථායෙන් එය පැහැදිලි වන බැවින් තපස, ශාසනික-බාහිරක වශයෙන් දෙපරිදි වන්නේ ය. එහි ඉවසීම-පෙහෙවස් රැකීම-බුදුවදන් ඉගෙණීම-දුහඟ පිරීම-පැවිද්ද-ඉඳුරන් සංවර කිරීම-වීර්‍යය යන මෙතෙක් ධර්‍ම ශාසනික තපස් යි ගතයුතු ය. මෙසේ ගත් කල්හි තපස් යන මෙයින් ශීල-සමාධි-ප්‍රඥාසඞ්ඛ්‍යාත ශික්ෂාත්‍රය ම ගැණුනේ වේ. ඒ මේ තපස් ධ්‍යානාදී වූ හැම උසස් ගුණයක් ලබා දෙන බැවින් බුදුරජානන් වහන්සේ තපස මඞ්ගලසූත්‍රයෙහිලා ද දෙසූහ.

බාහිරක වශයෙන් තපසා යි ගැණෙනුයේ බුදුරජුන් විසින් ආතමකුලමථු යි බැහැර කළ කෂටව්‍රතසමූහය යි.

නග්න ව විසීම, නැගී සිට මලමූ පහකිරීම, ඔත් කා අත-ලොවීම, ඔත් කෑ බඳුන ලෙවීම, මලපහරා අතින් පිසදැමීම, එනු වහන්සෑ යි දෙන ඔත, සිට වහන්සෑ යි දෙන ඔත, පළමු කොට එළවා දෙන ඔත, පවරා දෙන ඔත, සැළිමුවෙන් නගා දෙන ඔත, පැස්මුවෙන් නගා දෙන ඔත, එළිපත අතර කොට දෙන ඔත, මොහලක් අතර කොට දෙන ඔත, වළඳන දෙදෙනකු අතරින් එකකු නැගිට දෙන ඔත, ගැබනියක දෙන ඔත, පුරුෂයන් අහරට ගිය තැනැත්තියක දෙන ඔත, සමාදන් කොට දෙන ඔත, බල්ලකු බලා සිටියදී දෙන ඔත, මැස්සන් සමූහ සමූහ ව හැසිරෙණ තැන දෙන ඔත යන මෙඔත් නොපිළිගැණීම, සොවි-රකය නොපිළිගැණීම, එක් ගෙයකින් සිඟා එක් ඔත් පිඬකින්, ගෙවල් දෙකෙකින් සිඟා දෙ පිඬෙකින්, ගෙවල් සතෙකින් සිඟා සත් පිඬෙකින්, එක් ඔත් තැටියෙකින්, ඔත් තැටි දෙකෙකින්, ඔත් තැටි තුණෙකින්, ඔත් තැටි සතෙකින් යැපීම, දවසට වරක්, දවසට දෙවරක්, දවසට තෙවරක්, දවසට සත්වරක් කෑමැයි මෙසේ දින වාර විසින් බුදීම, අමුපලා - බොඩහමු - හූරුහාල් - සම් කැබැලි - ගස් මැලියම් - කුඩු - දම්ඔත් - තලමූරු - තණ - ගොම -

අසුචි අනුභව කිරීම, වනමූල්ගෙඩි ආහාර කොට ගැණීම, සණ-වැහැරි – මුසුවැහැරි – මළමිනී ඔතා දැමූ රෙදිකඩ – පොළොවැ ලූ කඩරෙදි-රුක්සුඹුළුයෙන් කළ වැහැරි-අඳුන්මූවසම – කුර සහිත දිවිසම-කුසතණවැහැරි-වාවැහැරි-පෝරුවැහැරි-මිනිස් කෙසින් කළ කම්බිලි-අස්වල් ආදියෙන් කළ කම්බිලි-බකමූණුපියාපතින් කළ වැහැරි දැරීම, කෙස් රැවුළු ගැලවීම, උඩුකුරුව සිටීම, අසුන් පිළිකෙව් කිරීම, උලෙළුයෙන් හිඳීම, උලෙළුයෙන් යෑම, කටු ඇති රියෙහි හිඳීම හා නිදීම, පුවරුයෙහි උස් බිමෙහි එක් ඇලයෙන් හොවීම, දූලිවැකුණු සිරුරුඇති ව විසීම එලිමහන්හි විසීම, ඇල්දිය නොබීම, උදය-මද්දහන-සන්දැව යන තුන් කල්හි පව් සෝදා හැරීමටැ සි ගඟදියෙහි ගැලීම, හිනි පිදීම, එළුවකු සේ ගොනකු සේ බල්ලකු සේ කෑම බීම නිදීම, අඩ දැණි ව හිඳීම, බිම හොවීම, උණුසුම්හි අව්ව සෙවීම, වැසිකල්හි රුක් මුල් සෙවීම යනාදිය ඒ කෂටවුතයන්ගෙන් සමහරෙකි. බැහැරියෝ නන් වැදෑරුම් කයතැවුම් සිත්තැවුම් සංසාරවිමුක්තිය පිණිස වූ තපස් සි පිළි ගත්හ. **"දෙමෙ භික්ඛවෙ! අනනා පබ්බජිතෙන න සෙවිතබ්බා"** සි බුදුරජුන් විසින් නොසෙවිය යුතු ය, හළ යුතු ය, නිවන් පිණිස නොපවත්නේ ය සි වදාළ අනන්ත දෙකින් එකෙක් වනුයේ බාහිරකයන්ගේ මේ ආත්මකලමථු නම් තපසැ සි දතයුතු ය.

මේ වනාහි ඒ තපස නොවේ. මෙහි ආයේ ශාසනිකතාපස නම් වූ ශික්ෂාත්‍රයසඞ්ඛෘතිතශාසනධර්මය සි දැන එහි පිළිපැදිය යුතු ය.

තිතික්ඛා යනු ද ක්ෂාන්තියට නමෙකි. **"තිතික්ඛා ඛන්ති ඛමනං"** යනු කොෂයි. **"තිතික්ඛනං ඛමනං තිතික්ඛා"** යනු නිරුක්තියි.

නිබ්බානං පරමං වදන්ති බුද්ධා = බුදුවරයෝ නිවන උතුම් සි කියත්.

බුදු-පසේබුදු-මහරහන්හු තෘෂ්ණාවෙන් නික්මුනු තෘෂ්ණාව හා කොහෙත් නොගැවුනු මගපලසිත්වලට අරමුණු වන නිබ්බුතිය නිවුනුගතිය සන්සිඳුනු සවභාවය උතුමැයි කියත්. ඒ එසේ කිය යුතු ය. භවත්‍රයයෙහි කිසින් තැනෙක සන්සිඳීමෙක් නැත. භවත්‍රයය ම තෘෂ්ණාවෙන් පිඬිත ය දුක්ඛිත ය. භවය දිහින් දිගට නැඟී යනුයේ ද තෘෂ්ණාව නිසා ම ය. තෘෂ්ණාව නැසුනු කල්හි භවය ද නැසුනේ ය. එයින් සියලු දුක් හමාර වූයේ ය. දුක්

හමාරවීමෙන් සන්සිදුනේය. සන්සිඳීම, තෘෂ්ණාවෙන් තොර බැවින් තෘෂ්ණාවෙන් නික්මුණු බැවින් සකඬ හා අසමමිශ්‍ර බැවින් නිවනැයි හඳුන්වනු ලැබේ. විස්තර මතු එන්නේ ය.

න හි පබ්බජිතෝ පරූපඝාතී = පණ නසනසුලු වූයේ පැවිද්දෙක් නොවේ.

මෙහි වූ **න, හි,** යනු නිපාතයි. පැවිද්ද ඇත්තේ හෝ ශ්‍රේෂ්ඨ භාවයට ගියේ හෝ **පබ්බජිත** නම්.[1]

අන්හු දිවි ගලවනසුලු වූයේ අන්හු දිවි නසනසුලු වූයේ අන්හු නසනසුලු වූයේ **පරූපඝාතී** නම්. **"පාණී ආදීහි පරං උපහනණතෝ = පරූපඝාතී"** යනු විවෘතියි. **'පාණ් ආදීහි'** යන මෙහි ආදිශබ්දයෙන් සතකු මරන්නට හැකි හැම උපකරණයෙක් ම ගැණේ. සතුන් නැසීමෙහි යෙදෙන කොයියම් එකෙකින් නමුත් කොයි ලෙසකින් නමුත් අන් සතකු නසනුගේ පැවිද්දෙක් නම් නොවේ.

සමණෝ හොති පරං විහෙඨයතෝ = මෙරමා වෙහෙසනසුලු වූයේ මහණෙක් නොවේ.

ගාථාවෙහි තෘතීයපාදයෙහි එන **න, හි** යනු මෙහි ද **'හොති'** යන ක්‍රියාපදය හා එක්වන බැවින් 'මහණෙක් නොවේ' යි අරුත් එන්නේ ය. අත්පා ඇ යමෙකින් අනුනට වෙහෙස කරන්නේ මහණ ලකුණු නැති බැවින් මහණ නම් නොවේ. **"සමිතතතා හි පාපානං සමණෝති පවුච්චති"** යි මහණ ලකුණු කිහ. පව් සන්සිඳවූබවය මහණලකුණු.

මඝඡින-මඝදෙසි-මඝජීවි-මඝදූසී යි මහණෝ සිවු දෙනෙකි.

"චතූරෝ සමණා න පඤ්ඤත්තී
තෙ තෙ ආජීකරෝම් සකඛිපුට්ඨෝ,
මඝඡිනෝ මඝදෙසකෝ ච,
මඝෙ ජීවති යෝ ච මඝදූසී" යනු,

බුදුරජානන් වහන්සේ එහිලා වදාළ සේක.

මේ **මඝඡින** සමණ:

"යෝ තිණ්ණකථංකථෝ විසල්ලෝ
නිබ්බානාභිරතෝ අනානුගිද්ධෝ,
ලෝකස්ස සදෙවකස්ස නෙතා
තාදිං මඝඡිනං වදන්ති බුද්ධා"

1, 5, 14, "ඉති පබ්බජිතා උභෝ" යනු බලනු.

මුළුමනින් සෑකයෙන් එතෙර වූයේ රාගාදී වූ කෙලෙස්හුල් නැත්තේ නිවනෙහි ඇලුනේ කිසිවක ඔසුදු නො වූයේ දෙවියන් සහිත ලොකය සසරින්. එතෙරට පමුණු වන්නේ අෂ්ටාංගික මාර්ගයෙන් වෙනසකට නො පත් වූයේ ය. ඒ නම්, මාගේ ත්‍රිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය.

මේ **මඟඟදෙසි** සමණ:

"පරමං පරමන්ති යොධඤ්ඤවා
අක්ඛාති විභජති ඉධෙව ධම්මං,
තං කඞ්ඛාච්ඡිදං මුනිං අනෙජං
දුතියං භික්ඛුනමාහු මඟඟදෙසිං"

මේ සසුනෙහි යමෙක් පරම නම් වූ නිවන පරමය යි ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් දැන සප්තත්‍රිංශත් බොධිපාක්ෂිකධර්ම මෙහිම ය, මෙයින් පිටත ඒ නැතැයි තමන් දත් හෙයින් අනුනට කියා ද, බෙදා දක්වා ද, අනුන්ගේ සෑක නසා ද, තෘෂ්ණා නැත්තේ ද, හේ ය. ඒ නම් රහතුන් වහන්සේ ය.

මේ **මඟඣජීවි** සමණ:

"යෝ ධම්මපදෙ සුදෙසිතෙ
මඟෙඝ ජීවති සඤ්ඤතෝ සතීමා,
අනවජ්ජපදානි සෙවමානෝ
තතියං භික්ඛුනමාහු මඟඣජීවිං"

අන්‍ය දෙකින් එක් අන්තයකටත් නො බැස දෙසූ බැවින් හෝ ආශයානුරූප ව සත්ත්වයන්ගේ වූ නොයෙක් අයුරින් දෙසූ බැවින් හෝ මොනවට දෙසූ නිවනට පද වූ අවසන් නො කළ මඟඤ්ඤ ඇති ව මාගීයෙහි ජීවත් වනුයේ සීලසංයමයෙන් සංයත වූයේ සිහි ඇත්තේ නිරවද්‍යපදසඞ්ඛ්‍යාතසප්තත්‍රිංශත්බොධිපාක්ෂිකධර්මයන් සෙවනය කරණුයේ ය. ශෛක්ෂ්‍ය තෙමේ ය. සිල්වත් පෘථග්ජන තෙමේ ය.

මේ **මඟඟදූසි** මහණ:

"ඡදනං කත්වාන සුබ්බතානං
පක්ඛන්දී කුලදූසකෝ පගබ්භෝ,
මායාවී අසඤ්ඤතෝ පලාසෝ
පතිරූපෙන චරං සමඟඟදූසී"

බුදු-පසේබුදු-මහරහතුන් වහන්සේගේ වෙස් ගෙණ මහණවෙස් දරා 'මමත් මහණෙක්මි' යි සඟමැදට පැන සිටියේ 'මෙතෙක් වස් ඇති මහණහු විසින් මේ ගතයුතු ය' යි ලාභයක් බෙදන කල්හි 'මම මෙතෙක් වස් ඇතියෙම්' යි සඟමැදට පැන ලාභ පැහැර ගෙණ කුලදූෂණය කරණුයේ කයින් වචනයෙන් සිතින් හැඩි දැඩි වූයේ මායාබසින් මායාක්‍රියායෙන් අන්හු රවටනුයේ නො මහණ ව මහණවෙසින් පෙණී සිටිනුයේ ය. මෙතෙමේ තමන්ගේ ලොකොත්තරමාගීයත් පරාගේ සුගතිමාගීයත් දූෂණය කරන්නේ ය. දුශශීල තෙමේ ය. ව්‍යවහාරමාත්‍රයෙන් මහණ ය.

අනූපවාදෙ = උපවාද නො කිරීම (ද)

"උපවදනං=උපවාදෙ" "ජාතිගොත්‍රාදීන්ගේ වශයෙන් අනුනට ආක්‍රොශ කිරීම අගුණකීම ගැරහීම **උපවාද** නම්. එබඳු බැණවැදීමක් නො කරණු **අනූපවාද** නම්. අනුන් ලවා උපවාද නො කිරීම ද මෙහි ම වැටේ. **"අනූපවාදෙති අනූපවාදනඤ්චෙව අනූපවාදිනං ච"** යනු අටුවා.

අනූපඝාතො = නො පැහැරීම. හිංසා නො කිරීම.

"උපහනනං = උපඝාතො" අතින් පයින් දඬුයෙන් මුගුරෙන් අවියෙන් මෙරමාහට පැහැරීම ගැසීම හිංසාකිරීම **උපඝාත** නම්. එබඳු පැහැරීමක් නො කරණු **අනූපඝාත** නම්. අන්හු ලවා නො පහරවනු ද මෙහි ම ඇතුළති. **"අනූපඝාතොති අනූපහනනඤ්චෙව අනූපඝාතාපනං ච"** යනු අටුවා.

නියම මහණක්හට අන්හට උපවාදයක් උපඝාතයක් තමන් කරණු තබා අන්හුලවාත් කරවනු නො යෙදෙයි. මහණ නම් කයින් වචනයෙන් සිතින් හොදට ම ඇතිතරමට සන්සිඳුනේ ය. එසේ කරණුත් කරවනුත් නො හැකි එහෙයිනි.

පාතිමොක්ඛෙ ච සංවරො = ප්‍රාතිමොක්ෂයෙහි සංවරය ද.

ප්‍රධානශීලය ප්‍රාතිමොක්ෂසංවරය යි. සප්තාපත්තිස්කන්ධයට නො පැමිණ ශික්ෂාපදසම්පූර්ණයෙන් රැකීමෙන් කායවාගද්වාරයන් රැකුම ප්‍රාතිමොක්ෂසංවරය යි.[1]

මත්තඤ්ඤුතා ච භත්තස්මිං = බතෙහි (අහරෙහි) පමණ දැනීම ද.

"දවිහි කාරණෙහි මත්තං ජානෙය්‍ය පටිග්ගහණතො වා පරිභොගතො වා" පිළිගැණුම වැළඳුම යන දෙකරුණෙන් බතෙහි පමණ දන්නේ ය. දෙන්නහු ටිකක් දෙන කල්හි කුලයනට අනු

1. 10, 10, "සීලෙන" යනු බලනු

කම්පා පිණිස කුලයන් රැකීම පිණිස ටිකක් පිළිගැණීම, වැඩියක් දෙන කල්හි කය පොහොනා පමණට පිළිගැණීම පිළිගැණීමෙහි පමණ දැනීම ය.

ශීතොෂ්ණාදීන් වළකාලනු පිණිස සිවුරු, සිරුරෙහි පැවැත්ම පිණිස වෙහෙස නසනු පිණිස බඹසරට අනුග්‍රහ පිණිස අහර, උතුවිඩා දුරුකරණු පිණිස එකඟබවෙහි ඇලීම පිණිස සෙන සුන්, රෝ උවදුරු නසනු පිණිස ගිලන්පස නුවණින් සලකා පරිභොග කිරීම පරිභොගයෙහි පමණ දැනීම ය.[1]

පන්තං ච සයනාසනං = ගමට දුර වනසෙනස්නෙහි ඇලීම ද.

ග්‍රාමාන්තය ඉක්මවා ගිය නො සානු ලබන නො වපුරණු ලබන මිනිස් හැසිරීම් නැති ගැටීම් රහිත වූ තැන පන්තැයි කියනු ලැබේ. වනයෙහි ඉතාදුර පිහිටි, මිනිසුන්ගේ යාම් ඊම් නැති බිහිසුණු ලොමු ඩැහ ගන්වන තැන් ය. නිදනා තැන් සයන යි. හඳිනා තැන් ආසන යි. **"සයන්ති එත්ථාති සයනං, ආසන්ති එත්ථාති ආසනං"** යනු වාක්‍යයි.

අධිචිත්තෙ ච ආයොගො = අෂ්ටසමාපත්තියෙහි නිතියෙදීම.

රුවාරූ අට සමවත් **අධිචිත්ත** නම්. එයට පැමිණෙනු පිණිස භාවනාවක එක්වන් යෙදුමය **ආයොග.** අටුවාවෙහි එය මෙසේ කීහ. **"අට්ඨන්නං සමාපත්තීනං අධිගමාය භාවනායොගො"** යි. රූප සමාපත්ති සතර හා අරූපසමාපත්ති සතර හා අෂ්ටසමාපත්ති.[2].

මෙහි අන්ලෙසෙක් ද වේ. ඒ මෙසේ දන්නේය. කිසිවක්හට සිත තැවෙන පැරෙණ බිඳෙන රළුබස් නො බිණීම **අනූපවාද.** මෙයින් ගැණෙන්නේ වාචසික ශීලය යි. කයින් කිසිත් පරහිංසාවක් නො කිරීම **අනූපඝාත.** මෙයින් කායික ශීලය ගැණේ. මෙ දෙක ම බුදුරජුන්ගේ සසුන පිළිබඳ වේ. **"පාතිමොක්ඛෙ ච සංවරො"** යනු වදාළෝ .එහෙයිනි. අනූපවාදය හා අනූපඝාතය හා යන දෙක ම පාතිමොක්ඛසංවරය යනු එහි අරුති. පාතිමොක්ඛ සංවර නම්, අනූපවාදය හා අනූපඝාතය හා යන දෙකැයි කී සේ ය.

උපසපන් බවට පැමිණීමට හැම සුදුසුකමක් ඇත්තහු කෙරෙහි එයට පැමිණෙන වේලෙහි පාතිමොක්ඛසංවරය පිහිටනු ලැබේ. එය සම්මතයෙන් වන්නේ ය. සම්මතයෙන් පසු උපවාද-

1. 1. 6. "භොජනමහි ච මත්තඤ්ඤුං" යනු බලනු.

2 2. 1. "ඣායිනො" යනු බලනු.

උපඝාතයන්ගේ නො කිරීම් විසින් සංවරය සිදු වේ. එසේ සිදුවන ඒ සංවරය අනුපවාදත් අනුපඝාතත් නම්. ප්‍රාතිමොක්ෂයෙන් සිදු කළයුතු අනුපවාද-අනුපඝාතයෝ ප්‍රාතිමොක්ෂසංවරයෙහි ඇතුළත් වූ අනුපවාද-අනුපඝාතයෝ ය. **සංවර** යන මෙයින් සති ඤාණ-ඛන්ති-විරියසංවර ගණු ලැබේ. මේ සතර ප්‍රාතිමොක්ෂයෙහි සාධන වේ.

පරියෙසන-පටිග්ගහන-පරිභොග-විස්සජ්ජන යන මේ ක්‍රියා-වන්ගේ වශයෙන් භොජනයෙහි පමණ දැනීම වන්නේ ය. භාව නාවට සුදුසු, වන රුක්මුල් ඇ තැන් විවිත්තසෙනාසන නම්. සියලු සිත්වලට අධික ව උත්තම ව සිටි බැවින් අධිචිත්ත නම් වූ අර්හත්ඵල චිත්තයන් උපදවනු පිණිස ශමථ-විදර්ශනාභාවනාවන්ගේ වශයෙන් එක්වන් යෙදීම **"අධිචිත්තෙ ච ආයොගො"** යන මෙයින් වදාළ සේක. ඒය, අන් ලෙසක් ද ඇත්තේ ය යි කියේ.

එතං බුද්ධානසාසනං= මේ බුදුරජුන්ගේ අනුශාසනා ය.

මෙරමාහට නො බැණීම, මෙරමා නො පෙළීම, පාතිමොක්ඛ සංවරය, බතෙහි පමණ දැනීම, වනසෙනසුන්හි ඇලීම, අටසම වත්හි යෙදීම යන මේ සියල්ල බුදුරජුන්ගේ අනුශාසනා ය. යමෙකින් අනුශාසනා කරණු ලැබේ නම් ඕ **සාසන** නම්.

"ආණායමාගමෙ ලේඛෙ සාසනං අනුසාසනෙ" යනු කොෂ යි. ආඥා-ආගම-හසුන්පත්-අනුශාසනා යන අරුත්හි වැටෙන සාසන ශබ්දය මෙහි අනුශාසනාවෙහි වැටුනේ ය.

කොටින් 'අනුපවාද' යන්නෙන් වාචසිකශීලයත් 'අනුපඝාත' යන්නෙන් කායිකශීලයත් 'පාතිමොක්ඛෙ ච සංවරො' යන්නෙන් ප්‍රාතිමොක්ෂශීලය හා ඉන්ද්‍රියසංවර ශීලයත් 'මත්තඤ්ඤුතා ච භත්ත ස්මිං' යන්නෙන් ආජීවපාරිශුද්ධිශීලය හා ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීල-යත් 'පන්තං ච සයනාසනං' යන්නෙන් සත්ප්‍රාය සෙනාසනත් 'අධිචිත්තෙ ච ආයොගො' යන්නෙන් අට සමවතත් යන මේ ගුණ ධර්ම මතු වන්නේ ය. මෙසේ මේ දෙශනාවෙන් ත්‍රිවිධ ශික්ෂාව වදා-රණ ලද්දේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලා දියට පැමිණියාහු ය.

ආනන්දස්ථවිරප්‍රශ්නවසතුව නිමි.

සසුනෙහි නො ඇලුනු මහණෙක්

14 — 5

මේ සසුන්හි පැවිදි ව උපසපන් වූ එක් මහණ කෙනෙක් ගුරුන්ගේ නියමයෙන්, ඉගෙණීම සඳහා අන් ගුරුවරයකු වෙත ගියහ. ඔහු ඉගෙණීම සඳහා ගුරුන් වෙත ගිය අතරෑ ටික දිනකින් ඔහුගේ පිය තෙමේ රොගාතුර වී ය. රොගාතුර වූ පියා පුතු දකිනු කැමැති වූයේ ද, ඔහු ගෙන්වා ගන්නට යවන්නට කෙනකු නො ලැබ නන් දෙඩනුයේ ලං වූ මරණ ඇති ව "මේ මා පුතුට සිවුරුම්ල ය" යි කහවණු සියයක් බාලපුතුට භාර කොට කලුරිය කෙළේ ය. ටික කලක් ගෙවා ගෙට පැමිණි ඒ මහණහු පා මුල්නි හඬා වැටුනු ඔහුගේ මලනුවෝ පියා මළ බව කියා "සවාමීනි! නාත්තා නන් දෙඩමින් සිට මළේය, ඔබ වහන්සේට දෙන්නැ, යි කහවණු සියයක් මට භාර කොට ඇත, මේ ඒ මුදල, මෙයින් කරණ යමක් මට කියනු මැනවැ" යි දන්වා සිටියේ ය. ඒ මහණ තෙමේ "මට මිල මුදලින් වැඩෙක් නැතැ" යි මුල දී කියා නැවැත, "ගෙයක් ගානේ ගොස් කරණ මේ හිඟමනෙන් වැඩෙක් නැත, සිවුරු හැර ගොස් මේ මුදලින් දිවි ගෙවන්නෙමි" යි සිතන්නට වන. රෑ දවල මේ සිතිවිල්ලෙන් පෙළුනු ඔහු ඉගෙණීම හා කමටහන් වැඩීම හැරපී ය. එයින් ම සුදු මැලි විය. දන්නා හඳුනන පැවිද්දෝ ඔහු දැක "සුදුමැලි ව වැහැරී ගියෙනි කිමැ" යි ඇසූහ. "මගේ සිත ටික දිනක සිට සසුනෙහි නො ඇලේ ය" යි කී විට ඒ පැවිද්දෝ එ බව ඔහුගේ ගුරුන්ට දන්වා බුදුරජුන් වෙතට ගෙණ ගියහ.

බුදුරජානන් වහන්සේ: = ඔය නම සසුනෙහි නො ඇලෙනු සැබෑ ද?

මහණ: = එහෙයි, සවාමීනි!

බුදුරජානන්: = සිවුරු හැර ගොස් ජීවත් වීමට ගායක් තමුසේට තිබේ ද? එසේ කරන්නට සිතුවෙහි ඇයි?

මහණ: = එහෙයි. තිබෙනවා, ඒ නිසා සිවුරු හැරලන්නට සිතුවෙමි.

බුදුරජානන්: = හොඳයි! තමුසේට ජීවත් වීමට ඇති මග මට කියන්න.

මහණ: = සවාමීනි! මාගේ පියා මැරෙද්දී මට දෙන්නැ යි කහවණු සියයක් මාගේ මලනුවන්ට භාර කොට තිබේ, එයට කරන්නේ

කිමැ යි ඔහු මගෙන් අසයි, සිවුරු හැර-
ගොස් මට ඒ මුදලින් ජීවත් විය හැකි ය.
ගෙයක් ගානේ හැමදා හිඟමනේ යෑම
කළ නො හැකි ය. හිඟමනේ ගොස් ලබා
ගන්නා එයට ද මිනිසුන් කරණ ඇණුම්
බැණුම් බොහෝ ය. එසේ ඇණුම් බැණුම්
කරන්නාගේ අදහස, ඔහු එකලාව ම
මහණුන්ගේ ජීවිතය රැක දෙන සේ ය.

බුදුරජානන්: = හා! හොඳයි! එසේ නම් තමුසේ ගල්
බොරළු ටිකක් වැඩි පුර ඇහිඳ ගෙණ
එන්න. තමුසේට ලැබී ඇති ඒ මුදලින්
ජීවත් විය හැකිදැ යි අප ගණන් කර
බලන්නට.

මහණ තෙමේ බොරළු ගොඩක් ගෙණ
ආයේ ය.

බුදුරජානන්: = ජීවත්වීම සඳහාය යි සිතා කහවණු
පණහක් වෙනුවට ඔයින් බොරළු කැට
පණහක් ගෙණ පැත්තක තබන්න.
ගොන් බාණක් ගන්නටැ යි සිතා තව
පස් විස්සක් පැත්තකට ගන්න. දැන්
තමුසේගේ මුළු මුදලෙන් පන් සැත්තෑ-
වක් වියදම් වුනා. තව ඉතිරි ව ඇත්තේ
පස් විස්සයි. එය බිත්තර වී ගැණීමට
නගුල් වියදඬු සෑදවීමට උදලු වෑ පොරෝ
කුඩා ගැණීමට වැඩ කරන්නන්ගේ
කුලිය පිණිස හුණු පුවක්වලට වියදම් වූ
කල්හි කහවණු සියය තබා ඒ හැටි
දෙතුන් ගුණයක් තුබුන ද මදි ය. තමු
සේගේ කහවණු සියය කරන්නට ඇති
වැඩවල හැටියට ඉතා මද බව තමුසේටම
දැන් පෙණෙනු ඇත. තමුසේගේ අදහස්
ඔය කහවණු ටිකෙන් කෙසේ පිරවිය
හැකි ද. පෙර දවස සක්විති රජකම්
කර වූ අප්පුඩි ගැසූ පමණකින් දෙලොස්
යොදුන් පමණ තැන කටිය පමණට
සත්රුවන් වස්සන්නට සමත් වූ ශක්‍ර
සම්පත් මිනිස්, සම්පතට වඩා උසස් ය යි

අසා තව්නිසා දෙව්ලොවට ගොස් සක්-දෙව්රජුන් සති සක් මැරී යන තුරු එහි සිට ශක්‍රසම්පත් වැළඳූ මඤ්ඤා රජ තෘෂ්ණාව පුරවා ගත නොහී ම මලේ ය. තමුසේට පියාගෙන් ලැබුනු ඔය කහ වණ්ණ සියය ජීවිතයෙහිලා කිනම් අස් වැසුමක් කෙරෙන්නේ ද.

මහණ: = සවාමීනි! මඤ්ඤාතුරජහු පිළිබඳ පුවත දැන ගණ්ණුකැමැතියෙමි. එය වදාරණ මැනැව.

එකල්හි බුදුරජාණන් වහන්සේ=

"බබලන සඳහිරු - යම් පමණ තැන් හැසිරෙත්,
බබලත් ද දිග්හි - එ පමණ පෙදෙස පොළොවෙහි.
වසනා යම් පමණ - පාණහු වෙත් ද ඒ හැම,
මන්දා රජුගෙ දස්හු - වෙත් ම ය (කම් සැපෙහි උස්)" යි

එය මෙසේ වදාරා අනතුරු ව තවත් ගාථා දෙකක් ද ගෙණ හැර පෑ සේක.

න කහාපණවස්සෙන තිත්තිකාමෙසු විජ්ජති,
අප්පස්සාදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතෝ.
අපි දිබ්බෙසු කාමෙසු රතිං සෝ නාධිගච්ඡති,
තණ්හක්ඛයරතෝ හොති සම්මාසම්බුද්ධසාවකෝති.

කහවණු වැස්සෙන් ද වස්තුකාමයන්හි සෑහීමෙක් නැත්තේ ය. නුවණැත්තේ 'කාමයෝ රසවිඳ ගැණුම් රහිතහ ය, දුක් ඇත්තා හ,යි මෙසේ දැන.

දිව්‍යමය වූ කාමයන්හි ද ඇල්මට නො පැමිණෙයි. ඒ සම්මා සම්බුදුරජුන්ගේ ශ්‍රාවක තෙමේ අසීත්ඵලයෙහි හෝ නිවනෙහි ඇලුනේ වෙයි.

න කහාපණවස්සෙන = කහවණු වැස්සෙන් ද.

මෙහි පෙණෙන **න** යන්න දෙවන පාදයෙහි එන **විජ්ජති** යන්න හා එක් වේ. **න** යනු නිපාතමාත්‍රයෙකි.

රන් පස් මස්සක් රිදී පස්මස්සක් තඹ දස මස්සක් යන මේ විසි මස්ස එක් කොට එහි මටබව පිණිස වී ඇටක් පමණ ලොහ-යත් බහා කලවම් කොට අතුරා හා යම්කිසි රූසටහනක් දක්වා කරණ ලද්දේ කහවණු, යි කියත්. නිල් කහවණු නමින් ද එන්නේ මේ ය. "**පංච මාසා සුවණ්ණස්ස, තථා රජතස්ස, දසමාසා**

තඞ්ඛස්ස, එතෙ විසති මිස්සෙත්වා මට්ටත්ථාය විහිමත්තං ලොහං පක්ඛිපිත්වා අක්ඛරාණි ච හත්ථිපාදාදීනං අඤ්ඤතරං ච රූපං දස්සෙත්වා කතො නීලකහාපණො නාම'' යනු විනයාර්ථකථා-වෙහි ආයේ ය.

'කහාපණවස්සෙන' යන මෙයින් මෙහි අදහස් කරණ ලද්දේ මන්ධාතුරාජකාලයෙහි වට සත්රුවන් වැස්ස ය. අහසින් වැටෙන දියදහර **වස්ස** නම්.

තිත්ති කාමෙසු (න) විජ්ජති=වස්තුකාම ක්ලෙශකාමයන්හි සෑහි-මෙක් නැත.

සෑහීම **තිත්ති** නම්. **'විජ්ජති'** යන මෙහි අරුත් ගත යුත්තේ, මුලින් දැක්වූ **න** යන නිපාතයත් මෙයට එක් කිරීමෙනි.

අප්පස්සාදා දුඛා කාමා = කාමයෝ රසවිඳගැණුම් නැත්තෝ ය. දුක් ඇත්තෝ ය.

රසවිඳ ගැණුම **අස්සාද** නම්. මේ හා එක් ව සිටි, **අප්ප** ශබ්දය අභාවයෙහි වැටේ. ස්වල්පාර්ථයෙහිලා ගත ද, විරොධයෙක් නො වේ. අභාවාර්ථයෙහිලා ගත්විට 'රසවිඳ ගැණුම් නැතැ' යි යන අරුත් යෙදෙයි. ස්වල්පාර්ථයෙහිලා ගත්විට 'මඳ වූ රසවිඳගැණුම් ඇතැ' යි යන අරුත් යෙදෙයි.

අප්පස්සාදා යන්නෙන් **කාමා** යන්න ගැණේ. අප්පස්සාදයෝ නම් කාමයෝ ය. කාමයෝ නම් අප්පස්සාදයෝ ය. මෙහි 'කාමයෝ රසවිඳගැණුම් නැත්තාහ' යි ගැණීම ම වඩා සුදුසු ය. 'කාමයෝ මඳ වූ රසවිඳගැණුම් ඇත්තාහ' යි ගණිතොත්, එය සිතැඟි අනුව ම වේ.

''**යං ඛො පන භික්ඛවෙ! ඉමෙ පංචකාමගුණෙ පටිච්ච උප්ප-ජ්ජති සුඛං සොමනස්සං අයං කාමානං අස්සදො**'' යන දෙශනා-වෙන් පස්කම්ගුණ ඇසුරු කොට උපදනා, සැපයෙක් සොම්-නසෙක් වේ ද, ඒය කාමයන්ගේ ආස්වාද ය. ඒ මේ ආස්වාදය ''**කො ච භික්ඛවෙ! කාමානං ආදිනවො? ඉධ භික්ඛවෙ කුල පුත්තො යෙන සිප්පට්ඨානෙන ජීවිකං කප්පෙති යදි මුද්දාය යදි ගණනාය**'' යන දෙශනායෙන් වදාළ ලෙසින් දුක හා සසඳ බලත් දුක හා කිරා බලත් ඉතා ටිකක් ම, දියබිඳක් පමණ ම වේ. එහි දුක ම බොහෝ ය. සිවු සයුරෙහි දියකඳ සමානය. ''**අප්පස්සා දො දුක්ඛමෙත්ථ භිය්‍යො**'' යනු වදාළෝ එහෙයිනි. කාමයන් කෙරෙහි ඇති දුක කෙබඳු දැ යි බුදුරජුන් වදාළ දුක්ඛක්ඛන්ධාදි

සූත්‍ර ගෙණ බැලිය යුතු ය. එකකු විසින් සැපෑ සී පිළිගන්නා වූ කාමවස්තුව අනෙකක්හට දුකැ සී හැඟෙන්නේ කාමයන්ගේ සැපයක් ආස්වාදයක් නැති බැවින් ම ය. කාමයන් කෙරෙන් යමෙක් සැපයක් ආස්වාදයක් උදුරා ගණී නම් එය සිතින් මවා ගත් සිතින් උදුරා ගත් නැත්තා වූ ම සැපයෙකි. ආස්වාදයෙකි. අර්‍ථ ශූන්‍ය චින්තාමාත්‍රයෙකි.[1]

ඉති විඤ්ඤූය පණ්ඩිතෝ = නුවණැත්තේ මෙසේ දැන.

"කාමයෝ රසවිදගැණුම් නැත්තාහ, බොහෝ දුක් ඇත්තාහ" යන මේ දේකරුණ දැනැ සී කියූ සේ සී.[2]

අපි දිබ්බෙසු කාමෙසු = දිව්‍යමය වූ කාමයන්හී ද.

දෙවියන් අත ඇති, දෙවියන් විඳුනා කාමයෝ දිබ්බකාමයෝය. 'ඔවුන් කෙරෙහි' යන අරුත් ය. **අපි** යනු නිපාත සී.

රතිං සෝ නාධිගච්ඡති = ඇල්මට නොපැමිණෙසි.

සෝ යනු '**සම්මාසම්බුද්ධසාවකෝ**' යනු බලා සිටියේ ය. නුවණැත්තේ වස්තු කාමක්ලේශකාමයන්ගේ තතු හරිහැටි දත් විට මිනිස් කාමයන්හී තබා දිව්‍යකාමයන්හී ද ඇල්මක් නොකරන්නේ ය. ඇල්මට නොපැමිණෙන්නේ ය. දෙවඟනන් දුටු නන්ද තෙරණුවෝ උසස් රූසපුවෙන් යුත් මිනිස්කතුන්, දැගිය වැහරීගිය වැඳිරිමැහැල්ලන් සේ දුටහ. උන්වහන්සේට එසේ පෙණුනේ ද කාමවිරතියක් ඇති විටක ද නොවේ. කාමයෙහි තද බැඳුමක් ඇතිවිටක ම ය. දෙවියන් අත ඇති කාමයන්ගේත් මිනිසුන් අත ඇති කාමයන්ගේත් අතර වූ පරතරය උස්පහත්කම හීනප්‍රණීත භාවය දැන ගැණුමට නන්ද තෙරුන්ගේ ඒ දැකීම ම පමණ වේ. මිනිස්කාමයන්ට වඩා හැම අතකින් ම උසස් ව සිටි දිව්‍යකාමයන් ගැණවත් කාමයන්හී දෙස් දුටු නුවණැත්තේ නොසිතන්නේ ය. නොපතන්නේ ය. ඇලීම නොකරන්නේ ය. කාමයන්හී නොද බැඳෙන්නේ ය. ඇලීම **රති** නම්. "**රමණං = රති**" යනු අරුත් පැවසීම ය.

තණ්හක්ඛයරතෝ හොති=අර්‍හත්ඵලයෙහි හෝ නිවනෙහි ඇලුනේ වේ.

---

1. 2. 4 "මා කාමරතිසන්ථවං" යනු බලනු
,, 4. 4 "අත්ථිකාමෙසු" ,, ,,
2. 2. 1 "අප්පමාදම්හි පණ්ඩිතා ,, ,,

තණ්හක්ඛය යනු නිවනට නමෙකි. අර්හත්ඵලය ද කියය වේ. තෘෂ්ණාව මුළුමනින් සිදලන හෙයින්, අර්හත්මාර්ගඥනය 'තෘෂ්ණා-ක්ෂය' යි ගත ද, එ මගින් තෘෂ්ණාවගේ **ක්ෂය**වීම සමග ම අර්හත් ඵලයත් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමට ආලම්බනප්‍රත්‍යයය වන නිර්‍වාණ යත් තෘෂ්ණාක්ෂය යි ගැණේ. "**තණ්හානං ඛයහෙතුතා තණ්හා ඛීයති එත්තානි=තණ්හක්ඛයෝ**" තෘෂ්ණාවගේ ක්ෂය කිරීමට හෙතු වන බැවින් මෙහි දී තෘෂ්ණාව නැසි යානු යි තෘෂ්ණාක්ෂය නම. එහි ඇලුනේ **තණ්හක්ඛයරත** නම්.

සම්මාසම්බුද්ධසාවකෝ = සම්මා සම්බුදුරජුන්ගේ ශ්‍රාවක තෙමේ.

සම්මා සම්බුදුරජුන් විසින් දෙසූ දහම් ඇසීමෙන් සසුන් ගත යොගාවචර මහණ තෙමේ ය ඒ. "**සම්මා සම්බුද්ධෙන දෙසිතස්ස ධම්මස්ස සවණේන ජාතෝ යොගාවචරෝ භික්ඛු**" යනු අටුවා[1].

මහාරාජ, අහස දෙස බලා අප්පුඩි ගැසූ කල්හි, දෙලොස් යොදුන් පමණ තන්හි මසක් පමණ වැස්සා වූ, සත්රුවන් වැස්සෙ-නුදු සැනීමට නොපත් බැවින් කහවණු වැස්සකින් කාමයන්ගේ සැනීමෙක් නොවන්නේ ය. එහෙයින් කාමයෝ සිහිනයක් සේ මඳ වූ ආස්වාද ඇත්තාහ. ආස්වාද නැත්තාහ යි සේ යි. බොහෝ දුක් ඇත්තාහ යි දැන නුවණැත්තේ මිනිස්කම්සැපෙහි තබා දෙවියන් පිළිබඳ පස්කම්සැපෙහි ද නොඇලේ. කිසිලෙසකින් එය නොපතයි. එසේ නොඇලෙන්නා වූ නොපතන්නා වූ ඒ සම්‍යක්සම්බුද්ධ ශ්‍රාවක තෙමේ අර්හත්ඵලයෙහි නිවනෙහි ඇලී-වසන්නේ ය, යනු දන්නේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ මහණ තෙමේ සෝවාන් ඵල යෙහි පිහිටියේ ය. පැමිණ සිටි පිරිසට දෙශනාව වැඩ සහිත වූ ය.

අනාගිරතභික්ෂුවස්තුව නිමි.

---

1. 4. 12. 'සම්මාසම්බුද්ධසාවකෝ' යනු බලනු.

අගඉදත්ත පුරොහිතයා.

14 — 6

මහාකොසොල් රජුගේ පෙරෙවි බමුණා නම් **අගඉදත්ත** බමුණු තෙමේ ය. **පසේනදි කොසොල්** රජ තෙමේ මහාකොසොල් රජු මළ පසු "මපියාණන්ගේ පෙරෙවියා" යි පියාට කළ පෙරෙවි-කම් සලකා ගරුබුහුමන් පෙරදැරි ව ඔහු තමන්ගේත් පෙරෙවි-කමට ගත්තේ ය. ඔහු රාජසේවාව පිණිස රජගෙට එන කල්හි පෙර ගමන් කොට පිළිගෙණ "ගුරුන්නාන්සේ මෙහි එන්නැ" යි අඩගා ඔහුට සම අසුනක් දෙවාලයි. මෙසේ සම අසුන් ගෙණ ඉන්නා වූ අගඉදත්ත තෙමේ "දිනක් රජ්ජුරුවෝ මට නො තරම් සේ සලකති, මෙය හැමදා කෙරෙන්නෙක් නො වේ, රජුන්ගේ සිත් හැම දා එක සේ කෙලෙසිනුත් සතුටු කළ නො හැකි ය, මෙය දැනෙන්නේ වැරදුනු දා ය, ඔහුට වඩා මම මහලු වෙමි, එ දා සුදුසු නො වේ, රජසැප විඳිනත් විඳිය යුත්තේ සමවයස් ඇත්තන් එකතුව ය, අප දෙදෙනාගේ වයස අහසට පොළොව සේ ඉතා ඈත් ය, මා මහලු බැවින් මට සුදුසු, රාජසේවාව හැරදමා පැවිදි වීමැයි" යි සිතා රජු වෙත ගොස් ඒ බව රජුට දන්වා සිටියේ ය. රජ තෙමේ ද එයට ඔහුට අවසර දුන. එ කල්හි ඔහු නුවර බෙර හසුරුවා තමන් ලඟ තුබූ ධනයෙන් සත් දවසක් මහදන් පවත්වා ඉසිවෙස් ගෙණ පැවිදි වී ය. ඔහු හා කැටි ව බොහෝ දෙන ද පැවිදි වූහ. අහුමගද දෙරට හා කුරුරට හා අතර එක් පෙදෙසක වාසයට ගිය අගඉදත්ත තවුස් තෙමේ ශිෂ්‍යයන් අමතා "දරුවෙනි! තොප කිසිවකුටත් කාමවිතර්කයක් උපන්නේ නම් ඔහු විසින් වහා ම එක එක වැලිගොටුව බැගින් ගෙණවුත් මෙහි බැහිය යුතු ය" යි අවවාද ලෙසින් කියේ ය. ඔවුහු එය පිළිගෙණ, පාපවිතර්කයක් උපන් විට එසේ කළහ. වික දවසක් යත් ම එ තැන මහවැලි ගොඩෙක් නැංගේ ය. එහි **අනිච්ඡත්ත** නම් නාරජෙක් අරක් ගතු. අහුමගද දෙරට වැස්සන් හා කුරුරුවියෝ මසක් පාසා ඔවුනට දන් දෙත්. අගඉදත්ත තෙමේ සත්කාර ගෙණ ආවුන්ට "හෙල් පිහිට කොට ගණිවු, වන කැලෑ සරණ කොට යවු, අරම් අසපු පිහිටැයි අදහවු, ගස්කොළං සරණ කොට යවු, එසේ සරණ ගෙණ දුකින් මිදෙවු" යි බණ කියයි. තම තවුස් පිරිසටත් එලෙසින් ම අවවාද කරයි. ඔය දවසෙහි දෙවරම් වෙහෙර වැඩ වසන බුදුරජාණන් වහන්සේ ලොව බලා වදුලේ, අගඉදත්තයා දුටහ. දැක මුගලන් මහාතෙරුන් කැඳවා "මුගලන්! මහදනා නො මඟ යවන නො තොටට පමුණු වන අගඉදත්ත

තමුසේට නො පෙණේ ද, තමුසේ එහි ගොස් උන්ට අවවාද කොට උන් සැම දෙනා සුමගට ගණිවු" යි වදාළ සේක. "ස්වාමීනි! ඔවුහු බොහෝ ය, එකලා මට ඔවුන් සුමගට ගැණීම පහසු නැත, බුදුරජානන් වහන්සේත් වඩනා සේක් මැනවැ" යි මුගලන් තෙරුන් දන්වා සිටි කල්හි බුදුරජානන් වහන්සේ "මුගලන්! මම ද එන්නම්, තමුසේ මට පෙරාතු ව එහි යවු" යි වදාළ සේක. මුගලන් මහාතෙරණුවෝ මගබැස වැඩියහ. වඩිනා ගමනේ "මූලා බොහෝ ය, බලවත්හු ය, යම් ලෙසකින් මම මුන් හැම දෙනා රැස් ව සිටි තැනේදී යමක් කීයෙම් නම් හැම දෙන නැගී සිට කැටි කැටි ව දෙඩන්නට පටන් ගණිති" යි සිතා එකෙකුගෙන් එකකු වෙන් කරණු පිණිස දළපොදවැස්සක් වස්වා ලූහ. වැසිපොද වැටෙත් ඔවුහු සියලු දෙන හුන් තැන්වලින් නැගිට තමතමන්ගේ පන්සල් තුළට රිංගා ගත්හ. ඉක්බිති මුගලන් මහාතෙරණුවෝ අග්ගිදත්තයාගේ පන්සල් දොර සිට "අග්ගිදත්ත" යි ඇමතූහ. ඒ අසා අග්ගිදත්ත "මට නම කියා අමතන්නට හපනෙක්, මෙ ලොව කොතැනකත් නැත, කවරෙක් මට නම කියා අමතා දැ" යි මානයෙන් තද ව "කතා කරන්නේ කවරෙක් දැ" යි ඇසී ය. "බමුණ! මමැ" යි තෙරුන් කී කල්හි බමුණු "කිමැ" යි විචාළේ ය. "අද එක් රැයක් මෙහි නවතින්නට මට ඉඩ දෙන්නැ" යි උන්වහන්සේ ඉල්ලූහ. "අය්යෝ! කණගාටුයි, මෙහි එකකුට මුත් දෙදෙනකුට වැද හෝනට ඉඩපහසු නැතැ" යි බමුණු කී ය. "අග්ගිදත්ත! එසේ නො කියව, මිනිස්සු මිනිසුන් ලඟට යති, ගොන්නු ගොනුන් ලඟට යති, පැවිද්දෝ පැවිද්දන් ලඟට යති, එහෙයින් එසේ කියනු නො වටියි, ගිහිගෙවලට යන්නට පැවිදි වූ අපට නො හැකි ය, කෙසේ නමුත් අදට නැවතීමට පොඩ්ඩක් ඉඩ දෙව" යි කීහ. එකල්හි "තමුසේ පැවිදි කෙනෙක්-දැ" යි අග්ගිදත්ත ඇසී ය. "ඔව් මම පැවිද්දෙක්මි" යි කී කල්හි "කෝ තමුසේගේ තවුස් පිරිකරු" යි විචාළේ ය. "බමුණ! මාගේ පිරිකර තිබේ, එය වෙන වෙන ම ගෙණ ඇවිද පියන්නට තරම් හයියක් මට නැත, එය මහගැහටෙකි, එහෙයින් අභ්‍යන්තරයෙහි ම රුවා ගෙණ ඇවිදිමි" යි කීහ. එකල අග්ගිදත්ත 'මොහු තවුස් පිරිකර නො ගෙණ හැසිරේ ය" යි උන්වහන්සේට කිපියේ ය. ඉක්බිති මහාතෙරණුවෝ "අග්ගිදත්ත! අහක පලයන්, තරහ නො ගෙණ, මට වසන්නට තැනක් කියව" යි කියා නැවැත "මේ වැලිගොඩේ ඉන්නේ කවරෙක් දැ" යි ඇසූහ. "නාරජෙකැ" යි ඔහු කී ය. "එසේ නම් මට ඒකවත් දෙව" යි ඉල්ලූහ. "එ තැන ද දෙනු නො හැකි ය, එහි ඉන්නා වූ නාරජ නපුරු එකෙකැ" යි කී ය. "තට එයින් කම් නැත, මට එතැන දෙව" යි නැවැත කීහ.

"තමුන්නාන්සේට ඌ හා එක් ව හිඳින්නට හැකි නම් මට කමක් නැත, තමුන්නාන්සේ ම වන්නක් ඉවසිය යුතු ය, මට අඩාපලි කියනු බැරි ය, කැමැති නම් හුන්නාට මගෙන් වරදෙක් නැතැ" යි අඟුදත්ත කියා සිටියේ ය. ඉක්බිති මහාතෙරණුවෝ වැලිගොඩ වෙත ගියහ. නාරජ තෙමේ, එන්නා වූ තෙරුන් දුර දීම දැක, "අර මහණ එන්නේ මෙහි ය, ඔහු මා මෙහි ඉන්නා බව නොදනියි, දැම් දමා ඔහු මරමි" යි දුමා ගියේ ය. එ කල්හි මහාතෙරණුවෝ "මේ නාරජ! මම ම දුමන්නට දනිමි, අනෙකෙක් නොදනී, යි සලකා" යි තමන් වහන්සේත් දුමා ගියහ. ඒ වේලෙහි දෙදෙනාගෙන් නැගි දුම බඹලොව තෙක් නැගී සිටියේ ය. ඒ දුමින් නාරජු ම පෙළුනේ ය. තෙරුන්ට කිසිත් ගැහටෙක් නොවී ය. ධූමවෙගය ඉවසනු නොහැකි නාරජ තෙමේ හින්නෙන් ඇවිළී ගත්තේ ය. තෙරණුවෝත් තෙජෝධාතුසමාපත්තියට සමවැද ඔහු හා එක් ව දිලෙන්නට වූහ. ගිනිදැල් ද බඹලොව තෙක් නැගින. එ කල්හි ඔහුගේ සිරුර පන්දම් විලක්කුවලින්, දල්වන ලද්දක් සේ පෙණෙන්නට වන. තවුස් පිරිස ගිනිදැල් දැක "නාරජ තෙමේ මහණහු දවා, අනේ! හොඳ මහණ, අප කීවක් නොගෙණ නටුයේ" යි සිතී ය. තෙරුන් නාරජු දමා විෂ නැත්තකු කොට වැලිගොඩ මත වැඩහුන් කල්හි නාරජ වැලිගොඩ දරණපවින් වෙළා කුළුගෙයක් පමණ වූ පෙණගොබක් මවා තෙරුන් හිස මත දරා සිටියේ ය. තවුසෝ "මහණහු මළ නොමළ බව දනිමු" යි තෙරුන් වෙත ගොස් වැලිගොඩ මත හුන් උන්වහන්සේ දැක දෙහොත් මුදුන් නගා සතුති කරමින් "මහණ! නාරජු විසින් පෙළන ලදුයෙහි දැ" යි ඇසූහ. "නොපෙණේ ද නාරජු, මා මත්තෙහි පෙණය දරා සිටින්නේ?" යි තෙරණුවෝ ඇසූහ. එකල්හි තවුසෝ "පින්වත! මහපුදුමයි, මෙබඳු මහානුභාවයෙක් දමන ලද්දේය" යි තෙරුන් වට කොට සිට ගත්හ.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ එහි වැඩි සේක. මුගලන් මහාතෙරණුවෝ බුදුරජුන් දැක නැගිට වැන්දහ. ඒ දුටු තවුසෝ "මෙතෙමේ ඔබ වහන්සේටත් වඩා උසස් එකෙක්දැ" යි ඇසූහ. "ඔව්! මෙතෙමේ මා පියා, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, මම මුන්වහන්සේගේ ශිෂ්‍ය පුත්‍ර" යි කීහ. බුදුරජාණන් වහන්සේ වැලිගොඩ මත වැඩ හුන්හ. එවිට තවුසෝ "ශිෂ්‍යපුත්‍රයාගේ ආනුභාවය මෙතරම් නම් මොහුගේ ආනුභාවය කොතරම් විය යුතු දැ" යි සලකා දෙහොත් මුදුන් නගා සතුති කළහ. එහිදී බුදුරජාණන් වහන්සේ අඟුදත්ත අමතා "ඔබ තම අතවැස්සන්ට අවවාද දෙන්නහු කුමක් කියා අවවාද දෙන්නහු දැ?" යි

අසා වදාළසේක. "මේ හෙල පිහිට කොට යවු, මේ කැලය සරණ කොට ගණිවු, මේ අරම පිහිටැයි අදහවු, මේ රුක සරණය, යි සලකවු, මෙනැන් සරණ යනුයේ දුකින් මිදේ යි මෙසේ අවවාද කරම්" යි අගසිදහන දන්වා සිටි කල්හි "අගසිදහන! මෙනැන් සරණ යන්නේ දුකින් නොමිදේ, බුදුන් දහම් සඟුන් සරණ යනුයේ ම සියලු සසරදුකින් මිදේ" යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

බහුං වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච,
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා.

නෙතං බො සරණං බෙමං නෙතං සරණමුත්තමං,
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

යො ච බුද්ධං ච ධම්මං ච සඞ්ඝං ච සරණඞ්ගතො,
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

එතං බො සරණං බෙමං එතං සරණමුත්තමං,
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති.

බියෙන් තැති ගත් බොහෝ මිනිස්සු බොහෝ වූ හෙල් ද වන ද අරම් ද රුක් ද එකතින් සරණ කොට යත්. සරණය යි සලකත්. පිළිගණිත්.

මේ සරණය නිභීය නොවේ. මේ සරණය උතුම් නොවේ. මේ සරණයට පැමිණ හැම දුකින් නොමිදේ.

යමෙක් බුදුන් ද දහම් ද සඟුන් ද සරණ කොට ගියේ නම් හේ, මේ සිවුසස් දහම් මනා කොට නුවණින් දක්නේ ය.

මේ දුඃඛසත්‍යය ද දුඃඛසමුදයසත්‍යය ද දුඃඛයාගේ අතික්‍රමණය ද දුක් සන්සිඳවීමට පමුණු වනසුලු අරි අටහි මග ද යන

මේ සරණය නිභීය වේ. මේ සරණය උතුම් වේ. මේ සරණයට පැමිණ සියලු දුකින් මිදේ.

බහුං = බොහෝ වූ.

'බහුං' යනු **'බහූ'** යි ගන්නැ යි අවුවාව කියයි. එ කල්හි ඒ පදය ගාථාවෙහි එන **පබ්බතානි-වනානි-ආරාමරුක්ඛචෙත්‍යානි** යන තෙපදය හා **මනුස්සා** යනු හා වෙසෙසයි. **පබ්බතානි** යනාදී වූ තෙපදය වෙසෙසන කල්හි එපදය නපුංසකලිඞ්ගික වේ. **මනුස්සා** යනු වෙසෙසන කල්හි පුංලිඞ්ගික වේ.

වෙ = එකාන්තයෙන්.

සරණං යන්ති = පිහිට කොට යෙත්. පිහිටැ යි සලකත්.

පිහිට කොට යෑම නම් හැම එකක් හැම වැඩක් සිදුකරගණු සඳහා ඒ ඒ සජීවාජීවවස්තු තමන්ට වහළැයි ගැණීම ය. සැලකීම ය. ගමනාර්ථධාතුන් අවබොධාර්ථයෙහි ද වැටෙන බැවින් **යන්ති** යන ක්‍රියාපදයට **සලකත්, දනිත්,** යන අරුත් ද දෙන්නෝ ය.

පබ්බතානි ච = පර්වතයන් ද.

"තත්ථ තත්ථ ඉසිගිලිවෙපුල්ලවෙභාරාදිකෙ පබ්බතෙ ච" යනු අටුවා. ඒ ඒ තන්හි වූ ඉසිගිලි-වෙපුල්ල-වෙභාරාදී වූ පර්වත. මෙහි ආදිශබ්දයෙහි ලෝවැස්සන් විසින් දෙවියන් අරක් ගන්නා ලදැ යි පිළිගත් හැම පර්වත කෙනෙක් ම සඞ්ග්‍රහයට යෙත්.[1]

වනානි ච = වනයන් ද.

"මහාවනගොසිඞ්ගසාලවනාදීනි වනානි" යනු අටුවා. මහාවන-ගොසිඞ්ගසාලවනාදී වූ වන. මෙහි ද ආදිශබ්දයෙහි ඒ මහාවනාදිය මෙන් ලෝවැස්සන් විසින් "දෙවියන් වසති" යි පිළිගත් සුභගවන-දෙවසාලවන-අඞ්වන-මධුවන-තාලවන-කුමුදුවන-චම්පකවන-බහුලවන-භද්‍රවන-ඛාදිරවන-කාලිඞ්ගාරණ්‍ය-මෙද්ධ්‍යාරණ්‍ය-මාතඞ්ගාරණ්‍ය-උපලාවෘතාරණ්‍ය යනාදී වූ හැම වන කෙනෙක් ම සඞ්ග්‍රහයට යෙත්.

මෙලොව පරලොව ඉෂ්ටාර්ථසිද්ධිය පතා දෙවියන් උදෙසා බිලි පුද පවත් වන කැලෑපෙදෙස් මෙයින් ගැණේ. මේ වනපෙදෙස්හි යමෙක් මළේ නම් හේ බඹලොව ඉපිද කෙළවර මොක්ෂයට පැමිණේය යි මිසදිටුවෝ කියත්. අඞ්විශ්වාසයෙන් කියන මේ කියුම් බැහැරලිය යුතු ය. නො ද පිළිගත යුතු ය.

"වනෙෂ්වෙතෙෂ්වරණ්‍යෙෂු යස්තු ප්‍රාණාන් පරිත්‍යජෙත්,
බ්‍රහ්මලොකෙපිතිර්භූත්වා ස යාති පරං පදම්"

යනු එහිලා කීහ.

මොනර-කොවුල් ඈ පක්ෂීන් විසින් සෙවුනා ලද තැන වනැයි අපගේ පොතපතෙහි කියන ලද්දේය. **"වනන්ති තං භජන්ති මයූරකොකිලාදයො සත්තාති = වනං"** යනු ඒය.

1. 9, 11 'පබ්බතානං විවරං පවිස්ස' යනු බලනු.

"බහු වෘක්ෂස්ථානං = වනම්, ග්‍රාමාදවහිර් ගුලමලතාකීර්ණං නිර්ජිනං බහුවෘක්ෂසංතතස්ථානං = වනම්" යනු ද එහිලා දත යුතු ය.

ආරාමරුක්ඛචෙත්‍යානි = අරම්-සෑරුක් ද

"වෙළුවනජීවකම්බවනාදයො ආරාමෙ ච උදෙනචෙතිය= ගොතමචෙතියාදීනි රුක්ඛචෙතියාදීනි ච" යනු අටුවා. වෙළු-වන ජීවකම්බවන ඈ අරම් ද, උදෙනචෙතිය-ගොතමකචෙතිය ඈ සෑරුක් ද යනු අරුත්. මෙහි ආදිශබ්දයන්හි දෙවියන් අරක් ගන්නා ලදැයි ලෝවැස්සන් පිළිගත් අම්බපාලිවන-උපවත්තන වන-වජ්ජිචෙතිය-සාරන්දදචෙතිය යනාදී වූ සෙසු අරම් සෑරුක් සඞ්ග්‍රහයට යෙයි.

සිත් ඇලෙන තැන ආරාමය යි ගණිත්. **"ආග නත්වා රමන්ති එත්ථාති = ආරාමො"** යනු එහි සමර්ථනය යි. හේ පුෂ්පාරාම-ඵලාරාම විසින් දෙ පරිදිය.

පෘථිවීසාරය-වාතය-ආලොකය-වර්ෂාධාරා ඈ හෙතුන් නිසා අවකාශය බලා නැගී යනුයේ වැඩී යනුයේ රුක් ය. හේ ඔසධී-තිණ-වනස්පතීන්ගේ වශයෙන් තෙ පරිදි ය. අරලු-නෙල්ලි-ඈ රුක් ඔසධිහු ය. තල්-පොල් ඈ රුක් තිණ ය. නුග-ඇසතු ඈ රුක් වනස්පතීහු ය.

මෙහි **ආරාමරුක්ඛ** ශබ්දය හා එක්ව සිටි **චෙතිය** ශබ්දය ගාථායෙහි එන **පබ්බත-වන** ශබ්ද හා ද **එක්** කොට ගන්නේ ය. ලොකයා විසින් බුහුමන් කරණු ලබන අරුතින් හා බුහුමන් කරන්නන් විසින් පුදනු ලබන අරුතින් ඒ හැම චෙතිය නම් වේ.

පර්වත-වන-ආරාම-ගඞ්ගා-තීර්ථ-වෘක්ෂ යනාදිය දෙවියන් අරක් ගන්නා ලදැයි ලොකයාගේ ඇදහීම ය. පිළිගැණීම ය. එහෙයින් ඔවුහු තමන්ට පැමිණෙන උවදුරු වළකා ගැණීම සඳහා පර්වතාදී වූ ස්ථානයන්හි පුද සැලකිලි පවත්වත්. දූ පුතුන් ලැබීම පිණිස යදිත්. සමහර කෙනෙක් පරලොව සුගතිය සඳහා සමහර කෙනෙක් සංසාරවිමුක්තිය සඳහා පර්වතවනාදිය ඇසුරු කරත්. ගඟදිය ගැලෙත්. වනගත වෙත්. අසපුවල වෙසෙත්. රුක්මුල් සෙවනය කෙරෙත්. මෙසේ මොවුන් එලොවින් හා මෙලොවින් එන සියලු බිය උවදුරු වළකාලීමට මෙතැන් ඇසුරු කරණු ලබන්නේ පුදනු ලබන්නේ මෙතැන්හි දෙවියන් වසති යි සැල-කීමෙනි. සමහර වටෙක දෙවියන්ගේ පිහිට පතා මෙ තන්හි

සත්ත්වයන්ගේ ගලලොහිතය ද පුදත්. එපමණට මෙ තැන් සරණ කොට යෑම සාමාන්‍යලොකයා අතර බල පවත් වන්නේ ය. එහෙයින් ඒ හැම තැන් වෙතිය යි ගණිත්.

පබ්බත ම පබ්බතචෛත්‍ය නම්. වන ම වනචෛත්‍ය නම්. ආරාම ම ආරාමචෛත්‍ය නම්. වෘක්ෂ ම වෘක්ෂචෛත්‍ය නම්. පබ්බත-වන යනාදියෙන් ගණු ලබත්නෝ ඒ ඒ තැන්හි අරක් ගත් දෙවියෝ ය. පබ්බතදෙවතා-වනදෙවතා-ආරාමදෙවතා-රුක්ඛ-දෙවතා යි පොතපතෙහි ආයේ එහෙයිනි.

මනුස්සා = මිනිස්සු.

භයතජ්ජිතා = බියෙන් තැති ගත්.

සිතේ සැලීම භය නම්. ආත්මසෙනහය නැසී යන කරුණු දැකීමෙන් උපදනා බැගැබව ඇසුරු කළ සිතේ වෙනස්බව භය නමැ යි කියන ලදි.

ජාති-ජරා-ව්‍යාධි-මරණ-සොක යි භය පසෙකි. මේ පස අතීත-වර්තමාන-අනාගත කාලවශයෙන් පස්ළොසෙක් වේ. චෝර--අරි-රාජ-උදක-අග්නි-දණ්ඩ-දුග්ගති-රොග-ආත්මානුවාද-පරානු-වාදභය යන මේ දසය හා ද ගිණු කල්හි භය පස්විස්සෙක් වේ. මේ මෙසේ වදාළසේක බුදුරජානන් වහන්සේ:-

> "ජාතිජරාව්‍යාධිවුතී ච සොකො
> නෙකාලිකා පඤ්චදසී ච හොනති
> චොරාරිරාජූදකපාවකො ච,
> දණ්ඩො භයො දුග්ගති සොරරොගො
> අත්තානුවාදෙ ච පරානුවාදෙ,
> බුඩ්ඩා වදෙ විසතිපඤ්චමෙ භයා" යි.

මෙහි කියූ ජාති-ජරාදිය සැලකීමේ දී සිතේ ඇති වන කම්පනය භයැ යි ගන්නේ ය. මේ කරුණුවලින් සාමාන්‍යජනයෝ තැති ගන්නාහ. සැලෙන්නාහ. "භයතජ්ජිතා" යන්න "මනුස්සා" යන්-නට විශෙෂණ වේ.

නෙතං ඛො සරණං ඛෙමං = මේ සරණය නිභීය නො වේ.

නෙතං යන මෙහි **න** × **එතං** යනු පද සිඳීම ය. **න** යනුත් **ඛො** යනුත් නිපාත යි.

දෙවියන්ගේ අනුකම්පාව බැල්ම ලද්දවුනට ඒ හෙතුවෙන් යම් විටෙක මෙ ලොවින් මද අස්වැසිල්ලෙක් ලැබුනේ ද එසින් එ ලොවින් හා මෙ ලොවින් හා එන හැම උවදුරක් හැම නපුරක්

වළකනු බැරිය. ඒ එසේ නම් සසරදුකින් නිදහස්වීමට සසරබිය වළකන්නට පවිත්‍ර-වන-ආරාම-වෘක්ෂශරණයෙන් නො හැකිය යනු කියයුතු නො වේ. එහෙයින් එතැන් මට පිහිටැයි ගැණීම ඇදහීම නිසරු ය. අර්ථරහිත ය. එසේ ගැණීමෙන් කිසිවකුටත් සසරදුකින් නිදහස්වීමට පිළිවත් කමෙක් නැත්තේ ය. එසේ ගත්තේ තව තවත් දිගට සසරෙහි ගැලෙන්නේ ය. දුකෙහි බැඳ බස්නේ ය. දෙවියන් පිහිට කොට ගැණීම නිහීයට කරුණු නො වේය'' යි වදාළෝ එහෙයිනි.

බිය රහිත වූයේ **ඛෙම** නම් වේ. මේ සරණය බිය රහිත නො වේ එහෙයින් ඛෙම ද නො වේ.

න එතං සරණමුත්තමං = මේ සරණ උතුම් නො වේ.

පවිත්‍රාදිය සරණ ගියේ ද පුන පුනා සසර ගැලෙන්නේ ය. හේ සසරෙහි වූ ජාති ජරා මරණාදී වූ කිසි දුකෙකින් නො මිදෙන්නේ ය. එහෙයින් ''මේ පවිත්‍රාදිශරණය උතුම් නො වේ ය'' යි වදාළ සේක.

උත්තම නම් හැම අතකින් නැඟී සිටියේ ය. තමාට වඩා **උත්තරිතරයෙක්** නැත්තේ නම්, නෙමේ ම හැම එකෙකින් වැඩී සිටියේ නම් හේ ම උත්තම ය. එබඳු **උසස්බවෙක්** පවිත්‍රාදි ශරණයෙහි නැත්තේ ය. එහෙයින් ඒ සරණය නො උතුමැ යි වදාළ සේක.

න එතං සරණමාගම්ම = මේ සරණයට පැමිණ, සරණය ගෙණ, සරණැ යි දැන.

මෙහි ඇති **එතං** යන්න හා සැසිව සිටි **න** යනු ගාථාවෙහි යෙදී සිටි **පමුච්චති** යන ක්‍රියාපදය හා **එක්** වන්නේ ය. එහෙයින් ඒ හා එක් කොට අරුත් ගතයුතු යි. **ආගම්ම** යනු පූර්ව්‍රක්‍රියාපදයි. පැමිණ, ගෙණ, දැන යන අරුත් එයට දිය හැකි ය.

සබ්බදුක්ඛා (න) පමුච්චති = සියලු දුකින් (නො) මිදෙයි.

සබ්බදුක්ඛා යන්නෙන් සසර ඇති තාක් දුක් ගැණේ. එක ද දුකක් නො හැර සිටියේ ය එය.

යො ච = යමෙක් වනාහි.

අනියාමිතවචනයි. අසුවලාය යි මෙහි නියමයෙක් නැත. **''ගහට්ඨා වා පබ්බජිතා වා''** යි අටුවායෙහි අනියමින් දක්-වන ලද්දේ එහෙයිනි.

බුද්ධං ච = බුදුන් ද[1]

ධම්මං ච = ධර්මය ද[2]

සඞ්ඝං ච = සඞ්ඝයා ද.

සඞ්ඝ නම් ආර්‍යදෘෂ්ටියෙන් හා ආර්‍යශීලයෙන් හා එකට හැනී සිටි පුද්ගලසමූහ තෙමේ ය. "**දිට්ඨිසීලසාමඤ්ඤෙන සංහතො තථාගතස්ස අට්ඨ අරියපුග්ගලසමූහසඞ්ඛාතො සාවක සඞ්ඝො**" යනු අටුවා ය. එහිලා ම "**සීලදිට්ඨිසාමඤ්ඤතාය සඞ්ඝා තහාවං ආපනෙනා සාවකසමූහො**" යනු දන්නේ ය. කාල-වශයෙන් දෙශ වශයෙන් ජාති වශයෙන් ගොත්‍ර වශයෙන් වයස් පමණින් උගත් පමණින් වෙනසක් නො තබා ඒ විසින් කොතෙක් වෙනස් කම් ඇත්තේ ද, ශීලයෙන් දෘෂ්ටියෙන් සමාන බැවින් එක් වන බැවින් සමග්‍රකර්මයට එළඹෙන පිරිස මෙයින් දක්වන ලද ය. එසේ ම යම් පිරිසක් කෙලෙස්ගිනි මැනැවින් නිවා ද කෙලෙස්ගිනි නිවීමට පිළිවෙත් හෝ පුරා ද ඒ පිරිසය. "**සංහන්ති සමග්ගං කම්මං සමුපගච්ඡති සම්මදෙව කිලෙසදරථෙ හන්තීති වා = සඞ්ඝො**" යනු කීයේ එහෙයිනි.

දම්සක් පැවැතුම් සූත්‍රදෙශනාව ඇසූ කොණ්ඩඤ්ඤ බමුණු තෙමේ පළමු කොට ආර්‍යසත්‍යාවබොධයෙන් ආර්‍යශ්‍රාවක විය. අනතුරු ව වප්ප-භද්දිය-මහානාම-අස්සජි යන බමුණෝ පිළි-වෙළින් ආර්‍යශ්‍රාවකයෝ වූහ. මේ පස්දෙන ම එයට පසු අනත් ලකුණු සුත්දෙසුම් අසා සව් කෙලෙස් නසා රහත් වූහ. පළමු කොට ලොකයෙහි පහළ වූ සඞ්ඝ තෙමේ ය මේ.

අවිශෙෂයෙන් **සඞ්ඝ** ශබදයෙන් යම් තනි පුද්ගලසමූහයෙක් කියන ලද්දේ නමුත් ඒ පුද්ගලසමූහ තෙමේ දක්ඛිණෙය්‍යසඞ්ඝ-සම්මුතිසඞ්ඝ යි දෙ පරිද්දෙකින් ව්‍යවස්ථිත විය. එහි දක්ඛිණෙය්‍ය-සඞ්ඝ නම් අෂ්ටාර්‍යපුද්ගලසමූහ තෙමේ ය.[3]. සැදැහවතුන් විසින් කම්පල අදහා පුදන දානවස්තූන් පිළිගැණීමට හැම අතකින් සුදුසු ව සිටි බැවින් මෙ පිරිස දක්ඛිණෙය්‍යසඞ්ඝ නම් වී ය.

සම්මුතිසඞ්ඝ නම් සෝවන් මගට ද නොපත් සාමාන්‍ය භික්ෂු සමූහ තෙමේ ය. මේ සම්මුතිසඞ්ඝ තෙමේ චතුවග්ග-පංචවග්ග-දස වග්ග-වීසතිවග්ග-අතිරෙකවීසතිවග්ග යි කර්මවශයෙන් පස්වැදැ-රුම් වේ. උපසම්පන්න වූ සාමාන්‍ය භික්ෂූන් සතර නමක් එක් වූ

1. 14. 1. 'තං බුඩමනන්තගොචරං' යනු බලනු.
2. 1. 14. 'ධම්මස්ස' යනු බලනු.
3. 2. 1. 'අරියානං' යනු බලනු.

කල්හි එතැන චතුවඟඟයි ගණිනු ලැබේ. සෙසු තැන ද මේසේ දන්නේ ය. එහි උපසම්පදා-පවාරණ-අබ්භානකර්ම හැර අන් හැම සඞ්ඝකර්මයක් චතුවර්ගික සඞ්ඝයාට කළ හැකි ය. මධ්‍යමජන-පදයන්හි උපසම්පදාවත් අබ්භානයත් හැර අන් හැම සඞ්ඝකර්මයත් පඤ්චවර්ගික සඞ්ඝයාට කළ හැකිය. දශවර්ගික සඞ්ඝයාට අබ්භාන කර්මය හැර අන්‍ය වූ සඞ්ඝකර්ම කළ හැකි ය. විංශද්වර්ගික-අතිරෙක විංශද්වර්ගික සඞ්ඝයාට නො කළැකි සඞ්ඝකර්මයෙක් විනයයෙහි නැත්තේ ය. **"පංච සඞ්ඝා. චතුවග්ගෝ භික්ඛුසඞ්ඝෝ, පංච-වග්ගෝ භික්ඛුසඞ්ඝෝ, දසවග්ගෝ භික්ඛුසඞ්ඝෝ, වීසතිවග්ගෝ භික්ඛුසඞ්ඝෝ, අතිරෙකවීසතිවග්ගෝ භික්ඛුසඞ්ඝෝ. තත්‍ර භික්ඛවෙ! යවායං චතුවග්ගෝ භික්ඛුසඞ්ඝෝ ඨපෙත්වා තිණ්ණං කම්මානි උපසම්පදං පවාරණං අබ්භානං ඔමෙමන සමග්ගෝ සඛණ්ඩසීමාය කම්මප්පත්තෝ. තත්‍ර භික්ඛවෙ! යවායං පංචවග්ගෝ භික්ඛුසඞ්ඝෝ ඨපෙත්වා වෙ කම්මානි මජ්ඣිමෙසු ජනපදෙසු උපසම්පදං අබ්භානං ඔමෙමන සමග්ගෝ සඛණ්ඩසීමාය කම්ම-ප්පත්තෝ. තත්‍ර භික්ඛවෙ! යවායං දසවග්ගෝ භික්ඛුසඞ්ඝෝ ඨපෙත්වා එකං කම්මං අබ්භානං ඔමෙමන සමග්ගෝ සඛණ්ඩසීමාය කම්මප්පත්තෝ. තත්‍ර භික්ඛවෙ! යවායං වීසතිවග්ගෝ භික්ඛුසඞ්ඝෝ ඔමෙමන සමග්ගෝ සඛණ්ඩසීමාය කම්මප්පත්තෝ. තත්‍ර භික්ඛවෙ! යවායං අතිරෙකවීසතිවග්ගෝ භික්ඛුසඞ්ඝෝ ඔමෙමන සමග්ගෝ සඛණ්ඩසීමාය කම්මප්පත්තෝ"** යනු විනය දෙශනා ය.

විනයයෙහි ආ කර්මවිසින් පස් වගකට බෙදුනු මේ භික්ෂුසමූහය මෙහිලා අභිමත නො වේ. අභිමත වූයේ ප්‍රධාන වසින් ආර්‍ය්‍ය ශ්‍රාවකසඞ්ඝ තෙමේ ය. බුද්ධ-ධම්ම-සඞ්ඝ යන තෙරුවන් සරණ ගියේ නම් **"ඉතිපි සො භගවා අරහං"** යනාදීන් ආ බුද්ධානුස්සති කම්මට්ඨානයත් **"ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ"** යනාදීන් ආ ධම්මානුස්සතිකම්මට්ඨානයත් **"සුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝ"** යනාදීන් ආ සඞ්ඝානුස්සතිකම්මට්ඨානයත් ඇසුරු කොට ශ්‍රේෂ්ඨ වසින් සරණ ගියේ ය. මාර්ගඵලශරණගමනයෙන් සරණ ගියේ ය. මොහුගේ සරණය අන්‍යතීර්ථකාදීන් වන්දනමානනාදී වූ කිසි හෙතුවෙකින් නො ද සැලෙන්නේ ය. නො ද බිඳෙන්නේ ය: ඒ දක්වනු සඳහා ය **"චත්තාරි අරියසච්චානි"** යනුත් වදළෝ.

චත්තාරි අරියසච්චානි = චතුරාර්‍ය්‍යසත්‍යයන්.

මෙහි **චත්තාරි** යනු සඞ්ඛ්‍යා දක් වන්නේ ය. ආර්‍ය්‍යසත්‍ය සතරෙකැ යි එයින් දක්වන ලදි. අඩු ද නැත. වැඩි ද නැත. ලැබෙනුයේ සතරෙක් ම ය. "පස්වන සත්‍යයෙක් ද ඇත, සතරෙක්

නොවේ, පසෙකි, සතරෙක් නොවේ, තුණෙකි, එහෙයින් එකෙක් හළයුතු ය, මේ නියූ සතර ආර්යසත්‍යය නොවේ, මෙයින් අන් සතරෙක් ආර්ය සත්‍ය වේ'' යන ආ ලෙසින් ප්‍රතිවිරුද්ධ ව සිතන්නට කියන්නට දක් වන්නට සමතෙක් මේ මුළු තුන් ලොව එදත් නොවී ය. දැනුත් නැත්තේ ය. මතු ද නොවන්නේ ය. එයට කරුණ, මෙයින් අන්‍ය වූ සත්‍යස්වභාවයක් නොලැබීම මින් එකාන්ත අසත්‍යය යි බැහැර ලන්නට නොහැකිවීම මේ සතර එකාන්ත සත්‍යවීම යන මේ ය. මේ සතරට ඇතුළත් නොවූ කිසිත් පදාර්ථයෙක්, වැඩිය යි හළ යුතු එක ද පදාර්ථයෙක්, මෙයින් අන්‍ය වූ එක ද පදාර්ථයෙක් භවත්‍රයයෙහි එකාන්තයෙන් නැත්තේ ය.

සසරෙහි ඇත්තේ පැවැත්ම නැවැත්ම හා එහි හෙතු ද පමණෙකි. හෙතූන්ගෙන් තොර ව සසරෙහි පැවැත්මෙක් නැත. එහෙයින් සසරෙහි පැවැත්ම හෙතුසහිත ය. සසරෙහි නැවැත්ම නිකමට නොවන්නේ ය. එයට උපායය ඇත්තේ ය. එහෙයින් නැවැත්ම උපායසහිත ය. සසරෙහි පැවැත්ම නම් දුඃඛසත්‍යය යි. පැවැත්මට හෙතු වූයේ සමුදයසත්‍යය යි. සමුදය නම් තෘෂ්ණා ය. සමුදය නම් වූ තෘෂ්ණාව නිසා දුකෙහි දිගින් දිගට පැවැත්ම වේ. එහෙයින් දුඃඛසත්‍යය වදාරණ තැන එයට හෙතු වූ සමුදයසත්‍යය ද වදාළ සේක.

සසරෙහි නැවැත්ම නම් නිරෝධසත්‍යය යි. දුක් නැති කිරීමෙන් පැමිණිය යුතු වූ නිවනයි. දුකෙහි නැවැත්මට හෙවත් නිවනට උපායය වූයේ මාර්ගසත්‍යයයි. එහෙයින් නිරෝධසත්‍ය නම් වූ නිවන වදාරණ තැන එයට උපායය වූ මාර්ගසත්‍යය ද වදාළ සේක.

මෙසේ පැවැත්ම හා නැවැත්ම හා එ දෙකෙහි හෙතු ද හැර ඉන් වැඩියක් නොලැබෙන බැවින් ඒ පරම කොට සත්‍ය සතරක් ම වදාරණ ලද්දේ ය.

බෙදා වෙන් කොට ලක්ෂණ-රසාදීන්ගේ වශයෙන් පිරිසිඳ දතයුතු ධර්ම, මාර්ගභාවනා බලයෙන් මුළුමනින් දුරු කළයුතු ධර්ම, මාර්ගඥනබලයෙන් ප්‍රත්‍යක්ෂ කළයුතු ධර්ම, තමන්ගේ සිත්හි පුන පුනා වැඩිය යුතු ධර්ම යන සතරක් ම ලැබෙන බැවිනුත් සත්‍ය සතරෙක් ම වන්නේ ය.

තෘෂ්ණාවට වස්තු, තෘෂ්ණා, තෘෂ්ණානිරෝධ, තෘෂ්ණානිරෝධයෙහි උපායය යන මේ වශයෙන් හා කාමවස්තු-කාමාලය-ආලය නිරෝධ-එහි උපාය ය යන මේ වශයෙන් හා සත්‍ය සතරෙක් ම ලැබේ. **චතුකාරි** යනු යෙදුනේ, මෙසේ සත්‍ය සතරක් ම අඩුත් වැඩිත් නැති ව ලැබෙන බැවිනි.

අරිය-සච්ච ශබ්ද දෙක්හි සමස්තය **අරියසච්ච** යනු යි. **අරිය** ශබ්දය විශෙෂ විසින් යෙදී සිටියේ බුදුරජානන් කෙරෙහි ය. සොතාපත්තිඵාවාදී වූ අටවැදෑරුම් ආර්‍යීභාවයෙහි ද එසේ වත්නා වූ තතුපරිදි දැන ගන්නා වූ අන්පරිදි නො වන්නා වූ දැයෙහි ද යෙදෙයි. **අරිය** නම් බුදු-පසේබුදු-මහරහත්හු ය. පුහුදුන් බැවින් නොරවුවෝ මෙහිලා ආර්‍යීයෝය යි ගණිත්. **"අරියානං ගොචරරතා"** යනු බලනු.

සච්ච ශබ්දය මෙහිලා ආර්‍යීසත්‍යයෙහි එත්තේ ය. එහෙයින් විද්‍යමාන වූ සවභාවය ම ඇති සැටිය ම මෙසින් ගැණේ. බුදු-පසේ බුදු--මහරහතුන් විසින් අවබොධ කරණ හෙයින්, බුදුරජුන් විසින් සොයාගත් බැවින්, බුදුරජුන්ට ම අයත් බැවින්, එසේ ම වනබව, කිසිලෙසකින් අසත්‍ය නො වන බව, අන් අසුරකින් නො වන බව යන **තථ-අවිතථ-අනඤ්ඤථ** බැවින්, පුහුදුන්බව නසා ආර්‍යීභාවය සිදුකරණ බැවින් යන වදනාහි වශයෙන් විද්‍යමාන සවභාවය ම ආර්‍යීසත්‍යය යි දතයුතු ය[1]

ආර්‍යීභාවය සිදු කරණ බැවිනැ යි මෙහි කියේ සොතාපන්නාදී වූ මාගීසථ-ඵලසථ පුද්ගලයන් අටදෙනාගේ ලැබීම ය. ආර්‍යීභාවය සිදු වත්තේ චතුරාර්‍යීසත්‍යය අවබොධ කිරීමෙනි. චතුඃසත්‍යය නැති කල්හි මාගීඵලාවබොධයෙක් නැත. සත්‍යප්‍රතිවෙධය ම එයට කරුණු ය.

මුල දී විදසුන් නුවණින් හා අධිගමකාලයෙහි මගනුවණින් හා විමසන්නහුට ඉන්ද්‍රජාලයක් සේ විපරීත ද නො ව මිරිඟුවක් සේ රැවටිල්ලක් ද නො ව වරදවා ගත් ආත්මය සේ නො ලැබිය හැකි ද නො ව පෙළෙනබව, හටගැණුමට හෙතුවනබව, සන්සිඳුනුබව, සසරින් නික්මෙන බව යන සිවු අයුරින් සත්‍ය වූ විපරීත නො වූ මාගීඥනයට ම ගොදුරු වන්නා වූ මාගීඥනයෙන් ම දත යුත්තා වූ යමෙක් වේ ද, ඒ මේ යථාභූතාර්‍යීය ඇති සැටිය සත්‍යාර්‍යීය යි කියන ලද්දේ ය.

සම්මප්පඤ්ඤාය පස්සති = මනා කොට දකියි.

විදසුන් නුවණින් දැකීම, මනා කොට නුවණින් දැකීම ය. පිරිසිඳ දැනීම ය.[2].

ආර්‍යීසත්‍යය විදසුන් නුවණින් දක්නාහුගේ සරණය ම අන්‍ය නිර්‍වීක වඳනාදී වූ කිසිත් හෙතුවෙකින් නො ද දෙදරන්නේ ය.

1. 1. 7. 'අපෙතො දමසවෙචන' යනු බලනු.

2. 10. 10. 'සම්පන්නවිජ්ජාචරණ' යනු බලනු.

නො ද සැලෙන්නේ ය. මෙබන්දහුගේ සරණය ම බවදුක් නැසීමට ඉවහල් වන්නේ ය. සියලු සසරදුකින් මිදෙන්නේ ද මෙ තෙ මේ මැයි කොටින් දතයුතු ය.

දුක්ඛං = දුක්ඛසත්‍යය (ද)

දුඃඛසත්‍යය ආර්‍යසත්‍ය අතුරෙහි පළමුවැන්න ය. **දුඃඛ** නම් උපාදානස්කන්ධ පංචකය යි. **"කතමං ච භික්ඛවෙ! දුක්ඛං අරිය-සච්චං?"** මහණෙනි! දුඃඛාර්‍යසත්‍යය කවරේ ද? යත්: **"පඤ්චු-පාදානක්ඛන්ධො"** පංච උපාදානස්කන්ධයෝ ය. මේ එහි සංක්ෂිප්ත දෙශනා ය. රූපොපාදානස්කන්ධය-වෙදනොපාදානස්කන්ධය සංඥොපාදානස්කන්ධය – සංස්කාරොපාදානස්කන්ධය – විඥානොපාදානස්කන්ධය මේ පස උපාදානස්කන්ධයෝ ය. කාම-දිට්ඨි - සීලබ්බත-අත්තවාද යන මොවුනට විෂය වන කෙලෙස් සහිත වූ රූප-වෙදනා-සංඥා-සංස්කාර-විඥාන යන ස්කන්ධයෝ ම ය උපාදානස්කන්ධ.

එකොළොස් වැදැරුම් වූ කාමභවය, සොළොස් වැදැරුම් වූ රූපභවය, සිවු වැදැරුම් වූ අරූපභවය යන භවත්‍රයයට ඇතුළත් කර්ම විපාකයන්ගේ පැවැත්මැ යි කියන උපාදානස්කන්ධයන්ගේ පිළිවෙළ නො සිඳ දිගින් දිගට යෑම දුඃඛ නැමැයි මෙසේත් කිය හැකි ය. **"දුක්ඛං තෙභූමකං වට්ටං"** යනු එහිලා දතයුතු ය.

දුඃඛ ශබ්දයෙහි පෙණෙන **දු** යනු නින්දා කළයුතු යන අරුත්හි වැටේ. නින්දා කළ යුතු පිළිකුල් කළ යුතු පුත්‍රයාට **දුපුත්ත** යි ද පිළිකුල් කළ යුතු ගන්ධයට **දුගගන්ධ** යි ද කියත්. හිස් වූ කිසි දැයක් නැති අහසට **ඛ** යි කියත්. **ඛ** ශබ්දය හිස් ය යන අරුත්හි වැටේ. එහෙයින් **දු-ඛ** ශබ්ද දෙක එක් වූ කල්හි "නින්දා කළ යුතු හිස් දෙය" යන අරුත නැගී එන්නේ ය. ප්‍රථමාර්‍යසත්‍යය එනම් පංචොපාදානස්කන්ධය, ත්‍රෛභූමක වෘත්තය රොගපීඩාදී වූ නො යෙක් උවදුරුවලට ආධාරස්ථාන බැවින් නින්දා කටයුතු ද, අඥයන් විසින් ගත් ධුව-සුභ-සුඛ-අත්තභාව යන මෙයින් හිස් බැවින් ශූන්‍ය ද වේ. මෙසේ කුත්සිත බැවින් තුච්ඡ බැවින් ඒ මේ පංචොපාදානස්කන්ධය දුක්ඛ යි කියනු ලැබේ. මෙය ආර්‍ය වූ බුදුරජානන් වහන්සේ විසින් ම දැන වදාළ බැවින්, මෙය දැන ගැණීම ආර්‍යභාවයට කරුණු බැවින් ආර්‍යසත්‍ය නම් වේ. දුඃඛ වූ ආර්‍ය සත්‍යය දුඃඛාර්‍යසත්‍ය නම්.

දුඃඛාර්‍යසත්‍යයෙහි **පීඩන-සඞ්ඛත-සන්තාප-විපරිණාම** යි අර්ථ සතරෙක් වේ. **"දුක්ඛස්ස පීළනට්ඨො, සඞ්ඛතට්ඨො, සන්තාපට්ඨො, විපරිණාමට්ඨො, ඉමෙ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා**

තථා අවිතථා අනඤ්ඤථා'' යනු අටුවා යි. සිත කය දෙක පෙළන ගතිය **පීඩන** නම්. හෙතුප්‍රත්‍යයයන්ගෙන් සකස් කැරෙණ බව **සඞ්ඛත** නම්. දුක කරණ කොට හාත්පසින් කැරෙණ තැවුලිය **සන්තාප** නම්. ගින්නකින් මෙන් රාගාදික්ලෙශදාහයෙන් දැවීම තැවීමය ඒ. මුල් පැවැත්මෙහි වෙනස්වීම පුන පුනා බිඳී යෑම **විපරිණාම** නම්. මොවුහු වනාහි දුඃඛසත්‍යයාගේ තත්ස්වභාව වූ නො ද බොරු වූ අන්‍යාකාර රහිත වූ දුඃඛස්වභාවයෝ ය.

මේ භවත්‍රයයෙහි කිසි ද තැනෙක මෙකී දුඃඛස්වභාවයන්ගෙන් තොර වූ දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍ය-නරක තිර්‍යක් ප්‍රෙතාදී වූ කිසිත් පදාර්ථයෙක් නැත්තේ ය. ලොව ඇති තාක් හෑම පදාර්ථයෙක් මේ සතරට යටත් ව පවත්නේ ය. එහෙයින් භවත්‍රයය පුරා සිටියේ දුක ය. දුඃඛසත්‍යය පිළිබඳ වූ මේ ස්වභාවධර්මයෝ මාර්ගඥානයට විෂය ව සිටියෝය යි දත යුතු ය.

ලක්ෂණ විසින් දුඃඛසත්‍යය පෙළීම ලකුණු කොට සිටියේ ය. **රස** විසින් තැවීම රස කොට සිටියේ ය. **පච්චුපට්ඨාන** විසින් සසරෙහි පැවැත්ම ඵල හෝ වැටහීම කොට සිටියේ ය. නිරෝධ සත්‍යය හෙතුන්ගෙන් සකස් වන්නක් නො වන බැවින් ආර්‍ය්‍ය සත්‍යවිෂයයෙහි පදට්ඨානයෙක් නො ලැබෙන්නේ ය.

> ''න බාධකං යතො දුක්ඛං දුක්ඛා අඤ්ඤං න බාධකං,
> බාධකත්තනියාමෙන තතො සච්චමිදං මතං''

දුක පෙළීම ලකුණු කොට සිටි බැවින් භවත්‍රයය පුරා සිටි ජාත්‍යාදි දුඃඛය කිසිවිටෙකත් සත්ත්වයන් නො පෙළන්නේ නො වේ ද, යම්හෙයකින් ජාත්‍යාදිදුඃඛයෙන් අන්‍යයකු පෙළන්නේ නො වේ ද, එහෙයින් දුඃඛයාගේ බාධකභාවය අනෙකක්හුගේ අබාධක භාවය යන මේ දෙවැදැරුම් නියමයෙන් ලැබෙන්නා වූ තථ-අවිතථ-අනඤ්ඤථ වූ පෙළීම දුඃඛයාගේ සත්‍යාර්ථය යි දතයුතු ය.

ඉතා සැකෙවින් කියූ මේ දුඃඛසත්‍යයෙහි තෘෂ්ණාව හා ආශ්‍රව ධර්මයන්ට අරමුණු නො වූ ලොකොත්තරධර්මත් හැර අන් සියලු ත්‍රෛභූමකධර්ම ඇතුළත් වේ. **''දුක්ඛසච්චස්මිං හි ඨපෙත්වා තණ්හා චෙව අනාසවධම්මෙ ච සෙසා සබ්බධම්මා අන්තොගධා''** යනු ආප්තයි.

දුඃඛසත්‍යය වදාරණ බුදුරජානන් වහන්සේ දුඃඛසත්‍යයෙහි ඇතුළත් කරුණු සමහර සූත්‍රප්‍රදෙශයන්හිලා **''ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සු-**

පායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා'' යි දුක් දෙළොසක් වදාළ සේක.

එහෙත් සමහර තැනෙක සොක-පරිදෙව-දුක්ඛ-දෙමනස්ස-උපායාස යන පස හැර එහිලා ව්‍යාධිය ඇතුළත් කොට ධර්ම අටක් දෙසූ සේක. එහෙයින් මෙය මෙසේ දතයුතු ය : ව්‍යාධිය කායික-මානසික වශයෙන් දෙ පරිදි ය. එහි පරිදෙව-දුක්ඛ දෙක කායික වෙයි. සොක-දෙමනස්ස-උපායාස තුණ මානසික වෙයි. මෙසේ මේ පස කායික-මානසික විසින් වෙන් වූයේ ද, ව්‍යාධිය ම වේ. යම් තැනෙක ව්‍යාධිය වදාළෝ නම්, එ තැන සොකපරිදෙව දුක්ඛ දෙමනස්සඋපායාසයෝ ද ගැණෙත්. යම් තැනක සොකපරිදෙව-දුක්ඛදෙමනස්සඋපායාසයන් වදාළෝ නම්, එ තැන කායික-මානසිකව්‍යාධිය ද ගැණේ. එක ම දෙශනාව මෙසේ ක්‍රමදෙකෙකින් වදාළෝ ශ්‍රාවකයන්ගේ චරිතයනට අනුකූල කොට ය. මිනිසුන් අතර ව්‍යාධිය ප්‍රකට බැවින් දම්සක්පැවැතුම් සූත්‍රාදීන්හි ව්‍යාධි පදය බැහීමෙන් ද, දෙවියන් අතර කායිකව්‍යාධිය අප්‍රකට බැවින් ඒ ප්‍රකට කරුණු සඳහා අභිධර්මයෙහි සච්චවිභඞ්ගයෙහි දී ව්‍යාධි පදය හැර සොකාදිපද බැහීමෙන් ද ඒ ඒ විනෙයජනයන් බලා එක ම කරුණ දෙ විධියෙකින් දෙශනා කළ බව හා කරුණු විසින් එහි කිසිත් වෙනසක් නො ලැබෙන බව හා සැලකිය යුතු ය.

ජාතිය ද දුක ය. ජරාව ද දුක ය. මරණය ද දුක ය. සොකය ද දුක ය. පරිදෙවය ද දුක ය. කායිකදුක්ඛය ද දුක ය. දෙමනස්සය ද දුක ය. උපායාසය ද දුක ය. සැකෙවින් උපාදානස්කන්ධ පස දුක ය යනු මුලින් දැක් වූ දෙශනාවෙහි කෙටි තේරුම ය.

ජාතිපි දුක්ඛා යන මෙහි ජාතිය වදාළ සැටි මෙසේ දන්නේ ය. **''යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධාතං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති ජාති''** යි.

ජාති ශබදය **''එකම්පිජාතිං දෙවපි ජාතියො''** යනාදි තන්හි භවයෙහි ය. **''අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාති''** යනාදී තන්හි නිකායයෙහි ය. **''තිරි නාම තිණජාති නාභියො උග්ගන්ත්වා නභං ආහච්ච ඨිතා අහොසි''** යනාදී තන්හි ප්‍රඥප්තියෙහි ය. **''ජාති චීහි ඛන්ධෙහි සඞ්ගහිතා.''** යනාදී තන්හි ප්‍රත්‍ය

ප්‍රත්‍යයෝත්පන්නධර්මයන්ගේ උත්පාදලක්ෂණයෙහි ය. **"යං මාතුකුච්ඡිම්හි පඨමං චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං තදුපාදාය සාවස්ස ජාති"** යනාදි තන්හි ප්‍රතිසන්ධියෙහි ය. **"සම්පති ජාතෝ ආනන්ද! බොධිසත්තෝ"** යනාදි තන්හි ප්‍රසූතියෙහි ය. **"අනුපකුට්ඨා ජාතිවාදෙන"** යනාදි තන්හි කුලයෙහි ය. **"සතෝහං භගිනි! අරියාය ජාතියා ජාතෝ"** යනාදි තන්හි ආර්‍යශීලයෙහි ය. හේ මෙහි වූයේ අණ්ඩජ-ජලාබුජසත්ත්වයන්ගේ පිළිසිඳ ගැණීමෙහි පටන් මවුකුසින් බිහිවීම දක්වා පැවැති සකඞ්ගයන්හි හා සංසෙදජ - ඔපපාතිකසත්ත්වයන්ගේ පිළිසිඳ ගන්නා කාලයෙහි පවත්නා වූ සකඞ්ගයන්හි ය. ඒ ද අප්‍රධාන විසිනි. ප්‍රධාන විසින් ඒ ඒ යොනිගති ආදියෙහි වූ සත්ත්වයන් පිළිබඳ ආදියෙහිලා ම පහළ වන සකඞ්ගයන් කෙරෙහි වැවේ.

ඒ මේ ජාතිය ආදිඋත්පත්තිය ලකුණු කොට සිටියා, ආදි උත්පත්තිය දුකට පාවාදීම කෘත්‍යය කොට සිටියා, අතීතභවයෙන් මේ භවයෙහි මතුවීම වැටහීම කොට සිටියා, දුඃඛවිචිත්‍රතාවය ඵල කොට සිටියා ය.

"ඉදං කි දුක්ඛං නාම අනෙකං නානප්පකාරකං" යි ආදිය **දුක්ඛදුක්ඛ-විපරිණාමදුක්ඛ-සඞ්ඛාරදුක්ඛ-පටිච්ඡන්නදුක්ඛ අපටිච්ඡන්නදුක්ඛ - පරියායදුක්ඛ - නිප්පරියායදුක්ඛ** යි දුක සත් කොටසක් කොට දක්වන ලද්දේ ය.

එහි දුක්ඛවේදනා, සභාව විසින් හා නාම විසින් හා නොමේ ම දුක් බැවින් කායික-මානසික විසින් දෙ පරිදි වූ දුක්ඛ වේදනාව **දුක්ඛදුක්ඛ** නම් වා. කායවඤ්ඤාදී වූ සුඛවේදනාව සභාව විසින් දුක් නො වතුදු අන්‍යඨානියට පැමිණෙන බැවින් හා දුක් ඉපදීමට හෙතුවන බැවින් හා **විපරිණාමදුක්ඛ** නම් වා. උපෙක්ඛාවේදනාව හා අන්‍ය වූ ත්‍රෛභූමකසංඝස්කාර හා උදය-ව්‍යය දෙකෙන් පෙළෙන බැවින් **සඞ්ඛාරදුක්ඛ** නම් වා. මේ වනාහි මාගී ඵල පිළිබඳ ද වන්නේ ය. එහෙයින් මාගී-ඵලඛීයෝ දුඃඛසත්‍යයෙහි ඇතුළත් වෙත්. එහිලා **"පීළනමපත්ත මග්ගඵලානම්පි අත්ථි තඤ්ච දුක්ඛ සච්චපරියාපන්නත්තෙන සඞ්ඛාරදුක්ඛං නාමාති වෙදිතබ්බා"** යනු දතයුතු ය. කත් කැක්කුම් දත් කැක්කුම් හා රාග දොෂයන් ගෙන් හටගත් තැවුලි යනාදි වූ කායික-චෛතසික ආබාධය විවාරා ම දතයුතු බැවින් හා අප්‍රකට බැවින් **පටිච්ඡන්නදුක්ඛ** නම් වේ. දෙතිස් කම් කටොලු ආ නිසා හටගත් ආබාධය නො විවාරා ම දත හැකි බැවින් හා උපක්‍රමයාගේ ප්‍රකට බැවින් හා **අපටිච්ඡන්නදුක්ඛ** නම් වේ. මෙහිලා කියාවුනු නො ද කියාවුනු

දුක් අතුරෙහි දුක්ඛදුක්ඛය හැර දුක්ඛසච්චවිභඞ්ගයෙහි දැක් වූ අනෙක් ජාත්‍යාදී වූ සියලු දුක් ඒ ඒ දුකට වසතු වන බැවින් **පරියාය දුක්ඛ** නම් වේ. දුක්ඛදුක්ඛය **නිප්පරියායදුක්ඛය** යි කියන ලදි. මෙසේ ඇති කල්හි හැම දුකෙක් ම දුක්ඛදුක්ඛ – පරියායදුක්ඛ දෙක්හි ම ඇතුළත් වේ. එහෙයින් ජාතිය ද තොමෝ ම දුක් නො ව දුකට වසතු වන බැවින් ද පරියායදුක්ඛයෙහි සඞ්ග්‍රහයට යන්නී ය.

දුඃඛසත්‍යය කිය යුත්තේ පරියායදුක්ඛ–නිප්පරියායදුක්ඛ යන දෙ පදයෙහි පිහිටා සිට ය. පෙළෙහි මෙය සැකෙවින් හා විසතර විසින් හා ඇයේ ය. විසතර විසින් ඇයේ ඉතා දිග ය. ඒ දීඝී විසතර යට මෙ තැන තැන් නො වේ. එහෙයින් මෙහි එය ඉතා සැකෙවින් එන්නේ ය.

සකඛයන්ගේ මුල් පහළවීම ජාති යි යට කියන ලදි. බුදුරජාණන් වහන්සේ විසින් එය බාලපණ්ඩිතසූත්‍රාදියෙහි උපමා වශයෙන් දුක් වූ සිවු අපායයෙහි වූ හැම දුකටත් මනුෂ්‍යලොකයෙහි ගබ්භොක්කන්තිකමූලක-ගබ්භපරිහරණමූලක-ගබ්භවිපත්තිමූලක-ගබ්භවිජායනමූලක-බහිනික්ඛමණමූලක-අත්තුපක්කමමූලක-පරූපක්කමමූලකදුක්ඛ යනාදී වූ ඇති නාක් හැම දුකටත් වසතුවන බැවින් දුක් වේ. ජාතිය ඇති කල්හි ම හැම දුක් වන්නේ ය. එහෙයින් ජාතිය දුකැයි දතයුතු ය.

> "ජායෙථ නො වෙ නරකෙසු සත්තෙනා
> තත්ථග්ගිදුහාදිකමපපසය්හං,
> ලභෙථ දුක්ඛං නු කුහිං පතිට්ඨං
> ඉච්චාහ දුක්ඛාති මුනීධ ජාති"

සත්ත්ව තෙමේ නරකයන්හි නො උපදී නම්, ඒ නරකයන්හි ගින්නෙන් දනු ලැබීම් ආදී වූ නො ද ඉවසිය හැකි දුක කො තැනක පිහිටක් ලබා ද. ජාතිය නො වේ නම් දුකෙක් නැත. බුදුරජාණන් වහන්සේ ඉපැත්ම දුකැයි වදාළේ එහෙයිනි.

> "දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද
> දණ්ඩාභිඝාතාදිභවං අනෙකං
> යං තං කථං තත්ථ භවෙය්‍ය ජාතිං
> විනා තහිං ජාති තතොපි දුක්ඛා"

තිරිසනුන් කෙරෙහි කසය කෙවිටය දඹුය යන මෙයින් පහර දීම් හෙතුවෙත් හටගන්නා වූ දුක් නත්වැදූරුම් වේ ද, ඒ සියල්ල තිරිසනුන් කෙරෙහි ඉපදීමක් නැති ව කෙසේ නම් වන්නේ ද. එහෙයින් ඉපැත්ම දුක් ය.

"නිබ්බන්ධකාරෙ ච අසය්හසීතෙ
ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං,
න තං භවෙ තත්ථ න චස්ස ජාති
යතො අයං ජාති තතොපි දුක්ඛා"

අඳුරෙන් ගහන වූ නො ඉවසිය හැකි සීත ඇත්තා වූ ලොකන්තරික නරකයෙහි ද විනිපාතික අසුරයන් කෙරෙහි ද යම් දුකෙක් වේ නම්, ඒ දුක එහි ඉපැත්මෙක් නො වේ නම් නො වන්නේ ය. එහෙයින් ඉපැත්ම දුක් ය.

"යං චාපි ගුථනරකෙ විය මාතුගබ්භෙ
සත්තො වසං චිරමතො බහි නික්ඛමං ච,
පප්පොති දුක්ඛමතිඝොරමිදම්පි නත්ථි
ජාතිං විනා ඉතිපි ජාතිරයං හි දුක්ඛා"

ගුථනරකය වැනි මවුකුසෙහි බොහෝ කල් වසන සත්ත්ව තෙමේ මවුකුසින් බැහැර නික්මෙන්නේ ගර්භාවක්‍රාන්තිමූලකාදී වූ යම් දුකකට පැමිණේ ද, ඉතා දරුණු වූ මේ දුක ද ඉපදීමෙක් නැත්තේ නම් නො වන්නේ ය. එහෙයින් ඉපැත්ම දුක් ය.

මේ ගාථාවෙහි දැක්වෙන පරිදි ජාතිය නිසා යට කියූ ගබ්භොක්කන්තිකමූලකාදිදුක්ඛයන්ගේ පැවැත්ම වනබව දත යුතු ය. ඒ පිට, එය පදනම් කොට මෙ දුක් හැම රඳා සිටුනේ ය.

ගබ්භොක්කන්තිකමූලකදුක්ඛය නම්, මවුකුස උපදින්නා වූ සත්ත්වයා පියුම් උපුල් ගැබෙක හෝ රන් රිදී කරඬුවෙක හෝ නො ම උපදියි. ඉපැදෙනුයේ ආමාශය යට පක්වාශය මතුයෙහි අතුණුවැටි පිටිකටු අතර අවකාශ රහිත වූ ලොකාන්තරිකනරකයක් සේ ඉතා අඳුරු වූ ගුථනරකය සේ පිළිකුල් වූ පරම දුර්ගන්ධ වාතයෙන් තදබද වූ මවුකුසෙහි වැසිකිළි වළෙක උපදනා පණුවකු සේ ය. ඔහු දස මසක් මුළුල්ලෙහි මවුකුසෙහි උෂ්ණයෙන් පැසෙමින් ශීතයෙන් ගැසෙමින් වාතයෙන් සැලෙමින් අත්පා හැකිළීම් දිගු කිරීම් රහිත ව දුක් විඳියි. මේ වනාහි එහිදී මේ සත්ත්වයා විසින් දසමස් කාලය තුළ විඳින්නා වූ දුක් ය.

ගබ්භපරිහරණමූලකදුක්ඛය නම්, මවුගැබ උපන් පසු එගැබ පරිහරණකාලයෙහි ගැබ උපන්නහු විසින් විඳින දුක් ය. මවුකුස උපන් සත්ත්වයා බිහිවනතුරු ම මවගේ ඉදීම් සිටීම් නැගී සිටීම් පෙරළීම් ආදී වූ ක්‍රියාවන්හි, කෑම් බීම් වැමැරීම් ආදී වූ ක්‍රියාවන්හි, රාසොඬකු අතට පත් එළුවකු සේ ද, ඇදීම් බැහීම්

යටිහුරු ව උඩුහුරු ව සැලීම් ආදී වූ ක්‍රියාවන්හි අභිතුණ්ඩිකයකු අතට පත් සර්පයකු සේ ද, ඉතා දැඩිදුක් විඳියි. එසේ ම මවු ඇල්දිය ගන්නා කල්හි ශීතනරකයෙහි උපන්නකු සේ ද, උණු කැඳ උණුබත් ඇ ගන්නා කල්හි උණු අඟුරු වැස්සෙන් වට කරණ ලද්දකු සේ ද, ලුනු ඇඹුල් ඇ ගන්නා කල්හි ලුනුදිය පිරී ගත් වෙතරණිනරකයෙහි උපන්නකු සේ ද දුක් විඳියි.

ගබ්භවිපත්තිමූලකදුක්ඛය නම්, ප්‍රසූතියෙහි ක්‍රම විරුද්ධවීමෙන් විඳිය යුතු දුක ය. මූඝගර්භය යි කියන සරස් වූ දරුගැබ් ඇති මවගේ නෑ හිතමිතුරන් විසින් බෙහෙවින් දුක් උපද වන්නා වූ ස්ථානයන්හි කරවනු ලබන කැපීම් කෙටීම් පැළීම් ආදියෙන් උපදනා දුක් ය.

ගබ්භවිජායනමූලකදුක්ඛය නම්, දරු බිහිවන වේලෙහි විඳිනා දුක් ය. මවගේ කුසතුළ ම හට ගන්නා වූ කර්මජවාතයෙන් ලදරු සිරුරෙහි හිස යටිහුරු ව පා උඩුහුරු ව ලං වන්නේ ය. නැවැත පරමසම්බාධ වූ යොනිමුඛයෙන් නික්මෙන වේලෙහි ඒ ලදරු කෙසි සිදුරකින් නික්මෙන ඇතකු සේ සඞ්ඝාතනරකයෙහි පෙරළෙන පර්වත දෙකට හසු වී තැළෙන සුණු වන නිරිසතකු සේ බලවත් දුකට පත් වේ. මවු තොමෝ ද මාරණාන්තික වූ දුක් විඳියි.

බහිනික්ඛමණමූලකදුක්ඛය නම්, මෙසේ අතිමහත් දුකින් මැඩෙමින් ගැටෙමින් උපන්, අළුත් වණයක් වැනි සියුමැලි සිරුරු ඇති ඒ සත්ත්වයා විසින් අතින් ගන්නා වූ නාවන්නා වූ සෝදන්නා වූ රෙදිකඩින් පිරිමදින්නා වූ හැම වේලෙහි ඉදිකටුතුඩින් විදිනා වැනි ව කරමුවහතින් පළනා වැනි ව විඳිනු ලබන දුක් ය.

අත්තුපක්කමමූලකදුක්ඛය නම්, ඉපිද වැඩිවිය පැමිණ දිවි ගලවන කාලයෙහි තමා ම තමන් නසා ගන්නා කාලයෙහි අවෙලකව්‍රතාදීන්ගේ වශයෙන් පස් වැදැරුම් තැවීම් පෙළීම් ආදී වූ ක්‍රියාවන්හි යෙදෙන කාලයෙහි ලොභ දෙවෂ මොහාදි අකුශලයන්ගේ බලවත් බැවින් නො කා නො බී කල් ගෙවන කාලයෙහි ගෙල වැල ලාගන්නා කාලයෙහි විඳිනා දුක් ය.

පරූපක්කමමූලකදුක්ඛය නම්, අන්හු අතින් වධ බන්ධනාදීන් විඳිනා කාලයෙහි උපදනා දුක් ය.

"කිං භාසිතෙන බහුනා නනු යං කුහිඤ්චි
අත්ථිධ කිංචිදපි දුක්ඛමිදං කදාචි,
නෙවත්ථි ජාතිවිරහෙ යදතො මහෙසී
දුක්ඛාති සබ්බපඨමං ඉමමාහ ජාතිං"

මේ සත්ත්වලොකයෙහි කිසි තැනෙකත් යම් කිසි දුකෙක් වේ ද, ඒ මේ සියලු දුක ජාතිය නැති කල්හි නො වේ ම ය. එහෙයින් සියලු දුක්වලට මුල් වූ මේ ජාතිය දුකැයි දතයුතු ය.

ජරාපි දුක්ඛා, යන මෙහි ජරාව වදාළ සැටි මෙසේ දන්නේ ය. **"යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා, ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති ජරා"** යි.

දිරා යෑම **ජරා** නම් වේ. ඒ ඒ භවයන්හි ඇතුළත් වූ සක්ඛ යන්ගේ මේරීම ය, මහලුබව ය ජරා. දත්වැටීම කෙස් ලොම් පැසීම ඇඟරැලි නැගීම යන මේ ආදිස්වභාවයන්ගෙන් ජරාව දක්වන ලද නමුත් එයින් එය ප්‍රකට නො වේ. ඉන් ප්‍රකට වනුයේ ජරාව ගිය මග ය. දියෙන් බිඳී ගිය තැන් දිය නො වන්නා සේ සුළඟින් කැඩී ගිය තැන් සුළඟ නො වන්නා සේ ගින්නෙන් දැගිය තැන් ගින්න නො වන්නා සේ දත් වැටීම කෙස්ලොම් පැසීම ඇඟ රැලිනැගීම කුදුවීම ඇස් නො පෙණීම ජරාව නො වේ. දියෙන් බිඳී ගිය තැනින් දිය ගිය මග, සුළඟින් කැඩී ගිය තැනින් සුළඟ ගිය මග, ගින්නෙන් දැගිය තැනින් ගින්න ගිය මග ප්‍රකට වන්නා සේ දත් රැවුළු ආදියෙහි ඇති වන කැඩුම් බිඳුම් පැසුම් ආදියෙන් ජරාව ගිය මග ම දන්නේ ය. ඒ මේ කැඩුම් බිඳුම් පැසුම් ආදිය ජරාව නො වේ. ජරාව ඇසින් දැකිය නො හැකි ය. **"යථෙව හි උදකස්ස වා වාතස්ස වා අග්ගිනො වා තිණරුක්ඛ-සංහග්ගපලිහග්ගතාය වා ඣාමතාය වා ගතමග්ගො පාකටො හොති, න ච සො මග්ගො ගතමග්ගො, තානි එව උදකානි, එව මෙව ජරාය දන්තාදිසු ඛණ්ඩිච්චාදිවසෙන ගතමග්ගො පාකටො, න ච ඛණ්ඩිච්චාදි එව ජරා, න හි ජරා චක්ඛු-විඤ්ඤෙය්‍යා හොති"** යනු අටුවා යි.

ඒ ඒ භවයන් පිළිබඳ සක්ඛයන්ගේ මේරීම හෙවත් දිරා යෑම නිසා කෙස් ලොම් පැසෙයි. දත් වැටෙයි. ඇඟ රැලි නගියි. සුදු කබර හටගණියි. ඇස් අඳුරු වෙයි. කන් බිහිරි වෙයි. සිහි නැති වෙයි. නුවණ දුබල වෙයි. ගොත ගැසෙයි. ඇඟ දුබල වෙයි. යන මේ ඇනට කරුණු වූයේ සත්ත්වයන් පිළිබඳ දිරා යෑම ය. සත්ත්ව-යන්ගේ මහලුබව ය. එහෙයින් සත්ත්වයන්ගේ මේරීම ජරා යි දත යුතු ය.

ප්‍රකට-ප්‍රතිච්ඡන්න-අච්චි-සච්චි විසින් ජරාව දෙපරිදි දෙපරිදි වේ. එහි රූපධර්මයන්හි පැණෙන පැරණිබව ප්‍රකටජරා ය. දත් වැටීම් කෙස් ලොම් පැසීම් ඇ විකාරයෙන් එය පැහැදිලි ව

පෙණේ. **"දන්තාදිසු ඛණ්ඩාදිභාවදස්සනතො රූපධම්මෙසු ජරා පාකටජරා නාම"** යනු එය සමර්ථනය කරයි. නාමධර්මයන්ගේ පැරණිබව ප්‍රතිච්ඡන්නජරා ය. මෙහි එබඳු විකාර ස්වභාවයක් වෙනස් වූ ලෙසක් දත නො හැකි ය. **"අරූපධම්මෙසු පන ජරා තාදිසස්ස විකාරස්ස අදස්සනතො පටිච්ඡන්නජරා නාම"** යනු එය ව්‍යක්ත කරයි.

යම් වෙනස්වීමක් වර්ණවිශෙෂාදීන්ගේ වශයෙන් අතරතුර පිරිසිඳ නො දත හැකි නම් ඒ අවීචිජරා ය. එහිලා මෙය කියේ ය. **"අන්තරන්තරා වණ්ණවිසෙසාදීනං දුබ්බිඤ්ඤෙය්‍යත්තා ජරා අවීචිජරා නාම"** යනු. එයින් අන්‍ය වූ කෙස්ලොම් නියදත් ආදීන්හි අතරතුර පෙණෙන ජරාව වර්ණවිශෙෂාදීන්ගේ වශයෙන් පහසු වෙන් දතහැකි බැවින් සවීචිජරා නම් වේ. **"තත්තා අඤ්ඤෙසු පන යථාවුත්තෙසු අන්තරන්තරා වණ්ණවිසෙසාදීනං සුවිඤ්ඤෙය්‍යත්තා ජරා සවීචිජරා නාම"** යනු එහිලා දතයුතු ය.

උපාදින්නක-අනුපාදින්නක වශයෙනුදු මෝ ජරා තොමෝ දෙ පරිදි ය. එහි තෘෂ්ණාදීන් විසින් ගන්නා ලද උපදවන ලද සක්ඛ-පරම්පරාව උපාදින්නක නම් වේ. ලදරු කාලයෙහි හටගන්නා වූ කිරිදත් ලදරු කාලය මදක් මැඩෙත් ම ගිලිහී වැටෙයි. එ දත් වැටුනු කල්හි නැවැතත් දත් හටගණියි. ඒ දත් මූලාවස්ථාවෙහි සුදුපැහැ ඇත්තේ වෙයි. ජරාවෙන් පහළ කල්හි කලුපැහැය ගන්නේ ය. හිසකෙහෙ ද ක්‍රමයෙන් තඹවන් ද කලුවන් ද සුදු වන් ද වේ. සිවිය ලෙහෙපැහැයෙන් යුක්ත ය. සුදුපැහැති සත්ත්ව යන් වැඩෙත් වැඩෙත් ම ඔවුන්ගේ සුදුපැහැය වැඩී යයි. කළු පැහැති සත්ත්වයන් වැඩෙත් වැඩෙත් ම ඔවුන්ගේ කළුපැහැය වැඩී යයි. ජරාවෙන් දැදුරු වූ කල්හි සිවියෙහි රැළි නැගෙයි. මෝ උපාදින්නක සන්තානයෙහි පහළ වන සවීචිජරා ය. එසේ තෘෂ්ණා දීන් විසින් නො උපදවන ලද වස්තුසමූහය අනුපාදින්නක නම් වේ. තව ද ඒ ඒ වස්තුන්හි ඒ ඒ කාලයෙහි පහළ වන වෙනස්-කම් ද සවීචිජරා යි ද ගැණේ. ගොයම වපුළ කාලයෙහි සුදුපැහැ ඇත්තේ, කල් ගිය කල්හි නිල්පැහැය ගණියි. තවත් කලක් ඉක්ම ගිය කල්හි පඬුවන් වේ.

ජරාව සක්ඛයන් මිහිකිරීම ලකුණු කොට සිටියා, මරණ-යට ලං කරණ කිස ඇත්තී තරුණබව නැසීම වැටහීම කොට සිටියා ය. තරුණබව නසන්නක් ව වැටහේ. තරුණබව නැසීම ඵලය වේ.

ජරාව, තොමෝ දුක් නො වේ. දිරුම්කඩට ගියහුගේ අත්බව දිරා ගිය ගැලක් සේ බෙලහීන ය. ඉන්නට සිටින්නට වැයම් කරණ කල්හි කායිකදුඃඛය බලවත් ව උපදියි. අඹුදරුවන්, වස්තු ව සපයන කාලයෙහි මෙන් තමාට නො සලකන විට මානසික දුඃඛය ද බලවත් ව නැගි එයි. මෙසේ කායික-මානසික වශයෙන් දෙ වැදැරුම් වූ දුකට කරුණු වන බැවින් ජරාව දුකැයි දතයුතු ය.

"අඞ්ගානං සිථිලීභාවා ඉන්ද්‍රියානං විකාරතො,
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතතො.

විප්පවාසා සතාදීනං පුත්තදාරෙහි අත්තනො,
අපසාදනීයතො ච භීය්‍යො බාලත්තපත්තියා.

පප්පොති දුක්ඛං යං මච්චො කායිකං මානසං තථා,
සබ්බමෙතං ජරාහෙතු යස්මා තස්මා ජරාදුඛා"

අත්පා ඇ අවයවයන් ලිහිල් වන බැවින්, ඇස් කන් නාස් ඇ ඉඳුරන් වෙනස් වන බැවින්, තරුණබව නැසී යන බැවින්, ශක්තිය පිරිහී යන බැවින්,

සිහි නුවණ දුර ගසා යන බැවින්, අඹුදරුවන් අවමන් කරණ බැවින් ලදරු බවට පැමිණෙන බැවින්,

සත්ත්ව තෙමේ කය පිළිබඳ වූත් සිත පිළිබඳ වූත් යම් දුකකට පැමිණේ ද, ඒ මේ හැම දුක් ම ජරාව හෙතු කොට වන්නේ ය. එහෙයින් ජරාව දුක් වේ. මෙහි එකාදශතරඞ්ගයෙහි පස්වැනි ගාථාවෙහි **ජරා ච** යන්නෙහි පරිකථාව බලනු.

මරණම්පි දුක්ඛං, යන මෙහි මරණය වදාළ සැටි මෙසේ දන්නේ ය. **"යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චති මරණං"** යි.

සත්ත්ව ජීවිතය නැසී යෑම **මරණැ** යි සම්මත ය. **චුති චවනතා භෙදො - අන්තරධානං - මච්චු - මරණං - කාලකිරියා - ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො - ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො** යන මෙකී පදයන්ගෙන් ද කීයේ මරණය යි. එහි **චුති** යන්නෙහි සිට **කාල කිරියා** යන පදය තෙක් ඇති පදයන් ගෙන් 'මරණය මේ ය' යි ලොකසම්මතය පරිදි කියන ලද්දේ ය. ඉතිරි පදයන් ගෙන් කියන ලද්දේ පරමාර්ථ විසිනි. පරමාර්ථ විසින් සකන්ධයෝ තුමූම

බිඳෙනි. සත්ත්වයෙක් නම් නොදමැරෙයි. සකඛයන් බිඳී ගිය විට 'සත්ත්වයා මළේ ය' යන ව්‍යවහාරයෙක් ලොකයා අතර පැන නගින්නේ ය.

ඛන්ධානං භෙදෙ යන මෙ පදයෙන් චතුවොකාරභව-පංච වොකාර භවයන්හි **සකඛයන්ගේ** නැසී යෑමත්, **කලෙබරස්ස නිකෙඛපො** යන මෙ පදයෙන් එකවොකාරභවයෙහි අත්බව බහා තැබීමත් කියන ලදි. අටුවාවන්හි අත් ලෙසකින් ද මෙහි අර්ථ විවරණය කැරෙන්නේ ය. එ නම් චතුවොකාරභවයෙහි සකඛ-යන්ගේ බිඳීම හා, අන්‍ය වූ එකවොකාර-චතුවොකාර භවයන්හි අත්බව බහා තැබීම හා වන බව ය. එකවොකාර පංචවොකාර භව දෙක්හි රූපකාය යි කියන කලෙබරය ලැබෙන බැවින් එසේ කිය හැකි ය. යම්හෙයකින් සිවු මහරජයෙහි සකඛ බිඳී ගිය ද කිසි සකඛයක බහා තැබීමෙක් එහි නැත්තේ ද, එහෙයින් සිවු මහරජයෙහි වූවන්ගේ වශයෙන් සකඛයන්ගේ බිඳීම හා මිනිස් නිරිසන් ආදීන්ගේ වශයෙන් සිරුර බහාතැබීම හා වන බව දත යුතු ය. මිනිස්ලෝ ආදියෙහි සිරුර බහා තබන බැවින් මරණය 'කලෙබරස්ස නිකෙඛපො' යන්නෙන් කියන ලදි. එ ද ඵලොප-චාර විසිනි. **ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදෙ** යන මෙයින් ඉන්ද්‍රියබද්ධ වූ සත්ත්වයාහට මරණය වනබව හා ඉන්ද්‍රියබද්ධ නොවූවහුට මරණය නොවන බව හා කිහ. ශස්‍යය මළේ ය, වෘක්ෂය මළේ ය, යන මෙය ව්‍යවහාර මාත්‍රයෙක් වේ. අර්ථ ඒසින් ඉන් දැක් වෙනුයේ ශස්‍යාදීන්ගේ විනාශය යි.

ඛණික-සම්මුති=සමුච්ඡෙද විසින් මරණය තෙ පරිදි ය. එහි ඛණික මරණ නම්, **"ඛණිකමරණං නාම පවත්තා රූපාරූප ධම්මානං භෙදෙ"** යනු කී බැවින් ප්‍රවෘත්තික්ෂණයෙහි වූ රූපා-රූප ධර්මයන්ගේ බිඳී යෑම ය. 'නිස්ස මළේ ය, ථුස්ස මළේ ය, යන මෙය සම්මුතිමරණයි **"තිස්සො මතො ථුස්සො මතොති ඉදං සම්මුතිමරණං නාම"** යන මෙයින් එය දැක්වූහ. සම්මුච්ඡේදමරණ නම්, රහතුන් වහන්සේගේ නැවැත්ත කෝ තැනෙකත් පිළිසිඳ ගැණුම් නැති කාලක්‍රියා ය. මේ එහි ආපත්ති ය. **"ඛීණාසවස්ස අපත්තිසඤ්ඤිකා කාලකිරියා සමුච්ඡෙදමරණං නාම"** යනු.

"මරණම්පි දුක්ඛං" යන මෙයින් කියන ලද්දේ සම්මුති-මරණය යි. දුඃඛසත්‍යය, වෘත්තනිඃශ්‍රිත බැවිනි. 'නිස්ස මළේ ය, ථුස්ස මළේ ය, යන මෙහි සකඛ බිඳී යෑමෙක් පෙණේ ද, ඒ සකඛ-යන්ගේ බිඳී යෑමෙන් සකඛ පරම්පරාව මූලොච්ඡින්න නොවූ බැවින් ව්‍යවහාර විසින් එය මරණයි කියන ලද්දේ ය. **"යස්ස ඛන්ධභෙදස්ස පවත්තත්තා තිස්සො මතො ථුස්සො මතොති වො-**

හාරො හොති, සො ඛන්ධප්පඛන්ධස්ස අනුපච්ඡිනනතාය සමමුති මරණනති වුත්තො," යනු ටීකා ය. ඒ ම **ජාතික්ඛයමරණ උපක්කමමරණ-සරසමරණ-ආයුක්ඛයමරණ-පුඤ්ඤක්ඛය මරණැ** යි නොයෙක් ස්ථලයන්හි ආයේ ය.

නැවැත මරණය, **ආයුක්ඛය-පුඤ්ඤක්ඛය-උභයක්ඛය-උපච්ඡේදකමරණැ** යි සිවු වැදැරුම් වේ. එහි ඉපැත්ම දුන් කර්ම ශක්තිය, ඉදිරියෙහි ජීවිතය පැවැත් වීමට තරම් ලෙසින් ඉතිරි ව තිබිය දී දිව්‍ය-මනුෂ්‍යාදී වූ ඒ ඒ භවයන්ට අයත් ආයු ගෙවී යෑමෙන් සිදුවන මරණය ආයුක්ඛයමරණ නම් වේ. ආයු ඉතිරි ව තිබිය දී ඉපැත්ම දුන් කර්මයාගේ බල වේගය ගෙවී යෑමෙන් වන මරණය කම්මක්ඛයමරණ නම් වේ. ආයු හා කර්ම හා එකවිට ගෙවී යෑමෙන් වන්නේ උභයක්ඛයමරණ නම් වේ. ආයු හා කර්ම හා ඉතිරි ව තිබිය දී පෙර අත්බවෙක හෝ මේ අත්බවෙහි ම හෝ කළ යම් කිසි කර්මශක්තියකින් පිළිසිඳ දුන් කර්මශක්තිය බිඳී යෑමෙන් වන්නේ උපච්ඡේදකමරණ නම් වේ.

මරණය වර්තමාන ආත්මභාවයෙන් ගිලිහිම ලකුණු කොට සිටියෙ ය. ඒ භවයට අයත් සක්ඛ්‍යයන් කෙරෙන් වෙන්වීම කෘත්‍යය කොට සිටියේ ය. පෙර අත්බවෙන් වෙන්වීම වැටහීම කොට සිටියේ ය.

මරණය තෙමේ ම දුක් නො වේ. මරණයට ලංවූ කල්හි සිරුරෙහි හටගන්නා වූ දුඃඛවෙදනාවෝ ප්‍රතිවාතයෙහි ගත් ගිනිහුල් මෙන් සිරුර ඉතිරි නො කොට දවන්නෝ ය. නිරය නිමිති වැටහෙන කල්හි දෙම්නස ඉතා දැඩි ව උපදනේ ය. මෙසේ කය සිත පිළිබඳ දුක්වලට කරුණු වන බැවින් ද මරණය දුකැයි කියන ලදි.

පාපස්ස පාපකම්මාදි නිමිත්තමනුපස්සතො,
හද්දස්සාපසහන්තස්ස වියොගං පියවත්ථුකං"

මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො,
සබ්බෙසං චාපි යං සන්ධිබන්ධනච්ඡේදනාදිකං,

විතුජ්ජමානම්මානං හොති දුක්ඛං සරීරජං,
අසය්‍හප්පටිකාරං දුක්ඛස්සෙතස්සිදං යතො,
මරණං වත්ථු තෙනෙතං දුක්ඛම්චෙව භාසිතං"

පාපකර්ම-පාපකර්මනිමිත්ත-පාපගතිනිමිත්ත යන අරමුණු දක්නා වූ පව්කම් ඇති ව මැරෙන්නා වූ සත්ත්වයාහට ද ප්‍රිය වස්තූන්ගේ වෙන් වීම නො ඉවසන්නා වූ,

පින් ඇති ව මැරෙන්නා වූ සත්ත්වයාහට ද සිතෙහි හටගත්-නා වූ දුකට හා පෙළනු ලබන මාංසඛාන ඇති සත්ත්වයාහට අත් පා බැඳීම් සිදීම් ආදියෙන් උපන් නොඉවසිය හැක්කා වූ පීඩියම් රහිත වූ සිරුරෙහි හටගන්නා වූ දුකට ද මේ මරණය හෙතු වූ යේ ද, එහෙයින් මරණැයි කියන ලදි.

මෙසේ මෙහි ඉතා සැකෙවින් කියූ ජාති-ජරා-මරණ යන මේ තුණ සත්ත්වයන්ට සතුරන් වෙනියි කිය යුතු ය.

ජාතිදුක්ඛය උවදුරු සහිත මහාකතරකට වැදගැණුමක් සේ, ජරාදුක්ඛය කෑම් පීම් නොලැබුවහුගේ දුබල බවක් සේ, මරණ-දුක්ඛය එසේ දුබලවූවහු යැම් ඊම් ඉරියවු පැවැත්වීමෙහි අපොහොසත් ව සිටි කල්හි වග ඇ සතුන් විසින් විනාශයට පැමිණ-වීමක් සේ දත්තේ ය. එකාදශතරඛයෙහි **මච්චු ච** යන්නට කළ පරිකථාව බලනු.

සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාපි දුක්ඛා, යනා මෙහි පළමු ව **ශොකය** වදුළ සැටි මෙසේ දත්තේ ය. **"ඤාතිව්‍යසනෙන වා භොගව්‍යසනෙන වා රොගව්‍යසනෙන වා සීලව්‍යසනෙන වා දිට්ඨිව්‍යසනෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන වා සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො අන්තො දුහෝ චෙතසා පරිජ්ඣායනා දෙමනස්සං සොකසල්ලං අයං වුච්චති සොකා"** යි.

ඤාතිව්‍යසනාදිවිපත්තීන්ගෙන් මැඩුනහුගේ සිතෙහි හටගත්-නා වූ තැවිල්ල ශොක නම් වේ. **"සොකො නාම ඤාතිබ්‍යසනාදීහි ඵුට්ඨස්ස චිත්තසන්තාපෝ"** යනු එහිලා කීහ. ඤාති-භොග-රොග සීල-දිට්ඨි යන මේ ව්‍යසනයන්ගෙන් හෝ මින් එකෙකින් හෝ නැත, මෙයින් අන්‍ය වූ මිත්‍රාදිව්‍යසනයකින් හෝ සිත් තැවීමට කරුණු වූ යම් කිසිවකින් හෝ තැළී පෙළී මිරිකී ගියහුගේ සිත් තැවිල්ල සොකය යි කියන ලද්දේ ය. නැයන්ගේ හිතසුව නසන හොර සතුරු උවදුරු ආදිය ඤාතිව්‍යසනය යි දත යුතු ය. සෙස්ස ද මේ නයින් සලකත්තේ ය.

සොකො සොචනා සොචිතත්තං අන්තොසොකා අන්තො පරිසොකො අන්තොදුහො චෙතසා පරිජ්ඣායනා දෙමනස්සං සොකසල්ලං යන මේ පද පෙළෙහි යෙදුනේ ද සොක යන මෙහි යථාර්ථය පැහැදිලි කරණු සඳහා ය.

ශොකයෙහි සවභාවය **'සොක'** නම්. ශොකයෙහි ආකාරය **'සොචනා'** නම්. ශොකයට පැමිණියහුගේ සවභාවය **'සොචිතත්ත'** නම්. ඇතුළත නහිනා ශොකය **'අනෙනාසොක'** නම්. ඇතුළත හාත්පසින් නහිනා ශොකය **'අනෙනාපරිසොක'** නම් ඇතුළත දැවීම **'අනෙනාදහ'** නම්. ඇතුළත හාත්පසින් දැවීම **'අනෙනාපරිදහ'** නම්. සිත දැවීම **'චෙතසොපරිජ්ඣායනා'** නම්. එහිදී ශොකයට පැමිණියේ "මාගේ සිත දැවුනේ ය, මට කිසිවක් නොවැටහෙයි" යන ආදී විසින් කියන්නේ ය. සිතෙහි හටගත්නා නොසතුට **'දොමනස්ස'** නම්. හුලක් සේ ඇතුළත වදනා ශොකය **'සොකසල්ල'** නම්. මේ මෙසේ තිබූ සේ ද නියම අරුත් විසින් කිය යුත්තේ දොමනස්සය ම ශොකය වන්නේය යනු ය. **"දොසාපි අත්ථතො දොමනස්සමෙව හොති"** යනු ආපත්ති. ඒ මේ දොමනස්සය ශොකය නමුදු ඇතුළත වියලීම තැවීම ලකුණු කොට සිටියේ සිත දැවීම හෝ ශොකයට හෙතු වූ කරුණු සිතට ලංකොට සිතීම කෘත්‍යය කොට ගත්තේ ය. ඒ ඒ ගුණදෙස්හි පසුපස ගොස් පසුතැවීම එහි වැටහීම වේ.

ශොකය සඞ්ඛ්‍යාවින් ම තෙමේ ද දුක් ය. දුකට හෙතු බැවිනුත් දුක් ය. බලවත් ශොකවෙගය හෙතු කොට සමහර කලෙක හෘදයෙහි මහාගණ්ඩයෙක් හට ගණියි. එය පැසවා බිඳී ගිය කල්හි කලු පැහැති ලේ වමනය වෙයි. ඒ වේලෙහි උපදනා කායික දුකඛය ඉතා බලවත් ය. "මාගේ මෙතෙක් නැයෝ වැනසී ගියහ, මෙතෙක් භොගයෝ වැනසී ගියහ" යි සිතන්නහුට උපදනා සිත් වේදනාවත් එසේ ම බලවත් ය. එහෙයින් කායික-මානසික දුකඛයන්ට කරුණු වන බැවින් ශොකය දුකැයි වදුළ සේක.

"සත්තානං හදයං සොකෝ සල්ලං විය විතුජ්ජති,
අගණිතතෙනාව නාරාචෝ භුසංව ඩහතෙ පුන.

සමාවහති ච ඛ්‍යාධි ජරාමරණභෙදනං,
දුකඛමපි විවිධං යසමා තසමා දුකෙඛනි වුච්චති"

ශොකය හුලක් මෙන් සත්ත්වයන්ගේ ලය විදියි. ගිනියම් කළ නාරස්සනයක් සේ නැවැත නැවැත ලය දවයි.

ශොකය ව්‍යාධිජරාමරණාදී වූ දුක් හා අන් නොයෙක් දුක් එළවන බැවින් දුකැයි කියනු ලැබේ.

එහි දෙවැනි ව **පරිදෙවය** මෙසේ දන්නේ ය. **"ඤාතිව්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගව්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගව්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලව්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිව්‍යසනෙන වා**

පුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන පුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං අයං වුච්චති පරිදෙවො'' යි.

ඥාතිව්‍යසනාදිවිපත්තීන්ගෙන් මැඩුනහුගේ පුන පුනා විලාප කියා හැඩීම පරිදෙවය යි. සෙස්ස ශොකයට කීසේ දතයුතු ය.

ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා ලාලප්පිතත්තං, යන මේ පද පෙළෙහි යෙදුනේ ද පරිදෙව යන මෙහි නියම අරුත් පැහැදිලි කරණු පිණිස ය.

මාගේ පුත්, මාගේ දූ, යි කියමින් හැඩීම වැලපීම **'ආදෙව'** නම්. යමකු කළ උපකාරය සිහි කොට එය කිය කියා විලාප කීම **'පරිදෙව'** නම්. **ආදෙවනා-පරිදෙවනා-ආදෙවිතත්තං පරිදෙවිතත්තං** යන සිවු පදය පළමු කී දෙ පදයෙහි ආකාර දක්වන පදයෝ ය. කීම බිණීම **'වාචා,** නම්. හිස් බස් බිණීම **'පලාප'** නම්. වචනයෙන් අඩක් කීම අන් ම වචනයක් කීම එකිනෙකට වෙනස් වූ පලක් නැති බස් බිණීම **'විප්පලාප'** නම්. නැවැත නැවැත බිණීම **'ලාලප්ප'** නම් එහි ආකාර දැක්වීමට **'ලාලප්පනා'** යනු යෙදුනේ ය. කෙළතොලුබව **'ලාලප්පිතත්ත'** නම්.

පරිදෙවය නැවැත නැවැත බිණීම ලකුණු කොට ගුණ දොස් පවසන කිස ඇති ව එක අරමුණෙක නො පිහිටීම වැටහීම කොට සිටියේ ය.

මේ ද තෙමේ ම දුක් නො වේ. කායික-මානසික දුක්ඛයන්ට වස්තු වන බැවිනුත් දුක් වේ. ඒ එසේ ම ය: විලාප කියනුයේ තමාගේ දසරුවට පහර දෙයි. දෙයත ලෙහි ගසයි. හිස බිත්තියෙහි ගටයි. එයින් ඔහුට මහාදුකෙක් වේ. 'මාගේ මෙතෙක් නෑයෝ නැසී ගියහ' යි යන ඇ ලෙසින් සිතන්නහුට උපදනා දොම්නස ද ඉමහත් ය. මෙසේ කායික-මානසිකදුක්ඛයන්ට හෙතු බැවින් පරිදෙවය දුකැයි දතයුතු ය.

''යං සොකසල්ලවිහතො පරිදෙවමානො
කණ්ඨොට්ඨතාලුතලසොසජමප්පසය්හං,
භීය්‍යොධිමත්තමධිගච්ඡතියෙව දුක්ඛං
දුක්ඛොති තෙන භගවා පරිදෙවමාහ''

ශොඞ්ඨශල්‍යයෙන් මැඩී විලාප කියනුයේ උගුරු තොල් හලු වියලී මෙන් හටගත් නොඉවසිය හැකි දුකට පැමිණේ. කායික-මානසික වශයෙන් ඉමහත් දුකට පැමිණෙන බැවින් වැලපීම දුකැයි වදාළ සේක.

එහි තෙවැනි ව **දුක්ඛය** මෙසේ දනයේය. **"යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වේදනා ඉදං වුච්චති දුක්ඛං"** යි.

කායප්‍රසාදරූපය වසනු කොට උපදනා රිදුම් දැවුම් ආදී නන් වැදූරුම් වූ ශාරීරිකවේදනාව දුකැයි ගත්තා ලදි. සිරුර තවන පෙළන ඉවසිය නොහෙන හැම වේදනාවක් ම දුක් ය. මෙ කී දුක අභ්‍යන්තරික-බාහිරඋපද්‍රවයන්ගෙන් වන්නේ ය.

දුක්ඛවේදනාව නොමේත් දුක් ය. එසේ ම අන්‍ය වූ කායික මානසික දුක්ඛයන්ටත් හේතු ය. කයෙහි හටගන්නා දුක්ඛවේදනාව සිත ද පෙළාලයි. මානසික දුක්ඛයන්ටත් හේතු යි කියේ එ බැවිනි. අන්පා කන් නාස් ආදී කැපීම් කෙරීම් හේතුයෙන් හටගත් දුක කරණ කොට දුකට පැමිණ පොළොන්තක් කොළපතක් අතේ ඇති ව අම්බලමෙක හෝනා එකෙකුට ඒ වණමුව ඩිදුරුවලින් පණුවන් නිකුත්වත් ම උපදනී සුළු වේදනාවක් නො වේ. මහත් දුක් වේදනාවක් ම උපදනී ය.

දුක්ඛය තෙමේ කය පෙළීම් ලකුණු කොට නුවණැත්තන්ට දෙම්නස උපද වන කිස ඇති ව කායිකාබාධය වැටහීම් කොට සිටියේ ය. මෙය සබැඳින් ම දුක් බැවින් දුක්ඛදුක්ඛතාවින් ද කියා වේ. ඉමහත් දුක ය යන අරුත් ය.

"පිළෙති කායකම්දං දුක්ඛඤ්ච මානසං භීයෝ,
ජනයති යසමා තසමා දුක්ඛතති ඨපෙසතෝ වුත්තෙනා"

සිතෙහි වූ මේ දුක කය පිළිබඳ දුක බෙහෙවින් පෙළා ද උපදවා ද එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් දුකැයි වෙසෙසින් වදාරණ ලදි.

එහි සිවුවැනි ව දෙමනස්සය මෙසේ දන්නේ ය. **"යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතොසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා අසාතා දුක්ඛා වේදනා ඉදං වුච්චති දෙමනස්සං"** යි.

සිතෙහි පෙළීම සිතෙහි උපදනා අමිහිරිය **'දෙමනස්ස'** නම්. අඹුදරුවන්ගෙන් ධනධාන්‍යාදියෙන් ශාරීරිකාවයවයන්ගේ විකලත්වයෙන් වත්නා වූ ගැහැට යනාදී වූ සිත තවන සිත පෙළන නොයෙක් කරුණු මෙහිලා ගැණේ. මේ ඇ ලෙසින් ගැටෙන්නෝ පෙළෙන්නෝ කෙහෙ උනා ලෙහි අත් ගසා බිම වැතිර හඬත්. දෙඩත් විෂ කත්. ගෙල වැල ලා ගණිත්. මේ ඇ දරුණු දුකට කරුණු වන්තේ දෙමනස ය. මැනැවින් හැඳ පැළඳ නොයෙක් කෙළි සෙල්ලම්වල යෙදෙන වටිනා ගෙවල වසන උසස් යාන වාහන නැගී යන මිනිසුන් දුටු කල්හි ද බණ දහම් දැනුමෙන් නොපොහොසත් වූ නුවණ නැත්තන්හට උපදනේ දෙමනස ය.

සිත පෙළීම ලකුණු කොට සිතට හිංසා කිරීම කෘත්‍යය කොට මානසික ව්‍යාධියකැයි වැටහීම ඇති ව සිටුනා දෙමනස. තෙමේත් දුක් ය. කායිකදුකඛයන්ට වසහු බැවිනුත් දුක් ය.

"පීළෙනි යතෝ දුක්ඛං කායස්ස ච පීළනං සමාවහති,
දුක්ඛනති දෙමනස්සං විදෙමනස්සා තතෝ ආහු"

දෙමනස සිත ද පෙළයි. සිරුර ද පෙළයි. එහෙයින් දෙමනස. දුකැයි බුදුරජාණන් වහන්සේ වදළ සේක.

එහිපස්වැනිව **උපායාසය** මෙසේදත්නේය. **"ඤාතිව්‍යසනෙන වා භොගව්‍යසනෙන වා රොගව්‍යසනෙන වා සීලව්‍යසනෙන වා දිට්ඨිව්‍යසනෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං අයං වුච්චති උපායාසා"** යි

ඤාතිව්‍යසනාදී වූ විපත්තීන්ගෙන් සිතෙහි උපදනා වෙහෙසීම කලාතතභාවය උපායාස නම් වේ. කිපියා වූ රජකු විසින් සමපත් පැහැර ගැණීමෙන් දුප්පත් වූ, නට දූ පුත් සොහොවුරන් ඇති අණ කළ මරණය ඇති බියෙන් වල් වැද සැඟවී ගත් ඉමහත් දුකට පැමිණි සත්ත්වයන්ට දුක සේ සිටීමෙන් නිදීමෙන් හිඳීමෙන් මෙ දුක උපදනේ ය. තව ද 'අපගේ මෙතෙක් නැයෝ නටහ, මෙතෙක් යසිසුරු නටහ' යි සිතන්නහුට ද උපදනේ උපායාසයයි. දැඩි දෙමනස යි.

සිතෙහි හිලන්බව **'ආයාස'** නම්. සිතෙහි දැඩිවෙහෙස **'උපායාස'** නම්. වෙහෙසට පැමිණියහුගේ සවභාවය **'ආයාසිතත්ත'** නම්. දැඩි සිත් වෙහෙස ඇත්තහුගේ සවභාවය **'උපායාසිතත්ත'** නම්.

උපායාසය ඥාතිව්‍යසනාදී වූ කරුණුවලදී වෙනස්බවට පැමිණි ආසත්තිය හෙවත් නැසෙන වස්තු රැක ගැණීමෙහි ආශාව ලකුණු කොට සිටියේ ය. මෙහි කෘත්‍යය වනුයේ තැතනීම් ය. විෂාදය හෙවත් කළකිරුණුගතිය වැටහීම ය. මෙය තෙමේ ම දුක් නො වේ. කායික-චෙතසිකදුක්ඛයන්ගේ ඉපැත්මට හෙතු බැවින් ද දුක් වන්නේ ය.

"චිත්තස්ස පරිදහනා කායස්ස විසාදනා ච අධිමත්තං,
යං දුක්ඛං උපායාසො ජනෙති දුක්ඛොත්‍යයං වුත්තො"

සිත දැඩි ව තවන බැවින් ද සිරුර කෘශභාවයට පමුණුවන බැවින් ද උපායාසය ඉතා අධික වූ කායික-චෙතසික දුක්ඛයන් උපදවා ද එහෙයින් දුකැයි වදාරණ ලදි.

තව ද මෙහිලා ශොකය මද ගින්නෙන් බඳුනතුළ පැසෙන තෙලක් සේ ද, පරිදෙවය තියුණු ගින්නෙන් තෙල පැසෙන කල්හි එය බඳුනෙන් නැගී උතුරා යෑම සේ ද, උපායාසය බඳුනෙන් උතුරා ගොස් ඉතිරි වූ තෙල බඳුනතුළ ම වියලී යෑම සේ ද වෙනස දන්නේ ය.

අපපියසම්පයොගය මෙසේ දන්නේ ය. **"ඉධ යස්ස තෙ හොන්ති අනිට්ඨා අකන්තා අමනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා යෙ වා පනස්ස තෙ හොන්ති අනත්ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා, යා තෙහි සඞ්ගති සමාගමො සමොධානං මිස්සීභාවො අයං වුච්චති අපපියසම්පයොගො දුක්ඛො"** යි.

තමන්ට ප්‍රිය නො වූ තම සිත් නො ගත් අරමුණු හා පුද්ගලයන් හා ගැටීමෙන් එක්වීමෙන් හටගන්නා දුක **'අපපියසම්පයොගදුක්ඛ'** නම්. නො සොයා ගත්, සිතෙහි නො වැදෙන, මන නො වඩන රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන මොවුහු සිත් නො ගත් අරමුණු ය. වස්තුහු ය. මේ අරමුණු, ස්වභාව වශයෙන් දුක් නො වතුදු මුන් දැකීමෙන් ඇසීමෙන් සිඹීමෙන් රස විඳ ගැණීමෙන් පැහැසීමෙන් සිතට හා කයට දුක් උපදනා බැවින් මුන් හා එක්වීම දුක් ය. එසේ ම තමාට අවැඩ කරණ හිතවත් නො වූ නො පහසුකම් ඇති කරණ හැම අතකින් බිය උපද වන පුද්ගලයෝ තම සිත් නො ගත් අප්‍රියජනයෝ ය. මුන් හා එක්වීම නැගීම උරෙනුර ගැටීම දුක් ය. මුන් හා එක්වීම් ආදිය නන්වැදැරුම් වූ කායික-චෙතසික දුක්ඛයන්ට හෙතු ය.

මෙහි මන නො වඩන්නා වූ රූපාදි අරමුණු **'අනිට්ඨ'** නම්. සිත්හි නො වදනා නො පිවිසෙන අරමුණු **'අකන්ත'** නම්. අනිට්ඨයෝ ම **'අමනාප'** නම්. ව්‍යසනය හෝ දුක කැමැත්තෝ **'අනත්ථකාම'** නම්. ව්‍යසනයට හෙතු වූ අවැඩ හෝ දුකට හෙතු වූ අවැඩ කැමැත්තෝ **'අහිතකාම'** නම්. නො සැප වූ දුක් විහරණ කැමැත්තෝ **'අඵාසුකාම'** නම්. චතුර්විධ යොගයන්ගෙන් නිර්භය වූ නිවන නො කැමැත්තෝ **'අයොගක්ඛෙම කාම'** නම්. අප්‍රිය වූ අරමුණු කරා ගොස් උන් හා එක්වීම **'සඩගති'** නම්. තමන් වෙත ආවා වූ උන් හා එක්වීම **'සමාගම'** නම්. සිවු ඉරියවු පිරිවැටුම්හි හා කෑම් බීම් ඈ ක්‍රියාවන්හි උන් හා එක්වීම **'සමොධාන'** නම්. සියලු කටයුතු උන් හා එක්ව කිරීම **'මිස්සීභාව'** නම්. **"පුගගලස්ස හි සඩගති ගනත්වා සඩ්ඛාරෙහි සංයොගො හොති. සමාගමො ආගතෙහි ච තෙහි පුගගලස්ස ච අත්තනො ඨානාදිසු සඩ්ඛාරෙහි සහභාවො හොති. සබ්බක්‍රියාසු ච මිස්සීභාවොති"** යනු මූල-ටීකා ය.

අප්‍රියසම්ප්‍රයොගය නො ඉෂ්ට වූ නො ද කැමැති වූ රූපාදීන් හා එක්වීම ලකුණු කොට සිටියේ ය. සිත ගිලන් බවට පමුණුවා ලීම කෘත්‍යය කොට ගත්තේ ය. උවදුරුබව මෙහි වැටහීම වේ. ඵලය ද ඒ ම ය.

අප්‍රියවස්තූන් හා එක්වීම සත්ත්වයන්ගේ කායික-චෙතසික දුක්ඛයන්ට හෙතු බැවින් මෙය දුකැයි වදාරණ ලදි. ඒ එසේ ම ය නො කැමැති වස්තූන් හා එක්ව ගියාහු ගැළපීමට ගියාහු විඳීම සිඳීම පැළීම යනාදීන් කරණ කොට කායිකදුක්ඛය උපදවත්. තැති ගන් වන බැවින් චෙතසිකදුක්ඛය ද උපදවත්.

"දිස්වාව අප්පියෙ දුක්ඛං පඨමං හොති චෙතසි,
තදුපක්කමසම්භූතමථකායෙ යතො ඉධ.
තතො දුක්ඛද්වයස්සාපි වත්ථුනො සො මහෙසිනා,
දුක්ඛො වුත්තොති විඤ්ඤෙය්‍යා අප්පියෙහි සමාගමො"

මේ ලොකයෙහි නො කැමැති වූ රූපාදීන් හා සත්ත්වයන් දැකීමෙන් පළමු කොට සිත්හි දුක් හට ගණියි. නැවැත ඒ අප්‍රියවස්තූන්ගේ හා සත්ත්වයන්ගේ උපක්‍රමයෙන් හටගත් දුක සිරුරෙහි හටගණියි. එහෙයින් මේ කායික-චෙතසිකදුක්ඛයන්ට කරුණු බැවින් ඒ අප්‍රිය වස්තූන් හා සත්ත්වයන් හා එක්වීම දුකැයි වදාරණ ලදි.

පියවිප්පයොගය මෙසේ දන්නේ ය:- **"ඉධ යස්ස තෙ හොන්ති ඉට්ඨා කන්තා මනාපා රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා ය වා පනස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා මාතා වා පිතා වා භාතා වා භගිනී වා මිත්තාමච්චා වා ඤාතිසාලොහිතා වා, යා තෙහි අසඞ්ගති අසමාගමො අසම්මොධානං අසම්මිහාවො අයං වුච්චති පියෙහි විප්පයොගො දුක්ඛො"** යි.

තමන්ට ප්‍රිය වූ තම සිත් ගත් වස්තූන්ගෙන් හා පුත්‍රදාරාදීන්-ගෙන් වෙන්වීමෙන් හටගන්නා දුක්, **පියවිප්පයොගදුක්ඛ** නම්. මෙය මෙහි මූලින් සැකෙවින් කියූ අපියසම්පයොග දුක්ඛයට ප්‍රතිපක්ෂ ව සිටියේ ය. මෙහි යම්ක්හට ප්‍රිය වූ සිත් වදනා මන වඩනා රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය යන මොවුහු වෙත් ද, එසේ ම මොහුට වැඩ කැමැති හිත කැමැති පහසු බැව් කැමැති නිර්‍යා වූ නිවන කැමැති මවු පිය සොහොයුරු සොහොයුරි මිතුරු ඇමැති නෑ සහලේ නෑ යන මොවුහු වෙත් ද, මේ වස්තූන්ගේ හා පුද්ගලයන්ගේ වෙන් වීමෙන් හට ගන්නේ පියවිප්පයොගදුක්ඛ ය යි. ධනධාන්‍යාදිවස්තූන්ගෙන් වෙන් වීම ද මෙහි ම හෙන්නේ ය. රජුන්ගෙන් සොරුන්ගෙන් දිගෙන් හින්නෙන් ධනධාන්‍යාදිය නැසීමෙන් මරණයට පැමිණීමෙන් වස්තු සවාමියා එයින් වෙන් වන්නේ ය. මේ හැම අවස්ථාවක ම දුක් උපදනේ ය. එසේ ම නොරට යැමෙන් මවු පිය සොහොයුරු සොහොයුරියන්ගේ මරණයෙන් වෙන්වීම වන්නේ ය. එහි ද දුක් උපදනේ ය.

මෙහි දූ පුතුන් විසින් ගරුබුහුමන් කරණු ලබන්නී, නැත, දූ පුතුන් කෙරෙහි මමායනය කරන්නී **'මාතා'** නම්. දූ පුතුන් විසින් ප්‍රිය කරණු ලබන්නේ, නැත, දූ පුතුන් කෙරෙහි සෙනහය කරන්නේ **'පිතා'** නම්. දෙටු කණිටු බෑයන් ඇසුරු කරන්නේ **'භාතා'** නම්. දෙටු කණිටු බෑයන් ඇසුරු කරන්නී **'භගිනී'** නම්. සෙනහ කරන්නේ, නැත, ප්‍රමාණ කරන්නේ **'මිත්ත'** නම්. කුදු මහත් කටයුත්තෙහි සම්ගිවීම් වශයෙන් එක් වන්නේ **'අමච්ච'** නම්. මෙතෙමේ අපගේ ඇතුළත් එකෙකි යි දන්නේ **'ඤාති'** නම්. ලෙය හා සම්බන්ධ වූයේ **'සාලොහිත'** නම්.

ප්‍රියවිප්‍රයොගය ප්‍රිය, මනාපවස්තූන්ගෙන් වෙන් කිරීම ලකුණු කොට සිටියේ ය. ශොකය ඉපදවීම කෘත්‍යය කොට ගත්තේ ය. ඤාතිව්‍යසනාදිය එහි වැටහිම වේ.

ප්‍රියමනාපවඝතුන් හා විප්‍රවාසයට පැමිණි සත්ත්වයන්ගේ කායික-චෙතසිකදුක්ඛයට හෙතු බැවින් මෙය දුකැ,යි වදුළ සේක. ඒ එසේ ම ය, ප්‍රියමනාපවඝතුහු වෙත් වන්නෝ, ශිරැර වියළීම මැලවීම යනාදී වශයෙන් කායිකදුක්ඛය ද "අප වෙත තුබූ ඉෂ්ටවඝතුහු අපට දැන් නැතැ" යි පුන පුනා ශොක උපදවන බැවින් චෙතසිකදුක්ඛය ද උපදවත්.

"ඤාතිබ්‍යසනාදියොගා සොකඝරසමප්පිතා විතුජ්ජනති,
බාලා යතො තතොයං දුක්ඛොති මතො පියෙහි විප්පයොගොා"

ඤාතිධනාදීන් කෙරෙන් වෙන්වීම් හෙතුවෙන් සොක නැමැති හුලින් පෙළෙනු ලබන අඥයෝ යම්හෙයකින් පෙළෙත් ද එහෙයින් මේ ප්‍රියවිප්‍රයොගය දුකැ,යි දන්නා ලදි.

ඉච්ඡාවිඝාතය මෙසේ දන්නේ ය:-**"ජාතිධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති:- 'අහෝ වත මයං න ජාතිධම්මා අඝ්ඝාම න ච වත නෝ ජාති ආගච්ඡෙය්‍යාති' න බෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති දුක්ඛං. ජරාධම්මානං සත්තානං-ව්‍යාධිධම්මානං සත්තානං-මරණධම්මානං සත්තානං-සොකපරිදෙව දුක්ඛදොමනඝුපායාසධම්මානං සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති:- 'අහෝ වත මයං න සොකපරිදෙව දුක්ඛදොමනඝුපායාඝා ආගච්ඡෙය්‍යුනති' න බෝ පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති දුක්ඛං"** යි.

ඒ ඒ සත්ත්වයන් විසින් ලැබීමට බලාපොරොත්තු වන වඝතුන් නො ලැබීම නිසා හට ගන්නා දුක්, **'ඉච්ඡාවිඝාතදුක්ඛ'** නම්. ඉපැත්ම පියවි කොට ඇති දිරීම පියවි කොට ඇති රොගයන්ගෙන් පෙළීම පියවි කොට ඇති මරණය පියවි කොට ඇති සොකපරිදෙව දුක්ඛදොමනඝුපායාසයන් පියවි කොට ඇති සත්ත්වයන්ට "අපි ඉපැත්ම දිරීම පෙළීම මරණය සොකපරිදෙවදුක්ඛදොමනඝුපායාස පියවි කොට ඇත්තමෝ නො වන්නෙමු නම්, ඉතා මැනැවැ, ජාතිජරාව්‍යාධිමරණසොකපරිදෙවදුක්ඛදොමනඝුපායාසයෝ නො පැමිණෙත්නාහු නම් ඉතා මැනැවැ" යි මෙසේ කැමැත්ත උපදනේ ය. ආශාව වන්නී ය. එහෙත් ඒ එකොහුත් නො සිදු වන්නේ ය. මේ බලාපොරොත්තුවීම් පැතීම් කිසිවක් සිඳ්ධ කට නො හැකි ය. මෙසේ මේ බලාපොරොත්තුවීම් පැතීම් කඩවීමෙන් නො සිදුවීමෙන් උපදනා දුක්, ඉච්ඡාවිඝාතදුක්ඛය යි දත යුතු ය.

ඉච්ඡාවිඝාතදුක්ඛය නොලද හැකි වස්තූන් සෙවීම පැනීම ලකුණු කොට සිටියේ ය. නොලද හැකි වස්තූන් සෙවීම කෘත්‍ය ය කොට සිටියේ ය. ඒ නොලැබීම එහි වැටහීම වේ. ඉච්ඡාවිඝාතය මෙසේ කායික-චෙතසිකදුක්ඛයන්ට හෙතු බැවින් දුකැ, යි වදුරණ ලදී.

"තෝ රජ වන්නෙහි ය" යි මහාජනයා විසින් කියන ලද යම් කිසි පුරුෂයෙක් විළිබිය නැති ධූතීයන් විසින්, වරහැලි ඇඳ ගත් දුප්පත් මිනිසුන් විසින් පිරිවරණ ලදු ව ගිරිදුගීයකට හෝ වනදුගීයකට පිවිසෙන්නේ ය. රාෂ්ට්‍රික රජ තෙමේ එ පවත් දැන ඔහු ගණු පිණිස බල පිරිස් යවන්නේ ය. ඒ දුටු ඔහු පිරිවර දෙනා හැර, ලත් පහර ඇති ව ගස් අතරකට හෝ ගල් අතරකට හෝ වදනේ ය. එකල්හි මහමේ නැගී වස්නේ ය. සිවු දිග ම මෙඝාඞ්කාරයෙන් වැසී යයි. ඒ පුරුෂ තෙමේ ද කළු කුහුඹු ආදී නොයෙක් සතුන් විසින් වසා ගන්නා ලදු ව බලවත් වූ කායික දුක්ඛයෙන් පෙළෙන්නේ ය. "එකලා වූ මා නිසා මෙතෙක් නැයෝ මෙතෙක් හොගයෝ නටහ" යි සිතන්නා වූ ඔහුට බලවත් වූ චෙතසික දුක්ඛයෙක් ද උපදියි. මෙසේ මේ ඉච්ඡාවිඝාතදුක්ඛය ද කායික-චෙතසික දුක්ඛයන්ට වස්තු බැවින් දුකැ, යි දත යුතු ය.

"තං තං පත්ථයමානානං තස්ස තස්ස අලාභතො,
යං විඝාතමයං දුක්ඛං සත්තානං ඉධ ජායති,

අලබ්භනෙය්‍යවත්ථූනං පත්ථනා තස්ස කාරණං,
යස්මා තස්මා ජිනෝ දුක්ඛං ඉච්ඡිතාලාභ මබ්‍රවී"

මේ ලොකයෙහි ඒ ඒ වස්තූන් පතන්නා වූ සත්ත්වයන්ට ඒ ඒ වස්තූන් නොලැබීමෙන් චිත්තපීඩාව උපද වන්නා වූ යම් කායික දුක්ඛයෙක් උපදී ද, නොලැබිය හැකි වස්තූන් පැතීම ඒ කායික-චෙතසිකදුක්ඛයන්ට කරුණු වේ ද එහෙයින් බුදුරජාණන් වහන්සේ කැමැති වස්තූන් නොලැබීම දුකැ, යි වදාළ සේක.

පඤ්චුපාදානක්ඛන්ධදුක්ඛය මෙසේ දත්තේ ය:- **"රූපූපාදානක්ඛන්ධෝ වෙදනූපාදානක්ඛන්ධෝ සඤ්ඤූපාදානක්ඛන්ධෝ සඞ්ඛාරූපාදානක්ඛන්ධෝ විඤ්ඤාණූපාදානක්ඛන්ධෝ ඉමෙ වුච්චන්ති සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"** යි.

තෘෂ්ණාදීන් විසින් දැඩි සේ ගත් සකඤ්චිපංචකය උපාදානස්කන්ධ නම්. මෙ කී උපාදානස්කන්ධපංචකය සියලු දුක් උපදවන ස්ථාන බැවින් දුක් වේ.

දුක් සියයෙක, දහසෙක, සියදහසෙකැ යි සැකෙවින් දක්වන්නට නො හැකි ය. එහෙත් පඤ්චොපාදානස්කන්ධය ලොව ඇති හැම දුකට ස්ථාන බැවින් ඒ හැම එක් කොට එය සැකෙවින් දුකැ, යි වදාළ සේක. සත්ත්ව පුද්ගල ස්ත්‍රී පුරුෂාදිනාමයෙනුදු දක්වන්නේ ද මේ උපාදානස්කන්ධපඤ්චකය මය. මින් තොර සත්ත්වයෙක් පුද්ගලයෙක් ස්ත්‍රියක් පුරුෂයෙක් දෙවියෙක් බඹෙක් නැත්තේ ය. ඒ ඒ තත්ත්ව විසින් මෙහි දැක්වුනු මේ පදාර්ථ උපාදානස්කන්ධ මැ යි. සසර මුල සිට සසර ගෙවා නිවන් ලබන තුරු ජාති-ජරා-මරණාදී වූ හැම දුකෙක් මුන් මුල් කොට සිටියේ ය. එහෙයින් මේ උපාදානස්කන්ධපංචකය දුකැ, යි ගත් කල නො ද ගැණෙන්නා වූ දුකෙක් නම්, භවත්‍රයයෙහි කොතැනෙකත් නැත්තේ ය. බුදුරජුන් විසින් ස්වරූපයෙන් වදාළා වූ ද, නම් වශයෙන් ස්වරූපයෙන් නො වදාළා වූ ද දුක් උපාදානස්කන්ධ නිසා ම ලැබෙන්නේ ය. ගින්න දර දවන්නා සේ ආයුධ ඉලක්කයට පහර දෙන්නා සේ මැසිමදුරු ඈ සතුන් ගෙරින් පෙළන්නා සේ වොළෝ ගන්නන් ගම් පහරන්නා සේ ජාත්‍යාදිදුක්ඛයෝ උපාදානස්කන්ධයන් ම පෙළමින් උපාදානස්කන්ධයන්හි ම හට ගණිත්. උපාදානස්කන්ධයන්ගේ මුල් දුක ඉපදීම, මැද දුක දිරීම, කෙළවර දුක මැරීම, ඇතුළත තවන දුක ශොකය, වැළපෙන දුක පරිදෙවය, කය පෙළෙන දුක කායිකදුක්ඛය, සිත පෙළන දුක දෙමනස්සය, තැතනීම් දුක උපායාසය, ප්‍රියයන්ගෙන් වෙන්වීම පියවිප්පයොගය; අප්‍රියයන් හා එක්වීම අප්පියසම්පයොගය, කැමැති දෙය නො ලැබීම ඉච්ඡාවිඝාතයැ යි මෙසේ සලකන කල්හි පඤ්චොපාදානස්කන්ධය මුළුමනින් දුකැ යි ගත යුතු ය. මෙ හැම දුක් මෙහි ම ඇතුළත් බව දක්වන්නට **"සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"** යි වදාළ සේක.

"ජාතිප්පභූතිකං දුක්ඛං යං වුත්තං ඉධ තාදිනා,
අවුත්තං යඤ්ච තං සබ්බං විනා එතෙ න විජ්ජති.

යස්මා තස්මා උපාදානක්ඛන්ධා සඞ්ඛෙපනො ඉධ,
දුක්ඛාති වුත්තා දුක්ඛස්ස දෙසකෙන මහෙසිනා"

මේ දුඃඛසත්‍යයෙහි ලා බුදුරජානන් වහන්සේ විසින් වදාළ ජාති දුක්ඛය මුල් කොට ඇති යම් දුකෙක් වේ ද, මෙහිලා නො වදාළ යම් දුකෙක් වේ ද, ඒ සියලු දුක් මේ උපාදානස්කන්ධයන් හැරපියා නො වන්නේ ය. නො ද ඇත්තේ ය. එහෙයින් සැකෙවින් මේ උපාදානස්කන්ධපඤ්චකය දුකැ, යි වදාළ සේක.

දුක්ඛසමුප්පාදං = දුඃඛසමුදයසත්‍යය (ද)

දුඃඛසමුදයසත්‍යය ආර්‍යසත්‍ය අතුරෙහි දෙ වැන්න ය. බුදු රජානන් වහන්සේ එය මෙසේ වදාළසේක:- **"යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍ය-පිදං:- කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, ඉදං වුච්චති භික්ඛවෙ! දුක්ඛසමුදයං අරියසච්චං"** යි.

සත්ත්වයාහට නැවැත නැවැත සසරෙහි ඉපැත්ම දෙන සත්ත්වයා පුන පුනා සසරෙහි උපදවන තමන් පිබළිඳ වූත් තමන් පිළිබඳ නො වූත් සක්ඛයන් කෙරෙහි ඒ ඒ තත්ත්ව විසින් පවත්නා සියලු පදාර්ථයන් කෙරෙහි තුටු පහටු බවෙන් හා ඇලීමෙන් යුත් ලද නො ලද කුදු මහත් හැම දෙයක හැම තැනෙක සතුටු වන කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යි තෙ වැදැරුම් වූ යම් මේ තෘෂ්ණාවක් වේ ද, මහණෙනි, මෙය දුඃඛසමුදයසත්‍යය, යි කියනු ලැබේ යනු එහි කෙටි අරුත ය.

දුඃඛසමුදයාර්‍යසත්‍යය වදාරණ බුදුරජානන් වහන්සේ තෘෂ්ණාව දුඃඛසමුදයැ, යි මෙයින් වදාළ සේක. එය වඩාත් තතු විසින් පැහැදිලි කරණු පිණිස **"පොනොභවිකා-නන්දිරාග-සහගතා-තත්‍ර තත්‍රාභිනන්දිනී"** යන මෙ පද තුණ වෙසෙසින් දැක් වූහ.

එහි මරණින් මතු නැවැත ඉපැත්ම 'පුනබ්භව' නම්. නැවැත ඉපැත්ම දීම තෘෂ්ණාව පිළිබඳ ස්වභාවයයි. ඒ ස්වභාවය යමක්හට ඇත්තේ නම් ඕ **"පොනොභවිකා"** නම්. තව ද යම් තෘෂ්ණාවක් වෙතනාව හා එක්ව නැවැත ඉපැත්ම දේ ද, කර්මය සහාය කොට නැවැත ඉපැත්ම පිණිස පවතී ද, එහෙයිනුදු පොනොභවිකා. මේ අටුවා:- **"පොනොභවිකා ති පුනබ්භවකරණං = පුනොභවො, පුනොභවො සීලමස්සාති = පොනොභවිකා, අපි ච පුනබ්භවං දෙති, පුනබ්භවාය සංවත්තති, පුනපපුනං භවෙ නිබ්බත්තෙ-තීති = පොනොභවිකා"** යනු

මේ එහි ටීකා:- **"තත්‍ර කම්මසහජාතා පුනබ්භවං දෙති, කම්මසහායභූතා සහජාතා පුනබ්භවාය සංවත්තති, දුවිධාපි පුනපපුනං භවෙ නිබ්බත්තෙති"** යනු.

ඒ ඒ අරමුණුවල දැඩි බැඳුමැ,යි කියූ නන්දිරාගය හා යුක්ත වූවා, අරමුණුවල දැඩි බැඳුම හා අරුත් විසින් සමානභාවයට ගියා නන්දි-රාගසහගතා. මේ අටුවා:- **"අභිනන්දන සඞ්ඛාතෙන නන්දිරා-ගෙන සහගතාති නන්දිරාග සහගතා, නන්දිරාගෙන සද්ධිං අත්‍රතො එකත්තං එව ගතාති වුත්තං හොති"** යනු.

මේ 'නන්දිරාගසහගතා' යන පදය තේරුම් කරණ ටීකාවී එය මෙසේ තේරුම් කරයි:- **"නන්දනට්ඨෙන නන්දි, රඤ්ජනට්ඨෙන රාගො, යො ච නන්දිරාගො, යා ච තණ්හා, උභයමෙතං එකත්ථං, ඛ්‍යඤ්ජනමෙවනානං"** යි. සිතේ බැඳීම සිත අරමුණුවල ඉපිලීම හෝ පොපියන බව නන්දි නම්. යම්කිසි පැහැයෙකින් රෙදිකඩක් රඳනා සේ සිත අන් අතකට පමුණුවා නුයි අලවා නුයි රාග නම්. යම් නන්දිරාගයෙක් වේ ද, යම් තෘෂ්ණාවක් වේ ද එ දෙක ම අරුත් විසින් සමාන ය, අකුරු විසින් අසමාන ය, යනු එහි අරුත ය.

යම් යම් භවයෙක් හි ආත්මභාවයෙක් වේ ද, ඒ ඒ ආත්මභාවයෙහි වෙසෙසින් සතුටු වූවා ඇලී සිටියා නොහොත් රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය-ධර්ම යන අරමුණුවල සතුටු වූවා තදින් ඇලී සිටියා **තත්‍රතත්‍රාභිනන්දිනී** ය. මේ අටුවා:- **"තත්‍රතත්‍රාභිනන්දිනීති යත්‍ර යත්‍ර අත්තභාවො, තත්‍ර තත්‍රාභිනන්දිනී, රූපාදීසු වා ආරම්මණෙසු තත්‍ර තත්‍රාභිනන්දිනීති රූපාභිනන්දිනී, ගන්ධරස ඵොට්ඨබ්බධම්මාභිනන්දිනීති"** යනු.

මෙහි **පොනොභවිකා** යන්නෙහි තතු අරුත්, නියම විසින් නො දත්තේ තෘෂ්ණාව ම සත්ත්වයන්ගේ පුන පුනා ඉපැත්මට එක ම හෙතුය යි ගත්තේ ය. එසේ නො ගත යුතු ය. එසේ ගන්නට එයින් අවසරයෙක් නො ලැබෙන්නේ ය. එක් ම හෙතුවෙකින් හට ගත්තා වූ ද හට ගන්නාවූ ද කිසිවෙක් ලොකයෙහි නැත්තේ ය. විශෙෂ විසින් සත්ත්වයාගේ පුන පුනා සසර ඉපැත්මට තෘෂ්ණාව හා එක් වූ කර්මාදී වූ තවත් හෙතුහු ඇත්තාහ. එහෙත් තෘෂ්ණාව ම එහිලා ප්‍රධාන බැවින් **"යායං තණ්හා පොනොභවිකා"** යනු වදාළ සේක. තෘෂ්ණාව හැර තෘෂ්ණාව හා එක් වූ අනෙක් හෙතුන්ට සත්ත්ව ජීවිතයක් ජාතියෙන් ජාතියට ගෙණ යෑමට නො හැකි ය. සත්ත්ව ජීවිතය ඉදිරියෙහි ගෙණ යෑමට සමර්ථ වූවා තෘෂ්ණාව ම ය. අනෙක් හෙතුහු ඒ පිණිය තෘෂ්ණාවට රුකුල් දෙන්නෝ ය.

මෙසේ මේ කියූ අරුත් ගැබ් කොට සිටි තෘෂ්ණාව, මුල් බෙදුම් විසින් **කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා** යි තෙ පරිදි ව බෙදී සිටියා සමුදය නම් වූ ය. ඒ කවරහෙයින? යත්:- අවිද්‍යා-උපාදානා දී වූ හෙතුන් හා එක්වීමෙන් උපතට කරුණු වන බැවිනි. **"සහ අවයවෙන උදයතීති=සමුදයො"** යනු අර්ථ සමර්ථනය යි.

සමුදය යන මෙහි **'සං-උ-අය'** යි තෙ සදෙක් එක් ව සිටියේ ය. එහි **සං** යනු 'සමාගමෝ, සමෙතං' යනාදී තන්හි සේ එක්වීම කියාලයි. **උ** යනු 'උපපන්නං, උදිතං' යනාදී තන්හි සේ උපත කියාලයි. **අය** යනු කාරණයෙහි වැටුනේ ය. වෙන් වෙන් ව සිටි කල්හි මෙසේ අරුත් කියන මේ ශබ්දත්‍රයය, එක්ව නැගී සිටියේ "එක්වීම ඇති කල්හි උපතට හෙතු ය" යන අරුත දෙන්නේ ය. තෘෂ්ණාව, සමුදය යන නාමානන්තරයට වැටුනී මේ අරුත බලා ය. මෝ, අවිද්‍යා උපාදානාදී වූ අනෙක් හෙතූන් හා එක්වීමෙන් දුකැ,යි ගැණෙන පඤ්චොපාදානස්කන්ධයාගේ උපතට කරුණු වන්නී ය. තෘෂ්ණාව, අවිද්‍යා උපාදානාදී වූ හෙතූන් හා එක් වූ කල්හි ම පඤ්චොපාදානස්කන්ධයාගේ පහළවීම වන්නේ ය. නැත, පහළ නොවේ. එහෙයින් තෘෂ්ණාව දුක්ඛසමුදය, යි කියනු ලැබේ. මේ අටුවාः- **"ඉදං අපි ච සච්චං අවයෙසපච්චය සම්භොගෙ සති දුක්ඛස්සුප්පත්තිකාරණං, ඉති දුක්ඛස්ස සංභොගෙ උප්පත්තිකාරණත්තා දුක්ඛසමුදයන්ති වුච්චති"** යනු.

මේ ද මුලින් කියූ දුඃඛසත්‍යය සේ ආර්‍ය්‍ය වූ බුදුරජාණන් වහන්සේ විසින් ම දැන වදාළ බැවින්, මෙය දැන ගැණීම ආර්‍ය්‍ය භාවයට කරුණු බැවින් ආර්‍ය්‍යසත්‍ය නම් වේ. දුඃඛසමුදය වූ ආර්‍ය්‍යසත්‍යය, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය නම්.

දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයෙහි **ආයූහන-නිදාන-සංයොග-පලිබොධ,** යි ගති සතරෙක් ඇත්තේ ය. **"සමුදයස්ස ආයූහනට්ඨො-නිදානට්ඨො-සංයොගට්ඨො-පලිබොධට්ඨො, ඉමෙ චත්තාරො සමුදයස්ස සමුදයට්ඨා තථා අවිතථා අනඤ්ඤථානි"** යනු අටුවාය. එහි කුශලාකුශලකර්ම රැස්කිරීම, හැම දුක් එකතු කිරීම **ආයූහන** නම්. පංචස්කන්ධභෙදයෙන් නැවැත ඉදිරියෙහි පංචස්කන්ධයකට පිහිටවීම, කරුණුවීම **නිදාන** නම්. නැවැත නැවැත පාවස්කන්ධදුඃඛයෙහි සත්ත්වයන් යොදුලීම **සංයොග** නම්. මාර්ගඵලාවබෝධයට බාධාකිරීම **පලිබොධ** නම්. මොවුහු වනාහි සමුදයසත්‍යයාගේ තත්ස්වභාව වූ නොදැ බොරු වූ අන්‍යාකාර රහිත වූ සමුදයස්වභාවයෝ ය.

භවත්‍රයයෙහි කිසිදු තැනෙක මේ කියූ සමුදයස්වභාවයන් ගෙන් තොර වූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය නරක තිර්‍ය්‍යක් ප්‍රෙතාදී වූ කිසිත් පදාර්‍ථයෙක් නැත්තේ ය. ලොව ඇති තාක් හැම පදාර්‍ථයෙක් මේ සතරට යටත් ව පවත්නේ ය. එහෙයින් භවත්‍රය පුරා සිටි සියලු ජීවපදාර්‍ථයන්ගේ ඉපැත්මෙහි හෙතු ව මූලකාරණය මේ ය. සමුදයසත්‍යය පිළිබඳ වූ මේ ස්වභාවධර්‍මයෝ ඥානයට විෂය ව සිටියෝ ය.

ලක්ඛණ-රස-පච්චුපට්ඨාන යන මෙ තුණ සමුදයසත්‍යයෙහි තත්ත්ව තුණෙකි. සමුදයසත්‍යය ලක්ෂණ විසින් මූලොත්පත්තිය ලකුණු කොට සිටියේ ය. රස විසින් පුනා පුනා ඉපැත්ම නොසිඳ පවත්වාලීම කෘත්‍යය කොට සිටියේ ය. පච්චුපට්ඨාන විසින් සසරින් මිදීමට ඉඩ නොදීම එයට පළිබොධ කිරීම වැටහීම කොට සිටියේ ය.

"තං විනා නාඤ්ඤතෝ දුක්ඛං න හොති න ච තං තතෝ,
දුක්ඛහෙතුනියාමෙන ඉති සච්චං විසත්තිකා"

ඒ තෘෂ්ණාව හැරපියා අනෙකොකින් පංචස්කන්ධදුඃඛය නොවේ ද, ඒ දුඃඛය තෘෂ්ණාවෙන් නොවනුයේ නොවේ ද, මෙසේ පංචස්කන්ධ දුඃඛයට හෙතුභාවනියමයෙන් විසත්තිකා නම් වූ තෘෂ්ණාව සමුදය-සත්‍යය නම් වේ.

මෙසේ සමර්ත්‍ථිත වූ සමුදයශබ්දය කාමතණහා-භවතණහා-විභවතණහා යි තෙ වැදෑරුම් වූ තෘෂ්ණාව දුක් උපදවන අරුතින් එකතියට පමුණුවා නැගී සිටියේ ය. **"ඉධ පනායං තිවිධාපි දුක්ඛසච්චස්ස නිබ්බත්තකට්ඨෙන එකත්තතං උපනෙතා දුක්ඛ-සමුදයත්ති වුත්තාති වෙදිතබ්බා"** යනු දත්තේ ය.

එහි **කාමතණහා** නම්, වත්‍ථුකාම-කෙලෙසකාම දෙක ය. කෙලෙසයන්ගේ ඉපැත්මට කරුණු වූ වත්‍ථු හැම එකොක් අප්‍රධානා වසින් **කාමැ**, යි ගණු ලැබේ.

ප්‍රධාන වසින් ගැණෙන්නේ ඒ ඒ වස්තූන්හි ඇස නිසා කණ නිසා නැහැය නිසා දිව නිසා කය නිසා සිත නිසා උපදනා ඇලීම ය. බැඳීම ය. පිපාසා ය. ප්‍රීතිය. මූර්ඡාය. බැසගැණීම ය. යෙදීම ය. දැඩිව ගැණීම ය. ඇවිරීම ය.I ඒ ය කෙලෙසකාම නම්.

මෙසේ වත්‍ථුකාම-කෙලෙසකාම වසින් දෙපරිදි වූ කාම තෘෂ්ණාව කාමලොක-රූපලොක-අරූපලොක යන තුන් ලොව ම ගෙණ සිටියා ය. කාමභවික සත්ත්වයන් පිළිබඳ වූවා කාමතණහා නම්. රූපභවිකසත්ත්වයන් පිළිබඳ වූවා රූපතණහා නම්. අරූප-භවිකසත්ත්වයන් පිළිබඳ වූවා අරූපතණහා නම්. මෙහි 'රූප තණහා'යි කීවා රූපභවිකසත්ත්වයන් පිළිබඳ වූවා මුත් කාම භවිකසත්ත්වයන් තුළ රූපාරම්මණය ඇසුරු කොට උපදනා තණහා, යි නොදතයුතු ය.

I. 2. 4 'ඔ කාමරතිසන්ථවං.' } පරිකථා බලනු.
, 4. 4 'අනිත්තාංසෙව කාමෙසු' }

"කාමෙ තණ්හා = කාමතණ්හා, පංචකාමගුණිකරාගස්සෙතං අධිවචනං" යන මේ අටුවායෙන් තෘෂ්ණා නම්, එකොළොස් වැදැරුම් වූ කාමභූමීන්හි හැසිරෙණ උත්පත්ති වශයෙන් යන එන සත්ත්වයන් තුළ රූපාදීන් අරමුණු කොට සිතෙහි උපදනා ඇලුම් බැඳුම්, යි දැක්වුනේ ය.

කාමතණ්හා යන මෙහි වූ **කාම** යන්න ගැණ යට කියූ කරුණු දතයුතු ය. **තණ්හා** නම්, සත්ත්වයන් අරමුණු විෂයයෙහි පිපාසිතයන් කරණ ධර්මශක්තිය යි. යම් ධර්මශක්තියක් කරණ කොට සත්ත්වයා අරමුණුරස විඳිනු කැමැත්තේ වේ ද, ඒ ධර්ම ශක්තිය යි. මේ ධර්මශක්තිය ම සත්ත්වයන්ගේ සිත්තුළ පව් කරන්නට කැමැත්ත උපදවයි. සත්ත්වයා පවෙහි යොදාලයි. එකොළොස් වැදැරුම් වූ කාමලොකයෙහි කො තැනෙක හෝ සත්ත්වයන්ගේ උපතට හෙතු වන්නී මෝ ය. සත්ත්වයන් ජාතියෙන් ජාතියට උත්පත්ති වශයෙන් ඇද ගෙණ යන්නී මෝ ය. **"ඉච්ඡා නරං පරිකස්සති"** යනු වදාළෝ එහෙයිනි. මළපුඩුවෙක බැඳුනු ළිහිණියක සේ ලොකයෙහි ඇති තාක් පෘථග්ජනසත්ත්වයෝ මේ තෘෂ්ණායෙන් බැඳී සිටුනෝ ය. **"ඉච්ඡාබද්ධා පුථුසත්තා පාසෙන සකුණී යථා"** යනු වදාළෝ එහෙයිනි.

මෙසේ හැම සසරදුකට මුල් වූවා තෘෂ්ණාව ය. තෘෂ්ණාව නිසා ම සත්ත්ව තෙමේ ජාතිජරාමරණා දී වූ හැම දුකක් විඳියි. සත්ත්වයන් සසර විඳුනා දුක් මෙතෙකැ, යි පමණ කළ නොහැකි ය. එහෙයින් සසර බිය දක්නවුන් විසින් තෘෂ්ණාව ගැණ කරුණු දතයුත්තේ ය. දැන එය මුලසුන් කළ යුත්තී ය. ඒ පිණිස හිත වූ මග යායුත්තේ ය.

සසර දුකට මුල් වූ මේ තෘෂ්ණාව, **රූපතණ්හා-සද්දතණ්හා-ගන්ධතණ්හා-රසතණ්හා-ඵොට්ඨබ්බතණ්හා-ධම්මතණ්හා** යි සවැදැරුම් ය. මෙය මෙසේ වදාළ සේක:- **"කතමා පනාවුසො! තණ්හා? ඡ ඉමෙ ආවුසො! තණ්හා කායා, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා"** යි.

"රූපෙ තණ්හා = රූපතණ්හා, රූපාරම්මණං පටිච්ච පවත්තා තණ්හා රූපතණ්හා" රූපය අරමුණු කොට රූපයෙහි එල්බ ගැණීමෙන් රූපය කෙරෙහි උපදනා ඇලීම බැඳීම 'රූපතණ්හා'යි මේ විවරණයන්ගෙන් පැහැදිලි ය. **"යං රූපං චතුන්නං මහාභූතානං උපාදාය වණ්ණනිභා සනිදස්සනං සප්පටිඝං නීලං**

පීතං ලොහිතං ඔදතං කාලකං" යනාදින් වදුල මහාභූත රූපයන් පිළිබඳ නීලාදි වූ යම් වණ්සංසථානයෙක් වේ ද, හෙවත් විකාතිමත් වණ්සංසථාන සඞ්ඛ්‍යාත රූපාලම්බනයෙක් වේ ද ඒ විකාරරූපය රූප නම් වේ. එබඳු වණ්සංසථාන රූපයක් චක්ඛු-ස්ප්‍රසාද රූපයට (ඇසට) හමු වූ කල්හි ඒ හා ගැටුනු කල්හි කාමරස විඳ ගැණීම් වශයෙන් සිතෙහි නගිනා ධර්මශක්තිය රූප තෘෂ්ණා, යි දතයුතු ය. ඕ ම කාමතණහා නමුදු වේ. "**රූපතණහා එව යදා චක්ඛුසස ආපාථගතං රූපාරම්මණං කාමස්සාදවසෙන පවත්තති, තදා කාමතණහා නාම හොති**" යනු එහිලා කිහ.

චිත්තචෛතසිකධර්ම මෙහි ඇලේ නුයි හෝ චිත්තචෛතසික ධර්මයන්ගේ ඇලීමට ආධාරසථාන නුයි හෝ මේ කියූ රූපාදීහු ම ආරම්මණ නම් වෙත්. "**චිත්තචෙතසිකා ධම්මා ආගනත්වා එතථ රමන්ති, ආගනත්වා වා චිත්තචෙතසිකා ධම්මා රමන්ති එතථාති = ආරම්මණං**" යනු විභාෂා යි.

චක්ඣුර්ද්වාරයන් රූපාලම්බනයක් එකට ගැටීමෙන් චක්ඣුර්-විඥානය පහළ වේ. ඉන්පසු එම අරමුණ නිසා පහළ වන සිත් පරපුරෙහි කෙළවර නගිනා ජවන් සිත්හි අයොනිසො මනසකාරය බලගතුව නැඟී ගියේ නම්, එකල්හි ඒ ජවන් සිත්හි වූ චෙතනාව අරමුණෙහි නියම තතු නොදැන ඇති තතු නොගෙණ අරමුණ ශුභ වශයෙන් ගෙණ රස විඳියි. එහි බැඳෙයි. එහි ගැලෙයි. එහි බැස ගණ්ගියි. මෙසේ රූපාරම්මණයෙහි ඇලීම රස විඳීම බැඳීම ගැලීම බැස ගැණීම නම් වූ රූපතෘෂ්ණාව අපායදුකට කරුණු වන්නී ය. රූපතෘෂ්ණාවෙන් මැඩුනෝ පුන පුනා සසර ම සැරිසරත්. සසර දුකෙහි ම වැටෙත්. සසර දුකෙහි ම ගැලෙත්.

තෘෂ්ණාවගේ ඉපැත්මට කරුණු වන රූපාරම්මණ අතුරෙහි පුරුෂයාහට ස්ත්‍රීරූපයත් ස්ත්‍රියහට පුරුෂරූපයත් තරම් සැහැසි වූ අන් එක ද රූපයෙක් නැත්තේ ය. ස්ත්‍රීරූපය හා පුරුෂරූපය හා දෙක අන් හැම රූපයක් යට කොට ගෙණ සිටියේ ය. ඒ වග වදුල සැටි මෙසේ දන්නේ ය:-

"**නාහං භික්ඛවෙ! අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! ඉත්ථිරූපං, ඉත්ථිරූපං භික්ඛවෙ! පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති**"

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! පුරිසරූපං, පුරිසරූපං භික්ඛවෙ! ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති" යි.

සත්‍රීරූපය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් පුරුෂරූපය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් ලොකයෙහි විපතට පත් වූත් විපතට පත්වන්නා වූත් සත්‍රීපුරුෂයන්ගේ ගණන පිරිසිඳිය නො හැකි ය. තිරිසන් ගත සත්ත්වයන් අතර ද මේ විපත දක්නට ලැබේ. මහද්ගතචිත්තසමාධි ඇති පුරුෂයෝ පවා මේ රූපතෘෂ්ණාවෙන් විපතට පත් වූහ.

"කත්වාන රාගමිසයොපි ඛගා දුපඤ්ඤා
ථිරූපිනාරිකුසුමෙසුපි රූපගිද්ධා,
පත්තානයං බලු පුරෙ පරිහීනඤ්ඤානා
රූපෙ න රජ්ජථ තතො බලු සාධුපඤ්ඤා"

පෙර අහසෙහි ගිය නුවණ නැති රූපයෙහි ගිජු වූ සෘෂිහු ද සත්‍රී රූපාකාර වූ නාරිලතා මල්හි ද ආලය කොට පිරිහුනු ධ්‍යාන ඇත්තාහු එකාන්තයෙන් විනාශයට පැමිණියහ. එහෙයින් නුවණැත්තෙනි! රූපයෙහි නො ඇලෙවු.

"සද්දෙ තණ්හා = සද්දතණ්හා, සද්දාරම්මණං පටිච්ච පවත්තා තණ්හා සද්දතණ්හා" ශබ්දය අරමුණු කොට ශබ්දයෙහි එල්බ ගැණීමෙන් ශබ්දය නිසා උපදනා ඇලීම බැඳීම ශබ්දතණ්හා නම් වේ. **"යො සද්දො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිසො භෙරිසද්දො මුතිඞ්ගසද්දො සඞ්ඛසද්දො පණවසද්දො ගීතසද්දො"** යනාදීන් වදාළ මහාභූතයන් නිසා හට ගැණෙන ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු වූ භෙරිමුතිඞ්ගාදී වූ යම් ශබ්දයෙක් වේ ද, ඒ ය ශබ්ද නම්. එබඳු ශබ්දාලම්බනයක් ශ්‍රොත්‍ර-ප්‍රසාදයට (කණට) වැටුනු කල්හි ඒ හා ගැටුනු කල්හි කාමරස විඳ ගැණීම් වශයෙන් සිතෙහි නගිනා ධර්මශක්තිය ශබ්දතෘෂ්ණා නම් වේ. ඕ ම කාමතණ්හා නමුදු වේ. **"සද්දතණ්හා එව සොතස්ස ආපාථගතං සද්දාරම්මණ කාමස්සාදවසෙන පවත්තති, තදා කාමතණ්හා නාම හොති"** යනු එහිලා කීහ.

මේ කියූ ශබ්දාලම්බනය ශුභ වශයෙන් ගෙණ රස විඳිනුයේ එහි බැඳෙනුයේ ගැලෙනුයේ බැස ගණ්ඩුයේ අපායයෙහි හෙන්නේ ය. පුන පුනා සසර දුකෙහි ම ගැලෙන්නේ ය.

තෘෂ්ණාවගේ ඉපැත්මට කරුණු වන සඳුරම්මණ අතුරෙහි පුරුෂයාහට සත්‍රීශබ්දයත් සත්‍රියහට පුරුෂ ශබ්දයත් තරම් සැහැසි වූ අන් එක ද ශබ්දයෙක් නැත්තේ ය සත්‍රී ශබ්දය හා පුරුෂ ශබ්දය හා දෙක අත් හැම ශබ්දයක් යට කොට නැගී සිටියේ ය. ඒ වග වදාළ සැටි මෙසේ දත්තේ ය:-

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! ඉත්ථිසද්දො, ඉත්ථිසද්දො භික්ඛවෙ! පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! පුරිසසද්දො, පුරිසසද්දො භික්ඛවෙ! ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති" යි.

සත්‍රීශබ්දය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් පුරුෂශබ්දය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් ලොකයෙහි විපතට පත් වූත් විපතට පත් වන්නාවූත් සත්‍රීපුරුෂයන්ගේ ගණන පිරිසිඳිය නො හැකි ය තිරිසන් ගත සත්ත්වයන් අතර ද මේ විපත දක්නට ලැබේ. මහදඟනචිත්තසමාධි ඇති පුරුෂයෝ පවා මේ ශබ්දතෘෂ්ණාවෙන් විපතට පත් වූහ.

"සද්දානුරාගමනුගොපි පුරෙ සිඛණ්ඩී
සුත්වාන මොරිමධුරං ගිරමිඤ්ජිතඤ්ඤා,
ව්‍යාධස්ස හත්ථිමගමාසි භවෙසු තස්මා
නත්ථෙව සද්දසමදුක්ඛකරං ජනානං"

පෙර මොණරෙක් ශබ්දානුරාගයට අනුව ගියේ මොණරියගේ මිහිරිනාදය අසා වැද්දුට හසු විය. සත්ත්වයන්ට ශබ්දය සමාන දුඃඛකාරණයෙක් නැත් ම ය.

"ගන්ධෙ තණ්හා = ගන්ධතණ්හා, ගන්ධාරම්මණං නිස්සිතා ජාතා තණ්හා = ගන්ධතණ්හා" ගන්ධයෙහි පැවැති ගන්ධාරම්මණය අසුරු කොට ගන්ධයෙහි එල්බ උපදනා ඇල්ම බැඳීම ගන්ධතණ්හා නම් වේ **"යො ගන්ධො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිඝො මූලගන්ධො සාරගන්ධො තචගන්ධො පත්තගන්ධො පුප්ඵගන්ධො"** යනාදීන් මහාභූතයන් නිසා උපදනා ඝ්‍රාණවිඥානයෙන් දතයුතු වූ මූලගන්ධාදී වූ යම් ගන්ධයෙක් වේ ද, ඒ ය ගන්ධ නම්. සුවඳ-දුගඳ වශයෙන් ද වෙන් කෙරෙණ එබඳු

ගන්ධාලම්බනයක් ඝ්‍රාණප්‍රසාදයෙහි (නාහයෙහි) වැදුනු කල්හි ඒ හා ගැටුනු කල්හි එහි රස විඳ ගැණීම් වශයෙන් සිතෙහි නහිනා ධර්මශක්තිය ගන්ධතණහා නම් වේ. ඕ ම කාමතණහා නමුදු වේ. **"ගන්ධතණහා එව ඝාණස්ස ආපාථගතං ගන්ධාරම්මණං කාමස්සාදවසෙන පවත්තති, තදූ කාමතණහා"** යනු එහිලා කිහ.

මේ කියූ ගන්ධාරම්මණය ශුභ වශයෙන් රස විඳිනුයේ එහි ගැටෙනුයේ ගැලෙනුයේ බැස ගණුයේ අපායයෙහි හෙන්නේ ය. පුන පුනා සසරදුකෙහි ම ගැලෙන්නේ ය.

තෘෂ්ණාවගේ ඉපැත්මට කරුණූ වන ගන්ධාරම්මණ අතුරෙහි පුරුෂයාහට ස්ත්‍රීගන්ධයත් ස්ත්‍රියහට පුරුෂගන්ධයත් තරම් සැහැසි වූ අන් එක ද ගන්ධයෙක් නැත්තේ ය. ස්ත්‍රීගන්ධය හා පුරුෂගන්ධය හා දෙක අන් හැම ගන්ධයක් යට කොට නැගී සිටියේ ය. ඒ වග වදුළ සැටි මෙසේ දන්නේ ය:-

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! ඉත්ථිගන්ධෝ, ඉත්ථිගන්ධෝ භික්ඛවෙ! පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! පුරිසගන්ධෝ, පුරිසගන්ධෝ භික්ඛවෙ! ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති" යි.

ප්‍රකෘති විසින් ස්ත්‍රියගේ ශරීර ගන්ධය දුහඳ වෙයි. එහෙත් මෙහි සිරුරෙහි අලෙවි දුන් ආගන්තුක වූ විලවුන් ආදීන්ගේ ගන්ධය මෙහි අදහස් කරණ ලද්දේ ය. ලොකයෙහි ඇතැම් ස්ත්‍රීහු අසුන්ගේ ගන්ධය බදු ගන්ධය ඇත්තෝ ය. එළුවන්ගේ ගන්ධය බදු ගන්ධය ඇත්තෝ ය. ඇතැම්හු ඩහදිය ගඳ ඇත්තෝ ය. ඇතැම්හු ලේ ගඳ ඇත්තෝ ය. කාමයෙන් ආතුර වූ අඛ්බාල පෘථග්ජනයාහට ඒ කිසිත් ගඳෙක් දුගඳක් සේ නොවැටහෙන්නේ ය. එහෙයින් හේ එහි ඇලෙන්නේ ය. බැඳෙන්නේ ය.

ස්ත්‍රීගන්ධය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් පුරුෂගන්ධය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් ලොකයෙහි විපතට පත් වූත් විපතට පත් වන්නා වූත් ස්ත්‍රීපුරුෂයන්ගේ ගණන විරිසිඳිය නොහැකි ය.

"ඔහාය නෙකකුසුමෙසු පරාගරාගං
මත්තෙභකුම්භමගමා මදගන්ධලුද්ධා,
භිඤ්ඤා පහග්ගතනුකෝ කරිකණ්ණතාලා
නත්ථෙව ගන්ධසදිසං තිනවෙසු පාසං"

භ්‍රමර තෙමේ නන් වැදැරුම් පුෂ්පයන්හි මල් පැණියෙහි ඇලීම හැර දමා මදගන්ධයෙහි ගිජු ව මදැතුන් කුඹුතල කරා ගොස් උන්ගේ කන් පහරින් තැළී මැරී යන්නේ ය. එහෙයින් තුන් ලොව ගන්ධය සමාන වූ මළපුඩුවෙක් නැත.

"රසෙ තණ්හා = රසතණ්හා, රසාරම්මණං පටිච්ච රසාරම්මණං නිස්සිතං කත්වා ජාතා තණ්හා = රසතණ්හා" රසයෙහි පැවැති රසය අරමුණු කොට රසය නිසා රසය ඇසුරු කොට උපදනා ඇලීම බැඳීම රසතණ්හා, යි කියන ලදි. **"යො රසො චතුන්නං මහාභූතානං උපාදාය අනිදස්සනො සප්පටිසො මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො ඵලරසො"** යනාදීන් වදාළ මහාභූතයන් නිසා හට ගැණෙන ජිව්හාවිඥානයෙන් දතයුතු වූ මූලරසාදී වූ යම් රසයෙක් වේ ද, ඒ ය රස නම් එබඳු රසාලම්බනයක් ජිව්හාප්‍රසාදයට (දිවට) ගත් කල්හි ඒ හා ගැටුනු කල්හි රසවිඳ ගැණීම් වශයෙන් සිතෙහි නගිනා ධර්මශක්තිය ගන්ධතෘෂ්ණා නම් වේ. ඕ ම කාමතණ්හා නමුදු වේ. **"රසතණ්හා එව ජිව්හාය ආපාථගතං රසාරම්මණං කාමස්සාදවසෙන පවත්තති, තදා කාමතණ්හා නාම හොති"** යනු එහිලා කිහ.

රසාරම්මණය ශුභ වශයෙන් ගෙණ රස විඳිනුයේ එහි ගැටෙනුයේ ගැලෙනුයේ බැස ගණුයේ අපායයෙහි හෙන්නේ ය. පුන පුනා සසරදුකෙහි ම ගැලෙන්නේ ය.

තෘෂ්ණාවගේ ඉපැත්මට කරුණු වන රසාරම්මණ අතුරෙහි පුරුෂයාහට ස්ත්‍රීරසයත් ස්ත්‍රියහට පුරුෂරසයත් තරම් සැහැසි වූ අන් එක ද රසයෙක් නැත්තේ ය. ස්ත්‍රීරසය හා පුරුෂ රසය හා දෙක අන් හැම රසයක් යට කොට නැගී සිටියේ ය. ඒ වග වදාළ සැටි මෙසේ දන්නේ ය:-

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! ඉත්ථිරසො, ඉත්ථිරසො භික්ඛවෙ! පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! පුරිසරසො, පුරිසරසො භික්ඛවෙ! ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති" යි.

මෙහි නිපිටක චූලනාග-චූලෝදය සථවිරයන් වහන්සේලා සත්‍රියගේ පිළිවිස කරණ සුලුබව, ඇ කෙරෙහි පැවැති කිකරු රසය හා පරිභෝගරසයෙකුත් වේ ද මෙය සත්‍රීරසය, යි කියත්. එහෙත් සත්‍රියගේ ඔජවමාංසයෙහි වැකුණු කෙළ ආදීන්ගේ රසයෙකුත් සවාමියාහට දුන් කැඳබත් ආදීන්ගේ රසයෙකුත් වේ ද ඒ සියල්ල සත්‍රීරසය, යි දත යුතු ය.

පොයෙක් දෙනා තමාගේ මාගම විසින් සියනින් දෙන ලද යම් කිසිවක් ම මිහිරිය යි ගෙණ සිටින්නෝ ය.

සත්‍රීරසය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් පුරුෂරසය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් ලොකයෙහි විපතට පත් වූත් විපතට පත් වන්නා වූත් සත්‍රීපුරුෂයන්ගේ ගණන ඉතා බොහෝ ය. ඒ පිරිසිඳ දත නො හැකි ය.

"ගම්භීරනීරධිභවෝ පචුරාසනොපි
මච්ඡෝ ගිලිත්ව බලිසං රසගෙධහෙතු,
පප්පොති දුක්ඛමතුලං න රසෙසු සාත
මත්ථීනි මත්ත පජහාථ රසෙසු ගෙධං"

ගැඹුරු වූ මහසමුදුර උපන් මත්ස්‍යයා බොහෝ ආහාර ඇත්තේ නමුත් රසතෘෂ්ණාව හෙතු කොට බිලිය ගිල අසමාන දුකට පැමිණේ. රසයන්හි සැපයෙක් නැතැ යි දැන රස විඳ ගැණීමෙහි ආශාව දුරු කරවු.

"ඵොට්ඨබ්බතණ්හා = ඵොට්ඨබ්බතණ්හා, ඵොට්ඨබ්බාරම්මණං පටිච්ච ඵොට්ඨබ්බාරම්මණං නිස්සිතං සත්තා ජාතා තණ්හා ඵොට්ඨබ්බතණ්හා" සප්‍රෂ්ටව්‍යයන් අරමුණු කොට සප්‍රෂ්ටව්‍යයන් නිසා සප්‍රෂ්ටව්‍යයන් ඇසුරු කොට උපදනා චිත්තවෙගය ඵොට්ඨබ්බ = තණ්හා යි කියන ලදී. **"පඨවීධාතු තෙජොධාතු වායොධාතු කක්ඛළං මුදුකං සණ්හං ඵරුසං සුඛසම්ඵස්සං දුක්ඛසම්ඵස්සං ගරුකං ලහුකං යං ඵොට්ඨබ්බං අනිදස්සනං සප්පටිඝං"** යනාදීන් වදුළ කායවිඥානයෙන් දතයුතු වූ පඨවීධාතු තෙජෝධාතු වායෝ-ධාතු නිදෙන උනුන් හා ගැටීමෙන් පහළ වන කැකුළු මොළොක් සියුම් රළු බර සැහැල්ලු ගති ඇති සුව දුක් පහස, ඵොට්ඨබ්බ නාමයෙන් හඳුන්වන ලදි. එබඳු පහසක් ඇසුරු කොට සිතෙහි නගිනා ඛණිකතිය සප්‍රෂ්ටව්‍යතෘෂ්ණා නම් වේ. ඕ ම කාමතණ්හා නමුදු වේ. **"ඵොට්ඨබ්බතණ්හා එව කාමස්සාදවසෙන පවත්තති, තදා කාමතණ්හා නාම හොති"** යනු එහිලා කීහ.

මේ කියූ සප්‍රෂ්ටව්‍යාලම්බනය ශුභ වශයෙන් ගෙණ රස විඳිනුයේ එහි බැඳෙනුයේ ගැලෙනුයේ බැස ගණුයේ අපායයෙහි හෙන්නේ ය. පුන පුනා සසරදුකෙහි ම ගැලෙන්නේ ය.

තෘෂ්ණාවගේ ඉපැන්මට කරුණු වන ඵොට්ඨබ්බාරම්මණ අතුරෙහි පුරුෂයාහට සත්‍රී සප්‍රෂ්ටව්‍යයත් සත්‍රියහට පුරුෂ සප්‍රෂ්ටව්‍යයත් තරම් සැහැසි වූ අන් එක ද සප්‍රෂ්ටව්‍යයෙක්. නැත්තේ ය. සත්‍රීසප්‍රෂ්ටව්‍යය හා පුරුෂසප්‍රෂ්ටව්‍යය හා දෙක අන් හැම සප්‍රෂ්ටව්‍යයන් යට කොට නැගී සිටියේ ය. ඒ වග වදුළ සැටි මෙසේ දන්නේ ය:-

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! ඉත්ථිඵොට්ඨබ්බා, ඉත්ථිඵොට්ඨබ්බා භික්ඛවෙ! පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ! පුරිසඵොට්ඨබ්බා, පුරිසඵොට්ඨබ්බා භික්ඛවෙ! ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති" යි.

සත්‍රීස්ප්‍රෂ්ටව්‍යය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් පුරුෂස්ප්‍රෂ්ටව්‍යය නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් ලොකයෙහි විපතට පත් වූත් විපතට පත් වන්නා වූත් සත්‍රී පුරුෂයන්ගේ ගණන පිරිසිඳිය නොහැකි ය. නිරිසන් ගත සත්ත්වයන් අතර ද මේ විපත දක්නට ලැබේ. මහද්‍යුත චිත්ත සමාධි ඇති පුරුෂයෝ පවා මේ ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාවෙන් විපතට පත් වූහ.

"හො බ්‍රහ්මලොකාගතසුද්ධසත්තෙනා
බුද්ධත්තමෙව නියතො අපි බොධිසත්තෙනා,
පිසඞ්ගමාය පරිහාසි සරජ්ජතොපි
තසමා හි එස්සසදිසො අනයො න වත්ති"

ඛඞ්ග ලොවින් පැමිණියා වූ පිරිසිදු ජීවිතයක් දැරූ බෝසත් තෙමේ බුදුබවට නියත වූයේ ද සත්‍රී සඞ්ගමය කරණ කොට සිය රජයෙනුදු පිරිහී ගියේ ය. එහෙයින් සපත්නීය සමානවූ ව්‍යසනයෙක් නොද ඇත්තේ ය.

"ධම්මෙ තණ්හා = ධම්මතණ්හා, ධම්මාරම්මණං පවිචය ධම්මාරම්මණං නිස්සිතං කත්වා ජාතා තණ්හා = ධම්මතණ්හා" ධර්මයන් අරමුණු කොට ධර්මයන් නිසා ධර්මයන් ඇසුරු කොට උපදනා ආලය සඞ්ඛ්‍යාත චිත්තවෙගය ධම්මතණ්හා යි කියන ලදි. පඤ්ච ද්වාරයට

ගොදුරු නො වන සියලු අරමුණු ධම්මාරම්මණ නමින් ගැණේ. ප්‍රසාදරූප - සූක්ෂ්මරූප - චිත්ත - චෛතසික - නිර්වාණ - ප්‍රඥප්ති, යි එය සැකෙවින් ස වැදැරුම් ය. විස්තර විසින් චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන ප්‍රසාදරූප පස ය, ආපොධාතු ය, ඉත්ථි-පුරිසභාව දෙක ය, හදය වත්ථු ය, ජීවිතින්ද්‍රිය ය, ඔජා ය, පරිච්ඡේද ය, විඤ්ඤත්ති දෙක ය, ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන විකාර රූප තුණ ය උපචය සන්තති ජරතා අනිච්චතා යන ලක්ෂණ රූප සතර ය, යන සූක්ෂ්ම රූප සොළොස ය, අසූ නවයෙකින් හෝ එක් විස්සෙකින් ගැණෙන සිත් ය, ඵස්සාදී වූ දෙපණස් චෛතසික ය, නිර්වාණ ය, භූමි පර්වත කසිණාදි ප්‍රඥප්ති ය, යි මෙසේ දත යුතු ය. මේ සියල්ල මනොද්වාරයට ම අරමුණු වේ. ධම්මසඞ්ගණියෙහි **"ජ අජ්ඣත්තිකානි ආයතනානි තීණි ලක්ඛණානි තයො අරූපිනො ඛන්ධා පණ්ණරසසුඛුමරූපානි නිබ්බාණපඤ්ඤත්තීති ඉමෙ ධම්මායතනපරියාපන්නා ච අපරියාපන්නා ච ධම්මාරම්මණං"** යි ආයේ ය. ආද්ධ්‍යාත්මිකෂඩායතන, ත්‍රිවිධලක්ෂණ, ත්‍රිවිධඅරූපස්කන්ධ, පණ්ණරස සූක්ෂ්මරූප, නිර්වාණ, ප්‍රඥප්ති යන ධර්මායතනයෙහි ඇතුළත් මේ ධර්මසමූහය ධම්මාරම්මණ ය, යි කියන ලදි එහි අටුවාව කියේ මෙ තැන මොවුන්ගේ වශයෙන් නො ගෙණ ඔජාදීන් පිළිබඳ ඇලිය යුතු තත්ත්වය ගත යුතු බව ය. **"ඉමස්මිං පන ඨානෙ එතෙසං වසෙන යොජනං අකත්වා ඔජාදානපානදානජීවිතදානවසෙන කාතබ්බා, ඔජාදීසු රජනීයං ධම්මාරම්මණං"** යනු ඒ අටුවා ය.

මේ ධම්මාරම්මණය ද තෘෂ්ණාවට කරුණු ව සිටියේ ය. වරදවා ගැණීමෙන් මෙ ද ඇසුරු කොට තෘෂ්ණාව උපදී. ධම්මාරම්මණ තෘෂ්ණාව විස්තර කරණ ඇතැම් තැන, ධම්මාරම්මණය නිවන හැර සිටියේ ය යි කියන ලදි. මේ ඒ කීම:- **"ධම්මාති නිබ්බාණං මුඤ්චිත්වා අවසෙසා ධම්මාරම්මණා"** යනු. ධම්මාරම්මණය, නාම රූප නිර්වාණ ප්‍රඥප්තීන්ගෙන් මිශ්‍ර වූ අරමුණෙක් වේ. මෙහිලා කළයුතු විස්තරය ඉමහත් ය එහෙයින් එය අනෙක් පොත් පත් බලා දත යුතු ය.

මේ ධම්මාරම්මණයෙහි ඇතුළත් වූ ධර්ම, ස්ථිරපදාර්ථ වශයෙන් හා ශුභ සුඛාදීන්ගේ වශයෙන් ගැණීමෙන් ඇලීමෙන් බැඳීමෙන් විශෙෂ විසින් පෘථග්ජනසත්ත්වසන්තානයෙහි උපදනා තෘෂ්ණාව පෘථග්ජනයන්ට දිගු කලක් සසරෙහි ඉපැත්මට කරුණු වන්නී ය.

භවතණ්හා නම්, රූපතෘෂ්ණාදීන්ගේ ඉපැත්මට කරුණු වූ අරමුණ ම රූපාරම්මණාදිය ම ශුභ ය, සුඛ ය, ස්ථිර ය, සදාකාලික ය, නො ද නැසේ ය, යි ගන්නා ශාස්වතදෘෂ්ටිය හා එක් වූ ශාස්වත දෘෂ්ටිය හා උපන් තෘෂ්ණාව යි **"යදා පන තදෙවාරම්මණං ධුවං සස්සතන්ති පවත්තාය සස්සතදිට්ඨියා සද්ධිං පවත්තති තදා භවතණ්හා නාම හොති, සස්සතදිට්ඨියා සහගතො හි රාගො භවතණ්හාති වුච්චති"** යි ඒ කීහ. භවය පැතීමෙන් උපන් ශාස්වතදෘෂ්ටිය හා එක් ව පැවැති රූපාරූපභවයන්හි ඇලීම ලෞකිකද්ධ්‍යානයන් ශුභ-සුඛ-ස්ථිර වශයෙන් ගැණීමෙන් උපන් ධ්‍යානනිකාන්තිය භවතෘෂ්ණා, යි කියන ලදි.

කෙවලශාස්වතදෘෂ්ටි ය, එකත්‍යශාස්වතදෘෂ්ටිය, යි ශාස්වත දෘෂ්ටිය දෙ පරිදි ය. නැවැත කෙවල ශාස්වත, එකත්‍ය ශාස්වත දෘෂ්ටි දෙක, එකක් සිවු වැදැරුම් ව අට වැදැරුම් වන්නේ ය. එහි විස්තරය මෙහි ප්‍රථමතරඞ්ගයෙහි දෙවදත්තවස්තුවෙහි දැක්ක හැකි ය. අට වැදැරුම් ශාස්වත දෘෂ්ටියෙහි විස්තර එයින් දත් කල්හි ඒ දෘෂ්ටිය හෙවත් දැක්ම හා එක් වූ පැතීම භවතෘෂ්ණා, යි උගත හැකි ය. එහි තමනුත් ලොකයත් නිත්‍ය ය, සදාකාලික ය, නො ද පෙරළෙනසුලු ය, යි ගන්නේ කෙවලශාස්වතදෘෂ්ටිකයා ය. කොට-සෙක් නිත්‍ය ය, සදාකාලික ය, නො ද පෙරළෙනසුලු ය, කොට-සෙක් අනිත්‍ය ය, සදාකාලික නො වේ, පෙරළෙනසුලු ය, යි ගන්නේ එකත්‍යශාස්වතදෘෂ්ටිකයා ය.

ධ්‍යානසමාපත්තිබලයෙන් උපදවා ගත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණින් තමහට පෙණෙන පමණින් ජාතීන් සිහිකිරීමේ දී චිත්තචෛතසිකයන්ගේ ක්ෂණභඞ්ගය නො දැක්-මෙන් මේ කෙවලශාස්වතදෘෂ්ටියට වැටෙන්නේ ය.

කප නැසී හට ගන්නා කාලයෙහි පහළ වන ශූන්‍ය වූ බඹ විමනෙක උපන්නහුට පසු කාලයෙහි එහි උපන් සත්ත්වයන් ගැණ "මාගේ ප්‍රාර්ථනාව නිසා මොවුහු මෙහි උපන්නෝ ය, එහෙයින් ලොකයත් ලොකසත්ත්වයාත් මම මැවීමි" යි සිතිවිලි පහළ වන්නේ ය. අනෙක් සත්ත්වයෝ ද "අප මැවූයේ මේ මහා බ්‍රහ්ම තෙමේ ය" යි අදහා ගණිත්. එහි යම් සත්ත්වයෙක් ආයු ගෙවී ඉන් ගිලිහී මිනිස්ලොව උපන්නේ පැවිදි ව චිත්තසමාධි උපදවා පෙර විසීම පමණක් සිහි කරන්නේ "ඒ මහාබ්‍රහ්ම තෙමේ නිත්‍ය ය, සනාතන ය, ඔහු විසින් මැවූ අපි අනිත්‍යයම්හ, සනාතන නො වම්හ" යි ගන්නේ ය. මෙසේ ගැණීම නිසා මේ තෙමේ මේ කෙවලශාස්වතදෘෂ්ටියට වැටෙන්නේ ය. විස්තර යට කියන ලදි.

විභවතණ්හා නම්, රූපතෘෂ්ණාදීන්ට කරුණු වූ රූපාරම්ම-ණාදීහු මරණින් මතු නැසී යන්නෝ ය, නැවැත ඔවුන්ගේ හට ගැන්මෙක් නැත්තේ ය, යි සත්ත්වයන්ගේ පුනරුත්පත්තිය වළකා එය මූලසුන් කොට ගන්නා උච්ඡේදදෘෂ්ටිය හා එක් වූ තෘෂ්ණාව ය. **"යදා පන තදෙවාරම්මණං උච්ඡිජ්ජති විනස්සතීති පවත්තාය උච්ඡේදදිට්ඨියා සද්ධිං පවත්තති තදා විභවතණ්හා නාම හොති, උච්ඡේදදිට්ඨියා සහගතො හි රාගො විභවතණ්හා"** යි ඒ කීහ. උච්ඡේදදෘෂ්ටිය සත් වැදැරුම් ය. එහි විස්තරය ද දෙවදත්ත වස්තු-වෙහි ආයේ ය. සත් වැදැරුම් උච්ඡේදදෘෂ්ටිය උගත් කල්හි ඒ දෘෂ්ටිය හෙවත් දැකීම හා එක් වූ පැතීම විභවතෘෂ්ණා, යි දත හැකි ය. එහි මේ ආත්මය මරණින් මතු සිඳී යන්නේ ය, යි සම්මුති විසින් විද්‍යමානසත්ත්වයාගේ මුළුමනින් නැවැත සසර ඉපැත්-මෙක් නැතැ, යි ගන්නේ උච්ඡේදදෘෂ්ටියට වැටේ.

රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨ-බ්බතණ්හා, ධම්මතණ්හා විසින් ස වැදැරුම් වූ තෘෂ්ණාව, කාම-තණ්හා විසින් සයෙක, භවතණ්හා විසින් සයෙක, විභවතණ්හා විසින් සයෙකැ, යි අටළොස් වැදැරුම් වේ. රූපයෙහි බැඳීමෙන් ඇලීමෙන් උපදනා තෘෂ්ණාව රූපතණ්හා යි, ද, එය ම ශුභ ය, සුඛ ය, සදාකාලික ය, යනාදීන් ගෙණ රූපාරූපභවයන්හි බැඳී-මෙන් ඇලීමෙන් උපදනා කල්හි භවතණ්හා යි, ද, එය ම මර-ණින් මතු උපතෙක් නැත, යනාදීන් උපදනා උච්ඡේදය හා එක් වූ කල්හි විභවතණ්හා ය යි, ද කියතු ලැබේ. මෙසේ අට-ළොස් වැදැරුම් වූ තෘෂ්ණාව නැවැත ආද්ධ්‍යාත්මිකවස්තුන් පිළි-බඳ අටළොසෙක, බාහ්‍යවස්තුන් පිළිබඳ අටළොසෙකැයි සතිස් වැදැරුම් වේ. නැවැත ඒ සතිස අතීතකාල විසින් සතිසෙක, වර්තමාන කාල විසින් සතිසෙක, අනාගත කාල විසින් සතිසෙ කැ, යි ගත් කල්හි අටෝ රාසියෙක් වේ. මෙහිලා මෙසේ දත යුතු ය:-

"රූපතණ්හාදිභෙදෙන ඡතණ්හා ඉධ දීපිතා,
එකෙකා තිවිධා තත්ථ පවත්තාකාරතො මතා" යි.

සැකෙවින් තෙ වැදැරුම් වූත් විස්තර විසින් අටෝරාසියක් වූත් තෘෂ්ණාව, චක්ඛු සොත ඝාණ ජිව්හා කාය මන යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන මොවුන් ප්‍රියත්ව-යෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කායවිඤ්ඤාණ මනොවිඤ්ඤාණ යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

චක්ඛුසම්ඵස්ස සොතසම්ඵස්ස ඝාණසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස මනොසම්ඵස්ස යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා ඝාණසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොසම්ඵස්සජා වෙදනා යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූපසංචෙතනා සද්දසංචෙතනා ගන්ධසංචෙතනා රසසංචෙතනා ඵොට්ඨබ්බසංචෙතනා ධම්මසංචෙතනා යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූපවිතක්ක සද්දවිතක්ක ගන්ධවිතක්ක රසවිතක්ක ඵොට්ඨබ්බවිතක්ක ධම්මවිතක්ක යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි,

රූපවිචාර සද්දවිචාර ගන්ධවිචාර රසවිචාර ඵොට්ඨබ්බවිචාර ධම්මවිචාර යන මොවුන් ප්‍රියත්වයෙන් හා මධුරත්වයෙන් පිළිගන්නා කල්හි, එසේ පිළිගන්නා සත්ත්වයන්හට නූපන් තෘෂ්ණාව උපදී. උපන් තෘෂ්ණාව තදින් ඇතුළත කා වැදි සිටියි. මේ මෙහි පාළිය:-

"සා ඛො පනෙසා තණ්හා කත්ථ උප්පජ්ජමානා උප්පජ්ජති කත්ථ නිවිසමානා නිවිසති? යං ලොකෙ පියරූපං සාතරූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති. කිඤ්ච ලොකෙ පියරූපං සාතරූපං? චක්ඛුං ලොකෙ පියරූපං, සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සොතං ලොකෙ-ඝාණං

ලොකෙ-ජිව්හා ලොකෙ-කායො ලොකෙ-මනො ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්ප-ජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

රූපං ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දා ලොකෙ-ගන්ධා ලොකෙ-රසා ලොකෙ-ඵොට්ඨබ්බා ලොකෙ -ධම්මා ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

චක්ඛුවිඤ්ඤාණං ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සොතවිඤ්ඤාණං ලොකෙ-ඝාණවිඤ්ඤාණං ලොකෙ-ජිවහා විඤ්ඤාණං ලොකෙ-කායවිඤ්ඤාණං ලොකෙ-මනොවිඤ්ඤා ණං ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජ-මානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

චක්ඛුසම්ඵස්සො ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සොතසම්ඵස්සො ලොකෙ-ඝාණසම්ඵස්සො ලොකෙ-ජිවහා-සම්ඵස්සො ලොකෙ-කායසම්ඵස්සො ලොකෙ-මනොසම්ඵස්සො ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සොතසම්ඵස්සජා වෙදනා ලොකෙ-ඝාණසම්ඵස්සජා වෙදනා ලොකෙ-ජිවහාසම්ඵස්සජා වෙදනා ලොකෙ-කාය=සම්ඵස්සජා වෙදනා ලොකෙ-මනොසම්ඵස්සජා වෙදනා ලො-කෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

රූපසඤ්ඤා ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දසඤ්ඤා ලොකෙ-ගන්ධසඤ්ඤා ලොකෙ-රසසඤ්ඤා ලො-කෙ-ඵොට්ඨබ්බසඤ්ඤා ලොකෙ-ධම්මසඤ්ඤා ලොකෙ පිය-රූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

රූපසංචෙතනා ලොකෙ පියරූපං. සාතරූපං. එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දසංචෙතනා ලොකෙ-ගන්ධසංචෙතනා ලොකෙ-රසසං-

චෙතනා ලොකෙ-ඵොට්ඨබ්බසංචෙතනා ලොකෙ-ධම්මසං-චෙතනා ලොකෙ පියරූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

රූපතණ්හා ලොකෙ පියරූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දතණ්හා ලොකෙ-ගන්ධතණ්හා ලොකෙ-රසතණ්හා ලොකෙ-ඵොට්ඨබ්බතණ්හා ලොකෙ-ධම්මතණ්හා ලොකෙ පිය-රූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ්ජති එත්ථ නිවිසමානා නිවිසති.

රූපවිතක්කා ලොකෙ පියරූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දවිතක්කා ලොකෙ-ගන්ධවිතක්කා ලොකෙ-රසවිත-ක්කා ලොකෙ-ඵොට්ඨබ්බවිතක්කා ලොකෙ-ධම්මවිත-ක්කා ලොකෙ පියරූපං. සාතරූපං එසොසා තණ්හා උපජ්ජ මානා උපජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති.

රූපවිචාරෙ ලොකෙ පියරූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ්ජති. එත්ථ නිවිසමානා නිවිසති. සද්දවිචාරෙ ලොකෙ-ගන්ධවිචාරෙ ලොකෙ-රසවිචාරෙ ලොකෙ-ඵොට්ඨබ්බවිචාරෙ ලොකෙ-ධම්මවිචාරෙ ලොකෙ පියරූපං. සාතරූපං. එසොසා තණ්හා උපජ්ජමානා උපජ-ජති. එත්ථ නිවිසමානා නිවිසති.

මේ දෙසනාපාළියෙන් දැක් වූ තැන්හි ඉපිද සිත්තුළ කා වැදී සිටුනා මේ තෘෂ්ණාව නිසා පරලොව තබා මේ ලොව ම මිනි-සුනට විඳින්නට සිදුවන දුක් මෙතෙකැයි මොනකෙනකුටත් පිරිසිඳ දැක්විය නො හැකි ය. බලනු මැනැවි.

තෘෂ්ණාව නිසා අව්වෙන් තැවෙමින් වැස්සෙන් තෙමෙමින් ශීතයෙන් සැලෙමින් උෂ්ණයෙන් පෙළෙමින් මැසිමදුරුවන්ගෙන් වෙහෙසෙමින් නයි පොළොහුන්ගෙන් ගැටෙමින් වගවලසුන් ගෙන් පහර කමින් සාපිපාසායෙන් මිරිකෙමින් කණුකටු මඬිමින් වනගහන සෙවුමෙන් ගිරිගහන නගිමින් බැළමෙහෙකම් කරමින් ගැත්තන් වෙමින් හේවාකම් කරමින් කුණු කසළ අදිමින් කුණු කසළ සෝදමින් දැසිදස්සන් ව කම්කරුවන් ව උපයන ධනයෙන් දිවි වැටුමෙහි යෙදෙන මිනිස්සු මෙසේ නොයෙක් දුක් ගැහැට විඳින්නෝ සිතැහි සේ ඵල නො ලබන්නෝ තැවෙත්. වැළපෙත්. වෙහෙසෙත්. එහිලා "මාගේ උත්සාහය හිස් ය, ඵලරහිත ය" යි ලෙහි අන් ගසා හඬත්.

තෘෂ්ණාව නිසා මෙ ලොව මෙසේ දුක් විඳිමින් යමක් උපයා ගත්තෝ ද "මා උපයා ගත් ධනය රජුන් විසින් සොරුන් විසින් අප්‍රියදායාදයන් විසින් පැහැර ගත හැකි ය, ගින්නෙන් හෝ දියෙන් හෝ නැසී යා හැකි ය, මීයන් වේයන් විසින් කා දැමිය හැකි ය" යි එය රැක්මෙහි යෙදී ගන්නෝ දව රැ දෙක්හි අව් පිනි නො තකා නිදි නො ලැබ දුක් විඳිත්. යම් ලෙසකින් තමන් උපයා ගත් රැක්මෙහි තැබූ ඒ ධනය රජුන් සොරුන් අප්‍රියදායාද යන් පැහැර ගත් විට ගින්නෙන් දැවී ගිය විට දියෙන් නැසී ගිය විට මී වේ ඇ සතුන් කා දැමූ විට "අහෝ මා ඉපැයූ ධනය විනාශ වී ගියේ ය" යි තැවෙත්. වැළපෙත්. වෙහෙසෙත්, "එහිලා මා ගත් උත්සාහය හිස් ය, ඵලරහිතය" යි ලෙහි අත් ගසා හඬත්.

තෘෂ්ණාව නිසා රජහු රජුන් හා, ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියයන් හා, බමුණෝ බමුණන් හා, ගැහැවියෝ ගැහැවියන් හා, මවු පුතු හා, පුත් මව හා, පියා පුතු හා, පුත් පියා හා, බෑයා බෑයා හා, බෑයා බුහුන හා, බුහුන බෑයා හා, බුහුන බුහුන හා, සැමියා අඹු හා අඹු සැමියා හා, යහළුවා යහළුවා හා, පැවිද්දා පැවිද්දා හා, නෑයා නෑයා හා, අසල්වැසියා අසල්වැසියා හා කලහ කරන්නෝ ඩබර කරන්නෝ විවාද කරන්නෝ අධිකරණ කරන්නෝ දොඩන්නෝ බණින්නෝ එකිනෙකා අතින් පයින් කැටින් කැබලිතියෙන් දඬුයෙන් මුගුරෙන් සැතින් හෙල්ලෙන් කඩුවෙන් පොරවෙන් කෙටේරියෙන් උදැල්ලෙන් යවුලෙන් තුවක්කුවෙන් විෂධූමයෙන් පහර දෙන්නෝ ය. පහර කන්නෝ ය. ඒ හෙතුවෙන් මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාව නිසා කඩු පලිහ ගෙණ දුනු හියවුරු දරා කවව හැඳ තෝමර ගෙණ යුදබිමට වැද ඊතල පහර කා අඩයටි පහර කා තෝමර පහර කා දඬු මුගුරු පහර කා කඩු පහර කා වෙඩි පහර කා මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාව නිසා ගම් පැහැර මං පැහැර ගෙවල් බිඳ අටුකොටු බිඳ සොරකම් කොට පරඹුවන් හා පරපුරුෂයන් හා එක් ව සිට රජුන් අතට පත්වීමෙන් කසපහර කා වේවැල් පහර කා අඩදඬු පහර කා අත් සිඳුම් පාසිඳුම් අත්පා සිඳුම් කන් සිඳුම් නැහැ සිඳුම් කන් නැහැ සිඳුම් ඇට බිඳුම් නහර සිඳුම් ලැබ බිලඞ්ගථාලික[1]

1. හිස්කබල ගලවා රත් කළ යගුළියක් අඬුවෙන් ගෙණ හිස් මුදුනෙහි තබා හිස්මොල උතුරුවා හරිණ කම්කටොල.

සඞ්ඛමුණ්ඩික[2] රාහුමුඛ[3] ජෝතිමාලික[4] හත්ථපජ්ජෝතික[5] එරක-වත්තික[6] චීරකවාසික[7] එණෙය්‍යක[8] බලිසමංසික[9] කහාපණික[10] ඛාරාපතච්ඡික[11] පළිඝපරිවත්තික[12] පලාල පිට්ඨික[13] යන කම් කටොලින් වධ විද කකාළතෙලින් දැවී දීන බල්ලන්ට හසු වී මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාව නිසා වසවිස කන්නෝ ගෙල වැල ලාගන්නෝ මුහුදට පනින්නෝ ගඟදියට පනින්නෝ දුම්රියට ගෙල තබන්-නෝ ගින්නට වදින්නෝ පරපණ නසන්නෝ බොරු කියන්නෝ පිසුණුබස් කියන්නෝ පරොස්බස් කියන්නෝ මත්පැන් බොන්-නෝ දූ කෙළින්නෝ ඔව්වූ අල්ලන්නෝ සලෙලුකම් කරන්නෝ අණින්නෝ කොටන්නෝ හැපෙන්නෝ වැතිරෙන්නෝ මරණය-යට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාහෙතුවෙන් පියා නිසා මව නිසා දූපුතුන් නිසා බැයා නිසා බුහුන නිසා බිරිය නිසා සැමියා නිසා නෑදෑයන් නිසා හිත-වතුන් නිසා අසල්වැසියන් නිසා නයහිමියන් නිසා සතුරන් නිසා මිතුරන් නිසා තරුණයන් නිසා තරුණියන් නිසා වතුපිටි නිසා ගේදොර නිසා මිලමුදල් නිසා හඬන්නෝ වැළපෙන්නෝ හැපෙන්-නෝ ගෙල වැල ලාගන්නෝ මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

---

2. උඩු තොල දෙකන් සිඳුව උකුණුවළ යන තුන් තැන සිට ඔස් සම උදුරා බොරලුවෙන් උලා ඔස්කබල සකක් සේ කරණ කම්කටොල
3. අඬුව ලා කට හරවා කට ඇතුලෙහි ගිනි දැල්වීම.
4. තෙල් පෙවූ කඹමාලුයෙන් ඹුළු සිරුර වෙලා ගිනි දැල්වීම.
5. තෙල් පෙවූ කඹමාලුයෙන් දෙයත් වෙලා ගිනි දැල්වීම.
6. බෙල්ලෙහි පටන් බොලට දක්වා සම්වැවිය කපා යොනින් බැඳ ඇද ඔහු ලවා ම සිය සම පැහවීම.
7. ගෙලෙහි පටන් කවිය දක්වා සම උගුලා කවියෙහි තබා එතැන් පටන් බොලට දක්වා සම් උගුලා කැඹීම.
8. දෙදත දෙවැල ඕවැ යවුල් ගසා වට කොට ගිනි දැල්වීම.
9. දෙපස තුඩු ඇනි බිලියෙන් ගසා ඇඟමස් කැඹීම.
10. කහවණු සේ මස් කැපීම.
11. සිරුර තෑබ තෑබ සිදුරු කොට කාරම් දිය ඉසීම
12. ඇලයකින් නිදි කරවා කන් සිදුරෙහි යවුල් ගසා දෙපා හෙණ කරකැවීම.
13. සම් තොඩ කැඩෙඩ සේ ඇට මස් තලා පිදුරු බිස්සක් සේ කිරීම.

තෘෂ්ණාහෙතුවෙන් පියා මළ කල්හි මව මළ කල්හි සැමියා මළ කල්හි බිරිය මළ කල්හි දූපුතුන් මළ කල්හි නැයන් මළ කල්හි හිතවතුන් මළ කල්හි මිතුරන් මළ කල්හි ගම්රට ඇති නැති කල්හි ගේදොර ඇති නැති කල්හි කෑම් බීම් ඇති නැති කල්හි ඇදුම් පැළඳුම් ඇති නැති කල්හි ඉදුම් හිටුම් ඇති නැති කල්හි මිල මුදල් ඇති නැති කල්හි වතුපිටි ඇති නැති කල්හි හඬන්නෝ වැළපෙන්නෝ හැපෙන්නෝ වැතිරෙන්නෝ ගෙල වැල ලා ගන්නෝ මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාහෙතුවෙන් ඇඟරැලි වැටුනු කල්හි නර නැගි කල්හි ඇස් නට කල්හි කන් නො ඇසෙන කල්හි නාස් බුන් කල්හි දිව ගොත ගැසෙන කල්හි දත් වැටුනු කල්හි අත් නො වසඟ කල්හි පා කොරවූ කල්හි තලකැලල් නැගි කල්හි කුදු ගැසුනු කල්හි කෙළ වැහෙන කල්හි කබ ගලන කල්හි මලමූ ගලන කල්හි සිහි මද කල්හි හඬන්නෝ වැළපෙන්නෝ හැපෙන්නෝ ගෙල වැල ලා ගන්නෝ මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෝ ය.

තෘෂ්ණාහෙතුවෙන් කයින් පව්කම් කරන්නෝ වචනයෙන් පව්කම් කරන්නෝ සිතින් පව්කම් කරන්නෝ මෙලොව ද මෙසේ දුක් විඳ මරණින් මතු සතර අපායයෙහි හෙන්නෝ ය.

මෙහි මෙසේ ඉතා සැකෙවින් දැක් වූ මේ දුඃඛරාශිය තෘෂ්ණාවට යටත් වූ තෘෂ්ණාවෙන් මැඩ ගන්නාලද හැම මිනිසකු විසින් ම විඳිය යුතු ය. තෘෂ්ණාව දුකට මූලකාරණය බව යට කියන ලදි. තෘෂ්ණානුශයන් මුළුමනින් නො නැසූ දිව්‍යබ්‍රහ්මාදී වූ හැම සත්ත්වයෙක් ම තමන් ලත් එසේ ම තමන් ලබන ඒ ඒ සකාඞ්ක්ෂයන්ගේ ප්‍රමාණ විසින් නන් වැදෑරුම් වූ දුක්වලට යටත් ව සිටුනේ ය. තෘෂ්ණාව මුළුමනින් නො නැසූ හැම කෙනෙක් ම තෘෂ්ණාවෙගයෙන් දිගින් දිගට සසර ඉපිද ඉපිද නැසී නැසී යන්නෝ ය. මෙසේ මේ තෘෂ්ණාව දිව්‍යබ්‍රහ්මාදී වූ හැම දෙන යට කොට ගෙණ සිටියි.

"යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රුහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං"

යනු දෙශනා ය. මෙහි පරිකථාව ඉදිරියෙහි එන්නී ය.

මුලින් දුක් වූ සේ සත්ත්වයාගේ උපතට හේතු වූ තෘෂ්ණාව නැසූ කල්හි ම සත්ත්වයාගේ සසර උපත ද නැසී යයි. තෘෂ්ණාව ඇති තාක් ම සත්ත්වයා සසර උපදියි. උපතට හේතු වූ ඒ අනෙක් කර්මාදිහේතු ද තෘෂ්ණාව හා ම හැනී පවතී. එහෙයින් මුළුමනින් දුක් නැති කිරීමට නම් මුළුමනින් තෘෂ්ණාව නැසිය යුතු ය සත්ත්වයා ඉදිරියෙහි අනෙක් අනෙක් ජාතීන්ට පමුණුවන්නී තෘෂ්ණායැ, යි යට කියන ලදි.

පළමු කොට ප්‍රතිසන්ධිචිත්තය අන් ජාතියකට ඇදී යන්නේ තෘෂ්ණාහේතුවෙනි. එසේ ඇදී නො ගියේ නම්, අන් එක ද හේතුවකුත් එහිලා සමර්ථ නො වේ. අතීතසත්ත්වයා ද තෘෂ්ණාවෙන් ම වූයේ ය. අනාගතසත්ත්වයා ද තෘෂ්ණාවෙන් ම වන්නේ ය. සත්ත්වයා පිළිබඳ ජාතිජරාමරණාදී වූ දුඃඛරාශිය ද තෘෂ්ණාව නිසා ම උත්පත්තිය හා හැනී පවතී. එහෙයින් සත්ත්වොත්පත්තියෙහිලා තෘෂ්ණාව ම ප්‍රධානහේතුවැ, යි වදාළ සේක.

ලොකය පුරා සිටි සත්ත්වගණයෙහි වූ වෙනස්කම් ද තෘෂ්ණාවත් ඒ හා හැනී සිටි කර්මාදිහේතූන් නිසාත් සිදු වන්නේ ය. කාය-භාව-වත්ථුදසක හා එක් වූ ප්‍රතිසන්ධිචිත්තය මවුකුස පහළවත් ම පහළ වූ සත්ත්වබීජය, සෘතු ආහාරාදීන්ගේ උපකාරශක්තියෙන් ක්‍රමයෙන් වැඩී යන්නේ ය. මවුකුස පහළ වූ ඒ සත්ත්වබීජයෙන් හට ගැණෙන සත්ත්වයාගේ සන්තානගතතෘෂ්ණාවට, මවුපියන්ගේ ශුක්‍රශ්‍රෝණිතයනට, සෘතු ආහාරයනට, අනුරූපපරිදි ශරීර පිණ්ඩය සකස් වෙයි. තෘෂ්ණාව නිසා ම එහි චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ ද පහළ වෙත්. උත්පත්තිය දීමෙහි පොහොසත් වූ ඒ මේ තෘෂ්ණාව ස්ත්‍රී පුරුෂ වශයෙන් ද දෙපරිදි වෙයි. පුරුෂතෘෂ්ණාව පුරුෂයකු උපදවනාතර ස්ත්‍රීතෘෂ්ණාව ස්ත්‍රියක උපදවයි. මිනිසුන් පිළිබඳ මේ තත්ත්වය පින් පව් බලයෙන් හා පැතුම්බලයෙන් වෙනස් ව ද යන්නේ ය. මිනිස්ලොව උපදනා ස්ත්‍රී පුරුෂයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය හා එක් වූ කාය-භාව-වත්ථුදශක තුණ, නපුංසක-පණ්ඩක-උභතොබ්‍යඤ්ජනකාදීන් විෂයයෙහි සම්පුණී වශයෙන් නො යෙදෙන බැවින් මනුෂ්‍යත්වයෙහි ද මොවුන්ගේ යෙදීම වෙනස් ව සිටුනේ ය. තෘෂ්ණාව හා කර්මාදිහේතූන් නිසා උත්පත්ති වශයෙන් භවයෙන් භවයට යන දිව්‍යබ්‍රහ්මාදී වූ සියලු සත්ත්වයන්ගේ ඒ ඒ භවයෙහි සකලප්‍රතිලාභය තම තමන් විසින් කරණ ලද කුශලාකුශලකර්මයන් අනුව සිදුවනු විනා අන් ලෙසකින් සිදු නො වන්නේ ය. කාමභවයෙහි හා රූපභවයෙහි සකල පස ම ලැබෙන්නේ ය. අරූපභවයෙහි ලැබෙනුයේ නාමසකල සතර පමණෙකි. අසඤ්ඤසත්ත්වයෙහි එක් ම රූපසකලය ලැබේ.

ඇතැම් කෙනෙක් අළුත් අළුත් සත්ත්වයන් දකින්. ඒ දැක්ම ධාර්මික නොවේ. ධම්මවිරුද්ධ ය. **"පුරිමකම්මභවසම්මං මොහෝ අවිජ්ජා ආයූහණා සඞ්ඛාරා නිකන්තී තණ්හා උපගමනං උපාදනං චෙතනා භවෝ ඉති ඉමෙ ධම්මා පුරිමකම්මභවසම්මං ඉධ පටිසන්ධියා පච්චයා, ඉධ පටිසන්ධිවිඤ්ඤාණං ඔක්කන්තී නාමරූපං පසාදෝ ආයතනං ඵුට්ඨෝ එසෙසා වෙදයිතං වෙදනා ඉති ඉමෙ පංචධම්මා ඉධූපපත්තිභවසම්මං තස්ස කම්මස්ස පච්චයා, ඉධ පරිපක්කත්තා ආයතනානං මොහෝ අවිජ්ජා ආයූහණා සඞ්ඛාරා නිකන්තී තණ්හා උපගමනං උපාදනං චෙතනා භවෝ ඉති ඉමෙ පංච ධම්මා ඉධ කම්මභවසම්මං ආයති පටිසන්ධියා පච්චයා"** යන මේ දෙසනාවන්ගෙන් අළුත් අළුත් සත්ත්වයන් නොලැබෙනබවත් සියලු සත්ත්වයන් හෙතුඵල වශයෙන් නිවත් පසක් කරණතුරු ම සසර දිගට උපදනාබවත් පැහැදිලි වේ. අතීතජාතියෙන් ලත් හෙතුපංචකය නිසා මේ ජාතියෙහි සත්ත්වයා, සි සම්මතයට හිය ඵලපංචකයෙක් ද. මේ ඵලපංචකය නිසා අනාගතජාතියෙහි උපතට කරුණු වූ හෙතුපංචකයෙක් ද, ඒ හෙතුපංචකය නිසා අනාගතජාතියෙහි සත්ත්වයා, සි සම්මත ඵලපංචකයෙක් ද වන්නේ ය, යන මේ ඇලෙසින් සත්ත්ව තෙමේ පිළිවෙළින් කිසි නැනෙකත් අතරක් නොතබා සසර දිගට ගමන් කරන්නේ ය. බීජයෙන් අඞ්කුරයත් අඞ්කුරයෙන් බීජයත් යන බීජාඞ්කුර න්‍යායයෙන් අවිද්‍යාදී වූ හෙතුපංචකය නිසා විඤ්ඤාණාදී වූ ඵලපංචාත්මක සත්ත්ව තෙමේ සසර වන්නේ ය.

දිව්‍යබ්‍රහ්මාදී වූ සත්ත්වගණයෙහි ඒ ඒ සත්ත්වයන් පිළිබඳ ප්‍රතිසන්ධීන්ගේ විශෙෂතාවෝ නානාභාවයෝ ඉතා ගැඹුරු ය. එහෙයින් ධම්මධරයන් විචාරා දහම් පොත පත කියවා ඒ හැම දත යුතු සි. මෙහි ද පස්වන තරඞ්ගයෙහි **"දීඝෝ බාලානං සංසාරෝ"** යන්නට ලියූ පරිකථාවෙහි එන ප්‍රතිසන්ධිවිස්තාරය ද කියවා බැලිය යුතු ය.

තව ද අවිද්‍යාප්‍රත්‍යයයෙන් සංඝකාර, සංඝකාරප්‍රත්‍යයයෙන් විඤ්ඤාණය, විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාමරූප, නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතන, ෂඩායතනප්‍රත්‍යයයෙන් ස්පර්ශ, ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනා, වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණා යනාදි ලෙසින් ආ ප්‍රතීත්‍යසමුත්පාදක්‍රමය ද, මෙහි ලා ධම්මධරයන් විචාරා දතයුතු ය.

ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ලා බුදුරජාණන් වහන්සේ **"වෙදනා පච්චයා තණ්හා"** සි වෙදනා ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව උපදී ය, සි වදාළ සේක. එහි වෙදනා නම්:- චිත්තපරමාර්ථයෙහි දැක් වූ සිත් අසූ

නවයෙහි යෙදෙන රූපාදීවූ අරමුණු රස විඳීමෙහි ශක්තිමාත්‍රය යි. එය, චක්ඛුසම්ඵස්සජා-සොතසම්ඵස්සජා-ඝාණසම්ඵස්සජා-ජිව්හාසම්ඵස්සජා-කායසම්ඵස්සජා-මනොසම්ඵස්සජා වෙදනා, යි සවැදෑරුම් වේ. චක්ඛුසම්ඵස්සජාදීන් නිසා හට ගන්නා වෙදනාව චක්ඛුසම්ඵස්සජා වෙදනා නම්. සෙස්ස ද මේ නයින් දන්නේ ය. සැකෙවින් මේ මෙසේ වතුදූ විපාකසිත් දෙ නිසෙහි යෙදෙන වෙදනාව ම මෙහිලා ගත යුතු ය. ඒ විසින් වෙදනාව දෙ තිස් වැදෑරුම් ය. ලොකොත්තර විපාකසිත් සතර මෙහිලා නොගත යුතු ය. මෙය සංසාරවෘත්තාශ්‍රිත කථාවක් බැවිනි ඒ නොගත යුතු. වෙදනාව සිත් අසූ නවය හා යෙදීම් වශයෙන් අසූනව් වැදෑරුම් කොට ගත හැකි වුව ද, මෙ තැන්හි දෙනිස් විපාකසිත් සමග යෙදෙන වෙදනාව ගතයුත්ති ය.

මේ හැම එක් කොට වෙදනාව, විපාක-අවිපාක වසින් දෙ පරිදි කොට ද දක්වන ලදි. කර්මයන්ගේ ඵලවශයෙන් ආයේ විපාක සිත් නම්. එසේ කර්මයන්ගේ ඵලවශයෙන් නො ආයේ අවිපාක සිත් නම්. විපාක සිත් හට ගන්නේ කර්මයන්ගේ ඵල වශයෙනි. එසේ කර්මඵල වශයෙන් හට ගත් කල එය විපාක සිතැ, යි කියනු ලැබේ. විපාක සිතක් ඉපදීමට කරුණු වූ කුසල් අකුසල් සිත් අවිපාක සිත් නම්. එහෙයින් විපාක සිත්හි වූවා විපාකවෙදනා ය. අවිපාක සිත්හි වූවා අවිපාකවෙදනාය, යි දත යුතු ය.

මේ ද්විධවෙදනා අතුරෙහි විපාකවෙදනාව තෘෂ්ණාවගේ ඉපැන්මට ප්‍රධාන වසින් කරුණු වන්නී ය. එහි ද ප්‍රධාන, සුඛවෙදනා ය. ඒ එසේ වනු එය නිරතුරුව ම තෘෂ්ණාවට ප්‍රත්‍යය වන බැවිනි. වැඩි වශයෙන් තෘෂ්ණාව හට ගන්නී සුඛවෙදනාව නිසා ය. සැප විඳීමෙහි කැමැත්ත නිසා ය. ඇස්-කන්-නාස් ආදියට හමු වූ රූප-ශබ්ද-ගන්ධාදීන් සුඛ වශයෙන් ගත් කල රූපතෘෂ්ණාදීහු හට ගණිත්. මේ විපාකසුඛවෙදනාව තෘෂ්ණාවගේ හට ගැණීමට කරුණු වන්නී උපනිස්සය වශයෙනැ, යි කීහ.

"යසමිං වේත්‍ථ අධිපෙතා විපාකසුඛවෙදනා,
එකාව එකධාවෙසා තසමා තණ්හාය පච්චයෝ"

යනු එහිලා දතයුතු ය.

විපාකසුඛවෙදනාව පමණක් ම තෘෂ්ණාවට ප්‍රත්‍යය නො වේ. එසේ කීයේ සාමාන්‍ය වසිනි. යහපත් කර්මයෙකින් යහපත් විපාකයක් ලැබීමට බලාපොරොත්තු වන කල්හි විපාකදුක්ඛවෙදනා-විපාකසුඛවෙදනා-විපාකඋපෙක්ඛාවෙදනා යන ත්‍රිවිධ

වෙදනාව ම තෘෂ්ණාවගේ ඉපැත්මට කරුණු වන බව දතයුතු ය. කෙනෙක් අකුශලකර්මයක ඵල විසින් දුකක් විඳිනා කල්හි මේ දුක්ඛවෙදනාව අකුශලකර්මයක ඵල විසින් වූවා ය, සි සිතා මත්තෙහි සැප ලබන්නට පින්දහම් කරත්. මේ බලාපොරොත්තුව තෘෂ්ණා ය. මෙසේ මත්තෙහි සැප ලබන්නට බලාපොරොත්තු වීමෙක් සිතෙහි පහළ වූයේ තමන් ඒ විඳි විපාකදුක්ඛවෙදනාව නිසා ය. මෙසේ විපාකදුක්ඛවෙදනාව තෘෂ්ණාවට ප්‍රත්‍යය වන බව දතයුතු ය.

කෙනෙක් සුඛවෙදනාවක් උපන් කල්හි මේ සුඛවෙදනාව උපන්නී පෙර කළ කුශලකර්මයන්ගේ ඵල විසිනැ, සි ගෙණ මත්තෙහි වඩාත් සැප ලබන්නට පින් දහම් කරත්. එසේ මත්තෙහි සැප ලැබීමෙහි වූ මේ කැමැත්ත තෘෂ්ණා ය. සැප ලැබීමෙහි මේ කැමැත්ත උපන්නේ තමන් ඒ අවස්ථායෙහි විඳිනා සුඛය නිසා ය. මෙසේ විපාකසුඛවෙදනාව තෘෂ්ණාවට ප්‍රත්‍යය වේ.

ඇස්-කන්-නාස් ආදී ඉඳුරන්ට, සිත් ගත්නාසුලු අරමුණු හමු වූ කල්හි එහිලා සතුටෙක් හෝ නො සතුටෙක් නො වේ නම්, මැදහත් බවෙක් ම වේ නම් ඒ උපෙක්ඛාවෙදනා නම්. ඒ ශාන්ත ය. සුඛදුක්ඛවෙදනාවන්ගේ ඇතුළත් ය. එය ඒ ඒ අවස්ථානුරූප ව සැපයෙක් ද දුකෙක් ද වේ. විපාකඋපෙක්ඛාවෙදනාව සමහර කලෙක සුඛවෙදනාව සේ ද, සමහර කලෙක දුක්ඛ වෙදනාව සේ ද තෘෂ්ණාවට ප්‍රත්‍යය වේ. මේ සියල්ල එක් කොට මෙසේ දැක් වූහ.

"දුක්ඛී සුඛං පත්ථයති සුඛී භියෝපි ඉච්ඡති,
උපෙක්ඛා පන සන්තත්තා සුඛම්වෙවව භාසිතා.

තණ්හාය පච්චයා තස්මා හොන්ති තිස්සොපි වෙදනා,
වෙදනා පච්චයා තණ්හා ඉති වුත්තං මහෙසිනා" සි.

එහිලා මෙ ද දන්නේය:- **"උපෙක්ඛා පන සන්තත්තා සුඛම්වෙවව භාසිතාති තඤ්ච ඛෝ භියෝ ඉච්ඡනවසෙන තණ්හාය උපනිස්සයොති අධිප්පායෝ. උපෙක්ඛා පන අකුසලවිපාකභූතා අනිට්ඨත්තා දුක්ඛේ අවරොඩෙතබ්බා. ඉතරා ඉට්ඨත්තා සුඛෙති. ඛා දුක්ඛං විය සුඛං විය ච උපනිස්සයෝ හොතීති සක්කා වත්තුන්ති"** යනු.

කර්මවිපාක විසින් නොව සාමාන්‍ය විසින් ප්‍රිය වූ අරමුණු, ඇස්-කන්-නාස් ආදියට හමු වූ කල්හි අවිපාකසුඛවෙදනාවත් අප්‍රිය වූ අරමුණු හමු වූ කල්හි අවිපාකදුක්ඛවෙදනාවත් හටගණියි.

අප්‍රිය වූ අරමුණුවල දුක්ඛවෙදනාව උපන් කල්හි "ප්‍රිය වූ අරමුණු හමු වේ නම් යෙහෙකැ"යි සිත මෙහෙයෙයි. එකල්හි තෘෂ්ණාව උපදියි. අවිපාක උපෙක්ඛාවෙදනාව, අවිපාක සුඛදුක්ඛවෙදනා දෙක්හි ඇතුළත් වූවා තෘෂ්ණාව උපදවා ය, යි ගත්තේ ය.

විපාකවෙදනාව වනාහි ඇස්-කන්-නාස් ආදී වූ දොරටුවලට හමු වූ රූපශබ්දගන්ධාදී වූ අරමුණු එල්බ ගෙණ ඒ ඒ අරමුණෙහි තෘෂ්ණාව උපදවයි. මේ ඒ කී සැටි:- **අස්සාදනීයතො සුඛාය හි වෙදනාය අස්සාදෙන සත්තා තං වෙදනං මමායත්තා වෙදනාය තණ්හං උප්පාදෙත්වා වෙදනාරාගරත්තා හුත්වා චක්ඛුදවාරෙ ඉට්ඨමෙව රූපං පත්ථෙන්ති. තථා සොතදවාරාදිසු"** යනු.

පාථග්ජනසත්ත්වයෝ රූපශබ්දාදිය කෙරෙහි තෘෂ්ණාව උපද වන්නෝ වෙදනාව නිසාම ය. පුතුට කිරි පොවන කිරිමවට දෙමවුපියෝ ඒ පිණිස වැටුප් දෙති. සත්කාර කෙරෙති. එසේ කරන්නෝ පුත්‍රාස්වාදය නිසා ය. දරුසුරතල් බැලීමෙන් උපදනා සෙනහය ආලය විඳගැණීම පුත්‍රාස්වාදය යි. එමෙන් රූප ඇඳ බැඳ දක්වන්නාහට, ශබ්ද අස්වන්නාහට, සුවඳබඩු දෙන්නාහට, කෑම්-බීම් සපයා දෙන්නාහට, සුවපහස් ඇති වස්ත්‍රාභරණ යාන වාහන දෙන්නාහට, රසායන බෙහෙත් සපයා දෙන්නාහට, රූපාස්වාදය නිසා ශබ්දාස්වාදය නිසා ගන්ධාස්වාදය නිසා රසාස්වාදය නිසා ස්පර්ශාස්වාදය නිසා ධර්මාස්වාදය නිසා සත්ත්වයෝ මහත් සත්කාර කෙරෙත්. මේ ඒ කී සැටි:- **"යස්මාපනිමෙ සත්තා පුත්තං අස්සාදෙත්වා පුත්තෙ මමත්තෙන ධාතියා විය රූපාදිආරම්මණවසෙන උප්පජ්ජමානං වෙදනං අස්සාදෙත්වා වෙදනාය මමත්තෙන රූපාදිආරම්මණදායකානං චිත්තකාරගන්ධබ්බගන්ධිකසුදත්තත වායරසායනවිධායකවෙජ්ජාදීනං මහාසක්කාරං කරොන්ති. තස්මා සබ්බාපෙසා වෙදනාපච්චයා තණ්හා හොතීති වෙදිතබ්බා"** යනු.

සත්ත්වයන්ගේ සිත්තුළ යම් යම් දේ ගැණ පහළ වන බලා-පොරොත්තුව එහිලා කරණ පැතීම තෘෂ්ණා ය. ඒ පතන දෙය ලැබීමෙන් සිතෙහි උපදනා සතුටත් නො ලැබීමෙන් උපදනා නො සතුටත් දෙක සුඛදුක්ඛවෙදනා ය. ඒ පැතීම සිදු වූ කල්හි සුඛවෙදනාවත් නො සිදු වූ කල්හි දුක්ඛවෙදනාවත් හට ගණියි. යමක් පැතූ ඇසිල්ලෙහි ම සිතෙහි සතුට නො උපදියි. පැතීම සිදු වූ කල්හි ම සතුට උපදියි. පැතීම නො සිදු වූ කල්හි නො සතුට උපදියි. පැතීම් පමණින්, බලාපොරොත්තු වූ පමණින් ම

සතුට හෝ නො සතුට නො උපදනේ ය. එහෙයින් තෘෂ්ණාව නිසා වෙදනාව නො හට ගන්නා බව හා වෙදනාව නිසා තෘෂ්ණාව හට ගන්නා බව හා දතයුතු ය. **"වෙදනා පච්චයා තණ්හා"** යනු වදාළෝ එහෙයිනි.

"තණ්හාය ජායති සොකො" තෘෂ්ණාහෙතුවෙන් ශොකය හට ගණී, යන මේ දෙශනාව සාමාන්‍ය දෙශනාවක් බැවින් මෙහිලා ඒ නො ගතයුතු ය. මෙය හෙතුඵල දැක්වීම සඳහා දෙශනා කරණ ලද්දේ නො වේ. සාමාන්‍ය විසින් ශොකය හට ගන්නා සැටියක් මෙයින් වදාළ සේක.

සත්ත්ව තෙමේ අළුත් අළුත් පිණ්ඩදය පතන්නේ ය. පැතූ පිණ්ඩදය ලද කල්හි එහි රස විඳ ගත්තේ ද එයින් සෑහීමට නො පත් ව ඉදිරියෙහි තව තවත් පතන්නේ ය. පෘථග්ජන-සත්ත්වයාගේ ස්වභාවය ඒ ය. පැතූ පිණ්ඩදය ලැබීමෙන් ඒ අවස්ථායෙහි සුඛාස්වාදයෙක් ලද්දේ ඒ නිසා ම හේ තව තවත් එයට වැඩි තරම් වූ පිණ්ඩදය පතයි. ඒ පැතීම තෘෂ්ණාව ය. මෙසේ සැපවෙදනාව නිසා නැවැත ද තෘෂ්ණාව උපදනා බව දතයුතු යි. පෘථග්ජන සත්ත්වයා සැපවෙදනා නිසා හට ගන්නා තෘෂ්ණාවෙන් නැවැත නැවැතත් සැප වෙදනා පතයි.

තසිනා-එජා-ජාලිනි-විසත්තිකා-ජන්ද-ජටා-නිකන්ති-ආසා-සිබ්බනී-භවනෙත්ති-අභිජ්ඣා-වනථ-වාන-ලොභ-රාග-ආලය-පිහා-මනොරථ-ඉච්ඡා-අභිලාස-කාම-දොහළ-ආකංඛා-රුචි යනාදීහු තෘෂ්ණාවට පර්‍යාය විසින් කොෂාගත නාමයෝ ය.

තෘෂ්ණා යන මෙහි කැවී සිටි අරුත් මේ පර්‍යායනාමයන්හි ද කැවී සිටියේ ය. එහි අරුත් මේ එක එක නාමයෙන් පැහැදිලි වේ. තෘෂ්ණාවෙහි ශක්තිය සත්ත්වයන් කෙරෙහි බලපවත් වන සැටි මොවුහු කියත්.

දුක්ඛස්ස ච අතික්කමං = දුක් ඉක්මීමට කරුණු වූ නිරොධ සත්‍යය ද.

දුඃඛනිරොධසත්‍යය ආර්‍යසත්‍ය අතුරෙහි තෙවැන්න ය. **"ඉදං ඛො පන භික්ඛවෙ! දුක්ඛනිරොධං අරියසච්චං, යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො"** යි එය වදාළ සේක. "මහණෙනි! පුන පුනා සසර උපත දෙන තෘෂ්ණාවගේ ආර්‍යමාර්ගයෙන් නිරවශෙෂයෙන් මුළු-මනින් යම් නිරුද්ධ කිරීමෙක් වේ ද, තෘෂ්ණාව නැසීම් විසින්

යම් බැහැරලීමෙක් වේ ද. නැවැත නූපදනා ලෙසින් දුරලීමෙක් වේ ද, තෘෂ්ණාඛ්‍යනයෙන් යම් මිදීමෙක් වේ ද, යම් නොඇලීමෙක් වේ ද මෙය දුඃඛනිරෝධසත්‍යය වේ ය" යනු එහි කෙටි අරුත් ය.

දුක් උපද වන සසර උපත දෙන ප්‍රධාන හෙතුව වූ සමුදය සඞ්ඛ්‍යාත තෘෂ්ණාව නැසී ගිය පසු සසර **දුක්** මුළුමනින් සංසිදෙන බැවින් සමුදයනිරෝධයෙන් ම දුඃඛනිරෝධය වනබව මෙයින් වදාළ සේක. එහෙත් අන්‍යයෝ දුක්ඛනිරෝධය කියන්නාහු අත්ත-කිලමථානුයොගාදී වූ දුක් විඳීමෙන් ම දුක් නැති කළයුතු ය, යි කියත්. ඔවුහු කෙලෙසකඤ්චුකයන්ගේ නිරෝධය නොකියත්.

දුක් නිරුඬ කිරීම දක්වනු සඳහා මෙහි යෙදුනු **අසෙසවිරාගනිරොධො-චාගො-පටිනිස්සග්ගො-මුත්ති-අනාලයො** යන මේ පදයෝ නිරෝධසත්‍යසඞ්ඛ්‍යාත නිර්‍වාණය කියා පාන්නෝ ය. එහෙයින් එහිලා මොවුහු පර්‍යායනාමපදයෝ වෙත්.

නිවන අරමුණු කොට නිවනට පැමිණ ආර්‍යමාර්ගයෙන් තෘෂ්ණාව කිසිත් ඉතිරි නොවී ක්ෂය වේ ද, නොපැවැතීම් විසින් නිරුද්ධ වේ ද එහෙයින් නිවන අසෙසවිරාගනිරොධ නම් වේ. නිර්‍වාණය අවබොධ කිරීම් හෙතුවෙන් තෘෂ්ණාවගේ නිරවශෙෂ-යෙන් ක්ෂයවීම් වශයෙන් පහවීම වේ ද, නැවැත නූපදනා ලෙසින් නිරුද්ධවීම වේ ද, ඒ නිවන අසෙසවිරාගනිරොධය යි කියන ලද්දේ ය.

මෙහි විරාග නම්, මාර්ගය යි. විරාග නම් වූ ඒ මාර්ගයෙන් තෘෂ්ණාව මුළුමනින් නිරුද්ධ කිරීම අසෙසවිරාගනිරොධය යි. මාර්ගයෙන් අරමුණු කිරීම් වසින් නිවනට පැමිණීමෙන් තෘෂ්ණාව කිසිත් ඉතිරි නොවී ප්‍රහාණය වන බැවින් නිවන තණ්හාවිරාග නිරොධ නම් වී ය. තවද කාමරාගාදිවශයෙන් පවත්නා තෘෂ්ණාව කාමරාගානුසය භවරාගානුසය සහිතව නැසී යන බැවිනුදු අසෙස විරාගනිරොධය යි කියනු ලැබේ.

තවද විරාග නම්, ප්‍රහාණය යි. එහෙයින් නිරවසෙසවිරාගය නිරවසෙසනිරොධය යි මෙසේත් මෙහිලා යෙදිය යුතු ය. පරමාර්‍ථ වසින් නිර්‍වාණය දුඃඛනිරොධාර්‍යසත්‍යය යි දත්තේ ය. මෙසේ මෙය කීහ ආචාර්‍යපාදයෝ:- **"විරාගො වුච්චති මග්ගො, විරාගා විමුච්චතීති කි වුත්තං, විරාගෙන නිරොධො=විරාගනිරොධො, අනුසයසමුග්ඝාතෙනා අසෙසසා විරාගනිරොධො - අසෙසවිරාගනිරොධො, අථවා විරාගාති පහාණං වුච්චති, තස්මා**

අසෙසවිරාගො අසෙසනිරොධොති එවමෙපත්ථ අත්ථයොජනා වෙදිතබ්බා, පරමත්ථතො හි දුක්ඛනිරොධං අරියසච්චන්ති නිබ්බානං වුච්චති'' යි. අරමුණු කිරීම් වශයෙන් නිවනට පැමිණ තෘෂ්ණාව අත්‍යන්තවිරාගයෙන් පහව යේ ද, කවදාත් කිසිලෙසකින් නැවැත නූපදනාපරිදි නිරුද්ධ වේ ද එහෙයින් නිවන විරාගය යි ද නිරොධය යි ද සම්මත ය. **''යස්මා පන තං ආගම්ම තණ්හා විරජ්ජති චෙව නිරුජ්ඣති ච, තස්මා විරාගොති ච නිරොධොති ච වුච්චති''** යනු ආප්තවචනයි.

අවබොධ කිරීම් වශයෙන් නිවනට පැමිණ, නිවන් අවබොධ කිරීමෙන් තෘෂ්ණාවගේ අත්හැරීම වන බැවින් නැවැත නූපදනා පරිදි බැහැරලීම වන බැවින් මුළුමනින් තෘෂ්ණාවගේ මිදීම වන බැවින් පඤ්චකාමගුණිකාලයයන් එකකුත් නැති බැවින් නිවන **චාග-පටිනිස්සග්ග-මුත්ති-අනාලය** නම් වේ. **''තදෙව ආගම්ම තස්සා චාගාදයො හොන්ති, කාමගුණාලයෙසු චෙත්ථ එකොපි ආලයො නත්ථි, තස්මා චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයොති වුච්චති''** යනු තදර්ත්ථසම්ත්ථනයයි.

තෘෂ්ණාවගේ විරජ්ජනය තෘෂ්ණාවගේ නිරොධය තෘෂ්ණාවගේ චජනය තෘෂ්ණාවගේ ප්‍රතිනිස්සර්ජනය තෘෂ්ණාවගේ මුක්තිය තෘෂ්ණාවගේ නො ඇල්ම මෙයින් කියන ලදී. මේ එහි ටීකාචාර්‍ය්‍ය විවරණය:- **''ඛයගමනවසෙන විරජ්ජති. අප්පවත්තිගමනවසෙන නිරුජ්ඣති. අනපෙක්ඛතාය චජනවසෙන චජීයති. පුන යථා නප්පවත්තති. තථා දූරඛිපනවසෙන පටිනිස්සජ්ජීයති. බන්ධන භූතාය තණ්හාය මොචනවසෙන මුච්චති. අසංකිලෙසවසෙන න අලලීයති''** යනු.

නිරොධො-චාගො-මුත්ති-අනාලයො යන මෙ පද අතුරෙහි දුඃඛයාගේ අනුත්පාදනිරොධය මැනැවින් කියාලනුයේ **නිරොධො** යන මෙ පදයෙනි. එබැවින් අපේ පොතපතෙහි අනුත්පාදනිරොධය කියනු සඳහා වඩාලා ම යෙදී සිටියේ මේ විභක්ත්‍යන්ත පදය යි. **'දුක්ඛනිරොධ'** යනු පද දෙකක් එක්වීමෙන් නිපැයුනු සමස්තනාමයෙකි. එහි දුක්ඛශබ්දයෙන් කෙලෙස් සහිත වූ පඤ්චස්කන්ධය ගැණේ. එ නම් පඤ්චොපාදානස්කන්ධය යි. උපාදානස්කන්ධ පස මුළුමනින් දුක්ඛව **''සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා''** යන්නෙන් දක්වා වදාළ සේක. උපාදානස්කන්ධයන් පිළිබඳ කෙටි කථාවක් දුඃඛසත්‍යකථාවෙහි දක්වා ඇත. ඒ එයින් දතයුතු ය.

දුක්ඛශබ්දය හා සර්ත වූ නිරොධ ශබ්දය නිපැදුනේ **නි + රොධ** යන ශබ්ද දෙක එක්වීමෙනි. නි ශබ්දය තමා **නිසෙසෂ-අභාව-සමානිවෙස-භූසකා-මොක්ඛ-රාසි-ගෙහ-නිසොග-උපමා-ඛීන-පසාද-නිඝහ-අවචය-දසන-අවසාන-නිඛ්ඛනන-අධොභාග-අවධාරණ-සාමීප්‍ය-බන්ධන-ඡේක-අනෙනාභාග-උපරමණ** යන අරුත්හි හෙන්තේ ය යි කොෂකාරයෝ කීහ.

නි උපසර්ගය මෙසේ නානාර්ථවත් වූයේ ද මෙහිලා ප්‍රධාන වශයින් නිෂ්ක්‍රමණාර්ථයෙහිලා ගතයුතු ය. එහෙත් සමහරු මෙය විශේෂයක් නොතබා ම අභාවමාත්‍රයෙහි වැටේ ය යි කියත්. ඒ නොමැනැවි. අතීතයෙහි උපන් සකල්ලයන් ඒ අතීතයෙහි ම නිරුද්ධවීම එක් අභාවයෙකි. වර්තමානයෙහි උපදනා මේ දැන් ඉපැදෙමින් සිටුනා කෙලෙසසකල්ලයන් තම තමන් අයත් ආයු පමණින් සිට නිරුද්ධවීම එක් අභාවයෙකි. අනාගත කෙලෙස-සකල්ලයන්ගේ අභාවය ගැණ යමෙක් කියයුතු නොවේ. මෙතෙක් ඔවුන් නොද උපන් බැවිනි. එහෙයින් දුක්ඛශබ්දය හා සර්ත වූ නිරොධශබ්දය කෙලෙසසකල්ලයන්ගේ ඒ මේ සාමාන්‍ය අභාවය නොව නැවැත නූපදනා පරිද්දෙන් වන කෙලෙසසකල්ලයන්ගේ අනුත්පාදනිරොධය ම කියාලන්නේ ය.

අභාවයෝ නත්පරිදි වූවාහු කොතෙකුත් ඇත්තාහ. ඒ අභාවයන් ගැණ නොද විචාරා මෙහිලා අභාවය නිරොධය යි නොවෙනස් ව ගැණීම මිත්‍යාග්‍රාහයෙක් වේ. හට ගත් බඳගින්න සත් සිඳවන්නට ආහාර ගත් කල්හි එය සන්සිඳී යෙයි. එහෙත් නැවැතත් බඳගින්න හට ගණියි. නැවැතත් ආහාර ගත් කල්හි එ ද සන්සිඳෙයි. මෙසේ නැවැත නැවැත ආහාර ගැණීමෙන් බඳගිනි වළකා ගැණීම දුඃඛනිරොධයෙක් නොවේ. ඒ වනාහි සාමාන්‍ය අභාවමාත්‍රයෙකි. දුඃඛනිරොධය නම්, පෙරකී සේ දුඃඛ සත්‍යයෙහි ඉතා කොටින් දක්වූ සකල කෙලෙසසකල්ලයන් මුල් නොතබා ම නැවැත කවදත් නූපදනා පරිදි සන්සිඳුවාලීම ය. මේ කියන පරිදි නිරුද්ධියට ගිය කිසි දුකෙක් මොන ලෙසකිනුත් නොඋපදනේ ය. එයින් සත්ත්වයාගේ සසරදුකෙහි පුන පුනා ගැලීම අවසන් වන්නේ ය. එහෙයින් දුඃඛයාගේ කෙලෙසසකල්ලයන්ගේ අනුත්පාදනිරොධය ම කැමැතිවන ලද්දේ ය.

නි උපසර්ගය හා එක් නොවූ එකපදභාවයට නොගිය **රොධ** ශබ්දය **බන්ධන-ගමන-කාරාගාර-වාරණ** යනාදී අරුත්හි එන්නේ ය. මෙහිලා ඒ 'රොධ' යනු, මේ අරුත් සතරෙහිලා ගතුද වරද නැත. සසරෙහි බැඳීම, පුන පුනා සසරෙහි උත්පත්ති විසින්

ඉදිරියෙහි යෑම, සසරදුකෙහි සිර කොට තැබීම යන අරුත් මෙයින් ගතහැකි බැවිනි. මෙසේ මේ අරුත්හි පවත්නා **රොධ** ශබ්දය **නි** යනු හා එක් ව **නිරොධ** යි නැඟී ආයේ සසර සැරිසැරීම සසර ගමන මුළුමනින් වළකාලීම, නැත, කෙලෙසසකඞ්කයන්ගෙන් මුළුමනින් නික්ම යෑම, කෙලෙසසකඞ්කයන්ගේ නිරවශෙෂනිරොධය කියා සිටියේ ය. දුකැයි ගන්නා කෙලෙසසකඞ්කසඞ්ඛ්‍යාතචාරකයාගේ චුතිපටිසන්ධි වශයෙන් ඉදිරියෙහි නොයෑමෙන් නොබැඳීමෙන් සිර නොවීමෙන් වන සන්සිඳීම මෙයින් ගතයුතු ය.

"නිරොධොති නිබ්බානං" යනු ආගමයුක්ති හෙයින් නිරොධ නම්, නිවනැයි දතයුතු ය. නිවන, නිරොධ ය යි වදාළෝ නිවන කෙලෙස් සහිත පස්කදෙහි චුතිපටිසන්ධි වශයෙන් පුන පුනා ඉපිද ඉපිද මැරි මැරී ඉදිරියෙහි යෑම මුළුමනින් සන්සිඳීමට කරුණු වන බැවිනි. නිවනෙහි දුඃඛරොධයෙක් නැත්තේ ය. චුතිපටිසන්ධි වශයෙන් පැවැත්මෙක් නැත්තේ ය. නිවන් අවබොධ කළාට පසු කෙලෙස් සහිත සඤ්ඤයන්ගේ පැවැත්මෙක් එහි නොවන්නේ ය. නිවන, නැවැත නූපදනා පරිදි දුක් සන්සිඳීමට පමුණු වන්නට මගපල සිත්වලට ප්‍රත්‍යය වන්නේ ය. එහෙයින් නිවන දුඃඛනිරොධ නම්. තතු අරුත් විසින් දුඃඛනිරොධ නම් දුක් ඉපදීමට කරුණු වන තෘෂ්ණාවගේ සමූලඡෙදනයෙහි ලා මගපල සිත්වලට ම අරමුණු වන නිර්‍වාණ යැ යි දතයුතු ය. දුඃඛ හෙතුව වූ තෘෂ්ණාව නැසූ කල්හි එයින් උපන් ඵලය වූ දුකත් නැසී යන බැවින් තෘෂ්ණානිරොධය දුඃඛනිරොධ ය යි ද වදාළ සේක. මෙසේ දුඃඛයාගේ අනුත්පාදනිරොධයට ප්‍රත්‍යය හෙයිනුදු තෘෂ්ණානිරොධය දුඃඛනිරොධ නම් වේ. තෘෂ්ණා හෙතුවෙන් හට ගත් සියලු දුඃඛයන්ගේ අතික්‍රමණය නිරොධය, තෘෂ්ණානිරොධය සමග එකවිට ම වන්නේ ය. සියලු දුක් තෘෂ්ණාව හා බැඳී සිටියේ ය. එහෙයින් දුඃඛනිරොධය තෘෂ්ණානිරොධ ය යි ද තෘෂ්ණානිරොධය දුඃඛනිරොධ ය යි ද කියන ලදි.

මේ දුඃඛනිරොධසඞ්ඛ්‍යාතඝානන්ධමීය කෙරෙහි ගුණ නාම විසින් නැඟී සිටි අර්‍ථප්‍රඥප්තීහු බොහෝ මෙත්. ඔවුනතුරෙහි "නිබ්බාන" යනු ම වඩාලා ප්‍රසිද්ධියට ගියේ ය.

නිබ්බාන නම්, වානය යි කියූ තෘෂ්ණාවෙන් වෙන් වූ තෘෂ්ණාව මුලිනුපුටා සිටියා වූ තෘෂ්ණාව ප්‍රධාන කොට ඇති සියලු කෙලෙසුන් කෙරෙන් මිදුනු ශාන්තස්වභාවය හෙවත් ශාන්තසුඛය යි. ඒ කීහ මෙසේ:- **"වානසඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති වුච්චති, අමතං අසඞ්ඛතං පරමං සුඛන්ති"** යනු.

මේ අර්ථය මෙසේත් කියන ලද්දේ ය:- **"යො සො සබ්බ-සඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සගෙගා තණ්හක්ඛයො විරා-ගො නිරොධො නිබ්බානං"** යි. යම් ධර්මයක් හෙතු කොට සියලු සංස්කාරධර්මයන්ගේ යම් ඒ සන්සිඳීමෙක් වේ ද, කාමූ පධි ආදීන්ගේ යම් ඒ දුරලීමෙක් වේ ද, තෘෂ්ණාවන්ගේ යම් ඒ ක්ෂයවීමෙක් වේ ද, සංස්කාරයන් කෙරෙහි යම් ඒ නො ඇලී-මෙක් වේ ද, කෙලෙස් හැකිල්ලෙන් යම් ඒ මිදීමෙක් වේ ද, යම් ඒ කෙලෙස් නිවීමෙක් වේ ද, ඒ ය නිවනැ යි යනු අරුත් ය. **"නිරොධො"** යනු මෙසේ ටීකා කළහ:- **"යුජ්ජන්ති එත්ථ සත්තා කිලෙසනිගළබන්ධනෙනාති රොධො. සංසාරස්සෙතං අධිවචනං. තතො නික්ඛන්තො ති නිරොධො"** යි

"යස්ස චාධිගමා සබ්බකිලෙසානං ඛයො භවෙ,
නිබ්බානමිති නිද්දිට්ඨං නිබ්බානකුසලෙන තං"

යම් නිවනක් අවබොධ කිරීමෙන් රාගාදී වූ සකලකෙලශයන්ගේ ක්ෂයවීමෙක් වේ ද, ඒ නිවනැ යි නිවන් දැනීමෙහි සමර්ථ වූ බුදු-රජානන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය.

නිබ්බාන ශබ්දය ද ශාන්තසුඛය පදනම් කොට **නි × වාන** යන ශබ්ද දෙක එක්වීමෙන් භාෂාවට ආයේ ය. මෙහි සිටි **නි** යනු ද සිටියේ 'නිරොධ' යන්නෙහි සිටි **නි** උපසර්ගය ගත් අරුත ගෙණ ය. **වාන** නම් තෘෂ්ණා ය. **"ඛන්ධායතනාදිභෙදෙ තෙභූ-මක්ඛධම්මෙ තෙට්ඨූපරියවසෙන විනනතො සංසිබ්බනතො වානං වුච්චති තණ්හා"** යි විවෘත්ති හෙයින් ආද්ධ්‍යාත්මික වූත් බාහිර වූත් ස්කන්ධායතනාදිභෙද ඇති ත්‍රෛභූමක ධර්මයන් හෙවත් මනු-ෂ්‍යත්වයෙන් මනුෂ්‍යත්වය දෙවත්වය බ්‍රහ්මත්වය, නැවැත බ්‍රහ්මත්ව-යෙන් බ්‍රහ්මත්වය දෙවත්වය මනුෂ්‍යත්වය, නැවැත දෙවත්වයෙන් දෙවත්වය බ්‍රහ්මත්වය මනුෂ්‍යත්වය, නැවැත මනුෂ්‍යත්වයෙන් ආපායි-කත්වය යන ඈලෙසින් කුඩාභවයෙන් කුඩාභවය ද, කුඩාභවයෙන් මහත්භවය ද, මහත්භවයෙන් මහත්භවය ද, මහත්භවයෙන් කුඩාභවය ද උඩු යටි කොට ගැටලමින් විවිධාවස්ථාවන්ට පමුණු වමින් ඒ ඒ තැන්හි මසාලන බැවින් ගොතාලන බැවින් තෘෂ්ණාව එ නම් වූ ය.

ලොකොත්තර වූ චතුර්විධමාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කටයුතු වූ මාර්ගඵලයන්ට අරමුණු වූ වානය යි නම් ලද තෘෂ්ණාවෙන් විෂයාතික්‍රමණ විසින් නික්ම ගිය කෙලශස්කන්ධයන් හා නො හැනුනු ධර්මතත්ත්වය නිර්වාණය යි කියන ලද්දේ ය. **"නිබ්බානංපන**

ලොකුත්තරසඞ්ඛාතෙචතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බං මග්ගඵලානමාලම්බනභූතං වානසඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති පවුච්චති'' යනු අර්ථසම්පාදන ය යි.

මේ පාලිවාක්‍යප්‍රදේශයෙහි එන **''ලොකුත්තරසඞ්ඛාත චතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බං''** යනා මෙයින් කියේ නිවන සෝවන් ආ මග්ඵලඵල ඒ ඒ ආර්‍යපුද්ගලයන් විසින් ආර්‍යඥානචක්ෂුසින් දක්ක යුතුබව ය. ස්‍රෝතාපත්තිමාර්ගඥානයෙන් නැසෙනසුලු කෙලෙස් නැසුනු පසු ස්‍රෝතාපත්තිමාර්ගස්ථ ආර්‍යයාහට, සකෘදාගාමිමාර්ගඥානයෙන් නැසෙන සුලු කෙලෙස් නැසුනු පසු සකෘදාගාමිමාර්ගස්ථ ආර්‍යයාහට, අනාගාමිමාර්ගඥානයෙන් නැසෙනා සුලු කෙලෙස් නැසුනු පසු අනාගාමී ආර්‍යයාහට, අර්හත්මාර්ගඥානයෙන් නැසෙනසුලු කෙලෙස් නැසුනු පසු අර්හත්මාර්ගස්ථ ආර්‍යයාහට නිර්‍වාණය ප්‍රත්‍යක්ෂසිද්ධ ය. **''චතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බන්ති ඉමිනා නිබ්බානස්ස තං තං අරියපුග්ගලානං පච්චක්ඛසිද්ධතං දස්සෙති''** යනු ආඥාවචන යි. ආගම අධිගම නැති අන්ධබාලපෘථග්ජනයන් හැර ස්‍රෝතාපත්තිමාර්ගීය ලැබීමට ඉතාලංව සිටි නුවණ මෝරාගිය කල්‍යාණ පෘථග්ජනයන්ට නිර්‍වාණය අනුමානසිද්ධ ය. **''මග්ගඵලානමාලම්බනභූතන්ති ඉමිනා කල්‍යාණපුථුජ්ජනානං අනුමානසිද්ධතඤ්ච දස්සෙති''** යනු එය කීහ.

නිවනැ යි කියන ලද්දේ එකවට සකල ක්ලේශසඤ්ඤාන්ගේ ම නිරෝධය යි බුද්ධධර්මය අනුව නො කිය හැකි ය. සෝවන් ආ යම්කිසි මඟනින් ක්ලේශසඤ්ඤයන්ගේ යම්කිසි කොටසෙක් නැවැත නූපදනා පරිදි අනුත්පාදනිරෝධඥාන පැමිණියේ නම්, එ ද නිවනැයි ගත හැකි ය. ක්ලේශනිරෝධය බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ කොටස් විසින් බෙදා දක්වුනේ ද එහෙයිනි. ක්ලේශයන්ගේ නිරෝධයත් සඤ්ඤයන්ගේ නිරෝධයත් ක්ලේශසඤ්ඤයන්ගේ නිරෝධයත් එක්වට ම සිදු වන්නේ නො වේ. එහෙත් නිවන යථාර්‍ථවසින් එකෙක් ම ය.

ස්‍රෝතාපත්තිමාර්ගස්ථපුද්ගලයාහට නිරෝධය ලැබෙනුයේ ඒ මාර්ගචිත්තක්ෂණයෙහි දී සත්කායදෘෂ්ටි විචිකිත්සා ශීලව්‍රතපරාමර්ශී යන මේ ක්ලේශත්‍රිකයාගේ නිරුද්ධියෙනි. සකෘදාගාමිමාර්ගස්ථ පුද්ගලයාහට ලැබෙනුයේ බලවත් ලෙසින් සන්තානගත ව සිටි කාමරාග ව්‍යාපාද දෙදෙනාගේ බලවත් බව නසාලීමෙනි. අනාගාමිමාර්ගස්ථපුද්ගලයාහට ලැබෙනුයේ සකෘදාගාමී මාර්ගයෙන් බලගතුකම් නසා තුබූ කාමරාග ව්‍යාපාදයන්ගේ නිරුද්ධියෙනි.

එහෙත් මේ අවස්ථා තුණෙහි ලැබෙන කෙලශනිරුද්ධියෙන් මුළු-මනින් සන්සිඳීම වේ ය යි නො ගත යුතු ය. අර්හනමාර්ගස්ථ පුද්ග-ලයාහට ලැබෙනුයේ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යනාදී වූ සකල කෙලශයන්ගේ නිරුද්ධියෙනි. මෙයින් මුළුමනින් සන්සිඳීම වේ. මෙසේ ඒ ඒ මාර්ගඥානයන්ගෙන් නැසෙන කෙලෙස් නැවැත කවදාත් නූපදනේ ය. එහෙයින් මාර්ගඥානයන්ගේ ශක්ති ප්‍රමාණයෙන් වෙන් වෙන් ව කෙරෙණ කෙලෙස්සන්සිඳීම එකක් ම බැවින් ඒ එක් ම සන්සිඳීම එක් ම නිවනැ යි දතයුතු ය.

දැන්, මේ හෙතුවෙන් සෝවන්මගට පැමිණියහු පිළිබඳ ව තුබූ සියලු ආපායිකසක්ඛියෝත් සත් භවයෙකින් එපිට දෙව්-ලොව උපත දීමට සමර්ථ ව සිටි ස්වර්ගීයසක්ඛියෝත් නිරොධ-යට යන්නාහ. කාමභවයෙහි එක්වරක් ඉපදීමට සමර්ථ වූ සෙද-ගැම්මගට පැමිණියහු පිළිබඳ ඒ එක්භවයෙහි උපතට හෙතු වූ සක්ඛියන් හැර අන්‍ය වූ ස්වර්ගීයසක්ඛියෝ නිරොධයට යන්-නාහ. අනගැම්මගට පැමිණියහු පිළිබඳ කාමභවික වූ සියලු සක්ඛියෝ නිරොධයට යන්නාහ. රහත්මගට පැමිණියහු පිළිබඳ වර්තමාන සක්ඛිපඤ්චකය ඉතිරි කොට අන්‍ය වූ සියලු කෙලශ සක්ඛියෝ නිරොධයට යන්නාහ. ඉතිරි වූ සක්ඛියෝ ද පිරිණිවී-මෙන් පසු විනාශයට යන්නාහ. නිරුද්ධියට යන්නාහ. දැන් කෙලශසක්ඛියන්ගෙන් කිසිත් නැත්තේ ය.

සසරෙහි උපත දෙන සත්ත්වයා උත්පත්ති විසින් දිගින් දිගට ඇද ගෙණ යන සෝවන්මගින් නසා ඉතිරි වූ කෙලෙස් භවයෙහි ඉදිරියෙහි උපත දෙන්නේ සත්වරක් ම ය. එ බැවින් නසාලූ ම කෙලෙස් ඉතා බොහෝ ය. පමණ නො කට හැකි ය. ඉතිරි ව ඇති කෙලෙස් ඉතා ටික ය. එය මහළොවෙන් නියසිළට නගාගත් පස්-බිඳක් සේ ය. බුදුරජානන් වහන්සේ මෙය මෙසේ වදාළ සේක. **"අථ බො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා භික්ඛූ ආමන්තෙසි. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ! කතමං නුඛො බහුතරං යොචායං මයා පරිත්තං නඛසිඛායං පංසු ආරොපිතො අයං වා මහාපඨවීති? එතදෙව භන්තෙ බහුතරං යදිදං මහා-පඨවි. අප්පමත්තකො නඛසිඛායං භගවතා පරිත්තො පංසු ආරොපිතො. සො නෙව සතිමං කලං උපෙති, න සහස්සිමං කලං උපෙති මහාපඨවී උපනිධාය. භගවතා පරිත්තො නඛ-සිඛායං පංසු ආරොපිතොති"** සෙදගැම්මගින් අනගැම්මගින් නැසුනු කෙලෙස් ගැණ ද යට කී සේ දන්නේ ය. නැසෙන කෙලෙස් ගණනින්, කෙලෙස් නැසීමෙහි වූ පිළිවෙත් ගණනින් නිවන්

බොහෝ ය යි ගිණීමට බුදු බණින් පිළිවන් කමෙක් නැත්තේ ය. කොයිමගකින් හෝ කොයිපිළිවෙතකින් හෝ යමක් හෙතු කොට කෙලඟයන්ගේ අනුත්පාදනිරොධය වී නම්, ඒ අනුත්පාදනිරොධය නිවනැයි ඒ එකෙක් ම ය.

"නිබ්බානං නිබ්බානන්ති ආවුසො සාරිපුත්ත! වුච්චති. කත්තමං නුඛො ආවුසො නිබ්බානං?"= ඇවැත! ශාරිපුත්‍රය! නිවන නිවනැයි කියනු ලැබේ. නිවන නම් කිමැයි ජම්බුඛාදක පරිව්‍රාජකයා නැඟූ ප්‍රශ්නයට **"යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති නිබ්බානං"** = ඇවැත! යම් රාගක්ෂයෙක් වේ ද, යම් ද්වේෂක්ෂයෙක් වේ ද, යම් මොහක්ෂයෙක් වේ ද එය නිවනැයි කියනු ලැබේ, යනු ශාරිපුත්‍රමහාස්ථවිරයන් වහන්සේ දුන් පිළිතුර ය.

එහි, **රාගක්ඛයො**=රාගයන්ගේ ක්ෂයවීම, **දොසක්ඛයො**=ද්වේෂයන්ගේ ක්ෂයවීම, **මොහක්ඛයො** = මොහයන්ගේ ක්ෂයවීමැයි වදරණ ලද්දේ ද, රාගාදීන්ගේ ක්ෂයමාත්‍රය නිවනැයි ගන්නට මෙහි යුක්තියෙක් අවසරයෙක් නැත්තේ ය. මෙහිලා මෙසේ වදාළ සේක් හෙතුව ඵලයෙහි ආරොපණය කිරීමෙනි. නිවන හෙතු කොට රාගාදීන්ගේ ක්ෂයවීම වන්නේ ය. රාගාදීන්ගේ ක්ෂයවීම ඵලය වේ. එහි හෙතුව නිවන ය. නිවන සනාතන වූ පරමාර්ථසභාවධර්මයෙකි. නිවන රාගාදීන්ගේ ක්ෂයවීමෙහි බලවත් උපකාරය යි. බලවත් හෙතුව යි. කෙලෙස් ක්ෂය කොට හැරීමෙහි සමීපව හැසිරෙන බැවිනුත් රාගාදීන්ගේ ක්ෂයවීම නිවනැ යි කියන ලදි. කෙලෙස් නසන්නා වූ චතුර්විධමාගීඥනයට අරමුණු වූ නිර්‍වාණය කෙමේ අර්‍ථවශයෙන් කෙලෙස් නැසීමැ යි කියන ඵලයට කරුණු වේ. කෙලෙස් නැසීම වූ ඵලය උපද වන්නට නිර්වාණසඛ්‍යාත හෙතුව කාරණයක් ම වන බැවින් ඒ ඵලය නිවන් හෙතුවෙහි නගා ඵල විසින් **රාගක්ඛයො** යනාදිය වදරණ ලද්දේ ය උක්සකුරු සෙම් උපදවයි. සෙම් හටගැණීමට උක්සකුරු හෙතු වන්නේ ය. එහෙයින් ශෙලෂමසඛ්‍යාත ඵලනාමය හෙතුසඛ්‍යාත ශකීරායෙහි නගා සකුරු ද ශෙලෂමා යි ඵලොපචාර විසින් ව්‍යවහාරයෙහි ආ සේ, අර්‍හත්මාගීඥනහෙතුව කෙලෙස් නැසීමැ යි කියන ඵලය උපදවාලීමට කාරණ බැවින් ඒ ඵලනාමය හෙතුව වූ අර්‍හත්මාගීඥනයෙහි නගා අර්‍හත්මාගීඥනය රාගක්ඛයදොසක්ඛය-මොහක්ඛය යි කියන ලද්දේ ය. එසේ ම මාගීඥනයට අරමුණු වූ නිර්‍වාණය ද කෙලෙස් නැසීමට කාරණ වූ බැවින් හෙතුහුගේ නාමය ඵලයෙහි නගා රාගක්ඛයාදිනාමයෙන් ව්‍යවහාර

කරණ ලදැ සි දතයුතු ය. එලොපවාර නම්, එලය හෙතුවෙහි නගා කිම ය. ක්ෂයානන්තක්ෂණයෙහි හෙවත් මාගීක්ෂණයාගේ කෙළවර අතීතඵලය උපදනා බැවින් මාගීඵල දෙක ම ඛය සි කියන ලදි එහෙත් ඵලයෙන් සන්සිදීම මුත් කොලෙස් බිඳවැටීමෙක් නො වන්නේ ය. තවද සම්පොපවාර විසිනුදු නිර්ණය අක්ෂය වුව ද ක්ෂයනාමයෙන් හදුන්වත්.

"රාගො ඛියති අනෙනාති = රාගක්ඛයො, දොසො ඛියති අනෙනාති = දොසක්ඛයො, මොහො ඛියති අනෙනාති මොහක්ඛයො" යන මෙහි **"අනෙන"** යන්නෙන් දක්වුනේ නිවනයි. එහෙයින් නිවන කරණ කොට නිවන ඇසුරු කොට රාග-දෙවෂ-මොහයන්ගේ ක්ෂයභාවය පැහැදිලි ය. නිවන ක්ෂය සි කියන ලද්දේ එහෙයිනි. මෙසේ නො ගෙණ රාගාදි කෙලෙශයන්ගේ ක්ෂයමාත්‍රය නිවනැයි ගැණීම ධම්විරුද්ධ ය. **"යං ආගම්ම රාගාදයො ඛියන්ති තං නිබ්බානං"** = යම්කට පැමිණ රාගාදි කෙලෙශයෝ ක්ෂය වෙත් ද, ඒ නිවනැ සි දන්නේ ය. **"තං පනෙතං රූපිනො ධම්මා අරූපිනො ධම්මාති ආදිසු දුකෙඤ අරූපිනො ධම්මාති සඞ්ගහිතත්තා න කිලෙසමත්තං එව"** ඒ මේ නිවන අභිධම්මාතෘකා චුල්ලන්තර ගොවිඡක දුක මාතෘකා-වෙහි නාම ධම්යක් වශයෙන් සඞ්ග්‍රහ කොට වදුළ බැවින් කෙලෙශ ක්ෂයමාත්‍රය ම නො වේ ය සි දතයුතු ය. **"එකඤ පන චෙතසික සුඛුමරූපනිබ්බානවසෙන එකූනසත්තති ආයතනෙසු ධම්මායතනං, ධාතුසු ධම්මධාතූති සඞ්ඛං ගච්ඡන්ති"** = මෙහි චෙතසික දෙපණස ය, සූක්ෂ්මරූප සොළොස ය, නිර්ණය ය්න එකූන් සැත්තෑ ධම්යන් ධම්යතන, ධම්ධාතුය සි ගිණීමට යන බැවින් නිර්ණය ද ධම්යතන ධම්ධාතුන්ට ඇතුළත්බව මෙයින් කියන ලද්දේ ය. එසේ කියන ලද්දේ නිර්ණය පරමාර්ථධම්ස්වභාවයක්බව දැක්වීමට හා අතීතාදිකාලභෙදය ද වළකාලනු පිණිස ය **"නනු ච ආයතනධාතූසු නිබ්බානං සඞ්ගහිතං? ඛන්ධෙසු සඞ්ගහිතං න සඞ්ගහිතං? ආහ හෙදුභාවෙනාති, අනීතාදිභෙදභින්නානං හි රාසවසෙන ඛන්ධවොහාරොති, නිබ්බානං භෙදුභාවතො ඛන්ධසඞ්ගහතො නිස්සටං විප්පමුත්තනන්ති අත්ථො"** යනු ටීකා ය.

මෙසේ මෙන ම හෙතුවකිනුදු ක්ෂයභාවයක් නො නැගිය හැකි නිවනට ක්ෂයභාවදොෂය නැගීම බුද්ධවචනයට විරුද්ධ වේ. දිනක් වසවත්මරු ආලවක තෙරුන් වෙත පැමිණ "ශ්‍රමණය! ලොකයෙහි නිස්සරණයෙක් නම් නැත, එහෙයින් ඔබගේ විවෙකයෙන් වැඩෙක් නැත, කම්සැප විඳින්නැ"යි කී ය. එවිට උන්-

වහන්සේ "මා විසින් මගනැණින් ප්‍රත්‍යක්ෂ විසින් ඒ නිස්සරණය දක්නා ලදි, එහෙයින් තාගේ උත්සාහයෙන් ප්‍රයොජනයෙක් නො වන්නේ ය, යා" යි වදාළාහු ය.

"අත්ථි භික්ඛවෙ! අජාතං අභූතං අකතං අසඞ්ඛතං, නො චෙතං භික්ඛවෙ! අභවිස්ස අජාතං අභූතං අකතං අසඞ්ඛතං නසිධ ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ, යස්මා ච ඛො භික්ඛවෙ! අත්ථි අජාතං අභූතං අකතං අසඞ්ඛතං, තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සඞ්ඛතස්ස නිස්සරණං පඤ්ඤායති" = මහණෙනි! නිවන නො හටගතු ය. නො පහළ ය. කිසිවකු විසින් නො කරණ ලද ය. කිසිහෙතුවෙකින් සකස් නො කරණලද ය. මහණෙනි! මෙසේ වූ නිවනෙක් නො වන්නේ නම් හට ගත් පහළ වූ හෙතුවෙන් උපන් සංස්කාරධර්මයන්ගේ නිස්සරණයෙක් නො පෙණෙන්නේ ය. මහණෙනි! යම්හෙයකින් නිවන ඇත්තේ ද එහෙයින් සංස්කාරධර්මයන්ගේ නිස්සරණය පෙණෙය" යි වදාළේ ද, නිවනෙහි නගන ක්ෂයදෙෂය වළකාලනු පිණිස ය. ක්ෂයපක්ෂයෙහි ගැණෙන පදාර්ථ විද්‍යමානත්වයෙහිලා ගැණීමට කිසිත් යුක්තියෙක් නැත්තේ ය. නිවන නො පෙරළෙන පරමාර්ථධර්මයෙකි.

අජාත-අභූත අකෘත අසංස්කෘත නිර්මාණය ඇත්තේම ය යි මෙයින් වදාළ සේක. එහි හෙතුප්‍රත්‍යයයන්ගේ සම්වායයෙන් එක්වීමෙන් නො නිපන්නේ **අජාත** නම්. හෙතුප්‍රත්‍යය රහිත ව නො නිපන්නේ **අභූත** නම්. කිසිවකු විසින් නො කරණ ලද්දේ **අකෘත** නම්. හෙතුප්‍රත්‍යයයන් විසින් සකස් නො කරණ ලද්දේ **අසංස්කෘත** නම්.

"තිස්සො ඉමා භික්ඛවෙ! නිස්සරණා ධම්මා, කතමා තිස්සො? කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං, රූපානමෙතං නිස්සරණං යදිදං ආරූප්පං, යං ඛො පන කිඤ්චිභූතං සඞ්ඛතපටිච්චසමුප්පන්නං නිරොධො" = මහණෙනි! නිස්සරණධාතු තුණෙකි, කම්සැප හැරදමා ගෙයින් නික්ම යෑම, අරූපද්ධ්‍යාන ලැබීම, හෙතුප්‍රත්‍යයබලයෙන් හට ගත් සකන්ධයන්ගේ අනුත්පාද නිරොධය යන මේ තුණ ඒ නිස්සරණධාතුය, යනු එහි කෙටි තේරුම ය. මෙ තුණ කාමනිස්සරණ - රූපනිස්සරණ - සඞ්ඛතනිස්සරණ විසින් දතයුතු ය. මෙ ද වදාළේ මෙහිලා ම කරුණු ගැන්වීම සඳහා ය. තව ද ප්‍රථමද්ධ්‍යානය කාමනිස්සරණය යි. ආකාසානඤ්චායතනය රූපනිස්සරණය යි. නිර්මාණය සඞ්ඛතනිස්සරණය යි. යමෙක් ප්‍රථමද්ධ්‍යානය උපදවා ගෙණ එයින්

නො පිරිහුනේ ප්‍රථමධ්‍යානතලයෙහි උපන්නේ නම්, හෙතෙමේ කාම ලොකයෙන් නික්ම ගියේ වේ. යමෙක් ආකාසානඤ්චායතනය උපදවා ගෙණ එයින් නො පිරිහුනේ ප්‍රථමාරූප්‍යතලයෙහි උපන්නේ නම්, හෙතෙමේ රූපලොකයෙන් නික්ම ගියේ වේ. යමෙක් මිගපල නුවණින් නිවන් අවබොධ කෙළේ නම්, හෙතෙමේ සඞ්ඛත පටිච්චසමුප්පන්නලොකයෙන් නික්ම ගියේ වේ.

"අසඞ්ඛතං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අසඞ්ඛතං? යො භික්ඛවෙ! රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අසඞ්ඛතං,

අනනං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අනනං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අනනං,

සච්චං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි,කතමං ච භික්ඛවෙ! සච්චං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! සච්චං,

පාරං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! පාරං? යො භික්ඛවෙ රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! පාරං,

නිපුණං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! නිපුණං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! නිපුණං,

සුදුද්දසං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි,කතමං ච භික්ඛවෙ! සුදුද්දසං? යො භික්ඛවෙ රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! සුදුද්දසං,

අජරං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අජරං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අජරං,

ධුවං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! ධුවං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! ධුවං,

අපලොකිතං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අපලොකිතං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අපලොකිතං,

අනිදස්සනං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අනිදස්සනං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අනිදස්සනං,

නිප්පපඤ්චඤ්ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! නිප්පපඤ්චං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! නිප්පපඤ්චං,

සන්තං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! සන්තං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! සන්තං,

අමතං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අමතං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අමතං,

පණ්තං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! පණ්තං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! පණ්තං,

සිවං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! සිවං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! සිවං,

ඛෙමං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! ඛෙමං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! ඛෙමං,

තණ්හක්ඛයං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමො ච භික්ඛවෙ! තණ්හක්ඛයො? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! තණ්හක්ඛයො,

අච්ඡරියං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අච්ඡරියං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අච්ඡරියං,

අබ්භුතං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අබ්භුතං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අබ්භුතං,

අනීතිකං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අනීතිකං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අනීතිකං,

අනීතිකධම්මං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අනීතිකධම්මං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අනීතිකධම්මං,

නිබ්බානං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! නිබ්බානං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! නිබ්බානං,

අබ්‍යාපජ්ඣං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අබ්‍යාපජ්ඣං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අබ්‍යාපජ්ඣං,

විරාගං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමො ච භික්ඛවෙ! විරාගො, යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! විරාගො,

සුද්ධිං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමා ච භික්ඛවෙ! සුද්ධි? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! සුද්ධි,

මුත්තිං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමා ච භික්ඛවෙ! මුත්ති? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! මුත්ති,

අනාලයං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! අනාලයං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! අනාලයං,

දීපං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමො ච භික්ඛවෙ! දීපො? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ! දීපො,

ලෙණං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! ලෙණං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! ලෙණං,

තාණං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! තාණං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! තාණං,

සරණං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛවෙ! සරණං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! සරණං,

පරායණං ච වො භික්ඛවෙ! දෙසිස්සාමි, කතමං ච භික්ඛ-වෙ! පරායණං? යො භික්ඛවෙ! රාගක්ඛයො-මොහක්ඛයො, ඉදං වුච්චති භික්ඛවෙ! පරායණං"

ප්‍රත්‍යයහෙතුවෙන් නො තිපන් බැවින්, දැ මරණ කෙළවර කරණ බැවින්, පරමාර්ත්‍ථසත්‍ය බැවින්, කවදත් නො පෙරළෙන බැවින්, සසරසයුරෙන් එතෙරකරණ බැවින්, පිළිවෙත් මගින් බැහැර ව අවබොධ නො කටහැකි බැවින්, ඉතා දුකසේ දැක්ක යුතු බැවින්, මොහය මුලිනුපුටාලූ බැවින්, ජරායෙන් නො දැදුරු බැවින්, නො පෙරළෙන සැහැවි ඇති බැවින්, නො නැසෙන සැහැවි ඇති බැවින්, මසැසට හා සාමාන්‍ය දිවැසට නො පෙණෙන බැවින්, රාග දෙස මොහ දිට්ඨි මාන ප්‍රපඤ්චයන් නිරවශෙෂයෙන් ප්‍රහීණ බැවින්, හැමතින් සන්සිඳුනු බැවින්, ඉපදුම් දිරුම් නැසුම් නැති බැවින්, සෑහීමක් නැති බැවින්, සසරබිය දක්නවුන් විසින් සෙවිය යුතුබැවින්, රා ඈ ගිනි නිවෙන බැවින්, තෘෂ්ණාවන්ගේ ක්ෂයහෙතු බැවින්, කළ පිණැත්තන් විසින් දැක්කයුතු බැවින්, විස්මයජනක බැවින්, කෙලෙස් උවදුරු නැති බැවින්, නිදුක් සැහැවි ඇති බැවින්, තෘෂ්ණාවානයෙන් නික්මුණු බැවින්, මුළු-මනින් නිදුක් බැවින්, ඇලීම් රහිත බැවින්, කෙලෙස්මල පිරිසිදු කරණ බැවින්, සසර බැඳුම් මුදලන බැවින්, කෙලෙසුන්ගේ නැවැත්මට ආලය නො වන බැවින්, පරමප්‍රතිෂ්ඨා බැවින්, කෙලෙස් සතුරන් විසින් ලුහුබඳිනවුන්ගේ නිලීයන ස්ථාන බැවින්, සියලු කෙලෙස් උවදුරු වළකාලන බැවින්, සියලු දුක් නසන බැවින් හා සියලු සැපතට පිහිට බැවින්, උත්තම වූ ආර්‍යපුද්ගල-යන් විසින් යායුතු බැවින් යන මේ අරුත් විසින් රාගක්ෂයට කරුණු වූ දෙවෂක්ෂයට කරුණු වූ මොහක්ෂයට කරුණු වූ එක් ම නිර්වාණධාතුව **අසඞ්ඛත-අන්ත-සච්ච-පාර-නිපුණ-සුදුද්දස-මොහක්ඛය-අජර-ධුව-අපලොකිත-අනිදස්සන-නිප්පපඤ්ච-සන්ත-අමත-පණ්ත-සිව-ඛෙම-තණ්හක්ඛය-අච්ඡරිය-අබ්භුත-අනිකික-අනිතිකධම්ම-නිබ්බාන-අබ්‍යාපජ්ඣ-විරාග-සුද්ධි මුත්ති-අනාලය-දිප ලෙණ-තාණ-සරණ-පරායණ** යන නාමප්‍රඥප්තීන් විසින් හඳුන්වනු ලැබේ. මෙයින් ඇතැම් ප්‍රඥප්ති කෙනෙක් නිර්වාණධාතුව කෙරෙහි පැණවුනෝ විනෙයජනාද්ධ්‍යා-සය විසිනි. මොවුහු හැම කෙනෙක් රාගක්ෂයාදියට හෙතු වූ නිර්වාණධාතුව කෙරෙහි ම යටකියූ අරුත් විසින් නැහී සිටියෝ ය.

නිවන ඇසුරු කොට මිලිඳු නාගසෙන දෙදෙන අතර නැගු-නු සංවාදයෙක් ඇත්තේ ය. එ ද මෙහිලා මෙසේ දතයුතු ය.

මිලිඳු = සවාමීනි! නාගසෙන සථවිරයන් වහන්ස! නිවන නිවනැ යි යමක් ගැණ කියහු ද, ඒ නිවනෙහි රූපයක් සටහනක් ප්‍රමාණයක් මොනලෙසකින් හෝ දක්වන්නට හැක්කේ ද?

නාගසෙන = මහරජ! නිවනට සමාන කළ හැක්කෙක් නැත. ඒ අසදිස ය. එහෙයින් එහි රූපයක් සටහනක් වයසක් ප්‍රමාණයක් දක්වන්නට නො හැකි ය. එබන්දෙක් නැත්තේ ය.

මිලිඳු = මම ඔබවහන්සේගේ වචනය නො පිළිගණිමි. නිවනෙහි රූපය සටහන වයස ප්‍රමාණය පිළිබඳ යම්කිසි ක්‍රමයෙකින් පැණවීමෙක් ඇත්තේ ද? මට එය කියනු මැනැවි.

නාගසෙන = මහරජ! වේවා, ඔබට එය කාරණයෙකින් හඟවන්නෙමි. මහරජ! මහමුහුදෙක් ඇත්තේ ද?

මිලිඳු = එසේය; සවාමීනි! මහමුහුදෙක් ඇත්තේ ය.

නාගසෙන = මහරජ! කිසිවකු මහමුහුදෙහි ජලය කො පමණ ද? එහි වසන මස් කැසුබු ආදි සත්ත්වයෝ කොතෙක් දැ'යි ඔබගෙන් ඇසූ විට ඔහුට කුමක් කියහු ද?

මිලිඳු = සවාමීනි! යමෙක් මාගෙන් මෙසේ ඇසූයේ නම් ඔහුට නෝ මාගෙන් නො ඇසිය යුත්තක් අසන්නෙහි ය. මේ ප්‍රශනය ඇසිය යුත්තෙක් නො වේ. මෙය ඨපනීය ප්‍රශනයෙකි. ලොකතත්ත්වය විභාග කළවුන් විසින් මහමුහුද, ජල-සත්ත්ව විසින් නො බෙදන ලද්දේ ය. මහමුහුදෙහි ජලය හෝ එහි වසන සත්ත්වයන් මෙතෙකැ'යි මනින්ට හෝ ගණින්නට හෝ නො හැකිය' යි මම කියන්නෙමි.

නාගසෙන = මහරජ! කුමක්හෙයින් ඇසට පෙණෙන මහමුහුදෙහිලා මෙසේ කියහු ද? එහි ජලය මැන, එහි වසන සතුන් ගැණ බලා මෙපමණ දියකඳ වෙයි, මෙපමණ සත්ත්වයෝ වෙසෙත් යි ඔහුට කියයුතු නො වේ ද?

මිලිඳු = සවාමීනි! එය එසේ නො කළ හැකි ය. මේ ප්‍රශනය මට විෂය නො වේ.

නාගසෙන = මහරජ! මහමුහුදෙහි ජලය මනින්නට එහි වසන සතුන් ගණින්නට නො හැක්කා සේ සත්පදාර්ථ වූ නිවනෙහි රූපයක් සටහනක් වයසක් ප්‍රමාණයක් උපමාවක් දක්වා මොනම හෙතුවකිනුදු දක්වා ලන්නට නො හැකි ම ය. වේතොවශීප්‍රාප්ත වූ සෘද්ධි ඇතියෙක් මහමුහුදෙහි ජලයත් එහි වසන සතුනුත් මනින්නට ගණින්නට සමර්ථ වන්නේ ද? හේ නිවනෙහි රූපයක් සටහනක් වයසක් ප්‍රමාණයක් කොයිලෙසකිනුදු කියන්නට නම් අසමර්ථ ය. එහිලා තව කරුණක් කියන්නෙමි. අරූතලයෙහි අරූප කායිකා නම් දෙවිකෙනෙක් ඇත. මහරජ! ඔවුන් ගැණ දන්නහු ද?

මිලිඳු = ස්වාමීනි! දන්නෙමි. අසනු ලැබේ. අරූපකායිකා නම් දෙවිකෙනෙක් ඇත.

නාගසෙන = මහරජ! ඒ දෙවියන්ගේ රූපයක් සටහනක් වයසක් ප්‍රමාණයක් දැක්විය හැකි ද?

මිලිඳු = නො හැකිය ස්වාමීනි!

නාගසෙන = හොඳයි, එසේ නම් ඒ දෙවියෝ නො වෙත් ද?

මිලිඳු = දෙවියෝ වෙත්. එහෙත් ඔවුන්ගේ රූපයක් සටහනක් වයසක් ප්‍රමාණයක් දක්වන්නට නො හැකි ය.

නාගසෙන = ඇත්තා වූ දෙවියන් ගැණ එසේ නො කිය හැකි නම් ස්වභාවයෙන් ම විද්‍යමාන වූ නිවනෙහි ද ඒ කිසිවක් දැක්විය නො හැකි ය.

මිලිඳු = ස්වාමීනි! නිවන එකාන්ත සැප ඇත්තෙක් වේවා. එසේම එහි රූපාදිය ගැණත් කිසිවක් නො කිය හැකි ය. ස්වාමීනි! අනෙකෙකු විසින් නො දක්නා ලද උපමා දර්ශනමාත්‍රය වූ යම්කිසි ගුණයෙක් එහි තිබේ ද?

නාගසෙන = මහරජ! ස්වරූපවශයෙන් නිවනෙහි රූපයෙක් නැත. ගුණවශයෙන් නම් එහිලා යමක් කිය හැකි ය.

මිලිඳු = හොඳයි, ස්වාමීනි! ඒ වදරණු මැනැවි.

නාගසෙන = **පියුම** පිපී තිබේ දිය හා නොඇලේ ද, එසේ නිවන ද රාගාදිකෙලෙශයන් හා නොඇලුනේ ය.

ජලය සිහිල් ගුණ ඇත්තේ ශරීරදුහය නිවාලන්නා සේ නිවන ද සිහිල් ගුණ ඇත්තේ කෙලෙස් දුහය නිවාලන්නේ ය.

ජලය විඛාපත් වූ ග්‍රීෂ්මයෙන් තැවුනු සියලු සත්ත්වයන්ගේ පිපාසය දුරු කරන්නා සේ නිවන ද කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා යන තෙවැදෑරුම් වූ තෘෂ්ණාපිපාසය දුරලන්නේ ය.

බෙහෙත යම් සේ රොගොපද්‍රවයන්ගෙන් පීඩිත වූ සත්ත්වයන්ට පිහිට වේ ද, එසේ නිවන රාගාදිකෙලෙශොපද්‍රවයන්ගෙන් පීඩිත වූ සත්ත්වයන්ට පිහිට වන්නේ ය.

බෙහෙත යම් සේ සියලු රොග සන්සිඳුවා කෙළවර කරන්නේ ද, එසේ නිවන සියලු සසරදුක් කෙළවර කරන්නේ ය.

බෙහෙත අමාගුණ ඇත්තා සේ නිවන අජරාමෘතගුණ ඇත්තේය.

මහාමුහුද යම් සේ සියලු සත්ත්ව කුණපයන් ගොඩලා බැහැර කොට සිටින්නේ ද, එසේ නිවන සියලු කෙලෙස්කුණප හැර සිටියේ ය.

මහාමුහුද එතෙර මෙතෙර නැත්තේ මොන ම ගඟදියෙකිනුත් නොපිරවිය හැක්කේ නොද පිරෙන්නේ ය. එසේ නිවන ද එතෙර මෙතෙර නැත්තේ සත්ත්වයන්ගෙන් නොපිරවිය හැක්කේ නොද පිරෙන්නේ ය.

මහාමුහුද තිමිඟලාදි මහාසත්ත්වයන්ට ආවාස වූයේ ද, එසේ නිවන ද ශාරීපුත්‍රාදිකෂීණාශ්‍රවයන් වහන්සේට ආවාස වූයේ ය.

මහාමුහුද පමණ නොකටහැකි නන්වැදෑරුම් රළ කුසුම්න් ගැවසී ගත්තේ ද එසේ නිවන අපරිමිත විවිධවිපුල පරිශුද්ධ විමුක්තිපුෂ්පයෙන් ගැවසී ගත්තේ ය.

භොජනය යම්සේ සියලු සත්ත්වයන්ගේ ආයුෂය දරන්නේ ද, එසේ නිවන තමා සාක්ෂාත් කළවුන්ගේ ජරාමරණ නැසීම් වශයෙන් ආයුෂය දරන්නේ ය.

භොජනය යම්සේ සියලු සත්ත්වයන්ගේ බල වඩන්නේ ද, එසේ නිවන තමා සාක්ෂාත් කළවුන්ගේ අනෙකවිධ සෘද්ධිබල වඩන්නේ ය.

භොජනය යම්සේ සියලු සත්ත්වයන්ගේ ශරීර වර්ණය උපදවන්නේ ද, එසේ නිවන තමා සාක්ෂාත් කළවුන්ගේ ගුණවැණුම් උපද වන්නේ ය.

භොජනය යම්සේ සියලු සත්ත්වයන්ගේ දරථය ව්‍යපශමනය කරන්නේ ද, එසේ නිවන තමා සාක්ෂාත් කළවුන්ගේ සකලක්ලෙශදරථය ව්‍යප ශමනය කරන්නේ ය.

භොජනය යම්සේ සියලු සත්ත්වයන්ගේ ක්ෂුධා දුර්ලත්වය නසාලන්නේ ද, එසේ නිවන තමා සාක්ෂාත් කළවුන්ගේ සර්වදුඃඛක්ෂුධාදුර්ලත්වය නසා ලන්නේ ය.

අහස නො හට ගණියි. නො දිරයි. නො මැරෙයි. නො චුත වෙයි. මතු නො උපදියි. මැඩලිය නො හැකි ය. සොරුන්ට ගත නො හැකි ය. කිසිවක ඇසුරෙක් නැත. පක්ෂීන්ගේ හැසිරීම් ඇත්තේ ය. ආවරණ රහිත ය. කෙළවරක් නැත්තේ ය. එමෙන් නිවන නො හට ගණියි. නො දිරයි. නො මැරෙයි. නො චුත වෙයි. මතු නො උපදියි. මැඩලිය නො හැකි ය. සොරුන්ට ගත නො හැකි ය. කිසිවක ඇසුරෙක් නැත්තේ ය. ආර්‍යයන්ගේ හැසිරීම් ඇත්තේ ය. ආවරණ රහිත ය. කෙළවරෙක් නැත.

මිණ්රුවන කැමැති දෑ දෙන්නා සේ නිවන කැමැති දෑ දෙන්නේ ය.

මිණ්රුවන ප්‍රීතිජනනය කරන්නා සේ නිවන ප්‍රීතිජනනය කරන්නේ ය.

මිණ්රුවන බැබලීමෙන් අර්ථසිද්ධිය කරන්නා සේ නිවන බැබලීමෙන් අර්ථසිද්ධිය කරන්නේ ය.

රත්සඳුන ලැබිය නොහැක්කේ යම්සේ ද, එසේ නිවන ද ලැබිය නොහැකි ය.

රත්සඳුන අන්‍ය වූ සුගන්ධ ද්‍රව්‍යයන් හා සම නොකට හැක්කේ යම්සේ ද, එසේ නිවන ද අන්‍ය වූ ගුණසුගන්ධයන් හා සම නොකට හැක්කේ ය.

රත්සඳුන සජ්ජනයන් විසින් ප්‍රශස්ත වූයේ යම්සේ ද, එසේ නිවන ද සජ්ජනයන් විසින් ප්‍රශස්ත වූයේ ය.

ගිතෙල්මණ්ඩය වණ්ණසම්පන්න ය. සුගන්ධවත් ය. රසවත් ය. එ පරිද්දෙන් නිවන ද ගුණවණ්ණයෙන් වණ්ණවත් ය. ශීලසුගන්ධයෙන් සුගන්ධවත් ය. විමුක්ති රසයෙන් රසවත් ය.

මහමෙර ඉතා උස් ය. අචල ය. නැගීම දුෂ්කර ය. බීජජාතීන්ගේ හටගැණීම් රහිත ය. අනුනය ප්‍රතිඝයෙන් මිදුණේ ය. එ මෙන් නිවන ද තුන්ලෝ ඉක්මවා ඉතා උස් ව සිටියේ ය. අචල ව සිටියේ ය. කෙලෙසුන්ට නැගීම දුෂ්කර ය. කෙලෙසයන්ගේ හට ගැණීමෙක් නැත්තේ ය. අනුනයප්‍රතිඝයෙන් මිදුනේ ය.

මිලිඳු = සවාමීනි! ඔබවහන්සේ නිවන අතීත වූයේත් අනාගත වූයේත් වර්තමාන වූයේත් උපන්නේත් නූපන්නේත් ඉපදිය යුත්තේත් නොවේ ය යි වදාරණ සේක. සවාමීනි! මෙහි යම්කිසිවෙක් මැනැවින් පිළිපදිමින් නිවන ප්‍රත්‍යක්ෂ කරණුයේ ඉපද තුබූ නිවනක් ප්‍රත්‍යක්ෂ කෙරේ ද? නැත, උපදවා ගෙණ ප්‍රත්‍යක්ෂ කෙරේදැ යි වදාරණු මැනැවි.

නාගසෙන = මහරජ! මැනැවින් පිළිපදින්නෙක් උපන් නිවනක් ප්‍රත්‍යක්ෂ නොකෙරෙයි. උපදවා ගෙණත් ප්‍රත්‍යක්ෂ නොකෙරෙයි. එහෙත් මැනැවින් පිළිපදින්නෙක් යම් නිවනක් ප්‍රත්‍යක්ෂ කෙරේ ද, ඒ මේ නිර්‍වාණ ධාතුව ඇත්තේ ම ය.

මිලිඳු = සවාමීනි! ඔබවහන්සේ විසින් ආලය ඇති ව උත්සාහ ඇති ව යම් ධර්මයෙක් උගන්නා ලද ද, ඒ සියල්ල මේ ප්‍රශ්නයෙහි බහාලුව මැනැවි. මෙහිලා ලෝකීය

ජන තෙමේ සම්මූඪ ව සිටුනේ ය. හටගත් විමති ඇත්තේ ය. සැකයට වැටුනේ ය. මෙහිලා මම ද සම්මූඪ යෙමි. එහෙයින් මාතුළ උපන් සැකය බිඳ හරිණු මැනැවි.

නාගසෙන = මහරජ! ශාන්තසුඛප්‍රණීත වූ නිර්‍වාණධාතුව ඇත්තේ ම ය. මොනවට පිළිපන්නෙක් බුදුරජුන්ගේ අනුශාසනා පරිදි සකලසංස්කාර ධර්‍මයන් මෙනෙහි කරණුයේ ඒ නිර්‍වාණධාතුව ප්‍රත්‍යක්ෂ කෙරෙයි. මහරජ! අතැවැසි තෙමේ ගුරුන්ගේ අනුශාසනා පරිදි විද්‍යාවිශෙෂයන් උගන්නා සේ මොනවට පිළිවෙත් පුරණුයේ බුද්ධානුශාසනා පරිදි නිර්‍වාණය නුවණින් ප්‍රත්‍යක්ෂ කරන්නේ ය.

මිලිඳු = ස්වාමිනි! නිවන කෙසේ දැක්ක යුතු ද?

නාගසෙන = මහරජ! අනීතික විසින්, නිරුපද්‍රව විසින්, අභය විසින්, ඛෙම විසින්, සන්ත විසින්, සුඛ විසින්, ශාන්ත විසින්, ප්‍රණීත විසින්, සුචි විසින්, සීතල විසින්, දැක්ක යුතු ය. මහරජ! බොහෝ දරකෝවු රැසක් නිසා ඇවිළ ගත්තා වූ ගින්නෙන් දැවෙනපුරුෂයෙක් මහත් වූ උත්සාහයෙන් එයින් මිදී ගිනි නැති එලි මහනකට ගොස් මහත් අස්වැසුමක් ලබන්නේ යම්සේ ද, එසේ මොනවට පිළිපන්නේ යොනිසොමනසිකාරයෙන් පහ කළ රාගාදීවූ කෙලෙස් ගිනි තැවිලි ඇති පරම සැපය වූ නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ ය.

මහරජ! රාගාදී වූ ත්‍රිවිධාග්නිය ඒ පුරුෂයා වැළඳ ගත් ගින්න සේ ද, මොනවට පිළිපන් පුරුෂයා ගින්නට හසු වූ පුරුෂයා සේ ද, නිවන ගිනි නැති එලිමහන සේ ද දතයුතු ය.

මහරජ! යම්සේ නසි බලු මිනිස් ඇ කුණප යෙන් හා මලමූත්‍රාසින් දූවවුනු පුරුෂයෙක්, එසේ ම නොයෙක් කුණපයෙන් අවුල් වූ තැනකට පැමිණියේ මහත් වූ උත්සාහයෙන් එ තැන හැර කුණප රහිත වූ එලිමහනකට පිවිස අස්වැසුම් ලබා ද, එසේ යමෙක් මොනවට පිළිපදිමින් යොනිසොමනසිකාරයෙන් පහ කළ කෙලෙස් කුණප ඇත්තේ පරමසුඛ ප්‍රණීත වූ නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ ය.

මහරජ! නන්වැදෑරුම් වූ කුණපකොට්ඨාසයෝ යම්සේ ද, රූපශබ්දගන්ධාදි පඤ්චකාමයෝ ද එසේ ය. කුණපයට හසු වූ පුරුෂයා යම්සේ ද, මනා කොට පිළිපන් යොගාවචරයා එසේ ය. අමාමහානිවන කුණප නැති සිත්කලු වූ එලිමහන සේ දතයුතු යි.

මහරජ! බියට පත් තැනි ගත් වෙව්ලන පෙරළෙන භ්‍රාන්ත සිත් ඇති පුරුෂයෙක් මහත් ව්‍යායාමයෙන් එයින් මිදී අභයස්ථානයකට පිවිස, සැනසුම් ලබන්නේ යම්සේ ද, එසේ යමෙක් මොනවට පිළිපදිමින් යොනිසෝ මනස්කාරයෙන් පහ වූ බියතැනි ගැණුම් ඇති නිවන් සෑප සිඳ කර ගන්නේ ය.

මහරජ! ජාති ජරා ව්‍යාධි මරණ නිසා පුන පුනා උපදනා බිය, සතුරන් විසින් වටකර ගත් භයස්ථානය වැනි ය. බියෙන් තැති ගත් පුරුෂ මොනවට පිළිපන් යොගාවචරයා වැනි ය. නිර්භය ස්ථානය අමාමහානිවන වැනි කොට දතයුතු ය.

මහරජ! කිලිටිමඩවගුරෙක වැටුනු පුරුෂයෙක් මහත් උත්සාහයෙන් ඒ කිලිටිමඬින් නැගී එය සෝදාහැර පිරිසිදු තැනකට ගොස් සැනසුම් ලබන්නේ යම්සේ ද, එසේ පිළිවෙත්හි ඇලුනු යොගාවචර තෙමේ පහවගිය කෙලෙස්මඬ ඇති නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ ය.

මහරජ! ලාභසත්කාරසතුතිප්‍රශංසා, කිලිටිමඬ වැනි ය. යොගාවචර තෙමේ මඬමතුයෙහි වැටුනු පුරුෂයා වැනිය. අමාමහානිවන මඬ රහිත වූ පිරිසිදු ස්ථානය වැනි ය.

මිලිඳු = ස්වාමීනි! මොනවට පිළිපන් යොගාවචර තෙමේ නිවන කුමක් කොට ප්‍රත්‍යක්ෂ කරන්නේ ද?

නාගසෙන = මහරජ! මනා කොට පිළිවෙත් රකින යොගාවචරයා සියලු සංස්කාරධර්මයන්ගේ පැවැත්ම සම්මර්ශනය කරන්නේ ඔවුන්ගේ හට ගැන්ම - දිරීම - පෙළීම - මැරීම දකියි. භවයොනි ගත්වා සත්ත්වාවාසාදිභෙද ගත වූ සකල සංඛ්‍යයන්ගේ. කිසිම මිහිරක් නොදකියි. එහි මූල මැද අග යන කිසි තැනකත් නිත්‍ය ය, සැපය, යි ගත යුතු කිසිවක් නොදකියි.

මහරජ! දවස මුළුල්ලෙහි ගිනියම් කළ ගිනිදැල් සහිත වූ යගුලෙහි මුල මැද අග කිසි තැනක අතින් ගත යුතු තැනක් යම්සේ නො දකිසි ද, මහරජ! එසේ සංඝකාරධර්මියන්ගේ පැවැත්ම සමමශීනය කරන්නේ එහි හට ගැණීම-දිරීම-පෙළීම්-මැරීම දකිසි. කිසි මිහිරක් නො දකිසි. මුල-මැද-අග කිසි තැනක නිත්‍ය ය, සැප ය, යි ගත යුතු කිසිවක් නො දකිසි. එසේ නො දක්නාවූ ඔහුගේ සිත්හි සසර කළකිරීම පහළ වන්නේ ය. සිරුරෙහි ඛහ නැගෙන්නේ ය. රැකුම් නැති පිහිට නැති අනාථ වූ හෙතෙමේ භවත්‍රයයෙහි කළකිරෙන්නේ ය. මහරජ! පුරුෂයෙක් තෙමේ දැල්වෙන ගිනිදැල් ඇති මහත් ගිනි රැසක් කරා පැමිණියේ එහි රැකුම් බැලුම් නැත්තේ අනාථ වූයේ කළකිරෙන්නේ යම්සේ නම්, මේ යොගාවචර තෙමේ ද එ පරිද්දෙන් සසර කළකිරෙන්නේ ය. තව ද ඔහු දැලෙහි බැඳුණු මසකු සේ සප්මූවපත් මැඩියකු සේ මැදිරියක ලූ වනපක්ෂියකු සේ ගරැඩිමුවපත් නයකු සේ රාහුමුවපත් සඳු සේ සංඝකාරයන් කෙරෙන් තැති ගත්තේ වේ. සංඝකාරයන්ගේ පැවැත්මෙහි මෙසේ බිය දක්නා සුලු ඔහුට මෙබදු සිතෙක් උපදියි. "මේ ජාතියෙහි පැවැත්ම රාගාදිගිනිවලින් රත් ව ගියේ ය, රාගාදි ගිනිවලින් ඇවිළ ගත්තේ ය, එලොව මෙලොව දෙක්හි විඳිය යුතු වූ බොහෝ දුක් ඇත්තේ ය, දැඩි සිත් තැවුලි ඇත්තේ ය, ඉදින් කිසිවෙක් ජාතියෙහි නො පැවැත්ම ලැබූයේ නම්, හේ ම නිවුනේ ය, හේ ම දුකින් මිදුනේ ය, හේ ම සිත් තැවුලි නැත්තේ ය, හේ ම සසර බැඳුම් බින්දේ ය, ජාතියේ නො පැවැත්ම නම්:- සියලු සංඝකාරධර්මියන්ගේ සන්සිඳීම ය, සියලු උපධීන්ගේ දුරුකිරීම ය, තෘෂ්ණාව නැසීම ය, සංඝකාරයන් කෙරෙහි නො ඇලීම ය, මාගීයෙන් අනුත්පාදනිරෝධයට පැමිණීම ය, තෘෂ්ණාවෙන් වෙන්වීම ය, නිවීම ය" යි. මෙසේ සිතන් සිතන් ඔහුගේ සිත "මා විසින් භවනිස්සරණය ලදැ" යි ජාතිය පිළිබඳ නො පැවැත්මෙහි වැටෙයි. එහි තුටු වෙයි. පහදියි. මෙසේ සංඝකාරප්‍රවෘත්තියෙහි බිය දක්නා වූ ඔහුගේ සිත සංඝකාරයන්ගේ ඒ අප්‍රවෘත්තියෙහි ම නැවැත

නැවැත තුටු වෙයි. පහදියි. තව තවත් ඉදිරියට යෙයි. නිස්සරණය පිණිස ව්‍යායාම කරයි. සිහිය පිහිටුවයි. මෙසේ නැවැත නැවැතත් සිත්හි කරන්නා වූ සංස්කාරයන්ගේ අප්‍රවෘත්තිය පිණිස වැර වඩන්නා වූ හෙතෙමේ ආයතිමාගීඥනය ලබා සංඃසාරප්‍රවෘත්තිය ඉක්මවා ගොස් සංස්කාරයන්ගේ අප්‍රවෘත්ති නම් ලද රහත් පලයට පැමිණෙන්නේ ය.

මිලිඳු = මැනැවි. මැනැවි. පින්වතුන් වහන්ස! ඉතා මැනැවි. මම ඔබවහන්සේගේ වචනය අදහමි. නිවන නිවනැ යි ඔබ කියූ නිවන ඇත්තේ ම ය, යි පිළිගතයුතු ද? ස්වාමීනි! පෙරදිග දකුණුදිග පැසුළුදිග-උතුරුදිග-උඩ-යට-සරස යන කොතැනක නිවන පිහිටියේ ද? නිවන පිහිටි ප්‍රදෙශයෙක් තිබේ ද?

නාගසෙන = මහරජ! පෙරදිග හෝ දකුණුදිග හෝ පැසුළුදිග හෝ උතුරුදිග හෝ උඩ හෝ අහසෙහි හෝ පොළොව යට හෝ සරස හෝ අනත් ලෝදුනි කොතැනක හෝ නිවන පිහිටි තැනෙක් නැත්තේ ය.

මිලිඳු = ස්වාමීනි! නිවන පිහිටි තැනෙක් නැත්තේ නම්, එයින් ම නිවනෙක් නැත්තේ ය, යන නිශ්චයට බැස ගන්නට සිදු වන්නේ ය. දෙවි මිනිස් කෙනකුන් විසින් නිවන ප්‍රත්‍යක්ෂ කරණ ලද්ද යි කියන ලද්දේ නම්, එය කෙසේ පිළිගත හැකි ද? ඔබවහන්සේට කාරණයක් කියන්නට කැමැත්තෙමි. ස්වාමීනි! ධාන්‍ය හට ගන්නේ කෙත්හි ය. සුවඳ හට ගන්නේ මල්හි ය. මල් පල හට ගන්නේ රුක්හි ය. රුවන් හට ගන්නේ ආකරයන්හි ය. මේ කියූ දය ලබන්නට කැමැත්තහු ඒ ඒ තැන්හි යා යුතු ය. ස්වාමීනි! එපරිද්දෙන් නිවනෙක් ඇත්තේ නම්, ඒ නිවන නැගෙන්නා වූ තැනකුත් තිබිය යුතු ය. යම් හෙයකින් නිවන හට ගන්නා වූ තැනෙක් නො වේ නම්, එහෙයින් ම නිවනෙක් නැතැ, යි කියයුතු ය. දෙවි මිනිස් කෙනකුන් විසින් නිවන ප්‍රත්‍යක්ෂ කරණ ලද්ද, යි කියන්නේ නම්, එ ද බොරු ය.

නාගසෙන = මහරජ! නිවන පිහිටි තැනෙක් නැත. එහෙත් නිවන ඇත්තේ ය. මනා කොට පිළිවෙත් පිරූ යොගවරයා යොනිසො මනසකාරයෙන් නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ ය. මහරජ! ලොකයෙහි ගින්න තිබේ. එහෙත් තිබෙන තැනෙක් නැත. දර කඩ දෙකක් එකට ගැටූ කල්හි ගින්න උපදනේ ය. එ පරිද්දෙන් මහරජ! නිවන තිබේ. එහෙත් පිහිටි තැනෙක් නැත්තේ ය. මහරජ! සක්විති රජහට සප්තාවිධරත්නයෙක් ඇත්තේ ය. එහෙත් එය පිහිටි තැනෙක් නැත. දසවැදෑරුම් සක්විතිවත් පිරීමෙන් මනා කොට පිළිපන්නහු වෙතට ප්‍රතිපත්තිබලයෙන් ඒ ලභා වන්නේ ය. එ පරිද්දෙන් නිවන ඇත්තේ ය. එහෙත් නිවන පිහිටි තැනෙක් නැත. මනා කොට පිළිපන් යොගාවචරයාහට ප්‍රතිපත්තිබලයෙන් ඒ ලැබෙන්නේ ය.

මිලිඳු = ස්වාමීනි! නිවන පිහිටි තැනෙක් නො වේවා! ඒ සැබෑව, යොගාවචරයා යම් තැනක සිට නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ නම්, එබඳු තැනෙක් තිබේ ද?

නාගසෙන = එසේය; මහරජ! යොගාවචරයා යම් තැනක සිට නිවන ප්‍රත්‍යක්ෂ කෙරේ නම්, එබඳු තැනෙක් ඇත.

මිලිඳු = ස්වාමීනි! එ තැන කවරේ ද?

නාගසෙන = මහරජ! ශීලය ඒ ස්ථානය යි. ශීලයෙහි පිහිටි යොගාවචරයා නුවණින් සිත්හි කරණුයේ කො තැනක හෝ සිටියේ මනා කොට පිළිපදිනුයේ නිවන ප්‍රත්‍යක්ෂ කරන්නේ ය. මහරජ! ඇස් ඇති පුරුෂයා කො තැනක සිටියේ ද අහස දකියි. මහරජ! එ පරිද්දෙන් ශීලයෙහි පිහිටියේ නුවණින් සලකනුයේ මනා කොට පිළිපදිනුයේ නිවන දකින්නේ ය. මහරජ! යම් තැනෙක සිටි ඒ පුරුෂයාහට පෙරදිග ඇද්ද, එ පරිද්දෙන් ශීලයෙහි පිහිටි නුවණ සිත්හි කරන්නා වූ යම් තැනක සිට පිළිවෙත් පුරන්නා වූ යොගාවචරයාහට නිවන ප්‍රත්‍යක්ෂ වන්නේ ය.

මිලිඳු = සාධු! සාධු! ආචාර්‍යපාදයන් වහන්ස! නොයෙක් මිහිරි විසිතුරු උපමා ගෙණහැර දක්වීමෙන් ඔබ වහන්සේ විසින් නිවන දෙසන ලද්දේ ය. සාක්ෂාත්

කරණයත් දෙසන ලද්දේ ය. ශීලානිශංසයත් දෙසන ලද්දේ ය. සම්‍යක් ප්‍රතිපත්තියත් දක්වන ලද්දේ ය. සමීදෘෂ්ටිමථනයෙන් විජයධවජසඞ්ඛ්‍යාත සඳ්ධර්මධ්වජයත් නගන ලද්දේ ය. දෘෂ්ටිගතයකු විසින් පත් දහස් වස් සොලවාලන්නට නො හැකි සේ ධර්මවිනය සථිර කොට තබන ලද්දේ ය. නිවන් සොයන්නවුන්ගේ සම්‍යක් ප්‍රයොගය සිස් නො වන්නේ ය. සඵල වන්නේ ය. නිවන ක්‍ෂය ධර්මයෙක් නො වේ. මාගේ පින්වත් ආචාර්‍යපාදයන් වහන්සේගේ මේ ප්‍රශන ව්‍යාකරණය මම එසේ ම පිළිගන්නෙමි.

මෙතෙකින් මේ සංවාදය නිමාවට ගියේ ය. නාගසෙන මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ මේ ව්‍යාකරණයෙන් පිණා ගිය වූ මිලිඳු මහාරජ තෙමේ දෙහොත් මුදුන් දී සාධු කාර දුන්නේ ය.

මෙහි කියූ ආගමයුක්තීන්ගි පිහිටා බලන කල්හි මාගීඵලයන්ට අරමුණු වූ උත්පාද-ස්ථිති-භඞ්ග හෙවත් ජරා මරණාදී වූ හැම දුකින් වෙන්ව සිටි බැවින් මූළමනින් නිදුක් වූ විකාරස්වභාවයකට නො පැමිණෙන බැවින් අරූප වූ ආර්‍යයනට ප්‍රත්‍යක්‍ෂ සිද්ධ වූ කල්‍යාණ පෘථග්ජනයනට අනුමාන සිද්ධ වූ අඞ්ගබාලයනට කෙසේත් නො දත හැකි වූ අසවල් දිශායෙහි අසවල් පෙදෙසෙහි පිහිටියේ ය යි නො කිය හැකි බැවින් නිෂ්ප්‍රපඤ්ච වූ අශූන්‍ය වූ සථිර වූ ආලොකයක් බඳු වූ සියලු දුක් මුලිනුපුටා ලැබිය යුතු වූ කෙලෙශ විමුක්ත වූ ධ්‍රුව ශුභ සුඛ යුක්ත වූ ඒ මේ සත්පදාර්‍ථය නිවනැ, යි දතයුතු ය.

ශීලවිසුද්ධියෙන්, දිට්ඨිවිසුද්ධියෙන්, කඞ්ඛාවිතරණවිසුද්ධියෙන්, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධියෙන්, බාහ්‍යාර්ථාත්ම්කවස්තූන් පිරිසිදු කළ යොගීහු විසින් නැවැත අනුලොමඥානය ලබනු කැමැති ව උදයව්‍යයඥානය ආදි කොට ඇති අෂ්ටවිධඥානයෙහි භාවනා කිරීම් වශයෙන් යොග කටයුතු ය. උදයව්‍යයානුදර්‍ශනඥානය-භඞ්ගානුදර්‍ශනඥානය - භයතූපස්ථානඥානය - ආදීනවානුදර්‍ශනඥානය - නිර්විදානුදර්‍ශනඥානය-මුඤ්චිතුකම්‍යතාඥානය - ප්‍රතිසඞ්ඛ්‍යානුදර්‍ශනඥානය-සංස්කාරොපෙක්‍ෂාඥානය යන මේ අෂ්ටවිධඥාන ය. විවර්‍තනාඥානය පිණිස මෙහි දශමතරඞ්ගයෙහි දැසවන වස්තුවෙහි **"සම්පන්නවිජ්‍යාචරණා"** යන්නට කළ පරිකර්‍මය බලනු.

සංස්කාරොපෙක්‍ෂාඥානය ඇසුරු කිරීම වැඩීම ඇති යොගාවචරයා පිළිබඳ අධිමොක්‍ෂසඞ්ඛ්‍යාතශ්‍රද්ධාව අතිශයින් බලවත් වේ. වීර්‍යය ඉතා දැඩි වේ. සිහිය එළඹ සිටියි. සිත සමාහිත වේ.

අනුලොමඥානයාගේ පැවැත්මට හෙතු වන්නට සමර්ථ බැවින් අතිශයින් තීක්ෂණ ව සංස්කාරොපෙක්ෂාව උපදනේ ය. මේ යොගී හට දැන් දැන් මාර්ගය උපදී ය යි කියයුතු කාලයෙහි ත්‍රෛභූමක-සංස්කාරයන්හි එල්බ ගෙණ අනිත්‍ය ය, යි හෝ දුඃඛ ය, යි හෝ අනාත්ම ය, යි හෝ සම්මර්ශනය කොට සිත භවාඞ්ගයට බස්නේ ය. අනතුරු ව සංස්කාරොපෙක්ෂාව අනිත්‍යාදී විසින් අරමුණු කළ සේ ම සංස්කාරයන් අනිත්‍ය ය, යි හෝ දුඃඛ ය, යි හෝ අනාත්ම-ය, යි හෝ අරමුණු කරමින් මනොද්වාරාවර්ජනය උපදනේ ය. භවාඞ්ගය පෙරළා උපන් ඒ ක්‍රියාසිතට අනතුරු ව අතර නැති ව චිත්තසන්තතිය නිරන්තර කොට පවත්වමින් පෙර සේ ම අනි-ත්‍යාදී විසින් සංස්කාරයන් අරමුණු කොට ප්‍රථම ජවනචිත්තය උපදී. එය පරිකර්මය, යි කියනු ලැබේ. නැවැත එසේ ම සංස්කාර-යන් අරමුණු කොට උපචාර ය, යි කියනු ලබන දෙවන ජවන් සිත උපදි යි. එයට අනතුරු ව එසේ ම සංස්කාරයන් අරමුණු කොට අනුලොම ය, යි කියන තෙවන ජවන් සිත උපදි.

මේ අනුලොමඥානය වනාහි සංස්කාරයන් අරමුණු කොට සිටි ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවෙහි අවසානය වේ. මුළුමනින් ගො-ත්‍රභූඥානය ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාවගේ පරියොසානය යි.

මෙසේ උපන් අනුලොමඥානය ඇති යොගීහුගේ ඒ පරි-කර්ම-උපචාර-අනුලොමසඞ්ඛ්‍යාතඅනුලොමඥාන තුනින් තමාගේ බලයට සුදුසු පරිදි ඉතා මහත් වූ සත්‍යය වසා සිටි මොහාන්ධ-කාරය නසාලූ කල්හි කිසි ද සංස්කාරයක සිත නො පිහිටන්-නේ ය. නො ඇලෙන්නේ ය. පියුම් පතෙක හුනු දියබිඳක් සේ හැකිළෙන්නේ ය. පෙරළෙන්නේ ය. සියලු නිමිත්තාලම්බනයෝ සියලු විපාකප්‍රවෘත්තිආලම්බනයෝ පළිබොධ විසින් වැටහෙත්. එසේ වැටහුනු කල්හි අනුලොමඥානයාගේ ආසෙවනයෙහි කෙළ-වර සංස්කාරනිමිත්තරහිත වූ සංස්කාරප්‍රවෘත්තිරහිත වූ සංස්කාර-යන්ගෙන් වෙන් ව සිටි සංස්කාරයන්ගේ නිරොධය වූ නිර්වා-ණය අරමුණු කරමින් පෘථග්ජනගොත්‍රය ඉක්මවමින් ආර්‍ය්‍ය ගොත්‍රයට බසිමින් නිවන් අරමුණෙහි ප්‍රථමාවර්තනය වූ මාර්ග-චිත්තයට අනන්තර-සමනන්තරාදී වශයෙන් සයයුරෙකින් අත දෙමින් විදර්ශනාවගේ මස්තකය වූ ගොත්‍රභූචිත්තය උපදනේ ය. එහෙයින් කිහ අර්ථකථාචාර්‍ය්‍යපාදයෝ:- **"ගොත්‍රභූචිත්තං පන නිබ්බානං ආලම්බිත්වා පුථුජ්ජනගොත්තං අභිභවන්තං අරිය-ගොත්තං අභිසම්භොන්තං ච පවත්තති"** යි.

මෙසේ ගොත්‍රභූඤ්ඤනයෙන් ඤනවත් වූ යොගාවචර තෙමේ භව-යොනි-ගති-ස්ථිති-සත්ත්වාවාසයන්ගේ පරතෙර වූ නිවනෙහි පිහිටනු කැමැත්තේ උදයව්‍යයානුදර්ශනාදී වූ වෙගයෙන් දුවැවිත් ආත්මභාව නැමැති වෘක්ෂශාඛායෙහි එල්වා තුබූ රූප නැමැති රැහන හෝ වෙදනාදීන් අතුරෙහි අන්‍යතරවෙදනා නැමැති යටක් හෝ අනිත්‍ය ය, සි හෝ දුඃඛ ය, සි හෝ අනාත්ම ය, සි හෝ අනුලෝමාවජ්ජනයෙන් අරමුණු කරමින් එය නො හැර ම ප්‍රථම අනුලෝමචිත්තයෙන් උඩට නැග දෙවන අනුලෝමචිත්තයෙන් පරතෙරට නැමුනු සිත් ඇති ව තෙවන අනුලෝමචිත්තයෙන් පරතීරයෙහි මතුපිටට පැමිණියා සේ පැමිණිය යුතු නිවනට ලංව තෙවන අනුලෝමචිත්තනිරොධයෙන් සංස්කාරාලම්බනය හැර ගොත්‍රභූචිත්තයෙන් විසංඛාර වූ පරතීර වූ නිවනෙහි පිහිටා ගන්නේ ය. එහෙත් එක්වරක් ම ලද අරමුණෙහි ආසෙවන නො ලද බැවින් හේ මැනැවින් පිහිටා ගත්තේ නො වේ.

අනුලෝමඤ්ඤනය සත්‍යය විසාලන කෙලෙස් අඳුරු දුරු කරන්නට පොහොසත් වුව ද, නිවන අරමුණු කරන්නට පොහොසත් නො වේ. ගොත්‍රභූඤ්ඤනය නිවන අරමුණු කිරීමට පොහොසත් වුව ද, කෙලෙස් අඳුරු දුරු කරන්නට පොහොසත් නො වේ. එහෙයින් මේ ගොත්‍රභූඤ්ඤනය මාගීයට ආවජ්ජන ය, සි කියනු ලැබේ. ගොත්‍රභූඤ්ඤනය ආවජ්ජන නො වූයේ ද ආවජ්ජනස්ථානයෙහි සිට "මෙසේ ඉපදෙන්නැ"යි මාගීයට සංඥ දෘනය කොට නිරුද්ධ වන්නේ ය. මාගීය ද ඒ ගොත්‍රභූචිත්තය දුන් සංඥව නො හැර ම අතරක් නො තබා ප්‍රබන්ධ වසින් ඒ ගොත්‍රභූඤ්ඤනය ලුහුබඳිනු ලබන්නේ නො නැසුවිරූ ලොභසහගතය ද දොෂසහගතය ද මොහසහගතය ද පළමින් නසමින් දුඃඛසත්‍යය අසමෙමාහ ප්‍රතිවෙධ වශයෙන් දනිමින්, සමුදයසත්‍යය දුරුකරමින්, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරමින්, මාගීසත්‍යය වඩමින් මෙසේ දුඃඛසත්‍යය දැනීම, සමුදයසත්‍යය ප්‍රහාණය කිරීම, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීම, මාගීසත්‍යය වැඩීම යන කෘත්‍ය සතර සිද්ධ කරමින් උපදනේ ය. මෙසේ උපන් ප්‍රථම මාගීඤ්ඤනයට අනුරූප පරිද්දෙන් ඵලචිත්තයෝ දෙ තුන් දෙනෙක් සිදහල කෙලෙස් ඇති සන්තානයෙහි කෙලෙස් දුවිලි සන්සිඳවා හරිණු පිණිස ඉපිද නිරුද්ධ වෙත්. මේ මාගීඤ්ඤනය ප්‍රත්‍යක්ෂ කෙළේ 'සොතාපන්න' සි කියනු ලැබේ. මේ තෙමේ කෙලෙස් නසාලීම පමණක් නො කෙරේ. මුල් නැති සසරවට දුක් මුහුද වියළන්නේ ය. සියලු අපාය දොර වසන්නේ ය. සප්තාර්යධනය අභිමුඛ කරන්නේ ය. සියලු කෙලෙස් සතුරුබිය සන්සිදු වන්නේ ය. නියතසම්බොධිපරායණ වේ.

අනතුරු ව සොතාපන්න පුද්ගල තෙමේ "මම මේ මගින් ආයෙමි" යි මාගීය ද, "මා විසින් මේ අනුසස් ලදැ" යි ඵලය ද, "මාගේ මේ කෙලෙස් පහවී ය" යි පහ වූ කෙලෙස් ද, "මා විසින් මේ ධර්මය අරමුණු කිරීමෙන් මෙය ප්‍රතිවෙධ කරණ ලදැ" යි නිවන ද ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ ආසනයේ ම හිඳ හෝ පසුව හෝ හෙතෙමේ සකෘදාගාමීමාගීඥානය පිණිස විදර්ශනාභාවනාවෙහි යොග කරන්නේ ය. එහිදී ශ්‍රද්ධා-දිපංචෙන්ද්‍රියයන් ද ශ්‍රද්ධාදිබලයන් ද සමෘත්‍යාදිබොද්ධ්‍යඞ්ගයන් ද එක් කොට ගෙණ රූප වෙදනා-සංඥා-සංස්කාර-විඥානැයි භෙද වත් වූ සංස්කාරසමූහය අනිත්‍ය ය-දුඃඛ ය අනාත්ම ය, යි නැවැත නැවැත නුවණින් පිරිමදින්නේ ය. උදයව්‍යයානුදර්ශනයෙහි පටන් විදර්ශනාවට බට ඔහුට පෙර කී සේ සංස්කාරොපෙක්ෂාවගේ කෙළවර එක් ආවර්ජනයෙන් අනුලොම-ගොත්‍රභූඥානයන් උපන් කල්හි ගොත්‍රභූඥානයට අනතුරුව සකෘදාගාමී මාගීඥානය උපදනේ ය. එයින් පසු එහි ඵලයින් උපදී. හෙතෙමේ ද සොතාපන්න පුද්ගලයා සේ ම මග-පල-පැහූ කෙලෙස්-ඉතිරි කෙලෙස්-නිවන යන මෙ තැන් ප්‍රත්‍යවෙක්ෂා කොට අවසන්හි ඒ ආසනයේ ම හිඳ හෝ පසුව හෝ අනාගාමී මාගීඥානය පිණිස විදර්ශනාවෙහි යෙදී ගන්නේ ය. එසේ යෙදීමෙන් ඉන්ද්‍රිය-බල-බොද්ධ්‍යඞ්ගයන් එක් තැන් කොට ගත් ඒ ආර්‍යපුද්ගල තෙමේ සියලු ම සංස්කාරයන් විදර්ශනාඥානයෙන් අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් පිරිමදින්නේ ය. එසේ පිරිමදිනා ඔහුට සංස්කාරොපෙක්ෂාවගේ කෙළවර එක් ආවර්ජනයෙන් අනුලොම-ගොත්‍රභූ සිත් උපන් කල්හි අනතුරු ව අනාගාමීමාගීඥානය උපදී. ඉනික්බිති පල සිත් උපදනේ ය. නැවැත ඔහු මග-පල-පැහූ කෙලෙස්-ඉතිරි කෙලෙස්-නිවන යන මෙ තැන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ය. හේ මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට ඒ ආසනයේ ම හිඳ, නැත, පසු කලෙක අර්හනමාගීඥානය පිණිස විදර්ශනාවෙහි යොග කොට ඉන්ද්‍රිය-බල-බොද්ධ්‍යඞ්ගයන් එක් රැස් කොට සියලු සංස්කාරයන් අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් පිරිමැද විදර්ශනාවීථියට බස්නේ ය. එහිදී ඔහුට සංස්කාරොපෙක්ෂාවගේ කෙළවර එක් ආවර්ජනයෙන් අනුලොම-ගොත්‍රභූඥානයන් උපන් කල්හි ඉන් මතු අර්හනමාගීඥානය උපදී. නැවැත පලයින් උපදනේ ය. තත්ත්වපූර්ණ විසින් කෙලශසකන්ධයන්ගේ අනුත්පාද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණ ධාතුව අවබොධ කෙළේ මෙ තෙමේ ය. එහෙයින් අන්තිමදෙහධාරී වූයේ සකලකෙලශසකන්ධභාරය බහා තැබූයේ ස්වාර්ථසිද්ධියට පැමිණියේ ක්ෂය කළ භවසංයොජන ඇත්තේ මොනවට දැන විමුක්ත වූයේ සදෙවක ලොකයාගේ අග්‍රදක්ෂිණාර්හ වූයේ ද මෙ තෙමේ ය.

මේ ද මෙහිලා දනයුතු ය:- **"සෙය්‍යථාපි භික්ඛවෙ! චක්ඛුමා පුරිසො රත්තන්ධකාරතිමිසායං විජ්ජන්තරිකාය සමන්තා රූපානි පස්සෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ! භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධ ගාමිනිපටිපදාති යථාභූතං පජානාති-පෙ-"** යනු. මහණෙනි! ඉතා තද රෑ අඳුරෙහි ඇස් ඇති පුරුෂයෙක් විදුලි ගසත් ගසත් විදුලිඑලියෙන් හාත්පස්හි වූ රූපයන් දක්නේ යම්සේ ද, එපරිද්දෙන් මහණෙනි! භාවනානුයොගී මහණ තෙමේ මේ දුක ය, මේ දුක් හට ගැණීම ය, මේ දුක් වැළකීම ය, මේ දුක් වැළකීමේ මග ය, යි තතු සේ දනියි, යනු එහි සිංහල තේරුම ය.

දැටුවාව මෙය මෙසේ පැහැදිලි කළා ය:- **"චක්ඛුමා විය යොගාවචරො දට්ඨබ්බො"** = යොගාවචර තෙමේ ඇස් ඇති පුරුෂයා සේ දනයුතු ය.

"අන්ධකාරා විය සොතාපත්තිමග්ගවජ්ඣා කිලෙසා" සෝවන් මග අවුරා සිටි කෙලෙස් ගනදුර සේ ය.

"විජ්ජුසඤ්චරණං විය සොතාපත්තිමග්ගඤාණස්ස උප්පත්ති කාලො" ස්‍රොතාපත්තිමාගීඥානයාගේ උත්පත්තිකාලය විදුලිගැසීම සේ ය.

"විජ්ජන්තරිකාය චක්ඛුමතො පුරිසස්ස සමන්තා රූපදස්සනං විය සොතාපත්තිමග්ගක්ඛණෙ නිබ්බානදස්සනං" ස්‍රොතාපත්තිමාගීක්ෂණයෙහි නිවන් දැකීම, විදුලිඑලියෙන් ඇස් ඇති පුරුෂයාගේ හාත්පස්හි වූ රූප දැකීම සේ ය.

"පුන අන්ධකාරාවත්ථරණං විය සකදාගාමිමග්ගවජ්ඣා කිලෙසා" සෙදගැම්මග අවුරා සිටි කෙලෙස් නැවැත අන්ධකාරය පැනිරී යෑම සේ ය.

"පුන විජ්ජුසංවරණං විය සකදාගාමිමග්ගඤාණස්ස උප්පාදෙ" සකෘදාගාමීමාගීඥනයාගේ උත්පත්තිය නැවැත විදුලි ගැසීම සේ ය.

"විජ්ජන්තරිකාය චක්ඛුමතො පුරිසස්ස සමන්තා රූපදස්සනං විය සකදාගාමිමග්ගක්ඛණෙ නිබ්බානදස්සනං" සකෘදාගාමීමාගීක්ෂණයෙහි නිවන් දැකීම, විදුලිඑලියෙන් ඇස් ඇති පුරුෂයාගේ හාත්පස්හි වූ රූප දැකීම සේ ය.

"පුන අන්ධකාරාවත්ථරණං විය අනාගාමිමග්ගවජ්ඣා කිලෙසා" අනගැමිමග අවුරා සිටි කෙලෙස් නැවැත අන්ධකාරය පැතිරී යෑම සේ ය.

"පුන විජ්ජුසංචරණං විය අනාගාමිමග්ගඤ්ඤාණස්ස උප්පාදො" අනාගාමිමාර්ගඥානයාගේ උත්පත්තිය නැවැත විදුලි ගැසීම සේ ය.

"විජ්ජත්තරිකාය චක්ඛුමතො සමත්තා රූපදස්සනං විය අනාගාමිමග්ගක්ඛනෙ නිබ්බානදස්සනං" අනාගාමිමාර්ගක්ෂණයෙහි නිවන් දැකීම විදුලි එලියෙන් ඇස් ඇති පුරුෂයාගේ හාත්පස්හි වූ රූප දැකීම සේ ය, යනු.

"සෙය්‍යථාපි භික්ඛවෙ! වජිරස්ස නත්ථි කිඤ්චි අභෙජ්ජං මණ්ඩ වා පාසාණො වා, එවමෙව ඛො භික්ඛවෙ! ඉධෙකච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති භික්ඛවෙ! වජිරූපමචිත්තො පුග්ගලො" යනු ආයේ මහාරහතුන් වහන්සේට ම නිවන සියලු කල්හි ම නො ඇවිරී පෙණෙන බව දැක්වීමටය. "මහණෙනි! විදුරවියෙන් නො බිඳිය හැකි නො විනිවිදිය හැකි කිසිත් මැණිකෙක් හෝ ගලෙක් හෝ නැත්තේ යම්සේ ද, එ පරිද්දෙන් මහණෙනි! මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් ආශ්‍රවධර්මයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රවරහිත වූ අර්හත්ඵලසමාධිය හා අර්හත්ඵලප්‍රඥාව ඉහාත්වයෙහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නේ වජ්‍රයට බඳු සිත් ඇති පුද්ගලයා යි කියනු ලැබේ, යනු එහි සිංහලයි. අටුවාව මෙහිලා කළ විවරණය මෙසේය:- **"වජිරං විය හි අරහත්තමග්ගඤ්ඤාණං"** අර්හන්මාර්ගඥානය විදුරවිය සේ ය.

"මණ්ඩ ගණ්ඨි පාසාණගණ්ඨි විය අරහත්තමග්ගවජ්ඣා කිලෙසා" රහත්මග අවුරා සිටි කෙලෙස් මිණිගැට පහත්ගැට සේ ය.

"වජිරෙන මණ්ඩ ගණ්ඨිම්පි වා පාසාණගණ්ඨිම්පි වා විනිවිජ්ඣිත්වා අගමනභාවස්ස නත්ථිතා විය අරහත්තමග්ගඤ්ඤාණෙන අච්ඡෙජ්ජානං කිලෙසානං නත්ථිභාවො" අර්හන්මාර්ගඥානයෙන් නො සිඳිය හැකි කෙලෙස් නැතිබව, විදුරවියෙන් මිණිගැටක් හෝ පහත්ගැටක් හෝ විනිවිද ගෙණ නො යෑමක් නැතිබව සේ ය.

"වජිරෙන නිබ්බිද්ධවධස්ස පුන අප්පතිපූරණං විය අරහත්තමග්ගෙන ඡිත්තානං කිලෙසානං පුන අනුප්පාදො දට්ඨබ්බො" අර්හන්මාර්ගඥානයෙන් සිඳහළ කෙලෙසුන්ගේ නැවැත කිසි කලෙකත් නො උපදනා බව, විදුරවියෙන් විනිවිද යන සේ සිඳහරිණ ලද්දහුගේ නැවැත නො පෑස්සීම සේ ය, යි දතයුතු ය යනු.

මෙසේ කෙලෙසුන්ගේ එක් කොටසක් සෝවන් මගින් ද එක් කොටසක් සෙදගැමීමගින් ද එක් කොටසක් අනගැමීමගින් ද එක් කොටසක් රහත්මගින් ද,යි සිවුමගින් සිවුවරකට නැසී සීදී යන අතර වර්තමානස්කන්ධයන්ගේ සිදී යෑම ස්කන්ධපරිනිර්මාණ-යෙන් වන්නේ ය. මෙසේ පස්වරකින් වන ක්ලෙශස්කන්ධයන්ගේ අනුත්පාදනිරෝධය එක් ම නිවනැ,යි ගණු මිස නිවන් පසෙකැ,යි ගන්නට ධර්මයුක්තියෙක් කැල ම නැත්තේ ය.

දවසෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩහුන් බුදුරජා-නන් වහන්සේ වෙත පැමිණි එක්තරා දෙවියකු විසින් උන්-වහන්සේ ඉදිරියෙහි නැගූ=

"කුතො සරා නිවත්තන්ති කත්ථ වට්ටං න වට්ටති,
කත්ථ නාමං ච රූපං ච අසෙසං උපරුජ්ඣති"

යන මෙම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් බුදුරජානන් වහන්සේ පහත දැක්වෙන ගාථාව වදාළ සේක.

"යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති,
අතො සරා නිවත්තන්ති එත්ථ වට්ටං න වට්ටති,
එත්ථ නාමං ච රූපං ච අසෙසං උපරුජ්ඣති"යි.

පඨවී – ආපො – තෙජො - වායො - යන මහාභූතරූපයන් බැස නො ගත්තා වූ රූපතෘෂ්ණාදී සංසාරප්‍රවාහයන් නො ද ගලන්නා වූ ස්කන්ධධාතු ආයතනාදීන්ගේ පැවැත්මක් නැති නාම - රූප දෙක මුළුමනින් ඉතිරි නැතු ව නිරුද්ධව ගිය තත්ත්වය නිවනැ,යි යනු එහි ඉතා කෙටි තේරුම ය.

"අත්ථි භික්ඛවෙ! තදායතනං, යත්ථ නෙව පඨවී, න ආපො, න තෙජො, න වායො, න ආකාසානඤ්චායතනං, න විඤ්ඤා-ණඤ්චායතනං, න ආකිඤ්චඤ්ඤායතනං, න නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනං, නායං ලොකො,න පරොලොකො,න උභො චන්දිමසුරියා, තත්‍රාපහං භික්ඛවෙ! න ආගතිං වදාමි, න ගතිං, න ඨිතිං, න උප්පත්තිං, අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙ-වෙතං එසෙවන්තො දුක්ඛස්ස" යන උදානදෙශනාවෙනුදු මෙය ම ව්‍යක්ත කරණ ලද්දේ ය.

මහණෙනි! යමෙක්හි පෘථිවීධාතුව නැද්ද, ආපොධාතුව නැද්ද තෙජොධාතුව නැද්ද, වායොධාතුව නැද්ද, ආකාසානඤ්චායතනය නැද්ද, විඤ්ඤානඤ්චායතනය නැද්ද, ආකිඤ්චඤ්ඤායතනය නැද්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය නැද්ද, මේ ස්කන්ධලොකය නැද්ද,

මෙයින් උපදනා අන්‍ය වූ සත්ත්වලෝකයෙක් නැද්ද, සැඟහිරු දෙදෙනෙක් නැද්ද, එසේ වූ ආයතනය මගපල සිතට අරමුණු වන නිවන ඇත, එහි කිසිවකුගේ ඒමක් යෑමක් සිටීමක් මැරීමක් මැරී ඉපැත්මක් නො කියමි, මෙය කිසිවෙක නො පිහිටි ප්‍රත්‍යයයන්ගෙන් නො පවත්නා කිසි ම අරමුණෙක නො එල්බෙන ධර්මයෙකි, මෙය ම දුකෙහි කෙළවර ය, යනු කෙටි අරුත ය.

> "ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
> විරත්තචිත්තා ආයතිකෙ භවසම්මි,
> තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡනෙ
> නිබ්බන්ති ධීරා යථායං පදීපෝ"

යනු ද එහිලා දතයුතු ය. "යම්කෙනකුන්ගේ පුරාතනකර්ම හා කෙලෙස්, මෙයින් මත්තෙහි පිළිසඳ ගැණුමක් දිය නො හැක්කේ ක්ෂීණ වූයේ ද, කර්මක්ෂය කළ බැවින් මත්තෙහි විපාක දිය හැකි අළුත් කර්ම කෙලශයන්ගේ හට ගැණීමෙක් පහළ වීමෙක් නැත්තේ ද, මතු භවයක් කෙරෙහි නො ඇලුනු නැවත ඉපැත්මෙහි ආශා නැති ක්ෂීණ වූ ප්‍රතිසන්ධිවිඥානසඞ්ඛ්‍යාත බීජ ඇත් පුනර්භවසඞ්ඛ්‍යාත සංස්කාරයන්ගේ වැඩීමෙහි ආශා රහිත වූ ධෛර්යසම්පන්න වූ ඒ රහත්හු මේ පහන නිවෙන්නාක් මෙන් අවසන් සිත නිරුද්ධ වීමෙන් නිවී යෙත්" යනු එහි අරුත් ය.

නිවන සුබුමරූපගතිකය යි වරදවා තේරුම් කිරීමෙන් නිවන රූපලක්ෂණ සහිත ය, යි කියා පෑමෙන් සඞ්ඛතධර්මපක්ෂයෙහිලා ගත් උගතුන්ගේ ද, නිවන භාවාත්මකය,යි නිවනෙහි සූක්ෂමවිඥානයෙක් ඇත්තේ ය, නිවනෙහි ආත්මයෙක් ඇත්තේ ය, යි කියන උගතුන්ගේ ද ඒ සියලු මිථ්‍යාමත මෙයින් බිඳවැටී යායුතු ය. යම් කෙනෙකු නිවනෙහි රූපලක්ෂණ ඇතැයි කියතොත්, එ ද, නිවන භවාත්මක ය, නිවනෙහි සූක්ෂමවිඥානයෙක් ඇත, නිවනෙහි ආත්මයෙක් ඇතැ,යි කියතොත්, එ ද, එසේ කියන්නවුන්ගේ පරමාර්ථධර්මවිෂයයෙහි ලා නො දැනුම ම කියා පාන්නේ ය.

නිවන වනාහි සවභාවලක්ෂණ වියෙන් ගාතනිසුඛ සවරූප වියෙන් එකෙක් ම වූයේ ද, **සඋපාදිසෙස නිබ්බාන-අනුපාදිසෙසනිබ්බාන** යි කාරණපර්‍යායයෙන් දෙ වැදෑරුම් වේ. **"තදෙතං සභාවතෝ එකවිධම්පි සඋපාදිසෙසනිබ්බානධාතු අනුපාදිසෙසනිබ්බානධාතු චෙති දුවිධං හොති කාරණපරියායෙන"** යනු එහිලා කීහ.

පංචසකඛන්ධසඞ්ඛ්‍යාත වූ යම් ධර්මසමූහයෙක් කාමූපාදානාදීන් විසින් ලං කොට ගණු ලැබේ ද, ඒ ධර්මසමූහය උපාදි නම්. උපාදි යන මෙය පංචස්කන්ධයට නමෙකි. උපාදානයන් විසින් ලං කොට ගත් ඒ පංචස්කන්ධය කෙලෙසුන් නැසීමෙන් පසු කෙලෙසුන් හැර ඉතිරි වේ ද, එහෙයින් කෙලෙසුන් නැති ඒ පංචස්කන්ධය උපාදිසෙස නම්. යම් නිවනෙක් කෙලෙස් රහිත වූ පංචස්කන්ධය හා පවත්නේ ද, ඒ නිවන **සඋපාදිශේසනිබ්බානධාතු** නම්. කෙලෙසුන් නැති පංචස්කන්ධය කෙලෙස් ප්‍රහීණ වීමෙන් පසු ඉතිරි වූ දිවිකෙළවර තෙක් පවත්නා ශුද්ධ වූ පංචස්කන්ධය සමග පවත්නා නිවන සඋපාදිසෙස ය, සි ද රහතන් වහන්සේගේ කෙලෙසුන් හා යම්තම්කිනුත් නො ගැවුනු ශුද්ධ වූ (කෙලෙස් රහිත ස්කන්ධපංචකයාගේ) පිරිනිවීමෙන් වන ශාන්තනිර්වාණය **අනුපාදිසෙස ය** සි ද දතයුතු ය.

මෙ ද මෙහිලා දත යුත්තේ ය:- **"දෙවමාහිකඛවෙ! නිබ්බානධාතුයො, කතමා දෙව? සඋපාදිසෙසා ච නිබ්බානධාතු, අනුපාදිසෙසා ච නිබ්බානධාතු, කතමා ච භිකඛවෙ! සඋපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භිකඛවෙ! භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස තිට්ඨතෙනෙව පඤ්චින්ද්‍රියානි යෙසං අවිභාතත්තා මනාපාමනාපං පච්චනුභොති, සුඛදුක්ඛං පටිසංවෙදෙති, තස්ස යො රාගඛඛයො දොසඛඛයො මොහඛඛයො, අයං වුච්චති භිකඛවෙ! සඋපාදිසෙසානිබ්බානධාතු,**

කතමා ච භිකඛවෙ! අනුපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භිකඛවෙ! භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස ඉධෙව භිකඛවෙ! සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතී භවිස්සන්ති, අයං වුච්චති භිකඛවෙ! අනුපාදිසෙසා නිබ්බානධාතු" යනු. මහණෙනි! නිර්වාණධාතුහු දෙදෙනෙක් වෙත්. කවර දෙදෙනෙක් ද? යත්:- සොපාදිශෙෂනිර්වාණධාතු-අනුපාදිශෙෂනිර්වාණධාතු යන දෙ දෙන ය. මහණෙනි! සොපාදිශෙෂනිර්වාණධාතු කවරේ ද? මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ රහත් වූයේ පහ කළ ආශ්‍රව ඇත්තේ වැස නිම වූ බඹසර ඇත්තේ කරණ ලද සිවු මග කිස ඇත්තේ බහා තැබූ කෙලෙස් බර ඇත්තේ පිළිවෙළින් පැමිණි රහත් බැවි ඇත්තේ ක්ෂය කළ බව බැඳුම් ඇත්තේ මනා කොට නුවණින් දුන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේ ද, ඒ රහත්හු පිළිබඳ

යම් ඉන්ද්‍රිය කෙනකුත් නිරුද්ධ නො කළ බැවින් ඉටු අනිටු අරමුණු ලබා ද, සැපදුක් විඳී ද, ඒ පඤ්චෙන්ද්‍රියයෝ පවත්නාහු ම වෙත්. ඒ රහත්හුගේ රාගක්ෂය දෙවෂක්ෂය මොහක්ෂය වේ ද මහණෙනි! මේ කෙලශපරිනිර්මාණය සොපාදිශෙෂ නිර්මාණධාතු ය යි කියනු ලැබේ.

මහණෙනි! අනුපාදිශෙෂනිර්මාණධාතු කවරේ ද? යත්: මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ මනා කොට නුවණින් දැන මිදුනේ වේ ද, මහණෙනි! ඒ රහත්හු පිළිබඳ සියලුවෙදනාවෝ මේ අත්බැව්හි ම තෘෂ්ණාදීන් නො රැස්නා ලද්දාහු සිහිල් වන්නාහු ය. මහණෙනි! මේ ස්කන්ධපරිනිර්මාණය අනුපාදිශෙෂනිර්මාණධාතු ය යි කියනු ලැබේ, යනු එහි අරුත්.

මෙ ද දත යුතුය:-

"දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා
නිබ්බානධාතු අනිස්සිතෙන තාදිනා,
එකා හි ධාතු ඉධ දිට්ඨධම්මිකා
සඋපාදිසෙසා භවනෙත්තිසඞ්ඛයා.
අනුපාදිසෙසා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො,
යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං
විමුත්තචිත්තා භවනෙත්තිසඞ්ඛයා,
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බභවානි තාදිනො" යනු.

එහි කෙටි අරුත් මෙසේ ය:- "පසැස් ඇත්තා වූ තෘෂ්ණාදෘෂ්ටීන් ඇසුරු නො කළා වූ තාදීගුණයුක්ත වූ බුදුරජුන් විසින් මේ නිර්මාණධාතුහු දෙදෙනෙක් වදාරණ ලදහ. එකෙක් ඉහාත්මයෙහි වූ තෘෂ්ණාක්ෂය කිරීමෙන් සඋපාදිශෙෂ වේ. යම් නිර්මාණධාතුයෙක්හි මුළුමනින් භවයෝ නිරුද්ධ වෙත් ද, ඒ අනුපාදිශෙෂනිර්මාණධාතු තොමෝ මරණින් මතුයෙහි වේ.

යම් කෙනෙක් මේ අසඞ්ඛතධාතුසඞ්ඛ්‍යාත නිර්මාණපදය දැන තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් මිදුනු සිත් ඇත්තාහු වෙත් ද, ඔවුහු ධර්මසාර නම් වූ රහත් බව ලැබීමෙන් නිවනෙහි ඇලුනාහු වෙත්. තාදී වූ ඔවුහු සියලු භවයන් පහකළාහු වෙත්" යනුයි.

මේ සූත්‍ර දෙශනාවෙන් සොපාදිශෙෂනිර්මාණය කෙලෙස් නැති රහතුන් වහන්සේට නිෂ්පර්‍යාය විසින් හා, පිරිනිවීමෙන් පසු අනුපාදිශෙෂනිර්මාණය ලැබෙන බව හා දක්වා වදාළ සේක. මේ

වනාහි සකාඛයන්ගේ ඇති නැති බව ය. එක් ම නිර්ණය යි. සෝවන්-සෙදගැමි-අනගැමි තුන් දෙනා වහන්සේට පඤ්ඤාය විසින් සොපාදිශෙෂනිර්ණය ලැබෙන්නේ ය. එසේ වනුයේ සියලු සසර දුකින් නැගී ගත් හෙයින් හා නිවන් අරමුණු කොට තම තමන් පිළිබඳ සමවතුන්ට සමවැද නිවන්සුව වළඳනා බැවිනි.

නිවන වනාහි, **සුඤ්ඤත-අනිමිත්ත-අපණිහිත** යි ආකාර භෙදයෙන් තෙ පරිදි වේ. එහි අරමුණු කිරීම් විසින් හා, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් රාග දෙෂ මොහයන් කෙරෙන් හිස් වූ බැවින්, සියලු සංස්කාරධර්මයන්ගෙන් අස් වූ බැවින් **සුඤ්ඤත** නම් වේ. රාගාදිවෘත්තදුඃඛයෙන් සසර උපතට කරුණු වූ රාගාදී හෙතූන් කෙරෙන් තොර බැවින්, සඞ්ඛතැ යි කියන ලද සියලු අරමුණු කෙරෙන් වෙන් වූ බැවින් **අනිමිත්ත** නම් වේ. තෘෂ්ණා යි කියූ ප්‍රාර්ථනාවගේ අවිද්‍යමානතාවයෙන් **අපණිහිත** නම් වේ. කිහ මෙය මෙසේ:- **"ආරම්මණතො සම්පයොගතො ච රාගදොසමොහෙහි, සඞ්ඛතඞ්කාරෙහි වා සුඤ්ඤත්තා සුඤ්ඤතං, තථා රාගාදිනිමිත්තරහිතත්තා, සඞ්ඛතසඞ්කාරනිමිත්තාභාවතො වා අනිමිත්තං, තණ්හාය පණිධියා අභාවතො අපණිහිතං"** යි.

අනත්තානුපස්සනාව ධුර කොට ගෙණ මාර්ගඵලාවබෝධය සුඤ්ඤත නම්. අනිච්චානුපස්සනාව ධුර කොට ගෙණ මාර්ගඵලාවබෝධය අනිමිත්ත නම්. දුක්ඛානුපස්සනාව ධුර කොට ගෙණ මාර්ගඵලාවබෝධය අපණිහිත නම්. තව ද මාර්ගය, අනත්තානුපස්සනාවෙන් ආත්මය – සත්ත්වය – පුද්ගල ය යන සංඥා හැර පියා සංස්කාරධර්මයන් ශූන්‍යතාවයෙන් දක්නා ලද බැවින් සුඤ්ඤත නම අනිච්චානුපස්සනාවෙන් සංස්කාරධර්මයන්ගේ ඝනවිනිභෝග කොට නිත්‍යනිමිත්ත-ධ්‍රුවනිමිත්ත-ශාශ්වතනිමිත්ත යන මොවුන් දුරුකරමින් ආ බැවින් අනිමිත්ත නම. දුක්ඛානුපස්සනාවෙන් සුඛසංඥා හැරපියා ප්‍රාර්ථනාව වියළවමින් ආ බැවින් අපණිහිත නම. මාර්ගය රාගාදීන්ගෙන් වෙන් ව සිටි බැවින් සුඤ්ඤත නම. රූපනිමිත්ත ආදීන්ගේ හා රාගනිමිත්ත ආදීන්ගේ ද අභාවයෙන් අනිමිත්ත නම. රාගප්‍රාර්ථනා ආදීන්ගේ අභාවයෙන් අපණිහිත නම. මාර්ගය ශූන්‍ය වූ අනිමිත්ත වූ අප්‍රණිහිත වූ නිවන අරමුණු කරණ බැවින් සුඤ්ඤත ය, අනිමිත්ත ය, අපණිහිත ය, යි කියනු ලැබේ. අනත්තානුපස්සනාවෙන් ආත්මසංඥාව, අනිච්චානු පස්සනාවෙන් නිත්‍යසංඥාව, දුක්ඛානුපස්සනාවෙන් සුඛසංඥාව ප්‍රහීණ වේ.

නිරෝධසත්‍යසඞ්ඛ්‍යාතනිර්ණධාතුයෙහි මේ **නිස්සරණට්ඨ – විවෙකට්ඨ-අසඞ්ඛතට්ඨ-අමතට්ඨ** යි අර්ථසතරෙක් ඇත්තේ ය. එහි **නිස්සරණට්ඨ** නම්:- සියලු කෙලෙසුන් කෙරෙන් හා සියලු

දුකින් හා නික්මුනුබව ය. මිදුනුබව ය. බැහැරිබව ය. ලොකීය-සත්ත්වයෝ කෙලෙසුන්ගෙන් හා සසරදුකින් නො නික්මුනෝ ය. නො මිදුනෝ ය. නො ද බැහැරියෝ ය. නිවන වනාහි කෙලෙසුන් හා සසරදුක් හා නො හැනී සිටියේ ය. නිවනින් සන්සිදුනෝ කෙලෙසුන්ගෙන් හා සසරදුකින් නො හැනුනෝ ය. මෙසේ මේ නික්මීම මිදීම නො හැනීම නිශ්ශරණාඛ්‍ය නම් වේ.

විවෙකතඨ නම්:- කෙලෙසුන්ගෙන් හා සසරදුකින් වෙන්වීම ය කෙලෙසුන් හා සසරදුක් හා නො ගැටුනුබව ය. නිවනෙහි කෙලෙස් දුක් නැත්තේ ය. නිවන මුළුමනින් එයින් නිදහස්ව සිටියේ ය. මෙසේ කෙලෙසුන්ගෙන් හා දුක්වලින් වෙන් ව සිටීම විවෙකාඛ්‍ය නම් වේ.

අසඞ්ඛතඨ නම්:- කර්‍මාදී වූ කිසිත් හෙතුවකින් නො හටගත්බව ය. පිළියෙල නො කළබව ය. නිවන වනාහි ලොකීයවස්තූන් සේ හෙතූන් නිසා හට ගත්තේ නො වේ. එය විද්‍යමාන වූ ධර්‍මස්වභාවයෙක් වේ. විද්‍යමාන වූයේ ද ප්‍රත්‍යයහේතූන් නිසා නො හට ගත් බැවින් ඉපදීමෙක් දිරීමෙක් නැසීමෙක් නැත්තේ වේ. සඞ්ඛත යන්නෙන් ගණු ලබන්නේ හෙතූන් නිසා උපදවා ගත් පිළියෙල කර ගත් සකස්කර ගත් දේ ය. එසේ කිසිවෙකින් නො ද ඉපද වූ නො ද පිළියෙල කළ නො ද සකස් කළ ධර්‍මතත්ත්වය අසඞ්ඛත ය කි ගැණේ. ඒ වනාහි නිවන පිළිබඳ අසංස්කෘතාඛ්‍ය නම් වේ.

අමතඨ නම්:- කවදුත් කිසිත් කරුණෙකින් නො නස්නා බව ය. නාම-රූපධර්‍ම පිළිබඳ හැම එකෙක් හැම මොහොත ඉපිද ඉපිද නැසි නැසී යන්නේ ය. නාම-රූපධර්‍මයෝ ඉපද ඇසපිය හෙලන තරම් කාලයකුදු නො පැවත නැසී යන්නෝ ය. එහෙයින් ඔවුහු අමත නො වෙත්. අමත නම් නො ද ඉපදෙන්නේ ය. නො ද නැසෙන්නේ ය. නො උපදනා බැවින් ම නො නස්නා මේ ධර්‍මතත්ත්වය ලැබුයේ ද නො ඉපදෙන්නේ ය. නො නස්නේ ය. මෙසේ නො නස්නාබව අමෘතාඛ්‍ය නම් වේ.

දුකින් නික්මුනුබව දුක් හා නො ගැටුනුබව හෙතූන් විසින් පිළියෙල නො කළබව නො නස්නාබව යන නිශ්ශරණාඛ්‍ය විවෙකාඛ්‍ය අසංස්කෘතාඛ්‍ය අමෘතාඛ්‍ය යන අඛ්‍ය සතර යම් ධර්‍මතත්ත්වයෙක වේ නම් ඒ නිවනැ යි දතයුතු ය.

මිලිඳ ප්‍රශ්නයෙහි එන **නිබ්බානභව්‍ය-නිබ්බානයාන-නිබ්බාන-අරූප නිබ්බානසිඛ්‍ඛි** ප්‍රශ්න ද කියවා බැලිය යුතු ය.

සම්බොධිඥානයෙන් නිවන් ලබනු පිණිස මෙයට, කල්ප ලක්ෂ-යක් අධික කොට ඇති චතුරසඞ්ඛ්‍යකල්ප ලක්ෂයකින් ඔබ්බෙහි තැබූ ප්‍රාර්ථනා ඇති ව මේ අතර උපනුපන් ජාතියෙහි ජීවිත පරිත්‍යාගාදී වූ හැම පරිත්‍යාගයක් කොට ඒ පිණිස පිරිය යුතු ගුණදහම් පුරා සම්‍යක් සම්බොධියට පැමිණි බුදුරජානන් වහන්සේ තමන් වහන්සේ විසින් අතිදීර්ඝකාලයක් මුළුල්ලෙහි එහි ම පිළි-යෙල වීමෙන් අවබොධ කර ගත් නිර්වාණධර්මය එයට සුදුසු සේ පිළියෙල නො වූ සාමාන්‍යයකුට අවබොධ නො කොට හැකිබව බුදු වූ ඇසිල්ලෙහි ම:-

"කිච්ඡෙන මෙ අධිගතං හලන්දානි පකාසිතුං,
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො.
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං,
රාගරත්තා න දිස්සන්ති තමොක්ඛන්ධෙන ආවටා"

යනු වදාළෝ ද, නිවන් තතු සාමාන්‍ය ඥානයෙකින් මොන කෙන-කුට වත් අවබොධ නො කොට හැකි බැවින් ම ය.

"මා විසින් දුකසේ අවබොධ කර ගත් චතුරාර්‍යසත්‍යධර්මය දැන් ප්‍රකාශ කිරීමෙන් වැඩෙක් නැත්තේ ය, රාගද්වෙෂයන්ගෙන් පෙළුනවුන් විසින් මේ චතුරාර්‍යසත්‍යධර්මය අවබොධ කට හැක්කේ නො වේ,

උඩු හෝ (නිවන්) කරා යන්නා වූ නිපුණ වූ ගැඹුරු වූ දුක සේ දැක්කයුතු වූ සියුම් වූ චතුරාර්‍යසත්‍යධර්මය රාගයෙන් රත් වූ අවිද්‍යාස්කන්ධයෙන් වැසුනා වූ සත්ත්වයෝ නො දක්නාහු ය" යනු එහි අරුත් ය.

තව ද අජපාලන්‍යග්‍රොධමූලයෙහි වැඩ හිඳිනා වේලෙහි උන් වහන්සේට "සංස්කාරයන්ගේ සන්සිඳීමට සකල උපධීන්ගේ බැහැර ලීමට තෘෂ්ණාවගේ ක්ෂයවීමට නො ද ඇලීමට සකල දුඃඛස්කන්ධයන්ගේ නිරොධයට කරුණු වූ නිවන දැකීම අතිදුෂ්කරය තර්කබුද්ධියෙන් නො කට හැකිය, ඉතා සියුම් ය, නිවියේ ය, ප්‍රණී-තය" යනු වැටහුනේ ද සාමාන්‍යයන්ට මෙය අවබොධ නො කට හැකි බැවින් ම ය.

එහෙත්, නිවන් තතු දැනීම මෙබන්දන් විසින් නො කට හැකි වුව ද එදා නානාවිධ ධර්මශාස්ත්‍ර විද්‍යාවන්හි පරිණතියට ගිය විවිධදාර්ශනිකයන් විසින් නිවනෙහි ලා කරණ ලද විවිධවිචාරයෝ ඔවුන්ගේ පොතපතෙහි දක්නට ලැබෙත්. එයින් කිහිපයක් මෙසේ දනයුතු ය:-

පළමු කොට දිශාවෝ හට ගත්හ. එයින් පසු අහස පොළව ආදී සජීවාජීවනිකායයෝ පහළ වූහ. නැසෙන කල්හි මොවුහු හැම කෙනෙක් දිශාවන්හි ම ලීන වේත්. දිශා නිත්‍ය ය. නිවන සිටියේ දිශා කරුණු කොට ගෙණ ය.

විදව්ලෙලොකය බඹහුගෙන් උපන, බඹහු විසින් මැවූ පශූන් නස්‍ා ඔහුට දෙන්නේ බඹලොව උපදි. ඒ නිවන ය. නිවන බ්‍රහම හෙතු කොට පවති.

විවිධහෙතූන්ගේ නිර්විකල්පය නොදැක්ම නිවන යි.

ඊශාන, සකල වසතූන්හි පැනිර සිටියේ ය. ප්‍රභු ය. දැක්ක නොහැකි ය. මූර්තිමත් නොවේ. වෙතනාවෙතනාතමකභාවයන් ඉපදවීමෙහි පොහොසත් ය. මේ දැනීම නිවන යි.

සුළඟ ඇසුරු කොට සජීවාජීවසකලපදාර්ථයන්ගේ ඉපැත්ම - පැවැත්ම - නැසීම සිදු වෙත්. ඒ මේ සුළඟ මොවුන්ගේ ශක්තිය යි. ඥනය නිවන් පිණිස ය. සුළඟ නිත්‍ය ය. නිවන මූලක ය.

සිරුරෙහි සිදීමෙන් හා සැප පින් ගෙවී යෑමෙන් නිවන ලැබේ. සිරුරෙහි සිදීම හා සැප පින් ගෙවී යෑම නිවන යි.

සවභාවධර්ම මෝරා යෑමෙන් මිනිසත්බව ලැබීම නිවන යි. කාරණය ස්ත්‍රීහු ය.

පින් පව් ගෙවීම්මාත්‍රය නිවන යි.

ප්‍රකෘතිය නිත්‍ය යි. සියලු භූතයන්ගේ මූල කාරණ ය යි. සත්‍යමාගීවබොධයෙන් නිවන ලැබේ.

සියලු භූතයන්ගේ උත්පත්තිස්ථානය අන්තරීක්ෂය යි. සියලු ජීවපදාර්ථයෝ අන්තරීක්ෂයෙහි ම ලයට පැමිණෙත්.

ඊශ්වර, ජගත්කර්තෘ, යි දැනීම නිවන යි.

සියල්ලට හෙතුභාවයෙන් ස්ත්‍රීපුරුෂයන්ගේ සංයොගය නිවන යි.

මහෙශ්වර, සියල්ල උපද වන්නේ ය. හේ නිත්‍ය ය. ඔහු ගැණ දැනීම නිවන මුල් කොට සිටියේ ය. මහෙශ්වර ජගත්කර්තෘ ය. ඔහුගේ හා ඔහු විසින් මවන ලද්දහුගේ එකීභාවය ලැබීම නිවන යි.

චරාචරලොකය ප්‍රකෘතියෙන් උපනැ යි දැනීමෙන් නිවන ලැබේ.

මේ ආදී විසින් ගත් නිර්ණයන්ට බුදු දහමින් පිහිටක් නොලැබේ. මෙයින් අන්‍ය වූ නිවන් ද ඔවුන්ගේ පොත පතෙහි ඇත්තේ ය. එයින් අර්ථයෙක් වේ නම් ඒ හා මේ හා බලා විමසා

ගතයුතු ය. එහෙත් ඒ විමසීම විඤ්ඤාතයට කරුණු විය හැක්කේ ය. මේ මෙහි දක්වන ලද්දේ මෙහිලා උන්ගේ හා අපගේ විවිධත්වය දක්වනු පිණිස ය.

මෙකල ඇතැම් බෞද්ධ ධර්මධරයෝ ද **'නිබ්බාන'** යනු භාවසාධනයෙහි සිද්ධපදයක් කොට ගන්නට කියත්. නො ගතයුතු ය. බුද්ධධර්මයට විරුද්ධ ය. එසේ ගත් කල්හි රාගාදීන්ගේ ක්ෂයභාවයට අරමුණෙක් නො ලැබෙන්නේ ය. ධර්මයට අනුව රාගාදීන්ගේ ක්ෂයභාවයට අරමුණ වන්නේ නිවන ය. එහෙයින් 'නිබ්බාන' යනු කරණසාධනයෙහි සිද්ධපදයක් සේ ගතයුතු ය. ධර්මයට අවිරුද්ධ වනුයේ ඒ ය. එහිලා කරුණු යට කියන ලද්දේ ය.

නිර්‍වාණ වෙවචන අතුරෙහි එන මොක්ෂ ශබ්දය ද විවිධදර්ශනිකයන් අතින් තැළී පෙළී ගියේ ය. මොක්ෂ-මුක්ති ශබ්ද දෙක බුදුරජාණන් වහන්සේ ලෝ පහළ වන්නට පෙර සිට ම දර්ශනික සම්ප්‍රදාය ඉදිරියෙහි ගමන් ගෙණ සිටියේ ය. එහිදී ඒ ඒ දර්ශනිකයෝ මොක්ෂ ශබ්දය අල්වා ගෙණ 'මොක්ෂ නම් මේ ය' යි තමන් දන්නා ලෙසින් විවරණය කළහ.

ඔවුනතුරෙහි චාර්‍වාකයෝ **'දෙහමුක්තිය'** මොක්ෂ ය යි කීහ. බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු නැගුනු මහායානිකයන් සම්මත බෞද්ධයෝ **ශූන්‍යවාදී - විඥානමාත්‍රාසත්තිවාදී - බාහ්‍යසත්තානුමෙයපදාර්ථවාදී - බාහ්‍යසත්තාප්‍රත්‍යක්ෂවාදී** යි කොටස් සතරකට බෙදී සිටියහ.

එහි ශූන්‍යවාදීහු **'සර්‍වශූන්‍යතාවය'** මොක්ෂය යි ද, සෙසු තිදෙන **'ආලයවිඥානක්ෂරරූප වූ විඥානය'** මොක්ෂය යි ද කියත්.

ජෛනයෝ **'බොහෝ කල් සිට රැස් කළ පාපයෙහි හැලී ගිය ජීවය සියල්ලන් මතුයෙහි සම ව සිටීම'** මොක්ෂය යි ද,

නෛය්‍යායිකයෝ **'ශරීරාතිරිකතආත්මඥානය ම තත්ත්වඥානය වේ. එය ලැබීමෙහි භ්‍රමරූප වූ දෙහාත්මඥානයාගේ නැසීම වේ. මේ නැසීමෙහි දී වන සියලු සසර දුක් නැසී යෑම** මොක්ෂය යි ද,

සාඞ්ඛ්‍යයෝ **'ප්‍රකෘතියෙන් පුරුෂයාගේ වියොගය'** මොක්ෂ ය යි ද,

අද්වෛතවාදීහු **'ප්‍රත්‍යක්ෂාදිසිද්ධ වූ ලෝකය බ්‍රහ්මන් කෙරෙහි නැගී සිටියේ ය. බ්‍රහ්මරූප වූ ඥානයෙන් ලෝකය වියතුවක් සේ වැටහෙන්නේ ය. ප්‍රකෘතිජීව යන මොවුන් කෙළවර බ්‍රහ්ම කෙරෙහි නැගී සිටීම'** මොක්ෂ ය යි ද කියත්.

මොක්ෂ ය මේ ය, යි කළමේ විවෘති එකෙකුත් ප්‍රත්‍යක්ෂසිද්ධීන්හි පිහිටා කරණ ලද්දේ නො වේ. අනුමිත ම වේ. අනුමානඥානයෙන් ගන්නා ලද මේ එක ද විවෘතියෙකුත් රාගද්වෙෂමොහක්ෂය සඞ්ඛ්‍යාතනිර්වාණය කෙරෙහි යථාර්ථ විසින් තත්ත්වාර්ථ විසින් නැගී නො සිටියි. එහෙයින් හළයුතු ය. නිර්වාණයෙහි ලා නො ද ගත යුතුය.

මොක්ෂ ශබ්දය ථෙරවාදීන් ගන්නා නිවනෙහි ද වැටෙන බැවින් බෞද්ධාචාර්‍යයෝ බුද්ධවචන පදනම් කොට මොක්ෂ ශබ්ද-යෙහි නිරුක්ත්‍යර්ථය **"මුච්චන්ති එත්ථ එතෙන වා රාගාදීහිති = මොක්ඛො"** යි සමර්ථනය කළහ. යම් සන්සිඳීමෙක්හි හෝ යම් සන්සිඳීමක් අරමුණු කිරීමෙන් හෝ රාගද්වෙෂාදිකෙලශයන්ගෙන් මිදෙත් ද, ඒ මිදීමට කරුණු වූ ශාන්තධර්මය මොක්ෂය යනු එහි අරුත් ය. මෙයට අනුගත වූ පරකීය අර්ථසමර්ථනයෙක් ද මෙහි ලා එන්නේ ය. ඒ නම් **"මොක්ෂ්‍යතෙ දුඃඛමනෙනෙති=මොක්ෂඃ"** යනු ය.

"න මොක්ෂො නභසඃ පෘෂ්ටෙ න පාතාලෙ න භූතලෙ,
සර්වාශාසංක්ෂයෙ වෙතඃ ක්ෂයො මොක්ෂ ඉති ස්මෘතඃ"

යනු ද එහි කීහ මොක්ෂය අහසෙහි හෝ පාතාලයෙහි හෝ පෘථිවී-තලයෙහි හෝ නැත. සියලු ආශාවන් ක්ෂය කිරීමෙහිලා මොක්ෂය දන්නා ලද්දේ ය, යනු අරුත් ය.

අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං = දුක්ඛ නිරොධයට පමුණුවන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ද.

දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය ආර්‍ය්‍යසත්‍ය අතුරෙහි සිවු වැන්න ය. එය මෙසේ වදාළ සේක:- **"කතමං ච භික්ඛවේ! දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං; සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාඅජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි, ඉදං වුච්චති භික්ඛවේ! දුක්ඛනිරොධ-ගාමිනීපටිපදා අරියසච්චං"** යි.

මහණෙනි! දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය කවරේ ද? යත්:-සම්‍යගදෘෂ්ටි-සම්‍යක්සඞ්කල්ප-සම්‍යගවචන-සම්‍යක්කර්මාන්ත-සම්‍යගාජීව-සම්‍යගව්‍යායාම-සම්‍යක්ස්මෘති-සම්‍යක්සමාධි යන මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය ය යි කියනු ලැබේ, යනු ඒ දෙශනායෙහි කෙටි අරුත් ය.

සියලු සසරදුක් නැවැත කිසිදුක නො උපදනා බවට පමුණු වන දුකැයි බුදුරජුන් වදාළ පංචවිධ උපාදානස්කන්ධලොකයෙන් එතර කරණ කිසිත් ආශ්‍රවධර්මයක් හා නො හැනුනු ලොකොත්තර වූ සම්මාදිට්ඨි ආදී වූ ධර්මචක්‍රය, ස්‍රොතාපත්ති ආදී චතුර්විධ ලොකොත්තරමාර්ගවිත්තයන්හි යෙදෙන ප්‍රඥා - විතර්ක - විරති - වියර්‍ය-ස්මෘති එකාග්‍රතා යන චෛතසික අතුරෙහි විරති චෛතසිකය සම්‍යගවචන-සම්‍යක්කර්මාන්ත-සම්‍යගාජීවය යි තුණකට බෙදෙන විරති තුණත් සමග වූ ප්‍රඥාදිචෛතසික සය ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ග ය යි දත යුත්තේ ය. සියලු දුක් අනුත්පාදනිරොධයට පමුණු වන හෙවත් දුඃඛනිරොධ නම් වූ නිවනට පමුණු වන පිළිවෙත බැවින් මෙය දුක්ඛනිරොධගාමිනීපටිපදා නම් වී ය.

දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යසඞ්ඛ්‍යාතඅෂ්ටාඞ්ගිකමාර්ගය බුදුසසුනෙහි ම මුත් අන් කිසිදු සසුනෙක නො ලැබෙන බව **"ඉමස්මිං බො සුභද්ද! ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති"** යි මෙසේ වදාළ සේක එහෙයින් මේ මිනිස් ලොව බුදුරජුන් පරම පිහිට කොට ගත් බෞද්ධයා ම ප්‍රතිෂ්ඨා සහිත ය. විමුක්තිරස විඳිය යුත්තේ ය.

ලොකොත්තර මාර්ග ය යි කියූ මෙහි ඇතුළත් අඞ්ග අටෙහි සම්මාදිට්ඨි නම් යහපත් දැකීම ය, සම්මාසඞ්කප්ප නම් යහපත් කල්පනා ය, යන ඇලෙසින් මතු පිටින් අක්ෂරමාත්‍රවිසින් එල්බ ගෙණ අරුත් ගැණීම මේ හා විරුද්ධ ය. එසේ ගන්නා ඒ යහපත් දැකීම් කල්පනා කිරීම් ආදිය පූර්වභාගප්‍රතිපදා වශයෙනුදු නො ගැණේ. ඒ අරුත් ඇත්තත් ආර්‍යමාර්ගයට අඞ්ග නො වන බැවිනි. ඒ අරුත්හිලා ගන්නා සම්මාදිට්ඨි ආදීහු කො තැනත් ලැබෙන සාමාන්‍යයෝ ය පරසමයෙහි ද එව්හු වෙති.

දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායෙහිලා ගැණෙන මේ අඞ්ග අට අතුරෙහි ප්‍රධාන වනුයේ සම්මාදිට්ඨි නම් වූ ප්‍රඥාචෛතසිකය යි. සම්මාසඞ්කප්පාදී වූ අනෙක් අඞ්ග සත දුක් නසාලීමෙහි එයට උපකාරක ව සිටියේ ය. මේ අඞ්ග අට සම්පූර්ණ විසින් ලැබෙනුයේ ස්‍රොතාපත්ති ආදී වූ මගසිත් සතරෙහි ය. ඒ සිත් සතර ලොකොත්තර ය. මගසිත් යි ගැණුනේ ද මෙවුන් එහි යෙදී ගන්නා බැවිනි යෙදෙන විට ද නිවන් අරමුණු කොට එකක්ෂණයෙහි ම යෙදෙන්නේ ය. පෘථගජනවිත්තයෙහි එසේ එක්වට ම මොවුන්ගේ යෙදීමෙක් නැත්තේ ය. එහි අඩුවැඩිවෙමින් මෙතෙකැයි නියමයක් නැති ව නානාක්ෂණික ව යෙදෙත්. එසේ එහි විටින් විට පහළ වන මොවුනට කෙලෙස් නැසීමෙහි ශක්තියෙක් නැත. එහෙයින් විටින්

විට පළවන මෙ කියූ අඞ්ගයෝ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායෙහි ඇතුළත් නො වෙත්. මේ අඞ්ග අට කෙලෙස් නැසීමෙහි ශක්තිමත් ව එක්වට ම එක් ම සිතෙහි යෙදේ නම්, එකල්හි දුඃනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යයෙහි ඇතුළත් වේ. කෙලෙස් නැසීමෙහි ශක්තිමත් ව එක්වට ම එක් ම සිතෙහි යෙදෙන්නෝ ය ලොකොත්තරභාවයට ගියෝ. මෙසේ මොවුන් එක්වට එක් ම සිතෙහි ලොකොත්තර විසින් යොදා ගැණීමෙහි සමර්ථ වනුවෝ මොවුන් පුහුදුන් කාලයෙහි වෙන් වෙන් වශයෙන් සිත්හිලා වැඩූ නුවණැත්තෝ ම ය.

සම්මාදිට්ඨි ආදී වූ මේ ධර්මචක්‍රය ස්‍රොතාපත්ති ආදී වූ සිවුවැදැරුම් අවධීන්ගේ වශයෙන් කෙලෙසුන්ගෙන් දුරු ව සිටි බැවින් හා ආර්‍යභාවය සාදා දෙන උපාය බැවින් හා චතුර්විධ ආර්‍යඵලය සිදු කරණ බැවින් හා ආර්‍ය නම් වන අතර නිවන් කැමැත්තන් විසින් සෙවියයුතු බැවින් හා නිවන් අරමුණු කොට එය සොයා යන බැවින් හා කෙලෙසුන් නසා ලමින් නිවන් අරමුණු කොට පවත්නා බැවින් හා මාර්ග ද නම් වේ.

ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ග යන මෙයින් ස්‍රොතාපත්ති ආදි චතුර්විධ ආර්‍යමාර්ගය ම ගන්නා ලද්දේ ය. "**සවායං චත්තාරොපි ලොකුත්තරෙ මග්ගෙ එකතො කත්වා කථිතො අට්ඨඞ්ගිකො මග්ගොති**" යන ආචාර්‍යවචනයෙන් එවග පැහැදිලි ය. එහි ප්‍රථම ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ග ය සොතාපත්තිමග්ග ය යි. එයින් කෙරෙණුයේ සක්කායදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස සංයොජනයන් නැසීම හා ඉතිරි සංයොජනයන්ගේ අපායොත්පත්තිදායක බලවෙගය නසාලීම ය. ද්විතීය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය සකදාගාමිමග්ග ය යි එය කාමරාග-ව්‍යාපාදයන්ගේ බලවත් බව නසා ඔවුන් දුබල බවට තුනීබවට පමුණුවාලන්නේ ය. තෘතීය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අනාගාමිමග්ගය යි. එය එසේ බලවත්බව නැසී යෑමෙන් දුබලබවට ගිය කාමරාග-ව්‍යාපාදයන් මූළුමනින් නාසලන්නේ ය. තුරීය අෂ්ටාඞ්ගිකමාර්ගය අරහත්තමග්ග ය යි. එය රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා සංයොජනයන් මුල් නො තබා ම අනුශයන් සහිත ව සිඳලන්නේ ය. අවස්ථා විසින් අෂ්ටාඞ්ගිකමාර්ගය මෙසේ සතරක් ව බෙදී ගියේ ද, මේ වනාහි එක් ම අෂ්ටාඞ්ගිකමාර්ග ය යි දතයුතු ය. ස්‍රොතාපත්ති ආදී අවස්ථා සතරෙහි ද වෙන් වෙන් වූ පරිකර්මභාවනා වශයෙන් ලැබෙන අෂ්ටාඞ්ගිකමාර්ගය සතරවරෙක සතර විථියෙක ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන්ගේ අව්‍යක්තතා-ව්‍යක්තතා-ව්‍යක්තතරතා-ව්‍යක්තතමතා යන එකිනෙකට වැඩියෙන් වැඩී ගිය විශෙෂගුණ ඇසුරු කොට උපදනේ ය. ඒ

මුත් අෂ්ටාඞ්ගිකමාගී සතරෙකැ යි නො ගතයුතු ය. අෂ්ටාඞ්ගික-මාගීය සකෘදාගාමීත්‍රිකයෙහිලා ගණිත් ම ස්‍රොතාපත්ති අවස්ථායෙහි අව්‍යක්ත ය. සකෘදාගාමී අවස්ථායෙහි ව්‍යක්ත ය. අනාගාමී අවස්ථා-යෙහි ව්‍යක්තතර ය. අර්හත්ත්ව අවස්ථායෙහි ව්‍යක්තතම ය. සම්මාදිට්ඨි ආදීවූ ධර්මචක්‍රය පෙර පසුත් අඩුවැඩිත් නො ව එක්වට ම ප්‍රථම ලොකොත්තරචිත්තයෙහි උපදනා විට සොතාපත්තිමග්ග-ය යි ද දෙවන වූ ලොකොත්තරචිත්තයෙහි උපදනා විට සකදා-ගාමීමග්ග ය යි ද තෙවන වූ ලොකොත්තරචිත්තයෙහි උපදනා විට අනාගාමීමග්ග ය යි ද සිවුවන වූ ලොකොත්තරචිත්තයෙහි උපදනා විට අරහත්තමග්ග ය යි ද කියනු ලැබේ. මෙය මෙසේ ලොකොත්තර සිත්හි යෙදුනේ ද ක්‍රමයෙන් අව්‍යක්තතාදිගුණ විසින් වැඩුනු පැහැනු අෂ්ටාඞ්ගිකමාගී ය යි දතයුතු ය.

ඒ මේ අෂ්ටාඞ්ගිකමාගී ය "**චත්තාරො පන මග්ගුප්පාදා එක-චිත්තක්ඛණිකා**" යනු ආගම බැවින් එකෙකුගේ සිත්හි යට කියූ අවස්ථා විසින් සතරවරක් ම මුත් ඉන් වැඩි එක්වරකුදු කිසිලෙසකිනුත් නො උපදනේ ය. එසේ වන්නේ ඉන් වැඩියක් ඉපදීමෙන් කළයුතු කාර්‍යයක් නැති බැවිනි. සෝවන් ඈ ඒ ඒ මගින් නැසිය යුතු වූ කෙලෙස් නැවැත නො උපදනා ලෙසින් අවධි විසින් මුළුමනින් නැසී යන බැවින් සත්ත්වයාගේ සසරෙහි ඉපැත්ම ද එයින් අවසන් වන්නේ ය. මෙසේ අවස්ථා සතරෙක උපදනා ආර්‍යමාගීයෙන් අවධි විසින් භවයන්ගේ ඉදිරියෙහි නො පැවැත්මත් කෙලෙසුන්ගේ අනුත්පාදනිරොධයත් වන්නේ ය. එසේ නැසුනු භවයෙහි පැවැත්ම හා, නැවැත කෙලෙස් නො උපදනා බැවින් හා පුන පුනා අෂ්ටාඞ්ගිකමාගීයාගේ ඉපදීමෙන් වැඩෙක් නැත්තේ ය. එබැවින් මුලින් උපන් සිතෙහි නැවැත නැවැතත් ඒ නො උපදියි. සෝවන් ඈ සිත් සතරෙහි අෂ්ටා-ඞ්ගිකමාගීය සතරවරක් ම මුත් එක් සිතෙක දෙවරක් නම් නො උපදියි.

පූර්වභාගප්‍රතිපත්ති විසින් ලැබෙනුයේ ලෞකික වූ අටහින් ම පිරිපුන් නො වූ මාගීය යි. එ ද නානාක්ෂණික ය. හෙවත් නන් ඇසිල්ලෙහි ලැබෙන්නේ ය. ලොකොත්තරමාගීයට සම්භාර ව සිටියේ ය. පූර්වභාගමාගී නාමයෙන් ගැණෙන්නේ ය. ලෞකික-ලොකොත්තර මිශ්‍රකනය විසින් ආයේ මාගීසත්‍යයෙහි ඇතුළත් වේ. එහෙයින් මාගීය ප්‍රධාන විසින් ලොකොත්තර වේ. අප්‍රධාන විසින් ලෞකික වේ. ලෞකිකය අඞ්ග විසින් සම්පූර්ණ නො වේ. නානාක්ෂණයෙහි උපදනේ ය. පූර්වභාගප්‍රතිපත්ති විසින් ගැණෙන මෙහි විරති තුණ එක් ව නො යෙදේ. ලොකොත්තරයෙහි අඞ්ග

අට ම එක් ම සිත්හි නිවන අරමුණු කොට යෙදෙයි. මේ යෙදීම **උතකෘෂ්ට** විසිනි. ප්‍රථමද්‍ධ්‍යාන ස්‍රොතාපත්තිමාර්ගචිත්තය ප්‍රථම-ද්‍ධ්‍යාන සකෘදාගාමීමාර්ගචිත්තය ප්‍රථමද්‍ධ්‍යාන අනාගාමීමාර්ගචිත්තය ප්‍රථමද්‍ධ්‍යාන අර්හත්මාර්ගචිත්තය යන ලොකොත්තරකුශලචිත්ත-යන්හි උපදනා මාර්ගය බලා ලොකොත්තරමාර්ගය අටහින් **යුක්තය** යි වදාළ සේක.

ද්විතීයද්‍ධ්‍යාන ස්‍රොතාපත්තිමාර්ගචිත්තය යනාදී වූ සෙසු ධ්‍යාන යන්ගේ වශයෙන් උපදනා මාර්ගචිත්තයන්හි විතර්කය නො යෙදෙන බැවින් සම්මාසඞ්කප්ප නම් වූ මාර්ගාඞ්ගය ඒ සිත්හි නො ලැබෙන්-නේ ය. එහෙයින් ඒ ලොකොත්තරමාර්ගසිත්, සතහින් **යුක්ත** ව ලැබේ. මේ වනාහි ඔමක වශයෙනි. සෙස්ස මේ නයින් සලකා ගත යුතු ය. පඤ්චඞ්ගිකාදීන්ගේ වශයෙන් ලැබෙනුයේ ලෞකික වූ පූර්වභාගප්‍රතිපත්තිමාර්ගය යි. මෙය විදර්ශනා වීථීන්ගේ වශයෙන් නොයෙක් වර නානාවිධ සංස්කාරයන් අරමුණු කොට එක-චිත්තක්ෂණික ව උපදියි. අනෙක් බොධිපාක්ෂිකධර්මයන් හා යෙදී මිශ්‍රව ලැබෙන බැවින් මිශ්‍රකමාර්ග ය යි ද කියනු ලැබේ.

සම්මාදිට්ඨි නම්:- චතුස්සත්‍යධර්මයන් ප්‍රතිවෙධ කරණු පිණිස විවට්ටපාදකෂට්විශුද්ධිසඞ්ඛ්‍යාතපූර්වභාගප්‍රතිපදා පිරීම් වශයෙන් පිළිපන්නා වූ යොගාවචරයාගේ නිවන් අරමුණු කොට සිටි, අවිද්‍යා නුශය මුළුමනින් සිඳලන බැවින් විද්‍යා නම් වූ ප්‍රඥාවෛතසිකය යි. එය අවිපරීත දැකීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය සිවුසස් දහම් පැවසී ම ය. වැටහෙන අයුර අවිදඳුරු නැසීම ය. **"චතු-සච්චපටිවෙධාය පටිපන්නස්ස යොගිනො නිබ්බානාරම්මණං අවිජ්ජානුසයසමුග්ඝාතකං පඤ්ඤාචක්ඛු, තං සම්මාදස්සන-ලක්ඛණං, අත්ථප්පකාසනරසං, අවිජ්ජන්ධකාරවිද්ධංසනපච්චු-පට්ඨානං"** යනු එහිලා කීහ.

සිවුසස්දහම් ඇති සැටියෙන් අවිපරීත කොට දක්නා චතුර්-විධ මාර්ගචිත්තයෙහි යෙදුනු ප්‍රඥාවෛතසිකය සම්‍යගදෘෂ්ටිය යි මෙයින් කියන ලද්දේ ය. කියන ලද්දේ ද උතකෘෂ්ට විසින්ම ය.

"සම්මා අවිපරීතතො පස්සතීති=සම්මාදිට්ඨි, සම්මා වා තාය පස්සන්තීති = සම්මා දිට්ඨි, සම්මා දස්සනං=සම්මා දිට්ඨි, පසත්ථා සුන්දරා වා දිට්ඨි=සම්මා දිට්ඨි, යථාව දිට්ඨි=සම්මා දිට්ඨි, නිය්‍යානිකා කුසලදිට්ඨි=සම්මා දිට්ඨි" යනු එහි ශබ්දාර්ථ දැක්වීම ය.

සම්මාදිට්ඨිය, ලෞකික ලොකොත්තර විසින් දෙ පරිදි ය. **"දුවිධා හොති සම්මා දිට්ඨි ලොකියලොකුත්තරා චෙති"** මෙසේ දළ විසින් දෙ පරිද්දෙකින් බෙදුනු සම්‍යගදෘෂ්ටිය නැවැත **කම්මස්ස-**

කතා සම්මාදිට්ඨි-ඣාන සම්මා දිට්ඨි-විපස්සනාසම්මාදිට්ඨි-මග්ග-සම්මාදිට්ඨි ඵලසම්මාදිට්ඨි යි පස් අයුරකින් ද, නැවැත **කම්මස්ස-කතාසම්මාදිට්ඨි-නාමරූපපරිග්ගහසම්මාදිට්ඨි-හෙතුපච්චයපරි-ග්ගහසම්මාදිට්ඨි-විපස්සනාඤ්ඤණදස්සනසම්මාදිට්ඨි-ලොකුත්තර මග්ගඵලසම්මාදිට්ඨි** යි පස් අයුරකින් දැ යි පස් පස් අයුරකින් බෙදා දක්වන ලද්දී ය. මේ පංචක දෙක්හි ම කම්මස්සකතාසම්මාදිට්ඨි යි ආවා එක් ම සම්මාදිට්ඨිය යි. එහිලා කියයුතු වෙනස් බවෙක් නැත්-තේ ය. එහි ප්‍රථමපංචකයෙහි ආ මග්ගසම්මාදිට්ඨි-ඵලසම්මාදිට්ඨි දෙක හා ද්විතීයපංචකයෙහි ආ ලොකුත්තරමග්ගඵලසම්මාදිට්ඨිය යන තුණ එක් ම ලොකොත්තරසම්‍යග්දෘෂ්ටිය යි දත යුතු ය. මෙහිලා දතයුතු කරුණු අතින් මේ ත්‍රිකයෙහි ද නානාත්වයෙක් නැත්තේ ය. ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙහි ද අඞ්ගත්වයෙන් ආවා මෝ තොමෝ ය. ආර්‍ය යනු එක් වූයේ ද මෙ බැවිනි. මේ ධර්ම කථායෙහි ද කිය යුත්තී මෝ ය. එහෙත් ප්‍රාස්තාවික විසින් හා මෙයට ප්‍රත්‍යයභාවයෙන් සිටුනා බැවින් හා කම්මස්සකතා දීලොකීය සම්මාදිට්ඨින් පිළිබඳ අතිසංක්ෂිප්ත ධර්මකථාමාත්‍රයෙක් ආ යුත්තේ ම ය. මෙයට ප්‍රත්‍යයභාවයෙන් සිටුනා බැවිනැ යි කීයේ ලොකීය වූ කර්මස්වකතාදි සම්‍යග්දෘෂ්ටීන්ගෙන් සම්‍යග්දෘෂ්ටික නො වූයේ ලොකොත්තරසම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යග්දෘෂ්ටික වන්නේ ය යනු නො වන බැවිනි. ලෞකිකසම්‍යග්දෘෂ්ටීන් ගැණ කරුණු කෙටි යෙන් වුව ද දැක්විය යුත්තේත් දත යුත්තේත් එහෙයිනි. සසර දුක් ගෙවා නිවන් ලබන්නට කැමැත්තන් විසින් පළමු කොට කර්මස්වකතාදිසම්‍යග්දෘෂ්ටීන්හි පිහිටා ගත යුතු ය. බෞද්ධ උපාසක වනුයේ ද එහි පිහිටා ගත් පසු ය. තිසරණයෙහි පිහිටා ගැණී-මෙන් කරණුයේ ද ඒ ය. එය නිවන් පිණිස තබනා පළමු පියවර වන්නේ ය. ලෞකිකසම්‍යග්දෘෂ්ටිඥානය ලොකොත්තරසම්‍යග්දෘෂ්ටි ඥානයට අත දී සිටියේ ය. ලෞකිකසම්‍යග්දෘෂ්ටිය පූර්වභාග සඞ්ඛ්‍යාත ෂට්විශුද්ධි කාලයෙහි හා ලොකොත්තරසම්‍යග්දෘෂ්ටිය ඥානදර්ශන විශුද්ධිකාලයෙහි ලැබෙන්නී ය.

එහි, **කම්මස්සකතාසම්මාදිට්ඨි**නම්:- සත්ත්වජීවිතය හා සත්ව-ජීවිතයෙහි ලැබෙන නොයෙක් උස් පහත් කම් සැප දුක් ඇ පෙරැළි, ඒ ඒ සත්ත්වයන් විසින් කරණ ලද අතීතකර්මයන්ගේ හා වර්තමානකර්මයන්ගේ අනුභාවයෙන් සිදුවන බව දැකීම ය. **"කම්මස්සකා මාණව! සත්තා කම්මදායාදා කම්මයොනි කම්ම-බන්ධු කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්ප-ණීතතායාති"** යනු දෙශනා ය.

එකවොකාර-චතුවොකාර-පංචවොකාර භව වශයෙන් බෙදී ගිය සත්ත්වලොකයෙහි හැම සත්ත්ව කෙනෙක් තමන් තමන් කළ කුශලාකුශලකර්ම ස්වසන්තකඛනය කොට සිටියෝ කප් සිය දහස් ගණන් ජාතීන්හි එයට අනුව තෘෂ්ණාසාහාය්‍යයෙන් උපත ලබා උස්පහත්කම් සැපදුක් ලබමින් විඳිමින් ගමන් ගෙණ සිටිත්. කුශලාකුශලකර්ම, සෙවනැල්ල මෙන් කර්ම කළවුන් ලුහු බැඳ යන්නේ ය. මෙසේ කර්මය ස්වඛනය කොට සිටියෝ **කම්මස්සක** යෝ ය. කර්මයෙන් උපදනා විපාකඵලයට හිමිවූවෝ කර්ම කළෝ-ම ය. යම් කෙනෙක් කුශලාකුශලකර්ම කළෝ නම් ඔවුහු ජාතියක් ජාතියක් පාසා කර්මඵල නැමැති දායාදයට හිමි ව සිටියෝ ය. ඔවුහු **කම්මදායාද**යෝ ය. උස් පහත් කම්වලට සැප දුක්වලට හෙතු ව යොනි සි කියනු ලැබේ. ඒ මේ කුශලාකුශලකර්ම යොනි කොට උපාය කොට සිටියෝ **කම්මයොනි**හු ය. කුශලාකුශලකර්ම නෑ හිතවතුන් කොට සිටියෝ **කම්මබන්ධු**හු ය. කුශලාකුශලකර්ම පිළිසරණ කොට සිටියෝ **කම්මපටිසරණ**යෝ ය. තව ද මෙකල මිනිසුන් විසින් කරණු ලබන සීසෑම් වෙළඳාම් ගෙරිරැකීම් ආදී සත්කර්ම හා හොරකම් මිසහැසුරුම් බේබදුකම් ආදී අසත්කර්ම දිවි පැවැතුම් පිණිස ඛනය කොට සිටියවුන් ද, ඒ සත් අසත්කර්ම දායාද කොට සිටියවුන් ද, ඒ ම උපාය කොට සිටියවුන් ද, ඒ ම නෑ හිතවතුන් කොට සිටියවුන් ද, ඒ ම පිළිසරණ කොට සිටියවුන් ද මේ **කම්මස්සකාදිපදයන්**ගෙන් හැඳින් විය හැකි ය. ඒ ඒ සත්ත්ව යන් විසින් වරක් කළ කුශලාකුශලකර්ම කප් සියදහසක්හුගේ ගෙවී යෑමෙනුදු විපාක දිය හැකි බැවින් කර්ම රැස් කිරීමෙහිලා පරීක්ෂාකාරී විය යුතු ය. මෝ කම්මස්සකතාසම්මාදිට්ඨිය, සම්පත්ති-භවය දෙන්නී ය.

දශවස්තුකසම්‍යග්දෘෂ්ටිය විසින් ගැණෙන සම්‍යග්දෘෂ්ටිය ද මෙහි ම ඇතුළත් ය. **"දසවත්ථුකා සම්මාදිට්ඨි කම්මස්සකතා-සම්මාදිට්ඨියායෙව සඞ්ගහං ගච්ඡති"** යනු ආචාර්‍ය්‍යවචන යි.

අත්ථි දින්නං = දෙන ලද්ද විපාක ඇත. **අත්ථි යිට්ඨං** = පුදන ලද්ද විපාක ඇත. **අත්ථි හුතං** = පඬුරු විසින් දෙන ලද්ද විපාක ඇත. **අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො** = කුශලාකුශල කර්මයන්ගේ ඵලවිපාක ඇත. **අත්ථි අයං ලොකො** = මෙලොව ඇත. **අත්ථි පරො ලොකො** = පරලොව ඇත. **අත්ථි මාතා** = මව ඇත. **අත්ථි පිතා** = පියා ඇත. **අත්ථි සත්තා ඔපපාතිකා** = ඔපපාතික සත්ත්වයෝ ඇත. **අත්ථි ලොකෙ සමණබ්‍රාහමණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති** = මෙලොව පරලොව තුමූ

විශිෂ්ටඥානයෙන් දැන පවසන නො ඇදව ගමන් ගත් මොනවට පිළිපන් මහණ බමුණෝ ඇතැ යි මෙසේ නුවණින් දැන පිළිගැණීම දශවස්තුකසම්‍යග්දෘෂ්ටිය යි කියනු ලැබේ. මෙහි පදරෑන් පමණින් කියූ මෙහි විස්තරධර්මකථාව අන් බණපොත් බලා ධර්මධරයන් විචාරා දතයුතු ය.

ඤානසම්මාදිට්ඨි නම්:- ප්‍රථමධ්‍යානාදිරූපාවචරධ්‍යාන-චිත්තයෙහි හා ආකාසානඤ්චායතනාදිඅරූපධ්‍යානචිත්තයන්හි යෙදුනු ප්‍රඥාවෛතසිකය යි. ධ්‍යානචිත්තවිභාගය යට කියන ලද්දේ ය. මෝ සම්‍යග්දෘෂ්ටිය රූපාරූපභවයන්හි පිළිසඳ දෙන්නී ය.

විපස්සනාඤාණසම්මාදිට්ඨි නම්:- බණදහම් උගෙණ බණදහම් අනුව සිල්වත් ව ගිහි කම්කටුලෙන් මිදී කම් සැප හැර දමා සමාජයෙන් බැහැර ව විවෙකස්ථානයකට වැද පඤ්චස්කන්ධය හා එහි නැගී සිටි අනිත්‍ය-දුඃඛ-අනාත්ම ලක්ෂණයන් පොතපතෙහි කියූ ලෙසින් භාවනා කරන්නහුගේ විදර්ශනා චිත්තයෙහි යෙදී ගන්නා වූ ප්‍රඥාවෛතසිකය යි. මෝ සම්‍යග්දෘෂ්ටිය කවර භවයෙක හෝ පිළිසඳ නො දෙන්නී ය. මෝ වඩනා ලද්දී දිවුදුමියෙහි රහත්බව දෙන්නී ය. යම් ලෙසකින් එසේ රහත්බව නො දුන්නී නම්, ඉදිරි සත්භවයෙහි පිළිසඳ දෙන්නීය යනු ආචාර්‍යවාද යි.

මෙහි දෙවතීය පඤ්චකයෙහි දැක්වුනු නාමරූපපරිග්‍රහ-හෙතු-ප්‍රත්‍යයපරිග්‍රහ - විපස්සනාඤාණදස්සනසම්මාදිට්ඨීහු, ප්‍රථමපඤ්චකයෙහි දැක් වූ එක් ම විපස්සනාසම්මාදිට්ඨියෙහි ඇතුළත් වෙත්. නාමරූපධර්ම, නාමරූපධර්මයන්ට අයත් සාමාන්‍ය විශෙෂලක්ෂණත් සමග මැනැවින් බෙදා වෙන් කොට බලන්නහුගේ විදර්ශනා චිත්තයෙහි යෙදෙන ප්‍රඥාවෛතසිකය නාමරූපපරිග්‍රහසම්‍යග්දෘෂ්ටිය යි ද, නාමරූපධර්මයන්ගේ උපතට කරුණු වූ ප්‍රතීත්‍යසමුත්පාද-ලක්ෂණ දැන වඩන්නහුගේ විදර්ශනාචිත්තයෙහි යෙදෙන ප්‍රඥාවෛතසිකය හෙතුප්‍රත්‍යයපරිග්‍රහසම්‍යග්දෘෂ්ටිය යි ද, නාමරූපධර්මයන් පිළිබඳ අනිත්‍යාදිලක්ෂණ නැවැත නැවැත වඩන්නහුගේ විදර්ශනාචිත්තයෙහි යෙදෙන ප්‍රඥාවෛතසිකය විදර්ශනාඤානදර්ශන සම්‍යග්දෘෂ්ටිය යි ද ඉතා සැකෙවින් දතයුතු ය. මඟසම්මාදිට්ඨි - ඵලසම්මාදිට්ඨි යි මුල්වාරයෙහි දෙකක් කොට ගත් ලෝකුත්තර සම්මාදිට්ඨිය දෙවන වාරයෙහි ලෝකුත්තරමඟඵලසම්මාදිට්ඨිය යි එකක් කොට ගත්හ. එහි ලෝකොත්තරමඟඥානය මඟසම්මා-දිට්ඨිය යි. ලෝකොත්තරඵලඥානය ඵලසම්මාදිට්ඨිය යි. එ දෙක එකක් කොට ගත් කල්හි ලෝකුත්තරමඟඵලසම්මාදිට්ඨිය යි.

මෙහි ඉතා සැකෙවින් කියූ කර්ම්ස්වකතාසම්‍යග්දෘෂ්ටිය හැර අන් එක ද සම්‍යග්දෘෂ්ටියෙක් බුද්ධොත්පාදයක ම මුත් අන් කිසිදුකත් නො ලැබෙන්නේ ය. මෙහි ධ්‍යානසම්‍යග්දෘෂ්ටිය චිත්තවිශුද්ධියෙහි, නාමරූපපරිග්‍රහසම්‍යග්දෘෂ්ටිය දෘෂ්ටිවිශුද්ධියෙහි, හෙතුප්‍රත්‍යයපරිග්‍රහසම්‍යග්දෘෂ්ටිය කාඞ්ක්ෂාවිතරණවිශුද්ධියෙහි, විදර්ශනාඥානදර්ශනසම්‍යග්දෘෂ්ටිය මාර්ගාමාර්ගඥාන-ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධීන්හි ඇතුළත් ව සිටුනා බැවින් ඒ විශුද්ධීන්හි යොග කටයුත්තේ ය.

ලොකොත්තර වූ ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයෙහි ප්‍රථමාඞ්ගය සම්‍යග්දෘෂ්ටිය යි. එය මෙසේ වදාළ සේක:

"කතමා ච භික්ඛවෙ! සම්මාදිට්ඨි? යං භික්ඛවෙ! දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති භික්ඛවෙ! සම්මාදිට්ඨි" යි.

මහණෙනි, සම්‍යග්දෘෂ්ටිය කවරිද? යත්:- දුකෙහි යම් දැනීමෙක් වේ ද, දුක් හට ගැණීම් හෙතුයෙහි යම් දැනීමෙක් වේ ද, දුක් සන්සිඳීමෙහි යම් දැනීමෙක් වේ ද, දුක් සන්සිඳීමට පමුණු වන පිළිවෙතෙහි යම් දැනීමෙක් වේ ද, මහණෙනි! මෙය සම්‍යග්දෘෂ්ටිය යි කියනු ලැබේ යනු එහි අරුත් ය. මෙයින් වදාළෝ දුඃඛසත්‍යඥානය - දුඃඛසමුදයසත්‍යඥානය - දුඃඛනිරොධසත්‍යඥානය - දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යඥානය යන චතුර්විධ සත්‍යඥානය සම්‍යග්දෘෂ්ටිබව ය. ධර්මයන් පිළිබඳ ලොකය පිළිබඳ ඇති සැටිය ඇති සැටියෙන් විපරීත නො කොට අවිපරීත ව දකින චතුර්විධ මාර්ගයෙහි යෙදුනු ප්‍රඥාචෛතසිකය සම්‍යග්දෘෂ්ටිය යි ඉතා කොටින් දත යුත්තේ ය.

එහි **දුක්ඛෙ ඤාණ** නම්,

"දුක්ඛං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චිත්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං අමොහො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤා පජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි" යනු ආගම බැවින් දුඃඛසත්‍යය පිළිබඳ දතයුතු තාක් කරුණු ඇතිතාක් තොරතුරු දුක පිළිබඳ පෙළීම - පිළියෙලවීම - තැවීම-

පෙරැළීම යන පීඩන – සඞ්ඛත – සන්තාප – විපරිණාම සභාවයන් එකකුත් නො හැර විපරීත නො කොට නො වෙනස් කොට දැනීම හා පංචස්කන්ධය අනිත්‍යානුදර්ශීනාදින්ගේ වශයෙන් පුන පුනා පෙරළ පෙරළා නග නගා එම වගවිභාග මැනැවින් දැනීම ය.

දුක ඇරැඹ දුක අරමුණු කොට දුකෙහි තතු හැමතින් ප්‍රකට කිරීම් විසින් පහළ වන ප්‍රඥාවෛතසිකය දුඃඛඥනය යි කියන ලද්දේ ය. දුඃඛඥනය වඩාත් පැහැදිලි කරණු පිණිස එයට පර්‍යාය විසින් යෙදූ පදසමූහයෙන් දුඃඛඥනය වඩාත් පැහැදිලි වන්නේ ය.

එහි, දුක ප්‍රකෘතියෙන් අතිශයින් දැනීම **පජානනා** නම්. දුක පිළිබඳ අනිත්‍යාදිලක්ෂණ සොයා දැනීම **විචය** නම්. ඒ ම වඩ වඩාත් සොයා දැනීම **පවිචය** නම්. සිවුසස් දහම් සොයා බලා නුවණට හසුකර ගැණීම **ධම්මවිචය** නම්. දුකෙහි නැගී සිටි අනිත්‍යාදි **ලක්ෂණ** මැනැවින් ලක්ෂණ විසින් සැලකීම **සල්ලක්ඛණා** නම්. අනිත්‍යාදිලක්ෂණ ඇසුරු කොට දුකෙහි තතු දැඩිලෙස සලකා බැලීම **උපලක්ඛණා** නම්. අනිත්‍යාදිලක්ෂණ පුන පුනා සැලකීම **පවවුපලක්ඛණා** නම්. ජවන – නිමේඩිකා ප්‍රඥාදීන්ගේ වශයෙන් දැනීම **පණ්ඩිච්ච** නම්. අනිත්‍යාදිලක්ෂණ විෂයයෙහි නුවණින් බැලීම **කොසල්ල** නම්. අනිත්‍යාදිලක්ෂණ නො අඩු ව දැනීම **නෙපුඤ්ඤ** නම්. අනිත්‍යාදිලක්ෂණ පංචස්කන්ධයෙහි නගා විභාවනය කිරීම **චෙතව්‍යා** නම්. අනිත්‍යාදිලක්ෂණ සිතට නගා ගැණීම, නැත, චිත්තා ව යමක්හට උපදී නම් උන් ලවා තිලකුණු ගැන්වීම **විඤ්ඤා** නම්. විද්‍යමාන වූ අනිත්‍යාදිලක්ෂණ කෙරෙහි ඇලීම, නැත, පොළොව සම ව පතළ නුවණින් අනිත්‍යාදිලක්ෂණ බැලීම **භූරි** නම් පංචස්කන්ධය නිසා උපදනා කෙලෙස් හිංසා කරන්නී **මෙධා** නම් අනිත්‍යාදිලක්ෂණ ප්‍රතිවෙධයට නැඹුරු කරන්නී **පරිණායිකා** නම් අනිත්‍යාදිලක්ෂණ විවිධාකාරයෙන් දක්නී **විපස්සනා** නම්. අනිත්‍යාදි ලක්ෂණ මැනැවින් දැනීම **සම්පජඤ්ඤ** නම්. අනිත්‍යාදිලක්ෂණ මැනැවින් දැන එහි මුළානොවීම **අමොහ** නම්. අනිත්‍යාදිලක්ෂණ නියම තතු විසින් දැනීම **පඤ්ඤා** නම්. එහිලා ආධිපත්‍යය දරන්නේ **පඤ්ඤින්ද්‍රිය** නම්. අවිද්‍යාව නිසා අනිත්‍යාදීන් කෙරෙහි නො සැලෙන්නේ **පඤ්ඤාබල** නම්. කෙලෙස් සිදලීමෙහිලා ප්‍රඥාව ම ශස්ත්‍රයක් වැනි ව සිටියා **පඤ්ඤාසත්ථ** නම් හැම කෙලෙස් බල ඔබා අතිශයින් නැගී සිටි බැවින් ප්‍රඥාව ම පහයක් වැනි ව සිටියා **පඤ්ඤාපාසාද** නම්. අනිත්‍යාදීන් මැනැවින් දැක්මෙහි ආලෝකයක් වැනි ව සිටියා **පඤ්ඤාආලොක** නම්. එහි ම අවභාසයක් මෙන් සිටියා **පඤ්ඤාඔභාස** නම්. අනිත්‍යාදීන් විෂයයෙහි පහනක් මෙන් සිටියා **පඤ්ඤාපජ්ජොත** නම්. රතිජනනාදීන්ගේ වශයෙන් රුවනක් මෙන්

සිටියා **පඤ්ඤාරතන** නම්. මේ එ පදයන්ගේ ඉතා කෙටි අරුත් ය. මේ හැම පදයෙකින් කියන ලද්දී දුඃඛසත්‍යවිෂයයෙහි පැවැති ප්‍රඥා ය. මෙසේ දුඃඛසත්‍යඥානය පදසමූහයෙකින් විවෘත කරණ ලද්දේ අනෙකෙකු අන්ලෙසකින් අනෙකෙකු අන්ලෙසකින් යන ඇලෙසින් පංචස්කන්ධය පිළිබඳ අනිත්‍යාදිලක්ෂණ අවබෝධ කරණ බැවින් විවිධාකාරයෙන් භින්න වූ ලොකය බලා ය. මේ පාලිසූත්‍රයෙහි ධම්මවිචය- අමොහ ශබ්ද දෙක දෙ තැනක යෙදී සිටියේ ය. අමොහය මොහයට ප්‍රතිපක්ෂභාවයෙන් ආයේ ය. එහෙයින් යම් මේ මොහ යෙක් වේ ද, එය හුදෙක් මෝහයෙන් අන්‍ය වූ ධර්මයෙක් නො වේ. මොහයට ප්‍රතිපක්ෂ වූ ධම්මවිචය යි කියන අමොහය ම මෙහි අදහස් කරණ ලද්දේ ය.

දුක්ඛසමුදයෙ ඤාණ නම්:-

"දුක්ඛසමුදයං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා-පෙ-සම්මා-දිට්ඨි" යනු ආගම බැවින් දුක්ඛසමුදය පිළිබඳ දතයුතු තාක් කරුණු ඇති තාක් වගවිභාග දුක්ඛසමුදය පිළිබඳ රැස්කිරීම-හෙතු-යෙදීම බාධා කිරීම යන ආයූහන – නිදාන – සංයොග – පළිබොධස්වභාව යන් එකකුත් නො හැර විපරීත නො කොට නො වෙනස් කොට දැනීම ය.

දුක් හට ගැණීම ඇරැබ දුක් හට ගැණීම අරමුණු කොට දුක් හට ගැණීමෙහි තතු හැමතින් ප්‍රකට කිරීම් විසින් පහළ වන ප්‍රඥාවෛතසිකය දුක්ඛසමුදයඤාණය යි කියන ලද්දේ ය. දුඃඛ සමුදයඥානය වඩාලාත් ගන්වනු පිණිස යෙදුනු පදයන්ගේ අරුත් යට කී ලෙසින් දතයුතු ය.

දුක්ඛනිරොධෙ ඤාණ නම්:-

"දුක්ඛනිරොධං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා-පෙ-සම්මා දිට්ඨි" යනු ආගම බැවින් දුක්ඛනිරොධය පිළිබඳ දතයුතු තාක් කරුණු ඇති තාක් ධර්මයන්, දුක්ඛනිරොධය පිළිබඳ මිදීම-පිළියෙල නො කිරීම-නො මැරීම-වෙන් ව සිටීම යන නිස්සරණ – අසඞ්ඛත- අමත – විවෙකස්වභාවයන් දැනීම ය.

දුක් සන්සිඳීම ඇරැබ දුක්සන්සිඳීම අරමුණු කොට දුක් සන්සිඳීමෙහි තතු හැමතින් ප්‍රකට කිරීම් විසින් පහළ වන ප්‍රඥා වෛතසිකය දුඃඛනිරොධඥානය යි කියන ලද්දේ ය. දුඃඛනිරොධ ඥානය වඩාලාත් දන්වන්නට යෙදුනු පදයන්ගේ අරුත් යට කී සේ දතයුතු ය.

දුක්ඛනිරොධගාමිනීපටිපදාය ඤාණ නම්:-

"දුක්ඛනිරොධගාමිනිං පටිපදං ආරබ්භ යා උප්පජ්ජති පඤ්ඤා -පෙ- සම්මාදිට්ඨි" යනු ආගම බැවින් දුක්ඛනිරොධගාමිනීපටිපදාව පිළිබඳ දතයුතු තාක් කරුණු ඇති තාක් විස්තර, දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව පිළිබඳ එතෙරකිරීම - හෙතු - දැකීම - අධිපතිභාව යන නීයාන-හෙතු-දස්සන-ආධිපතෙය්‍ය ස්වභාවයන් එක කුත් නො හැර විපරීත නො කොට නො වෙනස් කොට දැනීම ය.

දුක් සන්සිඳීමට පමුණු වන පිළිවෙත ඇරැබ දුක් සන්සිඳීමට පමුණු වන පිළිවෙත අරමුණු කොට දුක් සන්සිඳීමට පමුණු වන පිළිවෙතෙහි තතු හැමතින් ප්‍රකට කිරීම් විසින් පහළ වන ප්‍රඥා චෛතසිකය දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාඥානය යි කියන ලද්දේ ය. දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාඥානය වඩාලාත් පහදාලන්නට යෙදුනු පදයන්ගේ අරුත් යට කියූ සේ ය. මෙහිලා කියන ලද්දේ අතිසංක්ෂිප්තමාත්‍රයෙකැයි ද දතයුතු ය.

ස්‍රොතාපත්තිමාගීචිත්තයෙහි අව්‍යක්ත ව, සකෘදාගාමීමාගීචිත්තයෙහි ව්‍යක්තව, අනාගාමීමාගීචිත්තයෙහි ව්‍යක්තතර ව අර්හත්මාගීචිත්තයෙහි ව්‍යක්තතම ව පහළ වන සම්‍යගදෘෂ්ටිය, එසේ ම වූ අනෙක් සම්‍යක් සඞ්කල්පනාදී වූ මාර්ගාඞ්ගයන් හා එක් ව සිඳහළ යුතු වූ කෙලෙස් සිඳලමින් එක්වට ම දුඃඛසත්‍යය පිරිසිඳ දැන ගන්නී ය. සමුදයසත්‍යය ප්‍රහීණ කරන්නී ය. නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරන්නී ය. මාර්ගසත්‍යය වඩන්නී ය. මෙසේ දුඃඛසත්‍යය පිරිසිඳින්නා වූ සමුදයසත්‍යය ප්‍රහීණ කරන්නා වූ නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරන්නා වූ මාර්ගසත්‍යය වඩන්නා වූ මේ චතුර්විධ-සම්‍යගදෘෂ්ටිය ප්‍රතිවෙධඥාන ය යි ද හඳුන්වනු ලබන්නී ය. මෝ තොමෝ ලොකොත්තර වූ ය.

මෙසේ දුඃඛසත්‍යය දක්නේ, දුඃඛසමුදයසත්‍යය ප්‍රහීණ කිරීම් වශයෙන් දකියි. දුඃඛනිරොධසත්‍යය සාක්ෂාත් කිරීම් වශයෙන් දකියි. දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාසත්‍යය වැඩීම් වශයෙන් දකියි. මේ ඒ වදාළ සැටි:- **"යො ඛො භික්ඛවෙ! දුක්ඛං පස්සති, දුක්ඛසමුදයම්පි සො පස්සති, දුක්ඛනිරොධම්පි පස්සති, දුක්ඛනිරොධගාමිනීපටිපදම්පි පස්සති"** යනු.

මේ කියූ චතුර්විධ සම්‍යග්දෘෂ්ටීන්ගෙන් මේ දැකීම පෙර පසු නො ව අඩු වැඩි නො ව සම පමණින් සිටුමග නැණ ලෙසින් එක්වට ම සිදු වන්නේ ය. ප්‍රදීපය අඳුරු දුරුකිරීම - තෙල්සිඳවීම-ආලොකය පැතිරවීම-වැටිය දැවීම යන කෘත්‍ය සතර එක්වට ම සිදු කරන්නා සේ ය.

දුඃඛසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් සත්කායදෘෂ්ටිය නවතාලන අතර සමුදයසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් උච්ඡේදදෘෂ්ටියත් නිරෝධසත්‍ය-සම්‍යග්දෘෂ්ටියෙන් ශාස්වතදෘෂ්ටියත් නැසී යනු එකාන්ත සිද්ධ ය. මේ එහිලා සාධකසූත්‍ර:-

"ලෝකසමුදයං ඛෝ කච්චාන! යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකෙ නත්ථිතා සා න හොති" යනු.

කාත්‍යායන! සංස්කාරලෝකයෙහි හට ගැණීම තතු සේ විදර්‍ශනා සහිත මාගීප්‍රඥාවෙන් දක්නහුගේ සංස්කාරලෝකය පිළිබඳ වූ යම් නාස්තිකදෘෂ්ටියෙක් වේ නම් ඒ නො වන්නී ය, යන අරුත්.

"ලෝකනිරොධං ඛෝ කච්චාන! යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතෝ යා ලෝකෙ අත්ථිතා සා න හොති" යනු.

කාත්‍යායන! සංස්කාරලෝකයෙහි සන්සිඳීම තතු සේ විදර්‍ශනා සහිත මාගීප්‍රඥාවෙන් දක්නහුගේ සංස්කාරලෝකය පිළිබඳ වූ යම් ආස්තිකදෘෂ්ටියෙක් වේ නම් ඒ නො වන්නී ය, යනු අරුත්.

මෙසේ ආර්‍යජනයා හැර සෙසු සාමාන්‍ය ලෝකීයජනයා මේ දෘෂ්ඨදෘෂ්ටිය ඇසුරු කොට නො හැර සිටුනාබව **"දවයං නිස්සිතෝ ඛොයං කච්චාන! ලෝකෝ යෙභුය්‍යෙන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච"** යන දෙශනාප්‍රදෙශයෙන් පැහැදිලි ය.

දුඃඛසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් සමුදයසත්‍යයාගේ ඵලභාවයෙන් ලැබෙන පඤ්චස්කන්ධය කෙරෙහි නිහිතා නිත්‍ය-ශුභ-සුඛ-ආත්ම භාවයෝ නැසී යන්නාහ.

සමුදයසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් හෙතුඵලපරම්පරාවගේ අවිච්ඡින්නත්වය දැකීමෙන් "ඊශ්වර ලෝකය හා ලෝකසත්ත්වයා මවා පවත්වා පිළියෙල කොට අවසානයෙහි නසාලන්නේ ය" යන ඊශ්වරනිර්මාණවාදය ද,

"සත්ත්ව - රජස් - තමස්සඞ්ඛ්‍යාතගුණත්‍රයාත්මක වූ ප්‍රකෘති යි ගත්තා අව්‍යක්තහෙතුවෙක් ඇත්තේ ය, ඒ අව්‍යක්තහෙතුවෙන් හට ගත් ලෝකය හා ලෝකසත්ත්වයාත් ලොව ඇති අනෙක් සියලු දෑයත් නැසී ගිය පසු ඒ හැම ඒ අව්‍යක්තප්‍රකෘතියෙහි ම ලීනව සැඟවී යන්නාහ, ඒ හැර ලොව මවා පාලනය කරණ අන්‍ය වූ ඊශ්වරයෙක් නො ද වේ ය"යි ගත් ප්‍රකෘතිවාදය ද,

"කාලය භූතයන් මවයි, කාලය සත්ත්වයන් නසයි, කාලය නිදන්නන් පුබුදුවයි, එහෙයින් කාලය ඉක්මවිය නො හැකි ය, ලොව මවන්නේ ද රකින්නේ ද නසන්නේ ද කාලය යි, එහිලා ඊශ්වරාදී වූ කිසිවකුගේ බලයෙක් නැත්තේ ය" යන කාලවාදය ද,

"ලොකයෙහි ඇති තාක් කටු තියුණු ය, දික්ව හට ගන්නේ ය, බෙලි-ගිවුළු ඈ පල වටකුරු ය, නයි-පොළොන්-ගැරඬි-පිඹුරු ඈ දිග් සත්තු පා නැත්තෝ ය, මුව-ගෝන-ඇත්-අස්-සී-වලස් ඈ සත්තු සිවුපා ඇත්තෝ ය, මොනර-කොබෙයි-ගිරා-ලිහිණි ඈ සත්තු දෙපා ඇති පියාපත් ඇත්තෝ ය, නන් අයුරෙන් පැහැයෙන් සටහනින් විසිතුරු වන්නාහ, මේ ඈ ලෙසින් ලොකයෙහි වූ සවිඥාන-අවිඥානක වූ හැම වස්තුහු ස්වභාව සිද්ධ යහ, කිසිවකු විසින් නො ද උපදවන ලදහ, ස්වභාවශක්තිමාත්‍ර ය ම මෙහි හෙතු ය, ස්වභාවයෙන් හට ගෙණ ස්වභාවයෙන් නැසී යෙති" යි යන ස්වභාවවාදය ද,

"පූර්වේකෘතහෙතුවෙන් පරපණ නසන්නෝ සොරකම් කරන්-නෝ බොරු කියන්නෝ කේලාම් කියන්නෝ රළුබස් කියන්නෝ නිසරු බස් කියන්නෝ වෙති" යන ඈ ලෙසින් ලොකයෙහි සියල්ල සියලු සැපදුක් විඳීම්, පූර්වේකෘතහෙතුයෙන් වේ ය යන පූර්වේකෘත හෙතුවාදය ද,

"නො සිඳෙන හුයෙක ඇවුණු නො බිඳෙන මැණිකක් සේ ලොකය නියත ය, කිසිවකුගේ පුරුෂකාර්‍යයෙක් මෙහි නැතැ"යි ගන්නා නියතවාදය ද,

"ප්‍රජාව කැමැති සේ පවතී, කැමැති සේ නවතී, කැමැති සේ සැපදුක් විඳී, එහෙයින් ලොකය තම තමන් පිළිබඳ ඉච්ඡාවට යටත්ව පවතී" යන යදිච්ඡාවාදය ද යනාදී වූ වාදයෝ නැසී යන්නාහ.

නිරොධසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් "අරූපලොක විමුක්තිස්ථා-නැ"යි ගත් **රාමඋද්දකාදීන්ගේ** මතය ද,

"අසංඥසත්ත්වය විමුක්තිස්ථානැ"යි ගත් **ඥාතපුත්‍රනිර්ග්‍රන්ථා-දීන්ගේ** මතය ද,

"ප්‍රකෘතිසඞ්ඛ්‍යාත අව්‍යක්තයාගේ මහත්ත්වාදිභාවයෙන් අපරි-ණාමය - අප්‍රකාශය හෝ **"අහමඤ්ඤා, පකති අඤ්ඤා"** මම අනෙකෙක්මි, ප්‍රකෘතිය අනෙකකැ යි පැවැති ප්‍රකෘති-පුරුෂ-යන්ගේ අන්තරය දැනීමෙන් ආත්මසුඛ-දුඃඛ-මොහයන් විභාග කොට නො ගැණීම වැළකූ කල්හි කියූ පරිදි ප්‍රකෘතිය (ප්‍රධානය) නො පවතී නම් ඒ විමොක්ෂය" යි ගත් **කපිල**යන්ගේ මතය ද,

"ගුණවියුක්ත වූ එනම් බුද්ධිසුඛ-දුඃඛ-ඊර්ෂ්‍යා-ද්වේෂ-ප්‍රයත්න-ධර්මාධර්ම-සංස්කාර යන නවවිධ ආත්මගුණයෙන් වෙන් වූයේ මුක්තය" යි ගත් **කරවරණ**යන්ගේ මතය ද,

"බඹහු හා සහවාසය - බඹහුට සමීපව පැවැත්ම - බඹහු හා එකීභාවයට පැමිණීම විමොක්ෂ ය"යි ගත් **මිත්‍ථ්‍යාවිමොක්ෂය** ද යන මෙතෙක් වාදයෝ නැසී යෙත්.

මාර්ගසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් අරි අටඟිමග වැඩීමෙන් ම දුක්සන්සිඳීමට පැමිණෙන බව ප්‍රකටව පැණෙන බැවින් "තමාගේ යහපත පිණිස කළ කර්මයන්ගේ විපාකයෙක් නැත, මෙරමාගේ යහපත පිණිස කළ කර්මයන්ට විපාකයෙක් නැත, බලයෙක් නැත, වීර්‍ය්‍යයෙක් නැත, පුරුෂ ශක්තියෙක් නැත, පුරුෂ පරාක්‍රමයෙක් නැත, හැම සත්ත්වයෝ හැම ප්‍රාණීහු හැම භූතයෝ හැම ජීවයෝ තමන් පිළිබඳ වශයක් බලයක් වීර්‍ය්‍යයක් නැත්තෝ ය, නියමය-එළැඹීමය-ස්වභාවය යන මෙ තුණෙන් නන් වැදැරුම් බවට පැමිණියාහු සැවැදැරුම් අභිජාතියෙහි සිට සැපදුක් විඳිත්" යි ගන්නා අක්‍රියදෘෂ්ටිය ද,

මාර්ගසත්‍යසම්‍යග්දෘෂ්ටියෙන් පිළිවෙන් පිරීමෙන් ම වැඩීමෙන් ම දුක් සන්සිඳීමට පැමිණෙන බව ප්‍රකට බැවින් "සත්ත්වයන්ගේ කෙලසීමට හෙතුයෙක් නැත, ප්‍රත්‍යයයෙක් නැත, හෙතු රහිත ව ප්‍රත්‍යයරහිත ව සත්ත්වයෝ ඉබේ ම පිරිසිදුබවට යන්නාහ" යි ගන්නා අහෙතුකදෘෂ්ටිය ද,

"ඉඳුරන් පිණවීම - භාර්‍ය්‍යා පුරුෂ සෙවනය - පුත්‍රමුඛදර්ශනාදී වූ කාමසෙවනය හැර නිවණෙක් නැතැ"යි ගත් කාමසුඛල්ලිකානුයොගය හා "නො කා හැරීම-හිසරැවුළු ඉගිලීමා දී වූ තපස් කිරීම නග්නශීල ගොශීල-අජශීල-කුක්කුරශීලාදිය රැකීම යනා දී වූ ආත්මපරිතාපනයෙන් මොක්ෂය ලැබේය"යි ගත් ආත්මක්ලමථුව ද යන සියලු මිත්‍ථ්‍යාග්‍රාහ ද බිඳී යන්නාහ.

සත්ත්වයා මෙසේ සිවු සස්දහම් අවබොධ නො කරණ තුරු **සංස්කාරලොකයෙහි,** සංස්කාරලොකය පිළිබඳ **හෙතුයෙහි,** සංස්කාරලොකනිරොධය වූ **නිවනෙහි,** එයට උපාය වූ **මාර්ගයෙහි** මූඪවේ. මේ ඒ දෙශනාව:-

"ලොකෙ ලොකප්පභවෙ - ලොකත්ථගමෙ සිවෙ ව තදුපායෙ'
සම්මුය්හති තාව නරො - න විජානාති යාව සච්චානි" යනු.

චතුර්විධ මාර්ගඥානසඞ්ඛ්‍යාත වූ සම්‍යගදෘෂ්ටියෙහි **විමංසිද්ධිපාද - පඤ්ඤින්ද්‍රිය - පඤ්ඤාබල - ධම්මවිචය**යන බොධිපාක්ෂිකධර්මයෝ වැද සිටිත්. මෙ කියූ බොධිපාක්ෂිකධර්මයන්ගෙන් හා සම්‍යක්සඞ්කල්පාදී වූ

අනෙක් මාර්ගාඞ්ගයන්ගෙන් පොෂිත ව හැදී වැඩී ගිය සම්‍යග්දෘෂ්ටිය ඒ ඒ අවස්ථානුරූප ව වැඩුනු වැඩුනු ලෙසින් සිවුවරක දී සකල කෙලශසකන්ධයන් නසා අනුත්පාදනිරොධසඞ්ඛ්‍යාතනිර්වාණය සිද්ධ-කර දෙන්නී ය.

මෙ ද මෙහිලා දන්නේය:-

"පංචහි ඛො ආවුසො අඞ්ගෙහි අනුග්ගහිතසම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච, ඉධාවුසො සම්මාදිට්ඨි සීලානුග්ගහිතා ච හොති, සුතානුග්ගහිතා ච හොති, සාකච්ඡානුග්ගහිතා ච හොති, සමථානුග්ගහිතා ච හොති, විපස්සනානුග්ගහිතා ච හොති, ඉමෙහි ඛො ආවුසො පංචහි අඞ්ගෙහි අනුග්ගහිතා සම්මාදිට්ඨි චෙතොවිමුත්තිඵලා ච හොති චෙතොවිමුත්තිඵලානිසංසා ච, පඤ්ඤාවිමුත්තිඵලා ච හොති පඤ්ඤාවිමුත්තිඵලානිසංසා ච"

ඇවැත්නි! අඞ්ග පසෙකින් අනුග්‍රහ කරණ ලද සවිදර්ශනා සම්‍යග්දෘෂ්ටිය මාර්ගඵලසමාධිය ඵලකොට ඇත්තී මාර්ගඵලසමාධිය අනුසස් කොට ඇත්තී ද වේ. ඵලඥානය ඵල කොට ඇත්තී ඵලඥානය අනුසස් කොට ඇත්තී ද වේ. ඇවැත්නි! මෙහි සම්‍යග්දෘෂ්ටිය, ශීලයෙන් අනුග්‍රහ කරණ ලද්දී වේ ද, සත්ප්‍රාය-ධර්මශ්‍රැතියෙන් අනුග්‍රහ කරණ ලද්දී වේ ද, ධර්මසාකච්ඡායෙන් අනුග්‍රහ කරණ ලද්දී වේ ද, විදර්ශනාපාදකඅෂ්ටසමාපත්තියෙන් අනුග්‍රහ කරණ ලද්දී වේද, විදර්ශනාසඞ්ඛ්‍යාතසප්තවිධ අනුදර්ශන-යෙන් අනුග්‍රහ කරණ ලද්දී වේ ද, මෙසේ මේ අඞ්ගපසෙන් අනුග්‍රහ කරණ ලද සම්‍යග්දෘෂ්ටිය, මාර්ගඵලසමාධිය ඵල කොට ඇත්තී මාර්ග-ඵලසමාධිය අනුසස් කොට ඇත්තී ද වේ. ඵලඥානය ඵලකොට ඇත්තී ඵලඥානය අනුසස් කොට ඇත්තී ද වේ, යනු එහි අරුත් ය.

මෙසේ ශීලයෙන් ඥානයෙන් ධර්මසාකච්ඡායෙන් අෂ්ටසමා-පත්තියෙන් සප්තානුදර්ශනයෙන් එක්වන් රක්නා ලද අනුග්‍රහ කරණ ලද මූල සම්‍යග්දෘෂ්ටිය, වහා මාර්ගවශයෙන් වැඩී මාර්ගඵල සමාධි ඵලඥානසඞ්ඛ්‍යාත ඵලප්‍රදානය කරන්නී ය, යි දතයුතු ය.

අඹ කනු කැමැත්තෙක් අඹබිජුවටක් රොපණය කරන්නේ ය. එය හාත්පස වැටකටු බඳින්නේ ය. දිය ඉසින්නේ ය. මුල් ශුද්ධ කරන්නේ ය. පණු කැදලි ඉවත් කරන්නේ ය. මකුළුදැල් කඩා හරින්නේ ය. මෙසේ අනුග්‍රහ ලැබූ අඹපැලය වහා වැඩී පල දෙන්නේ ය.

මෙහි මූලසම්‍යග්දෘෂ්ටිය අඹබිජුවට රොපණය වැනි ය. එයට ශීලයෙන් කෙරෙණ අනුග්‍රහය අඹපැලයට වැටකටුබැඳීම වැනි ය. ඥානයෙන් කෙරෙණ අනුග්‍රහය දියඉසිම වැනි ය. ධර්මසාකච්ඡායෙන් කෙරෙණ අනුග්‍රහය මුල් ශුද්ධකිරීම වැනි ය. අෂ්ටසමාපත්තියෙන් කෙරෙණ අනුග්‍රහය පණුකැදලි ඉවත්කිරීම වැනි ය. සප්තානුදර්ශනයෙන් කෙරෙණ අනුග්‍රහය මකුළුදැල් කඩා හැරීම වැනි ය. මාර්ගවශයෙන් වහා වැඩී මාර්ගඵලසමාධිඵලඥානප්‍රදානය අඹපල දීම වැනි ය.

මෙ ද මෙහිලා දන්නේ ය:-

"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ! සම්මාදිට්ඨි,, යනු.

"මහණෙනි! යම් ධර්මයක් හෙතුකොට ගෙණ නූපන්නා වූ ද කුශලධර්මයෝ උපදිත් ද උපන්නා වූ ද කුශලධර්මයෝ බොහෝ බව පිණිස මහත්බව පිණිස පවතිත් ද, එහිලා සම්‍යග්දෘෂ්ටිය බඳු අන් එක ද ධර්මයකුත් මම නුවණැසින් නො දකිමි,, යනු එහි අරුත්.

මෙසේ ලෞකික-ලොකොත්තර සුබදායක වූ සම්‍යග්දෘෂ්ටිය උපදවනු කැමැති නුවණැත්තන් විසින් ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි පිහිටා දුඃඛ-සමුදය-නිරොධ-මාර්ග යන චතුස්සත්‍යධර්මය මැනැවින් උගෙණ විදර්ශනාභාවනාවෙහි යෙදී ගතයුතු ය. නැවැත නැවැත විදර්ශනා වැඩිය යුතු ය. එසේ විදර්ශනා වඩනා කල්හි සාමාන්‍ය විසින් ලෞකික වශයෙන් ඔවුන්තුළ සම්‍යග්දෘෂ්ටිය පහළ වන්නී ය. එකල්හි එහිලා උත්සාහවත් ව තව තවත් වඩනා කල්හි පින්ගුණ ඇතිසැටියෙන් කවර හෝ කලෙක එක්වට ම චතුස්සත්‍යාව බොධයෙන් කෙලෙස් නසා මාර්ගචිත්තය නිසා ලොකොත්තර සම්‍යග්දෘෂ්ටිය පහළ වන්නී ය.

ප්‍රධාන විසින් සම්‍යග්දෘෂ්ටිකයෝ **පෘථග්ජන - ශෛක්ෂ-අශෛක්ෂ** යි තිදෙනෙකි. එහි පෘථග්ජන තෙමේ **බාහිරක-ශාසනික** යි දෙ දෙනෙක් වේ. කර්මවාදී බාහිරක තෙමේ කර්මස්වකතා සම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යග්දෘෂ්ටික වේ. ශාසනික තෙමේ කර්මස්වකතා-සත්‍යානුලොමිකදෘෂ්ටි දෙකින් සම්‍යග්දෘෂ්ටික වේ. නියත සම්‍යග්දෘෂ්ටියෙන් යුක්ත වූයේ ශෛක්ෂ තෙමේ ය. අශෛක්ෂ තෙමේ අශෛක්ෂසම්‍යග්දෘෂ්ටියෙන් සම්‍යග්දෘෂ්ටික ය.

සම්මාසඞ්කප්ප නම්:- අවිද්‍යානුශය මූළමනින් නසනසුලු මාගී-සම්‍යග්දෘෂ්ටියෙන් සම්පූර්ණදෘෂ්ටි ඇත්තහුගේ ඒ සම්‍යග්දෘෂ්ටිය හා යෙදී ගන්නා වූ කාමසඞ්කල්පාදිමිථ්‍යාසඞ්කල්පයන් මුල් සුන් කොට සිඳලමින් සිත නිවන් අරමුණෙහි නංවමින් මාගීචිත්තයෙහි උපදනා චිත්තචෛතසික ය යි. මෙය කියේ උත්කෘෂ්ට වියිනි. එය සිත මනා කොට නිවන් අරමුණෙහි නැංවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය සිත නිවනෙහි ඔප්පු කරවීම ය. ඇලවීම ය. වැටහෙන අයුර මිථ්‍යාසඞ්කල්පයන් පහ කොට හැරීම ය **"සම්පයුත්තදිට්ඨිනෝ තං සම්පයුත්තං මිච්ඡාසඞ්කප්පසමුග්ඝාතකං චෙතසෝ නිබ්බානපදූහිරොපණං සම්මාසඞ්කප්පෝ, සෝ සම්මා චිත්තාභිරොපණලක්ඛණෝ, අප්පණරසෝ, මිච්ඡාසඞ්කප්පූප-භාණපච්චුපට්ඨානෝ,,** යනු එහිලා කීහ.

"සම්මා සඞ්කප්පෙතීති = සම්මාසඞ්කප්පෝ, සම්මා වා තෙන සඞ්කප්පෙනතීති = සම්මාසඞ්කප්පෝ, යථා වා සඞ්කප්පෝ = සම්මාසඞ්කප්පෝ, පසත්ථෝ සුන්දරෝ වා සඞ්කප්පෝති = සම්මා-සඞ්කප්පෝ" යනු ශබ්දාර්ථ දැක්වීමය.

සම්මාසඞ්කප්ප ය ලෞකික-ලොකොත්තර වශයින් දෙ පරිදි ය. **"දුවිධෝ හොති සම්මාසඞ්කප්පෝ ලොකිය ලොකුත්තරවසෙන වාති"**

පූර්භාගප්‍රතිපදා වශයෙන් ගැණෙනුයේ ලෞකික ය. මාගීඵල සම්ප්‍රයුක්ත වූයේ ලොකොත්තර ය. නැවැත ලෞකිකය, කාමාවචර -රූපාවචර-අරූපාවචරවිසින් තෙ පරිදි වේ. එහි කාමාවචරකුශල චිත්තයන්හි යෙදුනේ කාමාවචර ය. රූපාවචරකුශලචිත්තයන්හි යෙදුනේ රූපාවචර ය. අරූපාවචරකුශලචිත්තයන්හි යෙදුනේ අරූපාවචර ය. මෙ තුන් තන්හි යෙදුනේ චිතකීනාමයෙන් හඳුන්-වනු ලැබේ. කාමාවචර-රූපාවචර-අරූපාවචර කුශලචිත්තයන්ගේ එකින් එක වැඩී සිටි පරිද්දෙන් මෙය ද වැඩී සිටියේ ය. කාමාවචර කුශලචිත්තයෙහි යෙදුනු සඞ්කල්පය, කාමවිතකීදීප්‍රතිපක්ෂ ධර්මයන් තදඞ්ගප්‍රහාණයෙන් ද, රූපාවචර-අරූපාවචරකුශලචිත්තයන්හි යෙදුනු සඞ්කල්පය, විෂ්කම්භණප්‍රහාණ වශයෙන් ද, ලොකොත්තර-කුශලචිත්තයෙහි යෙදුනු සම්‍යක්සඞ්කල්පය, සමුච්ඡේදප්‍රහාණ වශ-යෙන් ද පහ කරන්නේ ය. තෙවැනි ව කියූ මේ සම්‍යක්සඞ්කල්පය ම මාගීඞ්ගයනට පැමිණි බැවින් සම්මාසඞ්කප්ප යි කියනු ලැබේ. එය ආර්‍යාෂ්ටාඞ්ගිකමාගීයෙහි දවිතීයාඞ්ගය වේ.

මෙය මෙසේ වදාළ සේක:-

"කතමො ච භික්ඛවෙ! සම්මාසඞ්කප්පො? යො ඛො භික්ඛවෙ! නෙක්ඛම්මසඞ්කප්පො අව්‍යාපාදසඞ්කප්පො අවිහිංසාසඞ්කප්පො අයං චුච්චති භික්ඛවෙ! සම්මාසඞ්කප්පො" යි.

"මහණෙනි! සම්‍යක්සඞ්කල්පය කවරේ ද? යත්:- මහණෙනි! යම් නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පයෙක් යම් අව්‍යාපාදසඞ්කල්පයෙක් යම් අවිහිංසාසඞ්කල්පයෙක් වේ ද, මහණෙනි! මෙය සම්‍යක්සඞ්කල්ප යි කියනු ලැබේ" යනු අරුත් ය. ලෞකික-ලොකොත්තරාදිවශයෙන් භෙදයට ගිය ඒ මේ සම්මාසඞ්කප්ප ය තෙ පරිදිබව මෙයින් වදාළ සේක.

එහි, **නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප** නම්:- **"කාමතො නිස්සටොති නෙක්ඛම්මසඞ්කප්පො"** යනු ආගම බැවින් පෘථග්ජනසත්ත්වයන්-ගේ සිත නොයෙක් ලෙසින් තම පමණින් රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය යන කාමවස්තූන්හි වස්තුකාමක්ලෙශකාමයන්හි දිවා රෑ දෙක්හි බැඳී සිටුනේ ය. එහෙයින් කාමවස්තූන් ම පතමින් සිතමින් සොයමින් ඔවුහු දව රෑ ගෙවත්. මේ බැඳීම මේ සෙවීම කවදා කො තැනින් පටන් ගතු දැයි කීමට කිසිවෙක් සමර්ථ නො වේ. දීර්ඝකාලයක සිට එන මේ කාමවස්තූන්හි බැඳීමෙන් සෙවීමෙන් බැහැරවීම ගිහි කම්කටොලුවලින් වෙන්වීම පිළිබඳ සිතිවිල්ල නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප නම්. එය මාර්ගඵලප්‍රතිලාභයෙන් නිවන් අරමුණු කොට සිටියේ නම්, සම්‍යක්සඞ්කල්ප යි කියනු ලැබේ. කාමවස්තූන් පිළිබඳ තෘෂ්ණා සහගත වූ විතර්කය, සත්ත්වයා පුන පුනා සසරදුකෙහි ම ගල්වන බැවින් සසරෙහි ම බැඳ තබන බැවින් කාමසඞ්කල්ප යි බුද්ධාදී වූ උතුමන් විසින් පිළිගන්නා ලද්දේ ය. එයට පටහැනිව සිටියේ නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය යි. **"නෙක්ඛම්මවිතක්කො ච කාමවිතක්කස්ස පච්චනීකො හුත්වා උප්පජ්ජති"** යනු ආප්තයි. නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය, කාමසඞ්කල්පය පිළිබඳ උත්පත්තිහෙතු විනාශය උත්පත්තිහෙතු සිදීම කරමින් උපදනේ ය. **"නෙක්ඛම්මවිතක්කො කාමවිතක්කස්ස පදඝාතං පදච්ඡෙදං කරොන්තො උප්පජ්ජති"** යනු එහිලා කීහ.

පෙහෙවස්විසීම පැවිදිවීම බඹසරහැසිරීම විවෙකස්ථාන ඇසුරු කිරීම දුහඟපිරීම අශුභභාවනා වැඩීම යනාදී වූ මෙ තැන්හි යෙදී මෙන් පළමු කොට නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය ලෞකිකචිත්තයෙහි උපදවා ගතයුතු ය. නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය උපදවා ගැණීමෙහි පූර්වභාගප්‍රතිපදාව වනුයේ ද මේ පෙහෙවස්විසීමාදියෙහි යෙදීම් ය. එසේ ම කාමයෙහි වරද මැනැවින් දැන නිතර කාමයෙහි දොස් ද

මෙනෙහි කළයුතු ය. මෙසේ කරන්නහුගේ සිත්තුළ කාමසඞ්කල්ප යන් තදඞ්ග වශයෙන් පහ කරමින් ලෞකික නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය උපදනේ ය. නැවැත එම කාමසඞ්කල්පය ම හෝ අන් කිසි සංස්කාරධර්මයක් හෝ සම්මර්ශනය කරණ කල්හි විදසුන් විසින් වඩනා කල්හි විදර්ශනා ජවනචිත්තයන් හා යෙදුනු නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පය, කාමසඞ්කල්පයාගේ උත්පත්තිහෙතු විනාශය කරමින් උත්පත්තිහෙතු සිදිමින් උපදී නැවැතත් මතු මතුයෙහි විදසුන් වඩනා කල්හි මෙය නියුණු වීමෙන් ස්‍රෝතාපත්තිමාර්ගචිත්තය පහළ වන්නේ ය. ඒ උපන් කෙණෙහි මාර්ගචිත්තය හා යෙදුනු සඞ්කල්පය තෙමේ සමුච්ඡේදප්‍රහාණවශයෙන් කාමසඞ්කල්පයාගේ උත්පත්තිහෙතූන් නසමින් පහළ වේ. විස්තර අනෙක් පොත පතින් දන්නේය.

අව්‍යාපාදසඞ්කප්ප නම්:- **"ව්‍යාපාදතෝ නිස්සටෝති අව්‍යාපාදසඞ්කප්පෝ"** යනු ආගම බැවින් පාඨග්ජනසන්තානයෙහි අනිටු අරමුණු නිසා පහළවන සැඩබවැ සි ගණිත දෙඹයෙන් බැහැර වූ කල්පනාව, මෙරමාහට වැඩෙක් යහපතෙක් නො වේවා සි වැඩක් යහපතක් සිදු නො වනු දැක්මෙනි කැමැත්තෙන් මුළුමනින් වෙන් වූ මෙත්ගුණ හා එක් වූ සිතීම හැඟීම අව්‍යාපාදසඞ්කල්පය යි. ව්‍යාපාදය කිමැයි යට කියන ලද්දේ ය.

මේ ද අව්‍යාපාදය මාර්ගඵලප්‍රතිලාභයෙන් නිවන් අරමුණු කොට සිටියේ සම්‍යක්සඞ්කල්ප යි දතයුතු ය. අනිටු අරමුණු පිළිබඳ දෙඹ සහගත වූ සඞ්කල්පය, සත්ත්වයා සසරදුකෙහි ගල්වන බැවින් සසරෙහි බැඳ තැබීමට අනෙක් පාපධර්මයන්ට රුකුල් දෙන බැවින් ව්‍යාපාද සඞ්කල්ප යි නම් ලැබී ය. එයට පටහැනි ව නැගී සිටියේ අව්‍යාපාද සඞ්කල්පය යි. **"අව්‍යාපාදවිතක්කෝ ව්‍යාපාදවිතක්කස්ස පච්චනීකෝ හුත්වා උප්පජ්ජති"** යනු ආපහසි. අව්‍යාපාදසඞ්කල්පය, ව්‍යාපාදසඞ්කල්පය පිළිබඳ උත්පත්තිහෙතු විනාශය උත්පත්තිහෙතු සන්සිඳීම කරමින් උපදනේ ය. **"අව්‍යාපාදවිතක්කෝ ව්‍යාපාදවිතක්කස්ස පදඝාතං පදච්ඡේදං කරොතෙනා උප්පජ්ජති"** යි එය කිහ.

අනිටු අරමුණු දැකීමෙන් හටගත් ව්‍යාපාදයෙහි **"දුට්ඨෝ හවුසෝ දෝසෙන අභිභූතෝ පරියාදින්නචිත්තෝ පාණම්පි හනති"** ආවැත්නි! දෙඹයෙන් දූෂිත වූයේ දෙඹයෙන් මැඩුනේ දෙඹයෙන් මැඩ ගන්නා ලද්දේ සතුන් ද මරයි, යනාදීන් දෝස් දැක **"ඛන්තී පරමං තපෝ තිතික්ඛා නිබ්බානං පරමං වදන්ති බුද්ධා"** ඉවසීම උතුම් තපසෙකි, බුදුවරු නිවන උතුම් ය යි කියත්,

යනාදීන් ඉවසීමෙහි අනුසස් සිහි කොට මෙසේ දක්නා ලද ව්‍යාපාදදෝෂයෙන් සිත ගලවා ගණු පිණිස මෛත්‍රීභාවනාව වැඩිය යුතු ය. එ ද වඩන්නහු, තමා පටන් "සියලු සත්ත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, සැප ඇත්තෝ වෙත්වා" යනාදී ලෙසින් මෙත් වඩා අව්‍යාපාදසඞ්කල්පය පළමු කොට ලෞකික වශයෙන් උපදවා ගතයුතු ය. ලෞකික වශයෙන් අව්‍යාපාදසඞ්කල්පය උපදවා ගැණීමට කරුණු වූ මෙත් වැඩුම් ආදිය මෙහිලා පූර්වභාගප්‍රතිපදා වශයෙන් සිටුනේ ය. මෙසේ වූ පූර්වභාගප්‍රතිපදාශක්තියෙන් ඔහුගේ සිතෙහි වූ ව්‍යාපාදසඞ්කල්පය තදඞ්ග විසින් පහවී යයි. නැවැත එම ව්‍යාපාදසඞ්කල්පය හෝ අන්කිසි සංස්කාරධර්මයක් සම්මර්ශනය කරත්, විදසුන් විසින් වඩත්, විදර්ශනා ජවනචිත්තයන් හා යෙදුනු අව්‍යාපාදසඞ්කල්පය, ව්‍යාපාදසඞ්කල්පයාගේ උත්පත්ති හෙතු විනාශ කරමින් උත්පත්තිහෙතු සිඳිමින් උපදී. නැවැතත් මත්තෙහි විදසුන් වඩනා කල්හි මෙය තව තවත් තියුණු වීමෙන් ස්‍රොතාපත්තිමාර්ගචිත්තය පහළ වන්නේ ය. ඒ පහළ වූ ඇසිල්ලෙහි මාර්ගචිත්තය හා යෙදුනු සම්‍යක්සඞ්කල්පය තෙමේ සමුච්ඡේදප්‍රහාණ විසින් නැවැත නො උපදනා ලෙසින් ව්‍යාපාදසඞ්කල්පයාගේ උත්පත්තිහෙතු නසමින් ඔදවැඩි වන්නේ ය.

අවිහිංසාසඞ්කප්ප නම්:- **"විහිංසාය නිස්සටොති අවිහිංසාසඞ්කප්පො"** යනු ආගම බැවින් **"ඉමෙ සත්තා විහිංසීයන්තු"** මේ සත්ත්වයෝ වෙහෙසනු ලැබෙත්වා යි මිනිස් තිරිසන් ඇ සතුන් අතින් පයින් කැටින් ගලින් දඬුයෙන් මුගුරෙන් හා පරොස් බසින් වෙහෙසීමැ යි කියන හිංසාවෙන් වෙන් වූ බැහැර වූ කුළුණු ගුණය හා එක් වූ කල්පනාව අවිහිංසාසඞ්කල්පය යි.

මෙ ද අවිහිංසාව, මාර්ගඵලප්‍රතිලාභයෙන් නිවන් අරමුණු කොට සිටියා සම්‍යක්සඞ්කල්පය යි දත යුතු ය. මෙරමාහට හිංසා කිරීම සත්ත්වයා සසරදුකෙහි ගල්වන බැවින් සසරෙහි නොයෙක් වද-බැදුම්වලට පමුණුවන බැවින් විහිංසාසඞ්කල්ප යි කියන ලද්දේ ය. එයට පටහැනි ව නැගී සිටියේ අවිහිංසාසඞ්කල්පය යි. **"අවිහිංසාවිතක්කො විහිංසාවිතක්කස්ස පච්චනීකො හුත්වා උප්පජ්ජති"** යනු ආප්තයි. අවිහිංසාසඞ්කල්පය, විහිංසාසඞ්කල්පය පිළිබඳ උත්පත්තිහෙතුවිනාශය උත්පත්තිහෙතු සන්සිඳීම කරන්නේ උපදනේ ය. **"අවිහිංසාවිතක්කො විහිංසාවිතක්කස්ස පදඝාතං පදච්ඡේදං කරොන්තො උප්පජ්ජති"** යි එය කීහ.

හැමට පළමු කරුණා කළයුතු තද දුකට පැමිණි දිළිඳු වූ සිඳහළ අත් පා ඇති කබලක් පොළොත්තක් කොළපතක් ඉදිරි යෙහි තබා ගෙණ අම්බලමක වැද හෝනා අතින් පයින් පණු වැදලි

කඩා හැලෙන බැගෑහඬින් හඬන පව් කළ මිනිසකු දැක **"කිච්ඡං වතායං සත්තො ආපන්නො අප්පෙවනාම ඉමම්හා දුක්ඛම්හා මුච්චෙය්‍ය"** අනේ! මේ සත්ත්වයා දුකට පැමිණියේ ය, මෙතෙමේ මේ දුකින් මිදෙන්නේ නම් ඉතා යෙහෙකැ, යි යනාදීන් සිත්හි නගා, පෙර මෙතෙමේ මෙරමාහට හිංසාකළ බැවින් මෙසේ දුකට පත් වී ය යි හිංසාකිරීමෙහි දොස් දැක කරුණාභාවනාව වැඩිය යුතු ය මෙසේ කරුණාභාවනාව වඩා අවිහිංසාසඞ්කල්පය පළමු කොට ලෞකිකවශයෙන් උපදවා ගත යුතු ය. ලෞකිකවශයෙන් අවිහිංසාසඞ්කල්පය උපදවා ගැණීමට කරුණු වූ මේ කරුණාභාවනාමාත්‍රය මෙහිලා පූර්වභාගප්‍රතිපදාවශයෙන් සිටුනේ ය. මේ පූර්වභාගප්‍රතිපදාශක්තියෙන් ඔහුගේ සිතෙහි උපන් විහිංසාසඞ්කල්පය තදඞ්ග විසින් පහවී යයි. නැවැත එම විහිංසාසඞ්කල්පය හෝ අන් කිසි සංස්කාරධර්මයක් සිත්හි නගා සලකත්, එසේම විදසුන් විසින් වඩත්, විදර්ශනා ජවනචිත්තයන් හා යෙදුනු අවිහිංසාසඞ්කල්පය, විහිංසාසඞ්කල්පයාගේ උත්පත්තිහෙතු විනාශ කරන්නේ උත්පත්තිහෙතු සිඳින්නේ උපදි. නැවැතත් මත්තෙහි විදසුන් වඩනා කල්හි මෙය තව තවත් දියුණු තියුණු වෙමින් ස්‍රොතාපත්තිමාර්ගචිත්තය පහළ වන්නේ ය. ඒ පහළ වූ ඇසිල්ලෙහි මාර්ගචිත්තය හා යෙදුනු සම්‍යක්සඞ්කල්පය තෙමේ සමුච්ඡේදප්‍රහාණ විසින් නැවැත නො උපදනා ලෙසින් විහිංසාසඞ්කල්පයාගේ උත්පත්තිහෙතු නසමින් ඉදිරියෙහි වූ මාර්ගඵල බලා බලගතු වන්නේ ය. කිසිත් හෙතුවකින් නැවැත නො ද ගිලිහෙන්නේ ය.

කාමවිතර්කාදිත්‍රිවිධවිතර්කයන්ට අවිරුද්ධ නො වූ එක ද කමටහනෙක් සූත්‍රාභිධර්මදෙක්හි බෙදා දැක් වූ අටතිස් අරමුණු අතුරෙහි නැත්තේ ය. එහිදු අශුභ කර්මස්ථානයන්හි උපදනා ප්‍රථමද්ධ්‍යානය කාමවිතර්කයට පටහැනි ය. මෛත්‍රීකර්මස්ථානයෙහි උපදනා තෘතීය චතුර්ථද්ධ්‍යානයෝ ව්‍යාපාදවිතර්කයට පටහැනි වෙත්. කරුණා කර්මස්ථානයෙහි උපදනා තෘතීයචතුර්ථද්ධ්‍යානයෝ විහිංසාවිතර්කයට පටහැනි වෙත්. එහෙයින් අශුභකර්මස්ථානයන්හි පරිකර්ම කොට ධ්‍යානයට පැමිණි පුද්ගලයා ධ්‍යානයට පැමිණි ඇසිල්ලෙහි, ධ්‍යානචිත්තය හා යෙදුනු විතර්කය, විෂ්කම්භණ වශයෙන් කාමවිතර්කයට විරුද්ධ ව උපදනේ ය. ධ්‍යානය පාදක කොට විදසුන් වඩන්නාහට විදසුන් වඩනා කාලයෙහි විදර්ශනා ජවනචිත්තයන් සමග යෙදුනු විතර්කය තෙමේ තදඞ්ගප්‍රහාණ වශයෙන් කාමවිතර්කයට සතුරු ව උපදනේ ය. විදර්ශනාව මතු මත්තෙහි වැඩියක් තෙද ගන්වා වඩවා ස්‍රොතාපත්තිආදිමාර්ගයනට පැමිණෙන පුද්ගලයාගේ මාර්ගක්ෂණයෙහි මාර්ගචිත්තය හා යෙදුනු විතර්කය, සමුච්ඡේදප්‍රහාණ

වශයෙන් කාමවිතර්කයට විරුද්ධ ව සිටුනේ ය. මෙසේ උපන් විතර්කය නෛෂ්ක්‍රම්‍යසඞ්කල්ප යි කියනු ලැබේ. මෛත්‍රීකර්ම්ස්ථාන-යෙහි පරිකර්ම් කොට වඩා කරුණාකර්ම්ස්ථානයෙහි පරිකර්ම් කොට වඩා ධ්‍යාන මාර්ගඵලයන්ට පැමිණීමට අශුභ කර්ම්ස්ථානය වඩා ක්‍රම-යෙන් ධ්‍යාන මාර්ගඵලයනට පැමිණීම සේ දතයුතු ය. මේ මෛත්‍රී-කරුණා කර්ම්ස්ථාන වඩා ලැබෙන්නා වූ මාර්ගචිත්තයන් හා එක්වන් යෙදුනු විතර්ක දෙක, අව්‍යාපාදසඞ්කල්ප-අවිහිංසාසඞ්කල්ප යි කියනු ලැබේ.

මෙසේ මේ නෛෂ්ක්‍රම්‍ය-අව්‍යාපාද-අවිහිංසා සඞ්කල්පයෝ තිදෙන කාමාවචර-ධ්‍යාන-විදර්ශනා වශයෙනුදු උපදනා බැවින් ආර්‍ය්‍යමාර්ගයාගේ පුර්ව්භාගයෙහි වෙන් වෙන් වූ සඞ්කල්පයෝ වෙත්. මාර්ගක්ෂණයෙහි කාම-ව්‍යාපාද-විහිංසා යන මෙ තුන් තන්හි උපදින්නා වූ අකුශල විතර්කයාගේ පැවැත්මට කරුණු වූ උත්පත්ති හෙතු නසමින් අනුත්පත්තිසාධන විසින් මාර්ගාඞ්ගය පුරමින් එක් ම කුශලචිත්තසම්ප්‍රයුක්ත විතර්කය උපදනේ ය. මේ කුශලචිත්තසම්ප්‍ර යුක්ත විතර්කය තෙමේ තත්ත්වප්‍රණී සම්‍යක්සඞ්කල්පය වේ.

සම්මාවාචා නම්:- මාර්ගසම්‍යග්දෘෂ්ටියෙන් චතුස්සත්‍යධර්මයන් ඉතිරි නො කොට දක්නා වූ මාර්ගසම්‍යක්සඞ්කල්පයෙන් නිවන් අරමුණෙහි සිත නංවන්නහුගේ ඒ සම්‍යග්දෘෂ්ටීන් හා යෙදී ගන්නා වූ බොරු-කීම-කේලාම්කීම-පරොස්බස්කීම-නිසරුබස්කීම යන චතුර්විධ වාග්දුශ්චරිතය සමුච්ඡේදප්‍රහාණයෙන් මුළුමනින් ඉතිරි නො වන ලෙසින් නසාලන මිත්‍ථ්‍යාවචනයෙන් වැළකීමැ යි කියන විරති-චෛතසිකය යි. එය, සිත නිවන් අරමුණට මැනැවින් නැංවීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය මිත්‍ථ්‍යාවචනයෙන් වෙන්වීම ය. වැටහෙන අයුර මිත්‍ථ්‍යාවචනයන් පහ කොට හැරීම ය. **"තථා පස්සතො විතක්කයතො ච තං සම්පයුත්තාව වච්දුච්චරිත-සමුග්ඝාතිකා මිච්ඡාවාචාය විරති සම්මාවාචා නාම, සා පරිග්ග-හලක්ඛණා, විරමණරසා, මිච්ඡාවාචාපහාන පච්චුපට්ඨානා"** යි එය කීහ.

සම්‍යග්වචනය ලෞකික-ලොකොත්තර විසින් දෙ පරිදි ය. **"දුවිධා හොති සම්මාවාචා ලොකියලොකුත්තරභෙදෙනාති"** යනු දත යුතු ය. පුර්ව්භාගප්‍රතිපදා වශයෙන් ගැණුනී ලෞකික ය. මාර්ගඵලසම්ප්‍රයුක්ත වූවා ලොකොත්තර ය. යම්හෙයකින් අන් සිතෙකින් බොරුබසින් වළකී ද, අන් සිතෙකින් පිසුණුබසින් වළකී ද, අන් සිතෙකින් පරොස්බසින් වළකී ද, අන් සිතෙකින් නිසරුබසින් වළකී ද, එබැවින් ඒ මුසාවාදා දී වූ විරති සතර ම

පුළුභාගමාගීයෙහි දී නානාක්ෂණික ව නානාලම්බනික ව සතරක් ව ම උපදී. එය ලෞකික ය. මේ මෙහි ආපත ය:- **"යස්මා පන අඤ්ඤෙනෙව චිත්තෙන මුසාවාදා විරමති, අඤ්ඤෙනෙව චිත්තෙන පිසුණාය වාචාය විරමති, අඤ්ඤෙනෙව චිත්තෙන ඵරුසාය වාචාය විරමති, අඤ්ඤෙනෙව චිත්තෙන සම්ඵප්පලාපා විරමති, තස්මා චතස්සොපෙතා වෙරමණියො පුබ්බභාගෙ නානා"** යනු.

ආර්‍යමාර්ගක්ෂණයෙහි මිත්‍ථ්‍යාවාක් යි කියූ අකුශලදුශ්ශීල්‍ය-චෙතනාවගේ උත්පත්තිහෙතු සිදීමෙන් මතු නො ඉපැත්ම සිදු කිරීම් වශයෙන් මාර්ගාඞ්ගය පුරමින් එක් ම කුශලවිරතියෙක් උපදි එය ලොකොත්තර ය. මේ එහි ආපත ය: **"මග්ගක්ඛණෙ පන මිච්ඡාවාචාසඞ්ඛාතාය අකුසලදුස්සීල්‍යචෙතනාය පදච්ඡෙදතො අනුප්පත්තිසාධනවසෙන මග්ගඞ්ගං පූරයමානා එකාව සම්මාවාචාසඞ්ඛාතා කුසලවෙරමණී උප්පජ්ජති"** යනු. මෙය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙහි තෘතීය අඞ්ගය යි. එය මෙසේ වදාළ සේක.

"කතමා ච භික්ඛවෙ! සම්මාවාචා? යා ඛො භික්ඛවෙ! මුසාවාදා වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති භික්ඛවෙ! සම්මාවාචා" යි.

මේ මෙහි අරුත්:-"මහණෙනි! සම්‍යග්වාක් තොමෝ කවරී ද? යත්:- මහණෙනි! බොරුබසින් යම් වෙන්වීමෙක්, කේලාම්බසින් යම් වෙන්වීමෙක්, පරොස්බසින් යම් වෙන්වීමෙක්, නිසරුබසින් යම් වෙන්වීමෙක් වේ ද, මහණෙනි! මෝ වාක් තොමෝ සම්‍යග්-වාක් යි කියනු ලැබේ" යනු.

එහි නො සිදුවූවක් සිදුවූවක් කොටත් සිදුවූවක් නො සිදු-වූවක් කොටත් මෙරමාහට හඟවනු කැමැත්තහුගේ සිතෙහි පහළ වන චෙතනාමාත්‍රය මුසාවාදය යි. මෙරමා බිඳවනු කැමැති වූ මෙරමාහට අවැඩ කැමැති වූ උනුන් අතර වූ පියමනාපබව සිඳලනු කැමැත්තහුගේ සිතෙහි පහළවන චෙතනාමාත්‍රය පිසුණවාචා ය. අන්‍යයා පිළිබඳ මම්චෙජ්ද කරන්නා වූ පරොස්බස් කියන්නහුගේ සිතෙහි පහළ වන චෙතනාමාත්‍රය ඵරුසවාචා ය. තමාට හෝ මෙරමාහට වැඩක් නො වන සීතාහරණාදීන්ගේ වශයෙන් පවත්-නා නිසරු වූ වැඩක් නැති බස් බිණිමෙහිලා සිතෙහි පහළ වන චෙතනාමාත්‍රය සම්ඵප්පලාපය යි. විස්තර යට කියන ලද්දේ ය.

ඉතා කොටින් කියූ මේ චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වෙන්වීම, මුසාවාදවිරති – පිසුණවාචාවිරති – ඵරුසවාචාවිරති – සම්ඵප්පලාප විරති යි පිළිවෙළින් ලෞකිකචිත්තවීථීන්ගේ වශයෙන් සතරක් ව බෙදී ආයේ ද, මාගීචිත්තවීථීන්හි එක් ම විරතියෙකැ යි යට කියන ලදි.

ලෞකික සම්‍යග්වචනය බොරුබස් බිණීමට කරුණු වන පුද්ගලයන් හා වස්තූන් එල්බ පවත්නේ ය. බොරු කීමෙන් වැළකීම පිණිස ඇත්ත කියන කල්හි, එය මුසාවාදය ප්‍රහාණ කිරීම් වශයෙන් පවතී. කේලාම්කීමෙන් වළකිනු පිණිස අන්‍යයාගේ එක්වීමට කරුණු වන ප්‍රියමනාප වචන කියන කල්හි, එය පිසුණවචනයාගේ ප්‍රහාණ කිරීම් වශයෙන් පවතී. පරොස්බස් කීමෙන් වළකිනු පිණිස මුදු මොළොක් බස් කියන කල්හි, එය ඵරුස වචනයාගේ ප්‍රහාණ කිරීම් වශයෙන් පවතී. නිසරුබස් කීමෙන් වළකිනු පිණිස අර්ථවත් වචන කියන කල්හි, එය සම්ඵප්පලාපයාගේ ප්‍රහාණ කිරීම් වශයෙන් පවතී. මේ හැම වැළකීමෙක් වන්නේ වාග්දුශ්චරිතයන් යම්තමකින් යටපත් කිරීමෙනි. සම්‍යග්වචනය, මෙසේ පූර්වභාගප්‍රතිපදා වශයෙන් වඩා දියුණු තියුණු කොට වාග්දුශ්චරිතයෙන් වැළකී සිටියේ ම, යම් කලෙක මෙහිලා විදසුන් වැඩුයේ නම් ඔහුට නිවන් අරමුණු කොට මාගීචිත්තය පහළ වන්නේ ය. එය පහළ වූයේ නිවන අරමුණු කොට ය. ලෞකික අවස්ථායෙහි වස්තු පුද්ගලයන් එල්බ ගෙණ සතරක් ව සිටි සම්‍යග්වචනය ලොකොත්තර අවස්ථායෙහි නිවන එල්බ ගෙණ එක්වට ම වාග්දුශ්චරිතය සමුච්ඡේද ප්‍රහාණයෙන් පහ කරන්නේ ය.

මෝ විරති තොමෝ **සම්පත්තවිරති – සමාදානවිරති – සමුච්ඡේදවිරති** යි තෙවැදෑරුම් ද වන්නී ය. එහි **"මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** යනාදීන් සමාදන් වීමක් නැති ව දැ කුලගොත් ඇසූ පිරුතැන් ඇ ගැණ සලකා වාග්දුශ්චරිතයෙන් වැළකීම සම්පත්තවිරති නමු. එසේ සික පද දැඩි ව ගැණීමෙන් එය සිත්හි කොට වාග්දුශ්චරිතයෙන් වැළකීම සමාදානවිරති නමු. ආර්‍යමාර්ගයෙන් මෙ කියූ දුශ්චරිතයන්ගේ නැවැත නො උපදනා පරිදි මුල්සිඳ වැළකීම සමුච්ඡේදවිරති නමු. ඕ ම මෙහි කැමැතිවන ලද්දී ය. මුසාවාද විරති ඇ විරති සතර මෙතුණෙන් බෙදූ කල්හි ඒ වශයෙන් විරති දොළොසෙක් වේ. ඒ සතරෙහි ලැබෙන සමුච්ඡේදවිරති සතර මේ බෙදීමෙහි දී සතරක් සේ බෙදුනේ ද ලොකොත්තරමාර්ගයෙහි වූයේ එකෙක් ම වේ. එක් ම සමුච්ඡේදවිරතිය ලොකොත්තරමාර්ගයෙහි වූ වා ය. අන්‍යයෝ පූර්වභාග ප්‍රතිපදාසඞ්ඛ්‍යාතලෞකිකපක්ෂයෙහි සිටියෝ ය.

සම්මාකම්මන්ත නම්:- මිනිසාගේ එ ලොව මේ ලොව දියුණුව නසාලන මිනිසා අපා දුකට ඇදලන තමාට මොනලෙසකිනුත් වැඩක් නො වන නුවණ නැත්තහුට විපාක දෙනතුරු මිහිරක් සේ වැටහෙන සතුන් මැරීම-හොරකම් කිරීම-ඕස හැසිරීම යන පව් කම් තුණ මුග්ධලොකයා විසින් දිවිගැලවීමෙහි උපායය කොට ගන්නා ලද මිත්‍යාකම්මන්තයෝ ය. වැරදි ක්‍රියා ය. යට දැක් වූ චතුර්විධ මිත්‍යාවචනයෙන් වෙන්වූවහුගේ ඒ සම්‍යග්වචනය හා එක් වූ සතුන් මැරීම් ආදී වූ ත්‍රිවිධ මිත්‍යාකම්මන්තයන් මුළුමනින් සිඳහරිමින් කායදුශ්චරිතයෙන් සදහට වෙන්වීමැ සි කියන විරති-චෙතසිකය සි. එය තමන් හා එක් වූ හැම පිරිසිදු සිතිවිල්ලක් ම නිවන් අරමුණෙහි **නැංවීම** ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය ඒ මිත්‍යාකම්මන්තයෙන් වැළකීම ය. වැටහෙන අයුර මිත්‍යාකම්මන්ත-යන් බැහැර කොට සිටීම ය. **"තථා විරමතෝ තං සම්පයුත්තානඤ්ච මිච්ඡාකම්මන්තසමුට්ඨාපිකා පාණාතිපාතාදිවිරති, සෝ සමුට්ඨා-නලක්ඛණෝ, විරමණරසෝ, මිච්ඡාකම්මන්තප්පහාන පච්චුප-ට්ඨානෝ"** සි එය කිහ.

සම්‍යක්කම්මන්තය ලෞකික-ලොකොත්තර වසින් දෙ පරිදි ය. **"සෝ දුවිධෝ හොති සම්මා කම්මන්තෝ ලෝකිය ලොකුත්තර භෙදෙනාති"** යනු දන්නේ ය. පූර්භාගප්‍රතිපදා වශයෙන් ගැණුනේ ලෞකික ය. මාගීඵලසම්ප්‍රයුක්ත වූයේ ලොකොත්තර ය. යම් හෙයකින් අන් සිතෙකින් සතුන් මැරීමෙන් වළකී ද, අන් සිතෙකින් හොරකම් කිරීමෙන් වළකී ද, අන් සිතෙකින් ඕස හැසිරීමෙන් වළකී ද, එබැවින් ඒ පණාතිපාතාදී වූ විරති තුණ ම පූර්භාගමාගීයෙහි දී නානාක්ෂණික ව නානාලම්බනික ව තුණක් ව ම උපදී. ඒ ය ලෞකික ය. මේ මෙහි ආපා ය. **"යඤ්ඤ පන අඤ්ඤඤ්ඤෙව චිත්තෙන පාණාතිපාතා විරමති, අඤ්ඤඤ්ඤෙන චිත්තෙන අදින්නාදානා විරමති, අඤ්ඤඤ්ඤෙව චිත්තෙන මිච්ඡා-චාරා විරමති, තඤ්ඤා තිස්සොපෙතා චෙරමණියෝ පුඛ්ඛභාගෙ නානා"** යනු.

ආර්‍යමාගීක්ෂණයෙහි මිත්‍යාකම්මන්තය සි කියූ අකුශලදුශ්ශීල්‍ය චෙතනාවගේ උත්පත්තිහෙතු සිදීමෙන් මතු නො ඉපැත්ම සිදුකිරීම් විසින් මාගීඞ්ගය පුරන්නී එක් ම කුශලවිරතියෙක් උපදී ඒ ය ලොකොත්තර ය. මේ එහි ආපා ය. **"මග්ගක්ඛණෙ පන මිච්ඡාකම්මන්තසඞ්ඛාතාය අකුසලදුස්සීල්‍යචෙතනාය පද-ඛෙජ්දතෝ අනුප්පත්තිසාධනවසෙන මග්ගඞ්ගං පූරයමානා එසාව සම්මා කම්මන්ත සඞ්ඛාතා කුසලවෙරමණී උප්පජ්ජති"** යනු.

සම්‍යක් කර්මාන්තය ලෞකික විසින් නොයෙක් ක්ෂණ ඇත්තේ නොයෙක් අරමුණු ඇත්තේ ය. ලොකොත්තර විසින් එක් ම ක්ෂණයෙක් ඇත්තේ එක් ම අරමුණෙක් ඇත්තේ ය යි **"සම්මා කම්මන්තො පුබ්බභාගෙ නානාක්ඛණො නානාරම්මණො, මග්ගක්ඛණෙ එකක්ඛණො එකාරම්මණො"** යි මෙයින් වඩාත් ව්‍යක්ත කළහ පූර්වභාගප්‍රතිපදා අවස්ථායෙහි විරති ද වෙතනා ද වේ. මාර්ගක්ෂණයෙහි එක් ම විරතිමාත්‍රයෙක් වේ. මෙය ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගික මාර්ගයෙහි තුරීය අඞ්ගය යි. එය මෙසේ වදාළ සේක:-

"කතමො ච භික්ඛවෙ! සම්මා කම්මන්තො? යා බො භික්ඛ-වෙ! පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, මිච්ඡා-චාරා වෙරමණී, අයං වුච්චති භික්ඛවෙ! සම්මාකම්මන්තො" යි.

මේ මෙහි අරුත්:- "මහණෙනි! සම්‍යක් කර්මාන්තය කවරේ ද? යත්:- මහණෙනි! සතුන් මැරීමෙන් යම් වෙන්වීමෙක් හොරකම් කිරීමෙන් යම් වෙන්වීමෙක් මිසහැසිරීමෙන් යම් වෙන්වීමෙක් වේ ද, මහණෙනි! මෙය සම්‍යක්කර්මාන්ත ය යි කියනු ලැබේ" යනු.

එහි ඉදිරියෙහි දිවි ගලවන්නට පොහොසත් වූ යම්කිසි සත්ත්වයකු එසේ ඉදිරියෙහි දිවි ගෙවන්නට ඉඩ නො තබා යම්කිසි උපක්‍රමයෙකින් අතරක දී දිවියෙන් තොරකිරීමෙහි ලා සිතෙහි පහළ වන වධකවෙතනාමාත්‍රය පාණාතිපාතය යි. මෙරමා අයත් දැයක් මෙරමා අයත් බව දැන දැන හිමියා නො දන්වා යම්කිසි උපක්‍රමයෙකින් පැහැර ගැණීමෙහිලා සිතෙහි පහළවන වෙතනා මාත්‍රය අදින්නාදානය යි. ලොකසදාචාරයට පටහැනි වූ නින්දිත වූ ලාමක හැසිරීමෙහිලා සත්‍රීපුරුෂ දෙදෙනක්හුගේ සිත්හි නගිනා සෙවන වෙතනා මාත්‍රය මිත්‍ථ්‍යාචාරය යි. විස්තර යට කියන ලද්දේ ය.

ඉතා කොටින් කියූ මේ ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වෙන්වීම පාණාතිපාතවිරති-අදින්නාදානවිරති-මිච්ඡාචාරවිරති යි පිළිවෙළින් ලෞකිකවීථීන්ගේ වශයෙන් තුණක් ව බෙදී ආයේ ද මාර්ගචිත්ත-වීථීන්හි එක් ම විරතියෙකැ යි දතයුතු ය. මෙසේ පූර්වභාගප්‍රතිපදා වශයෙන් වඩා දියුණු තියුණු කොට කායදුශ්චරිතයෙන් වැළකී සිටියේ ම යම් කලෙක මෙහිලා විදසුන් වැඩුයේ නම් ඔහුට නිවන් අරමුණු කොට මාර්ගචිත්තය පහළ වන්නේ ය. එය පහළ වනුයේ නිවන අරමුණු කොට ය. ලෞකික අවස්ථායෙහි වස්තු සංස්කාර-යන්හි එල්බ ගෙණ තුණක් ව සිටි සම්‍යක්කර්මාන්තය ලොකොත්තර අවස්ථායෙහි නිවන එල්බ ගෙණ එක්වට ම කායදුශ්චරිතය සමුච්ඡේද ප්‍රහාණයෙන් පහ කරන්නේ ය.

මෝ විරති තොමෝ ද සම්‍යග්වචනයෙහි කියූ සේ සම්පත්ත සමාදාන සමුච්ඡේද විසින් බෙදී යන්නී ය. සමාදානයක් නැති ව කායදුශ්චරිතයෙන් වෙන්වීම සම්පත්තවිරතිය යි. සිකපද සමාදන් ව ගැණීමෙන් කායදුශ්චරිතයෙන් වෙන්වීම සමාදානවිරතියයි. ආර්‍යමාර්ගයෙන් නැවැත නො උපදනා පරිදි කායදුශ්චරිතයාගේ මුල් සිඳ දමා වැළකීම සමුච්ඡේදවිරතිය යි. මේ විරති තුණ සම්පත්තාදිවිරති තුණෙන් බෙදූ කල්හි ඒ වශයෙන් විරති නවයෙක් ලැබේ. එ තුණෙහි ලැබෙන සමුච්ඡේදවිරති තුණ මෙහි දී පූර්වභාගප්‍රතිපදා විසින් තුණක් කොට බෙදුනේ ද ලොකොත්තරමාර්ගයෙහි වූයේ එකෙක් ම ය. එක් ම සමුච්ඡේදවිරතිය ලොකොත්තරමාර්ගයෙහි වූ ය. අන්‍ය විරතීහු ලෞකිකත්වයෙහි වූහ.

සම්මාආජීව නම්, සිවු වැදැරුම් වූ වාග්දුශ්චරිතයෙන් හා තෙ වැදැරුම් වූ කායදුශ්චරිතයෙන් වෙන් වූ සම්‍යග්වචනයෙන් හා සම්‍යක්කර්මාන්තයෙන් උපදනා එයින් පිරිසිදු බවට ගියා වූ, ඒ හා එක් ව යෙදී ගත්තා වූ කුහනා-ලපනා-නෙමිත්තිකතා-නිප්පෙසිකතා-ලාභෙන ලාභං නිජිගිංසනතා යනාදී වූ කොහොත් වත් මුළුමනින් නසා ලන්නා වූ මිත්‍ථ්‍යාජීවයෙන් වෙන් වීමැ යි කියන විරතිචෛතසිකය යි. එය තමන් හා එක් වූ ධර්මයන් වඩවඩාත් පිරිසිදු කිරීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය මේ සම්‍යගාජීවයාගේ පැවැත්මෙහි පටන් මිත්‍ථ්‍යාජීවය නො පවත්නා බැවින් බුදුරජුන් විසින් නිඳු නො කරණ ලද සම්‍යගාජීවයාගේ පැවැත්ම ය. වැටහෙන අයුර මිත්‍ථ්‍යාජීවිකාප්‍රහාණය යි. **"යා පනස්ස තෙසං සම්මා වාචා සම්මා කම්මන්තානං විසුද්ධිභූතා කුහනාදිඋපච්ඡේදිකා මිච්ඡාජීවවිරති, සො සම්මාආජීවො නාම, සො වොදානලක්ඛණො, ඤායාජීවප්පවත්තිරසො, මිච්ඡාජීවප්පහානපච්චුපට්ඨානො"** යි එය කීහ.

"සම්මා ආජීවතීති = සම්මා ආජීවො, සම්මා වා තෙන ආජීවත්තීති = සම්මා ආජීවො, පසත්ථො සුන්දරො වා ආජීවොති සම්මා ආජීවො" යනු ශබ්දාර්ථ දැක්වීම ය.

ලෞකික-ලොකොත්තර විසින් සම්‍යගාජීවය දෙ පරිදිය. එය කීහ මෙසේ:- **"දුවිධො හොති සම්මා ආජීවො ලොකිය ලොකුත්තරභෙදෙනාති"** යි. පූර්වභාගප්‍රතිපදා වශයෙන් ගැණුනේ ලෞකික ය. එය කාමාදිආශ්‍රව සහිත ය. කාම රූපාරූප කුශල විපාක භජනය කරන්නේ ය. මාර්ගඵලසම්ප්‍රයුක්ත වූයේ ලොකොත්තර ය. එය ආර්‍යමාර්ගය වඩන්නහුගේ ආර්‍යමාර්ගකුශල චිත්තයෙහි පහළ වන මිත්‍ථ්‍යාජීවයෙන් තොර වූ ආර්‍ය වූ කාමාදි ආශ්‍රව

රහිත වූ සමුච්ඡේදවිරති ය යි යම් හෙයකින් අන් සිතෙකින් දිවි-පැවැත්ම කරුණු කොට ඇති පාණාතිපාතාදී වූ ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් වළකී ද, අන් සිතෙකින් දිවිපැවැත්ම කරුණු කොට ඇති මුසාවාදාදී වූ චතුර්විධ වාග්දුශ්චරිතයෙන් වළකී ද, එහෙයින් ආර්‍යමාර්ගය ලැබීමට පූර්වයෙහි නානාක්ෂණයෙහි නානාලම්බනික ව පහළ වන මෝ විරතිය ලෞකික ය. මේ එහි ආචාර්‍යවචනය:- **"යස්මා පන අඤ්ඤෙනෙව චිත්තෙන කායදවාරවීතික්කමා විරමති, අඤ්ඤෙනෙව චිත්තෙන වචීදවාරවීතික්කමා විරමති, තස්මා පුබ්බභාගෙ නානාක්ඛණෙසු උප්පජ්ජති"** යනු.

මාර්ගක්ෂණයෙහි සත් වැදැරුම් වූ, කර්මපථයන්ගේ වශයෙන් දෙ වැදැරුම් වූ කායවාග්ද්වාරයෙහි උපදනා වූ මිත්‍ථ්‍යාජීවැ යි කියූ දුශශීල්‍යචෙතනාවගේ උත්පත්තිහෙතු නසමින් නැවැත නො ඉපැත්ම සිදු කිරීම් විසින් මාර්ගාඞ්ගය පුරමින් උපදනා සම්‍යගාජීවය යි කියන ලද එක් ම කුශලචිත්තසම්ප්‍රයුක්ත වූ මෝ විරතිය ලොකොත්තර ය. මේ එහි ආචාර්‍යවචනය:- **"මග්ගක්ඛණෙ පන දවීසු දවාරෙසු සත්තන්නං කම්මපථානං වසෙන උප්පන්නාය මිච්ඡාආජීවදුස්සීල්‍යචෙතනාය පදච්ඡෙදතො අනුප්පත්තිසාධන වසෙන මග්ගඞ්ගං පූරයමානා එකාව සම්මාආජීවසඞ්ඛාතා කුසලවෙරමණී උප්පජ්ජති"** යනු. මෙය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙහි පඤ්චම අඞ්ගය යි. එය මෙසේ වදාළ සේක:-

"කතමො ච භික්ඛවෙ! සම්මාආජීවො? ඉධ භික්ඛවෙ! අරියසාවකො මිච්ඡාආජීවම්පහාය සම්මාආජීවෙන ජීවිකං කරොති, අයං වුච්චති භික්ඛවෙ! සම්මාආජීවො" යි.

මේ මෙහි අරුත්:- "මහණෙනි! සම්‍යගාජීවය කවරේ ද? යත්: මහණෙනි! මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවක තෙමේ ලාමක වූ දිවි-පැවැතුම් හැරපියා නිවරද වූ දිවිවැටුමෙන් දිවිපැවැතුම් කෙරේ ද මහණෙනි! මෙය සම්‍යගාජීවය යි කියනු ලැබේ" යනු.

මෙහි එන **මිච්ඡාජීවං** යන පදයෙන් බුදුරජුන් විසින් නො කටයුතු ය යි වදාළ නො දැහැමි වෙණදාමෙන් හා මෙරමා තළා පෙළා වධ දී පැහැර ගන්නා දැයින් හා ගිහියා කරණ දිවිවැටුමත්, ශික්ෂා ඉක්මවා යෑමෙන් හා කුහනා ලපනා දී වූ කොහොන් වතින් හා එක්විසි අනෙසනයෙන් ගිහියා සිත් ගැණීමෙන් හා ලත් සිවු පසයෙන් ද තවත් නොයෙක් නො කැප දැයින් පැවිද්දා කරණ දිවිවැටුමත් දක්වන ලද්දේ ය. විස්තර යට කියන ලදී.

මේ සම්‍යගාජීවවිරතිය ද යට කියූ සේ සම්පත්තාදිවිරති තුණෙන් බෙදී යන බැවින් එහිලා කීයේ මෙහිලා ද දතයුතු ය. එහි ද ලැබෙන සමුච්ඡේ ද විරතීහු ආර්‍ය්‍ය මාර්ගක්ෂණයෙහි දී එක් ම විරතියකට වැටී එක් ම විරතියක් ව සිට කෙලෙස් සිඳ හරින්නෝ ය. පූර්වභාගප්‍රතිපදායෙහි සම්පත්ත-සමාදාන නමින් නැගෙන විරතීහු තදඞ්ගාදී විසින් කෙලෙස් ඔබාලන්නෝ ය.

නිවන් පසක් කරණු පිණිස නම්, ගිහියන් විසින් කායවාග්-දුශ්චරිතයෙන් හා නො දැහැමි වෙණදාමෙන් කරණු ලබන නො දැහැමි දිවිවැටුම, මුළුමනින් හැරපියා ගොවිකම් ගෙරිරැකීම් දැහැමි වෙණදාම් ආදියෙහි යෙදී වීර්‍ය්‍ය ධුර කොට සම්‍යගාජීවයෙන් පිරිසිදු ව ජීවත් විය යුතු ය.

පැවිද්දහු විසින් වනාහි ආජීවපාරිශුද්ධිය පිණිස විශෙෂ කොට බුදුරජුන් විසින් දක්වා වදාළ ශික්ෂාවන් නො ඉක්මවා මේ ශාසනයෙහි මහත් ගුණයෙන් අගතැන් පත් වූ මහසුප් ඇ මහ රහතුන් වහන්සේ ගිය මග සිහි කරන්නහු, සිවුපසය ලබනු රිසියෙන් කොහොන් කම් නො කරන්නහු, අනෙසනයන්හි නො ද යෙදෙන්නහු, වීර්‍ය්‍ය ධුර කොට ආජීවය පිරිසිදු කළ යුතු ය. මෙසේ පිළිපදින්නා වූ ගිහි පැවිද්දනට ඒ ඒ අවස්ථායෙහි මේ සම්‍යගාජීවය ලෞකික විසින් සිදු වන්නේ ය. දැඩි ව ගත් සම්‍යගාජීවයෙහි සිට විදසුන් වඩන්නා වූ ඔවුනට මාර්ගචිත්තය ලැබෙනුයේ ලොකොත්තරමාර්ගයාගේ අඞ්ග විසිනි.

සම්මාවාචා – සම්මාකම්මන්තචෛතසික දෙ දෙන අවාබිය කරුණු කොට වාග්දුශ්චරිතයෙන් හා කායදුශ්චරිතයෙන් වළකිත්. සම්මාආජීවචෛතසිකය, විසපල කෑයෙම් නම්, මාගේ දිවි නැසේ-ය, යන බියෙන් විසපල නො කන්නා වූ පුරුෂයකු සේ තමාගේ දිවිවැටුම බලාපොරොත්තුවෙමින් මෙ කියූ සත් වැදැරුම් දුශ්චරිතයෙන් වැළකී සිටුනේ ය. සම්මාවාචාවිරතිචෛතසිකය, වාග්-දුශ්චරිතයෙන් වළක්නා කල්හි දිවිවැටුම බලාපොරොත්තු රහිත ව අවාබිය ගැණ ම අපෙක්ෂා කරන්නී ය. සම්මාආජීවය, වචීදුශ්චරිතයෙන් වළක්නා කල්හි දිවිවැටුම බලාපොරොත්තුවෙමින් පව්කමින් වැළකී ගණියි. සම්මාකම්මන්තචෛතසිකය, කායදුශ්චරිතයෙන් වළක්නා කල්හි දිවිවැටුම බලාපොරොන්තු නැතිව අවාබිය බලාපොරොත්තුවීම් වශයෙන් කායදුශ්චරිතයෙන් වැළකී සිටියි. සම්මාආජීවචෛතසිකය ඇසුරු කොට දුශ්චරිතයෙන් වළක්නා කල්හි පළමු කොට අවාබිය බලාපොරොත්තු වූයේ නමුදු පසු කාලයෙහි දිවිවැටුම බලාපොරොත්තුවෙන් පවත්නේ ය.

මේ සම්‍යග්වාගාදි විරතිත්‍රය, පාණාතිපාත-අදින්නාදාන-මිච්ඡා-චාර-මුසාවාද - පිසුණවාචා - ඵරුසවාචා - සම්ඵප්පලාප - මිච්ඡාජීව යන අටවැදෑරුම් වූ පාපධර්මයන්ගෙන් වැළකීම් වශයෙන් ආජීවාෂ්ටමක ශීලය සමාදන්වන කල්හි එක එක ශික්ෂාපදය පිළිබඳ ව උපදනා කාමාවචරකුශලචිත්තවීථි අටෙහි, අට අට බැගින් ක්‍රමයෙන් උපදී. පන්සිල් අටසිල් සමාදන් වීමෙහි දී එයට සුදුසු පරිදි උපදින්නේ ය. සාමණේර-උපසම්පදා සීලයන්හි කොහොත් වතින් වෙන්වීම් වශයෙන් සම්මාආජීව චෛතසිකය උපදී. දශපුණ්‍යක්‍රියා වසතු වශයෙන් පවත්නා වූ කාමාවචරකුශලචිත්තයන් අතුරෙහි ශීලමයපුණ්‍යක්‍රියාවසතු වශයෙන් ගැණෙන කාමාවචරකුශල චිත්ත යෙහි මුත් අන්‍ය වූ නවවිධ පුණ්‍යක්‍රියාවස්තූන් ඇසුරු කොට මෙය නොඋපදනේ ය. කාමාවචරවිපාකචිත්තය, කායවාග්විඥප්තිජනක නොවන බැවින් එහි විරතීහු නොලැබෙත්. කාමාවචරමහාක්‍රියා සිත් රහතුන්ට ම උපදනා බැවින් ඒ සිත්හි ද ඔවුහු නොලැබෙත්. රූපාරූපමහද්ගතචිත්තයෙහි ශීල විශුද්ධිය අමුතුවලා නොලැබෙන බැවින් එහි එක ද විරතියෙකුත් නොලැබේ. කාමාවචරකුශල චිත්තයෙහි ලැබෙන්නා වූ විරතීහු අවිද්‍යාප්‍රත්‍යයයෙන් ලැබෙන්නා වූ කුශලසංස්කාරයන්ට උපකාරව සිටිත්. එහෙයින් ඒ ධර්මයෝ ප්‍රතීත්‍යසමුත්පාදයෙහි අඞ්ගභූයෙන් සිටින්නාහ. මතු සසරැ ඉපැදීමට හෙතුභූ වෙත්. මාර්ගචිත්තයෙහි මාර්ගාඞ්ග වශයෙන් ලැබෙන්නෝ සසරින් බැහැර යෑමට හෙතු වූ නෛර්‍යාණිකාඞ්ගයෝ වෙත්. කාමාවචරවිරතීහු ලෞකොත්තර විරතීන්ට ප්‍රතිපක්ෂ වූවාහු නමුදු පිදුරු විකිණීමෙන් රන් කහවණු ලබන්නා සේ ලෞකොත්තරවිරතින්ගේ පිළිලැබීමට එකාන්තයෙන් උපකාර වෙත්. මෙහිලා දතයුතු කරුණු ඉතා බොහෝ ය. ඒ හැම අනෙක් පොත පතින් දතයුතු ය.

සම්මාවායාම නම්, සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මාආජීව ය යි ගැණෙන ශීලභූමියෙහි පිහිටියහුගේ සියලු අකුසල් සිඳලන අලස බව නසාලන වීර්‍යචෛතසික ය යි. ඥානදර්‍ශන විශුද්ධියෙහි පැවැති වීර්‍යය සම්‍යග්ව්‍යායාම යි ගණු ලැබේ. එය තමන් හා එක් වූ අනෙක් ධර්මයන් උත්සාහවන් කිරීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය නූපන් අකුසල් නොඉපදවීම, උපන් අකුසල් පහකිරීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් රැකගැණීම ය. වැටහෙන අයුර, මිථ්‍යාව්‍යායාමයාගේ ප්‍රහාණ ය යි. **"අථස්ස යෝ තස්මා සම්මාවාචාකම්මන්තාජීවසඞ්ඛාතාය සීලභූමියං පතිට්ඨිතස්ස තදනුරූපෝ තං සම්පයුත්තෝ වා කොසජ්ජසමුච්ඡේදකෝ විරියාරම්භෝ, අයං පගුණභූලකඞ්ගණෝ, අනුප්පන්නඅකුසලානුප්පාදනාදිරසෝ, මිච්ඡාවායාමප්පහානපච්චුපට්ඨානෝ"** යි එය කීහ.

"සම්මා වායමතීති=සම්මාවායාමො, සම්මා වා තෙන වාය-මතීති=සම්මාවායාමො, පසත්ථො සුන්දරො වා වායාමොති=සම්මාවායාමො" යනු ශබ්දාර්ථ දැක්වීම ය.

සම්‍යග්ව්‍යායාමය, ලෞකික-ලොකොත්තර විසින් දෙ පරිදි ය. එය කීහ මෙසේ:- **"දුවිධො හොති සම්මාවායාමො ලොකිය-ලොකුත්තරභෙදෙනාති"** යි. පුර්වභාගප්‍රතිපදා වශයෙන් ගැණුනේ ලෞකික ය. මාර්ගඵල සම්ප්‍රයුක්ත වූයේ ලොකොත්තර ය. ආර්‍යමාර්ගය වඩන්නහුගේ ආර්‍යමාර්ගකුශලචිත්තයෙහි පහළ වන මිත්‍ථ්‍යාව්‍යායාමයෙන් නො හැනුනු ආර්‍ය වූ වීර්‍යය යි. මෙය ආර්‍යමාර්ගයාගේ පුර්වකාලයෙහි නොයෙක් සිත්හි ලැබෙන්නේ ය. ඒ එකාන්ත ය. "අන් සිතෙකින් නො උපන්නා වූ ලාමක වූ අකුශලධර්මයන්ගේ නො ඉපදීම පිණිස ව්‍යායාම කෙරෙයි, අන් සිතෙකින් උපන්නා වූ ලාමක අකුශලධර්මයන්ගේ පැහීම පිණිස ව්‍යායාම කෙරෙ යි, අන් සිතෙකින් නො උපන්නා වූ කුශලධර්මයන්ගේ ඉපදීම පිණිස ව්‍යායාම කෙරෙයි, අන් සිතෙකින් උපන්නා වූ කුශලධර්මයන්ගේ කල් පැවැත්ම පිණිස ව්‍යායාම කෙරේ ය" යි කීයේ ආර්‍යමාර්ගයෙන් පුර්වඅවස්ථාව සලකා ගෙණ ය. ආර්‍ය මාර්ගක්ෂණයෙහි වනාහි එක් ම සිතෙක්හි මේ ලැබේ. ඒ එකාන්ත ය. එකලා වූ ම මාර්ගචිත්තය සමග යෙදී සිටියා වූ වීර්‍යය, සිවු කිසක් සපයන අරුතින් නම් සතරක් ලබා සිටියේ ය. සම්‍යග්ව්‍යායාමය, පුර්වාවස්ථායෙහි නානාක්ෂණික නානාලම්බනික බවත් මාර්ගාවස්ථායෙහි එකක්ෂණික එකාලම්බනික බවත් පැහැදිලි වන්නේ ය. මේ එහි සාධක වචනය:- **"අයං පන පුබ්බභාගෙ නානා චිත්තෙසු ලබ්භති, අඤ්ඤෙනෙව හි චිත්තෙන අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය වායාමං කරොති, අඤ්ඤෙන උප්පන්නානං පහානාය, අඤ්ඤෙනෙව අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය, අඤ්ඤෙන උප්පන්නානං ඨිතියා, මග්ගක්ඛණෙ පන එකචිත්තෙයෙව ලබ්භති, එකමෙව හි මග්ගසම්පයුත්තං විරියං චතුකිච්චසාධනට්ඨෙන චත්තාරි නාමානි ලභති"** යනු.

වීර්‍යවෛතසිකය, ක්‍රමවත් ව වැඩූයේ ම ලොකික-ලොකොත්තරාර්ථයෙන් සම්පූර්ණ වන්නේ ය. **"න සක්කා කුසීතෙන නව ලොකුත්තරෙ ධම්මෙ ලද්ධුං ආරද්ධවිරියෙනෙව සක්කා, අයමා නිසං සො"** කුසීතයා විසින් නව ලොවුතුරාදහම් ලබන්නට නො හැකි ය, ඇරඹූ වැරඇතියහු විසින් ලබන්නට හැකි ය, මෙය වීර්‍යයාගේ අනුසස් ය, යනු ද සිත්හිලා දැරිය යුතු ය. මෙය තමන් හා එක් වන අන්‍යවෛතසිකයන් ද තම තමන් අයත් කාර්‍යයෙහි

තෙද ගන්වනුයේ ය. සිත යම්කිසි අරමුණෙක නැඟී සිටීමෙහි දුර්වල වූ කල්හි සිතෙහි ඒ දුබලබව නසා සිත ඒ ඒ අරමුණුවල සුපිරුවනගා සිටුවනුයේ ද මේ ය. පූර්භාගප්‍රතිපදා විසින් වැඩුනු මෙය ලෞකික විසින් පවත්නා හැම සැපතක් ලං කොට දෙන්නේ ය. ලොකොත්තර විසින් වැඩුනේ ආර්‍යමාර්ගයාගේ අඞ්ගභූතයෙන් සිට සියලු සසරදුක් නසා ලන්නේ ය. මෙය ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙහි ෂඞ්ඞාඞ්ගය වන්නේ ය. එය මෙසේ වදාළ සේක:-

"කතමොච භික්ඛවෙ! සම්මාවායාමොෘ? ඉධ භික්ඛවෙ! භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං අරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චති භික්ඛවෙ! සම්මාවායාමොෘ" යි.

මේ මෙහි අරුත්:- "මහණෙනි! සම්‍යග්ව්‍යායාමය කවරේද? යත්:- මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ නූපන් ලාමක අකුශලධර්මයන්ගේ නො ඉපදීම පිණිස කුසලච්ඡන්දය උපදවා ද පරාක්‍රමය කෙරේ ද කායික චෛතසිකවීර්‍යය කෙරේ ද සිත ඔසොවා තබා ද ප්‍රධන්වීර්‍යය කෙරේ ද, උපන් ලාමක අකුශලධර්මයන්ගේ පැහීම පිණිස කුසලච්ඡන්දය උපදවා ද පරාක්‍රමය කෙරේ ද කායික චෛතසිකවීර්‍යය කෙරේ ද සිත ඔසොවා තබා ද ප්‍රධන්වීර්‍යය කෙරේ ද නූපන් කුශලධර්මයන්ගේ ඉපදීම පිණිස කුසලච්ඡන්දය උපදවා ද පරාක්‍රමය කෙරේ ද කායිකචෛතසිකවීර්‍යය කෙරේ ද සිත ඔසොවා තබා ද ප්‍රධන් වීර්‍යය කෙරේ ද, උපන් කුශලධර්මයන්ගේ බොහෝ කල් පැවැත්ම පිණිස නො නැසීම පිණිස නැවැත නැවැත වැඩීම පිණිස මහත්බව පිණිස වැඩීම පිණිස පිරිපුන්බව පිණිස කුසලච්ඡන්දය උපදවා ද පරාක්‍රමය කෙරේ ද කායිකචෛතසික වීර්‍යය කෙරේ ද සිත ඔසොව තබා ද ප්‍රධන් වීර්‍යය කෙරේ ද, මහණෙනි! මෙය සම්‍යග්ව්‍යායාමය යි කියනු ලැබේ" යනු.

මෙහි එන **"ඡන්දං ජනෙති වායමති"** යනාදී පදපෙළින් මේ සිවු තන්හි ආසෙවනා භාවනා බහුලීකරණ සතත ක්‍රියා වශයෙන් යෙදී සිටිය යුතුබව වදාරණ ලද්දේ ය. සම්‍යග්ව්‍යායාමය කෘත්‍යය සතරක් සිදු කරණබව මෙයින් පැහැදිලි ය.

එහි පළමු වැන්න = ශමථවිදර්ශනාදියෙහි යෙදීම නිසා මෙතෙක් සිත්හි නූපන්නා වූ ලොභ දෙවෂ මොහාදී වූ අකුශලධර්මයන්ට මත්තෙහි ඉපදීමට ඉඩ නො තබනු පිණිස ධ්‍යානමාර්ගයන්ට පැමිණ නැවැත නැවැතත් ශමථවිදර්ශනාවන්හි යෙදීමෙහි වැර ඇරැඹීම ය.

දෙවැන්න = සිත්හි හැසිරීම් විසින් පවත්නා වූ මෙ කී අකුශල ධර්මයන් පහ කොට හැරීමට විදසුන් වැඩීමෙහි වැර ඇරැඹීම ය.

තෙවැන්න = ප්‍රථමද්ධ්‍යානාදිඅෂ්ටසමාපත්තීන් හා සොතාපත්ත්‍යාදි-මාර්ගයන් ඉපදවීමෙහි වැර ඇරැඹීම ය.

සිවුවැන්න = තමන් ලත් මාර්ගයාගේ පැවැත්ම පිණිස එය වැඩීම පිණිස වැර ඇරැඹීම ය.

නූපන් කුසලයන්ගේ ඉපදීමත් උපන් කුසලයන්ගේ පැවැත්-මත් දෙක මාර්ගයාගේ පැවැත්මෙන් ම වන්නේ ය. මාර්ගය පවත්නේ ද පෙර නූපන් බැවින් අනුපපන්න නම් ද, නැවැත උපන් බැවින් උත්පන්න නම් ද වේ.

"මාගේ සිතතුළ නූපන්නා වූ ලාමක අකුශලධර්මයෝ උප-දින්නෝ අනර්ථය පිණිස පවත්නාහු ය, උපන්නා වූ අකුශල ධර්මයෝ ප්‍රහීණ නො කරණ ලද්දාහු අනර්ථය පිණිස පවත්නාහු ය, මා සිතතුළ නූපන්නා වූ කුශලධර්මයෝ නො ඉපදෙන්නෝ අනර්ථය පිණිස පවත්නාහු ය, උපන්නා වූ කුශලධර්මයෝ නො පැවැත නිරුද්ධ වන්නෝ අනර්ථය පිණිස පවත්නාහු ය" යි සිතන්නහුගේ සිතෙහි නැගි ව්‍යයාමය, නූපන් අකුසල් නො ඉපදවීම, උපන් අකුසල් පහකිරීම, නූපන් කුසල් ඉපදවීම, උපන් කුසල් ස්ථිරත්වයට පැමිණවීම යන මේ කෘත්‍යය සතර ගැබ් කොට සිටියේ ය.

අනවරාග්‍රසංසාරයෙහි නූපන්නා වූ ලාමක අකුශලධර්ම කෙනෙක් නැත. නො ද ඉපිද නැවැත උපදින්නෝ ද මොවුහු ම උපදිත්. ප්‍රහීණ වන්නෝ ද මොවුහු ම ප්‍රහීණ වෙත්.

වත් සපයන, දහම් පොතපත හදාරණ, දුහඟ රකින, සමාධි-විදර්ශනා වඩන, නවකම් කරණ, කරවන, බඹලොවින් විත් මෙලොව උපන් මොවුන්ගේ සිත්හි ඒ මේ අකුශලධර්මයෝ ඔවුන් වත් සැපයීම් ඈ කරණ වේලෙහි ඉපදීමට ඉඩ නොලබත් යම් ලෙසකින් මොවුහු අයොනිසොමනසිකාරයට සිහියෙන් තොරබවට පැමිණ වත් සැපයීම් ඈ හැර සිටියෝ නම් මොවුන්ගේ සිත්හි අසමුදාචාර විසින් අකුශලධර්මයෝ උපදිත්.

පෙර කාමාස්වාද වශයෙන් නො වළඳනා ලද මන වඩන රූපාදී වූ අරමුණක් දැක එහි එල්බ කම්රස විඳින්නහුගේ සිතෙහි අයොනිසොමනසිකාරය හා සිහියෙන් තොරබව හෙතු කොට අනුත්පන්න වූ රාගාදිකෙලශයෝ අනනුභූතාරම්මණ විසින් උපද-නාහු ය. මෙසේ නො වළඳනා ලද රූපාදී වූ අරමුණු ඉෂ්ටත්වයෙන් ගැණීම නිසා ඒ අනුත්පන්නඅකුශලධර්මයන්ගේ ඉපැත්ම ඇති කල්හි තමාට වන අනර්ථය දැක ඔවුන් නො උපදවාලීමට සතිපට්ඨානභාවනායෙහි යෙදී සම්‍යග්ව්‍යායාමයාගේ ප්‍රථමය වූ සම්‍යක්ප්‍රදහනවීර්‍යය වඩන්නේ ය. උපන් අකුසලයන් පහ කොට නො යැවීමෙන් වන අනර්ථය දැක ඔවුන් පහ කොට හරිණු පිණිස දවිතීය සම්‍යක්ප්‍රදහනවීර්‍යය වඩන්නේ ය. නූපන්නා වූ ශමථ-විදර්ශනාවන්ගේ හා මාර්ගයාගේ නො ඉපැත්මෙහි වන අනර්ථය දැක නූපන්නා වූ ඒ ශමථවිදර්ශනාමාර්ගයන් ඉපදවීම පිණිස තෘතීය සම්‍යක්ප්‍රදහනවීර්‍යය වඩන්නේ ය. නො උපන්නා වූ කුශලධර්ම නම් ශමථවිදර්ශනාවෝ ය. මාර්ගය වනාහි වරක් ඉපිද නිරුද්ධ වූයේ ද අනර්ථ පිණිස නම් නො වන්නේය. මාර්ගය, ඵලලාභයට රුකුල් දී නිරුද්ධ වන්නේ ය. ඒ ශමථවිදර්ශනාවන්ගේ නිරොධයෙන් වන අනර්ථය දැක ඔවුන්ගේ ස්ථිරත්වය පිණිස තුරීය සම්‍යක්ප්‍රදහන-වීර්‍යය වඩන්නේ ය. මෙසේ කෘත්‍ය විසින් සතරකට බෙදුන සම්‍යග්ව්‍යායාමය මාර්ගක්ෂණයෙහි එක් ම වීර්‍යයෙක් වේ. ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි අඞ්ගත්වයෙන් සිටියේ ලොකොත්තර වූයේ මේ ය. මෙහි මෙසේ සතර සම්මප්පධාන - විරියින්ද්‍රිය - විරියබල විරියසම්බොජ්ඣඞ්ගයෝ සඞ්ග්‍රහ වෙත්. විස්තරකථාව අනෙක් පොතපතින් දතයුත්තී ය.

සම්මාසති නම්, මේ කියූ සම්‍යග්ව්‍යායාමයෙන් තෙද ගැණුනු එයින් පුෂ්ටිමත් වූ වීර්‍යවත්හුගේ ඒ සම්‍යග්ව්‍යායාමය හා එක්වූ කාය - වෙදනා-චිත්ත-ධම්ම යන මෙතැන්හි අනුපස්සනාදීන්ගේ බලයෙන්, අශුභයන් ශුභවිසින් ගන්නා මිත්‍ථ්‍යාස්මෘතිය කම්පිත කොට නසා-ලන සිත පිළිබඳ නො මුළාබවය යි කියන ස්මෘතිචෛතසික ය යි. එය අරමුණෙහි ඇති තතු ඇති සැටියෙන් වටහා ගැණීම ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, අශුභයෙහි ශුභ ය යි නො මුළාබව ය. වැටහෙන අයුර, මිත්‍ථ්‍යාස්මෘතිය පහ කොට හැරීම ය. **"තස්සෙවං වායමතො තං සම්පයුත්තො ව මිච්ඡාසති විනිදධුනනො චෙ-තසො අසම්මොසො සම්මාසති නාම, සා උපට්ඨානලක්ඛණා, අසම්මුස්සනරසා, මිච්ඡාසතිප්පහානපච්චුපට්ඨානා"** යි එය කීහ.

"සම්මා සරතීති= සම්මාසති, සම්මා වා තාය සරතීති= සම්මාසති, පසත්ථා සුන්දරා වා සතීති=සම්මාසති" යනු ශබ්දාර්ථ දැක්වීම ය.

සම්‍යක්සමාධිය ලෞකික-ලොකොත්තර යි දෙ පරිදි ය. එය කිහ මෙසේ:- **"දුවිධා හොති සම්මාසති ලොකිය ලොකුත්තර හෙදෙනොති"** යි. මෙහි මාගීප්‍රතිලාභයට පූර්වයෙහි කය අරමුණු කොට, වෙදනාව අරමුණු කොට, සිත අරමුණු කොට, පඤ්චස්-කන්ධාදිධර්මයන් අරමුණු කොට, වෙන් වෙන් ව වැඩූ සමාධිය පූර්භාගප්‍රතිපද යි ගැණුනි ලෞකික ය. **ස්‍රොතාපත්ත්‍යාදී** චතුර්-විධ මාගීචිත්තයන් හා හැනී සිටියා ලොකොත්තර ය. ආර්‍යමාගීය වඩන්නහුගේ ආර්‍යමාගීකුශලචිත්තයෙහි පහළ වන මේ සමාධිය ආර්‍යී වූවා මිථ්‍යාසමාධිය හා නො හැනුනී ය. පූර්භාගප්‍රතිපද-යෙහිලා නම් නොයෙක් සිත්හි පහළ වන්නී ය. "අන් සිතෙකින් රූපකය පිරිසිඳ දන්නී ය, අන් සිතෙකින් වෙදනාව පිරිසිඳ දන්නී ය, අන් සිතෙකින් සිත පිරිසිඳ දන්නී ය, අන් සිතෙකින් ධර්මයන් පිරිසිඳ දන්නී ය" යි කියේ ආර්‍යමාගීයෙන් වෙන් වූ සමාධිය පිළිබඳ පූර්වාවස්ථාව බැලීමෙනි. ආර්‍යමාගීක්ෂණයෙහි වනාහි එක් ම සිතෙහි ලැබේ. ඒ එකාන්ත ය. මෙසේ නො වෙන් වූ ම මාගීචිත්තය හා සෙදුනු සමාධිය සිවු කිසක් සපයන බැවින් නම් සතරක් ලබන්නී ය. මෙසින් කියේ සම්‍යක් සමාධිය මාගී-යෙන් පූර්කාලයෙහි මාගීභාවයට පැමිණීමට පෙරාතුව නානා ක්ෂණික නානාලම්බනික බව හා මාගීක්ෂණයෙහි එකක්ෂණික එකාලම්බනික බවත් ය. මේ එහි සම්පිණ්ඩනය:- **"අයම්පි පුබ්බභාගෙ නානාචිත්තෙසු ලබ්භති, අඤ්ඤඤ්ඤෙවචිත්තෙන භාගං පරිගණ්හාති, අඤ්ඤඤ්ඤඤ්ඤෙන වෙදනාදීනි, මග්ගක්ඛණෙ එක චිත්තෙනයෙව ලබ්භති, එකාසෙව හි මග්ගසම්පයුත්තා සති චතු කිච්චසාධනත්ථෙන චත්තාරි නාමානි ලබ්භති"** යනු.

මාගීඵල විසින් නො වැඩුනු පූර්භාගප්‍රතිපද විසින් වැඩුනු සාමාන්‍යසමාධිය පවා මිනිසාට එ ලොව මෙ ලොව දෙක්හි සියලු අර්ථසිද්ධිය සිද්ධ කර දෙන බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එකාන්තකුශලචෛතසිකයක් වූ මෙය අරමුණෙහි දැඩි ව පිහිටා ගණිසි. ඇස් කන් නාස් ආදී වූ දෙරටු රක්නා මෝ දෙරටු පල්ලකු වැනි ය. සිතට නැගුනු අරමුණු අමතක වන්නට නො දෙන්නී මෝ ය. කුසල් සිත්හි තමන් හා අන්වැල් බැඳ සිටුනා අනෙක් නාමධර්මයන්ට අරමුණු ඔහි කර ගන්නට රැකුල් දෙන්නී මෝ ය. ලොකොත්තර විසින් වැඩුනු කල්හි සියලු සසර දුක් නසාලන්නී ය. මෙහි විසතරයට කියන ලද්දේ ය. ආර්‍යඅෂ්ටාඞ්ගික මාගීයෙහි **සප්තමාඞ්ගය** වන්නී මාගී විසින් වැඩුනු මෝ තොමෝ ය එය මෙසේ වදාළ සේක:-

"කතමා ච භික්ඛවෙ! සම්මාසති? ඉධ භික්ඛවෙ! භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, අයං වුච්චති භික්ඛවෙ! සම්මාසති" යි.

මේ මෙහි අරුත්:- "මහණෙනි සම්‍යක්ස්මෘතිය කවරී ද? යත්:- මහණෙනි! මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත වූයේ සිහි ඇතියේ මේ කයෙහි කය අනුව අනිත්‍යාදී විසින් බලන සුලු වූයේ උපාදානස්කන්ධ-ලොකයෙහි ඇලීම හා දොම්නස දුරු කොට වෙසෙයි, කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක් ප්‍රඥා ඇතියේ සිහි ඇතියේ වෙදනායෙහි වෙදනා අනුව අනිත්‍යාදී විසින් බලන සුලු වූයේ උපාදානස්කන්ධ ලොකයෙහි ඇලීම හා දොම්නස දුරු කොට වෙසෙයි, කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක් ප්‍රඥා ඇතියේ සිහි ඇතියේ සරාගාදී වූ සිත්හි සිත අනුව අනිත්‍යාදී විසින් බලන සුලු වූයේ උපාදාන ස්කන්ධ ලොකයෙහි ඇලීම හා දොම්නස දුරු කොට වෙසෙයි. කෙලෙස් තවන වැර ඇතියේ සම්‍යක් ප්‍රඥා ඇතියේ සිහි ඇතියේ නීවරණාදි ධර්මවිෂයයෙහි ඒ ධර්ම අනුව අනිත්‍යාදී විසින් බලනසුලු වූයේ උපාදානස්කන්ධ ලොකයෙහි ඇලීම හා දොම්නස දුරු කොට වෙසෙයි, මහණෙනි! මෙය සම්‍යක්ස්මෘති යි කියනු ලැබේ" යනු.

සම්‍යක්ස්මෘතිය, අනුපස්සනා විසින් කාය-වෙදනා-චිත්ත-ධර්ම යන මේ සිවු තන්හි විද්‍යමාන වූ අනිත්‍ය දුඃඛ අනාත්මලක්ෂණ නුවණින් එක්වන් සිහි කිරීම් වශයෙන් කායපරිග්‍රාහිකාස්මෘති - වෙදනාපරිග්‍රාහිකාස්මෘති - චිත්තපරිග්‍රාහිකාස්මෘති - ධර්මපරිග්‍රාහිකාස්මෘති යි කෘත්‍ය සාධන විසින් වෙන වෙන නම් ලැබූය. මෙය යට ද කියන ලද්දේ ය.

අටවිසි රූප අතුරෙහි එක් එක් රූපයෙහි අනිත්‍ය-දුඃඛ - අනාත්ම විසින් පුන පුනා සිහි එළවා බැලීමෙන් මග නැණින් මුදුන් පැමිණියා කායපරිග්‍රහිකාස්මෘතිය යි.

එක් අසූවක් ලෞකිකචිත්තයෙහි යෙදී සිටි එක් අසූවක් වෙදනාවන් අනිත්‍ය දුඃඛ-අනාත්ම විසින් නැවැත නැවැත සිහි එළවා බැලීමෙන් මගනැණින් මුදුන් පැමිණියා වෙදනාපරිග්‍රාහිකාස්මෘතිය යි.

එක් අසූවක් ලෞකිකචිත්තයන් අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් සිහි එළවා බැලීමෙන් මග නැණින් මුදුන් පැමිණියා චිත්තපරිග්‍රාහිකාස්මෘතිය යි.

එක් අසූවක් ලෞකිකචිත්තයන්හි යෙදුනු එක් අසූවක් සංඥා, එක් පණසක් ස්පර්ශාදිචෛතසික යනාදී ධර්මයන් අනිත්‍ය-දුඃඛ-අනාත්ම විසින් සිහි එළවා බැලීමෙන් මග නැණින් මුදුන් පැමිණියා ධර්මපරිග්‍රාහිකාස්මෘතිය යි. මෙසේ මග නැණින් සමෘද්ධිමත් වූ ස්මෘතිය ම සම්‍යක්ස්මෘති යි කියනු ලැබේ. **"ඉති එකාව මග්ගසම්පයුත්තා සති ලොකුත්තර සම්මාසතීති වුච්චති"** යනු එහිලා කියන ලදි. මෙයින් ලොවුතුරුමගපලසිත් හා නිවන හැර අන්‍ය වූ සියලු ත්‍රෛභූමකධර්මයන් අනිත්‍යාදී වශයෙන් ත්‍රෛභූමක ධර්මයන්ගේ ඇති තතු ඇති ලෙසින් සිහියට නගා ගැණීම ගැණේ. එහෙයින් ත්‍රෛභූමකධර්ම ආලම්බන වශයෙන් හා ස්මෘතිචෛතසිකය ආලම්බනික වශයෙනුත් ගතයුතු ය. ස්මෘතිචෛතසිකය, මේ ආලම්බනයන් කෙරෙහි ලා වැඩීම හෙතු කොට ගෙණ ධුව-ශුභ-සුඛ-ආත්ම සංඥා පහ ව යන්නී ය. සතර **සතිපට්ඨාන සතිඉද්ධිය සතිබල සතිසම්බොජ්ඣඞ්ග** යන ධර්මයෝ මෙහි සඞ්ග්‍රහයට යන්නෝ ය. ධර්මවිස්තරය විස්තීර්ණව සිටියේ ය. අන් පොතපතින් එය දත යුත්තේ ය.

සම්මාසමාධි නම්, මෙසේ නිරුත්තර වූ සම්‍යක්ස්මෘතියෙන් මොනවට රකිනු ලබන සිත් ඇත්තහුගේ ඒ සම්‍යක්ස්මෘතියෙන් ඔද වැඩුනු තෙද ගැණුනු මිත්‍ථ්‍යාසමාධිය නසාලීමෙන් සිත හා සිතුවිලි නන් අරමුණෙහි විසිර යා නොදී දැහැමි එක් අරමුණෙක මනා කොට පිහිටුවීමැ යි කියන එකාග්‍රතාචෛතසිකය යි. මේ චෛතසිකයාගේ ශක්තිමාත්‍රයෙන් ම නන් අරමුණු කරා නිතර දුවන සිත එක් ම අරමුණෙහි සම ව නො විසිර පිහිටා ගන්නේ ය. එය නොයෙක් අරමුණෙහි නො විසිර පවත්නා බව ලකුණු කොට සිටියේ ය. කෘත්‍යය, සිත හා සිතුවිලි උඩඟුබවෙන් නන් අරමුණු කරා පැමිණවීම නසාලීම ය. වැටහෙන අයුර, උඩඟු බවෙන් සිත හා සිතුවිලි නො සැලෙන බව ය. "සුව පත් වූයේ සිත එකඟ කරන්නේ ය" යි වදාළ බැවින් පස්කම් සැපයෙන් වෙන් වූ නිරාමිශසුඛය යි. **"එවං අනුත්තරාය සතියා සංරක්ඛිය-මානචිත්තස්ස තං සම්පයුත්තාව මිච්ඡාසමාධි විද්ධංසිකා චිත්තෙ-කග්ගතා සම්මාසමාධි නාම, සො අවික්ඛෙපලක්ඛණො, සමා-ධානරසො, මිච්ඡාසමාධිප්පහානපච්චුපට්ඨානො, සුඛිනොචිත්තං සමාධියතීති වචනතො පන සුඛමස්ස පදට්ඨානං"** යි. එය කීහ

"එකා ලම්බනෙ සුට්ඨු ආධානං=සමාධි, සම්මා සමාධියතීති= සම්මා සමාධි, සම්මා වා තෙන සමාධියතීති = සම්මා සමාධි පසත්ථො සුන්දරො වා සමාධීති = සම්මා සමාධි" යනු ශබ්දාර්ථ දැක්වීම ය.

සම්‍යක් සමාධිය, ලෞකික-ලොකොත්තර යි දෙ පරිදි ය. එය කීහ මෙසේ:-**"දුවිධො හොති සම්මාසමාධි ලොකියලොකුත්තර-භෙදෙනාති"** යි. ප්‍රථම-දවිතීය-තෘතීය-තුරීයද්ධ්‍යානයන්හි යම් එකාග්‍රතායෙක් වේ ද, එය පූර්වභාගප්‍රතිපදා විසින් වැඩුනේ ලෞකික වේ. මෙය භවය ඇසුරු කොට සිටියේ ය. කාමසුගති භූමියෙහි හා රූපභූමියෙහි හා අරූපභූමියෙහි හා උපන් මිනිස් දෙව් බඹුන් විසින් උපද වන ලද ධ්‍යානකුශලචිත්තවීථියෙහි යෙදී සිටි එකාග්‍රතාව ලෞකික ය. මේ ලෞකිකයෙහි උපචාර-අප්පණා සවිතක්ක-සවිචාර-අවිතක්ක - අවිචාර-සප්පීතික - නිප්පීතිකා දී වූ භෙද රාශියෙක් වේ. ඒ හැම දැක්වීමට මෙහි අවකාශ නැත්තේ ය. දහම් පොතපත බලා එ හැම දතයුතු ය.

මෙසේ ඔවුන් ලැබූ ඒ ධ්‍යාන දෙස් සහිතබව දැක ඒ ම පාදක කොට විදසුන් වඩනා කල්හි ස්‍රොතාපත්ත්‍යාදිමාර්ගචිත්තයන්හි සුදුසු සේ පහළ වන එකාග්‍රතාවෛතසිකය, ලොකොත්තරසම්‍යක්සමාධි නම් වේ. **"යා ඉමෙසු චතුසු ඣානෙසු එකග්ගතා, අයං පුබ්බ-භාගෙ ලොකියො, අපරභාගෙ මග්ගක්ඛණෙ ලොකුත්තරො සම්මාසමාධීති වුච්චති"** මෙයින් මොවුන්ගේ සසර දුක ද කෙළ-වර වන්නේ ය. විස්තර යට කියන ලද්දේ ය. ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යෙහි අෂ්ටමස්ථානය පුරා සිටියේ ය. එය මෙසේ වදාළ සේක:-

"කතමො ච භික්ඛවෙ! සම්මාසමාධි? ඉධ භික්ඛවෙ! භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතිය-ජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහ-රති, අයං වුච්චති භික්ඛවෙ! සම්මාසමාධි" යි.

මේ මෙහි අරුත්: "මහණෙනි" සම්‍යක් සමාධිය කවරේද? යත්:-මහණෙනි,මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන් කෙරෙන් වෙන් ව අකුශලධර්මයන් කෙරෙන් වෙන් ව විතර්කසහිත වූ විචාර සහිත වූ කය සිත පිළිබඳ විවේකයෙන් හට ගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන් සන්සිඳවා ලීමෙන් තමන් තුළ හට ගත් දැනී පැහැදීමෙන් යුක්ත වූ සිතෙහි එකඟබව වූ විතර්කරහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හට ගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි. ප්‍රීතිය කෙරෙහි පිළිකුළින් ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇතියේ සිහි ඇතියේ මනානුවණැති ව වෙසෙයි, කයින් සැප ද විඳියි, ආර්‍යයෝ යම් ධ්‍යානයක් ගැන ඒ ධ්‍යානයෙන් යුක්ත වූයේ උපෙක්ෂා ඇත්තෙක, සිහි ඇත්තෙක, සුවසේ වෙසෙන්නෙකැ යි කියත් ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, සුඛප්‍රහාණයෙන් ද දුඃඛප්‍රහාණයෙන්ද පළමු කොට සොම්නස් දෙම්නස් දෙක නැසීමෙන් නිදුක් වූ නො සැප වූ උපෙක්ෂාවෙන් හට ගත් සිහිය පිළිබඳ පිරිසිදුබව ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි, මහණෙනි! මෙය සම්‍යක්සමාධි යි කියනු ලැබේ" යනු.

මේ දෙශනායෙන් ප්‍රධාන විසින් ධ්‍යාන සතරෙක් ප්‍රථමධ්‍යානාදීන්ගේ වශයෙන් දක්වන ලද්දේ ය. **ලෞකික-ලොකොත්තරාදිභෙද** විසිනුදු බෙදී යනුයේ මේ සතරම ය. ලෞකික සම්‍යක්සමාධිය, බ්‍රහ්මත්වාදිසම්පත් සාදා දෙන අතර ලොකොත්තරය, මාර්ගඵල සම්පත් සිදු කරන්නේ ය. එසේ සිදු කරණුයේ ද අනෙක් මාර්ගාඞ්ග හා එක්වීමෙනි. ලෞකිකය, කසිණාදී වූ නොයෙක් අරමුණු ඵල්බ ගන්නා අතර ලොකොත්තරය නිවන ඵල්බ ගණියි. ලෞකිකය, වෘත්තනිශ්‍රිතය. එහෙයින් එය බොධිපාක්ෂික නො වේ.ලොකොත්තරය ම බොධිපාක්ෂික වේ.එහෙත් ලෞකිකය, ලොකොත්තරසමාධියගේ **උත්පත්ති**යට රුකුල් දී සිටියි. ලොකොත්තරමාර්ගීය පිණිස යාන දෙකක් ඇත්තේ ය. එකෙක් ශමථ යාන ය. එකෙක් විදර්ශනා යානය. එයින් ශමථයානිකයන්ගේ සමාධිය ලෞකික ය. එහෙත් එය ආර්‍යමාර්ගයෙහිලා ගැණෙන සම්‍යක් සමාධියට අයත් ය. ශමථවිදර්ශනායානිකයන්ගේ පරිකර්ම-උපචාර සමාධි දෙක ද සම්‍යක්සමාධිමාර්ගයෙන් ගන්නා ලැබේ.

මේ සූත්‍රයෙන් දැක් වූ සම්‍යක්සමාධිය පුග්ගලාධිෂ්ඨාන වශයෙන් දෙශනා කරණ ලද්දේ ය. ගුණවිශෙෂ, පුද්ගලයා මතු පිට නගා කරණ දෙශනා පුග්ගලාධිෂ්ඨාන නමු. මෙහි **සමාධින්ද්‍රිය – සමාධිබල – පීති – පස්සද්ධි – උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගයෝ** එක්වීමට යෙත්.

සම්‍යග්ව්‍යායාම - සම්‍යක්ස්මෘති - සම්‍යක්සමාධි යන මෙතුණ එක් ම සිත්හි එක් ව ම උපන්නේ නම් අර්ථසිද්ධිය වන්නී ය. නැත, නො වන්නී ය සම්‍යග්ව්‍යායාමය, ප්‍රග්‍රහකෘත්‍යයත් සම්‍යක් ස්මෘතිය, අපිලාපනකෘත්‍යයත් සිදුකරමින් එක් වූ කල්හි එයින් ලැබුනු රුකුල් ඇති ව සම්‍යක්සමාධිය ඔවුන් හා ම නිවනෙහි එල්බ ගන්නේ ය.

මෙ තුණ මෙහිලා උයන් කෙළි කෙළිම්හ, යි මල්උයනකට ගිය යහළුවන් තිදෙනෙකු වැනි ය. එයින් එකකු පිපී ගිය මල් ඇති සපුරුකක් දැක මල් නෙලා ගන්නට අත දිගු කළ ද, මල් නෙලා ගත නො හී සිටුනා කල්හි දෙවැන්නා ඔහුට ආධාර පිණිස පිට දී සිටියේ ය. මල් නෙලන්නහු ඔහු පිට නැගී ගතු ද පිට මතුයෙහි සැලෙන බැවින් මල් නෙලා ගත නො හී සිටිනු දැක තෙවැන්නා ඔහුට එල්බ ගැණීමට උරහිස ලං කොට සිටගතු. එකල්හි ඔහු එකකුගේ පිට නැග එකකුගේ උරහිස එල්බ රිසි සේ මල් නෙලා ගෙණ තිදෙනා ම එක් ව නැකැත් කෙළි කෙළ ගියහ. මෙහි මේ තිදෙනාගේ එක්වීම නිසා මල් නෙලා ගන්නට හැකි වූ සේ "සම්‍යග්ව්‍යායාම-ස්මෘති-සමාධි තිදෙනාගේ එක්වීමෙන් ම නිවන් සැප සිදුකර ගත හැක්කේ ය.

මෙසේ ඉතා සැකෙවින් මෙහි දැක් වූ ආර්‍යමාර්ගය තෙමේ විද්‍යා විසින්, ශමථ විසින්, විදර්ශනා විසින්, ශීලාදිස්කන්ධ විසින්, අධිශීලාදි ශික්ෂා විසින් බෙදුනේ ය. එ ද සැකෙවින් මෙසේ දත යුත්තේ ය.

"සො බො පනෙස මග්ගො සම්මාදිට්ඨිසඞ්ඛාපානං විජ්ජාය සෙසධම්මානං චරණෙන සඞ්ගහිතත්තා විජ්ජා චෙව චරණඤ්ච, තථා තෙසං ද්වින්නං විපස්සනායානෙන, ඉතරෙසං සමථයානෙන සඞ්ගහිතත්තා සමථො චෙව විපස්සනා ච, තෙසං ද්වින්නං පඤ්ඤාක්ඛන්ධෙන, තදනන්තරානං තිණ්ණං සීලක්ඛන්ධෙන, අවසෙසානං තිණ්ණං සමාධික්ඛන්ධෙන, අධිපඤ්ඤාඅධිසීල අධිචිත්තසික්ඛාහි ච සඞ්ගහිතත්තා ඛන්ධත්තයඤ්චව සික්ඛාත්තයඤ්ච හොති, යෙන සමන්නාගතො අරියසාවකො දස්සන සමත්ථෙහි චක්ඛූහි ගමනසමත්ථෙහි ච පාදෙහි සමන්නාගතො අද්ධිකො විය විජ්ජාචරණසම්පණ්ණො හුත්වා විපස්සනායානෙන කාමසුඛලලිකානුයොගං, සමථයානෙන අත්තකිලමථානුයොගන්ති අන්තදවයං පරිවජ්ජෙත්වා මජ්ඣිමපටිපදං පටිපන්නො පඤ්ඤාක්ඛන්ධෙන මොහක්ඛන්ධං, සීලක්ඛන්ධෙන දොසක්ඛන්ධං, සමාධික්ඛන්ධෙන ච ලොභක්ඛන්ධං පදාළෙන්නො අධි-

පඤ්ඤාසික්ඛාය පඤ්ඤාසම්පදං, අධිසීලසික්ඛාය සීලසම්පදං, අධිචිත්තසික්ඛාය සමාධිසම්පදඤ්හි නිසෙසා සම්පත්තියෝ පත්වා අමතං නිබ්බානං සච්ඡිකරොති, ආදිමජ්ඣපරියොසානකල්‍යාණං සත්තතිංසබොධිපක්ඛියධම්මරතනවිචිත්තං සම්මත්තනියාම සඩ්ඛාතං අරියභූමිං ඔක්කන්තනියා හොතීති'' යනු ආගම බැවින්.

මෙහි ඉතා කෙටි අදහස මෙසේ දතයුතු ය. සම්මාදිට්ඨි-සම්මාසඞ්කප්පයෝ විදෘවෙන්, විදර්ශනායෙන්, ප්‍රඥාසඤ්ඤයෙන්, අධිප්‍රඥා ශික්ෂායෙන් සඞ්ග්‍රහ කරණ ලදහ. සෙසු ෂඞ්ඞයෝ මූළුමනින් චරණයෙන් හා සමථයෙන් ද, නැවැත එහි සම්මාවාචා-සම්මා කම්මන්ත-සම්මාආජීවයෝ ශීලසඤ්ඤයෙන් ද, සම්මාවායාම සම්මා සති-සම්මාසමාධිහු සමාධිසඤ්ඤයෙන් ද එක්වීමට හියහ. එහෙයින් මෙහි කියූ ලෙසින් ආයර්‍යශ්‍රාවකයා විසින් දැකීමෙහි පොහොසත් ඇස් ඇති පා ගමනෙහි පොහොසත් පා ඇති මිනිසකු මෙන් විදර්ශනායානයෙන් ගොස් කාමසුඛල්ලිකානුයොගය ද, ශමථයානයෙන් ගොස් අත්තකිලමථානුයොගය ද දුරු කොට ප්‍රඥාසඤ්ඤාදි ගුණසඤ්ඤයෙන් මොහාදිකෙලශසඤ්ඤයන් පළවා හැර අධිප්‍රඥාදිශික්ෂාත්‍රයයෙන් ප්‍රඥා-ශීල-සමාධිසම්පත්තීන් ද අත්පත් කොට එයින් පුෂ්ටිමත් ව සියලු සසර දුක් නසා නිවන් සැප සිදුකර ගණු ලැබේ. මෙසේ මේ හැම ගුණයෙකින් පිරී ගත් ආයර්‍ය ශ්‍රාවක තෙමේ ම මුල-මැද-අග යහපත් වූ බොධිපාක්ෂිකධම්මරතනයෙන් විසිතුරු වූ ආයර්‍යභූමියට පැමිණ අමාමහනිවන අවබොධ කරන්නේ ය.

අට වැදූරුම් වූ ආයර්‍යමාර්ගාඞ්ග අතුරෙහි සම්‍යග්දෘෂ්ටිය මුල් කොට දෙසන ලද්දී පූර්‍වභාගප්‍රතිපදායෙහි ලා ගැණෙන විදර්ශනාඥානසඞ්ඛ්‍යාත සම්‍යග්දෘෂ්ටිය, යොගීහට අවිදූරු නසා කෙලෙස් සිඳ හැර නිවනට පැමිණීමට අන් හැම අඞ්ගයකට වඩා උපකාර බැවිනි. පූර්‍වභාගයෙහි වූ විතර්කයෙන් විතර්කණය කරමින් විදර්ශනා ප්‍රඥයෙන් අනිත්‍යාදිවශයෙන් බලමින් මේ ධර්ම කාමාවචරය, මේ ධර්ම රූපාවචරාදිය යි පිරිසිදීමට රුකුල් දෙන බැවින් සම්‍යක් සඞ්කල්පය දෙවැනි ව ද, පළමු ව විතර්කණය කොට පසුව වාග්භෙදය කරණ බැවින් සම්‍යග්වචනය තෙවැනිව ද, සම්‍යග්වචනය සම්‍යක්කර්මාන්තයට බොහෝ උපකාර බැවින් සම්‍යක්කර්මාන්තය සිවුවැනි ව ද, කායවාක් දුශ්චරිතයන් හැර කායවාක් සුචරිතයන් පිරීමෙන් ම ආජීවාෂ්ටමක ශීලය පිරෙණ බැවින් සම්‍යගාජීවය පස්වැනි ව ද, ආජීවය පිරිසිදු බැවින් ප්‍රමත්ත ව විසීම නො සුදුසු ය යි ගෙණ සියලු ඉරියව්වල වීර්‍යය කළ යුතු බැවින් සම්‍යග්වීර්‍යය සවැනිව ද, වැර ඇරඹුවහු විසින් කායාදිසතිපට්ඨානයන්හි

සිහිය එළවා විසිය යුතු බැවින් සම්‍යක්සමෘතිය සත්වැනි ව ද, එළඹ සිටි සිහියෙන් සිතේ එකඟබවට උපකාරධර්ම, සිහියට ගෙණ එහි සිත පිහිටවිය යුතු බැවින් සම්‍යක්සමාධිය අටවැනි ව ද දෙසන ලදහ යි දත යුතු ය.

ධර්මනියමය මෙසේ බැවින් මාර්ගභාවනාවට පෙරාතුව පඤ්ච-ස්කන්ධ ද්වාදශායතන අෂ්ටාරශධාත්වාදී වූ ධර්මකොට්ඨාසයන් ගැණ උසස් දැනීමෙක් මේ පිණිස භාවනා කරන්නහු විසින් ලැබිය යුතු-ය. මේ දැනීම මාර්ගභාවනාවට ස්ථාන වන්නේ ය. එසේ ම භාවනා වඩන සැටිත් දැන ගත යුතු ය. සිල්වත් ව විවෙකී ව හිඳ නාම රූපධර්මයන් අනිත්‍යාදිලක්ෂණයන්ට නගා භාවනා කළ යුතු ය. එසේ භාවනා කරණ කල්හි සම්මාදිට්ඨි ආදි මාර්ගාඞ්ගයෝ ක්‍රම ක්‍රමයෙන් වැඩී මෝරා යන්නාහ. මේ වැඩී මෝරා යෑම නිසා කෙලෙස් ද ක්‍රමයෙන් තුනී වී යන්නේ ය. සිත නිවනට නැමී ගන්නේ ය. සිත නිවන් අරමුණෙහි වැටෙන්නේ ය. සිත මෙසේ පළමු කොට අරීඅටඟිමගට වැටී නිවනට නතු වීමෙන් කෙලෙස් කොටස් කිහිපයක් බිඳ වැටීම නිසා විදර්ශකයා ඒ ලැබූ තත්ත්වය ස්‍රොතාපත්ති යි කියනු ලැබේ. මේ ස්‍රොතාපත්තිමාර්ගය ලබත් ම දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බතපරාමාස සංයොජනධර්ම නැසෙන්නේ ය. දැන් ඒ විදර්ශක ආර්‍යශ්‍රාවක තෙමේ ඉදිරියෙහි නැසිය යුතු කෙ-ලෙස් නැසීමෙහි ස්ථිර ව බැඳී සිටුනේ ය. සම්බොධියට නියත විය. ඉදිරියෙහි තව තවත් විදර්ශනා වඩා සකෘදාගාමී-අනාගාමී-අර්හන්-මාර්ගයන්ට ද පැමිණ සසර දුක් කෙළවර කරන්නේ ය. ඒ එකා-න්ත ය මෙහි මෙසේ ඉතා කොටින් කියූ අෂ්ටාඞ්ගිකමාර්ගය, නිවන් ලැබීමෙහි නො වරදින සත්‍ය වූ නො ද පෙරළෙන එකායනමාර්ග-ය වේ. නිවන් පිණිස මෙය හැර අන් මගෙක් නැත්තේ ය. එහෙ-යින් මේ ආර්‍යමාර්ගය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍යසත්‍යය යි සම්මත ය. ධර්මවිස්තරය කෙටි නො වේ. එහෙයින් එය අන් බණ පොතින් දත යුත්තේ ය.

එතං ඛො සරණං ඛෙමං=මේ සරණය වනාහි බියරහිත ය.

ශරණය පිළිබඳ කරුණු මෙසේ දතයුතු ය යි පොතෙහි කීයේ මෙසේ ය: **"සරණගමනකොසල්ලත්ථං සරණං, සරණගමනං, යො ච සරණං ගච්ඡති, සරණගමනප්පභෙදො, ඵලං, සඞ්කිලෙ-සො, භෙදො, වොදානත්ති අයං විධො වෙදිතබ්බො"** යි.

එහි බුද්ධ=ධම්ම-සඞ්ඝ යන ශ්‍රේෂ්ඨවස්තුත්‍රය තමාට එක් ම පිහිටැ යි අදහා ගත්තවුන් පිළිබඳ ව එලොව-මෙලොව දෙක්හි වන්නා වූ බිය-තැතිගැණුම්-අවැඩ-රෝදුක් හා අපාදුක් වධබැඳුම්

නසාලන්නේ නු යි **සරණ** නම්. බුද්ධාදිරතනත්‍රය යි. බුද්ධාදිරතනත්‍රය ම සත්ත්‍වයන් හිතවැඩෙහි යොදන්නේ ය. අහිතයෙන් රැක ගන්නේ ය. සියලු බිය නසන්නේ ය. සසර දුකින් මුදුලන්නේ ය. අස්වැසිලි දෙන්නේ ය. සවලප වූ ද සතකාරය, මහත් පල කරන්නේ ය. පොතෙහි මෙය කී සැටි බලනු මැනැවි:- **"හිංසතීති= සරණං, සරණගතානං තෙනෙව සරණගමණෙන භයං සන්තාසං දුක්ඛං දුග්ගතිං පරික්කිලෙසං හනති විනාසෙතීති රතනත්තයස්සෙතං අධිවචනං, අථ වා හිතෙ පවත්තනෙන අහිහා නිවත්තනෙන ච සත්තානං භයං හිංසතීති බුද්ධා, භවඛනනාරහතා උත්තාරණෙන අස්සාසදානෙන ච ධම්මා, අප්පඛානම්පි ඛාරාණං විපුලඵලපටිලාභකරණෙන සඞ්ඝා, තස්මා ඉමිනාපි පරියායෙන රතනත්තයං සරණං,,** යනු.

තුණුරුවන් කෙරෙහි සිත පැහැදීමෙන් තුණුරුවන් ගරු කොට ගැණීමෙන් නසාලූ කෙලෙස් ඇති පිරිසිදු වූ තුණුරුවන් මට පිහිටැ සි මෙලෙසින් සිතෙහි නැගුනු ශ්‍රද්ධාපූර්ණකසම්‍යග්-දෘෂ්ටිය, චෙතනාමාත්‍රය **සරණගමන** නම්.

පොතෙහි මෙසේ ආයේ ය:- **"තප්පසාදනඟරුනාහි විහතකිලෙසො තප්පරායණතාඛාරප්පවත්තෙතා චිත්තුප්පාදෙ සරණගමනං"** යි.

මේ කියූ ශ්‍රද්ධාපූර්ණක චිත්තෝත්පාදයෙන් යුක්තව 'මේ තුණුරුවන් ම මට පිහිටැ' යි සිතා අදහා ගෙණ තුණුරුවන් සෙවනය කරන්නේ සිතින් අදහා ගන්නේ **සරණගත** නම්. මෙතෙමේ ම බුදුරජානන් වහන්සේ විසින් උපාසකා යි හඳුන්වන ලද්දේ ය.

මේ බලනු මැනැවි:- **"තං සමඞ්ගිසත්තෙතා සරණං ගච්ඡති, වුත්තනයෙනාකාරෙන චිත්තුප්පාදෙන එතානි මෙ තීණි රතනානි සරණං එතානි පරායණානති එවං සරණං උපෙති"** යනුන්.

"යතෙ ඛො මහානාම! අරියසාවකො බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො මහානාම! උපාසකොති" යනුන්.

සරණගමනය දෙ පරිදි ය **ලෞකික-ලොකොත්තර** වියින්. එහි **ලොකොත්තරසරණගමනය** දක්නා ලද චතුස්සත්‍යය ඇති ආයර්‍යපුද්ගලයන්ගේ සේවන් ඇ මගසින් උපදනා ඇසිල්ලෙහි සරණගමනය කෙලසන ධර්‍මයන් මුළුමනින් සුන් කොට අරමුණු වියින් නිවන් අරමුණු කොට කෘත්‍ය වියින් තුණුරුවන් විෂය කොට සම්‍බුද්ධ වන්නේ ය. එය මෙසේ කීහ:-

"ලොකුත්තරං දිට්ඨසච්චානං මග්ගක්ඛණෙ සරණගමනූ-පක්කිලෙසසමුච්ඡෙදෙන ආරම්මණතො නිබ්බානාරම්මණං හුත්වා කිච්චතො සක්කලෙපි රතනත්තයෙ ඉජ්ඣති" යි.

ලෞකිකසරණගමනය, පෘථග්ජන සත්ත්වයන්ගේ සරණය කිලිටි කරණ ධර්මයන් යටපත් ව යෑමෙන් තෙරුවන් ගුණ අරමුණු කොට සමෘද්ධ වන්නේ ය. ඒ නම් බුද්ධාදිරත්නත්‍රය විෂයයෙහි තෙරුවන් ගුණ ඇදහීම ය. ශ්‍රද්ධාපූර්වක සම්‍යග්දෘෂ්ටිය දශවිධ පුණ්‍යක්‍රියාවස්තුන් අතුරෙහි දෘෂ්ටිය සෘජු කිරීමැ යි දත යුතු ය. පොතෙහි එය කී සැටි මෙසේ ය:-

"ලොකියං පුථුජ්ජනානං සරණගමනූපක්කිලෙසවික්ඛම්භනෙන ආරම්මණතො බුද්ධාදිගුණාරම්මණං හුත්වා ඉජ්ඣති, තං අත්ථතො බුද්ධාදිසු වත්ථුසු සද්ධාපටිලාභො, සද්ධාමූලිකා ච සම්මා දිට්ඨි, දසසු පුඤ්ඤකිරියවත්ථුසු දිට්ඨුජ්ජුකම්මන්ති වුච්චති" යනු

ලෞකිකසරණගමනය සිවු වැදැරුම් ය, ආත්මසන්නිය්‍යාතන-තත්පරායණතා-ශිෂ්‍යභාවොපගමන-ප්‍රණිපාත විසින්. එහි "මම අද පටන් මාගේ ආත්මභාවය තුණුරුවනට පුදමි" යි ස්වකීය ආත්මභාවය තුණුරුවනට පුදදීම පාවාදීම **ආත්මසන්නිය්‍යාතනය** යි. **"අත්තසන්නියාතනං නාම, අජ්ජ ආදිං කත්වා අහං අත්තානං බුද්ධස්ස නීය්‍යාතෙමි ධම්මස්ස සඞ්ඝස්සාති එවං බුද්ධාදීනං අත්තපරිච්චජනං"** යනු කීයේ ඒ දක්වනු සඳහා ය.

"මාගේ ආත්මය භාග්‍යවත්හට පරිත්‍යාග කරමි, ධර්මයට සඞ්ඝයාහට මාගේ ආත්මය පරිත්‍යාග කරමි, මාගේ ජීවිතය ද පරිත්‍යාග කරමි, මාගේ ආත්මය පරිත්‍යාග කරණ ලද්දේ ම ය, මාගේ ජීවිතය පරිත්‍යාග කරණ ලද්දේ ම ය, දිවි කෙළවර කොට බුදුන් පිහිටයැ යි දනිමි, බුදුරජ තෙමේ මාගේ ප්‍රතිෂ්ඨාස්ථානැ යි මාගේ නිලීයනස්ථානැ යි මාගේ ගතිස්ථානැ" යි මෙසේ සමාදන් විය යුතු ය. මේ එහි පාලිය:- **"භගවතො අත්තානං පරිච්චජාමි, ධම්මස්ස සඞ්ඝස්ස අත්තානං පරිච්චජාමි, ජීවිතඤ්ච පරිච්චජාමි, පරිච්චත්තොයෙව මෙ අත්තා, පරිච්චත්තං යෙව මෙ ජීවිතං, ජීවිතපරියන්තිකං බුද්ධං සරණං ගච්ඡාමි, බුද්ධො මෙ සරණං, තාණං, ලෙණං, පරායණන්ති"** යනු.

"මම අද පටන් තුණුරුවන් පිහිට කොට ඇත්තෙම් වෙමි" යි තුණුරුවන් පිහිට කොට සිටිබව **"තත්පරායණතා**ය. **"අජ්ජ ආදිං කත්වා අහං අත්තානං බුද්ධස්ස නීය්‍යාතෙමි ධම්මස්ස සඞ්ඝස්සාති**

එවං බුද්ධාදීනං අත්තපරිච්චජනං තප්පරායණතා නාම'' යනු දතයුතු ය. මෙය ආලවකයා ගත් සරණය වැනි ය. එය මෙසේ ය:-

''සො අහං විචරිස්සාමි ගාමාගාමං පුරාපුරං,
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං''

ඒ මම බුදුරජුන්ටත් මනා කොට දෙසූ ධර්මයටත් නමස්කාර කරමින් ගමින් ගම පුරයෙන් පුරය හැසිරෙන්නෙමි යි ආලවක සරණ ගියේ ය.

''මම අද පටන් තුණුරුවනට අතැවැසි වෙමි, මෙසේ මා දරවු'' යි ශිෂ්‍යභාවයට පැමිණීම **ශිෂ්‍යභාවොපගමන**ය යි. **''අජ්ජ ආදිං කත්වා අහං බුද්ධස්ස අන්තෙවාසිකො ධම්මස්ස සඞ්ඝස්ස ඉති මං ධාරෙථාති එවං සිස්සභාවස්ස උපගමනං''** යනු පාලි යි. ශිෂ්‍යභාවොපගමනය මහාකාශ්‍යප මහරහතුන් වහන්සේගේ සරණ යෑම වැනි ය. උන්වහන්සේ **''සත්ථාරඤ්ච වතාහං පස්සාමි භගවන්තමෙව පස්සාමි, සුගතඤ්ච වතාහං පස්සාමි භගවන්ත මෙව පස්සාමි, සම්මාසම්බුද්ධඤ්ච වතාහං පස්සාමි භගවන්තමෙව පස්සාමි''** යි සරණ ගියහ. ''එකාන්තයෙන් මම ශාස්තෘන් වහන්සේ ම දකිමි, භාග්‍යවතුන් වහන්සේ ම දකිමි, එකාන්තයෙන් මම සුගතයන් වහන්සේ ම දකිමි, භාග්‍යවතුන් වහන්සේ ම දකිමි, එකාන්තයෙන් මම සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ම දකිමි, භාග්‍ය වතුන් වහන්සේ ම දකිමි යනු'' එහි අරුත්.

ප්‍රණිපාත නම්, මම අද පටන් කොට තුණුරුවනට ම වැඳුම්පිදුම් සත්කාර සම්මානාදිය කරන්නෙමි, මෙසේ මා දරා ගණු මැනැවැ'යි තුණුරුවනට ඉතා යටත් පහත්බව ය. මේ එය කියූ සැටි:- **''අජ්ජ ආදිං කත්වා අහං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලීකම්මං සාමීචිකම්මං බුද්ධාදීනං එව තිණ්ණං වත්ථූනං කරොමි ඉති මං ධාරෙථාති, එවං බුද්ධාදිසු පරමනිපච්චාකාරො පණිපාතො නාම''** යි.

මෙය බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ සරණයෑම වැනි ය. බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ හුනස්නෙන් නැගිට උතුරුසළුව එකස් කොට පොරවා බුදුරජුන්ගේ පාමුල හිසින් වැටී බුදුරජුන්ගේ පාදයන් මුවෙන් ද සිඹියි. අතින් ද පිරිමදියි. ''භවත් ගෞතමයන් වහන්ස! 'මම බ්‍රහ්මායු බ්‍රාහ්මණ වෙමි'' භවත් ගෞතමයන් වහන්ස! මම බ්‍රහ්මායු බ්‍රාහ්මණ වෙමි, යි නම ද අස්වයි. මේ පාලිය:- **''අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සරසා නිපතිත්වා භගවතො පාදානි**

මුඛෙන ච වුම්බති, පාණ්හි ච පරිසම්බාහති නාමඤ්ච සාවෙති බ්‍රහ්මායු අහං හො! ගොතම! බ්‍රාහ්මණො, බ්‍රහ්මායු අහං හො! ගොතම! බ්‍රාහ්මණොති'' යි.

ඒ මේ ප්‍රණිපාතශරණගමනය ඥාති-භය-ආචාර්‍ය්‍ය දක්ෂිණාර්‍ය විසින් සිවු වැදැරුම් ය. එහි දක්ෂිණාර්‍ය භාවය සලකා වැදීමෙන් පමණක් සරණගමනය සිදු වන්නේ ය. ''බුදුහු අප නෑයහ'' යි නෑකම් සලකා හෝ ''බුදුහු රාජපූජිතයහ, මහානුභාව ඇතියහ, නො වඳිනා ලද්දේ නම් අනර්ථ කරන්නාහ'' යි බියහෙතු සලකා හෝ ''බුදුහු මාගේ ඇදුරුය''යි ඇදුරුබව සලකා හෝ වඳී නම් සරණ නො පිහිටන්නේ ය. සරණය ශ්‍රෙෂ්ඨවශයෙන් ගැණේ. ශ්‍රෙෂ්ඨවශයෙන් ම බිඳේ. එහෙයින් යමෙක් ''මෙතෙමේ ම ආර්‍ය්‍ය ය, ලෙව්හි සියලු සතුන්ට උතුම් ය, අග්‍රදක්ෂිණාර්‍ය වේ ය'' යි වඳී නම් ඔහු විසින් ම ය සරණය ගන්නා ලද්දේ. ඥාති භය ආචාර්‍ය්‍ය භාවයන් සලකා වඳින්නහු විසින් සරණය නො ගන්නා ලද්දේ ය. මෙසේ ගත් සරණ ඇත්තකු අන්තොටුවන් වෙත පැවිදි වූ තම නෑයකු වෙත ගොස් ''මෙතෙමේ මාගේ නෑයෙකැ''යි වඳිනු ලබන්නේ ද ඔහුගේ සරණය නො බිඳෙන්නේ ය. ගිහිනෑයකු වඳින්නහුගේ සරණය නො බිඳේ ය යනු ගැණ කිනම් කතා ද. ''රජ තෙමේ රටවැස්සන් විසින් පුදන ලද්දේ ය, නො වැන්ද හොත් නපුරක් කරන්නට බැරි නැතැ'' යි භයහෙතු සැලකීමෙන් වඳින්නහුගේ ද, ශිල්පශාස්ත්‍ර ඉගැන්නූ තීර්ථයකු ''මේ මාගේ ඇදුරු ය''යි ඇදුරුබව සලකා වඳින්නහුගේ ද සරණභෙදයෙක් නො වේ.

සරණගමනඵලය, ලෞකික-ලොකොත්තර විසින් දෙ වැදැරුම් ය. එහිදු ලොකොත්තරඵලය, විපාකඵලය-ආනෘශංසඵලය යි නැවැත දෙ පරිදි වේ. ස්‍රොතාපත්තිආදිචතුර්ථධශ්‍රාමණ්‍යඵලය විපාකඵලය යි. මගපලසිත්වලට අරමුණු වන නිර්ථාණය ආනෘශංඵලය යි. **''යො ච බුද්ධං ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතොපෙ-සබ්බදුක්ඛා පමුච්චති''** යනු එහිලා දතයුතු ය. සංස්කාරධර්මයන් ආස්වාදනීයස්ථාන වශයෙන් නො ගැණුම හා නිත්‍ය සුඛ ශුභාදී වශයෙන් නො ද පිළිගැණුම ද ලොකොත්තරසරණගමනය පිළිබඳ ආනෘශංසඵලයෙහිලා ගතයුතු ය.

''යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං දෙවකායං පරිපූරෙස්සන්ති''

යම් කෙනෙක් බුදුරජුන් සරණ ගියෝ ද, ඔවුහු අපායයට නො යන්නාහ. මිනිස් සිරුර හැරදමා දිව්‍යකායය, දෙව්ලොව පුරවන්නාහු ය යි වදාළ බැවින් භවසම්පත්ති ය හා භොගසම්පත්ති ය ලෞකිකසරණගමනය පිළිබඳ ඵලය වන්නේ ය.

මහාමෞද්ගල්‍යායන මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ සක් දෙවිඳුට මෙසේ වදාළ සේක:- "දෙවෙන්ද්‍රය! බුද්ධ-ධම්ම-සඞ්ඝ යන වස්තුත්‍රය පිහිටැයි ගැණීමෙන් එසේ ගත් ඇතැම් සත්ත්වයෝ මරණින් මතුයෙහි දෙව්ලොව උපදින්නෝ ය, මේ පුණ්‍යශක්තියෙන් දෙව්ලොව උපදින ඔවුන් අන් පින්කමෙකින් දෙව්ලොව උපන්නවුන්ට වඩා දෙවියන් පිළිබඳ ආයුෂයෙන් වණියෙන් සුඛයෙන් යසසින් ආධිපත්‍යයෙන් රූපයෙන් ශබ්දයෙන් ගන්ධයෙන් රසයෙන් සප්‍රෂ්ටව්‍යයෙන් උසස් ව වැඩී සිටින්නෝ ය, මේ දසකරුණෙන් අන් දෙවියන් අභිභවනය කෙරෙති" යි. මෙ ද වනාහි ලෞකිකසරණගමනයෙහි ඵල දැක්වීමෙක් වෙයි. **"හෙට්ඨිමකොටියා තිසරණ ගතඋපාසකො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති"** යි වදාළ බැවින් බුද්ධාදිරත්නත්‍රය සරණ ගියේ ම ගුණනුවණින් වැඩුනු ලෙසින් ශ්‍රාවකබොධිය ප්‍රත්‍යෙකබොධිය සම්‍යක්සම්බොධිය යන ත්‍රිවිධ බොධියෙන් එක්තරා බොධියකට පිළිපන්නෙක් වන්නේ ය. එහෙයින් ලෞකිකලොකොත්තරසරණගමනඵලය ඉතා සැකෙවින් මෙසේ දත යුත්තේ ය.

ලෞකිකසරණගමනය බුද්ධ-ධම්ම-සඞ්ඝ යන රත්නත්‍රයයෙහි ඇත්තා වූ ගුණ නො දැනීමෙන් ද, බුද්ධාදිවස්තුත්‍රයයෙහි වූ මහත් ගුණ පිළිබඳ උපදනා සැකයෙන් ද, වරද සහිත වූ දැකීමෙන් ද යන මේ ආදියෙන් කිලිටි වන්නේ ය. එසේ කිලිටි වූ සරණගමනය, ඵලදානයෙහිලා තෙද ඇත්තේ ද බැබලීම් ඇත්තේ ද පැතිරීම් ඇත්තේ ද නො වේ. ලොකොත්තරසරණගමනයෙහි කෙලෙසීමෙක් මොනලෙසකිනුත් නො වන්නේ ය. එහෙයින් එය නිර්මල ය. පිරිසිදු ය. ප්‍රභාස්වර ය.

ලෞකිකසරණගමනයාගේ භෙදය දෙ පරිදිය සාවද්‍ය-අනවද්‍ය විසින්. එහි සාවද්‍යභෙදය, අන්‍යශාස්තෘන් කෙරෙහි ආත්මසන්නියර්‍යතනාදියෙන් වන අතර අනවද්‍යභෙදය කලුරිය කිරීමෙන් වන්නේ ය. එහි සාවද්‍යභෙදය අනිටුපල දෙන්නේ ය. අනවද්‍යභෙදයෙහි විපාකයෙක් නැත්තේ ය. මේ සරණ භෙදයෙන් අන්‍ය ශාස්තෘන් සරණ යෑමක් නො වන බැවින්, ඒ, අනවද්‍යභෙද නම් වී ය. අන්‍යභවයෙක උපන්නා වූ ද ආර්‍යශ්‍රාවක තෙමේ අන්‍ය ශාස්තෘවක්හු නම් මොනලෙසකිනුත් නො ද අදහන්නේ ම ය.

මෙහිලා දෙශක-දෙශනාස්ථාන-දෙශනාකාල-දෙශනා-හෙතු ද දතයුතු ය. එහි **දෙශක** = සම්මාසම්බුදුරජානන් වහන්සේ ය. **දෙශනාස්ථානය** = බරණැස මෘගදාය නම් වූ සෘෂිපතනාරම ය **දෙශනාකාල ය** = පූර්වජාතීන්හි රැස් කරණ ලද කුශලධර්මයන්ගේ

බලයෙන් මෙහෙයුනු සිත් ඇති ව සසුන් වත් යස **සථවිරයන්** වහන්සේ ප්‍රධාන කොට ඇති එක්සැටක් මහරහතුන් දම් දෙසමින් ගම්නියම්ගම්හි හැසුරුණු කාල ය. **දෙසනාහෙතු**=පැවිදි උපසපන් කම් ය. බුදුරජානන් වහන්සේගේ බුදුබව ලැබීමෙන් වැඩිදවස්-නොයාදී ම දම්දෙසුම් පිණිස ඒ ඒ තැන ගිය භික්ෂූන් වහන්සේ ඒ ඒ තැනින් පැවිදි උපසපන්වනු කැමැති කුලපුත්‍රයන් බුදුරජුන් වෙතට කැඳවාගෙණ ආහ. එසේ ඉතා දුරබැහැරින් පැමිණි භික්ෂූන් වහන්සේටත් පැවිදි උපසපන් කැමැත්තන්ටත් විඳින්නට වූ වෙහෙස දුටු බුදුරජානන් වහන්සේ ඔවුන්ගේ ඵාසුවිහරණය සඳහා ඒ ඒ තැන්හිදී ම පැවිදි උපසපන්කම් කරණු පිණිස සරණගමනය දෙශනා කොට වදාළ සේක. මේ ඒ දේශනාව:- **"අනුජානාමි භික්ඛවෙ! ඉමෙහි තීහි සරණගමනෙහි පබ්බජ්ජං උපසම්පදනන්ති"** යනු.

සරණගමනය පිළිබඳ දතයුතු කරුණු බණපොතපතෙහි නොයෙක් තැන දක්නට ලැබේ. ඒ හැම එකෙක් මෙහි නොඇයේ ය. එහෙයින් ඒ බණපොත් බලා විසතර දත යුත්තේ ය.

ඛො යනු නිපාත සි. එය පදපූරණ-අවධාරණ යන අරුත්හි ඇයේ ය. **"නනු ඛො භගවා භික්ඛු ආමන්තෙසි"** යන මෙහි නුනුයේ පදපූරණය බලා ය. **"අස්සොසි ඛො චෙරසෙජ්ජා බ්‍රාහ්මණො"** යන මෙහි අවධාරණාර්ථය බලා සිටියේ ය.

සරණගමනය, බියරහිත ය යන අරුත් විසින් **ඛෙම** නම් වී ය. **"භිංසයතීති භයං = ඛෙමං, ඛයනති එතෙන රාගාති ආදයොති= ඛෙමං, ඛීයනති එසු උපදවුපසග්ගාදයොති = ඛෙමං, ඛියතෙසු අසුභනාති = ඛෙමං"** යනු ඛෙම ශබ්දය නිරුක්තියට නැඟ සැටියි.

එතං සරණං උත්තමං = මේ සරණය උතුම් ය.

ලොකොත්තර සරණය අනෙක් හැම සරණයක් ම අභිභවනය කොට උස්ව නැඟි සිටියේ ය යනු උත්තම ශබ්දය කියන්නේ ය. **"උද්ධං තමති ගච්ඡතීති = උත්තමො, ඉදමෙතෙසං අත්‍ථීසයෙන උක්කට්ඨනති = උත්තමං"** යනු නිරුක්ති සි.

එතං සරණං ආගම්ම = මේ සරණයට පැමිණ.

සබ්බදුක්ඛා පමුච්චති = සියලු සසරදුකින් මිදෙන්නේ ය.

මුවවති යන ක්‍රියාව **ප** යන උපසර්ගයෙන් වැඩී සිටියා දුඃඛ-සමුදය-නිරොධ-මාර්ග යන චතුරාර්‍යසත්‍යය විඳසුන් නුවණින් දැන එය පිහිට කොට සිටියහු, එය බියරහිත තැන් කොට ගත්තහු, එය උතුම් කොට ගත්තහු හා එසේ ම බුද්ධ-ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය පිහිට කොට ගත්තහු, සියලු සසර දුකින් හා ඒ ලොව මේ ලොව වන හැම විපතින් හා මුදුලන්නීය සි අරුත් ගතයුත්තේ ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ සියලු සෘෂිහු පිළිසිඹියාවන් සමඟ රහත් බවට පැමිණියාහු ය. අනතුරු ව ඔවුහු බුදුරජුන් වෙත එළැඹ වැඳ පැවිද්ද ඉල්ලා සිටියහ. බුදුරජාණන් වහන්සේ සිවුරුගැබින් අත දිගු කොට "මහණෙනි! එවු, බඹසර හැසිරෙවු" සි වදාළ සේක. ඔවුහු ඒ ඇසිල්ලෙහි අටපිරිකර ධරා සිය වස් පිරී සිටි තෙරුන් මෙන් ආකල්පසම්පන්න වූහ. එ දවස වනාහි අහුමගද කුරුරට වැසියන් පුදපඬුරු ගෙණ එන දවස වී ය. මේසේ පුද පඬුරු ගෙණ එහි පැමිණි ඔවුහු පැවිදි ව සිටි ඒ සියලු සෘෂිවරුන් දැක "කිම අපගේ අග්නිදත්තබ්‍රාහ්මණ තෙමේ ශ්‍රේෂ්ඨ වේ ද, නැත, ශ්‍රමණ ගෞතම තෙමේ ශ්‍රේෂ්ඨ වේ දැ" සි සිතන්නාහු "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ම අග්නිදත්තබ්‍රාහ්මණයන් සොයා ඔහු වෙත පැමිණි බැවින් අපගේ අග්නිදත්තබ්‍රාහ්මණ තෙමේ ම ශ්‍රේෂ්ඨ වේ ය" සි අදහා ගත්හ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ අදහස් දැන "අග්නිදත්ත! මෙහි පැමිණ සිටිනා මේ පිරිසෙහි සෑක සිඳ හරුව" සි වදාළ සේක. ඔහු ද "මම මෙතෙක් මෙහිලා බුදුරජාණන් වහන්සේගේ අවසරය ම බලාපොරොත්තු වීමි" සි ඍද්ධි බලයෙන් ඔවුන් ඉදිරිපිට සත් වරක් අහසට නැඟී සත් වරක් බිමට බැස ඒ බිමට බට හැමවර ම "සුවාමීනි! භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘ වන සේක, මම ඔබ වහන්සේගේ ශ්‍රාවක වෙමි" සි ශ්‍රාවකභාවය ප්‍රකාශ කෙළේ ය.

අග්නිදත්ත බ්‍රාහ්මණ වස්තුව නිමි.

ආනන්ද මහාස්ථවිරයන් වහන්සේගේ ප්‍රශ්නය

14 — 7

බුද්ධොපස්ථායක වූ ආනන්ද මහාස්ථවිරයන් වහන්සේ එක් දවසක් දිවාස්ථානයෙහි හුන්නාහු "බුදුරජානන් වහන්සේ හස්ත්‍යාජානීයයෝ ඡද්දන්තකුලයෙහි හෝ උපොසථ කුලයෙහි උපදිති, අශ්වාජානීයයෝ සින්ධවකුලයෙහි හෝ වලාහකස්සරාජකුලයෙහි උපදිති, ආජානීයවෘෂභයෝ දක්ෂිණා පථයෙහි උපදිති' යි හස්ත්‍යාජානීය්‍යාදීන් උපදින තැන් වදාරණ සේක, එහෙයින් පුරුෂාජානීයයෝ කොහි උපදින්නෝ දැ? යි දත යුතු ය" යි බුදුරජුන් වෙත එළැඹ වැඳ "ස්වාමීනි! පුරුෂාජානීයයෝ කොහි උපදින්නෝ දැ?" යි විචාළාහු ය. "ආනන්ද! පුරුෂාජානීයයෝ සෙස්සවුන් මෙන් හැම තැන උපදින්නෝ නො වෙති, දිගින් හා පළලින් යොදුන් තුන් සියයක් හා යොදුන් දෙසිය පණසක් පමණ වූ අවටින් යොදුන් නව සියයක් පමණැති මද්‍ධ්‍යදෙශයෙහි උපදිත්, උපදින්නෝ ද එසේ මෙසේ කුලයෙක නො උපදිත්, රජමහසල් කුලයෙහි හෝ බමුණු මහසල් කුලයෙහි හෝ යන එක්තරා උසස් කුලයෙක උපදනාහු ය" වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති,
යත්ථ සො ජායතී ධීරො තං කුලං සුඛමෙධතී ති.

පුරුෂාජානෙය තෙමේ දුර්ලභ ය. ඒ පුරුෂාජානෙය තෙමේ හැම තැන නො උපදී. ප්‍රාඥ වූ හෙතෙමේ යම් කුලයෙක උපදී නම් ඒ කුලය සැපයෙන් වැඩෙන්නේ ය.

දුල්ලභො පුරිසාජඤ්ඤො = පුරුෂාජානෙය තෙමේ දුර්ලභ ය ලැබිය නො හැකි ය. ලැබීම අපහසු ය.

මෙහි **පුරිස** ශබ්දය හා එක්ව සිටි **ආජඤ්ඤ** යනු කර්තෘ අර්ථයෙහි සිද්ධ කෘදන්ත ශබ්දයෙකි. **"ආ භුසො කාරණාකාරණං ජානාතීති = ආජඤ්ඤං"** යනු නිරුක්ති යි. හැමතින් ගැඹුරට ම බැස කරුණු නො කරුණු දන්නේ ආජඤ්ඤ නම් යනු එහි අරුති. පිරිමි බව ලත් හැම කෙනකු කෙරෙහි ම වෙනසක් නො තබා සාමාන්‍ය විසින් නැගෙන පුරිස ශබ්දය ආජඤ්ඤ ශබ්දයා හා එකාර්ථවත් භාවයට ගියේ විශෙෂාර්ථයක් කියන්නේ ය. ඒ නම් ලෞකික ලොකොත්තරාර්ථයන් ඉතිරි නො කොට දැනීමෙහි සමර්ථ වූත් ලෞකික-ලොකොත්තරාර්ථයන් ඉතිරි නො කොට දත්තා වූත් පුරුෂශ්‍රෙෂ්ඨ තෙමේ පුරුෂොත්තම තෙමේ

පුරිසාජඤ්ඤ නම් වේ යනු මෙහි ලා කියා පෑම ය. භාෂායෙහි වෘෂභ-අශ්ව-හස්ති ශබ්දයන් හා සටිත ව සිටි ආජඤ්ඤ ශබ්දය විසින් වෘෂභාදීන් අතුරෙහි ජාතිමත් වූ ද කරුණු නො කරුණු දැනීමෙහි සමර්ථ වූ ද ස්වාමියාගේ අදහසට අනුව යන වෘෂභාදීහු කියනු ලැබෙත්. **"ආජඤ්ඤෝ ජාතිමා කාරණාකාරණානං ආජානනකො, සාමිකානං අජ්ඣාසයානුවත්තකො, සො තිවිධො හොති උසභාජඤ්ඤෝ-අස්සාජඤ්ඤෝ-හත්ථාජඤ්ඤෝති"** යනු සාධක කථා ය. මෙසේ ගත් කල්හි උසභාජඤ්ඤ-අස්සාජඤ්ඤ-හත්ථාජඤ්ඤ-පුරිසාජඤ්ඤ යි ආජඤ්ඤයෝ සිවු දෙනෙක් වෙත්. වෘෂභයන් අතුරෙහි ජාතිමත් ශ්‍රෙෂ්ඨවෘෂභ තෙමේ, අශ්වයන් අතුරෙහි ජාතිමත් ශ්‍රෙෂ්ඨඅශ්ව තෙමේ, හස්තීන් අතුරෙහි ජාතිමත් ශ්‍රෙෂ්ඨහස්ති තෙමේ, පුරුෂයන් අතුරෙහි ජාතිමත් ශ්‍රෙෂ්ඨපුරුෂ තෙමේ ආජඤ්ඤ ය.

න සො සබ්බත්ථ ජායති = ඒ පුරිසාජඤ්ඤ තෙමේ හැම තැන නො උපදියි.

ශ්‍රෙෂ්ඨපුරුෂ තෙමේ, පුරුෂශ්‍රෙෂ්ඨ වන ජාතියෙහි ප්‍රත්‍යන්ත දෙශයෙක හෝ පහත් කුලයෙක හෝ නො උපදියි. උපදිනුයේ දඹදිව මද්ධ්‍යදෙශයෙහි මහාජනයා විසින් වැඳුම් පිදුම් ගරු සැලකිලි කටයුතු වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ කුලයන් අතුරෙහි එවක වඩාත් මානනීය වූ කුලයෙහි ය. එසේ ම හැම කල්හි නො ද උපදනේ ය. ලොකයට හිත පිණිස තමන් මතු කළ මග ගොස් පල ගැණුමෙහි පොහොසත් වූ අල්පරජස්ක වූ තියුණු වූ මෘදු වූ ශ්‍රද්ධාදිඉන්ද්‍රියයන් ඇති සුවසේ හෝ දුකසේ ධර්මාවබෝධය කට හැක්කා වූ පරලොව බිය දක්නා සුලු ව වසන්නා වූ මිනිසුන් ඇති කාලයෙහි ම උපදියි.

යත්ථ සො ජායති ධීරො = ඒ ප්‍රාඥ තෙමේ යම් ක්ෂත්‍රිය බ්‍රාහ්මණ කුලයෙක උපදී ද.

තං කුලං සුඛං එධති = ඒ කුලය සැපයට පැමිණේ. සැපයෙන් වැඩෙන්නේ ය.

යම් දෙශයක යම් කුලයෙක පුරුෂ ශ්‍රෙෂ්ඨයෙක් උපන්නේ නම්, ඒ දෙශය ඒ කුලය ශීලසමාධ්‍යාදි ගුණසම්පත්තියෙන් හා ධන සම්පත්ත්‍යාදී වූ අනෙක් හැම සම්පත්තියෙන් වැඩෙනු එකාන්ත ය. එයට දැක්විය හැකි සාධක එදාත් තුබුනේ ය. අදත් ඇත්තේ ය. මේ ගාථා ධර්මයෙන් දැක් වූ පුරුෂශ්‍රෙෂ්ඨයා මහොත්තම වූ බුදු රජානන් වහන්සේ ය. උන්වහන්සේගේ උපත දුර්ලභ ය. එය

එක් දෙශයක එක් ජාතියෙක එක් කුලයෙක මිනිසුන්ගේ වැඩීමට සීමා වූයේ ය යි වරදවා නොගත යුතු ය. ඒ උපත දෙවියන් සහිත ලොකයෙහි වැඩීමට කරුණු විය. **"තං කුලං"** යනු මෙහි යොදා වදාළේ සියලු සත්ත්ව ලොකය එක් ම කුලයක් කොට ගැණීමෙනි. තමන් වහන්සේගේ ශාක්‍ය කුලයෙහි වැඩීම පමණෙක් ම නො දක්වන ලද්දේ ය. මේ වනාහි දෙසනා විලාසය යි.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙනා සෝවන් ඵලාදියට පැමිණියාහු ය.

ආනන්දමහාස්ථවිරප්‍රශ්නවස්තුව නිමි.

බොහෝ භික්ෂූන් එක්ව කළ කථාවක්

14 — 8

එක් දවසක් පන් සියයක් පමණ භික්ෂූහු උවැටන්හලෙහි රැස් ව "ඇවැත්නි! මේ ලොකයෙහි සැපය කුමක් දැ" යි කතාවක් ඉපදවූහ. එහි සමහරු "රජසැපය තරම් සැපයෙක් නැතැ" යි කීහ. සමහරු "කම් සැපය තරම් සැපයෙක් නැතැ" යි කීහ. මේ අතර එහි වැඩම කළ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මහණෙනි! තමුසේලා මා මෙහි එන්නට පෙරාතුව කුමක් ගැණ කතා කරමින් හුන්නහු දැ?" යි අසා වදාළ සේක. ඔවුන් "සඩිමිනි! අපි මේ ලොකයෙහි ඇති සැපය කුමක් දැ යි කතා කරමින් හුන්නමෝ ය" යි කී කල්හි "මහණෙනි! තමුසේලා කුමක් කියහු ද? මේ තමුසේලා කියන හැම සැපයක් ම සසර දුකෙහි ගැලී සිටියේ ම ය, මේ ලොකයෙහි ඇති සැපය නම් බුද්ධොත්පාදය ධර්මශ්‍රවණය සඞ්ඝ සාමග්‍රිය යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

සුඛෝ බුද්ධානං උප්පාදෝ, සුඛා සද්ධම්මදේසනා,
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපෝ සුඛෝ නී.

බුදුවරුන්ගේ ඉපදීම සැපයි. සද්ධර්මදේශනා සැපයි. සඞ්ඝයාගේ සාමග්‍රිය සැප යි. සමග වූවන්ට තපස සැප යි.

සුඛෝ බුද්ධානං උප්පාදෝ=බුදුවරුන්ගේ උපත සැප ය.

මෙහි **සුඛ** ශබ්දය, **සුඛෝ-සුඛා** යි සිටියේ තිලිහු බැවිනි. **සුඛං** යි නපුංසකලිඞ්ගයෙහි ද වේ ලොකයෙහි බුදුවරු උපදනාහු දුකඳිත සත්ත්වයන් ජාතිකාන්තාරාදියෙන් එතෙර කොට නිවන් පුර පමුණුවා මුළුමනින් සුඛිතයන් කරණු සඳහා ය. එහෙයින් බුදුවරුන්ගේ ලොව ඉපැත්ම නිවන් සුවයට කරුණුවන බැවින් සැපය යි වදාළ සේක.

දෙව්යන් සහිත ලොකයට හිතයක් සිදු කළ හැකි ජීවිතයක් පිළියෙල වන්නට ගත වන කාලය කළයුතු වීර්‍යය විඳියයුතු වෙහෙස හළයුතු සැපත මෙ තරම් ය යි මොන ලෙසකිනුත් කියන්නට නො පිළිවන. ගුණයෙන් හා දැනුමෙන් පරම කොටියට නො පත් වූ ජීවිතයකට නියම විසින් ක්‍රමවත් සේවාවක් කළ නො හැකි ය. එහෙයින් මේ ජීවිතය දැනයෙන් ශීලයෙන් නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රඥයෙන් වීර්‍යයෙන් ක්ෂාන්තියෙන් සත්‍යයෙන් අධිෂ්ඨානයෙන් මෛත්‍රියයෙන් උපෙක්ෂායෙන් යන මේ මහත් ගුණයන්ගෙන් පශ්චිමකොටියෙන් කල්ප ලක්ෂයක් අධික කොට ඇති

චතුරසඬ්‍යයක් මුළුල්ලෙහි හැදී වැඩී යා යුතු ය. මේ කියූ ගුණයන්ගෙන් වැඩුනු ජීවිත අතුරෙහිදු එය අදිතීය විය යුතු ය. අසහාය විය යුතු ය. අප්‍රතිම විය යුතු ය. අප්‍රතිසම විය යුතු ය. අප්‍රතිභාග විය යුතු ය. අසම විය හතු ය. අසමසම විය යුතු ය. අග්‍ර විය යුතු ය. මෙලෙ[1]ස් සකස් වූ ජීවිත ඇත්තෝ ම ලොක සෙවාවෙහි සමර්ථ වෙඃ. ඔවුහු නම් සම්මා සම්බුදුවරයෝ ය. උන්වහන්සේලාගේ උපත සැපය සි වදුලේ බුදුවරුන්ගේ ලොව පහළවීම නිසා ම ප්‍රඥාචක්ෂුසගේ ප්‍රඥාලොකයාගේ ප්‍රඥාවභාසයාගේ සවැදෑරුම් අනුත්තරියධර්මයන්ගේ පහළවීම වන්නේ ද, සිවු පිළිසැඹියාවන්ගේ ප්‍රත්‍යක්ෂ කිරීම වන්නේ ද, අනෙකධාතු නානා ධාතූන්ගේ ප්‍රතිවෙධය වන්නේ ද, සෝවන් සෙදගැමි අනගැමි රහත් මගපලයන්ගේ සාක්ෂාත් කිරීම වන්නේ ද එහෙයිනි.

මෙසේ ගුණනුවණින් කුළුගැන්වුනු බුදුවරුන්ගේ උපත නිසා ම සත්ත්වලොකය සසර දුකින් මිදි යන්නේ ය. නැත, නොද මිදෙන්නේ ය. යම් ඉගැන්වීම් මගෙක අරිඅටහිමග නොඉගැන් වේ නම්, ඒ ඉගැන්වීම් මඟ සිස් ය. නිසරු ය. අර්‍ථරහිත ය. එය සත්ත්වයාගේ විමුක්තිය පිණිස පවතී යනු සත්‍ය නොවේ. එය අසත්‍යයෙකි. නොද පිළිගත යුතු ය. අරිඅටහිමග නොලැබෙන ඉගැන්වීම් මඟෙකින් දුක-දුක් හට ගැණීම-දුක් සන්සිඳීම ගැණ පිළිසමුපා ගැණ දැනුමෙක් මොන ලෙසකිනුත් නොලද හැකි ය. එකල්හි සත්ත්වවිමුක්තියෙක් නැත්තේ ය. සත්ත්වයාහට දුකෙන් මිදීමෙක් කවදාවත් නොලැබෙන්නේ ය. දුකෙහි ම ගැලෙන්නේ ය. සසරින් මිදෙන එක් ම මග වූ ඒ මේ අරිඅටහි මග ඇති දහම්මග එලිපෙහෙලි වනුයේ බුදුවරුන්ගේ උපතින් ම ය එහෙයින් බුදුවරුන්ගේ උපත සැපැයි දත යුතු ය. එහෙත් එය දුර්ලභ ය. **"ඉමස්ස බෝ භික්ඛවෙ! එකපුග්ගලස්ස පාතුභාවෝ දුල්ලභෝ ලෝකස්මිං"** යනු එහිලා සාධක සූත්‍ර සි.

සුඛා සද්ධම්මදෙසනා=සද්ධර්මදේශනා සැප ය. I

සද්ධර්ම ශ්‍රවණයට පැමිණ දහම් අසා ධර්මය වූ පරිදි දිවි ගලවන සත්ත්වයෝ ජාති ජරාමරණාදිදුඃඛරාශියෙන් මිදෙත් ද, මෙසේ සද්ධර්මදේශනා, සැපයට කරුණු වන බැවින් සැපය සි වදුළ සේක. එහි **සද්ධම්ම** නම්:- බුදුරජානන් වහන්සේ විසින් සත්ත්වහිතානුකම්පායෙන් සංසාරවිමුක්තිය පිණිස දෙශනා කොට වදුළ ධර්ම සමූහය සි. ඒ සමූහය, ධර්මයට අනුව දව රෑ දෙක්හි ද්වාරත්‍රය ඇ හුසුරු වන හැම සත්ත්වයන් සසර දුකෙහි, අපායයෙහි හෙන්නට

1. 14, 3, "කිච්ඡං සද්ධම්මසවණං" යනු බලනු

නො දී දරා සිටුනා බැවින් ධර්ම නම් වී ය. ප්‍රථමතරඞ්ගයෙහි **'සහිතං'** යන්නට කළ පරිකථාව බලනු. ඒ ම ශොභන වූයේ පරම සත්පුරුෂ වූ බුදුරජුන් විසින් වදාරණ ලදුයේ සද්ධම්ම නමැ යි කියනු ලැබේ. **"සොභනො ධම්මො=සද්ධම්මො, සතං වා බුද්ධාදි සපපුරිසානං ධම්මො=සද්ධම්මො"** යනු එහි ලා දත යුතු ය.

ඒ මේ සද්ධර්මදෙශනාව සම්මුති-පරමාර්ථ විසින් දෙ පරිදි ය. එහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම ලක්ෂණ නො දක්වා, සකන්ධ-ධාතු-ආයතන-ස්මෘතිප්‍රස්ථාන නො දෙසා, සත්ත්ව-පුද්ගල-සත්‍රී-පුරුෂ-ක්ෂත්‍රිය-බ්‍රාහ්මණ-දෙව-මාර-යක්ෂ-රාක්ෂස-නාග-සුපර්ණාදීන්ගේ වශයෙන් ලොකය බෙදා විග්‍රහ කොට, ලොකයාගේ ව්‍යවහාර විසින් කරණ දෙශනා සම්මුතිදෙශනා ය. සත්ත්වපුද්ගලාදී වූ ලොක ව්‍යවහාරය නො ගෙණ, අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය, සකන්ධ ය, ධාතු ය, ආයතන ය, ස්මෘතිප්‍රස්ථාන ය, යන ඈ විසින් පංචසකන්ධ ය බෙදා විග්‍රහ කොට, ඇති තතු විසින් කරණ දෙශනා පරමාර්ථ දෙශනා ය. යම් කෙනෙක් ලොක ව්‍යවහාර ගෙණ කරණ දෙශනාව අසා අර්ථප්‍රතිවෙධය කොට මොහඳුරු නසා මගපල ලබන්නට පොහොසත් වෙත් ද, සම්මුතිදෙශනාව ඔවුන් සඳහා ය. යම් කෙනෙක් පරමාර්ථ විසින් කරණ දෙශනාව අසා අර්ථප්‍රතිවෙධය කොට මොහඳුරු නසා මගපල ලබන්නට පොහොසත් වෙත් ද පරමාර්ථදෙශනාව ඔවුන් සඳහා වූ ය වාදශ තරඞ්ගයෙහි **'අත්තානං වෙ පියං ජඤ්ඤා'** යන්නට කළ පරිකථාව බලනු.

ධර්මාධිෂ්ඨානධර්මදෙශනා-ධර්මාධිෂ්ඨානපුද්ගලදෙශනා-පුද්ගලාධිෂ්ඨානපුද්ගලදෙශනා-පුද්ගලාධිෂ්ඨානධර්මදෙශනා යි ධර්ම-පුද්ගල වශයෙන් සද්ධර්මදෙශනාව සිවු පරිදි වන්නී ය. එහි **"නාහං භික්ඛවෙ! අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං කම්මනියං හොති, යථයිදං චිත්තං, චිත්තං භික්ඛවෙ! භාවිතං කම්මනියං හොති"** යි මෙබඳු වූවා ධර්මාධිෂ්ඨානධර්මදෙශනා ය. **"අට්ඨානමෙතං භික්ඛවෙ! අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො කඤ්චි සඞ්ඛාරං නිච්චතො උපගච්ඡෙය්‍ය නෙතං ඨානං විජ්ජති"** යි මෙබඳු වූවා ධර්මාධිෂ්ඨානපුද්ගලදෙශනා ය. **"එකපුග්ගලො භික්ඛවෙ! ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං"** යි මෙබඳු වූවා පුද්ගලාධිෂ්ඨානපුද්ගල-දෙශනා ය. **"එකපුග්ගලස්ස භික්ඛවෙ! පාතුභාවා මහතො චක්ඛුස්ස පාතුභාවො හොති"** යි මෙබඳු වූවා පුද්ගලාධිෂ්ඨාන ධර්මදෙශනා ය.

එහි ධර්මය ප්‍රධානස්ථානය කොට තබා ධර්මාවබෝධය කර වීමට ධර්ම විසින් කරණ දෙශනා ධර්මාධිෂ්ඨානධර්මදෙශනා නමු. ධර්මය ප්‍රධාන විසින් ගෙණ එය පුද්ගලයා මතු පිට තබා කරණ දෙශනා ධර්මාධිෂ්ඨානපුද්ගලදෙශනා නමු. පුද්ගලයා ප්‍රධාන විසින් ගෙණ පුද්ගලයාගේ වශයෙන් ම කරණ දෙශනා පුද්ගලාධිෂ්ඨාන පුද්ගලදෙශනා නමු. පුද්ගලයා ප්‍රධාන කොට තබා ධර්මය විසින් කරණ දෙශනා පුද්ගලාධිෂ්ඨානධර්මදෙශනා නමු.

තව ද **ආනුපූර්විධර්මදෙශනා - පශ්‍යායදර්ශිනීධර්මදෙශනා - කරුණාපූර්ඩගමධර්මදෙශනා - ලාභානපෙක්ෂිතධර්මදෙශනා - අවිහිංසාපූර්ඩගමධර්මදෙශනා** යනු විසිනුදු සද්ධර්මදෙශනා පස් වැදෑරුම් ය. එහි දුනයට අනතුරුව ශීලය, ශීලයට අනතුරුව සවර්-ගය යන ආ ලෙසින් වූවා ආනුපූර්විදෙශනා ය. ඒ ඒ අර්ථය ගැණ නුවණින් සලකා එයට හෙතු උදාහරණ දී කරුණු දක්වමින් ආවා පශ්‍යායදර්ශනීදෙශනා ය. සසරදුකෙහි බැඳී සිටුනා සත්වයන් දැක ඔවුන් එයින් මුදලනු පිණිස වූවා කරුණාපූර්ඩගමදෙශනා ය. චීවරාදී වූ සිවුපසය ලබනු රිසියෙන් නොවූවා ලාභානපෙක්ෂිත දෙශනා ය. තමන් හුවා දැක්වීම, පරා හෙළා දැකීම ආ විසින් තමන් හා අනුන් හා නොද පෙළනු රිසියෙන් වූවා අවිහිංසා-පූර්ඩගමදෙශනා ය.

ශාසනිකධර්මදෙශනාවන්හි ආදියෙහි ශීලය මධ්‍යයෙහි මාගීය අවසානයෙහි නිවන පැවැසෙන්නේ ය. එසේ පැවැසෙනුයේ බුදුරජාණන් වහන්සේගේ දහම් දෙසීම එසේ බැවිනි. මේ එයට සාධක:- **"සෝ ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං"** යනු. ආදියෙහි ශීලය පැවැසෙන ධර්-දෙශනා ආදිකල්‍යාණ ය. මධ්‍යයෙහි මාගීය පැවැසෙන ධර්මදෙශනා මජ්ඣෙකල්‍යාණ ය. අවසානයෙහි නිවන පැවැසෙන ධර්මදෙශනා පරියොසානකල්‍යාණ ය. තව ද ශාසනයාගේ ආදි නම්, ශීල-සමාධි-විදර්ශනා ය. **"සද්ධා චාදී කුසලානං ධම්මානං සීලං ච විසුද්ධං දිට්ඨි ච උජුකා"** යනු සාධක සි. මධ්‍යය නම්, ආර්ය්මාගීය සි. **"අපි හිකඛවෙ! මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා"** යනු සාධක සි. පර්‍යවසාන නම්, ඵලය හා නිවන ය. මෙය එයට සාධක විසින් දන්නේ ය. **"තස්මා තිහ තවං බ්‍රාහ්මණ! බ්‍රහ්මචරියං එතං සාරං එතං පරියොසානං"** යනු. **"නිබ්බානොගධං හි ආවුසො විසාඛ! බ්‍රහ්මචරියං වුස්සති නිබ්බානපරායණං නිබ්බානපරියොසානං"** යන මෙයින් නිවන අවසානය සි කියන ලදි.

මෙසේ ම ශාසනිකදෙශනා නම්, **සත්‍රීපුරුෂාදිවර්ණිනා** නිශ්‍රිත නොවූ සිවු සීවටත් ඇති ගැඹුරු දහම් ඇසුරු කොට සිටි දෙවියන් සහිත ලොකයට හැමතකින් වැඩ සහිත වූ **ශිථිල-ඛනිත-දීර්ඝ-හ්‍රස්ව-ගරුක-ලහුක-නිගෘහීත-සම්බන්ධ-ව්‍යවසථිත-විමුක්ත** යන ව්‍යඤ්ජන තො නසා සමාන ව්‍යඤ්ජනයෙන් යුක්ත වූ සියල්ල නොඅඩු වූ එසේ ම නොවැඩි වූ චීවරාදී වූ සිවුපසය ලැබීමෙහි ආශාවෙන් නොකිලිටි වූ ශීල-සමාධි-ප්‍රඥ යන **ශික්ෂාත්‍රය** ගැබ් කොට සිටි දෙශනා ය. **"සාසථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති"** යන මෙයින් දක්වා වදාළේ බුදුරජානන් වහන්සේගේ ධර්මදෙශනා මෙ කී ගුණයන්ගෙන් පරිපූර්ණ ව සිටුනා බව ය. මෙහි ධර්මදෙශනාක්‍රම මෙ මතු ම නො වේ. තව ද ඇත්තේ ය. පාල්‍යර්ථකථාශ්‍රයයෙන් ඒ දතයුතු ය.

සුඛා සඞ්ඝස්ස සාමග්ගි = සඞ්ඝයාගේ සාමග්‍රිය සැප ය.

යම් හෙයකින් සඞ්ඝයාගේ සමග බව **එක්** සිත් ඇති බව දෙවියන් සහිත ලොකයට හිත පිණිස සැප පිණිස වැවේ ද එහෙයින් සඞ්ඝයාගේ සමග බව සැප ය යි වදාළ සේක.

සඞ්ඝස්ස යන මෙහි සඞ්ඝ නම්, සසුන් පිළිවෙතෙහි හොස් කෙලෙස් නසා සසරදුක් මුළුමනින් නසා සිටි උසස් පිරිස හා කෙලෙස් නසන්නට දිවි නොතකා පිළිවෙත් පුරන්නා වූ පිරිස ය. සඞ්ඝ යනු, දක්ෂිණාර්හ-සම්මුති විසින් ගැණෙන සඞ්ඝයා කෙරෙහි හෙන්නේ ද මෙහිලා නැගී සිටියේ ගිහිදහම් සිදහැර සසුන් පැවිද්දෙන් පැවිදි ව සිවු පිරිසිදු සිල් පුරන්නා වූ දුහඟ රකින්නා වූ සම්මුතිසඞ්ඝ තෙමේ ය. මෙහි ත්‍රයොදශතරඞ්ගයෙහි **දුනං** යනු විසතර කළ ධර්මකථාව බැලිය යුතු ය.

සාමග්ගි නම්, එක්වීම ය. එය සිතින් හා කයින් වන්නේ ය. උනුන්ගේ සිත් එකෙනෙකට අවිරුද්ධ ව පැවැත්ම එක් දෘෂ්ටියෙහි පිහිටීම සිතින් වන එක්වීම ය. කායසාමග්‍රිදුනයෙන් එක් සීමා යෙක්හි සිටීම කයින් වන එක්වීම ය. **"සමග්ගෙහා නාම සඞ්ඝා සමානසංවාසඞ්ඝා සමානසීමායං ඨිතා"** යනු විනයපදභාජනයෙහි ආයේ ය. සඞ්ඝසාමග්‍රි නම්, සඞ්ඝයාගේ එක්වීම වෙනසක් නැති බව සම්විනයකම් ඇති බව සමථදෙසීම් ඇති බවැයි අර්ථකථාවෙහි කියන ලදි **"සඞ්ඝසාමග්ගීති සඞ්ඝස්ස සමග්ගභාවෝ සහදුභාවෝ එකාකම්මතා එකුදෙදසතා ච"** යනු අර්ථ කථාය.

උපාලි මහරහතුන් වහන්සේ = **කති නු ඛො භන්තෙ! සඞ්ඝසාමග්ගියො**=? ස්වාමීනි! සඞ්ඝසාමග්‍රීහු කෙතෙක් ද?

බුදුරජානන් වහන්සේ = **දෙවමා උපාලි! සඞ්ඝසාමග්ගියො, අත්ථුපාලි සඞ්ඝසාමග්ගි අත්ථාපෙතා බ්‍යඤ්ජනූපෙතා, අත්ථුපාලි! සඞ්ඝසාමග්ගි අත්ථුපෙතා බ්‍යඤ්ජනූපෙතා ච.**

කතමා ච සා උපාලි! සඞ්ඝසාමග්ගි අත්ථාපෙතා බ්‍යඤ්ජනූපෙතා? යස්මිං උපාලි වත්ථුස්මිං හොති සඞ්ඝස්ස භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණං, සඞ්ඝො තං වත්ථුං අවිනිච්ඡිනිත්වා අමුලා මූලං ගන්ත්වා සඞ්ඝසාමග්ගිං කරොති අයං වුච්චති උපාලි! සඞ්ඝසාමග්ගි අත්ථාපෙතා බ්‍යඤ්ජනූපෙතා. කතමා ච සා උපාලි! සඞ්ඝසාමග්ගි අත්ථුපෙතා බ්‍යඤ්ජනූපෙතා ච? යස්මිං උපාලි! වත්ථුස්මිං හොති සඞ්ඝස්ස භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණං, සඞ්ඝො තං වත්ථුං විනිච්ඡිනිත්වා මූලා මූලං ගන්ත්වා සඞ්ඝසාමග්ගිං කරොති අයං වුච්චති උපාලි! සඞ්ඝසාමග්ගි අත්ථුපෙතා බ්‍යඤ්ජනූපෙතා ච= උපාලි! සඞ්ඝසාමග්‍රි දෙකෙකි. උපාලි! අර්ථයෙන් තොර වූ පදයෙන් යුක්ත වූත් සඞ්ඝසාමග්‍රියෙක් ඇත. උපාලි! අර්ථයෙන් තොර වූ පදයෙන් යුක්ත වූ ඒ සඞ්ඝසාමග්‍රිය කවරී ද? යත්:- උපාලි! යම් වස්තුවක් නිමිති කොට සඞ්ඝයාගේ ඛබරයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් සඞ්ඝයාගේ බිඳීමෙක් සඞ්ඝයාගේ ඉරිතැලීමෙක් සඞ්ඝයාගේ වෙන් වීමෙක් සඞ්ඝයාගේ වෙනස් බවෙක් වේ ද, සඞ්ඝ තෙමේ ඒ වස්තුව විනිශ්චය නො කොට අමුලයෙන් මූලයට ගොස් සඞ්ඝසාමග්‍රිය කෙරේ ද, උපාලි! මේ අර්ථයෙන් තොර වූ පදයෙන් යුක්ත වූ සඞ්ඝසාමග්‍රිය යි කියනු ලැබේ.

උපාලි! අර්ථයෙන් නො තොර වූ පදයෙන් යුක්ත වූ ඒ සඞ්ඝසාමග්‍රිය කවරී ද? යත්:- උපාලි! යම් වස්තුවක් නිමිති කොට සඞ්ඝසාමග්‍රිය කෙරේ ද, උපාලි! මේ අර්ථයෙන් යුක්ත වූත් පදයෙන් යුක්ත වූත් සඞ්ඝසාමග්‍රිය යි කියනු ලැබේ.

අනතුරු ව උපාලි ස්ථවිරයන් වහන්සේ මෙය අසා උගෙණ හුනස්නෙන් නැගිට උතුරුසඟසිවුර එකස් කොට වැඳ සිය වෙහෙර බලා වැඩියහ. බුදුරජානන් වහන්සේ මෙසේ වදාළ සේක:- **"එකධම්මො භික්ඛවෙ! ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජනහිතාය බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං, කතමො එකධම්මො? සඞ්ඝසාමග්ගි, සඞ්ඝෙ ඛො පන භික්ඛවෙ! සමග්ගෙ න චෙව අඤ්ඤමඤ්ඤං භණ්ඩනානි හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිභාසා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරික්ඛෙපා හොන්ති, න ච අඤ්ඤමඤ්ඤං පරිච්චජනා හොන්ති, තත්ථ අප්පසන්නා චෙව පසීදන්ති, පසන්නානඤ්ච භිය්‍යොභාවාය හොන්තීති"** යනු. "මහණෙනි! ලොකයෙහි සදෙවකලොකයාහට හිතසැප පිණිස වැඩ පිණිස පවත්නා වූ එක් ධර්මයෙක් ඇත්තේ ය, ඒ නම් සඞ්ඝසාමග්‍රිය යි, මහණෙනි! සඞ්ඝයා සමග වූ කල්හි කයින් හා සිතින් එක්ව බැඳී සිටි කල්හි උනුන් අතර කලහයෝ තර්ජනයෝ පිරිහෙළීම් අත්හැරීම් නො වන්නාහ, එහිලා නො පහන් වූවෝ පහදිත්, පහන්වූවන්ගේ පහන්බව වඩවඩාත් දියුණු වන්නේ ය" යනු ඒ සූත්‍රයෙහි ඉතා කෙටි අදහස ය.

සඞ්ඝයාගේ සමගබව සැපයට කරුණු ය. සමගවූවනට අනුබල දීම ද සුව එළවන්නේ වේ. සමගබවෙහි ඇලුනා වූ ධර්මයෙහි පිහිටි පුද්ගල තෙමේ නිවනින් නො පිරිහෙයි. සඞ්ඝයා සමග කොට කල්පයක් දෙව්ලොව සතුටු වේය, යි බුදුරජානන් වහන්සේ වදාළ සේක. මේ ඒ වදාළ සැටි:-

"සුඛා සඞ්ඝස්ස සාමග්ගි සමග්ගානඤ්චනුග්ගහො,
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසති,
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදති"යි.

"එකධම්මො භික්ඛවෙ! ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති" යනාදීන් වදාළා වූ දෙශනායෙහි **'එකධම්මො'** යනු යෙදුනේ සඞ්ඝසාමග්‍රියෙන් උපදනා පුණ්‍යරාශිය දක්වනු සඳහා ය. සඞ්ඝ සාමග්‍රිය වනාහි එක් කුශලධර්මයෙකි, එක් අනවද්‍යධර්මයෙකැ' යි අටුවායෙහි කීයේ එහෙයිනි. "මේ ය ධර්ම ය, මේ ධර්මය නො වේ"යි යන ඈ විසින් සඞ්ඝයා අතර යම් විවාදයෙක් උපන්නේ නම් එහිලා විනය දන්නහු විසින් "සඞ්ඝයා අතර උපන් මේ විවාදය අනර්ථකර ය, බිහිසුණු ය, ඉදිරියෙහි වැඩී ගියේ නම්, එය සඞ්ඝ සාමග්‍රිය ඉරිතැලීමට සඞ්ඝයාගේ බිඳීයෑමට කරුණුය" යි සලකා

තමාත් පක්ෂයක බැස සිටියේ නම්, ගිහිගත් අහුරුරැසක් පාගත් නකු සේ වහා එයින් වැළකිය යුතු ය. මෙරමා විසිනුදු ගන්නා ලද එය, තමාට සන්සිඳවිය හැක්කේ නම්, එහිලා උත්සාහවත් ව ඉකා දුර බැහැර ගොසින් හෝ එය සන්සිඳවිය යුතු ය. තෙමේ ඒ පිණිස අපොහොසත් නම්, විවාදයත් වැඩේ නම්, එහි දී සුදුසු ප්‍රතිබලසම්පන්න වූ ශික්ෂාකාමී සබ්‍රහ්මචාරීන් වෙත ගොස් ඔවුන් උත්සාහවත් කරවා ධම්මිනය ශාසනාශාසනය පරිදි ඔවුන් ලවා සන්සිඳවාලිය යුතු ය. මෙසේ මේ විවාදය සන්සිඳවීමෙන් සඞ්ඝයා සමග කිරීමෙහිලා විවාදය සන්සිඳවන්නහුගේ සිත්හි හට ගන්නා ධාර්මිකඋද්‍යොගය මහත් කුසලයක් බැවින් එය 'එකඛමෙමා' යන මෙයින් දක්වා වදාළ සේක. මේ උද්‍යොගය දෙපසට බෙදී ගිය භික්ෂූන්ට හා ඒ දෙපසට අනුව වැටෙන මෙහෙණ-උවසු-උවැසියනට ද එසේම උත් අරක් ගත් දෙවිබඹුන්ට ද වන්නට ගිය අහිතකර වූ දුක් එළවන ඒ අධම්ය වළකාලීම කුසල් රැස් වන්නට කරුණු බැවින් දෙවියන් සහිත ලොකයට සැප එළවන්නේ වේ.

"යාවකිවඤ්ච භික්ඛවෙ! භික්ඛූ සමගගා සමානිපතිස්සන්ති, සමගගා වුට්ඨහිස්සන්ති, සමගගා සඞ්ඝකරණීයානි කරිස්සන්ති, වුද්ධියෙව භික්ඛවෙ! භික්ඛූනං පාටිකඞ්ඛා නො පරිහානි" යි මහා පරිනිබ්බානසූත්‍රයෙහි දා මෙ ද සිත්හි දැරිය යුතු ය. "මහණෙනි! භික්ෂූහු යම් තාක් කල් සිතින් හා කයින් සමග ව රැස්වන්නාහු ද, සිතින් හා කයින් සමග ව නැගී සිටින්නාහු ද, සිතින් හා කයින් සමග ව සඞ්ඝකර්ම කරන්නාහු ද, මහණෙනි! මෙසේ පවත්නා තාක් භික්ෂූන්ට වැඩීමක් ම මුත් පිරිහීමෙක් නම් නො වන්නේ ම ය" යනු එහි කෙටි අදහස ය.

සැ පිළිදැගුම් කරණු පිණිස හෝ බෝගෙය, පොහොයගෙය වසා පිළියෙල කරණු පිණිස හෝ කතිකාවක් නියම කරගණු කැමැත්තෙන් හෝ අවවාද දෙනු කැමැත්තෙන් හෝ රැස් වන්නට ගෙඩිය ගැසූ කල, කිසිත් නො බැණ අන් හැම වැඩක් බහා තබා සියල්ලට පළමු මම රැස්වීමට යම් සි එක්වරට ම නැගී සිටිත් නම්, ඔවුහු ය සමග ව රැස්වන්නාහු.

මෙසේ රැස් වූවෝ සිතා මතා කතා කොට කළ යුතු දැය කොට එක්ව ම නො නැගී සිටින්නෝ නම්, ඔවුහු සමග ව නැගී සිටින්නෝ නො වෙත්. තව ද "අසුවල් තැන වෙදහෙදකම් කරණ නැකැත් කියන බලිබිලි දෙන බලිසූනියම් කරණ දෙවොල් නටන දෙවියන් පුදන පඹුරු බඳින ගිහින් අයත් මෙහෙවර කරණ පව්වූ මහණෝ සසුන වනසත්, දහම් නො දහම් කරත්, විනය අවිනය කරත්, අඹු

දරුවන් රකින්, කවරෙක් එහි ගොස් ඔවුනට නිග්‍රහ කරන්නේ ද" යි විචාළ කල්හි 'මම යමි, මම යමි'යි යම් කෙනෙක් යන්නට නැගී සිටින් නම්, ඔවුහු ය සමගව නැගී සිටින්නාහු.

ආගන්තුකයකු දැක "මේ පිරිවෙණට යව, අර පිරිවෙණට යව, අපි කවුරු වෙමු ද"යි නොබැණ ඒ ආගන්තුකයා පිළිබඳ වන් කරන්නෝ ද, දිරාගිය පාසිවුරු දරන්නකු දැක ඔහු පිණිස පා සිවුරු සොයන්නෝ ද, ශීලන්හට ශීලන් බෙහෙත් පිරිකර සපයන්නෝ ද ඉතා බාගැපත් කිසි ද පිහිටක් නැති ශීලන්කු දැක "අසුවල් පිරිවෙණට යව, අසුවල් පිරිවෙණට යව"යි නොකියා තමන්ගේ පිරිවෙණට කැඳවා ගෙණ ගොස් පිරිදුගුම් කරන්නෝ ද, ඉගෙණීමෙහි පසුබස්නා දුර්ලභයකු දැක වහා නුවණැති ආදුරකු සංග්‍රහ කොට ඔහු වෙත පමුණුවා ඔහු ලවා ඔහුගේ දැනුම ඔසොවා තබන්නෝ ද, උපසම්පදා පරිවාස මානත්ත අබ්භානාදි-සඞ්ඝකම් කරන්නෝ ද සමගව එක් ව බැඳී සිට සඞ්ඝකම් කරන්නෝ වෙත්.

මෙසේ සඞ්ඝසාමග්‍රියෙහි පැවැත්මට හැම තැන සමගව රැස් වීම සමගව නැගී සිටීම සමගව සඞ්ඝකම් කිරීම යන මේ තුන ප්‍රධාන වසින් ගත යුත්තේ ය.

පාරිලෙය්‍යක වනයට වඩින ගමනේදී අරලියගස්වනයට වැඩි බුදුරජාණන් වහන්සේ = අනුරුද්ධයෙනි! කිම ඉවසිය හැකි ද? කිම දිවි ගැලවිය හැකි ද? කිම පිණ්ඩපාත-යෙන් වෙහෙස නැත්තහු ද?

අනුරුද්ධ සථවිරයන් වහන්සේ = නැත, පින්වතුන් වහන්ස! ඉවසිය හැකිසි. දිවි යැවිය හැකිසි. පිණ්ඩපාතයෙන් වෙහෙසෙක් නැත.

බුදුරජ = කොහොම ද? අනුරුද්ධයෙනි! එක්සිත් ඇති ව සතුටු ව වාදවිවාද නැති ව තමුසේලා කිරි හා දිය එක්වූවා සේ උනුන් දෙස ප්‍රිය ඇසින් බලන්නහු ද?

අනුරුද්ධ සථවිර = ස්වාමීනි! එසේ ය, අපි සමග ව සතුටු ව වාද විවාද නැති ව එක් වූ කිරි හා දිය සේ නොවෙනස් ව උනුන් දෙස ප්‍රිය ඇසින් බලමින් වසන්නෙමු.

බුදුරජ = අනුරුද්ධයෙනි! තමුසේලා කෙසේ සමගවහු ද?

අනුරුද්ධ සථවිර = සවාමීනි! මෙහි මෙබඳු හොඳ සබ්රම්සරුන් හා එක් ව වසන්නට ලැබීම අප හැමට මහත් ලාභයෙකැ යි අපට නිතර සිහි වන්නේ ය. එසේ සිහිවත් ම අපි ඉතා හොඳින් එක්සිත් ව වසන්නෙමු. සවාමීනි! මේ ආයුෂ්මතුන් වහන්සේලා කෙරෙහි මාගේ මෛත්‍රී සහගත කාය-වාඞ්මනසකම් ප්‍රකට ව ද අප්‍රකටව ද එළැඹැ සිටියේ ය. එකල්හි සවාමීනි! මාගේ සිත මේ ආයුෂ්මතුන් වහන්සේලාගේ සිතට යටත් කොට උන්වහන්සේලාගේ සිතට අනුකූල ව පවත් වන්නේ නම්, මැනැවැ යි මට අදහස් වේ. එකල්හි මම මාගේ සිත උන්වහන්සේගේ සිතට යටත් කොට උන්වහන්සේගේ සිතට එකඟ ව පවත් වන්නෙමි. සවාමීනි! අපගේ ශරීරයෝ ම වෙන් ව පවතිත්. සිරුරුවලින් ම පමණක් අපි වෙන් ව සිටුම්හ. අපට ඇත්තේ එක් සිතෙක් ම ය. සිතෙන් වෙනස් බවෙක් අපට නැත්තේ ය.

බුදුරජ = නන්දිය! නන්දියගේ අදහස කෙසේ ද? නන්දිය මෙහි කුමක් කියන්නේ ද?

නන්දිය සථවිර = සවාමීනි! මෙහිලා මාගේ අදහසෙහි වෙනස් බවෙක් නැත. අප කාගේත් අදහස එකෙක්ම ය. අපට වෙන් වෙන් වූ සිත් නැත. වෙන් වෙන් වූ අදහස් නැත. අනුරුද්ධ සථවිරයන් වහන්සේ යම් සේ කියූ නම් මා කියන්නේත් එසේ ය.

බුදුරජ = කිමබිල! කොහොම ද, මේ දෙනමගේ අදහසට කිමබිලත් එකඟ ද?

කිමබිල සථවිර = එසේය; තිලෝගුරු හිමියෙනි! අපගේ අදහස් වල වෙනසෙක් නැත්තේ ය. පැවැතුම්වල වෙනසෙක් නැත්තේ ය.

බුදුරජ = හොඳයි! හොඳයි! අනුරුද්ධයෙනි! අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව හළ ආනමාලය ඇති ව වසහු ද තමුසේලා?

අනුරුද්ධ සථවිර = සවාමීනි! අපි එකාන්තයෙන් අප්‍රමත්ත ව කෙ-
ලෙස් තවන වැර ඇති ව හළ ආත්මාලය
ඇති ව වසන්නෙමු.

බුදුරජ = හොඳයි! අනුරුද්ධයෙනි! කෙසේ නම් තමුසේලා
අප්‍රමත්ත ව කෙලෙස් තවන වැර ඇති ව හළ
ආත්මාලය ඇති ව වසනු ද?

අනුරුද්ධ සථවිර = සවාමීනි! මෙහි අප අතර යමෙක් පළමු කොට
ගමින් පිඬු සිඟා ගෙණ ආයේ නම්, හෙතෙමේ
අසුන් පණවා පැන් බඳුන හා පිරිබෝදිය බඳුන
එළවා තබා ඉඳුල් ලන බඳුන ගෙණවුත් තබයි.
යමෙක් පසුව ගමින් පිඬු සිඟාගෙණ ආයේ නම්,
හෙතෙමේ වළඳ, ඉතිරි වූ දෑය කැමැති නම්
වළඳයි. නොකැමැති නම් තණ නැති බිමෙක
හෝ බහයි. නැත, සතුන් නැති දියෙහි හෝ
පාකොට හරියි. යමෙක් පැන් කළය, පිරිබෝ-
දියකළය, වැසිකිළිදියකළය සිස්වූවන් දකියි ද
හෙතෙමේ ඒ හැම එකක් දියෙන් පුරවා එළවා
තබයි. ඔහුට එය එකලා ව කළ නොහැක්කේ
නම් හස්ත සංඥයෙන් දෙවැන්නකු ගෙන්වා
ගෙණ අත් විලහුයෙන් ගෙණ එළවා තබයි.
ඒ නිසා කිසි කතාබහෙක් අප අතර නැත.
සවාමීනි! අපි පස් දවසකට වරක් එක්තැන් ව
මුළු රැම දැහැමි බණකතා කියමින් හිඳින්නෙමු.
සවාමීනි! අපි මෙසේ අප්‍රමත්ත ව කෙලෙස්
තවන වැර ඇති ව හළ ආත්මාලය ඇති ව
වසන්නෙමු.

බුදුරජ = මැනැවි. මැනැවි. අනුරුද්ධයෙනි! ය සි වදාළ
සේක.

සමග ව එක්සිත් වන්නට පිළිපැදිය යුත්තේ කෙසේ ද, යනු
මෙයින් පැහැදිලි වන්නේ ය. සඞ්ඝසාමග්‍රිය සඞ්ඝයාගේ පහසුව
පිණිස සසුනෙහි කල් පැවැත්ම පිණිස නිවන් පසක් කරණු
පිණිස උපකාර වන්නා සේ මහණ-මෙහෙණ උවසු-උවැසියන්ගේ
හා දෙව් බඹුන් ආ හැම කෙනෙකුගේ ඒ ලොව මේ ලොව
දියුණුව පිණිස ඒ ලොව මේ ලොව සැපවිහරණය පිණිස වන්නේ ය
යනු දතයුතු ය.

සමගගානං තපො සුඛො = සමග වූවන්ට තපස සැප ය. I

විශෙෂ විසින් භික්ෂූන් වහන්සේගේ සමග බව බුදුවදන් උගෙණීමට ධුතඞ්ගපරිහරණයට මහණ දහම් පුරන්නට ප්‍රබල හෙතු බැවින් සමගවූවන්ට තපස සැපැයි වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බැව්හි පිහිටි-යාහු ය. දෙශනා තොමෝ මහාජනයාට වැඩ සහිත වූ ය.

භික්ෂුවසතුව නිමි.

I. 14, 3 "තපො නිනික්ඛා" යනු බලනු.

රන් සෑයෙක්.

14 – 9.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ දවසෙක සැවැතින් **නික්ම බරණැස** බලා මහාභික්ෂුසඞ්ඝයා පිරිවර කොට ඇති ව වඩිනා සේක්, අතරමග **තෝදෙය්‍ය** ගම සමීපයෙහි වූ එක්තරා දෙවොල කට ගොඩවැද අනඳ තෙරුන් යවා ඒ අසල ගොවිකම් කරමින් හුන් බමුණකු කැඳවා ලූ සේක එ බමුණු පැමිණ බුදුරජුන් නොවැඳ එහි දෙවොල වැඳ සිටියේ ය. එකල්හි බුදුරජාණන් වහන්සේ ද "බමුණ! මේ පෙදෙස කිමැ' සි හඟනෙහි දැ?" සි අසා වදාළ සේක. ඔහු "මෙ තැන අපගේ පරපුරෙන් ආ සෑ තැනෙකි, භවත් ගෞතමයන් වහන්ස! ඒ නිසා වඳිමි"සි පිළිතුරු දින. බුදුරජාණන් වහන්සේ "තා විසින් කළ සෑවැඳීම ඉතා අගනේ ය, මෙ තැන වඳින තා විසින් කරණ ලද්දේ ඉතා යහපත් ක්‍රියාවකැ"සි බමුණා සතුටු කළ සේක. එ වේලෙහි එහි හුන් භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේ බමුණාට කළ සතුතිය අසා "කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ මොහුට මෙබඳු උසස් පැසසීමක් කළ සේක් දැ"සි සැකයක් ඉපද වූහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන්ගේ සැකය දුරු කරණු පිණිස මැදුම්සඟියෙහි ආ ඝටීකාරසූත්‍රය වදාළ සේක. නැවැත සුකීය ඍද්ධ්‍යනුභාවයෙන් කසුප් බුදුරජුන්ගේ යොත්නක් උස් වූ රන්සෑය අනෙක් රන්සෑයක් කොට අහසැ මවා මහාජනයාට දැක්වූ සේක. "බමුණ! මෙසේ කිරීම, පිදිය යුත්තන්ට පිදීම ඉතා සුදුසු ය" සි වදාරා මහාපරිනිර්‍වාණසූත්‍රයෙහි වදාළ ලෙසින් ම බුද්ධාදී වූ චතුර්විධසතුපාර්‍ශ්‍වයන් මේ මේ ය සි පැහැදිලි කොට දුන්හ. නැවැත එහිදී ශාරීරික - උද්දෙසික - පාරිභොගික යන ත්‍රිවිධ චෛත්‍යයන් වෙසෙසින් දක්වා මේ ධර්මදෙශනාව ද කළ සේක.

පූජාරහෙ පූජයතෝ බුද්ධෙ යදි ච සාවකෙ,
පපඤ්චසමතික්කමනෙ තිණ්ණසොකපරිද්දවෙ,
තෙ තාදිසෙ පූජයතෝ නිබ්බුතෙ අකුතොභයෙ,
න සක්කා පුඤ්ඤං සඛ්‍යාතුං ඉමෙත්තකමිති කෙනචිති.

පූජාවට සුදුසු වූ ප්‍රපඤ්චයන් ඉක්මවා ගිය ඉක්මවාලූ ශොක පරිදෙවයන් ඇති බුදුවරුන් ද නොහොත් බුදුසව්වන් ද (යමෙක්) පුදා ද.

නිවුනු සිත් ඇති කොතැනිනුත් බියරහිත වූ එබඳු පුද්ගලයන් පුදන්නහුගේ පිණ මේ මෙතෙකැ යි ගණින්නට කිසිවකුටත් නො හැකි ය.

පූජාරහෙ=පිදීමට සුදුසු වූ. පිදිය යුතු වූ.

ආමිෂපූජා-ප්‍රතිපත්තිපූජා යි ඉතා කොටින් පූජා දෙකෙකි. විස්තර මතු එන්නේ ය. ඒ දෙ පරිදි වූ ම පූජාවන්ට සුදුසු වූවෝ කවරහු ද, යනු ගාථායෙහි එන අනෙක් පදයන්ගෙන් මතු වන්නේ ය.

පූජයතෙ=පුදා ද.

ය ශබ්ද ප්‍රථමා විභක්ති එකවචනය වූ **'යො'** යනු අපෙක්ෂා කොට සිටියේ ය.

බුද්ධෙ=බුදුවරුන් ද.[1]

සාවකෙ=බුදුසව්වන් ද.[2]

පපඤ්චසමතික්කන්තෙ=ප්‍රපඤ්චයන් ඉක්මවා ගිය.

පපඤ්ච නම්, තෘෂ්ණාදෘෂ්ටිමානයෝ ය. තෘෂ්ණදෘෂ්ටිමානයෝ සත්ත්වයන් සසර බොහෝ කල් තබත්නු යි පපඤ්ච නම් වෙත්. **"පපඤ්චන්ති සත්තෙ සංසාරෙ චිරං ඨපෙන්තීති=පපඤ්චා"** යනු විවෘති යි. සත්ත්වයන් සසර මත්වූවන් සේ පමාවූවන් සේ තබත්නු යි ද පපඤ්ච. මේ ඒ කියූ සැටි:- **"පපඤ්චන්ති සත්තෙ මත්තපමත්තාකාරෙනාති=පපඤ්චා"** යි. තෘෂ්ණා දෘෂ්ටි මානයන්ගේ විස්තර යට කියන ලදි. ප්‍රපඤ්චසඞ්ඛ්‍යාත තෘෂ්ණා දෘෂ්ටි-මානයන් ඉක්මවා ගියෝ ආර්‍යයන් වහන්සේ ය. උන්වහන්සේ ස්‍රොතාපත්ත්‍යාදිආර්‍යමාර්ගඥානයෙන් ඔවුන් ඉක්මවා ගියහ. එහෙයින් ආර්‍යයෝ පපඤ්චසමතික්කන්ත නම්.

තිණ්ණසොකපරිද්දවෙ=තරණය කළ ශොක පරිදෙවයන් ඇති. පරිදෙවයන් නැසූ.

ශොක පරිදෙව විස්තරය කියන ලද්දේ ය. ශොක පරිදෙව ද නැසිය යුත්තේ තරණය කළ යුත්තේ මාර්ගඥානයෙනි.

තෙ තාදිසෙ=එබඳු වූ ඔවුන්.

---

1. 14, 1, 'තං බුද්ධමනන්ත ගොචරං' යනු බලනු.
2. 4, 12. 'සම්මාසම්බුද්ධ සාවකො' යනු බලනු

බුදු-පසේබුදු-මහරහතුන් වහන්සේ ගැණෙත්.

පූජයතො=පුදන්නහුට. නැත, පුදන්නහුගේ.

නිබ්බුතෙ=නිවී ගිය සිත් ඇති.

රාග-දෝස මොහ-ජාති-ජරා-මරණ-සොක-පරිදෙව-දුක්ඛ-දෝමනස්ස-උපායාස යන මොවුන් සත්ත්වයන් දවාලන කෙලෙස් ගිනි ය. මේ ගිනිවලින් නො දැවෙන එක ද පෘථග්ජනයෙක්, ලොකයෙහි කො තැනකත් නැත්තේ ය. මුළු සත්ත්වලොකය දිවා රැ දෙක්හි අතර නො තබා ම ඇවිළ දන්නේ ය. මේ ගිනි නිවීම වන්නේ ආර්‍යමාර්ගඥානප්‍රතිලාභයෙනි. එහෙයින් මේ ගිනි නිවූවෝ ආර්‍යමාර්ගඥානප්‍රතිලාභයෙන් කෘතකෘත්‍ය වූ ආර්‍යයන් වහන්සේ ය. බුද්ධාදිඋත්තමයෝ ය. උන්වහන්සේ ය **නිබ්බුත.** කෙලෙස්ගිනි මුළුමනින් නිවාලූ බැවිනි.

අකුතො භයෙ=කො තැනිනුදු බිය රහිත වූ.

දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍ය-නරක- තිර්‍යක්-ප්‍රෙත-අසුර යන මේ කිසිතැනකින් අරමුණෙකින් ඉපැදුම්-පෙළුම්-දිරුම්-මැරුම් ඈ කිසි පෙරැළියෙකින් නො බිය වන්නෝ බිය නැත්තෝ ලොකාතීත වූ බුද්ධාදිආර්‍යයන් වහන්සේ ය. එසේ ම ලොකධර්මයන්ගෙන් නො තැවෙන්නෝ නො ද සැලෙන්නෝ මුන්වහන්සේ ය. එහෙයින් මුන්වහන්සේ **අකුතො භය** නම් වෙත්.

ප්‍රථම ගාථායෙහි එන **පූජාරහෙ-පපඤ්චසමතික්කන්තෙ-තිණ්ණසොකපරිද්දවෙ** යන තෙ පදය එක් ව **බුද්ධ-සාවකෙ** යන දෙ පදයට විශෙෂණ විසින් සිටියේ ය. ද්විතීය ගාථායෙහි එන **තාදිසෙ-නිබ්බුතෙ-අකුතො භයෙ** යන තෙ පදය **තෙ** යන්නට විශෙෂණ ව සිටියේ ය.

න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තමිති කෙන චි=පිණ මේ මෙතෙකැ යි ගණන්නට කිසිවකු විසිනුදු නො හැකි ය. පිණ ගණින්නට කිසිවකුටත් නො හැකි ය. පිණෙහි අණ ගුණ යට කියන ලදි.

පිදිය යුතු වූ, ඉක්මවා සිටි ප්‍රපඤ්ච ඇති එතෙර කළ ශොක පරිදෙව ඇති බුදුවරුන් බුදුසව්වන් යමෙක් පුදා ද, නිවුනු රාගාදි ගිනි ඇති කො තැනිනුත් බිය නැති එබඳු පුද්ගලයන් වඳින්නහුට පුදන්නහුට ලැබෙන පිණ, පිණෙහි පමණ මේ මෙතෙකැයි කිය හැක්කෙක් ලොකයෙහි නැත්තේ ය. දෙවියකු විසින් බ්‍රහ්මයකු

විසින් මාරයකු විසින් මනුෂ්‍යයකු විසින් ඒ ලැබෙන පිණෙහි පමණ නොකිය හැකි ය. මෙබඳු ගුණවත් මහාපුරුෂයන් ජීවත්-ව ඉන්ද දී හෝ පිරිනිවී ගිය කල්හි හෝ, වඳින පුදන කල්හි, ඒ වඳින්නහුට පුදන්නහුට තම සිත සම සේ පිහිටුවා ගත හැකි නම් ඔවුනට ලැබෙන විපාක ඵලය සමාන වේ. බුඬාදී වූ උතුමන් කෙරෙහි වන චිත්තප්‍රසාදහෙතුවෙන් පමණකුත් සත්ත්වයෝ සුගතියට යන්නාහ.

බුදුරජාණන් වහන්සේ **රජගහ** නුවර **වෙළුවනාරාමයෙහි** වැඩ වසනා දවසෙක ඉතා අලුයම් කාලයෙහි බුදුරජුන් විසින් පුරුදු පුහුණු කළ මහාකරුණාසමාපත්තියට සමවැදී එයින් නැගී සිට, ලොව බලා වදාළ සේක්, එනුවර සැඩොල් ගෙයක වසන එක් සැඩොල් මැහැල්ලියක දුටු සේක. දැක ඇය කෙරෙහි නාගුනු මහත් කරුණා ඇති බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ නුවණැස යොදා බලන සේක්, ඇය ආයු ගෙවී ඇති බැවින් හා නිරයෙහි උපදවන පෙර කළ අකුශල කර්මයක් විපාකදුන අවස්ථාවට එළඹ සිටුනා බැවින් අදම කලුරිය කොට අපායයෙහි උපදනා බව දැන, ඇය ලවා දෙව්ලොව ඉපදීමට කරුණු වන කුශලකර්මයක් කරවන්නට මහණගණයාත් පිරිවරා ගෙණ රජගහනුවර පිඬු සිඟා වැඩි සේක. සැඩොලිය ද සැරයටිකොණ එල්බ කොළපතක් අතට ගෙණ නුවරින් බැහැර යන්නී බුදුරජුන් දැක ඒ දෙසට මුණ දී සිටියා ය. බුදුරජාණන් වහන්සේ ඇයගේ ගමන් වළකන්නා සේ ඇය ඉදිරියෙහි වැඩ සිටි සේක. එකල්හි ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අදහස් දැන ආයු ගෙවී ගිය බැගෑපත් සැඩොල් මැහැල්ලිය ද දැක ඇ ලවා බුදුරජුන්ගේ පා වන්දවනු පිණිස මහත් කරුණායෙන් මෙසේ වදාළ සේක:-

"සැඩොලිය! මුන්වහන්සේ එසේ මෙසේ කෙනෙක් නොවෙත්, මුන්වහන්සේ සියලු මුනිවරයන්ට උතුම් වූ සියල්ල දත් මහාකාරුණික වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ය, තී කෙරෙහි මහත් අනුකම්පායෙන් නුවරට නොවැඩ තිට පරලොවින් යහපතක් කරණු සඳහා මහසඟුන් පිරිවරා ගෙණ මෙහි වැඩ සිටින සේක, දෙවිමිනිසුන් විසින් කරණු ලබන කුදුමහත් පූජා, මහත් විපාක ඇත්තක කිරීමෙහි සමර්ථ වූ මුන්වහන්සේ කෙරෙහි සිත පහදා ගණුව, තීගේ ජීවිතය පවත්නා කාලය ඉතා සුලු ය, වැඩි කල් නොපවත්නේ ය, එය දැන් බිඳ වැටෙනු ඇත, එහෙයින් දෙහොත් මුදුන් දී බුදුරජාණන් වහන්සේගේ සිරිපා වහා වඳුව" සි.

සැඩොලිය එ බස් අසා හටගත් වෙවුලුම් ඇත්හි පහත් සිතින් පැහැ පිහිටුවා වැඳ බුදුරජුන් කෙරෙහි වූ ප්‍රීතියෙන් එකඟ වූ සිත් ඇති ව සිටියා ය. බුදුරජාණන් වහන්සේ ද සැඩොලිය තමන් වහන්සේ කෙරෙහි පහත් ව ගිය බව දැන මෙය මෑට දෙව්ලොව ඉපදීමට පමණෑ සි මහණගණයාත් ගෙණ නුවර පිඬු සිඟා වැඩි සේක. එ වේලෙනි අලුත වැදූ ගව දෙනක් වසුපැටියාත් සමග එ තැනින් දුවන්නී බුදුරජුන් වෙත ම බැල්ම හෙලා සිටි මැහැල්ලට අඟින් දැණ ඇය ජීවිතක්ෂයට පත් කළා ය. එ කෙණෙහි ඕ තොමෝ බුදුරජුන් කෙරෙහි කළ චිත්තප්‍රසාදමාත්‍රහෙතුවෙත් තව්තිසා දෙව් ලොව මහත් වූ රන් විමනෙක දෙවඟනන් සිය දහසක් පිරිවර කොට උපන්නී ය. එසේ උපත ලැබූ ඒ දෙවිදූ තොමෝ තමන්ගේ දිවඉසුරු බලා උදම්ව "මම කිනම් කුසලයක් කොට මෙබඳු මහත් දෙවි සැපතක් ලැබීම් දැ" සි බලන්නී මුගලන් මහාතෙරුන්ගේ නියමයෙන් බුදුරජුන්ගේ සිරිපා වැඳ උන්වහන්සේ කෙරෙහි කළ චිත්තප්‍රසාදමාත්‍රයෙන් ලදැ සි දැක බුදුරජුන්ගේ හා මහාතෙරුන් ගේ ගුණ සිහි කොට "මහාතෙරුන් දක්නට යෙම්" සි සිතා විමානය සමග මිනිස් ලොවට අවුත් මහාතෙරුන් කරා එළැඹ විමන අහස්හි රඳවා විමනින් බැස, "මහාවීරයන් වහන්ස! දිව්‍යර්ද්ධියට පැමිණි මම මේ වනයෙහි එකලාව වැඩ හිඳනා ක්ෂය කළ ආශ්‍රව ඇති පහ වූ රාගාදිරජස් ඇති තෘෂ්ණාරහිත වූ මහත් අනුභාව ඇති ඔබ වහන්සේ වඳිමි" සි වැඳ සිටියා ය.

එකල්හි මුගලන් මහාතෙරණුවන් "මා වඳින නී කවරහ" සි අසා වදාළ විට "ස්වාමීනි! එදා ඔබ වහන්සේ විසින් බුදුරජුන්ගේ පා වඳුව සි නියොග කරණ ලද මම මහත් ප්‍රසාදයෙන් උන්වහන් සේගේ පා වැඳ සිටි සැඩොල් මහැල්ලිය වෙමි, එකෙණෙහි ම කුළු දෙනක විසින් ඇණ මරණ ලද්දී දැන් තව්තිසා දෙව්ලොව රන් විමනෙක ඉපිද සිටිමි, සියදහසක් දෙවඟනෝ මට පිරිවරව සිටිත්, ඒ හැම එකියකට ම වඩා මම සිරුරු පැහැයෙන් හා පිරිවර සැපතින් ප්‍රධාන වෙමි, මේ මහත් සැපත ලැබීමට මම ලොකු පින් කමක් නොකෙළෙමි, මේ සැපත ලැබීමට කරුණු වූයේ පින්වතුන් වහන්සේගේ නියොගයෙන් මග වඩනා බුදු රජාණන් වහන්සේගේ පා වැඳ උන්වහන්සේ කෙරෙහි කළ චිත්තප්‍රසාදමාත්‍රය"සි කියා ඒ දෙවිදූ තොමෝ දෙව්ලොවට ගියා ය.

මේ ඒ දෙවිදුවගේ ප්‍රකාශය පොතෙහි ආ සැටි:-

"අහං භදන්තෙ චණ්ඩාලී තයා වීරෙන පෙසිතා,
වන්දිං අරහතො පාදෙ ගොතමස්ස යසස්සිනො.

සාහං වන්දිත්ව පාදුනි චුතා වණ්ඩාලයොනියා,
විමානං සබ්බතෝ භද්දං උපපන්නාමහි නන්දනං.

අච්ඡරානං සතසහස්සං පුරක්ඛත්වාන තිට්ඨති,
තාසාහං පවරා සෙට්ඨා වණ්ණෙන යසසායුනා.

පහූතකතකල්‍යාණා සම්පජානා පතිස්සතා,
මුනිං කාරුණිකං ලොකෙ තං භනෙත වන්දිතුමාගතා''

තමන් වෙත අලුත උපත් දෙව්දුවක දැක සක්දෙව්රජ තෙමේ ''සොඳුර! නී පෙර මිනිසත් බවේදී කිනම් කුසලයක් කෙළෙහි ද? මේ මහත් දිව්‍යවිපාකය කිනම් කුශලකර්මයක් කොට ලදද?'' යි ඇසී ය. ''සක්දෙව්රජතුමනි! මම එදා රජගහනුවර එක්තරා ගැහැණියක් වීමි, ඒ මම ඉතා උදැසන නිත්දෙන් නැගිට මූණකට සෝදා ගෙයි කටයුතු කොට පිරිසිදු ව ඇඳ පැලඳ ගෙණ වැටකොලු මල් සතරක් කඩා ගෙණ අජාසත් රජු විසින් බුදුරජුන් පිරිනිවි කල්හි බුදුරජුන්ගේ සිරුරුදා නිදන් කොට ගොඩ නැගූ දාගබට පුදන්නට මග බැස ගියෙමි, වටපිට නො බලා බුදුගුණ සිහි කරමින් මග බැස ගිය මා වෙනට දුව ආ දෙනක විසින් දුන් අං පහරින් මම එතැන ම මැරී වැටුනෙමි, දාගබට මල් පුදන්නට නො හැකි වීම්, ඒ මල් දා පුදන්නට සිතා ගත් පමණින් මේ මහත් සැපත ලැබීම්, ඉදින් මල් පුදන්නට ඉඩ ලැබුනේ නම්, මෙයට වඩා මහත් සැපතක් ලබනු එකාන්තය'' යි ඒ දෙව්දූ තොමෝ කීවා ය.

මේ දෙව් දුව කී සැටි:-

''කොසාතකී නාම ලතාසි භනෙත කිත්තිතා අනභිඤ්ඤිතා,
තස්සා චත්තාරි පුප්ඵානි බුද්ධං අභිහරිං අහං.

සත්ථු සරීරමුද්දිස්ස විපසන්නෙන චෙතසා,
නාස්ස මග්ගං අවෙක්ඛිස්සං තදඤ්ඤමනසා සතී.

තෙන කම්මෙන දෙවින්ද! මඝවා දෙවකුඤ්ජර!
පහාය මානුසං දෙහං තව සහව්‍යතමාගතා''

එකල්හි සක්දෙව්රජ තෙමේ මාතලි දෙව්පුත් අමතා ''මාතලි! පුදුමයෙක්; මේ විසිතුරු වූ කර්මවිපාකය බලව, ටික විසිනුදු කළ කුශලකර්මය මහත් ඵල ඇත්තේ ය, තථාගත වූ සම්බුදු රජුන් කෙරෙහි හෝ උන්වහන්සේගේ සව්වකු කෙරෙහි හෝ සිත පහන් කල්හි දක්ෂිණාව සවලප නො වන්නී ය, මාතලි! එව; අපි වඩ වඩාත් තථාගතයන් වහන්සේගේ ධාතූන් පුදමු, එහිලා මදකුදු

පසුබට විය යුතු නො වේ, පින් රැස් කිරීම සැප සි, බුදුරජුන් දිවමන් කල්හි හෝ පිරිනිවි කල්හි උන්වහන්සේ කෙරෙහි සිත පහන් කල්හි සම වූ විපාක වන්නේ ය, යම් තැනක පුද සැලකිලි කොට සත්ත්වයෝ සග සැපටත් නිවන් සැපටත් යෙත් ද, තථාගතයන් වහන්සේ ඒ හෙතුයෙන් බොහෝ දෙනාට හිත සැප පිණිස ලොව පහළ වන්නාහ" සි කී ය.

එදු සැඩොල් මැහැල්ලියක් ව සිටි මැයට මේ මහත් උදුර වූ දෙව්සැපත ලැබීමට කරුණු වූයේ අතර මග දී දිවමන් බුදුරජුන් සියැසින් දැක උන්වහන්සේගේ මහත් ගුණයෙහි ඉපද වූ චිත්තප්‍රසාදමාත්‍රය සි.

එදු එක්තරා කුලගෙයක ඉපද සිටි මැයට මේ මහත් උදුර වූ දෙව්සැපත ලැබීමට කරුණු වූයේ සිරුරුදු නිදන් කොට කළ දුගැබක් මලින් පුදන්නට කළ චිත්තෝත්පාදය සි. මේ දෙ දෙනාගේ චිත්තප්‍රසාදයත් චිත්තෝත්පාදයත් දෙක ම බුදුරජුන් අරමුණු කොට වී ය. පිරිනිවි බුදුරජුන් කෙරෙහි හෝ පිරිනිවි බුදුසව්වකු කෙරෙහි හෝ සියැසින් නො දැක ද චිත්තප්‍රසාද මාත්‍රයෙන් දිව සැපත් ලැබීම සසුන් පිළිවෙතෙහි නො වඳ බව කියාලන්නේ ය.

බුදු සව්වන් කෙරෙහි සැදැසිතින් කරණ සත්කාරයෙහි ඉෂ්ටවිපාකය බලනු මැනැවි.

රජගහනුවර වැසි එක්තරා සැදැහැති උපාසකයෙක් සඞ්ඝයා උදෙසා නිතිබත් සතරක් දෙන්නට නියම කොට එය සකස් කොට දෙන්නේ ය. ඔහුගේ ගෙය පිහිටි පෙදෙස නිතර සොරුන් හැසිරෙන පෙදෙසක් වූ බැවින් සොරුන්ගෙන් උවදුරු වේ ය යන බියෙන් ඒ වළකාලනු පිණිස නිතර ගෙයි දෙර වසා තබන්නේ ය. මේ නිසා සිඟා වඩනා භික්ෂූන් වහන්සේ ඇතැම් දවසෙක එහි පිඬු සිඟා වැඩියහු ද පිඬු නො ලැබ හැරී එන්නාහ. දවසක් උපාසක තෙමේ "සොදුර! කිම අපගේ සඞ්ඝයන් වහන්සේ පිඬු සිඟා මෙහි වඩනා සේක් ද? උන්වහන්සේට භික්ෂාව පිරිනමන්නී දැ" සි සිය බිරිය අතින් විමසේ ය. එවිට ඕ තොමෝ "හිමියෙනි! ඇතැම් දවස්හි උන්වහන්සේ මෙහි නො වඩිනා සේක, ඒ නො වඩිනා දවස්වල දන් පිරිනමන්නට නො ලැබේ ය" සි කිවු ය. "මා නිතිබත් සතරක් පිළියෙල කොට තිබිය දී උන්වහන්සේ දිනපතා මෙහි නො වඩින්නෝ කුමක් නිසා දැ" සි උපාසකයා ඇසූ විට "දිනපතා වාගේ මේ ගෙයි දෙර වසා තිබෙන බැවින් උන්වහන්සේ එසේ නො වඩිනු ඇතැ"යි උපාසිකා

තොමෝ කිවා ය. උපාසක මේ අසා මහත් සංවෙගයට පැමිණ එක් මිනිසකු දෙරටුපල්ලකු කොට එහි සිටුවා "තමුසේ අද පටන් මේ ගෙය රැක බලා ගෙණ මෙහි නැවතී සිටිය යුතු ය, පිඬු සිඟා වඩිනා ස්වාමීන් වහන්සේ මේ ගෙට වැඩියා ම දෙර හැර උන් වහන්සේ ගෙය තුළට වැඩම කරවා පාත්‍රය පිළිගෙණ අසුන් පැණවීම් පා දෙවීම් ඈ සියලු වතාවත් දැන මැනැවින් කළ යුතු ය"යි නියම කෙළේ ය. දෙරටුපල් තෙමේ "මැනැවැ"යි එය පිළිගෙණ එතැන් පටන් එසේ කරණුයේ ගෙට වඩිනා භික්ෂූන් වහන්සේට වතාවත් කොට දන් පිළිගන්වා අවසාන-යෙහි උන්වහන්සේ වෙතින් බණ අසා උපන් සැදැ ඇතියේ කම්පල අදහා සරණසිල් පන්සිල්හි පිහිටා ගත්තේ ය. කලක් ගෙවී ගිය තැන මිය ගොස් යාම දෙවලොකයෙහි උපන්නේ ය. දෙරටුපල්ලා අනුන්ගේ දානයෙහි වතාවත් කිරීමෙන් හා එහි පින් අනුමෝදන් වීමෙන් මිය ගොස් තව්තිසා දෙව්ලොව උපන්-නේ ය. ඔහුට එහි සොළොස් යොදුන් පමණ වූ රන් විමනෙක් පහළ වී ය.

දවසෙක දෙව්ලොව චාරිකායෙහි වැඩම කළ මුගලන් මහා-තෙරුන්ට හමු වූ මේ දෙව්පුත් තෙමේ "ස්වාමීනි! මෙහි ඉපැත්මට මා කළ පින්කම උපාසකයාගේ ගෙට වඩනා බුදුසව්වනට අසුන් පණවා දී, මෙහි වැඩ හිඳිනු මැනැව, ආර්‍යයන්ගේ ආරොග්‍යය කෙසේ ද? වසන තැන් සුවපහසු කම් ඇත්තේ දැ? යි පැවැත් වූ පටිසත්ථාර කථාමාත්‍රය හා "මොවුහු බ්‍රහ්මචාරීහු ය, ධර්මචාරීහු ය, සිල්වත්හ" යි යන ඈ විසින් සිතෙහි පැවැති ප්‍රසාදමාත්‍රය" යි දන්වා සිටියේ ය.

මේ දෙව්පුත්හුගේ ප්‍රකාශය:-

"දිබ්බං මමං වස්සසහස්සමායු
වාචාභිගීතං මනසා පවත්තිතං,
එත්තාවතා ඨස්සති පුඤ්ඤකම්මො
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතො" යි.

බණපොතෙහි ආ මේ ද දන්නේ ය.

"තිට්ඨන්තෙ නිබ්බුතෙ චාපි සමෙ චිත්තෙ සමං ඵලං,
චෙතො පණිධිහෙතුහි සත්තා ගච්ඡන්ති සුග්ගතිං.
බහුන්නං වත අත්ථාය උප්පජ්ජන්ති තථාගතා,
යත්ථ කාරං කරිත්වාන සග්ගං ගච්ඡන්ති දායකා"

එහෙයින් තෙරුවන් ගුණ සලකා පහන් සිතින් කරණ කුදු මහත් හැම පිදිවිල්ලක් ම විපාකදානයෙන් මහත් වන බැවින් කරණ කුසලය කුඩා ය යි කිසිවකු විසිනුත් පින් කිරීමට පසු බට නො විය යුතු ය. පිණට අවමන් නො කළ යුතු ය. දෙවියන්ගේ හෝ මිනිසුන්ගේ ජීවිතය වැඩී යනුයේ පින් කළ තරමටැයි දැන පින් කළ යුතු ය. යහතින් දිවි ගෙවන්නට නම් තෙරුවන් කෙරෙහි පහන් සිත් ඇතිව පින් කළ යුතු ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ බමුණු තෙමේ සෝවන් වූයේ ය. යොත්නක් පමණ වූ රන්සෑය සත් දවසක් අහස ම රැඳී සිටියේ ය. එහි රැස් වූ මහාජනකාය ද ඉතා මහත් වී ය. ඔවුහු සතිය මුළුල්ලෙහි නොයෙක් අයුරින් සෑය පිදූහ. එහි රැස්ව හුන් මිසදිටු ගත්තවුන්ගේ මිසදිටු ද බිඳී ගියේ ය. සතිය කෙළ-වර සෑය බුදුරජුන්ගේ ආනුභාවයෙන් තුබූ තැන ම පිහිටා ගත්-තේ ය. රන්සෑය පිහිටා තුබූ තැන එ කෙණෙහි ම ගල්සෑයෙක් පහළ ව සිට ගතු. ඒ මහාජනසමාගමයෙහි අසූසාර දහස්ක් දෙනාහට ධර්මාවබොධය වූයේ ය.

සවණ්ණවෛත්‍යවසතුව නිමි.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල** ස්ථවිරයන් කළ සද්ධර්මසාගර නම් වූ ධර්මපදවර්ණනායෙහි බුද්ධවර්ගාත්මක වූ චතුර්දශ තරඞ්ගය නිමියේ ය.

ප්‍රථම භාණවාර ය.

විද්‍යාරණ්‍යයෙන්:-

වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදයපරිවෙණාධිපති විද්‍යාවිභාරද පණ්ඩිත
ගරු ඉඳුරුවේ උත්තරාරාමනිකායකම්මාසථවිරයන්
වහන්සේගේ ප්‍රකාශය.

ධර්මඥනයටත් සාහිත්‍යඥනයටත් එකසේ ඉවහල් වන මේ ග්‍රන්ථය වනාහි **රාජකීය පණ්ඩිත අම්බලන්ගොඩ ධම්මකුසල සථවිරපාදයන් වහන්සේ** විසින් ප්‍රතිපාදනා කරන ලද්දේ වෙයි. මේ ග්‍රන්ථය සද්ධර්මසාගරය නමින් ද **ධම්මපදවණ්ණනා** නමින්ද ප්‍රතිපාදකයෝ ම හඳුන්වති. මෙය බැලූ බැල්මට ම සද්ධර්ම සාගරයකි. මේ ග්‍රන්ථය **සද්ධර්මසාගර** නමින් හැඳින්වීම හැම අතින් ම සුදුසු ය. ධම්මපදයෙහි එන හැම ධම්මපදයක් ම නිරවශෙෂයෙන් විවරණය කිරීම මේ ප්‍රතිපාදකයන් වහන්සේගේ කවිකෘතලක්ෂණය වශයෙන් හැඟෙයි. එහෙයින් ම මෙය **ධම්මපදවණ්ණනා** නමින් හැඳින්වීමද උචිත ය. බුද්ධියට සරිලන උගත්කමත් උගත්කමට සරිලන බුද්ධියත් සාටෝපයක් නැති ව මැ රඳා පවතින මේ ප්‍රතිපාදකයාණන්ගේ බහුශ්‍රැතසම්පත්තිය සමග කැපී පෙනෙන ධර්මඥනය කාගේ වුව ද පැසසුමට ලක් විය යුතු මැ යි. ශ්‍රද්ධාමූලිකප්‍රතිපත්තියත් බුද්ධිමූලකපාණ්ඩිත්‍යයත් එකවිට පෙනෙන සේ මේ ග්‍රන්ථය ප්‍රතිපාදනා කර තිබෙන බව නොමසුරු ව කිය යුතු ගුණයෙකි.

"අකත" යි නිවණට නමෙකි. හෙතුප්‍රත්‍යයධර්මයන් විසින් දිව්‍යබ්‍රහ්මාදීන් විසින් නො කළ බැවින් ඒ අකත යැයි හඳුන්වනු ලැබේ. නිවණ වනාහි කුශලාකුශලකර්මාදිහෙතුධර්මයකින් නිපන්-නෙක් නො වේ. එසේ ම දිව්‍යබ්‍රහ්මාදී කෙනකුන් විසින් නිපදවන ලද්දේ ද නො වේ. ඍතුශක්තියකින් උපදින්නේ ත් නො වේ. එහෙයින් කර්මජ නො වේ. හෙතුජ නො වේ. ඍතුජ නො වේ. අතීත නො වේ. අනාගත නො වේ. ඇසින් දත හැක්කේ නො වේ. කතින් දත හැක්කේ නො වේ. නාසයෙන් දත හැක්කේ නො වේ. දිවෙන් දත හැක්කේ නොවේ. සිරුරෙන් දත හැක්කේ නො වේ. මෙසේ අකත හෙයින් ආර්‍යශ්‍රාවකයා විසින් දත යුත්තේ ය. =පෙ= නිර්‍වාණධර්මය ආර්‍යපුද්ගලයන් විසින් චතුර්විධ මාර්ගඥනයන් කරණකොටගෙණ ප්‍රත්‍යක්ෂ විසින් ද කල්‍යාණපෘථග්ජනයන් දෙශනා මාර්ගය කරණකොටගෙණ අනුමාන විසින් ද දත යුතුය"

අකත යන්නට කළ මේ විවරණයෙන් මෙහි ප්‍රතිපාදකයාණන්ගේ ධර්මඥනය විශද වෙයි. මෙසේ සාහිත්‍යරසයෙන් ද ධර්මරසයෙන් ද රසවත් වූ මේ **සද්ධර්මසාගරය** ප්‍රතිපාදකයාණන් වහන්සේගේ ක්‍රියාත්මක පාණ්ඩිත්‍යයට අගනා නිදර්ශනයක් බව අවසාන වශයෙන් කියමිහ.

මාගේ අදහස

අම්බලම්ගොඩ ශාසනෝදය විශ්වවිද්‍යාලය පරිවෙණාධිපති රාජකීයපණ්ඩිත ගරු අම්බලම්ගොඩ ධම්මකුසල හිමිපාණන් අතින් ලියැවී ගෙන යනු ලබන සද්ධර්මසාගරය ප්‍රමාණයෙන් මෙන් ම පරිපූර්ණත්වයෙන් ද මෙතෙක් ලියැවුණ සෑම කෘතියක් ම අබිබවා සිටුනේ ය. විසිවන සියවසෙහි සිංහලයෙන් ලියැවුණු උසස් ම බණ පොත මෙයැ යි අවිවාදයෙන් පිළිගත හැකිය. පෙර පළ වූ කොටස් මෙන් මෙය ද ගැඹුරු වූ ධර්ම විවරණයෙන් හා සමයාන්තර පිළිබඳ තුලනාත්මකවිවෙචනයෙන් යුක්ත ය. බුදුදහම මෙන් ම භාරතීයදර්ශනවාද පිළිබඳ ව විශදතරපටුත්වයක් ලබා ඇති මේ හිමිපාණෝ ව්‍යක්ත ලෙස සිය මත ඉදිරිපත් කෙරෙති. පර මත විවෙචනය කරති. මෙ වැනි පොතක් සිංහලපාඨකයන් අතට ලක් වන්නේ ඉතාමත් කලාතුරකිනි. මාගේ මේ ප්‍රකාශයෙහි සත්‍යය සොයා බැලීමට කැමැත්තෝ අගනිදත්තා පුරොහිතයාට දෙසූ ගාථාවනට ලියැවුණු පරිකථා බලත්වා. මේ ගාථාවලිය බුදු දහමේ සම්පිණ්ඩනයෙකි. ඊට ධම්මකුසල හිමිපාණන් අතින් ලියැවුණු පරිකථාව බුදුදහමෙහි අගය වටහා ගැනීමටත් බුද්ධදර්ශනයෙහි ශ්‍රේෂ්ඨත්වය දැන ගැනීමටත් එකාන්තයෙන් ම ඉවහල් වෙයි.

සද්ධර්මසාගරය වූ කලි උසස් පාණ්ඩිත්‍යයත් මනා ධර්මාවබෝධයත් සානුකම්පික ශාසනෝන්නතිකාමිත්වයත් විවෙචනාත්මක බුද්ධි ප්‍රභාවත් එකලෙස විදහාපාන කෘතියකි. මින් වන ධර්මශාස්ත්‍රීය සේවය සුළුපටු නො වේ. මේ උතුම් කටයුත්තෙහි නිරත ව සිටින **ගරු ධම්මකුසල හිමිපාණන් වහන්සේට** සිංහල බෞද්ධ ජනතාවගේ ගෞරවසම්ප්‍රයුක්ත කෘතඥතාව ලැබිය යුතු ය.

ආනන්ද ගුරුගේ.

අනුර,
නුගගහවත්ත, කොළඹ 3.

පඤ්චදශතරඞ්ගීයකථාසූචි

පිට	වර්ගය	වස්තුව	
1893	15	1	ශාක්‍ය කොලිය දියදබරය.
1899	,,	2	මරහු කළ නපුරු වැඩෙක්.
1901	,,	3	කොසොල් රජුගේ පරාජය.
1903	,,	4	කුලදූරියකගේ ආවාහය.
1906	,,	5	දුප්පතකු ලද සංග්‍රහයෙක්.
1911	,,	6	කොසොල් රජ සුවපත්වූ සැටි.
1916	,,	7	නිස්ස සථවිරයන් වහන්සේ.
1919	,,	8	සක්දෙවිඳුන් කළ උපස්ථානය.

ඡොඩශතරඞ්ගීයකථාසූචි

පිට	වර්ගය	වස්තුව	
1931	16	1	මවුපිය දෙදෙනා හා එක් ම පුතා.
1938	,,	2	පුතු මළ ශොකයෙන් හැඬූ බමුණා.
1941	,,	3	විශාඛා මහා උපාසිකාවගේ දුක් සන්සිඳවීම.
1944	,,	4	ගැහැණියක නිසා වූ විපතක්.
1946	,,	5	අනිත්තිගන්ධ කුමාරයා.
1949	,,	6	මිසදිටු ගත් බමුණෙක්.
1952	,,	7	මුණ බලා පිදූ කැවුම්.
1955	,,	8	ප්‍රශ්නයට පිළිතුරු නොදී පිරිනිවීම.
1958	,,	9	නන්දිය හා රෙවතී.

සප්තදශතරඞ්ගීයකථාසූචි

පිට	වර්ගය	වස්තුව	
1963	17	1	රොහිණීයගේ අසුත්හල් පූජාව.
1976	,,	2	දෙව්දුවකගේ පැමිණිල්ලෙක්.
1980	,,	3	උත්තරා සිරිමාවට කළ සත්කාරය.
1989	,,	4	ගැහැණියකට දෙව්ලොව උපතට කරුණු වූ පින්කම.
1992	,,	5	බුදුරජුන්ගේ පෙරදැකි මවුපිය දෙදෙනෙක්.
1996	,,	6	කුඩු කැවුමක් පිළිගැණීම.
2000	,,	7	අතුල උපාසකයා.
2006	,,	8	සවග මහණුන්ගේ අසංවරය.

අෂ්ටාදශතරඞ්ගීයකථාසූචි

පිට	වර්ගය	වස්තුව	
2009	18	1	ගොඝාතක පුත්‍රයා.
2016	,,	2	ශ්‍රද්ධාවත් බ්‍රාහ්මණයෙක්.
2019	,,	3	ඉණිකුණු ව උපන් මහණෙක්.
2023	,,	4	ලාලුදායී සථවිරයන් වහන්සේ.
2027	,,	5	සොර සැමියන් සොයා ගිය ගැහැණි.
2031	,,	6	වෙදකම් කළ මහණෙක්.
2039	,,	7	පන් සියයක් උපාසකයෝ.
2042	,,	8	තම නැයන් උසස් කොට දැක්වූ තිස්ස මහණ.
2046	,,	9	බණ ඇසූ උපාසකයා.
2053	,,	10	මෙණ්ඩක සිටානෝ.
2062	,,	11	උජ්ඣානසඤ්ඤී සථවිර.
2063	,,	12	සුභද්‍ර පරිව්‍රාජක.

එකොනවිංශතිතමතරඞ්ගීයකථාසූචි

පිට	වඟීය	වසතුව	
2075	19	1	ඛම්යෙහි පිහිටියෝ.
2078	,,	2	සවග මහණෝ.
2080	,,	3	එකුදුන සථවිරයන් වහන්සේ.
2083	,,	4	ලකුණ්ටක භද්දිය සථවිරයන් වහන්සේ.
2113	,,	5	පදබ්‍යඤ්ජනයෙහි දක්ෂ වූ ශ්‍රමණයෝ.
2121	,,	6	වාදයෙන් පැන යන හන්ඨක.
2125	,,	7	බැහැරි සසුන්හි පැවිදි වූ බමුණෙක්.
2127	,,	8	නියම මුනිවරයා.
2129	,,	9	බිලී වැද්දෙක්.
2131	,,	10	බුදුරජානන් කළ අවවාදයෙක්.

විංශතිතමතරඞ්ගීයකථාසූචි

පිට	වඟීය	වසතුව	
2133	20	1	ආඟිය තැන් ගැණ කතා කළ භික්ෂූන් වහන්සේලා.
2140	,,	2	අනිත්‍යානුදශීනය වැඩූ පන් සියයක් භික්ෂූන් වහන්සේලා.
2196	,,	3	දුඃඛානුදශීනය වැඩූ පන් සියයක් දෙනා වහන්සේ.
2197	,,	4	අනාත්මදශීනය වැඩූ පන් සියයක් දෙනා වහන්සේ.
2199	,,	5	ප්‍රධාන කර්මිකතිෂ්‍ය සථවිරයන් වහන්සේ.
2203	,,	6	ප්‍රෙතයෙක් ව උපන් මහණෙක්.
2210	,,	7	පොසිල සථවිරයන් වහන්සේ.
2214	,,	8	මහලු තෙරුන් පන්සියයක්.
2219	,,	9	සුවණ්ණකාර සථවිරයන් වහන්සේ.
2223	,,	10	මහාධන වෙළෙන්දා.
2227	,,	11	කිසාගොතමී.
2229	,,	12	පටාචාරා.

එකවිංශතිතමතරඩගීයකථාසූචි

පිට	වගීය	වසතුව	
2231	21	1	ගඞ්ගාරොහණ කථාව.
2241	,,	2	කුකුළු බිත්තර කෑ දැරිය.
2143	,,	3	නොකටයුත්තෙහි යෙදුනු භික්ෂූන් වහන්සේ.
2254	,,	4	ලකුණ්ටක භද්දිය ස්ථවිරයන් වහන්සේ.
2258	,,	5	යකුන්ගෙන් රැකුනු දරුවා.
2285	,,	6	වැදුරට වැසි භික්ෂු නමක්.
2288	,,	7	චිත්තගහපතියා.
2291	,,	8	චූලසුභද්‍රා.
2297	,,	9	එකවිහාරික ස්ථවිරයන් වහන්සේ

සුබවග්ය

ශාක්‍ය – කොලියයන්ගේ දියදබරය

15 — 1

ශාක්‍ය කොලිය දෙරට වැස්සෝ **කිඹුල්වත්** නුවරටත් **කොලිය** නුවරටත් අතරින් ගලා බස්නා **රොහිණී** ගඟ එක් ම ඇවුරුමෙකින් ඇවුරුම් කොට බඳවා ගොයම් කරත්නෝ ය. පොසොන්මස් ඉද්දෙහි ගොයම් මැලවී යනු දුටු දෙනුවර වැස්සන්ගේ කම්කරුවෝ එහි රැස් වූහ. කොලිය නුවර සිට පැමිණි කොලිය කම්කරුවෝ "මේ දිය ඇල්ල දෙපසෙහි ම කුඹුරුයායනට නතු කොට ගෙණ යනු ලබන්නේ නම් අප දෙපසෙහි ම කුඹුරුයායනට දිය නො පොහොනේ ය, අපගේ ගොයම් එක් දියවරකින් ම පල ගන්නේ ය, එහෙයින් මේ දිය අපට දෙවු"යි ඉල්ලා සිටියහ. එකල්හි කිඹුල්වනින් පැමිණ සිටි ශාක්‍ය කම්කරුවෝ "තොප ගොයම් කපා පාගා අටුකොටු පුරවා ගත් කල්හි අපට රන්රුවන් මිලමුදල් කහවණු ගෙණ මලුපැස් ගත් අත් ඇති ව තොපගේ ගේදොරට පැමිණ පෙළ ගැසී සිටින්නට සිදුවනු ඇත, අපගේ ගොයම් ද එක් ම දියවරකින් පැසෙන්නේ ය, එහෙයින් මේ දියවර අපට දෙවු"යි කීහ. "නො දෙන්නෙමු අපි, අපිත් නො දෙන්නෙමු, කරණ එකක් කරවු, අපි එය බලා ගන්නෙමු" යි මෙසේ උනුන් වහසි බස් කියා කලහ වඩා ගෙණ එකෙක් නැගිට එකක්හට පහර දුන්නේ ය. පහර කෑයේ පහර දුන්නහුට පෙරළා පහර දුන්නේ ය. මෙසේ උනුන් පැහැර පැහැර රජපවුල් පිළිබඳ ජාති-කුල-පරම්පරාභෙද ඇද දක්වා උනුනුන්ට නිඳු පරිභව කරමින් ඔවුහු තව තවත් කලහ වැඩූහ. එහි කොලිය කම්කරුවෝ "තෙපි බලු කැණහිල් ඇතිරිසනුත් සේ තම බුහුනන් හා විළිබිය හැර සහවාසයට පැමිණ ලෝසිරිත් කුලසිරිත් ඉක්මවා දිවිවැටුම් කරණ ශාක්‍යයන් කර පිණවා සිටියහු, මොවුන්ගේ ඇත්-අස්-රිය-පාබලසෙත් හා කඩු පලිහ ගෙණ අපට කුමි කරහු?" යි කීහ. ශාක්‍ය කම්කරුවෝ "බැහැර යවු, තෙපි කවරහු, ඉන්නට හිටින්නට හොවින්නට තැනක් නැති තිරිසනුත් සේ කොලොම්රුක්බිල්හි දිවි ගැල වූ කුලයක් පරපුරක් ගමක් රටක් දිවෙලක් නැති අනාථ වූ අසරණ වූ කුෂ්ඨරෝගීන්ගේ ඇත්-අස්-රිය-පාබලසෙත් හා එක්ව කරට ගත් කඩු පලිහයෙන් අපට කුමි කරහු? ආවහු නම් කර බැඳ ගෙණ පෙරළා යහු" යි ගුගුළහ. මෙසේ උනුන්ගෙන් ඇණුම් බැණුම් පහර ලත් දෙපසෙහි කම්කරුවෝ වහා ගොස් එබව ඒ ඒ රාජ්‍යයන්හි ඒ ඒ කාර්‍යාංශයන්හි නියුක්ත ඇමතියනට

දන්වා සිටියහ. ඇමැතියෝ රජදරුවනට කියා පෑහ. එබස් අසා නැගි සිටි ශාක්‍යරජදරුවෝ "බුහුනන් හා සහවාසයට ගිය-වුන්ගේ බලපුළුවන්කම් දක්වන්නෙමු"සි යුදඅවි ගෙණ යුදට සැරසී නික්ම ගියහ. කොලියරජදරුවෝ ද කොලොම්රුක්මුල්හි විසූ-වන්ගේ හසිබල බලවු" සි යුදඅවිගෙණ යුද පිණිස නික්ම ගියහ.

එ දවස තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ අලුයම ලොව බලා වදුරණ සේක් යුදට සැරසී ගත් දෙපස නැයන් දැක "මා මෙහි නො ගියහොත් මූ හැම දෙන යුදබිම නැසී යන්නාහ, එහෙයින් මා දැන් එහි යා යුතුය" යි සිතා එකලාව ම අහසින් වැඩ **රොහිණී** ගඟ මැද අහසෙහි පලක් බැඳ වැඩ හුන් සේක. යුද පිණිස ගඟබඩ දෙපස රැස් වූ නැයෝ බුදුරජුන් දැක යුදඅවි බිම දමා දෙහොත් මුදුන් දී වැඳ සිටියහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "මහරජුනි! මේ කලහය කුමක් නිසා?" යි විවාළවිට "නො දනිමු සවාමීනි!"යි ඔවුහු කීහ. "කවරෙක් දනී දැ?"යි විවාළවිට "සෙනෙවිරද්හු දනිති" යි කීහ. සෙනෙවිරදුන් විවාළ විට "යුවරජහු දනිති" යි කීහ. මෙලෙසින් දස් කම්කරුවන් තෙක් විවාරා ඔවුන් දියදබරයෙකැ යි කිවිට "මහරජුනි! මෙය දියදබරයෙකැ යි කියත්, එසේ නම් දබරයට මුල් වූ දියත්ත වටිනා කම්න් කොතෙක් වටී ද, දිය මිලට ගන්නේ ද නො වේ, වටිනාකම කිය හැක්කේ දිය මිලට ගණිතොත් පමණි, දිය යිදී බොන්නට නාන්නට දිය නැති ව ගිය කල්හි වුව ද දියෙහි වටිනා කමෙක් නැ නො වේ දැ" යි වදුළ විට "එසේ ය සවාමීනි! දියෙහි වටිනා කමෙක් නැත, දිය සිදී ගිය කල්හි ද දියෙහි වටිනා කමෙක් නැතැ" යි ඔවුහු කීහ. "එසේ නම් අගයක් නැති දියත්තක් නිසා යුද වැද සිවුනා තොපගෙන් එකක්හුගේ වටිනා කම කොතරම් වේ දැ?" යි ඇසූ කල්හි "නිලෝගුරු හිමියනේ! අප එකක්හුගේ වටිනා කම නො කිය හැකිය, අගය මෙතෙකැ යි පමණ නො කිය හැකිය" යි කීහ. බුදුරජාණන් වහන්සේ "එසේ නම් වැඩි වටිනකමක් නැති වටිතත් තුට්ටුවක් තරම්හුත් නො වටිනා දියත්තක් නිසා පමණ නො කටහැකි අගය ඇති එක් රජදරු කෙනෙකුන් වුව ද මේ නිසා නැසී ගියහොත් එය තොපට තරම් දැ" යි අසා වදුළ සේක. එකිදී ඔවුහු සැම දෙන නිහඬ වූහ. බුදුරජාණන් වහන්සේ ඔවුන් අමතා "මහරජුනි! කුමක් නිසා මෙබදු නො සුදුසු ගැරහිය යුතු කරුණක් ඉදිරියට ගෙණ අවි ගැටුම් දිවිනැසුම් කරන්නහු ද, මම දැන් මෙහි නො ආයෙම් නම් අද මෙහි මේ ගඟ ලේගඟක් වනු එකාන්ත ය, තෙපි ඉදිරි පත් වූවහු අයුත්තක් අපරාධයක් කරන්නට ය, තෙපි උනුන් කෙරෙහි

වෛරී ව වසන්නහු ය, මම වෛර නැත්තෙම් වෙමි, තෙපි කෙලෙස් ලෙඩින් පීඩිත ව වසන්නහු ය, මම කෙලෙස් ලෙඩින් නො ද පීඩිත වෙමි, තෙපි සසර දිග් ගසන පස්කම් බැඳුම් සෙවුමෙහි උත්සාහ ඇති ව වසන්නහු ය, මම එහි උත්සාහ රහිත ව වසමි"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො,
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො.

සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා,
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා.

සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා.
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකාති,

වෛර ඇති මිනිසුන් අතුරෙහි අවෛරී වූ අපි, මිනිසුන් වෛර ඇතිව වසන කල්හි අවෛරී ව වසමු ද, (ඒ අපි) එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

ආතුර වූවන් අතුරෙහි නො ද ආතුර වූ අපි, මිනිසුන් ආතුර ව වසන කල්හි අනාතුර ව වසමු ද, (ඒ අපි) එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

උත්සාහ ඇත්තවුන් අතුරෙහි උත්සාහ රහිත වූ අපි, මිනිසුන් උත්සාහ ඇති ව වසන කල්හි උත්සාහ රහිත ව වසමු ද, (ඒ අපි) එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

සුසුඛං වත ජීවාම = එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

"සුටඨු සුඛං = සුසුඛං" ක්‍රියාවිශෙෂණ යි. **'ජීවාම'** යන ක්‍රියාපදයට විශෙෂණ ව සිටියේ ය. **සුඛ** ශබ්දය **සු** උපසර්ගයෙන් වැඩී ගියේ ය. 'සුඛ' ශබ්දයෙහි අරුත් එයින් තර වූයේ ය. 'ඉතා සුවසේ'යි අරුත් දෙනුයේ එහෙයිනි. **වත** යනු එකතරුත්හි නිපාත යි.

වෙරිනෙසු = ප්‍රාණඝාතාදි පාපකර්ම ඇති (මිනිසුන් අතුරෙහි)

ප්‍රාණඝාත – අදත්තාදාන – කාමමිත්‍ථ්‍යාචාර – මෘෂාවාද – මද්‍යපාන යි වෛර පසෙකි. **"පංච වෙරා පාණාතිපාතො අදිත්තාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො සුරාමෙරයමජ්ජ-පමාදට්ඨානන්ති"** යනු සූත්‍ර යි. විස්තර යට කියන ලද්දේ ය.[1]

1. 1. 10. 'පාපකාරි' යනු බලනු

"වෙරං අස්ස අත්ථීති" = වෙරී" ප්‍රාණඝාතාදි වෛර ඇත්තේ වෙරි නම්. **වෙර** යනු පාපයෙහි හා ප්‍රතිඝයෙහි වැවේ.

අවෙරිනෝ = ප්‍රාණඝාතාදිවෛර නැත්තමෝ.

වෙරිනෙසු මනුස්සෙසු = මිනිසුන් ප්‍රාණඝාතාදිවෛර ඇතිව වසන කල්හි.

විහරාම = වසමු.

වී පුළු **හර** ධාතුවෙන් නිපන්නේ ය. ධාතුවෙහි අර්‍ථය හැරීම ය. එහෙත් ධාතුව හා එක් වූ **'වි'** උපසර්‍ගය විසින් 'හර' ධාතුවෙහි ඒ ප්‍රසිද්ධාර්‍ථය හැර එහි වූ අනෙක් අර්‍ථයෙක් මතු කරණ ලද්දේ ය. ඒ නම්: විසීම් අර්‍ථය යි. ධාතූන් අනෙකාර්‍ථ බැවින් ධාතූන්හි ඇත්තා වූ ම අර්‍ථ උපසර්‍ග විසින් ප්‍රයොගානුකූල ව මතු කරණු ලැබේ.

"සන්තමේව හි නීලාදි වණ්ණං දීපාදයෝ විය,
ධාතුසම්ං සන්තමෙවත්ථං උපසග්ගා පකාසකා"

යනු ආචාර්‍යවචන යි. මේ එක් ම **'හර'** ධාතුව **විහාර** = වසන තැන, **ආහාර** = භොජනය. **සංහාර** = සඞ්කෙෂ්පය. **පරිහාර** = ඛාරය, **පහාර** = ගැසීම යි ඒ ඒ උපසර්‍ග විසින් වෙනස් වෙනස් අරුත්හි නඟා සිටුවන ලද්දේ ය.

"උපසග්ගේණ ධාත්වත්ථෝ බලාදන්‍යත්‍ර නීයතෙ,
විහාරාහාරසංහාර ප්‍රතිහාර ප්‍රහාරවත්"

යි සංස්කෘතශාබ්දිකයෝ එය පැහැදිලි කළහ.

අවෙරිනෝ = ප්‍රාණඝාතාදිවෛර නැති ව.

සත්ත්වයන් මොලොව නන්වැදෑරුම් ගැරහුම් වදබැදුම් වලට පමුණු වන්නෝ පරලොව අපායයෙහි හෙළා නොයෙක් තවුක දුක් කරදර වලට පමුණු වන්නෝ සත්ත්වයන් විසින් ම කරණු ලබන ප්‍රාණඝාතාදි දුශ්චරිතයෝ ය. ඒ පව්කම්, පව්කම් කරන්නහුට සතුරකු වැනි ව සිටුනා බැවින් වෛරයක් වැනි ව සිටුනා බැවින් වෛරය යි කියනු ලැබේ. මෙලොව යමක්හට සතුරෝ වෙත් ද' විරුද්ධයෙක් වේ ද ඔහුට තම ජීවිතය නිරාබාධ ව ගෙහැට නැති ව ගෙණ යන්නට නො හැකි ය. ඔහු හැමදෑ ජීවත් වනුයේ මහත් බියෙනි. මහත් දුකෙනි. බුදුරජානන් වහන්සේට එබඳු සතුරෝ නැත. එබඳු විරුද්ධයෙක් නැත. එහෙයින් උන්වහන්සේ සුවසේ ජීවත් වන සේකැ යි වදාළ සේක.

සුසුඛං වත ජීවාම = එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

ආතුරෙසු අනාතුරා = ආතුර වූවන් අතුරෙහි ආතුර නොවූ වමෝ.

ආතුර නම්: රොගග්‍රස්තයෝ ය. ලෙඩින් පෙළෙන්නෝ ය. රොගග්‍රස්ත නොවූවෝ ලෙඩින් නොද පෙළෙන්නෝ අනාතුරයෝ ය.

ආතුරෙසු මනුස්සෙසු = මිනිසුන් ආතුරව වසන කල්හි.

විහරාම අනාතුරා = අනාතුරව වසමු.

සත්ත්වයන්ගේ සිත් දවරැ දෙක්හි පෙළන්නෝ දවන්නෝ කෙලෙසයෝ ය. සිත තරමකින් හෝ නොදැමුනු නොසන්සිඳුනු හැඬි දැඩි මිනිසුන්ගේ සිත් රූපාදී වූ අරමුණු ශුභ විසින් සුඛ විසින් රස විඳියයුතු විසින් ගෙණ පෙළෙන්නේ ය. දැවෙන්නේ ය. සැලෙන්නේ ය. එය ඔවුනට රොගයක් බඳු ය. ඔවුහු කෙලෙස් ලෙඩින් පෙළෙමින් දැවෙමින් දුකසේ ජීවත් වෙත්. එබඳු කෙලෙසාතුරයන් අතුරෙහි බුදුරජානන් වහන්සේ අනාතුර වූවාහු සුවසේ ජීවත් වන සේකැ යි වදාළ සේක.

සුසුඛංවතජීවාම = එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.

උස්සුකෙසු අනුස්සුකා = උත්සාහ ඇත්තවුන් අතුරෙහි උත්සාහ රහිත වූ වමෝ.

උස්සුක නම්: පස් කම්සැප සෙවීමෙහි උත්සාහ ඇතියෝ ය. **අනුස්සුක** නම්: පස් කම්සැප සෙවීමෙහි උත්සාහ නැතියෝ ය. පස් කම්සැප බලාපොරොත්තු නොවන්නෝ ය.

උස්සුකෙසු මනුස්සෙසු = මිනිසුන් උත්සාහවත් ව වසන කල්හි.

විහරාම අනුස්සුකා = උත්සාහ රහිත ව වසමු.

රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය යන මේය පස් කම්සැප. පස් කම්සැපෙහි හිඳුවූවහුට එහි ගැලුනහුට කෙනෙක් ලදුවත් කිසිදුකත් සෑහීමෙක් නම් නොවන්නේ ය. ඔහු පුන පුනා එය ම සොයන්නේ ය. එහි ම ගැලෙන්නේ ය. අළුත් අළුත් දය පිණි පිණි දය පතන්නේ ය. සොයන්නේ ය. කාමයෙන් ආතුර වූවෝ සිත් ඇති නැති දෑයෙහි පරම දීනයෝ ය. කාමවස්තූන් සෙවීමෙහි උත්සාහී වූයේ තමන් කැමැති දය ලද්දේ සතුටු

වන්නේ ය. නො ලද්දේ තැවෙන්නේ ය. දුක් ඇත්තේ වන්නේ ය. බුදුරජානන් වහන්සේ පස්කම්සැපෙහි බලාපොරොත්තු නැති කළ බැවින් එහි පැතීම මුළුමනින් නැසූ බැවින් පස් කම්සැපෙහි උත්සාහ රහිතයහ. එහෙයින් රාග ද්වෙෂයන්ගෙන් උපදනා කරදර ගැහැට උන්වහන්සේට නැත්තේ ය. මේ නිසා උන්වහන්සේ සුවසේ ජීවත් වන සේකැ යි වදාළ සේක.

නො දහමින් උපදවා ගත් දැයින් දිවි ගලවන ගිහිපැවිදි දෙපසෙහි අය, අපි දිවි ගලවන්නමෝ සුවසේය යි සිතති. කියති. එහෙත් ඒ දිවි ගැලවුමෙහි අනිටු විපාක තමන් කරා කඩා වැටෙනතුරු ඔවුහු එසේ සිතති. කියති. මෙසේ නො දහමින් දිවි යවන්නෝ සැපසේ ජීවත් වන්නෝ නො වෙත්. ප්‍රාණඝාතාදීවූ පංචවිධ වෛර නැති කෙලෙස් ලෙඩින් ආතුර නො වූ පස් කම්සැප සෙවීමෙහි උත්සාහ රහිත වූ අපි ම ඉතා සුවසේ ජීවත් වන්නෙමු යි වදාළසේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන්-පලාදියට පැමිණියාහු ය.

ඥාතිකලහව්‍යපශමන වසතුව නිමි.

මරහු කළ නපුරු වැඩෙක්

15 — 2

එක් දවසක් බුදුරජාණන් වහන්සේ **සඤ්ඤාල** නම් බමුණු ගම් වැසි පත්සියයක් කුලකුමරියනට සෝවන්මග ලැබීමට තුඩු වාසනාගුණය දැක එ බමුණුගම ඇසුරු කොට එහි තැනෙක වැඩහුන් සේක. එ දවස නැකත් දවසෙක් විය. ඒ කුලකුමරියෝ එදා දිය නාන්නට ගඟට ගොස් දිය නා අඛරණ ලා සැරසී ගමට එන්නට නික්ම ගත්හ. බුදුරජාණන් වහන්සේ ද එ ගම් වැද පිඬු සිඟා වැඩිය සේක. පිඬු සිඟා වඩනා බුදුරජුන් දුටු වසවත් මරු බුදුරජුන්ට බත් සැන්දක් පමණකුත් නො ලැබෙන ලෙසට ගම්වැස්සන්ගේ සිරුරෙහි ආවිෂ්ට වූයේය. නැවැත සේදූ පාත්‍රයෙන් යුකතව කිසිත් දුයක් නො ලැබ හිස් පය ගෙණ වඩනා බුදුරජුන් දැක ගම්දෙර සිට "මහණ! කිම බතෙක් ලදදැ?"යි ඇසීය. බුදුරජාණන් වහන්සේ "මාරය! තෝ මට බත් ලැබෙන සැටියක් කෙළෙහි දැ?"යි අසා වදාළවිට, මරු "මොහු බත් පිණිස නැවැත ගම් වද්දවා ගම්වැස්සන්ගේ සිරුරෙහි වැදී මොහුට බත් නො ලැබෙන සැටියක් කොට මොහු ඉදිරියෙහි අප්පුඩි ගසා සිනා කෙළි කරන්නෙමි"යි අදහස් කොට "ස්වාමීනි! නැවැතත් සිඟා වඩිනු මැනැවැ"යි කීයේය. එවේලෙහි ඒ කුලකුමරියෝද ගම් දෙරට පැමිණියාහු බුදුරජුන් දැක වැඳ පසෙකට වී සිටියහ. මරු ද "කොහොම ද, ස්වාමීනි! බත් නො ලබනුයෙහි බඩසාදුකින් පෙළෙහි දැ?"යි ඇසූ කල්හි "මාරය! මම අද කිසිවක් නො ලබනුයෙම් නමුදු ආහාස්වරබ්‍රහමයන් සේ ප්‍රීතිසුඛයෙන් කල් ගෙවන්නෙම්"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං,
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා.

යම් බදු වූ අපට පළිබොධයෙක් නැත්තේ ද (මේ අපි) එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු. ආභාස්වර දෙවියන් මෙන් ප්‍රීතිය ආහාර කොට ඇත්තමෝ වන්නෙමු.

සුසුඛං වත ජීවාම = එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වන්නෙමු.
යෙසං නො නත්ථි කිඤ්චනං = යම් බදු වූ අපට පළිබෝධයෙක් නැත්තේ ද.

රාග දෙෂ මොහයෝ **කිඤ්චන** නම් වෙත්. **"නත්ථි රාගසමා කිඤ්චනා, දෙසසමා කිඤ්චනා, මොහසමා කිඤ්චනා"** යනු දෙශනාය. රූපාදී වූ අරමුණු නිසා සත්ත්වයන් ගේ

සිත්හි උපදනා රාග ද්වේෂ මෝහයන් සසර සත්ත්වයන් බැඳ තබන බැවින් පිළිබඳනා බැවින් රාගාදීක්ලේශයන් ධ්‍යාන විමොක්ෂාදි ගුණයන් වළහාලන බැවින් එ කියූ ගුණයන් ලැබීමට ඉඩ නොතබන බැවින් රාගද්වේෂමෝහ කියනු නමැයි කීහ. මේ අටුවා:- **"රාගෝ උපපජ්ජමානෝ සත්තෙ බන්ධති, පළිබන්ධති, තස්මා කිලෙසනන්ති වුච්චති"** යනු.

පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා = ආභාස්වර දෙවියන් මෙන් ප්‍රීතිය ආහාර කොට ඇත්තමෝ වන්නෙමු.

ආභස්සර නම්: දවිතියධ්‍යානය ප්‍රණීත වශයෙන් වඩා ධ්‍යාන යෙන් නො ද පිරිහී කලුරිය කළවුන් උපදනා බඹලොව ය. **'දුතියං ඣානං පණීතං භාවෙත්වා ආභස්සරානං දේවානං සහව්‍යතං උපපජ්ජති"** යනු දන්නේ ය.

මෙහි මෙසේ උපදනා බ්‍රහ්මයෝ සප්‍රීතික ධ්‍යානානුභාවයෙන් පහළ වූ සකල ඇතියාහු මහාකල්ප අටක් සප්‍රීතිකධ්‍යානසුඛය ආහාර කොට ඇත්තාහු වෙත්. ප්‍රීතිය ම ආහාර කොට වසත්. ඔවුන්ගේ සිරුරෙන් වලාපටලයෙකින් නික්මෙන විදුලිකළඹක් සේ රැස් විහිදෙන බැවින් මේ බඹලොව වැස්සෝ ආභස්සර නම් වෙත්. මොවුන් ගෙණ මුන් උපදනා තැන ආභස්සර යි හඳුන්වන ලද්දේ ය. **"බලාභක්ඛතෝ චිජ්ජු විය ඉතෝ චිතෝච ආභා සරති නිච්ඡරති එතෙසං සයංජිතක්ඛණා කිඤ්චාපි නත්ථි ඔභාසනන්තරන්ති = ආභස්සරා, දණ්ඩදීපිකා අච්චිච්ච එතෙසං සරීරතෝ ආභා ස්සජ්ජන්ති ස්සජ්ජන්ති පතන්ති විය සරති විසරන්තීති = ආභස්සරා"** යනු අටුවා.

පරිත්තාභ - අප්පමාණාභ – ආභස්සර යන මෙ තුන් බිම එක් ම දවිතියධ්‍යාන භූමිය ගි. මුන් හැමගේ සිරුර එක් ම ආලෝක ධාරාවක් සේ ආලෝකයෙන් මුළුමනින් පැතිර ගත්තේය. සංඥව වනාහි අවිතක්කවිචාරමාත්‍ර හෝ අවිතක්කඅවිචාරමාත්‍ර හෝ වේ.

යථා යනු නිපාතයි **යොභාතා-විජ්ජා-පදුජ්ජොතනිවනතා-සාදෘශ්‍ය** යන අරුත්හි වැවේ. මෙහි සාදෘශ්‍යයෙහි සිටියේ ය. ආභාස්වර දෙවියන් මෙනැ යි කියේ එහෙයිනි. ආභාස්වරයන් හා සමානත්වය මෙයින් පැවසේ. **යථාරූපං-යථාඛුඩ්ඩං යථාඝතන්ති** යනු සෙසු අරුත් සඳහා දතයුතු ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ කුලකුමරියෝ පන්සියදෙන සෝවන්පලයෙහි පිහිටියහ.

මාරවඝතුව නිමි.

කොසොල්රජුගේ පරාජය

15 — 3

කොසොල් රජ, කසිරට ගමක් නිසා බුහුනන පුත් අජාසත් රජු හා යුද වැදුනේ තෙවරක් ම පැරද ගියේය. තෙවන වර "මම මෙතෙක් යුද කොටත් කට කිරිගඳ හමන මේ කොලු පරදවා ලන්නට අසමර්ථ වීමි, එහෙයින් මාගේ මේ දිවිවැටුමෙන් ප්‍රයොජනයෙක් නැතැ"යි නොකා නොබී හොත්තේ ය. රජුගේ මේ කැමි පීම් හැර දමා වැතිර හොවීම රට පුරා පැතිර ගියේ ය. එරට වෙහෙර වැසි නිස්සුන් වහන්සේලා මෙපුවත අසා "ස්වාමිනි! කොසොල් රජ කසිරට ගමක් නිසා අජාසත් රජු හා තෙවරක් යුද කොට පැරද තෙවනවර ගෙට වී කට කිරිගඳ හමන මේ කොලුයට කොට ගන්නට මම අපොහොසත් වීමි, මට ජීවිතයෙන් වැඩෙක් නැතැ'යි කියා ගෙණ කැමි පීම් හැරදමා හෝනේය"යි බුදුරජාණන් වහන්සේට සැලකළහ. බුදුරජාණන් වහන්සේ එය අසා "මහණෙනි! දිනන්නේත් අකුසල් රැස් කෙරෙයි, පරා විසින් පරදවන ලදුයේත් දුක සේ හොවීය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතෝ,
උපසන්තෝ සුඛං සෙති හිත්වා ජයපරාජයන්ති.

අනුන් දිනන්නේ වෛර උපදවයි. පරා විසින් පරදවන ලදුයේ දුක සේ හොවියි. දිනුම් පැරදුම් හැර සන්සිදුනේ සුවසේ හොවියි.

ජයං වෙරං පසවති = යුද වැද ජය ගන්නේ, දිනන්නේ, වෛර උපදවයි.

දුක්ඛං සෙති පරාජිතෝ = පරා විසින් පරදවන ලදුයේ දුකසේ හොවියි.

උපසන්තෝ සුඛං සෙති හිත්වා ජයපරාජයං = දිනුම් පැරදුම් හැර සන්සිදුනේ සුවසේ හොවියි.

කෙලෙස් සතුරන් පරදවා ලබන ජය හැර යුද්ධකොලාහලාදියෙන් ලබන ජය, ජයෙක් නොවේ. යුද්ධකොලාහලාදියෙන් ජය ලබන්නට කරණ හැම ප්‍රයොගයෙක් පවි ය. නපුරු ය. එයින් පවි රැස් වන්නේ ය. සතුරෝ ද වන්නාහ. එහි දී පැරද ගියේ ධන හානියෙන් හොගහානියෙන් රාජ්‍යහානියෙන් පිරිහුනේ සතුරාට කිනම් නපුරක් කරම් දැ යි සිතමින් නොකා නොබී සිවු ඉරියව්

වෙහි ම දුකසේ වසන්නේ ය. යමෙක් සිවුමග නුවණින් කෙලෙස් නසා සිටියේ නම් හෙතෙමේ අනුන් පරදවාලන්නට කරණ නපුරු කම් නො කරණ බැවින් තමන් පරදවා ලන කෙලෙසුන් නැසූ බැවින් මුළුමනින් සන්සිඳුනේ දිනුම් පැරදුම් හැර සුවසේ වසන්නේය යනු අදහසි.

ධම්දෙසනාවගේ අවසානයෙහි බොහෝදෙන සෝවත් පලාදියට පැමිණියාහු ය.

කොසලරාජවසතුව නිමි.

කුලදූරියකගේ ආවාහය

15 - 4

එක් කුලදූරියක ආවාහ කොට ගෙණ ඇයගේ මවුපියෝ මගුල් දවසෙහි දැනය පිණිස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළහ. උන්වහන්සේ භික්ෂුසමූහයාත් කැටුව එහි මගුල් ගෙට වැඩම කොට පණවා තුබූ අසුන්හි වැඩහුන් සේක. ඒ කුල කුමරිය ද භික්ෂුසඞ්ඝයා වහන්සේට පැන් පෙරා දීම් ආ කුදු මහත් වතාවත් සොයා බලා කරන්නී දැනශාලාවෙහි තැන තැන හැසුරුණී ය. ඇයගේ සැමිපුත්‍රයා මෙසේ වතාවත් කරමින් හැසුරුණු සිය බිරියගේ "ඇඟපත කදිම ය, මුහුණ පැහැපත්ය, කෙස් වැටිය මොනරපිල් කළඹක් සේ ය, දත් මුතු ඇට වැනිය, පියවුරු නෙරා සිටියේ ය, පා ඉතා යහපත්ය"යි ඒ ඒ අවයව දෙස බලමින් සිතමින් එහි රැඳී සිටියේ ය. මෙසේ බිරියගේ ඒ ඒ අඟපසඟ රාග විසින් බලමින් සිටි ඔහුගේ සිත්තුළ රාගය නැඟී ගත්තේ ය. රාගයෙන් මැඩුනු මෙතෙමේ නුවණින් ගිලිහුනේ බුදුරජුන්ට වේවයි අසූ මහසවිවන්ට වේවයි කිසින් උවැටනක් කිරීමෙහි අපොහොසත් වගියේ අත දිගු කොට බිරිය අල්ලා ගණිම්"යි සිතමින් සිටියේ ය. එවේලෙහි බුදුරජාණන් වහන්සේ ඔහුගේ අදහස් දැන ඔහුට ඒ කුලදූරිය නො පෙණෙන ලෙසක් කළ සේක. එවිට ඔහු සිය බිරිය නො පෙණී ගියෙන් බුදුරජුන් දෙස බලන්නට වන. උන්වහන්සේ තමන් වහන්සේ දෙස බලා සිටි ඔහුට "දරුව! රාගය තරම් ගින්නෙක් දෙෂය තරම් අපරාධයෙක් සඞ්ඛාරපරිහරණය තරම් දුකෙක් නැත්තේ ය, එසේ ම නිවන්සුව තරම් සුවයෙකුත් නැතැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

නත්ථි රාගසමෝ අග්ගි නත්ථි දෝසසමෝ කලි,
නත්ථි ඛන්ධසමා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛන්ති.

රාගය හා සම වූ ගින්නෙක් නැත. දෙෂය හා සම වූ අපරාධයෙක් නැත. සඞ්ඛාර හා සම වූ දුක් නැත. නිවනට වැඩිතරම් වූ සුවයෙක් නැත.

නත්ථි රාගසමෝ අග්ගි = රාගය හා සම වූ ගින්නෙක් නැත.

ඒ ඒ අරමුණුවල රැඳීම්-ඇලීම් අරුතින් එක්වැදුරුම් වූ රාගය භූමිභෙදයෙන් කාමරාග-රූපරාග-අරූපරාග යි තෙවැදුරුම් වේ. එහි වසතුකාමයන්හි රැඳීම් ඇලීම් විසින් උපදනා ඡන්දරාගය කාමරාග නම්. බ්‍රහ්මපාරිෂද්‍යාදී වූ සොළොස් බඹතලයන්හි ඉපැත්මට හෙතුවන ඡන්දරාගය රූපරාග නම්. ආකාසානඤ්චායතනාදී වූ

සිවුවැදැරුම් බඹතලයෙහි ඉපැත්මට හෙතු වන ඡන්දරාගය අරූප-රාග නම්. මෙසේ රාගයෙහි ඉපැත්මට තැන් වූ කරුණු බොහෝ බැවින් ඒ වශයෙන් රාගය අතිවිස්තාරයට ගියේ ද, බුදුරජානන් වහන්සේ, ඒ හැම රාගය යි වදාළ සේක. ඒ මේ රාගය සත්ත්වසන්තා-නය තවන දවන බැවින් අග්ගි යි වදාරණ ලදි. මේ ලක්දිව සිතුල් පවුවෙහෙර පොහෝ ගෙට ගොස් එහි වූ විසිතුරු වූ දෙරටුපල් රුවක් බලමින් සිටි දහර මෙහෙණකගේ සිත්හි රාගය උපන. එය ඉවසා ගත නුහුනු ඕ තොමෝ එයින් ම දැවී කලුරිය කළා ය. **"රාගො උප්පජ්ජමානො සත්තෙ අනුදහති ඣාපෙති තස්මා අග්ගීති වුච්චති"** යනු කීයේ එහෙයිනි.

රාගය, රාගී පුද්ගලයා දවනුයේ දුම් නගා ගිනිසිළු උපදවා අඟුරු දක්වා නො වේ. ඇතුළත සිට ඇතුළත ම දවන්නේ ය. එසේ දුම් ගිනිසිළු අඟුරු නො දක්වා ඇතුළත හට ගෙණ ඇතුළත දවන්නට සමර්ථ වූ අන් ගින්නෙක් කො තැනත් නැත්තේ ය. මේ අටුවා:- **"ධූමං වා ජාලං වා අඞ්ගාරං වා අදස්සෙත්වා අත්තො-යෙව ඣාපෙත්වා භස්මමුට්ඨිං කාතුං සමත්ථො රාගෙන සමො අඤ්ඤො අග්ගි නාම නත්ථි"** යනු.

තවද රාගය පළිබොධයක් බැවින් **කිඤ්චනැ** යි ද තීව්‍රක්ලෙ-ශයක් බැවින් **අඞ්ගනැ** යි ද සත්ත්වසන්තානය කිලිටි කරණ බැවින් **මලැ** යි ද සසුනෙන් හා සුගතියෙන් පැකිළ වැටෙන බැවින් **විසමැ** යි ද අප්‍රණීත බැවින් **කසටැ** යි ද නම් කරණ ලද්දේ ය.

රාග යනු තෘෂ්ණාවෙවචනයක් බැවින් මෙහි **"දුක්ඛසමුප්පාදං"** යන්නට කළ පරිකථාව බලා විස්තර දත යුතුය. **"රාගොති තණ්හාය එතං වෙවචනං"** යනු **යුත්තිභාරවිභඞ්ගයෙහි** කියන ලද්දේ ය. ඒ ඒ වස්තූන් විෂයයෙහි එක් ම තෘෂ්ණාව ඒ ඒ අවස්ථානු රූප ව ක්‍රියාත්මක වන අයුරු දක්වනු පිණිස ඒ ඒ ස්ථලයන්හි බුදුරජානන් වහන්සේ **ආසා - පිහා - රාගො-ජන්දො -පෙමං - පරි දාහො -ඉච්ඡා-සල්ලං-ධූපායනා-සරිතා-විසත්තිකා-සිනෙහො-කිලමථො - ලතා - මඤ්ඤනා - බන්ධො - පිපාසා - නන්දනා - අභිනන්දනා** යනාදි නම් විසින් දක්වා වදාළ සේක. දෙශනා කාල-යෙහි හෝ ඉන් මොබ හෝ කවරක්හට හෝ කෙසේ හෝ ඒ ඒ ධර්මපදයන්ගේ යථාර්ථය ගැන්වීම පිණිස, අන් අරමුණු කරා ගිය සිත් ඇත්තවුනට අන් ක්‍රමයක් ගෙණ අර්ථ ගන්වනු පිණිස, මන්ද-බුද්ධිකයනට පුන පුනා ඒ ඒ අරුත් සලකා ගැණීමෙහි නො මුළා බව පිණිස සමාන ව්‍යඤ්ජන ඇති පදයෝ නන් අරුත්ගෙණ සිටිත්. එහෙයින් එබන්දෙහිලා අන් අරුත් ගැණ යම් යම් පරිකල්පනාවෝ වෙත් ද එය වළකනු පිණිස වෙවචන යෙදූහ.

නත්ථි දොසසමො කලි = දෙවිෂය හා සමාන අපරාධයෙක් නැත.

දොස නම්: තමන් සිත් නො ගත් අරමුණු හා ගැටීමෙන් සිතෙහි උපදනා සැඩගතිය යි

කලි නම්: අපරාධය යි. යමකින් ත්‍රිවර්ගසම්පත්තිය බිඳ වැටේ නම් පිරිහේ නම් ඒය අපරාධ. දෙවිෂය, කලි යි වදාළෝ එහෙයිනි. කලි ශබදය **"විවිනාති මුඛෙන සො කලිං"** යන මෙහි පාපයෙහි ද **උභයත්ථකලිගගාහො"** යන මෙහි පරාජයෙහි ද **"නත්ථි දොසසමො කලි"** යන මෙහි අපරාධයෙහි ද ආයේ ය. තවද **විවාද-සුද්ධ - ශූර - කලිසුග - එළඅත්තන - බදුලුගස - බුළුගස - මල්කැකුළ** යන මෙ ඈ අරුත්හි ද වැටේ.

නත්ථි ඛන්ධසමා දුක්ඛා = සකන්ධ හා සම වූ දුක් නැත.

ඛන්ධ නම්: රූප වෙදනාදීහු ය. නිඤ්ඤ කටයුතු බැවින් හා තුච්ඡ බැවින් සකන්ධ පස දුක් ය. මෙසේ ස්වභාව විසින් ම දුක් වූ ඒ සකන්ධයන්ගේ පරිහරණය බෙහෙවින් ම දුක් ය. සකන්ධපරිහරණය පහසු නැත. නියමිත වේලාවෙහි නැගිටීමෙන් සේදීමෙන් කැවීමෙන් පෙවීමෙන් ඉදීමෙන් සිටීමෙන් නිදීමෙන් සක්මන් කිරීමෙන් උතුගැන්වීමෙන් මැඩීමෙන් නස්‍යයෙන් විරෙකයෙන් තෙල් ගැල්වීමෙන් උණුදියෙන් සිහිල්දියෙන් අව්වෙන් වැස්සෙන් රැකිය යුතු ය. වැඩිය යුතු ය. මේ එකකුත් යථාවිධියෙන් නො වීමෙන් සකන්ධ පස ම එකවිට රොගාතුර වන්නේ ය. සකන්ධ සම වූ දුක් නැතැ යි වදාළෝ එහෙයිනි.

නත්ථි සන්තිපරං සුඛං = නිවනට වැඩිතරම් වූ සැපයෙක් නැත.

දුක් සන්සිඳීමට අරමුණු වන්නේ යමෙක් වේ නම් ඒය ශාන්තිය. දුක් සන්සිඳීමෙන් පසු ජාතිජරාමරණාදී වූ කිසි දුකෙක් නො වන්නේය. මෙයින් භවොත්පත්තිය මුළුමනින් නැසී යන්නීය. එහෙයින් නිවනට වැඩිතරම් වූ සැපයෙක් නැතැ යි වදාළ සේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ කුලදූරිය හා කුලදරු සෝවන්පලයෙහි පිහිටියහ. එකල්හි බුදුරජානන් වහන්සේ උනුන් දක්නා ලෙසට සෘද්ධිය හළ සේක.

අන්‍යතර කුලදාරිකා වස්තුව නිමි.

දුප්පතකු ලද සඞ්ග්‍රහයෙක්

15 — 5

අලව් නුවර එක් දුප්පත් මිනිහෙක් විසී ය. ඔහු සෝවන් වීමෙහි හෙතුසම්පත් ඇතියේ ය. බුදුරජානන් වහන්සේ දවසක් ඉතා අලුයම දෙව්රම් වෙහෙර ගඳකිළියෙහි වැඩහිඳ ලොව බලා වදාළ සේක්, එහිදී මේ දුප්පත් මිනිසා උන්වහන්සේගේ පිවිතුරු නුවණට හසු විය. එකෙණෙහි උන්වහන්සේ පත් සියයක් භික්ෂූන් වහන්සේ ද ගෙණ අලව් නුවරට වැඩියහ. අලව් නුවර වැස්සෝ දන් පිණිස බුදුරජුන්ට ආරාධනා කළහ. ඒ දුප්පත් මිනිසා ද බුදුරජුන් වැඩිය බව අසා උන්වහන්සේ වෙත ගොස් බණ අසමි, යි සිතී ය. එදා ඔහුගේ ගොනෙක් ගාලෙන් පැන ගියේ ය. එවිට ඔහු "කිම, මම ගොනු සොයා යෙම් ද, නැත, බණ අසන්නට යෙම් දැ"යි සිතනුයේ "ගොනු සොයා ගෙණ පසු ව බණ අසන්නට යන්නෙමි"යි අදහස් කොට උදැසනින් ම ගෙන් නික් ම ගොනු සොයා ගියේ ය. අලව් නුවර වැස්සෝ ද බුද්ධ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා වඩා හිඳුවා වළඳවාලා අනුමෙවෙනි බණ අසන්නට ඉඳ ගත්හ.

එකල්හි බුදුරජානන් වහන්සේ "මම යමකු බලා තිස් යොදුන් මග ගෙවා ආයෙම් ද, ඔහු අද ගොනකු සොයා වල් වැදී ඇවිදින්නේ ය, එහෙයින් ඔහු ආ විටක දහම් දෙසන්නෙමි"යි නිහඬ ව වැඩ හුන්හ. ගොන් සොයා ගිය ඒ දුප්පත් මිනිසා ද දහවලින් ම ගොන් සොයා අල්ලා ගෙණ ගාලට යවා "පුදන්නට යමක් නැති නමුත් වැඳීම් පමණකුත් කරන්නෙමි"යි බඩසයින් පෙළී සිටියේ ද බතක් මාළුවක් කන්නට නොසිතා වහා බුදුරජුන් වෙත ගොස් වැඳ එකත් පසෙක්හි සිට ගත. ඔහු එසේ වැඳ සිටි කල්හි එහි වතාවත් කළ එකකු අතින් වළඳ ඉතිරි වූ බතෙක් මාළුවෙක් තිබේ දැ?"යි අසා වදාළ සේක. "ස්වාමීනි! ඇතැ"යි ඔහු කී විට "එසේ නම් මේ දුප්පතාට කන්නට මොකුත් දෙව"යි වදාළාහු ය. වතාවත්කරු බුදුරජුන් නියම කළ තැන ම ඔහු හිඳුවා කැඳබත් ආදිය ඔහුට දුන්නේ ය ඔහු බත් කා අත කට සෝදා ගත්තේ ය. මෙතැන හැර අන් තැනෙක බුදුරජානන් වහන්සේ කළ භත්ත-විචාරණයෙක් ත්‍රිපිටක බුද්ධ වචනයෙහි දක්නට නැත්තේ ය. බත් කා පැන් බී අවසන් කළ ඔහුගේ ඇඟපතෙහි තුබූ රිදුම් පෙළුම් ඈ හැම අපහසු කම් මග හැරී ගොස් සිත ද එකඟ වී ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ ඔහුට අනුපිළිවෙළකතාව වදාරා සිවුසස් දහම් විදහා දැක් වූ සේක. ඔහු ධර්මදෙශනාවසානයෙහි සෝවන්

වී ය. බුදුරජානන් වහන්සේ බණ වදාරා හුනස්නෙන් නැගිට වැඩි-සේක. මහාජන තෙමේ උන්වහන්සේ පසු පස ගොස් නැවතුනේ ය. බුදුරජුන් හා එක්ව ගිය භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි! බුදු රජුන්ගේ මේ ක්‍රියාව බලනු මැනැවි, මෙයට කලින් කිසිදාකත් බුදුරජුන් විසින් බත් පිළිවිසීමෙක් කරණ ලදැයි අප අසා නැත, දැකලාත් නැත, අද එක් දුප්පත් මිනිසකු දැක ඔහුට කැඳබත් ආදිය දෙවූ සේකැ"යි නො සතුටු සිතින් කතා කරන්නට වූහ. බුදුරජානන් වහන්සේ එහි නැවැතුනු සේක් "මහණෙනි! කුමක් කියවු දැ"යි අසා එපුවත දැන "මහණෙනි! ඔවු, මම මේ උපා-සකයාගේ හෙතුසම්පත් දැක තිස් යොදුන් කතර මග ගෙවා ආයෙමි, ඔහු ඉතා තද බඩගින්නෙන් පෙළෙමින් උදැසන සිට ගොන් සොය මින් වෙනෙහි ඇවිද්දේය, බඩසයින් පෙළෙන්නකුට බණ කීමෙන් වැඩෙක් නැත, බඩසයින් පෙළෙන්නේ දහම් දැන උගැන්මෙහි අපොහොසත් ය, ඇස් අඳුරු ය, කන් බිහිරි ය, සිත හා කය ගිලන් ය, එබන්දහුට බණ කීමෙන් වැඩෙක් නො වේ, එහෙයින් මම මෙසේ කෙළෙමි, මහණෙනි, බඩගිනි ලෙඩය තරම් ලෙඩක් මෙලොව කොතැනත් නැතැ"යි වදාරා මේ ධම්දෙශනාව කළ සේක.

ජිඝච්ඡාපරාමා රොගා සඞ්ඛාරපරමා දුඛා,
එතං ඤත්වා යථාභූතං නිබ්බානං පරමං සුඛනති.

රෝගයෝ බඩගින්න ප්‍රධාන කොට ඇත්තාහ. දුඃඛයෝ සංඝකාර ප්‍රධාන කොට ඇත්තාහ. මෙ දෙක තතු සේ දැන (නුවණැත්තේ නිවන් පසක් කෙරෙයි) එහෙයින් නිවන උතුම් වූ සුවයෙකි.

ජිඝච්ඡාපරමා රොගා = රෝගයෝ බඩගින්න ප්‍රධාන කොට සිටිත්.

ජිඝච්ඡා නම්: කනු කැමැත්ත ය. බඩගින්න ය. **"ඝසිතුං ඉච්ඡා = ජිඝච්ඡා"** යනු දන්නේ ය. "ජිඝච්ඡාවට වැඩි තරම් වූ රොගයෙක් සත්ත්වයනට නැතැ"යි වදාළෝ එය මොන ලෙසකිනුත් නැවැත කවදාත් නූපදනා ලෙසට සන්සිඳවාලිය නො හැකි බැවිනි. බඩගිනි උපන් කල්හි එයට පිළියම් පිණිස ගන්නා ආහාරපානයෙන් ඒ ගත් මොහොතෙහි මද අස්වැසිල්ලෙක් ලැබුනේ ද ඇසිල්ලෙකින් එය නැවැතත් හටගන්නේ ය. සත්ත්වයා සසර යම්තාක් කල් උපදි-නම් ඒ තාක් ජිඝච්ඡාසඞ්ඛ්‍යාත වූ මේ බඩගින්න ඔහු පස්සෙහි එළවා යන්නේ ඔහු පෙළන්නේ ය. අන් හැම රෝගයක් සන්-සිඳවාලීමට උපක්‍රම ඇත්තේ නමුදු බඩගින්න නම් සත්ත්වයා සසර උපදනාතුරු නැවැත නූපදනා ලෙසින් සින්සිඳවාලීමට උපක්‍රම-යෙක් නැත්තේ ය. සන්සිඳ වන්නට නම් සත්ත්වයන් කෙලෙසුන්

නසා සකන්ධ බහා තැබිය යුතු ය. එහෙයින් බඩගින්න අන්හැම රොගයනට වඩා මහත් ය, දරුණු ය. දින පතා පෙළන්නේ ය. සත්ත්වයන් විසින් කරණු ලබන සතුන් මැරීම් ඇ බොහෝ පව්කම්-වලට කරුණු ව සිටියා ද ජිඝච්ඡාව ය.

වා – පිත් – සෙම් යන තුන් දොසුන්ගේ විෂමත්වය එකකට අධික ව හෝ ඌන ව නො සම ව පැවැත්ම **රොග** නම්. **"රොගසතු දොෂවෛෂම්‍යම්"** යනු කීයේ එහෙයිනි. තුන් දොසුන්ගේ ඒ නො සම පැවැත්ම සත්ත්වශරීරය පිළිබඳ කුදු මහත් අවයව රුදා කරණ අරුතින් බිඳ හෙළන අරුතින් රොග නම් වී ය. **"රුජ්‍ය-තෙනෙනෙති = රොගඃ, රුජති භඤ්ජති අඞ්ගපච්චඞ්ගානීති = රොගො"** යනු ව්‍යාඛ්‍යා ය.

ජ්වරාදික වූ රෝගයෝ සත්ත්වයනට මහත් සේ දුක් දෙන්-නෝ ය. ඒ මේ රොගයෝ පළමු කොට **ස්වාභාවික – ආගන්තුක – මානසික – කායික** විසින් සිටු වැදැරුම් වෙති යි වාගභටයෝ කීහ. මෙසේය කීයේ:–

"තෙ ච ස්වාභාවිකාඃ කෙචිත් කෙචිදාගන්තවඃ ස්මෘතාඃ,
මානසඃ කෙචිදාඛ්‍යාතාඃ කථිතාඃ කෙචි කායිකාඃ"යි

එහි ක්ෂුතපිපාසාදීහු ස්වාභාවිකයහ. මොවුනට 'සහජ'යි ද නමෙකි. උපතින් ලැබූ අඳබැව් ආදීහු ද මෙහි ම සඞ්ග්‍රහයට යෙත්. ගැටීම් තැළීම් හෙතුවෙන් හටගන්නා රොගයෝ ආගන්තුකයහ. උපතින් පසු හට ගන්නා විවිධරොග ආගන්තුක නම්. කාමක්‍රොධලොභ මොහාදීහු මානසිකයහ. උන්මාද අපස්මාරාදිරොග ද මෙහි ම ඇතුළත් වේ. පාණ්ඩුරොගාදීහු කායිකයහ.

කර්මජ – දොෂජ – කර්මදොෂජ යි තුණට බෙදීමෙක් ද මෙහි ඇත්තේ ය. ඒ මෙසේ කීහ:

"කර්මජාඃ කථිතාඃ කෙචිද්දොෂජාඃ සන්ති චාපරෙ,
කර්මදොෂොද්භවාශවාන්‍යෙ ව්‍යධයස්ත්‍රිවිධාඃ ස්මෘතාඃ"යි

එහි පෙර කළ කර්මයන්ගේ විපාක විසින් හටගන්නෝ කර්මජයෝ ය. පිළියමින් සන්සිඳවාලිය නො හැක්කෝ ය. රොගයට හෙතු වූ කර්මය ගෙවී ගිය කල්හි එහි ඵලය වූ රොගය ද සන්සිඳෙන්නේය. කර්මය පවත්නාතුරු රොගය ද පවත්නේ ය. **"න ශමං යාන්ති යෙ රොගාඃ තෙ ඥෙයාඃ කර්මජා බුධෛඃ"** යනු විසින් කීයේ ඒ වග ය. දොෂජ නම්: මිත්‍ථ්‍යාහාර විහරණයන් නිසා කිපුනු වා –

පිත් – සෙම් යන තුන් දොසුන් නිසා හට ගත්තේ ය. **"මිත්‍ථ්‍යාහාර විහාර ප්‍රකුපිත වාත පිත්තකඵජාඃ"** යන මෙයින් එය කියා පෑහ. කර්මශක්තිය උඩ දොස් කිපීමෙන් හටගන්නෝ කර්මජදොෂජයෝ ය.

මෙසේ වෙදපොතෙහි ඉතා සැකෙවින් සිවු වැදැරුම් විසින් හා තෙවැදැරුම් විසින් බෙදා වෙන් කළ රොග බණපොතෙහි **පිත්තසමුට්ඨාන – සෙම්හසමුට්ඨාන – වාතසමුට්ඨාන – සන්නිපාතික – උතුපරිණාමජ – විසමපරිහාරජ – ඔපක්කමික – කම්මවිපාකජ** යි අටවැදැරුම් කොට දක්වන ලද්දේ ය.

එහි වෙදපොතෙහි සිවුවැදැරුම් කොට බෙදීමෙහි දී දක් වූ ස්වාභාවික රොගයෝ, තෙවැදැරුම් කොට බෙදීමෙහි කියූ කර්මජ රොගයන්හි ඇතුළත් වන්නෝ බණපොතෙහි කියූ කම්මවිපාකජ රොග හා ද එක් වෙත්. සිවුවැදැරුම් විසින් බෙදීමෙහි කියූ කායික රොගයෝ තෙ වැදැරුම් බෙදීමෙහි එන දොෂජරොගයන්හි හා බණපොතෙහි එන පිත්ත සමුට්ඨාන – සෙම්හ සමුට්ඨාන – වාත-සමුට්ඨාන-සන්නිපාතික-උතුපරිණාමජ-විසමපරිහාරජ රොගයන්හි ඇතුළත් වෙත්. සිවුවැදැරුම් බෙදීමෙහි ලා කියූ ආගන්තුක රොගයෝ බණපොතෙහි කියූ ඔපක්කමිකයෙහි ඇතුළත් වෙත්.

පිත් හෙතුවෙන් සෙම් හෙතුවෙන් වා හෙතුවෙන් වෙන් වෙන් ව හටගන්නා රොග පිත්තසමුට්ඨාන-සෙම්හසමුට්ඨාන වාත-සමුට්ඨානැ යි ගැණෙන අතර පිත් සෙම් වා එක්වට කිපී හටගන්නා රොග සන්නිපාතිකැ යි ගැණේ. උතුපෙරළියෙන් හටගන්නා රොග උතුපරිණාමජ නම්. තමන්ගේ සැහැවි හැසිරීමට පටහැනි ලෙසින් කෑම් බීම් ඉඳුම් හිටුම් ගමන් බිමන් බර ඉසිලීම් නිසා හටගන්නා රොග විසමපරිහාරජ නම්. වද බැඳුම් ඈ පරා විසින් කළ උපක්‍රම යන්ගෙන් හටගන්නා රොග ඔපක්කමික නම්. පෙර කළ කර්ම-යන්ගේ විපාක වශයෙන් හටගන්නා රොග කම්මවිපාකජ නම්. බඩ ගින්න ද කම්මවිපාකජරොගයෙකි. ජිඝච්ඡාසඞ්ඛ්‍යාත වූ බඩගින්න පොතපතෙහි කම්මජතෙජොධාතු–පාකජතෙජොධාතු යන නම් ද ලබයි. මේ අටුවා:- **"පිත්තපච්චයා පිත්තහෙතුකා පිත්තසමුට්ඨානා. සෙම්හසමුට්ඨානාදිසුපි එසෙව නයො. සන්නිපාතිකාති තිණ්ණම්පි පිත්තාදීනං කොපෙන සමුට්ඨිතා. උතුපරිණාමජාති උතුපරිණතෙන අච්චුණ්හාතිසීතෙන උප්පජ්ජනකරොගා. විසමපරිහාරජාති අත්තනො පකතිචරියානං විසමං අධිට්ඨාන-නිසජ්ජනභාරවහනාදිනා කායස්ස පරිහරණෙන ජාතා. ඔපක්කමිකාති වධබන්ධනාදිනා පරස්ස උපක්කමෙන ජාතා. කම්මවිපාකජාති, විනාපි ඉමෙහි කාරණෙහි කෙවලං පුබ්බෙ කතකම්ම විපාකවසෙනෙව ජාතා"** යනු.

මෙහි මුලින් දැක් වූ පිත් සෙම් වා යනාදී වූ කරුණු සතින් උපන් රොගයන් යම් යම් උපක්‍රමශක්තීන්ගෙන් සන්සිඳවාලීමට හැකි වුවද කර්ම විපාක විසින් උපන් රොගයන් සන්සිඳවාලීමට කිසි ද උපක්‍රමයෙක් නැත්තේය. ඒ සඳහා බෙහෙත් නැත. පිරිත් නැත. මේ අටුවා:- **"තත්ථ හි පුරිමෙහි සත්තහි කාරණෙහි උප්පන්නං සක්කා පටිබාහිතුං. කම්මවිපාකජාතං පන සබ්බ භෙසජ්ජානිපි සබ්බපරිත්තානිපි නාලං පටිසාතාය"** යනු.

සඞ්ඛාරපරමා දුඛා = දුඃඛයෝ සංස්කාර ප්‍රධාන කොට ඇත්තාහ.

නාම-රූපධර්මයෝ **සංස්කාර** නම්. එව්හු කර්ම-චිත්ත-ඍතු-ආහාර යන චතුර්විධ ප්‍රත්‍යය බලයෙන් උපන්නෝ ය. අනිත්‍යයහ. හැම මොහොතෙහි වෙනස් වන්නෝ ය. එහෙයින් පරිහරණය නො කට හැකිය. එහෙයින් දුක් වෙත්.

එතං ඤත්වා යථාභූතං= මෙදෙක තත්වූ පරිදි දැන (නුවණැත්තෝ නිවන් පසක් කෙරෙත්)

"සාදුක් සම වූ රොගයෙක් නැත, සක්ඛ්‍යපරිහරණය තරම් වූ අන් දුකෙක් නැත" යන මේ දෙ කරුණ ඇති සැටියෙන් නුවණින් දැන නිවන් පසක් කරන්නෝ ය.

නිබ්බානං පරමං සුඛං = නිවන උතුම් සැපය යි.

සක්ඛ්‍යපරිහරණය යි කියූ දුක් කිසිත් නැති බැවින් සදා-කාලික වූ නො වෙනස් වන සුලු නො ද පෙරළෙන සුලු නිවන උතුම් වූ සැපය යි. දතයුතුය.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

අන්‍යතර උපාසක වස්තුව නිමි.

---

1. 14. 6. 'දුක්ඛස්ස ච අනිකකමං' යනු බලනු.

කොසොල් රජ සුවපත් වූ සැටි

15 — 6

කොසොල් රජ තෙමේ බොහෝ බත් අනුභව කරන්නේය. මූල් අවදියෙහි මගධ නැළියෙන් සොළොස් නැළියක බත් හා එය අනුභව කරන්නට තරම් වූ මස් මාළු ද අනුභව කෙළේ ය. රජ දවසක් පෙරවරුයෙහි මෙසේ බත් අනුභව කොට බත්මත සත්-සිදෙන්නට පෙරාතුව ම බුදුරජුන් වෙත ගොස් සුසුම් ලමින් බඹ ගන්නට නොහැකිව කෙඳිරිගාමින් එහා මෙහා හැරෙමින් නිදි බරින් මැඩුනේ ඉඳුරා නොනිදා එකත්පස්ව හුන්නේ ය. මෙසේ මහත් වෙහෙසට පත්ව හුන් කොසොල් රජුන් දුටු බුදුරජාණන් වහන්සේ "ඇයි මහරජ! විඩාවට පත් වූවහු?"සි අසා වදාළ කල්හි "සවාමීනි! ආහාර ගත් වේලෙහි සිට අමාරුයි, හුස්ම ගැණීමටත් නොහැකියි, බඹ උසුලා සිටීම ද පහසු නැතැ"සි කීය. "ඔවු, මහරජ! බඹ තුබුනට උගුරතෙක් බත් කෑම දුකට කරුණුය"සි වදාරා බුදුරජාණන් වහන්සේ නැවැත මෙසේ ද වදාළ සේක:—

"නො දූන බඹ තරමත් — උගුර තෙක් බත් බුදිනේ,
සිරුරෙත් හිලත් බැව් පත් — සුසුම් හෙලුමෙහි අසමත්,

එක්ලෙස නිදිනු බැරි — ඔබමොබ පෙරැළි තතනා,
හිඳිනා හිතර හෝනා — උඟරු බොජුනෙන් තර වූ,

කදඹඹිනි උඟරකු — වැනි ව වැඩුනු අදබල්,
පුන පුනා මවුගැබට ම — එන්නේ උපත් විසිනි"

යනු විසින් මෙසේ අවවාද කොට "මහරජ! ආහාරානුභවය පමණ දූන කළ යුතුය, පමණ දූන කරණ ආහාරානුභවය සැපයට කරුණුය"සි

"ලද බොජුන් මත් දූන — බුදින සිහියැති එ පුරිස්,
වෙසින් තුනු වී යනුයේ — ආ රුක දිරා සනිකව"

යන මෙය වදාළ සේක. රජ තෙමේ මෙය උගන්නට අසමත් ව වෙත සිටි බැනතු වූ **සුදස්සන** මාණවකයාහට "එය උගණුව"සි කීය. ඔහු එය උගෙණ "සවාමීනි! මෙහිලා කුමක් කරම් ද?"සි බුදුරජුන් විවාළේය. එවිට උන්වහන්සේ "රජු බත් අනුභව කොට අවසන් කරණ වේලෙහි අවසන් බත් පිඬ කට තබත් ම තා දූන් උගත් ඔය ගය කියව, එවිට රජු එහි අරුත් වටහා ගෙණ අතට ගත් බත්පිඬ හැරලන්නේය, හැර දැමූ ඒ බත් පිඬෙහි බත්උළු

ගණන් කොට රජුට බත් පිසන කල්හි ඒ බත්උළු ගණනින් සහල් ඇට ඉවත් කොට බත් පිස දෙව''යි වදාළ සේක. ඔහු ''ස්වාමීනි! යහපතැ''යි සවස හා දවල රජු බත් බුදින වේලෙහි එතැන සිට අවසන් බත්පිඩ කට තබත් ම තමන් උගත් ඒ ගය කියන්නේ ය. රජ තෙමේ කටට ගත් බත්පිඩ හැර දමා එයට කන් දී සිට බෑනනුහට දහසක් දෙවී ය. මෙය අසා පිළිවෙළින් බොහෝ කොට කෑම හැරදැමූ රජ තෙමේ පමණ දැන නැළියක පමණ බතින් යැපෙන්නට වන. රජතෙමේ සැහැල්ලු සිරුරු ඇතියේ සුවපත් වූයේ ය. දවසක් බුදුරජුන් වෙත ගොස් වැඳ ''ස්වාමීනි! මට දැන් හොඳ සනීප තිබේ, දුවන මුවන් අසුන් පස්සේ ගොස් උන් අල්ලා ගන්නට තරම් සිරුරෙහි හයිබල ඇත්තේ ය, පසුගිය දා බෑනා සමග ගමක් නිසා යුද වැදුනෙම් ද, දැන් මම ඒ ගම නහනසුණු වියදම් පිණිස දායාද කොට දී මාගේ දූ වූ **වජිරාවත්** ඔහුට දුනිමි, දැන් බෑනා හා යුද වැදීමෙක් ද නැත, යුද වැදුම ද නතර වී ය, මෙයින් මට වූයේ සැපයෙක, කුස රජුගේ කාලයට අයත් අප රජගෙයි තුබූ අගනා මිණිරුවන නැතුව ගොස් තිබුනේ ද, එය දැන් නැවැත මා අතට ආයේ ය, එය ද මට මහත් සැනසුමෙක, ඔබවහන්සේගේ ශ්‍රාවකයන් හා තද සම්බන්ධය කැමැත්තා වූ මා විසින් ඔබ වහන්සේගේ නෑ දුවක් මාගේ මාලිගායෙහි අගමෙහෙසිය කරණ ලද ය, මෙ ද මට මහත් සැපයෙකැ''යි රජ තෙමේ කියා සිටියේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ ''මහරජ! සියලු ලැබීම්වලට වඩා උතුම් ම ලැබීම ලෙඩ නැති බව ය, එයට ඉහලින් ලැබීමෙක් නැත, එසේ ම ලද දෙයින් සතුටුවීම තරම් ධනයෙක් ද නැත, විශ්වාසය තරම් නෑයෙක් ද නැත, නිවන තරම් සැපයෙක් ද නැතැ''යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨිපරමං ධනං,
විස්සාසපරමා ඤාති නිබ්බානං පරමං සුඛන්ති.

ලාභයෝ නිරොගිභාවය ප්‍රධාන කොට ඇත්තාහ. ධනය සන්තොෂය ප්‍රධාන කොට සිටියේ ය. නෑයෝ විශ්වාසය ප්‍රධාන කොට ඇත්තාහ. නිවන උතුම් සැපය යි.

ආරොග්‍යපරමා ලාභා = ලාභයෝ නිරෝගීභාවය ප්‍රධාන කොට සිටියහ.

ආරොග්‍ය නම්: වා – පිත් – සෙම් යන තිදෙනාගේ සමව පැවැත් ම ය. **''දොෂශාම්‍යවරොගතා''** යනු එහිලා ගන්නේ ය. **ලාභ** නම්, පැවිද්දන්ගේ වශයෙන් සිවුරු – පිඬුපා – සෙනසුන් – බෙහෙත්

පිරිකර ලැබීම ය. ගිහින්ගේ වශයෙන් වතුපිටි – ගේදෙර – මිල මුදල් – මුතුමැණික් – ඇඳුම් කැඩුම් – දූ පුතුන් – හිත මිතුරන් ලැබීම ය. මේ හැම ලැබීමකට වඩා ගිහි පැවිදි දෙපසට ම නීරොගී භාවය උතුම් ය. ප්‍රධාන ය. රොගීහු විසින් මේ කියූ මොන දැයෙක් ලද ද, ඔහුට එයින් ප්‍රයෝජනයෙක් නැත්තේ ය. මේ කියූ ලාභයෝ නිරෝගීන් විසින් ලද්දේ ද ඒ ලාභයෝ වැඩියක් මෙලොව හිතයෙහි ම නතුව සිටිත්. මොවුහු පරලොව හිත-යෙහි ද මදක් හිතව නො සිටින්නෝ නො වෙත්.

පැවිද්දෙක් පැවිදිදිවියට හිත වූ සිවුපසය නො ලබා නම් ඔහුට ඒ පැවිදිදිවිය නිවරද ව ගෙණ යා නො හැකි ය. පැවිද්ද පරලොව හිතයෙහි වැටෙන්නට නම් පැවිද්දහු විසින් සිවුපසය දැහැමිව ලැබිය යුතු ය. සිවුපසය දැහැමිව ලදුයේ ද පැවිද්දා ලෙඩ රොගයන්ගෙන් පෙළේ නම් ඔහුට ඒ පිණිස වූ සිල් පිරීම් වතා වත් කිරීම් කමටහන් වැඩීම් ආදී වූ සම්‍යක් ප්‍රතිපත්තියෙහි යෙදෙන්නට පිළිවන්කමෙක් නැත්තේ ය. රොග නැති පැවිද්දා ම ඒ හැමතැන සමර්ථ වන්නේ ය. එහෙයින් අන් හැම ලැබීමකට වඩා නිරොගීභාවය ලැබීම උතුම්ය යි වදාළ සේක. ගිහින් විසින් ලබන ලාභයෙහි ද මෙසේ දතයුතු ය. පැවිද්දාට සේ ම ගිහියාටද අන් හැම ලාභයකට වඩා නිරොගී භාවය ම උතුම් ය.

සන්තුට්ඨිපරමං ධනං = ධනය සන්තොෂය ප්‍රධාන කොට සිටියේය.

"ගිහිනො වා පබ්බජිතස්ස වා යං අත්තනා ලද්ධං යං අත්තනො සන්තකං තෙනෙව තුස්සනභාවො සන්තුට්ඨි නාම"යි කියූ බැවින් ගිහියක්හුගේ හෝ පැවිද්දක්හුගේ හෝ තමන් ලැබූ තමන් සතු වූ යම් ධනයෙක් වේ නම් එයින් සතුටු වීම **සන්තුට්ඨි** නමැයි දත යුතුය. තමන් ලැබූ තමන් සතු වූ ධනයෙන් සතුටු වන්නහුට ගැහැටක් නපුරක් ගැරහුමක් පසු තැවිල්ලක් නොවන බැවින් තමන් ලද ධනයෙන් සතුටුවීම උතුම් ධනය යි වදාළ සේක. ඒ ඒ දැයෙහි තද ආශා ඇත්තහුට කොතෙක් ලදුවත් සෑහීමෙක් නැත්තේ ය. එය ම ඔහුට මහත් දුකෙක් වන්නේ ය. ඔහු කරා එන ගැරහුම් ගැහැට විපත් ද මහත් ය.[1] ධනය කිමැයි කියන ලද්දේ ය.[2]

විස්සාසපරමා ඤාති = නෑයෝ විශ්වාසය ප්‍රධාන කොට සිටියහ.

---

1. 5. 2. 'නත්ථි බාලෙ සහායතා' යනු බලනු.
2. 2. 4. 'ධනං සෙට්ඨිව රක්ඛති' ,, ,,

"මාතා වා හොතු පිතා වා කෙන සද්ධිං විස්සාසෝ නත්ථි යෙන අඤ්ඤාතකෙන පන සද්ධිං විස්සාසෝ අත්ථි සෝ අසම්බන්ධොපි පරමෝ උත්තමෝ සුහී" යනු අටුවා බැවින් මවු හෝ වේවයි පියා හෝ වේවයි නැදිමයිල් ආදී වූ අන් නැයෙක් හෝ වේවයි ඔවුන් සමග හිත විශ්වාසයෙක් නැත්තේ නම් එකඟ බවෙක් නැත්තේ නම් ඔවුහු කිසි කෙනෙක් නෑ නොවෙති. නොනැයකු සමග හිත විශ්වාසයෙක් වේ නම් ඔහු නොනෑ වුව ද නැයෙක් ම ය. නොනැයන් හා වූ ඒ හිතසම්බන්ධය උතුම් නැයා යි දත යුතු ය.

හිතවත්කම එකඟබව ඇදහිම සැක නොකිරීම **විශ්වාසය** යි. මිනිසුන්ගේ අදහස් අප්‍රකට බැවින් ගහන බැවින් විෂම බැවින් නෑ හෝ නොනෑ හෝ වේවා ඇතැමුන් කෙරෙහි තබන විශ්වාසය තමාට විපත් පිණිස ද වන්නේ ය. එහෙයින් මිනිසුන් අතුරෙහි විශ්වාසයකු ලැබීම පහසු නොවේ. සත්ඵල දෙනුයේ අව්‍යාජ විශ්වාසය යි. මෙහි කියන ලද්දේ ඒ ය. නැයාන් අව්‍යාජ විශ්වාසය ඇත්තේ ම ය.

විශ්වාසය නොතැබිය යුතු තැන් සතරෙක් අපගේ පොත පතෙහි එන්නේ ය. සොරු "පෙර මාගේ යහළු"යි විශ්වාස නොකට යුතු ය. තමා අතුට හුන් කොළ "මා පෙර වැළඳ හුන් කොළැ"යි විශ්වාස නොකට යුතු ය. රජ "මා පුදැ"යි විශ්වාස නොකට යුතු ය. ගැහණිය "මට වසඟැ"යි විශ්වාස නොකට යුතු ය. මේ ඒ තැන් සතර ය.
මෙහිලා මෙ ද දන්නේ ය.

"ලොභප්‍රමාදවිශ්වාසෛඃ පුරුෂෝ නාශ්‍යති ත්‍රිභිඃ,
තස්මා ලෙලාහෝ න කර්තව්‍යඃ ප්‍රමාදෙ න නවිශ්වසෙත්"

ලොභය-ප්‍රමාදය-විශ්වාසය යන තුණින් මිනිසා නැසේ. එහෙයින් ලොභය නොකට යුතු ය. පමා නොවිය යුතු ය. නොසුදුසු තැන විශ්වාසය නොතැබිය යුතු ය.

"නවිශ්වසෙදවිශ්වසෙතා විශ්වසෙතා නාතිවිශ්වසෙත්,
විශ්වාසාද්භයමුත්පන්නං මූලාන්‍යපි නිකෘන්තති"

තමන් කෙරෙහි නියම විසින් නොතැබූ විශ්වාස ඇතියන් කෙරෙහි විශ්වාසය නොතැබිය යුතු ය. තැබූ විශ්වාසය ඇතියන් කෙරෙහි පමණ ඉක්මවා විශ්වාසය නොතැබිය යුතු ය. විශ්වාස හෙතුවෙන් උපන් භය මුල් සිඳලත්නේ ය.

"න විශ්වාසං විනා ශත්‍රැදේවානාමපි සිද්ධ්‍යති,
විශ්වාසාත්ත්‍රිදශෙන්ද්‍රෙණ දිතෙර්ගර්භෝ විදාරිතඃ"

විශ්වාසයෙන් තොර ව දෙවියනට ද සතුරා යටතට ගත නො හැකිය. විශ්වාස හෙතුවෙන් සක්දෙවිඳුන් විසින් අසුර මවගේ දරුගැබ නසන ලදැ යි ගෙතුනේ ද විශ්වාසයෙහි තරම කියා පාන්නට ය.

ව්‍යාජවිශ්වාසය විපතටත් අව්‍යාජවිශ්වාසය සැපතටත් කරුණු බව මේ කියුම්වලින් දත හැකි ය.

නිබ්බානං පරමං සුඛං=නිවන උතුම් සැපය යි.[1]

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

ප්‍රසෙනජිත් කොසලරාජ වසතුව නිමි.

1. 14. 6 'දුක්ඛස්ය ච අතික්කමං' යනු බලනු.

තිස්ස ස්ථවිරයන් වහන්සේ.

15 — 7

දිනක් සම්මා සම්බුදුරජානන් වහන්සේ "මහණෙනි! මම මෙයින් සාර මසක් ගිය තැන පිරිනිවන් පාන්නෙමි" යි වදාළ කල්හි බුදුරජුන් වෙත හුන් පන්සියයක් පමණ වූ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා තැති ගත්හ. රහතුන් වහන්සේට ධර්ම-සංවෙගය උපන. පෘථග්ජන භික්ෂූන් වහන්සේලා කඳුලු දරා ගැන්මෙහි අපොහොසත් වූහ. තැන තැන කැටි කැටි ව කුමක් කරමු දැ,යි කතා කරමින් ඔබමොබ හැසිරෙන්නට වූහ. උන් අතුරෙහි සිටි තිස්ස ස්ථවිර තෙමේ "බුදුරජානන් වහන්සේ සාර මසක් ගිය තැන පිරිනිවන් පානා සේක් ල, මම ද පහ නො කළ රාග ඇතියෙම් මි, එහෙයින් බුදුරජුන් වැඩ හින්ද දී ම රහත් වන්නට ඕනෑ"යයි සිවු ඉරියව්වෙහි ම එකලාව විසී ය. අන් මහණුන් වෙත යෑමෙක් හෝ අන් කෙනකුන් හා කථා සල්ලාපයෙක් හෝ නො වී ය. එකල්හි එහි විසූ මහණෝ "ඇවැත්නි! තිස්ස! කුමක් නිසා මෙසේ කරහු දැ?"යි ඔහුගෙන් ඇසූහ. ස්ථවිර තෙමේ ද ඔවුන්ගේ ඒ කතාව නො ඇසුනකු සේ නිහඬව හුන්නේ ය. භික්ෂූහු තිස්ස තෙරුන්ගේ ඒ පැවැත්ම බුදු රජුන්ට සැලකොට "ස්වාමීනි! තිස්ස ස්ථවිර තෙමේ බුදුරජුන් කෙරෙහි සනා නැතියේ ය"යි දැන්වූහ. බුදුරජානන් වහන්සේ තිස්ස තෙරුන් කැඳවා "තිස්ස! කුමක් නිසා තමුසේ මෙසේ කරහු?"යි අසා, ඔහු තම අදහස දන්වා සිටි කල්හි "හරි, තිස්ස! තමුසේගේ අදහස් මනා"යි සාධුකාර දී "මහණෙනි! යමෙක් මා කෙරෙහි සනා ඇතියේ නම්, ඔහු තිස්ස වැනි විය යුතුය, ගඳින් මලින් කැවිලියෙන් පෙවිලියෙන් පුදන්නේ මා පුදන්නෝ නම් නො වෙති, ධර්මානුධර්මයෙහි පිළිපදින්නෝ ම මා පුදන්නෝය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබන්නි.

ප්‍රකර්ෂවිවෙකරසය ද නිර්වාණරසය ද පානය කොට ධර්මප්‍රීතිරසය බොන්නේ පීඩාරහිතයෙක් පව් නැතියෙක් වේ.

පවිවෙකරසං පීත්වා = ප්‍රකර්ෂවිවෙකරසය ද පානය කොට.

මෙහි කාය-චිත්ත විවෙකයෙන් උපන් රසය ප්‍රකර්ෂවිවෙක රසය යි. විවෙකය කියන ලද්දේය.[1] **"පවිවෙකතො උප්පන්නරසං එකීභාව සුඛන්ති අත්ථො"** යනු අටුවා විසින් ප්‍රකර්ෂවිවෙකයෙන් උපන් රසය, එකඟ බව පිළිබඳ සැපය යි ගතයුතුය.

1. 5. 13. 'විවෙකමනුබ්‍රෑහයෙ' යනු බලනු.

විවෙකය, කාය චිත්ත-උපධි විසින් තෙපරිදි බැවින් මෙහි රස ශබ්දය හා එක් වූ පවිවෙක ශබ්දයෙන් **ධම්මපදඨකථාව** අනුව තෙපරිදි වූ ම විවෙකය ගතයුතු සේ පෙණුන ද, මෙහි කාය-චිත්ත විවෙකය ම ගත යුතුය. **සුත්තනිපාතයෙහි** හිරිසූත්‍රයෙහි එන මේ ගාථායෙහි **'පවිවෙකරසං'** යනු **''පවිවෙකෝති කිලෙස-විවෙකතෝ ඤාතත්තා අඟඵලං වුච්චති තස්ස රසෝති අස්සා-දනට්ඨෙන තං සම්පයුත්තං සුඛං''**යි එම අර්ථකථායෙහි දක්වන ලද්දේ ය මේ අනුව ප්‍රකෘතිවිවෙකය නම්: උපධිවිවෙකය යි. එහෙත් එකලාව ම උපධිවිවෙකයෙහි හෙන උපසම ශබ්දයක් ඉදිරියෙහි ඇති බැවින් එ ද නො යෙදෙන්නේ ය.

ධම්මපදපුරාණසන්නයෙහි 'පවිවෙකරසං' යන්නට කාය – චිත්ත විවෙකයෙන් උපන් සුඛසෝමනස්ස යි අරුත් කියා **'රසං උපසමස්ස ච'** යන්නට කෙලෙස ව්‍යුපශමය යි කියන ලද නිර්‍වාණයා ගේ රසය යි අරුත් කිහ. ඒ ගතයුතු සේ පෙණේ.

රසං උපසමස්ස ච=කෙලෙසව්‍යුපශමය යි කියන ලද නිවන් රසය ද පානය කොට.

මෙයින් උපධිවිවෙක සඞ්ඛ්‍යාත නිර්‍වාණ රසය ගැණේ. එ ද ''විවෙකමනුබ්‍රූහයෙ'' යන්නෙහි ලා කියන ලදි.

පීතිා යනු සාමාන්‍ය විසින් යම් කිසි පියයුත්තක් පානය කොට, බීලා, යන අරුත් දෙන්නේ ය. ඒ අරුත්හිය මෙය, වඩා ප්‍රසිද්ධ ව සිටියේ. එහෙත් මෙහි ඒ යෙදුනේ එසේ මුඛයට ගෙණ කරණ බීමක් දක්වනු සඳහා නො වේ. කාය-චිත්ත විවෙකයෙන් හට ගන්නා එකීභාවරසයත් කෙලෙසුන්ගේ සන්සිඳීමට අරමුණු වන නිර්‍වාණරසයත් අරමුණු කිරීමෙන් හා ප්‍රත්‍යක්ෂ කිරීමෙන් විඳ, ලබා යන අරුත් දෙනු පිණිස ය. **''පීතිානි දුක්ඛපරිඤ්ඤාදිනි සරොතෙනා ආරම්මණතෝ සච්ඡිකිරියවසෙන පීතිා''** යි එහිලා අටුවායෙහි ඉතා සැකෙවින් කියන ලදි.

නිද්දරෝ හොති නිප්පාපෝ ධම්මපීතිරසං පිබං=නවලොකොත්තර ධර්‍ම වශයෙන් උපන් ප්‍රීතිරසය බොන්නේ පීඩා රහිතයෙක් පව් නැතියෙක් වේ.

විවෙකී ව හිඳ සිත එකඟ බවට පමුණුවා පංචස්කන්ධය, නාම – රූපාදීන්ගේ වශයෙන් බෙදා, ඒ හැම එකක් අනිච්චානුපස්සනා – දුක්ඛානුපස්සනා – අනත්තානුපස්සනාදීන්ගේ වශයෙන් සිහියට නගාගෙණ පංචස්කන්ධයාගේ ඉපැත්මට මූලික හෙතුව වූ තෘෂ්ණාව නිවන අරමුණු කොට ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්‍ගයෙන් නසා සිටි

රහත් මහණ තෙමේ රාගදෙෂමොහාදී වූ දරථ නැත්තේ එසින් ම පව් නැත්තේ නවලොකොත්තරධම් විසින් උපන් ප්‍රීතිරසය වළඳන්නේ ය.

නිද්දරෝ යනු **නි**+**දර** ශබ්ද දෙක එක් ම අරුතෙක්හි සහයොගයට ගියේ එක් ම අරුතක් කියන්නේ ය. **'නි'** ශබ්දය පාලියෙහි නිස්සයාදී වූ අර්ථ රාශියෙක හෙන්නේ ය. දර ශබ්දය හා යෙදී සිටියේ උපරතියෙහි ය. උපරති නම්: වැලකීම ය. වෙන් වීම ය. **නි** ශබ්දය හා එකයොග වූ **දර** ශබ්දය, එකලාව කාය දරථ=චිත්තදරථ-කිලෙස දරථයන්හි වැටේ. **දර-දරථ** ශබ්ද දෙක එක් ම අරුත් ඇතියේ ය. මෙ දෙකින් ම කියවෙනුයේ දැවීම ය.

"ආදිත්තං වත මං සන්තං සත්තහිත්තං ච සාවකං
වාචිනා චිය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං"

යන මෙහි කාය චිත්තදරථයෙහි ආයේ ය. **"චිත්තදරෝ චික-ඝොකෝ චිකඝලෙලා සයං අභිඤ්ඤාය අභාසි බුදෙධා"** යන මෙහි ආයේ කිලෙස දරථයෙහි ය. **නිද්දර** යන්නෙහි වූ **දර** යනු කාය-චිත්ත-කිලෙස යන තෙවැදෑරුම් දරථයෙහි ම වැටේ. කාය-විවෙකයෙන් කායදරථය, චිත්තවිවෙකයෙන් චිත්තදරථය, උපධි විවෙකයෙන් කෙලඝදරථය යන දරථයන්ගෙන් වෙන් ව සිටියේ දරථයන් වළකා සිටියේ කියනු ලැබේ. **'නිස්සාපෝ'** යනුත් මෙසේ දන්නේ ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි නිස්ස ස්ථවිර තෙමේ රහත් බවට පැමිණියේ ය. ධම්දෙශනා තොමෝ මහාජනයාට වැඩ සහිත වූය.

අනාකරණිකසුවණ්ණවණ්ණුවණ්ණා නිමි.

සක්දෙවිඳුන් කළ උපස්ථානය

15 — 8

ආයුසංස්කාරය හැර සිටි තථාගතයන් වහන්සේට ලොහිත-පක්ඛන්දිකා නම් වූ රක්තාතිසාරරොගය හට ගත්තේ ය. සක්-දෙවිඳු එබව දැන "මා බුදුරජානන් වහන්සේ වෙත ගොස් උන්-වහන්සේට ගිලන් උවැටම් කළ යුතුය"යි සිතා තුන් ගවු පමණ වූ අත්බව හැරපියා බුදුරජුන් වෙත එළැඹැ සියතින් උන්වහන්සේගේ සිරිපා පිරිමදින්නට වන. එකල්හි බුදුරජානන් වහන්සේ "මාගේ පා පිරිමදින්නේ කවරෙක් දැ?"යි අසා වදාළ සේක. "ස්වාමීනි! මම සක්දෙවිඳු"යි පිළිතුරු දුන්නේ ය. "ආයේ කිමැ?"යි විචාළ විට "ගිලන් වූ බුදුරජානන් වහන්සේට උවැටන් කිරීමටැ"යි කීය. "දෙව්රජතුමනි! දෙවියන්ට මිනිසුන්ගේ ගඳ යොදුන් සියයක පටන් ගෙල බැඳි කුණපයක් සේ දැනෙන්නේ ය, එහෙයින් ඔබ යන්න, මට උවැටනට භික්ෂූහු වෙති"යි වදාළ කල්හි "ස්වාමීනි! මම මෙතැනින් යොදුන් අසූසාරදහසකින් ඈත සිටියෙම් බුදු-රජානන් වහන්සේගේ සිල්සුවඳ අසා ආයෙම් මම ම උවැටන් කරමි"යි බුදුරජුන් මලමූ වදාරණ බඳුන අනෙකක්හට අත තබන්නට ද නො දී සිත් ගත් සුවඳ පිරූ බඳුනක් හිස තබා ගත්තා සේ හිස තබා ගෙණ බැහැර ලන්නේ මුව හැකිළීම් පමණකුත් නො කෙළේ ය.

මෙසේ සක්දෙවිඳු බුදුරජුන්ට උවැටන් කරණුයේ රොගය සන්සිඳී ගිය පසු පෙරළා දෙව්ලොවට ගියේ ය. "අහෝ! පුදුමයි සක්දෙවිඳු බුදුරජුන් කෙරෙහි දැක් වූ ලෙන්ගතුකම, ඔහු මහත් දිවසැපත් හැරදමා මූණ හැකිළීම් පමණකුත් නො කොට සුවඳ බඳුනක් ගෙණ යන්නකු සේ බුදුරජුන් මලමූ පහ කළ බඳුන හිස උඩ තබා ගෙණ බැහැරලමින් උවැටන් කෙරේය"යි භික්ෂූන් වහන්සේලා කතා කරන්නට වූහ. එකල්හි බුදුරජානන් වහන්සේ එය අසා "මහණෙනි! සක්දෙවිඳු මා කෙරෙහි යම් ලෙන්ගතු කමක් දක්වා ද, එය පුදුම වියයුත්තෙක් නො වේ, මේ සක්දෙවි මා නිසා මහලුබව හැරපියා සොතාපන්න ව සසරදුක් ද කෙළවර කොට තරුණබවට පැමිණ දිගා ඇත්තෙක් වී ය, මහණෙනි! මරණබියෙන් බිය පත් ව වෙව්ල වෙව්ලා පඤ්චසිඛ නම් ගන්ධර්ව පුත්‍රයා පෙරටු කොට බොහෝ දෙවියන් පිරිවරා ගෙණ ඉන්ද්‍රශාලා ගුහාවට පැමිණිවිට මොහුට මම දෙව්පිරිස් මැද,

"සක්දෙව්! තා සිතින් - පැණක් යම්කිසි මාගෙන්,
පුළුවුස්නට කැමැත්තෙහි - පුළුවුස එයට කල් දැන්.

ඒ ඒ හැම පැණක් - නො තබා කිසිත් අඩුවක්,
යතරුන ලෙසින් මම තට - විසඳම් කරම් කෙළවර.''

යි මෙසේ කියා ඔහුගේ දුක් දුරු කරමින් දහම් දෙසිම්, දම් දෙසුම් අවසන්හි තුදුස් කෙළක් සත්ත්වයන්ට ධර්මාවබෝධ වී ය, සක්-දෙව් ද හුන් පරිදිම හුන්නේ සෝවන්ඵලයට පැමිණියේ තරුණ ද වී ය, මෙසේ මම ඔහුට බොහෝ උපකාර ඇත්තෙම් වීම්, එහෙයින් මා කෙරෙහි මොහු දක්වන ලෙන්ගතුකම පුදුම වීමට කරුණෙක් නො වේ, මහණෙනි! බුද්ධාදි ආර්‍යයන්ගේ දැකීම් පමණකුත් සැපයට කරුණු ය, ඔවුන් හා එක් තැන්හි විසීම ද සැප ය, කිසිත් දහමක් නො දත් පින් පව් නො හඳුනන අසත්පුරුෂයන් හා එක්ව විසීම දුක්ය''යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

සාධු දස්සනමරියානං සන්නිවාසෝ සදා සුඛෝ,
අදස්සනෙන බාලානං නිච්චමේව සුඛී සියා.

බාලසඞ්ගතචාරීහි දිසමද්ධාන සෝචති,
දුක්ඛෝ බාලෙහි සංවාසෝ අමිත්තෙනෙව සබ්බදා,
ධීරෝ ච සුඛසංවාසෝ ඤාතීනංව සමාගමෝ.

තස්මා හි ධීරං ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච,
ධෝරයහසීලං වතවන්තමාරියං,
තං තාදිසං සප්පුරිසං සුමේධං,
භජේථ නක්ඛත්තපථංව චන්දිමා.

ආර්‍යයන්ගේ දැක්ම මැනැවි. ඔවුන් හා එක්ව විසීම හැම කල්හි සැප ය. අඥයන්ගේ නො දැක්ම හේතුකොට සතතයෙන් ම සුව ඇත්තේ වන්නේ ය.

ඒ එසේ ම ය. බාලයන් හා එක්ව හැසිරෙණ සුලු වූයේ දීර්ඝ කාලයක් ශොක කරයි. බාලයන් හා එක්ව විසීම සතුරකු හා එක්ව විසීම මෙන් හැම කල්හි දුක් වේ. නුවණැත්තේ වනාහි නැයන්ගේ එක්වීමක් මෙන් සැප වූ සහවාසය ඇත්තේ ය.

එහෙයින් ධෘතිසම්පන්න වූ ද ප්‍රඥාවත් වූ ද බහුශ්‍රැත වූ ද ප්‍රතිපත්තිධුරය උසුලන සුලු වූ ද ව්‍රත ඇත්තා වූ ද ශ්‍රේෂ්ඨ වූ ද සුන්දර ප්‍රඥ ඇති එබදු වූ ඒ සත්පුරුෂයා අහස සෙවුනා වූ චන්ද්‍රයා මෙන් සෙවනය කරන්නේ ය.

සාධු දස්සනං අරියානං = ආර්‍යයන්ගේ දැක්ම මනා ය. යහපත් ය.

සාධු යන මෙහි **ධ** කාරයට **හ** කාරයවීමෙන් **සාහු** යනු සිද්ධ ය. නාම-නිපාත විසින් දෙ පරිදි ය. නාම විසින් ගැණෙනුයේ වාච්‍යලිඞ්ගික ය. **සුන්දර-දළහිකමී-යාචන-සම්පච්ඡන-සජ්ජන-සංපහංසා** යන අරුත්හි එයි. නිපාත විසින් ගැණෙනුයේ පිළිගැන්මෙහි ය. එය සාධු-සාහු යි දෙපරිදි ව භාෂායෙහි යෙදී සිටියේ ය. මෙහි යෙදුනේ ලිඞ්ග විසින් නපුංසක වූ විභක්ති විසින් ප්‍රථමා වූ වචන විසින් එකවචන වූ සාධු රූපය යි. ආර්‍යයන්ගේ දැක්ම මනා ය, යහපත් ය, සුන්දරය යි කියනුයේ එහෙයිනි.

දැක්ම **දස්සන** නම්. **"තම්පනෙතං චක්ඛුදස්සනං ඤාණදස්සනන්ති දුව්ඛං"** යි කියූ බැවින් ඒ වනාහි චක්ඛුදස්සන-ඤාණදස්සන යි දෙ පරිදි ය. පහන් වූ ඇසින් ආර්‍යයන්ගේ දැක්ම චක්ඛුදස්සන නම. මගපල ලබා සිටි පුද්ගලයාගේ ආර්‍යභාවය සිද්ධ කරණ ධර්මයන් දැක්ම, විදර්ශනා මාර්ගඵලයන් කරණ කොට ආර්‍යභාවයාගේ ලැබීම, ආර්‍යභාවයට පැමිණි පුද්ගලයන් පිළිබඳ ආර්‍යභාවය දැක්ම ඤාණදස්සන නමැ යි දතයුතු ය. මෙය ආර්‍යයන් පිළිබඳ ය. **"යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤාසම්පන්නා විමුත්තිසම්පන්නා විමුත්තිඤාණදස්සනසම්පන්නා දස්සනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහූපකාරං වදාමි. තං කිස්ස හෙතු? තථාරූපානං භික්ඛවෙ භික්ඛූනං දස්සනතො අපරිපූරො සීලක්ඛන්ධො භාවනා පාරිපූරිං ගච්ඡති. අපරිපූරොපි සමාධික්ඛන්ධො-පෙ-අපරිපූරොපි පඤ්ඤාක්ඛන්ධො-පෙ-අපරිපූරොපි විමුත්තික්ඛන්ධො-පෙ-අපරිපූරොපි විමුත්තිඤාණදස්සනක්ඛන්ධො භාවනා පාරිපූරිං ගච්ඡති"** යි වදාළ මේ දෙශනායෙන් ආර්‍යයන්ගේ දැක්මෙහි අනුසස් මැනවින් පැහැදිලි වන්නේ ය. ශීල-සමාධි-ප්‍රඥා-විමුක්ති-විමුක්තිඥාන දර්ශනයන්ගෙන් පිරිපුන් භික්ෂූන් දැකීමෙන්, දක්නහුගේ පිරිපුන් නො වූ ශීලසමාධ්‍යාදිගුණයෝ වැඩීමෙන් පිරිපුන් බවට යන්නාහ, යනු මෙහි ඉතා කෙටි අරුත ය. කොටින් කියයුත්තේ ශීලසමාධ්‍යාදිගුණයන්ගෙන් හෙබි භික්ෂූන්ගේ දර්ශන මාත්‍රය ම දක්නහුට සසර දුක් ගෙවා නිවත් ලැබීමට කරුණු වන බව ය.

ලෞකික විසින් පිය ඇසින් දැකීම බැලීම මුල් කොට සිටි පිණෙන් නොයෙක් සිය දහස් ගණන් ජාතීන්හි ඇසෙහි රොගයෙක් හෝ දොෂයෙක් හෝ වණයෙක් හෝ පිළිකාවක් හෝ නො හටගන්නේ ය. දෙ ඇස වෙසෙසින් පහන් වූයේ පස්වණක් පැහැයෙන් පැහැපත් වූයේ රුවන්විමනෙක විවෘත කොට තැබූ මිණිකවුළු වැනි වන්නේ ය. එසේ ම කප් සිය දහසක් පමණ

දෙව් මිනිස් සැප විඳින්නේ ය. මේ මෙසේ දැක් වූහ: **"එවං දස්සනමුලකෙනාපි හි පුඤ්ඤෙන අනෙකජාතිසහස්සානි චක්ඛුම්හි රොගො වා දොසො වා උස්සදා වා පිළිකා වා න හොන්ති. විප්පසන්නානි පංචවණ්ණසස්සිරිකානි හොන්ති චක්ඛුනි රතනවිමානෙ උග්ඝාටිතමණ්ඩිකවාටසදිසානි. සත-සහස්සකප්පමත්තං දෙවෙසු ච මනුස්සෙසු ච සබ්බසම්පත්තීනං ලාභී හොති"** යි. ආර්‍යදර්ශනයෙහි ඵලලාභය මෙසේ බැවින් ආර්‍යයන්ගේ දැක්ම මනාය යි වදාළ සේක.[1]

සන්නිවාසො සදා සුඛො = එක් ව විසීම හැම කල්හි සැප වේ.

දර්ශනමාත්‍රයට ද වඩා මහත් ඵලයක් ආර්‍යයන් හා එක්ව විසීමෙන් ලැබෙන බැවින් හැම කල්හි ආර්‍යයන් හා එක්ව විසීම සැපය යි වදාළ සේක. දර්ශනමාත්‍රයෙන් ශීලසමාධ්‍යාදියෙන් වැඩෙන්නේ නම් නිතර එක්ව විසීමෙන් එකී ගුණයන්ගෙන් වැඩෙන්නේ ය යනු කියයුතු නො වේ. එයට වඩා හැම අතකින් වැඩෙන්නේ ය. එ ලොව මෙ ලොව දෙක්හි නිතර සුව එළවන්නේ ය. දර්ශනයෙහිලා කියූ කතා මෙහි ද ගත යුත්තී ය. මෙසේ ම ආර්‍යයන්ගේ සෙවන භජන පයිරුපාසනයෝ ද සත්ත්වයනට හිත සුව එළවන්නෝ ය.

අදස්සනෙන බාලානං නිච්චං එව සුඛී සියා = ආඥානයන් ගේ නො දැක්ම හේතුකොට සතතයෙන් ම සුව ඇත්තේ වන්නේ ය.

මෙතැන අඥානයන්ගේ අදර්ශනය පමණක් වදාළ නමුදු ඔවුන්ගේ අසෙවන අභජන අපයිරුපාසන ද ගන්නේ ය.[2]

දෙලෝ වැඩ නො දත් දවරු දෙක්හි පව්කම්හි යෙදී ගත්තා වූ පන්සිල් පමණකුත් නැති හළ වැර ඇති මිනිසුන්ගේ නො දැක්ම නො සෙවුම හෙතු කොට මිනිස් තෙමේ සියලු කල්හි සුව ඇත්තේ වන්නේ ය. ආර්‍යයන්ගේ දර්ශනය, ආර්‍යයන් හා එක්ව විසීම, අඥානයන්ගේ අදර්ශනය යන මෙතුන ලෞකික-ලොකොත්තර සුඛ ලාභයට මහත් ප්‍රතිෂ්ඨා යි මෙයින් වදාළ සේක. **හලිද්දිරාග – මහිලාමුඛ – ගිරිදත්ත – සුතසොම – අකිත්තිපණ්ඩිත ජාතක** හා **සමුද්දවාණිජවත්ථු – දෙවදත්තවත්ථු – විඛ්‍යන්තකභික්ඛුවත්ථු** ආදිය බැලිය යුතු ය.

බාලසඞ්ගතචාරිහි දීඝං අද්ධානං සොචති = බාලයන් හා එක්ව හැසිරෙණ සුලු පුද්ගල තෙමේ දීර්ඝකාලයක් ශොක කරන්නේ ය.

1. 2 1. 'අරියාතං ගොචරෙරතා' යනු බලනු.
2. 5. 1. 'දීඝො බාලානං සංසංරො' ,, ,,

පව්කම් කරණ ආඥානයන් හා සමග එක්ව හැසිරෙණ උන්ගේ බස් පිළිගෙණ වැඩ කරණ තැනැත්තේ "එව, අප හා එක් ව සතුන් මරමු, හොරකම් කරමු, මත්පැන් බොමු, දූ කෙළිමු, ගම් ගෙවල් පැහැර ගණිමු, හොඳට කන බොන අඳිනවුන්ට පහර දෙමු, පරඹුවන් ගණිමු, උගතුන්ට ගරහමු, ගුණවතුන්ට නිගාකරමු, එසේ කළ කල්හි අපට තැනෙක් ලැබෙන්නේ ය, අපට ගෙවලට වී හොඳින් කා බී ජීවත් විය හැකිය"යි කියනු ලබන්නේ උන් හා එක් සිත්ව නන්වැදැරුම් පව්කම් කරණුයේ මෙලොව ම අත්පා සිදීම් හිරගෙවල වැටීම් ගෙල වැල ලෑම් ආදියට පැමිණ දරුණු දුක් විඳිනුයේ මරණින් මතු අපාදුකට ද වැටී අතිදීඝීකාලයක් දුකින් කල් ගෙවනුයේ ශොක කරන්නේ ය. **"යො බාලසහායො යෙන 'එහි සත්ත්වේජදාදීනි කරොමා'ති වුච්චමානො තෙන සද්ධිං එකච්ඡන්දො හුත්වා තානි කරොන්තො හත්ථච්ඡේදාදීනි පත්වා දීඝමද්ධානං සොචති"** යනු අටුවා.

දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙන ඉව සබ්බදා = බාලයන් හා එක්ව විසීම සතුරකු හා එක් ව විසීම මෙන් සියලු කල්හි දුක් වේ.

කඩු ගත් අත් ඇති සතුරකු සමග විසීම මෙන් ද ඝොර වූ දරුණු විෂ ඇති සර්පයන් සමග විසීම මෙන් ද දවරු සියලු කල්හි පව්කම් කරණ අඥානයන් හා එක්ව විසීම දුක් වන්නේ ය. **"යථා අසිහත්ථෙන වා අමිත්තෙන ආසිවිසාදීහි වා සද්ධිං එකතො වාසො නාම නිච්චදුක්ඛො, තථෙව බාලෙහි සද්ධිනති"** යනු අටුවා.

ධීරො ච සුඛසංවාසො ඤාතීනං ඉව සමාගමො = නුවණැත්තේ වනාහි නෑයන්ගේ එක්වීමක් මෙන් සැප වූ සහවාස ඇත්තේ ය.

යුතු අයුතුකම්හි පින්පව්හි වරදනිවරදෙහි ඈ සැම තැන්හි මනාදැනුම් ඇති නුවණැත්තන් හා එක් තැන්හි විසීම ප්‍රියඥාතීන් හා එක් ව විසීම මෙන් සැප වන්නේ ය. නුවණැත්තන් හා එක්ව විසීම සැප ය. **"යථාපි ඤාතීනං සමාගමො සුඛො, එවං පණ්ඩිතෙන වාසො සුඛො"** යනු අටුවා.

තස්මා හි = එහෙයින්.

බාලයන් හා එක්ව විසීම දුක් එළවන බැවින් හා නුවණැතියන් හා එක්ව විසීම සුව එළවන බැවින් හා. **"යස්මා බාලෙන සද්ධිං සංවාසො දුක්ඛො, පණ්ඩිතෙන සද්ධිං සුඛො තස්මා"** යනු අටුවා.

ධිරං ච = අධීතධර්මශාස්ත්‍රඥාන ඇත්තා වූ ද.[1]

පඤ්ඤං ච = ලෞකිකලොකොත්තර ප්‍රඥා ඇත්තා වූ ද.[2]

බහුස්සුතං ච = බහුශ්‍රැත වූ ද. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තාවූ ද.

බහුස්සුත නම්: බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ය. **"බහුං සුතං අස්සාති බහුස්සුතො"** යි එය විදැහි ය. මෙතෙමේ පළමු කොට **අනගාරියබහුස්සුත, අගාරියබහුස්සුත** යි දෙපරිදි වේ. එහි අනගාරියබහුස්සුත, මුල මැද අග යහපත් වූ සිවු සීවටත් ඇ ඉතා ගැඹුරු දහම් පිළිබඳ අරුත් කියා ලන්නා වූ දශවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ සියල්ලෙන් පිරිපුන් කොතැනකත් අඩුබවක් නැති මුළුමනින් පිරිසිදු වූ බඹසර පවසන්නා වූ නවාඞ්ග ශාස්තෘ ශාසනය, පාලි අනුසන්ධි පූර්වාපර විසින් ඇසූයේ ය. උගත්තේ ය. ඒ අසන ලද්ද උගත්නා ලද්ද දරා සිටියේ ය. අසන ලද්ද උගත්නා ලද්ද දස - විසි අවුරුද්දක් නො හදාළ නමුදු ගලෙහි කෙටූ ඉරක් සේ රන් බඳුනෙක ලූ සිංහ තෙලක් සේ හෘදයමඤ්ජුසායෙහි රැස් කොට තැබූයේ ය. ඒ මේ ශාස්තෘ-ශාසනය, සූත්‍රදශක - වර්ගදශක - පණ්ණාසදශක විසින් වචනයෙන් පුරුදු කොට සිටියේ ය. සිතින් විමසා සිටියේ ය. අරුත් විසින් කරුණු විසින් මනා කොට දැන සිටියේ ය. නවාඞ්ග ශාස්තෘ-ශාසනය, සුත නම් වූයේ සසරදුකින් මිදෙනු කැමැත්තන් විසින් ඇසිය යුතු බැවිනි.

පරියත්තිබහුස්සුත - පටිවෙධ බහුස්සුතැ යි බෙදෙන තන්හි පරියත්තිබහුස්සුතැ යි පෙණී සිටියේ මේ අනගාරියබහුස්සුත තෙමේ ය. **"අනගාරියොව තිසු පිටකෙසු අත්ථතො නිච්චලො පරියත්තිබහුස්සුතො"** යනු අටුවා.

පරියත්තිබහුස්සුත තෙමේ වනාහි, **නිස්සයමුච්චනක - පරිසූපට්ඨාපක - භික්ඛුනොවාදක - සබ්බත්ථකබහුස්සුතැ** යි හෙද විසින් සිවුවැදැරුම් වේ.

එහි **නිස්සයමුච්චනක** නම්: උපසපන් වූ තැන් පටන් නිස සමාදන් ව මනා පැවැත්මෙන් ගුරුන් සිත් ගෙණ සිට එයින් මුක්ත ව ආචාර්‍යොපාද්ධ්‍යායයන්ගෙන් වෙන් ව විසීමෙහි සමර්ථ වූයේ ය. නවක භික්ෂූන් වහන්සේ උපසම්පත්තියෙහි පටන් පස් වසක් ගෙවී යනතුරු ගුරුන් ඇසුරෙහි විසිය යුතු ය. ඒ කාලයෙහි ඔහු විසින් යටත් පිරිසෙයින් උභය මාතෘකාවන් වාවොදගත කොට සතර බණවර උගත යුතු ය. වෙත පැමිණියවුනට දම් දෙසනු පිණිස අත්ධකවිත්ධ - මහා රාහුලොවාද - අම්බට්ඨ සූත්‍රාදිය වැනි වූ

1. 2. 1. 'ඵුසන්තිධීරා නිබ්බානං' යනු බලනු

2 2 5 'පඤ්ඤාපාසාදමාරුය්හ' ,, ,,

එක් කථාමාගීයෙක් ද සඟබත්හි හා මඟුල් අවමඟුල්හි අනුමොදනා පිණිස ත්‍රිවිධ අනුමොදනා ද පොහෝ පවුරුණු දැනීම පිණිස පරිවාරයෙහි එන කර්මාකර්මවිනිශ්චය ද මහණදම් කරණු පිණිස ශමථ විසින් හෝ විදර්ශනා විසින් හෝ රහත්මග දක්වා එක් කර්මස්ථානයෙක් දැ යි මෙතෙක් බණදහම් උගත යුතුය. මෙතෙ-කින් මෙතෙමේ නිස්සයමුච්චනකබහුස්සුතැ යි කියනු ලැබේ.

පරිසූපට්ඨාපක නම්: සිය පිරිස් ලවා උවැටන් කරවා ගන්නේ ය. පරිසූපට්ඨාපක බහුස්සුතයකු වීම පිණිස මහණහු උපසම්පත්තියෙන් දස වස් පිරී සිටියකු විය යුතුය. සිය පිරිස් විනයයෙහිලා හික්ම වන්නට ඔහු විසින් උභය විභඞ්ගය වාචොද්ගත කොට කර්මාකර්මවිනිශ්චය හා කඳුවත් ද උගත යුත්තේ ය. ඔහු මජ්ඣිමභාණක නම්, මූලපණ්ණාසකය, දීඝභාණක නම් මහාවර්ගය, සංයුත්තභාණක නම්, සගාථක – නිදාන – ඛන්ධක වර්ග හෝ එහි මහාවර්ගය, අඞ්ගුත්තරභාණක නම්, අඞ්ගුත්තරයෙහි අඩක් හෝ එකක – දුකනිපාත දෙක, ජාතකභාණක නම් අර්ථකථාසහිතජාතකපාලිය උගත යුතු ය. යමක්හු විසින් අර්ථකථා සහිත වූ විනයපිටකය හා අභිධර්මපිටකය ප්‍රගුණ කරණ ලදුයේ ද සූත්‍රපිටකයෙහි කියූ කොටස් ප්‍රගුණ නො කරණ ලද්දේ නම්, ඔහු පරිසූපට්ඨාපකයකු වීමට නො සුදුසු ය. සූත්‍ර පිටක – විනයපිටක දෙකින් උගත යුතුය යි මෙහි දැක් වූ දහම් කොටස් උගෙණ සිටියේ ම පරිසූපට්ඨාපකබහුස්සුත නම් වේ.

භික්ඛුනොවාදක නම්: උපසම්පත්තියෙන් විසිවයස් ඉක්මවා සිටි අටුවා සහිත තුන් පිටකය උගත්තේ ය. භික්ඛුනොවාදකයකු වීමට යටත් පිරිසයින් අටුවා සහිත එක් නිකායයක් හෝ උගත යුතු ය. එක් නිකායයක් පමණකුත් මැනැවින් උගත් කල්හි ඉතිරි නිකායයන්හි ද එන ප්‍රශ්න විසඳලීමෙහි පොහොසත් වන්නේ ය. අභිධර්මපිටකයෙහි සප්තප්‍රකරණ අතුරෙහි ප්‍රකරණ සතරක් අර්ථකථා සහිත ව උගත්තේ ඒ නයයෙහි පිහිටා සෙසු ප්‍රකරණ යන්හි එන ප්‍රශ්න ද විසඳන්නට සමර්ථ වන්නේ ය. විනයපිටකය නොයෙක් අරුත් ඇත්තේ නොයෙක් කරුණු ඇත්තේ ය. එහෙයින් මොහු විනයපිටකය අර්ථකථා සහිතව ප්‍රගුණ කළ යුතු ය. මෙපමණකින් මෙතෙමේ භික්ඛුනොවාදකබහුස්සුත වේ.

සබ්බස්ථකබහුස්සුත නම්: ආනන්ද ස්ථවිරයන් වහන්සේ වැනි ත්‍රිපිටකධර තෙමේ ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ වනාහි, තමන් වහන්සේගේ හැම ධර්මයෙක පැතිර ගත් සර්වසම්පූර්ණ වූ බහුශ්‍රැතභාවය කරණ කොට මේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන්

වහන්සේ අතුරෙහි අග්‍රස්ථානය ලැබූ සේක. භාග්‍යවතුන් වහන්සේ දවසෙක භික්ෂූන් අමතා "මහණෙනි! ආනන්ද තෙමේ බහුශ්‍රැත ය, පණ්ඩිත ය, ව්‍යක්ත ය, විශාරද ය, සප්‍රානෝචිත ප්‍රඥ ඇතියේ ය, සඛණ්ඩ ධාතු ආයතනාදියෙහි දක්ෂ ය, තථාගතයන් දැක්ම පිණිස මහණුන්ට මෙහෙණන්ට උවසුවන්ට උවැසියන්ට රජුන්ට ඇමැතියන්ට බමුණන්ට ගැහැවියන්ට තොටුවන්ට තොටුසවිවන්ට එළැඹීමට මේ කලැ යි දන්නේ ය" යන ආ ලෙසින් සූත්‍රතිමුඛයෙන් දක්වා වදාළ සේක. මේ ශාසනයෙහි බහුශ්‍රැතභික්ෂූහු වූවාහු නමුත් ඒ කිසි කෙනෙක් ආනන්ද ස්ථවිරයන් වහන්සේට බහුශ්‍රැත භාවයෙන් ලං නො වූහ. ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේ "ආනන්ද ස්ථවිර තෙමේ නවාඞ්ගශාස්තෘශාසනය දරන්නේ ය, ඇසූ පරිදි අන්හට කියන්නේ ය, කියවන්නේ ය, හදාරන්නේ ය, විතකන්නේ ය, ත්‍රිපිටකධරභික්ෂූන් වෙත නිතර එළැඹ විචාරන්නේ ය, අර්ථයෙහි පාළියෙහි නිරුක්තියෙහි ව්‍යඤ්ජනයෙහි අර්ථපූර්ණපරයෙහි ධර්මපූර්ණපරයෙහි පදපූර්ණපරයෙහි අක්ෂර පූර්ණපරයෙහි අනුසන්ධි පූර්ණපරයෙහි දක්ෂ ය, විචක්ෂණ ය" යි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ බහුශ්‍රැතභාවය කියා පෑහ. මෙසේ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ බහුශ්‍රැතභාවය වැනි බහුශ්‍රැත භාවය ඇත්තේ **සබ්බන්තකබහුස්සුතැ** යි දත යුතු ය

පටිසම්භිදාබහුස්සුත නම්: චතුස්සත්‍යාවබෝධය කොට සිටියේ ය. හේ චතුර්විධ මාර්ගඥානප්‍රතිලාභ විසින් සිවු වැදෑරුම් ය. චතුර්විධමාර්ගඥානය හා මාර්ගඥාන විසින් සත්‍යාවබෝධය ලබන සැටි පෙර කියන ලද්දේ ය. ඒ එනයින් දත යුතුය. මෙතෙමේ මාර්ගඵලවිද්‍යාභිඥවන්ගේ ප්‍රතිවේධ විසින් ද ව්‍යවස්ථා කරණ ලද්දේ ය. **"සෝ මග්ගඵලවිජ්ජා භිඤ්ඤාණානං පටිවේධතෝ ච පටිවේධබහුස්සුතෝති වවත්ථිතෝ"** යනු ටීකා ය.

මෙහි මෙතෙක් ඉතා සැකෙවින් කියූ නිස්සයමුච්චනකාදී වූ බහුශ්‍රැතයෝ අනගාරිය පක්ෂයෙහි වැටෙති. එහිදු ප්‍රධාන වනුයේ අර්හත්මාර්ගඥානයෙන් චතුස්සත්‍යාවබෝධය කොට කෘතකෘත්‍ය ව සිටි මහාක්ෂීණාශ්‍රව තෙමේ ය. මේ ගාථායෙහි දක්වන ලද්දේ ද මෙතෙමේ ය.

අගාරියබහුස්සුත නම්: නිරවද්‍ය ධර්මශාස්ත්‍ර උගත්තේ ය. එහි කෙළ පැමිණියේ ය. සෙනකපණ්ඩිතාදීන් වැන්නේ ය. චතුස්සත්‍යාවබෝධයට හිත වූ ධර්මශාස්ත්‍ර දතුයේ ය. සත්‍යාවබෝධයට කරුණු නො වූ එයට ප්‍රතිපක්ෂ ව සිටි ධර්මශාස්ත්‍රයන්ගේ

බහුශ්‍රැතභාවයෙන් බහුශ්‍රැත වූවහු තමාට හා අන්හට අවැඩ පිණිසම සිටුනා බැවින් මෙහිලා බහුශ්‍රැත නො වේ. මේ මෙහි නො නගියි.

ධොරයහසීලං = ප්‍රතිපත්තිධුරය උසුලන සුලු.

සරණසීලසමාදානයෙන් උපාසකභාවයට පැමිණියහු විසින් එතැන් සිට, නැත, සරණසීලයෙහි පටන් ගොත්‍රභූඥාන ප්‍රතිලාභය තෙක් සම්පූර්ණ කළ යුතු වූ වැඩිය යුතු වූ පිළිපැදිය යුතු වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙහි ලා සඞ්ගෘහිත වූ ශීල සමාධි ප්‍රඥා යි කියූ පිළිවෙත් සමූහය මෙහි ධුරා යි වදාරණ ලද්දේ ය. ශමථ - විදර්ශනා විසින් ද මේ එන්නේ ය. ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ග විසින් හෝ ශීල සමාධි ප්‍රඥා විසින් හෝ ශමථ - විදර්ශනා විසින් හෝ ගැණෙන මේ පිළිවෙත් සමූහය නවලොකොත්තරධර්මයට අනුව වැටෙන බැවින් ධම්මානුධම්මපටිපදා යි ද, සුදුසු ව වැටෙන බැවින් සාමීචිපටිපදා යි ද, පෙරාතුව පිළිපැදිය යුතු බැවින් පුබ්බභාගපටිපදා යි ද, නො කඩ කොට මැනැවින් පිළිපැදිය යුතු බැවින් සම්මාපටිපදා යි ද, ශාසනයෙහි දක්වන ලද්දේ ය. **"ධම්මානුධම්මපටිපදා නාම නවවිධස්ස ලොකුත්තරධම්මස්ස අනුධම්මභූතා පුබ්බභාගපටිපදා, සා අත්ථතො සීලආචාර පඤ්ඤත්තිධුතඞ්ගසමාදානෙන යාව ගොත්‍රභූනො සම්මා-පටිපදා ව. සා යෙව අනුච්ඡවිකත්තා සාමීචිති වුච්චති"** යනු අටුවා.[1]

මෙහි ධොරයහසීල නම් වූයේ මෙ කියූ ප්‍රතිපත්තිධුරය උසු-ලන සැහැවි ඇත්තේ ය. එ මතු ද, මෙ තෙමේ ම ය ධම්මානුධම්ම පටිපන්න. සාමීපටිපන්න. සම්මාපටිපන්න. අනුධම්මචාරී. **"තං යො පටිපජ්ජති චරති පූජේති යො ධම්මානුධම්මපටිපන්නො සාමීචි-පටිපන්නො සම්මාපටිපන්නො අනුධම්මචාරීති වුච්චති"** යනු අටුවා.

වතවන්තං = ව්‍රත ඇත්තා වූ.

සීලසමාදානයෙන් හා ධුතඞ්ගසමාදානයෙන් යුක්ත වූයේ **'වත-වන්තු'** නම්. එහි දෙවන විබතෙහි එක බසෙහි **'වතවන්තං'** යි සිද්ධ ය. **"සීලවතෙන ච ධුතඞ්ගවතෙන ච වතවන්තං"** යනු අටුවා.[2]

---

1. 1. 14 'අනුධම්මචාරී,
1 5. 5. න සො ධම්මං විජානාති. } පරිකථා බලනු.
2. 7. 6. 'සුබ්බතා'

පුරාණග්‍රන්ථකාරයෝ "පින් උපදනා උපවාසාදිය ව්‍රතැ" යි කිහ. **"පුණ්‍යජනකොපවාසාදි ව්‍රතම්"** යනු විසින් නියම-පුණ්‍යක-නියාම-සංයම යනාදිය එහි පර්‍යාය නාම ලෙස ද දැක්වූහ.

තව ද "උදැසන ආහාර නො ගෙණ දිය නා එකඟ වූ සිත් ඇති ව සූර්‍යාදිදෙවියන් යැද ව්‍රතයෙක හැසිරිය යුතුය,

ඒ ව්‍රතසමාචරණයෙහි බඹසර - පිරිසිදුකම - සත්‍යවචනය-ආහාර වර්ජනය යන මේ සතර ඉතා උතුම් ක්‍රියා වෙති,

යමෙක් යමක් පිණිස ව්‍රතසමාචරණය කරණුයේ එය නිමා කරන්නට පෙර මිය ගියේ නම් ඔහු එහි පුණ්‍යඵලය පරලොවට පැමිණ විඳින්නේය"යි මෙහිලා ඔවුහු මෙසේ අතිදීර්ඝවිස්තරයක් කළහ. ඒ දන්නට කැමැත්තන් විසින් **මත්ස්‍යපුරාණ, ගරුඩ-පුරාණදිය** කියවා බැලිය යුතුය.

"අභුක්ත්වාප්‍රාතරාහාරං ස්නාත්වා වෛව සමාහිතඃ,
සූර්‍යාදිදෙවතාභ්‍යශ්ච නිවෙද්‍ය ව්‍රතමාචරෙත්.

බ්‍රහ්මචර්‍යං තථා ශෞචං සත්‍යමාමිෂවර්ජනම්,
ව්‍රතෙෂ්වෙතානිචත්වාරි චරිෂ්‍යානීති නිශ්චයඃ.

යො යදර්ත්ථං චරෙද්ධර්මං න සමාප්‍ය මෘතො භවෙත්,
ස තත්පුණ්‍යඵලං ප්‍රෙත්‍ය ප්‍රාප්නුයාත්මනුරබ්‍රවීත්"

යනු එහි ආයේ ය.

ආරියං = උතුම් වූ.

"අරියො එව=ආරියො, තං අරියං" අරිය ම ආරිය නම්. ඒ ආරිය වූ උතුම් වූ යන අරුත් ය.[1]

තං තාදිසං = ඒ එබඳු වූ.

ත යන ප්‍රකෘතිය 'තං' යි දෙවන විබත් එකබස ගෙණ සිටියේ ඉදිරියෙහි සිටි 'සප්පුරිසං' යන්න වෙසෙසන්නට ය. ඒ 'ත' යනු ගැණ යට කියූ කතා දන්නේ ය.

තාදිස යනු කෙනෙක් කම්-කතු දෙයරුත්හි ද කෙනෙක් කමරුත්හි ද කෙනෙක් කතු අරුත්හි ද සිද්ධ කෙරෙත්. එහෙත් කමරුතෙහි ම සිද්ධයයි ගතයුතු සේ පෙණේ. විමසා ගන්නේ ය. **"සො විය සො දිස්සති, තම්ච නං පස්සති"** යනු කම්-කතු අරුත්ය.

---

1 2. 1. 'අරියානං ගොචරෙ රතා' යනු බලනු.

සපපුරිසං = සත්පුරුෂයා. හැම ගුණයෙන් පිරී සිටියහු.[1]

සුමෙධං = මනානුවණැති.[2]

මේ ගාථායෙහි එන **ධීරං, පඤ්ඤං, බහුස්සුතං, ධොරයහ-සිලං, වතවන්තං, ආරියං, තං, තාදිසං, සුමෙධං** යන මේ පද සමූහය **'සපපුරිසං'** යනු වෙසෙසා සිටියහ. මේ හැම පදය-කින් කියන ගුණ 'සප්පුරිසං' යන්නෙන් කියන ශ්‍රේෂ්ඨපුරුෂයා කෙරෙහි කැවී ඇත්තේ ය.

භජේථ = සෙවනය කරන්නේ ය.

නක්ඛත්තපථං ඉව චන්දිමා = අහස සෙවුනු සඳ මෙන්.

අහස **'නක්ඛත්තපථ'**යි හඳුන්වනු ලබනුයේ නක්ෂත්‍රයන්ගේ ගමන් මග බැවිනි. **නක්ඛත්ත** නම්, තාරකාය. ඒ අන් නමෙකි. පොරණැදුරෝ "තමන්ගේ ගමන් මග මදකුත් නො හැර සමහර කලෙක ලැසි ව සමහර කලෙක නො ලැසි ව අතනින් මෙතනින් නො ගොස් සමපමණ ගමනින් තමන් අයත් විථියෙහිම ගමන් කරමින් තමන් අයත් ගමන් රකිමින් මඩුලු ලෙසින් මහමෙර වටා කරකැවෙන බැවින් තාරකාවෝ නක්ඛත්ත නම්හ"යි කීහ. **"අත්තනො ගමනට්ඨානං න ඛරකි න විනාසෙතීති වා නක්ඛත්තං, අත්තනො ගමනට්ඨානං ඊසකම්පි න විජහතති කිඤ්චි සීසං කිඤ්චි දන්ඩං කදාචි සීසං කදාචි දන්ඩං එතෙතා ඉතො චාති එවං විසමගතියා අගන්ත්වා යන්තචක්කෙක පටි-පාටියා යොජිතානි විය සමස්පමාණගතියා අත්තනො විථියාව ගච්ඡන්තානි මණ්ඩලාකාරෙන සිනෙරුං පරිවත්තෙන්තී"**යි ඒ කියූ සැටියි.

ප්‍රධාන විසින් නක්ෂත්‍ර සත් විස්සෙකි. ඒ මෙසේ දත යුතුය:- **අස්සයුජ**=අස්විද, **භරණ්**=බෙරණ, **කත්තිකා**=කැති, **රොහණ්**=රෙහෙණ, **මිගසිර**=මුවසිරිස, **අද්දා**=අද, **පුනබ්බසු**=පුනාවස, **පුස්ස**=පුස, **අසිලෙස**=අස්ලිස, **මාස**=මා, **පුබ්බඵගගුණ්**=පුවපල්, **උත්තර-ඵගගුණ්**=උතුරුපල්, **හත්ථ**=හත, **චිත්තා**=සිත, **සාතී**=සා, **විශාඛා**=විසා, **අනුරාධා**=අනුර, **ජෙට්ඨා**=දෙට, **මූල**=මුල, **පුබ්බාසාළ්හ**=පුව-සල. **උත්තරාසාළ්හ**=උතුරුසල, **සවණ**=සුවණ, **ධනිට්ඨා**=දෙනට **සතභිසජ** = සියාවස, **පුබ්බභද්දපද** = පුවපුටුප' **උත්තරභද්දපද**= උතුරුපුටුප, **රෙවතී**=රෙවති යි.

---

1. 6. 8. 'සප්පුරිසං' යනු බලනු

2. 2. 3. 'මෙධාවී'
, , 4. 'දුමෙමසිතො' } ,, ,,

මේ කියූ නක්ෂත්‍රයනට අධිපති දෙවතාවෝ ද සත් විස්සක් වෙත්. ඔවුහු නම් පමණින් මෙසේ ය. **අග්ගි - සම - දහන - කමලජ - ගහි - ගිව - අදිති - ජීව - වණ්හි - පිතර - භගාභිධ - අයම්හි - අකි - නිඡටා - පවන - අජපද - හඳ - පුසන්** යි. මෙයේ ප්‍රධාන විසින් නක්ෂත්‍ර සත් විස්සක් වුව ද නක්ෂත්‍රයන්ගේ ගණන දැක්විය නො හැකි ය. ඔවුහු සඞ්ඛ්‍යා රහිත ය. ප්‍රයොජන ඇතියන් විසින් ජ්‍යොතිශ්ශාස්ත්‍රියන්ගෙන් බලා දත යුතු ය.

සවභාව විසින් නිපැයුනු අහසෙහි පැණෙන ශීත සපගීවත් වායුගෝලයෙක් චන්ද්‍ර නම් වී යයි වර්තමාන විද්‍යාධරයෝ කියත්. එයට අරක්ගත් දෙව් **චන්ද්‍රිමණතු**. ලොව නැසී හටගන්නා කාල යෙහි මිනිසුන්ගේ අදහස් ලෙසින් කැමැත්ත පරිදි සවභාව විසින් සඳවිමන පහළ වන්නේ ය. ඇතුළත මිණිමුවාය. විමන රිදියෙන් පිරිකෙවි කරණ ලද්දේ ඇතුළත පිටත ශීතස්පර්ශී ඇත්තේ ය. අයම් විතරින් උසින් එකුත් පණස් යොදුන් ඇත්තේ වටින් එක්සිය සත්සාළිස් යොදුන් ඇත්තේ ය. මිනිසුන්ගේ කැමැත්ත දැක පහළවූ බැවින් **චන්ද්‍ර** නම් වීය යි ද, සඳවිමන් වැසි දෙව පුත්‍ර චන්ද්‍රිමනතු යි ද බෞද්ධාවාර්‍යවරයෝ කියත්. **සාරසඞ්ග්‍රහයෙහි** ලොකසංසිති කථාව බලනු.

හරිවංශයෙහි චන්ද්‍ර, අත්‍රිමුනිහුගේ පුත්‍රයයි කියන ලද්දේ ය. එහෙයින් මොහු **අත්‍රිජ** - අත්‍රිජාත යි හඳුන්වනු ලබන බවද එහි ම කියත්. අත්‍රිමුනිහුගේ දෙනෙතින් චන්ද්‍ර උපන්නේල. **"චන්ද්‍රොහි ප්‍රජාසඟීඤ්ඡං තපස්‍යතො, නෙත්‍රෝත්‍රින් ජානෑ"** යනු එහි දක්නා ලැබේ. මෙය ද ලොකයෘ දෙවියකු විසින් මවන ලදැ යි කියූ කතාව වැනි ය.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවාන් පලාදියට පැමිණියාහු ය.

ශක්‍රදෙවරාජවස්තුව නිමි.

සකලජනධර්මාර්ථසඞ්ග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ
ධම්මකුසල සථවිරයන් කළ **සද්ධර්මසාගර** නම් වූ
ධර්මපදවර්ණනායෙහි සුඛවර්ගාත්මක
පඤ්චදශ තරඞ්ගය නිමියේ ය.

ප්‍රියවග්ගය

මවුපිය දෙදෙනා හා එක් ම පුතා.

16 — 1

සැවැත් නුවර එක් කුලගෙයක දෙමවුපියනට එක් ම පුතෙක් වීය. ඔහු, ඔවුන්ගේ මන වඩනුයේ අතිශය ප්‍රිය වූයේ ය. දවසෙක ඒ පුත්‍රතෙමේ තමන්ගේ ගෙයි දන් වළඳ, අනුමෙවෙනි බණ වදාළ භික්ෂූන්ගේ අනුමෙවෙනි බණ අසා පැහැද පැවිදිවනු කැමැත්තේ ඒ පිණිස මවුපියන්ගෙන් අවසර ඉල්ලා සිටියේ ය. එක් ම පුතු බැවින් ඔවුහු එයට ඔහුට අවසර නො දුන්හ. එවිට "ඔහු, මම මවුපියන්ට නො දන්වා ම ඔවුන්ට නො පෙණී ගොස් පැවිදි වන්-නෙමි"යි සනිටුහන් කොට ගත්තේ ය. පුතු පැවිද්දට අවසර ඉල්ලූදු සිට පියා ගෙයින් පිටත යන්තේ "පුතු රකුව"යි මවුට භාර කොට යන්නේය. මවු පිටත යන්නී එසේ කියා පියාට භාර-කොට යන්නී ය. දවසක් පියා ගෙයින් පිටතට ගිය කල්හි මවු පුතු රකින්නට සිතා පුතු ගෙයතුළ ලා තොමෝ උළුවහු මතුයෙහි එක් උළුවහු කඳකට පිට දී අනික් උළුවහු කඳෙහි දෙපා හැන දෙර කඩ අහුරා හිඳ හූ කටින්නට පටන් ගත්තී ය. පුතු ද "අම්මා රවටා පැන යමි"යි සිතා "අම්මා! පොඩ්ඩක් පා හකුලා ගන්න, මට සිරුරුකිස කරන්නට යන්නට ඕනෑය"යි කී ය. ඕ තොමෝ ද පුතුගේ කිම සැබෑය යි සිතා දෙපා හකුලා ගත්තා ය. එකෙණෙහි ඔහු ගෙයින් පිටතට බැස කඩිමුඩියේ විහාරයට ගොස් භික්ෂූන් වෙත එළැඹ "ස්වාමිනි! මා පැවිදි කරන්නැ"යි ඇවිටිලි කොට උන්වහන්සේලා වෙත පැවිදි වීය. ප්‍රියා ගෙට අවුත් "පුතු කොහි-ද"යි මව විචාළ විට "දැන් මෙහි සිටියේ ය"යි ඕ තොමෝ කිවු ය. එවිට ඔහු පුතු සොයන්නේ නො දැක විහාරයට ගියේ වනැ"යි සිතා එහි ගියේ පුතු පැවිදිව සිටුනාබව දැක හඬා වැලප "පුත! කිම මා නසහි? ඔබ පැවිදිව ගත් කල්හි මම එකලාව ගෙයි කුමක් කරම් ද, මට ගෙයින් ඇති කාරිය කිම් ද, මමත් පැවිදි වෙමි"යි භික්ෂූන් ඇයද පැවිදි වීය. මවු "කුමක් නිසා ම පුතු, ම හිමි මෙතෙක් ගෙට නො අවුත් පිටත කල් ගෙවත් ද, කිම, වෙහෙරට ගොස් දෙදෙන ම පැවිදි වූවෝ දැ"යි සොයා යන්නී පැවිදි වූ උන් දෙන්නා දැක "මොවුහු මෙසේ පැවිදි වූහු නම්, එකලා වූ මට ගෙයින් ඇති වැඩෙක් නැත, මමත් පැවිදි වෙමි"යි මෙහෙණවරට ගොස් පැවිදි වූය. මෙසේ පැවිදි වූ මොවුහු තිදෙන මහණදම් නො කරමින් එකෙ-නෙකාගෙන් නො වෙන් ව වෙහෙරෙහි වුව, මෙහෙණවරෙහි වුව ඒ හැම කැන්හි එක් ව හිඳ කතා කරන්නෝ කල්දවස ගෙවත්. මොවුන් මෙසේ එකතුව අතැන මෙතැන නිකරුණේ කතාබහෙන් කල් යැවීම එහි විසූ මහණ මෙහෙණනට මහත් ගැහටෙක් වූයේ ය.

එහෙයින් දවසක් භික්ෂූන් වහන්සේලා බුදුරජුන් වෙත ගොස් ඔවුන්ගේ මේ නිකරුණේ කල් ගෙවීම බුදුරජුන්ට සැළ කොට සිටි යහ. බුදුරජානන් වහන්සේ උන් ගෙන්වා "තෙපි මෙසේ වැඩක් නැතිව කතා බහෙන් නිකරුණේ කල් ගෙවන්නහු සැබෑදැ"යි අසා වදාළ සේක. "එසේ ය, ස්වාමීන් වහන්සැ"යි ඔවුහු කීහ. එවිට බුදුරජානන් වහන්සේ "කුමක්හෙයින් තෙපි මෙසේ කරහු ද? මෙය පැවිද්දන්ට නො සුදුසු ය, පැවිද්දන්ට මෙසේ නිකරුණේ කල් ගෙවනු නො හැකිය, මෙසේ නො කටයුතු ය, මෙය මහණ මෙහෙණනට සරුප් නො වේ"යි වදාළ විට "ස්වාමීනි! අපට වෙන්ව වසන්නට නො හැකි ය, සිත නගින්නේ එක්තැන් ව විසීමට ම ය, පැවිදි වූවමෝ වෙන්ව වසන්නට නො වෙමු"යි කීහ. එකල්හි බුදු-රජානන් වහන්සේ "මහණෙනි! පැවිදි වූදා සිට මෙසේ කිරීම නො සුදුසු ය, ප්‍රියයන්ගේ නො දැක්මත් අප්‍රියයන්ගේ දැක්මත් දෙක ම එකසේ දුක් උපද වන්නේ ය, දුකට හෙතු ය, එහෙයින් සත්ත්වයන් කෙරෙහි සංස්කාරයන් කෙරෙහි ප්‍රිය වූ හෝ අප්‍රිය වූ කිසිවක් කරන්නට නො වටනේය"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

"අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිඤ්ච අයොජයං,
අත්ථං හිත්වා පියගගාහි පිහෙතත්තානුයොගිනං.

මා පියෙහි සමාගඤ්ජි අප්පියෙහි කුදාචනං,
පියානං අදස්සනං දුක්ඛං අප්පියානං ච දස්සනං.

තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො,
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්ථ පියාපියන්ති"

තමා නො යෙදිය යුතු තැන යොදන්නා වූ ද යෙදිය යුතු තැන නො යොදන්නා වූ ද පුද්ගල තෙමේ කටයුතු දැය හැර ප්‍රිය දැය ම ගන්නා සුලු වූයේ අත්වැඩෙහි යෙදුනහු පතයි.

ප්‍රියයන් සමග ද අප්‍රියයන් සමග ද කිසි කලෙකත් එක් නො වෙව. ප්‍රියයන්ගේ නො දැක්ම දුක් ය. අප්‍රියයන්ගේ දැක්ම ද දුක්ය. (එහෙයිනි)

එහෙයින් (කිසිවක්) ප්‍රිය නො කරන්නේ ය. ඒ එසේම ය. ප්‍රියයන්ගේ වෙන්වීම ලාමක ය. යම් කෙනෙකුන්ට ප්‍රියවූවෙක් හෝ අප්‍රියවූවෙක් නැත්තේ ද ඔවුනට කායග්‍රන්ථයෝ නැත්තාහු ය.

අයොගෙ යුඤ්ජං අත්තානං = තමා නො යෙදියයුතු තැන යොදන්නා වූ ද.

මෙහි තමන් දක්වනු සඳහාය **'අත්තානං'** යනු යෙදුනේ[1]

1 12, i 'අත්තානං වෙ පියං ජඤ්ඤා' යනු බලනු.

තමා නො යෙදිය තැන්, **'අයොග'** යන්නෙන් දැක්වුනේ ය. වෙසඟනන් වසන තැන් – මළ සැමියන් හා බැහැරගිය සැමියන් ඇති ගෑණුන් වසන තැන් – නිසි වයසෙහි සරණ නො ගොස් ගෙයි ම මහලු වූ ගෑණුන් වසන තැන් – නැගි සිටි නො සන්සුන් කෙලෙස් ඇති නපුංසකයන් වසන තැන්–මෙහෙණන් වසන තැන්–රාසොඬුන් නිතර ගැවසෙන මත්පැන්හල් යන මෙ සතැන තමන් නො යෙදිය යුතු තැන් ය. එහෙයින් එතැන් අයොනිසොමනසිකාරයෙහිලා ගත්හ. **"අයුඤ්ජිතබ්බෙ අයොනිසොමනසිකාරෙ, වෙසියගොචරාදිභෙදස්ස හි ජබ්බිධස්ස අගොචරස්ස සෙවනං ඉධ අයොනිසොමනසිකාරො නාම, තස්මිං අයොනිසො මනසිකාරෙ අත්තානං යුඤ්ජනෙතා"** යනු අටුවා.

'අයොග' යන්නෙන් අයොනිසොමනසිකාරය ගැණෙනුයේ, අයොනිසොමනසිකාරය නො යෙදිය යුතු තැන්හි යෙදීමට හැම එකක්හට කරුණුවන බැවිනි. මෙහි කියූ ඒ සතැන පැවිද්දකු විසින් සිල්වතකු විසින් හැදුනු වැඩනකු විසින් නො යෙදිය යුතු තැන් ය. මෙසේ මේ නො යෙදිය යුතු තැන්හි යෙදෙනුයේ අයොනිසොමනසිකාර හෙතුවෙනි. මෙතැන්, නිවරද තැන් ලෙසින් ගන්නේ යායුතු තැන් ලෙසින් ගන්නේ, අයොනිසොමනසිකාර හෙතුවෙනි. හැම එකෙක්, තමන් ඉදිරියට එන ඉටු අනිටු හැම තැන නො වෙනස් කොට ශුභ ලෙසින් හිතලෙසින් ගන්නේ, අයොනිසොමනසිකාර හෙතුවෙනි. එහි අයොනිසොමනසිකාරය මෙසේ වදාළ සේක:– **"තත්ථ කතමො අයොනිසොමනසිකාරො? අනිච්චෙ නිච්චන්ති දුක්ඛෙ සුඛන්ති අනත්තනි අත්තාති අසුභෙ සුභන්ති අයොනිසොමනසිකාරො උප්පථමනසිකාරො සච්චපටිකකුලෙන වා චිත්තස්ස ආවට්ටනා අන්වාවට්ටනා ආභොගො සමන්නාහාරො මනසිකාරො අයං වුච්චති අයොනිසොමනසිකාරො"**යි. අනිත්‍යයෙහි නිත්‍යය, දුඃඛයෙහි සුඛය, අනාත්මයෙහි ආත්මය, අශුභයෙහි ශුභය යි නුනුවණින් මෙනෙහි කිරීමෙක්, නො මගින් මෙනෙහි කිරීමෙක්, නැත, සත්‍යයට පටහැනි ලෙසින් කල්පනායෙක් පුනපුනා මෙනෙහි කිරීමෙක් චෙතනායෙක් සැලකීමෙක් වේ ද, මෙ තෙමේ අයොනිසොමනසිකාරය, යනු අරුත්.

යොගස්මිං ච අයොජයං = යෙදියයුතු තැන නො යොදන්නා වූ ද.

යොග නම්: යොනිසොමනසිකාරය යි. අයොනිසොමනසිකාරයට පටහැනි ව සිටියේ ය. **"යොගස්මින්ති තබ්බිපරීතෙ ච යොනිසොමනසිකාරෙ"** යනු අටුවා. ලොකය පිළිබඳ වූ හැම සත්ත්ව සංස්කාරයක ම පවත්නා අනිත්‍යාදිලක්ෂණ ඒ හැටියෙන් නුවණින්

සලකා ගැණීම යොනිසොමනසිකාර නම්. සසර දුක් ඉක්මවා යනු කැමැති හැම එකක්හට යොනිසොමනසිකාර නම් වූ ඇතිතතු විමසා ගැණීම ඇතිතතු සලකා ගැණීම ආවශ්‍යක ව සිටි සත්ත්වයාගේ සිත්තුළ නො උපන් කාමච්ඡන්දාදී වූ පාපධර්ම නො ඉපැදෙනුයේ උපන්නා වූ පාපධර්ම පහව යනුයේ සත්ත්වයා සුමග යනුයේ සත්ත්වයා නැගී සිටිනුයේ යොනිසොමනසිකාර හෙතුවෙනි. එහි යොනිසොමනසිකාරය මෙසේ වදාළ සේක:- **"තත්ථ කතමො යොනිසොමනසිකාරො? අනිච්චෙ අනිච්චන්ති දුක්ඛෙ දුක්ඛන්ති අනත්තනි අනත්තාති අසුභෙ අසුභන්ති යොනිසොමනසිකාරෙ පථමනසිකාරො සච්චාපටිකකුලෙන වා චිත්තස්ස ආවට්ටනා අන්වාවට්ටනා ආභොගො සමන්තාභාරෙ මනසිකාරො අයං වුච්චති යොනිසොමනසිකාරො"** යි. අනිත්‍යයෙහි අනිත්‍ය ය, දුඃඛයෙහි දුඃඛය, අනාත්මයෙහි අනාත්ම ය, අශුභයෙහි අශුභය යි නුවණින් මෙනෙහි කිරීමෙක්, නියම මඟින් මෙනෙහි කිරීමෙක්, නැත, සත්‍යයට නො පටහැනි ලෙසින් අවිරුද්ධ ලෙසින් කල්පනා-යෙක් පුන පුනා මෙනෙහි කිරීමෙක් චෙතනායෙක් සැලකීමෙක් සිතට නගා ගැණුමෙක් වේ ද, මෙතෙමේ යොනිසොමනසිකාරය, යනු අරුත්.

අත්ථං ගිත්වා = කටයුතු දැය හැර.

මෙහි **'අත්ථ'** නම්, අධිශීල - අධිචිත්ත - අධිප්‍රඥා ශික්ෂා ය. එහි පන්සිල් දසසිල්, පියවි සිල් ය. ඒ වනාහි අබුද්ධොත්පාද කාලයෙහි ද පවත්නේ ය. එකල්හි පසේ බුදුවරු කර්මවාදී වූ මහණ බමුණෝ සක්විතිරජහු බෝසත්හු මහාජනයා මෙහිලා සමාදන් කරවත්. බුද්ධොත්පාදයෙහි බුදුරජහු බුදුසව්වෝ සමාදන් කරවත්. දැන උගත් මහණ බමුණෝ තුමූ ද සමාදන් වෙත්. ඔවුහු පන්සිල් දසසිල් රැක දෙව්ලොව මිනිස්ලොව ඉපද දෙව්මිනිස් සැප විඳිත්.

ආලොකයන් අතර සූර්‍යාලොකය මෙන් පර්වතයන් අතර මහාමෙරු පර්වතය මෙන් සියලු ලෞකික ශීලයන් අබිබවා මුදුන් ව සිටියේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය යි. මෙය බුද්ධොත්පාදයෙහි ම ලැබේ. බුදුරජුන් හැර අන් කෙනෙක් එහි ප්‍රඥප්තීන් උදුරා තබන්නට සමර්ථ නො වෙත්. බුදුරජානන් වහන්සේ ම කාය-වාග්ද්වාරයන්ගෙන් සිදු වන අද්ධ්‍යාචාරයන් සිඳහැර ඒ ඒ ව්‍යතික්‍රමයන්ට සුදුසු පරිදි ප්‍රාතිමොක්ෂ සංවරය පණවන්නාහු ය. එහෙයින් එය පියවිසිල් අබිබවා සිටියේ අධිශීල නම් වී ය. එහි ද

මාර්ගඵල සම්ප්‍රයුක්ත ශීලය, ප්‍රාතිමොක්ෂ සංවරය ඔබා නැගී සිටියේ උතුම් ව සිටියේ ප්‍රධාන විසින් අධිශීලය යි ගණු ලැබේ. එම හික්මිය යුතු බැවින් අධිශීලශික්ෂා නම.[1]

අෂ්ටවිධකාමාවචරකුශලචිත්තය හා අෂ්ටසමාපත්ති චිත්තය අබුද්ධොත්පාදයෙහි ද, නුවණැත්තන්ට උපදවා ගත හැකි ය. එහෙයින් බුද්ධොත්පාදයෙහි ම ලැබිය යුතු වූ සියලු ලෞකික-චිත්තයන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ විදර්ශනාපාදකඅෂ්ටසමාපත්තිචිත්තය අධිචිත්ත නම් වී ය. එහෙත් එ ද ඔබා නැගී සිටි මාර්ගඵලචිත්තය ම ප්‍රධාන විසින් අධිචිත්තය යි ගණු ලැබේ. එම හික්මිය යුතු බැවින් අධිචිත්තශික්ෂා නම.

අබුද්ධොත්පාදයෙහි ද ලැබෙන කර්මස්වකතාඥානය, සාමාන්‍ය ප්‍රඥා ය. පසේ බුදුරජහු කර්මවාදී වූ මහණ බමුණෝ සක්විතිරජහු මහබෝසත්හු මහාජනයා එහි හික්ම වත්. දැන උගත් මහණ බමුණෝ තුමූ ද හික්මෙත්. එහෙයින් බුද්ධොත්පාදයෙහි ම ලැබෙන සියලු ලෞකිකප්‍රඥාවන් යටපත් කොට ඔවුනට උතුම් ව සිටි විදර්ශනාඥානය අධිප්‍රඥා නම් වී ය. මෙහි එ ද යට කොට සිටි මාර්ගඵලප්‍රඥා ව ප්‍රධාන විසින් අධිප්‍රඥාය යි ගණු ලැබේ. එම හික්මිය යුතු බැවින් අධිප්‍රඥාශික්ෂා නම.

පියගගාති = ප්‍රිය දැය ම ගන්නාසුලු පුද්ගල තෙමේ.

රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය යන මෙපස සාමාන්‍යයන් විසින් ඉෂ්ටත්වයෙන් හා ප්‍රියත්වයෙන් ගණුලබන ප්‍රියවස්තුහු ය. සසර බොහෝ කලක සිට ඇස්-කන්-නාස් ඇ ඉඳුරන් පිණවීමෙහි යෙදුනු අයොනිසොමනසිකාරයෙහි බැඳුනු මහාරජසකයනට රූප ශබ්දාදීහු ප්‍රිය වස්තුහු වෙත්. එහෙයින් මෙ කියූ රූපශබ්දාදිය ප්‍රිය යි ගන්නේ **පියගගාති** නම්

පිහෙති = පතයි. බලාපොරොත්තු වෙයි. කැමැති වෙයි.

අත්තානුයොගිනං = අත්වැඩෙහි යෙදුනහු.

මෙහි අත්වැඩැයි කියූයේ නිවන ය. නිවන් පසක් කරණු පිණිස අධිශීල-අධිචිත්ත-අධිප්‍රඥාශික්ෂාවන්ගෙන් ශික්ෂිතවන්නේ **අත්තානුයොගි** නම්.

අයොනිසොමනසිකාරය යි කියූ අගොචරස්ථානසෙවනය කරමින් අනිත්‍යය අනිත්‍ය විසින් ගැණීම, දුඃඛය දුඃඛ විසින් ගණීම, ආත්මය අනාත්ම විසින් ගැණීමැ යි කියූ යොනිසො-

1. 4. 10. 'සීලවන්තං' යනු බලනු.

මනසිකාරය බැහැර කොට පස්කම්ගුණ සෙවුමෙහි ම බැඳුනු ගැලුනු ත්‍රිවිධශික්ෂාපූරණසඞ්ඛ්‍යාතඅර්‍ථය හැරදමා සසුන් පිළි වෙනින් ගිලිනී ගිහිබවට ගිය පුද්ගල තෙමේ, දෙවිමිනිසුන්ගෙන් සත්කාර-සම්මාන-ලබන අත්වැඩෙහි යෙදුනවුන් දැක මමත් මෙබඳු වීම් නම් යෙහෙකැ යි ඔවුන් පතන්නේ ය.

මා පියෙහි සමාගඤ්ඡි අප්පියෙහි කුදාචනං = ප්‍රියයන් සමගත් අප්‍රියයන් සමගත් කිසිදුකත් එක් නොවෙව.

මෙහි ප්‍රියයෝ නම්, තම සිත් ගත් මවු-පිය-අඹු-දරු-දැසි-දස්-ගව මහිෂාදි සත්ත්‍වයන් හා රත්-රිදී-මුතු-මැණික් වතුපිටි-ගේදොර ආ දේවල් ය. අප්‍රියයෝ නම්, සතුරෝ ය. අසමඛ්‍යෝය. මෙ කී ප්‍රියයන් හා ප්‍රියවස්තූන් හා අප්‍රියයන් හා අප්‍රියවස්තූන් හා කිසි දවසෙක කිසි මොහොතෙක තෘෂ්ණාසංසර්‍ගය විසින් එක්විය යුතු නොවේ. මේ හැම තැන මැදහත් විය යුතුය.

පියානං අදස්සනං දුක්ඛං අප්පියානං ච දස්සනං = ප්‍රියයන්ගේ නොදැක්ම හා අප්‍රියයන්ගේ දැක්ම ද දුක් ය.

ප්‍රියයන් හා ප්‍රියවස්තූන් නොදැක්මත් අප්‍රියයන් හා අප්‍රිය වස්තූන් දැක්මත් යන දෙක ම එකසේ දුක් ය. ප්‍රියයන්ගේ නොදැක්ම නම්, පියවිප්පයොගය යි. අප්‍රියයන්ගේ දැක්ම නම්, අප්පියසම්පයොගය යි. මේ පියවිප්පයොගය හා අප්පියසම්ප-යොගය දුකැයි දුඃඛනිර්දේශයෙහි දක්වන ලද්දේ ය. ප්‍රියයන් හා ප්‍රිය වස්තූන් හා එක්වීමෙන් රාගයත්, අප්‍රියයන් හා අප්‍රිය වස්තූන් හා එක්වීමෙන් ද, ද්වේෂයත්, යන කෙලෙශධර්ම මිනිසුන්ගේ සිත් තුළ නැඟී එනු වළකාලිය නොහැකි ය. සිත් තුළ කෙලෙසුන්ගේ පහළවීම දුකට හේතු ය. ප්‍රියාප්‍රියවස්තූන් කිසිවක් ප්‍රියාප්‍රිය භාවයෙන් නොගෙණ ඒ හැම තැන මැදහත් වන්නේ ම සැපසේ ජීවත් වන්නේ ය. එහෙයින් කිසි කලෙකත් ප්‍රියාප්‍රියයන් හා එක් නොවෙව, යි වදාළ සේක.

තස්මා පියං න කයිරාථ = එහෙයින් (කිසිවක්) ප්‍රිය නොකරන්නේ ය.

යම් හෙයකින් ප්‍රියයන්ගෙන් වෙන්වීමත් අප්‍රියයන් හා එක් වීමත් දෙක රාගද්වේෂාදීවූ කෙලෙශයන්ගේ ඉපැන්මට කරුණු වේ ද, එහෙයින් කිසි කෙනකු කිසි දෑයක් ප්‍රිය යි නොගත යුතු ය.

පියාපායෝ හි පාපකෝ = ප්‍රියයන්ගේ වෙන්වීම ලාමක ය.

ඒ එසේ ම ය. ප්‍රියයන්ගෙන් හා ප්‍රියවස්තූන්ගෙන් වෙන්වීම කාහටත් ඉවසිය නොහැකි බැවින් ඒ ලාමක ය.

ගන්ථා තෙසං න විජ්ජන්ති = ග්‍රන්ථයෝ ඔවුනට නැත්තාහ.

යෙසං නත්ථි පියාපියං = යම් කෙනෙකුන්ට ප්‍රියයෙක් හෝ අප්‍රියයෙක් නැත් ද.

මේ ලොකයෙහි යම් කෙනෙකුන්ට යමකු කෙරෙහි හෝ යම් දැයක් කෙරෙහි ප්‍රියාප්‍රියභාවයෙක් නොවේ නම් ඔවුනට සසර ගැටලන කායග්‍රන්ථයෝ නැත. සත්ත්වයන් කෙරෙහි හා වස්තූන් කෙරෙහි ප්‍රියගති නැත්තවුනට අභිද්‍යාකායග්‍රන්ථය නැත්තේ ය. එසේ ම අප්‍රිය ගති නැත්තන්ට ව්‍යාපාදකායග්‍රන්ථය නැත්තේ ය. එදෙක නැති තැන ඉදංසත්‍යාභිනිවේශ-ශීලව්‍රත-පරාමර්ශී යන කායග්‍රන්ථයෝ ද නොවෙත්. ඔවුහු ද ප්‍රහීණ වූවාහු වෙත්.[1]

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් ඵලාදියට පැමිණියාහු ය. ඒ කිදෙන ද "අපි වෙත්ව වසන්නට නොහැක්කොමු" යි සිවුරු හැර ගෙට ගියහ.

භික්ෂූන් කෙනෙමගේ වසතුව නිමි.

1. 7. 1. 'සබ්බගන්ථප්පහීණස්ස' යනු බලනු.

පුතු මළසොකයෙන් හැඬූ බමුණා.

16 — 2

සැවැත් නුවර වැසි එක් කෙළෙඹියෙක් සියපුතු මළසොකයෙන් මැඬුනේ පුත්‍ර ශොකය දරා ගත නොහැකි ව දිනපතා සොහොනට ගොස් හඬා වැලපෙන්නේ ය. සම්මා සම්බුදුරජානන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදුරණ සේක් ඒ කෙළෙඹියාහට ඇති සෝවන් මග ලැබීමෙහි හෙතුසම්පත් දැක පිණ්ඩපාතයෙහි හැසිරීමෙන් හැරී වැඩි සේක් එක් පැසුළු මහණකු ද ගෙණ ඔහුගේ ගෙට වැඩි සේක. කෙළෙඹි, බුදුරජුන් වැඩිය බව අසා "මෙහි වැඩියෝ මා සමග පිළිසඳර කතාවටැ" යි සිතා බුදුරජුන්ගේ තුළට වැඩමවා එහි අසුනක් පණවා වැඳ හිඳුවා වෙත එළැඹ වැඳ පසෙකට වී හුන්නේ ය. එකල්හි බුදුරජානන් වහන්සේ "උපාසකය! දුකට පැමිණියෙහි කුමක් නිසා ද"යි අසා වදාළ සේක. "සවාමීනි! මම දුකට පැමිණියෙම් පුත්‍රවියොගදුඃඛයෙනැ" යි කී කල්හි "උපාසක! පුත්‍රවියොගය දුකට කරුණෙක් නොවේ, එහෙයින් එහිලා දුක් ඇත්තෙහි නොවන්න, මරණය එකකුට දෙන්නකුට එක් තැනෙක දෙ තැනෙක වන්නේ නොවේ, සත්ත්වයෝ යම්තාක් භවයෙහි උපදින් නම්, ඒ තාක් සියලු දෙනාහට මරණය නියමයෙන් ම වන්නේ ය, හැමදා එකසේ පවත්නා නිත්‍ය වූ එක් සංඝකාරයෙකුදු ලොව නැත්තේ ය, එහෙයින් මරණ සැහැවි ඇත්තේ මළේ ය, මැරෙන්නේ ය, බිඳෙන සැහැවි ඇත්තේ බිඳුනේ ය, බිඳෙන්නේ ය, සි දව රැ දෙකෙහි හැම කෙනකුත් විසින් සිහි කළ යුතු ය, නුවණැති පැරැන්නෝ පුතු මළ කල්හි ද මරණ සැහැවි ඇත්තේ මළේ ය, බිඳෙන සැහැවි ඇත්තේ බිඳුනේ ය, සි ශොක නොකොට මරණ සිහිය ම සිත්හි ලා වැඩූහ" යි වදාළ සේක. එකල්හි "සවාමීනි! කවුරු කවර කලෙක එසේ කළාහු ද; වදාරණ මැනැවැ'යි කෙළෙඹියා විසින් අයදනා ලද සේක් ඒ පවසනු පිණිස:—

"(මිනිසා) දිරූ සැව – හැර යන සපුන් මෙන් සිය,
තුනු හැර යේ එසේ ගත – දිවියෙන් තොරව හිය කල.

දැවෙනුයේ සැයෙහි – නොදනී වැළපුම් නැයන්,
එබැවිනි මූ නිසා – සෝ පත් නොවෙම් නිසිලෙස.

ඔහු පිළිබඳනි යම් – ගතියෙක් ඇද්ද ඒ ලෙස්,
හියේ සිය තුනු හැර – ඒ සත් මෙලොවින මෙසේ"

යි පංචක නිපාතයෙහි එන මේ උරගජාතකය විස්තර විසින් වදාරා "තෝ කළයුතු කර්මාන්ත හැරදමා කැම් පීම් නැති ව මෙසේ හඬා වැළපෙහි ද, එසේ නොකොට පෙර නුවණැත්තෝ මරණානුස්මෘති භාවනා බලයෙන් ශෝකය දුරු කොට කැම් පීම් ද ගත්හ, ගෙයි කළමනා කටයුතු ද කළහ, එහෙයින් මාගේ පිය පුත් මළේය යි නොසිතව, සිහි නොකරව, සිත්තුළ උපදින්නා වූ ශෝකයෙක් හෝ බියෙක් හෝ වන්නේ ද, එ ශෝකය හා බිය ප්‍රියයකු නිසා ම උපදිය" යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

පියතෝ ජායති සෝකෝ පියතෝ ජායති භයං,
පියතෝ විප්පමුත්තස්ස නත්ථි සෝකෝ කුතෝ භයන්ති.

ප්‍රියයන් නිසා ශෝකය උපදී. ප්‍රියයන් නිසා භය උපදී. ප්‍රියයන්ගෙන් මිදුනහුට ශෝකයෙක් නැත. බියෙක් නැත.

පියතෝ ජායති සෝකෝ = ප්‍රියයන්ගෙන් ශෝකය උපදී.

සංසාරවට්ටය මුල් කොට ඇති ශෝකය ඉපදෙනුයේ ප්‍රිය වූ සත්ත්වයන් ප්‍රිය වූ සංස්කාරයන් නිසා ය. ඇතැම් කෙනෙක්හට තමතමන්ගේ සිතැඟි අනුව ඇතැම් සත්ත්වයෝ ද ඇතැම් වස්තූහු ද ප්‍රිය ද අප්‍රිය ද වෙත්. එකක්හට ප්‍රිය වන්නෙක් අනෙකක්හට ප්‍රිය නොවන්නට හැක්කේ ය. සංසාරගත සත්ත්වයන්ගේ සභාව-ධර්මය මෙබඳු ය. කෙලෙස් නොනැසූ හැම සත්ත්වයන් කෙරෙහි පවත්නා සාමාන්‍යගතිය මේ ය. එහෙයින් සත්ත්වයන්හට ශෝකයෙක් උපදනේ නම්, ඒ උපදනේ තම තමන් ප්‍රියත්වයෙන් ඉෂ්ටත්වයෙන් ගන්නා සත්ත්වසංස්කාරයන් නිසා ය.[1]

පියතෝ ජායති භයං = ප්‍රියයන්ගෙන් බිය උපදී.

ප්‍රියත්වයෙන් ගන්නා සත්ත්ව සංස්කාරයන් නිසා සත්ත්වයනට ශෝකය උපදනා සේ බිය ද උපදනේ ප්‍රියත්වයෙන් ගන්නා සත්ත්ව සංස්කාරයන් නිසාය.[2]

පියතෝ විප්පමුත්තස්ස = ප්‍රියයන්ගෙන් මිදුනහුට.

පංචවිධවිමුක්තීන්ගෙන් මුළුමනින් තම සිත මුදාගෙණ සිටුනා රහතුන් වහන්සේ ය **විප්පමුත්ත**. උන්වහන්සේට ය යන අරුත්.

---

1. 14. 6. 'දුක්ඛං' යනු බලනු.
,, ,, ,, 'භයතජ්ජිතා' ,, ,,

නත්ථි සොකො කුතො භයං = ශොකයෙන් නැත. බියෙක් කොයින් වේ ද.

කිසි සත්ත්වයකු නිසා කිසි සංස්කාරයක් නිසා ශොකයෙක් බියෙක් නො වන්නේ රහතුන් වහන්සේට ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි කෙළෙඹි තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය. පැමිණ සිටියවුන්ට ද ධර්මදෙශනාව වැඩ සහිත වූ ය.

අන්‍යතරකුටුම්බිකවස්තුව නිමි.

විශාඛා මහාඋපාසිකාවගේ [දුක් සන්සිඳවීම.

16 — 3

විශාඛා මහා උපාසිකාවට **දත්තා** නම් මිනිබිරියක් වූය. **දත්තා-සුදත්තා** යි ද ඇයට නම් විය. ඕ උපාසිකාවගේ පුතුගේ දූ ය. උපාසිකා තොමෝ ඇය සැදැහැති බැවින් තමන්ගේ තැන තබා තම ගෙට දන් පිණිස වඩිනා මහාසඞ්ඝයා වහන්සේට ඇය ලවා වතාවත් කරවූය. ඕ තොමෝ මිත්තැනියගේ නියමය ලෙස මිත්තැනිය සේ ම මහාසඞ්ඝයා වහන්සේට වතාවත් කරන්නී හදිසියේ කලුරිය කළා ය. විශාඛා තොමෝ මළසිරුර තැන්පත් කොට තබා ශොකය දරා ගත නො හැකිව දුක් ඇන්ති කඳුළු පිරි මුහුණු ඇති ව හඬමින් බුදුරජුන් වෙත ගොස් උන්වහන්සේ ඉදිරියෙහි එකත් පසෙක හුන්නී ය.

බුදුරජාණන් වහන්සේ = "විශාඛාවෙනි! මොක ද; දුක් වූවක සේ නො සතුටු සිත් ඇතියක සේ හඬමින් මෙහි ආවා?

විශාඛා = සවාමීනි! මාගේ මිනිබිරියක් කලුරිය කළා, ඇය මා සේ සඞ්ඝයා වහන්සේට වතාවත් කළා, හොඳින් වතාවත් කරන්නට දන්නීය, එහෙයින් ඇය මට ඉතා ප්‍රිය ය, වත්තසම්පන්න ය, දැන් එබදු අන් එකියක් දක්නට නැත, එයින් මම දුක් ඇතියා වෙමි, දුකට පත් වූවා වෙමි,

බුදුරජ = විශාඛාවෙනි! මේ සැවැත් නුවර අද ජීවත් වන මිනිස්සු කොපමණ ද?

විශාඛා = සවාමීනි! භාග්‍යවතුන් වහන්සේ විසින් ම සැවැත් නුවර සත් කෙළක් මිනිස්සු ජීවත් වෙතියි වදාරණ ලදුයේ දනිමි,

බුදුරජ = හොඳයි; ඒ සත් කෙළ ම උපාසිකාවගේ මිනිබිරිය වගේ වන්නී නම් උපාසිකාව කැමැති ද?

විශාඛා = එහෙයි; සවාමීනි! මම එසේ වනු දක්නට කැමැතියෙමි,

බුදුරජ = විශාඛාවෙනි! මේ සැවැත් නුවර දවස-කට කී දෙනෙක් කලුරිය කෙරෙත් ද?

විශාඛා = ස්වාමීනි! බොහෝ දෙනෙක් කලුරිය කරත්, ගණන කියන්නට මට නො හැකිය,

බුදුරජ = එසේ නම් උපාසිකාව නො හඬන දවසක් නො හඬන රැයක් විලාප නො කියන රැ දවලෙක් නැ නො වේ ද? හැමදා ඔවුන් නිසා ශොක කළයුතු නො වේ ද? හැඬිය යුතු නො වේ ද? හැමදා හඬමින් ශොක කරමින් දුක් ඇති ව විසිය යුතු නො වේ ද?

විශාඛා = එසේය, ස්වාමීනි! දන්නා ලදි,

බුදුරජ = එසේ නම් දන්නා ලද නම් ශොක නො කරව, ශොකයත් බියත් දෙක ම වන්නේ ප්‍රෙමය නිසාය'' යි වදාරා

මේ ධර්මදෙශනාව කළ සේක.

පෙමතො ජායති සොකො පෙමතො ජායති භයං,
පෙමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයන්ති

ප්‍රියභාවය හෙතු කොට ශොකය උපදි. ප්‍රියභාවය හෙතු කොට භය උපදි. ප්‍රියභාවයෙන් මිදුනහුට ශොකයෙක් නැත. බියෙක් කොයින් වේ ද?

පෙමතො ජායති සොකො = ප්‍රියභාවය නිසා ශොකය උපදි.

පෙමතො ජායති භයං = ප්‍රියභාවය නිසා බිය උපදි.

පෙමතො විප්පමුත්තස්ස = ප්‍රියභාවයෙන් මිදුනහුට.

නත්ථි සොකො කුතො භයං = ශොකයෙක් නැත. බියෙක් කොයින් වේද.

ප්‍රිය යැයි හැඳින්වීමට යම් කිසි සෙනහයෙක් කරුණු වේ නම් ඒ ය ප්‍රෙමැයි කියනුයේ. ප්‍රිය යනු නැගී ආයේ ප්‍රෙමය ගැබ් කොටගෙණ ය. **"පියස්ස භාවො = පෙමං"** යනු දන්නේ ය. පිය ශබදයෙන් භාවයෙහි ඉම ප්‍රත්‍යය කොට පිය ශබදයට ප

ආදෙශ කිරීමෙන් පෙම යනු සිද්ධය. නපුංසක ය. **"ප්‍රියස්‍ය භාවඃ = ප්‍රෙමන්"** යි සංස්කෘතයෙහි ආයේ ය. එහි **ප්‍රිය** ශබ්ද යෙන් **ඩිමන්** ප්‍රත්‍යය කොට ප්‍රිය ශබ්දයට **ප්‍ර** ආදෙශයෙන් සිද්ධ කරත්. පුංනපුංසක දෙක්හි ම වේ.

යමෙක් පුත්‍රදාරාදී වූ යම් යම් සත්ත්වයන් කෙරෙහි, මුතු මැණික් ආදී වූ කුදු මහත් යම් යම් වස්තූන් කෙරෙහි යම් යම් තරමකින් ප්‍රෙමය කෙරේ නම් ඔහුට ඔවුන් කෙරෙහි හා ඒ වස්තූන් කෙරෙහි ඒ ඒ තරමින් ශොකය හා භය උපදනේ ය. ශොකයට හා භයට ප්‍රෙමය මුල් වන්නේ ය. යමක්හට ඒ නැත් නම්, ශොකභය ද නැත්තේ ය. එහෙයින් සංසාරය පිණිස පවත්නා ප්‍රෙමය හළ යුතුය. කිසි තැනෙක ප්‍රෙම නො කළ යුතුය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

විශාඛාවස්තුව නිමි.

ගැණියක නිසා වූ විපතක්

16 — 4

ලිච්ඡවීහු එක් උත්සවදවසෙක උනුන් තන්වන් පිළී හැඳ නන්වන් අබරණින් නොයෙක් ලෙසින් සැරසී උයන්කෙළි පිණිස යන්නට නුවරින් නික්ම ගත්හ. බුදුරජාණන් වහන්සේ ද එ දවස නුවර පිඬු සිඟන්නට වඩනා සේක් උන් දැක භික්ෂූන් අමතා "මහණෙනි! අර එන ලිච්ඡවීන් දුටු වහු ද? තමුසේලා විසින් තව්තිසා වැසි දෙවියෝ පෙර නො දක්නා ලද්දේ නම් ඒ එන ලිච්ඡවීන් බලවු"සි වදරා පිඬු පිණිස නුවරට පිවිසි සේක. ලිච්ඡවීහු ද උයන් කෙළියට යන්නෝ එක් වෙසඟනක ද ගෙණ ගොස් ඇය නිසා ඊෂ්‍යාවෙන් මඩනා ලද්දාහු කලහ උපදවා උනුන් ඇණ කොටා ගෙණ එ උයන ලේ ගඟක් මෙන් කළහ. ඇණුම් කෙටුම් ලැබ ලෙයින් වැකුණු සිරුරු ඇතියවුන් මැසිවල තබා ඔසොවා ගෙණ ගියහ. බුදුරජාණන් වහන්සේ ද කළ බත් කිස ඇතිසේක් නුවරින් නික්ම වැඩියාහ. භික්ෂූන් වහන්සේ ද එසේ මැසිවල තබා ඔසොවා ගෙණ යන ඔවුන් දැක "ස්වාමිනි! අද උදැසන ම නන්වන් අබරණ ලා හොඳට සැරසී තව්තිසා වැසි දෙවියන් මෙන් උයන් කෙළි කෙළනට නුවරින් නික්ම ගිය ලිච්ඡවීහු දැන් මේ වෙසඟනක නිසා මහත් ව්‍යසනයට පැමිණියෝ වෙති"සි කී කල්හි "මහණෙනි! ශොකයෙක් හෝ භයෙක් හෝ ඇණ කොටා ගැණුමෙක් හෝ ගෙල වැල ලා ගැණුමෙක් හෝ වස විෂ කෑමෙක් හෝ වන්නේ නම් ඒ වන්නේ සංසාරික සත්ත්වසංස්කාරයන් කෙරෙහි නො මනා ඇලීම නිසාය"සි වදරා මේ ධර්මදේශනාව කළ සේක.

රතියා ජායති සොකෝ රතියා ජායති භයං,
රතියා විප්පමුත්තස්ස නත්ථි සොකෝ කුතෝ භයන්ති.

ඇලීම් හෙතුවෙන්ම ශොකය උපදී. ඇලීම හෙතුකොට භය උපදී. ඇලීමෙන් මිදුනහුට ශොකයෙක් නැත. බියෙක් කොයින් වේද.

රතියා ජායති සොකෝ = ඇලීම නිසා ශොකය උපදී.

රතියා ජායති භයං = ඇලීම නිසා බිය උපදී.

රතියා විප්පමුත්තස්ස = ඇලීමෙන් මිදුනහට.

නත්ථි සොකෝ කුතෝ භයං = ශොකයෙක් නැත. බියෙක් කොයින් වේ ද.

රති නම්: ඇලීම ය. විශෙෂ විසින් රූප - ශබ්ද - ගන්ධ - රස - සප්‍රෂ්ටව්‍ය යන කාම වස්තූන්හි ඇලීම **රති** යි වදරණ ලදි.[1]

ශොකයටත් බියටත් කරුණු වන්නී මේ පඤ්චකාම ගුණ රතියයි. එමතු ද නොවේ. මෙතැන්හි ඇලීම සත්ත්වයනට නත් වැදෑරුම් විපත්වලට කරුණුව සිටියේ ය. අපාදුකට ද මෙය හෙතු වන්නේ ය. මෙහි ඉච්ඡා විඝාත දුක්ඛයෙහිලා කළ ධම්මකථාව ද බැලිය යුතු ය. අනැගැම්මග නුවණින් මෙය නසා සිටියවුනට නම් මේ නිසා වන කිසි ශොකයෙක් නොවන්නේ ය. කොතැනිනුදු බියෙක් ද නැත. එහෙයින් කාමවස්තූන්හි ඇලුම් ගැලුම් බැඳුම් නසාලන්නට වැර වැඩිය යුතු ය.

ධම්දෙශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවන් පලාදියට පැමිණියාහු ය.

ලිච්ඡවිවසභුව නිමි.

---

1 2 4 'මා කාමරතිසන්ථවං' යනු බලනු.

අනිත්ථිගන්ධ කුමාරයා

16 — 5

අනිත්ථිගන්ධ කුමාර තෙමේ බ්‍රහ්මලෝකයෙන් චුතව අවුත් සැවැත්නුවර මහාසම්පත් ඇති එක් කුලගෙයක උපන්නේ ය. උපන්දා සිට ගැණියක ලඟට යන්නට නොකැමැත්තේ ගැණියක විසින් ඇඟිලි තුඩුනුදු අල්ලා ගන්නා ලද්දේ නම් හඬන්නේ ය. එබැවින් වත්කඩ කැටියෙකින් එසා වඩාගෙණ උන්ට කිරි පොවත්. මෙසේ කල් යන් වැඩිවියට පත් අනිත්ථිගන්ධ කුමාරයාගේ මවුපියන් ඔහුට මගුලක් කරදීමට කැමැත්ත විචාළ විට "මට ගැණියකගෙන් වැඩෙක් නැතැ"යි මවුපියන් කළ ඒ මඟුලයොජනාව ප්‍රතික්ෂේප කෙළේ ය. එයින් පසුබට නොවූ මවුපියෝ නැවැත නැවැතත් මගුලට කැමැති වන්නැ"යි කීහ. එකල්හි ඔහු රන් කරුවන් පන්සියයක් ගෙන්වා ඔවුනට රන්නික දහසක් දෙවා ඔවුන් ලවා එය ඝන කොට තලවා රන්රුවක් කරවා, මවුපියන් "පුත! ගැණියක නොගෙණ කල අපගේ වංශය මුළුමනින් නැසී යන්නේ ය, එහෙයින් ඔබට ශරණ පිණිස කුලකුමරියක ගෙණ එන්නෙමි"යි කී කල්හි තමන් තනවා සඟවා තුබූ රන්රුව පෙන්වා "එසේ නම් මේ රන්රුව වැනි කුමරියක ගෙණ එන්නහු නම් ශරණ ගන්නෙමි"යි කියා සිටියේ ය.

එකල්හි ඔවුහු රටේ නම ගිය බමුණන් කීපදෙනකුන් ගෙන්වා කෑම් බීම් ඇදුම් පැලඳුම් දී සඬ්ග්‍රහ කොට "අපගේ පුත් මහපිණැන්තේ ය, එකානතයෙන් මුන් හා සසර එක්ව පින් කළ කුමරියක මෙරට හෝ අන්රටක විය යුතු ය, යවු! මේ රන්රුව ගෙණ, මේ රන්රුව වැනි කුලකුමරියක සොයා ගිවිස්වා ගෙණ එවු"යි ඔවුන් පිටත් කොට යැවූහ. ඔවුහු "මැනැවැ"යි රන්රුවද ගෙණ ඉන් නික්ම යන්නෝ මදුරට සාගල නුවරට වන්හ. එනුවර එක් කුලගෙයක වයසින් සොළොස් වයසැති එ රන්රුවට වැඩි තරම් වූ මනාරූ ඇති කුමරියක් වූවා ය. ඇය ඇයගේ මවුපියෝ තමන්ගේ සත් මහල්ගෙයි උඩ මහලෙහි රඳවා වැඩුහ. ඒ බමුණෝ "යම් ලෙසකින් මේ නුවර මෙබඳු කුමරියක් වන්නී නම් මේ රන්රුව දැක, මේ රන්රුව අසුවල් කුලගෙයි වැඩෙනා කුමරිය සේ මනාරූ ඇතැයි රන්රුව දකින්නන් කියනු ඇතැ"යි ඒ රන්රුව ගංතොටට යන මග තබා පසෙක සැඟවී හුන්හ. එකල්හි මේ කුමරියගේ කිරිමවු තොමෝ පළමු කොට ඒ කුමරිය නාවාපියා තොමෝ ද නාන්නට ගංතොටට පැමිණියා රන්රුව දැක "තමාගේ දූ"යි සිතා "අනේ! නොභික්මුනු කෙල්ල, මේ දැන් මම තී නාවා

නික් ම ආවා ම වෙමි, තී මට කලින් කො තැනින් පැනගෙණ මට නො පෙණෙන සේ කෙසේ මෙහි ආවා දැ''යි අතින් පහරක් ගැසූ විට තදබවත් වෙනසකට නො පත් බවත් දැන ''පින්වත්නි! මෝ මාගේ දූය යි සිතා මම පහරක් ගැසීමි, මේ කිමැ''යි ඇසූ ය. බමුණෝ ඇගෙන් ''මැනියෙනි! තීගේ දූත් මෙබඳු දැ''යි විචාළහ. ''මේ රුව මාගේ දුවනිය ඉදිරියෙහි කුමට අහී දැ''යි කී කල්හි ''එසේ නම් මැනියෙනි! තීගේ දුවනිය අපට දක්වාලව''යි ඔවුහු කීහ. ඕ තොමෝ බමුණන් කැඳවා ගෙණ මාලිගාවට ගොස් එහි අධිපතියනට ඔවුන් දක්වාලූ ය. ඔවුහු බමුණන් හා කළ පිළි-සඳර කතායෙන් සතුටුව සිය දුවනිය උඩමාලෙන් පාතමාලයට ගෙන්වා රන්රුව ඉදිරියෙහි සිටවාලූහ. රන්රුව නිෂ්ප්‍රභ විය. කුමරිය ම රූපශොභායෙන් නැගී සිටියා ය. අඟපසඟින් සියල්ලන් සිත් ගත්තී ය. බමුණෝ රන්රුව කුමරියගේ මවුපියනට දී ඇය පොරොන්දු කරවා ගෙණ පෙරළා ගොස් අනිත්‍ථිගන්ධ කුමාරයාගේ මවුපියන්ට ඒ සියලු තොරතුරු දන්වා සිටියහ. ඔවුහු සතුටු සිත් ඇති ව ' යවු! වහා කල් නො යවා ඒ කුමරිය කැඳවා ගෙණ එවු''යි පඬුරු පාක්කුඩම් දී සාගල පුරයට ඔවුන් යැවූහ.

අනිත්‍ථිගන්ධ කුමාර තෙමේ ද එපුවත් අසා ඇසීම් පමණින්ම සෙනහය උපදවා ''වහා කැඳවා ගෙණ එත්වා''යි කියා සිටියේ ය. බමුණන් ඒ පඬුරු පාක්කුඩම් ගෙණ එහි ගොස් ඒ සියල්ල කුමරියගේ මවුපියන්ට දී ඔවුන්ගේ නියමයෙන් කුමරිය සරසා ඇය මගුල්රියට නංවා ගෙණ එනු ලබන්නී ඉතා සියුමැලි බැවින් හා රියෙන් යෑම නුපුරුදු බැවින් රියෙහි ඒ මේ අත හැපීමෙන් අතර මගදී හටගත් දරුණු වාත රොගයෙකින් රිය තුළ ම කලුරිය කළා ය. එදා සිට කුමාර තෙමේ ද එහි සිට එන්නන්ගෙන් නිතර නිතර ම කුමරියගේ තොරතුරු විමසන්නේ ය. බලවත් සෙනහයෙන් යුක්ත ව ම කරුණු විචාරණ ඔහුට මේ වග එක්වට ම නො කියා කීප දිනක් යවා නො කියා නො හැකි බැවින් කුමරිය අතරමග දී මළ බව දැන්වූහ. කුමාර තෙමේ ''එබඳු රූසපුවෙන් යුත් තැනැත්තියක දක්නා පමණකුත් නො ලදිමි'' යි උපන් දෙම්නස් ඇත්තේ මහාපව්වෙකින් මිරිකෙන්නකු සේ මහත් ශොක දුඃඛ යෙන් මිරිකුනේ විය. ශොකයට යටව ගියේ ය.

බුදුරජානන් වහන්සේ අනිත්‍ථිගන්ධ කුමාරයන් ගැණ බලා වදාරණ සේක් ඔහුට සෝවන් වීමට පින් ඇති බව දැක, පිඬු පිණිස හැසිරෙණ සේක් ඔහුගේ ගෙදොරට වැඩි සේක. මවුපියෝ බුදු රජුන් ගෙය තුළට වැඩමවා ගෙණ මැනැවින් වැළඳ වූහ. උන්වහන්සේ වළඳා අවසානයෙහි ''අනිත්‍ථිගන්ධ කුමාරයා කොහි

දැ?'' යි අසා වදාළවිට ''ස්වාමීනි! ඔහු කෑම් බීම් නො ගෙණ නිරාහාරව ශොකාතුරව ඇතුළු ගබඩාවට වැද හිඳීය'' යි කීහ. ''කැඳවා ගෙණ එවු'' යි උන්වහන්සේ වදාළ සේක. කුමාර තෙමේ බුදුරජුන් ඉදිරියට අවුත් උන්වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකල්හි ''දරුව! කුමක් නිසා නොකා නො බී ඉන්නට තරම් ශොකයෙක් තට උපන්නේ දැ'' යි අසා වදාළ විට ''ස්වාමීනි! මෙබඳු රූසපුවෙන් යුත් දැකුම්කලු කුමරියක් අතර මගදී කලුරිය කළාය යි අසා මට බලවත් ශොකයෙක් උපන, එයින් බත් ද නො රුස්නේ ය'' යි කී ය. ඉක්බිති බුදුරජානන් වහන්සේ ''දරුව! කුමක් නිසා මේ බලවත් ශොකයෙක් තට උපනැ යි දනිහි දැ?'' යි විචාළ සේක. ''ස්වාමීනි! නො දනිමි'' යි කී කල්හි ''දරුව! තට මේ ශොකය බලවත් ව උපන්නේ කාමය නිසාය, ශොකයෙක් හෝ බියෙක් හෝ උපදී නම් කාමය නිසා ම උපදීය'' යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

කාමතො ජායති සොකො කාමතො ජායති භයං,
කාමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයන්ති.

කාමය හෙතුකොට ශොකය උපදි. කාමය හෙතුකොට බිය උපදි. කාමයෙන් මිදුනහුට ශොකයෙක් නැත. බියෙක් කොයින් වේ ද.

කාමතො ජායති සොකො = කාමය නිසා ශොකය උපදි.

කාමතො ජායති භයං = කාමය නිසා බිය උපදි.

කාමතො විප්පමුත්තස්ස = කාමයෙන් මිදුනහුට.

නත්ථි සොකො කුතො භයං = ශොකයෙක් නැත. බියෙක් කොයින් වේද.

කාම නම්: වස්තුකාම ක්ලෙශකාමයෝ ය.[1] මේ දෙවැදැරුම් කාමයන් නිසා සත්ත්වයාගේ සිත්තුළ ශොකභය උපදනේ ය. කාමවස්තූන් කෙරෙහි ශොකය ආශාව ඇතිතාක් ම සත්ත්වයාහට ශොකයෙන් බියෙන් නිදහසෙක් නැත. සත්ත්වයන් විසින් හැම ගැහටෙක් හැම කරදරයෙක් විඳිනු ලබනුයේ කාමය නිසා ය. කාමයන්ගේ ආදීනව සලකා දෙස් දැක එයින් මිදී සිටියහුට කිසිත් ගැහටෙක් කරදරයෙක් නැත්තේය'' යි මෙයින් වදාළසේක.

ධර්මදෙශනාවගේ අවසානයෙහි අනිත්ථිගන්ධ කුමාරතෙමේ සෝ-වන් පලයෙහි පිහිටියේ ය.

අනිත්ථිගන්ධකුමාර වස්තුව නිමි.

---

1. 2. 4 ''මා කාමරනිසත්ථවං'' යනු බලනු.

මිසදිටු ගත් බමුණෙක්

16 — 6

සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙවිරම් මහාවෙහෙර වැඩ වසන දවසෙක මිසදිටු ගත් එක් බ්‍රාහ්මණයෙක් ගඟබඩට ගොස් කුඹුරක් සකස් කරන්නේ ය. බුදුරජාණන් වහන්සේ ලොව බලා වදාරණ සේක් ඒ බමුණාහට සෝවන් වීමට තුබූ හේතු සම්පත් දැක ඔහු වෙතට වැඩියහ. ඔහු බුදුරජාණන් දැකත් සැලකිලි පමණකුත් නොකොට නිහඬ විය. එහෙයින් බුදුරජාණන් වහන්සේ පළමු කොට බමුණාට කතා කොට "බමුණ! කරන්නෙහි කිමැ?" යි ඇසූහ. "ගෞතමයන් වහන්ස! කුඹුරක් සකස් කරමි" යි හේ කීය. බුදුරජාණන් වහන්සේ එ දවස අන් කිසිත් නොබැණ විහාරයට වැඩම කළහ. පසුදත් උන්වහන්සේ බමුණා කෙත සකස් කරන්ම, ඔහු වෙතට වැඩියහ. වැඩ "බමුණ! කුමක් කරන්නෙහි?" යි ඇසූහ. "ගෞතමයන් වහන්ස! කුඹුරක් සාන්නෙමි" යි කී විට පෙරළා විහාරයට වැඩියහ. පසු පසු දවස්වලදී ද එහි වැඩම කොට එසේම බමුණා විචාරත් ම, ගෞතමයන් වහන්ස! කුඹුර වපුරමි, කුඹුර නෙලමි, ගොයම් රකිමි" යි ඇ විසින් බමුණු කී බස් අසමින් විහාරයට වැඩියහ.

මෙසේ කිහිප දවසක් ගෙවා එක් දවසෙක බමුණු තෙමේ "භවත්! ගෞතමයන් වහන්ස! ඔබවහන්සේ මේ කුඹුර සකස් කරන්නට පටන් ගත් දා සිට දිනපතා මෙහි අවුත් ඒ ගැණ මාගෙන් කරුණු විචාරන්නාහු ය, යම් ලෙසකින් මාගේ අදහස් ලෙස ගොයම් පැසී හිඳේ නම්, ඔබවහන්සේට ද කොටසක් බෙදා දෙන්නෙමි, ඔබවහන්සේට නොදී මම මෙය එකලා ව නොකමි, මෙ තැන් පටන් ඔබවහන්සේ මාගේ යහළුවෙකැ" යි කීයේ ය. විත දවසක් යත් ම ගොයම පැසිනා. බමුණා පැසී හිය ගොයම බලා සෙට ගොයම දවනෙමි යි දැවුමට කළයුතු කටයුතු සියල්ල පිළියෙල කොට තිබීය දී එදා ම රැයෙහි වට මහා වැස්සෙක් සියලු ගොයම දියෙහි පා කොට හැරියේ ය. කුඹුර සැස තබන ලද්දක් මෙන් වී ය. බුදුරජාණන් වහන්සේ එහි පළමු වැඩිය දින යෙහි ම ගොයම නැසී යන බව දුටු සේක. බමුණා පසුදා උදැසන කුඹුර බලන්නෙමි යි එහි හියේ සිස් කුඹුර දැක උපන් බලවත් ශොක ඇත්තේ එදා මම "ශ්‍රමණ ගෞතම! ඔබවහන්සේ මා මේ කුඹුර සකස් කරන්නට පටන්ගත් දාසිට මෙහි ආවහු ය, මමත්

මේ ගොයම පැසී කපා කොටා ගත් විට ඔබවහන්සේට කොටසක් බෙදා දෙන්නෙමි, ඔබවහන්සේට නො දී නො කන්නෙමි, මෙතැන් පටන් ඔබවහන්සේ මාගේ යහළු' යි කීමි, මාගේ ඒ අදහස මුදුන් පැමිණියේ නැතැ''යි සිතමින් කෑම් බීම් වළකා ඇඳ වැතිර හොත්තේ ය. බුදුරජානන් වහන්සේ බමුණා නො කා නො බී ඇඳ වැතිර නිදන කල්හි ඔහුගේ ගෙදොරට වැඩිය සේක. ඔහු බුදුරදුන් එහි වැඩිය බව අසා ''මාගේ යහළු මෙහි කැඳවා ගෙණ අවුත් වඩා හිඳුවාලවු''යි පිරිවර දෙනාට කීයේ ය. ඔවුහු එසේ කළහ. බුදුරජානන් වහන්සේ වැඩහිඳ ''බමුණු කොහි දැ?'' යි අසා ''කාමරය තුළ නිදන්නේය'' යි කී කල්හි ''බමුණු මෙහි කැඳවවු''යි කැඳවා ඔහු අවුත් පසෙක හුන් කල්හි ''බමුණ! මේ කිමැ?''යි අසා වදාළ සේක. ''භවත් ගෞතමයන් වහන්ස! ඔබ වහන්සේ මා කුඹුර සකස් කරන්නට පටන් ගත් දා සිට එහි ආවහු ය, මමත් ගොයම් පැසී ගිය කල්හි ඔබ වහන්සේටත් කොටසක් බෙදා දෙන්නෙමි,යි කීමි, එහෙත් මාගේ ඒ අදහස නො ද නිපන්නේ ය, එයින් මා තුළ හටගත් ශොකය බලවත්ය, මට බත් ද නො රුස්නේය''යි බමුණා කී කල්හි බුදුරජානන් වහන්සේ ''බමුණ! දනිහි ද ශොකය කුමක් නිසා උපනි දැ?'' යි විචාරා ''නො දනිමි භවත් ගෞතමයන් වහන්ස! ඔබවහන්සේ දන්නහු නම් කියවු''යි කී කල්හි ''බමුණ! මම දනිමි, ශොකය ඉපදෙනුයේ තෘෂ්ණාව නිසා ය, භයෙක් හෝ වේ නම් එද ඉප-දෙනුයේ තෘෂ්ණාව නිසාය''යි වදාරා මේ ධර්ම දෙශනාව කළ සේක.

තණ්හාය ජායති සොකො තණ්හාය ජායති භයං,
තණ්හාය විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයන්ති

තෘෂ්ණාව හෙතු කොට ශොකය උපදි. තෘෂ්ණාව හෙතු කොට බිය උපදි. තෘෂ්ණාවෙන් මිදුනහුට ශොකයෙක් නැත. බියෙක් කොයින් වේද.

තණ්හාය ජායති සොකො = තාෂ්ණාව නිසා ශොකය උපදි.

තණ්හාය ජායති භයං = තෘෂ්ණාව නිසා බිය උපදි.

තණ්හාය විප්පමුත්තස්ස = තෘෂ්ණාවෙන් මිදුනහුට.

නත්ථි සොකො කුතො භයං = ශොකයෙක් නැත. බියෙක් කොයින් වේද.

එහි **තෘෂ්ණා** නම්: ඇස් – කන් – නාස් ඇ සදොර උපදනා හෙද විසින් අටෝරාසියක් වූ ලෝභය යි. රූප – ශබ්දාදී වූ අරමුණුවල ගැලීම බැඳීම බැස ගැණීම නිසා සත්ත්වයන් තුළ තෘෂ්ණාව උපදී.[1]

මෙසේ උපදනා මේ තෘෂ්ණාවෙන් මිදී සිටියේ රහතුන් වහන්සේ ය. එහෙයින් උන්වහන්සේට ශොක – භය තබා සසර කිසිත් ගැහැටෙක් නො වන්නේ ය. නැත්තේ ය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි බ්‍රාහ්මණ තෙමේ සෝවන් පලයෙහි පිහිටියේ ය.

අන්‍යතර බ්‍රාහ්මණ වස්තුව නිමි.

---

1. 14 6. 'දුක්ඛසමුප්පාදං' යනු බලනු.

මූණ බලා පිදූ කැවුම්

16 — 7.

එක් දවසක් බුදුරජාණන් වහන්සේ අසූ මහාශ්‍රාවකයන් ප්‍රධාන කොට ඇති පන්සියයක් භික්ෂූන් පිරිවර කොට ඇති සේක් රජගහ නුවරට පිඬු පිණිස වැඩියාහුය. උත්සව දවසක් වූ එදා උන්වහන්සේ කැවුම් පැස් කරපිට ගන්වා ගෙණ නුවරින් නික්ම උයනට යන තරුණයන් පන්සියයක් දුටුසේක. ඔවුහු ද බුදුරජුන් දැක වැඳ නික්ම ගියහ. එක් භික්ෂූ නමක්හටත් කැවුමක් පිළිගණ්ණු මැනැවැයි නොදකීහ. බුදුරජාණන් වහන්සේ උන් එතැනින් ගිය වේලෙහි "මහණෙනි! කැවුම් වළඳහු දැ"යි භික්ෂූන්ගෙන් ඇසූහ. භික්ෂූන් "වළඳන්නට කැවුම් කොහි දැ"යි අසා සිටි කල්හි "කැවුම් පැස් කරපිට ගන්වා ගෙණ යන තරුණයන් කිම නොදුටුවහු?"යි විචාළ සේක. "ස්වාමිනි! මෙබඳු ගැටවරයෝ කවරක්හට නම් කැවුම් දෙත් දැ"යි කී කල්හි "මහණෙනි! ඔවුන් මමත් තොපත් කැවුම්වලින් නොදපැවරූහ, එහෙත් මහණෙනි! කැවුම් අයිතිකරුවෝ භික්ෂූන් පස්සේ එන්නාහ, කැවුම් වළඳ මයන්නට ඕනෑ ය"යි වදාළ සේක. බුදුවරුනට වනාහි එක් පුද්ගලයකු කෙරෙහි හෝ ඊෂ්‍යාවක් චිත්තප්‍රදෝෂයෙක් නැත. එහෙයින් මෙසේ වදාරා භික්ෂූන් හැර ගෙණ රුක්මූලෙක සෙවනෙහි වැඩහුන්සේක.

ඒ තරුණයෝ ද පස්සේ වඩනා මහසුප් මහාතෙරුන් දැක උපන් සෙනහ ඇත්තෝ ප්‍රීතිවෙගයෙන් පිරිපුන් සිරුරු ඇත්තාහු පැස් බහා තබා පසඟ පිහිටුවා තෙරුන් වැඳ කැවුම් පැස් පිටින් ම ඔසවා ගෙණ "ස්වාමිනි! කැවුම් පිළිගත මැනැවැ"යි තෙරුන් ඇයද සිටියහ. එකල්හි උන්වහන්සේ "මේ අපගේ නිලෝගුරු බුදුරජාණන් වහන්සේ භික්ෂුසඞ්ඝයාත් සමග රුක්මුල්හි වැඩහිඳිනා සේක, එහෙයින් තමුසේලාගේ ඔය කැවුම් පැස් ගෙණ ගොස් භික්ෂුසඞ්ඝයාට බෙදා පිළිගන්වාලවු"යි කීහ. ඔවුහු "ස්වාමිනි! යහපතැ"යි ආපසු හැරී තෙරුන් සමග ම ගොස් කැවුම් පිළිගන්වා කැවුම් වළඳනා සැටි බලමින් එකත් පස්ව සිට වළඳා අවසන්හි පැන් පිළිගැන්නූහ. එකල්හි ඇතැම් භික්ෂූන් වහන්සේ "බලනු මැනැවි, මොවුහු මූණ බලා කැවුම් දුන්හ, බුදුරජුන්ට වේවයි, අසූමහාසවිවන්ට වේවයි, කැවුම් වළඳන්නට නොදපිළිගන්වා මහසුප් මහාතෙරුන් දැක උන්වහන්සේට පැස් පිටින් ම ගෙණවුත් දුන්හ, උන්වහන්සේගේ නියමයෙන් බුදුරජුන්ට හා අනෙක් දෙනා වහන්සේටත් කැවුම් ලැබිනැ"යි අවමන් කළහ.

බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූන්ගේ මේ කතාව අසා "මහණෙනි! මපුත් මහසුප් වැන්නෝ දෙවිමිනිසුනට ප්‍රිය වෙත්. දෙවිමිනිස්සු ඔවුන්ගේ මහත් ගුණයෙහි පැහැද මහත් ගුණය ම සලකා ඔවුනට සිවු පසය පුදති"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවෙදිනං,
අත්තනෝ කම්මකුබ්බානං තංජනෝ කුරුතෙ පියන්ති.

ශීලයෙන් හා ප්‍රඥයෙන් යුක්ත වූ ධර්මයෙහි පිහිටියා වූ සත්‍යය දන්නා වූ තමාගේ කටයුතු කරන්නා වූ ඒ පුද්ගලයා, ජන තෙමේ ප්‍රිය කොරෙයි.

සීලදස්සනසම්පන්නං = ශීලයෙන් හා ප්‍රඥයෙන් යුක්ත වූ.

මෙහි **ශීල** නම්: ප්‍රාතිමොක්ෂසංවර-ඉන්ද්‍රියසංවර-ආජීවපාරිශුද්ධි-ප්‍රත්‍යයසන්නිශ්‍රිත යන සිවු පිරිසිදු සිල් ය[1]. ශීලශබ්දය හා සමස්ත ව සිටි **දස්සන** ශබ්දයෙන් කියවෙනුයේ මාර්ගඵලසම්ප්‍රයුක්ත වූ සම්‍යග්දෘෂ්ටිවෛතසික ය යි. එය මෙහි **චතුර්දශකරඬගයෙහි** එන **සම්මාදිට්ඨිකථායෙහි** කියා ඇත.

ධම්මට්ඨං = ධර්මයෙහි පිහිටියා වූ.

ධම්මට්ඨ නම්: ධර්මයෙහි පිහිටියේ ය. නවලෝකොත්තරධර්මය ප්‍රත්‍යක්ෂ කෙළේ ය.

සච්චවෙදිනං = සත්‍යය දන්නා වූ.

චතුරාර්‍යසත්‍යය සොළොස් අයුරකින් දැන සිටියේ **සච්චවෙදී** නම්. ස්‍රොතාපත්තිමාර්ගඥානය නිවන අරමුණු කොට සිටියේ, දුඃඛසත්‍යය වෙන් වෙන් කොට දැනීම - සමුදයසත්‍යය දුරුකිරීම-නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීම-මාර්ගසත්‍යය වැඩීම යන කෘත්‍ය සතර එක්වට ම සිදු කරන්නේ ය. සකෘදාගාමී මාර්ගඥානාදී වූ මාර්ගඥන තුන ද මේ කෘත්‍ය සතර මෙසේ ම සිදු කරණ බැවින් සත්‍යවෙදීභාවය සොළොස් අයුරකින් වන්නේය, යි වදාළ සේක. එක් ම මාර්ගඥනයෙකින් එකක්ෂණයෙහි මේ කෘත්‍ය සතර සිදු වන්නේ, ප්‍රදීපයත් පෙරපසු නොව එක්වට ම පහන්වැටිය දැවීම-අඳුරුනැසීම-ආලෝකය පැතිරවීම-තෙල්ගෙවීයෑම යන කෘත්‍ය සතර සිදුකරන්නා සේ ය. පිළිවෙළින් පහළ වන ලොකොත්තර මාර්ගඥන චතුෂ්කය, පහළ වූ ඒ ප්‍රථම-දවිතීය-තෘතීය-චතුර්ථ අවස්ථාවන්හි මෙකී කෘත්‍ය සතර සිදු කරන්නේ ය. එක් එක් මාර්ගී

1. 4. 10. 'සීලවතං' යනු බලනු.

ඥානය පහළවන අවස්ථායෙහි නිවන අරමුණු කොට පහළ වනුයේ චතුස්සත්‍යධර්මයන් පරිඥානාධිගමය ප්‍රහාණාධිගමය සාක්ෂාත් ක්‍රියාධිගමය භාවනාධිගමය යන චතුර්විධ අධිගමය සිදු කරමින් ම පහළ වනුයේ ය.

අත්තනො කම්මකුබ්බානං = තමාගේ කටයුතු කරන්නා වූ.

මෙහි තමන්ගේ කටයුතුය, යි වදාළේ ශීල-සමාධි-ප්‍රඥා සඞ්ඛ්‍යාතශික්ෂාත්‍රය යි. **"අත්තනො කම්මං නාම තිස්සො සික්ඛා"** යනු අටුවා. මෙ කී ශික්ෂාත්‍රය පුරණුයේ තමාගේ කටයුතු කරන්නේ නම.[1]

තං ජනො කුරුතෙ පියං = ඒ පුද්ගලයා ජන තෙමේ ප්‍රිය කෙරෙයි.

සිලදස්සනසම්පත්තං-ධම්මට්ඨං-සච්චවෙදිනං-කම්මකුබ්බානං යන මෙ කී පද සතර සිටියේ **තං** යනු වෙසෙසාය. මෙ කී පදයන්ගෙන් කියන අරුත් රඳා සිටියේ සාමාන්‍ය ජීවිතයක් ඇත්තකු කෙරෙහි නො වේ. විශිෂ්ට ජීවිත ඇත්තකු කෙරෙහි ම ය. ඒ විශිෂ්ටයා නම් ලොවට පින් කෙත් වූ රහතුන් වහන්සේය. කරුණු දත් ලොකීය මහාජන තෙමේ ප්‍රිය කරන්නේ රහතුන් වහන්සේට ය. රහතුන් වහන්සේ ම ලොකීය මහාජනයාට ප්‍රිය වෙති. උන්වහන්සේ නැති තැන, ආත්මාලය හැර සසුන් පිළිවෙත දිවිමෙන් රක්නා සිල්වත් තෙමේ ම ප්‍රිය වේ. තමන්ගේ වැඩ කටයුතු සලසා දෙන තමාගේ වැඩට රුකුල් දෙන දුශ්ශීලයාත් දුශ්ශීලයාගෙන් එසේ වැඩ කටයුතු සිදුකර ගන්නා වූ දුශ්ශීල වූ වංචනික වූ ඇතැම් දෙනාට ප්‍රිය වේ. ඒ දෙදෙන ම ගුණ නසන්නෝ වෙති. දුසිල් පැවිද්දා දුසිල් ගිහියා නසන්නේ ය. දුසිල් ගිහියා දුසිල් පැවිද්දා නසන්නේ ය. ඔවුහු මෙහි නො ගැණෙති. අජාසත් රජුට දෙව්දත් ප්‍රිය විය. දෙව්දත්හට අජාසත් රජ ප්‍රිය විය. දෙදෙන ම ගුණයෙන් නැසුනාහ. විඥ වූ ලොකීය ජන තෙමේ රහතුන් වහන්සේටත් රහතුන් වහන්සේ ගිය මග යන්නවුනටත් හැමදා පුද සැලකිලි දක්වනු කැමැත්තේය.

ධර්මදෙශනාවගේ අවසානයෙහි ඒ සියලු තරුණයෝ සෝවන් පලයෙහි පිහිටියාහු ය.

පංචශතදාරකවස්තුව නිමි.

---

1. 16. 1. 'අත්ථංහිත්වා' ,, ,,

ප්‍රශ්නයට පිළිතුරු නො දී පිරිනිවීම

16 — 8

එක් දවසක් අනැගැම්පල පත් මහාතෙරනමක් වෙතට ගිය උන්වහන්සේගේ සද්ධිවිහාරිකයෝ "ස්වාමීනි! ස්වාමීන් වහන්සේට විශෙෂාධිගමයෙක් ඇත්තේ දැ?" යි විචාළාහු ය. එවිට ඒ ස්ථවිරයන් වහන්සේ "ගිහියෝත් අනැගැම්පලට පත් වෙති, රහත් බවට පැමිණ ම මොවුන් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමි"යි එහිලා ලජ්ජිත ව කිසිවක් නො කියා ම කලුරිය කොට ශුද්ධාවාස බඹලොව උපත්හ. එකල්හි උන්වහන්සේගේ සද්ධිවිහාරිකයෝ හඬා වැලප බුදුරජුන් වෙත ගොස් වැඳ හඬ හඬා ම පසෙකට වී හුන්හ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ "කිම මහණෙනි! හඬහු?"යි අසා වදාළ සේක. "ස්වාමීනි! අපගේ උපාධ්‍යායයන් වහන්සේ කලුරිය කළහ"යි කීහ. "මහණෙනි! ඒ එසේය; අමුත්තක් නො සිතවු, මේ වනාහි එකාන්ත ධර්මයෙකි, මැරෙණු වළකාලනු නො හැකිය"යි වදාළ විට "ස්වාමීනි! එසේ ය; අපිදු දනිමු, අපි උපාධ්‍යායයන් වහන්සේගෙන් 'ස්වාමීන් වහන්සේ විසින් විශෙෂාධිගමයෙක් ලද දැ?'යි ඇසී මු, එහෙත් උන්වහන්සේ කිසිත් නො බැණ කලුරිය කළහ, එය අපට දුකැ"යි කීහ. "මහණෙනි! නො සිතවු, තමුසේලාගේ උපාධ්‍යායයන් විසින් අනාගාමී ඵලය අත්පත් කරණ ලද්දේ ය, ගිහියෝ අනාගාමීඵලයට පත්වෙති, එහෙයින් මා විසින් එය ලබන ලදැ'යි කීම ලජ්ජාවට කරුණු ය, රහත් බවට පැමිණ ම කියමි' යි සිතූ ඒ තැන තමුසේලාට කිසිත් නො බැණ කලුරිය කොට ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙහි ඉපිද ගත්තේ ය, මහණෙනි! අස්වැසෙවු, නො හඬවු, තමුසේලාගේ උපාධ්‍යාය තෙමේ කාමයෙහි නො බැඳුනු නො පැටලවුනු සිත් ඇතිබවට පැමිණියේ වනැ"යි වදාරා මේ ධර්මදෙශනාව කළ සේක.

ඡන්දජාතෝ අනක්ඛාතෙ මනසා ච ඵුටෝ සියා,
කාමෙසු ච අපටිබද්ධ චිත්තෝ උද්ධංසොතෝති වුච්චති ති.

(යමෙක්) නිවනෙහි හටගත් ඡන්දය ඇත්තේ වේ ද සිතින් පහස්නා ලදුයේත් වේ ද කාමයන්හි නො ඇලුන සිත් ඇත්තේ වේ ද හෙතෙමේ උද්ධංසොත යි කියනු ලැබේ.

ඡන්දජාතෝ = හටගත් ඡන්දය ඇත්තේ වේ ද.

මෙහි **ඡන්ද** නම්: කත්තුකම්‍යතාකුශලචඡන්දය යි. ශමථවිදර්ශනා භාවනාදිකුශලධර්මයන් කරණු කැමැති බව ලකුණු

කොට සිටියේය. කුසල්දහම් කිරීමෙහි බලවත් කැමැත්ත යි. බලවත් උත්සාහය යි. ඒ බලවත් කැමැත්තට උත්සාහයට පැමිණියේ උපන් බලවත් කැමැත්ත ඇතියේ **ඡන්දජාත** නම්. **"කත්තුකම්‍යතාවසෙන ජාතඡන්දෝ, උස්සාහසම්පයුත්තෝ"** යනු අටුවාය.

අනාකඛාතෙ = නිවනෙහි.

අසවලා විසින් කරණලද යි හෝ නිල පිත ආදිය දිසා දිවණ්ඩ සංස්ථානයෙන් මෙබඳුය යි නොකිව යුතු බැවින් නිවන **අනාකඛාත** නම්[1] **"නිබ්බානං කි අසුකෙන කතං වා නීලාදිසු එවරූපං වාති අවත්තබ්බතාය අනාකඛාතං නාම"** යනු අටුවා.

මනසා ච ඵුටෝ සියා = සිතින් පහස්නා ලදුයේත් වේද.

සෝතාපත්ති – සකදාගාමි – අනාගාමී යන මගපලසින් තුනෙන් පහස්නා ලදුයේ මෙකී මගපලසින් තුනෙන් නිවන අරමුණු කොට සිටියේ තුන් මග තුන් පල සිතින් පිරී සිටියේ මෙසින් නියන ලද්දේ ය. **"හෙට්ඨිමෙහි තීහි මග්ගෙහි ඵලචිත්තෙනාපි ඵුටෝ පූරිතෝ භවෙය්‍ය"** යනු අටුවා.

කාමෙසු ච = කාමයන්හි ද.

කාම නම්: වත්ථුකාම කෙලෙස කාමයෝ ය[2].

අප්පටිබද්ධචිත්තෙනා = නොඇලුනු නොබැඳුනු සිත් ඇත්තේ වේ ද.

අනාගාමී මාර්ගයාගේ වශයෙන් කාමරාගය පැහිම් හෙතුයෙන් රූපාදී වූ වත්ථුකාම කෙලෙස කාමයෙහි නොඇලුනු නොබැඳුනු සිත්ඇත්තේ **අප්පටිබද්ධචිත්ත** නම්. **"අනාගාමිමග්ගභාවසෙන කාමෙසු ච අප්පටිබද්ධචිත්තෙනා"** යනු අටුවා.

උද්ධංසොතොති වුච්චති = උඩුං සෙන යි කියනු ලැබේ.

මෙසේ නිවන් ලැබීමෙහි ලා හටගත් කත්තුකම්‍යතාකුසලච්ඡන්දයෙන් උත්සාහවත් වූ සෝතාපත්ති ආදී වූ යට මගපල සිත්වලින් නිවන අරමුණු කොට සිටි රූපාදිපංචකාමයෙහි නොඇලුනු නොවැටුනු සිත් ඇති පුද්ගල තෙමේ අවිහ නම් ශුද්ධාවාස බ්‍රහ්මලොකයෙහි ඉපද එතැන් පටන් පිළිසිඳ ගැණීම් විසින් අකනිට්ඨ බඹලොවට යනුයේ උඩුබලා පැවැති ප්‍රතිසන්ධි-

---

1. 14. 6. 'දුක්ඛස්ස ච අනික්කමං' යනු බලනු.
2. 2. 4. 'මා කාමරතිසන්ථවං' ,, ,,

ස්‍රොතස ඇති බැවින් **උද්ධංසොත** යි කියනු ලැබේ [1] **"එවරූපො භික්ඛු අවිහෙසු නිබ්බත්තිත්වා තතො පට්ඨාය පටිසන්ධිවසෙන අකණිට්ඨං ගච්ඡනෙතා උද්ධං සොතොති වුච්චති"** යනු අටුවා.

ස්වකීය උපාද්ධ්‍යායයන් වහන්සේගේ කලුරිය කිරීමෙහිලා හඬා වැටුනු සද්ධිවිහාරික භික්ෂූන් අමතා බුදුරජානන් වහන්සේ "තමුසේලාගේ උපාද්ධ්‍යාය තෙමේ මේ කියූ උද්ධංසොත වැනිය"යි වදාළ සේක.

ධර්මදේශනාවගේ අවසානයෙහි ඒ භික්ෂූහු රහත්බවෙහි පිහිටා ගත්හ. ධර්මදේශනා තොමෝ මහාජනයාට වැඩ සහිත වූය.

අනාගාමිස්ථවිරවස්තුව නිමි

---

1. 2. 1. 'අරියානං ගොචරෙරතා' ,, ,,

නන්දිය හා රෙවතී

16 — 9

බරණැස් නුවර සැදැහවත් කුලයෙක් විය. එහි පුතෙක් උපන. හේ නමින් **නන්දිය** නම් ය. මවුපියන් සේ ම සැදැහැවත් ය. තුනුරුවන් කෙරෙහි පහන් ය. මහාසඞ්ඝයාට උවැටන් කරන්නේ ය. ඔහු වැනි විය පැමිණි කල්හි මවුපියෝ තම ගෙය ඉදිරි යෙහි වූ ගෙයි මසිලනුවන්ගේ දුවක වූ රෙවතී නම් කුමරිය නන්දිය කුමරුට බිරිය කොට කැඳවා ගෙණ එන්නට කතාබස් කළහ. ඕ තොමෝ සැදැහැ නැත්තී ය. තොදෙන සුලු ය. එහෙයින් නන්දිය එබන්දියක බිරිය කරන්නට කැමැති නැත. නන්දියගේ මවු, රෙවතියගේ ගෙට ගොස් "දුව! තී අපගේ ගෙට භික්ෂුසඞ්ඝයා වහන්සේ වැඩම කොට වළඳන්නට භිඳිනා තැන් ගොම පිරිබඳ කොට අසුන් පණවා තබා නම් පාත්‍රාධාර පිරිසිදු කොට තබා නම් භික්ෂූන් වහන්සේ වැඩම කළ කල්හි පාත්‍ර ගෙණ වඩා භිඳුවා ඛඩරායෙන් පැන් පෙරා තබා වළඳ අවසන් කළ විට පාත්‍ර ගෙණ සෝදා නම් එසේ ඒ කටයුතුවල යුහුසුලු වන්නී නම් මපුතු සිත් ගන්නට සමර්ථ වන්නීය" යි කිහ. ඕ තොමෝ එතැන් පටන් නන්දියගේ ගෙට ගොස් ඒ සියල්ල මැනැවින් කළා ය. එකල නන්දියගේ මවුපියෝ "පුත! ඇ අපගේ අවවාදය පිළිගෙණ දැන් ඒ කටයුතු සැදැහැතිව පහන් සිතින් කරන්නීය" යි දැන්වූහ. නන්දිය එය පිළිගත් පසු දවස් නියම කොට ආවාහය කළහ. ඉන්පසු නන්දිය, බිරිය අමතා "සොඳුර! තී භික්ෂුසඞ්ඝයාටත් මාගේ මවුපියන්ටත් මෙසේ උවැටන් කරන්නී නම් මේ ගෙයි සියලු සමපත් තිට වන්නී ය, එහෙයින් ඒ කටයුතුවල යුහුසුලු වන්නැ" යි කීය. ඕ තොමෝ ද "මැනැවැ" යි පිළිගෙණ ටික කලක් සැදැහැ ඇත්තියක සේ හිමියාට උවැටන් කරන්නී දෙපුතු කෙනකුන් වැදූ ය. මේ අතර නන්දියගේ මවු පියෝ කලුරිය කළහ. ගෙයි තුබූ සියලු සමපත් නන්දිය අතට පත් වූය. නන්දිය ද මවුපියන් කලුරිය කළ දා සිට මහාදානපතීව භික්ෂුසඞ්ඝයා වහන්සේට දන්වැට තැබී ය. දුගී මගී යාචකා-දීන්ට ද දන් දුන්නේ ය.

ඔහු මෑත කාලයෙහි බුදුරජුන් වෙනින් බණ අසා ආවාස පිදීමෙහි අනුසස් සලකා ඉසිපතන මහාවිහාරයෙහි ගබඩා සතර කින් යුත් ගෙයක් කරවා ඇඳ පුටු ආදිය ගෙන්වා තබා අතුරුවා ඒ ආවාස ගෙය පූජා කරන්නට බුද්ධ ප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේට දන් දී අවසන් කොට බුදුරජුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන් වක්

කෙළේ ය. බුදුරජුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන් වක්කරත්ම ඔහුට තව්තිසා දෙව්ලොව සියලු දිශාවන්හි දෙළොස් යොදුන්නක් තැන් පැතිර ගත් යොදුන් සියයක් උස් වූ සත්රුවන් මුවා දෙවඟනන් ගෙන් පිරුණු දෙව් විමනක් පහළ වී ය.

මේ අතර කාලයෙහි දවසක් මහාමෞද්ගල්‍යායන මහා සථවිරයන් වහන්සේ දෙව්ලොව චාරිකාවට වැඩ ඔහුගේ විමන අසල සිටියාහු තමන් වෙත පැමිණි දෙව්පුතුන්ගෙන් "මේ දෙව ඟනන්ගෙන් අතුරු සිදුරු නැතිව පිරී ගත් දෙව්විමන කවරක්-හුගේදැ"යි ඇසූහ. "ස්වාමීනී! නන්දිය නම් ගැහැවි පුතු විසින් පසුගිය දා ඉසිපතනයෙහි ශාස්තෘන් වහන්සේට විහාරයක් කරවා පුදන ලද්දේ ද, ඔහු පිණිස මේ විමන මෙහි පහළ වීනැ"යි ඒ දෙවපුත්‍රයෝ විමන්හිමියා දක්වමින් කියා පෑහ. එහි සිටි දිව්‍යප්-සරාවෝ ද උන්වහන්සේ දැක විමනින් බැස "ස්වාමීනී! අපි නන්දියගේ මෙහෙකරු දෙවඟනෝ ව මෙහි උපන්නෙමු, එහෙත් ඔහු නො දක්නමෝ කළකිරුණෝ වම්හ, ස්වාමීනි! මිනිස් සැපත් හැර දෙව්සැපත් ගැණීම මැටිපයක් බිඳ දමා රන්පයක් ගන්නා සේ ය, එහෙයින් මෙහි එනු පිණිස ඔහුට කියනු මැනැවැ"යි දන්වා සිටියහ.

මෞද්ගල්‍යායන මහාසථවිරයන් වහන්සේ දෙව්ලොව සැරි සැරුම් අවසන් කොට දෙව්ලොවින් බැස බුදුරජුන් වෙත පැමිණ "ස්වාමීනි! කළ පින් ඇති මිනිසුන් මිනිස් ලොව ජීවත්ව සිටිය දී ම ඔවුන්ට දෙව්ලොව විමන් පහළ වේ ද?"යි ඇසූහ. "මුගලන්! තමන් විසින් ම ඒ දක්නා ලද්දේ නො වේ ද? ඇයි; මාගෙන් විචාරණ්නේ?"යි බුදුරජුන් අසා වදාළ කල්හි "ස්වාමීනි! එසේය, මා විසින් දක්නා ලදැ"යි මුගලන් තෙරණුවෝ සැලකළහ. එවිට බුදුරජාණන් වහන්සේ "මුගලන්! මේ කුමක් කියහු? බොහෝ කල් නොරට විසූ පුතකු හෝ සොහොයුරකු හෝ නොරටින් එනු ගම්දොර සිටි කිසිවෙක් දැක වහා දුව ගොස් 'අසුවලා ආයේ ය'යි නැයන්ට දන් වන්නේ ය, එකල ඔහුගේ නැයෝ තුටු පහටුව වහා ගෙන් නික්ම ගොස් දරුව! ආයෙහි?"යි ඔහු සතුවින් පිළිගන්නේ ය, මුගලන්! එපරිද්දෙන් මෙලොව කළ පින් ඇති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ මෙලොව හැර පරලොව ගිය කල ඔවුන් දසවැදෑරුම් දෙව්පඬුරු ගෙණ මම පළමු පිළිගණිමි, මම පළමු පිළිගණිමි, යි දෙවියෝ ඉදිරියට පැමිණ සතුවින් පිළිගණිත්"යි වදාරා මේ ධර්මදේශනාව කළ සේක.

චිරපවාසිං පුරිසං දූරතෝ සොත්ථිමාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං.

තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතිව ආගතන්ති.

බොහෝ කල් නො රට විසූ පුරුෂයකු, දුර රටින් සුවසේ ආවහු (දැක) නෑයෝ ද මිතුරෝ ද හිතවත් යහළුවෝ ද (ඒ) ආවහු සතුටින් පිළිගණිත් ද,

එපරිද්දෙන් කළ පින් ඇත්තකු මෙලොවින් පරලොවට ගියහු (ඔහු විසින් කළ) පුණ්‍යයෝ (දුර සිට) ආ ප්‍රිය නෑයකු පිළිගන්නා වූ නෑයන් මෙන් පිළිගණිත්.

චිරප්පවාසිං = බොහෝ කල් නො රට විසූ.

යමෙක් යම් රටෙක නූපන්නේ නම් ඔහුට ඒ රට නො රට වන්නේ ය. එබඳු තමන් උපන් රට හැර අන් රටකට ගොස් කුමකට වුව ද එහි රැඳී සිටියේ **චිරප්පවාසී** නම්.

පුරිසං = පුරුෂයකු.

පුරිස නම්: ලොකයෙහි උසස් තැන ගත්තේ ය. දෙව්බඹුන් පරදවා ගුණ දහම් පිරීමෙන් නැගී සිටියේ ද පුරිස් තෙමේ ය. කුමක් නිසා එසේ කියා ද? යත්:- සම්මා සම්බුදුවනු පුරුෂ-යක්හු ම, පසේබුදුවනු පුරුෂයක්හු ම සක්විතිවනු පුරුෂයක්හු ම අයත් කොට සිටියේ ද එහෙයිනි. **"පුරි උච්චෙ ඨානෙ සෙති පවත්තති, අථ වා නිස්සයස්සාභිලාසං පුරෙති, පුං අපායං රිසති හිංසති වාති = පුරිසො"** යනු එහිලා ඒ ඒ ඇදුරන් විසින් කළ විවෘතියි.

දූරතො = දුරින්. දුර සිට.

සොත්ථිං ආගතං (දිස්වා) = සුවසේ ආවහු (දැක)

ඤාතිමිත්තා (ව) = නෑයන් හා මිතුරෝ (ද) [1. 2].

සුහජ්ජා ච = හිතවත් යහළුවෝ ද.

සුහජ්ජයෝ නම්: හිතවතුන් කෙරෙහි මැනැවින් හිතවත්ව වසන්නෝ ය. හිතවතුන්ගේ එ ලොව මෙ ලොව දියුණුවෙහිලා දවරැදෙක්හි හිත දී දුක් සැප දෙක්හි සමාන පැවැතුම් ඇත්තෝ ය. **"සුහදයභාවෙන සුහජ්ජා"** යනු කීයේ එහෙයිනි.

අභිනන්දන්ති ආගතං = ආවහු පිළිගණිත්. ඊමට සතුටු වෙත්.

---

1. 3. 9. 'අඤ්ඤෙවාපිච ඤාතකා' යනු බලනු.
2. 6. 3. 'පාපකෙ මිත්තෙ' ,, ,,

ගෙට ආවහු **'සඞ්ගත'** යි වදන් පමණින් හෝ සිප ගැණීම් පමණින් හෝ දෙහොත් නගා වැදීම් පමණින් හෝ නන් වැදුරුම් වූ පඬුරු එළවීමෙන් පිළිගණිත්. ඔහුගේ ඊම ගැණ සතුටු වෙත්. **"නං ඝාගතන්ති ඛවනමත්තෙන වා අඤ්ජලිකරණමත්තෙන වා ගෙහං සම්පත්තං සන්ත කාමාසඞ්කාරපණ්ණාකාරාභිහරණ වසෙන අභිනන්දන්ති"** යනු අටුවා.

තථා එව = එ පරිද්දෙන් ම. ඒ ලෙසින් ම.

කවර පරිදි ද? යත්:- කලක් පිට රට වැස ගෙට පැමිණියකු, නෑ මිතුරු සුහදයන් විසින් ප්‍රිය වචනයෙන් සිප වැළඳ ගැණීමෙන් ආචාර කිරීමෙන් පඬුරු එළවීමෙන් පිළිගන්නා පරිද්දෙනි.

කතපුඤ්ඤං අපි = කළ පින් ඇත්තහු ද.[1]

අයං ලොකා = මේ ලොවින්. මේ මිනිසත් බවෙන්.

පරං ගතං = පරලොවට ගියහු.

පුඤ්ඤානි පතිඝණ්හන්ති = පුණ්‍යයෝ පිළිගණිත්.[2]

මෙහි **පරං** යන්නෙන් ගැණෙනුයේ දෙව්ලොව ය කළ පින් ඇත්තකු පරලොව ගිය විට මවු පිය නැන්හි සිටියා වූ ඔහු විසින් කරණ ලද පුණ්‍යයෝ දිව්‍ය වූ ආයුෂ-වණ්-සුඛ-යශස-අධිපති භාවයන් හා දිව්‍ය වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන දස වැදුරුම් පඬුරු පිළිගත්වා ඔහු පිළිගණිත්. මේ මෙය අටුවාව කියූ සැටි:- **කෙනෙවාකාරෙන කතපුඤ්ඤම්පි පුග්ගලං ඉමස්මා ලොකා පරලොකං ගතං දිබ්බං ආයුවණ්ණසුඛයසආධිපත්තෙය්‍යං දිබ්බං රූපසද්දගන්ධරසඵොට්ඨබ්බන්ති ඉමං දසවිධ සණ්ණාකාරං ආදාය මාතාපිතිඨානෙ ඨිතානි පුඤ්ඤානි අභිනන්දන්ති පතිගණ්හන්ති"** යනු.

පියං ඤාති ඉව ආගතං = (ගෙට) පැමිණි ප්‍රිය නෑයකු පිළිගන්නා නෑයන් මෙන්.

---

1 1. 11. 'කතපුඤ්ඤ' යනු බලනු.

2. 1. 13. 'පුඤ්ඤං මෙ කතන්ති' ,, ,,

, 4 8. 'කතඛබ්බං කුසලං බහුං' ,, ,,

මෙ ලොවදී ගෙට පැමිණි ප්‍රිය නැයකු පිළිගත්නා සෙසු නැයන් මෙන් පිළිගණිත්.

ධර්මදේශනාවගේ අවසානයෙහි බොහෝ දෙන සෝවත් පලාදියට පැමිණියාහු ය.

නන්දියවසතුව නිමි.

සකලජනධර්මාර්ථසංග්‍රහාභිලාෂී **පණ්ඩිත** අම්බලම්ගොඩ **ධම්මකුසල** සථවිරයන් කල **"සද්ධර්මසාගර"** නම් වූ **ධර්මපදවර්ණනා**යෙහි ප්‍රියවර්ණාත්මකඡොඩශ තරඞ්ගය නිමියේ ය.